# SEPALIKA

WRITTEN BY CHERRY MINSHI



@Shan

@Shan

# සේපාලිකා - හැදින්වීම

**මෙහි**

**PDF**

**ශෙයා**

**කිරීම**

**හා**

**whatsapp channel, telegram channel ඔස්සේ තැන් තැන් වල පල කිරීම තහනම් !!**

**චරිත හැදින්වීම...**

රධ්‍ය ෂනව් හෙලාක්ෂ - කොලඹ ප්‍රධානපෙලේ පිරිමි පාසලක උප ප්‍රධාන ක්‍රීඩා නායකයෙකි.. පාසලේ ප්‍රසිද්ද චරිත අතර සිටින මොහු තරමක් ආඩම්බර ගතිපැවතුම් උසුලයි.. මිතුරන් අඩු ගුප්ත අමුතු අයෙකි..

වරද් ෂනෙරු උද්යෝග්‍ය  - ඉහත කී පාසලේම අධ්‍යාපනය හදාරන පාසලේ කැපී පෙනෙන සිසුවෙකි.. තමාට හැකි අයුරින් සැහැල්ලුවෙන් දිවි ගත කරන මොහු අන් සැමගේම ගෞරවාදරයට පාත්‍ර වූ අයෙකි...

සෙනුක වත්සල් - ෂනෙරුගේ සිව්මිතුරන්ගෙන් හොදම මිතුරාය.. පාසලේ මොහු නොදන්නා දෙයක් නොමැති තරම් ය.. හඩ නළුවෙක් සහ මාධ්‍යවෙදියෙක් ලෙස යම් ප්‍රසිද්ධියක් උසුලයි.. මොහු ෂනෙරු සෙවනැල්ලක් මෙන් පසුපසින් හිදී..

@Shan

ආධ්‍ය ෂදිල් ඉෂාක්‍ය - රධ්‍යගේ වැඩිමහල් සොහොයුරා මෙන්ම හොදම මිතුරාය.. පුහුණු වෛද්‍යවරයෙක් ලෙස කොළඹට ආසන්න රෝහලක පුහුණුව ලබයි..

අයුක ශල්‍ය සිංහවංශ - රධ්‍යගේ හොදම මිතුරෙක්, පාසලේ ප්‍රධාන ශිශ්‍ය නායකයා සහ පාසලේ ක්‍රිකට් කණ්ඩායමෙ නායකයා වශයෙන් ක්‍රීඩා කරයි.. දේශපාලන පවුල් පසුබිමක හැදී වැඩුණු අයෙකි..

සුපුනි අරාශි - ෂනෙරුගේ සිව්මිතුරන්ගෙන් අයෙකි.. විලාසිතා සහ ඉවුම්පිහුම් ගැන වැඩි උනන්දුවක් දක්වයි.. කරුණාවන්ත අයෙකි..

කියාන් සදේශ් - රධ්‍යගේ හොදම මිතුරෙකු වන අතර පාසලේ උප ප්‍රාධාන ශිශ්‍ය නායකයා සහ රගර් කණ්ඩායමෙ නායකයා වශයෙන් ක්‍රීඩා කරයි..

මහීශා ජොවානා - ෂනෙරුගේ සිව්මිතුරු සමාජයේ වඩාත් නිහඬ චරිතයයි..

චමිරු අශ්වින් සිංහවංශ - පාසලේ ශිශ්‍යහට බණ්ඩයේ සාමාජිකයෙක් වන අතර සෙල්ලක්කාර තරුණයෙකි..

**සැඩ සුලගකට ගසාගෙන යන මලානික කණාමැදිරි එළියක් අහමබෙන් පැටළුණු සේපාලිකා මලක සුවද කෙසේ හදුනාගනීවිද..?**

**-සේපාලිකා-**

https://www.youtube.com/watch?v=ycP8Twg0VGA

@Shan

SEPALIKA OST

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..

- කථාංගයේ යම් යම් කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

**- අර කතාව මෙ කතාව ගැන මතක් වුනාට කමක් නැහැ ඒ චරිත පිලිබඳ මෙහි තැන තැන කමෙන්ට නොකරන්න තරම සංයමයක්, ගරුත්වයක් සහ බුද්ධියක් තබාගන්න.. අනවශ්‍ය කරදර ඇතිකරන්න එපා.. ලියන්නාටත් කියවන්නාටත් ඔබෙ සංයමයක් නැති ක්‍රියා වලින් අපහසුතාවයක් විතරයි ඇතිවෙන්නෙ..**

ස්තූතියි ❤

**shenun**

**- කතාවෙ ප්‍රධාන චරිත වල නම දුන්නු ෂෙනුන් අයියට හුහක් හුහක් ස්තූතියි..**

**('▽'ʃ♡ƪ)**



@emiliagrace94 ❤❤

@Shan

# 1 කොටස

" සුරගනක් විලස..ඈ සැරසිලා.. එන තුරා හිදිමි මෙ යාමෙ.. සොදුරියේ නුබ කොහේ කොතනදෝ.. දකින තුරු ඉවසුම නෑ-ටහික්කෙන්න කවුද යකෝ අපේ පේලියේ පුටු ටික අරන් ගිය පරයා.."

මේ පිටුව විතරයි පුතේ කියලා අපිට සම්පූර්ණ බහිශ්ශ්‍රාවී පද්ධතියම උගන්නලා ලැබ් එකෙන් එලියට දැම්ම දොළහ එම් එකේ හතලිස් දෙනාම බයෝ මැඩම්ගෙ පරම්පරාවම මතක් කර කර පන්තියට ගාටද්දි මේ දවස්වල ට්‍රෙන්ඩිං සින්දුවක් සද්දෙට කිය කිය ආපු සෙනුකයා බෙරිහන් දුන්නේ මුලු පන්තියෙම අවදානෙ ඌට ගන්න ගමන්.. සෙනුකයා අපේ එකා.. අවදානෙමයි ඉල්ලන්නෙ..

" මොකද බං බෙරිහන් දෙන්නෙ.. අප්පද බොල කෝ මේ පෝලිමේ පුටු ටික.."

මමත් කට බලියගෙන පොත් ටික මේසේ උඩට දැම්මෙ පෝමලින් ගඳ ගහන ලැබ් එක අස්සෙ පුප රත් කර කර හෙන වූ ලෝඩ් එකකුත් හිර කරගෙන එලියට බැහැලා ඇවිත් කන්න ගද්දි අපි හතරදෙනා හිටපු පෝලිමේ එක පුටුවක්වත් නෑ කියලා දැක්ක වෙලෙයි..

" මොනිටර............යෝහ්.. අපේ පුටු කොහෙද යකෝ.."

පංතියේ එකෙක්ගෙ හොටු ලේන්සුවේ ඉදන්ම වග කියන පංති මොනිටරයා තඩි නාමලේඛනෙත් උස්සන් කන්නඩි දෙක අස්සෙන් අපි උන්න අන්තිම පෝලිම දිහා බලද්දී මම පංතියෙන් එලියෙ දොරකොඩට ගිහින් හොට දාලා බැලුවේ කොරිඩෝවෙ වත් පුටු ටික තියේද බලන්න.. ඇති ලබ්බක් නෑ..

" උබලගෙ ලංකට් එකේ ඉදන් මගෙන් අහන්න එපා යකෝ.. පොඩ්ඩක් බලපන් පල්ලෙහා පොඩි උන් පොලක් දාලා.. ඒකට උස්සන් ගියාද දන්නෙ නෑ.."

අපේ පංතියේ මොනිටරයා එහෙම කියාගෙන ස්ටාෆ් රූම් එක පැත්තට යද්දි මමයි සෙනුකයායි මතීශයි හශානුයි පහලට ගියේ අපි හතරදෙනාගෙ පුටු ටික උස්සගෙන එන්න..

@Shan

" ඔය පොඩි පක්කො ඉන්නව බං.. හිතාගෙන ඉන්නෙ උන් අලිප්පුපෙන් ඇවිත් කියලා.. හිටපන්කො අද තමයි ඕකුන් දැනගන්නෙ අපෙ හැටි.."

සෙනුකයා පාරේ ගලකට පයින් ගහගෙන ගියපු පාර ගල ගිහින් ඉස්සරලා තිබ්බ පොකුණට 'ජබොහ්' ගාලා වැටුනේ පොකුනේ දැහැමින් සෙමෙන් වාසය කරන ඉබ්බට පපුවෙ අමාරුව හදවලා.. ඌ බයට ගලෙනුත් ලිස්සලා වතුරේ.. මේකා සතෙක්ටවත් නිදහසේ ඉන්න දෙන එකෙක් නෙමෙ..

" සෙනුකයා කෑගහන්න එපා යකෝ.."

මතීශ ඇස් වලින් අඹ ගහ යට දාපු බෙන්ච් වල ඉඳගෙන විසාල සාකච්ඡාවක් කරන අපේ ඉස්කෝලේ ප්‍රිෆෙක්ට් කවුන්සිල් එකේ ටොප් බෝර්ඩ් එක පෙන්නලා කියද්දි මාත් හොම්බ දාලා බැලුවේ අලුතින් පත් වුනු අය කවුද කියලා හොයාගන්න..

අපි හිටියේ දොළහා වසරේ තුන්වෙනි වාරේ.. බයෝ කරන උන් ඉන්නවානම් දන්නවා ඇති ඔය සාපකාරී පද්ධති පාඩම් ටික සෙට් වෙන්නේ ඔය කාලෙට තමා.. මුලදි සුන්දරයි කියලා අල්ලං ආවට මොකද ස්ත්‍රී ප්‍රජනක පද්දතිය පටන්ගත්තු තැනදිම ප්‍රජනනයත් එක්කම එපාවෙලාම ගියා.. මෙ කාලෙ කියන්නෙ ඉතින් ඩිප්‍රෙශන් වල මූලික පියවර වගේ තමා.. හෙන ගේමක් ගහලා තමයි වැඩ ටික ගොඩ ගහගන්නෙ නැතුව ශේප් එකේ ඇදගෙන යන්නේ..

" හැපෝ මුන් ටිකද බං හෙඩාලා වෙලා තියෙන්නෙ.. නෙද්දකින්.. මුන් ටික එකතුවෙලා පොඩි උන්ට දැන් ඉස්කෝලෙම එපා කරවාවි.."

සෙනුකයා කට ඇද කරන් පෙන්නුවේ අයුක අයියව.. අපේ ඉස්කෝලේ ප්‍රිෆෙක්ට් බෝඩ් එකට ගන්නෙ ඒ ලෙවෙල් කරලා ඉවරවුනු අයියලව.. මොකද දහතුනෙන් හුගක් අය ඉස්කෝලෙ එන්න හොරයි ඉතින් ප්‍රිෆෙක්ට්ලා එන්නෙ නෑ.. එතකොට ඒක විනයට බලපානවා කියලා ඒ ලෙවෙල් ඉවරවුනු අයියලා රිසාල්ට්ස් එනකල් ඉස්කෝලෙ ප්‍රිෆෙක්ලා විදියට වැඩ කරනවා.. අනික ඔය ටොප් බෝඩ් එක කියන්නෙ හෙන ඔලුකාරයෝ ඉන්න එකක්.. ඉස්කෝලෙ ඉන්න බ්‍රයිට්ම ලමයි තමයි ඔය සෙට් එකට වැටෙන්නෙ.. බ්‍රයිට් කිව්වෙ ඉගනගන්න ඒවා නෙමෙ අනිත් කුසලතා පැත්තෙනුත් ඉස්කෝලෙට යමක් කරන්න ඕන ප්‍රිෆෙක්ට් කෙනෙක් වෙන්න නම්..

@Shan

අයුක අයියා අපි දන්න විදියටනම් හෙන පොශ් ෆැමිලි එකක පොරක්.. වැඩි කතාබහක් නෑ හැබැයි ඩයල් එක පට්ට හැන්ඩ්සම්.. මම දැකලා තියෙනවා අපේ ඉන්ට්‍රැක්ට් ක්ලබ් එකේ වැඩ වලට එහෙම එනවා බ්ලෙසර් එක දාලා හෙන තදයා.. මම දවසක් කට ඇරගෙන බලාගෙන හිටියා උගුඩු පැටියා වගේ..

අයුක අයියා හෙඩා වෙද්දි ඩිපියුටි හෙඩා වෙලා හිටියේ කියාන් අයියා.. ඒ ඩයල් එකත් ඉස්කෝලෙ රගර් ටීම් එකේ කැප්ටන්.. දන්නවනෙ ඉතින් රගර් ගහන කොල්ලෙක්නම්.. ඇගපත නලුවා වගේ හදාගෙන ඉන්නෙ.. උංට මල පයිනවා සෑහෙන්න.. මේවා ඉතින් ඉස්කොලෙ සෑහෙන්න ප්‍රසිද්ද රහස්.. කියාන් අයියගෙ එහාපැත්තෙ ෆයිල් එකක් බල බල හිටියේ රධ්‍ය අයියා.. මම එයා ගැන නම් ලොකුවට අහලා නෑ හැබැයි ඉස්කෝලෙ කැඩෙට් සාජන් කියලනම් සෑහෙන්න ප්‍රසිද්දයි.. අපි උදේට ඉස්කෝලෙ එද්දි පොඩි කාලෙ මම දැකලා තියෙනවා රධ්‍ය අයියා යටි ගිටියෙන් කෑගගහා මාච් පාස්ට් කරනවා.. ඒ කාලෙනම් පොර හෙන ගිනිපුකාරයා.. දැන් කියලත් වෙනසක් නැතුවැති ඉතින්.. රධ්‍ය අයියා ගාව තව දෙන්නෙක් හිටියා ඒ අයියලා එච්චර ඉතින් මම දන්නෙ නෑ.. මම කිව්ව උන් ටිකනම් ඉතින්.. සෙලිබ්‍රිටිලා වගේ තමා.. අල්ලපු වැටෙ ඉන්න කෙල්ලොත් මුන්ට පැනි හලාගෙන ඉන්නෙ..

" ඒ පොඩිඑකා.. මෙහෙවරෙන්.."

මම කල්පනා ලෝකෙන් මිදුනේ හශාන් නවය වසරේ මල්ලිලා ටිකකට කතාකරන සද්දෙන්.. නවය කියන්නෙ ඉතින් සිගිති පාතාලේ තමා..

" කියන්න අයියෙ.."

ඇට්ටර පාට පොඩි එකෙක් ඇහුවේ කොලර් එකත් උඩට උස්සගෙන හෙන චන්ඩි පාට එකෙන්.. මටනම් පේන්න බෑ ඔහොම උන්ව.. එහෙමයි කියලා රන්ඩුවට යන්න බෑනෙ.. මම කරබාගෙනම හිටියා..

" මල්ලි ඔය පුටු අපේ ක්ලාස් වල ඒවා.. ඔයාලා ඒවා අරගෙන ගියානම් ඇයි ගෙනැත්දෙන්න බැරි.."

මතීශ කොහොමත් ඇල්වතුරත් නිමලා බොන එකා නිසා මුලින් හිමින්සැරේ ඇහුවා..

@Shan

" ආ ඒව අපි දන්නෑ අයියෙ.. අපිට බෑ ඔවා අඳින්න.. ඒ වරෙන් බං යන්න.."

පොඩි පගයා පාට් එකක් දාලා මතීශයගෙ ඇගේ වැදීගෙන යන්න යද්දිනම් මට මාරයා ආවෙස වුනා.. ඇයි යකො ඉන්ටවල් එකෙ කන්නත් නෑ මොන කරුමයක්ද.. ගෙනත්දෙන්න බැරි.. අලිපුපෙන් ඇවිත් නැනෙ..

" ආ ආ මල්ලි මෙහ් සද්දෙ අඩුකරගනින් කරුනාකල්ලා.."

මම අතත් මිට මොලවගෙන අහද්දි සෙනුකයා මාව අල්ලගත්තෙ ප්‍රිෆෙක්ට්ස්ලා ඉස්සරහා රන්ඩුවෙන්න ගියොත් කෙලවෙනවා කියලා දන්න නිසායි.. ඒ වුනාට මටනම් මේ ලබ්බෙ පාට් පේන්න බෑ..

" ඇයි අඩුකරගත්තෙ නැතිවුනොත් අයියා ගහන්නද.."

ඌ කට කොනෙන් හිනාවෙලා කියද්දී මම අල්ලගත්තෙ උගෙ කොලර් එකෙන්.. එහෙමම කොලර් එක පහලට නමලා ශර්ට් එකේ නොපෙනෙන දූවිලිත් ගසපු මම උගෙ උරහිසට අත් තියලා උගෙ මූනටම බරවුනා..

" පාඩුවෙ කියපු දේ කරපන්.. හරී.."

මම ඇහිබැමත් ලං කරගෙන උගෙ මූනට ලංවෙලා කියද්දී ඌ බයවෙලා වගේ බලන් හිටියේ මගේ දිහා..

" අයියේ අපි ගෙනැත්දෙන්නම්.. මෙතන රණ්ඩුවෙන්න ඕන්නෑනෙ.."

පොඩි එකාගෙ යාලුවෙක් කලබලෙන් පුටු ටික අරන් යන්න යද්දී මම බැලුවේ පිටිපස්ස.. බලද්දි කියාන් අයියා එනවා අපේ දිහා බලන් මේ පැත්තට.. කලබලයක් කියලා හිතුවද දන්නෑ..

" මොකද මෙතන කරන්නෙ.. පන්තිවලට යනවලා.. තමුසෙලා පීරියඩ් කට් කරනවද..??"

කියාන් අයියා අහද්දි සෙනුරයා ඔලුව වැනුවෙ නෑ කියන්න පිස්සෙක් වගේ..

" තමුසෙලගෙ පංතිය මොකක්ද..??"

" ට්වෙල් එම් අයියේ.."

@Shan

" අහ් බයෝ නේද.. මෙහෙ මොකද රවුම් ගහන්නෙ බං.. ක්ලාස් එකට පලයන්.."

කියාන් අයියා සෙනුකයගෙ පිටට ගහද්දි මම ශේප් එකේ එතනින් ලිස්සලා පන්තිය පැත්තට ආවා..

(අවුල් වගේත..=) අදහස් කියමන)

ප.ලි.

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..

- කථාංගයේ යම් යම් කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

මාගේ දුක්ගැහැට ඉවසාගෙන අල්ලපු ඩෙස්ක් එකේ දැහැමෙන් සෙමෙන් පෞල් කන කවර ලෝචියාගෙන් පිං පිණිස..

@lchi_jk තැන්ක්ස් පනේ...❤❤

@Shan

# 2 කොටස

" එක්ස්කියුස් මී මැඩම්.. වරද් ෂනෙරු..????"

මම හිටියේ ලාස්ට් පීරියඩ් එකේ හෙනටම කලකිරිලා.. ලාවට නිදිමතකුත් සෙට් වෙගෙනම ආපු නිසා අම්මා දවල්ට මොනවා හදලද කියලා හිත හිත බාගෙට ඇස් වහන් උන්නු මම උඩ ගිහින් ඇහැරුනේ පිසික්ස් මැඩම්ගෙ කටේ සද්දෙට.. ඒකනම් කටක් නෙමෙ ආයෙ ඉතින් වැඩක් නෑ කතාකල්ලා..

" ෂනෙරු..... "

" යස් මැඩම්.."

" ඔයාට එන්න කියලා පණිවිඩයක්.. ගිහින් බලලා ඉක්මනට එන්න දරුවෝ.. මම තාපමිතිය කොටස ඉවරකරන්න ඉන්නේ.."

" හරි මැඩම්.."

මම එහෙම කියන ගමන් කෝකටත් නිල් පෑන සාක්කුවේ ඔබාගෙන පන්තියෙන් එලියට යද්දී පන්තියෙන් එහා බැම්මට හේත්තුවෙලා කලිසම් සාක්කුවල අත් ඔබාගෙන හිටියේ රධ්‍ය අයියා.. මම එලියට ඇවිත් මනුස්සකමට උං එක්ක හිනාවෙද්දී මේ යකා ගැස්සිලා වගේ මගේ දිහා බලලා මටත් රවලා පඩිපෙල දිහාට යන්න ගත්තෙ මාව බලු බෙට්ටක් ගානටවත් ගනන් නොගනිද්දි.. මමත් ඉතින් මටත් මොකෝ කියලා හිතාගෙන උගෙ පස්සෙන් ගියේ ප්‍රිෆෙක්ට් රූම් එකට..

" ෂනෙරු.. අපි නෙක්ස්ට් වීක් වෙද්දි ස්පෝර්ට්ස්මීට් එකේ ප්‍රැක්ටිසස් පටන්ගන්නවා.. ඔයාගෙ ක්ලබ් එකේ වැඩ කොහොමද..??"

අයුක අයියා මගෙ දිහාවත් නොබලා මොනවදෝ ලිය ලිය අහද්දි තමයි මට මතක් වුනෙත් ඉස්කෝලෙ බැඩ්මින්ටන් ක්ලබ් එකේ කැපා මම කියලා.. මෙ වැඩ අස්සෙ පංතියි අරවයි මෙව්වයි ගෙදර ප්‍රශ්නයි එක්ක උසස් පෙළේදි මට ක්‍රීඩා බාහිර ක්‍රියාකාරකම් එහෙම්පිටින්ම මග ඇරුනා.. ක්ලබ් එකේ වැඩ බලන්නෙත් මම දන්න කියන මල්ලිල්ල දෙන්නෙක්.. ඒ නැතුව මම පැත්ත පලාතෙවත් ගියේ නෑ..

@Shan

" කරගෙන යනවා අයියෙ.."

" හොදයි.. දැන් ජිම් එකේ මීටින් එකක් යනවා ස්පෝර්ට්ස් ක්ලබ් වල කැප්ටන්ස්ලගෙ.. ඔයා එහෙට යන්න.. ඒ ගමන් මේක සයෝන්ට දෙන්න පුලුවන්ද..?"

" හරි අයියෙ.."

මම අයුක අයියා දීපු ක්ලියර් බෑග් එක අරගෙන ජිම් එක පැත්තට දුවද්දි ජිම් එකේ කොනක හදලා තිබ්බ ස්ටේජ් එක උඩ රධ්‍ය අයියයි සයෝන් අයියයි මොනවදෝ කියවනවා.. වටේ ඉන්න උනුත් අහගෙන ඔලු වනනවා.. මම ඉතින් ඇගවෙන්නෙ නැතිවෙන්න හිමින්සැරේ කට්ටිය අස්සට රිංගගත්තා..

යකෝ මේ රධ්‍ය කාරයා කතාකරන්නෙත් හරි කෙලින් පහසුවෙන් හිටගෙන.. මටනම් ඔහොම ඉන්න බෑ පුතෙ මම විනාඩි පහෙන් පහට ඇගේ බර කකුල් වලට මාරු කර කර හෙන වන්නමක් නටනවා එක තැන ඉන්න බැරි ලෙඩේ නිසා.. ඒ අතින් බලද්දි මෙන්න කොම්ලො..

රධ්‍ය අයියා කතාකරද්දි කටහඩ හරි ගැඹුරුයි ඒ වගේම බය හිතෙනවා.. ඔච්චවට තමයි ඉතින් කෙල්ලො ආස.. මම ඉතින් ඌ කියවන දිහා පුරුදු විදියටම උගුඩු පැටියා වගේ බලන් ඉද්දි එයාගෙ ඇස් මගෙ ඇස් එක වෙලාවක අහම්බෙන් හම්බුනා.. ඇත්තටම එයා මගේ ඇස් පහු කරගෙන යන්න ගිහිල්ලත් ආපස්සටම ඇවිත් නැවතුනා.. ඒ එක්කම රධ්‍ය අයියා කියන්න ගිය එක පැටලිලා බොරුවට කැස්සෙ මමත් ඉක්මනින් අහක බලාගන්න ගමන්.. ඒ වුනාට මේ මිනිහා හරි අමුතුයි.. මම බිම බලාගෙන මීටින් එක ඉවර වෙනකල් ඉදලා ආපහු පංතියට එන්න ආවෙ සයෝන් අයියට ක්ලියර් බෑග් එකත් දීලා..

දැන් ඉතින් අම්මගෙන් කතා කෝටියක් විතර අහගන්න වෙනවා මම ස්පෝර්ට් එකක් කරද්දි.. හවස් වෙලා ගෙදර එන්නෙ අරකයි මෙකයි ඉස්කෝලෙ වැඩ කරන්නෙ නෑ.. එපාම වෙනවා.. අනික අම්මට මම කොච්චර කරත් මදි.. මම පන්තියේ දෙවෙනියා වුනොත් අහන්නෙ ඇයි පලවෙනියා නොවුනේ කියලා.. මම කරන කිසි දේක අම්මට ඇගයීමක් තිබුනෙ නෑ.. ඔය වගේ දේවලුයි මගෙ නිදහස් වෙන්න දගලන මනසයි කටයි නිසා ගෙදර අයයි මමයි පරස්පරවිරෝදී වෙලා පවුලෙ අය එච්චරට මාත් එක්ක එකතුවක් නෑ.. සිරාම කතාව මම ඉන්නෙ නිකන් පවුලෙ බල්ලා මාක් වැටිලා කොන් වෙලා..

@Shan

අපේ තාත්තා මම පොඩි කාලෙදිම අම්මගෙන් අයින්වෙලා වෙන කසාදයක් බැදලාලු ඉන්නේ..අම්මා මාව පොඩි කාලෙ වඩාගෙන දික්කසාද නඩුවට ගියාට මට එහෙමට තාත්තව මතක නෑ.. මම එදා අර ස්ටේජ් එක උඩ ඉන්න නඩුකාරයා දිහා මොකාද එකා වගේ බලන් හිටියා මිසක් වෙන මොකුත්ම මගෙ මතකෙට එන්නෙ නෑ.. මොකද එතකොට මම හෙන පොඩියි..

ඔය තාත්තා ගියේ මම ඉපදුනාට පස්සෙයින් අරකයි මේකයි මගෙ අවාසනාව කිය කිය අම්මගෙ පැත්තෙ උදවිය මට එහෙමට කැමැත්තක් නෑ.. මට ඔව්වට පොඩි කාලෙ රිදුනා සැහෙන්න කොන්වෙලා උන්නු නිසා.. ඒවුනාට දැන්නම් මට පරමාණුවක් තරම්වත් ගානක් නෑ මට මොකා කොච්චර කතා කීවත්..

මම මේ හෙන පොර වගේ කතාකලාට.. සිරාම කතාව මම එහෙම හෙන පොශ් එකෙක් නෙමේ.. මමත් මේ ඉස්කෝලෙට ආවෙ ස්කොලශිප් පාස් වෙලා.. ඊටකලින් මම හිටියේ ආච්චිගෙ ගෙදර.. ගමේ.. කතරගම පැත්තෙ.. පස්සෙ අම්මට ඕනවුනා මම මෙහෙ දාලා උගන්නන්න.. ඉතින් හයේදි මම මෙහෙට ආවේ පට්ට ගොඩයා වගෙ.. හය වසරෙදි මාව හෙනට කොන් වෙලා පේන්න ගද්දි මට මගෙ හිතේ තිබ්බ දුක හිතෙන හැඟීමවත් කියන්න බලු බල්ලෙක් උන්නෙ නෑ.. හොඳම යාලුවා වුනත් සෙනුකයාටවත් මේවා කියන්න පුලුවන් කමක් නෑ.. ඔහොම තමයි කොළඹ ජීවිතේ මගේ පටන් ගත්තෙ..

අම්මගෙ සහෝදරයොනම් හෙනට ඉගනගත්තු මිනිස්සු.. ඉතින් අපි නැවතිලා හිටියෙත් අම්මගෙ අක්කගෙ ගෙදරක.. ඒගොල්ලොන්ට මෙහෙ ඉඩම් එහෙම තියෙනවා.. පවුලෙ බාගයක්ම වැඩකරන්නෙ හොස්පිටල් එකේ.. සර්ජන්ලා කියයි මේට්‍රන්ලා කියයි.. ඉතින් ඔක නිසාම තමා මම දැන් බයෝ කරන්නෙ.. මම ආසාවෙන් හිටියෙ පොලිටිකල් සයන්සුයි ලොජිකුයි කරන්න.. ඒ වුනාට ඒ හීනේ තිත තියවුනේ හුග කාලෙකට කලින්.. ඉතින් මට සිද්ද වුනා මගේ හීන සින්න වෙන්න ඇරලා අම්මගෙ හීනෙට පන දෙන්න.. පන දෙන්න කිව්වාට මොකද මගෙ නම් පන දැනටමත් ගිහින් තියෙන්නෙ..

මුලදි කොලඹ මෙලෝ රෙද්දක මම යන්න දන්නෙ නෑ හෙන බයයි අම්මා එක්ක විතරයි එහෙ මෙහෙ යන්නෙත්.. පස්සෙ පස්සෙ ඉතින් ඉස්කෝලෙ ඌශ්නෙ මටත් ගහලා අට වසරෙදි විතර මගෙත් දිව ඇඹරිලා කඩ්ඩෙන් කතාකරන්න හුරු වුනා.. ඔහොම ඔහොම ඉතින් රූපෙයි හැසිරීමයි

@Shan

ඔක්කොම වෙනස් වෙලා දැන් නම් ඉන්නවා කුරුදුවත්තෙන් බැහැපු එකා වගේ.. ගෙදර වුන් සැහීමකට පත් වෙන දේකට තිබ්බනම් තිබ්බෙ රූපෙ විතරයි.. ඒකත් අම්මගෙන් ආපු නිසා..

මම පවුලට බනිද්දි හිතන්නෙපා මම හෙන කුහකයෙක් කියලා.. ඒවුනාට දන්නැද්ද ඕනම පවුලක ඉන්නවා දැහැට පේන්න බැරි එවුන් සෙට් එකක්.. ඉතින් මටත් එහෙමම තමයි.. ඔන්න අපේ ආච්චිඅම්මයි මාමයිනම් මගෙ ඉශ්ට දෙවිවරු වගේ.. ආච්චිඅම්මා එහෙම ජීවිතේ ගැන ලොකු අවබෝදයක් තියෙන මනුස්සයෙක්.. මගෙ හිත හදන්න පුලුවන් මනුස්සයෙක්ට මට ඉන්නෙ ආච්චිඅම්මා විතරයි.. එයත් හරි මගෙ පණත් හරි ඉතින්..

ඉස්කෝලෙ ඉවරවෙලා මම පොත් ටිකත් බෑග් එකේ ඔබාගෙන එලියට ආවේ නුගේගොඩට යන්න.. හවස රිවිශන් නිසා අපේ උන් සේරම ඉතින් නුගේගොඩට තමා.. සෙනුකයා වූ දාන්නෝන කියලා ඉස්කෝලෙ ඇතුලට ගිය නිසා ඉස්කෝලෙ ගේට් එක ඉස්සරහා ලෝගෝ එක ගහපු තැනට වෙලා මමයි හශේනුයි මතීශයි කියෝ කියෝ ඉද්දි මම දැක්කේ කියාන් අයියයි රධ්‍ය අයියයි මොනවදෝ කියව කියව මේ පැත්ත බල බල හිනාවෙනවා.. මම එච්චර ගානකට ගන්නැතුව අහක බලාගත්තෙ හිතට අමුත්තක් දැනෙද්දි.. රධ්‍ය අයියව මම දන්නෙ නෑ.. එහෙව් එකේ ඇයි හැමතිස්සෙම එයා මාව දැක්කහම අමුතුවට හැසිරෙන්නෙ..?? ඒක දන්නෙ ඉතින් උඹම තමයි..

ඒ එක්කම සනුකයා ආපු නිසා මම ඒ පැත්තවත් නොබලා ස්ටේශන් එකට එන්න ආවේ ට්‍රේන් එක අල්ලගන්න..

ට්‍රේන් එක ගැන කියනවනම් ඉතින් ආයෙ කතාකරන්න වැඩක් නෑ සෙනග ෆුට්බෝඩ් එකේ ඉදන්.. මාත් යාන්තම් ෆුට්බෝඩ් එකෙන් එල්ලුනේ ට්‍රේන් එක ස්ටේශන් එකෙන් යද්දිම වගේ.. තා ඩිංගෙන් මෙක මිස් වෙනවනේ..

ට්‍රේන් එක ඇතුලේ ගර්ල් ස්කූල්ස් හතර පහකම කෙල්ලො කිචි බිචි ගගා කියවනවා.. අම්මපා මුන්ගෙ කටවල් නම් කටවල් නෙමෙ.. වක්කඩවල්.. පියුමි හංසමාලිලා පරාදයි..

" ආ නංගේ ක්ලාස් යන්න වගේ.."

" නෑ උබෙ අම්මට හුරුල්ලො ගන්න දෙල්කද පොලට යනවා.."

@Shan

අපේ ඉස්කෝලෙ වෙනුරයා පාඩුවෙ උන්නු කෙල්ලෙක්ට කෝචොක් කරන්න ගිහින් ලෙසටම අහගත්තෙ ඔක්කොම කොල්ලො උඟට හිනාවෙද්දි.. මම කිව්වෙ මම කිව්වෙ.. මුංගෙ කටවල් බෙංගාල බොක්ක වගේ.. ඕකට හිනාවෙවී ඉදපු මම එකපාරට අල්ලන් ඉදිය බාර් එකෙන් අත ලිස්සලා ඇදගෙන වැටෙන්න ගියේ අත එකපාරට පණ නැති වෙලා ගිය නිසා..

මට ජීවිතේට මරණ බය කියන එක දැනිලා තිබ්බෙ නෑ.. ඒ වුනාට මෙ වෙලේනම් ඒක ලෙසටම දැනෙද්දි මාව ෆුට්බෝඩ් එකෙන් ඇදගෙන වැටෙන්න යද්දි මම තද කල්ලා ඇස් දෙක පියාගනිද්දි මට මැවුනේ අම්මගෙ රූපෙ.. සිරාවටම මම දන්නෙ නෑ ඒක ඒ වෙලාවෙ මැවුනේ ඇයිද කියන්න.. අම්මා උදේ 'පරිස්සමින්' කියන වචන ටික ඇහෙනවා ඇහෙනවා වගේ කනට දැනෙද්දි මගෙ අතින් සම්පූර්නෙන්ම බාර් එක ඈතැරුනේ මාව කැගස්සවන ගමන්..

" අම්මාහ්හ්හ්!!!"

මම හිටියේ ඇස් දෙක තද කරලා උණ්ඩි කරලා පියාගෙන.. මගෙ පපුව ගැහෙනවා රේස් දුවන්න වගේ.. ඒත්.. ඒත් මගෙ මූනට දැනෙන හුලං පාරවල් එක්ක මට දැනුනේ මම වැටිලා නෑ කියලමයි.. ඒ එක්කම මගෙ මූණෙ ඇනුනේ සිල්වර් බැජ් එකක්.. ඒකෙ වැල් දෙකක් එල්ලෙනවා.. මෙක අපෙ ඉස්කෝලෙ එකක්.. ඒවුනාට මෙහෙම ඒව තියෙන්නෙ ඉස්කෝලෙ හය දෙනාටයි.. මම එහෙමම හරි සිහියට ඇවිත් කෙලින් වෙන්න හැදුවත් ඒ කටහඩ.. ඒ කටහඩ මගේ කන ලගින් ඇහුනේ මගේ ඇගම සීතල වෙලා යද්දී..

" දගලන්නැතුව ඉන්නවා.. තමුසෙට මොලයක් කියලා නාමයක් නැද්ද ඔයි.."

රධ්‍ය.. ඒ රධ්‍ය අයියගෙ කටහඩ.. මම ඔලුව උස්සලා බැලුවෙ නැතත් මම ඒ කටහඩ අදුනගත්තා..

" ආව්.."

මම දගලලා හැරෙන්න හැදුවත් රධ්‍ය අයියා මාව කිටි කිටියේ බදාගත්තෙ මගේ ඉන වටේ යවලා තිබුනු අත් තව තද කරලා..

@Shan

" දගලන්න එපා අයියෙ.. උඹට ඕන මාවත් වට්ටන්නද..??"

ආයෙමත් කන ගාවට නැමිලා රධ්‍ය අයියා කියද්දි මම ලොකුවට දගලන්නැතුව කෙලින් වුනේ වාටර් නිසා.. එහෙම ඉතින් නොදන්න එකෙක්ට තුරුල් වෙලා යන්න පුලුවන්ද.. ඊටපස්සෙ ඕක ෆොටෝ ගහලා ෆේස්බුක් දැම්මොත් එහෙම ' ආදරය යනු' අරකයි මෙකයි කියලා.. ඊටපස්සෙ එහාවැටේ ගර්ල් ස්කූල් එකේ නැට්ටිච්චියො මූවයි මාවයි එකතුකල්ලා ශිප් එකක් හදලා මුහුදුගත කරයි..

" අයියෙ අත-"

මම කියන්න ගිය එක බල්ලෙක්ටවත් ගනන් නොගෙන රධ්‍ය අයියා කියාන් අයියා එක්ක කියවද්දි මම උගුඩු පැටියා වගේ ඌට තුරුල් වෙලා අහක බලාගෙනම නුගේගොඩට ආවා..

කතාව හොදයිත.. අදහසාක්..

ප.ලි.

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..

- කථාංගයේ යම් යම් කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 3 කොටස

" සොරි අයියෙ.."

නුගේගොඩ ස්ටේශන් එකෙන් බැහැලා සනුකයයි මතීශයයි එක්ක 138ක එල්ලිලා දෙල්කදට යන්න හැරෙද්දිම අපිට අහුවුනේ රධ්‍ය අයියයි කියාන් අයියයි.. ක්ලාස් යන එකත් පැත්තකින් තියලා ඉස්ස ඉස්සෙල්ලාම කියාන් අයියගෙන් කන පුරෝගෙන අහගන්න වුනු නිසා සනුකයයි මමයි මතීශයයි හිටියේ හොර බලල්ලු රෑනක් වගේ බිම බලාගෙන.. කොටින්ම කිව්වොත් කියාන් අයියා බනින බැනිල්ල අහගෙන ඉන්න පුලුවන් රධ්‍ය අයියගෙ රැවිල්ල දැක්කහම මට වූ බරකුත් හීනියට සෙට වුනා..

" සොරි සොරි නෙමේ අයියෙ උබ අතනින් වැටුනනන් එහෙම උබ හිතනවද ඉතුරු වෙයි කියලා.. අනිත් දවසෙ බස් එකේ පලයන්.. ඔක්කොටම කලින් ජීවත් වෙලා ඉන්න එපැයි.. "

" හරි අයියෙ.."

මතීශයා බය වෙලා නහුතෙටම, හිමීට කෙඳිරි ගෑවා.. මටනම් එකට එක කියාගෙන යන්න කටට වචන හෝ ගාලා ගලාගෙන එනවා.. මොකක් වුනත් උන් කියන එකෙත් ලාවට ඇත්තකුත් තියන නිසා මම බෑග් එකේ පටිය කරකෝ කරකෝ පාරෙ තිබ්බ ට්‍රැෆික් ලයිට් එකක් දිහා බලාගෙන උන්නා..

" දැන් පලයන්.. පරක්කු වෙනවා කිව්වනෙ.."

කියාන් අයියා පලයන් කිව්වා විතරයි අපි තුන් හතරදෙනා පිඹගෙන බස් එක දිහාට දුවන්න ගත්තා.. 138 බස් එකට දුවලා යන්න තරම් පුපේ අමාරුවක් අපිට නොතිබ්බත් අර යක්කු දෙන්නගෙ මූනවල් බලන් ඉන්නම බැරි නිසා අපි දුවගෙන ගිහින් එල්ලුනා..

උදේට අම්මා ගෙදරින් එව්ව බත් එක පලවෙනි පීරියඩ් එකේම දෙසලා ඇරියා විතරයි දවසටම මොකුත් නෑ.. ඒ මදිවට මට මේ ටිකේ දරුනුවටම ගැස්ට්‍රයිටිස් හැදිලා ඉන්න නිසා බඩයි පපුවයි දනවා හොඳටම.. සෙනුකයට කියන්නත් හිතිලා මම කාගෙනම ඩයජීන් පෙත්තක් හපලා කාලා

@Shan

පෙනඩෝල් දෙකකුත් ශේප් එකේ බිව්වා.. ඉන්ටවල් එකෙත් කන්න හම්බුනේ නැනෙ.. දැන් තුනට ක්ලාස් පටන්ගත්තාම ඉවරවෙන්නෙ අටට.. ලේසි නෑ කෙමෙස්ට්‍රි චාලක රසායනය මට මෙලෝ ලබ්බක් ඔලුවට යන්නෙත් නෑ ඔලුවෙ කැක්කුම නිසා..

ඔහොම ක්ලාස් එකටත් ගිහින් පලවෙනි පැය දෙකහාමාරෙන් පස්සෙ පොඩි ඉන්ටවල් එකක් දුන්නා.. ලැල්ලට පස්ස තැලිලා දැන් නම් පස්සෙ තියන ඇටකටු හමත් ඉරාගෙන එලියට පැනලා වගේ දැනෙන්නෙ.. මැද්දෙ පෝලිමකට වෙලා හිටිය අපි සර් ස්ටේජ් එකෙන් බැහැලා යනවත් එක්කම නැගිටලා පහල කැන්ටිම පැත්තට ගියා.. ගියත් වැඩක් නෑ පුතෙ මගෙ අතේ සන්තකේටම තිබ්බෙ බස් එකේ යන්න සල්ලි විතරයි.. ඒවුනාට ටොයිලට් එකට යන්න එපැයි..

මමයි හශානුයි ටොයිලට් එකට ගිහින් ඒ බරත් නිදහස් කරගෙන එල්ලියට ආවෙ ශර්ට් එකත් යට කර කර.. එතකොටම අපි ඉස්සරහට ආවේ මහීශා..

මහීශා ගැන කියනවනම් ඒකි ඉතින් කෙල්ලෙක්.. කොල්ලොන්ට එහෙම නම් නැනෙ.. ඒවුනාට මෙතන තියන බයානකම කාරනාව තමයි මූ කෙල්ලෙක් වගේ නෙමේ.. තනිකර කොල්ලෙක්ම වගේ.. මට මහීශා සෙට් වුනේ කොළඹට ඇවිත් ටියුශන් යන්න ගත්තට පස්සෙ.. අපි එක ටියුශන් එකට ගියේ.. ඊටත් එහා ඩයල් එක අපේ ගෙවල් ලග , අපෙ අම්මලා දෙන්නත් හෙනම ෆිට්.. ඔහොම තමයි අපේ යාලුකම පටන් ගත්තෙ.. මොකක් වුනත් ඒකි හෙන හිත හොඳ එකා.. මම කෙල්ලෙක්ට කියලා ආශ්‍රය කරන කෙල්ලොන්ගෙන්, වැඩිපුර ළඟ ඒකි විතරයි.. තව එකියක් ඉන්නවා කැරොල් කරත්තයක් වගේ- කොහොමහරි ක්ලාස් ඉවරවෙලා ඒකියි මමයි ගෙදර යන්නෙ එකට.. සෙනුකයා යන්නෙ කැරොල් කරත්තෙ එක්ක.. අපි හුගක්ම බස් එකේ යනවා අඩුයි.. මහීශාගෙ අම්මා එනවා වෙහිකල් එකෙන් ඒකිව පික් කරන්න.. ඉතින් මටත් ඉබේම ට්‍රාන්ස්පෝට් සෙට් වෙනවා ගෙදරටම..

" මොකද බල්ලො පරක්කු උනේ එන්න.."

මම කිව්වෙ.. මෙකි මට කොටින්ම කතාකරන්නෙත් බල්ලා කියලා..

" ආපු හුවක්කුව හුටු හුටු ගගා එද්දි කොහෙ වෙලාවට එන්නද බං.. "

" ඒකත් ඇත්ත නේ.. මේ උබ කාලද..??"

@Shan

මහීශා ඇහුවෙ නිල්පාට ලන්ච් බොක්ස් එකක් අතේ තියාගෙන..

" මේ මම-"

" උබ කෑවනම් කමක් නෑ මේකත් කාපන්.. අපෙ අම්මා පෑන්කේක් වගයක් දුන්නා උබටත් දෙන්න කියලා.."

මහීශා ලන්ච් බොක්ස් එක බලෙන්ම මගේ ඇගේ ගහලා අමුතු කොලු ගමනකින් පඩිපෙල නැගගෙන උඩට දිව්වා.. මේකි මොකද අද දුවන්නෙ.. මොකක් හරි හොරයක් තමා.. කොල්ලෙක්වත් ඉන්නවද?? නෑනෙ මේකිට කොහෙ කොල්ලොද..?? කෙල්ලෙක්වත් සෙට් වෙන්න යනවද දන්නෙ නෑ.. අහලා බලන්නෝන..

මම ඉතින් දෙයියෝ දුන්නා වගේ ලැබුනු පෑන්කේක් ටික අරුන් තුන්දෙනාටත් දීලා කාලා ටැප් එකෙන් වතුරත් බීලා උඩට ගියා.. පැය බාගෙ ඉවරයි.. ආයෙම සර්ගෙ අහවල් රසායනේ තමා..

ඔහොම ඉතින් ක්ලාස් එකේ සර්ගෙ හිනායන්නෙ නැති විහිලුයි වදනුයි අරවයි මේවයි අස්සෙ පහමාරට ඉවරකරන්නම් කිව්ව ක්ලාස් එක දෙයියන්ගෙ පිහිටෙන් පහයි හතලිස් පහට ඉවර කලා.. ඒකත් සර්ට විට කෝටියක් විතර ලමයි යවපු නිසා..

අපි පහලට යද්දි මහීශා ඉන්නවා බෑග් එකත් කරේ එල්ලගෙන කණුවකට මුවා වෙලා.. මම දැක්කා විතරයි මාවත් ඇදගෙන පාකින් එකට දිව්වා.. අද ආන්ටි ඇවිත් වගේ.. ඇතියාන්තම්.. ඒවුනාට ඇයි මේකි දුවන්නෙ.. මට ඒකනම් සෑහෙන්න ප්‍රශ්නයක්.. අහන්නත් බෑ ආන්ටි ඉන්නවනේ.. මැසේජ් එකක්වත් දාන්නෝන ගෙදර ගියහම..

" සුදුමහත්තයා.. "

සැක් අපේ අම්මා.. අම්මා ඔහෝමමයි.. දෙනෝදාහක් මැද්දෙ වුනත් මට කෑගහලා කතාකරන්නෙ සුදුමහත්තයා කියලා.. මම ඒ කටින් මගෙ නම කියවෙනවා ඇත්තටම අහලා නැති තරම්.. අම්මා සුදුමහත්තයා ගාගෙන කාර් එක ලගට එද්දි මහීශා නෝන්ඩියට බැලුවෙ මගේ දිහා.. මේකි දවසක් ඕක ක්ලාස් එකකත් කියලා මාව නෝන්ඩි කලා.. මම ඉතින් ආන්ටිටත් ගොං හිනාවක් දාලා කාර් එකෙන් බැහැලා අම්මා ගාවට ගියහම අම්මා මගෙන් බෑග් එක ගත්තා.. ඊටපස්සෙ ආන්ටිත් එක්කත් කතාකලා අපි ගෙදරට ආවා..

@Shan

අපේ අම්මා හෙන අමුතු චරිතයක්.. බදාගන්නෙ ඉඹින්නෙ එච්චා මෙච්චා කරන්නෙ නෑ.. හෙන නීති එක්ක ඉන්න නපුරු චරිතයක්.. මාත් එක්ක චලි වුනාට ඉතින් මට ආදරෙයි.. අවුල තියෙන්නෙ වයසෙ වැරුද්දද කොහෙද මමත් පොඩ්ඩක් අම්මා එක්ක කටගහන් යනවනෙ.. දවසෙ තනියෙම ගෙදරට වෙලා ඉන්න නිසා අම්මා ඉන්නෙ හෙන පාලුවෙන්.. මම ගෙදර ආවහම ඉතින් පස්සෙන් එලව එලව දවසෙ වෙච්ච දේවල් කියවනවා.. මම ගෙදර ඉන්න දවස්වල එහෙම අම්මා උයද්දි බැම්මට වෙලා තාත්තගෙ පැත්තෙ උදව්යට බනින්න හෙන ආසයි..

" මහන්සී අම්මා.. ඔලුව කකියනවා පැලෙන්න වගෙ.."

මම කිව්වෙ කාමරේට ගිහින් දොර අඩවල් කරගෙන ශර්ට් එකයි බැනියමයි ගලවන ගමන්..

" රිදෙන්නැතුව තියෙයිද ඉතින්.. ඔහොම නොකා නොබී නිදි මරාගෙන මහන්සි වෙද්දි.. නාගෙන එනවා මම බත් බෙදන්න.. "

" හා.."

මම ටවල් එකත් අරන් අම්මා ඉන්නවද නැද්ද කියලා වටපිට බලලා සුටුස් ගාලා නානකාමරේට රිංගුවා..

අපේ ගෙදර තනි තට්ටුවෙ පොඩි ගෙයක්.. වත්ත එහෙම ටිකක් ලොකුවට තිබ්බා.. කාමර දෙකකුයි සාලෙයි කුස්සියයි නානකාමරෙයි ඉස්තොප්පුවයි.. ඔච්චර තමා..

අපෙ අම්මා ඇහැට කනට පේන්න ඉන්න නිසා ගමෙ ගෑනු අම්මා එක්ක හෙන තරහයි.. ගෑනුනෙ ඉතින්.. මමත් දැන් ලොකු නිසා අම්මත් මිනිහා නැතුව තනියම ගෙදර ඉන්න නිසා අම්මටයි මටයි ගමෙ එක එක කතා හැදිලා තිබුනා.. මම ඕවා හිතට ගන්නැතුව උන්නට ඕවා කියවන ගෑනු දැක්ක ගමන් මන්නෙන් කොටන්න තරම් කේන්තියි.. මෙ සමාජෙ ඉන්නෙම මහ කුහක කාලකන්නි.. අම්මෙකුටයි පුතෙකුටයිවත් ඉන්න දෙන්නෙ නෑ.. ඒකටත් බලු කතාවක් හදනවා.. අද උදෙත් මම බස් හෝල්ට් එකේ ඉද්දි කමනි ඇන්ටි මොකක්දෝ බලු කතාවක් ඒ ගෑනුගෙ දුවත් එක්ක කියලා හිනාවෙනවා මම අහගෙන හිටියා.. මට ඕවට රණ්ඩුවෙන්න යනන්ත් බෑ මොකද මම දවසින් වැඩි හරිය ගෙදර නෑ.. අම්මා විතරයි ගෙදර තනිපංගලමේ.. මොකෙක් හරි අනතුරක් කලත් තරහට, කියන්න

@Shan

බල්ලෙක්වත් නෑ.. හිටියත් මහීශගෙ අම්මා විතරයි ඒත් ආන්ටිලත් ටිකක් එහාට වෙන්නනෙ ඉන්නෙ..

" සුදුමහත්තයා.. ගෙදර ඉන්න දවසක පීල්ල සුද්ද කල්ලා දාන්නකො.. මෙ උඩ රොඩු හිරවෙලා වැස්සොත් එහෙම.."

මම බත් පිගාන අතට අරන් ඉස්තෝප්පුවෙන් ඉදගද්දි අම්මා බැම්මට හේත්තු උනා..

" හා අම්මා.. මම අනිද්දා විතර සුද්ද කරන්නම්.. මෙ ඒකනෙමෙ.."

" ඕ.."

" අපෙ ඉස්කෝලෙ නිවාස තරග පටන්ගෙන අම්මෙ.. මට බැඩ්මින්ටන් ප්‍රැක්ටිස් යන්න වෙයි මෙ ටිකේ.."

" ඇයි ලමයො මෙ තියන වැඩ අස්සෙ ඕවත් පටලගෙන.."

" මාසයයිනෙ අම්මෙ.. මොකෝ ආයෙ ඉස්කෝලෙ යනව කියලයැ.. "

" හ්ම්.. සෙනුක පුතත් ඉන්නව නේද.."

" ඔව් අම්මෙ.. පුලුවන් නම් හෙට මගෙ කිට් එක හොයලා මැදලා තියන්නකො.."

" ම්ම්.. මෙ සුදුමහත්තයට අර පල්ලෙහා ගෙදර කමනි පාරෙදි මොනවහරි කීවද..?"

" නෑ අම්මෙ.. මම යද්දිම බස් එක ආවෙ.. මම ඔය ගැනු බලන්න ගියෙ නෑ.."

" ඒක මිසක්.."

අම්මා සැනසීමෙන් හුස්මක් පහල දානවා මම බලාගෙන.. අනිවාරෙන් ඔය ගැනි මොනවහරි කියන්න ඇති..

" අම්මෙ.. ඔය එක එක ගැනුන්ට පේන්න එලියට බහින්න එපා.. මොනවහරි ගෙදර අඩුපාඩුවක්නම් මම කියලා තියනවනෙ.. ලිස්ට් එකක්

@Shan

ලියලා තියන්ඩ.. මම අරන් එන්නම්.. ඕක මහ ලොකු දෙයක්ද.. පිස්සුනෙ ඔයාටත්.."

" නෑ සුදුමහත්තයො ගෙදර සීනි තේකොල ඉවරවෙලා තිබ්බෙ.. මම ඒකට කඩේ ගියේ-"

" ඔය ගෑනි අම්මපා මගෙන් මැරුම් කනවා.. දුව එක එක ගංජාකාරයො එක්ක බෝක්කු ගානෙ ලගින එක පේන්නෑ.. අපේ ගෙදර වෙන එක තමයි ඒ ගෑනිටත් පේන්නෙ.."

" අනේ මන්දන්නෑ පුතේ.. "

" අම්මා ඕවා හිතනෙපා.. මම සල්ලි හම්බ කරන කාලෙක අපි මෙහෙන් යන්නම යමු.. මටත් තිත්ත වෙලා ඉන්නෙ මේවා අහලා කරලා.."

මම කාපු පිගාන පැත්තකින් තියලා අම්මගෙ ඔලුව අතගාලා කියද්දි අම්මා කලාතුරෙකින් මගේ දිහා බලද්දි දිලිසෙනවා වගේ ඇස් දිලිසුනා.. ඒ වෙලාවටනම් ආදරේ හිතෙනවා.. අම්මා හරි ලස්සනයි..

" හෙට පන්තිද පුතේ.."

" නෑ අම්මා ඒවුනාට එන්න හවස් වෙයි.. ඉස්කෝලෙ තුනහමාර වෙනකන් අමතර පංතියක් දාලා.. මම කාමරේට යනවා අම්මා ලයිට් නිමලා නිදාගන්න.."

මම නිදාගන්න යන්න කලින් අම්මට වැදලා කාමරේට ඇවිත් මෙසෙන් ඉදගත්තා..

මගේ කාමරේ ගත්තොත් ඒකෙ පැත්තක් ඇවිල්ලා පිරිලා තිබ්බෙ ඇනිමි කැරක්ටර්ස් වල පෝස්ටර් වලින්.. නරුටො, සස්කෙ, යෝසන්, රකුසාන්, සෙයිරි, ආශ් එකී මෙකී නොකී ඔක්කොම ඒකේ හිටියා.. ආ තව සෙනුකයා මට මරන තර්ජන කල්ලා ලාන් වංජියි, වෙයි වුෂියෑනුයි බදාගෙන ඉන්න එකකුත් ඒකෙ පැත්තකින් ඇලෙව්වා..ඌ ආස ඒවගෙ එව්වට.. අනික් පැත්ත සමීකරනයි නෝට්සුයි සක්‍රියතා ශ්‍රේනියයි ආවර්තිතා වගුවයි තව ඔය ඔක්සිකරන අනම් මනනුයි ඔව්වගෙන් තමා.. අම්මා කාමරේ පිලිවෙලට තියාගන්න නිසා හොදයි ඉතින්..

@Shan

මම පාස්පේපර් පොත දිගැරගෙන පුටුවෙන් වාඩිවෙද්දි හිත ඉබේටම ඇදිලා ගියේ ඉස්කෝලෙට.. ඔලුවෙ කැක්කුම අඩුවෙලා ගිහින් තිබ්බට මම සිද්දාලේප පොඩ්ඩකුත් ඇඟිලිවලට අරගෙන ඔලුව දෙපැත්තෙ ගාලා කුප්පියට නහය ඔබාගෙන හිටියා.. ඒ සුවදට මම් ආසයි.. මම එහෙමම මෙසෙට ඔලුව තියාගෙන පොඩ්ඩක් ඇස් පියාගත්තා..

" අම්මෙ!!!!!!!!!!!!!"

මම දන්නෙ නෑ කොච්චරවෙලාවක් මට නින්ද ගියාද කියලා මම ගැස්සිලා මෙසෙන් ඔලුව ගත්තේ දවල් කෝච්චියෙන් වැටෙන්න ගිය එක ආපහු මට හීනෙන් පෙනුන නිසා.. මගෙ පපුව ගැහෙනවා එකසිය ගානට.. මම එහෙමම වතුර ජොග්ගුව පිටින්ම කට තියාගෙන බීගෙන බීගෙන ගියා..

දැන් ඉස්කෝලෙ වැඩ කරන්න හිතෙන්නෙත් නෑ මම එහෙමම ඇදට පැන්නෙ නිදාගන්න.. අම්මටයි මටයි තිබ්බෙ හවුලෙ පාවිච්චිකරන ටච් ෆෝන් එකක්.. ෆෝන් එක අම්මා ලග නිසා එෆ්බී පැත්තෙවත් යන්න විදියක් නෑ.. මම එහෙමම ඇද ලග තිබ්බ ජනේලෙට පයින් පාරක් දීලා ජනේලෙ ඇරගෙන ඇදේ හාන්සිවෙලා අහස දිහා බලාගෙන හිටියා.. එලියෙ හුලග හරි සනීපයි.. මට රධ්‍ය අයියව මතක් වුනේ කෝච්චියෙ සිද්දිය හීනෙන් පෙනුනු නිසා.. ඒ එක්කම රධ්‍ය අයියා සම්බන්ද සිදුවීම් හැම එකක්ම ඉක් ඉක්මනින් මගෙ හිතට මතක් වෙගෙන ආවා..

ඇයි එයා මාව දැක්ක ගමන් ගැස්සිලා අහක බලාගන්නෙ..

මට හෙන ප්‍රශ්නයක්.. අනික අද දවසේ රධ්‍ය අයියව කොච්චරවතාවක් නම් හම්බුනාද.. මට නිකන් පිස්සු වගේ.. එයා ස්ටේජ් එකේ පපුවත් ඉස්සරහට දාගෙන කතා කර කර උන්නු හැටි මට මැවිලා පෙනෙද්දි මට මහ කෝල හිනාවක් කට කොනකට ආවා..

" සැහ් මේ මොන මගුලක්ද.."

මම ඒ එක්කම කටට ගහගත්තෙ හිනා ගියපු එක ගැනම ලැජ්ජ හිතිලා.. මෙකනම් පුතේ හොදකට නෙමෙයි.. මම දහ අට වන්නමම නටලා නින්ද යන පොසිශන් එකක් හොයාගෙන එහෙමම නින්දට වැටෙද්දි වෙලාව පාන්දර දෙකයි..

ප.ලි.

@Shan

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

හෝලා!!! මේ කතාව මම ඉස්සරහට ලියන්නද.. මම හිතනවා මම ලියන විදිය අවුලක් නැතුවැති කියලා..

අනික මෙක සැඩ් එන්ඩින් එකක් නෙමෙයි.. මැද්දෙදි ටිකක් දුක හිතෙයි ඒවුනාට සැඩ් දෙන්නෙ නෑ.. මොකත මේ ළමයට එහෙම දුන්නොත් දුක හිතෙනවනෙ.. ඉමිහි ඉමිහි..

කතාව කියවනවාට වගේම වෝට් කමෙන්ට් කරනවාට හුගක් ස්තූතියි.. ඉක්මනටම අප්ඩේට් එකක් අරගෙන එන්නම්.. ලව් යූ ඕල්.. ('▽'ʃ♡ƪ)



තැන්ක් යූ මගෙ දලඹු පැටියෝ...

@Shan

# 4 කොටස

පහුවදා ඉස්කෝලෙ යන්න ලැහැස්තිවෙලා මම ගෙදරින් එද්දී අම්මා උන්නෙ අසනීප ගතියෙන්.. ඇහුවට කිව්වෙත් නැති නිසා මම ඕක කල්පනා කර කර හෝල්ට් එකට ඇවිත් අපේ ඉස්කෝලෙ ස්කූල් බස් එකේ නැගලා ඉස්කෝලෙට ආවා..

වෙලාව පාන්දර හයයි හතලිහයි.. අපේ පන්තිවල උන් උදේට ඇවිත් ගනන් හදනවා.. පාඩම් කරනවා.. කොහොමත් බයෝ මැත්ස් සෙක්ශන් මම දැක්ක දවසෙ ඉඳන් ඔහොම තමයි.. එහෙම නොකරත් බැනෙ වැඩ අහස උසට.. අනික මේ ජනවාරි.. ලබන අවුරුද්දෙ පෙබරවාරි විතර විබාගෙ.. ඔක්තෝබර් වල තියන්න තිබ්බ විබාගෙ පෙබරවාරි වලට කල් ගියේ ඉස්කෝලෙ ගුරුවරු වර්ජනයක් කරපු නිසා පහුගිය කාලෙ.. ඒකත් හොඳයි එහෙම වෙච්ච එක..

මම ක්ලාස් එකෙන් බෑග් එක තියලා එලියට යද්දි හශාන් මල් වට්ටියත් උස්සගෙන මං ගාවට ආවේ මල් කඩන්න යන්න කියන්න..

හැමදාම පංති බාර මැඩම් කියනවා මල් ගෙදරින් ගේන්න කියලා.. ඒවුනාට මමනම් මේ ඉස්කෝලෙ ඉදපු අවුරුදු හයේම අපි මල් කැඩුවෙ ඉස්කෝලෙන්.. ඇයි යකො ඉස්කෝලෙ මල් හැමතැනම වවලා තියෙනවා හිතේ හැටියට.. කඩා ගත්තම මක් වෙනවද.. ඒකත් ඉතින් අලි වට්ටි වලට නෙමෙ නෙ.. මේ හිච්චං පීරිසියකට වගේනෙ තියන්නෙ..

ඌයි මමයි පීරිසියත් වන වනා ආවෙ ඉස්කෝලෙ බුදු මැදුර පිටිපස්සට.. ඉස්කොලෙ වට කරපු ලොකු බුදුමැදුරෙ පිටිපස්සෙ තිබුනේ ලොකුම ලොකු සේපාලිකා ගහක්.. ඕක ඉතින් ඓතිහාසික සේපාලිකා ගහක්.. මොකද ඕක ඉස්කෝලේ පටන් ගත්තු දවසේ ඉඳන්ම ඔතන තියෙනවාලු.. උදේට ඔය පැත්තට ගියෝතින් සේපාලිකා සුවඳට නහය කඩාගෙන යන්න හදනවා.. ඒ තරමට මල්.. රෑ පිපිලා උදේට බිම පුරාම හැලිලා පලසක් එලලා වගේ මාරම ලස්සනයි.. අපි ඉතින් සේපාලිකා වට්ටියට තියන්නෙ නෑ බිම වැටිලා නෙ.. ඊට එහා පැත්තෙ තිබ්බ චතුසුදු ගහ ගාවට ගිහින් මල් ටිකක් කඩාගත්තා..

ඉස්කෝලෙ බුදුමැදුරට ඉස්සරහින් තිබ්බෙ ඉස්කෝලෙ ඔඩිටෝරියම් එක.. මම ඉස්සි ඉස්සි මල් වලට අත දික් කර කර කඩද්දී නිකමට මට ඇහැ ගියේ

@Shan

ඔඩිටෝරියම් එකට අල්ලලා තිබ්බ බැල්කනිය දිහාවට..

මම කීයටවත් බලාපොරොත්තු වුනේ නෑ මේ වෙලේ මෙයාව දකින්න.. ඒ වුනාට බැල්කනි වැටට අත් දෙකත් තියාගෙන මගේ දිහා එක එල්ලෙම බලාගෙන හිටියේ රධ්‍ය අයියා..

මට එයාගේ මූනේ මොන වගේ හැඟීමක් තිබුනද කිසිම අදහසක් නෑ.. ඒවුනාට කියන්න පුලුවන් එයා එක එල්ලෙ හරියටම බලාගෙන හිටියේ මගේ දිහා.. මොකද එතකොටත් හශාන් හිටියේ වෙන පැත්තක.. මම හිටිය තැන වෙන මොකෙක්වත් උන්නෙත් නෑ..

මම උගුඩු පැටියා වගේ මලට දික් කරපු අතත් එහෙමම තියාගෙන රධ්‍ය අයියා දිහා බලාගෙන ඉද්දි වෙනදා වගේම හරි සිහියට ඇවිත් එයාගෙ ඇස් ගැස්සුනා.. එතකොටම එයාගෙ පිටට දබෝස් ගාලා ගහගෙන එතනට ආවෙ කියාන් අයියා..

මම හනිකට හශාන් ඉන්න පැත්තට දුවගෙන ගියේ මොකුත් නොවුනු ගානට හරිම සාමාන්‍ය විදියට.. ඒ වුනාට මගෙ හිත ගැස්සුනා.. මට ඒක දැනුනා.. වරද් උබ මොකක්ද මේ නටන්න යන නාඩගම කියලා මගෙ හිත මගෙන්ම ඇහුවෙ කීවෙනි සැරේටද කියලා මට මතකත් නෑ..

" මොකද බං යකෙක් දැකලා වගේ.."

හශාන් මගෙන් අහද්දි මම තක්බීරි වුනා.. යකෝ මම හැසිරුනේ මොකුත් වුනේ නෑ වගේනෙ.. මූට ඒක මීටර් වුනේ කොහොමද..

" නෑ බං අර ගහේ දලඹුවෙක් හිටියා.. උබ දන්නවනෙ මට උන් ඇලජික්.."

මම දලඹුවාට අරුව ආදේශ කල්ලා කියලා පැන් ඉහලා ඉවර හශානුත් ඇදගෙන ක්ලාස් පැත්තට දුවගෙන ආවා.. පන්තියෙන් එලියට බහින්න හොද නෑ.. මේ කාලෙ මට අපලයි කියලා ආච්චිඅම්මත් කිව්වා.. මම යද්දි තියන පුපේ අමාරුවට ආයෙම හැරිලා ඔඩිටෝරියම් එක දිහා බලද්දි සැක්.. රධ්‍ය අයියයි කියාන් අයියයි හිනාවෙවී මේ පැත්ත බලගෙන ඉන්නවා.. මම ඒ කේන්තියට පාරේ තිබ්බ ගලකට පයින් ගහගෙන පඩිපෙල නැගගෙන උඩට ගියා..

@Shan

උදේම පීරියඩ් එකේ ජෙනරල් ඉංග්ලිශ් මිස් ඇවිල්ලා නැති නිසා පංතියේ උන් හරේ මෙහේ ගිහින් ඉතුරුවෙලා හිටියේ දහදෙනෙක් වගේ.. අන්තිම පෝලිමේ මැද්දෙ උන්නු මම සෙනුකයාගෙ කෑම පෙට්ටියත් හායි ගාලා ඇරගෙන අලි නූඩ්ලස් හැන්දක් කටේ ඔබාගත්තෙ සෙනුකයාගෙ අම්මගෙ කෑම මාරම රහ නිසා.. අම්මෝ ඒ හැන්දට රස නහර පිනා ගියා සිරාවටම.. මම නිකන් සෝමාලියන්කාරයා වගේ කට පුරෝගෙන සෙනුකයාගෙ නූඩ්ලස් එක රසවිඳින ගමන් කකුලක් අරගෙන තිව්වෙ සෙනුකයාගෙ උකුලේ.. මූ ආපු වෙලේ ඉඳන් පරිවර්තනයක් කරනවා කන්නත් සිහියක් නෑ.. පරයට හෝම්වර්ක් කරන්න අමතක වෙලා..

" මොකක්ද යකෝ උබට වෙලා තියෙන්නෙ.."

මම ඉතින් කටේ කෑමත් පුරෝගෙන ඌට ගොබ්බ හිනාවක් දාලා ආයෙම හැන්දක් කටේ ඔබාගන්න යද්දිම ක්ලාස් එකට කඩාපාත් උනේ ගේම්ස් කැප්ටන් සෙයෝන් අයියා..

" ෂනෙරු මල්ලි.. කෝච් ඇවිත් පොඩ් උන්ට ප්‍රැක්ටිස් පටන්ගන්න කලින් උබට එන්නලු.."

සෙයොන් අයියා කියද්දි මම කල්පනා කලේ අද බැඩ්මින්ටන් තියන දවසක්ද..?? නැනෙ.. අනික ප්‍රැක්ටිසස් පටන්ගන්නෙ ලබනසතියෙ කිව්වනෙ.. මම ආයෙම කතාකරන්න යද්දි සෙයෝන් අයියා යූ ටර්න් එකක් ගහලා එතනින් ගියා.. මට කතාකරන්න හම්බුනෙත් නෑ.. මම සෙනුකයා දිහා බලලා ඌවත් අඩගහගෙන යන්න හැදුවත් ඌ වැඩක්නෙ.. ඌට කරදර නොකර මම යන්න නැගිට්ටා..

මම ජිම් එකට යද්දි බැඩ්මින්ටන් ක්ලබ් එකේ ඔක්කොම උන් එතන.. ඩිපියුටි ගේම්ස් කැප්ටන්ලා දෙන්නත් බොටම් ටී ගහගෙන කොච් ගාව ඉදගෙන උන්නා.. ඔක්කොම කලර්ඩ් කිට් ගහගෙන ඉද්දි මම විතරක් ගොටුකොල සුනකයෙක් වගේ යුනිෆෝම් එක ඇදගෙන ජිම් එක මැද්දෙන් හිටගත්තා.. වස වාටර් එක කෝච්කාරයත් හෙන සැරයි.. මට වූ බරකුත් ලෝඩ් වුනා ඒ අස්සෙ..

" ෂනෙරු කිට් එක දාගෙන එන්න ප්‍රැක්ටිස් පටන් ගන්න.."

කෝච්කාරයා මම දිහා බලලා හැමෝ ඉස්සරහම කියද්දි මට පට්ට අසරනකමක් දැනුනා.. මොන කිට් ද.. මං ගාව මෙලෝ ලබ්බක් තිබ්බෙ නෑ..

@Shan

අනික ක්ලබ් එකේ කැපා මම.. මම හිමින්සැරේ කෝච් ගාවට කිට්ටු කරද්දි මාව මෙහාට ඇදලා ගත්තෙ කියාන් අයියා.. මූ මොකද මෙතන කරන්නෙ.. ඩිපියුටි හෙඩාට ස්පෝර්ට්ස් අදාල නැනෙ.. මොකක් හරි මමත් ඌ ඇදගෙන ගිය පස්සෙන් ඇදිලා ගියා..

" කෝ බං උබ කිට් එකක් ගෙනාවෙ නැද්ද.. "

" නැනෙ අයියෙ මට සෙයෝන් අයියා කිව්වෙ ලබන සතියෙ කියලනෙ.."

" ඇයි යකෝ උබ ගෲප් එක බැලුවෙ නැද්ද.. ඊයෙ දවල්නෙ මැසේජ් එක යැව්වෙ.."

අප්පද බොල මම ඊයෙ ෆෝන් එකක් ඇල්ලුවෙවත් නැනෙ අම්ම ලගනෙ ඒක තිබ්බෙ.. අදනම් අහගන්නවා පුතේ ලෙසටම කෝච්කාරයාගෙන්..

" නැනෙ අයියෙ.. ඊයෙ ගෙදර එද්දි රෑ වුනා.. ෆෝන් එකක් බැලුවෙ නෑ.."

" යකෝ ෆෝන් එකක් බලන්නැති එකෙක් ගැන ඇහුවමයි.. හරි හරි මේ උබ දන්න එකෙක් ගාවවත් කිට් එකක් නැද්ද හදිසියකට.."

" නෑ අයියෙ සෙනුක ගෙනැල්ලා තිබ්බෙත් නෑ.."

" ඕ ශිට්!!!"

කියාන් අයියා ඔලුවෙ අත ගහගෙන රධ්‍ය අයියා ගාවට යද්දී ආයෙම කෝච් මගෙ නම කියලා කෑගැහුවා.. මදැයි අද රාහු කාලෙන්ද කොහෙද එලියට බැහැලා තියෙන්නෙ..

" ෂනෙරු ඉක්මනට චේන්ජ් කරගෙන එනවා.. මෙහෙම ලේට් වෙලා මම කීයට මේක ඉවරකරන්නද ආ..!!"

කන පැලෙන්න කෝච්කාරයා කෑගහද්දි මම කෙලත් ගිලලා කට හදාගත්තෙ මම කිට් එකක් ගෙනාවෙ නෑ කියන්න.. එතකොටම වගේ කියාන් අයියා අපි මැද්දට දුවගෙන ආවා..

" සර් පටන්ගන්න.. ෂනෙරු චේන්ජ් කරන් ඒවි.."

@Shan

කියාන් අයියා එහෙම කියලා ජිම් එකේ චේන්ජින් රූම් එකට යද්දි මමත් උගුඩු පැටියා වගේ උගෙ පස්සෙන් ඒකට ගියා.. යද්දි රධ්‍ය අයියා පුටුවක ඉදගෙන ඩෙග් දෙක ගලවනවා..

" මේක ඉක්මනට ඇදගෙන පලයන්.. අරූ නැත්නම් ආයෙ කෑගහයි.."

කියාන් අයියා මගෙ අතට දුන්නේ අළුපාට නයිකි බොටමකුයි ඒ පාටම ටී ශර්ට් එකකුයි.. ශර්ට් එකටනම් මට වගේ දෙන්නෙක්ට බැහැතැකි.. ඒ වුනාට තැනේ හැටියට මම ඒකත් අරගෙන කබඩ් එකකට මුවා වෙලා ඉක්මනට චේන්ජ් කරගත්තා.. පොඩ්ඩක් ලොකුයි තමයි ශර්ට් එක.. හැබැයි ඒකෙ ගතියක් නැත්තෙමත් නෑ.. මම ඇදගෙන ඉන්න ඇදුම උණ්ඩි කල්ලා කබඩ් එක අස්සෙ ගහලා එලියට යද්දි කියාන් අයියා හිටියේ නෑ.. රධ්‍ය අයියා විතරයි හිටියේ..

" මේක දාගෙන එනවා ඉක්මනට.."

රධ්‍ය අයියා මට දික් කලේ එයා දාගෙන උන්නු ඩෙග් දෙක.. මම බයවෙලා වගේ එයාගෙ කකුල් දෙක දිහා බලද්දි රධ්‍ය අයියා නෝමල් බාටා දෙකක් විතරක් දාගෙන..

" මොනවද අයිසෙ බලන්නෙ මේක ගන්නවා.."

ආයෙමම මේකා බෙරිහන්දුන්නු නිසා මම ඉක්මනට ඩෙග් දෙක දාගෙන එලියට ගියා.. උගෙ ගනන් යකෝ.. සැක් මම කකුල් දෙක දිහා බැලුව වෙලේ හිතුවද දන්නෙ නෑ යටිපතුල් පිස්සෙක් කියලා..

මම ඇදුනුත් ඇදගෙන එලියට යද්දි කියාන් අයියා ඉන්නවා මනමාල හිනාවකුත් දාගෙන මගෙ දිහා බලාගෙන.. මට දැනන්ම් සාදාරන සැකයක් තියෙනවා.. මූ මගෙ පස්සෙන් එනවද කොහෙද.. මුගෙන් ඈත් වෙලා රධ්‍ය අයිය එක්ක හිටියනම් හරි.. වරද් පුතේ උබ වරදක් කරනවා..

" ආ දැන් පලයන්.. මතක් කල්ලා යද්දි අරූගෙ සපත්තුදෙක දීපන්.. ඌට ප්ලේ කරන්න මොකුත් නැතිනිසා අවුලක් නෑ බාටා දෙක ශේප්.."

මම කියාන් අයියට හිනානොවී කිව්ව එක අහලා යන්න ගියා.. මනමාලයා.. එනවා මෙතන සපත්තුවක් අහගෙන.. දෙන්න හිතයි මූන මැද්දෑවට.. එක්කො රධ්‍ය අයියට කියන්නත් හිතෙනවා තමුසෙගෙ යාලුවා අහකට

@Shan

කල්ලා තියාගනින් කියලා.. ඒත් මොකටද නිකන්.. ඌත් එකයි උගෙ යාලුවොත් එකයි.. මොක්කුද මන්දා අපෙ ඉස්කෝලෙත් බැජ් අරගෙන ඉන්නෙ..

මම හිතින් උන් සේරටම පොල් ගගහා රැකට් එක අරගෙන නෙට් එක ගාවට ගියා..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

කියාන් පුතෙ!! සුදුමහත්තයගෙන් ඇත් වෙලා ඉදපන්!!

මීට...............

හිස්තැන පුරවා තව චැප්ටරයක් දිනාගන්න.. ලව් යූ..

❤

@Shan

# 5 කොටස

උදේ නමය හමාරට පටන්ගත්තු ප්‍රැක්ටිසස් ඉවරවුනේ එකොළහමාරට විතර.. මම පොඩි ලමයි ප්ලේ කරද්දි ඒවගෙ අඩුපාඩු හදන්න උදව් කරලා හවුසස් වලට ලමයිව බෙදලා අන්ඩර් ටවෙල් වල ඉදලා අන්ඩර් ටවෙන්ටි වෙනකල්ම ටීම් බෙදලා රිසව් තුන්දෙනා ගානේ දාලා කෝච් කාරයයි සයෝන් අයියයි එක්ක ජිම් එකේ පැත්තක මෙසෙකුයි පුටු තුනකුයි තියාගෙන එන්ට්‍රි ශීට් පුරව පුරව හිටියේ.. ඉන්ටවල් එකට අදත් කන්න නෑ.. ආයෙම මගෙ පපුවෙ දැවිල්ල අල්ලලා තිබ්බෙ වෙලාවට නොකාපු නිසා.. ඒ එන කැක්කුම කියන්න වචන නෑ පට්ටම අමාරුයි.. ගැස්ට්‍රයිටිස් කියන්නෙ මහා විසාල පාපයක්.. මම මල්ලි කෙනෙක්ගෙන් වතුර බෝතලයක් ඉල්ලගෙන බීලා ආපහු පුටුවෙන් ඉදගත්තා.. දැන්නම් වැඩ ඉවරයි පොඩි උන් ක්ලාස් වලට එවන්න කියලා එනවුන්ස්මන්ට් එකක් දුන්නහම ඒ ගොල්ලො ජිම් එකෙන් එලියට ගියා..

රධ්‍ය අයියා ජිම් එකේ තැන තැන වැටිලා තිබ්බ ශටල්ස් ඇහුලලා බින් එකකට එකතු කරන ගමන් හිටියේ.. කොහොමත් ඩයල් එක පාඩුවෙ වැඩක් කරගෙන කූල් එකේ ඉන්නවා මිසක් අර කියාන් කාරයා වගේ පැණි හලන්නෙ නෑ.. මම ඌ දිහාත් බලලා නැගිට්ටෙ ඇදුම් මාරු කරගන්න.. ඒ වුනාට ශර්ට් එක දාඩියෙන් පෙගිලා ගන්න දෙයක් නෑ.. මෙක මෙහෙම ආයෙ දෙන්නත් බැනෙ.. මම චේන්ජින් රූම් එකට ගිහින් යුනිෆෝම් එක හොයද්දි යුනිෆෝම් එක පිලිවෙලට නමලා කබඩ් එකේ උඩම තට්ටුවෙන් තියලා තිබ්බා.. මම ඉතින් ඒක අරන් ඇදගෙන බොටමයි ටීශර්ට් එකයි අතේ ඔතාගෙන එලියට ඇවිත් රධ්‍ය අයියව හෙව්වෙ උගෙ ඩෙග් දෙක ආපහු දෙන්න.. ඒවුනාට මම බලද්දි ඌ ජිම් එකේ හිටියේ නෑ..

ඌ එනකල් ඉන්න බැරි නිසා ඉතින් මම ක්ලාස් එකට ආවා.. එද්දි බයෝ මැඩම් අලි පත චාට් එකක් බෝඩ් එකේ ඇදලා ඒක විස්තර කරනවා හො ගලා.. පන්තියෙන් බාගයක්දෙයියනේ කියලා නිදි.. ඔහොම තමයි බයෝ පීරියඩ් එක කියන්නෙ ඉතින් නිදාගන්නම සෙට් වෙන පීරියඩ් එකක්.. පලවෙනි පීරියඩ් එකහමාර ඇස් ඇරගෙන හිටියත් අන්තිම පැය බාගෙ හරි නින්ද යන එක නියතයක්..

" ඇල්ඩොස්ටෙරොන් වලින් ලමයි විදුර නාලිකා වලින් සෝඩියම ප්ලස් හා එච් ටූ ඕ වැඩි ප්‍රමානයක් ප්‍රතිශෝශනය නිසා රුධිර පරිමාව වැඩි වෙලා-

@Shan

ඡනෙරු ඇවිත් ඉදගන්න-මොකක්ද මම කිය කිය හිටියේ ආ ඇල්ඩොස්ටෙරොන්"

මම පන්තියේ දොරකඩ ලග බහිරව රූපෙ වගේ හිටගෙන ඉන්න එක දැකලා බයෝ මැඩම් මට පන්තිය ඇතුලට අඩ ගැහුවා..

ඊටපස්සෙ ඉතින් දිගටම තිබ්බ පීරියඩ් වල ඉගැන්නුවා ඉගැන්නුවා ඉවරයක් නෑ.. අපිත් මෙලො ලබ්බක් තේරුනේ නැතත් අහගෙන ඉදලා ඔලුව වනලා සාර්තක රංගනයක් දුන්නා.. ඔය අස්සෙ හිමීට මම කෙමෙස්ට්‍රි සර්ට පේන්නෙ නැතිවෙන්න ලන්ච් බොක්ස් එකත් උකුල උඩ තියාගෙන අනිත් උන් එක්ක කෑවා.. ඇයි යකො බඩගිනී.. ඒක කාලා බෑග් එකේ තිබ්බ ඔමෙප්‍රසෝල් එකකුත් බීලා ශෙප් එකේ වාඩිවෙලා හිටියා..

එක හමාර වුනාට පස්සේ ගාතා කියලා ඉස්කෝලෙ ඇරියහමයි මතක් වුනේ අරුගෙ ඩෙග් දෙග තාම මගේ ලග කියලා.. හවස පේපර් එකට කලින් දෙක වෙනකල් ඉන්ටවල් එකක් දුන්නු නිසා මම මතීශයා එක්ක ප්‍රිෆෙක්ට් රූම් එක පැත්තට ගියේ රධ්‍ය අයියව හම්බෙලා උගෙ සපත්තුව දෙන්න.. උගෙත් අලි ඔලුවනෙ.. මට පේන්න බැරි ඕක තමා.. ඇයි යකො මම වගෙ හිනාවෙලා කතාකරානම් පරයගෙ කට ගෙවෙනවද?? ගෙවෙනවද?? නෑනෙ.. මුංගෙත් සමයං අප්පා..

මමයි මතීශයයි ප්‍රිෆෙක්ට් රූම් එක පැත්තට යද්දි අපේ සෙක්ශන් කෝඩිනේටරයා මතීශව දකලා ඌට කතාකරගත්තා ප්‍රින්ට් කරපු පේපර්ස් ටික උස්සගෙන යන්න.. ඉතින් ඒකනිසා මතීශයට ඒකට යන්න වුනා..

" උබට පිස්සුද..??"

" මට ඇති පිස්සුවක් නෑ උබට තමා ඔහොම ගිහින් තව ටික දවසකින් පිස්සු හැදෙන්නෙ.. යකෝ ඔහොම උපාසකයා වගේ ඉදලා ඌව ටෝක් කරගන්න බෑ.. පොඩ්ඩක් විහිලුවක් කල්ලා කතාකරන්න ට්‍රයි කරපන්.."

" අනේ මෙ කියාන් නිකන් ඉදපන්.. මගුලක් කතාකරනවා.."

මම රූම් එකේ දොර ගාවට වෙලා මුන් දෙන්නගෙන් එකෙක් හරි මාව දකිනකල් කියලා බලාගෙන ඉද්දි උන් දෙන්නා කතාකරන එක මටත් ඇහුනා.. දන්නැද්ද ඉතින් කුතුහලේනෙ.. මම පොඩ්ඩක් කන දික් කල්ලා උන් කතාකරන ඒවා අහගෙන උන්නා.. මම හිතන්නෙ පෙම් පලහිලවක්

@Shan

වගෙ.. සැක් වෙයා ආ මයි මැනර්ස්?? මැනර්ස් බල්ලට ගියාවෙ මුගෙ සායම අරින්න ඕපයක් හොයාගන්නෝන..

" මගුලක් නෙමෙ බල්ලො මම කතාකරන්නෙ.. දැන් පොඩ්ඩක් හිතපන්.. උබ ගිය අවුරුද්දෙම නැහුනා ඌ පොඩි ඌ පොඩි ඒ ලෙවෙල් වෙනකල්වත් ඉදිමු අහන්නෙ නෑ කියලා.. යකෝ!! ඒ ලෙවෙල් පටන් අරන් අවුරුද්දකුත් ගිහින් උබත් එක්සැම් ඉවර කලා.. උබ තාම හිතේ තියන් ඉන්නවා කියන්නැතුව.. ඊටපස්සෙ දැන් කියනවා ඌත් ඒ ලෙවෙන් ඉවරවෙනකල් ඉන්න ඕනලු.. ඔහොම ඉදපන් ඌ කසාද බදිනකල්ම හිතේ තියාගෙන.. අනේ උබේ ලබ්බෙ ලව.."

කියාන් අයියා වක්කඩෙ කඩපු බොම්බයිමොටයිකාරයා වගේ රධ්‍ය අයියට බනිනවා බනිනවා ඉවරයක් නෑ.. ආ දැන් මෙයා මෙ වන් සයිඩ් ලව් එකක් රන් කරනවද.. යසයි බේසිකයා.. එහෙම එකකුත් තිබ්ලනෙ ට්‍රේන් එකේ මාව තුරුල් කරන් ගියෙ.. හෙනම ගහපන්.. බොරුකාරයා..

" ඒ සිරාවට බං.. මූ ඔක කියන්නැද්ද මෙ ආත්මෙට.. දැන් කොයි කාලෙද මූ ඔක හිතේ තියන් නටන්නෙ.. "

අම්මටසිරි මට ඒ අස්සෙන් අයුක අයියගෙ කටහඩත් ඇහුනා.. මුලු බෝඩ් එකම දන්නවද මූට වන් සයිඩ් ලව් එකක්  තියෙනවා කියලා..

" අනෙ මන්දා අයුකයා.. මෙ බේසිකයට පිස්සු තදටම.."

පෙනේද පෙනේද ඉස්කෝලෙ විනය බාරදීලා තියෙන පුත්තු ටික කතාකරන දේවල් ආ.. අපිට ඒ ලෙවෙල් පටන්ගද්දිම ටියුශන් සර් කිව්වා සුදාම්මිලා කර ගහගන්නෙපා.. කෙලවෙනවා කියලා.. ඒ නිසා ඉතින් මම තනිකඩයා.. කොහොමත් මෙ ජීවිතේ මට හොදා.. නොදන්න පුපවල් කරන්න ගිහින් නිකන් කෙලවගන්නෙ මොකටද?? ඔන්න සෙනුකයානම් මාසෙක ලව් එකක් කරගෙන ගියා.. පස්සෙ දැනගත්තෙ ඒක හශානයගෙ ෆේක් එකවුන්ට් එකක් කියලා.. මූ හොදහැටි මඩවලා ඒ කාලෙ උන් ආතල් ගත්තා.. පස්සෙ ඉතින් උන් තරහවෙලත් හිටියා ආයෙ යාලුවුනා ඉතින්..

" මගෙ ඔලුව අවුල් කරන්නෙ නැතුව උබල දෙන්නා කටවල් වහගෙන ඉදපන්කො පොඩ්ඩක්.. මගුල.."

@Shan

රද්‍ය අයියා අයුක අයියටයි කියාන් අයියටයි කෑගහලා මොකක්ද ෆයිල් එකකුත් උස්සගෙන එලියටම එද්දි මම දුවගෙන දුවගෙන දුරට ගිහින් ආපහු ඒ පැත්තට දුවගෙන ආවා දැන් ආවා කියන්න වගේ.. සැක් ලැජ්ජයිනෙ මුන් හිතයි මම ඕපදූප අහන් ඉදියා කියලා.. අනික කවුද ඕපදූප අහගෙන ඉදියේ.. මට ඇහුන එකනේ.. උවමනාවෙන් අහන්න ගියායැ..

මම දුවගෙන දුවගෙන ඇවිත් රධ්‍ය අයියා හැරෙද්දිම උගෙ ඉස්සරහින් හිටගද්දි ආයෙම මෙකා ගැස්සුනා.. මූට මීමැස්මොරේද.. දකින දකින සැරේ ගැස්සෙන්නෙ.. කියාන් අයියට කියන්න ඕන හදිසියට යකඩ හැන්දක් තියාගන්න කියලා මූ ගැස්සෙද්දි කටට ගහන්න.. කවුද දන්නෙ මැරිලා වැටුනොත් එහෙම.. ආපෝ නෑ කියාන් කාරයා මනමාලයා.. මම ඕකා එක්ක කතාකරන්නෙ නෑ ආයෙ.. අයුක අයියගෙත් මාර ඔලුවනෙ.. ඌ මා එක්ක කතාකරන්නෙ නෑනෙ.. අනේ හැන්ද අරන් ගහගනින් පුපේ.. මල විකාර.. මම දාහක් දේවල් හිතින් හිතාගෙන මනුස්සකමට රධ්‍ය අයියා එක්ක හිනාවුනා..

" අයියෙ ශූස් දෙක.."

මම සපත්තු දෙක ඇඟිලි දෙකකින් අල්ලගෙන රධ්‍ය අයියට දික් කරද්දි මෙකා උදුරලා වගේ ඒක මගෙන් අරගෙන ඇතුලට ගියා.. පුහ් මුගෙ ගනන් යකො.. සපත්තුව අඩිඩාස් නිසාඅ දන්නෑ.. අනෙ පගො මටත් තියෙන්නෙ අඩිඩාස් දෙකක් තමා..

" ෂනෙරු මල්ලි පොඩ්ඩක් ඇතුලට වරෙන්.."

මම යන්න හැරෙද්දිම කියාන් අයියා මට කතාකලා.. මූ මොකටද මට කතාකරන්නෙ.. උගෙ මූන දකිද්දිත් මට මල පයිනවා දැන්නම්.. මම ඉතින් කරබාගෙන ඇතුලට ගියා.. යද්දි අයුක අයියා කට අබරගෙන පොතක් කියවනවා.. කියාන් අයියා නහය කසනවා.. රධ්‍ය අයියා බෑග් එක අදිනවා..

" ෂෙනෙරු මේ උබලගෙ ක්ලබ් එකේ ටී ශර්ට්ස් ප්‍රින්ට් කරන්න ඕන.. දැන් මීට එකත් ලගනෙ.. පුලුවන්ද මෙ ටිකෙන් එකක් සිලෙක්ට් කල්ලා කියන්න.. උබ කැපානෙ අවුලක් නෑනෙ.."

" අවුලක් නෑ අයියෙ.."

@Shan

මම මේසෙ උඩ තිබ්බ ටැබ් එකට මූන දැම්මා.. ආවුස්.. ලස්සන ඩිසයින් ටිකක් මේ පාර ඇවිත් තියෙනවා..

" උබට පරක්කු නෑනෙ.."

කියාන් අයියා අහද්දි මම වෙලාව බැලුවා.. තාම එකයි හතලිහයි.. ආපෝ තව වෙලා තියෙන්නෙ..

" නෑ අයියෙ.."

මම ටැබ් එක අතට අරගෙන ස්ක්‍රෝල් කල්ලා බැලුවා.. ඒකෙන් හිත ගිය දෙක තුනක්ම තිබ්බා.. මම ඒකෙ අළුයි සුදුයි මික්ස් වෙලා තිබ්බ ස්කූල් ලෝගෝ එකයි ක්ලබ් එකේ නමයි වම් පැත්තෙ ගහපු චාම් ඒ වුනාට අමුතු ලුක් එකක් තියෙන එකක් තෝරලා කියාන් අයියගෙ අතට ටැබ් එක දුන්නා..

" මේක හොදයි වගේ.."

" ආ මේකද.. ඒකතමා රධ්‍යත් කිව්වෙ මේක හොදයි කියලා.. නේද බං.."

කියාන් අයියා අයුක අයියා ඉදපු මේසෙට හේත්තුවකුත් දාලා කියද්දි අයුක අයියා ඔලුව වැනුවෙ ඔව් කියන්න වගෙ.. ඉතින් මට පුපද.. අනික මගෙ ක්ලබ් එකේ ශර්ට් ඌ තෝරන්නෙ මොකටද.. දෙන්න හිතයි බකමූනගෙ කොන්ද කැඩෙන්න දෙකක්.. මට දැන් හේතුවක් නෑ මුන් තුන්දෙනාව ජේන්න බැරි වෙගෙන එන්නෙ.. රෙද්ද..

" මම යන්නම් අයියෙ.."

මම තව ටිකක් එතන ඉන්නෙ නැතුව යන්න යද්දිම අයුක අයියා පුටුවෙන් නැගිට්ටා.. ඒකා පුටුව පස්සට දාලා නැගිටිද්දිම කියාන් අයියගෙ කකුලෙ පැටලුනු මම මල් පෝච්චියකුත් පෙරලගෙනම පතබෑවෙන්න ගිහින් විසික් වෙලා වගේ වැදුනේ රද්‍ය අයියගෙ ඇගේ.. මට විසික් වෙලා ගිය පාරට රධ්‍ය අයියා දෝත බදලම මාව තද කල්ලා අල්ලගත්තෙ එයාවත් ගිහින් බිත්තියේ හයියෙන් වදින ගමන්..

මට වුනේ මොකක්ද කියලා තේරෙන්නත් තප්පර ගානක් ගියා..

@Shan

මම ඔලුව උස්සලා රඩ්‍ය අයියා දිහා බලද්දි මූ බිත්තියට හේත්තුවෙලා බය වෙලා මගෙ දිහා බලන් ඉන්නවා මල යකෙක් ඇගේ වැදුන ගානට.. අනික පොඩ්ඩක් වෙවුලනවද මන්දත් එක්කන්.. මට දැනුනා රඩ්‍ය අයියා හෙන හයියෙන් හුස්ම ගන්නවා.. මට හෙන අපහසුතාවයක් දැනුනා ඒ වෙලාවෙ ම ෆෙක්මනට කෙලින් වෙන්න හදලත් තිබ්බ කඩ් කුලප්පුවට වැරදිලා පැගුනේ රඩ්‍ය අයියගෙ කකුල.. සැක් මට මේ මොකක් වෙලාද.. මම හනිකට උගෙන් ඈත් වෙලා හිටගනිද්දි මේකා ඉන්නවා බිත්තියටම හේත්තුවෙලා බකමූනා වගේ බයවෙලා බලාගෙන.. පොර සුදු නිසා බෙල්ලයි මූනයි රතුවෙලා..

" අඩෙ අඩෙ මල්ලි සොරි බං.. උබට අවුලක් නැනෙ.. අඩෙ කකුල පැටලුනා බං.."

කියාන් අයියා කියද්දි මම හැරිලා බැලුවහම උන් දෙන්නම අමුතුවට හිනාව හිරකරගෙන ඉන්නවා..

" අහ් අවුලක් නෑ අයියෙ මම යනවා.."

මම තව වෙලා නොඉදම ඉක්මනින් දුවගෙන ආවා.. සැක් පපුවත් ගැහෙනවා මැරෙන්න යන්න වගේ.. මුන් මාව මඩවනවද තියාගෙන.. මට එහෙමත් හිතුනා.. නැත්නම් මම අහගෙන හිටපු එක දැකලවත් ද.. මට හෙන අවුල්.. අරුන් දෙන්නව මරාගෙන කන්න හිතෙනවා.. ඒ අස්සෙ කම්මුලත් හීරුනා අර රඩ්‍ය කාරයගෙ බැජ් එකේ මූන ඇනිලා.. දනවා එතනත්.. මම මූන ලේන්සුවෙන් අතුල්ලගෙන ක්ලාස් එකට දුවලා ගියා..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

වරද් වැටුනේ ගුරුත්වාකර්ශනය නිසා විතරයි.. නැතුව ඔය ළමයි කතා හදන්නෙපා..

මීට ඔතරී..

හවසට ආයෙ එකක් දෙන්නන.. ලව් යූ.. ❤

@Shan

# 6 කොටස

හවස ක්ලාස් ඉවරවෙලා මම රාජගිරියට ඇවිත් එහෙමම ආපු බස් එකේ ගෙදරට එන්න ආවා.. එතකොටත් වෙලාව හතර හමාරට විතර ඇති.. ඔෆිස් ටයිම් නිසා රාජගිරියෙ ගුවන් පාලම පැත්තෙන් පට්ටම ට්‍රැෆික් එකක් සෙට් වෙලා පැය ගානක් ඉඳලා මෙහාට ආවකොට සෙත්සිරිපාය ගාව හෝල්ට් එක ලග බස් එක නැවැත්තුවා විතරයි බස් එකට නැග්ගා සෙනග පුලුවන් නම් වහලෙත් එල්ලිලා යයි.. මමත් ඉතින් බෑග් එකත් එල්ලගෙන යන්තම් ෆුට්බෝඩ් එකෙන් උඩට නැගගෙන ගෙදර ගාව හෝල්ට් එකෙන් බැහැලා ගෙදරට එන අතුරු පාරට ආවා.. අපේ ගෙදර තියෙන්නෙ අතුරුපාරකින් උඩහට ගියාම.. ටිකක් ගමක් වගෙ ඒ හරිය.. මම ගෙදරට යද්දි ඉස්සරහ දොර වහලා..

අම්මා නිදිද දන්නෙ නෑ..

උදෙත් අසනීපෙන් උන්නු නිසා මම පිටිපසෙ අඩවල් කරපු දොරෙන් ගෙදර ඇතුලට ගිහින් අම්මගෙ කාමරේට ඔලුව දැම්මා.. අම්මා ඇඳේ හරහට ඇලවෙලා වතුර බෝතලේකුත් බඩට තියාගෙන නිදි.. මම අම්මගෙ නලලට අත තියලා බැලුවෙ උනද කියලා.. උනක් නම් නෑ..

" අප්පද බොල.."

අම්මගෙ බඩට තියාගෙන උන්නු උනු වතුර බෝතලේ නිසා තමා මටත් වැඩේ මීටර් වුනේ.. අම්මට අසනීප වෙලා.. ඒකතමා උදේ ඇහැව්වම කිව්වෙත් නැත්තෙ.. අම්මට ඔක කියන්න ලැජ්ජා වුනාට ඇත්තම කතාව ඉතින් ඔක අරුමයක් නෙමෙ.. හද්ද පරන කාලෙ මිනිස්සු ඔක කුනුහරුපයක් කරගෙන දැගලුවට මමනම් හිතනෙ නෑ එහෙන් මෙහෙන් මෝඩ මිනිහෙක් දෙන්නෙක් ඔක මැජික් වගේ දැක්කට තරුන උන් ඔක අරුමයක් වගේ දකිනව ඇති කියලා..

ඔක්කොමත් හරි මේ කාලෙට අම්මගෙන් පරිස්සම් වෙන්නෝන හරියට.. ඇයි යකො මල පනිනවානෙ සෑහෙන්න.. මම හච්මක් ඇරියක් අපෙ තාත්තගෙ ඉදන්ම මට බනිනවා.. හෝමෝන වල අවුල තමා ඉතින්.. ඔවා අහගෙන ඉන්න එකම හොඳයි මොකුත් කියන්න හොඳ නෑ.. කියන්න බැනෙ එකපාරක් වගේ කොස්ස විසිකල්ලා ගැහුවොත් එහෙම..

@Shan

මම ශේප් එකේ කබඩ් එක ඇරලා බැලුවේ අම්මට උවමනා කරන කියන දේවල් කබඩ් එකේ තියද කියලා.. අම්මා ඔච්චා මට කියලා ගෙන්නවගන්නෙ නෑ ලැජ්ජයි කියලා..

ෆුඩ්සිටිය පැත්තෙ යන්නෝන.. ගෙදර කුස්සියේ අම්මගෙ ඒප්‍රන් එක අස්සෙ තිබ්බ බඩු තුන්ඩුව හොයාගෙන මම කාමරේට ඇවිල්ල ඇදුම් ඉවර කල්ලා හොදහැටි නාගත්තා.. සැක් මූනෙ හරහට රතුපාටින් ඉරක් ගිහිල්ලා.. රඩ්‍ය කාරයගෙ යකඩ කැල්ල ඇනිලා.. මට පිටගැස්ම හැදෙයිද මන්දා.. ඒකනිසා මම කෝකටත් ඩෙටෝල් පොඩ්ඩක් අරගෙන මූනෙ තියාගත්තා.. අපෙ අම්මා ගාන්නෙ බේබි සබන්.. ඒවුනාට මම ගාන්නෙ ඩෙටෝල්.. මගෙ ඇගේ කුනු යවන්න අම්මනම් කියන්නෙ සර්ෆෙක්සෙල් දැම්මත් වැඩක් නෑ කියලා.. ඇයි ඉතින් දාඩිය නාගෙන නෙ ගෙදර එන්නෙ.. මේ පිවිතුරු මට මෙහෙම අපහාස විදින්න උනානෙ..

මම ඉතින් සුවද ගගහා නාගෙන කෑමත් කාලා අම්මව අවදි නොකර ගෙදර ලයිට් දාලා දොරවලුත් වහගෙන එලියට බහිද්දී හයහමාරයි.. අම්මා නිදි නිසා යතුරත් අතට අරගෙන මම පාර පැත්තට ගියා..

සන්ලයිට් කැට තුනයි , පෙයාර්ස් දෙකයි , ඩෙටෝල් දෙකයි , රින් කිලෝ එකේ පැකට් එකයි , සුදුළුෑනු පන්සීයයි , හාල් කිලෝ පහේ ඒවා දෙකකුයි යකෝ මෙකෙ දිග.. මේ සේරම උස්සන් යන්න ඕනෙද.. සැක් ත්‍රීවිල් එකකවත් යනවා..

අපෙ අම්මට තාත්තා යුතුකමක් වශයෙන් හැම මාසෙකම වෙලාවට කලාවට එකවුන්ට් එකට හතලිස්දාහක් විතර දානවා.. ඒ වුනාට ඇත්තටම ඒක පිරිමහගෙන වැඩ කරනවා මිසක් මෙ කාලෙ හැටියට ඒ සල්ලි හැරෙන්නත් මදි මාසෙකට.. ඔය හින්දම ගෙදරට බඩු එකපාරම ගේනවා..

මම ඉතින් පැයක් විතර බඩු හොය හොයා කාට් එක පුරෝගෙන අම්ම කන්න ආස අයිස්ක්‍රීම් ටබ් එකකුත් උස්සන් කවුන්ටර් එකට යද්දි කමනි ඇන්ටි ඉන්නවා පෝලිමේ.. මෙ ගෑණි දකිද්දි අම්මපා මට හාල් ගෝනියම උස්සලා ගහන්න හිතයි.. මම කේන්තිය පාලනේ කරගෙන කවුන්ටර් එකේ අයියට බඩු ටික දීලා ක්‍රෙඩිට් කාඩ් එක ඇදලා ගද්දි මේ ගෑනි කටත් දෙහි ලෙල්ල වගේ ඇද කරගෙන කාට් එක දිහා බලාගෙන මම දිහා බැලුවෙ නිකම් ස්ත්‍රී දූෂකයෙක් දිහා බලනවා වගේ.. ඇයි යකෝ මම මේකෙ කොන්ඩම් දාගෙන ආවෙ නෑ.. අනික දාගෙන ආවත් ඒ ගෑනිට ඇති රුදාව

@Shan

මොකක්ද.. මම ඒ ගෑනිගෙ ඇඟට සමාන්තරව බැලුවෙ මෙච්චර හූල්ලන්න මොකක්ද මේ ගෑනි දැක්කෙ කියලා..

ආහ්.. දැනුයි මට මීටර් වුනේ මේ ගෑනි මම ගත්තු නැප්කින් පැක් එකක් දිහා බලන් ඉදලා තියෙන්නෙ.. අනෙ ගෑණියෙ මට අදින්න නෙමෙ බොල ගත්තෙ.. මම ඉක්මනට බඩු ටිකත් අරගෙන හංදියෙ කඩෙන් පරාටා අරගෙන වීල් එකක ගෙදරට ආවා.. අම්මට රෑට උයන්න ඕනෙත් නැනෙ..

මම යද්දි අපෙ අම්මා බය වෙලා ඉස්තෝප්පුවෙ.. මම එනවා දැක්කා විතරයි දුවගෙන වීල් එක ලගට ආවා..

" අනේ මට නින්ද ගියානෙ.."

අම්මා හරියට නිකන් බරපතල වැරැද්දක් කරපු ගානට කතාකරද්දි පව් කියලා හිතුනා..

" අම්මෙ මේ ටික ගෙයින් තියන්නකො.. මම සල්ලි දීලා එන්නම්.."

අම්මා බඩු මලු වලින් බර නැති එව්වා ටික උස්සන් ගෙට යද්දි මම වීල් එකට සල්ලිත් දීලා පෙතුරු බඩුත් උස්සන් ගෙදර ආවා..

" කාගෙද ලමයො මේ ඇඳුම්.."

අම්මා නානකාමරේ ඉදන් කෑගැහුවේ මම ඉස්තෝප්පුවේ එල්ලලා තිබ්බ කළිලැල්ලේ ගනන් වගයක් හදන ගමන් ඉද්දි.. කාමරේ ඉන්න බෑ රස්නෙයි නිසා මම ඉස්තෝප්පුවට ආවේ..

" අර මම කිව්වෙ අම්මෙ අයියා කෙනෙක් දුන්නෙ.. ඔක හෝදලා තියන්ඩ මම අනිද්දා ගෙනිහින් දෙන්නම්.."

කාගෙද දන්නෙ නෑ ඒ ඇදුම් දෙක.. කියාන් අයියා ගෙනැත්දුන්න මිසක් කාගෙද අහන්නත් බැරිවුනානෙ.. අනිද්දට වෙලලා මැදලා ගිහිල්ලා දෙන්න ඕන.. මම ගනන් හද හදා ඉද්දි ඉස්තෝප්පුවට ආවෙ අම්මා..

" අද ලොකු අම්මා කතාකලානෙ.."

ඔන්න අම්මා එන්ටර් වෙන්න එන්නෙ මට මල පනින මාතෘකාවට..

@Shan

" හ්ම.."

" මල්ලි මේ පාර පන්තියේ පලවෙනියලු.. මගෙන් ඇහුවා ඔයා කීවෙනියද කියලා.."

" ම්ම්.."

මම අම්මා කියන ඒවා අහ අහා බෝඩ් එකේ ගාන හැදුවා..

" මම ඉතින් කිව්වා දොළොස්වෙනියා කියලා.. ලොකු අම්මා කිව්වා මනස්ගාත හිතේ ඇතිලු එකපාරටම වැඩ නොකර වෙනියා පස්සට ගිහින් තියෙන්නෙ කියලා.."

" ම්ම්.."

" හරියට ඉස්කෝලෙ වැඩ කරගන්න.. මට කතා අස්සවන්නෙ නැතුව.. එහෙ ලමයි ඔක්කොම හොදට ඉගනගන්නවනෙ.. ඔයාට විතරක් බැරිවෙන්නෙ ඇයි.."

මම මුලදි කිව්වා වගේ ඔය පරස්පරතාවය නිසාතමයි මම කොන් වෙන්නෙ පවුලෙන්.. මම අම්මට කොච්චර කරත් වැඩක් නෑ අන්තිමට ලොකු අම්මා කතාකල්ලා එහෙ ලමයි ගැන පම්පෝරි ගැහුවම අම්මට කල කී දේ අමතකයි..

" මම කරන්නෙ මට පුලුවන් තරම අම්මෙ.. මීටවඩා කරන්න කියන්න එපා.. මට මැරෙන්නද කියන්නෙ.."

" ආ ඒක හරි වැඩක්නෙ.. කවුද මැරෙන්න කිව්වෙ.. මහන්සිවෙලා වැඩ කරන්න නෙ කිව්වෙ.. එහෙ ලමයි-"

මම අතේ තිබ්බ පොත ස්ටූල් එක උඩට දමලා ගහලා අම්මා ගාවට ආවා..

" අම්මෙ එහෙ ලමයින්ට සේරම ගෙදරට ගෙනැල්ලා උගන්නනවා.. අතට පයට වැඩකාරයො යාන වාහන තියෙනවා.. මට එහෙම නැනෙ.. මම කීයක් කරගන්නද.. ඔයත් ඔහොම කතාකරන එක හරිද ආ.. ඔයාලට මේවා තේරෙන්නෑ අම්මෙ.. මම කොච්චර කලත් මගෙ අගයක් නැනෙ පවුලට.. මම ඉතින් අනාතයානෙ.. අහසින් කඩාපාත්වෙලානෙ.."

@Shan

" උබට මොලේ නැතිඵක තමා.. නැත්නම් කොච්චර උඹට වඩා නැතිබැරි උන් හොදට ඉගනගන්නවද.. මම දන්නවා කවදාහරි කේන්දරේ තිබ්බා වගේ උඹ මගෙ මූනෙයි පවුලෙයි දෙකේම දැලි ගාලා තමයි නවතින්නෙ.."

" කවුද දැලි ගාගත්තේ කියලා ඉතින් හිතලා බැලුවොත් තේරෙයි.. අනෙ අම්මෙ පිං සිද්ද වෙයි තියන දෙයක් කාලා ගිහින් නිදාගන්න.. මම ගෙදර ඉන්න පැය ගාන්ටවත් නිදහසේ ඉන්න දෙන්න.. පුදුම කරුමයක් උනානෙ මෙක.."

" වරද්!!!!!!!!!"

අම්මා මට නම කියලා කලාතුරෙකින් කතාකරන්නෙ මෙහෙම වෙලාවට තමයි.. මම කාමරේට ගිහින් ෆෝන් එකත් අරගෙන ගෙදරින් එලියට බැහැලා වත්ත පල්ලෙහා බංකුව උඩට ආවා.. ඇත්තෙන්ම මම හිටියේ මෙ ටිකේ ලොකු ප්‍රෙශර් එකක.. මම එහෙම වෙලා ගෙදර ඇවිත් අම්මගෙන්වත් සහනයක් බලාපොරොත්තු වෙද්දි එයත් කලේ මට අවලාද කියන එක වෙද්දි මට මහා හිතට බර දුකක් දැනුනා.. මට එහෙම සාමාන්‍යෙන් දුක හිතෙන්නෙ නෑ.. ඒත් අර කාලයක් තිස්සෙ ගොඩ ගහගත්තු දුක පිටකරගන්නත් එපැයි.. මම ආච්චිඅම්මට කෝල් එකක් ගත්තා හිතේ දුක නිවාගන්නත් එක්කලා.. ඔන්න රිංග්ස් දෙක තුනක් ගියා..

" හෙලෝ සුදුමහත්තයා.. කොල්ලො මේ උඹද..??"

ආච්චිඅම්මගෙ කටහඩ ඇහෙද්දි මගෙ ඇස් වලින් කඳුළු හිටු කියලා කඩන් වැටුනා.. අනේ මගෙ ලගක ඉන්නවනම්..

" ආච්චිඅම්මෙ.. මි-මොකද කරන්නෙ.."

මම කතාකරද්දිත් කටහඩ වෙවුලනවා..

" ආ මේ වයසක ආච්චිව මතක් වෙලා තියෙන්නෙ උඹට.. නිවාඩු නැතෙයි කොල්ලො මෙහෙ ඇවිත් යන්න.."

" මම එන්නම් ආච්චිඅම්මෙ.. ඉක්මනට.. මේ මාසෙ අන්තිම.."

" අප්පේ ඒක හොදයි.. ගෙදර කටු අනෝදා ගහේ ගෙඩි හැදිලා මට අද උදෑහෙත් උඹව මතක් උනා.. උඹ ආසානෙ කන්න.. "

@Shan

" මටත් අරන් තියන්නකො ආච්චිඅම්මෙ.. මට ඉතින් ඉන්නෙත් ඔයා විතරනෙ.."

" ඇයි කොල්ලො උඹ අඩලා වගේ.. මගෙ පොඩි එකාට කවුරුහරි හිතෙ රිදෙන කතාවක්කත් කීවද.."

මට එතකොට ඉකි ගැහිලම ඇඬුවා.. මට පට්ටම දුකයි.. පුලුවන් නම් මම දැන් ආච්චිඅම්මා ගාවට දුවලා යනවා.. ඒ තරමට හිතට මූසල පාලුවක් දැනෙනවා..

" එහෙම එකක් නෑ අච්චිඅම්මෙ.. අම්මා මෙ හිත රිදෙන කතාවක් කීවා.. ලොකු අම්මා කතාකලාලුනෙ අද.. එහෙ ලමයින්ට හොදට ලකුනු තියේලු.. මම ඉතින් වැඩ බැරි එකානෙ.."

" මොනවද බං කොල්ලො උඹ ඔය දොඩවන්නෙ ඈ.. උඹෙ අම්මා තියන හිතුවක්කාරකමට කසාදයක් කොරගෙන උඹව හදලා දැන් බැන්නහම හරියනවද.. මම හැමදාම ඕකිට කියනවා පොඩි එකාගෙ හිත රිදෙන කතා කියන්නෙපා කියලා.. මට තේරෙන්නෑ පුතෙ උඹෙ අම්මා මොන නැකතකින් ඉපදිලාද කියලා.. මෙහෙ ඉන්නකල් අපිටම ගිනිගෙඩි දීලා දැන් මගෙ කොල්ලට ගින්දර දෙනවා.. අනේ පුතෙ උඹ වරෙන් මා අම්මා ගෙදර ඇවිත් යන්න.. මම උඹට මක්කාවත් හදලා දීලා ඉන්න ටිකේවත් සතුටින් තියන්නම්කො.. මම.."

" මම හෙට එන්නද ආච්චිඅම්මෙ.. මට මෙහෙ ඉන්න බෑ.."

" වරෙන් වරෙන්.. ඔය පොත් මක්කාවත් ඇරගෙන දවස් තුන හතරකට ඇවිල්ලා යන්න වරෙන්.. දැන් මදෑ ඔය පළාතට වෙලා උන්නා.. "

" හ්ම්.. මම එන්නම්.. ආච්චිඅම්මා පරිස්සමින් ඉන්නකො.. තෙරුවන් සරනයි.."

" උඹටත් තෙරුවන් සරනයි පුතේ.. පරිස්සමට වරෙන් මයෙ අම්මා.."

මම ෆෝන් එක කට් කලා.. හෙට ගමෙ යනවා.. කොහොමත් හුග කාලෙකින් ගියෙත් නැනෙ.. මටත් දැන් ඇතිවෙලා උන්නෙ.. මම ආපහු ගෙදරට යද්දි අම්මා මුලු ගෙදරම ලයිට් නිමලා කාමරේට ගිහින් දොරත් ලොක් කරගෙන.. මමඔච්චර කේන්තිගන්න දෙයක් කලාද අම්මෙ.. මම

@Shan

කරන්නෙ මට පුලුවන් තරම නෙ.. ඇයි එක දවසකටවත් මාව තේරුම්ගන්න බැරි.. අඩුමතරමෙ දැනෙන්න ආදරේ කරන්නවත් බැරි.. මම අම්මට කොච්චර ආදරෙන් සලකන්න මහන්සි වෙනවද.. අම්මට ලොකු පිට ලමයි නම්.. මට කොයිතරම් දුකද දෙයියනෙ.. මම මහීශාට කෝල් එකක් ගත්තා හෙට ගෙදර යනවා කියන්න.. ආන්ටි මෙහෙ ඇවිල්ල යන්නෙ නැතැයි.. එතකොට බයක් නැනෙ..

මම මහීශාටත් ප්‍රශ්නෙ කියලා කාමරේට ඇවිත් පොත් දෙක තුනකුයි ඇඳුම් ටිකකුයි ආච්චිඅම්මට දෙන්න අරන් තියාගත්තු බණ පොත් ටිකයි බෑග් එකට දාලා නිදාගන්න ඇඳට ආවා.. අදත් පාඩම් කරන්න වෙන්නෙ නෑ.. මගෙ හිත එක තැනක නෑ..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

වරද් ගමෙ යයිද.. ඊටපස්සෙ මොකක් වෙයිද..??

ඉක්මනට අප්ඩේට් එකක් අරන් එන්නාම්..

කතාව මෙහෙම බෝරින්ග් ද ලමයිනෙ..

❤

@Shan

# 7 කොටස

මම පහුවදා කොටුවට ඇවිල්ලා කතරගම බස් එකක නැගලා ගාලු පාරෙ ගමේ එන්න ආවා.. උදේ අම්මා නැගිටලා උයන ගමන් ඉදියේ.. මම කියන්නෙත් නැතුව නෝට් එකක් ලියලා මේසෙන් අලවලා නොකියම එන්න ආවා.. අම්මා දකින්නත් ඇති මම එනවා.. ඒවුනාට ඊයෙ වෙච්ච දේත් එක්කත් මට හෙනට අවුල්.. අම්මා එක්ක කතාකරන්න හිතුනේ නෑ.. සෙනුකයටත් උදේම මැසේජ් එකක් දැම්මා ගමේ යනවා එන්න වෙන්නෙ නෑ කියලා..

ලේසි නෑ කොටුවෙ ඉදන් එහෙට පැය හත හමාරක්.. මම ඉතින් සීටීබී බස් එකකට නැගලා මැද්දෙ හරියෙ මූද තියන පැත්තෙ ජනේලෙ අයිනක් බලලා ඉදගෙන පාඩුවෙ එන්න ආවා.. මොරටුව හරියෙදි විතර මැරෙන්න නින්දක් සෙට් වුනු නිසා මම ටක ටක ගාලා හෙල්ලෙන ජනේලෙ ඔලුව වද්දගන්නෙ නැතුව ශේප් එකේ සීට් එකට ඔලුව හේත්තු කරන් නිදාගෙන ඇහැරෙද්දි හිටියේ ගාල්ල හරියේ..

ගාල්ල පහුකරගෙන යද්දි මම හරි හිස් හැඟීමකින් මහ මූද දිහා බලාගෙන උන්නා.. මේ හරිය ඉතින් කියන්න ඕන නෑනෙ මාරම ලස්සනයි.. මම මූදු රළ ගල්පර වල හැප්පෙන දිහා බලාගෙන කල්පනා කලේ මම ගැනමයි..

සිරාවටම මමම හිතුවා මම හෙන පව් කියලා.. ආච්චිඅම්මවත් නොහිටින්න මට මෙහෙමවත් හිත නිදහස් කරගන්න මොකෙක් වත් නැනෙ කියන හැඟීම සැරටම මගෙ හිතට බලපෑවා.. පොඩි කාලෙ ඉදන්ම තාත්තා නැති එකා , මොලේ නැති එකා අරවා මේවා කතා ඇහිලා ඇහිලාම මට ගානක් නොවුනට ඒවගෙන් මගෙ හිත නොරිද අරින්නෙ නෑ.. මම මාර ආසයි නවල් වල තියෙන තාත්තගෙ පුතාගෙ සම්බන්දයක් මොනවගේද කියලා අත්විදින්න.. හැමෝම කියන්නෙ ඒක හරියට 'යාලුකමක්' වගේ කියලා.. ඒවුනාට ඇත්තම කතාව මගේ අවාසනාවට මට එහෙම එකක් ලබන්න පිනක් තිබිලා නෑ.. ෆොටෝ එකකින් දැක්කා ඇරෙන්න මම අඩුමගානෙ අතදරුවා කාලෙවත් තාත්තා එක්ක ෆොටෝ එකක් ගහලා තිබුනේ නෑ.. ඔහොම ඔහොම හිතාගෙන යද්දී මට පැල් බැදගෙන අඩන්න හේතු කාරනා කෝටියක් විතර තිබුනා..

@Shan

මූදු රළ ගල් පරවල හැපිලා ආපස්සට බිඳිලා යද්දි මූදු වතුරේ කසිංජී සුවඳ නාස් පුඩු ඇතුලින් මට හොදට දැනුනා.. වෙරල අයිනේ සමහරක් තැන්වල ජෝඩු ජෝඩු වෙලීගෙන බදාගෙන උන්ගෙ ලෝක වල තනිවෙලා ඉද්දි එහෙන් මෙහෙන් මමත් වගේ එකෙක් වඩේ මල්ලකුත් අතේ තියාගෙන තනියම මූද දිහා බලාගෙන ඔහේ කල්පනා කරනවා බස් එකේ යන මට පෙනුනා.. සමහරක් හිතේ සතුටට මූදු වෙලරට ඇවිදින් යද්දි සමහරක් හිටියේම හිතේ තියෙන දුක අදෝනාව මූද එක්ක දියකරලා ඈත දියඹට යවන්න බලාගෙන..එහෙම යවන්න තිබුනානම් කොයිතරම් හොදද..

මම ෆෝන් එක අරගෙන ෆේස්බුක් එක පැත්තේ ගියා.. මොකුත් විහිලු පෝස්ට් එකක් බලන්න මගෙ හිත සැහැල්ලුවකින් නොවෙද්දි මම පින්ටරස්ට් එකෙන් සේව් කරගත්තු බටර්කප් මල් කිනිත්තක ෆොටෝ එකක් දාලා හිතට ආපු වචන ටිකක් උඩින් ලියලා පෝස්ට් කලා.. සමහරවෙලාවට ඔහොම එකක් ලියලා දාද්දි නිකන් හිතට සැහැල්ලුවක් දැනෙනවා..

**" කැකෑරුන බොර දියටසුපිපි නෙළුමක් ලෙසටමෙ විශම ලෝකයටනුඹ හිමිය..."**



මම එහෙමම ෆෝන් එක අතේ තියාගෙන ඇස් පියාගත්තා.. අම්මා ගව තව බටන් ෆෝන් එකක් තියෙනවානෙ.. මහීශා කිව්වා උදේ ආන්ටි යනවා කියලා අපේ ගෙදර.. ඒකනිසා හිතට බරකුත් නෑ.. ඔහොම ටික වෙලාවක් ඉද්දි ෆෝන් එකේ නොටිෆියක් ඇවිත් ටිලිං ගෑවා.. මම බලද්දි ෆේස්බුක් එකේ මම දාපු පෝස්ට් එකට රිප්ලයි එකක් ඇවිල්ලා..

*" යම් දිනෙක පිපේනම්ඒ ලොවේ පිරුණ මිනිසෙකු ලෙසටනුඹයි ඒ සුදු නෙළුමබොර දියම අරුත් කළ.."*

ඒ රිප්ලයි එක දාලා තියෙන්නෙ කවුද කියලා මම දන්නෙ නෑ.. ප්‍රොෆයිල් එකට ගිහින් බලද්දි අපේම ඉස්කොලෙ එකෙක් දාලා තියෙන්නෙ.. මමත් ඔහේ ඇඩ් කරගෙන ෆ්‍රෙන්ඩ් ලිස්ට් එකට.. Shanaw Helaksha ජීවිතේට අහලා නැති නමක්.. ප්‍රොෆයිල් පික්චර් එකටවත් වෝල් එකේවත් ෆොටෝ එකක්වත් හොයාගන්න බැරිවුනා.. දාලා තියෙන්නෙම ඉස්කෝලෙ ඉවෙන්ට්ස් අනම් මනම් ෆොටෝග්‍රැපි විතරයි.. කමක් නෑ ඔන්න ඔහේ ඒ

@Shan

රිප්ලයි එකට මට හිතේ සතුටක්වත් ඇතිවුනානෙ.. මම ඒකට හාට් රිඇක්ට් එකක් දාලා ෆෝන් එකේ ඩේටා ඕෆ් කරගෙන ඒක බෑග් එකට දාගත්තා..

ඊටපස්සෙ හම්බන්තොට හරියෙදි විතර මගෙම මල කරුමෙට සුදුඅම්මියෙකුයි සුදුනාත්තියෙකුයි මගෙ එහාපැත්තෙන් ඉදගත්තා.. සැක් මගෙ මෝඩකමට තුනේ සීට් එකක ඉදගත්තනෙ.. දැන් අහන් ඉදපන්කො උන්ගෙ මල් කතා.. මම ආයෙම ෆෝන් එක අරන් ඉයර්ෆෝන් එක කනට ගහගෙන ප්ලේලිස්ට් එකක් ප්ලේ කල්ලා ඇස් දෙක පියාගත්තා.. තව පැයක දෙකක්වත් තියෙනවා ගෙදරට යන්න..

" අනේ දෝනි මැනික ඉන්න දෙන්නකො.."

හෑ යකෝ මම හිටියේ හෙන කන්දක් උඩ බයිසිකලයක් පැදගෙන යනගමන්.. මෙහෙ කොයිද දෝනිලා..

" මම මගෙ අප්පච්චිට ආදරෙයිනෙ ඉතිම්.."

මම කවද්ද බොල අප්පච්චියෙක් උනෙ.. පාඩුවෙ සයිකල් පැද පැදානෙ හිටියෙ..

" මාව ගෙදරින් අරගෙන කොහේහරි දුරකට යන්නකො අප්පච්චියො.. මට ඔයා නැතුව විනාඩියක්වත් ඉන්න බෑනෙ.. මතක් වෙනවා හැමවෙලෙම.."

මොන හත්වලාමක්ද යකෝ මෙක.. මම එකපාරටම ගැස්සිලා කන්දෙන් වැටෙන්න ගියා.. පපුව ගැහෙනවා එකසිය ගානට.. මම කොයි වෙලේද බයිසිකලෙන් බැහැලා බස් එකකට නැග්ගෙ..

සැක් ඔච්චනෙ මම බස් එකේනෙ හිටියේ.. ටහිකෙන හීනයක්නෙ යකෝ ඒක.. මම හිතුවෙ කන්දෙන් වැටුනමයි කියලා.. මම ඇස් ඇරලා වටපිට බලද්දී ෆෝන් එක කකුල් දෙක අස්සටම වැටිලා ප්ලේලිස්ට් එකත් ප්ලේ වෙලා ඉවරවෙලා.. ඒ අස්සෙ එහා පැත්තෙන් ඉන්න උන් දෙන්නගෙ කෙල්ල අර කොන්ඩෙ කහ පාටින් පාට කරන් රැවුල වවාගෙන ඉන්න කෙට්ටු හාදයගෙ ශර්ට් එක අස්සෙ අතකුත් දාගෙන.. මගෙ ඇඟ කිලිපොලා ගියා දෙයියනේ.. ඔහොම එව්වා මම දැකලම නෑ මීටකලින්.. අපි බස් වල යද්දි කොලඹ ඔහොම එකක් දැක්කොත් ගහලා පන්නාවි බස් එකෙන්.. හවස පහමාරත් වෙලා.. දැන්නම් බහින තැනත් කිට්ටුව.. මම බෑග් එකත් කරේ දාගෙන අතනින් නැගිටලා බස් එකේ ඉස්සරහට ගියා.. ඉස්සරහ

@Shan

හංදියෙන් බැහැලා පලවෙනි පටුමගේ ගුරුපාරෙන් ගිහින් ඉවරවෙන්නෙ අපේ ගෙදරට.. කකුල් දෙකත් හිරිවැටිලා වගේ පස්සත් රිදෙනවා හොදටම.. බඩත්ගිනී ඒ අස්සෙ.. ඊයෙ දවල්ට කෑවට පස්සෙ කෑවෙත් නෑ.. මට ගැස්ට්‍රයිස් හැදෙන එකේ පුදුමයක් නෑ පේනවනෙ.. කන්න තිබිලත් කන්න වෙලාවක් නැති මම වගේ උනුත් ඉන්නවා..

මම හංදියෙන් බැස්සා.. බස් එක මාව පහුකරන් යද්දි ඇවිස්සුනු දූවිල්ලට මම ඇස් දෙක පියාගත්තා.. කටෙත් එක්ක වැලි.. ඉදකින්වත්..

මම එහෙමම බෑග් එකත් කරේ දාගෙන ඉස්සරහට ඇවිදගෙන යද්දි මේ හවසනෙ ගමේ උන් කඩේ ගාවට ඇවිත් හෝ ගාලා කදේ දාගෙන ඉන්නවා.. ඩයල් වලට මාව මීටර්ම නෑ මම ආවත් ගෙදරටම වෙලා ඉන්නව මිසක් එහෙ මෙහෙ යන එකක් යැ.. මම ඉතින් අර ගෝනිබිල්ලා වගේ කළු පැච් ඩෙනිමට සුදු ෂර්ට් එකක් ඇදලා ඊට දුඹුරු කළුසුදු චෙක් ශර්ට් එකකුත් ඇදගෙන ඩෙග් දෙකකුත් දාගෙන හෙන තදයා වගේ එන්න ආවා.. මුලු කඩපිලේම උන් පිටසක්වලයෙක් දිහා බලන ගානට මම දිහා බලන් ඉන්නෙ..

" ඔය ඉස්කොලෙහාමිනේගෙ මුණුබුරෙක් නොවැ.. අර මද්දු කෙලීගෙ කොල්ලා.."

" ආ ඔය අදුනගත්තෙ.. දැක්කනෙ මේ සීයලාට බස් එකේ බෝඩ් එකක් කියෝගන්න බැරිවුනාට මාව හොදට පෙනිලා තියෙනවා.. ඒ තරම ඇති.."

මම ගෙදරට යන්න ගේට්ටුව අරිද්දි මිදුලේ මාගලක මිරිස් වේල වේල හිටපු ඉස්කෝලෙහාමිනේ නැත්නම් ඉතින් මගෙ ආච්චිඅම්මා මාව දැක්ක ගමන් කණ්ණාඩිදෙකත් ඇහැට දාගෙන විපරමින් බැලුවා.. කවුද මේ එන හැන්ඩි කොල්ලා කියලා වෙන්න ඕන බලන්න ඇත්තෙ..

" මගෙ දෙයියනේ සුදුමහත්තයෝ.. මට උබලගෙ අම්ම කතාකලා විතරයි..මගෙ කොල්ලො.."

මම බෑග් එක තනකොලබිස්සට විසික් කල්ලා ගිහින් ආච්චිඅම්මව බදාගෙන උස්සලා වටේකුත් කැරකුවා.. අපෙ ආච්චිඅම්මා චූටි හුගක්.. මට වඩාගන්නත් පුලුවන්..

@Shan

" කොල්ලො මගෙ කොන්ද කඩන්නද ඔය හදන්නෙ ආ.. තියපිය බිමින්.."

ආච්චි හිනාවෙවී කියද්දි මට මගෙ ලෝකෙම පය පාමුලට ගෙනැල්ලා දුන්නා වගේ හිතට දැනුනා.. මනුස්සයොන්ට අර හෝම් ෆීලින් එකක් දැනෙනවා කියන්නෙ මේකට වෙන්න ඇති.. ආපු ගමන් මහන්සියත් නෑ ආච්චිගෙ හිනාව දැක්කගමන්..

" ගෙට යමන් කොල්ලො.. මම සුදුමහත්තයා එන හින්දම වේලපහින් උයලා කෑම මේසෙට ඇරියා.."

ආච්චිඅම්මා තණකොලබිස්සෙ තියෙන බෑග් එක ගන්න යද්දි මම දුවලගිහින් ඒක ගත්තා.. බෑනෙ කරන්න ඉතින්.. පණ්ඩිතකම වැඩිනෙ.. බර උස්සන්න යන්නෙ..

මම ආච්චි එක්කන් විනාඩි දහයක් පහලොවක් කතාකල්ලා කාමරේ දොර එද්ද මෙහාට කල්ලා මගෙ කාමරේට මූන දැම්මා.. මේක ඉතින් මගෙම කාමරේ.. ගෙදර නැගෙනහිර පැත්තට වෙන්න තිබ්බ සාමාන්‍ය තරමෙ කාමරේ තමයි මට වෙන් වෙලා තිබුනේ.. ආච්චිඅම්මා ඉතින් මම නැති වුනාට කාමරේ නම් හොඳහැටි පිරිසිදුව තියාගෙන ඉදලා වගේ.. කොටු කොටු බෙඩ් ශීට් එකක් දාලා ඇඳ උඩ ටවල් එකකුයි අදින්න මාමගෙ ශර්ට් එකකුයි ශෝටකුයි තියෙලා තිබ්බා.. මෙහෙ මට ඇඳුම් වැඩිය නෑ.. මමත් මාමගෙ කබඩ් එකෙන් තමා ඇඳුම් උස්සන්නෙ.. නැත්නම් අම්මගෙ නයිටියක් තමා ඇඳන් ඉන්න වෙන්නෙ.. සැක් කියද්දිත් බොක්ක කුල් වෙලා ගියා..

ගෙදර පාවිච්චියට ළිදෙන් වතුර මෝටර් කරලා ගන්න නිසා හවස ශවර් එක ඇරලා ඔලුව ඇල්ලුවා විතරයි සර්වාංගෙම හිරිවැටිලා ගියා.. වතුර සීතලයි අයිස් වගේ.. මම ඉතින් උඩ පැන පැන නට නට සීතල හුරුවෙනකල් නාලා ටවල් එකත් ඇඳගෙන කාමරේට යද්දි ෆෝන් එකට ආවෙ අන්නෝන් නම්බර් එකකින් කෝල් එකක්.. මම අත් දෙකේ වතුර පිහිදලා ෆෝන් එක අතට ගත්තා..

පොඩ්ඩයිනෙ ටයිප් කරගන්න පුලුවන් වුනේ ලමයි.. පාන්දරට තා එකක් දෙන්නම් මම..

කිව්වත් වගේ රධ්‍ය අයියගෙ පපුව පැලිලා මැරිලත..

@Shan

කවුද ඒ කතාකලේ..

ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 8 කොටස

" (පොඩ්ඩක් ඉදපන් පගයො.. අඩෝ අඩෝ අන්සර් කලා-අහ්ම්-)හලෝ.. මෙ ෂනෙරු ද..?"

එහා පැත්තෙන් පිරිමි කටහඩවල් දෙක තුනක්ම ඇහෙද්දි මම ආන්සර් කල්ලා ෆෝන් එක කනේ තියාගෙන කතානොකරම හිටියා..

" අ.. ඔව්..?? කවුද මෙ..??"

මම කතාකලේ සැකෙන් වගේ.. එහෙම ඉතින් කතාකලාම සැක හිතෙනවනෙ..

( ස්පිකර් ඔන් කරපන් පගො)

" අහ් ෂනෙරු මම කියාන් කතාකරන්නෙ.."

පසුබිමින් අපහැදිලි කටහඩවල් ඇහුනත් කතාකලේ කියාන් අයියා කියද්දි මම ඇඳෙන් වාඩිවෙලා කලිසම තනි අතින් කකුලකට දාගත්තා..

" අහ්.. ඔව් අයියෙ.."

" මෙ බං.. උබට මම කතාකලේ..( හවුස් මීටින් හවුස් මීටින්) මම කතාකලේ බං උබව Aphrodite එකේ වයිස් කැප්ටන්ට දාලා.. ඒක කියන්න.. උබ අද ආවෙ නැනෙ.."

" මම?? වයිස් කැප්ටන්?? අපේ හවුස් එකේ??"

මාව හෝන්දු මාන්දු වෙලා ගියා.. මෙ වැඩ අස්සෙ කොහොමද යකෝ ඔවගෙත් වැඩ කරන්නෙ.. අපේ ඉස්කෝලෙ හවුසස් පහක් තියෙනවා.. Zeus, Poseidon, Ares, Aphrodite, Athena.. ඉස්කෝලෙ එක වසරෙ ඉදන්ම ඉවරවෙනකල්ම තමන්ට හම්බෙන්නෙ එකම හවුස් එකක්.. ඒක වෙනස් කරන්න බෑ.. අපෙ ඉස්කෝල වල ඉතින් ස්පෝර්ට්මීට් එක කියන්න හෙන ලොකු ඉවෙන්ට් එකක්.. අනික පිට පිට ඇෆ්‍රොඩයිට් එක පස් වතාවක්ම එක වෙච්ච නිසා ඒකත් එක්ක අනිත් හවුසස් වලට තියෙන්නෙ මාර තරගයක්.. එහෙම එකක හවුස් කැප්ටන් වෙනවා

@Shan

කියන්න බලද්දි හෙන විසාල වගකීමක් ඉතින්.. මම වයිස් කැප්ටන් වුනත් මටත් වැඩ සෑහෙන්න කරන්න වෙයි.. අම්මගෙන් ගියාම අහගන්න වෙනවා දැන්.. කරදර සෙට් වෙන්නෙ වැල වගේ එකදිගට..

" ඇයි ෂනෙරු මොකක් හරි අවුලක්ද..??"

කියාන් අයියා අහද්දියි මම ආයෙම හරි සිහියට ආවෙ..

" අහ්..න්-නෑ අයියෙ එකපාරට මාවම දැම්මෙ?? මම හිතුවෙ නෆ්‍රාස්ට දෙයි කියලා ඒකයි.. "

නෆ්‍රාස් අපේ හවුස් එකේ ස්පෝර්ටි පොර.. අපේ වයසෙන් ඉතින් වැඩ්ඩෙක්ට ඉන්නෙ ඌ තමා..

" නෆ්‍රාස් කැප්ටන්.. ඒකයි ෂනෙරුට වයිස් ආවෙ.. ඔය දෙන්නා එකතුයිනෙ..( කොහෙද ඉන්නෙ අහපන් බල්ලො)"

" අහ් එහෙමද.."

" මල්ලි හෙට ඉස්කෝලෙ එනවද..?? නෑ එතකොට අපිට මීටින් එකක් ගන්න පුලුවන්නෙ.. ඒකයි-"

" අයියේ මේ මම ආයෙ ඉස්කෝලෙ එන්නෙ සඳුදා.. හදිසියකට ගමෙ ආවා.."

" (මම කිව්වෙ බං.. උබ ඇහුවෙ නෑනෙ) අහ් හරි හරි ෂනෙරු.. එහෙනම් මෙ නම්බර් එක සේව් කරගන්න.. මම ඔයාව හවුස් ගෲප් එකට ඇඩ් කරන්නම්.. (මූන පුප කරගන්නැතුව ඉඳහන්කො බං)"

මට කියාන් අයියගෙ කටහඩ අස්සෙන් අයුක අයියගෙ කටහඩත් ඇහෙනවා ඇහෙනවා වගේ..

" හරි අයියෙ.. මම තියන්නම්.."

" බායි ෂනෙරු.."

බීප්.. බීප්..බීප්..

කෝල් එක කට් වුනා..

@Shan

රෑවෙලා ආච්චිඅම්මා එක්ක කෑම කකා අපි දෙන්නා එක්ක නිවුස් බැලුවා.. රෑට සුදු කැකුළු බත් එක්ක පොලොස් ඇඹුලකුයි කලවම් පලා මැල්ලුමකුයි පරිප්පුයි හදලා ආච්චිඅම්මා පපඩම් එක්ක මිරිස් කරල් බැදලා තිබ්බා..

අන්න කෑම.. කනවානම් ආච්චිඅම්මගෙ කෑම තමා මේ ලෝකෙ රසම කෑම.. අනේ මන්දා මොන වගේ මැජික් එකක්ද කියන්න ආච්චිඅම්මගෙ අතින් පොල් සම්බෝලයක් හැදුවත් එකේ තියෙන්න ඕන රහ ඒ විදියට අඩුවක් නැතුව හරිම පදමට තිබ්බා.. මම ඉතින් දවසෙම කෑම කාපු නැති එකේ තුන් පාරක් විතර බෙදාගෙන කට ලගටම බඩ එනකල් කෑවා කෑමක්.. අම්මොහ් පිස්සු හැදෙනවා..

ඊට පස්සෙ ගෙදර තිබ්බ මීකිරි හට්ටියකුයි කිතුල් පැණි බෝතලේකුයි උස්සගෙන ආයෙම ආච්චි කුස්සියට අඩගැහුවම මම පිඹගෙන දිව්වෙ කුස්සියට.. මෙහෙ සතියක් හිටියත් ඌරෙක් වගේ මහත්වෙනවා.. ආච්චිඅම්මා පව් දෙයියනේ හරි ආසාවෙන් මහන්සිවෙලා උයලා.. මට එයාගැනනම් දැනෙන ආදරේ මෙතෙකැයි කියන්න බෑ.. ආච්චිම සමහර වෙලාවට කියනවා අපි ගිය ආත්මෙ අම්මයි පුතයිද දන්නෙ නැහැල්ලු මෙච්චරම එකතු.. ඒ බැදීම ගැනනම් කියන්න වචන නෑ.. මගෙ පිනකට පහළ වෙලා වගෙ..

" අම්මෝ කොල්ලො හත් අවුරුද්දකින් කාලා නෑ වගේනෙ.."

" එහෙම තමයි ආච්චියෙ ඉතින්.. මේ සුදු අත් දෙකෙන් හදන කෑමක් කන්නත් පිනයි බඩෙ ඉඩයි තියෙන්නෙ එපැයි.."

මම ආච්චිගෙ අත් දෙකම එකට අල්ලලා හාදුවක් තිබ්බම ආච්චි කෝල වෙලා හිනාවුනා..

" නිකා ඉදින් කොලුවො.. උබලගෙ අම්මා මට කතාකලා ආයෙම.. උඹ නැතිවුනාම අගේ දැනෙනව ඇති.. යස වැඩේ දෝනිඇන්දට.. තියන මුරන්ඩුගතිය.."

" අම්මා ගැන නම් වැඩක් නෑ ආච්චිඅම්මෙ කතාකල්ල.. ඉතින් මොකෝ මේ පැත්තෙ විස්තර එහෙම.."

බොරු කියන්නෝනැනෙ ඉතින් පිරිමි කම පොඩ්ඩක් පැත්තකින් තියලා අපෙ ආච්චි එක්ක චීත්ත බෙසම් ගනන් හෝදන්න මම හෙන ආසයි..

@Shan

" උඹට කියන්න බං සුදුමහත්තයෝ.."

අටට විතර පටන්ගත්තු කතාව අපි දෙන්නම බඩ පැලෙනකල් හිනාවෙලා හිනාවෙලා ඉවරවෙද්දි දෙයියනේ කියලා ඉවරකරද්දි දොළහමාරයි.. මම ආච්චිව ඇදෙන් වාඩිකරවලා වැදලා ජනෙල් දොරවල් සේරම වහලදත් කියලා බලලා මගේ රාජධානියට ආවෙ ෆෝන් එකක් ෆුල් චාර්ජ් වෙලා තියෙනවා දකිද්දි.. මේ තරම් ආධ්‍යාත්මික සුවයක් වෙන කොයින්ද ඉතින්.. නයිට් ටයිම් ඩේටයි ෆුල් චාර්ජ් වෙච්ච ෆෝන් එකයි.. ෆීලින් ඕසම්.. මම වට්සැප් ලොග් වෙලා මැසේජ් බැලුවා.. මහීශා උවමනා මැසේජ් වගයක් දාලා සදුදා වෙද්දි ඉස්කෝලෙ ආවෙ නැත්තන් මගෙ වෘශන කෝෂ දෙක කපලා විකුණනවා කියලා තර්ජනය කල්ලා මැසේජ් එකක් දාලා තිබ්බා.. දෙනෝ උඹට කපන්න මම..

මෙකී යකෝ..

මම එහෙමම ඒකිගෙ ඩීපී එක බැලුවා..

" කැහ්-ඃඇහ්-ඃඅහ්ක්කැ-හ්-කැහ්-හ්"

එකපාරට පුදුමෙන් කෙළ ගිලින්න ගිහින් මගෙ උගුරෙ කෙළත් හිරවෙලා මට හුස්මගන්න බැරුව මාව මැරෙන්න ගියා.. මේ මොන මගුලක්ද හත්වලාමෙ මේ..

මහීශාගෙ ඩීපී එකේ හිටියේ මෙකී කහපාට ගවුමක් ඇඳගෙන ඇහැල මල් වගයක් එක අතකින් අල්ලගෙන ස්මයිල් ඉන් ජේන් වගේ හිනාවක් දාගෙන ඉන්න ෆොටෝ එකක්.. මම මෙකී මෙහෙම ඉන්නවා දැක්කෙ පළවෙනි වතාවට.. ලස්සනයි කෙල්ල මාරම.. ඒ වුනාට දැන් ටික දවසක් තිස්සෙ ඉඳලා මෙකී වෙනස්.. හම්බෙලාම අහන්නෝන.. මැසේජ් ඇම්මට මෙකී කියන්නෙම නැනෙ.. මම එහෙමම ස්ටේටස් බලන්න ගියා.. මහීශා අපෙ අම්ම එක්ක සෙල්ෆියක් ගහලා දාලා.. මෙ බේසික කෙල්ලට ඕනවට වැඩී.. හිටපියකො දෙන්න..

ඒකිගෙ ස්ටේටස් එකට පස්සෙ ජස්ට් නව් කියලා වැටුනේ කියාන් අයියගෙ කන්ටැක් එක.. ආ ඕව්නෙ මම සේව් කරගත්තනෙ..දැන් උගෙ ස්ටේටස් මටත් පේනවා.. මම ඕපන් කල්ලා බලද්දි වැල වගේ ෆොටෝ හතරක්ම දාලා.. අයුක අයියයි, රධ්‍ය අයියයි, කියාන් අයියයි තුන්දෙනාම.. මොකෙක්ගෙහරි ගෙදරකට සෙට් වෙලා පිස්සු කෙලිනවා..

@Shan

පලවෙනි ෆොටෝ එකේ හිටියේ රධ්‍ය අයියා කොකාකෝලා බොතලේකට බටයක් ගහන් ඒක කටේ ගහගෙන ජනේලෙන් එලිය බලාගෙන ඉන්න මහ අද්භූත ෆොටෝ එකක්.. මට ඒක දැක්කහම බකස් ගාලා හිනාගියා.. යකෝ ගැනි පිටමං වෙලා වගේ බලාගෙන ඉන්න හැටි.. කැප්ශන් එකට දාලා තිබ්බෙ

**'ආදරය සුන්දර වරදකි මීට රධ්‍ය හෙලාක්ෂ😂'**

මට ඒකට බකස් ගාලා හිනා ගියා.. මුන් ඉස්කෝලෙ සද්දෙ දාගෙන හිටියට සිරාම ආතල් පොරවල් තුනක් වගේ.. ඒවුනාට හෙලාක්ෂ කියන නමේ මට පොඩි හුරු ගතියක් දැනුනා.. කලින් අහලා තියෙනවා වගේ.. ඒ එක්කම මට අර බස් එකේ හිටිය සුදුතාත්තියව මතක් වෙච්ච නිසා මම ඔලුව ගසලා හරි සිහියට ආවා.. ඒ හිපාටුවා ලගින්වත් තියන්න පුලුවන්ද අපේ ඩිපියුටි ගේමස් කැප්ටන්ව.. පිස්සුනෙ.. රධ්‍ය අයියා හෙන සුදුයි.. අරහෙම රැවුල වවලත් නෑ.. පිස්සු හැදෙයි ඌ දෝනි දෝනි කිය කිය කෑල්ලට කතාකලොත්.. අනික ඒකා සීරුවෙනුයි පහසුවෙනුයි විතරයිනෙ ඉන්නෙ.. අර වගේ කොන්ද නමාගෙන අස්සවල් වල අත දාන්න යන්නෑනෙ..

සැක් මම මේ මොනවද හිතන්නෙ.. මම ඊටපස්සෙ තිබ්බ ෆොටෝ එක බැලුවා.. ඒක අයුක අයියා දිවත් ඇදගෙන ගහපු ෆොටෝ එකක් පැත්තක රධ්‍ය අයියා කොට්ටෙකුත් හපාගෙන පස්ස හරෝගෙන නිදි.. මුන් උගෙ පස්සට කොටුවෙ පොඩි හාමුදුරුවොන්ගෙ ස්ටිකර් එකක් දාලා ඒ ස්ටිකරේ ගහලා තියෙනවා 'අපිට ඉතින් ස්පර්ශය තහනම්නෙ..බලන්න විතරයි පුලුවන්' කියලා.. මුන් හොරෙන් කසිප්පු පෙරලද මන්දා.. ඊටපස්සෙ එකේ කියාන් අයියා වහලෙ ෆෑන් එකේ අන්ඩර්වෙයාර් එකක් එල්ලලා

**'බැට්මෑන්**

' කියලා පහල ඉදන් ඒකදිහා බලන් ඉන්න අයුක අයියගෙ කුජීත ෆොටෝ එකකුයි අවසානෙ 'ඔක නවත්තපන් හු#තො' කියාගෙන රධ්‍ය අයියා ඇවිත් ෆෝන් එක උදුරගන්න වීඩියෝ කෑල්ලකුයි දාලා යටින් කැප්ශන් එකක් දාලා

**'වරදක් කළත් සිතකින් නොවෙ'**

කියලා.. යකූ අද මුන් වැරදි විතරමද කල්ලා තියෙන්නෙ.. පිස්සු මගුල් ටිකක්.. මම ඇතිපදම් ඒ කුජීත ෆොටෝවලට හිනාවෙලා ෆෝන් එක මෙසෙ උඩට දැම්මෙ තදටම නිදිමතක් ගලාගෙන ආපු නිසා.. ඒ එක්කම ෆෝන්

@Shan

එකට මිස් කෝල් එකක් ඇවිත් කට් වෙනවා දකිද්දිම මට සිහියක්පතක් නැතුව මැරිලා වගේ නින්ද ගියා..

පහුවදා මට ඇහැරුනේ අපේ ගෙදර ඉන්න කම්මැලි පූස් තඩියා ඇවිත් වට දෙක තුනකුත් කැරකිලා උගෙ සිරියහන වගේ මගෙ මූන උඩින් පස්ස තියාගත්තු නිසා.. සැක් විතරක් මලජරාව..

" බැහැපිය චූටි බිමට.. ආවා මෙතන ඇට දෙක මගෙ මූන උඩ තියන්න.. චිප් චිප්.. එලියට එලියට.."

මම උගව උඩින් විසික් කල්ලා ඇදෙන් බැස්සෙ ආච්චිඅම්මා කුස්සියෙ ඉදන් මොකක්දෝ කොටනවා සද්දයක් ආපු නිසා.. මම නැගිටලා ඇද ගසලා මූනකට හෝදගෙන කුස්සියට එබෙද්දී ආච්චිඅම්මා කොළ වගයක් කොටනවා හෝ ගලා.. අප්පද බොල කොළකැද හදනවා වගේ..

" සුදුමහත්තයා නැගිට්ටද.. තව ටිකක් නිදාගනින්කො කොල්ලො.. මම මෙක හනික හදලා ගේන්නම්.."

ආච්චිඅම්මා  ලිපේ තිබ්බ මුට්ටිය අහක් කල්ලා වෙන මුට්ටියක් තියද්දි මම ආච්චිට කලින් ලිප ගාවට ළං වෙලා ඒකට පොල් ලෙල්ලක් එබුවා.. උදේ සීතල නිසා ඇගේ රස්නෙ යවාගන්න මරු පොට් එක දර ලිප ගාව..

" එහෙනන් උඹ ලීප බලාගනින්.. මම අර හදාපු වැලිතලප එක එලියෙන් තියන්න..."

ආච්චි එහෙම කියාගෙන ගේ ඇතුලට ගියා.. මට එතකොටයි මතකෙට ආවෙ ඊයෙ රෑ ආපු කෝල් එක.. බැලුවෙත් නෑ නින්ද ගියානෙ..

ආයෙම හෙට එන්නම් ලමයිනේ..

රධ්‍ය අයියගෙ දුකට කවි ගී ලියවුනා මදී..හුම්

කවුත ආයෙම මූට කෝල් කලේ.. ඉන්න දෙන්න අප්පා එයාට කෝල් ගන්නැතුව..

ලව් යූ   ❤

@Shan

මේ කාම ලෝකෙට ආස කරන්න එපා.. 😂

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුනකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 9 කොටස

" සුදුමහත්තයා මම පන්සලට ගිහින් එන්නම්.. පරිස්සමට ගෙදරට වෙලා ඉදපන් ඈ.. කොල්ලො.."

ආච්චිඅම්මා හවසට තියෙන මරණාධාර සමිතියෙ රැස්වීමට යන්න ඇඳපැලඳගෙන මම ඉන්න කාමරේට මූනදාලා කිව්වා.. මම එවෙලෙ ඉදියේ පාඩම් කර කර.. ඇරත් ඔවට ආච්චිඅම්මා මාව එක්කන් යන්නෙ නෑ එක්කන් යන්න කිව්වත්.. ගමේ ගෑනු අස්සෙ නැටිත් ඉන්නවට කාරි නෑ කියල තමා කියන්නෙ..

" ආ.. හා.. ආච්චිඅම්මෙ පරිස්සමට ගිහින් එන්න එහෙනම් හොදේ.."

මම ඔන්ලයින් තිබ්බ ක්ලාස් එකකුත් ඉවරකල්ලා හැන්දෑ වෙන්න ගෙදර ඉස්සරහට වෙන්න හදලා තිබ්බ ඔන්චිල්ලාවට වෙලා ඔහේ පැද්දි පැද්දි හිටියා.. අම්මා මොනවා කරනවද දන්නෙ නෑ කතාකලේම නැනෙ.. කමක් නෑ ආච්චිඅම්මා හැමතිස්සෙම කතාකරනවනෙ.. අනිද්දා යන නිසා ඉන්න එකයි තනියෙම.. මම හිටියහමනෙ රණ්ඩුවෙන්න එන්නෙ.. මම ඔන්චිල්ලාවෙ එක පැත්තකට කඹේට ඔලුව තියාගෙන මනෝ පාර ගහන් ඉද්දි ලස්සන නංගි කෙනෙක් මාව දැකලා කොණ්ඩෙත් ගස්සා ගස්සා අල්ලපු ගෙදරට දුවගෙන ගියා.. මටත් ඉතින් හෙන මනමාල හීනාවක් ආවත් ඒක එකපාරට කබාසිනියා කල්ලා දැම්මෙ ෆෝන් එකට ආපු කෝල් එකක්.. මෙ අර පාන්දර ආපු නම්බරේ නේද.. මම ආන්සර් කල්ලා ෆෝන් එක කනේ තියාගෙනත් බැලුවෙ එහා ගෙදර නංගි ගෙට ගියාද කියලා.. සැක් හිනාවෙන්නවත් බැරිවුනානෙ..

" හලොව්.. කවුද කතාකරන්නෙ..??"

මම කතාකරත් තප්පර පහක් විතර යනකල් එහාපැත්තෙන් කිසිම සද්දයක් ඇහුනේ නෑ..

" මම රධ්‍ය කතාකරන්නෙ.. මේ වරද් ද..??"

ඔන්චිල්ලාවෙ පැද්දි පැද්දි හිටිය මම එකපාරම ගල් ගැහිලා වගේ නැවතුනා.. දෙයියනේ මුගෙ කටහඬේ ගොරෝසු ගතිය.. බයත් හිතෙනවා.. අනික

@Shan

හලෝ අනම් මනම් මොකුත් නෑ නිකන්ම 'මම රධ්‍ය කතාකරන්නෙ' යැයි යැයි තමා.. මේ හාල්පාරුවා නිසා මගේ ලස්සන සුදු මූනෙ රතුපාට ඉරක් ඇදිලා තාම ගිහින් නෑ.. දෙන්න හිතයි.. පගයට..

" ඔව් අයියෙ වරද් තමා.."

මම ඕනවට එපාවට කතාකලා.. මම වරද් නෙමෙයි යකෝ ෂනෙරු ෂනෙරු.. මම ඔය වරද් කැල්ලට එච්චර ආස නෑ.. නිකන් වරදක් කල්ලා වගේ.. ඔය නම දන්න උන් ඉන්නෙත් දෙතුන්දෙනයි.. ඒ අයවත් මට නම ඔය කැල්ල කියලා කතාකරන්නෙ නෑ..

" මට අද හවස වෙද්දි ඔයාලගෙ හවුස් එකේ ඇත්ලටික් ඉවෙන්ට්ස් කරන අයගෙ ෆුල් නේම්ස් එක්ක බර්ත්ඩේ එකයි, ඉන්ඩෙක්ස් නම්බර් එකයි, බර්ත්ඩේ එකයි ඕන.. පිළිවෙලට ටයිප් කල්ලා පීඩීඑෆ් එකක් මට ඊමෙල් දාන්න.. නැත්නම් මේ නම්බර් එකෙට වට්සැප් කරන්න.."

මූ යකෝ.. මම ඉන්නෙ ගමේ පගො ගමේ.. අනික ඔච්චර ගොඩක් මම හවස වෙද්දි කරන්නෙ කොහොමද.. අනික දැන් හවසනෙ.. මූට පයිත්තියන්ද..??

" මේ අයියෙ.. ඉතින් මේ හවසනෙ.."

මම ඇහුවෙ කිසිසේත් විහිලු කරන අදහසකින් නෙමෙ වුනත් රධ්‍ය අයියගේ ෆෝන් එකේ එහැපැත්තෙන් හිනා සද්ද දෙක තුනක් මට ඇහුනා.. එක්කො මට ඇහුන හැටි..

" මේ අයිසෙ ඒ පණ්ඩිතකම් ඇහුවෙ නැනෙ.. පැය දෙකක් දෙන්නම්.. මට ඊමෙල් එක එන්න ඕන.. හරිනෙ.. මම තියනවා.."

" ඒත්- ගොං ලබ්බා.."

මම කතාකරන්නත් කලින් ෆෝන් එක කට් වෙලා ගියා.. මේ ගොටුකොල හිවලා.. කතාකරපු හැටි මට.. කියාන් අයියා කොච්චර හොදද.. මට ඊයෙ කතාකල්ලා ඉස්කෝලෙ ආවෙ නැත්තෙ ඇයිදත් ඇහුවා.. ඒකට මූ.. දෙයියනේ මම ඉන්නෙ ගමේ කියලා ඔච්චර දන්නැතුවද.. කියාන් අයියා කියල නැතිවෙන්න බැනෙ.. හිටපන් මම ඉස්කෝලෙ ඇවිත් කෙල්ලෙක්ගෙන් බූට් කාලා අත කපාගත්තා කියලා කතාවක් හදලා

@Shan

ස්කෝලෙ පුරාම කියනවා.. පුලුවන් නම් එහාවැටේ ගර්ල් ස්කූල් එකටත් කියනවා.. මගෙ හිතේ රධ්‍ය කාරයා ගැන තිබ්බ පැහැදීම බින්දුවටම බැහැලා නැතිවෙලාම යන්න යද්දි මට මතක් වුනේ එදා මම කෝච්චියෙන් වැටෙන්න ගිහින් මූ මාව අල්ල ගත්ත එක..

එක්කො ඔන්න ඔහේ කමක් නෑ.. උගෙයි මගෙයි කොහොමත් ඇයි හොඳැයියක් නැනෙ.. මොකෝ මම ඌව කසාද බඳිනවයැ ඌ මට හොඳින් කතාකරන්න.. එදා උදව් කරපු නිසා සමාව දෙනවා.. නැත්නම් දනී මෙ වරද් වරං ගත්තහම හැටි..

මම කේන්තියෙන් නැගිටලා ගෙට ගියේ ගෙදර ඉස්සරහා තිබ්බ කොහොඹ ගහ යට හිටිය චූටියටත් පයින් ඇනගෙන.. මේ අනිකා.. සක්කිලි පූසා කනවා නිදාගන්නවා විතරයි.. මුන් ඔක්කොම එකයි..

මම සෙනුකයටයි නෆාස්ටයි කෝල් කල්ලා හෙන ගේමක් දීලා ඇත්ලටික් ක්ලබ් එකේ ඇෆ්‍රොඩයිට් එකේ උන්ගෙ නම් හොයාගෙන අනිත් විස්තරත් හොයාගෙන පැය තුනහමාරකට විතර පස්සෙ ඩොකියුමන්ට් එකක් හදලා අරුට වට්සැප් කලා..

සෙනුකයා වෙලාවට ඇෆ්‍රොඩයිඩ් එකේ නිසා මට අවුලක් නෑ ඕන වෙලාවක සජ් එකක් ගන්න පුලුවන් නෙ.. මතීශයයි හශානයයි සියුස් එකේ.. ඒකනිසා උන්ගෙන් මේව අහන්නත් බෑ..

මම ඩොකියුමන්ට් එක යවලා තප්පර බාගයක් යන්න වුනේ නෑ ඩබල් ටික් එක නිල් පාට වුනා.. දෙයියනේ දෙයියනේ අපේ උත්තම ඩිපියුටි ගේමස් කැපා හරිම ඉක්මන් නෙ.. ආලෝකේ වේගෙන් සීන් කලා.. විනාඩි පහක් ගියා.. ආයෙම මුගෙන් වට්සැප් කෝල් එකක්..

" කියන්න.."

මම නිකන් පාච්චල් වෙන්න ඕන නැනෙ.. පොඩ්ඩක් ගනන් ඉස්සුවා..

" මම උබට කිව්වෙ පැය දෙකකින් එවන්න කියලනෙ.. දැන් වෙලාව කීයද.."

" ඉන්න බලන්න.. ආ.. හත හමාරට තප්පර දෙකක් විතර තියෙනවා..ටික්..ටික්.. හරියටම හතාමාරයි.. ඇයි අයියෙ.."

@Shan

" ජෝක් කරන්න නෙමෙ අයිසෙ වෙලාවට වැඩක් කරන්න ඉගෙන ගන්නවා ඉස්සෙලා.. ඔහොමද වගකීමක් අරගෙන වැඩකරන්නෙ.. මතක තියාගන්නවා ඇෆ්‍රොඩයිට් එක මගෙත් හවුස් එක.. මේ පාරත් අනිවාරෙන් ෆස්ට් ප්ලේස් ගන්නෝන අපේ හවුස් එක.. ලීඩර්ශිප් එකක් අරන් වැඩකරන්න කලින් බලාබලා.."

හරි ඉතින් මම එපා කිව්වෙ නැනෙ.. මූ මේ ඉස්කෝලෙ සාජන් කියලා මට ලොකු නෑ හරිද.. ඒවා දාපන් පුතේ කැඩෙට් කරන් උන්ටම.. ආවා මෙතන මට සද්දෙ දාගෙන හිටුකෝ මම උඹ කියල කිසිම දෙයක් අහන්නෙ නෑ.. නෑ නෑ නෑමයි..

" අයියා එකට ආසද.. මම ඇහුවෙ හවුස් එක එක වෙනවට.."

මගෙ කට අවුස්සගන්න එපා කියන්නෙ ඔක තමා..දැන් ඉතින් දිගට හරහට මට කියන්න හිතෙනවා..

" මොකක්ද තෝ කිව්වෙ.."

" ඇයි අනෙ එකට ආසද ඇහුවෙ.. මමනම් ආසයි.. අයියා කියනවනම් එක වෙන්න බැරියැ.. කේන්තිගන්න ඔනෙ නැනෙ බොරුවට.."

" එකට ආස මොකාද බිංදුවට ආස මොකාද කියලා මම උඹට පස්සෙ වෙලාවක පෙන්නන්නම්.. සදුදා මීටින් එකට වරෙන් ලබ්බක් නොකර.. වගකීමක් අරන් වැඩකරන්න බෑ.."

බීප්.. බීප්.. බීප්..

කට් කලා නේද.. මෙක යකෝ.. හරි මගුලක් උනානෙ.. පගයා මාව එදා අල්ලගත්තෙ නැත්තන් ගහනවා උගෙ බැජ් එක ගලවලා පුපේ මම.. දන්නෑ මගෙ හැටි.. දැන් මූ එක්ක වැඩ කරන්න එපැයි මාසයක්ම.. ඇෆ්‍රොඩයිට් මගෙත් හවුස් එක.. යැයි යැයි.. මූට බැජ් එක දුන්න එකාගෙ වම් ඇටේ මොට පිහියකින් තැලුවත් මදි..

මම ඌට බැන බැන ගිහින් වම් කකුලේ පොඩි ඇඟිල්ල උලුවස්සෙත් වද්දගත්තා.. සැක් මෙ උළුවහු.. මොකා දාලද මන්දා.. අරුටනම් ජීවිතේට කෙල්ලෙක් සෙට් වෙන්න එපා.. ඡ්ස්වාහා පුඃ.. හැලපයා..

@Shan

" සුදුමහත්තයා.."

ඒ එක්කම ආච්චිඅම්මා ගෙදර ඇවිත් ඉන්නවා දැක්ක මම කකුලෙ ඇගිල්ලත් අතගාගෙන ඉස්සරහට ගියා.. තව දවස් තුනනෙ ඉතින් ආක්චිඅම්මා ලග ඉන්නෙ.. ආයෙම කොලඹ යන්න එපැයි.. නැත්තම් අරුට ප්‍රෙශර් අමාරුව හැදිලා මැරිලා යයි.. අන්තිමට ඒකටත් පලි මාව වෙයි.. මගෙ මූනත් හූරලා පරුෂ වචනෙන් බැන්නත් එක්ක..

ඔහොම ඒ දවස් දෙකත් ඉක්මනටම ගෙවිලා ගිහින් මම ආයෙම කොළඹ ආවා.. ආපු ගමන් අම්මා මාත් එක්ක කතාකලෙ නෑ. ඊටපස්සෙ ඉතින් පොඩ්ඩ පොඩ්ඩ හා හුම් ගගා ඉදලා වෙනදා වගේ කතාකරන්න ගත්තා.. මම ආවෙ ඉරිදා රෑ වෙන්න.. ඊටපස්සෙ සදුදා ඉස්කෝලෙ යන්න බෑග් ලෑස්ති කරලා අර කියාන් අයියා එදා දුන්නු ඇදුම් දෙකත් නමලා ඒක අස්සට ඔබාගත්තා.. ආච්චිඅම්මව හරියට මතක් වෙනවා.. දැන් ඉතින් සතියක් විතර යනකල්ම හිතට හරි නෑ ආච්චිවම මතක් වෙනවා.. මම බස් එකට නගිද්දිත් ආච්චිඅම්මා ඇඩුවා.. එහෙම එද්දි පපුව කඩාගෙන යන්න වගේ.. මට මතක් වෙද්දිත් හරි හිතට බරයි දෙයියනේ..

පහුවදා ඉස්කෝලෙ ගිහින් මට ක්ලාස් එකේ ඉන්න වුනේම නෑ.. ක්ලාස් වල ඉන්න උන් සේරම හවුස් වැඩ වලට කියලා එක්කන් ගියා.. මමත් ඉතින් වයිස් කැපා නිසා බැහැලා ඉස්කෝලෙ අඹගහ යට බංකුවෙ නඵාසයයි සෙනුකයයි එක්ක තඩි ෆයිල් මිටියකුත් තියාගෙන වැඩ වගේක හිටියේ.. ඒ එක්කම එතනට ආවෙ ආවේ රඨ්‍ය අයියයි අයුක අයියයි.. කියාන් අයියා කොහෙද දන්නෙ නෑ.. මම එයා එක්ක විතරනෙ කතාකරන්නෙ.. අයුක අයියා ආවා විතරයි සෙනුකයා නැගිටලා වූබරයි කියාගෙන පොඩි උන්ගෙ ක්ලාස් පැත්තට දුවගෙන ගියා.. මූට මොන යකෙක් වැහිලද.. මම ඉතින් ආපු උන්ව ගනන් ගන්නෙත් නැතුව මගේ වැඩේ කර කර ඉද්දි නඵාසයත් එකපාර නැගිටලා ඌ අදුනන එකෙක් හම්බෙන්න යනවා කියලා යන්න ගියා.. දැන් අඹ ගහ යට මමයි අයුක අයියයි රඨ්‍ය අයියයි විතරයි.. මම අයුක අයියා එක්ක හිනාවෙලා අරුට රවලා එන්ට්‍රි ෆෝම් එකක් අරගෙන නම් වගයක් ලියන්න ගත්තා.. මුන් දෙන්නත් මගෙ ඉස්සරහින් ඉදගත්තා..

සැක් මොන මගුලක්ද මේ වුනේ.. මම මුන් දෙන්නා එක්කම වැඩිය නැනෙ.. හෙන අන්කොම්ෆටබල් ෆීලින් එකක් දැනෙද්දි උන් දෙන්නා හාවක් හූවක් නැතුව අපි හදපු ෆයිල් එකින් එක අරගෙන බලන්න ගත්තා..

@Shan

" රධ්‍ය මම පොඩ්ඩක් අර පැත්තට ගිහින් එන්නම්.. උඹ ඉවරවෙලා වරෙන්.."

අයුක අයියා සාක්කුවට අත් දෙකත් දාගෙන සෙනුකයා දුවලා ගිය පැත්තට හිමින් සැරේ ඇවිදගෙන යද්දි රධ්‍ය කාරයා උගුර පාදලා ආයෙම ෆයිල් එකට මූන ඔබාගත්තා.. අනේ ඔබාගෙනම හිටපන්.. මට මූ එක්ක හෙන තරහයි අනෙ..

" ඔය මොකක්ද කරලා තියෙන්නෙ.. කැපිටල් වලින් ලියපන්.. මොන ලෝකෙද ඉන්නෙ.."

මම පෑනත් කටේ ගහගෙන ඉන්ඩෙක්ස් නම්බර් වගයක් චෙක් කරද්දි මගෙ කන ගාවින්ම රධ්‍ය කාරයගෙ කටහඬ ඇහුනා.. මූ කොයි වෙලේද මෙතෙන්ට ආවෙ.. මම ගැස්සිලා ගිහින් කටේ ගහගෙන ඉදිය පෑනත් විදුරුමහේ ඇනුනා.. මුගෙ ආච්චිට..

" ආව්.. මොකද අප්පා.."

මම කටට අතත් තියාගෙන කේන්තියෙන් අහද්දි මූ ඉන්නවා හෝතම්බුවා වගේ මගේ මූන දිහා බලාගෙන.. ඒ මදිවට මුගෙ ගාව නහය කඩාගෙන යන ප්‍රියුම් සුවදක් එනවා..

" මොකද අහන්නෙ මොනලෝකෙද උඹ ඉන්නෙ.. ඔක කැපිටල් වලින් වලින් ලියපන්.."

" හරි හරි හරි ඉතින්..මගුල කෑගහනවා ඉවරයක් නෑ.. "

මම තරහට ඒ ෆෝම් එක පොඩි කල්ලා ගුලි කල්ලා චප්ප කල්ලා බිමට විසික් කල්ලා වෙන එකක් ඇරගෙන කැපිටල් වලින් ලියන්න පටන් ගත්තා..

රධ්‍ය කාරයා මම විසික් කරපු කොලේ ආපහු අහුලගෙන මේසෙ උඩින් තිබ්බා..

" බිම කොළ දාන්න එපා උඹද මේවා අතුගාන්නෙ.."

" නෑ ඇයි අයියද අතුගාන්නෙ ඔච්චර කේන්ති ගන්නෙ.."

@Shan

" මම නෙමෙයි තමයි ඒ වුනාට ඒ විදියට ඉදපන්.. කට කඩනවා එකට එක කියවන් ආවොත්.. එනවා කරේ නගින්න.."

" කෝ.. කොහෙද කවුද ඔයාගෙ කරේ නගින්න ආවෙ.. හරි වැඩක්නෙ මේක.. අනික කඩ කඩනකල් මම බලන් ඉන්නවා කියලද හිතේ.. නිකන් ඉදපන් අයියෙ.."

" වරද්..!! දෙන්නෙ උඹට"

රධ්‍ය අයියා මට ගහන්න වගේ අත උස්සද්දි මම උරහිස් අකුලගෙන ඇස් දෙක පියාගත්තා.. ඩයල් එක කේන්තියටම රතු වෙලා ඉදිය විදියෙන් මම හිතුවේ ඔලුවට පාරක් දුන්නා කියලා තමයි..

" මොකද උඹ ඇස් පියාගෙන.. ඇස් ඇරලා ඕක ලියපන්.."

සැක්.. ලැජ්ජාව බාල්දියෙන් එකයි.. මෙ දවස් ටිකේම මුගෙ ලග මම පාච්චල් වෙනවා ඉවරයක් නෑ.. කරුමෙට යන යන තැනම මූවම සෙට් වෙනවනෙ.. අද උදෙත් මෙන් ගේට් එක ගාව ඉදන් එද්දි මුගෙ ඉස්සරහම මට නියපොතු කපන්නත් උනා..

" පලයන්කො අයියෙ..මම මේක කරගන්නම්.. ඇයි අප්පා.. කෑගහනවා විතරයි.. කියාන් අයියනම් ඔහොම නෑ.."

මම කියාන් අයියා ගැන කිව්වා විතරයි මුගෙ මූන කළු වුනා..

" මගෙ ඇදුම් දෙක ගෙනත් දීපන් යන්න කලින්.. මම යනවා.."

රධ්‍ය අයියා මගෙ මූන බලන්නෙවත් නැතුව නැගිටලා එතනින් යන්න ගියා.. එදා මම උඩ පැන්නෙ මුගෙ ඇදුම් ඇදගෙනද.. සැක්නෙ ඉතින්.. කොහෙ ගියත් මුගෙ ඇදුමක් හරි මට පැටලෙනවා.. රධ්‍ය අයියා ගිය දිහා ඔලුව කස කස මම බලන් ඉදලා ආයෙම කරපු වැඩේ ඉවරකරන්න ගත්තා.. ඒ එක්කම ඇස් දෙකයි මූනයි රතු කරගෙන බංකුවට දුවගෙන ආවෙ සෙනුකයා.. මූ අඩලද.. මොකක් හරි වෙනවා මේ දවස්වල මගේ වටේ ඉන්න උන්ට.. මම සෙනුකයාගෙන ඇහුවත් ඌ ඔලුව වනලා මෙසෙන් ඔලුව තියාගත්තෙ ඔලුව රිදෙනවා කියාගෙනම එහෙමම.. ඉදපන්කො ඔය ඔක්කොම මම හොයාගන්න..

@Shan

රැට තව අප්ඩේට් එකක් එක්ක එන්නාම් ලමයි..

රධ්‍ය පුතාගෙ මූන කළු වුනේ ඇයි..

දීප්තිමත් සමක් සදහා ෆෙයාර් ඇන්ඩ් ලව්ලි ගෑවනම් ඒම වෙන්නෙ නෑ..

සෙනුක පුතා ඇයි සතු වෙලා ආවෙ..

මුන් ඔක්කොම පාට මාරුකරන්නෙ..

මුන් කටුස්සො වෙන්න බැරිද..

ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 10 කොටස

" ආ මල්ලේ.."

මම සෙනුකයා එක්ක රධ්‍ය අයියව හම්බෙලා ඇඳුම දෙන්න ප්‍රිෆෙක්ට් රූම් එක පැත්තට එද්දි එලියට ආවෙ කියාන් අයියා..

" අයියේ රධ්‍ය අයියා ඉන්නවද..??"

" ඇතුලෙ ඇති බං.. බලහන්.."

කියාගෙන කියාන් අයියා මොකක් හරි වැඩකට යනගමන් වෙන්න ඇති එතනින් ගියා.. මම රූම් එක ඇතුළට යද්දි සයෝන් අයියයි රධ්‍ය අයියයි ලොකු කතාවක.. අයුක අයියා ඉන්නවා පැත්තෙ මේසෙක ඔලුවත් ගහගෙන.. මම ආවා කියලා දැකලත් රධ්‍ය අයියා බලු මැක්කෙක්ක්ට ගනන් ගත්තෙ නැති නිසා මම බෑග් එක පුටුවක් උඩින් තියලා එලියට යන්න එද්දිම අයුක අයියා ඔලුව ඉස්සුවා.. ඒ එක්කම සෙනුකයා රූම් එකෙන් එලියට පැන්නා..

අයුක අයියගෙ මූණෙ හොඳට පේන්න පැහැදිලිවම ඇඟිලි පහක් හිටලා.. අයුක අයියා ඉස්සෙක් වගේ රෝසපාට හමක් තියෙන එකෙක් නිසා ඌට හච්මක් ගියත් මූන බයහිතෙන විදියට රතුවෙනවා.. ඉතින් ඇඟිලි පහ හොඳටම පේන්න හිටලා.. අයුක අයියා සෙනුකයව දැක්කා විතරයි පුටුවත් පස්සට පෙරලන් සෙනුකයා පස්සෙන් දිව්වා.. මම නැති ටිකට මොකක් හරි යමක් සිද්දවෙලා තියෙනවා.. නැතුව සෙනුකයා මෙහෙම හැසිරෙන එකෙකුත් නෙමේ.. විශේශෙන්ම අයුක අයියා වගේ එකෙක් මොකෙක්ගෙන්වත් ගුටි කන එකෙකුත් නෙමෙයි.. ඌ හෙන ආඩම්බරෙන් ඉන්න ඩයල් එකක්නෙ..

" වත්සල්.. ඔහොම ඉන්න.. වත්සල්!!!!"

වත්සල් කියන්නෙ සෙනුකයගෙ අනිත් නම.. අපි ඉතින් ඔකෙන් කතාකරන්නෙ නෑ ඌට.. අයුක අයියයි උගෙ යාලුවයි දෙන්නම එකයි... මිනිස්සුන්ට කතාකරන්නෙ වැඩිය පාවිච්චිකරන්නෙ නැතිම නමින්.. පිස්සු

@Shan

පගයො දෙන්නා.. මම අයුක අයියා පස්සෙන් දුවලා යන්න හැදුවත් එකපාරට මොකෙක් හරි මගෙ අතින් අල්ලගත්තා..

" වරද්.. ඔහොම ඉන්න.."

හරිනෙ.. මේ ගස් වැද්දා මට ඉන්න දෙන්නෙම නෑ.. මම අත දිහා බලලා අත ගසලා දෙකක් රැව්වා..

" මොකද..??"

" මම උබට එකක් කියන්නම්.. සෙනුක මල්ලි උබෙ යාලුවා වෙන්න ඇති.. ඒ වුනාට හැම එකාගෙන ප්‍රශ්න වලට අතදාන්න යන්න එපා.. උන්දෙන්නා ප්‍රශ්න දාගත්තානම් උන් විසාදගනී.. තනි අතින් අප්පුඩි ගහන්න බැනෙ.."

රධ්‍ය අයියා කලබලයන් නැතුව මගෙ දිහා එක එල්ලේ බලාගෙන කතාකරද්දී මම ගල් බූතයා වගේ ඌ දිහා බලාගෙන හිටියා.. ඒ වචන ඊතල වගේ හරි කෙලින්.. හරියට විධානයක් දෙනවා වගේ.. කියන්න ඕන දේ පැහැදිලිවම කියනවා.. ඒකත් අයි කන්ටැක් තියාගෙන හිතට වැදෙන්නම.. ඔච්නෙ මූ ඉතින් කොහොමත් එහෙම වෙන්න එපැයි.. මම දැකලා තියෙනවා මාච් කරද්දී වැරදෙන උන්ට මේ යකා ගිරිය පලාගෙන බනිනවා මහා සද්දෙන් මුලු ග්‍රවුන්ඩ් එකටම ඇහෙන්න..

" ඇහුනද කියපු එක.."

මම රධ්‍ය කාරයගෙ මූන දිහා උගුඩු පැටියා බලාගෙන කොච්චරවෙලා ඉදියද දන්නෙ නෑ ඌ මූන ඉස්සරහින් අත වනද්දි තමයි මම හරි සිහියට ආවේ..

" මම නැති දවස්වල මොකක් හරි උනාද..??"

හරි මට අතදාන්න උවමනාවක් නෑ.. ඒ වුනාට සෙනුකයා මගෙ හැමදේටම ලගින් ඉන්න එකා.. මගේ හොදම යාලුවා.. දැනගන්න හරි මට අයිතියක් තියෙන්න එපැයි.. අනික සෙනුකයට පුපේ අමාරුවක් නැනෙ පාඩුවේ ඉන්න එකෙක්ට කනට ගහන්න.. අයුක අයියා කනේ පාර කාලා තියෙන්නෙ අපේ එකාගෙන් කියලා මට හොදටම ශුවර්.. ඕක ඕන එකෙක්ට තේරෙනවා.. අයුක අයියත් වත්සල් ගාගෙන පස්සෙන් යද්දි..

" මිම්.."

@Shan

මේ අනිත් බකමූනා.. දෙයක් ඇහුවහම කියන්නෙත් නෑ.. මටනම් හරිම කේන්තියි දැන්..

" රධ්‍ය අයියේ මොකක් හරි වුනානම් කියන්න මට.. මම උගේ හොඳම යාලුවා.. මට දැනගන්න අයිතියක් තියෙනවනෙ.."

" අයුක සෙනුක මල්ලිට කැමැත්තෙන් ඉන්නෙ.. ගිය සතියේ අයුක ආස්ක් අවුට් කලා.. ඒ වෙලාවෙ සෙනුක මොකුත් කියලා නෑ දෙන්නම චැට් කරලා කතාකරලා ඉඳලා.. ඉතින් අයුක හෝප්ස් තියාගෙන හිටියෙ.. ඒවුනාට අද උදේ ඇවිත් සෙනුක මල්ලි අයුකට කියලා එයාගෙ හිතේ එහෙම එකක් තිබ්බෙ නෑ.. යාලුකමට කතාකලේ කියලා.. ඒ වුනාට ඕන බූරුවෙක්ට තේරෙනවා සෙනුක මල්ලි හැසිරුනේ අයුක කැමතියි වගේ.. ඊටපස්සෙ උන් දෙන්නා බැනගෙන මල්ලි අපේ එකාගෙ කනට ගහලා අපේ එකත් මල්ලිට ගහන්න ගිහින්.."

මම රධ්‍ය අයියා විස්තරේ කියද්දි කට ඇරගෙන බලාගෙන හිටියේ.. සෙනුකයා මට මෙහෙම දෙයක් කිව්වෙවත් නැනෙ.. සෙනුකයගෙ පොඩි බයි ලයින් එකක් තියෙනවා අපි හැමෝම ඒක දන්නවා ඒ වුනාට අයුක අයියා.. මට මෙලෝ මගුලක් හිතාගන්න බෑ.. රධ්‍ය අයියලා කලින් දැනගෙන ඉන්න ඇති හැමදේම..

" ම-මට සෙනුක එහෙම එකක් කිව්වෙ නැනෙ.."

" ඉතින් ඌම කියනවනෙ යාලුකමක් විතරයි තිබ්බෙ කියලා.. ඇයි උඹත් යාලුවෝ හදාගත්තම හැම එකාටම කියනවද..?? නැනෙ.. මම දන්නෙ නෑ උන්ගෙ ප්‍රශ්න මගෙන් අහන්න එපා.."

" හ්ම.."

මම එන්න හැරුනා.. හිතටත් අවුල්.. මූ මෙච්චර එකක් වෙලා මට කීවෙවත් නැනෙ.. නැත්නම් මූ අයුක අයියගෙන් ආතල් ගත්තද දන්නෙ නෑ.. අපි කොච්චරවත් කියනවා මේ පකයට මිනිස්සුන්ගෙ හැගීම් එක්ක සෙල්ලන් කරන්න එපා කියලා.. හරිනෙ දැන් පිස්සු හු#තට ඔය වෙලා තියෙන්නෙ..

" ඒ වරද්.. පොඩ්ඩක් ඉන්නවා..  උඹ හවසට හොකී පැක්ටිස් මැචස් බලන්න ඉන්නවනෙ.."

@Shan

රධ්‍ය අයියා අහද්දි මම ලාවට ඔලුව වැනුවා.. දැන් ඉතින් දිගටම තියෙන මැචස් වලට ඉන්න එපැයි.. ඒව බලන්න ඉන්නයි ප්ලෙයර්ස්ලා දාලා ටීම් හදන්නයි.. මල කරුමෙ එක දෙයක් හරියට කල්පනා කරන්න විදියක් නෑ.. ඔක්කොම ඔලුව උඩ පැටව්ලා මට නම් දැන් පිස්සු වගේ..

" වරෙන් කාලා යන්න.. දැන් ආපු එකේ මට මෙච්චර කන්නත් බෑ.. අරුන් දෙන්නත් ගියානෙ.."

" ආ මොකක්ද..??"

මම ඇහුවෙ පුදුමෙන්.. යකෝ.. මෙක ලියලා තියාගනින් දිනෙත් එක්ක ෂනෙරු පුතේ.. මෙන්න මෙකා උඹට කන්න කතාකරනවා.. උදේ මාව මරාගෙන කන්න හදලා දවල්ට බත් කන්න කතාකරනවා.. මූ නම් සිරාවටම ට්‍රැක් ඩයල් එකක් තමා.. මම බය වෙලා වගේ රධ්‍ය අයියා දිහා බලන් ඉද්දි මූ බෑග් එකට අත දාලා බත් මුලක් අරගෙන මෙසෙ උඩින් තියලා මෙසෙ දෙපැත්තෙන් පුටු දෙකක් ලං කලා.. සිරාවටම මම හීනයක් නෙමෙනෙ දකින්නෙ.. මූ මෙහෙම ඕනවට හොඳ වෙන එකේ පොඩි අවුලක් තියෙනවා වුනත් කෑම එකෙන් එන සුවඳට මට තරහ මරහ පොඩ්ඩකට අමතක වුනා.. දවල්ටත් කෑවෙ නෑනෙ ඉතින්.. මූ මාව කෑම එකක් පෙන්නලා සෙඩ්යුස් කලා.. තණකොල පෙත්තා..

" අත හෝදන් වරෙන් ඉතින් කන්න.. ඇයි උඹ උපවාසද.."

" කියාන් අයියා එන්නැද්ද.."

මම මනුස්සකමට ඇහුවම තණකොලපෙත්තගෙ මූන නැඹිලියක් වෙලා ගියා..

" ඇයි උගෙ කටින්ද උඹ කන්නෙ.. වදුරු කුණුහර්ප අහගන්නැතුව අත හෝදන් වරෙන් වරද්!!!"

මූට කොහිල ගිල්ලන්න ඕන හෝදන්නෙ නැතුව කටු පිටින් අමුවෙන්.. කවලා විතරක් මදි.. කොහිල අලයක් අරන් පුපෙත් ගැහුවනම් හරි.. මම දැන් මූට කේන්ති ගන්න දෙයක් ඇහුවද මගුල..

" ඉන්නවා ඉතින්.."

@Shan

මම හිමින්සැරේ එලියට ගිහින් අත හෝදගෙන ආයෙම රූම් එකට ආවා.. අම්මෝ අම්මෝ මෙන්න ජෝක්.. මෙකා බත් මුල දිගැරගෙන හැන්දෙන් කනවා.. හැන්දත් දික් කරන් කන හැටි පෙනුන මම පුප හපාගෙන මැරෙන්න හිතාගත්තා.. ඇයි යකෝ ඉතින් හිනායන්නැද්ද.. මම කට බොරුවට පිහිදගෙන ගිහින් උගෙ ඉස්සරහින් වාඩිවුනා.. කෑම එක සුවදට උණුවට තියෙනවා.. රස පාටයි.. ඇඹරුල්ලා මාලුවකුත් හදලා..

" මොකද උඹ හිනාවෙන්නෙ.."

රධ්‍ය අයියා හයියෙන් ඇහුවම මාව ගැස්සිලා ගියා.. අනේ පගො හිනාවෙන්නැතුව අඩන්නද කියන්නෙ..

" න්-නැහ්.. පිස්සුද අයියෙ.. කෝ කවුද හිනාවුනෙ.."

මම පාඩුවෙ බත් කටක් අනාගෙන කටේ ඔබාගත්තා.. බොරු කියන්න ඕනෙ නැනෙ කෑම එක ඇත්තටම මාරම රසයි..

" උඹ දැන් හිනාවෙන්නෙ මම හැන්දෙන් කන නිසානෙ.. බලපන් මගෙ ඇඟිලි තුනක්ම තුවාලවෙලා.. ඒකයි හැන්දෙන් කන්නෙ.. එනවා හිනාවෙන්න.."

රධ්‍ය අයියා ඩෙටෝල් ප්ලාස්ටර් ගහපු ඇඟිලි තුන මගෙ ඉස්සරහට දික් කරද්දියි මට සීන් එක තේරුනේ.. හරි ඉතින් හිනාවෙච්ච එව ඉල්ලා අස් කරගන්නවා.. මට ඉතින් පෙනුනයැ එහෙම එකක්..

" මොනවා කරන්න ගිහින්ද.."

මම පපඩමක් අරන් කරස් ගාලා හැපුවා..

" රේසරේට කැපුණා.."

" ආ.. ඒකනෙමෙ කෑම එක රසයි.. කවුද ඉව්වෙ.."

" අයියා.."

රධ්‍ය අයියා කිව්වෙ හෙන ඩෝන්ට් කෙයාර් වොයිස් එකෙන්.. මූඑ ගනන් වැඩි හොදටම..

@Shan

" චෝව්.. මරුනෙ.."

"...."

ඌ උගෙ පාඩුවෙ කනවා හැන්දෙන්.. මම අලි බත් පතවල් අතින් කද්දි පොඩ්ඩක් අවුල් වගේ හිතුනා.. මම ඉතින් මනුස්සකමට පුටුව උගෙ ලගට ඇදගෙන ඉදගද්දි මූ මගේ දිහා බැලුවෙ මම ඌව රේප් කරන්න ආවා වගේ..

" මි-මොකද.."

" මරන්න නෙමේ හලෝ.. ආ කියනවා.."

මූ තාම මම දිහා බලන් ඉන්නෙ අමුතු සතෙක් ගානට.. ඇයි යකො කවන්න යන්නෙ කවන්න.. අහවල් එකක් කරන්න නෙමෙයි..

" ආ කියපන්කො අයියෙ.. මගුල අතත් රිදෙනවා.."

මම කලින් තිබ්බ තරහටත් එක්ක බෝංචි එකේ තිබ්බ පත මිරිස් කෑල්ලකුත් කරකුටන් වෙන්න අනලා රධ්‍ය කාරයගෙ කටට ලං කලා.. මූ නිකන් හීනෙන් වගේ කට ඇරලා කද්දි ඒ ඇස් වල අමුතු පෙනුමක් තිබුනා.. ඒක හරි බර බැල්මක්.. දීසෙන ඇස් වලින් මම දිහා බලන් ඉද්දි එයාගෙ අත ලාවට වෙවුලනවා මම දැක්කා..

මම නිකටට යටින් අතත් තියලා යහමින් මිරිස් තියෙන බත් කට කැව්වත් මෙ යකා ඒක හීනෙන් වගේ හපලා ගිල්ලා.. නෙද්දකින් කිරි ඉබ්බා අපරාදෙ අනපු මිරිස් කෑල්ල.. මූ බලන් ඉන්න විදියට බොක්කත් එක්ක කුල් වෙලා යනවා.. ඌට කවලා ඊටපස්සෙ කට මම කෑවා..

" උඹ කාටහරි මීට කලින් කවලා තියේද.."

" නෑ ඇයි??"

" රසයි.."

අවසාන කටත් කාලා මෙකා අමුතු හිනාවකුත් දාගෙන වතුර බෝතලෙත් අරන් එලියට යද්දී මම තුෂ්නිම්බූතවෙලා වගේ රධ්‍ය අයියා දිහා බලාගෙන හිටියා.. මූ ලගට වැඩිය ලං වෙන්න එපා වරද් පුතේ.. මූ එන්නෙ හොදකට නෙමේ..

@Shan

මම මෙලෝ හේතුවක් නැතුව හයියෙන් ගැහෙන පපුවට ඉදුල් අතින් නැතුව අනිත් අතින් ගහගත්තා.. එතකොටම සෙනුකයා හිනාවෙවී මම ඉන්න දිහාට දුවන් එද්දි මම ඌව දැක්කෙ නෑ වගේ රධ්‍ය අයියා ගාවට ගිහින් අත හෝදගෙන උගෙන් වතුර බෝතලෙත් උදුරලා අරන් බීලා ආපහු ඒක උගෙම ඇගේ ගහලා රවාගෙන යන්න ගියා..

" ඕන නෑ එක පකෙක්.. එකට ඉදගෙනත් මූ කිසිදෙයක් මට කිව්වෙ නැනෙ.."

" ෂනෙරුවා.. ඉදපන්.. ඒයි..අඩෝ!!"

මම සෙනුකයගෙ කටහඩ ඇහි ඇහිත් ග්‍රවුන්ඩ් එක පැත්තට දුවලා ගියා..

සැට ආවා..

සෙනුක ඇයි හිනාවුනේ..

ගුලි කාලා වෙන්න බැරිත..

පව් අනෙ ලමයි ඔයාලගෙ රද්‍ය අයියගෙ අත කැපිලා..

දුකයි දුකයි දුකායි...

සෙනුක අයුක නැවට ආස අය ඉම්නවත..

මේකෙ මේල් ප්‍රෙග්නසි ඍූහ්.. හරිත..

ලව් යූ ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

@Shan

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 11 කොටස

මම ග්‍රවුන්ඩ් එකේ කැරකි කැරකි ඉදලා ආපහු ජිම් එකට යද්දි ප්‍රැක්ටිස් මැචස් පටන් අරන් පැයකටත් වැඩී.. සියුස් එකේ ඉන්න මතිශයයි හශානයයි හම්බෙලා කයියක් දාගෙන ඉදලා ආපහු එද්දි සෙනුකයා මං දිහා බලාගෙන කට ඇද කරගෙන එහාට යනවා මම ඇස් කොනින් දැක්කත් මගෙ හිත රිදුනා.. අයුක අයියා සෙනුකයා යන දිහාවට ඇවිදගෙන යද්දි මට කතාකරන්නවත් මොකෙක්වත් හිටියෙ නෑ.. ජිම් එකේ සිමෙන්ති පඩිපෙලවල් වල කොනේ රිධ්‍ය අයියයි කියාන් අයියයි ඉදගෙන ඉද්දි මම කරබාගෙන ඒ පැත්තට ගියා.. අඩුම මුන් දෙන්න හරි ඉන්නවනෙ කියවන්න.. කමක් නෑ.. මම කතාබහක් නැතුවම ගිහින් කියාන් අයියට එහාපැත්තෙන් වාඩිවෙලා ඌ බල බල හිටිය ෆයිල් එකට මූණ දැම්මා.. හරිනම් මම කරන්න ඕන වැඩ මුන් දෙන්න මෙ කරන්නෙ.. මම ඉතින් හිත බිදිලා ගියානෙ වටෙ..

" දෙන්න අයියේ මම කරන්නම්.."

මම කියාන් අයියගෙ අතේ තියන පෑන උදුරලා ගද්දි රධ්‍ය අයියා රවාගෙන බලාගෙන හිටියේ පෑන ගද්දි එකට ගෑවෙන අත් දිහා.. කලකිරීමෙන්ද මොකක්ද මන්දා.. ඒ ඇස් වල අමුතු දුකක් තිබුනා.. මම ගිය විනාඩි ගානට මුගෙ මූණ නාප වෙලා..

" උඹලා දෙන්නා එහෙනම් ඔය ටික ඉවර කරපන්.. මම ගයාන් සර්ව හම්බෙලා එන්නම්.."

කියාන් අයියා මගේ පිටට ගහගෙන එහනින් නැගිටලා ගියාම රධ්‍ය අයියා ලොකු හුස්මක් පහල දාලා කලකිරීමෙන් ඈත බලාගෙන හිටියා.. ජිම් එකේ තියෙන ආටිෆිශල් වුඩන් ෆ්ලෝ එකේ ලමයින්ගෙ සපත්තු ලිස්සලා එන සද්දෙයි කෝච් කාරයා කෑගහන එකයි අපි අතරේ ලොකු සෝශාවක් මවලා තිබ්බා වුනත් රධ්‍ය අයියා ඈත බලාගෙන හිටියේ ඒ මෙලෝ දෙයක් ඇහෙන්නෙ නැතිව එයා විතරක් මෙතන ඉන්නවා වගේ.. මූ ඔහොම බකන් නිලාගෙන ඉද්දි මගෙ හිතට හරි නෑ වගේ නිසා මම හිතලම මගෙ අතේ තිබ්බ පෑන බිමවැට්ටුවා..

@Shan

රධ්‍ය අයියා ගැස්සිලා වගේ මගේ දිහා බැලුවෙ මේ සේරම සද්ද අස්සෙ පෑන බිමට වැටුනු එක විතරක් එයාගෙ මොලේ හරියටම ප්‍රතිචාර දැක්කුවා වගේ.. රධ්‍ය අයියා ඉක්මනින් පෑන අහුලලා මගෙ උකුල උඩින් තිබ්බම නොදැනිම මම එයා දිහා බලාගෙන හිටියා..

පලවෙනි පාරට..

පලවෙනි පාරට මම කවදාවත් දැකලා නැති පෙනුමක් රධ්‍ය අයියගෙන් මම දැක්කා.. එයාගෙ ඇස් තද කළු පාට ගැඹුරු හරිම ගුප්ත පාටයි.. මූනේ සුදුමැලි පෙනුම කපාගෙන මතුවෙලා තිබුනු දුඹුරු ලප එයාට හුගක්ම ගැලපුනා.. මට දැනුනේ ඇග කිලිපොලා යන අමුතු හැගීමක්.. ඒ ඇස්වල තිබ්බ අමුතු දුක මගේ හිතේ අමතක නොවෙන විදියට ඇදුනේ ඇයිද මම කියන්න දන්නෙ නෑ.. මට තේරෙන එකම දේ.. මෙහෙම දෙයක් කවමදාවත් මට දැනිලා නෑ..

" අහ්ම.."

එකපාරට සිහියට ආපු රධ්‍ය අයියා උගුර පාදලා අහක බලාගත්තම මමත් කලබලෙන් වටපිට බැලුවේ කවුරුහරි අපි දිහා බලන් ඉන්නවද කියලා බලන්න.. වෙලාවට කවුරුත් නෑ.. ඒවුනාට හැම තිස්සෙම මරාගන්න උගෙයි මගෙයි අතරෙ මෙහෙම ඉදහිට ඇතිවෙන ටෙන්ශන් එක මට හරිම අපහසුයි.. මම කැමතී අපි හොද යාලුවෝ වෙනවනම්.. ඒත් මොකක්දෝ කරුමෙකට මට මුගෙ යාලුවෙක් වෙන්න හිතෙන්නෙ නෑ.. මේ ඉන්න විදිය රණ්ඩුවෙන විදිය හොදයි කියලා හිතෙනවා..

මම ආයෙම රධ්‍ය අයියා දිහා බලද්දී ජිම් එකේ එහා කොනේ චේන්ජින් රූම් එකෙන් එළියට එන අයුක අයියයි සෙනුකයයි දිහා අමුතු දුකකින් බලාගෙන හිටියා.. අනේ මන්දා මූ මෙහෙම ඉද්දි දෙන්න හිතයි මැරිලා වැටෙන්න..

" රධ්‍ය අයියේ.. මට පරක්කු  වෙනවා.. ගෙදර යන්න ඕන.."

වෙලාව බලද්දී මම දැක්කෙ දැන් හතර හමාරට විතර ඇති.. අම්මා බයවෙනවා පරක්කු වුනොත්.. කෝල් එකක් අරන් කියන්නවත් ෆෝන් එකක් නැනෙ.. මම ෆයිල් ටික ගෙදර ගිහින් බලනවා කියලා හිතාගෙන නැගිට්ද්දි රධ්‍ය අයියත් ඉන්න තැනින් නැගිට්ටා..

@Shan

" කොහෙටද රාජගිරියට ගිහිල්ලද යන්නෙ..?? වරෙන් මා එක්ක යමු.."

මම හා කියන්නත් බෑ කියන්නත් කලින් රඨ්‍ය අයියා මගෙ අතේ තිබ්බ ෆයිල් ටිකත් අරගෙන ජිම් එකෙන් එලියට ගියා.. අද මොන වගේ දවසක්ද මන්දා මට පට්ට මූසල ගතියක් දැනෙනවා.. අනික හවස ඉදන් ඔලුව කකියනවා ඉවරයක් නෑ..

" අහ්-කැහ්-බ්වැක්-කැහ්-කැහ්ඃ-අම්මාහ්.."

ජිම් එකෙන් එලියට ඇවිත් ඔක්කාරෙට ආපු නිසා මම එහෙමම වොශෲම් එක පැත්තට යද්දී මට එහෙමම වොමිට් වුනා.. කාපුවයි බීපුවයි සේරම ආපහු දාද්දී මගෙ ඔලුව කැක්කුම ඇස් දෙකටත් ඇවිල්ලා වගේ ඇස් දෙක ඇරන් ඉන්න බැරි කමට මම එහෙමම බිත්තියට වාරු වෙලා බිම දනගහගත්තෙ පපුව හයියෙන් මිරිකගෙන.. මට ඉන්න බෑ දෙයියනේ මගෙ ඇගම කකියනවා මැරෙන්න වගේ..

" මල්ලි.. අඩෝ ෂනෙරු.. මල්ලි!!"

මම ස්ටෝල් එකේ දොර අඩවල් කල්ලා තිබ්බ නිසා සයෝන් අයියා මම ඉන්න පැත්තට දුවගෙන එනවා විතරයි මට පෙනුනේ.. එහෙමම මම වටේට අන්ධකාරවෙලා ගිහින් බිමට කඩාවැටුනා.. විටින් විට නින්දෙන් ඇහුනු සද්ද කීපයක් මිසක් මට කිසිදේක දැනීමක් තිබ්බෙ නෑ.. මම ආයෙම දෙයියනේ කියලා යාන්තම් ඇස් අරිද්දී මම හිටියේ පොඩි කාමරේක.. ඇස් දෙක කඩාගෙන යන්න වගේ ලයිට් එළියක් ඇස් වලට වදිද්දී කාමරේ දොර ඇරගෙන කවුරුහරි අතුලට ආවා..

" අයියේ ඇයි වරද් නගිට්න්නැත්තෙ.. මොකක් හරි කරපන්කො බං.."

" පොඩ්ඩක් ඉදපන් පොඩී.. සේලයින් එකෙන් බාගයක්වත් තාම නැනෙ.. අනික මේ මල්ලිට ප්‍රෙෂර් අඩුවෙලා.. ගැස්ටයිටිස් එක්ක.."

" මූ අයියෙ වැඩක් නෑ මුගෙ කටනම් තියනවා මෝය කට ඇරියා වගේ.. මට මූව මරන්න හිතයි.. හරකා..දවල්ට බෙහෙත් බීලා නෑ.."

" හරි හරි බං මෙ කාලෙ පොඩි එකාට ස්ට්‍රෙස් ඇති.. ලෙඩ නොහැදී ඉන්න නම් මෙන්ටල් හෙල්ත් එකයි ෆිසිකල් හෙල්ත් එකක් දෙකම හොදට තියාගන්න ඕන.. ඔය කාලෙ තියන ප්‍රෙශර් එකට ඔහොම වෙනවා..

@Shan

සාමාන්‍යයි.. උඹ දැන් මෙතන යකා නටන්නෙ නැතුව වාඩිවෙලා ඉදපන් පොඩි එකාට සිහිය එනකල්.. ඉස්සරහා පේශන්ලා පිරිලා.. මම යන්න ඕන.."

මට ඇහුනා ඇඳ ගාව තිබ්බ පුටුව ඇදගෙන රධ්‍ය අයියා වාඩිවෙනවා.. අර නහය කඩාගෙන යන සුවඳ එහෙමමයි.. මට ඒ එක්කම දැනුනා මගේ ඔලුව හරි සනීපෙට පිරිස්සමට අතගානවා.. මූ යකෝ.. බැනලා බැනලා එනවා අතගාන්නත්.. මම එහෙමම ඇස් අරින්න හදද්දි රධ්‍ය අයියා ඉක්මනින් අත ඇදලා ගන්නවා මට දැනුනා.. මම ඇස් අරිද්දි මේකා ඉන්නවා මූණට එබිලා බිලී කොක්ක උගුරෙ පැටළුනු ලූලා වගේ මගේ දිහා බලාගෙන.. කන්න වගේ..

" උඹෑ මැරිලා නෑනෙ..ඒ.. කතාකරපන්.."

සැක්ම සැක්.. ලෙඩෙක්ගෙන් ඔහොම අහනවද දෙයියනේ.. මූ නම් වැරදිලාවත් සාත්තු සේවකයෙක්ට යවන්න නරකයි.. මැරෙන්න ඔන්න මෙන්න ඉන්න එකෙක්ගෙන් ඇහුවොත් එහෙම 'තාම මැරුනේ නැද්ද' කියලා.. මලකෙලියයි..

" පිස්සුද හලෝ.."

මම නැගිටලා කෙලින් වෙන්න යද්දි මූ ආයෙම මගේ නලලට ඇඟිල්ලක් තියලා කොට්ටෙටම මාව තල්ලු කල්ලා දැම්මා.. අනේ මූව අරන් පලයාන්.. මූ ලෙඩාට හිංසා කරනවා..

" දඟලන්නැතුව ඉදපන් වරද්.."

" ආ.. ලෙඩා ඇහැරිලාද.."

ඒ එක්කම ඩොක්ටර්ස් කෝට් එකකුයි ස්ටෙත් එකකුයි කරේ දාගෙන ඇතුළට ආවේ රධ්‍ය අයියගෙම හැඩහුරුකම තියෙන තව පිරිමි ළමයෙක්.. අලි කණ්ණාඩි දෙකකුත් දාගෙන පොර අපි දෙන්නා ලඟට ඇවිදගෙන අවා..

" ඇගට අමාරු මොනවද තියෙන.. තවම වොමිට් වෙන්න වගේද.."

ඩොක්ට මගේ සේලයින් එකට කහම කහපාට බීකො එකක් දාලා මූනට එබිලා අහද්දි මම නෑ කියන්න ඔලුව වැනුවා.. දැන් වෙලාව කියද..?? මල

@Shan

හත්තිලව්වයි අම්මා බයවෙලා ඇති.. මගෙ පපුව එකසිය ගානට ගැහෙන්න ගත්තා..

" අයියෙ අපෙ අම්මා.."

මම හරි අසරණව රධ්‍ය අයියා දිහා බලලා අහද්දි ර්ධ්‍ය අයියා ගැස්සිලා වගේ ගියා.. අර එදා සේපාලිකා ගහ ගාවදි වගේම..

" මම අම්මට කිව්වා.. උඹෙ එස් ආර් බී එක අරගෙන අම්මට කෝල් කල්ලා කිව්වා.."

" මොකද අම්මා කිව්වෙ.."

" අම්මා හදිසියේ එන්න හැදුවෙ.. මම කිව්වා එපා මම එක්කන් එන්නම් කියලා.."

" ඔයා?? මාව එක්කන් යන්න්??"

" උඹට ඒ පහිච්චකම් වලින් වැඩක් නැනෙ.. අයියෙ මුගෙ මේ කට වැහෙන්න මොකුත් නැද්ද බෙහෙතක්. අම්මපා උඹ ලෙඩින් නොවුනනම් මම උඹව පට්ට ගහනවා.. ගොන් හරකා.."

මෙ පළගැටියා මට උඩට බිමට රව රවා බනිද්දි මම ඌටයි ඩොකාටයි දෙන්නටම ගස්සලා අහක බලගත්තා.. හරි මගුලක්නෙ යකො ඉතින් හිතලා ලෙඩ වුනායැ.. හරි නොකා ඉදියා තමා.. ඒ වුනාට ඔහොම කෑගහන්න ඕන නැනෙ.. හොදින් කියන්න පුලුවන් නෙ..

" හරි හරි උඹලා ඕන මගුලක් කරගනින්.. පොඩී මෙන්න බයික් එකේ යතුර.. පැය බාගෙකින් මේක ඉවරයි.. පරිස්සමට ගිහින් ගෙදර වරෙන්..මම වීල් එකක යන්නම්.."

ඩොක්ට අයියා බයික් එකක යතුරක් රධ්‍ය අයියගෙ අතේ ගුලි කල්ලා මටත් හිනාවෙලා එලියට ගියා..

" ඒ කවුද..?"

මම ඩොක්ටර් යන දිහා බලාගෙන ඇහුවා..

@Shan

" අපේ අයියා.."

" අර රහට කෑම හදන්නෙ.. එයාද??"

" මම.."

" සිරාවටම අඩෙ.. මරුනෙ.. අයියා ඩොක්ටර් කෙනෙක්ද.."

" නෑ පයිලට් කෙනෙක්.. ගෙං කතා අහන්නැතුව මෙ කිරි එක බීපන්.."

රධ්‍ය අයියා පැත්තකින් තිබ්බ මොලේම රහක් නැති ෆ්‍රෙශ් මිල්ක් එකක් කඩලා මගේ කටේ ගැහුවා.. ඇක්කා සීනිවත් නෑ අමුම අමු රහයි.. මම මූණ ඇඹුල් කරගෙන කට අහක් කරන්න යද්දි මේ ඇට මැස්සා මගෙ කට දෙපැත්තෙන්ම අල්ලලා බලෙන් බලහත්කාරකමින් කිරි එක බඩට දැම්මා.. මූ මීටකලින් ලෙඩ්ඩු බලාගෙන නැද්ද කොහෙද.. ප්‍රචණ්ඩකාරී විදියටනෙ හැසිරෙන්නෙ ලෙඩ්ඩු එක්ක.. මම හිතින් බැන බැන හිටියට ඉතින් ඌ මගෙ ලග ඉන්න එකත් හයියක් මේ වෙලාවෙ..

" ඇදුම ගලවපන්.."

රධ්‍ය අයියා මම හවස එයාට දුන්නු බෑග් එක අතේ තියාගෙන එපාකරපු බැල්මකින් මගේ දිහා බලන් කියද්දි මගෙ ඇස් දෙක ලොකුවෙලා එලියට පනින්න සයිස් එකට ආවා.. ඇදුම් ගලවන්න.. මෙතන.. ආස ඇති..

" ඒ මොකටද.."

" උඹ මුලු ඇගේම වමනෙකරගෙන බලපන් මගෙ ඇදුමෙත් එක්කන්.. මේක ඇදගෙන හිටපන් මම එලියෙන් ඉන්න.."

" ඕ-"

දැක්කනෙ.. කියන්න හම්බුනාද එක වචනයක්.. නෑ.. දොරත් දඩාස් ගාලා ඇරගෙන ගියා.. යකෝ මගෙ අතට බටයක් ගහලා මූට පේන්නෙ නැද්ද.. ඇදුම් අදින්නෙ කොහොමද මූ මැත්ස් කලාට මොලේ තියෙන්නෙ පුපේද කොහෙද.. මම මූනට දමලා ගහපු ඇදුම් ටික පුටුවට විසික් කල්ලා නිදාගෙන හිටියා.. එන්නෙ නැතැයි පිඹගෙන.. අද නම් මහා මොනවගේ

@Shan

දවසක්ද මට තේරෙන්නෙ නෑ.. හෙන විතරයි ගැහුවෙ නැත්තෙ.. ඒත් කියන්න බෑ එලියට බැස්සම ඒකත් ගන්න ඉඩ තියේ..

" කෝ ඇඳුම මාරුකරන්නෑ??"

" බැනෙ පේන්නැද්ද අතට බටයක් ගහලනෙ.."

" ඕක ගලවපන්.. දැන් ඒකෙ යන්න දෙයක් නෑනෙ.."

මේකා මොන විදියේ මානසික රෝගියෙක්ද කියන්න මම දන්නෙ නෑ මම ලගට ඇවිත් කිසි හෙවිල්ලක් බැලිල්ලක් නැතුව කැනියුලා එක ඇදලා දැම්මා. ටහික්කෙන්න.. යකෝ..මට හදේ ආවාටෙ ඉදලා ක්ශීරපත වල්ගාතරු සේරම එකපාර පෙනුනා.. මම ඇස් දෙක තද කල්ලා පියාගෙන බෙරිහන් දෙන්න කට ඇරියා විතරයි මූ අර පුටුවෙ තිබ්බ බොටම අරන් මගෙ කටේ එබුවා..

" කෑගහන්න එපා යකෝ මේක ඩිස්පැන්සරියක්.. මම උබට බලහත්කාරකම් කලේ නෑනෙ.."

අනේ දෙයියනේ මූ නම් සයිකො කිලර් කෙනෙක්ද කොහෙද.. බලහත්කාරකම් කර කර මටම කියනවා එහෙම කලේ නැල්ලු.. මූ මෙලෝ ගානක් නැතුව කැනියුලා එකෙ ගලවලා දාලා අත දියේ උණුවට උකුවට ගලාගෙන යන ලේ ටික පුලුන් කැල්ලකින් පිහිදලා දැම්මා..මම අර මොකාද එකා වගේ බොටමක් ගුලි කල්ලා කටේ ඔබාගෙන.. මගෙ ඇස් දෙකෙන් කදුලු වැටුනේ අනේ වේදනාවටයි මූ හැසිරෙන විදියටයි..

" දැන් හරි- ඒ වරද්.. මොකද මේ.. ඇයි මෙ අඩන්නෙ.."

මම ඇස් වල කදුලු පුරවන් රධ්‍ය අයියා දිහා බලන් ඉද්දි එයා බයවෙලා මගෙ කටේ තිබ්බ බොටම අයින් කල්ලා මගේ මූන දෙපැත්තෙන්ම අල්ලගෙන මූනට එබුනා.. මෙහෙම ලග වැඩිත් එක්කන්..

" ඇයි අහන්නෙ.. මගුල.. රිදුනා අත.. ආව.. අම්මාහ්.."

මම අත ගස ගසා දගලද්දි මූ මගෙ මූනෙ තිබ්බ අතක් පරිස්සමට ලේ ගලන අත උඩින් තියලා පුලුන් කැල්ලට උඩින් හීමිහිට ඇතගෑවා.. ඒක කලේ හරි පරිස්සමට.. ඒ වෙලාවෙත් ඒ ඇස් මම දැක්කේ පුදුම විදියේ බරක්

@Shan

පුරෝගෙන ඉන්නවා වගේ.. ඇහිබැම එකට ලං වෙලා මං ගැන වදවෙන ගානට මූනට එබිලා ඉද්දි කවදාවත්ම මෙහෙම නොගැස්සුනු මගේ හිත රධ්‍ය අයියා ගාවදි ආයෙම ගැහෙන්න ගත්තා.. අනිත් අතින් මගේ මූනේ තිබ්බ එදා බැජ් එකට හීරුනු කැලල අතගාලා අයින් වුනේ මූනේ හැඟීම් කෝටියක් විතර පුරෝගෙන.. මගෙ හිතට පොඩ්ඩක්වත් හොදක් නෑ.. පපුවෙ පැත්තක් හිරිවැටීගෙන බඩ කැලතෙනවා වගේ.. අනේ අම්මේ මම මැරෙන්න යන්නෙ..

" ඇඳුම් මාරු කරන් එන්න වරද්.. අම්මා කතාකලා දැන් ටිකකට කලිනුත්.."

රධ්‍ය අයියා මගේ ඔලුව අතගාලා කාමරේටම අල්ලලා හදලා තිබ්බ වොශෲම් එකට ගියා..

" මැරුම් නොකා අල්ලගනින් වරද්.. උඹට ඕන වැටිලා මැරෙන්නද.. එහෙනම් මැරිය මාත් එක්ක නොයා වෙන එක්ක ගිහින්.."

මම රධ්‍ය අයියා එක්ක බයික් එකට නැගලා එන්න හදද්දි මූ ආයෙම පරල වෙන්න ගත්තා.. ඇයි යකෝ දැනුත් බදාගෙනනෙ ඉන්නෙ.. මූ මට මොකක් කරන කියනවද..

" ඇයි මගුල.. අල්ලගෙන තමා ඉන්නෙ.. පේන්නැද්ද.."

මම උදේ මගේ නියපොතු කප්පපු එකේ තරහටත් එක්ක උගෙ පපුවෙ මැද්දෙන්ම කැල්ලක් ගැලව්ලා යන්න කෙනිත්තුවා.. දන්නෑ මෙ වරද්ගෙ හැටි.. මිදි කන හිවලා..

" ආව් බං.. උඹට පිස්සුද.."

රධ්‍ය අයියා මම උගෙ බඩ වටේ දාගෙන හිටිය අත් දෙක ඉස්සරහට ඇද්දා විතරයි මම බෝස් ගාලා ලිස්සලා ගිහින් මුගෙ පිටකොන්දට හූනු පැටියා වගේ ඇලුනා..

" ඔහොම ඉදපන්.."

" මෙ හයියෙන් යන්නෙපා හරී.. මම වැටෙයි.."

" කට වහන් ඉදපන්.. මම යන විදියට යන්නම.."

@Shan

කියලා රේස් කලා මට ආයෙම කලන්තෙට ආවා.. මම ඇස් දෙකත් පියාගෙන උගෙ පිටට මූන තියාගෙන හිටියා.. මට එච්චර හුරු නෑ බයික් වල ගිහින්.. යද්දි නිකම් වැටෙන්න යන්න වගේ දැනෙනවා..

කොහොමහරි පැය බාගෙකට කිට්ටුවෙන්න ඇවිත් අපේ ගෙදර ඉස්සරහින් බයික් එක නැවැත්තුවා.. මූ කොහොමද අපේ ගෙදර දන්නෙ..?? කොහොම හරි දන්නව ඇතිනෙ..

" බැහැපිය.."

රධ්‍ය අයියා එක කකුලක් බිමට තියාගෙන බැලන්ස් ඇතුව ඉද්දි මම බයික් එකෙන් බැස්සා.. සැක් කකුල් දෙකත් වෙවුලනවා මේ ලබ්බෙ ඇවිත්..

" ආ බෑග් එක.. හෙට ඉස්කෝලෙ එන්නෙපා.."

" ම්ම්.."

මම රධ්‍ය අයියා දීපු බෑග් එක තුරුල් කරගෙන ඌ දිහා බලාගෙන ඉද්දි ඌ මගෙ ඔලුවෙ තිබ්බ හෙල්මට් එක ගලවලා අරගෙන හැන්ඩ්ල් එකේ එල්ලගත්තා..

" අම්මට කියන්න මම ගියා කියලා.. බෑග් එකේ බෙහෙත් ඇති කාලා බීපන්..මම රෑට ගන්නම් ෆෝන් එක ලග තියාගෙන ඉන්නවා.. නැත්තන් මම උඹව හොයාගෙන ගෙදරට එනවා.."

" අනේ මේ.. යනවා යන්න.. මම යනවා.."

" ම්ම්.."

රධ්‍ය අයියා බයික් එක හරෝගෙන මම දිහා බලන් ඉදලා ආයෙම ඔලුව අතගෑවා.. හරි පව් කියලත් හිතෙනවා අප්පා..

" පරිස්සමින් යන්න.."

" ගෙදරට යනවා.."

මම හැරිලා එනකල් බයික් එක නවත්තගෙන හිටිය රධ්‍ය අයියා මම ගෙදරට අඩිය තිව්ව විතරයි යන්න ගියා.. මේ දවස් ටිකට රධ්‍ය අයියා මෙච්චර ලගින්

@Shan

ආශ්‍රය කරන්නෙ කොහොමද කියලා මට හිතාගන්න බෑ.. මොකක් වුනත් ඩයල් එක හොදයි ඉතින්.. මම කල්පනා කර කරම එද්දි අම්මා කලබලෙන් ඉස්සරහට දුවගෙන ආවා..

" දෙයියනේ ලමයෝ.. සුදුමහත්තයා!!!"

කෝමද ලමයිනේ.. මම හෙට අප්ඩේටුවක් ඇරන් එන්නම්..

ඇත්තටම ඔයාලගෙ කමෙන් වෝට්ස් දෙයියනේ මට කියන්න හිතාගන්න බෑ.. හැමදේකටම ආදරෙයි මහ ගොඩක් ලමයි.. දිස් මීන් අලොට් ටු මී.. රියලි තැන්ක්ෆුල්.. උම්මවහ්.. මෙහෙම අප්ඩේට් දෙන්න ලොකුම හේතුව ඔයාලගෙ කමෙන්ට්ස්.. ඔතර් කෙනෙක් දන්නවා ඒක කොච්චර දෙයක්ද කියලා.. මොකද මම බලාපොරොත්තු වෙන්නෙ එච්චරමයි.. තැන්කූ මගෙ ලමයිනේ..

එන්නාම්.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 12 කොටස

මම ඊයේ ගෙදර ආපු වෙලේ ඉඳලා අම්මා බනිනවා බනිනවා ඉවරයක් නෑ වෙලාවට කන්නෙ නෑ අරකයි මේකයි කිය කිය.. ඒක ාඅච්චිට කිව්ව පාර ආච්චි කතාකලා අම්මටයි මටයි දෙන්නටම බැන්නා.. ආයෙ මදිපාඩුවට රධ්‍ය කාරය රෑ අරගෙන තව ටිකක් මට බැනලා ෆෝන් එක තිබ්බා..

අද මම හිටියෙ ගෙදර.. ඇගට මොකුත් අමාරුවක් තිබ්බෙ නැති නිසා මම උදේ ගෙදර පිටිපස්සෙ හේත්තු කල්ලා තිබ්බ ඉණිමග උස්සන් ඇවිදින් වහලට තියලා පීල්ල සුද්ද කරන්න වහලට නැග්ගා.. වහලට නැග්ගා විතරයි මට තරු පෙනුනේ මේකෙ උඩ තිබ්බ කුණුරොඩු ගොඩ දැක්ක පාර.. අදනම් වහලෙන් බහිද්දි උන ගනී සිරාවටම.. මම ඉදල අරගන්න වටපිට බලද්දි මතක් වුනේ ඉදල බිම තියලනෙ මම හරකා වගේ වහලට නැග්ගෙ.. මම වහල උඩ ඉදගෙන අම්මට අඩගැහුවා..

" අම්මෙහ්හ්හ්හ්හ්හ්හ්හ්හ්හ්හ්හ්!!!!!!! පොඩ්ඩක් එන්නෝඕඕඕ!!"

" මොකද ලමයො.. ඔය වහල උඩ මගුලක් කරනවද.."

" අනේ මේ ඔය ඉදල අරන් දීලා යන්නකො අප්පා.. මම මේක සුද්ද කරනවා.."

" පුලුවන්ද ලමයො.. අමාරුනම් බිමට බහිනවා.. පස්සෙ බැරියැ අස් කරන්න.."

" අන්න අල්ලපු ගෙදර පූසා අම්මා ගාපු පොල් ටික කනවා.. ඔය ඉදල දීලා යන්න.."

මම බොරුවට වහලෙ අස්සෙන් බලලා කියද්දි අම්මා වරං අරගෙන දුවන්න ගිහිල්ලත් මට ඉදල දීලා ආයෙම කුස්සියට දුවලා ගියා.. වහලෙ උළු අස්සෙන් මට අම්මා කුස්සියෙ වැඩ කරනවා පේනවා..

මම ඉතින් උළු අස්සෙ තිබ්බ පේර කොළයි, සියඹලා කොළයි, වවුල් බෙටියි එකී මෙකී නොකී සේරම දහජරාවල් අස් කරලා ඇඟ පුරාමත් ගාගෙන බිමට බහින්න යද්දි මෙන්න බොලේ මහීෂා එනවා කැප් එකකුත් දාගෙන උගෙ කොළු ගමනින් අපෙ ගේ පැත්තට.. මාව දැකලා ගේට්ටුව ගාව නැවතිලා

@Shan

ඇස් හීනි කරන් බෙල්ල දික් කල්ලා බලලා මෙකී කින්ඩියට හිනාවුනා.. බේසික කෙල්ල..

" ආ මුතු.. වහල අස් කරනවා වගෙයි.."

" නෑ උඹෙ-"

" හා හා හා ඇති ඇති උබේ ඔය බෝක්කු කට වහගෙන බැහැලා ඉදපන් ඉස්සෙල්ලා.. මම බැලුවා ඒත් ග්‍රීස් යකෙක් පැනලද කියලා ගෙට.."

" ම්ම්.. ග්‍රීස් යකා ඊලගට එන්නෙ උඹෙ ගෙදරට පරිස්සමෙන් ඉදපන්.."

මම ඉණිමගෙන් බහිද්දි ඒකි ඇවිත් ඉණිමග අල්ලන් හිටියා..

" සැක් බං.. නාගෙන වරෙන්.. උඹ ලග ගන්දස්සාරෙ බෑ.. මම ආන්ටිව හම්බෙන්න යනවා.."

මහීශා ගේ පිටිපස්සෙන් කුස්සිය පැත්තට ගියේ අතේ මොකක්දෝ පාර්සලේකුත් තියාගෙන.. මම මගෙම නහය වහගෙන එළියෙ වැලේ වනලා තිබ්බ සාලුව අරගෙන බාත්‍රූම් එකට වැදුනා.. හොදහැටි පැය ගානක් නාලා අම්මගෙ අලුත් ෆේස්වොශ් එක අරගෙන මම ඇගපුරාම ගාගත්තා.. ඒක ස්ට්‍රෝබෙරි සුවදයි. කන්න හිතෙනවා.. තව කණ්ණාඩිය ලග පේලියට තියලා තියෙනවා එක එක ජාතියෙ බෝතල්.. ක්ලෙන්සින් කියයි ස්ක්‍රබ් කියයි ටෝනර් කියයි.. මම දන්නෙ නෑ ඕව කොහෙ කොහෙ ගානවද කියලා.. මම ඉතින් දන්න එක ෆේස් වොශ් එක.. ඒක ඉතින් ඇගේම ගාගත්තා.. නාගෙන කියාගෙන ටවල් එකෙන් පිහිදගත්තම තමා මතක් වුනේ අදින්න මොකුත් ගෙනාවෙ නෑ නෙ.. අරකි කාමරේද දන්නෙ නෑ.. මම හිමිහිට බාත්‍රූම් එකේ දොර ඇරලා උනහපුලුවා වගේ වටපිට බැලුවා.. මෙකී මගේ කාමරේද කොහෙද..

" මේ බං.. උඹ කාමරේද.."

" ඕ මොකෝ.."

" එළියට පලයං.. මට ඇදුම් මාරුකාන්නෝනෙ.."

" ආ හා.. ඉදපන්.."

@Shan

ටිකකින් මහීශා මගේ කාමරෙන් ගියා වගේ ඇහුන නිසා මම ටවල් එකත් ඉණේ පටලන් කාමරේට පැනලා ඇඳුම් මාරුකරගත්තා.. එහෙමම ෆෝන් එක අරගෙන නොටිෆි බලද්දි රඨ්‍ය අයියා කෝල් එකක් අරගෙන.. මම පස්සෙම ගන්නවා කියලා හිතාගෙන මහීශා හම්බෙන්න ගියා.. මොකද දන්නෙ නෑ ඇහැළ මලී අපේ ගෙදර ආවෙ..

" මොකක්..!!! උඹ ඔය කියන්නෙ අපේ ගර්ල් ස්කූල් එකේ ඉන්න ශශිනිද බං.. ඒකි සිරාවට උඹේ පස්සෙන් එනවද.."

මම මහීශා එක්ක වත්ත පල්ලෙහා බංකුවට වෙලා කියව කියව ඉද්දි මෙකි කිව්ව කතාවට මොලේ කුරුවල් වෙලා ගියා.. යකෝ ශශිනි අපේ වයසෙ ඩයල් එකක් ගර්ල් ස්කූල් එකේ ඉන්න.. ඕකිට හැම කොල්ලම ට්‍රයි.. ඒ වුනාට මහීශාට පේන්න බෑ ශශිනි දවසක් මෙකි එක්ක වලියක් අල්ලගත්තා ඕ ලෙවෙල් කාලෙ ඩෙස්ක් එකකට..

" ඔව් ඔව් ඒකි තමා.. මල කරුමයක් බං.. මැසේජ් දානවයි කෝල් ගන්නවයි.. උඹ දන්නවනෙ අපෙ අම්ම දැනගත්තොත් මාව මරලා එල්ලාවි උඩ.."

" ඉතින් උඹ මොකද කිව්වෙ.."

" මම හොඳින් කිව්වා බං ඉතින්, ශශිනි ඔයා වැරදි වැටහීමක ඉන්නෙ මම කැමති පිරිමි ලමයින්ට කියලා.."

" හම්මට ඒකද උඹ අර ගවුමක් ඇඳගෙන ෆොටෝ ගහලා ඩීපී දැම්මෙ.. මම හිතුවා යම් දෙයක් සිද්ද වෙන්න ඇති කියලා.."

" අනේ මන්දා බං ක්ලාස් එකෙත් මේ පිස්සු ගෑනි හැරි හැරි මගේ දිහාම බලනවා.. ආශී කිව්වා ආයෙ ඕකි බැලුවොත් ඒකි ගිහින් ශශිනිගෙ කනට ගහනවා කියලා.."

" කවුද අර හාල්මැස්සි.. ගහයි ගහයි බලන් ඉදපන්.. ආශිට කියපන් ඔන්නං මමත් සප් එකට එන්නම් කියලා.."

" නෑ නෑ ඔන්නෑ.. ඒක මමයි ඒකියි බලාගන්නම්.. එනවා ලබ්බක් අහගෙන.. මේ ඒකනෙමේ උඹට ඊයෙ ජබර කලන්නෙ හැඳුනද.. මට අපෙ අම්මා උදේ කිව්වෙ.."

@Shan

" ආ නෑ බං පොඩ්ඩක් ගැස්ට්‍රයිටිස් වැඩිවෙලා අවුල් වුනා.. දැන්නම් හොදයි.. උඹ දන්නෝනෙ ඔය කරුමක්කාර ලෙඩේ මට පොඩි කාලෙ ඉදලම තියේනෙ.."

" වෙලාවට බෙහෙත් බීපන්.. උඹ බෙහෙත් බොන්නැනෙ හරියකට.. මේ බං මම දැන් යන්න ඕන.. අපේ ගෙදරට කට්ටිය වගයක් ඇවිල්ල අම්ම බලාගෙන ඇති.."

" හරි හරි බං.. පරිස්සමට පලයන්.. ග්‍රීස් යක්කු ඇති උඹව උස්සන් යයි.."

මෙකි බේසික කෙල්ල හැරිලා මට මැද ඇගිල්ලත් දික් කරලා ආයෙම උගෙ අර කොළු ගමනින් ගෙදර යන්න ගියා.. මෙකිට ඉතින් කොල්ලො සෙට් වෙව්යැ.. කෙල්ලොම තමා පස්සෙන් එන්නෙ.. දැන් මෙ කීවෙනි එකද.. ඒකත් අර ශගිනි වගේ එකෙක්..

" සුදුමහත්තයා.. මේ කෝල් එකාක්!!"

ඒ එක්කම අපෙ අම්මා ගේ ඇතුලේ ඉදන් බෙරිහන් දෙද්දි මම ගෙට දුවගෙන ගියා.. ෆෝන් එක අරන් බලද්දි අර ගස් වැද්දා කතාකරන්නෙ.. පොඩ්ඩක් ඉන්න.. පොඩ්ඩක් ඉන්න.. දැන් වෙලාව තාම එකට කාලයි.. එතකොට මූ කෝල් කරන්නෙ අද ඉස්කෝලෙ ගිහින් නැද්ද..?? නැනෙ වෙන්න බෑ ඕකා හැමදාම ඉස්කෝලෙ එනවා.. මම ඔච්ච හිත හිත ෆෝන් එක ආසන්සර් කල්ලා කනේ තියාගත්තා..

" වරද්.."

මූ කෝල් එකක් ගත්තහම හෙලෝ කියන්න දන්නෙ නෑ.. බක් මහේ ගහන හෙණ වගේ දඩාස් ගාලා නමම කියලා කතාකරන්නෙ..

" කියන්න.."

"" උඹට දැන් මොකද.."

" මොකද අහන්නෙ ඉතින් ඉන්නවා.. විශේශයක් නෑ.."

" ම්ම්.. වෙලාවට බෙහෙත් බීපන්.. ඒකනෙමෙ කොහෙද උඹ ඊයෙ අර මම උදේ දුන්න ෆෝම ටික තිබ්බෙ.. මමයි කියානයයි හැමතැනම හොයනවා..

@Shan

උඹ ඒක කැවද.."

" ඔව්නෙ අයියෙ..න්-නෑ නෑ ඒක මේ.. බලන්නකො හලෝ මම ඒක වැදිලා ගෙදර ගෙනැල්ලනෙ.. මම දෙන්න හිටියෙ ර්යෙ-"

" ආ ඇති ඇති ඒකනෙමෙ ඒක හවසට ඕන.. අද ප්‍රින්සිපල් මීටින් එකක් ගන්නවා හවුස් වල බෝඩ්ස් වලින්.. අද නෆ්රාස් ඇවිල්ලත් නෑ.. උඹත් නැනෙ.. අපේ හවුස් එකෙන් මොකෙක්වත් නෑ.. උඹට හවස එන්න බැරිවෙයිද ඉස්කෝලෙ පැත්තෙ.."

" ම්ම්.. මම අම්මගෙන් අහලා කියන්නද.. පොඩ්ඩක් ඉන්න.."

මම ෆෝන් එකත් උස්සගෙන අම්මා ලගට දුවගෙන ගියා..

" අම්මේ මම හවසට ඉස්කෝලෙට ගිහින් එන්නද.. පොඩි වැඩ වගේකට.. හවස් වෙන්න කලියෙන් එන්නම්.."

" දැන්?? අර මොකටද..??"

" හවුස් එකේ වැඩ වගේකට අම්මෙ.."

" ගියාට කමක් නෑ රෑ වෙන්න කලින් ගෙදර එන්නෝන.. තේරුනානෙ.."

" හරි හරි අනේ.."

මම ආයෙම ෆෝන් එක කනේ තියාගත්තා..

" ආ හරි එනවනේ තිබ්බා.."

බීප්.. බීප්.. බීප්..

මෙ කොහිල පිසාචයා.. යකෝ මූ නිකන් කතාකරන්නෙ මට ඕනවට කතාකලා වගේනෙ.. කියනකන් හිටියෙත් නෑ කවදාවත් මට කතාකරන්න දෙන්නෙත් නෑ.. ඌට ඕන ටික කියනවා තියනවා.. අනේ මූට කිසිමදාක ගැනියෙක් සෙට් වෙන්න එපා එපා එපාමයි.. ඔයිට වඩා සාපයක් නැනෙ ඉතින්.. අනික ඌ වගේ ගල් ඉබ්බෙක්ට එහෙම ලිංගික ආශාවල් ආකර්ශනයන් ඇතිවෙනවද ශුවරුත් නෑ.. සමහරවිට ලිංගික බෙලහීනතාවය වෙන්නත් පුලුවන්.. පිටියුටරියේ අවුලක්ද දන්නෙ නෑ..

@Shan

කමක් නෑ වරද් පුතේ උඹ උගෙ ගෑනි නෙමෙනෙ ඌ දඩාස් ගාලා ෆෝන් එක තියන්න බැරිනම් ඒක අල්ලලා පොලොවෙ ගැහුවත් උඹට වැඩක් තියෙද නෑනෙ..

මම ඌට දෙස් දෙවොත් තිය තිය ශර්ට් එකකුයි බොටමකුයි ඇඳන් ස්පෝර්ට්ස් බෑග් එකත් කරේ දාගෙන හැන්ඩියා වගේ ගෙදරින් එළියට බහිද්දි සෙනුකයාගෙන් කෝල් එකක් ආවා.. ඔන්නෑ පකයගෙ කෝල් මට.. ඉදපන්කො අද හම්බුනොත් ඔකට මම හොඳ වැඩක් කරනවා.. ඌරු මීයා..

මම ඉතින් හංදියට ඇවිත් බස් එකක නැගලා දෙයියනේ කියලා දෙක වෙද්දි ඉස්කෝලෙට යද්දි සයෝන් අයියා ඉන්නවා ගේට් එක ලග.. දැන් ඉතින් ඉස්කෝලෙ ඉවරවෙලානෙ.. ඒකනිසා කලර්ඩ් ඇතුලට යන්න පුලුවන්..

මම ඉතින් ෆුල් ෆිට් එකේ හඩු පෙරාගෙන එහෙ මෙහෙ යන ඉස්කෝලෙ ලමයි අතරින් කොන්ඩෙත් ගස්ස ගස්ස ප්‍රිෆෙක්ට් රූම් එක පැත්තට යද්දී මම දන්නවා මගේ දිහා කට්ටිය බලනවා ඇති හැරි හැරි.. මම මල්ලි කෙනෙක්ටත් ඇහැක් ගහගෙන පඩිපෙල ගාවින් හැරුනා විතරයි මට කියාන් අයියව හම්බුනා..

" ආ අයියේ.."

" උඹ ආවද.. ආන් අරූ අරගෙහෙ පරල වෙනවා උඹ ආවෙ නෑ කියලා.. දැන් අසනීප ගතියක් නෑනෙ.."

" නෑ අයියෙ.. "

" එහෙනං ඔෆිස් එකට පලයන්.. තව ටිකකින් මීටින් එකක් ගන්නවා කිව්වා.. ආපු එකේ හවස බැඩ්මින්ටන් ප්‍රැක්ටිස් ඉඳලම පලයන්..

කියාන් අයියා මගෙ උරහිසටත් ගහගෙන කලබලෙන් දුවගෙන ගියා.. කෝ මේ රධ්‍ය කාරයා.. කියාන් අයියා කිව්වත් වගේ පරල වෙවී ඇති.. මම ස්පෝර්ට්ස් බෑග් එක කිහිල්ලෙ ගහගෙන ඔෆිස් එක පැත්තට ගෑටුවා..

කොහොමද ලමයිනේ..

මම පුලුවන් වුනොත් රෑ වෙලා දිග කොටසක් දෙන්නම් හොදේ..

@Shan

ඔතරිට පොඩ්ඩක් වැඩ වැඩි වෙලානෙ..

සෙනුකයාට වරද් පුතා ගහවිද.. අම්පි දමනෙ ඤුහ්..

ලව් යූ ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 13 කොටස

මම ඔෆිස් එක පැත්තට යද්දී ප්‍රින්සිපල් සර් කතාකරන්න ලෑස්තිවෙනවා.. සර්ට පිටිපස්ස්සෙන් රධ්‍ය අයියයි අයුක අයියයි සයෝන් අයියයි කියාන් අයියයි අහිරු අයියයි පේලියට හිටගෙන හිටියා.. ඒ තමා සම්පූර්ණ ටොප්බෝඩ් එක.. ඔය එකෙක්වත් මට පේන්න බෑ..

( පැටලෙනවා වගේනම් මම පොඩි අදහසක් ගන්න මෙතනින් බෝඩ් එකේ නම් ටික දාන්නම්..

අයුක - හෙඩ් ප්‍රිෆෙක්ට්

කියාන් - ඩිපියුටි හෙඩ් ප්‍රිෆෙක්ට්

සයෝන් - ගේම්ස් කැප්ටන්

රධ්‍ය - ඩිපියුටි ගේම්ස් කැප්ටන්

අහිරු - ඩිපියුටි ගේම්ස් කැප්ටන් )

මම හිමින් සැරේ කට්ටිය අස්සෙන් රිංගගෙන ගිහින් අපේ හවුස් එකේ උන් ඉන්න තැනින් හිටගත්තා.. මට එහාපැත්තෙ මතීශලා හිටියේ උන්ගෙ හවුස් එකත් එක්ක.. ඒ එක්කම ප්‍රින්සිපල් සර් ප්‍රයිමරි එකේ ස්පොර්ට්ස් මීට් එක ගැන හෙන දේශනයක් දීලා ඒකෙ වැඩසටහන් මාලාව කියෙව්වා.. ප්‍රයිමරි එකට කලින් ස්පෝර්ට්ස් මීට් තියෙලා ඉවරකරනවා.. නැත්නම් ළමයි පන්දාහක් එකපාර ස්ටේඩියම් දාලා කරන්න බෑ.. අමාරුයි.. ඊටපස්සෙ ප්‍රිෆෙක්ට් බෝඩ් එකෙයි ඔගනයිසින් කමිටි වල උන්ගෙයි මීඩියා ස'කල් එකෙයි පණ යනවා වැඩ ටික ඔගනයිස් කරගන්න බැරුව..

ප්‍රින්සිපල් සර් කට්ටඩියා වගේ කියවගෙන කියවගෙන යද්දි මට යන්න ගියපු ඇනුමකුත් නතර කරගෙන මම වටපිට බල බල හිටියා.. ඕවා අහන් ඉන්න ඕන නෑ අනේ.. තව ටිකකින් මට ප්‍රින්ට් කරපු කොලයක් අතටම හම්බෙනවානෙ.. ඒ එක්කම මම දැක්කෙ අපේ ඉස්කෝලෙ ඩිපියුටි ගේම්ස් කැප්ටන් ගස් වැද්දා මගේ දිහා කන්න වගේ බලාගෙන රවනවා..

@Shan

මම හුනා කිව්වා වගේ කියන්නෙ මූ දවසක රවලා පොට්ට වෙනවා එක ඇහැක්.. හරි කලින් රැව්වා කමක් නෑ කියමුකො මගෙත් කුපාඩි වැඩවල සීමාවක් නැනෙ.. ඒවුනාට දැන් රවන්න ඕන නැනෙ.. මුගෙත් තියන කැටයම්.. අනේ ඉතින් මේකට මැරෙන්න ඉන්න කෙල්ලොත් ඉන්නවනෙ එහා වැටේ.. ගෑනුන්නට මොලේ නෑ කියන්නෙ නිකන්ද මං අහන්නෙ..

මමත් සෙකන්ඩ් වෙන්න ඕන නැති නිසා ඌ රැව්ව එකට රිප්ලයි එකක් දැම්මා.. මෙන්න මෙකා ආයෙත්ම රවාපි.. මම හිමිහිට මගෙ කලිසමේ සිපර් එක දිහා බැලුවේ ඒකවත් ඇරිලද දන්නෙ නැනෙ.. ඒවුනාට ඔලුව පහත් කල්ල බලද්දි තමා මීටර් වුනේ.. බොටමෙ කොයින්ද සිපර්.. මම ආයෙම ඌ දිහා බැලුවාම ඌ ඇස් කරකලා අහක බලාගත්තා.. මොන මගුලක්ද.. ඔය සේරමත් අස්සෙ මම සෙනුකයා ඉන්න පැත්ත බැලුවහම මූ පැණි හිනාවකුත් දාගෙන අයුක අයියා දිහා බලාගෙන ඉන්නවා..

නොදොකින්වත් මෙ වගේ පෙරේතයෝ.. අයුක අයියත් උගෙ මනමාල හිනාව දාගෙන සෙනුකයා දිහා බලාගෙන ඉන්නවා.. ගස් බල්ලො දෙන්නා අපිට හොරෙන් ලව් කරන්න.. එච්චා කොහෙද මාත් එක්ක.. මම හිමින් සැරේ ගිහින් උන් දෙන්නගේ දර්ශන පථයට හානි වෙන විදියට මැද්දෙන් හිටගෙන බොරුවට ඔලුවත් වන වන සර් කියන එක දිහා පුදුම අවධානෙකින් බලාගෙන අහගෙන හිටියා.. මට දැන් මැව්ලා පේනවා සෙනුකයගෙ මූන නැඹිලියක් වගේ වෙනවා.. මම ශේප් එකේ සර්කාරයා දිහා බලන මුවාවෙන් අයුක අයියා දිහා බලද්දි ඌ මූන සෙඩරොක් කරගෙන රධ්‍ය අයියට මොනවදෝ කියනවා.. ඒකා පුරුදු විදියටම මට රවාගෙන අහන් ඉන්නවා.

" මට රවනා.. මුහුණත් අතරේ..

නුඹ පෙනුනා.. කොනකින් වාගේ..

නුඹමද මාගේ..

තොල්පෙති තෙමුවේ..

ඒ හාදුවෙ නෑ අවසානය දුටුවේ.."

ඒ අස්සෙ මට ඌ රවන දිහා බලන් ඉදලා ලහිරු පෙරේරගෙ සිංදුවකුත් මතක් වුනා.. සැක්.. තොල්පෙති තෙමුවේ කැල්ල අයින් කරන්නෝන.. නැත්තන්

@Shan

හරි නෑ..

" හොදයි මම බලාපොරොත්තු වෙනවා හැම නිවාස නායකයෙක්ම තමන්ට පැවරිලා තියෙන වගකීම හරියට ඉටු කරයි කියලා.. දැන් හැමෝම පුහුණුවීම් වලට සම්බන්ධ වෙන්න.."

බඩ තඩි ප්‍රින්සිපල් සර් අවසානේ සර්ගෙ ඔෆිස් එකේ කැරකෙන පුටුවෙන් වාඩිවෙද්දි මමයි අනිත් ඔක්කොමයි හීමීට එලියට ගියා.. මම තාම මොකාද එකා වගේ බෑග් එක එල්ලගෙන.. මම වටපිට බලලා ජිම් එකට යන්න හදද්දි සෙනුකයා ඇත තියා නාලාගිරිට රා පොවලා වගේ මගේ පැත්තට දුවගෙන එද්දි මම අනිත් පැත්ත හැරිලා දුවන්න හැදුවා විතරයි..

" ආව්..අම්මා.."

මගෙ එහාපැත්තෙ තිබ්බ මල් වැටේ කකුල පැටලිලා මම එහෙමම තණකොල ගොඩට පතබෑවුනා.. මේ මොන වස විලි ලැජ්ජාවක්ද යකෝ මේ වුනේ.. පස්ස ඇනුනා බිම.. මට කලන්තෙට ආවා.. දෙයියනේ මගේ පස්ස නෑ වගේ.. මම ශේප් එකේ වටපිට බලලා නැගිටලා පස්සෙ තිබ්බ තණකොල කෑලි අයින් කරගද්දි සෙනුකයා දෝත බදලා දුවගෙන ආපු වේගෙටම මගෙ ඇගට පනිද්දි දෙවෙනි පාරටත් මම උඩුබැලි අතට මේ බල්ලවත් එක්කම බිම ඇදගෙන වැටුනා.. ආව් අම්මා මේ පාරනම් පුප ලෙප්ට් වුනාද කොහෙද.. මට මුගෙ අත්තා පනත්තගෙ ඉදන් කිරිකිත්තා වෙනකල් මතක් කරන්න හිතුනා..

" පිස්සු හු#තො මොන ලබ්බක්ද උඹ කරන්නෙ.."

මම සෙනුකයාව ඇගෙන් අහක් කරන්න යද්දි මෙකා මගේ බෙල්ලෙ එල්ලිලා අඩන්න තියාගත්තා.. අපි දෙන්නම නිකන් අසහනකාරයො දෙන්නෙක් වගේ ඉස්කෝලෙ මැද්දෙම තනකොළ ගොඩේ බදාගෙන වෙලිලා ඉන්නවා.. ගැරඩි දෙන්නෙක් සංසර්ගෙ යෙදෙනවා වගේ.. ඉස්කෝලෙ අදුරන මල්ලිලත් හිනාවෙනවා මේ පකා කරන වැඩ වලට..

" අනේ ෂනෙරුවෝ සමාවෙයන්කෝ බං.. මාව මගාරින්න එපා.. මම උඹට කියන්නනේ ඉදියේ.. අම්මපල්ලා බං.. බොරු නෙමේ.. "

මූ උගේ දුක කියද්දී මම බලෙන්ම උගෙ අත අහක් කල්ලා ඌවත් එහාට විසික් කල්ලා තණකොළ ගොඩේ එරමිණියා ගොතාගෙන වාඩිවුනා..

@Shan

මට අවංකවම තරහක් නෑ මූ අයුක අයියා එක්ක යාලුවුනු එකට. ඒ වුනාට යුතුකමක් තියෙනවනෙ ඌට කරදරයක් උනානම් මට කියන්න.. අනික මට හුග කල් තරහා හිතේ තියාගෙන පල් කර කර ඉදලා පුරුද්දකුත් නෑ.. මූ එක්ක කවදාහරි යාලුවෙන්නත් එපැයි..

" අඩන්න එපා බං.. උබෙ මිනිහා ආවොත් හිතයි මම උඹව බඩ කරා කියලා.."

" අනේ බං.. තරහ නෑ කියපන්කො.. ප්ලීස් ෂනෙරු.. උඹ මගෙ ඇගේ කෑල්ලක් වගේනෙ දෙයියනේ.. මෙහෙම කතානොකර ඉන්න එපා.."

" තරහ නෑ පගො තරහ නෑ.. ඔය අඩොවැඩියාව නවත්තගනින්.. ඉදකින් කොල්ලෙක් නේද.."

මම වෙනදා විදියටම කතාකරද්දි සෙනුකයා ගොං හිනාවක් දාලා මාව බදාගෙන මගෙ පස්ස මිරිකුවා.. මූට අසහනෙ.. එක එක ගේ ඩ්‍රාමා බලලා උදේ ඉදන් රෑ වෙනකල්.. ඒවගෙ තියන ඒවා ඇවිත් ඉස්කෝලෙ ඉවරවෙනකල් අපිට කියනවා තොරතෝංචියක් නැතුව.. මූ නිසා තමා කොටින්ම අපි හතරදෙනා වල් වැදුනෙ.. කාලයක් හීශනයක් තිබ්බා මූ කින්පෝර්ශ් කියලා මාහියාද මොකක්ද මගුලක් බලලා ඇවිත් ඌට කින් වගේ එකෙක් හොයලා දෙන්න කිය කියා අඩා වැලපුනා.. පස්සෙ කින් වේගාස් වෙලා ඌට වේගාස් කෙනෙක් ඕන කිය කියා ඇඩුවා.. ඊටපස්සෙ අන්ටේම්ඩ් කියලා එකක් බලලා හන්ගුවාන්ජුන්ව ගෙනැත් දෙන්න කිය කිය මගුලක් නැටුවා.. තව ජේන් කියයි, ස්කයි කියයි, වෙරි බ්ලොසම කියයි..

" අත ගනින් අහකට.. මෙ මොන කුපාඩි කමක්ද.. අන්න උබෙ මිනිහා මෙ පැත්තට එනවා.. දැක්කොත් උඹව ඩිවෝස්කරයි.."

මම කිව්වා විතරයි මෙ හැලපයා මගෙන් අහක් වුනා.. කමක් නෑ දැන් ඉතින් ඉස්සර වගේ ඌට ඇගවල් වල නගින්න අයුක අයියා දෙන්නෙ නැතුවැතිනෙ.. පවුල් පන්සල් වෙලානෙ ඉන්නෙත්..

" අනේ පලයං.. "

" සුදූ මෙහෙ එන්න.. කෝ මම උදේ දුන්න ෆයිල් ටික.."

@Shan

ටහිකේ.. සුදූ ලූ.. මම හිනායන්න ආපු නිසා නහයත් පිහාගෙන වාඩිවෙලා හිටපු තැනින් නැගිට්ටා.. අයුක අයියගෙත් පැලියාවනෙ.. ඉරිසියාව ඉහේ ඉඳන් දෙපතුල වෙනකල් බේරෙනවා..අනේ අයියේ.. අයුක අයියේ.. මේ වගේ එකෙක් උඹ කරේ එල්ලගත්තට මට එච්චර පුපේ අමාරුවක් නෑ.. උඹට වගේ..

" මම ජිම් එකට යනවා බං.. වැඩ වගයක් තියේ.."

සෙනුකයා දිහාට අයුක අයියා එද්දි මම ශේප් එකේ ලිස්සලා ගියා.. කමක් නෑ ඉතින් උනුත් ලව් කරන්න එපැයිනෙ.. ඒවුනාට..සුදූ.. බැනෙ අප්පා මට හිනායනවා..

" ආ මල්ලේ.."

" කියාන් අයියෙ.."

මම ජිම් එකට යද්දිත් මගේ ජාතිකක්‍රීඩාව බැඩ්මින්ටන් ප්‍රැක්ටිස් පටන් අරගෙන.. මම ඉතින් දැන් ක්ලබ් එකේ කැප්ටන් නිසා පණ දාගෙන උඩ පනින්න ඕන නෑ ඉවරවෙද්දි කෝච් කොහොමත් මාත් එක්ක පොඩ්ඩක් ප්ලේ කරනවා.. මොකද ක්ලබ් එකේ කෝච් එක්ක ප්ලේ කරන්න පුලුවන් මට්ටමකට මට පුලුවන් නිසා..

අපේ ක්ලබ් එකේ ඒ කාලේ යාවජීව සාමාජිකයා රධ්‍ය අයියා. මම ඌව දැක්කෙ මම හයේදි.. මූ එතකොට හතේ.. අපේ ක්ලබ් එකේ සර් පොරට හෙන ආදරෙයි.. කටේම තියෙන්නෙ ශනව්.. ශනව්.. ශනව්.. ඔහොම කාලයක් ඉඳලා මේකා කැඩෙටින් කරන්න සේරම ක්ලබ් වලින් අස් වුනා.. ඌ ගියාට පස්සෙ මම තමයි මේ වෙනකල්ම චැම්පියන්ශිප් ගත්තෙ.. මොකක් වුනත් කෝච්කාරයා රධ්‍ය අයියට හෙන ආදරෙයි..

" වරද්.. මෙහෙ වරෙන්.."

පළගැටියා මට ඇත තියාම අඩගැහුවා.. මූටත් මම නැතුව හුස්ම ගන්න බැරිද මම අහන්නෙ හැම ලබ්බටම වරද් වරද්.. මම අම්මපා නම වෙනස්කරනවා.. මුගෙ කටින් මගෙ නම ඇහෙන වාරයක් ගානෙ මට මල පයිනවනෙ..

" මොකෝ.."

@Shan

මම ඇහිබැමත් රැළි කල්ලා රධ්‍ය අයියගෙන් ඇහුවා.. ඇයි ඌට විතරද හොද.. මටත් පුලුවනි රවන්න..

" දැන් මේ මාසෙ අන්තිම වෙන්න කලින් අපි බජට් එක හදන්න ඕනනෙ.. ප්‍රින්සිපල් සර් කිව්වෙ නම් එක හවුස් එකකට තිහ ගානෙ(තිස්දාහ) ඉස්කෝලෙන් දෙන්නම් ඉතුරුවා අපිට මොකක් හරි කරන්න කියලා.."

" ම්ම්.."

" ඇයි බං හවුස් එකේ ෂර්ට් ප්‍රින්ට් කරන්නයි ඩ්‍රිල් එකේ ඇඳුම මහන්නයි.. කීයක්ද.. හැබැයි ස්පෝර්ට්ස් ක්ලබ් වල උන් නම් උන්ගෙ කොස්ටියුම්ස් හදාගනී.. ඩ්‍රිල් එකයි අපේ ඕබී එකේ උන්ට දෙන්න ටීශර්ට්ස් ටිකයි තමා මොකක් හරි කරගන්න වෙන්නෙ.."

" කියාන් අහපන්කො.. බජට් එක හදන වැඩෙ අපි හිමිහිට කරගමු.. උඹලට පුලුවන්ද ඉන්අනිද්දට අපේ ගෙදර එන්න.. උඹයි වරදුයි නෆ්‍රාසුයි අයුකයි සෙනුක මල්ලියි අහිරුයි.. ඔක්කොම වරෙන්.. එදාට කොස්ටියුම්ස් වල වැඩෙත් ඉවර කරගන්න පුලුවන් නෙ.. මම පොඩ්ඩක් මේ ටිකේ හිරවෙලා බං ඉන්නෙ රන්ටැඹෙ කැම්පින් යන්න සෙට් වෙලා මට.. ගියොත් මාසෙකටවත් එන්න වෙන්නෙ නෑ.. මට ඒක කතාකරගන්නත් ඕන.. අනික කැඩෙට්න් අයිටම් එක හදන්නයි ස්කොඩ් එකයි බලාගන්න කියලා ප්‍රින්සිපල් සර්කිව්වා.."

මම රධ්‍ය අයියා කියද්දි උගෙ කට දිහා උණහපුලුවා වගේ බලාගෙන හිටියා.. යකෝ මූ මෙච්චර වැඩ කරනවද. ඕවනෙ ඉතින්.. මූට සෝශල් එක දවසෙ හොදම ප'සනැලිටි එකට අවෝඩ් එකක් හම්බුනත් එක්කනෙ.. එදා මුගෙ ලස්සන.. හදිසියේ අපේ ස්කූල් පේජ් එකේ කරක් නොගහපු එකෙක් නෑ ගර්ල් ස්කූල් එකේ.. මමත් දැක්කා ඉතින් නිකන් අහම්බෙන් යද්දි.. අළුපාට ෆුල් කිට් එකට බෝ එකක් දාලා කොන්ඩෙ උඩට හදලා.. හැන්ඩියා තමයි..

" වරද්.. අහගෙනද ඉන්නෙ.."

සැක් මම මුගෙ මූණ දිහා බලාගෙන ඉඳලනේ මුළු වෙලාවෙම.. ලැජ්ජාවෙ බෑ.. මම ඔව් කියලා ඔලුව වනලා කට්ටියගෙන් එහාට වුනා.. ඉන් අනිද්දට මට උදේ ක්ලාස් එකකුත් තියේ.. අනේ මන්දා ඒකට යන්නත් ඕන..

@Shan

" ෂනෙරු.. මොකද කියන්නෙ අද මැච් එකකට හොද දවසක් වගේ නේද.."

ඒ අස්සෙන් කෝච්කාරයා මගේ දිහා බලන් බෙරිහන් දෙද්දි මම රැකට් එකත් අරගෙන කෝච් ඉන්න දිහාට දිව්වා.. කෝච් කිව්වට මූ මෙ නාකියෙක් එහෙම නෙමේ.. අවුරුදු විසිනමයක් විතර ඇත්තෙ.. මහ කුකුලෙක් කියලා මට මහීශා දවසක් කිව්වා.. උගේ නම තිළිණ.. මහීශලාගෙ ඉස්කෝලෙත් කෝච්ින් ඉන්නෙ තිළිණ සර්මයි..

" ම්ම.. අද ෂනෙරු මාත් එක්ක ප්ලේ කරන්නෙ නැතුව අපේ පරණ ගෝලයෙක් එක්ක ප්ලේ කරමු බලන්න.. මම හිතනවා ශනච්ට බැඩ්මින්ටන් අමතක නැතුව ඇති කියලා.."

අනේ දෙයිහාමුදුරුවනේ.. මේ රධ්‍ය කාරයා.. මේ වාරේ පටන්ගත්තා විතරයි. මගෙ නමත් එක්ක කොහේන් හරිම පැටලෙනවා.. උගෙ ලොකුකම බලන්නයි කතා අහගන්නයි මදිවට දැන් ඌ එක්කම මගෙ ආසම ගේම් එක ප්ලේ කරන්නත් වෙලා.. මෙහෙම හැමතිස්සෙම ඌ මගෙ පස්සෙන්ම එන එක මට මහ මානසික වදයක්.. ඊයෙත් මට හිතට අමුතුයි වගේ දැනුනා.. මම දන්නෙ නෑ රධ්‍ය අයියා කොහොම කෙනෙක්ද කියලා.. ඒ වගේම මම දැනගන්න උත්සහ කරන්නෙත් නෑ.. මට දැනගන්න උවමනාවකුත් නෑ.. ඒත් මොකක් හරිම වෙලා මට හැමතිස්සෙම හම්බෙන්නෙත් රධ්‍ය අයියවමයි..

" ෂනෙරු.. "

" අහ් සර්.."

මම ජිම් එකේ පැත්තකට ගිහින් බොටම ගලවලා සෙනුකයට දිලා යටට ඇදපු ශෝට් එක පහළට ඇදගෙන නෙට් එක ළගට ආවා..

" Set your goals high, and don't stop till you get there.."

සර් අපි දෙන්නටම කියද්දි රධ්‍ය අයියයි මමයි දෙන්නම රැකට් දෙක උස්සලා සර් කිව්ව එකට ප්‍රතිචාර පෙන්නුවා.. සර් කොයි මැච් එක පටන් ගන්න කලිනුත් ඔක අනිවාරෙන්ම කියනවා.. අනික ප්‍රැක්ටිස් කරන වෙලාවට කෝච් මාරම උනන්දුවෙන් ස්පෝර්ට් එක ඇතුලෙම අපිව ජීවත් කරවනවා.. ඒක වෙනස් හැඟීමක්.. මම බැඩ්මින්ටන් වල ආදරේ කලේ ආස වුනේ මෙ ඉස්කෝලේ නිසා..

@Shan

මම අමුතු ගිල්ටි ෆීලින් එකකින් රධ්‍ය අයියා දිහා බලද්දි රධ්‍ය අයියත් මගේ දිහා බලාගෙන හිටියේ අමුතුවට.. දැන් සෙල්ලම් කරන්න හිතක් නෑ දෙයියනේ.. මට ගෙදර යන්න ඕන.. ඒත් අපි දෙන්නා ප්ලේ කරනවා කිව්ව නිසා අපේ ක්ලබ් එකේ සේරමයි එලියේ වෙන ස්පෝර්ට්ස් ඉවරවෙලා ගෙදර යන්න ඉදපු උන් ඔක්කොමයි ජිම් එක ඇතුලේ පිරුනා.. හැමෝම සිමෙන්ති පඩිපෙලේ ඉදගෙන අපි දෙන්නම දිහා කන්න වගේ බලන් ඉන්නවා.. කමක් නෑ මම මීට වඩා තැන්වල ප්ලේ කල්ලා තියෙනවා.. ඒ වුනාට දැන් ටිකකට කලින් හිතුනු දේවල් එක්ක මගෙ හිතට මොකක්දෝ බරක් දැනෙනවා..

" Ok.. now.."

සර් පටන්ගන්න කියද්දිම රධ්‍ය අයියා මගේ දිහා බලලා හරිම පෝස් එකට ප'ෆෙක්ට් විදියට මට ශටල් එක පාස් කලා.. මමත් පුලුවන් උපරිමෙන්ම ප්ලේකරගෙන ගියා.. ඇත්තටම අපි දෙන්නගෙන් එක්කෙනෙක්වත් පරදින පාටක් තිබුනෙ නෑ.. මම සම්පූර්ණ අවධානය ගේම් එකේම තියාගෙන ඉන්න හුගක්ම ට්‍රයි කලා.. මුලු ජිම් එකේම ඉන්න ලමයි පිල් දෙකකට බෙදිලා අපි දෙන්නට චියර් කරද්දි මම ප්ලේ කරන අස්සෙම ඔඩියන්ස් එකට ඇහැක් ගැහුවා.. සෙනුකයා ඒ අස්සෙ මැරෙන්න හදනවා කෑගගහා.. ඌ මම ප්ලේ කරන හැම මැච් එකක්ම බලන්න එනවා පොඩි කාලෙ ඉදන්ම..

ඔහොම විනාඩි හතලිහක්ම අපි සෙල්ලම් කලා.. දෙන්නගෙම ස්කෝ එක තිබ්බෙ සේම සේම..ඒවුනාට මේකෙ ඉවරෙකුත් නැතිනිසා කෝච් නෙට් එක ගාවට ඇවිත් ගේම් එක එන්ඩ් කලා.. මම රැකට් එකෙන් මැරෙන්න හදන සෙනුකයාට ෆ්ලයින් කිස් එකක් යවලා නෙට් එක ගාවට ඇවිත් රධ්‍ය අයියට අතට අත දුන්නා..

මම අතට අත දෙද්දී මූ හරි කෙලින් මාව මරන්න වගේ මගේ මූණ දිහා බලන් හිටියත් මම රධ්‍ය අයියගේ අතකින් අල්ලලා හිමිහිට උඩ පහත කරද්දි ඒ ඇගිලි මගේ අතේ ඇගිලි හතරක් තදින් අල්ලගත්තා.. හරියට.. හරියට මම දන්නෙ නෑ ඒක මොකක්ද කියන්න.. අනේ මන්දා මට මහ අමුතු බයක් එක්ක හිත ගැස්සුනා.. රධ්‍ය අයියගෙ අත වෙවුලනවා.. දාඩිය පෙරෙන මූනෙ ඇස් වලින් මගෙ දිහා අමුතු හැගීමකින් බලාගෙන ඉද්දි මට කොහෙත්ම ගැලපෙන්නැති කෝල හිනාවක් මූනට ඇවිල්ලා මම අත ඇදලා

@Shan

ගත්තා.. ඔය ඔක්කොම වෙන්න ඕන්නම් තප්පර තිහක් යන්න ඇති.. ඒ වුනාට ඒ තප්පර තිහ ඇතුලේ හුගක් දේවල් වුනා වගේ මට දැනුනා..

මම කෝල හිනාවකින් අත ඇදලා ගද්දි මම මෙච්චර කාලෙකට දැකලා නැති හිනාවක් රධ්‍ය අයියගේ කට කොනක ඇදුනා.. එයා යාලුවෝ එක්ක හිනාවෙනවා වගේ නෙමෙයි.. මෙක හෙන අමුතුයි.. මම රැකට් එක අත් දෙකෙන්ම බදාගෙන අල්ලගෙන ඉද්දි රධ්‍ය අයියා හිනාවෙලා එතනින් යන්න ගියා.. මැච් එක ඉවරවෙලා නිසා ජිම් එකේ හැමෝම එලියට යනගමන් හිටියේ.. එතන මහ කාලගෝට්ටියක්.. මම අත් දෙකින්ම අල්ලගෙන හිටපු රැකට් එක එක අතකින් පහලට එල්ලුනා.. මගෙ පපුව ගැහෙනවා.. ඒක පොඩ්ඩක්වත් හොද විදියකට නෙමෙයි.. මම ආසම නැති විදියට..

" ෂනෙරු මල්ලී.. රධ්‍ය කතාකරනවා ගෙදර යන්න ලෑස්තිවෙන්නලු.."

ආයෙමත්.. රධ්‍ය.. රධ්‍ය..රධ්‍ය.. මගෙ ඔලුව කකියන්න ගත්තේ කියාන් අයියගේ කටහඩින්..

ළබැඳියේ.. ළබැඳියේ..හේ..හේ..

මා සිතින්.. පෙම් කලා...

මේ ලමයින්ට මොන යකා ගහලද අම්පි දම්නෙ නෑ..

කොහොමත් මමනම් දන්නෙම නෑ..

මම බබා.. මෙක කියවන උඹලා තමා වගකියන්නෝන..

දවල්ටහරි හවසටහරි එන්නම් මම ආයෙම.. ටටා..

ලව් යූ.. ❤

බිඳුණු කැටපත් කියවපු දළඹුවො

@Shan

ප.ලි.

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 14 කොටස

මම ගෙදර ඇවිත් නාලා කියලා ගෙට එද්දී අම්ම ඉස්තෝප්පුවෙ වාඩිවෙලා ආච්චිඅම්මා හින්දලා එවාපු තෙල් බෝතලයක් කකුලේ ගානවා නැමීගෙන.. මම ටවල් එක එහෙම්මම වැලට දාගෙන අම්මගෙ කකුල් දෙක ලගින් බිම වාඩි වෙලා අම්මගෙ කකුල් දෙක උකුළට අරන් බෙහෙත් තෙල් ගාලා පහලට අතගෑවා..

අම්මගෙ කකුලෙ කැක්කුමක් තියෙනවා දැන් අවුරුදු එකාමාරක විතර ඉදලා සැරින් සැරේ බහිනවා ආයෙම එනවා.. කීප තැනකින්ම බෙහෙත් අරගෙනත් අඩු වුනේ නැති නිසා අපේ ආච්චිඅම්මා ගමේ වෙද සීයගෙන් වට්ටෝරුවක් අහගෙන ඇවිල්ලා ආච්චිඅම්මම අම්මට බෙහෙත් තෙල් බෝතලයක්ම හින්දලා මාමා අතේ මෙහේ එව්වා.. අපි කොච්චර කොහොම ඉන්ග්‍රීසි බෙහෙත් කියලා උඩ දමාගෙන නැටුවත් සිංහල බෙහෙත් කියන්නෙ වෙනම එකක්.. අපෙ අම්මා ඔක මාසයක් විතර ගාලා නැව්වා එහෙමම අමාරුව අඩු වුනා.. ඒ වුනාට වෙද සීයා ආච්චිට කියලා තිබ්බෙ තෙල් බෝතලේ ඉවරවෙනකල්ම ගාන්න නවත්තන්න එපා කියලා..

මම අපරාදෙ නැවෙ දැන් ඉතින් ඇගම බෙහෙත් තෙල් ගදයි.. අම්මට එහෙමම හාන්සි පුටුවෙ නින්ද ගිය නිසා මම අම්මට නිදාගන්න යන්න කිව්වා.. මම ඉතින් නිශාචර එකානෙ.. මම නිදාගන්නෙ ඇද ඇහැට අහුවුන වෙලාවක තමා..

මෙ ටිකේ මෙ ස්පොර්ට්ස් කර කර උඩ පැන්නට එක්සෑම් එකත් ලග ලග එනවා.. ඒක කොච්චර අමතක කරන්න හැදුවත් වතුරෙ ගහපු රබර් බෝලෙ වගේ සැරින් සැරේ මතක් වෙද්දි බඩ පපුව කුල් වෙලා යනවා.. අමතකකරන්න හදනවා නෙමෙයි මේ වැඩ අස්සෙ ඒක පිටිපස්සට දාන්න බැහැනෙ..

මම කෙමෙස්ට්‍රි පොතත් පෙරලගෙන මගේ පාඩම් මේසෙන් වාඩි වුනා.. මට තිබ්බෙ ලොකු මෙසයක් නෙමෙ සාමාන්‍ය තරමෙ පොඩි මෙසෙයක්.. ඔකෙ උඩ ,පැත්තකින් පාඩම් කරන වෙලාවට දාගන්න ටේබල් ලැම්ප් එකයි පෑන් පැන්සල් දාන පොඩි බින් එකකුයි පොතුයි තමා තිබ්බෙ.. මල් වාස් අනම් මනම් නෑ.. ඔවා දැක්කහම මට වැඩ කරන්න හිතෙන්නෙ නෑ.. ඒ එක්කම අතේ දුරින් පොත් රාක්කයක් තියෙනවා..

@Shan

මම කෙමෙස්ට්‍රි වල මුල් පාඩම් ටික ආයෙම බලාගත්තා.. මීට එක ඉවරවුනු ගමන්ම එක්සෑම් තියයි.. ටර්ම් ටෙස්ට් එකත් මහ සාපයක්.. අපෙ අම්ම ඒ ලෙවෙල් පටන්ගත්තු දවසෙ පේරන්ට්ස් මීටින් ආවා විතරයි ආයෙ ආවෙම නෑ.. කාගෙවත් එහෙම ලොකුවට පේරන්ට්ස්ලා එන්නෙ නෑ දෙවෙනි වාරෙන් පස්සෙ.. මම නම් අවංකවම අපෙ අම්මට කියන්නෙ නෑ.. තිබ්බත් මට තියෙන්නෙ හතලිස් ගනන් පනස් ගනන්.. ඕකෙන් උඩ යන්නෙම නෑ.. ඒත් හැබැයි ඉතින් ඒක ගන්නත් මාර කට්ටක් කන්න වෙනවා..

මටම හිතෙනවා වෙලාවකට මම වැඩ කරනවා මදිදෝ කියත්. ඒ වුනාට දවසට තියෙන්නෙත් පැය විසිහතරනෙ.. ඔකෙන් කීයෙන් කීයද මම පොඩ්ඩක් හරි නිදහසේ ඉන්නෙ.. නිදාගන්නෙත් පැය දෙකක් වෙනකොට මට පුලුවන් කමක් තිබ්බෙ නෑ ඒ පැය දෙකෙත් ඇහැරගෙන වැඩ කරන්න..

මම අවුෆ්බාවු මූලධර්මය කියලා ලා නිල් පාට පෑනකින් ලියලා තිබ්බ මාතෘකාව දිහා බලාගෙන උගන්නපුවා මතක් කරන හදද්දි මට මතක් වුනේ අද බස් එකේ එද්දි රධ්‍ය අයියා කියපු දේවල්.. මට මූ ගැන මතක් වෙද්දි හිත එක තැනක තියාගන්න බෑ.. ජේනවනෙ දැන් කරන්න ගිය එක නෙමෙයි කෙරෙන්නෙ..

හවස රධ්‍ය අයියයි කියාන් අයියයි දෙන්නම මාත් එක්ක එකම බස් එකේ රාජගිරියෙ හෝල්ට් එකට ආවෙ.. රධ්‍ය අයියා ඉන්නෙ කොට්ටාව හරියෙ කියලා මම කලින් දැනගෙන ඉදියා.. ඉතින් රධ්‍ය අයියටත් මම යන බස් එකේම යන්න පුලුවන්.. කියාන් අයියා කොහෙ ඉන්නවද මම දන්නෙ නෑ..

හවස් වෙලා රාජගිරියට ඒගන්න පුලුවන් වුනත් අපිට ගෙදරට එන්න බස් එකක් ගන්න හුගක් වෙලා හෝල්ට් එකේ ඉන්න වුනා.. මටනම් ඒ එන බස් එකේම ගෙදර යන්න පුලුවන්.. ඒත් රධ්‍ය අයියා තව බස් එකක යන්න ඕන මම හිතන්නෙ.. කොට්ටාව බොරැල්ල බස් අපි ලගින් දෙක තුනක්ම යද්දි මම හෝල්ට් එකේ කණුවට හේත්තුවෙලා කල්පනා කලේ මූ ඒකෙ නොයා මොකද මම යන්න ඉන්න බස් එකේම යන්නෙ කියලා.. එහෙම ඕන නැනෙ ඉතින්..

" මේ අඩෝ බස් එක ආව මම කැපුනා.."

කියාන් අයියා යන බස් එක ආපු නිසා කියාන් අයියා අපි දෙන්නටම කියලා බස් එකේ එල්ලිලා යන්න යද්දි අපි දෙන්නටත් යන්න බස් එක ආවා.. හවස සිද්දියෙන් පස්සෙ මම රධ්‍ය අයියගෙ මූන බැලුවෙවත් නැති තරම්.. පුලුවන්

@Shan

තරම් මග ඇරියා.. ඒ වුනාට මේ පිස්සු ගස් ලබ්බා මම දිහා සැරින් සැරේ බල බල අමුතුවට හිනාවෙනවා මට ඇස් කොනෙන් පේනවා.. මම ඌව ගනන් ගන්නෙ නෑ වගේ බෙල්ලෙ පොට යනකල්ම අහක බලාගෙන ඉදියා..

බස් එකට නැගලත් මම ටිකට් ගන්න කලියෙන් මේකා වොලට් එක ඇදලා මටත් එක්ක ටිකට් ගත්තා.. එයා මෙහෙම කරන්න උවමනා නෑනෙ.. අපි යාලුවොවත් නෙමෙයි. නිකන් අදුරන මිනිස්සු විතරයි.. මම එයාව දන්නෙත් නෑ එහෙමට.. උගෙයි මගෙයි මොන කරුමෙටද මන්දා අපි හිටගෙන ඉදිය තැන සීට් එකේ ඉදපු අක්කලා දෙන්නත් නැගිටලා බහින්න ගියා.. මම වාඩිවෙනවදෝ නොවෙනවදෝ කිය කිය හිත හිත ඉද්දී මේකා මගේ කකුලට පයින් පාරක් ගහාලා සීට් එකට තල්ලු කල්ලා ඌ මගෙ එහාපැත්තෙන් ඉදගත්තෙ උඩ රැක් එකේ දාපු මගෙ බෑග් එක මගෙ උකුලට විසික් කරන ගමන්..

හැන්දෑවෙ හයට විතර ඇති.. අපි ආපු බස් එකේ කොල පාටයි නිල් පාටයි රතු පාටයි ලයිට් පත්තුවෙනවා කතරගම දේවාලෙ වගේ.. ඒ අස්සෙ මර ලතෝනි දෙන සින්දුවකුත් කන පැලෙන්න දාලා ඩ්‍රයිවර් කාරයා වංගු ගදින්නි බොකු බඩවැල් එලියට එන්න හදනවා.. සාපයක් මේ ප්‍රයිවට් බස්නම්.. සීටීබී එකක ආවානම් පාඩුවේ එන්නවත් තිබ්බා.. මුන් හිතාගෙන ඉද්දි මේ රෝද හයක් උඩ නයිට් ක්ලබ් එකක් දාලා කියලා.. ඕවට ආස උන් ඇති ඒවුනාට මටනම් අප්පිරියයි..

මම ශටර් එකෙන් එළිය බලාගෙන එද්දි රධ්‍ය අයියා බෑග් එකෙන් ෆෝන් එකත් අරගෙන මොනවදෝ කොටනවා කොටනවා ඉවරයක් නෑ.. මට කලුපාට ශටර් එකෙන් උගෙ ෆෝන් එකේ සේරම පේනවා.. වෝල්පේපර් එකට දාලා තිබුනේ එදා අර හම්බුනු ඩොක්ටර් අයියයි මේ හැලපයයි කරට අත දාගෙන හිනාවෙලා ගහපු ෆොටෝ එකක්..

මේකයි මම හැලපයා අරකා මේකා කිව්වට රධ්‍ය කාරයා ලස්සනයි හැන්ඩ්සම්.. ඒවුනාට උගෙ අයියා ඊටවඩා හැන්ඩ්සම්.. මම එදා දැක්කනෙ ට්‍රාන්ස්පේරන්ට් ෆ්‍රේම් එකක් දාපු ස්පෙක්ස් දෙක එක්ක ටිකක් පහලට වවපු කොණ්ඩෙයි ප'ෆෙක්ට් ෆිගර් එකයි.. ජස්ට්.. වාව්.. අයියලා මල්ලිලා ඔක්කොම නළුවො වගේ..

ආධ්‍ය අයියා කියලා තිබ්බ චැට් එකක මේකා මොනවාහරි ටයිප් කල්ලා රිප්ලයි එනකල් බලගෙන ඉන්නවා.. මට චැට් වෝල්පේපර් එකෙන්

@Shan

පෙනුනේ කවුරුහරි කොල්ලෙක් පීස් සයින් එකකුත් පෙන්නගෙන හිනාවෙලා මුලු ඇඟේම පාට ගාගෙන ඉන්න ෆොටෝ එකක්.. ඒත් වැට් එකේ එහෙන් මෙහෙන් ටයිප් කරපුවා වැටිලා තියෙන නිසා මට කොල්ලගෙ මූන හරියටම පේන්නෙ නෑ..

අනිවාරෙන් ඔය බිග් මැච් දවසෙ වෙන්න ඕන.. එදා ෆොටෝගැපි සොසයිටි එකෙන් කැප්චර් කරපු ෆොටෝස් හුගක් ඉස්කෝලෙ මෙමරීස් දාලා තිබුනා එෆ් බී එකේ.. මමත් හිටියා එකක. ඉස්කෝලෙ කොඩියක් ඉණේ බැඳගෙන.. මුළු ඇඟේම පාට නාගෙන.. බිග් මැච් කියන්නෙ ඉතින් ආතල් තමා.. ඒවුනාට මූ මොකද අනුන්ගෙ ෆොටෝ වෝල්පේපර් එකද දාගෙන ඉන්නෙ..

අප්පද බොල මේ අර මේකා කිව්ව වන් සයිඩ් ලව් එකද..??

මට ඔක හිතට ආපු වෙලේ ඉඳලම හිතේ කුතුහලේ.. මේ ඉන්නෙ මොකාද කියලා බලාගන්න.. අපේ ඉස්කෝලෙමනෙ.. ඒවුනාට රධ්‍ය අයියා කොල්ලෙක්ට කැමති.. මුන් ඔක්කොම ඇයි කොල්ලොන්ටම කැමති.. රධ්‍ය අයියා දිහා බැලුවම ගේ කියලා කියන්න ත් බෑ.. ඒවුනාට ඉතින් ගේ කියලා නලලෙ කොටලා නෑනේ. නැත්නම් මූ බයි වෙන්න ඇති.. බයි වුනත් දොයි උනත් උඹට අදාල නෑනෙ වරද්..

මම උගෙ ෆෝන් එක දිහා ඇස් ලොකු කරන් බලන් ඉද්දි මේකා බයවෙලා වගේ ෆෝන් එක ඕෆ් කල්ලා බෑග් එකටම ඔබාගත්තා. පුහ්.. හිතුවද දන්නෙ නෑ වෝල්පේපරේ ඉදිය එකාට මම පැනි හැලුවා කියලා.. අනේ මට වැඩෙමයි.. මුගෙ කැලි වලට පැනි හලන්න..

" මොකද..??"

මම උගෙ මූන දිහා බලාගෙන ඉද්දි මේකා මාව මරාගෙන කන්න වගේ ඇගට කඩන් පැන්නා.. දන් මම ඇගට කඩන් පනින්න දෙයක් කීවද නෑනෙ.. ඔය වෙලාවට තමා මට යකා නගින්නෙ ඉතින්..

" මොකද අහන්නෙ මොකුත් නෑ.."

මම උගට ගස්සලා අහක බලාගන්න යද්දි මේකා මගෙ කට දෙපැත්තෙන් හයියෙන් අල්ලලා මගෙ මූන උගෙ මූන දිහාට හරව ගත්තා.. මේ ලබ්බෙ බස් එකේ ලයිට් දාලා පාට අපට මෙලො මගුලක් පේන්නෙත් නෑ.. ක්ලබ් එකක් වගේ.. මට රධ්‍ය කාරයව හැම පාටින්ම පෙනුනා..

@Shan

" ආව් මගුල.. මොකද කරන්නෙ.."

මේකා අනිත් අතින් මගෙ මූනෙ අර මලකඩ බැජ් එකට හීරුන පාර දිගේ ඇඟිල්ලකින් අතගාලා මූන අතැරියා.. යකෝ ඔහොම අල්ලනවද.. කට දෙපැත්ත ඇල්ලූ පාර හක්ක පැන්නද කොහෙද.. මම කට අතගාගද්දි මේකා මම දිහා අමුතු විදියට බලාගෙන හිටියා.. දෙන්න හිතයි ගස් වැද්දට..

" උඹ දිහා කෙල්ලෙක්වත් බැලුවද.."

ඇහ්.. ඒ මොන මගුලක්ද ඒ ඇහුවෙ.. ඉතින් කෙල්ලොන්ට ඇස් තියනවනෙ හත්දෙයියනෙ.. මූ අහන්නෙත් කින්ඩියට වගේ.. අනික මමත් හැන්ඩියා වගේ ඉදී කෙල්ලො බලනවා තමයි.. ඌ දිහා විතරද බලන්න හොද..

" ඇයි එහෙම ඇහුවෙ.."

" උඹෙ මූනෙ පිම්පල් එකක් දාලා නළල මැදම.. බලපන් මොට්ටුවක් තියලා වගේ.."

සැක්නෙ.. මූට මොකද මගෙ මූනෙ පිම්පල් එකක් බැරිනම් ගහක් පැලවුනත්.. ඕන නැනෙ.. අනික කෙල්ලො බැලුවහමද පිම්පල් එන්නෙ.. හරි මගුලක්නෙ ඒක යකො..

" අනේ මේ කෙල්ලො බැලුවහම නෙමේ පිම්පල් එන්නෙ.. ඒක හෝමෝන වල වෙනසක්.. අනික මගෙ මූනෙනෙ පිම්පල් දාල තියෙන්නෙ.. අයියගෙ මූනෙ නෙමේනෙ.."

" මම්.. මම්.. ඒකත් ඇත්ත තමයි.. "

" ආවා මෙතන මගුලක් අහගෙන.."

" මොකක්ද උඹ කිව්වෙ.."

" නෑ නෑ මම කිව්වෙ.. මොකුත් නැහ්.."

" දැන් උඹ ස්පෝර්ට්ස් මීට් කියලා උඩ දාගෙන නැටුවට පාඩම් වැඩත් හරියට කරගනින්.. අන්තිමට වැඩ ගොඩ වෙලා තියෙන පිස්සුව තද වෙලා මොකක් හරි වෙයි.."

@Shan

" කාටද පිස්සු කිව්වෙ.. මටද.. අනේ මේ රධ්‍ය අයියෙ.."

" ඕ කියපන්.."

" කිව්වා කියලා හිතාගනින්.. සිරාවටම ඇයි බැරි තමුසෙට අර කියාන් අයියා වගේ මාත් එක්ක ෆිට් එකේ ඉන්න බැරි.. හැම තිස්සෙම බනිනවා බනිනවා ඉවරෙකුත් නෑ.. එක්කො තරහ වෙයන් එකපාර.. එහෙමත් නෑ.. එපාවෙනවා රෙද්ද. ගෑනියි මිනිහයි වගේ.."

" මම.. දැන් එතකොට උඹ මගෙ ගෑනිද.. හා..හා "

" අනේ මේ මම කිව්වෙ 'වගේ' කියලා.. අනික මම ගෑනියෙක් වගේ පේනවද.. නෑනෙ.. තවුසෙ වගේ මිනිහෙක් හම්බුනොත් මම මූදෙ පැනලා මැරෙනවා.."

" ඒක හොඳයි.. බෝට්ටුවකින් ටිකක් දුරට ගිහින් පැනපන්.. එතකොට මට ගෑනි මැරුනා කියලා මල ගෙවල් තිය තිය කරදර වෙන්න ඕන නෑනෙ.."

" සැක් අයියෙ තවුසෙනම්.. "

" ඉතින් උඹනෙ කිව්වෙ මැරෙනවා කියලා.."

" ඒ ඉතින් මම බැන්දොත්නෙ.. මම බඳින්නෑ.."

" ඔව් ඉතින්.. උඹ වගේ එකෙක් කර අහගන්න එකා ගොං ගහක් වෙන්නෝන.. දැන් බලපන් උඹ එක්ක වචනයක් කතාකරන්න පුලුවන්ද.. කුඩැල්ලා වගේ එල්ලෙනවා.."

" ආ ඇත්තද්‍ද.. මට මොකෙක්වත් සෙට් වෙන්නැත්තන් තවුසෙ වගේ ඔට්ටපාලු කලවැද්දෙක්ටත් කවුරුත් ජීවිතේට කර ගහන්නෙ නෑ.. තවුසෙනෙ මුලින්ම මට එක එක ඒව කියලා රණ්ඩුවෙන්න පටන් ගත්තෙ.."

" මම.. මේ මම??"

" යැයි යැයි තමා.."

@Shan

මම ආපු කේන්තියටත් එක්ක උගේ සුදුවට ලස්සනට තිබ්බ අතේ නියපොතු පහම හිටින්න හොඳ මස් කුට්ටියක් අල්ලලා උඩට ඇද්දා..

" වරද්!! ආව් යකෝ උඹ මොන මගුලක්ද කරන්නෙ.."

මම උගෙ අත හූරලා ශටර් එකෙන් අහක බලාගෙන කේන්තියට ගස් වලට ඔවර ඔරව හිටියා.. මූ අත කරක කරන හිරුනු එක අතගානවා.. හොඳවැඩේ පරයට.. අනිත් පාර එක එක ඒවා කියන් ආවොත් ගලවන්නෙ බෙල්ල ඕකගෙ මම..

" බලපන්.. මගෙ අතින් ලේත් එනවා.. උඹ බළලෙක්ද.. පහුරු ගාන්නෙ.. ඊයෙ පපුව හූරල අද අත හූරලා.. ඊලග පාර දෙන්නෙ මම උබට.."

රධා කියන දොදොල් හැලපායා මට ගහන්න වගේ අත උස්සලා ඇත්තටම මගෙ ඔලුවට ගැහුවා.. රිදෙන්නත් නෙමෙ.. ඒවුනාට ගැහුවනෙ.. මේක මම ලේසියෙන් අතාරින්නෙ නෑ ගෝත පරෙයියා.. වෙලාවක් එයිනෙ මට පලි ගන්න..

" මම බහිනවා.. මගුල.. පරිස්සමට පලයන්.. "

" පලයන් ඉතින්.. වල් ගැරඩියා.."

මම කියපු එකට ඌට හිනායන්නත් ඇවිත් ඌ හිනාව හිර කරගෙන පිටිපස්සෙ ෆුට් බෝඩ් එකට ගියා.. මගේ ඇගේ දැන් මාලු කස්තිරම් නටනවා.. මූ මට කරපු අපහාස ගොඩ.. හිටපන්කො අයියෙ මම ඉන් අනිද්දට උඹලගෙ ගෙදර එනවනෙ.. තවුසෙගෙ අහවල් එකේ මම සිද්දාලේප ගාලා හලනවා උණුවතුර..

මේ දරුවට කලබලේනේ ඉතින්..

කතාව නිකන් දිගට ඇදෙනවා වැඩී වගේද ලමයි..

එහෙමනම් මට කියන්න හරිත..

කතාව කියවනවට වගේම කමෙන්ට්ස් වෝට්ස් වලට හුගක් ස්තූතියි කැකුලියනි.. මම එහෙනම් ගියා..

ලව් යූ.. ❤

@Shan

ප.ලි.

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 15 කොටස

" දැන් ඔය ළමයගෙ ගෙවල් කොහෙද තියෙනව කියන්නෙ.."

අම්මා ඇහුවේ මම ලෙලි ගහපු පොල් ගොඩ ගෙට අරන් යන ගමන්.. තාම උදේ පහමාරයි.. අපේ අම්මා ඉතින් මම ඉස්කෝලෙ නොගියත් උදේම උයලා ඉවරකරනවා.. ඊටපස්සෙ දවල්ට එයාට ඇඳුම් මහගන්නවා.. නැත්නම් මල් පැලයක් බදාගෙන ඉන්නවා.. වැඩක් ඇත්තෙම නැත්නම් ඉතින් නිදාගන්නවා..

මම ඊයෙයි පෙරේදයි ඉස්කෝලෙ ගියේ නැත්තෙ අපිට මේ දවස් දෙකේම රිවිශන් ක්ලාස් තිබුනා උදේ ඉදලා රෑ වෙනකල්ම.. ඒ වැඩ අස්සෙ ඉස්කෝලෙ යන්න තියා හිතාගන්නවත් වෙලාවක් තිබුනෙ නෑ.. මම නෑ කියලා ලොකු අවුලක් තිබ්බෙත් නෑ කියලා නෆ්‍රාස් මට මැසේජ් එකක් දාලා තිබුනා.. අනික මම ගෙදර ඉදලා කරන්න පුලුවන් උදව්වක් තිබ්බනම් එවෙලෙම කල්ලා ඒගොල්ලොන්ට යැව්වා.. අයියලත් ඉන්න නිසා අවුලක් තියෙන්නෙ නැතුව ඇති..

මම උදේ ලෑස්ති වුනේ රධ්‍ය අයියලගෙ ගෙදර යන්න.. මම යන්න දන්නෙත් නෑ ගිහිල්ලත් නෑ.. ඒකනිසා සෙනුකයට කතාකල්ලා කිව්වහම ඌ එන්නම් කිව්වා උදේ ගෙවල් ලගට මාවත් පික් කරන් යන්න්න.. ඌට දැන් ශුගර් ඩැඩී කෙනෙක් හම්බෙලා ඒකනිසා අයුක අයියා ඌවත් දාගෙනම කාර් එකේ එන්නම් කියලා තිබ්බා.. අයුක අයියගෙ තාත්තා මම අහලා තියෙන විදියට මිනිස්ටර් කෙනෙක්.. අපේ එකත් ඉදලා ඉදලා පය ගහලා තියෙන්නෙ සෑහෙන්න බර අත්තකට බලන් යද්දි..

කාර් එකේ යන නිසා මම සුදු කොට කලිසමකට ලා නිල් පාට අතට අහුවෙච්ච ටී ශර්ට් එක මදින්න කම්මැලි නිසා එහෙමම ඇදගෙන කොණ්ඩෙත් උඩට හදලා අම්මගෙ කාමරේට රිංගලා ඒකෙ තිබ්බ ඕඩිකොලොන් බෝතලේ ඇගේ හලාගෙන බාට දෙකයි වොලට් එකයි සාක්කුවෙ ඔබාගෙන හතාමාරට ගෙදරින් ආවා..

හොදට අඳින්න ඔන්නෑනෙ අනික මගුල් ගෙදරක යනව කියලයෑ.. මම හංදියට එද්දිම වගේ සෙනුකයා මට කෝල් කලා..

@Shan

" ඕ බං.."

" මේ අපි ඇවිල්ලා ඉන්නෙ.. ඉස්සරහට වරෙං.."

" ආ හා.."

මම ඉස්සරහට යද්දී දැක්කා සොරෙන්ටො එකක් පාරෙන් එහාපැත්තෙ නතරකල්ලා තියෙනවා.. සෙනුකයා මොකාද එකා වගේ ශටර් එකෙන් මට අත වනනවා.. සැක් මූ මොකෙක්ද මන්දා.. මම ඌව දැක්කෙ නෑ වගේ ගිහින් පිටිපස්සෙන් නැග්ගා.. මූ හෙන ඩ්‍රාමා ක්වීන් මෙහෙම ඉදියට.. අයුක අයියා ශේඩ්ස් දෙකත් දාලා ෆිට් ඩෙනිමකට චෙක් ෂර්ට් එකක් ඇදලා හෙන ගැම්මට ඇවිත් ඉදියේ.. සෙනුකයත් එහෙමයි.. මම අර හත්පත්තුවෙන් බැහැලා ආපු එකා වගේ බාටා කැලි දෙකකුත් දාගෙන මෙලෝ රහක් නෑ..

" ආව්.. ඒ බං උඹ නිකන් පොඩි එකෙක් වගේ හෙන කියුට් පාටයි ඔයි.. නේද සුදුඅයියෙ.."

" මම.."

සුදුඅයියෙ..?? මට දැන් හෙන අවුල් මෙහෙම කපල් එකක් මැද්දෙ මූකලන් බස්සා වගේ යන එක.. ඇයි හත්වලාමෙ අපේ සෙට් එකේ මොකෙක්වත්ම කලින් අෆෙයාර්ස් තියාගෙන ඉදලා නෑ.. ඉතින් මුන් දෙන්නා මෙහෙම ලව් එකේ කතාකරද්දි මට හෙන අවුල්.. අනික අපේ එකා පට්ට රොමැන්ටික් වෙලානෙ දවස් දෙක තුනට.. මෙකා උදේම අයුක අයියගෙ පර්ස් එකට විදලද කොහෙද අතේ ෆැබ් එකෙන් ගත්තු හෙන තඩි මල්ලක් තියාගෙන ගිලිනවා ගිලිනවා ඉවරයක් නෑ.. ඒ අස්සෙ අයුක අයියගෙ කටෙත් ඔබනවා එක එක එව්වා.. මටත් දෙන්නද ඇහුවම මම එපා කියලා නිකන් ඉදියා.. උදේ අම්මා කාලා යන්න කිව්ව නිසා වෙන කැමක් කන්න බඩේ ඉඩ තිබ්බෙත් නෑ.. අපේ අම්මා කොහොමත් දැන් මට බඩගින්නෙ එහෙ මෙහෙ යන්න දෙන්නෙ නෑ එදා කලන්තයක් හැදුනු නිසා..

අන්තිමේ ගිහින් ගිහින් අපි කොට්ටාවෙ හංදියෙන් හැරිලා ටිකක් දුර ගිහින් අතුරු පාරකට හැරුනා..ඒක ප්‍රයිවට් රෝඩ් එකක්.. මම ඉතින් එලිය බලාගෙනනෙ ආවෙ..මේ ලේන් එකේ තිබ්බෙ ඔක්කොම වගේ හෙන විසාල තාප්ප දාපු ලොකු ගෙවල්.. සමහර ගෙවල්වල සෙකියුරිටි ගාඩ්ස්ලාත් ඉන්නවා.. මම ඇත්තටම දැනගෙන ඉදියේ නෑ රධ්‍ය අයියගෙ ෆැමලි

@Shan

බැක්ග්‍රවුන්ඩ් එක මොන වගේ එකක්ද කියලා.. ඒවුනාට මෙ පැත්තෙ හැටියට පොරත් අයුක අයියා වගේම ඩයල් එකක් වෙන්න ඕන..

මෙ පාරේ ටිකක් දුර ගිහින් අයුක අයියා කාර් එක හැරෙව්වෙ තට්ටු දෙකට හදාපු ලොකු ගෙයක් ඉස්සරහට.. අපි යද්දිත් ගේට් එක ඇරලා තිබුනේ.. මම ඒ එක්කම දැක්කෙ එදා රධ්‍ය අයියා මාව ඇරලපු බයික් එක පැත්තකට වෙන්න ස්ටෑන්ඩ් කල්ලා තියෙනවා.. එහෙනම් ඉතින් මේක තමා රධ්‍ය අයියගෙ ගෙදර..

අයුක අයියා කාර් එකෙන් බහිද්දිම වගේ මමයි සෙනුකයයිත් කාර් එකෙන් බැස්සා.. සෙනුකයා වටෙන් දුවගෙන දුවගෙන ඇවිත් මගේ අතේ එල්ලුනා.. ඕකා ඔහොම තමයි කොහේ හරි නොදන්න තැනකට ගියොත් මගෙ කලිසමෙන් හරි අල්ලගන්නවා.. ඌ කියන්නෙ එතකොට පොඩි සේෆ් ෆීලින් එකක් එනවලු.. අනේ උගේ මනස්ගාත.. ඔක්කොමත් හරි කෝ මෙ ගෙදර උන්..

අයුක අයියා ගේට් එක වැහෙන්න බිත්තිය ගාව තිබ්බ බටන්ස් වගයක් ප්‍රෙස් කල්ලා ඇතුලට ගියා.. අයුක අයියයි කියාන් අයියයි නම් නිතර මෙහෙ එනවා යනවා ඇති.. උන් තුන්දෙනා හොදම යාලුවොනෙ.. මමත් අයුක අයියා පස්සෙන් ගියා..

" අයියේහ්.. කෝ මම අර වැලේ වනපු අන්ඩවෙයාර්ස් ටික.. කොහෙදෝ...................................."

" පොඩී මෙහෙ ඇවිල්ලා මට මේ පොල් ටික ගාලා දීලා යනවා.. අර ලමයි දැන් එනවත් ඇති.."

මමයි සෙනුකයයි දොර ගාව බහිරවයො දෙන්නා වගෙ හිටගෙන ඉද්දි සාලෙ මැද්දෙන් බාගයක් විතර ඇවිදගෙන ආවේ රධ්‍ය අයියා.. ඌව දැක්ක පාර මට බකස් ගාලා හිනාගියා..

දෙයියනේ කෙහෙල් දල්ලෙ කොළ පාට සරමකුත් ඇදගෙන ඒක පැත්තකින් උස්සගෙන මේකා දාහකට ගහන්න වගේ කුස්සිය දිහාට යනවා.. සැක් උදේට මූන හෝදලාත් නැද්ද කොහෙද කොන්ඩෙත් හෙන ගහලා වගේ.. මට හිනාගියා විතරයි මූ පොල් බෑයකුත් අතේ තියාගෙන අපි ඉන්න පැත්තට හැරුනා.. ඇහිපිල්ලම් දෙකක් ගැහුවා.. ඊටපස්සෙ හොද සිහියට ආවා වගේ ආපු පැත්තටම පොල් බෑයත් උස්සගෙන දුවගෙන ගියා.. මට විතරක්

@Shan

නෙමේ සෙනුකයටත් හිනා රධ්‍ය අයියව දැක්ක විදියට.. මූව යවන්න තිබ්බෙ විකට ඇඳුම් තරගෙකට.. අම්මොහ් අපේ ඉස්කෝලෙ කැඩෙට් සාජන්..

" මල්ලිලා.. එන්න ඇතුලට.. මම හිතුවේ එන්න පරක්කු වෙයි කියලා.."

ඒ එක්කම අපි ඉන්න දිහාට ඇවිදගෙන ආවේ පිළිවෙලට ඇඳපැලඳගෙන ඉන්න ඩොක්ට අයියා.. අරූ වගේ නෙමේ ඩොක්ට අයියා හෙන ලස්සනයි.. හිනාවෙද්දි ඇස් දෙකත් එක්කම දිලිසෙනවා.. මමයි සෙනුකයයි ඒ අයියා එක්ක හිනාවෙලා ඇවිත් සෝෆා එකේ ඉඳගත්තා..

" මෙ මල්ලිවනම් මම දන්නවා.. වරද් නෙ.. මෙ සෙනුක මල්ලි වෙන්න ඕන.."

" ඔව් අයියෙ.. හායි.."

" මම ආඪ්‍ය.. එදා හරියට අඳුනගත්තෙත් නැනෙ.. අර උඩට ගියපු එකාගෙ අයියා.."

අපි තුන්දෙනාම කියව කියව ඉද්දි පැය බාගෙකට විතර පස්සේ අයුක අයියා එක්ක රධ්‍ය අයියා ඇඳුනුත් මාරු කරගෙන පඩිපෙළ බැහැගෙන පහලට ආවා.. මේකා යකෝ අලුත බැඳපු මනමාලි වගේ අයුක අයියට මුවා වෙලා එන හැටි විතරක්.. මමයි සෙනුකයයි උගෙ සත්‍ය ස්වරූපය ඇස් දෙකට දැක්ක නිසාද දන්නෙ නෑ..

" පොඩී අර ලිපේ තියෙන මාළුව හැඳිගාලා එන්නකෝ.."

ආඪ්‍ය අයියා රධ්‍ය අයියට කියද්දි ඌ මූන නාළු කරගෙන කුස්සිය පැත්තට ගියා.. අයුක අයියත් ඒ පස්සෙන්ම ගියා..

රධ්‍ය අයියගෙ ගෙදර පඩිපෙළ ගාව බිත්තියේ ලොකුවට රාමු කරපු එයාලගෙ ෆැමලි ෆොටෝ එකක් ගහලා තිබුනා.. තාත්තා නම් හෙන නපුරු පාටයි.. අම්මා නම් රධ්‍ය අයියා වගේමයි.. අමුතු සුදක් තියෙන ලස්සන හිනාවකින් පිරුනු මූනක් අම්මට තිබ්බේ..

ආඪ්‍ය අයියා එක්ක කතාකර කර ඉද්දි මට එයාලගෙ පවුලේ විස්තර ටිකක් දැනගන්න පුලුවන් වුනා.. එයාලගේ අප්පච්චි දැනට පලාලි වල ආමි කෑම්ප්

@Shan

එකක වැඩ කරන මේජර් කෙනෙක්ලු.. අම්මා කැම්ප් එකේම වැඩකරන ඩොක්ටර් කෙනෙක්ලු.. අම්මටයි අප්පච්චිටයි එකපාර ට්‍රාන්සර් එකක් ඇවිල්ලා දැන් ඒ දෙන්නම මෙහෙ නැහැල්ලු පලාලි වලලු ඉන්නෙ.. ආධ්‍ය අයියා මෙහෙ රධ්‍ය අයියවත් බලාගෙන ඉන්නවලු.. ඒකතමා එහෙනම් මූ හිතේ හැටියට රවුම් ගහන්නේ අරගෙ මෙහේ.. බලද්දිනම් මට හිතුනේ මෙ පවුල හෙන ස්ට්‍රික්ට් එකක් කියලා.. ඒ නිසාමද මන්දා රධ්‍ය කාරයත් කිසි හිතක් පපුවක් නැති එකෙක් වගේ හැසිරෙන්නෙ..

තව පැය බාගයක්විතර ගෙවිලා ගියාම කියාන් අයියයි අහිරු අයියයි නෆ්‍රාසුයිත් රධ්‍ය අයියලගෙ ගෙදර ආවා.. අපි ඔක්කොම ඉඳගෙන ඉදියේ කැම මේසෙ.. ඔක්කොම කිව්වට මේක දැන් පටන්ගත්ත වෙලේ ඉඳන්ම සෙනුකයයි අයුක අයියයි පේන තෙක් මානෙක නෑ.. ආධ්‍ය අයියත් නයිට් කරලා මහන්සී නිදාගන්න යනවා කියලා කිව්වා..

නැති උන් බල බල ඉන්නෙ නැතුව අපි ටික දෙනා එකතුවෙලා තිස් දාහකට සෙට් වෙන්න බජට් එකත් හැදුවත් මෙතෙන්ට තිස්දාහට වඩා යනවා.. ඒකනිසා අපි හිතාගත්තා හවුස් එකට ෆන්ඩ් එකක් එකතු කරන්න..

" මෙහෙමයි ඉස්සෙල්ලම වයිස් ප්‍රින්සිපල් සර්ව හම්බෙලා මම මේක ගැන කතාකල්ලා බලන්නම්.."

සයෝන් අයියා ෆෝන් එකේ කැල් එක ක්ලියර් කරන ගමන් රධ්‍ය අයියා දිහාට හැරිලා කිව්වා..

" බොහෝ දුරට ප'මිශන් නම හම්බවේවි.. ඊටපස්සෙ බලන්න ඕන කොස්ට්යුම්ස් වලට මොකද කරන්නෙ කියලා.. ඕ බී එකත් එන නිසා අපිට සතියකට කලින්වත් ශර්ට්ස් ප්‍රින්ට් කල්ලා ඉවර කරගන්න වෙයි.."

" එහෙනම් දැන්ම ඕඩර්ස් දුන්නනම් හරිනෙ.. "

" මෙ අයියෙ.. ඩ්‍රිල් එකෙත් තවම ට්‍රැක් එක හදලත් නෑ.. මම එදා ගයාන් සර්ගෙන් ඇහුවා ඒක හදලා ඉක්මනට දෙන්න පුලුවන්ද කියලා.. ඒවුනාට ගයාන් සර් ඒක ගැන බලන්නෙවත් නෑනෙ.. මොකද ඒකට කරන්නෙ.."

මම කියද්දි සයෝන් අයියා ගයාන් සර්ට කෝල් එකක් ගත්තා.. ඒ සර් ඒක බාරගත්තනම් හරියට කරන්න එපැයිනෙ මගුල..

@Shan

" ඔන්නෑ ඔන්නෑ.. සයෝන් ෆෝන් එක තියපන්කො.. අපිම ට්‍රැක් එකක් හදාගමු.. උන්ට වැඩක් බාරගත්තනම් හරියට කරන්න බැරිද.. මොනාහරි කිව්වොත් කියපන්කො මම බලාගන්න.. "

කියාන් අයියට මල පැනලා ගයාන් සර්ට බනින්න ගත්තා.. ඒ සර්නම් කොහොමත් පණ්ඩිත වැඩී තමා.. ඔපදූප හල හලා ඉන්නවා මිසක් හරිහැටි පන්තියකට එන්නෙත් නෑ.. බාරගත්තු වැඩක් කරන්නෙත් නෑ..

" එහෙනම් මෙහෙම කරමු.. අද ආපු එකේ මේ ටික ඉවරයක් වෙන්නත් එපැයි.. මේ මල්ලිලට ආයෙම එන්නත් බෑ වැඩත් පාඩුකරගෙන නැහෙන්න ඕන නැනෙ.. අදම ඩ්‍රිල් එකේ කොස්ටියුම් එක අපි ඩිසයින් කරගමු.. මම දන්න එකෙක් ඉන්නවා එන් වී කියු එකේ ඩිසයිනින් කරන.. ඌ හෙල්ප් කරයි ඒකට.. අපිට එතකොට සඳුදට පොඩි ලමයින්ගෙ මෙශර්මන්ට්ස් ගන්න පුලුවන්.. කියාන් පුලුවන් නම් හවසට අහිරුව එක්ක ගිහින් ටේලර් ශොප් එකත් එක්ක කතාකරමු.. අවුලක් නැනෙ.."

" ඒවා හරි බං.. අපි යන්නම්.."

" එතකොට මම හවුස් ඩෙකරේශන්ස් වලට සෙට් වෙන තීම් එකකුයි හවුස් එකේ කොමන් ටීශර්ට්ස් වල වැඩෙයි බලාගන්නම්.. මම ලැප් එකේ එදා තීම වගයක් හැදුවා.. කොස්ට් එක අඩුවෙන් ලස්සනට තියෙන්න කරන්න ඕන.. Who can help me with this?"

රධ්‍ය අයියා අහද්දි මොකෙක්වත් ඉදිරිපත් වුනේ නෑ.. මේකා වැඩ කරද්දි ගිරිය පලාගෙන කෑගහනවා කෑගහනවා ඌ එක්ක වැඩ කරන්න ගියොත් යන එකාට පිස්සු ඩබල් වෙනවා.. මම ටික වෙලාවක් වට පිට බල බල ඉදලා බැරිම තැන ඌට උදව් කරන්න ඉදිරිපත් වුනා.. අම්මපා මේ සෙනුකයා.. බේසිකයා හොයාගන්නත් නෑ..

" මම උදව් කරන්නම්.."

මම රධ්‍ය අයියා දිහා බලලා කියද්දි පොරට ලාවට හිනාවක් ගියා.. ඇයි දන්නෑ හිනාවෙන්නෙ.. මොට්ට සලමන්දරා..

" හරි එහෙනම් වරද් මම උදව්වට ගන්නවා.. එහෙනම් දැන් ශේප් නෙ.. නෆ්‍රාස් මල්ලි මැචස් වල වැඩ එක්ක හිරවෙලා නිසා මම එයාට වැඩ මොකුත් බාරදෙන්නෙ නෑ.. ඒ වුනාට මෙතන ඉන්න හැම එකෙක්ම

@Shan

බාරගත්තු දේවල් වෙලාවට ඉවරකරන්න ඕන.. තේරුනානෙ.. මාසයයි කට්ට කන්න තියෙන්නෙ... ඊටපස්සෙ ආයෙම උඹලට මේ ඉස්කෝලෙ ස්පෝර්ට්ස් මීට් එකක් ජීවිතේට සෙට් වෙන්නෙ නෑ.. "

රධ්‍ය අයියා කියන්න ඕන ඒව කියලා ඉවරකලාට පස්සෙ කියාන් අයියයි අහිරු අයියයි ලැප් එකක් දිගෑරගෙන අර රධ්‍ය අයියා අඳුරනවා කියපු ඩිසයිනින් කරන අයියා එක්ක සූම් මීටින් එකක් දාගෙන ඒකෙ වැඩ කරන්න පටන්ගද්දි නෆ්‍රාසුයි සෙයෝන් අයියයි රධ්‍ය අයියා එක්ක ටික වෙලාවක් කතාකර කර ඉදලා යන්න්න ගියා.. ඒ දෙන්නට අද හවස ස්විමින් ප්‍රැක්ටිස්ලු.. අන්තිමට ඉතුරුවුනේ පුරුදු විදියටම මමයි රධ්‍ය අයියයි තමා..

" වරද් එනවා මම අර හදපු ඩිසයින්ස් ටික බලන්න.. ලැප් එක මගෙ කාමරේ.."

රධ්‍ය අයියා මටත් කතාකරගෙන පඩිපෙළ නැගලා උඩට ගියා.. උඩ තට්ටුවෙ එකළග තියෙන කාමර දෙකෙන් පලවෙනි කාමරේ ගාව රධ්‍ය අයියා නතරවෙලා දොරේ හැන්ඩ්ල් එකට අත තියෙලා තල්ලු කරා ඒ වුනාට දොර ඇරුනෙ නෑ.. මුගෙ ගෙදර මුගෙ කාමරේ දොර මූටම ඇරගන්න බැරිද.. මම එහෙම හිත හිත ඉද්දි මම ලාවට රධ්‍ය අයියා ගාවට කිට්ටු වෙලා දොරට කන තිබ්බා.. කවුද යකෝ මේකෙ ඇතුලෙ කෙදිරිගාන්නෙ.. මෙකා අර වන් සයිඩ් ලව් එක ගෙනැල්ලා රපුන්සල් වගේ ගෙදර හිරකරගෙනවත් ද.. මම රධ්‍ය අයියව එහාට විසික් කල්ලා යතුරු හිලට ඇහැ තියලා බැලුවා.. එකෙන් නෙමෙ දෙතුන්දෙනෙක්ම කෙදිරි ගානවා..

" මේකෙ කවුරුහරි ඉන්නවද..??"

" පිස්සුද බං.. මේක මගේ කාමරේ.. මොකෙක්වත් මේකට එන්නෙ නෑ.. පොඩ්ඩක් හිටපන් මම අයියගෙ කාමරෙන් යතුර අරන් එන්න.."

රධ්‍ය අයියා බයවෙලා වගේ ආධ්‍ය අයියගෙ කාමරේට ගිහින් යතුරක් ගෙනැල්ලා දොර ඇරියා.. ඒත්..

ඇත්තවශයෙන්ම මට හිතුනා අපරාදෙ දොර ඇරියේ කියලා..

හරියටම මම හිටියේ රධ්‍ය අයියට එහාපැත්තෙ.. මගේ දර්ශන පතයට කෙලින්ම අහුවුනේ රධ්‍ය අයියගෙ හොදම යාලුවා මගේ හොදම යාලුවගෙ

@Shan

කට කන හරිම අසභ්‍ය දර්ශනයක්.. මුන් දෙන්නට අපි දොර ඇරියා කියලා සිහියක්වත් නෑ වෙලීගෙන ඇලීගෙන හෝ ගාලා වැඩේ කරන් යනවා.. මුන් දෙන්නා අද තකහනියක්ම මෙහේ ඇවිත් තියෙන්නෙ හවුස් එකේ වැඩකට නෙමේ මේකට.. මාව තප්පරෙන් ජම්බු ගෙඩියක් වගේ රතුවෙද්දි රධ්‍ය අයියා උගුරෙ කෙල හිර කරගෙන මැරෙන්න ගියා.. ඒකා කැහැ කැහැම මගෙ බෙල්ලෙන් අල්ලලා මාව අනිත් පැත්ත හැරෙව්වා.. හැබැයි දෙයියනේ කියලා රද්‍ය අයියගෙ කැස්සට පිං සිද්ද වෙන්න අරුන් දෙන්නා කර කර හිටිය වැඩේ නවත්තලා බය වෙලා වගේ අපි දිහා බලන් ඉදියා..

" ඌප්ස්.. රධ්‍ය අයියා.."

තුහ්.. නොදකින්වත් මේ සෙනුකයා ලැජ්ජාවක් නැතිව රධ්‍ය ඇයියා ගැව හැටි.. මූ මගේ යාලුවා කියන එක මටම මතක් වෙලා පොලොව පලාගෙන යන්න හිතුනා..

" මොනවද යකෝ කරන්නෙ.."

" මොනවද අහන්නෙ උඹලා දෙන්නා ඔය මගෙ ඇද උඩ මොකද කරන්නෙ.. අයුකයා!!!"

" හරි හරි බං ඉතින් ඕකට නහින්න ඕන නෑනෙ.. උඹලා මොකටද ආවෙ.."

" අපි ආවෙ වැඩකට.. දෙන්නම පල එළියට.. යකෝ අපේ අයියා ගෙදර ඉන්නෙ.. තොපිලා කෙදිරිගානවා එළියටත් ඇහුනා.."

" ආ බං ඉතින් ඇහුනදෙන්.. සුදූ මෙහෙ එනවා මුන් දෙන්නට වැඩ වගයක් තියේලුනෙ.. අපි මොනාහරි කන්න යමු.."

" තෝ පකයා!!!!"

මම සෙනුකයා මගේ ලගින් යද්දි රවලා උෟ දිහා බැලුවා.. ඇත්තට මුන් දෙන්නනම් පුදුම අසහනකාරී ජීවිත දෙකක් තමා..හරි මුන් ලව් කරනවා තමයි.. ඒවුනාට දෙයියනේ වටේ පිටේ මිනිස්සු ඉන්නවනේ.. බේසික පුත්තු දෙන්නා.. මරු අපේ ඉස්කෝලෙ බැජ් දීලා තියෙන උන් නම්.. හරිම අගෙයි..

" වරද් මෙහෙ එනවා!!!!!!!!!!!!!!!!!!!!!!!!"

@Shan

සැක්ම සැක් ඒ ළමයි දෙන්නා නම්.. ඒ වුනාට රධ්‍යට තිබ්බ දොර අරින්නැතුව ඉන්න..

කොහෙද ඒ ළමයටත් කලබලේනේ..

පාන්දර වෙනකල් ඉන්නෝන්නෑ ළමයිනෙ.. මේ ළමයා කලින්ම ලියලා අහවර කොරා..

ලව් යූ.. හෙට එන්නාම්.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 16 කොටස

( මම ඊයෙ අංක දාද්දි පොඩ්ඩක් වැරදිලා තිබ්බා ලමයී.. සොරි වෙන්නෝන..)

අයුක අයියයි මගේ පොල්පිති හරකයි කාමරෙන් ගියාට පස්සේ රධ්‍ය අයියා එක්ක මම උගෙ රීඩින් ටේබල් එකේ පැත්තක පුටුවකුත් තියාගෙන මෙකා අර බැලුවයි කිව්ව තීම්ස් ටිකයි ඩිසයින් ටිකයි බලලා හොද ඒවා ටිකක් සිලෙක්ට් කරගන්න ගමන් හිටියේ.. ඒ අස්සේ රධ්‍ය අයියා මම අත තියාගෙන හිටපු කහ පාට කවරයක් දාපු පොත හදිසියේම ඇදලා අරගෙන උගෙ ලාච්චුවක් අස්සට දාලා ඒක යතුරත් කරකලා යතුර මල්පෝච්චියකට දානවා මම බලාගෙන හිටියේ.. ඌ හිතුවද දන්නෙ නෑ මම උගෙ පොත් අවුස්සන්න මෙතෙන ආවා කියලා.. මට වැඩේමනෙ පොත් අවුස්සන්න.. ඒ මදිවාට ඇදේ නවල් දෙකතුනකුත් පෙරලලා දාලා තිබුනා.. දැන් ඉතින් එක්සැම් ඉවර නිසා මෙකා හෙන ආතල් එකේ ඇත්තෙ.. අපි තමා නහින්නෙ..

" වරද්.. මෙක හොද නැද්ද.."

" අපෝ බෑ බෑ ඕකට හෙන කොස්ට් එකක් යාවි.. අනික ඕක වාම් වැඩී.. අපෙ හවුස් එක කැපිලා පේන්න ඕන අනිත් ඒවට වඩා.."

" එහෙනම් මේක.."

" ඒකතමා මම මුලින් කිව්වෙ මෙක හොදයි කියලා.."

" ඒවුනාට ඒක වාම් වැඩී නැද්ද.."

" ඇයි මනුස්සයො.. මෙක ගලා පාට් එකක් කියලා හිතුවද.. මෙහෙම වාම් විදියට හොදයි.."

" වාම් ලු කැපිලා පේන ඕනලු.. එකක් හරියට කියපන්කො.. මගුල.."

" ඉතින් වාම් විදියට කැපිලා පේන්න කරන්න කියලා මම කියන්නෙ.."

@Shan

" අනේ මට තේරෙන්නෙ නෑ උඹ මොකක් කියවනවද කියලා.. හා දැන් උඹ කියන විදිය මට තේරුම් කල්ලා දීපන්කො.."

රධ්‍ය අයියා මගේ සිලෙක්ශන් වලට අකමැති නිසා මට මල පැන්නා.. ඇයි යකො.. කියන මෙලෝ මගුලක් මූට හොඳ නෑ අරකයි මේකයි.. අපරාදෙ මූ එක්ක වැඩකරන්න ආපු එක..

" මම කියන්නෙ මේක හොඳයි කියලා.. තේරෙන්නැද්ද මනුස්සයො.."

" දැන් උඹට ඕන මේකද.. හරියට කියපන්.. ආයෙ අහන්නෙ නෑ.."

" ඔව් ඔව් මේකම තමා ඕන.."

" ආ එහෙනම් ඕකෙ ප්‍රින්ට් අවුට් එකක් ගනින්.. උඹ එක්ක මේවා සිලෙක්ට් කරන්න ඇවිල්ලා මගෙ හිස කකියනවා දැන්.."

රධ්‍ය අයියා බොරුවට ඔලුව දෙපැත්ත අල්ලගෙන පුටුවට බරවුනා.. ආ දැන් මම කියන ඒවටද මුගෙ ඔලුව රිදෙන්නෙ.. මේක හරි ලබ්බක් උනානෙ..

" දැන් මම කිව්ව ඒවටද ඔලුවෙ රුදාවක් ඇල්ලුවෙ.. අනේ මේ තවුසෙම කරගන්නවා එහෙනම්.. මගුල.. මොකටද මට කතාකලේ.."

" මම කතාකලායැ.. උඹමනෙ ආවෙ.."

" ආ මම නැත්නම් වෙන එකෙක් එයි වැඩ කරන්න තවුසෙ වගේ පුප ගිනි ගත්ත තඩි පැස්බරෙක් එක්ක.. මම යනවා කියාන් අයියලට උදවු කරන්න.."

මම දමලා ගහලා පහලට යන්න හැදුවා..

" ඉතින් පලයන්.. කියාන් ගියා ටවුන් එකට.."

" හා ඉතින් මම යනවා සෙනුකයා එක්ක.."

" ඇයි උඹට බලූ ෆිල්ම් බලන්න ඕන වෙලාද.. මෙන්න මෙහෙන් ඉදපන් මම කන්න මොනාහරි අරන් එන්න.. ආ මේ උඹ බෙහෙත් බොන්න ඕන නේද.. කෝ ගෙනාවෙ නැද්ද.."

" නැහ්.. මම දවල්ට බෙහෙත් බොන්නෙ නෑ.."

@Shan

" ම්ම්.. ඔහොම ඉදපන් මම එන්න.."

රධ්‍ය අයියා මාව උගෙ කාමරේ දාලා පහලට ගියා.. සෙනුකයා මොනා කරනවද දන්නෙ නෑ.. පහල ටීවී එකේ සද්දෙත් ඇහෙනවා.. මුන් දෙන්නා ෆිල්ම් බලනවද දන්නෙ නෑ..

මම රධ්‍ය අයියගෙ ලැප් එකේ ටච් පෑඩ් එකේ ඇඟිල්ල එහෙ මෙහෙ කර කර ඉද්දි කර්සර් එක ගිහින් නැවතුනේ 'warrr' කියලා තිබ්බ ෆෝල්ඩර් එකක් ගාව.. අම්මටසිරි ඒ මොකක්ද.. ටීවී සීරිස් එකක්ද දන්නෙ නෑ.. මම ෆෝල්ඩර් එක ඕපන් කරද්දි මෙක මෙක ලොක් කල්ලා.. අම්මටසිරි වැලක්ද දන්නෙ නෑ මූ ලොක් කරගෙන ඉන්නෙ.. සැක් රධ්‍ය කාරයා මහ වලත්තයෙකෙ.. මම ආයෙම උගේ මොකුත් අල්ලන්නෙ නැතුව ගිහින් උගේ ඇදෙන් වාඩිවුනා.. වාඩිවුනාමත් නෙමේ ඇදට පැන්නා.. පැන්න පාර මව දෙපාරක් විතර බවුන්ස් වෙලා ඉන්දවුනා.. හෙන ආතල්.. මම තුන් හතර පාරක්ම බවුන්ස් වෙවී ඉදලා සාක්කුවේ තිබ්බ මගේ ෆෝන් එක ඇද්දේ ඒකට කෝල් එකක් ආපු නිසා.. බලද්දි අම්මා..

" හෙලෝ අම්මෙ.."

" ආ අර ලමයගෙ ගෙදර ආවද.."

" ඔව් අම්මෙ.. මම හවස් වෙලා එන්නම්.. සෙනුකත් ඉන්නවා.."

" හරි හරි මේ ලමයො මට පොඩි වැඩක් කල්ලා දෙන්නකො.."

අම්මගෙ බටර් පාර මට එච්චර ඇල්ලුවෙ නෑ.. මොකක් හරි බාල්දියක් තමා ඉතින්..

" ඕ මොකක්ද.."

" අනේ සුදුමහත්තයො එන ගමන් කඩෙන් පාන් පිටි කිලෝ එහෙකුයි ගිනිපෙට්ටි පැක් එකකුයි ගේන්නකො.."

" ආ හා.. ගේන්නම් ගේන්නම්.."

" පරිස්සමට ගෙදර එන්න රෑ වෙන්න කලින්.. බුදුසරණයි.."

" බ්‍රා- කට් කලා නේද.."

@Shan

අපෙ අම්මා ඔහොම්මමයි.. කිව්වා තිබ්බා.. අම්මයි මේ රධ්‍ය කාරයයි.. ඔක්කොම මටම වෙනස්කම් කරනවා.. මම ෆෝන් එකෙන් ඉන්ස්ට ලොග් වෙලා මම ලඟදී අප්ලෝඩ් කරපු ෆොටෝ එකට ආපු කමෙන්ට්ස් බල බල ඉඳියේ..ආවිස්.. ගර්ල් ස්කූල් එකෙන් ආපු හාට් ගොඩ.. ගැම්මක් තමා.. කෙල්ලොනම් ඉතින් ෂනෙරුට නතින්.. මම ඔහොම වෝල් එකේ උඩ පහල යන ගමන් ඉද්දි හෙන නිදිමතක් ඇවිල්ල මට දන්නෙම නැතුව නින්දක් සෙට් වුනා.. මුගෙ ඇඳට දාලා තියෙන්නෙත් පත ස්ප්‍රින් මෙට්‍රස් එකක්.. ඒක උඩ බ්ලූ් තියන රෙද්දකුත් දාලා.. ඉතින් මේ නිදිමරාගෙන වැඩ කරන අසරණ මට නිදිමත එන එක සාදාරන නැද්ද මම අහන්නෙ.. සාදාරනයිනෙ..

" මේ අරූ නැගිටලා මැරෙන්න හදයි.. ඔකුන් දෙන්නව ඇදෙන් අයින් කරපන්.. "

" ඕන්නෑ ඔහොම ඉදපුදෙන්.."

" මුගෙ මනමාල හීනාව බලපන්කො.. දැන්නම් මට පේනෙ උඹ සිරාවටම මූව ලයින් කරන්නම වැඩේට බැහැලා වගේ.."

" පිස්සුද උඹට.. පලයන් බං යන්න.."

" නෑ ඉතින් මම සිරාවටම කියන්නෙ.. උඹ ඔය තියන ලොකුකම පොඩ්ඩක් පැත්තකින් තියලා ඌ එක්ක හොදින් කතාකරන්න බලපන්.. උඹත් කොයි වෙලෙත් කඩාපැන්න ගමන්මනෙ.."

" ඇම්ම ඕන නෑ.. ඒ ලෙවෙල් ඉවරවෙලා මම උගෙන් අහනවා.."

" ම්ම්.. අනේ මන්දා ඉතින්.. ඒවුනාට මටනම් හිතෙන්නෙ උබලා ලව් කරන්න නෙමේ ඉපදිලා තියෙන්නෙ එක එකාට වෛර කරගන්නනද කොහෙද.."

" උගේනෙ කට වැඩි.. කොයි වෙලෙත් එරමිණියා අත්ත වගේ එල්ලෙන්නම එනවා.."

" උඹත් ඉතින් ආසයිනෙ ඌත් එක්ක එල්ලෙන්න.. අම්මො අම්මො.."

" එල්ලෙන්න..?! මම කියන්නෑ උඹට.. ඕක නවත්තගනින්කො අයුකයා.."

@Shan

" අඩෙ මුගෙ හිනාව.. සැහ්! මටත් ලැජ්ජ හිතෙනවා.."

මම ලාවට ඇහෙන සද්ද වලට කන් දීගෙන ඉදියේ.. අම්මටසිරි නින්ද ගියා නේද පුතේ. මම හිමින් සැරේ එහෙ මෙහෙ වෙන්න හැදුවත් මොකෙක් හරි මාව බදාගෙන වෙලාගෙන මගෙම බඩ උඩින් කකුලකුත් දාගෙන හිරකරගෙන ඉන්නවා වගේ මට දැනුනේ.. ඒ මදිවාට බඩේ බූල් බූල් මොකක්ද ඇතිල්ලෙනවා.. ඇදත් හෙල්ලෙනවා ඇදේ මොකෙක් හරි උඩ පනිනවා වගේ.. ඒ අස්සෙ වෙඩි තියාගන්න මරාගන්න සද්දත් ඇහෙනවා..

මම හීනෙක කැල්ලක්ද දකින්නෙ නැනෙ.. ඇහැරිලා ඉන්නෙ.. මම හිමීට අස් ඇරිය පාර මගෙ හුස්ම ටික මෙතනම යන්න හැදුවා.. හත්තික්කේ මහසෝනා මගේ මූණටම එබිලා බලාගෙන ඉන්නවා.. උගට රතු පාට දිවකුයි කළු හොම්බකුයි දුඹුරු මූනකුයි තිබ්බෙ.. නෑ නෑ එකෙක් නෙමේ මගේ කකුලෙන් තෙතට මොනාහරි ගෑවෙනවා.. අනේ දෙයියනේ මහසෝනගෙ නිවුන් සහෝදරයෙකුත්..

" ආආආආආආආආආආආආආආආආඅ!!!! රධ්‍ය අයියේ!!!!!!!!!!"

" මම කිව්වෙ.. ඕකා මැරෙන්න හදයි කියලා.."

අයුක අයියගෙ කටහඩ ඇහෙද්දි මට අර වෙඩි තියාගන්න සද්ද එකපාර ඇහෙන්නැතුව ගියා.. එළියෙ වහිනවද කොහෙද හෝ ගාලා වතුර වැටෙන සද්දෙ ඇහුනේ එතකොටයි..

" රෙක්සී!! කියාරා!! ඇදෙන් බහින්න.. කමෝන් ගර්ල්ස්.. එන්න එන්න.."

රධ්‍ය අයියගෙ වැල්ඩින් කටහඩ ඇහුනා විතරයි අර මහසෝන්නු දෙන්නා ඇදෙන් බැහැලා උඩ පැන පැන රධ්‍ය අයියා ගාවට දිව්වා.. ඒත් මට හෙල්ලෙන්නවත් බැනෙ.. මම ඔලුව හරවලා බලද්දි අර ගොබ්බ සෙනුකයා මාව උගෙ කොට්ටෙ කියලා හිතාගෙන බදාගෙන වෙලාගෙන මගෙ උරහිස අස්සෙ මූන ගහගෙන නිදි.. සැක්.. මෙ මොන මගුලක්ද.. මම උගෙ අත පය සේරම අහකට විසික් කල්ලා ඉක්මනට නැගිට්ටා.. ඒ අස්සෙ අයුක අයියා ඉන්නවා හිනාවෙවී අර ගොටුකොල නාම්බා එක්ක..

සිරාවටම මට හාට් ඇටැක් එකක් එනවා ඒ බය වුනු බයවිල්ලට.. මම බලද්දි තඩි ජ'මන් ශෙපඩ් බල්ලෝ දෙන්නෙක් රධ්‍ය කාරයගෙ ඇග වටේ කැරකෙනවා.. උන් දෙන්නට පුදුම විසයක් තියෙන්නෙ.. කැමෝන් ගර්ල්ස්

@Shan

තමා.. දෙන්න හිතයි මුගෙ ඔලුවට පාරක්.. ඌත් එකයි උගෙ බල්ලොත් එකයි උගෙ යාලුවොත් එකයි..

" ආර්හ්.. මොන මගුලක්ද අයියේ.."

මම නිදිමතින් ඇස් දෙකත් ඇරගෙන මේ යකාට කෑගහද්දී ආයෙම අර බලු තඩියෝ දෙන්නා මගෙ දිහා දිවත් ඇදගෙන බලාගෙන හිටියා.. සැක් කෙළත් බේරෙනවා..

" මොකද සද්දේ.."

" යනවා යන්න.. වෙලාව කියද.. මම ගෙදර යන්නෝන.. පොඩ්ඩක් ඇහැරන්න බැරිද අප්පා..!!"

" ඇහැරන්න?? මම කීපාරක් කතාකලාද උඹට බෙහෙත් බොන්න.. අරකව බදාගෙන නිදාගෙනනෙ හිටියෙ.."

" ම්ම්.. මොකක් හරි.. මම දැන් ගෙදර යන්න ඕන.. පහමාරත් වෙලා.. අම්මා බලන් ඇති.."

මම ඇදෙන් නැගිටලා පොඩි වෙලා තිබ්බ ශර්ට් එක පහලට ඇදගත්තා..

" අයුකයා.. මුන් දෙන්නව පහලට අරන් පලයන්කො.."

රඩ්‍ය අයියා බල්ලො දෙන්නගෙන් එහාට වෙලා අයුක අයියටට කියද්දී අයුක අයියා උන්දෙන්නගෙ නම් කියාගෙන එලියට ගියා.. උන් දෙන්නත් නැට්ට වන වන අයුක අයියා ගිය පස්සෙන් යන්න ගියා.. ඇති යාන්තම්.. මට ශර්ලොක් හෝම්ස් පොතේ බැස්කවිල් බල්ලවමයි මතක් වෙන්නෙ.. මුන් දැක්කහම..

" මේ කාලා යමං.. උඹ දවල් බෙහෙත් බිව්වෙ නෑ.."

" දැන් කන්න බෑ අනේ.."

" අනේ පනේ නෙමෙයි.. මූන හෝදන් පහළට වරෙන්. අයියා කියල ගියේ උඹට කාලා නැතුව යන්න දෙන්න එපා කියලා.."

" ආඩ්‍ය අයියා ගිහින්ද.."

@Shan

" මම්.. වරෙන් දැන් ඉතින්.. උඹ අයියගෙ කෑම කන්න ආසයි කිව්ව නිසා ඌ අද වැඩියෙනුත් හැදුවා.."

" අ.. මම එන්නම් මූන හෝදගෙන.."

ඒ ලමයා මූනහෝදගෙන කන්න යන්නෙ..

ඔය ලමයි දැන් වැඩක් බලාගන්න..

දෙයියනේ දෙයියනේ අද රධ්‍ය පුතා ඇදේ නිදාගනීද දමනෙ නෑ..

කෝමහරි ඇදටම නග්ග ගත්ත නේත..

පිස්සු කොල්ලෙහ් අපේ..

රෑට එන්නම් මම ආයෙ..(ජනේලෙ ඇරලා තියන්න😂)

ලව් යූ... ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 17 කොටස

අන්තිමට කොහොමහරි මම රධ්‍ය අයියලගෙ ගෙදරින් කෑමත් කාලා එන්න ලෑස්තිවෙද්දි අයියා කිව්වා මාව ගෙදරින් ඇරලන්නම් කියලා.. ඒ වෙද්දිත් එළියේ හොදටම වැස්ස.. රෑ හතට කිට්ටු කරලා.. යන්න පුලුවන් තත්වෙක තිබ්බෙත් නෑ බයික් එකක වගේනම්.. ඒවුනාට නොගිහින් බෑ අම්මා මම එනකල් බලාගෙන ඇති..

" කාර් එකේ යමු.. මම යතුර හොයන් එන්නම්.."

" ලයිසන් තියෙද.."

" ලයිසන් ඕන්නෑ. උඹට ඕන ගෙදර යන්නනෙ.. කියවන්නැතුව වරෙන්.."

" අනේ මෙ තවුසෙ වාහනේ කොහේහරි ඇනගනීද දන්නෑ මෙ වැස්සෙ ගිහින්.."

" එහෙම වෙන්නෑ වරෙන්.. උඹව පරිස්සමට ඇරලන්නම්.."

" ම්ම්.."

මමයි රධ්‍ය අයියයි එළිය බලාගෙන දොරකොඩ ගාවට වෙලා හිටියේ වැස්ස අඩුවෙනකල්.. සෙනුකයා තලපතා වගේ තාම ඇද බදාගෙන නිදි.. දැන්ම නැගිටින පාටකුත් තිබ්බෙ නැති නිසා මම අයුක අයියට කියලා යන්න ලෑස්ති වුනා..

" අයියගෙ කාමරේ යතුර ඇති මම අරං එන්නම්.."

" අනේ මෙ ශුවර්නෙ.. තවුසෙට ඩ්‍රයිවින් පුලුවන්නෙ.."

" ඔව් බං ඔව කිව්වනේ නහින්නතුව ඉදපන්.."

රධ්‍ය අයියා ගිරිය පලාගෙන කෑගහලා උඩට ගියාමයි මම සාක්කුව අතගාලා බලද්දි තේරුනේ ෆෝන් එක සාක්කුවෙ නෑ කියලා.. මල කෙලියයි තා ඩිංගෙන් ෆෝන් එක මෙහෙ දාලා යන්නෙ..

@Shan

මම ඉක්මනට පඩිපෙළ නැගගෙන උඩට බාගයක් යද්දිම හත්තිලවවෙ ලයිට් ගියා.. බොරු කියන්න ඕන නෑ ඇත්තටම මම පොඩ්ඩක් විතර කරුවලට බයයි.. බයයි කියන්නෙ මේ මැරෙන්න තරම් බය නෑ.. ඒ වුනාට අර මූණ හෝදන්න ඇස් පියාගද්දි හොල්මන් මතක් වෙනවා වගේ මට ලයිට් ගිහින් කළුවර වුනාමත් හොල්මන් කතා මතක් වෙනවා..

සැක් පඩිපෙලේ දැන් ආපු එකේ මම ඉතුරු ටිකත් අතගාගෙන උඩට නැගගෙන ගියා.. අයුක අයියත් මොන මගුලේ ගිහින්ද මන්දා.. රධ්‍ය අයියත් පේන්න නෑ.. ඔව් පේන්න ලයිට් තිබ්බෙ නෑනෙ.. මම බිත්තිය කොනෙන් අතගාගෙන රධ්‍ය අයියගෙ කාමරේට.. සැක් මේ සෙනුකයා ගොරව ගොරව නිදි.. මම ඌව එහාට රෝල් කල්ලා කොට්ටෙ අස්සෙ හිබ්බ ෆෝන් එක අරගෙන ටෝච් එක ගහගන්න යද්දි ඒකෙ බැටරි දහයට ලෝ වෙලා ෆ්ලෑශර් එක දාන්න විදියක් නෑ.. කමක් නෑ දැන් ෆෝන් එක ගත්තනෙ.. මම පේන පේන විදියට දොර ඇරගෙන එලියට ආවා විතරයි මොකෙක් හරි මගේ ඇගේ වැදුනා දඩාස් ගාලා.. වැදුනා කියන්නෙ මාව විසික් වෙලා යන්නම වැදුනා..

මාව විසික් වෙලා වගේ බිත්තියේ වැදුනා විතරයි මට මොකෙක් හරි මගෙ කන ලගින්ම හුස්ම ගන්න සද්දෙ මට ඇනුනා.. ටහිකේ.. හොල්මනක්ද කොහෙද.. රධ්‍ය කාරයගෙ ගෙදර හොල්මන්.. මට කෑගහගන්නත් බැරුව ගොළු වෙලා චූ යන්න වගේ ඉද්දි විනාඩියක්වත් ගියේ නෑ ගෙදර ලයිට් ආවා.. මම ලයිට් ආපු ගමන් කලබලෙන් බිත්තියට හේත්තු වුනත් උඩ තට්ටුවේ මොකෙක්වත් හිටියේ නෑ.. රධ්‍ය අයියගෙ කාමරෙත් වහලා ආධ්‍ය අයියගෙත් කාමරේ වහලා.. සිරාවටම හොල්මන් තමා.. ආයෙ මේ ගෙදරට පය ගහන හොද නෑ.. මම බයටම බිත්තියට වාරු වෙලා එහෙමම බිමට රුටලා ගියා.. අඩෝ මම කලින් හොල්මන් දැකලත් නෑ.. පලවෙනි වතාවට මෙහෙම වුනේ.. මට බෙල්ල ගාවින්ම හුස්ම ගන්න සද්දෙකුත් ආවනේ.. මම බෙල්ල අතගාගෙන ශර්ට් එකේ කරෙන් බෙල්ල පිහිදගත්තා..

" වරද්!!!!! එන්න යන්න.."

ඒ අස්සෙ රධ්‍ය අයියගෙ කටහඩ ඇහෙද්දි මම දඩිබිඩි ගාලා පඩිපෙල බැහැගෙන පහලට දිව්වා..

" මොක්ද ඕයි බයවෙලා වගේ.."

" න්-නෑ නෑ මොකුත් නෑ.. මට ගෙදර යන්නෝන.."

@Shan

" මම.."

ඊටපස්සෙ රධ්‍ය අයියා එක්ක කාර් එකේ මම ගෙදර එන්න ආවා.. වහිනවා වහිනවා.. කොළඹ ලසන වැස්සට කියපු එකා හොයාගෙන යන්න තරම් මට අදරේ හිතිලා ඉන්නෙ.. ඒ අස්සෙ මේ රධ්‍ය කියන වැලි කාවයියා සැරින් සැරේ හිනාවෙනවා ඉවරෙකුත් නෑ.. මුන්ට මදන විසේ.. ඒකයි ඔය..

මුගේ කොල්ලා කවුද දන්නෙ නෑ.. මම නිදගෙන ඉද්දි කතාකර කර ඉදියෙ රධ්‍ය අයියගෙ කොල්ලා ගැන වෙන්න ඇති.. බලන් යද්දි මේකා ඌට පණ ඇරලා ලව්ද කොහෙද.. ඒකත් හොදයි.. දන් කාලෙ එහෙම කොල්ලො නැනෙ.. අනික මෙකා ලස්සනයි හැමදේමත් තියෙනවා.. එහෙව් එකේ වටේ නොයා එකෙක්ට ලව් කරන එකම ඇතිනෙ.. ඒ ලෙවෙල් ඉවරවෙනකල් ඉන්න ඕන කිව්වෙ අපේ වයසෙද දන්නෙ නෑ.. කමක් නෑ අපිටත් ආරංචි වෙයිනෙ.. හිමින් සැරේ සෙනුකයා ලව්වා අයුක අයියගෙන් අහගන්නත් පුලුවන්.. අනේ මට මොකදට උගෙ කැල්ල ගැන හොයලා අහවල් එකක් කරන්නයැ.. අනවශ්‍ය දේවල් වලට සම්බන්ධ වෙන්න හොද නෑ.. විශේශෙන්ම මේ රධ්‍ය කාරයා සම්බන්ධ දේවල් වලට..

මම වාහනෙන් එළිය බලාගෙන කල්පනා කර කර යද්දී මට දැනුනා වාහනේ යන වේගෙ ටිකක් වැඩී වගේ.. හදිසියක් නැනෙ.. වැස්සෙ ඔච්චර හයියෙන් යන්න ඕන නෑ අනික.. මම හිමීට බෙල්ල හරවලා ලයිසන් නැති රධ්‍ය කාරයා දිහා බලද්දී මූ මූණත් රැළි කරගෙන වට පිට බල බල කලබලෙන් හුස්ම ගන්නවා.. ඒ මදිවට වාහනේ ප්ලේ වෙවී තිබ්බ කැමීලගෙ ඩෝන්ට් ගෝ යෙට් සින්දුවත් ඕෆ් කල්ලා දැම්මා.. අපරාදෙනෙ මගෙ ආසම සින්දුව.. මූට මොකක් වෙලාද.. මම ඇයි කියලා අහන්නත් කලින්ම ඌ කතාකලා..

" ඒ මාර වැඩෙ වරද්.. වාහනේ බ්‍රේක් නෑ වගේනෙ.. මොකද කරන්නෙ..!!"

එකපාර හෙනයක් ගහන්න වගේ රධ්‍ය අයියා කියපු කතාවට මට ගොක්කොළත් පෙනුනා.. හත්දෙයියනේ බ්‍රේක් නැහැයි කියන්නෙ.. මම මේ ගොං හෝතඹුවට කිව්වා මේ අටමගලෙ එන්න බෑ කියලා.. අයියෝ මගේ තරුණ කාලෙ.. මැරෙන්න වෙයිද..

" මො-මොකක්.. බ්‍රේක් නෑ.. සිරාවටමද කියන්නෙ.."

@Shan

මම සීට් බෙල්ට් එකත් අතින් අල්ලගෙන සීට් එකටම ඇලවෙද්දි රධ්‍ය අයියා වාහනේ ස්ටියරින් වීල් එක එහාට මෙහාට කපද්දි මම ඇත්තටම බය වුනා.. විහිලු නෙමේ.. මට මැරෙන්න බෑ..

" ජෝක් නෙමෙයි ඔයි.. මේක කාලෙකින් පාවිච්චි කලෙත් නෑ.. මෙ බලනවකො.."

රධිය අයියා මූණත් දෙක කරගෙන කලබලෙන් පල්ලමකින් වාහනේ දැම්මා විතරයි මට ඇඩෙන්න වගේ.. අපරාදෙ කියාන් අයියා එක්ක එන්න තිබ්බෙ.. මම බයවෙලා වගෙ මෙලෝ මගුලක් කරගන්න බැරුව ඇස් දෙකත් එළියට පනින්න තරම් ලොකු කරගෙන රධ්‍ය අයියා දිහා බලන් ඉද්දි මේකාත් වාහනේ හැටට හැටේ අරගෙන යනවා හෙන වේගෙන්.. දන් ඉස්සරහින් වාහනයක් ආවොත්.. මැරෙන්න තමා වෙන්නෙ.. කැලිවත් ඉතුරු වෙන එකක් නෑ..

කිව්වත් වගේම මගේ කටමද මන්දා ඉස්සරහින් වාහනයක් හරවනවා..

" ඕ ෂිට් වරද්.. මූ මොකක්ද මේ පාරමැද්දෙ කරන්නෙ.."

" අයියෙ..??!!"

මම වාහනේ හෙඩ් ලයිටුත් ගහගෙන හුළං කපාගෙන අර වාහනේ පැත්තට යද්දි බෙල්ල ශටර් එක පැත්තට හරවලා ඇස් දෙක තදකල්ලා පියාගත්තා.. මම මැරෙන්න යන්නෙ.. දෙයියනේ මැරෙන්න යන්නෙ.. මම බයටම රධ්‍ය අයියගෙ ශර් එකේ අත තද කල්ලා අල්ලගත්තා විතරයි මෙ හරකා බ්‍රේක් පාරක් ගැහුවා.. සීට් බෙල්ට් දාලා නොතිබ්බනම් වින්ඩ්ස්ක්‍රීන් එකේ වැදිලා මගේ මූන රොටියක් වෙනවා.. මාව ඉස්සරහට විසික් වෙලා යද්දි රධ්‍ය අයියා මගෙ පපුව හරියෙන් අත ඉස්සරහට කල්ලා මාව ඉස්සරහට යන්න ගිය එක නැවැත්තුවා..

තප්පරයක්.. දෙකක්.. තුනක්..

මම තාම රධ්‍ය අයියගෙ ශර්ට් එක තදින් මිරිකගෙන ඇස් දෙකත් පියාගෙන.. ඒ වුනාට හැප්පුනේ නැනෙ.. මම ඇස් ඇරලා බලද්දිම මෙ ගොම කුරුමිනියා මහා හයියෙන් හිනාවෙන්න ගත්තා.. වාහනේ දෙක වෙන්න.. මූ මොකද හිනාවෙන්නෙ.. මූ බොරුද කිව්වෙ.. මට පුදුම කේන්තියක් දැනුනේ.. ඇයි හත්වලාමෙ මූට ආතල්ද.. මට ඒ වෙලාවෙ සිරාවටම බය හිතුනා..

@Shan

මැරෙන්න වගේ පපුව ගැහෙන්නෙ.. මම පපුවට අත තියාගෙන උගෙ අත ගසලා දැම්මා.. ඕන්නෑ මුගෙ වාහනේ යන්න.. මම මෙතනින් බැහැලා බස් එකක ගෙදර යනවා..

" රඩ්‍ය අයියෙ..!!!!!!!!!!!!"

මම කේන්තියෙන් උගේ නම කියලා කතාකලත් ඌ හිනාවෙන එක නතර කලේ නෑ.. මූට මාව ආතල් එකක්ද.. මට ආපු ආවේගෙටම මම වාහනේ දොර ඇරගෙන බහින්න හැදුවෙ.. ඕන්නෑ ආයෙ නම් මූ එක්ක මම එක වචනයක් කතාකරන්නෙ නෑ.. ඌට ආතල් වුනාටමට මේකෙ කිසි ආතල් එකක් පේන්නෙ නෑ..

" ඒ ඒ වරද්.. කොහෙද යන්නෙ.. මෙ ඉන්නවා.."

මම වාහනේ දොර ඇරගෙන බහින්න හැදුවම ඌ මගේ ශර්ට් එකෙන් ඇදලා නවත්තගත්තා..

" අතෑරපන්..!!"

" ඒ මම විහිලුවක් කලේ.. මෙහෙ එනවා පිස්සු නටන්නැතුව.. එලියේ වහිනවා තෙමෙයි.."

" මම කිව්වනේ අත ගනින්..!! උඹෙ වාහනේ මට යන්න ඕන නෑ.. මම ආයෙ එන්නෙත් නෑ.."

මට ආපු කේන්තියටම මම රඩ්‍ය අයියට කෑගැහුවා.. ඌ දන්නෙ නැනෙ මට හිතුනු දේවල්.. කවදාවත්ම මම මිනිස්සුන්ට හිත රිදෙන දේවල් කියනෙ නෑ.. ඉදලා හිටලා ඉවසලා බැරිම තැන මගෙ කටින් එහෙම එකක් පිටවුනත් මම කැමති නෑ මනුස්සයොන්ව නෙමෙයි සතෙක්වත් එහෙම රිද්දන්න.. මොකද මම උවමනාවටත් දන්නවා හිත රිදෙන දෙයක් කිව්වම ඒක කොච්චර මානසික පීඩායක්ද කියලා.. මම කවදාවත්ම මගේ පවුලේ අය මට සලකන විදියට වෙන කෙනෙක්ට සලකලා නෑ.. එහෙම කරන්නෙත් නෑ.. ඒ වුනාට මම රඩ්‍ය අයියට කෑගහද්දි ඌ ගැස්සුනා මම දැක්කා.. ඒ එක්කම මම කෑගහපු එක වැරදියි කියලා මගේ හිතට හිතුනා.. ඒ වුනාට උගේ අතේ වරදක් නැත්තෙ නැනෙ.. ඌ වරදක් කලානෙ..

@Shan

" වරද්.. සොරි.. මම හිතුවෙ නෑ ඔයා ඒක මෙච්චර සීරියස් ගනී කියලා.. මම විහිලුවක් කලේ.. අගේන් රියලි සොරි වරද්.. ඇත්තටම මම-මම-"

රධ්‍ය අයියා මගේ අතක් එයාගෙ අතක තදින් පටලගෙන එකදිගට සමාව ඉල්ලද්දි මම ඇරපු දොර වහලා අත ඇදලා ගන්න ගියත් රධ්‍ය අයියා මගේ අත අතැරියෙ නෑ.. හුගක් තදින් අල්ලගෙන අනිත් අතනුත් අල්ලගත්තා..

" ආයෙ ඔය වගේ බූරු වැඩ කරන්නෙපා.. "

මම අහක බලාගෙන නැති තරහක් මවාගෙන කිව්වා.. ඌටත් පාඩමක් ඉගනගන්න එපැයි.. මම මට මොකුත් වෙනවට බය නෑ.. කොටින්ම මම මැරෙන්න බය නෑ.. එහෙම ලොකු කමට මම හෙන පොර කියලා කියන්න හදනවා නෙමෙයි.. ඒත් මට එහෙම හැමවෙලාවකම අම්මව පේනවා.. අම්මට මම ඇරෙන්න හයියක් නෑ මම ඒක හොදටම දන්නවා.. නෑදෑයො කරයි තමා ඒවුනාට අම්මගෙ ජීවිතේ මම ලොකු පාට් එකක්.. හුගක් වෙලාවට අම්මට තාත්තගෙන් නොලැබුනු ආරක්ශාව අම්මා මගෙන් බලාපොරොත්තු වෙනවා.. ගෙදරට පිරිමියෙක් ඉන්න ඕන කියන්නෙ නිකන් නෙමෙ.. නැතිවුනා කියලා මැරෙන්නෙ නෑ මම ඒක දන්නවා.. ඒත් මම මොන ලෝකෙක හිටියත් මට මගේ අම්මව මතක් වෙනවා.. අම්මට ඉන්නෙ මම විතරයි මම ඉගනගන්න ඕන පරිස්සම් වෙන්න ඕන කියන හැගීමමට පොඩි කාලෙ ඉදලම තිබ්බා.. රධ්‍ය අයියා කලේ විහිලුවක් වෙන්න ඇති ඒක මම මෙච්චර සිරා ගන්න ඕන නෑ ඒවුනාට මම ඕවර් ඇක්ටින් දගලනවා නෙමෙ මම කියන්නෙ මට දැනුනු දේ.. එයාට ඒක තේරෙන්නෙ නැතුව ඇති මට ඒක තේරෙනවා..

" වරද්.. සොරි.."

" අමතක කල්ලා දානවා.. ඒක දැන් ඉවරනෙ.. දැන් යමු මට ගෙදර යන්න පරක්කු වෙනවා.."

මම රධ්‍ය අයියගෙ මූන දිහා බැලුවම මූ ඉන්නවා ඇස් දෙකත් මගෙ මූන දිහාට හරවගෙන හෙන අවුල් මූනක් හදාගෙන.. ඇස් දෙක දිලිසෙනවා මට ලාවට පෙනුනා.. මූ අඩනවද.. වෙන්න බෑනෙ.. අඩන්න මම උගෙ කවුරුත් නෙමේ නෙ..

" ම්ම්.. යමු.."

@Shan

රඨ්‍ය අයියා එකපාරට ගැස්සිලා වගේ අහකට මූන හරවලා උඩ බලාගෙන ඇස් පිය ගැහුවා.. ඊටපස්සෙ මගෙ ඔලුව පිටිපස්සෙන් අත තියලා කොන්ඩෙ පොඩ්ඩක් අවුල් කල්ලා ආයෙම කතාවක් නැතුව ඩ්‍රයිව් කරන් ගෙදරට ගියා.. ගෙදරට යනකල්ම මොකුත් කතාවක් තිබ්බෙ නෑ.. ප්ලේ වෙවී තිබ්බ සින්දුවත් නවත්තලා තිබ්බ නිසා මට මාර ටෙන්ශන් එකක් දැනුනා.. ආයෙම පපුවෙ පැත්තක් හිරිවැටීගෙන මගේ බඩ ඇතුලෙ මොක්කු හරි දඟලනවා වගේ.. මට සැරින් සැරේ පෙනුනේ රඨ්‍ය අයියගෙ කලබල වුනු මූන.. මම මගෙම ශර්ට් එක අතක ගුලි කරගෙන පපුවෙ වැටෙන හිටිය ඉවසගෙන හිටියා.. මෙහෙම වුනු කීවෙනි වතාවද මම දන්නෙ නෑ.. මෙහෙම වෙන්න ඕන නෑ.. මම ඒකට පොඩ්ඩක්වත් කැමති නෑ.. මම හැරිලා ඊඨ්‍ය අයියා දිහා බලද්දී ඒ මූන පැත්තට පේන ඇහීපිහාටු හුගක් දිගයි.. ඒවා එක ලග එක ලග ගැහෙනවා.. ඒ හැම සැරේකමත් මගේ පපුව රිදෙනවා.. රිදෙනවා නෙමෙයි හිරි වැටෙනවා..

' රඨ්‍ය අයියේ හිටපු විදියකටම මගෙන් ඈතට වෙලා ඉන්නවා.. මෙහෙම වෙන්න ඕන නෑ..'

මහ්ක්.. ඕන්නෑ.. ඒකනෙ කියන්නෙ..

වරද් පුතාට බෙහෙත් ගන්න ඉක්කනටම එක්කන් යන්න වෙව් නේත..

පව්නෙ පොඩි එකා.. දුකයි දුකයි දුකායි..

ඉක්මනට එන්නාම් ලමයිනේ.. කියවනවට වගේම වෝට්ස් කමෙන්ට් වලට හුගක්ම ස්තුතියි.. හැමදාම කියනවා වගේ කතාව ලියද්දී ඔයාලගෙ අදහස් දැක්කම මට හුගක් සතුටු හිතෙනවා..

ලව් යූ ඕල්.. ❤

thanks for 1k+ views guys.. really really love you.. muwh.. මෙච්චර පොඩි දවසකින් මම මෙහෙම එකක් බලාපොරොත්තු වුනේ නෑ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

@Shan

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 18 කොටස

මම හිටියේ ඇදේ හාන්සිවෙලා ජනේලෙට පයින් ගහලා ජනේලෙ ඇරගෙන එලිය බලාගෙන.. වැස්ස පායලා තිබ්බ නිසා හිරිකඩ එන්නෙත් නැනෙ.. අලුත් හුළං පාරවල් ජනෙල් උළුවස්සෙන් ඇවිත් මූණෙ වදිද්දී හිතට පුදුම සැනසීමක් දැනුනා..

ගෙදර ඇවිල්ලා කාලා බීලා පාඩම් වැඩත් ඉවරකල්ලා මම ඇදට එද්දි වෙලාව පාන්දර දෙකට කාලයි.. පැය කීයද මං නිදාගන්නෙ.. අද එහෙමත් නිදිමතක් නෑ නිදි මරන්නම හුරු වෙලා දැන් ඉබේම මගේ නින්ද පැය දෙක තුනකට සීමා වෙලා.. අනික දවාලෙත් මම නිදාගත්තනෙ..

මගේ හිත වෙනදට වඩා බර ගතියක් මට දැනුනා.. මම මෙහෙම වෙනදට හිතේ කනස්සල්ලෙන් පැත්තක් බලාගෙන ඔහේ ඉන්න එකෙක් නෙමේ.. හිතට දුක හිතුනු වෙලාවක උනත් සිංදුවක් අහලා ආච්චිඅම්මට කතාකල්ලා හෙන නිදහසේ උන්නු එකෙක්.. ඒ වුනාට අද මට සිංදුවක් වත් අහන්න කිසිම මූඩ් එකක් තිබුනෙ නෑ.. මම හිටියේ හරියටම කෙල්ලගෙන් බූටක් කාපු මල් කොල්ලෙක් වගේ..

මම බිත්තියට කකුලක් ගහගෙන ඉද්දි රධ්‍ය අයියා මාව ගෙදරින්ම ඇරලලා අම්මා එක්කත් කතාකල්ලා ගියපු හැටි මට මැවි මැවි පේනවා.. යද්දිත් රධ්‍ය අයියගෙ මුනේ එහෙමට සතුටක් තිබ්බෙ නෑ.. මමත් ලොකුවට කතාකරන්න ගියේ නෑ යන්නම් කිව්වම හ්ම් කිව්වා විතරයි.. ඒ අර වාහනේ හප්පන්න ගිය නිසා නෙමෙයි.. කොහොමටවත් ඒකනිසා නෙමෙයි.. මගෙ පපුව රිදෙන්න අල්ලන නිසා.. ඒවුනාට එහෙම හැමතිස්සෙම වෙන්නෑනෙ.. ඉදලා හිටලා ඔහොම වෙන්නෙ නිකන් වෙන්න ඇති කියලා මම මගෙම හිතට මෝඩ පහේ බොරුවක් කියාගෙන නින්දට වැටුනා..

ආයෙම හතරෙ එලාම් එකෙන් පස්සෙ හතරයි කාලෙ එකයි හතරයි විස්සෙ එකයි හතරයි විසි පහේ එකයි හතරයි විසිනමයේ එලාම් එකයි වැදිලා අම්මා කාමරේට ඇවිල්ලා ෆෝන් එක පොලොවෙ ගහනවා කිව්වට පස්සෙ මම ඇහැරිලා වෙලාව බැලුවා..

@Shan

මල මගුලයි හතර හමාරයි.. පහයි හතලිස් පහට බස් එක එනවා.. මම එහෙමම ෆෝන් එක ඇදට විසික් කරන්න ගිහිල්ලත් බැලුවෙ උදේ රධ්‍ය අයියගෙන් මැසේජ් එකක් ඇවිල්ලා..

" වැඩිපුර ඇඳුමක් අරගෙන එන්න.. හවස ඇත්ලටික් සිලෙක්ශන් වලට සුගතදාස ස්ටේඩියම් යනවා "

" noted "

මම ඌට රිප්ලයි එකක් දාලා ඉක්මනට බොටමයි ඩෙග් දෙකයි ශර්ට් එකකුයි පොඩි පොකට් ප්'රියුම් ස්පෝර්ට්ස් බෑග් එකට ඔබා ගත්තා..

ඉස්කෝලෙ යන්න එළියට බහිද්දී ගේට්ටුව ගාව ඉඳපු කමනි ඇන්ටි නයිටියකට උඩින් බ්ලවුස් එකකුත් ඇඳගෙන මම යන දිහා හැරි හැරි බල බල ඒ ගෑණිගෙ එහාපැත්තෙ ඉන්න මිනිහෙක්ට මොනවද කියනව මම ඇහැ කොනෙන් දැක්කත් මම මොකුත් නොදැක්ක ගානට කරබාගෙන හෝල්ට් එකට ගියා.. ඔය ගෑනි ඔහොම්මමයි.. මාව දැක්කොත් ඇහේ කටු අනිනවා වගේ.. හොඳ වෙලාවට අපෙ අම්මා ගෙදරින් එළියට බහින්නෙ නැත්තෙ..

මම ඉස්කෝලෙට එද්දි වෙලාව උදේ හයහමාරයි.. ස්කූල් බස් එකේ ඩ්‍රයිවර් අයියත් මොන මගුලකට උදේම එනවද මන්දා බයෝ එකටම හිටියෙ මමයි තව දෙතුන්දෙනෙකුයි විතරයි.. කොහොමත් හතට කාලක් තියෙද්දි වෙනකොට තමා සෙනුකයත් එන්නෙ.. මම බෑග් එක ක්ලාස් එකෙන් තියලා සෙක්ශන් එකේ පඩිපෙළෙන් පහලට බැහැලා ඉස්කෝලෙ හදලා තිබ්බ පොකුණ ගාවට ගියා.. ඒකෙ උදේට මාලු පිරිලා කටවල් උඩට හරෝගෙන ඉන්නවා.. තව ඉබ්බෙකුත් ඉන්නවා තඩිම තඩි.. ඌ උගෙ ආතල් එකේ පාඩුවේ කාලා බීලා පීනගෙන ඉන්නවා.. මමත් ඒ ඉබ්බා වගේ.. ලව් පලහිලව් මොකුත් නෑ කාලා බීලා දැහැමෙන් සෙමෙන් ජීවත් වෙන අහිංසක ජීවියෙක්..

මම එහෙමම ඒ ළග තිබ්බ ඇඹරැල්ලා ගහෙන් දල්ලක් කඩාගෙන වඳුරු පැටියා වගේ ඒක කකා බුදුමැදුර පිටිපස්සට ගියා.. ඊයෙ වැස්සා කියලා නෑ සේපාලිකා ගහේ මල් පිපිලා තැඹිලි පාට නටු උඩ අතට හැරෙන්න බිම පුරාම විසිරිලා.. මාරම සුවදයි.. සුවද වැඩි නිසා ඉන්න ටිකක් අමාරුයි..

@Shan

මම එතනම තිබ්බ තාප්පෙට කකුලක් නමාගෙන තියාගෙන බුදුමැදුරේ පිටිපස්ස දිහා බලාගෙන ඇබරල්ලා දල්ලත් හප හපා කල්පනා කලේ ඊයේ අර කිරි ඉබ්බා කරපු ගොබ්බ වැඩෙ ගැන.. සිරාවටම බ්‍රේක් නැතිවෙලා මැරුනනම් එහෙම.. මමත් මැරෙන්නම සෙට් වෙන තැන හැමතිස්සෙම රධ්‍ය කාරයා ඉන්නවා.. මොන කරුමයක්ද මන්දා.. දැන් මට පේනවා පේනවා වගේ අදත් මේ හොට කැත පොල් කාවයියා ඔඩිටෝරියම් එකේ ඉඳන් මගේ දිහා බලන් ඉන්නවා.. මම හිතේ මැවෙන දේවල් ගනන් නොගෙන අන්තිම ඇඹරල්ලා දල්ලත් හපාගෙන හපාගෙන ගියා.. ඒක රසයි ආයෙ යද්දි එකක් කඩාගන්න ඕන..

මම ඔහොම හිත හිත ලග තිබ්බ සේපාලිකා අත්තෙන් ඇද්ද විතරයි මාව නැව්ලා ගියා.. සැක් ඊයෙ වැස්සනෙ.. අතු වල තිබ්බ සේරම වතුර ඇගේ.. මටත් අත පය තියාගෙන ඉන්න බැනෙ..

මම ලේන්සුවක් ගන්න සාක්කුව අතගාද්දි සාක්කුවෙ හිලක්.. ඒ කිව්වෙ ඒකෙ මොකුත් නෑ.. ඇත්ත වශයෙන්ම මගේ සාක්කුවට අත දැම්මොත් දෙයියනේ කියලා අන්ඩවෙයාර් එක අතට අල්ලගන්න පුලුවන්.. මොකද මේ කලිසමේ වම් සාක්කුවෙ මම අත දාලා දාලා හිලක් හැදිලා තියෙන්නෙ.. මම ශේප් එකේ සාක්කුවෙන් අත අරගෙන ඇගේ තිබ්බ වතුර ගසාගත්තා..

ඒ එක්කම මම දැක්කෙ අත් දෙකත් පිටිපස්සට බැදගෙන අමුතු ලීලාවකින් ප්‍රියුම් ලෝකයක් නාගෙන මගේ පැත්තට එන රධ්‍ය කියන පලගැටියව..මෙකා ඇත එද්දිම කියන්න පුලුවන් ජීවන සුවද දසතේ හමාගෙන යනවා.. මම ඌව දැකලත් නොදැක්කා වගේ අහක බලාගත්තා.. යකෝ මූට කොල්ලෙක් ඉන්නවනම් පලකො ඒකව බලාගන්න.. මොන මගුලකට මගේ වටේ කැරකෙනවද..

" වරද්.. මෙහෙ එන්න.."

" මට බෑ.."

මම එළුවා වගේ බෑ කිව්ව නිසා රධ්‍ය කාරයා හෙන ඩ්‍රැමටික් විදියට ඇස් දෙකත් කරකලා මගේ පැත්තට ඇවිදගෙන ආවා.. ඇයි දන්නෑ හොඳින් කතාකරන්නෙ..

" වරද්.. මම ඊයෙ-"

@Shan

ආයෙත් පටන්ගත්තා ඊයෙ සිද්දියක් ගැන කියන්න.. අනේ පුතේ.. ඒක වෙලා ඉවරයි.. දැන් ඒක වෙලා ඉවර නිසා ආයෙ කතාකරන්න එපා.. වැඩක් නැනෙ..

" ඒක අල්ලලා දාන්න අප්පා.. "

" මොකක්ද අල්ලලා දාන්න කිව්වෙ.."

" ඊයෙ සිද්දිය ඉතින් වෙන මොකක්ද.."

" උඹ මට කියන්නෙ හවුස් ඩෙකරේශන්ස් ටික අල්ලලා දාන්න කියලද.. උඹ මොකක්ද හිතුවේ.."

" ඈ.."

" මම කියන්න ගියේ ඊයෙ උඹ තෝරපු ඩෙකරේශන්ස් වලට උවමනා බඩු ගන්න ලබන සතියේ එළියට යන්න ඕන කියලා.. ෆ්‍රී දවසක් කියපන්.."

" අහ්-හහ-හා මම කියන්නම්.."

සැක්ම සැක්ම සැක් වාටර් වුනාද මන්දා.. මම ගොං හිනාවක් දාලා හිමීට මාරුවෙන්න හැදුවෙ.. ඒවුනාට.. ඒවුනාට.. අපි මෙහෙම අසමගියෙන් හැමදාම ඉන්න ඕන නැනෙ මං අහන්නෙ.. කියාන් අයියායි අයුක අයියයි සයෝන් අයියයි මාත් එක්ක හෙන ෆිට් එකේ ඉන්නවනම් මට ඇයි බැරි මේ මොට්ට කලුකුමා එක්ක සමගියෙන් ඉන්න.. මම පටාර් ගාලා මොළේට ආපු අයිඩියා එකට අඩිය ආපහු රඩ්‍ය කාරයා පැත්තටම හරෝලා තිබ්බා..

" මෙ අයියෙ.."

මම උෟට 'අයියෙ' කිව්ව එක අවුල්ද මන්දා මූ මා දිහා බැලුවෙ නිකන් අංගොඩින් පැනලා ආපු පිස්සෙක් ගානට.. ඇයි අනේ සහෝදර බැඳීමක්නෙ මේ ෂනෙරු පුතා ආ සොරි සොරි වරද් පුතා ගොඩනගාගන්න වැයම් දරන්නෙ..

" මොකද.."

" මෙ අහනෝකො අයියෙ.. සිරාවට අපිට බැරිද යාලුවෝ වෙන්න.. හරි යාලුවො ඕන්නෑ රණ්ඩු නොවෙන අඳුරන අය වෙන්න බැරිද.."

@Shan

" ඒ මොකටද.."

" ඇයි අනේ මෙහෙ එන්නකො.."

මම ඌ මට වැඩිය උස නිසා පොඩ්ඩක් ඇගිලි වලින් ඉස්සිලා කර වටේ අතක් දමාගත්තා.. මූ නම් මොකෙක්ද මන්දා.. හරිනම් මගෙත් කර වටේ අතක් දමාගන්න එපැයි.. මම බලෙන්ම උගෙ අත අරගෙන මගෙ කර වටේ දමාගත්තා.. දැන් හරි.. රධ්‍ය අයියා එක අතකින් පපුව අල්ලගෙන දෙපාරක් තුන්පාරක්විතර කැස්සා.. ඊයෙ වැස්ස නිසා හෙම්බිරිසාව වෙන්න ඇති.. සමහන් එකක්වත් බොන්න කියන්න ඕන..

" මෙ අයියෙ.. සිරාවටම අයියා කැමති අයියගෙ ක්‍රශ් එක ඉන්නෙ අපේ වයසෙ නේද.. මට යාලුහිටි එකට කියන්නකො.. මම මේ ඔයාට උදව් කරන්න යන්නෙ.."

මම කියද්දී ආයෙම රධ්‍ය කාරයා ඇස් දෙකත් ලොකු කරගෙන මගේ දිහා හැරිලා බැලුවා..

" මොකක්.. උඹ කොහොමද දන්නෙ.."

" ඒක වැඩක් නැනෙ අයියෙ.. සිරාවට කියන්නෙ.. දැන් උඹට සෙට් කල්ලා එපාද.."

" එපා.."

සැක් මේ ගල් සෙවලයනම්.. මොකෙක්ද මන්දා..

" ඔහොම හිතේ තියාගෙන බෑ අයියෙ මේක කරන්න.. මුලින්ම ඔයා පුරුශ ශක්තිය මෙතෙන්ට ගන්නෝන.."

මම උගෙ පපුවට තට්ටුවක් දාලා කිව්වා.. මූ වෙවුලනවද මන්දා.. හීනියට දාඩියත් දාලා ඒ ටිකට..

" අරගෙන??"

" අරගෙන කෙලින්ම ගිහින් උගෙන් අහන්න ඕන,

@Shan

මම රධ්‍ය අයියගෙ කර අතෑරලා ඉස්සරහට ගිහින් බිම වැටිලා තිබ්බ සේපාලිකා මලක් අතට ඇරගෙන අත් දෙකෙන්ම ඒකෙ නැට්ට අල්ලගෙන රධ්‍ය අයියා දිහාට දික් කලා.. රධ්‍ය අයියා මම දිහා පුදුමෙන් ඇස් දෙකත් ලොකු කරගෙන බලාගෙන ඉන්නවා..

"My feelings for

**you**

are a miracle.. Not like walking on water, but pretty darn close.."

" හහ්???"

" or I LOVE YOU"

මම සේපාලිකා මල අත් දෙකින්ම අල්ලගෙන රධ්‍ය අයියගෙ මූන දිහා බලාගෙන එයාට ඒක දික් කරද්දි රධ්‍ය අයියා බලාගෙන හිටියේ බයවෙලා වගේ.. බය වෙන්න දෙයක් කිව්වෙ නෑනෙ.. මම කිව්වේ එයාගෙ කොල්ලට හිතේ තියෙන දේ කෙලින්ම කියලා දාන්න හොදම විදිය.. හැමදාම ඕවා හිතේ තියාගෙන ඉදලා බෑනෙ.. කියන්නත් එපැයි.. රධ්‍ය අයියා දහපාරක් විතර මම දිහායි මගෙ මූණ දිහායි බැලුවා.. ඒකගෙ ඇස් දිලිසෙනවා.. ඔහොම පෙනුමක් මම රධ්‍ය අයියගෙ මූනෙන් දැකලා තියෙන්නෙ දවස් දෙකතුනයි.. එකක් ඊයෙ.. අනික අර එදා මම කෑම කවද්දි.. ආයෙම මාව බයික් එකේ ගෙදර ඇරලුව දවසේ.. මම අතේ තියාගෙන ඉදපු මල ගන්න කියලා ඇස් වලින් කියද්දී මේකා හීනෙන් වගේ මගේ අත තියෙපු මල අරගත්තා.. මගේ ඇගිලිතුඩු එයාගෙ ඇගිලිතුඩු එකට ගෑවෙන විදියට..

" ඔන්න ඔහොම.. කිව්වනම් හරි.. දැක්කනෙ ටේක් ඉට් ඊසි .."

මම උගේ උරහිසට පාරක් ගහද්දී ඌ හීනෙන් නැගිටලා වගේ උගුර පාදලා අහකබලාගත්තා.. ලැජ්ජ හිතිලද දන්නෑ.. ඔහොම බෑනෙ අන්තිමට කියන්නැතුව ඉදලා මුගේ මල අන්සතු වුනොත් එහෙම.. මොන අපරාධයක්ද..

" මම්ම.. "

@Shan

රඩ්‍ය අයියා මම එයාගෙ අතින් තියපු මල මිට මොලවලා පොඩි කරගෙනම මාව පහුකරගෙන ගියේ හරි වේගෙන්.. මම වැරදි දෙයක්වත් කිව්වද.. ඇයි එයාට කේන්ති යන්නෙ.. මම මොකුත් වැරදි දෙයක් කිව්වෙ නැනෙ.. මම පපුවේ පැත්තකට අත මිට මොළවලා ගහගෙන ක්ලාස් එකට යන්න ගියා.. අනේ මන්දා රඩ්‍ය අයියා හෙන අමුතුයි.. මට මූව තේරෙන්නෙ නෑ..

වරද් කොලුවට මොලයක් දෙන්න ඉක්මනට පිස්..

ලොකු උදව්වක්..

මම කතාව ලිය ලියා ඉද්දි සිරාවටම ඊයෙ හෙන ගගහා වැස්සා..( මම කතාවට ලියන්නෙ ඇමත.. දැම්කනෙ ලේසි නෑ වැහි දෙයියොත් කෝප වෙලා ඉන්නෙ මෙ වරද්ගෙ ගොංකම නිසා)

ඒකනිසා ලියන එක පැත්තකින් තියලා පාඩම් වැඩ වගයක් ඉවරකලා..

පුලුවන් වුනොත් අර සැට එන්නම් දුම් කවුලුවෙන් සැන්ටා වගේ කතාවත් ඇරගෙන..

ලව් යූ..❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 19 කොටස

"..ඔය නෙතු හමුවන තුරු පාර දිහා

බලමින් තව වෙහෙසයි දෑසට මා

කිමදෝ පමා වූ ඒ කාරණා.."

" ඒ කියාන් අයියෙ.."

"..මගෙ සතුටකදී නුඹ පාන සිනා

ඔබ ලඟ රැඳුනේ ඔය ස්නේහෙට මා

සිතුවිලි මැද කිමිද මා භාවනා.."

" ඕයි අයියෙ.."

මමයි කියාන් අයියයි සෙනුකයයි රධ්‍ය අයියයි හිටියේ සුගතදාස ස්ටේඩියම් එකෙන් එළියට ඇවිල්ලා කැන්ඩොස් චොක්ලට් ශොප් එක ලඟින් දෙපැත්තට බෙදෙන පාරෙන් පාර පැනලා එකසිය හැත්ත හය බස් පාරට යන පාරෙ දිගට යන ගමන්.. කිලෝමීටරයක් විතර බස් එක ගන්න මේ පාරේ යන්න ඕන දිගටම.. ඒ මදිවට හවස් වෙලා නිසා ඒ පැත්තෙ එක එක නානාප්‍රකාර මිනිස්සු එළියට ඇවිත් පාර දෙපැත්තෙ සිගරට් බොනවා.. කියෝ කියෝ ඉන්නවා.. අපි හතරදෙනා ඒ සේරම පහු කරගෙන යන ගමන් හිටියේ.. රධ්‍ය අයියා සිගරට් ගඳට ආස නැද්ද මන්දා ලේන්සුවක් නහයට තියාගෙන පාර අයිනටම වෙලා ඔලුවත් පොඩ්ඩක් බිමට හරෝගෙන මෙලෝ සද්දයක් නොකර පාඩුවේ යද්දි අර කියාන් අයියා සරිගම කකා සින්දුවක් කිය කිය යනවා..

උන් දෙන්නට පිටිපස්සෙන් මම සෙනුකයවත් එල්ලගෙන ගියා.. සෙනුකයා කැන්ඩොස් එකෙන් තඩි චොක්ලට් බාර් එකක් අරගෙන ඒක ගිලින ගමන් මාත් එක්ක පච හල හල ආවෙ.. ඒ වුනාට මේ තඩි කියාන් අයියා සින්දු කියන එක මට ඇත්තටම අහන් ඉන්න බෑ.. ඇමීබා අතීසාරය හැදිච්ච ගොනෙක් තප්පුලනවා වගේ.. ඒ අතින් බලද්දි රධ්‍ය අයියා සිරාම පොශ්

@Shan

පොරක්.. ඩයල් එක අද මාත් එක්ක වලි දාගත්තෙත් නෑ සයිඩ් ගහලා පාඩුවේ වැඩක් බලාගෙන ඉදියේ..

මම සරිගම කන කියාන් අයියට කතාකලාම ඒකා හැරිලා පිටිපස්ස බැලුවා..

" මොකෝ මල්ලේ.. ඒ සෙනුකයා මෙහෙට දීපන් ඕක.. තෝ කනවා කනවා ඉවරයක් නෑ.."

පිටිපස්ස හැරිලා මට කතාකරන ගමන් කියාන් අයියා සෙනුකයා කකා හිටිය චොක්ලට් බාර් එක උදුරලා ගත්තා.. සෙනුකයා ඒ ගමන් මූන බෙරි කරගත්තා..

" මෙ කියාන් අයියෙ සිරාවට කියන්නෙ අපි රධ්‍ය අයියට අර කොල්ලව සෙට් කරමුකො හලෝ.."

" කොයි..??"

කියාන් අයියා බයවෙලා වගේ මගේ දිහා බලලා රධ්‍ය අයියා දිහා බලද්දි රධ්‍ය අයියා මෙලෝ ප්‍රතිචාරයක් නැතුව යන ගමනින්ම යනවා.. ඔව් ඉතින් මූ හිටි පිළිමෙ වගේ මෙහෙම මෙලෝ හැඟීම් ප්‍රකාශනයක් නැතුව ඉද්දි කොල්ලො සෙට් වේවියැ.. මූට කොල්ලො සෙට් කරන්න යන අපිට ගහන්න ඕන මඩු වලිගෙකින්...

" ඇයි අනේ රධ්‍ය අයියගෙ ක්‍රශ් එක.."

" ක්‍රශ් එක ඉතින් වෙන කවුරුත් යැ බං.. උ-මම කිව්වෙ ඕ ඉතින් ඌට මොලේ නැනෙ.."

මම සෙනුකයව දාලා උන් දෙන්නා මැද්දට දුවලා ගිහින් රධ්‍ය කාරයගෙයි කියාන් අයියගෙයි කරට අත් දෙක දාගත්තා.. සැක් මුන් දෙන්නා උසයි මහසෝන්නු වගේ.. කියාන් අයියා පොඩ්ඩක් මගේ ගානට පහත් වුනා..

" සිරාවටම මොලේ නැද්ද හලෝ.."

" මොලේ නෑ කියන්නෙ බං.. කතාකල්ලා වැඩක් නෑ.. මූ ඒකට කැමති මූ නමය වසරෙ ඉදන්.. ඌ දවසක් ක්ලාස් එක මැද්දෙ ඩෙස්ක් එකක් උඩට

@Shan

නැගලා සිංදු කිය කිය ඉඳලා ඒක වයිස් පිනාට අහු වෙලා ඌව ඔෆිස් එක ඉස්සරහා දණ ගස්සලා තියද්දි තමා මූ ඒකව දැකලා තියෙන්නෙ.."

" සිරාවට.. ඔහොම එකක් මටත් වුනා දවසක්.. සැක් ලැජ්ජයි මතක් වෙද්දිත්.. ඉතින් ඉතින්.."

" ඉතින් කියන්නෙ මූ කැමති එකා අමු හරකා.. දැන් නිකන් හිතපන් මූ ගිහින් ඌට හිතේ තියෙන දේ කිව්වොත් ඌ ඒකත් ආතල් එකට ගන්නවා.. එහෙම එකෙක්ට කියලා වැඩක් නැනෙ බං.. පව් අපේ එකා.."

" ඒකනෙ අප්පා.. අපි ඌව මරනවා කියලා බය කල්ලා අයියට සෙට් කල්ලා දෙමු.."

" එහෙම බෑ බං.. ඕවා ප්‍රායෝගික නෑ.."

" ඒ වුනාට රඨ්‍ය අයියගෙ වරදක් නැනෙ අනෙ.. ඌ නම් අයියා කිව්වා වගේ සිරාම මොලේ නැති එකෙක්.."

" ම්ම්.. "

" රඨ්‍ය අයියෙ ඕකව අතෑරලා දාන්න අප්පා.. අහසෙ තියෙන්නෙ එක තරුව යැ.."

මම රඨ්‍ය අයියට කියද්දි ඌ මගේ අත උගෙ කරෙන් අයින් කල්ලා සෙනුකයගෙ ලගට ගියා.. මේ මොන මගුලක්ද.. මම කේන්ති ගන්න දෙයක් කිව්වයැ..

" අහසෙ තියෙන්නෙ තරුද මොනවද මම දන්නෙ නෑ.. ඒ වුනාට මුගෙත් ලොකුකමනෙ මල්ලි.. උඹම කියපන් තනි අතින් අප්පුඩි ගහන්න බෑනෙ.."

" ඒකනෙ.. මේ රඨ්‍ය අයියා මහ මෝඩයෙක්.."

මම පිටිපස්සට හැරිලා රඨ්‍ය හැලපයට රැව්වා.. ඇත්තනෙ ලොකු කම පැත්තකට දාලා කියන්න එපැයි..

" ඒකනෙමේ ෂනෙරුවා.. උඹ මට කැමති නැද්ද.. අපි ප්‍රේම සම්බන්ධයක් පටන් ගමු.."

@Shan

කියාන් අයියා දබරැගිලි දෙකත් එකට හප්ප හපා මගෙ දිහා බලාගෙන අහද්දි මාව වෙවුලලා ගියා.. සැක් මේකා එක්ක සම්බන්ධ ඇති කරගන්න.. මේ මම??

" රධ්‍ය අයියේ.."

මම සෙනුකයව කියාන් අයියා දිහාට විසික් කල්ලා පිටිපස්සෙන් ගිය රධ්‍ය අයියා ලගට ගියා.. මට මේ මස් පිරුනු රගර් ගහන සූකර පැටියව උපන්තේකට එපා..

" ඇයි උඹ රධ්‍යට කියන්නෙ.. ඌ උඹෙ මිනිහයැ.. ඌට කියන්න.."

" කමක් නෑ.. දැන් ඉදන් රධ්‍ය අයියා තමා මිනිහා.. ලැජ්ජ නැද්ද අයිසෙ මිනිස්සු ඉන්න උන් දිහා බලන්න.. ඉස්සරහා බලාගෙන යනවා.."

මම රධ්‍ය අයියගෙ වැලමිට ගාවින් අතකුත් දාගෙන කියාන් අයියට රැවවහම ඌ සෙනුකයගෙ උරහිසට ගහලා අමුතු හිනාවක් දාගෙන ඉස්සරහා හැරුනා.. ඉදකින්.. හැලපයා..

" ආ හරි හරි.. මේ රධ්‍ය එතකොට උඹෙ අර ක්‍රශ් එක නෑ නෙ.. දැන් වරද්නෙ කැල්ල.."

" එයාගෙන් අහන්නෙ මොකටද.. මමනෙ ඔයාගෙ කැල්ල ඒයි.. නෙහ්.."

මම රධ්‍ය අයියට වැලමිටින් ඇනලා හෙන ගෑණු පාට් එකක් දැම්මහම රධ්‍ය අයියා මාව පාර පැත්තෙන් එහා පැත්තට මාරු කල්ලා පාඩුවේ ඇවිදන් ගියා.. කෝ ඉතින් බැනෙ කරන්න.. මේ මිනිහා කතාකරන්නැනෙ..

" කියපන්කො අයියෙ.. මමනෙ කැල්ල.. "

" ම්ම්.."

" අර දැක්කනෙ.. පාඩුවෙ පලයන් දැන්.."

කියව කියව අපි බස් හෝල්ට් එකටම ඇවිදන් ඇවිත් තිබ්බා.. හැන්දෑව නිසා හෙනට සෙනග එහා මෙහා යනවා.. අපි හතරදෙනා කලර් ලයිට් එක ගාව තිබ්බ බටන් එක ප්‍රෙස් කල්ලා ටිකක් වෙලා හිටගෙන ඉදියා පාර මාරු වෙන්න.. පාර මාරු වෙද්දි රධ්‍ය අයියා වැඩි ගානක් නැතුව මාගේ අතින්

@Shan

අල්ලගෙන පාර පැනලා එහාපැත්තට ගියාම අතින් අතෑරියා.. මට ඒවා එච්චර ගානක් නෑ වගේ පිටින් පෙන්නුවට හිත ඇතුලින් අමුතු සතුටක් දැනුනා.. රධ්‍ය අයියා හැම පොඩි දෙයක් ගැනම පරිස්සම් වෙන විදියට මට ආස හිතුනා.. අනේ මන්දා මොකද කියන්න.. රධ්‍ය අයියා කැමති කියන කොල්ලා ගැන මට ඉරිසියාවක් දැනුනා.. මම දන්නෙ නෑ මෙහෙම වෙන්නෙ ඇයිද කියලා.. මම ඒකගැන හාර අවුස්ස අවුස්ස ඇහුවත් කාගෙ හරි කටින් ඒ ලමයා ගැන හිතද්දි මම මූනට ගන්න හිනාව හරිම ව්‍යාජ එකක් වගේ මට දැනුනේ.. මට අපහසුවක් දැනුනා..

" ඒ බං මේකෙ යමුද.. ඊළග එකේ යමුද.."

" මේකෙ යමු බං.. රෑවෙන්නත් එනවා.."

කරගම්පිටිය හෙට්ටියාවත්ත බස් එකක් එද්දි කියාන් අයියා ඇහුවේ රධ්‍ය අයියගෙන්.. මේ වෙලාවේ කොයි බස් එකේ ගියත් සෙනග පිරිලා ඉතිරිලා ඉන්නවා.. අනික අපි හතරදෙනාම රාජගිරියට යන්න එපැයි.. එතන ඉදන් වෙන වෙනම බස් වල ගියාට..

" සැක් සෙනග බලහන්කො.."

අපි හතරදෙනාම අතින් කටින් ස්පෝර්ට්ස් බෑගුයි ස්කූල් බෑගුයි එල්ලගෙන බස් එකට නැග්ග කොට බස් එකේ හිටගන්නවත් ඉඩක් නෑ.. දෙපැත්තෙම කටිය පිරිලා.. ඒ මදිවට බෑගුත් බරයි අම්බානෙකට.. කර කැඩෙන්න එනවා.. ඒ එක්කම බස් එකේ කන්ඩක්ටර් අයියා බුලත් විටකුත් කාගෙන අපි ගාවින් මරලතෝනි තියන්න ගත්තා..

" ඔය මල්ලිලා.. මැද පොල්ල අල්ලගෙන ඉස්සරහට යන්න.. ඔය ඉස්සරහ ඉඩ තියනවනේ.. ආ නගින්න නගින්න.. මල්ලි බෑග් උඩට දාන්න.. ආ නගින්න නගින්න නගින්න.."

මුගෙ ආච්චිට.. පරයා කන ගාව ඉදන් කෑගන්නෙ.. පොඩ්ඩක් ඉදපන් ඉතින් නැග්ගා විතරනෙ.. මැද පොල්ල මම කියන්නෑ පකයට.. මම කේන්තියෙන් බෑග් එක රැක් එකකට දාලා සෙනුකයා එක්ක අරුගෙ මැද පොල්ල අල්ලගෙන හිටගත්තා..

" අඩෙ සෙනග බලපන්කො බං.. බැහැගන්න පුලුවන් වෙයිද.."

@Shan

සෙනුකයගෙ අත ඇදිලා බාර් එක අල්ලගන්න කම්මැලි නිසා මගෙ කලිසමෙන් අල්ලගත්තා..

අපි ඉස්සරහට ගිහින් ටිකකින් රධ්‍ය අයියයි කියාන් අයියයිත් එතනට ආවා.. දැන් සෙනුකයයි මමයි රධ්‍ය අයියයි කියාන් අයියයි පෝලිමට මොක්කුද වගේ හිටගෙන.. ඒ අස්සෙ දානවා දාඩියක්.. හුස්ම ගන්නත් බෑ.. මාරම අමාරුයි.. බස් කාරයා යන්නෙත් හුටු හුටු ගගා හෙමින් හෙමින්.. ඒ වෙගෙට ගෙවල්වල ඉන්න උන්ට ඇදගෙන පාරට එන්නත් වෙලා.. සිරිලංකාවෙ ගමනාගමන සේවය ගැන කවි ගී ලියවෙන්න ගන්නෙ ඔය වෙලාවට තමා.. මෙහෙම ගිහින් කීයට ගෙදර යන්න වෙයිද දන්නෙ නෑ..

" අයුක අයියට මක් වෙලාද.."

මම සෙනුකයගෙන් ඇහුවා..

" එයාට මොකක්ද එක්සිබිශන් එකකට යන්න තියනවා කිව්වා බං.."

" අම්මෝ නේද ඉතින්.."

" අනේ පලයන්.. මෙ ඒකනෙමෙ උඹ සිරාවටමද කිව්වෙ රධ්‍ය අයියට කැමතී කියලා??"

" ආ..?"

" මට පේන්නෙ පෙම් කැකුලක් පීදීගෙන එනවා වගේ.. ම්ම..ම්ම.."

සෙනුකයා මනමාල මූණකුත් හදාගෙන ඇස් කරක කරක කියද්දී මම හැරිලා රධ්‍ය අයියා දිහා බැලුවා.. ඒකාට දාඩිය දාලා දිලිසෙනවා සුදුපාටට.. මම බලද්දි කියාන් අයියා එක්ක මොනවද හිනාවෙවී කියවනවා..

" පිස්සුද පගො.. කෑගහන්න එපා.."

" ඒවුනාට උඹ ලාවට කැමතිනෙ.."

" සෙනුකයා.. කටවහන් පලයන්කො.. සැක් මෙ අයුක අයියා අද ආවෙ නැනෙ.."

@Shan

" ආ උඹ නෑ කියන්නැතුව කතාව මගාරින්නෙ මොකක් හරි තියෙන නිසා නේද.. ඈ කියපන් ෂනෙරුවා.. ඔව් නේ.."

" ඕන මගුලක් හිතාගනින්.. රෙද්ද.."

මම ළඟටත් රවලා ඉස්සරහ බලාගෙන හිටියා.. ඇත්තට මම මූට කැමති වෙගෙන එනවද මන්දා.. ඒ වුනාට මේකා කැමති එකෙක් ඉන්නවනෙ.. මම මේ මොනවද දෙයියනේ හිතන්නෙ.. මම රධ්‍ය අයියගෙ දිග ඇස් පිහාටු පියවෙන ඇරෙන දිහා බලාගෙන හිටියා..

රධ්‍ය අයියට තිබුනේ තද කළුපාට ඇස්.. මගේ වගේ ලා දුඹුරුපාට ඒවා නෙමෙයි.. ඒ ඇස් වල ඇහිපිල්ලම් ගහන දිහා මම සමහර වෙලාවට බලාගෙන ඉදලා තියෙනවා.. මට හිතෙන්නෙ ඒ දිහා මට තව තව බලාගෙන ඉන්න ඇත්නම් කියලා.. එක ලග ගැවෙන්න ඕන්න මෙන්න තියන ඇහිබැමට යටින් තියන ඒ ඇස් ඉදලා හිටලා හරි එකවතාවක් මං දිහා හැගීම් කෝටියක් විතර පුරෝගෙන බලන විදිය මතක් වුනාම මගේ පපුවෙ පැත්තක් හිරිවැටීගෙන ගිහින් බඩ ඇතුලෙන් මොකක්ද වෙනවා වෙනවා වගේ මට දැනෙනවා..

මම එකදිගට එයාගෙ ඇහිපිල්ලම් ගැහෙන වාරයක් ගානේ ඒ ඇස් දිහාම බලාගෙන හිටියා.. මම පිස්සෙක් වගේ වෙන්න ඇති ඒ වුනාට ඒ වෙලාවෙ මට මගේ ඇස් අහකට ගන්න හිතුනෙම නෑ.. මම උගුඩු පැටියෙක් වගේ ඇස් දෙක ලොකු කරගෙන රධ්‍ය අයියා දිහා බලාගෙන ඉද්දි රධ්‍ය අයියා සැරයක් මගේ දිහා හැරිලා බැලුවා.. මට එවෙලෙ ඇස් අහකට අරගෙන මම එයා දිහා බලන් හිටියේ නෑ වගේ ප්‍රිටෙන්ඩ් වෙන්න ඕන වුනත් මම එහෙම කරන්නෙ නැතුව දිගටම බලාගෙන ඉදියා..

රධ්‍ය අයියා ඇහිබැම ගස්සලා වගේ ඇයි කියලා මගෙන් අහද්දි මම ලාවට හිනාවුනා.. හිනාවෙලා ඉස්සරහ බලාගත්තා.. ඒ වුනාට මට ඇස් කොනෙන් පේනවා රධ්‍ය අයියත් කට කොනෙන් ලාවට හිනාවෙනවා කියලා.. මාව එයාගෙ උරහිස් වල වැදෙනවා.. එයාගෙ බෙල්ල ගාවින් එන ප'ෆියුම් සුවද මට හොදට දැනෙනවා.. මේ හැම එක පුංචි ඩීටේල් එකක්ම මට හිතට මහ කෝල හැගීමක් ගෙනාවා..

මම මෙහෙම හිතලා නෑ කවදාවත්ම.. මෙහෙම හිතිලත් නෑ.. දැනිලත් නෑ.. මම තොලකුත් හපාගෙන කල්පනා කලේ අද මට මොන මගුලක් වෙලාද කියලා..

@Shan

ම්ම්ම්.. වස්සානේ එම්ලී ආ.. මමමද ඒ පෙමහොරා..😂 ❤

මෙතැන් සිට පටන් ගම්නෙ මල් පිපෙන සමයයි..

(පසුව එලැබෙන්නේ මල් පරවෙන සමයයි) වරද් කොලුවට මම හැමදාම කෑමට ගොටුකොළ සම්බෝලයක් එකතුකරමින හිතුවා.. ඒකනිසා තමා මොලේ යාන්තම් පෑදීගෙන එන්නෙ.. ඔය ගැටිස්සියොත් ගොටුකොල කන්ඩ..

වරද්ට ගැලපෙන සිංදු කෑල්ලක් කොටාන යමු බලන්ඩ..

ලව් යූ ❤

තද කළු ඇස් x ලා දුඹුරු ඇස්

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 20 කොටස

" සුදුමහත්තයා.. මම දැන් කීසැරයක් කතාකලාද ලමයො.. මොන සිහියෙද ඉන්නෙ.."

මම ඉස්තෝප්පුවෙ බැම්මට වෙලා එලියට කකුල් දෙකත් දාගෙන පද්ද පද්ද එළිය බලාගෙන ඉදියේ.. මට හිතාගන්න බෑ සැරින් සැරේ මගේ පපුවේ පැත්තක් හිටිවැටීගෙන යනවා.. ඒ එක්කම වෙනදා නොදැනුනු අමුතු සෙල්ලක්කාර හැගීමක්, කෝල ගතියක්, අමුතු උද්යෝගයක් හිතේ නළියනවා වගේ..

" ඕහ්.. අම්මෙ.."

" මොන ලෝකෙද හිටියෙ.. ඈ ලමයො ගිහින් පාඩම් කරන්න.. දැන් මදෑ ඔය එළිය බලාගෙන හිටියා.."

" හා අම්මා නිදාගන්නවද.."

" නිදාගන්න යන්න කියලා තමා බැලුවෙ.."

" ආ.. හරි හරි නිදාගන්න එහෙනම්.. අම්මෙ මේ සෙනසුරාදා සෙනුක මෙහෙ එනවා කිව්වා.."

" හා හා.."

අම්මා පනාවත් ඔලුවෙ ගහගෙන ගේ ඇතුලට යද්දි මමත් ඉස්සරහ දොර අගුලු දාලා අම්මට වැදලා කාමරේට ආවා.. මේ මගුල් හිත හිත බෑ පාඩම් කරන්නෝන.. මේ යකාව මැවි මැවි පේන්න ගත්තොත් මට ලයිට් කණු තුනක් තමා ගන්න වෙන්නෙ..

මම කෝකටත් මූණත් හෝදගෙන කාමරෙන් ඇවිල්ලා ඉදගෙන ඇස් දෙක පියාගෙන යෝගා කරන විදියට පුටුවේ ඉදගත්තා අර දබර ඇගිල්ලයි මහපට ඇගිල්ලයි නමලා එකට තියාගෙන එරමිනියා ගොතාගෙන..

**" රධ්‍ය කාරයව අමතක වෙයාන්.. ඒස්වාහ පුඃ.."**

@Shan

දැන් හරි..

පහුවදා සිකුරාදා මට හවස පේපර් ක්ලාස් තිබ්බත් යන්න විදියක් තිබ්බෙ නෑ.. සදුදට මට බැඩ්මින්ටන් මැචස්.. ඒකනිසා අද දවසෙම ප්‍රැක්ටිස් ගනීවි.. දැන් හවුස් මැචස් පටන්ගන්න නිසා ඉස්කෝලෙ හෙන කලබලයක් තිබුනේ.. හවුස් වලට මරාගන්නවා.. තව උන් මෙලෝ වැඩකට එන්නැතුව කට්ටි පයිනවා.. ඒ අස්සෙ හවුස් කැප්ටන්ලා පුප ගිනි අරගෙන අරහෙ දුවනවා මෙහෙ දුවනවා.. ඒ අස්සෙ ඔගනයිසින් බෝඩ් එකේ ඉන්න රධ්‍ය කාරයටයි සයෝන් අයියටයි අහිරු අයියටයි වැඩියෙන් මල පයිනවා..

සදුදට මට අම්බානෙක වැඩ.. එදාට මෙෂර්මන්ට්ස් ගන්න එනවා කියලා තිබ්බා ඩ්‍රිල් ප්‍රැක්ටිස් කරන අයගෙ.. ඒ අස්සෙ මට ඒ මොකුත් බලන්න වෙන්නෙ නෑ මට මැචස් නෆ්රාසුත් ඒකෙ හිරවෙලා.. රධ්‍ය අයියත් දවසෙම කැඩෙට් රූම් එකේ ඉදීවි කැඩෙට් කරන අයගෙ අයිටම් හදන්න තියෙනවා කිව්වා.. තව ස්කොඩ් එකත් එයාම ප්‍රැක්ටිස් කරවනවලු.. කියාන් අයියලා හිටියත් එයාලට අමතර වැඩ.. සෙනුකයා බෑන්ඩ් එකේ ලීඩර් නිසා ඌට ඔය කියන මොකකටවත්ම එන්න වෙන්නෙ නෑ දවසෙම පොල්ලක් කරක කරක එහෙ දුවනවා මෙහෙ දුවනවා.. ඔන්න ඔහොම මේ පටන් ගන්න තියෙන්නෙ මේ මාසෙ වැඩ වැඩම සතිය..

අද සිකුරාදා.. මම උදේ ඉස්කෝලෙ ඇවිත් ඇදුම් මාරු කල්ලා රැකට් එකත් අරගෙන පහලට ආවෙ කෝච් ඇවිල්ලද බලන්න.. මේ වෙලාවට එන්නෙ නෑනෙ ඒත්.. තාම වෙලාව හතට කාලයි.. මම රැකට් එකත් වන වන ග්‍රවුන්ඩ් එක පැත්තට යද්දි කියාන් අයියා ගේට් එක ගාව ඉදගෙන ප්‍රිෆෙක්ට්ලගෙ ඩියුටි බලනවා.. මම ඌට කරදර කරන්නැතුව එහෙමම ග්‍රවුන්ඩ් එකට යද්දි මට ඇහෙනවා ගිරිය පලාගෙන පොල් කාවයියෙක් කෑගනවා..

" බණ්ඩය...................................ජ් සීරුවෙන් සිටින්.."

මුගෙ උගුර ලෙප්ට් වෙන්නෙ නැද්ද දන්නෙ නෑ මෙහෙම කෑගහලා.. මම ඌව පේන තැනකින් තිබ්බ තුග ගහට හේත්තු වෙලා ඌ දිහා බලාගෙන හිටියා.. මෙකා රීප්ප පටියකුත් වන වන එහෙට යනවා මෙහෙට යනවා.. විනයබාර කියලා හිතන් ඇත්තෙ.. ගෙම්බා..

" උඹ ඔය ඉන්නෙ සීරුවෙන්ද..??"

@Shan

සැක් දුන්නා නේද රීප්ප පටියෙන්.. උගෙන් ගුටි කාපු එකා මගේ හොඳම යාලුවෙක්.. මම මෙහෙම මුගෙන් ගුටි කෑවොත්නම් අම්මපා අනිත් පැත්තට රීප්ප පටිය අල්ලලා පුපේ ගහන්නෙ.. පුපේ..

" එකෙක් වැරද්දුවනේ.. ඔක්කොම වට පහක් ග්‍රවුන්ඩ් එක වටේ දුවලා වරෙන්.. අනේ?? අනේ පනේ ගාන්න තොපි ගෑණුද..අපිත් ඔය කාලෙ කට්ට කෑවා.. කෝ හරි අප්!!!"

ඇයි දන්නෑ කට්ට කෑවෙ.. බත් කන්න තිබ්බනෙ.. උගුඩුවා.. ඔකා නිසා තමා මට පාඩම් කරන්න වෙන්නැත්තෙ.. මම විභාගෙ ෆේල් වුනොත්නම් මෙකා තමා සීයට සීයක්ම ඒකෙ වගකීම ගන්නෝන.. මම නුග ගහ යටට වෙලා එල්ලි එල්ලි තිබ්බ මුලක අත පටලගෙන වටේ පිටේ බැලුවෙ අඳුරන උන් ඉන්නවද කියලා.. එහෙම බල බල ඉද්දි මෙන්න බොලේ මෙකා කෙලගෙන එනවා මගේ පැත්තට.. මූ මටත් දුවන්න කියයිද දන්නෙ නෑ.. මම අඩිය හිමීට හරවලා අනිත් පැත්තට තියලා මාරුවෙන්න හදද්දිම,

" වරද්!!!!"

සැක්.. මූ එක්ක බෑ දෙයියනේ.. මම හරෝපු කකුල කෙලින් කරගෙන දුර ඈත පේන කාක්කෙක් දිහා බලාගෙන ඌට උත්තර දුන්නා.. මෙකා එක්ක මූණබලාගෙන කතාකලොත් මගෙ පපුව රිදෙන්න අල්ලනවා..

" ඕ.."

" මේ කී එකෙන් ප්‍රිෆෙක්ට් රූම් එක අරින්න පුලුවන්ද?? කී එක ඔයා ලග තියාගන්න මම පස්සෙ ඉල්ලගන්නම්.."

" හා.."

මම ඈත පේන කාක්කා දිහා බලාගෙනම අත දික්කල්ලා යතුර ගද්දි මෙකා බලෙන්ම මගේ කරට බෑග් එකකුත් එල්ලුවා..

" මොන මගුලක්ද.."

" මගේ බෑග් එක රූම් එකෙන් තියන්න.. ආ මේ.. බෑග් එකේ ෆෝන් එකක් ඇති.. ඒක ඕෆ් කල්ලා බෑග් එක ඇතුලටම දාන්න.. "

@Shan

"ඊ-"

ආයෙමත්.. ආයෙමත් මේ ප්ලැට්පසා මම උත්තර දෙන්නත් කලින් උගෙ රීප්ප පටිය වන වනා යන්න ගියා.. මම උගේ වැඩකාරයද.. කියන කියන එක කරන්න.. මේක හරි සමයමක් උනානෙ.. මම උගෙ නයිකි බෑග් එක අතකින් එල්ලගෙන යතුරක් කරක කරක ප්‍රිෆෙක්ට් රූම් එකට යන්න ගියා.. යකෝ මම ප්‍රිෆෙක්ට් කෙනෙක් නොවෙලත් මේකෙ අස්සෙ වැඩිපුරම ඉන්නෙ මමද කොහෙද.. වෙන මොකෙක්වත් ඒකට එන්නෙත් නෑ අත්සන් කරන්න එනවා මිසක්.. මම ප්‍රිෆෙක්ට් රූම් එක ගාවට යද්දි කියාන් අයියා එතනම තිබ්බ පුටුවකට හේත්තුවෙලා කම්මුලකට අතකුත් තියාගෙන ඈත බලාගෙන ඉන්නවා.. මූ බූටක් කාලද.. අපි දන්නෙත් නෑ.. කිව්වෙවත් නෑනෙ..

" ගුඩ්මෝනින් අයියෙ.."

" ආ මල්ලේ..මෝනින් මෝනින්.. මෙ උඹෙ මනිහගෙන් මෙ අටමගලෙ යතුර ඉල්ලන් වරෙන්.. ඌ පිට්ටනියෙ පැලවෙලා එන්නෙත් නෑ රෙද්ද.. මේක ඇරලත් නෑ.."

" අරින්න තමා මම මේ ආවෙ.."

මම වැඩි ගානක් ගන්නැතුව සපත්තුවෙන් පුටු කකුලට ගහද්දි කියාන් අයියා බයවෙලා වගේ මගෙ දිහා උඩ ඉදන් පල්ලෙහාටම බැලුවා.. හරියට මම අමු කුණුහර්පයක් කිව්වා වගේ..

" කාට අරින්න?? මට??"

" ඒ ඇරිල්ලක් නෙමේ බං අයියෙ.. දොර අරින්න.. නෙද්දකින් වලත්තයා.."

" ආ දොර.. මම කිව්වෙත් දොර තමා.. ඔන්න ඔක ඇරගන් ඉක්මනට.."

මම කියාන් අයියට දෙකක් රවලා යතුරෙන් දොර ඇරලා ඒක රධ්‍ය කාරයගෙ බෑග් එකේ සාක්කුවට එබුවා.. හිතේ ඇති හම්බෙලා ඉල්ලගන්න.. ඌට ඉල්ලගන්න කියනවා ඌගේ අර හිතේ ඉන්නවයි කියන එකාගෙන්ම..

" අම්මටසිරි.. උඹද රධ්‍යගෙ බෑග් එක ගෙනාවෙ..අන්න බලපන් නියම භාර්‍යාවක් තමගෙ ස්වාමියට ගරුසැලකිලි කරන හැටි.."

@Shan

කියාන් අයියා උගේ වක්කඩේ වගේ කටින් එක එක ඒවා කියද්දි මම උගට මැද ඇඟිල්ල දික් කල්ලා ඇතුලෙ තිබ්බ පුටුවක් අරගෙන අනිත් පැත්ත හරෝලා කකුල් දෙක දෙපැත්තට දාගෙන වාඩිවුනා.. කියාන් අයියත් ඒ ලග තිබ්බ පුටුවක් ඇදගෙන වාඩිවුනේ මහ ඔන්නැති මනමාල හිනාවක් දාගෙන..

" මොකෝ වෙන්නෙ අද.."

" ප්‍රැක්ටිස් දවසෙම.."

" ආ සදුදා උබලට මැචස් නෙහ්.. හොදට ප්ලේ කරහන් ඈ.."

" ම්ම්.."

මම කාත් ඇල කරගෙන පුටු ඇන්දෙන් මූන තියාගත්තා..

" මොකෝ බං අවුලෙන් ඉන්නෙ.."

" මොකුත් නෑ හලෝ.. මේ දවස්වල මගෙ මොලේ හොදනැති වේගෙන එනවා.."

" ඇයි උඹ එහෙම කියන්නෙ.."

" කියන්නෙ ඉතින් එහෙම වෙගෙන එන නිසා.."

" සිරාවටම.. මම හිතුවේ ඒ කාලේ ඉදලම උඹෙ මොලේ හොදනෑ කියලා.. බලද්දි මටනෙ වැරදිලා තියෙන්නෙ.."

" අනේ මෙ කිව්වා කියලා හිතාගනින්.."

මම කියාන් අයියට රවලා රධ්‍ය අයියගෙ බෑග් එක ඇරලා ඇතුලට අත දාගෙන ඉද්දි සෙනුකයා කඩාගෙන බිදගෙන රූම් එක ඇතුලට ආවා..

" ආ ලමායි.. ගුඩ්මෝනින්.."

" උඹේ මිනිහා මෙහෙ නෑ.."

@Shan

සෙනුකයට ගුඩ් මෝනින් කියන්න හම්බුනෙත් නෑ කියාන් අයියා කටත් ඇද කරගෙන මගෙ අහිංසකයගෙ හිත රිද්දුවා..

" ඒ වුනාට හොර මිනිහා ඉන්නවනෙ.."

සෙනුකයා මගෙ එහාපැත්තෙන් ඉදගෙන චුයින්ගම් එකක් කටට දාගත්තා.. මූ නම් සීනි කුඹියෙක්ද මන්දා කනව අකනවා කනවා දියවඩියාව හැදිලා මැරිල යන්න උවමනා වෙලා වගේ..

" මිනිස්සුයි හොර මිනිස්සුයි.. යකෝ අපි වගේ හැදිච්ච උන්ට මෙකෙ වසන්නම නැතිවුනානෙ.. හරි හත්තලාමක් මේක.."

" ඒ ෂනෙරුවා මොකෝ අවුලෙන් ඉන්නෙ.."

" එහෙම අවුලක් නෑ බං.."

මම රධ්‍ය අයියගෙ ෆෝන් එක එළියට ඇදලා අරගෙන ඒක ඔෆ් කරා.. පෙනේද ඉස්කෝලෙ ශිශ්‍ය නායකයෝ ඉස්කෝලෙ ෆෝන් ගේනවා.. අල්ලලා දෙන්න තියෙන්නෙ මූව පිනාට.. ඇයි යකො..

" බලපන්කො කියාන් අයියෙ.. දැන් රධ්‍යගෙ ඇසිස්ටන් මූද.."

" ඇසිස්ටන් නෙමෙ බං වයිෆ් වයිෆ්.."

" ආ ඔව් වයිෆී~"

සෙනුකයා මගෙ කම්මුලෙන් ඇදලා දෙපැත්තට හොලවද්දී මම මූන ඇද කරගෙනෞගෙ අත ගසලා දැම්මා.. සැක් මේ ෆෝන් එක ඇරගත්තනම් අර රධ්‍ය කාරයා යාලුවෙලා ඉන්න මෝඩ පකාගෙ ෆොටෝ එකක් බලාගන්න තිබ්බා.. මේ මගුලෙ ෆින්ගර් ප්‍රින්ට් නැතුව ඇරගන්න බෑනෙ.. මම කොළපාටයි කලුපාටයි කවරයක් දාපු රධ්‍ය අයියගෙ සැම්සුන්ග් ෆෝන් එක කරක කරක ඉදියා..

" මේ කියාන් අයියෙ.. සිරාවට මට කියපන් රධ්‍ය අයියගෙ කෑල්ල කවුද කියලා.. මගුල.. ඌ කියන්නෙත් නෑ.. තවුසෙලා කියන්නෙත් නෑ.."

මම මලපැනලා දඩාස් ගාලා ෆෝන් එක මේසෙ උඩින් තිබ්බා.. ඒ සැරේ මුන් දෙන්නා මූනට මූන බලාගෙන හිනාවෙනවා.. මම හිනාවෙන්න දෙයක්

@Shan

කිව්වයැ.. මටත් දැනගන්න අයිතියක් තියෙනවනෙ.. මුන්ගෙ යාලුවෙක් විදියට.. එක පතෝල මැස්සෙක්වත් මට මොකක්වත් කියන්නෙ නෑ.."

" මෙහෙමයි කොල්ලො.. මම උගේ ඔය නල්ලමලේ ලව් එක උගෙ හිතට කඩාපාත් වුන දවසෙ ඉදන්ම ඌ එක්ක එකට තමා ඉන්නෙ.. ඔන්නං මෙහෙම කරන්නම්.. උඹට නම ගම අදාල කරගන්නැතුව ස්ටෝරිය විතරක් කියලා දාන්නම්.. එකගද.."

" හා කියන්න බලන්න ඉතිම්.."

මම රධ්‍ය අයියගෙ බෑග් එක අවුස්සද්දි හම්බුනු ලොලිපොප් එකක් ගලවලා කොලේ උගේ බෑග් එකට ඔබලා ලොලිපොප් එක කටෙ ගහගත්තා.. ඇයි මගුල කන්නනෙ තියෙන්නෙ..

" මෙහෙමයි කතාව.. රධ්‍ය උ-ඌව දැක්කෙ අර පිනාගෙ ඔෆිස් එකේ මම කිව්වෙ උඹට.. දණ ගහගෙන ඉද්දි.. මූ එදා මාත් එක්ක ඔෆිස් එකේ හිටියෙ වැඩ වගේකට ගිහිල්ලා.. ඔහොම ඉද්දි එදා හවස අපි ටෘත් ඕ ඩෙයා කලා.. අපි ඇහුවා උඹ වැරදිලාවත් කොල්ලෙක්ට කැමති වුනොත් කාටද කැමතිවෙන්නෙ කියලා.. මූ ටිකක් වෙලා කල්පනා කල්ලා කිව්වා අර ඔෆිස් එකේ දණගහගෙන හිටපු එකාට කැමති කියලා.. එදා නම් ඌ ඒක ජෝක් එකකට කිව්වෙ.. ඊටපස්සෙ දවසක් අපි තුන්දෙනා ලයිබ්‍රි එකේ ඉද්දි ඔය මල්ලිත් ලයිබ්‍රි එකේ හිටියා.. ඌ අපේ ඉස්සරහා ටේබල් එකේ ඉදියේ.. කියවනවා කියවනවා ඉවරයක් නෑ ඒ අස්සෙ මහා හයියෙන් හිනාත් වෙනවා..අපේ එකා එදා මූ දිහා කන්න වගේ බලන් ඉදියා.. අම්මොහ් මට තාම මතක් වෙනවා ඒ බැල්ම උගේ.. පස්සෙ පස්සෙ අපි ඕක අල්ලගෙන ඌට නොසෑහෙන්න විහිලු කලා.. ඒ මල්ලිත් මූ ඉන්න හැම ක්ලබ් එකේමයි හැම සොසයිටියෙමයි ඉන්නවා.. යන යන තැන දකිනවා.. ළගින් ගියොත් ඇගේ හරි හැප්පෙනවා.. අනික ඌට තියෙන්නෙ එසේ මෙසේ විසයක් නෙමෙ.. හෙනට නෝට් වෙනවා රධ්‍යට.. පස්සෙ ඉතින් ඌම දවසක් කිව්වා ඌ ඒකාට කැමති කියලා අපි එක්ක.. එතකොට අපි උඹලගෙ වයසෙ.. අපි කිව්වා ඉතින් ගිහින් උගෙන් අහපන් අකමැති වෙන එකක් නෑ කියලා.. මූ ඉතින් නහිනව ඒ ලෙවෙල් ඉවර වෙනකල් ඉන්න ඕනලු අහන්න.."

" ම්ම්.. නවය වසරෙ කියන්නෙ ඉතින්..නවය.. දහය.. එකොලහ.. දොළහ.. දහතුනයි මේ අවුරුද්දයි.. අවුරුදු හයක් හිතේ තියාගෙන ඉදලද.. අනේ මේ ඔව්වා බොරු කතා.. ඕක බදින්න වෙන්නෙ නෑ.."

@Shan

" අවුරුදු හයක්මත් නෙමෙ බං ඉතින් මූ කැමතී කියලා සුවර් එකටම කිව්වෙ දොළහෙදිනෙ.. එතකොට අවුරුදු තුනක් වගේ වෙන්නෙ.. එතකල් මූ හිටියෙ කැමතිත් නෑ අකමැතිත් නෑ සීන් එකේ.."

" ම්ම්ම්.."

මම ඇස් දෙකත් කරකලා කට ඇද කරගත්තා.. එච්චර ලවුලුද ඉතින්..

" ඇයි දැන් උඹ අවුලෙන් ඉන්නෙ.."

" අවුලෙන් නෑ පිස්සුද.."

" අනේ මේ බල්ලො මම උඹව දන්නෙ අවුරුදු හයකට කලින් ඉදලා.. උඹ එනවද මට කොලේ වහන්න.. මේ කියාන් අයියෙ මූට රධ්‍ය අයියගෙ ලව් එක ගැන කිව්වහම දුක හිතෙනවා.. ඒකයි මේ මූන එල්ලන් ඉන්නෙ.."

සෙනුකයා කියද්දි මම නියපොත්තකුත් හපාගෙන එළිය බලාගෙන හිටියා.. අපි නිකන් අර වැදගත් සාකච්චාවකට ආපු මහාචාර්යවරු ටිකක් වගේ හෙන සීරියස් මූනු හදාගෙන එකාට එකා දිහා බලාගෙන ඉදියේ..

" එහෙම මගුලක් නෑ.. මම ඒක නිකමට ඇහුවෙ.. උඹලට පිස්සු හැදීගෙන එනවද.."

මම පුටුවත් මේසෙ පැත්තට හරෝගෙන කම්මුලකට අතක් ගහගෙන බිත්තියෙ යන පොඩිම පොඩි කළු කුඹියා දිහා බලාගෙන හිටියා.. මගේ හිත රිදිලා වගේ දැනෙනවා.. ඒ වුනාට හිත අර කොහෙවත් ඉන්න එකෙක්ට සෙකන්ඩ් වෙන්න වෙන නිසා රධ්‍ය කියන පොල් කාවයියට මම කැමති වෙගෙන එනවා කියලා පිලිගන්න ලෑස්තිත් නෑ.. මට පට්ටම අවුල්.. නිකන් සෑන්ඩ් කාසල් එකක් මූදු රළට කැඩිලා ගිහින් වගේ දැනෙන්නෙ..

මම අතපය තියාගෙන ඉන්න බැරිකමට රධ්‍ය අයියගෙ ෆෝන් කවරෙ නියපොත්තෙන් පොඩ්ඩ පොඩ්ඩ ගැලෙව්වා.. එතකොටම වගේ අයුක අයියා සෙනුකයට කතාකරපු නිසා කියාන් අයියත් මගේ පිටට තට්ටුවක් දාගෙන උන් එක්කම ගියා.. දැන් මම විතරයි කාමරේ..

මම කොළපාට ෆෝන් කවර් එක ගැලෙව්වා විතරයි ඒකෙ අස්සෙ තිබ්ලා ක්‍රෙඩිට් කාඩ් එකකුයි රධ්‍ය අයියගෙ අයි ඩී එකයි මේසෙ උඩට හැලුනා..

@Shan

මමත් මොන මගුල් කරන්න යනවද මන්දා.. ඉක්මනට උගෙ කාඩ් දෙක ෆෝන් එක අස්සට ඔබද්දී මම දැක්කෙ ෆෝන් එකේ කවරෙටම ඇලවිලා තියෙන පාට මැකිලා වෙලිලා තියෙන පොඩි වෙච්ච සේපාලිකා මලක්..

සේපාලිකා මලක්??

රධ්‍ය පුතාට සේපාලිකා මලක් ගෙන කුමක් කරන්නද..

හිත බිඳුනු වරද් කොලුවා වෙනුවෙන් විනාඩි එකක නිස්සබ්දතාවයක් ප්‍රකාශයට පත් කර සිටිමි.. ස්තූතියි..

අනෙ අප්පා ඔය ලමයින්ගෙ සිංදු වලටනම් මම හරි ආ.......සයි මම හිතුවෙ නෑ කට්ටිය ඒකට රිප්ලයි කරයි කියලා.. අනේ මම ඔයාලට හුගක් හුගක් හුගා....රියක් ආදරෙයි අප්පා..

දවල්ට එන්නම.. අද අප්ඩේට් නැත්තෙ ඕතරීට ක්ලාස් ලමයිනේ.. උදේ කරන්ට් තිබ්බෙත් නෑ ඒකනිස අලියාගන්න බැරිවුනා.. සමාවෙන්න ඕන..

ලව් යූ ❤

හිතේ තියාගෙන ඉන්න දේ කියාගන්න බැරුව ඉන්න වරද්ට පණ ඇරලා ඉන්න රධ්‍ය...

රධ්‍ය වෙන එකෙක්ට කැමතී කියලා හිතාගෙන වුනත් හිතින් ලාවට ආදරේ කරන වරද්..

උන් දෙන්නව යාලුකරන්න ගහන්න ඕන ප්ලෑන් ඔක්කොම ගහන කියාන්..

සමාජෙට බම්බු ගහන්න කියලා පාඩුවෙ ආදරේ විදින යුගයේ රෝමාන්තිකම කපල් එක 'සෙයුක'

@Shan

මල්ලී හිටිහැටියෙ හිනාවෙන්නයි, මල්ගස් වටේ කැරකෙන්නයි, කොට්ට හපාගෙන දුකින් ඉන්නයි, බූට් සින්දු අහන්නයි, රොමැන්ටික් ෆිල් දාගෙන මනෝ ගහන්නයි හේතුව මොකක්ද කියලා හිතාගන්න බැරුව ඉන්න ආධ්‍ය

ඕතරී මුන් දෙන්නා සෙට් නොකර අහවල් ලබ්බක්ද කරන්නෙකියලා හිතන රීඩර් ජනතාව

කවුරුවත්ම ශහිනිගෙයි මහීශාගෙයි ප්‍රශ්නෙ ගැන කතාකරන්නැතුව ඒක නොසලකා හරිනවා කියලා කේන්තියෙන් ඉන්න ඇහැළ මලී මහීශා..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 21 කොටස

මම හිටියේ ජිම් එකේ පැත්තකින් වාඩිවෙලා රැකට් එක අත දිගේ රෝල් කර කර වහළ දිහා බලාගෙන.. සර්ගෙන් බැනුමකුත් අහලා ගුටියකුත් කාලා.. දැන් මම ප්ලේ කරන අරගෙන පැය දෙකකටත් වැඩී.. සර් මට අවධානෙ නෑ තෝ මොන ලෝකෙද ඉන්නෙ කියලා රැකට් එකේ හැන්ඩල් එක පැත්තෙන් දුක්කා පුපට පාරක්.. මම ඉතින් ලැජ්ජාව බාල්දියෙන් එකකුත් පුරවගෙන ඇවිත් පැත්තකින් වාඩි වුනා.. මොකුත් කරන්න හිතෙන්නෙ නෑ අරුගෙ අර ලබ්බෙ ෆෝන් කවරෙ අස්සෙ තිබ්බ වේළිච්ච මල දැක්ක වෙලේ ඉදන්.. මට ඒක එවෙලෙ මීටර් වුනේ නැති වුනත් පස්සෙ මතක් උනේ දවස්ක් මම උගේ කොල්ලට ප්‍රපෝස් කරන්න හිතාගෙන ඔය මලක් ඌට දික් කරපු හැටියි.. එදා මූ මලපැනලා මටත් ගස්සගෙන ගිය හැටියි..

" බැරිවෙලාවත් මූ කැමති මටද දන්නෙ නෑ.."

මම දැන් හපලා හපලාම නියපොතු අහුවෙන්නෙත් නෑ.. මට මේක දැනගන්නම ඕන.. මොකද කියාන් අයියා කියපු සේරම දේවල් මටත් එහෙන් මෙහෙන් අදාලයි.. මම ඔය කියන විදියට අටේදි සිංදු කියලා ඔෆිස් එකේ දණගහගෙන හිටියා.. ඒ කාලෙ මම හිටිය කල්බ් වල සොසයිටි වල මූත් හිටියා..ඒ වුනාට මූ මාත් එක්ක කතාකල්ලවත් නෑනෙ.. කතාකරන්න තියා මූණවත් හරිහැටි බලලා නෑ.. හිනාවෙලාවත් නෑ.. එහෙම එකේ මට අරහෙම හිතන්නත් බෑ.. ඒ වුනාට නොහිතත් බෑ.. මූ පලවෙනියටම මම මූ එක්ක කතාකරපු දවසේ ගැස්සුන විදිය.. මාව මගාරින විදිය.. එදා මම නිදාගෙන ඉද්දි අයුක අයියා එක්ක කියවපු විදිය.. මට දැන් සේරම එකට මැවිලා පේනවා ෆිල්ම් එකක් වගේ.. අනේ මන්දා කොහොම හිටිය මමද මේ කොනක් අල්ලගෙන කල්පනා කර කර ඉන්නෙ.. මට හෙන අවුල්.. එකපැත්තකින් මම මූට කැමති වේගෙන එනවා.. අනිත් පැත්තෙන් මූ කැමති එකෙක් ඉන්නවා.. ඒවුනාට මට හිතෙනවා ඌ කැමති මටද කියලා..

මේවා හිත හිත බෑ සදුදට මැචස්.. මට මෙලෝ අවධානයක් නෑ කියලා එහේ කෝච්කාරයා කෑගහනවා.. මම වටපිට බලලා ශේප් එකේ රැකට් එකත් උස්සගෙන ජිම් එකෙන් එළියට පැනගත්තා..

" සෙනුකයා.. කෝ මේකා.."

@Shan

මම සෙනුකයව හොයාගෙන මියුසික් රූම් එක පැත්තට යද්දී මියුසික් රූම් එක ගාව පඩිපෙලේ සෙනුකයයි අයුක අයියයි රධ්‍ය කාරයයි වාඩිවෙලා හෙන කයියක් දාගෙන ඉන්නවා.. නෑ නෑ රධ්‍ය කාරයා පැත්තකට වෙලා කම්මුලකට අතකුත් ගහගෙන අරුන් දෙන්නා දිහා නෙමේ අහක බලගෙන ඉන්නවා.. මූ මොන මගුලක්ද කපල් අස්සෙ කරන්නෙ.. පැත්තකට වෙලා ඉන්න බැරියැ.. එක්කො මුන් දෙන්නා විතරක් ඉන්න එක හරි නැති නිසා පැත්තකින් ඉන්නව ඇති..

මම වටපිට බලලා උන් තුන්දෙනා ගාවට දුවගෙන ගියා.. මම ආවා කියලා වගේ වගක් නෑ මේ අයුක අයියයි සෙනුකයයි උන්ගෙ කතාවක් සැරටම.. මම ආවා දැක්කා විතරයි රධ්‍ය අයියා ගැස්සිලා වගේ කම්මුලට තියාගෙන හිටපු අතත් ලිස්සලා ගියා..

" මොකද බං අවුලෙන්.."

" මොකුත් නෑ බං.. කෝච්කාරයා මාව එළෙව්වා.."

මම වැඩි ගානක් නැතුව රධ්‍ය අයියා ඉදගෙන හිටපු පඩියට පහල එකෙන් ඉදගත්තා..

" සිරාවට ඒ මොකෝ.."

" අවධානෙ නෑ කියලා මගෙ පස්සට රැකට් එකෙන් දුන්නා.."

" පිස්සු කෙලින්න එපා ෂනෙරුවා.. හරියට ප්ලේ කරපන් බල්ලො.. සඳුදා උඹට මැචස්නෙ.."

" ම්ම්.. මම ක්ලාස් එකට යනවා බං.. හශාන්ලා එහෙ ඇති නේ.."

" හිටියා නම් තමා.. ඉදපන් මාත් එන්න.."

සෙනුකයා පඩියෙන් නැගිටලා මටත් නැගිටින්න අත දුන්නා.. මමත් උගෙ අත අල්ලගෙන නැගිටපා පස්සෙ තිබ්බ වැලිටික පිහිදගත්තා..

" අයියෙ අපි පොඩ්ඩක් ගිහින් එන්නම්.. වරෙං යන්න.."

සෙනුකයා මාවත් ඇදගෙන ක්ලාස් පැත්තට ගියා.. සැක් රැකට් එකත් අමතක වුනා ඒක පඩිපෙලේ දාලා ආවනෙ.. මම මරන්න ගෙනියන හරකා

@Shan

වගේ ගස් ගල් වල හැප්පි හැප්පි සෙනුකයා පස්සෙන් ඇදිලා ආවා.. අපි ඇවිත් නතරවුනේ ක්ලාස් එකේ අපේ වාසභවන වෙච්ච අවසාන පෝලිමේ.. පංතියෙ ඉන්නෙත් එකා දෙන්නයි ඔක්කොම වැඩවලට එළියට ගිහින්.. අපි ආවා කියලවත් උන්ට ගානක් නෑ උන් උන්ගෙ වැඩ.. හශානුයි මතීශයි පංතියෙ හිටියෙත් නෑ.. සෙනුකයා මාව බලෙන්ම පුටුවට තල්ලු කල්ලා දාලා ඌ මගෙ එහාපැත්තෙන් ඉදගත්තා..

" ෂනෙරුවා.. මෙ අහපං.. මට බොරු කියන්න ලෑස්තිවෙන්න එපා.. අද උදේ ඉදලා උඹ මූන කුණ්ඩහට්ටියක් කරගෙන ඉන්නෙ.. මොකක් හරි ප්‍රශ්නයක්නම් මටත් කියපන්.. මම උඹෙ හොදම යාලුවනෙ.. උඹෙ ඔය මූණ එල්ලගෙන ඉදියා කියලා ප්‍රෂ්න විසදන්න බෑනෙ.."

සෙනුකයා හරි.. ඌ මගේ යාලුවා තමා.. ඒ වුනාට ප්‍රශ්නෙ තියෙන්නෙ මම මොකක්ද ඉතින් මූට කියන්නෙ.. මට තියෙන්නෙ මටවත් තේරුම්ගන්න බැරි ප්‍රශ්නයක්.. උදේ ඉදන්ම මට තරහා යනවා එපාවෙලා වගේ.. සේරම දමලා ගහලා යන්න හිතෙනවා..

" අනේ මන්දා බං.. මගෙ හිතට හරි නෑ වගේනෙ.."

" ඒ මොකෝ.. මොකක් හරි ප්‍රශ්නයක්ද.. අම්මා මොනවහරි කිව්වද.."

සෙනුකයා ඇහුවේ මගේ අත් දෙක උඩින් උගෙ අත් දෙක තියලා ගුලි කරගෙන හරි ආදරෙන්.. මූ ඔහොමයි.. කොච්චර අපි එකාට එකා මරාගෙන ජෝක් කර කර ඉදියත් ඕන වෙලාවට පණ වුනත් දෙනවා.. උගේ ඇස් වල තියෙන්නෙ ආදරේ වැස්සෙන බැල්මක්.. අයුක අයියා ඒ අතින් හෙන වාසනාවන්තයි.. මූ වගේ පට්ට සංවේදී එකෙක්ගෙන් ආදරේ විදින්න..

" අම්මා නෙමෙයි බං.. හරි මම උඹට ඇත්තම කියන්නම්.. උඹ මං ගැන මොනවා හිතයිද දන්නෙ නෑ.. ඒ වුනාට මට රධ්‍ය අයියව දකිද්දි හෙන අමුතුයි බං.."

" අමුතුයි කීවෙ.. ඌ උඹට මොකක් හරි හිත රිදෙන දෙයක්වත් කිව්වද.."

" හිත රිදෙන දෙයක් නෙමෙයි බං.. ඒකා මාත් එක්ක කතාකරන්නෙත් වචනයයි දෙකයි.. ඒවුනාට මට හිතෙනවා මම ඌට කැමතිවත් ද කියලා.. ආයෙ උගේ අර කොල්ලා ගැන කියද්දි අවුල් යනවා.."

@Shan

" තව.."

" තව කියන්නෙ ඉතින් එච්චර තමා.. ඒත් වෙලාවකට හිතෙනවා උෟ කැමති මට ද කියලා.. කියාන් අයියා උදේ කිව්ව ඒවත් එක්ක.."

" ම්ම්.."

සෙනුකයා මගෙ කර වටේ අතක් යවලා මාව උගේ ඇගට හේත්තු කර ගත්තා.. මූ ගාව අයුක අයියගෙ ලග සුවදයි.. ආපු වෙලේ ඉදන්ම මුන් දෙන්නා ඇලිලනෙ ඉන්නෙ.. පව් ඉතින් මුන් දෙන්නගෙ තර්ඩ් වීල් එක වෙන්නෙ අර රධ්‍ය අයියයි කියාන් අයියයි.. ඔවා ඉස්කෝලෙ පැතිරිලා ගියොත් එක කෙලියක් වෙන්නෙ.. ඒක නිසා මුන් දෙන්නා ඉන්න තැනක අර දෙන්නත් කොහෙහ් හරි එල්ලිලා ඉන්නවා.. එතකොට ලොකුවට සැක හිතන්නෙ නැනෙ..

" මෙ අහපන්.. දැන් උඹම කියහන්.. උඹ උෟට කැමතිද කියලා උඹ ටක්කෙටම දන්නෙ නැනෙ.. පොඩ්ඩක් වෙලාව අරගෙන හිමින් හිතලා බලපන්.. මම ලව් ගැන මහ ලොකු ටෝක් දෙන්න දන්නෙ නෑ ෂනෙරුවා.. ඒ වුනාට උඹ රධ්‍ය අයියට පහුවට කැමති වුනොත් වත්.. උඹ මාර ලකී.."

" ඒ මොකෝ.."

" ඒ මොකෝ කියන්නෙ බලපන් රධ්‍ය අයියා හෙන ෆේමස්.. උෟට ඕන්නං කෙල්ලො තියාගෙන නටවන්න බැරිද.. අභිරු අයියලා වගේ හතර පහ රන් කරන්න බැරිද.. කෙල්ලො ෆෝම් කර කර ආතල් ගන්න බැරිද.. උෟට මොනවද නැත්තෙ.. එහෙම වෙලත් උෟ ඒකගෙ හිතේ ඉන්න එකාට පාඩුවෙ ලව්.. උෟට විතරක්ම.. මම නම් මෙච්චර කාලෙකට රධ්‍ය අයියා වෙන එකෙක්ගැන කියනවා අහලම නෑ.. තියා උෟ උෟ කැමති එකා ගැනවත් කතාකරන්නෙ හෙන අඩුවෙන් නෙ.. ඒකත් උෟට දුක හිතුනහම.. අවුල් ගියහම.. ඉතින් නිකමට හිතපන් ඒකා ආදරේ කරන එකා පට්ටම ලකී.."

" ම්ම්.."

" මම කියන්නෙ නෑ උඹට හදිසි වෙන්න කියලා.. ඒ වුනාට හිතලා බලපන්.. ඕන්නම් රධ්‍ය අයියගෙන් කෙළින් අහපන්.. සැක් ඔයි මම හිතුවෙ නෑ තවුසෙ ලව් වලදි ඔච්චර පිස්සු කෙලින මෝඩ පකෙක් කියලා.. බලපන් හැටි අඩන්න වගේ.."

@Shan

" අනේ පලයන්.. උඹ කියයි.."

සෙනුකයයි මමයි ඔහොම ඉඳගෙන හෙන වෙලාවක් වල් පල් කතාකර කර ඉඳියා.. වෙලාවත් ගියා දන්නෙම නෑ.. කෝච්කාරයා මාව හොයනවා ඇති පණ දාගෙන.. දැන් ගියොත් නම් අහගන්න වෙනවා අම්බානෙක.. උදෙත් ගුටි කාලනෙහිටියෙ.. කියන්න බොරු මතක් වෙන්නෙත් නෑ.. ඒකනිසා මම සෙනුකයා එක්ක පංතියටම වෙලා ඉඳියා.. තව ටිකකින්ම යනවා.. කොහොමත් ආයෙ ගුටි කන්න තමා වෙන්නෙ..

මම ඩෙස්ක් එකට ඔලුව තියාගෙන සෙනුකයා කට උල් කර කර කියවන ආට් එකේ ධනුකයා උගෙ කෙල්ලගෙන් ස්ටේශන් එක මැද කනේ පාර කාපු සීන් එක අහ අහා හිටියේ.. සැක් ධනුකයා මාර චාටරේ වෙලා තියෙන්නෙ.. ඔහොමත් ගුටි කනවද යකෝ කෙල්ලොන්ගෙන්.. ඒකි කුඩෙනුත් ගහලා..

" උංට කෙල්ලො හැමතැනමනෙ බං.. කුඩෙන් නෙමෙ මමනම් කියන්නෙ කටු කම්බියක් එස්ලෝන් බටේකට දාල පුපේ ඔබලා එස්ලෝන් බටේ එළියට අරන් කම්බියෙන් අදින්න තියෙන්නෙ.. පව් මොනව වුනත් ඉතින් කෙල්ලෙක්නෙ.."

" මටත් ධනුකයව පේන්න බෑ බං.. ඕකා කුඩුත් ගහනවද කොහෙද.."

" ඔව් බලපන් ඇස් දෙකේ හැ-අහම් මේ පැත්තට කවුද එනවා ෂනෙරුවා~.."

මම සෙනුකයගෙ පැත්ත හැරිලා ඉදිය නිසා මට පංතියෙ දොර පෙනුනේ නෑ..  මම ඔලුව උස්සලා බලද්දි අයුක අයියයි කියාන් අයියයි රධ්‍ය අයියයි තුන්දෙනාම ඇවිත්.. සැක් කියාන් අයියගෙ අතේ අර තියෙන්නෙ මගේ රැකට් එක නේද.. මරු ඕක නැතිවුනානම්.. අම්මා මාව ගලේ ගහලා මරාවි.. හොඳ වෙලාවට ඒක රධ්‍ය කාරයා ගාව දාලා ආවෙ..

එතකොට වෙලාව දොළහට විතර ඇති.. ප්‍රැක්ටිස් කරන්නම් කියලා බොටමකුත් ගහගෙන ඉදියට මම මෙලෝ මගුලක් අද කලෙත් නෑ.. හීත බිඳුනු සමනලී වගේ මූ එක්ක පංතියෙමනෙ ඉදියෙ.. මේ වෙලාව වෙද්දි පංතියෙන් මොකෙක් වත්ම හිටියෙ නෑ.. ඔක්කොම එළියට ගිහිල්ලා.. සෙනුකයා මනමාල හිනාවක් දාගෙන අරුන් තුන්දෙනාට පංතියට එන්න කියද්දි මම ඔලුව උස්සලා උන් දිහා බලලා ආයෙම ඔලුව තියාගත්තා.. මට බෑ අරුට මූණ දෙන්න..

@Shan

" ආ මල්ලේ.. මේ උඹේ මැස්සො එළවන එක දාලා ඇවිල්ලා.."

කියාන් අයියා රැකට් එකෙන් මගෙ පිටට ගැහුවා..

" අනේ මේ මගෙ රැකට් එකට මොකුත් කියන්නෙපා.. මෙහෙ දීපන්.."

මම උඌට රවලා රැකට් එක උදුරලා අරන් මේසෙ උඩින් තිබ්බා.. රධ්‍ය අයියා මගේ දිහා බලාගෙන ඉදියේ මූන අමුතු කරගෙන නලල රැලි කරන්.. හරියට උඌට දැනගන්න ඕන වෙලා වගේ මම මොකක්ද පංතියෙ කරන්නෙ කියලා..

" මේ මූව ජිම් එකට යවපන් බං.. අරහෙ කෝච් මූව හොයනවා ඉවරයක් නැතුව.. සයෝන් දැනුත් ඇවිත් කියලා ගියා.."

" ෂනෙරුවගෙ ඔලුව රිදෙනවලු හලෝ.."

මේ සෙනුකයා පලන බොරු.. කවුද කිව්වෙ ඔලුව රිදෙනවා කියලා.. මගෙ ඔලුව මේ යසට තියෙන්නෙ..

" ඒ මල්ලි.. සිරාද.. මොකද වුනේ.. උඹට අමාරුනම් අපිට කියන්න එපැයි.."

කියාන් අයියා මගේ එහාපැත්තෙ පුටුවෙන් ඉදගද්දි අනිත් උන් දෙන්නා ඉස්සරහ පුටුවල කකුල් දෙක දෙපැත්තට දාගෙන ඉදගත්තා.. ලිද ළග සංගමෙ..

" ලොකු අමාරුවක් නෑ අයියෙ.."

මම ඩෙස්ක් එකෙන් ඔලුව උස්සගෙන කෙලින් වුනා.. මොකද දන්නෙ නෑ මගෙ ඉස්සරහින්ම ඉදගත්තෙ.. ගැටපොලොස් කොට්ටෝරුවා..

" මේ අයියෙ ෂනෙරුවටයි රධ්‍ය අයියට කියන්න මොකක්ද තියලු.. අපි කැන්ටිම පැත්තෙ යමුද.."

මේ සෙනුක හාල්පාරු හැලපයා.. මම කිව්වද මූ එක්ක කතාකරන්න ඕන කියලා.. සෙනුකයා එහෙම කිව්ව ගමන් කියාන් අයියා නැගිටලත් ඉවරයි.. මේ ගස්ලබ්බො එක්ක මට වසන්න බෑ..

" මොක්-"

@Shan

" ඕවා උඹලා කතාකරගෙන වරෙන්.. අපි කැපුනා කොල්ලො.. ටටා.."

සෙනුකයා මටත් ටටා දිදී අරුන් දෙන්නා එක්ක වාෂ්ප වුනා.. සැක් මේ මොන ඉලව්වක්ද මේ වුනේ.. සෙනුකයා ගස් බල්ලා කරොත් කරන්නෙ මෙ වගේ ගොං වැඩක්මයි.. මම රධ්‍ය අයියා දිහා බලද්දි ඒකා නැගිටලා ඩෙස්ක් එක වටෙන් මගේ එහාපැත්තෙ පුටුවෙන් ඉදගත්තා.. මම හෙන ඔලුවෙ කැක්කුමක් හැදිලා වගේ බොරුවට ඔලුව දෙපැත්තත් මසාජ් කරගෙන දෙපාරක් කැහැලා ආයෙම ඩෙස්ක් එකෙන් ඔලුව තියාගත්තා..

ඒ අස්සෙ මේ පපුවත් ගැහෙනවා එළියට පනින්න වගේ.. අතුත් වෙවුලනවා.. මම අත් දෙක මිටමොළවගෙනම ඉදියා.. මට මොනවා වෙනවද කියලා මටම හිතාගන්න බෑ..

" වරද්.. හුගක් ඔලුව රිදෙනවද..??"

රධ්‍ය අයියා කතාකලේ හෙන වදවෙන කටහඩකින්.. බොරු කියන්නෙ නැතුව ඇත්තම කියනවනම්.. ඒකට මගේ හිත ගැස්සුනා.. මට තේරෙන්නෙ නෑ මම මූට ඇත්තටම ආදරේද කොහෙද.. නැත්නම් මෙහෙම හිත පිස්සු කෙලින්න විදියක් නෑනෙ.. මම කලින් මොකෙක්ටවත් ආදරේ කල්ලා නෑ.. කොටින්ම ආදරේදි දැනෙන හැගීම් හැම එකක්ම මම පළවෙනියට අත්විදින ගමන් හිටියේ.. මම ඔලුව උස්සන්නෙ නැතුව හිටියා.. මූගේ මූණ දැක්කොත් මට පපුවේ අමාරුව හැදිලා මැරෙනවා ශුවර්..

" ම්ම්.."

" කෑම කෑවද.. බෙහෙත් බිව්වෙ නැද්ද.. ම්ම්.."

රධ්‍ය අයියගෙ අතක් මගේ උරහිස උඩින් තියවෙනකොට මම ඇස් දෙක තද කල්ලා පියාගෙනම හිටියා.. ශිට් ශිට් ශිට්!!! මගෙ මූණට ලේ පිරුනම හෙන මොංගල් විදියට මූණ රතුවෙනවා.. මට දැනෙනවා මගේ මූණට ලේ පිරෙනවා.. ඔලුව උස්සන්න වුනොත් මාර ලැජ්ජාව..

" නෑ.."

" එන්න කන්න.. වරද්!! කාලා බෙහෙත් බොනවා.."

" බෑ.."

@Shan

" මුරණ්ඩු වෙන්නැතුව නැගිටපිය.."

මේ කලවැද්දා මාව බලෙන්ම නැගිට්ටුවලා මගේ බෑග් එක අස්සට අත දාලා ලන්ච් බොක්ස් එක අරන් මේසෙ උඩින් තිව්වා.. මූ බලන් ඉද්දි කන්නෙ කොහොමද.. අනික මට බඩගිනිත් නෑ.. මොන මගුලක්ද.. යන දීපංකරේක පලයංකො මට වද නොදී.. මූ මගෙ මූණ දිහා ටිකක් වෙලා බලාගෙන ඉදලා නෝන්ඩියට කට කොනෙන් හිනාවුනා.. අම්මප මීට වඩා හොදයි පුප හපන් මැරුනනම්..

" දැන් කන්න බැරිද.."

" බෑ අනේ බෑ බෑ.. යනවකො යන්න.."

මම නාහෙන් අඩද්දි මේකා ලන්ච් බොක්ස් එක ඇරලා හැන්ද අතට ගත්තා.. අනේ කවන්නනම් නෙමෙ නේද පුතේ මේ යන්නෙ.. මේ මොන මගුලක්ද වෙන්නෙ..

" කට ඇරපං.."

" මට බ්-ආව්-මොන-ආආ"

මට කියලා ඉවරකරන්න හම්බුනේ නෑ මේකා කට ඇරිය පාරම පාස්තා හැන්දක් පුරෝලා කටේ එබුවා.. මූ මනුස්සයොන්ට එකම එක පොඩ්ඩක්වත් ආදරෙන් සලකන්න දන්න එකෙක් නෙමේ.. තා ඩිංගෙන් හැන්ද ගිහින් කටෙත් ඇනෙනවා.. රිදුනත් එක්කන්..

" හපනවා ඕක.."

මම හරකා තණකොළ කන්න වගේ කට පුරොගෙන පාස්තා එක කෑවා.. කවනවනම් කවපන්කො පොඩ්ඩක්.. මේක සවලෙන් බදාම දානවා වගේ ඔබනවා කටට.. පුටුව උස්සලා ඔලුවට දෙන්න හිතයි..

" කෝ ආ.."

" කන්න බෑ අ-"

කියන්න හම්බුනේ නෑ ආයෙම මේක හැන්දක් පුරෝලා කටට එබුවා.. යකෝ කලින් එක තාම කාලා ඉවරත් නෑ.. මම තමා ගොනා වගේ එදා මූට

@Shan

හොඳට අනලා කැව්වෙ.. එක්කො මූට මම එදා නයි මිරිස් අනලා කැව්ව එකේ තරහ පිට කරනවද දන්නෙත් නෑ.. සමහරවිට එහෙම වෙන්න ඇති..

කොහොමහ ඌ මහ ප්‍රචණ්ඩකාරී විදියට මට මුළු කෑම එකම කවලා බෑග් එකේ කවරෙක දාපු බෙහෙත් ටිකත් අරන් මේසෙන් තිබ්බා..

" වතුර එක අරන් බෙහෙත් බොන්න.."

" ම්ම්ම්.."

මම වතුර බෝතලේ අරන් වතුර බීලා නැගිට්ටා.. බෙහෙත් බොන්න මම?? පිස්සු හැදෙයි.. ඔය මගුල බිව්වම උගුරට එනවා විනාඩි පහෙන් පහට.. මම නැගිට්ටා විතරයි රධ්‍ය කාරයා මල පැනලා වගේ නැගිට්ටා දඩාස් ගාලා..

" උඹෙ ඔය මුරණ්ඩුකම තමා වරද් මට පේන්න බැරි.."

මෙකා එදා අර කිරි එක කටේ ගැහුවා වගේ බෙහෙත් ටික එක අහුරට අරගෙන මගෙ කට දෙපැත්තෙන් අල්ලලා බලෙන්ම කටට බෙහෙත් අහුරම දැම්මා.. වස තිත්තයි.. අප්පිරියාවෙ බෑ..

" ඇක්.. මොන-ඒ වතුර වතුර.. වතුර එක දෙනවා.."

මම වතුර බෝතලේ අරගෙන බීගෙන බීගෙන ගියා..සැක් දිවේ බෙහෙත් පෙත්ත ඇලවුනාද කොහෙද.. තිත්ත රහ යන්නෙත් නෑ.. මම වතුර බෝතලෙන් බාගයක්ම බීගෙන බීගෙන යද්දි මේ පොල් කාවයියා මනමාල හිනාවකුත් දාගෙන මගේ දිහා බලාගෙන හිටියා.. මොන නරියෙක්ද මන්දන්නෙ නෑ.. යකෝ මෙහෙමද ලව් කරන උන්.. මෙකා මට කරන්නෙ බලහත්කාරකම් නෙ.. හක්කත් පැන්නද මන්දා අල්ලපු පාර..

" මොකද රවන්නෙ.."

" මට ඕන නිසා.."

" හ්ම්ම්.."

රධ්‍ය අයියා ලොකු දෙයක්කියන්න වගේ හුස්මක් උඩට ගත්තා.. මට බය හිතෙනවනෙ..

@Shan

" වරද්.. මේ අහපන්.. මට උඹට කියන්න දෙයක් තියෙනවා.. ඒවුනාට දැන්ම නෙමේ.. සමහරවිට උඹ දන්නව ඇති මම මොකක් ගැනද කියන්නෙ කියලා.. ඒ ලෙවෙල් ඉවරවෙනකල් ඉදපන්.. මම ඒක උඹට කියන්නම්.."

රධ්‍ය අයියා එකපාර මූණ වෙනස් කරගෙන හෙන සීරියස් විදියට කියද්දි මම ඇස් දෙකත් ලොකුකරගෙන එයා දිහා බලාගෙන හිටියා.. ඒ කියන්නෙ.. ඒ ලෙවෙල් ඉවරවෙනකල් ඉන්නව කිව්වෙ.. රධ්‍ය අයියා කැමති.. මගෙ දෙයියනේ..

" තේරුනාද..මිම්??"

රධ්‍ය අයියා මගෙ ළගටම ඇවිත් මගෙ කොන්ඩෙ අවුස්සලා කියද්දි මම හිටියේ බයෙන් බිරාන්ත වෙලා යකෙක් ගහපු එකෙක් ගානට.. මට එකපාර  ඔක්කොම මොලේට යන්නෙත් නෑ.. දාහක් දේවල් හිතෙනවා.. රධ්‍ය අයියගෙ ඇස් දිලිසෙනවා.. කළුපාට ඇස් වල ඇහිපිය ගැහෙන වාරයක් ගානෙ මට දැනුනේ ලෝකෙම නතරවෙලා වගේ.. මගේ වටේ තියන මෙලෝ දෙයක් මට සිහියට එන්නෙ නෑ.. මම හිටියේ තනිකරම පුදුම වෙලා.. අනේ මන්දා.. හිතට සතුටක් දැනෙනවා.. බලාපොරොත්තුවක් ඉශ්ඨ වෙලා වගේ.. ඒ එක්කම ඉස්කෝලෙ පීරියඩ් එකක් ඉවරවුනු බෙල් එක වදිද්දි රධ්‍ය අයියා මගේ උරහිසේ හැප්පිගෙනම පංතියේ දොරෙන් එළියට ගියා..

වරද් රයිට් නව් :



සංසාර සිහිනේ පෙරමග මා සිටියා..මිම්..මිම්..

පොල් කාවයියා සහ උගුඩු පැටියා ලව් එක නැගලා යයි කියලා කියන අය හාටුවක් දමාන යන්න බලන්න..

හෙට නම් රෑ වෙයි අප්ඩේටු වලට සප්තලමලා.. ඕතරීට කාස්..

අද චැප්ටරේ හොදද මන්දා.. මට හෙන ගහලා වගේ ෆීලින් එකක් දැනෙනවා.. මොනව ලිව්වද නැත මට වැටහෙන්නේ.. ඔයාලට කියන්න අනෙව් මෙකෙ ඉස්සරහ කොටස් ලියන්න මට හෙන උනන්දුවක් තියෙන්නෙ.. මෙහෙම සිරාම ගැම්මෙන් කතාවක් ලියන පලවෙනි සැරේ

@Shan

මේ.. නැත්නම් ඔබතුමියන්ලා දන්නවනෙ.. හෙහේ.. ඩාම් වෙනවා ඩූම් වෙනවා අප්ඩේට් දෙන්න පරක්කු වෙනවා..මේක ඒම නෑ.. මේ මාසෙ ලියලා ඉවරකරන්න බලනවා..

කතාවෙ චැප්ටර් ගාන පොඩ්ඩක් වැඩි වුනාට කමක් නැද්ද ලමයි..

ඉක්මනින් එන්නාම්..

ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම් යම් කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 22 කොටස

" Hey, hey, hey

Just think, while you've been getting down and out about

The liars and the dirty, dirty cheats of the world

You could've been getting down to this sick beat.."

" සුදුමහත්තයා..."

" My ex-man brought his new girlfriend

She's like "Oh, my God", but I'm just gonna shake

And to the fella over there with the hella good hair

Won't you come on over, baby?

We can shake, shake

Shake

Yeah, yeah.."

" ළමයෝ.."

" 'Cause the players gonna play, play, play, plආව් අම්මේ.. මොකද අප්පා.."

මම ඉදියේ ඉස්තෝප්පුවට වෙලා හැන්ඩ්ෆ්‍රී දෙකත් කනේ ගහන් හයියෙන්ම සිංදුවක් දාගෙන.. මට හෙන හැපි.. හැපී කව් චීස් එකේ ඉන්න කව්වා වගේ මම ටේලර් ස්විෆ්ට්ගෙ මෙල් වර්ශන් එක වෙලා සිංදුවක් කියාගෙන ඉන්නකොට ඔලුව මැද්දටම පොල් ගෙඩියක් වැටුනා වගේ අම්මගෙන් හොද ටොක්කක් කෑවා..

@Shan

" ගලවනවා ඔය කනේ ගහගෙන ඉන්න මගුල.. කන්න කතාකරනවා කරනවා ඇහෙන්නෙ නෑ.."

" මොකක්ද අප්පා වෙලා තියෙන්නෙ.. එන්නම් එන්නම් ඉතින්.."

" බෙරිහන් දෙනවා ගමටම ඇහෙන්න.. නාන්න ගියත් කනක් ඇහෙන්න නෑ පැය ගානක් ඒකෙ අස්සට වැදිලා බෙරිහන් දෙනවා.. ඇත්තමයි ලමයෝ මම.."

" හයියෝ මෙන්න පටන්ගත්තා බෙරිහන් දෙන්න.. අම්මා තනියම කියෝගෙන එන්න මම කන්න යනවා..You just want attention, you don't want my heart~"

"..Maybe you just hate the thought of me with someone new"

මම අම්මගෙ කම්මුලට තට්ටුවකුත් දාගෙන වටේකුත් කැරකිලා ගේ ඇතුලට ගියා..ම්ම්.. අම්මා කොමඩු ගෙනැල්ලද කොහෙද.. මරු මරු ..

" Watermelon sugar

High~"

මම කාලා බීලා කාමරේට ඇවිත් මෙසෙන් වාඩිවුනා.. 'මෙව හිතලා බැනෙ පාඩම් කරන්නෝන..' දැන්හැමදාම මේකම හිතලා හිතලා ඉබේම මට ඒක කටින් කියවෙනවත් එක්කන්.. ඒ වුනාට අද අමුතු කික් එකකුත් තියෙන එකේ විනාඩි පහක් හිතලාම පාඩම් කරනවා..

මම ෆෝන් එක අරගෙන වට්සැප් ලොග් වුනා.. සැක් මේ සෙනුක මොට්ට පරෙයියා.. මට හින්ට් එකට සිංදු කියලා එවනවා.. අපරාදෙ උෟට මම වෙච්ච දේවල් සේරම කිව්වෙ.. මටත් ඉන්න බැනෙ කට පියාගෙන.. ඒවුනාට කියලා හිත නිදහස් කරගන්නත් ඕනනෙ.. මම උෟට දවල් වෙච්ච සේරම උඩ පැන පැන කියද්දි මේකා අම්බලමේ පිනා වගේ චොක්ලට් එකකුත් කකා අංශු මාත්‍රයක්වත් පුදුම නොවී ඔහේ මගේ දිහා බලාගෙන ඉදියා.. මම පස්සෙයි දන්නෙ උෟත් මේක මුල ඉදලම දැනගෙන ඉදලා කියලා.. පව් රධ්‍ය කාරයත් හැබැයි.. ඔබ නොදනී මුළු ලොවම දනී වගේ ඉන්න ඇති.. කමක් නෑ ඔන්න ඔහේ මම දිගටම හාර්ඩ් ටු ගෙට් රෝල් එක ප්ලේ කරගෙනම ඉන්න ඕන..

@Shan

" ඇස ගැටෙනා දස දහසක් නෙතු මත

ඔබෙ දෑසම මා සෙවූ තරම්

ඒ නෙතු කිසි දින මා සතු නොව බව

දැන දැන මා පෙම් කෙරූ තරම්

ඔබ නොදනී මුලු ලොවම දනී.. ම්ම්..ම්ම්..~"

ඒ වුනාට දෙයියනේ මගේ හදවත උඩපනිනවා වගේ සතුටට.. නිකමට හිතන්න.. තමන්ට කවුරුහරි කෙනෙක් අවුරුදු ගානක ඉඳලා සිරාම ලව් කල්ලා.. ඒකත් රධ්‍ය වගේ මෙලෝම එකෙක් දිහා හැරිලා හිනාවෙන්නෙවත් එකෙක්.. අනික අනේ කොහොමද අප්පා මම වචනෙන් කියන්නෙ.. මටම කොච්චර දේවල් හිතන්න තියෙද.. හෙන කාලෙකට පස්සෙ මගේ හිත අද පිරිලා ඉතිරිලා ගිහින්ම තිබ්බෙ සතුටින් විතරයි..

**"..ඒ ලෙවෙල් ඉවරවෙනකල් ඉඳපන්.. මම ඒක උඹට කියන්නම.."**

මට රධ්‍ය අයියා කිව්ව වචනයක් ගානෙම අයෙ මතක් වෙද්දි මම ඇඳට පැනලා කොට්ටෙට මූන ගහගත්තා.. ඒ ලෙවෙල් ඉවරවෙනකල් ඉන්න ඕන නෑනෙ ඉතින්.. දැන්මම ඇහුවනම් ඉවරයිනෙ.. කමක් නෑ ඌ හිතන පතන විදිය වෙන්න ඇතිනෙ.. ඒවුනාට මම උගෙ වෙන්ඩ බෝයිෆ්‍රෙන්ඩ් කියලා හිතද්දිත් බඩේ මොක්කුද..මේ.. ආ.. සමනල්ලු.. සමනල්ලු නටනවා නටනවා වගේ.. මම හුස්ම හිරවෙලා මැරෙන්න වගේ එනකල් කොට්ටෙට මූණ ගහගෙන ඉද්දි ෆෝන් එකෙන් විසිල් සද්දයක් ආවා.. මැසේජ් එකක්.. දෙයියනේ රධ්‍ය.. වෙන්න මගේ ඇටිකෙහෙල් උගුඩුවා..

" වරද්.. ඔයා ඉන්නවද..??"

ඉන්නවා තමයි ඒයි නැතුව උඹ මට කැමති කිව්ව පලියට මම මැරෙන්නද.. මාර කතා තමා අහන්නෙ..

" ම්ම්.."

මම එම් එකුරු දෙකක් යැව්වා.. වැඩිය නටන්න හොද නෑ.. පොඩ්ඩක් ගැම්මෙන් ඉන්න ඕන.. හරිනෑනෙ..

@Shan

" පාඩම් කරනවද..??"

" කරනගමන් ඉදියෙ.."

" ඈ බොල ඔන්ලයින් ඉදගෙන තොපි පාඩම් කරන්නෙ.."

සැක් මූ ඉස්සරහා ලැජ්ජවෙන එක ඇයි දෙයියනේ ඔබවහන්සේට නවත්තගන්න බැරි.. ඉදලා ඉදලා පෙම් මලක් මේ කුළුදුල් හිතේ පිපීගෙන එනවා ඔබවහන්සේට දරාගන්න බැරිද..

" නෑ නෑ එහෙම නෙමේ සෙනුක එක්ක කතාකලා.. ඒකයි ඔන්ලයින් ඉදියෙ.."

" ෆෝන් එක තියලා පාඩම් කරන්න.. දැන් මීට එක තියලා ඉවර කරපු ගමන් එක්සෑම් පටන් ගන්නවා ඔයාලට.."

" ගෞරවයෙන් බුදුසරනයි!!"

මම ස්ටිකර් එකක් යැව්වා.. මොනවද අප්පා මේ මැසේජ් කරන්නෙ.. මූඩ් එකත් ගියා එක්සෑම් එකක් ගැන කියවලා.. සකලබුජං රධ්‍ය කාරයා..

" 😂😂 පිස්සුද බං උඹට.."

" ඔව් ඔව් පිමිසු.."

" ඒක මං දන්නවා.. ඉදපන් මම අපෙ අයියගෙන් අහලා උඹව සයිකැට්‍රිස්ට් කෙනෙක් ගාවට එක්කන් යන්න ඉන්නෙ.."

" ඌප්ස්.. ආධ්‍ය අයියගෙන්ද.."

" ම්ම්.."

" එයා හෙන හොදයි නේද.."

" මගේ අයියනෙ බං.. හොද වෙන්න එපැයි.."

" අනේ මේ මම කිව්වයි කියලා හිතාගන්නවා.. තවුසෙ මහ හිවලෙක්.."

@Shan

" උඹ දැකලා තියෙද මං හූ කියනවා.."

" නැතුව.. මම දවසක් දැක්කා ඇත්තටම තවුසෙ හූ කියනවා ග්‍රවුන්ඩ් එක මැද්දෙ ඉදන්.."

" පලයං යන්න.. කිව්වා මම හූ නෙමෙයි.."

" පම්කක්.."

" වරද්..!!! කුනුහර්ප කියන එක නවත්තපං.."

" ඇයි ඉතින් ඒක කුණුහර්පයක්ද අයියො.."

" උඹ දන්නෙම නෑ.. අනේ මේ.."

මම කොට්ටෙත් හපාගෙන ඌව අවුස්සද්දි මෙකා රිප්ලයි කරන්නැතුව ඉදියා.. තරහ වෙලාද කොහෙද.. තොත්ත බබාට කුක්කු දීලා නිදිකරවන්න කියනවද.. අනික කොල්ලොනෙ අප්පා.. තියා අර මහීශා ඒකි කෙල්ලෙක් වෙලත් කියන්නෙ.. කුණුහර්පයක් කිව්වම ගෙවෙනවද නැනෙ.. සැක්.. කුක්කු දීල දොයි-.. මොන මගුල්ද මම මේ හිතන්නෙ..

" මේ අයියෙ.."

" ම්ම්."

" මම පොඩී බඩ්ඩක් කියන්නද.."

" ම්ම්.."

" පොඩි බඩ්ඩක්.."

" අනේ මේ උඹ නටපං.. මම යනවා.."

මූට ලගදිම කොහිල අලයක් මම අමුවෙන් කවනවා.. මෙකාට අර්ශස් අමාරුවද කොහෙද.. මෙච්චර තරහ යන්නෙ.. මලබද්දකාරයා..

" නෑ නෑ අනේ පොඩ්ඩක් ඉන්නවකො ඉතින් අහන්න.."

@Shan

" කියනවා ඉතින්.."

" ඇයි ඉතින් ඔයා ඒක අහන්න ඒ ලෙවෙල් ඉවරවෙනකල් ඉන්නෙ..?? වරද් කුතුහලෙන්නෙ ඉන්නෙ.."

මම ඇඟිලි දෙකක් එකට හප්පන් ඉන්න ඉමොජි දෙකකුත් යැව්වා.. ටයිපින්.. ටයිපින්..

" එහෙනම් කුතුහලෙන්ම ඉදපන්.."

සැක් මෙ හැපීකව්වා.. මූටම මමත් ලව් කරනවනෙ..

" අනේ මේ කියන්න බැරිනම් නිකන් ඉන්නවා.. අනික මම තවුසෙට කැමතිත් නැනෙ.. කොහොමත්.."

දෙන්න හිතයි මුගේ ඔලුව මැද්දට ඇද පොල්ලක් ගලවලා.. අම්මපා ලග පාතක ඉදියනම් දෙනවා පැලෙන්නම ඔලුගෙඩිය..

" එහෙම නෙමෙයි වරද්.. ඔයා එක්සැම් එක්කයි බාහිර වැඩ එක්කයි බිසී.. ඉතින් වෙන දේකට කාලෙ වෙන් කරන්න ඕන නෑ.. ඉගන ගන්න කාලෙ ඒක හරියට කරන්න.. මමත් උඹෙ වයස පහු කලානෙ.. අනික මම විතරක් එක්සැම් ඉවරකලා කියලා උඹෙන් අහන්න බැනෙ ඒක මහ සෙල්ෆිශ් වගේ නැද්ද. ඒකයි මම කියන්නෙ.. පොඩ්ඩක් ඉදපන්.."

රධ්‍ය අයියා දිග මැසේජ් එකක් ටයිප් කල්ලා එව්වා.. අනේ මන්දා එයා හරි අමුතුයි.. හිහන පතන විදිය වුනත්.. වෙනස්.. මට තාම රධ්‍ය අයියගෙ මේ සයිඩ් එක හිතාගන්න බෑ.. මම ජීවිතේට හීනෙකින්වත් හිතුවෙ නෑ රධ්‍ය අයියා එක්ක මෙහෙම කතාකරන්නවත් පුලුවන් වේවි කියලා.. මොකද මගෙ හිතෙත් කැමැත්තක් විතරයි තිබ්බෙ ඒකත් හරියටම ශුවර් නැති එකක්නෙ.. රධ්‍ය අයියා හැමතිස්සෙම ඔහොමයි.. ආදරේ පෙන්නන්නෙ නෑ ඒ වුනාට ඒක හෙනටම දැනෙන්න දෙනවා.. මම කියන්නෙ මම ගැන නෙමේ එයාගෙ යාලුවො එක්ක ඉද්දි වුනත් එහෙමයි.. හුගක් පොඩිම දේ ඉදලා හැමදේම.. මම දැන් හිතද්දි මට මතක් වෙන්නෙ රධ්‍ය අයියා ඒ දවස් වල මම දිහා බලන් ඉන්න හැටි.. වෙලාවකට දුකින්.. වෙලාවකට සතුටින්.. පහුගිය මාසෙටම මට කරදරයක් වුනු හැමතැනකම එයා ඉදියා.. සමහර විට පහුගිය අවුරුදු වල දුරින් බලන් ඉන්න ඇති..

@Shan

එක අතකින් රධ්‍ය අයියා තනියම ආදරේ කල්ලා දුකින් ඉන්න ඇති.. කොහොමත් මම දන්නවා තනියම ආදරේ කරන එක මහ දුකක්.. ඉතින් රධ්‍ය අයියා දුකින් ඉන්න ඇති.. මම කිසි ගානක් නැතුව හැසිරෙද්දි එයාට දුක හිතෙන්න ඇති.. මට දවසක් ආච්චිඅම්මා කිව්වා

**මෙ මහපොලොව උඩ ඉන්නවා කියලා, කාටවත්ම පේන්නෙ නැති පේන්න එන්නෙත් නැති ඒ වුනාට හදවතේ ආදරේ මහගොඩක් පුරෝගත්තු පුදුමාකාර මිනිස්සු.**

. මම හිතුවා.. එයත් ආච්චිඅම්මා මට කියලා දීපු පුදුමාකාර මනුස්සයෙක්ද කියලා..

මම දුන්නු පුංචිම පුංචි මලත් පරිස්සමට කවරෙ අස්සෙ දාගෙන ඉදියේ ආදරේ නිසා නෙමෙද.. මෙක මහා ලොකු මිනිස්සුන්ගෙ පරිණත හැගීම් වලින් පිරුනු කවි දාස් ගානක් ලියන්න තරම් ආදරයක් නෙමෙ.. ඒක මමත් දන්නවා එයත් දන්නවා.. ඒ වුනාට වටේ පිටේ අපි අතරේ වුනු පුංචිම දෙයක් වුනත් පරිස්සමින් මතකයක් කරගෙන හිතේ හිරකරන් ඉදියේ රධ්‍ය අයියා ආදරේ නිසා නෙමෙද.. ඕවා හිතද්දි මටම හිතෙනවා මේ පැය ගානට මම ආදරේ ගැන දන්නෙ මොන ලබ්බක්ද කියලා.. ඇත්තනෙ මම දන්න දෙයක් නෑ.. ඒ වුනාට මම හරි ආදරෙයි.. අද ඉදලා වෙන හැම දේකටම මට ආදරේ හිතෙයි.. සමහරවිට මෙච්චරකාලෙකට මට පවුලෙන් නොලැබුනු පිරිමියෙක්ගෙ ආදරේ එයා දෙයි.. මම හුගක් බලාපොරොත්තු පොදි බැදගත්තා..

" ම්ම්.."

මම රධ්‍ය අයියට කියන්න දෙයක් නැති කමට අකුරු දෙකක් ටයිප් කල්ලා යැව්වා.. මම මොනවා කියන්න.. මට විහිලු කරන්න මානසිකත්වයක් මුලදි තිබ්බත් දැන් ඒ හැගීම සහමුලින්ම නැතිවෙලා ගිහින් තිබුනා..

" දැන් හොද ලමයා වගේ පාඩම් කරන්න යන්න.. සදුදා මැවස් වලට කලින් බුදුමැදුර ළගට එන්න පුළුවන්ද..??"

" මම එන්නම්.."

@Shan

මගේ සකලබුජංලා ටික.. කෝමද අනේ ඉතිම්.. මේක කොටයි මම දන්නවා.. පුලාන් උනොත් උදේ වෙන්න කලින් තා එකක් දෙන්නම් මම.. ඕතරී ජුක හිච්ලා ඉන්නෙ.. අම්මා මට සබන් බෝල පුම්බන එකක් අරන් දුන්නෑ අද මම ඉල්ලුවට.. බැන්නා මට නෝලිමිට් එකේ හිටිය ලම්සන අයියා කෙනෙක් ඉස්සරහම.. දැන්වත් වයසට හැසිරියන් කියලා.. දුකයි මට..

ගිහින් එන්නම් සකලබුජම්ලා.. 😂 ඔවරීට මොංකල්

ලව් යූ..

( බුදුමැදුර පිටිපස්සෙ මේ ඇටයො දෙන්නා මක් කොරන්න යනවත)

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 23 කොටස

සෙනුකයා සෙනසුරාදා අපේ ගෙදර ආවා.. මේ වැඩ අස්සෙ ඌටයි මටයි පාඩම් වැඩ හෙනට මගෑරිලා තිබ්බෙ.. ඉතින් දවසෙම වගේ ඌයි මායි ගනන් හැදුවා තව පේපර්ස් වගේකුත් කලා.. කලාට පස්සෙ හවස පහට තිබ්බ ක්ලාස් එකට අපි දෙන්නම ගියා.. ඉරිදා මුළු දවසත් ක්ලාස් වලම ගෙවිලා ගිහින් ඉක්මනටම සඳුදා වුනා.. සති අන්ත ගෙවෙනවා එහෙ බලලා මෙහෙ බලද්දි.. දන්නෙමත් නෑ පෙබරවාරි මාසෙ අන්තිමටත් කිට්ටු වෙලා.. ඇත්තටම දවස් ගෙවෙන්නෙ හිතාගන්නත් බැරි ඉක්මනින්.. ඔකෙන් මෙකෙන් ඉතින් එක්සෑම් එක කට ලඟටම එන එක තමා සිද්දවෙන නරකම දේ..

සති අන්තෙටම රධ්‍ය අයියා හවසට මැසේජ් එකක් දාලා 'හොඳට පාඩම් කරන්න' 'රෑ වෙන්න කලින් ගෙදර එන්න' 'යාලුවො එක්ක රස්තියාදු ගහන්න එපා' 'වෙලාවට කෑම කන්න' 'නිදිමරන්න එපා' 'බැරි ගානක් තියෙනවනම් එවන්න මම හදලා එවන්නම්' ඔය වගේ උවමනාම දේවල් අහනවා මිසක් වෙන දේවල් කතාකරන්න ගියේ නෑ.. කොහොමත් ඌ වල්පල් කියවන්න එච්චර කැමති එකෙක් නෙමේ.. වල්පල් කිව්වෙ අනුන්ගෙ දේවල්.. නැත්නම් මම මොනවහරි මං ගැන හරි, අපෙ අම්මා ගැන හරි, වෙන මම කැමති දෙයක් ගැන කියවද්දි නම් අහගෙන ඉදියා.. හුගක් වෙලාවට මොකක් හරි සිංදුවක් ගැන අපි කතාකලා.. මහ ගොඩක් නෙමෙයි ඒ වුනාට අපි දෙන්නම කැමති ආටිස්ට්ලා හිටියා.. ඒ කතාකලත් පැය බාගෙකට වඩා අපි කොහොමවත් කතාකලේ නෑ.. රධ්‍ය අයියා වගේමයි අයුක අයියත්, සෙනුකයට සපෝට්ව් කොල්ලෙක්.. ඒ ඔෆිශියල් කපල් එකක්නෙ.. නැනීලා දෙන්නා අපිව හොඳට බේබිසිට් කරනවා.. කොර..!

සඳුදා උදේ මම හිටියෙ පොඩ්ඩක් කලබලෙන්.. අද මැච්.. එදා පිස්සු නට නට ඉදියා මිසක් හරිහැටි ප්‍රැක්ටිස් කලෙත් නෑ.. කමක් නෑ දැන් ඉතින් අවුරුදු හයක් තිස්සෙම මේ මගුල එහාට මෙහාට වනලා එහෙම අමතක වෙන්නෙත් නැනෙ ඉතින්.. මම මැච් වලදි මම අඳින්න ගන්න ටයිට් ශෝට් එකයි ඇඩ්‍රොඩයිට් එකේ නේම් ප්‍රින්ට් කරපු ආම් කට් ශර්ට් එකයි බොටම්යි තව ෂර්ට් එකකුයි ස්පෝර්ට්ස් බෑග් එකට ඔබා ගත්තා.. අන්ඩර් ට්වෙන්ටි ප්ලේ කරද්දි හවස් වෙයි.. මුලින්ම තියෙන්නෙ පොඩි ළමයින්ගෙ නෙ.. මම උවමනා සේරම දේවල් අරගෙන ගෙදරින් එද්දී අම්මා වඳින වෙලේ ඔලුව

@Shan

අතගාලා කිව්වෙ 'උඹ අන්ඩක් කඩාගෙන ආවොත් අනිත් අණ්ඩත් කඩලා දානවා' කියලයි.. මහ කුරිරුයි අපෙ අම්මත්..

මම ඉස්කෝලෙට ආපු ගමන් චේන්ජ් කරගත්තා.. කෝච්ලා තුන්දෙනෙක් ඇවිල්ලා ජිම් එකේ නෙට් ඇදලා ඒවා හරිගස්සනවා.. ගියාට කරන්න දේකුත් නැනෙ නෆ්‍රාස් උදේ මම එද්දිත් එන්ට්‍රි බාරදීලත් ඉවරයි.. ඒ අස්සෙ අරකා එදා බුදුමැදුර ගාවට එන්නත් කිව්ව නිසා මම හිමිහිට පඩිපෙළත් බැහැලා පොකුණ ගාවින් හැරිලා ඇඹරුල්ලා කොළේකුත් කඩාගෙන බුදුමැදුර පැත්තට ආවා.. පොකුනෙ ඉබ්බා පාඩුවෙ ගලක් උඩට වෙලා බෙල්ලත් එලියට දාගෙන පාළුවෙ බලාගෙන ඉන්නවා.. ඉස්සර හිතුවට ඉතින් ඉබ්බා වගේ තනිකඩව ඉන්නවා කියලා.. ඇම් රියලි සොරි ඉබ්බෝ.. මට චෙන්ඩ බෝයිෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්නවනෙ.. මම විශ් කරනවා ඔයාටත් හොඳ ඉබ්බියෙක් හම්බෙලා ඉබි පැටව් ගොඩාක් හදාගෙන සතුටින් ඉන්න පුලුවන් වෙයි කියලා..

මම උඩ පැන පැන බුදුමැදුර ගාවට එද්දි රධ්‍ය අයියා ඉන්නවා එතන බිත්තියට කකුලකුත් තියාගෙන සේපාලිකා ගහ උඩ බලාගෙන.. මේ කිව්වට ඒක උස ගහක් නෙමේ.. අපේ ඔලුවල අතුත් ගෑවෙනවා.. එන සුවදට මටනම් පොඩ්ඩක් ඔලුව රදේ අල්ලනවා.. සුවද වැඩිනෙ.. මේ පැත්තට කවුරුත් එන්නෙත් නැති නිසා වෙන්නැති මට මෙතෙන්ට එන්න කිව්වෙ.. මම ආවා කියලාවත් ගානක් නෑ මෙකා උඩ බලාගෙන ඉන්නවා.. මම ගිහින් ඌට කකුලෙන් එකක් ඇන්නා..

" ගුඩ්මෝනින්.."

" ගුඩ්මෝනින්.. දැන්ද ආවෙ.."

" ටිකක් වෙලා.. මම චේන්ජ් කරගන්න ගියා ක්ලාස් එකට.."

" ම්ම්.."

මම හිනාවෙලා රධ්‍ය අයියා ගාවම හිටගෙන බිත්තියට හේත්තු වුනා.. අපි අතරෙ විශේශ දෙයක් සිද්දවුනේ නෑ.. ඒ වුනාට රධ්‍ය අයියා සතුටින් ඉන්නවා වගේ මට දැනුනා.. මං නිසා වෙන කවුරුවුනත් සතුටින් ඉද්දි මටත් දැනුනේ සතුටක්.. ඉතින් මේ වෙලාවෙත් මට එහෙම දැනුනා.. එයාගෙ දිගටි ඇස් පිහාටු සැරින් සැරේ පියවෙද්දි ඒ ඇස් වල තිබ්බ දිලිසෙන ගතිටයි සැහැල්ලුවයි මම හොදටම දැක්කා.. මගේ පපුව හිරිවැටෙනවා..

@Shan

ඉස්කෝලෙ කවුරුත්ම එන්නෙ නැති බුදුමැදුර ගාව සේපාලිකා ගහ යට රධ්‍ය අයියා හිටගෙන ඉද්දි ඊට එහාපැත්තෙන් ඉදපු මම බිම පුරාම තැබිලිපාට නැටි තිබ්බ සේපාලිකා මල් විසිරිලා තියෙන හැටි බලාගෙන හිටියා.. අපි මොකුත්ම කතා නොකලත් තව තව එහෙම ඉන්න හිතුනා..

" හෙට යන්න එනවද.."

" ඕ එන්නම්.."

" කොටුවට ගිහිල්ලා ඒ බඩු ටික අරගෙන අපේ ගෙදරින් තියමු.."

" එහෙම හොදයි.. "

" මම අම්මට කතාකල්ලා අහන්නද.."

" මම ඇහුවා, එතකොට කිව්වා ගිහින් එන්න කියලා.. ඔයාට ඕනමනම් අහන්න ඉතින්.."

" කමක් නෑ කෝකටත් මම අහන්නම්.. ක්ලාස් යන්නත් තියෙනවනෙ.. ඒකනිසා.."

" හා.."

හවුස් මීට් එක තියෙන දවස් ලගම එන නිසා ඩෙකරේශන්ස් වලට ඕන බඩු වගේකුයි ෆ්ලැග් හදන්න ඕන රෙදි අනම් මනම් ගන්න හෙට කොටුවෙ යනවා කියලා මමයි කියාන් අයියයි රධ්‍ය අයියයි හිතාගෙන හිටියේ.. පුලුවන් වුනොත් නත්‍යාසයත් එනවා කිව්වට අන්තිමෙ මේ සතියේ මැවස් වැටුන නිසා යන්න ඉතුරුවුනේ අපි දෙන්නා විතරයි.. කොහොමත් වැඩිය ඇවිදින්නැතුව උවමනා දේවල් ඉක්මනට අරගෙන එන්න අපි හිතාගෙන ඉදියෙ.. මට හෙට හවස ක්ලාස් එකකුත් තියනවා.. ඒකනිසා රධ්‍ය අයියා කිව්වා උදේ වැඩේට ගිහින් හවස ක්ලාස් එකෙන් ඩ්‍රොප් කරන්නම් කියලා.. ඌට පුලුවන් නම් මටත් මොකද කියලා මමත් හා කියලා නිකන් ඉදියා..

" ම්ම.. දැන් ජිම් එකට යමු.."

රධ්‍ය අයියා සාක්කුවෙන් වොච් එක අරගෙන වෙලාව බලලා ආයෙම ඒක සාක්කුවට දාගත්තා.. මෙකා මෙක අතේ බදින්නැතුව මගුලටද සාක්කුවෙ

@Shan

දාගෙන ඉන්නෙ.. මම අඳුරන උන් හුගක් ඔහොමයි.. වොච් එක තියෙන්නෙ අතේ නෙමෙ සාක්කුවෙ.. මටනම් කොටින්ම වොච් එකක් තිබ්බට ඒක තියෙන්නෙ අල්මාරියෙ.. මොකද මම ඕක දාගෙන ඉදියේ එක දවසයි එදාම වීදුරුව බිදගත්තා.. මට ඕවගෙන් අපලයි.. ඒකනිසා ෆෝන් එකෙන්ම වෙලාව බලන එක හොදයි..

" හොදට ප්ලේ කරන්න.. ලොකුවට ස්ට්‍රෙස් වෙන්න ඕන නෑ.."

රථ්‍ය අයියා හිටිය තැනම ඉදගෙන අත දික් කල්ලා මගෙ කොන්ඩෙ පොඩ්ඩක් ඇවිස්සුවා.. මේ යකා බලන විදියට බගේ බඩේ සමනල්ලු වන්නම් නටනවා වගේ.. මම ලාවට හිනාවෙලා ඔලුව ගස්සලා මෙහාට කරා.. සැක් මට ලැජ්ජ හිතෙනවනෙ..

" ඔච්චර රතු වෙන්න එපා බං.. බලපන් උඹ දිහා බැලුවම බය හිතෙනවා.."

රථ්‍ය අයියා හයියෙන් හිනාවේගෙන ඉස්සෙල්ල යද්දි මමත් බිම දිගේ කකුල් ඇදු ඇද වගේ උගේ පස්සෙන් ජිම් එකට ගියා.. යද්දි කියාන් අයියයි සයෝන් අයියයි අපි දිහා බලලා හිනාවුනා..

" මෙකා එදා පිස්සු කෙළ කෙළ ඉදියා ප්‍රැක්ටිස් කලෙත් නෑ.. දෙන්නෙ උඹට අපේ හවුස් එක දෙක වුනොත් දැනගන්.."

කියාන් අයියා බොරුවට තරහ අරගෙන වගේ දත් මිටි කාගෙන කියලා මගෙ පිටට 'දබෝස්' ගලා එකක් අතැරියා.. මෙ හැලපයා මහ මොකෙක්ද මන්දා.. රිදුනත් එක්කන්..

" අනේ මේ මම කෙළපු පිස්සුවක් නෑ හරිත.. අනික මං පුරුදු වෙන්න කරන වැඩද මල්ලි මේවා.."

" මුගෙ කට යකෝ.."

අපි කියව කියව ඉදලා අන්තිමට මැචස් පටන්ගත්තා.. ප්ලෙයර්ස්ලා ඉදගෙන හිටියෙ ජිම් එකේ වම් පැත්තට වෙන්න හදලා තිබ්බ ස්ටෙයාර්ස් වල.. අපේ වයසෙ මම අඳුරන උන් කීපදෙනෙක්ම ඉදපු නිසා මම උන් එක්ක කියව කියව හිනාවෙවී හිටියා.. රථ්‍ය අයියා ජිම් එකේ ඉදියේ නෑ වැඩ වගයක් කියලා එළියට ගියා ආයෙ ආවෙම නෑ.. සයෝන් අයියයි අහිරු අයියයි කෝච්ලා ලග ඉදගෙන හිටියා..

@Shan

අවසානෙ මට ප්ලේ කරන්න සෙට් වුනේ හවස එකට විතර.. මුලින්ම ඇෆ්‍රොඩයිට් එකත් එක්ක තිබ්බෙ සියුස් එක.. ඔක්කොම මම ස්මූත්ලි ප්ලේ කලා.. ලොකුවට ගානක් ගියෙත් නෑ.. ඔහොම ප්ලේ කරගෙන කරගෙන යද්දි ෆයිනල් රවුන්ඩ් එක මට ප්ලේ කරන්න තිබ්බෙ සියුස් එකේ චමිරු එක්ක.. චමිරුවා තමයි මේ ටිකට ප්ලේ කරන්න අමාරු එකෙක්ට හම්බුන එකම එකා.. ඌ දැන් නෙට් එක එහැපැත්තෙ ඉදන් මගේ දිහා බලාගෙන ඉන්නෙ මාව කන්න වගේ මූණක් හදාගෙන.. මූට මාත් එක්ක වෙන තරහක් තියෙනවද මන්දා මම මට තියෙන කියුට්ම හිනාව දාලා මෙහාට වෙලා ඉද්දි මේකා හැටට හැටේ මට රවනවා ඉවරයක් නෑ.. මොන මගුලක්ද.. මමත් හිනාවෙන්නැතුව මෙහාපැත්තෙ ඉදන් රැව්වා.. ආයෙනම් මේ බේසිකයා එක්ක හිනාවෙන්නෙ නෑ.. ඇටේ තලන්න තියෙන්නෙ..

මම දැක්කෙම නෑ රධ්‍ය අයියා ඇතුලෙ ඉන්නවා.. ඒ වෙනුවට කියාන් අයියනම් ඇවිත් හිටියා.. කවුරු නැතත් ඉතින් සෙනුකයා නම් ගිරිය පලාගෙන චියර් කරනවා මම දැක්කා.. මේ හෝතම්බුවා මගේ ග්ලූකෝස් ටික කකා මටම හූරේ දානවා.. මම හති දුසිමක් විතර හලාගෙන මූ ගාවට යද්දි මේකා ඒක කාලා ඉවරකල්ලා.. ඒ වුනාට කමක් නෑ ඉතින් බලන්න හරි ඌ ඉන්නවනෙ.. ඒකට අර මිනිහා ආවෙවත් නෑ..

හැඬුට ප්ලේ කරඤ්ඤ හැයි යැයි තමා.. වරෙන්කො මම කතාකරන්නෙ නෑ ඕකත් එක්ක.. තියා අර අයුක අයියත් හවස හිටියා මාත් එක්ක ඉන්ටවල් එකේ කතාකලත් එක්කන්.. මට එපා ඔය ගැටපොලොස් කොට්ටෝරුවව පොල් කාවයියා.. මම  අවසාන ටිකේ හිටියේත් පට්ටම අවුලෙන්.. ඒ අස්සෙ චමිරු කියලා එකෙක් මට රවනවා ඉවරෙකුත් නෑ.. අනික මටත් මහන්සී.. ඔක්කොම ප්ලේ කලේ මම තනියම.. මාස ගානකින් හරියට එක්සයිසස් මේන්ටේන් නොකරපු නිසා මසල්ස් පේන් එකක් ඇවිල්ලා උරහිසත් කැක්කුමයි එපාවෙන්නම..

ෆයිනල් රවුන්ඩ් එක ප්ලේ කරද්දිත් අපේ හවුස් එක හුගක් එහයින් හිටියා.. මම මේක ප්ලේ නොකර හිටියත් ඉතින් මහලොකු අවුලක් නෑ.. රිසර්ව් ඉන්න එකෙක් දාල මට වාඩිවෙලා ඉන්න තිබ්බත් මම තියෙන පුපේ අමාරුවට ප්ලේ කරන්න ගියානෙ.. මැද හරියක් ප්ලේ කරද්දි මගෙ අතින් දෙපාරක් විතරම මිස්ටේක් වුනා.. උරහිස ගැලවෙන්න වගේ කැක්කුමක් එනවා.. මට ඒ අතින් රැකට් එක අල්ලන් උස්සන ඉන්නවත් බෑ.. ඒ මදිවට එහාපැත්තෙන් ඉන්න පුත්තලම් බූරුවත් මගෙත් එක්ක මොන තරහක් පිරිමහනවද මන්දා මම මිස්ටේක් කරන කරන සැරයක් ගානෙම මට

@Shan

කින්ඩියට හිනාවෙනවා.. ඔහොම විනාඩි පහලොවක් ප්ලේ කරන්න ඇති මගෙ අතින් රැකට් එක අතෑරුනා.. මම එහෙමම ජිම් එක මැදෙ ඉන්දවුනා.. උරහිස ගැලවෙන්න වගේ මෙ පාරනම් පැන්නද කොහෙද මම අත අනිත් අතින් තද කල්ලා මිරිකගෙන බිම හාන්සිවුනා.. එතකොටම වගේ ෆස්ටෙයිඩ් යුනිට් එකේ අයියලා දෙන්නෙකුයි කෝච්වුයි මගේ පැත්තට දුවගෙන ආවා මට පෙනුනත් මම කැක්කුමටම ඇස් දෙක තද කල්ලා පියාගත්තා.. අම්මටසිරි වෙන්න රිදෙනවා.. ඉවසගන්න බෑ..

" ෂනෙරු.. පුතා.. ඔහොමම ඉන්න හෙල්ලෙන්න එපා!!"

සර්නම් කියයි මටනෙ රිදෙන්නෙ ###..

" ආව්.. අම්මාහ්..!!!!!!!!!!!!! අනේ අයියේ රිදෙනවා හලෝ.."

" ආර්හ්!!!!!!!!!!!!!! රිදෙනවා ඕයි අයියෙ.. මොන-"

" අම්මට කෝල් එකක් අරගෙන දීපන් අම්මාහ්!!"

මම හිටියෙ ඉස්කෝලෙ සික් රූම් එකේ සෙනුකයයි කියාන් අයියයි එක්ක තව ෆස්ට් එයිඩ් යුනිට් එකේ අයියලා දෙන්නෙක් ඇද දෙපැත්තෙ ඉදගෙන මොකක්ද මගුලක් ගාලා මගේ උරහිස එහෙටයි මෙහෙටයි කරනවා.. මට වූ යන්න රිදෙනවා.. මුන්ට කියන පමකක් තේරෙන්නෑ රිදෙනවා කියද්දිත් තියාගෙන අඹරනවා.. ඒ අස්සෙ ස්කූල් ඩොකා මොකෙක්ද මන්දා අරහෙම කරන්න මෙහෙම කරන්න කියලා ගියා.. උගෙ අම්මට- මට එනවා කියන්න හොදවයින්..

" මුගෙන් ගුටිකාලා අපේ ඇගවලුත් රිදෙනවා.. දගලන්නැතුව ඉදපන්කො මල්ලි.."

ෆස්ටෙයිඩ් එකේ අයියකෙනෙක් සසර කලකිරිලා වගේ කියාන් අයියට කියද්දි කියාන් අයියා මට රව්වා.. කොහෙද දන්නෙ නෑ අර පුත්තලම් බූරුවා.. ඕකව එපා මට එපාමයි.. මම මෙහෙ ඉන්ජර්ඩ් වෙලා ඉන්නවා බලන්නවත් ආවද.. නෑනෙ නෑනෙ.. ඕකගෙ බොරුව තනිකර තියෙන්නෙ.. වරෙන්කො මම ඕකගෙ මූණටම කියනවා හොදවයින් දෙකක්.. හැකරුල්ලා..

@Shan

පැය බාගෙකට විතර පස්සෙ අරුන් දෙන්නා මගේ උරහිසටයි අතටයි බැන්ඩේජ් එකක් දාලා කර වටේ ආර්ම් ස්ලින්ග් එකකුත් දාලා යන්න ගියා.. සැක් දැන් ඉතින් එල්ලගෙන ඉඳපන්කො මේ ලබ්බ.. මම සෙනුකයටත් රවලා කියාන් අයියටත් රවලා කොට්ටෙ මූණට තියාගෙන ඉඳියා.. මොන මගුලක්ද.. මට ඕන නෑ එකෙක්.. අනික සික් රූම් එකේ ඉන්න එකත් ආතල්..

ඉස්කෝලෙ සික් රූම් එක කියන්නෙ ඉතින් හෙවන් එකක් තමා.. රූම් එක කිව්වට එකක් නෙමෙ පේලියට තුනක් හදලා තිබ්බා.. නිල් පාට කර්ටන් දාලා වීදුරු ජනෙල් වහලා ෆුල් ඒසී කල්ලා තියෙන්නෙ.. හෙන කොම්ෆි සිංගල් බෙඩ් එකයි ටවල්ස් අනම් මනම් ඔක්කොම තියලා තියෙනවා මට තියෙන්නෙ ආතල් එකේ ඉන්න තමා..

" ඒ ෂනෙරු මල්ලි රිදෙනවද.."

කියාන් අයියා එතන තිබ්බ පුටුවක් ඇදගෙන ඉඳගනිද්දි සෙනුකයා පව් ඒක මගෙ කකුල් දෙක අතගානවා.. මම කොට්ටෙන් මූණ අරගෙන උා දිහා බැලුවා.. පව් දෙයියනේ මේකා අඩන්න වගේ මූණ රතුකරගෙන තොලකුත් හපාගෙන කකුල් දෙක අතගානවා.. මට ඒකටනම් පට්ටෙටම දුක හිතුනා..

" ඒ බං මෙ සෙනුකයා.."

මම කතාකරද්දි සෙනුකයා ඇස් දෙකත් ලොකු කරගෙන මං දිහා බැලුවා..

" රිදෙනවද බං.. අමාරුවක් තිබ්බනම් ප්ලේ නොකර ඉන්න තිබ්බනේ.."

" ලොකු අමාරුවක් නෑ බං.. ඔක නවත්තපන්.. අයියෝ මොකද බං.. ඒ මෙහෙ වරෙන්.."

මම එල්ලගෙන ඉන්න අතින් නැතුව අනිත් අතින් උාට කතාකලා.. ඒකා මූන නැඹිලියක් කරගෙම මගේ ලගට ආවහම මම උාට හිනාවෙලා අවුලක් නෑ කිව්වා.. මේක යකෝ මිනිහා මැරිච්ච ගෑනි වගේනෙ..

" මම හිතුවෙ කලින් වගේ ඉන්ජර්ඩ් වුනා කියලා.. බලපන්.. බූරුවා ප්ලේ කරන්නෙ නැතුව ඉන්නනෙ තිබ්බෙ."

" එහෙම එකක් නෑ බං මේක පොඩ්ඩක් ගැස්සුනා වගේ එච්චරයි.. ඔය අඩන එක නවත්තගනින්."

@Shan

මම සෙනුකයගෙ පිටට එකක් ගැහුවා..

එක වතාවක් ස්කූල් ටුනමන්ට් එකකදී මම වැටිලා කකුලට පොඩි මයිනර් සර්ජරි එකක් කරන්න වුනා.. ඊටපස්සෙ මාසයක් විතර ඇඳේ ඉන්න වුනා කකුල් හොල්ලන්නෙවත් නැතුව.. අපෙ අම්මා උදෙත් ඔක නිසා තමයි කිව්වෙ අඩු කඩාගෙන ගෙදර එන්න එපා කියලා.. ඒ මගුලක් වුන නිසා තා ඩිංගෙන් අම්මා ස්පෝර්ට් එකත් අතාරින්න කියනවා.. පස්සෙ කෝච්කාරය කතාකල්ලා යන්තම අම්මව ශේප් කරගත්තෙ..

" අයියෙ රධ්‍ය අයියා නැද්ද.."

මම කියාන් අයියගෙන් අහද්දි මේකා බයවෙලා වගේ උඩබිම බැලුවා..

" රධ්‍ය දැක්කෙ නෑ බං.. ඌට මොකක් හරි වැඩක් වෙන්නැති.. නැත්නම් එහෙම එන්නෙ නැතුව ඉන්නෙ නැනෙ.."

" අනේ මට මොකෝ.. මම කිව්වයෑ ඉන්න කියලා.. මල සමයං.."

මම කියාන් අයියටත් රවලා සෙනුකයගෙ අතින් අල්ලගත්තා..

" අනේ මනදා උබලා පවුල් වෙලා මෙ තනිකඩ මට මෙවට කරගහන්න වුනානෙ.."

කියාන් අයියා මගේ ඔලුවත් අතගාගෙන එළියට ගියා අයුක අයියවයි අර බූරු පුතාවයි හොයාගෙන එන්නම් කියලා.. සෙනුකයා පව් ඌ මගේ ඔලුව අතගානවා අඩනවා එක මගුලයි..

ඔහොම ටික වෙලාවක් යද්දි ඒසී එක නිසා මටත් ලාවට නිදිමතක් සෙට් වෙලා තිබ්බෙ..හවස හතරයි වෙලාව.. ගෙදර යන්නත් ඕන.. අර පොල් කාවයියත් ආවෙ නෑ තාම ඌ එක්ක එපැයි ගෙදර යන්නත්.. මම ඕවා හිත හිත මම පැයබාගයක් විතර සිවිලිම දිහා බලාගෙන ඉද්දි අඩාස් ගාලා දොර ඇරගෙන හති දාගෙන ඇතුලට දුවගෙන ආවෙ රධ්‍ය අයියා..

මේකා යකෝ මුළු ඇඟටමත් දාඩිය දාලා.. මූ ගම හරහාවත් දිව්වද.. ඇස් දෙකත් ලොකු කරගෙන ඇරගත්ත දොරත් වහන්නැතුව බයවෙලා වගේ මගේ දිහා බලාගෙන ඉන්නවා.. ඒ අස්සෙ කුළුමීමා වගේ හති දානවත් එක්කන්.. ඌ ආවා විතරයි සෙනුකයා හිමීට ශේප් එකේ මගේ මූණ දිහා

@Shan

බලලා මගේ උරහිස ගාවින් ඇල්ලුවා.. මට තරුත් එක්ක අහසෙ තියෙන ඔක්කොම පෙනුනා..

" ආහ්ව්.. අම්මෝ එහාට පලයන්කො බං.. අම්මා රිදෙනවා..!!!!!!!!!!!!!!"

මම බෙරිහන් දෙද්දි සෙනුකයත් ඕවර් ඇක්ටින් දගලානා පටන් ගත්තා.. මූට මොන මගුලක් වෙලාද මන්දා.. දොර ගාව ඉන්න එකත් පපුවෙ අමාරුව හැදුනු එකා වගේ ඇස් දෙක ලොකු කරන් බලාගෙන ඉන්නවා.. ආවනම් වරකො මෙතෙන්ට.. එතන ඉදන් මෙගා නාට්ටි බලනවද..

" අනේ බං හුගක් රිදෙනවද.. දෙයියනේ ෂනෙරුවා මම උඹට කිව්වා ප්ලේ කරන්න එපා කියලා අමාරුවක් තියෙනවනම්.. බලන්නකො අයියේ.."

සෙනුකයා අරූ දිහා බලාගෙන 'බලනකෝ' ගාද්දි මේකා දොරත් වහගෙන මං ගාවට ඇවිත් මගේ මූණ අත් දෙකෙන්ම අල්ලගත්තා.. ඒකටනම් බය හිතුනා පුතේ.. සෙනුකයා ගල් ආදා වගේ හිමීට ලිස්සලා කාමරේ දොර වහගෙන එළියට ගියා..

" මොනවද වරද් මේ කරගන්නෙ..!!"

කරගන්නෙ කියන්නෙ ඉතින් මම හිතලා කරගත්තෙ නැනෙ.. අහන්නෙ මොකටද.. ඉදපු දිහාවක ඉන්න එපැයි.. මම උගේ අත් දෙක මගෙ අතින් එහාට ගසලා මූණ අහකට හරවගත්තා.. මම මූට කැමති නැනෙ දැන් කොහොමත්..

" අහන්න-"

" මට මොන ලබ්බක්වත් අහන්න ඕන නෑ අයියෙ.. ගියපු දිහාවක ඔයාගෙ වැඩ ඉවරකරගෙන එන්න එපැයි.. මොකටද හදිස්සියෙ ආවෙ.."

" වරද් එහෙම එකක් නෙමේ අද කැම්ප් එකෙන් ඔෆිසර්ස්ලා වගයක් ඇවිල්ලා ඉස්කෝලෙට.. මට කොහොමවත් එන්න වුනේ නෑ.. අයුක කිව්වහම උඹ ඉන්ජර්ඩ් වුනා කියලා මම ඒක එහෙමම දාලා දුවගෙන ආවෙ.."

" මට අමාරුවක් නෑ.."

@Shan

මම අහක බලාගෙනම කිව්වා..

" වරද්.. අමාරුවක් තිබ්බනම් ෆයිනල්ස් ප්ලේ නොකර ඉන්න තිබ්බනෙ.. මොනවද බං මේ කරගන්නෙ.. "

මම බෙල්ල කැඩෙනකන් අහකට හරවගෙන ඉද්දි මූ මගේ කොන්දට අතක් තියලා මාව ඇදේ ඉන්දුවා.. අනේ මට ඕන්නෑ මූ එක්ක විනාඩියක්වත් මේකෙ ඉන්න.. දැන් බොරුවට රගපානවා..

මාව ඇදේ ඉන්දුවපු රධ්‍ය අයියා මගේ ගාවින් වාඩිවෙලා මාව ඇගට හේත්තු කරගත්තා.. හේත්තු කරගෙන ඔලුව අතගෑවා.. මම අතකුත් එල්ලගෙන මොකාද එකා වගේ උගේ බෙල්ල අස්සෙ මූන ගහගෙන එහාපැත්තෙ දොර දිහා බලාගෙන ඉදියා.. මට මොකුත් හිතෙන්නෙ නෑ.. කේන්තියි මට.. එයාට එක විනාඩියක් හරි එන්න තිබ්බනෙ.. උදේ ආවා විතරයි.. ආයෙ ආවෙවත් නෑ.. මට ඕවා මතක් වෙද්දි මම ඇස් දෙක පියාගත්තා.. ඌ ඔලුව අතගාද්දි අනිත් අතින් මගේ පිට දිගට අතගානවා.. හෙන සනීපයි.. නිදිමතකුත් එනවා ඒ අස්සෙ.. මම නිදහසේ තිබ්බ අතකින් එයාගෙ අවුල් වෙලා උඩට ආපු ශර්ට් එකේ කොනත් තද කල්ලා මිරිකගත්තා.. මෙහෙම ඉද්දි අඩන්න හිතෙනවා.. හිතට අමුතු බරක් දැනෙනවා.. දුකකුත් එක්ක.. මම දන්නෙම නැතුව ඇස් දෙකේ කඳුලු පිරිලා ඒවා කම්මුල් දිගේ පහලට ගලගෙන ගියා..

මට රධ්‍ය අයියා ඉස්සරහ අඩන්න උවමනා නෑ.. කොහොමවත් නෑ.. අනික මම එහෙම අඩන්නෙ නෑ.. මෙච්චර වෙලා හිටියා මගේ ඇස් වලින් එක කඳුලක්වත් වැටුනෙ නෑ.. ඒ වුනාට රධ්‍ය අයියගෙ උරහිසට මූණ තියාගෙන ඉද්දි මට නොදැනිම ඇස් වලට කඳුලු ඉනුවා.. සමහරවිට මට කලින් අඩන්න උවමනා වෙලා තිබ්බද දන්නෙ නෑ.. මට මං අඩන එක ගැන ලැජ්ජාවක් ඇති වෙද්දි මම ඉක්මනට ඇස් වලට උනපු කඳුළු එයාගෙ ශර්ට් එකෙන්ම පිහිදගත්තා..

රධ්‍ය අයියා සෑහෙන්න වෙලාවක් මගේ ඔලුව අතගෑවා.. අන්තිමේ මාව එයාගෙන් එහාට කල්ලා මගේ මූණ දිහා බලාගෙන හිටියා.. එයාගෙ දිග ඇහිපිහාටු වලින් මගේ ඇස් දිහාම බලාගෙන ඉද්දි මම හිතලාම ඒ ඇස් මග ඇරලා බිම බලාගත්තා.. ඒ බැල්ම හිතට බරයි.. ඒවුනාට එයා මගේ මූණෙ හැම අගලක් දිහාම හොදට බලාගෙන ඉදියා මට දැනුනා.. සමහරවිට මේ ටිකටම මගේ ඇස් වටේ රතුවෙලා ඇති..

@Shan

ටික වෙලාවක් මගේ මූණ අත් දෙකෙන්ම අල්ලගෙන බලාගෙන ඉදපු රධ්‍ය අයියා ලාවට හිනාවෙලා මගේ හිස් මුදුනින් තොල් තියද්දි මම ආයෙම ඒ ශර්ට් එක තදකල්ලා අල්ලගත්තා.. දෙයියනේ!!! මීට කලින් කිසිම දවසක ආච්චිඅම්මා අම්මා මාමා ඇරෙන්න වෙන කවුරුත්ම එහෙම කල්ලා නෑ.. එයා හුගක් වෙලා එහෙම ඉදියා.. කොච්චර වෙලාවක්ද දන්නෙ නෑ.. මම ඇස් පියාගෙන ඉදියා.. එයා මෙහෙම හැසිරෙද්දි මගේ හිතේ තිබ්බ තරහයි දුකයි හිමිහිට දියවෙලා වැක්කෙරුණා.. රධ්‍ය අයියා කතාකරන්නෙ නෑ.. මේ ආපු වෙලාවට මහ ගොඩක් කතාකලේ නෑ.. ඒ වුනාට එයාගෙ පොඩි බැල්මකින් වුනත් මහා ගොඩක් ආදරේ දැනුනා.. ඒක නිසාම හිතට දැනෙන බර වැඩියි..

අවසානෙ මගේ නළලෙ පැත්තකට දැනෙන නොදැනෙන හාදුවක් තියපු රධ්‍ය අයියා මගෙන් එහාට වුනා..

" ගෙදර  යමු.."

රධ්‍ය අයියා මං ගාවින් බිමට නැමිලා බිම තිබ්බ සපත්තු දෙක අරගෙන මගේ මේස් දාපු කකුල් වලට දාලා ලේස් ගැටගැහුවා.. මේකා මට වඩා වැඩිමල් එකෙක්නෙ කියලා මට මතක් වුනේ උගේ උකුලෙ මම කකුල් දෙකම තියාගෙන ඉද්දි.. එහෙම හරිනෑනෙ ඉතින්.. සපත්තු දෙකත් දාලා අතත් එල්ලගෙන මම ඇදෙන් නැගිටිද්දි රධ්‍ය අයියා මගේ ස්පෝර්ට් බෑග් එකයි එයාගෙ බෑග් වගේකුයි ඔක්කොම අතින් කටින් එල්ලගෙන එළියට එද්දි මමත් වැනි වැනි උගේ පස්සෙන්ම ගියා.. එළියට යද්දි අයුක අයියයි සෙනුකයයි කියාන් අයියයි එලියේ ඉදගෙන ඉදියා..

" හලෝ අයියෙ.. ඩියුටි ඔෆ් නම් අපිව පික් කරනවද.."

" ආ ඇවිල්ලද ඉන්නෙ.."

" ඉන්න ඉන්න එනවා.."

" වරද්.. යමු.. ඒ බං අපි යනවා.. කියාන් වරෙන් උඹවත් දාගෙන යන්න පුලුවන්නෙ.."

රධ්‍ය අයියා ඉස්ස්සරහින් යද්දි මමයි කියාන් අයියයි පිටිපස්සෙන් ගියා.. යද්දි ස්කූල් පාකින් එකේ ආධ්‍ය අයියා ඉන්නවා එළියට වෙලා කාර් එකට හේත්තුවකු දාගෙන..

@Shan

" පොඩි මස්සිනා අත කඩාගත්තද.."

" අයියෙ..!! "

රධ්‍ය අයියා ආධ්‍ය අයියට රවලා බෑග් ටික පිටිපස්සෙන් දාලා වාහනේට නැග්ගා..

" කෝ බලන්න.. ලොකු ඩැමේජ් එකක් නෑනෙ.."

ආධ්‍ය අයියා මගේ අත එහෙට මෙහෙට කල්ලා බලලා ඉක්මනට හොදවෙයි කියලා ඩ්‍රයිවින් සීට් එකට නගිද්දි කියාන් අයියා පැසෙන්ජර් සීට් එකෙන් වාඩි වුනා..

" මෙකට විසේ බං.. මම හිතුවා දෙපාරක් තුන්පාරක් වැනෙද්දිම.."

" අනේ මේ.. එහෙම මගුලක් නෙමේ.."

කියාන් අයියේ දෙන්නැතුව හිටපන්කො.. ආධ්‍ය අයියත් හිනාවෙනවා.. මුගේ කටනම් අම්මපා.. පියුමි හංසමාලිගෙ නෑදෑයොද කොහෙද..

" ඕක මහලොකු දෙයක්ද බං පොඩි එකාට බනින්නෙ.. බලපං මමත් ඔය ඉස්කෝලෙම බයෝ කලේ.. ඔය මෙලෝ මගුලකට ගියේ නෑ ගැනි වගේ පංතියෙම ඉදගෙන ඉදියා මිසක්.. ඒ අතින් බලද්දි වරද් හෙන ෆෝවඩ් නෙ.."

" ම්ම්.. ෆෝවඩ් බලාගන්න තිබ්බ සික් රූම් එක දෙවනත් කරපු හැටි දැක්කනම්.. මෙකා ලේබර් රූම් එකේ වගේ ගිරිය පලාගෙන බෙරිහන් දීලා ඩොකාටත් ගැහුවා.. බලපං අයියෙ අපේ එකාටත් කවදහරි ගුටි කාගෙන මූට වැදගෙන තමා ඉන්න වෙන්නෙ.."

" ඒක හොදයි බං.. අපේ එකාගෙත් නහරයක් වැඩිනෙ.. නැද්ද පොඩී.."

ආධ්‍ය අයියා ෆොන්ට් මිරර් එකෙන් රධ්‍ය අයියා දිහා කින්ඩියට බලද්දි රධ්‍ය අයියා රවලා අහක බලාගත්තා.. මුගේ නහර එකක් නෙමේ ඔක්කොම වැඩී තමා.. දෙන්න හිතයි පරෙයියගෙ මූණට.. හිටපන්කො ගෙදර ගිහින් බැනලා මැසේජ් දාලා ෆෝන් එක ඕෆ් කරනවා.. අයියෝ අම්මා මාව මරාවි අද..

හායිම්.. මම පාන්දර හරි ආවා නේ.. අදනම් දිහට ලිව්වා හරිත.. වචන දෙදාස් හත්සිය අනූ හවරක් ලියලා ඉමනෙ..

@Shan

ර්යෙ අපේ ඉස්කෝලෙ අවුරුදු උත්සවෙනෙ ළමයි ඉතිම..

ඕතරීට හවස කාස් තිබ්බා.. ඒකනිසා ඉතින් දෙන්න බැරිවුනා.. නැතුව මේවා ඉතින් නොදී ඉන්න කතා නෙමේනෙ ළමයි..නේත.. ඒකනෙ..

ඔයාලටත් හාදුවක් ඕනද..?????????????

එහෙනම් හාතාත්තෙක්ගෙන් හරි හාඅම්මෙක්ගෙන් හරි හාදුවක් ඉල්ලගන්න.. එයාලා ළම්සනයි..

ගිහින් එන්නා..

ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නේත් නෑ..**

@Shan

# 24 කොටස

මම හිටියේ කාමරේ ඇඳේ ඉඳගෙන බිත්තියට ඔලුව ගහගෙන සිවිලිම දිහා බලාගෙන.. වෙලාව පාන්දර දෙක හමාරයි.. ඒ වුනාට නින්ද යන්නෙ නෑ.. කොහොමත් මට රෑට නින්ද යනවා අඩුයිනෙ.. හවස අම්මගෙන් පිට පැලෙන්න පාරක් කාලා බැනුම් කෝටියක් අහගෙන රධ්‍ය අයියා ඉස්සරහම පව වෙලා මම මීමින්නා වගේ කාමරේ අස්සට වැදිලා හිටියේ.. අත කර වටේ එල්ලගෙන මොකාද එකා වගේ.. ආර්ම ස්ලින්ග් එක නිසා නින්ද යන්නෙත් නෑ හරියට.. මේ මගුල ඉක්මනට හොදවුනොත් හොදයි..

ගෙදර ඇවිත් මම අරුට බැනලා ෆෝන් එක ඔෆ් කරනවා කිව්වට මොකද අන්තිමේ රෑ එකොළහට විතර ඒකා මට කෝල් එකක් අරගෙන බැනලා බැනලා ෆෝන් එක තිබ්බා.. ඔන්නෑ ඔය මිනිහව.. බනින්නයි පුප්පන්නයි විතරනෙ දන්නෙත්.. ඒ වුනාට ඉතින්.. මාත්.. ආදරෙයි වගේනෙ.. ඔන්නෑ කියලත් බෑනෙ..කමක් නෑ ඌ මොකක් වුනත් ලෝයල් බෝයිෆ්‍රෙන්ඩ් කෙනෙක්නෙ.. මොකක්ද වැඩක් තිබ්බලුනෙ කරන්න.. කැම්ප් එකෙන් ආවා කියන්නෙ මෙකා මටත් නොකියා රන්ටැඹෙවත් යන්නද.. අනේ එහෙම වුනොත් මෙකා මාසෙකට ඉස්කොලෙ නෑනෙ.. යයිද දන්නෙ නෑ.. මම පටාර් ගාලා ෆෝන් එක අරගෙන රධ්‍ය අයියට කෝල් එකක් ගත්තා..

ම්ම්..ම්ම්.. එකපාරක් කට් වුනා.. මෙකා නිදිද.. ඔව්නෙ පාන්දර දෙකහමාරට මිනිස්සු නිදාගන්නැතුව මක් කරන්නද නේද.. ඒ වුනාට මම ෆෝන් එක ආන්සර් කරනකන්ම කෝල් ගත්තා.. යාන්තම් දෙවෙනි කෝල් එක ආන්සර් කලා..

" හලෝ.. නිදිද.."

" ම්ම්..හ්.."

" මේ අද කවුද අර ඉස්කෝලෙට ආවයි කිව්වෙ.."

" ම්ම්.. "

" නැගිටපන් අයියෙ මොන මගුලක්ද.. මම කෝල් ගත්තහම නිදිද.. "

" ම්ම්.. වරද් .."

@Shan

" නෑ මම සෙලීනා ගෝමස් කතාකරන්නෙ.. අනේ නැගිට්නවකො අයියෙ අහන්න දෙයක් තියෙනවා.."

" කියහන් බං.. අහගෙන ඉන්නෙ.."

" බැනෙ ඔයා නිදිනෙ.."

" පොඩ්ඩක් ඉඳපන්.."

මට ෆෝන් එකෙන් ඇහුනා සර සර ගාන සද්දයක්.. ඇති යන්තම් නැගිට්ටද කොහෙද..

" ම්ම්.. කියන්න බලන්න.."

" මෙ ඔයා කැම්පින් යනවද.."

" ඕක අහන්නද බං මේ පාන්දර තුනට මට කෝල් කලේ.. උදේ ඇහුවනම් ඉවරයිනෙ.."

" එහෙම බෑ මම නිදි නැනෙ ඔයා නිදි වුනාට.."

මම ෆෝන් එකට හැන්ඩ්ෆ්‍රී එක ගහලා පැත්තකින් තියලා නියපොත්තක් හපන්න ගත්තා..

" යන්න නෙමෙයි ඉන්නෙ.. ඒ වුනාට කියන්න බෑ ඉතින්.."

" එහෙමද.. ඇයි ඉතින් යන්නෙ නැත්තෙ.. යනවකො.."

" යන්නෙ නැත්තෙ.. මට බෑ අව්වෙ කට්ට කන්න අප්පා.."

සැක් මම මොනවද හිතුවෙ.. උඹ නිසා ඌ ඒක නොයා ඉන්නෙ නෑ වරද් මෝඩ කාවයියෝ.. ඌට උඹට වඩා උගේ ස්කින් එක වටිනවා..

" එහෙමද.. ඒකද යන්නෙ නැත්තෙ.."

" ම්ම්.. "

" හරි හරි ඔයා නිදාගන්න මම තියෙනවා.."

@Shan

" දැන් තකහනියක් කතාකරපු එකේ ඔහොම ඉදපන්.. නිදාගෙන ඉන්න මනුස්සයො ඇහැරලා මහ රෑ ප්‍රශ්න අහනවා.."

" මට බෑ මම තියනවා.."

මම ෆෝන් එක කට් කලා.. මොනවද අප්පා මම මේ හැසිරෙන විදිය.. ලමිස්සි වගේ.. යකෝ මම කොල්ලෙක්.. කොල්ලෙක්.. කොල්ලෙක්.. කොල්ලෙක්.. මෙහෙම සීනි බෝල දේවල්වලට මොකට රණ්ඩු වෙනවද.. පරිණත මනුස්සයෙක් වගේ හැසිරියන් වරද්.. මට මං හැසිරෙන විදිය ගැන හෙන ලැජ්ජාවක් ඇතිවුනා.. මෙහෙම බොළද දේවල් වලට මම ඉස්සර කැමති නෑ.. ලව් කරන උන් දිහා බලාගෙන අනේ අනිච්චං කියලා කල්පනා කරපු මම මේකා මාසෙකට ඉස්කෝලෙ නෑ කිව්ව ගමන් මූණ නාළු කරගත්තා.. මොන මගුලක්ද..

ඔහොම ඉද්දි ආයෙම ෆෝන් එකට කෝල් එකක් ආවා..

**Radhya (DGC) Calling...**

" මොකද.."

" මොකද අහන්නෙ.. මගුල.. කනට ගහන්න වගේ ෆෝන් එක කට් කලේ මොකද.."

" කනට ගහන්න බැරි නිසා.."

" මොකක්ද කිව්වෙ.."

" මොකුත් නෑ මොකුත් නෑ.."

" ඔච්චර නටන්නැතුව උඹට කෙලින්ම කියන්න පුලුවන්නෙ බං 'රධ්‍ය අයියෙ කැම්පින් යන්න එපා' කියලා.. බොරුවට නටනවා මහ රෑ නැගිටගෙන.."

" පිස්සුද කැම්ප් බැරිනම් ඕන ලබ්බක යනවා..මට අමාරුවටයැ මම ඉන්න කියන්නෙ.."

" ආ එහෙනම් මම යනවා.. මටත් පිස්සුනෙ උඹව දකින්න ඕන නිසා ඒ මගුලෙ යන්නෙ නැතුව ඉන්න.."

@Shan

මම්.. කිව්ව නේද.. ඔය කියන්නෙ.. ඉතින් කලින් වතාවෙ ඔහොම කිව්වනම් මුගෙ කට ගෙවෙනවද.. නෑනෙ.. නිකම් බොරුවට මගෙත් ලේ පුච්චනවා.. මුගෙත් මාර කැටයම් තමා තියෙන්නෙ..

" මගෙ මොනව බලන්නද.. "

" මම ඕකට උත්තර දෙන්නම් උඹට පස්සෙ වෙලාවක.."

" ඕන්නෑ.. මේ ඒකනෙමේ තවුසෙ නිදාගන්නවා.."

" නින්දෙ හොඳම හරියෙ කෝල් කල්ලා නින්දත් කඩලා.. මගුල.. දැන් නින්ද යන්නෙ නෑ.."

" හරි ඉතින් උදේ වෙද්දි අමතක වුනොත් කියල දැන් ඇහුවෙ.. මේ ඔයා අද අරහෙ යනවද.."

" ඔව් මම ගිහින් ඒ වැඩ ටික ඉවරකරගෙන එන්න ඕන.."

" තනියම??"

" ඔව් යන්න හිටපු එකා අත එල්ලගෙනනෙ ඉන්නෙ.."

" මම හිතලා එල්ලගත්තයැ ඉතින්.. බනිනවා බනිනවා.. එක විනාඩියක් හොඳින් කතාකරන්නෑ.. රෙද්ද.."

" උඹට හොඳින් කතාකල්ලා දෙයක් කියන්න පුලුවන් එකෙක් නෙමේ.. "

හරි වැඩක්නෙ ඒක යකෝ.. මම ෆෝන් එකේ ප්‍රොෆයිල් පික්චර් එකේ හිටිය උගෙ දෙකක් රවලා ඇදේ හාන්සි වුනා.. නිදිත් මතයි වගේ දැන්නම්..

" දගලලා ඔය අත පාරගන්නැතුව ඉඳපන්.. උඹ බ්ලෙසර් එක දාලා එදාටත් අත එල්ලගෙනද ඉන්න හදන්නෙ.."

" දැගලුවෙ කවුද අප්පා.. මේක ඉක්මනට හොඳ වෙයි.. එච්චර ගානක් නෑ.."

" ම්ම්.. නිදාගන්න නිදාගන්න.. මම උදේට ගන්නම්.. "

" බුදුසරණයි.."

@Shan

" බුදුසරණයි පරිස්සමින්.."

රධ්‍ය අයියා ෆෝන් එක කට් කලා.. පව් හැබැයි පාන්දර කතාකල්ල මම නින්දත් කැඩුවනෙ.. කමක් නෑ ඉතින් බැන්නෙ නැනෙ..

" සුදුමහත්තයා.. උදේ නවයයි වෙලාව.. නැගිටලා එන්න මෙහෙට.."

උදේ පාන්දර- කිව්වට පාන්දර නෙමේ දවල් වෙලා මම නැගිට්ටෙ අම්මගෙ මිහිරි කූජනය කන පලාගෙන මට ඇහෙන්න ගත්තු නිසා.. මුලු ගමම දන්නවද කොහෙද මම නැගිට්ටා කියලා.. එහා ගෙදර කමනි ඇන්ටිගෙ දුව ඉස්සර මම ක්ලාස් යද්දි බොරුවට මල් කඩන්න වගේ පාරට ඇවිල්ල කෙල පෙරාගෙන මගේ දිහා බලාගෙන ඉන්නවා.. මට පේන්න හිච්චි කලිසම් ඇඳගෙන එළියෙ එහෙට මෙහෙට යනවා.. ඒ ගෑනි හිතාගෙන ඉන්නෙ මට ඒකි දැක්කම නගිනවා කියලා.. පස්සෙ ඔක අපේ අම්ම දැකලා මට කිය කිය හිනාවුනා..ඒ ගෑනිට පුදුම අමාරුවක් තියෙන්නෙ.. දන් ඇයි මම මේ කමනි ඇන්ටිගෙ දුව ගැන කියවන්නෙ.. මම නැගිටලා ඇඳ හදලා එළියට යද්දි අම්මා කොහේද යන්න ලෑස්ති වෙලා..

" අම්මෙ කොහෙහරි යන්නද.."

" ඔව්නෙ මම අද මහීශා දුවගෙ අම්මත් එක්ක එළියට යන්න කියලා වැඩ වගේකට.. එන ගමන් පොළෙත් යන්න ඕන.. ගිහින් එනකල් දොරවල් වහගෙන පරිස්සමට ඉන්න.. ඔය එල්ලන් ඉන්න අණ්ඩ තෙමාගන්නෙහෙම එපා.. තේරුනානෙ.."

" හා මේ අම්මෙ කන්න දෙයක් ගේන්න.."

" ම්ම්.."

අම්මා මට කෑම එකත් මේසෙට තියලා ගිහින් තියෙන්නෙ.. මම ඉතින් තනි අතින් දත් මැදලා මූණත් හෝදගෙන ඇඳුමකුත් ඇඳගෙන කෑම කාලා ගෙදරට වෙලා හිටියා.. අපරාදෙනෙ අද පන්ති යන්නත් නෑ මේ මගුල අත කැඩුනනෙ.. සෙනුකයත් ඉස්කෝලෙ යන්න ඇති.. අරකා ගියාද දන්නෙ නෑ.. මම ෆෝන් එක අරන් බලද්දි රධ්‍ය අයියා මැසේජ් එකක් තියලා යනවා කියලා..

@Shan

මම ඉතින් කරන්න වැඩක් නැති නිසා කෑම මේසෙ උඩ පොත් දෙක තුනක් තියාගෙන කෙමෙස්ට්‍රි වල පරිවර්තන වගයක් හද හද හිටියා.. මේක පටන් ගත්ත කාලෙ සර්නම් කිව්වෙ පරිවර්තන කරන එක පිස්සුවක් කියලා.. ඒ තරමට ආස හිතෙනවලු.. කොහොමහරි මටනම් වුනේ ඒකෙ අනිත් පැත්ත.. පරිවර්තන කරන්න ගිහින් පිස්සු හැදුනා..

හවස තුන විතර වෙනකල් ඉස්කෝලෙ වැඩ කරපු මම ගෙදර ඉස්සරහ දොර ඇරලා ඉස්තෝප්පුවට වෙලා එහෙට ඇවිද්දා මෙහෙට ඇවිද්දා.. අම්මා නැතුව පාලුයි වගේ.. කියට එයිද දන්නෙත් නෑ.. මගෙත් ඔලුව විකාරයි වගේ.. ඒකනිසා මම ලැප් එක සාලෙට උස්සගෙන ඇවිත් ඇනිමි එකක් දාගෙන බලන්න ගත්තා.. සැක් මම නරුටො බලන්නෙ ගිය අවුරුද්දෙ ඉදලා.. කොහෙද ඒකෙ එපිසෝඩ් පන්සීයක් තියෙනවනෙ.. මම බලල තියෙන්නෙ තාම දෙසීය ගානයි.. මේක බලලා ඉවරකරද්දි මම නාකි වෙලා ඉදීද දන්නෙ නෑ.. ඔහොම ඒක බල බල ඉද්දි වෙලාව යනවා දැනුනෙත් නෑ.. මම ඉතින් ඉන්න පුලුවන් හැම පොසිශන් එකටම සෝෆා එකේ ඉදගෙන ඒක බැලුවා.. එක විදියක ඉන්න බෑ ඇග නලියනවා නලියනවා වගේ.. එහෙම කල්ලා අතත් තුන්පාරක් විතර පුටු ඇන්දෙත් ඇනගත්තා.. ඒ එක්කම වගේ මගේ ෆෝන් එකට කෝල් එකක් ආවා.. ඌප්ස් රධ්‍ය අයියා.. එයා ගියාද දන්නෙ නෑ..

" හලෝ...ව්"

" ගෙදරද ඉන්නෙ.."

" ඔ.. ගෙදර ඉන්නෙ.."

" ම්ම්.."

මම ෆෝන් එකත් කනේ ගහගෙන ඉස්තෝප්පුවට ආවා..

" ඔයා ගෙදර ආව්-ඔයා මෙහෙ ආවද.."

මම ෆෝන් එකත් කනේ ගහගෙන එළියට එද්දි මේකා ගෙදර ඉස්සරහ කාර් එක නවත්තලා බැහැලා දොර වහනවා.. මම ටාර් ගාලා කාමරේට වැදිලා හෙන ගහලා වගේ තිබ්බ කොන්ඩෙ හදාගත්තා.. සැක් මම ඉන්න හැටි සකලබුජං වගේ ශෝටකුත් ගහගෙන රෝස පාට ශර්ට් එකකුත් ඇදගෙන.. අපෙ අම්මා එක්ක බෑ.. ඇදුම් ගන්න ගියාම එයාට ඕන ඒවා විතරයි

@Shan

ගන්නෙ.. ඒවා ඔක්කොම මට වඩා දහගුනයක් ලොකු බාච්චු වගේ ඒවා.. අනික ගන්නෙත් රෝස පාට කහ පාට වගෙ මහ සීනිබෝල පාට.. ඒ වුනාට මම ආස කළුපාටයි සුදුපාටයි අඳින්න..

" ගිය වැඩේ කරගත්තද"

එයා මට දුන්නු ෆැබ් එකේ බෑග් එකක් ස්ටූල් එක උඩින් තියලා සෝෆා එකෙන් ඉඳගත්ත මම රධ්‍ය අයියා දිහා බලාගෙන ඇහුවා..

" ඔව් ආයෙ යන්න දෙයක් නෑ.. ඔක්කොම ෆිනිශ් කරගෙන ආවා.."

" එහෙමද.."

මම රධ්‍ය අයියගෙ එහාපැත්තෙන් ඉඳගත්තා..

" මොකද කලේ කෝ අම්මා.."

" ගමනක් යනවා කිව්වා.. හවස් වෙලා ඒවි.."

" පාඩම් කලාද.."

" ඕ කලා.."

" හොදයි.. හෙට ඉස්කෝලෙ එන්න පුලුවන්ද.."

" එන්න එපැයි.. අනික අත ලොකුවට අවුලක් නෑ.."

" ආ.. මම බෙහෙත් වගයක් ගෙනාවා.. අයියා කිව්වා මේ ජෙල් එක ගාන්න ඉක්මනට අඩුවෙයි කියලා.."

" හුම්.."

" වෙලාවට බෙහෙත් බීපිය.. මගුල.. බලපන් අතකුත් එල්ලගෙන.."

රධ්‍ය අයියා අත දිහා බලාගෙන රැව්වා.. ඉතින් අප්පා ඒක වෙලා ඉවරනෙ.. හැමතිස්සෙම ඒකම මතක් කර කර කෑගහනවා.. සැක් ගෙදර කොහිල නැනෙ.. නැත්නම් අමුවෙන්ම ගිල්ලලා යවන්න තිබ්බා..

@Shan

" අනේ මේ ඉන්නවා.."

" හරි හරි.. මේ බං මම ගෙදර යන්න ඕන අයියා එන්න කලින්.. මම යන්නද.."

" ආපු ගමන් යන්නෙ..??"

" අම්මත් ගෙදර නැනෙ වරද්.. මම වෙන දවසක එන්නම්.. හෙට ඉස්කෝලෙ එනවනෙ.."

" ම්ම්.. ගෙදර ගිහින් කතාකරන්න.."

" හරි පරිස්සමට ඉන්න අම්මා එනකල්.. මම යනවා.."

රධ්‍ය අයියා මගේ කොන්ඩෙ අවුස්සලා නැගිට්ටා.. ඇයි අප්පා ඔච්චර ඉක්මනට යන්නෙ ඉතින්.. කමක් නෑ මහන්සි ඇතිනෙ..

" පරිස්සමට යන්න.. බුදුසරණයි.."

මම රධ්‍ය අයියා අවුල් කරපු කොණ්ඩෙ අතින් හදාගන්න ගමන් එයා පස්සෙන් ඉස්තෝප්පුවට ආවා..

" ම්ම්.."

රධ්‍ය අයියා යන්න ගිහිල්ලත් ආයෙම හැරිලා මං ගාවට ආවා.. මේකා මෙහෙම එන එන සැරේට මගේ පපුව රිදෙන්න ගන්නවා.. මම ඇස් දෙක ලොකු කරගෙන රධ්‍ය අයියා දිහා බලාගෙන ඉද්දි එයා මගේ කම්මුල් දෙක පොඩි වෙලා මිරිකෙන්නම අත් දෙකෙන් අල්ලලා නළලෙ පැත්තකට තොල් දෙක ගෑවෙන්න නොගෑවෙන්න තිබ්බා.. මේක දෙවෙනි වතාව.. එයා මෙහෙම කරද්දි අනේ මන්දා මගේ හිත පිරිලා යනවා.. එයා මේ කිසි දෙයක් හැඟීමක් නැති මූණකින් ඔහේ කරනවනම් මට කොහොමටවත් මේ තරම් මේ දේවල් හිතට කාවදින්නෙ නෑ.. ඒ වුනාට එයාගෙ දිග ඇහිපිහාටු තියෙන කළුපාට ඇස් දිලිසෙද්දි ඒක වෙනමම කතාවක්.. මම රධ්‍යයියගෙ සුදු පාට දුහුල් ශර්ට් එකේ වාටිය ළගින් පොඩි කරගෙන අල්ලගෙන ඉදියා..

එයා මගේ නළලින් තොල් ගත්තම මම එයාගෙ පපුවට තිකට තියාගෙන මූණ දිහා බලාගෙන හිටියා.. හැමදාම මෙහෙම ඉන්න තියෙනවනම්.. වගේ

@Shan

හැඟීමක් මගේ හිතේ පණ ගැහී ගැහී තිබුනා.. ඇත්තටම මම හිටියේ දුක පොඩ්ඩක්වත්ම ලග නැති සතුටයි ආදරෙයි පිරුනු සැහැල්ලු හිතකින්..

මම රධ්‍ය අයියගෙ පපුවට නිකට තියාගෙන එයාගෙ මූණ දිහා බලාගෙන ඉද්දි ආයෙම එයා මගේ කොණ්ඩෙ ඇවිස්සුවා.. එයාගෙ මූණෙත් තිබ්බෙ හරිම දගකාර ආදරේ හිතෙන මූණක්..

" ඔහොම ඉන්න එපා බං.. මම කොහොමද ගෙදර ගිහින් ඉන්නෙ..ම්ම්.."

" ඇයි.."

" උඹ ඔහොම බලන් ඉද්දි ලෝබයි වරද්.."

රධ්‍ය අයියා ආයෙම එක අතකින් මාව පපුවට කිටි කිටියේ තුරුල් කරගෙන ඉදලා මගෙන් අයින් වෙලා වාහනේට ගියා..

කෝමදේ.. මගෙ සකලබුජම්ලා ටිකට මම කලිසම් ගෙනාවා..

ඔය ළමයි සතුටින් කල් ගෙවන්න.. තව චරිත මෙකට එන්නත් ඉන්නවනෙ..

ඇස් ඇන් එක්සාම්පල් රධ්‍ය කොලුවගෙ අප්පච්චි

වරද් කොලුවගෙ පවුලෙ උදවිය

දැම්කනෙ..

පාන්දරට තා එකක් ඕනත.. ඒනම් කොමෙන්ටුවක් කොටාගෙන යන්ඩ..

ලව් යූ..   ❤.

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

@Shan

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 25 කොටස

" බණ්ඩය.........................................ප් පහසුවෙ.........න් සිටින්.."

මම හිටියේ ස්කූල් ග්‍රවුන්ඩ් එකේ මාච්පාස්ට් කර කර.. මට මෙච්චර දවස් තිබ්ලත් මතක් වුනේ නෑ මෙහෙව් මගුලකට මමත් ඉන්න ඕන කියලා.. අද උදේ රධ්‍ය අයියා ගවුන්ඩ් එකට ඇදගෙන එනකල්ම මම හිටියේ ප්‍රිෆෙක්ට් රූම් එකට වෙලා කියාන් අයියත් එක්ක කයියක් ගහගෙන..

ඉස්කෝලෙ ජූනියර් ස්කොඩ් එකයි සීනියර් ස්කොඩ් එකයි දෙකෙන්ම ඉස්සරහා, හවුස් එකේ ෆ්ලැග් එක අරගෙන කැප්ටනුයි වයිස් කැප්ටනුයි යනවනෙ.. දැන් මම මේ ඉන්නෙ ඒ මගුල පුරුදු වෙන ගමන්.. ආබාදිත සෙබලා වගේ අතත් එල්ලගෙන මම පහසුවෙන් හිටගෙන හිටියා.. පහසුවෙන් කිව්වට මට දැනුන පහසුවක් නම් නෑ..

ග්‍රවුන්ඩ් එකේම ළමයි පන්සීයක් විතර හිටියා.. හවුසස් පහෙන්ම.. ඒ ඔක්කොම ඉස්සරහින් මමයි නෆ්‍රාසයයි අනිත් හවුසස් වල කැප්ටන්ලයි ෆ්ලැග් දෙක ගානෙ අතේ තියාගෙන පහසුවෙන් හිටගෙන.. හොදම වැඩේ මෙක ප්‍රැක්ටිස් කරන්න ඉන්නෙ රධ්‍ය පොල් කාවයියා.. දැන් මට දෙපාරක්ම ඇවිත් බැනලා ගියා පපුව ඉස්සරහට දාන් ඉදපන් කියලා.. ඊළග වතාවෙ කිව්වොත් අම්මපා මම ඉදියේ ෆ්ලැග් එක අරගෙන උගේ පුජේ ගහන්න..

පහසුවෙන් ඉන්න කිව්වහම හැමෝම පහසුවෙන් ඉද්දි මට ලාවට ඇහුනා කොහෙන්දෝ මන්දා ඩාන් ඩාන් ගාලා සද්ද වගේකුයි ගිරිය පලාගෙන බනින සද්ද වගේකුයි.. මුගේ රීප්ප පටිය අල්ලලා බිදින්න තියෙන්නෙ දෙකට.. ඔහොම විනාඩි පහක් විතර ඉද්දි මගේ කොන්ද හරියෙන් මොකක්ද තදට වැදිලා මාව ඉස්සරහට තල්ලු වුනා..

" කොන්ද කෙලින්.."

රධ්‍ය අයියා මාව බලු බෙට්ටකටවත් ගනන් ගන්නැතුව කියාගෙන යද්දි මමත් ඌව එක මදට්ය ඇටයක් තරමට ගනන් ගත්තෙ නෑ.. ඒ වුනාට ඉර අව්ව වැදෙනවා මූණට අම්මටසිරි වෙන්න.. මම අවුවෙ ඉදියම කළු නෙමෙ රතු වෙනවා.. අනික කැප් එකක්වත් මොකුත්ම නෑ..

@Shan

" බණ්ඩය...............................ප් සීරුවෙ...............න් සිටින්.."

" ලෙෆ්ට් රයිට්.."

මම කකුල උස්සලා එකළග තියාගෙන ඉදියා.. සැක් මේ එකතැන ඉන්න වැඩ මට හරියන්නෙ නෑ.. කන කහනවා වගේ.. සපත්තුව අස්සෙ වැලි ගිහින් වගේ.. මූණෙ දාඩිය බේරෙනවා.. බෙල්ල කසනවා වගේ.. ඔහොම ඒවා දාහක් හිතෙනවා.. අතත් රිදෙනවා.. මගුල.. මට දමලා ගහලා බෙල්ල කසන්නමයි හිතෙන්නෙ.. ඒ වුනාට පන්සීයක් මැද්දෙ වාටර් වෙන්නත් බැනෙ..

ඔහොම හරියටම පැය තුන හමාරක්.. පැය තුනහමාරක්.. අර ගැටපොලොස් කොට්ටෝරුවා අපිව ග්‍රවුන්ඩ් එකේ තියාගෙන පුදුම කට්ටක් කන්න දුන්නෙ.. අන්තිමේ එකාට දෙන්නට කලන්තෙ අල්ලද්දි පොර ඒකටත් අපිට කැගහලා ක්ලාස් වලට යන්න කිව්වා.. මම ඌ එද්දිම ගස්සගෙන ප්‍රිෆෙක්ට් රූම් එකට ගියා.. මගේ බෑග් තිබ්බෙ ඒකෙ.. කොහොමත් ක්ලාස් එකේ ඉන්න වෙන්නෙ නැනෙ..

මම ප්‍රිෆෙක්ට් රූම් එක ඇතුලට යද්දි කවුරුත්ම පේන්න ඉදියෙ නෑ.. ඒ වුනාට දොර ගාවදි මම දැක්කා එදා මාත් එක්ක බැඩ්මින්ටන් ප්ලේ කරපු චමිරු මගේ ඇගෙත් හැප්පිගෙන දුවගෙන යනවා.. මට ඒක පොඩ්ඩක් අමුතුයි වගේ හිතුනත් මහ ලොකුවට ගනන් ගත්තෙ නෑ.. මම ඇවිත් පුටුවකින් වාඩිවෙලා පොතක් අරන් මූණට පවන් ගහගත්තා.. ශර්ට් එකේ බොත්තම් දෙකකුත් ඇරගත්තා..

මොනාහරි කන්න තියේනම්..ම්ම්..ම්ම්..

මම වටේටම ඇස් දෙක අරගෙන යද්දි මට අහුවුනේ රධ්‍ය අයියගෙ බෑග් එක.. එදා ලොලිපොප් තිබ්බනෙ.. අදත් මොනාහරි තියද දන්නෙ නෑ.. මම ගිහින් රධ්‍ය අයියගෙ බෑග් එක අරන් ඇවිල්ල උකුල උඩින් තියාගෙන ඒකෙ අස්සටම අතදාලා ඇවිස්සුවා.. මොකක් හරි අහුවෙනවා..

නයිස්.. ට්විස්ට් එකක්.. පොඩ්ඩක් දියවෙලාද මන්දා.. කමක් නෑ දියවුනාමත් රහයි.. තව කිට් කැට් එකකුත් අතට අහුවෙලා මම ඒක ආයෙම ඌට කන්න බෑග් එකට දමලා වහලා පැත්තකින් තියන්න යද්දි මෙකගෙ බෑග් එකෙන් පොතක් 'දඟ්' ගාලා බිමට වැටුනා.. ඒක අස්සෙ තිබ්බ කොළ වගේකුත් බිම විසිරුනා..

@Shan

සැක් මම වැඩ නාගන්නවනෙ..

මම චොක්ලට් එක පැත්තකින් තියලා අර කොළ සේරම පොත අස්සට දාද්දි මගේ ඇහැ ගියේ ලා නිල් පාට ඒ ෆෝ එකක තද නිල් පෑනෙන් ඉංග්‍රීසියෙන් ලියපු ලියුමක් වගේ එකකට..

මම ඒක මේසෙ උඩින් තියලා අනිත් ඔක්කොම බෑග් එකට දාලා පැත්තකින් තිබ්බා..

Radhya,

Long have I waited here, countless ago.

Is it too much to ask?

Too much to consider, that we could ever be together?

I know, I understand,

That we do belong together.

Do you not see how perfectly our hands fit?

All you have to do is ask.

Ask and I will answer.

I would gladly be yours but now I wonder.

Is there something wrong with me?

Is there somehow an offense against you?

I would give you the world, I would give you my heart.

I could love you, forever and farther.

Why do you evade my love?

@Shan

I would be yours, and never consider another.

The way things are going though,

The pain you've put me through,

I must question myself, how could this end.

Long have I waited here, and forever more.

I cannot love you near,

But my heart is yours and from afar I cry out.

To you! To you I cry out!

My heart is yours,

But I fear yours will never be mine...

" මොනෞත්තක්ද මේ..??"

මම දෙපාරක් තුන්පාරක්ම ලියුම හරව හරව බැලුවා.. මොකෙක්ද මේක ලියලා තියෙන්නෙ.. ලිට කරන එකෙක්ද.. අනික රධ්‍ය අයියා මොන එහෙකටද මේක බැග් එකේ දාගෙන ඉන්නෙ.. අනික මේක කවුද දෙන්න ඇත්තෙ.. ඉස්කෝලෙම මොකෙක් හරිද.. මම කොලේ අතේ තියාගෙන කල්පනා කර කර ඉද්දි අයුක අයියයි කියාන් අයියයි රූම් එකට ආවා.. ඒ වුනාට මම හිටියේ නියපොත්තකුත් හපාගෙන කොලේ දිහා බලාගෙන..

" ආ මල්ලේ.."

" මොකක්ද ෂනෙරු ඔය..??"

අයුක අයියා මගේ අතේ තියෙන කොලේට එබිලා ඇහුවා..

" අනේ මන්දා.."

@Shan

මම කොලේ අයුක අයියට දෙද්දි කියාන් අයියත් පැත්තෙන් බෙල්ල දාලා ඒක දිහා බැලුවා.. මොකක්ද ඉතින්.. පෙම් හසුනක්නෙ.. පරෙයියෙක්ද දන්නෙ නෑ  ගෙනැත් දුන්නෙ රෝමියෝට..

" ටසිරි මල්ලේ.. උඹද මේක ලිව්වෙ.."

" පිස්සුද බං.. මම නෙමෙ.. රධ්‍ය අයියගෙ බෑග් එකේ තිබ්බෙ.."

" කාගෙ.. මේ අපේ එකාගෙ.. සිරාවටම?? වෙන්න බෑ.. අඩෙ බොරු නොකිය කියපන් උඹනෙ ලිව්වෙ.."

" නෑ බං නෑ මම ඔව්වා ලියනවද.."

මම කියාන් අයියට රවලා පාඩුවෙ චොක්ලට් එක කන්න ගත්තා.. ලියුම් බැරිනම් ඕන ලබ්බක් ලියාගත්තුදෙන්.. මට මොකෝ.. හැබැයි ඒක ලියපු එකා පවු මොකක් වුනත්.. නොලැබෙන මගුල් පස්සෙනෙ යන්නෙ ඉතින්..

ඒවුනාට අනුන්ගෙ මිනිස්සුන්ට ලියුම් ලියන්නෙ අහවල් මගුලකට යැ.. මගෙ හිත යටින් ඉරිසියාවකුත් තියෙනවා තියෙනවා වගේ.. මම ඔව්වා හිත හිත චොක්ලට් එක කාලා ඉවර කලා..

" අපේ එකාගෙ සිකුරා උච්ච වෙලාද කොහෙද.. බලපන් අපි තමා වෙලි වෙලි ඉන්නෙ.."

" උඹලා මෙහෙද.. මම අරහෙ හෙව්වා.."

කියන් අයියගෙ පිටට එකක් ගහගෙන මගෙ ඉස්සරහ පුටුවෙන් ඉඳගත්තෙ රධ්‍ය අයියා.. එයාගෙ ඇස් එකපාර නතරවුනේ අයුක අයියගෙ අතේ තියන ලියුම දිහාවට..

" ඔය මොකක්ද බං.. පොඩි එකෙක්ගෙ ලියුමක්ද.."

රධ්‍ය අයියා අහද්දි කියාන් අයියා 'මම ඕවට නෑ' කියාගෙන මගේ එහාපැත්තෙ පුටුවක් අදගෙන ඉඳගත්තා..

" මේ උඹට පෙම් කවියක් කඩඩෙන් ලියලා එවලා.. වරද් පෙන්නුවෙ.."

" මොකක්..??"

@Shan

රධ්‍ය අයියා මොකුත් හිතාගන්න බැරි මූණකින් අයුක අයියගෙ අතේ තිබ්බ ලියුම උදුරලා ගත්තා.. මේකා ඇත්තටම දන්නෙ නැතුවද..

ඊටපස්සෙ ඒක මුල ඉඳලා අගටම කියවලා මෙලෝ ගානක් නැතුව ගුලි කල්ලා ඉස්සරහ ඩස්ට්බින් එකට ගානට විසික් කලා.. මම කිව්වනෙ.. ඌ වගේ එකෙක්ට කැමති වෙන්නෙ මොන එකාද.. මූම කැමති වුනොත් මිසක්.. පස්සෙන් ගිහින් යාලුකරගන්න පුලුවන් ටයිප් එකේ එකෙක් නෙමේ මේකා..

" nonsense.. මේ අයුකයා මල්ලිව එක්කන් වරෙන් කන්න.."

" ම්ම්.."

අයුක අයියා කියාන් අයියත් එක්ක සෙනුකයව එක්කන් එන්න ගියා.. මේකට මෙලෝ ගානක් නෑ.. යකෝ ඉතින් ලියුමක්නෙ හම්බුනේ.. පොඩ්ඩක් පුදුම වෙයන්කො එහෙමත් නෑ..

" අත අමාරුවක් නෑනෙ.."

" ම්ම් ලොකුවට නෑ.."

මම අහක බලාගෙන කියද්දි රධ්‍ය අයියා මගෙ මූණ දිහාට අතක් දික් කල්ලා යටි තොල ගාව තිබ්බ මොකක් හරි පිහිදැම්මා.. එකපාරට එයා කරපු දේත් එක්ක මම ටිකක් පුදුම වෙලා බලාගෙන ඉද්දි එයා ලන්ච් බොක්ස් එක අරගෙන මේසෙ උඩින් තියලා මම ආපහු බෑග් එකට දාපු කිට් කැට් එක මටම දුන්නා..

" මම චොක්ලට් කන්නෙ නෑ.."

" චොක්ලට් කන්නෙ නෑ?? ඇයි ඒ.."

" පැණිරස අප්පිරියයි.."

" එහෙනම් මම කනවා ඈ.."

" ම්ම්.."

@Shan

මම කිට් කැට් එක දෙකඩ කඩලා කෑලක් කටට දාගෙන අනිත් එක එයාගෙ මූණට ලං කලා..

" ආ කියනවකො අයියෙ.. ආව්.. මොන-"

මම ළඟට චොක්ලට් කෑල්ල දෙන්න කට අරින්න කිව්වහම මේකා මගේ ඇඟිල්ලත් එක්කම කෑවා.. සැක්.. රිදුනත් එක්කන්.. මම දෙකක් රවලා ඇඟිල්ල පිහිදගත්තා.. දෙන්න හිතයි හිනාවෙන හැටි.. දත් ටික බඩට යන්න..

" මෙ කවුද අර ලියුම දුන්නෙ.."

මම හිමීන් සැරේ පුටුව රධ්‍ය අයියගෙ පුටුව ලගට කිට්ටු කරගත්තා.. හොයානන්නෝන කවුද ඔය ජූලියට කියලා..

" දන්නෙ නෑ.. හැබයි ඔහොම එකක් මගේ පොත් අස්සෙ තිබ්බෙ නෑ.."

" නෑ කියන්නෙ ඉතින් මට හම්බුනානෙ.."

" ඒකතමා ඉස්කෝලෙ කවුරු හරි දාන්න ඇති.. මම දන්නෙ නෑ මට වැඩක් නෑ.."

" වැඩක් නෑ කියල කොහොමද.. ඉන්නවකො මම හොයාගන්න.. කවුද මේ ලියුම් එවන පරෙයියා කියලා.."

" හොයාගෙන මටත් කියපන් එහෙනම්.."

" බෑ ඇයි ඒ.."

රධ්‍ය අයියා ආයෙම කට කොනෙන් හිනාවෙලා පුටුවට හේත්තු වුනා..

" අනේ බං උඹෙත් ඉරිසියාව.. "

කවුද පගො රධ්‍ය අයියට ලියුම් එවන කොන්ද නැති පරෙයියා.. තලනවා ඇම්ට දෙක..

-වරද් ෂනෙරු උද්යෝග රධ්‍ය අයියට කියලා කෑම කවාගන්න ගමන් සිට-

දිග එපියකින් එන්නාම.. ලව් යූ..

@Shan

ප.ලි.

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 26 කොටස

" මෙ සිරාවට ඒක හුගක් පේනවද..??"

" පේනවද අහන්නෙ බලපන් සාක්කුව ගාවින් හරහටම ඉරිලා තියෙන්නෙ.."

" බලපන් කියන්නෙ ඉතින් මට පිටිපස්සට ඇස් නෑනෙ.."

" දැන් ඔය ශර්ට් එකවත් උඩට දාගනින්.. ඇත්තට උඹට අලි විසේද බං.."

" බෑ බෑ කවුරුහරි දැක්කොත් බැනුම් අහන්න වෙයි.."

" දෙයියනේ කියලා එකතැනක ඉදපන් වරද්.. අම්මපා උඹ දෙන වදයක්.."

" ආ එතකොට මම දැන් වදේ.."

" එහෙම එකක් කිව්වද මම.."

" ඇයි මම වද දෙනවා කිව්වෙ.."

" මාව මරාගෙන කාපන්.. මගුල.. ඔහොම ඉදපන් මම ඉදිකට්ටක්වත් හොයාගෙන එන්න.. "

" ඕන්නෑ මම මෙහෙම ඉන්නවා.."

" ඇයි උඹෙ අන්ඩවෙයාර් එක කළු පාටයි කියලා රටටම පෙන්නන්නද.. මෙතන ඉදින් මම එනකල්.."

රධ්‍ය අයියා මාව පුටුවට තල්ලු කල්ලා මටත් ගස්සගෙන ප්‍රිෆෙක්ට් රූම් එකෙන් එලියට ගියා.. කැගැහුව හැටි විතරක්.. දෙන්න හිතයි ගැටපොලොස් කොට්ටෝරුවට.. හොම්බට එකක්.. ආපුදෙන්කො ඉදිකට්ටක් අරගෙන කට මහන්නෙ මුගෙ කට..

මෙ දවස් ටික විශේශයක් නැතුවම ගෙවිලා ගිහින් සිකුරාදා වෙද්දි මම ආර්ම් ස්ලින්ග් එක අයින් කල්ලා අතට බැන්ඩේජ් එක විතරයි දාගෙන ඉදියේ.. ඒත්

@Shan

ඉතින් මටත් තියන කසන ලෙඩේට හවස ඉස්කෝලෙ ග්‍රවුන්ඩ් එකට එහාපැත්තෙන් තියෙන කම්බි වැටෙන් රිංගලා අඹයක් කඩාගෙන සෙනුකයා එක්ක මෙහාපැත්තට රිංගලා එන්න ගිහින් ඒ ලබ්බෙ කම්බි වැටට කලිසම පැටලිලා කලිසමෙ සාක්කුව  ගාවින්ම පැත්තක් ඉරිලා ගියා..

මම ඉතින් හිමින් සැරේ කලිසම වහගෙන ක්ලාස් එක පැත්තට යද්දි රධ්‍ය අයියා මාව දැකලා එතෙන්ට ආවා විතරයි සෙනුකයා ගොං වස්සා පැනපු ගමන් මගේ කලිසම ඉරුණු එක ඒකාට කිව්වා.. මූට ඒකට මල පැනලා සෙනුකයා ඉස්සරහම මගෙ පිට මැද්දට ඩාන් ඩාන් ගාලා දෙකක් දීලා ප්‍රිෆෙක්ට් රූම් එකට ඇදගෙන ආවා.. සැක් මූ මාර බෝයිෆ්‍රෙන්ඩ් තමා.. ගහනවයි බනිනවයි රවනවයි පුප්පනවයි.. මම ඉතින් මගේ අතෙත් පොඩ්ඩක් වැරැද්දක් තියෙනවා නිසා කට වහගෙන ඉදියෙ.. නැත්නම් අඹ ගෙඩියෙන්ම ඔලුවට නෙලන්නෙ..

මම පුටුවෙ ඉදගෙන කිසි ලැජ්ජාවක් නැතුව අමාරුවෙන් කඩාගත්තු අඹගෙඩිය කාකා ඉදියා.. එන්නෙ නැතැයි ඉදිකට්ටක් හොයාගෙන කොහෙන් හරි.. ආ හෝම සයන්ස් රූම් එකේ ඇතිනෙ එක එක සයිස් එකෙන් ඉදිකටු.. බෙනිෆිට්ස් ඔෆ් හැවින් අ බෝයිෆ්‍රෙන්ඩ්..

මේ දවස් ටිකේම රධ්‍ය අයියට පාට පාට ඒ ෆෝ වල ලියුම් හිටු කියලා හම්බෙනවා.. හැමදාම මට අඩුමතරමෙ එකක්වත් අහුවෙනා.. හුගක් දවස්වලට ඕවා අනිත් අයියලත් දකිනවා.. සෙනුකයා නම් කිව්වෙ අපි නැති වෙලාවක් බලලා ඔය පරෙයියා පියාඹගෙන මෙකට ඇවිල්ලා රධ්‍ය අයියගෙ බෑග් එකට ඕවා දාලා යනවා කියලා.. ඒ වුනාට මට හෙන කුතුහලයක් තියෙන්නෙ.. ඔය පරෙයියව හම්බුනොත් නම් අම්මපා පිහාට්ටෙන් පිහාට්ට ගලවලා මම හුණු කොට්ටයක් මහනවා..

" ෂනෙරුවා.."

මම අඹෙ කකා ඉද්දි සෙනුකයා රූම් එකට ඇවිත් මගෙ එහාපැත්තෙන් ඉදගත්තා.. පාවලා දෙන්නා.. පස්සෙ ඌයි මායි ඔය පරෙයි සීන් එක ඇදගෙන පව හල හලා ඉද්දි තමයි සෙනුකයට මතක් වුනේ ප්‍රිෆෙක්ට් රූම් එකේ කර්ට්න් එකට එහාපැත්තෙ කණ්ණාඩියක් තියන වග.. මම ඉතින් ඌ එක්ක නැගිටලා කර්ට්න් එක පිටිපස්සට ගියේ කණ්ණාඩියෙන් මගේ පස්ස බලාගන්න..

" අප්පටසිදි සෙනුකයා අම්මගෙන් කන්න වෙනවා අද.."

@Shan

" සැක් උඹ කම්බිවැටටම අහු කරගත්තනෙ පුප.. අම්ම කෙසේවෙතත් බලපන් ගෙදර යන්නෙ කොහොමද කියලා.."

" අවුල් නේ බං.."

" ඉදපන් රධ්‍ය අයියා උඹේ පුප මහලා දෙයි.."

" මම කියන්නෑ උඹට ගස්ලබ්බා.."

අපි දෙන්නා කර්ටන් එක පිටිපස්සට වෙලා කියව කියව ඉද්දි කවුරුහරි රූම් එක ඇතුළට ආවා.. හුගක් වෙලාවට මෙකට එන්නෙ අපි විතරයි.. තව සයෝන් අයියයි අහිරු අයියයි එනවා.. එච්චරයි.. රධ්‍ය අයියටයි අයුක අයියටයි මෙකෙ ඉන්න මිනිස්සු බය නිසා එන්නෙ නෑ මුන් කලිසම කොටයි කොන්ඩෙ වැව්ලා වැඩී අරවා මේවා ඇද හොයලා අම්බානෙක බැනලා යවන නිසා..

මම කර්ටන් එක ලාවට මෙහාට කල්ලා බැලුවේ ආවෙ රධ්‍ය අයියද කියලා බලන්න..

ඒවුනාට..

ප්‍රිෆෙක්ට් රූම් එකට ආවෙ හීනෙකින්වත් හිතපු එකෙක් නෙමෙ..

ඒ ඇවිත් හිටියේ චමිරුවා.. එදා මාත් එක්ක බැඩ්මින්ටන් ප්ලේ කරපු ඩයල් එක.. මම කර්ටන් එක මෙහාට කරන් බලාගෙන ඉද්දි සෙනුකයත් ඒ අස්සෙන්ම බලාගෙන හිටියේ මූ කරන වැඩේ.. මූ දෙපාරක් තුන්පාරක් වටේ පිටේ බලලා රධ්‍ය අයියගෙ බෑග් එක ගාවට ගියා..

මම හිතුවා හරි.. මූ තමා අවලං පරෙයියා.. පහුගිය දවස් ටිකේම මූ මට කරපු තරමක් කලේ හතුරුකම් විතරයි.. මම සෙනුකයට කිව්වත් උෟ කිව්වෙ හරියටම දන්නෙ නැති නිසා මූට මොකුත් කියන්න බැනෙ කියලා.. ඒ වුනාට අද අතටම අහුවුනේ.. මේකා රධ්‍ය අයියගෙ බෑග් එක ඇරලා මොකක් හරි ලියුමක් දැම්මා.. දාලා කලබලෙන් එළියට යන්න දොරට අත තිබ්බා විතරයි දොර ඇදගෙන ඇතුළට ආවෙ කියාන් අයියා..ම්ම්.. නයිස්..

කියාන් අයියා මුලින් මූ දිහා දෙපාරක් විතර උඩ ඉදන් පල්ලෙහාටම සර්ච් කරද්දි චමිරුවා හිටියේ ගු බයෙන්.. කියාන් අයියා අපිට විහිලු කරගෙන

@Shan

ආතල් එකේ ඉදියට මූ සිරාම ආතල් පොරක් නෙමේ.. මල පැන්නහම කුලු මීමා වගේ.. අනික උගේ ඇගත් ඌටම හරියන්න හැදිලා තියෙනවා දසමහා යෝධයොන්ගෙ වගේ.. චමිරුවා බය වෙන එක සාධාරනයි.. ඒ වුනාට හොද වැඩේ..

" මෙ මල්ලි මොකද.."

" අම්.. මම ආවේ ර්-රධ්‍ය අයියව හම්බෙන්න.."

" රධ්‍ය මෙ වෙලේනම් නෑ.. මොකක්ද වෙන්න ඕන.."

ඔව් රධ්‍ය පුතා ගියානෙ ඉදිකට්ටක් හොයන් එන්න.. ඒ ලමයට හරියට වැඩ..

" ම්-මම අහන්න ආවෙ- කැම්පින් එකේ විස්තර වගයක් අහන්න.. රධ්‍ය අයියා නැත්නම් මම යන්නම.."

චමිරුවා කියාන් අයියගෙ ඇගෙත් වැදීගෙන දුවගෙන ගියා.. යකෝ මූ කිව්ව බොරුව.. මූ කැඩෙට් කරනවා තමයි ඒක හරි.. කැම්පින් එකේ විස්තර අහන්නෙ පාට පාට ලියුම් දීලද.. උගෙ අපගෙ කැම්පින් එකක්නෙ ඒක..

" අයියෙ.."

" උඹලා මොකක්ද ඔය රෙද්දක් අස්සට වෙලා කරන්නෙ.."

" කලිසම ඉරුනා බං.."

" මොක්-ජ්ජ්ෆ්-යකෝ උඹ ඇදගෙන ආවෙ කළුපාට ජොකෙක්ද.. හරිම ලස්සනයි.."

" අනේ පලයං අයියෙ යන්නෙ.. මගුල.."

" කෝ රධ්‍ය.. මම දැක්කා අන්න හරේ හෝම සයන්ස් රූම් එක පෙරළනවා.. ආවෙ නැද්ද.."

" නැනෙ.."

@Shan

" මේ අරූ උඹලගෙ වයසෙ නේද.. මේකෙ මොකක්ද කලේ.. අනික උඹලා රෙද්දක් අස්සට වෙලා ඉදියෙ මොකද ඌ එළියට යනකල්.."

" ආං අර බෑග් එක ඇරලා බලපන්.. කරපු එක පෙනෙයි.."

" ඈ..?? පොඩ්ඩක් ඉදපන්.. අඩේ මේ අර උඹෙ පරෙයියද.. සිරාවටම.. අර මල්ලි???"

" යැස්.."

" ඌ මාර ඩයල් එකක්නෙ.. සැක් රධ්‍ය එන්න තිබ්බෙ.. අපිට ඩ්‍රාමා එකක් බලාගන්න තිබ්බා.."

" හුම්.. ඔය පකයා එදා මට හිනාවුනත් එක්කන්.."

" මෙකා නේද එදා ෆයිනල්ස් ප්ලේ කරන්න සෙට් වුනේ.. මට ලාවට මතකයි..අඩේ ඒ වුනාට ඌ අපේ එකාට කැමතී.. කඩවුලේ මොනවද අප්පා මේ වෙන්නෙ.."

" ඉම්හී.."

අපි අයුක අයියත් එක්ක චමිරුවා ගැන කියව කියව ඉද්දි රධ්‍ය අයියා අයුක අයියත් එක්ක ඉදිකට්ටකුයි සුදු පාට නූල් වගේකුයි අරගෙන රූම් එකට ආවා.. රධ්‍ය අයියා ගැන දුකත් හිතෙනවා ඉතින්.. මම මොන මගුල කිව්වත් වචනයක්වත් කියන්නැතුව කල්ලා දෙනවනෙ.. පොඩ්ඩක් බයිනවා තමා.. ඒ වුනාට..

" මම උඹට කිව්වෙ මොකක්ද.. ශර්ට් එක පහලට දාගනින් කියලනේ.. "

" හරි හරි අප්පා ඉතින්.."

" මෙහෙ වරෙන්.. ඕක මහලා දෙන්න.. "

රධ්‍ය අයියා පුටුවකින් වාඩිවෙලා මට එතෙන්ට කතාකලා.. සැක්ම සැක් මම දැන් මූ මහනකල් පස්ස දික් කරන් ඉන්නෝනද.. ඒක පොඩ්ඩක් හරි නෑ වගේනෙ..

" අහ්ම්.. අයුකයා.. කැන්ටිමට යමුද.."

@Shan

කියාන් අයියා හිමිහිට මාරුවෙලා දොරත් වහගෙන එළියට යද්දි ඒ පස්සෙන් සෙනුකයයි අයුක අයියයිත් එළියට ගියා..

" මේ ඕක ඇගේ අනින්න එපා හරිද.."

" හරි හරි.."

" මේ ඔයා කතිර මැස්මෙන්ද ඔය මහන්නෙ.."

"...."

" කියනවකො අයියෙ..."

" මම දන්න කතිර මැස්මක් නෑ බං.. පොඩ්ඩක් දගලන්නැතුව ඉදපන්කො.. ඊටපස්සෙ බෙරිහන් දෙනවා ඇගේ ඇනුනා කිය කිය.."

" මේ අන්ඩවෙයාර් එක අල්ලලා මහන්න එපා හරිද.. අපෙ අම්මගෙන් මට බැනුම් අහගන්න වෙයි.."

" ම්ම්.."

" ඉවරද.."

" උඹ හිතුවද මම මහන මැශිමක් කියලා.. පොඩ්ඩක් ඉදපන් කැරකෙන්නෙ නැතුව.."

" කොහෙන්ද ඔයා මහන්න ඉගනගත්තෙ.."

" කැම්ප් යද්දි ටෙන්ට් මහලා තියෙනවා.."

" ආ.."

මම උගේ මූණ ඉස්සරහ හිටගෙන උඩ බලාගෙන ඉදියා.. මෙකා කලිසම අල්ලගෙන මහනවා වුනාට ඉතින් ඒක මගේ පස්සනෙ.. උගේ අත ගැවෙද්දි මට හෙන අමුතුයි.. ඒ වුනාට මෙකා ඉස්සරහා ඔච කියලා ලැජ්ජ වෙන්න බැරි නිසා මම දිවත් හපාගෙන උඩ බලාගෙනම ඉදියා.. ආයෙනම් කම්බි වැටෙන් රිංගන්න හොද නෑ.. මේ මොන ලැජ්ජාවක්ද.. මූ මගේ යට

@Shan

කලිසමත් දකින්න ඇති.. මට උනොත් වෙන්නෙ මේ වගේ අද්භූත වැඩක් තමා..

" මිම්.. හරි.. නටන්නැතුව ඉදපන්.. ඕක ඉරෙයිද දන්නෙ නෑ.."

" කවුද අනේ දගලන්නෙ.. අරිගතෝ ගොසයිමස්.."

මම උගේ පැත්තට හැරිලා අංශක අනූවට කොන්ද නමලා පුටුවක් ඇදගෙන එහාපැත්තෙන් ඉදගත්තා..

" මේ මම පරෙයියව හොයාගත්තා.. "

" මොන??"

" අර අප්පා ලියුම් දාලා යන්නෙ ඔයාගෙ බෑග් එකට.. අර කියලා තිබ්බෙ දවසක්, ඩූ යූ සී හව් ප'ෆෙක්ට්ලි අවර් හෑන්ඩ්ස් ෆිට්?? ඉස් දෙයා සම්තින්ග් රොන්ග් විත් මී?? ඉස් දෙයා සම්හව් ඔෆෙන්ස් අගෙයින්ස්ට් යූ?? අයි වුඩ් ගිව් යූ ද ව'ල්ඩ් අයි ෆුඩ් ගිව් යූ මයි ඇස් බලා බලා.."

මම කියද්දි රධා අයියා මහා හයියෙන් හිනාවෙන්න ගත්තා.. හරි හිනා.. මටනම් හිනායන්නෙ නෑ..

" මොනවද බං කියවන්නෙ.."

" ඉතින් ඇත්තනෙ.."

" ආ හා ඉතින් කවුද ඔය කියන පරවියා.."

" පරවියා නෙමෙ පරෙයියා හලෝ පරෙයියා.. එහෙම කියන්නෙ ඌට අපහසේට.. මගුල.. ඔයා දන්නවද අර කැඩෙට් කරන අපේ වයසෙ චමිරුව.. අර අනේ ආට් කරන්නෙ සුදු උස කෙට්ටු.."

" ඔ.."

" ඒකා.."

" එහෙමද.. මිම්..මිම්.. "

@Shan

රධ්‍ය අයියා මම කිව්ව එක ලොකුවට ගානක් ගන්නෙ නැතුව මගේ කර වටේ අතක් දාලා උගේ ඇගට ඇදලා ගත්තා..

" ලියුම ගැනනම් මං දන්නෙ නෑ ඒ වුනාට

**Do YOU see how perfectly OUR hands fit..??**

මිම්.."

රධ්‍ය අයියා මගේ අතක් එයාගෙ ලොකු අතක ඇඟිලි අස්සෙන් පටලගෙන අහද්දී මම හිනාවෙලා රධ්‍ය අයියගෙ අත ඇඟිලි වලින් තදින් අල්ලගෙන ටිකක් වෙලා ඉදලා අතෑරියා..

"

**I see**

.."



ආ බියුටිපුල් කෙල්ලනේ.. කොහොමද..

චමිරු පුම්තා ඉම්ලගෙනනෙ කම්නෙ ඉතිම්..

රධ්‍ය ඩිංගිත්තක් කියාන් අයියන්ඩි එක්ක ජෙලත මන්දා.. පෞ ඉටිම්.. දුකයි දුකයි දුකායි..

දැන් ඔය මදෑ ස්පෝර්ටස් මීට තිව්වා.. ඒකත් ඉවර කොල්ලා දාමු..

මම මේක අර පාසල් ප්‍රේමයක් නිසා ඉස්කෝලෙ හැම සිදුවීමක් ම මේකට දාලා ලියන්න ආසයි.. ඒ වුනාට දිග වැඩිවුනොත් හරි නැති වෙයි කියලත් හිතෙනවා.. මොකද ඉස්සරහට කතාව අනිත්පැත්ත ගැහෙන නිසා.. ඔයාල කොහොම ලිව්වොත්ද ආස..???

ආයෙ එන්නම් ඈ..

ලව් යූ..   ❤

@Shan

ප.ලි.

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 27 කොටස

ඉක්මනින්ම සති එක දෙක ගෙවිලා ගියා.. ඉස්කෝලෙ වැඩ මීට් එකේ වැඩ අනම් මනම් එක්ක මමයි සෙනුකයයි අනිත් හැමෝමයි කාර්‍යබහුල වෙද්දි සමහර වෙලාවට හිත් රිදීම් ඇති වුනා.. සමහර වෙලාවට හැමදේම එපාවෙලා ගියා.. එක දිගට තිබ්බ මැච් දෙකකින් අපි ෆෝත් ප්ලේස් ගද්දි හවුස් එකේ ගුරුවරුන්ගෙ ඉදන් මටයි නෆ්‍රාස්ටයි ඇඩෙන්න බැනුම් අහන්න වෙද්දි මට දැනුනා වගකීමක් කියන්නෙ මොකක්ද.. වගකීමක බරපතලකම මොකක්ද කියලා..

අන්තිමට තියපු හවුස් මීටින් එකේ මමයි අපේ හවුස් එකේ කෝඩිනේටරින් බෝඩ් එකයි මුලු ඉස්කෝලෙම අපේ හවුස් එකේ ලමයි ඉස්සරහා අම්බානෙක බැනුම් අහද්දි මම නාඩා හිටියේ හරි අමාරුවෙන්.. මම කොච්චර වුනත් ඔහොම බැනුම් අහලා තිබ්ලා නෑ.. ජීවිතේට.. ඔච්චර ගොඩක් මැද්දේ.. මම අතත් බිදගෙන අන්තිමට තිබුනු හොකී මැච් වල රිසර්ව් පවා ප්ලේ කලා.. මමත් නොසෑහෙන්න මහන්සි වුනා.. මෙශර්මන්ට්ස් අරයට මදි මෙයාට මදි කියද්දි ආයෙම ඒවා මාරුකරගන්න එහෙ ඇවිද්දා මෙහෙ ඇවිද්දා.. ස්ට්‍රෙස් එක උපරිමේටම තියෙද්දිත් මට ක්ලාස් යන්න වුනා.. ක්ලාසස් වල එක්සෑම් ලියන්න වුනා.. මග ඇරුනු නෝට් ලියන්න නිදාගන්න තිබ්බ වෙලාවත් නැතිකරගත්තා.. මැරිලා මැරිලා ගෙදර එද්දි ඇග පතේ අමාරුවට මට සේරම දමලා ගහලා ගෙදර ඉන්නෙ හිතුනා.. ගෙදර ආවත්, ගෙදර ප්‍රශ්න අම්මා ගැන අඩුපාඩුවක් නොකර හොයලා බලලා ඒ දේවල් කරන්නත් වුනා.. අනේ මන්දා හිතද්දිත් මම කොහොම එච්චර ගොඩක් කලාද හිතාගන්න බෑ.. ඒ ලෙවෙල් කරන කාලෙ මෙහෙව් එකක් කලා කියද්දිත් මගේ බඩ පපුව දගලනවා..

මේ කාලෙදි.. ඇත්තටම.. මට අනන්ත වතාවකට වඩා හිතුනා රධ්‍ය අයියා මගේ ජීවිතේට ආවෙ මගේ මොකක් හරි ලැබීමකට කියලා.. මම දන්නෙ නෑ කොහොම වචනෙන් විස්තර කරන්නද කියලා.. එයා මගේ ලග නොහිටි වෙලවක් නැති තරම්.. මම අදහස් කලේ තුරුල් වෙලා වෙළිලා කියන එක නෙමේ.. වචනෙකින්, හුස්මකින්, විනාඩි දහයක පහලොවක කෝල් එකකින් හැමතිස්සෙම වගේ රධ්‍ය අයියා මගේ ළගින් ඉදියා.. සමහර දවස්වලට අපි දෙන්නම ඉස්කෝලෙ ආවත් එක විනාඩියක්වත් කතාකරන්න වෙලාවක් හම්බුනේ නෑ.. රධ්‍ය අයියට තිබුනු වැඩ ගොඩේ

@Shan

හැටියට මාව අහන්න, බලන්න, කියන්න වෙලාවක් කොහොම තිබ්බද මන්දා..

ඒ වුනාට වෙලාවට කෑවද, බිව්වද, ගෙදර ආවද කියලා රධ්‍ය අයියා නිතර හොයලා බැලුවා.. මාව සමහර දවස්වලට ගෙදරින් ඇරලුවා.. ස්ට්‍රෙස් එකට ගැස්ට්‍රයිටිස් වැඩි වෙලා හවසට කාපු බීපු සේරම අනික් පැත්තට වමනෙ යද්දි පුලුවන් හැමවෙලාවකම මගේ පිට දිගට අතගෑවා.. මාව වාරු කරන් හිටියා.. එයා එයාගෙ හරිම සීමාවෙ ඉදන් වුනත් පුදුම විදියට ආදරේ කලා.. මට ලෝබයි.. වෙලාවකට සේරම දමලා ගහලා 'රධ්‍ය අයියේ ඒ ලෙවෙල් වෙනකල් ඉන්න ඕන නෑ' කියලා රධ්‍ය අයියට 'ආදරෙයි' කියන්න හිතුනා..

ආදරේ මොකක්ද කියන්න මම දන්නෙ නෑ.. ආදරේ කරන අයගෙන් අපි කරන්නෙ මොන වගේ එකක්ද, ඒක කොයි කාන්ඩෙටද වැටෙන්නෙ කියලා මම දන්නෙ නෑ.. මම විතරක් නෙමෙයි එයා දන්නෙත් නෑ.. ඒ වුනාට හිත මෙහෙම පිරිලා යන හැගීමට මම 'ආදරේ' කියලා කිව්වා.. ළගින් නොඉද දුරින් හිටියත් ඒ ආදරේ මට ගෙනාවෙ හරි සැහැල්ලුවක්.. එයා ලගදි මට ප්‍රිටෙන්ඩ් වෙන්න ඕන වුනේ නෑ.. මම හිටියේ මම වගේ..

මම කලිනුත් කිව්වා වගේ මම මේ හැමදේම වින්දේ මාසයක් විතර කාලයක් ඇතුලේ එක්තරා සීමාවක ඉදන්.. ආදරේ කරන අයත් නෙමෙයි නොකරන අයත් නෙමෙයි.. එහෙව් වෙලාවකදි මටම හිතෙනවා ඇත්තටම අපි ආදරේ කලොත් මට මේ හැගීම දරාගන්න බැරුව මාව පිපිරිලා යයි කියලා..

'උඹ නම් මාව කන්නම ආපු එකෙක් බං'

රධ්‍ය අයියා මම හැමතිස්සෙම මොකක් හරි ලෙඩක් දාගෙන මූණ නාළු කරගෙන ඉන්න වෙලාවක ඔහොම කියලා හිනාවෙනවා..

දවසක්.. මම ඉදියේ හෙනම අවුලෙන්.. ඒක ඉස්කෝලෙ වෙච්ච ප්‍රශ්නයක්වත් මොකක්වත් නෙමෙයි.. මට ඒක කාටවත්ම කියන්න බැරි විදියේ ප්‍රශ්නයක්.. මොකද මං ගැන හුගක්ම දන්නෙ මම විතරයි.. සෙනුකයවත් සමහර වෙලාවට මහීශාවත් නෙමෙයි.. උන් මගේ හොදම යාලුවෝ තමයි.. ඒ වුනාට හැමදේම කියන්න පුලුවන් සීමාවක් තියෙනවනෙ.. ඉතින් මෙකත් එහෙම ප්‍රශ්නයක්..

@Shan

ගෙදර අම්මගෙන් ආච්චිගෙන් මාමාගෙන් ඇරෙන්න මට කිසි පැත්තකින් සැනසීමක් දැනෙන්නෙ නෑ.. අපේ ගෙදර හිටිහැටියේ දවසක් මම ප්‍රැක්ටිස් ඉවරවෙලා යද්දි ලොකු අම්මලා ඇවිත් ඉදියා..

එයාලා මට කොහොමත් කැමති මිනිස්සු නෙමේ.. ඒවුනාට අම්මගෙ අක්කනෙ.. මට මොකුත් කියන්න බෑ.. අනික මම වැඩිහිටියොන්ට මොකක් වුනත් ගරු කලා.. ඒ නිසා මනුස්සකමට හිනා වුනා මිසක්.. ලොකුවට කතාබහක් අපි අතරෙ තිබුනෙ නෑ..

අම්මා නොකීවට මම දන්නවා මම පොඩි කාලෙම දවසක් ලොකු අම්මා අපේ අම්මා එක්ක කිව්වා 'ඔය ලමයා නැති කල්ලා දැම්මනම් ඔයාට ජීවිතේ යස අගේට හදාගන්න තිබ්බනෙ නංගි'..

මගේ ඔලුවට අකුණක් කෙටුවා වගේ ඒ කිව්ව වචන වලට මගේ හිත සැහෙන්න රිදුනා.. අම්මා, ලොකු අම්මා කිව්ව දේවල් වලට අසරණ විදියට හිනාවෙලා තේ කෝපෙ කාල් ගාද්දි ඒක ඇහුනු ලොකු අම්මගෙ පුතා මට කින්ඩියට හිනාවුනු හැටි මට මතකයි..

ඉතින් එහෙම තමා අපේ ගෙදර මිනිස්සු මට සැලකුවේ.. හරියටම කිව්වොත් මම කියන්නෙ 'මිස්ටේක්' එකක්..

එදා මම කකුලත් බැන්ඩේජ් කරගෙන මහන්සි වෙලා ගෙදරට ආවෙ අම්මට ඕන කිව්ව බඩු වගේකුත් කඩෙන් අරගෙන එතන ඉදලා පයින්.. මම ගෙදරට අඩිය තියද්දිම ලොකු අම්මා හෙන ගහන්න වගේ අපේ අම්මා දිහා බලාගෙන 'මේ ලමයා මොන දිහාවක රිංගලාද මෙච්චර රෑ වෙලා ගෙදර එන්නෙ' කියලා ඇහුවා..

මම ඒක ගානකට ගන්නෙ නැතුව බඩු ටික අම්මා අතට දීලා කාමරේට රිංග ගද්දි ලොකු අම්මා තව මොනාදෝ මොනාදෝ කියලා අම්මට කතාකරනවා මට ඇහුනා..

ඔහොම ලොකු අම්මලා ගෙදර එන හැම වතාවකමයි, මාව පහත් කල්ලා කතාකරන හැම වතාවකමයි මට අර මම 'මිස්ටේක්' එකක් කියන හැඟීම දැනෙන්න ගන්නවා.. ඒක හරි වේදනයි.. නොකියා කියන්නෙ මම තාත්තා නැති එකා.. අනාතයා කියලා වෙන්න ඇති..

@Shan

මම එදා ඒ ඇදුම පිටින්ම ඇදට වැටුනා විතරයි ඇගේ අමාරුවට උණත් අරගෙන නින්ද ගියා.. මරු විකාරෙන් වගේ රධ්‍ය අයියා ගත්තු කෝල් එකත් කට් කරද්දි යාන්තම් දැක්කා අම්මා ඇද ගාවට ඇවිත් ඔලුව අතගාලා යනවා.. පව්.. අම්මා කියලා මොනවා කරන්නද.. කියන දෙයක් අහන් ඉන්නවා මිසක.. ඔවට කට ගහගෙන යන්න තරම් පුලුවන් කමක් තියෙන මිනිස්සු නෙමේ අම්මයි මමයි කියන්නෙ.. කොටින්ම වැටිලා ඉදියෙත් එයාලගෙම තැනක වෙද්දි..

පහුවදා පාන්දර මම නාලා පෙනඩෝල් දෙකක් බීලා ඉස්කෝලෙ ආවෙ එහෙම ඇවිත් වත් ඒ වෙලාවෙදි මට මේ ප්‍රශ්න අමතක වෙලා යන නිසා.. ඉස්කෝලෙ ලමයින්ගෙ සද්දෙ එක්ක මට ඉස්සර තනිකමක් දැනෙන්නෙ නෑ.. ඉස්සර ඉදන්ම මම ඔහොම හිත රිදුන හැම දවසකම පහුවදා අනිවාරෙන් ඉස්කෝලෙ එනවා.. ඇවිල්ලා නටලා කියලා විහිලුවක් කල්ලා ගෙදර යද්දි මගේ හිත ඉබේටම හැදිලා ඉවරයි..

ඒත් එදා මට ඉස්කෝලෙත් මහ මූසල හැගීමක් දැනුනා.. මම ක්ලාස් එකෙන් එළියටවත් ආවෙ නෑ.. සෙනුකයා මියුසික් රූම් එකේ උගට එන්න වෙලාවක් තිබ්බෙත් නෑ.. ඔක්කොම වෙන්නෙ හොදටයි කියලා මම කවුරුත්ම නැති බෑග් විතරක් ඉතුරුවෙලා තිබ්බ පන්තියේ මගේ පුටුවට වෙලා ඔලුව ගහගෙන උදේ වරුවම නිදාගෙන උන්නා..

කලින් දවසෙ උණ, පැය හයේ පෙනඩෝල් එකේ සැර බැස්සට පස්සෙ ආයෙම මතුවීගෙන එද්දි මම ගින්දර වගේ රස්නෙ පිටවෙන නළල අත් දෙකෙන්ම අතගාගෙන නිදාගන්න ට්‍රයි කලා..

එදා මම පිලිගන්න කොච්චර අකමැති වුනත් මම රධ්‍ය අයියව බලාපොරොත්තුවෙ හිටියා.. එයා කොයි වෙලාවක හරි එයි කියලා මම බලාපොරොත්තුවෙන් ඉදියේ.. ඒ වගේම රධ්‍ය අයියා තුන්වෙනි පීරියඩ් එකට බෙල් කරද්දි අපේ ක්ලාස් එකට ආවා..

මම හිටියේ ඔලුව තියාගෙන ඩෙස්ක් එකට.. එයා මගේ එහාපැත්තෙන් ඉදගනිද්දි ඒ සැර ප'ෆියුම් එකේ සුවද මට හොදට දැනුනා..

" වරද්.. මොකද මේ.."

රධ්‍ය අයියා කතාකරද්දි මම මූණ උස්සලා රධ්‍ය අයියා දිහා බැලුවා.. එයා ගැස්සුනා.. එකපාරට මූණෙ තිබ්බ සතුටු හැගීමක් වගේ එක නැතිවෙලා

@Shan

ගිහින් තප්පරේට මූණ වෙනස් වුනා.. හරියට පුදුමයක් එක්ක බයක් වගේ..

" වරද්.. "

මගේ අත පය සීතල වෙලා රෝස පාට වෙලා මටම දැනෙනවා ඇස් දෙක ගොරකා ලොඩ් දෙකක් වගේ රතුවෙලා ඉදිමිලා ඇති..

" මිම්.."

" ඇයි මට කතාකලේ නැත්තෙ වරද්.. ඔයාට හොදටම උණ.. මොකද ලමයෝ ඉස්කෝලෙ ආවෙ.."

රධ්‍ය අයියා මගේ නලලට පිට අල්ල තියලා බෙල්ලටත් අත් තියලා බැලුවා..

" මට අවුලක් නෑ.."

මම රධ්‍ය අයියගෙ අත අයින් කලා..

" අවුලක් නෑ..?? මේ අවුලක් නැද්ද.. මෙහෙ වරෙන් වරද් සික් රූම් එකට යන්න.."

" අනේ මට ඉන්න දෙන්න අයියෙ.. මට බෑ.."

" මාව යකා කරගන්නෙපා වරද්.. දැන් උඹට එන්න බැරිද.. හා බෑනෙ.."

රධ්‍ය අයියා මගේ අතින් හයියෙන් ඇදලා අරගෙන මාව නැගිට්ටුවා.. එයා මෙහෙම කේන්ති ගන්නෙ අඩුවෙන්.. ඒ වුනාට මේ තරම් කේන්තියෙන් ඉන්නවා මම දැකලම තිබ්බෙ නෑ.. මමත් හුලගට ගහගෙන යන පරඬැල වගේ ඇදිලා ගියා.. අනිත් පැත්තට අත ඇදලා ගන්නවත් මට හයියක් තිබ්බෙ නෑ.. මම ඔහේ මොකෙක්ද එකෙක් වගේ එයාගෙ පස්සෙන් ඇදීගෙන සික් රූම් එකට ගියා..

සික් රූම් එකේ ඉදපු ස්කූල් නර්ස් මගේ කකුලෙ බැන්ඩේජ් එක අයින් කල්ලා උණට බෙහෙතුත් දීලා නිදාගන්න කිව්වා.. මම හිටියේ ඇදේ හාන්සි වෙලා ඇස් දෙක පියාගෙන.. මට වැඩ සැහෙන්න තියෙනවා.. මොකුත් කරගන්න බෑ.. එක එක මගුල් හිතෙනවා.. මම ඇදේ මෙහාපැත්තට හැරුනා..

@Shan

ආච්චිඅම්මා ගාවට යන්න ඕන..

මම පහුවදා දුකම හිතින් මතක් කර කර හිත රිද්දගනිද්දි සික් රූම් එකේ දොර ඇරගෙන ඇතුලට ආවේ රධ්‍ය අයියා.. එයා මගේ ලගට ඇවිත් ඇදෙන් ඉදගත්තා.. ඒ වුනාට මම හිටියේ බිත්තිය පැත්තට හැරිලා..

" වරද්.. මෙහෙ බලන්න.."

මම ලාවට ඔලුව හරවලා එයා දිහා බැලුවා..

" මොකක් හරි ප්‍රශ්නයක්ද වරද්.. ඇයි අවුලෙන් ඉන්නෙ.. ඊයෙ මම කතාකලා ඔයා ෆෝන් එක ආන්සර් කලෙත් නෑ.."

" විශේශ දෙයක් නෑ.. පොඩි ප්‍රශ්න වගයක්.. ඒක දැන් වෙලා ඉවරයි.."

මට ඒ මනුස්සයගෙත් හිතට බරක් එකතු කරන්න උවමනා නැති නිසා නැගිටලා ඇද වියලට හේත්තු වුනා..

" ම්ම්.."

" මට අවුලක් නෑ.."

මම රධ්‍ය අයියගෙ උරහිසට එකක් ගහලා ලාවට හිනාවුනා.. මේකා මූණ එල්ලගෙන ඉන්න විදියට බයත් හිතෙනවා..

" ජේනවා.."

" ඒකනෙ කියන්නෙ.. අද ස්කොඩ් ප්‍රැක්ටිස් නෑ??"

" තියෙනවා.. මම අදුරන එකෙක්ට කිව්වා බලාගන්න කියලා.."

" ම්ම්.. මම නිසා හෙන වදේ නේ.."

" ඔව් ඔව් උඹ නිසා පුදුම වදයක් තියෙන්නෙ.. ජේනවනෙ.."

රධ්‍ය අයියා හිනාවෙලා කියද්දි මමත් හිනාවුනා.. වදයක්නම් ඇයි දන්නෑ ආවෙ..?? මම එහෙම කියන්න කට හදද්දිම වගේ රධ්‍ය අයියා ඇදේ තව ටිකක් මගේ ගාවට ඇවිල්ලා මගේ ඔලුව අතගෑවා.. මම මේ හැම එකක්ම

@Shan

හිත යටින් බලාපොරොත්තු වෙද්දි මම ඉස්සරහට ඇදිලා රධ්‍ය අයියගෙ පපුවට මූණ ගහගත්තා.. මම මෙහෙම ඉදලම නෑ.. ඒ වුනාට ඒ වෙලේ මට එහෙම ඉන්න හිතුනා.. රධ්‍ය අයියා මාව පපුවට තද කරගෙන ඔලුව අතගාද්දි මම එයාගෙ පපුවෙන් එන අමුතු සුවදෙන් පෙනහලු පුරෝගත්තා.. ඒක ප්‍රියුම් සුවදක්වත් වෙන මොකක්වත් ගාපු දේක සුවදක් නෙමෙ.. එයා ලගින් සාමාන්‍යෙන් එන සුවද.. ඒක මම පලවෙනි වතාවට විදගත්තා..

අහලා තිබ්බට දැකලා තිබ්බට ආදරේ කරන මනුස්සයගෙ පපුවෙ උණුහුමට හිත නිවෙනවා කියලා.. මම ඒක වින්දෙ අද.. ඕවා කතාවලින් අහලා තිබ්බට මට ඒ හැගීම ගැන අදහසක් තිබ්බෙ නෑ.. අම්මගෙ පපුවට අන්තිමට තුරුල් වුනේ පොඩි කාලෙ.. කොල්ලෙක් ඉලන්දාරියෙක් විදියට ලොකු වෙද්දි මට ඒ උනුහුම මගෑරුනා.. දැන් මට එහෙම ඉන්න බෑ.. අම්මා ගාව පොඩි එකෙක් වගේ හුරුතල් වෙන්න බෑ.. අම්මා ගාව මට හැසිරෙන්න වුනේ කරදඩු උස් මහත් වුනු පිරිමියෙක් වගේ.. මොකද අම්මා මගෙන් බලාපොරොත්තු වුනේ ඒ චරිතෙ මිසක් පොඩි කාලෙ වගේ පපුවෙ උනුහුමට තුරුල් වෙලා හිටිය බොලද පොඩි ලමයා නෙමෙයි..

" වරද්.."

" ම්ම්.."

රධ්‍ය අයියගෙ ඇගිලි මගේ කොණ්ඩෙ අස්සෙන් හරි සනීපෙට එහෙ මෙහෙ ගියා.. මට දැනෙනවා වගේම ඇහෙනවා එයාගෙ හදවතේ ගැස්ම.. මම කන් දීගෙනම හිටියා..

" මොකක් හරි ප්‍රශ්නයක් වුනාද.."

" ම්ම්.."

" කියන්න පුලුවන් දෙයක්නම් කියලා හිත නිදහස්කරගන්න වරද්.. හැමතිස්සෙම හිර කරගෙන ඉන්න ඕන නෑ.."

" පස්සෙ වෙලාවක කියන්නම්.."

" ම්ම්.."

@Shan

මම ආයෙම එයාගෙ පපුවෙ ගැස්ම අහගෙන හිටියා.. මගේ කම්මුල් වලට ඒක දැනුනවා.. හුගක් වේගෙන් ගැහෙනවා.. මගේ කොන්ඩෙ එහෙට මෙහෙට වෙලා එයාගෙ උනු හුස්ම මගේ නළලෙ පැත්තකට හුගාක් වෙලා දැනුනා.. හරි උණුසුම් හැගීමක් එක්ක මම එයාගෙ ශර්ට් එක අතින් ගුලි කරගෙන ඉද්දි මට බෙහෙත් වලට ඇස් බර වුනා.. ඒ වුනාට ඇස් වහගන්න ලෝබයි..

" මගෙ වරද්.."

නලලෙ පැත්තකට දැනුනු ඒ උනු හුස්ම මට ආයෙම නොදැනී ගියා..

හායිම්.. මම ආවා..

ඕතරිට හෙට කාස් ලමයි දවසෙම.. අනිද්දා ගමෙ යමන ඉම්නෙ ඔතරී.. පුලුවන් වුනොත් තමාලු හෙට එන්නෙ ඉතිම්..

හා ද..??

ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 28 කොටස

" මේක අද ඉවර කරගන්න පුළුවන් වෙයිද බං.."

" අනේ මන්දා.. බලපන්කො බඩවැල වගේ දිග මේකෙ.."

" අපරාදෙ අපිට කලින්ම ඉවර කරන්න තිබ්බ නේ බං.."

" ඉතින් වෙලාවක් තිබ්බෙ නැනෙ.."

" ඔව් නේද.. ඔලුවත් රිදෙනවා දැන්නම්.."

මමයි සෙනුකයයි හිටියේ රධ්‍ය අයියගෙ ගෙදර ඒකාගෙ කාමරේට වෙලා මාගල වගේ දිග නම් ලිස්ට් එකක් ලැප් එකේ ටයිප් කර කර අපේ හවුස් එකේ සෙට්ෆිකේට්ස් වල ප්‍රින්ට් කරන්න..

මෙ මගුල දිග ඇරගෙන ඉන්නෙ උදේ නවයේ ඉදලා දැන් වෙලාව දෙක හමාරයි.. තාම ඉවර කල්ලා තිබ්බෙ බාගයයි.. අද රධ්‍ය අයියගෙ ගෙදර ප්‍රයිවට් බස් එකක් වගේ මුළු ගෙදරම කට්ටිය පිරිලා සෑහෙන්න වැඩ.. හෙට ස්පෝර්ට්ස්මීට් එකට ඩෙකරේශන්ස් වලට ඕන දේවලුයි ෆ්ලැග් අනම් මනම් ඩිසයින් කරන්නයි පහල සාලේ අපේ හවුස් එකේ මල්ලිලයි රධ්‍ය අයියගෙ යාලුවොයි මගේ යාලුවොයි සේරම මෙහේ ඇවිත් හිටියා.. උන් ආතල් එකේ පහළට වෙලා කෑගගහා හිනා වෙවී එක එක වැඩ කරනවා.. මමයි සෙනුකයයි කාමරේට වෙලා මේ ලැප් එකත් බදාගෙන පණ දාගෙන නම් ටයිප් කරනවා.. සෙනුකයගෙ මිනිහා උගෙ නැට්ල්ල වැඩී කියලා ඌව එක්ටැම්ගේ හිරකල්ලා ගියා..

" පහළ ඉන්න උන් මේ යන විදියට අද ඉවරකරයිද බං.. බලපන්කො සද්දෙ.."

" අනේ මන්දා.."

මම උරහිස අකුලලා පුටු ඇන්දට හේත්තු වුනා.. කමක් නෑ අද විතරනෙ.. ඊට්පස්සෙ නම් බාහිර වැඩ මෙලෝම ලබ්බකට මමනම් යන්නෙ නෑ නෑ නැමයි.. මෙහෙම කට්ටක් කෑවෙ නෑ කිසි අවුරුද්දක.. පුදුම කරුමයක් වුනා මෙ ලීඩර්ශිප් එකක් අරගෙන..

@Shan

මම හිතට ආපු කුජීත අයිඩියා එකකට මහත සෙලොටේප් එකක් අරගෙන ගිහින් දොරේ උළුවස්සෙ හරහට පටවල් දෙකක් විතර සෙනුකයා එක්ක අලවලා බැල්කනි එකට ගිහින් පහළට බෙල්ල දාලා එළියේ පේන්ට් එකක් ස්ප්‍රේ කර කර ඉදපු රධ්‍ය අයියටයි අයුක අයියටයි උඩට එන්න කතාකලා..

" රධ්‍ය අයියේ මෙ එන්නකෝ.. ලැප් එක ස්ටක් වෙනවනේ.."

" ඕක රීස්ටාට් කල්ලා බලපන්.."

" බෑ අනේ එනවකෝ.."

මමත් උඩ තට්ටුවේ ඉදන් බෙරිහන් දුන්නා.. මාව දැකලා ගෙදර පැත්තක කූඩුවේ ඉදපු තඩි බල්ලෝ දෙන්නා හෙන ගහන්න වගේ බුරන්න ගත්තා.. හොදවැඩේ කූඩුවෙම ඕන තියන්න.. අම්මන්ඩිලා දෙන්නා.. මලක් වගේ මට  බුරන්න..

" අනේ බං මම වැඩක්නෙ.."

" ආ එන්නෙ නැනෙ.. ආධ්‍ය අයි-"

" මෙන්න මෙක අල්ලගනින් බං.. "

රධ්‍ය අයියා නිල් පාට පේන්ට් එකක් ඇගපුරාම නාගෙන ක්‍රිශ්ණා වගේ.. මම ආධ්‍ය අයියට කතාකරන්න යද්දිම මෙකා ස්ප්‍රේ එක අයුක අයියට දීලා ගේ ඇතුලට එද්දි සෙනුකයා හිමිහිට ලිස්සලා කාමරෙනුත් ගිහිල්ලා.. යකෝ මූ මාර ඩයල් එකක්නෙ.. මම හිමිහිට මොකුත් දන්නැති බබා වගේ ලැප් එක ගාවින් වාඩිවෙලා හරිම සංවරව වැඩ කරන්න ගත්තා.. ටික වෙලාවක් ගියා.. ඌප්ස් එකයි දෙකයි,

" මොන හු### යකෝ මේ.."

හරි නේද.. රධ්‍ය අයියගෙ ඇහිබැමේ ගානට සෙලෝටේප් එක ඇලවිලා අනිත් එක කටේ ඇලවිලා.. මෙකා කෙලගෙන ආපු පාර කන්ෆියුස් වෙලාද කොහෙද හෙන කුණුහර්පෙකුත් කියාගෙන කටේ තිබ්බ සෙලෝටේප් එක ගලවලා අතට අරගෙන බැලුවා.. පෙනේද මට තමා කුණුහර්ප කියන්න එපා කියන්නෙ.. දැන් කිව්වෙ මොකක්ද දන්නෙ නෑ.. මුගෙත් පම්කෙ ලොජික්

@Shan

තමා තියෙන්නෙ බලන් යද්දි.. මම හීනාව නවත්තගන්න හොද හුස්මක් අරගෙන නහය පිහිදගත්තා.. පව්නෙ ඉතින් මොනා වුනත්..

" වරද්.. මොකාද මෙ මගුල හරහට සෙලෝටේප් ගැහුවෙ.."

" කෝ.. කොයි මගුලද අනේ.."

" උඹ දන්නෙ නෑ.. උඹ නේද මෙ වැඩෙ කලේ.."

" අනේ මේ මාව ඹවට අල්ලගන්න එපා හරිද මම බබා.."

" ඔව් උඹ බබා.. හිටපන් උඹට අද මම.. අම්මපා අහුවුනොත්නම් හම ගහනවා වරද්..මෙහෙ වරෙන්.."

" ඒ ඒ මේ මොකද මීටරෙන් ඉදපන් අයියේ.. මම කෑගහනවා.."

රධ්‍ය අයියා ඇහිබැමෙ සෙලෝටේප් එක ගලවගන්නෙත් නැතුව යකා වගේ මගේ පැත්තට එද්දි මම මෙසෙන් නැගිටලා කාමරේ එහා කොනට දිව්වා.. බැනෙ.. මේකා සිරාවටම ගහයිද දන්නෙ නෑ.. බයත් හිතෙනවා.. මම ඇද උඩින් පැනලා ඌව ඇතුලට දාලා දොර ලොක් කරගෙන කාමරෙන් එළියට පැනලා යද්දි එළියේ දොර ගාව ඉදපු ආධ්‍ය අයියගෙ ඇගේ හැප්පිලා අයියවත් පෙරලගෙන දඩාන් ගාලා පොලොව සිපගත්තා.. අම්මටසිරි ආධ්‍ය අයියගෙ බර යකෝ.. මගේ කොන්ද ලෙප්ට වුනාද කොහෙද..

" කොහෙද බං මේ දුවන්නෙ පන කඩාගෙන.."

ආධ්‍ය අයියා හෙන ගේමක් දීලා මගේ ඇග උඩින් නැගිටගෙන මට නැගිට්න්න අත දුන්නා..

" වරද්.. මේ දොර ඇරපන්.. අයියේ~~~"

ඒ අස්සෙ අර ගැටපොලොස් කොට්ටෝරුවා ඇතුලෙ ඉදන් කෑගහනවා..

" උඹලා දෙන්නා මොනවද බං කරන්නෙ.. අරකා ඇයි බෙරිහන් දෙන්නෙ.."

" අනේ මන්දා අයියෙ.. රධ්‍ය අයියට පිස්සු හැදිලද කොහෙද.."

@Shan

මම කොන්දත් අතගගා කියද්දි ආඩ්‍ය අයියා දොර ඇරිය පාර ඇතුලෙ ඉදපු එකා ආඩ්‍ය අයියගෙ අතින් ඇදලා අරගෙන අත අඹරලා බිත්තියටයි උගෙ ඇගටයි අතරෙ හේත්තු කරගත්තා.. දෙයියනේ මම මේ මොනවද දකින්නෙ.. ලැජ්ජයිත් එක්කන්.. අයියලා මල්ලිලා බදාගෙන.. හපොයි!!!

" පොඩ්..අ- අහකට වෙනවා.. මේ මොකද.."

ආඩ්‍ය අයියා බයවෙලා වගේ රඩ්‍ය අයියව එහාට තල්ලු කරද්දි රඩ්‍ය අයියා බයවෙලා වගේ ආඩ්‍ය අයියා දිහා බලාගෙන ඉදියා.. ඊටපස්සෙ උන් දෙන්නම හැරිලා පාඩුවෙ නියපොත්තකුත් හප හප බිත්තියට හේත්තු වෙලා ඉන්න මම දිහා බැලුවා..

" අහ්ම්.. මම අර පැත්තට ගිහින් එන්නම්.."

මම ශේප් එකේ බිත්තිය දිගේම ලිස්සලා ගිහින් පඩිපෙළත් බැහැගෙන පහල සාලෙට දිව්වා.. මම යද්දි කියාන් අයියා කුස්සිය පැත්තෙ කොකාකෝලා ලීටර් දෙකේ බෝතලයක් කට තියාගෙන ඇදලා අරිනවා.. යකෝ මූ.. ඔහොමත් බොනවද මං අහන්නෙ.. මම ගිහින් උගෙ ඉස්සරහින් ඉදගත්තම මේක මගේ උඩ ඉදන් පල්ලෙහාටම දෙපාරක් විතර බැලුවා.. දැන් මේ සේරටම මාව අපරාධකාරයෙක් ගානට පේන්න අරගෙන.. දුක හිතෙනවනෙ..

" මොකද උඹ..??"

" මොකුත් නෑ හලෝ.."

" ඒක මිසක්.. උඹ ළගට එද්දිත් බය හිතෙනවා.."

" ම්ම්.. ඒක හොදයි.. මේ අයියෙ මම පොඩි බඩ්ඩක් අහන්නද.."

" බඩ්ඩක්?? අහපන් බලන්න.."

" මේ සිරාවට ඔයාට කෑල්ලක් නැද්ද හලෝ.."

" ඉස්සර හිටියා.. දැන් නෑ.."

" අඩෙ එහෙමද.. අයියට ලව් එකක් තිබ්බද.."

@Shan

" ලව් එකක් කියන්නෙ මෙහෙමයි.. අපි යාලුවෙලා හිටියෙ නෑ ඉතින්.. මම හිතේ තියාගෙන හිටියා.. හිතේ තිබ්බ එක කිව්ව දවසෙම ඒකි බෑ කිව්වා.."

" ඈ.. ඒ මොනවගේ කතාවක්ද හලෝ.."

" මොනවගේ කතාවක්ද අහන්නෙ ඉතින්.. ඒකි බෑ කිව්වා මට කැමති වෙන්න.. මම ඇයි කියලා ඇහුවම ඒකි මට කිව්වා මට කෙල්ලො හතරවටේමලු.."

" ඌප්ස්.. ඉතින් අයියට හතරවටේම කෙල්ලොද.."

" ඒ කාලෙ යම්කිසි දෙයක් සිද්ද වුනා තමයි.. ඒ වුනාට දැන් එහෙම නැනෙ.."

" අයියලගෙ වයසෙමද.. කොහෙද ඉස්කෝලෙ.."

මම හිතාගත්තේ කියන් අයියව මහීශාටවත් සෙට් කල්ලා දෙන්න.. දෙන්න ගැලපෙනවනෙ.. මුගෙ බෝක්කු කට මහීශා ගානට වහලා ගනී..

" උඹලගෙ වයසෙ.. එහා වැටේ ඉන්නෙ.."

" අඩෙ එහෙනම් මම දන්න එකියෙක්ද දන්නෙ නෑ.."

" දන්නවත් ඇති.. පොඩි ආරංචියක් තියෙනවා කෙල්ල ස්පෝර්ට්ස්මීට් ඒවි කියලා ඉන්වයිටඩ් ස්කූල්ස් වලට.."

" හිටියොත් පෙන්නන්න ඈ.."

" ම්ම්.. පෙන්නන්නම්කො.."

මම නිකටට අතකුත් තියාගෙන කල්පනා කලා.. මහීශාත් එනවා කිව්වා ඒකිගෙ ඉස්කෝලෙන් ඉන්වයිටඩ් ස්කූල්ස් වලට හෙට.. ඒ වුනාට මහීශා එහා වැටේ නෙමෙනෙ.. මහීශගෙ කැල්ල ශශිනිවත් ද?? නෑ නෑ වෙන්න බෑ ශශිනි කොල්ලොන්ට කැමති නැනෙ.. කවුද දන්නෙ නෑ මේ ඌරු තඩියගෙ කැල්ල.. හොයාගන්න ඕන.. මම කියාන් අයියට ලෝකෙම ඉන්න කෙල්ලොන්ගෙ මූණු දාලා ගලප ගලප ඉද්දි පිට මැද්දට දඩාන් ගාලා පාරක් වැදුනා.. කවුද යකෝ මෙච්චර මාත් එක්ක තරහින් ඉන්න එකා.. මම පිටිපස්ස හැරුනම ක්‍රිශ්නා ඉන්නවා මටත් රවාගෙන..

@Shan

" මොකද අනේ ගහන්නෙ.."

මම රධ්‍ය අයියට කකුලෙන් එකක් ඇන්නා.. මගුල මම මොකක් කලාටද..

" ගහන්නෙ. ගහන්න නෙමෙ උඹව මකන්න තියෙන්නෙ.. මගුලක්ද අර සෙලෝටේප් එකක් දොරේ අලවලා කලේ.."

" දොරේ නෙමෙ බං අයියෙ උලුවස්සෙ.. ඒකට කියන්නෙ දොර කියලද.. ඔයාලා කිසි දෙයක් දන්නෙ නෑනෙ අප්පා.."

" ඔව් උඹ ඔක්කොම දන්න එකානෙ.. වරෙන් මට අර බෝඩ් එක පේන්ට් කරන්න ඕන.."

රධ්‍ය අයියා මම කැමැත්ත ප්‍රකාශ කරන්න කලින්ම මාවත් ඇදගෙන එළියට ආවා.. මම එළියට ගියා විතරයි අර තඩි බල්ලො දෙන්න මහ හයියෙන් බුරන්න පටන් ගත්තා..

" අනේ මේ අයියෙ මට බෑ එන්න.."

" මෙහෙ එනවා.. මම එයාලව එළියට ගන්න.."

" අපෝ බෑ බෑ මම ගෙට යනවා.. මෙයාලා හපනවා.."

" කිව්වහම වරෙන්කො බං.. එයාලා හපන්නෙ නෑ.. උඹ පණ කඩාගෙන දුවද්දි තමා පස්සෙන් පන්නන්නෙ.. මම දොර ඇරියහම ඔලුව අතගාන්න එයාලගෙ.."

" හැබැයි හැපුවොත් මම තවුසෙගෙ ඇඟිබැමෙ සෙලෝටේප් අලවලා නවතින්නෑ අයියෙ ගාලා දානවා.."

" හරි බං.. මේ දැක්කනෙ.. මෙහෙම ඔලුව අතගාන්න.. එතකොට හරි.."

රධ්‍ය අයියා මගේ අතක් අරගෙන කියාරා කියලා නේම් ටැග් එකක් එල්ලලා තිබ්බ එක්කෙනාගෙ ඔලුවෙන් අත තිබ්බා.. අනේව සිනිඳුයි එයාලා.. පොඩ්ඩක් ගඳයි හැබැයි.. මෙකා මම ඔලුව අතගාද්දි දිවත් එළියට දාගෙන ඔලුව දීගෙන හිටියා..

" හ්-හායි කියාරා.."

@Shan

මම පොඩ්ඩක් විතර කියාරාගෙ ඔළුවට තට්ටුවක් දාද්දි එයා කකුලක් මගේ අත උඩින් තිබ්බා.. හොඳ කෙල්ලෙක්නෙ.. රෙක්සිත් අවුලක්ම නෑ. ඒ වුනාට එයා පොඩ්ඩක් සැරයි වගේ.. රධ්‍ය අයියා එක්ක විතරයි ඉන්නෙ.. මම ඒකනිසා කියාරව එක්කගෙන රධ්‍ය අයියා පේන්ට් කරන තැනට කිට්ටුවෙන් තණකොල ගොඩේ ඉඳගත්තහම කියාරා මගේ ගාවට ඇවිත් ඉඳගත්තා.. එයා නම් හුඟක් හීලෑයි වගේ.. මම කියාරගෙ මූණ අත් දෙකෙන්ම අල්ලලා ඔළුවට කිස් එකක් දුන්නා.. එයා මගේ මූණ ලෙවකෑවා..

" High 5"

" Aww baby~"

" වරද්.. ඔයාට මෙයාලා ඇලර්ජි නෑනෙ.."

" නෑ නෑ.."

" ම්ම්.."

මම කියාරා එක්ක බෝලයක් අල්ලගෙන සෙල්ලම් කර කර ඉද්දි රධ්‍ය අයියා සැරින් සැරේ මං දිහා බල බල හිනාවෙවී එයාගෙ වැඩක් කරගෙන ඉදියා.. හරිම ෂෝක් මූමන්ට් එකක්.. රෙක්සි රධ්‍ය අයියා ගාවටම වෙලා ගල් පිළිමෙ වගේ පේන්ටින් එක දිහා බලාගෙන ඉද්දි කියාරා හෙන ප්ලේෆුල් විදියට හැමතැනම දුවනවා.. දුවගෙන ඇවිත් ඇඟට පනිනවා.. බෝලයක් අරගෙන ඈතට විසිකරද්දි ඒක උස්සන් ආයෙම මං ගාවට දුවගෙන එනවා.. එහෙම හුඟක් වෙලා අපි හතරදෙනා එළියට වෙලා ඉද්දි ආධ්‍ය අයියා ස්ප්‍රයිට් කෑන් දෙකකුත් අතේ තියාගෙන අපි හිටිය පැත්තට ආවා..

" අප්පා ලස්සන ෆැමිලි එක.. පික්නික් එකක් ඇවිල්ල වගේ.."

ආධ්‍ය අයියා කියද්දි රධ්‍ය අයියගෙ බෙල්ල රතු වේගෙන රතුවේගෙන එනවා.. මෙකට ලැජ්ජ හිතිලද.. වෙන්නැති.. අයියා කිව්වහම ලැජ්ජ හිතුනද දන්නෙ නෑනෙ..

" අවුරුදු දහතුනක්ම ඇතීනා එකේ ඉදපු මට මේ ඈෆ්‍රොඩයිට් එකේ උන්ට බීම අදින්න වුනානෙ.. ඔකට තමා මල්ලී කියන්නෙ දෛවය සරදම් කරනවා කියලා.."

@Shan

" ඒවුනාට අපේ හවුස් එකනෙ එක වෙන්නෙ.. ඇතීනා එක වැඩක් නෑ.."

" ආ පොඩි මස්සිනා.. ඒ කාලෙ ඒක එක වුනා හරි.."

" ආ අර එකපාරක්ද.. අපි ඒ කාලෙ ඉස්කොලෙ හිටියෙ නෑනෙ ඉතින් අයියේ.."

" එකපාරක් නෙමෙ බොල.. දෙන්නෙ.."

ආධ්‍ය අයියා මගෙ ඔලුවට හිමීට ටොක්කක් ඇන්නා.. ආධ්‍ය අයියා හොඳයිනෙ ඉතින්..

" හරි හරි ඉතින්.. අයියත් හෙට එනවද.."

" ඔව් කාලෙකින් නෙ මල්ලි.. මගේ යාලුවො වගේකුත් එනවා කිව්වා.."

" මරු.. අපි ශීල්ඩ් එක ගත්තම චියර් කරන්න හරිත.."

" පොඩීට මේකා එක්කගෙන ආවොත් පාලු හිතෙන එකක් නෑ.. වයින් කරපු බෝනික්කා වගේ කියවනවනෙ.."

" ම්ම.."

" තව ටිකකින් කන්න එන්න.. දෙන්නම.. හරි.."

ආධ්‍ය අයියා ස්ප්‍රයිට් කෑන් දෙක මට දීලා ගේ ඇතුළට ගියා.. මම බෝනික්කෙක් වගේද.. බෝනික්කො කිව්වහම මට බාබි ඩෝල් කෙනෙක්ව මැවුනු නිසා මම ඔලුව දෙපැත්තට වනලා හරි සිහියට ආවා..සැක්..

**'Not your Barbie girl, I'm livin' in my own world.. I ain't plastic, call me classic..'**

" මමත් පේන්ට් කරන්නම්.. දෙන්න.."

" අර පින්සල අරන් ඇවිත් අවුට්ලයින් අඳින්න එහෙනම්.."

" කළුපාටින්ද.."

@Shan

" මිම්.."

මම පින්සල අරගෙන අපේ හවුස් එකේ ලෝගෝ එක වටේ අවුට්ලයින් එක ඇන්දා.. ඒක ඉතින්මහ ලොකු වැඩක් නෙමේනෙ.. ඒවුනාට මට හිතෙන්නෙම මේකෙන් තීන්ත පොඩ්ඩක් අරගෙන මේ ගැටපොලොස් කොට්ටෝරුවගෙ මූණෙ අදින්න.. කැන්වස් එකක් වගේ සුදුවට තියෙනවනෙ ඉතින්.. මම හිමීට හොරෙන් රධ්‍ය අයියා දිහා බලද්දි,

" උඹ ඕක මගේ මූණෙ ගෑවොත් මම මේක උඹේ ඔලුවේ හලනවා වරද්!!"

සැක්.. මූ එක්ක බැනෙ..

" කවුද ඔයාගෙ මූණෙ ගෑවෙ.. මම නිකන් බැලුවෙ.. පැත්තට ලස්සනද කියලා.."

" පැත්තට මොකක්ද.."

" ඔයාගෙ පස්ස, පැත්තට ලස්සනද බැලුවෙ.. බලන්නකො හලෝ ලොකුවට තියෙනවනෙ.."

මම ලද අවස්තාවෙන් රධ්‍ය අයියගෙ ජේන්ටින් නැවුනු අඵපාට ශෝට් එකේ එක බට් චීක් එකක් පැත්තෙන් හාට් එකක් ඇන්දා..

" වරද්!!"

" ඇයි ඇයි අනේ.. කෑගහන්නෙ.. අනිත් පැත්තෙත් ඇදලා ඕනද.."

" අනිත් පැත්තෙ..??? අම්මපා උඹට අත පය එක විදියක තියාගෙන ඉන්නම බැරිද බං.."

" බැනෙ.."

මම පින්සල අරගෙන අනිත් පැත්තෙත් හාට් එකක් ඇන්දා.. ඔය තියෙන්නෙ ලස්සනට.. මම හිතන්නෙ රධ්‍ය අයියා මම කරන කියන ඒවට ඉවසලා ඉවසලා බැරිම තැන ඕන මගුලක් කරගනින් කියලා අතෑරලා දාලා හිටියේ.. එයා වුනත් දැනගන්න එපැයි මට මගේ පාඩුවෙ ඉන්න දෙන්න..

" මේ හෙට අපි කීයටද යන්නෙ.."

@Shan

" උදේම යන්න ඕන නැනෙ.. දහයට විතර යමු.. එතන වැඩ බලාගන්න කට්ටිය ඉන්නවනෙ.."

" මම්.. අයුක අයියලත් අද මෙහෙ ඉන්නවද.."

" ඉදීවි.. තවම වැඩ ඉවරත් නැනෙ.. මම උංට කිව්වා ඉන්න කියලා.."

" එහෙමද.."

මම ආයෙම පින්සල අරගෙන අවුට් ලයින් කරන්න ගත්තා.. අද වැඩ වැඩි නිසා මම අම්මට කියලා යුනිෆෝම් එකයි අනිත් උවමනා දේවලුයිත් අරගෙන මෙහෙ ආවෙ.. ආවෙ කිව්වෙ, මෙතන ඉන්න එකා තමා අම්මට ඕක කියලා එක්කගෙන ආවෙ.. අපෙ අම්මා දැන් රධ්‍ය අයියව හොදට අඳුරනවා.. අනික ඉතින් මම කොල්ලෙක්නෙ.. සෙනුකයත් ඉන්න නිසා යන්න දුන්නා..

ඔහොම රෑ දහය විතර වෙනකල් ගෙදර කට්ටිය හිටියා.. අන්තිමෙ ඔක්කොම වගේ ගෙවල් වල යද්දි මෙහෙ ඉතුරු වුනේ රධ්‍ය අයියයි මමයි කියාන් අයියයි සෙනුකයයි අයුක අයියයි සයෝන් අයියයි විතරයි.. අපිටත් වැඩ කල්ලා මහන්සි නිසා කාලා බීලා නිදාගන්න හිතාගෙන කාමරේට ගියා..

" වරද්.. ඔයා මුලින් ගිහින් වොශ් කරන් එනවද.."

" ඔයා යනවද.."

" නෑ නෑ ඔයා ගිහින් එන්න.. මම යුනිෆෝම් හදලත් නෑ.."

" හා එහෙනම්.."

මම ඇඳ උඩ තියලා තිබ්බ ටවල් එකයි ඇඳුම් ටිකයි උස්සගෙන වොශෲම් එකට ආවා.. යකෝ මේකා ඇගේ ගාන දේවල් ගොඩ.. මම මිරර් එක ලග තියන අයිලන්ඩ් එක උඩ තිබ්බ එක එක ප්‍රඩක්ට්ස් දිහා බලාගෙන බ්‍රශ් එක කටේ ගහගත්තා.. බලන් යද්දි මම විතරයි මෙලෝ මගුලක් ගාන්නෙ නැත්තෙ.. අපෙ අම්ම වගේ මේකත්.. ඔරිෆ්ලේම් නයිට් ක්‍රීම් එකකුයි ෆේස් මාස්ක් වගේකුයි.. නැති මගුලක් නෑ.. ඒ වුනාට මමත් හැඩට ඉන්නවනෙ.. ඕවා නොගෑවට අපි ඇවිල්ලා උපතින්ම ලස්සනයි කොහොමත්..

@Shan

මම ඉක්මනට නාලා එළියට එද්දි රධ්‍ය අයියා අයන් බෝඩ් එක උඩ ඇඳුම් වගයක් මදිනවා.. මගේ ඇඳුනුයි උගේ ඇඳුනුයි ඔක්කොම.. හෙන හස්බන්ඩ් මැටීරියල් අප්පා.. ඔහොම වෙලාවට තමා දමලා ගහලා ගිහින් ආදරේ ප්‍රකාශ කරන්න හිතෙන්නෙ..

" මම ඉතුරු ටික මදින්නම්.. ඔයා ගිහින් එන්න.."

" පුලුවන්ද.."

" ඔව් ඔව් අනේ.. මම කරන්නම්.."

" ම්ම්.."

මම රධ්‍ය අයියගෙ ශර්ට් එකයි මගෙ ශර්ට් එකයි මැදලා හැන්ගර් එකක දාලා ඒක අල්මාරියෙන් එල්ලුවා.. බ්ලෙසර් නම් ඉතින් මදින්න දෙයක් නැනෙ කොහොමත් ඒවා මැදලා පැක් කල්ලනෙ තියෙන්නෙ.. මම කලිසම් දෙකත් මැදලා අයන් බෝඩ් එක උඩින් දාලා බ්ලෙසර් එක එළියට අරගෙන ඒකෙ අස්සෙ තියෙන බැජ් හැටහුටහමාරත් ඇදට හලාගෙන පිලිවෙළට බැජ් ටිකයි මෙඩල්ස් ටිකයි බ්ලෙසර් එකේ ගහන්න පටන් ගද්දි රධ්‍ය අයියත් නාලා එළියට ආවා..

" ආ මට අමතක උනානෙ.."

රධ්‍ය අයියත් එයාගෙ බ්ලෙසර් එක ඇදේ එලාගෙන බැජ් මහා ගොඩක් හලාගත්තා.. සැක් මෙ ඔක්කොම මේකෙ ගහන්න ඉඩ තියද.. දැන් ඉතින් හෙට දුවන්න වුනොත් තමා ටිකක් හයියෙන්.. හොල්ල හොල්ල දුවන්න පුලුවන්.. වැස්සෙ නැතොත් හොදයි.. මෙ යකඩ කෑලිවලට මට හෙනයක්වත් පාත් වෙයිද දන්නෙ නෑ..

" ඕ.. මරුනෙ.."

මම රධ්‍ය අයියගෙ බැජ් දිහා කෙළ පෙරාගෙන බලාගෙන ඉදියා..

" ඇයි ඔය උඹටත් තියෙන්නෙ හෙන ගොඩක්.."

" හරි හරි ඉතින්.."

@Shan

මම මගේ කලර්ස් බැජ් ටිකයි මෙඩල් තුනයි සොසයිටි වල ප්‍රසිඩන්ට් අනම් මනම් බැජ් ටිකයි ඔක්කොම ලස්සනට බ්ලෙසර් එකේ අමුණ ගත්තා.. මම හිතන්නෙ අපේ වයසෙ නලාස්ට පස්සෙ වැඩිම බැජ් තියෙන්නෙ මට වෙන්න ඕන.. මොකද මම පොඩි කාලෙ හැම සංගමේම වගේ හිටියා.. ලොකු වෙද්දි ඒවගෙ බෝඩ් වල මට බැජස් තිබුනා.. ඉස්කෝලෙ ගියානම් එතකු කරගත්තෙ මේ ටිකයි සෙටිෆිකේට්ස් ටිකයි තමා.. දැන් නෙ පොත පතට බැහැගෙන ඉන්නෙ..

ඇඳුනුත් හදලා තියලා මම ඇඳේ පැත්තකට වෙලා බෙල්ලෙ ඉදන් පොරවගෙන ඉද්දි රධ්‍ය අයියා කාමරේ ලයිට් නිමලා ඇදට ආවා.. බැල්කනි එකේ ලයිට් දාලා නිසා කාමරේ මහ ගොඩක් කලුවර නෑ.. ඒ වුනාට මට එකපාරට මතක් වුනේ එදා අර මම මෙහේ ආපු වෙලේ කරන්ට් ගිහින් හොල්මනකට අහුවෙච්ච සිද්දිය.. එදා හොල්මනක් කියලා මම මූට බයවුනාද දන්නෙ නෑ.. එක්කො මූද එතන ඉදියෙ.. නැත්නම් සිරවටම මෙහෙ හොල්මන් ඉන්නවද දන්නෙ නෑ..

" මේ අයියෙ.. තවුසෙ හොල්මන් දැකල තියෙද.."

" ම්ම්.. ඔය මට එහාපැත්තෙ නිදාගෙන ඉන්නෙ.."

" අනේ පලයං අයියෙ.. මම අහන්නෙ සිරාවටමයි.."

" ආ ඔව් අපි දවසක් ඉස්කෝලෙ කැම්ප් එකක් ගහගෙන ඉද්දි එකෙක් දැකලා තියෙනවා.. මරු ඒකනම්.."

" සිරාවට.. අපේ ඉස්කෝලෙ..?? ඒ කොහෙද.."

" මේන් හෝල් එක යට අර ස්ටෝ රූම් එකක් තියෙන්නෙ ඒකෙ.."

" ඉතින්??"

" අපේ වයසෙ කොල්ලෙක් මොන මගුලකටද දන්නෙ නෑ, ඒකට ගිහින් මහ රෑ පැදුරක් හොයාගෙන එන්නම් කියලා.. ඌ දැකලා මොකෙක්ද පුටුවක වාඩිවෙලා ඉන්නවා.. ඊට්පස්සෙ අපි ඔක්කොම හොරෙන් ගිහින් බැලුවා ඌ කිව්ව එකක් තිබ්බද කියලා.."

" තිබ්බද ඉතින්.."

@Shan

" නෑ බං.. ඒවුනාට ඌට උණත් හැදුනා ඒ සැරේ.."

" සැක් එහෙමද.. මේ මෙහෙ හොල්මන් ඉන්නවද.."

" ම්ම්.. ඉන්නවා රෑට ඇවිත් කකුලෙන් ඇදන් යනවා.. පරිස්සමෙන් ඉදපන්.."

මූ කියන්නෙ අමු පවයක් කියලා කටහඩින් තේරෙනවා.. හරියට බොරුවක්වත් කියාගන්න බෑ හැකරැල්ලට..

" කකුලෙන් විතරද අදින්නෙ.. අපරාදෙ.."

" ඕ මෙතන උඹ නොඉද වෙන එකෙක් හිටියනම් මම කියනවා මොකෙන්ද අදින්නෙ කියලා.. නිදාගනින්කො බං.."

" හා.."

" දවසෙම දස වද දීලා නිදාගන්න ආපු ටිකටත් කියවනවා.. උඹ දවසකට මම වෙලා බලපන් තේරෙයි.."

මේ පොල් කාවයියා කියන කතා.. මම වද දුන්නලු.. දෙන්න හිතයි ඇද පොල්ලක් ගලවලා ඔලුව මැද්දට..

" ඔව් ඔව් මම වදනෙ දෙන්නෙ.. "

මම ඌට කකුලෙනුත් එකක් දීලා අනිත් පැත්ත හැරුනා..

" එහෙම මගුලක් නෙමෙ කිව්වෙ බං.. මේ පැත්ත හැරියන්.."

" බැහ්.. මම යනවා කියාන් අයියා ලඟ නිදාගන්න.."

" පලයං බලන්න.. කඩනවා උඹෙ කකුල් දෙක.."

ආස ඇති මගෙ කකුල් දෙක කඩන්න.. මහ කුරිරු මොට්ට ගස් වැද්දෙක් එක්කනෙ මාත් යාලුවෙන්න ඉන්නෙ..

" කතාකරන්න එපා මම නිදි.. පේන්නැද්ද මගුල.."

@Shan

" මේ පැත්ත හැරිලා නිදාගනින් ඉතින්.. උඹ අද විතරනෙ මෙහෙම හරි ඉන්නෙ.."

රධ්‍ය අයියා පොඩ්ඩක් දුකින් වගේ කියද්දි මම ලාව ඒ පැත්තට හැරුනා.. ඔව්නෙ අද විතරනෙ.. ඊටපස්සෙ අපිට හම්බෙන්න හොද හේතුවක්වත් නැනෙ ඉස්කෝලෙදි.. දවසෙම උගන්නාවි.. ඉන්ටවල් එකටයි උදේටයි ඇරෙන්න කොහෙ හම්බෙන්නද.. දැන් ඒ ගැන හිතද්දි හිතට දුකයි.. මෙච්චර දවසක්ම හැමතිස්සෙම වගේ ලගින් ඉදියනෙ.. අනික ඉස්කෝලෙදි වුනත් හැමතිස්සෙම අපි එකට ඉන්න එක හරිත් නැනෙ.. දැනටම චමිරු දන්නවා රධ්‍ය අයියගෙයි මගෙයි මොකක් හරි තියෙනවා කියලා.. ඉස්කෝලෙ ඕවා කතාවෙන්න ගත්තොත් අපි දෙන්නටම හොද නෑ.. එයයි මමයි අපි දෙන්නම ඉස්කෝලෙ හැමෝම දන්න ගුරුවරු අඳුරන කියන දෙන්නෙක්.. ඔහොම කතාවක් හැදුනොත් මට හිතාගන්න බෑ මොකක් වෙයිද කියලා.. සමහරවිට රධ්‍ය අයියා ඒ ලෙවෙල් ඉවරවෙනකල් ඉන්න කියන්නෙ.. මේ නිසා වෙන්න ඇති..

" මිම්.."

මම සම්පූර්නෙන්ම රධ්‍ය අයියගෙ මූණ පැත්තට හැරුණම රධ්‍ය අයියා මගේ දිහා හුගක් වෙලා බලාගෙන ඉදියා.. ඒක හරි ආදරේ පිරිච්ච බැල්මක්.. මට කෝල ගතියක් දැනුනෙ නැති තරම්.. මමත් රධ්‍ය අයියා දිහා බලාගෙන හිටියා.. ඊටපස්සෙ එයා කම්මුලක් ඇගිල්ලකින් හිමිහිට ඇල්ලුවා.. හරියට මොකක් හරි ඉක්මනට බිදෙන දෙයක් අල්ලන්න වගේ.. දැනෙන නොදැනෙන ගානට.. ඇගිල්ලකින් තට්ටුවක් දාලා අත එහෙට ඇදලා ගත්තා.. එයගෙ ඇස් ලාවට දිලිසෙනවා මට කළුවරේම වුනත් පෙනුනා..

" උඹ ඇත්තටම ඔතන ඉන්නවද කියලා මට විශ්වාස නෑ වරද්.."

" ඒ ඇයි.."

" නිකම්.."

සමහරවිට එයා හිතන්න ඇති කවදාවත් එයා ආදරේ කරන මනුස්සයා එයාට මෙහෙම ලගින් තියාගන්න පුලුවන් වෙන එකක් නෑ කියලා.. රධ්‍ය අයියා පව්.. මොකුත්ම බලාපොරොත්තු නොවී ආදරේ කරනවා මහ ගොඩක්.. එතකොටමට මගේ හිතේ තියෙන හැගීම හරිම පොඩි එකක් කියලා දැනෙනවා එයා ඉස්සරහදි..

@Shan

" මම ඇත්තටම මෙතන ඉන්නවා.."

මම හිමිහිට ඇද උඩ තිබ්බ රධ්‍ය අයියගෙ අතට ඇඟිලි මගේ ඇඟිලි වල පටලගත්තා.. අපි අතින් අල්ලගන්නෙ හරිම අඩුවෙන්.. ඒ වුනාට එයා දවසක් කිව්වා වගේ ඒවා ප'ෆෙක්ට් විදියට ෆිට් වෙනවා.. මට ඒ අතේ උණුහුම හොදට දැනෙනවා.. මම රධ්‍ය අයියගෙ අතේ ඇඟිලි පටලගද්දි රධ්‍ය අයියා අනිත් අතිනුත් මගේ අත වහගත්තා.. අපි තවමත් ඉදියෙ මූනට මූන බලාගෙන.. කතාකරන්න හුගක් දේවල් තියෙනවා.. මට කියන්න හුගක් දේවල් තියෙනවා.. ඒත් දැන්ම නෙමේ.. හොදම වෙලාවක.. දැන් කතාකරලා මටමේ මොහොත නැති කරගන්න උවමනා වුනේ නෑ..

" උඹ හරි ලස්සනයි වරද්.. මට ලෝබ හිතෙනවා.."

මගේ පපුවෙ ගැස්ම එකසැරේට වැඩිවෙද්දි ඇග දිගේ අමුතු හිරියක් ගලාගෙන ගිහින් බඩ ඇතුලේ සමනල්ලු දාස් ගානක් පිහාටු ගහලා පියාබන්න දැගලුවා.. මම ලාවට හිනාවුනාම එයා මගේ අත තව ටිකක් තද කල්ලා අල්ලගෙන හිටියා..

" අයියෙ.."

" ම්ම්.."

මම කියන්න හැදුවෙ මොකක්ද කියලා මට ඊලග මොහොතේ මතක් වුනේ නෑ.. මම ඇත්තටම මොකක්ද කියන්න ගියේ..?? මටත් හරි ලෝබයි අයියෙ කියලා කියන්නද.. මාත් හුගක් ආදරෙයි කියන්නද.. මට ඔයාව හුගක් දැනෙනවා කියන්නද.. මං ගාවින් හැමදාම ඉන්න කියන්නද.. ඒ ඔක්කොම හැගීම් වලට එක වචනයක් දෙන්න බැරි තැන මම වචන ගිලගත්තා..

" මම උඹව එකපාරක් තුරුල් කරගන්නද.."

රධ්‍ය අයියා අහද්දි මම රධ්‍ය අයියව අතින් මගේ පැත්තට ඇද්දා.. මම කලින් එයාට තුරුල් වෙලා ඉදලා තියෙනවා.. ඒක කිසිම විදියේ දුරදිග යන තුරුලුවීමක් නෙමේ.. ගිනිගන්න වෙලාවක වුනත් නිමෙන්න පුලුවන් එකක්.. මම රධ්‍ය අයියා ගාවට ලං වෙද්දි එයා මාව පපුවට කිට් කිට්යේ තුරුල් කරගත්තා.. රධ්‍ය අයියා ඉදියේ සතුටින්ම නෙමේ.. අමුතු දුකකුත් තිබුනා මම එයාගෙ මූනෙන් දැක්කා.. ඒ වුනාට හුරුපුරුදු අර සුවද මට දැනෙනකොට මම හොදහැටි රධ්‍ය අයියට තුරුල් වෙලා ඇස් පියාගෙනම

@Shan

ඉදියා.. එයාගෙ හුස්ම තාලෙකට ඇවිත් මගේ බෙල්ලේ වදිනවා.. රධා අයියා සැහෙන්න වෙලාවක් මගේ නලලේ පැත්තකට තොල් තියාගෙන එහෙමම ඉන්නකොට මම එයාගෙ දුහුල් ශර්ට් එක අතින් පොඩි කරගෙන ඇස් පියාගෙන උන්නා.. අනේ මටත් ලෝබයි..

" නිදාගන්න.."

මාව එයාගෙ ලගින් අයින් කල්ලා එයා පොඩ්ඩක් මෙහාට වෙලා මට නිදාගන්න කිව්වා.. හිතට හරි සැනසීමක් එක්ක සතුටක් දැනෙනවා.. එයාගෙ මූනෙනුත් ඒක පෙනුනා.. මම නිදිමත නිසාම ඇස් පියාගත්තා..

**ආදරේ කියන්නෙ හැම රෑකම හමබෙන හැම පොඩි වෙලාවෙම එකාට එකා ගැන හිතන්නෙ නැතුව නිරුවත් වෙන එකයි හති හලන එකයි නෙමෙයි.. ආදරෙයි රාගයයි ලස්සනයි.. හුගක් ලස්සනයි.. මම නෑ කියන්නෙ නෑ.. ඒ වුනත් සමහර වෙලාවට ආදරේ කරන මනුස්සයො දෙන්නෙක්ට ආත්මෙම පුරවගන්න එකම එක වැළඳගැනීමක් සෑහෙයි..**

ඔය ලමයින්ට තේරුනාත ඉතිං..

සැක් මේවා ලියන තනිකඩ අසරන මමයි කියවන උඹලයි..

#කවදහරි-අපිටත්-හරියනවා-බං

#වෙරිමින්සිගෝහෝම

අද දිගට දුන්නා මගෙ සකලබුජම්ලා.. කමෙන්ටුවක් කොටාන යනවනම් මේ ලමයට හිතට බෝම හැපි..

ලව් යූ.. ගමෙ ගිහින් ආයෙම එන්නාම්.. ❤



කියාරා-රෙක්සි

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

@Shan

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 29 කොටස

" ඔක්කොම ගත්තද.. ශුවර්නෙ.."

" මම් ගත්තානම් තමා.. වෙන මොකුත් නෑනෙ.."

මමයි රධ්‍ය අයියයි උදේම නැගිටලා කාලා බීලා ඇඳගත්තෙ ස්ටේඩියම යන්න.. හුගක් වෙලාවට මීට් එක ඉස්කෝලෙ තියන්නෙ නෑ ඕල්ඩ් බෝයිස්ලා එහෙමත් එන නිසා වෙනම ස්ටේඩියම් එකක් ඉස්කෝලෙන් දවසකට ගන්නවා..

මට අද හෙන අවුල් අවුල් වගේ.. හිතටත් බයයි.. මොනවා වෙයිද දන්නෙත් නෑ.. උඩ පැන පැන ඉදියට හිතේ යට බයකුත් තියෙනවා.. උදේම අම්මා කතාකල්ලා සුපුරුදු උපදෙස් මාලාව අම්මට පාඩම් හැටියට මට කියලා හුගක් රෑ වෙන්න කලින් ගෙදර එන්න කියලා තිබ්බා.. සෙනුකයයි අනිත් අයියලා තුන්දෙනයි පහළ ලෑස්තිවෙනවා.. ආධ්‍ය අයියා උදේම එයා ප්‍රයිවට් වැඩකරන ඩිස්පෙන්සරි එකට යනවා කිව්වා මොනවද එහේ දාලා ඇවිල්ලා ඒවා අරගෙන එන්න..

ඉතින් මමයි රධ්‍ය අයියයි අත් දිග ස්කූල් ශර්ට් එකට තද නිල් පාට ටයි එක දාලා ශර්ට් එක යට කල්ලා හෙන පිළිවෙලට ඇඳගත්තා.. ටයි එක දාන්නෙත් මෙ වගේ දවසකට විතරනෙ.. මෙහෙම පිළිවෙලට මමනම් ඉස්කෝලෙ යන්නෙ එක්කො ප්‍රයිස් ගිවින් එකට නැත්නම් මීට් එකට නැත්නම් කලර්ස් නයිට් එකට.. නැත්නම් මම ඇඳුම් ගැන වැඩි සැලකිල්ලක් දක්වන මනුස්සයෙක් නෙමෙ.. ඒකට රධ්‍ය අයියා ගෙදරට අදින්නෙත් මැදලද කොහෙද..

ඊටපස්සෙ රධ්‍ය අයියා ආධ්‍ය අයියගෙ කාමරෙන් ෆවුන්ඩේශන් එකකුයි සන් ක්‍රීම් වගේකුයි උස්සගෙන ඇවිල්ලා මට ඇදෙන් වාඩිවෙන්න කියලා මගේ මූණෙ තියන තරමක් දේවල් ගෑවා.. වෙනදටත් අම්මා මගේ මූණෙ අරවා මේවා ගානවා.. මම දන්නෙ ඉතින් ගානකල් උඩ බලගෙන ඉන්න තමයි.. කොහොමහරි ලාවට බ්‍රශ් එකකින් මූණට ටච්-අප් එකක් දීපු රධ්‍ය අයියා මට කොන්ඩෙ හදාගන්න කියලා ඌත් අර තිබ්බ ඒවගෙන් මූණ ගානට ලස්සනට හදාගත්තා.. එහෙම හදන්න තරම් දෙයක් නෑ උගෙයි මගෙයි

@Shan

මූනෙ.. ඒ වුනාට මේ ටිකේ අව්වෙ ඉදලා පොඩ්ඩක් එකෙන් මෙහෙන් කළු වෙලා තිබුනා..

" ඔය ඉන්නෙ හැන්ඩියා වගේ.."

මම කණ්නඩියෙන් මූන බලලා බ්ලෙසර් එකත් දාගෙන පහළට ගියා.. සැක් රධ්‍ය අයියා ඩබල් හැන්ඩ්සම්.. අද මේකා දිහා කීදෙනෙක් බලයිද දන්නෙ නෑ.. විශේශෙන් අර පරෙයියා.. අද ඉදිවි මාච්පාස්ට් කරන්න කැඩෙට් යුනිට් එකේ.. හම්බෙද්දෙන්කො.. දන්නෑ වරද්දෙ හැටි..

මම ඔච්චා හිත හිත සෝෆා එකේ වාඩිවෙලා ඉද්දි සෙනුකයා කහ පාටයි තද නිල් පාටයි බෑන්ඩ් එකේ යුනිෆෝම් එකත් ඇදගෙන කුකුල් පිහාටු ගහපු තොප්පියකුයි උගේ අර දිග මොකක්ද පොල්ලයි වන වන ඇවිත් මගේ එහාපැත්තෙන් ඉදගත්තා..

" ෂනෙරුවා හෙන හොට් අප්පා.."

" පලයං.."

" මේ බං මෙන්න මේ කට්ට ගහපන්කො කොලර් එක ගාවින් තියෙන ස්කාෆ් එක අල්ලලා.."

සෙනුකයා උගේ පාට දෙකේ ඇදුමට හෙන කියුට් පාටයි.. මූනෙ සීනියර් බෑන්ඩ් එකේ ලීඩර්.. ඌ ලීඩ් කරද්දි මාරම ලස්සනයි ඇතට බලන් ඉන්නකොට.. අපි රිහසල් කරද්දි දැක්කනෙ.. සෙනුකයට ලස්සනට ඇවිදින්න පුලුවන්.. අර කකුල් ගානට උස්සලා හරි කෙලින් ඉස්සරහ බලාගෙන..

අපි ටික වෙලාවක් ඉදලා ඔක්කොම ලෑස්ති වුනාට පස්සෙ ආධ්‍ය අයියගෙ කාර් එකේ ස්ටේඩියම් එකට ආවා.. ස්ටේඩියම් එක පිරිලා සෙනග.. ඕල්ඩ් බෝයිස්ලා ඇවිල්ලා එක සයිඩ් එකක් පිරිලම ගිහින්.. ඒ අස්සෙ ග්‍රේඩ් සික්ස් ටු තර්ටීන්, ආෆ්ටර් ඒලෙවෙල්ස් ලමයි ඔක්කොම අනිත් පැත්තෙ තම තමන්ගෙ හවුසස් වල ඉදගෙන.. එක සෝශාවක් ස්ටේඩියම් එක ඇතුලේ.. තව ගර්ල් ස්කූල්ස්, බෝයි ස්කූල්ස් වල ඉන්වයිටඩ් ලමයි, ටීචර්ස්ලා සර්ලා, ප්‍රින්සිපල් ලා.. මට වූ බරකුත් සෙට් වුනා.. අඩෙ දැන්නම් සිරාවටම බයයි වගේ..

@Shan

" Take it easy වරද්.. මොකුත් වෙන්නෑ.. ඔයා ඔයාවම බය කරගන්නවා.."

" මිම්.."

රඩ්‍ය අයියා මගේ දිහා නොබලා ස්ටේඩියම් එකේ ඔඩියන්ස් එක දිහාම බලාගෙන කිව්වා..

ඊටපස්සෙ අපි කවුරුත්ම එක්කෙනාට එක්කෙනා හම්බුනේ නෑ.. මට නෆ්‍රාස් එක්ක ප්‍රින්සිපල් සර්ව හම්බෙන්න යන්න වුනා.. රඩ්‍ය අයියලා ඩියුටි.. එයාලට කොහොමත් එක හවුස් එකකට කියලා සපෝර්ට් කරන්න බෑ.. මීට් එක දවසේ හැම හවුස් එකක් ගැනම බලන්න ඕන.. අයුක අයියට ස්පීච් එකක් කරන්න තිබ්බා.. සෙනුකයා ආපු ගමන්ම බෑන්ඩ් එකට ගියා.. ආධ්‍ය අයියා යාලුවෝ එක්ක ගියා..

මටයි නෆ්‍රාසයටයි කරන්න යන වැඩක්වත් හරියට කරගන්න බෑ.. ඌටත් මට වගේම ස්ටේඩියම් එකේ ක්‍රවුඩ් එක දැකලා ප්‍රෙශර් තදවෙලා තිබ්බේ.. කලින් පාරවල් වලටත් වඩා වැඩිද මන්දා.. අපි දෙන්නා ප්‍රින්සිපල් සර් මීඩියා රූම් එකට කතාකල්ල හවුස් කැප්ටන්ලට තිබ්බ විනාඩි දහයක විතර මීටින් එකට ඉදලා එළියට ආවා..ඒ එක්කම අනවුන්ස්මන්ට්ස් පටන් ගත්තා..

මුලින්ම තිබ්බේ කෙල්ලෙක් ග්‍රීක් ගොඩ් කෙනෙක්ට ඩ්‍රෙස් කරලා ෆයර් ටෝච් එක අරගෙන ස්ටේඩියම් එක මැද්දට ගිහින් ඕත් එක කියන එක.. ග්‍රීක් ගොඩ් තියා මොන මගුලක්වත් පේන්නෙ නෑ.. ගර්ල් ස්කූල් එකේ කෙල්ලෙක්ද කොහෙද හෙන දිග බිම දිගේ ඇදෙන සුදු පාට රැලි රැලි තියෙන ගවුමක් ඇදගෙන ඔලුවට ෆ්ලවර් ක්‍රවුන් එකකුත් දාගෙන ස්ටේඩියම් එක මැද්දට වෙන්න හදලා තිබ්බ පොඩි ස්ටේජ් එක උඩට නැලා ඕත් එක කියලා ස්ටේජ් එකෙන් බැහැලා ගිහින් එයාගෙ අතේ තිබ්බ ෆයර් ටෝච් එක ස්ටේජ් එකට ටිකක් ඉස්සරහින් හිටගෙන ඉදපු අහිරු අයියට දීලා අමුතු කැට් වෝක් එකකින් ස්ටේඩියම් එකින් එළියට ගියා.. ඒකිගෙ අර දිග ගවුම පස්සෙන් තව පොඩි ෆෙයරීස්ලට ඇදපු පොඩි කෙල්ලො පස් දෙනෙක් ඒ කැට් වෝක් එකෙන්ම ඇවිදගෙන ගියා..

ඊටපස්සෙ අහිරු අයියා ෆයර් ටෝච් එක අරගෙන ග්‍රවුන්ඩ් එක වටේ වටයක් හැල්මේ වගේ දුවගෙන ගිහින් ස්ටේඩියම් උඩට වෙන්න හදලා තිබ්බ ලොකුම ෆයර් ටෝච් එක පත්තු කලා.. නෆ්‍රාස් එක්ක අනිත් හවුසස් වල කැප්ටන්ලා එතනට ගිහින් හිටියේ.. මම ශේප් එකේ අපේ හවුස් එකට ඇවිත් බ්ලෙසර් එක ගලවලා අතේ ඔතාගෙන අවසානම පඩිපෙලේ

@Shan

ඉදගෙන මීට් එක දිහා බලාගෙන ඉදියා.. ආයෙ ඉතින් ඉවරවෙද්දි තමා හරේ මෙහේ දුවන්න තියෙන්නෙ.. මම පැය දෙකක් විතර තනියෙම අපේ හවුස් එකේ ඉදගෙන මීට් එකේ ඉවෙන්ට්ස් බල බල ඉදියා.. ඇත්තෙන්ම බෝයි ස්කූල්ස් වලින් ලොකුවටම මීට් එකක් කරන්නෙ අපේ ඉස්කෝලෙ තමා..

මම ඔහොම ඉන්න අතරේ මට මතක් වුනේ අද මහීශාත් මෙකට ආවා නේද කියලා.. මම ඒකිව හොයාගෙන කයියක් දාගෙන ඉන්නවා කියලා හිතලා බ්ලෙසර් එකත් දාගෙන ඉන්වයිට්ඩ් ස්කූල්ස් පැත්තට යද්දි මෙකි ඉන්නවා කොලූ බාගෙ වගේ කොළ පාට බ්ලෙසර් එකකුත් දාගෙන කකුලකුත් වන වන.. හොදට ටෙන්ට් එකක් අස්සට වෙලා ඉදගෙන.. මම හිමින් සැරේ ඒකිට කිට්ටු වෙලා ඔලුවට තට්ටුවක් දැම්මා..

" අඩෝ උඹ.."

" මොකෝ වෙන්නෙ.."

මම ඒකිට එහාපැත්තෙ තිබ්බ පුටුවෙන් ඉදගත්තා.. කොහොමත් මහීශා කෙල්ලො අස්සෙ රිංගගෙන ඉන්නෙ නෑ හුගක් වෙලාවට පාඩුවෙ කෙල්ලො නැති පැත්තක් බලලා ඉදගෙන ඉන්න නිසා හොදයි..

" උඹව දකින්නත් නෑ දැං.. පගයා.. ක්ලාස් එන්නෙත් අඩුවෙන් නෙ.."

" මේ මගුලකට හිරවුනා බං.. ඉවර වුනාම ආයෙ එනවා ක්ලාස්.."

" ඒක හොඳා.. මේ බං ආශි ආවා.. ඒකි තාම නෑනෙ.."

" ආශි?? ඒකි මෙහෙත් ආවද.. උඹලා දෙන්නා ගෑණියි මිනිහයිද බං.. යන යන හැම ලබ්බෙම ඉන්නෙ එකට.."

" ඒ ඒ මගේ යාලුවට මොකුත් කියනෙපා.. උස්සලා විසික් කරනවා එහාපැත්තට.."

" හාකො.. කෝ උඹේ ප්‍රියම්භිකාව ශශිනි ආවෙ නැද්ද බං.."

" සැක් කතාකරන්න එපා ඒ නැට්ටිච්චි ගැන.. පුදුම කරුමයක් වුනානෙ.."

" තාම පස්සෙන් එනවද බං.."

@Shan

" පසෙන් එන්නෙ නෑ.. දැන් බූට් කාලා වගේ අත කපාගන්නවයි දුක හිතෙන පෝස්ට් ශෙයා කරනවයි.. පිස්සු බං.."

" පස්සෙන් එන්නැති එකනම් ලොකු දෙයක්.. පරිස්සමෙන් ඉදපන් ඉතින්.."

" උඹ කියන්නෝන නෑ ඒක.. මේ උඹට පේනවද අර අතන ඉන්න ඩයල් එක.. උඹලගෙ ඉස්කෝලෙ ගේම්ස් කැපා බං.. ඔය ඉන්නෙ ඉස්සරහ.."

මම මහීශා ඇහෙන් පෙන්නුව පැත්ත දිහා හරි සමානව බලද්දි.. ටහිකෙ රඩ්‍ය අයියා මාව අමුවෙන් මරාගෙන කන්න වගේ වැටකට හේත්තු වෙලා සාක්කු දෙකටත් අත් දෙක දමාගෙන මේ පැත්ත බලාගෙන ඉන්නවා. මට ඒකට කෙළත් ගිලුනා..

" ඔ-ඕ.. ඒ අයියා මම දන්නවා -බං.."

" ඉතින් මොකද උඹ ගොත ගහන්නෙ.."

" එ-එහෙම නෑ පිස්සුද.."

මම ශේප් එකේ මහීශා ගාවින් අගලක් විතර මෙහාට එද්දි මෙන්න මෙකා කෙලගෙන එනවා අපි දෙන්න දිහාට..

" ඒ අන්න ඒකා මෙහෙට එනවා.."

" ඕ ෂිට්!!"

" වරද්!!!"

රඩ්‍ය අයියා මගේ ඔල්ලුවේ ඉදන්ම පහළට ස්කෑන් කරලා මහීශා දිහා ටිකක් වෙලා බලාගෙන හිටියා.. ඇයි යකෝ තේරෙන්නැද්ද බැලුවහම මේ වගේ එකියක් මට සෙට් වෙන්නෙ නෑ කියලා..

" කියන්න අයියෙ.."

" මොකද මෙතන කරන්නෙ.."

" යාලුවෙක් හම්බුනා.. කතා කර කර ඉදියෙ.."

@Shan

" රනින් ඉවෙන්ට්ස් වල ෆයිල් එක මට ගෙනත් දෙන්න ඉක්මනට.."

රධ්‍ය අයියා රවාගෙන කතාකරද්දි මට පොඩ්ඩක් දුකහිතුනා.. මාර ඉරිසියාවක්නෙ යකෝ.. පොඩ්ඩක් ඉස්සෙල්ල හොයලා බලපන් මේ ඉන්න එකා මගේ කවුද කියලා.. එහෙමත් නෑ.. රවන්න විතරයි දන්නෙ..

" ඉන්න ගේන්නම්.."

මම නැගිටලා හවුස් එක පැත්තටයන්න හදද්දි රධ්‍ය අයියා මගේ පිටිපස්සෙන් අඩිය තියලා එන්න ඇවිල්ලත් එකපාරම නැවතුනා.. ආයෙම අඩියක් පිටිපස්සට ගත්තා..

" සොරි නංගී.. වරද් අද ටිකක් බිසී.. talk some other time.."

හිච්චි එකක් ගෙනාවා.. ආයෙ හෙට වෙනකල් සෑහ් හොදේ.. ඕතරී නිදියන්න යනවා.. ගුඩනායිට්..

ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 30 කොටස

" කවුද ඒ..??"

රධ්‍ය අයියා මාව අතින් ඇදගෙන අජ් හවුස් එක තිබ්බ තැනට ඇවිත් මම කලින් ඉදගෙන හිටිය ලාස්ට් ස්ටෙයාර් එකේ ඉදගෙන මගෙන් ඇහුවෙ අහස කඩන් වැටුනා වගේ පුදුම කලබලේකින්.. තඩි බොරුවක් කියලා මහීශා එක්ක ඉන්න දෙන්නැතුව තකහනියක්ම මේ ග්‍රවුන්ඩ් එකෙන් බාගයක්ම ගෙවාගෙන ආවෙ යකෝ මෙක අහන්නද.. මහීශා ඉන්න තැන ඉස්සරහම ඇහුවනම් ඉවරනෙ.. අඳුන්වලාම දෙන්න තිබ්බෙ..

" මගේ යාලුවෙක්..??"

" යාලුවෙක් කිව්වෙ.."

" එයා මහීශා.. මගේ පොඩි කාලෙ ඉදලා යාලුවෙක්.."

" තව.."

" තව.. ආ අපි එක ගෙවල් ලග ඉන්නෙ.. අපේ අම්මා මහීශාගෙ අම්මගෙ හොදම යාලුවෙක්.."

" ම්ම්.."

රධ්‍ය අයියා මම කියන ඒවත් අහගෙන ග්‍රවුන්ඩ් එක දිහා බලාගෙන ඉදියා.. මේකට දුක හිතිලද.. තරහා ගිහින්ද.. ඉරිසියා හිතිලද.. මූනෙන් කිසි හැගීමක් පේන්නෙ නෑ.. ඔහේ ග්‍රවුන්ඩ් එකේ ස්කූල් ෆ්ලැග්ස් ගහපු පැත්තම බලාගෙන ඉන්නවා..

" මොකද අප්පා.."

ඌ එහෙම ඉද්දි මටත් ලාවට අවුල් ගියා.. ඉතින් අවුල් වෙන්න දෙයක් වුනායැ.. මම කෙල්ලෙක් එක්ක කතාකරපු පලියට එහෙම යාලුවෙනවද..

" මොකුත් නෑ.. වරෙන් කියාන්ලා අරපැත්තෙ ඉදියා.."

@Shan

රධ්‍ය අයියා ස්ටෙයාර් එකෙන් නැගිටලා මට නැගිටින්න අත දුන්නා.. මම එයා දිහා බලලා ආයෙම අත දිහා බලලා මූණ දිහා බලාගෙන හිටියා.. මේ යකා හරි අමුතුයි.. මටනම් කොහොමවත්ම තේරුම් ගන්න බෑ..

" කෝ නැගිටින්න.."

රධ්‍ය අයියා මගේ අතකින් ඇදලා අරන් මාව නැගිට්ටුවා.. මේ මනුස්සයා ගැන දවසම හිතුවත් දවසට තියෙන පැය ගානත් මදි.. එච්චර හිතන්න තියෙනවා.. මේ හොදින් ඉන්නවා.. ඊටපස්සෙ එකපාර අවුල් යනවා.. ආයෙම හොදයි.. ආයෙ වෙලාවකට හොදම හොදයි.. ආදරේ හිතෙනවා..

මම රධ්‍ය අයියා පිටිපස්සෙන් කියාන් අයියලා හිටියා කියන පැත්තට යද්දි චමිරුවා කැඩෙට් ටීම් එකේ කැඩෙටස්ලගෙ යුනිෆෝම් එකකුත් ඇදගෙන රධ්‍ය අයියා ඉක්මනින් ඉක්මනින් යන දිලා බලාගෙන ඉන්නවා මම දැක්කා.. මොනවද දන්නෙ නෑ බලන්නෙ..

මම අඩිය ඉක්මන් කල්ලා රධ්‍ය අයියා ගාවට ගිහින් කරට අතකුත් දාගත්තහම රධ්‍ය අයියා අනිත් අත මගේ කර වටේ දාගත්තා.. ඒ ගමන්ම මම හැරිලා චමිරුවා දිහා බලද්දි මේකා ඉන්නවා මූන ඇතිලියක් කරගෙන.. මම උගේ දර්ශන පතේ අවුල් කලාද කොහෙද.. මට උඩ ඉදන් බිමටම රැව්වා.. මම චමිරුවට ඇහැකුත් ගහලා කට ලාවට උල් කල්ලා පොඩි කිස් එකකුත් යැව්වා.. මම්මම්මවාහ්!! සොරි බබා.. දෙයාරා මෙනි ෆ්ලවර්ස් ඉන් දිස් ව'ල්ඩ.. බට් ඇම් සොරි ටු සේ දැට් මේ මල මගේ වෙන්නනෙ ඉන්නෙ..

" අර සෙනුක ඉන්නවා.."

මම හැරිලත් චමිරුවා දිහා බල බල එද්දි රධ්‍ය අයියා අපේ ඉස්සරහට කුකුල් පිහාටු ගහපු තොප්පියකුත් දාගෙන පොල්ලක් වන වන එන සෙනුකයව, ටොක්කක්ම ඇනලා පෙන්නුවා..

" මොනවද බං ෂනෙරුවා හැරි හැරි බැලුවෙ.."

" සක්කිලි පරෙයියෙක් දිහා.."

" මොකෙක් කිව්වා.. ඒ අයියේ මූ මොනවද මේ කියවන්නෙ.."

@Shan

සෙනුකයා රධ්‍යා යියගෙන් අහද්දි ඒක උරහිස අකුලලා ලාවට හිනාවුනා.. අනේ උඹ බබා දන්නෙම නෑ..

" සක්කිලි පරෙයියා බං.. පාට පාට ලියුම් දෙන්නෙ.."

" ආහ්.. පරෙයියා.. ඇයි ඩයල් එක උබට මොනවහරි කිව්වද.."

" එහෙම කිව්වෙ නෑ බං.. මම නිකං බැලුවා ඉතින්.."

" හුම් හුම්.. ඒ මේ අර කවුද බං අර තඩි ගවුමක් උස්සගෙන මේ පැත්තට කෙලගෙන එන්නෙ.."

සෙනුකයා බෙල්ල හරවලා පෙන්නුවේ අපේ පැත්තට හෙන තඩි ගවුමක් අත් දෙකට අකුළගෙන ඒක අමාරුවෙන් උස්සගෙන මේ පැත්තට දුවගෙන එන කෙල්ලෙක්ව..

" ග්‍රීක් ගොඩට මද කිපිලද බං.. "

හීල් එකත් ටොක් ටොක් ගගා අපි ඉන්න පැත්තට එන ග්‍රීක් ගොඩ්ව දැක්ක පාර මට දෙකට තුනට නැමිලා හිනාවෙන්න හිතුනා.. ටහිකෙ මහීශාගෙ ගැනි නේද මේ නලාගිරිට රා පොවලා වගේ මේ පැත්තට එන්නෙ..

" අඩෙ ආශිද බං.."

" ඒ අර කියාන් අයියා මොකද බං දුවගෙන මෙහෙට එන්නෙ.."

ආශි පිටිපස්ස බල බල දුවගෙන ආපු පාර අර තඩි ගවුමට අපිට ඊට පිටිපස්සෙන් මොකුත් පෙනුනේ නෑ.. ඒ වුනාට ටිකක් එහාට මෙහාට වෙලා බලද්දි අපි දැක්කේ කියාන් අයියා වෙඩි කාපු ඌරු නාම්බා වගේ මෙකි පස්සෙන් අඹෝගෙන එනවා.. මුල් අල්ලන සෙල්ලම් කරනවද..

" ආශු පොඩ්ඩක් ඉන්න.."

ආශි අපි ගව්න් යන්න ගියා විතරයි අර ආල් හයේ විතර හීල් එක කුරු කුරු ගහලා තිබ්බ කාණුව වහලා තිබ්බ තහඩුවෙ මැද්දට ගියා විතරයි කෙල්ල දඩාස් ගාලා අපි සේරම ඉස්සරහා අර තඩි ගවුමත් උස්සගෙන දණගහලා වැන්දා.. කිව්වෙ වැටුනා..

@Shan

ඒ අස්සෙ කියාන් අයියා බ්‍රේක් නැතුව දුවගෙන ආපු පාර බිම වැටිලා නැගිටගන්නවත් බැරුව කොන්ෆියුස් වෙලා ඉඳපු ආශිගෙම ඇඟට විනාඩියක්වත් යන්න කලින් අර තඩි ගවුමේම සපත්තුව පැටලිලා වැටුනා..

'''සලබලාං''' ගාන මෙඩ්ල්ස් එකට එකට වැටෙන සද්දයක් එක්ක, කියාන් අයියා වැටෙද්දි ආශි ගිරිය යටින් මරලතෝනි දීලා එක හීල් එකක් අතට අරගෙන දුන්නා කියාන් අයියගෙ පිට මැද්දට පාරක්..

" බුදුඅම්මෝහ්.."

" අහකට පලයං වනචරයා.."

ආශි ඒකිගෙ මිණි මිණි කටහඬ අවදි කල්ලා කියාන් අයියව එහෙට තල්ලු කල්ලා දැම්මා.. දැන් අපි ඔක්කොම මුන් දෙන්න ඉස්සරහ හිටගෙන මේ ඩ්‍රාමා එක බලාගෙන ඉදියේ..

ග්‍රීක දෙවඟන අන්තිමට ගියේ හොම්බෙන්.. මෙහෙම පුරාවෘත්තයක් අතීතයේ තිබ්බද කියන්න මම දන්නෙ නෑ.. මම දන්න විදියටනම් නෑ..

ඒ විනාඩි පහේ ඩ්‍රාමා එකේ අන්තිමට කියාන් අයියා හීල් පාරෙන් හරි සිහියට ඇවිල්ලා වට පිට බලලා වස විලිලැජ්ජව දෙපිටින් බේරෙන්න ගද්දි හිම්හිට සෙනුකයගෙ උදව්වෙන් නැගිට්ටා.. මම ඉතින් මොනා වුනත් යාලුවා නිසා ගිහින් ආශිව නැගිට්ටුවහම රධ්‍ය අයියා කාණුවෙ හිරවෙච්ච හීල් එක අරන් ආශිගෙ අතට දුන්නා.. එතනින් ගිය උනුත් අපි දිහා හැරි හැරී බලනවා..

" තැන්ක් යූ ෂනෙරු.. තැන්ක් යූ අයියෙ.."

ආශි හීල් එක අරගෙන මගේ උරහිසකුත් අල්ලගෙන හීල් එක ආයෙම කකුල් දෙකට දාගෙන කියාන් අයියට රව්වා..

" මේ අහන්න ආශූ.."

" පිස්සුද මනුස්සයෝ.."

ආශි කියාන් අයියට බනින්න යද්දි එතෙන්ට තව කෙල්ලෙක් එක්ක ආවෙ මහීශා.. මෙකි ඒකිගෙ ගෑණිට කරදරයක් කියලා දැක්කා විතරයි සුටුස් ගාලා

@Shan

සීන් එකට එන්ටර් වුනා..

" ඒ බං මොකද මේ.."

" මොකුත් නෑ බං.. අපි යමු.."

ආශි මහීශාගෙ අතින් අදිනවා එතනින් යන්න.. මහීශා අපි ඔක්කොම දිහා බලන් ඉදලා කියාන් අයියා දිහාට හැරිලා ෆුල් සර්ව් පාරක් දැම්මා.. උඩ ඉදන් යටටම.. මේකි ගහයිද.. එහෙම වුනොත් මාර වැඩේ.. මම කාගෙ පැත්තද ගන්නෙ..

මම ඔහොම හිත හිත ඉද්දි කියාන් අයියා ආශිට ඇඟිල්ලකුත් දික් කල්ලා යන්න ගියා.. ආශි මහ හයියෙන් අඩාගෙන අනික් පැත්තට ගියා.. මටනම් ඇත්තටම මෙලෝ ලබ්බක් තේරුනේ නෑ.. මට විතරක් නෙමේ සෙනුකයටත් මොකුත් තේරුනේ නෑ.. ඒ අස්සෙ මම රධ්‍ය අයියා දිහා බලද්දි මේකා මහීශා දිහා කන්න වගේ බලාගෙන ඉන්නවා..මහීශා දිහා බලද්දි ඒකිත් මූ දිහා කන්න වගේ බලන් ඉන්නවා.. මුන්ට මාන්දමද..

" මේ අයියෙ යාලුවට කියන්න පාඩුවෙ ඉන්න කියලා.."

මහීශා රධ්‍ය අයියට සැරෙන් වගේ කියලා ආශි ගිය පැත්තට දුවලා ගියා.. මොනවද හත්දෙයියනේ මේ වෙන්නෙ.. හින්දි මෙගා ඩ්‍රාමා එකක් වගේ.. රධ්‍ය අයියා, මහීශා යන දිහාත් බලලා රැව්වා වගේ මම දැක්කා..

" ඒ මොකද ඒ.."

මම හිමීට හැටට හැටේ රවන රධ්‍ය අයියට ඇඟිල්ලකින් ඇන්නා..

" පස්සෙ කියන්නම්.."

රධ්‍ය අයියා සාක්කුවට අත් දෙක ඔබාගෙන බිම බලාගෙන ඉස්සරහට ඇවිදගෙන ගියා..  මමත් ඒ පස්සෙන්ම දුවගෙන දුවගෙන ගියා..

" ඔයා මහීශා දන්නවද.. යාලුවට පාඩුවේ ඉන්න කිව්වෙ මොකද ඒ.."

" ඔය අර කියාන් යාළුවෙලා ඉදපු කෙල්ල.."

" හෑ.. කවුරු?????????????? ආශි????????????"

@Shan

" ම්ම්.."

පක්ම පක්.. ඒ මොන මගුලක්ද ඒ.. කියාන් අයියා කැමතිවෙලා ඉදියේ ඒ ටිං බෙලෙක්කෙටද.. දෙයියනේ මොනවද මේ සිද්දවෙන්නෙ..

" මගේ ඔලුව විකාරයි වගේ අනේ.."

" ඔව්.. උඹට කොහොමත් ඔලුව විකාර වෙලානෙ.."

රධ්‍ය අයියා මීඩියා රූම් එකට යන පඩිපෙළ ලග නතර වුනා..

" අනේ මේ.."

" ඇෆ්‍රොඩයිට් එක ෆස්ට් ප්ලේස් ගනී.."

රධ්‍ය අයියා මූනේ හිනාවක් එක්ක මං දිහා බලාගෙන කියද්දි මම ඇස් දෙකත් ලොකු කරගෙන රධ්‍ය අයියා දිහා බලාගෙන ඉදියා..

" මි-මොකක්??"

" මම කිව්වෙ ගනීවි කියලා බං.. ශුවර් නෑ ඉතින්.."

" අහ් ඒක මිසක්.."

මේ අහංකාර සලබයා මාව බය කරපු තරමක් අම්මපා..

" දැන් හවුස් එක ෆස්ට් ප්ලේස් ගත්තොත් උඹ මට මොනවද දෙන්නෙ.."

රධ්‍ය අයියා වැටට හේත්තු වෙලා ඇහිබැමක් උස්සලා සෙල්ලක්කාර විදියට හිනාවුනා..

" ඒ මොකටද ඔයාට මොකුත් දෙන්නෙ.."

" යකෝ මෙච්චර දවසක් උඹට උදව් කල මට එපැයි ගහන්න.."

" මම ගහන්නද.."

@Shan

මාත් මනමාල හිනාවක් දාලා කිව්වහම මේකා මට කකුලෙන් ගැහුවා පාරක්..

" වරද්..!!"

" ඇයි ඇයි අනේ.. ආ මම කියන්නම්.. අපි ෆස්ට් ප්ලේස් ගත්තොත් මම ග්‍රවුන්ඩ් එක මැදම තවුසෙම කිස් කරනවා.."

මම වැඩි ගානක් නැතුව විහිලුවට කියද්දී මේකගෙ ඇස් ලොකුවෙලා මූණ රතුම රතු පාට වුනා..

" උඹට ආතල්ද.."

මමත් අහන්නෙ..?? ආතල්ද??

සනෙරු පුම්තා කිව්ව වගේ කොරයිද

මම ගමේ ආවා සකලබුජම්ලා.. මම දන්නවා ඔහේලට මේක අහලා එපාවෙලා ඇත්තෙ.. කමක්නෑ අහගෙන ඉදහල්ලා.. ඊළග වැප්ටරේ දිගට කොටලා දෙන්නම්.. ඕතරීට හරී........යට වැඩලු..

හා ද.. මම ආදරෙයිනෙ මගෙ කොට කලිසම් ටිකට ඉතින්.. උම්මම්මවහ්

ලව් යූ ❤

HAPPINESS <33

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම**

@Shan

කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 31 කොටස

" අඩෝ නෆාස්.."

" මගේ බොක්ක කුල් වෙලා ඉන්නෙ බං.."

මමයි නෆාසුයි හිටියේ අපේ හවුස් එකේ ෆ්ලැග් දෙකත් දෙපැත්තට අල්ලගෙ පපුව ඉස්සරහට දාගෙන හවුස් ප්ලේසස් එනවුන්ස් කරන්න ඉන්න ප්‍රින්සිපල් දිහා බලාගෙන.. ස්කොඩ් එකෙන් පස්සෙ ස්කූල් යුනිෆෝම් දාපු ඔක්කොම ළමයි ග්‍රවුන්ඩ් එකට ඇවිත් තමන්ගෙ හවුසස් පිටිපස්සෙන් පෝලිමට පිටිපස්සට බිම තණකොළ වල වාඩිවෙලා හිටගෙන ඉදි හවුස් කැප්ටන්ලා විතරක් නැගිටගෙන ඉදියා.. මම වෙවුනලනවා වගේ.. ඒ අස්සෙ වූ බරකුත් ඇවිල්ල කකුල් දෙකත් ගිටාර් ගහනවා වගේ.. රඩ්‍ය අයියා ප්‍රින්සිපල්ට පිටිපස්සෙන් හිටගෙන කලබල වෙලා ඉන්න මගේ දිහා මෙලෝ හැඟීමක් නැතුව බලාගෙන ඉදියා.. මේකත් මාව බයකරනවා.. අපි එක නෙමේද.. දෙයියනේ මට ඇඩෙන්න වගේ.. කොල්ලෙක් තමා.. ඒ වුනාට පහුගිය මහන්සියයි කරපු කැපකිරීමුයි මතක් වෙද්දි එක නොවුනොත් දරාගන්න බැරි වෙයි කියලා මම හෙනම අවුලෙන් හිටියේ..

ප්‍රින්සිපල් පොඩි කතාවක් කල්ලා ෆයිනල් රිසල්ට්ස් තියන කොලේ අතට අරගෙන ඉස්සරහා බලාගෙන හිනාවුනා.. ඊට්පස්සෙ මයික් එකට මූණ ලංකල්ලා රිසල්ට්ස් කියන්න ලෑස්තිවුනා.. මුළු ග්‍රවුන්ඩ් එකම මීයට පිම්බා වගේ සයිලන්ට්.. මොකෙක්වත් ආසාවට බෝතලයක්වත් බිම වැට්ටුවේ නෑ.. හවස පහමාරයි වෙලාව.. කළුවරත් වැටීගෙන එනවා.. මගේ අතේ තිබ්බ ෆ්ලැග් එක හුළං පාරවල් වලට එහෙට මෙහෙට වැනෙද්දි මම ඒක තදින් අල්ලගෙන හිටියා.. බ්ලෙසර් එකේ එල්ලෙන මෙඩල් එකට එක වැදෙනවා හීනි සීනු සද්ද වගේ..

" Fifth place goes to.."

ප්‍රින්සිපල් පොඩ්ඩක් වෙලා ඔඩියන්ස් එක දිහා බලාගෙන ඉදියා.. පස්වෙනියා වෙන්න මොකෙක්වත් බලාගෙන හිටියේ නෑනෙ.. හැමෝම ඇස් ලොකු කරගෙන අල්ලගත්ත හුස්ම පහළ නොදාම ඉදියා.. අනේ දෙයියනේ ඇෆ්‍රොඩයිට් වෙන්න නම් එපා.. එපා..

@Shan

" The house Poseidon.."

ප්‍රින්සිපල් සර් කියද්දි ඒ හවුස් එකේ ඔක්කොම උන් එකාට එකා බදාගත්තා.. දැන් තමා කාලගෝට්ටිය පටන්ගත්තේ.. උන්ට දුක ඇති.. මොනව කරන්නද..

" Forth place goes to.."

" The house Ares.."

" Third place goes to.."

" The house Zeus.."

මම තාම ෆ්ලැග් එක අල්ලගෙන ඉන්නවා..අපේ හවුස් එක තාම කිව්වෙ නෑ. ඒ කියන්නෙ අපි දෙකද.. කමක් නෑ අනුශූරතාවයත් හොදයිනෙ.. එක වෙන්නම ඕන කියලා නීතියක් නෑනෙ.. අනික අපි මහන්සි වුනා.. ඒක එච්චර දෙයක් නෙමේ..

මම දැනටමම අපේ හවුස් එක සෙකන්ඩ් ප්ලේස් ගත්තා කියලා හිතාගෙන මගේ හිත හදාගත්තා.. දැන් ප්‍රින්සිපල් සර් එනවුන්ස් කරන්නෙ ෆස්ට් ප්ලේස් එකයි සෙකන්ඩ් ප්ලේස් එකයි දෙකම එකට.. කමක් නෑ ෂනෙරු.. දෙක උනාට අවුලක් නෑ.. උඹලට පස්සෙන් තව හවුස් තුනක්ම තියෙනවනෙ..

" Today The Athena house gets the runner-up by getting seven hundred and twenty two points and

**The Aphrodite house gets the championship by getting eight hundred and fifty four points..**

I extend my warmest greetings to all the boys of Aphrodite House, including the two leaders of Aphrodite, and to all the other Houses as well.. Thank you.."

ප්‍රින්සිපල් සර් අප්පුඩි තුනකුත් ගහලා මයික් එකෙන් එහාට වෙද්දී රධ්‍ය අයියා මයික් එක ළගට ලං වෙලා හිනාවෙන ඇස් වලින් කතාකලා.. මම හිටියේ මගේ වටේ වෙන මොකුත් හිතාගන්න බැරුව ගල් වෙලා ඉස්සරහා

@Shan

බලාගෙන.. මගේ ෆ්ලැග් එකත් අතින් වැටුනා.. නෆ්‍රාස් ඉදියෙත් මගේ දිහා බලාගෙන ඇස් දෙක ලොකු කරගෙන මොකුත් හිතාගන්න බැරුව.. අපි වටේ මහා කාලගෝටියක් ඇති වෙලා කිසිම දෙයක් ඇහෙන්නෙ නෑ මට තේරෙන්නෙත් නෑ.. මම ගත්තු හුස්ම පහළ දාගන්න බැරුව පුදුම වෙලා ෂොක් වෙලා ඉස්සරහම බලාගෙන ඉදියා..

" Accordingly, we respectfully invite the two leaders of Aphrodite House, Mohammad Nafraz and Varad Udyoga to the stage to receive the shield related to their house as the winners of the annual inter-house sports meet.. Thank you.."

රධ්‍ය අයියා හුගක් සතුටින් මයික් එක ගාවින් එහාට වෙද්දි මම නෆ්‍රාස්ව තද කල්ලා පොඩි වෙලා තැලිලා යන්නම බදාගත්තා.. ඌත් අනිත්පැත්තට මාව බදාගනිද්දී අපි දෙන්නවම වටේ හිටිය හැමෝම හග් කලා.. මම ජීවිතේ විදපු ලස්සනම ගෲප් හග් එක.. මට ඇඩෙන්න එනවා.. අත පයත් රතු වෙලා ඇස් වලින් කදුලු ගලනවා.. අන්තිමේ ලොකුම ලොකු ගෲප් හග් එකේ බැලන්ස් නැතිවෙලා සේරම ග්‍රවුන්ඩ් එකේ ඇදගෙන වැටුනා.. එහෙම වෙලත් නෙමේ එකෙක්වත් නැගිට්ටින්නෙ.. මටත් නැගිට්ටින්න උවමනාවක් නෑ.. මාව සතුටටම පැලිලා යන්න වගේ.. කිව්වත් වගේ මේ ගෙවෙන්නෙ මගේ ජීවිතේ මම විදින සතුටුම කාලෙ වෙන්න ඇති.. විනාඩි විස්සකට පස්සෙ මමයි නෆ්‍රාසුයි කොන්ඩ අවුල් කරගෙන කලිසම්වල දූවිලි නාගෙන ස්ටේජ් එකට නැගලා චීෆ් ගෙස්ට් අතින් අපේ හවුස් එකට හම්බවුනු ලොකුම ලොකු ගෝල්ඩන් ශීල්ඩ් එක ගද්දි ප්‍රින්සිපල් අපි  දෙන්නටම මෙඩල්ස් දෙකක් දාලා පිටට තට්ටු කලා.. මගේ බ්ලෙසර් එකට තව මෙඩල් එකක්.. අනිත් ඒවා ඉතින් කලර්ස් නයිට් එකේදි තමා.. මම මට තියන ලොකුම හිනාවෙන් හිනාවෙද්දි රධ්‍ය අයියා ස්ටේජ් එකේ පැත්තක හිටගෙන අත්පුඩි ගහන ගමන් මම දිහා ආදරෙන් බලාගෙන හිටියා.. අනේ මන්දා එයාගෙ ඇස් කියවන්න බෑ.. හැගීම් හුගක් එකපාර මතුවෙලා දිලිසිලා නිමිලා යනවා.. මම මෙඩල් එකට කිස් එකක් දීලා ශීල්ඩ් එක උස්සලා ඔඩියන්ස් එකට පෙන්නුවහම චීෆ් ගෙස්ට් ප්‍රින්සිපල් වගේම ටීචර්ලා කෝච්ලාත් මම දිහා බලලා අත්පුඩි ගහලා හිනාවුනා.. මම ආයෙම රධ්‍ය අයියා දිහා බලද්දි එයා හරි ආඩම්බරෙන් වගේ මගේ දිහා බලාගෙන ඉදලා ස්ටේජ් එකෙන් බැහැලා ග්‍රවුන්ඩ් එකේ ළමයි අතරට ගියා..

ඉස්කෝලෙ උන් නම් කෙලින්නෙ තනිකර පිස්සු.. ස්ටේජ් එකේ ඉදපු මාව ඇදලා ගත්තු සෙනුකයා ආයෙම වතාවක් මාව බිම පෙරලගෙන බදාගත්තා..

@Shan

ඉස්කෝලෙ පන්දාහකුයි තව හෙන ඕල්ඩ් බෝයිස්ලා තොගේකුයි ග්‍රවුන්ඩ් එකේ උන් උන්ගෙ හවුස් ගත්තු ප්ලේසස් සමරනවා විශ් කරගන්නවා.. එකම විකාරයයි.. මට බ්ලෙසර් එකට දාඩිය දාලා ඇඟ ඇතුලින් ඇඳුම පිටට ඇලිලා ගිහිල්ලා.. මම ඒ මොකුත් ගැන හිතන්නෙ නැතුව රධ්‍ය අයියව හොයන්න ගත්තා.. දෙයියනෙ මට එයාට මුලින්ම තැන්ක් කරන්න ඕන.. මට කොච්චර සතුටුද මට දැනෙන හැඟීම කියාගන්න ඕන.. මම එහෙ මෙහෙ හැමතැනම රධ්‍ය අයියව හොයද්දි මූනට හම්බුනු කීදෙනෙක් මට විශ් කලාද මතක නෑ..

හයයි කාලයි.. හැන්දෑ කලුව හිමින් හිමින් ස්ටේඩියම් එක වහගද්දි ඔක්කොම ලමයි බලාගෙන ඉදපු ඉවෙන්ට් එක පටන්ගත්තා..

ඉස්කෝලෙ හැම ඇනුවල් මීට් එකක්ම අවසානෙ පැයක් විතර ඩීජේ ප්ලේ කරනවා.. සමහරු ඉතින් මීට් එකට එන්නෙම ඔකෙ නටන්න බලාගෙන තමයි.. ඔහොම ඉවෙන්ට් එකක් අන්තිමට ඕගනයිස් කරන්න හේතුව තමයි ලමයි ඉන්නෙ මීට් එකත් එක්ක ස්ට්‍රෙස් එකෙන්.. ඉතින් අවසානෙ රිසාල්ට්ස් කිව්වම අනිත් ප්ලේසස් ගත්ත හවුස් වල ලමයි ඉන්නෙ හරි ස්ට්‍රෙස් එකෙන්.. දුකෙන්.. පීඩනේකින්.. ඒ දේවල් අමතක කල්ලා පොඩ්ඩක් නටලා කියලා පිස්සු කෙලලා කලින් මානසිකත්වෙට එන්න තමයි ඕක තියෙන්නෙ.. එතකොට ඉතින් මුලු ඉස්කෝලෙම වයස් බේදයක් නැතුව ස්ටේඩියම් එකට පැනලා ඒක දෙක කරනවා.. සමහර වෙලාවට ඉස්කෝලෙ බෑන්ඩ් එක පපරෙ ප්ලේ කරනවා.. හෙන ආතල් ගොඩයි..

ඩීජේ ප්ලේ කරන අයියා උගේ අඩුම කුඩුම ටිකත් හරිහැටි අටවගෙන වටේටම පාට පාටට ස්පොට්ස් ලයිට් වැටෙද්දිම ස්ටේඩියම් එකේම කාලගෝට්ටිය දෙගුන තෙගුන කරගෙන කන පැලෙන්න මියුසික් එකක් ප්ලේ කලා..

කඩිගුලක් ඇවිස්සුනා වගේ.. මම තාම රධ්‍ය අයියව හොයනවා.. පන්දාහක් හයදාහක් මැද්දෙ එකම යුනිෆෝම් ඇඳගත්ත උන් ගොඩක් අස්සෙ මම කොහොමද මේකව හොයාගන්නෙ.. මම ලමයින්ගෙ ඇගේ වැදි වැදී ස්ටේඩියම් එකේ එහෙට මෙහෙට ගියා.. දැන්නම් කළුවර වැටිලා.. මට පේන්නෙ ලමයින්ව පාට පාටට විතරයි.. ෆ්ලැග් එහෙ වනනවා මෙහෙ වනනවා.. සමහරු එක එකාගෙ කරවල් උඩත් නැගලා.. කෑගහනවා.. චියර් කරගන්නවා.. නටනවා..

@Shan

මම ඇගිල්ලක් ගහන්න ඉඩ නැති ස්ටේඩියම් එකේ කොච්චර දුර ආවද කියන්න දන්නෙ නෑ.. මම මැද්දටම වගේ ඇවිත් හිටියා.. දන්න අඳුරන එකෙක් නෑ.. මල්ලිලා ගොඩකුයි තව එහේ මෙහේ කලර්ඩ් ඇඳගත්තු කට්ටියයි.. අපේ වයසෙ උනුයි.. මම බැරිම තැන මහන්සියට බ්ලසර් එක ගලවලා අතට පටලගෙන අතින් පවන් ගහගත්තා.. දාඩියට ඇඳුම ඇලිලා.. පිට දිගේ වතුර බේරෙනවා වගේ.. කොන්ඩෙ දෙපැත්තෙන් මූණටත් දාඩිය දාලා.. හුස්මක් ගන්නවත් ඉඩ නෑ.. මහන්සී කියන එකේ උපරිම මහන්සී..මේ මිනිහා පේන්නවත් නෑ.. මොන ලබ්බෙ ගියාද මන්දා.. මම ඒත් වටපිට බල බල පවන් ගහගද්දි මගේ වටේ උන් සිහියක් පතක් නැතුව දඟලනවා.. මම හිටියේ හෙම්බත් වෙලා.. මට දුක හිතුනා හුගක්..

මම හිතාගෙන ඉදියේ රධ්‍ය අයියව හම්බෙලා තෑන්ක් කරන්නනෙ.. මට කොච්චර සතුටුයිද කියන්න.. ඒ වුනාට මම පැය බාගයක් තිස්සෙම එයාව හොයනවා.. එයාට උවමනාවක් නැද්ද මාව හම්බෙන්නවත්.. මට අපි චැම්පියන්ශිප් එක ගත්තු සතුට එහෙමම දියවෙලා ගිහින් දුක හිතුනා.. මුලු දෙනෝ දාහක් මැද්දෙ දුකින් ඉන්න එකම මනුස්සයා මාම් වෙනකොට මගේ වටේ හිටිය හැමෝම එක පිම්මට උඩ පැන පැන කෑ ගගහා එයාලගෙ සතුට සමරන ගමන් ඉදියා.. මම විතරක් තවම බ්ලෙසර් එකත් අතකින් ගුලි කරගෙන ඔහේ පැත්තක් බලාගෙන කල්පනා කරනවා.. ඒ හුදකලා පාළු තනිවෙච්චි හැඟීම නිසා මට හිතට දැනුනු දුකට ඇඩෙන්න ගන්නකොට මම ඉක්මනට ඇස් පිය ගහලා කදුලු නවත්තගත්තා.. මම මෙහෙම පොඩි දේවල් වලට අඩන මනුස්සයෙක් නෙමේ.. මම අඩලත් නෑ මෙහෙම කලින්.. හරිනම් මම සතුටු වෙන්න එපැයි.. මගේ ගෝල් එක මම වින් කලා..

මම ඇස් දෙකේ කදුලු පුරෝගෙන ග්‍රවුන්ඩ් එකෙන් එහාට ඇවිදගෙන යන්න ගියේ මෙතෙන්ට වෙලා බකන්නිලාගෙන ඉදලා තේරුමක් නැති නිසා.. වෙනදට ග්‍රවුන්ඩ් එක දෙක කරගෙන කැපිච්ච පණුවා වගේ දාලන මම අද මෙහෙම සයිඩ් ගහලා ඉන්න එකේ වෙනස මටම තදින්ම මගේ හිතට වැදුනා.. මම වෙනස් වේගෙන යනවා.. හරි අමුතුයි.. මට තේරෙන්නෙ නෑ..

මම ග්‍රවුන්ඩ් එක මැද්දෙන් අඩි පහ හයක් ඇවිදගෙන ගියේ වටේම ඉන්න උන්ගෙ ඇඟවල් වල හැප්පෙන ගමන්.. ඇගිල්ලක් ගහන්න ඉඩ නෑ මම කිව්වනෙ.. මම පරිස්සමෙන් පරිස්සමෙන් ඇවිදගෙන එහාට යද්දී කවුරු හරි මගේ අතින් තද කල්ලා හයියෙන් අල්ලගත්තා.. හුගක් හයියෙන්.. ඒ

@Shan

වාරුවට මාව ඉස්සරහා හිටපු එකෙක්ගෙ ඇගේ වැදිලා පිටිපස්සට තල්ලුවෙලා කාගෙහරි ඇගක වැදෙද්දි මට අර හුරුපුරුදු සැර ප්'රියුම් සුවඳ නහයට දැනුනා.. මම කලබලෙන් එහාපැත්ත හැරෙද්දි රධ්‍ය අයියා මගේ අත අතාරින්නෙම නැතුව මගේ දිහා එක එල්ලේ බලාගෙන ඉදියා..

කන පැලෙන්න සින්දු ප්ලේ වෙද්දි ස්පීකර්ස් වල බේස් එකට මගේ පපුවත් ඒ තාලෙට ගැස්සෙනවා.. කොල්ලො නටන්නෙ රීලා වගේ.. එහෙව් තැනක මෙහෙම මූනට මූන බලාගෙන ඉන්න එක බැලුවහම කිසි ප්‍රායෝගික ගතියක් නෑ වගේ දැනුනත් ඇත්තෙන්ම මට වටේ පිටේ තියෙන මෙලෝම දෙයක් සිහිකල්පනාවට ආවෙ නෑ.. මම හිටියේ රධ්‍ය අයියා දිහා බලාගෙන..

එයාගෙ මූණ දාඩියෙන් පෙගිලා හයියෙන් හයියෙන් හුස්ම ගන්නවා.. මම වගේමයි දාඩියෙන් පෙගිලා හෙම්බත් වෙලා ගිහින්.. අපි හිටියෙත් හුස්ම එකාට එකා වැදෙන දුරකින්..

" මම හැමතැනම හෙව්වා වරද්.. කොයි ලෝකෙද ඉදියෙ.."

මම හරි සිහිකල්පනාවට ආවේ එවෙලේ..

" ආ මොකක්??"

මට වටපිටේ සෝශාවට කිසිදෙයක් පැහැදිලිව ඇහුනේ නෑ.. රධ්‍ය අයියා මගේ කන ගාවට නැමිලා ආයෙම කලින් කිව්ව එක කිව්වා..

" මම එළියට යන්න හැදුවෙ.."

මමත් රධ්‍ය අයියගෙ කනට ලං වෙලා හයියෙන් කිව්වා.. රධ්‍ය අයියා එකපාරම මාව හග් කලා.. ගහ් කල්ලා මහා හයියෙන් දබෝස් දබොස් ගාල පිටට දෙපාරක් විතර තඩිබෑවා..

" congratulations මගෙ වරද්.. මට උඹ ගැන සතුටුයි.. මාරම සතුටුයි.."

ඒ වචන වල මට අවංකම සතුටක් දැනුනා.. අනික එයා කිව්වෙ මගෙ වරද් කියලද.. දෙයියනේ මගේ පපුව එකසිය ගානට ගැහෙන්න පටන් ගත්තා.. ඔහොම බර වචනයක් දෙකක් ඉදලා ඉදලා කිව්වහම හිතට දරාගන්න අමාරුයි.. මට කියාගන්න බැරි තරම් සතුටුයි..

@Shan

" මටත් සතුටුයි.. මාත් එක්ක ඉදියට තැන්ක්ස්.. හුගක්.."

මම කියලා ඉවරවෙද්දි රධ්‍ය අයියා මගෙන් අයින් වුනා.. දැන්නම් හිතේ තිබ්බ දුක ඔක්කොම නැතිවෙලා ගිහින් වගේ.. පායලා පායලා වැස්සක් වැහැලා වගේ අලුත් සතුටක් දැනෙනවා.. මම රධ්‍ය අයියගෙ අත් උඩට නමලා තිබ්බ ශර්ට් එකේ කරෙන් ඇදලා මගේ ගානට පහත් කරගද්දි රධ්‍ය අයියා පුදුමවෙලා වගේ මගේ දිහා බලාගෙන ඉදියා.. මම ඉක්මනට වටපිට බලලා රධ්‍ය අයියගෙ දකුණු පැත්තෙ කම්මුල එබෙන්නම කිස් එකක් තියලා කොලර් එකෙන් අතෑරියා.. රධ්‍ය අයිය ඒත් හිටියේ නැමීගෙනමයි.. මම හිතන්නෙ වුනු දේ මොළේට ප්‍රොසෙස් වෙන්න තප්පර පහක් විතර ගියා.. ඒ එක්කම මහ මනමාල හිනාවක් දාලා මගේ අතින් කරකලා අරගෙන මව ඉස්සරහට හරවලා එයාගෙ ඇගට හේත්තු කරගෙන කනට ලං වුනා..

" උඹෙයි මගෙයි අන්තිම ස්පෝර්ට්ස් මීට් එක.."

රධ්‍ය අයියා කොලපාට නිල්පාට රතුපාට පොප් අවුට් වෙන ලයිට්ස් මැද්දෙන් දෙපැත්තට පැද්දෙද්දි මම බ්ලෙසර් එක අතට හිර කරගෙන තව ටිකක් රධ්‍ය අයියගෙ ඇගටම හිර වුනා.. කොහොම හිටියත් ගානක් නෑ.. මෙතන ඉන්න ඉඩ තිබ්බෙත් නෑ.. අනික කවුරුවත් හිටියේ හොද සිහියෙන් නෙමේ.. මම ඇගට හිර වෙද්දි රධ්‍ය අයියා මාව ඉණ වටෙන් අත දාලා ඇගට හිර කරගත්තා..

" Let's make it memorable.."

මම හිප් එක බීට් එකට මූව් කරද්දි රධ්‍ය අයියා මගේ ඉණෙන් අල්ලගෙන මම මූව් වෙන රිදම් එකටම හිප් එක thrust කරද්දී අපි දෙන්නම ඇති වෙනකල් නැටුවා.. අපි වගේ නටන උන් ඕනතරම් අපේ වටේ ඉදියා.. මේක බෝයි ස්කූල් එකක්.. කෙල්ලො නැනෙ ඇතිල්ලි ඇතිල්ලි නටන්න.. ඔක්කොම ඉන්නෙ කොල්ලොම විතරයි..

අන්තිමේ පැයක්ම නටන්න ඕන හැම නැටුමක්ම නටලා මම ආවෙ කකුල් දෙකත් පණ නැතුව මේන් ගේට් එක ගාවට.. අපි දෙන්නත් එක්ක ආපු අනිත් උන් මොන ලෝකෙද දන්නෙත් නෑ.. ආධ්‍ය අයියා කියාන් අයියා සෙනුකයා අයුක අයියා මහීශා මොකෙක්වත්ම නෑ.. මහීශා නම් කලින්ම ගෙදර යන්න ඇති.. දැන් රෑ වෙලානෙ..

" කෝ අනේ.."

@Shan

" ඉන්න බලන්න අයියට කෝල් එකක් ගමු.."

රධ්‍ය අයියා ෆෝන් එක කනේ ගහගෙන මගේ අතිනුත් ඇදගෙන පාකින් ලොට් එක පැත්තට ඇවිදගෙන ගියා..

මිම්.. එන්න අපි නටමු මිතුර..

රධ්‍ය තමා හොදටම කරන්නෙ බලන් යද්දි..

මම රූට තව එකක්දෙන්නත..

කමෙන්ට්ස් වලට මම රිප්ලයි කරන්නම් මගෙ සකල බූජන්ලා ඉඩ තියෙන වෙලාවක අනිවාරෙන්ම.. ඒ වුනාට මම ඒ හැම එකක්ම කියවන්නෙ හුගක් ආදරෙයි.. අනේ දෙයියනේ ආදරෙයි හැමෝටම කතාව කියවන.. මමත් ඔයාලා නිසා තමා හුගක් ආසාවෙන් කතාව ලියන්නෙ..

ස්පෝර්ට්ස්මීට්තුත් ඉවර වුනා.. රධ්‍යලටත් හරි ගියා.. එක ගලෙන් පොල් කාවයියො දෙන්නයි!!

එන්නාම්.. ලව් යූ.. ❤

ඕතරී පඩි දෙකකින් වැටිලා කොන්දයි අතයි ලෙප්ට් කරන් ඉන්නෙ.. නිවන් සුව පතන් යන්න.. ගෞරවයෙන් බුදුසරණයි!!

රූට රධ්‍ය : අතිනුත් අල්ලුවා..

නැටුවත් එක්කන්..

නින්ද යන්නෙත් නෑ වගේ අප්පා..

සින්දුවක්වත් අහමුද..

මට මොකක්ද මේ වෙලා තියෙන්නෙ..

අයියගෙන් බෙහෙතක්වත් ඉල්ලගන්නවද..

වරද් නටද්දි ලස්සනයි..

@Shan

ඉණෙනුත් ඇල්ලුවනෙ..

කවදාහරි මගෙනෙ..

ඇස්වහ කටවහ පුච්චගන්නෝන..

කෝල් එකක්වත් ගන්නවද.. පාන්දර දෙකට නිදි ඇති නෙ..

එයාට මහන්සිත් ඇති..

දොලහ වෙනකල්ම කෝල් කලානෙ..

පෙනඩෝල් දෙකක් බිව්වද දන්නෙ නෑ..

වරද් රට : අම්මේහ් ඇග රිදෙනවෝ..

පොඩ්ඩක් එන්නකෝ..

අම්මෙ පෙනඩෝල් එකාක්!!

අම්මෙ කකුල කැඩිලා වගේ..

හනේ ඇයි මම නැටුවෙ..

කොන්ද කැඩිලද මන්දා.

රඩ්‍ය අයියේහ්..

මාව හොස්පිටල් ගිහින් දාන්න අයියෝහ්..

රඩ්‍ය අයියෙ මගේ ඇග රිදෙනවා තවුසෙ ඇහැරිලද ඉන්නෙ..

කෝල් එක උස්සපා.....න්!!!

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

@Shan

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 32 කොටස

" දැන් ඉතින් ස්පෝර්ට්ස් මීට් තිබ්බා ඒවා ඉවරයි ළමයි.. ඔවා තිබ්බා කියලා දින්නා කියලා ඒ ලෙවෙල් පාස් වෙන්නෙ නැනෙ.. ඔය ළමයි දැන් ආයෙම පාඩම් වැඩ වලට අවධානය දෙන්න ඕන.. මම එක්සෑම් ටයිම් ටේබල් එක නෝටිස්බෝඩ් එකේ ඇලෙව්වා.. හැමෝම ඒක කොපි කරගන්න අනිවාරෙන්ම.."

ස්පෝර්ට්ස් මීට් තියලා ඉවරවුනත් එක්ක ඉස්කෝලෙට වැස්සක් වැහැලා පායලා වගේ.. අපි ආයෙමත් හිටියේ පෝමලින් ගඳ ගහන බයෝ ලැබ් එකේ අන්තිම පෝලිමට කලින් එකේ.. මම බයෝ මැඩම් දිහා බලන්නෙ නැතුව මගේ එහාපැත්තෙ කෙමිකල් එකක ඔබ්බලා තිබ්බ මිනිස් මොළය දිහා බලාගෙන ඉදියා.. කම්මැලී හොදටම..

මේ ටිකේ නටලා නටලා ආයෙම ඉස්කෝලෙ වැඩවලට ෆෝකස් වෙන එක ඇත්තෙන්ම අමාරුයි.. ඒ වුනාට ඒවා නොකර බෑනෙ.. අත්‍යාවශ්‍යම දේ ඒකනෙ.. මම නෙමේ රධ්‍ය අයියා කිව්වෙ.. මගේ එහාපැත්තෙ ඉදපු හශානයා තඩි ඇනුමක් යන්න ගිහින් ඒක හිරකරගෙන ඉදලා ඌ අඩලා වගේ ඇස් දෙකේ කදුලු.. මතීශයා හෝ ගාලා බයෝ රිසෝස් බුක් එක හයිලයිට් කරනවා.. සෙනුකයා පාට පාට පෑන් වලින් මොනවදෝ කියනවා.. මම මොලේ දිහා බලාගෙන ඉන්නවා.. බයෝ මැඩම් නම් කියවන එක සාපයක්.. හැමදාම එක පීරියඩ් එකක්ම කරන්නෙ අපිට බනින එක..

" දැන් අපි කතාකරමු පාකින්සන්ස් රෝගය ගැන.."

මේ මොළේ කාගෙද දන්නෙ නෑ නේද.. සමහරවිට මගේ ගිය ආත්මෙ වෙන්නත් බැරි නෑ. එහෙම වුනොත් මේක ඓතිහාසික හමුවීමක් තමයි.. ඒ කියන්නෙ මම දැන් මේ බලාගෙන ඉන්නෙ මගේ කලින් ආත්මෙ මොලේ දිහා.. ඒක පොඩ්ඩක් පොඩියි වගේනෙ..

" මේ රෝගය මොළයෙහි මධ්‍ය මොළය , පාදස්ත ගැංග්ලියා ඩෝපමයින් ස්නායු සම්ප්‍රේශක නිදහස් කරන නියුරෝනවල ක්‍රමික හායනයක් හා සම්බන්ධයි.."

@Shan

දැන් මේ මැඩම් ගත්තොත්.. අපිට මහ ලොකුවට උගන්නනවා පාකින්සන්ස් ලෙඩේ ගැන.. ඒ වුනාට ලෙඩේට බෙහෙත් තියෙද.. නෑ.. සුව කරන්න බෑ.. ඒ වුනාට අපි පාඩම් කරන්නෝන හෙන ගොඩක්.. මේකට සුව වෙන ලෙඩ ගැන විතරක් දැම්මනම් ඉවරනෙ..එතකොට ලියන කෙනත් සතුටින්.. කියවන අපේ බයෝ මැඩමුත් සතුටින්..

මම අපිට දැනට මාස හතරකට විතර කලින්ම ඉවර කරපු පාඩම දිහා බලන් ඉදියා.. මම මේක පාඩම් කල්ලනෙ තියෙන්නෙ.. ඒ මදිවට ඊයෙ රෑ එකොළහට විතර අර ගැටපොලොස් කොට්ටෝරුවට කෝල් එකක් අරගෙන සරල අනුවර්තීය චලිතය ගැන ප්‍රශ්නයක් අහන්න ගිහින් ඒකගෙන් මහා පරිමානෙන් බැනුම් අහලා දේශනේකට සවන් දෙන්නත් වුනානෙ.. ඌ නම් කියයි.. ඒකා ඉතින් මැත්ස් කරපු එකානෙ.. අනික ඒකත් සිංහල මීඩියමුත් නෙමෙයි.. මම ඌට මගේ ප්‍රශ්නෙ සිංහලෙනුත් කියලා ඒක ඉංග්‍රීසියට ට්‍රාන්ස්ලේට් කරන්නත් ඕන.. හරි මගුලක් තමයි ඒක.. ඌ දැනගන්න එපැයි සිංහල තේරුම..

දන්නෙ මොනවද වරද් උඹ හරියට පාඩම් කල්ලා නෑ , බලපන් මේවා හරි සරල දේවල් , නට නට ඉදපන්.. යැයි යැයි ඔච්චර තමා දන්නෙ අපෙ අම්මා වගේ කියවන්න.. ඒකා මට එදා ස්පෝර්ට්ස් මීට් එක ඉවරවෙලා ඩිනර් එකට කේෆ්සී ගිය වෙලාවෙ අර සේරම ඉස්සරහා මට අපහස කලා මට මගේ නම වස් වැදිලා කියලා..

වරද් කියන්නෙ හැමතිස්සෙම මම වැරදි විතරලු කරන්නෙ.. උද්යෝග කියලා තියෙන නිසාම උද්යෝගෙ වැඩි වෙලා නැටිල්ල වැඩිලු.. ඌටත් මම නටද්දි නටන්න හොදයි.. අන්තිමට මම තමයි වැරදිකාරයා වෙලා තියෙන්නෙ.. ඉදපන්කො රධ්‍ය අයියෙ මම උඹ එක්ක යාලුවෙන දවසක් එයිනෙ.. මම එදාට තවුසෙගෙ ඔලුව කනවා.. කාලා කාලා ඉවරයක්ම කල්ලා දානවා.. තවුසෙ ලොකු වරදක් තමා කර ගහගත්තෙ..

මම රධ්‍ය අයියා එක්ක තරහට ලැබ් මේසෙ සෙනුකයා කවකට්ටෙන් කොටපු එස් ධන ඒ සමීකරනය කරෙක්ශන් පෙන් එකෙන් මකලා එතන බ'නූලි මූලධර්මය කෙටුවා.. පරයට සමීකරන හදන්න.. ආස ඇති.. රධ්‍ය අයියා කියනෝ වගේ ඉගනගන්න කාලෙ ඉගනගන්න ඕන..

" ළමයි හින්නෝන්මාදය කියන්නෙ සැබෑ තත්ත්ව වලට වඩා විකෘති වුනු සංජානනයෙන් යුක්ත ලාක්ශණික මනෝ ව්‍යාධික කතාංගයන්ගෙන් යුක්ත

@Shan

බරපතළ මානසික බාධාකාරි තත්ත්වයක්.."

මේ බයෝ මැඩම් කරන්නෙ තනිකර බොරුවනෙ.. යකෝ අපි ළගත් පොත් තියෙනවා.. බොරුවට පොතේ තියෙන ඒවම කියවනවා ඇලපිල්ලක් ඉස්පිල්ලක් අඩු නැතුව එහෙම්මම.. කලින් කිව්වනම් ඉවරනෙ ළමයි රිසෝස් බුක් එක කියවගන්න කියලා.. එහෙමවුනානම් අපි පන්තියට වෙලා ඒක කියවගන්නවනෙ.. හැමතැනම මුළාව තමා තියෙන්නෙ..

මම ස්ටිකී නෝට් එකක් අරගෙන රධ්‍ය අයියට පෙම් හසුනක් ලියන්න ගත්තා..

" මම පූසෙක් හු#තො.."

ලොකු අකුරෙන් ලියලා දෙපැත්තෙන් පූසොන්ගෙ රැවුලකුත් ඇන්දා.. යද්දි හම්බුනොත් මේක පිටේ ගහගෙන යන්න ඕන.. ඌ ටිකක් බළලෙක් වගෙත් තමයි.. ඔය පොඩ්ඩක් බැන්නහම මක් වෙනවද.. මේක පිට මැද්දෙම ගහන්න ඕන.. කලින් දවසෙ මම පොල් කොළ තුනක් එකට ගොතලා උගේ කලිසමේ ගැහුවා කියලා මේකා මගේ පිට මැද්දටම හයියෙන් ගැහුවනෙ.. කමක් නෑ ඒ වුනාට එදා ඒක වන වනනෙ අපිට ස්කොඩ් එක පුරුදු කලේ.. හරිම ලස්සනයි.. කහපාට පොල් කොළයයි කොල පාට පොල් කොල දෙකයි ගෙතුවහම හරිම හැඩැයි.. රධ්‍ය අයියා යද්දි ඒක දෙපැත්තට වැනෙනවා..

ඒ වුනාට කියාන් අයියා කිව්වා වගේ වද දෙන එකෙත් සීමාවක් තියාගන්න ඕන.. රධ්‍ය අයියා ඔය බැන්නට ගැහැව්වට එහෙම කේන්තියට බනින්නෙ ගහන්නෙ නැහැනෙ.. කියාන් අයියා ගැන කියද්දි මතක් වෙන්නෙම ග්‍රීක දේවතාවිට මද කිපිච්ච එකමයි.. කියාන් අයියත් මාර කැලි තමා ලයින් කරන්නෙ.. මම ලගදි ඌට අහකට පලයන් වනරයා කියලා බැනුමකුත් ඇහුවා.. පස්සෙ ආයෙ ආයෙ ඒකම කියද්දි දැන් ඌට ගානක් නෑ.. අනේ මට වැඩක් නැනෙ ඔය කවුරුත්ම ගැන.. මට ඉන්නෙ ගැටපොලොස් කොට්ටෝරුවෙක්..

මේකා නැතුව පාලුයිත් වගේ.. කලින් මාසෙම ලග ඉදියනෙ.. දැන් හම්බෙන්න වෙන්නෙත් නෑ.. දුක හිතෙනවා.. මම දුකා සෙනුකයා හදපු තව එස් ධන ඒ සමීකරණයක් උඩින් අත තියාගෙන ඩෙස්ක් එකට ඔලුව ගහගත්තා.. වම්රුවා පාට පාට ලියුම් දෙන එක නතර කල්ලා දැන් නම් මූනට හම්බුනත් හැරිලා යනවා.. මොකද මන්දා.. මම දැක්කොත් බලන්නෙ

@Shan

නෑ මූන හංගගෙන ඉන්නෙ.. රධ්‍ය අයියා දිහා බලන්නෙත් නෑ.. මුන් මට මොකියා මොකුත් කිව්වද දන්නෙ නෑ.. හොද වැඩේ සක්කිලි පරෙයියට..

මම ඉන්ටවල් එකේ ප්‍රිෆෙක්ට් රූම් එකට සෙනුකයා එක්ක ගිහින් බෙල්ල දාද්දි රධ්‍ය අයියා ඉන්නවා හොරාට බැග් එක අස්සෙ දමාගෙන ෆෝන් එක ඔබ ඔබ.. මම ඉක්මනට ගිහින් ෆෝන් එක ඇදලා එළියට ගත්තා.. හොරාට මොනවා බලනවද දන්නෙ නෑ.. මම ෆෝන් එක අරන් බලද්දි ,

**"Saranghae! saranghandago! saranghandanikka! jinjja neomu neomu saranghae!"**

ෆෝන් එකේ ප්ලේ වෙවී තිබ්බ ඩ්‍රාමා එකේ කවුදෝ මන්දා තොප්පියක් දාගත්තු කෙල්ලෙක් ඇස් හීනි කොල්ලෙක්ට කුණුහර්පයක්ද කොහෙද කියලා බනිනවා..කොල්ලා බයවෙලා දුවනවා.. ගෑනු ඔහොම්මමයි.. දන්නෙ කෑ ගහන්න විතරනෙ..

" ඒ ෆෝන් එක දීපන්.."

මම රධ්‍ය අයියගෙ එහාපැත්තෙන් වාඩිවෙලා ඩ්‍රාමා එක දිහා බලාගෙන හිටියා.. මෙකා කොරියන් ඩ්‍රාමා බලනවද.. මමත් ආසයි.. ඒ වුනාට වෙලාවක් නෑනෙ.. මගේ පලවෙනි කොරියන් ක්‍රශ් එක අර ෆුල් හවුස් එකේ Kom sema-ri-ga ,Han chi-be-yi-so, Appa gom Omma gom Ae-gi gom කියලා සින්දුවක් කියන කෙල්ල..

" මේ මොකක්ද.."

" ඩ්‍රාමා එකක්.. ඒක ලස්සනයි ඕයි.."

" මොකක්ද නම.."

"  It's Okay to Not Be Okay.."

" එහෙමද.. මම බලලා තියෙනවා mister queen ඒකත් මරු නේ.."

" ඔව් මට ඒක බලද්දි උඹ මතක් උනා.. උඹත් ඒකෙ අගබිසව වගේ හෙන මොංගල් නෙ.."

@Shan

" අනේ මේ පලයං අයියෙ.. එහෙම බලද්දි උඹත් අර රජා වගේ.. *නෝ ටචින්*.."

මම රධ්‍ය අයියට හිනාවෙලා පිටට එකක් ගහන මුවාවෙන් ශේප් එකේ අර කොලේ පිටේ ඇලෙව්වහම පොරට මතක නෑ මම ඇගට අත තිබ්බද කියලා.. මම ශේප් එකේ රධ්‍ය අයියගෙ මූණටත් තට්ටුවක් දාගෙන ක්ලාස් එකට දිව්වා..

මම ක්ලාස් එකට එද්දී මනීශයා ඉදියෙ සෙනුකයට බනින ගමන්.. මම යද්දිම මනීශයා හෙන අප්පිරිය විදියට මගේ දිහාත් බලලා සෙනුකයා දිහාත් බලලා මේසෙට මිට මොලවලා ගහගෙන පන්තියෙන් යන්න ගියහම හශානයක් ඒ පස්සෙන්ම ගියා.. සෙනුකයා අඩන්න වගේ රතුම රතු වෙලා.. මෙකා ඇස්වල කඳුලු පුරවගෙන.. මම සෙනුකයට කතාකරන්න යද්දිම සෙනුකයා මගේ උරහිසට වරුවෙලා ඉකි ගගහා අඩන්න ගත්තා..

මම නැති ටිකට මොකද වුනේ.. මූ මොකද අඩන්නෙ??

ටංට ටාං.. මගේ සකලයෝ ටික මම ආවා..

අනාව් ඉතිම් බදගෙන උම්මා එකක් දෙන්න හිතෙනවානෙ..

හැයි සෙනුක පුම්තා කඳුලු හලන්නෙ..

එන්නාම්.. දිග එකක් ඇරන්.. ඔයාල දිග එව්වට ආසනෙ.. අර කියලා තිබ්බෙ එක වැප්ටරේක..

ලව් යූ .❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

@Shan

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 33 කොටස

" මොකක්ද ඌ කියනවා කියන්නෙ සෙනුකයා.."

අපි වාඩිවෙලා ඉන්නෙ පන්තියෙ අන්තිම පෝළිමේ නිසා වැඩිය අනිත් උන්ගෙ අවධානෙ අපි ඉන්න පැත්තට නෑ.. පිසික්ස් මැඩම් එනකල් මම සෙනුකයට නාඩා ඉන්න කියලා වෙච්ච දේ ඇහුවා.. මතීශයා තාම ඇවිත් හිටියේ නෑ පන්තියට.. ඌ ගියා ගියාමයි.. ඒ වුනාට මට බයයි.. මුන් දෙන්නා මොකක් කරගෙනද දන්නෙ නෑ..

" උන් මහ හු#න කතාවක්නෙ ෂනෙරුවා කියන්නෙ.."

" මොකක්ද.."

" බං මම ලයිබ්‍රි එකට යන්න පන්තියෙන් එළියට ගියහම මතීශයයි හශානයයි එළියෙදි මාව හම්බෙලා මගෙන් අහනව කොල්ලොන්ටද කැමති කියලා.. ඊටපස්සෙ කියනවා උන්ට ලැජ්ජ කරන්නෙ නැතුව ඉන්නලු.."

" ඇයි උන්ට ලැජ්ජ ඉතින්.. අපි මහපාරෙ හෙළුවෙන් ගියේ නැනෙ බං.."

" දන්නෑ බං.. ඔය එන්නෙ කියද්දි.."

සෙනුකයා තව මොනවහරි කියන්න හදද්දිම ගියපු උන් දෙන්නා පන්තියට එද්දි සෙනුකයා අහක බලාගත්තා.. ඇයි අපි අහක බලාගන්නෙ.. ඒක හරි මගුලක්නෙ.. කාටවත් බයේද අපි ජීවත් වෙන්නෝන..

" ෂනෙරු අහකට පලයන්.. උඹලා වගේ උන් එක්ක මෙච්චරකල් ඉදපු අපිට ගහන්න ඕන.."

මතීශයා මාව පිටිපස්සට තල්ලු කල්ලා උන්ගෙ බෑග් දෙක අරගෙන පන්තියෙ වෙන තැනකට ගියා.. මුන් දෙන්නගෙ මෙ නාඩගම නිසා පන්තියෙ උන් හැරි හැරි අපි දිහා බලනවා.. ඒ වුනාට මම එක එකාගෙන වැරැද්දක් නොකර ලොකුකම් බලන්න ඕන නැනෙ.. මම මෙච්චර කාලෙකට එහෙම එක එකාට පාච්චල් වෙලා නෑ ඉස්කෝලෙ..

@Shan

" මොකක්ද හශාන් උඹ කියන්නෙ.. ප්‍රශ්නයක් තියනවනම් මූණට කියපන්.. වටෙන් හු#න්නෙ නැතුව.."

" වටෙන් හු#න්නෙ කවුද අපි දන්නෙ නෑ.. ඒ වුනාට උඹලා වගේ හෙන මල් පො#නයො එක්ක අපිට ඔතන ඉන්න බෑ.."

මතීශ කිව්ව බලු කතාවට මට මල පැන්නා.. මෙච්චර කාලෙකට ඔහොම ජරා කතා අපි මොකෙක්ගෙන්වත් අහලා නෑ.. අනික සෙනුකයයි මමයි පාඩුවෙ ඉන්නෙ.. උන්ගෙ ඔලුව උඩ අපි නැගගෙන හිටියෙ නැනෙ..

" මොකක්ද පකයො උඹ කිව්වෙ.. ආයෙත් කියපන් බලන්න.."

මට ආපු කේන්තියට මම මතීශයගෙ කොලර් එකෙන් ඇදලා අරගෙන බිත්තියට දමලා ගැහුවා.. මගේ ඇගේ ලේ උණු වෙලා වගේ.. ඇග ගිනිගන්නවා වගේ එන කේන්තියට, ආවෙගෙට.. මට මූව මරන්න හිතයි.. අපි දෙන්නගෙම බැනගැනිල්ලට මුළු පන්තියම කලබල වෙලා අපි දිහා බැලුවා..

" උඹ කාගෙ හයියක් අරගෙනද බල්ලො මගේ ඇගට අත තියන්නෙ.."

මතීශයා අත මිට මොළවලා මගේ මූණට ගහද්දී මගේ ඇස් දෙකත් නිලංකාර වෙලා ගියා.. ඒ වුනාට මමත් අනිත්පැත්තට කකුල නවලා උගේ බඩට ගහපු පාරෙන් ඌ බිමට නැමුනහම මම ඌට බිම දාගෙන එක කකුලකින් උගෙ අතත් පාගගෙන මූනට ගහගෙන ගහගෙන යද්දි පන්තියේ උන් දුවලා ඇවිල්ලා මාව අල්ලගත්තා..

" අතෑරපන් සෙනුකයා.."

" හහ්.. ඇයි උඹට අමාරු ෂනෙරු.. උඹත් හෙඩ් ප්‍රිෆෙක්ට්ට රෙද්ද උස්සන් ගියාද.. ආ සොරි.. කලිසම පාත් කරන්න ගියාද.."

මතීශයා මුළු මූනම නිල් කරගෙන, මගේ මූණටම නැහැදිච්ච කතා කියද්දි පන්තියේ උන් මේ මෙලෝ මගුලක් දන්නෙ නැතුව බයවෙලා වගේ අහගෙන හිටියා.. මට ලැජ්ජයි.. කේන්තියි.. අවුරුදු හයක් මේ ඉස්කෝලෙ ඉදියා මෙහෙම දේවල් කලින් වෙලා නෑ.. අනික් මතීශයා වගේ සයිලන්ට් පොරක් මෙහෙම කුණු කතා කියයි කියලා මම ජීවිතේට බලාපොරොත්තු වුනේ නෑ.. මනුස්සයො පිටතින් මනින්න බෑ.. මමයි උන්ට ලස්සන චරිත

@Shan

මචාගෙන ඒවා හිතින් නඩත්තු කල්ලා තියෙන්නෙ.. බලද්දි මුන් ඔක්කොන්ටම වඩා අන්ත සක්කිලිනෙ..

" මම කාට කලිසම පාත් කරත් උඹට ගායද මතීශ.. ඕන්නං උඹ අරහෙන් දෙකට නැමිලා කලිසම පාත් කරපන්.. මම උඹෙ අමාරුව හොඳකරන්නම්.."

" ඇයි උඹ හිතුවට අපිටත් උඹලට වගේ අසහනේ කියලා.. කොලුකාර හැත්ත.. ඉස්කෝලෙටත් ලැජ්ජ කරනවා.."

" මතීශ!!!!!!!!!"

මම සෙනුකයගෙ අත ගසලා ආයෙම මතීශයව ඇදගෙන ගිහින් බිත්තියට තියලා තද කල්ලා ගේ ඔලුව බිත්තියෙ හප්පගෙන හප්පගෙන ගියා.. මාව වෙවුලනවා.. මට මූ මෙතන මැරිලා ගියත් කමක් නෑ..

මතීශයත් නිකම් ඉදියේ නෑ මගේ බෙල්ලෙ පැත්තක් උගේ නියපොතු වලට හූරගෙන ඉදියා.. බෙල්ල හිරවෙද්දි මට කැස්සක් ඇවිත් හුස්මගන්න අමාරු වුනා.. ඒ එක්කම මතීශයා මගේ බෙල්ලෙන් අල්ලලා බිමට තල්ලු කරලා පයින් මගේ බඩට ගැහුවා.. ඒ පාර මට මුළු ඇගම හිරිවැටීගෙන ඇගේ එක පැත්තක් පණ නැතුව කලන්තෙට ආවා.. ඒ තරමට ඒ පාර සැරයි.. මතීශයගෙ ඔලුවෙන් ලේ එනවා.. මගේ බෙල්ලෙන් ලේ එනවා.. ශර්ට් කොලර් එක තැනින් තැන රතුපාට වෙලා.. පන්තියේ උන් ඔක්කොම බයවෙලා වගේ බලාගෙන ඉදියා මිසක් අපි ගාවට කිට්ටු වුනේ නෑ..

" මොකක්ද මේ කාලගෝට්ටිය ළමයි.."

" ඒ ඒ තමුසෙලා මොකක්ද මේ කරන්නෙ.. ආ.. නවත්තපන් ඕක.."

මට ලාවට ඇහුනේ කියාන් අයියගෙයි සයෝන් අයියගෙයි කටහඬ.. මම අමාරුවෙන් වාරු අරගෙන කොහොම හරි නැගිටගත්තා.. නැගිටලා ලග තිබ්බ පුටුවක් අල්ලගත්තා.. මට පණක් තිබ්බනම් අම්මපා මම මේ පුටුවෙන් මතීශට ගහනවා ඌ මැරුණත් මට කමක් නෑ.. ආයෙ උගෙයි මගෙයි කිසිම ඇයි හොඳැයියක් නෑ.. මම අපේ යාලුකම මෙතෙන්දි මේ මොහොතම මම හිතින්ම අයින් කල්ලා දැම්මා..

" ෂනෙරු!! මොනවද මේ තමුසෙලා කරන්නෙ ආ.. ඉස්කෝලෙ මෙහෙම පිස්සු කෙලින්න උඹලට මේක නාඩගම් මඩුවක් වගේ පේනවද.."

@Shan

කියාන් අයියා මගෙයි මතීශගෙයි මැද්දට ඇවිල්ලා කෑ ගහද්දි සයෝන් අයියා පන්තියෙ අනිත් ළමයි වාඩි කරවලා උන්ට උන්ගෙ වැඩක් බලාගන්න කිව්වා..

" එළියට වරෙන්.. දෙන්නම වරෙන්.."

කියාන් අයියා මට රවලා මතීශයට සැරෙන් කතාකරද්දි මම උඩට ආපු ශර්ට් එක යට කරගෙන කට ලග දැවිල්ලට දැනෙන ටිතැන අතින් පිහිදගත්තා.. කම්මුල පුපුරු ගහනවා..

" ඔෆිස් එකට පලයන්.. දැන්මම.. උඹලා මෙතන මරාගන්නවා මොක්කුද වගේ.. මේක ඉස්කෝලයක් කියලා තේරෙන්නැද්ද.. ආ.. වරෙන්.."

කියාන් අයියට මල පැනලද කොහෙද අපිට ඔෆිස් එකට එන්න කියාගෙනම ඌ ඉස්සරහින් ගියා.. මම මතීශයා එනකල් ඉන්නෙ නැතුව ඔෆිස් එක පැත්තට ගියා.. මම වැරැද්දක් කලේ නෑනෙ.. එක එකාගෙන් ගුටි කන්න.. මම ගිහින් විනාඩි දහයකින් විතර මතීශත් ඔෆිස් එකට ආවා.. මගේ කරුමෙටම අද ඔෆිස් එකේ ප්‍රින්සිපල් ඔෆිස් එකේ ඉන්න දවසක්.. ඩිපියුටි ප්‍රින්සිපල් කෙනෙක්නම් කමක් නෑ.. විනය භාර සරුත් ඔෆිස් එකේ හිටියා.. අද නම් මොන කරුමක්කාර දවසක්ද කියන්න මම දන්නෙ නෑ.. කියාන් අයියා රණ්ඩුව ගැන කියද්දි විනයභාර සර් මගේ දිහා එක එල්ලේ බලාගෙන ඉදියා.. මම අත් දෙකත් පිටිපස්සට බැදගෙන බිම බලාගෙනම හිටියා.. අම්මට එන්න කියාවිද.. එහෙම වුනොත් නම් මට මැරුම් කන්න තමයි වෙන්නෙ.. ඊටපස්සෙ පවුලෙ උන්ගෙන් මට කුණුකතා අහලා ඉවරයක් නැතිවෙයි.. අනික මමත් පැටලුනේ අහක යන ලබ්බකනෙ... ඒ වුනාට මගේ වැරැද්දක් නෑනෙ ඌ ජරා කතා කිව්වෙ මට විතරක් නෙමෙයිනෙ.. සෙනුකයටත් කිව්වනෙ.. එහෙම උන්ගෙන් බලු කතා අහන්න අපි උන්ගෙන් ඇදලා කාලා හිටියෙ නෑනෙ..

අනික මට හිතට දුක උන් ාපේ ලගම යාලුවො නිසා.. මෙච්චර දවසක් එකට එක බත් පත ලිහාගෙන කාපු උන්ම මට මෙහෙම කරයි කියලා මම ජීවිතේට හිතුවෙ නෑ.. මතීශයා හිටියේ කොහොමද.. දහයට ගනින්න බැරි එකා වගේ.. ඌ මාත් එක්ක අවුල් වුනේ අපේ හවුස් එක නිසා කියලා මට කලින් සෙනුකයා කිව්වත් මම හිතුවෙ නෑ මූට මාත් එක්ක මෙච්චර ඉරිසියාවක් ඇති කියලා.. අනික අයුක අයියෙක් කොහොම ඒ කතාව අස්සට ඇදිලා ආවද මම දන්නෙ නෑ.. සමහරවිට ඌට රණ්ඩුවක්

@Shan

අල්ලගන්න හේතුවක් නැති නිසා සෙනුකයට බලු කතාවක් ක්වවද දන්නෙ නෑ.. මම දැනුවත්ව මුන් න්දෙන්නා ප්‍රසිද්දියෙ අනම් මනම් කරන්නෙ නෑ.. හුගක් වෙලාවට නිකම් කතාබහ කරනවා විතරයි.. මට බයයි.. මට මොනවගේ කතාවක් හැදෙයිද මම දන්නෙ නෑ.. කොළඹ ඉස්කෝලෙක වෙලත් මෙවගෙ මිනිස්සුන්ට තියෙන්නෙත් එක එක මානසිකත්ව.. මම දන්නෙ නෑ මිනිස්සු මේවා කොහොම පිලිගනීද කියලා.. ජීවිතේ පලවෙනි පාරට මට මමයි රධ්‍ය අයියා ගැනයි මහ අවිනිශ්චිත හැගීමක් දැනෙන්න ගත්තා.. මේවා කවදහරි කෙරෙන දේවල්ද කියලා හිතුනා.. මෙහෙම ප්‍රශ්න වලට මූණ දෙන්න පුලුවන් වෙයිද කියලා හිතුනා..

කොටින්ම මට තේරුනා මම සෙල්ලම්කරන්න හදන්නෙ ගින්දරත් එක්ක කියලා.. මේකෙ අන්තිමට ඌවත් පිච්චිලා මාවත් පිච්චිලා අපිට අපිව නැත්තටම නැතිවෙලා මගේ ජීවිතෙත් මට නැතිවෙයිද කියලා මට හිතුනා.. මට ජීවිතේ ගැන ආයෙම දැනෙන්න ගත්තෙ පට්ටම කලකිරීමක්.. මම සතුටින් ඉදියා විතරයි.. මගේ ජීවිතේට එන එක ලබ්බක්වත් හැමදාම නවතින්නෙ නෑ.. ඔක්කොම සතුට සැනසීම තාවකාලිකයි.. ටික කාලයක් ඉදලා ආයෙම මට නැගිටින්නවත් බැරි පල්ලමකට මාව ඇදලා දාලා යන්නම යනවා..

" උද්යෝග!! මොකක්ද මෙතන සිද්ධ වුනේ.. මේ දරුවා මෙහෙම දේවල් වලට පැටලිලා මම දැකලම නෑ..??"

ප්‍රින්සිපල් සර්ට මාව මීටර් ඇති.. පොඩිකාලෙ පන්තිවල මම ර්පෝට් කාඩ් එක ගන්න ස්ටේජ් එකට නගිද්දි සර් මගේ පිටට තට්ටුවක් දාලා හොදයි කියනවා.. කලර්ස් නයිට් වල මෙඩල්ස් ගද්දි සර්ට මාව නෝට්.. එකක නෙමෙයි හැම මගුලකම මම ඉන්න නිසා ඉස්කෝලෙ හැමෝම මාව දන්නවා.. කොහෙ ගියත් මම බාහිර වැඩවලට දක්ෂ නිසා මට තැනක් තියෙනවා.. ප්‍රින්සිපල් සර් කිව්ව කතාව ඇත්ත කියන්න වගේ විනය භාර සරුත් ඔලුව වනලා මතීශ දිහා බලාගෙන හිටියා.. කියාන් අයියත් හිටියේ බයෙන් වගේ.. ඌ ඉතින් මොනව කරන්න.. ඌ කරන්නෙ උගේ ඩියුටියනෙ..

" උද්යෝග!! What is the reason for this fight??.."

මම ඔලුව උස්සලා මතීශ දිහා බලාගෙන හිටියා.. මම මොකද කියන්නෙ.. ඇත්තම කියනවද.. මම වැරද්දක් කරලා නැනෙ.. කලේ නෑ.. මම මොකෙක්

@Shan

එක්කවත් යාලුවෙලා හන්දි ගානෙ සංසර්ගෙ යෙදුනෙ නැනෙ.. උන් එච්චර බලු කතා කියන්න මම වේසකමේ ගියේ නැනෙ.. අනික එක එකාට බයේ ජීවත් වෙන්න බැනෙ..

" Sir, we were talking in the class.. then Mateesha came there and insulted us very badly in front of everyone.. when I spoke about it, he started fighting with me.."

" What did he insult you by saying..??"

මම මතීශ දිහා බලද්දි ඌ බයවෙලා වගේ බිම බලාගෙන ඉදියා.. උගේ කටේ හයිය කොහෙද දන්නෙ නෑ.. බොරුකාර හැත්ත..

" He insulted us saying that we are gays.. He scolded us in front of everyone that we were behaving badly in school and therefore it was a shame for them to be with us.."

" What..???!! Is this true??? Matheesha.."

විනය භාර සර් කන්නාඩි දෙකත් ගලවලා මතීශැන් අහද්දි ඌ ඇගිලි එකට පටලගෙන බයෙන් බිම බලාගෙන හීටියා.. ඌ හරියටම දන්නෙත් නැතුව මොකටද අපිට බලු කතා කිව්වෙ.. ඇයි ඌ සාක්ශි තියෙනවා කියලා මවන්නද.. ඌට කරගන්න පුලුවන් ලබ්බක් නෑ..

" Sorry sir.."

" Sorry?? Is it okay to say I'm sorry? Are

**you**

taught in school to insult other people's characters and hit them like this? Be ashamed of yourself.. Learn to behave like a man.."

සර් මතීශට බැනලා මගේ පැත්ත හැරුනා..

" Udyoga.. You should also know not to fight like this.. If he says something that will damage your character again, tell section coordinator or class teacher.. You are a bright student in school.. I don't like this

@Shan

behavior.. If something like this happens again in the school, I will complain to your parents about this.. Remember well.. Don't talk unnecessary things in school.. Go to classes now.."

" Ok sir, excuse me.."

මම ඔලුව නමාගෙන ඔෆිස් එකෙන් එළියට ඇවිත් පන්තියට ගියා.. පන්තියෙ මැඩම් කෙනෙක් හිටියේ නැති නිසා මම කෙලින්ම අන්තිම පෝලිමට ගිහින් ඩෙස්ක් එකේ ඔලුව තියාගත්තා.. සෙනුකයා හිටියෙත් නෑ.. පතියේ ළමයි මං දිහා අමුතු සතෙක් දිහා වගේ බලාගෙන හිටියා මම දැක්කා.. ඒ වුනාට දැන් මට හිතට අමාරුයි.. මගෙම ලඟ ඉදපු එකෙක් මට මෙහෙම කරද්දි මට හිහ රිදුනා.. එක පැත්තකින් රධ්‍ය අයියගෙ ප්‍රශ්නෙ.. ප්‍රින්සිපල් සර් මොනවා හිතුවද දන්නෙ නෑ.. මූණට හොඳින් කතාකලාට හිතට සැකයක්වත් ආවද දන්නෙ නෑ.. ඒ වුනත් මම වැරැද්දක් කල්ලා නැනෙ.. මම හැමතිස්සෙම මටම, මම වැරද්දක් කරලා නෑ කියාගෙන හිත හදාගන්න ට්‍රයි කලා..

" ෂනෙරුවා.. මේ අහපන්.. මම දන්නෙ නෑ උඹලා අතරෙ තියන ප්‍රශ්න. ඒ වුනාට අපි දන්නවා උඹ ප්‍රශ්න වල පැටලෙන එකෙක් නෙමේ.. මහීශයලා එක්ක ආයෙ කතාවක් තියාගන්න එපා.. උඹ ගැන අපි මොකුත් හිතන්නෙ නෑ.."

ක්ලාස් මොනිටර් ඇවිත් මට පේපර් සර්වියට් එකක් දීලා ඔලුවට තට්ටුවක් දාගෙන ගියා.. සමහර වෙලාවල් වලට අපි හිතන්නෙ නැති අඳුරන්නෙ නැති මිනිස්සු වුනත් අහම්බෙන් හිතට සැනසීමක් ගේනවා.. මට එහෙම එකෙක් අපේ පන්තියේ ඉන්න එක ගැන සතුටක් දැනුනා..

" මහීශ.. උඹෙයි මගෙයි යාළුකම මෙතනින් ඉවරයි.."

මම හිතින් මටම කියාගෙන තොලේ පැත්තකට පේපර් ටිශූ එක තද කරගෙන ආයෙම ඩෙස්ක් එකට ඔලුව තියාගත්තා.. මගෙයි වැරැද්ද.. මින්ස්සු ඕනවට වඩා හොඳ කරගෙන ඉන්නවට..

හායි මගෙ සකලයො ටික.. කොහොමද සප්ටලම්ලා..

මහීශ වගේ මිනිස්සු පරිස්සමින් ආස්‍රේ කොරන්න.. පෞද්ගලිකව මට ඉන්නෙත් ඕහොම යාලුවො තමා බහුතරයක්.. තුන් හතරදෙනයි ඉන්නෙ

@Shan

මගෙම කියලා විශ්වාස කරන්න පුලුවන්.. හුගක් උන් මූණට හොදට කතාකරල්ලා තැන තැන බනිනවා.. එහෙම උන්ට.. රැස්පැක්ට්!! ආතරෙයි.. 😂❤

කතාව මොකක් වෙයිද.. වරද් රධ්‍යට මොනවා කියයිද..

එන්නාම්.. ලව් යූ ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 34 කොටස

පිසික්ස් මැඩම් පන්තියට ඇවිත් උගන්නන්න පටන් ගද්දිත් සෙනුකයා පන්තියට ආවෙ නෑ.. ඌ අවුලෙන් ඇති.. සමහරවිට අයුක අයියව හොයාගෙන යන්නත් ඇති.. මම මැඩම් ක්ලාස් එකට ආවට පස්සෙ ඔලුව උස්සලා වැඩ කලා.. ක්ලාස් මොනිටර් ප්ලාස්ටර් එකක් උස්සගෙන ඇවිත් මගේ කම්මුල ලග පැලිලා තිබ්බ එකට ඒක දාලා බෙටඩීන් වලින් පොගවපු පුළුන් කැල්ලකින් මගේ බෙල්ල ලග පිහිදාලා ෂර්ට් එකේ ගෑවිලා තිබ්බ ලේ පැල්ලනුත් මැකුවා.. ඌ හෙන හොඳ එකා.. ලොකුවට අපි අතරෙ කතාබහක් නොවුනත් උවමනා ඕනම වෙලාවක ඌ පන්තියේ ඕනම එකෙක්ට උදව් කලා..

එක අතකින් මෙහෙම වෙච්ච එකත් හොදයි කියලා හිතෙනවා.. ආයෙම ඌ මගේ මූණට මොකුත් කියන එකක් නැනෙ..තැන තැන නම් කියයි.. කමක් නෑ මට ඔවා ඇහෙන්නෙත් නැනෙ.. ඉස්කෝලෙ අන්තිම අවුරුද්දේ නිකම් අහක තියන හූනියම් ගොඩ දාගන්න ඕන නෑ.. පාඩම් වැඩ ටික කරගෙන පාඩුවෙ හිටියනම් හරි.. ඔහොම උන් හැලිලා යන එකමයි හොඳ.. තව කාලයක් හිටියනම් අපිත් නයි මල්ලෙ දාගෙන කිරි පොව පොව ඉදී..

අන්තිම පීරියඩ් පිසික්ස් මැඩම් උගන්නලා ඉවරවෙලා ගිහින් ගාතා කියලා ඉවරවුනු ගමන්ම මම බෑග් එකත් උස්සගෙන ඉස්සරහ ගේට්ටුව පැත්තට ගියා.. රධ්‍ය අයියා ඇති බලාගෙන.. ඒ වුනාට මට අද එයා එක්ක කතාකරන්න බෑ.. එක අතකින් මට ලැජ්ජයි මම හැසිරුනු විදිය ගැන.. එයා මං ගැන මොනවා හිතුවද මම දන්නෙ නෑ.. මම හෙන චාටර් චරිතයක් කියලා හිතුවද දන්නෙ නෑ.. අනික මම රධ්‍ය අයියා එක්ක දැන් ඉන්න කිසිම හේතුවක් නැනෙ ඉස්කෝලෙ.. කලින් නම් කමක් නෑ ස්පෝර්ට්ස් මීට් කියන්න පුලුවන්.. දැන් එහෙමත් නෙමෙයිනෙ.. ඉතින් ලමයින්ට කතා හදන්න බැරිද.. මතීශ අයුක අයියව අල්ලලා මට බලු කතාවක් කිව්ව එකේ වැඩිය උන් එක්ක ඉන්න ගිහින් මාව බඩුවක් කියලා අනිත් වතාවෙ කියයි..

ඔවා හිතලා හිතලා මට මහන්සී.. හවස ක්ලාස් නොයා මම ගෙදර යන්න හිතාගත්තා.. සෙනුකයා හිටියෙත් නෑ.. අනික දැන් අද ඉදියා කියලා මොලේට කිසි දෙයක් යන්නෙ නෑ.. මම ඕක ගැනම හිත හිත ඉදී.. ඊට හොදයි ගෙදර ගිහින් අම්මා හදපු මක්කාවත් කාලා ගෙදර ඉදන් පාඩමක් බලාගන්නවා..

@Shan

මම ඉස්සරහ ගේට් එකට යද්දි මම දැක්කා රධ්‍ය අයියා වෙලාව බල බල අපේ ක්ලාස් පැත්තට දුවගෙන යනවා.. මම ශේප් එකේ ළමයින්ට මුවා වෙලා යන්තම් ගේට් එකෙන් එළියට පැනගෙන ස්කූල් බස් එකේ එල්ලිලා ගෙදර ගියා.. රධ්‍ය අයියා පව් තමයි.. ඒ වුනාට මට මේ වෙලාවෙ එයාට වඩා මම ගැනම අනුකම්පායි.. මට ටිකක් තනියම ඉන්න ඕන..

ෆුට් බෝඩ් එකේ එල්ලිලා පැය එකහමාරකට පස්සේ මම ගෙදර යද්දි ගෙදර ඉස්සරහා දොර වහලා.. අම්මා අද මම හවස් වෙලා එයි කියලා හිතලා වෙන්නැති දොර වැහුවෙ.. මම බැග් එකේ තිබ්බ යතුරෙන් දොර ඇරගෙන ගේ ඇතුළට යද්දි අම්මට පත්තරයක් කියව කියව ඉද්දිම නින්ද ගිහිල්ලා.. පව්.. අම්මව ඉස්කෝලෙට ගෙන්නලා කතා අස්සන්න ඕන නෑ මට කොහොමත්.. ඒ වුනාට මගේ හිතේ කොනක මම කල්පනා කරන්න අකමැති කාරනාවක් අම්මව දැක්ක වෙලේ ඉඳන් හිතෙන්න ගත්තා..

කවදහරි මට අනිවාරෙන් කෙනෙක් තෝරගන්න වෙයි.. එක්කො පවුල.. එක්කො එයා..

මම සද්ද කරන්නැතුව ඇඳුම් ටික කිලුටු ඇඳුම් දානෙට කූඩෙට දාලා අයිස් කැටෙකුත් ෆ්‍රිජ් එකෙන් අරගෙන බාත්‍රෑම් එකට ආවා.. අම්මා මාව දැක්කොත් බය වෙයි.. මුලු කම්මුලම ඉදිමිලා.. මම අයිස් කැටේ ලේන්සුවක ඔතලා කම්මුලට තියාගෙන බාත්‍රෑම් එකේ කන්නඩියෙන් මගේ මූණ දිහා බලාගෙන ඉදියා..

මට ඇඬෙන්න එනවා.. කොල්ලෙක්ට කැමතිවුන පලියට මම මනීශ කිව්ව වගේ පො#නයෙක් වෙලාද.. කවුද මේ දේවල් මෙහෙම අනවශ්‍ය විදියට හැල්ලුවට ලක් කරන එක පටන් අරගෙන තියෙන්නෙ.. මම ඕවා දන්නෙ නෑ.. දැනගෙන වැඩකුත් නෑ.. මම වගකීම් ගොඩකට බැදිලා නැත්නම් කමක් නෑ ඕන දෙයක් මට කාගෙන ඉන්න පුලුවනි.. ඒ වුනාට මට මේ ගමනේ කිසිදෙයක් පැහැදිලි නෑ.. දෙයියනේ අහසයි පොලොවයි වගේ.. රධ්‍ය අයියයි මමයි.. අපි ගැලපෙනවා ඇති.. ඒ අපි දෙන්නට විතරයි.. අනිත් පැත්තෙන් හිතද්දි මම කොහොමද ඒ වගේ එකෙනෙක් ගැන හිතන්නෙවත්.. ගානට එදා වේලට මොනවහරි ශේප් කරගන්න විතරක් සල්ලි ඉතුරුවෙන, මට කියලා සත පහක්වත් බැංකු පොතක ඉතුරු කල්ලා නැති, රට වටේම උන්ගෙන් අම්මව තියාගෙන් ඉන්නවා කියලා ගමේ බලු කතා හැදිච්ච, අප්පෙක් නැති කුණුගොඩකට කොහොමද එහෙම කෙනෙක් ලගින්වත් තියන්නෙ..

@Shan

හීනමානය නෙමෙයි.. මම කතාකරන්නෙ මම හුගක් වෙලාවට නොදකින ඇත්ත.. ඒ වුනාට මට මහා පාළුවක් තනිකමක් දැනෙනවා.. දෙයියනේ මටත් කවුරුහරු ඕන.. සෙනුකයට අයුක අයියා ඉන්නවා වගේ හුගක් උවමනයි රධ්‍ය අයියා එක්ක ඉන්න.. මටත් ජීවිතේ ලගින් තියාගන්න දුක සතුට බෙදාගන්න කෙනෙක් ඕන.. මම හැමතිස්සෙම ආස වුනේ රධ්‍ය අයියා එක්ක ඒ හැම හීනයක්ම දකින්න.. මම දැකපු හැම හීනෙකමත් මම ඉදියේ එයා එක්කමිසක් වෙන මූණක් මට මැවුනේම නෑ.. මටම හිතුනා අපි මොකුත් පටන් නොගෙනත් ආපු දුර වැඩියිද කියලා..

මගෙ ඔලුව පැලෙන්න එනවා.. අයිස් කැටේ දියවෙලා වතුර අත දිගේ බේරිලා ගිහින් වැලමිට ලගින් ටොක් ටොක් ගගා බිම ටයිල් එකට වැටෙනවා.. මම ඉතුරු අයිස් කෑල්ල සින්ක් එකට දාලා හොදට නාගත්තා.. නියපොතු වලට සීරිච්ච පාරවල් දනවා.. මම ඒ ඇවිල්ල උඩටම ඩෙටොල් ලික්විඩ් එකට වතුර පොඩ්ඩක් දාලා බෙල්ල අතුල්ලගත්තා.. අඩන්න ඕන .. හොදටම ඕන.. ඒත් ගෙදර මම අඩන්නෙ කොහොමද..අම්මා බයවෙයි.. පිටට ඇහෙයි.. ගෑනියෙක් කියලා හිතයි.. අඩන්නවත් මට නිදහසක් නැතිවෙද්දි මම හිත හිර කරගෙන ඇදුමක් ඇදන් ඇවිත් අම්මව නැගිට්ටුවා..

" සුදුමහත්තයා!! අද පන්ති ගියේ නැද්ද දරුවො.. ආවනම් කතාකරන්න එපැයි මට.."

" ක්ලාස් යන්න බෑ අම්මෙ.. අද බාස්කට්බෝල් කෝට් එකේදි බෝලයක් වැදිලා මගේ මූණ තැලුනා.. රිදෙනවා.."

මම බෙල්ල වැහෙන්න ශර්ට් එකක් ඇදගෙන අම්මට බොරු කිව්වා.. අම්මා මගේ මූණ අත් දෙකින්ම අල්ලලා ලගට කල්ලා බැලුවා..

" මූණටම කරගන්න වැඩනෙ.. ඈ දරුවො.. මම මොනවහරි ඔක අඩුවෙලා යන්න ගාන්න හදන්නද.."

" එහෙම ඕන නෑ අම්මෙ.. මම ජෙල් එකක් ගාගන්නම්.. අම්මා බත් බෙදන්න.."

" ඉන්න ඉන්න.."

අම්මා මගෙ කරේ තිබ්බ ටවල් එක අරගෙන එළියේ වැලට දාලා කුස්සියට ගියා..

@Shan

මම කාමරේට ඇවිත් කොන්ඩෙ දෙපාරක් තුන්පාරක් ගසාගෙන පිරිටන් එකකුයි පෙනඩෝල් දෙකකුයි ඔමෙප්‍රසෝල් එකකුයි බිව්වා.. කැවෙත් නෑ බඩ දැවිල්ලත් වගේ.. අයිස් කැල්ල මූනෙ තියාගෙන ඉදලා හෙම්බිරිසාවක්වත් හැදෙයිද මන්දා..

මම පොත් බෑග් එක අස් කරලා අම්මා දුන්නු කෑම එකත් කාලා ඇදේ හරහට වැටිලා සිවිලිම දිහා බලාගෙන ඉද්දි ඇස් දෙක බරවෙලා පිරිටන් එකට හොදටම නින්ද ගියා..

" ඒකතමයි පුතා.. ඉන්න මම කතාකරන්න්මකො.."

මම ආයෙම ඇහැරෙද්දි හැන්දෑවෙ කළුවරත් වැටිලා.. ජනේලෙ ඇරලා නිසා හිටු කියලා මදුරුවෝ කනවා මාව වටකරගෙන.. මම ඔලුවත් කස කස ගිහින් කාමරේ ලයිට් එක දාද්දි අම්මගෙ කටහඩ සාලෙන් ඇහුනා.. කවුරුහරි ඇවිල්ලද.. සෙනුකයා හරි මහීශා වත් ද දන්නෙ නෑ..

මම මූන පිහිදගෙන සාලෙට යන්න දොර රෙද්ද මෑත් කරද්දිම අම්මා දොර ලඟ..

" කවුද අම්මෙ.."

" අර පුතා ඇවිත් මොනවද පොත් වගයක් දීලා යන්න.. ගිහින් කතාකරන්න දරුවො.. මම මොනවහරි හදාගෙන එන්න.."

අම්මා කුස්සියට යද්දි මම නිදිමරගාතෙ සාලෙට ගිහින් එබුනම නිදිමත උඩ ගිහින් මාවත් කරකලා ඇතැරියා වගේ.. ඇවිත් හිටියේ වෙන කවුරුත් නෙමෙ රධ්‍ය අයියා.. බයික් එකේ ඇවිල්ලද කොහෙද පුටුසෙට්ටිය උඩ හෙල්මට් එකකුත් තිබ්බා.. මම දැක්කා විතරයි රධ්‍ය අයියගෙ මූණ තරහින් පිරුනා.. මම බිම බලාගෙන ගිහින් රධ්‍ය අයියා ගාවින් ඉදගත්තා..

" අයියෙ.."

" කතාකරන්නෙපා වරද් උඹ මාත් එක්ක.."

රධ්‍ය අයියා අම්මා ඉන්න නිසාද කොහෙද හිමින් ඒත් තරහින් කතාකලේ..

" ඒත්-"

@Shan

" වරෙන් අම්මට කියලා එළියට.."

රධ්‍ය අයියා වොලට් එක සාක්කුවෙන් අරගෙන ස්ටූල් එක උඩට විසික් කල්ලා එළියට බහිද්දි මම අම්මට කියලා යාලුවො ආවහම කතාකරන වත්ත පල්ලෙහා ගල් බංකුව ගාවට ගියා.. මට මොනවා කියන්නද හිතාගන්න බෑ.. මම ප්‍රින්සිපල් ඔෆිස් එකට ගියා කියලා එයා දන්නව ඇති.. කියාන් අයියා එතන හිටියනෙ.. අනිවාරෙන් කියන්න ඇතිනෙ.. අනික මමනෙ එයා ක්ලාස් එක පැත්තට දුවනවා දැකලත් ගේට්ටුවෙන් පැනලා ගෙදර ආවෙ.. මම බංකුවෙන් ඉදගනිද්දි රධ්‍ය අයියා මගෙ ඉස්සරහින් ඉදගෙන අත් දෙක බැදගෙන බංකුවේ ඇන්දට හේත්තු වුනා.. මාව මරන්න වගේ බලන් ඉද්දි බය හිතෙනවා..

" උඹ ඉස්කෝලෙ ඉවරවෙලා කොහෙද ගියේ.."

මම බිම  බලාගෙනම ඉදියා.. මගෙත් වැරැද්දක් තියෙනවා මම දන්නවා.. ඒවුනාට හිත රිදිලා ඉද්දිවත් එයාට බැරිද හොදින් කතාකරන්න..

" මම-ගෙදර ආවා.."

" ක්ලාස් යන්නෙත් නැතුව??"

" හ්ම.."

" වරද්..!! උඹ හොයන්න මම-මම මුළු ඉස්කෝලෙම පීරුවා.. උඹට බැරිවුනාද විනාඩියක් ඇවිත් මාත් එක්ක කතාකරන්න ආ.. ඇත්තටම උඹට කිසි ගානක් නැද්ද උඹ ගැන තව එකෙක් වදවෙනවා.. ඒ ගැන බිංදුවක් හරි හිතන්න ඕන කියලා.. මාව විහිලුවක් වගේද වරද්.. මට කියපන් හරියට.. එහෙමනම් මම ආයෙ උබ ඉස්සරහටවත් නැවිත් ඉන්නම්.. මෙකෙ කිසි තේරුමක් නැනෙ.."

මගේ හිතට පිහිතුඩකින් අනිනවා වගෙ වේදනාවක් මට දැනුනේ.. මම එහෙම දෙයක් අදහස් කලේ නැනෙ.. කතාකරන්න තරම් මානසිකත්වයක් මට එවෙලෙ තිබ්බෙ නෑ.. ඒකයි මම නොකියම ඉස්කෝලෙන් ආවෙ..

" එ-එහෙම දෙයක් නෙමෙයි අයියෙ.."

@Shan

" එහෙම දෙයක් නෙමෙයිනම් කොහොම දෙයක්ද වරදේ.. මිම්.. උඹට බැරිවුනාද ප්‍රශ්නයක්නම් ඇවිත් මෙහෙමයි කියලා මට කියන්න.. මම ඒව අහගන්න ඕන වටේ ඉන්න උන්ගෙන්ද වරදේ.."

" මම කියන්න ඉදියෙ ඔ-"

" කවද්ද.. කවද්ද උඹ කියන්න ඉදියෙ.. ෆෝන් එක අරන් බලපන් මම කීපාරක් කෝල් කලාද කියලා.. මෙහෙම කරන්න එපා වරදේ.. සිරාවටම හිතට අමාරුයි.. මම උඹ ගාව ඉදන් උඹට හයියක් වෙන්න බලද්දි උඹ මාව මග අරිනකොට මම හැම මගුලම ඉවසගෙන ඉන්න මට තියෙන්නෙ හිතක් මිසක් ගලක් නෙමෙයි.."

රධ්‍ය අයියා තරහෙන් නැතුව හරි හෙමින් දේවල් කියද්දි මගේ හිත වැඩිපුරම රිදුනේ ඒ වචන වලට.. මම හිතුවා හරි.. හැරෙන්න බැරි දුරක් මම ඇවිත්.. මට ඒක තේරෙනවා.. රධ්‍ය අයියා කියන හැම වචනයක් ගානෙම මගේ ඇස් වලට කඳුලු බිංදු හරි ඉක්මනට එකතු වුනා.. ඒත් මම ඔලුව උස්සලා බැලුවෙ නෑ.. ඔලුව ඉස්සුවොත් ඇහි පිහාටුවල රැදිලා අමාරුවෙන් හංගගෙන උන්නු කඳුලු බිංදු කම්මුල් දිගේ පහළට ගලාවි.. මට කතාකරගන්න බෑ තොල් පටවල් වෙවුලනවා.. උගුරෙ මොකක් හරි හිරවෙලා වගේ.. කිසි දෙයක් කියාගන්න කටහඩ එන්නෙ නෑ.. මම බුරුල් වුනු නහය උඩට ඇද්දා..

" ම-මම එහ්-එහෙම එකක් කිව්වෙ න්-නෑ අයියෙ.. මම අ-අවුලෙන් ඉ-ඉදියෙ.."

" මිම්.. ඔව් උඹ විතරනෙ අවුලෙන් ඉදියෙ.."

රධ්‍ය අයියා මම කියන කිසිදෙයක් පිලිගන්නෙ නෑ වගේ හැම එකකටම හරහට මොකක් හරි කිව්වා.. එච්චර මාත් එක්ක කේන්තියෙන්ද රධ්‍ය අයියෙ ඔයා ඉන්නෙ..

" ඕන එකක් හිතාගන්න අයියෙ.. මට ඔයා කියන්න දෙන්නෙවත් නැත්නම්.. මම යනවා.."

මම බංකුවෙන් නැගිටලා යන්න යද්දි රධ්‍ය අයියා බයවෙලා වගෙ මගේ අතින් අල්ලලා මාව එයා වාඩිවෙලා හිටපු බංකුවෙන්ම ඉන්දවගත්තා.. එයා මගේ අත අල්ලන් හිටියෙ හුගක්ම තදින්.. මැණික් කටුව ගාවින් මිටි

@Shan

කල්ලාම.. මට රිදුනත් මම අත ගසලා ගන්නෙ නැතුවමම එහෙමම හිටියා.. දැනටම මගේ ඇස් පිහාටු අස්සෙ තිබ්බ කඳුලු කම්මුල් වලට වැටිලා.. ඒවා පහලට ගලාගෙන යනවා.. ඇස් දෙක දනවා වගේ..

" යන්න එපා.."

මම ශර්ට් එකේ කරෙන් ඇස් දෙක පිහිදගත්තා..

" ම්ම්.. යන්නෙ නෑ.. කියන්න.."

" මොකක්ද අද වුනේ වරද්.. මට වෙච්ච දේ කියපන් හරියට.."

රධ්‍ය අයියා මගේ අතේ මැණික් කටුව අතෑරලා මගේ ඇගිලි අස්සෙන් ඇගිලි යවලා අත පටල ගත්තා.. එහෙම පොඩිම පොඩි දේකට මගේ මූණෙ ලාවට හිනාවක් ඇඳිලා මැකිලා ගියා..

" ඔයා මතීශව දන්නවනෙ.. අර අපි එක්ක ඉන්නෙ.. ඌ සෙනුකට කොලුකාරයා කියලා පන්තිය මැද්දෙ කෑගැහුවා.. ඊටපස්සෙ මටත් කිව්වා අයුක අයියව අල්ලලා ජරා කතාවක්.. මට ඒකට කේන්ති ගිහින් ඌට ගැහුවා.. ඊටප්ස්සෙ රණ්ඩුවක් වෙලා කියාන් අයියා එතෙන්ට ආවෙ.. ප්‍රින්සිපල් ඔෆිස් එකට ගියා.."

" මතීශ මොනවද කිව්වෙ.."

රධ්‍ය අයියා උවමනාවෙන්ම අහද්දි මම මතීශ කිව්ව හැම එකක්ම එයාට කියද්දි මගේ අත පටලන් ඉන්න අත සැරින් සැරේ තද වෙනවා මට දැනුනා.. හිත හදාගෙන රධ්‍ය අයියගෙ මූනට හැම එකක්ම කියන්න අමාරුයි.. ඒවුනාට මම හැම එකක්ම කිව්වා.. වුනු හැමදෙයක්ම කිව්වා..

" මම හිතුවා වරද්.. මොකක් හරි ප්‍රශ්නයක් කියලා.. මම දවස් දෙක තුනක්ම දැක්කා චමිරු, මතීශ, හශාන් කතාකර කර ඉන්නවා.. ඒ වුනාට මෙහෙම දෙයක් වෙයි.. මෙච්චර ඉක්මනට වෙයි කියලා හිතුවෙ නෑ.."

රධ්‍ය අයියා කියද්දි මට වෙලා තියෙන දේ හොඳටම තේරුනා.. චමිරු රධ්‍ය අයියව මේකට ගාවගන්නෙ නැතුව සෙනුකයව ගාවගත්තෙ මේක තමයි.. මට චමිරු කියන බල්ලව මරන්න තරම් කේන්තියක් ආවා.. ඌ තනිකරම බල්ලෙන්කෙ.. බලද්දි ඌ තමා කොන්ද පණ නැති පො#නයා..

@Shan

" මට තේරෙන්නෙ නෑ අයියෙ.."

" අඬන්නෙ නතුව ඉදපන් වරද්.. ඔහොම උන් එක්ක උඹ ආයෙ ජීවිතේටවත් කතාකරන්න ඕන නෑ.."

" ම්ම්.."

රධ්‍ය අයියා එක අතකින් මගේ කම්මුල් වල තිබ්බ කඳුලු පිහිදෑවා.. හැන්දෑ කලුවර තදටම අපි වටේට වහගෙන තිබ්බ නිසා වටේ පිටේ කිසි දෙයක් ලොකුවට මට පෙනුනේ නෑ.. අනික අඹ ගහට මුවා වෙලා තියෙන නිසා ගල් බංකුව ගෙවල් පැත්තට පෙනුනෙ නෑ..

" ආයෙ මොන මගුල වුනත් මට කියපන් වරද්.. උඹ ඕනතරමක් මුරණ්ඩු වැඩ කරපන්.. මම මොකුත් කියන්නෙ නෑ.. ඒ වුනාට මෙහෙම දේවල් කරන්න එපා.. උඹට දැනෙන්නෙ නැනෙ මම හිතන දේවල්.."

" සොරි.. අයියෙ.."

මම රධ්‍ය අයියගෙ අතකට හෙමින් හේත්තු වෙලා සොරි කිව්වා..

" ආයෙ රණ්ඩුවලට පැටලෙන්න යන්නත් එපා.. උඹ ඉස්කෝලෙ හැමෝම දන්න හොඳ චරිතයක් තියෙන එකෙක් මිසක් මඩාවි වැඩ කරන එකෙක් නෙමේනෙ.. බලපන් කම්මුලත් පැලිලා ඉදිමිලා.."

රධ්‍ය අයියා මගේ කම්මුලක් ලාවට ඇඟිලිතුඩු වලින් ඇල්ලුවා.. ඒ පොඩි ස්පර්ශයට වුනත් මගේ කම්මුල පුපුරු ගැස්ම වැඩි වුනා.. මම වේදනාවට එයාගෙ අත එහාට කරද්දි රධ්‍ය අයියා බයෙන් අත එහාට ගත්තා.. ඊටපස්සෙ මගෙ දිහාවට සම්පූර්නෙන්ම හැරිලා මගේ පැලිලා තිබ්බෙ නැති කම්මුලට අතක් තියාගත්තා.. එයාගෙ අත හරි රස්නෙයි.. මම ඒ රස්නෙට කම්මුල තව තදකරගත්තා..

" හුරුතල් කරන්න නෙමේ හොඳවයින් දෙකක් පිට පැලෙන්න දීලා යන්න මම ආවෙ.."

රධ්‍ය අයියා තරහක් නැතුව බොරුවට තරහින් කියද්දි මම හිනාවුනා.. පිට පලන්න මගේ.. ??හිතේ ඇති ඉතින්.. මෝඩ කොට්ටෝරුවා..

@Shan

" කමක් නෑ තවුසෙ ආපු එකේ හුරුතල් කල්ලා යනවා.. "

මම රධ්‍ය අයියගෙ මූන දිහාවට එබිලා කියද්දි එයාගෙ ඇස් කළුවරේ වුනත් මගේ තොල් දිහාට යනවා මම දැක්කා.. මට එයාගෙ ප්‍රතිචාරය බලාගන්නමත් ඕන නිසා මම මූණට ලං වේගෙනම ඉද්දි එයා මාරුවෙන් මාරුවට මගේ ඇස් දිහයි තොල් දිහයි බලලා, ටිකකින් එකපාරම හරි සිහියට ඇවිත් වගේ ඉක්මනට අහස දිහා බලාගත්තා..

" උඹ ලඟ ඉන්නත් බයයි.. වරෙන් ගෙදර යන්න.."

රධ්‍ය අයියා බංකුවෙන් නැගිටලා මගේ අතින් ඇදලා නැගිට්ටුවා.. මට හිනාවෙන්නත් ඕන.. ඒ වුනාට එහෙම හිනාවෙන්න හිතෙන්නෙත් නෑ.. මේකා මට තේරෙන්නෙ නෑ.. තේරුම් ගන්නත් බෑ..

රධ්‍ය අයියා ගෙදරට යන්න අඩි දෙක තුනක් ඉස්සරහට ගිහින් හැරිලා මාව ඇදලා අරන් කිටි කිටියේ තුරුල් කරගත්තා.. මගේ මූණ තදවෙලා තිබ්බෙ එයාගෙ පපුව මැද්දට.. මට අර හරිම ආස හිතෙන සුවඳ දෙගුණයක් තුන්ගුණයක් දැනුනා.. රධ්‍ය අයියා මාව තප්පර පහ හයක් තුරුල් කරගෙන ඉදලා නළලෙ පැත්තකට හාදුවක් තියලා හිමිහිට 'මගේ' කියලා කියනව මට ඇහුනා.. ඒ තප්පරෙන්ම ආයෙම මාවත් ඇදගෙන ගේ දිහාට දුවගෙන ගියා..

රධ්‍ය ළමයට කේන්ති ගිහින්නෙ..

මම මේ ඒ ලමයට කොහිල තම්බනවා.. ඔය ළමයින්ට පුලුවන් නම් වරද්ට හදන්න ගොටුකොළ මිටියක් ගෙනැල්ලා දෙන්න.. අරිගතෝ අරිගතෝ..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

@Shan

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 35 කොටස

" සුදුමහත්තයා.. රෑ වෙනකල් ඇහැරලා ඉන්නෙ නැතුව පාඩම් කල්ලා නිදාගන්න.."

අම්මා මගේ කාමරේ දොර රෙද්ද මෑත් කල්ලා කියාගෙනම අම්මගෙ කාමරේ පැත්තට ගියා.. මම හිටියේ පාඩම් කරන මේසෙ වාඩිවෙලා මේසෙ උඩ තිබ්බ ටේබල් ලැම්ප් එක දිහා ඇස් දෙක කණ්ණ වෙලා යනකල් බලාගෙන.. අම්මා කතා කලා විතරයි ඇස් දෙක නිලංකාරවෙලා ගියා.. මමත් මොන මගුලෙ සිහියකින් ඉන්නවද මන්දා..

" හරි අම්මෙ.."

මම ඔලුවෙ තිබ්බ සේරම කුණුගොඩවල් ටික අයින් කල්ලා පාඩම් කරන්න පටන් ගත්තා.. වාර විභාගෙ ළඟයි.. ඒකට ලියන්නත් ඕන.. අනිත් ඔක්කොටමම කලින් එක්සෑම් එක කරගන්න ඕන.. කොහොමහරි කැම්පස් ගිහින් ජොබ් කට්ටක් අටවගෙන අම්මා එක්ක වෙන ගේකට මාරුවෙන්නෝන.. මට තිබ්බ හීන හුගක්ම ලොකු ඒවා නෙමෙයි.. සාමාන්‍ය හීන අතලොස්සක් මටත් තිබුනෙ.. හුගක්ම පොඩි කාලෙ තට්ටු පහකට ගෙයක් හදලා උඩ තට්ටුවෙ පූල් එකක් හදනවා කියලා මහ උජාරුවෙන් කිව්ව මමම නවය දහය වසරට යද්දි ජජ් කෙනෙක් වෙන්න, ලොකු ගාඩ් එකක් දාගෙන ගමන් බිමන් යන්න, නඩු කතාකරන්න වෙන රටකට යන්න හීන දැක්කා.. ඒත් ඒ ලෙවෙල් පන්තියේ දෙවෙනි අවුරුද්දෙ මට තිබ්බ හීනෙ වුනේ මොකක් හරි ජොබ් එකක්.. කැම්පස් එකේ සයන්ස් ෆැක්ල්ටි යන එක.. ඔය වගේ දේවල් ටිකක් විතරයි.. එන්න එන්න අපි සමාජෙට නිරාවරනය වෙද්දි, දේවල් තේරෙන්න ගද්දි හුගක් හීන වලට ඉබේම තිත තියවෙලා ඒ පරිච්චේද එහෙම්මම වැහිලා ගියා.. ආට් කරන්න ආසාවෙන් ඉදලා අවසානේ මම පුදුම කට්ටක් කාගෙන බයෝ කලේ..

මම පොතේ ලියලා තිබ්බ මාතෘකා දිහා ඔහේ බලාගෙන ඉදියා..

**'ලක්ෂීය ස්කන්ධයක් වටා ගුරුත්වාකර්ශන ක්ශේත්‍ර තීව්‍රතාවයෙහි වෙනස්වීම'**

@Shan

මාතෘකාව දැක්කහම මට සංසාරෙම එපාවුනා.. මොන කරුමයක්ද අප්පා මේ.. මම පැන්සලක් අරගෙන පාස් පේපර් පොතේ තිබ්බ ගනන් හදාගෙන ගියා.. කමක් නෑ.. වැඩ බැරි ගොඩෙ නැනෙ මේ සබ්ජෙක්ට් එක මෙච්චර එපාවෙලා තිබ්බත්..

මම පාඩම් කරන්න පටන් ගත්තෙ රෑ අට හමාරට විතර.. අම්මා රෑට රේඩියෝ එකේ අහන 'ආරාධනා ස්වර දැහැන' ප්‍රෝග්‍රෑම් එක දැන් ඉවරවෙලා පැය ගානක් වෙනවා.. මමත් ගනන් හදන ගමන් ලාවට කනට ඇහෙන ධම්මික බණ්ඩාරගේ ලොකු විචාර වලට කන් දීගෙන හිටියා.. පරණ සින්දු හරි ලස්සනයි.. ලොකු තේරුමක් තියෙනවා.. ඒවා විචාර කරද්දි අහන් ඉන්න හරි ආසයි.. අපෙ අම්මා ආසම සින්දුවක් තිබ්බා නන්දා මාලිනීගෙ.. ගජමන් නෝනා ගැන කියන.. මම පොඩි කාලෙ අම්මා ඒක ගමේ ගෙදර උකුලෙ වාඩිකරගෙන අහනවා.. මට තාමත් සින්දුව මතක් කරද්දි තාලෙ ඇහෙනවා ඇහෙනවා වගේ..

'ජීවිතේ කවියක්

ආදරේ එහි සොඳුරුතම වදනක්

කඳුලැලි බිඳක් - හසරැලි පොදක්

එකට එක් වූ විට දැනේ

පෙර නොවිඳි රසයක්..'

අම්මා ඒ කාලෙ මොකක් ගැන කිව්වද, පොඩි පට්ටම් වෙන්න හපපු පංචායුදයක් කරේ දාගෙන අම්මගෙ උකුලේ ඉඳගෙන නිදාගන්න මට තේරුනේ නෑ.. අම්මගෙ පපුවට මූණ ඔබාගෙන කටහඬ අහන් හිටියා මිසක්.. අම්මගෙ වචනවල තේරුමක් මම දැනගෙන උන්නෙ නැති තරම.. ඒත් මම ලොකු වෙද්දි මට දැනුනා.. අම්මගෙ කටින් පිටවුනු හැම සින්දුවකම මොකක් හරි ලොකු තේරුමක්, කතාවක් තිබුනා..

' සෙනෙහසින් රැඳී උන් එක දන

පලා යයි නොකියාම ඈතට

පවුරු පදනම් බිඳී දස අත

@Shan

විසිර යන යාමෙ

කවුරු නම් ලං වේද තනියට.."

ඒ සින්දුවේ අවසාන පද පේලි වලදී මට ඉස්සර නින්ද ගියත්.. ඒ පදපේළි මට නින්ද දීලා අම්මගෙ නින්ද හොරකම් කරගෙන ගිහින් තිබුනා.. බැදලා මට මාස දෙකෙන් තාත්තා ආගිය අතක් නැති වෙද්දි, එකපාර වෙන ගෑනියෙක් ඇවිත් අම්මට තව දරුවෙක් පෙන්නලා 'මේ දරුවගෙ තාත්තා කෝ' කියලා අම්මගෙන්ම අහනකොට.. ගෑනියෙක් වෙච්ච මගෙ අම්මා අවුරුදු විසි හයකින් කොහොම ඒවට මූණ දුන්නද මම දන්නෙ නෑ.. අඩුම තරමෙ පොඩිම හරි අදහසක් මට ඒ ගැන නෑ.. කොහොම වුනත් මම දන්නවා.. මගේ අම්මා තරම් හයිය ඇති ගෑනියෙක් මම මිහිපිට දැකලා නෑ..

මම පොඩි කාලෙ තිබ්බ කරදර එමටයි.. අම්මා මාවත් එල්ලගෙන උසාවි ගානෙ රස්තියාදු වෙද්දි තාත්තා කියන එකා ඇවිත් හැම මාසෙම අම්මට උසාවියෙ උන්ගෙ කීමට කීයක් හරි දික් කරද්දි.. හරි අහිංසක කමට ඒවා හැන්ඩ්බෑග් එකේ ඔබාගෙන එන හැටි මට ආච්චිඅම්මා කියලා තියෙනවා.. මට කිසිම මතකයක් නොතිබ්බත් ඒ දේවල් කියද්දි මට අම්මා මැවි මැවී පෙනුනා.. අවුරුදු පහක්ම නඩු කිව්ව අම්මා අවසානෙ ලෝයර්ස්ලා ගාව රස්තියාදු වෙලා වෙලා දික්කසාදෙ අරගෙන තාත්තගෙන් සම්පූර්නෙන්ම අයින් වුනා..

ඊටපස්සෙ නම් අම්මගෙ ජීවිතේ යන්තම් හොදට ගෙවීගෙන ගියා.. මම පොඩි කාලෙ ඉදලම, අම්මට අරක ඉල්ලලා මේක ඉල්ලලා වද දුන්නු එකෙක් නෙමේ.. ආච්චිඅම්මා මට කොයි වෙලෙත් අඩුපාඩු හොයලා බලලා හැමදේම අරගෙන දුන්නා.. කොයි වෙලේවත් ආච්චිඅම්මා අම්මව තනි කලේ නෑ.. එහෙම බලද්දි තාත්තගෙ අඩුව මට දැනුනෙ නෑ.. මට දැනුනෙ මට අම්මලා දෙන්නෙක් ඉන්නවා වගේ හැගීමක්.. ආදරේ තිබුනා පිරිලා ඉතිරිලා යන්නම..

ගමෙ කවුරුත් මගේ වයසෙ උන් මාත් එක්ක කතාබහක් තියගත්තෙ නැතිවුනත් මම තනියම හරි පහල වෙලට පැනලා මඩකරියා වගේ මඩ නාගන්නවා.. තනියම ඇලේ පනිනවා.. ආච්චිඅම්මා එක්ක ගගේ ගිහින් තිරුවානා ගල් එකතු කරනවා.. මාමා හවුල් කරගෙන ඔංචිල්ලා බදිනවා.. අම්මා එක්ක එකතු වෙලා පලා කඩන්න වත්ත පුරාම දුවනවා.. මගේ පොඩි

@Shan

කාලෙ හරි ලස්සනයි.. මාමා කැම්පස් ගිහින් ගෙදර ආවහම මාව අල්ලගෙන නොසැහෙන්න හුරුතල් කරනවා..

ඊටපස්සෙ ශිශ්‍යත්වෙන් මේ ඉස්කෝලෙට ආවහම මම පොඩ්ඩක් විතර වෙනස් වුනා.. හුරුතල් ගතිය ටිකක් අඩුවෙලා මට ඕන වුනේ කැපිලා පේන්න.. මම, මට පුලුවන් කියලා හිතෙන හැමදේම කලා.. හැමදේම.. ක්‍රීඩා නම් ක්‍රීඩා.. වෙන බාහිර දේවල් නම් එහෙම.. නොකරපු දෙයක් නෑ.. ඒ ඔක්කොමත් තියාගෙන පාඩනුත් කලා..

ඔය සේරම ඕලෙවෙල් පටන් අරගෙන ටික කාලෙකින් සම්පූර්ණෙන්ම උඩු යටිකුරු වුනා.. මම ලොකුයි.. දහ අට පහුවෙලා, කරදඩු උස්මහත් වෙද්දි අම්මව මගේ වගකීමක් වුනා.. පවුලේ බල කිරිල්ලට මට බයෝ කරන්න වුනා.. මම කලේ මට ඕන වුනු දේවල් නෙමේ තවදුරටත්.. මම කලේ මගේ වටේ ඉන්න අයට කරන්න ඕන වුනු දේවල්.. ක්‍රීඩා මගැරුනා.. පොතටම කාලෙ වෙන් වුනා.. හරියටම මම මේ කියන්නෙ ස්පෝර්ට්ස්මීට් එකට කලින් මම ජීවිතේ ගතකරපු අවුරුදු දෙක තුන ගැන..

ආයෙම දැන් බැලුවොත්, දැන් ජීවිතේ මම සතුටින්ද ඉන්නෙ..?? ඒක ගැන මට හිතන්න ඕන..

මම සතුටින් තමයි ඉන්නෙ.. මේ ගෙවාගෙන යන කාලෙ මට දුකක් දැනෙන දේවල් වුනේ හරි අඩුවෙන්.. මේ ජීවිත කාලෙටම මෙහෙම ලොකු කාලයක් සතුටින් ඉන්නවමයි.. ඊයෙ ලොකු ප්‍රශ්නයක් වුනත් රෑ වෙද්දි මගේ මූනෙ ඉතුරුවෙලා තිබ්බ පැල්ලම ඇරෙන්න හිතේ කොනකවත් පොඩිම දුකක් තිබුනෙ නෑ.. තිබ්බ දුක දියකරලා ඇරලා වගේ.. මම ඉස්සරහට වෙන දේවල් ගැන නොහිතා අවංකවම හිතින් සතුටු වුනා.. කවදාක හරිම මම සතුටින් ඉදීවි..

මම නැගිටලා ගිහින් අම්මගෙ කාමරේ ඉස්සරහ තිබ්බ රේඩියෝ එක ඕෆ් කරලා ගෙදර ලයිට්ස් ඕෆ් කරගෙන ඇදට ආවා.. උදේට ඉස්කෝලෙ යන්නත් ඕන.. දැන් වෙලාව දෙකහමාරයි.. ඒත් හවස නිදාගත්තු නිසා ලොකු නිදිමතකුත් නෑ.. මම ඇස් පියාගෙන නින්ද යනකල් ඉද්දි කොට්ටෙ අස්සෙ තිබ්බ ෆෝන් එක වයිබ්‍රේට් වුනා..

**Radhya DCG Calling...**

මම ෆෝන් එක ආන්සර් කල්ලා කනේ තියාගෙන බිත්තිය පැත්තට හැරුනා..

@Shan

" වරද්.. නිදිද.."

" නිදාගන්න හැදුවෙ.."

" මම්.. පාඩම් කලාද.. මොනවද පාඩම් කලේ.."

" Variation of the gravitational field intensity around a point mass වල ගණන්වගයක් හැදුවා.."

" හොදයි.. මේ වට්සැප් කෝල් එකක් ගන්නවකො බඩ්ඩක් පෙන්නන්න.."

" ඒ මොකක්ද.."

මම නැගිටලා බිත්තියට හේත්තු වුනා.. මේ මනුස්සයා මහ රෑ මොනවා පෙන්නන්න කතාකරනවද මන්දා..

" මොකක්ද කියලා පෙන්නන්න කෝල් එකක් ගනින්කො.."

බීප් බීප් බීප්

තිව්වා නේද.. මෙකට කොච්චර කිව්වත් වැඩක් නෑ.. මම තියනකල් ඉදපන් කිව්වට හැමදාම ඌ කියන එක කියලා ඩාං ගාලා ෆෝන් එක කට් කරනවා.. මූට දැන් එක එක නම් කියලම මට කියන්න නම් මතක් වෙන්නෙත් නෑ.. ගැටපොලොස් කොට්ටෝරුවා..

මම ඩේටා ඕන් කල්ලා වීඩියෝ කෝල් එකක් ගත්තා.. සැක් මහ රෑ මට මොනවා හිතෙනවද මන්දා.. මූ මොකක් පෙන්නන්න යනවද දන්නෙ නෑ.. දෙපාර රිංග්ස් යන්න කලින් වීඩියෝ ඕන් වුනා.. මට බකස් ගාලා හිනාගියා..

" මොකද උඹ හිතාවෙන්නෙ.."

" කොහෙන්ද ඔය පිජාමා එක ගත්තෙ.. හෙන ලස්සනයි ඕයි.."

මම කළුවරේ ඉදගෙන රධ්‍ය අයියා ඇදගෙන හිටපු රෝස පාට හාවො ඉන්න පිජාමා එක දිහා බලාගෙන හිනාවුනා.. තොත්ත බබෙක් වගේනෙ.. හැබැයි එහෙමත් පොඩි කියුට් ගතියක් තියෙනවද මන්දා..

@Shan

" උඹට ඒක වැඩක් නැනෙ.. මොන මගුලක්ද කළුවරේ ඉදන් කරන්නෙ.. ලයිට් ඕන් කරපන්කො.."

" ආ හරි මගුලක්නෙ.. පාන්දර දෙකට කෝල් අරන් තවුසෙ හිතුවද මම ලයිට් දාගෙන කාමරේ බාල් නටනවා කියලා.."

මම ගිහින් ටේබල් ලැම්ප් එක ඕන් කලා.. ඒකෙන් කාමරේ එළිය වෙනවා.. අනිත් ලයිට් එක දැම්මහම ඇස් දෙක රිදෙන්න ගන්නවා.. සැර වැඩී රෑ වෙලා නිසා.. ඇස් දෙක කළුවරටම හුරු වෙලා..

" හරිද.."

" හරි හරි.. මෙ ඉන්නවා පොඩි වැඩක් පෙන්නන්න.."

රධ්‍ය අයියා ෆෝන් එකත් අරගෙන ඇදෙන් නැගිටලා එළියට යනවා මම බලාගෙන හිටියා.. මේකා මෙ මහ රෑ ගේ පෙරලන්නෙ ආධ්‍ය අයියා ගෙදර නැතුවද..

" අයියෙ.."

" ම්ම්.."

" කෝ ආධ්‍ය අයියා.."

" අයියට නයිට් ඩියුටි.. උදේ එන්නෙ ආපහු.."

" ආ.. කෝ අනේ පෙන්නනවකො ඔය බඩ්ඩ.."

" ඉදපන් ඉතින් පොඩ්ඩක්.. ආ මේ.. ඔයා අදුරන එක්කෙනෙක් ඉන්නවා.."

රධ්‍ය අයියා ෆෝන් එකේ කැම් එක හැරෙව්වෙ සෝෆා එකේ හතර ගාතෙ උඩ දමාගෙන බෙල්ල පැත්තට ඇල කරගෙන දිවකුත් එළියට දාගෙන රධ්‍ය අයියා දිහා බලාගෙන ඉන්න කියාරා දිහාවට.. එයා අදුරගන්න ලේසී.. එයා පොඩ්ඩක් ලා පාටයි.. ඊට එහායින් රෙක්සි බිම නිදාගෙන ඉන්නවා..

" ආව්.. හායි කියාරා.."

@Shan

මම කතාකරන කටහඬ ඇහුන ගමන් කියාරා කකුල් හතර පහලට දාලා ඉදගෙන ෆෝන් එකට එබිලා එකපාරක් බිරුවා..

" මේ යස්සනී නිදාගන්නෙ නෑ.. උඹ වගේ මහ රෑටත් අවදි වෙගෙන පිස්සු කෙලිනවා.. පේනවනෙ.."

" එහෙම තමා ඉන්න ඕන.. නේද කෙල්ලෙ.. ඉතින් නිදාගනින්කො පිස්සු කෙලිනවා බලන් ඉන්නෙ.."

" උඹ නිදි නැනෙ.. මම උඹට කතාකරන්න ඉදියෙ.."

" ම්ම්.. ඒ මොකද.."

" මම කැම් එක ඕෆ් කරනවා.. කමක් නැනෙ.."

" ආ හරි හරි.."

රධ්‍ය අයියා කැම් එක ඕෆ් කල්ලා දැම්මහම මම ආයෙම ලයිට් එක ඕෆ් කල්ලා ඇදට ගිහින් බිත්තියට ඔලුව තියාගෙන කොට්ටෙ බඩට තදකරගත්තා.. අරූ ගහපු පාර තැලිලා රිදෙනවත් එක්ක..

" දැන් ඊයෙ වෙච්ච මගුල් හිතන්න එපා වරද්.. අද සාමාන්‍ය විදියට ඉස්කෝලෙ ඇවිත් ඉදපන්.. ආයෙ උන් උඹට මොකුත් කියන එකක් නෑ.."

" ඔයා කොහොමද හරියටම කියන්නෙ.."

" කොහොම හරිනෙ.. උඹට ඒ පණ්ඩිතකම වැඩක් නැනෙ.."

" ම්ම්.. ඒ වුනාට ඉස්කෝලෙ ලමයි මොනවා හිතුවද දන්නෙ නෑ.. මටම ලැජ්ජයි ඒක මතක් වෙද්දි.."

" කවුරු මොනවා හිතුවහම මොකද වරද්.. මම උඹ උනානම් ගහන්නෙ ඔකගෙ කන පැලෙන්න.. හැම මගුලම කරබාගෙන ඉන්න ඕන නෑ තමයි.. ඒ වුනාට දැන් ඔක ආයෙ හිත හිත අවුල් යන්න ඕන නෑ.."

" මම ඒක හිතන්නෙ නෑ.."

" ම්ම්.."

@Shan

" අයියෙ.."

" මිම්.. ඇයි.."

" සිරාවටම ඇයි තවුසෙ මට කැමති.. මං අහන්නෙ මම වගේ එකෙක්ට මොකද කැමති වුනේ.. ඔයාට ඒක ගැන මොකුත්ම කියන්න නැද්ද.."

මම මෙච්චර කාලයක් මගේ හිතේ තියාගෙන ඉදපු ප්‍රශ්නයක් එයාගෙන් ඇහුවා.. ඇත්තටම ඇයි මට කැමති වෙන්න හේතුව..

අපිට ඉතින් මහ රෑ කතාකලොත් මහසෝනා තමා.. #රියල්දූක

හැයි කැමිති උනේ ඒයිම් ඉතිම්..

රධ්‍ය ඔකට උත්තර දෙයි කියලා හිතන අය වෙනුවෙන් මං ගානෙ උම්මියක්.. ඔන්න අල්ලගම්න..

මට අද හරිර්ර්ර්ර්ර්ර්ර්ර්ර්ර්ර්ර්ර්ර්ම හැපී ලමයි.. හැපී කව් එකේ කව්වා වගේ.. හැපී එකේ ඉන්නෙ..

අනේ අප්පා මම මෙච්චර දෙයක් බලාපොරොත්තු වුනේ නෑ මෙක ලියද්දි කොහොමවත්.. ජේන් ඉන් කිසස් ලිව්වට පස්සෙ මම හුගක් ආසවෙන් ලිව්ව කතාවක් මෙක.. මට දරාගන්න බෑ හත්තික්කෙ.. ඔතර් කෙනෙක්ට මෙච්චරට වඩා සතුටක් තියේද..

කතාව වෙනුවෙන් සපෝට් කරන කාලය වැය කරන් කියවන හැම කෙනෙක්ටම හුගක්ම ස්තූතියි.. මම ඔයාලට හුගාරියක්ම ආදරෙයි.. තැන්කු සෝ මච්.. මගෙ සකලබුජංලා ටික..

අනිත් අප්ඩේටුව උදේ නැගිටලා කියවමන.. ගුන්නායිට..

ලව් යූ..   ❤

ප.ලි.

@Shan

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුනවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 36 කොටස

පාන්දර රධ්‍ය අයියා එක්ක රණ්ඩුවෙලා රණ්ඩුවෙලා අන්තිමට මට නින්ද ගිය වෙලාවවත් මතක නෑ.. උගෙන් මම ඇහුවම මට කැමති වුනේ ඇයි කියලා.. ඒකා මාව ආතල් එකකට අරගෙන ගොං විහිලු වගයක් කරන්න ගත්ත නිසා මම ඌට බැනලා බැනලා මුලු ලෝකෙම තිබ්බ නම් කියලා ඌට ජීවිතේට කැමති වෙන්නෙ නැමයි කියලා දිවුරලා දිවුරලා මූණත් දික් කරගෙන හිටියා.. ඒ ගස් වැද්දා හිනාවෙවී අහන් ඉන්නවා මිසක් එක්කො අනිත් පැත්තට රණ්ඩු වෙන්නෙත් නෑ.. එතකොට මලපනින්නෙ නැද්ද.. මගුල..

මම උදේ ඉස්කෝලෙ යද්දි පාන්දර හයහමාරයි.. අපේ ස්කූල් බස් එක කෙලගෙන උදේම ඉස්කෝලෙ එනවා.. මොකෙක්වත් බයෝ එකේ නෑ.. ඒ මදිවට මේ බිල්ඩින් එකේ හොල්මන් ඉන්නවා කියලත් පොඩි සීන් කෝන් එකක් තියෙනවා ඉස්කෝලෙ.. ඒත් එළියට බහින්න කම්මැලි නිසා මම හොල්මනට බම්බු ගහන්න කියලා පන්තියටම වෙලා පොතක් බලාගෙන හිටියා.. අපේ සෙක්ශන් වල උදේ පාඩම් කරන එක මැජික් නෙමෙ හැමෝම වගේ කරන්නෙ පාඩම් කරන එක තමා..

මම හයයි හතළිස් පහ විතර වෙනකල් පාඩම් කරද්දි මම දැක්කා කොරිඩෝවෙ අනිත් පන්තිවල ළමයි ක්ලාසස් වලට යනවා එකා දෙන්නා.. මම ඔහොම කොරිඩෝව දිහා බලාගෙන කල්පනා කරද්දි අපේ පන්තියෙ දොරකොඩින් ඇතුලට ආවෙ කියාන් අයියා.. පොරගෙ මූණ එච්චර හොඳත් නෑ.. මම ඒකා මගේ ලගට එනකල් ඉදලා ගුඩ්මෝනින් කිව්වා..

" ගුඩ් මෝනින්.."

" ගුඩ් මෝනින් බං.. මම හිතුවෙ උඹ මාත් එක්ක අවුලින් කියලා.."

" ඒ මොකටද.."

" සොරි මල්ලි.. මම ඊයෙ කරපු වැඩේ ගැන මටම ලැජ්ජයි උඹ මගේ යාලුවෙක් වෙලත්.. ඒත් බං මේ ඉස්කෝලෙ, මම ඩීඑච්පී.. ඒකනිසා නිසා මට වෙන කරන්න දෙයක් තිබ්බෙ නෑ."

@Shan

" ඒක අවුලක් නෑ බං අයියෙ.."

" ඒ වුනාට මට හරි නෑ බං හිතට.. මට ලාවට අයිඩියා එකක් තිබ්බා සර් මොකුත් කියන එකක් නෑ කියලා.."

" ඔව් මොකුත් උනේ නැනෙ ඉතිං.. ආයෙ මතීශ මොකුත් කියන එකක් නෑ.."

" ඔව් ඒකත් එක අතකට හොදයි.. ඒ ඩයල් එක බයේ හිටියෙ.. මම දැක්කනෙ ඊයෙ.. මොන සමනලයෙක්ද බං ඒ.."

" වැඩක් නෑ කතාකල්ලා.."

" අඩෝ මේ.. ඒ කියන්නෙ උඹ තරහ නැනෙ.."

" අයියෝ නෑ නෑ.. මොන එහෙකට තරහ වෙන්නද.."

" හා එහෙනම් කමක් නෑ.. කෝ උඹෙ අයියන්ඩි.. මේ පැත්තට එනවා මම දැක්කා.."

කියාන් අයියා හෙන මනමාල හිනාවක් දාගෙන කියද්දි මට මතක් වුනේ ඊයෙ රෑ රධ්‍ය කාරයා මට කිව්ව කතා ගොඩ.. මම කියාන් අයියට රවලා පොත වහලා පැත්තකින් තිබ්බා..

" මම කොහොමද දන්නෙ.."

" අනේ මන්දා උඹලා දෙන්නත්.. ආ ඔය කියද්දි එන්නෙ.."

කියාන් අයියා දොර දිහා බලාගෙන රධ්‍ය අයියට අත වනලා එන්න කියද්දි මම රවාගෙනම හිටියා.. රවලා රවලා ඇස් දෙකත් පොට්ට වෙලා වගේ.. කමක් නෑ ඒ වුනාට.. රධ්‍ය අයියා කට කොනෙන් හිනාවෙගෙන ඇවිත් මගේ ඉස්සරහින් මේසෙට හේත්තු වුනා.. මොනවද දන්නෙ නෑ බලන්නෙ.. පොල් කාවයියා..

" උඹල දෙන්නට මක් වෙලාද.."

" මොකුත් නෑ බං.. ඒ වරද්.. පහලට එනවා.."

@Shan

රධ්‍ය අයියා කකුලෙන් මගේ කකුලකට ගහද්දි මම කකුල ඇදලා මෙහාට ගත්තා.. එනවා අනින්න.. පහලට ගිහින් මොනවා කරන්නද.. කියාන් අයියා එක්ක ගියත් මූ එක්ක නම් යන්නෙම නෑ..

" මට බෑ..!"

" ආ බෑනෙ.. එහෙනම් නටපං.. මම යනවා.."

රධ්‍ය අයියා මාව සත එකකටවත් ගනන් ගන්නෙ නැතුව ආ පයින්ම පන්තියෙන් එළියට ගියා.. මොන මගුලක්ද.. ආවනම් කතාකරලාවත් පලයන්කො.. එන්න බෑ කිව්වහම ඔහොමත් යනවද.. මූව මරාගෙන කන්න හිතයි.. හැමදාම ඔහොමයි..

" අන්න ගියා.."

කියාන් අයියා කම්මුලට අතකුත් ගහගෙන වන වන ගිය රධ්‍ය අයියව ඔලුවෙන් පෙන්නලා කිව්වා.. මේ ගැටපොලොස් කොට්ටෝරු හැලප සිප්පි කට්ටා.. මාව පස්සෙන් ගෙන්නගන්නවද.. හහ්.. හිතේ ඇති මේ වරද්ව එහෙම ගෙන්නගන්න..

" ගියපුදෙන්.. අල්ලන් හිටියෙ නෑනෙ.."

මම අත් දෙකත් බැදගෙන ඇහිබැමත් රැලි කරගෙන පුටු ඇන්දට හේත්තු වෙලා හිටියා.. මම පසෙන් යන්න උගෙ.. ඊයෙ මහ ලොකුවට කිව්වෙ කවදහරි මමත් උගෙ පස්සෙන් එයිනෙ යැයි යැයි කියලා.. එනවා පමකක් තමා.. බලන් හිටපන්..

මම ඊයෙ ඇහුවම මේ ගැටපොලොස් කොට්ටොරුවගෙන් මට කැමති වුනේ ඇයි කියලා.. මේකා ම්ම්.. ම්ම්.. ගගා විනාඩි දහයක් විතර කල්පනා කරද්දි මම හිතුවා හරිම ලස්සන හිත ඇදිලා යන උත්තරයක් දෙයිනෙ කියලා..

" විශේශ දෙයක් නෑ බං උඹෙ ගොංකමට තමා.."

ඕක තමා අන්තිමේ දුන්න නල්ලමලේ හිත ඇදිලා යන උත්තරේ..

@Shan

මම තව විනාඩි පහලොවක්ම බලාගෙන හිටියා.. ක්ලාස් එකට එකා දෙන්නා එද්දි කියාන් අයියත් නැගිටලා ගියා.. වොශෲම් යන්නත් හිතෙනවා පහලට.. ඇයි මනුස්සයොන්ට යන්න ඕන වෙන්නෙ නැද්ද.. මම වතුර බොනවා වැඩියි.. ඒකතමා මේ..

මම පුටුවෙන් නැගිටලා දොර ගාව ඉඳපු හශානයගෙ ගාවින් යද්දි අතින් නහය වහගෙන ඉතුරු ටිකේ හොඳට හුස්ම අරගෙන ආවා.. සැක් බලුබෙටි ස්මෙල් එකක් එන්නෙ දැක්කහමත්..

මම කලිසමට අත් දෙකත් දාගෙන පුරුදු විදියට පොකුණ ගාව ඉන්න ඉබ්බටත් සැලියුට් එකක් දාගෙන ඇඹරැල්ල ගහෙන් කොලේකුත් කඩාගෙන වොශෲම් එකේ සින්ක් එක ගාවට ගිහින් අත හෝදගෙන හිමිහිට බුදුමැදුර පැත්තට ගියා.. මෙක මමනෙ මුලින්ම අල්ලගත්තෙ.. මගේ සේපාලිකා ගහයි මගේ තාප්පෙයි.. දැන් ඔය එක එකා හේත්තු වෙලා හිටියට.. මෙක මගේ තැනනෙ.. ඉන්න හැටි විතරක්.. ඊයේ ෆැබ් එකෙන් කේක් පීස් දෙකකුයි අයිස් කොෆී දෙකකුයි ගෙනැල්ලා දුන්න එකට ගුනේ තියලා මොකුත් නොකර ඉන්නෙ.. නැත්නම් පයින් දෙන්නෙ..

" තවුසෙ මොකද මෙතන කරන්නෙ.."

මම රධ්‍ය අයියා දිහා නොබලා ගහ උඩ බලාගෙන ඇහුවා.. ඇත්තනෙ.. මෙක මගේ ගහ.. එයාට එන්න ඕන නැනෙ..

" ඇයි උඹේ නම ගහල තියෙද මෙතන.."

" ඔව් මෙහෙ එනව පෙන්නන්න.."

මම රධ්‍ය අයියට මං ගාවට එන්න කියලා කතාකලා.. මූ හිතාගෙන ඇති මගේ නම මෙතන ගහලා නැතුව ඇති කියලා.. ඌ දන්නෙ නැනෙ මගේ හැටි..

" මේ බලනවා.. ව-ර-ද්-ෂ-නෙ-රු.."

මම අවුරුදු දෙකකට කලින් සේපාලිකා ගහේ උඩ හරියට වෙන්න කවකට්ටකින් කොටපු මගේ නම ඌට පෙන්නුවහම ඒකා මං දිහා බයවෙලා වගේ බලාගෙන හිටියා.. දැක්කනෙ.. වරද් කියන්නෙ ෆුල් ඔෆ්

@Shan

සප්‍රයිසස් තමා.. මම ඕක කෙටුවෙ පොඩිකාලෙ මම මෙතනට ආපු දවසක.. තාමත් ඒක එහෙමම තියෙනවා..

" උඹද මේක කෙටුවෙ.."

" ම්ම්.."

" ගස් ගල් වල චිත්‍ර ඇද ඇද යන්න උඹ කාශ්‍යපද වරද්.."

සැක්ම සැක්.. මූ හිටියේ කොහොමද ඒ කාලෙ.. ඇගේ වැදුනත් වෙවුලලා රතු වෙලා මැරෙන්න හදනවා.. ඒකට දැන්.. කට බලකො.. දෙන්න තියෙන්නෙ වයස බලන්නැතුව..

" පිස්සුද අයියෙ.. මම තමයි විජ්ජුලතා.. අර උඩට නැතුව සිවිල් ඉන්න අක්කියා.. අන්න එයා.."

මම පපුව ලොකුවට අත් දෙකෙන් පෙන්නලා පොඩ්ඩක් ගස්සලා කෙල්ලෙක් වගේ ඇක්ශන් එකක් දැම්මහම මේකා හයියෙන් හිනාවෙන්න ගත්තා.. මේකා ඉදලා ඉදලා හිනාවෙද්දි ලස්සනයි.. මම බිත්තියට හේත්තුවෙලා රධ්‍ය අයියා හිනාවෙන දිහා බලාගෙන ඉදියා..

අපි හැමදාමත් උදේට බුදුමැදුර පිටිපස්සෙන්දි හම්බුනා.. අවසානෙ ඒක නතර කරගන්නම බැරි පුරුද්දක් වුනා.. ඒ ඇරෙන්න ඉස්කෝලෙ වෙන කොහෙදිවත්ම අපි හම්බුනේ නෑ.. සමහරවෙලාවට ලාවට හිනාවේගෙන යනවා මිසක්.. එහෙම නැතුව අපි කතාකලේ නෑ.. හොදම වැඩේ මේ කාලෙදි මම රධ්‍ය අයියගෙ කවදාවත් දැකපු නැති පැත්තකට මූණ දෙන ගමන් හිටියා..

රධ්‍ය අයියා-මම අපි දෙන්නම කතාකරන හැම දවසකම කලින් දවසට වඩා ලොකු ලෙන්ගතුකමක් දැනුනා.. ඒක හරි පුදුමයි.. අපි ගොඩක් කතාකලේ නිදහසේ හම්බෙන වෙලාවල් වල.. හුගක් වෙලවට කතාකලේ උදේම සේපාලිකා ගහ ගාවදි.. එහෙමත් නැත්නම් රෑ දෙක තුන අතර වෙලාවල් වල.. මුලදි මුලදි එදිනෙදා වෙන සාමන්‍ය දේවල් කතාකරපු අපි, ඊට පස්සෙ අපේ වටේ තියෙන දේවල් ගැන කැමැත්ත අකමැත්ත කතාකලා.. ඊටපස්සෙ අපි දෙන්නගෙම ජීවිතේ තියෙන පොඩි පොඩි ප්‍රශ්න වගේ දේවල් ඒ කතාවට එකතු වුනා..

@Shan

මේ හැමදේම වුනේ ලොකු කාලයක් අරගෙන හෙමින් හෙමින්.. ඒ වුනාට මම ඒකට කැමති වුනා.. මම වගේම එයත්.. ඔහොම කතාකරද්දි කතාකරද්දි රධ්‍ය අයියා වෙන වෙලාවල් වල වගේ නෙමෙයි.. හුගක් හිනාවෙනවා.. විහිලු කරනවා.. ඒ වගේම කියවනවා.. මම එයා එහෙම ඉන්නවා වෙන කොහේදිවත්ම දැකලා තිබිලා නෑ.. පුදුම සැහැල්ලුවකින් කතාකලේ..

ඒ වගේම මමත් සෙනුකයට වඩා රධ්‍ය අයියට කිට්ටු වුනා.. රධ්‍ය අයියා ගැන කොහොම පටන් අරගෙන විස්තර කරන්නද මට තේරෙන්නෙ නෑ.. එයා හරිම හොද යාලුවක්.. මාත් එක්ක හුගක් වෙලාවට යාලුවෙක් වගේ කතාකලා.. විහිලුවක් කල්ලා සාමාන්‍ය විදියට ඉදියා.. එහෙම ඉන්න වෙලාවක හෙන කලාතුරකින් හදිස්සියේ, රධ්‍ය අයියගෙ කටින් මං ගැන හිතේ තියාගෙන ඉන්න ආදරේ හිතෙන කතා දෙක තුනක් පැනලා මම ඒක ගැන වද දිදී අහද්දි හරි ලේසියෙන් එයා ඒ ප්‍රශ්න මගෑරලා කතාව වෙනස් කරනවා..

එයා කොයිම වෙලාවකවත් ආදරේ සම්බන්ධ දේවල් කතාකලේ නෑ.. මම එයා කතාකරාවි කියලා බලාපොරොත්තු වුනත් එයා කොහොමවත්ම කතාකරන්නෙ නෑ.. ඒකා කියන්නෙ ඒවා කතාකරන වෙලාවෙ ගානක් හදපන් කියලා.. ඒ වුනාට වෙන වල් පල් කියවන්න නම් හොදයි..

උගෙත් අමුතු ලොජික් තියෙන්නෙ..

අපි දෙන්නා මට ක්ලාස් නැති දවස්වල හවසට ඉස්කෝලෙ ඉදන් හෝල්ට් දෙකක් විතර එහාට පයින්ම ඇවිදගෙන යනවා.. කියව කියව.. කියාන් අයියත් වෙනස් වෙලා වගේ.. ඉස්සර වගේ නටන්නෙ නෑ.. කෙල්ලො ෆෝම් කරන්න යන්නෙත් නෑ.. පාඩුවෙ පැත්තකට වෙලා විහිලුවක් කරගෙන ඉන්නවා.. ඇහුවහම කියන්නෙ මොකුත් නැහැල්ලු.. ඒ වුනාට මෙකා සෙනසුරාදා ඉරිදා අපේ ක්ලාස් ගාව කරක් ගහනවා මම අනන්තවත් දැකලා තියෙනවා.. රධ්‍ය අයියට කිව්වහම කියන්නෙ ඌට හරිගිහින් ලු..

මහීශා ශශිනිගෙන් බේරෙන්නම බැරි තැන ශශිනි ගැන ඒකිගෙ අක්කට කිව්ව දවසේ ඉදන් මහීශාගෙ කෙලි ප්‍රශ්නෙත් ඉවරවුනා. දැන්නම් ශශිනියි ඒකියි නයි මුගටි වගේ තරහයි.. දැක්කත් රවාගන්නවා.. ඔක තමා කියන්නෙ ආදරෙයි වෛරෙයි අතර තියෙන්නෙ කෙස් ගහක පරතරේ කියලා.. සෙනුකයත් දැන් හෙන සයිලන්ට්.. වෙනදා වගේ අනිත් උන් එක්ක කියවන්න යන්නෙ නෑ.. අර ප්‍රශ්නෙන් පස්සෙ හුගක් දේවල් වෙනස් වෙලා

@Shan

වගේ දැනෙනවා.. ඒ වුනාට ඒකා අපි එක්ක නම් වෙනදා වගේ විහිලු කල්ලා ආතල් එකේ ඉන්නවා.. අයුක අයියා කොහොමත් සෙනුකයා එක්ක හැමතිස්සෙම හිටියා.. ඒක සෙනුකයට ලොකු හයියක් වුනා.. මතීශලා ගැන කියනවනම්.. උන් හැමදාම හිටියේ අපි එක්ක තරහින්.. උන් දෙන්නා දැන් ආශ්‍රය කරන්නෙ චමිරුව.. අපිව නෙමෙයි.. පන්තියෙ උනුත් උන්ට එච්චර කැමති නෑ.. උන් විහින් පිරිහුනා.. අපිට කරන්න දෙයක් නෑ.. දැන් උන් නෑ කියලා අපිට මෙලෝම ගානක් නෑ.. ඕවා හිතන්නත් වෙලාවක් කොහොමත් නෑ.. හැබැයි චමිරුවා ආයෙම මට මූණට හම්බුනේම නෑ.. මාව ඈත දැක්කත් හැරිලා යනවා මිසක් මූණවත් බලන්නෙ නෑ..

මේ වාරෙ ඉවරවෙලා අපි දහතුනටත් ඇවිත් අලුත් අවුරුද්දත් කිට්ටු වුනා.. ඊටපස්සෙ නිවාඩුව දුන්නහම මම හිතාගෙන හිටියේ ආච්චිඅම්මව බලන්න ගමෙ යන්න.. ඒ වුනාට සතියෙ දවස් හතම ක්ලාස් දාලා, ගිහින් ඉන්න වෙන්නෙ නෑ ලොකු දවසක්.. අම්මට ගමෙ යන්න ඕනමයි කිව්ව නිසා තමා මමත් යන්න හිතාගත්තෙ.. අවුරුදු දවස් කිට්ටු වෙලා..

වාර විභාගෙ ගැන කියනවනම්.. මම පුලුවන් උපරිමෙ පාඩම් කලා.. යාන්තම් පනස් ගනන් වලින් සබ්ජෙක්ට් තුනම ශේප් කරගන්න පුලුවන් වුනා.. මටනම් ඒත් හොදටම ඇති..ඉස්කෝලෙ වාරෙ ඉවරවෙන්න කිට්ටුව පේරන්ට්ස් මීටින් තියලා ඉවරකල්ලා ඉස්කෝලෙ අවුරුදු උත්සවෙ තියන්න ලෑස්ති වුනා.. ඉස්කෝලෙ කාලෙ නම් ඉතින් කොච්චර වැඩද.. ඉස්කෝලෙට උත්සව නැති දවසක් නෑනෙ.. හැමදාම මොකක් හරි.. අපේ ඉස්කෝලෙ ටැමිල් මීඩියම් ක්ලාසස් වල බාගයක් එදාට සිංහල විදියට අදිනවා.. අපේ පන්ති වගේ ටැමිල් ලමයි නැති ඒවාගේ පන්තියෙන් බාගයක් එදාට අදින්නෙ ටැමිල් අය වගේ.. අර පලපු සරමකුයි.. ටිකක් දිග දෙපැත්තෙන් පලපු කමිසෙයි.. වෙට්ටිය කියන්නෙ අන්න ඒක.. ඉතින් මෙ අවුරුද්දෙ මට පලවෙනි වතාවට දෙමළ කොල්ලෙක්ට අවුරුදු උත්සවෙට අදින්න වුනා.. මම දන්න කියන සේරම අදින්නෙ සිංහල උන්ට.. මම විතරක් දෙමල කොල්ලෙක්ට.. කොහෙ ගියත් මට සෙට් වෙන්නෙ අමුතු අමුතු ටොපි..

මම පන්තියට වෙලා අර පලපු අමුතු සරම අතේ තියාගෙන ඒක කරක කරක අදින පැත්ත හොයාගන්න හෙන ට්‍රයි එකක් දුන්නා..

හිච්චි දනුෂ්..😂

@Shan

වරදයා සරම ගලෝගනී කියලා සැකයක් තියන අයට මං ගානෙ පිච්ච මල් වැලක්..

මෙන්න සුදෝ ගන්නකො මගෙ දැත..

ඊයෙ දෙන්න තමා අනේ හිටියෙ රෑ.. ඒවුනාට මගෙ අර පඩිපෙලේ බල්ටි ගහපු අත රිදෙන්න ගත්තා.. ටයිප් කරපු ටික එහෙමම තියලා මම biය බබා වෙන්න ගියානෙ..

අද පුලුවන් වුනොත් අනිවාරෙන් රෑට දෙනවා.. වරදයා අවුරුදු කන හැටි බලන්න.. ඒකත් කෝමහරි සීසන් එකටම සොට් වුනා.. ම්ම්..

ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 37 කොටස

" කෝ ෂනෙරු පුතා ඔක අදින්නැද්ද.. හැමෝම ඇඳලා ඉවරනෙ.."

මම උඩ ගිහින් බිම වැටුනේ ක්ලාස් එකේ මැඩම් මගේ පිටිපස්සෙන් කතාකරන සද්දෙ ඇහුනු නිසා.. මෙ මැඩමටත් අනේ මන්දා.. කොල්ලො ඇඳුම් අදින අස්සෙ මොනව කරනවද මන්දා.. මම බැනියම විතරක් ඇඳගෙන හිටපු නිසා දඩාස් ගාලා අර දෙපැත්ත පලපු සරුවාලෙ ඇගට දමාගෙම මැඩම්ගෙ පැත්ත හැරුනා.. මැඩමනම් කියයි.. මෙක අදින පැත්ත අම්මා කිව්වට මට හොයාගන්න බැනෙ..

" ආ මැඩම්.. මේ මම කලින් මේව ඇඳලා නැනෙ.."

" කෝ මෙහෙ දෙන්න බලන්න.."

මැඩම් අර සරම අරගෙන දෙපාරක් තුන්පාරක් විතර සර්ච් කල්ලා මට හරි පැත්ත හොයලා දුන්නා..

" මෙ පැත්තට ෂනෙරු.."

" තැන්ක් යූ මැඩම්.."

මම බඩ මැද්දෙන් අර සරම ගැටගහගෙන කෝකටත් කට්ටක් ගහගත්තා.. අවුරුදු උත්සවේ එපාවෙන්නෙ මෙ ලබ්බෙ සරම අදින එක තමා.. මම ජීවිතේට සරම් අදින්නෙ නෑ.. මොකද මම එහෙම එකක් ඇඳගෙන බැරිවෙලාවක් ඇදේ නිදාගත්තොත් සරම හොයාගන්න වෙන්නෙ අල්ලපු ගෙදර කමනි ඇන්ටිගෙ වැට ගාවින් තමා.. මම දගලන දැගලිල්ලට සරම රෝල් වෙලා කරට ඇවිත් ඊටපස්සෙ මම ඒක තින්දෙන්ම ගලෝලා විසික් කරනවා.. අන්තිමට හොදට හුළං වැදි වැදි රෙදි නැතුව නිදාගන්න පුලුවන්.. ඒකනිසා කෝකටත් බෙත සෝට තමා.. කකුල් දෙක දාගත්තා උඩට ඇඳගත්තා නිදාගත්තා.. සරලයි..

මම අර ඇඳුම කොහොමහරි අටවගෙන විජේ වගේ කකුල් දෙකත් ගස්ස ගස්ස සෙනුකයා ගාවට යද්දි ඌ නම් ඉන්නවා කහමලියා වගේ කහ පාට අර පැත්තෙන් පටියක් බදින කම්සෙකුයි කළුපාට සරමකුයි ඇඳගෙන.. මූගෙ

@Shan

පස්ස යකෝ.. තියෙනවා පිට්ටු ගෙඩිය වගේ පිම්බිලා.. මම කකුල දික් කල්ලා උගෙ පුපට පයින් පාරක් දුන්නා..

" ටහුක් මොන ලබ්-අඩේ ෂනෙරුවා!"

" අවුල් නේ ඕයි.."

" පිස්සුද පගො.. උඹට ඒක ලස්සනයි.. පට්ට.."

" අනේ පලයං බං.. මේ මගුල ඇදගෙන ඇවිදින්නවත් බෑ.. ගැලවෙන්න යනවා.."

මම අර සරමෙ පලපු පැත්තෙන් කකුලක් දාලා මම මගේ සුසිනිඳු කකුල ඌට පෙන්නුවම ඌ රතු වෙලා අහක බලාගත්තා.. මල සමයං..

" උඹට පිස්සුද බං.. මෙහෙ වරෙන් ඕක හරියට අන්දන්න.."

සෙනුකයා මගේ සරම ආයෙම හරියට ඇන්දෙව්වා.. කී දෙනෙක් ඇන්දුවද මේ ටිකට මේ සරුවාලෙ..

මම ඕකත් ඇදගෙන පන්තියෙන් එළියට බහින්න බැරුව ලත වෙවී ඉද්දි අපේ ක්ලාස් එකේ මැඩම්ටත් අමුතු වුන් එකක් ගහලා මගේ නළලෙ මොට්ටුවක් රතු පාටින් තියලා අර සුදු පාට මොනවද ටැමිල් මීඩියම් ක්ලාස් එකකින් උස්සන් ඇවිත් ඉරි තුනකුත් ඇන්දා.. සැක් දැන් නම් නියම දෙමළා වෙන්න ඇති.. කණ්ණාඩියක්වත් නැනෙ බලන්න.. යන යන හැම එකාම හැරි හැරි මං දිහා බලද්දි මම ස්මයිල් ඉන් පේන් හිනාවක් දාගෙන මැඩම් ගාවට වෙලා හිටියා..

" ෂනෙරුට කොස්ටියුම් එක හරි ගානට මැච් වෙනවා.."

මේ අවුරුදු පනස් දෙකක මැඩම්ට මං ගැන හිතක් පහළ වෙලාද මන්දා දැන් සිය සැරේකට වඩා ඕකම කියෙව්වා.. මටනම් ඇති ලස්සනක් නෑ.. කකුලත් එළියට පනිනවා ඇවිදිද්දි.. පැජන්ට් එකක පලපු ගවුමක් ඇදගෙන යනවා වගේ හැඟීමක් දැනෙන්නෙ..

කොහොමහරි අර පොල් ගෙඩියක් අරගෙන මොකක්ද කරන දෙමළ චාරිත්‍රයි, ඊටපස්සෙ කිරි උතුරන චාරිත්‍රයි කල්ලා මැඩම්ගෙ අතින් කිරිබතුත්

@Shan

කාලා මමයි සෙනුකයයි පන්තියේ ඉදගෙන කොකිස් වගයක් කකා ඌ බලපු බීප්ල්ද මොකක්ද ඩ්‍රාමා එකක බොටම් කොල්ලා පූසෙක්ට ඇදගෙන මොකක්ද නාඩගමක් නැටුවයි කිව්ව කතාව අහගෙන හිටියේ.. මූ ඉතින් ඕක මට කියලා හරියනවයැ.. පූසෙක්ට බැරිනම් බූරුවෙක්ට හරි ඇදගෙන කරන්නෙ එකම දේනෙ.. අනේ මුංගෙත් කැටයම් තමා.. සෙනුකයට කියන්න ඕන බූරුවෙක්ට ඇදගෙන හනිමූන් එකට යන්න කියලා.. අයුක අයියව සප්‍රයිස් කරන්න..

රධ්‍ය අයියත් එක්ක හනිමූන් යන්න ඕනමද දන්නෙ නෑ.. ඌට කියන්නෝන යාළුවුනාට පස්සෙ හනිමූන් ගියොත් පොලොස් කොට්ටෝරුවෙක්ට ඇදගෙන එන්න කියලා මාව සප්‍රයිස් කරන්න.. ඒකා එක්ක එහෙම යන එක ගැන හිතන්නවත් බෑ.. එදාටත් මෙකා 'ගානක් හදලා නිදාගනින් වරද්' කියයිද දන්නෙ නෑ.. සැක් මම මොනවද මේ හිතන්නෙ.. මම ඌ එක්ක යාලුවෙලත් නෑ.. හනිමූනුත් යන්න ප්ලෑන් ගහනවා.. හරිම ශෝක් වරද් උඹ හැදෙන හැටි.. උපාසකයෙක් එක්ක නේද යාලුවෙන්න ඉන්නෙ.. මම ඔලුව ගසලා හරිසිහියට ආවා.. අපේ පන්තියට වටේම පන්ති වලින් නැගම් එනවා හිටු කියලා තඩි පිගන් උස්සගෙන.. මැඩම් පන්තියේ උන්ට කතාකර කර එන උන් පිලිගන්න කියනවා.. මට මේ සරුවාලෙ ඇදන් යන්න ලැජ්ජ නිසා මම සයිඩ් ගහලා හිටියා.. තියන තියන අඩිය කකුල එළියට එනවනෙ මගුල.. කොහොමද පාරක බැහැලා යන්නෙ..

මම ශේප් එකේ පැය බාගයක්ම මැඩම්ගෙ තියුනු ඇහැට සෙට් වෙන්නෙ නැතුව හිටියා.. සෙනුකයා නම් දැන් නැගම් ගිහින් හෙන වෙලා.. තාම ආවෙත් නෑ.. මම තව කොකිස් එකක් අරගෙන ඒක වාටර් නැතුව හපලා කන්න ට්‍රයි කරන ගමන් හිටියෙ.. මට කැවිලි වලින් සෙට් වෙන්නෙ කොකිස් විතරයි.. කැවුම් සෙට් නෑ.. මුං කැවුම් පැණිවලලු ඔවා කන්න බෑ.. පොඩ්ඩක් කන්න පුලුවන්.. ඒවට කොකිස් වල ලිමිට් එකටනම් කිට්ටු වෙන්නවත් බෑ..

" ෂනෙරු පුතා..!! මෙහෙ එන්න.."

මේ මැඩම්ගෙ හස්බන්ඩ්ට යටකලිසම් මහන්න.. මොන කරුමයක්ද අප්පා.. මම සයිඩ් ගහලා පාඩුවෙ ඉන්නනෙ හිටියෙ.. මොන මගුලකට කතාකරනවද.. මම සරම ගැලවිලා නොවැටියන් කියලා හිතෙන් හිතාගෙන ඇදුමත් හදාගෙන පන්තිය ඉස්සරහට යද්දි.. කියන්න සතුටුයි මට ඇඩෙන්න ආවා.. ඇවිත් හිටියේ කියාන් අයියයි රධ්‍ය අයියයි.. හරිනෙ.. නැගම් ඇවිත්

@Shan

රෙදි ගැලවුනා නේද.. මම මැඩම්ගෙ ආච්චිට දහසක් දෙවිවරුනෙ රැකවරණේ පත පත මැඩම් බලහත්කාරකමෙන් අතට දුන්න බුලත් හුරුල්ල අරගෙන ගිහින් රධ්‍ය අයියගෙ අතට දීලා පොඩ්ඩක් අත් දෙක එකතු කල්ලා නැවුනා..

" වණක්කම්!!"

" වණක්කම් වණක්කම්..!!"

රධ්‍ය අයියට හිනාවෙන්න බැරුව කට තද කරගෙන තොල් දෙකත් හපාගෙන රතුම රතු වෙලා ඉද්දි කියාන් අයියා බුලත් අතත් අරගෙන මට නෝන්ඩියට වණක්කම් කිව්වා.. වෙට්ට පලංචි කාවයියා..

ඊටපස්සෙ මම මැඩම්ගෙ මූණ දිහා බලලා ශේප් එකේ ආයෙම පන්තියෙ සයිඩ් එකකට රිංග ගත්තා.. ගාගත්තා නේද වරද් පුතේ හත්පොළේම.. මැඩම්ගෙ මොට්ටුවත් ජේන්න ඇති.. ඉරි තුනකුත් ඇඳලා.. සැක්.. මම හොරෙන් රධ්‍ය අයියා මැඩම් එක්ක කතාකරන දිහා බලාගෙන හිටියා.. ඒකා සරමට ලස්සනයි කොහොමත්.. මම එකපාරක් දැක්කනෙ පොල් බැයක් අතේ තියාගෙන සාලෙ මැද්දෙන් දුවනවා.. අද ඇඳලා හිටියේ ඇත්දළපාටයි කළුපාටයි බතික් කිට් එකක්.. මෙකගෙත් පස්සෙ ලොකු යකෝ.. මම හැරිලා ශේප් එකේ මගේ පස්ස දිහා බැලුවා..ම්ම්ම්.. ඔය තියෙන්නෙ.. ලස්සනට ගානට.. මෙ ගාන ඇති හොඳටම.. නැත්නම් ජිම් එකකට ගිහින් හදාගන්න බැරියැ.. ඕවත් මහ ලොකු වැඩද..

රධ්‍ය අයියා විනාඩි දහයක් විතර මැඩම් එක්ක කතාකර කර ඉඳලා මැඩම්ට බුලත් දීලා වැඳලා එළියට යන ගමන් ශේප් එකේ මටත් එන්න කියාගෙන ගියා.. මමත් එළියට යන්න අර සරුවාලෙ හොඳට තද කරගත්තා.. හැලෙන්නම් නම් එපා දෙයියනේ.. එහෙම වුනොත් සැඟවුනු අමුත්තා තවදුරටත් සැඟවිලාම නොතියෙයි කියලා මට බයයි.. ශෝට් එකක් විතරයි ඇඳගෙනත් ඉන්නෙ..

මම එළියට යද්දි මුලුඉස්කෝලෙම ලමයි එක එක පාට වල ඇඳුම් ඇඳගෙන එහෙ දුවනවා මෙහෙ දුවනවා හිනාවෙනවා.. විහිලු කරගන්නවා.. හෙන ආතල් ගොඩයි.. මම එනකල් රධ්‍ය අයියා පඩිපෙල ගාව ඉන්නවා.. මම අර සරමට හෙන ගහපන් කියලා කකුල් දෙකත් ගස්ස ගස්ස ගිහින් රධ්‍ය අයියා ගාවින් හිටගත්තා..

@Shan

" තවුසෙ හිනාවුනොත් අයියෙ.. අම්මපා උඹෙ සරම දෙකට ඉරනවා.."

මම මේ යකාගෙ ගොබ්බ විහිලු වල හැටි දන්න නිසාම ඉස්සෙල්ලම කතාකලා..

" නෑ නෑ හිනාවෙන්නෙ නෑ.. උඹට ඕක ලස්සනයිනෙ.."

" අනේ පලයං.."

" කිව්වට වැඩක් නැනෙ ඉතින්.. සිරාවටම කියන්නෙ අවුලක් නෑ.. උඹ ඇවිදින විදියට හිනායනවා.."

දැන් මම දැක්කහම මූට හිනායනවනෙ.. මම ආයෙම පන්තියට යන්න හැරුනා.. හරි මගුලක්නෙ..

" ඒ ඒ ඉදපන්.. ඉතින් ඇත්තනෙ කියන්නෙ.. හෙමින් ඇවිදපන්.. ඔය කලිසමක් නෙමෙනෙ.."

" මම ඇවිදින එක මම බලාගන්නම්.. කරදර වෙන්න අවශ්‍ය නෑ.."

" හා හා ඕක ගලවගන්නෙ නැතුව ඕන විදියකට ඉදපන්.. වරෙන් සෙනුක මල්ලිලා අරහෙ හිටියා.."

" මෙක ඇදන් ඇවිදින්න බෑ ඕයි.. මෙ බලනවා කකුල ඔක්කොම එළියෙනෙ.."

මම කකුල උස්සලා අර පලපු මෙව්ව එක පෙන්නද්දි මෙකා ඉක්මනට අහක බලාගත්තා.. ඉතින් ඇත්තනෙ මම කියන්නෙ.. කකුල එළියට එනවනෙ පලපු තැනින්.. ඉදිකට්ටක් නැද්ද දන්නෙ නෑ එදා වගේ මෙකට කියලා මහගන්න.. දිගට..

" ඔය කකුල පහල දාපන් වරද්.. උඹනම් මහ මොකෙක්ද මන්දා.."

" මගේ කකුලට හිත ගියානේ.. ඒ මෙහ්.."

මම උඩ පඩියකට කකුල තියලා කකුල උඩට වනලා පෙන්නද්දි මෙකා දබෝස් ගාලා මගේ පිට මැද්දට හොද පාරක් අතැරියා..

@Shan

" දාගනින් කකුල පල්ලෙහාට.."

ඊටපස්සෙ මේකා මාවත් ඇදගෙන ඉස්කෝලෙ අඹගහ යට බංකු ගාවට යද්දි එතන අම්මටසිරි වෙන්න කට්ටිය.. උදාගම්මානයක් දාලා වගේ..ඔරලෝසු කණුව විතරයි අඩු..දන්න කියන උන් හුගක් හිටියා.. මම ඉතින් පූස් පැටියා වගේ රධ්‍ය අයියගෙ පිටිපස්සෙන් යද්දි එතන ඉන්න උන් මගේ දිහා කන්න වගේ බලන් හිටියා..

" සුබා-ලෞ-ත්-අවුරුද්දක්වේවා මල්ලේ.."

" වෙන්නෝනකොහොමද එසේම වේවා.."

මම කියාන් අයියගෙ අතේ තිබ්බ ඇහැල මල අරගෙන රධ්‍ය අයියගෙ කනේ ගැහුවම ඌ මට රවලා මල අරගෙන විසික් කලා.. මුගෙ ගනකම යකෝ..

" මෙ උඹලා දැක්කද ඉංග්ලිශ් මැඩම්ගෙ ඔසරිය.. අම්මෝ නේ.."

අහිරු අයියා වලත්ත කතාවක් කියන්න මුල පිරුවා.. අපේ ඉස්කෝලෙ ඉතින් කෙල්ලෙක්ට ඉන්නෙ ඉංග්‍රීසි මැඩම්ලා තමා අලුතින් ආපු.. ඒලෙවෙල් වලට නම් දෙන්නෙ නෑ ඒගොල්ලො.. ලමයි ඇස් රතු වෙන විහිලු කරනවනෙ..

" ඔසරිය නම් දැක්කෙ නෑ හැබයි අපි දැක්කා.."

" මොකක්ද.."

" පඹයා..!!"

" අනේ පකෝ.."

" අඩෙ ෂනෙරු මල්ලි මේ පාර මොකුත් නැද්ද අයිටම් එකක්.."

සයෝන් අයියා පාඩුවෙ රධ්‍ය අයියගෙ ශර්ට් එකේ නූලක් දිගට දිගට ඇද ඇද හිටිය මගෙන් ඇහුවා.. පහුගිය අවුරුද්දක මම හිටියා සිංදුවක් කියන්න..අර නාඩන් පුංචි හිරමනේ කියලා එකක් තියෙන්නෙ..ඒක.. අවුරුදු උත්සවේ තව ටිකකින් ඒක පටන් ගනී.. ඒ වෙලාවට ඉස්කෝලෙ ඔක්කොම ලමයි ග්‍රවුන්ඩ් එකට එන්න ඕන.. එතන හෙන අයිටම් ගොඩක් තියෙනවා..

@Shan

" මොකුත් නෑ අයියෙ.. මේ පාර ගියේ නෑ.."

" සිරාවට.. අපරාදෙ.. මූ ඒ කාලෙ ඉඳන් නටන්න හරි ඉන්නවනෙ.."

" යේකටමා අණ්ණා.. හැමදාම නටන එක තමා කරන්න බැනෙ.."

මම එතන ගල් බංකුවේ මෙසෙ උඩින් ඉඳගත්තා..

" මේ සැරේ රධ්‍ය කොම්ලා සිංදුවක් කියනවලු.."

අභිරු අයියා කියද්දි මම හැරිලා පිටිපස්සෙන් ඉන්න එකා දිහා බැලුවා.. ඈ යකෝ.. කිව්වෙවත් නැනෙ එහෙම එකකට ඉන්නව කියලා.. කිව්වනම් සප් එකක් දෙනවනෙ මම..

" අනේ පලයං බං.. මම ඕනකමින් ගිය ලබ්බක් නෙමෙ.. ගයනිකා මැඩම් එක්ක බේරෙන්න බෑ.."

රධ්‍ය අයියා ඉස්සර school choir එකේ ඉදියා මට මතකයි.. මොකද මමත් ඒකෙ හිටපු නිසා.. මට මතකයි මේකා මට වඩා පේළි හතරක් පස්සෙන් සුදු අත් දිග ශර්ට් එකයි කලු කලිසමයි බෝ එකයි දාගෙන ගල් පිළිමෙ වගේ හිටගෙන ඉන්නවා.. රධ්‍ය අයියයි මමයි දෙන්නම කලේ වෙස්ටර්න් මියුසික්.. එයාට හොඳට පියානෝ ප්ලේ කරන්න පුලුවන්.. මට ලොකුවට ඉන්ස්ට්‍රුමන්ට් බෑ.. කියන්න පුලුවන් හොඳට, ලාවට ගිටාර් එකක් ලයින් කරගෙන..

" රධ්‍ය එහෙනම් උඹ මේකවත් ඇදගෙන පලයං.. උඹලා දෙන්නා ඉතින් හෙන ෆිට්නෙ.."

අයියා කෙනෙක් මාව පෙන්නලා කියද්දි මම බයවෙලා ඌ දිහා බැලුවා.. බෑ බෑ මටනම් කියන්න බෑ. මොන මගුලක්ද.. පුරුදු වෙලත් නෑ.. අනික රධ්‍ය අයියා එක්ක සිංදු කියන්න ගිහින් වැඩේ දෙල් කරන් එන්න වෙන්නෙ.. මම මූ එක්ක ඕවා කරන්න බයයි.. අනික ලැජ්ජයි.. ඈයි යකෝ..

" ඒ සිරාවට.. රධ්‍ය තනියම කියන්න ඕන්නෑ ඔය ඉන්නෙ උබෙ අනිත් කොපිය.. එක්කන් පලයන්.."

" ඒ මට බෑ බෑ.. මට සිංදු මතක නෑ.."

@Shan

" අනේ බොරු නොකිය ඉදපන් මල්ලි.. ආ උඹට කියන්න බෑනෙ.."

" බෑ හලෝ.. අනේ මේ පිස්සුනම් කෙලින්න එපා.. රධ්‍ය අයියට කියන්න දෙන්න.. මටනම් බෑ.."

" නෑ නෑ පලයන්.. ගයනිකා මැඩම් උඹට හෙන ලව්නෙ.. උඹ එනවා කිව්වම මැඩම්ට සතුටු හිතෙයි.."

" ඒ ඒ අයියෙ. ඉදපන්.. මොන මගුලක්ද.. ඕයි.."

අර විස්සක් විතර මැද්දෙ සේරම උන් මට සිංදු කියපන් කියලා බලහත්කාරකම් කරද්දි මම එනවා කියලා ගයනිකා මැඩම්ට කියන්න ගිය අහිරු අයියා පස්සෙන් දුවන්න ගියපු මම මෙසෙන් පැනපු පාර අර හත්වලාම කකුල් දෙකේ පැටලිලා එතනම ඇදගෙන වැටෙන්න ගියා.. රධ්‍ය අයියා පැන්න ගමන් මගේ සරමෙන් අල්ලගත්තා.. අල්ලගත්තෙ නැත්නම් විස්සක් මැද්දෙ රෙද්ද තමා ලෙප්ට් වෙන්නෙ ආඩවනේ.. මටමයි වෙන්නෙ..

" උඹට මොකක්ද බං වෙලා තියෙන්නෙ.. එක විදියක ඉදපන්කො ඔය රෙද්ද ඇදගෙන.. නැත්නම් ගිහින් කලිසමක් දාගෙන වරෙන් ඕකට යටින්.."

රධ්‍ය අයියා මගේ අර ගැලවිච්ච රෙද්ද මුල ඉදලා අන්දලා හෙන තදට කට්ටක් ගැහුවා.. හුස්ම ගන්නත් බෑ.. තරහට ගැහුවද මන්දා කට්ට..

" මොන මගුලක්ද අප්පා කෑගහන්නෙ ඉතින්.. රෙදි ගැලවෙනවා තමා.. මම මක් කරන්නද.."

" වහගනින් ඔය කට.. වාඩිවෙලා එකතැනක ඉදපන්.."

මමයි රධ්‍ය අයියයි ලෝක යුද්දයක් පටන් ගන්න යද්දිම කියාන් අයියා දෙපාරක් කැහැලා කතාව වෙනස් කල්ලා වෙන වල් පල් වගයක් කියවන්න ගත්තා.. අපි ඉතින් හෙන වෙලාවක් කියව කියව එක එක එව්වා කකා අඹගහ යට හිටියා.. ඒ අස්සෙ රධ්‍ය අයියා එතන ඉදපු අනිත් උන් එක්ක මට අර දනුශ්ගෙ වයි දිස් කොලවරි එකේ සිංදුව කිය කිය ගොං ආතල් වගයක් දුන්නු නිසා මම තඩි කෑවුමක් අරගෙන රධ්‍ය අයියගෙ කටේ ඔබලා ඇගිල්ලක් කැඩිලා වෙන් වෙන්නම හැපුවා.. එතන ඉන්න උන් ඔක්කොම හිතාගෙන ඉන්නෙ රධ්‍ය අයියයි මමයි හෙනම බොක්කෙ ෆිට් නිසා මෙහෙම ලගින් ඉන්නවා කියලා.. ඒකනිසා ලොකු අවුලක් තිබ්බෙ නෑ

@Shan

අයියලා එක්ක එකට ඉද්දි.. අයියලා කිව්වෙ ඉතින් ප්‍රීෆෙක්ට්ලා තමා.. නැත්නම් ඉස්කෝලෙ ඉන්න අයියලා අපි තමා..

" Yo boys I am singing song..

Lovvu lovvu-Oh my lovvu

You showed me power-u

Cow-u cow-u- holy cow-u

I want to hear now-u"

" මේ අයියෙ.."

" හරි හරි බං ඉහින්.. උඹට කිව්වෙ කවුද.. ඇයි උඹ හෝලි කව්ද.. නෑනෙ.."

" රධ්‍ය අයියේ!!!!!!!!!!"

පැය දෙකකට පස්සෙ මම හිටියේ ඉස්කෝලෙ මියුසික් රූම් එකේ කණ්ණාඩිය ඉස්සරහා..ලා ගුරුපාට බතික් සරමකුත් ඇඳගෙන බෙල්ල කහ කහ.. මොන මගුලක්ද සිරාවට මේ මට වෙන්නෙ.. දැන් ඉස්කෝලෙ ඉන්න උනුත් මූවයි මාවයි එකට තියන්න ට්‍රයි කරනවා.. අනික සිංදුව මතකත් නෑ.. ගයනිකා මැඩම් මට එන්න කියලා ඇඳගන්නත් කියලා මූණත් අතගාලා බටනළාවකුත් අතේ තියලා ගියේ.. බටනළාව අරගෙන පුපේ තමා මට ගහගන්න වෙන්නෙ.. මටත් හොඳ වැඩේ පන්තියේ පාඩුවේ ඉන්නෙ නැතුව ගියානෙ අරුගෙ පස්සෙන්..

මම මූනෙ තිබ්බ මොට්ටුව පිහිදන්න එකක් හොය හොය ඉද්දි රධ්‍ය අයියා වෙට් විශු එකකුත් අරගෙන මං ගාවට ඇවිත් මූණ එයාගෙ පැත්තට උස්සලා හරෝගත්තා.. දෙන්න හිතයි මුගෙ මූන මැද්දට..මට බාල්දි පෙරලනවට..

" මොකද මූණ හට්ටියක් කරන් ඉන්නෙ.."

" ලිරික්ස් මතක නැතුව ගියා.."

" ටිකිරි නිසා හොදට ගියාද..??"

@Shan

" ඕ ගියා.. ගියා පකක් තමා.. තවුසෙට විහිලුද අයියෙ.."

" ඔච්චර හිතන්න දෙයක් නැනෙ බං.. මතක නැත්තං මම කියන්නම්.."

" තවුසෙගෙ යාලුවො නම් මහ මොක්කුද මන්දා.. අහක යන ටොපි මට පාත් කරන්නෙ.."

" මම්.."

" බලන් යද්දි ඉස්කෝලෙ තමා අපිව මේවට පොළබන්නෙ.. අර ගයනිකා මැඩම්.. "

රධ්‍ය අයියා මගේ නලලෙ තිබ්බ අර මොට්ටුවයි අනිත් ඒවයි පිහිදලා දැම්මා..

" දැන් හරි.."

" ඒ ගයනිකා මැඩම්ට කියනවකො අයියෙ.. අනේ හලෝ බෑ.."

" මෙහෙ වරෙං බං.. ඔච්චර බය වෙන්න ඕනද ඕකට.."

මම ගැරඩි පැටියා වගේ අවුරුදු උත්සවේ තිබ්බ පැත්තට රධ්‍ය අයියා පස්සෙන් ඇදිලා ගියා.. මේකනම් මේ ඉස්කෝලෙපරිසරේ අවුලක්ද කොහෙද.. මේ අවුරුද්ද පටන් ගත්තා විතරයි.. ලැට් එකට ගියත් රධ්‍ය.. නිදාගන්න ගියත් රධ්‍ය.. පාඩම් කරන්න ගියත් රධ්‍ය.. බස් එකේදිත් රධ්‍ය.. රධ්‍ය රධ්‍ය රධ්‍ය.. ඔලුව වටේත් කැරකෙනවා වගේ..

අවුරුදු උත්සවේ ස්ටේජ් එක මල් වලින් සරසලා පැත්තකින් ඔංචිල්ලාවක් හදලා ඒකෙ මල් ගහලා.. ඉරකුත් එක්ක එරබදු මලුයි.. තව ආවුරුදු රිලේටඩ් දේවල් අරගෙන සරසලා ලස්සනට.. ඒ වුනාට ලස්සන බලන්න බෑ.. මට පැනලා දුවන්න ඕන වෙලා ඉන්නෙ..

" මීළගට අප පාසලේ අපරදිග ගායන කණ්ඩායමෙ රධ්‍ය සොහොයුරාටත්, ෂනෙරු සොහොයුරාටත් වේදිකාවට ආරාධනා කර සිටිනවා අවුරුදු උද්යෝගයෙන් ඔබ අප සැම සිත් සතන් මිහිරි ගීතයකින් පිනවීමට.."

" රෙදි ලෙප්ට් වෙන්න නම් එපා දෙයියනේ.."

@Shan

මම දාහක් දෙවියොන්ට කිය කිය ලිරික්ස් මතක් කරගන්න ට්‍රයි කලා.. කමක් නෑ මේකත් ඉන්නවනෙ.. වෙන දෙයක් වෙන්නෙ නැතැයි.. පුරුදු වෙන්න සිංදු කියනව නෙමෙයිනෙ.. මම බටනලාව ඉණේ ගහගෙන ඉස්සරහට ගියා.. මියුසික් ප්ලේ වෙන්න ගත්තා.. ලිරික්ස් මතක් වෙද්දි පොලොව පලාගෙන යන්න හිතෙනවා.. හෙන අවුල් වගේ මම කියද්දි..

" කිවි බිවියට ගී ගයන්න

රූ වරුණා මැව්වයි

කතා කරන ඔය ඇස් දෙක

අලුත් ඉරක් මැව්වයි..//"

රධ්‍යා අයියට තිබ්බෙ ලස්සන කඩහඩක්.. පොඩ්ඩක් නදීමාල්ගෙ වගේ.. මට තිබ්බෙත් ඒ ගාවින්ම යන එච්චරම ගොරෝසු නැති කටහඩක්.. ශෝන් මෙන්ඩිසුයි නදීමාලුයි සිංදු කියනවා වගේ මට දැනෙන්නෙ..

" අයියණ්ඩිගේ හිත අද්දර

නොකී කතා රැඳුනයි

එපා එපා නොදොඩා ඉන්න

සුනංගු නම් නැතිවෙයි.."

මමත් බටනලාව ඉණේ ගහගෙන රධ්‍යා අයියා දිහා බලාගෙන සිංදුව කියාගෙන ස්ටේජ් එකට ආවා.. මටම හිනා සිංදුවට.. ඒ වුනාට හිනා වෙන්න වෙලාවක් නෙමේ.. මම බයෙන් නෙ ඉන්නෙ.. එකපාරට ඔලුව කඩාගෙන වැටුනු එකක්නෙ මේ.. රධ්‍යා අයියා නම් හෙන සැහැල්ලුවෙන් සිංදුව කිව්වෙ.. එයා එහෙම ඉන්නවා දකිද්දි මටත් මුලින් තිබ්බ බය නැතිවෙලා ගිහින් හිතට පොඩි කික් එකක් ආවා..

" රූ වරුණා පද බඳනා

සිත සනහා නෙතු නළවා

හිරු මහුලට හිනැහෙන්නයි..//"

@Shan

රධ්‍ය අයියා එයාගෙ මැන්ලි ඩ්‍රැමටික් වෝක් එකෙන් මගේ වටේ වටයක් කැරකෙන ගමන් ඇත ඉරක් තියෙනවා වගේ මට අත දික් කල්ලා පෙන්නුවම මමත් ඒකට හරියන්න ඇක්ට් කලා.. දැන්නම් ශේප් වගේ.. අවුලක්ම නෑ..

" අහස් ගව්ව සොයා යන්න

සමනල තටු ලැබුණයි

නුඹෙ අතින් හැදෙන ඇඹුල

දිගු ගමනක් යන්නයි..."

මම ගානක් නැතුව සිංදුවේ ඉතුරු ටික කියද්දි ඔඩියන්ස් එක හෙනට අපි දෙන්නට ඇටෙන්ශන් දීලා හිටියේ.. සමහරු වීඩියෝ කරනවා.. සමහරු සිංදුව කියනවා.. ඒකෙන් හිතට ආවෙ හෙන අමුතු කික් එකක්.. මට විතරක් නෙමේ රධ්‍ය අයියගෙ මූනෙන් වුනත් ඒක හොදට පේන්න තිබ්බා.. අනිත් එක මේකගෙ මූණෙ තියෙන්නෙ හෙන මනමාල හිනාවක්.. ඒක දැක්කහම මටත් හිනායන්න එනවා.. මේ ඔක්කොම වීඩියෝ කරලා ඉස්කෝලෙ ෆේස්බුක් පේජ් එකේ අප්ලෝඩ් කලාම.. ආතල්.. ඉබේම අපිව කසාද බන්දලා ගෙදර යවයි..

" හීන් හිනා කවට කතා

අද විතරක් ඔටටුයි

කිරි වදිනා හෙට දිනයේ

අලුත් පැලක් තැනුණයි.."

" රු වරුණා.."

අනේ දෙයියනේ.. 😂

හෙන අවුල් වගේත සකලබුජංලා..

සමාවෙන්න සමාවෙන්න.. ඒවුනාට ඔහොම එව්ව වෙන්ට පුලුවනි..

@Shan

අයියණ්ඩිගේ හිත අද්දර

නොකී කතා රැඳුනයි.. මම..මම😁 ඒක ඇහුනහම හිනා යනවා..
අයියන්ඩිගෙ හිත අද්දර තියෙන්නෙ මරු මරු කතා තමා..

එන්නාම් ලමායි.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 38 කොටස

" අනේ අම්මෙ මෙහාට දෙන්න අප්පා ෆෝන් එක.. මොන මගුලක්ද.."

" පොඩ්ඩක් ඉදපන් ඉතින්.. මොකෝ අපි ඉස්කෝලෙ ඇවිත් මේවා බලන්නයැ.. දැන් ඉතින් මොකක්ද මෙකෙ තියන අවුල.."

" අවුල කියන්නෙ මට ලැජ්ජයි.."

" අනේ උඹෙ ලැජ්ජාව.."

මම හිටියේ අම්මා ඉස්තෝප්පුවට වෙලා මහා හයියෙන් සවුන්ඩ් වැඩි කරගෙන ඇස් දෙක කඩාගෙන යන්න බ්‍රයිට්නසුත් වැඩිකරගෙන ෆුල් ස්ක්‍රීන් දාගෙන බලන අර රූ වරුණාව අහගෙන.. මටම පොළොව පලාගෙන යන්න හිතෙනවා ඒක දැක්කහම.. මොන ලැජ්ජාවක්ද හත්වලාමෙ මේ වුනේ..

මීඩියා යුනිට් එකේ උන් අපි දෙන්නගෙ ප'ෆෝමන්ස් එක හෙන ක්ලියර් වීඩියෝ කලා ඉස්කෝලෙ ෆේස්බුක් පේජ් එකෙයි වෙබ් සයිට් එකෙයි පෝස්ට් කල්ලා.. ඒක ශෙයාර් වෙනවා හිටු කියලා.. නෙගටිව් කමෙන්ට් නැති වුනාට උගෙයි මගෙයි ඇඹල හිනාවට ඉස්කෝලෙ උන් කමෙන්ට් දාලා තිබ්බා.. ඒ අස්සෙ ගෙදර ආවහම තකහනියක් මහීශාත් කෝල් කල්ලා නෝන්ඩියට කතා දාහක් කියලා හිනාවෙලා හිනාවෙලා ෆෝන් එක තිබ්බා.. සැක් මම හිනාවෙන හැටි විතරක්.. රධ්‍ය පොලොස් කොට්ටෝරු හැලප කාවයි සිප්පි කටු ගොම්බෙල්ලා.. මාව මරාගෙන කාපන්.. ඇටි කුකුලා..

මම අම්මට ඕන එකක් කියාගන්න කියලා කාමරේට ගියා.. දැන් ඉතින් ඌටයි මටයි අමුතුවෙන් සෙට් වෙන්න දෙයක් නෑ.. අල්ලපු වැටේ සක්කරවට්ටම ටික ඌවයි මාවයි දාලා ෆික්ශනුත් ලියලා බන්දලා කරන්න ඕන ඒවා ඔක්කොම කල්ලා තියෙයි.. අපේ ක්ලාස් වල ආශ්‍රය කරන කෙල්ලොන්ගෙන් දැනගත්ත විදියට උන් හෙන ආසයි කොල්ලො කොල්ලො ශිප් කරන්න..පිස්සු වලාමවල්.. දැන් ක්ලාස් ගිහිල්ලත් හමාරයි.. ඒ මදිවට ඉස්කෝලෙ ඇරිලා ගෙදර එද්දි මම රධ්‍ය අයියගෙන් ඇහුවම මොකක්ද තවුසෙ ඒ කලේ කියලා.. මේ ගැටපොලොස් කොට්ටෝරුවා

@Shan

'ඒකත් පිටපතේ කොටසක් තමයි' කියාගෙන හෝල්ට් එකෙන් බැහැලා ගියා.. අම්මපා හෝල්ට් එකෙන් බැස්සෙ නැත්නම් මම බස් එක කියලා බලන්නෙ නෑ.. ඕකව අල්ලලා පොළොවෙ ගහනවා.. මේකා මම කරන ඒවා එකතු කරගෙන ඉඳලා එකපාර පලිගන්නවද කොහෙද..

" ඒ ළමයා ලස්සනයි නේද කොල්ලො.."

" කවුරු.."

ඒ පාර අම්මා ඒකත් උස්සගෙන කාමරේටත් ඇවිල්ලා..

" මේ ළමයා අනේ.."

" රධ්‍ය අයියද.."

" ආ ඔව් මට ඒ ළමයගෙ නම මතක හිටින්නෙම නැනෙ.. මොකක්ද කිව්වෙ රධ්‍ය නේද.."

" ඕ ඕ ඒක තමා.. ඌ අවුරුදු කුමාරයා උනානෙ.."

" ඒකටනම් ගැලපෙනවා තමා.. උඹ ගියේ නැද්ද අවුරුදු කුමාරයට.. යන්න එපැයි.. අර කලින් අවුරුද්දෙ ගිහින් මොකක්ද සාටකයක්ද එකක් උස්සන් ආවෙ.."

" මේ අම්මෙ ඕවා හයියෙන් කියන්න එපා අයියෝ.. යන්නකෝ ඔය ෆෝන් එක දීලා.."

මම අම්මගෙන් ෆෝන් එක අරගෙන අම්මට පොඩි තල්ලුවක් දීලා කාමරේ දොර ගාවට යැව්වා..

" මල සමයං.."

අම්මා මටත් ගස්සගෙන එළියට ගියා.. හොදවැඩෙ ගොම්බෙල්ලට.. මට කරපු නින්දිත චාටර් වැඩේට මම උගෙන් පලි ගන්න හිතාගෙන උගේ නම අවුරුදු කුමාරයට දාලා පැත්තකට වෙලා මගේ වැඩක් කරගෙන පාඩුවෙ හිටියා.. රධ්‍ය අයියත් හිටියෙම එතනම තමා.. ඊටපස්සෙ අවුරුදු කුමාරයොන්ගෙ නම් අනවුන්ස් කරද්දි 'රධ්‍ය ශනව් හෙලාක්ශ අංක හතර' කිව්ව පාර මේකා උඩ ගිහින් බය වෙලා ස්ටේජ් එක පැත්ත බැලුවා..

@Shan

" සියලුම තරගකරුවන් කරුණාකර වේදිකාව මතට පැමිණෙන්න.."

ආයෙම මීඩියා එකේ කොල්ලෙක් අනවුන්ස් කරද්දි අපේ වටේ හිටිය සේරම හැරිලා බැලුවෙ රධ්‍ය අයියා දිහාවට.. මම.. රූ වරුණා.. පද බදිනා.. දැන් පලයං අයියෙ අවුරුදු කුමාරයට..

" ඒ රධ්‍ය උඹද බං ඒ.."

" පි-පිස්සුද යකෝ.. මොන අවුරුදු කුමාරයොද.. මම ඔය ලබ්බවල් වලට නම දුන්නෙ නෑ.."

හරිම පවු රධ්‍ය අයියා.. බයවෙලා නහුතෙටම..

" ඉතින් බං රධ්‍ය ශනව් හෙලාක්ශ කියන්නෙ උඹටනෙ.."

" ඉතින් බල්ලො මම ඔය ලබ්බවල් වලට ගියේ නෑ.."

" ගියේ නැත්නම් ඔය කියන්නෙ.."

කතාව දුර දිග ඇදෙද්දි මම හිමිහිට ඉදගෙන හිටපු ඩෙස්ක් එකෙන් පල්ලම් බැහැලා අයුක අයියගෙ අත යටින් රිංගගෙන ඉස්කෝලෙ නුග ගහ අස්සට ගිහින් හැංගුනා.. අහුවුනොත් අවුරුදු කුමාරයො පෙන්නයි මේකා.. මල පැනලද මන්දා.. ඔක්කොම ඒකා දිහා බලගෙන ස්ටේජ් එකට යන්න කියද්දි මේකා රතු වෙගෙන ස්ටේජ් එක ගාවට ගිහින් සර් කෙනෙක්ට මොකක් හරි කිව්වා.. ඒත් ඒ සර් හිනාවෙලා රධ්‍ය අයියගෙ පිටට එකකුත් ගහලා බලෙන්ම ඒකගෙ අතින් ඇදගෙන ස්ටේජ් එකට ගෙනිච්චා.. පව් කියලත් හිතෙනවා අනේ.. ඒවුනාට..

ඔහොම ඉතින් වට දෙක තුනක් යද්දි ඒකෙ ජජ් පැනල් එකට හිටපු උන්ටත් හිනා.. රධ්‍ය අයියා ඇවිදින්නෙ මාච් පාස්ට් කරන්න වගේ තනි කෙලින්, දාහකට ගහන්න වගේ මෙලෝ හිනාවක් නැතුව..අනික ඒකා ඔවට යන්නෙත් නැනෙ.. හැමෝම පුදුම වෙලා බලාගෙන හිටියෙ රධ්‍ය අයියා දිහා.. ඔහොමද අප්පා අවුරුදු කුමාරයොන්ට යන්නෙ.. අපරාදෙ පොඩ්ඩක් ඇවිදින්න කියලා දුන්නනම් හරි කලින්.. දැන් මොකක් කරන්නද.. ඒකා දාහකට කෙලින්න වගේ ඉස්සරහට ඇවිදගෙන ඇවිත් අර ඡන්දෙ ඉල්ලන ඇමතියා වගේ ආයුබෝවන් කියලා වටේම ඉන්න උන් මරාගෙන කන්න වගේ බලාගෙන ඇවිදගෙන ගියා.. මම ඉතින් ඈත තියන නුග ගහ අත්

@Shan

දෙකෙන්ම බදාගෙන සරම ගලෝලා කරට දාගෙන ඔය විගඩම දිහා බලාගෙන හිටියෙ.. සරම කරේ උනාට මම දිග කලිසමක් ඇඳලා හිටියේ.. රධ්‍ය අයියට දෙපාරක් තුන්පාරක්ම සරම කඩාගෙන ඒක මට අන්දන්න වුන නිසා ඇඳගෙන ගිහින් ඉස්කෝලෙ කලිසම ඇඳගනින් කිව්වා..

කොහොමහරි ඉතින් අන්තිමට මගේ මහන්සිය වතුරේ ගියේ නෑ.. රධ්‍ය අයියා එක වුනානෙ.. ඒකා උසම උසයි.. අනික රවාගෙන ඉද්දි පොඩි ලුක් එකක් තියෙනවා.. ඌ රැව්වත් ලස්සනයි.. ඊටපස්සෙ ඉස්කෝලෙ ඩිපියුටි ප්‍රින්සිපල් සර් සාටකයක් අරගෙන රධ්‍ය අයියා ගාව ටගිහින් ඒක කරට දාලා හිනාවෙලා පිටට තට්ටු කලා.. කැඩෙට් සාජන් අවුරුදු කුමාරයා..

" ඒ අනුව දෙදහස් විසි තුන* බක් මහා සූයී මංගල්‍යයේ අවුරුදු කුමරා ලෙස අභිශේක ගන්වන්නේ අංක හතරෙන් තරගවැදුනු..

රධ්‍ය ශනව් හෙලාක්ශ.."

ඊටපස්සෙ ඔන්න පොඩ්ඩක් ප්‍රින්සිපල් ගාවදි රධ්‍ය අයියා හිනාවුනා.. මූනිජ්චාවට වගේ.. හිනාවෙලා ෆොටෝ දෙක තුනකටත් ඉදලා සාටකෙත් ස්ටේජ් එකේදිම ගලවගෙන ඉක්මනට පඩිපෙළ බැහැගෙන බැහැගෙන ඇවිත් අතුරුදහන් වෙලා ගියා.. අවුදුරු කුමාරයා තෝරන්නෙ අන්තිමටනෙ.. ඒක ඉවර වුනාම අවුරුදු උත්සවෙත් ඉවරවෙලා හැමෝම ලමයින්ට පන්තිවලට ගිහින් ඇඳුම් මාරුකරගන්න කිව්වා.. මම ඉතින් සරම කිහිල්ලෙ ගහගෙන පන්තියට ඇවිත් ශර්ට් එක ඇඳලා ඒක යටකරගෙන කොන්ඩෙ හරියට හදාගත්තා..

ඊටපස්සෙ සෙනුකයත් ඇවිත් මම දිහා අමුතුවට බලලා ඌත් ඇඳගන්න ගියා.. මං දිහා අමුතුවට බලන්නෙ..මමයැ අවුරුදු කුමාරයට ගියේ..

" උඹ නේද ඒ කුප්ප වැඩේ කලේ ෂනෙරුවා.."

" කොයි?? මොන??"

" අර රධ්‍ය අයියගෙ නම අවුරුදු කුමාරයොන්ට දැම්මෙ.."

සෙනුකයා කලිසමයි ශර්ට් එකයි ඇඳගෙන මාත් එක්ක එලියට ආවා.. මැඩම ඩෙස්ක් අස් කරන්න කියනවා.. ඔය මගුල් උදේ හදන්න අපි හිටපු නිසා ආයෙ හවසටත් හදන්න ඕන නැනෙ.. එහෙම අසාධාරනයිනෙ.. අපි අනිත්

@Shan

උන්ට හදන්න දීලා බෑග් දෙකත් එල්ලගෙන අර අඹගහ යට බංකුවට ආවා.. එකයි කාලයි වෙලාව.. තා පැය කාලකින් ඉස්කෝලෙ අරිනවනෙ..

" මම දැම්මෙ නෑ උඹට පිස්සුද.."

" සිරාවට.. එහෙනං කවුද දන්නෙ නෑ දැම්මෙ.."

" අනේ මන්දා.. කවුරු දැම්ම වුනත් ඒකා එක වුනානෙ.."

" ඒ වුනාට බං.. අයියෝ මට බෑහ් ඔයි.."

සෙනුකයට ආයෙම අවුරුදු කුමාරයගෙ වෝක් එක මතක් වෙලා මහා හයියෙන් මගේ පිටට තඩිබබා හිනාවෙන්න ගත්තා.. මට උගෙ හිනාවෙන විදියටයි රධ්‍ය අයියවයි මතක් වුනු විදියටයි හිනා ගියා.. අපි දෙන්නා නිකන් ගුලි කාපු උන් දෙන්නා වගේ මහා හයියෙන් හිනාවෙනවා.. වටේ පිටේ ඉන්න උනුත් අමුතු සත්තු දෙන්නෙක් දිහා බලනවා වගේ අපි දෙන්නා දිහා බල බල හිනාවෙවී යනවා..

ඒ එක්කම මට මගෙ කොලර් එකෙන් ලාවට තදවෙලා උඩට ඉස්සෙනවා දැනුනා.. මම ක්ශනිකව පිටිපස්සට හැරුනා විතරයි අවුරුදු කුමාරයට මද කිපිලා සාටකෙන්ම මගේ මූණටම දමලා ගැහුවා..

" කාපන් මාව.. පිස්සු හු##.."

" ඌප්ස්.. අවුරුදු කුමාරයා ඇවිල්ලා.."

මම උගෙ සාටකේ අරගෙන අත වටේ ගුලි කරගෙන අඩු කුලේ එකා වගේ දෙකට තුනට නැමිලා ඌට ගෞරව දැක්වුවා..

" උඹට ශුවර්ද රධ්‍ය.. මූ එක්කමයි යාලුවෙන්න ඕන කියලා.."

කියාන් අයියා අහද්දි රධ්‍ය අයියා කියාන් අයියටත් රවලා මටත් රැව්වා.. රවලා හරියනවද අප්පා.. අභිශේක ගන්වලානෙ තියෙන්නෙ.. සමරන්න එපැයි..

" මං හිතන්නෙ රධ්‍ය අයියා මූණ දෙන්නෙ තාම පටන්ගැන්මට.. තවත් සහන ඉදිරියේ බලාපොරොත්තු වුනානම් හරි.."

@Shan

සෙනුකයා ශේප් එකේ අයුක අයිය ගාවට ලිස්සලා යන ගමන් රධ්‍ය අයියට කියද්දි කියාන් අයියට කැස්සක් හැදිලා ඌ මැරෙන්න ගියා..

" එහෙම නෑ අනේ.. නේද ඒයි.."

එක එකාගෙ කැත කතාවලට හිත පොඩ්ඩක්වත් රිද්දගත්තෙ නැති මම රධ්‍ය අයියට වැලම්ටෙන් එකක් ඇන්නහම ඒකා මගේ අතේ තිබ්බ සාටකේ ඇදලා ගත්තා.. මෙකෙන් බාගයක් මටත් හම්බෙන්න එපැයි ඉතින්.. කමක් නෑ කවදහරි මම මෙකා එක්ක යාලුවුනාම ඌ මගේ වෙනවනෙ.. බාගයක් නෙමෙ එතකොට සම්පූර්නෙන්ම හම්බෙනවනෙ.. ඔය කිව්වට මෙකා හිත යටින් කැමති ඇති.. අවුරුදු කුමාරයා වුනාට.. කොච්චර ආඩම්බරයක්ද ඉතින්.. ගිය අවුරුද්දෙ මම මේ අවුරුද්දෙ මූ..

" දෙන්නෙක් ප්‍රසිද්ධ වෙන්නයි යන්නෙ.."

කියාන් අයියා එතකොට තමා අර ෆේස්බුක් එකේ අප්ලෝඩ් කරපු සිංදුව අපිට පෙන්නුවෙ.. ඒක දැක්කා විතරයි රධ්‍ය අයියා මට නෝන්ඩියට හිනාවුනා.. අපරාදෙ මූව අවුරුදු කුමාරයට දැම්මෙ.. විකට ඇදුම් තරගෙ සාත්තර කියන එකෙක්ට දාන්න තිබ්බෙ.. මම හොද වුනා වැඩියි.. මම මගේ බැග් එකෙන් උගෙ මූණට දමලා ගැහුවා..

" අනේ මේ උඹලා දෙන්න ගෙවල් වල ගිහින් කුලල් කාපියව්.."

කියාන් අයියා මගේ බැග් එක අරගෙන උගෙ කරට දාගත්තා.. හිටපංකො අයියෙ ගෙදර ගිහින් උඹව මම කනවා.. ගැටපොලොස් කොට්ටෝරුවා..

ඊටපස්සෙ අපි ගෙදර එන්න ආවා.. එනගමනුත් මම ඌට දහ අතේ දිවුරුවා මම ඌට කැමති වෙන්නෙ නෑ උගෙ අයියා එක්ක පැනලා යනවමයි කියලා.. මූ ඒවට හිනාවෙනවා විතරයි මොකුත් කියන්නෙත් නෑ.. එහෙම වුනාමත් කේන්ති යනවනෙ.. බැරිම තැන මම ඒකගෙ අතේ නියපොතු පහම හිටින්න හොද පාරක් හූරලා ජනේලෙන් එලිය බලාගෙන ආවා.. ඌ ඒකටත් හිනාවෙනවා.. වෙට්ට පිත්තල මුගටියා..

" වරද්.. බෙල්ලෙ පොට යයි.."

" ඉතින් මගෙනෙ.. තවුසෙගෙ නෙමෙයිනෙ.."

@Shan

" Someone's වෙන්ඩ boyfriend got angry.. Bang bang!!"

" Fuck off!!!"

ඔන්න ඔහොමලු ඒගොල්ලො අවුරුදු කැවෙ..

අවුරුදු කුමාරයා වෙනුවෙන් මල් මිටක් දීගෙන යන්ඩ..

ඒ වගේම,

සුභ අලුත් අවුරුද්දක් වේවා හැමෝටම..

එන්නාම්.. ලව් යූ..❤

(කොකිස් අච්චුව කකුලෙ වට්ටගෙන පුච්චගෙන ඉන්න ඕතරී තනි ඇහෙන් අඩන ගමන්..උම්මච්හ්)

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 39 කොටස

එදා අවුරුදු උත්සවේ දවසෙමයි ඉස්කෝලෙ වාර නිවාඩුව දුන්නේ අලුත් අවුරුද්දට.. ඊටපස්සෙ දවස් දෙකක්ම පන්ති තිබ්බ නිසා මට ඒවට යන්න වුනා.. අවුරුදු වලට මහරගම නුගේගොඩ ඔය පැතිවලට කිට්ටු වෙන්න බෑ.. පුදුම සෙනගක් ඉන්නෙ බස් වල.. බස් විතරක් නෙමෙ පාරවල් වලත්.. අපේ ගෙදර ඇඳුම් ගන්න යන්නෙ ඉතින් අඩුවෙන්.. මට විතරයි.. අම්මා ඇඳුම් අඳින්නෙ මහගෙන.. මහලා තියෙන ඒවා අම්මට හරි යන්නෙ නෑ හුගක් වෙලාවට.. කොහොමහරි අන්තිමට අවුරුද්දට දවස් හතරක් විතර තියලා මමයි අම්මයි ආච්චිඅම්මලගෙ ගෙදර යන්න ලෑස්ති වුනා..

රධ්‍ය අයියලගෙ ගෙදරත් එයා කිව්ව විදියට වැඩ වැඩිලු.. එයාගෙ අම්මයි අප්පච්චියි පලාලි ඉඳලා ගෙදර ඇවිත්ලු ඉන්නෙ.. කියලා තියෙන විදියටනම් එයාගෙ අප්පච්චි හුගක් සැරයි.. රධ්‍ය අයියයි ආධ්‍ය අයියයි අප්පච්චි ඉන්න තැනක මූන බලාගෙනවත් කතාකරන්නෙ නෑ කියලා කියාන් අයියා කියලා තිබ්බා.. කොහොම වුනත් මටත් එහෙම හිතුනෙ මේ ටිකේ රධ්‍ය අයියා ෆෝන් එකෙන් කතාකලත් කතාකරන්නෙ රහසින් වගේ.. එපාවෙලාලු ඉන්නෙ.. අප්පච්චි ගෙදර ඉද්දි අඩුම තරමෙ එයාලට ගෙදර හයියෙන් ඇවිදින්නවත් බැරිලු.. අම්මනම් හොඳයිලු.. අම්මා ඩොක්ටර් කෙනෙක් නිසා අම්මා ලබන අවුරුද්දෙ කන්සාල්ටන්ට් කෙනෙක් වෙන්න රට ගිහින් ස්ටඩීස් කන්ටිනුව් කරන්නලු හිතාගෙන ඉන්නෙ.. රධ්‍ය අයියා කිව්වා අම්මා ගියෝතින් එයා පිටින් බෝඩ් වෙනවා කියලා.. ගෙදර ඉන්න බැහැල්ලු.. හිසරදයක්ලු අප්පච්චි ඉන්න තැනක ඉන්න එක..

මම කිව්වහම එහෙම කියන්න එපා කියලා ඒකා ඒකටත් මට කෑගැහුවා.. ඒ වුනාට එයාට අප්පච්චි ඉන්න නිසා අගයක් නෑ.. මට නැති නිසා අගෙයි.. ඔහොම තමා.. තියන එකාට අගයක් නෑ.. නැති එකාට අගේ වැඩී..

මම ගමේ යන්න ඇඳුම් හදන ගමන් හිටියේ.. ඇඳුම් නම් ඕනෙත් නෑ.. පොත් දෙකතුනකුයි.. ලැප් එකයි.. ඔච්චර තමා.. ඒකට අපේ අම්මා.. මොනවා දාඅත්තද මන්දා..හෙන ලොකු බෑග් එකකින් එකයි එක එක දේවල්.. මේ බස් වල යද්දි ඔවා උස්සන් යන්න වෙන්නෙත් මටමයි.. දැන් ඇඳපන්කො බර පුත්තලම් බූරුවා වගේ.. ඔවා අම්මට කිව්වහමමට බනිනවා කරේ තියාගෙනලු හැදුවෙ, වඩාගෙනලු බත් කැව්වෙ, අඩනකොට උකුලෙ තියාගෙනලු නිදි කලේ..අනේ දෙයියනේ ඒ මලවදේ අහගෙන ඉන්නවට

@Shan

වඩා හොදයි අත් දෙක කැඩිලා පලයන් කියලා බඩුත් උස්සගෙන ගමේ යන එක..

මම මගේ බැක්පැක් එකට උවමනා දේවල් දාලා කෑම කාලා ඇවිත් පොතක් බලාගත්තා.. ගමේ යන්න හිතත් නෑ.. ලගදි ගියානෙ.. අනික බස් වල හෙනට සෙනග.. මම තනියම යනවනම් ශේප්.. ඒ වුනාට අම්මා එක්ක යද්දි එහෙම බෑනෙ.. අම්මව බලාගන්නත් ඕන.. වැඩ වැඩී.. ආච්චිඅම්මත් චුරු චුරු ගානවා එන්න එන්න කියලා.. ඒ අස්සෙ ඉන්ට්‍රැක් ක්ලබ් එකෙන් ඕෆේන්ජ් එකකට අවුරුද්දෙන් පස්සෙ ඩොනේශන්ස් වගයක් දෙන්න තියනවා කියනවා.. එහෙම වුනොත් ඒකට ආයෙම කොළඹ දුවගෙන එන්නත් ඕන.. ඒ මගුලෙ බෝඩ් එකේ මමත් ඉන්නවා.. අන්තිමට ඕවට අවෙ නැති වුනහම බලු කතා කෝටියක් අහගන්න ඕන ඉන්න උන්ගෙන්.. නිකම් බැජ් අරගෙන ඉන්නවා, වැඩක් කරන්නෙ නෑ, අයිස් කිය කිය.. තව බිග් මැච් එකකුත් තියනවා..

බලන් යද්දි මෙ ඔක්කොම කල්ලා වෙලාවක් තිබ්බොත් තමා මට ඒ ලෙවෙල් ලියන්න වෙන්නෙ..

රඨ්‍ය අයියට කිව්වහම නම් කිව්වා එයත් ඉන්ට්‍රැක් ක්ලබ් ඉන්න නිසා ඒ වැඩ බලාගන්නම්.. මට එන්න ඕනම නෑ කියලා.. ඒ වුනාට එහෙම බෑනෙ.. එයාව ඇපේට තියලා මම වැඩ පැහැර හැරියා වගේනෙ.. එයා එහෙම එකක් හිතන්නෙ නෑ තමා.. ඒ වුනාට මගේ හිතට හරි නෑ උවමනාවට වඩා රඨ්‍ය අයියට කරදර කරන්න..

අවුරුදු උත්සවේ දවසෙ දැක්කට පස්සෙ මම රඨ්‍ය අයියව දැක්කෙම නෑ.. ඉස්කෝලෙ නිවාඩුවනෙ.. අප්පච්චිත් ගෙදර ඇවිත් නිසා එයාට කොහෙවත් යන්න විදියක් නැහැල්ලු.. පහුගිය ටිකේම රඨ්‍ය අයියා ගෙදර අයත් එක්ක රණ්ඩු රණ්ඩු ඉවරයක් නෑ.. එයා හරි මුරණ්ඩුයි.. ආඨ්‍ය අයියත් මට කෝල් කල්ලා කිව්වා රඨ්‍ය අයියා පිස්සු කෙලිනවා ගෙදර ඉදන්, පොඩ්ඩක් පැත්තකට වෙලා ඉන්න කියපන් මල්ලි කියලා.. මම කිව්වට ඒ පිස්සු මගුල අහන එකක්යැ.. අහන එකෙක්ට නම් කියලා දෙන්නවත් තිබ්බා. කිව්වහම කියන්නෙ මට තේරෙන්නෙ නැහැල්ලු එයාගෙ පීඩනේ.. එහෙම හිර වෙලා ඉන්න බැහැල්ලු අනිත් අයට ඕන විදියට.. රූකඩයක් නෙමෙයිල්ලු.. දාහක් දේවල් කියනවා.. පස්සෙ පස්සෙ මම එයාට පැහැදිලි කල්ලා දෙන එක නතර කල්ලා දැම්මා.. මුරණ්ඩු වෙන එකේ සීමාවක් තියෙන්න එපැයි..

@Shan

අනික වෙනදා වගේ නෙමේ මම මොකක් හරි කිව්වහමත් කේන්ති ගන්නවා.. මේ දවස් ටිකට මල යකෙක් වැහිලා වගේ හැසිරෙන්නෙ..

උදෙත් චුරු චුරු ගාලා ෆෝන් එක තිබ්බා මම ගමේ යනවා කිව්වහම.. මම ඉතින් මහ දවසකට යනවා කියලා නෙමේනෙ.. ඉක්මනට එනවනෙ.. ඕකට ඔච්චර අවුල් යන්න ඕන නැනෙ..

මම පාන්දර එකහමාර විතර වෙනකල් පාඩම් කල්ලා එහෙමම ඇදට ආවා.. උදේ හයට විතර මෙහෙන් ගියාම හරි.. හවස් වෙන්න වගේ එහෙට යන්න පුලුවන්.. ගියාමත් නිකන් ඉන්න වෙන්නෙ නැනෙ.. ගෙදර ඔක්කොටම ඉන්නෙ අම්මයි ආච්චියි විතරයි නිසා මමයි මාමායි පිටි කොටන්න ඕන.. කැවිලි හදන්න උදව් කරන්නත් ඕන.. ලිප් බදින්න ඕන.. කුස්සියෙ දර ලිප තියන පැත්තෙ මැටි ගාන්න ඕන.. එපාවෙනවා අවුරුද්දනම්.. පොඩි කාලෙ ආස වුනාට දැන් නම් තිත්තයි..

මට ලාවට නින්ද යාගෙන වගේ එද්දි කොට්ටෙ අස්සෙ තිබ්බ ෆෝන් එක වයිබ්‍රේට් වෙන්න ගත්තා.. අරගෙන බලද්දි රධ්‍ය අයියා.. උදේ ගත්තට පස්සෙ ඔන්ලයින්වත් ආවෙ නෑ.. මම හිතුවා ගෙදර වැඩ වෙන්නැති කියලා අම්මත් ගෙදර නිසා.. නිදිමත එහෙම්මම නැතිවෙලා ගියපු නිසා මම නැගිටලා බිත්තියට හේත්තු වෙලා ෆෝන් එක කනේ තියාගත්තා..

" මම හිතුවෙ ඔයා නිදි ඇති කියලා.. ෆෝන් එකත් ඕෆ් කල්ලනෙ තිබ්බෙ.."

"...."

මම කතාකලාට අනිත් පැත්තෙන් කිසිම සද්දයක් නෑ.. බයත් හිතෙනවා අප්පච්චි ගෙදර කිව්ව නිසා..

" රධ්‍ය අයියෙ..??"

"...."

" හලෝ.. අයියෙ.."

මම ෆෝන් එක කනෙනුත් අරන් බැලුවා හරියටම කතාකරන්නෙ එයාද කියලත් බලන්න.. රධ්‍ය අයියා තමා..

@Shan

" කතාකරනවකො අයියෙ.."

" ම්ම්.."

" කොච්චර කතාකරනවද.. ඇහෙන්නෙ නෑ වගේ ඉන්නෙ.."

" ම්ම්.. නිදාගෙනද හිටියෙ.."

රධ්‍ය අයියා කතාකරන්නෙ නාහෙන් වගේ.. උගුර බැරැන්ඩි වුනාම කටහඩ තියෙන්නෙ.. අන්න ඒ වගේ. අසනීපයක්වත් හදාගෙනද..

" නිදාගෙනනම් නෙමෙ හිටියෙ.. අසනීපෙන්ද.."

" ම්ම්ම්.."

" ඒ මොකක් වෙලාද.. බෙහෙත් මොකුත් බිව්වෙ නැද්ද.."

" ම්ම්.. පුලුවන් නම් විනාඩි පහකට එළියට වරෙන් වරද්.."

රධ්‍ය අයියා කිව්ව කතාවට මගේ ඇගත් එක්ක හිරිවැටිලා ගියා.. මෙකා අපේ ගෙදර ඇවිල්ලද.. මේ මහ රෑ..අප්පච්චි ගෙදර කිව්වනෙ.. මෙකට පිස්සු තදවෙලාද.. මම දනිපනි ගාලා නැගිටලා අම්මගෙ කාමරේට ඇහැ දාලා බැලුවා.. අම්මා හොදටම නිදි.. අම්මට කොහොමත් නින්ද ගියාම ඇහැරන්න මෙතන පපරෙ ගහන්න වෙනවා මේ වෙලාවට.. මම ඒ වුනත් හිමින් සැරේ ගෙදර ඉස්සරහ දොර අඩවල් කරගෙන එළියට බැස්සා.. මේ ඉන්නෙ බයික් එකත් ස්ටෑන්ඩ් කරගෙන ගේට්ටුවෙන් ඇතුලෙ ඇඹරිල්ලා ගහ ගාව.. අපෙ අම්මා වැරදිලාවත් නැගිට්ටනම් තමා.. මේ යකා මොනවා කරනවද මට හිතාගන්න බෑ..

මම ඉස්තෝප්පු පඩියෙ තිබ්බ සෙරෙප්පු දෙකත් දාගෙන බොරලු ගොඩේ හිමින් හිමින් අඩිය තියලා රධ්‍ය අයියා ගාවට ගියා.. එයා බයික් එකට හේත්තුවෙලා මම එනකල්ම බලාගෙන ඉදියා.. මහා ලොකු එළියක් නොතිබ්බත් මට කළුවරේම එයාව පෙනුනා.. කළු ශර්ට් එකකුයි ශෝටකුයි ඇදගෙන.. කොට්ටාවෙ ඉදන් මෙහෙට කොච්චර දුරද අනික..

" අයියෙ.. මොකද මේ.."

@Shan

මම රධ්‍ය අයියා ගාවට ගිහින් එයාගෙ ඇඟිලි වලින් අල්ලගත්තා.. ඒවා සීතල වෙලා හොඳටම.. මේ මහ රෑ සීතලේ හෙල්මට් එකක්වත් නැතුව මොන මගුලක් කරනවද මට තේරෙන්නෙ නෑ.. කලින් මෙහෙම හැසිරෙනවා මම දැකලත් නෑ..

" මම..?? මොකුත් නෑ.."

" නැතිවෙන්නෙ කොහොමද.. කෝ හෙල්මට්..??"

" අමතක වුනා.."

" මට තමා කියන්නෙ.. ඒකනෙමෙයි දැන් අසනීප එක්ක මොකද මෙහෙ ආවෙ.. රෑට සීතලයිනෙ මනුස්සයො.. ලෙඩ වැඩිවෙන්නැද්ද.."

මම අහද්දි එයා මගේ අතේ ඇඟිලි වලින් ඇදලා මාව අඩියක් විතර එයා ගාවට කිට්ටු කරගත්තා..

" උඹව මතක් උනා.."

රධ්‍ය අයියා කළුවරේම එකට බැඳිලා තිබ්බ එයාගෙයි මගෙයි ඇඟිලි දිහා බලාගෙන අර බැරන්ඩ් වෙච්ච කටහඬින් කෙඳිරුවා.. ඒ වුනාට ලෙඩවෙලා වගේ නෙමෙයි.. මේකා අඬලාවත්ද.. මගෙ පපුවෙ පැත්තක් හිරිවැටීගෙන වගේ ගියා..

" මොකක් හරි වුනාද.."

මම රධ්‍ය අයියගෙ අත් වලින් මගෙ අත් අහකට අරගෙන එයාගෙ උරහිස් දෙකෙන් අල්ලගත්තා.. ඒකද දවසටවත් කතාකලේ නැත්තෙ..

" ම්ම්.."

රධ්‍ය අයියා මාව බයික් එකට හේත්තු කල්ලා උස්සලා මාව බයික් එකෙන් ඉන්දුවා.. හැමදේම හිතපු නැති වෙලාවල් වලම සිද්දවෙන නිසා ඔක්කොම මට තේරෙන්නෙ, වෙලා තප්පර ගානක් ගියහම.. මගේ එක කකුලක සෙරෙප්පුවක් කකුලෙන් ලිස්සලා බිමට වැටුනා..

" මොකද වුනේ.. මට කතාකලේවත් නෑ.."

@Shan

මම හිමින් කියද්දි රධ්‍ය අයියා මගේ ඉණෙවටෙන් අත් යවලා මගේ පපුවට තුරුල් වුනා. කිට් කිට්යෙම තුරුල් වුනා.. මම කොච්චරවත් රධ්‍ය අයියට තුරුල් වෙලා ඉදලා තියෙනවා වුනත් මෙහෙම එයා මට තුරුල් වුනේ පළවෙනි වතාවට.. මගේ පපුව හයියෙන් හයියෙන් ගැහෙද්දි එලියෙ තිබ්බ සීතලත් ටික ටික මගෙන් ඈතට ඈතට ගියා.. මට දැනෙනවා මගේ ශර්ට් එක තෙමීගෙන මගේ පපුවේ මොනවාහරි ගැවෙනවා.. රධ්‍ය අයියව හිමින් හිමින් ගැස්සෙනවා.. මගේ ඉණ වටේ තියන අත් සමහර වෙලාවට හුගක් තදවෙනවා.. ආයෙම ලිහිල් වෙනවා..

වෙන්නෙ මොකක්ද කියලා මට ඒ තප්පරේම දැනුනා..

මම මගේ එක අතකින් රධ්‍ය අයියව මගේ පපුවට තුරුල් කරගෙන අනිත් අතින් එයාගෙ කොන්ඩෙ පිටිපස්සට අතගෑවා.. හිමින්.. හුගක්ම හිමින්.. ඇයි කියලා අහන්න ඕන තමයි.. අඩන්න තරම් මොකද වුනේ කියලා අහන්න මට හුගක්ම ඕනෙ.. ඒ වුනාට එයා කියන්න ලෑස්ති නැත්නම් අහලා වැඩක් නැති නිසා මම අහන්න ගියේ නෑ.. ඒ වෙනුවට මම එයාට ඕනතරම් වෙලා එහෙමම ඉන්න දුන්නා..

මමත් අඩන වෙලාවක එයා මාව තුරුල් කරගත්තා මිසක් පස්සෙන් පන්න පන්න ඇයි කියලා ඇහුවෙ නෑනෙ..

විනාඩි දහයක් විතර රධ්‍ය අයියා එහෙමම ඉදලා මගේ පපුවෙන් අයින් වුනා.. එතකොට මට සීතලක් දැනුනා..

" උඹට වදේ නේද.."

" එහෙම එකක් නෙමේ.. පිස්සුද.."

" ම්ම්.. මට එපාවෙලා ඉන්නෙ හැමදෙයක්ම.."

" හැමදේම කිව්වෙ..??"

" උඹයි ඉස්කෝලෙයි අයියයි ඇරෙන්න මගේ වටේ තියන ඔක්කොම.."

රධ්‍ය අයියා මගේ එහාපැත්තෙන් බයික් එකට හේත්තු වුනා.. මම ආයෙමත් එයාගෙ ඇගිලි වලින් අල්ලගත්තා..

@Shan

" අප්පච්චි මොනවහරි කිව්වද.."

" නොකියන වෙලාවක් නෑ වරද්.. මට ඕන විදියට හුස්මක්වත් ඒ ගේ ඇතුලෙ ගන්න බෑ.."

රධ්‍ය අයියා කියවන්නෙ හිතේ දුකින් කියලා මට තේරුනා.. මමත් එක්තරා විදියකට පවුල නිසා විඳවන එකෙක් තමයි..

" ඒ මොකද.."

" හැමතිස්සෙම මාව හිරකරනවා වගේ.. මට අවුරුදු විස්සක් වෙලත් මම තාම කරන්නෙ එයාලට ඕන දේවල් විතරයි.. අප්පච්චි දැන් මට බල කල්ලම කියනවා කේඩීයූ ගිහින් ආමි එකට බැදෙන්නලු.. ඒකෙ ඉන්ජිනියරින් ෆැක්ල්ටි යන්නලු.. මට ඩිෆෙන්ස් යුනිවසිටි යන්න බෑ වරද්.. මට ඕන නිදහසේ ඉන්න.. සාමාන්‍ය ළමයෙක් වගේ මොරටු හරි පේරෙ හරි යන්න.. මට මැරෙන්න හිතෙනවා වරද්.. මම මේ කිසි දෙයක් ආසාවෙන් කරනවා නෙමෙයි.."

" ම්ම්.."

" හිතට හරි අමාරුයි.."

රධ්‍ය අයියගෙ කටහඬේ තිබ්බ වේදනාව විතරක්ම වෙද්දි මම ඒ අතක් තදින්ම අල්ලගත්තා.. තමන්ගෙ හිතේ තියන ගින්දර දනෙ තමන් විතරයි.. මම මෙතන ඔලුවෙන් හිටගෙන හරි රධ්‍ය අයියට 'හිතන්න එපා ඔක්කොම හරියයි' කිව්වට එහෙම වෙන්නෙ නෑ.. මම කිව්ව පලියට ඔක්කොම හරියන්න මම වයිමා නෙමෙයිනෙ..

" මට තේරෙනවා.. මටත් ඔහොම දැනිලා තියේ.."

" ම්ම්.."

" රණ්ඩුවෙන්න යන්න එපා.. රිසාල්ට්ස් එන්න තව මාස තුනක්වත් යයිනෙ.. එතකල් හදිසි වෙලා තීරණ ගන්න යන්න එපා.."

" ම්ම්.."

@Shan

" අප්පච්චි ඉන්නෙත් පොඩි දවසයි නිසා ඉවසන් ඉන්න.. හැමදෙයක්ම ඉක්මනට කරන්න බැනෙ.."

" මම්.. මම්.. මොකක් හරි කරගන්න බලමු.. පාන්දර යනවද.."

" ඔව්.. අම්මත් යනවනෙ.. ඒ වුනාට ඉක්මනට එන්න වෙව්.."

" ඉක්මනට එන්න.."

මට ලාවට හිනාගියා..

" එන්නම්.. රෑ ආපු එක අප්පච්චි දන්නෙ නෑනෙ??"

" නෑ.. දැනගත්තොත් මාව මරාවි.."

මගේ හිතට අර දැනෙන බය ආපහුම දැනෙන්න ගත්තා.. ගින්දර එක්ක සෙල්ලම් කරොත් පිච්චෙන්න වෙනවා.. අනිවාරෙන්ම ඔව්.. මම කැමතිම නැති හැඟීම.. අපි හිනාවෙලා කතාකලාට හිතේ කොච්චර ගින්දරකද ඉන්නෙ..මට කියාගන්න තේරෙන්නෙ නෑ..

" එහෙම තියේදිත් ආවෙ ඇයි රඬ්‍ය අයියෙ.. ඔයාට සෙල්ලමක් වගේ පේනවද මේ දේවල්.. කරදරයක් උනානම් අනික.. මටනම් තේරෙන්නෙ නෑ.. ඔයා මේ ටිකට මොනවද නොකරගත්තෙ.."

මම හිමින් වුනාට එයාට සැරෙන් කියද්දි රඬ්‍ය අයියා මට ඒක කියන්න නොදී මාව ඇදලා අරගෙන පපුවට හේත්තු කරගත්තා.. එයාගෙ පපුවෙ මූණ වැදුනු නිසා මට කතාකරගන්න බැරි වුනා..

" උඹ ගාව හරි සනීපයි.. ඒකයි මැරුණත් කමක් නෑ කියලා ආවෙ මහ රෑම.."

මම දඟලලා දඟලලා එයාගෙ අත් අස්සෙන් මූන එලියට දාගත්තා.. හුස්ම ගන්නත් බෑ.. වලහෙක් වගේ බදාගන්නවා..

" මැරුණහම හරි ඇති.."

" එපාද.."

" මැරිය ඉතින්.. ඔච්චර අමාරුව නම්.."

@Shan

" ම්ම්.."

මම රධ්‍ය අයියගෙ අතේ කොහෙන්ද මන්දා අහුවුනු තැනින් කැල්ලක් ගැලවිලා යන්නම හැපුවහම මෙකා බෙරිහන්දෙන්න ගත්තා..

" මොකද බං.."

" මොකද අහන්නෙ.. මැරෙන ලබ්බවල් කියවනවා.. බූරුවා.."

මම යන්තම් දගලලා එළියට ගත්ත මුන් ආපහු මෙකා හරවලා උගෙ පපුවට තද කරගත්තා.. මාව තැලිලා පොඩි වෙලා ගියපු තක්කාලි ගෙඩියක් වගේ වුනා..

" මට ලෝබයි වරද්.. සිරාවටම හෙන ලෝබයි.."

" ඒ මොකද.."

මම ආයෙම යන්තම් බෙල්ල උස්සලා රධ්‍ය අයියගෙ පපුවට නිකට හේත්තු කරගත්තා.. මේ වෙලාවෙදි හිතට දැනෙන දේවල් කෝටියක්විතර කියාගන්න තේරෙන්නෙ නෑ.. හිත ආදරෙන් පිරිලා ඉතිරිලා යනවා වගේ.. මම ලොකු හුස්මක් අරගත්තහම රධ්‍ය අයියා ගාවින් එන උනුහුමයි හුස්මයි මගේ පෙණහලුවල පිරුණා.. රධ්‍ය අයියා මං දිහා බලලා ලාවට හිනාවුනා.. එයා හිමින් මගේ නිකට ගාව ඉදන් ඇගිලි මගේ යටි තොල් දිගේ ලාවට අරගෙන ගිහින් කම්මුලකින් නැවැත්තුවා..

" මොකුත් නෑ.. හෙට අම්මත් එක්ක පරිස්සමින් ගෙදර යන්න.. ගිහින් මට කතාකරන්න.."

" ම්ම්.. තවුසෙත් පිස්සු නටන්නැතුව ඉන්නවා.. මම ආධ්‍ය අයියගෙන් නැත්නම් අහනවා හොදේ.."

" ම්ම්.. ගමෙ ගිහින් සිහියෙන් ඉදපං.. උඹට අලි විසේනෙ.."

" හා.. ඉන්නං.. දැන් ගෙදර යන්න.. පාන්දරනෙ.. අප්පච්චි හෙව්වොත් එහෙම.."

" ම්ම්.."

@Shan

මම රධ්‍ය අයියගෙ පපුවෙන් අයින් වුනාම එයා මගේ දිහාට නැමිලා මගේ නළලෙ පැත්තකට හුගාක් වෙලා තොල් තදකරගෙන ඉදලා මාව බයික් එකෙන් බැස්සුවා.. සෙරෙපුව පේන්නෙත් නෑ.. ලිස්සලා කොහේ වැටුනද මන්දා..

" මෙ පරිස්සමට යන්න.. හෙල්මට් ඇත්තෙත් නෑ කළුත් ඇදගෙන.. මගුල.."

" අපෝ හා හා බං.. දැන් ගෙට පලයං.."

" ගෙදරට ගිහින් මට කෝල් එකක් ගන්න මම අවදියෙන් ඉන්නෙ.."

" හා පරිස්සමට වරද්.. මම යනවා.."

රධ්‍ය අයියා ගේට්ටුවත් වහගෙන යන්න යද්දි මම සෙරෙප්පුවත් අතේ අරන් ගෙට ආවා.. පරිස්සමට යයිද කියලත් හිතට බයයි.. මුගෙ මුරණ්ඩුකමට අණ්ඩක් කඩාගත්ත දවසට තේරෙයි.. කොට්ටෝරුවා..

මම වොශෲම් එකට ගිහින් කකුල් දෙකත් හෝදගෙන ඇදට ඇවිත් නිදාගන්නැතුව හිටියා.. කණ්ණාඩියෙන් පේන මගේ ශර්ට් එකේ පපුව හරියෙන් පෙගිලා.. මතක් වෙද්දිත් පපුව රිදෙනවා.. මමත් ගමෙ යන නිසා එයාව තනිකරනවා කියලා හිතයිද දන්නෙ නෑ..

මම දාහක් දේවල් හිත හිත ඉද්දි විනාඩි විස්සකින් විතර මට කෝල් එකක් ආවා..

" මම ගෙදර ආවා.."

යසෙ මහ රෑ හෙල්මටුත් නැතුව.. හැදෙන හැටි..

දෙන්න තියෙන්නෙ පුප පුපුරන්න දෙකක්..

පික්සනල් කැරැක්ටර් එක්ක ආතරෙන් බැදෙන එක පවක්ත ඒයිම්..

එන්නාම්.. ලව් යූ ❤

බොලාගෙ කපටිකම අවුරුදු කියලා දෙකක් ඕනලු!! දෙනවා දෙකක් මම..

ප.ලි.

@Shan

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 40 කොටස

පාන්දර මම අම්මත් එක්කන් ගමේ එන්න ආවා.. සෙනග කියන්නෙ.. බස් එකේ අම්මට විතරයි ඉඳගන්න හම්බුනෙත්.. මම අම්ම එක්ක ඉඳගන්න යද්දි අපෙ ආච්චිගෙ වයසෙ විතර ආච්චිඅම්ම කෙනෙක් අපි ගාව බැරු බැරුව හිටගෙන යන්න හදද්දි මම ආච්චිඅම්මට සීට් එක දීලා නැගිටලා ගියා..හෙන පෝලිමක් බස් වලට.. අම්මට අවුලක් නෑ කොහොමත් ආච්චි කෙනෙක් ගාවනෙ ඉඳගෙන යන්නෙත්.. ඒ ආච්චි මගේ මූණ අතගාලා මට පිං දුන්නා..

කොහොමහරි මම ගාල්ලට විතර එනකල්ම හිටගෙන ආවා.. ෆෝන් එකත් අම්මගෙ හෑන්ඩ්බෑග් එකේ.. නැත්නම් මොකක් හරි බල බල වත් එන්න තිබ්බා.. ගාල්ලට එනකල්ම හිටගෙන ඉන්න එකත් ලේසි නෑ.. පැය කීයක්ද.. මම බස් එකේ කොක්කක එල්ලිලා හෙන අමාරුවෙන් එක කකුලකට බර දීගෙන ආවා.. ආයෙම අනිත් කකුලට බර දීගෙන ආවා.. කොන්දත් රිදෙනවා දැන්නම්.. ඔහොම යද්දි දෙයියනේ කියලා අර ආච්චිඅම්මා තලල්ල හරියෙන් බහින්න නැගිට්ටා.. ඒ ආච්චි මට ආයෙමත් පිං සිද්ද වෙච්චාවෙ කියාගෙන බස් එකෙන් බැහැලා ගියා.. අම්මා හොඳට නිදි.. මම අම්මගෙ හෑන්ඩ් බෑග් එකෙන් ෆෝන් එක ගත්තහම රඨ්‍ය අයියගෙන් මිස් කෝල් පහක් විතර ඇවිත් තිබ්බා.. සැරින් සැරේ අරගෙන.. මම එයාට ආපහු කෝල් එකක් ගත්තා.. දෙපාරක් විතර රිංග්ස් යද්දි කෝල් එක ආන්සර් වුනා..

" හලෝ මල්ලි.."

ඒ කතාකලේ ආධ්‍ය අයියා.. මෙකා ෆෝන් එකත් දලා කොහේ ගිහින්ද.. ඊයේ වෙච්ච කෙරිච්ච දේවල් නිසා හිතටත් බයයි.. මම නිදාගෙන ඉන්න අම්මා දිහා බලලා ෆෝන් එක එහා කනට මාරු කරගත්තා..

" අයියෙ.. කෝ රඨ්‍ය අයියා.."

" ආ මෙ බල්ලො දෙන්නා නාවනවා මල්ලි.. ඉන්න මම දෙන්නම්.."

" ආ නෑ නෑ අයියෙ.. එයා වැඩ ඉවරවුනු වෙලාවක ගන්න කියන්නකො.. හදිසි නෑ.."

" හා එහෙනම්.. මල්ලි යන ගමන්ද.."

@Shan

" ඔව් අයියෙ..තාම මග.. තව පැය හතරක්වත් යයි.."

" පරිස්සමට යන්න මල්ලි එහෙනම්.. බුදුසරණයි.. මම පොඩීට කියන්නම්.."

" හරි අයියෙ බුදුසරණයි.."

මම ෆෝන් එක කට් කල්ලා බැක්පැක් එකට දාගත්තා.. හිතට හරිත් නෑ වගේ.. මට හෙන බයයි.. ඊයෙ රධ්‍ය අයියා එනවා කමනි ඇන්ටිවත් දැක්කද දන්නෙ නෑ.. මට අපේ ගෙවල් වටේ ඉන්න මෙලෝම එකෙක් ශුවර් නෑ.. හැමතිස්සෙම ඉන්නෙ අපිට කතාවක් හදන්න බලාගෙනම තමයි.. බැරිවෙලාවත් දැක්කනම්.. මම හතර අතේ දෙයියොන්ගෙන් ඉල්ලුවෙ එහෙම දෙයක්නම් වෙන්න එපා කියලා.. ඒ වුනාට කවුරුත් පාරෙ හිටියෙ නැනෙ.. පාන්දර දෙකහමාරට කවුද නගිටගෙන අපේ ගේ දිහා බලාගෙන ඉන්නෙ.. රධ්‍ය අයියත් මොන මගුල් කරනවද හිතාගන්න බෑ.. එයාටත් හිතට අමාරු නිසා එන්න ඇත්තෙ.. නැත්නම් අපෙ අම්මා ගෙදර නැති වෙලාවකවත් ගෙට එන එක්කෙනෙක් නෙමෙනෙ.. තියා අපේ ගෙදර ආවට මගේ කාමරේටවත් ඇවිල්ලා නෑ.. ආවහම අම්මා එක්ක කතාකල්ලා සාලෙම ඉදලා යනවා මිසක්.. එහෙම එක්කෙනා ඊයෙ රෑ ආව කිව්වහම හිතාගන්නත් බෑ.. හිතේ ප්‍රශ්න තියෙනවා දාහක් විතර.. මගෙ ඔලුව රදෙත් වගේ.. මම එහෙමම සීට් එකට ඔලුව තියාගෙන පොඩ්ඩක් ඇහැ පියාගත්තා..

මට හොදටම නින්ද ගිහින් ආයෙම ඇහැරුනේ බැක්පැක් එකේ ඉස්සරහ පොකට් එක වයිබ්‍රේට් වෙනවා අතට දැනුන නිසා.. මම ගැස්සිලා ඇහැරිලා වටපිට බලද්දි හම්බන්තොටටත් කිට්ටු කල්ලා.. අපේ අම්මනම් මොන මනුස්සයෙක්ද මන්දා.. නිදි නිදි.. තාම නිදි.. හරියට ගෙදර නිදාගන්න නෑ වගේ.. මම මූණ අත් දෙකෙන් පිහිදගෙන ෆෝන් එක එළියට ගත්තා..

**Radhya (DGC) Calling...**

මම ෆෝන් එක ආන්සර් කල්ලා කනේ තියාගත්තා..

" මම කීපාරක් කෝල් කලාද ඔයාට.. දැන් කොහෙද ඉන්නෙ.."

මේ යකා හලෝ කියන්නෑ හැමදාම ගත්ත ගමන් දබෝස් ගාලා අහන්න තියෙන එක අහනවා.. ඉස්සෙල්ලා කතාකල්ලා බලපන්කො මොකාද කතාකරන්නෙ කියල.. අපෙ අම්මා එහෙම ගත්තනම්.. මහ මොන

@Shan

මනුස්සයෙක්ද මන්දා.. මම ඒකාට හිතින් බැන බැන අහපු එකට උත්තර දුන්නා..

" තව පැයකින් විතර ගෙදර.. හම්බන්තොට හරියෙ.. අම්මා ගාව ෆෝන් එක තිබ්බෙ.."

" සෙනගද හුගක්.."

" දැන් නම් නෑ.. උදේ නම් හිටගෙන ආවෙ.. කොටුවෙන් හෙනට සෙනග.."

" ඒකතමයි මම දැක්කා.. අපරාදෙ කලින් යන්න තිබ්බෙ.."

" කලින් යන්නත් පන්ති තිබ්බනෙ ඉතින්.. කොහෙ යන්නද.."

" මම කන්න හැදුවෙ.. තව පැයකින් විතර කියන්නෙ පහමාර විතර වෙයි නේද යද්දි.."

" ඔ ඒ වගේ වෙයි තමා.. මෙච්චරවෙලා කන්නැතුව මොකක් කලාද.."

" අයිය එක්ක ටවුන් ගියා බං.. හෙන මහන්සී.. පුදුම සෙනගක්නෙ ඉන්නෙ කඩවල් වල.."

" ඒකතමා.."

" අම්මා එක්ක පරිස්සමට යන්න වරද්.. ගෙදර ගිහින් මැසේජ් එකක් තියන්න මට..බුදුසරණයි.."

" හරි බුදුසරණයි.."

මම කෝල් එක කට් කරද්දි අම්මා නැගිටලා ඉන්නෙ කොහෙද මිටර් නැතුවද කොහෙද..මං දිහා බලාගෙන ඉන්නවා..

" කොහෙද ළමයො දැන්.."

" තව වැලිගත්ත හරියෙ.. ඉතුරු ටිකත් නිදාගත්තනම් තමා හරි.."

" මේ පොඩ්ඩක් ඇහැ පියවුනා.. මම ඇහැරිලා හිටියෙ.."

@Shan

" අනේ හා.. ඇහැරිලා නම් තමා හිටියෙ.."

අපෙ අම්මගෙත් තනිකර බොරුව තමා තියෙන්නෙ.. ඇහැරිලා හිටිය හැටි දකින්න තිබ්බා.. ඔහොම පැයකට විතර පස්සෙ අම්මයි මමයි හිටියෙ ගෙදරට යන පාරෙ කඩේ ඉස්සරහා.. අම්මා දැකලා අඳුරන අය කීපදෙනෙක්ම නැවතිලා කතාකරද්දි මම අර තඩි බෑග් එකත් උස්සගෙන බැක්පැක් එකත් එක කරක එල්ලගෙන ගේ දිහාවට ඇවිදගෙන ගියා.. මම අඳුරන උන් මෙහේ ඇත්තෙ නෑ.. බස් එකේදි චෙක් ශර්ට් එක ගලවලා ඉණේ බැඳගත්ත නිසා ලොකුවට දාඩියක් නෑ.. ඒ වුනාට හති හොඳටම මේ ටික ඇවිල්ලා.. අපේ අම්මා නිසා හොඳ කටු තමා මමත් කන්නෙ..

මම ගේට්ටුව ඇරගෙන ගෙදරට යන්න හදද්දි අර එහා ගෙදර නංගි වැට අයිනෙ මල් වට්ටියකට මල් කඩනවා.. බුදුපහන තියන්නද කොහෙද.. මාව දකලා මහ අමුතු හිනාවක් දාගෙන ඒකි රතුම රතු වෙලා කොණ්ඩෙත් ගස්ස ගස්ස ඒකිගෙ ගේ ඇතුළට දුවගෙන ගියා.. මෙකිට මක් වෙලාද..

මම ශේප් එකේ පහත් වෙලා බැලුවෙ කලිසමේ සිප් එකවත් ඇරිලද කියලා.. එහෙම මගුලක් නැනෙ.. මේ ගෑනුන්ටත් මල සමයං..

මම ඒ මගුල් ගනන් ගන්නැතුව ගෙට යද්දි ආච්චිඅම්මා ඉස්තෝප්පුවට වෙලා ඉන්නවා පාර දිහා බලාගෙන.. අම්මා එනකල් වෙන්න ඇති.. මොකක් වුනත් ළමයනෙ ආච්චිගෙ.. මම ගියා විතරයි ආච්චි ඇවිත් මාව බදාගත්තා..

" ලස්සන කෙල්ලේ.. මගබලාගෙන ඉදලා වගේ.."

" අනේ පලයං කොල්ලො.. කෝ අම්මා.."

" අන්න කඩේ ගාව නතරවුනා.. දැන් එයි.."

" එහෙමද.. ගෙට යං ගෙට යං.. සුදුමහත්තයා තෙහෙට්ටු පාටයි හොඳටම.. කළුවෙලාද මන්දා.."

මම ආච්චිඅම්මා එක්ක ගෙදරට ගිහින් බෑග් ටික සාලෙන් තියලා මගේ කාමරේට වැදුනා.. ආච්චිඅම්මා මට අලුත්ම කොට්ට උරයි බෙඩ්ෂීටුයි දාලා කාමරේ අස් කල්ලා තිබ්බා.. කාමරේ හඳුන් සුවඳයි.. හවසට ආච්චිඅම්මා සාම්බ්‍රාණි අල්ලනවනෙ..

@Shan

මම සපත්තු අනම් මනම් ගලවලා ටවල් එකක් පටලගෙන ඉක්මනට නාන කාමරේට පැනගත්තා.. අම්මා එන්න කලින් නාගන්නෝන.. නැත්නම් මට පැය ගානක් ඉන්න වෙනවා අම්මා එනකල්..

මම හිතේ හැටියට පැයබාගයක් විතර හොදහැටි නාගත්තා.. වතුර අයිස් වගේ සීතලයි..ළිදේ ලාවට කිවුල වගේ තිබ්බට වතුර සනීපයි.. ඒ අස්සෙ මට මතක් වුනේ එහාගෙදර නංගි.. මාමත් ආවහම හොයන්නෝන කවුද ඒ කියලා.. මාව දැක්කහම රතුවෙන්නෙ ඒකිට රක්තපාතෙද දන්නෙ නෑ.. ඔහොම කලින් රතුවෙච්ච එකෙක් හිටිය ආපේ ඉස්කෝලෙත්.. පස්සෙ ඌ මගේ වෙන්න මිනිහා වුනා.. දැන් රක්තපාතෙ හොදයි.. යන්තම් ප්‍රෙශර් තමා වැඩිවෙලා තියෙන්නෙ..

මම නාගෙන ගෙට එද්දි ආයෙම රධ්‍ය අයියා ගන්නවා.. පුදුම මූලග්ගින්නක්නෙ තියෙන්නෙ දෙයියනෙ.. මම මෙහෙ ආවහම හිතුවද දන්නෙ නෑ මම ගමෙන් කැල්ලක් දාගනී කියලා ලස්සන.. ඒ වුනාට මම ගැමි ලඳවල් වලට ආස නැනෙ.. ඕවා රධ්‍ය අයියා දන්නදව ඉතින්.. නැනෙ..

" කියන්නෝ.."

" ආවද ගෙදර.."

මම කාමරේ දොර වහලා ෆොන් එක ස්පීකර් ඔන් කල්ලා ඇඳ උඩ තියලා දිග කලිසමක් අඳින්න ගත්තා..

" ආවා.. නාලා මම මේ ඇඳුම් අඳිනවා.."

" ඇඳුම් අඳිනවා??"

" ඕ ඇයි තවුසෙ අඳින්නෑ නැවට පස්සෙ.."

" නැනෙ හෙළුවෙන් ඉන්නෙ..මම මේ ඒකයි උඹෙන් ඇහුවෙ.."

" ආතල් ඇති හැබැයි නේ හුළං වැදි වැදි ඉන්නකොට.."

" ම්ම්.. මාර ආතල්.. උඹත් ඉදලා බලපන්.."

" මෙහෙ බැනෙ ඉතින්.. අල්ලපු ගෙදර නංගි දැක්කොත් එහෙම හරි නැනෙ.."

@Shan

මම කලිසම උඩට ඇදගෙන අර නූල ගැටගහගෙන ශර්ට් එකක් දාගත්තා..

" අල්ලපු ගෙදර..?? අල්ලපු ගෙදර ගෑණියෙක් ඉන්නවද.."

සැක් මුගෙ ඉරිසියාව.. දැන් ඉතින් ඒ කෙල්ලගෙ ඉපදුන තැන ඉඳන් කියන්න වෙයිද දන්නෙ නෑ..

" ගෑණියෙක් කියන්නෙ ඔව්.. එයාගෙ අම්මා තමා ගෑණියෙක්ට ඉන්නෙ එතකොට ගෑණු දෙන්නයි.."

" ගොඩක් ලොකුද.. කීයක් විතර..??"

මේ මිනිහා මොනවා අහනවද මන්දා.. මම ටක් ගාලා ෆෝන් එකේ ස්පීකර් ඔෆ් කලා.. ඒකි ඉතින් කීයද කියලා මම දන්නවයැ.. මම වික්ටෝරියාස් සීක්‍රට් එකේ වැඩ කරන්නෙ නැනෙ..

" මම කොහොමද ඕයි ලොකුද නැද්ද දන්නෙ.. මොනවා අහනවද මන්දා.. ඊය හලෝ.."

" මම ලොකුද ඇහුවෙ වයස බං.. උඹනම් මහ මොකෙක්ද මන්දා.."

" ආ ඒකද.. දන්නෙ නෑ අනේ.. මම මෙහෙ එන්නෙත් කාලෙකට සැරයක්නෙ.. මාව දැකලා ඒ නංගී ගේ අස්සට දුවගෙන ගියා.."

" ආ එහෙනං උඹට නංගී ලයින් ඇති.."

" මං කොහොමද ඉතින් දන්නෙ.."

" ගෙට වෙලා ඉදපන්.. ගෑනුන්ට පේන්න රෝන්දෙ ගහන්නැතුව.. ගියා කෙලගෙන ගමේ.."

" හරි හරි  අප්පා.. මම යනවද එහෙම.."

" මම.."

" කෝ අප්පච්චි ගෙදරද.. ආයෙ රණ්ඩු කලේ නැනෙ.."

" ඉන්නවා අරහෙ..මම කතාකරන්නෙ නෑ.."

@Shan

" එහෙමද.. අලුත් අවුරුද්දෙ රණ්ඩු වෙන්න යන්න එපා අයියෙ.. මොකක් වුනත් ඔයාගෙ අප්පච්චිනෙ.."

" මම්.. මම්.. ඉක්මනට එනවකො ලබ්බ මෙහේ.."

" එන්න ඉතින් වදේ මම දැන්නෙ මෙහෙට ආවෙ.. මාර කතා තමා කියන්නෙ.."

" මම්.."

" පිස්සු තවුසෙට.. ඉරිසියාව, ඉරිසියාව ඕකට කියන්නෙ.."

" ඉතින් මගෙ එකාට ඉරිසියා හිතෙන්නැතුව උඹ මට කියන්නෙ මොකක් කරන්නද.."

" අනෙ මේ මම තවුසෙගෙ නෙමේ.."

" එහෙනං.."

" ආධ්‍ය අයියගෙනෙ.. මට රස කැමත් උයලා දෙනවනෙ.."

" ඇයි උඹ ලැස්තිවෙන්නෙ එක ගෙදර කන්නද.."

" ඇයි ඉතින් අපිට එක ගෙදර කන්න බැරිද.. කොහෙ කැවත් බඩටනෙ යන්නෙ.."

" අනේ මේ වරද්.. තියපං ඔය ෆෝන් එක.. උඹ එක්ක කතාකරන්න බෑ.. අහන මගුලට නෙමෙ උත්තර දෙන්නෙ.."

" තවුසෙ වයසට යයි හලෝ ඔහොම තරහ ගත්තොත්.. යූ නීඩ් ටු කාම් ඩවුන්.. යූව බීන් ටූ ලවුඩ්~"

" කුණුහර්ප කතානොකර ඉදපන්.. මහ වාචාල කටත් උඹටනෙ තියෙන්නෙ.."

" කමක් නෑ මගෙ කට මට හොදයිනෙ.."

@Shan

" යකඩ කට.. උඹ ඊයෙ මගේ පපුවෙ පැත්තක් හපලා.. බලපන් ශර්ට් එකක් නැතුව ගෙදර ඉන්නත් නෑ.."

මම කොහෙද උගෙ පපුව හැපුවෙ.. හරි මගුලක්නෙ නොකරපු ඒවට මාව අල්ලගන්නෙ.. මම හැපුවෙ නෑනෙ.. ඒ කියන්නෙ මුගේ පපුව මොකෙක් හරි හපලා.. දෙයියනේ..

" මම හැපුව එකක් නෑ හලෝ.. කවුද තවුසෙගෙ පපුව හැපුවෙ.. මම නැත්නම් වෙන එකෙක් ඉන්න එපැයි හපන්න.. කියපන් අයියෙ.."

" මොක්-වරද්!!! උඹට මොන හොල්මනක් වැහිලද.."

" හොල්මන් නෙමෙ මම සිරා කතාකරන්නෙ.."

" ආ උඹ සිරාද.. මම හිතුවෙ වරද් කියලා.. සොරි සොරි.."

" ඕයි අයියෙ කතාව වෙනස්කරන්නෙපා.. කියපන් උඹ හැපුවෙ මොකාද.."

" මොකාද අහ්න්නෙ උඹනෙ ඊයෙ රෑ අත කියලා හිතාගෙන මගෙ පපුව හපලා කැලි කඩලා අරගෙන තියෙන්නෙ.."

සැක් මම එහෙමත් කල්ලද.. එතකොට ඒ අත නෙමේද.. මම මොනවද හිතුවෙ..

" ඌප්ස්.. එහෙමද.."

"...."

" සොරි වෙන්නෝන.. කවුද ඉතින් දන්නෙ.. තවුසෙත් මහ රෑ කළුකුමාරයා වගෙ එනවා.. මෙලෝ ලබ්බක් පේන්නෙත් නෑ.. හොදවැඩේ.."

" අනේ මේ හිටපං.. දැන් කාලා නෑනෙ.. ගිහින් කාපන්.. උඹ කන ඔක්කොම යන්නෙ කටටනෙ.."

" නරක් වෙලා තියෙයි.. මම යනවා තවුසෙ එක්ක කතාකරන්න බෑ.."

" මම්.. එහා ගෙදර ගෑනි එක්ක තොදොල් වෙන්නෙ නැතුව පාඩුවෙ ඉදපන්.. බුදුසරණයි.."

@Shan

" බුදු- ටික් ටික් ටික්.."

අර දැක්කනෙ ගැටපොලොස් කොට්ටොරුවා කිව්වා තිබ්බා.. අනේ මූ එක්ක යාලුවෙන්නමයි තියෙන්නෙ.. යාලුවෙලා කනවා මුගෙ ඔලුවෙ ඉඳන්.. සිප්පි කටු හැකරුල්ලා.. තියෙන පැලියාව..

ඒ ලමයි මල් කඩනවා.. ඔය ලමයි වැඩක් බලාගම්න..

හෙඩ් වා එකක් දෙක්ඳකො කියපන් මම සෙනුකගෙ අර කරකන පොල්ලෙන් දෙනවා පුප පැලෙන්න..

(ඒම කරනවත ඒයිම් මම.. විහිලුවට කිව්වෙ පිම්සු කෙල්ලොහ් ටික..රට එඤ්ඤම්)

ඔය මොකක් කිව්වත් මහින්ද මහත්තයා නැත්නම් මෙවා අප්ඩේට් කරන්න රටක් ඉතුරු වෙනවද.. නෑ.. උබර්ලා මොකුත් දන්නෙ නෑ බං..

එන්නාම්.. ලව් යු❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 41 කොටස

" අනේ මේ මාමෙ.. මට බෑ අප්පා.. මගුල.. කොන්දත් රිදෙනවා.."

" පිස්සු කෙලින්නැතුව ගිහින් කිකිරිදිය ටිකක් කඩාගෙන වරෙන්.. අර වෙල නියරෙ ඇති ඕනතරම්.."

" නියරෙ තියනවා ලබ්බක් තමා.. රෙද්ද.. මම යනවා දමලා ගහලා යන්න.."

" ඔව්.. ඔහොම ගිහින් අන්න අතනින් වෙලට බැහැලා කඩාගෙන වරෙන්.. හොඳ එකානෙ.."

" අනේ පලයන් මාමෙ.."

මම මාමටත් රවලා ගස්සගෙන දාගෙන වෙලට බැස්සා.. මේ අපේ අම්මගෙ මලයා ඉන්නවා ඌට පුදුම ඇම්මනෙ තියෙන්නෙ.. අත පය නිකම් තියාගෙන ඉන්න බෑ.. දැන් බෙහෙත් තෙලක් හිදින්න ඕනලු ඔලුවෙ ගාන්න.. මොන මගුලකට ඩෙන්ටල් ඩොකෙක් උනාද මටනම් හිතාගන්න බෑ.. මෙකා යවන්න තියෙන්නෙ වෙද ගෙදරට..

මාමා ආමි මෙඩිකල් කොප්ස් වල ඩෙන්ටල් ඩොක්ටර් කෙනෙක්(යුධ හමුදා වෛද්‍ය බලකායෙ).. මම හම්බුන අවුරුද්දෙ තමා ඩයල් එක දෙපාරක් ඒ ලෙවෙල් ලියලා කැම්පස් සිලෙක්ට් වුනේ.. ඒකනිසා ඒකා කියන්නෙ මමලු එයාගෙ ලකී ස්ටාර් එක.. පලවෙනියටම මාමා කෙනෙක් වුනේ මම නිසාලුනෙ.. ඒකලු කැම්පස් ගියේ ඒ අවුරුද්දෙ.. කොහොමහරි කමක් නෑ ඩයල් එකට පිස්සු තදටම.. කැම්පස් කාලෙ ලව් එකක් තිබිලා ඒක එහෙමම කැඩිලා තාම බැඳලා නෑ.. ගෙදරට නාකි වෙවී ඉන්නවා.. මම ඕක අල්ලගෙන දවසක් කියවද්දි මට කියනවා උඹ ආදරේ ගැන දන්න පකක් නැහැල්ලු.. කමක් නෑ දැන් දැනගන්නනෙ ඉන්නෙ..

මම වත්ත පල්ලෙහායින් වෙලට බැහැලා නියර දිගේ මාමගෙ අර මොකක්ද පැලේ හොයන්න බිම පාත් වෙවී වෙවී ඉස්සරහට ගියා.. ඉස්සර වගේ නෙමේ.. කිකිරිදිය දැන් නෑ හොයාගන්න කොහේවත්.. නාකි විසේ.. කොණ්ඩෙ කලු වෙන්න තෙල් හිදිනවා පුප ඉරාගෙන.. හිතේ ඇත්තෙ තාම කොල්ලා කියලා.. ලස්සනයි තමා ඒ වුනාට වයසනෙ..

@Shan

මම නියර දිගේ නැමීගෙන ඇවිදගෙන ඇවිදගෙන ඉස්සරහට යද්දි මට එකපාර ඇහැට හම්බුනේ කළුපාට නියපොතු තියෙන සුදු පාට කකුල් දෙකක්.. ඉර මද්දහනෙ යක්කුත් ගස් නගිනවා.. මම බයවුනා නහුතෙටම.. ඒ වුනාට ගස් නගින වෙලාවනෙ.. ඉතින් මේ ඉන්නෙ ගහෙන් බිමනෙ.. මාව දැකලා බිමට බැස්සද දන්නෙත් නැනෙ.. මම එහෙමම නැමිලා කකුල් දෙක උඩට උඩට බලාගෙන බලාගෙන එද්දි මේ යකා ගානට කකුල් දෙක ශේව් කරලනෙ දෙයියනෙ.. රාබු අල දෙකක් වගේ.. ඉතින් මම මොකක්ද කිය කිය හිටියෙ.. ආ.. උඩට බලාගෙන ඒදි මම දැක්කෙ ලා රෝස පාට ගවුමක්.. මම එහෙමම බයවෙලා කොන්ද කෙලින් කරගත්තා.. සැක් ගෑනියෙක් නේද මේ.. මම පහල ඉදන් උඩට බැලුවහම මොනව හිතුවද දන්නෙ නෑ..

" අහ් සොරි නංගි.."

මූණ දිහා බලද්දි නාලා කොණ්ඩෙත් කඩාගෙන මගේ ඉස්සරහා නැලවි නැලවි ඉන්නෙ අල්ලපු ගෙදර රක්තපාතෙ හැදිච්ච නංගි.. මම ඉතින් මැනර්ස් ඇති එකා වගේ නියරෙන් වෙලට බැහැලා නංගිට යන්න දුන්නා.. පලයන්කො ඉතින්.. මූණ දිහා බලාගෙන මොන මගුලක් කරනවද..

" නංගි යන්නෙ නැද්ද.."

" නැනෙ අයියෙ.. ඔහේ මක්කයි බිමට නැමීගෙන කරන්නෙ.."

" ඈ.."

සැක්.. මේ මොනෞත්තක්ද මට සෙට් වුනේ.. අපිට සෙට් වුනොත් ඔහොම හත්වලාමක් තමා..

" ආ නංගි මම මේ බෙහෙත් පැලයක් හොයනවා.."

" අයියට උදව්වක් ඕනෙයි.."

" ආ එපා නංගි..මම හොයාගන්නම්.. තැන්ක් යූ.."

" ඕක මොකක්ද අයියෙ මම ඔහෙට හොයලා දෙන්නම්.. මොකක්ද ඔය පැලේ නම.."

" කිකිරිදිය.. දන්නවද.."

@Shan

" මොකෝ මම දන්නැත්තෙ.. මෙ පැත්තෙ ඔහේ හොයන ඒවා නෑ අයියෙ.. අර කුඹුක් ගහ යට හරියෙ ඇති ඕනතරං.."

" ආ හරි හරි.."

මම නියර උඩම තියාගනින් නංගී කියලා වෙලෙන්ම මඩ උඩින්ම කුඹුක් ගහ පැත්තට යන්න යද්දි මෙන්න මෙකි පගෙ පස්සෙන් එලෝනවා.. එහෙම කිව්වට හිමින් ආවෙ..

" අයියෙ ඔහේ ඒ පැත්තට යනවනං මාත් එන්නෙයි.. අපෙ අම්ම මට කලවම් පලා හදන්න කොළ කඩාගෙන එන්නෙයි කිව්වනෙ.."

" ම්ම්.."

මම පය ඉක්මන් කල්ලා මාමගෙ අර පැලේ හොයන්න ගියා.. හරිනෙ ඔය ගොඩදාගත්තෙ හොඳවයින් හූනියමක්.. මෙකිට කොණ්ඩෙ බැඳගන්න කිව්වනම් හරි.. බය හිතෙනවා කොණ්ඩෙ හුළගෙ යද්දි.. යකින්නියෙක් කියලා.. අනික දාඩිය නැද්ද මන්දා.. අනේ ඒකිට දාඩිය දැම්මා තියා මීමැස්මොරේ හැදුනත් මට අමාරුවද..

ඒකි කලවම් පලා කඩද්දි මම ඒකිට මීටර් සීයෙ ඇතින් ඉදගෙන අර කිකිරිදිය ගාලෙන් මුල් පස් සේරම එක්ක පැල අහුරක් ගලවගත්තා..

" නංගී මම යනවා.."

" ඕ ඉන්න මාත් එන්නං.."

" ආ-හ් හා.."

එහෙම කිව්වට මම හිටියෙ නෑ ඉක්මනට ගේ පැත්තට ආවහම අරකිත් තියන සේරම හොල්ල හොල්ල නියරවල් වලින් පැන පැන මගෙ දිහාවට දුවගෙන එනවා.. මෙකි හොදයි ගම හරහා දුවන්න යවන්න.. කොහොමහරි මගේ කකුල් දෙකට පිං සිද්ද වෙන්න මම වත්තට අඩිය තියද්දි අපේ මාමා ඉන්නවා ඔංචිල්ලාවෙ පැද්දි පැද්දි.. යසයි.. මාව කට්ට අවුවෙ යවලා ඔංචිල්ලා පදින්න.. මම පිටිපස්සෙන් ගිහින් ඔංචිල්ලාවට පාරක් දුන්නහම මාමා දඩාස් ගාලාබිම ඇදගෙන වැටුනා..

@Shan

" පිස්සුද උඹට.. කොන්දත් ඇද වුනාද කොහෙද.."

" ඇපෝ කයිය කොහොමද හමුදාවෙ අරකයි මෙකයි.. වැඩක් නැනෙ ඔයි මෙකෙන් වැටුනහම පොට ගියාද.."

" ගියා පොට නෙමෙ-"

" අයියේ..!! මම යනවා..!!!!!!!!! ඔහේට බෙහෙත් මක්කහරි ඕනනං අපේ වත්තෙන් කඩාගන්න.."

අර එහා ගෙදර නියපොතු කළුකරපු මල යස්සනී පලා මිටියත් වන වන එහා වත්තට යද්දි මාමා මගේ දිහා මහා කුප්ප මනමාල බැල්මක් දැම්මා.. හරිනෙ.. මෙ ගෑණු මාවමනෙ කන්නෙ..

" මගෙ පුතාට සිකුරා ලබලා වගෙ-යී~"

" අනේ මෙ මාමෙ.. සිකුරා නෙමෙ ඒකිනම් මහ වාමන ග්‍රහයෙක්.. කක්ශගතව නෙමෙ රොන්ග්සයිඩ් එන්නෙ.. බයත් හිතෙනවා.. කටෙ සද්දෙ බලනවකො.."

" සැක් උඹ මෙකි එක්ක එහෙම යාලුවෙන්නෙපා.. ඔකිගෙ අප්පා මම පොඩිකාලෙ මම ඇලේ නාද්දි මගේ රතුකෝප්පෙ පැළුවා.. පරයා.. කියන්න ඕන උන්ට දෙන්නෙ මෙහෙ කොල්ලො නෑ කියලා.."

" මොනවද බං මාමෙ මේ කියවන්නෙ.. ගංජ ගැහුවද.."

" මම මතින් තොරයිනෙ පුතේ.."

මාමා බුලත් කොලේක තඩි දුංකල කැල්ලක් ඔතාගෙන කටෙ ඔබාගන්න ගමන් මට කිව්වා.. ඇයි.. ඇයි මම මෙකා එක්ක කතාකරන්නෙ.. මට එපැයි ගහන්න.. අර වෙලේ ඔබල මැටි ගහන්න ඕන..නල්ල මලේ ඩෙන්ටල් ඩොක්ට.. ඒවුනාට බුලත් කනවා.. මොකෙක්ද මන්දා.. මම මාමට රවලා ගෙයි පිටිපස්සෙන් කුස්සියට රිංගගත්තා.. අම්මයි ආච්චියි තඩි පචයක් හලනවා කුස්සියෙ ඉදන්..

" අම්මේ මාමා බුලත් කනවා.."

" බුලත්..?? බුලත් කොයින්ද.. එන්න කියනවා මාමට.."

@Shan

අපෙ අම්මා පොල් බෑයත් පැත්තකින් තියලා එලියට බැස්සා.. දෙන්නම පුතේ.. අපේ මාමා අපේ අම්මගෙ සහෝදරයට වඩා පුතෙක් වගේ.. මෙකා බුලත් කනවට අපෙ අම්ම කැමති නෑ..

" මහත්තයෝ.. මෙහෙ එනවා.."

" ඕ පොඩි අක්කෙ.."

" උඹ බුලත් කනවද.. ඇරපං බලන්න කට.."

අම්මා බිත්තියට හේත්තු කල්ලා තියෙන ඉදලත් උරුක් කරගෙන මාමගෙ කට අරින්න යද්දි මම ශේප් එකේ ආච්චිඅම්මගෙ වටේ වටයක් කැරකිලා කාමරේට ගියා.. අදට ඔය වැඩ කලා මදෑ.. පිටිත් කොටලා බෙහෙත් කොළත් හොයන්න ගියානෙ.. ආ තව දරත් කඩන්න ගියා..

මම ඇඳේ හරහට හාන්සි වෙලා ෆෝන් එක අතට අරගෙන ආපු මැසේජ් බලද්දි ආධ්‍ය අයියා මට වීඩියෝ එකක් එවලා.. මම ඒක ඕපන් කල්ලා ඒක බලපු පාර උගුරෙ කෙලත් හිරවෙලා මට කැස්සකුත් අල්ලලා මැරෙන්න ගියා..

රධ්‍ය අයියා බැල්කනියෙ ටවල් එකකුත් ඇඳගෙන පස්ස එහෙ වනනවා මෙහෙ වනනවා.. ඒ රිදම් එකටම කියාරාත් පස්ස එහෙට වනනවා මෙහෙට වනනවා.. මරු ජෝඩුව..

My name is no(පස්ස දකුණට වනනවා)

my sign is no(පස්ස වමට වනනවා)

my number is no(ආයෙම පස්ස දකුණට දෙකක් වනනවා)

You need to let it go //

Need to let it go(ආයෙම වමට දෙකයි)

Nah to the ah to the, no, no, no(දකුණටයි වමටයි තුන්පාරයි)

මම ඒකට කඳුළු පැනගෙන හිනාවෙන ඉමෝජි දෙකක් යවලා රධ්‍ය අයියට මැසේජ් එකක් දැම්මා..

@Shan

" ඔබගේ නර්තනය මා අමන්දානන්දයට පත් කලා.."

විනාඩි පහක් විතර ගියා.. මම මහීශා එක්ක කියව කියව හිටියෙ ඒ එක්කම රධ්‍ය අයියගෙන් මැසේජ් එකක් ආවා..

" අපේ අයියා උඹට මොකක් හරි එව්වද.."

" පිස්සුද අනේ.."

" ඔහොම ඉදපන්.."

" ඔම්කේ.."

මම නිවීහැනහිල්ලෙ ඇදේ වටයක් පෙරලිලා කොට්ටෙ අස්සෙ මූණ ඔබාගත්තා.. අපේ අම්මා මාමව මරන හොයනවද කොහෙද.. පවු ඉතින්.. මොනව කරන්නද.. අපේ තනිකඩයව හදාගන්න නෙ මේ හැමදේම කරන්නෙ..

**Radhya (DGC) Calling...**

" කියන්න.."

" හැබැයි උඹ ඕක කාටහරි යවලා වත් තිබ්බොත් මම උඹව මරනවා වරද්.."

" කාට යවන්නද අනේ.. මම ඒක නිකම ෆෝන් එකේ තියන් ඉන්නම.."

" ඒ මොකටද.."

" ස්වයංවින්දනේ කරන්නනෙ වෙන මොකටද.."

" වරද්!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

රධ්‍ය අයියා ෆොන් එකේ එහාපැත්තෙන් මගේ කන පැලෙන්නම කෑගැහුවා.. අනේ දෙයියනේ මම මේකා ගැන හිතාගෙන හිටියෙ කොහොමද.. හෙන ගටෙන් ඉන්න පොරක් කියලනෙ.. සැක් බයවෙලත් හිටියා කාලයක්.. මටම ලැජ්ජයි දැන්නම්..

" කෑගහන්න එපා අප්පා කන රිදෙනවා.."

@Shan

" මට තේරෙන්නෑ උඹනම් මොනවගේ එකෙක්ද කියලා.. ලැජ්ජාවක් නැති මහ-මහ"

රධා අයියට මං ගැන කියන්න වචන නැතුව මගදි හිර වුනා.. කලින් හදාගෙන එපැයි කියන්න.. එතකොට හිර වෙන්නෙ නැනෙ..

" මේ ඒකනෙමේ අයියෙ තවුසෙගෙ නම රධා නෙ.. ඒක නිකම් රාධා වගේනෙ..ඒවුනාට මට රාධා කිව්වහම සීතාව මැවුනා.. මට මේ උදෙත් මතක් උනා.."

" ඇයි උඹට මතක් කරන්න වෙන දේවල් නැද්ද.. මගෙ නමම මතක් කරන්නෙ.."

" නැනෙ ඒකනෙ කියන්නෙ.. ඔයාවමයි මතක් වෙන්නෙ.. I can't write one song that's not about you.. Can't drink without thinkin' about you.. Is it too late to tell you that.. Everything means nothing if I can't have you?"

"...."

" අනාව් රාධා..ඌප්ස් සොරි.. සීතා.. කෝ ඔයාගෙ රාමා.. රාමා නැද්ද.. රාමා ඕන්නෑ අනේ ඔයා එන්න මේ රාවණා එක්ක.. ගෑනු හරි චපලයි.."

" දැන් උඹ ඔය රාමායනේ ගේ වර්ශන් එකක් ගහන්නද යන්නෙ.."

" අන්න රයිට්.. වාල්මිකීගෙන් සමාව ඉල්ලගෙන ලියමු අපි රාමායනේ මුල ඉදලා.. මන්දෝදරීලත් ඕන්නෑ සීතාලත් ඕන්නෑ.. මේක ඇවිල්ලා 'රාමාවණය'.."

" උඹට පිස්සුද බං.. සිරාවටම මම අපේ අයියගෙන් අහලා සයිකැට්‍රිස්ට් කෙනෙක් චැනල් කරන්නද.."

" තවුසෙ ඔය හදන්නෙ මම පිස්සෙක් කියලා හිත යටින් ගේමක් ගහලා මාත් එක්ක යාළු නොවී ඉන්නනෙ.. නේහ්.. මම දන්නවා තවුසෙ මට හොරෙන් හිතන ඒවා.. මට දැනෙනවා.."

" ආ උඹට දැනුනද.."

@Shan

" ම්ම්.. නැත්නම් තවුසෙ ප්ලෑන් ගහන්නෙ මට හොරා තව එකෙක් ලයින් කරගන්න.."

" උඹ කියනකල් මට ඔහොම මගුල් හිතිලත් නෑ.."

" හිටපං අයියෙ මම කතරගම දේවාලෙ ගිහින් පොල් ගහනවා තවුසෙට සහකාරයො දෙන්නෙක් ඉන්නවා කියලා.."

" ඉතින් බං කතරගම දෙයියොන්ටත් දෙන්නෙක් හිටියනෙ.. ඒක හරියන්නෑ වෙන කොහේහරි පලයං.. උඹ එතන ගිහිල්ලත් දෙයියෝ කෝප කරනවා.."

සැක්.. ඔව්නෙ.. කතරගම දෙයියෝ මේ වැඩේට සට් නැනෙ.. යන්න ඕන පත්තිනි දේවාලෙටවත් එහෙනම්..

" අනේ මේ තවුසෙ ඉන්නවා.. මම ඒක කරගන්න.. අනික මම තවුසෙට කැමති නැනෙ.."

" ම්ම්.."

" කාලද ඉන්නෙ.."

" බලපන් මම කාලා උඹෙන් කැවද අහන්න ගත්තෙ.. මෙතන වෙන අටල්පහුරු කියවලා මට ඒකත් අමතක වුනා.."

" මම කෑවා..බලන්නකො නේද මං එක්ක කතාකරද්දි ඔයාට අහන්න තියෙන ඒවත් අමතක වෙනවනෙ..නේද.."

" ඒකතමා.."

මට හිනායන්නත් එනවා.. හරි සිහියෙන්ද දන්නෙ නෑ ඉන්නෙ..

" මොකක්.."

" මොකුත් නෑ..ඔලුව කකියන්නත් ගත්තා උඹෙ රාමාවණේ අහන් ඉදලා.. මම තියනවා.."

" බුදුසරනයි.."

@Shan

" බු- ටීක් ටීක් ටීක්.."

මම ඇඳෙන් නැගිටලා උඩ පැනලා යෙස් එකක් දැම්මා.. හරිනෙ මම මුලින් කට් කලා.. ගැම්මක් තමා.. හිතේ ඇති හැමදාම මුලින්ම කට් කරන්න.. හෙන වැඩ්ඩා කියලා හිතාගෙන ඇත්තෙ.. මගේ වෙන්ඩ ගැටපොලොස් කොට්ටෝරුවා..

එන්න අපි ඉතිහාසය අලුතින් ලියමු

-රධ්‍යගෙ සේපාලිකා මල-

ආයෙම තා එකකුත් දෙන්නත් හිතෙනවා.. මේ ළමයා තාම ගමේනෙ හලෝලා.. කරන්න දේකුත් නෑ.. එක්කො තුනක් වැඩී නේත.. රධ්‍ය අයියා ගැන වාක්‍ය එක ගානෙ කොටන් ගියොත් නම් දෙනවාමයි..

එන්නාම්.. ලව් යූ.. ❤

ආදරේ නිසානෙ මේ හැමදේම.. ආදරේ ගිම්දරක්..

-රාදා-

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම් යම් කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 42 කොටස

ඉතුරු දවස් කීපෙත් ඉක්මනට ගෙවිලා ගිහින් ඉක්මනටම අවුරුද්දත් ආවා.. අවුරුදු දවස මොකක්ද මන්දා අටාමාරෙ ඉදන් පහයි ගානක් වෙනකල්ම නොනගතේ.. දවසෙම බඩගින්නෙ.. කන්නත් නෑ අපේ අම්මා නාග මාණික්‍ය රකින නාග කන්‍යාව වගේ කෑම මේසෙ ගාව ඉදන් පුප්පනවා පුප්පනවා ඉවරයක් නෑ.. ටැප් එකක්වත් අරින්න නෑ.. මමයි මාමයි වෙල පහලට ගිහින් ජම්බු වගයක් කඩාගෙන කාලා ඇවිදලා ආයෙම ගෙදර එන්න ආවා.. බඩගින්න ඉවසගෙන ඉදල බැරිම තැන රඩ්‍ය අයියට කෝල් එකක් අරගෙන ඌටත් බැනලා බැනලා තිබ්බා.. ඌ හොදට ගිලිනවා කාමරේ අස්සට වෙලා.. මම කිව්වහම බඩගිනී කියලා ඌ කියනවා අර හින්දු අය වගේ වෙන්න ස්වාමිපුරුශයා වෙනුවෙන් මට උපවාස කරන්නලු දීර්ඝායුශ පතලා.. පතනවා මම ඕකට.. ගැටහැලප පොලොස්කොට්ටෝරුවා..

අන්තිමෙ යාන්තම් ඔරලෝසුවට වැදලා වැදලා පහයි පහ උනාට පස්සෙ දෙයියනේ කියලා දකුණ හොයාගෙන කලින් හදපු ගානක් හදලා දාලා පොත කාමරේ කොහේටදෝ මන්දා විසික් කරගෙන හොදහැටි කෑවා මාමයි මමයි..

ඊටපස්සෙ ඉතින් කාමරේට තමා.. මාමගෙ කාමරේට රිංගත්ත මම මාමා එක්ක ගේම් එකක් ගහගෙන සාමෙන් සතුටෙන් ලැබුවාවූ නව වසර සැමරුවෙ පැයයි.. අපේ ආච්චි ඉස්කෝලෙහාමිනේ නිසා ගමේ මිනිස්සු තඩි පිගන් උස්සගෙන අපේ ගෙදර එන්න ගත්තා.. ඒ අස්සෙ අපෙ අම්මට ඕන වුනා මම කොච්චර ලොකු වුනාද කියලා අම්මා අදුරන යාලුවොන්ට පෙන්නන්න.. මම ඉතින් සැරින් සැරේ කතාකරද්දි දොර රෙද්ද මෑත් කරනවා දත් ටික පෙන්නලා හිනාවෙනවා කාමරේට රිංගනවා.. මල කරුමයක් ඒකනම්.. ඒ අස්සෙ පොඩි උන් ඇවිත් පාඩම් කරන හැටිත් අහනවා.. අනේ ලමයෝ මේ අයියා පාඩම් කරන හැටි ඇහුවොත් ඔය ලමයි මට පුපෙන් හිනාවෙයි..

" මුල ඉදන් හොදට පාඩම් කරන්න ඕන මල්ලි.."

" ඒකතමයි නේද නැන්දෙ.. ඔව් ඔව් ෆෝන් එක නම් ඕන නැනෙ මෙ කාලෙට.."

@Shan

" ටිවී බලලා නාස්තිකරන්න වෙලාවක් නෑ මල්ලි.. පාඩම් කරන්න ඕන හොඳට.."

" ඒකතමා අනවශ්‍ය දේවල්නෙ නැන්දෙ.. ඔවා කැම්පස් ගියහම පුලුවන්නෙ.. ඔව් ඔව් ඒකතමා.."

මම ඉතින් හැමෝම කියන සාමාන්‍ය බොරු ටික හෙන උපදෙස් ගානට දාලා මගෙන් පාඩම් කරන හැටි අහන උන් සේරටම කියල දැම්මා.. උන් දන්නැනෙ මම නටන නාඩගම්.. මොකෝ කුරුඳුවත්තෙ ඇවිත් ඔවා හොයන්නයැ.. නෑනෙ.. අපේ මාමටනම් ඒ අස්සෙත් විවාහ යෝජනා දෙක තුනක් සෙට් වුනා.. ඒ වුනාට ඩයල් එක ඔවට නෑ.. පාඩුවෙනෙ ඉන්නෙ.. හිනාවෙලා සයිඩ් ගහලා හිටියා..

අන්තිමේ ඔය විගඩම ඉවරවුනෙ මහ රෑ නවයට විතර.. මමයි මාමයි ඉස්තෝප්පුවට වෙලා පැණිවලල්ලක් කකා හිටියෙ.. මාමා ටිකක් වෙලා වෙල දිහා බලාගෙන ඉඳලා මගේ පැත්ත හැරුනා.. මොකක් හරි ලොකු දෙයක් කියන්න වගේ..

" කොල්ලො.."

" මාමෙ.."

" මම ඇහුවට මොකුත් හිතන්නෙපා.. අපි අපිනෙ බං.. උඹට කවුරුහරි කුරුඳුවත්තෙ සක්කරවට්ටමක් කොක්කක් ගැහුවද..මම බලාගෙන හිටියේ පුතේ.. උඹ හැරෙන්නෙ එච්චර හොඳකට නෙමේ.."

මාමා විහිලුවෙන් කිව්වා වුනත් ඒ වචනවල අමුතු අනතුරු ඇඟවීමක් තිබුනා.. මම ඒ වචන ගානකට ගන්නෙ නැතුව ඉන්න ට්‍රයි කලත් මූණෙ ඇඳුනේ මවාගත්ත බොරු හිනාවක්.. මාමට මම හැරෙද්දි කියන්න පුලුවන්.. හුගක් වෙලාවට අපි දෙන්නා එක වගේ.. හිතන්නෙ පතන්නෙ හැමදේම.. අනික මට තාත්තා කෙනෙක් වගේම ලගින් ඉන්නේ මාමා..

" පිස්සුද මාමෙ.. එහෙම මොකුත් නෑ.."

" නැත්තෙ නෑ උඹෙ මොකක් හරි තියෙනවා.. තිබ්බට කමක් නෑ කොල්ලො ඔය වයසට ඔවා ඔහොම තමා.. ඒ වුනාට පාඩම් වැඩත් ඒ වගේම කරගනින්.."

@Shan

" ම්ම්.."

" ඒ වුනාට..... ඕක බඳින්න වෙන්නෙ නෑ බං.."

" අනේ මේ මාමෙ.. පලයන්කො මගුල.. පිස්සු කියෝනවා.."

" කුරුඳුවත්තෙ කෑල්ල ලොකුද දන්නෑ.."

මාමා මගේ ඔලුවට එකක් ඇනගෙන ගේ ඇතුලට යද්දි මම ඉස්තෝප්පුවෙ තිබ්බ කණුව අත් දෙකින්ම බදාගෙන වෙල දිහා බලාගෙන හිටියා.. හරි පාළු පාටයි.. හුළං පාරවල් වලට මගේ නළලට වැටුනු කොන්ඩෙ ඉස්සිලා පිටිපස්සට යද්දි මම හුළගට මූණ අල්ලගෙන හිටියා.. කොච්චර අමතක කරන්න හැදුවත් මෙකම ඇයි උඩට එන්නෙ.. මට හිතාගන්න බෑ..

ඉතුරු දවසුත් ගෙවිලා ගිහින් අප්‍රේල් දහනමයත් වුනා.. මම එදා කොළඹ එන්න හිටියෙ ආපහු.. මාමා වැඩකලේ ත්‍රින්කො වල කෑම්ප් එකේ නිසා මාමා කලින්ම ගියා.. ඉස්සර නාරාහෙන්පිට වැඩ කලත් ඊටපස්සෙ එයා ඉල්ලන්නෙම දුශ්කර පලාත්වලට ට්‍රාන්සර්.. ඇහුවහම කියන්නෙ වැඩ අඩුයිලු.. හැමතිස්සෙම යුනිෆෝම් ඉන්න ඕන නැහැල්ලු.. ඒ වුනාට මාමා කොළඹ ඉන්නැත්තෙ වෙන මොකක් හරි පලහිලව්වකට කියලා මම දන්නවා.. ඇහුවට ඉතින් ඒ ගැන සඳහනක්වත් කරන්නෙ නැනෙ..

අම්මට ආච්චිඅම්මා එක්ක තව ටික දවසක් ඉන්න ඕන කියලා නාහෙන් අඩන්න ගත්තු නිසා දහනමය මම විතරයි කොළඹ එන්න ලෑස්තිවුනේ.. මාතරට ඇවිත් එහෙන් හයිවේ එනවා.. එතකොට ගමන් මහන්සියත් ලොකුවට නැනෙ.. මම දවල් වෙන්න මාතර බස් එකක ඇවිත් කඩුවෙලට එන හයිවේ බස් එකට නැගලා සිංදුවකුත් අහගෙන පාඩුවෙ ජනේලෙන් එහාපැත්ත බලාගෙන ආවෙ.. මගේ එහාපැත්තෙ ඉන්න යුනිවසිටි කොල්ලෙක් සැරින් සැරේ මං දිහා බලනවා මට ෆෝන් එකේ ස්ක්‍රීන් එකෙන් පේනවා.. ප්‍රයිවට් කැම්පස් එකක ටීශර්ට් එකකුත් ඇඳගෙන.. පොරගෙ පොඩි ලුක් එකකුත් තියෙනවා ඒ වුනාට එහෙම බලද්දි හරි අමාරුයි එතන ඉන්න..

මම පොඩ්ඩක් මෙහාට වෙලා ඉදගෙන කලිසමෙ කලව ගාවිත් තිබ්බ පැච් එක වැහෙන්න බෑග් එක තියාගත්තා.. මොනෞත්තක්ද.. කන්න වගේ බලන් ඉන්නෙ.. ඒ එක්කම මගේ ෆෝන් එක වයිබ්‍රේට් වෙන්න ගත්තා..දැන් මේ හැත්තෑවෙනි කෝල් එක.. රඨ්‍ය අයියා.. කොච්චරවත්

@Shan

කිච්චට තනියෙම එන්න පුලුවන් කියලා.. මෙකා නැහෙනවා ගෙදර ඉදගෙන.. එයාගෙත් අම්මයි අප්පච්චියි දාහත පලාලි ගියා කිච්චනෙ.. දැන් ආයෙම මල යකා ඇගෙන් පැනල ගිහින් සාමාන්‍ය විදියට ඉන්නවා..

" වරද්.. දැන් කොයි හරියෙද.."

" තව විනාඩි විස්සකින් විතර එන්න පුලුවන්.."

" ආ මම හෝල්ට් එකේ ඉන්නවා.. ආවහම කෝල් එකක් ගන්න හරිද.."

මෙ යකාට කිච්චට වැඩක් තියෙද.. නැනෙ නැනෙ.. මොන එහෙකටද හෝල්ට් එකට ෙන්නෙ..

" ඔයා හෝල්ට් එකට ඕන්නෑ අයියෙ.. ගෙදරට වෙලා ඉන්නකො අප්පා."

" උඹ ඉදපන්කො කට පියාගෙන.. මමනෙ එන්නෙ.."

" හා හා මම ඇවිත් කතාකරන්නම් එහෙනම්.. අනේ මන්දා තවුසෙත්.."

" උඹටත් ක්ලබ් එකේ වැඩ නැත්නම් එන්නෙ නැනෙ.. ගමේම ඉදපන්.. අල්ලපු ගෙදර ගෑණි දිහා බලාගෙන.."

" මම බලන් ඉදපු ගෑණියෙක් නෑ අනේ.. පිස්සුද මන්දා.. විකාර කියවනවා.."

" මම නාගන්න යනවා.. ඇවිත් මතක් කල්ලා කෝල් එකක් ගන්න.."

" ආ හා.. ගන්නම්.."

මම ෆෝන් එක කට් කල්ලා ජනේලෙන් එළිය බලාගෙන ලාවට හිනාවුනා.. කොහොම කිච්චත් ඉතින් එහෙම හොයලා බලද්දි හිතට හුගක් සතුටුයි.. මම ජීවිතේට හිතුවෙ නෑ කොල්ලෙක්ට ආදරේ කරන්න.. මම කොල්ලොන්ට කැමතිත් නෑ.. ඒ වුනාට රධ්‍ය අයියා ගැන හිතේ තියෙන්නෙ වෙනම හැඟීමක්.. අවුරුද්ද ඉවරවුනු දවසේ ඉදන් මෙකා නටනවා ඉවරයක් නෑ කොළඹ එන්න කියලා.. අනිද්දට එල්ඩර්ස් හෝම් එකේ කැම්පේන් එක නිසා මට හෙට ඉස්කෝලෙට යන්න වෙනවා.. රධ්‍ය අයියා ඒක ඇපේට තියාගෙන මාව ගෙන්නගත්තෙ.. ඒකට ඕන නිසාම ආවා නෙමෙයි.. ඇත්තටම පන්තිත් පටන්ගත්තා ආයෙම.. ඒවත් මගෑරෙනවා.. අනිත් එක

@Shan

තමා ඔය කැම්පේන් එක..එල්ඩර්ස් හෝම් එකකට යන නිසා මටත් මුල ඉදන් උනන්දුවක් තිබ්බා එන්න..

මගේ එහාපැත්තෙ ඉන්න එකාට බම්බු ගහගන්න කියලා මම වීදුරුවට ඔලුව තියාගෙන එළිය බලාගෙන ආවා.. හරි මගුලක්නෙ.. කොල්ලෙක්ට බස් එහෙක යන්න බැරි තරමට මේ සමාජෙ පිරිහිලාද.. මොකක් හරි වුනොත්නම් අම්මපා ගහනවා අත දිගැරලා කනට.. මමත් පිරිමියෙක්නෙ.. මොකෙක් කියලා හිතාගෙන ඔහොම බලන් ඉන්නවද දන්නෙ නෑ..

පැය බාගෙකට පස්සෙ විතර මම හිටියේ කඩුවෙල.. මම රධ්‍ය අයියට මැසේජ් එකක් දාලා කළු කැප් එක මූණ වැහෙන්න දාගෙන බස් එකෙන් බැහැලා හෝල්ට් එකේ දිගට ඇවිදගෙන ආවා.. මට පැත්තෙන් පේනවා මගෙ එහාපැත්තෙ හිටපු එකත් මගේ පස්සෙන් දුවගෙන දුවගෙන වගේ එනවා.. මම බැක්පැක් එක එක කරක දාගෙන හෝල්ට් එකෙන් එළියට එද්දි එතනම වැටට හේත්තු වෙලා ශේඩ්ස් දෙකකුත් දාගෙන ෆෝන් එක ඔබ ඔබ හිටියේ රධ්‍ය අයියා.. ඒකා යකෝ.. නළුවා වගේනෙ.. මාව දැක්කා විතරයි හෙන හිනාවකුත් දාගෙන ශේඩ්ස් දෙක ගලවලා ශර්ට් එකේ කරේ රදවගෙන මගේ පැත්තට ඇවිදගෙන ආවා..

" ඔයා ආවද.."

" ම්ම්.."

රධ්‍ය අයියා ඒ විනාඩියට රතුම රතු වෙලා බීට් අලයක් වෙලා පුපුරන්න එනවා.. මෙකා සතුටු හිතුනහමත් රතු වෙනවා.. තරහ ගියහමත් රතු වෙනවා.. තියෙන්නෙත් මහ අමුතු තාලෙ සුදක්නෙ.. ඒකායි මමයි සුදුවට සුදුවෙ හෝල්ට් එක ගාව මූනට මූන බලාගෙන හිටගෙන ඉද්දි අපි ගාවින් යන හැම එකාම හැරි හැරි අපි දෙන්නා දිහා බැලුවා..

" යමු.."

රධ්‍ය අයියා මගේ අතේ මැණික් කටුව ගාවින් අල්ලගනිද්දි මට බය හිතුනා.. අපි එළියෙදි මෙහෙම ඉන්නෙ නැනෙ.. මිනිස්සු මොනවා හිතයිද දන්නෙ නැනෙ.. ඒ වුනාට මට අත ගසලා අරගෙන එයාගෙ හිත රිද්දන්න ඕන වුනෙත් නෑ. මෙච්චර වෙලාම සතුටින් නෙ හිටියෙ.. මම හැරිලා පිටිපස්ස බලද්දි මගේ එහාපැත්තෙ ආපු එකා අපි දෙන්නා යන දිහා බලාගෙන ඉදලා මම බලද්දිම අහක බලගත්තා.. ආව පිස්සු පගා පස්සෙන් එන්න..

@Shan

මම බැක්පැක් එක පිටිපස්සට දාලා පැසෙන්ජර් සීට් එකෙන් වාඩිවෙලා කැප් එකයි උඩට දාගෙන හිටපු චෙක් ශර්ට් එකයි ගැලෙව්වා.. මේ එළියට බැස්ස ටිකට මාරම රස්නෙයි.. ඉවසගන්න බෑ.. රධ්‍ය අයියා මහ මනමාල හිනාවකුත් කට කොනකට අරගෙන ඩ්‍රයිවින් සීට් එකට ඇවිත් වාහනේ අපේ පැත්තට යන පාරට දැම්මා.. මෙකට මක් වෙලාද.. ආපු වෙලේ ඉදන් හිනාවෙනවා හිනාවෙනවා ඉවරයක් නෑ.. ගුලියක්වත් කැවද දන්නෙ නෑ.. මට ඕවා අහන්න හිතිලත් මම මොකුත් අහන්නෙ නැතුව අම්මට කෝල් එකක් ගත්තා..

" මෙ මම අම්මට ගන්නවා.."

" හරි.."

ෆෝන් එක තුන් හතර සැරයක් රිංග්ස් යද්දි අම්මා ආන්සර් කලා..

" සුදුමහත්තයා ආවද.."

" ඔව් අම්මෙ.. මම ආවා.. ආච්චිඅම්මට කියන්න.."

" හා කොල්ලො.. ගිහින් මොනාහරි ඕඩර් කරගන්න.. දැන් මහන්සිනෙ.. හෙට ඉස්කෝලෙ යනත් එපැයි.."

" ඒකතමා.. හරි අම්මෙ මම තියන්නම් බුදුසරණයි.."

මම ෆෝන් එක කට් කල්ලා දැම්මා.. දැන් ඉතින් ගිහින් කොහෙ උයන්නද.. රධ්‍ය අයියා කාලද දන්නෙ නෑ..

" මෙ ඔයා කාලද ඉන්නෙ.."

" නෑ තාම කැවෙ නෑ..'

" කැවෙ නෑ කියන්නෙ.. දැන් තුනත් පහුවෙලානෙ.. මොකක්ද කලේ මෙච්චරවෙලා.."

" මොකක්ද කලේ අහන්නෙ උඹ එනකල් හිටියා.. වෙන මොකක් කරන්නද.. අපෙ අයියා ගෙදර ඉන්නවා එහෙ ගිහින් කාලා හවස් වෙලා ගෙදර යමු.. අයියා කිව්වා එක්කන් එන්න කියලා.."

@Shan

" ඌප්ස් ආධ්‍ය අයියද.."

" නැතුව මට වෙන අයියල ඉන්නවද.. ගමේ ගිය ටිකට උඹට ඒකත් අමතක වුනාද.."

මේකගෙ තියෙන්නෙ මහ විසාල ඉරිසියාවක්.. හැම මගුලටම අල්ලගන්නෙ මම ගමේ ගියපු එක තමා.. ගමේ ගියපු එකයි.. අල්ලපු ගෙදර ගෑනියි..

" අනේ මේ.."

මම රධ්‍ය අයියට රවලා ඉස්සරහ බලාගනිද්දි එයා හිනාවෙලා එක අතකින් ස්ටියරින් වීල් එක අල්ලගෙන අනිත් අතේ ඇගිලි මගේ ඇගිලි වල පටලගත්තා.. මගේ අත් සීතලම සීතලයි.. එයාගෙ අත් උනුම උනුයි..

" උඹ මෙහෙ නැතිවුනාම පාලුයි.."

මම ලාවට හිනාවුනත් ඉස්සරහ බලාගෙනම ඉදියා.. පොඩි ළමයෙක් වගේ.. එයා එහෙම කියද්දි..

" ඉතින් මම ආවෙ.."

" ආවෙ අනේ නිකං හිටපන්.. කොච්චර දේවල් කියලද ගෙන්නගත්තෙ.. අර අල්ලපු ගෙ-"

" අනේ මොන මගුලක්ද බං අයියෙ.. අල්ලපු ගෙදර ගෑනියෙක් දිහා මම බලන් ඉදියෙ නෑ.. ආයෙනම් තවුසෙට මොකුත් කියන්නෙනෑ.. බලාගෙන හිටපන්.."

වරද් පුතා රධ්‍ය පුතාගෙ ගෙදර යනවලුනෙ.. ඒ වුනාට ඔයැයිලගෙ හිත්තකයගෙ තියෙන එච්චා සඵල වෙන්නෙ නෑ බොල.. රධ්‍ය ඇවිල්ලා ප්‍රතිපත්තියක් තියෙන මනුස්සයෙක්නෙ..

ඔයාලට කියන්න.. මගෙ හිතට මේ කතාව ලියන්න අයිඩියා ගලාගෙන එන්නෙ මම මෙන්න මේ සිංදුව ඇහුවට පස්සෙ.. ඇත්තමයි හරිම ලස්සනයි ඒ සිංදුව.. දැන් නම් ලස්සන සිංදු මෙහෙ එනවා වගේ.. සතුටුයි එහෙම වෙද්දිනම්.. අර අහන් ඉන්න බැරි සිංදු නැතුව.. මම මේකෙ පලවෙනි

@Shan

වැප්ටරේ ලියද්දිත් මම මේක ඇහුවා.. මගේ හොදම යාලුවෙක් රෙකමන්ඩ් කල්ලා තමයි මමත් ඇහුවෙ.. ඔයාලත් කැමති වෙයි කියලා හිතනවා..

කඳුලයි පවසන්නේ සැඟවූ ඒ ආදරේ

අදමයි මා දන්නේ නොකියූ ඒ ආදරේ

කඳුලයි පවසන්නේ සැඟවූ ඒ ආදරේ

අදමයි මා දන්නේ නොකියූ ඒ ආදරේ

සඳේ මං කෙසේ කියන්නේ

හිතේ තියෙන ඒ ආදරය

මා මන්මත් කෙරුවා කියා

ඔබ දුටුවදා

නෙතේ වේදනා නිවෙන්නේ

ඔබේ රූ නිසා

හිත පාවෙලා දුර ගියා

පෙම් වර්ෂා වැහී මා තෙමා

සිත් සංඛා නිවී යයි මෙදා

සංසාරිණී මගේ

නන්නාඳුනන්නියේ

මා මවනා හීනයේ

ඔබ ඉන්නවා වගේ

සංසාරිණී මගේ

@Shan

නන්නාඳුනන්නියේ

මා මවනා හීනයේ

ඔබ ඉන්නවා වගේ

දේදුන්නේ පවා නැති සොබා රූපේ

හැංගෙන්නේ ඔබේ ළඟ තමා

**කුළුඳුලේ මාගේ ප්‍රේමාදරේනේක වාරේ බැඳේ හදවතේ**

**පෙම වර්ෂා වහී මා තෙමාසිත් සංඛා නිවී යයි මෙදා**

සංසාරිණී මගේ

නන්නාඳුනන්නියේ

මා මවනා හීනයේ

ඔබ ඉන්නවා වගේ

සංසාරිණී මගේ

නන්නාඳුනන්නියේ

මා මවනා හීනයේ

ඔබ ඉන්නවා වගේ

සඳේ මං කෙසේ කියන්නේ

හිතේ තියෙන ඒ ආදරය

මා මන්මත් කෙරුවා කියා

ඔබ දුටුවදා

නෙතේ වේදනා තිවෙන්නේ

@Shan

ඔබේ රූ නිසා

හිත පාවෙලා දුර ගියා

පෙම් වර්ෂා වගී මා තෙමා

සිත් සංඛා නිවී යයි මෙදා

සංසාරිණී මගේ

නන්නාදුනන්නියේ

මා මවනා හීනයේ

ඔබ ඉන්නවා වගේ

සංසාරිණී මගේ

නන්නාදුනන්නියේ

මා මවනා හීනයේ

ඔබ ඉන්නවා වගේ

එන්නාම්.. ලව් යූ ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 43 කොටස

මමයි රධ්‍ය අයියයි ගෙදර ඇවිත් කාර් එකෙන් බහින්න එළියට අඩිය තිබ්බා විතරයි කියාරා මිදුලෙ බෝලයක් හප හප ඉදලා මාව දැකලා දිවත් ඇදගෙන දුවගෙන ඇවිත් මගේ ඇගට පැන්නා.. මම ආයෙම කාර් එකේ සීට් එකේම ඉන්දවුනා.. මම එයාට වීඩියෝ කෝල් අරං හුගක් කතාකල්ල තියෙන නිසා මගේ කටහඩ හොදට අදුරනවා.. රෙක්සි මාව දැකලා ගේ ඇතුළට ඇවිදගෙන ගියා.. සත එකකටවත් මාව නෙමෙ ගනන් ගත්තෙ.. මහඑකා වගේ නැතැයි.. මම කියාරගෙ ඔලුව අතගගා එයාව හුරුතල් කරද්දි රධ්‍ය අයියා වටෙන් ඇවිත් කියාරාගෙ පටියෙන් ඇදලා එයාව එහාට කලා..

" කියාරා.. ඇතුළට යන්න.."

රධ්‍ය අයියා සැරෙන් කිව්වහම කියාරා දුකම දුක හිතෙන මූණකුත් හදාගෙන ගේ ඇතුලට ගියා.. මහ මොකෙක්ද මන්දා.. මම රධ්‍ය අයියට රවලා උගෙ කලිසමෙ බෙල්ට් එක අල්ලගෙන ඒ වාරුවෙන් හිතලම බර දීලා නැගිට්ටහම මෙකා ඉක්මනට කලිසම දෙපැත්තෙන් අල්ලගත්තා.. වැටුනනම් තමා.. ගැටපොලොස් කොට්ටෝරුවගෙ කලිසම.. අපිට ලස්සන යටකලිසමක් බලාගන්න තිබ්බා..

" මොන මගුලක්ද බං කරන්නෙ.."

" කරන්නෙ මොකක්ද අහන්නෙ ඉතින්.. දැක්කෙ නැද්ද.. නැගිට්ටනෙ.."

මම රධ්‍ය අයියට ගස්සගෙන දොරත් එහෙමම ඇරලා දාලා ගේ ඇතුලට ගියා.. අර අහිංසකීට කතාකරපු හැටි.. කලිසම විතරක් ගලවලා මදි.. මම දවසක් කිව්වා වගේ සිද්දාලේප ගාන්න තියෙන්නෙ.. මම යද්දි ආධ්‍ය අයියා සාලෙට වෙලා අර කණ්ණාඩි දෙකත් දාගෙන හෙන තඩි පොතක් කියවනවා.. මූ නම් පොත්ගුල්ලෙක්මද කොහෙද.. අයියයි මල්ලියි අහසයි පොලොවයි වගේ.. මම ආවා දැකලා ආධ්‍ය අයියා කණ්ණාඩි දෙක පන්නලා පොත උඩින් තියලා නැගිටලා මගේ පැත්තට ආවා..

" අම්මෝ මල්ලි ආපු එක හොදයි.. එකෙක් මෙහෙ පරල වෙනවා උගේ පණ්ටික ගමේ ගිහින් ආවෙ නෑ කිය කිය.. දැන්නම් නිදහසේ මට නිදාගන්න පුලුවන්.."

@Shan

" සැක් නේද අයියේ.."

" මල්ලි උඹට හොඳටම විශ්වාසයි නේද අපේ එකා ඕනමයි කියලා.."

" අයියෙ!!!!!!!!!!!!!"

මටයි ලස්සන ආධ්‍ය අයියටයි හුගක් වෙලා කතාකරන්න බැරිවුනේ අර ගැටපොලොස් කොට්ටෝරු ඉරිසියාකාරයා ඇවිත් අපි දෙන්නගෙ කතාව මැද්දෙන් පැනපු නිසා.. ඒ වුනාට මටත් හරිම කුතුහලයක්.. ඇයි හැමෝම අහන්නෙ එකම දේනෙ.. එක්කො මගෙන් අහනවා රධ්‍ය අයියව ඕනමද කියලා.. නැත්නම් රධ්‍ය අයියගෙන් අහනවා මාව ඕනමද කියලා.. ඕන නේන්නං හත්වලාමෙ මට මෙකගෙ ඔලුව කන්න තියෙනවනෙ.. ඇයි කාටවත්ම තේරෙන්නෙ නැත්තෙ..

" මල්ලි ගිහින් මූණ සෝදගෙන පහලට එන්නකො.. මූ කැවෙ නෑ මල්ලි එනකල් ඉන්න ඕන කිය කිය හිටියා.."

මම හැරිලා ඇස් දෙකත් හීනි කරගෙන රධ්‍ය අයියා දිහා බැලුවම ඒකා වහල දිහා බලාගත්තා.. මෙකා අද හුරුතල් වෙන්න එනවා වැඩී.. පැත්තකින් තියාගෙන ඉන්නෝන.. ඇයි යකො මටත් වැඩිය වැඩිමල්.. හරිනම් මම එපැයි හුරුතල් වෙන්න..

" ආ හා අයියෙ.. අයියට හෙන වදේ නේ.."

" අදනම් වදයක් නෑ ලොකුවට.. මම නෙමේනෙ ඉව්වෙ.. ඔය ඉන්න එකා තමා ඉව්වෙ.."

මට ආධ්‍ය අයියගෙ කටින් පිටවුනු අන්තිම ටික ඇහුවෙ පඩිපෙල අන්තිම හරියෙදි.. කොහෙද මේ හැකරුල්ලා මාව ඇදගෙන උඩතට්ටුවට ගියානෙ.. ඒකත් හිමින් නෙමේ.. ආධ්‍ය අයියා, මලයගෙ රෙදි මං ඉස්සරහා ලෙප්ට් කරයි කියලා හිතුවද දන්නෙ නෑ..

" ඒ ඔයා උයන්නත් දන්නවද.."

" ම්ම්.. උයන්න විතරක් නෙමේ.. මුලු හෝඩියමත් දන්නවා.."

@Shan

රඨ්‍ය අයියා මගේ අතට ටවල් එකක් දීලා මාව බෝස් ගාල වොශෲම් එක ඇතුලට තල්ලු කල්ලා දොර වහගෙන කාමරෙනුත් එළියට ගියා.. මල සමයං මූණෙත් තියෙන්නෙ.. අද මොකද දන්නෙ නෑ ඔච්චර හොද වෙලා ඉන්නෙ.. අමුතුයිත් වගේ මූගේ මනමාල හිනාව මටනම් එච්චර අල්ලන්නෙ නෑ.. මම මූණත් හෝදගෙන එළියට ඇවිත් කණ්ණාඩියෙන් බලාගෙන මූණ පිහිදගත්තා.. ගෙදර හිටිය සතියට මහත් වෙලාද මන්දා.. ඇයි ඉතින් ඌරා වගේ කනවා කනවා ඉවරයක් නෑනෙ..

" ඔය දෙන්නා කන්න එහෙනම්.. මම පොඩි නැප් එකක් දාන්න යනවා ළමයි.."

ආඪ්‍ය අයියා ඔලුව දෙපැත්තට අතගාගන්න ගමන් උඩ තට්ටුවට ගියා.. මම හිටියෙ කෑම කන ගමන්.. කෑම ඉතින් රහයි.. රහයි කියනෙ මරු.. හොදට හදලා තියෙනවා.. මම මේකා උයන කෑම කවමදාවත් කාලා නෑ.. දවසින් දවස මට රඨ්‍ය අයියා ගැන අලුත් මොකක්මහරි දැනගන්න හම්බෙනවා.. දැන් ඉතින් උයන්නත් දන්නවලුනෙ.. කොච්චර හොදයිද.. මේකට බැරි මොනවද දන්නෙ නෑ මෙහෙම බලද්දි..

" කෑම මරු ඒයි.."

" සිරාවට.. ම්ම්..ම්ම්.."

රඨ්‍ය අයියා හිනාවෙවී කෑම ඔලුව පහත් කරගෙන කන ගමන්ම මම දිහා බලන්නෙවත් නැතුව උත්තර දුන්නා.. ඒකා කද්දි කතාකරන්නෙ නෑනෙ.. කතාකරනවට කැමති නැහැල්ලු.. අනේ මටනම් ඔය මොකක්වත් අදාල නෑ.. කට මගේනම් කියවන්නෙ මමනම්.. මම කියවනවා.. අහන් ඉන්න බැරිනම් නැගිටලා යන එකයි ඇත්තෙ.. ඒ වුනාට රඨ්‍ය අයියා කියාන් අයියා කතාකරනකොට විතරනෙ බනින්නෙ.. මම කතාකරාට බනින්නෙ නෑනෙ..

" මෙ අයියෙ.. ක්ලබ් එකේ ඔක්කොම කොළ ඔයා ගාවද.."

" ම්ම්.."

" මම යද්දි ඒ ටික අරගෙන යන්නද.. මම මොකුත් කලේ නෑනෙ.. ආයෙම මම ඔක්කොම හරිද බලලා ඔයාට රෑට කියන්නම්.."

" ම්ම්.. මම යද්දි දෙන්නම්.."

@Shan

රධ්‍ය අයියා ක්ලබ් එකේ වැඩ ටික බලාගන්නම කිව්ව නිසා මට ලොකු වැඩක් තිබ්බෙත් නෑ.. හෙට ඉස්කෝලෙට ගිහින් අර තියෙනවා කිව්ව මීටින් එකට ඉදලා අනිද්දා එල්ඩර්ස් හෝම් යන්න පුලුවන්.. බෙනිෆිට්ස් ඔව් හැවින් අ ෆකින් කෙයාරින් වෙන්ඩ බෝයිෆ්‍රෙන්ඩ..

අපි දෙන්නා කාලා මතේ ගහලා වගේ ඔහේ කාමරේට වෙලා ඇඳේ හිතුනු හිතුනු පැත්තට වැටිලා සිවිලිම දිහා බලාගෙන හිටියා.. මේක යන්න දෙන්නෙත් නෑ.. හවස් වෙනකල් ඉන්නලු ගෙදර යන්න.. අම්මත් නෑ ගෙදර ඉන්න පාළුයි වගේ.. කමනි ඇන්ටිටයි දෝණිඇන්දටයි මම නැතුව පාළු හිතුනද දන්නෙ නෑ.. මම ඔහොම වල් පල් හිත හිත ඉද්දි මට මතක් වුනේ බස් එකේදි හම්බුන ඩයල් එක.. මට නිකම් උගෙ මූණ හුරුයි හුරුයි වගේ.. කලින් කොහේහරි දැකලා තියෙනවා මගේ මීටරේ මට කියනවා.. ඒ වුනාට එක වගේ උන් නැද්ද මේ ලෝකෙ.. සමහරවිට මට ඉස්කෝලෙ ඒ වගේ එකෙක්ට මේකා පැටලුනාද දන්නෙ නෑනෙ.. මම රධ්‍ය අයියා දිහා ඔලුව උස්සලා බැලුවහම ඒකා ඇඳේ හරහට වැටිලා මූණ උඩින් අතකුත් තියාගෙන ඇස් දෙක පියාගෙන ඉන්නවා.. මම නැගිටලා උගේ පැත්තට හැරිලා අත ඇදලා අරගෙන අත උඩින් මගේ ඔලුව තියාගත්තා.. හෙන සනීපයි..

රධ්‍ය අයියා මුලින් බයවෙලා වගේ මගේ මූණ දිහා බලාගෙන ඉදලා ඊටපස්සෙ අත වැලමිට ගාවින් නමලා මගේ ඔලුව තව ටිකක් අතේ උඩ හරියෙන් තියාගත්තා.. ඌට හොදනම් මටත් මොකෝ කියලා මමත් ඔලුව තියාගෙන හිටියා..

" මොකෝ.."

" මුකුත් නෑ.."

රධ්‍ය අයියා ආයෙම සිවිලිම දිහා බලාගත්තා.. දවල් පිච්චිලා කරවෙලා යන්න තරමට පායලා හවස් වෙද්දි අහසෙ ලාවට වගේ වැහි වලාවක් වහගෙන තිබ්බා.. ඒ අස්සෙ මට හෙන නිදිමතකුත් එනවා.. ඇස් පියවෙන්න වගේ..

" වරද්.."

" ම්ම්.."

@Shan

" අම්මා කවද්ද එනවා කිව්වෙ.."

" මේ සතියෙත් ඉදලම එනවා කිව්වෙ.. හරියටම දන්නෙ නෑ ඉතින්.."

" එහෙමද.. දැන් උඹට තනියම ඉන්න පුලුවන්ද.."

" මම කලින් ඉදලා තියෙනවා අනේ.. සතිගනන්.. මම ගෑණියෙක්යැ තනියම ඉන්න බැරි.."

" ගෑණියෙක් වෙන්න ඕනද බං තනියම ඉන්න.."

" ඔව්නෙ.."

" උඹෙත් මහ අමුතු ලොජික් තියෙන්නෙ.. හා හා තනියම ඉදපන්කො.."

" ඇයි .."

" පරිස්සමින් ඉදපන්.."

" ම්ම්.."

මම බෙල්ල පැත්තට ඇල කරගෙන රධ්‍ය අයියගෙ දිග ඇහිපිහාටු තියන ඇස් දිහා බලාගෙන හිටියා.. ඒවා මගේ ඇස් වලට හුගක්ම ලගින් තිබුනේ.. සැරින් සැරේ පියවෙනවා.. දිගෑරෙනවා.. මම කොහොමත් රධ්‍ය අයියගෙ දිග ඇස් පිහාටු තියෙන ඇස් දිහා බලාගෙන ඉන්න ආසයි..

" ම්ම්..??"

" ඔයාගෙ ඇස් ලස්සනයි.. මම හෙන ආසයි ඔහොම ඇස් තියන අයට.."

" මගේ ඇස් නෙමෙ අර කණ්ණාඩියෙන් ගිහින් බලපන් උඹෙ බලල් ඇස් දිහා.. දැක්කහම බය හිතෙනවා.."

" බය හිතෙනවා..?? අනේ නිකන් ඉන්නවා.."

" එහෙම බයවිල්ලක් නෙමෙ බං.. ඒවා ලස්සනයි.. ඒ වුනාට.. අනේ මන්දා.."

" ආ ඒ කියන්නෙ තවුසෙ කැමතිවුනේ මගේ ඇස් දෙකටනෙ.. නෙහ්??"

@Shan

මම රධ්‍ය අයියගෙ පැත්තට හැරිලා මගේ කම්මුල අර අතට තද කරගත්තා..

" එහෙම එකක් නෑ.."

" එහෙනම් කොහොම එකක්ද.."

" මං දන්නෙ නෑ.."

" දන්නෙ නැති වෙන්නෙ කොහොමද.. අනේ කියනවකො.."

" මගෙන් අහන්නෙපා මම දන්නෙ නෑ.."

දෙන හිතයි මේකගෙ ඔලුව හිල් වෙන්න එකක්.. ඇයි යකො කියන්න බැරිද පොඩ්ඩක් මම කැමතිවුනේ මෙහෙමයි මෙහෙමයි කියලා.. හැමදාම පැනලා යනවා.. මොකුත් කියන්නෙ නෑ..

" මම ගෙදර යන්න ඕන අයියෙ.."

" තව ටිකක් ඉදලා යනවකො ඉතින්.. මමනෙ ගිහින් දාන්නෙ.."

" ඒ වුනාට.."

" හරි හරි පැයබාගයයි.. ගිහින් දාන්නම්.. උඹට අර ගමෙ අල්ලපු ගෙදර ගෑනි දිහා බල බල සති ගනන් ඉන්න පුලුවන්.. මම පොඩ්ඩක් ඉන්න කිව්වොත් තමා කෙලගෙන යන්න ඕන වෙන්නෙ.."

අපෝ ඔන්න පටන්ගත්තා පරණ තැටියම ප්ලේ කරන්න.. කොහෙන් ගියත් අර රක්තපාත මල හුවක්කුවක් ගැනමයි කියවන්නෙ.. මූ ඒකිව දැක්කොත් එහෙම වලක් හාරගෙන ඒකට ඔලුව ඔබාගෙන ඉදී මැරෙනකල්.. මමයි.. ඒකියි.. හිතද්දිත් ඇගේ හිරිගඩු පිපෙනවා..

" හැපෝ ඔන්න කියවන්න ගත්තා.. මගුල.."

" ඒ ගෑණි කොහොම එකියක්ද.. උඹ කතාකල්ලා තියෙනවනෙ"

" ම්ම්.."

"මොනවද කිව්වෙ.."

@Shan

" මම කියවන්න ගියේ නෑ බං.. ඒකි මොනවද පලා මිටියක් උස්සගෙන මගේ පස්සෙන් එලවගෙන ආවා දවසක්.. එච්චරයි.. ආයෙ හවසට අපේ ගෙදර මල් ගහෙන් මල් කඩන්න එනවා.."

" ඇයි උඹලගෙ ගමේ මල් හැදෙන්නෙ උඹලගෙ ගෙදර විතරද.."

" ඔව්නෙ.. මේ ඔයා ඉස්සරහම ඉන්නෙ.. මං මලක්.."

මම හරිම ලස්සනට ඇහිපිල්ලම් දෙකක් තුනක් ගැහුවම මේකා මට කින්ඩියට හිනාවෙලා අහක බලාගත්තා.. හැලපයා..

" මොකද තවුසෙ හිනාවෙන්නෙ.."

" උඹට හිනාවුනේ කවුද ඉතින්.."

" අනේ පලයං අයියෙ.."

මම උගේ අත දිගට රෝල් වෙලා ගිහින් කොට්ටෙකට ඔලුව තියාගෙන එහාපැත්ත හැරිලා හිටියා.. හෙන නිදිමතයි.. මේකා ගාව ඉද්දි රස්නෙට නින්ද යන්න එනවා.. මම පොඩ්ඩක් ඇස් දෙක පියාගත්තා.. නිකන්ම නින්ද යනවා.. මම ඔලුව තියාගෙන හිටිය කොට්ටෙන් රධ්‍ය අයියා ගාව සුවඳ එනවා..

මට නින්ද යාගෙන එද්දි මට ඇහුණා රධිය අයියා ලාවට සින්දුවක් මුමුනනවා.. ලස්සන කටහඬින්.. මට ඒක එන්න එන්න ඈතින් ඈතින් ඇහිලා නැතිවෙලා ගියා..

" වැහිබිඳු වැටෙනවා නම්

සුලඟක් සැලෙනවානම්

මොහොතක් තනිවී විඳිමී ආදරේ...

ලංවී ඉන්නෙ මානම්

රහසක් කියනවානම්

මොහොතක් තනිවී සොයමී ආදරේ..."

@Shan

සමාවෙන්නෝන මුලින්ම ප්‍රමාද දෝසයට අනේ.. අද හවසට දෙකක් දෙන්නම් මම.. අද අපෙ ගෙදරට පොඩි පගයො ටිකක් ඇවිත් නටනවා නටනවා ඉවරයක් නෑ.. මම කාමරේ අස්සෙ ඉදියෙ ලැප් එකත් තියාගෙන කතාව ලිය ලිය..අම්මා කතාකල්ලා මම කාමරෙන් එළියට ගිය ටිකක අර පොඩි එකෙක් ඇවිත් මම ලැප් එකේ ලිව්ව කතාව මහා හයියෙන් කියෝනවා.. මගෙන් මහප්‍රාන දයන්න පෙන්නලා අහනවා මේ මොකක්ද පුංචි කියලා.. යසයි බේසික පොඩි එකා.. මම ආයෙ ලැප් එක දිගෑරියෙ නෑ පිංචතුනි.. යනකල්ම ඉදියා.. අනේ රධ්‍ය පුතේ.. තා ඩිංගෙන් ලෙප්ට වෙන්න මගේ රෙද්ද තමා..

ඉම්හි...

එන්නාම්.. ලව් යූ.. ❤

රූ පානේ තරුවක් දිස් වෙන්නේ

නුබ කෝ කියා ඇසුවා එදා

මා ගාවින් තනියයි වැලපෙන්නේ

කදුලින් සදා මල් දම් ගොතා

හිරි වැටුනු සද සේයා

නිදි වරපු රූ මාහා

තනිවෙන්න හදවත් දැන් හිගයි

වැහිබිදු වැටෙනවා නම්

සුලගක් සැලෙනවානම්

මොහොතක් තනිවී විදිමී ආදරේ

ලංවී ඉන්නෙ මානම්

රහසක් කියනවානම්

@Shan

මොහොතක් තනිවී සොයමී ආදරේ

මනලෝල රංග සේනා

හදේ සියුම්ව දාරා

නැවතිලා නැවතිලා නේ

නිබ රහසෙ කියන ගීතා

සෙමෙන් ඇසෙන්නෙ මාත්රා

පැටලිලා පැටලිලා නේ

හිරි වැටුනු සද සේයා

නිදි වරපු රෑ මාහා

තනිවෙන්න හදවත් දැන් හිගයි

වැහිබිදු වැටෙනවා නම්

සුලගක් සැලෙනවානම්

මොහොතක් තනිවී විදිමී ආදරේ

වැහිබිදු වැටෙනවා නම්

සුලගක් සැලෙනවානම්

මොහොතක් තනිවී විදිමී ආදරේ

ලංවී ඉන්නෙ මානම්

රහසක් කියනවානම්

මොහොතක් තනිවී සොයමී ආදරේ

( අහලා බලන්න ඒක ලස්සනයි ලමයි)

@Shan

ප.ලි.

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 44 කොටස

" ඇත්තට.. අඩෙ මගෙත් ෆේවරිට්ම ආටිස්ට් එයා.. මෙහේ අයගෙන්.."

" ලෙජන්ඩ්ස්ලා.. මම එයාගෙ ආස නැති සිංදුවක් නෑ.. කොහොමත් මගේ වයිබ් එකට සෙට් වෙන ටයිප් සිංදු එයා කියන්නෙත්.."

" ම්ම්.. මියුසික් මාර කාම් නේද අනේ.. මම ආසයි එයාගෙ ගෝල්ඩ් ඇල්බම් එකට.."

" මම හිතුවෙ ඔයාට ෂෝන් මෙන්ඩිස්ගෙන් තොර ලෝකයක් නෑ කියලා.."

" අපෝ පිස්සුද මම සිංහල සිංදුවලට හෙන ආසයි.. තමංගෙ ලැන්ග්වේජ් එකෙන් සිංදුවක් අහන්න තියෙන එක කොච්චර හොදද.. ඒ වුනාට මට අර මර ලතෝනි තියන සිංදු පේන්න බෑ.."

" ම්ම්.. මමත් ආසම නෑ.. ආ තව සනුකත් සෙට් වෙනවා.. එයාගෙත් සිංදු කීපයක් තියෙනවා මම ආස.. ඒ ඇරෙන්න බී ඇන් එස්ලත් හොදයි.. තව.. නදීමාල්..ම්ම්.. ඔය වගේ ඉන්නවා.. තව සමහර සිංදු තියෙනවා ආටිස්ට්ලට ලොකු කැමැත්තක් නෑ රැන්ඩම්ලි ආසයි.."

" මටත් එහෙම ප්ලේලිස්ට් එකක්ම තියෙනවා.. මම ඔයාට ශෙයා කරන්නද මගේ ස්පොටිෆි ප්ලේ ලිස්ට් එක.."

" ම්ම්.."

" ඔයත් ඔයාගෙ එක මට එවන්න.. හා ද.."

" හා.."

මමයි රධ්‍ය අයියයි අපේ ගෙදර යන ගමන් හදිසියේ ඇහුණු සිංදුවක් ගැන කතාකරන්න ගත්තා.. එයාගෙ ආසම ආටිස්ට්ල La Signore.. ඒ කිව්වෙ ලහිරු පෙරේරා.. මමත් හුගක් ආසයි එයාගෙ සිංදු වලට.. එයාගෙ පරණ සිංදුවල තියෙන වයිබ් එක වෙන කොහෙන්වත් හොයාගන්න බෑ.. ලෙජන්ඩ් කෙනෙක් තමා..

@Shan

" මේ වරද්.."

" ම්ම්.."

" ඔයාට බැඩ්මින්ටන් කන්ටිනිවු කරන්න අයිඩියා එකක් නැද්ද.. දැන්ම නෙමේ.. මම කියන්නෙ ආෆ්ටර් ඒලෙවෙල් වගේ.."

" ලොකුවටම කැමැත්තක් තියේ.. ඒත් අනේ මන්දා.. ගෙදරින් කැමති නෑනෙ.."

" එහෙම කියලා බෑනෙ වරද්.. ඔයාට ටැලන්ට් එක ඇගේම තිබිලත් වැඩක් ගත්තෙ නැත්නම් අපරාදෙ.. මම හිතන්නෙ ඔයාට නැශනල් වුනත් ප්ලේ කරන්න තරම් ටැලන්ට් එකක් තියෙනවා.."

" ඉතින්??"

" ඉතින් ආෆ්ටර් ඒලෙවෙල් ස්පෝර්ට්ස් ක්ලබ් එකකට ජොයින් වුනානම් නරකද.. ඔයා හොඳ ප්ලෙයර් කෙනෙක් නිසා ඉන්කම් එකකුත් හොයාගන්න පුලුවන්.. නිකන් ඉන්න එකේ.. කොච්චර හොඳද.."

" බලමු.."

" බලමු බලමු නෙමෙ ඒක කරන්න ඕන!! ගෙදර අයට ඕන විදියට හැමදාම ජීවත් වෙන්න බෑනෙ වරද්.. හරියට බැලුවොත් එයාලා ජීවත්වෙන ජෙනරේශන් එකයි අපි ඉන්න ජෙනරේශන් එකයි හෙනම වෙනස්.. ලගින්වත් තියන්න බෑ.. මමනම් කියන්නෙ ඔයාට ස්පෝට්ස් වලින් හොඳ ගෝල් එකකට යන්න පුලුවන් කියලා.."

" ම්ම්.."

" මම ආෆ්ටර් ඒලෙවෙල් ඔයාව ක්ලබ් එකකට ජොයින් කරනවා.. ඒකෙ හෙඩ් කෝච් අපේ අයියගෙ යාලුවෙක්ගෙ තාත්තා කෙනෙක්.. ඒක නිසා එතන අවුලක් නෑ.."

" ම්ම්.. ම්ම්.."

" ඒ වුනාට ක්ලබ් එකේ වැඩ එක්ක ඔයා යුනිවසිටි යන කාලෙක ඒ දෙක බැලන්ස් තියාගන්න ඕන.. ස්පෝර්ට්ස් විතරක් බෑනෙ බයෝ කරපු එකෙන්

@Shan

වැඩක් නෑනෙ නැත්නම්.."

" තා මොකුත් එපාද..මොඩලින් එපාද.."

මම සීට් එකේ පහලට ලිස්සලා ගිහින් මූණ ඇදකරගත්තා..

" මොඩ්ලින් අවුලක් නෑ.. ඒ වුනාට උඹ ඒවට යන්න ඕන නෑ.."

" ම්ම්.. දැන් එතකොට ඔයා මොකද කරන්න හිතාගෙන ඉන්නෙ.. ඉස්කෝලෙන් අයින් වෙලා..??"

" රිසාල්ට්ස් බලලා කැම්පස් එකකට යන්න තමා හිතාගෙන ඉන්නෙ.. ඒ වුනාට.. ඔයා දන්නවනෙ.."

" ඉතින් ඩිෆෙන්ස් යුනි එකේ අවුල මොකක්ද තියෙන.."

" මට ඒක අවුල්.. උඹ හිතුවද මම මේ ආසාවට කැඩෙට් කරනවා කියලා.."

" ඇයි කැමති නැද්ද ඔයා.."

" කැමති.. ලොකුවට නෙමෙ.. අපේ අප්පච්චිට තමයි ඕන වුනේ මාව කැඩෙට් කරන්න යවන්න.. ඒත් මට හිතෙනවා අපේ අයියා මට වඩා ලකී කියලා.."

" ඒ ඇයි.."

" අයියා වගේ ඔලුව නමාගෙන මටත් ඉන්න පුලුවන් වුනානම් හැමදාම මම නිසා ගෙදර ප්‍රශ්න නෑනෙ.."

" ම්ම්.. ඒ වුනාට අකමැත්තෙන් දේවල් කරන එක හරි වදයක් තමා.. ඔයා දන්නවද මම ආසාවෙන් හිටියෙ ආට් කරන්න.. පොලිටිකල්.."

" අපරාදෙ කරන්න තිබ්බෙ.. ගැළපෙන සබ්ජෙක්ට් එක.."

" අනේ මේ ඉන්නවා තවුසෙ.. මම ඇත්තට කිව්වෙ.."

" ඉතින් දැන් බයෝ කරන්නෙ.."

@Shan

" අම්මට ඕන නිසා.."

" ම්ම්.."

රධ්‍ය අයියා මොකක් හරි කියන්නත් ගිහින් ආයෙම ලොකු හුස්මක් පහලට දාලා ඉස්සරහා බලාගෙනම ඩ්‍රයිව් කලා.. එයයි මමයි දෙන්නම එක වගේ තමා.. අපි දෙන්නම පවුලෙ නැටවෙන රූකඩ..

" වෙලාවකට මට බයයි.."

" ඒ මොකද.."

" මේ වෙන හැමදේම ගැන බයයි ඉතින්.. හැමදේම හොදින් වෙද්දි හිතට බය හිතෙනවා.."

මම සීට් එකේ හරියට ඉදගෙන අපි පහුකරගෙන යන ගස්, මිනිස්සු, වාහන දිහා බලාගෙන හිටියා..

" බය වෙන්න ඉතින් උඹයි මමයි මොකක් හරි වැරැද්දක් කරලා තියෙන්න එපැයි.."

" ඒ වුණාට.. අපි දෙන්නම කොල්ලො දෙන්නෙක්.. ඔයාගෙ අප්පච්චි අපේ අම්මා එතකොට ගෙවල් වල අය.. ඔයාට ඇත්තටම ගානක් නැද්ද අයියෙ.."

" අපි දෙන්නම කොල්ලො වුන එකේ වැරැද්ද මොකක්ද ඇත්තටම.. මට නම් මෙ හු#න සමාජ සම්ප්‍රදාය අප්පිරියයි.. දෙදාස් පන්සියක් කියලා උඩ දාගෙන දෙසුවට බලන් යද්දි මුතුන් මිත්තො තිරිසන් සත්තු එක්කත් නිදාගෙන තියෙනවා.. එතකොට ඒවා හොදයි.. අර සිංහබාහුද මොකක්ද තියෙන්නෙ.. ඒ පාඩම කරපු කාලෙ මට තිබ්බ ලොකුම ප්‍රශ්නෙ කොහොමද එහෙම වුනේ කියන එක.."

" ම්ම්.."

මම ලාවට හිනාවුනා.. ඇත්ත හැබැයි.. රධ්‍ය අයියට මල පැනලා වගේ..

" අනික ලංකාවෙ ගේ කමියුනිටි එක.. කොච්චරට චාටර්ද බලපන්.. මම හැමෝම එහෙමයි කියනවා නෙමෙ වරද්.. ඒ වුනාට බලපන් එකෙක්ට කියලා අවංකව ආදරේ කරන එකෙක් ඉන්නවද.. නෑ.. එක්කො මිනිහට

@Shan

ගෑනියෙක් ඉද්දි හොරාට කොල්ලො ගහනවා.. නැත්නම් සල්ලි වලට යනවා.. නැත්නම් අසහනේ වගේ හැම එකාටම කියලා ඇරගන්න යනවා.. ඉතින් මනුස්සයොන්ගෙ හිතේ වැරදි ආකල්ප ඇති එක සාමාන්‍යයිනෙ.. ලංකාව වගේ රටක ඔය වගේ මාතෘකා සාමාන්‍ය වෙන එක, ඕන්නම් අපි මැරිලා අපේ ලමයින්ටත් පරම්පරා සීයක් විතර ගියාමවත් සිද්ද වුනොත් හොදයි.."

" ඒක ඇත්ත.."

" උඹ ඔය මගුල් හිතන්නෙ නැතුව වැඩ ටික කරගනින්.. මම ඉන්නකම් උඹට කාගෙන්වත් කතා අහන්න දෙන්නෙ නෑනෙ.."

රධ්‍ය අයියා අත දිගැරලා මගේ කොන්ඩෙ අවුල් කල්ලා දැම්මහම මම එයාගෙ අතට පාරක් ගහලා එහාට තල්ලු කල්ලා මගෙ කොන්ඩෙ හදාගත්තා..

" හෙට එනවද ඉස්කෝලෙට යන්න.."

" උඹ යනවනෙ.."

" ඕ.."

" එනවා.."

රධ්‍ය අයියා අපේ ගෙදර ඉස්සරහින් වාහනේ නැවැත්තුවහම මම කාර් එකෙන් බැහැලා පිටිපස්සෙ සීට් එකේ තිබ්බ බෑග් එක අරගෙන ගෙදරට යද්දි රධ්‍ය අයියත් එන්ජින් එක ඕෆ් කල්ලා මාත් එක්කම ගෙදරට ආවා.. මම බැක්පැක් එකේ තිබ්බ යතුරෙන් දොර ඇරලා ගේ ඇතුලට යද්දි රධ්‍ය අයියා ඉස්තෝප්පුව ගාව නැවතිලා කමනි ඇන්ටිලගෙ ගේ දිහා කන්න වගේ බලගෙන ඉන්නවා.. මේ මනුස්සයා මොකක් කරනවද.. මම බැක්පැක් එක පුටුසෙටියට දාලා ඉස්තෝප්පුවට ආවා..

" අර කවුද.."

රධ්‍ය අයියා නයිටියකට උඩින් බ්ලවුස් එකක් දාගෙන අපේ ගෙදර පැත්ත දිහා ඔරවගෙන හිටපු තඩි කමනි ඇන්ටි දිහාට ඇඟිල්ලක් දික් කල්ලා කේන්තියෙන් අහද්දි මම උගෙ ඇඟිල්ලෙන් අල්ලලා ඒක පහලට කලා..

@Shan

මොනවද මේ කරන්නෙ.. නයිට්ටිය උස්සන් ආවොත් හෙම මේ පැත්තට.. ඉවරයි..

" මේ ඇතුළට එනවකො.. මම කියන්න.."

මම රඩ්‍ය අයියගෙ ශර්ට් එකෙන් ඇදගෙන ගේ ඇතුළට ගියා..

" ඒ එහා ගෙදර ඉන්න ඇන්ටි අනේ.. අපි එක්ක එච්චර හොද නෑ එයා.. මල කුණ්ඩවාලයක්.."

" ම්ම්.. ඒ ඇන්ටිට කිච්චනම් හරි බ්‍රෙසියර් එකක් අරගෙන අදින්න කියලා ගෙදරට.. මෙලෝ ලැජ්ජාවක් නැනෙ.."

" මොනවද බං කියවන්නෙ.. සැක්.. ඕන්නම් ගිහින් කියලා එනවා.."

" සිරාවට..?? පොඩ්ඩක් ඉන්නවා මම සුටුස් ගාලා කියල එන්නම්.."

රඩ්‍ය අයියා එළියට දුවන්න හදද්දි මම දෝත බදලම ඌව අල්ලගත්තා.. මේකා ගංජා ගහලද.. මේ මොනවද කරන්න යන්නෙ.. පෙන්නයි ඇන්ටි බ්‍රෙසියර් උඹට..

" ඒ මේ ආතල් දෙන්නැතුව හිටපන් අයියෙ.. තවුසෙට පිස්සුද.."

රඩ්‍ය අයියා එයාගෙ හරිම විනෝදය උපදවන සුළු විහිලුවට තනියම හිනාවෙන ගමන් පුටුසෙටියෙන් වාඩිවුනා..

" තනියමනෙ ඉන්නෙ.. මේ මොකක් හරි උවමනාවක් වුනොත් මට කෝල් එකක් ගන්නවා.. අපේ අයියට වුනත් කමක් නෑ.. තේරුනානෙ.."

" ම්ම්.. ගන්නම් ගන්නම්.. ඔයා ඉතින් කොට්ටාවෙ ඉදන් පියාඹලානෙ එන්නෙ නේද.."

" සුපර්මෑන් සුපර්මෑන්.."

" සුපර්මෑන් උනාට කමක් නෑ තවුසෙ ජොක්කු උඩට ඇදගෙන එහෙම මේ පැත්තට එන්න එපා.. එක්කො ඒක නැතුව වරෙන්.."

" ඒක නැතුව කොහොමද.."

@Shan

" ඇයි දවසක් කිව්වෙ හුළං වැදි වැදි ඉන්න හෙන ආසයි කියලා.. සිහිල් සුළන් රැල්ලේ~"

" අනේ මෙ වරද්.. කුණුහර්ප කතානොකර ඉදපන්.. මම දැන් යනවා.. උඹත් තනියමනෙ ගෙදර.. හෙට මම එන්නම් ගන්න.. ලෑස්තිවෙලා ඉන්න.. කෑම හදාගන්න පුලුවන් නෙ.."

" පුලුවන්.. පරිස්සමට ගෙදර යන්න.."

එයා ඉදගෙන ඉදලා නැගිටිද්දි ඊට ටිකක් එහායින් හිටපු මමත් පුටුවෙන් නැගිට්ටා..

" ෆෝන් එක ලග තියාගන්න.."

" හරි.."

" මෙහෙට එනවකො.."

රධ්‍ය අයියා මගේ අතකින් හිමිහිට අදිද්දි මම රධ්‍ය අයියා ගාවට කිට්ටු වුනා.. එයා මගේ දිහා ටිකක් වෙලා බලාගෙන ඉදලා මගේ කොන්ඩෙ අවුල් කල්ලා මාව පපුවට තුරුල් කරගත්තා.. මම එයාගෙ ශර්ට් එකේ කොනකින් පොඩි කල්ලා අල්ලගත්තා.. හරි හුරුපුරුදු හැගීමක් දැනෙනවා.. රධ්‍ය අයියා ගාව අමුතු උනුහුමක් දැනෙනවා.. මුලදිට වඩා හරිම ලග හැගීමක් දැනෙනවා.. ඒකට හරියට ලෝබ හිතෙනවා.. හුග දවසකින් ආයෙම ඒ හුස්ම මගේ නලලෙ පැත්තකින් හුගක් වෙලා නතරවෙද්දි මම ඇස් දෙක පියාගෙනම ඉදියා..

විනාඩි ගනනකට පස්සෙ රධ්‍ය අයියා මාව එහාට කරද්දි මම එයාගෙ පපුවට නිකට තියාගෙන මූණ දිහා බලාගෙන හිටියා.. මම ආසමෙ එයාගෙ ඇස් දිලිසෙනවට.. එතකොට පුංචි තරු දෙකක් වගේ.. දිග ඇස් පිහාටු දිහාම බලාගෙන ඉන්න හිතෙනවා..

" මතක් වුනා.."

මම රධ්‍ය අයියට ඇහෙන නැහෙන ගානට කතාකරද්දි රධ්‍ය අයියා මගේ මූණ දෙපැත්තෙන් අල්ලගෙන මගේ මූණ දිහාවට පහත් වුනා.. මම

@Shan

ඉක්මනට ඇස් දෙක පියාගත්තා.. මට එයාගෙ හුස්ම මගේ මූනෙ වදිනවා දැනෙනවා දැනෙනවා වගේ..

" මම ආයෙම උඹව උස්සන් යනවා වරද්.. මට යන්න දීපන්.."

රධ්‍ය අයියා මගේ නලලට ආයෙම හාදුවක් දීලා ස්ටූල් එක උඩ තිබ්බ කී එකත් අරගෙන ඉක්මනටම ගෙදරින් ගියා.. මම තාම මොකුත් හිතාගන්න බැරුව හිටගෙන ඉදපු තැනම ඇස් දෙකත් ලොකු කරගෙන බලාගෙන ඉන්නවා..

" දෙයියනේ මම මොනවද හිතුවෙ.."

ඔව.. උබර් මොනවද හිතුවෙ.. පොඩ්එකො..

එතකොට කියවන උබර්ලා මක්කයිහිතුවෙ.. මක්කවත් නැනෙ..

හවසට එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 45 කොටස

මම ඊයෙ ඉස්කෝලෙට ගිහින් ක්ලබ් එකේ මීටින් එකටත් ඉඳලා ගෙදරත් ආවා.. කවුරුත් නෙමෙ අපේ සෙනුකයා තමා ක්ලබ් එකේ ප්‍රසිඩන්ට්.. ඌ මේ ටිකේ සාංකාව හැදිලා වගේ ඉන්නෙ.. අයුක අයියා බිග්මැච් එකට ප්‍රැක්ටිස් වෙනවා දවසෙම.. මූට අයියව හම්බෙන්න විදියක් නෑ.. අල්ලගත්තනෙ ඉස්කෝලෙ ක්‍රිකට් ටීම් එකේ කැපාව ඉතින්.. ඊයෙ දවසෙම ඉස්කෝලෙ ඉඳගෙන කැම්පේන් එකට ඕන දේවල් ලෑස්ති කල්ලා අද උදේ යන්න තමා හිතාගෙන හිටියේ..

අම්මා උදේ කතාකල්ලා සති අන්තෙ එනවා කියලා කිව්වා.. මාමා ට්‍රින්කො ගියා විතරයි කතාකලේවත් නෑ ආයෙම.. ඒ මනුස්සයගෙ අභිරහස් ජීවිතේ ගැන ඉතින් අපිට කියන්නෙත් නෑනෙ කොහොමත්.. මම කාල බීල ගෙවලුත් අස් කරගෙන පාඩුවේ හිටියා.. අල්ලපු ගෙදර කමනි ඇන්ටි කොයිවෙලේ බැලුවත් බෙල්ල මෙහෙට දික් කරගත්ත ගමන්මයි ඉන්නෙ.. ඒකනිසා ඊයෙ රධ්‍ය අයියා මාව ගේට් එක ගාවින් දාලා එහෙමම යන්න ගියා.. හරි මගුලක් තමා ඒක.. අපි ඉන්න ඕන උන්ට ඕන විදියට..

මම උදේ නැගිටලා ක්ලබ් එකේ සුදු ටීශර්ට් එකට කළු ඩෙනිමක් ඇඳලා කලු ඩෙග් දෙකකුත් දාලා බැක්පැක් එකත් ලෑස්තිකරගෙන එළියට වෙලා හිටියා.. අයුක අයියා නැති නිසා රධ්‍ය අයියා සෙනුකයවත් පික් කරගෙනම එනවා කියලා කිව්වේ.. කියාන් අයියලා මේ ක්ලබ් එකේ නෑ.. ඇරත් ඒකා පිස්සුවෙන් වගේ මේ ටිකේ රගර් ගහනවා මැච් එකක කියලා..

ටික වෙලාවකින් රධ්‍ය අයියා අපේ ගෙදර ඉස්සරහ ඉද්දි මම දුවගෙන ගිහින් කාර් එකට නැග්ගා.. සෙනුකයා ඉන්නවා පෑනකුත් කටේ ගහගෙන මොනවද බල බල.. මම ආවා කියලවත් ඌට ගානක් නෑ..

" අම්මට කිව්වද.."

" ඔ කිව්වා.. ඒ සෙනුකයා.. බල්ලො.. ඔයි.."

මම පිටිපස්සෙ සීට් එකට වෙලා කොළ ගොඩක් බදාගෙන ඉන්න සෙනුකයගෙ ඔලුවට අත දිගැරලා පාරක් ගැහුවා..

@Shan

" ආ අඩෙ ෂනෙරුවා.. ගුඩ් මෝනින්.."

" මෝනින්.. මොකක්ද ඔය.."

" නෑ බං මේ මම ආයෙම මේක බැලුවා.. ඒ උඹ තනියමනේ බං ඉන්නෙ මේ ටිකේ.."

" ම්ම්.. අම්මා ඉරිදා එනවා කිව්වා.."

" එහෙමද.. ඒ උඹට බය නැද්ද බං තනියම ඉන්න.."

" බය වෙන්නෙ මොකටද ඉතින්.. උඹ වගේ නෙමේ මම හෙන පිට කොල්ලෙක් හරිත.."

" අනේ පලයං.. මම උඹට- ඒ පොඩ්ඩක් ඉදපන්.."

සෙනුකයා ෆෝන් එකට කෝල් එකක් ආපු නිසා කතාව නවත්තලා ෆෝන් එක ආන්සර් කලාම මම ඉස්සරහා බලාගෙන පාඩුවෙ ගියා.. රධ්‍ය අයියා වෙන කවුරුත් ඉද්දි ඉතින් ලොකුවට කතාකරන්නෙ නෑනෙ..

" මොකද.."

" මොකුත් නෑ.."

" ඕ රධ්‍ය අයියා ඉන්නවා.."

" මොකටද මං ගැන හොයන්නෙ.. තවුසෙ ඔය ලබ්බෙ බැට් එකම බදාගෙන ඉන්නවා.."

" අනේ මේ මම තියනවා.."

" කියනවා ඉතින්.."

" මම කරන්නෙ මට ඕන දේ.."

" මම පොඩි එකෙක් නෙමේ හැම මගුලම ඇගිල්ලෙන් ඇන ඇන කියන්න.."

" තවුසෙට කිසි ගානක් නෑ.."

@Shan

" ආ දැන් මම තමයි වදේ.. එහෙමනෙ.."

" නෑ නෑ දැන් තවුසෙම කිව්වෙ මම මාර වදේ කියලා.."

" අනේ තවුසෙගෙ බොරු ආදරේ.. එක පොඩ්ඩක් කතාකරන්න බෑ.."

" අනේ නටපං.."

" මම දන්නෙ නෑ.. කතාකරන්න එපා මට ආයෙම.."

" මම තියනවා.. නෑ නෑ ඕන්නෑ.. මට පුලුවන් මං ගැන බලාගන්න.."

සෙනුකයා ෆෝන් එක අරගෙන අයුක අයියට දිගට හරහට බනිනවා.. පවුල් ප්‍රශ්නයක්ද කොහෙද.. මම රධ්‍ය අයියගෙන් මොකද ඇහුවහම එයා උරහිස අකුලලා දන්නෙ නෑ කිව්වා.. සෙනුකයා කෝල් එක කට් කලා විතරයි අනිත් පැත්තට රධ්‍ය අයියට කෝල් එකක් ආවා..

" ඕ කියපං.."

" එහෙම අවුලක් නෑ බං මම හවස් වෙනකල්ම ඉන්නවා.."

" මට ඕවා කියන්නෙපා මම දන්නෙ නෑ.."

" දන්නෑ.."

" මට බෑ.."

" එනවනම් වරෙං.."

" හා හා.."

" මල්ලි මේ අයුක කියනවා උගේ නම්බරේ අන්බ්ලොක් කරන්නලු.."

රධ්‍ය අයියා ෆොන්ට් මිරර් එකෙන් සෙනුකයා දිහා බලලාකියද්දි සෙනුකයා රධ්‍යායියටත් රවලා ශටර් එකෙන් අහක බලාගත්තා.. යකෝ මූට රවන්නෙ.. මු මක් කලාද..

@Shan

" මල්ලි කතාකරන්නෑ.. අනේ මේ උඹලා ඕන ලබ්බක් කරගනින්.. එනවනම් වරෙන්.. මම තියනවා.."

රධ්‍ය අයියා ෆෝන් එක කට් කල්ලා ෆෝන් එක මගේ උකුලට දැම්මා.. ෆෝන් එකේ ලොක් ස්ක්‍රීන් එක දැකලා මට කෙලත් හිරවුනා.. මේකා ඒක වෙනස් කල්ලද.. ඒකෙ හිටියෙ එදා ස්පෝර්ට් මීට් එක දවසෙ අපි දෙන්න බ්ලේසර් දෙක උරහිසට දාගෙන කරට අත දාගෙන හිනාවේගෙන ගහපු ෆොටෝ එකක්.. ඌප්ස් මගේ ලස්සන.. මම ඒක දැක්කා විතරයි රධ්‍ය අයියා මොකක් හරි මතක් වෙලා වගේ ආපහු ෆෝන් එක අරගෙන ඒක කකුලෙ කලවට යටකරගත්තා.. දැකලා ඉවරයිනෙ ඉතින්.. මම ලාවට හිනාවෙලා ඉස්සරහා බලාගත්තා.. සෙනුකය ඉන්නවා මූණ හට්ටියක් කරගෙන.. ශටර් එකට නහයත් තද කරගෙන..

" මල්ලි.. අයුකයා මේ ටිකේ බිසී.. මැච් එක ළඟයිනෙ.. පොඩ්ඩක් එහෙ මෙහෙ වෙනවා.. කතාකල්ලා බලන්න.. ඌ අවුලෙන් ඉන්නෙ.."

" මට බෑ.."

සෙනුකයා රධ්‍ය අයියටත් කෑගහලා ෆෝන් එක අරගෙන ආපහු කනේ තියාගත්තා..

" මොකද.."

" මම කිව්වනෙ ඕන්නෑ.."

" තවුසෙත් තවුසෙගෙ සීයා වගේ තමා.. මිනිස්සුන්ට බොරුමයි කියන්නෙ.. ඒ වගේ නැතැයි නල්ලමලේ මුනුබුරත්.."

යකෝ සෙනුකයා මේ බනින්නෙ අපේ රටේ පරිසර ඇමතිට නේද.. යසයි බේසිකයා ඕහොම මූනටම කියනවද මං අහන්නෙ..

" එපා ඕන්නෑ.. බෑ මම රධ්‍ය අයියා එක්ක එන්නෙ.."

" බෑ රධ්‍ය අයියා එක්ක විතරමයි එන්නෙ.."

" ඔව් රධ්‍ය අයියා තමා මිනිහා.. තවුසෙට වඩා කොහොමත් ඒ අයියා හොඳයි.."

@Shan

" මගේ කන මිනිහෝ.. කැඟහන්න එපා මගුල.."

" එනවා එනවා.. මගුල.. පිස්සු හැදිලා වගේ බෙරිහන් දෙනවා.."

සෙනුකය ආයෙම ෆෝන් එක කට් කල්ලා මහ කුප්ප හිනාවක් දාගෙන රධ්‍ය අයියා දිහා බලාගෙන ශටර් එකට මූන තියාගත්තා.. මූ යකෝ.. මගේ වෙන්න මිනිහටත් විදින්නද හදන්නෙ.. මෙ පුතේ ඕවටනම් එන්නෙපා හරිද.. මටත් මල පනිනවා..

" මෙ රධ්‍ය අයියෙ.."

" මිම්..??"

" අයාන් අයියා කොළඹ ඇවිල්ලලු නේද.. ඔයාලව හම්බුනාද.."

" නෑ බිග්මැච් එකේදි හම්බවෙච්චි සමහරවිට.."

" ආ.. ඒකතමා.."

කවුද යකො අයාන් කියන්නෙ.. අනික මම නොදන්න මොකක්ද රධ්‍ය අයියගෙයි සෙනුකයගෙයි කතාව..

" කවුද අයාන්..??"

" ඇයි බං කියාන් අයියගෙ අයියා.. අයාන්.. අර ඉස්සර අපේ ඉස්කෝලෙ ක්‍රිකට් ටීම් එකේ කැපාට හිටියේ.."

" කොයි කාලෙද.."

" අපි පොඩියි එතකොට හැබැයි.. හයේදි විතර.."

" මට ලොකු මතකයක් නෑ බං.."

" ඩයල් එක රුහුණේ මැනේජ්මන්ට් එකේ ඉන්නෙ.. මෙ ටිකේ මෙහෙ ප්‍රයිවට් යුනියක අයිටී කෝස් එකක් කරනවලු.."

" එහෙමද.."

@Shan

" ඌ හෙන කුකුලා.. උඹට බිග්මැච් එකේදි හම්බවෙව්.. කියාන් අයියා වගේ නෙමේ හෙන ඔලුව.."

" සිරාවට.. මම..මම.."

අපි එල්ඩර්ස් හෝම් එකට ආවහම අපේ ක්ලබ් එකේ ඔක්කොම වගේ එතනට ඇවිල්ලා හිටියා.. හරි නිදහස් පරිසරේක තියන එල්ඩර්ස් හෝම් එකක්.. වැඩි සද්ද බද්ද නෑ කොළඹ වුනත්.. එන තැනම සාමාන්‍ය තරමේ ක්‍රිස්තියානි පල්ලියක් එක්ක ලොකු කුරුසයක් හදලා තිබුනා.. ඒ කුරුසෙන් දකුනුපැත්තෙ හිටියේ සීයලා.. වම් පැත්තෙ ආච්චිලා.. තැනින් තැන ගස් යට බංකු දාලා ඒවගේ සීයලා ආච්චිලා වාඩිවෙලා හිටියා.. සමහරු කල්පනා කරනවා.. සමහරු පොත් කියවනවා.. ගොතන කටු වලින් ගොතනවා.. හැමෝම හිටියේ තම තමන්ගෙ ලෝකවල.. ඒත් මට එහෙම දකිද්දි පපුව පිච්චිලා ගියා.. එයාලගෙම ලෝක වල උන්නත් හිත්වල කොච්චර දුකක් ඇද්ද.. මට ඒකම මතක් වෙලා මහා දුකක් දැනුනා..

අපි මුලින්ම ගිහින් එල්ඩර්ස් හෝම් එකේ සිස්ටර්ලා දෙන්නත් එක්ක කතාකලා.. එයාල හරිම කරුණාවන්තයි.. අපේ ඉස්කෝලෙන් හැම අවුරුද්දෙම මෙතෙන්ට එන නිසා එයාලා අපිව හොදට අදුරනවා..අපිව හිනාවෙලා පිලිඅරගෙන අපි එක්ක කතාබහ කලා.. එයාලගෙ අඩුපාඩු ගැන අපිත් එක්ක කිව්වා..

අපි කරන කැම්පේන් එකෙන් ඩොනේට් කරනවා විතරක් නෙමෙයි දවසක්ම අරගෙන එල්ඩර්ස් හෝම් එක ක්ලීනුත් කරනවා.. ඉන්ට්‍රැක් ක්ලබ් එකම නෙමෙ කැමතිනම් වෙන ක්ලබ් වලට මේකට ජොයින් වෙන්නත් පුලුවන්.. ගිය අවුරුද්දේ ලියෝ ලත් මෙකට ජොයින් වුනා.. මේ වතාවෙ හිටියේ ඉන්ට්‍රැක් එකයි ෆොටෝග්‍රැෆි එකයි.. ලමයි හෙන තොගයක් හිටියා කැම්පේන් එකට ආපු.. ෆොටොග්‍රැෆි එකේ කට්ටිය කැමරාස් ස්ටෑන්ඩ් කරගෙන පොඩි එන්ටටේනින් වැඩ වගේකුත් ආච්චිලා සීයලා වෙනුවෙන් ලෑස්තිකල්ලා තිබ්බා..

පිරිමි ලමයි හැමෝම මාස්ක් දාගෙන කොහු ඉදල් අරවා මේවා අරගෙන එල්ඩර්ස් හෝම් එක ක්ලීන් කලා.. මකුළුදැල් කැඩුවා.. බිම සේදුවා.. කැඩුනු කබඩ්ස්, හදන්න පුලුවන් දේවල් හැදුවා.. එතකන් ඔක්කොම ආච්චිලා සියලා පල්ලියට වෙලා හිටියා.. නැත්නම් එළියේ ඇවිද ඇවිද හිටියා, ඇවිදින්න පුලුවන් අය..

@Shan

මමත් කොස්සක් අරගෙන එල්ඩර්ස් හෝම් එකේ එක හෝල් එකක් අතුගාද්දි සෙනුකයා පණ දාගෙන ආච්චි කෙනෙක්ගෙ කබඩ් එකක් අස් කරනවා.. රෙදි නමනවා.. ඇඳවල් ගසලා හදනවා.. රඨා අයියා කැඩිලා තිබ්බ ඉලෙක්ට්‍රික් බඩු වගයක් තියාගෙන බවුත් කරනවා තව ලමයි වගයක් එක්ක.. ඔය අස්සෙ ෆොටෝග්‍රැපි සොසයිටි එකෙන් චමිරුයි මතීශයිත් මේකට ඇවිත් හිටියා.. මම උන් දැක්කත් දැක්කෙ නෑ වගේ පාඩුවෙ මගේ වැඩක් කරගෙන හිටියා.. උන් මගේ හිතින් මම කොහොමත් අයින් කලේ හුග කාලෙකට කලින්.. දැන් නම් හෙන ගහලා ගියත් මට අදාල නෑ.. තරහක් නෑ.. ඒත්.. ඕන්නෑ..

මම අතුගාපු හෝල් එකේ මකුළුදැල්ත් කඩලා මොප් කල්ලා සෙනුකයා ඇඳවලුත් හදලා නෙට් එල්ලලා ඕවා කරලා ඉවරවෙන්නම පැය තුන හතරක් ගියා.. හෝල් කියන්නෙ පොඩි හොල් නෙමෙනෙ.. හෙන දිගයි එකක්.. ඒවගෙ බඩු එහෙඅ මෙහෙට අස් කර කර අස් කරද්දි ඉතින් හොද පණ යනවා.. ළමයි කෑගහන්නෙ කියවන්නෙ මොකුත් කරන්නෙ නෑ.. අපේ ඉස්කෝලෙ තියන හොඳකම කියන්නෙ තැනකට ආවහම නම් ඉස්කෝලෙ නම තියාගෙන ඉන්න උගන්නලා තියෙනවා.. රඨා අයියා දාඩිය පෙරාගෙන හෙන තඩි පෙට්ටි වගයක් උස්සගෙන උඩ තට්ටුවකට යනවා මම ටිකකට කලින් දැක්කා..

" අම්මෝ බං කොන්දත් රිදෙනවා.."

සෙනුකයා මම හේත්තුවෙලා ඉදපු බිත්තියට මොප් බකට් එකකුත් උස්සගෙන ඇවිත් හේත්තු වුනා.. දාඩිය දානවා අම්මටසිරි වෙන්න.. මමයි සෙනුකයයි විනාඩි දෙක තුනක් විතර කතාකර කර ඉද්දි අපිට පෙනුනේ ඈතින් සුදු බොටමකුයි සුදු අත් දිග ශර්ට් එකකුයි සුදු කැප් එකකුයි දාගෙන මේ පැත්තට එන කොල්ලෙක්ව.. මම සුටුස් ගාලා සෙනුකයා දිහා බැලුවම මේකා බයවෙලා වගේ මගේදිහා බැලුවා..

" අන්න පලයං.. උඹෙ අයූ බබා එනවා.."

" අනේ පගො කටවහගනින්.. ඒ සිරාවට මේකා ඇවිල්ලද.. මම හිතුවෙ එන එකක් නෑ කියලා.."

" වත්සල්.."

@Shan

අයුක අයියා මේ පැත්තට එද්දි මම සෙනුකයව එතන දාලා රධ්‍ය අයියව හොයාගෙන යන්න හැදුවත් මම දැක්කෙ අත මැණික් කටුව ගාවින් අල්ලගෙන බිත්තියකට වාරු වෙලා ඉන්න චමිරුව.. එයා ඇඳගෙන හිටිය ක්ලබ් එකේ සුදුපාට ශර්ට් එකේ ලේ පැල්ලමකුත් තියෙනවා.. මම ඇයි කියලා බලන්න හිමින් සැරේ ඒකා ගාවට කිට්ටු වුනහම ඒකා මාව දැකලා අත පිටිපස්සට කරගෙන හංගගත්තා..

" චමිරු??"

" ම්ම්.."

" මොකක් හරි අවුලක්ද.."

" නෑ.."

මම චමිරුගෙ අත ඇදලා අරගෙන බලද්දි මෙකා මොකකටහරි අත කපාගෙන.. මැණික් කටුව ගාවින් හරහටම කැපිලා ගිහිල්ලා.. මම උගේ අත ඇදලා අරගෙන ඒ ලගම තිබ්බ ටැප් එකට අල්ලද්දි ඒකා අත මිටි කරගෙන මං දිහා කන්න වගේ බලාගෙන හිටියා.. මෙකා යකඩෙකට කපාගෙනද දන්නෙ නෑ..

" මොකකටද අත කැපුනෙ.."

" පේපර් කටර් එකකට.."

" ඒක මලකඩ කාලා තිබ්බද.."

" දන්නෙ නෑ.."

" එහෙමද.. උඹට ටෙටනස් විදින්න වෙයිද දන්නෙ නෑ.. මලකඩ කාලා තිබ්බනම්.. මෙක බැදගනින්.. යනගමන් බෙහෙත් දාගෙන පලයන්.."

මම මගේ සාක්කුවෙ තිබ්බ පාවිච්චි කරපු නැති කහ පාට ලේන්සුව චමිරුගෙ අතේ ගැටගහලා එතනින් එන්න ආවා.. මම එන්න හැරෙද්දි රධ්‍ය අයියා පඩිපෙල ගාව වාඩිවෙලා මං දිහා බලාගෙන ඉන්නවා.. මමත් ඇවිදගෙන ගිහින් පඩියකින් ඉදගත්තා.. රධ්‍ය අයියගෙ මූණට දාඩිය දාලා

@Shan

කොණ්ඩෙ දෙපැත්තෙන් දඩිය පහළට පහළට බේරෙනවා.. ඇඳුමත් තෙතම තෙතයි.. මං ගාව ලේන්සුවක් තිබ්බෙත් නෑ.. මටත් හොදටම දාඩියයි..

" අයුක අයියා ආවා.. හම්බුනේ නැද්ද.."

" නැනෙ.. ඌ ඇවිල්ලද.."

" ඔව්.. සෙනුක එක්ක කතාකර කර හිටියා.."

" ඌ ඔය කෝච්ගෙන් අම්බානෙක බැනුනුත් අහගෙන බස් එකේ ඇවිත් තියෙන්නෙ.. මට එනගමන් කෝල් කලා.. අරූ මැරෙන්න හදනවනෙ.."

" එහෙමද.. දුක තමා ඉතින්.. මොනා කරන්නද ඒයි.."

අයුක අයියා බස් වල යන එන එක්කෙනෙක් නෙමෙයිනෙ.. සෙනුකයා ඒකව ගානට හදලා ගනී වගේ.. අයුක අයියා ගැන හරියට දුක හිතෙනවා.. ඒ වුනාට සෙනුකයත් මහ පතෝල ගැරඩියෙක්නෙ.. රධ්‍ය අයියා තමා මිනිහා ගගා හිටියෙ.. හිතේ ඇති මගෙ වෙන්න මිනිහව අල්ලගන්න.. ඒ වුනාට ඉතිං මේ ගැටපොලොස් කොට්ටොරුවා ආදරේ මට විතරනෙ.. ඒකනෙ ඉතින් වෝල්පේපර් එකටත් දාගෙන ඉන්නෙ..

" මේ ඔයාගෙ ෆෝන් එක මෙහෙ දෙනවකො.."

" ඒ මොකටද.."

" ආ බැරිද දැන්.."

" බෑ බෑ.."

මම උගේ සාක්කුවට අතදාලා බලෙන්ම ෆෝන් එක එලියට ඇදලා ගත්තා.. ඒ ඩින්ගට මේකා මං දිහා බලන් හිටියේ මම ඌව රේප් කරන්න ආවා වගේ.. යකෝ සාක්කුවට අත දැම්මෙ.. කලිසම අස්සට නෙමේනෙ..

" මොනවද බං කරන්නෙ.."

" මේකෙ පාස්වර්ඩ් කියනවකො.."

" හයයි නමයයි නමයයි හය.."

@Shan

" ම්ම්.. හයටයි නමයටයි ආසයි වගෙ.."

මම කුප්ප හිනාවකුත් දාගෙන උගෙ ෆෝන් එක අන්ලොක් කල්ලා ගැලරියට ගියා.. මට බලන්න ඕන වෙලා තිබ්බෙ මෙක මගේ ෆොටෝ කීයක් හොරාට තියාගෙන ඉන්නවද කියලා.. මම ගැලරියට යන්න ස්ක්‍රීන් එක ටච් කරන්න හැදුවා විතරයි ෆෝන් එක උඩින් ගියා..

" දීපිය ෆෝන් එක මෙහෙට.."

රධ්‍ය අයියා ෆෝන් එක උදුරගෙන මොනවද කොටලා ෆෝන් එක සාක්කුවට ඔබාගත්තා.. හිටපන්කො මම ඕක දවසක බලාගන්න.. පිත්තල ගෙම්බා..

" අපි එළියට යමුද.. මෙහෙ දාඩියයි අනේ.."

" ම්ම්.."

මමයි රධ්‍ය අයියයි පඩිපෙලෙන් නැගිටලා එළියට එද්දි අපිට මූණට චමිරුව හම්බුනත් චමිරු බිම බලාගෙන එතනින් ගියා.. රධ්‍ය අයියා කොහොමත් චමිරුව දන්නෙ නැනෙ හිනාවෙච් කතාකරන්න.. තියා ඌ දන්න එකෙක් එක්කවත් හිනාවෙලා කතාකරන්නෙ නැනෙ.. අපි දෙන්නම එළියෙ ඇවිදගෙන යද්දි අපි දැක්කෙ වයසක සීයා කෙනෙක් ගහක් යට බංකුවකට වෙලා පොතක් කියවනවා.. හරි වැදගත් පෙනුමක් ඒ සීයට තිබ්බෙ.. කණ්ණාඩි දෙකකුත් දාගෙන පොත කියවන ගමන් ඒ පොතේ මොනවහරි ලියනවා.. මමයි රධ්‍ය අයියයි ඈත ඇවිදගෙන එද්දි ඒ සීයා අපි දෙන්නා දිහා බලාගෙන ඉදලා හිනාවෙලා අපි දෙන්නට එතනට එන්න කියලා කතාකලා.. අපි ඉතින් මොකද කියලා දන්නෙ නැති නිසා ඒ බංකුව ගාවට ගියා..

" මේ දරුවො දෙන්නා මොකක් හරි වැඩකට යන ගමන්ද.."

සීයා මගේ අතකින් අල්ලගෙන අහද්දි මම රධ්‍ය අයියා දිහා බැලුවා..

" නෑ සීයෙ.. අපි පොඩ්ඩක් එළියට ආවා.. දාඩිය නිසා.."

" ආ එහෙනම් මෙහෙන් වාඩිවෙමුකො බලන්න.."

@Shan

සීයා බංකුවට තට්ටුවක් දැම්මහම අපි දෙන්න සීයට දෙපැත්තෙන් ඉදගත්තා..

" මේ දරුවො දෙන්නව දැක්කහම මට ආයෙම මගේ ඉස්කෝලෙ කාලෙ මතකෙට ආවා.. මොකක්ද නම් කිව්වෙ..."

සීයා රධ්‍ය අයියගෙ අතක් අල්ලගෙන අහද්දි රධ්‍ය අයියා සීයා එක්ක හිනාවුනා.. ආදරෙ හිතෙන හිනාවක්..

" මම රධ්‍ය.. මේ ඉන්නෙ වරද්.."

" ම්ම්.. ලස්සන නම් දෙකක්.. මේ හොදම යාලුවොද.."

සීයා මගෙන් අහද්දි මම හිනාවෙලා ඔලුව වැනුවා.. සියා අපිත් එක්ක හිනාවුනා..

" දැන් කාලෙ තරුණ දරුවො මේ හැටියට වැඩිහිටියොන්ට උදව් කරනවා දකිද්දි මගෙ හිතට හරි සතුටක් දැනෙනවා.. හොද පුරුදු පොඩි කාලෙන්ම පුරුදු වුනාම ඉස්සරහට මේ රටේ වැඩිහිටි නිවාස තැනෙන එකක් නැතිවේවි.."

සීයා පොඩිම දුකක්වත් හිතේ නැතුව හිනාවෙලා කිව්වත් මට දුක හිතුනා.. රධ්‍ය අයියත් සීයගෙ පිට අතගානවා දුක හිතිලා වගේ.. සීයත් මෙහෙම තැනක ඉන්නෙ එයාගෙ ළමයි සැලකුව නැති නිසානෙ.. නැත්නම් වැඩිහිටි නිවාසෙක මෙහෙම තනිවෙලා ඉන්න ඕන නැනෙ..

" මගේ නෝනා නැතිවුනේ දැනට මාසෙකට කලින්.. අපි දෙන්නම උන්නෙ මේ වැඩිහිටි නිවාසෙමයි.. අවුරුදු හතරක ඉදලා.. ඉස්සරනම් පාළුවක් නොදැනුනාට.. දැන් දැන් මේ වයසක මනුස්සයටත් පාළු හිතෙනවා දරුවො.."

සීයා හයියෙන් හිනාවෙවී කියද්දි මම රධ්‍ය අයියා දිහා බැලුවා.. සීයා හිනාවුනත් ඒ හිනාවෙ නොකියන දුකක් තියනවා මට හොදට දැනුනා..

" මේ දරුවො හරිම වාසනාවන්ත පෙනුමයි.. මම දැක්කා දෙන්නත් එක්කලා හරි හරියට මහන්සි වෙනවා.."

@Shan

සීයා අතේ තිබ්බ පොත වහලා පැත්තකින් තිබ්බා..

" මේ ළමයි ඉගනගන්නෙ කොයි පන්තිවලද..??"

" මම මේ අවුරුද්දෙ ඒ ලෙවෙල් ලියනවා සීයෙ.. මේ අයියා ඒ ලෙවෙල් ලියලා ඉවරයි.."

" ම්ම්..ම්ම්.. හොදයි හොදයි.. මේ ළමයින්ගෙ අනාගත බලාපොරොත්තු මොනවද ඉතින්.."

සීයා රධ්‍ය අයියගෙන් අහද්දි රධ්‍ය අයියා පොඩ්ඩක් විතර උත්තරදෙන්න පරක්කු කලා.. එකපාරට මොකක් කියන්නද හිතාගන්න බැරිවෙන්න ඇති..

" මම හිතාගෙන ඉන්නවා ඉන්ජිනියරින් කරන්න.."

" එතකොට මේ දරුවා.."

" මම-මම හුගක් ඒවා හිතාගෙන ඉන්නවා.. ඉස්සෙල්ලම සතුටින් ඉන්න එක තමා බලාපොරොත්තු වෙන්නෙ.."

" ආ ඉලන්දාරියා දැන් ඉන්නෙ දුකෙන්ද ඒ කියන්නෙ.."

" ඔව්නෙ ටිකක් විතර.. ඉගනගන්නොකොට හැමෝටම දුකයිනෙ.."

" ඒකනම් ඇත්ත ඉතින්.. දුක විදලා හරි ඉගනගත්තු දේ තමයි දරුවො මතුවට රැකෙන්නෙ.. එතකොට තව මොනවද තියන බලාපොරොත්තු.."

" තව කැම්පස් යන්න.. ඔලිම්පික් වලට බැඩ්මින්ටන් ප්ලේ කරන්න.. ට්‍රැවල් කරන්න.. හුගාක් තියෙනවා.."

සීයා හයියෙන් හිනාවුනා..

" මේ ළමයි දෙන්නා මට මගෙ තරුණකාලෙ මතක් කරනවා.."

" ඒ කිව්වෙ සීයෙ.."

" මගේ නෝනා.. එයත් මේ දරුවා වගේමයි.. මේ ළමයට කියන්න.. මම කතාකරන්නෙ වචන තුනක් නම් එයා ඒ තප්පරේට වචන සීයක්ම

@Shan

කතාකරනවා.. මට ඔය ළමයි දෙන්නව දැක්කහම ඒක මතක් වුනා.."

සීයා රධ්‍ය අයියගෙ පිටට එකක් ගහල කියද්දි රධ්‍ය අයියා ඇස් දෙකත් ලොකු කරගෙන මගේ දිහා බැලුවා.. මම ඇස් වලින් 'එපා' කියද්දි රධ්‍ය අයියා ආයෙම මූණ තිබ්බ විදියට හදාගෙන සීයා එක්ක හිනාවුනා..

" එහෙමද සීයෙ.."

" ඒකනෙ.. මට ලෝබකමේ බෑ.. හරිම පිංපාට ලමයි දෙන්නෙක්..මේ ළමයි හොදට ඉගනගන්න ඕන.. ලොකු මහත්තුරු දෙන්නෙක් වෙන්න.. ම්ම්..තේරුනාද.."

" හොදයි සීයෙ.."

" අපිනම් තව අවුරුද්දකින් දෙකකින් පොළොවට පස් වෙලා යාවි.. ඒ වුනාට දරුවෝ.. අපි කරන හැම හොද දෙයක්ම මෙ ලෝකෙ සදහටම පවතිනවා.. තේරුනාද..මගේ මේ අවුරුදු හැත්තෑවටම අත්දැකපු දේ බොහෝයි.. මේ ළමයි තාම මල් වගේ.. හරිම පොඩියි.. මේ ලෝකෙ මල් වලට ඉන්න හුගක් අමාරුයි දරුවෝ.."

" ඔය පොඩි මල් ගහ මහා විසාල රුස්ස ගහක් කරගන්නෝන.. තේරුනාද.. මල් ඉක්මනට පොඩි වෙනවා.. හුලගට පෙති ගහගෙන යනවා.. සමහරු කඩාගන්න බලනවා.. එහෙම නෙමෙයි.. රුස්ස ගහක් වුනොත් අනිත් අයට හෙවණ දෙන්න පුලුවන්..කෑම දෙන්න පුලුවන්.. මහපොලොවට හයියක් වෙන්න පුලුවන්.. ඒවගේ මුල් තද කල්ලා පොලොව බදාගත්තහම ලේසියෙන් කාටවත් ගලවන්න බෑ.. කුණාටුවකට වුනත් ඔරොත්තු දෙනවා.. මේ ලස්සන මල් පැල කවද්දහරි රුස්ස ගස් වෙන්න ඕන.. එහෙම වෙලා මහපොළොව තදින් බදාගන්න ඕන..ම්ම්.."

සීයා ලොකු කතාවක් කල්ලා මගේ ඔළුව අතගෑවා.. රධ්‍ය අයියා ඒ හැම වචනයක්ම අහගෙන හිටියේ හුගක් උවමනාවෙන්.. හැම වචනයක් ගානෙම එයාගෙ ඇස් වෙනස් වුනා.. සීයා කියපු කතාවෙ ලොකු තේරුමක් ගැඹුරක් තියෙනවා අපි දෙන්නටම තේරුනා.. වචනෙන් විස්තර කරන්න බැරි ලොකු තේරුමක්..

සීයා අපි දෙන්නා එක්ක කතාකරලා ටික වෙලාවකින් සීයගෙ කරේ තිබ්බ මාලයක් ගලවලා අතට ගත්තා.. ඒ මාලෙ අමුණලා තිබ්බෙ පෙන්ඩන්ට

@Shan

එකක් නෙමේ.. හෝලි ක්‍රොස් එක ගානෙ තියන මුදු දෙකක්.. ඒවා හරිම අලුත් පාටට දිස්නෙට තිබුනා.. සීයා මාලෙ පැත්තකින් තියලා අර මුදු දෙක අතට අරගත්තා.. මමයි රධ්‍ය අයියයි මොකුත් හිතාගන්න බැරුව මූණට මූණ බලාගෙන ඉද්දි සීයා හිනාවුනා..

" මේ මුදු දෙක දැන් සෑහෙන්න පරණයි දරුවෝ.. ඒ වුණාට මම පුලුවන් විදියට පරිස්සම් කරගත්තා.. තව අවුරුද්දකින් දෙකකින් මමත් මේ ලෝකෙන් ගියහම මේ මුදු රකින්න කෙනෙක් ඉතුරු වෙන්නෙ නෑ.. නිකරුනේ කුණු ගොඩකට විසික් වෙලා යනවට වඩා හොදයි මේක තියාගන්න පුලුවන් කෙනෙක්ට දෙන එක.."

සීයා රිදීපාට මුදු දෙක රධ්‍ය අයියගෙ අතින් තිබ්බා..

" මට ඔය ලමයි දෙන්න දැක්කහම මේක දෙන්න ඕනමයි කියලා හිතුනා.."

" අනේ සීයෙ.."

" නෑ නෑ දරුවෝ.. මේක ඔය දෙන්නගෙ ළගින්ම තියාගන්න.. මම ඕකට පණ වගේ ආදරේ කලා.. මේ ළමයි දෙන්නා හොදම යාලුවො වුනත් ලොකු බැදීමක් ඇති කියල මට දැනෙනවා.. නැත්නම් ඉතින් මාව් මතක් වෙන්න තියාගන්නකො..මම්.."

" තැන්ක් යූ සීයෙ.."

" ජේසු පිහිටයි මගෙ දරුවො දෙන්නට.. හැමදාම සතුටින් ඉන්න ඕන.. කරන කියන හැමදේම සාර්ථක වෙන්න ඕන.."

සීයා බංකුවෙන් නැගිටලා මගෙයි රධ්‍ය අයියගෙයි ඔලුව අතගාලා හැරමිටියත් අරගෙන බංකුවේ තිබ්බ පොතත් අතට අරගෙන එතනින් හිමින් හිමින් ඇවිදගෙන නිවාසෙ පැත්තට ගියා.. මමයි රධ්‍ය අයියයි තවම බංකුවේ වාඩිවෙලා සීයා දිහා බලාගෙන ඉන්නවා.. මම රධ්‍ය අයියගෙ අතේ තියෙන මුදු දෙක දිහා බැලුවා.. ඒවා තවම රිදී පාටයි..

" හරි පුදුමයි නේද.."

මම රධ්‍ය අයියගෙ මූණ දිහා බැලුවහම එයත් මොකුත් හිතාගන්න බැරුව මං දිහා බැලුවා..

@Shan

" මටත් හිතාගන්න බෑ.. මොකක්ද ඒ වුනේ.."

" ඒත් ඒ සීයා හරි හොදයි නේද අයියෙ.."

" ම්ම්.. අත දෙන්න මෙහෙට.."

රධ්‍ය අයියා මගේ උකුළ උඩ තිබ්බ අත අරගෙන අර මුදු දෙකෙන් එකක් මගේ අතේ වෙදැගිල්ලට දැම්මා.. දාලා එයා ඉතුරු එක දාගත්තා.. මම එයාගෙ ඇඟිලි වල මගේ ඇඟිලි පටලගෙන අපේ අත් දිහා බලාගෙන හිටියා.. අපේ අත් දෙකේම හෝලි ක්‍රොස් එක ගානෙ තියෙන මුද්දක් ගානෙ තිබ්බා.. රධ්‍ය අයියා අපේ අත් දිහා බලාගෙන හිනාවුනා.. පොඩි පොඩි දේවල් වලට වුනත් කොච්චරක් සතුටු හිතෙනවද.. මටනම් හරිම සතුටක් එක්ක ආදරයක් දැනුනා.. මට මං ගැනම ලෝබයි.. මම කොච්චරක් ආදරේ විදිනවද.. කියාගන්න තේරෙන්නෙ නෑ..

" ඉතින් කොහොමද බං මම උඹට ආදරේ නොකර ඉන්නෙ.."

❤අනේ ලමයි..

කෝමද.. මම දොළහයි එක වෙද්දිම ලියලා ඉවර කලා.. යේහේ..

ආයෙ හවහට එන්නම් මම ඉතින්..

අනේ මම කොච්චර කිව්වත් ඇති වෙන්නෙ නෑ දෙයියනේ ඔය හැමෝටම.. මේ කතාවට ආදරේ කරනවට හුගක් ස්තූතියි.. මම හුගක් හුගක් ආදරෙයි.. ඒ ආදරේට.. ❤

"

**We are still kids, but we're so in loveFighting against all oddsI know we'll be alright this timeDarling, just hold my handBe my boy, I'll be your manI see my future in your eyes**

.."

"

**Well, I found a man, stronger than anyone I know**

@Shan

**He shares my dreams, I hope that someday I'll share his home**

**I found a lover, to carry more than just my secrets**

**To carry love, to carry children of our own.."**

❤❤❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 46 කොටස

එදා එල්ඩර්ස් හෝම් එකට ගියාට පස්සෙ ආයෙම මාවයි රධ්‍ය අයියවයි හම්බුනේ නෑ.. එයාට ගන් ශූටින්ද මොකක්ද තියෙනවා කියලා ඒකට යන්න වෙලා අපේ ගෙදර ආවෙ නෑ.. ඒකත් හොදයි එක අතකට.. අල්ලපු ගෙදර ඉන්න පිස්සු කමනි ඇන්ටි හැමතිස්සෙම හොම්බ දික් කරගෙනනෙ ඉන්නෙ.. මෙහෙ මොනවද වෙන්නෙ කියලා.. අම්මා අද ගෙදර එනවා කියලා තිබ්බා..දැන් නම් ඇවිල්ලත් ඇති.. මම උදේ ක්ලාස් ඇවිල්ලා ගෙදර එනකොට රෑවෙනවනෙ.. මම හිටියේ මහීශා එක්ක කරුමක්කාර එකසිය හැට තුනේ ෆුට් බෝඩ් එකට පොඩ්ඩක් උඩින් එල්ලිලා යන ගමන්.. රෑට යන අන්තිම බස් නිසා මේවගෙ එන්න වෙන්නෙ නුගේගොඩින් ෆුට්බෝඩ් එල්ලිලා තමා.. ඉස්සර හයට ඉවරකරද්දිනම් මහනුවර-පානදුරක එල්ලිලා අපි දෙන්නටම ගෙදර ගාවින් බහිනවා.. කොහෙද දැන් මහ රෑ වෙනකල් පන්ති දානවනෙ.. අද මහීශාගෙ අම්මට වැඩ වගේකට එළියට යන්න වෙලා අම්මා  එනකල් මහීශා අපේ ගෙදර ඉන්නවා කිව්වා.. අපේ අම්මත් ඉන්නවනෙ.. මෙකි ගිය වෙලේ ඉදන් කරන්නෙම අපේ අම්මා එක්ක පච හලන එකනෙ.. මම බස් එකේ කොක්කක අත තියාගෙන ඔලුව අතට බර කරගෙන ආවෙ.. පුරුදු කරුමක්කාර ලෙඩේට මගේ ඔලුව කකියන්න අරගෙන බඩේ ඇවිල්ලක් අල්ලලා.. මාරම අමාරුයි.. බෙහෙත් ගෙනාවෙත් නෑ උදේ එන්න පරක්කු උනු නිසා අතට අහුවෙච්ච පොත් ටික ඔබාගෙන පන්ති ආවෙත්.. මම අතට ඔලුව බර කරගෙන ඇස් දෙක පොඩ්ඩක් පියාගෙන එද්දි මගේ සාක්කුවෙ තිබ්බ ෆෝන් එක වයිබ්‍රේට් වෙන්න ගත්තා..

" වරද්.. ක්ලාස් ඉවර වුනාද.."

" ඔව් මේ ගෙදර යන ගමන්.. තාම බස් එකේ.."

" මට ගන්න බැරිවුනා.. දැනුයි මම මෙතනින් එළියට ආවෙ..අද අම්ම එනවා කිව්වනෙ.."

" ම්ම්.. එනවා කිව්වා.. ඔලුව රිදෙනවා අයියෙ.."

" ඒ මොකද.. දවල්ට කෑම කෑවෙ නැද්ද.. බෙහෙත් බිව්වෙ නැද්ද නැත්නම්.."

@Shan

" අමතක වුනානෙ ඒක ගේන්න.."

" අම්මපා වරද්.. උඹට සිහිය නෑ.. හුගක් අමාරුද.."

" ම්ම්.. රිදෙනවා.."

" පොඩ්ඩක් ඉදපන්.. දැන් ගෙදර යනවනෙ.. දැන් කොයි හරියෙද.."

" කෝට්ටෙ.."

" ම්ම්.. ඩයජීන් එකක්වත් ගත්තෙ නැද්ද.."

" ගත්තා.. ඒ වුනාට අමාරුයි.."

" උඹට මතකයක් නෑ අසනීපයක් තියෙනවනෙ.. ඒකට බෙහෙත් බොන්න ඕන කියලා.. තියන පණ්ඩිතකමට උඩ දාගෙන යනවා අරහෙ මෙහෙ.. කන්නෙ බොන්නෙ නැතුව මැරිය.."

" කෑගහන්න එපා මනුස්සයෝ.. මගුල.."

" කෑගන්න නෙමේ උඹව හමගහන්න තියෙන්නෙ.. ගෙදර ගිහින් ඇදේ දපලා නිදියන්නෙ නැතුව කාලා බෙහෙත් බීපිය.. මැරෙන්න හදනවා.."

" හරි හරි මේ මම තියන්නම්.. මෙකෙ කතාකරන්න අමාරුයි.."

" පරිස්සමට ගිහින් මට ගන්නවා.."

" ම්ම්.."

මම ෆෝන් එක කට් කල්ලා ෆෝන් එක පොකට් එකට ඔබාගනිද්දි මහීශා මගේ ෆෝන් එක ඇදලා ගත්තා..

" උඹට මම දන්නැති කවුරුහරි ඉන්නවද ෂනෙරු.."

" මොන.. පිස්සුද.."

" බොරු කියන්නෙපා.. උඹෙ මොකක් හරි හුටපටයක් තියෙනවා.. දැන් උඹට හරියට කෝල් එනවා වැඩීනෙ.."

@Shan

මහීශා නලල රැළි කරගෙන මගේ දිහා බලාගෙන ඉදලා ෆෝන් එකේ කෝල් ලොග් එක බලන්න ගත්තා.. දැන් ඉතින් ඕකෙ ඇති උඩ ඉදන් පල්ලෙහාට රිසිව් කෝල්ස් වල අර යකාගෙ නම.. මම ඒකට උත්තර දෙන එක මගාරින්න ආයෙම අතට ඔලුව ගහගෙන ඇස් දෙක පියාගත්තා.. මැසේජ් බැලුවත් ඉතින් හොයාගන්න පුලුවන් එකක්යැ.. ඒකයි මමයි කතාකරන්නෙ බහුබූතනෙ.. ලව් කරන්නෙ නැනෙ ෆෝන් එකෙන්..

" රධ්‍ය.. මේ රධ්‍ය ද රධ්‍යා ද.. කොහේ ඩී ජී සී ද.. ඒ නැගිටපන්.. ෂනෙරුවා.. බල්ලො.. කවුද මේ.."

මහීශා මගේ පිටට තඩිබාගෙන තඩිබාගෙන ගියා.. මෙකි අලි මස් ගිලිනවද මන්දා..

" මොන??"

මම බොරුවට ෆෝන් එකට මූණ දාල බැලුවා..

" ආ ඔය රධ්‍ය.. අපේ ඉස්කෝලෙ ඩිපියුටි කැපා.."

" පොඩ්ඩක් ඉදපන්.. අර එදා මට රවපු එකා නේද.. ස්පෝර්ට්ස්මීට් එකේ..කියාන් අයියලගෙ යාලුවා?? මට ආශි කියලා තියෙනවා.."

" ම්ම්.."

" එතකොට ඌ මොකටද උඹට මෙච්චර කෝල් කරන්නෙ.. ඇත්ත කියපන් ෂනෙරුවා.. උඹෙ මොකක් හරි පටලැවිල්ලක් තියෙනවා නේද මෙකා එක්ක.."

" එහෙම මගුලක් නෑ බං.. පටලැවිල්ලක් කියන්නෙ.. ඌයි මමයි ලව් කරන්නෙ නෑ.."

" එහෙනම් ඉලව්වක්ද කරන්නෙ.."

" මම දන්නෙත් නෑ බං.."

" එහෙනම් ඌ උඹට කැමති???"

" ම්ම්.. ඒ වගේ එකක් තමා.."

@Shan

" එතකොට උඹත් ඌට කැමති???"

" ම්ම්.."

" ටහුක්.. මොකක් කිව්වා.. උඹ අරුට කැමති?? අරු වගේ එකෙක් උඹට කැමති?? සිරාවට?? උඹලා දෙන්නට පිස්සු හැදිගෙන එනවවත්ද..නැත්නම් මෙ ලෝකෙ කැරකෙන්නෙ වෙන පැත්තකටද.."

" ඇයි??"

" ඇයි අහන්නෙ.. ඌ එහෙම වැඩිය මොකෙක් එක්කවත් කතාකරන එකෙක් නෙමේනෙ.. උඹ වගේ යන යන තැන බාල්දි පෙරලගන්න අලි විසේ තියන එකෙක්ට ඌ කැමතිවුනා කිව්වහම.. අඩෝ උඹලා ඔක්කොම කපල් වෙලා.. බලපන් මම තනිවෙලා.."

" අනේ පලයන්.."

" කිව්වෙවත් නෑ පරයා.. මම උඹේ හොඳම යාලුවා නෙමේ.. පැය දෙකකට අපි යාලුවකම් ඉවරයි.."

" උඹට කියන්නත් අපි හම්බුනේ නෑනෙ.. කියන්න තරම් දෙයක් තියේද බං ඉතින් ඔකෙ.."

" නැත්තං.. උඹලා කොහොමද සිරාවට ඔක දැනගත්තෙ.. උඹලා කපල් එකක් නොවුණට එහෙම හැසිරෙනවනෙ.. නේ?? නේ??"

" එහෙමම නෑ.."

" නැත්තෙමත් නෑ??"

" ම්ම්.."

" ඉතින් කියපන්කො අගේ නොකර.."

" අනේ මන්දා බං කවදා කතාකරන්න ගත්තද මටත් හරියටම මීටර් නෑ.. ආ දවසක් ස්පෝර්ට් මීට් කාලෙ මම මූ එක්ක අවුල් ගිහින් සෙනුකයා එක්ක පන්තියට වෙලා ඉද්දි, ඇවිත් කියලා ගියා එයාට කියන්න දෙයක් තියෙනවා.. ඒ ලෙවෙල් ඉවරවෙලා කියන්නම් කියලා.. ඒ වෙද්දි මට

@Shan

නිකමට ලාවට වගේ තේරිලා තිබ්බෙ.. මටත් ක්‍රශ් එකක් වගේ එකක් තිබ්බ ඒ කාලෙ ඌට.. ඊටපස්සෙ තමා ඉතින් කතාකරන්න ගත්තෙ.."

" මම්.. ඉන්ටරෙස්ටින්.. ඉතින් ඊටපස්සෙ.."

" එච්චර තමා.. දැන් නම් හුගක් වෙලාවට කතාකරනවා.. මොකද කරන්නෙ ,පාඩම් කරනවද ඕවා අහන්න තමා.. ඌත් ටිකක් අමුතු කැරැක්ටර් එකක්.."

" අමුතුයි කියන්නෙ බං.. ඌ මොකෙක් එක්කවත් කතාකරන්නෙ නැනෙ.. මම හිතුවෙ හෙන ඔලුවෙන් ඉන්නෙ කියලා.. ආශිත් කිව්වා හෙන අමුතු ඩයල් එකක් කියලා.. උගෙන් වැඩක් නෑ ඌ උඹට කැමති වුනා කිව්වහම.. අඩෙ.. උඹත් ඉදලා ඉදලා පය ගැහුවොත් ඉතින් හෙන විසාල අත්තක් තමා.."

" කටවහගනින්කො බං.."

" ඉතින් මං කියන්නෙ ඇත්තනෙ.. අන්තිමෙට සෙනුකයටත් හරිගියා.. ආශිටත් හරිගියා.. උඹටත් හරිගියා.. මාත් හොයාගන්නෝන ෂුගර් ඩැඩීකෙනෙක් හරි.."

" උඹට ඩැඩීලා කැමතිවෙන්නෑනෙ බං.. මමී කෙනෙක් තමා හොයාගන්න වෙන්නෙ.. නැත්නම් අර දැන් පස්සෙන් එන සහසා එක්කවත් යාලුවෙයං.."

" අනේ මෙ මාව පල්ලි ගෙනිගින් ගල් ගහලා මරාවි.. ආතල් දෙන්නැතුව ඊළග හෝල්ට් එකෙන් බහින්න මගේ බෑග් එක අරන් දීපන්.."

මහීශා පස්සෙන් එන අලුත්ම යුවතිය තමයි සහසා.. ඩයල් එක මුස්ලිම්.. ඒකනිසා මහීශා මෙ ටිකේ බයෙන් ඉන්නෙ ඒකිගෙ අයියගෙන් කන්න වෙයිදෝ කියලත්.. මෙකි මහීශා දැක්කහම පිස්සු කෙලිනවානෙ.. අදත් වැරදිලා ඒකිගෙ ඇගේ හැප්පිලා මෙකි එතන කොණ්ඩෙ ගස්සලා අමුතු විදියට බලලා පිස්සුවක් කෙලියා.. පේපර් එක ලියද්දිත් හැරි හැරී මහීශා දිහා බලනවා මට සෙනුකයා පෙන්නුවෙ.. හොදම දේ ඒකි ඉන්නෙත් මහීශාගෙන ඉස්කෝලෙ එකම පන්තියෙ..මෙකිට පෝලිමක් පිටිපස්සෙන්.. ආයෙම වද මලක්වත් කනේ ගහන් ඩීපී එක වෙන කරන්න කිව්වනම් හරි ගවුමක් ඇදගෙන..

අපි දෙන්නා හෝල්ට් එකෙන් බැහැලා අපේ ගෙදරට ඇවිදගෙන ගියා.. යද්දි අපේ අම්මා ඉස්තොප්පුවට වෙලා අපි එනකල් ඉන්නවා.. මහීශා අපේ

@Shan

අම්මව දැක්කා විතරයි දුවගෙන ගිහින් බදාගත්තා.. මෙකි යකෝ.. මෙහෙම ගිහින් අපේ අම්මලා අපි දෙන්නව බන්දලා දෙයිද මට සැකේකුත් තියෙනවා.. ඒ වුනාට මම විශ්වාසෙන් කියනවා මෙකිව බන්දන්න ගියොත්නම් මම ජීවිතේ එපා කියලා කැළණි ගගට පනිනවා..පනින එක පනිනවාමයි.. කැළනි ගඟානෝ~ නිතරම වතුර ගලානෝ~

" දෙන්නම මූණ හෝදගෙන එන්නකො..මම කෑම බෙදලා තියන්න.."

" හරි නැන්දා.."

මහීශා කොණ්ඩෙම පිටිපස්සට අල්ලලා බූලක් දාගෙන වොශෲ එකට දුවගෙන යද්දි මම අම්මගෙ හොඳට පීරලා ගොතලා තිබ්බ කොණ්ඩෙ බූල ගලෝලා පුටුසෙටියට විසික් කරගෙන කාමරේට රිංගගත්තා..

" සුදුමහත්තයා.. උඹට මොලේ අමාරුවද.."

" මම ආදරෙයිනෙහ් අම්මෙ.."

" සමයං.."

අපේ අම්මා මටත් කෑගහගෙන කුස්සියට යනවා ඇහුනහම මම රඩ්‍ය අයියට කෝල් එකක් ගත්තා.. දෙපාරක් රිංග්ස් වෙන්න කලින් ආන්සර් කළොත් මම මූට ටොප් වෙනවා..

" ටීක්.."

" ටී- ගෙදර ආවද.."

සැක්.. මම මොකුත් හිතුවෙ නෑ.. ඒවා අමතක වෙවා.. ඒස්වාහඃ පුහ්..

" ඕ.. දැන් ආවෙ.. ඔයා ගෙදරද.."

" ඔව් දැන් ඇවිත් ටිකක් වෙලා.. දැන් ඔලුවෙ කැක්කුම මොකද.."

" රිදෙනවා තාම.."

" කෑම කාලා බෙහෙත් බීලා නිදාගන්න ටිකක්.. පාන්දර ඇහැරිලා වැඩ කරන්න පුලුවන් නෙ.."

@Shan

" මිම්.. හෙට ඉස්කෝලෙ එනවද.."

" අපි ඉතින් හැමදාම එන්න එපැයි.."

" ෂනෙරුවා මට ටිශූ එකක් දීපන් යකෝ මූණ පිහිදාගන්න.. උඹ මොකක්ද ඔය ජනේලෙ බදාගෙන කරන්නෙ!!!!!!!!!!!!!!!!!"

මෙ ගෙම්බි.. මගේ ප්‍රේමනීය මොහොත නැතිකල්ලා ඒක සුන්නද්දූලි කල්ලා දැම්මා.. බේසික කෙල්ල.. මේ ආත්මෙට මොකෙක්වත් සෙට් වෙන්නෙපා..

" මෙ තියෙන්නෙ.. ගනින්කො.."

මම ළඟ තිබ්බ ටිශූ බොක්ස් එක ඒකිගෙ මූණට දමලා ගැහුවා..

" කවුද ඒ.. කෙල්ලෙක් නේද.."

" මහීශා අනේ.. අපේ ගෙදර ඇවිල්ලා.."

" ආ මස්සිනේ~"

" මොන මගුලක්ද බං.."

" මස්සිනා කාලද ඉන්නෙ.. අපි කන්නයි යන්නේ~"

මහීශා මගෙන් ෆෝන් එක උදුරල කනේ තියාගෙන මගේ ඇඳ උඩට නැගලා මට කොට්ටෙකින් ගැහුවා..

" මස්සිනා කලබල වෙන්න අවශ්‍ය නෑ.. මම ඇවිල්ලා මුගේ බොක්ක.. බොක්ක කියන්නෙ අපි එන්නෙ පතාගෙන.. ඔතාගෙන යන්න.. මස්සිනා එදා රැව්වට මම අමනාපයක් නෑ හොදේ.. මා එක්කත් අමනාප වෙන්න එපා.. ආ අපි බිග් මැච් එකේදි සෙට් වෙමු හොදේ.. මෙන්න ඔයාගෙ කුක්කු පැටියා ඉන්නවා.. දෙන්නම්.."

මෙ පරට්ටි මොනවද අරුට අර කිව්වෙ..කුක්කු පැටියා.. ?? සැක්.. මහීශා මගේ කනේ ෆෝන් එක ගහලා මහා හයියෙන් සිංදුවක් කියාගෙන කැරකිලා කුස්සිය පැත්තට ගියා..

" අයි කැන් බයි මයිසෙල්ෆ් ෆ්ලවර්ස්.. රයිට් මයි නේම් ඉන් ද සෑන්ඩ්~"

@Shan

" අ-අයියෙ.."

" උඹට ඉන්න ඔක්කොම යාලුවො උඹ වගේ උන්ද.."

" අනේ මේ මම මෙහෙම නෑ හරිත.. මම ඇවිල්ලා- ආව් අප්පා ඔලුව රිදෙනවා.."

" නටන්නැතුව ගිහින් කාපන්.. මටත් ඔලුවෙ කැක්කුමක් ඇල්ලුවා වගේ.."

" හා බුදුසරණයි.."

" බුදුසරණයි කාලා නාලා බෙහෙත් බීලා දෙයියනේ කියලා නිදාගනින්.."

රධ්‍ය අයියා ෆෝන් එක කට් කලා.. එහෙම කොහොමද.. දෙයියනේ කියලා නිදාගෙන පාන්දර ඇහැරිලා මම ඔබතුමාවත් ඇහැරන්නම්කො.. මම ඇගිල්ලේ තිබ්බ මුද්ද කරක කරක කෑම කන්න ගියා..

ඒ ලමයි කාලා නාලා නිදාගන්න යන්නෙ.. ඔය ලමයිනුත් ගිහින් සූ දාලා නිදාගන්න..

එපා!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!

මේ දවල් නිදාගන්න ලැජ්ජා නැතිද.. යසෙ බේසික අක්කලා අයියලා නම්කිලා මම්ලිලා..

ඉස්තුතියි නැවත එන්නම්.. ලා යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම**

@Shan

කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 47 කොටස

" වරද්.. ශර්ට් එක උඩට ඇවිල්ලා.. ඕක යට කරගනින්.."

ඉස්කෝලෙ ලයිබ්‍රි පීරියඩ් එකේ ලයිබ්‍රි යන්න කම්මැලි නිසා මමයි සෙනුකයයි හිමිහිට ඒ පීරියඩ් එකේ ක්ලාස් එකෙන් පැනලා ජිම් එක ගාව පැත්තට වෙන්න හදලා තිබ්බ ස්ටෙයාර්ස් වලට වෙලා කැන්ටිමෙන් ගත්තු කෝක් දෙකක් බිබී කියව කියව ඉද්දි ඉස්කෝලෙ කරක් ගහ ගහ හිටපු කියාන් අයියව අපිට සෙට් වුනා.. කියාන් අයියා ඉතින් තනියම යන්නෙ නැනෙ උගේ පරම මිත්‍රයො වෙච්ච සෙනුකයගෙ මිනිහයි මගේ වෙන්ඩ මිනිහයිත් අපිට හම්බුනා..පස්සෙ අපිට කෝක් දෙක අහිමි වෙලා ගියා.. මගේ යාලුවට මේ ලෝකෙ අමතක වෙලා ගියා.. මූට අයුක අයියගෙ හෙවනැල්ල වැටුනත් ඇති අතුරුදහන් වෙලා යනවා.. අනික අයුක අයියා වැඩිය අනිත් අය එක්ක කතාකරන එක්කෙනෙක් නෙමෙයිනෙ.. ටිකක් රඩ්‍ය අයියත් වගේ.. ඒ වුනාට සෙනුකයා එක්ක කියවනවා.. සෙනුකයත් අයුක අයියා හම්බුනහම දවසෙ වෙච්ච පොඩිම පොඩි දේ ඉදලා කියනවා.. අයුක අයියා අහගෙන ඉන්නවා.. අමුතු කෙමෙස්ට්‍රි එකක් උන් දෙන්නට තිබුනේ..

අයුක අයියා මම කලිනුත් කිව්වා වගේ හෙන ඔලුවෙන් ඉන්න ඩයල් එකක්.. එයාගෙ ෆැමලි එක හෙන පොශ්.. මිනිස්ටර්ස්ලා ඉන්නවා.. ඉස්කෝලෙ හැමෝම වගේ එයාව දන්නවා.. පොඩිම පොඩි දුරක් යන්නත් ඩ්‍රයිවර් කෙනෙක් ඉස්කෝලෙට එනවා.. යන්නෙත් රඩ්‍ය අයියගෙයි කියාන් අයියගෙයි ගෙදර විතරයි.. වෙන යාලුවෝ ඇත්තෙත් නෑ.. ඒ වුනාට ළගින් ආශ්‍රය කරන්න ගත්තට පස්සෙ තේරුනේ, අයුක අයියා හෙන හොදයි හැබැයි වැඩිය කතාකරන්නෙ නෑ.. ඕන උදව්වක් කිව්ව සැනින් කල්ලා දෙනවා.. රඩ්‍ය අයියගෙ ග්‍රේඩ් වන් වල ඉදලා යාලුවා තමා අයුක අයියා..

සෙනුකයා හම්බුනාට පස්සෙ අයුක අයියා හෙනට වෙනස් වෙලා වගේ දැනෙනවා.. විශේශෙන්ම එයාගෙ වටේ ඉන්න අයට.. සෙනුක හුගක් ආදරේ බලාපොරොත්තුවෙන එකෙක්.. ඌට කොච්චර ආදරේ කලත් මදී.. තව තව ඕන.. ඌට කලින් අෆෙයාර්ස් තිබිලා නැති නිසා ලව් කරන්නෙ කොහොමද මොනවද වෙන්නෙ ඒ මොකුත්ම දන්නෙ නෑ.. බබා වගේ අයුක අයියා අස්සටම වෙලා ඉන්නවා.. එදා මතීශලා එක්ක වලියක් දාගත්ත දවසෙත් මෙකා ඉස්කෝලෙ අලුතින් හදන ටෙක් එකේ පන්තියක් අස්සට

@Shan

වෙලා හොඳටම අඩලා අඩලා අන්තිමට හෙන අමාරුවෙන් කියාන් අයියයි අයුක අයියයි හොයාගෙන තියෙන්නෙ.. ඌට ප්‍රශ්න තිබිලම නෑ ජීවිතේ.. හෙන මලක් වගේ හැදෙන්නෙ.. මටනම් හිතෙන්නෙ ඌට හරියනම එක්කෙනා හම්බෙලා කියලා.. අයුක අයියා හෙන ආදරෙයි මූට.. මම දන්න විදියට ඒ දෙන්නට ටිකක් දුර ගියපු රිලේශන්ශිප් එකක් තියෙනවා.. ඒ කොහොම වුනත් අයුක අයියා උගේ හිත රිද්දන්නෙ නැත්නම්, ඌත් සතුටින් ඉන්නවනම්, ඒ දෙන්නගෙ කැමැත්ත ඒකනම් අපිට ඒකෙ ප්‍රශ්නයක් නෑ..

" කොයිවෙලාවෙ දැක්කත් වැරදි විතරයි කියන්නෙ.. මගුල.."

මම රධ්‍ය අයියට රවලා පිටිපස්සෙන් උඩට ආපු ශර්ට් එක යටකරගත්තා..

" ඉතින් උඹෙ නම වරද් නෙ.. වරද් කරන්නෙ වැරදි විතරමයි.."

" අනේ මේ කියාන් අයියෙ.."

ආවා මෙතන කුලියට කහින්න.. තඩි අලි පැටියා..

" අඩෙ බිග්මැච් එකත් එනවා බං.. බලපන් එකදිගට වැඩ වැඩ වැඩ..අපේ තමා පණ යන්නෙ.."

" මේ පාර විශේශ යමක් සිදුවෙයිද දන්නෙ නෑ නේද.. ගියපාර නම් මරු හලෝ.."

" ගිය පාර.. මරු තමා.. උඹ අර ස්කූල් ෆ්ලැග් එක ඉණේ බැඳගෙන පිස්සුවක් කෙළියනෙ.."

" එහෙම තමා.. මම ඒ ලැබූ ජය සැමරුවෙ.. ඒකනෙමේ තවුසෙ කොහොමද ඒක දැක්කෙ.."

" ඉතින් බං ඒ කාලෙ අපේ ගාව හිටියනේ රෝමියෝ කෙනෙක්.. ඌට පිංසිද්ද වෙන්න උඹ කෙලපු පිස්සු ඔක්කොම අපි පිටිපස්සෙ ඉඳගෙන බලාගෙන හිටියේ.. අනේ යකෝ.. උඹලගෙ රෝ එකට පිටිපස්සෙන් අපි ඉඳගෙන හිටියෙ.. පරයා.. ඒක දැකලත් නෑ.."

@Shan

" දකින්න ඉතින් ඕගොල්ලො වැදගත් මිනිස්සුයැ අනේ.. මාර කතා තමා ඔයත් කියන්නෙ.."

" රධ්‍ය අන්න බලපං කිච්ච කට කැඩිච්ච කතාව මෙකා.."

කියාන් අයියා පාඩුවෙ හිටපු රධ්‍ය අයියගෙ පිටට දබෝස් ගාලා එකක් අතැරියා..

" මේ මේ ඔයා එයාට ගහන්න තියාගන්න එපා හරිද.. ඒ ළමයා මහන්සි වෙලා ඉන්නෙ.."

" ඇයි ඌ බඩ වෙලාද.."

"සැක් ඕයි.. මොනවද කියවන්නෙ.. එයා තාම අතින් විතරයි අල්ලලා තියෙන්නෙ.."

" වරද්!!"

" පොඩ්ඩක් කට වහගෙන ඉන්නවකො අයියෙ.. මම මූට අපි දෙන්නා ගැන කියනවා.."

" සිරාවට අතින් විතරමද ඇල්ලුවෙ.."

" මම.. හරියටම මතක නෑ.. අතින් නම් ඇල්ලුවා මතකයි.. තව කොහෙන්හරි ඇල්ලුවද ඒයි.."

" වරද් කට වහගනින්.. උඹට ඇත්තට ලැජ්ජාවක් නැද්ද බං.."

" නැනෙ හරි වැඩේ.. මේ කියාන් අයියෙ කෝ ඔයාගෙ කැල්ල.."

" කැල්ල ඉන්නවා අල්ලපු වැටේ.. ඒ වුනාට මේ දවස් ටිකේ අපේ අයියා ගෙදර නිසා කතාකරන්නවත් විදියක් නෑ.."

" තවුසෙ අයියට බයද හලෝ.. ඒකට ආධ්‍ය අයියා.. හරිම හොදයි මගේ අතටත් බෙහෙත් දාල දුන්නා දවසක්.."

" ආධ්‍ය අයියා කොහොමත් හොදයි බං.. අපේ එකා එහෙම නෑ.. මහ අමුතු එකෙක්.. ඌ මාත් එක්ක කතාකරන්නෙත් නෑ ලොකුවට.. ඒ වුනාට හැම

@Shan

ලබ්බම අත දදා හොයනවා.. ආශු ගැන දැනගත්තොත් ඒකත් තාත්තගෙ කනේ තියයි.. ඌ යන්නෙ කවද්ද කියලා මම හොය හොය ඉන්නෙ.."

" ඌප්ස්.. අයාන් අයියා හෙන දරුනුයි වගේ.."

" ඒ වුනාට මෙ පාර මට පොඩි අවුලක් තේරෙනවා.."

" ඒ මොකක්ද.."

" අපේ අයියට කෑල්ලක්වත් සෙට් වෙලාද මන්දා.. මේ ටිකේ වැඩිය ගෙදර හිටියෙත් නෑ.. මම හිතන්නෙ ඌ මෙහේ කෙල්ලෙක්ට ට්‍රයිද කොහෙද.. කාවහරි ෆලෝ කරනවා.."

" එහෙමද.. මම..මම.. උබෙ කෑල්ලටද දන්නෙ නෑ අයියෙ ට්‍රයි.."

" පිස්සුද බං.. අනේ මෙ අයියට බම්බු ගහගන්න කියනවා.. යකෝ ඔකිව ආයෙ යාලු කරගන්න මම අර උඹලගෙ පන්තිය ගාව කාපු කට්ට මමනෙ දන්නෙ.."

" ආදරේ ගින්දරක්නෙ හලෝ.."

" එහෙමද.. ඒක ඇත්ත..උඹ වගේ ලෝදිය හැලියක් සෙට් නොවී ගිනි ගොඩක් සෙට් වුන එක ගැනනම් මට සතුටුයි තමා.."

" අනේ මම කිව්ව කියලා හිතාගනින්.."

මම රධ්‍ය අයියා පැත්තට හැරිලා වාඩිවුනා..

" මට ඔයාට කියන්න පොඩි වැඩක් තියෙනවා.. ඉස්කෝලෙ ඉවර වුනාම කියන්නද.."

" මොකක් ගැනද.."

" මොකුත් නෙමෙ අනේ පොඩි වැඩක්.. ඉන්නවකො ඉස්කෝලෙ ඉවර වෙනකල්.."

" මම..උඹලා දෙන්නා මෙ පීරියඩ් කට් කරනවා නේද.. මොනවද දැන් තියෙන්නෙ.."

@Shan

" දැන්ද ඒක අහන්නෙ.. අපිට ලයිබ්‍රි.. ඒකෙ ඉන්න බෑ අප්පා.."

" ඔව් උඹට අලි විසේනෙ.. කොහොමත් එක තැනක ඉන්න බෑනෙ.."

මම හිමිහිට රධ්‍ය අයියගෙ අතේ තිබ්බ මුද්ද ඇල්ලුවහම මෙකා මං දිහා බලලා හිනාවුනා.. එයාගෙ ඇස් යට දාඩිය රැඳිලා ඇහිපිහාටු තෙත වෙලා.. මම ඒක පිහිදාන්න හිමිහිට අත දික් කරනකොටම.. ඒ එක්කම කියාන් අයියා අපි දෙන්නගෙ මැද්දෙන් බෙල්ල දාලා අපේ අයි කන්ටැක් එක එහෙම පිටින්ම කඩලා එතන වෙන ලබ්බක් කරන්න ගත්තා..

" අඩෝ උඹලා බැන්දද බං.. මම හිතුවෙ අපේ එකා මෙක ආතල් එකට දාගෙන කියලා.."

" පිස්සුද හලෝ.. මේ දෙක අපි දෙන්නට හම්බවුනු දෙකක්.. අපි ගත්තෙ නෑ.."

" ඒ කොහෙන්ද.."

" වයසක සීයා කෙනෙක් දුන්නේ.. මතක් වෙන්න තියාගන්න කියලා.. ලස්සනයි නේ.."

මම මගේ අතේ තිබ්බ මුද්ද කියාන් අයියට පෙන්නුවා..

" ඒකතමා මම බැලුවේ උඹල කැතලික් නෙමෙයි වෙලා මොකටද හෝලි ක්‍රොස් දෙකක් ගහගෙන ඉන්නෙ කියලා.. ඒක ලස්සනයි තමා.."

" ඒකනෙ.."

" උඹලා දෙන්නා මරු බං.. මම ආශූ එක්කත් කිව්වේ.. උඹලා දෙන්නා සෝල්මේට්ලද දන්නෙ නෑ.. පෙනුමෙ ඉදන් හැම මගුලම උඹල දෙන්නගෙ ගැලපෙනවනෙ.. අපේ එකා හැපි එකේ ඉන්නවා දකිද්දිත් සතුටුයි.."

" අරිගතෝ අරිඅතෝ.."

" මේ උඹලා ලව් කරා ඇති.. ඔෆිස් එකට යන්න ආවෙ අපි.. සයෝන්ට මල පැනලද දන්නෙත් නෑ.. ඒ වරෙන් අයුකයා යන්න.."

@Shan

ටිකකින් ඒ තුන්දෙනා උඩහට යන පඩිපෙළ නැගගෙන ඔෆිස් එකට යන්න ගියා.. ආයෙම සෙනුකයයි මමයි එතන ඉතුරු වුනා..

" මොකක්ද උඹ අර රධ්‍ය අයියට කියන්න තියෙනවා කිව්වෙ.. මොකක් හරි ප්‍රශ්නයක්ද බං.."

" ප්‍රශ්නයක්මත් නෙමෙ බං.. මම දැන් ටික කාලෙකට කලින් දැක්කා එක මිනිහෙක් කමනි ඇන්ටි එක්ක කත අකර කර අපේ ගේ දිහා බලාගෙන ඉන්නවා.. ඊටපස්සෙ නම් ඌව දැක්කෙ නෑ.. ඒ වුනාට ලගකදි ඉදලා මට ඌව හැමතැනකම හම්බෙනවා.. මැදි වයසෙ පිරිමි කෙනෙක්.. බයික් එකකින්.. මට බය හිතෙනව බං.. අම්මා විතරයිනෙ ගෙදර තනියම.."

" සිරාවට?? උඹ දැන්ද කියන්නෙ බල්ලො.."

" නෑ බං අදත් මම උදේ හෝල්ට් එකේ ඉද්දි බයික් එක මං ගාවින් ස්ලෝ කරගෙන ගියා.. මට හිතට අමුතුයි වගේ.."

" අමුතු වෙන්නැතුව තියෙයිද බං.. උඹ කිව්වහම මටත් බයයි..  කෝකටත් ෂනෙරුවා අම්මා එක්ක පරිස්සමින් ඉදපන්.. අම්මට ගේට්ටුව වහලා දොරවල් වහගෙන ගේ ඇතුලටම වෙලා ඉන්න කියපන්.. හැබැයි කොහොමත් අම්මා එළියට බහින්නෙ නැනෙ.. ඒකනිසා ලොකු අවුලකුත් නෑ.."

" මම්.. බලමුකො.."

" ඒ වුණාට පරිස්සමින් බං.. උබ පොඩ්ඩක් හෙවිල්ලෙන් ඉදපන්.. උබ විතරයි ගෙදර කොල්ලෙක්ටත් ඉන්නෙ.."

" ටිකක් බලමුකො අපි ඉස්සෙල්ලා.."

කවුද පගො අපේ කොමලව ෆලෝ කරන රැලි වැටිච්ච හොට කැත කොකටුවා..

තලනමා ඇම්ටෙ මම..

බිග් මැම්ච් එකට සෙම්ට් වෙම්මු සකලබුජම්ලා.. ඔය ලමයිතුත් කොට කාසමක් ඇදගෙන එන්න..

@Shan

එන්නාම්.. ලව් යූ.. ❤

ඔතරීට ජබර නිදිමතක් ගහලා ටයිප් වෙන්නෙත් නෑ හරියට.. ගුඩ් නායිට්..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 48 කොටස

මම හිටියේ මගේ කාමරේ අනිත් පැත්ත පෙරළගෙන මගේ මේස් එකක් හොය හොය.. අම්මා මේස් දාපු කුඩේ තිබ්ලා කප්පාට බෑන්ඩ් එකක් තියන සුදුපාට මේස් එකේ එකක් තිබ්ලා හම්බුනාට ඒකෙ අනිත් එක හොයාගන්න හම්බුනේ නෑ.. මම මේ තකහනියක් ලෑස්තිවෙන්නෙ ලංකාවෙ පරණම බිග්මැච් එක වෙච්ච අපේ බිග්මැච් එක බලන්න යන්න..

බිග් මැච් කිව්වහම ඉතින්.. එක එක විදියෙ ඒවා තියෙනවනෙ.. සුලෝහිත සංග්‍රාමය කියයි.. ආදරවන්තයන්ගේ සටන කියයි.. බැට්ල් ඔෆ් බ්ලූස්, මරූන්ස්, ගෝල්ඩ්ස්, බැට්ල් ඔෆ් රොක්ස් එකී මෙකී නොකී ඒවා බොහෝයි.. ඕකෙ මැච් ෆීවර් නැතුව එන උන්ගෙ නම් ඒකායන පරමාර්තය තමා තම පාසලේ හයිය ගැහැනු පාසලට හා ලෝකයාට පෙන්වීමයි, පිස්සු කෙලීමයි.. කොහොම වුනත් බිග් මැච් මාරම ආතල්.. ඒ කාලෙට තියෙන්නෙ වෙනම කික් එකක්.. සමහර බිග් මැච් තිබ්බා හැමදාම මැච් එක ඩ්‍රෝ වෙන.. එක අතකින් මරදානෙ ගැම්මක් තමා..ඉතින් එදාට සයිකල් පැරඩ්ස් රෝඩ් ශෝ ඔවා සාමන්‍ය දේවල්.. හැම අවුරුද්දකම මේ කාලෙට කොළඹ හීගනේ වගේ.. මනුස්සයොත් ඔය හීගනේට ඉතින් හුරුවෙලා හිටියා..

මහීශා නමය වෙද්දි අපේ ගෙදර එනවා කියලා කිව්ව නිසා මම ඉතින් පොඩ්ඩක් දවල් වෙන්න නිදාගත්තා.. ඒ වුනාට අපේ අම්මා ඇදුම් අයන් කල්ලා මට කතාකලේ අට හමාරට.. අපේ අම්මත් මාර ඩයල් එක තමා.. කට ළගට ආවහම 'සුදුමහත්තයෝ දවල් වෙලා නැගිට්ටිනවා' කියලා කෑගහලා පොරවගෙන ඉදපු රෙද්දත් ඇදලා බිමට දාලා යන්න ගියා.. එතන ඉදන් ආයෙම මම මගේ අමතර විනාඩි පහත් නිදාගෙන, ඊටත් පස්සෙ එන අමතර විනාඩි දෙකත් නිදාගෙන ඇහැරෙද්දි වෙලාව නමයට පහ වෙලා..

ඊටපස්සෙ මම මහිශාට අනිත් පැත්තට කෝල් කල්ලා කිව්වා නමය හමාරටවත් වරෙන් කියලා.. ඊටපස්සෙ ඉක්මනට ගිහින් නාලා කොණ්ඩෙත් වෙලගෙන ඇදගත්තා.. ස්කූල් යුනිෆෝම් යන්නෙ නැතුව අපි ඔක්කොම හිටියේ කලර්ඩ් යන්න.. ඒක ලේසි.. අනික අපි ලොකු නිසා එහෙම ගියාට අවුලකුත් නෑ.. මහීශා ආශි දෙන්නම එන නිසා උන් එන්නෙත් කලර්ඩ් නිසා අර කියාන් අයියා කලර්ඩ් වරෙන් කියලා වැන්දෙ නැති ටික විතරයි අපිට.. හරිම පෞ කියාන් අයියා..

@Shan

මම ඉස්කෝලෙ බලූන්ගෝල්ඩ් එකෙන් ගත්තු ස්කූල් ලෝගෝ එක ගහපු කළුපාට ඕවර්සයිස්ඩ් ශර්ට් එකට සුදුපාට රිප්ඩ් ට්‍රවුසර් එකක් ඇදලා සුදුපාට ඩෙග් දෙකක් දාලා සුදුපාටම sun visor කැප් එකකුත් දාලා ඉස්කෝලෙ බෑන්ඩ් තොගයක් අතට දාගෙන හැන්ඩියා වගේ ලෑස්ති වුනා.. හැන්ඩියෙක් තමා ඉතින්.. අපෙ අම්මත් මගේ ඔලුව ඉඳන් පහළට බලලා අමුතු හිනාවක් දාගෙන කුස්සියට ගියා.. අම්මටත් හිත ගිහිල්ලනෙ පුතාට ඉතින්.. ඊටපස්සෙ මම අඩුවෙන්ම පාවිච්චි කරන මෙන් ප'ෆියුම් එකකුත් නාගෙන ඇස් යට කළුපාට ලයිනර් එකකින් ලයිනර් කරගත්තා.. කලර්ඩ් යන එකේ උපරිම ප්‍රයෝජන ගන්න එපැයි.. අනික මගේ ඇස් දෙකට කළුපාටින් ලයිනර් කලාම අමුතු ලුක් එකක් එනවා.. මම ඒකට ආසයි.. ඊටපස්සෙ අම්මට හොරෙන් තියාගෙන ඉන්න මැග්නට් ඉයරින්ග් එකත් සාක්කුවෙ ඔබාගෙන එළියට බහිද්දි මහීශා අම්මත් එක්ක ඇවිත් හිටියා.. මහීශාගෙ අම්මා අපේ අම්මා එක්ක කතාවක්.. ආශී මම දැක්ක ගමන් කට ඇරගත්තා.. කියාන් අයියට කියන්නෝන ගෑණි මට කෙළ හලනවා කියලා..

" ටසිරි යකෝ.. ෂනෙරුවා.."

" මොකද බං.."

" පිස්සු හැදෙනවා.. උඹ හෙන වල් පාටයි ඕයි.. බලපන් උබෙ බලල් ඇස් දෙක.. අපරාදෙ මට උඹ එක්ක යාලුවෙන්නත් තිබ්බා.. ඒ බං ආශී His boyfriend will be crazy today.. I can't imagine how Radhya's reaction will be.."

" I have never seen him dress like this before.. Varad has a unique look.. මූ දිහා නොබල ඉන්න තරමට අද පවුල් ටික රැකිලා තියෙයි.."

" අනේ බේසික කෙල්ලො දෙන්නා.. පරක්කු වෙනවා වරෙන් යන්න.."

" හැබැයි මූ කට ඇරියොත් ලුක් එක කැළණි ගඟේ පා වෙනවා.."

ආශී මටත් ගස්සගෙන ගිහින් කාර් එකට නැග්ගා.. උන් දෙන්නම අද ඇදලා ඇවිත් හිටියෙ එකවගේ.. කළු ශෝට් දෙකකට ස්ලීව්ලස් ට'ට්ල් නෙක් බ්ලවුස් දෙකක් ඇදලා.. මෙහීශාගෙ කොළු ලුක් එකට එහෙමත් ලස්සනයි හැබැයි.. වෙනසකට තියෙන්නෙ ආශී හයි පෝනිටේල් දෙකක් දාලා අරකී කොල්ලා වගේ කොණ්ඩෙ එක ඇහැක් වැහෙන්න කඩලා සුදු පාට

@Shan

බැන්ඩනා එකක් දාලා.. යකෝ අපේ ඉස්කෝලෙ මැච් එක තියෙන්නෙ.. අල්ලපු වැට හිතාගෙන එන්නෙ මේක ෆැශන් ශෝ එකක් කියලා..

අපි එස් එස් සී එකට එද්දි දහයට කිට්ටුයි.. රෝඩ් ශෝ අරවා මේවා ඉවරත් වෙලා මැච් එක පටන් අරගෙන.. අද අයුක අයියා ප්ලේ කරන්න ඉන්නවා.. සෙනුකයා රධ්‍ය අයියා එක්ක උදේ රෝඩ් ශෝ යනවා කිව්වා.. කියාන් අයියා එයාගෙ අයියත් එක්කනෙ එනවා කිව්වෙ.. අර ගැටපොලොස් කොට්ටෝරුවා මට රෝඩ් ශෝ එන්න එපා කියලා මාව දාල ගියා.. හිටපන්කො කරන්න මම හොඳ වැඩක්.. ඌට යන්න හොඳයි. මම ආවොත් තමා නරක.. කමක් නෑ ඔන්න ඔහේ මම ඒකෙ ටිකක් වැඩිපුර නිදාගත්තනෙ..

අපි ගේට් එකෙන් ග්‍රවුන්ඩ් එකට යද්දි ඉන්නවා බැට්ල් ඔෆ් නයිට්ස් එකට ආපු දෙනෝදාහක් සෙනග ඕඩියන්ස් එකේ ඉදගෙන.. තාම කොයින් ෆ්ලිප් එකද කොහෙද.. මට එච්චර දුර පෙනුනේ නෑ.. අයුක අයියයි අනිත් කැප්ටනුයි ග්‍රවුන්ඩ් එක මැද්දෙ හිටගෙන ඉන්නවා.. මම රධ්‍ය අයියට කෝල් එකක් ගත්තා.. මේ සෙනග මැද්දෙ මම කොහොමද මූව හොයාගන්නෙ.. මම ෆෝන් එක අතට ගද්දිම කෝල් එකක් ආවා.. අප්පටසිරි මිස්කෝල් දහයක් විතර ඇවිල්ලා.. මම ෆෝන් එක සයිලන්ට් දාලනෙ තිබිලා තියෙන්නෙ.. සුළු වැරැද්දක් වෙලා වරද්ගෙ අතින්..

" කොහෙද උඹ ඉන්නෙ වරද්.. තාම නිදිද මගුල.."

මම සද්දෙ අස්සෙ ෆෝන් එක කනේ තියාගත්ත ගමන් ගිරිය පලාගෙන අර පොල් කාවයියා මට කෑගහන්න ගත්තා.. ඇයි දෙයියනේ සද්දෙ ඇහෙන්නෙ නැද්ද.. මම ඉන්නෙ ග්‍රවුන්ඩ් එකේනෙ.. මූගෙ කන් දෙක බලාගන්න කිව්වනම් හරි..

" ඇවිල්ලා ඔයි ඉන්නෙ.. තවුසෙලා කොහෙද ඉන්නෙ.. මට හොයාගන්න බෑනෙ.."

" පොඩ්ඩක් ඉදපන්.. කියාන් ආවා.. උඹට වඩා සිහියෙන් ඉන්නවා අර කෙල්ලො දෙන්නා.."

" හැයි හැයි තමා.. ආ මේ මම තියනවා.. කියාන් අයියා ආවා.."

@Shan

මම ෆෝන් එකත් කනේ අහගෙන සකබඹරේ වගේ ගේට් එක ගාව කැරකෙද්දි යන යන හැම එකාම මගේ දිහා හැරි හැරි බැලුවා.. අර දෙරණේ පුංචි අවුරුදු කුමාරයා වගේ මාවත් ශෙයා වෙයිද දන්නෙ නෑ පුතේ.. මම හිමිහිට කැප් එක පහත් කල්ලා ඇස් දෙක ඒක වැහෙන්න දාගත්තා..

" ඔයාලා ලේට් ආශූ හොදටම.. කෝ ෂනෙරු මල්ලි.."

යකෝ කියාන් අයියෙ උඹට පොට්ටයා ගහලද.. කියාන් අයියා මගේම ඉස්සරහා හිටගෙන ආශිගෙන් අහද්දි ආශි ඇගිල්ල දික් කල්ලා කැප් එකෙන් මූන වහගෙන ඉන්න මාව පෙන්නුවහම මම පොඩ්ඩක් කැප් එක උස්සලා උංට මූණ පෙන්නුවා..

" ටහුක්.. මල්ලි.. උඹ- ඒ මේ වරෙන් යන්න.."

කියාන් අයියා මාවත් ඇදගෙන අපේ ඉස්කෝලෙ ඕඩියන්ස් එකේ කට්ටිය ඉන්න තැනත් පහුකරගෙන ගිහින් බැල්කනි එකක් වගේ සෙට් කරලා තියන තැනකට ගියා.. මුන් වී අයි පී ද මේවගෙ ඉන්න.. ඒකත් හොදයි වීව් එකත් හොදයි.. කියාන් අයියා මාව එතන තිබ්බ පඩිපෙළ ගාව අතෑරලා ආශිලා එක්ක මුලින් ගියා.. මම ඉතින් එතන ඉදපු අපේ ඉස්කෝලෙ ඕල්ඩ්බෝයි සීයා කෙනෙක්ට හයි ෆයිව් එකකුත් දාගෙන උඩට දුවගෙන දුවගෙන එද්දි තා පොඩ්ඩෙන් හොම්බෙන් යනවා.. හොදවෙලාවට අත්වැල අල්ලගත්තෙ.. මම උඩට යද්දි රධ්‍ය අයියා ඉන්නවා පිටිපස්සෙම බෙන්ච් එකක ඉදගෙන ෆෝන් එක දිහා බලාගෙන.. මූණේ ස්කූල් ෆ්ලැග් එකකුත් ගහලා මම වගේ හෙන බෑන්ඩ් ගොඩකුත් අතේ දාගෙන තනි කළුපාටින්ම ඇදගෙන කළුපාට කැප් එකකුත් අනිත් පැත්තට දාගෙන.. ශර්ට් එකේ අත් දෙක පුපුරන්න වගේ තදවෙලා..

මම උඩට ආවා විතරයි රධ්‍ය අයියා මම දිහා බලලා අඳුරන්නෙ නැති එකෙක් වගේ ආපහු ෆෝන් එක දිහා බලාගත්තා.. මූ යකෝ.. තමන්ගෙ වෙන්න මිනිහව අඳුරගන්න බැරිද.. ඊට්පස්සෙ තප්පරයක්.. තප්පර දෙකක් ගියා.. ආයෙම කරන්ට් එක වැදිලා වගේ පඩිපෙලේ මූණත් නාළු කරගෙන ඉන්න මම දිහා බලලා ඇස් දෙක ලොකු කරගත්තා.. දෙන්න හිතයි පොල් කාවයියට මූණ ගැලවෙන්න එකක්..

" ව-වරද්..??"

" වරද් තමා.. තවුසෙට මාව අඳුරගන්න බැරිවුනාද.."

@Shan

" න්-නෑ නෑ.."

රධ්‍ය අයියා ඉක්මනට ඉදපු හිටිය බෙන්ච් එකෙන් නැගිටලා ඇවිත් පඩිපෙලේ ඉදපු මගේ අතින් උඩට ඇද්දා.. මෙකෙ ඉන්නෙ මුන් ටික විතරද.. මාර ආතල් නෙ.. ආධ්‍ය අයියත් ඉන්නවා..

මම උඩට ඇවිත් වටේ ඉන්න උන් කවුද කියලා බලද්දි රධ්‍ය අයියා මගේ කැප් එක ගලවලා උගේ අතට ගත්තා.. අරගෙන මගේ මූන ලගටම එබිලා ඇහිබැම රැලි කරගෙන මගේ ඇස් දිහා බලාගෙන හිටියා.. ඊටපස්සෙ ආයෙම කැප් එක බෝස් ගාලා මගේ මූණට දැම්මා ඇස් දෙක පේන්නෙ නැතිවෙන්නම.. මූට පිස්සුද මන්දා.. මම ආවෙ මැච් එක බලන්නෙනෙ.. මේක මෙහෙම දාගෙම කොහොම බලන්නද.. මම කැප් එක ගානට හදාගත්තා..

" මොකක්ද අනේ කරන්නෙ.."

" දෙයියනේ කියලා උඹ ශේඩ්ස් දෙකක්වත් දාගෙන ඉදපන්.."

" ඇයි මාව දැක්කහම නගිනවා වගේද.."

මම ඇහැ යටින් බලලා රධ්‍ය අයියගෙන් අහද්දි ඒකා මට රැව්වා.. රැව්වට ඒකා රතුවෙලානෙ..

" උඹට ලැජ්ජ නෑ.. මගුලක් අහනවා.."

රධ්‍ය අයියා මාව අතින් අල්ලගෙන ගිහින් ආධ්‍ය අයියගෙනුයි එයාගෙනුයි මැද්දෙන් ඉන්දවගත්තා.. සෙනුකයා මැච් එකට අනුගත වේගෙන ඉස්සරහා තිබ්බ වැටට හේත්තු වෙලා පස්සත් දික් කරගෙන ග්‍රවුන්ඩ් එක දිහා බලාගෙන ඉන්නවා.. සපෝටිව් බෝයිෆ්‍රෙන්ඩ් වයිබ්ස්.. අයුක අයියා අදනම් අනිවාරෙන් ට්‍රෝෆි එක ගෙනෙයි වගේ ඉස්කෝලෙට..

ටිකකින් සෙනුකයා මාව දැකලා කටත් ඇරගෙන මං ගාවට ආවා.. ඇවිත් බෝස් ගාලා පිටට එකක් දුන්නා.. මහීශා ආධ්‍ය අයියට එහාපැත්තෙන් ඉදගෙන අයියා එක්ක අධ්‍යාපනික කරුණු ගැන කතාකරනවා.. ආධ්‍ය අයියත් හෙන පැණි හිනාවක් දාගෙන මහීශා එක්ක කතාකරනවා..

" මූ බලපන්කො.. සෙලිබ්‍රිටි වගේ.. සෙලිබ්‍රිටි කපල් එක.."

@Shan

" අනේ පලයං.."

" උඹ හෙන වල් පාටයි ඕයි.. ඔහොම ඇස් දෙක පාටකරාම.. පට්ට.."

" එහාට පලයන්කො මට ග්‍රවුන්ඩ් එක පේන්නෑ.."

" අනේ මේ උඹයි මමයි බලන මැච්.. මේ සිරාවටම කියන්නෙ.. රධ්‍ය අයියා හෙන පවු ඕයි.. මට ඒකා ගැන සෑහෙන්න දුකක් දැනෙනවා.."

" ඒ මොකද.."

" මොකද අහන්නෙ.. උඹ හිතා මතා ඌව අවුස්සනවා නේ..??"

" උඹට පිස්සුද පගො.. එහෙම මගුලකට නෙමේ මම ඇදගෙන ආවෙ.. නිකම්.."

" ඒ වුනාට උඹ තමා ඌව වරදට පොළඹවගන්නෙ.."

" ඉතින් මම වරද් නෙ.."

" ඒකා කිව්වා වගේ උඹට නම වස් වැදිලා තමා.. අර බලපන් දාඩියත් දාලා උදේ හොදට හිටිය එකාට.."

" Happiness is making my වෙන්ඩ boyfriend horny~ මිත්‍රයා.."

" ප#යා.."

සෙනුකයා ඉස්සරහ රෝ එකේ ඉදන් මගේ පැත්තට හැරිලා කතාකරනවා.. මම ඉස්සරහට ඇදිලා ඌ එක්ක කතාකරනවා.. රධ්‍ය අයියනම් ආපු වෙලේ ඉදන්ම මැච් එකම විතරයි බලන්නෙ.. කියාන් අයියත් ආශි එක්ක කියවනවා.. මැච් එකත් සැරටම නැගලා යනවා.. ඊටපස්සෙ අපි හිටපු තැනට ලොකු අයියලා ගොඩක් ආවා.. තව අංකල්ලා වගේකුයි.. හෙන සෙට් එකක්.. රධ්‍ය අයියා ඒකනිසා ඉදගෙන හිටපු තැනින් නැගිටලා මාවයි සෙනුකයයි ඇදගෙන ඇවිත් ඉස්සරහම රෝ එකේ කොනෙන් ඉදගෙන අපි දෙන්නව කොනට දාලා ඌ එහාපැත්තෙන් ඉදගත්තා.. අපිට පිටිපස්සෙන් ආශියි කියාන් අයියයි ඉදගෙන හිටියේ.. සෙනුකයත් කියවන එක පැත්තකින් දාලා මැච් එක බලන්න ගත්තහම මම රධ්‍ය අයිය පැත්තට හැරුනා..

@Shan

" මගෙත් මූණෙ ෆ්ලැග් එකක්.."

" මොන.."

" මට ස්ටිකර් එකක් දෙනවකො.. මූණෙ අලවගන්න.."

" ආ.. ඉන්න බලන්න.."

රධ්‍ය අයියා සාක්කුවට අත දාලා හොයලා හොයලා ඉස්කෝලෙ පාට දෙකින් ෆ්ලැග් දෙකක් අතට අරගත්තා..

" කොයි පාටද.."

" දෙකම.. හා ද.."

" ම්ම්.."

රධ්‍ය අයියා ස්ටිකර්ස් දෙකෙන් එකක් ගලවලා මගේ එක කම්මුලක ස්ටිකර් එක ඇලෙව්වා.. ඊටපස්සෙ ඒකට පහළින් අනිත් ස්ටිකර් එකත් අලවලා චටාස් ගාලා මූණට එකක් දුන්නා.. මූට මනුස්සයෙක්ට හොඳින් සලකන්නම බෑ.. මම අනිත් පැත්තට කකුල දිගෑරලා උගේ කකුලට එකක් දුන්නා..

" මොකද බං අනින්නෙ.."

" තවුසෙ මොකද මගෙ කම්මුලට ඇහුවෙ.. ආ.."

" කම්මුලට කවුද ගැහුවෙ.. මම ඕක තදට ඇලෙව්වා.."

" තදට.. තදට ඇලෙව්වා පකක්.. කම්මුලත් රිදෙනවා.. ආව්.."

" ආ සොරි සොරි ඉතින්.. කවුද අනේ ඔයාගෙ කම්මුලට ගැහුවෙ.."

රධ්‍ය අයියා මගේ කර වටේ අතක් යවල මාව උගේ ගාවට ඇදලා ගත්තා.. මුගේ බොරු වාටුව.. මම බෙල්ල වටේ දාගෙන ඉන්න රධ්‍ය අයියගෙ අත කැල්ලක් කැඩිලා යන්නම හොඳ පාරක් හැපුවා.. මූ දැන් මම හැපුවට ගනන් ගන්නෙත් නැනෙ.. හපලා හපලා සංවේදන ස්නායු හානි වෙලාද කොහෙද..

" එහාට පලයං.."

@Shan

"..."

මම බොරුවට අකමැති වගේ රධ්‍ය අයියා ගාව දගලලා අන්තිමට උගේ කර වටෙත් අත දාගෙන මැච් එක බලන්න ගත්තා..අපිට පිටිපස්සෙ ඉන්න අයියලා හෙන හයියෙන් හිනාවෙනවා කෑගහනව චියර් කරනවා.. අනිත් ඉස්කෝලෙ විවේචනය කරනවා.. ඒ අස්සෙ අංකල් කෙනෙක් දේශපාලනෙත් ගැන කියනවද මන්දා.. මෙ පාර මාලිමාවටද අහන්නත් හිතෙනවා.. යද්දි අහගන්න ඕන.. ඒ වුනාට ප්‍රසිඩන්ට් කිව්වනෙ චන්දෙ තියන්නෙ නෑ තියන්න චන්දයක් නෑ කියලා.. ගැම්මක් තමා.. මට පොරවත් පේනවා හට් එකක් අස්සට වෙලා ඉන්නවා..

" ඊලගට අයුක අයියද ඒයි බැට් කරන්නෙ.."

" ම්ම්.. මම හිතන්නෙ ඌ තමා.."

" මොකද උඹ එන්න පරක්කු වුනේ.."

" නින්ද ගියා පොඩ්ඩක්.. ඔයාලා රෝඩ් ශෝ එකට ගියාද.."

" ම්ම්.. කියාන් හිටියනෙ.. ඌයි සෙනුකයි අපේ අයියයි අයාන් අයියයි ඔක්කොම ගියා.."

" තවුසෙ මාව හලලා ගියානේ ආතල් එකේ.. කැලි ලයින් කරන්න.."

" කවුද බං කැලි ලයින් කරන්න ගියේ.."

" තවුසෙට කිසි අගයක් නෑ මං ගැන.. මගුල.. තේරෙයි දවසක.."

" අගයක් නෑ කියන්නෙ කොහොමද උඹ.."

" කටින්.."

" එහෙම මගුලක් නෙමෙ බං.. අගේ නිසා තමා උබට එන්න එපා කිව්වෙ.."

" ඒ මොකද.."

" මොකුත් නෑ.. වරෙන් අතෙන්ට යන්න.. අයුකයා බැට් කරනවා ඊලගට.."

@Shan

රධ්‍ය අයියයි මමයි සෙනුකයයි ඉස්සරහා වැට ගාවට ගිහින් ග්‍රවුන්ඩ් එක දිහා බලාගෙන හිටියා.. අපේ ඉස්කෝලෙ බෙස්ට්ම බැට්මන් නෙ ප්ලේ කරන්න යන්නෙ.. පිටිපස්සෙ ඉදපු අයියලත් ඔක්කොම වගේ ඉස්සරහට ආවහම කියාන් අයියත් අපි ලගින් පිටිපස්සෙන් ආශී එක්ක හිටගෙන හිටියා.. අයුක අයියා පුදපු ගමන් කාපි යකා කියලා හයේ එකක් ගැහුවා විතරයි අපේ ඉස්කෝලෙ උන් කොඩි වන වන එතන දෙවනත් වෙන්න කෑ ගහන්න ගත්තා.. විශේශෙන්ම අපේ එහාපැත්තෙ ඉදපු සෙනුකයා.. මගෙයි රධ්‍ය අයියගෙයි කන් අඩි ලෙප්ට් වෙලා ගියා..

ඔක්කොමත් හොදයි රධ්‍ය අයියා මූ නරියා.. ලද අවස්තාවෙන් ප්‍රයෝජනේ ගන්න මාව ඉස්සරහට දාලා මගේ ඉණ වටෙන් අත දෙක දාගෙන ඉස්සරහා වැටට අත දෙක තියාගෙන මගේ මූණ ගාවට නැවුනා.. අපි දෙන්නගෙ උසේ මහා ලොකු වෙනසක් නෑ.. ඒ වුනාට ඌ ටිකක් උසයි.. ශේප් එකේ මගේ කන ගාවටම පහත් වුනා.. මට මුගේ හුස්ම බෙල්ලෙ වැදෙද්දි මූණ ගිනිගන්නවා වගේ.. මම කැප් එක ගලවලා අතට ගත්තා..

" I find it difficult to control myself because someone's වෙන්ඩ boyfriend is getting too hot to handle.."

රධ්‍ය අයියා මගේ කන ගාවටම නැමිලා හෙන හිමින් කියද්දි මම අත් වැට තද කල්ලා අල්ලගත්තා.. මූට පිස්සු හැදීගෙන එනවද..

" මොකද ඇඹරෙන්නෙ.."

" පිස්සුද.. මොකුත් නෑ.. එ-එහාට වෙලා ඉන්නවා.."

මම රධ්‍ය අයියගෙ බඩට වැලමිටක් තියලා එහාට කරන්න යද්දි රධ්‍ය අයියා තව ටිකක් මගේ ඇගටම හේත්තු වුනා.. හුගක් කට්ටියත් ඉන්නවා අපි ඉන්න තැන.. මේකා පිස්සු කෙලිනවා.. මම හිමින් සැරේ සෙනුකයා ගාවට ලිස්සලා යන්න දගලලා දගලලා රධ්‍ය අයියගෙ අත ඉස්සරහ වැටෙන් ගලවගන්න ට්‍රයි කරද්දි රධ්‍ය අයියා මගේ ඔලුවට හොදවයින් ටොක්කක් ඇන්නා..

" ආව්.. මොන-.."

" මගුලක්ද?? මගුලක් වෙයි දගලන්නෙ නැතුව එක විදියක ඉදපන්.. උඹ කොල්ලෙක්නෙ.. තේරෙනවනෙ.."

@Shan

රඨ්‍ය අයියා මගේ කනට පහත් වෙලා හිමිහිට කියද්දි මම දඟලන එක නතර කල්ලා හිටිය විදියටම ගල් වෙලා ඉස්සරහා බලාගෙනම හිටියා.. සැක්.. මට මොකක්ද මේ වුනේ.. මම එක පොඩ්ඩක්වත් හෙල්ලෙන්නෙ නැතුව හිටපු විදියට හුගක් වෙලා එහෙමම හිටියා.. මේ රඨ්‍ය අයියගෙ පිටිපස්සෙන් ඉන්න උන් යන්නෙත් නෑ ඒකනිසා ඌට යන්න විදියකුත් නෑ.. ඒකාත් ඉන්නෙ අහසට පිඹ පිඹ දාඩියෙන් නැවිලා ගිහින්.. අපිට වුනොත් ඉතින් මෙහෙම ලබ්බක් තමා.. මදැයි බිග්මැච් බලන්න ආවා.. මගේ මූණත් අම්බානෙක රතුවෙලා..

ඔය සේරමත් එක්ක අපේ එහාපැත්තෙ ඉදපු සෙනුකයා හිටියේ තරග උද්යෝගයෙන් පිනා ගිහින් පොලොවෙන් අඩි දාස් ගානක් ඉහළ ආකාසෙ.. අයුක අයියා දිගට හරහට හයේ පාරවල් හතරේ පාරවල් ගහනවා.. කොහොම හරි අපිට දැන් නම් තේරෙනවා මෙකෙ ඉතින් වින් කරන්නෙ අපි තමා..

රඨ්‍ය අයියා ඒ අස්සෙ කොහොමහරි දඟලලා දඟලලා මගේ එහාපැත්තට පැනගත්තා.. ඊටපස්සෙ තමා මගේ ඇඟට ලේ ටිකක් ඉනුවෙ.. රඨ්‍ය අයියා රතු වෙලා රතු වෙලා දාඩිය පෙරාගෙන.. නිකම් මීටර් සීයෙ මැරතන් එකක් දුවපු එකෙක් වගේ.. මම රඨ්‍ය අයියා දිහා බලලා ඒකා මගේ දිහා බලන්න කලින් අහක බලාගත්තා.. ලැජ්ජාව බාල්දියෙන් එකයි.. ඒ වුනාට ඌ මොකටද අහක හිටපු මාව ඇදලා අරගෙන එක එක මගුල් කියන්න ගියේ.. එක අතකින් හොඳ වැඩේ..

" අයියෙ.. කියාන් අයියා දෙන්න කිව්වා.."

සෙනුකයා එකපාරටම රඨ්‍ය අයියට කෝක් බොටල් එකක් දික් කරද්දි රඨ්‍ය අයියා සෙනුකයා දිහා බලාගෙන ඉදලා එකපාරට හරි සිහියට ඇවිත් බොතලේ ඉල්ල ගත්තා.. ඒ වෙනකොට පොඩ්ඩක් අත් වැට ගාව හිටපු අය එහාට ගිහින් හිටියේ..

" තැන්ක් යූ.."

රඨ්‍ය අයියා වැඩි ගානක් නැතුව බොතලේ අරින්න යද්දිම මගේ ඔලුවටත් උඩින් කොකාකෝලා වැස්සක් වැස්සා.. අපි දෙන්නට එහාපැත්තෙ ඉදපු සෙනුකයයි කියාන් අයියයි බඩ අල්ලගෙන හිනාවෙනවා.. මගේ මූණෙ ඉදලා ඇඟ පුරාම බීම.. මුංගෙ මරිමොංගල් ආතල්.. රඨ්‍ය අයියා බෝතලේ එක

@Shan

අතකින් එහාට කල්ලා අල්ලගෙන මූණ ටීශර්ට් එකේ අතකින් අතුල්ලගත්තා..

" පිස්සු හු#තා.. කලොත් මේ වගේ ප#ක් තමා.."

" උබලට ආතල්ද අයියෙ.. බලපන් ඇගපුරාම හැලුනනෙ.."

මම ඇගේ හැලුනු බීම අතකින් පිහිදදා වාඩිවෙන්න එද්දි රධ්‍ය අයියා වාඩිවෙලා ඉදපු තැන ටිකක් දැකලා පුරුදු වගේ එකෙනෙක් වාඩිවෙලා ශේඩ්ස් දෙකත් ගලවලා අතේ ඇගිල්ලක් වටේ කරක කරක හිටියා.. මම ඒක එච්චර ගානකට ගන්නෙ නැතුව ඇවිත් වාඩිවුනා..

" ෂර්ට් එක තෙමිලා නේද.."

මගේ එහාපැත්තෙ ඉදපු අයියා කතාකරද්දි මට දැනුනෙම කියාන් අයියා කතාකරනවා වගේමයි.. ඒ කටහඩමයි.. මම සුටුස් ගාලා කියාන් අයියා දිහා බලලා ආයෙම මෙකා දිහා බැලුවා.. එතකොට.. එතකොට..

" හායි.. මම කියාන්ගෙ අයියා.. අයාන්.."

ඌ බලෙන්ම මගේ අත අල්ලගෙන පොඩ්ඩක් වැනුවා.. මම හිටියෙ මෙලෝ දෙයක් හිතාගන්න බැරුව බූත වෙලා..

" හ්-හායි.."

මම ලාවට හිනාවෙලා මගේ අත ඉක්මනට ඇදලා ගත්තා.. මෙකා.. එදා මට මාතර බස් එකේ හම්බුන කැම්පස් ඩයල් එක නේද.. එදා මං රධ්‍ය අයියා එක්ක එද්දි හෝල්ට් එකේ බලාගෙන ඉදියේ.. එතකොට ඒකද මට ඌව දැකලා පුරුදුයි වගේ දැනුනේ.. මූ ලාවට කියාන් අයියා වගේ නිසාද..

" ඔහ්.. මං ගාව ටිශූ එකක්වත් නෑ.. ඔයාගෙ අවුට්ෆිට් එකම රැයින් වු-"

" වරද්.. මෙහෙ එන්න ඕක පිහිදන්න.."

අයාන් අයියා කතාකල්ලා ඉවර වෙන්න කලින් රධ්‍ය අයියා කතාකරපු නිසා මම නැගිටලා රධ්‍ය අයියා ගාවට දුවලා ගියා.. ඒ පාර මොන කුණ්ඩවාලයක්ද මේ කඩාගෙන පාත් වුනේ.. රධ්‍ය අයියට කියනවද නැද්ද..

@Shan

මම හිත හිත ඉද්දි රධ්‍ය අයියා වෙට් ටිශු එකකින් මගේ මූණය් ඇදුමයි පිහිලදා ඒක සාක්කුවට ඔබාගත්තා..

" පොඩ්ඩක් අරපැත්තට ගිහින් එමුද.."

මම පහළ තිබ්බ ෆුඩ් ස්ටෝල්ස් වගයක් පෙන්නද්දි රධ්‍ය අයියා මගේ අතකින් අල්ලගෙන පහළට ගියා.. අපි දෙන්නා යන දිහා අයාන් අයියා අමුතුවට බලාගෙන ඉදලා මට කට කොනකින් හිනාවුනා.. මම ඌව ගනන් ගන්නැතුව ඉක්මනට පහලට බැහැගෙන ගියා..

" මේ.."

මමයි රධ්‍ය අයියයි බබල් මී ස්ටෝල් එකෙන් බබල් ටී දෙකකුත් අරගෙන වැඩිය කවුරුත් හිටියෙ නැති හට් එකකින් ඉදගත්තා..

" මම..??"

" ඔයා අයාන් අයියගෙ හොද යාලුවෙක්ද.."

" අයාන් අයියගෙ?? නෑ මම ඌ එක්ක එච්චර නෑ.. ඇයි??"

" නෑ නිකම්.."

මම 'චස්' ගාලා ස්ට්‍රෝ එකෙන් ටී එකේ කවර් එකට ගැහුවා විතරයි ඒක වැදුනු පාර ආයෙම මගේ මූණ බබල් ටී ස්වල්පයකින් නැව්ලා ගියා..

" උඹෙ කර ගාවින් අර මොන්ටිසෝරි යන එකෙක්ගෙ වගේ තුන්හුලස් ලේන්සුවක් එල්ලුවනම් හරි කට්ටක් ගහලා.. නාගන්නවා යන යන තැන.."

" අනේ මෙ එහෙමමගුලක් නෙමේ.. මෙකෙ පේපර් ස්ට්‍රෝ එක නැමුනා.."

රධ්‍ය අයියා මගේ මූණෙ තිබ්බ ටී බිංදු ටික ඇඟිල්ලකින් පිහිදලා කලිසමෙ අත පිහාගත්තා..

" හදිසියෙම අයාන් අයියා ගැන ඇහුවෙ??"

" ඔයාට මතකද මම දවසක් කිව්වා.. මම මෙහේ එද්දි බස් එකෙ මහ අමුතු ඩයල් එකක් මගේ එහාපැත්තෙ වාඩිවෙලා හිටියා කියලා.."

@Shan

" ම්ම්.. අර හෝල්ට් එකේදිත් බලාගෙන ඉදියා කිව්වෙ??"

" ම්ම්.. ඒ කවුද දන්නවද.."

"  කවුද??"

" කියාන් අයියගෙ අයියා.. අයාන් අයියා.. මට දැන් දැක්කහම මතක් වුනේ.. ඒ හිටියේ ඌ තමා.."

මම කියද්දි රධ්‍ය අයියා මගේ දිහා ටිකක් වෙලා නළල රැළි කරගෙන බලාගෙන හිටියා..

" එහෙමත් එකක්ද.. ඌ මොකාටද එන්න හදන්නෙ.."

රධ්‍ය අයියා ස්ට්‍රෝ එක කටේ පැත්තක ගහගෙන මගේ පපුව දිහා බලාගෙන ඒක පොඩි වෙලා යන්න හැපුවා..

" මන්දා.."

" එහෙනම් ඌ හැමදාම ඉස්කෝලෙ ඉවරවෙද්දි ඉස්කෝලෙ ගාවට එන්නෙ උඹව බලලා යන්නද.."

" ඈ.. කොහේ?? අපේ ඉස්කෝලෙ?? ඔයා මට කියලවත් නෑනෙ.."

" මම ලාවට දකිනවා විතරයි.."

" අහ්.."

" අයාන් අයියා.. ම්ම්..ම්ම්.."

රධ්‍ය අයියා බබ්ල් ටී එක එක උගුරට බීලා ඉවරකල්ලා හිස් වුනු කප් එක පැත්තකින් තියලා මගේ අතේ ඇගිලි වල එයාගෙ ඇගිලිපටල ගත්තා.. එහෙමකරන හැම වතාවකම අපි දෙන්නගෙ අත් දෙකේ තියන මුදු දෙක එකට හම්බෙනවා..ඒ දිහා බලාගෙන ඉන්න රධ්‍ය අයියා හුගක් ආසයි..මමත් ආසයි..

" උඹ හිතන්නෙ මට උඹව වටින්නෙ නෑ කියලද.."

@Shan

රධ්‍ය අයියා මගේ දිහා නොබලා අහද්දි මම එකපාරට හිතන්න ගත්තේ මොකක්ද ඒ කියපු කතාව කියලා.. එහෙම එකක් කිව්වද.. වටින්නෙ නෑ කියලා?? මට හොඳටම ශුවර් මම සීරියස් වෙලාවක නම් එහෙම දෙයක් කියවිලාම නෑ..  දවල් මම එහෙම එකක් කිව්වද?? මම හිතුවා හිහුවා හිතුවා.. හරිනෙ.. කිව්ව තමා.. ඒ වුනාට ඒක මම නිකමටනෙ කිව්වෙ.. ඒකටද මේ අවුල් ගිහින් තියෙන්නෙ..

" පිස්සුද.. මම එහෙම කිව්වෙ නෑ අනේ.. ඒක කිව්වෙ නිකම්.. ඔයා ඕනවට වඩා හිතන්න යනවා.."

" ම්ම්.."

" තවුසෙ වගේ මං ගාවින් ඉතින් වෙන මොකෙක්වත් මෙහෙම ඉන්නෙ නෑනෙ.."

මම රධ්‍ය අයියගෙ අත මගේ නියපොතු වලින් තද කල්ලා කිව්වහම මෙකා මං දිහා ඔලුව උස්සලා බැලුවා..

" මොකෙක්වත් ඉන්න ඕන නෑ.."

ඇපෝ මුගේ ඉරිසියාව.. හිතාගෙන ඉන්නෙ මහ ලොකු එකා කියලා..බලද්දි ඉතින් හෙන තොත්ත බබෙක්නෙ.. මේවා කැඩෙට් යුනිට් එකේ උන් දන්නවනම් පපුවෙ අමාරුව හැදිලා මැරෙනවා.. මම උගේ අනිත් පැත්තට දාගෙන ඉදපු කැප් එක ගලවලා හරි පැත්තට දැම්මා..

" මාව ගෙදරින් දානවද.. බයික් එකේනෙ ආවෙ.."

" ම්ම්.."

අපි දෙන්නා ටිකක් වෙලා කියව කියව ඉදලා ආයෙමහිටපු තැනට ගියා.. මහීශා ආධ්‍ය අයියා එක්ක හිනාවෙවී පව හලනවා හලනවා ආපු වෙලේ ඉදන්.. මෙකිට මොකක් වෙලාද මං දන්නෙ නෑ.. ආධ්‍ය අයියත් හෙන ඇඹලයා..මල්ලි වගේ නැතෑ.. කණ්ණාඩි දෙකත් උස්ස උස්ස අරකි කියන ඒවා අහගෙන ඉන්නවා..ෆෝන් එකෙන් මොනාද පෙන්නනවා.. රධ්‍ය අයියා ගිහින් අයාන් අයියගෙ එහාපැත්තෙන් ඉදගෙන මට එතෙන්ට ඇවිත් ඉදගන්න කතාකලා.. කියාන් අයියයි ආශියි පේන්න කොහේවත් නෑ..

@Shan

අයාන් අයියා ආපු නිසා මාරුවෙලා ගිහින්ද කොහෙද..මූ නම් මල පරාලයක් වෙයි වගේ.. දැන් ඉතින් මම මැද්දෙ.. මුන් දෙන්නා දෙපැත්තෙ..

" කොහෙද ගිහින් හිටියේ.. කියාන් පේන්නත් නෑ.."

ගියා.. ගියා.. උඹෙ කිරි ආච්චිට හික්කඩුවෙන් හුරුල්ලො අල්ලන් එන්න.. ගහලයා.. උඹට මොකටද අපි කොහේ ගියත්.. අපරාදෙ එදා බස් එකේදි ගහන්න තිබ්බෙ මූට..

" අපි පොඩ්ඩක් පහළට ගියා අයියෙ.."

" අහ්.. රධ්‍යත් ෂනෙරුව අඳුරනවද.."

මූ ඒ ටිකට මගේ නමත් දැනගෙන.. අඳුරන්නැත්නම් එකට ඉන්නවද.. මහ මෝඩ කතා තමා අහන්නෙ..

" ඔව් අයියෙ.. අපි අඳුරනවා.."

රධ්‍ය අයියා අයාන් අයියා එක්ක හිනාවෙලා මගේ පිටට එකක් දබෝස් ගාලා දීලා මාව එයා පැත්තට ඇදගත්තා..

"එහෙමද.. රධ්‍ය මල්ලිටමෙ ටිකෙ හරියට වැඩ නේද.."

වැඩ තමා පගො.. උඹ වගේ රෝන්දෙ ගහ ගහ ඉන්නවට වඩා අපිට වැඩ තියෙනවා..

" වැඩනම් තමයි අයියෙ.."

" මම එදා පළවෙනියටම ෂනෙරුව දැක්කෙ බස් එකේදි.. මම දැක්කා රධ්‍ය මල්ලි කඩුවෙලට ඇවිත් ඉන්නවා..මම කතාකරන්න හදලත් කතාකලේ නෑ.. Is there any relationship between you two..? මට ඔයාලව දැක්කහම එහෙම හිතුනා.."

" Not yet.. Maybe in the future?? නෑ නෑ.. Definitely in future.."

" අහා.."

@Shan

අයාන් අයියා නිකම් මූණට වගේ හිනාවෙලා ඉස්සරහ බලාගෙන හිටියා.. අනේ මේ ගහල අයියෙ.. මෙකාත් මාත් එක්ක තාම යාලු නොවීත් පුදුම දුකක් තමයි විදින්නෙ.. උඹ ඔච්චරටම ආස නම් අහක යන හූනියමක් ගොඩ දාගන්න චමිරුවට සෙට් කල්ලා දෙන්නම්.. නියමෙට ගැලපෙනවා..Unexpected love stories are also beautiful..

ඊටපස්සෙ හවස් වෙනකල් මැච් එක ගියා..අයුක අයියා බැට් කල්ලා ඉවර වුනු වෙලේමයි අපේ සෙනුකයත් අතුරුදහන් වුනේ.. ශූවර් එකටම මූ ඩ්‍රෙසින් රූම් එකේ ඇති කියලා කියාන් අයියා කිව්වා..

කොහොමහරි හවස් වෙලා මැච් එක ඉවර වුනේ අපේ ඉස්කෝලෙ ඉතිහාසගත වාර්තාවක් තියලා මැච් එක වින් කලාම.. අයුක අයියා මේ අවුරුද්දෙ ශීල්ඩ් එක අරගෙන ප්‍රසිඩන්ට්ට අතට අත දීලා ස්ටේජ් එකෙන් බැහැගෙන ඇවිත් ටීම් එකට ග්‍රෲප් හග් එකක් දුන්නා.. එච්චර තමයි.. පොර නටන කියන වැඩ වලට නෑනෙ.. ඊටපස්සෙ මියුසික් ප්ලේ වෙන්න අරගෙන එදා දවසත් ඉවරවුනා.. හවස් වෙද්දි මටනම් හොඳ පණ ගිහින් හිටියේ.. කාලා කාලා නටලා නටලා එහෙ මෙහෙ දුවලා රධ්‍ය අයියත් හිටියේ මතේ ගහලා කොයි වෙලේ ගෙදර යන්න හම්බෙයිද කියලා.. ඒ වුනාට අයුක අයියා හැමෝටම එයාගෙන් ඩිනර් එකක් ඇරේන්ජ් කල්ලා තිබුනු නිසා අපි හැමෝටම ඒකට ඉන්න වුනා..මහීශා ආශි අයාන් අයියත් ඒකට ජොයින් වුනා..

අපි ඉතින් ඉවෙන්ට් එක ඉවරවෙලා ග්‍රවුන්ඩ් එකට ගියේ අයුක අයියව හම්බෙන්න.. එයාව වට කරගෙන හැමෝම විශ් කරනවා.. මල් දෙනවා.. එක විකාරයයි.. එතනත් පැයක් විතර කැරකිලා සෙනුකයි මමයි රධ්‍ය අයියයි වාහනේට එන්න ආවා..

ඒ අතරේ මමයි රධ්‍ය අයියයි ගියේ උන් දෙන්නට පොඩ්ඩක් දුරින්.. සෙනුකයගෙ ලේස් එක ලිහිලා.. ඒක පාර දිගට ඇදෙනවා.. මූ දැන් කොයි වෙලේ හරි ඕක පැටලිලා පතබෑවෙනවා..

" සෙනුක මල්ලි.. ඔය ලේස් එක ලිහිලා.. මල්ලි.."

රධ්‍ය අයියා සෙනුකයට කතාකලා විතරයි තඩි මල් බොකේ එකක් උස්සගෙන පාඩුවෙ ගියපු අයුක අයියා නැමිලා සෙනුකයගෙ කකුල දිහා බැලුවා.. එකක් නෙමේ.. මූ දෙකම ලිහාගෙන..

@Shan

" වත්සල් මේක පොඩ්ඩක් අල්ලගන්න.."

අයුක අයියා මල් බොකේ එක සෙනුකයගෙ අතෙන් තියලා නැමිලා උගේ ලේස් දෙක ගැටගැහුවා.. ඒ එක්කම අපේ ඉස්කෝලෙ ෆොටෝග්‍රැෆි සොසයිටි එකේ මල්ලි කෙනෙක්..

" අයියේ ඔහොම ඉන්න.. වන් ටූ ත්‍රී.. ඕකේ.. නයිස් ශොට්.."

අයුක අයියට වෙච්ච දේ වත් හිතාගන වුනේ නෑ ඇස් දෙක නිලංකාර වෙලා යන්න උන් දෙන්නට ෆ්ලෑශර් එකක් වැදුනා.. අරූ මොනවදෝ කියාගෙන දුවගෙන එහාට ගියා..

හොඳයි.. මට දැන් මැවිලා පේනවා මේ සතියේ ස්කූල් මැගසින් එකේ කවර් පික්චර් එක කොහොම එකක් වෙයිද කියලා..

"

**brotherhood, unity and identification**

.." යසයි යසයි..

ඩිනර් අවුට් එකට ගිහින් ඉදගත්තු වෙලේ ඉඳලා අයාන් අයියා එන්නෙ ඇමිනෙන්නෙමයි රධ්‍ය අයියා එක්ක හරි කියාන් අයියා එක්ක හරි.. ඌට පුදුම අමාරුවක් තිබුනේ.. මම සයිඩ් ගහලා පාඩුවෙ ඉදියත් ඌ එන්නෙම පැන පැන පුප දෙන්න.. ඒකනිසා ඩිනර් අවුට් ගියාට රධ්‍ය අයියයි මමයි කියාන් අයියයි හිටියෙ මූඩ් ගහලා.. අනිත් උන්ගෙ මූඩ් අවුල් කරන්න බැරි නිසා ඉවස දරාගෙන ඉදියා.. අනික මහන්සි නිසා ඇවිදගන්නවත් බෑ හරියට.. නිදිමතක් එනවා..

මම ටිකක් වැනි වැනී ගිහින් අපි ඉදපු ෆ්ලෝ එකේ බැල්කනි වැටට හේත්තුවෙලා පහල බලාගෙන ඉදියා.. රෑ වෙලා සීතලම සීතලයි එළියෙ හුලග.. මම හුළගට මූණ අල්ලගෙන ඇස් දෙක පියාගෙන ඉද්දි කවුරුහරි ඇවිත් මාව තුරුල් කරගන්නවා වගේ දැනුනා.. මම ඒ උනුහුමට කිට්ටු වෙලා ඔලුව පිටිපස්සට බර කරගෙන ඒ පපුවට හේත්තු වුනා.. හරි සනීපයි..

" මහන්සිද.. මිම..??"

@Shan

" ම්ම්.. මාරම මහන්සී.."

" අපි යමු.. අරුන් දෙන්නත් දැන් යනවා කිව්වා.."

" හා.."

මමයි සෙනුකයි අයියලා දෙන්නයි පාකින් එකට ඇවිත් ගෙදර එන්න ලෑස්ති වුනා.. අයුක අයියා හතර අතේ වැනෙනවා.. හිටගෙන ඉන්නත් බෑ වගේ.. කකුල් දෙක වෙවුලනවා වගේලු.. උන් දෙන්නා ඩ්‍රයිවර් එක්ක ගෙදර යන්න ගියාම මමයි රධ්‍ය අයියයි ගෙදර එන්න ආවා.. ආධ්‍ය අයියලා කාර් එකේ යනවා කියලා කිව්ව නිසා..

" නිදාගන්න එපා.."

" ම්ම්.."

මම රධ්‍ය අයියගෙ ඉණ වටෙන් අත් යවලා උරහිසට මූණ තියාගත්තා.. ඌ කිව්වට ඉතින් මට නින්ද යනවනෙ.. අනික කාලා ඉන්න නිසා දැන්නම් ඇද විතරමයි පේන්නෙ.. අන්තිමට මට නින්ද ගියා.. ලාවට වගේ.. රධ්‍ය අයියා සැරින් සැරේ මගේ අත් දෙක එයාගෙ ඇගට තියලා තද කරගන්නවා..

හුග වෙලාවකට පස්සෙ රධ්‍ය අයියා අපේ ගෙදර ගේට් එක ඉස්සරහින් බයික් එක නැවැත්තුවහම මම එයාට වාරු වෙලා බයික් එකෙන් බැහැගත්තා.. ගෙදර ඉස්සරහ දොරත් වහලා..

" මම මෙහෙමම යනවා වරද්.. ගිහින් වොශ් දාලා නිදාගන්න.."

" හා ඔයා ගිහින් මට කෝල් එකක් ගන්නවද.."

" ගන්නම්.."

" පරිස්සමට යන්න.."

" ම්ම්.."

මම හෙල්මට් එක ගලවලා ඉස්සිලා රධ්‍ය අයියගෙ නිකට ගාවින් හාදුවක් තිබ්බහම එයා බයවෙලා වගේ මගේ දිහා බලාගෙන ඉදියා..

@Shan

" බායි~~"

මම ගෙදරට දුවගෙන ආවා..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

හොදට ලිව්වාද මන්දා ළමයි.. ඔතරිට පොඩ්ඩක් සනීප නෑ.. හෙම්බිරිස්සාවක් හැදිලද මන්දා.. නින්ද ගියානෙ..

සමාවෙන්ඩෝ..

අද හවසට එන්නම්.. මෙක ටිග වප්පෙක් හරිත..

මොකක් හරි කොටාගෙන යන්න..

එන්නාම්.. ලව් යූ.. ❤

දවල් රස්නෙ දරාගන්න බැරි නිසා යාලුවට කතා ගොතලා කියන මම සහා ඒ හැමදේම අසා සිටින මගේ පෙම්බරිය :



කොල්ලො දෙන්නෙක්ම එක්ක යාලුවෙලා ඉන්නවා කියලා හිතාගෙන ඉන්න අපේ අම්මා.. *හැදිලා තියෙන්නෙ අමුතුම තාලෙකට මෙකි*

යාලුවට මමම හදපු කතාවක් කිව්ව මම * එහෙම එකක් නෙමෙ අම්මෙ* *ඉම්හික්*

@Shan

# 49 කොටස

බිග්මැච් එකෙන් පස්සෙ ආයෙම සාමාන්‍ය විදියට ඉස්කෝලෙ තිබ්බත් අපිට ඉස්කෝලෙ යන්න පුලුවන් වුනේ දවස් තුනයි.. ඉතුරු දවස් දෙකේ රිවිශන් වැටුනා.. නට නට ඉදියට අර විහාගෙ කියන රබර් බෝලෙ සැරින් සැරේ මගේ හිත උඩට එද්දි මම ආයෙම අනවශ්‍ය වැඩ සේරම අහකට තල්ලු කල්ලා පාඩම් කරන්න ගත්තා.. ආයෙම එපාවෙන කට්ටක් කන්න වුනා.. ක්ලාස් යන්න එන්න දවසෙම බංකු රත් කර කර ඉන්න..

ඒ අස්සෙ ලොකු අම්මලත් අම්මට කතාකලා දොස් කියලා තිබ්බා මම අවුරුද්දට එයාලා එනකොට ඉන්නෙ නැතුව කලින්ම කොළඹ ආපු එකට.. අනේ හොදයි.. උන් එන නිසාම තමා මම කලින් පැනගත්තෙ.. ඊටපස්සෙ උන් ආවහම ඒ පම්පෝරි අහගෙන බලු කතා අහගෙන මම ඉන්න එපැයි අඩු කුලේ එකා වගේ දෙකට තුනට නැමීගෙන. හුගක් වෙලාවට මට ප්‍රතික්ශේප වෙනවා කියලා දැනෙන තැන් වලින් මම අයින් වෙනවා මිසක් ඒවා එක්ක හැප්පෙන්න යන්නෙ නෑ.. හැප්පුනා කියලා මට තෑගි ලැබෙන්නෙ නැනෙ..

ගිය සතියෙ ඉදලා මම ක්ලාස් යන එන වෙලාවල් වල අපේ ගෙවල් පැත්තෙදි කවුරුහරි මගේ පස්සෙන්ම එනවා කියලා මට නිතරම දැනෙනවා.. මට අම්මා ගැන බයක් හිතුනා.. අම්මා ගෙදර හැමතිස්සෙම තනියම ඉන්න නිසා..

අදත් මම ක්ලාස් යන්න උදේ හත හමාරට විතර හෝල්ට් එකට ආවහම පාරෙන් එහාපැත්තෙ මම ජේන දුරින් මොකෙක් හරි බයික් එකක ඉදලා මම බස් එකේ නැග්ග ගමන්ම එතනින් යන්න ගියා.. ගියෙත් අපේ ගෙවල් පැත්තට.. මට ආයෙම බස් එකෙන් බහින්න විදියක් තිබ්බෙ නෑ.. අනිත් පැත්තට අම්මට කෝල් එකක් අරගෙන මහීශලාගෙ ගෙදර මගේ පොත් වගයක් තියෙනවා.. ඒක අම්මට අරන් එන්න පුලුවන්ද කියලා අහලා අම්මා උදේ එහේ යැව්වා.. මහීශාත් ඔය ප්‍රශ්නෙ දන්නවා.. මට අම්මට කියන්නත් බයයි අම්මා කලබල වෙන නිසා..

කොහොමත් අපේ අම්මා එහෙ ගියාම ලේසියකට එන්නෙ නෑ.. ආන්ටි එක්ක කියවලා කාලා බීලා එද්දි පොඩ්ඩක් හවස් වෙනවා.. ආයෙම එන්නෙ ඉතින් මම එන වෙලාවට රෑට උයන්න තමා..

@Shan

මම බයෝ ක්ලාස් එකේ ඉද්දිත් සර් කියන මෙලෝ දෙයක් ඔලුවට යන්නෙ නෑ.. අම්මවම මතක් වෙනවා. උදේ පන්තියට ඉදලා හවස ගෙදර යන්න හිතුවත් මට යන්න විදියක් තිබ්බෙ නෑ.. හවස සෙමින එකක් දාලා තිබ්බ නිසා ඉන්ස්ටිටියුට් එකෙන් එලියට යන්න දෙන්නෙ නෑ.. යන්නනම් පේරන්ට් කෙනෙක්ගෙන් ප'මිශන් තියෙන්න ඕන..

මුළු දවසම ඔහොම ඉදලා මම ගෙදරට එන ගමන් අම්මට කෝල් කලත් අම්මා ෆෝන් එක ආන්සර් කරන්නෙ නෑ.. මම කෝල් විස්සකට වඩා ගත්තා.. හයිලෙවෙල් වල ට්‍රැෆික් නිසා ගෙදර යද්දි අට හමාරවත් වෙනවා.. අම්මා ආන්සර් නොකරන නිසා හිතටත් බයයි.. මට ඉන්නෙ අම්මා විතරයි.. මම මොකක් කරන්නද කියලා හිත හිත බස් එකේ ඉද්දි අනිත් පැත්තට මහීශාගෙ අම්මට කෝල් කලා.. අම්මා නාම එහේද දන්නෙ නෑ සමහරවිට.. මහීශා අද ක්ලාස් ආවෙ නෑ එයාට ඉස්කෝලෙ සයන්ස් ඩේ එකේ වැඩ වගයක් වැටිලා කියලා..

" ෂනෙරු පුතා.."

" හලෝ ආන්ටි.. අපේ අම්මා ගෙදර ආවද.."

" ඔව්නෙ පුතා.. අම්මා ගිහින් දැන් පැය බාගයක් විතර වෙනවා.. ඇයි අම්මා ෆෝන් ආන්සර් කරන්නෙ නැද්ද..මම මේ එළියට ආවා.."

" නැහැනෙ ආන්ටි.. හරි මම බලන්නම්.. තැන්ක් යූ.."

" හරි පුතා.. උවමනාවක්නම් කෝල් බැක් කරන්න.."

මම කෝල් එක කට් කල්ලා  අනිත් පැත්තට ආයෙම අම්මට ගත්තා..මගේ හිතට මහ මූසල ගතියක් දැනෙනවා.. උගුරෙ මොකක් හරි හිරවෙලා වගේ.. කට හඩ පිටවෙන්නෙත් නෑ.. මම කාටද ගන්නෙ කියලා හිත හිත ඉද්දි මට රධ්‍ය අයියව මතක් වුනා.. එයා හවස ගෙදර ඉන්නවා කිව්වා..

මම රධ්‍ය අයියට ගන්නකොටත් මගේම වෙලාවට වෙනදා දෙපාර රිංග්ස් වෙද්දි ආන්සර් කරන රධ්‍ය අයියගෙ ෆෝන් එකත් ඕෆ් කල්ලා.. මට ඕන වෙලාවට එක මගුලක්වත් වැඩ කරන්නෙ නෑ.. මට ඇඩෙන්න එනවා.. යාගන්න පුලුවන් දුරක නෙමෙ ඉන්නෙ.. මට ඉක්මනට ගෙදර යන්න ඕන.. ඇයි මම අද පන්ති ආවෙ කියලා මගේ හිත මටම දොස් කියන්න ගත්තා..

@Shan

මම කරන්නම දෙයක් නැති තැන ආධ්‍ය අයියට කෝල් එකක් අත්තා.. අනේ දෙයියනේ ආන්සර් කරපන් කියලා හිතින් මේ ලෝකෙ ඉන්න ඔක්කොම දෙවියොන්ගෙන් ඉල්ලුවා..

" හලෝ මල්ලි.."

" අනේ ආධ්‍ය අයියෙ රධ්‍ය අයියා ඉන්නවද.."

" ආ ඔව් පොඩ්ඩක් ඉන්න මල්ලි මේ එයාගෙ ෆෝන් එක මොකක්ද වෙලා හදන්න ට්‍රයි කරනවා.."

" අනේ අයියෙ ෆෝන් එක දෙන්නකො ඉක්මනට.."

" මොකක් හරි ප්‍රශ්නයක්ද මල්ලි.. මොකද මේ අඩන්නෙ.. පොඩ්ඩක් ඉන්න මම දෙන්නම්.."

* පොඩී මෙහෙ එන්න........ මේ වරද් මල්ලි කතාකරනවා...!!!!!!!!*

" වරද්..??"

" ඔයා වැඩකද ඉන්නෙ.."

" නෑ මම ගෙර ඉන්නෙ.. මොකක් හරි අවුලක්ද.. මොකක්ද වුනේ.. වරද්??"

" අනේ ප්ලීස් මට උදව්වක් කරන්න අයියෙ.. අපේ අම්මා ගෙදර ඉන්නවද බලලා මට කියන්න ප්ලීස්.. අනේ මට කරන ලොකු උදව්වක්නම්.. ප්ලීස් ප්ලීස් .."

" මොකද මේ.."

" අනෙහ්-"

" හරි හරි මම යන්නම්.. ඔයා කලබල වෙන්නෙ නැතුව පරිස්සමට ගෙදර එන්න..මම අම්මව බලන්නම්.. හරිද.."

මට කතාකරගන්න බැරි තැන ෆෝන් එක කට් කල්ලා දැම්මා.. දෙයියනේ මම ඉන්න ගින්දර දන්නෙ මම විතරනෙ..

@Shan

පැය බාගෙකට පස්සෙ මම බස් එකෙන් බැහැලා අපේ පාර දිගේ දුවගෙන ආවෙ පිස්සෙක් වගේ.. තනිකර පිස්සු හැදිච්ච එකෙක් වගේ.. සපත්තුව පැන්නිලා ගැලවිලා යන්න හදද්දි මම ඒ මොකුත් බලන්නෙ නැතුව බෑග් එක කරේ එල්ලගෙන අතුරු පාරෙ අපේ ගෙදර දිහාට දුවගෙන දුවගෙන ආවා.. දුවද්දි සපත්තුවට කකුල කැපිලා ඇඟිලි එකට ඇලෙනවා වගේ.. ලේ එනවද කොහෙද.. මට ඒ වේදනාවවත් හරිහැටි දැනුනේ නෑ..

මම අපේ ගෙදර ගේට් එක ගාවට එද්දි ගෙදර ගේට් එක ඔහේ ඇරලා දාලා.. ගෙදර පුරාම ලයිට් දාලා.. පිරිමි දෙතුන්දෙනෙක්ගෙ සද්දෙ ගේ ඇතුලින් ඇහෙනවා.. මට මේ ලෝකෙ වෙන්න තියන නරකම දේවල් එකපාරට ඔක්කොම මතක් වෙලා කකුල් දෙක පණ නැතුව ගියා.. රධ්‍ය අයියගෙ බයික් එක ස්ටෑන්ඩ් කල්ලා ගේට් එක ගාව තිබ්බා.. එයා ඇවිල්ලද.. මම බෑග් එක ඉස්තෝප්පුවට විසික් කරගෙන ගේ ඇතුලට දුවද්දි.. ගේ ඇතුලේ ඉදපු පිරිමි දෙන්නෙක් මගේ දිහා ඇස් ලොකු කරගෙන බලාගෙන ඉද්දි.. මගේ පපුව එකපාරට නැවතිලා ගියා වගේ හැඟීමක් මට දැනුනා..

මම මොකුත් හිතාගන්න බැරුව ගේ පුරාම ඇස් යවද්දි රධ්‍ය අයියගෙ ශර්ට් එක අල්ලගෙන අපේ අම්මා රධ්‍ය අයියට මුවා වෙලා හුගක් බය වෙලා මගේ දිහාබලාගෙන ඉන්නවා.. අම්මගෙ තොල ගාව පැලිලා ගිහින් කම්මුලේ ඇඟිලි පාරක් මූණෙ හරහටම ඇදිලා ගිහින් තිබ්බා.. මට..මට මොනවද කියන්න ඕන මොනවද කරන්න ඕන කියලා හිතාගන්න බෑ.. මොකක්ද දෙයියනෙ මේ වෙලා තියෙන්නෙ..

මම.. මම අම්මව මගේ වයසට පුලුවන් තරමින් පරිස්සම් කලා.. මට කරන්න පුලුවන් හැමදේම අම්මා වෙනුවෙන් කලා.. ටවුන් එකටවත් යවන්නෙ නැතුව එච්චර ගේ අස්සටම කල්ලා පරිස්සම් කලේ මිනිහෙක් නෑ කියලා මිනිස්සුන්ගෙන් කතා මූණට අහගන්න ඕන නැති නිසා.. මට අප්පෙක් නෑ කියලා මට අහගෙන ඉන්න පුලුවන්.. ඒ වුනාට අම්මා එහෙම අහගන්න ඕන නෑ.. එහෙව් පරිස්සම් කරපු අම්මගෙ මූණෙ ඇඟිලි පහක් හිටලා තියෙද්දි මට මාරයා ආවෙස වෙගෙන ආවා..

" අම්මා.."

මම අම්මගෙ ගාවට යන්න අඩියක් ඉස්සරහට තියද්දි අම්මා බයෙන් රධ්‍ය අයියා පිටිපස්සට වුනා.. අම්මට මාව අදුනගන්න බැරිද.. ඇයි මාව දැකලා බය වෙන්නෙ.. මම මොකුත් හිතාගන්න බැරුව රධ්‍ය අයියගෙ මූණ දිහා

@Shan

බලද්දි එයා අසරණ වෙලා වගේ මගේ දිහා බලාගෙන හිටියා.. මේ හැමදේම වුනේ හරි ඉක්මනින්..

මම ඇවිත් හිටපු පිරිමි දෙන්නා දිහා බලද්දි මට අමුතු හුරුපුරුදු ගතියක් දැනුනා.. පපුව හයියෙන් ගැහෙන හැඟීමක්.. මම නිතර දෙවේලෙ දකින මගේම ඇස් දෙකේ කොපියක්.. මගේ ඉස්සරම හිටගෙන මගේ දිහා බයෙන් බලාගෙන හිටියා.. ඒ දුඹුරුපාට ඇස්.. මම දන්නවා.. මට දැනෙනවා..

" තා...ත්..තා..??"

මම ජීවිතේට දැකපු නැති මගේ තාත්තා.. හිතපු නැති වෙලාවක.. හිතපු නැති තැනක හිතපු නැති විදියට මට හම්බුණා.. ඒකත් හම්බවෙන්න ඕන නරකම විදියට.. මට මොනවද හිතෙන්නෙ කියලා මටම තේරුම්ගන්න බෑ.. ලෙයට ලේ අදුරගන්නවා කිව්වට මම ඒක විශ්වාස කලේ අද.. මට කොහොමවත් සතුටක්නම් හිතුනෙ නෑ.. පොඩ්ඩක්වත් නෑ.. සතුට කියන දේ ඒ මිනිහගෙනුයි මගෙනුයි තිබ්බෙ පේන්නෙ නැති දුරක.. මට දැනුනේ කලකිරීමක්ද.. වේදනාවක්ද.. පිළිකුලක්ද.. කේන්තියක්ද.. ඒ හැම එකක්ම එකතු වුනු කාලකන්නි හැඟීමක්ද..මොකක් හරි.. එහෙම වෙන්න ඕන..

" පුතේ.. ෂනෙරු.."

තාත්තා මට කතාකලා.. ඒක ..හෙනම විහිලුවක් වගේ නැද්ද.. පුතේ?? මම උගෙ පුතා කියලා මතක් වුනේ අවුරුදු දහනමයකට පස්සෙද.. මම කොහොමද හිනාවෙන්න ඕන.. කොච්චර ඒකට හිනාවෙන්න ඕනද..

මගේ අම්මා කිරි බොන අතදරුවෙක් එල්ලගෙන විත්ති කූඩු ගානෙ නගිද්දි ලෝයර්ස්ලා පස්සෙන් අසරණ වෙලා ගිහි ගිහින් නඩත්තු සල්ලි ඉල්ලලා දෙන්න කියද්දි.. ඌට මතක තිබ්බෙ නැද්ද.. මම උගේ පුතෙක්මයි කියලා..

" උඹේ පුත්තු මෙහෙ නෑ.. පාහරයා.. බැහැපන් ගෙයින් එළියට.."

මම අත මිට මොළවගෙන උගේ මූණ ලගටම කිට්ටු වෙද්දි රධ්‍ය අයියා ඇවිත් මගේ අතකින් තද කල්ලා අල්ලගත්තා..

" වරද්.. එපා!!"

@Shan

මම රධ්‍ය අයියගෙ අත ගසලා අරගෙන තිබ්බ මුලු හයියෙන්ම මගේම තාත්තගේ කන් අඩිය පිපිරිලා යන්න තරම් හයියෙන් පාරක් ගැහුවගම තාත්තා වැටෙන්න ගිහින් එහාපැත්තෙ හිටපු පිරිමි කෙනාට වාරු වුනා..

මම අම්බානෙක පවුකාරයෙක් වෙන්න ඇති.. ඊළඟ ආත්මෙටත් තාත්තෙක් නැතුව ඉපදෙන්නම පව් පුරෝගන්නවා වෙන්න ඇති.. තාත්තට ගහන්න එපා.. ආනන්තරීය පාප කර්ම.. අරවා.. මේවා.. බණ.. මට ඕවා අහන්න ඕන නෑ.. මට අම්මා වෙනුවෙන් මිනීමරුවෙක් හරි වෙන්න පුලුවන්.. මරාගෙන වුනත් මැරෙන්න පුළුවන්.. මම මෙච්චර කාළයක් මේ කොළඹට ඇවිල්ලත් අම්මට එක එකාගෙ කතා අහගන්නෙ නැතිවෙන්න පරිස්සම් කලා.. එහෙව් එකේ මේ වගේ කොන්ද පණ නැති පාහරයෙක්ට කාගෙ කොහෙන් ආපු අයිතියක්ද මගේ අම්මට අත උස්සන්න..

" මහ ගෑණි වගේ ලැජ්ජාවක් නැතුව ඔය හැදිලා තියෙන්නෙ අගේට.."

තාත්තව වාරු කරගෙන හිටප් පිරිමි කෙනා මට රවාගෙන කියද්දි මම උගෙට කට කොනෙන් හිනාවුනා..

" මේ මොකාද මේ කුලියට කහින එකා.. කවුරු වුනත් කමක් නෑ බැහැපන් මේ ගෙයින් එළියට.. සැරයක් කිව්වා.. ඊළඟපාර මම මෙහෙම නෙමේ කියන්නෙ.. දැනගනින්.. උඹලා මොක්කු වුනත් මට වැඩක් නෑ.."

" වරද්.. මේ බලන්න.."

" ප්ලීස් ඔයා පැත්තකට වෙලා ඉන්න.. මට බණ අහන්න උවමනාවක් නෑ.."

මම රධ්‍ය අයියව පිටිපස්සට තල්ලු කල්ලා ආපු උන්ට ඇඟිල්ලක් දික් කල්ලම දොර තියෙන දිහා පෙන්නුවා..

" ෂනෙරු.. උඹ මගෙම සල්ලි වලින් කාලා ඇඳලා ඉඳලද.. උඹ මට මෙහෙම අත උස්සන්නෙ.. ආ.."

තාත්තා මට කින්ඩියට හිනාවෙද්දි මට තව ටිකක් කේන්ති ගියා.. එතකොට උගේ සල්ලි වලින් ජීවත් වුනාම අපි උගෙට ඕන ඕන වෙලාවට ඇවිත් උගේ හයිය හත්තිය අපේ අම්මටයි මායි පෙන්නලා යනකල් ඉන්න ඕන.. ඒකනෙ කියන්නෙ..

@Shan

" දැන් මොකක්ද කියන්නෙ.. සල්ලි දෙන නිසා අපි කට පු# වහගෙන ඉන්න ඕන.. එහෙමනෙ.. නේ.."

" මම උඹ කවුද කියන්න දන්නෙ නෑ තාත්තෙ.. වදින්නම් ආයෙ උඹෙ ඔය සල්ලි මටයි අම්මටයි ඕන නෑ.. මගේ අත පය හයිය තියනව යකෝ.. මට මගේ අම්මව ජීවත් කරවන්න පුලුවන්.. උඹෙ පකේ සල්ලි අපිට ඕන නෑ.."

" වරද්..!!!! දැන් ඇති.."

රඩ්‍ය අයියා මගේ අතින් අල්ලලා මාව බිත්තියේ වදින්න තල්ලු කල්ලා දැම්මා.. අම්මා පේන්න නෑ සාලෙ.. මම බිත්තියට වාරු වෙලා හුස්ම ගන්න ට්‍රයි කලා.. මගේ ඔලුව කැරකෙනවා වගේ.. මට මෙහෙම කේන්ති යන්නෙ නෑ.. ගියාම මටම තේරෙන්නෙ නෑ.. මොනවද මගේ වටේ වෙන්නෙ කියලා..

රඩ්‍ය අයියා තාත්තටයි අර මිනිහටයි ඇඟිල්ල දික් කර කර මොනවහරි කියනවා මට ලාවට පෙනුනා.. බ්ලැක් අවුට් වෙලා වගේ.. මාව වෙවුලනවා.. මම බිත්තිය අල්ලගෙනම අම්මගෙ කාමරේ පැත්තට යද්දි අම්මා නානකාමරේ සින්ක් එකෙන් පපුවයි මූණයි අතුල්ල අතුල්ල හයියෙන් හයියෙන් සෝදනවා.. මුළු ඇඟම සූරගෙන වගේ.. රතුපාට නියපොතු පාරවල්.. අම්මා අඩ අඩාම වතුර දෝතට අරගෙන ඇඟට හලාගන්නවා.. මූණ හූරගන්නවා.. මම එතන තිබ්බ ටවල් එකක් අරගෙන ගිහින් අම්මගෙ ඇඟට ටවල් එක දාලා අම්මව හයියෙන්ම තුරුල් කරගත්තා. දෙයියනේ මගේ පණ ටික.. අම්මට මොනාහරි වුනානම් මම මොනවා කරයිද.. දෙයියන්ගෙ නාමෙට අපිට මොනවද මේ වෙන්නෙ කියලා මට තේරෙන්නෙ නෑ..

මම අම්මව තුරුල් කරගත්තහම අම්මා මගේ කොලර් එකෙන් තද කරලා අල්ලගෙන මගේ පපුවට තුරුල් වුනා.. මම එහෙමම නැමිලා ටැප් එක වහලා දැම්මා.. අම්මා හරි පොඩියි.. හුරුබුහුටියි.. මං ගාව ඉද්දි පොඩි ලමයෙක් වගේ.. මගේ පපුව ගාවට උසයි.. මම අම්මගෙ කැඩිලා තිබ්බ දනහිස ගාවට දිග කොණ්ඩෙ අත් දෙකෙන් එකතු කල්ලා කට්ටක් ඇහුවා.. අම්මව වෙවුලනවා වගේ..

" අම්මෙ.. මේ බලන්න.. මම ඉන්නවා.. හැමදේම හොදින්.. බලන්නකො අනෙ අම්මෙ.."

@Shan

අම්මා මා එක්ක කතාකරන්නෙවත් නැතුව මාව බදාගෙනම බිමට කඩාගෙන වැටුනා..

" අනෙ අම්මෙ කතාකරන්නකො දෙයියනේ.. මම ආවනෙ.. අම්මට මොකුත් වෙන්න දෙන්නෙ නෑ මම.. මේ බලන්න.. මම ඉන්නවා මෙතන.."

මම අම්මව අත් දෙකෙන් අල්ලගෙන බිම වාඩිවෙලා කතාකරද්දි රධ්‍ය අයියා නානකාමරේට දුවගෙන ආවා..

" වරද්.. මොකද මේ.."

රධ්‍ය අයියා මං ගාව බිම දණ ගහගෙන අම්මව අල්ලගත්තා.. අම්මව ටවල් එකෙන් ඔතලා තිබ්බත් වෙවුලනවා..

" මම දන්නෙ නෑ අයියෙ.. අනේ මට බයයි.. අම්මා කතාකරන්නෙ නැනෙ.."

" අම්මා ශොක් වෙලා ඉන්නෙ වරද් මම හිතන්නෙ.. ගිහින් උනු වතුර එකක් ලිපේ තියලා එන්න.. මම අම්මව කාමරේට එක්ක යන්න.."

මම අම්මව රධ්‍ය අයියට වාරු කල්ලා වැටි වැටීම කුස්සියට දිව්වා.. මෙස් එකේ එක කකුලක් ලේ පාට වෙලා. කැපිලා ලේ එනවා.. මම මෙස් එක එහෙමම ගලවලා විසික් කල්ලා දැම්මා.. හුළං වැදෙද්දි දනවා.. නියපොත්ත ගාවින්ම කැඩිලා ගිහින්..

වතුර එක උනු වුනාම මම අම්මගෙ කාමරේට යද්දි රධ්‍ය අයියා අම්මට මොනවහරි කියනවා අම්මගෙ අත් දෙකින් අල්ලගෙන.. අම්මව ඇඳ උඩින් වාඩි කල්ලා අම්මගෙ කකුල් දෙක ගාවින් වාඩිවෙලා.. හරියට මම ඉදගන්නවා වගේම.. මම ආවහම රධ්‍ය අයියා මගෙන් උණුවතුර බේසම අරගෙන මට හැන්ඩ් ටවල් එකක් ගේන්න කිව්වා.. ඊටපස්සෙ එයා කිව්ව විදියට මම අම්මගෙ බෙල්ල අත පය තවලා අම්මට ඇදුමක් ඇදගන්න දීලා කාමරෙන් එළියට ආවා..

" ආ ඔව් අයියෙ.. මම වරද්ට දෙන්නද.. ඔයා අහනවද.."

" වරද්.. මෙකට කතාකරන්න.. අපේ අයියා.."

මම රධ්‍ය අයියා දීපු ෆෝන් එක කනේ තියාගත්තා..

@Shan

" ආධ්‍ය අයියෙ.."

" මල්ලි.. ඔයා දැනුවත්ව අම්මා ඩිප්‍රෙශන් වගේ දේකටකලින් බෙහෙත් අරන් තියෙනවද.. හොදට මතක් කල්ලා කියන්න.."

" ඔව් අයියෙ.. තියෙනවා.. මම පොඩි කාලෙ වගේ.."

" පොඩ්ඩක් බලන්න මල්ලි Fluoxetine කාඩ් එකක් ගෙදර තියේද කියලා.. අම්මා පාවිච්චි කරනවා ඇති හුගක් වෙලාවට.. ගිහින් බලන්න.."

මම ෆෝන් එක කනේ තියාගෙන අම්මා ඇදුම් ඇදලා ඉවර ඇති කියලා හිතාගෙන කාමරේට ගිහින් අම්මගෙ අල්මාරිය ඇවිස්සුවා..

" ආ ඔව් අයියෙ.. තියෙනවා.."

" හරි.. අම්මට එක කැප්සුල් එකක් දීලා පොඩ්ඩක් වෙලා ඉන්න.. ඊටපස්සෙ අම්මට නින්ද යාවි.. බය වෙන්න එපා මල්ලි ඒක පොඩි පැනික් ඇටැක් එකක් වගේ එකක්.. මම එන්නද නැත්නම්.."

" එපා එපා අයියෙ.. රධ්‍ය අයියත් ඉන්නවනෙ.. මම මොකක් හරි කරගන්නම්.. අනේ තැන්ක්ස් අයියෙ.."

" උවමනාවක් උනොත් අනිවාරෙන් කතාකරන්න හරිද.. මම එන්නම්.."

මම ෆෝන් එක කට් කල්ලා අම්මට බෙහෙත් පොවද්දි රධ්‍ය අයියා කාමරේට ආවා..

" අම්මෙ.. මේක බීලා නිදාගන්න.. මම ඉන්නව මෙතන.. හොදද.."

අම්මා මාව ගානකට නොගෙන බෙහෙත් බීලා බිත්තිය පැත්තට හැරිලා හාන්සි වුනා.. මගේ හිතට පුදුම වේදනාවක් දැනෙන්නෙ.. වෙනදා කටපුරා සුදුමහත්තයෝ කියද්දි අද මොකුත්ම නොකියා මාව දන්නෙ නෑ වගේ අනිත් පැත්ත හැරිලා ඔහේ ඉන්නවා.. මම ඇස් වලට ඉනුව කදුලු ශර්ට් එකේ කරෙන් පිහිදගෙන අම්මා දිහා බලාඑන හිටියා..

" වරද්.. එන්නකො.. අම්මට නිදාගන්න දෙමු.. අපි එළියට යමු.."

" ම්ම්.."

@Shan

මම අම්මගෙ කාමරේ ලොකු ලයිට් එක නිමාගෙන දොරත් අඩවල් කරගෙන එළියට ආවා.. වෙලාව රෑ එකොළහයි.. හොඳටම රෑ වෙලා.. වටේ පිටේ කිසි සද්දයක් නෑ..

" ස්ස්.. ආව්හ්.."

මගේ කකුල මොකකට හරි පසාරු කරගෙන යනවා වගේ දැනෙද්දි මම ඉක්මනට බිම බැලුවා.. අම්මගෙ පිගන් මැටි මල් පෝච්චිය කුඩු වෙලා ගිහිල්ලා.. තැන තැන වීදුරුකටු ගොඩයි. මම මෙහෙම එකක් දැක්කෙ නැහැනෙ කලින්..අම්මගෙ ආසම මල් පෝච්චියක්.. ඒක බිදිලා ගිහිල්ලා.. අම්මගෙ හිත වගේම ඒකත් බිදිලා ගිහිල්ලා..

මම නැමිලා කකුලේ බාගයක් ඇනිලා තිබ්බ වීදුරු කටුව ඇදලා දාද්දිම ඩස්ට්පෑන් එකකුත් අරගෙන සාලෙට ආවේ රධ්‍ය අයියා.. මාව දැක්ක ගමන් කොස්ස පැත්තකින් තියලා මං ගාවට දුවගෙන ආවා..

" තුවාල කරගත්තා නේද.. මෙතනින් වාඩිවෙන්න වරද්.. මම මේක අස් කල්ලා එන්නම්.. පොඩ්ඩක් ඔහොම ඉන්න..හරිද.."

රධ්‍ය අයියා මාව සෙටියෙන් වාඩිකරලා සාලෙ අතුගාලා එහා මෙහා වෙලා තිබ්බ පුටු ටිකත් පිළිවෙලට හදලා වීදුරු කටු ටිකත් අස් කලා.. මම ලේ ගලන කකුලත් ඔහේ තියාගෙන මහා හිස් හැඟීම් ගොඩකින් රධ්‍ය අයියා දිහා බලාගෙන ඉදියා..

වැස්සක්වැහැලා පායලා වගේ දැන් වටපිටාව හරි නිහඩයි.. අම්මා නිදි ඇති.. කලින් කලබලයක් වුනාද කියලා හිතාගන්නවත් බෑ.. මම මූන අත් දෙකින් වහගෙන සෙටියට හේත්තු වුනා..

මට ජීවිතේ පොඩිම පොඩි හිතේ කොනක අදහසක් තිබුනා තමයි.. තාත්තව හම්බෙන්න.. ඒත්.. ඒත් මම දැන් ඒ පොඩිම බලාපොරොත්තුවටත් වෛර කරනවා.. ඇයි මම එහෙම බලාපොරොත්තු වුනේ කියලා හිතෙනවා.. මම එහෙමබලාපොරොත්තු නොවුනනම් හිතට හොදයි.. මගේ ඇගේ දුවන්නෙත් ඒ වගේ පාහරයෙක්ගෙ ලේ කියලා මතක් වෙද්දි මට අර ලොකු අම්මා කියන කතාව එකපාරම මතක් වෙන්න ගත්තා..

" මිස්ටේක් එකක්"

@Shan

මම ඇත්තටම මිස්ටේක් එකක්ද.. ඇයි අම්මා මාව නැතිකලේ නැත්තෙ කියලා මට හිතෙනවා.. එහෙම කලානම් අම්ම සතුටින් ඉන්න ගියා.. මට පුලුවන් නම් කාලෙ පස්සට ගන්න.. සත්තයි අම්මගෙ බඩට එන්නෙ නෑ.. මම් උවමනාවෙන් ආවා නෙමෙයිනෙ.. ඇයි මට හිතේ සැනසීමෙන් ඉන්න බැරි.. මට ඇස් දෙක අස්සෙන් මාව කළුවර ගැඹුරු තැනකට ඇදිලා වගේ යනවා දැනෙද්දි මගේ උරහිස වටේ හුරුපුරුදු උනුහුමක් එක්ක කටහඩක් ඇහුණා.. මම එවෙලෙම ඇස් ඇරියා..

" වරද්.."

" මම්.."

" හොද ලමයා වගේ ගිහින් වොශ් එකක් දාගෙන එන්න.. අපි කකුලට බෙහෙත් දාමු..මම්??"

" මොකක්ද වුනේ.. මම එන්න කලින් මොකක්ද වුනේ අයියෙ.."

මම ජීවිතේ අන්ත අසරන වෙලා වගේ රධ්‍ය අයියා දිහා බලද්දි රධ්‍ය අයියා මගේ මූණ මගෑරලා බිම බලාගත්තා..

" ඇයි කියන්නෙ නැත්තෙ.."

" කියන්නම්.. මම කියන්නම්.. ඉස්සෙල්ලම වොශ් එකක් දාගෙන එන්න.. කකුලට බෙහෙත් දාන්න.."

මම රධ්‍ය අයියගෙන් තව අහලා වැඩක් නැති නිසා නැගිටලා කාමරේට ගිහින් අතට අහුවුනු ඇදුමක් අරගෙන නානකාමරේට ගියා.. මට තනියම ඉන්න ඕන.. ඒත් එහෙම ඉන්න විදියක් නෑ.. මට ආච්චිඅම්ම ගාවට යන්න ඕන.. ගිහින් තුරුල් වෙලා අඩන්න ඕන.. නැත්නම් රධ්‍ය අයියට මේ හැමදේම කියන්න ඕන.. ඒත් මට බයයි රධ්‍ය අයියා මං ගැන මොනවා හිතයිද.. මාව එයාටත් මිස්ටේක් එකක් වගේ පෙනෙයිද.. මගේ පපුව කකියනවා.. දවසෙම කාපු නැති නිසා ඔක්කාරෙට එනවා.. මම ඇදුම් මාරු කරන්නත් කලින්ම කොමොඩ් එක ගාවට පහත් වෙලා පපුව අල්ලගෙන වමනෙ කලා.. යන්න දේකුත් නෑ.. බඩ පපුව හාරවගෙන ඔක්කාරෙට එනවා.. මම පපුව අත් දෙකෙන්ම මිරිකගෙන වමනෙ කලා.. බිම ටයිල් එක පුරාම ලේ.. කකුලෙන් ලේ ගලාගෙන යනවා ඉවරයක් නෑ.. මට මාවම අපායක් වගේ..

@Shan

" වරද්.. මම ඇතුලට එනවා.."

මම දොර ලොක් කල්ලා නොතිබ්බ නිසා රධ්‍ය අයියා දොර අගුල කරකගෙන ඇතුලට ආවා.. එකපාරටම බිම තිබ්බ ලේ දැකල එයා අබයවුනත් ලේ පාගැනම මං ගාවට ඇවිත් මාව නැගිට්ටුවලා එයාට වාරු කරගත්තා.. වාරු කරගෙන මගේ පපුව අතගාන්න ගත්තා.. ටිකකින් මට වමනෙ කරාම සහනයක් දැනුනා..

" මම නාගෙන එන්නම්.."

" ඉක්මනට එන්න. වැඩිය වතුරෙ ඉන්න එපා.."

" හරි.."

මම කණ්ණාඩියෙන් පේන මට ටිකක් එහායින් ඉන්න රධ්‍ය අයියා දිහා බලලා යන්තමින් හිනාවුනා.. ඔයත් මෙහෙම ලගින් ඉදලා යන්න යයිද මට බයයි.. දැන් මම දන්නෙම නැතුව හැම තිස්සෙම මම එයාව බලාපොරොත්තු වෙනවා.. හැම ලොකු දේකකදිම.. හැම පොඩි දේකකදිම..

රධ්‍ය අයියා දොර වහගෙන එළියට ගියාම මම හොදට නාගත්තා.. නාගෙන ඉවර වුනහම ඇගට පොඩි සහනයක් දැනුනා.. මම දිග කලිසමකට අත් කපපු ශර්ට් එකක් ඇදගෙන එළියට එද්දි ආධ්‍ය අයියා ඇවිත් සාලෙ ඉන්නවා..

" අයියා මෙහෙ ආවද.."

" එන්නෙ නැතුව කොහොමද බං.. අම්මා නිදිද.."

" ම්ම්.. නිදාගන්න ගියා.."

" ඒක හොදයි.. මල්ලි කෑම කෑවෙ නැද්ද.. මට පොඩී කිව්වා ගැස්ට්‍රයිටිස් වැඩිවෙලා කියලා.."

" ටිකක් විතර අයියෙ.. දැන් අවුලක් නෑ.. අයියලාට හෙන වදේ නේද.. මට කතානොකර ඉන්නයි තිබ්බෙ.."

මම නොන්ඩි ගගහා ගිහින් ටවල් රැක් එකෙන් ටවල් එක දැම්මා..

@Shan

" අනේ මේ පිස්සු කියවන්නැතුව ඉදපන් බං.."

මම ආධ්‍ය අයියා ගාවින් වාඩිවෙද්දි ආධ්‍ය අයියා මගේ කොන්ඩෙ තිබ්බ වතුර එහෙට මෙහෙට විසිවෙන්න කොන්ඩෙ ගැසුවා..

" හදාගන්නවා ලෙඩක්.. මහ රෑ නාලා.."

" වරද්.. එන්න කන්න.."

රධ්‍ය අයියා කුස්සියේ ඉදන් කෑගහනවා මට ඇහුනා.. කුස්සියේ මක් කරනවද..

" පොඩ්ඩී.. මේකා දැන් කෑවොත් ආයෙම අනිත් පැත්තට ඒකත් දාවි.. මේ අයි වී එක දීලා ටිකකින් කෑම කැවනම් හරි.."

ආධ්‍ය අයියා සාලෙ ඉදන් රධ්‍ය අයියට කෑගැහුවා..

" ආ හරි හරි.."

" අයි වී දෙන්න.. අනේ මේ මට එහෙම අමාරුවක් නෑ.."

ආධ්‍ය අයියා පොඩි ග්ලාස් බොටල් එකක් අරගෙන ඒකෙ උඩට ගෝස් එකක් තියලා 'ටකස්' ගාලා බොටල් එකේ උඩ කෑල්ල කඩලා සිරින්ජර් එකකට ලික්විඩ් එකක් පුරවගත්තා..

" පොඩ්ඩී මෙහෙ ඇවිත් මේ කොටන් එකට ස'ජිකල් දාලා මේ වේන් එක ගාව ක්ලීන් කරන්නකෝ.."

ආධ්‍ය අයියා රධ්‍ය අයියට කතාකරද්දි එයා අත් දෙකේ වතුර ගස ගස ඇවිත් මගේ එහාපැත්තෙන් වාඩිවුනා..වාඩිවෙලා ආධ්‍ය අයියා කිව්ව විදියට කලා..

" අත ගස්සන්න එපා.."

ආද්‍ය අයියා ඇස් දෙකත් වපර කරන සිරින්ජර් එකට තුන් හතර වතාවක් තට්ටු කල්ලා නීඩල් එක මගේ පිට අල්ලෙ තිබ්බ වේන් එකක් හිල් කරගෙන යන්නම ඇන්නා.. මම ඒක දිහා බලාගෙන හිටියා.. පොඩි කාලෙත් මම ලේ ගද්දි අහක බලාගන්නෙ නැතුව ඒක දිහාම බලාගෙන ඉන්නවා..

@Shan

" හරි.. පැය බාගෙකින් විතර කන්න.. එතකොට අමාරු ගතිය ඇරිලා යාවි.."

ආධ්‍ය අයියා සෙටියෙන් නැගිට්ටා..

" අයියා යන්නද.."

" ඔව් මල්ලි.. ගෙදර කවුරුත් නැනෙ.. පොඩී මල්ලි එක්ක ඉදලා එන්න එහෙනම්.."

" ම්ම්.."

ආධ්‍ය අයියා මගේ ඔලුව අතගාලා යන්න ගියා.. රධ්‍ය අයියා අයි වී එක යවපු තැන කොට්න් එකක් තදකරගෙන හිමිහිට අතගානවා..

" ඒක ගානක් නෑ.."

" එන්න කකුලට බෙහෙත් දාන්න.. කොහෙද ෆස්ටෙයිඩ් බොක්ස් එක.."

" මගේ කාමරේ ඇති.. යමු.."

" කාමරේට??"

" ඔව්.. යමු.."

මම නැගිටලා කකුලෙ මැද හරිය පොලොවෙ වදින්නෙ නැතිවෙන්නෙ ඇවිදගෙන කාමරේට ගිහින් ඇද උඩින් වාඩිවුනා.. මට ඇහුනා ගෙදර ඉස්සරහා දොර අගුලු දාලා සාලෙ ලයිට් ඕෆ් කරනවා.. අද මෙයා මෙහේ ඉන්නද..

" කෝ කොහෙද.."

රධ්‍ය අයියා පොඩ්ඩක් කාමරේට එන්න අදි මදි කල්ලා මං ගාවින් ඉදගත්තා..

" අර රැක් එකේ පහලම ඇති.."

මම ෆස්ටෙයිඩ් බොක්ස් එක පෙන්නුවහම එයා එක්ක අරන ඇවිත් මං ගාවින් ඉදගෙන මගෙ එක කකුලක් උස්සලා අරන් උකුල උඩින් තියාගත්තා.. මගේ හිතට හරි නෑ වගේ.. මම නිසා කොච්චර වදේද රධ්‍ය

@Shan

අයියටත්.. මෙහෙම ගිහින් මාව එපාවෙලා යයිද දන්නෙ නෑ.. අහක යන ප්‍රශ්නගොඩක් ඔලුවේ හලාගත්තා වගේනෙ..

" මොකක්ද වුනේ.. මට දැන්වත් කියන්නකො.."

රධ්‍ය අයියා පුලුන් කැල්ලක් බෙටඩින් වලින් පොගවද්දි මම අහපු ප්‍රශ්නෙ එක්ක එයා ලොකු හුස්මක් පිට කලා..

" ඔයා ආයෙම පිස්සුවක් නටන්නෙ නැත්නම්.. මම කියන්නම්.. හැබැයි අහගෙන විතරක් ඉන්න.."

" ම්ම්.."

" මම ඔයා කියලා විනාඩි විස්සෙන් වගේ මෙහෙ එද්දි ගෙදර දොර ඇරලා දාල තිබ්බා.. මම අම්මා විතරක් නිසා එළියේ ඉදන් කතාකලා.. ඒත් අම්මා ආපු නැති නිසා මම ඇතුලට යන්න හදද්දි පිරිමි කෙනෙක් අම්මගෙ කාමරෙ ඉදන් එළියට ආවා.. මාව දැකලා මාරුවෙන්න හැදුවෙ.."

" ඊටපස්සෙ අම්මා කෑගහන සද්දයක් ආපු නිසා මම කාමරේ පැත්තට යන් අහදද්දි.. අම්.. මෙහෙමයි.. අර අනිත් පිරිමි කෙනා.. ඔ-ඔයාගෙ තාත්තා අම්මට කරදර කරන්න හදනවා දැක්කා.. මල් පෝච්චිය බිදුනේ මගේ අතින්.. ඔයා එන්න ටිකකට කලින් ලොකු රණ්ඩුවක් වුනා.."

" පෝච්චිය බිදුනා??"

" ම්ම්.. මම ඒකෙන් ඒ මනුස්සයට දමලා ගැහුවා.. මට කරන්න වෙන එකක් මතක් වුනේ නෑ.."

" ම්ම්.."

මට හිතාගන්න බෑ.. රධ්‍ය අයියා නොහිටියානම් මොනවයින් මොනවා වෙයිද කියලා මට හිතාගන්න බෑ.. මම එද්දි වෙන්න ඕන සේරම වෙලා තියෙයි.. මම ඇදේ පිටිපස්සට ඇදිලා ගිහින් බිත්තියට හේත්තු වෙලා බිත්තියට ඔලුව ගහගෙන සිවිලිම දිහා බලාගෙන හිටියා.. මම එතන නොහිටියත්..මට හැමදේම මැවිලා පේනවා වගේ.. මගේ ඇස් අගිස්සෙන් කදුලු බේරෙනවා.. ඇයි වෙන ඕන දෙයක් මට නොවෙන්නෙ.. මම ආදරේ කරන අයටම වෙන්නෙ..

@Shan

රධ්‍ය අයියා ප්ලාස්ටර් එකක් යටි පතුලට ගහලා අනිත් එක ඇඟිල්ලක් වටේ අලවලා ෆස්ටෙයිඩ් බොක්ස් එක පාඩම් මේසෙ උඩින් තියලා මං ගාවට ඇවිත් මගේ එහාපැත්තෙන් බිත්තියට හේත්තු වුනා..

" වරද්.."

රධ්‍ය අයියා එයාගෙ ඇඟිලි මගේ ඇඟිලි වල පටලගත්තා.. ඒ ඇඟිලි තුඩු වලින් එන උනුහුමත් මට සැනසීමක්.. ගිනි ගොඩක් උඩ ඉදගෙන හිටියත් රධ්‍ය අයියව මට දැනුනේ වැහි වලාකුලක් වගේ..

" මට කියන්න තේරෙන්නෙ නෑ අයියෙ.. මට මොකුත්ම හිතෙන්නෙ නෑ.."

" ඔයා ඔයාටම දොස් කියාගන්න එපා වරද්..ම්ම්.. මට තේරුන විදියට නම් තාත්තා එයාගෙ අනිත් කසාදෙන් ඩිවෝස් වෙලා අවුරුදු දෙකක්ලු.. ඒකයි මම හිතන්නෙ අම්මව හොයන් මෙහෙ ආවෙ.. ඔයා නැති වෙලාවක් මීටර් කල්ලා.. කොහොම වුනත් මොකුත් වුනේ නෑනෙ.. හැමදේම හොදින්.. ඔයා ඔයාට කරන්න පුලුවන් උපරිමේ කරනවා වරද්.. ඔයිට වඩා ඔයාට කරන්න බෑනෙ.."

" ම්ම්.."

" දැන් අඩලා අසනීප වෙන්න එපා.. මම ඉන්නවනෙ උඹට.. මම හැමතිස්සෙම ඉන්නවා වරද්.."

" ඒ වුනාට-.."

" අනේ මගුල් කතානොකර ඉදපන් බං.. උබ සතුටින් ඉද්දි ලෝබ හිතෙනවා.. මටනම් සිරාවටම හෙන ලෝබයි.. උඹව ඇල්ලුවත් දියවෙලා යයිද හිතෙනවා.. මං කියන නිසාවත් මේ දේවල් හිතට නොගෙන කොහොමහරි කට්ට කාගෙන එක්සෑම් කරගනින්.. උබට එහෙම වරදින්නෙ නෑ.. උඹට කරන්න බැරි දෙයක් නෑනෙ බං.."

" ම්ම්.."

" දැන් වෙච්ච දේ වුණා.. උන් ආයෙම එන්නෙ නෑ.. මේවා ගැන හිත හිත දුක් වෙලා කාලෙ නාස්ති කරගන්නැතුව හෙට අලුත් දවස ගැන හිතන්න.."

@Shan

" ආයෙම තාත්තා ඒවිද.. මට බය හිතෙනවා.. මම එයාව ඉස්සරවෙලාම හම්බෙන්න හිතුවේ මෙහෙම නෙමෙයි.. මම මහ කරදර ගොඩක්.. මම බලාපොරොත්තුවෙන කිසිදෙයක් මට ලැබෙන්නෙ නෑ.. දැන් මං ඉස්සරහා මොකක් හරි තියෙනව කියල හිතන්නකො.. මම ඒකත් නිසා සතුටින් ඉන්නවා.. එහෙම ඉද්දි ඒක හෙට වෙනකොට නැතිවෙලා ගිහින්.. මම එච්චරටම කාලකන්නියි.."

" උබ එහෙම නෑ.. උබටම දවසක හිතෙයි උඹ හෙන වාසනාවන්තයි කියලා.."

" එහෙම වුනොත් හොඳයි.."

" එහෙම වෙනවා.. ඒකනිසා දැන් ඔය ඔක්කොම අමතක කල්ලා දාලා හිත නිදහස් කරගන්න.. අම්මා පව් වරද්.. උඹ අනිවාරෙන්ම හයියට ඉන්න ඕන.."

" මම..."

" මතකද අර සීයා කිව්ව රුස්ස ගහේ කතාව.."

" මම.. මට දැන් තේරෙනවා සීයා කිව්වෙ කොහොම එකක් ගැනද කියලා.."

" මලක් වෙලත් ඉදපන්.. රුස්ස ගහකුත් වෙලා ඉදපන්.. මම ආසයි උඹ මලක් වගේ ඉන්නවනම්.."

" ඒ මොකද.. කඩාගන්නද.."

" පිස්සුද බං.. එහෙම එකක්ට නෙමේ.. උඹ මලක් වෙලා ඉන්නවනම් මම වතුර දාලා බලාගන්නම්.."

රධ්‍ය අයියා ඉදහිට ඔහොම කතාවක් දෙකක් කියද්දි මගේ හිත සතුටින් උඩ පනිනවා.. මම ආදරේ කරන්නෙ මේ ලෝකෙ ඉන්න ආදරණීයම මනුස්සයටද කියලා මට හිතෙනවා.. මම රධ්‍ය අයියා ගාවට ලං වෙලා එයාගෙ බෙල්ලයි උරහිසටයි අතරට මූණ තියාගත්තා.. අපේ ඇගිලි තාමත් තිබ්බෙ පැටලිලා.. එයා සැරින් සැරේ මගේ අතේ තිබ්බ මුද්ද කරකනවා..

" මම කොහොමද ආදරේ දැනෙන්නෑ වගේ ඉන්නෙ.."

@Shan

මට හදිසියේ එල්ඩර්ස් හෝම් එකේ බෙන්ච් එක ගාවදී රධ්‍ය අයියා කියපු කතාව මතක් වුනා.. එයාටමනෙ උවමනා වුනේ අපි දෙන්නගෙ අතරෙ සීමාවක් තියාගන්න.. ඒ වුනත් මට හිතෙනවා ඒක නිසාම අපි දෙන්නා දුරින් ඉදගෙන අපිව අඳුරගන්නවදෝ කියලත්..

රධ්‍ය අයියා මගේ අතේ තිබ්බා මුද්ද උඩින් හාදුවක් තිබ්බා.. හරි හිමින් දැනෙන්න නොදැනෙන්න..

" මගෙ.."

රධ්‍ය අයියා ගාවින් එන අර නිදිමත හැදෙන උනුහුම මගේ ඇගට දැනෙද්දි මගේ ඇස් බර වෙලා කඳුලු එක්කම වැහිලා යන්න දැගලුවා.. ඇස් වහද්දි දැවිල්ලයි.. ඒ වුනාට මට ඇස් වහගන්න ඕන.. හැමදෙයක්ම හීනයක් වෙලා ගිහින් මම ආසම දේවල් මගේ ඉස්සරහා මවාගන්න ඕන..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

දොයිය බබා වෙන්නයි යන්නෙ එයා..(නමුත් රධ්‍ය කොලුවා විසින් මගකදී ඔහු අවදි කරවා බලෙන් කිරි වීදුරුවක් පොවන ලදී)

මට ඔයාලගෙන් පුංචිම පුංචි දෙයක් ඉල්ලන්න ආසයි.. මම ඉදල හිටලා මොකක් හරි චැප්ටර් එකක සිංදුවක් ගැන සඳහන් කලොත් ඒක අහලා බලන්න පුලුවන් නේද.. ඉඩ තියෙන වෙලාවක..

මෙ කතාව කියවද්දි ඔයාලට නිකම් විකාරයක් වගේ හිතෙනවද.. මම මෙක ලියන ගමනුත් කල්පනා කලේ.. ඉමෝශනල් රෝලර්කෝස්ටර් එකක්

@Shan

වගේ..එක වැප්පෙන් වැප්පට එයාලා වෙනස් වෙනවනෙ.. ඒක කැතයි වගේද.. අනික මේකෙ කිස් තියා තාම මොකුත් නැති නිසා, කිසි හොට් ගතියක් නැති නිසා බෝරින් වගේද..

මට ඕව හිතෙනවානෙ අයියො ඉතින්.. ඒකනෙ මේ ළමයා අහන්නෙ..

හෙට සකලබුජම් ඕතරී ආයෙ කොළඹ යනවා.. ඒකනිසා එන්න වෙන්නෙ නැතිවෙයි ළමයි.. පුලුවන් වුනොත් නම් අනිවාරෙන්ම දෙනවා..

ලව් යූ.. ❤

"I think we could last forever"

"I'm afraid that everything will disappear"

"Just trust me"

*like crazy*

@Shan

# 50 කොටස

එදා වුනු සිද්දියෙන් මම හුගක් වෙනස්වෙන ගමන් හිටියා.. කලින් හිතේ කොනකවත් ජීවිතේ ගැන බයක් නොතිබ්බ මට සමහර වෙලාවල් වලදි ජීවිතේ ගැන බයක් හිතුනා.. හිනාවෙන හැම වතාවකම මට කොච්චර අඩන්න වෙයිද කියලා මට අදහසක් තිබුනේ නෑ..මට ජීවිතේ ගැන බරක් දැනුනට බයක් දැනුනේ නැති තරම්.. මට දැනෙන හැම හැගීමක්ම වචන කරන්න තේරෙන්නෙ නෑ.. ඒත් අනේ මන්දා..

රඩ්‍ය අයියා මට නින්ද යනකල්ම මගේ ලගින් ඉදලා පාන්දර ගෙදර ගිහින් තිබුනා.. අම්මයි මමයි තනියම ඉද්දි එයා කියනවා එහෙම උදේ පාන්දර තව පිරිමියෙන් ගෙයින් එලියට බහින එක හොද දෙයක් නෙමෙයිලු.. ඒ වුනාට ඉතින් වුනු සිද්දිය හැමෝම දන්නවත් ඇති.. විශේශෙන්ම එහා ගෙදර ඇන්ටි.. මොකද මම මේ අවුරුද්ද මුලදි තාත්තා ඔය ගෑනි එක්ක කතා කර කර ඉන්නවා දැක්කනෙ.. ඉතින් ඒ කවුද කියලා කමනි ඇන්ටි හොදටම දන්නවා ඇති.. ඒ වුනත්.. කමක් නෑ.. මට ලොකෙ මිනිස්සු මං ගැන මොනවා හිතුවත් කමක් නෑ.. හෙන ගහලා පලච්චාවෙ.. මට ඇති වැඩක් නෑ..

මට හුගක්ම උවමනා වෙලා තිබ්බෙ මගේ ඔලුව ආයෙම ඉස්කෝලෙ වැඩ වලට ෆෝකස් කරගන්න.. ඇත්තටම පාඩම් පොතක් අතට ගත්තත් මට ඔලුව කකියන්න එනවා.. හිත මොනවාදෝ හොය හොය ,හිත හිත ඈතට ඇදිලා යනවා..

අම්මා දවස් දෙක තුනක් යද්දි සාමාන්‍ය අතට ආවා වගේම මාමා අපේ ගෙදර ටික දවසක් නැවතිලා අම්මා ගාවින් ඉදලා අම්මගෙ හිත හුගක් හැදුවා.. අම්මා හිටියේ මුලදි ලොකු දුකකින්.. ඒත් අම්මා කියනවා ජීවිතේ හැම දුකක්ම ඉවසදරාගෙන ජීවත් වුනේ මම නිසාලු.. මීට වඩා දේවල් වෙලා තියෙන අම්මට මේක එච්චර ගානක් නෙමෙයිලු.. අම්මට ලොකු හයියක්ලු මම අම්මා ලග ඉන්න එක..

ඒත් අම්මා දන්නවද.. මට එහෙම හයියක් නැති වග.. අම්මට මාව හයියක් වගේම මටත් හයියක් ඕන වුනා ජීවත් වෙන්න.. අපි ජීවත්වෙන්නෙම කෙනෙක් මත යැපෙන ගමන්ද මට හිතුනා.. එක්කො මනුස්සයෙක්

@Shan

එක්කො මතකයක් එක්කො හීන.. ඕවා මත යැපෙන ගමන් සමහරු සතුටින්, සමහරු දුකින්, සමහරු සැහැල්ලුවෙන් ජීවත් වුනා..

ආයෙම කීවෙනි වතාවටද මන්දා.. මට හිතුනේ මගේ ජීවිතේට රඨ්‍ය අයියා ආපු එක මගේ ලැබීමක් කියලමයි.. ඒකත් හරිම වෙලාවෙදි හම්බුනු එක ගැන මට ලොකු සැනසීමක් දැනුනා.. මගේ හිත දැනටම පිරිමියෙක්ටම මෙච්චර ලෙන්ගතු වෙන්නෙ මට නොලැබුන ආදරයක් හොයාගෙනද කියල මට හුගක් වෙලාවට හිතුනා..

මම බලාපොරොත්තු වුනු තේරුම් ගැනීම, ආදරේ හැමදේම රඨ්‍ය අයියා එයාට පුලුවන් තරමින් උපරිමෙන්ම මට දුන්නා.. ලගින් ඉන්න දුරින් ඉන්න හැම වෙලාවකම.. මට ඒකම දැනුනේ මහමෙරක් වගේ..

තාත්තා අපේ ගෙදර ඇවිත් සති එකහමාරක් ගෙවිලා ගිහින් තිබ්බත්, මගේ යටි පතුලෙ තුවාලෙ වේදනාව මට නොදැනෙන්නම වෙලිලා ගිහින් තිබ්බත්, අමු අමුවෙම අර බය හිතෙන දුක හිතෙන හැගීම මගේ හිත ඇතුලේ සැරින් සැරේ පාරවලා යනවා..

පෝය දවසේ මම රකට් එකත් අරගෙන එළියට බැස්සේ කොහේහරි යනවා කියලා හිතාගෙන.. කොළඹ.. කොළඹ එක එක මිනිස්සුන්ට ජීවිතේ එක එක මතක ගේනවා ඇති.. මම ඉස්සර මේ අහසට ලොකු බැඳීමක් තිබ්බ මනුස්සයෙක් නොවුනත් දැන් කොළඹ අහස කියන්නෙ මගේ ජීවිතේ හුගක් රහස් හංගගත්තු අමුතු ලෝකයක්.. මම අපේ ඉස්කෝලෙ කෝච්ට කෝල් කල්ලා අහගත්තා කෝච් වැඩකරන් ක්ලබ් එකේ මට ටිකකට සෙල්ලම් කරන්න පුලුවන්ද කියලා.. කෝච් කොහොම සැර වුනත් මට එකතුයි.. මම ඇහුවහම හේතුවක් අහන්නෙ නැතුවම මට කිව්වා ක්ලබ් එකේ ඇවිත් ඕන වෙලාවක් සෙල්ලම් කල්ලා යන්න.. අවුලක් නෑ කියලා.. පෝය දවසක් නිසා කවුරුවත් ක්ලබ් එන්නෙ නෑ.. මට කෝච් ඉන්ස්ට්‍රක්ට කෙනෙක් තියන්නද ඇහුවත් මම එපා කියලා යන්න බස් එකට නැග්ගා.. ඒ එක්කම රඨ්‍ය අයියගෙන් මට කෝල් එකක් ආවා.. ටෙලිපති..

" වරද්.. මොකද කරන්නෙ.."

" අනේ මන්දා.. මම කෝච්ගෙ ක්ලබ් එකට යන්න එළියට ආවා.."

" කෝ ඔයා මට කිව්වෙවත් නැනෙ.. අද ක්ලබ් එක ඕපන් ද.."

@Shan

" නෑ කෝච් කිව්වා කැමති වෙලාවක් මට සෙල්ලම් කරන්න කී එක පහළ තියලා යන්නම් කියලා.. මම හිතුවෙ ඔයා නිදි ඇති කියලා.."

" එහෙමද.. දැන් කොහෙද ඉන්නෙ.."

" දැනුයි බස් එකට නැග්ගෙ.."

" මම.. පරිස්සමින් යන්න එහෙනම්.. ආ මෙ ඒකනෙමෙ.. ඔයා මොන පාට ශර්ට් එකක්ද ඇදගෙන ආවෙ.."

" ඇදගෙන ආවෙ මොනපාටද.. මොකක්ද අනේ ඒ ඇහුවෙ.."

මට එකපාරටම හිනාගියා.. මොනවා අහනවද මට තේරෙන්නෙ නෑ..

" මම.. තද නිල්?? කළු වගේ එකක්.."

" ආ ඒ පාට ඔයාට ලස්සනයි.. පරිස්සමට යන්න.. බුදුසරනයි.."

" බුදුසරණයි.."

මම ෆෝන් එක ස්පෝර්ට්ස් බෑග් එකට ඔබාගත්තා.. අද එච්චර බසුත් නෑ පාරෙ..පොය නිසා.. අපේ අම්මා සිල් ගන්න ගියා.. කොහොමත් අපේ අම්මා මතක ඇති කාලෙ ඉදන් සිල් ගන්න යනවා.. තනියම.. ඒ ගිහින් ආයෙම එන්නෙ හවස් වෙලා.. මම හිටි ගමන් පන්සල් යනවා.. ලොකුවට යැවෙන්නෙ නෑ.. ඒත් යන්න ආසයි.. අර හදුන්කූරු සුවදට මම හරිම ආසයි.. හිත නිවිලා යනවා..

මම බම්බලපිටියෙන් බැහැලා සර් කෝච්න් කරන ක්ලබ් එක පැත්තට ගියා.. හයික්ලාස් ක්ලබ් එකක් ඒක.. මම කීපවතාවක් ඇවිත් තියෙනවා ප්‍රැක්ටිසස් වලට කෝච් එක්ක..

මම පහළ ඔෆිස් එකේ තියෙලා තිබ්බ කී එකෙන් ක්ලබ් එකේ එක රූම් එකක් ඕපන් කරගෙන ගිහින් මගේ ස්පෝර්ට්ස් බෑග් එක ලොකර් එකකට දාලා ශූටින් මැශින් එක ලෝ දාගෙන ඔහේ රැකට් එක වන වන හිටියා.. කම්මැලි නිසා එයාපොඩ් දෙකක් අරගෙන කනේ ගහගත්තා..

ඔහොම දාඩිය දානකල්ම මම සෙල්ලම් කලා.. ආවට මොකද පාලුයි වගේ.. මම ශූටින් මැශින් එකේ ස්පීඩ් හයි දාලා සෙල්ලම් කලා.. එතකොටනම්

@Shan

හිතට අමුතු කික් එකක් ආවා.. මම හති වැටෙනකල්ම, ශර්ට් එක දාඩියෙන් පෙගෙනකල්ම සෙල්ලම් කලා.. හරිනම් අතරමැද බ්‍රේක් එකක්වත් ගන්න ඕන.. ඒත් මම දිගටම සෙල්ලම් කරපු නිසා අත් දෙකේ මස්ගොබ රිදෙන්න ගත්තා..

පැය ගානක් සෙල්ලම් කරපු මම ටවල් එකකුත් කරට දාගෙන ලොකර් එකට ගිහින් ෆෝන් එක එලියට අරගෙන බලද්දි රධ්‍ය අයියා විනාඩි පහක ඉදන් කෝල් අරගෙන දෙක තුනක්ම.. මම අනිත්පැත්තට කෝල් බැක් කලා..

" කොහෙද බං උඹ ප්ලේ කරන්නෙ.."

" ක්ලබ් එකේ.."

" ක්ලබ් එකේ වග මමත් දන්නවා.. මොන රූම් එකේද.. රූම් නම්බර් එක කියපන්.."

" මේක අර සෙකන්ඩ් ෆ්ලෝ එකේ අන්තිමට තියෙන්නෙ.. දම් පාට එකක්.. අන්න ඒකෙ.."

" ආ.."

" පොඩ්ඩක් ඉන්න.. ඒ මෙ තවුසෙ මෙහෙ ආවද.. මොකටද අහන්නෙ.."

" ආවෙ නෑ.. ඒ වුනාට මට දැන් ඔතනින් ටෙලිපෝට් වෙන්න පුලුවන්.. උඹ විශ්වාස කරනවද.. නද්ද.."

" ඇයි ටෙලිපෝට් වෙන්න හැරීපොටර්ද.. අනේ මේ.. ආතල් දෙන්නැතුව ඉන්නවා.."

" ආ එහෙමයි නේ.. තප්පර දෙකෙන් මම ටෙලිපෝට් වෙනවා.. වුනොත් අද මම මොකක් කිව්වත් උඹ කරන්න ඕන.."

" එහෙනම් ඉතින් ඇවිල්ලා ඇති අනිවාරෙන්.."

" ගෙසස් ඔට්ටු නෑ.. ඔන්න කිව්වා.. හරිනෙ.. කරන්න ඕන.."

ඒ එක්කම ඉතින් තප්පර දෙකක් යන්න වුනේ නෑ රධ්‍ය අයියා පේපර් බෑග් වගේකුත් උස්සගෙන ඩෝ එකෙන් ඇතුළට ආවා.. හිතේ ඇත්තෙ සුපර්

@Shan

මැන් කියලා..

" I'm only one call away

I'll be there to save the day

Superman got nothing on me

I'm only one call away

Call me, baby, if you need a friend

I just wanna give you love

C'mon, c'mon, c'mon

Reaching out to you, so take a chance

No matter where you go, know you're not alone

I'm only one call away

I'll be there to save the day

Superman got nothing on me

I'm only one call away

Come along with me and don't be scared

I just wanna set you free

C'mon, c'mon, c'mon

You and me can make it up, anyway

For now, we can stay here for a while

Cause you know, I just wanna see your smile

@Shan

No matter where you go, know you're not alone

I'm only one call away

I'll be there to save the day

Superman got nothing on me

I'm only one call away

When you're weak I'll be strong

I'm gonna keep holding on

Now don't you worry, it won't be long

Darling, if you feel like hope is gone

Just run into my arms "

*(one call away by charlie puth)*

රධ්‍ය අයියා හෙන ඩ්‍රැමටිකලි විදියට සිංදුවකුත් කිය කිය ඇතුළට ඇවිත් පේපර් බෑග්ස් ටික ටේබල් එක උඩින් තියලා මගේ ගාවට ඇවිදගෙන ඇවිදගෙ ආවා.. ඒ සිංදුවටත් හරි වගේ.. මේකා මම ආසම සිංදු සැරින් සැරේ එක එක විදියට කියලා මොකක් හරි මේ වගේ සකලබුජං වැඩක් කරලා ආයෙම මම සිංදුවක් අහන්න ගත්තහම ඒක ඇහෙන්නෙ නෑ මූ කරපු කුජීත වැඩේ තමයි මතක් වෙන්නෙ..

" ඇම් ඔන්ලි වල් කෝල් අවේ.. දැක්කනෙ.. හැරී පොටර් තමා.."

" යැයි යැයි යැයි.. කොස්ස උඩ නැගලද ඉතින් ආවෙ.."

" ඒ ඉස්සර බං අපි කොස්සෙ නැගලා ආවෙ ගියේ.. දැන් කෙලින්ම බිත්ති හරහා තමයි යන්නෙ.. කොස්සෙ ආවහම පස්ස රිදෙන්න ගන්නවා.."

" සැක් ඔයි.. මොනවා කියවනවද මන්දා.. මම හිතුවෙ පෝය දවසෙ ගෙදර නිදි ඇති කියලා.."

@Shan

මම වතුර බොතලේකුත් අරගෙන ලොකර් එකකට හේත්තු වෙලා බිමින් ඉදාත්තහම රධ්‍යා අයියත් ඒ කිට්ටුවෙන්ම ඉදගත්තා..

" අනේ මේ උඹ වගේ පුපට එළිය වැටෙනකල් නිදාගන්න මිනිස්සු නෙමේ අපි.."

" එහෙනම් කොහොම මිනිස්සුද.."

" අපි ඇවිල්ලා කැඩෙට් කරපු උදේම ඇහැරිලා කොළඹ හතේ පුරාම දුවපු ෆිට්නස්-"

" ආ ඇති ඇති හැමදාම එකම බනේ කියෝනවා.. ෆිට්නස් තියෙන එළකිරි වගේ කොල්ලෙක් කියලනෙ කියන්න ගියේ.."

" අන්න තමා.. හරියටම හරි.. උඹ උනත් බලපන් ඒක පිලිගන්නවනෙ.."

" ඇඹෙද් ඔව පිලිගත්තා.."

මම රධ්‍යා අයියගෙ ඔලුවට පාරක් ගහලා මම ප්‍රැක්ටිස් කරන්න ගෙනියන නයිකි බොටල් එක කටෙ ගහැන වතුර බිව්වා.. සෙනුකය අගිය අවුරුද්දෙ මගේ බර්ත්ඩේ එකට දුන්නු නයිකි බොටල් එක.. ඔය තියෙන්නෙ කිරි කිරි ටොයියා වගේ..

මම වතුර බීලා ඉවරවුනු ගමන් බොතලේ 'චූස්.....' ගාලා පිම්බිලා ගියා..

" ඉතින් ඉතින්.."

" විශේශයක් නෑ.. මම ආවා ඉතින්.. කම්මැලී ගෙදර.. අයියට අද ඔන්කෝල් ලු.."

" එහෙමද.. ආධ්‍ය අයියා හැමතිස්සෙම බිසී නේද.."

" මම.."

" එහෙම තමා ඉතින් ඩොක්ටර් කෙනෙක් වුනාම.. කැපවීමෙන් වැඩ කරන්න එපැයි.."

@Shan

" මේ ඒකනෙමෙ දැන් උඹත් ඩොකෙක් උනාම දවසෙම ගෙදර නැද්ද.. නයිට් කරන්නත් ඕනද.."

" ඇයි තවුසෙ හිතුවද මට විතරක් රජයෙන් වෙනම ඩේ හදලා දීලා නලවනවා කියලා.. අනික ඉතින් අපි මෙඩ්ඩො වෙයිද කවුද දන්නෙ.. මටනම් ඕන මගුලක්.. කැම්පස් යන්න තිබ්බොත් ඇති.."

" එහෙම කියලා බෑ.. උඹ මෙඩිසින් යන්න ඕන කොහොම හරි.."

" ම්ම්.. ම්ම්.. who knows what tomorrow brings.."

මම අත් දෙකත් දෙපැත්තට කල්ලා ඩෝන්ට් නෝ සයින් එකක් දුන්නහම රධ්‍ය අයියා හිනාවුනා..

" ඔය මදෑ ඕක දෙපැත්තට වැනුවා.. වරෙන් කන්න.. ඔහේ එනවා ඉස්තාලෙන් පැනපු අස්සයා වගේ.. උබට සිහියක් නෑ කන්න ඕන බොන්න ඕන.. බෙහෙත් ගන්න ඕන කියලා.."

" ආ ඉතින්.. බලන්නකො.. මගේ මොලේ ඩේටා වලින් පිරිලා තියෙන්නෙ.. ඔවා හිත හිත ඉන්න වෙලාවක් තියෙද.. නෑ.. ඒ වුනාට someone's වෙන්ඩ boyfriendට ඔවා ගානට තිතට මතකයි.. සෝ එයා මට හැමදාම කෝල් කල්ලා කියනවලුනෙ බෙහෙත් බොන්න කන්න කියලා.."

" එහෙමද.."

" එහෙමනෙ.."

මම නැගිටලා ගිහින් රධ්‍ය අයියා ගෙනාපු පේපර් බැග්ස් ටික උස්සගෙන ඇවිත් අපි දෙන්නගෙ මැද්දෙන් තියලා බිමින් ඉදගත්තා.. බිම වුඩන් ෆ්ලෝ එක ඒ සී නිසා කූල් වෙලා.. මුලු ක්ලබ් එකේම හිටියේ අපි දෙන්නා විතරක් නිසා අපි කතා කරද්දි හිනාවෙද්දි දෝංකාර දෙනවා..

" මම මේකෙන් ට්‍රයි කරන ෆස්ට් ටයිම්.. මම කලින් අපේ අයියා කිව්වහම හිතුවා ඔයත් එක්ක ගිහින් ට්‍රයි කරන ඕන කියලා.. දැන් ඉතින් මෙහෙ ආපු එකේ මම අරගෙනම ආවා.."

" ඔයා දැන් මේ එනගමන් ඇරබියන් නයිට්ස් එකට ගියාද.."

@Shan

" ම්ම්.."

" මම දන්න විදියට ඒකෙ කෑම හෙන ගනන්.."

" ඒ වුනාට කොලිටි.."

" ඒ වුනාට ගනන් නේ.."

" ඒ වුනාට රසයි නේ.."

" රස වුනාට.."

" ඇයි රස වුනාට??"

" ගනන් නේ.."

" කොහෙන් ගියත් කියවන්නෙ එකම එක.."

" අනේ මේ.. මට මොකෝ.. තවුසෙ ගේනවනම්.. මම කනවා.. තවුසෙ එක්ක හැමදාම ආගිව් කරන්න ගිහින් මට ඔලුව රදේ හැදෙනවා.."

" උබට ඔලුව රදේ හැදෙනවා.. මට පිස්සු හැදෙනවා.. කමක් නෑ කොහොමහරි කාපන් කට වහගෙන.."

" කට-"

" ආ ආ කට ඇරගෙන කාපන්.. අනේ අම්මපා වරද්.. උඹනම් මහ.."

" මොකෙක්ද මන්දා නේද.."

" අන්න හරි.. ඒක තමා.."

අපි කොච්චරටම කතාකරනවද කියනවනම් අනිත් එකා කියන්න කලින්ම කියන්නෙ මොකක්ද කියලා හිතෙනවා.. හුගක් වෙලාවට මම මොනාහරි කිව්වහමැඑකෙ ඉතුරු ටික කටපාඩමින් වගේ රඨ්‍ය අයියා කියනවා.. නැත්නම් ඌ බාගයක් කියද්දි මම ඉතුරු බාගෙ කියනවා.. කියාන් අයියා ඒකට නමක් හදාගෙන සෝල්මේට් ගෝල්ස් කියලා.. සෝල්මේට්ද

@Shan

මොකක්ද දන්නෙ නෑ..මටනම් හැමදාම මේකා ගැටපොලොස් කොට්ටෝරුවෙක්ම තමා.. පොඩ්ඩක්වත් වෙනස් වෙන්නෙ නෑ..

මම බෑග් එකේ තිබුනු කෑම ටික බිමින් දිගෑරලා තියලා කන්න ගත්තා..හැමදාම වගේ ඉන්ටවල් එකේ ප්‍රිෆෙක්ට් රූම් එක පැත්තෙන් ගියෝතින් දෙයියනේ කියලා ආධ්‍ය අයියගෙ බත් කටක් රධ්‍ය අයියට කියලා කවාගන්න පුලුවන්.. ඒ වුනාට ඒකෙ වැඩිය ඉන්න යන්නෙත් නෑ.. කොහොමත් ඉස්කෝලෙදි අපි කතාකරන්නෙ නැනෙ ලොකුවට.. දැක්කොත් පිටට තට්ටුවක් දාගෙන යනවා හිනාවෙනවා මිසක්.. ලොකු කතාබහක් නෑ ස්පෝර්ට්ස් මීට් කාලෙ වගේ..

අපි දෙන්නා කකුල් දෙකත් බැදගෙන මූණට මූණ බලාගෙන බිම ඉදගෙන කන්න ගත්තා.. ස්ටාර් රේටඩ් රෙස්ටොරන්ට් එකකින් ගෙනැල්ලා මෙහෙම බිම එලාගෙන මොක්කුද වගේ කන එකම එක උන් අපි වෙන්න ඇති.. කමක් නෑ එහෙමත් පොඩි ආතල් එකක් තියෙනවා..

" අම්මා පන්සල් ගියාද උදේ.."

" ම්ම්.. ගියා.. හවස හරි රෑ හරි ඒවි.."

" එහෙමද.. රෑ වෙන්න කලින් ගියාම ඇතිනෙ.."

" ඇති.. ඒත් ඉතින් මම කොහොමත් ක්ලබ් එකේ ඉදන් යන්නෙ ගෙදරටනෙ??"

" ගෙදරට යනවා කිව්වෙ කවුද.. ඇයි මතක නැද්ද මම කිව්වෙ ටෙලිපෝට් වුනොත් මම කියන ඕනම දෙයක් කරන්න ඕන කියලා.."

" ටෙලිපෝට් වුනා තමා.. ඇයි ඇයි මොකද.."

" ආ හරි හරි.. දැන් කොහෙද ඉතින් යන්නෙ.."

" ඒක ඉතින් හවසට කියන්නම්.. හදිසි වෙන්න ඕන නැනෙ.."

" ම්ම්.. ඒ මෙ මේක සිරාවාම පට්ටනෙ ඒයි.."

" මමත් කියන්න ගියේ.. මම හිතුවෙ නෑ මිඩ්ල් ඊස්ටර්න් කෑම මෙහේ මෙච්චර කොලිටි ඇති කියලා.."

@Shan

" ඒත් මරු.."

"ඒකනෙ උඹට මුලින් කිව්වෙ.. පටන් ගත්තනෙ හැල්ලක් කියවන්න.."

" හරි ඉතින් කවුද හිතුවෙ.."

රධ්‍ය අයියා ලූනු කොලයක් අරගෙන මගේ කටේ එබුවා.. හැමදාම ඔහොමයි හැලපයා.. දවසක් කරාබුනැට්ටක් කවලා ඉස්කෝලෙදි මම එතන තිබ්බ ලන්ච්ශීට් එක මූට කැව්වා.. අපි හරි සාමකාමීව ඉන්න මනුස්සයො දෙන්නෙක්..

කොහොම හරි කාලා බීලා ඉවරවෙද්දි ඌටයි මටයි හොඳ ගනන්.. යස බැඩ්මින්ටන් ජ්ලේ කිරිල්ල මගේ.. දැන් කාලා කාලා නැගිටගන්නත් බෑ.. මම කාපු බීපු සේරම ආයෙම බැග් එකට ඔබලා වුඩන් ෆ්ලෝ එකේම පතබෑවිලා හිටියා..

රධ්‍ය අයියා තියෙන පණ්ඩිතකමට ග්‍රීන් චිලී දාපු මොකක්ද එකක් කාලා මුළු මූනම රතු කරගෙන ඉන්නවා ඇස් දෙකේ කඳුලුත් පුරවගෙන.. මම කිව්වා ඕකට.. කන්න එපා තවුසෙට අමරු වෙයි කියලා.. කොහෙද උගෙත් ඉතින් මොලේ ඇගපුරාමනෙ.. හරි අමාරුයි දෙයක් කිව්වහම ඒක තේරුම් ගන්න..

" ඒ මේ වතුර ටිකක් බොන්න.. ඕක අඩුවෙලා යයි.."

" වතුර බොන්න ඉඩ නෑ බං.. දනවා..!!!"

" දනවනම් නටපං.. කිව්වා ගස් වැද්දට කන්න එපා එපා කියලා.."

" බනින්නෙ ඉතින්??"

" බනින්නෙ බොගෙ ඇග පුරාම මොලේ නිසා.."

මම රධ්‍ය අයියට පයින් එකක් ඇනගෙන නැගිටලා ගිහින් එලියෙ තිබ්බ වෙන්ඩින් මැශින් එකෙන් ස්ප්‍රයිට් එකක් අරගෙන ඇවිත් රධ්‍ය අයියට දුන්නහම ඒකා ඒක බීගෙන බීගෙන ගියා.. මරු මුගෙ ඇක්ටින්.. වතුර බොන්න ඉඩ නෑ.. ස්ප්‍රයිට් කෑන් එකක් ඇදලා දාන්න ඉඩ තියෙනවා.. මහ ප# ඉඩක් තමා ඒක..

" තැන්ක් යූ.."

@Shan

" ෆක් යූ.."

මම රධ්‍ය අයියට එතනම වැටිලා ඉදපන් කියල මැද ඇඟිලි දෙකමපෙන්නගෙන ගිහින් ශුටින් මැශින් එක මීඩියම් ස්පීඩ් දාගෙන ප්ලේ කලා.. ඒ වුනාට කාපු ගමන් නිසා හෙන නිදිමතකුත් එනවා.. මම පැයක් විතර ප්ලේ කරනකල් රධ්‍ය අයියා නැගිට්න්නෙවත් නැතුව බිම ඉදගෙන කොරියන් ඩ්‍රාමා එකක් බලනවා හිනාවෙවී.. මරු.. සුපර්මැන් ගොට් නතින් ටු මී ඇම් ඔන්ලි වන් කෝල් අවෙ.. යැයි යැයි තමා..ඇවිත් තියෙන්නෙ ෆ්‍රී වයි ෆයි වලින් නෙට්ෆ්ලික්ස් බලන්න..

මම ශටල්කොක් එකක් උඩ දාලා රැකට් එකෙන් දුන්නා ගිහින් රධ්‍ය අයියගෙ මූණ මැද්දටම වදින්න..

" මොකද බං.."

" මෙහෙ ඇවිත් මාත් එක්ක ප්ලේ කරපන්.. දපලා ඉන්නවා පිඹුරා වගේ.."

" ආර්හ්!!.. හිටපන් හිටපන්.."

රධ්‍ය අයියා ෆෝන් එක පැත්තකින් තියලා ඇවිත් ශුටින් මැශින් එක අයින් කල්ලා එයා ප්ලේ කරන්න ගත්තා.. එතකොටනෙ කික් එකක් තියෙන්නෙ.. එහෙට මෙහෙම පැන පැන ලඃයි මායි ඉස්සො දෙන්නෙක් වගෙ ප්ලේ කලා.. රධ්‍ය අයියට ලොකුවටම බෑ ඇයි ඉතින් රාත්තල් ගානක් ගිලලා වැනි වැනිනෙ හිටියේ.. අපි දෙන්නා හවස හතර වෙනකල්ම ප්ලේ කලා.. හති වැටිලා මස්ල්ස් ලොක් වෙනකල්ම.. ඒක ජොලි වැඩේ.. මට මේ සතියටම ලොකු වෙලාවක් යනකල් පරණ මොකුත්ම මතක් වුනේ නෑ.. හිටියේ හුගක් සතුටින්.. මේ කාමරේ ඇතුලෙ විතරක්ම හිත තියාගෙන ඉදියා.. අන්තිමෙ 'දැන් ඇති දැන් ඇති' කියාගෙන රධ්‍ය අයියා රැකට් එක නෙට් එක දිහාට විසික් කරගෙන බිම හාන්සි වුනා.. හොදටම මහන්සී.. හති වැටෙනවා හිටු කියලා.. මමත් රැකට් එක බිමින් තියලා ඉනට අත් දෙක ගහගෙන නැමිලා පොඩ්ඩක් බ්‍රීත් කලා..

" මෙහෙ වරෙන්.."

රධ්‍ය අයියා එයා ගාවින් බිමට තට්ටුවක් දාලා මට එන්න කිව්වහම මම එතනට ගිහින් පොඩ්ඩක් හාන්සි වුනා.. මගේ කොණ්ඩෙ දාඩියට නළලට වැටිලා වතුර වගේ තෙතම තෙත වෙලා..

@Shan

" මම්ම්.. මොකෝ.."

අර මගේ ස්පෝර්ට්ස් බෑග් එකේ සුදු පාට මගේ ශර්ට් එකක් ඇති.. ඒක දාගෙන මූණ හෝදන් එන්න ගමනක් යමු..

" කොහෙද.. පන්සල්??"

" මම්.. ගිහින් එමු.. අද පෝයත් නෙ.."

" මරුනෙ.. මම හෙන කල් ඉඳලා හිත හිත හිටියෙ යන්න.. ඉතින් වෙලාවක් උනේ නෑනෙ..."

" මම හිතුවා.. යන්න.. ඉක්මනට ගිහින් මූණ හොදන් ඇඳුම් මාරු කරන් එන්න.."

" හා.."

මම කොණ්ඩෙත් අතින් පිටිපස්සට කරගෙන නැගිටලා ශර්ට් එකත් අරගෙන රෙස්ට් රූම් එකට ගිහින් එද්දි රධ්‍ය අයියත් බොටමට වෙන සුදු ශර්ට් එකක් දාගෙන එළියෙන් ඉන්නවා..

" යමු..??"

" යමු.."

මම දැනගෙන හිටියෙ නෑ අපි කොහේ පන්සලටද යන්නෙ කියලා.. කොහොම වුනත් ඉතින් යන එක හොදයි..

" අපි කැළණි ද යන්නෙ.."

රධ්‍ය අයියා කාර් එක ඒ පැත්තට හරවද්දි මම පුදුම වුනා.. මෙහෙ ඉදලත් මම මේ යනනෙ හෙන කාලෙකින්.. අද නම් හෙනට සෙනග ඇති..

" මම්.. මම කාලෙකින් ගියේම නෑ.."

" මමත්.. මම හිතුවේ දුර නිසා ඒ පැත්තෙ එකකට යයි කියලා.."

@Shan

අපි කැළණි පන්සලට ඇවිත් කාර් එක පාක් කල්ලා ඇතුළට ඇවිදගෙන ආවා..

පන්සලක් කියන්නෙ.. ඒක බෞද්ධ අපිට ගේන්නෙ වෙනමම හුරුපුරුදු හැඟීමක්.. ඒක හරියට කැතලික් කෙනෙක් පල්ලියට ගිහින් අල්තාරෙ දිහා බලද්දි දැනෙන ඒ පිරිසිදු හැඟීමමයි.. වෙනසකට තියෙන්නෙ.. ඒක පල්ලියක්..මේක පන්සල..

පන්සල් මළුවට යන ලොකු පඩිපෙළ ගාවදි මම අර කිව්ව හිත නිවෙන පුදුමාකාර හඳුන්කූරු සුවඳ මට හුඟක් හොඳට දැනුනා.. ඉබේම හිත හේදිලා යනවා වගේ.. එතකොට වෙලාව හයට ඇති.. හැන්දෑ කළුවර හතර අතේ වහගන්නකොට ඒ සමානවම මගේ හිතෙත් අමුතු සැහැල්ලුවක් පාවෙගෙන ඇවිත් වගහත්තා..

රධ්‍ය අයියයි මමයි රෝස පාට නෙළුම් මල් මිටියක් අරගෙන දෙකට බෙදාගෙන ඇතුළට අඩිය තිබ්බා.. මළුවේ ලාවට තෙත වැලි මගේ කකුලේ යන්තමින් එරුණා..සෙනග ලෝකයක්.. සුදු පිරුවට ඇඳගෙන.. සමහරු ප්‍රෙග්නට්.. සමහරු ළමයි එක්ක.. යාලුවො එක්ක.. තනියම.. ආදරේ කරන කෙනා එක්ක.. අම්මලා තාත්තලා පවුල් එක්ක පන්සල් ඇවිත් ඉදියා.. කොච්චරවත් සෙනග හිටියත්.. හිතට දැනෙන්නෙම අර පන්සලටක ආවහම දැනෙන අමුතු පාළුවම තමයි..

මමයි රධ්‍ය අයියයි බුදු කුටියට ඇවිත් මල් වල නටු කඩලා ඒවා භාජනේකට දාලා මල් ආසනේට මල් තියලා වැන්දා.. අපි මල් වලට අත ගහද්දි එතන ඉදපු මැදිවයසෙ මනුස්සයෙක් අමුතු විදියට අපේ අත් දිහා බලාගෙන ඉදලා යන්න ගියා.. එතකොටයි මට මතක් වුනේ අපේ අත් දෙකේම හෝලි ක්‍රොස් ගහපු රින්ග් දෙකක් තියෙන වග.ඒ වුනාට ඉතින් අපේ ආගමේ අයට විතරද පන්සල් එන්න හොඳ.. බුදුහාමුදුරුවො එහෙම දේශනා කල්ලා නැහැනෙ.. ඕන කෙනෙක්ට දොරටුව විවෘත්තයි කියලනෙ කියන්නෙ..

අපි දෙන්නා වැඳලා පහන් පත්තු කරා.. පහන් වැට ගාව ඉතින් ගිනිගන්නවා වගේ.. රස්නෙම රස්නෙයි.. අර යකඩ රත් වෙලා අත ගැවුනොත් එහෙම පිච්චිලාම යනවා.. අපි දුරින් තිබ්බ පහන් වැටි දෙකක් පත්තු කල්ලා නිවෙන්න ගිය පහන් වලට තෙල් දැම්මා.. ආවත් හරි අපි දෙන්නටම කතාකරන්න තරම් සිහියක් තිබුනෙ නෑ..

@Shan

රධ්‍ය අයියා එයාඑ පහන් වැටියට තෙල් දාලා පත්තු කල්ලා ඇවිත් මට පිටිපස්සෙන් හිටගෙන මම ගිනිගන්න පහනක් එක්ක ඔට්ටු වෙන හැටි බලාගෙන හිටියා.. ඒ පහනෙ තෙල් ඉවරවෙලා.. තිරේ ගිනිගන්නවා.. අල්ලන්නවත් බෑ..

" පුච්චගන්න එපා.."

රධ්‍ය අයියා එහායින් තිබ්බ පහනක් අරගෙන ඇවිත් ඒ පහන උඩින් දාලා ඒකට තෙල් දාලා පහන්තිරයක් ගිල්ලලා මම පත්තු කරනකල් බලාගෙන හිටියා.. මම ගිනිකූරක් ගහලා පහන පත්තු කරද්දි එයා අත් දෙකින් ඒක වගහෙන දැල්ල නිවෙන්න නොදී අල්ලගෙනම හිටියා.. අපේ ඇඟිලි තුඩු ගෑවෙන නොගෑවෙන දුරකින් තිබුනත්.. හිත හරියට ගැස්ස්සෙනවා.. හරියටම මගේ හිතේ එයා ගැන හැඟීමක් ඇනිච්ච මුල්ම දවස වගේ..

පහන් දැල්ලේ එළි ගොඩාක්, අපි දෙන්නගෙම මූණු තැඹිලිපාට කල්ලා.. එයා හදිසියෙම පහනෙන් ඇස් අහක් කල්ලා මගේ මූණ දිහා බලද්දි මට ලාවට හිනා ගියා.. ඒත් මම පහන දිහාම බලාගෙන හිටියා මිසක් එයා දිහා බලන්න ගියේ නෑ.. ඒත් මට දැනෙනවා.. එයා බලාගෙනම ඉන්නවා.. පහන පත්තු වුනායින් පස්සෙ මම ගිනිකූර ගසලා අහක් කල්ලා මගේ මූණ එයාගෙ පැත්තට හැරෙව්වහම එයාගෙ ඇස් ගැස්සිලා ගිහින් එකපාරටම පපුවට පාරක් ගහගෙන මගෙන් අයින් වුනා.. මට ඒකට හිනා ගියා..

ඊටපස්සෙ අපි ඔහේ නිකම් ඇවිදගෙන ඇවිත් බෝ මළුවේ කොනකින් වගේ වාඩිවෙලා ඉදියා.. රධ්‍ය අයියා සැරෙන් සැරේ පපුවට ගහගන්නවා..

" අද ආපු එකනම් හොදයි.. මට හිතට ලොකු සැහැල්ලුවක් දැනෙනවා.."

" ම්ම්.. මම නිකමට හිතුවා.. කැමැත්තෙන් ඇති කියලා.. සැහැල්ලුවක් දැනුනනම් හොදයි.."

" මෙතනින් පිට ලෝකෙත් මෙහෙම සාමකාමි වෙනවනම්.. මට යන්න හිතෙන්නෙ නෑ.."

"..."

" ඔයා මට මේ කරන දේවල් ඕනවටත් වැඩියි අයියෙ.."

@Shan

" මම මොනවද කලේ??"

" ඔයා මොනවද නොකලේ??"

" මට හිතෙනවා.. මම වෙනස්වෙලා වගේ කියලා.. අපේ අම්මත් කිව්වා.."

" ම්ම්.."

" මිනිස්සු ආදරේ කරනකොට ඉබේම වෙනස්වෙනවා වරද්.. කොයි කාටත් එහෙම තමා.."

" මමනම් කියන්නෙ.. මේ ලෝකෙ තියන හැම දෙයක්ම.. දවසකටවත් ආදරේ ලබන්න ඕන.."

" ම්ම්.."

" මටනම් මෙහෙම ඉද්දි බය හිතෙනවා.. කොයි මොහොතෙ මොනවා වෙයිද කියන්න අපි දන්නෙ නැහැනෙ.. ඕනම දෙයක් වෙනස් වෙන්න යන්නෙ තප්පරයයි.."

" කොයි මොහොතෙ මොනවා වුනත් මේ මොහොතේ මට ඕනෙ උබත් එක්ක ඉන්න.. ගෙදර ගියාම පාළු හිතෙනවා වරද්.. මම හිතන්නෙ-"

" ම්ම්??"

" නෑ නෑ මොකුත් නෑ.."

" මගින් කියලා නවත්තන්න එපා අනේ.. ඉතුරුටිකත් කියන්න.."

" නෑ මම කියන්න ගියේ.. මට දැනටමත් එහෙම හෝම් ෆීලින් එකක් ඇතිවෙලාද කොහෙද.."

" ඇත්තට.. දැන් ඔයාගෙ හෝම් ෆීලින් එක මොනවගේ එකක්ද.."

" අනේ මන්දා.. දකිද්දි සතුටු හිතෙනවා.. පරිස්සම් කරගන්න ඕන.. කොයි ලෝකෙක හිටියත් ආපහු එන්න ඕන.. ඒකටනෙ හෝම් ෆීලින් එකක් කියන්නෙ.."

@Shan

" ඉතින් එහෙම දැනෙනවද.."

" ම්ම්.."

රධ්‍ය අයියා බෝ මළුවෙ තියෙන බෝ ගහ දිහා බලාගෙන ලොකු හුස්මක් පහළ දැම්මා..

" දැන් ඔයා කැම්පස් ගියාම අලුත් හෝමියෙක් සෙට් වෙයිද.. එහෙම වුනොත් එහෙම??"

මම විහිලුවෙන් ඇහුවත් මම ඇහුවෙ මගේ හිතේ තියෙන පොඩි බයහිතෙන කාරනාවක්.. හුගක් අය කියනවා කැම්පස් ගියාම ඔිවා වෙනස් වෙනලු.. අරවා.. මේවා.. මට හිතට තියෙන ලොකුම අවුලක් වෙලා තිබුනත් අහන්න විදියක් නැති ප්‍රශ්නයක් ඒක..

" උඹ අහලා තියෙනවද Love can touch us one time.. And last for a lifetime.. කියලා එකක්.."

" ම්ම්.. තියෙනවා.. ඒ වුනාට ඉතින් ආදරේ හැමෝටම පලවෙනි වතාවම හරියන්නෙ නැනෙ.. හුගක් වෙලාවට නෑ.."

" පලවෙනි ආදරෙයි, ඇත්තම ආදරෙයි දෙකක් වරද්.. අපි හිතනවා ජීවිතේට එන හැම කෙනාම එන්නෙ ආදරේ දෝතින් අරගෙන කියලා.. එහෙම ලබ්බක් නෙමෙ.. හුගක් අය එන්නෙ එක්කො රිප්ලේස් කරගන්න.. නැත්නම් තමන්ට මොකක් හරි වාසියක් බලාගෙන.."

" ඒකනම් සිරා කතාව.. දැන් බලන්න කවුරුහරි ඉන්නවා කියලා හිතමු කෙනෙක් එයාට එයාගෙ හිතේ තියෙන දේවල් කියන්න කවුරුත්ම නෑ.. එයාට ඒ දේවල් කියන්න කෙනෙක් ඕන.. කියලා.. ඊටපස්සෙ ආදරේ කරන්න  කෙනෙක් හොයාගෙන ඒ දේවල් කියනවා.. එතනම දෙයක් බලාපොරොත්තු වෙලානෙ..ඒ එයා කියන දේවල් අහන් ඉන්න කෙනෙක්.."

" ම්ම්.. මම ආදරේ ගැන මෙලෝ මගුලක් දන්න එකෙක් නෙමෙයි වරද්.. මුලු ජීවිත කාලෙටම එකම එකයි හිතේ තියාගෙන හිටියේ.. ඌ අද මං ගාව ඉන්නවා.. වගේම මම ඌ නිසා හෙනට දේවල් ඉගනගන්නවා.. ඒ හැම

@Shan

පාඩමක්ම මාරයි.. මටම හිතෙනවා මම මවාගෙන උන්නු ජීවිතේ මහ විකාර ෆැන්ටසියක් කියලා..

මට කියලා දීපු ලොකුම පාඩම තමයි හීනාවෙලා ඉන හැම මනුස්සයම සතුටින් ඉන්නෙ නෑ කියන එක.. ඉතින් මම ට්‍රයි කරනවා හැමතිස්සෙම උගේ ලගින් ඉන්න.. හරි පුදුමයි.. මම මොකුත් අනිත්පැත්තට බලාපොරොත්තු වෙන්නෙත් නෑ.. ඒකයි මම කිව්වෙ.. මම වෙනස් වේගෙන යනවා මටම දැනෙනවා කියලා.. ඒකනම් අර උඹ කිව්වා වගේ කතාවක් තමා.. මේ ලෝකෙ තියන හැම දෙයක්ම දවසකට හරි ආදරේ ලබන්න ඕන තමයි.."

" මම්.. ඔයා කතාකරද්දි අහන් ඉන්න ආසයි.."

රධ්‍ය අයියා මගේ අතේ තිබ්බ මුද්ද ලාවට අල්ලලා කැරකුවා.. ඊටපස්සෙ මගේ අගිලි වල එයාගෙ ඇගිලි පටලගත්තා.. හැමතිස්සෙම කරනවා වගේ..

" අපි යමු.. අම්මා එන්නත් වෙලා.."

අවසානේ මුළු දවසකට පස්සේ අපි ගෙදර එන්න ආවා.. රධ්‍ය අයියත් අපේ ආච්චිඅම්මා කිව්ව වගේ හිතේ ආදරේ හංගගෙන ඉන්න පුදුමාකාර මනුස්සයෙක් කියලා මට දහස් වෙනි වතාවටත් ඔප්පු කරලා පෙන්නුවා.. මට මේ ගෙවෙන ජීවිතෙ කොච්චර කරදර ආවත් සැනසීමක් තියෙනවා.. හයියක් තියෙනවා.. ඒක මගේ හදවතේ ගැඹුරුම තැනට දැනෙනවා.. ගෙදරින් යද්දි තිබ්බ කලකිරීම තවදුරටත් මට දැනුනේ හරි අඩුවෙන්.. මගේ ඩයරියේ අන්තිම පිටුවෙ ලියවිලා තියෙනවා වගේ මට හිතෙන්නෙම වරද් කියන්නෙ ගිනිගොඩක් නම් රධ්‍ය කියන්නෙ වැහි වලාවක්.. ලගින් ඉදියත් දැනුනේ හරිම නිමෙන ගතියක්..

" පරිස්සමින්.. රෑ වෙලා පාඩම් කරන්න.. බුදුසරණයි.."

" පරිස්සමට යන්න ඔයත්.. බුදුසරණයි.."

රධ්‍ය අයියා වාහනේ ගේට්ටුව ඉස්සරහින් නතර කල්ලා තිබුනා.. අම්මෙ ගෙදර ඇවිත් නෑ.. ඒකනෙ ලයිට් දාලා නැත්තෙ..

මම සීට් බෙල්ට් එක ගලවලා බහින්න යද්දි රධ්‍ය අයියා මගේ අතකින් අල්ලගෙන මහපට ඇගිල්ලෙන් මගේ අත ලාවට අතගාලා මගේ දිහාට

@Shan

නැමිලා මගේ නලලෙ පැත්තකින් දැනෙන්න නොදැනෙන්න හාදුවක් තිව්වා.. ඒක නිකම් හරියට.. මලකට වහන සමනලයෙක්ගෙ ඇගේ මල් රේනු ගෑවෙනවා වගේ.. හාදුව මගේ නලලේ තැවරුනා..

" යන්නම්..~"

මම කාර් එකෙන් බැහැලා ගේට්ටුව ඇරගෙන ගේ ඇතුලට යද්දි රධ්‍ය අයියා යන්න ගියා..

අද වැඩ පොඩ්ඩක් වැඩි වුනානෙ ලමයිනෙ.. ඕතරී ගෙදර ඇවිත් අස් කලානෙ.. ඒකයි පරක්කු.. හැබැයි පොඩ්ඩක් දිගට ලිව්වා..

අයුක සෙනුක

රධ්‍ය වරද්

හතරදෙනාගෙම ආදර කතා යන්නෙ එච්චර ලස්සන පාරවල් වල නෙමෙ ලමයි.. හැමදේම පටන් ගද්දි සුන්දරයි.. ඉතින් මට හිතුනොත් පොඩි කතාවක් විදියට සයිඩ් ශිප් එක වෙනම ලියනවා.. මට මගේ ආදරෙ හිතෙන රීඩර්කෙනෙක් එහෙම ඉල්ලලා තිබුනු නිසා.. බලමුකො..

එන්නාම්.. ලව් යූ ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 51 කොටස

" ඒ ළමයා හොඳට හැදුණු දරුවෙක්නම් තමයි.. මටනම් දැක්ක ගමන්ම හිතුනා.."

" මම.."

අපේ අම්මා කෑම කන ගමන් රධ්‍ය අයියව මතක් කලා.. අම්මට ලොකු පැහැදීමක් රධ්‍ය අයියා ගැන මුල ඉඳන්ම තිබුන බව මට දැනිලා තිබුනා.. ඒ වුනාට මෙවගෙ ඇත්ත තත්වෙ දැනගත්තු දවසක මේ පැහැදීම මේ වගේම තියෙයිද කියලා මම දන්නෙ නෑ..

" කැළණියෙ හුගක් සෙනග ඉන්න ඇති නේද සුදුමහත්තයො.."

" ඔව් අම්මෙ.. හිටියා හුගක්.. ඒ වුනාට පොඩ්ඩක් ගිහින් ආපු එකනම් හිතට හොඳයි.."

" ඔව් මේ දවස් ටිකේම මූණ එල්ලගත්තු ගමන්මනෙ.. දැන් නම් ඔන්න යන්තම් හිනාවක් පේනවා.."

" මම්.. අම්මෙ ඒකනෙමේ.. නිකමට හිතන්නකො.. කවදහරි අම්මා ආයෙම මැරි කලොත්.. හොඳයි වගේ නැද්ද.."

" කසාද බදින්න..?? මේ මම.. අර මොකටද.."

" නෑ මම නිකම හිතිලා ඇහුවේ.. ගනන් ගන්න එපා.."

" ඒකමිසක්.. අටල්පහුරු අහනවා.."

මම අම්මට හිනාවෙලා පිගානත් අරගෙන කුස්සියට ගිහින් සින්ක් එකේ තිබ්බ වලං දෙකතුනත් සෝදලා නවලා කාමරේට එන්න ආවා..

මට නිකමට හිතෙනවා.. අම්මට ආයෙම කසාද බැන්දොත් ජීවිතේට වටිනාකමක් එකතු වෙයි කියලා.. ඒත් හැමදේම ගහෙන් ගෙඩි එනවා වගේ කරන්න බැහැනෙ.. මට අම්මව මගේ පණ රැකිලා තියෙන තාක්කල් ඇහැක් වගේ බලාගන්න පුලුවන්.. ඒත් අම්මටත් ජීවිතේ එක මිටක් අතෑරිලනෙ

@Shan

තියෙන්නෙ.. හිතට දවසින් දවස හීන ගොඩගැහෙනවා.. කැම්පස්ම ගිය පලියට මදි කියලා ඒ ලෙවෙල් වලට මාස පහමාරක් වගේ තියෙන මේ කාලෙදි හොදටම දැනුනා.. හීන තිබ්බත් වදේ නොතිබ්බත් වදේ..

රධ්‍ය අයියලගෙ රිසාල්ට්ස් මේ සතියේ අවුට් වෙනවා කියලා කතාවක් කියනවා.. එයා නම් ලොකු බලාපොරොත්තුවකින් ඉන්නෙ හොද රෑන්ක් එකක් ඒවි කියලා.. එයාටත් වඩා එයාගෙ අප්පච්චි.. අප්පච්චි ඉන්නෙ රධ්‍ය අයියා කරන කියන හැමදෙයක්ම හොදට බලාගෙන.. ආධ්‍ය අයියට වඩා අප්පච්චි හොයලා බලන්නෙ රධ්‍ය අයියා ගැන.. මොකුත් නිසා නෙමෙයි.. ආධ්‍ය අයියනම් අම්මලා අප්පච්චිලා කියන දේ අහගෙන පාඩුවේ ඉන්නවා.. ඒත් රධ්‍ය අයියා එහෙම නෙමෙයිනෙ.. එයා මුරන්ඩුයි..

ඉතින් අප්පච්චි හැමතිස්සෙම කියන්නෙ මුරණ්ඩුකමලු කවදහරි එයාගෙ විනාසෙට මුල් වෙන්නෙ.. සමහරවිට එයාලා කියන කතාවෙ ඇත්තක් තියෙනවද දන්නෙ නෑ.. මටනම් හිතුනෙ ඔය කියන තරමට රධ්‍ය අයියා මුරන්ඩු නෑ.. එයා අකමැති ජීවිතේට අනවශ්‍ය විදියට බලපෑම් කරන එකට විතරයි.. නැත්නම් හිතේ අප්පච්චිගැන ලෙන්ගතු හැගීමක් තියෙනවා.. නැත්තෙ නෑ.. එයාලා විහින්ම රධ්‍ය අයියට කියලා එයාලවම එපා කරගන්නවා.. ගහකට කොළේකට වුනත් ආදරේ දුන්නොත් තමා අපිට ඒකෙන් මලක් පලතුරක් හරි ලැබෙන්නෙ.. සතෙක්ට වුනත් ආදරෙන් සැලකුවොත් තමා උන් අපිට ලෙන්ගතු වෙන්නෙ.. ඕක තේරුම් ගන්න මිනිස්සු අඩු එකයි ප්‍රශ්නෙ..

මම රෑ දෙකහමාර විතර වෙනකල්ම පාඩම් කරලා පහුවදා ඉස්කෝලෙ යන්න බෑග් එකත් හදලා නිදාගන්න ගියා.. රධ්‍ය අයියට මහන්සී කියලා කලින් නිදාගන්න ගිහින් තිබුනා.. මටත් අද දවල් මහන්සි වුනු නිසා ඉක්මනින්ම නින්ද ගියා..

පහුවදා ඉස්කෝලෙට ඇවිත් තුන්වෙනි පීරියඩ් එකේ මම පහළට යද්දි රධ්‍ය අයියා කැඩෙට් යුනිෆෝම් එකත් ඇදගෙන මෙන්හෝල් එක පැත්තට යනවා.. එයාලට අද මොකක් හරි ඉවෙන්ට් එකක් තියෙනවා කියලා මට ඊයේ කියලා තිබ්බට මම කැඩෙට්ින් ගැන ලොකුවට මොකුත් දන්නෙ නෑ.. මොකක් හරි අලුත් අයට බැජ් දෙනවා වගේ එකක්..

රධ්‍ය අයියට ඒ යුනිෆෝම් එක මරුවට ගැලපෙනවා.. බූට්ස් දෙකයි ඇගට ෆිට් වෙන යුනිෆෝම් එකයි ඒකෙ ගහලා තියෙන එක එක ජාතියෙ බැජ්

@Shan

ගොඩයි.. මාරම ලස්සනයි.. මම කීප වතාවක් විතරයි එයා ඔහොම ඇඳගෙන ඉන්නවා දැකලා තියෙන්නෙ.. ඒක ඇඳලා ගිරිය පලාගෙන මාව පාස්ට කරද්දි මම ග්‍රවුන්ඩ් එකේ ඉදන් බලාගෙන ඉදලා තියෙනවා..

රධ්‍ය අයියා ඇත තියලා මාව දැකලා නැවතිලා මට ලගට එන්න කියලා කතාකලා.. එයා ඉතින් හදිසියෙ ගියාට මට හදිසියක් නැනෙ.. මම ඉතින් කකුල් දෙකත් අද්ද අද්ද හිමින් සැරේ රධ්‍ය අයියට කිට්ටු කලා.. බූට්ස් දෙක දැම්මහම මෙකා උසයිනෙ.. ලග ඉන්න මම කොටයි වගේ හිතෙනවා..

" මොකද එළියෙ කරන්නෙ.. දැන් මොකුත් නැද්ද.."

" ඉංග්ලිශ් තියෙන්නෙ.. මැඩම් අද එන්නෙ නැහැල්ලු.."

" එහෙමද.. එළියෙ කරක් ගහන්නැතුව ගිහින් පන්තියෙන් හිටපන්.. පොතක් පතක් බලාගෙන.."

" පොතක් පතක් බලාගන්න තිබ්බා.. සෙනුකයා වගේ පාප මිත්‍ර සේවනයක් මට නොතිබ්බනම්.. ඌට අයුක අයියව හම්බෙන්නෝන කිව්ව නිසා මට එළියෙ තනි රක්කින වුනා.."

" කෝ අයුක දැන්.."

" අර ලැබ් එකට එහාපැත්තෙ ඉන්නවා කණුවක් බදාගෙන.."

" මම.."

" ඔයා අර ඉවෙන්ට් එකට යන ගමන්ද.."

" ඔව්.. උඹට අද විතරයි මම මෙ යුනිෆෝම් එකෙන් බලාගන්න පුලුවන්.. ආයෙ කිසිම දවසක නෑ.."

" එතකොට ආයෙම ඔයා කැඩෙට්න් කරන්නෙ නැද්ද.."

" නෑ අදින් මගේ වැඩ ඉවරයි.. මගේ තැනට වෙන කෙනෙක් ඒවි.."

" ඔයාලා තව ටික දවසයි නේද ඉස්කෝලෙ එන්නෙ.. අපි ඒ ලෙවෙල් කලාම එන්නෙ නැනෙ.."

@Shan

" ම්ම්.. එහෙම තමා.. අවුරුදු දහතුනකුයි තව වැඩිපුර අවුරුද්දකුයි අපි පුලුවන් තරම් ඉස්කෝලෙට වැඩ කලානෙ වරද්.. ඊළඟට එන අයට ඉඩ දීලා අපිට යන්න වෙනවා.."

" අවුරුද්ද අද ඊයෙ පටන් ගත්තා වගේ දැනෙන්නෙ.."

" මටත්.. අද හවසට ඔයා කලින් ගෙදර යනවද.."

" එහෙම තමා හිතාගෙන ඉන්නෙ.. ඔයා එන්න හවස් වෙනවනෙ.. ක්ලාසුත් නෑ.."

" ස්කූල් බස් එකේ යන්න.. පාරෙ බස් වල යන්න ඕන නැනෙ.. මම රැට කතාකරන්නම්.."

" හා.. මම යන්නම්.. සෙනුකයා මොකක් කරනවද දන්නෙ නෑ.."

" ම්ම්.. පරිස්සමට යන්න.."

" හරී~"

මම රධ්‍ය අයියා යනකල් ඉදලා ආපහු එන්න ආවා.. සෙනුකයා එළියෙ ඉන්නවා නියපොත්තකුත් හපාගෙන.. අපි හිටියේ කොමස් සෙක්ශන් එක ඉස්සරහා..

ආර්ථිකය ගැන හෙන හැලි ගොඩක් කඩ්ඩෙන් ගහපු අපේ ඉස්කෝලෙ කොමස් සෙක්ශන් එක.. අයුක අයියගෙයි කියාන් අයියගෙයි ඉස්සර ක්ලාස් තිබ්බෙ මෙහේ.. රධ්‍ය අයියා විතරයි මැත්ස් කලේ.. උන් කොහොම සබ්ජෙක්ට් තෝරගත්තත් හැමදාම හොදම යාලුවො තමා.. ඒක කොහොමටවත් වෙනස් වෙන්නෙම නෑ.. අපි කොමස් සෙක්ශන් එක ගාව දාලා තිබ්බ බංකුවකින් ඉදගත්තා.. සෙනුකයා නියපොතු හපන්නෙ ඌ මොකක් හරි ගැන සීරියස් හිතද්දි තමා.. මම දන්න තරමට එහෙව් සීරියස් ප්‍රශ්න මූට ඇත්තෙම නෑ..

" මොකෝ.."

" ෂනෙරුවා.. බං.. මම මෙහෙම කිව්වට මොකුත් හිතන්න එපා.. ඒ වුණාට.. උඹට හිතෙන්නෙ නැද්ද බං.. නෑ එක්කො ඕන නෑ.. අපි ඒ ගැන කතා

@Shan

නොකර ඉමු.."

" නෑ නෑ කියපු එක ඉවර කරපන්.. ගොත ගහන්නැතුව.."

" ෂනෙරුවා.. මට බයයි බං.."

" ඒ මොකද ඒ බය.."

" අයුක අයියා.. අනේ මන්දා.. මම අයුක අයියට ආදරෙයි තමා.. ඒ වුණාට.. අපි මේ යන පාර හරිද බං.. මගෙ හිතට ලගකදි ඉදන් හොදක් දැනෙන්නෙ නෑ.. මොකක්ද බයක් දැනෙනවා.."

" ඒ කිව්වෙ.."

" ඒ කිව්වෙ බං.. මට උඹට හංගන්න දේවල් නෑ උඹ දන්නවනෙ.. අපේ ගෙවල්.. හිතන පතන විදිය.. අනික අපි මේ හෙනට තියෙන කියන මිනිස්සු නෙමේනෙ බං.. මට හැමදාම අයුක අයියා එක්ක කතාකල්ලා එද්දි හිතට අමුතු බයක් දැනෙනවා.."

" මම.. උඹ කියන කතාවෙ ඇත්තක් නැත්තෙ නෑ තමයි.."

" අනික මේ දවස්වල ප්‍රශ්ණ ප්‍රශ්ණ ඉවරයක් නැතුව.. මේවා කොහෙන් ඉවරවෙයිද හිතාගන්න බෑ.. දැනටම මේකෙ අපි පැටලිලා ඉවරයිනෙ.."

" මම ඕක ගැන හිතනවා බං.. හැමතිස්සෙම හිතේ තියෙනවා.. ඒත් ඔක්කොම දමලා ගහලා අතෑරලා දාන්න උඹයි මමයි හුගක් දුර ඇවිත් වැඩී කියලා හිතෙන්නැද්ද.."

" ඒකම තමා මටත් තියන ප්‍රශ්නෙ.. උඹයි රධ්‍ය අයියයි යාලුවෙලා නෑ කියමු.. ඒත් ඌ කරන දේවල් වලට කොහොමද බං කටක් ඇරලා මෙ දේවල් කියන්නෙ.. අයුක අයියත් එහෙමයි.. මට පව් පිරෙනව බං.. මේ කරන දේවල් වලට.."

සෙනුකයා කටහඩ බිදීගෙන එද්දි ඉක්මනට අහක බලාගත්තා..

" සෙනුකයා.. උඹට මම ඉන්නවා.. අපි දන්නෙ නැනෙ.. අපේ ජීවිත වලට කොහොම ප්‍රශ්න ඒවිද කියලා..දැන් කරන්න තියෙන එකම දේ.. වෙන දේකට ඒ වෙලාවට මූණ දෙන එක විතරයි.."

@Shan

" එක අතකින් මෙහෙම විදවනවට වඩා මැරිලා යනවනම් ඒකත් එකක් බං.. මට වෙලාවකට එහෙමත් හිතෙනවා.. අපේ ගෙවල් මේවා දැනගත්තොත් මට ශුවර්.. මාව නම් පන්නලාම දාවි.. අනිවාරෙන්ම ඒක තමා වෙන්නෙ.."

" මේ පිස්සු දොඩවන්න එපා හු#තො.. උඹට මම ඉන්නකල් එහෙම මැරෙන්න පුලුවන්ද.. පිස්සු පකෙක් වගේ කියවන්නැතුව වෙන දේකට මූණ දෙමු.. උඹ ගෙදරින් පැන්නුවා කියලා යන එන මං නැති වෙන්නැනෙ.. උඹට මම යාලුවෙක් වගේ නෙමේද පේන්නෙ.."

" ඉක්මනට මේ කරුමක්කාර විභාගෙ ඉවර වෙනවනම් හොදයි බං.. හිතට සැනසීමයි.."

" ඒකනෙ.. පොඩ්ඩක් ඉවසලා ඉදපන්..මේ වෙලාවෙ එක්සැම් ඇරෙන්න වෙන දේවල් වලට උඹටයි මටයි උත්තර හොයන්න බෑ.. පොඩ්ඩක් මේවා ඉවර වුනාම උඹයි අයුක අයියයි මේ ගැන කතාකරපන්.. උඹලා දෙන්නගෙ දේවල් වෙන උන් විසදන්න ගියෝතින් ප්‍රශ්න ඇතිවෙයි.. ඒකනිසා මොකෙක්ටවත්, මටවත්, රඨ්‍ය අයියටවත් උඹලගෙ ප්‍රශ්න විසදන්න දෙන්න එපා.. අපි දෙන්නගෙ ප්‍රශ්නයි උඹලා දෙනගෙ ප්‍රශ්නයි වෙනස්නෙ බං.. මම මේ උඹෙ හොදට කියන්නෙ.."

" ම්ම්.. මට තේරෙනවා ෂනෙරුවා.."

" ඒකනෙ.. පොඩ්ඩක් අල්ලගෙන ඉදපන්.. හැමදාම හෙන ගගහා වහින්නැනෙ.."

" කියන්න බෑ වැහැලා වැහැලා ගංවතුරක් දාලා සේරම විනාසවෙලා යයිද කියලා.. එහෙම වුනොත් පායපු කාලෙකට ඉන්න වෙන්නෙ උඩ බලාගෙන තමා.."

" ඒ මොකද.."

" ගංවතුරට සේරම ගහගෙන යනවනෙ.."

" ගංවතුර එනකල් වහින්නෑ බං.. උඹට පිස්සු.."

" ඒ වුනාට දිනේස් අයියා සෙංකඩගල නුවරට දාගෙන රට වටේ ගියොත් නම් වැහැලා ගංවතුර දායි.."

@Shan

" දිනේස් යන්නෙ රට වටේ මිසක් උඹෙ හිත වටේ නෙමෙනෙ.. උඹනම් මහ පිස්සු මගුලක්.."

මමයි සෙනුකයයි නැගිටලා ක්ලාස් පැත්තට ගියා..

රධ්‍ය අයියා අර ඉස්කෝලෙ ඉවෙන්ට් එකේ වැඩ වලට බිසී නිසා මට එයාව ආයෙම මූණ ගැහුනෙම නෑ.. ගෙදර ගිහින් කතා කරනවා කිව්වනෙ.. සෙනුකයා හිතේ අවුලෙන් ඉදියට හිනාවෙලා කතාබහ කල්ලා සාමාන්‍ය විදියට ඉන්න ට්‍රයි කලා.. කොහොම වුනත් මම හොදම යාලුවා විදියට උගේ පොඩි වෙනසත් දැනෙනවා.. කරන්න දෙයක් නෑ.. ඌටවත් මටවත්.. අයියලා දෙන්නටවත්.. මේ ටික දවස ඉවසගෙනම ඉන්න වෙනවා..

ඉස්කෝලෙ ඉවර වුනාම සෙනුකයා පොඩ්ඩක් අයුක අයියව හම්බෙලාම යනවා කියලා ඉස්කෝලෙ ග්‍රවුන්ඩ් එක පැත්තට ගියා.. රධ්‍ය අයියා අද නැති නිසා මම බෑග් එකත් එක කරකින් එල්ලගෙන ඉස්කෝලෙන් එළියට ඇවිත් ස්කූල් බස් පාක් කල්ලා තියෙන පැත්තට ඇවිදගෙන ගියා.. හෙන දුර තියෙන්නෙ බස් ගහලා.. ඒ එනගමන් ගේට් එක ගාවින් තඩි හැන්ඩ් බිලක් බලෙන්ම එකෙක් ඇගේ ගැහුවා..

" අපේ ජීවිත කතාව අපිම ලියාගමු - චරිත දිසානායක "

අපේ කෙමෙස්ට්‍රි සර් නළුවා වගේ රැන්ඩම් ශොට් එකකට අහක බලාගෙන ඉන්න ෆොටෝ එකක් ගහලා තිබ්බා.. මගේ කෙමෙස්ට්‍රි පොතේ පාට පාට පෑන් වලින් ලිව්මෙ හා තොරන් දැමීමේ මහා බලවේගය..

' ළමයි දම් පාටින් ලියාගෙන රෝස පාටින් කොටු කරගන්න'

' ළමයි මේ ශ්‍රේණිය කොළ පාටින් ලියාගන්න'

' තැබිලි පාටින් තරුවක් දාලා ලියාගන්න'

චරිත සර් එහෙම කිව්වට ඒ කියවන වේගෙට පාට මාරු කර කර ලියන්න අපිට යෝධ බල යෝධ ශක්තියවත් තියෙන්න ඕන.. කියවනවා ආලෝකේ වේගෙන්.. ලියාගන්න අපේ අත ලෙප්ට් වෙලා යනවා.. අවසානෙදි මම නිල් පෑනෙන්ම ඔක්කොම ලියාගෙන රීතලයක් ගහලා ඒවා තැබිලි පාට, කොළ පාට කියල දාන්න පටන් ගත්තා.. නැත්නම් බැරන්නෙ..

@Shan

' සක්‍රියතා ශේණිය කියන්නෙ මොකක්ද..?? සක්‍රියතා ශ්‍රේණිය කියනෙ සක්‍රියතා ශ්‍රේණියට ඉතින්.. ලියාගන්න.. දහතුන් වන කාණ්ඩයේ මූලද්‍රව්‍ය-'

හැන්ඩ්බිල දැක්කහම මගේ කනේ වචන දෝංකාර දෙනවා දෙනවා වගේ..

මම ඒකෙ ලියල තිබ්බ ඒවා කියව කියව ස්කූල් බස් තියන පැත්තට ඇවිදගෙන යද්දිම එකපාරටම මගේ ඇගටම කාලා බයික් එකක් නැවැත්තුවා.. මම උගට ලයිසන් දීපු එකාගෙ අම්මා අප්පා මතක් කරන්න කට ඇරියා විතරයි..

" ඔහ්.. ෂනෙරු මල්ලි"

ෂනෙරු මල්ලි තමා පගො.. ඇයි ගහන්නත..

මීට වෙරී

ඔයාලා හිතන එකා තමා ආවෙ.. ඉම්හි ඉම්හි..

මම ඔයාලට ආදරේම ආදරෙයි ළමයි.. අනෙව්.. හුගක් අප්පා..

සෑ වෙලා එන්නත් හිතෙනවා.. මෙ ළමයි හරි ආස නේ රෑ වෙලා එනවට..එහෙනම් දුම් කවුලු සුද්ද කල්ලා ජනෙල් ඇරලා නිදාගන්න.. මම එන්නම්..

ලව් යූ..❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම් යම් කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

## 52 කොටස

" ඔහ් ෂනෙරු මල්ලි.."

මම බයික් එකේ ඉදපු හාල්පාරුවට බනින්න හොදවයින් වචන ටිකක් කටට එකතුකරගෙන ඉස්සරහා බැලුවත් හෙල්මට් ග්ලාස් එක උස්සලා මට නම කියලාකතාකරපු එකා දැක්ක ගමන් කතාකරන්න ගත්තු වචන ටික ආපහුම දිව අගින් ලොක් වෙලා ගියා.. යාන්තම් පහුගිය ටිකේ දෙයියනේ කියලා වසලා හිටියා රධ්‍ය අයියා නිසා.. මදැයි ඉදලා ඉදලා තනියම ඉස්කෝලෙන් එළියට බැස්සා..

" අයාන් අයියෙ.."

" මල්ලි ගෙදර යන ගමන්ද.. අද ක්ලාස් නැද්ද.."

නෑ උඹෙ කිරිඅප්පට බල්ලො හොයන්න යනවා.. මට කියාගන්න දාහක් දේවල් එනවා කියාන් අයියා මුගෙ මල්ලි නොවුනනම් අම්මපා කියනවා.. කියනවාමයි..

" අද කලාස් නෑ අයියෙ.. ගෙදර යනවා.."

" ආ.. මම හදිසියේ දැකලා නැවැත්තුවෙ.."

අනේ ලොන්ත සිප්පි හිකනලෝ.. උඹ හැමදාම මෙතන ඇවිත් බයික් එකෙන් කැරකෙනවා මම දැකලා තියෙනවා.. දිවෙ ඉදන් තියෙන්නෙ බොරුවම තමා.. මූ නම් වැරදිලා කියාන් අයියගෙ අයියා වෙලාද කොහෙද..

" ආ එහෙමද අයියෙ.. මට අද ලේට් වෙලා තියෙන්නෙ.. මම යන්නම්.."

මම අඩිය තියලා ඉක්මනට එන්න හැදුවත්..

" පොඩ්ඩක් ඉන්න ෂනෙරු.. මට ඔයා එක්ක පොඩ්ඩක් කතාකරන්න ඕන.."

" කියන්න.."

@Shan

" ඇයි ඔයා මගේ මැසේජස් වලට රිප්ලයි කරන්නෙ නැත්තෙ.. මම හිතන්නෙ ඔයා මාව බ්ලොක් කරලා.."

ඇත්තටම මම ඔය කියන විදියෙ මැසේජස් කවදාවත් දැකලා තිබ්බෙ නෑ.. එකපාරම කිව්වහම පුදුම හිතුනා..

" මට?? මැසේජ් දාලා තිබ්බා??"

" ඔව්.."

" මම දැක්කෙ නෑ.. එහෙම මැසේජ් වගයක්.."

" ඒත් ඔයා ඒවා රීඩ් කල්ලා තිබ්බා.."

" ආ සමහර විට රධ්‍ය අයියා ගාව වෙන්න ඇති ෆෝන් එක තියෙන්න ඇත්තෙ.."

" ඔහ්.. එහෙමද.. ඔයාගෙ ෆෝන් එක එයා ළග තියෙන්න තරම් ඔයාලා කිට්ටුයිද.."

" ම්ම්..ඔව්.. එහෙම තමා.."

" මල්ලි රධ්‍යව හෙනට බිලීව් කරනවා වගේ.. නේද.. වට් අ ලව්ලි

ගේ

කපල්.."

අයාන් අයියා කින්ඩියට හිනාවෙන ගමන් හෙල්මට් එක ගලවලා බයික් එකේ ඉස්සරහින් තියාගෙන ඒකට බරවුනා..

" නොට් යෙට් අ කපල්.."

" tsk tsk.. කමක් නෑ..කොහොමත් රධ්‍ය වගේ හෙන නැරෝ මයින්ඩඩ් නැරෝ අයිඩියාස් තියෙන කොල්ලෙක් ඇරෙන්න.. මල්ලි වගේ කොල්ලෙක් ඔහොම වටේ යවන්නෙ නෑ.."

" මොකක්ද ඒ කිව්වෙ.."

@Shan

මම බෑග් එකේ පටිය උස්සලා කරට දාගන්න ගමන් ඇස් දෙක අකුලලා ඌ දිහා බැලුවා.. ඌට මොකටද අපේ දේවල්..

" නෑ ඉතින්.. මම කියන්නෙ.. ඌ මල්ලිට ආදරෙයි කියන්නෙත් නැතුව.. ආදරේ කරන්නෙත් නැතුව.. මල්ලිව තියාගෙන හෙන වටයක් යනවනේ.. මටනම් ඒ හැටි රඩ්‍යගෙ ලව්ලිනස් එකක් පේන්නෙ නෑ.. සෝ බෝරින්ග්.."

" ම්ම්ම්.. අයාන් අයියෙ..We have already been in love a lot.. මම කිව්වට විශ්වාස කරන්න.. we are a couple in a way even though we don't say love in words.. මම හිතන්නෙ ඔයා නැරෝ මයින්ඩඩ් කිව්වෙ ඒකටද දන්නෙ නෑ.."

මම ඇඟිල්ලක තිබ්බ රින්ග් එක හිමින් සැරේ දෙපාරක් කරකලා ආයෙම සාක්කුවට අත දා ගත්තා..

" එනිවේ.. මට ලේට් වෙනවා.. I hope that we will not meet again like this..

**You**

are so boring.."

මම අයාන් අයියට කට කොනකින් හිනාවෙලා ඉස්සරහට එන්න අඩියක් තියද්දිම අයාන් අයියා මගේ අතින් තද කල්ලා අල්ලගත්තා.. නියපොතු පාරක් හිටින්නම.. මම ආසම නැති දේ.. මම අකමැති උන් ඇගේ ගෑවෙන එක..

" උඹ මටද නෝන්ඩියට කතාකරන්නෙ ෂනෙරු.."

" අත අහකට ගන්න අයාන් අයියෙ.. පාරෙ මිනිස්සු ඉන්නවා.. නිකන් මෙතන ජෝකර් කෙනෙක් වෙන්න හදන්න එපා.."

" ජෝකර්!!?? ෂනෙරු..!! උඹෙ කට හොදටම වැඩී.. උඹ කාගෙ හයියක් අරගෙනද මට ඔය විදියට කතාකරන්නෙ ආ..??? අර රඩ්‍ය කාරයගෙ හයිය අරගෙනද.."

අයාන් කෑගහපු සද්දෙට අපේ වටේ හිටපු මනුස්සයොත් අපේ දිහා හැරි හැරී බැලුවා.. මට නම් මූව මෙතනම බිම දමාගෙන ගහන්න තරමටම ලොකු

@Shan

කේන්තියක් තිබුනේ..

" කාගෙවත් හයිය අරන් කතාකරන්න ඔහේ හිතුවද මට කොන්ද පණ නෑ කියලා.."

මම අත ගසලා දාලා අයාන් අයියගෙ බයික් එකටත් පයින් ගැහුවා.. ඌ ඒ වෙලාවෙ එහෙම එකක් බලාපොරොත්තු වෙලා තිබුනේ නැති නිසා එකපාරම බයික් එක බැලන්ස් නැතුව වැටෙන්න වගේ ගියා..

" ෂනෙරු උබට ම-!!!!!!!!!!!!!"

" ෂනෙරු..!!"

අයාන් අයියා ආයෙම මගෙ අතින් ඇදලා ගන්න යද්දිම අපිට පිටිපස්සෙන් කේන්තියෙන් වගේ ඇවිදගෙන ආවෙ අයුක අයියා.. කොච්චර කේන්තියෙන් ඉදියත් ඇවිදගෙන ආවෙ එකම වෙගෙන්.. අයාන් අයියා ඒකට ටිකක් විතර ගැස්සුනා..

" ෂනෙරු.. මම ඔයාව හෙව්වා.."

අයුක අයියා මගේ අතේ මැනික් කටුව ගාවින් අල්ලගෙන අයාන් අයියට රවලා වගේ බලලා එතනින් එන්න ආවා.. මගක් දුරකදි මගේ අත අතැරලා එයා ඉස්සරවෙලා ගියා.. මම පිටිපස්සෙන් ඇදි ඇදී ගියා.. ගිහින් අයුක අයියා ගේට් එකෙන් ඇතුළේ නැවතුනාම මමත් බෑග් එකේ පටියත් රෝල් කරගෙන බිම බලාගෙන ඉදියා..

" මොනවද අරු කියන්නෙ..."

" අනේ මන්දා.. පිස්සෙක්නෙ තනිකරම.."

මම එතන තිබ්බ බැම්මට හේත්තු වුනා.. බස් එකත් ගිහින් ඇති දැන් නම.. මදැයි කලින් ගෙදර ගිහින් පාඩම් කරන්න හිටියා.. මේ ගොං ලබ්බෙක් ඇවිත් නාඩගමන් නැටුවනෙ.. අයුක අයියා මං ගාවින් බැම්මට හේත්තු වෙලා නළල රැළි කරගෙන බිම බලාගෙන ඉදියා.. එයා එහෙම ලොකුවට කතාකරන කෙනෙක් නෙමේ.. අවශ්‍යම දේකට කතාකරනවා මිසක්.. නැත්නම් වටේ පිටේ තියෙන කිසිම දෙයක් සත පහකට ගනන් ගන්නෙ නෑ.. ටිකක් වෙනස් කැරැක්ටර් එකක්.. මම අයුක අයියා දිහා බලලා

@Shan

ඉස්සරහ අබලද්දි කියාන් අයියා අපි ඉන්න පැත්තට බෑග් එකත් අතේ එල්ලගෙන මල පැනලා වගේ ඇවිදගෙන එනවා මම දැක්කා.. මුන් තුන්දෙනාගෙ යාලුකම මම නිසා කෙලවෙයිද මට බයත් හිතුනා.. අයාන් කියන්නෙ කියාන් අයියගෙ අයියනෙ.. අන්තිමට මම නිසා සේරම හබක් වෙන ලයින් එකක් මටනම් පේන්නෙ..

" අයුකයා.. මොකක්ද බං සීන් එක.."

කියාන් අයියා එතෙන්ට එනකල්ම අයුක අයියා ඒ දිහා ඔලුව උස්සලාවත් බැලුවෙ නෑ.. මම හිතන්නෙ එයා මොකක් හරි කල්පනා කරන ගමන් ඉදියෙ.. කියාන් අයියා කතාකලාම අයුක අයියා මලපැනලා වගේ කියාන් අයියා දිහා බලලා බැම්මට කකුලක් තියලා කෙලින් වෙලා සාක්කුවට අත් දෙක දාගත්තා..

" කියාන්.. උඹෙ අයියට ඇත්තටම සිංහල තේරෙන්නෙ නැද්ද.."

" ඇයි ඌ අදත් ඇවිල්ලද.."

" ම්ම්.."

" ෂිට්.. මූ නම් මහ කරුමයක් උනානෙ.."

කියාන් අයියා බෑග් එක බැම්මට විසික් කල්ලා ගේට් එක දිහා බලාගෙන හිටියා..

" කියාන් උඹලගෙ අයියට මම එකපාරකුත් කිව්වා.. එකපාරක් නෙමෙ.. දෙපාරක්ම කිව්වා.. පැත්තකට වෙලා ඉදපන් කියලා.. ඊළග වතාවෙ මම ඌට ආයෙම හොදින් කියන්නෙ නෑ.."

" පිස්සු පකෙක් බං.. මට හිතාගන්නත් බෑ.. ඌ මොකක්ද මේ නටන නාඩගම කියලා.. මල්ලි උඹට මොනවද ඌ කිව්වෙ.."

කියාන් අයියා මගෙන් අහද්දි මම ටිකක් කියාන් අයියා දිහා බලාගෙන ඉදලා බිම බලාගත්තා.. ප්‍රශ්නයක් වෙයිද මගේ හිතට හරි නෑ..

" මට.. ඒකා කියන්නෙ මොනවද කියලා මටත් හිතාගන්න බෑ.."

" ඒ කිව්වෙ.."

@Shan

" ඒ කිව්වෙ ඌ හෙන නෝන්ඩියට කතාකරන්නෙ.. සිරාවටම කියාන් අයියෙ.. ඌ උඹෙ අයියා වෙන්න ඇති.. ඒ වුනාට මට ඔහොම පකේ ලයින් නම් සෙට් වෙන්නෙ නෑ.. "

" උඹට විතරක් නෙමේ බං.. අපි එකෙක්ටවත් සෙට් වෙන්නෙ නෑ තමා.. අයුකයා.. රඨ්‍ය තාම හෝල් එකේද.."

" ඌට වැඩ බං.. දැන් ගිහින් මේවා කිව්වොත් කෙලගෙන එයි එක වැඩක්වත් හරියට කරගන්නැතුව.."

" ඌට නම් මේවා කියලා බෑ තමයි.. ඒ වුනාට දැන් කී සැරයක් උඹයි මමයි මෙච්ච මැදිහත් වෙලා විසඳන්න බැලුවද.. වැඩක් නෑනෙ.. රඨ්‍යට නොකිය ඉඳලා මොකක් හරි වුනොත්- ඊටපස්සෙ උඹට මම කියන්න ඕන නෑනෙ මොකක්ද වෙන්නෙ කියලා.."

" ම්ම්.."

" මේ මල්ලි.. උඹ රඨ්‍යට මොකුත් කියන්න යන්න එපා.. අපි ශේප් එකේ ඌට විස්තරේ කියන්නම්.. අද වෙච්ච දේවල් කියන්න ඕන නෑ.. මතකනෙ අයුකයා දවසක් මුගෙ ෆෝන් එකේ මොකක්ද මැසේජ් වගයක් දැකලා මෙතන නහින්න ගියා.."

" ඒ වුණාට කියාන්.. ඒක හරිද.. මම දන්න විදියට මුන් දෙන්නා ඔහොම ඒව හංග හංග ඉන්නෙ නෑ.. මම නම් කියන්නෙ මල්ලි.. ඔයා කියන්න.. නැත්නම් උගේ හිත රිදෙයි මේ කිසි දෙයක් කිව්වෙ නෑ කියලා.. මුලින්ම අපි කියන්නම්.. ඊටපස්සෙ ඌ ඔයාගෙන් ඇහුවොත් ඔයා විස්තරේ කියන්න.."

" ආ ඔව්.. ඒකත් අවුලක් නෑ.."

" ම්ම්.. මම බලන්නම්.. අනේ මන්දා.. ඕකා කවද්ද ආයෙම මාතර යන්නෙ.."

" අනිද්දා යාවි මම හිතන්නෙ.. එතකල් පොඩ්ඩක් ඉඳපන්.. අපි බලමුකො ඌ නටන්නෙ මොකාටද කියලා.."

" අනේ මන්දා අයියෙ.. මේ මගුල් නිසා මගේ ඔලුවත් කකියනවා.. මේ මම ගෙදර යන්න ඕන.. මම යන්නම්.."

@Shan

මම තව එතන ඉන්නෙ නැතුව බෑග් එකත් අරගෙන එන්න හදද්දි අයුක අයියා මාව නවත්තගත්තා..

" මල්ලි.. පොඩ්ඩක් කතාකරන්න පුලුවන්ද.."

" ආ..?? ආ ඔව් කියන්න අයියෙ.."

" මේ එහෙනම් උඹලා වරෙන්.. මාත් යනවා.. පස්සෙ සෙට් වෙමු.."

" හරි බං.."

" මල්ලෙ අපි ගියා.."

" හරි අයියෙ.."

කියාන් අයියා අපි දෙන්නගෙම පිටට ගහගෙන ගේට් එකෙන් එළියට ගිහින් ගර්ල් ස්කූල් එක ඉස්සරහා තිබ්බ කැෆේ එකට ගියා.. අයුක අයියා මගේ දිහා බලලා ආයෙම බිම බලාගත්තා..

" ෂනෙරු.. වත්සල් මොකක් හරි ප්‍රශ්නෙකද ඉන්නෙ.. එයාගෙ ගෙදර..??"

" ඒ කිව්වෙ.."

" ඔයාට එයා මොනවහරි කිව්වද.."

" එක්සෑම් එක ලගයිනෙ අයියෙ.. මම හිතන්නෙ සෙනුක ඉන්නෙ ස්ට්‍රෙස් එකේ.."

" නෑ නෑ ස්ට්‍රෙස් එකේ නෙමේ.. එයා වෙන මොකක් හරි ප්‍රශ්නෙක ඉන්නෙ.."

" අයියා අහලා බැලුවෙ නැද්ද.."

"  නෑ මම ඇහුවා.. එයා කියන්නෙ නෑ.. වත්සල් ඔහොම ඉදලම නෑ.."

" මමනම් හිතන්නෙ අයියා හිතන මොකුත් නැතුව ඇති.. මේ කාලෙට හැමෝම ඉන්නෙ ඔහොම තමයි අයියෙ.."

@Shan

" වත්සල්ගෙ ගෙදරින් මොකක් හරි ප්‍රශ්නයක්ද.."

" මම දන්න තරමින් නම් නෑ.. ඒ වුනාට.. මේ.. ඔයා දන්නවනෙ.. එයාගෙ ෆැමලි එක ටිකක් ස්ට්‍රික්ට්..ඉතින්.."

" මම දන්නවා.. එයා ඔයා එක්ක කියනවද මේක නවත්තන්න ඕන කියලා.."

අයුක අයියා ඇස් දෙක රතු කරගෙන මගේ දිහා බලද්දි මගේ පපුවත් එක්ක ගැස්සිලා ගියා.. මේ මින මගුලක්ද මේ වෙන්නෙ.. මේකා අඬන්නද යන්නෙ.. ඒකත් මේ දෙනෝදාහක් මෙතනින් යද්දි.. අනික මේවට මම මැදිහත් වෙලා තව මගුලක් වෙයි කියලා මට බය හිතුනා..

" පිස්සුද අයුක අයියෙ.. අපේ සෙනුකයා.. එහෙම කියයි කියලා හිතනවද.. එහෙම මගුලක් නෑ.. අම්මපා මම සෙනුකයා ගැන දන්නවා හොඳටම.. ඌ එහෙම එකෙක් නෙමේ.."

" ඒ වුනාට මමයි වත්සල් එක්ක බලෙන් යාලුවුනේ.. එයා වෙනස් වෙයි ෂනෙරු.."

" නෑ නෑ පිස්සු කියවන්න එපා අයියෙ.. ඔයා හිතන මොකුත් මෙතන නෑ.."

මමත් ටිකක් කලබලෙන් වගේ කතාකලාද මන්දා.. අයුක අයියගෙ ඇස් වලින් ගලාගෙන ආපු කඳුලු බිංදුවක් නාස් පොල්ල දිගේ රූටලා ඇවිත් එයාගෙම අතට වැටුනා.. මට තේරෙන්නෙ නෑ මොන වගේ දේවල්ද මේ වෙන්නෙ කියලා.. ඉස්කෝලෙ ඉන්න කෝල්ඩම ප'සනැලිටි මගේ ඉස්සරහා අඬනවා.. මට මූව බදාගෙන සනසන්න කියලද.. එහෙමහරි කමක් නෑ.. මෙතන?? අයුක අයියගෙ අත් දෙක වෙවුලනවා මම දැක්කා..

" අයියෙ අපි පොඩ්ඩක් අරහෙට යමුද.. මෙතන කතාකරන්න බෑනෙ.."

මම අයුක අයියා එක්ක මෙන්හෝල් එක යට තිබ්බ ස්ටෝරූම් එක පැත්තට ගියා.. අර දවසක් රධ්‍ය අයියා හොල්මනක් ඉන්නවා කිව්ව ස්ටෝ රූම් එක.. අයුක අයියා හීනෙන් වගේ ඇවිදගෙන එන්නෙ.. සෙනුකයත් ගෙදර ගිහින්.. රධ්‍ය අයියත් නෑ කියාන් අයියත් නෑ.. මොකෙක්වත් නෑ.. අයුක අයියා ස්ටෝරූම් එක ඇතුලෙ තිබ්බ බිත්තියටක ඔලුව ගහගෙන අඬන්න ගත්තා..

@Shan

අපි දන්නෙ නෑනෙ.. මනුස්සයො පිටතින් මනින්න බෑනෙ.. මම කොච්චර කිව්වත් අයුක අයියා කිසිදෙයක් ගනන් ගන්න එකෙක් නෙමෙයි කියලා.. සමහර විට ඇත්තටම ඒකා සංවේදී ඇති.. සෙනුකයට පණ ඇරලා ආදරේ කරනවා ඇති..

" අයියෙ.. මේ අහන්නකො.. එහෙම අයියා හිතන දෙයක් මෙතන නෑ.. මේ බලන්නකො.."

මම අයුක අයියගෙ පිටට තට්ටු කරත් එයා හයියෙන් අඩනවා විතරයි.. මටත් ඇඩෙන්න වගේ..

" මල්ලි.. ෂනෙරු.. රධ-රධ්‍යට එන්න කියපන්.. කොහෙ හිටියත් කමක් නෑ එන්න කියපන්.. ප්ලීස්.."

මම අයුක අයියා කිව්ව ගමන් බෑග් එක ඩෙස්ක් එකක් උඩට දාලා ස්ටෝ රූම් එකෙන් බැක් ස්ටේජ් එකට තිබ්බ දිරාපු පඩිපෙළ දිගේ උඩට ගිහින් එතන දොරෙන් මූණ දාලා බැලුවා රධ්‍ය අයියා ඉන්නවද කියලා.. ඒ පඩිපෙළ දාලා තිබ්බට දොර ලොක් කල්ලා තියෙන්නෙ.. පඩිපෙල දිරලා නිසා.. උඩ ලොකු ඉවෙන්ට් එකක්.. මට ලාවට බැක්ස්ටේජ් එකේ කැඩෙට් ඔෆිසර් කෙනෙක් එක්ක කතාකර කර ඉන්න රධ්‍ය අයියව පෙනුනා.. දැන් ඉතින් කොහොමද මම උෟට කතාකරන්නෙ.. මම කෝකටත් එළියෙන් බැක්ස්ටේජ් එකට දාපු පඩිපෙළ දිගේ ගිහින් අර ඔෆිසර් යනකල් ඉදියා.. විනාඩි දෙක තුනකින් වෙලාවට ඒ කෙනා යද්දි රධ්‍ය අයියත් යන්න හැදුවෙ.. මම රීටකලින් දුවලා ගිහින් රධ්‍ය අයියගෙ ෂර්ට් එකෙන් ඇදලා ගත්තා.. ඒකාත් බය වුනාද මන්දා.. බය වෙලා වගේ මගේ දිහා බලාගෙන හිටියා..

" වරද්.. මෙහෙ මොකද කරන්නෙ.. ගෙදර ගියේ නැද්ද.."

" මම කියන්නම්.. ඔයාට පොඩ්ඩක් පහලට එන්න පුලුවන්ද.."

" ම්ම්.. එන්නම්.. මොකක් හරි ප්‍රශ්නයක්ද වරද්.."

මම රධ්‍ය අයියගෙ අතින් ඇදගෙන ඉක්මනට ඉක්මනට බහින ගමන් ඉද්දි රධ්‍ය අයියා මගෙන් ඇහුවා..

" වරද්.. වැටෙයි.. හිමින්.."

@Shan

මම අවසාන පඩි දෙක අතැරලා බිමට අඩිය තිබ්බහම රධ්‍ය අයියා මට කෑගැහුවා..

" ප්‍රශ්නයක්නම් තමා.. හැබැයි මට නෙමේ.."

මම ස්ටෝ රූම් එක පැත්තට ඇඟිල්ලක් දික් කල්ලා කියද්දි රධ්‍ය අයියා මං දිහා බලාගෙන ස්ටො රූම් එක ඇතුලට ගියාම මමත් ඒ පස්සෙන්ම ගියා.. අයුක අයියා තාම බිත්තියට ඔලුව ගහගෙන බිම බලගෙන ඉන්නවා.. ඉකි වැටෙනවා හයියෙන්..

" අයුක.."

" අනේ බං රධ්‍ය.."

රධ්‍ය අයියව දැක්ක ගමන් අයුක අයියා දෝත බඳලම රධ්‍ය අයියව බදාගත්තා.. රධ්‍ය අයියගෙ අතේ තිබ්බ අර තද කොළපාට හෙඩ් වෙයාර් එක බිමට අතැරුනා..

" මේ මොකද බං.. අයුකයා.."

රධ්‍ය අයියට අයුක අයියව වාරු කරගන්නත් බෑ.. උන් දෙන්නම හෙන ලොකුයි.. රධිය අයියා පිටිපස්සට වැටෙනත් ගිහින් එහෙමම බිත්තියට වාරු වුනා..

" මම එළියෙන් ඉන්නම්.."

මම රධ්‍ය අයියගෙ අර හෙඩ් වෙයාර් එක ඇහිදලා මගේ බෑග් එක උඩින් තියලා එළියට ගිහින් පඩිපෙලේ ඉදගත්තා.. ඒත් මට ඇතුලේ කතාකරන ඒවා ඇහෙනවා..

" අයුක.. මොනවද බං මේ කියවන්නෙ.. උඹට පිස්සුද.."

" නෑ නෑ බං.. මට තේරෙනවා.. වත්සල් මාව අනිවාරෙන්ම අතාරිනවා..මට තේරෙනවා.."

" දැන් උඹට කවුද එහෙම එකක් කිව්වෙ.."

@Shan

" ඒත් මට දැනෙනවා බං.. මම ඌට ආදරේ කලා මගෙ පවුලෙ උන්ටත් වඩා.. උඹ දන්නවනෙ.. රධ්‍ය.. උඹ දන්නවනෙ බං..මම වත්සල්ට කොච්චර ආදරේද කියලා.. කියපන්.. "

" දන්නවා දන්නවා බං.. අඩන්නැතුව ඉදපන්කො.."

" අඩන්නැතුව මම මොකක්ද කරන්නෙ රධ්‍ය.. ආ.. එකපැත්තකින් අපේ සීයා.. අනිත් පැත්තෙන් වත්සල්.. අනිත් පැත්තෙන් තාත්තා.. මම කොහොමද මෙ හැමදේම දරාගෙන ඉන්නෙ රධ්‍ය මම මැරෙයි බං.."

" මැරෙන කතා කියවන්න එපා යකෝ.. උඹට මොන යකෙක් වැහිලද මෙ.."

" වත්සල්.. අනේ බං.. ඌ මට මගෙම අම්මා කෙනෙක් වගේ දැනෙන්නෙ.. ඌ වගේ කවුරුත්ම මට ආදරෙ කල්ලා නෑ බං.. අම්මවත් නැති මට ඌව එච්චරටම දැනෙනවා බං..උඹ දන්නවනෙ.. අපේ ගෙදර තියෙන ප්‍රශ්න.. ආ රධ්‍ය.. උඹ දන්නවනෙ.. මම ජීවත්වෙන්නෙ කොහොම අපායකද උබ දනවනෙ.."

" හරි හරි බං.. උඹ හිතල හිතලා පිස්සු කෙලිනවනෙ.. අර බලපන් වරද්.. ඌත් ඉන්නෙ ඔහොම තමා මෙ ටිකේ.. එක්සැම් එක්ක උන් ඉන්නෙ විකාර වෙලා.. පොඩ්ඩක් ඉදපන්.. මල්ලි උඹට මොකුත් කියලත් නැතුව උඹ ඔහොම අඩන්න තියාගත්තම හරිද.. පිස්සු යකෙක්නෙ.. නාඩා ඉදපන්.. උඹට මම ඉන්නවා කියාන් ඉන්නවා මල්ලි ඉන්නවා වරද් ඉන්නවා.. බලපන් උඹ තනිවෙලා නැනෙ.."

" වත්සල්??"

" ඔව් ඔව් ඌ උඹ එක්ක හැමදාම ඉන්නවා.. උඹ හිතනවා වැඩියි.. මම.. උඹට මම ඉන්නවනෙ බං.. මොනවද මෙ කියවන්නෙ.."

" මම දන්නෙ නෑ බං.. මට පිස්සු වගේ.."

" නාඩා ඉදපන්.. දැන්.."

මම පඩිපෙලේ ඉදගෙන බිත්තියට හේත්තුවෙලා පඩිපෙලට ආපු ඇහැල අත්ත දිහා බලාගෙන හිටියා.. සෙනුකයා එහෙම කරන්නෙ නෑ මම

@Shan

දන්නවා.. මම ඌ ගැන හොඳටම දන්නවා.. ඌට තියෙන්නෙත් බය.. පවුලයි ආදරෙයි.. දෙකෙන් එකක් තෝරගන්න ප්‍රශ්නෙ තමා ඌටත් තියෙන්නෙ.. අනික උගේ අප්පච්චියි අම්මයි හෙන සැරයි.. මේවා කොහෙන් ඉවරවෙයිද මම දන්නෙ නෑ.. ඒත් කවුරුවත් වරදක් නොකර මෙච්චර මිනිස්සුන්ට දුක් දෙන්න එපා කියලමයි මගෙ හිත හැමතිස්සෙම ඉල්ලනෙ.. මට විතරක් නෙමේ.. හැමකෙනෙක්ටම.. අපි හැමෝම හැගීම් දැනීම් තියෙන මිනිස්සු.. අසරණ කම දැනෙන්නෙ නැති උන්ට විතරක් නෙමෙ ඇති උන්ටත් දැනෙනවා..

ඒත් මෙ හැමදේම සිද්දවුනේ අවුරුද් දහනමයෙ විස්සෙ පොඩි කොල්ලො හතරදෙනෙක්ට කියන එක මතක් වෙද්දි මට ඉබේටම ඇස් වලට කඳුලු ඉනුවා..

අපි හතරදෙනාම ඉදියේ ප්‍රශ්න ගොඩක.. එක එකාට වෙනස් ප්‍රශ්න වල..

ඊයේ සෑ එන්ට බැරිවුනානෙ අනේ.. ඔතරීට පේපර් එකක් කරන්න අමතක වෙලා ඒක කරන්න උනානෙ.. සමවෙන්නෝ.. මම රෑ වෙලා අයෙම එන්නම් එහෙනම්..

ඉතින්.. ඔයාලගෙන් මට ලැබෙන ලොකුම ලොකු සපෝට් එක නිසා මට මේ කතාව හැමදාම ලියන්න ආස හිතෙනවා.. ඒ වගේම හිතේ තියෙන කතාව වෙනස් නොකර ලියන්න හිතෙනවා.. වගේම මේක අමතක නොවෙන කතාවක් වෙනවා මට.. ඇත්තන්ම

**I am so lucky to have such supportive readers like you..**

ආදරේ-යාලුකම ඒ දෙකම මම මේකෙ ඇතුලේ දැනෙන්න ලියන්න ට්‍රයි කරනවා.. මම කොච්චර සක්සස්වෙයිද කියලනම් දන්නෙ නෑ හැබැයි ලමයි.. ඉම්හි.. =)

ඔයාලා ඊයේ කියද්දියි මටත් මතක් වුනේ චැප්ටර් පනස් එකක්ම ඇවිල්ලනෙ දෙයියනේ කියලා.. ලියන මටත් දැවුනෙ නෑ බොලව්.. ආදරේයි හුගක්..

එන්නාම්..

ලව් යූ.. ❤

@Shan

ප.ලි.

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 53 කොටස

" මම සෙනුකයව හම්බෙන්න යන්නද.."

අයුක අයියා ගෙදර යන්න ගියේ රධ්‍ය අයියා එක්ක සෑහෙන්න වෙලාවක් කතාකලාට පස්සෙ..මම එතකල්ම එළියේ පඩිපෙලේ ඉදගෙන හිටියා.. රධ්‍ය අයියව හොයාගෙනවත් කවුරුත් ආපු නැති නිසා රධ්‍ය අයියා පුලුවන් තරම් අයුක අයියගෙ හිත හදලා එයාව ගෙදර යැව්වා.. වෙලාවත් හවස තුනයි.. මට හිතුනෙම සෙනුකයට මගට වරෙන් කියලා ඌව හම්බෙන්න යන්න..

" දැන් හවස් වෙලා වරද්.. කොහෙ යන්නද.. තව පැයකින් මමත් ගෙදර යනවා.. ඒකනිසා ඉදපන්.."

රධ්‍ය අයියා මට එහාපැත්තෙන් ඉදගත්තා..

" ඔයාව හොයනවද දන්නෙ නෑ.."

" නැතුව ඇති.. දැන් ඕක ඉවරවෙන්න කිට්ටුයි.."

" එහෙමද.."

"ම්ම්.."

" මේ.."

" ම්ම්.."

" අයුක අයියට මොකක්ද ගෙදරින් තියෙන ප්‍රශ්නෙ.. කියන්න පුලුවන් එකක්නම්.."

" අයුකයගෙ සීයා අයුකයගෙ පස්සෙන්මයිනෙ ඉන්නෙ.. සීයගෙ හිතේ අයිඩියා එකක් තියේලු අයුකව පොලිටිකල් වැඩ වලට ජොයින් කරගන්න.."

" මොකක්.."

@Shan

" ඔව්.. ඒ වුනාට උඹටම පේනවනෙ.. අයුකයා කීයටවත් ඕවට කැමති වෙන්නෙ නෑ ඌ ඒවා කරන්නෙත් නෑ.. අනිත් එක උගේ තාත්තට රට වටේම ගෑනු.. අයුකයා තාත්තට පොඩ්ඩක්වත් කැමති නෑ.. තාත්තා ඔය ක්ලබ් වල කෙලින පිස්සු අයුකයා පොඩිකාලෙ ඉදන්ම දැකලා දැකලා ඌට තාත්තව අප්පිරිය වෙලා තියෙන්නෙ.. අයුකයගෙ අම්මා ඌ ඉපදුන දවසෙ ඉදන්ම ගෙදර නෑ.. දැන් ඔය අයුකයගෙ අම්මා කියලා එන්නෙත් උගෙ කුඩම්මා.. ඕවා එළියට වැඩිය යැවෙන්නෙ නෑ.. හෙන සල්ලි තියන පවුල් නෙ.. සල්ලි වලට හැම කුණු ගොඩක්ම මේ රටේ යට ගහන පුලුවන් නෙ.."

" දෙයියනේ.."

" ඒකනෙ.. ඌව දැක්කහම කියන්න පුලුවන්ද එහෙම ප්‍රශ්න ගොඩක ඉන්නෙ කියලා..බෑනෙ.."

" මම ඔයා කියනකල් ඔය මෙලෝ දෙයක් දන්නෙවත් නෑ.. සෙනුක මේවා දන්නවද.."

" ම්ම්.. සෙනුක මල්ලි හැමදේම දන්නවා මම හිතන්නෙ.."

" එහෙනම් හොදයි.."

" අයුකයා ඌට පණ ඇරලා ලව්.. දැන් ඔය පිස්සා වගේ කියවගෙන ගියාට ඌම ටිකකින් දන්නෙ නෑ ඌ මොනවද කියෙව්වෙ කියලා.. හැබැයි ඌ කිව්වෙ බොරු නෙමේ.."

" ම්ම්.. අයුක අයියා වගේ නෙමේ සෙනුක.. ඌ පවුලෙ අය අස්සෙම හැදුනු එකා නිසා ඌට ඒවා අතාරින්න අමාරුයි.."

" සෙනුක මල්ලිගෙ තාත්තා පිරිවෙනක උගන්නනවා නේ.. අම්මා ඉස්කෝලෙ ටීචර් කෙනෙක්??"

" ඔව්.. එහෙම තමා.. ඉතින් ඔයාට තේරෙනවනෙ.."

" ඒකතමා.. මට අයුක කියලා තිබ්බා.."

" පව් ඒ දෙන්නම.. මට හෙන දුකයි.. සෙනුකයා හිත හොද එකා.. ඌ හෙන සතුටින් ඉදියේ අයුක අයියා එයා ලගින්ම ඉන්න එක ගැන.."

@Shan

" උන් දෙන්නා විතරද පව වරද්.."

රධ්‍ය අයියා දුර බලාගෙන කට කොනකින් හිනාවෙලා මගෙන් අහද්දි මම හුස්මක් පහළ දැම්මා..

" මට තේරෙන්නෑ අයියෙ.. මම ඒකයි කිව්වෙ.. ඔනම දෙයක් වෙනස් වෙන්න යන්නෙ තප්පරයයි.."

මේ ලොකෙ වෙනස් නොවෙන එකම දේ වෙනස්වීම කියලා මට ආච්චිඅම්මා කියලා තියෙනවා.. කාලෙත් එක්ක හැමදේම වෙනස් වෙනවා.. මේ ලෝකෙ තියන හැමදෙයක්ම මේ මොහොතෙත් තියෙන්නෙ වෙනස් වෙන ගමන්.. මම එහෙම කියලා ඉවරකරන්න හම්බුනේ නෑ අහසේ මහා සද්දෙන් අකුණක් පුපුරලා ගියා.. රධ්‍ය අයියා ඒකට හයියෙන් හිනාවෙලා මගේ දිහා බලලා ආයෙම අහස දිහා බැලුවා..

" ඒකනම් සිරා කතාව.. තප්පරයයි තමා.."

" සැක් වහිනවා නේද.."

" මම ඇදුම් මාරු කරන් එන්නම්.. ??"

" එපා ඔහොම පොඩ්ඩක් ඉදලා යන්න.. දැන් ඉතින් මේ වැස්සෙ ගෙදර යන්නත් බෑනෙ.."

රධ්‍ය අයියා නැගිට්ටන්න හැදුවත් මම එයාගෙ ශර්ට් එකෙන් ඇදලා එතනින් වාඩිවෙන්න කිව්වා..

" අදනම් නාන්න වෙනවා වරද්.."

"තවුසෙ නාන්නෙත් නැනෙ.. ඔන්න ඔහේ නාගෙනම ගෙදර යනවා.."

" අනේ මේ පලයං.."

" ම්ම්.. මේ අද මට ඉස්කොලෙ ඇරිලා ගෙදර යන්න යද්දි පාරෙදි අයාන් අයියව හම්බුනානෙ.."

රධ්‍ය අයියා එකපාරම හැරිලා මං දිහා බැලුවා..

@Shan

" ගෙදර යන්න යද්දි?? කොයි වෙලේද එළියට ගියේ??"

" මම ස්කූල් බස් එකේ ගෙදර යන්න තමයි ගියේ.. මම යද්දි අයාන් අයියව හම්බුනා.. ඊටපස්සෙ තමයි අයුක අයියා ඇවිත් ආයෙම මාත් එක්ක ඉස්කෝලෙට ආවේ.."

" මොකක්ද ඌ කියන්නෙ.."

" මන්දා.. හෙන නෝන්ඩියට කතාකරනවා.."

" වේ# බල්ලා.. ඌ හිතාගෙන ඉන්නෙ අපි මොක්කු කියලද දන්නෙ නෑ.."

" අනේ තමා.. පිස්සු පකෙක්.."

" පොඩ්ඩක් ඉදපන්.. මමත් ඉන්නෙ ඕකව මූණට හම්බෙනකල් තමා.."

" ඕකා එක්ක පැටලෙන්න යන්න ඕන නෑ.. අනිද්දා ආයෙම මාතර යනවලුනෙ.."

" ම්ම්.. බලමුකො.. මෙ හිරිකඩත් එනවා බං.. උඹ අසනීප වෙයි.. වරෙන් යන්න.."

" අනේ මේ හිරිකඩක් වැදුනහම ලෙඩ වෙන්න තවුසෙ හිතුවද මම මේ මලෙන් උපන් සමනලී කියලා.. මගුල.."

" එහෙම හිතුවෙ කවුද.. මලෙන් අනික සමනල්ලු එන්නෙ නැනෙ.. උඹ බයෝ නේද කරන්නෙ.. ඒක දන්නෙත් නැද්ද.."

" නැනෙ.. සමනල්ලු කොහෙන්ද ඉතින් එන්නෙ.."

මම නිකටට අතක් තියාගෙන රධ්‍ය අයියා දිහාට එබුනා..

" සමනල්ලු එන්නෙ.. අර.. මොකක්ද එකක් හදාගන්නව නේද.. ඒකෙ අස්සෙන් නෙ එන්නෙ.."

රධ්‍ය අයියා හරියටම ශුවර් නැති මූනකින් මට පැහැදිලි කරන්න ට්‍රයි කරද්දි මට හිනායන්න ආවා.. කියුට්..

@Shan

" මොන??"

" chrysalis එකකින් නේ..??"

" ඉතින්??"

" ඊටපස්සෙ ඉතින් ඌ එළියට එනවා??"

" මට තේරුන්නෑනෙ.."

" මෙහෙමයි.. උඹ හිනාවෙන්නෙපා.. මම මේ දන්න හැටියට කියන්නෙ.. මුලින්ම බිත්තරක් දානවා.. ඊටපස්සෙ caterpillar කෙනෙක් එනවා.. ඊටපස්සෙ ඌ chrysalis එකක් හදාගෙන ඒකෙ අස්සට යනවා.. ඊටපස්සෙ ඒකෙන් සමනලයෙක් එළියට එනවා.. හරිද??"

" ඕ ඕ ඔයා කියන එකක් තමා ඉතින්.. සමනලයා ඇවිත්??"

" ඇවිත්.. ඇවිත් ආච්චිට හාල් ගරනවා.. උඹ එක්ක කතාකරන්න බෑ.. හැම මගුලම ආතල් එකට ගන්නවා.."

" මොන ආතල්ද අනේ.. ඔයා කිව්වා හරි තමා.. හැබැයි මෙයා අර ආච්චිට හාල් ගරන එකනම් වැරදී.. ඌ ඊටපස්සෙ මල් වල රේනු ඇගේ ගාගෙන මලෙන් මලට යන එක තමා කරන්නෙ.."

" ම්ම්.."

" මේ ඔයාට අර මගේ සේපාලිකා ගහ පේනවද.. ඒක මෙතෙන්ට පේනවා.."

මම අතදික් කලා ඈතට පෙනුන තාප්පෙ එක්කම තනියෙම තියෙන සේපාලිකා ගහ පෙන්නුවා.. ඉස්කෝලෙ ලාවට කලුවර වෙලා.. වැහි කලුවට.. පඩිපෙලෙන් පහල වතුර වලක් හැදිලා ඒකට වැහි පොද වැටෙනවා.. ඒත් මට ඒක දිහා බලාගෙන ඉද්දි දෝලන හා තරංග පාඩමෙ රැළිති ටැංකියයි, නිරෝධනයයි, තරංග අයාමයයි අරවා මේවා මතක් වෙලා මොලේ අවුල් වෙන්න ගිය නිසායි ඉක්මනට සේපාලිකා ගහ පැත්ත බැලුවේ..

" ම්ම් පේනවා.."

@Shan

" මම ඉස්කෝලෙ ඉන්න අන්තිම අවුරුද්ද.. මගේ සේපාලිකා ගහට පාළු හිතෙයිද දන්නෙ නෑ නේද.."

" පාළු හිතෙන එකක් නෑ.. හැබැයි ගහට උඹව මතක තියෙයි.."

" ඔව් මම නමත් කොටලා අයිතිය තහවුරු කල්ලනෙ තියෙන්නෙ.."

" ම්ම්.."

" අනේ මම ඒ ගහට ආදරේයි.."

" ඒ මොකද.."

" මම ඉස්කොලෙට ආපු කාලෙ ඉදන්ම මම එතනට යනවා එනවා නෙ.. ඉතින් ඒ ගහ මට හොද යාලුවෙක් වගේ දැනෙනවා.. අනික ඉතින්-"

" ම්ම්.. කියන්න කියන්න.."

" මොකුත් නෑ.."

" කියන්න ගිය ටික ඉවරකරන්න ඉතින්.. මම මොකක් හරි ඔහොම කියලා නැවැත්තුවනම් බලන්න තිබ්බා.."

" අනේ මේ.. මම කියන්න ගියේ ඉතින්.. මේ අවුරුද්ද පටන් අරගත්තු මාසවල ඉදන්ම අපි දෙන්න උදේට එතන හම්බෙනවනෙ.. බලන් යද්දි ඒ ගහ නොදන්න දෙයක් නෑ.."

" ම්ම්.. මමත් දකිනවනෙ.. උඹ අර ඇඹරුල්ලා අහේ කොළ කඩාගෙන ගිහින් ඔතන කකා තනියම කියවනවා.."

" දකිනවා නෙමෙයි.. තවුසෙ හැමදාම අර ඔඩිටෝරියම් එක උඩට වෙලා බලාගෙන ඉන්නවා.."

" ආ හා කැමති විදියක් හිතාගනින්.."

මම මූණ පිරෙන්න හිනාවෙලා හිරිකඩ එක්ක එන සීතල හුළගට මූණ අල්ලගෙන ඉදියා.. මම ආසයි.. හුළගට මූණ අල්ලගෙන ඉන්න.. එතකොට ඒ හුළං දුර ඉදන් පාවෙලා ඇවිත් මගේ මූණ ඉඹලා යනවා වගේ දැනෙනවා..

@Shan

වෙලෙන් පාවෙලා එන හුළඟ.. හිරිකඩ එක්ක එන හුළඟ.. සේපාලිකා මල් සුවඳ අරගෙන එන හුළඟ.. පන්සලේ හඳුන්කූරු සුවඳ එක්ක එන හුළඟ.. ඒ හැම එකකටම මම ආසයි..

මගේ මූණේ ටික වෙලාවක් වැදි වැදී ඉඳපු හුලඟ මගේ මූණේ ආයෙම වැදුන්නැති නිසා මම ඇස් ඇරලා ඉස්සරහා බලද්දි රධ්‍ය අයියගෙ ලොකු අතක ඇගිලි විහිදුවලා මගේ මූණ ඉස්සරහින් අල්ලගෙන ඉදියා.. මම ඒ ඇයි කියලා අහන්න වගේ එයාගෙ මූණ දිහා බැලුවා.. එයාගෙ අර දිග ඇහිපිහාටු තියෙන ඇස් මං දිහා බලාගෙන ඉද්දි සමහර වෙලාවට ඒවා දිලිසෙන්න ගන්නවා.. ලාවට තෙත තුනී පටලයක් බැදිලා වගේ.. මේ වෙලෙත් මම ඒ තුනී පටලෙ ඇස් වල බැදිලා තියෙනවා හොදට දැක්කා..

ඒක මනුස්සයෙක් ආසම හැඟීම් වලින් කීපයක් වෙන්න ඇති.. තමන් වෙනුවෙන් කෙනෙක්ගෙ ඇස් වල එහෙම තුනී දිලිසෙන පටලයක් බැඳෙන එක.. ඒවා දිලිසෙන්න ගන්න එක.. මූණේ හිනාවක් ඇඳෙන එක..

" හරි ලෝබ හිතෙනවා.."

" ආ??.."

" මම්?? නෑ නෑ.."

" අපි දැන් යමුද.. මේ වැස්ස පායන පාටක් නෑ.."

" හා.."

රධ්‍ය අයියා නැගිටලා කලිසමේ තිබ්බ වැලි පිහාගෙන මටත් නැගිටින්න අත දුන්නා.. මම එයාගෙ ලොකු අතක් අල්ලගෙන නැගිට්ටා..

රධ්‍ය අයියා ඇඳුම් මාරුකරගෙන තව එයාගෙ මොනවද වැඩ වගේකුත් කරලා ඉවරවෙලා ඉස්කෝලෙන් එළියට එද්දි හතරට කාලක් විතර ඇති.. කොළඹට වහිනවා හිටු කියලා.. අපි දෙන්නම ගේට් එක ගාව ගහපු වහල යටට වෙලා යන්නෙ කොහොමද කියලා බලාගෙන ඉදියේ.. තියෙන කම්මැලිකමට කුඩ ගේන්නෙත් නෑනෙ.. අනික කවුද හිතුවේ වහී කියලා..

" කොහොමද යන්නෙ.."

@Shan

" ඒකතමා.. හෝල්ට් එකට යනකල් දුවන්න තමා වෙන්නෙ.."

" දුවන්න??"

" මම.."

" හා.."

" ඔයා දන්නවද බිලී බොබ් තෝන්ටන් කියලා කෙනෙක් කියලා තියෙන කතාවක්.."

" මීහ්ම්.. මොකක්ද..?"

" I believe in running through the rain and crashing into the person you love and having your lips bleed on each other.."

" ඔහ්.."

මම රධ්‍ය අයියා දිහා නොබලා ඉක්මනට පාර දිහා බලාගත්තා.. ඔය වගේ කතා මට හුරු නෑ.. එයා එහෙම ඒවා කියන්නෙත් නැනෙ.. ඉදලා හිටලා කියද්දි මට නුපුරුදු ලැජ්ජාවක් දැනෙනවා.. මම ඒකට අකමැති නෑ..!! ඒ වුනාට ලැජ්ජයි..

" දැන් ඇයි ඉතින් රතුවෙලා??"

රධ්‍ය අයියා මම දිහා බලලා මහ මනමාල හිනාවක් දැම්මා..

" මම?? පිස්සුද.."

" වරෙන් දැන් ඉතින් දුවන්න.."

රධ්‍ය අයියා එයාගෙ බෑග් එක මූණට උඩින් අල්ලගෙන අනිත් අතින් මගේ අතල් අල්ලගත්තා.. අපේ ඉස්කෝලෙට එන පාරේ තියන නුග ගස් පෝලිමයි වැහි පොදයි ඇරෙන්න වෙන කිසිම දෙයක් පාරෙ තිබුනෙ නෑ.. මේ පාරෙ බස් යන්නෙ නෑනෙ.. රධ්‍ය අයියා දුවන්න පටන්ගත්තු නිසා මාවත් එහෙමම එයාගෙ පස්සෙන් ඇදිලා ගියා.. එයා බෑග් එක මූනට අල්ලගෙන ගියත් මම මොකුත් අල්ලගෙන හිටියේ නෑ.. වැහි පොද බිංදු බිංදු ගහගෙන ඇවිත් මගේ මූණේ වැදිලා බිදිලා ගියා.. සමහර වෙලාවකට දිය කඩිත්තකට කකුල

@Shan

තිබ්බොත් මගේ සපත්තුවේ මේස් එකත් තෙමාගෙන ඒ වතුර සීතලට කකුල් වලට දැනුනා.. ඒත් මම දිව්වේ හරි ආසාවකින් වගේ.. මහා හයියෙන් නෙමේ.. ඒ වුනාට දිව්වා.. වැහි කළුවයි ගොරවන අහසයි වැස්සයි වැහි පොදයි ඈත පාරවල් වලින් ඇහෙන වාහන සද්දෙයි..

රධ්‍ය අයියා මගේ අතින් ඇදගෙන දුවගෙන දුවගෙන ඇවිත් බස් හෝල්ට් එක යටට වුනා.. හෝල්ට් එකෙත් කවුරුත් නෑ.. සමහරවිට අපි එනකොට පරක්කු ඇති.. බස් එක දැන් වගේ යන්න ඇත්තෙ..

" තෙමුණා නේද.."

රධ්‍ය අයියා සාක්කුවෙන් ගත්තු හොදට මැදලා හතරට නවපු ලේන්සුවක් මගේ දිහාට දික් කලා..

" මූණ පිහිදගන්න.."

මම තද නිල්පාට කපු ලේන්සුවෙන් මූණ යන්තම් තෙත මාත්තු කරගෙන ට්‍රාන්ස්පේරන්ට් වීදුරු වලින් තුන් පැත්තක් වට කල්ලා හදලා තිබුනු බස් හෝල්ට් එකේ දිග බංකුව උඩින් ඉදගත්තා..හෝල්ට් එකේම පැත්තක ස්පා සිලෝන් එකේ ඇඩ්වටිස්මන්ට් එකකුයි ඔඩෙල් එකේ ඇඩ්වටිස්මන්ට් එකකුයි උඩ පල්ලෙහා මාරු වෙවී ප්ලේ වෙනවා.. රධ්‍ය අයියත් මගේ එහාපැත්තෙන් ඉදගත්තා.. කුරුඳුවත්තෙ පාරවල් හරි පාළු පාටයි.. ඉදලා හිටලා වැස්ස වෙලේ කාර් දෙක තුනක් අපිව පහු කරගෙන ගියා..

" මේ.."

" මම්??"

" අයුක අයියට කියන්න පුලුවන්ද.. සෙනුකයව පොඩ්ඩක් නිදහසේ හම්බෙලා කතාකරන්න කියලා.. වෙන මොකුත් අහන්න කියන්න යන්න එපා.."

" මම කියන්නම්.."

" අනිවාරෙන් කියන්න.. අනික එක්සෑම් අස්සෙ සෙනුක මේවා හිතලා ඒක අනාගත්තොත්.."

@Shan

" මම අයුකට කියන්නම්.. මල්ලි එක්ක කතාකරන්න කියලා.. අයුක වුනත් ඔහොම ඉමෝශනල් වෙලා බැනෙ.."

" ම්ම්.."

" දැන් ඕවා නොහිත පාඩම් කරන්න.. තව ටිකදවසයිනෙ.."

" මෙ සතියෙ රිසාල්ට්ස් එනවා නේද ඔයාලගෙ.."

" ම්ම් එන කතාවක් තියෙනවනෙ.."

" හොදයි නේද.."

" මොන හොදක්ද.. මට මොකෝ අනිත් උන් වගේ කැම්පස් යන්න කියලද.. නෑනෙ.."

" එහෙම කියන්න එපා අයියෙ.. අප්පච්චිලා ඔයාට එහෙම කරන්න කියන්නෙ මොකක් හරි හේතුවකට වෙන්න ඇතිනෙ.. හැමදේම නරකට හිතන්න එපා.. එහෙම හොද නෑනෙ.."

මම රධ්‍ය අයියා ගාවට පොඩ්ඩක් ලිස්සලා ගිහින් එයාගෙ ඇගිලි දෙකක් මගේ අතින් මිටමොළවලා අල්ලගත්තා.. රධ්‍ය අයියා මගේ අත දිහා බලලා හිනාවුනා..

" රස්නෙයි.."

" මම කියපු එක අහගෙනද ඉදියෙ.."

" ම්ම්.. ඔයා ශෝන් මෙන්ඩිස්ට හුගක් ආසද.."

රධ්‍ය අයියා කතාව වෙනස් කලේ හිතාමතාම කියල මට තේරුනා.. එයා එච්චරටම ඒ ගැන කතාකරන්න අකමැති.. මම දන්නෙ නෑනෙ මට තාත්ත කෙනෙක් නෑනෙ.. සමහරවිට එයා අකමැතිවෙන්න හේතුව මට පස්සෙ දැනගන්න ලැබෙයි කියලා මම හිතුවා..

" අම්මෝ ඔව්.. ආසයි කියන්නෙ.. මාරම ආසයි.."

" අපි දවසක කොන්සර්ට් එකක් බලන්න යමු??"

@Shan

" වාව්.. ඒකනම් හීනයක් වගේ එකක්.. මට ආසම ආසයි යන්න.."

" යමු ඉතින් දවසක.."

" හා.. යමු.. ඔයාට මතකද ඇලන් වෝකර් ලංකාවට ආපු කාලෙ.."

" ඔව් ඔව් අපේ අයියලා ඒ කාලෙ අපේ වයසෙනෙ.. උන් ගියා බලන්න ඒක.. කොහෙද උඹයි මායි හිටියෙ ග්‍රේඩ් එයිට් නයින් වලනෙ.."

" ඒක මරු ඇති නේද.."

" ඔව් අපේ අයියලා හෙන පිස්සුවක් කෙලලා ඇවිත් තිබ්බෙ.. ආයෙනම් එහෙම එකක් ආවොත් මිස් කරගන්නෙ නෑ ජීවිතේට.."

" ම්ම්.. මාත්.."

අපි කතාකර කර ඉන්නකොටම ගෙදර යන්න බස් එක ආවා..

ඇලන් අයියා ලංකාවට ආවනෙ.. ඉම්හි.. ඕතරී හිටියෙහ් හිච්චා වගේනෙ.. යම්න දුම්නෙ නෑ පිංචත්නී.. අතීතය වේමදනාවක්.. ඉම්හි ඉම්හි..

ආයෙම එන්නාම්.. ලව් යූ ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම් යම් කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 54 කොටස

" හලෝ.."

මම හිටියේ හරියටම නුගේගොඩ නෝලිමිට් එක ඉස්සරහා.. සෙනුකයා එක්ක පාර පනින්න.. ඊයේ වැස්සට අහුවෙලා ලාවට හෙම්බිරිසාවක් හැදිලා තිබුනට පිරිටන් එකක් බීලා නිදාගත්තහම ඒක ඉබේටම ඇරිලා ගියා.. හැබැයි පොඩ්ඩක් කටහඬ හබක් වෙලා ඉන්නෙ.. දැන් කතාකරන්නෙ නාහෙන්..

මටත් ඉන්නෙ හරි පුදුම වෙන්ඩ බෝයිෆ්‍රෙන්ඩ් කෙනෙක් තමා.. ඒකාට මම ලෙඩ වෙච්ච එකට වඩා මම ලෙඩ වෙලා නාහෙන් කතාකරන එකට ආස හිතිලා මගෙන් අහනවා මාස දෙකකට සැරයක් වගේ ලෙඩවෙන්න බැරිවෙයිද කියලා.. ඕකා කොච්චර කොහොම කිව්වත් ගැටපොලොස් කොට්ටෝරුවෙක්මයි.. කිව්වොත් කියන්නෙ මගේ ඇගේ මාලුයි ගගේ මාලුයි ඔක්කොම නටන කතාවක් තමා..

හදිසියෙම ෆෝන් එකට එක දිගට එක දිගට කෝල්ස් වගයක් එන්න ගත්ත නිසා සෙනුකයා මට ෆෝන් එක ආන්සර් කරන්න කිව්වා.. එහෙම නැත්නම් මම පාරෙ ඉද්දි කෝල්ස් ආන්සර් කරන්නෙ ඉතින් අඩුවෙන්..

" හලෝ.. කවුද කතාකරන්නෙ.."

" කවුද ෂනෙරු.."

" කතාකරන්නෙ නැනෙ.."

" කෝ බලන්න"

" හලෝ "

සෙනුකයා පාර පැනලා මගෙන් ෆෝන් එක ඉල්ලගෙන ඒක කනේ තියාගත්තා..

" ඔන්න ඕක තියපන් බං.. මගුල කතාකරන්නෙත් නෑ.."

@Shan

සෙනුකයා මගේ ෆෝන් එක කට් කල්ලා උගේ සාක්කුවට ඔබාගෙන අපි දෙන්නම බස් හෝල්ට් එකට ඇවිදගෙන ගියා.. ඒ යන්න වුනේ නෑ ආයෙම ෆෝන් එක වයිබ්‍රේට් වෙන්න ගත්තු නිසා සෙනුකයා ෆෝන් එක අරන් සයිලන්ට් දැම්මා..

" පිස්සු හු#තෙක් ගන්නවා ගන්නවා ඉවරයක් නෑ.."

මම සෙනුකයට මොකුත් කියන්නැතුව කල්පනා කරේ කවුද ඔය ගන්නෙ කියලා.. ක්ලාස් එකේදිත් ඇලර්ට් විස්සකට වඩා එකම නම්බර් එකකින් ඇවිත් තිබුනා.. ඒ වුනාට මම එහෙම නම්බර් එකක් දන්නෙ නෑ.. මගේ කන්ටැක් ලිස්ට් එකේ නෑ..

හැන්දෑව නිසා සෙනග හැමතැනම පාරෙ එහා මෙයා යනවා.. අපි ඒ අස්සෙන් හරිම අමාරුවෙන් මොකෙක්ගෙවත් ඇගේ වදින්නැතිවෙන්න ඉස්සරහට ඇවිදගෙන ගියත් සෙනුකයා එකපාරටම මොකක් හරි දැකලා මාවත් ඇදගෙන එතනම තිබ්බ කහ ඉරෙන් පාර පැනලා සරසවි බුක් ශොප් එක ඇතුලට ගියා.. ට්‍රැෆික් නිසා හොදයි.. නැත්නම් මූටයි මටයි වැලිගමට අද ටිකට් ඇදෙන්නෙ.. ශොප් එක ඇතුලට ආවා විතරයි මම සෙනුකයගෙ පිට මැද්දට දබෝස් ගාලා පාරක් අතැරියා.. යකෝ ඔහොමත් පාරවල් පනිනවද..

" ඈ බූරුවෝ.. උඹට කුලප්පුවද.."

" පොඩ්ඩක් ඉදපන්කො.."

" කොහෙ ඉන්නද.. ආ.. බලපන් හොද වෙලාවට ට්‍රැෆික් සෙට් වුනේ.. නැත්නම්-"

" ශ්හ්.. කට වහගනින්කො පොඩ්ඩක්.. ආර්හ්.. එනවා එනවා.."

සෙනුකයා රැක් එකක් එහාපැත්තට මුවා වෙලා වගේ බුක් ශොප් එකේ දොර දිහා බලාගෙන හිටියා.. මම හිටියෙ සම්පූර්නෙන්ම රැක් එකට වැහිලා.. ඒකනිසා මොකුත් පෙනුනෙ නෑ..

" කවුද බං.. මොන??"

" ඕ ශිට්.. ෂනෙරුවා අයාන් කාරයා ඇවිල්ලා.. මොකද කරන්නෙ.."

@Shan

" මොකක්.. අයාන්??"

" ඔව් ඔව් හු#තො.. මොකද දැන් කරන්නෙ.."

සෙනුකයා නැමීගෙන රැක් එකෙන් එලියට බෙල්ල දාගෙන ඉද්දි මාත් ශේප් එකේ උඩින් මූණ දාලා බැලුවා.. ටසිරි.. ඇවිල්ලා තමා.. සෙල්ස්ගර්ල් කෙනෙක්ගෙන් මොකක් හරි අහනවා ඉදගෙන.. මට මාරුවෙන්න තැනක් කල්පනා වුනෙත් නෑ.. ඒ එක්කම අපි පිටිපස්සෙන් ඇවිත් සෙල්ස්බෝයි කෙනෙක් ඇවිත් බම්බුවක් අහන්න ගත්තා.. කරුමෙ තමා.. ඒ සද්දෙ අයාන් කාරයට ඇහුනා.. ඌ සෙල්ස්ගර්ල් ගාවින් අයින්වෙලා අපි ඉන්න පැත්තට අඩිය තිය තිය ආවෙ අමුතු හිනාවක් කටේ කොන තියාගෙන.. මට දෙලොව රත් වුනා..

" මල්ලිලා මොනවද බැලුවෙ.."

බැලුවෙ?? බැලුවෙ උඹෙ ඇටේ තලන්න හොඳ කුළු ගෙඩියක්.. සිප්පි හිකනල් ඇටගෙම්බා.. කැවා.. අයාන් අපිව ඒ එක්කම වගේ දැක්කා.. මටයි සෙනුකයටයි කරගන්න දෙයක් තිබුනෙ නෑ.. අපරාදෙ මෙක අස්සට ආවෙ..

" අම්.. ප්‍රෝමේට් එකේ සයන්ස් බුක් තියේද.."

" ප්‍රෝමේට් නම් ඉවරවෙලා මල්ලි.. මෙ දවස්වල එන්නෙ නැනෙ.. ඇට්ලස් වගේ නම් තියෙනවා.."

අනේ පකෝ ප්‍රෝමේට් ගන්න අපිටත් සල්ලි නෑ තමා.. ඇට්ලස් එක අරගෙන ගහගනින් තොගෙ පුපේ..

" එහෙමද.."

" එක්ස්කියුස් මී.."

අයාන් හරි හොද මැනර්ස් තියෙන එකා වගේ ඇවිත් සෙල්ස්බෝයිට එක්ස්කියුස් කලාට පස්සෙ ඒ කොල්ලා මුගේ පෙනුමට රැවටිලා හෙන වැදගත් එකෙක් වෙන්න ඇති කියලා හිතාගෙන ඔලුව නමාගෙන එතනින් යන්න ගියා.. සෙනුකයා අයාන්ට පේන්නම ඇස් දෙක රෝල් කල්ලා උඩ බලාගත්තා..

@Shan

" වට් අ සප්‍රයිස්..?? මම යන යන හමතැනම ඔයාව මීට් වෙනවනෙ.. මිම.."

අයාන් රැක් එකට හේත්තු වෙලා මගේ මූණ පැත්තට එබෙද්දි මම පිටිපස්සට වුනා.. ඌ ගාවින් එන සිගරට් ගඳට මට හෙන අප්පිරියාවක් ඇතිවුනා.. කොහොමත් මට සිගරට් ගඳ හුරු නෑ එච්චර.. ඔලුව රදේ අල්ලනවා..

" ඔයා තාම මාව ඉග්නෝර් කරනවා ලමයා.. The only thing I really don't like about you is that.."

" එහෙමද.. අපිට ලේට් වෙනවා අපි යනවා.."

" කමෝන් ලමයෝ.. ඇයි මෙච්චර හදිසි.. අර බලන්න වැස්සකුත් එන්න වගේ.."

" කමක් නෑ මම වැස්සෙ ඕනතරම් ගිහින් තියෙනවා.. වදවෙන්න උවමනා නෑ.."

මම සෙනුකයා එක්ක ශොප් එකෙන් එළියට ආවා.. එහෙම වැස්සක් එනවා කියලා පේන්නෙවත් නෑ..මේ කලුවරේ ඒවා කොහේ පේන්නද.. වටපිටාවෙ අමුතු සීතලක් නම් තියෙනවා මම හිතුවෙ මට ලාවට සනීපන් ඇති නිසා ඇගට එහෙම දැනෙනවා ඇති කියලා..

" Hey wait a minute.. I think this is your wallet.. Isn't it?.."

අපි දෙන්නා එන්න අඩිය තියද්දිම මට ආයෙම අර මම ආසම නැති කරුමක්කාර කටහඬ මට එහායින් ඇහෙද්දි මම ඉක්මනට පොකට් එකට අත යවලා බැලුවේ මගේ වොලට් එක ඇත්තටම ඒකෙ නැද්ද කියලා.. ඌ හරි.. මගේ වොලට් එක නෑ තමයි..

" ඕක මගේ.."

මම හොදට හුස්මක් අරගෙන ඌ ගාවට ගිහින් මගේ වොලට් එක ආපහු දෙන්න කියලා අත දික් කලත් අයාන් වොලට් එක දෙනවා වෙනුවට මගේ ඇගිලි වල උගේ ඇගිලි පටලගන්න ගියා.. මම ඉක්මනට අත ගසලා අහකට වුනා.. අපි පහුකරගෙන දෙනෝදාහක් මිනිස්සු එහෙට මෙහෙට ගියා..

@Shan

" මගේ වොලට් එක දෙනවා!!!!"

" ඔහ්.. My little tiger cub, why are you doing this to me? It hurts my heart a lot.. මම යන්න කලින් ඔයාගෙ මූණ බලලා යන්න විතරයි ආවෙ.."

අයාන් ඩ්‍රැමටික් විදියට පපුවෙ පැත්තක් අල්ලගෙන ඇස් යටින් මගේ දිහා බැලුවා..

" තමුසෙට ඇත්තටම පිස්සුද.. ආ..!!"

" ඇත්තටම කිව්වොත් When did those two eyes meet for the first time..?? ම්ම්.. That was the day that Ayan got really crazy.."

" මගේ වොලට් එක මෙහෙට දීලා යන අහක මකබෑවිලා පලයන්.. මම උඹ මට වඩා ලොකු එකෙක් කියලා බලන්නෙ නෑ අයාන්.."

මම අවසාන වතාවට මගේ අත දික් කල්ලා වොලට් එක ඉල්ලුවා..

" Damn.. these eyes.."

අයාන් මගේ මූණ ලගටම ලගටම කිට්ටු වෙද්දි මට හිතන්නවත් වෙලාවක් වුනේ නෑ සෙනුකයා මාව පාර පැත්තෙන් දාපු වැටට තල්ලු කල්ලා දාලා අයාන් ගෙ කම්මුල පුපුරු ගහන්න තරම් පාරක් හයියෙන් දමලා ඇරිලා.. ඒකනම්.. මම දිවුරලා කියනවා.. උගේ කම්මුල පැලෙන්න ඇති.. අයාන් කම්මුලත් අල්ලගෙන අඩි දෙක තුනක් පිටිපස්සට ගිහින් මූණ උස්සන්නත් කලින් සෙනුකයා උගේ අතේ තිබ්බ මගේ වොලට් එකත් අරගත්තා..

" අසහනකාරයා.. උඹේ අමාරුවට හොයාගනින් ඒ වගේ එකෙක්.."

" සෙනුකයා අපි යමු බං.."

" නෑ බං.. මූ හිතාගෙන ඉන්නෙ අපි කවුරු කියලද දන්නෙ නෑ.."

" සෙනුකයා යමු මේ මිනිස්සු බලන් ඉන්නවා ප්ලීස්.."

" ආයෙ උඹ අපි ඉස්සරහට එකම එක වතාවක් හරි ආවොත්.. බලාගමු.."

@Shan

සෙනුකයා තරහට මගේ අතත් ගස්සගෙන දාගෙන යන්න ගියා.. මම අයාන් දිහා නොබලම ඌව අල්ලගන්න උගේ පස්සෙන් ගියා.. අපි වටේ ඉදියමිනිස්සු හැරි හැරි බල බල යනවා.. ලැජ්ජයි.. මෙහෙම දේවල් පාරක මට කවමදාවත් වෙලා නෑ.. අනික සෙනුකයා මෙහෙම කේන්ති ගන්න එකෙක් නෙමෙයි..මට මෙලෝ දෙයක් හිතාගන්න බැරිවුනා.. අයාන් ගිනිගන්න ඇස් වලින් මැඑ දිහා බලන් හිටියා මම ලාවට දැක්කා.. මට බයයි.. මූ මොනවා කරයිද දන්නෙ නෑ.. දැන් පැත්තක හිටිය සෙනුකයත් මෙ ප්‍රශ්නෙට ඇදිලා ආවා..

සෙනුකයා මං දිහාවත් බලන්නැතිව එකසිය හැට තුනේ බස් එකකට නැගලා දෙන්නටම ටිකට් අරගෙන ලාස්ට් සීට් එකේ ඉදගත්තා.. මමත් ඌට එහාපැත්තෙන් ඉදගත්තා..

" ෂනෙරු.. උඹට බැරිවුනාට අත දිගෑරලා අරූගෙ කනට දෙකක් දෙන්න ආ??"

සෙනුක කේන්තියෙන් මගෙන් අහද්දි මට දෙන්න උත්තරයක් හිතාගන්න බැරිවුනා.. හැමදේම වුනේ ඉක්මනට ඉක්මනට.. මහ පාරෙ රණ්ඩු ඇතිකරගන්න මට උවමනාවක් තිබ්බෙ නෑ.. ඒ වුනාට මගේ හිතේ ඌ ගැන පිලිකුලක් තිබුනා.. ඇත්තටම ඇයි මට උගේ කනට දෙකක් දීගන්න බැරිවුනේ කියලා දැන් මගේ හිතට පසුතැවීමක් වගේ එකක් දැනෙනවා..

" පාර මැද සෙනු-"

" පාර නෙමේ මොන ලබ්බෙ වුනත් උඹට කරදරයක් කියලා තේරෙනවනම් උඹ දැනගන්න ඕන ඒකට ඒ විදියේ දෙයක් කරන්න.. උඹත් එක්ක අර කෙල්ලෙක් එහෙම ආවනම් ෂනෙරුවා.. ආශි හරි මහීශා හරි ආවනම්?? මොකද කරන්නෙ.. එහෙම කට වහන් ඉන්නවද.. අනේ ඇත්තමයි පිස්සු හු#තා උඹට ගහන්නෝන සේරටම කලින්.."

" මම හිතුවෙ නෑ බං එහෙම දෙයක් වෙයි කියලා.."

" රඩ්‍ය අයියා කිව්වා හරි තමා.."

" මොන??"

" උඹ-*Beep Beep*

@Shan

සෙනුකයට කියන්න හම්බුනේ නෑ අයුක අයියා සෙනුකයට කෝල් එකක් ගන්නවා.. ඌ මට පොඩ්ඩක් ඉන්න කියලා කෝල් එක ආන්සර් කලා..

" ඔව් අපි මේ ගෙදර එන ගමන්.."

" මොකක් කිව්වා.. ආ ඉන්න ඉන්න. .මෙහ්.. ෂනෙරුවා රිසාල්ට්ස් ඇවිල්ලලු.."

" මොකක්??? අද..??දැන්??"

" ඔව් ඔව් බං.. මම ඔයාට ගන්නම්... පොඩ්ඩක් ඉන්නවද.."

" හරි බුදුසරනයි.."

" ෂනෙරුවා රධ්‍ය අයියට කෝල් එකක් ගනින්.."

" මගේ ෆෝන් එක දියන්.. ඒක උඹ ගාවනෙ.."

මම සෙනුකගෙන් ෆෝන් එක ඉල්ලගෙන රධ්‍ය අයියට කෝල් එකක් ගත්තා..

රධ්‍ය පුතාට කැම්පස් යන්න පුලාන් වෙවා!!! ඒස්වාහ පුඃ..

( කෝ හැමෝම පුඃ කියාගෙන යන්නෝ..)

රෑ වෙලා පුලුවන් වුනොත් එන්නම් මට දැන් බිත්ති හරහා යන්න පුලුවන් නිසා ජනෙල් වහන් ඉන්නෝ..

අද වහිනවා යේයේ..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

@Shan

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 55 කොටස

" අනේ!! පුතාට තුණුරුවන් සරණයි.. කොච්චර සතුටක්ද.. මටනම් ඇත්තටම සතුටුයි.. පුතාගෙ ඉදිරි වැඩකටයුතුත් මේ වගේම සාර්තක වෙන්න ඕන.. හරි වාසනාවන්ත දරුවෙක්..දෙයියනේ..ඇස් වහක් කටවහක් නම් වදින්න එපා.."

" තැන්ක් යූ අම්මා.."

මම ගෙදර සාලෙ බිත්තියකට හේත්තු වෙලා බලාගෙන හිටියේ අපේ අම්මයි රධ්‍ය අයියයි දිහා.. කලින් දවසේ එයාලගෙ රිසාල්ට්ස් අවුට් වුනා..

G.C.E A/L EXAMINATION

NEW Syllabus

NAME : RADHYA SHANAW HELAKSHA ADHIKARI

INDEX NUMBER : *******

YEAR : 2022

STREAM : PHYSICAL SCIENCE

PHYSICS - A

CHEMISTRY - A

COMBINED MATHEMATICS - A

COMMON GENERAL TEST - 078

GENERAL ENGLISH - A

SUMMARY

Z-Score - 2.3404

@Shan

District Rank - 6

Island Rank - 11

මම එයාගෙ රිසාල්ට්ස් බැලුවෙ බස් එකේ එනගමන්.. එකපාරටම රිසාල්ට්ස් දැක්කා විතරයි මට කලන්තෙට වගේ ආවා.. කලින් වුනු මෙලෝ දෙයක්ම මතක නැතුව මම විනාඩි පහළොවක් විතරම කලේ ස්ක්‍රීන් එකේ වැටුනු රිසාල්ස් ශීට් එක දිහා බලාගෙන ඉන්න එක.. මට එකපාරටම මෙලෝ හැඟීමක් දැනුනෙ නෑ.. හරියට මගේ රිසාල්ට්ස් ඇවිල්ලා වගේ මගේ පපුව ගැහි ගැහී තිබ්බෙ එකසිය ගානට.. මම කීපාරක් එයාගෙ ඉන්ඩෙක්ස් එකයි නමයි අකුරෙන් අකුරට බැලුවද කියලා මට මතක නෑ.. ඒ එක්කම වගේ මට එයාගෙන් කෝල් එකක් ආවා..

" ඒ වරද්.. අපේ රිසාල්ට්ස් ඇවිල්ලා.."

" අ-ආ ඇවිල්ලා තමයි..!! අනේ බං අයියෙ!!.."

මම සතුටටම නියපොත්තකුත් හපාගත්තා..

" මම තාම බැලුවෙ නෑ බං.. හිතට මොකක්ද මොකක්ද වගේ.."

" මොනෞත්තක්ද අයියෙ බලන්නැතුව කරන්නෙ.. බලපිය සයිට් එකට ලොග් වෙලා.."

" අනේ බෑ වගේ බං.."

" කුණුහර්ප නාහා බලපිය යකෝ.."

" උඹ බැලුවද.."

" ඔව් මම මේ තාම.. ඉන්නෙ බලාගෙන.. මට.. නිකන්.. පිස්සු පිස්සු වගේ.."

" අඩෝ.. අවුල්ද බං ඒ කියන්නෙ.."

" අනේ මිනිහෝ.. ෆෝන් එක තියලා රිසාල්ට්ස් බලපන්..!!!"

" උඹ බැලුවනේ.. හොදයිද නරකයිද කියපන්.."

@Shan

" හොදයි නෙමේ හලෝ හොදම හොදම හොදයි.. තවුසෙට ඒ තුනක් එක්ක රැන්ක් එකකුත් තියනවා දෙයියනේ.."

" සිරාවට..!!?? උඹ ඔය ඇත්ත නේද කියන්නෙ.."

" බොරුනම් බලපිය.. ඒක නොබලා මොන මගුලක් කරනවද මන්දා.."

" ඉන්න.. අයියේ.............හ්.. මේ මගේ ඉන්ඩෙක්ස් නම්බර් එක ලියපු පොත කෝ????????????????????"

" අයියගෙන් අහන්න ඕන නෑ.. ඉන්නවා මම දාන්නම් මැසේජ් එකක්.. බූරුවා.. ඒකවත් ලග තියාගෙන නෙමෙයිද ඉදියේ.."

" සොරි ඉතින්.."

" බලලා කතාකරන්න.. මම ගෙදර ගිහින් ගන්නම්.. බුදුසරණයි.."

" පරිස්සමට යන්න හොදද එහෙනම් බුදුසරණයි.."

මම ෆෝන් එක තියලා ගෙදර ආපු ගමන් අම්මට විස්තරේ කිව්වා.. අම්මට එවෙලෙම රධ්‍ය අයියට කෝල් එකක් අරගෙන ඕන කියලා නටන්න ගත්තු නිසා මම අම්මට කෝල් එකක් අරන් දීලා කාමරේට වැදිලා දොර වහගෙන දබෝස් ගාලා ඇදට පැන්නා..

" අඩෙ ඒ තුනක් තියෙනවා දෙයියනේ.."

කොට්ටෙට මූණ ඔබාගෙන පිස්සන් කොටුවෙන් පැනලා ආපු එකෙක් වගේ මම සතුටටම මැරෙන්න ඔන්න මෙන්න වෙනකල්ම කොට්ටෙන් මූණ ගත්තෙ නෑ.. ඒ අස්සෙ ඇඩෙනවත් එක්කන්.. අපේ අම්මා හෝ ගාලා රධ්‍ය අයියට සුභ පතනවා.. ඉවරයක් නෑ.. මට කාමරේට ඇහෙනවා..

අයුක අයියටත් ඒ එකයි බී දෙකක් තිබුනා සෙනුකයා මට පෙන්නුවා.. ඌටත් ඉතින් මාරම සතුටුයි.. අයුක අයියා කලේ කොමස් නෙ.. මගේ ගැටපොලොස් කොට්ටෝරුවා කලේ මැත්ස් නෙ.. දෙන්නා ස්ට්‍රීම් දෙකක.. කොහොමහරි කමක් නෑ උන් දෙන්නටම හොඳ රිසාල්ට්ස් තියෙනවනෙ.. මටනම් අද වගේ හැපී එකක් දැනිලා තිබ්බෙම නෑ..

@Shan

අම්මා කතාකල්ලා ඉවරවෙලා මට යාන්තම් පැය බාගෙකට විතර පස්සෙ ෆෝන් එක හම්බුනා.. රධ්‍ය අයියා කියනවා එයාට මුලින්ම විශ් කලේ අපේ අම්මා ලු.. එයාගෙ අම්මටයි තාත්තටයි පලාලි වල කෑම්ප් එකට ගන්න ඕනලු කියන්න නම්.. එහෙට සිග්නල් නැහැල්ලුනෙ කතාකරන්න.. කොහොම වුනත් එයා සතුටින් ඉදියෙ.. මට ඒ කටහඩින් ඒක හොදටම දැනුනා.. එයා කියනවා අවසාන කාලෙ වුනු මහන්සිය ඇරෙන්න ඉස්කෝලෙවත් හරියට නොඉද ඔහොම ආපු එක හරි පුදුමයිලු..

ඊටපස්සෙ ඉතින් යැයි යැයි බණ දේශනාවක් තිබ්බා.. උඹත් අරහෙම පාඩම් කරන්නෝන, මෙහෙම පාඩම් කරන්නෝන අරකයි මෙකයි කියලා.. මම ඉතින් අග්‍රශ්‍රාවකයා වගේ හැමදාම කලේ උගේ බණ අහන් ඉන්න එක නිසා පුරුදු විදියටම අදත් බණ අහගෙන ඉදලා දවසෙ වුනු දේවල් කියවලා නිදහසේ නිදාගන්න ගියා..

ඒ වුනාට..

ඒ වුනාට රෑ ආයෙම මට සෙනුකයා කතාකලේ අඩ අඩා.. මහ රෑ.. එතකොට වෙලාව දෙකට විතර ඇති.. රධ්‍ය අයියා කතාකර කර ඉදලා මට එහෙමම නින්ද ගියානෙ.. මම ෆෝන් එක ආන්සර් කල්ලා කනේ තියාගත්තා..

" අ-අනෙහ් ෂ-ෂනෙරුවා-හ් බං.. මට-මට උ-උදව්වක් ක්-කරපං..ප්ලීස්.."

ඌ අඩද්දි මගේ නින්දත් එහෙමම පැනලා ගියා.. මේ මහ රෑ සෙනුකයගෙ තාත්තා ගෙදර ඉන්නවා.. එතකොට ඌ ඔහොම කෝල් ගන්නෙ නෑ.. උගේ ගෙදර රෑට කෝල් ගන්න තහනම් කල්ලා තියෙන්නෙ තාත්තා.. අයුක අයියා එක්ක කතාකරන්නෙත් හොරෙන් තියාගෙන ඉන්න බටන් ෆෝන් එකකින්.. ඒ කියන්නෙ මට මෙවෙලේ කතාකරන ෆෝන් එකෙන්..

" ඇයි බං.. මොකද මේ.. මොකක් හරි අවුලක්ද.. සෙනුකයා.. නාඩා කතාකරපන්.."

" අ-අනේ බං අ-අයුක අයියා.. අයුක අයියා හොස්පිටල් ඇඩ්මිට් කල්ලා.. අනේ ෂ-නෙරු මට දැන් කියාන් අයියා කතාකලේ.."

" මොකක්???"

" අනේ රධ්‍ය අයියට කියන්න.. අනේ බං.. මම මොකද කරන්නෙ.."

@Shan

" මොකක්ද වුනේ කියපන් සෙනුක හරියටම.. ඉස්සෙල්ලම අඩන එක නවත්තගනින්.. තාත්තා ගෙදර නේද.."

" දන්නෙ නෑ බං.. මාත් එක්ක කතාකලා හවස.. ඒ-ඒත් මොකක් හරි අවුලක් තිබ්බා.. අ-අනේ ෂනෙරුවා.. අයියට කතාකල්ලා බලපන් බං.."

" හරි හරි.. මම බලන්නම්.. නාඩා ඉදපන්.. හොදේ.. මම ඉක්මනට අහලා කියන්නම්.."

" අ-අනේ ඉක්මනට බං.."

මම කෝල් එක කට් කල්ලා අනිත් පැත්තට රධ්‍ය අයියට ගත්තා.. දෙපාර රිංග්ස් යන්න කලින් ෆෝන් එක ආන්සර් වුනා..

" වරද්.. මම මෙ හොස්පිටල් යන ගමන් ඉන්නෙ.. ඔයාට පස්සෙ ගන්නද.."

" මෙ අහන්න.. මොකක්ද වුනේ.. සෙනුකයා හොදටම අඩනවා.. මොකක් හරි ප්‍රශ්නයක්ද.."

" අයුකයා උගේ තාත්තා එක්ක රණ්ඩුවෙලා.. සුයිසයිඩ් කරගන්න ට්‍රයි කල්ලා.. මන්දා බං.. මට තේරෙන්නෑ මොනවා කරන්නද කියලා.."

" ම්-මොකක්?? සුයිසයිඩ් කරගන්න?? අ-අනේ අයුක අයියට දැ-දැන් මොකද.."

" දන්නෙ නෑ මම මෙ අපේ අයියා එක්ක යන ගමන්.. කියාන් හොස්පිටල් එකේ ඉන්නෙ.. ඌ නම් කිව්වෙ ලොකු අවුලක් නෑ කියලා.. මේකා වේන් එකක් කට් කරගෙන.. කාමරේ ලොක් කරලා.. පිස්සු යකෙක්නෙ.. පස්සෙ ගෙදර ස'වන්ට් කෙනෙක් හොස්පිටල් ගෙනියලා තියෙන්නෙ.."

" ආර්හ්.. මොන මගුලක්ද අයියේ.."

" හෙට කියාන් සෙනුක මල්ලිව එක්කන් එන්නම කිව්වා.. වරද්.. සිහියෙන් ඉදපන්.. සෙනුක මල්ලි එක්ක කතාකල්ලා අවුලක් නෑ කියලා මොනව හරි කල්ලා හිත හදන්න.. හරිද.. මම උදේම එන්නම් ඔයා හම්බෙන්න.."

" ම්ම්.. හා.. පරිස්සමට ගිහින් එන්න එහෙනම්.."

@Shan

" මම තියනවා වරද්.."

රධ්‍ය අයියා කෝල් එක කට කලා.. මම සෙනුකයට අනිත් පැත්තට කෝල් එකක් ගත්තා..

" අනේ ෂනෙරු.. මොකද බං අයියා කිව්වෙ.."

" ශ්හ්.. කෑගහලා අඩන්න එපා යකෝ.. තාත්තා ඇහැරෙයි.. මේ අහපන්.. එහෙම ලොකු අවුලක් නෑ.. කියාන් අයියා හොස්පිට්ල් එකේලු.. උඹ හෙට ගන්න එන්නම් කිව්වා.."

" අනේ අයුක අයියා හොදින් නේද බං.. උඹ මට බොරු නෙමේ නේද ඔය කියන්නෙ.."

" බොරු නෙමේ බං.. සත්තයි.. අයියා හොදින්.. ආධ්‍ය අයියලත් යනවා කිව්වනෙ.. නාඩ ඉදපන්.. උඹ බයවෙලා තියෙන්නෙ බොරුවටනෙ.."

" අනේ ෂනෙරු.. බයයි මට.. අනේ මං ගාවට වරෙංකො.. ෂනෙරුවා.."

මම කොහොම කිව්වත් වැඩක් නෑ.. සෙනුකයා ඉන්න තත්වෙ එක්ක ඌට මම කියන දේවල් ගානක් නෑ.. ඌ ඉකි ගගහා අඩනවා ඉවරයක් නැතුව.. අම්මපා රෑ වෙලා නැත්නම් මම යනවා.. මටත් අම්මව ගෙදර තනියම දාලා යන්න විදියක් නෑ.. අනික අයාන් කාරයා ඉන්නවා ඒකත් ප්‍රශ්නෙ.. මට කරගන්න මෙලෝ දෙයක් නැතුව සෑහෙන්න අසරණ කමක් දැනුනා..

" මම ඉන්නවා සෙනුක.. මේ බලපන්.. මම උඹ එක්ක ඉන්නවනෙ.. ම්ම්.. නාඩා ඉදින්.. අයියට මොකුත් වෙන්නෙ නෑ.. හෙට උදේම යන්න පුලුවන් නෙ.. අනේ කොල්ලො අඩන්නැතුව ඉදපන් රත්තරනෙ.. මට එන්න පුලුවන් දුරක නම් මම එනවා අම්මපා.. සෙනුකයා.."

" අ-අනේ ෂනෙරු.. මොනවද දෙයියනේ මේ වෙන්නෙ.. හවසත් කොච්චර හොදට ඉදියද බං.. එකපාරටම මොන හෙනයක්ද මේ කඩාපාත්වෙන්න යන්න.."

" එහෙම හෙනයක් නෙමේ බං.. උඹ පොඩ්ඩක් අයියා එක්ක ඉදපන් මේ ටිකේ.. මම ගෙවල් ශේප් කරන්නම්.. උඹ අපේ ගෙදර පාඩම් කරනවා හරි මොකක් හරි කියන්න පුලුවන් නෙ.. අනික අපේ අම්මා එච්චර අවුල් නෑ

@Shan

උඹලගෙ ගෙදර වගේ.. මොකක් හරි කරගන්න බලමු.. හරිද.. උඹ පුලුවන් තරම් අයුක අයියා එක්ක ඉන්න බලපන්.."

" ම්ම්.."

මම පැයගානක් සෙනුකයගෙ හිත හදලා හදලා උෟට නින්ද යනකල්ම ෆෝන් එකේ ඉදියා.. අන්තිමේ මට නිදාගන්න වුනේ නෑ දන්නෙම නැතුව පාන්දර වෙලා.. මම හයට විතර ඇහැ පියාගත්තා විතරයි මතක පැයබාගයක් නිදාගන්න ඇති අම්මා ඇවිත් මාව ඇහැරලා මූණ හෝදගෙන එන්න කිව්වා..

උදේ රධ්‍ය අයියා එනවා කිව්ව නිසා මම ගිහින් නාගෙනම ඇදුමකුත් දාගෙන කුස්සියට වෙලා අම්මට පොල් ගාලා දීලා කිරිබතකට ලුනුමිරිසුත් කොටලා දුන්නා.. අපේ අම්මා රධ්‍ය අයියා එනවා කිව්ව නිසාද මන්දා කිරිබත්ම හදන්නෙ.. අනික එයා කරපු උදව් පදව් අම්මට හොදට මතකයි.. ඒකනිසායි, දැන් ඉතින් හෙන අයිලන්ඩ් රන්ක් ගහපු පොරක්නෙ.. ඕවා නිසායි එයාගෙ අම්මලා ගෙදර නැති නිසායි අම්මා කිරිබත් හදනවා..

අම්මා උයලා පිහලා ඉවර වුනාට පස්සෙ මට සෙනුකයා මැසේජ් එකක් එවලා තිබ්බා උෟ කියාන් අයියා එක්ක හොස්පිටල් යනවා, උගේ අම්මා කතාකල්ලා ඇහුවොත් කියන්න බෑන්ඩ් ප්‍රැක්ටිස් කියන්න කියලා.. මම ඒකට රිප්ලයි කල්ලා ගේ අතුගාගෙන යද්දිම වගේ තමා රධ්‍ය අයියා අපේ ගෙදර ආවෙ..

ඊටපස්සෙ ඉතින් රධ්‍ය අයියා අම්මට වැන්දහම අම්මා අම්මගෙ අත් දෙකින්ම රධ්‍ය අයියගෙ මූණ අල්ලගෙන එයාට සුභ පැතුවා.. අපේ අම්මා ඔහොම කියන්නෙ හැසිරෙන්නෙ මෙ කැස්බෑවා විය සිදුරෙන් එළිය බලනවා වගේ හරිම කලාතුරකින්.. මටත් යාන්තම් පුදුම හිතුනා.. මම ඉතින් අතුගාලා ඉවරවෙලා කොස්ස තිබ්බ තැනින් තියලා බිත්තියට හේත්තු වෙලා එයාලා දෙන්නා දිහා බලාගෙන ඉදියා..

රධ්‍ය අයියා ඔහොම අවංකවම හිනාවෙද්දි හරි ලෝබ හිතෙනවා.. මගේ පපුවට ඒක හොදට දැනුනා..

" පුතා.. කෑම කාලම යන දැන් ඉතින් ආපු එකත් වෙලා.. ඉන්නකො මම කතාකරන්න.."

@Shan

අම්මා කුස්සියට යනකල් ඉදල රධ්‍ය අයියා හිමීන් සැරේ ඇවිත් මං ගාවින් බිත්තියට හේත්තු වුනා..

" ගුඩ් මෝනින්.."

" ගුඩ් මෝනින් විතරද.. කොහොමත් දැන්නම් මෝනින් එක ගුඩ් වගේ තමා.."

" එහෙමද.. තා මොනවද දන්නෑ ඕන.."

" අපි දන්නෑ.. මෙ ඒකනෙමෙ.. වරද්.. කාලා හොස්පිටල් යන්න ඕන.."

" මම ඔයාගෙන් අහන්නනෙ ඉදියෙ.. අපේ අම්මා ඉස්සරහා ඕවා ඇහෙන්න කියන්න එපා.. ඊටපස්සෙ දන්නවනෙ..මුල ඉදන්ම අහන්න ගන්නවා.."

" ම්ම්.. අයුකට පොඩ්ඩක් අමාරුයි.. බ්ලීඩ් වෙලා පැය බාගෙක විතර ඉදන්.. අපි යද්දි අයි සී යූ ඉදියෙ.. උදේ වෙද්දි රූම් එකට මාරු කලා.."

" අයුක අයියලගෙ ගෙදරින් ඇවිල්ලද.."

" නෑ බං.. බලු බල්ලෙක් නෑ.. මමයි අපේ අයියයි කියානයයි විතරයි ඉදියෙ උදේ වෙනකල්.. ඒකා බලාගන්න.."

" මාර මිනිස්සුනෙ.. යකෝ එහෙමත් කරනවද.."

" ම්ම්.. මම යනගමන් කියන්නම්.. අම්මා ඉන්නවනෙ.."

" හා.."

උදේ රධ්‍ය අයියා කෑමත් කාලා අපේ අම්මා එක්ක කතාකරනකල් මම ගිහින් ඇදුමක් දාගෙන ආවා.. අපේ අම්මටත් ඉතින්.. රධ්‍ය අයියා එක්ක කියවන්න ගත්තහම ඉවරයක් නෑ.. හැම එකම අහනවා.. පුතෙ ඒහෙම කොහොමද.. මෙහෙම කොහොමද.. ඇයි ඒ එහෙම.. රධ්‍ය අයියට මගේ කියවිල්ල අහගෙන ඉදලා ප්‍රැක්ටිස් එකෙන් ඒ සේරම අහගෙන ඉදියා.. ඊටත් වඩා එයාම තමා අම්මව කතාවට අවුස්ස ගන්නෙ.. ඒ හැම එකක්ම ආසාවෙන් අහගෙන ඉන්නවා.. අපේ අම්මටත් කටපුරා 'අම්මා' කියලා කියනවා.. මම එහෙම කතාකරනවා අහන් ඉන්න ආසයි.. මම ඉතින් දෙන්නගෙ කතාව අහ අහ ලෑස්ති වෙලා කාමරෙන් එළියට ආවා..

@Shan

" අම්මෙ.. මම මෙහෙමම සෙනුකයා හම්බෙන්නත් යනවා.. ගිහින් හවස් වෙන්න කලින් එන්නම් හොඳේ.."

" ආ.. පරිස්සමට ගිහින් එන්න එහෙනම්.. මේ පුතා ආයෙම දවසක එන්නකො මෙහෙ.. හරිද.."

" හා අම්මා.. ගිහින් එන්නම්.."

රධ්‍ය අයියා අම්මට වැඳලා මාත් එක්ක හොස්පිටල් එන්න ආවා..

" මොකක්ද පස්සෙ කියනවයි කිව්වෙ.."

" ම්ම්?? ආ මම කියන්න ගියේ.. අයුකයගෙ මෙන්ටල් හෙල්ත් එක එච්චර හොඳ නෑ වගේ.. ඩොක්ට නම් කිව්වෙ රිකවර් වුනාම සයිකැට්‍රිස්ට් කෙනෙක්ට දාමු කියලා.. මම හිතන්නෙ ඌ කලිනුත් ට්‍රීට්මන්ට්ස් වල හිටියෙ.. අපේ අයියා කියනවා අයුක හැසිරෙන විදියට නම් එයා ඩිප්‍රෙස් වෙලා වගේ තේරෙනවලු.."

" ආ??"

" ඒකනිසා තමාලු සුයිසයිඩ් කරගන්න ට්‍රයි කරන්නෙ.. මට තේරෙන්නෑ වරද්.. අයුකගෙ ගෙදර ඉන්නෙ මිනිස්සු නෙමෙ අමනුස්සයො.."

" ඒකතමා.. අයුක අයියා හැසිරෙන හැටි අමුතුයි තමා.. පහුගිය ටිකේ මට හිතුනා.. හිටි ගමන් අඬනවා.. ඔහේ බලාගෙන ඉන්නවා.. දැන් මොකද අපි කරන්නෙ.."

" ඌව තනි කරන්න හොඳ නෑ.. කොහොමහරි ලගින් ඉන්න ඕන.. ආයෙ මොනව කරගනීද දන්නෙ නෑ.. සෙනුක මල්ලිවත් ඉන්නවනම් මේ වෙලේ ලොකු දෙයක්.."

" ඌ නම් ඉදීවි.. ඊයේ අඬලා අඬලා දෙවනත් කලා.."

" උන් දෙන්නා පව් බං.. මට කරන්න පුලුවන් උපරිමේ මම කරනවා.. අයුකයා මට ලගම එකෙක්.. මගෙ හිතට අවුල්.."

" ම්ම්.. මටත් දුකයි.. ඒත් ඉතින් දුක් වෙලා හරියන්නැනෙ.. දැන් කරන්න තියෙන එකම දේ අයුක අයියා සනීප කරගන්න එක.."

@Shan

" ම්ම්.. බලමු.."

" මම ඔයා එක්ක ඉන්නවනෙ.."

මම රධ්‍ය අයියා කලවෙකින් තියාගෙන හිටිය අත අස්සෙන් ඇඟිලි තුඩු පටලගෙන එයා දිහා බලාගෙන ඉදියා.. රධ්‍ය අයියා මගේ අත තදට අල්ලගෙන මගේ දිහා බලලා හිනාවුනා.. ඒක හරියට 'මම දන්නවා' කියන්න වගේ එකක්.. ඒ වුනාට.. මම එයා එක්ක ඉන්නත්,

මම දැනගෙන හිටියෙ නෑ අපිට මොනවා වෙයිද කියලා..

මගේ පුංචි ලමයිනේ,

රෑ වුණා නේද.. කමක් නෑ.. මට ඉතින් ඔයාලා එක්ක කතාකරන්න හිතුනා නෙ.. මම බිත්තිය හරහා එම්නෙ දැන්.. අහම්නකො..

ඔයාලා දන්නවනෙ??

ජීවිතේ ගැන..

එක එක්කෙනා කොහොම කිව්වත්

අපේ ජීවිත එක සමාන නෑ

එහෙමනෙ??

මමයි ඔයයි අපි දෙන්නෙක්නෙ??

අපි හැමෝම බලාපොරොත්තු වෙන්නෙ කොහෙන්හරි සැනසීමක්

ඒක එක්කො සින්දුවක් වෙන්න ඇති

මනුස්සයෙක්

ඩ්‍රාමා එකක්

චිත්‍රයක්

@Shan

මතකයක්

හීනයක්

මේ ඕනම දෙයක් වෙන්න ඇති

මේ ගමන හරි මහන්සියි

නේද??

ඉවරයක් නැතුව අපි දුවනවා දුවනවා

සමහර වෙලාවට අපි දුවන්නෙ ඇයිද කියලවත් අපි දන්නෙ නෑ

දුක හිතුනහම කියන්න කෙනෙක් නෑ

කියන්න කෙනෙක් ඉදියට එයාට ඒක තේරුම් ගන්න බෑ

හැමතිස්සෙම හිත් බිදීම් විතරයි

අපහාස විතරයි

සතුටක් හොයන ජේන තෙක් මානෙක නෑ

හරිම මහන්සියි ළමයෝ..

ආදරේ ඕනමයි කියලා හිතෙන වෙලාවල් එනවා නේද

මේ තරුණ වයසේ අපි හැමෝම ඉන්නෙ මහා පීඩනේක

ඒක අපිට වඩා වැඩිහිටි පරම්පරාව තේරුම්ගන්නෙ අඩුවෙන්

ඔලුව රිදෙනවා අම්මෙ කිව්වොත්

'තව ෆෝන් එක ඔබපන් එතකොට හරි'

' නිදි මරාගෙන මොන මගුලක් කරනවද දන්නෙ නෑ'

' අපේ කාලෙ උන් ඔහොම හැදුනෙ නෑ'

@Shan

අපි බලාපොරොත්තු උනේ එහෙම උත්තරයක්ද??

නැනෙ..

නෑ..

අපි බලාපොරොත්තු උනේ

' මොකක් හරි අසනීපයක්ද'

' ටිකක් නිදාගන්න'

' ප්‍රශ්නයක්නම් කතාකරමුද'

ඔහොම මොකක් හරි සැනසීමක් ගේන වචන කීපයක්නෙ..

එයාලා තේරුම්ගන්නෙ නෑ.. තේරුම් කරන්නත් බෑ..

මම අදහසක් දෙන්නම්..

හැමතිස්සෙම හැල්මේ දුවන්න එපා..

ටිකක් විවේක ගන්න..

ඔයා ඔයාටම ඔච්චර නපුරු වෙන්න එපා..

ඔයාවම තුවාල කරගන්න එපා..

රිද්දගන්න එපා..

වචන වලට රැවටෙන්න එපා..

ඔයාගෙ වටිනාකම අඩුකරගන්න එපා..

මිල අධික මනුස්සයෙක් වෙන්න ට්‍රයි කරන්න

දවසින් දවස මොකක් හරි දේකින් වටිනාකම වැඩි කරගන්න

හැමදාම වරදින් නැන් නෑ..

@Shan

දවසක් එනවා එදාට හරියනවා..

එතකල් ටිකක් අමාරුයි..

ඉවසන් ඉමු..

ආදරෙන්..

මම දන්නවා අද දවස ඔයාට.. මේක කියවන ඔයාට හරි අමාරු දවසක් වෙන්න ඇති.. එහෙමනෙ?? ප්‍රශ්න ගොඩයි නේද ඔලුවෙ.. හිතලා හිතලා මල කරුමෙ ඔලුව කකියනවා වගේ නේ??

හැබැයි මම විශ්වාස කරනවා.. එහෙම අමාරුවෙන් දවස් ගෙවන ඔයාගෙ ජීවිතේ ස්ටෝරිය තමා ලෝකෙ හොදම චරිතාපදානෙ වෙන්නෙ.. පරණ චැප්ටර් ඔන්නෑ.. මේ අලුත් චැප්ටරේ ඉදන් අපි පටන්ගමු.. පෑන තියෙන්නෙ ඔයාගෙ අතේ.. හිස් පිටු ගොඩක් තියෙන පොතක් ඔයා ඉස්සරහා තියෙන්නෙ.. ඇදේ යවාගන්නැතුව හරි කෙලින් ලියන්න.. ඔන්න ඔහේ වචනයක් වැරදුනාට කමක් නෑ.. තනි ඉරකින් කපලා දාන්න.. වැරදුනා කියලා පේන්නත් එපැයි..

❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 56 කොටස

" සෙනුකලා ඇවිල්ලා ඇති නේ??"

" ඔව් කියාන් කතාකල්ලා කිව්වා ආවා කියලා.."

අපි හිටියේ LANKA HOSPITAL එකේ කා පාකින් එකේ.. උදේ දහයට කිට්ටු කල්ලා.. රධ්‍ය අයියා මම ශුස් දෙක දාගන්නකල් කාර් එකෙන් බැහැලා ගිහින් මගේ පැත්තෙ දොර ඇරියා..

" යමු.."

" ඉන්න ඉන්න.."

මම ශුස් දෙකේ ලේස් දෙක ගැටගහගෙන කාර් එකෙන් බැහැලා එයාගෙ පස්සෙන් ඇවිදගෙන ඇවිදගෙන ගියා.. ඒක හොස්පිටල් එකක් වගේ නෙමෙ තනිකර හොටෙල් එකක් වගේ මටනම් තේරුනේ.. මූණ පේන්නම පිරිසිදු බිම, කුනු පොදක්වත් නැති බිත්ති, පලයිට් ස්ටාෆ් එක, සැරින් සැරේ ඇහෙන කාම් අනවුන්ස්මන්ට්ස්, ස්ලෝ මියුසික්.. මට ඒ එක්කම මතක් වුනේ රජයේ ඉස්පිරිතාලෙ.. මම පහත් කල්ලා හිතන අදහසින් කියනවා නෙමෙයි.. ඒ වුනාට ඒවයි මේවයි අහසයි පොලොවයි වගේ.. සැරම සැර ඇටෙන්ඩන්ලා, නර්ස්ලා, එතකොට ගියාම පිරිසිදු නැති ටොයිලට්, ඕපීඩී එක.. ඒ හැමදේම.. කවුරු හරි කියනවනම් සල්ලි නැති ජීවිතේ සතුටින් ඉන්න පුලුවන් කියලා..

අනේ නිකම් පලයන් බං යන්න..

මම රධ්‍ය අයියා යන පස්සෙන් ඇවිදගෙන යද්දි රධ්‍ය අයියා නැවතිලා මගේ අතකින් අල්ලගෙන ආයෙම ඇවිදගෙන ගියා.. අපි අත් අල්ලගෙන ඇවිදගෙන ගියත් අපි පහුකරගෙන යන කිසිම කෙනෙක් අපි දිහා විශේශෙන් බැලුවෙ නෑ.. කිසිම කෙනෙක්.. ඒක නම් ඇත්තටම හිතට සහනයක්.. නැත්නම් කොල්ලො දෙන්නෙක් මෙහෙම පාරෙ හරි වෙන පබ්ලික් ප්ලේස් එකක අත් අල්ලගෙන ඇවිදගෙන ගියොත් මම නම් හිතන්නෙ ඊලග දවසේ ෆේස්බුක් එකේ කට්ටියක් ලියාවි 'ආදරේට කොයින්ද සීමාවක්' කියලා.. ආයෙම තව කට්ටියක් ලියාවි 'සමනල්

@Shan

හැගුමන් අතරේ' කියලා.. එහෙම ප්‍රසිද්ධ වෙන්න අපි දෙන්නගෙන් එක්කෙනෙක්ටවත් උවමනාවක් තිබුනෙ නෑ..

අපි නතරවුනේ ෆෝත් ෆ්ලෝ එකේ රූමස් තිබ්බ පැත්තෙ අන්තිමටම තිබ්බ රූම් එක ගාව.. දොරේ තිබ්බ වීදුරුවෙන් මට බොද වෙලා වගේ සෙනුකව පෙනුනා.. තව කියාන් අයියත්.. රධ්‍ය අයියා දොර ඇරගෙන මාවත් ඇදගෙනම ඇතුළට ගියා..

අයුක අයියා හිටියේ අවදියෙන්.. එයාගෙ ඇස් මලානික වෙලා වගේ කිසි හැගීමක් නැති හිස් ගතියකින් පිරිලා තිබුනා.. මම මුලින්ම දැක්කෙ ඒ ඇස්.. ඒවා කවදත් හිනාවෙලා තිබුනු ඒවා නොවුනත් හැගීම් පිරිලා තිබ්බා.. ඒ වුනාට දැන් මෙතන හිටියේ ලේ කදුලක්වත් නැතුව ඔහේ බලගෙන ඉන්න මලම්නියක් වගේ මනුස්සයෙක්.. අතේ වැලමිට ගාව ඉදන් මැණික් කටුව ගාවට යනකල් සුදුපාට බැන්ඩේජ් වලින් සනකමට ඔතලා.. අනිත් අතේ සේලයින් එකක් ගහලා තිබුනා..

රධ්‍ය අයියා දැක්ක ගමන් අයුක අයියා ඇදලගම හිටගෙන හිටපු සෙනුකගෙ පපුවට මූණ තියාගත්තා.. සෙනුක ඒක බලපොරොත්තුව ඉදියා වගේ.. සෙනුකගෙ මූනෙ තිබ්බෙ කිසි සතුටක් නැති හැමදේම කලකිරුනු පෙනුමක්.. ඌ ඉන්නෙත් ගිනි ගොඩකනෙ..

මම හිතලා බැලුවොත්.. මම සෙනුකයගෙ තැන හිටියනම් මටත් පිස්සු හැදෙනවා.. සෙනුකයා අඩ අඩා හරි හැමදේටම මූණ දෙනවා.. මම?? මම මොනවා කරගනීද මට හිතාගන්න බෑ.. මම අනිත් උන්ගෙ ප්‍රශ්න වලට දාර්ශනිකයා වගේ මැදිහත් වුනාට මට ප්‍රශ්නයක් ආවොතින් නම් ලෙල්ලටම නාගෙන හත්පොලේ ගාගන්නවා.. ඔක කිය කිය තමා රධ්‍ය අයියා හැමතිස්සෙම මට බනින්නෙ..

අපි මූණදුන්නු ප්‍රශ්න හැම එකක්ම අපේ වයසට කඩාපාත්වුනු ඒවා නෙමෙයි.. ජීවිතේට මේ වගේ හෙන බරපතල ප්‍රශ්න සෙනුකයගෙ ජීවිතේ තිබ්ලම නෑ.. ඔහේ පිස්සා වගේ නට නට කියව කියව ඉන්න සෙනුකයා දැන් හැමදේටම පොඩ්ඩක් ඇත්නම් කේන්ති ගන්නවා.. ඊයෙත් ඒකමනෙ වුනේ..

අපි ආවා කියලා අයුක අයියා කතාකලේ නැති නිසා මමයි කියාන් අයියයි රූම් එකේ තිබ්බ සෝෆා එකේ ඉදගෙන කතාකර කර හිටියා.. සෙනුකයි රධ්‍ය අයියයි අයුක අයියට සූප් එකක් පොවලා වෙට් ටවල් එකකින් එයාව

@Shan

ක්ලීන් කලා.. ඩොක්ටර් කෙනෙක් ඇවිත් සේලයින් එකට බෙහෙත් වගයක් ඉන්ජෙක් කලාට පස්සෙ අයුක අයියට නින්ද ගියා හොදටම.. සෙනුකයා මෙච්චර වෙලාම අඩන්නැතුව ඉදියේ අමාරුවෙන් කියලා මට තේරෙනවා.. අයුක අයියට නින්ද ගියාට පස්සෙ සෙනුකගෙ ඇස් වලින් කඳුලු වැස්සක් වහිනවා වගේ කඩන් වැටුනේ..

" අනේ ෂනෙරු.. මට තේරෙන්නෑ බං.."

සෙනුකයා මගේ එහාපැත්තෙන් ඉඅගෙන මූණ අත් දෙකින්ම වහගෙන සෝෆා එකේ පිටිපස්සට බරවුනා..

" අපි මොකක්ද බං කරන්නෙ.."

කියාන් අයියා රධ්‍ය අයියගෙන් අහද්දි රධ්‍ය අයියා ඒක ඇහුනේ නෑ වගේ අයුක අයියා නිදාගෙන උන්නු දිහා බලාගෙනම හිටියා.. විනාඩි පහක් විතර.. එකදිගටම එයා කලේ බලාගෙන ඉන්න එක විතරයි.. කාමරේ එයා කන්ඩිශනර් එකෙන් එන සද්දෙයි සෙනුක සැරින් සැරේ නහය උඩට අදින සද්දෙයි ඇරෙන්න අපි අතරෙ වෙන කිසිම සද්දයක් තිබුනේ නෑ.. අයුක අයියා සාමාන්‍ය ලමයෙක් වුනානම් එයාට අද වගේ දවසක සතුටු වෙන්න තිබ්බා.. හැමෝගෙන්ම සුභ පැතුම් පනිවිඩ එක්ක කෝල්ස් එන්න තිබ්බා.. ඒත් එයාගෙ වෙලාවට ඒක එහෙම වුනේ නෑ.. අඩුම තරමේ එයාලගෙ ගෙදරින් කිසිම කෙනෙක් කෝල් එකක්වත් දුන්නෙ නෑ.. හොස්පිට්ල් බිල් එක විතරක් සෙට්ල් කරන්න ඉන්න එයාලගෙ පවුල ගැන මට දැනුනේ මහා අප්පිරියාවක්..

" උඹ හිතනවද අයුකයා මෙහේ තියන එක හොද දෙයක් කියලා.."

" ඒ කිව්වෙ..??"

" අයුක මෙහෙ ඉන්න ඉන්න උගේ ගෙදර උන් ඌට ඉන්න දෙන්නෙ නෑ.. ඊයෙත් මෙ රණ්ඩුව උනේ උගේ තාත්තා ගෙදරට ගෑනු දෙන්නෙක් ගෙනැල්ලා මූ ඉස්සරහම මොකක්ද මගුලක් කරන්න ගියපු නිසානෙ.."

" මන්දා බං.. අයුකයා ඉවසන තරම් මටනම් ජීවිතේට ඉවසන්න බෑ.."

" කාටද බං ඔහොම ඒවා ඉවසන්න පුලුවන්.."

@Shan

" දැන් ඉතින් මොකක්ද කරන්න හදන්නෙ.."

මම සෙනුකයගෙ කකුලක් උඩින් අතක් තියලා උාට අඩන්න එපා කියන ගමන් රධ්‍ය අයියගෙන් ඇහුවා..

" අයිඩියා එකක් තියෙනවා.. මට හිතාගන්න බැරි කොහොමද ඒක කරගන්නෙ කියලා.."

" ඒ කිව්වෙ??"

" අයුක පවුල එක්ක ඇලිලා ඉන්න තරමට උා ලෙඩෙක් වෙනවා.. අපිට බැරිවෙයිද ඩිග්‍රි එක ඉවරවෙනකල් උාව වෙන රටක වත් යවාගන්න.. එහෙම වුනොත් අවුරුදු හයක් විතර අයුක එහෙ ඉදීවි.."

රධ්‍ය අයියා කියද්දි කියාන් අයියයි මමයි හැරිලා සෙනුක දිහා බැලුවා.. උා ඔහේ ඉස්සරහා බලාගෙන ඉන්නවා.. උාට මේ දේවල් හිතාගන්න බැරුවැති.. මට ඇත්තටම පුලුවන් වුනානම් උගේ හිතේ තියන වේදනාවෙන් කොටසක් ගන්න.. ඇත්තටම මම එහෙම කරනවා දෙපාරක් නොහිතා..

" ඉදලා??"

" ඊටපස්සෙ ඉතින් අයුකම එයාගෙ ජීවිතේ ගැන තීරනයක් ගනී වරද්.. එක්කො උා එහෙ ඉදී නැත්නම් ලංකාවට එයි.. එහෙම මොකක් හරි තමා.."

" ඒකට සල්ලි.. ?? අනික මේ තත්වෙ එක්ක අයුක අයියව තනියම යවන්න පුලුවන්ද.."

" සල්ලි නම් මොකක් හරි කරගන්න බලමු.. ස්ටුඩන්ට් ලෝන් එකක්වත් සෙට් කරගන්න පුලුවන් නෙ.. අයුකයගෙ පවුලෙ උන් මේකට ගෑවෙන්නෙ නැතුව ඕන එකක්.."

" උඹ කියන එකේ අවුලක් නම් නෑ තමා..ඒත් අයුකයා මල්ලිව මෙහෙ තියලා යයිද බං.."

" නෑ අයියෙ.. මම මොකුත් කියන්නෙ නෑ.. මෙහේ ඉදගෙන මෙහෙම දුක් විදිනවට වඩා හොදයි එයා එහෙම ගිහින් ජීවිතේ හදාගන්න එක.. ඇත්තට

@Shan

මූණ දෙන එපැයි.."

" ම්ම්.. අයුක අයියා හොද තත්ත්වෙකට ආවට පස්සෙ කතාකල්ලා බලමු.."

අපි හුගක් වෙලා කතාකර කර ඉදියා.. සෙනුක හිටියේ හිතේ පුපුරන්න දුකක් හිර කරගෙන.. මට තේරෙනවා.. ඒ වුනාට ඌ ඒක කියන්නෙ නෑ.. මම දන්නෙත් නෑ මොකක්ද කරන්න ඕන කියලා.. ඒත් හැමතිස්සෙම හොද දෙයක් වේවි කියලා මගේ හිත මට කිව්වා.. අයුක අයියා තනිවෙලා නෑනෙ.. එයාට හොද යාලුවෝ හිටියා..

හවස් වෙනකල් මමයි රධ්‍ය අයියයි හොස්පිට්ල් එකේ ඉදලා එන්න ආවා.. සෙනුකයටත් ගෙදරින් කෝල් එන්න ගත්ත නිසා ඌ බස් එකේ ගෙදර යනවා කියලා ගියා.. කියාන් අයියා අයුක අයියා ගාව නතර වුනා.. කියාන් අයියගෙ අම්මා ආපු නිසා ලොකු අවුලක් වුනේ නෑ.. ඒ ආන්ටි හුගක් හොද පාටයි.. පොඩි කාලෙ ඉදලම ඒ තුන්දෙනා යාලුවො නිසා අම්මලා අදුරනවා ඇති..

මම කාර් එකේ එන ගමනුත් ශටර් එකට මූණ තියාගෙන එළිය බලාගෙන හිටියා.. සෙනුකයා මේ දේවල් අස්සෙ කොහොමද එක්සැම් කරගන්නෙ.. මට හිතාගන්න බෑ.. මගේ හිතට හරි බරයි.. සතුටින් හිටපු කාලෙ ගෙවීගෙන යනවා මට දැනුනා.. හැම සීත කාලෙකටම පස්සෙ වසන්තයක් එනවා කිව්වට මට වුනේම ඒකෙ අනිත්පැත්ත.. වසන්ත කාලෙ ගෙවිලා ඉවරවෙන්න හදනවා.. ඊටපස්සෙ එන කාලෙ ගැන මට අදහසක් නෑ..

" මොනවද කල්පනා කරන්නෙ.."

රධ්‍ය අයියා දිගටම ඉස්සරහා බලාගෙන මගෙන් ඇහුවා..

" එකක් කියලා නෑ.."

" අපි බලමු.. මොකක් හරි හොද දෙයක් වෙයි වරද්.. අයුකයා ඉක්මනට සනීප වේවි.."

" එහෙම වෙනවනම් ලොකු දෙයක්.."

" අනිවාරෙන් එහෙම වෙයි.."

@Shan

රධ්‍ය අයියා අතක් දික් කලා මගේ කොන්ඩෙ අවුල් කලා..

" බඩගිනී වගේ නැද්ද ඔයාට.."

" ම්ම්.. ලොකුවට නෑ.."

" කොහේහරි යමුද..??"

" දැන්..??"

" ඔව්.. දැන්.. තාම ලොකුවට හවස් වෙලා නැනෙ.."

" මම අම්මට කියලා ඉන්නම්.."

" ම්ම්.."

මම අම්මට කතාකල්ලා එන්න පොඩ්ඩක් රෑ වෙයි කියලා කිව්වා.. අපේ අම්මට අනුව මම ඉතින් කොල්ලෙක්නෙ.. එහෙම යාලුවෙක් එක්ක අරහෙ මෙහෙ ගියාට කමක් නෑ පරිස්සමට ගෙදර එනවනම්.. අම්මා මාව හිර කරගෙන ඉන්න ලොකුවට දගලන්නෙ නෑ.. අම්මා දන්නවා කොහොමවත් මම මැරෙන්නැතුව යහතින් කීයට හරි ගෙදර එනවා කියලා.. යහතින් නොවුනත් ඉතින් ගෙදරනම් එනවා..

පැය බාගෙකට විතර පස්සේ අපි හීයේ තනි කොළපාටම කොළපාට කැෆේ එකක් ඉස්සරහා.. කැෆේ එකක්ද රෙස්ටොරන්ට් එකක්ද මන්දා.. කොහොම වුනත් ඒකනම් මාරම හිත ඇදිලා යන පෙනුමක් තිබ්බ තැනක්.. මම කලින් මෙහෙ ඇවිත් තිබුනෙ නෑ.. බත්තමුල්ල හරියෙ තැනක් නිසා අපි දෙන්නගෙම ගෙවල් වලට මහා ලොකු දුරක් තිබ්බෙත් නෑ.. එළියේ ලාවට පොද ගහනවා.. තැනට ආවට පස්සෙ නම් මට හිතුනා අද පොඩ්ඩක් පරක්කු වෙලා ගෙදර ගියාට කමක් නෑ කියලා..

'

සිම්පල් ඒ අකුරක් තිබුනු ලෝගෝ එක වටේ කොළ පාටට එක එක ජාතියේ පැල,වැල් ජාති යවලා තිබුනා.. හරි නිදහස් තැනක් වගේ..

මම කාර් එකෙන් බැහැලා රධ්‍ය අයියා ලගට යද්දි එයා මාව ඇදලා අරගෙන කරට අතක් දාගත්තා..

@Shan

" මොන මගුලක්ද.."

මම රධ්‍ය අයියගෙ අත කර වටෙන් එහාට කල්ලා එයාව ඉස්සරහට තල්ලු කලාම මං දිහා හැරි හැරි බලාගෙන හිනාවෙවී ඇතුළට ගියා.. හරි හිනා.. සමයං.. කලොත් කරන්නෙ මහ ගැටපොලොස් කොට්ටෝරු වැඩක්මයි..

අපි ගිහින් ටේබල් එකකින් ඉඳගත්තා.. ඇත්තටම ඒකෙ ඇතුල මාරම මාරම මාර ලස්සනයි.. විස්තර කරන්නෙ කොහෙන්ද කියල හිතාගන බෑ.. මම ගස් කොළං තියෙන තැන්වලට සිම්පල් තැන්වලට හෙන ආසයි.. ඉතින් මේ කැෆේ එක තනිකරම ඩිසයින් කල්ලා තිබ්බෙ එක එක පැළ ජාති වලින්,වැල් ජාති වලින්.. හැමදෙයක්ම.. වුඩන් ෆ'නිචර් එක්ක කාම මියුසික්.. පොඩි රොමැන්ටික් වයිබ් එකකුත් එක්ක නිදහස් ගතියක් දැනෙනවා..

" ප්ලෙසන්ට් ඇට්මොස්ෆියර්.."

" ම්ම්.. මම හිතුවා ඔයා කැමති වෙයි කියලා.."

කොළ පාට ලාවට ඩිම් වෙලා තියෙන ලයිට්ස් වලින් මම මගේ ඉස්සරහා වාඩිවෙලා ඉන්න රධ්‍ය අයියා දිහා බලාගෙන හිටියා.. හරි පුදුම මනුස්සයෙක් තමයි.. හැමදාම කොහේට හරි ගිහිල්ලා කියන්නෙ 'මම හිතුවා ඔයා කැමතිවෙයි කියලා'.. කවමදාවත් කියන්නෙ නෑ 'මමත් මෙතෙන්ට ආසයි' කියලා.. හුගක් වෙලාවට අපි දෙන්නම කැමති දේවල් එක වගේ.. ඒ වුණාට එහෙම මං ගැන විතරක්ම කියලා කැමතියි කියද්දි හරි අමුතුයි අමුතුයි වගේ..

" ඉතින් ඔයාට එහෙම හිතුනද.."

මම කම්මුලකට අතක් තියාගෙන රධ්‍ය අයියගෙන් අහද්දි එයා බොරුවට බිසී කියලා පෙන්නන්න මෙනූ එක දිගෑරගත්තා.. අපරාදෙ මෙතන ලයිට්ස් කොළපාට නොවුණනම් මට මේකාගෙ රතු පාට මූණ දිහා බලාගෙන තිබ්බා..

" කියන්නකො.. හිතුනද.."

" ම්ම්.. ම්ම්.."

" තවුසෙ මෙතෙන්ට ආවෙ බස්සෙක් වගේ ම්ම් ම්ම් ගාන්නද ආ.."

@Shan

මම කකුලක් දික් කල්ලා රධ්‍ය අයියගෙ කකුලට පාරක් ගැහුවහම රධ්‍ය අයියා මගේ දිහා බොරුවට රවලා බැලුවා..

" දැන් මොකක්ද මිස්ටර් වරද්ට ඕන.. අවධානෙද ඕනෙ.."

" අන්න හරි.."

" අවධානෙ දීලා තියෙන්නෙ.."

" ඒකමිසක්.."

මට වෙන මොකුත් කියාගන්න හම්බුනේ නෑ වේටර් කෙනෙක් එතෙන්ට ආපු නිසා.. රධ්‍ය අයියා මොනවද මොනවද ඕඩර් කලා.. හෙන තොගයක්.. කොහෙට කන්නද දන්නෑ.. මගෙන් මෙලෝ ලබ්බක් ඇහුවෙත් නෑ.. ඇහුවෙ නැති නිසා ඉතින් මම කට පියාගෙන ඉදියා..

" තර්ටි මිනිට්ස් වගේ යාවි සර්.."

" දැට්ස් ෆයින්.."

වේටර් එතනින් යනකල් ඉදලා රධ්‍ය අයියා මෙනූ එකත් පැත්තකින් තියලා පුටුවෙ පිටිපස්සට හේත්තු වෙලා අත් දෙකත් බැදගෙන මගේ දිහා අමුතු විදියට බලාගෙන හිටියා.. දෙන්න හිතයි මුගෙ මනමාලකම.. සැක්.. ඕකනෙ බැරි..

" මොකෝ.."

" මොකුත් නෑ.. අවධානෙ දීගෙන ඉන්නෙ.. දැන් ඉතින් මොනවහරි කියන්න.."

" මොනවා කියන්නද.. මම මලක්.."

" මොන මලක්ද..?? බිම්මලක්??"

" නෑ කෙහෙල්මලක්.."

" අන්න රයිට්.. ගැලපෙනවා.."

@Shan

මම කකුල දික් කල්ලා ආපහුම රධ්‍ය අයියගෙ කකුලට පාරක් ගැහුවා..

" මොකද බං ගහන්නෙ.. නටන්නැතුව ඉදපන්කො.."

රධ්‍ය අයියා මට නටන්නැතුව ඉන්න කිව්ව නිසා මම පුටුවෙ පහලට රුටලා ගිහින් මූණ ඇද කරගත්තා..

" මොනවහරි කියන්න දැන් ඉතින්.. අපි මොනවා ගැනද කතාකර කර හිටියෙ කලින්.."

" අපි අන්තිමටම සතුටින් කතාකලේ මොකක් ගැනද.."

" ම්ම්.. රිසාල්ට්ස් ගැන?? නෙ??"

" එතන ඉදන් කතාකරමු.."

අපි කතාකරන අතරේ වේටර් ආපහු ඇවිත් මොක්ටේල්* ග්ලාස් දෙකක් ටේබල් එක උඩින් තියලා ගියා..

" ඔයා බ්ලූ ලැගූන් කලින් ට්‍රයි කල්ලා තියෙනවද.."

රධ්‍ය අයියා මගේ පැත්තට බ්ලූ ලැගූන් මොක්ටේල් ග්ලාස් එක හිමිහිට තල්ලු කල්ලා බ්ලැක් කරන්ට් මොජිටො එක එයා ගත්තා..

" මම කලින්.. ට්‍රයි කල්ලා නෑ.."

" සිරාවට?? යූ මස්ට් ට්‍රයි දිස්.."

" කේ.."

මම බ්ලූ ලැගූන් මොක්ටේල් එකේ ස්ට්‍රෝ එකෙන් පොඩ්ඩක් ඇදලා බැලුවා.. ඒක සීතලම සීතයි.. නිල් පාටයි.. මුලින්ම අමුතු තිත්ත රහක් එක්ක ලෙමනේඩ් රහක් එනවා.. ටිකකින් ඒකට ආස හිතෙනවා.. ඒ ඇරෙන්න පොඩි ඇල්කොහොලික් ගතියක් දැනෙනවා..

" අවුලක් නෑ.. ටිකක් වෙනස්.."

@Shan

" ටිකක් වෙනස් කිය කිය ඕක ඇදලා ඇරලා පස්සෙ වැනෙන්න තියාගන්නෙපා.."

" පිස්සුද අනේ.. එහෙම වෙරි වෙන්න මම පොඩි එකෙක්යැ.."

මම තියන පණ්ඩිතකමට ලොකු කම් කියවලා රධ්‍ය අයියා එක්ක වල් පල් කියව කියව මුලු බිලූ ලැගුන් එකම බීලා ඉවර කලා.. තිත්ත වුනාට ඒක බොන්න ආස හිතෙනවනෙ.. ලාවට පොඩි කැරකෙන ලයින් එකක් ආවට මම ඒක ගනන් ගත්තෙ නෑ.. මුලින්ම සිංහල කතාකර කර යස අගේට ඉදපු මට ටික වෙලාවක් යද්දි ඉබේම කඩ්ඩෙන් කියවෙන්න ගත්තා.. ඊටපස්සෙ කෑම ඕඩර් කරපුවා ආවා..

" මෙච්චර කෑම ඕඩර් කලේ තවුසෙ කොහෙට කන්නද අයියෙ.."

" කන්නෙ ඉතින් බඩට තමා.. වෙන කොහෙටද.."

" එහෙමද.. මම දැනන් හිටියෙ නැනෙ.."

මම කට්ල් ෆිශ් ඩිශ් එකට ගෑරුප්පුවෙන් ඇනලා එකක් කටට දාගත්තා..

" වෝහ්..!! Heavenly..~ මේ බලන්න.."

මම ඒ ගෑරුප්පුවම ආයෙම කට්ල් ෆිශ් පීස් එකකට ඇනලා රධ්‍ය අයියගෙ කටට බලෙන්ම එකක් එබුවා.. මම හිතන්නෙ එයා මොකක් හරි කකා හිටියෙ.. කමක් නෑ මම කන්න කියද්දි කන්නෝන.. නැත්නම් මගේ දැල්ලො පැටියා පව්නෙ..

" Heavenly නේද.."

"..."

" කියන්නකො අනේ.. Heavenly නේද.."

" ඔව් ඔව් Heavenly තමා.."

රධ්‍ය අයියා කොහොමහරි කැස්සක් හදාගන්නැතුව ඒක හපලා ගිල්ලා.. ඉබ්බෙක් කිරිමැටි ගිලින්න වගේ.. ඉබ්බො නේද කිරිමැටි ගිලින්නෙ.. කමක් නෑ වටෙවර්..

@Shan

" තවුසෙ අර දවසක් මට කියලා කවාගත්තෙ බොරුවට නේහ්..??"

" කවද්ද.."

" අර දවසක් රේසරේට කැපුණා කිව්වෙ ඇඟිලි.."

" මට  මතක නෑ??"

" ආ ඒ කියන්නෙ තවුසෙ මට බොරුවක් තමයි කල්ලා තියෙන්නෙ.. ඒකනිසා මට තව බ්ලූ ලැගූන් එකක් අරන් ඕන.."

" මොකක්?? මොන රේසරේද.. ඒකයි බ්ලූ ලැගූන් එකෙයි සම්බන්ධෙ මොකක්ද.."

" කොහොමහරි සම්බන්ධයක් තියෙනවනෙ.. දැන් තවුසෙ මට බොරු කල්ලා මම කියන එකට බෑ කියලත් කියනවද.. ආ..!!"

මම වටපිට බලලා ඒප්‍රන් එකක් ඇඳගෙන එහෙට මෙහෙට ඉවරයක් නැතුව දුවන ලස්සන අයියට කතාකලා..

" ප්ස් ප්ස් අයියා..!!"

" වරද්!!!"

" මේ ඔවා කට පියන් ඉන්න හරිත.. අයියා Can I have one more blue lagoon glass pwees.."

" sure sir.."

ඒප්‍රන් එක ඇඳගෙන හිටපු ලස්සන අයියා ආපහු දුවගෙන ගියා.. රධ්‍ය අයියා මගේ දිහා කන්න වගේ බලාගෙන ඉන්නවා.. ඕකා කොහොමත් මං දිහා ඒ කාලෙ ඉඳන් බලන් හිටියේ කන්න වගේ තමයි.. මට මතකයිනෙ.. මට කරපු හැම එක වෙනස්කමක් ගානෙම.. දවසක් අර ගමේ ඉද්දි කෝල් කල්ලා මට අයිසෙ කිව්වා.. වෙලාවට වැඩ කරන්න දන්නැද්ද ඇහුවා.. මම ඒකට අර සක්කිලි පූසටත් පයින් ගැහුවෙ.. ඌ මගේ මූණ උඩත් වාඩිවෙන්න හැදුවා.. පකයා.. ඇට දෙක තලන්න තියෙන්නෙ.. ඌයි මූයි එක වගෙ නිසා සක්කිලි පූසව පෙර වැරදි වලින් නිදොස් කොට නිදහස් කල්ලා ඒ සියලු වැරදි මූගේ පිටට දාලා මූව අවුරුදු සීයකට හිරේ දාන්න තියෙන්නෙ.. ඒ වුනාට ඌ හිරේ

@Shan

ගියාම මට පාලු හිතෙනවනෙ.. එතකොට කවුද මාත් එක්ක ඉස්කෝලෙ ඇරිල ගෙදර එන්නෙ.. මගේ හිතට දුක වැඩි නිසා මම මේසෙට ඔලුව තියාගෙන ඉවරවෙලා තිබ්බ මොක්ටේල් ග්ලාස් එකේ දියවෙලා යන ලොකුම ලොකු අයිස් කැටේ දිහා බලාගෙන හිටියා.. එයා හිරේ යන්නම ඕනලුද ඉතින්.. මට ඇඬෙන්න වගේ එනවා..

" වරද්!! මොකද මේ.. නැගිටින්න.. ඒ වරද්.."

එයා හිරේ ගියාටත් පස්සේ මට එයාගෙ කටහඬ හැමතැනම ඇහෙන්න ගන්නවා.. මට දුක හිතෙනවා වැඩී එතකොට.. මම ඒකනිසා නැගිටලා පාඩුවෙ මගේ ඉස්සරහා තිබ්බ පැස්ටා එකෙන් ලොකු හැන්දක් පුරෝලා කටේ ඔබාගත්තා.. ඒක චීස් රසයි.. හැපී කව් චීස්ද දන්නෑ දැම්මෙ.. අනේ මගේ හැපීකව්වා හිරේ ගියානෙ.. එයා වෙලාවට කනවද කියලවත් මම දන්නෙ නෑ..

" කතාකරනවකො වරද්.. උඹට වෙරිද.. ආ..??"

මගේ ඉස්සරහා ඉදගෙන හිටපු පොල් කාවයියෙක් වගේ එකා නැගිටලා ඇවිත් මම වාඩිවෙලා හිටපු පුටුවේ පැත්තකින් වාඩිවුනා.. හොදවෙලාවට මේකෙ දෙන්නෙක්ට වාඩිවෙන්න පුලුවන් වුනේ.. නැත්නම් ඉතින් වාඩිවෙන්න වෙන්නෙ මගෙ උකුළ උඩ තමා.. ආස ඇති මගේ උකුළ උඩ වාඩිවෙන්න..

" මේ මොකද අඩන්නෙ.."

පොල් කාවයියා මගේ මූණ දෙපැත්තෙන් අල්ලගෙන කඳුලු පිහිදැම්මා..

" ඔයා ආසද මගේ උකුළ උඩ වාඩිවෙන්න..*සුරුස්*"

මම නහය උඩට අදින ගමන් ඇහුවහම එයා ටිශූ එකක් අරගෙන මගේ කට දෙපැත්ත පිහිදැම්මා..

" නෑ නෑ මම ඔයාගෙ උකුළ උඩ වාඩිවෙන්නෙ නෑ.."

" හා එහෙනම්.. ඔයා මගේ හිරකාරයව දන්නවද.."

" ඒ කවුද.."

@Shan

" මගේ හැපීකච්චා.. ගැටහැපල ලොපොස්කොට්ටෝරුවා.. එයා හිරේ ගියා.."

" ඒ ඇයි.."

" දන්නෑ.. අවුරුදු සීයකින් මම එයාව දැකලා නෑ.."

" එහෙමද.."

" ම්ම්.."

මම මගේ නහය මගේ එහාපැත්තෙ ඉදගෙන හිටපු පොල් කාවයියගෙ සුවද ෂර්ට් එකේ ඇතිල්ලුවා..

" එයා හම්බුනහම කියන්න මට එයාගෙ බල්ලො දෙන්නව ඕන කියලා.. තව ආඪ්‍ය අයියගෙ කණ්ණඩිදෙකත්.."

" ආඪ්‍ය අයියගෙ කණ්ණඩිදෙකත් ඕනද.."

" ඔ ඒකයි.. එච්චරක් ඕන.."

මම ඒ පොල් කාවයියගෙ බෙල්ල අස්සෙ මූණ ගහගත්තා..

" කාලා ගෙදර යමු.."

" අපි ගෙදර යනවද.."

" ඔව් දැන් යනවා.. ඉස්සෙල්ලම කාලා ඉන්න.."

මම ඒ එක්කම 'හව්' ගාලා පොල් කාවයියයියගෙ බෙල්ල හැපුවා.. ඉස්සෙල්ලම කාලා ඉන්න කියලනෙ කිව්වෙ..

" ආව් යකෝ.. මගේ බෙල්ල නෙමෙ.. කෑම එක කාපිය.."

පොල් කාවයියා මාව නැගිට්ටුවලා ඇගට වාරු කරගෙන මොනවදෝ කැව්වා.. ඒක රසයි.. මම හොදට හපලා කෑවා.. අපේ ආච්චිඅම්මා කියන්නෙ හොදට හපලා කන්න කියලා.. අනික හපලා කන්න ඕන එතකොට තමා දත් වලින් යාන්ත්‍රික ජීරනය වෙලා බේට ඇමයිලේස් එක්ක ඒවා රසායනික

@Shan

ජීරණය වෙලා අපිජිව්හිකාවෙන් පැනලා අන්නස්‍රෝතය දිගේ ක්‍රමාකුංචනය වෙවී ආමාශයට-

" වතුර බොන්න.."

" හා.."

මම වතුර එක ඔක්කොම බීලා 'බොහ්' ගාලා පුටුවෙ පිටිපස්සට කඩාගෙන වැටුනා.. ඊටපස්සෙ ටික වෙලාවකින් අපි කොළපාට ලයිට් තියන තැනින් කළුපාට තැනකට ඇවිදගෙන ඇවිත් කොම්ෆි කොම්ෆි මොකක් හරි එකකින් ඉඳගත්තා.. ඊටපස්සෙ මගේ එහාපැත්තෙ තිබ්බ දොරක් වැහුනා..

" අපි ගෙදරද යන්නෙ.."

" ම්ම්.."

මම පොල් කාවයියගෙ කොලර් එකට අත දික් කල්ලා ඒකෙන් අල්ලගෙන මගේ පැත්තට ඌව ඇදලා ගත්තා.. පොල් කාවයියා මගේ ගැටහැපලයා වගේ.. ඒ සුවඳමයි එන්නෙත්..

" Give me a kiss.. Give me one like he gives.."

" ම්-මොක??"

මම එයාගෙ කොලර් එකෙන් තව ටිකක් ඇදලා හැපීකච්ච දෙනවා වගේ නළලට එක හාදුවක් දීලා පෙන්නුවා..

" like that.."

ඊටපස්සෙ මට ලාවට දැනුනා මගේ කොන්ඩෙ අස්සෙන් ඇඟිලි වගයක් එහාට මෙහාට යනවා.. මම ඒ සනීපෙට ඇස් දෙක පියාගත්තහම අර මම ආසම නලලට දැනෙන හුස්ම වල රස්නෙයි තෙත ගතියයි මට දැනුනා.. මම දිගටම එයාගෙ කොලර් එක තද කල්ලා ගුලි කරගෙනම අල්ලන් හිටියා.. ඒක දැනෙන්නෙ නැතිවෙලා යන තැන ඉඳලා මට දුක හිතෙනවා.. එහෙම වෙන්න ඕන නෑ..

ඊටපස්සෙ කළුවරේම එයා මගේ කම්මුලේ පැත්තකින් අල්ලගෙන අනිත් අතේ මහපොට ඇඟිල්ලක් මගේ තොල් මැද්දෙන් තිව්වා.. මම ඇස් ඇරලා

@Shan

එයා දිහාම බලාගෙන ඉදියා.. එයාගෙ ඇස් පිහාටු දිගම දිගට බාගෙට පියවෙලා තිබුනා.. මට වෙන්නෙ මොකක්ද කියලා තේරුම් ගන්න වෙලාවක්වත් සිහියක්වත් තිබ්බෙ නෑ.. හීනෙකින් ඇහැරුණා වගේ දැනෙන්න පටන් ගත්තා..

එයා උන්නෙ මගේ මූණට හුස්මක් වැදෙන දුරකින්.. නෑ නෑ ඒ තරමටත් වඩා අඩු දුරකින්.. මම ඇස් දෙක පියාගන්නෙ නැතුව දිගටම එහෙමම ඉද්දි එකපාරම.. එකපාරටම ඒ ඇගිල උඩින් එයා තොල් තිව්වා.. මට ඒක දැනෙනවා නොදැනෙනවා වගේ.. මගේ තොල්වල හුස්ම වදිනවා.. ඒවා උනුයි.. මගේ පපුව දෙගුණයක් තුන්ගුණයක් වේගෙන් ගැහෙද්දි මම මගේ අතට අහුවුනු කොලර් එක අතේම ගුලි කරගෙන ඇස් පියාගත්තා.. මාව එයාගෙ පැත්තට ඇදිලා යනවා වගේ.. මගේ කම්මුලක තිබ්බ අත මගේ ඉණ වටේ එතුනා.. මම ඒ උනුහුමක් දැනෙන ඇග අස්සට ගුලි වෙලා තව තදට ඇස් පියාගෙන හුස්ම හිරකරගෙනම හිටියා..

" ආව් අම්මාහ්!!!!!!!!!!!!!!!!"

මම හිටියේ ඇදෙන් බිම..

" නැගිටලා ඉස්කෝලෙ යන්න ලෑස්ති වෙනවා සුදුමහත්තයෝ.."

" ටහික්කෙන හීනයක්නෙ යකෝ මම දැක්කෙ.."

" සුදුමහත්තයෝ!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

" ඒක හීනයක් නේද.. නේද.. නේ!!????????????? මම ඇයි ඩෙනිමක් ඇදගෙන නිදාගත්තෙ.."

ස්වප්නා.. හෝ.. ස්වප්නා.. දුහුල් මාරුතේ.. වෙලී මා ගතේ..

කොහොමද ලමායිනේ~ මම ආවා.. මොක්ටේල් කියලා වරද්ට කොක්ටේල් එකක් සැට් කොරපු අහිංසක මම.. හායි ඉට්ස් මී.. ඇම් ද ප්‍රොබ්ලම් ඉට්ස් මී..

මුලින්ම මම මේක කියන්න හිටියෙ 10K වුනු දවසෙ.. ඒත් අනේ මම වට්පැඩ් ලොග් වෙලා කතාව ලියන එක විතරනෙ කරන්නෙ.. වෙන මොකුත් කතා කියවන්නෙ නෑ.. එතකොට මට ඒවගෙ රයිටින් ස්ටයිල් මේකට ලියවිලා අන්ද්‍යකොරොස් වෙනවා මගේ රයිටින් ටයිප් එක.. ඉතින්

@Shan

මම ආයෙම දකිද්දි 10K එක 11K+ වෙලා.. හුගක් හුගක් ස්තූතියි මගෙ ලමයිනේ.. මම බලාපොරොත්තු වුනේ නෑ මෙච්චර ලෙන්ගතුකමක් මේ කතාව වෙනුවෙන්.. ඔයාලා හැමොටම හුගක් ආදරෙයි මම..

මට අද මගේ ආදරනීය ලමයා තෑග්ගක් දුන්නා.. මට සතුටුයිනෙ අනේ..

@JK_ChoHee ආදරෙයි පුංචි ලමයෝ..

එන්නාම්.. ලව් යූ ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම් යම් කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 57 කොටස

" Steward කෙනෙක් වුණ පලියට මෙතන ඉන්න හැමෝම හිතන්න එපා තමුන්ට කවදාහරි ස්කූල් සීනියර් ප්‍රිෆෙක්ට් බැජ් එකක් නිකන් හම්බවෙවි කියලා.. ඒකට කැපවීම , උනන්දුව වගේම

*හොද විනයක්*

අනිවාරෙන්ම තියෙන්න ඕන.."

" ඒක කිස් එකක්ද.."

" හොදයි මුලින්ම Stewardship එකක් කියන්නෙ මොකක්ද..??"

" නෑ ඒක කිස් එකක් නෙමෙ.. මම දන්න කිස් එහෙම නෙමෙ දෙන්නෙ.. කමෝන් වරද්.. ඒක කිස් එකක් නෙමෙ.. පිස්සුද උඹට.."

" Stewardship is the highest leadership position a student can achieve while still studying in school.."

" ආර්හ්!! මොන මගුලක්ද මෙ.. ඒක කිස් එකක් නෙමෙ!!!"

" They are selected from among the Grade 12 students in the beginning of their Advanced Level education. Their closeness to the student population makes them well suited to gather insights to couple with the previous experiences of Prefects which can be used for various improvements in the school structure.."

" නෑ නෑ මට එහෙම ලොකු මතකයක් නැතිවෙන්න බෑ.. එහෙම මොකුත් වුනේ නෑ.. වරද්.. සිහියට වරෙන්.."

" Stewardship is considered a challenging role for an Advanced Level student. Balancing academics with all extra and co-curricular activities in which they participate may sometimes be mentally and physically demanding for them.."

@Shan

මම හිටියේ ඉස්කෝලෙ මේන් හෝල් එකේ ලමයි එකසිය පනහක් පෝලිමට හිටගෙන ඉන්න ලයින්ස් වල ඉස්සරහම ලයින් එකක.. පොඩ්ඩක් කොට වුනා කියලනෙ කරුමෙට පෝලිම් වල ඉස්සරහට යන වෙලා තියෙන්නෙ..

මම උදේ ඉස්කෝලෙ ඇවිත් පලවෙනි පීරියඩ් එකට දෙයියනේ කියලා ඉඳගන්න යද්දිම අපේ ඉස්කෝලෙ අභිමානවත් කියලා හිතාගෙන ඉන්න ශිෂ්‍ය නායක කමිටුවේ අලි ඕලුවා රධ්‍ය ශනව් හෙලාක්ශයි සයෝන් අයියයි ක්ලාසස් වලට ඇවිත් නම් පෝලිමක් කියාගෙන ගිහින් ඒ ලමයිට මේන් හෝල් එකට එන්න කිව්වා.. මට පොඩිම අදහසක්වත් තිබ්බෙ නෑ මේ ගස් වැද්දා මොන එහෙකට කතාකරනවද කියලා.. මගේ නමයි සෙනුකයගෙ නමයිත් ඒකෙ තිබ්බා.. ඒ වුනාට අද සෙනුකයා ඉස්කෝලෙ ආවෙ නෑ.. අයුක අයියා හොස්පිටල් නිසා එහේ යනවා කිව්වා..

අන්තිමේදි මම මේන්හෝල් එකට ආවට පස්සෙ තමයි දැනගත්තෙ අපේ ඉස්කෝලෙ Steward කෙනෙක් විදියට මාව තෝරගෙන කියලා.. Stewardලා කියන්නෙ සීනියර් ප්‍රිෆෙක්ට් කෙනෙක් වෙන්නට කලින් තියන ලීඩර්ශිප් එක.. Steward කෙනෙක් විදියට මේ කාලෙ හොඳට හැසිරුනොත්, වැඩ කලොත් තමයි සීනියර් ප්‍රිෆෙක්ට් කෙනෙක් විදියට අපිව තොරගන්නේ.. මට මේ මගුලට එන්න කොහෙත්ම උවමනාවත් තිබ්බෙ නැතිවුනත් ඉස්කෝලෙ මට ඇරෙන්න අනිත් ඔක්කොන්ටම සැහෙන්න ලොකු අමාරුවක් තිබ්බා මගේ නම මෙකට දාන්න.. ඉතින් දැන් මම ඒ මීටින් එකේ හිටගෙන ඉන්නවා.. අපිට ඉස්සරහින් මේන්හෝල් ස්ටේජ් එකේ අර අලි ඕලුවා රධ්‍යකාරයා පහසුවෙන් හිටගෙන අත් දෙකත් පිටිපස්සට බැඳගෙන හරි ලොකු එකා වගේ අපිට Steward කෙනෙක් කියන්නෙ කවුද කියලා කියලා දෙනවා.. කොහොමත් ඉස්කෝලෙ ස්පීච්ස් කරන්නෙ ඌ තමා.. ඌ කතාකරන විදියට බය හිතෙනවනෙ.. මට නෙමේ අනිත් උන්ට එහෙමලු.. ස්ටුවර්ඩ්ශිප් එකක් කියන්නෙ මොකක්ද යැයි යැයි තමා..

" Their general responsibilities include various morning, interval and after school duties at different parts of the school during which they wear a silver circular badge indicating their post of leadership.."

මගේ හිතේ ඔක්කොන්ටම වඩා තිබ්බෙ ඊයෙ රෑ මොන හත්වලාවක්ද වුනේ කියන එක.. මට ලාවට ලාවට මතකයි තැනින් තැන.. වරද් මැට්

@Shan

කොහිල රතු කුකුලා තෝ මොකක්ද ඌව බදාගෙන උගේ අස්සෙ ගැන්නීගෙන කලේ කියලා මම මේ මගෙන්ම අහන ලක්ශවෙනි වතාව..

" The senior Prefect board in charge of the Stewards are responsible for leading them as a group and also for duty allocations for general and special occasions. But they mostly, just like for all other junior groups, play the role of training them to sharpen their leadership qualities that may help them cope with the strenuous work of the possible future leadership positions.."

ඒ වුණාට ඉතින් දැන් එහෙම එකක් උනයි කියමු.. ඒක ප්‍රශ්නයක්ද.. නෑනෙ.. කවදහරි මම ඌ එක යාලුවෙනවනෙ.. නේද.. ඈ වරද්.. උඹනම් අම්මා කියනවා වගේ පොල් ගහකින් කපාගත්තු එකෙක්ද කොහෙද.. යකෝ කොල්ලෙක් නේද.. පොඩි කොක්ටේල් එකක් බිව්වහම අච්චර නටන්න ඕනද.. මං අහන්නෙ.. ලැජ්ජයිනෙ.. ආ..??!!

" කාටහරි ප්‍රශ්න තියෙනවද මෙතන ඉන්න.."

රධ්‍ය අයියා හෙන ඩ්‍රැමටික් වෝක් එකකින් ස්ටේජ් එකේ එහාට මෙහාට යන ගමන් අහද්දි මම ශේප් එකේ කම්මුල කසාගත්තා.. කසනවනෙ ඉතින්.. මගුල.. අත් දෙක එහෙම පිටිපස්සට දාගෙන ඉන්න ඕනමයි කියලා නීතියක් නෑනෙ.. රිදෙනවනෙ.. හිරි වැටුනොත් එහෙම..

" හොදයි.. ඒ කියන්නෙ ප්‍රශ්න නෑ.."

තියෙනවා..!!!!!!!!! මම ඉන්නෙ දැවෙන ගිනිගන්න කඩාහැලෙන ප්‍රශ්නෙක.. ඒ වුනාට මට ඒක මෙතන අහන්න බෑනෙ.. ඒක ඇහුවොත් මගේ ස්ටුවර්ඩ් බැජ් එකයි තොගේ ප්‍රිෆෙක්ට් බැජ් එකයි දෙකම පිනාට බාරදීලා අස්වීම අරන් දෙන්නටම ගෙදර යන්න වෙනවා.. ඌ නම් කමක් නෑ අයිලන්ඩ් රෑන්ක් එකකුත් ගැහුවනෙ.. මට මොකද වෙන්නෙ..

" මම මෙහෙමම ඩියුටීස් බාරදෙන්නම්.. යද්දි බැජ් එක ඉල්ලගන්න අහිරුගෙන්.. ඔය කොනේම ලයින් එක.. ග්‍රේඩ් සික්ස් ටු සෙවන්.. එක්කෙනෙක්ට එක ක්ලාස් එක ගානෙ.. උදේම ගිහින් ඩියුටි ක්ලාස් එකේ සීනියර් ප්‍රිෆෙක්ට්ව මීට් වෙලා නෝට් බුක් එකේ සයින් එකක් දාගන්න ඕන.. ප්‍රශ්න ඇතිකරගන්න බෑ..ජූනියර් ප්‍රිෆෙක්ට්ස්ලා ඉන්නවනම් ඒ අය ගැන බලන්න ඕන.."

@Shan

" ඊලග ලයින් එක ග්‍රේඩ් එයිට් ටු නයින්.. ඒ ගොල්ලොත් අර විදියටම කරන්න ඕන.."

" ග්‍රේඩ් ටෙන් ටු ලෙවන් ඔයාලා, ග්‍රේඩ් ට්වෙල් ඇන්ඩ් එන් ටී කිව් ක්ලාසස් ඔයාලා.. එතකොට මේ ලයින් එක.."

රධ්‍ය අයියා මම හිටපු කොනේම ලයින් එක පැත්තට හැරුනා..

" මේ ලයින් එක ගේට් ඩියුටි.."

මුගෙ ආච්චිට හාල් ගරන්න.. ගේට් ඩියුටි..!!?? මොන ලබ්බක්ද.. යකෝ උදේ හයහමාරෙ ඉදන් පැයක් ගේට් එක ගාව හිටගෙන බෑග් බලන්නයි කොන්ඩ බලන්නයි.. ඉදපන්කො ගැටපොලොස් කොට්ටෝරුවා මම උඹෙන් පලි ගන්නවා ගන්නවා ගන්න එක අම්මපා ගන්නවාමයි..

මම රධ්‍ය අයියට ඉස්සරහා ඉදගෙන දෙකක් රුව්වම පිටිපස්සෙ හිටපු සයෝන් අයියටයි කියාන් අයියටයි හිනා ගියා..

" හරි.. දැන් ක්ලාසස් වලට යන්න.. අහිරු ඔය බැජ් ටික මෙයාලට බෙදන්න.."

රධ්‍ය අයියා අප්පුඩියක් ගහලා හැමොටම ක්ලාසස් වලට යන්න කිව්වා.. මමත් දෙකක් තුනක් නෙමෙ පහ හයක්ම රවලා අඩියකුත් හප්පගෙන මේන් හෝල් එකෙන් එන්න ආවා.... ඔක්කොම මහපගයො එකයි..

ඒ ඇවිත් ක්ලාස් එකට පඩිපෙළ නගිද්දි තමා මතක් වුනේ.. ගස්සගෙන ආවා තමයි..ඒත් අහිරු අයියගෙන් බැජ් එකක් ඉල්ලගත්තෙ නෑනෙ.. මට තේරෙනවා මගේ පියවි සිහියට කෙලවීගෙන කෙලවීගෙන එනවා මේ කොහෙවත් ඉදන් පැන පැන ආපු ගැටපොලොස් කොට්ටෝරුවෙක් නිසා.. ඒ එක්කම මට රධ්‍ය අයියා පැන පැන යනවා වගේ එකක් මට මැවෙන්න ගත්තු නිසා මම පස්සෙ වෙලාවක බැජ් එකක් ඉල්ලගන්න හිතාගෙන පන්තියට ඇවිත් වාඩිවුනා..

" හොදයි ළමයි.. 3,5-diamino-7-choloro-6-cyno-5-nitro-2-methyl-5-nitro-4-oxonon-6-enoic acid මෙක අදින්න ඉක්මන් කල්ලා.."

@Shan

මම අපේ කෙමෙස්ට්‍රි මැඩම්ගෙ කහපාට ඔසරියට දෙස් දෙවොල් තිය තිය පැන්සලක් අරගෙන අර බඩවැලවගේ කිච්ච දාමෙ අඳින්න ගත්තා..

උදේ වරුවෙම කෙමෙස්ට්‍රි මිස් උගන්නලා උගන්නලා අන්තිමේදි ඉන්ටවල් එකෙත් විනාඩි පහලොවක් අරගෙන උගන්නලා යන්න ගියේ මගේ මොලේ නහරයක් පුපුරන්න ඕන්න මෙන්න තියලා.. යකෝ!! පීරියඩ් හතරක් එස්ටර බන්ධනයි ලෝකෙ නැති මගුල් උගන්නලා උගන්නලා ඒ සේරම මගේ මොලේට දාගන්න ඉඩ නැතුව මොලේ රසායනිස සංයුතියත් වෙනස් වෙලා මම හිටියේ පැන්සලෙන් ඔලුව කහන ගමන්.. සෙනුකයත් නෑ.. වෙනදා ඉතින් අපි දෙන්නා හොරෙන් හරි කනවනෙ.. මම ඉතින් පැන්සල පැත්තකින් තියලා පාඩුවෙ කාලා බීලා ඇස් දෙක වපර කරගෙන ඔරලෝසුව දිහා බලාගෙන හිටියා.. එතකොට ඔරලෝසු දෙකක් පේනවා.. මම ඉන්ටවල් එකේ කොහේහරි යන්න හිතාගෙන හිටියා.. ටොයිලට් එකටද?? නැනෙ.. එහෙම බරකුත් නෑ මට.. ලයිබ්‍රි එකේ පොත් රිටර්න් කරන්නත් නෙමේ..

අප්පදබොල බැජ් එක ගන්න යන්න ඕන!!

මම එහාපැත්තෙ පුටුව උඩින් පැනලා ප්‍රිෆෙක්ට් රූම් එකට දුවගෙන දුවගෙන ගියා.. ඒ ගිහින් දොර හරියට විතර යද්දි කලින් දවසෙ හත්පොලේම ගාගත්තු සිද්දිය මතක් වෙලා නොයා ඉන්නත් හිතුනා..

නෑ නෑ!!! මට, ඒ කියන්නෙ වරද්ට වරදින්න විදියක් නෑ..එහෙම මොකුත් වුනේ නෑ කියලා මට විශ්වාසයි.. අනික වුනහ් කමක් නෑ කියල අමම කලින් හිත හදාගෙනනෙ හිටියෙ.. ඇයි ඉතින් දැන් මම ගෑනි වගේ මෙතන නැලවෙන්නෙ.. ඉදා මම ඔකගෙන්ම අහගන්නවා..

" ආ මල්ලේ..මොකෝ මෙ පැත්තෙ.."

කියාන් අයියයිය් රධ්‍ය අයියයි සයෝන් අයියයිය් කෑම කනවා බත් මුලකුත් දිගැරගෙන..

" ඔගොල්ලො කනවද.. මම පස්සෙ එන්නම් එහෙනම්.."

" නෑ නෑ ආපු එකේ කියලා පලයන්.. මොකෝ අවුල.."

@Shan

" අවුල කියන්නෙ.. මම බැජ් එක අරගෙන නෙමෙයිනෙ ඇවිත් තියෙන්නෙ.."

මම කියලා කට ගන්න හම්බුනේ නෑ රඨ්‍ය අයියට කැස්සක් ඇවිල්ල හිර කරගෙන මැරෙන්න ගියා.. මම ළඟ තිබ්බ වතුර බෝතලේ අරගෙන මූඩිය ඇරලා අහක බලාගෙන ඒක රඨ්‍ය අයියට දික් කලාම රඨ්‍ය අයියා ඒක අරගෙන බිව්වා..

" මට කාලා ඇති වගේ බං.. දැන් ඔෆිස් එකට යන්නත් ඕන.. උඹලා කාලා වරෙන් එහෙනම්.."

සයෝන් අයියා වතුර බෝතලෙත් අරගෙන මගේ පිටටත් දබෝස් ගාලා එකක් ගහගෙන හිනාවේගෙන එළියට ගියා.. මම පුටුවක් ඇදගෙන කකුල් දෙක දෙපැත්තට දාලා වාඩිවුනා..

" උඹලා දෙන්නා වලියක් ඇදගත්තද.."

කියාන් අයියා තඩි පපඩමක් කරස් ගාලා හැපුවා.. සැක් මූ නම් කනවා කනවා අලි පැටියා වගේ..

" එහෙම එකක් නෑ හලෝ.."

" එහෙමද.. හා හා මොකක්ද උඹට ඕන කිව්වෙ.. බැජ් එකක්නෙ.."

" මම.."

" මරු එකා අපේ ඉස්කෝලෙ හෙඩ් ප්‍රිෆෙක්ට් කරන්න ඉන්නෙ.. රඨ්‍ය මූට දෙකක් ඇනලවත් හදාගනින්.. නැත්නම් අපේ ඉස්කෝලෙ ජාත්‍යන්තරේටම යවලා මූ නතරවෙන්නෙ.."

" ඈ සිරාවට.. හෙඩ් ප්‍රිෆෙක්ට්.. මේ මම??"

මම මගේ පැත්තට ඇඟිල්ල දික් කරගෙන ඇහුවා.. යකෝ අදමයි ස්ටුවර්ඩ් කෙනෙක් වුනේ.. මොනවද මේ කියන්නෙ..

" එහෙම කතාවක් යනවා ඉතින්.. කොහොම වුනත් උඹ ටොප් බෝඩ් ඉදී.. උඹට බාහිර වැඩවලට හෙන සෙටිෆිකේට්ස් තොගයක් තියෙනවනෙ.. අනික පිනා උඹව දන්නවනෙ.."

@Shan

" සිරාවට.. අඩෙ.. මට හිතාගන්න බෑ.."

" ඉස්සෙල්ලම ඒ විදියට හැසිරියන් ඉතින්.. කොහෙද උඹට අලි විසේනෙ.."

" අනේ මේ පලයං අයියෙ.."

මම කියාන් අයියට රවලා සිවිලිම දිහා බලාගත්තා.. මට ඇති විසයක් නෑ.. මුන්ගෙ ඉරිසියාව මට කතා හදන්නෙ.. දරාගන්න බැරුවැති.. මම හෙඩ් ප්‍රිෆෙක්ට් වුනොත් ඉස්කෝලෙ විනය හදනවා අම්මටසිරි වෙන්න.. ඇඩෙයි එතකොට..

" වරද්..මෙහෙ එනවා.."

රධ්‍ය අයියා මට ලග තියෙන පුටුව පෙන්නුවහම මම හොද ලමයා වගේ ගිහින් වාඩිවුනා.. පොඩ්ඩක් ලැජ්ජයිත් වගේ මූණ බලන්න.. මම බිම බලාගෙන ඉද්දි රධ්‍ය අයියා මගේ නිකටට යටින් අතක් තියලා බත් කටක් කැව්වා.. ආධ්‍ය අයියා උදේම නැගිටලා උයලා මහන්සියෙන් නෙ එවන්නෙත් ඉතින්.. මම උඩ බලාගෙන බත් කට කාලා මොකාද වගේ හැපුවා..

" මේ.."

" ම්ම්..??"

" මම පොඩි වැඩක් අහන්නම් වැඩිය හිතන්නැතුව උත්තර දෙනවා.."

" ම්ම්.."

" තවුසෙ ඊයෙ රෑ මාව කිස් කලාද.."

මම ඇහුවා විතරයි ඒ පාර කියාන් අයියට මහ හයියෙන් කැස්සක් ඇල්ලුවා.. මම ආයෙම වතුර බෝත්ලේ මූඩිය ඇරලා ඌට දික් කලා..අම්මපා මුන්ට කාසෙද.. හරිහැටි කෑම එකක්වත් කාගන්න බෑ.. ආගිටවත් කිව්වනම් හරි මිනිහට කන්න උගන්නන්න කියලා..

" හිමින් කාපන්කො අයියෙ.."

@Shan

" අනිත් දව-කැහ්-කැහ්-සෙ-ඉන්ටවල් එකෙන්-කැහ්-කැහ්පස්සෙ-මෙහේවරෙ-කැහ්-න්න්.."

" ඈ මොකක්?? මොකක් හරි.. මෙ කියනවකො එහෙම එකක් උනාද.."

" පිස්සුද උඹට..!!"

" මට ඇති පිස්සුවක් නෑ.. නැත්නම් කමක් නෑ ඉතින්.."

මම බලෙන්ම රධ්‍ය අයියා කන්න ගිය කට අත ඇදලා අරගෙන මට කවාගෙන සර්වියට් එකෙන් කටත් පිහිදගෙන නැගිට්ටා..

" මේ මට බැජ් එකක් දෙනවකො.."

" හෙට උදේට දෙන්නම් අභිරුවගෙන් ඉල්ලලා මම.."

" හා.. අනිවාරෙන් දෙන්න හොදේ.."

" මේ සිරාවට රධ්‍ය උඹ මූට කුලුදුල් හාද්ද පුද කලාද.."

" මොන??"

" උම්මා එකක්.."

" උඹට පිස්සුද කියාන්.."

" ඔව් පිස්සුද උඹට.."

" මේ උඹ ඉදපන් පොඩි එකා.. මට සුවර් අපේ එකා ප්‍රතිපත්තියක් ඇති එකා.. රධ්‍ය මූ උඹව පොළඹගන්න එනවනම් ඉක්මනට මගේ මූණ මවාගනින්.."

" සැක් අයියෙ.. ඒ මොකටද.."

" එහෙම තමයි මගේ මූණ මවාගත්තහම සාන්ත හැඟීම් හිතට ගලාගෙන ඇවිත් උඹලගෙ නගින ඒවා බහිනවා.."

" සාන්ත කියන්නෙ කවද.."

@Shan

" අනේ රධ්‍ය මූ කවුද කියපන්කෝ මට.."

" මම ඇවිල්ලා-"

" ඌ මලක් කියන්නෙ"

රධ්‍ය අයියා කට කොනෙන් මට හිනාවේගෙන කෑම කොලේ නමලා පැත්තකින් තිබ්බා..

" හහ් හහ් අමෝහ්.. ෂනෙරු මම්ලි.."

" අනේ මේ මහපගයො දෙන්නා.. ඕන ලබ්බක් කරගන්නවා.. මම යනවා.. තවුසෙ.. තවුසෙ ආයෙ මාත් එක්ක කතාකරන්න එපා.. මාම් කැමති ආධ්‍ය අයියට.."

මම ගස්සගෙන දාගෙන එන්න ඇවිල්ලා දොරෙත් උරහිස වද්දගෙන වාටර් නැතුව ක්ලාස් එකට ඇවිත් ඉඳගත්තා.. ගස්ලබ්බො.. ආවා මෙතන මලක් අහගෙන..

ඌ මලක් බං.. පොඩ්ඩක් තේරුම් ගනිල්ලකො..

සැටත් එන්නත අනෙහ්..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 58 කොටස

" ඒ ෂනෙරුවා.. සිරාවටම මාවත් තෝරගෙනද බං.."

" ඔව් බං.. දැන් ඉතින් උඹත් ස්ටුවර්ඩ් කෙනෙක් තමා.. ලේසි පාසුද..මිම..මිම.."

මම සෙනුකයයි උදේම ඉස්කෝලෙ ඇවිත් ගේට් එක දිහාවට ඇවිදගෙන යනගමන් ඉදියෙ.. ඌත් ඉතින් ගේට් ඩියුටි තමා, මමත් ගේට් ඩියුටි නම්.. ෆ්‍රෙන්ඩ් ගෝල්ස් කියන්නෙ ඒවටනෙ.. කලින් දවසේ අර ගෙම්බා මාව ආතල් එකකට ගත්තු නිසා මම ඉස්කෝලෙ ඇරිලා ගෙදර යනකල් කතාකරන්නෙ නැතුවනෙ හිටියෙ.. පස්සෙ ඉතින් පව් කියලා රෑ කෝල් එකක් ගත්තෙ.. මොකක් වුනත් කවදහරි යාලුවෙන්න ඉන්න එක්කෙනානෙ.. එහෙම කරන එක ලාවට වගේ හරි නෑනෙ..

" ඒ පකක් නෙමෙ බං ඔය මගුලට දැන් හැමදාම ඉස්කෝලෙ එන්න වෙයිද.."

" අනේ මෙ පිස්සු හැදෙයි.. මට එන්න වෙන්නෙත් සතියට තුනයි බං.."

" ඒකනෙ.."

" උඹට අවුලක් නෑනෙ ඉතින් ඇපෑවල් නිකන්ම ලැබෙනවනෙ.. ඉස්කෝලෙ හෙඩා බෝයිපෙන් නෙ.."

" අනේ පලයන්.."

" ඒකනෙමේ.. දැන් අයුක අයියට මොකද.."

" දැන් නම් ඉන්නවා.. කලින් වගේම ලොකු අවුලක් නෑ.. ඒ වුනාට ලොකු හොදකුත් නෑ බං.."

" අයියට ඉක්මනට සනීප වෙයි.. උඹ ඒකා එක්ක ඉන්නවනෙ.."

මම සෙනුකයගෙ කරට අතක් දාගත්තා..

@Shan

" උඹ වගේ එකෙක් ලැබෙන්න උගේ මොකක් හරි පිනක් තියෙන්නැති බං.."

" ඒ මොකෝ.."

" නෑ උඹ මාරයි.."

" මම.. මම.."

සෙනුකයයි මමයි ගේට් එක ගාවට යද්දි සීනියර් ප්‍රිෆෙක්ට්ස්ලා පස් දෙනෙක් ගේට් එක ගාව ඉඳගෙන බෑග්ස් චෙක් කරනවා.. උදේ නිසා ඉතින් කට්ටිය ලොකුවට නෑ.. රධ්‍ය අයියත් පේන්න හිටියෙ නෑ අද උදේ මොකක්ද වැඩකට ඔෆිස් එකට යනවා කිව්වනෙ.. අපි ගියාට පස්සෙ එතන ඉඳපු අයියලා දෙන්නෙක් අපි ගාවට ආවා.. අපි දෙන්නටම බැජ් තිබ්බෙත් නෑ.. ඒ වුනාට ඒ අයියලව මම දන්නවා..

" කෝ බැජ්??"

" රධ්‍ය අයියා අද ඉල්ලගන්න කිව්වා.."

" මම ඊයෙ ආවෙ නෑ අයියෙ.."

" ආ හා කමක් නෑ.. උඹලා දෙන්නා අර ලයින්ස් දෙකට ගිහින් බලපන්.. අපි මෙහෙන් ඉන්නම්.. අවුලක් නම් කතාකරහන් හොදේ.."

" හා.."

" දන්නවනෙ.. කලිසම් කොට වෙන්න බෑ.. කොණ්ඩෙ රැවුල් වවලා තියෙන්න බෑ.. ෆෝන් ගේන්න බෑ.. පෙන් ඩ්‍රයිව් අනම් මනම් බෑ.. එස් ආර් බී එකයි ලන්ච් බොක්ස් එකයි තියෙන්න ඕන.."

" හරි අයියෙ.."

" ඒවා පිලිවෙලට නැත්නම් 'මම පාසලේ නීති කඩ නොකරමි' සී ආර් කොලයක් පිරෙන්න ලියවලා තමා මෙතනින් යවන්නෙ.. පරක්කු වෙලා එන සේරම කෙලින්ම ග්‍රවුන්ඩ් එකට.. උන්ගෙ එස් ආර් බී එක අරගෙන ප්‍රමාද වී පැමිනීම චාර්ට් එකේ නෝට් එකක් දාන්න ඕන.. තේරුනානෙ.."

@Shan

" හරි අයියෙ.."

" දැන් යන්න.."

මම ඉතින් දෙයියනේ කියලා පලවෙනිම දවසේ ස්ටුවර්ඩ් රාජකාරිය ආරම්භ කලා.. ගේට් ඩියුටි සාපයක් කියන්නෙ සාපෙනුත් සාපයක්.. සාමාන්‍ය පෙළවත් එච්චර සාපයක් වුනේ නෑ.. අනිත් එක මේ පොඩි පගයො දෙන්න හිතයි.. හොම්බ කට සමතලා වෙන්න.. බෑග් එක පෙන්නන්න කිච්චහම සිප් එක වහගෙන එන්නෙ අපි ගාවට.. මම ඉතින් ඉහ වහා යන කේන්තිය හිතේ කොනට ගුලි කරගෙන බොහොම අමාරුවෙන් කට පියන් උන්ගෙ බෑග් බැලුවෙ.. ඒ මදිවට එන එන මැඩම්ට සර්ට ග්‍රීට් කරන්නත් ඕන.. හිනාවෙලා..

මම හත විතර වෙනකල් ගේට් එක ගාව එසේ මෙසේ කට්ටක් නෙමෙ කෑවෙ.. හතේ ඉදන් හත හමාර කියන්නෙ.. ඉස්කෝලෙ හොස්ටල් වල උන් එළිබහින වෙලාව නිසා තව හෙන පෝළිමයි.. ස්කූල් බස් එනවා.. ඒවගෙ ඉන්න හැත්ත බුරුත්ත සේරමත් එකතු වෙලා.. මටනම් දැන් අර රධ්‍ය කියන සිප්පි කට්ටා එක්ක මලපැනලා හිටියෙ.. මෙකා හිතලමද කොහෙද මට ගේට් ඩියුටි දුන්නෙ.. ඉදපන්කො.. අද මගේ හන්දිපත් රුදාව ඇල්ලුවොත්නම් අම්මපා මම ඕකව මරලා මහනවා හොද හයිය තියන අපේ අම්මට පොලේ යන්න මල්ලක්..

ඔහොම මම බෑග් වලට එබි එබි කොල්ලොන්ගෙ කලිසම්,කොණ්ඩ දිහා බල බල හිටගෙන ඉද්දි එකපාරටම මහා හෙනයක් ගැහුවා වගේ මගේ පෝලිමේ හිටපු උන් බාගෙට බාගයක් මගේ එහාපැත්තෙයි මහා පැත්තෙයි වෙන පැතිවල තියෙන පෝලිම් වලටයි පැනලා ගියා.. එකපාරට වෙච්ච දෙයින් මම සෑහෙන්න කොන්ෆියුස් වුනත් ඒ එක්කම අපේ ගයනිකා මැඩම් ආපු නිසා මම හිනාවෙලා මැඩම්ට ග්‍රීට් කලා.. මැඩම් මට හෙන ලව්.. අපි පොඩි කාලෙම ඉදන් මගෙ ආදරබර මියුසික් ටීචර් නෙ.. දැන් නම් මැඩම් ප්‍රෙග්නට්..

" ගුඩ් මෝනින් මැඩම්.."

" ගුඩ් මෝනින් උද්යෝග පුතා.. ආ මේ රධ්‍ය පුතත් ඉන්නෙ.."

" ගුඩ් මෝනින් මැඩම්.."

@Shan

මම ක්ශනිකව බෙල්ලෙ පොට යන ගානටම හැරිලා පිටිපස්ස බැලුවා.. යකෝ!! කොයිවෙලේද මෙතෙන්ට ආවෙ.. මම දැක්කෙත් නෑ දන්නෙත් නෑ.. ඉන්නවා මරුමුස් විදියට හිනාවෙගෙන උසට උසේ හෙනකදයා වගේ..

" කොයිවෙලේද ආවෙ.."

" දැන් ටික- ඒ මෙහෙ වරෙන්..!! ඔය රතු පාට බෑග් එක.. ඔව්.. මම තමා.. මෙහෙ වරෙන්..!!"

මෙකා එකපරටම මුල් ටික හොඳින් කතාකල්ලා මැදහරිය ගිරිය පලාගෙන කෑගැහැව්ව කිව්වා නිසා මාව ගැස්සිලා ගියා.. යකෝ කටෙ සද්දෙ.. මෙකගෙ උගුරු දණ්ඩ කැඩිලා යයි මෙහෙම කෑගහලා..

" උඹ අද කොහෙ එන්නද ආවෙ.."

රධ්‍ය අයියා මගේ එහාපැත්තෙ ඉදගෙන එකෙක් අල්ලගෙන බනිද්දි මම මගේ පාඩුවේ පෝලිමේ ඉදපු උන් චෙක් කර කර යැව්වා.. යකෝ බය හිතෙනවනෙ.. මේ මොන මගුලක්ද.. මලයකෙක් වගේ.. ඇඟිබැමත් එකට හා වෙලා.. මෙකා යකෙක් වගේ එකෙක්ද කොහෙද.. ඇඟිබැම එකට ගැව්ලා තියෙන උන් නපුරුයි කියලා අපේ ආච්චිඅම්මා කිව්වනෙ.. මූත් එහෙමද කොහෙද..

" අ-අයියෙ.."

" අයියෙ හුයියෙ නෙමේ..!! මට මතකයි.. ගිය සතියෙත් උඹට ක්ලාස් එකේ ප්‍රිෆෙක්ට් කිව්ව නේද රැවුල කපන් වරෙන් කියලා.."

" අ-අ"

" කිව්වද නැද්ද කියපන්!!!"

" කිව්වා අයියෙ.."

" එතකොට උඹ රැවුල කැපුවෙ නැද්ද.."

" න්-න්"

@Shan

" ඉෂාන් මූව ඔෆිස් එකට එක්කන් පලයන්.."

" අනේ අයියෙ-"

" ඉෂාන්!!!!!!!!!"

" ඒ මෙහෙ වරෙන් යන්න.."

අර එකොළහ වසරේ පොඩි එකා මූණ ඎෙරොක් කරගෙන ඉෂාන් අයියා පස්සෙන් ඔෆිස් එකට යන්න ගියා.. අනේ පුතේ.. මූ කියන තරම් උපාසක බළලෙක් නෙමේද කොහෙද.. ඌට කෑගහලා එතන දෙවනත් කල්ලා ආයෙම රධ්‍ය අයියා උගුර පාදගෙන හිමීට මගේ පැත්ත හැරුණා..

" වරද්.. බැජ් එක.."

සිල්වර් පාට රවුම් බැජ් එකක් මගේ අතේ තියපු රධ්‍ය අයියා මගේ පිටට තට්ටුවක් දාගෙන සෙනුකයා ඉන්න තැනට ගියා.. ඩියුටි බලන්නද ඇවිත් තියෙන්නෙ.. හරිම හොඳයි වරද් පුතේ!! ගේට් ඩියුටි චෙක් කරන්න ඉන්නෙ මූ කියල මෙච්චර කල් දැනගෙන ඉදියෙ නෑනෙ.. එහෙමත් තියෙද්දි තමා අර සේපාලිකා ගස් අස්සෙ පැල් බැදන් කියව කියව හිටියෙ.. කියාන් අයියා හරි පෞ.. මෙච්චර කල්ම රධ්‍ය අයියගෙ කට්ට නෙ ඇදලා තියන්නෙ..

ඔක්කොමත් හරි පෙනේද මේකා වෙස් මාරු කරන හැටි.. මූ වෙස් මාරු කරන නාග කන්‍යාවියක්ද දන්නෙ නෑ.. සැක්.. කන්‍යාවියක් නෙමෙයිනෙ.. කන්‍යාවෙක්ද.. කොහොමද කන්‍යාවියගෙ පිරිමි සතාට කතාකරන්නෙ.. වර්ජින් මේල්?? මොකක් හරි.. අන්න එහෙම එකෙක් වෙන්න ඇති.. මේ දැන් කෑගැහුවා.. ඊටපස්සෙ ආයෙම හොදට කතාකලා..මම..මම.. හිටපු හැටියෙ පණ යනවා ආයෙත් පණ මතුවෙනවා පුංචි රධ්‍ය මගෙ පැ-මොනෞත්තක්ද මට මේ වෙලා තියෙන්නෙ..

මම ඔලුව ගසාගෙන හරි සිහියට ආවා..

කොහොම හරි හත හමාර වෙනකල්ම රධ්‍ය අයියා ගේට් එක ගාව අර මැණික රකින නාග වර්ජින් මේල් වගේ කැරකි කැරකි හිටියා.. ඉස්කෝලෙ පටන් ගන්න බෙල් එක ගහද්දි මගේ අතේ 'මම පාසලේ නීති කඩ නොකරමි' කොළ බන්ඩල් එකයි.. දැන් ඉතින් මේක ලිව්වහම මේ ලියපු හැම එකාම නීති රකිනවද.. මල සමයං නෙ.. මේ මමත් මේ වගේ

@Shan

කොළනම් කීයක් ලිව්වද.. දවසක් මේ රධ්‍ය අයියම ජූනියර් ප්‍රිෆෙක්ට් කෙනෙක් වෙලා ඉද්දි මම මේ වගේ කොළයක්ම ලියලා උෟට දුන්න කියලා උෟ මට ලගදි මතක් කලා.. දැක්කනෙ.. මම පොඩි කාලෙ ඉඳලම හැදුනේ සිරිමත් වගේ.. පොඩ්ඩක් එහෙන් මෙහෙන් සමානකම් තිබ්බා..

මම ඉතින් හත හමාරෙ ඉඳන් අට වෙනකල් බුදුන් වැඳලා පරක්කු වෙලා ආපු උන්ගෙ එස් ආර් බී වලත් ලියලා පන්තියට එන්න එද්දි සෙනුකයත් දුවගෙන ඇවිත් මගේ කරට අතක් දාගත්තා..

" මේ ගේට් ඩියුටි මොන කරුමයක්ද බං.. බුදුමැදුර වගේ සෙට් කරගන්න බැරිවෙයිද අපිට.."

" ඒ ඔව් නේ බං.. එතකොට අපිට පාඩුවේ බුද්ධ පූජාව ඉවරවෙනකල් ඉදලා ශේප් එකේ ක්ලාස් එකට එන්න තිබ්බා.."

" මේ උඹෙ අයියණ්ඩිගෙන් අහලා බලපන්කො.."

" ඒ දියබරියා ගත් කටටම 'එපා දමසාරී~!' කියයි.. සතියක් විතර ගිහින් අහමු.."

" හා.."

මමයි සෙනුකයයි ක්ලාස් එකට ගියාම තමයි අපිට දැනගන්න ලැබුනේ අපේ සෙක්ශන් එකේ කෝඩිනේටර්ගෙ ගෙදර මළ ගෙයක් වෙලා සෙක්ශන් එකේම මැඩම්ලා සර්ලා ඒකට උදේ ගිහින් කියලා.. ඉතින් මමයි සෙනුකයයි පන්තියේ ඉන්න කම්මැලි නිසා පේපර් වගේකුත් උස්සගෙන අර අපේ ඉස්කෝලෙ අඹ ගහ යට බංකු තියෙලා තියන තැනට ගියා ගනන් හදන්න.. සෙනුකයා කොහොමත් ඉතින් පොඩ්ඩක් පොත් ගුල්ලා සීන් එකේ නෙ ඉන්නෙ..

අපි දෙන්නා නිවාඩු පාඩුවේ පැය දෙකක් විතරම පාඩම් කලා.. ඉස්කෝලෙ මෙ වගේ තැන් හදලා තියෙන්නෙ කොහොමත් ළමයින්ට පාඩම් කරන්න තමා.. අපිට එහායින් තව පොඩි ළමයි වගේකුත් පාඩම් කර කර හීයා.. අපේ කොමස් උගන්නන හාමුදුරුවොත් අපිව දැකලා පිටට වේවැලෙන් තට්ටුවක් දාගෙන ගියා.. උන්වහන්සේ ඉතින් තට්ටු දාන්න දන්නෙ වේවැලෙන් විතරයි.. කියාන් අයියා කිව්වා හාමුදුරුවො දවසක් වේවැලෙන් දාපු තට්ටුවකට සතියක් බෙහෙත් දාන්න වුනා කියලා..

@Shan

ඒ වුණාට හාමුදුරුවෝ හරි හොදයි.. සැර වුණාට අපි ඕලෙවෙල් කාලෙ කොමස් උගන්නන්න ඉදියෙ හාමුදුරුවො තමා.. මට මතක හැටියට මුලු ක්ලාස් එකටම කොමස් වලට තිබ්බෙ ඒ.. දෙතුන් දෙනෙක්ට බී තිබ්බා.. හොදම දේ අපේ උන් එකෙවත් ටියුශන් ගියේ නෑ.. ඒ තරමට ඒ හාමුදුරුවො නැහිලා අපිට ඉගැන්නුවෙ..

මමයි සෙනුකයයි ගනන් හද හදා ඉදලා මට ඊටපස්සෙ දෙන්නම හෙන කතාවකට සෙට් වුනා.. අයුක අයියා රට යන කතාවක් දැන් ඇදිලනෙ තියෙන්නෙ.. සෙනුකයා ඒක ගැන කතාකලා.. ඌ නම් කියන්නෙ හැමදේටම කලින් ජීවිතේ හදාගන්න එපැයිනෙ කියලා.. ඒකනම් ඇත්ත තමයි.. සෙනුක කිව්වා ඒ ගැන පුලුවන් තරම් අයුක අයියට තේරුම් කල්ලා දෙන්න බලනවා කියලා.. මොකක් හරි කමක් නෑ උන් දෙන්නට නරකක් නොවී ඕනදෙයක්..

අපි දෙන්නා කතාකර කර ඉද්දී රධ්‍ය අයියා තනියම මොකක්ද කොළ ඉත්තකුත් අතේ තියාගෙන මේ පැත්තට එනවා මම දැක්කා.. ඔය එන්නෙ.. මගේ වෙන්ඩ නාග වර්ජින් මේල්.. මුගෙ වෝක් එක යකෝ.. ඕක දාන්න බැරිවුනාද මං අහන්නෙ එදා අවුරුදු කුමාරයට ස්ටේජ් එකේ වෝක් එක යද්දි.. බලන් යද්දි මේකා ඇත්තටම වෙස් මාරු කරනවද කොහෙද..

" මොකද කරන්නෙ.."

රධ්‍ය අයියා අපි හිටපු මේසෙ ඉතුරු බංකුවකින් ඉදගත්තා..

" අපි හදට යන්න රොකට් එකක් හදනවා.. එනවත.."

" කොහෙට?? හදටද??"

" නැතුව ඉතින්.."

" මම උඹට හද පෙන්නන්නද.."

" හා.."

" ඉදපන් පස්සෙ දවසක පෙන්නන්නම්.. සෙනුක මල්ලි.. අයුක කතාකල්ලා ඔයා අහනවා.. කෝල් එකක් ගන්න පුලුවන්ද කියලා අහන්න කිව්වා.."

@Shan

" මං ගාව ෆෝන් එකක් නැනෙ අයියෙ.."

සෙනුකයා ඇඟිලි අඹර අඹර පොත දිහා බලාගෙන කිව්වා..

" ආ ඒකට මොකද බං.. මේ අයියෙ තවුසෙගෙ ෆෝන් එක ගෙනාවා නේ..??"

" ම්ම්.."

" අන්න ඒකෙන් ගනින් බං.. හයයි නමයයි නමයයි හය ගහලා ලොක් එක ඇරගනින්.."

මම හෙන පණ්ඩිතයා වගේ කියද්දි සෙනුකයා ඇස් දෙක ලොකු කරගෙන මගේ දිහා බලාගෙන ඉඳලා රධ්‍ය අයියා දිහා බැලුවා..

" ගිහින් ගන්න.."

රධ්‍ය අයියා ගන්න කියන කැල්ල කියන්න පටන් ගත්තා විතරයි සෙනුකයා ආලෝකේ වේගෙන් බංකුවෙන් නැගිටලා ඇවිදගෙන ඇවිදගෙන ප්‍රිෆෙක්ට් රූම් එක පැත්තට ගියා..

" කෝ බලන්න මොනවද හදපු ගනන්.."

" හද හද හිටියෙ එක ගානක්.. ඒකෙ මගක් යද්දි තේරෙන්නෙ නෑ වගේ.."

මම පැන්සලෙන් කම්මුලට ඇනගත්තහම රධ්‍ය අයියා මගේ පැන්සලයි පොතයි එයාගෙ පැත්තට අරගෙන පොතට එබුනා..

" කෝකද.."

" මේ තියෙන්නෙ.. මෙකේ ටීටා සමානයි සයින් සෘණ එක වාරයක් සයින් ඇල්ෆා මූල එන් වර්ගයයි සෘණ එක සෘණ කොස් ඇල්ෆා බව පෙන්වන්න කියලා තියෙනවා.. එන් කියන්නෙ ප්‍රිස්ම ද්‍රව්‍යයේ වර්තනාංකයලු.."

මම කියවගෙන කියවගෙන යද්දි රධ්‍ය අයියා කටත් ඇරගෙන පිටසක්වල එකෙක් වගේ මං දිහාබලාගෙන ඉන්නවා.. සැක්.. මූට තේරුනේ නැතුවැතිනෙ..

@Shan

" ඒක රුප් එකක් වගේ.."

" අනේ මේ.. මෙන්න මේක හදලා දෙනවා.. මට බෑ ආයෙම ඉංග්‍රීසියෙන් පහදන්න.."

" මම්..මම්.. ඉන්න බලන්න.. ආ මේක ලේසිනෙ.."

රධ්‍ය අයියා ගාන දිහා බලාගෙන ඉදලා මගේ උත්තරේ දිහාත් ටික වෙලාවක් බලාගෙන ඉදලා මම හදපු සමීකරණෙන් බාගයක් පැන්සලෙන් කපලා දැම්මා..

" මේක වටයක් වරද්.. මේ වගේ ගනන් වලදී මෙහෙම දත්ත ටික ලියාගෙන හිතෙන් හදලා බලන්න ඉස්සෙල්ලා.. ඊටපස්සෙ උත්තරේට යන්න.. මෙච්චර ලිය ලිය ඉන්න ගියොත් වෙලාව අපතේ යනවා.."

රධ්‍ය අයියා මගේ පොතේ ගානෙ වැරදි හදලා උත්තරේ ගන්න විදිය පෙන්නුවා..

" මේ ඒකනෙමේ.. මේ ටිකේ මම ඔහේ නිකන් ඉන්න එකේ එනවා උඹට ගණන් ටිකක් හදවන්න.."

" කොහෙ??.."

" ඉස්කෝලෙදී තමා.. දැන් ඉස්සරහට ළමයි එන්නෙත් නැනෙ.. එතකොට නිකම්මනෙ ක්ලාස් එකේ ඉන්නෙ.. සෙනුක මල්ලිටත් එන්න කියන්න.."

" හා.."

" මම්.."

රධ්‍ය අයියා එයාගෙ අතේ තියෙන මුද්ද කරක කරක මගේ පොතේ තිබ්බ ගනන් දිහා බලාගෙන හිටියා..

" මේ ඇත්තටම තවුසෙ මාව කිස් කලේ නෑ නේද අයියෙ.."

මම ඈත ඉන්න කාක්කෙක් දිහා වපරෙට බලාගෙන රධ්‍ය අයියගෙන් ඇහුවා..

@Shan

" නෑ බං නෑ.."

" නැත්තං කමක් නෑ ඉතින්.. මම දැනගන්න ඇහුවෙ.."

" ඒකට කියන්නෙ කිස් එකක් කියලද.. ඒ මන්දා උඹත්.."

" අපි මේ ඔවාලා වගේ ඩ්‍රාමා බලලා ඕවා හුරුකරගෙන නෑ.. මම ඇවිල්ලා පොතක් පතක් බලාගෙන පාඩුවෙ ඉන්න මනුස්සයනෙ.."

" ඔව් ඔව්.. උඹකියන එකක් තමා.. මේ නියපොතු කපාගෙන වරෙන් ඊලග දවසෙ.."

" හරි හරි අනේ.. අපරාදෙ මම ලස්සනට තියාගෙන ඉදිය මගේ රෝස පාට නියපොතු ටික.."

මම දුකින් මගේ ලස්සන නියපොතු ටික දිහා බලාගෙන හිටියා.. පස්සෙ වැවෙමු මගෙ යාලුවනේ.. වවන්නෝ.. දිනන්නෝ..

" ආ මේ.. මම උඹට පොඩි වැඩක් ගෙනාවා.."

රඩ්‍ය අයියා මෙච්චරවෙලා නටුවෙන් අල්ලගෙන කරක කරක ඉදිය කොළ අත්ත මට දික් කලා.. සැක් ඇඹරුල්ලා ඉත්තක් නේද මේ උස්සන් ඇවිත් තියෙන්නෙ..

" මේ මොකෝ.."

" උඹ ඇඹරුල්ලා දලු කනවනෙ.. දළඹු පැටියා වගේ.."

ඔහොම තමා.. අන්න දැක්කනෙ.. ඒ කාලෙ කොහොමද.. ට්විස්ට් ටොබ්ලරෝන් අරවා මෙච්චා.. දැන් දෙන්නෙ ඇඹරුල්ලා කොළ.. අපේ මාමා කිව්වා හරි මම ආදරේ ගැන දන්න පකක් නෑ තමා.. දැන් නෙ මේ ඉගනගන්නෙ..

" අනේ මේ.. පලයං යන්න.."

මම ඇඹරුල්ලා ඉත්ත දෙකට තුනට නමලා සාක්කුවේ ඔබාගත්තා.. පස්සෙ කන්න බැරියැ.. මොකක් වුනත්.. මාව මතක් වෙච්ච නිසාලුවෙ ගෙනාවෙ..

@Shan

" ඔබ ඇපල් මලක් වාගේ~ ලස්සන වසන්ත කාලේ~ මට හදිස්සියෙන් වාගේ~ හමු වූ~"

මම හිමීට සිංදුවක් මුමුණ මුමුණ මෙසෙ පුරාම තිබ්බ පැන්සල් මකන පෑන් අරවා මෙව්වා එකතු කරගෙන පර්ස් එකට ඔබාගත්තා.. රධ්‍ය අයියට ඒක ඇහිලා හිමීට කට කොනෙන් හිනාවුනා.. ඔය දැන් ඉතින් කියයි අසමජ්ජාති මෙලෝ රහක් නැති උගට විතරක් හිනායන හරිම හාස්‍ය උපදවන සුලු කතාවක්..

" නෑ නෑ ඔබ කෙහෙල්මලක් වාගේ~ ලස්සන වසන්ත කාලේ~"

" අයියෙ!!!!!!!!!!!!"

" මොකද බං කෑගන්නෙ.. අර පොඩි උන් වගයක් අරහෙ පාඩම් කරනවා.."

රධිය අයියා මට අපේ එහාපැත්තෙ ඉන්න මල්ලිලා සෙට් එක පෙන්නද්දි එතන කණ්ණාඩි දාගෙන ඉඳපු කොට කලිසම් සකලබුජම් මල්ලි රතුම රතු වුනා.. හරි ශෝක් පොඩි එකා..

" අම්මපා මම තව්සෙගෙ ඇට දෙක තලනවා දැනගනින්.."

මම කටට ආවට ඔහේ කිව්වට ටිකකින් තමා මීටර් වුනේ මොකක්ද කිව්වෙ කියලා.. හරිනෙ ඇට ගැන කියවලා කියවලා මිනිහගෙත් ඇට දෙක තලන්න තමයි ලෑස්තිය..

" මොකක් කිව්වා..??"

" ම්-මොකුත් නෑ.."

" වරද්.. උඹනම් මහ-"

" මොකෙක්ද මන්දා.. ඕකනෙ කියන්න ගියේ.."

මම මගේ පර්ස් එක ඇතුලේ තිබ්බ මකනයක් ශේප් එකේ රධ්‍ය අයියගෙ කටේ එබුවා.. එනවා මෙතන කට ගහගෙන.. කාපිය මගේ දොඩම් සුවද තැඹිලිපාට මකනෙ දැන්..

" තුහ්.. මොන මගුලක්ද උඹට වෙලා තියෙන්නෙ අද.."

@Shan

" මොකුත් නෑ අනේ.. දෑසින් පෑ මා ඉහි මැරු දෙව්ලියේ

රහසින් එයි හැගුමන් මතු වී හදේ

නෙහගින් පෑ විසිරී උණුහුම රුදේ

දෑසින් පෑ මා ඉහි මැරු දෙව්ලියේ

යලි කිසිදා නොලියූ මේ ආදරේ~ "

මම රධ්‍ය අයියට ඇහැකුත් ගහගෙන බංකුවෙන් නැගිටලා සාක්කුවට අත් දෙකත් ඔබාගෙන බුදුමැදුර පැත්තට ඇවිදගෙන ගියා..

" වරද් ඔහොම ඉන්නවා.."

හොඳායි මගෙ ලමයිනේ~ මගෙ ඊලග ඔයාලට ආදරෙන් අහන්න ඉල්ලන සිංදුව.. දෑසින් පෑ.. රධ්‍ය අයියගෙ ආසම අටිස්ට් ගෙ.. මේවා ඇවිල්ලා පරණ වුනාට හෙන ලස්සන සිංදු..

ඔන්න මම ආවා.. මෙන්න මම ගියා..

මම ඔයාලට ආදරේම අදරේ අනේ.. හැම කමෙන්ට් එකක් ගානෙම මම පුරෝලා දෝතින් එකක්.. ආදරේම අදරෙයි.. ඒ හැම කමෙන්ට් එකක් ගානෙම මගේ අතින් ලියවෙන වැප්ටරේ ගානෙ ලියන්න ආස හිතෙනවා.. හව් ලව්ලී යූ ආ~

එන්නාම් මගෙ සකලබුජම් කොටකලිසම් ටික..

ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

@Shan

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 59 කොටස

" අම්මපා මේ ලබ්බෙ සරම ගැලවුනොත් එකපාරක් හරි.. උතුරු සලුව එක්කම තවුසෙගෙ කටේ ඔබනවා අයියෙ.. දැනගනින්.."

" ඉතින් දගලන්නැතුව ඉදපන්.. ඉවරනෙ.."

" තවුසෙටත් මම දගලන එකම තමා පේන්නෙ.."

" ඉතින් මල්ලෙ උෟට උඹ දගලන එක පේන්නැතුව වෙන මොකක් බලන් ඉන්නද කියන්නෙ.. උඹත් මට හු#න කතා තමයි කියන්නෙ.."

" මේ උඹලා මෙතනත් ඇවිල්ලා කුණුහර්ප පලන්න තියාගත්තද.. යකෝ අපි වගේ උනුත් සිල් ගන්න ඇවිත් ඉන්නවා.. කට වහගෙන ඉදපල්ලා.."

සෙනුකයා මහපගයා වගේ අපේ රහස් සාකච්චාව මැද්දෙන් පැනලා තඩි බාල්දියක් හැලුවා.. අපි හිටියෙ මේන්හෝල් එකේ පිටිපස්සෙ බිත්තියට හේත්තුවක් දාගෙන හාමුදුරුවො කියන බණ අහගෙන.. පොසොන්ලු නෙ ඉතින්.. සිල් ගන්න එපැයි ඉස්කෝලෙ ඇවිත්.. මුලු හෝල් එකේම පැදුරු එළලා ලස්සනට පිරිසිදුව හදලා හාමුදුරුවොන්ට ආසන පනවලා විසාන නෙළුම් මල් වට්ටි පිටින් තියලා හදුන්කූරු ගහලා තියන හැම ජාතියෙන්ම ගිලන්පස තියලා විසාලෙට හදලා තිබ්බෙ..

දැන් ඉතින් මම ස්ටුවර්ඩ් කෙනෙක් වෙලා සති ගානක් වෙනවා.. මේ සති ගානම ඉහේ කෙස් ගානට මේ රධ්‍ය කියන ගැටහැලප පොලොස්කොට්ටෝරුවා මට කැගහලා බැනලා ගැහුවෙ නැති ටික විතරයි.. හැබැයි අම්මපා ගැහුවනම් මමත් දෙනවා අනිත් පැත්තට ඇට දෙක ලෙප්ට් වෙන්නම..

ඉස්කෝලෙ වෙන්න හෙඩා මම කියලා ඉස්කෝලෙ පුරාම උන් කිය කිය ඉදියත් මටනම් ඔය බැජ් එක දෙනකල්ම සත එකකට ශුවර් නෑ.. මොකද මට ඕක නැතිවෙන්න තිබ්බ සම්බාවිතාව.. ඕක හම්බෙන්න හිබ්බ සම්බාවිතාවට වඩා හුගක් වැඩී..

මම හෙඩා උනොත් ඩිපියුටි හෙඩා වෙන්න හිටියේ මගේ සක්කිලි පරෙයියා චමිරුවා.. චමිරු දැන් මාත් එක්ක ලොකුවට අවුල් නෑ.. එදා එල්ඩර්ස් හෝම්

@Shan

එකේ මම උගේ තුවාලෙට ලේන්සුවක් බැන්ද හින්දද දන්නෙ නෑ.. මාත් එක්ක පැටලෙන්න වලි අනම් මනම් වලට ආවෙම නෑ.. ලඟදි දවසක මාත් එක්ක හිනාවේගෙනත් ගියා.. හරි අමුතු දේවල් තමා මගේ වටේ ඉන්න උන්ටත් වෙන්නෙ.. ඒත් චමිරු හොඳ වුනාට මතීශ මාත් එක්ක කවදාවත්ම අඩුමතරමෙ හිනාවුනේවත් නෑ.. ඌ හිනාවුනා කියලා මොකෝ මට අමුතුවෙන් හතර මහ නිධානෙ පහල වෙන්නෙ නැනෙ.. මම ඉතින් ඒක ගානක් නැතුව හිටියා.. නෆාස් තමා ගේම්ස් කැප්ටන්ට සිලෙක්ට් වෙලා හිටියේ.. සෙනුකයා ඩිපියුටි ගේම්ස් කැපෙක් වෙයි කියලා අයුක අයියා කිව්වා.. කොහොම වෙයිද දන්නෙ නෑ ඉතින්..

අයුක අයියා සතියකට විතර පස්සෙ ආපහු ඉස්කෝලෙ එන්න ගත්තා.. එයා ඩිප්‍රෙශන් වලට බෙහෙත් ගන්නවා කියලා සෙනුක නම් කිව්වෙ.. ඒත් කොහොම වුනත් සෙනුකයා එක මොහොතකටවත් අයුක අයියව අතෑරියෙ නෑ.. කොහොම හරි හම්බෙන විනාඩියෙ වුනත් අයුක අයියගෙ ලගින්ම ඉදියා.. වෙනසක් නැතුව.. එක දවසකවත් කිව්වෙ නෑ.. 'මට මේක කරන්නබෑ බං' 'එපාවෙලා තියෙන්නෙ' 'මේක නවත්තලා දානවා' කියලා..

ඒ අතින් ඌ මාරම කොල්ලෙක්..

දැන් ඉතින් අද පොසොන් පෝයට අපි සිල් ගන්නවනෙ.. අයුක අයියයි සෙනුකයයි නම් උපාසක මහත්තුරු දෙන්නා වගේ හාමුදුරුවො කියන බණ මාරම හොදට අහගෙන අපිට එහාපැත්තෙ බිත්තිය කොනටම වෙලා දොහොත් මුදුන් දීගෙන වැදගෙන හිටියට.. මාත් එහෙම වෙන්න ඕන කියලා එකක් නැනෙ.. මම හිටියේ රධ්‍ය අයියගෙයි කියාන් අයියගෙයි මැද්දට වෙලා කකුල් දෙකත් හායි ගාලා දිගෑරගෙන සිවිලිමේ කැරකෙන ෆෑන් එක දිහා බලාගෙන..

වෙනදට ඔහේ කලිසමටම උතුරු සලුවක් දාගෙන එක්ක තිබ්බ චාන්ස් එකට මෙ කොහෙවත් යන ස්ටුවර්ඩ් පට්ටමක් නිසා කෙලවිලා ගියා.. කොහෙද ඉස්කෝලෙ ශිෂ්‍ය නායක මණ්ඩලේ භාරව ඉන්න සර්ට ඕන වුනානෙ අපි ඔක්කොන්ටම නැශනල්ම අන්දලා එවන්න.. ඉතින් මම ටොප් බෝඩ් නොමිනේට් වෙලා ඉන්න නිසා මෙන්හෝල් එකේ අපේ ඉස්කෝලෙ සීනියර් බෝඩ් එකත් එක්ක නැවතිලා හොද ලමයා වගේ සිල් ගන්න ගමන් ඉදියෙ..නැත්නම් පන්තියේ මැඩම් එක්ක ඉන්න තිබ්බා පන්තියා වෙලා.. කොහොම හරි කමක් නෑ බිත්තියක් සෙට් වුන එකනම් මගේ මහා පිනක්ද කොහෙද..

@Shan

රධ්‍ය අයියා ඉතින් දඟලන්නෑනෙ.. හොඳ ළමයා වගේ කකුල් දෙකත් එරමිනියා ගොතාගෙන නහය ගාවට අත් දෙකත් තියාගෙන ඔලුව පහත් කරගෙන ඇස් දෙකත් පියාගෙන බුදුන් වදිනවා.. දැක්කහමත් ආසයි.. ඊට එහාපැත්තෙ ඉඳපු මම නිගණ්ඨයා වගේ කකුල් දෙකත් දිගෑරගෙන බඩ උඩ අත් දෙකත් බැඳගෙන කටත් බලියගෙන සිවිලිම දිහා බලාගෙන ඉන්නවා.. මට එහාපැත්තෙ කියාන් බිත්තියට ඔලුව ගහගෙන නිදි කිරා වැටෙනවා..

මගේ කකුල් දෙක හිරිවැටිලා තියෙන්නෙ.. බද්ධ පර්‍යංකෙන් ඉඳලා.. ඊටපස්සෙ බැරිතැනම මම අර්ධ පර්‍යංකෙනුත් ඉඳියා.. ඒ වුණාට එහෙම එකමවිදියට ඉන්න බෑනෙ.. මට දැන් සැතපෙන ඉරියව්වට මාරුවෙන්න තිබ්බනම් ඊටවඩා දෙයක් ඕන නෑ..

" කියාන් අයියෙ.. කන්න දෙයක් නැද්ද හලෝ.."

" ඇයි දැන් උඹ ටිකකට කලිනුත් ලොලිපොප් එකක් කටේ ගහගෙන ඉඳියා නේද.."

" සැක් බං.. ලොලිපොප් එකකට බඩගින්න නිවෙනවද.."

මම හිමීට ඇස් දෙක පියන් වැදගෙන ඉන්න රධ්‍ය අයියට කිට්ටු කල්ලා පැත්තකින් හේත්තුවක් දාගත්තා.. කොහොම ඉන්නවද මන්දා උන් තුන්දෙනා හෙල්ලෙන්නෙවත් නැතුව එකම විදියට.. ඉරිසියත් හිතෙනවා මට..

" ජ්ස් ජ්ස් මෙහ්.."

" ම්ම්.."

" කීයටද හාමුදුරුවො ආපහු පන්සලට වඩින්නෙ.."

" තව විනාඩි විස්සක් විතර යයි.."

" ම්ම්.."

උදේ බණට වැඩම කරවපු හාමුදුරුවෝ ආපහු පන්සලට වැඩියහම අපිට දවල් දානෙ හම්බෙනවා.. ආපහු ඉතින් දානෙන් පස්සෙ ඉස්කෝලෙ ඇරෙනකල්ම භාවනා වැඩසටහනකුයි බණකුයි තියෙනවා.. අද මේ ක්ලාස්

@Shan

එකකුත් කට කරගෙන මෙකට ආවෙ.. අපරාදෙ ක්ලාස් එකේ නම් බංකුවෙ හරි වාඩිවෙලා ඉන්නවනෙ.. දැන් ඉතින් උස් ආසන වල ඉඳගන්නත් බෑ.. මුද්දත් ගලවලා බෑග් එකේනෙ.. මුලු මාල අරවා මේවා දාන්න හොඳනෑනෙ..

කොහොම හරි වැඩම කරපු ලොකු හාමුදුරුවෝ පැය බාගෙකින් විතර බන ඉවර කරලා ආපහු පන්සලට වැඩම කලා.. මම දෙයියනේ කියලා නැගිටලා කකුල් දෙකත් ගසලා ගසලා අත් දෙක උඩට කල්ලා ශේප් එකේ ඇඟමැලි කඩාගන්න ගියා විතරයි..

"ටහුක්"

සරම ලූස් වෙලා කකුල් දෙක ගාවට රෝල් වෙන්න ගියා.. වැටුනට කමක් නෑ ඉතින් මම යටට දිග කලිසම ඇඳලා හිටියේ.. ඒත් ලැජ්ජයිනෙ.. සරම කැඩෙන්න මොහොතයි තප්පර කාලකට කලින් රධ්‍ය අයියා මගේ සරම දිහා බැලුවා විතරයි.. මූ බැලුව නිසා තමා කඩන් වැටෙන්න ගියේ.. නැත්නම් යස අගේට තිබ්බනෙ.. මම පටස් ගාලා සරම අත් දෙකින්ම අල්ලගත්තා..

" යකෝ.. මල්ලි.. ෂනෙරු..!!!"

" මොකද මොකද අප්පා.."

" උඹ කොල්ලෙක් නේද යකෝ.. සරමක් ඇඳගෙන එක විදියක ඉන්නම බැරිද.."

" මම සරම් අඳින්නෑනෙ.."

මම කියාන් අයියට දෙකක් රවලා ආයෙම මගේ සරම ලස්සනට ඇඳගෙන උතුරු සලුවත් හදාගෙන කම්සෙත් පහළට ඇදගෙන බිත්තියට හේත්තු වෙලා මගේ දිහා සසරම කලකිරිලා වගේ බලාගෙන ඉන්න රධ්‍ය අයියට මූණ පිරෙන්නම හිනාවුනා.. සසර කලකිරුණට කමක් නෑ පුතේ මහාභිනිශ්ක්‍රමණය නොකර..

" පහළට යමුද.."

" ම්ම්.."

@Shan

මමයි, කියාන් අයියයි, සෙනුකයි, අයුක අයියයි පහළට එද්දි පහළ පොඩි ළමයි එහෙට දුවනවා මෙහෙට දුවනවා.. රෙදි කැලේ.. පොඩි ළමයි ඉතින් දඟලනවනෙ කොහොමත්.. උන්ට සිල් අරන් කියලා ගානක් නෑ.. හයේ හතේ පන්ති වල චූටි ළමයිනෙ.. උන්ගෙ ක්ලාස් වල ටීචර්ස්ලා උන්ව අල්ලගන්න බෙරිහන් දිදී පස්සෙන් පන්නනවා..

ඒ අස්සෙන් අස්සෙන් අපේ දිහාට දුවගෙන ආපු චමිරුවා මාව දැකලා අතත් වනාගෙන මම ගාවට එද්දි මම ඇස් දෙකත් ලොකු කරගෙන හිටපු තැනම නැවතුනා.. අනේ හත්තික්කේ මේ මොකක්ද මේ වෙන්න යන්න.. චමිරුවා මට කැමතිවෙලාද දන්නෙ නෑ.. ඒක දැක්ක රධ්‍ය අයියත් මගේ දිහා අමුතුවට බලගෙන ඉඳලා මගේ එහාපැත්තෙන් හිටගත්තා..

" ෂනෙරු.. පහළ ස්ටාෆ් රූම් එකේ පිරිකර වගයක් තියෙනවා.. හවස බණට වැඩම කරන හාමුදුරුවන්ට ඒක පූජ කරන්න පුලුවන්ද.."

" මම??"

මම මටම ඇඟිල්ල දික් කරගෙන ඇහුවා..

" ඔව්.. උඹයි ඕන්නම් තව කවුරුහරියි.. පුලුවන් නෙ.. මම නෙමෙ පාලිත සර් කිව්වෙ.. කියන්න කියලා.."

" ආ හා.. හා.. මම දෙන්නම්.."

" හරි~"

චමිරුවා මගේ පිටට බෝස් ගාලා පාරක් ගහගෙන දුවගෙන දුවගෙන ආපු දිහාටම යන්න ගියා.. ඒ වුනාට මගේ මූනෙයි රධ්‍ය අයියගෙ මූණෙයි තිබ්බෙ 'වට් ද ඩක්' පෙනුමක්..

" උඹ අරූ එක්ක කතාකරනවද.."

" මම?? පිස්සුද අනේ.. මට ඔය සක්කිලි පරෙයියා අල්ලන්නෑ.. ඔයා දන්නවනෙ.."

" එහෙනම්..??"

" අනේ මන්දා.. ඌ එකපාරම හොඳ වෙලා.. පෙර වැරදි තේරිලාද දන්නෑ.."

@Shan

" මම.. කොහොම හරි කමක් නෑ උඹ ඌ එක්ක කතාකරන්න ඕන්නෑ.."

රධ්‍ය අයියා මට ලාවට රවලා ප්‍රිෆෙක්ට් රූම් එකට ඇවිදගෙන ගියා.. මමත් සරම අත් දෙකින් උස්සන් ඒ පස්සෙන්ම ඇවිදගෙන ගියා..

දානෙන් පස්සෙ හවස භාවනා වැඩසටහනට අපි ආයෙම මෙන්හෝල් එකට ගියා විතරයි ලොකු ප්‍රින්සිපල් සර් අපි දැකලා ඇවිත් ඉස්සරාහින්ම ඉදගන්න කිව්වා.. සර්ලා ලගින්ම..

" හරිනෙ අමාරුව.."

මම සර්ට ස්මයිල් ඉන් පේන් හිනාවක් දාගෙන ගිහින් ඉස්සරාහින්ම ඉදගත්තම රධ්‍ය අයියත් ඇවිත් මගේ එහාපැත්තෙන් ඉදගෙන කනට කල්ලා 'එකවිදියක ඉදපන්' කියලා මූණට හිනාවුනා.. දෙන්න හිතයි මොට්ට සිප්පි කට්ටට දෙකක්.. ඌ තමා මේ සේරටම වගකියන්න ඕන.. පරක්කු වෙලා ඇවිල්ලා ඉස්සරහම ඉදගන්නත් වුනා.. අර හම්බුණ අයිස්ක්‍රීම් එක මට දුන්නෙ නැත්නම් අම්මපා මම කරනවා හොද වැඩක්.. අනික මම නිසා උගේ දත් පණුවො කන්නෙත් නෑ.. කොච්චර හොදද.. බෙනිෆිට්ස් ඔෆ් හැවින් අ සීනිබෝල ෆැක්ටරියක් වගේ කොල්ලෙක්..

භාවනා වැඩසටහන මම හිතුව තරමම බෝරින් වුනේ නෑ මගේ වාසනාවට.. ඒ කියන්නෙ බෝරින් නෑ කොහොමවත්.. ටිකක් තරුණ වගේ හාමුදුරුවො කෙනෙක් වැඩම කල්ලා තිබ්බෙ.. මම හිතුවෙ මට මෙතනම නින්ද යයි කියලා.. එහෙම වුනේ නෑ.. ඒ වුණාට සැරෙන් සැරේ රධ්‍ය අයියා මගේ උරහිසේ උගෙ උරහිස වද්දනවා.. මූ හිතුවද දන්නෑ මට එහෙම නින්ද ගියා කියලා.. පිස්සු හැදෙයි.. මම කොහොමත් මලක් වගේ බනක් භාවනාවක් කරගෙන ඉන්න තමයි හිතේ තියාගෙන හිටියේ මේ රධ්‍ය කියන දළඹුවා හෝ මීමැස්සා ආවෙ නැත්නම්..

භාවනා කල්ලා ඉවර වුණාම ඒ හාමුදුරුවොම පැය දෙකක විතර බණක් කිව්වා.. මම ඉතින් ඔලුව පොඩ්ඩක් නමාගෙන අර රධ්‍ය අයියා ඉන්නවා වගේ වැදගෙනම බණ අහගෙන ඉදියා.. ඒකා නම් සිරාම උපාසකයා තමා.. හෙල්ලෙන්නෙවත් නෑ.. මමත් ඉතින් හෙල්ලුනේ නෑ තමා.. මොකද අපිට පිටිපස්සෙන් ඉස්කෝලෙ ප්‍රින්සිපල් සර්ලා පස් දෙනෙකුයි විනයභාර සර්ලායි මැඩම්ලායි හිටිය නිසා..

@Shan

හාමුදුරුවො බණට දේශනා කලේ අපි කරන පින් පව් පව් වලට කොහොමද විපාක පල දෙන්නේ කලා.. හාමුදුරුවො, ඉස්සරහම ඉදපු මම දිහා බල බල දෙපාරක් තුන්පාරක්ම හිනාවුනා.. ඒ කියන්නෙ මේ හොදට බණ දේශනා කර කර ඉදලා.. එකපාරටම නවත්තලා මගේ දිහ බලාගෙන ඉන්නවා.. ඕක නිසා මගේ මූණට ලේ පිරිලා රතු වෙලා එතන වෙන විකාරයක් වුණා.. බලාගෙන ඉදලා ඔලුව වන වන හිනාවෙනවා..

" ඉහළ රූප සම්පත්තියක් ඇතුව ඉපදෙන්නත් මේ දරුවෝ දන්නවද.. ඒකටත් පින පව බලපානවා.. ශිල්ප පිහිටන්නත් එහෙමමයි.. ගිය ආත්ම භව වල අපි කරන කර්ම විපාක ඵල දීමක් විදියට තමයි අපි මේ ආත්ම භව වල කිසිම අඩුපාඩුවක් නැතුව ඉපදෙන්නේ.. හරියට විශාඛා මහා උපාසිකාව වගේ.."

හාමුදුරුවෝ එහෙම දේශනා කර කර සැරින් සැරේ මගේ දිහා බලද්දි රධ්‍ය අයියත් හිනාවෙවී මගේ දිහා හැරිලා බැලුවා.. මම තා ටිකක් මූණ පහතට නමාගෙන මූන උස්සලා බලන්නෙවත් නැතුව වැදගෙනම හිටියා..

පැය දෙකකට පස්සේ හාමුදුරුවෝ බණ අහවර කරලා, සිල් පවාරණය කල්ලා, අපේ ඉස්කෝලෙ විනය ගැනත් හොද කියලා ප්‍රශංසා කල්ලා ,ආපහුම පන්සලට වැඩම කරන්න ලෑස්ති වුනාම ප්‍රින්සිපල් සර් අට පිරිකරක් රධ්‍ය අයියගෙ අතට දීලා මගේ අතට බ්‍රවුන් පේපර් වලින් රැපින් කරපු හෙන ලොකු බොක්ස් එකක් දීලා ගිහින් පූජ කරන්න කිව්වා.. මෙන් හෝල් එකේම ලමයි හිටියා පන්සීයක් හයසීයක් විතර..මම ඉතින් දෙයියනේ කියලා සරම කඩාගන්නෙ නැතුව හිමින් නැගිටලා හාමුදුරුවොන් ඉදපු තැනට ගියහම රධ්‍ය අයියා මුලින්ම අට පිරිකර පූජා කල්ලා හමුදුරුවොන්ට වැදලා එහාට වුනා.. මමත් එතන තිබ්බ ස්ටූල් එක උඩින් බොක්ස් එක තියලා පසග පිහිටුවලා හාමුදුරුවොන්ට වැන්දහම හාමුදුරුවෝ 'සුවපත් වෙත්වා' කියලා මගේ ඔලුවට උඩින් නොගැවෙන්න අත තියලා හිනාවුනා.. මමත් හිනාවෙලා රධ්‍ය අයියගෙ එහාපැත්තෙන් හිටගත්තහම ඉස්කෝලෙ බෞද්ධ සංගමෙ කොල්ලෙක් රධ්‍ය අයියට මයික් එකක් ගෙනැත් දුන්නා..

" අද දින මෙහි වැඩමවා වදාළ අතිපූජ්‍ය.."

රධ්‍ය අයියා පොඩි කතාවක් කරනකල් මම ඉතින් උපාසක බළලා වගේ අත් දෙකත් ඉස්සරහට  බැදගෙන බිම බලාගෙන හිටියා.. ඉස්සරහා බැලුවොත්

@Shan

ලැජ්ජ හිතෙන නිසා.. ඒ එක්කම ෆොටෝග්‍රැෆි සොසයිටි එකේ පොඩි එකෙක් කැමරාවකුත් උස්සගෙන ඇවිත් ඇඟිලි වලින් වන් , ටූ , ත්‍රී කවුන්ට් කල්ලා ඇස් දෙක නිලංකාර වෙලා යන්න ෆොටෝ එකක් ගත්තා..

මේ සතියේ ස්කූල් මැගසින් එකේ මුල් පිටුව.. '

Rajakeeya Abhiwandhana 'Annual Sil' program..'

කොහොම හරි ඒවා මේවා ඉවරවෙලා මමනම් මෙන්හෝල් එකේදිම උතුරු සළුව ගලවලා අතේ ඔතාගත්තා.. ඊටපස්සෙ ප්‍රිෆෙක්ට් රූම් එකට ගිහින් සරමත් ගලවලා බෑග් එකේ ඔබාගෙන ක්ලාස් එකට ගිහින් මැඩම්ව හම්බෙලා ආයෙම ප්‍රිෆෙක්ට් රූම් එකට එද්දි රධ්‍ය අයියා ගෙදර යන්න ලෑස්තිවෙන්න සපත්තුදෙක දානවා.. කියාන් අයියයි අයුක අයියයි සෙනුකයයිත් ඒ අහළ පහළ උන්ගෙ වැඩ..

" මේ.."

" මම.."

රධ්‍ය අයියා මේස් දෙක නමාගෙන උඩ බැලුවා..

" දැන් ආයෙම ලීඩර්ශිප් කෑම්ප් එකටත් එන්න ඕනද අප්පා.."

" එන්න වෙනවනෙ.. මේ සැරේ එන්න කියලා ලෙටර් එකක් දුන්නා නේද.."

" ඒ ලෙවෙල් අස්සෙ මදැයි ස්ටුවර්ඩ්ශිප් එකකුත් පටලගත්තා.. බලපන් එහෙම්පිටින්ම දවසක් අපරාදෙනෙ.."

සෙනුකයා මූණ නරක් කරගෙන කිව්වා.. ඌ කියන්නෙ ඇත්ත තමා.. අරවා මේවා පැටලිලා එක්සෑම් එකට කෙලවුනොත් මේ එක මගුලක්වත් නෑනෙ.. එක්සෑම් එක්සෑම් එක්සෑම් කොහේ ගියත් මතක් වෙන්නෙ ඒකමයි.. මානසික ආතතිය වගේ දැන්නම්..

" සිරාවට මුන් දෙන්නට බයෝ කරන අස්සෙ මේවත් කරන්න පුලුවන්ද බං.. ඔකට නැවිත් ඉන්න බැරිවෙයිද.."

" බෑනෙ කියාන්.. අර උපාලි සර් කෑගහනවනෙ ආවෙ නැතිවුනොත් ස්ටුවර්ඩ්ශිප් කැන්සල් කරනවා කියලා.. මාත් අහලා බැලුවා ස්ටුවර්ඩ්ස්ලා

@Shan

එන්න ඕනමද කියලා.."

" ඉතින්.."

" එන්න ඕන කියන්නෙ.."

රධිය අයියා බෑග් එක අතට අරගෙන යන්න ලෑස්තිවුනාම මාත් මගේ බෑග් එක හොයාගෙන කරේ දාගත්තා..

" ම්ම්.. කමක් නෑ ඕකට විතරක් පලයන් එහෙනම්.. ආයෙ මුන්ට මහාලොකුවට වැඩ දෙන්න යන්න ඕන නෑ.."

" ම්ම්.. වරද් යමු.."

අපි දෙන්නා ගෙදර එන්න ආවා.. අනිද්දට වන් නයිට් කෑම්ප් එකක් ඉස්කෝලෙ.. ඒකට නවතින්නත් වෙනවා.. අපේ ගෙදර දෝෂිත් කේස් මෙවට ඉතින්.. මොනා කරන්නද..

" අයියෙ.."

" ම්ම්.."

" අර හාමුදුරුවොන්ට මක් වෙලාද සැරින් සැරේ හිනාවෙන්න ගත්තෙ ආ.."

" මම කොහොමද දන්නෙ බං.. උඹව දැක්කහම විශාබාව මතක් වුනාද දන්නෙ නෑ.."

" අනේ මේ පලයං.."

" නෑ නෑ උඹ ඉදගෙන ඉද්දි හාමුදුරුවො බලන්න ඇති හෝල් එකේ කවුද ඩමියක් ගෙනැල්ලා ඉස්සරහින් තිව්වෙ කියලා.."

" ඩමියක්.. ඒ මොකද ඒ..??"

" නිකන් නිකන්.."

" ඒකමිසක්.."

@Shan

" සිරාවට උඹ මොකද බං හැමදාම ලස්සන වෙන්නෙ.."

" මම??"

" ම්ම්.."

" මගේ හිතේ කහට නැනෙ හලෝ.."

" එහෙමද හා හා.. උඹ කියන එකක් තමා.. වරෙන් බස් එකක් එනවා.."

හායිම්.. හිතේ කහට නැති ඔතරිත් ආවා.. ආයෙ රැටත් එම්නත ඒයිම්..

එන්නාම්.. ලව් යූ..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 60 කොටස

" සුදුමහත්තයා.. උඹ ඕවට ගියාට කමක් නෑ.. ලකුණු එහෙම අඩුකරගෙන මෙතන මට එක එකාගෙන් කතා අහගන්න ලැස්ති කරනවා නෙමේ.."

" හරි හරි අනේ එකදවසනෙ.. ඉවරයි.. ආයෙ යන්නෙ නෑ.."

" ආයෙ යන්නෙ නෑ තමයි.. එක දවසකවත් ගෙදර නෑ.. හැමදාම මොකක් හරි මගුලක්.."

" අනේ මේ අර රධ්‍ය අයියත් කවදාවත් ඉස්කෝලෙ ඉදපු එකෙක් නෙමේ උෟ හැමදාම හිටියෙ කැඩෙට් කැම්ප් වල.. කෝ ඉතින් අයිලන්ඩ් රැන්ක් එකකුත් දැම්මෙ.."

" උඹට ඉතින් එච්චර එකක් කරගන්න බැරි වග මම දන්නවනෙ.. ඒ ළමයි ඒවට ගියාට උනන්දු වෙනවා ඇති.."

" ආපෝ මොන මගුලක්ද මේ.. බනිනවා බනිනවා.. මම යනවා යන්න.. දොරවල් වහන් ඉන්න හොදේ.. රෑට ලොකු අම්මලගෙ ගෙදර යනව නේ.."

" ම්ම්.."

මම පුප්පගෙන ගිහින් අම්මට වැන්දහම අම්මත් පුප්පගෙන මට බුදුසරණයි කිව්වා.. ඊටපස්සෙ මම උදේ පාන්දර පහට පුප්පගෙනම එළියට බැහැලා හෝල්ට් එකට ආවා.. මොන ලබ්බකට උදේම එන්න කියනවද මන්දා.. සීතලයිත් එක්කන්.. බෑග් එකත් ටොන් එකක් විතර බරයි.. මම හෝල්ට් එකට ඇවිත් විනාඩි දහයකින් විතර අපේ අම්මගෙ වීර පුතා උගේ අයියත් එක්ක ඇවිත් මාවත් දාගෙන ඉස්කෝලෙට එන්න ආවා..

" ගුඩ්මෝනින් ආධ්‍ය අයියෙ.."

" ඒයි මෙහ් ගුඩ්මෝනින්.."

මම දෙන්නටම ගුඩ්මෝනින් කියලා ආධ්‍ය අයියට හිනාවුනා..

" අම්මෝ හුග කාලෙකින් දැක්කෙ.. ගුඩ් මෝනින්.."

@Shan

" ඔයාට මාව මතක් වුනාද අයියෝ.."

මම ආධ්‍ය අයියගෙන් අහද්දි මගේ එහාපැත්තෙ ඉදගෙන හිටපු රධ්‍ය අයියා මං දිහා රවලා බැලුවා.. මොකද දන්නෑ රවන්නෙ.. නැනෙ.. රවන්න විතරනේ දන්නෙ..

" මතක් වුනා නේන්නම.."

" ඔහ්.. ශෝක්නෙ.."

" ම්ම්.. මතක් නොවී තියෙන්න බැනෙ අපේ ගෙදර ඉන්න ඔයාගෙ හැපීකච්චගෙ ඇග පුරාම හූරලානෙ බළල් පැටියෙක්.. බළල් පැටියෙක්ද ඩැකියුලෙක්ද මන්දා.."

" ඈ සිරාවට.. හැපීකච්චා..??? ඒ අයියෙ ඔයා කිව්වෙ හැපීකච්චා කියලද.."

" ම්ම්.."

මම පටාස් ගාලා රධ්‍ය අයියා දිහා බැලුවා.. ඇස් දෙකත් හීනි කල්ලා.. රධ්‍ය අයියා ශටර් එකෙන් එළිය බලාගෙන ඉදියේ..

" ජ්ස් මේ.. තවුසෙ මොකක් හරි කැත වැඩක් කලා නේද.."

රධ්‍ය අයියා මගේ දිහා පුදුමෙන් වගේ බැලුවා..

" මම??"

" ඕ.."

" මම මොනවද කලේ.. උඹට පිස්සුද.."

"  තවුසෙගෙ ෆෝන් එක මෙහෙ දීපන්..ගැටහැලප පොලොස් කොට්ටෝරුවා.. මොකක් හරි හිපාටු කතාවක් කිව්ව නේද ආධ්‍ය අයියට.."

මම ටක් ගාලා පැනලා රධ්‍ය අයියගෙ සාක්කුව අස්සට අත දැම්මා විතරයි ඌ දගලලා දගලලා මගේ අත එළියට අරන් විසික් කලා..

"එච්ච කොහෙද තවුසෙට මාත් එක්ක"

@Shan

මම සපත්තු දෙක ගලෝලා එහා කොනටයි මෙහා කොනටයි විසික් කල්ලා රධ්‍ය අයියගෙ බෙල්ලෙන්ම අල්ලලා ශටර් එකට තියලා තද කලාම උෟ හුස්ම ගන්න බැරුව මැරෙන්න ගිහින් මගේ උරහිසෙන් අල්ලලා සීට් එකේ එහා කොනට තල්ලු කලා.. මම කළු කැත තඩි වවුලෙක් වීදුරුවෙ වැදුනා වගේ ගිහින් වීදුරුවේ වැදුනා..

"ආහ් තවුසෙ මාව තල්ලු කලා නේද"

මම මෙස් එකක් ගලෝලා රධ්‍ය අයියගෙ මූණටම විසික් කලාම උෟ මගේ කකුල් දෙක අල්ලලා අත් දෙකින්ම තද කරගෙන ලොක් කල්ලා සීට් එක උඩ තියලා මගේ ලස්සන කකුල් දෙක උඩිත් උගේ තඩිම තඩි පස්ස තියාගත්තා.. යකෝ තල්මහෙක් වගේ මුගේ බර.. මගේ කකුල් දෙක කැඩෙන්න ආවා.. හෙල්ලෙන්න්වත් බෑ..

"එහාට යනවා.. ආව් අම්මාහ් කකුල් දෙක මගේ.."

මම අත් දෙකින්ම රධ්‍ය අයියව තල්ලු කලාම රධ්‍ය අයියා මගේ අත් දෙකත් තද කල්ලා අල්ලගත්තා..

"ආව්හ්.. අනේ ආධ්‍ය අයියේ.."

ඊටපස්සෙ මම කොහොමහරි දගලලා දගලලා මගේ එක කකුලක් අර තඩි පස්ස යටින් අරගෙන ඒ කකුල රධ්‍ය අයියගෙ කම්මුලට තියලා එහාට තල්ලු කලාම රධ්‍ය අයියා මගේ අත් දෙක අතෑරලා කකුල අහක් කරන්න ට්‍රයි කරද්දිම, මම රධ්‍ය අයියගෙ බෙල්ලෙන්ම අල්ලලා, එක අතකින් කොහොමහරි සාක්කුවට අතදාලා ෆෝන් එක ඇදලා ගත්තා..

" ඒ මෙහෙ දෙනවා ෆෝන් එක"

රධ්‍ය අයියා දගලද්දි දගලද්දි මම ෆෝන් එක අරගෙන ඉස්සරහට කල්ලා පට ගාලා ලොක් එක ඇරගෙන ගැලරි ගිහින් උගේ ඇඟිල්ල ඇදලා ගන්න ට්‍රයි කරාම මෙකා මාව පිටිපස්සට ඇදලා අරගෙන බෙල්ල වටේ අතක් දාලා ඇගට හිර කරගත්තා..

"කැහ්-කැහ්-අම්මෝ-හුම්ම.."

@Shan

මම ඒ වුණාට සැලෙන්නැතුව උගේ ඇඟිල්ලක් අරගෙන ඒක හපලා ෆින්ගර් ප්‍රින්ට් එක තියාගෙන ගැලරි ලොක් එක ඇරගත්තා..

"වරද්.. මෙහෙ දීපන් ෆෝන් එක.."

" බෑ.. ආහ්.. මොකක්ද මේ මලකුයි හාට් එකකුයි තියන ෆෝල්ඩර් එක.."

" වරද්..!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

" තවුසෙට කොහෙන්ද මේවා.."

මමවත් ජීවිතේට දැකපු නැති මගේ ෆොටෝ ගොඩක් රධ්‍ය අයියගෙ ෆෝල්ඩරයක් පිරෙන්නම තියෙනවා දැකලා මට කැස්සකුත් ඇල්ලුවා.. සැක්.. මොකක්ද මේ මම කොට කලිසමකුත් ගහගෙන පස්ස දික් කරන් නැමිලා බිම හාරන ෆොටෝ එක.. යකෝ!! හැටි විතරක්.. බිං ඌරෙක් වගේ..

" ඕක දීපන්.. වරද්.. මම උඹට ගහනවා හැබැයි.."

මම ඒ මගුලෙ ෆෝල්ඩර් එක බලන්නෙ නැතුව ඉක්මනට වීඩියෝස් තියන ෆෝල්ඩර් එකට ගිහින් මම හොයන ජාතියෙ එක තියද බැලුවා.. ම්ම්..ම්ම්.. කොළපාට වගේ එකක්..

" ආ මේ තියෙන්නෙ.."

මම වීඩියෝ එක ප්ලේ කලාම රධ්‍ය අයියා තවදුරටත් මාත් එක්ක සටන් කරන එක නවත්තලා මගෙ ඔලුවට තඩි ටොක්කක් අතෑරියා..

" කෝ මේකෙ සද්දෙ නෑනෙ.."

මම වොලියුම් බටන් එක සීයට යනකල්ම ප්‍රෙස් කරන් හිටියා විතරයි එකපාරටම බෙබද්දෙක් වගේ එකෙක් වැනි වැනී මොනවදෝ පිස්සු මගුල් වගයක් කියවනවා ඇහුනා.. සැක්.. මේ මොනෞත්තක්ද මේ..

*ඔයා ආසද මගේ උකුල උඩ වාඩිවෙන්න*

*එහෙනම් ඔයා මගේ හිරකාරයව දන්නවද*

@Shan

*මගේ හැපිකව්වා.. ගැටහැපල ලොපොස්කොටටෝරුවා.. එයා හිරේ ගියා*

*අවුරුදු සීයකින් මම එයාව දැකලා නෑ*

* එයා හම්බුණහම කියන්න මට-*

මේ මොන නවනිංගිරාවක්ද යකෝ මේ.. මම මොනවද මේ කියවන මරිමොංගල් කතා.. මම තරහින් පුපුර පුපුර රධ්‍ය අයියා පැත්තට හැරුණහම ඉස්සරහා හිටිය ආධ්‍ය අයියා කාර් එකේ යන සිංදුව වැඩි කල්ලා දැම්මා..

" තවුසෙ මැටි මෝල් සකපෝරු හිවල් ඇට නැති කාන්තාර පතොක් ඔටුවා..!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!! මේක මොකටද වීඩියෝ කලේ ආ!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!.."

මම රධ්‍ය අයියගෙ අත ඇදලා අරගෙන කැල්ලක් ගැලව්ලා යන්නම හැපුවහම ඌ මැරෙන්න යන ඔටුවෙක් වගේ මහා හයියෙක් කෑගහලා මාව එහාට තල්ලු කලා..

" මොකද තවුසෙ තල්ලු කරන්නෙ.."

" ආ ආ ආ ආ අයියේ.. මූ හපනවා.. ආව්හ්..! වරද්..ආ ආ අත අත යකෝ මගේ අත අතෑරපන්.. අයියේ~හ්!!!!!! මූට පිස්සු බලු ලෙඩේ හැදිලා.."

" කාටද තවුසෙ පිස්සු බල්ලා කිව්වෙ.."

" ආ~ මූණ- මූණ හූරන්න එපා යකෝ.. අයියේහ්.. උඹට බල්ලා කිව්වෙ නෑ.. යකෝ ලෙඩක් ගැන කිව්වෙ.."

" නෑ තවුසෙ මට කැත බල්ලා කිව්වා.."

" හෙන ගහන බොරු කියන්නෙපා යකෝ.."

" තවුසෙ දැන් මට හෙනගහන්නත් කියනවද.."

මම රධ්‍ය අයියගෙ කොණ්ඩෙන් ඇදගෙන ඉදලා ශර්ට් එකෙන් ඇද්දා විතරයි..

*සරාස්*

@Shan

" ඌප්ස්.."

" වරද්!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

ෂර්ට් එක පියවලා තිබ්බ බොත්තම් ජේලියම ගැලවිලා ඇවිත් කාර් එක පුරා විසිරිලා ගියා.. ටහිකෙ..!! ගැලවුනා නේද රෙද්ද..රධ්‍ය අයියා මූණ රතු කරගෙන පුම්බ පුම්බ මගේ දිහා බලාගෙන ඉදපු හැටිය එච්චර සුභ එකක් නොවෙච්ච නිසා මම සීට් එක උඩ වැටිලා තිබ්බ බොත්තම් දෙකත් අහුලගෙන පාඩුවේ සීට් එකේ එහා කොණටම ඇදිලා ගිහින් ශටර් එකේ මූණ ගහගත්තා..

" හපොයි පොඩී.. ඔය මොකද.."

" අයියෙ!!!!!!!!!!!!!!!!"

" හරි හරි ඉතින්.. කෑගහන්න ඕන නෑ.. අර පිටිපස්සෙ මගේ ශර්ට් එකක් ඇති.. ඒක ඇදගන්නවකො.. බාල රෙද්ද කොහෙද.."

" අන්න තමා.. බාල රෙදී.. සන් නූල් වලින් නෙමෙයිද කොහෙද මහලා තියෙන්නෙ.."

මම රධ්‍ය අයියට හිනාවෙලා කිව්වහම ඌ උගේ කකුල ගාව තිබ්බ මගේ සපත්තුවෙන් මගේ මූණට දමලා ඇරියා..

" තෝ.. තෝ.. කතාකරන්න එපා මාත් එක්ක.."

රධ්‍ය අයියා පිටිපස්සෙ තිබ්බ බෑග් එකකින් ශර්ට් එකක් ඇදලා අරගෙන ඒක ඇදගත්තා.. මම ඉතින් ඇදුම් මාරු කරද්දි බලන්න හොද නැති නිසා අහක බලාගෙන ආවා.. දැන් නම් මට දුකත් හිතෙනවා හිතෙනවා වගේ.. මොකක් වුනත් මට ශර්ට් එක ඉරන්නෙ නැතුව.. සොරි.. මම හිතලා ඉරුවෙ නෑනෙ.. ඒක ඉරෙන්න අනුබල නොදී ඉන්න තිබ්බා..

රධ්‍ය අයියා ශර්ට් එකත් මාරු කරගෙන කොන්ඩෙත් හදාගෙන මගේ දිහාවත් බලන්නෙ නැතුව ශටර් එකෙන් එහාපැත්ත බලාගෙන යද්දි මට සිරාවටම හිත රිදුනා.. මූණත් සීරිලාද කොහෙද.. අතත් රතු වෙලා..

'වරද් උඹනම් මහ හොදන් නරකක් දන්නෙ නැති පොල්පිති හරකෙක්'

@Shan

මම එක මේස් එකක් විතරක් කකුලට දාගෙන සපත්තුත් නැතුව ඉදපු නිසා නැමිලා මගේ සපත්තු දෙක හරියට දාගෙන ලේස් එකත් ගැටගහගෙන අවුල් වෙලා තිබ්බ ඇඳුමත් හදාගෙන අගලක් සීට් එකෙන් මෙහාට වුනා..

'කෝ බලන්නැනෙ..'

මම තා පොඩ්ඩක් මෙහාට වුනා..

ඒත් බැලුවෙවත් නෑ.. රවාගෙන ෂටර් එකෙන් එළිය බලාගෙන ඉන්නවා..

මම රධ්‍ය අයියා ලගටම කිට්ටු වෙලා ඇගටම ඇලිලා හේත්තු උනාම ඌ උරහිස ගස්සලා මාව ගනන් ගන්නැතුවම දිගටම හිටියා.. සිරාවටම තරහ වෙලාද කොහෙද.. මම ගැලරියත් දැක්කනෙ.. ඌ ඒක මට නොපෙන්න සැහෙන්න ආරක්ශා කලානෙ.. ඒත් ඉතින් මම දැක්කෙ එක ෆොටෝ එකනෙ..

මම රධ්‍ය අයියගෙ අතක් අල්ලගන්න යනකොටම රධ්‍ය අයියා අත ඇදලා ලගට ගත්තා.. සැක් සැක් මට ඇඩෙන්න වගෙ ඒකක් වෙනවා.. මේ මොන බොළද හත්වලාමක්ද මේ..

මම ඉක්මනට කදුලු එන්නැති වෙන්න ඇස් පිය ගහලා ගහලා කදුලු වේලගෙන එහාට වෙලා පාඩුවෙ වාඩිවෙලා ගියා.. ඒ වුණාට කදුලු වේලෙන්නෙ නැනෙ.. මගේ කම්මුල දිගේ රූට්ටලා ගිහින් අත උඩට වැටෙනවා.. මට දුකයි.. උගුරෙ මොකක් හරි හිරවෙලා වගේ.. පපුවෙ පැත්තක් හිරිවැටීගෙන රිදෙනවා..

'එයාට මාව එපාවෙලාද දන්නෙ නෑ'

'ආයෙ ජීවිතේටවත් මාත් එක්ක කතා නොකරයිද දන්නෙ නෑ'

'මීට කලින් තරහ වෙලා ඉදලත් නෑ'

මට එක එක මල විකාර මතක් වෙලා දුකත් වැඩිවෙලා අත පයේ ඉදලම රතු වෙන්න ගත්තා.. ඒ එක්කම ආධ්‍ය අයියා පිටිපස්ස හැරිලා මං දිහා බැලුවා..

" මල්ලි.. ඒ.. මේ මොකද.. මල්ලි.. චූටියො.."

@Shan

ආධ්‍ය අයියා සැරින් සැරේ මට කතාකරද්දි මම නහය උඩට ඇදගෙන ආධ්‍ය අයියා දිහා බැලුවහම ඒකා ගැස්සිලා ගියා..

" පොඩී!!!! මේ පොඩි එකා ඇඩෙව්වද ඒ පාර.."

ආධ්‍ය අයියා රධ්‍ය අයියට කියද්දි රධ්‍ය අයියා හැරිලා මං දිහා බැලුවා.. බලලා බය වෙලා වගේ ආයෙම ආධ්‍ය අයියා දිහා බැලුවා.. මම මගේ නියපොතු දිහා බලාගෙන ඉදියා..

" වරද්!! මේ-මේ මොකද.."

මම කතාකරන්නෙ නැතුව බර වෙලා තියන නහය උඩට ඇද්දා..

" වරද්.."

" මොකුත් නෑ.."

අපි ඉස්කෝලෙ ගාවටම ඇවිල්ලා හිටියෙ.. ආධ්‍ය අයියා කාර් එක පාකින් එකට දැම්මහම මම බෑග් එකත් අරගෙන කාර් එකෙන් බැස්සා..

" යන්නම්.. තැන්ක් යූ ආධ්‍ය අයියේ.."

මම බෑග් එකත් එල්ලගෙන දුවගෙන දුවගෙන ග්‍රවුන්ඩ් එකට ගියා.. හයට කිට්ටු කල්ලා.. සෙනුකයා අයුක අයියා එක්ක ග්‍රවුන්ඩ් එකේ ගේට් එක ලග කතාකර කර ඉන්නවා දැකලා මම දුවගෙන ගිහින් සෙනුකයගෙ අතේ එල්ලුනා..

" ආ කොම්ලො.. ගුඩ් මෝනින්.."

" ගුඩ් මෝනින්.. ගුඩ් මෝනින් අයියෙ.."

මම අයුක අයියත් එක්කත් හිනාවෙලා සෙනුකයා දිහා බැලුවහම සෙනුකයා ඇස් දෙකත් හීනි කරගෙන මගේ මූණට එබුනා..

" මේ මොකද.. ෂනෙරුවා.. උඹ ඔය අඩලද.."

" උඹට පිස්සු හැදීගෙන එනවද.."

@Shan

" ඔව් ඔව් මට තමා පිස්සු.. මොකද උනේ කියපන්කො.."

" මොකුත් නෑ බං.. කෝ කියාන් අයියා.."

" අන්න හිටියා බං.. දැන් නම් කොහෙද දන්නෙ නෑ.."

" එහෙමද.."

ඒ එක්කම රධ්‍ය අයියා ඈතින් එනවා දැක්ක නිසා මම සෙනුකයට බායි කියලා ග්‍රවුන්ඩ් එකට ගිහින් කියාන් අයියව හොයාගන්න ට්‍රයි කලා.. මේ මහපගය කොයි ලෝකෙ ගියාද දන්නෙ නෑ.. වෙන මොකෙක්වත් දන්න එකෙක් කියලා හිතට අල්ලන එකෙක්වත් නෑ.. කැම්ප් එක පටන් ගන්නෙ හය හමාරටනෙ.. මම බෑග් එක ස්ටෙයාර්ස් වලින් තියලා ඉස්කෝලෙ නුග ගස් අස්සෙන් අස්සෙන් ඔහේ ඇවිදගෙන ළමයින්ගෙන් ඈත් වෙලා ඉදියා..

" මියෑව්~"

මම ඇවිදගෙන යද්දි මගේ ඉස්සරහා ඇග ලෙවකකා හිටියේ පොල්සම්බෝල පාට පූසෙක්.. මට අපේ ගමෙ ගෙදර සක්කිලි පූසව එකපාරම මතක් වුනා.. එයත් පොල්සම්බෝල පූසෙක් නේ.. මම හිමින් හිමින් ඌ ගාවට කිට්ටු කල්ලා ඌගාවින් බිම ඇණ තියාගෙන උගේ මූණ අතගෑවා..

" prrrrrrr"

ඒකා පුරු පුරු ගගා මගේ අතේ මූණ අතුල්ලන්න පටන් ගත්තා.. උගේ සිනිදු.. සිනිදු කියන්නෙ පුලුන් ගොඩක් වගේ.. බෙල්ල හරියෙන් සුදු පාට ස්කාෆ් එකක් තියෙනවා.. තව කකුල් වලට මේස් දාලා වගේ ඒවත් සුදුයි.. මම ඌව අත් දෙකටම අරගෙන ඌව සෙනුකයටත් පෙන්නන්න එක්කන් යන්න හැරෙද්දිම මං ගාව තිබ්බ නුග ගහට හේත්තු වෙලා බොටමට අත් දෙකත් දාගෙන මං දිහා බලාගෙන ඉදියේ රධ්‍ය අයියා.. මොන මගුලක්ද.. වෘක්ශ දේවතාවා වගේ ගස් අස්සෙ කරන්නෙ.. මම බයත් වුනා යකෝ..

" මෙහෙ මොකක්ද කරන්නෙ.."

"................"

@Shan

මම මොකුත් කියන්නෙ නැතුව එන්න හදද්දි රධ්‍යා අයියා මගේ අතකිල් අල්ලලා නතර කලා.. මම පූසව අත් දෙකේ ගුලි කරගෙන බිම බලාගෙන ඉදියා.. හිතේ පොඩි ගිල්ටි එකක් තියෙනවනෙ..

" මාර මගුලක් තමා.. යකෝ!! මම ගුටිත් කාලා අපේ අයියගෙන් බැනුනුත් අහලා දැන් උඹවත් යාලු කරගන්න ඕනද.."

" සොරි.."

"සොරි..?? සොරි තමා.. උඹ හොර බළලෙක්ද..මිම්.. හූරනවා හපනවා.. බලපන් මගේ මූණත් හූරලා.."

රධ්‍යා අයියා කේන්තියෙන් නැතුව හිමිහිට කියද්දි මම පූසව තව ටිකක් තදට පපුවට ගුලි කරගෙන ඇස් උස්සලා රධ්‍යා අයියගෙ මූණ දිහා බැලුවා.. පොඩ්ඩක් සීරිලා තමයි ඉතින්..එතන රතු වෙලා.. මම එහෙමම නුග ගහට හේත්තු වුනා.. ආයෙම කඳුලු උනනවා වගේ ඇස් වලට.. යකෝ මම මෙච්චර බොළඳ වුනේ කවදා ඉදන්ද.. මට හිතාගන්න බෑ..

" සොරි ඉතින්.. සොරි කිව්වනෙ.."

" ආ හරි හරි ඉතින්.. අඩන්න ඕන නෑ.. මම දැන් බැන්නද නෑනෙ.."

" ම්ම්.."

රධ්‍යා අයියා හිමිහිට මම ඉන්න පත්තට පාත් වෙද්දි මම පූසා අත් දෙකට තව ටිකක් තුරුල් කරගෙන නුග ගහට හේත්තු වුනා.. අද ඉරිදා දවසක් නිසා ඉස්කෝලෙ කවුරුත් නෑ තමයි.. ඒ වුනාට මෙක ඉස්කෝලෙනෙ..

" මේ මොකද.."

මම එක අතකින් රධ්‍යා අයියගෙ උරහිසට ගැහුවහම එයා හිනාවුනා..

" මොකද අහන්නෙ.. මොකක් වගේද පේන්නෙ.."

සැක් මේකගෙ මනමාල හිනාව.. මගෙ කම්මුල් දෙක රතුවේගෙන රතුවේගෙන එනවා මට දැනෙන්න ගත්තා.. කම්මුල් දෙක නෙමේ ඇගම රතුවෙනවද කොහෙද.. රධ්‍යා අයියා මගේ ඇස් වල අගින් තිබ්බ කඳුලු ඇගිලි තුඩුවලින් පිහිදැම්මා..

@Shan

" අඩන්නැතුව ඉදපිය.. අලුතින් එකක් පුරුදුවෙලා.."

" අනේ මෙ යනවා.."

අඩ අඩ ඉද්දි හිනායන එක කොච්චර චාටර්ද දන්නව නේද.. මාත් අර හෙන ගහලා වගේ අඩ අඩ ඉදලා එකපාරට බකස් ගාලා හිනාවුනා..

" එනවා ග්‍රවුන්ඩ් එකට යන්න.. ඔය බළලව අතෑරලා.."

රධ්‍ය අයියා මගේ අතේ ඉදපු බෝල පූසා බිමින් තිව්වහම ඒකා අපි වටේ කැරකි කැරකි ඉදලා කොහේද යන්න ගියා.. අපරාදෙ සෙනුකයට පස්සෙ පෙන්නන්න ඕන.. ඌ ලස්සනයිනෙ.. මම පූසා ගිය පැත්ත බලාගෙන ඉදලා මූණ හරවන්න ගියා විතරයි ,

එකපාරම..

එකපාරම රධ්‍ය අයියා නැමිලා මගේ කම්මුලකින් ඉක්මනට හාද්දක් තිව්වා.. මාව ගැස්සිලා ගියා.. ඒ මොකක්ද ඒ වුනේ.. ??වුනේ මොකක්ද කියලත් මොළේට ප්‍රොසෙස් වෙන්න මට විනාඩි ගානක් ගියා.. ඒක ලාවට තෙතට මට කම්මුලේ දැනෙනවා දැනෙනවා වගේ..

" රධ්‍ය අයියෙ..!"

" ම්ම්..??"

" මොන-එහාට වෙනවා මට යන්න ඕන.."

මම රධ්‍ය අයියව තල්ලු කරගෙන එන්න හැදුවහම ආයෙම ඒකා නැමිලා මගේ අනිත් කම්මුලටත් 'චුක්' ගාලා හාදුවක් තිව්වා.. මේකාට මොනවා වෙලාද..

" අයියෙ!!"

" ම්ම්..?? උඹව දැක්කහම සාක්කුවෙ දාගෙන ගෙදර ගෙනියන්න හිතෙනවා.."

" සාක්කුවෙ දාගෙන.. ඇයි මම tinkerbellද.."

@Shan

" tinkerbellගෙ මෙල් වර්ශන් එක.."

රධ්‍ය අයියා මගේ කරට අතකුත් දාගෙන ග්‍රවුන්ඩ් එක පැත්තට එන්න ආවා.. මුගේ තියෙන්නෙ කපටිකම.. වෙන මොකක්වත් නෙමෙ.. නරියා.. අපි දෙන්නම කියව කියව ග්‍රවුන්ඩ් එක පැත්තට ඇවිදගෙන එද්දි චමිරු උගේ යාලුවෙක් එක්ක මගේ දිහා කට කොනින් හිනාවෙගෙන යනවා මම දැක්කා..ඌ ආවෙත් අපි හිටපු හරියෙ ඉදලමයි.. ඇස් දෙකත් රතු කරගෙන.. මම ඒක එච්චර ගනන් ගන්නෙ නැතුව කියාන් අයියලා හිටපු තැනට ඇවිල්ලා කැම්ප් එක පටන් ගන්නකල් එතන ඉදගෙන හිටියා.. තාම ග්‍රවුන්ඩ් එකේ ටෙන්ට් ගහනවා..

චමිරු.. මම..මම..

ඔතරි ආයෙම එන්නාම ලමයිනේ.. මොකුත් ලියන්න බෑ අනේ නිදිමතේ ඉන්නෙ.. අඩුපාඩු තිබ්බනම් සමාවෙන්ඩෝ.. ආදරෙයි මම..

එන්නාම..ලව් යූ ❤



රධ්‍ය වරද්ට එරෙහිව එන කැරැක්ටර් වලට ප්‍රතිචාර දක්වන මගේ සේපාලිකා දලඹු හමුදාව :

**වරෙන් යකෝ!!!!!!වරද් නාමෙන් තලනවා ඇ#ට 2ක..**

ආ ඒ වගේම.. කොටස් හැටක් තිස්සෙම.. ලිප් කිස් එකක්වත්, මොකුත් නැතුව උපේක්ශාවෙන් මෙ කතාව කියවන මගේ ආදරනීය ලමයි හැමෝටම මේ ඉවසන ඉවසිල්ලට මෙක හැපි එන්ඩින් දෙන්නම එපැයි.. ආතරෙයි.. චුක් චුක් (රධ්‍යගෙන් කිම්ස් දෙකක්)

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/**

@Shan

ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 61 කොටස

හයහමාර වෙද්දි හරියටම කෑම්ප් එක පටන් ගත්තා.. අපි විතරක් නෙමෙ කෑම්ප් එකට හයසීයක් විතර හිටියා.. ජූනියර් ප්‍රිෆෙක්ට් බෝඩ් එක, සීනියර් ප්‍රිෆෙක්ට් බෝඩ් එක, ස්ටුවර්ඩ් බෝඩ් එක, ප්‍රයිමරි ප්‍රිෆෙක්ට් බෝඩ් එක ඔක්කොම අද කෑම්ප් එකට ඇවිත් හිටියා.. ඒත් ප්‍රයිමරි එකේ පොඩි මල්ලිලා හවස් වෙද්දි ගෙදර යනවලු... අපිට තමා රෑටත් නවතින්න වුනේ..

මුලින්ම උදේට බුදුන් වැඳලා අපිට ආපු ගෙස්ට් කෙනෙක් හෙන විසාල ලෙක්චර් එකක් දුන්නා.. අද කෑම්ප් එකේ අරමුණු මොනවද , දවසේ කාලසටහන මොකක්ද , හැසිරෙන්න ඕන කොහොමද අරවා මේවා හෙන තොගයක්..පැය එකහමාරක් විතරම ආපු ගෙස්ට් ඒවා ගැන කියවද්දි මම ශේප් එකේ කියාන් අයියා එක්ක පිටිපස්සට වෙලා ඉස්කෝලෙන් අහුලගත්තු සියඹලා වගයක් කකා කියව කියව ඉදියා.. සෙනුකයයි අයුක අයියයි රධ්‍ය අයියයි අපිට එහාපැත්තෙ හරි කෙලින් ඉඳගෙන අර ලෙක්චර් එක අහගෙන ඉන්නවා..

" මෙක ඇඹුල් වැඩි නැද්ද හලෝ.."

" ඒකතමා උඹට කිව්වෙ අර පහළ ගහේ ඒවා පැණිරසයි.. කොහෙද උඹට මෙකම කන්න ඕන වුනානෙ.."

" හරි ඉතින් දැන් තවුසෙ කියන්නෙ මෙ තකහනියෙ මට පහළ යන්න කියලද.."

" ඒ වුණාට ගිහින් එන්න තිබ්බෙ නැද්ද..?? ආ?? කියපන් බලන්න.."

" හරි හරි මගුල ඉතින්.. මට බනින්නෙ.. මෙ රධ්‍ය අයියෙ මූ මට බනිනවා.."

මම රධ්‍ය අයියගෙ ශර්ට් එකෙන් ඇදලා කියද්දි රධ්‍ය අයියා මටයි කියාන් අයියටයි දෙන්නටම රවලා ආයෙම පහසුවෙන් ඉඳගෙන ඉස්සරහා බලාගත්තා..

" ජ්ස් මෙන්.. ඔයාටත් සියඹලා ඕනද??"

"...."

@Shan

" කියනවකො එපාද.."

"...."

" ඒයි රධ්‍ය ශනව හෙ-මමම.මම.ම.මම"

" කට වහගෙන ඉදපන් වරද්!!"

රධ්‍ය අයියා මගේ හක්ක ගැලවිලා එන්නම කට තද කල්ලා අල්ලලා මට නොමනා විදියට තර්ජනයක් කලා..

" මට ගෙදර යන්න ඕන.. කකුල් දෙක රිදෙනවා.."

" බලපන්.. ඇ ෂනෙරු මල්ලෙ.. අර ප්‍රයිමරියෙ පොඩි උනුත් ඉන්නවා යසඅගේට හිටගෙන.. උඹට මොකද බැරි එහෙම ඉන්න.."

" කොහොම..??"

" එක විදියට.."

" මොකද මම ගොඩක් විදි වලට ඉන්න නිසා.."

" හා හා.. මෙ ඒකනෙමෙ මෙක ඉවරවුනාම ශේප් එකේ ලැට් එකට යනවා කියලා යමුත පහළ ගහේ සියඹලා කඩන්න.."

" සිරාවට?? යමු යමු.."

" අනේ අම්මපා උඹලා දෙන්නා පලයන් පොලේ මාළු විකුණන්න.. ඇ කියාන් අයියෙ.. ලැජ්ජ නැද්ද මෙ ඉස්සරහ ඉන්න පොඩි උනුත් හැරිලා බලනවා.. එතකොට උඹ පොල්පිති වස්සා.. ඉස්කෝලෙ හෙඩ් ප්‍රිෆෙක්ට් වෙන්න නේද ඉන්නෙ.."

" නැහ්.. කවුද කියන්නෙ.. මට පුලුවන් නම් මම මෙකත් දාලා යනවා අනේ කොහේ හරි.."

සෙනුකයා හැමදාම මහපගයා වගේ අපේ කතාවට පැනලා ඒකෙ තිබ්බ උද්යෝගෙ එහෙම්පිටින්ම නැතිබංගස්තාන කල්ලා දැම්මා.. ඌට

@Shan

තියෙන්නෙ මෙතන ඉරිසියාව.. නැත්තම් හැමදාම මගේ ලස්සන චතුර කථන විලාසයට මෙහෙම කැගහන්න ඕන නැනෙ..

" උඹලට මේවා කියන මට පිස්සු.. මම තමා ඔක්කොටම වඩා වස්සා.."

" අහ්ම්~

මාතලේ හැඳුව මම ගේ තට්ටු~"

" කොට්ටාවෙන් කොල්ලෙක් ගත්තා කෙට්ටු~"

" ඒ කොම්ලා දැම්මනේ මට වෙට්ටු~"

" කවද හරි කරනවා අයියව මට්ටු~"

" වරද්!!!!"

" සිරිපාල කපුවා තිබ්බේ මොට්ටු~"

" මොට්ටුවට මතුරලා ඕංරීං කට්ටු~"

" කියාන්!!"

" මොට්ටු තී ඌ හට උනා මම වෙට්ටු~"

" ඇයිද දැං පෙරළන්නෙ ප~නිට්ටු"

රඩ්‍ය අයියා මගේ ශර්ට් එකේ කොලර් එකෙන් අල්ලලා මාව එහාපැත්තට දාලා සිංදු කිය කිය උන්නු කියාන් අයියගෙයි මගෙයි මැද්දෙන් හිටගත්තා.. එහෙම ඉතින් එයා මැද්දෙන් හිටගත්තා කියලා මගේ ආතල් එක මම නැතිකරගන්නවද.. පිස්සු හැදෙයි..

" වරද් අම්මපා උඹ කට වහගෙන හිටියෙ නැත්නම් මම හොද වැඩක් කරනවා!!"

" හොද වැඩ කරන එක හොදයි තමා.. ඔයාට  කියන්න අපේ දෙක වසරෙ ටීචත් මට හොද වැඩ, පොතක ලියන්න කියලා කිව්වා.."

@Shan

"......"

" පස්සෙ පොත නැතිවුනා.."

"......"

" ඔයාට කියන්න මම පොඩි කාලෙ මදුරුවොන්ට ලේ බීලා යන්න අතත් අල්ලගෙන ඉන්නවා.."

"......"

" මම ඒවත් හොද වැඩ පොතේ ලිව්වා.. ඒත් දවසක් අපේ මාමා මගේ හොදවැඩ පොතේ පිටු කඩලා වැස්සට බෝට්ටු යවලා ඒක නැතිකලා.."

"....."

" මේ ඔයා අහගෙනද ඉන්නෙ.."

මම රධ්‍ය අයියගෙ කකුල හිමිහිට පාගලා ඇහුවහම පෝලිමට රධ්‍ය අයියයි, සෙනුකයයි, අයුක අයියයි, කියාන් අයියයි මගේ දිහා රවලා බැලුවා..

" ආ හරි හරි ඉතින්.. මම නිකන් කිව්වෙ.. ඔගොල්ලො අහගෙන ඉන්න.."

මම ඊට්පස්සෙ ඉතින් කට පුප වහගෙන කකුලෙන් බිම හාර හාර අර බෝරින් දේශනාව අහගෙන හිටියා.. කෝ අප්පා මෙක මහ කිසි ගතියක් නෑනෙ.. දුවලා පැනලා කරන්න මොකුත් නැද්ද දන්නෙ නෑ.. කොහොම හරි අර බෝරින් දේශනේ ඉවර වුනාම අපිට ගෲප් වර්ක් එකක් හම්බුනා.. සැක්.. මම හිටපු ගෲප් එකේ ඉදියේ සයෝන් අයියයි මමයි තව ප්‍රයිමරියෙ පොඩි උන් දෙන්නෙකුයි ජුනියර් ප්‍රිෆෙක්ලා දෙන්නෙකුයි.. හැමෝගෙම ගෲප් වල ඉදියේ එහෙම තමයි.. ඒ වුනාට මේ අපිට සෙට් වුනු කණ්ණාඩි දාන ජේප්පි දැක්කහම මට කියන්න පුලුවන් මෙකා මල හෝන්තුවක් වගේ එකෙක් කියලා.. සයෝන් අයියනම් ඉතින් මම දන්න අදුරන එක්කෙනානෙ..

" අයියේ.. අයියා දැන් බැඩ්මින්ටන් ක්ලබ් එකේ නැද්ද.. ඔයා නේද ඒකෙ කැප්ටන්.. ඇයි දැන් ඒකෙ නැත්තෙ.."

" මට වැඩනෙ මල්ලි.."

@Shan

" වැඩ කිව්වෙ.."

වැඩ කිව්වෙ වැඩ තමා පොඩි එකෝ.. උඹ දන්නවද මට තියන වැඩ ගොඩ ඉතින්.. නැනෙ.. මගේ මූණ සෑදුරොක් වුණු හැටි දැකලා සයෝන් අයියට හිනා ගියා.. උඹත් හිනාවෙයන් අයියෙ.. ඔක්කොම දන්නෙ හිනාවෙන්න විතරනෙ..

" ඒ අයියට ඒලෙවෙල්ස් එක්ක බිසී.. දැන් කැගහන්නැතුව ඉන්න අර කියන දේට අවධානෙ දීලා.."

සයෝන් අයියා අර මල්ලිගෙ කට වස්සලා ඉස්සරහට හැරෙව්වා.. ආවා මෙතන මගෙ වැඩ අහගෙන.. කණ්ණාඩි ඉබ්බා.. මම කණ්ණාඩි දාන අයගෙන් ආස ආධ්‍ය අයියට විතරනෙ.. එයා ඉතින් මම කියන සේරම අහගෙන ඉන්නවනෙ.. රැට ස්ටිකර් මැසේජ් එකක් දානවත් එක්කන් හුගක් දවස් වලට.. ආ තව එදා මට එයාගෙ ස්ටෙත් එකත් දුන්නා.. මෙඩිකල් ඩික්ශනරි එකත් බලන්න දුන්නා..

මට වෙලාවකට හිතෙනවා ඒ වගේ අයියෙක් මටත් හිටියනම් කියලා..

රධ්‍ය අයියගෙ හොදම යාලුවා වගේ පොඩි කාලෙ ඉදන්ම ඉන්නෙ ආධ්‍ය අයියලු.. ආධ්‍ය අයියා රධ්‍ය අයියගෙ නොදන්න දෙයක් නෑ.. හැම පොඩි දේම දන්නවා.. ඒ වාගෙම මාරම ආදරෙයි.. කෙයාරින්.. අප්පච්චිලා වුනත් එයාලා දෙන්නා තනියම දාලා යන්නෙ ආධ්‍ය අයියා හැමදේම ගැන වගකීමක් අරගෙන කරන නිසාලුනෙ..

" හොදයි දැන් හැමෝගෙම ග්‍රෑප්ස් වල ලොකුම කෙනා මේ ෆ්ලැග් එක අරගෙන ගිහින් අර සර්කල් එකෙන් ගහලා එන්න.. හරි අප්.."

කෝච් කෙනෙක් වගේ ඉදපු අයියා කෙනෙක් විසිල් එකක් ගහලා කරන්න ඕන ඇක්ටිවිටි එක කිව්වහම සයෝ අයියා කහපාට ෆ්ලැග් එකක් අරගෙන ඉස්සරහට ගියා..

මම හිතන්නෙ ඇවිත් හිටියේ ආමි කැම්ප් එකක පීටී කරන කට්ටිය වගයක්.. මහා කළු සිංහලයො වගේ.. දැක්කහමත් බය හිතෙනවා.. ඔතන අවුරුදු විසි ගානක විතර අයියා කෙනෙක් දැන් විනාඩි විස්සක විතර ඉදන් මගේ වටේ කැරකෙනවා කැරකෙනවා ඉවරයක් නෑ.. කියාන් අයියා ඉදියේ මගේ ග්‍රෑප් එක එහාපැත්තෙ.. ඒකා ඉදගෙන අර ගල් කිඹුලට රවනවා රවනවා ඇස්

@Shan

දෙක පොට්ට වෙලා යනකල්.. රධ්‍ය අයියා පේන්න ඉදියෙ නෑ..
සෙනුකලවත් මම දැක්කෙ නෑ.. හුගක් කට්ටිය අස්සෙ හොයන්න බැනෙ..

" ෂනෙරු මල්ලි.. මේ උණ බට ටික අල්ලගන්නවද.."

සයෝන් අයියා මට උණබට වගයක් අලගන්න දීලා නැමිලා එයා ඒවගෙ ගැට පාහිනවා.. මම ඒක අල්ලගෙන ඇහැ කරකලා අර අපි එක්ක හිදපු හිම්මිච්චො ටික දිහා බැලුවා.. ඇති යාන්තම් එක තැනකට වෙලා බෝඩ් වගයක් තියාගෙන ඒකෙ එක එක ඒවා ලියනවා.. මට දැන් අර ජේපී පේන්න බැරි ගතිය ඇරිලා ගිහින් තිබ්බෙ.. ඒකා බෝලෙ වගේ කියුට්.. ඊටත්වඩා කියුට් අර ප්‍රයිමරියෙ මල්ලි.. සනෙරු අයියේ ගාගෙන පස්සෙන් එද්දි මට අල්ලලා මිරිකලා වප්ප කල්ලා කන්න හිතෙනවා.. ආදරේට..

සයෝන් අයියා උණ බට ටික පාහලා ඉවරවෙලා ඒවා පැත්තකින් තියලා අපි ඉදපු ග්‍රෑප් එක වාඩිවෙලා ඉදිය මැට් එකෙන් ඉදගත්තා.. මෙතන ඉතින් හයසීයක් විතර ඉන්නවනෙ.. මම ඉතින් අර ප්‍රයිමරියෙ පොඩි මල්ලිව කතාකරගෙන මගේ ළගින් ඉන්දවගත්තා..

" සනෙරු අයියේ.. මට වතුර තිබහයිනේ.."

" ඔයාට තිබහද.. ඉන්න බලන්න~ මල්ලි වතුර තියේද ඔයා ගාව.."

" ඔව් අයියේ.."

" පොඩ්ඩක් දෙන්නකො.. කමක් නැනෙ.."

" කමක් නෑ අයියෙ.."

අර දහයෙ මල්ලි මට එයාගෙ වතුර බෝතලේ දුන්නහම මම ඒකෙ මූඩිය ඇරලා අර පොඩි මල්ලිට දුන්නා..

" ඔයා ආ~ කියන්න.. මම වතුර දාන්නම්.."

" හා.."

ප්‍රයිමරියෙ කියුට් පොඩි මල්ලි වතුර බීල ඉවරවෙලා අන්තිමෙ නාගත්තා.. හිමින්සැරේ සංයමයක් තියෙන එකෙක් එපැයි ඉතින් වතුර උගුරක්වත් පොවන්න ඕන.. අන්තිමෙ සයෝන් අයියගෙන් ටොක්කක් කන්නත් වුණා..

@Shan

" මෙ බං.. අරූ මොකද උඹ දිහා කන්න වගේ බලන් ඉන්නෙ.."

" කොයි.. අර ගල් කිඹුලද.. මම දන්නෙ නෑ අනේ.."

"මම.. කැම්ප් ආවනම් ඒ විදියට ඉන්න එපැයි.. මෙ මොන හු#තක්ද හැරි හැරි බලන්නෙ.."

" ඔයි අයියෙ.. කට පියන් ඉඳපන්කො මෙ පොඩි උන් ටිකකුත් ඉන්නවනෙ.."

" නෑ බං ඉතින්.. මල පනිනවනෙ.."

සයෝන් අයියා අර ගල් කිඹුලට දෙකක් රවලා අපේ මැට් එක උඩ තිබ්බ එක එක දේවල් එහාට මෙහාට කල්ලා ඉඩක් හදාගත්තා..

පලවෙනි ඇක්ටිවිටි එක තමයි ද ටෝලස්ට් ටවර් කියන ඇක්ටිවිටි එක.. ඒකෙදි අපිට දීලා තිබ්බා මාස්කින් ටේප් රෝලකුයි, පේපර් කප්ස් දහයකුයි , පොප්සිකල් ස්ටික්ස් පහකුයි කන්ස්ට්‍රක්ශන් ශීට්ස් අටකුයි.. ඉතින් අපි විනාඩි විස්සක් ඇතුළත මෙ ඔක්කොම පාවිච්චි කලා උසම නිර්මාණය කරන්න ඕන.. මෙකෙන් බලාපොරොත්තු වෙන්නෙ නිර්මාණාත්මක ගැටළු විසඳීම, සහයෝගීතා කුසලතා වර්ධනය වගේම දිරිගැන්වීම කියන ගුණාංගයක් වැඩිදියුනු කරන එක.. ඉතින් අපි විනාඩි විස්සක් අරගෙන කියලා තිබ්බ විදියටම අපේ වැඩේ කලා.. ඒක හෙන ලේසි වගේ පෙනුනට අපි අපේ හැම වයස් මට්ටමකම ඉන්න අයගෙ හැගීම් තේරුම් අරගෙනයි මෙක කරන්න ඕන.. ඒ කියන්නෙ අපි අර පහේ ඉන්න මල්ලි හිතන විදියට පවා හිතන්න ඕන.. වැඩේ හරියටම කරගන්න නම්..

ඒ ඇක්ටිවිටි එකෙන් පස්සෙ ග්‍රෑප් ස්විච් වුනා.. මට හම්බුනේ අහිරු අයියා ඉදපු ටීම් එක.. ඒකත් අර වගේමයි පොඩි මල්ලිලා තුන් දෙනෙක් ඉන්නවා.. ඒ වෙලාවෙ තිබුනේ සෙන්ටර් ස්ටේජ් කියලා ඇක්ටිවිටි එකක්.. ඒ හැම ග්‍රෑප් වර්ක් එකකදිම මම නොදන්න සෑහෙන්න අය අලුතින් අඳුන ගත්තා.. සෙන්ටර් ස්ටේජ් එකේදි අපි මොකක් හරි රෝල් එකක් ඇක්ට් කරන්න ඕන.. දැන් නිකමට හිතන්න මම ඉස්කෝලෙ ලමයෙක් මෝනින් එසෙම්බලි එකට පරක්කු වෙලා ආපු.. එතකොට අර දහයෙ මල්ලි ප්‍රිෆෙක්ට් කෙනෙක් විදියට කොහොමද ඒකට මූණ දෙන්නෙ.. අනිත් කෙනාගෙ අවස්ථාව අඳුනගන්නෙ කොහොමද.. ඔය වගේ දේවල්.. ඒකත් හෙන ජොලි වැඩේ..

@Shan

ඊළඟට කලේ මයින්ෆීල්ඩ් කියලා ඇක්ටිවිටි එකක්.. මෙකෙදි බලන්නෙ එකිනෙකා මත විශ්වාසය කොහොමද ගොඩනැගෙන්නෙ කියලා.. එක්කෙනෙක්ගෙ ඇස් බැදලා තියෙනවා.. එයා හොයාගන්න ඕන මයින්ෆීල්ඩ් එක මොකක්ද කියලා.. කණ්ඩායමේ උදව්වෙන්.. කණ්ඩායමෙ අනිත් අයට කියන්න පුලුවන් 'වම' 'දකුණ' 'ඉස්සරහට' 'පස්සට' කියලා විතරයි.. ඇස් බැදපු කෙනා ඒ කියන ඩිරෙක්ශන්ස් වලට ගිහින් හොයාගන්න ඕන මයින්ෆීල්ඩ් එක මොකක්ද කියලා..

ඔහොම ඔහොම ඉතින් හවස් වරුව වෙනකල්ම jumping ship , who ya gonna call , ducks in a row, move the egg , lead the blindfold , quick quiz වගේ හෙන ගොඩක් ඇක්ටිවිටීස් තිබ්බා.. සමහර ඒවා කරද්දි එක ග්‍රෑප් එකක පනහක් විතර හිටියා.. ඉතින් මෙතන ඉන්න හැමෝම ලීඩර්ස්ලා නිසායි එක එක අයගෙ අදහස් එක එක විදිය නිසයි වයස් භේදය නිසායි එක ඩිසිශන් එකක් ගන්න හරි අමාරුයි.. චැලේන්ජින්..ඒත් කොහොම හරි ප්‍රශ්න ඇති නොකරගෙනම හවස තුන වෙනකල්ම ඇක්ටිවිටිස් කන්ටිනිව් වුනා..

මමනම් හිටියෙ රධ්‍ය අයියව හම්බුනත් මරාගෙන කන්න තරම් බඩගින්නෙ.. ඊටත් වඩා මම වෙලාවට නොකෑවහම බඩේ දැවිල්ලක් අල්ලලා වොමිට් වෙන්න එනවනෙ..මම ඉතින් කකුල් දෙකත් අද්ද අද්ද වැනි වැනී රධ්‍ය අයියව හොයාගෙන ගියා.. කොහෙද මගෙ පොල් කාවයියා.. එහෙන් මෙහෙන් දැක්කා විතරයි.. කතාකරන්න හම්බුනේවත් නැනෙ.. මම ග්‍රවුන්ඩ් එකේ තණකොළ බිස්සෙ ඇවිදගෙන යද්දි හුගක් අය මැට් වල දිගෑරිලා බාගෙට මරලා දාලා වගේ ඔහේ ඉන්නවා.. හැමෝටම බඩගිනිත් ඇති.. අනික කෑගහලා කල්ලා මහන්සිනෙ..

මම රධ්‍ය අයියව හොයාගෙන හොයාගෙන යද්දි එයා රෝස පාට මැට් එකක ඉදගෙන වතුර බෝතලයක් කටේ ගහගෙන වතුර බොනවා.. මම දුවගෙන ගිහින් එයාට එහාපැත්තෙන් ඉදගත්තා..

" මටත්.."

රධ්‍ය අයියා මට වතුර බොතලේ දීලා කකුල් දෙක නමාගෙන අත් දෙක පිටිපස්සට බර කරගෙන ඉස්සරහා බලාගෙන ඉදියා.. මම වතුර බීලා බෝතලේ මැට් එක උඩින් තියලා රධ්‍ය අයියගෙ පැත්ත හැරුනා..

" මේ.."

@Shan

" ම්ම්.."

" කෝ කියාන් අයියලා.."

" අර සියඹලා කඩන්නද මොකක්ද කියලා සෙනුක මල්ලි එක්ක පහළට ගියා.."

රධ්‍ය අයියා මගේ මූණෙ තිබ්බ මොනවහරි ඇඟිල්ලෙන් පිහිදැම්මා..

" තීන්ත කැවද.."

" තීන්ත ගෑවිලාද මූණෙ.."

" ම්ම්.. ඉන්න පිහිදාන්න.."

රධ්‍ය අයියා එයාගෙ ශර්ට් එකේ කොනකින් මගේ කම්මුලේ ගෑවිලා තියනවයි කිව්ව තීන්ත අතුල්ලලා පිහිදලා දැම්මා..

" කියාන් අයියා මම නැතුව සියඹලා කඩන්න..!!?? ඌරු පැටියා.. මටත් යන්න ඕන.."

" කොහෙ යන්නද.. මෙන්න මෙතෙන්ට වෙලා ඉදින්.. සියඹලා කන්න උඹ බඩ වෙලාද.. ඔච්චර ඇඹුල් ගිලින්නෙ.."

" ආ බඩ වෙන්න ඕනද ඇඹුල් කන්න.. මාර කතා තමා ඔයත් කියන්නෙ.."

මම රධ්‍ය අයියට දෙකක් රවලා අත පය හතර අටපොලේ දාගෙන දඩාස් ගාලා මැට් එක උඩ පතබැවුනා.. මහන්සී මහන්සී මහන්සී..~

" මහන්සිද.."

" ඔව් අනේ.. ඔලුවත් කැක්කුමයි වගේ.."

" ඔලුව කැක්කුමයි..?? ඒ මොකද.."

" දන්නෑ.. ගැස්ට්‍රයිටිස් වෙන්න ඇති.. කෑවහම අඩු වෙලා යයි.."

@Shan

" දැන් කන්න පුලුවන් නෙ.. ඉන්න කියාන්ලා ආවහම අපි යමු.. දැන් අතන ලමයි ගොඩ.."

" මම්.."

" කොතනද ඔලුව රිදෙන්න.."

" මෙ පැත්ත.."

මම ඔලුවෙ රිදෙන පැත්ත පෙන්නුවහම රධ්‍ය අයියා මගේ ඉස්සරහට වැටිලා තියන කොණ්ඩෙ අස්සෙන් ඇගිලි යවලා කොණ්ඩෙ පිටිපස්සට අතගෑවා.. ඒ ෆීලින් එකනම්.. වෝහ්~ මාරම සනීපයි ඔලුව අතගාද්දි.. ක්ලවුඩ් නයින් ඉන්නවා වගේ..මම සනීපෙටම ඇස් දෙක පියාගත්තගම මට දැනුනා මගේ නළලෙ රස්නෙට සීතල හුළං වදිනවා.. ගින්නකට වතුර ගහනවා වගේ..

" මාරම සනීපයි~"

මම එක ඇහැක් ඇරලා රධ්‍ය අයියට මූණ පිරෙන්නම හිනාවුනාම එයා හිමීට,ලාවට,මූණට රිදෙයි කියලා බයේ පොඩ්ඩක් විතර  හිනාවුනා.. එහෙම හරියන්නැනෙ.. මම මගේ අත් දෙකෙන්ම රධ්‍ය අයියගෙ කට දෙපැත්තට ඇදලා බලෙන්ම මූණෙ හිනාවක් මැව්වා..

" ලොකුවට හිනාවෙනවා.. බාගෙට හිනාවෙන්නැතුව.."

රධ්‍ය අයියා මගේ අත් දෙක අරගෙන බඩ උඩට අතැරියා.. රිදුණද දන්නෙ නෑ මම ඇල්ලුවහම.. උදෙත් පොඩ්ඩක් මූණ සීරුනානෙ.. ඒ වුණාට මූණ සීරුනාමත් අමුතු ලස්සනක් තියෙනවා.. අනේ මෙ කැඩෙට් කරන්න ගිහින් මූණෙ මඩත් ගාගෙන ඉන්නෙ.. මම පොඩ්ඩක් හීරුවහම මක් වෙනවද.. හූරන්න බැරිනම් මම හපලා කනවා.. ඇයි ඉතින් මට වෙන්ඩ බෝයිෆ්‍රෙන්ඩ්ලා සීයක් නැනෙ.. ඉන්නෙ එක්කෙනයිනෙ..

" මෙක රිදෙනවද ඒයි.."

රධ්‍ය අයියා ලාවට මූණ දෙපැත්තට හෙලෙව්වා..

@Shan

" ඌප්ස්.. කපල් මූමන්ට් එකකටද අපි මේ බාධා කරන්නෙ.. සමාවෙන්න ඕන.. ඒ වුණාට එහාට පලයන්.."

කියාන් අයියා අලි පැටියා වගේ ඇවිත් මැට් එක උඩින් ඉඳගත්තා..

" කෝ සෙනුක.."

" අහ්ම..මෙහෙමයි මල්ලි.. පහළ මොකෙක්වත් නෑ ඉස්කෝලෙ පාලුයි.. ඉතින් උන් දෙන්නා කරන ඒවා මගෙන් අහන්න එපා.."

" ඒ දෙන්නා කිස් කරනවද.."

" වරද්!!!!!!!!"

" ඇයි ඇයි අනේ ඉතින් කපල් වුනාම කිස් කරන්නෙ නැද්ද.. ඕකට කෑගහන්න ඕනයෑ.."

" ෂනෙරු මල්ලෙ.. ඕවා මූ ඉස්සරහා කියන්න යන්නෙපා.. ඒකා ලැජ්ජ බයට හැදිච්ච එකා.. මම දන්නවනෙ රත්තරං ඔයා ගැන.."

කියාන් අයියා රධ්‍ය අයියගෙ උරහිසට එකක් ගහලා කියද්දි මම රධ්‍ය අයියගෙ උකුලෙන් නැගිට්ටා.. ඇ ලැජ්ජ බයට???.. මූට පිස්සුද..

" කාටද ලැජ්ජ බය තියෙනවා කිව්වෙ.."

" මගේ රධ්‍යට තමා ඉතින්.. වෙන කාටද.."

" අනේ මේ තවුසෙ දන්නවා ලබ්බක් තමයි.. අද උදෙත් අර නුග-"

" ඒ කියාන් වරෙන් කන්න යන්න.."

රධ්‍ය අයියා මගේ කට අත් දෙකින්ම වහගෙන කියාන් අයියට කන්න යන්න කතාකලා..

" මමහ්-මම්-මම- මොන මගුලක්ද අප්පා..කතා කර කර ඉද්දි කට වහන්නෙ.. මේ කියාන් අයියෙ.. මේ මනුස්සය තවුසෙ හිතන් ඉන්න තරම් හොඳ නෑ හරිත.."

@Shan

" ඒ-ඒ කියන්නෙ.. උඹලා දෙන්නත් අද.. අඩෙ අප්පා!!!!!!! උඹලා සේරම කපල් වෙලා.. මම විතරද යකෝ මෙහෙම වේලි වේලි ඉන්නෙ.. යකෝ අරකිව අල්ලන්නත් මම උඹෙ අර කොලු යාලුවගෙන් අවසර ගන්නෝන.. හෙන ගහනවා තොපිට.. අනික-අනික ෂනෙරු මල්ලි..මම මේවා ප්‍රසිද්දියෙ නොකිව්වට...ඔයාගෙ වෙන්න කලින් රධ්‍ය මගේ වෙලා උන්නෙ.. නේද රත්තරං.. ඔයා මෙයාට කියල නැද්ද අපි ගැන.."

" තවුසෙ ගංජා ගහලා දූරියං කැවද අයියෙ.."

" මගේ වෙලා ලග උන් ඔයා~ (අපෝ ඔන්න පටන්ගත්තා)

මටත් හොරෙන් වෙනකෙකුගෙ වෙලා~ ( කට වහගනින් කියාන්)

හිත අඩනව තුන් යම නොනිදා( මේ මිනිස්සුත් හැරි හැරි බලන්වා)

මගෙ පණ තාමත් ඔයා නිසා~

හුස්මෙ පවා

ඉන්නෙ ඔයා

නිතරම මට සිහි වෙනවා( අනෙ අයියෙ)

මැව්වෙ ඔයා

මට නොකියා( රධ්‍ය අයියෙ මට වොමිට් වෙන්න වගේ)

හදවත තව පවසනවා(කියාන් නවත්තපන් ඕක)

පාළුවේ~ මා තනිවී

ජීවිතේ~ රිදවනවා

වෙනසක් නෑ මගෙ ආදරේ

ඔබෙ නමටයි මුලු ජීවිතේ.."

@Shan

කියාන් අයියා බොක්කටම ඉමෝශනල් වෙලා පපුවත් අල්ලගෙන මෙලෝ රහක් නැති විදියට සිංදුවක් කියන්න ගත්තු නිසා අපේ වටේ ඉදපු මල්ලිලත් හැරි හැරි අපේ දිහා බලන්න ගත්තා.. යකෝ ඉස්කෝලෙ ඩී එච් පී නේද මේ මද කිපුනු ඇතා වගේ පිස්සු කෙලින්නෙ.. උගේ පිච් එක අවුට් ගිහින් ඒක කැලේ පැනලා.. තාලෙට සිංදුවක් වත් කියාගන්න බෑ.. ඒහ්.. මොන එකෙක්ද මන්දා.. දන්නෙ අර රගර් බෝලෙ බදාගෙන පිට්ටන්නෙ වටේ දුවන්නයි පොරකන්නයි විතරයිනෙ..

" රත්තරං.. ඔයාට දැනෙනවා නේද මේ පපුවෙ තියන වේදනාව.."

" අනේ රධ්‍ය අයියෙ මම මූට ගැහුවට කමක් නැද්ද.."

" ආ ආ මොකද උඹ.. ඉරිසියාකාරයා.. මගේ ආදරේ මගෙන් උදුරගෙන.."

" කියාන් උඹට පිස්සු හැදිලද.."

" ඔව් මගේ හිතේ ඔයාට තියන ආදරේ පිස්සුවක් තමයි රත්තරං.. ඇයි දෙයියනේ ඒක මොහොතකට තේරෙන්නැත්තෙ.."

" ආර්හ් අයියෙ!!!!!!!!!"

" ආයේ මා තනිවීලා~

යායේ තරු සැගවීලා~

මේ අහසේ රෑ රහසේ සඳ දොඩමලු නෑ...........හ්~"

" මම උඹට අද- ඔහොම ඉදපන් කියාන් අයියෙ.."

කියාන් අයියා මම බෝතලෙත් උස්සගෙන පාරෙ පස්සෙ එලවන්න ගද්දි ග්‍රවුන්ඩ් එක වටේ දුවන්න ගත්තා.. රධ්‍ය අයියා ඔලුව දෙපැත්ත ඇගිලි දෙකකින් තද කරගෙන නැගිටලා කේටරින් ටෙන්ට් එක පැත්තට හෙමින් හෙමින් ඇවිදගෙන යනව මම දැක්කා.. කොහොම හරි මම ළමයි අස්සෙන් පන්නගෙන පන්නගෙන ගිහින් කියාන් අයියට අල්ලගන්න නූලයි දශම දෙකක් තියෙද්දි මොකෙක් හරි එකෙක් ඇවිත් මී හරකෙක් වගේ මගේ උරහිසේ හැප්පුනා.. මම එහාට විසික් වෙනවත් එක්කම කවුරුහරි මාව

@Shan

ඇදලා අරගෙන ඇගට තද කරගත්තා.. ඒත් මගේ අතකින් තව මොකෙක් හරි ඇදගෙන ඉන්නවා වගේ මට දැනෙනවා..

" කි-කියාන් අයියෙ.."

කියාන් අයියා මාව තද කල්ලා ඇගට තද කරගෙන ඉස්සරහා ඉදපු එකෙක්ට රවනවා මට පෙනුනා.. ඒ එක්කම මම මගේ අත ඇදලා අරගෙන ඉස්සරහා හැරුනා..

" are you alright..??"

සැක්.. මේ අර සයෝන් අයියා බැන්න ගල් කිඹුලා නේද.. ඌ මගේ දිහාට පහත් වෙලා අහද්දි කියාන් අයියා මගේ ඉස්සරහට ඇවිත් මගේ අතින් ඇදලා පිටිපස්සට කරගත්තා..

" He is fine.. no need to worry.."

කියාන් අයියා මගේ අතින් ඇදගෙන රධ්‍ය අයියා ඉදපු පැත්තට එන්න ආවා..

" අරූට මොකක්ද තියන අමාරුව ආ.. හැම තිස්සෙම මොකටද උඹෙ දිහා කන්න වගේ බලන් ඉන්නෙ.."

" අනේ මන්දා.. මම කොහොමද දන්නෙ.."

අපි හට් එකට යද්දි රධ්‍ය අයියා ප්ලේට් එකක් අරගෙන මගේ අතින් තිබ්බා..

" මොකද කියාන්.."

" නෑ බං.. අර මම උඹට කිව්වෙ.. පිස්සු පකෙක් කන්න වගේ මූ දිහා බලාගෙන ඉන්නවා.."

කියාන් අයියා කියද්දි රධ්‍ය අයියා ඇහිබැමත් රැලි කරගෙන මගේ දිහා බලාගෙන ඉදියා..

" මම උඹට මොකක්ද කිව්වෙ වරද්..!! නටන්නැතුව ඉදපන් කියලනේ..??"

" ඉතින් මම මොකක්ද කලේ.."

@Shan

" කලේ..?? ආයෙ එක වතාවක් හරි මොකෙක් හරි උඹව අල්ලන්න අතගාන්න තියාගත්තොත්.. මම උඹට ඉස්සෙල්ලම ගහන්නෙ වරද්..!!!!! කිව්වහම අහලා මෙහෙන් ඉදපන්.. මගුල.."

රඩ්‍ය අයියා නොබැන බැනලා මට දෙකක් රවලා කිව්වහම මම හිමීට මාරු වෙලා කැම බෙදාගන්න ගියා.. බනින්න ඕනයැ ඉතින්.. බනින්න විතරනෙ දන්නෙ.. අනික මම මොකක් කලාටද..

" ආ හා වරෙන් කන්න යන්න.. ඔකට කැගහන්න ඕනයැ රඩ්‍ය.."

මම පාඩුවේ ඇවිත් මැට් එකේ වාඩිවෙලා කන්න ගත්තහම සෙනුකයත් අයුක අයියා එක්ක ඇවිත් අපේ මැට් එකෙන්ම ඉදගත්තා.. අයුක අයියගෙ බෙල්ල මදුරුවෙක් කාලද කොහෙද..මේ කාලෙ ඩෙංගුත් තියෙනවා.. පැගිරි තෙල් ටිකක්වත් ගාගන්න කිව්වනම් හරි යන්න කලින්..

" මේ පකා මොන මගුලක්ද මෙතන ඇවිත් කරන්නෙ.."

ගල් කිඹුලා ඇත තියා ෆයිල් එකකුත් අතේ තියාගෙන අමුතු විදියට හිනාවේගෙන අපි ඉදපු පැත්තට ඇවිදගෙන එද්දි මම ශේප් එකේ සෙනුකයට මුවා වෙලා ඔලුව පුලුවන් තරම් පහත් කරගෙන කන්න ගත්තා.. මොන මගුලක්ද.. මම එපැයි බැනුම් අහන්න.. අනික මම මොකුත් කල්ලද බැනුම් අහන්නෙ.. නැනෙ.. අනික-අනික මට දුක හිතෙනවනෙ.. කියාන් අයියා ඉස්සරහම කැගැහුවෙ..

" මිම්.. උද්යෝග..?? Can I have your number and add it to this file.."

ඒකා මොකක්ද ෆයිල් එකක් දික් කල්ලා මගෙන් අහද්දි මට මොකක් කරන්න හිතාගන්න බැරුව ඒ ගල් කිඹුලගෙ මූණ දිහා බලාගෙන ඉද්දි මගේ එහාපැත්තෙන් දඩාස් ගාලා සද්දයක් ආවා..

" Which file..?? I am the Deputy Games Captain of this school..

**I filled the form myself**

.. If there is a problem with the numbers, you should have informed me earlier.."

@Shan

" You may be someone.. but I am not talking to you.."

" We can't give students' personal details like that.. we have a responsibility.. At least the principal should have informed us-"

" මොකක්ද රධ්‍ය ප්‍රශ්නෙ.. ඇයි??"

" සයෝන්.. උඹට ශුවර් නේද මේ වගේ ෆෝම් එකකට ඩීටේල්ස් දෙන්න අපිට කවුරුත් ඉන්ෆෝම් කලේ නැනෙ.."

" ඔව්.. මොකක්ද දැන් වෙන්න ඕන.. උද්යෝගට විතරක් විශේශයක් දෙන්න බැනෙ.. මේ අයිසෙ!! මෙතන ප්‍රශ්න දාන්නැතුව ඉන්න පුලුවන්ද..කරුණාකල්ලා.."

" උඹලට මොකක්ද ඔච්චර තියෙන අමාරුව.. ඇයි මම උබලගෙන් නම්බර් එකක් ඉල්ලුවෙ නැනෙ.. නිකන් දෙන්නෙ නැතුව ඉදපන් මල්ලි.."

" දෙන්නැතුව..?? මොකක්ද උඹ කියන්නෙ.."

" කියාන් අයියෙ..!!"

" ඇයි උඹ මොකක් කරන්නද.."

" උඹට කල්ලා පෙන්නන්නද.. යකෝ අපේම ඉස්කෝලෙ අපිටම පාට පෙන්නන්න.. උඹ කවුරු කියලද හිතාගෙන ඉන්නෙ.."

" උඹලගෙ මේ ඉස්කෝලෙ අනිත් උන්ට ලොකු වුණාට අපිට ලොකු නෑ යකෝ.."

" මොකක්ද උඹ කියන්නෙ.."

" අයුක අයියෙ ප්ලීස් මෙතන රණ්ඩු කරන්න ලෑස්ති වෙන්න එපා.."

" මොකද මෙතන වෙන්නෙ.. මොකක්ද ප්‍රශ්නෙ ළමයි.."

ඒ එක්කම වගේ අපේ ඉස්කෝලෙ ඩිපියුටි ප්‍රින්සිපල් සර් කෙනෙක් අපි ඉන්න පැත්තට ඇවිදගෙන ආවා.. මට මැරෙන්න හිතයි.. මොන කරුමයක්ද

@Shan

මේ.. එක්කො මේ මූණට මොකක් හරි වෙලා යන්න ඕන.. එතකොට හරිනෙ.. මොකෙක්වත් පස්සෙන් එන්නෙ නෑනෙ.. ඒකනෙ වැරැද්ද..

" සර් මේ මනුස්සයා අපෙන් ළමයින්ගේ ප'සනල් ඩීටේල්ස් ඉල්ලනවා.. ඒත් අපිට කවුරුත් ඉන්ෆෝම් නොකර එහෙම දෙන්න බැහැනෙ.."

" ම්ම්.. ඒක ඇත්ත.."

සර් එතන හුගක් වෙලා කතාකර කර ඉදලා අර මානසික පිස්සා එක්ක යන්න ගියා..මටනම් කන එකත් එපාවෙලා තිබ්බෙ..

" ඕකුන් එච්චර හොද උන් නෙමේ බං.. මම දැක්කනෙ මේකා දිහා විතරක් නෙමේ අර පොඩි උන් දිහාත් ඕකා ජරා විදියට බලාගෙන ඉදියා.."

" නෑ බං සයෝන්.. ඌ මාර පාට් එකක්නෙ දැම්මෙ.. අම්මපා කෙලිනවා පකයගෙ මූණට මම මේ ඉස්කෝලෙ නොවුනනම්.."

" ඇති ඇති කියාන්.. මේ උඹලා කාපන්.. මම යනවා.. රධ්‍ය උඹ මේකා එක්ක ඉදපන්..ෂනෙරු අවුල් ගන්න එපා.."

" අදනම් මහ මොන දවසක්ද මන්දා.."

සයෝන් අයියා යන්න ගියාම කියාන් අයියා ආපහු වාඩිවෙලා කන්න ගත්තා.. මම නිසා හැමෝගෙම දවස අවුල් ගියා.. දැන් ඉතින් අනවශ්‍ය ප්‍රශ්නයක්නෙ වුනේ.. අපරදෙ මට තනියම ඉන්නයි තිබ්බෙ.. නැත්නම් ස්ටුවර්ශිප් නොගෙන අකමැතියි කියලා අයින් කල්ලා දාන්න තිබ්බා..

" ඒ ෂනෙරු අවුල් ගන්න එපා කොල්ලො.. ඔය වගේ මානසික පිස්සො ඉන්නවා කොහොමත්.."

" ම්ම්.. මම නිසා මල වදේ නේද.."

" උඹට පිස්සුද බං.. උඹ මක් කලාටද.. අනේ මේ ඉදින්.."

සෙනුකයා මගේ උරහිසට හේත්තු වුණා..

" හුම්.."

@Shan

" වරද්.. මේ කාපු හැටිද.. මෙහෙ එනවා කන්න.. දැන් ඔලුව කැක්කුමයි කිව්වා නේද.."

" දැන් කන්න බෑ වගේ.. මම යනවා.. ඔයා කාලා එන්න.."

මම නැගිටලා යන්න හැදුවහම රධ්‍ය අයියා මගේ අතින් ඇදලා අරන් ඉන්දුවගත්තා..

" දැන් මූණ එල්ලගන්න මොකුත් වුණාද නැනෙ.. මෙහෙ ඉදපන්.."

" ම්ම්.."

මම රධ්‍ය අයියට එහාපැත්තෙන් ඉදගත්තහම රධ්‍ය අයියා මට එයාගෙ කෑම එකෙන් කටක් කැව්වා..

කොහොමහරි හවස් වෙනකල් අපි කාලා බීලා මැට් එකේ ඉදගෙන කියව කියව හිටියා.. ආයෙම ටී ටයිම් එකෙන් පස්සෙ හැමෝම චේන්ජ් කල්ලා කැම්ප්ෆයර් එකක් ගහන්න ඉදියෙ.. ඊටපස්සෙ ඉතින් නිදාගන්න තමා.. හවස මොකුත් ඇක්ටිවිටි නෑ ප්‍රයිමරි එකේ ළමයි ගෙවල් වල යන්නනෙ ඉදියෙ..

" සනෙරු අයියේ~"

එයාලා යන්න ලෑස්තිවෙද්දි එකපාරම ඈත තියා අපි දිහාට දුවගෙන ආවෙ අර උදේ ඉදපු චූටි මල්ලි.. ඒකා පැන පැන මං ගාවට ඇවිල්ලා 'බොහ්' ගාලා මගේ ඇගට පැන්නා.. මම දෝත බදලම ඒකා වැටෙන්න නොදී අල්ලගත්තා..

" මම යනවා අයියේ.."

" එහෙමද.. ටේක් කෙයා~"

" අයියටත් ටේක් කෙයා~ සී යූ.. බායිබායි.."

චූටි මල්ලි මට ෆ්ලයින් කිස් එකකුත් දීලා මගක් දුරට දුවගෙන ගිහින් ආපහු හැරිලා දුවගෙන ඇවිත් මගේ අතේ මොකක් හරි ගුලි කල්ලා ආපු දිහාටම දුවගෙන දුවගෙන ගියා..

@Shan

එයා මට දීලා ගිහින් තිබ්බෙ කොළ වලින් හදපු පුංචිම පුංචි සමනලයෙක්.. රෝස පාට.. මම ඒක දිහා බලාගෙන ඉදියා.. කියාන් අයියා අපි එක්ක ඒ වෙලේ ඉදියෙ නෑ මොකක්ද වැඩකට යනවා කිව්ව නිසා.. මමයි සෙනුකයි රධ්‍ය අයියයි විතරයි හිටියේ.. සෙනුකයි අයුක අයියයි මොකක් හරි කතාකරනවා එහාපැත්ත හැරිලා..

" මෙන්.. ලස්සනයි නේද.."

මම සමනලයගෙ තටුවකින් අල්ලලා රධ්‍ය අයියට පෙන්නුවා..

" ම්ම්.."

රධිය අයියා අත ඉස්සරහට කල්ලා ඇල්ලුවහම මම සමනලයව එයාගෙ අතින් තිබ්බා..

" ඒ මල්ලි උදේ මාත් එක්ක ඉදියෙ.."

" මම දැක්කා.."

මම හිනාවෙලා අහස දිහා බලාගෙන ඉදියා.. රධ්‍ය අයියා හැරිලා මගෙ දිහා බලාගෙන ඉන්නවා මම ඇහැ කොනෙන් දැක්කා.. එයා ලොකු හුස්මක් අරගෙන ඒක හිමින් පහළ දැම්මා.. හරියට මොකක් හරි කියන්න හිත හදාගත්තා වගේ..

" මම අවුරුදු පහක් උඹ දිහා ඈතින් ඉදන් හරි බලාගෙන ඉදියා වරද්.."

" ම්ම්??"

මම ඉක්මනට හැරිලා එයා දිහා බැලුවා..

" තව මාස හතර පහකින් මම එහෙමත් නෑ.. මට පාළු හිතෙනවා බං.. මම අවුරුදු පහකින් උඹ නොදැක ඉදලා නෑ.. දැන් එහෙම ඉන්න විදිය මට මතක නෑ.."

"අ-අයියෙ.."

" මේ ගෙවෙන තප්පරෙත් මට ගෙවෙන්න නොදී තියාගන්න තරම් ලෝබයි.. උඹයි මමයි ආයෙම යුනිෆෝම් වලින් මේ ඉස්කෝලෙ ඇවිදින්නෙ

@Shan

නෑ වරද්.. උඹ ඉදී මම නෑ.. ඊටපස්සෙ.. උඹත් නෑ.. මමත් නෑ.. පිට ලෝකෙට වඩා අපි මෙහේ නිදහසේ හිටියා.."

" ම්ම්.. ඒක ඇත්ත.."

" මම නැතිදවසකත් පරිස්සමට ඉදපන්.. උඹට උඹ ගැන අගයක් නැති වුනාට මට එහෙම නැනෙ.."

"....."

" මම හෙන ආසයි උඹ ගැන අනිත් උන් කතාකරද්දි අහගෙන ඉන්න.. අර ස්පෝර්ට් මීට් එකේ ශීල්ඩ් එක ගත්ත වෙලේ වගේ.. උඹ ලස්සනයි කියලා අහන්න.. ටැලන්ටඩ් කියලා අහන්න.. ඒ වුණාට එක එක අසහනකාරයොන්ට කියලා උඹ ලස්සනයි, මරු ක- අහ්ම්- එහෙම අහන්න මම ආස නෑ වරද්.. උඹ දිහා මිනිස්සු බලනවට අකමැති, කතාකරනවට අකමැති, ඉරිසියයි එහෙම පිස්සු හත්තලාමක් ගැන නෙමේ මම කියන්නෙ.. ලස්සන දෙයක් දැක්කහම මිනිස්සු අගයනවා.. ඒක සාමාන්‍යයි.. ඒ වුණාට එහෙම අහගන්නත් ඒ විදියේ මිනිස්සු ඉන්නවා.."

" දැන් බලපන්.. අපේ අයියා උඹට හෙන කැමතියි..උඹ ගැන ගෙදර ඉද්දි කතාකරනවා.. මම ඒවා අහන් ඉන්නවා.. අහන් ඉන්න ආසයි.. ඒ වුනාට අද දවල් ආපු එකා වගෙ එකෙක් උඹ ගැන කියද්දි.. අපේ අයියයි ඌයි දෙන්නෙක්.. තේරෙනවනෙ.."

" මට තේරෙනවා.."

" ඒකනිසා.. කොහේ ඉදියත්.. පරිස්සමට ඉදපන්.. මම කිව්වෙ.. උඹ මලක් වගේ ඉදියොත් මම වතුර දාලා බලාගන්නවා.."

" ඔයාම පැලේ ඉන්දලා ඔයාම වතුර දාලා ඒකෙ මලුත් පිපෙනවා බලාගෙන ඉදලා මල් පිපුණට පස්සෙත් බලාගනන්වද.."

" ම්ම්.. එහෙම තමයි.."

" ම්ම්~"

මම රධ්‍ය අයියගෙ අතේ සුළගිල්ලෙ මගේ සුළගිල්ල පටලගත්තා..

@Shan

"  මම කාලෙකට කලින් විශ් කලා මේ ලෝකෙ ඉන්න හොඳම ගාඩනර්ව මට හම්බෙන්න කියලා..මට හෙන සතුටුයි.."

අම්මෝ අම්මෝ මේ මම ආවා.. ගියා.. මට නිදිමතයි යකුනේ..කැම්පින් අහවර නෑ..හිතුවට වඩා මේක දික් වුනානෙ.. සමාවෙන්ඩෝ චැප්ටර් තුනක්ම මේක ඇද්දට..

බිත්තිය හරහා ඇවිල්ලා බිත්තිය හරහා යමනෙ හරිත..

" The very best relationship has a gardener and a flower.. The gardener nurtures and the flower blooms.."

එන්නාම්.. ලව් යූ..   ❤



මේක මට සේපාලිකා දළඹු හමුදාවෙ පුංචි දළඹුවෙක් එව්වෙ.. එයාට රධ්‍ය අයියව මතක් උනාලු.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 62 කොටස

" දැන් මොකද ඉතින් කරන්න හිතාගෙන ඉන්නෙ.."

" ඒ කිව්වෙ.."

" නෑ දැන් ඉතින් ඔයා ඒලෙවෙල් ලියලා රිසාල්ට්ස් ආවා නේ.. අප්පච්චිලා මොකද කියන්නෙ.."

" ආ ගෙදර අය..?? මම කිව්වෙ කලින්.. විශේෂ දෙයක් කිව්වෙ නෑ.. කොහොම රිසාල්ට්ස් ගත්තත් මට මොරටු යන්න වෙන්නෙ නෑනෙ.."

මම මොකුත් නොකියා එයාගෙ මූණ දිහා බලාගෙන ඉදියා.. හැමදාම මෙ කතාව පටන්ගත්තොත් එයා මූණ අවුල් කරගන්නවා.. ඇත්තටම මොකක් කරන්නද.. මම දන්නෙ නෑ.. මට කොහොමටත් ඒ ප්‍රශ්න වලට මැදිහත් වෙනවා තියා හිතන්නවත් බෑ.. ඒ වුණාට එයා හිතේ දුකින් ඉද්දි මගේ හිතට හරි නෑ..

" ඔයා ආයෙම කතාකල්ලා බැලුවොත් නරකද.."

" මම විතරක් නෙමෙ.. අපේ අයියත් කතාකලා වරද්.. මට වෙන කරන්න දෙයක් නෑ.. අන්තිමට රණ්ඩු වෙලා අප්පච්චිගෙන් බෙල්ට් පාරවල් කාලා කාමරේට වෙලා ඉන්න වෙන්නෙ.. ඕවා දුරදිග කතාකරන්න ගියෝතින්.."

" ඒ කියන්නෙ.. ඔයා කේ ඩී යූ යන එක දැන් ශුවර් ද.."

" ම්ම්.. මටනම් මගේ රිසාල්ට්ස් ගැන කිසිම සතුටක් නෑ.. වැඩක් නෑනෙ.. මොකටද.."

" ඔයා කවුරු වෙන්නද ආස.."

" ඉලෙක්ට්‍රිකල් ඉන්ජිනියර් කෙනෙක්.. ඒත් ඉස්සර කැමති වෙලා ඉදියේ ඇරෝස්පේස් ඉන්ජිනියරින් කරන්න.. ඒ කල්ලා තර්මොඩයනමික් ඉන්ජිනියර් කෙනෙක් වෙන්න.."

" වව්ව්වෝහ්~..  "

@Shan

" ම්ම්.."

" ඔයා මාරයිනෙ.."

" ඒ මොකද.."

" නෑ ඉතිං.. මාරයි.. තා මොනවද කරන්න හිතාගෙන ඉන්නෙ.."

" තව.. තව තියෙනවා උඹට මොකටද.."

" කියනවකො ඉතින් දැනගන්න.. මමත් කියලා තියෙනවනෙ මගේ ඒවා.."

" පස්සෙ පස්සෙ.. දැන් බෑ.."

රධ්‍ය අයියා මැට් එකෙන් නැගිටලා බිම පතබෑවිලා ඉදිය මගේ අතිනුත් ඇදලා නැගිට්ටුවා..

" කොහෙද යන්නෙ.."

" කියාන් හෝමසයන්ස් රූම් එකට ගියා නෙ.. ඒ පැත්තට ගිහින් එමු.. ඒ බං.. අයුක.. උඹලා එනවද.."

රධ්‍ය අයියා කතාකලාම සෙනුකයා හැරිලා බැලුවා.. මුන් දෙන්නා කියවනවා කියවනවා.. මොනව කොදුර කොදුර කියවනවද මන්දන්නෙ නෑ.. ආ නෑ දෙන්නම නෙමෙ..මගේ පොල්පිති වස්සා තමා කියවන්නෙ.. හහ්.. ඒ වුණාට මොකද මට තමා බනින්නෙ..

" උඹලා දෙන්නා පලයං.. අපි පස්සෙ එන්නම්.."

" පස්සෙ එන්නත් එපා.. අපි යනවා.."

මම සෙනුකයගෙ කොණ්ඩෙ අවුස්සලා ඌ අනිත් පැත්තට ගහන්න කලින් එතනින් දුවගෙන ආවා.. මම ඉතින් දුවලා හොම්සයන්ස් රූම් එකට යද්දිත් අර රධ්‍ය සීයාතාත්තා පඩිපෙළ නගිනවා.. අම්මපා පොඩ්ඩක් දිව්වහම කකුල් දෙක ගෙවෙනවද නෑනෙ.. විශාඛා මහා උපාසිකාව කියලා හිතාගෙන ඉන්නෙ.. හයියෙන් ඇවිද්දහම පොලොවට රිදෙනවා.. හිනාවුනාම මූණට රිදෙනවා.. ඒ වුනාට මොකද.. මම දැක්කනෙ..උදේ වෙඩි කාපු ඌරා වගේ අහිංසක මට ගැහුවෙ.. වීදුරුවෙ වැදෙන්නම.. මම

@Shan

පාඩුවෙ ඉඳලත්නෙ මූ මට කරදර කලේ.. අම්මපා දවසක යාලුවෙයිනෙ මාත් එක්ක.. තවුසෙ හම ගහලා මම අම්මට පොලේ යන්න බෑග් එක මහන එක මහනවාමයි..

" ආ මල්ලේ.."

තූ........ හ් නොදෝමකින්.. මේ අපත කියාන් අයියා.. අපි හෝමසයන්ස් රූම් එකට යද්දි ෆ්‍රිජ් එකත් ඇරන් ඒකෙ තිබ්බ ඇපල් ගෙඩියක් කනවා.. යකෝ මූ වැඩක් කියලා දුවගෙන ආවෙ ඇපල් ගෙඩිය කන්නද.. මුන්ටම ගිය ඉස්කෝලෙ මේක..

" ඊයා බං.. තවුසෙ මෙකටද කිව්වෙ හෙන ලොකු වැඩක් තියෙනවා කියලා.."

" කොයි..?? නෑ නෑ මම මේ අර ගෙස්ට්ලට තේ හදන්න කියලා කියන්න මෙහේ ආවෙ.. කෝ කවුරුත් නෑනෙ මෙකෙ."

" ඉතින් කවුරුහරි හොයාගන්න එපැයි.. මෙතෙන්ට වෙලා ගිල ගිල ඉඳලා හරියනවද.."

" නෑ බං.. මම ආවා හරිද.. මෙහෙම ඇවිදගෙන ෆ්‍රිජ් එක ගාවට ආවහම ෆ්‍රිජ් එක මට අත වනලා කතාකරනවා කතාකරනවා වගේ දැනෙන්න ගත්තා..අනේ මාව අරින්නකො කියලා.. ඊටපස්සෙ මම ඇරියා.."

" කාටද.."

" එහෙමෞත්තක් ඇරියා නෙමේ.. බං ෆ්‍රිජ් එක ඇරියේ.. ඊටපස්සෙ ෆ්‍රිජ් එකේ තිබ්බ මේ රතු ඇපල් ගෙඩිය මට අතවනල කතාකලා අනේ මාව කන්නකො කියලා.. ඉතින් මම කෑවා.."

" පිස්සු හු#තෙක් තමා බලන් යද්දි.."

" ආ..ආ.. අඩෝ රඩ්‍ය මේ මූ කුණුහර්ප කියන හැටි දැක්කද.. දෙන්නෙ උඹට ඇපල් ගෙඩියෙන් දැනගනින්.. කුණුහර්ප කිව්වොත්.."

" යැයි යැයි තමා.. තවුසෙලා නිසා තමා මම හොදට ඉඳලා කුණුහර්ප කියන්න පුරුදු වුණේ.."

@Shan

මම හෝම්සයන්ස් රූම් එකෙ කිචන් කවුන්ටර් එක උඩින් වාඩිවෙලා කියාන් අයියා එක්ක කතාකර කර ඉද්දි රධ්‍ය අයියා ගිහින් ඉස්කෝලෙ වැඩ කරන ඇන්ටි කෙනෙක් එක්කගෙන හෝම්සයන්ස් රූම් එකට එක්කගෙන ආවා.. තේ හදන්න කියන්න..

ඒ ඇන්ටි තේ හදනකල් අපි තුන්දෙනා හෝම් සයන්ස් රූම් එකට වෙලා ඉදියා.. ඒ අස්සෙ අර සක්කිලි පරෙයියා චමිරුවත් උගේ යාලුවෙක් එක්ක හෝම්සයන්ස් රූම් එකට මොනවදෝ පෙට්ටි වගයක් උස්සගෙන ඇවිත් ඒවා අන්පැක් කරන්න ගත්තා.. මට උදවු කරන්න හිතිලත් ආයෙම ඉතින් ගියේ නෑ.. පැන පැන දෙන්න යන්න ඕන නෑනෙ.. අනික මෙකා මට අල්ලන්නෙ නෑනෙ කොහොමත්..ඌ සැරින් සැරේ මගේ දිහා කට කොනෙන් හිනා වෙවී බලනවා.. ආයෙම අහක බලාගන්නවා.. ආයෙම බලනවා.. රධ්‍ය අයියා දිහා බලනවා.. පිස්සු පකෙක්.. මට මල පැනලා මම එන්න ආවා ආයෙම ග්‍රවුන්ඩ් එකට.. මම ග්‍රවුන්ඩ් එකට එද්දි ග්‍රවුන්ඩ් එක මැද විසාල කෑම්ප් ෆයර් එකක් ගහන්න දර අඩුක් කරනවා.. මම එතෙන්ට ගිහින් එතන ඉදපු ලමයින්ට උදවු කලා.. දර අඩුක් කරන්න.. කොහොම හරි ඊටපස්සෙ අපිට සර් කෙනෙක් කිව්වා වොශ් කරන අය වොශ් කරලා ඇදුම් මාරු කරන් එන්න කියලා.. ඒ වෙද්දිත් කොහොමත් හවස හය හමාර විතර වෙලා තිබුනේ.. අපිට ටෙන්ට් හම්බුනා නවතින්න.. ලොකු ළමයි ටෙන්ට් වල.. පොඩි ළමයි කැඩෙට්ින් කෑම්ප් ගහන අය නවතින හෝල් එකේ..

මම ඉතින් මගේ බෑග් එක හෙන ගේමක් දීලා හොයාගෙන ඒකෙන් බ්‍රශ් එකයි ටූත්පේස්ට් එකයි අරගෙන ගිහින් ස්කෝලෙ ශවර් දාලා තිබ්බ ස්ටෝල් එකෙන් ඉක්මනට වොශ් එකක් දගෙන ආවා.. ඒකෙ තාම ලොකු සෙනගක් නෑ.. ඒකනිසා මම ඉතින් පා~ඩුවෙ ඇග සෝදලා එහෙන්ම අළු පාට බොටමකුයි කළු පාට ශර්ට් එකකුයි දාගෙන ටෙන්ට් එකට එද්දි ටෙන්ට් එකේ සිප් එක වහලා.. මම ඒක මෙච්චර උඩට වැහුවෙ නෑනෙ.. මොකෙක් හරි ඇවිත් අපේ ටෙන්ට් එක අත් පත් කරගෙනද..?? අනික ඒකෙ මගෙයි රධ්‍ය අයියගෙයි කියාන් අයියගෙයි තුන්දෙනාගෙම බෑග් තිබ්බා.. බෑග් ඇතුලෙ ඉතින් බඩු තියෙනවනෙ..

මම සිප් එක ඇරලා ටෙන්ට් එක අස්සට ඔලුව දාලා බැලුවා කවුද ඉන්නෙ කියලා.. පේන්නෙ නෑනෙ මේ මගුල ඇතුළ කරුවලයිනෙ..හීනියට ටෝච් එළියක් පේනවා.. මම ශේප් එකේ තිබ්බ ටෝච් එක අතට අරගෙන කාමරේ හෙවනැල්ලක් හෙල්ලෙනවා වගේ පේන මුල්ලට ගැහුවා විතරයි..

@Shan

" ඌප්ස්.. සොරි සොරි සොරි.. මම හිතුවෙ-මම යන්නම්- සොරියෝ~"

" වරද්!!!!!!!!!!!!!!!!!!"

මම ටෝච් එක එහෙමම මැට් එක උඩට අතෑරලා එළියට පැනගත්තා..සැක්.. මොන මගුලක්ද ඒ වුණේ.. මේකා එක්කො කියපන් මම ඇතුළට එද්දි ඉන්නවා කියලා.. විලි ලැජ්ජාවෙ සන්තෝසෙ බෑ.. මම එළියට වෙලා නියපොතු හප හප දැන් ටිකකට කලින් දැක්ක දේ අමතක කරගන්න ට්‍රයි කරන ගමන් ඉදියේ.. ඔන්න ඔහේ.. දැක්කා කියලා මැරෙනවද වරද්.. ඌ හිටියෙ උගේ අන්ඩවෙයාර් එක පිටින් මිසක් හෙළුවෙන් නෙමෙනෙ..අනික මොකෝ උඹ ලමිස්සිද.. උඹට තියන ඒවාම තමා ඌට තියෙන්නෙත්.. ඒ වුනාට යකෝ!! පස්සෙ ලොකු!! මම හිතුවා හරි තමා.. මෙකගෙ පස්ස බොරු එකක්ද කොහෙද.. ඔච්චර ලොකුවට තියෙන්නෙ..

ඒ එක්කම ටෙන්ට් එකේ සිප් එක ඇරුණා..

" ඇතුළට වරෙන්.."

" ආ..?? හා හා.."

මම ඔලුව පහත් කරගෙන මොකුත් නොදැක්ක එකා වගේ ටෙන්ට් එක ඇතුළට ගිහින් සිප් එක වහලා දැම්මා.. දැන් ඉතින් ආයෙම කෑප් ෆයර් එකට යන්න ඕනිනෙ.. මෙකෙ අස්සෙ ඉදලා බෑනෙ..

" ඒ ඔයා වොශ් දැම්මෙ නැද්ද.."

" මම කැඩෙට් රූම් එකේ එකට ගියේ.. කියාන් වොශ් දාන්න ගියා.."

" එහෙමද.."

මම විසිල් පාරක් ගහගෙන ගිහින් බෑග් එක ඇදලා ඇදලා මගේ බේබි ශෙරම් කොලෝන් බෝතලේ එළියට ගත්තා.. ඒක නැතුව නින්ද යන්නෙ නෑනෙ.. අනික අපේ අම්මා ටොම් ෆෝඩ්සැන්ටල් බ්ලශ් අරන් දෙන්නෙ නෑනෙ ඇගේ ගහන්න.. අම්මත් ගන්නෙ ගෝයා එකේ ජැස්මින් ප'ෆියුම් එකක්.. ඕක ඉතින් මට ගහගෙන එන්න පුලුවන්ද.. බෑනෙ.. කොලෝන් බෝතලේ තමා ලෝ බජට් ප'ෆියුම් එක.. ඕන තැනකට ගැලපෙනවනෙ.. හැබැයි බේබි ශෙරම් එකට වඩා අර ජොන්සන් ඇන්ඩ් ජොන්සන් එකේ නිල් පාට

@Shan

වළාකුලක් තියෙන එක මාරම සුවදයි.. හැබැයි මේ කාලෙ අපේ අම්මා ඕවා ගන්නෙ නෑ.. මොකද දැන් තාත්තා සල්ලි දෙන්නෙත් නෑ.. ගෙදර දුවන්නෙ බොහොම අඩු වියදමෙන්.. ආච්චිඅම්මා මාසෙකට දෙන කීයක් හරි සල්ලි වලිනුයි මාමා බැංකුවට දාන සල්ලි වලිනුයි..

" උඹ තාම පොඩි එකා වගේ ඕවා ගානවද බං.."

රධ්‍ය අයියා CK ප'ෆියුම් එකක් අරගෙන ඇඟ පුරාම ගහගත්තා.. කැවනෙ කැවනෙ.. මගේ හුරුබුහුටි සුවද මේ නහය කඩාගෙන යන සුවදට වැහිලා ගියානෙ.. කලොත් කරන්නෙ.. මහ මෝඩ වැඩක් තමා..

" ඔක රටත් ගහන්න ඕනද අප්පා.. බලනවකො මගේ මල් සුවද වැහිලා ගියානෙ.."

" කෝ උඹ ගාව මල් සුවදත් එනවද.. අපි දනෙනෙත් නෑ.."

" තවුසෙ වගේ උන්ට මල්වල සුවද තේරෙනවද ඉතින්.."

" ඇයි නැද්ද..??"

" අම්මපා තවුසෙගෙ ඔය තද කොළපාට යටකලිසම පල්ලා.. රෑට මම තවුසෙව ටෙන්ට් එකෙන් එළියට දානවා තව මොනවහරි කිව්වොත්.."

මම මගේ කොලෝන් බෝතලෙන් රධ්‍ය අයියට දමලා ගැහුවහම ඒකා ඒක අල්ලගත්තා..

" උඹ කොහොමද කියන්නෙ මගේ අන්ඩවෙයාර් එක තද කොළපාටමයි කියලා.."

" ඇයි නැද්ද.."

මම ක්ශනිකව හැරිලා රධ්‍ය අයියා දිහා බැලුවා.. මට වරදින්න විදියක් නෑ?? මම ටක්කෙටම දැක්කා ඒක තද කොළ එකක් තමයි..මගේ බළල් ඇස් දෙකට එහෙම වරදින්නෙ කොහොමද..

" ආ නෑ නෑ.. කොළ තමා කොළ තමා.. ඔහොම බලන්න එපා.. ඒයි වරද්.. ළගට එන්නෙපා.. ගහනවා උඹට මේකෙන්.. ටහුක්- මගෙ කලිසම අතැරපන් වරද්!!!!!!!!!!!!!!!"

@Shan

මගේ ඇස් දෙකට කළ අපහාසෙට මම පැන්න ගමන් දෝත බදලම රධ්‍ය අයියගෙ කලිසමෙන් පහළට ඇද්දා විතරයි ඒකා කලිසම අත් දෙකෙන්ම අල්ලගත්තා..

" කෝ තවුසෙ මට කලිසම පෙන්නනවා.. ඒක තදකොළ තමයිනෙ.."

" ඔව් ඔව් බං.. තද කොළ තමා හරී.. දැන් දෙයියනේ කියලා මගේ කලිසම අතැරපන්.."

මම රධ්‍ය අයියගෙ කකුලින් ඇද්ද පාර ඒකා ගෙම්බා පොලොවෙ ගැහුවා වගේ මැට් එක උඩට ඇදගෙන වැටුනා.. පණක් කඳක්වත් නෑ හරියට.. ඒ වුණාට නල්ලමලේ කැඩෙට් සාජන්..කොහොම වුණත් මම රධ්‍ය අයියගෙ කලිසම නම් අතැරියෙම නෑ..

" අම්මො කොන්ද.. ඇග උඩින් නැඟිටපිය.. මෙක ඇතුළට මොකෙක් හරි ඒවි.. යකෝ!!"

මම රධ්‍ය අයියගෙ කියවිල්ල වැඩි නිසා කොට්ටෙ අරන් මූණට තදකල්ලා බඩ උඩින් කකුල් දෙක දෙපැත්තට දාලා වාඩිවුනා.. මෙකගෙ බඩෙ ගල්ද තියෙන්නෙ.. මාර හයියයිනෙ අප්පා..

" මේ තවුසෙ කෑගහන්නැතුව ඉන්නවා.. කෝ බලමු.. ඌප්ස්.. දැක්කනෙ කොළ තමා.."

මම ශේප් එකේ රධ්‍ය අයියගෙ යට කලිසමේ පාට බලාගෙන ඒක කොළ කියලා තහවුරු වුනු නිසා ඒ ප්‍රීතියට විසිල් එකකුත් ගැහුවම තමා තේරුණේ උගේ මූණ තාම තියෙන්නෙ කොට්ටෙට යටවෙලා කියලා.. අප්පදබොල.. මෙකා මළාද දන්නෑ.. මම පට ගාලා මූණෙන් කොට්ටෙ ගත්තා.. මෙකා මැරිලද.. ඇස් දෙකත් පියාගෙන අත් දෙකත් දෙපැත්තට කරගෙන ඉන්නවා.. මම මූණට පොඩ්ඩක් තට්ටුවක් දාලා බැලුවහම මූණ එහාපැත්තට කඩන් වැටුණා..

" ඒයි රධ්‍ය අයියෙ.."

"....."

" මේහ්.. කතාකරනවකො.."

@Shan

"....."

" ඒ තවුසෙ මැරුණද.. ඔයි අයියෙ.. නැකිටපිය ඉක්මනට.."

"....."

" මෙහ්.."

මම රධ්‍ය අයියගෙ උරහිසෙන් අල්ලලා හොලවගෙන හොලවගෙන හොලවගෙන ගියා.. මෙකා නැගිටින්නෙ නෑනෙ.. කෘතිම ශ්වසනයවත් දෙන්න වෙයිද.. නෑනෙ.. සර් කෙනෙක්ටවත් කතාකරනවද.. අඩෙ..!! මාව හිරේ දාවිද මිනිමැරීම හා මිනීමැරීමට තැත් කිරීම වරද යටතේ.. ටහිකෙ උසස් පෙළ කලෙත් නැනේද.. අපරාදෙ යකෝ පන්ති වලට ගෙවපු සල්ලි.. අනික මම මූ එක්ක යාළුවුනෙත් නෑ.. මගෙ පළවෙනි කිස් එකවත් කාටවත් දීලා නෑ.. අපේ අම්මට මම මොකද කියන්නෙ..අපේ අම්මා මට හිරේටවත් බත් එකක් ගෙනැත් දෙන එකක් නෑ..

" ඒ රධ්‍ය අයියෙ නැගිටින්නකො අප්පා~"

මම රධ්‍ය අයියෙගෙ පපුවට පහත් වෙලා හාටබීට් එක ඇහෙනවද කියලා බැලුවා..

ඔය වැඩකරන්නෙ යකෝ හොදට..!

" තව්සෙ..!!!!!!!! රතු කොහිල සිප්පි හැලකිඹුල් ඔට්ටපාලු කාවයියා.. මට බොරු නේද කරන්නෙ.. නැකිටපිය නැකිටපිය නැකිටප්-අම්මාහ් බෙල්ල බෙල්ල.. මෙ මුන හු-"

" ආව් යකෝ!! මගේ උරපත්ත ගැලවුණාට කොහෙද..උඹට මොකක්ද වෙලා තියෙන්නෙ.."

රධ්‍ය අයියා මාව තල්ලු කල්ලා මගේ අත් දෙක උඩට කල්ලා අල්ලගෙන මූණට පහත් වුණා..

" අහකට යනවකො.. මගුල.."

මම රධ්‍ය අයියගෙ බඩට පයින් එකක් ගැහුවම මෙකා මගේ කකුල් දෙකත් උගේ කකුල් දෙකෙන් ලොක් කරගත්තා.. මූ යකෝ..

@Shan

" යන්නෑ.. උඹට හොඳින් කිව්වහම තේරෙන්නෑනෙ.."

" ඇයි ඔයා මට බලහත්කාරකම් කරන්නද.."

මම ඇස් පිල්ලම් තුනක් එක දිගට ගහගෙන ගහගෙන ගිහින් රධ්‍ය අයියගෙන් ඇහුවම ඒකා මූණ අමුතු කරගෙන මගේ දිහා බලාගෙන හිටියා..

" මම ඔයාගෙ පස්ස මිරිකනවා හැබැයි එහාට වුණේ නැත්නම්.. හා ද.."

මම දගලලා දගලලා අතක් නිදහස් කරගෙන, ඒ අත රධ්‍ය අයියගෙ පිට දිගේ අරගෙන අරගෙන අර~ගෙන පහලට පහලට පහලට ඇවිත් අර ලොකුම ලොකු පස්සෙන් කෑල්ලක් අල්ලගන්න යද්දිම..

" සමන්මල් පියල්ලේ~ සඳේ රැස් කැරැල්ලේ~මම්.. මම්.."

ටෙන්ට් එකේ සිප් එක ඇරගෙන හෙන ගහන්න වගේ ඇතුළට ආපු කියාන් අයියා ෆෝන් එකේ ෆ්ලෑශර් එක ඔන් කල්ලා කෙළින්ම හරියටම අපි දෙන්නගෙ මූණටම එල්ල කලා.. මගේ ඇස් දෙකත් නිලංකාර වෙලා ගියා.. රධ්‍ය අයියා ඒ කලබලේට නැගිටින්න ගිහින් කකුල් දෙක පටලගෙන හෙනකදයා වගෙ ආයෙම මගේ ඇග උඩටම කඩාගෙන වැටුනා.. පොලොවත් හෙල්ලුනාද මන්දා..

" මේ මොකත මේ.."

" මොකද අහන්නෙ.. ඔය ටෝච් එක අහකට ගනින් අයියෙ.. ඇස් දෙකත් රිදෙනවා.."

" ටෝච් ගහන්නැතුවම මගේ ඇස් දෙකත් නිලංකාර වෙලා ගියා උඹලා දෙන්නා නිසා.. යකෝ රධ්‍ය උඹ උපාසකයා වගේ ඉඳගෙන.. බේසිකයා.."

රධ්‍ය අයියා කොහොම හරි කල්ලා මගේ ඇගෙන් අහකට වුනා.. දැන් ඉතින් ඇග හේදුව එකෙන් වැඩකුත් නෑනෙ..දගලලා දගලලා මූ නිසා දාඩියත් දැම්මා..

" උඹට පිස්සුද.. උඹ හිතන මගුලක් වුනේ නෑ.."

" නෑ නෑ කියාන් අයියෙ.. ඔයා හිතන එක තමා වෙනන් ගියේ.. මොකද ඔවා බොරු කියන්නෙ.."

@Shan

" මොක-?? උඹට පිස්සුද.."

" ඇයි අනේ ලැජ්ජ වෙන්නෙ.. ඔයාට කියන්න කියාන් අයියෙ.. මෙයා හරි~ම ලැජ්ජකාරයා.. පිස්සු කොල්ලහ්.."

මම බිම හාන්සි වෙලා ඉද්දිම එක අතකට ඔලුවත් බර කරගෙන කියද්දි කියාන් අයියා බඩ අල්ලගෙන දෙකට තුනට නැමිලා හිනාවෙන්න ගත්තා.. රධ්‍ය අයියටට ඒකට මලපැනලා ටෙන්ට් එකේ සිප් එකත් හායි ගාලා ඇරලා දාලා යන්න ගියා..

" ඒ ඒ තවුසෙට විහිලුවක් තේරෙන්නෙ නැද්ද හලෝ ඔහොම ඉන්නවා~"

මම පටස් ගාලා මැට් එකෙන් නැගිට්ටා..

" උඹට උඟව අවුස්සගන්නැතුව ඉන්නම බැරිද බං.."

මම ඉතින් රධ්‍ය අයියා මාත් එක්ක අමනාප වෙලා පියඹගෙන ආපු කැම්ප් ෆයර් එක  ගාවට එද්දි එයා මැට් එකක වාඩිවෙලා මූණත් හට්ටියක් කරගෙන ඉන්නවා..

" අපෝ විහිලුවක් කලේ අනේ.."

මම දුවගෙන දුවගෙන ගිහින් රධ්‍ය අයියගෙ එහා පැත්තෙන් ඉදගත්තා.. ඉදලා හිටලා ඉතින් පොඩ්ඩක් ගහගත්තට මගෙ වෙන්න බෝයිෆ්‍රෙන්ඩ් නෙ.. එහෙම තරහවෙලා කොහොමද..

කොහොම හරි දන්න කියන සේරම දේවල් කියලා රධ්‍ය අයියව යාළු කරගත්තහම කැම්ප් ෆයර් එකට හැමෝම වගේ ඇවිත් ඉදගෙන ඉදියා.. කැම්ප් ෆයර් එක මාරම ජොලි වැඩේ.. අපි රොටී කකා තේ බිබී සිංදු කිව්වා.. සිංදු කියන අයට මයික් පාස් වුණා.. මට මේ වෙලේ සිංදු කියන්න පොඩි ලැජ්ජාවක් ආපු නිසා කලින්ම ගිටාර් එක ඉල්ලගෙන සිංදු කියන අයට ගිටාර් ප්ලේ කලා.. මගේ එහාපැත්තෙ තමයි සෙනුකයයි රධ්‍ය අයියයි හිටියේ..

මහ රෑ දොළහ විතර වෙනකල් කට්ටිය සිංදු කිය කිය හිටියා.. ඒ කියන්නෙ නැටවෙන සිංදු නෙමෙයි.. අර හිමින් ප්ලේ වෙන ඇකොස්ටික් වයිබ් එකක් තියන සිංදු..

@Shan

" සෙනුකයා උඹ කියපන්.."

" මොන.. අනේ මේ මට බෑ.. පාඩුවෙ ඉදින්.."

" මෙ මෙ මල්ලි.. අපේ බෑන්ඩ් ලීඩර් සිංග් කරනවලු.. කමෝන් සෙනුකයා.."

" අඩෝ මල්ලි උඹත් එකක් කියපන්.."

" අඩෙ මට මතක නෑ ඕයි.."

" ඒ මගුල් හරියන්නෑ.. ඒ වරෙන් වරෙන්.. මගෙ පොල්පිති වස්සා.."

මම සෙනුකයා මරන්න ගෙනියන හරකා ගෙනියන්න වගේ මයික් එකක් ස්ටෑන්ඩ් කල්ලා තියෙන උස වෙයාර් එක තිබ්බ තැනට ඇදගෙන ගියා..

" කාපන් මාව.."

සෙනුකයා මට රවලා රධ්‍ය අයියට එන්න කියලා කතාකලා..

" අයියෙ.. අඩෙ මාත් එක්ක සිංග් කරන්නකො.. සිරාවටම මට ප්‍රැක්ටිස් නොකර කියන්න බෑ.."

" මම්.."

රධ්‍ය අයියත් ඒ ලගින් ස්ටූල් එකත් තියාගෙන මයික් එක අතට ගත්තම මම කුප්ප හිනාවක් දාගෙන ගිහින් ගිටාර් එක අතට ගත්තා.. ගහන්න පුලුවන් මෙකයි රෙකෝඩර් එකයි විතරනෙ ඉතින්.. උන් දෙන්නා සිංදුවක් හිතන කල් මම ගිටාර් එක කරට දාගෙන මගේ ගානට ඇජෙස් කරගෙන රධ්‍ය අයියට එහාපැත්තෙන් ඉදගත්තා.. සෙනුකයා මයික් එක අතට අරගෙන ටිකක් වෙලා ඔලුව පහත් කරගෙන ඉදියා..

1 2 3 4

"

*යායට පායනා පෝදා සඳ..නෙත බේරෙනා පිණි දෝරෙක..හිත පාරනා මෙ මා දුක..සැපසේ වින්දා..*

@Shan

හෙට රෑ වෙලා එලිවෙන සඳ..

හිත හාරනා මහ පාලුව..

නුඹ ගන්නවානම් ආපිට..

යනවා.. කැන්දා..

රධ්‍ය අයියා හරිම පාඩුවෙ ඇස් දෙකහ් බාගෙට පියාගෙන සිංග් කරද්දි මම ගිටාර් එක ප්ලේ කරන ගමන් එයා දිහ අබලාගෙන ඉදියා.. බලාගෙනම ඉන්නත් ඕන.. ඒත්.. කොඩස් වරදී කියලා බයයි.. මම ආසම ආසයි එයාගෙ අර ලස්සන කටහඩින් සිංදුවක් කියවෙනවා අහන්න.. එයා හැමතිස්සෙම සිංදුවල කෑලි කියනවා.. හුගක් සිංදු පරණ ඒවා.. ඒ වුණත් හරි ලස්සනයි.. කැම්ප්ෆයර් එකෙන් එන ලා තැඹිලිපාට එළියට එයාගෙ මූණ සැරින් සැරේ එළිය වැටෙනවා.. මට ඕන වුනේ මේ රූපෙ හැමදාටම.. හැමදාටම මගේ හිතේ ඇදලා තියාගන්න.. මම ඇත්තටම පාර්ථනා කලා මේ හැමමතකයක්ම මට කවමදාවත් අමතක නොවී තියෙන්න කියලා.. ප්‍රශ්න ගොඩක් මැද්දෙන් ගලාගෙන ගියත්.. ඇත්තමයි.. මම මේ ජීවිතේට හරි ආසයි..

*වැහෙන්නම් මා ඉඳ හිට ඒ සඳේ ඇදිලා..සැහෙන්නම් මා නුඹගේ ඇස් පුරා රැඳිලා..*

*තනි පැලේදී තනිව උරගෑ රෑ ගනන් බලලා..අවේලාවක පෑයු තරුවී පෑ බැලුම් හින්දා..තනි ඇතා සේ හිතින් හිතපු මල් වියේ අරුමේ..නුඹ නිසාවෙන් හිතේ පිරුනු ආලයෙන් බැඳුනේ..*

තරු ගනිද්දී නුඹව පෙන්වූ හීනයේ ගිලිලා..

සැපට ඉද්දී පැතුම් සේරම කළුවරේ බින්දා..

මල් බිසෝවී මෙමට දුන්නු සතුට යළි ගත්තා..

නුඹ පතා මං එක සිතින් පිදූ ජීවිතේ මැරුණා...."

ඒ සිංදුවෙ තිබ්බ දුක හිතෙන පාළු ගතිය මට එයාගෙ කටහඩත් එක්ක හොඳට දැනුනා.. සිංදුව ඉවරවුනු ගමන් සෙනුකයා ආඳා වාගෙ හිමිහිට ලිස්සලා ගිහින් අයුක අයියා ගාවින් ඉඳගත්තා.. රධ්‍ය අයියා මගේ දිහා බලලා

@Shan

මගෙන් ගිටාර් එක ඉල්ලගත්තා.. හරියට මට එකක් කියන්න වගේ.. ඒ වුණාට මට දැන් සිංදු මතක් වෙන්නෙ නැනෙ.. අනික සිංහල සිංදු මට කියවෙන්නෙ දිව ඇඹරිලානෙ.. මම කලේ ර්ස්ටර්න් මියුසික් නෙමෙයිත් එක්කන්.. ම්ම්..ම්ම්..ම්ම්..

" මතක් වෙන්නෙ මොකක්ද ඒක කියන්න.."

රධ්‍ය අයියා මගේ කනට කල්ලා කිව්වහම මම ඔලුව වනලා මයික් එක අතට ගත්තා..එතන ඉදිය හැමෝම අපි දිහා බලාගෙන ඉදියෙ.. මම හිතනවා මම කියන්න යන එක මෙතන ඉන්න උන් දන්නව ඇතියි කියලා.. දන්නැත්නම් පුතේ මට කරන්න දේකුත් නෑ.. අහන් ඉන්න තමා තියෙන්නෙ..

1 2 3 4

**Loving can hurt, loving can hurt sometimes**

But it's the only thing that I know

When it gets hard, you know it can get hard sometimes

It is the only thing makes us feel alive

We keep this love in a photograph

We made these memories for ourselves

Where our eyes are never closing

Hearts are never broken

And time's forever frozen, still

**So you can keep meInside the pocket of your ripped jeans**

Holding me closer 'til our eyes meet

You won't ever be alone, wait for me to come home

@Shan

මම කියද්දි රධ්‍ය අයියට ලාවට හිනායනවා මම දැක්කා.. මේකා සිංදු කියද්දි දාන මනමාල හිනාව තමා.. අර අවුරුදු උත්සවෙත් හතරවටේ ශෙයා වුනේ.. දැන් සෙනුකයා එක්කත් කිව්වා.. හිනාවෙන්න එපැයි..මොකද මට විතරක්.. එතකොට මටත් කට කොනෙන් හිනා යනවා..

**Loving can heal, loving can mend your soul**

And it's the only thing that I know, know

I swear it will get easier

Remember that with every piece of ya

Hmm, and it's the only thing we take with us when we die

Hmm, we keep this love in a photograph

We made these memories for ourselves

Where our eyes are never closing

Hearts were never broken

And time's forever frozen, still

So you can keep me

Inside the pocket of your ripped jeans

Holding me closer 'til our eyes meet

You won't ever be alone

ඒ එක්කම රධ්‍ය අයියා මයික් එකට කිට්ටු කලා..

And if you hurt me

That's okay,

@Shan

*baby,*

only words bleed

Inside these pages, you just hold me

And I won't ever let you go

Wait for me to come home//

Oh, you can fit me

Inside the necklace you got when you were

*nineteen*

Next to your heartbeat where I should be

Keep it deep within your soul

And if you hurt me

Well, that's okay, baby, only words bleed

Inside these pages, you just hold me

And I won't ever let you go

**When I'm away, I will remember how you kissed meUnder the lamppost back on Sixth street**

Hearing you whisper through the phone

**"Wait for me to come home"**

*( photograph by Ed Sheeran )*

රෑ දොළහට විතර හැමෝම නිදාගන්න ටෙන්ට් වලටයි හෝල් වලටයි ගියා.. අපේ ටෙන්ට් එකේ ඉදියෙ මමයි රධ්‍ය අයියයි කියාන් අයියයි.. මම ඉතින්

@Shan

ටෙන්ට් එකට පැනලා රෙද්ද ඔලුවෙ ඉඳන් වහගන්න ගියා විතරයි..

" ඔය මගේ කොන.."

කියාන් අයියා මගේ පොරවන්නගත්ති ශීට් එක ඇදලා ගත්තා.. ආ ඒක හරි මගුලක්නෙ යකෝ.. මේක මගේ කොන.. කොන හොය හොය ඉන්න මේකා තම්බිද..

" බෑ මේක මගේ කොන.. මෙතනනෙ ටෝච් එක තියෙන්නෙ.. මේක මගේ.. අනික මම තමයි මෙතන ඉන්න පොඩිම එක්කෙනා.. තව රධ්‍ය අයිය-"

" ආ හා හා හා හරි හරි.. අම්බෝ.. ඕකට ඔච්චර කියවන්න ඕනද.. ඔයා ඔතන ඉන්න එහෙනම් මම මෙතන කොනේ ඉන්නවා.."

" අන්න එහෙම.."

අපි නිදාගත්තෙ, මම කොනේම.. රධ්‍ය අයියා මැද.. කියාන් අයියා එහාපැත්තෙ.. මම පොඩ්ඩ පොඩ්ඩ රධ්‍ය අයියා ගාවට ඇදිලා ගිහින් එයාගෙ උනුම උනු ශීට් එක අස්සට ඇග දාගත්තා.. රෑට සීතලයි යකෝ.. මේකා ගාව රස්නෙයි..

" මේ මොකෝ.."

" සීතලයි අනේ.."

රධ්‍ය අයියා එයාගෙ සීට් එක අස්සට මගේ කුඩා ශරීරයත් ඔබාගන්න මට ඉඩ දුන්නා.. හරි හොදයි ඉතින්.. මම ඉතින් මගේ කොට්ටෙත් රධ්‍ය අයියගෙ කොට්ටෙ ගාවටම ඇදගෙන රධ්‍ය අයියගෙ ඇගට හේත්තුවක් දාගත්තා.. අම්මෝ රස්නෙ.. හෙන සනීපයි.. මම බෙල්ල ගාවටම පොරවගෙන හිමින් සැරේ රධ්‍ය අයියගෙ මූණ දිහා බලන්න යද්දිම..

" මගෙ සුදුඅම්මියෝ~.. එන්න අනේ ඉස්සර වගේ බදාගන්න මම ඔයාව.."

අර කියාන් කියන අසමජ්ජාති ඌරු පැටියා රධ්‍ය අයියගෙ උරහිසට ඔලුව තියාගෙන අතක් ඇග වටේ දාලා කකුලකුත් ඇග උඩින් දාගෙන මං ගාව

@Shan

ඉදපු රධ්‍ය අයියව ඇදලා ගත්තා.. යකෝ මගේ හීටරේ මෙහාට දීපන්.. කොහිලයා..

" කියාන්!!!!"

" හරි හරි රත්තරං.. ලැජ්ජ වෙන්න ඕනද අප්පා.. අපි අපිනෙ.."

" ඕයි කියාන් අයියෙ හොඳ හිතින් රධ්‍ය අයියව මෙහාට දීපන්.."

" ඒ මොකටද.."

" මට සීතලයි.."

" ඉතින් උඹට විතරයැ සීතල.. මටත් සීතලයි තමා.."

" එහෙනම් සීතලේ ඉදපන්.. මට රධ්‍ය අයියව මෙහෙට දීපන්.."

මම රධ්‍ය අයියව ඇදලා අරගෙන තද කල්ලා බදාගත්තා.. දැන් ගනින් බලන්න පුලුවන් නම්..

" ෂනෙරුවා.. රධ්‍ය උඹෙ වෙන්න කලින් මගේ වුනේ..මෙහෙ දීපන් හොද හිතින්.."

කියාන් අයියා ඇවිත් රධ්‍ය අයියව බදාගත්තා.. මම කකුලකින් කියාන් අයියට ගහලා ඌව එහාට තල්ලු කල්ලා දැම්මා..

" දෙන්නෙ නෑ.. පුලුවන් දෙයක් කරපන්.."

" අනේ මේ මොන කරුමයක්ද දෙයියනේ.. මට නිදාගන්න දීපල්ලා!!!"

" මේ ඔයා පොඩ්ඩක් කට වහන් ඉන්නවද.. මේක අපේ ප්‍රශ්නයක්නෙ.."

මම රධ්‍ය අයියගෙ කට අත් දෙකින්ම වහලා කියාන් අයියට රැව්වහම කියාන් අයියා මාව වවුල් බෙට්ටක් ගානටවත් ගනන් නොගෙන ආයෙම රධ්‍ය අයියව බදාගත්තා.. මාත් අනිත් පැත්තෙන් මගේ කකුල් දෙකම රධ්‍ය අයියගෙ ඇග උඩට දාලා රධ්‍ය අයියව බදාගත්තා..

" තවුසෙට ලැජ්ජ නැද්ද අපි අස්සෙ එන්නෙ.. අහකට පලකො.."

@Shan

" මට ලැජ්ජ නෑ මම යන්නෙ නෑ!!"

" එහාට යනවා.. මට රධ්‍ය අයියට කියන්න පොඩි බඩ්ඩක් තියෙනවා.."

" ඔහොම ඉදන් කියපන්.. මම මගේ රධ්‍යව දාලා යන්නෙ නෑ.."

කියාන් අයියා රධ්‍ය අයියගෙ පපුවට උඩින් ඔලුව තියාගෙන ඇස් දෙක පියාගත්තා.. රධ්‍ය අයියා අත් දෙක බඩ උඩින් බැදගෙන සංසාරෙම එපාවෙලා කලකිරිලා මැරෙන්න යන එකෙක් වගේ ටෙන්ට් එකේ වහල දිහා බලාගෙන ඉද්දි මට දුක හිතුනා.. මම කොහොම හරි ජීවිතේ පරදුවට බැයිනම් එහාගෙදර ඇන්ටිගෙදුවට හරි තියලා ඔයාව මේ කියාන් කියන තඩි ඌරගෙන් බේරගන්නම් අයියෙ..

" මෙහෙම බෑ.. තවුසෙ අහකට යනවා.. මම රධ්‍ය අයියට කුක්කු දෙන්න යන්නෙ.."

මම කියාන් අයියගෙ මූණ අහකට තල්ලු කලා විතරයි මැරෙන්න වගේ ඉදපු රධ්‍ය අයියා එකපාරටම ඔලුව උස්සලා ඇස් දෙක එළියට පනින්න තරම් ලොකු කරගෙන මගේ දිහා හැරිලා බැලුවා.. බයවෙන්න එපා අනේ.. මම ඔයාව බේරගන්න මේ යන්නෙ..

" මොක්-කැහ් කිව්වා.."

" තවුසෙ ඒවා දන්නෙ නෑ.. දැන් එහාට පලයන්.."

" ඈ රධ්‍ය.. මූ උඹට ඒවත් දෙනවද.."

" එයාගෙන් අහන්නෙ මොකටද දෙනවා තමා.."

" සිරාවට.. අඩෝ.. මම හිතුවෙ අපේ අයුකයට විතරයි ඕව හම්බෙන්නෙ කියලා.."

" නෑ අනේ රධ්‍ය අයියටත් හම්බෙනවා.. නේද ඒයි.."

" ආ?? මොන-මොකක්??"

" කුක්කු අනේ.. මම ඔයාට දෙන්නෙ.."

@Shan

" ආ..??"

" හරි හරි හරි.. උඹලා එහෙනම් දෙන ඒවා දීලා නිදාගනිල්ලකො.. කවුද ඔහොම මගුල් දන්නෙ ඉතින්.. මම මේ කොට්ටෙ බදන් නිදාගන්නවා සැපට.. උඹම මේකා තියාගනින්.."

කියාන් අයියා මම හමුවේ පසුබැහැලා මම ඔලුව තියන් හිටපු කොට්ටෙන් ඇදලා අරගෙන එහාපැත්ත හැරුණා.. දැක්කනෙ.. මේ වරද් එක්ක කොහොම හැප්පෙන්නද එයා.. ආවා මෙතන..

මම ලැබූ ජය සාමකාමීව සමරන ගමන් හිමිහිට ඉස්සිලා රධ්‍ය අයියා දිහා බැලුවම ඒකා කළුවරේම ඉදගෙන මට රවනවා.. කොහොමත් ඒකා ඉතින් දන්නෙ රවන්න විතරනෙ.. මම දත් තිස් දෙකම පෙන්නලා රධ්‍ය අයියට හිනාවුණා..

" මාව කාපන්!!"

" පස්සෙ අනේ දැන් බෑ.. මට මහන්සී නිදිමතයි.."

මම හොදට රධ්‍ය අයියගෙ උණු ඇග අස්සට ගුලි වෙලා ඇස් දෙක පියාගත්තා..

" එහාපැත්ත හැරිය.."

" බෑ අනේ ඉන්න දෙනවකො.."

" හැරෙනවකො එහාපැත්ත.. දැන් උඹට සීතලයි කිව්වා නේද.."

රධ්‍ය අයියා මාව බලෙන්ම එහාපැත්ත හරෝලා මාව පිටිපස්සෙන් බදාගත්තා.. ඇගට හිර කරගෙනම.. මගේ හුස්ම හිරවෙලා මැරෙන්න තරමට.. මම පොඩ්ඩක් දගලලා දගලලා මගේ ගානට ඉඩ හදාගත්තා..

" ගුඩ් නයිට්.. මම නිදි.."

මම ඇස් දෙක පියාගනිද්දි.. මට නින්ද යාගෙන එනවා වගේ ඇස් දෙක බරවෙලා පියවෙනවා ආයෙම ඇරෙනවා.. මට දැනුනා රධ්‍ය අයියා මාව එයාගෙ ඇගට තුරුලු කරගන්නවා.. ඒකනිසා මට සීතලක් දැනුනෙ නෑ.. අනික එයාගෙ උනුහුම හරි සනීපයි.. මම ආසවෙන් එයා ගාවට වෙලා

@Shan

ඉදියා.. එයාගෙ හුස්ම ඇවිත්මගේ බෙල්ලෙ වදිද්දි මට මගේ බෙල්ල ගාවින් තෙත හාදුවක් දැනුනා.. එකක් නෙමේ.. දෙක තුනක්.. හතරක් විතර..

" ගුඩ් නයිට්.."

කියාන් සුදුමහත්තයව බදාගන්න කාරුහරි ඉදිරිපත් වෙන්න.. පව්නෙ.. අහිංසකයා.. හැමදාම කපල් අස්සෙ අසරණ වෙනවා..

ඕතරීට රෑ නින්ද ගියානෙ.. ඒකනිසා සමාවෙන්න ඕන මුලින්ම.. හරිත..

එන්නාම්.. ලව් යූ..

රධ්‍යගේ දවසක නිමාව : මට හරිම මහන්සී~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 63 කොටස

" ආර්ග්!! වරද්!! මගෙ ඔළුවත් කකියනවා බං.. මොන මගුලක්ද.. මේක හරියට හදපන් දැන් මම සිය පාරකට වඩා කියලා දුන්නනේ.."

" හරි හරි අනේ.. පොඩ්ඩක් ඉතින් දන්නැද්ද.. ඩාම් වෙනවා ඩූම් වෙනවා.. මම මකලා හදන්නම් ආයෙ.."

" මක මක ඉන්නෙ නැතුව එහා පිටුවෙ ගාන හරියට හදපන්.."

" අනේ මේ.. තවුසෙ දැනගන්නවා.. අපිට මෙහෙම ගනන් හදන්න හරි රටක් ඉතුරුවුනේ මහින්ද මහත්තයා නිසා කියලා.. ආවා මෙතන මකන හැටි කියලා දෙන්න."

මම මගේ තැඹිලි පාට දොඩම් සුවඳ මකනෙ අරගෙන මකන්න හැදුවා විතරයි ඔල්ලුව මැද්දටම තඩි ටොක්කක් පතබෑවිලා මකනෙ උඩින් ගියා. මම ඔලුව උස්සලා රධ්‍ය අයියා දිහා බලද්දි ඒකා ඉතින් රවාගෙන ඉන්නවා මගේ පොත දිහා බලාගෙන..

" හදපිය එහා පිටුවෙ.."

මම රධ්‍ය අයියට රවලා පොතේ එහාපිටුවෙ ගාන හදන්න ගත්තා.. මූට පුලුවන් වුණාට මට බැනෙ ඉතින්.. පිසික්ස් සාපෙ..

එක්සෑම් එකට මාස තුනක් වගේ හෙන පොඩි කාලයක් තිබ්බෙ.. මට තේරෙන්නෑ තියන වැඩ කන්දරාව කොහෙන් නිමක් දකින්න පුලුවන් වෙයිද කියලා.. උසස් පෙළ මානසික පීඩනේ මේ වෙද්දි මාව ගිලගෙන තිබ්බෙ.. එකවෙලාවක උගන්නන මෙලෝම දෙයක් තේරෙන්නෙ නෑ.. ඔහේ අහගෙන ඉන්නවා.. ගෙදර එනවා.. ඉස්කෝලෙ වැඩත් ඒ අස්සෙ පිරිලා.. ඒවා කරන්නත් ඕන..

ගිය සතියේ අයාන් අයියා කොළඹ ආවා කියලා කියාන් අයියා කිව්වත් මමනම් ඇහැටවත් දැක්කෙ නෑ.. මගේ ඇහැට ඌව දකින්න ඕනත් නෑ.. අනික එදා රධ්‍ය අයියලගෙ රිසාල්ට්ස් ආපු දවසෙ වුනු සිද්ධිය එයාට මම තවම කියලා තිබුනෙ නෑ.. මට බයයි මොකක් හරි ප්‍රශ්නයක් වෙයි කියලා.. අයාන් කියන්නෙ කියාන් අයියගෙ අයියා නොවුණනම් මට ඕන මගුලක්..

@Shan

ඌ මැරිලා ගියත් කමක් නෑ.. ඒ වුණාට.. හද්සියේ මම නිසා ඒගොල්ලො අතරෙ ප්‍රශ්න වුනොත්.. මම නිසා මේ වෙද්දි වෙලා තියන ප්‍රශ්න ඕනවටත් වැඩී.. ඒකනිසා තව ප්‍රශ්න ඕන්නෑ කියලා මට හිතුනා..

රධ්‍ය අයියා දැන් හැමදාම ගනන් කියලා දෙන්න එක්කො ඉස්කෝලෙ අඹ ගහ ගාව බංකුවට හරි නැත්නම් ඉඩ තියන වෙලාවක අපේ ගෙදර හරි එනවා.. අපේ ගෙදර ආවත් ඉතින් මගේ කාමරේට එන්නෙ නැහැනෙ.. කාමරේට තියා ගේ ඇතුළටවත් එන්නෙ හදිසියෙන්.. අම්මත් ගෙදර ඉන්නවනම් විතරයි.. එළියේ බංකුවේ පොත් දිගෑරගෙන මම ගනන් හදනවා හවස් වෙනකල්.. එයා පේපර්ස් බලනවා.. ගනන් කියලා දෙනවා.. ප්‍රැක්ටිලක් පවා මුල ඉදන් කියලා දුන්නා.. මම නිසාම එයා ලයිබ්‍රි එකෙන් සිංහල මීඩියම් පිසික්ස් කෙමෙස්ට්‍රි පොත් පවා අරගෙන කියෙව්වා.. වෙලාවකට මට හිතටත් හරි නෑ වගේ.. එයා කරන තරම ඕනවටත් වැඩී.. මම මෙහෙම මෙච්චර දේවල් එයාගෙන් බලාපොරොත්තු වෙන්නෙ නෑ කොහොමටවත්..

" දැන් හරිනෙ.."

මම ගාන හදලා පොත එයාගෙ පැත්තට හරවලා තිබ්බා..

" කෝ බලන්න..මම්..මම්.."

එයා තැඹිලි පාට පෑනක් අරගෙන තැනින් තැන රවුම් කර කර මොනවදෝ ලියනවා.. මගෙන් රතු පෑන කොහෙද අහන්න එපා.. අපේ ගෙදර දෝණි එක රතුපෑනක් තියෙන්න දෙන්නෙ නෑ එයාගෙ මැහුම් පොත් වල ලියන්න අරගෙන ඒවා මැෂින් ලාච්චුවේ දාගෙන රාජසන්තක කරගෙන ඉන්නෙ..

" හරි.. ඔක්කොම හරි.."

රධ්‍ය අයියා ලාවට ටික් එකක් දාලා පොත මට ආපහු දුන්නා.. වැරැද්දක් දානකොටනම් දානවා පොත පිරෙන්න තඩියට.. හරියක් දම්මොත් ඒක හොයන්න වෙනම එකෙක් ගේන්න වෙනවා..

" හරියක් නෙමෙ තරුවකුත් දානවා.."

" උඹට තරු දදා ඉන්න මම මොන්ටිසෝරි ක්ලාස් දාලා නෑනෙ.."

@Shan

" එහෙනම් හරි දානවනම් ලොකුවට දානවා.. ඇහැටවත් පේන්නෙ නැති හරි දාන්නෙ.."

" ඉතින් උඹේ නම වරද් නෙ.. ඒකනිසා වැරැද්ද තමා ලොකුවට දාන්න ඕන.."

" අනේ පලයං.. දැන් ආයෙ කෝකද හදන්නෙ.."

" හදන්නෙ කියන්නෙ.. මේ පිටුවෙ ගණන් හතළිස් හයම හදන්න ඕන.. තාම හැදුවෙ විස්සක් විතරනෙ.."

" ම්-මොකක් කිව්වා.. හතළිස් හයක්.. අනෙ අප්පා.. මගේ හක්ක රිදෙනවා.."

" උඹට ගානක් හදන්න ගත්තහම කොහොමත් හක්ක රිදෙනවා ඔලුව රිදෙනවා අතන රිදෙනවා මෙතන රිදෙනවා.. බොරු නොකිය ගාන හදපිය.."

රධ්‍ය අයියා පෑනෙන් මගේ ඔලුවට ගැහුවා..

" සිරාවටම රිදෙනවා ඕයි.."

" ඒ මොකද.."

" මගෙ හක්කෙ දතක් එනවා.. ඒක රිදෙනවා.."

" හක්කෙ ඉතින් දත් එන්නෙ නැතුව වෙන මොනව එන්නද.. නටන්නැතුව ඔය ගනන් ටික හදපන්.."

රධ්‍ය අයියා මාව සත එකකටවත් ගනන් ගන්නෙතුව හිතක් පපුවක් නැති ගැටපොළොස් කොටවෝරුවෙක් වගේ ආයෙම බංකුවට හේත්තු වෙලා පොතක් කියවන්න ගත්තා.. මූත් පොඩ්ඩක් ආධ්‍ය අයියා වගේ තමා.. පොතක් අතට ගත්තොත් ඒකෙම එබීගෙන ඉන්නවා.. මම කොන්ද පොඩ්ඩක් කෙලින් කරගෙන කකුලක් අරගෙන ඉස්සරහ ඉදපු රධ්‍ය අයියිගෙ උකුළ උඩින් තියාගත්තා..වැඩිහිටියෙක් තමා..ඒ වුණාට දැන් කමක් නෑ.. එක අවුරුද්දනෙ.. රධ්‍ය අයියා කකුල දිහා බලාගෙන ඉදලා ආයෙම පොත දිහා බලාගත්තා..

@Shan

මම ඉතින් ආයෙම පොතට මූණ අලවගෙන අර කියපු ගනන් ටික හදාගෙන ගියා.. අම්මපා මේ නිවුටන් කාරයා මට හම්බුනෝතින්.. තලනවා ඇට දෙක.. මම ගනන් හද හද ඉද්දි අපේ අම්මා තද නිල් පාට අත් දිග දනිස්ස ගාවට කොට ගවුමකුත් ඇදලා එක අතකින් බීම වීදුරු දෙකකුයි බෑග් එකයි අරගෙන ඉස්සරහා දොරින් එළියට බහිනවා මම ඇහැ කොනෙන් දැක්කා.. ඒ එක්කම පටාස් ගාලා රධ්‍ය අයියගෙ උකුළ උඩ තියාගෙන ඉදපු මගේ කකුල මම පහළ දාගත්තා.. දෝණී කොයි යන්නත.. හැටට හැටේ ඇදගෙන..

අපේ අම්මා මගේ පැත්තට ඇවිදගෙන එද්දි මම හෙනට පාඩම් කරන එකා වගේ පොත දිහා මහා බැරෑරුම් මූණකින් බලාගෙන හිටියා.. නෑ මම කොහොමත් බැරෑරුම් ගානක්තමා හද හද ඉදියෙත්..

" සුදුමහත්තයා!!!!!!!!"

අපේ අම්මා ඈත තියා කතාකරද්දි මම කකුලෙ ඇගිලි ටික කේන්තියටම තද කරගෙන අම්මා දිහා බැලුවා.. කී සරයක් කියලා තියෙනවද හැම මනුස්සයම ඉස්සරහා මට සුදුමහත්තයා ගාන්න එපා අම්මේ නම කියන්න කියලා.. කොහෙද.. ඉස්කෝලෙ හැමෝමත් දන්නවා මම ගෙදරට සුදුමහත්තයා කියලා... මේ දැන් මගේ ඉස්සරහා ඉන්න එකත් මං දිහා අමුතුවට හිනාවෙලා බැලුවා..

" ඕ.. ඇයි.."

" මම පොඩි ගමනක් ගිහින් එන්නම්.. මේ පුතත් එක්ක ඉන්න පුළුවන් නෙ.."

" කොහෙ යන්නද.. දැන් හවස් වෙලත් එක්කන්.. දුර කොහේ හරිද.. මාත් එන්නද.."

" දැන් උඹ ඇවිල්ලා ඉන්නවද..මම සැලොන් යනවා.."

අපේ අම්මා ඒක කිව්ව විදියෙන්ම මට සැලොන් එකේ ඇන්ටිගෙ මූණ මතක් වෙලා ඒ ටිංබෙලෙක්ක කටහඩ කන් දෙකේ දෝංකාර දෙන්න අරගෙන අර දතක් එන හක්කත් රිදෙන්න ඇල්ලුවා.

" ආපෝ.. යන්න යන්න.. ගිහින් එන්න.. මමනම් ඔය මගුලට එන්නෙ නෑ.."

@Shan

" ඒකනෙ.. පුතා මම ගිහින් එන්නම්.. කැම කාලම යන්න හොදේ.."

අපේ අම්මා අර හෙන දිග කොණ්ඩෙ ගස්සලා යන්න ගිහිල්ලත් ආයෙම බ්‍රේක් ගහලා නැවතිලා මගේ දිහා ඇස් හීනි කල්ලා බැලුවා..

" ගේ වනසලා තිබ්බොත් කඩනවා අඩු දෙක.."

මම අම්මට මූණ පිරෙන්න හිනාවෙලා බායි කිව්වා.. දෝණිගෙ සැර යකෝ.. අපේ අම්මා ඉතින් ගේට්ටුව ඇරගෙන යන්න ගියා..

අපේ අම්මත් එක්ක සැලොන් යන ගමන් ගැන කියනවනම්.. මම ඕකට මූණ දෙන්නෙ අවුරුදු තුනේ ඉඳලා.. පොඩිම කාලෙනම් අම්මගෙ උකුලෙ ඉන්නවා අම්මගෙ කොණ්ඩෙ කපලා ඇහිබැම හදලා ඕවා මේවා කරනකල්.. ඒ වුණාට දැන් ඉතින් අවුරුදු විස්ස්සකට කිට්ටු මම ගිහින් අම්මගෙ උකුළෙ ඉන්නයැ.. ඒක හෙන විකාරයක්නෙ..

අම්මා හැමදාම කොළඹ ආවට පස්සෙත් යන්නෙ එකම සැලොන් එකකට විතරයි.. ඒකෙ ඉන්න ඇන්ටි අපේ අම්මව හොදට අඳුරනවා.. ඇයි ඉතින් හැම මාසෙම රෙපෙයාර් කරගන්න යනවනෙ.. මම ඉතින් හුගක් දවස් වලට අම්මා එක්ක යනවා.. ඒ ඇන්ටි කියවන්න ගියාම.. බියුටි ප්‍රඩක්ට්ස් ගැනයි, එයා කරපු පැජන්ට්ස් ගැනයි, ඇඳුම් මෝස්තර ගැනයි, ලඟදි බ්‍රයිඩ් කෙනෙක් අන්දන්න මගුල් ගෙදරකට ගිහින් වෙච්ච හරි හරි දේවල්යි, එයාගෙ මහත්තයගෙ අම්මා ගැනයි නාට්‍යානුසාරයෙන් අපේ අම්මා එක්ක කියවනවා.. ඊට්පස්සෙ අපේ අම්මට කොණ්ඩෙට මේක හොදයි, මේක හොදයි, ඔයාගෙ ස්කින් එක හෙල්ති අරවා මේවා දාහක් කියනවා.. ඊටත්පස්සෙ අම්මා මූණේ අර මොනවද සුදුපාට එකක් ගාගෙන පැයක් විතර ඉන්නවා..

ඔය ඔක්කොම ඉවරවෙනකල් මමත් ගැනු ලමිස්සි වගේ විසිටින් ඒරියා එකේ ඉඳගෙන එතන තියන සගරා ගොඩයි, පත්තර ගොඩයි, මනමාලියොන්ට ඇඳගෙන ඉන්න ඒවයි, ලංකාදීප පත්තරෙයි, මව්බිම පත්තරෙයි සේරම කියවලා ඉවර කරනවා..

ලංකාදීප පත්තරේනම් මරු.. ඉරිදා එක ගැන මම කියන්නෙ.. මව්බිම පත්තරේ අර හොල්මන් කතා තියන ටික විතරයි මම කියවන්නෙ.. ඒ ඇරෙන්න ඔරිෆ්ලේම් එකේ අර පොතක් තියෙන්නෙ කොට දිග.. ඒක හොදයි.. මම ඒකෙ ඉන්න ලස්සන අක්කලා දිහා බලාගෙන ඉන්නවා..

@Shan

සඳැල්ල නම් සැක්ම සැක්.. මම නළුනිළි පරම්පරාවවල් ගැන අහන්න ආස නැනෙ.. ඒවගෙ ඉන්න ගෑනු මේ සතියේ බැඳලා වෙඩින් ශූට් එක ගහලා දාලා ඊලඟ සතිය වෙද්දි දික්කසාදත් වෙලා.. මිනිස්සුත් එහෙමයි.. ඕවා කියවලා මොලේ කුරුවල් කරගන්න ඕන නැනෙ.. සැලොන් එකෙ ඇන්ටිට ඉන්නවා කිරි හට්ටියක් වගේ කිරි සුදු කෙල්ලෙක්..මට වඩා අවුරුද්දක් විතර බාල.. ඩයල් එකත් බියුටීශියන් කෙනෙක් වෙන්න තමයි ඉන්නෙ අපේ අම්මා කිව්ව විදියට.. ඒ කෙල්ල මම ගියාම ඇවිත් මාත් එක්ක වාඩිවෙලා කියව කියව ඉන්නවා.. ඇත්තෙන්ම මට ඒකි කියන්නෙ මොනවද කියලා මෙලෝම දෙයක් තේරුනේ නැතත් මම අහගෙන ඉන්නවා.. නියපොතු දහය පාට දහයකින් ගාගෙන ඒක විලිස්සගෙන කතාකරන්නෙ.. ඇග පුරාම චිත්‍ර පොත වගේ ටැටූ කරලා, හැම අගලකටම කරාබු දාලා, කොණ්ඩෙ පාට කරන් ඉන්නෙ මම අන්තිමට දැක්ක දවසෙ නම් කොළ පාටට.. වෙලාවකට මට හිතෙනවා මේකි කොයිවෙලේ හරි මගේ ඇගට කඩාපැනල මගේ බෙල්ල පහුරුගාලා මාව මරලා දාවි කියලා..

" ට්‍රේන් එකේ දැක්කේ - මා හා සිනා පෑවේ..

පුසුඹේ බැරුවා - මා ළඟින් වාඩිවුන්නේ..

ජනේලයෙන් අහක බැලුවේ..

මා දෙස හොරෙන් බැලුවේ..

කොටුවට ටිකට් ගත්තේ - ඒ ළඟම හදත් ගත්තේ.."

" සිංදු කිය කිය ඉන්නෙ.. හදලා ඉවරද ඕක.."

" යැස්.."

මම පොත රධ්‍ය අයියගෙ පැත්තට හරවලා තියලා මේසෙට ඔලුව තියාගෙන එයා දිහා බලාගෙන හිටියා.. ජනවාරි වල ඉඳන් එයා ආයෙම මං ගාව නැනෙ.. මට පාළු හිතෙයි.. එයාටත් පාළු හිතෙයිද දන්නෙ නෑ.. හිතද්දිත් මට දුකයි.. අසනීප වුනොත් මිසක් එයාලට එළියට එන්න දෙන්නෙ නැනෙ.. කෝල්ස් නෑ ලෙටර්ස් විතරයි.. එයාලට ආමි ට්‍රේනින් එක දෙනවලුනෙ.. ඒ අස්සෙ ඉගනගන්නත් ඕන.. අයිලන්ඩ් රෑන්ක් එකකුත් දාලා කේ ඩී යූ යන මනුස්සයෙක් ගැන.. මම අහනවමයි.. එයාලගෙ අප්පච්චිට සිරාවටම පිස්සු..

@Shan

" ඔයා ජනවාරි වල යනවනෙ.."

මම පැන්සලෙන් පොතේ කුරුටු ගගා එයාගෙන් ඇහුවා..

" ම්ම්.. ජනවාරි වල පටන්ගන්නවනෙ.."

" ඉක්මනට ජනවාරි වෙයිද දන්නෙ නෑ නේද.."

" මේ අවුරුද්දත් පටන්ගෙන අද ඊයෙ වගේ.. ඕක අහන්නත් දෙයක්ද.."

මම ලොකු හුස්මක් අරගෙන ඒක හිමින් හිමින් පහළට දැම්මා.. හුස්මක් අරගෙන හුස්මත් එක්කම හිතේ තියන නමක් දන්නැති හැඟීමක් නැති වේදනාවත් දිය කරලා දාන්න පුලුවන් නම්..

" හැමදේම වෙන්න තියෙන විදියට සිද්ධ වෙනවා නේද.. මම ඒකට කැමති නෑ.."

රධ්‍ය අයියා හැමතිස්සෙම මගෙ ලගින් ඉන්නවා.. මම ඒක හැම තිස්සෙම කියනවා.. හිතනවා.. දැනෙනවා තමයි.. දැන් මම එයාව හැමතිස්සෙම බලාපොරොත්තු වෙනවා.. කොයිවෙලේ හරි එනවා කියලා හැඟීමක් මගේ හිතේ පැලපදියම් වෙලා තියනවා.. බලාපොරොත්තුවක් තියෙනවා.. මම ඒ හැඟීමට කැමතියි ඒත්..

ඒත් කැමත්තක් එක්කම කමැත්තකුත් දැනෙනවා.. මම ආයෙම තනියම ඉන්න විදිය, මට එයා නිසා අමතක වෙලා යනවා වගේ දැනෙනවා.. හිත හැමතිස්සෙම තව හිතකට වාරුවෙන්න හුරුවෙලා.. දැන් තනියම හිටගන්න හැටි මතක නැතිවෙගෙන යනවා..

මට දුකයි.. හිතේ එක මුල්ලක අවුස්සන්න ආස නැති මල්ලක් පුරෝලා දුක හිතෙන දේවල් ගොඩගහලා තියෙනවා.. මම ඒ දිහා බලන්නෙවත් නෑ.. ඉදලා හිටලා ඒ දිහා බැලුවත් මට ඇඬෙනවා.. මට බයයි.. දවසක ඕක ලිහලා බලන්න වුනොත් මට තේරෙන්නෙ නෑ එතනින් එහාට මොනවද කරන්න ඕන කියලා.. රධ්‍ය අයියා ගනන් වල හරි වැරදි බලන වෙලේ මම නැගිටලා ගෙට එන්න ආවා.. අම්මා කිව්වනෙ කෑම කන්න කියලා..

" අදට ඔය ඇති.. කන්න එන්න.."

@Shan

" මිම්.."

මම ගෙට දුවගෙන ඇවිල්ලා බාත්‍රෑම් එකේ සින්ක් එකෙන් මූණ සෝදගෙන සෝදගෙන ගියා.. මොන මගුලක් මට වෙලාද තේරෙන්නෙ නෑ.. මෙහෙම හැම ලබ්බටම මම අඩන්න පුරුදුවෙලා ඉදියෙ නෑ.. දැන් පොඩි දේකටත් ඇඩෙනවා.. හිත රිදෙනවා.. යකෝ!! මට මීට වඩා දේවල් වෙලා තියෙන එකෙක්.. මෙහෙම අඩන්න ඕන නෑ..

මම මගේ හිතටම බැන ගන්නවා දොස් කියනවා.. මේ මොන විකාරයක්ද කියලා.. ඇත්තටම මොකක්ද මේ විකාරෙ..??? මම දන්නෙ නෑ..

රධ්‍ය අයියා ගෙට ආවහම එයයි මමයි කෑම කෑවා.. එයා කෑමකද්දි වචනයක්වත් කතාකරන්නෙ නෑනෙ.. මම කතාකරන්න ගියෙත් නෑ.. අපේ අම්මා කුස්සියෙ පොල් කෙන්දක්වත් නැතිවෙන්න අස් කල්ලා නිසා මම පිගන් සෝදලා ඒ විදියටම තියලා සාලෙට එන්න ආවා.. දැන් හොදට තිබ්බ අහස මේ පැය බාගෙට වෙනස් වෙලා කළු වලාකුලු වලින් වහගෙන.. වහින්න වගේ.. මම ජනේලෙන් එබිලා වැලේ රෙදි තියද කියලා බැලුවා..

" පොද ගහනවා නේද.."

රධ්‍ය අයියා මගේ ළගින් හිටගෙන එළිය බලාගෙන ඇහුවා..

" ඒකතමා.. ඔයා යන්නෙ කොහොමද.."

" වැස්ස අඩු වුණාම යනවා.."

මම ජලෙන් උලුවස්සට හේත්තු වෙලා රධ්‍ය අයියා දිහා බැලුවා.. එයා තාම ඉදියේ පොද වැස්ස මහා වැස්සක් වෙන අහස දිහා බලාගෙන.. එයා හරි ලස්සනයි.. දිග ඇස් පිහාටු පියවෙන දිගෑරෙන විදිය බලන් ඉන්න ආස හිතෙනවා.. මම ඒ දිහා හුගක් බලාගෙන ඉදලා තිබුණත්, මම සැරින් සැරේ හිතලාම ඒවා අමතක කරගෙන ආයෙම මුල ඉදන්ම බලාගෙන ඉන්නවා..

" මොකද.."

" මොකුත් නෑ.. හෙට ඉස්කොලෙ යනවද.."

" යන්න ඕන නෙ.."

@Shan

" මමත් හෙට එනවා.. අයුක අයියට දැන් මොකද.."

" ඊයේ පාස්පෝට් එක හදාගන්න යනවා කිව්වා.. රෑ කතාකල්ලා අර ලෝන් එක ගැන ඇහුවා.."

" ඒකට මොකද දැන්.."

" ලෝන් එක නම් පාස් වෙව් ශුවර් එකටම.. ඊළගට එම්බසි යන්න ඕන කිව්වා.."

" එහෙමද.."

අයුක අයියා මැනේජ්මන්ඩ් ඩිග්‍රි එකකට ඔස්ට්‍රේලියා යන්න ප්ලෑන් කරගෙන ඉදියෙ.. විශේෂෙන්ම ඕක ඕන වුනේ සෙනුකයට.. සෙනුකයා කියලා කියලා කොටලා පොවලා තමා අන්තිමේ අයුක අයියව වඩේට කැමති කරවගත්තේ.. එහෙම හරි ඉතින් කැමති කරවගත්තු එක හොදයි..

" උඹට දුක සෙනුක ගැනද.."

රධ්‍ය අයියා අහද්දි මට කට කොනෙන් හිනා ගියා..

" සෙනුක ගැන දුක හිතෙන්නත් මම හොදින් ඉන්න එපැයි.."

" ඇයි.."

" මම හොදින් වගේ ඔයාට පේනවද.. මම හෙන සතුටින් ඉන්නවා.. හැමදේම වෙන්නෙ හුගක් හොදින්.. කිසි දුකක් නෑ.. එහෙම පේනවද.."

"....."

" මොකක්ද දෙයියනේ මේ වෙන්නෙ.. මට තේරෙන්නෙ නෑ.. මම ඒ ලෙවෙල් ලියාවි.. එතකල් ඔයා මාත් එක්ක ඉදීවි.. ඊටපස්සෙ..?? ඊටපස්සෙ මොකද වෙන්නෙ.. මම ක්ලබ් එකේ ප්ලේ කරන්න යාවි.. එතකොට ඔයා ඉන්නවද නෑනෙ.. මගේ රිසාල්ට්ස් ඒවි.. එතකොටවත් ඔයා නෑ.. ඊටපස්සෙ මම කැම්පස් යාවි.. අඩුම තරමෙ ඕවා වෙන්න කලින් එකම එක වතාවක් හරි ඔයා ඒවිද අයියෙ.. ඔයාට තාම මාව හොදින් වගේ පේනවද.."

"....."

@Shan

" කිසි දෙයක් හොඳින් වෙන්නෙ නෑ.. ඔයයි මමයි හොඳයි වගේ රගපානවා.. ඒකනෙ වෙන්නෙ.."

මම අත් දෙකෙන් මූණ වහගත්තම දැනුනා මගේ උරහිස් වටේ උනුහුම් අත් දෙකක් එතිලා මාව එයාට තුරුල් වෙනවා.. ඒ අත් වලට මැදිවෙලා ඉද්දි මට උනුහුමක් එක්ක පුදුමාකාර සැනසීමක් දැනෙනවා.. ආත්මාර්ථකාමී සතුටක් දැනෙනවා.. 'මට විතරනෙ' කියලා හිතෙනවා..

ආදරේ කියන්නෙ දෙන්නට දෙන්නා අතරෙ ඇතිවෙන ආත්මාර්ථකාමී සතුට,හැඟීම නෙමෙයිද..

" උඹ වගේම මම ,අපි වටේ තියන කිසි දෙයක් හොඳින් නෙමෙයි වරද්.. මම දන්නවා.. මම මොකක්ද කරන්නෙ.. උඹ ඔහොම කතාකරද්දි මගේ පපුව කකියනවා.."

රථ්‍ය අයියා මගේ සීතල වෙච්ච අතක් අරගෙන එයාගෙ පපුවට තද කරගත්තා.. මම එයාගෙ ශර්ට් එකම ගුලි කරගෙන පොඩි කරගත්තා..

" මොකුත් ඕන නෑ.. එක වතාවක් හරි එනවද.."

" එන්නම්.."

" කට වචනෙට නෙමේ නේද එන්නම් කිව්වෙ.. අනිවාරෙන්ම එනවා නේද.."

" මම කටවචනෙට මීට කලින් මොනවාහරි කියලා තියෙද.. මම්.."

" නැහැ.."

" මම එන්නම්.."

මම මගේ නිදහස් අත රථ්‍ය අයියගෙ ඉණ හරියෙන් දාලා තද කරලා බදාගත්තා.. එයාගෙ අත් මගේ පිට පුරාම දුවනවා.. හිමින් තාලෙකට වගේ.. වැස්ස මහ හයියෙන් ඇද හැලෙන නිසා එයාගෙ හුස්ම වල සද්දෙ මට දැනුනා විතරයි ඇහුනේ නෑ.. මට දවසක් කියාන් අයියා කියපු කතාවක් මතක් වුනා..

@Shan

'උඹ වගේ එකෙක් ළඟ තියාගෙන ඔහොම සිල් රකින එකම එකා රධ්‍ය වෙන්න ඇති..'

මම රධ්‍ය අයියගෙ පපුවෙන් නිකට තියාගෙන එයාගෙ ඇස් දිහා බලාගෙන ඉදියා.. එයාගෙ ඇස් වල හුගක් කතා තියෙනවා..

" ඔහොම බලන්න එපා.."

" කොහොම.."

" උඹ ඔහොම ඇස් වපර කල්ලා බැලුවහම-.."

" බැලුවහම?? මොකද.."

" මොකුත් නෑ.."

මම රධ්‍ය අයියගෙ බෙල්ල වටේ අත් යවලා ඇගිලි තුඩු වලින් ඉස්සිලා එයාගෙ කම්මුලෙන් හාද්දක් තිව්වා.. එයා නොහිතපු වෙලාවල් වල වෙන දෙන හාද්දකට කැමතී.. ඒ ඇරෙන්න මම දෙන ටොෆියකට පවා කැමතී.. එතකොට ඒ ඇස් දිලිසෙනවා.. රධ්‍ය අයියගෙ කම්මුල් රතු වෙලා කට කොනේ හිනාවක් ඇදිලා මැකිලා ගියා..

" උඹට නිකං ඉන්න බැරිද.."

මම හිනාවෙලා එයාගෙ ඇත් වෙන්න හදද්දි එයාම මාව ඇගට තුරුල් කල්ලා තද කරලා අල්ලගත්තා.. මට හෙල්ලෙන්නවත් විදියක් තිබුනේ නෑ.. ඒ තරමටම මගේ වටේ තිබුනු අත් දරදඩු වෙලා තිබුනා.. රධ්‍ය අයියා මගේ නළලට එයාගෙ නලල හේත්තු කරගෙන ඉදියා.. මගේ පපුව හිරි වැටීගෙන යනවා.. හයියෙන් -වේගෙන් හැගෙනවා.. එයාගෙ ඇගිලි තුඩු මගේ කම්මුල් වල තැනින් තැන වදිනවා.. කොනිත්තනවා වගේ.. වෙලාවකට ඇගිලි වලින් අවුස්සනවා..

" ඒ වුණාට සමහර වෙලාවල් වලට මට හිතෙනවා මම හොදින් කියලා..

සමහර වෙලාවල් වලට.."

අනේහ්!!!!!!!!!!! අයි මිස් යූ මගේ දළඹු හමුදාව.. අයියෝ අයියෝ මාව මිස් වුණාද කියන්ටකො..

@Shan

(උබර්ලට මිස් වෙන්නෙ මාව නෙමෙ රධ්‍ය අයියව කියලා මම දන්නවා.. ඉම්හි..)

කෝමහරි කමක් නෑ මම ආවා පුම්තේ!!! ආයෙම අප්ඩේටුවක් දෙන්නං..

සම්තුටු වෙන්න දෙයක් කියන්නත.. හැත්තෑවෙනි එපියට කලින් වරද් පුතා ඒ ලෙවෙල් ලියලා ඉවර කරනවා..

වරද් ඒ ලෙවෙල් ලියලා ඉවර කරනවා කියන්නෙ..

එන්නාම්.. ලව් යූ.. ❤

thermodynamics engineer : තාප ගති විද්‍යාව යනු යාන්ත්‍රික සහ රසායනික ඉංජිනේරු විද්‍යාව ඇතුළු ඉංජිනේරු අංශ කිහිපයක භාවිතා වන ව්‍යවහාරික විද්‍යාවකි. එහි සරලම දෙය නම්, තාප ගති විද්‍යාව යනු පද්ධතියක් හරහා ශක්තිය, එහි භාවිතය සහ පරිවර්තනය පිළිබඳ අධ්‍යයනයයි.. තාප ගති විද්‍යා ඉංජිනේරුවෙකු විවිධ නිෂ්පාදන හෝ පද්ධති සංවර්ධනය කිරීමට සහ වැඩිදියුණු කිරීමට තාප ගති විද්‍යා සංකල්ප පිළිබඳ ඔවුන්ගේ දැනුම යොදා ගනී..

( කමෙන්ට්ස් වලට රිප්ලයි කරන්න වෙලාවක් තිබ්බෙ නෑ ලමයිනේ.. ඉඩ ලැබුනු වහා කරන්නම්..සියලු දළඹුවෝ තේරුම්ගනිත්වා.. ආදරෙයි ඒස්වාහා පුඃ)

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම**

@Shan

කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 64 කොටස

" ඔව් ඉතින්.. උසස් පෙළ පටන්ගත්තු දවසේ ඉඳන් කළෙත් නටපු එකනෙ.. දැන් ඉතින් උසස් පෙළ කටේ හොර ලෙඩ අල්ලලා ඒක ඇජේට තියාගෙන කියාවි අගේට.. ලෙඩ නිසා විභාගෙ ෆේල් වුණා කියලා.."

" එහෙම නෙමෙයි අක්කෙ.. කොල්ලා මහන්සි වුණානෙ.. ඔය ගැස්ට්‍රයිටිස් වලට ඔහොම වෙන්නෙ.."

" අනේ මේ මම නොදන්න ඔකගෙ ලෙඩ.. මෙ නංගී.. උගේ අප්පා කළෙත් උඹව ගොනාට අන්දපු එක.. ඌ කරන්නෙත් ඒකම තමා.. මටනම් ඔය කාලකණ්ණියව දැහට-"

" අනේ අක්කෙ එහෙම-"

අපේ ගෙදරට ලොකු අම්මලා ඇවිත් හිටියා.. ලොකු අම්මලා කියන්නෙ ඉතින්.. ඒකගැන නම් කතාකල්ලා වැඩක් නෑ.. ඒ මිනිස්සුන්ට මම හව්මක් අරියත් වැරදියි තමා..

දැන් සතියක ඉඳලා මට බඩේ දැවිල්ල එක්ක වමනෙ යනවා.. ඉවරයක් නෑ.. බෙහෙත් බොන එකෙත් සීමාවක් නෑ.. ඩොක්ට කිව්වෙ උසස් පෙළ කාලෙට ළමයින්ට ඔහොම ලෙඩ හැදෙනවා කියලා මානසික පීඩනයට.. ගැස්ට්‍රයිටිස් වලට ස්ට්‍රෙස් එකත් බලපානවනෙ..

ඉතින් අද උදේ ලොකු අම්මලා අපේ ගෙදර ආවා අම්මව හම්බෙන්න ඕන කියලා.. මම දැක්කම ඉතින් එයාලගෙ ඇගේ මාළු නටනවලුනෙ.. එයාලා සාලෙ ඉද්දි මම කටත් අත් අත් දෙකින්ම වහගෙන කාමරේ ඉඳන් වොශෲම් එකට දිව්වා.. මට වමනෙ යන්න ආපු නිසා..

මම කෙල්ලෙක් වුණානම් කියයි මම බඩ වෙලා කියලා.. එහෙව් මිනිස්සු..

ඉතින් ලොකු අම්මා අම්මගෙන් ඇහුවා මට මොකක්ද වෙලා තියෙන්නෙ කියලා.. අම්මා කිව්ව සතියක ඉඳන් ඔහොමයි වමනෙ යනවා ඕලුව රදෙත් එක්ක අමාරුවෙන් ඉන්නෙ කියලා.. එක්සැම් එකට තිබ්බෙ හරියටම සතියයි.. මම ඉන්න ගින්දර දන්නෙ මම විතරයි..

@Shan

සිරාවටම මම පහුගිය කාලෙ මාර විදියට මහන්සි වුණා.. පාඩම් කලා.. රැයක් දවාලක් නැතුව.. අම්ම වුණත් දන්නවා.. මම තනියම මහ රෑ තුනට හතරටත් නැගිටගෙන ඉස්තෝප්පුවෙ කළුලැල්ලේ ගනන් හදනවා.. ඉස්කෝලෙවත් ගියේ නෑ.. පන්ති ගියා.. පේපර්ස් කලා.. කරපු පේපර්ස් ආයෙම කළා.. දවසට පෑනක් එහෙම් පිටින්ම ඉවර වෙනවා.. රධ්‍ය අයියත් එයාගෙ පොත් පේපර්ස් ට්‍රාන්ස්ලේට් කල්ල මට පීඩීඑෆ් කරනවා.. පිසික්ස් වගේ ඒවගෙ ගනන් හදන ලේසි ක්‍රම කියනවා.. ආධ්‍ය අයියත් කතාකල්ලා මට ලොකුවට ස්ට්‍රෙස් වෙන්න එපා හොදට නිදාගන්න කන්න බොන්න ඕවා මතක් කරනවා.. මොකක් වුණත් මට මාරම සපොට් එකක් රධ්‍ය අයියගෙන් ලැබුණා..

ඔය මනුස්සයට මම ණයයි සෑහෙන්න..

" අම්මෙ මං යන්නම්.."

ඩයජීන් පෙති කාඩ් එකක් සාක්කුවට ඔබාගෙන මම බොටමට ටීශර්ට් එකක් දාගෙන ගෙදරින් එළියට බැස්සා.. ලොකුඅම්මලා කැමති නෑනෙ මම ගෙදර ඉන්නවට..

මම ඇක්ස් ඔයිල් එක ඔලුව දෙපැත්තෙ අතුල්ල අතුල්ල ගේට් එක ඇරගෙන පාර දිහාට යද්දි කමනි ඇන්ටි මං දිහා නෝන්ඩියට බලාගෙන ඉදලා ගෙට ගියා..

යන්නෙ කොහෙද කියලවත් ඉතින් මට නිච්චියක් නෑ.. වෙනදටත් ඔහේ යනවා.. එක්කො ජොගින් පාත් එකක බංකුවක් උඩට වෙලා ඉදලා එනවා.. අදත් එහෙමයි.. විශේශෙකට තිබ්බෙ මගේ ඔලුව පැලෙන්න ආපු එක විතරයි..

අපේ ගෙදර ළාම තිබ්බ ජොගින් පාත් එකේ උදේට හෙන සෙනඟක් ඉන්නවා.. දුවන්න ඇවිත්.. මම සාක්කුවට අත් දෙකඟ් ඔබාගෙන ඒ දිහා බලාගෙන ඉදලා මොකක්ද කරන්නෙ කියලා හිත හිත හිටියා.. යනවද.. එනවද.. සෙනඟත් ඉන්නවා.. ඩෙග් දෙකවත් දාගෙන ආවෙ නෑ.. ඔකෙ ගිහින් චාටර් වෙන්න බැරි නිසා මම හැරිලා බස් හෝල්ට් එකටවත් යන්න හිතාගෙන එන්න ආවා.. සාක්කුවෙ ඔබාගත්තෙත් පන්සීයෙ කොළයක් විතරයි.. මං ගාව සල්ලිත් ලොකුවට නෑ.. යන්නෙ කොහෙද දන්නෙත් නෑ.. යන්න තැනකුත් නෑ..

@Shan

මම එනගමන් ජොගින් පාත් එකට යන තැන හරහට දාලා තිබ්බ පාලම ගාව නැවතිලා අත් වැටට අත් දෙක තියාගෙන පහළ ගලාගෙන යන වතුර පාර දිහා බලාගෙන ඉදියා.. මට මගේම රූපේ වතුරට එබීගෙන ඉන්නවා ජේනවා.. හෙන අසරණයා වගේ.. දැක්කහම මටම හිනායනවා..

මම සෑහෙන්න වෙලාවක් වතුර අලාගෙන යන දිහා බලාගෙන ඉදියා.. ඔලුව පැලෙන්න කකියද්දිම මම අවුවෙ හිටගෙන ඉන්නවා.. බඩ දැවිල්ලයි අම්බානෙක.. මට ගෙදර යන්න ඕන.. වමනෙ දදා හරි පාඩම් කරන්න ඕන.. මට මේ වෙලේ දැනෙනවා මම ඉගනගන්න කොච්චර ඕනද කියලා.. හීන හැබෑකරගන්න එක කොච්චර වටිනවද කියලා.. මෙහෙම අනාථයා වගේ වැනි වැනි ඉදලා හරියන්නෙ නෑ.. මම මොකද කරන්නෙ.. මම ඇස් දෙක හීනි කරගෙන වතුරෙ පීනගෙන යන මාලුවො දිහා බලාගෙන ඉදියා..

පැය බාගයක්ම මම පාලමක් උඩට වෙලා හිටගෙන ඉන්නවා.. ලොකු අම්මලා දවසම ඉදීවි.. මට ඒ එක්කම කෝල් එකක් ආවා..

'අම්මා..'

මම ෆෝන් එක ආන්සර් කල්ලා කනේ තියාගත්තා..

" හලෝ අම්මෙ.."

" සුදුමහත්තයා කොහේද උඹ ගියේ කොල්ලො.."

අම්මා රහසින් වගේ කතාකරනවා මට ඇහුනා.. ලොකු අම්මලා ගෙදර ඇති සමහරවිට..

" ආ අම්මෙ මම මේ පුස්තකාලෙට ආවා.."

" උඹ පාඩම් කරනවද.."

" ඔව් අම්මෙ.. මෙතන කෝල් කරන්න බෑ.. පස්සෙ ගන්නම්.."

මම කෝල් එක කට් කල්ලා ෆෝන් එක සාක්කුවට ඔබාගත්තා.. කමක් නෑ තව පැය පොඩ්ඩනෙ.. ඉවසන් ඉදපන් වරද්.. ඔක ඇරිලා යයි..

මම සාක්කුවෙන් ඩයජින් පෙත්තක් අරගෙන කටට දාගත්තා.. පාලම උඩ ඉදලා එපාවෙලා මම සාක්කුවට අත් දෙක ඔබාගෙන ඔහේ පාර දිගේ පිස්සා

@Shan

වගේ ඇවිදගෙ ගියා.. කොහෙද මම යන්නෙ.. මම දන්නෙත් නෑ.. මම පාරෙ ටික දුරක් ඉස්සරහට ඇවිදගෙන යද්දි ආයෙම ෆෝන් එක වයිබ්‍රේට් වෙන්න ගත්තා..

" වරද්.. පාඩම් කරනව නේද.."

කතාකලේ රධ්‍ය අයියා.. මම ෆොන් එක පොඩ්ඩක් එහාට කල්ලා උගුර පාදගෙන ආයෙම ෆෝන් එක කනේ තියාගත්තා..

" ඔව් මේ.. කරනගමන් ඉදියෙ.."

" කෑම කාලද ඉන්නෙ.."

" ඔව් කාලා ඉ-ඉන්නෙ.."

" මම කලින් ගත්තා කෝල් එකක්.. ෆෝන් එක බිසී තිබුණේ.. සෙනුකද කතාකලේ.."

" අ.. ඔව් සෙනුක කතාකලා පාඩමක් අහගන්න.. ඔයා මොකද කලේ.."

" මම ටවුන් යන්න කියලා.. රෙක්සිගෙයි කියාරාගෙයි බෙහෙත් වගයක් ඉවරවෙලා.. අරගන්න ඕන.."

" එහෙමද.."

මම ෆෝන් එක කනේ ගහගෙන බිම බලාගෙන දිගටම ඇවිදගෙන ගියා.. පාරේ වාහන ගොඩයි.. මාව පහුකරගෙන යනවා..

" පොඩ්ඩක් ඉදපන්.. ඔහොම.. කොහෙද ඔය වාහන සද්දයක් එන්නෙ.. වරද්!!! කොහෙද ඉන්නෙ.."

රධ්‍ය අයියා කේන්තියෙන් අහද්දි මට මතක් වුනේ.. එයා ගෙදර ඉදීද් කෝල් ගත්තට කිසි සද්දයක් ඇහෙන්නෙ නෑනෙ.. ගෙවල් තියෙන්නෙ පාර අද්දර නෙමෙයිනෙ.. ඇතට වෙන්නනෙ.. ඉතින් පාරෙ ඉද්දී එයාට වෙනස තේරෙන්න ඇති..

" පොඩ්ඩක් එළියට ආවා.."

@Shan

" දැන් ටිකකට කලින් කිව්ව නේද ගෙදර පාඩම් කරනවා කියලා.."

" ආ ඔව්.. පාඩම් කලා.."

" මගෙන් කුණුහර්ප නාහා ඉන්න තැන කියපන්.. කොයි ලෝකෙද කියලා.. කෝල් ගන්න්නවා ගන්නවා ආන්සර් කරන්නෙ නෑ.. උඹ කාටද බොරු කියන්නෙ.."

" දන්නෙ නෑ මම ඇවිදිනවා.. ජොගින් පාත් එක හරියෙ.."

" එහෙ ගියේ මොකකටද.."

" ඇවිදින්න.."

" ඒ ලෙවෙල්වලට සතියක් තියාගෙන උඹට ජොගින් යන්නද ඕන වුණේ.."

" නෑ ඇවිදින්න කිව්වෙ.. ඉ-ඉතින් මට වෙන යන්න තැනක් තිබ්බෙ නෑ.."

" වරද්.. මොකක් හරි ප්‍රශ්නයක්ද.. මොකක්ද වුනේ.. ඔහොම ඉන්න.. විනාඩි පහලොවෙන් මම එනවා.. ඉන්න තැනක ඔහොමම ඉඳපන්.. හරිද.."

" ම්ම.."

මම ඒ ළග තිබ්බ බස් හෝල්ට් එකේ බංකුවකින් වාඩිවෙලා ඔලුව බිමට නමාගෙන ඉදියා.. මට හුරුයි මෙහෙම ඉදලා.. එච්චර ගානක් නෑ.. ඔලුව කැක්කුම නොතිබ්බනම් හවස් වෙනකල් ඉන්නවත් තිබ්බා.. මම කලින් දැනන් ඉදියෙ නැනෙ ඒගොල්ලො ගෙදර එනවා කියලා.. අපේ අම්මවත් කිව්වනම් මට සෙනුකයගෙ ගෙදර හරි මහීශගෙ ගෙදර හරි යන්න තිබ්බා..

විනාඩි විස්සකින් විහර රධ්‍ය අයියගෙ කාර් එක බස් හොල්ට් එක ගාවින් නැවැත්තුවා.. බස් හෝල්ට් එකේ මිනිස්සු ඉදියෙ නෑ මම විතරයි ඉඳගෙන ඉදියේ.. රධ්‍ය අයියා කාර් එකෙන් බැහැලා මං ගාවට එන්න කලින් මම ගිහින් වාහනේට නැග්ගා.. රධ්‍ය අයියා ඉදියෙ පුපුර පුපුර වගේ.. පුදුම කේන්තියකින්.. මට හිතුනා කාර් එකේදිම කන පුරෝලා එකක් ගහයිද කියලත්.. මම බිම බලගෙනම ඉදියා.. එයා කාර් එක ස්ටාර්ට් කලෙත් නෑ.. ගියෙත් නෑ..

" දැන් බිම බලාගෙන හිටියම හරිද.."

@Shan

රධ්‍ය අයියා කේන්තියෙන් වුනත් හිතලාම නිවිච්ච කටහඬින් කතාකලා..

" මිම්.. කතාකරන්න වරද්!!!"

" මොක??? මම-ටිකක් එළියට ආවා.. කියන්න අමතක වුණා.."

" ඒකද වුණේ.. මම අම්මට කෝල් එකක් ගන්නවා වරද්!! ප්ලීස් මම උඹ නිසා මෙහෙම ඉවසන්නෙ.. මොකක්ද වුනේ කියපන්.."

" අපේ ගෙදර ලොකු අම්මලා ඇවිත්.. ඒගොල්ලො මට කැමති නෑ.."

" ඉතින්.."

" ඉතින් මම අම්මට කියලා ආවා.. ඒගොල්ලො ගියාම ආයෙ ගෙදර යනවා.."

"....."

" මට බැනුම් අහන්න බෑ.."

මම ශර්ට් එකේ නූලක් අතින් ඇද ඇද එයාට ඇත්ත කිව්වා.. ලැජ්ජයි තමා.. මොකක් කරන්නද.. ලැජ්ජයි කියලා මැරෙන්නද.. නැත්නම් මෙතන මැරුම් කන්නද..

" අම්මා එන්න දුන්නද.."

" ඕ.. මම වෙනදත් එනවා.."

" මට කෝල් එකක් ගන්න බැරිවුනාද.. මිම්.."

" කෝල් එකක් කියන්නෙ ඉතින්-අනේ මන්දා.. මතක් වුණේ නැනෙ.."

මම බිම බලාගෙනම උත්තර දුන්නා.. කෝල් එකක් දෙන්න තිබ්බා.. ඒ වුණාට හැම මගුලටම රධ්‍ය අයියටම වද දෙන එක හරිද..

" ගෙදර යමුකො.. මම අහගන්න.."

රධ්‍ය අයියා මගේ දිහා බලලා දෙකක් රවලා ඩ්‍රයිව් කරගෙන එයාලගෙ ගෙදර ගියා.. කියාරා ඉන්නවද දන්නෙ නෑ.. ආධ්‍ය අයියත් හිටියොත්

@Shan

හොඳයි.. රධ්‍ය අයියා එනකල් මාත් එක්ක වචනයක්වත් කතාකලේ නෑ.. කතාකළත් මට කියන්න මොකුත් මතක්වුණෙත් නෑ.. මම ඉතින් ඔහෙ එබිම බලාගෙන ඉදියා.. මට මහන්සී.. අඩුම තරමෙ මම බස් හෝල්ට් එකක නොඉද ගේක ඉන්න යන එක ගැන මට සතුටුවෙන්න පුලුවන් කමක් තිබුනා..

" බහින්න.."

රධ්‍ය අයියා මට බහින්න කියාගෙනම වාහනෙන් බැහැලා පිටිපස්සෙ සීට් එකේ තිබ්බ මොනවද බෑග් වගයක් අරගත්තා.. මම වාහනෙන් බැහැලා ගෙට ඇවිදගෙන යද්දි ආධ්‍ය අයියා පුරුදු විදියටම සෝෆා එකේ ඉදගෙන කණ්ණාඩිදෙකත් දාගෙන පොතක් කියවනවා.. මම දැක්කා විතරයි කණ්ණාඩි දෙක පන්නලා පොත උඩින් තියලා නැගිට්ටා..

" මෙන්න එක්කෙනෙක්ට මෙහෙ මතක්වෙලා.."

" අනේ යන්න.. මට අයියව මතක් වුණා.."

මම ගිහින් ආධ්‍ය අයියා ගාවින් ඉදගත්තම අයියත් මං ගාවින් ඉදගත්තා.. මම ඉතින් පිස්සා වගේනෙ ආවෙ..

" ඇදිලා ගිහිල්ලා වගේ.. බලන්නකො.. අසනීපෙන්ද ඉන්නෙ.."

" ගැස්ට්‍රයිටිස්.."

" බෙහෙත් ගත්තද.. මම අහන්න ඉදියෙ.. කොහෙද අමතක වුණානෙ මේ ටිකේ ඔන්කෝල් වැටිලා වැඩ වැඩිවුනානෙ.. කෑවද ඔයා.."

" ඔව්.. බෙහෙතුත් බිව්වා.. කෑමත් කෑවා.. අඩුවක් නෑ අනේ ඒ වුනාට.."

" ස්ට්‍රෙස් නිසා වෙන්න ඇති එහෙනම්.. දැන් ඔය පාඩම් කලා මදැයි.. පොඩ්ඩක් රෙස්ට් එකේ ඉන්න.. ඒකනෙමේ.. මොකක් හරි අවුලක්ද.. මූණ හරිනෑ වගේනෙ.. අපේ එකා මොකක් හරි හිත රිදෙන දෙයක් කිව්වද.."

" රධ්‍ය අයියද.. පිස්සුද අනේ.. එහෙම එකක් නෙමේ.."

" එහෙනම්.. මේ මේ මූණ දිහා බලන් කතාකරපන් මල්ලී.."

@Shan

" ඇයි අයියෝ.. ඇත්ත කියන්නෙ.. අර හැපීකවවා මට බයින්නෑ එහෙම.."

" ම්ම්.. ගෙදර අවුලක්ද.. වෙනදා චණ්ඩ මාරුතය වගේ හමාගෙන එන එකා මද පවන වගේ හමාගෙන ආපු එකනම් මට අල්ලන්නෙ නෑ හැබැයි.."

" ගෙදර අවුලක්නම් තමා.. අපේ ගෙදරට කට්ටියක් ඇවිත්.. හරි හිසරදේ.. මම එච්චර ආස නෑ.. මම ඉතින් ආවා එන්න ගෙයින් එළියට බැහැලා.."

" හරි චණ්ඩි වැඩක් කල්ලා කියලා හිතේ ඇත්තෙ.. නේ.."

" එහෙම නෑ අනේ.."

" දෙන්න තියෙන්නෙ ඔලුව හිල්වෙන්න.. යකෝ එහෙමත් බැහැලා එනවද.. අපේ එකාටවත් කතාකරන්න එපැයි.."

" මම ක-අපෝ ඔන්න එනවා.."

රධ්‍ය අයියා මං දිහා මරාගෙන කන්න වගේ ගෙට ඇවිදගෙන ඇවිත් අර පාර්සල් ටික ආධ්‍ය අයියගෙ අතට දුන්නා.. මම ඔලුවත් නමාගෙන සෝෆා එකට හේත්තු වෙලා අත් දෙක දිහා බලාගෙන ඉදියා..

" අම්මපා දෙනවා මම උඹට!!"

රධ්‍ය අයියා මට ගහන්න වගේ අත උස්සලා ආයෙම පහළ දැම්මා..

" ආ.. පොඩී පාඩුවේ ඉන්නවා.."

" පාඩුවෙ ඉන්න කියන්නෙ.. මෙකට කියලා වැඩක් නෑ අයියේ.. දැන් මම කෝල් එකක් අරගෙන බලෙන්ම අහගන්නකල් කිව්වෙ නෑ කොයි ලෝකෙද ඉන්නෙ කියලා.. මුලින් කිව්වෙ ගෙදර පාඩම් කරනවා කියලා.."

" ආ ඉතින් ඕක මහලොකු දෙයක්ද.. දැන් චූටියා ගෙදර ආවනෙ.. මම බොන්න මොනවහරි හදාගෙන එන්නම්.. ඔය දෙන්නා කතාකරනකො.. පොඩී කැගහලා මෙතන දෙක කරන්න ලැස්තිවෙන්නෙ නෑ!!"

ආධ්‍ය අයියා රධ්‍ය අයියටත් ඇගිල්ල දික් කරගෙන කුස්සිය පැත්තට ගියාම රධ්‍ය අයියා සිවිලිම දිහා බලාගෙන හොද හුස්මක් පහළට දාලා මං ගාවින් ඉදගත්තා..

@Shan

" වරද්.."

" ම්ම්.."

" මොකක්ද වුණේ.. මට කියන්න බැරි දේවලුත් තියෙනවද.."

" නෑ නෑ එහෙම නෙමේ.. අපේ ගෙදර ලොකු අම්මලා ආවා උදේ.. මම අර කියලා තියෙන්නෙ.. ඒගොල්ලො මට කැමති නෑ කියලා.. උදේ මට වොමිට් වුණා ගොඩක්.. ඒක දැකලා කිව්වා මම බොරුවට ලෙඩ වෙලා එක්සෑම් ෆේල් වුනාම ඒක ඇපේට තියාගෙන කියයිලු.. නටනවා වැඩිලු.. ඉතින් අපි ඉන්නෙත් එයාලගෙ ගෙදරකනෙ.. මට බැනුම් අහගෙන ඉන්න හිතුනෙ නෑ.. ඒකට ඔලුව රිදෙන එක වැඩි වෙනවා.."

" උඹ නැටුවහම උන්ට අමාරුද ඔච්චරටම.. අනික වරද් ඔහොම එනවද හිතුනු හිතුනු දිහා ආ.. උඹට මොකක් හරි ප්‍රශ්නයක් නම් එක කෝල් එකක්නෙ ගන්න තියෙන්නෙ.. මට බෑ කියමු.. උඹ අපේ අයියට එකතුයිනෙ.. එහෙමවත් ගනන් තිබ්බනෙ.."

" මම කලින් එහෙම එනවා.. එච්චර ගානක් නෑ.. අනික හැමතිස්සෙම ඔයාට කි-"

" ඔකනෙ උඹත් එක්ක බැරි.. මෙ දෙවෙනි වතාව වරද්.. උඹ උඹට ප්‍රශ්නයක් වුනාම පිස්සා වගේ ඔහේ හිතෙන හිතෙන දේ කරනවා.. යකෝ!! මම මැරිලා නෑ.. කොයි ලෝකෙ හරි ඉදලා එනවා උඹට ඕනනම්.."

" එච්චර හිතුවෙ නෑ.."

" හිත රිදෙනවා වරද්.. උඹ මෙ කරන දේවල් වලට.."

"....."

" උඹ කියන ඒවා අහලා මම කෝල් එක කට් කලානම් උඹ තාම පාරෙ.."

"....."

" මම ආයෙම අහන්නෙ, උඹට ගානක් නැද්ද උඹ ගැන වදවෙන එකෙක් ඉන්නවා.. උෟට මෙවට හිත රිදෙනවා කියලවත්.. ම්ම්.."

@Shan

රඨ්‍ය අයියා කේන්තියක් නැතුව හරි හීමින් කතාකරද්දි මෙච්චරවෙලාම දුක හිතුනත් ඇඩුනෙ නැති මට, මගේ ඇස් වල කඳුලු කැට කෙවෙනවා දැනුනා..

" එ-එහෙම නැහැ.. ගානක් නැත්තෙ නැහැ.. මට පුරුද්දට-"

" නාඩා ඉදපන්.."

එයා අඩන්න එපා කියද්දි මට ඉකි ගැහිලම ඇඩුනා.. අනේ එයාටවත් තේරෙන්නෙ නැද්ද.. මට හිතෙන්නෙ මොනවද කියලා.. එයාව අමතක වුණා නෙමෙයි.. සිය දහස් වාරයක් මතක් වුණා.. ඒත් මනුස්සයෙක්ට වදයක් වෙන එකේ සීමාවක් තියෙනවා.. මේ වගේ සීරියස් ප්‍රශ්නවලට මට එයාව ඇදගන්න උවමනාවක් තිබුනෙ නෑ.. මම අත් දෙක එකට ගුලි කරගෙනම අත් දෙක දිහා බලාගෙන ඉදියා..

" වරද්.."

රඨ්‍ය අයියා කතාකලත් මම ඔලුව උස්සලා බැලුවෙ නෑ.. ඔලුව කැක්කුමත් වැඩි වෙනවා අඩලා.. අනික එයා ආයෙම බනීද කියලා මට හිතට බයයි..

" වරද්.. මෙහෙ බලන්න.."

" මම.."

" ඔලුව උස්සලා මගේ දිහා බලන්න වරද්.."

මම ඇස් දෙකේ අගිස්සෙ කඳුලු ටික වැටෙන්න දෙන්නෙ නැතුව එකතු කරගෙන එයා දිහා ඔලුව උස්සලා බැලුවහම එයාගෙ මූණෙ තිබ්බෙ කේන්ති පෙනුම පොඩ්ඩක් අඩුවෙලා ගියා..

" ඇ-ඇයි.."

රඨ්‍ය අයියා මං ගාවට ඇවිත් මාව එයාගෙ උරහිසට වාරු කරගෙන තද කල්ලා අල්ලගත්තා..

" හරි හරි නාඩා ඉදපන්.. මම බයවුණා.. උඹ බොරු කියද්දි.. ආයෙ කැගහන්නෙ නෑ.. දැන් අඩලා ඔලුවරදේ වැඩිවෙයි.."

@Shan

මම රධ්‍ය අයියගෙ ශර්ට් එක මගේ වම් අතට ගුලි කරගෙන එයාගෙ උරහිසට මූණ තද කරගෙන ඇස් දෙක පියාගෙන ඉදියා.. අඩන්න එපා කිව්වට.. මට ඇඩෙනවා.. මම මං ගැනම මතක් කරගෙන දුක් වෙවී අඩනවා.. මට මැවිලා පේනවා පාලමේ වතුරෙන් පෙනුනු අසරනකමින් පිරුනු මාවම.. ඒක කොච්චර හීනායන පෙනුමක්ද කියලා මතක් වෙද්දි මට සමච්චලයක් එක්ක එකතුවුනු දුකක් දැනෙනවා.. මේවා කොහොමද මම තව කෙනෙක්ට කියන්නෙ.. මම දන්නෙ නෑ.. හිතේ ඇතිවෙන හැම හැගීමක්ම වචන කරන්න බෑ.. සමහර ඒවා දැනෙනවා විතරයි.. කියන්න වචනයක් හොයාගන්න බෑ..

" දැන් ඉවරයි වරද්.. ඒක වෙලා ඉවරයි.. මොකුත් වුනේ නැනෙ.. අඩන්න එපා.."

රධ්‍ය අයියා මගේ පිට දිහට අතගාද්දි මම අඩන්නෙ නැතුව ඉන්න ට්‍රයි කලා.. ඒ වුණාට එහෙම කියද්දි තව තව ඇඩෙනවා..

" ම-මට ආච්චිඅම්මව ඕන.."

මම ආච්චිඅම්මා ගැන කියද්දි රධ්‍ය අයියා මගේ කොන්ඩෙ අස්සෙන් ඇඟිලි යවලා අතගෑවා..

" ආච්චිඅම්මව බලන්න පුලුවන් දැන් සතියකින් එක්සෑම් ඉවර වුණාම.. අද හොදට රෙස්ට් කරමු.. ඊටපස්සෙ ආයෙම පාඩම් කරන්න පුලුවන් නෙ.."

" මම එක්සෑම් ෆේල් වෙයිද අයියෙ.."

" පිස්සුද.. එක්සෑම් ෆේල් වෙන්නද ඔච්චර නැහීගෙන පාඩම් කලේ.. එක එක පිස්සු හත්තලාමවල් කියන ඒවා ඔලුවට දාගන්න එපා වරද්.. උඹ මෙඩිකල් කොලේජ් යනවා.. මොකා මොනව කිව්වත්.."

" ම්ම්.."

" සැක් බං.. අපේ ඉස්කෝලෙ හෙඩ් ප්‍රිෆෙක්ට් වෙන්න ඉන්න එකා නේද මේ හොටු පෙරාගෙන අඩන්නෙ.. ලැජ්ජයි වරද්.. මොකද මේ.."

" අනේ පලයං ගෙම්බා.. තවුසෙට මාව විහිලුවක්ද.."

@Shan

මම රධ්‍ය අයියගෙ බෙල්ල පහුරුගාලා එතන රතුපාට ඉරි තුනක් හැදුවා..

" උඹ ඉතින් පහුරුගාපන්.. දන්නෙ එච්චරනෙ.."

රධ්‍ය අයියා කතාකරද්දි මට දැනුනා සෝෆා එකේ එහාපැත්ත බරවෙනවා..

" අපිටත් බැයිද දන්නෑ ඉල්ලගන්න.. පොඩ්ඩක් හුරුතල් කල්ලා රිටර්න් කරන්න.."

මම රධ්‍ය අයියගෙ ශර්ට් එකේ කදූලුයි හ්ට්‍රුයි සේරම පිහිදගෙන මොකුත් නොවුණ එකා ගානට මූණ කෙලින් කරගෙන සෝෆා එකට හේත්තු වුණා..

" අපෝ ඔයාට පුලුවන්.."

" මට පුලුවන් තමා.. ඒ වුණාට මගේ එකකුස උපන් සහෝදරයා ඒකට ආස නැද්ද කොහෙද.."

" ඉරිසියාව අයියෙ.."

" ඔව් මුගෙ පැලියාව.. ඔලුව රිදෙනවා කිව්වා නේද.. මම කිරි එකක් නිමලා ගෙනාවා.. අයි වී එකක් දෙන්නද පොඩ්ඩක් නිදාගන්න.."

" ම්ම්.. මොකක් හරි කමක් නෑ මේ ඔලුව කැක්කුම අඩුවෙන ඕන එකක්.."

" පොඩ්ඩක් ඉන්නකො මම සිරින්ජර් එකක් අරන් එන්නම්.."

ආධ්‍ය අයියා මගේ ඔලුවත් අතගාගෙන උඩට ගියා..මම කිරි එක අරගෙන ඒක බීලා ස්ටූල් එක උඩින් තිබ්බා.. කන්නවත් වුනේ නෑ අර මිනිස්සු ඇවිත් නාඩගමක් නැටුවනෙ.. මගේ බඩත් දනවා හොදටම.. මම සෝෆා එකට හේත්තුවෙලා ඉදියා..

" වොශ් දාලා නිදාගන්න.. මම කියාරා ගෙනැල්ලා දෙන්නද.."

" හා!!!!!!!!!!!!!!!"

" උඹට ඒවට ලෙඩ නෑ.."

@Shan

රධ්‍ය අයියා මට ටොක්කක් ඇනගෙන එළියට ගිහින් කුඩුව අරින සද්දයක් මට ඇහුනා.. ඒ වෙලේ ආධ්‍ය අයියා මට අයිවි එකක් දීලා උඩට ගිහින් වොශ් දාගෙන එන්න කිව්වා කෑම කන්න.. මම ගිහින් රධ්‍ය අයියගෙ ශර්ට් එකකුයි ශෝට් එකකුයි හොයාගෙන වොශෲම් එකට ගිහින් ඔලුවේ ඉදන්ම නාගෙන කාලා බීලා කියාරා එක්ක ඇදට ඇවිත් හාන්සිවෙලා ඉදියා.. වැකේශන් එකකට හොටෙල් එකකට ඇවිත් වගේ ෆීලින් එකක් දැනෙන්නෙ.. කියාරා උදේ නාලා.. එයා ගාව හරී~ම සනීපයි.. සුවදයි.. මම අත් දෙකෙන්ම එයාව බදාගත්තහම එයා හොම්බ මගේ බෙල්ලෙ ඇතිල්ලුවා..

රධ්‍ය අයියා නාගන්න ගිහින් දැන් පැයක් විතර වෙනවා නානවා නානවා ඉවරයක් නෑ.. මූ දියවෙලා වැක්කෙරිලා කාණුව දිගේ යයි කියලා මට හිතෙනවා.. ඒ එක්කම මට මැවිලා පෙනුනා රධ්‍ය අයියා අර ලොකු පස්සත් වන වන නනා ඉද්දි ඉටිපන්දමක් වගේ දියවෙලා හේදිලා ගිහින් කාණුව දිගේ ගලාගෙන යනවා..

හරි පව්..

ඊටපස්සෙ මම ආධ්‍ය අයියව බදිනවා..

නෙමෙයි.. එහෙම හිතුවෙ බොරුවට.. ආධ්‍ය අයියා හොදයි මස්සිනා කමට.. ඒ වුණාට ස්වාමිපුරුශයා.. අහ්ම්.. මම කිව්වෙ බෝයිෆ්‍රෙන්ඩ් විදියට මම බලාපොරොත්තු වෙන්නෙ මේ නැට්ට ගිනිගත්තු ගැටපොලොස් කොට්ටෝරුවවනෙ..

" click "

වොශෲම් එකේ දොර ඇරෙන සද්දෙ ඇහුණා විතරයි මෙච්චරවෙලා මගේ බෙල්ල ලෙවකකා ඉදිය කියාරා ටක් ගාලා ඇද කොනට ගිහින් එතන ලැගලා දිවත් එලියට දාගෙන හොද කෙල්ල වගේ ඔලුව පිහිදදා ආපු රධ්‍ය අයියා දිහා බලාගෙන ඉදියා.. මේ කෙම්ලට මක් වෙලාද..

" කියාරා.. එන්නකෝ.."

මම අත් දෙක දික් කල්ලා කියාරාට එන්න කිව්වත් මෙකි මං දිහා බලලා ආයෙම ඉස්සරහා බලාගන්නා.. යකෝ කපෙපෙකම..මෙච්චරවෙලා හුරුතල් වෙන්න හොදයි.. බලූ වැඩ පුරුදුවෙලා කියාරා..

@Shan

" කියාරා එළියටම~"

" අනේ.."

" අනේ පනේ නෙමෙ කියාරා ළග තියන් නිදාගන්නෙ නෑ.. මේ මාසෙට මගේ තුන්වෙනි කොට්ටෙ.. මෙයා හපලා දාලා.. ඕන්නම් රෙක්සිව ගෙනැත් දෙන්නම්.."

" අනේ තියාගන්නවා.. මට ඕන්නෑ.."

මම කොට්ටෙකුත් බදාගෙන අනිත් පැත්ත හැරිලා ඇස් දෙක පියාගෙන ඉදියා ටික වෙලාවක්..

රධ්‍ය අයියා බැල්කනි එකේ දොර වහලා ඒසී එක ඔන කරගෙන රිමෝට් එකකුත් අරගෙන ඇදට ආවා.. මම ඒ එක්කම ඇස් දෙක පියාගත්තා..

" ඔක්කොම තියලා රහපාන්න යමං.."

රධ්‍ය අයියා හොදට අතිබ්බ මගේ පස්සට කකුලෙන් ගහලා සීට් එකක් අරගෙන මගේ ඇගට දැම්මා.. ඊටපස්සෙ ඇඳ කෙලින් තිබ්බ ටීවී එකේ මොකක් හරි දාලා ඒක බලන්න ගත්තා..

"

**In 1895**

,

**after his wife Martha was killed by an angry human mob, Count Dracula commissions and builds a massive monsters-only hotel in Transylvania, in which he raises his daughter, Mavis**

.."

හුරුපුරුදු ඉන්ට්‍රො එකක් යද්දි මම ලාවට එක ඇහැක් ඇරලා ටීවී එක දිහා බැලුවා.. දෙයියනේ හොටෙල් ට්‍රාන්සිල්වේනියා එකේ පළවෙනි මූවී එක.. මම කොට්ටෙත් හපාගෙන ඒක දිහා බලාගෙන ඉදියා.. මම ආසම ඇනිමේශන් මූවී එකක්.. කොච්චර බැලුවත් එපාවෙන්නෙ නෑ.. පපා ඩ්‍රැක්

@Shan

ජොනීට මුලින් අකමැති වෙලා පස්සෙ මේවිස්ට බන්දලා දෙන හැටි.. එතකොට අර ජොනී මේවිස්ව කිස් කරන්න යද්දි එයා හැමදේම එකපාර නවත්තන හැටි එතකොට අර වැලි හාදයා ඇවිත් මුලු හෝල් එකම ගදගස්සන එක ඒ ඔක්කොම මට එක කොටසක් නැරම මතකයි.. ඒ සේරටමත් වඩා මම ඒකට ආසම මේවිස්ට හඩකවන්නෙ සෙලිනා ගෝමස් නිසා.. මගේ පොඩිකාලෙ ක්‍රශ් එක.. රමෝනා ඇන්ඩ් ද බීසස් එකේ බීසස්..

මම කොට්ටෙ හපාගෙන ට්‍රාන්සිල්වේනියා හොටෙල් එකේ මොන්ස්ටර්ලව අඳුනවලා දෙන කැල්ල බ් අලන ගමන් ලාවට ඇහැ කරකලා රධ්‍ය අයියා දිහා බැලුවා.. ඒකාත් රිමෝට් එක හපාගෙන ටීවී එක දිහා බලාගෙන ඉන්නවා.. මම පොඩ්ඩක් විතර රධ්‍ය අයියට කිට්ටු කලා..

" මෙහ් ඔයා මේකට ආසයිද.."

" ඔව් මම මේක පොඩි කාලෙ ඉදන් බලනවා.. මගෙ ආසම එක.."

" මගෙත්~"

මම තා පොඩ්ඩක් රධ්‍ය අයියගෙ ගාවට කිට්ටු වෙලා අතට හේත්තුවක් දාගත්තා.. අපරාදෙ රස්නෙ අහක යනවනෙ..

" මොකද හොරගල් අහුලන්නෙ.."

" මොන ගල්ද.. පිස්සුද.. මම මේ බැලුවෙ.. නිකන්.."

" ම්ම්.."

මම රධ්‍ය අයියට දෙකක් රවලා කොට්ටෙත් බදාගෙන ටීවී එක දිහා බලාගෙන ඉදියා.. මට දැනෙනවා බ්ලැන්කි එක අස්සෙන් මගේ කොට්ටෙ ඇදිලා යනවා.. මම තව ටිකක් ඒක තදකල්ලා බදාගත්තා.. ඒත් ඒක ඇදිලා යනවා.. අත් දෙක අස්සෙන්.. මම ශේප් එකේ රධ්‍ය අයියා දිහා බැලුවහම ඒකා ඔහේ ටීවී එක දිහා බලාගෙන ඉන්නවා.. මම ආයෙම කොට්ටෙ හොදට තුරුල් කරගත්තම මට පෙනුනා රධ්‍ය අයියා කොට්ටෙට රවනවා.. මූට කොට්ටෙ එක්ක ඉරිසියා හිතිලද.. එහෙම අප්‍රාණික වස්තූන් කෙරෙහි ඉරිසියාව වගේ ඒවා දැනෙන්න පුලුවන්ද.. මම දන්නෙ නෑනෙ.. කියන්න බෑ රධ්‍ය අයියා මනුස්සයෙක් නෙමේ නිසා එහෙම දැනෙනවද දන්නෙ නෑ..

@Shan

මම ආයෙම කොට්ටෙ බදාගෙන ටීවී එක බල බ් අල ඉද්දි කොටෙ බොහ් ගාලා අත් දෙක අස්සෙන් ලිස්සලා ගියා.. මම ඒක අතගාලා අතගාආ හොයන්න ගියත් අතට අහුවුනේ නෑ..

" කෝ මගෙ කොට්ටෙ.."

" මොන??"

" අනේ මම කඩ්ල් කරගෙන ඉදපු කොට්ටෙ.. ඒකනෑ.."

රධ්‍ය අයියා මම කියන ඒවා ගානක් නැතුව ටීවී එක දිහා බලාගෙන ඉදියා.. ඊටපස්සෙ ටිකකින් ටීවී එක ඕෆ් කල්ලා දාලා කොට්ටෙන් හරියට ඔලුව තියාගෙන මගේ පැත්ත හැරුණා..

" උඹට කඩ්ල් කරන්න ඒ කොට්ටෙම ඕනද.. යකෝ!! මෙච්චර ළඟ වෙන්ඩ බෝයිෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්නවා.. පොඩ්ඩක් අහන්න බැරිද Can you cuddle me? කියලා.."

" ආස ඇති.."

" ආස නැතුව..  තව සතියකින් උඹ මගේ බෝයිෆ්‍රෙන්ඩ් වෙනවා.. These days my self-confidence has increased.."

" දැන් මම කෝකද අහන්න ඕන.. Can you cuddle me? කියලද.."

" ම්ම්.."

" Can you cuddle me හැපීකච්චො.."

මම 'ඇම් සෝ ඩන් විත් දිස් මැන්' මූනකින් ඇහුවත් රධ්‍ය අයියා පැනපු ගමන් තඩි කෝලා කෙනෙක් වගේ මාව බදාගෙන එයාගෙ ඇග උඩුන් තියාගත්තා.. මට ලැජ්ජ හිතුනු නිසා මම පොඩ්ඩක් දගලලා දගලලා එහාටවෙන්න හැදුවත් මට හෙල්ලෙන්නවත් විදියක් හිබ්බෙ නෑ..

" Anytime you need a cuddle, I'm here.."

මම රධ්‍ය අයියගෙ වීසි සයිඩ් එක දකින්න කණ කැස්බෑවා අර මොකක්ද එකෙන් අහස බලනවා වගේ හරිම කලාතුරකින් එන දවසක තමා.. එහෙම

@Shan

වුණාමත් ආදරේ හිතෙනවා ඉතින්.. හැමදාම නැනෙ..

" මම බරයි.. එහායින් තියන්න මාව.."

" අනේ නිකන් ඉදපං.. කන්නෙත් නෑ හරියට බොන්නෙත් නෑ හරියට.. බරයිලු.. ඔව් ඔව් මහමෙර දරාගෙන ඉන්නෙ මම මේ.."

මම රධ්‍ය අයියගෙ වාවාල කට අත් දෙකෙන්ම අල්ලලා වැහුවා.. එනවා මෙතන නොමනා විහිලු කරන්න..

" ඇපෝ කට වහගන්නවා.."

" කීයටද මිස්ටර් වරද් ෂනෙරු උද්යෝගට ගෙදර යන්න ඕන.."

" හවස් වෙලා.. ලොකු අම්මලා ගියහම.."

" I will drop you.. It is my pleasure My lord.."

රධ්‍ය අයියා ඩ්‍රැමටිකලි මගේ අතක් කිස් කල්ලා කිව්ව විදියෙන් මට හිනා ගියා.. අද මක් වෙලාද.. උදේ යකා වෙලා දැන් එනවා හුරුතල් වෙන්න..

" ලොකු අම්මලට බම්බුවක් අරන් ගහන්න කියන්න.. දැන් My lord ගෙදර ගිහින් කාලා බීලා ආයෙම පාඩම් කරන්න ඕන.. සතියයි එක්සැම් පටන් ගන්නවනෙ.. Your Knight will always be with you.."

" මම දන්නවා.."

මම රධ්‍ය අයියගේ පපුව උඩින් මූන තියාගත්තහම එයා මගේ හිස් මුදුනින් හාදුවක් තිබ්බා මට දැනුනා..

" ආයෙ මෙ වගේ පිස්සු වැඩ කලොත්නම් හම ගහනවා තේරුණාද.. උඹ ඉස්සර තනිවෙලා ඉදියට දැන් එහෙම නැනෙ.. "

" මම්.. ඔයත් මගෙන් ආයෙම අහන්න එපා ගානක් නැද්ද කියලා.. මට ඒකට හෙනට දුක හිතුණා.."

" ඉතින් කරන වැඩවලට එහෙම නාහා කොහොම අහන්නද.. හරි හරි අහන්නෙ නෑ.. නොකර ඉදපියකො.. ඉවරනෙ.."

@Shan

"මම.."

මම ඇස් දෙක පියාගෙන ඉදියා.. එයාගෙ පපුව ගැහෙන සද්දෙ ඒ ලා නිල් පාට දුහුල් ශර්ට් එක අස්සෙන් මට ඇහෙනවා.. මම බලැන්කට් එක අස්සට ගුලි වෙලා රධ්‍ය අයියගෙ පපුවට කම්මුලක් තියාගෙන ඒක අහගෙන ඉදියා.. එයා මාවත් තුරුලු කරන ඇස් පියාගෙන ඉන්නවා.. හුස්ම හිමිහිට උඩට පහලට යනවා.. මටත් ඒ එක්කම නිදිමතක් ගලාගෙන ආවත් න්න්ද යන්න කලින් මම රධ්‍ය අයියගෙ පපුව මැද්දෙන් හාදුවක් තිව්වා..

එයා දවසක් කිව්වා වගේ හෝම් ෆීලින් එකක් මටත් දැනෙන්න අරගෙන වගේ.. මට දැනෙනවා..

මම ආවා පුතේ.. බෙඩ් ටී එක ගෙනාවා.. බීලා දාස පටන්ගන්ඩෝ~

මෙ ළමයා හරී ආදරෙයිනෙ ඔගොල්ලොන්ට.. උම්ම්ම්ම්ම්ම්ම්ම්ම්වහ්

එන්නාම් ලව් යූ.. ❤

උබර්ලා මොනවද හිතුවෙ.. යසෙ යසෙ බේසික කෙල්ලෙ/කොල්ලො

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 65 කොටස

"..හන්තානට පායන හඳ

ලස්සනයිද කියන්න

මා නොදකින ඒ පුර හඳ

ඔබට හැකිය දකින්න

ලතා මඬුලු අත වනාවි

එපා අහක බලන්න

මා ගැන මතකය ගුලි කර

මහවැලියට දමන්න.."

මමයි රධ්‍ය අයියයි ඉදියේ හවස හය හමාරට විතර අපේ ගෙදර යන ගමන්.. හීනියට පොද වැස්සක් යනවා.. මේ ටිකේ කොහොමත් වැස්ස.. මට පැය ගානක් හොදහැටි නින්ද ගියා ආධ්‍ය අයියගෙ අයි වී එකයි රධ්‍ය අයියගෙ රස්නෙයි රස්නෙ බ්ලැන්කට් එකයි නිසා.. දැන් ඉතින් ආයෙම ගෙදර යනවා.. කාර් එකේ රේඩියෝ චැනල් එකක අමරසිරි පීරිස්ගෙ සිංදුවක් ප්ලේ වෙන ගමන් තිබුණා.. රධ්‍ය අයියා ඒක ලාවට ඇහෙන නැහෙන ගානට මුමුණ මුමුණ ස්ටියරින් වීල් එකට ඇඟිලි වලින් තට්ටු කරනවා.. මම ශටර් එකෙන් එළිය බලාගෙන ආවා..

" මේ වරද්.."

" ම්ම්.."

" ලතා මඬුලු අත වැනුවොත් උඹ මොකද කරන්නෙ.."

" ඈ..?? ඒ මොකටද අත වනන්නෙ.."

" මම කියනෙ මේ සිංදුව ගැන බං.. මොකද කරන්නෙ.."

@Shan

" අහක බලන්න එපා.. එහෙමද?? ඒකනෙ සිංදුවෙ කියන්නෙ.."

" දැන් උඹ අමරසිරි පීරිස් කිව්ව නිසා ලතා මඩුලු දිහා බල බල යනවද.."

" මොනවද අනේ කියන්නෙ.. මට තේරෙන්නෑ හරියට.."

" ලතා මඩුලු අත වැනුවොත්.. උඹ අහක බලාගෙන පලයන්.."

" හා.. එතකොට මතකය ගුලි කල්ලා මහවැලියට දාන කෑල්ල.."

" උඹ මහවැලි ගඟට පැනපං.. එතකොට මතකෙ නැතිවෙලා යයි.."

" හා.. ඔයා කියන එකක් තමා.."

මම රඩ්‍ය අයියගෙ හරිම හාස්‍යජනක විහිලුවට මද සිනාවක් පාලා සීට් එකට හේත්තු වුණා.. මම ආස පේරාදෙණියෙ කැම්පස් යන්න.. ඒ වුණාට රඩ්‍ය අයියා කියන්නෙ කොළඹ කැම්පස් යන්න කියලා.. එයාගෙ අයියත් කොළඹ කැම්පස් එකේලු ඉගනගත්තෙ..

" දැන් උඹ තා අවුරුදු හතකින් විතර ඩොකෙක් නෙ.."

" එහෙමයි කියලා අපි හිතමුකො.."

" හිත හිත ඉන්නෙ මොනවද.. එහෙම තමා.."

" හරි ඉතින්.."

" ඊටපස්සෙ අවුරුදු හතකින් දවසක් එනවා උඹලගෙ ෆැකලටියෙ බඩ තඩි ඩීන් රෝල් කරපු කොල මිටියක් අතේ තියාගෙන උඹලගෙ ෆැකල්ටියෙ බිල්ඩින් එකේ බැල්කනියට එන.."

" ඊටපස්සෙ.."

" ඊටපස්සෙ ඩීන් බැල්කනියට ඇවිත් අර අතේ තියන කොළ රෝල පහළට විසික් කරනවා.. පුලුවන් නම් කියපන් මොකක්ද ඒ රෝල ඇතුළේ තියෙන්නෙ කියලා.."

" මම.. මොකක්ද.. මම දන්නෙ නෑ.."

@Shan

" ඒ කොළ රෝල ඇතුලේ තියෙන්නෙ උඹලගෙ ෆයිනල් ඉයර් රිසාල්ට්ස්.. එතන උඹෙ නමත් තියෙයි.. ඊටපස්සෙ ඉතින් උඹ රජයේ පත්වීමක් තියන ඩොකෙක් තමා.."

" ආධ්‍ය අයියා වගේද.."

" ඕ ඒවගේ තමා.."

" ඉතින් ඇයි ඩීන් කොළ රෝල පහළට විසික් කරන්නෙ.."

" ඒක කැම්පස් එකේ සම්ප්‍රදාය.. එහෙම තමා ඩීන් ෆයිනල් ඉයර් ස්ටුඩන්ට්ස්ලගෙ රිසාල්ට්ස් දෙන්නෙ.."

" මරුනෙ.."

" ඒකතමා කියන්නෙ.. කැම්පස් එක කියන්නෙ වෙනම ලෝකයක්.. මම ආසයි උඹ කැම්පස් ටීශර්ට් එකක් ඇදගෙන ඇවිත් මාව හම්බෙනවා දකින්න.. අර නිල් පාට කිට් එක ඇදගෙන ක්ලිනිකල් යනවා බලන්න.. ස්ටෙත් එක සාක්කුවෙ දාගෙන මෙඩිකල් කෝට් එක ඇදගෙන වෝඩ් රවුන්ඩ් යනවා බලන්න.. තව ඉතිං.. කොච්චර තියද බං.."

" මම්ම්.."

" කොහොම හරි මෙඩිසින් යන්න ඕන වරද්.. අම්මගෙ හිතට සැනසීමක් දියන්.. අම්මට අද වුණත් උඹව නවත්තගන්න බැරිවුණේ අම්මට වෙන කරන්න දෙයක් නෑ.. උඹ පොඩි එකෙක් නෙමෙ.. දැන් අවුරුදු විස්සකට කිට්ටුනෙ.. තේරෙනවනෙ.."

" මම්.. තේරෙනවා.."

රධ්‍ය අයියා වෙනදා වගේ නෙමෙ අද හුගක් කතාකරනවා කියලා මට දැනුනා.. මම එක්සෑම් නාගත්තොත් මම කී දෙනෙක්ගෙ හිත් රිද්දාවිද හිතාගන්න බෑ.. අම්මගෙ ආච්චිඅම්මගෙ මාමගෙ රධ්‍ය අයියගෙ ආධ්‍ය අයියගෙ කීදෙනෙක්ගෙද.. ඊටත් වඩා අපේ එහා ගෙදර ඇන්ටි ඉන්නෙම මගේ රිසාල්ට්ස් අවුට් වෙනකල්.. මට හිනාවෙන්න.. මම ඉදියේ බෙල්ල ගාවටම හිරවෙලා.. එයා කියනවා මම කැම්පස් යනවා දකින්න ආසලු.. ඒත් එයාට යන්න විදියක් නෑ.. අපිට අගේට දෙන්නටම රජයේ කැම්පස් වල

@Shan

ඉගනගන්න තිබුනා.. එහෙම වුණානම් කොච්චර හොදද.. හැමදේම ඕනවටත් වඩා හොඳින් වෙන්න තිබ්ලත් කිසිම දෙයක් හොදට සිද්ධ වුණේ නැනෙ..

" ඔයත් හිටියනම්.."

" මම්?? මම ඉතින් ඉන්නවනෙ.."

රධ්‍ය අයියා අත දික් කල්ලා මගේ කොණ්ඩෙ අවුල් කලා.. එයා බොරුවට මට පේන්න හොඳින් ඉදියට ඉන්නෙ හිතේ අමාරුවෙන් වග මම දනවා.. ඉදලා හිටලා එයා ඕවා මාත් එක්ක කියනවා.. එයාට කියන්න වෙන කවුරුත්ම නැනෙ..මටත් ඉදියේ එයා විතරයි.. එයාටත් අයියා ඇරෙන්න හැමදේම කියන්න ඉදියේ මම විතරයි..

" දැන් උදේ වුණු මගුල් ආයෙ හිත හිත ඉන්නෙ නෑ.. ගියා කාලා බීලා පාඩම් කලා නිදාගත්තා.. එච්චරයි.. තේරුණාද.."

" ඕ.."

" අනික මොකක් හරි උවමනාවක් නම් මට කෝල් එකක් දීපන්.. මම ගෙදරනෙ ඉන්නෙ.. මට බැරිනම් අපේ අයියට.. උඹ ඉතින් වැඩිපුර කැමති අපේ අයියටනෙ.."

රධ්‍ය අයියා කට ඇද කරගෙන ඒක කියපු විදිය දැකලා මට හිනාගියා..

" නෑ අනේ මම දෙන්නටමනෙ කැමති.. මම කිව්වෙ.."

" එකගෙයි කන්නද.."

" ඕ.. හොඳ නැද්ද.."

" උඹ වගේ එකෙක් එක්ක අපේ අයියා දවසක් ඉදියොත් පහුවදා මහණ වෙන්න යයි.."

" ඒ මොකද ඒ.."

" මේ බලපන් මගේ බෙල්ල.. මෙහෙම උන් එක්ක මිනිස්සු ඉදීද.."

@Shan

රඨ්‍ය අයියා ශර්ට් එකේ කොලර් එක මෑත් කල්ලා නියපොතු පාරවල් තුනක් පෙන්නුවා..

" ඒක සුලු අතපසුවීමක් ඒයි.. මම ඒ අයිතිය තහවුරු කල්ලා තියෙන්නෙ.."

" එහෙමද.."

" ඕ.. නැත්තම හරි නෑනෙ.."

මම රඨ්‍ය අයියා පව් කිසා බෙල්ල පොඩ්ඩක් අතගාලා බැලුවා..
පොඩ්ඩයිනෙ සීරිලා තියෙන්නෙ..

" මේ පව්කාරයට සමාවෙන්න සුදුඅම්මියෝ~"

මම කියාන් අයියගෙ වොයිස් එකෙන් කතාකලා විතරයි රඨ්‍ය අයියා හැරිලා මං දිහා උඩ ඉඳන් පල්ලෙහාට බලලා දෙකක් රැව්වා..

" ඕක නවත්තගනින්.."

" මගේ හිතේ තියන මේ නමක් නොදන්න පිවිතුරු හැඟීම එහෙම නවත්තගන්න බෑනෙ රත්තරං.. ඔයා දන්නවනෙ.. මගෙ සුදුඅම්මියො.. මෙහෙම ගින්දරක් දෙන්නෙ මොන හිතකින්ද ඔයා.."

" ඒයියා බං.. මොන මගුලක්ද.."

" මගේ පපුව හත් කඩකට පැලිලා ගිහින් දෑසම පලාගෙන කඳුලු එනවා..මේ බලන්න  සුදුඅම්මියෝ.."

" මට කියලා කනත් පලාගන්නැතුව ඉඳපන්.."

" ඔයා නම් කියයි..මම එපෑ මෙවා දරාගෙන ඉන්න.. සුදුඅම්මියා හරි නරකයි.."

"....."

" නරක සමනලයා.."

" වරද්!!"

@Shan

" ඕ.. කියන්න සුදුඅම්මියො.."

" ඔය ලබ්බෙ නම කියන එක නවත්තගනින්.. මගේ ඇගත් එක්ක හිරිවැටිලා යනවා.. උබලට පිස්සුද බං.."

" උන්මාද වූ ප්‍රේමාදරේ..~ආදරේ කියන්නෙ පිස්සුවක් තමයි රත්තරං.. මම සතියකින් පස්සෙ ඔයාට කියලා දෙන්නම්කො.."

" ආදරේ පිස්සුවක් වෙලා පිස්සෙක්ට ආදරේ කරන්න ගත්තහම.. ආර්හ් මගේ ඔලුව.."

රධ්‍ය අයියා මොකක් හරි කුටු කුටු ගගා ඔලුව දෙපැත්ත අතගාගත්තා.. මම ඉන්නකොට තමා හැම තිස්සෙම ඔලුව අතගාගන්නෙ.. මම හිසරදයක්ද දන්නෑ..

" මොකක්ද කිව්වෙ.. ඇහුනෙ නෑනෙ.."

" ආ?? මම මොකුත් කිව්වද.. නෑ ඔයාට ඇහුණ හැටි වෙන්න ඇති.. මම මේ සිංදුව කිව්වෙ..

ඉටි රූපෙ අපූරුව විඳින්න මන් හරි ආසයි

පින්තූරෙ වගේ ඔබ හිනැහෙනකොට මට ලෝබයි

අහිතක් හිතන්නෙ නැති නම් මන් හරි ආදරෙයි

කියාගන්න බැරි කමින් හිත බරයි

ඊයේ අද මෙන් හෙටත් එහෙම වෙයි

හුදෙකලාව අවනඩුවක්... පිරිමි ළමයෝ

ඔබ ඇපල් මලක් වාගේ

ලස්සන වසන්ත කාලේ

මට හදිස්සියෙන් වාගේ හමු වූ.."

@Shan

රධ්‍ය අයියා සිංදුවක් කිය කිය හෙන ආතල් එකේ ඩ්‍රයිව් කලේ.. මම කකුල් දෙකත් සීට් එක උඩට අරගෙන දෙපැත්තට වැනි වැනී ගෙදර ආවා.. ගෙදර මිදුලේ උදේ තිබ්බ මොන්ටෙරෝස්පෝට් එක නෑ.. ලොකු අම්මලා ගිහින් වගේ.. මට හෙන සතුටු හිතුනා.. මායාකාර කුඩම්මා පියාඹලා ගිහිල්ලා.. මම සීට් බෙල්ට් එක ගලවලා සෙරෙප්පු දෙක දාගත්තා..

" ඔයා එනවද ගෙදරට යන්න.."

" අම්මා ඉන්නවද.."

" ඔ.. යමු.."

" මම.. හා.."

රධ්‍ය අයියා කාර් එකෙන් බැහැලා මට පිටිපස්සෙන් ගෙට ඇවිදගෙන ආවා.. අපේ අම්මා ගේට්ටුව අරින සද්දෙටද කොහෙද ඉස්තෝප්පුවට ඇවිදගෙන ආවා.. අම්මගෙ ඇස් දෙක රතුම රතු වෙලා.. අඩලා වෙන්න ඇති.. ලොකු අම්මලා ඇවිත් කියලා යන කතාවලට ඉතින් අම්මට ඇඩෙන්න ඇති.. ඕවා පුරුදුයි.. මට කරන්න දෙයක් නෑ.. අම්මගෙ අක්කනෙ.. ඒ මිනිස්සු හැමදාම කලේ අම්මා අවුරුදු විස්සකට කලින් කළපු දේවල් මතක් කර කර අම්මගෙ හිත පාරවන එකයි බනින එකයිනෙ.. අඩුම තරමෙ තමන්ගෙ නංගිට ජීවිතේ එකලාසයක් කරගන්නවත් එක දශමෙකින් උදව් කරන මිනිස්සු නෙමෙ.. ඒත් මෙ ඉන්න ගෙදර ඒගොල්ලොන්ගෙ නිසා හැමදේම ඉවස දරාගෙනම් ඉදියා..

" සුදුමහත්තයා.. කොහෙද කොල්ලො ඉදියෙ.. මම කොච්චර කෝල් කලාද.."

අම්මා මං ගාවට එන්න කිට්ටු කරද්දි මම අම්මා එක්ක හිනාවෙලා අඩියක් පිටිපස්සට තිබ්බා..

" අම්මා.. වරද් අපේ ගෙදර හිටියේ.. පාඩම් කළා.."

" අනේ මේ දරුවට.. වදේ නේද.. ගෙදර ඇත්තටම පොඩි-"

" එහෙම වදයක් නෑ අම්මා.. වරද් අද කොහොමත් එන්න හිටියේ.. නේද වරද්.."

@Shan

" ම්ම්.. ඔව් අම්මෙ.."

" එහෙනම් මම යනවා අම්මා.. වරද්ට පාඩම් කරන්න තියෙනවනෙ.. මෙ පොඩි වෙලාවත් වටිනවනෙ නේද.."

" පුතා යනවද ආපු ගමන්ම.."

"ඔව් අම්මා අයියා හොස්පිට්ල් යන්න කලින් මම ගෙදර ඉන්න ඕන.. මම යන්නම්.."

රධ්‍ය අයියා අපේ අම්මට වැඳලා මගේ පිටට තට්ටුවක් දාලා යන්නම් කිව්වා..

" පාඩම් කරන්න.. රෑට කතාකරන්නම්.."

රධ්‍ය අයියා අම්මට නැහෙන්න කියාගෙනම යන්න ගියා.. අම්මා රධ්‍ය අයියා දිහා බලාගෙන ඉඳලා අයියා ගේට්ටුවෙන් එළියට ගියාම මගේ පැත්ත හැරුණා..

" සුදුමහත්තයා කාලද.."

" ම්ම්.. කෑවා.. මම කාමරේට යනවා අම්මෙ.."

මම එතන වැඩිවෙලා නොඉඳ කාමරේට යන්න හැදුවත් අම්මා මගේ අතින් අල්ලගත්තා..

" ලොකු අම්මා ඇහුවා කවුද අර දරුවා කියලා.."

ඒ වචන වලට  මගේ හිත ගැස්සුනත් මම ඒක නොපෙන්නම අම්මා දිහා බැලුවා..

" රධ්‍ය අයියවද.."

" ඔව්.. ඔච්චර උදවු කරන්න ඒ ළමයා කවුද ඇහුවා.. ඔච්චර ළඟින් දන්නෙ.."

" රධ්‍ය අයියා විතරයැ.. සෙනුක මහීශා හැමෝම ඔහොමනෙ.. අම්මා මොකද කිව්වෙ.."

@Shan

" මම කිව්වා යාලුවෙක් කියලා.. ඒ දරුවා කොච්චර උදවු කල්ලා තියෙනවද.. අනික ඉතින් ඔයාලා හොඳ යාලුවො නෙ.. නේද.."

" ම්ම්.. එහෙම තමා.. මම යනවා.. අම්මා කාලා නිදාගන්න.."

මම කාමරේට ඇවිත් දොර අඩවල් කල්ලා වැහුවා.. අනේ ලොකු අම්මට බම්බු ගහන්න කියලා තම අකියන්න තියෙන්නෙ.. හැම ලබ්බම හොයන්න එනවා.. පුදුම කරුමයක් තමා..

රෑට එන්නම් ලමයිනේ.. ඕතරීගෙ පූස් කෙල්ලෙක් තාම ගෙදර ඇවිල්ලා නෑ.. මේ බේසික කෙල්ල හොයන්න යන්න ඕන.. බායිබායි..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 66 කොටස

" දෙයියන්ගෙ පිහිටෙන් මයෙ කොල්ලා විභාගෙ හොදට ලියලා වරෙන්.. උඹට වරදින්න විදියක් නෑ.. මම දන්නවනෙ.. මගෙ කොල්ලා කොහොම හරි ගොඩ යනවා.. තෙරුවන් සරණයි රත්තරනේ.."

" හරි ආච්චිඅම්මෙ.. මම ගිහින් එන්නම් හොදේ.. බුදුසරණයි.. ආදරෙයෝ..~"

මම උදේම ආච්චිඅම්මගෙන් ආපු කෝල් එකට ආන්සර් කල්ලා ආච්චිඅම්මගෙ ආදරේ පිරුණු කටහඬ අහුවා.. අවුරුදු දහතුනක් ඉස්කෝලෙ ගිහින් අදින් පස්සෙ මම ඉස්කෝලෙ ඉගනගන්න එකෙක් නෙමෙයි වෙනවනෙ.. ආයෙම මටම කියලා පන්තියක් නෑ.. මුල්ම දවසේ තිබුනේ බයෝ එම් සී කිව්.. ඒකටනම් හිතේ බයක් තිබ්බෙ නෑ.. මට ශුවර් එකක් තිබ්බා බයෝ නම් ලොකු අවුලක් නෑ කියලා.. තර්ඩ් ටර්ම් ටෙස්ට් එකෙයි අනාවරණ පරීක්ශනෙයි දෙකේම මට ඔක්කොම සබ්ජෙක්ට්ස් වලට හැත්තෑවෙන් උඩ තිබ්බා.. ඒකම කොච්චර දෙයක්ද.. බයෝ වලටත් අසූ පහක් තිබුණා.. අපේ ක්ලාස් එකේ මැඩම් කිව්වේ අන්තිම පේරන්ට්ස් මීටින් එකේ ෂනෙරුට බාහිර වැඩ නොතිබ්බනම් මීට වඩා හොඳ ළකුනකට වුනත් යන්න තිබ්බා කියලනෙ.. අනේ මෙ මැඩම් දන්න තරම තමා.. මට මෙහෙම හොදයි..

ඒ එක්කම 'ටිං' ගාලා ෆෝන් එකට මැසේජ් එකක් ආවා..

මාමා : උඹ ඒ තුනක් අරං නාවොත් පුතේ ලැස්තිවෙලා ඉදපන් අල්ලපු ගෙදර කෙල්ලව කසාද බඳින්න.. අම්මපා උඹව බන්දලමයි මේ මාමා පස්ස බලන්නෙ.. බී එස්..

Adhya : Prayers and good thoughts are coming your way..

Get 'em, tiger!!!

Rdhya (DGC) : ඉස්කෝලෙ කලර්ස් නයිට් එකේ වැඩ වගේකට මම ඉස්කෝලෙ බී බ්ලොක් එකට එනවා.. විනාඩි පහකට බුදුමැදුර ගාවට එනවද..

@Shan

මම ෆෝන් එක ඕෆ් කල්ලා පුටුසෙටිය උඩට දාලා බෑග් එක ආයෙමත් හරිද බලලා එළියට බැස්සා.. අපේ අම්මා සුදු පාට පිච්චමල් මල් දාපු වතුර එකකුත් අතේ තියාගෙන දොරකොඩ ගාව හිටගෙන ඉදියා..මම ගිහින් අම්මට වැන්දා..

" බුදුසරණයි සුදුමහත්තයො.. හොදට විභාගෙ ලියන්න.."

" හොදමයි.. මේ මම මේක බොන්න ඕනද.."

" ඔව් ඉතින් පොඩ්ඩක් විතර.."

" මේකෙ මල් නෙ අප්පා.. කොහොමද බොන්නෙ.."

" සුදුමහත්තයා!!!!"

අපේ අම්මා කේන්තියෙන් රතු වෙන හැටි සාමකාමීව බලාගෙන ඉදපු මම වතුරත් බීලා අම්මගෙ නළලටත් හාදුවක් දීගෙනම එළියට බැහැලා එන්න ආවා.. අපේ ලේන් එකේ තව උසස් පෙළ ලියන ඩයල් එකක් ඉන්නවා ටිකක් එහායින්.. ඒකා හැබැයි අපේ ඉස්කෝලෙ නෙමේ.. මම දන්න කියන එකෙක්.. ක්ලාස් එහෙම යන්න සෙට් වෙනවා ඉදලා හිටලා.. ඌ හැමදාම ක්ලාස් එන්නෙ පැය බාගයක් විතර පරක්කුවෙලා.. නිවීසැනසිල්ලෙ.. කාලාබීලා.. එහෙම එකෙක්.. උගේ ඉස්කෝලෙ ගේට්ටුවෙ විතරයි ලොකුවට ගහලා තියෙන්නෙ 'අප්පමාදෝ අමතපදං' කියලා.. අද ඉතිං මම යද්දි ඌත් මගින් මට සෙට් වුණා.. ඒකා කලේ කොමස්..

මම උදේ හයයි හතලිස්පහට ඉස්කෝලෙට ගිහින් මම ඉන්න හෝල් එක හොයාගත්තා.. ඉස්කෝලෙ විභාග මධ්‍යස්ථාන කල්ලා තියෙන්නෙ පහළ හෝල් විතරයි.. උඩ, ඉස්කෝලෙ කලර්ස් නයිට් එකේ වැඩ වලට කට්ටිය ඇවිල්ලා නවරහහල ගාව ඉන්නවා..

මම හිටියේ හෝල් ටූ එකේ.. ඒ කියන්නෙ හත වසරෙ ක්ලාස් තිබ්බ හරියෙ කොනේම පංතියෙ ෆෑන් එක යටම පුටුවෙ.. සෙනුකයා හිටියේ පහළ පංතියෙ..

මට පොඩි කාලෙ ඉදන්ම ඉස්කෝලෙ ඇවිත් අන්තිම මොහොත වෙනකල් පොත අතේ තියාගෙන, හෙන හයියෙන් පාඩම් කර කර, පාඩම් කරපු උන් එක්ක ආගිච් කර කර, ඔක එහෙම නෙමේ මෙහෙම කිය කිය ඉදපු

@Shan

පුරුද්දක් නෑ.. එහෙම ඉස්කෝලෙ ඇවිත් අන්තිම මොහොතේ මට පාඩම් කලා කියලා මෙලෝ මගුලක් ඔලුවට යන්නෙනෑ.. අනික ඉතින් බයෝ මට ලොකු ශුවර් එකක් තියෙන සබ්ජෙක්ට් එකනෙ..

මම පහළට ගිහින් සෙනුකයා එක්ක කතාකලා.. ඌ නම් පොත්ගුල්ලා.. ශාලාධිපති මෙතන ඇවිත් අඩබෙරග ගහනකල්ම පොත අතේ තියාගෙන ඒක මූණෙ අලවන් ඉන්නෙ.. මේ ටිකේ පාඩම් කල්ලාම උගේ ඇස් යටත් කළුවෙලා සොම්බියා වගේ.. මම ඉතින් යාලුවා ගැන කිව්වට මගෙත් එහෙම තමා මූණ තිබ්බෙ.. ලස්සන නම් ඉතින් කවදා වෙන්න බැරිද.. අනික ඉතින් ලොකුකමට කියනවා නෙමේ.. අපි ඇවිල්ලා කොහොමත් ලස්සන මිනිස්සුනෙ.. අහ්ම්~

මම සෙනුකයා ගාවින් ශේප් එකේ ලිස්සලා උඩට දුවගෙන ආවා.. ශාලාධිපතිලා ආවහම එළියට යන්න දෙන්නෙ නෑනෙ.. ඒ වුණාට වෙන්ඩ බෝයිෆ්‍රෙන්ඩ් හම්බෙලා විශ් එක අරගන්න එපැයි නැත්නම් හරි නෑනෙ..

රධ්‍ය අයියනම් මෙ දවස්වල මට හිත රිදෙන්න හව්මක්වත් යවන්නෙ නෑ.. උපාසක පූසා වගේ මම කියන ඕනදේකට 'හා හුම්' කියලා පාඩුවෙ ඉදියා.. හරියටම එක්සෑම් ඉවරවෙන්න සති දෙකක් යනවා.. ඒ වුණාට අපිට ඉතින් මුල් සති එකහමාරෙන් ඉවරයිනෙ.. විද්‍යා විශය ධාරාවන් මුලින් ඉවරවෙනවා කියලනෙ කියලා තිබ්බෙ.. කොහොම වුනත් පොදු පරීක්ශෙනත් තිබ්බහම තමා හිතට සැටිස් විදියට සම්පූර්නෙන්ම එක්සෑම් ඉවරවෙන්නෙ..

රධ්‍ය අයියගෙ අප්පච්චි එනවා කිව්වා අනිද්දා.. ඉතින් එයාට ගෙදරින් එළියට එන්න විදියක් නැති නිසා අදින් පස්සෙ අපි ආයෙම හම්බෙන්නෙ කලර්ස් නයිට් එකේදි තමා.. මට කලර්ස් තියෙනව හැම අවුරුද්දෙම වගේ.. මෙ පාරත් එහෙමයි.. පොදු පරීක්ශනේ ඉවරවෙන දවසෙම රෑ කලර්ස් නයිට් තියෙන්නෙ.. එදාට රධ්‍ය අයියත් එනවා.. එයාට ස්පීච් එකක් කරන්න තියෙන නිසායි ගේම්ස් කැප්ටන් කෙනෙක් නිසායි..

මම උඩට යද්දි රධ්‍ය අයියා බුදුමැදුර ගාව තිබ්බ බැම්ම උඩ ඉදගෙන කකුල් දෙකත් පද්ද පද්ද ෆෝන් එකේ මොනවහරි බලනවා.. මම ළගට යනකල්ම දැක්කෙ නෑ.. මම එනවා දැකලා එයා ලාවට හිනාවෙලා ෆෝන් එක බැම්ම උඩින් තියලා තඩි බළලෙක් වගේ එතනින් බිමට පැන්නා..

" ගුඩ්මෝනින්.. මම හිතුවෙ එන එකක් නෑ කියලා.."

@Shan

" ඒ මොකද ඒ.."

" ඔයා මැසේජ් බලලා තිබ්බෙ නෑනෙ.."

" වට්සැප් ලොග් වෙන්න වෙලාවක් වුණේ නෑ අනේ.. මම නිකන් උඩින් බලලා ආවා විතරයි.. ඒ වුණාට මම මැසේජ් එක දැක්කා.."

" ම්ම්.."

" මම නිකමට හිතුවා ඔයා අද ඒවි කියලා.. "

" ඒ ඇයි.."

" නිකං හිතුනා ඉතින්.."

රධ්‍ය අයියා පාරෙ තිබ්බ ගල්වලට ලාවට කකුලෙන් තට්ටු දදා ඇවිද්දා.. අද මේ හරියෙ කවුරුත්ම නෑ හෙන පාලුයි.. සේපාලිකා මල් බිම වැටිලා අතුගාලා නැති නිසා ඒ මල් වලින් මාර සුවඳක් එනවා.. ඒකට කලන්තෙ වගේ.. බිම පුරාම මල් හැලිලා හැලිලා සුදු පාටට පලසක් එලලා වගේ.. මට ඒ මල් පාගන්න ලෝබ හිතුනු නිසා ගහ යටට නොයා මෙහායින් බිත්තියට හේත්තු වුනා..

" ආයෙම මට එන්න වෙන්නෙ සති දෙකකින් නෙ.. අප්පච්චි අනිද්දා ගෙදර එනවා.."

" ම්ම්.. ඔයා මට කියලා තිබුනනෙ.. මේ තවුසෙ අප්පච්චි එක්ක රණ්ඩු නොවී ඉන්නවා හරිද.."

" ම්ම්.."

රධ්‍ය අයියා මං දිහා නොබලා මම කියපු එක ගානකට නැතුව ඈත බලාගෙන උත්තර දුන්නා.. අපි හුගක් වෙලාමොකුත් කතා නොකරම එහෙම ඉදියා.. හුග දවසකින් නිසා අර ගොඩ දවසකින් දකින කෙනෙක් දැක්කා වගේ හිත පිරිලා යනවා අමුතු සතුටකින්..

" මම යන්නද.. සෙනුක හොයනවා ඇති.."

@Shan

" දැන් යන්න එහෙනම්.. පරිස්සමට වැඩ කරගන්න.. අසනීප වෙන්න එපා.. දන්නවනෙ.."

රධ්‍ය අයියා මගේ අතක ඇඟිලි බයෙන් වගේ අල්ලලා ඒවා එයාගෙ සීතල ඇඟිලි වල පටල ගත්තා.. මගේ අතේ තවම මුද්ද තියෙනවා.. එයාගෙ අතෙත් තියෙනවා.. සතියකට පස්සෙ මම එයාව දකින්නෙ.. එකපාරම එයාගෙ ඇඟිලි සීතලට මගේ ඇඟිලි වල වදිද්දි හිතට අමුත්තක් දැනුනා.. ටිකකින් රධ්‍ය අයියා තද කල්ලාම මගේ අතින් අල්ලගත්තා..

" හොඳට ලියන්න.. Alles Gute!.."(all the best)

රධ්‍ය අයියා හිනාවෙවී මට විශ් කරද්දි එයාගෙ අමුතු විශ් එකට මට හිනා ගියා.. .

" දැන්නම් මතකත් නෑ එච්චර.. ich danke dir sehr.."(thank you so much)

අපේ ඉස්කෝලෙ පොඩි කාලෙ ජර්මන් අනිවාරෙන් උගන්නනවා.. මටනම් දැන් ලොකුවට මතක නෑ.. ඇයිද දන්නෙ නෑ හදිසියේ රධ්‍ය අයියට ජර්මන් මතක් වුනේ..

" යන්නම්~"

මම රධ්‍ය අයියගෙන් අත මෙහාට අදින්න හැදුවත් එයා අමුතු බැල්මක් මූණෙ තියාගෙන ඇහිබැම රැලි කරගෙන මං දිහා කට කොනෙන් හිනාවේගෙන බලාගෙන ඉදියා.. ඔහොම කරද්දි මට හෙන කෝල ගතියක් දැනෙනවා.. මූණට ලේ පිරෙනවා.. මම අත ඇදලා ගන්න දෙපාරක් තුන්පාරක් එහෙට මෙහෙට ගැසුවා..

" යන්න දෙන්නකෝ.."

මම අනිත් අතින් රධ්‍ය අයියා අල්ලගෙන ඉදපු ඇඟිලි දිගෑරගන්න හදද්දි එයා මගේ ඉණෙන් ඇදලා අරගෙන මාව එයාගෙ ඇගට හේත්තු කරගත්තා.. හේත්තු කරගත්තා නෙමෙ තදකරගත්තා.. අපි ඉන්නෙ ඉස්කෝලෙ නෙ.. මේ මනුස්සයට මක් වෙලාද..

" සතියකින් දැක්කෙවත් නෑ.. ආයෙම තව සති දෙකක් ඉන්න ඕන.. මොන මගුලක්ද මේක.."

@Shan

" අනාරින්නකො අනේ.. කවුරුහරි ඒවි.. "

" බෑ.."

මම අහකට යන්න හදද්දි රධ්‍ය අයියා මාව තව ටිකක් තුරුල් කරගත්තා.. අන්තිමේ මම යන්න දඟලන එක නතර කල්ලා මූණ පැත්තකට හරවන් ඉදියා.. එයා බලන් ඉන්න විදියට අමුතු දේවල් හිතෙනවා.. ඒක හෙන මනමාල පෙනුමක්.. මගේ කම්මුල් ගිනි අරගෙන පිච්චෙනවා වගේ..

" කෝල් එකක්වත් ගන්න විදියක් නැනෙ.. මම.. මට උඹව මතක් වෙනවා.. පාළුයි.."

" තව ටික දවසනෙ ඉතින්.."

මම තව ටික දවසනෙ කිව්වහම රධ්‍ය අයියා මගේ කම්මුලකින් හාද්දක් තිව්වා.. එකක් නෙමේ.. දෙකතුනක්ම එකපාර තිව්වා..

" ඉක්මනට එන්න.. මම බලන් ඉන්නවා.."

මම රධ්‍ය අයියගෙන් ඈත් වෙලා එයා දිහා බලාගෙන අඩි දෙක තුනක් පිටිපස්සට තිබ්බා.. එයා හිටියේ දුකම දුක හිතෙන මූණක් හදාගෙන..

" එන්නම්~"

මම බුදුමැදුර ගාව තිබ්බ පඩිපෙළ බැහැගෙන විභාග ශාලාවට දුවගෙන ආවා.. තව පැය බාගයක්ම තියෙනවා.. මම සෙනුකයා එක්ක ඌ කියන දේවල් අහගෙන ඉදියා එක එක පාඩම් වල වැදගත් කරුණු වගේ දේවල්.. රධ්‍ය අයියා ගාවින් එන සැර ප'රියුම් සුවඳ මං ගාවින් දැනෙනවා.. සැරින් සැරේ ඒක මගේ වටේ කැරකෙනවා වගේ..

ඉක්මනින්ම එක්සෑම් එක පටන් ගන්න වෙලාවත් ඇවිල්ලා ශාලාධිපතිලා හෝල් වලට පේපර්ස් මිටි අරගෙන ඒවා බෙදන්න ලෑස්ති කරනවා..

" ඇඩ්මිශන් එකයි අයි ඩී එකයි මේසෙ උඩින් තියන්න.."

බේසික පූස් කෙල්ල තාම  ගෙදර ආවෙ නෑ ළමයිනෙ.. මෙකි ගිහින්ද කොයිද කොම්ලෙක් එක්ක.. යසෙ යසෙ..

@Shan

කමක් නෑ දුකක් නෑ.. චීසි රධ්‍ය 'ස් හියර්.. කැමති අය ඉන්නවදෝ..

හවසට එන්නාම්.. බෙඩ් ටී ගෙනාවෝ..

ලව් යූ.. ❤



ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 67 කොටස

" නෙද්දකින්.. මෙහෙම මගුලක් වෙනවා කියලා දන්නවනම් කලින්ම ජී කේ වලට පාඩම් කරන්න ගන්නවා අනිත් තුනම පැත්තකින් තියලා.."

" මොනවද බං අර මිසිස් පෙරේරට ඉපදෙන්න ඉන්න ළමයා කෙල්ලෙක්ද කොල්ලෙක්ද කියලා අපෙන් අහලා තිබ්බෙ.."

" පිස්සු හු#තෙක් හදපු උගෙ අප්පගෙ පේපරයක් ඒක.. යකෝ සබ්ජෙක්ට් තුනම ලිව්වා දැන් හිතෙනවා මේ මගුල ෆේල් වෙලා කැම්පස් යන්න බැරිවෙයිද කියලා.."

" පිස්සුද බං.. එහෙම වෙන්නෑ.. වරෙන් ගෙදර යන්න.."

" දැන් ඉතින් ගෙදර ගිහින් ආයෙම රෑට එන්න එපැයි නේද.."

මමයි සෙනුකයයි එක්සෑම් එකේ අවසාන දවසෙ තිබ්බ පේපරේ වෙච්ච ජී කේ පේපරේ ලියලා බෑග් දෙකත් කරේ එල්ලගෙන ගේට් එක පැත්තට ඇවිදගෙන ආවා..

එක්සෑම් එක තිබුනා කියන්නෙ සති දෙක පට ගාලා ගෙවිලා ගියා.. මගේ ජීවිතේ එක්තරා විදියකට ගත්තොත් කෙටිම සහ දිගම සති දෙක ඒක.. පිසික්ස් නම් මං දන්නෑ කොහොම වෙයිද කියලා.. බී හෝ සී ඒවි කියලා හිතෙනවා.. විශ්වකර්මයක් හරි මගේ ලක් එකට හරි යාන්තම් වැට උඩ ඒ එකක් සෙට් වුනොත් තමා.. බයෝ නම් ශුවර් ශොට් ලිව්වා ලිවිල්ලක්.. අන්තිම තප්පරේ වෙනකල්ම ලියලා රූප ඇඳලා හෙන පිලිවෙලටම කලා.. ඒක විතරයි හැබැයි.. කෙමෙස්ට්‍රි නම් ලේසිත් නෑ අමාරුමත් නෑ.. කොහොම වෙවිද දන්නෙ නෑ.. ලිව්වා ඉතින්.. ජීවිත කාලෙ දැනට ලියපු අමාරුම එක්සෑම් එක ලියලා ඉවරයි කියලා දැනෙන ගැම්මට මම පොඩ්ඩක් සතුටින් ගේට් එක පැත්තට අඩිය තියන්න ගියා විතරයි කලර්ස් නයිට් එකට ගේට් එක ගාව මොකෙක් හරි අටවපු තුප්පැහි වයර් කෑල්ලක කකුල පැටලිලා මාව හොම්බෙන් යන්න ගියා.. දැක්කනෙ සතුට තියෙන්නෙ වරද්ගෙන් ඈතම ඈත..

" ටහුක්- කවුද පගෝ පාරෙ වයර් ඇටෙව්වෙ.."

@Shan

" ඒ බං උඹ.. පොඩ්ඩක් බලාගෙන යමංකො.. උඹ රෑට කුන්දු ගහ ගහද ස්ටේජ් එකට නගින්න ඉන්නෙ.."

" අනේ මෙ උඹ මහපගයා නොවී ඉදපන්.."

මම සෙනුකයගෙ ඔලුවට පාරක් ගහගෙන බස් හෝල්ට් එක පැත්තට ඇවිදගෙන ගියා.. බලන්න එපැයි අල්ලපු වැටේ ගෑනු දැරිවියොන්ගෙ මූණුවල සිරියාව.. සිරියාවට බෝම්බ ගහලා වගේ.. මමයි සෙනුකයයි බස් හෝල්ට් එකට වෙලා බස් එකක් එනකල් ඉදගෙන හිටියා..

" මෙ දැන් උඹ අයියට අරක කියන්නෙ නැද්ද.. මට නින්ද යන්නෙත් නෑ බං.. මගුල.. ඔක කියපංකො.."

" කෝක..."

" උඹලා දෙන්නා දැන් ලව් නැද්ද ලව්නෙ.. නේ.."

" ඉතිං.."

" දැං ඒක ප්‍රකාශකරගෙන තියද කවදහරි.. අවුරුද්දක් තිස්සේ ගැටුවනෙ.. දැන් ඉතින් එක්සැම් ඉවරයි.. ඔක කියපන්.. අයියා ඉන්නෙත් තව මාස දෙකනෙ.."

" ම්ම්.."

මම සෙනුකයා කිව්ව එකට ඔලුව වනලා බිම බලාගත්තා.. කැමැත්ත කියන්න බැරියැ ඉතින්.. ඊටවඩා මගේ හිතට තියෙන අවුල රධ්‍ය අයියා යන එකනෙ.. ආදරේ කියන්න ඔන තමා.. ඒ වුණාට ඉතින් මෙච්චර දවසකුත් කලේ ඒකනෙ.. දැනට සති දෙකක් වෙනවා.. රධ්‍ය අයියා මට කතාකලේ දෙසැරයයි.. ඒකත් ආධ්‍ය අයියත් එක්ක එළියට ආපු වෙලාවක විනාඩි දහයකට විතර.. එයාලගෙ අප්පච්චි ගෙදර ඇවිත් නිසා රධ්‍ය අයියගෙ ෆෝන් එක ආධ්‍ය අයියා ළග තියලා තියෙන්නෙ.. ඒක බැලුවොත් ඉතින් වෙන්න පුළුවන් දේවල් අමුතුවෙන් කියන්න ඔන නැනෙ.. රෑට කතාකරන්නවත් විදියක් තිබ්බෙ නෑ.. මමත් ඉදියේ පාඩම කරන සිහියෙන් නිසා ෆෝන් එක පොඩ්ඩක් පැත්තකට තල්ලු වුණා.. රධ්‍ය අයියගෙ අප්පච්චි හෙට උදේ යනවා කියලා එයා අවසාන වතාවට කතාකල වෙලේ මට කිව්වා..

@Shan

" මොකෝ කල්පනා කරන්නෙ.."

" මොකුත් නෑ බං.."

මම බෑග් එකේ පටිය රෝල් කර කර බස් එකක් එන පැත්ත බලාගෙන ඉන්න වෙලේ එකපාරට හෙනයක් ගහන්න වගේ මගේ පිට මැද්දට මොකෙක් හරි හෙන පාරක් ගහලා  අතේ එල්ලුනා..

" හේයි.. ෂනෙරුවා.. කොහොමද එක්සෑම්.."

" ආශී.."

මම පොඩ්ඩක් බිමට නැමිලා කතාකලා.. ආශී මට වඩා පොඩියි හෙනට.. අපේ යාලුවොන්ගන් පොඩිම ඒකි.. මහීශා ලගින් තිබ්බත් මෙකි හෙන කුඹි කැල්ලක් වගේ..

" මොකද බං.. ඒයි සෙනුකයා.. කෝමද.."

" ඉන්නවා බං.. විශේශයක් නෑ.. උඹලා දැක්කෙත් හෙන කාලෙකින්.."

" ඒකනෙ.. බලහන් අලපු වැටේ ඉදලත්.. පංතියෙදි විතරනෙ උඹලව හම්බෙන්නෙ.. කොහෙද උඹලට බෝයිපෙන්ලා ඉන්නවා.. උන් උඹලව එක්කන් එනවා.. එක්කන් යනවා.. අපි යාළුමිත්‍රයො වශයෙන් හම්බෙන්නෙ නෑනෙ.."

" අනේ පලයං.. ඒ සෙනුකයා.. මෙකි හැමදාම අර ගර්ල් ස්කූල් එකේ කැෆේ එක අස්සට වෙලා කියාන් අයියා එක්ක මොකද දන්නෑ එතකොට කරන්නෙ.."

" අනේ හිටපං.. උඹලා වගේ මොකෝ ඒ මනුස්සයා අපේ ඉස්කෝලෙට එනවයෑ.. නෑනෙ.. එහෙම තමා හම්බෙන්න තියෙන එකම විදිය.."

" කෝ අද කියාන් අයියා නැද්ද.."

" නෑ හලෝ.. මස්සිනා ගෙදර ඇවිල්ලා.. ඒ හැලකිඹුලා ආවහම අපි කතාකරන්නෙ නෑ.."

" කවුරු.. අයාන් ද.."

@Shan

" ම්ම්.. බේසික මස්සිනෙක්.."

" ඔව් බේසිකයා.. සෙනුකයගෙන් කනේ පාරක් කාලා ඉන්නෙ.."

" මට කිව්වා මහීශා සීන් එක.. කනට නෙමෙ බං ගහන්න තිබ්බෙ ඔකගෙ.. අහවල් එක-ඌප්ස්.. සොරි.."

ආශිට එකපාරට අපි දෙන්නත් කොල්ලො දෙන්නෙක් කියලා මතක් වෙලා කට අත් දෙකින්ම වහගත්තා..

" මෙ අපේ බස් එක එනවා.. මම යනවා හලෝ බායි.."

ආශි යන්නත් හැරිලා ආපහු යූ ටර්න් එකක් ගහලා මං ගාවට දුවගෙන ආවා..

" ඕල් ද බෙස්ට් ඈ.. පස්සෙ මට කේක් කෑල්ලක් මහීශා අතේවත් එනවන්නෝ~"

ආශි උන්ගෙ ස්කූල් බස් එකේ නැගලා අපිටත් බායි කියලා යන ගියා..

" බලපන්.. උඹ අයියා එක්ක යාළුවෙනකල් කීදෙනෙක් බලන් ඉන්නවද කියලා.. අඩෝ මට නිකන් ලැජ්ජයි ලැජ්ජයි වගේනෙ.."

සෙනුකයා ගෑනු පරානෙ වගේ ඇඹරි ඇඹරි කකුලකින් බිම හාරනවා.. සිමෙන්ති පොලොවෙ ඉතින් මොනවා හාරන්නද..

" ඒ මොකටද උඹට ලැජ්ජ.."

" නෑ ඉතිං.. දන්නැද්ද.. මම ඉමැජින් කලා.."

" උඹ අර කොලු නාට්ටි බලලා ඔලුව කුරුවල් කරන් ඒවා මටනම් කියන්න එන්න එපා පුතේ.. ගහනවා උඹට මල් පෝච්චියෙන් ඔලුවට.."

මම බස් හෝල්ට් එකේ පැත්තක තිබ්බ මට උස්සගන්නවත් බැරි තඩි පෝච්චියක් පෙන්නලා සෙනුකයා බය කලා..

" ඔයාට අනේ කිස් ගැන කියනවනම්.. හියර් අයි ඈම් ද එක්ස්පර්ට්.. මමනම් කියන්නෙ අර කින් පෝර්ශ්ව කිස් කරන විදිය තියෙන්නෙ ඒක මරු.. අර බං මම උඹට දවසක් එව්වෙ.. ඒ වුණාට වෙගාස් පීට් කරන්න ගිය ඒවා

@Shan

කරන්න උඹ යන්නෙපා.. මම කියන්නම්.. අන්න වැඩේ.. සිරාවටම.. චෙරි බ්ලොසම් ආෆ්ටර් වින්ටර් එකේ වගේ කරහන්.. උඹ ඒකෙ බොටමා තරම් කොට නැනෙ.. ඒ වුණාට උන් දෙන්නා කියුට් ස්වීට් ලව්ලි කපල් එක.. සෙමෙන්ටික් එරර් එකත් හොඳයි හැබැයි.. මම කියන්නම්-"

" අනේ පගෝ.. මම ඔය ලබ්බවල් බලන්නෙ නෑ උඹ දන්නවනෙ.. මට කොලූ නාට්ටි පිස්සුව නෑ උඹට වගේ.."

" මම ඔයාට කල්ලා පෙන්නනන්නද ඒයි.."

සෙනුකයා ඇඟි පිල්ලම් තුනක් ගහලා මගේ ලගට එද්දි මම උගෙන් අඩි හය හතක් ඈතට ගියා..

" එන්නෑ ළගට.. ගහනවා උඹට මම.."

" ආවිස්.. මාව ගිනිගන්නවා වගේ අනේ.."

" බේරෙ වැවට පැනහන්.."

මම සෙනුකයට රවලා ආපු බස් එකට නැගලා ගෙදර එන්න ආවා.. දැන් ඉතින් ගෙදර ගිහින් නාලා කියලා අපේ අම්මා අර රෝස් වොටර්ද මොනවද දාලා මූණෙ අතුල්ලන්න හදපු අයිස් කැටයක්වත් මූණෙ තියන් ඉන්න ඕන.. මගේ හැටි.. ඇස් වටේ කළුවෙලා නිදිමරලාම.. හෙනගහලා වගේ.. හිතට දැනෙන සැනසීම නම්.. කියලා නිම කරන්න වචන මදි..

මහමෙර ඔලුව උඩ තියන් ඉදලා ඒක බිමින් තිබ්බ වගේ මටනම් දැනෙන්නෙ.. අම්මෝ මොන දුකක්ද දෙයියනේ මම වින්දෙ පහුගිය ටිකේ.. පිස්සෙක් වගේනෙ හිටියෙ.. අම්මට කියන්න ඕන පොත් ටික අදුරන මල්ලි කෙනෙක්ටවත් බලලා දෙන්න කියලා.. ආයෙනම් පුතේ.. පිසික්ස් නම් දිහා බලන්නෙවත් නෑ.. එපා එපා එපාමයි..

මම දැන් නිදහස් කුරුල්ලෙක්..

මම පාර දිගේ උඩ පැන පැන ගෙදරට ඇවිත් ගෙදර ගේට්ටුව නාට්‍යානුසාරයෙන් ඇරගෙන බකිංහැම් මාළිගාවට චාල්ස් කුමාරයා සැපත් වෙන ලීලාවෙන් ඔලුව කෙලින් කරන් අම්මගෙ රෝස මලකුත් පාත්තියෙන් කඩාගෙන ඒක සුවද බල බල ගෙදරට ආවා.. දෝණි උයනවද කොහෙද..

@Shan

මම උඩ පැනපැන ආපු රාජකීය ලීලාව දැකපු එහාගෙදර බ්‍රෙසියර්ලස් කමනි ඇන්ටි කොස්සෙන් හයියෙන් පොලොවටත් ඇනලා ගේ ඇතුලට යන්න ගියා.. පිස්සු කෙල්ලහ්.. බ්‍රෙසියර් එකක්වත් අදින්නෑ.. මගේ වෙන්ඩ බෝයිෆ්‍රෙන්ඩුත් දවසක් කිව්වා මෙයාගෙ නැහැදිච්ච කල්කිරියාව ගැන.. හරි කැතයි..

මම බෑග් එක සෙටියට විසික් කරන් සපත්තු දෙක ගලෝලා රැක් එකෙන් තියාගෙනම අම්මා ගාවට ගිහින් මම ආදරෙන් අම්මගෙ පාත්තියෙන් නෙලාගත්තු රතු රෝස මල අම්මගෙ දනිස්ස ගාවට කඩලා දාපු කොණ්ඩෙන් ගහලා අම්මව අල්ලලා බලෙන්ම වටයක් කරකලා 'බොහ්' ගාලා අතට වට්ටගත්තා.. දෝණි නාලද කොහෙද..

" කුමාරියේ..

අමතක නොවේ..

ලස්සන රුවේ..

සිත සැනසුවේ..

ටනන නනන නං ටං ටං.."

" මේ මොන කෝලමක්ද මේ.."

අම්මා මගේ පපුවට අත් දෙක තියලා මාව අහකට තල්ලු කල්ලා දැම්මා..

" කෝලමක්ද අහන්නෙ.. සතුටු හිතිලා ඉන්නෙ ඔයාගෙ පුතාට.. අද එක්සෑම් ඉවරයි.. එක්සෑම් ඉවරයි.. නනන නනන නා.. අම්මට කියන්න.. මට අත්තටු දෙකක් තිබ්බනම් මම මේ වහල උඩට නැගලා පියාඹලා පියාඹලා-"

" ගිහින් නාගෙන වරෙං.. හවසට යන්නත් තියනවා නේද.."

අම්මා පොල්කටු හැන්දෙන් මට ඇන්නා.. ඔය ඉතින් පිටට නොපෙන්නුවට මම දන්නවා අම්මට හෙන සතුටුයි එක්සෑම් ඉවරවෙච්ච එක ගැන.. කොහෙද එහෙම ඉතින් හැඟීම් පෙන්නන මනුස්සයෙක් නෙමෙනෙ අපේ අම්මා..

" අම්මා ඇඳුම් හැදුවද.."

@Shan

" ඇඳුම් නම් මැදලා එල්ලලා ඇත්තෙ.. අර පිත්තල කැලි ටික නම් ගහගන්න ගිහින්.. මම ඕවා ගහන්න දන්නෙ නැනෙ.."

" ආ.. මෙ මෙ මෙහ්.. පිත්තල කැලි කියලා නිකම් කැත කතා කියන්නෙපා හරිද.. මේ හැම එකක්ම මම දාඩිය මහන්සියෙන් උපයගත්තුවා.. මගේ ඒවා ඉතින් වටින්නැනෙ අම්මට.."

මම මූණ එක්කගෙන ගිහින් ෆ්‍රිජ් එක ඇරලා අම්මගෙ ෆේස් මාස්ක් ගොඩ එළියට ගත්තා..

" එහෙම එකක් කිව්වද මම.."

" මෙ අම්මෙ.. මෙකෙන් මොකක් ගැවහමද දැන් සුදු වෙන්නෙ.."

" ඕක මොකටද.."

" මූණෙ අලවගන්න අනේ.. මෙහෙම යන්න පුලුවන්ද හොල්මන වගේ නයිට් එකට.. ම්ම්.. කෝමාරිකා තියෙනවා.. යෝගට් තියෙනවා.. ග්‍රේප්ෆෲට් තියෙනවා.. හනී තියෙනවා.. අඩෙ ස්ට්‍රෝබෙරිත් තියේද.. ඒ මේවා කන්න බැරිද අම්මෙ.."

" පිස්සුද ලමයො.. කෝක ගැවත් හොදයි ඕන එකක් ගන්න.."

" අපරාදෙ කන්නත් පුලුවන් වුනානම් මරු නේද.. මම මේ කොළපාට එක ගත්තා.."

මම කෝමාරිකා ගහක් තිබ්බ ෆේස් මාස්ක් එකත් අරගෙන කාමරේට වැදිලා ඇඳුම් ටික ගලවලා බාස්කට් එකට දාලා මූන හෝදගෙන ආවා.. ඊටපස්සෙ අර මාස්ක් එකේ හරි පැත්ත හොයාගෙන ඒක මූණට අලවගෙන බ්ලෙසර් එකේ බැජ් ගහලා සපත්තු දෙක පොලිශ් කල්ලා තියලා අයිස් කැටෙකුත් අරගෙන නානකාමරේට වැදුනා..

" ම්ම්..ම්ම්.. නිම් හිම් සෙව්වා මා සසරේ..

හමුවී.. යුගයෙන් බැඳී යුගයේ..

ළංවී වෙන් වී වරින් වරේ..

@Shan

ඔබ හා මා..ටහුක් සබං කෑල්ල.."

මම ඇඟට වතුර දාගෙන සබං කෑල්ල අතට ගත්තා විතරයි ඒක ලිස්සලා උඩින් ගියා.. මගේ කිච්චට.. මගේ සබං කෑල්ලම නෙමෙයි.. අපේ අම්මගෙ එකක්.. ඒක ගාන්නෙ මූණෙ විතරක්ලු.. මට ඒවා අදාළ නෑ අද ලස්සනට යන්න ඕන මට මෙඩල්ස් දෙකක්ම තියෙනවා ගන්න.. චීෆ් ගෙස්ට්ගෙ අතින් ඒකත්.. දෝණිගෙ අදට විතරක් මූණෙ ගාන සබං කෑල්ල මම ඇගේ ගානවා..

මම අම්මගෙ අර පාට පාට බෝතල් වල තියෙන ඔක්කොම ඇගේ ගාලා නාලා සුවඳ ගගහා ඇවිත් ඇඳේ වැටිලා හවස් වෙනකල් හොඳහැටි නිදාගත්තා.. අන්න දැන් තමයි හරිම නින්ද යන්නෙ.. ඔලුවෙ කිසි බරක් නෑ නිදහසේ නින්ද යනවා.. මම හිතෙන හිතෙන පැත්තට පෙරළි පෙරළි හවස පහ වෙනකල්ම අඛණ්ඩව නිදාගත්තා.. අම්මෝ ජීවිතේ දිගම නින්ද මම ලැබුවා.. ඒකත් නිදහසේම නිදහසේ.. හීනෙන් රධ්‍ය අයියවත් පෙනුනා මම හිතන්නෙ.. දැන් මොනවා කරනවද දන්නෙ නෑ..

මම කෝකටත් ෆෝන් එක බැලුවත් රධ්‍ය අයියගෙන් මැසේජ් එකක් ඇවිල්ලා තිබ්බෙ නෑ.. කමක් නෑ ඒ වුණාට රට හම්බෙනවනෙ.. හිතනකොටත් පපුව ගැහෙනවා හෙන හයියෙන්.. සති දෙකක් යනකල්ම දැක්කෙවත් නැනෙ.. හිතට අමුතු කික් එකක් තියෙනවා.. ඒ අස්සෙ ලැජ්ජාවකුත් තියෙනවා.. අනේ මන්දා..

මම ඕවා හිත හිත ඇඳුම් ඇඳගෙන ටයි එකත් අරගෙන අම්මා ගාවට ගියා.. අම්මා ඔසරියක් ඇඳලා කොණ්ඩෙත් ගෙඩියක් ගහලා දිග ආස්ති මාලයක් දාලා.. කහ පාට හැන්ඩ්ලූම් ඔසරියට අපේ අම්මා ලස්සනට පෙනුනා.. අම්මා කොහොමත් ලස්සනයිනෙ.. ඒ වුණාට සරියක් ඔසරියක් අඳින්නෙ කලාතුරකින්.. කෙල්ල වගේ.. බලන්න එපැයි..

" අම්මෙ ටයි එක.."

මම අම්මගෙ අතට ටයි එක දුන්නහම අම්මා ඇඟිලි වලිනුත් ඉස්සිලා ඒක මගේ කර වටේ දැම්මා.. මම පොඩි කාලෙ අම්මා කරට ටයි එක දාන්නෙ බිම දනගහගෙන නැමිලා.. දැන් ඇඟිලි තුඩු වලින් ඉස්සිලා.. කාලෙ කොච්චර ඉස්කමනට ගෙවිලද හිතාගන්න බෑ.. අවුරුදු දහතුනක් ගෙවිලා ගිහින්.. ඒක අවසානෙට ඇවිල්ලා.. මට අදටත් තවම මතකයි මම අම්මගෙ අතේ එල්ලිලා වතුර බෝතලේකුත් කරේ එල්ලන් අඩ අඩා ගිහින් ගමේ ඉස්කෝලෙ එකවසරෙ පන්තියෙන් ඉඳගෙන ඉඳියා..

@Shan

" මම උස්සලා පුටුවකින් තියන්නද.."

අම්මගෙන් කින්ඩියට අහද්දි අපේ අම්මා මට දෙකක් රවලා කනෙන් ඇදලා මගේ බෙල්ල පහත් කලා..

" මේ ළමයින්ගෙ උස විතරක්.."

අම්මා මගේ ටයි එක ගැටගහලා කොලර් එක නමලා ශර්ට් එකේ පොඩි වෙලා තිබුනු තැන් අතින් හැදුවා..

" සුදුමහත්තයො මෙක සාරි පොට අල්ලලා ගහන්නකො.."

අම්මා සාරිකට්ටක් මගේ අතේ තියලා පිටිපස්ස හැරුණා..

අපි ඇදගෙන ඉවරවෙද්දි සෙනුකයා උගේ අම්මා එක්ක කාර් එකේ අපේ ගෙදර ඇවිත් ඉදියා.. අපේ අම්මා කහපාට කහ කිරිල්ලි වගේ ගිහින් පැසෙන්ජර් සීට් එකෙන් ඉදගත්තා.. මමයි සෙනුකයයි පිටිපස්සෙන් ඉදගෙන ඉදියේ.. අපේ අම්මා සෙනුකගෙ අම්මා හොදට අදුරනවා.. අපි දෙන්නා පොඩි කාලෙ ඉදන්ම යාලුවොනෙ.. සෙනුකයගෙ අම්මා හෙන අමුතු චරිතයක්.. ඒ වුණාට හරි හොදයි.. ටීච කෙනෙක් නිසා පොඩ්ඩක් සැරයි.. එච්චරයි.. අම්මෝ සෙනුකයගෙ තාත්තා තමා.. ඒ ගැනනම් කතාකල්ලා වැඩක් නෑ..

අපි ඉස්කෝලෙට යද්දි ඉස්කෝලෙ පාකින් ලොට් එක පිරිලා වාහන වලින්.. හෝල් එකේ අම්මලා තාත්තලා ළමයි එක්ක හෙන පොශ් විදියට ඇදලා එහෙට යනවා මෙහෙට යනවා.. හිනාවෙනවා කතාකරනවා.. මූණු ඉඹගන්නවා.. ස්පෝර්ට්ස් කෝච්ලා ඇවිත් පේරන්ට්ස්ලා එක්ක කතාකරනවා..දේවල් ගොඩයි.. ඉවෙන්ට් එක පටන්ගන්න තිබ්බෙ විනාඩි පහළොවත් විතර..

අපේ අම්මා මගේ අතේ එල්ලිලා හෝල් එකේ පේරන්ස්ලට වෙන් කල්ලා තිබ්බ රෝ පැත්තට ඇවිදගෙන ගියා.. අපේ අම්මා පොඩි ළමයා වගේ.. මගේ අතේ එල්ලිලා.. හුරතල් පාටයි.. ලා රෝස පාට ලිප්ස්ටික් එකට මූණ පොඩ්ඩක් බ්ලශ් කල්ලා ඉදියේ.. දැන් නම් හැමෝම අම්මා දිහා බලන නිසා නිකන්ම බ්ලශ් වෙලා.. මූණ දෙපැත්තට ලේ පිරිලා රතුම රතු වෙලා.. අම්මා දිහා කට්ටිය බලද්දි මට අම්මව ගුලි කල්ලා සාක්කුවෙ ඔබාගන්න හිතෙනවා.. අවුරුදු හතළිස් පහක් නෙමෙ විස්සක කෙල්ල වගේ.. මම

@Shan

අම්මගෙ අතින් අල්ලගෙන එක්කගෙන ස්ටෙයා එක නැගගෙන උඩට ගියා.. ඒ යන ගමන් අම්මා මගේ කණට ළංවෙලා මොනහරි කිව්වත් මට මොකුත් ඇහුනේ නෑ වටපිටාවෙ සද්දෙ නිසා.. අනික පහළින් නෙ ඇහෙන්නෙ.. අම්මා චූටියිනෙ.. මම අම්මා ගානට නැමිලා කන ළං කල්ලා අම්මා කියන්නෙ මොකක්ද කියලා ආයෙම ඇහුවා..

" මේ අර දරුවා නේද.."

" කොයි.. කොහේ..??"

" ඉස්සරහා ලමයෝ.."

අම්මා කියනවත් එක්කම මම පිටිපස්ස හැරිලා අපිට උඩ ස්ටෙයාර්ස් දිහා බලද්දි.. එතන හිටගෙන ඉදියේ වෙන කවුරුත් නෙමේ.. රධ්‍ය අයියා.. බැජ් ගොඩක් එල්ලපු බ්ලෙසර් එක එක්ක හීනි හිනාවක් තියන මූණ, එයා හරි ආඩම්බර පෙනුමයි.. එයාගෙ අතේ එල්ලිලා ඉදියේ එයාගෙ අම්මා..

මම එයාගෙ අම්මව දැක්ක පළවෙනිම පාර.. මම කලින් කිසිම දවසක එයාගෙ අම්මව හැබැහින් දැකලා නෑ.. කොණ්ඩෙ කොටට කපාපු රධ්‍ය අයියගෙම සුදක් තියෙන ස්පෙක්ස් දාපු හරි උගත් පෙනුමක් තිබ්බ ලස්සන අම්මා කෙනෙක්.. අයිවරි පාට සාරි එකක් ඇදගෙන රධ්‍ය අයියගෙ අතේ එල්ලිලා අපි දිහා බලාගෙන ඉදියා.. ඊටපස්සෙ රධ්‍ය අයියයි එයාගෙ අම්මයි දෙන්නම අපි දිහාට ඇවිදගෙන ආවා.. මම හිටියේ වෙන කිසිදෙයක් මොළේට ප්‍රොසෙස් කරගන්න බැරුව..

" ඔහ්.. ෂනෙරු පුතා.. I know you.. Radhya always talks about you.. ඒත් අද තමයි ඔයා හරියටම කියලා අඳුනගන්නේ.."

මම කන්ෆියුස් වෙලා රධ්‍ය අයියගෙ අම්මා දිහා බලාගෙන ඉන්න ගමන් රධ්‍ය අයියා දිහා බැලුවත් එයා හිනාවේගෙනම මගේ දිහා බලාගෙන ඉදියා.. මොකක්ද මේ වෙන්නෙ.. මම එයාගෙ අම්මව දැක්කෙත් අදමයි..

" Hi aunty.. nice to meet you.."

මම හිනාවෙලා රධ්‍ය අයියගෙ අම්මට අත දුන්නහම අම්මා මගේ කම්මුලට කිස් එකක් දුන්නා.. මේ වෙන සේරම දේවල් මට නිකන් විකාර වගේ..

@Shan

අනික හිතට බයකුත් තියනවා.. අපේ අම්මා හිනාවෙවී මගේ දිහා බලාගෙන ඉන්නවා..

" Hi Darling.. You must be Shaneru's mother.. Nice to meet you.. I am Radhya's mother.. "

රධ්‍ය අයියගෙ අම්මා අපේ අම්මට හග් එකක් දීලා චීක්ස් කිස් කලා.. මම ඒ දෙන්නව ඒ පැත්තට දාලා රධ්‍ය අයියා ඉඳපු පැත්තෙන් හිටගත්තා.. අම්මලා හැමෝම වෙඩින්ස් වලට වගේ ඇඳගෙන ඇවිල්ලා.. අපේ අම්මා රධ්‍ය අයියගෙ අම්මා එක්ක හොඳට කතාකරනවා.. මම රධ්‍ය අයියා දිහා බැලුවහම රධ්‍ය අයියා ඇහිබැමක් උස්සලා මගේ දිහා බලලා අම්මලා දෙන්නව ඇස් වලින් පෙන්නුවා.. මේ මනුස්සයා මොනවද මේ කියවන්නෙ.. මම මොකුත් තේරුණේ නෑ වගේ මූණ හදද්දි රධ්‍ය අයියා උගුර පාදලා අම්මලගෙ පැත්තට නැමුනා..

" අම්මා අපි යන්නද.. ඔයාලා ඉඳගන්න.."

" හරි පුතා.."

රධ්‍ය අයියගෙ අම්මා මගේ පිටට තට්ටුවක් දාලා හිනාවෙලා කියද්දි මම අපේ අම්මටත් යනවා කියාගෙන ඇවිත් මගේ නම ගහලා තිබුනු චෙයාර් එකෙන් ඉඳගත්තා.. සෙනුකයා මගේ එහාපැත්තෙ ඉන්න හිටියේ.. ඒ වුණොට දැන් ඒකා ඉන්නෙ අපිට රෝ දෙකක් ඉස්සරහා අයුක අයියට එහාපැත්තෙ රධ්‍ය අයියා ඉන්න ඕන චෙයාර් එකේ.. රධ්‍ය අයියා ඇවිත් බ්ලෙසර් එකේ බටන්ස් දෙක අන්බටන් කරගෙන මගේ ළඟින් ඉඳගත්තා..

" මොකද බයවෙලා වගේ.."

" අ-ආ..?? නෑ.. එහෙමම නෙමේ.."

" එහෙමම නෙමේ කිව්වෙ.. කොහොමද.."

රධ්‍ය අයියා කිසි ගානක් නැතුව පුටුවට හේත්තු වෙද්දි ඒ එක්කම හෝල් එකේ ලයිට්ස් ඩිම් වුණා.. ලයිට්ස් ඩිම් වුණාම පෙනුනේ ලඟම ඉන්න කීපදෙනා විතරයි.. අයුක අයියා ඒ එක්කම වගේ හැරිලා රධ්‍ය අයියා දිහා බලද්දි එයා 'that's fine' සයින් එකක් දෙන්න වගේ වින්ක් කලා.. ඊටපස්සෙ අයුක අයියා හිනාවෙලා ඉස්සරහා හැරුණා.. මීඩියා යුනිට් එකේ කොල්ලො

@Shan

දෙන්නෙක් ඇවිදගෙන ස්ටේජ් එක ඉස්සරහට ඇවිත් අද දවස ගැනයි ඉස්කෝලෙ කලර්ස් නයිට් ඉතිහාසෙ ගැනයි විස්තර කලා.. නෆ්‍රාස් ඉදියේ මගේ එහාපැත්තේ.. ඉස්කෝලෙ සීනියර් ප්ලෙයර්ස්ලා ඒ කියන්නෙ මම අයුක අයියා සෙනුක වගේ අය ඇදගෙන ඉදියේ නිල් පාටයි කහ පාටයි ඉරි තියෙන බ්ලෙසර්ස්.. රධ්‍ය අයියා ඇදගෙන ඉදියේ තද නිල් බ්ලෙසර් එකක්..

ඉස්කෝලෙ බ්ලෙසර්ස් තුන් වර්ගයක් තියෙනවා.. ස්පෝට්ස් රිලේටඩ් දේවල් වලදි සීනියර් ප්ලෙයර්ස්ලා ඒ අවෝර්ඩ් සෙරමනි වලදි අදින්න ඕන

**නිල් කහ ඉරි තියන බ්ලෙසර් එක**

ස්කූල් ලොගෝ එකත් එක්ක.. එතකොට

**තද නිල් බ්ලෙසර් එක**

අදින්නෙ ස්පෝර්ට්ස් රිලේටඩ් දේවල් වලට නැතුව ඒත් ඉවෙන්ට් එකට සහභාගී වෙන වෙලාවල් වලදී, ඉස්කෝලෙන් පිට තැනක ඉස්කෝලෙ නියෝජනය කරද්දි, සංගම් වල උත්සව වලදි වගේ දේවල් වල.. එතකොට අනිත් බ්ලෙසර් එක

**සුදු**

.. ඒක තියෙන්නෙ ඉස්කෝලෙ සීනියර් ප්‍රිෆෙක්ස් බෝඩ් එකට විතරයි.. එයාලා ප්‍රිෆෙක්ට්ස්ලා විදියට මොකක් හරි විශේශ උත්සවයක ඩියුටි ඉන්නවනම් අනිවාරෙන්ම ටොප් බෝඩ් එක වයිට් බ්ලෙසර් එක අදින්න ඕන.. ඒකෙ අනිත් බැජ්ස් එල්ලන්න බෑ.. ප්‍රිෆෙක්ට් බැජ් එක විතරයි තියෙන්න පුලුවන්.. අර තද නිල් බ්ලෙසර් එකේ තමයි එක එක මෙඩල්ස්, කලර්ස් බ්ලෙසර් පොකට්ස්, බැජ්ස් සේරම එල්ලගන්න පුලුවන්.. මට ඕකෙන් දෙකක් තියෙනවා.. එකක් එන්න තියෙනවා..

" මම හිතුවෙ නෑ ඔයාගෙ අම්මා ඒවි කියලා.."

" අම්මා හෙට යනවනෙ.. ලාස්ට් කලර්ස් අවෝඩ්ස් සෙරමනි එකට එන්න ඕන කිව්වා.."

" එහෙමද.. මම්..මම්.. එතකොට මම ගැන දන්නෙ..??"

@Shan

" ඒක.. ඒක පොඩි කතාවක්.."

" All stand up from their seats to sing the school anthem to honor the school father.. Thank you.."

එයා මොකක් හරි කියන්න කලින්ම ස්කූල් ඇන්තම් එක ප්ලේ කරන්න අනවුන්ස් කලා.. සැක් මේ මගුල මැද්දෙ මේ කතාව අහගන්න වෙන්නෙ නෑනෙ.. මට හෙන කුතුහලේ මේක අහගන්නකල්.. විනාඩි දහයකට විතර පස්සෙ ගහගන්න වගේ ඉංග්‍රීසියෙන් ප්ලේ වුණු ස්කූල් ඇන්තම් එක ඉවරවෙලා හැමෝම ඉඳගත්තා.. මම පුටුව උඩ තිබුනු මගේ අනිත් බ්ලෙසර් එක උකුළට අරගෙන ඉඳගෙන කතාවෙ ඉතුරු ටික අහන්න වගේ රඩ්‍ය අයියා දිහා බැලුවා..

" මොකක්ද කතාව.."

" අපේ අයියා තමයි ඔක කිව්වෙ මුලින්ම.. මම පහුගිය ටිකේ ටියුශන් මාස්ටර් කෙනෙක් වෙලා හිටියා කියලා අම්මට.. අම්මා ඇහුවා කවුද කියලා.. ඉතින් මම ඔයා ගැන අම්මට කිව්වා.. අම්මා ඔක්කොම අහලා ඉවර වුණාම කිව්වා දකින්න ආසයි කියලා.."

"එහෙමද.. මොනවද මං ගැන කිව්වෙ.. ඔච්චරට කියන්න දේවල් තියෙන්න එපැයි.."

" අම්මෝ හෙන ගොඩක් තිබ්බා.. බැඩ්මින්ටන් ක්ලබ් එකේ දැන් ප්‍රසිඩන්ට් කිව්වා.. අපේ හවුස් එකේ වයිස් කැප්ටන්ට හිටියා කිව්වා.. ස්ටුවර්ඩ් කෙනෙක් කිව්වා.. ඔල් අයිලන්ඩ් චැම්පියන්ශිප් තියෙනවා කිව්වා.. ස්කූල් හෙඩ් ප්‍රිෆෙක්ට් නොමිනේට්ඩ් කිව්වා.. තව.. කලර්ස් අවෝඩින් සෙරමනි එකේ බෙස්ට් ප්ලෙයර් ඔෆ් ද ඉයර් කිව්වා.. ඔවා කිව්වහම ඉතින් අම්මට හිතෙන්න ඇති දකින්න.. අනිත් එක උඹ අර මාව අවුරුදු කුමාරයට යවපු මගුලත් අපේ අයියා කියලා.. ඒකටත් මාව අල්ලගෙන හිනාවුනා.."

" ඉතුරු එකත් කියන්න එපැයි ඉතින්.."

" ඉතුරු එක කියන තිබ්බා.. ඔන්නම් කියමු.. කියන්නද.."

" අනෙ මේ පිස්සු නැතුව ඉන්නවා.."

@Shan

මම රධ්‍ය අයියගෙ අතට එකක් ගහලා ඉස්සරහා බලාගත්තා.. අපිට හුගක් වෙලා එකලග ඉන්න වුනේ නෑ.. ඉවෙන්ට් එක පටන් අරන් පලවෙනියටම සීනියර් ප්ලෙයර්ස්ලට එයාලගෙ ක්ලබ් වල ඇචීව්මන්ට්ස් වලට ශීල්ඩ් එක ප්‍රින්සිපල් සර් අතින් අරගන්න ස්ටේජ් එකට ඉන්වයිට් කලා..

බැඩ්මින්ටන් ක්ලබ් එකේ ප්‍රසිඩන්ට් විදියට මට අපේ ක්ලබ් එකේ මේ අවුරුද්දෙ ඇචීව්මන්ට්ස් ගනනාවක්ම තිබුනා.. මට සතුටුයි මගේ ක්ලබ් එකේ හැම කොල්ලෙක් ගැනම.. මම මේ ගන්න ශීල්ඩ් එක අපේ බැඩ්මින්ටන් ට්‍රෝෆීස් තියන කැබින් එකට යාවි.. හැමදාම තියේවි.. අපි ඉස්කෝලෙන් ගියත් අපි ගැන මතක විදියට හැමදාම ඒවා ඒ තැන් වල පරිස්සමට තියේවි.. මට ක්ලබ් ප්‍රසිඩන්ට් විදියට ඒ ශීල්ඩ් එක ගන්න එනවුන්ස් කරද්දි පුදුම තරම් සතුටක් දැනුනා.. ඒකනම් මාරම හැඟීමක්.. අරබෑමෝම ඉස්සරහා හරි ආඩම්බරෙන් සේටේජ් එකේ ඇවිදගෙන ගිහින් ප්‍රින්සිපල් සර් අතින් ශීල්ඩ් එක ගද්දි.. ඒ මියුසික් ඇහෙද්දි.. ඒක කියලා විස්තර කරන්න බැරි අමුතුම විදියේ හැඟීමක්.. මට හිතට දැනෙන සතුට දෙගුණ වුනේ අම්මත් ඔඩියන්ස් එකේ ඉදන් මං දිහා බලාගෙන ඉන්නවා කියන එක මතක් වෙද්දි..

" We respectfully invite Shaneru Udyoga, the captain of the school badminton team, to the stage to receive the shield from the Principal for his year's achievements.."

මම ශීල්ඩ් එක අරගන්න වෙලාවෙ ප්‍රින්සිපල් සර් මං දිහා බලලා පිටට තට්ටුවක් දාලා හැන්ඩ්ශේක් කලා.. රහසින් වගේ 'වෙල් ඩන්' කියලා කිව්වා..

මම ශීල්ඩ් එක අරගෙන බැහැලා ඇවිත් ඒක ප්‍රිෆෙක් කෙනෙක් අතට දීලා ආයෙම මගේ සීට් එකට ඇවිත් ඉදගත්තා.. දැන් බ්ලෙසර් එක මරු කරගන්න ඕන නිල් පාට එකට.. මම එද්දි රධ්‍ය අයියා මං දිහා ආදරේ~ හිතෙන බැල්මකින් බලාගෙන ඉදියා මම දැක්කා..

" මෙතන ඉදන් චේන්ජ් කරන්න.. ආයෙම නැගිටලා යන්න ඕන නෑනෙ.."

" කමක් නැද්ද.."

" ඕක ගලවලා මට දීලා මේක දාගන්න.."

@Shan

රධ්‍ය අයියා බ්ලෙසර් කවර් එකෙන් බ්ලෙසර් එක අරගෙන මට දුන්නහම මම කලින් ඇදගෙන ඉදපු එක ගලවලා රධ්‍ය අයියට දුන්නා.. එයා ඒක බ්ලෙසර් කවර් එකේ හැන්ගර් එකට දාලා සිප් එක වගලා පැත්තකින් තිව්වා.. මම එහෙට මෙහෙට ඇඹරිලා බ්ලෙසර් එක ඇදගෙන බටින්ස් දෙකත් දාගෙන සද්දයක් නැතිවෙන්න පුටුවට හේත්තු වුනා.. ඒකෙ මෙඩ්ල්ස් එකට එකට වදිනකොට සලාං සලාං ගානවා.. අවධානෙ ඕන නැනෙ ඉතින්..

" අද එක්සෑම් මොකද.."

" ආ ඔයාට කියන්න බැරි උනානෙ.. අපෝ මොන මගුලක්ද අනේ ඒ දීලා තිබ්බෙ.. සැක්.."

මම කට ඇදකරගෙන හිමින් කියද්දි රධ්‍ය අයියා හිනාවුනා..

" අමාරුද.."

" අමාරු කියන්නෙ.. විකාර තිබ්බෙ.. මිසිස් පෙරේරගෙ ලමයගෙ ජෙන්ඩර් එකයි මහින්ද මහත්තයා බදාදට අදින ජොකාගෙ පාටයි.."

" අඩෙ ඒවත් තිබ්බද.."

" නෑ නෑ මම ඒක නිකං කිව්වෙ.. අනේ මේ රධ්‍ය අයියෙ!!!"

" හරි ඉතින් කේන්ති ගන්න මොනවහරි මම කිව්වද නැනෙ.. මොකද මේ.."

" මොකුත් නෑ.."

මම රධ්‍ය අයියට රවලා ඉස්සරහා බලාගත්තා.. ගැටපොළොස් කොටෝරුවා.. මම මොනවහරි කිව්වොත් හැමතිස්සෙම මූට විහිලු තමා මතක් වෙන්නෙ.. රධ්‍ය අයියා හිමින් සැරේ එහාපැත්තයි මෙහාපැත්තයි බලලා මම උකුළ උඩින් තියාගෙන ඉදපු අතක සුළගිල්ල හිමින් අල්ලගත්තා.. මම ඒ එක්කම එයා දිහා බැලුවා.. ඔහොම ඉදලා ඉදලා ඇගේ වැදුනත් හරි අමුතුයි වගේ.. ඇගේ වදින්න ඕන නෑ දැක්කත් පපුව හිරිවැටීගෙන යනවා.. හරියට මම එයාව අද ස්ටෙයාර්ස් වලදි දැක්කා වගේ.. හුරු නැති ගතියක් එක්ක ලැජ්ජාවක් දැනෙනවා.. ඩිම් වෙලා තිබුනු

@Shan

ඔඩියන්ස් ලයිට්ස් වලින් මට එයාගෙ අර, හුගක් කතා වලින් පිරිලා තියෙන දිග ඇහිපිය වලින් බාගෙට වැහුණු ඇස් පෙනුනා..

" පහුගිය සතිදෙකට මට හිතුනා එදා උඹේ දිහා නොබලා අහක බලාගෙනම ගියානම් හොදයි කියලා.."

එයා මගේ ඇස් දෙක දිහා කෙලින්ම බලාගෙන කිව්ව දේ තේරුම මොන වගේ එකක්ද කියලා මට තේරුණේ නෑ.. මම එයාගෙ මූණ දිග අබලාගෙනම හිමින් එයාගෙ ඇගිලි වල මගේ ඇගිලි ලාවට පටලගත්තා..

" ඒ කිව්වෙ..??"

" මම දවසක් කිව්වෙ.. උඹ නොදැක ඉඳලා හුරු නැති නිසා දැන් එහෙම ඉන්න හැටි මට මතක නෑ කියලා.."

" ම්ම්.."

" සිරාවටම මට මතක නෑ තමයි.."

මම රධ්‍ය අයියා දිහා බලාගෙන හිනාවුණා.. එයා ඒ වෙලාවෙ ඒක කියන මොහොත වෙනකල්ම 'ආදරේ කරන්න ගිහින් මට මාවම නැතිවුණා' කියලා මම අහපු කතාව මොන වගේ හැඟීමක් ගේන එකක්ද මට තේරිලා තිබුනේ නෑ.. ඒත් මට ඒක මේ වෙලේ දැනුනා.. හුගක් තදින්ම දැනුනා.. මම මට දැනුනේ කොච්චර තදින්ම ඒ සමානවම රධ්‍ය අයියගේ අතින් තදින් අල්ලගෙන ඉඳලා අතෑරියා.. ඊළගට එයාගෙ මෙඩ්ල් එක ගන්න යන්න ඕන නිසා..

"  Radhya Shanav Helaksha, Deputy Games Captain of the school, who has proudly completed his service of the year, was awarded as the most disciplined and law-abiding cadet soldier.. We appreciate his dedication and interest at this time and thank you for all the achievements you have brought for the school..."

රධ්‍ය අයියා එයා ඉස්කෝලෙ ජීවිතේදි ගන්න අන්තිම මෙඩ්ල් එක චීෆ් ගෙස්ට් අතින් අරගනිද්දි මට මතක් වුනේ එයා අවසාන වතාවට කැඩෙට් යුනිෆෝම් එක ඇඳගෙන ඇවිත්, ඒක එයා අන්තිමටම කැඩෙට් යුනිෆෝම් එක අදින දවස කියලා මට කියපු විදිය.. මම එදා එයාව ලස්සනට දැකපු

@Shan

විදිය.. එදා වැස්ස විදිය.. අයුක අයියා අඩපු විදිය.. හවස් වෙනකල් අපි දෙන්නා හෙණ ගගහා වහින වැස්සෙ කියව කියව පඩිපෙලේ ඉඳගෙන ඉඳපු විදිය.. මාව නැතුව සේපාලිකා ගහට පාළු හිතෙයිද ඇහුවහම පාළු හිතෙන එකක් නෑ ඒත් මතක තියෙයි කියපු විදිය.. අපි වැස්සෙම දුවගෙන ගියපු විදිය.. එතකොට අර එයා I believe in running through the rain and crashing into the person you love and having your lips bleed on each other කිව්ව විදිය.. මට රතුවෙන්න එපා කිව්ව විදි-

දෙයියනේ..!!

මම එකපාරට ගැස්සිලා ගිහින් හරි සිහියට ආවා.. ඒක කොච්චර කාලෙකට කලින් වෙච්ච දෙයක්ද.. මට ඒ හැමදෙයක්ම දැන් ටිකකට කලින් වුනා වගේ මතක් වුනු විදිය ගැන මට බය හිතුනා.. මම එයාට ඒ තරමම ලං වෙලාද කියලා හිතුනා.. මෙච්චර පොඩිම දේවලුත් මතක හිටින්න තරම් මට මොකක්ද මේ වෙලා තියෙන්නෙ කියලා මම දන්නෙ නෑ.. මම දෙසැරයක් හිමින් පපුවට ගහගෙන ඉස්සරහා බලාගත්තා.. එකපාර සතුටු හිතෙන්නත් බය හිතෙන්නත් ඕන වෙලාවක්.. සතුටු හිතෙන්න ඕන අනිවාරෙන්.. මම දන්නවා හිතට එකහව මම එයාට සෑහෙන්න ආදරෙයි.. බයවෙන්න ඕන කාරනේ මම එයාට හුගක් බැඳිලා තියෙන එක..

බැඳීමයි ආදරෙයි මම හිතන්නෙ දෙකක්.. ඒ දෙක එකපාරම වෙනවනම්.. ඒ දෙකම හරි ලස්සන හැඟීමක් හිතට ගේනවනම්.. මම හිතනවා මේ ලෝකෙ තියන හැම ආදර කතාවක්ම ලස්සන වෙනවා කියලා.. ආදරේ හිතුණු පලියට බැඳීම් ඇතිවෙන්නෙ නෑ..

ආදරේ හිතුණු පලියට බැඳීමක් හයිය නැත්නම්.. වැඩක් නෑ.. ඒක දිරාපු පාලමක් වගේ කඩාගෙන පහලට වැටෙනවා..

මම රධ්‍ය අයියා ස්ටේජ් එකෙන් බැහැලා මං ගාවින් ඇවිත් ඉඳගන්න විදිය බලාගෙන ඉදියා.. ඊළගට අයුක අයියට අවෝර්ඩ්ස් දෙකක් හම්බුණා ක්‍රිකට් වලින්.. සෙනුකට ස්විමින් වලින් කලර්ස් තිබුනා..

සෙරමනි එකේ අන්තිම වෙද්දි රෑ දහයට විතර ඇති.. මමනම් ඉදියේ මහන්සියෙන්.. කෝක් දෙකකුත් බීලා මගේ ඉතුරු කලර්ස් ටික අරගෙන ගෙදර යන සිහියෙන් මම ඉදියෙ.. කෙල්ලො වගයක් නටන වෙලාවෙ මම ශේප් එකේ එළියට පැනලා සොෆ්ට් ඩ්‍රින්ක්ස් වගයක් උස්සගෙන ආවා..

@Shan

අවසානෙ මට මගේ ඉතුරු බැජ් දෙකත් හම්බුනා..

" Shaneru Udyoga will be awarded as the best player of the year 2023.. We invite him on the stage with great respect.. We appreciate him for all the achievements he has brought to our school as the leader of the school badminton club and for the wonderful sports skills he has shown in the school sports meet.."

මම හිනාවෙලා ගිහින් චීෆ් ගෙස්ට් අතින් මගේ කලර්ස් බැජස් අරගෙන හැන්ඩ්ශේක් කල්ලා ස්ටේජ් එකෙන් බැහැලා ඇවිත් වෙයා එකෙන් වාඩිවෙන්න ගියාම රධ්‍ය අයියා එතන ඉදියේ නෑ.. නෆ්‍රාස් ඒ වෙලේ ස්ටේජ් එකේ ඉදියේ.. ඒ එක්කම මම නිකමට ඉස්සරහා ඉදපු සෙනුකයා දිහා බලද්දි ඌ මට නවරගහලේ පැත්තෙන් තියන එක්සිට් ඩෝ එක පෙන්නුවා.. මෙකා කියන්නෙම නැතුව එළියට ගිහිල්ලද..

මම ශේප් එකේ වටපිට බලලා එක්සිට් ඩෝ එකෙන් එළියට එද්දි රධ්‍ය අයියා එතන එලියේ බිත්තියට හේත්තු වෙලා කකුලකුත් වන වන ඉන්නවා.. මම ඒ මනුස්සයගෙ උඩ ඉඳන් පල්ලෙහාටම බලලා ලඟට ඇවිදගෙන ගියා.. මූණෙ තියන හිනාවනම් මට එච්චර ඇල්ලුවෙ නෑ..

" මොකද එළියේ.. මේක ඉවර නැනෙ තාම.."

" ඉවරයි වගේ තමා.. ඇයි තව මොනවහරි ගන්න තියේද.. ඔය ගත්තා මදැයි.."

" ඒකනම් එහෙම තමා.. අම්මෝ මගෙ කොන්ද රිදෙනවා.."

මම වාඩිවෙලා ඉදලම ඇදුම් දෙන කොන්ද පොඩ්ඩක් කෙලින් කරගෙන දෙපැත්තට අත් දෙක වැනුවා.. පොඩ්ඩක් හෙලවුනත් සළඹ පත්තිනි වගේ සලාං ගාලා මෙඩල්ස් එකට එකට වදිනවා.. හරි කරදරයක්..

" මෙ වරද්.. මම උඹට අර ඉස්කෝලෙ ඉන්නවා කිව්ව හොල්මන පෙන්නන්නද.."

" මොන?? අර මෙන්හෝල් එක යට ස්ටෝරුම් එකේද.."

" ම්ම්.."

@Shan

මම ඒ පැත්තට ඔලුව දාලා බැලුවහම එකපාරම හීතල හුලගක් හමාගෙන ගිහින් ඇතින් බල්ලෙක් උඩුබුරු දාන සද්දයක් ඇහිලා මාව හොල්මන් වෙලා ගිහින් සුදු ඇදගත්තු මිනිස්සු කුරුස ගහපු කනතු වලින් නැගිටලා එනවා මැවිලා පෙනුනා.. මාව එහෙමම හිරිවැටිගෙන ගියා..

" අනෙහ්.. මේ.. ඔන මගුලක යන්න කතාකරන්න.. මේ අවුරුදු දෙසීයක් විතර හද්දා පරණ ඉස්කෝලෙක නම් හොල්මන් බලන්න යන්න කතාකරන්නෙපා.. මම එන්නෙ නෑ.. සැක් බයත් හිතුනා.."

මම අත් දෙකින්ම මාවම බදාගෙන බිත්තියට හේත්තු වුනා..

" එනවකො ඉතින්.. පෙන්නන්න මගුල.. මම කැඩෙට කරද්දි මෙකෙ මැද්දෙන් රෑට වොශෲම් පවා යනවා.. මොකෙක්වත් නෑ බං.."

" එහෙනං තවුසෙත් මනුස්සයෙක් නෙමෙ.. හොල්මනක් නේ..??"

" ම්ම්ම්.. හොල්මනක් තමා.. කොහොමද හරියටම කිව්වෙ.."

" මෙ සුවදින්නෙ මහත්තයො.."

මම අර අම්‍රිතා හදුන්කුරු ඇඩ් එකේ සීයා වගේ කතාකරද්දි රධ්‍ය අයියා එකපාරම මගේ අතින් අල්ලගත්තා.. මේ නම් හොදකට නෙමෙයි පුතෝ.. මමනම් එන්නෙ නෑ..

" අනේ මේ බල්ලෙකුත් උඩුබුරු දානවා හලෝ.. කුණුහර්පනම් කරන්න එපා.. සිරාවටම මේ ඉස්කෝලෙ හොල්මන් ඉන්නවා.."

" ඉතින් වරෙං.. ගිහින් ඒකව හම්බෙලා එන්න.. මාර බයක්නෙ යකෝ මේක.."

" බයයි තමා.. අම්මගෙන් පස්සෙ බයම හොල්මන් වලට.."

" වරෙං වරෙං හොල්මන් බලන්න යන්න.."

මම රධ්‍ය අයියගෙ අත ගලවගන්න යද්දි රධ්‍ය අයියා තද කල්ලා මගේ වැලමිට ගාවින් අල්ලගෙන එතන තිබ්බ පඩි දෙක බැහැලා මෙන්හෝල් එක පැත්තට දුවන්න ගත්තා.. බොරු කියන්න ඕන නෑ.. ඒකටනම් සිරාවටම බය හිතුණා.. මේ රෑ දොළහට කිට්ටු කරපු වෙලාවක මෙකා එක්ක හොල්මන්

@Shan

බලන්න ගිහිල්ලා.. යකෙක්වත් ගැහුවොත්.. අනික මෙහේ හෙන ෆේමස් අපේ ඉස්කෝලෙ හොල්මන් ඉන්නවා.. මේකා කියන තැන අනිවා ඉන්නවා.. බල්ලොත් උඩුබුරු දානවා.. හුළඟත් හීතලයි.. මට වෙලාවකට හිතෙනවා රධ්‍ය අයියා කියලා මාව ඇදගෙන දුවන්නෙත් වෙන මොකෙක් හරි හොල්මනක්ද කියලා.. ඔහොම මනස්ගාත පන්සීයක් විතර මගේ ඔලුවෙ මැවෙද්දි මම එක අතකින් බ්ලෙසර් එකේ තිබ්බ මෙඩ්ල්ස් ටිකත් අතින් ඇඟට තියලා තද කරගෙන දුවගෙන ආවා.. ඒක හෙල්ලෙද්දි කාංචනා වගේ.. 'සලාං සලාං' සද්ද ඇහිලා නැති හොල්මනුත් නැගිටලා එනවා..

කොහොමහරි රධ්‍ය අයියා මෙන් හෝල් එක පේන්න ඔන්න මෙන්න තියෙද්දි හැරුණේ මෙන් හෝල් එකට යන පාරට නෙමේ.. බුදුමැදුරට යන පාරට.. හිතලා බලන්න.. බල්ලෙක්වත් නැති මේ හරියෙ මනුස්ස පරානෙකට කියලා ඉදියෙ අපි දෙන්නා විතරයි.. දවල්ට ඉස්කෝලෙ ලස්සනයි තමා ඒ වුණාට රෑ වුණාම ඒක වෙනමම කතාවක්.. ලස්සන නෑ පොඩ්ඩක්වත්.. මල කනත්තක් වගේ.. යාන්තම් බුදුමැදුර ගාව එළියක් තිබුනා එතන පඩිපෙළට දාපු.. රධ්‍ය අයියා මගේ අත අතෑරියා..

" ඒ මේ අත අල්ලගන්නවා.. මොන මගුලක්ද.. මට බයයි.."

මම බලෙන්ම රධ්‍ය අයියගෙ අත අරගෙන මගේ අතේ පටලගත්තා..

" බයද.."

" තවුසෙ.. මම තවුසෙ අල්ලගන්නම් අයියෙ.. අම්මපා මම හොද වැඩක් කරනවා මේ කරපු වැඩේටනම්.."

රධ්‍ය අයියා හිනාවෙලා මගේ අතින් ඇදලා ලගට අරගෙන කර වටේ අතක් දාගත්තා..

" හොද වැඩ කරන එක හොදයි තමා.. මට දවසක් එක්කෙනෙක් එහෙම කිව්වා.."

රධ්‍ය අයියා බුදුමැදුර පිටිපස්සට ඇවිදගෙන යද්දි මම කල්පනා කලේ මොන එහෙකටද හොල්මන්බලන්න බුදුමැදුරට ආවෙ.. එහෙම නෙමෙයිනෙ වෙන්න ඕන.. බුදුමැදුරෙ ලාවට පිරිත් සද්දයක් ඇහෙනවා.. පොතේ හැටියට එහෙමනම් හොල්මන් එන්නෙ නැනෙ.. මට ලාවට සේපාලිකා ගහේ සුවද නහයට දැනෙනකල්ම වෙන්නෙ මොකක්ද කියලා මොලේට

@Shan

වැටහුනේ නෑ.. මම හිතාගෙන් ඉදියේ සිරාවටම මේ හොල්මනක් බලන්න ආවා කියලා.. සැක් සැක් කොහොමද මට අමතක වුනේ.. වරද් උඹනම් අම්මා කියනවා වගේම පොල්පිත්තෙන් කපාගෙන තමා..

මම රෑ අන්දකාරෙට හිතින් පිං දිදී සේපාලිකා ගහ යටට ආවා.. හොඳවෙලාවට කලුවර.. මගේ මූණ ගිනිගන්නවා වගේ.. අනික හෙන ලැජ්ජයි.. ආයෙම මට දුවගෙන නවරහහලට යන්න හිතුනා.. මම ලැස්ති නැනෙ.. මෙතෙන්ට එන්න කලින්වත් දැනගෙන ඉදියනම්.. මට හිත හදාගන්න තිබ්බා.. ඒත් ආයෙම මේ හොල්මන් පාරෙ දුවගෙන යන්නත් බෑ.. මූ මහ කපටියි..

රධ්‍ය අයියා මගේ උරහිසින් අල්ලලා මාව බිත්තියට හේත්තු කලා.. මම මූණ පහලට හරවගෙන බ්ලෙසර් එකේ කොණක් අතට ගුලි කරගෙනම ඉදියා.. අඩුම තරමෙ මට හඳේ තියන එළියෙන් පේන රධ්‍ය අයියගෙ මූණ දිහාවත් බලන්න තරම් ගටක් නෑ.. තියා මට මේ වෙලාවෙ මේ වෙන දේ වෙන්නෙ හැබැහින්ද කියලවත් විශ්වාසයක් තිබ්බෙ නෑ.. අවුරුද්දක් තිස්සේ හිතුවා තමා මෙහෙම දවසක් ඒවි කියලා.. ඒත් ඒක සේපාලිකා ගහ යටම වේවි කියලා මම කීයටවත් හිතුවෙ නෑ..

" වරද්.."

රධ්‍ය අයියා මගේ අත් දෙක එයාගෙ ලොකු අත්වල ගුලි කරගෙන මගේ නම කියලා කතාකලා.. එයාගෙ අත්වලට දාඩිය දාලා.. මට දැනෙනවා.. ඒවා ලාවට වෙවුලනවා වගේ.. මගේ අත් වලටත් දාඩිය දාලා.. මෙච්චර කාලෙකට මට රධ්‍ය අයියා ගාවදි මෙහෙම අන්කම්පටබල් ගතියක් දැනිලා තිබ්බෙම නෑ.. මගේ පපුව ඊළගට එන හැම මොහොතක්ම බලාපොරොත්තුවෙන් හයියෙන් වේගෙන් ගැහෙනවා.. මට පාලනය කරගන්නවත් බෑ..

" මම්.."

" ඔලුව උස්සලා මං දිහා බලන්න.."

රධ්‍ය අයියා කවදාවත්ම මම අහපු නැති විදියේ කටහඬකින් කතාකරද්දි මම හීනියට අපේ වටේ තිබ්බ එළියෙන්ම රධ්‍ය අයියගෙ මූණ දිහා බැලුවා..

" වරද්.. මම.. උඹට-"

@Shan

රධ්‍ය අයියගෙ කටහඬ වෙවුලනවා වගේ.. කියන්න ගිහිල්ලත් ආයෙම නවත්තගත්තා.. ඊළගට මං ගාවට අඩි දෙක තුනක්ම කිට්ටු වුනා.. එයාගෙ ඇගට මාව වැහිලා තිබුනේ.. එයා මට වඩා උසයි.. ඒකනිසා මට තව ටිකක් එයා දිහා ඔලුව උස්සලා බලන්න වුණා..

" මම මේක ගොඩක් කාලෙක ඉඳලා හිතේ තියාගෙන ඉන්නෙ වරද්.. මේ වෙලාවෙ වුණත්.. මේ වෙන දේවල් වෙන්නෙ ඇත්තටමද මට හිතාගන්න බෑ.. මේකත් මම හැමදාම දකින හීනෙක කොටසක්ද මම-

" මම දන්නෙ නෑ.."

රධ්‍ය අයියගෙ කටහඬ කලබලෙන් තැනින් තැන කැඩුනා.. ඒත් එයා එහෙම වුනත් දිගටම කතාකලා..මම බලාගෙනම ඉදියා..

" මම උඹට නොසෑහෙන්න ආදරෙයි වරද්.. මාරම ආදරෙයි.. කොච්චරක්ද කියලා දන්නෙ නෑ.. උඹ වෙනුවෙන් මට කරන්න පුලුවන් උපරිමේ වෙනකල්ම ආදරෙයි.. "

රධ්‍ය අයියා මගේ අත් දෙක අතෑරලා මගේ කම්මුල් දෙපැත්තෙන් අත් තියලා මගේ මූණ දෝතටම අරගත්තා.. මගෙ උගුර හිරවෙනවා වගේ දැනෙනවා..

" මම පොඩ්ඩක් හිස්තැනක්වත් නැතිවෙන්න උඹට ආදරෙයි.. My feelings for you are a miracle.. Not like walking on water, but pretty darn close..

මට-මටත් ආදරෙයි නේද.."

රධ්‍ය අයියගෙ ඇස් පිහාටු මගේ ඇස් පිහාටු එකට එක ගෑවෙන්න තිබ්බෙ දශම ගානක් වගේ පොඩ්ඩපොඩි හිඩැසක්.. මට එයාගෙ උනු හුස්ම දැනෙනවා.. සන්සුන් නැති විදියට උඩ පහළ යනවා.. මම නිදහසේ තිබ්බ මගේ අතක් රධ්‍ය අයියගෙ උරහිසින් තියාගත්තා.. අනිත් අතේ ඇඟිලි තුඩු එයාගෙ බෙල්ලෙ හිමිහිට ගෑවෙන්න අල්ලගත්තා.. හිත හිත ඉන්න තරම් ප්‍රශ්නයක් නෙමෙයි ඒක.. උත්තරේ මම දන්නෙ හුගක් කාලෙකට කලින් ඉඳලා...

" මම ආදරෙයි.."

@Shan

මම ඉස්සිලා රධ්‍ය අයියගෙ කම්මුලෙන් හාදුවක් තිව්වා.. මගේ ජීවිත කාලෙම මම මෙහෙම අත්දැකීමකට මූණ දීලා තිබුනෙ නෑ.. ඒත්.. ඒක හරි ආදරණීයව මගේ හිතේ ඇඳුනා.. මේ මොහොත දිහා මට පිටින් ඉඳන් බලන් ඉන්න ඇත්නම් හිතුනා..

රධ්‍ය අයියා ඇහිබැම එකට ලං කරන්, මං දිහා පරිස්සමින් තියාගත්තු වටින දෙයක් දිහා බලනවා වගේ හරි ආදරේ පිරුනු ලෝබ හිතෙන හැඟීම් පොදි බැඳුනු බැල්මකින් බලාගෙන ඉදියා.. මට එයාගෙ හුස්ම ලගින් දැනෙනවා.. හුගක් ලගින් දැනෙනවා.. ඒවා මගේ තොල් වල වදිනවා.. ඕනවටත් වඩා ලගින්.. ඒවා දැනෙන අතරෙම මට එයාගෙ අතේ ඇඟිල්ලක් අපි දෙන්නගෙ තොල් අතරට මැදි වෙනවා දැනුනා..

රධ්‍ය අයියා එහෙමම නැමිලා මගේ මූණට බර වුණා.. මගේ තොල් වල ගෑවෙන ඇඟිල්ල හිමින් පහලට රූට්ටලා යනවා.. ඒක එන්න එන්න නැතිවෙද්දි එයා එකසැරේම මගේ නිකටින් උස්සලා මගේ තොල් වලට බර වුණා.. රධ්‍ය අයියගෙ උරහිසක තිබුනු මගේ අත් එයාගෙ බ්ලෙසර් එකේ උරහිසේ තිබුනු ස්පොන්ජ් එක තද කල්ලා මිරිකිලා යන්නම අල්ලගත්තා..

ඒක.. ඒක මට දැනෙනවා.. මගේ ඇස් පිහාටු අමුතු මායාවකට අහුවෙලා මත් වෙලා, යනවා වගේ, ටික ටික පියවිලා යද්දිත් රධ්‍ය අයියා පොඩ්ඩක්වත් හෙලවෙන්නෙ නැතුව මාව බිත්තියට මැදි කරගෙන එහෙමම ඉදියා.. මම එයාගෙ බෙල්ලෙ දැවටිලා තිබුනු ඇඟිලි තුඩු එයාගෙ කොලර් එකේ අමුණලා පහලට බලෙන්ම ඇදගනිද්දි එයාට එහෙමම හිනා යනවා මට දැනුනා.. එයාගෙ තොල් මගේ තොල් උඩම තියෙද්දිත් එයා හිනාවුනා.. මම එයාගෙ ඇගටම ඇදිලා ගිහින් හිතලාම ඒ තුරුලේ හිරවුනා.. එයා අත අතක් මගේ ඉණ වටේ යවලා අනිත් අතින් මගෙ උරහිස් තද කල්ලම අල්ලගත්තා.. මම තව එයාගෙ කොලර් එකෙන් ඇද්දා.. ඒ එක්කම රධ්‍ය අයියා මගේ යටිතොල එයාගෙ තොල් මැද්දට අරගෙන ඒවා අමුතු තාලෙකට උරවන්න ගත්තා.. මම මොකුත්ම නොකර එහෙමම ගල් ගැහිලා වගේ  ඉදියත් හිත යටින් ඒකට කැමති වෙන ගමන් හිටියා වගේම ඒක තව තව ඕන වෙනවා කියලා හිතට දැනෙන්න ගත්තා.. මගේ ඇස් පිය බර වෙලා පියවෙනවා.. ආයෙම දිගෑරෙනවා.. එයාගෙ ඇස් වලින් ගලාගෙන ආපු සීතලම සීතල එක කඳුලු බිංදුවක් කම්මුල් දිගේ ගලාගෙන ඇවිත් මගේ අතේ මැණික් කටුව හරියට වැටිලා එතනින් රූට්ටගෙන පහලට වටුණා.. මට දැනුනා..

@Shan

රධ්‍ය අයියා මගෙන් ඈත් වෙලා මගේ බෙල්ල පැත්තකට ඇල කරලා අයෙම කලින් වතාවට වඩා හුරු ගතියෙන් මගේ තොල් වලට පහත්වෙලා ඒවා උරවන්නත් සමහර වෙලාවකට නොදැනෙන්න හපන්නත් ගත්තා.. ඒ වෙලේ තිබුනු වටපිටාව හුලගකින්වත් අපිට බාධාවක් කලේ නෑ.. මම එයාගෙ කොලර් එකෙන් තදින් අල්ලගෙන මගේ ළගට තව ඇදගන්න ගමන් බෙල්ල වටේ අතක් යවලා තව තදින් තුරුලු වුණා.. රධ්‍ය අයියගෙ අත් තවදුරටත් මගේ ඉණේ තිබුනේ නෑ ඒවා දනටමත් මගේ බ්ලෙසර් එකට යටින් පිටකොන්ද දිගේ උඩට පහලට යනවා..

අපේ හුස්මගන්න සද්දෙ එන්න එන්නම වෙගෙ වැඩිවුනා මිසක් අඩු වුනේ නෑ.. එයා මාව සිපගත්ත වේගෙටම පෙරලා මාත් එයාව සිපගත්තා.. හරියට ඒක ඇබ්බැහිවීමක් වගේ.. අපි දෙන්නගෙන් එක්කෙනෙක්ටවත් මොහොත්කටවත් නවතින්න ඕන වුණේ නෑ.. මම රධ්‍ය අයියගෙ බ්ලෙසර් එකේ බටන්ස් දෙක ගලවලා දාලා ටයි එකෙන් පහලට ඇද්දහම එයා මගේ කට දෙපැත්තෙන් තද කල්ලා අල්ලගත්තා.. මගේ අත්, එයාගෙ පිරිලා තියෙන පපුව පුරාම යනවා..

රධ්‍ය අයියා ඒ එක්කම මගේ අත් දෙක තද කල්ලා අල්ලගෙන මගේ ඇගට පිටිපස්සෙන් තියලා, මාව බිත්තියට තද කරගෙන මගේ තොල් වලින් ඈත් වුණා..

" මගෙ වරද්.. Come to your senses.."

රධ්‍ය අයියා මගේ කනට ලං වෙලා කියද්දී මම ඉදිමිලා ඇදුම් කන යටි තොලත් හපාගෙන එයා දිහා බලන් හිටියා.. එයා ඇගිල්ලකින් මගේ තොල් දත් වලින් නිදහස් කලා.. ඒත් මම ඉදියේ හති දාන ගමන්.. මොකක්ද දෙයියනේ ඒ වුනේ.. මට හිතාගන්න බෑ.. වැස්සක් වැහැලා පායලා වගේ දැනෙනවා.. ආයෙමත් මට ලැජ්ජවක් දැනෙන්න ගත්තහම රධ්‍ය අයියට ඒක තේරිලා මගේ මගේ අත් දෙක අතෑරලා මාව පපුවට තියාගෙන තද කල්ලා බදාගත්තා.. අර සනීප සුවද එයාගෙ පපුවෙන් ගලාගෙන එනවා.. මම ඒකෙන් පුරුදු විදියටම පෙණහළු පුරවගත්තා.. ඒක 'මගේ' කියලා හැගීමක් දැනෙනවා..

" තව එකම එක සැරයක් ආදරෙයි කියන්න වරද්.. එකම එක වතාවක්.."

රධිය අයියා මගේ උරහිස් අතගාන ගමන් කියද්දි මම එයාගෙ පපුවට නිකට තියාගෙන එයාගෙ මූණ දිහා බලාගෙන හිටියා..

@Shan

" ආදරෙයි.. ගොඩක් ආදරේ හිතෙනවා.."

රධ්‍ය අයියා මගේ තොල් වලා පහත් වෙලා පුංචිම පුංචි පෙක් එකක් තිව්වා.. ඒ එක්කම එයා මගේ කලිසමේ සාක්කුවට ලැම්නේටඩ් මොකක් හරි දානවා මට දැනුනා.. මම ඒක ගන්න හැදුවත්..

" දැන් නෙමේ.. ගෙදර ගිහින්.."

කෑවා නේත කට.. ඔතරිට මහන්සියෝ~ දැන් ඔය ළමයි සැපසේ නිදන්න.. සරිත..

ඊළග වැප්පෙන් එන්නම් මගෙ දළඹු ලමයිනේ.. වචන පන්දාහ පැනලා ලිව්වා.. ඒ නිසා කමෙන්ටුවක් දැම්මෙ නැතොත් තරහා වෙනවා.. හුහ්..

එන්නාම්.. ලව් යූ.. ❤

මගෙ දළඹු පැටව් ටික.. වෙසක් කූඩු හැදුවතේ..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 68 කොටස

" සුදුමහත්තයා.. මේ නැගිටලා මට මේ තෙල් ටික කොණ්ඩෙ ගාලා දෙන්නකෝ.."

" අනෙ මම නිදි අප්පා.. මේ උදේම නාන්න ඕනද.. දවල් වෙලා ගාන්නම.."

" එහෙනම් දවල් වෙලා ගාලා දෙන්න ඈ.."

" හා හා.."

මම ඇදේ වටයක් කැරකිලා කොට්ටෙ උස්සලා මූණෙ තියාගත්තා.. අපේ අම්මා උදේම නැගිටලා උයනවා.. මටත් පුරුද්දට හතරට නැගිට්ටෙනවා වෙනදා වගේ.. මම හතරට නැගිටලා ආයෙම හත වෙනකල්ම නිදාගත්තා.. ඊයෙ ගෙදර එද්දි රෑ දොළහත් පහුවෙලා.. මමනම් වැනි වැනී ඇවිත් එහෙමම ඇඳට වැටුනා විතරයි මතක ඇඳන් ඉදපු ඇඳුම් පිටින්.. එහෙම පැයක් විතර නිදාගෙන හිටියට පස්සෙ අම්මා ඇවිත් බලෙන්ම ඇදගෙන ගිහින් මාව නානකාමරේට දාලා ඇග හෝදගන්න කිව්වා.. ඉතින් ඊයෙ අපි දෙන්නම නිදාගත්තෙ පාන්දර.. ඒ වුණාට අම්මා පුරුදු විදියටම උදේ නැගිටලා උයනවා.. කොහොමත් එහෙමනෙ.. හෙන ගගහා වැස්සත් අම්මා රෙද්ද පොරවගෙන හරි උයනවා..

අපේ අම්මයි රධ්‍ය අයියගෙ අම්මයි ඊයේ මුලු සෙරමනි එක වෙලාවෙම කියවලා පස්සෙ පාකින් ලොට් එකට වෙලාත් හෙන වෙලාවක් කියෙව්වා.. ඊටපස්සෙ ඒකට සෙනුකයගෙ අම්මත් එකතු වෙලා තව පැයබාගයක් විතර කියවනකල් මමයි සෙනුකයයි රධ්‍ය අයියයි අපි තුන්දෙනාම බ්ලෙසර්, අරවා මෙවා, අම්මලගෙ හැන්ඩ්බෑග් සේරම එල්ලගෙ මොක්කුද තුන්දෙනා වගේ ජේළියට බිත්තියකට හේත්තුවෙලා ඒ කියන ඒවා ඉවරවෙනකල් අහගෙන ඉදියා.. ආයෙනම් අම්මලා එක්කන් මොකකටවත් යන්න හොද නෑ.. පුදුම කට්ටක් කෑවෙ ඒක නිසා..

අන්තිමට ඒ සුහද ළිද ළග සංගමේ ඉවරවෙලා අපි එන්න ආවා.. පුදුම චීත්ත තුනක් තමා සෙට් වුණේ.. හරිම සෝක්..

@Shan

අනිත් එක ෆොටෝග්‍රැෆි සොසයිටි එකේ අයියලා ටික.. හැම එකා එක්කම ෆොටෝ වලට හිනාවෙලා ඉඳලා මගේ හක්ක පැනලා තිබ්බෙ.. අපේ අම්මටත් ඒකනම් එපාවුණාද කොහෙද.. කොහොමහරි ඉතින් අපේ ගෙදර දෝණිත් බෝයි ස්කූල් එකක මැගසින් එකක ලස්සනට ප්‍රින්ට් වෙලා ඉදී ලබන සතිය වෙද්දි.. ඒකත් ඉතින් ලේසි පාසු බෝයි ස්කූල් එකකද.. අම්මට මම වගේ පුතෙක් ඉන්න නිසා ඉතින් හොදයි..

මම කොට්ටෙ බදාගෙන ඇඳේ මුනින් අතට හැරිලා නියපොත්තක් හපන්න ගත්තා.. සෙරමනි එක නෙමේනෙ.. ඊයෙ වෙච්ච දේවල් මුල ඉඳන් මොලේට ප්‍රොසෙස් කරගන්න එපැයි.. මදැයි හොල්මන් බලන්න ගියා.. මතක් වෙද්දිත් මගේ අත පයේ ඉඳන් රතු වෙන්න ගත්තා.. දැන්නම් වෙච්ච දේවල් මතක් වෙද්දි රෙද්දක් ඇඳන් රධ්‍ය අයියගෙ මූණ බැලුවෙ කොහොමද කියලා මටම හිතාගන්න බෑ.. හත්දෙයියනේ මම ඒ මනුස්සයට බලහත්කාරකම් කලා නේද.. සැක් වරද්.. උඹ හිටියේ කොහොමද හොර බළලා වගේ.. උඹ හොදයි.. ඒකා හිටියෙ කොහොමද.. උපාසක බලලා වගේ.. බේසික බළල්ලු දෙන්නා..

මම කොට්ටෙ අස්සෙන් ෆෝන් එක අරගෙන වට්සැප් ලොග් වුණා.. උදේම ආධ්‍ය අයියා මැසේජ් දෙකක් දාලා.. මම රධ්‍ය අයියා එවපු මැසේජ් එක බලන්නත් කලින්ම ආධ්‍ය අයියගෙ චැට් එකට ගිහින්ෙවාපු මැසේජ් දෙක බැලුවා.. නෑ නෑ එවලා හිබුනේ එක මැසේජ් එකයි.. අනික වීඩියො එකක්.. මම ඒක ලෝඩ් වෙනකල් ඉඳලා ප්ලේ කල්ලා බැලුවා..

අප්පදබොල රධ්‍ය අයියා උදේම තේ හදනවද කොහෙද.. කුස්සියේ පැන්ට්‍රි එකට හේත්තුවක් දාගෙන තනියම හිනාවෙවී තේ එක හැඳිගානවා.. ඒකත් හැඳි මිටෙන්.. මේ මිනිහට මක් වෙලාද.. ගුලියක්වත් කාලද උදේ පාන්දර..අනික හිනාව යකෝ.. මාර පැණි බේරෙන හිනාවක්නෙ තියෙන්නෙ.. සැක්.. දකිද්දිත් මට ඊයෙ වෙච්ච ඒවා මතක් වෙලා මූණ ගිනිගන්නවා වගේ දැනුනා..

" Being single doesn't mean no one loves me... it just means God is busy writing my love story 😂 bro crazily in love #single4ever #singlebells #ගෞරවයෙන්බුදුසරණයි.."

මම ආධ්‍ය අයියගෙ මැසේජ් එකට රිප්ලයි එකක් ටයිප් කල්ලා යැව්වා..

@Shan

" aww how cute mh boyfriend..😊 Anyway, being single for twenty-nine years is not easy අයියෝ #මංගලකිංකිණිදාමුත #සුදුඅම්මියගෙන්ඇත්වෙලාඉන්නහරිත "

ඒ මැසේජ් එක යවලා තප්පර පහක් යන්න වුනේ නෑ මගේ ගැටපොලොස් කොට්ටෝරුවා මට හිමිදිරි පාන්දර කෝල් එකක් ගන්නවා..

" අපේ අයියට මැසේජ් දාන්න පුලුවන්.. මම මොකක් හරි එව්වොත් බලන්න උඹට හරි වෙලා යනව නේද.."

එහාපැත්තෙන් මල පැනපු පොල් කාවයියෙක් කෑගහන සද්දෙ මගේ කන පලාගෙන ගියා..

" ඉතින් අනේ ආධ්‍ය අයියනෙ මුලින්ම මැසේජ් එක එවලා තිබ්බෙ.. එවපු පිළිවෙලට බලන්නෙ මම.. ඔයා මොකටද ආධ්‍ය අයියගෙ ෆෝන් එක බැලුවෙ අනික.."

" බැලුවෙ නෑ එහා කාමරෙන් නොටිෆි සවුන්ඩ් එද්දි මම හිතුවා උඹ වෙන්නැති කියලා.."

" ඌප්ස්.. එහෙමද.. මගෙ අංජනං දෙයියා.."

" මොකා..??"

" අංජනං දෙයියා අනේ.. ඔයාට අංජනක් එළි පවර්ස් තියෙනවනෙ.. මේ වීඩියෝ කෝල් එකකට මම රික්වෙස්ට් කලා.. ඇක්සෙප්ට් කරනවකො.."

" ම්ම්.."

මම ෆෝන් එක ඉස්සරහට අල්ලගෙන කොණ්ඩෙ පොඩ්ඩක් හදාගත්තා.. ම්ම්.. ම්ම්.. ඔය ඉන්නෙ මගෙ ගැටපොලොස් කොට්ටෝරුවා.. මූණ හට්ටියක් කරගෙන..

" ඕ මයි ගෝඩ්.. සී හව් ලකී අයි ඈම්.. මගේ වෙන්ඩ බෝ- සොරී~ බොයිෆ්‍රෙන්ඩ් අංජනං පවර්ස් වලින් දැන් සාස්තරත් කියන්න අරගෙන.."

මම කට උල් කල්ලා ලාවට රධ්‍ය අයියට පේන්න කිස් එකක් දුන්නහම රධ්‍ය අයියගෙ මූණෙ හෙන මනමාල හිනාවක් ඇඳෙන්න ගිහින් ඒකා හිතලම

@Shan

ඒක මූණෙන් මකාගෙන ආයෙම මූණ හට්ටියක් කරගත්තා..

" විකාරද.."

" කාට..?? මටද..??"

" නෑ නෑ මට මට.. මේ ඒකනෙමේ.. හවසට අපේ ගෙදර එනවද.. මම එන්නම් එකකන් යන්න.."

" අද හවස..?? හා එන්නම්.. මේ ඒකනෙමේ කෝ අප්පච්චිලා.."

" උදේම ගියා.. පහට විතර මෙහෙන් ගියේ.."

" එහෙමද.. ඒකනිසා තමා.. හැදි මිටෙන් තේ හදලා තියෙන්නෙ.."

" ඔව්-.. ආ..?? පොඩ්ඩක් ඉදපන්.. උඹ කොහොමද.. අයියෝ!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

රධ්‍ය අයියා ෆෝන් එකත් උස්සගෙන ආධ්‍ය අයියගෙ කාමරේට ගියා.. ආධ්‍ය අයියා ඇදුම් අදිනවද කොහෙද රධ්‍ය අයියා ෆෝන් එක එයාගෙ පැත්තට හරවගෙන ඉදියත් මට පිටිපස්සෙ තිබ්බ කණ්ණාඩියකින් ආධ්‍ය අයියව පෙනුනා.. සැක් උදේ පාන්දර මගේ ඇස් දෙකට මොනවද මේ අහුවෙන්නෙ.. ආධ්‍ය අයියා උඩට මොකුත් නැතුව කණ්නාඩිය ගාවට වෙලා ටවල් එකකුත් ඉණේ පටලන් කොණ්ඩෙ පිහිදනවා..

" මොකද පොඩී කෑගහන්නෙ.."

" මොකක්ද වරද් ට යැව්වෙ.."

" මොකුත් නෑ අනේ.. මම ගුඩ්මෝනින් කියලා යැව්වා.."

" අර තේ හදන එකත් යව්වද.."

" ආ.. සිරාවට පොඩී~ ඒකත් ගිහින්ද.. වැරදිලා එබිලා තමා එහෙනම්.."

ආධ්‍ය අයියා වීදුරු බෝතලයක් අරගෙන ඉස්සරහ හැරුණා.. අනේ දෙයියනේ මුන්ගෙ ඇගවල්.. මට කෙලත් හිරවෙලා හුස්ම ගන්න බැරුව මැරෙන්න ආවා..

@Shan

" කැහ්-කැහ්-මම තියන්නද-කැහ්.."

මම කැස්සක් දාලා ශේප් එකේ කෝල් එක කට් කරන ගියා විතරයි රධ්‍ය අයියා පටාස් ගාලා ෆෝන් එක දිහා බලලා කණ්ණාඩිය දිහා බැලුවා.. ඊටපස්සෙ ෆෝන් එක ශර්ට් එකට තද කරගත්තා..

" හරි බායි.."

මම කෝල් එක කට් කල්ලා දැම්මා.. ඔය බැලුවේ පාන්දර මොනින් ශෝ එකක් ලස්සන.. හරිම හොදයි වරද්.. මිනිහගෙ ඇගවත් හරියට දැකලා නැතුව කලින්ම මිනිහගෙ අයියගෙ සේරම බලාගත්තා නේද.. මෙහෙම ගිහින් නම් උඹට එක ගෙයි තමා කන්න වෙන්නෙ..

මම ඇදෙන් නැගිටලා මූණ කට හෝදගෙන කුස්සියට යද්දි අම්මා උයලා ඉවරවෙලා කුස්සිය අතුත්ගානවා..

" ආ නැගිට්ටද.."

" ඔව් ටිකක් වෙලා.. අම්මෙ මෙ මම හවස රධ්‍ය අයියලගෙ ගෙදර යන්නද.."

" ඒ මොකෝ.."

" නිකන් අනේ.. ගෙදර ඉදන් කරන්න දේකුත් නැනෙ වෙන.."

" හා.. ගිහින් හුගක් රෑ වෙන්න කලින් එන්න ඕන එහෙනම්.."

" හරි හරි කෙල්ලෙ.. ඔයා බයනොවී ඉන්නකො.."

මම අම්මා රත් කල්ලා පැත්තකින් තියලා තිබුණු තැඹිලි තෙල් වලට කරපිංචායි නීලවරියයි කොටලා දාලා හදපු පොඩි තෙල් පිහාන අරගෙන එතන පුටුව උඩ තිබ්බ ටවල් එක කරේ දාගත්තා..

" තෙල් ගාන්න එන්න.."

" හා.."

අම්මා කුස්සිය අස් කල්ලා ඉවරවෙනකල් මම ඉස්තොප්පුවෙ මිටි බංකුවක් තියලා මම උස පුටුවෙන් ඉදගත්තා.. දෝණිගෙ ඔලුවෙ මාසෙකට සැරයක්

@Shan

තෙල් දාලා පීරන්නෙ මම.. මේ ගෙදර තාත්තා,පුතා,දුව,අම්මා කියන භූමිකා සේරම මම එක එක විදියට රඟදක්වනවා.. දැන් රඟදක්වන්නෙ අම්මගෙ අම්මා භූමිකාව..

අම්මා කොණ්ඩෙත් කඩාගෙන ඇවිත් මගේ ඉස්සරහා තිබ්බ බංකුවෙන් ඉඳගෙන මට පනාව දුන්නා.. කොණ්ඩෙ බිම.. මම ඒක අරගෙන මගේ උකුලෙන් තියාගත්තා.. අම්මට මං නිසා හොඳයි ඉතින්.. වෙන පුත්තු නම් කරයි මෙච්චා..

මම අර මාමා ගමේ ගියාම හිඳල දුන්නු ලාවට රත් වෙලා තිබ්බ තැඹිලි තෙල් එක අරගෙන අම්මගෙ කොණ්ඩෙ කොටස් දෙකකට වෙන් කල්ලා එකපැත්තක ගාලා පීරලා පීරලා මසාජ් කල්ලා ඒක තද කල්ලා ගොතලා එහෙමම නමලා ගෙඩියක් ගැහුවා.. ඔහොම කිව්වට පැය ගානක් යනවා සේරම කරන්න.. ඊටපස්සෙ කොණ්ඩෙ අනිත් කොටසෙත් තෙල් ගාලා පීරලා මසාජ් කල්ලා ඒකත් අරගෙන අර විදියටම ගෙඩියක් ගහනවා.. අන්තිමට ටවල් එකක් උණු වතුරෙන් පොගවලා මිරිකලා අරගෙන කොණ්ඩෙ තද වෙන්න ගැටගහලා විනාඩි පහක් විතර තියලා සෝදලා දානවා.. අපේ අම්මා සමහර දවස්වලට හෝදලා ඉවර වුණාම උළුහාලුයි දෙහියි තම්බපු වතුරෙන් ආයෙම අවසානෙට කොණ්ඩෙ හෝදනවා.. එතකොට කොණ්ඩෙ සිනිඳු වෙලා හුළඟට ගහගෙන වගේ යනවා.. අනික සුවඳයිත් එක්කන්..

" අර දරුවගෙ අම්මා හරි හොඳයි නේද සුදුමහත්තයො.. ඊයෙ මාත් එක්ක හරිම හොඳට කතාකලා.."

" එහෙමද.. මොකද කිව්වෙ.."

" ඩොක්ට කෙනෙක් නේද.. මාත් එක්ක ඉතින් ඔය විස්තර කතාකලා.. දැන් වැඩකරන පැත්ත හරිම දුශ්කරයිලු.."

" එහෙමද.. ඒ ආන්ටි මේ අවුරුද්දෙ රට යන්නලුනෙ ඉන්නෙ.."

" ආ ඔව කිව්වා කිව්වා.. කන්සාල්ටන්ට් කෙනෙක් වෙන්න ඉගනගන්නවලු නේද.. හස්බන්ඩ්ට ඩබල් ප්‍රමෝශන් ඇවිත් කිව්වා.. ළඟදි ආයෙම කොළඹට මාරුවක් හදාගෙන එන්න හිතන් ඉන්නවා කිව්වා.."

@Shan

" එහෙමද.. මම එච්චර විස්තරයක්නම් දන්නෙ නෑ.. රධ්‍ය අයියත් ජනවාරි වල යනවනෙ.."

" ඒකනම් අපරාධයක් නේද පුතේ.. මටනම් හරිම දුකයි ඒ දරුව ගැන.. මම දවසක් ඇහුවහමත් වැඩි කැමැත්තකින් නෙමෙ කතාකලේ.."

" ම්ම්.."

" එක එක දෙමව්පියො එක එක විදියනෙ.."

මම දවල් වරුව වෙනකල් අම්මගෙ කොණ්ඩෙ පීරලා ඊටපස්සෙ ගිහින් නාගත්තා.. මට නාගන්න යන්නෙ පොඩි වෙලාවයි.. හැබැයි ඉතින් මූඩ් එක අනුව වෙනස් වෙනවා.. සිංදු කියන නටන මූඩ් එකකනම් ඉන්නෙ.. මම පැය ගානක් නානවා.. එහෙම නැතුව බෝරින් නම් ඉතින් විනාඩි පහෙනුත් නාලා එන දවස් තියෙනවා..

අද නටන්න මූඩ් එකත් තිබ්ලත් අපේ අම්මා එළියේ ඉදන් පරක්කු වෙනවා නැටුව නටන්න ගත්තු නිසා මම ඉක්මනට නාගෙන එළියට ආවා.. දැන් කුකරි ක්ලාස් එකක් අල්ලගෙන මහීශාගෙ අම්මා එක්ක.. හවසට ඒකට යනවා.. දැන් ඉතින් මගේ ක්ලාස් වලට වියදම එහෙමම ගෙදර ඉතුරුනෙ..

මම ටවල් එක වැලට දාගෙන ගෙට ඇවිල්ලා කාමරේට ගිහින් දොර වහගත්තා.. කොලෝන් බෝතලෙත් අතට අරගෙන මේසෙන් ඉදගත්තහම මගේ ඇහැට අහුවුනේ මේසෙ උඩ තියෙලා තියෙන ලැමිනේටඩ් කාඩ් එක.. මම ඒක අතට අරගෙන ඒක දිහා බලාගෙන ඉදියා..

ඊයේ රධ්‍ය අයියා රෑ මගේ සාක්කුවට දාලා තිබුණේ, අර දවසක් එයා මාව ජොයින් කරනවා කියලා කිව්ව ආධ්‍ය අයියගෙ යාලුවෙක්ගෙ තාත්තා කෙනෙක්ගෙ ක්ලබ් එකේ මෙම්බර්ශිප් කාඩ් එක.. මමනම් ඒක එයා එදා කිව්වට.. හිතුවෙ නෑ සීරියස් කිව්වා කියලා.. එදාත් මම විහිලු කර කර ඉදියා මිසක්.. එච්චර හිතට ගත්තෙ නෑනෙ.. මම මෙම්බර්ශිප් කාඩ් එකයි නේම් ටැග් එකයි ආයෙම සැරයක් කියවලා ඒක පරිස්සමට ලාච්චුවට දාලා වැහුවා..

මම එයාට මේවට කොහොම ගෙවන්නද මට හිතාගන්න බැහැ..

@Shan

ලබන සතියේ ඉඳන් මම ක්ලබ් එකක ප්ලේ කරනවා.. රඩ්‍ය අයියා කිව්ව විදියට මාසයක්ම මම ට්‍රේන් වෙන්න ඕන.. ප'සනල් ට්‍රේනර් කෙනෙක් දීලා ට්‍රේන් වුණාට පස්සෙ මගේ ප්‍රෝග්‍රෙස් එක බලලා මට ක්ලබ් එකේ ප්ලේ කරන්න පුලුවන් කිව්වා.. ඒකත් හොඳයි.. මට ගෙදරට වෙලා නිකම් ඉන්න එකේ ඔකෙන් කීයක් හරි අතට ගන්නත් පුලුවන්.. අනික දැන් මෙහේ ඉන්න බැනෙ.. මගේ එක්සෑම් ඉවරයි.. අම්මා දැන්වත් නිදහස් වෙන්න ඕන.. මට බත් තම්බ තම්බා ඉදියා හොඳටම ඇති.. අම්මට ආච්චිව ඕන.. ආච්චිඅම්මත් ගෙදර තනියම.. අම්මා ආච්චිඅම්මා ගාව ඉන්න ඕන.. ඉතින් මම මේ ගෙදර ඉන්න අවසාන කාලෙ මේක.. තව මාස දෙක තුනකින් මේ ගෙදර හිස් වෙලා යාවි.. බ්‍රෙසියර්ලස් කමනි ඇන්ටිටත් හොඳට නින්ද යාවි..

මම හිතාගෙන ඉදියේ කොළඹින්ම බෝඩ් වෙන්න.. කියන තරම් ලේසි නෑ තමා.. මම දන්නවා.. ඒ වුණාට ඉතින් මගෙ ජීවිතේට මේ ගෙවෙන මොහෙතෙත් කොයි වෙලේ ප්‍රශ්න කඩාපාත්වෙයිද කියන්න බෑ.. ලොකු අම්මලගෙන් කුණු කතා අහගෙන හැමදාම ඉන්නත් බැනෙ.. මෙවගෙ ඉවරෙකුත් තියෙන්න ඕන.. ඉතින් මෙහෙම වෙන එක හොඳයි..

මම කොණ්ඩෙ ගසාගෙන ගිහින් අල්මාරිය ඇදලා දුඹුරුපාට ශෝට් එකකට මදින්න ඕන නැති ලා කොළපාට ලේන් ටීශර්ට් එකක් දාගත්තා.. මම ඉතින් හැමදාම අදින්නෙ මෙහෙම තමා.. ඕය ඉදලා හිටලා දවසක කැස්බෑව විය සිඳුරෙන්ද අර මොකක්ද එකෙන් අහස බලනවා වගේ තමා.. කොටින්ම මට ඔවට තියෙන්නෙ සහජ කම්මැලිතාවය..

වොලට් එකයි ෆෝන් එකයි සාක්කුවට ඔබාගෙන මම එළියට එද්දි මහීශාගෙ අම්මා ඇවිත් ඉස්තෝප්පුවේ අපේ අම්මා එක්ක කතාකර කර ඉන්නවා.. මම මහීශාගෙ අම්මා එක්ක හිනාවෙලා බිත්තියට හේත්තු වුනා..

" ෂනෙරු පුතා.. කොහොමද ඉතින් කොල්ලො.. දැක්කෙත් කාලෙකින්.."

" ඒකනෙ ආන්ටි.. කෝ මහීශා.."

" අද ආශි එක්ක කොහෙද යනවා කිව්වනෙ පුතා.. ඩේට් එකකට යනවා කියලා කිව්වෙ.."

" එහෙමද.. ආ හා.."

@Shan

මම.. අද කියාන් අයියට ඩේට් එකක් වෙන්නැති.. මුන් එක්සැම් ඉවරවුණා විතරයි පෙම් කෙලින්න අරන්.. හරි ශෝක්.. මහීශා තර්ඩ් වීල් එකනෙ..

" සුදුමහත්තයා.. මම යනවා එහෙනම්.. යමු අක්කෙ.."

අපේ අම්ම මහීශාගෙ අම්මා එක්ක ගියාට පස්සෙ මම සෙරෙප්පු දෙකත් දාගෙන ගෙදර දොර වහලා යතුර අම්මගෙ ජපන් රෝස පැලේ අස්සට දාලා ගේට්ටුවත් වහගෙන පාර දිගේ හෝල්ට් එක පැත්තට ඇවිදගෙන ගියා.. වෙලාව හවස හතරට විතර ඇති.. ආධ්‍ය අයියා ගෙදර ඉන්නවද දන්නෙ නෑ..

මම හෝල්ට් එකට යන ගමන් ඉද්දි මගේ ඇගටම කපලා බයික් එකක් ඇවිත් නැවැත්තුවා.. මම ඉදියේ වෙන සිහියකනෙ.. ආපු එක්කගෙ අම්මා අප්පගෙ ඉදන් මතක් කල්ලා බනින්න මම හොඳ හුස්මක් ගත්තා විතරයි..

" ගෙදර ගිහින් බනින්න.. දැන් යං.."

රධ්‍ය අයියා හෙල්මට් එකේ ග්ලාස් එක උඩට උස්සලා මට ඇහැක් ගැහුවා..ඇහැ ගලවලා අතට දෙන හිතයි.. යකෝ!! මම බයත් වුනා.. මම අතට දුන්න හෙල්මට් එකත් ඇදලා අරගෙන දාගෙන රධ්‍ය අයියගෙ උරහිස හෙන හයියෙන් අල්ලලා මිරිකගෙනම වාරු වෙලා බයික් එකට නැග්ගා විතරයි මෙකා රේස් කල්ලා පිඹගෙන යන්න පටන් ගත්තා..

" යකෝ!! ඔහොමත් යනවද.. මොන මගුලක්ද.. අයියේ!!"

මම රධ්‍ය අයියගෙ ශර්ට් එක දෙපැත්තෙන් අල්ලගත්තා..

" වැටෙන්නද ඕන.. හරියට අල්ලගන්නවා.."

රධ්‍ය අයියා මගේ එක අතකින් ඇදලා අරගෙන ඉන වටේ පටලගත්තා.. මම උඩ බලාගෙන මම නෙමෙයි වගේ අනිත් අතත් ඉණ වටේ දාලා හයියෙන් අල්ලගත්තා.. මේ මගුලෙ මම යන්න ආස නැත්තෙ ඕක තමා.. වැටෙයි වැටෙයි කියලා ගමනාන්තය වෙනකල්ම හිතෙනවා.. අනික ඒක පදින එකාට අස්ස කුලප්පුව..

මටත් නිකන් ඉන්න බැරිකමට රධ්‍ය අයියගෙ ශර්ට් එකේ බොත්තම් දෙක තුනක් ඇරලා ශර්ට් එක අස්සට අත දාගෙන බඩ පහුරු ගාන්න ගිහින් අත කිස් කන්න පාරවල් දෙක තුනක් කාලා දුක හිතිලා ඉදියෙ..

@Shan

අපි ගෙදර එනකොට ආධ්‍ය අයියගෙ කාර් එක තිබ්බෙ නෑ ගෙදර.. ඒ කියන්නෙ රධ්‍ය අයියා විතරද කොහෙද ගෙදර ඉන්නෙ.. රධ්‍ය අයියා බයික් එක තණකොල අල්ලපු පැත්තෙන් නතර කල්ලා මට බහින්න අත දුනහම මම අත අල්ලගෙන බයික් එකෙන් බැහැලා හෙල්මට් එක ගැලෙව්වා.. රධ්‍ය අයියත් හෙල්මට් එක ගලවලා බයික් එකෙන් බැහැලා එකපාරටම මාව ඇදලා අරගෙන එයාගෙ ඇගට හිරකරගත්තා.. ගේට් එකත් ඔටෝම වැහිලා ගියා.. මෙක ඉතින් ඉස්කෝලෙ නෙමෙනෙ.. මොකක් වුනත් මොකද.. මම ලාවට කට කොනෙන් හිනාවෙලා රධ්‍ය අයියගෙ ඇගට හිර වුණා..

" පාඩුවෙ අත පය තියන් ඉන්න බැරිද.."

රධ්‍ය අයියා මගේ මූණට ලං වෙලා අහද්දි මම එයාගෙ ශර්ට් එකෙන් ගුලි කල්ලා අල්ලගත්තා..

" බැනෙ.."

රධ්‍ය අයියා මගේ නහයෙ එයාගෙ නහය ලාවට ගාවන ගමන් මගේ තොල් වලින් දැනෙන්න නොදැනෙන්න හාදුවක් තියලා මගේ මූණ දිහා බලාගෙන ඉදියා.. එහෙම ලගින් බලාගෙන ඉද්දි මගේ ඇස් දෙක වපර වෙනවා.. මම හිතන්නෙ එයා ඒකට කැමතියි.. ඒ එක්කම අපි ගාව තිබ්බ ලොකු මල් පෝච්චියෙ හිටවලා තිබ්බ පදුර ලාවට හෙලවෙන්න ගත්තු නිසා මම රධ්‍ය අයියගෙන් පොඩ්ඩක් මෙහාට වුණා.. කියාරා ද..

" ඔයා විතරද ගෙදර ඉන්නෙ.."

" ඔව්.. අයියා එන්න හවස් වෙනවා කිව්වා.."

" එ-"

මට කියලා ඉවරකරන්න හම්බුනේ නෑ මල් පෝච්චිය අස්සෙ ඉදලා හෝස් බටයක් උස්සගෙන ඒකෙන් එළියට පැනපු කෙල්ලෙක් මගේ මූණටම අල්ලලා ඒක ඇරිය පාර මාව ඔලුවෙ ඉදන් නැවිලා ගියා.. වෙන්නෙ මොන මගුලක්ද කියලා හිතාගන්නත් වෙලාවක් තිබ්බෙ නෑ.. අනික යකෝ බයවෙනවනෙ.. වනචාරියො වගේ පදුරු අස්සෙ ඉදන් මෙහෙම පනිනවද.. ආශි හෝස් බටේ වතුර එන ස්පීඩ් එක සැරින් සැරේ වෙනස් කර කර මාවයි රධ්‍ය අයියයි නැවිලා යන්න අල්ලගෙන ඉද්දි ඒ එක්කම මහා පත දියඇල්ලක්

@Shan

ඔලුවට කඩාහැලෙන්න වගේ ඔලුව මැද්දටම තව වතුර බේසමක් මොකෙක් හරි අතැරියා.. ඒකෙන් කහ රහකුත් ආවා..

" මොන හු#තක්ද යකෝ කරන්නෙ.."

රධ්‍ය අයියා උඩ බලාගෙන කාටද බනිද්දි මම ආශිගෙ වතුර පාරින් ඇස් දෙක බේරගෙන උඩ බලද්දි උඩ බැල්කනි එකේ ඉදන් හිනාවෙවී ඉදියේ කියාන් අයියා.. ඒ එක්කම බැල්කනි එකෙන් තව නිල් දාපු වතුර බේසමකුත් අපේ ඔලුවටම අතැරියා.. ඒකෙන් බේරෙන්න මම එහාට පැනපු පාර අර පර සෙනුක බල්ලා වතුර පුරවපු බැලුම් බෝලෙකින් මගේ මූණට දමලා ඇරියා.. මදි පාඩුවට ආයෙම මහීශා ඇවිල්ලා පොඩි පොඩි කෑලි වලට කපපු පත්තර කොළ තොගයක් ඔලුවට හලලා ගියා.. ඒ එක්කම ගෙදර දොර ඇරගෙන එළියට බැස්සේ අයුක අයියා.. ෆෝන් එකුත් අතේ තියාගෙන.. මොනෞත්තක්ද මේ වුනේ..

" ටඩා!!! අපේ ලස්සන ළමයි දෙන්නට සප්‍රයිස් එකාක්.."

මහීශා උඩ තටුවේ ඉදන් අත් දෙක වන වන කෑගහද්දි අපේ වටේ ඉදපු සේරම අපි දිහා බලාඅගෙන බිම පෙරලි පෙරලි හිනාවෙනවා.. මමනම් ඉදියේ තෙමිලා කුකුළෙක් වගේ.. ඔලුවේ ඉදන් වතුර බේරෙනවා.. පිස්සු පක්කු.. මීට වඩා හොදයි අපිව කැවනම්.. රධ්‍ය අයියා ඉණට අත් දෙකකුත් තියාගෙන උඩ ඉන්න කියාන් අයියට ඇගිල්ලත් දික් කර කර බනිනවා..

" උඹ තමා මේ හු#තවල් කරන්නෙ කියාන්.. උඹලා කොහොමද ගෙදරට ආවෙ.."

" අපි ගියා අපේ ආධ්‍ය මස්සිනා හම්බෙන්න.. ගේට් එකේ කී එක ඉල්ලගත්තා.. ඊටපස්සෙ ගෙදර ආවා.. ඊසි නෙ බබා.. කෝ කෝ එන්න අනේ ඇතුළට.. ඔය දෙන්නා අසනීප වේවි ඔහොම තෙමිලා.. අපි හරී~යට ඔයාලා ගැන වොරි වෙනවා.."

" වොරි වෙනවා.. යකෝ මම නාලත් එක්කන් ආවෙ.. බලපන්.. උඹලා කහත් දැම්මද යකුනේ වතුරට.."

" අපේ අයියගෙ කහ බෝතලේ.."

" ඒ වරෙන් වරෙන් ඇතුළට.."

@Shan

සෙනුකයා මගෙයි රධ්‍ය අයියගෙයි අතින් ඇදගෙන ගේ ඇතුළට ඉයා.. අපේ පස්සෙන් ආශි හිනා වෙවී දෙකට තුනට නැමීගෙන ඉන්නවා.. හරි හිනා ඇති.. ඉදපන් උඹලට කරන්න හොද වැඩක්..

මම අත් දෙකෙන්ම මූණ පිහිදාගෙන රධ්‍ය අයියගෙ කාමරේට යද්දි මහීශා අමුතු හිනවක් දාගෙන කියාන් අයියා එක්ක කාමරෙන් එළියට ආවා.. මම උන් දෙන්නටත් රවාගෙන ඇවිත් කෙලින්ම බාත්‍රෑම් එකට ගියා.. ඊට ටිකකින් රධ්‍ය අයියත් බාත්‍රෑම් එකට ආවා..

" සැක්.. කටෙත් එක්ක නිල් ගියා.."

" ඔයා දන්නෙ නැද්ද මෙයාලා මෙහෙ එනවා කියලා.."

" පිස්සුද බං.. මම උන්ව දකිනකල්ම දන්නෙත් නෑ.. මම ඇදුමක් ගෙනැත් දෙන්නම්.. නාලා ඇදගන්න.."

" හා එතකොට ඔයා..??"

" මම අපේ අයියගෙ කාමරේට යන්නම්.. ඉන්න පොඩ්ඩක්.."

රධ්‍ය අයියා මාව බාත්‍රෑම් එකේ තියලා දොර වහගෙන එළියට ගියා.. මම තෙමිලා ඇගට ඇලුනු ඇදුම් ටික ගලවලා රධ්‍ය අයියගෙ හෝදන ඇදුම් තියන බාස්කට් එකට ඔබලා ආයෙම නාගත්තා.. පහළ හිනාවෙන සද්දෙ මේ කාමරේටත් ඇහෙනවා.. මහීශා ආපු ඩේට් එක මෙකද.. ඉදපන් අම්මට කියනවා මම..

මම නාගෙන රධ්‍ය අයියා තියලා ගියපු ලූස් දිග කලිසමට හෙන විසාල ශර්ට් එකකුත් ඇදගෙන ඇද මැද්දට වෙලා කකුල් දෙකත් බැදගෙන ටවල් එකෙන් ඔලුව පිහිදලා ෆැන් එකට කොණ්ඩෙ අල්ලගෙන ඉදියා.. ඒ එක්කම වගේ රධ්‍ය අයියත් නාගෙන කාමරේට ආවා..

" ඔයා නාලා ඉවරද.."

" මම.. ශර්ට් එක ඇතිද.. මං ගාව ඔයිට පොඩි එකක් නෑ.."

" මේක අවුලක්ම නෑ.."

@Shan

මම ශර්ට් එක අල්ලගෙන අහද්දි රධ්‍ය අයියා හිනාවෙලා ඔලුව වනල කණ්ණඩි මේසෙ ගාවට ගිහින් මොනවදෝ ක්‍රීම් වගයක් අරගෙන මූණ පුරාම ඩොට් තියාගෙන ඒවා හරි ගානට පිලිවෙල පොතේ හැටියෙට මූණෙ අතුල්ලලා ගාගෙන ටෝනර් එකක් ස්ප්‍රේ කරගත්තා..

මල සමයං..

මම ටවල් එක බෙල්ලෙ ඔතාගෙන ඇදේ පෙරලිලා සිවිලිමේ කැරකෙන ෆෑන් එක දිහා බලාගෙන ඉදියා..

" මේහ්.."

" ම්ම්.."

" කොලෝන් එකක් තියේද ඔයා ගාව.."

" ඇති.. ඉන්න දෙන්නම්.."

රධ්‍ය අයියා එයාගෙ තියන සේරම ස්කින් කෙයා රුටින් ටික කරලා ඉවරවෙලා ඇදේ පතබෑවිලා ඉන්න මං ගාවට ඇවිත් මගේ අතින් ඇදලා ඇදේ ඉන්දෙව්වා.. මම එයාගෙන් බෝතලේ ඉල්ලුවත් එයාම ඒකෙන් කොලෝන් මගේ කොන්ඩෙටයි බෙල්ලටයි ස්ප්‍රේ කල්ලා කොණ්ඩෙ අවුස්සලා ඇස් දෙකට දැම්මා.. මම කොණ්ඩෙ ගසලා ගසලා ආයෙම පිටිපස්සට දාගෙන දබෝස් ගාලා ඇදේම පතබෑවුණා.. මේ ඇද බවුන්ස් වෙනවනෙ.. මෙකට ආපු පළවෙනි දවසෙ මේ ඇදේ උඩපැනලා නින්දත් ගියේ..

" යමු පහළට.."

" අනේ~"

" මෙහෙ එන්න වරද්.. කෝ නැගිට්ටින්න.."

මම ඇද දිගේ වල් ගැරඩියා වගේ ඇදීගෙන ගිහින් බිමට ඇදගෙන වැටුණා.. මට පහළට යන්න බෑ ලැජ්ජයි.. අර මහීශාත් ඉදියා.. කියාන් අයියත් හිටියා ආශිත් හිටියා.. සෙනුකයා නම් කමක් නෑ කියමු.. මේ මොන ලැජ්ජාවක්ද වුණේ..

@Shan

" මොකෝ.."

රධ්‍ය අයියා ඇඳෙන් ඉඳගෙන අහද්දි මම ඇදගෙන වැටුණු පොසිශන් එකෙන් නැගිටලා හිටගත්තා.. මෙහෙම ලමිස්සි වගේ බෑ.. පුරුෂ ශක්තිය බොක්කටම අරගෙන බහින්න ඕන පල්ලෙහාට..

" මොකුත් නෑ.. යමු.."

මම රධ්‍ය අයියගෙ අතකින් අල්ලලා නැගිට්ටුවන්න යද්දි එයා මාව උකුලින් ඉන්දවගත්තා.. මම කලින් රධ්‍ය අයියගෙ උකුලේ වාඩිවෙලා ඉඳලම නෑ.. මේකගෙ තයිස් ඇදටත් වඩා බවුන්ස් වෙනවා.. මම හොඳට කකුල් දෙක උඩින් වඩිවෙලා රධ්‍ය අයියගෙ පපුවට හේත්තු වුණා.. රධ්‍ය අයියා මගේ ඉණ වටේ අතක් දාලා මාව ඇගට ලං කරගෙන බෙල්ල අස්සෙන් මූණ තියාගත්තා.. මගේ ඇග හිරිවැටෙනවා හිරිවැටෙනවා වගේ දැනෙනවා..

" අයියේ අනේහ්~ "

" මම..??"

රධ්‍ය අයියගෙ තොල් තෙතට උණුහුමට මගේ බෙල්ලෙ වදිද්දි මම එහෙට මෙහෙට දැහැලුවා.. එයාගෙන් එහාට වෙන්න හැදුවා.. සැරින් සැරේ එයාගෙ තොල් මගේ බෙල්ලෙ තැනින් තැන වදිද්දි ඊයේ රෑ දැනුනා වගේ මම ඒකට කැමති වේගෙන එනවා මට දැනුනා.. මගේ ඉණ වටේ පැටලිලා තිබුණු රධ්‍ය අයියගෙ අත් වල ඇඟිලි තුඩු මගේ ශර්ට් එක යටින් සීතලට මගේ හමේ වදිනවා මට දැනෙනවා.. ඒ එක්කම රධ්‍ය අයියා මාව උස්සලා අරගෙන ඇඳෙන් තියලා මගේ ඇග උඩට ආවා.. මම ඇස් ලොකු කරගෙන එයා දිහා බලාගෙනම ඉදියා..

" වරද්.. ඔහොම බලන්න එපා බං.. මාත් හැඟීම් දැනීම් තියන කොල්ලෙක්නෙ.."

මට එයා කියපු එක තේරුනේ නෑ.. ඉතින් මම මේ බලන විදියනෙ..

" ඒ කිව්වෙ.."

" මම..?? මොකුත් නෑ.."

@Shan

රඩ්‍ය අයියා නැමිලා මගේ තොල් වලින් පෙක් එකක් තිබ්බා.. එයා එහෙම කරන හැම වතාවකම මගේ පපුව හිරිවැටෙනවා වගේ දැනෙනවා.. මම එයාගෙ බෙල්ල වටේ අත් දෙක පටලගෙන එයාව මගේ පැත්තට ඇදගත්තා.. අපි දෙන්නා අතර වුණු කිසිම දෙයක් අකමැත්තෙන් වුණු දේවල් නෙමෙයි.. අනික මම දන්නෙ නෑ මගේ හිතේ රඩ්‍ය අයියා ගැන ලොකු ලෙන්ගතුකමක් එක්කම විශ්වාසයක් තිබුණා.. ඒක එහෙම මෝඩ පගේ විශ්වසයක් නෙමෙ..

එයා දවසින් දවස එයා ගැන මට දැනෙන්න ඇරියා.. අවුරුද්දක් තිස්සෙම මම ඒක හොඳටම දන්නවා.. එයා දුන්නු පොරොන්දු හැම එකක්ම එයා අවසානෙ වෙනකල්ම රකින විදිය.. ඒවා මතක තියාගන්න විදිය.. මම ඒවට නොසෑහෙන්න ආදරෙ එකලා.. ඒ එක්කම මට උදේ මම ලාච්චුවට දාපු මෙම්බර්ශිප් කාඩ් එක මතක් වුණා.. මට එයාව සැක කරන්න අඩුම තරමෙ අබමල් රේණුවක තරමවත් දෙයක් දැකලා නෑ.. අනික සැක කරන්න තරම් දේවල් රඩ්‍ය අයියා කරන්නෙ නෑ කියලා මම එයාගෙ හැටියෙන් දන්නවා.. එයා මාත් එක්ක සෑහෙන්න ඔපන්ලි කතාකරනවා.. අපි දෙන්නම අපේ වටේ එකම්ෆටබල් සෝන් එකක් හදාගෙන හිටියා වගේම ඒක ඇතුලේ අපි හරිම නිදහසේ හිටියා.. යාලුවො විදියට සහෝදරයෝ විදියට ආදරේ කරන අය විදියට.. හැම විදියටම..

" පහළට යනවද.."

" යන්න ඕනමද.."

" දැන් ඔයාමනෙ කලින් යන්න ඕන කිව්වෙ.."

" මදැයි නිදහසේ ඉන්න කියලා කොල්ලව එක්කගෙන ආවා.. යමු යමු.."

රඩ්‍ය අයියා මූණ අද කරගෙන මගෙන් එහාට වෙලා කාමරේ දොර ඇරගෙන එළියට ගියා.. මමත් ඇඳුම හදාගෙන අර බාව්වු ඇඳුම ඇඳගෙන රඩ්‍ය අයියගෙ පස්සෙන්ම පහළට ගියා.. අපි පහළට යද්දි ඔක්කොම සාලෙ වාඩිවෙලා කියව කියව ඉන්නවා.. අපි දෙන්න පඩිපෙළ බහැගෙන එද්දි සේරම කටවල් වල හිනාවල් තදකරගෙන බලාගෙන ඉදියා..

" ඌප්ස්.. අපි නම් අහලා තියෙන්නෙ ඔහොම බෝයිෆ්‍රෙන්ඩ්ගෙ ඇඳුම ඇඳගෙන එන්නෙ හෙන හොට් මූමන්ට් එකකින් පස්සෙ කියලා.."

@Shan

" ඔව් ඉතින් එහෙම වෙන්න එපැයි.. අපි මේ හෙන හොට් මූමන්ට් එකකින් පස්සෙ තමා ආවෙ.. නේද ඒයි.."

මම රධ්‍ය අයියගෙන් අහද්දි ඒකා මට රවලා ටීවී එක දිහා බලාගෙන ඉදියා..

" මොකද බං කරන්නෙ.. ගෙවල් වල ඉන්නත් කම්මැලි.."

" ඔව් දැන් නිකන් හුරු නෑ වගේ පාඩම් නොකර ඉදලා.. මොකද කරන්නෙ සිරාවටම.."

" ඒ සෙනුකයා අපි මූවි එකක් බලමුද.."

ආශි ඇහුවහම සෙනුකයා අහේතුකව රතු වෙලා ගියා..

" නෙට්ෆ්ලික්ස් ඇන්ඩ් චිල් වෙන්න යනවනම් කලින් කියපන් මම යනවා ගෙදර.. ඔක්කොම කපල් වෙලා මම තනි අලියා වගේ මෙතන.. කොන් වෙන්න බැනෙ.."

" ඒ අඩෝ ක්‍රිකට් ගහන්න යමු.."

කියාන් අයියගෙ කතාවට හැමෝම ඒ පැත්ත හැරුණා..

" කොහෙද ගහන්නෙ.."

" පාරෙ බං.. අපි ඉස්සර ගහනවා.. මෙක ප්‍රයිවට් රෝඩ් එකක් නිසා වාහන යන්නෙ නෑ එච්චර.."

" ඒ එහෙනම් මරු.. යං යං.. ක්‍රිකට් ගහමු.."

ආශි උඩ පැනගෙන නැගිටලා සේරවම ඇදගෙන එළියට ගියා.. අයුක අයියා විකට් පොලු ටිකයි බැට් දෙකකුයි ලෙදර් බෝල දෙකකුයි හොයාගෙන ගේට් එක ඇරලා පාරෙ ඒක හිටවලා විකට් එක හැදුවා.. රධ්‍ය අයියා ලයින්ස් වගයක් මාක් කලාම මමයි සෙනුකයයි ගිහින් බැට් අරවා මෙවා අරගෙන පාරට ඇවිත් ටීම් දෙකකට බෙදුණා.. ආශියි මමයි රධ්‍ය අයියයි සෙනුකයයි එක ටීම් එකක කියාන් අයියයි අයුක අයියයි මහීශායි එක ටීම් එකකට ආවා..

@Shan

" ඒ සයෝන්ටත් කතාකරහං බං.. ඌ ඉන්නෙ මෙ එහා ලේන් එකේ.. ඌටත් එන්න කියමු.."

" අන්න මරු ඉඳපන් මම කෝල් එකක් ගන්න.."

කියාන් අයියා සයෝන් අයියට කෝල් එකක් අරගෙන අපිත් එක්ක ක්‍රිකට් ගහන්න එන්න කිව්වහම විනාඩි දහයකින් විතර සයෝන් අයියත් එතෙන්ට ආවා..

මුලින්ම බෝල් කරන්න ඉදියෙ රධ්‍ය අයියයි බැට් කරන්න අයුක අයියයි.. අයුක අයියට ඉතින් ක්‍රිකට් ගැන අමුතුවෙන් කියලා දෙන්න ඕන නෑ ඒකා කොහොමත් ඉස්කෝලෙ ක්‍රිකට් ටීම් එකේ කැප්ටන් නෙ.. කොහොම හරි අපි පැය බාගයක් විතරම සෙල්ලම් කලා.. අපේ සද්දෙට වටේ පිට ඉදපු කැම්පස් යන අයියලා ඉස්කෝලෙ යන මල්ලිලත් අපිට සෙට් වුණා.. කොහොම හරි විස්සක් විතර ඉදියා ඔක්කොම..

ඊටපස්සෙ අපේ බෝලෙ එහා වත්තට ගිහින් මමයි ආශියි ඒක ඉල්ලගන්න එහෙට ගිය වෙලාවෙ එහෙ ඉදපු සීයටත් අපි එක්ක ක්‍රිකට් ගහන්න එන්න ඕන වුණා.. ඊටපස්සෙ ඒ සීයගෙ යාලුවොත් එතෙන්ට සෙට් වෙලා තරුණ-මහළු පිල් දෙකක් හැදිලා ප්ලේ කලා.. ආශි නම් උඩ පැනගෙන ආවට දන්නෙ උඩ පනිනම විතරයි.. ඒකි ලෙදර් බෝලෙට බයයි.. බෝලෙ එද්දි බැට් එක දාලා දුවනවා.. මහීශා නම් ක්‍රිකට් ගහලා තියෙනවා ඉස්කෝලෙත්.. ඒකනිසා ප්ලේ කලා..

ඔහොම අපි හය විතර වෙනකල් පාරෙ සෙල්ලම් කලා.. මම හිතන්නෙ මේ ලේන් එක මෙහෙම එකතු වෙන්නම ඇත්තෙ අවුරුදු ගානකින් වෙන්න ඇති.. හැමෝම වගේ  එතෙන්ට ඇවිල්ල කතාකරනවා හිනාවෙනවා.. ලස්සන අක්කලා බැල්කනි වල ඉඳන් බලාගෙන ඉන්නවා.. අහ්ම.. ඉස්සරා ගෙදරට ගියපු බෝලෙ අහුලන්න ගිය මට ඒ අක්කා නම්බර් එකකුත් දුන්නා.. ඒක වෙනම කතාවක්.. ඒක ක්‍රීඩාවට අදාල වෙන්නෙ නෑ.. මම ඉතින් අක්කට හිනාවෙලා එන්න ආවා.. සොරි වෙන්නෝන මේ මල අන්සතු වෙලානෙ..

අපි සෙල්ලම් කර කර ඉද්දි එහා ගෙදර සීයගෙ ආච්චි අපිට කූල් ඩ්‍රින්ක්ස් හදාගෙන ඇවිත් දුන්නා.. ඉස්සරහා ගෙදර අක්කත් අගල් දෙකේ ශෝට් එකකුත් ඇඳගෙන ඇවිත් කේක් වගයක් හැමෝටම අල්ලලා ගියා.. එයා හැමෝටම කේක් අල්ලලා මගේ විතරක් අතත් ඇල්ලුවා.. තිහක් විතර පාරෙ

@Shan

කියව කියව විහිලු කර කර සෙල්ලම් කර කර ඉද්දි ගෙදර ගාවින්ම ආධ්‍ය අයියගෙ කාර් එක නවත්තනවා අපි දැක්කා.. අයියා හෙනට බයවෙලා වගේ අපි දිහාට ඇවිදගෙන එද්දි මම දුවගෙන දුවගෙන ගිහින් ආධ්‍ය අයියගෙ කරට අතකුත් දාගෙන මගේ අතේ තිබ්බ කේක් කෑල්ල ආධ්‍ය අයියගෙ කටේ එබුවා..

" ඒ ඕගොල්ලො සෙල්ලම් කරනවද.. මම මේ හිතුවේ සෙනගෙ හැටියට වෙන මොකක් හරි මගුලක් කියලා.. අම්මෝ මම බය වෙච්ච තරමක්.."

ආධ්‍ය අයියා මගේ චොක්ලට් කේක් කෑල්ල හපලා හපලා ගිලලා මගේ කරට ආපිට අතක් දාගත්තා..

" රධ්‍ය අයියා ලොකු ළමයෙක් වුණානෙ අයියෙ.. ඒකයි මේ සෙනග.."

" අඩෙ සිරාවට.. කොහොමද දැනගත්තෙ.."

මමයි ආධ්‍ය අයියයි කතාකර කර ඉදිය තැනට රධ්‍ය අයියා ආවහම ආධ්‍ය අයියට හිනා ගියා..

" අයියා ආවද.."

" චූටියො මොකද මේ ලොකු ළමයි වෙච්ච අය එළියෙ කරන්නෙ.."

" අයියේ මේ ළමයට කිව්වා අහන්නෙ නෑනෙ අයියො.. මම මන්නෙකුත් අතට දීලා ආවෙ.."

" මොනවද බං කියවන්නෙ..??"

රධ්‍ය අයියා කන්ෆියුස් වෙච්ච මූණකින් අපි දෙන්නා දිහා බලාගෙන අහලා මාව ඇදල අරගෙන මගේ කරට අතක් දාගත්තා.. මම අපි දෙන්නගෙ මැද්දට ආධ්‍ය අයියව ඇදලා ගත්තා..

" අපේ රධ්‍ය අයියා දැන් ලොකු ළමයෙක්.. රධ්‍ය අයියා බිග් බෝයි කෙනෙක් වෙලා~"

මම ඒක කිව්වා සද්දෙ වැඩිද මංදා ළග ඉදිය ආශිලා මහීශලාත් හැරිලා බැලුවා..

@Shan

" සිරාවටට.. එහෙනම් මේ මොකක්ද එළියෙ කරන්නෙ.. යන්න ළමයි ගෙට.. ඉන්න මම කියාන් අයියටත් කියලා එන්න.."

ආශි උඩ පැනගෙන කියාන් අයියා හොයාගෙන ගියා.. ඒ වෙද්දි කට්ටිය කලුවර නිසා ආයෙම ගෙවල් වලට යන්න වගේ ඉදියෙ.. අයුක අයියා බෝල ටිකත් හොයාගෙන බැට් දෙකයි විකට් පොලුයි සෙනුකයා එක්ක හවුල් වෙලා ගේ ඇහුළට ගෙනිහින් දැම්මා..

අපි එළියේ කියව කියව ඉදලා හැමෝම ගෙවල් වල ගියාට පස්සෙ ගේ ඇතුලට ඇවිත් ගේට් එක වහලා දැම්මා..

" මගේ සුදුඅම්මියා ලොකු ළමයෙක් වෙලා.. මොකක්ද බබා අර ඔයා හැමතිස්සෙම කියන්නෙ.. ආ!! ඔහ් මයි ගෝඩ් අයි කාන්ට් බිලීව් දිස්.."

කියාන් අයියා මගේ ගාව ඉදපු රධ්‍ය අයියව උස්සලා අත් දෙකට ගත්තා.. ඒකා බොඩි බිල්ඩර් වගේ.. රධ්‍ය අයියා කකුල් දෙකත් ගස්ස ගස්ස දගලලා කියාන් අයියගෙන් බේරෙන්න හැදුවත් කියාන් අයියා රධ්‍ය අයියව උස්සගෙන ගිහින් සෝෆා එකෙන් අතෑරියා..

" ඒ නංගේ..මන්නයක් ගෙනෙන්.. සුදුඅම්මියට තනිකම් දෝසෙවත් හැදුනොත් කාට කියන්නද.."

මහීශා දුවලා ගිහින් මන්නයක් ගෙනැත් රධ්‍ය අයියගෙ අතට දුන්නා..

" මේ මොන මගුලක්ද උඹලා කරන්නෙ.. මට පාඩුවෙ ඉන්න දීපන්!!"

" කෑගහනෙ නැතුව ඉන්න ඉතින් පොඩී.. දැන් ඔයා ලොකු ළමයෙක්නෙ.."

" අයියෙ..!!!!!!!!!"

ආධ්‍ය අයියා අපි කරන දේවල් වලට හිනාවෙවී වොශ් එකක් දාගෙන එන්නම් කියලා උඩට ගියා.. රධ්‍ය අයියට හැමෝම බලහත්කාරකම් කරනවා.. පව් අනේ මගේ බෝයිෆ්‍රෙන්ඩ්..

" දැන් අපි මොකද කරන්නෙ.. ඒ අපි දන්නෙ නෑනෙ බං.. උඹලා ලොකු ළමයි වුනාම මොකද කරන්නෙ.."

@Shan

සෙනුකයා මහීශගෙන් ඇහුවහම ඒකි දසාතේ කරපුවා කල්පනා කරන්න ගත්තා..

" දැන් ඉතින් මේ ළමයව ගේ මුල්ලට කල්ලා සුදු රෙද්දකින් වහලා තියන්න ඕන.."

සෙනුකයා ජ්‍යෝතිශ්‍යකාරයෙක්ට ඇදගෙන ඇවිත් රධ්‍ය අයියගෙ ඉස්සරහින් වාඩිවුනා.. ඒ අස්සෙ කියාන් අයියා රෙද්දක් හොයාගෙන ඇවිත් රධ්‍ය අයියගෙ ඔලුවට දාලා මූණ විතරක් එළියට හිටින්න මමියක් වගෙ එතුවා.. රධ්‍ය අයියට කේන්ති ගිහින් බලහත්කාරකම් වලට ලක් වෙලා එපාවෙලාද කොහෙද ඉදියෙ..

" කෝ මේ දරුවගෙ දෙමාපියෝ ආවනම් එහෙම.."

" මම තමා මේ ලමයගෙ අප්පච්චි.."

කියාන් අයියා මාවත් ඇදගෙන ගිහින් රධ්‍ය අයියගෙ එහාපැත්තෙන් ඉදගත්තා..

" මේ ඉන්නෙ මගේ මායියා.."

කියාන් අයියා මාව පෙන්නලා කියද්දි මම හිනාවෙලා රධ්‍ය අයියගෙ ඔලුව අතගෑවා..

" මොන හු-ම්ම්ම්-ම්ම්-ම්ම්-ම--හ්හ්-"

කියාන් අයියා රධ්‍ය අයියගෙ කටේ ලේන්සුවක් එබුවා.. රධ්‍ය අයියනම් නියම පාරාවෝ වගේ අත් දෙක ඇතුලට දාලා ඔතලා නිසා මොකුත් කරගන්න බැරුව වාඩිවෙලා ඉදියා.. අපි දැන් ජ්‍යොතිශ්‍යකාරයගෙන් මේ ලමයගෙ මල්වල එලාඵල බලන්නනෙ ඇවිත් තියෙන්නෙ..

" කොහොමද මහත්තයො මගෙ කොල්ලගෙ මල්වල ඵලාඵල.."

මම සෙනුකයගෙන් අහද්දි සෙනුකයා මහපගයා වගේ රධ්‍ය අයියගෙ මූණ දිහා බලාගෙන ඉදලා ඔලුව දෙපැත්තට වනලා අත් දෙකත් පිටිපස්සට බැදගෙන පුටුවෙන් නැගිට්ටා..

" අනේ අපේ කොල්ලට අපලද මහත්තයො.."

@Shan

කියාන් අයියා රධ්‍ය අයියගෙ මූණට ලොකු කිස් එකකුත් දීලා දුකින් අහද්දි මම රධ්‍ය අයියගෙ මූණ පිහිදලා එහා පැත්තට කිස් එකක් දුන්නා.. ආවා මෙතන කිස් දෙන්න.. පකයා..

" මේ ළමයා අනාගතේ ලොකු අමාරුවක වැටෙන්නයි යන්නෙ.. රාහු අටවැන්නෙ නීච වෙලා පව වෙලා කිව වෙලා තියෙන්නෙ.. මාරක අපල.. හැබැයි නීචභංග රාජයෝගයක් තියෙනවා.. මේ දරුවගෙ ලග්නෙ සෙනසුරාට පේන නිසා.. කෝකටත් අපි තොවිලයක් නටලා මේ දරුවගෙ කන්‍යාභාවය නැතිකල්ලා දාමු.."

සෙනුකයා ඒක ඇස් දෙකත් ලොකු කරගෙනබය හිතෙන විදියට කියපු පාර මගේ හුස්මත් එක නැවතිලා ගියා.. දෙයියනේ මගේ කොල්ලගෙ කන්‍යාභාවය නැතිවෙන්නයි යන්නෙ.. රධ්‍ය අයියා කුණුහර්ප පලනවද කොහෙද.. හොදවෙලාවට කටේ ලේන්සුව එබුවෙ..

" අනේ මහත්තයො.. හුගක් අපලද.. අපිට මොකුත් කරන්න බැරි වෙයිද අපල දුරු වෙන්න.."

" ම්ම්.. අපල දුරුවෙන්න නම්.. පෙරුම්කායම් ටිකක් ගල් අරක්කු වලින් පොහවලා මේ දරුවගෙ නාහෙන් ඇතුල් කලානම් හරි.. ඊටපස්සෙ පයට නුගපත් හා හිසට කරඳ-"

" සැක් පිස්සු කියන්නෙපා අප්පච්චි.."

ආගි සෙනුකයව තල්ලු කල්ලා ඒ පුටුවෙන් වඩිවුනා.. මෙකිද සෙනුකයගෙ දුව එතකොට.. මරු සක්කරවට්ටම..

" මේ අයියට අනේ එළහිතෙල් දාල උදේ හයට කිරිබත් ගුලි නමයක් දුන්නනම් මේ අපලේ දුරුවෙනවා ඒකාන්තයි.."

" ඒ පිස්සුද ඕයි.. ඒ කිරිබත් දෙන්නෙ මූට නෙමේ කපුටොන්ට.."

" ඌප්ස්.. ටෙක්නිකල් එරර් එකක් අනේ.. දන්නැද්ද.. කපුටොන්ට දුන්නනම් හරි.. එතකොට ඔය සේරම හංග වෙලා යාවි.."

ආගි රධ්‍ය අයියගෙ ඇස් වහ කටවහ යවලා නැගිටලා ගියාම මහීශා ඇවිත් රධ්‍ය අයියගෙ මූනට වතුර ඉහලා හඳුකුරක් අල්ලලා යන්න ගියා.. ඊටපස්සෙ

@Shan

සෙනුකය අයුක අයියව අදගෙන ඇවිල්ලා රධ්‍ය අයිඅගෙ එහාපැත්තෙන් ඉන්දුවා..

" දැන් ඉතින් කල වයසත් හරිනෙ.. මල්වරත් වුණ එකේ කසාද බන්දලා පිටක් කලානම් ලේසි නේද අපේ නෝනෙ.."

සෙනුකයගෙ නෝනා මහීශාද.. මරු පුංචි පවුල..

" අපෙ මහත්තයා මොකද කියන්නෙ.. මේ ගැටවරයා නම් අපේ කොල්ලට කියාපු මනමාලයා.."

මම කියාන් අයියගෙන් අහද්දිදි කියාන් අයියා බොරු රැවුලක් අතගගා කල්පනා කරනවා..

" අපෙ මැණිකෙ කියන කතාවෙත් ඇත්තක් තියෙනවා තමා.. මැණිකෙ මනාපනම්.. අපි මේ කසාදෙ කරමු.."

" කරමු කරමු.."

කියාන් අයියා අයුක අයියගෙ කට ශර්ට් එකකින් ගැටගහලා ඒ දෙන්නව නැගිට්ටුවහම මහීශයි ආශියි ඉටිපන්දමක් හොයාගෙන ඇවිත් ඒක සාලෙ මැද්දෙන් ගැහුවා..

" වට හත යන්නයි යන්නේ~"

රධ්‍ය අයියයි අයුක අයියයි බය වෙලා වගේ දෙන්නට දෙන්නගෙ මූණ බලාගෙන ඉද්දි මම ගිහින් දෙමාපියා වසයෙන් රධ්‍ය අයියගෙ ඔලුව අතගාලා සුභ අනාගතයක් පැතුවා.. අනිත් පැත්තෙ මනමාලයගෙ අම්මත් ඇවිත් අයුක අයියගෙ ඔලුව අතගාලා යන්න ගියාම රධ්‍ය අයියා මමිය වගේ බලෙන්ම ඉටි පන්දම වටේ වට හත යවලා ආශිගෙ ලිප්ස්ටික් එකෙන් සිංදූර් ගාලා අපි ඒ දෙනගෙ කසාදෙ ලස්සනට ඉවර කල්ලා දැම්මා..

" අද රැට අයුක පුතා අතින් රධ්‍ය පුතාගෙ කන්‍යාභාවයට කෙලවුනාම.. සියලු අපල දුරුවෙලා යාවි.."

කියාන් අයියා රධ්‍ය අයියව රෙද්දෙන් ලිහලා කටෙන් ලේන්සුව ගත්තා විතරයි රධ්‍ය අයියා පැනපු ගමන් කියාන් අයියගෙ බෙල්ලෙන්ම අල්ලගෙන

@Shan

පෙරලගත්තා සාලෙ මැද්දෙ.. අපි ගිහින් අමාරුවෙන් උන් දෙන්නගෙ සොඳුරු වලිය බේරලා අයුක අයියවත් නිදහස් කලාම අයුක අයියා අපිට බැන බැන රධ්‍ය අයියත් එක්ක පඩිපෙළ නැගගෙන උඩට යන්න ගියා.. මම රධ්‍ය අයියා කාමරේට ගිහින් දොර වහන්න කලින්ම ඇතුළට පැනගෙන දොර වහලා දාලා රධ්‍ය අයියගෙ බෙල්ලෙ එල්ලුනා.. තරහවෙලානෙ අයියෝ ඉතින්..

" මේ අයියෙ.."

මම රධ්‍ය අයියගෙ මූණට එබුනහම රධ්‍ය අයියා මගේ දිහා නොබලා උඩ බලාගෙන ඉදියා.. එහෙම කොහොමද උඩ බලාගෙන ඉන්නෙ..

වෙලාව රෑ හතට විතර ඇති කාමරේ කළුවර නිසා මම එහෙමම අත දික් කල්ලා රධ්‍ය අයියගෙ කාමරේ ස්විච් එක ඔන් කලා.. ඒක රෝස පාට බල්බ් එකක්.. කමක් නෑ ඕන පාටක්.. මම ඉස්සිලා රධ්‍ය අයියගෙ  තොල් වලින් පෙක් එකක් තිබ්බා.. රධ්‍ය අයියා බයවෙලා වගේ මගේ දිහා බලාඑන ඉදලා ආයෙම උඩ බලාගත්තා..

" තරහදෝ~"

මම ආයෙම රධ්‍ය අයියගෙ තොල් වලින් පෙක් එකක්.. දෙකක්.. නෙමෙයි තුනක්ම තිබ්බා.. ඊටපස්සෙ නම් රධ්‍ය අයියගෙ මූණෙ ලාවට හිනාවක් ඇඳුනා..

" තරහ නෑනෙ.. නෙහ්.."

මම රධ්‍ය අයියගෙ මූණට ලං වෙලා අහද්දි රධ්‍ය අයියා මාව බිත්තියට හේත්තු කරගෙන බිත්තියට අතක් තියලා මගේ මූණ ගාවට පහත් වුණා..

" මො-මොකද.."

රධ්‍ය අයියගෙ මූණෙ තිබ්බ අමුතු මනමාල හිනාව මට ඇල්ලුවෙ නැති නිසා මම ශේප් එකේ ලිස්සලා යන්න තැනක් බැලුවහම රධ්‍ය අයියා මගේ කම්මුලක් අතකින් අල්ලගෙන නහය උඩට හාද්දක් තිව්වා..

" හුරතල්.."

@Shan

රඩ්‍ය අයියා ආයෙම මගේ තොල් උඩට පෙක් එකක් තියලා එහෙමම මගේ තොල් වලට බර වුණා.. එයා ඒ ගමන්ම අත දික් කල්ලා කාමරේ ලයිට් එක නිමලා දැම්මා.. මම එයාගෙ තුරුලටම ඇදිලා ගිහින් එයාගෙ ඇගටයි බිත්තියටයි හිරවුනා.. ආයෙම අර මත් වෙන ගතිය දැනෙනවා.. ඇස් පියවෙනවා.. ආයෙම ඇරෙනවා.. මගේ වටේ වෙන හැමදේම මගෙන් ඈතට ගිලිහිලා යනවා..

මාරුවෙන් මාරුවට රඩ්‍ය අයියා මගේ තොල් ඒ තොල් වලට මැදි කරගනිද්දි එයා මාව උස්සලා අරගෙන ඇඳෙන් තියලා මගේ ඇග උඩට ආවා.. මට කලුවරේ එයාව දැනුනා විතරයි පෙනුනෙ නෑ.. මම එයාගෙ බෙල්ල වටේ අත් යවලා එයාව මගේ තුරුලට ඇදගත්තා.. රඩ්‍ය අයියගෙ ඇගිලි තුඩු මගේ ශර්ට් එක අස්සෙන් බඩේ වදිනවා.. එහෙමෙහෙ ගියත්.. ඒවා නතර වෙනවා.. බයෙන් වගේ.. අවසර ඉල්ලනවා වගේ.. මම එයාගෙ අතක් ශර්ට් එක අස්සෙන්ම මගේ පපුවෙන් තියාගත්තා.. ඒ හැම ස්පර්ශයක්ම අලුත් ඒවා වුන නිසා මාව ගැහෙන ගමන් තිබුණත් ඒකට මම කැමති වුනා.. රඩ්‍ය අයියා මගේ තොල් මාරුවෙන් මාරුවට උරවන ගමන් මගේ පපුවේ තිබුණු ඇගිලි තුඩු සීරුවට රටාවකට එහෙ මෙහෙ අරගෙන යනවා.. හරියටම ලී කැටයමක දාරයක් දිගේ ඇගිලි ඇදගෙන යනවා වගේ.. ඒ හැම අගලක්ම හොදට රසවිදිනවා වගේ.. මම පපුවෙන් ඉස්සෙන ගමන් රඩ්‍ය අයියගෙ කොන්ඩෙ අහුරක්ම මගේ අතට ගුලි කරගත්තා..

" වරද්.."

" ම්හ්"

රඩ්‍ය අයියා මගේ ශර්ට් එකෙන් අත එලියට අරගෙන මාව තුරුල් කරගෙන කොට්ටෙන් ඔලුව තියාගත්තා.. මම එයාගෙ පපුවට කම්මුලක් තද කරගෙන හාන්සි වුනාම එය මගේ නලලට ඉස්සර වගේම හාදුවක් 'තැවරුවා'... මම ඒකට හරි ආසයි..

" උඹව අල්ලන්නවත් මට ලෝබයි වරද්.."

" ඒ ඇයි.."

" එහෙම තමයි.. ටොෆියක් එකපාර කාලා ඉවරකල්ලා දානවට වඩා ටිකක් වෙලා කටේ තියාගෙන ඉදියම ඒකෙ අමුතු ගතියක් තියෙනවා.."

@Shan

" එතකොට මම ටොෆියක්ද.."

රඩ්‍ය අයියා හිනාවෙලා මගෙ කොන්ඩෙ ඇවිස්සුවා..

" ඒ වගේ තමා.. හැබැයි එක එක වෙලාවට එක එක රසයි.."

හායි~ මගේ ලමයි.. ඔතරීට මහන්සි අයියයියෝ~ ඔතර් නෝට් එකක්වත් දාන්න බැරියෝ~ නිදහසේ කතාකරන්න එන්නම්කො හොදේ.. ටොපියක් අරන් තරහා නොවී ඉන්නෝ.. කමෙන්ස්ට වලටත් රිප්ලයි කරන්නම් ඇ.. ඒ වගේම කලින් චැප්ටර් එකේ හැම කමෙන්ට් එකක් ගානෙම.. අනේ බතොම ස්තුතියි මගෙ ලමයිනේ.. මට සතුට කියාගන්න බෑ ඒවා දකිද්දි.. හිතට ලොකු සතුටක් දැනෙනවා.. ආව්..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 69 කොටස

" බෑ බෑ මාව ට්‍රිප් එකක් එක්කගෙන පලයා..............................න්!!!!!!!!!!!!!!!!!!"

මමයි රධ්‍ය අයියයි කාමරේ ඉදන් පල්ලෙහාට එද්දි ආශි සාලෙ මැද්දෙ බිම පෙරලිලා මහා හයියෙන් අඩනවා.. ලතෝනි තිය තිය.. කියාන් අයියගෙ මූණ තිබ්බෙ නිකන් තැලිච්ච කෙහෙල් ගෙඩියක් වගේ චප්ප වෙලා.. ඕකතමයි මම කියාන් අයියට කිව්වෙ මෙකි වගේ ඕවර් ඇක්ටින් දහලානා ඩ්‍රාමා ක්වීන් කෙනෙක් එක්ක යාළුවෙන්න කලින් දෙපාරක් හිතපන් කියලා.. කොහෙද මූට ඒකි ඕනමයි කිව්වනෙ.. සාලෙ හැමෝම මුවි එකක් බලනවා වගේ කියාන් අයියගෙයි ආශිගෙයි ඩ්‍රාමා එක බලාගෙන ඉන්නවා..

" බබා මෙ අහන්නකො.. ලබන සතියේ මට රගර් මැච් එකක් තියෙනවා.. පොඩ්ඩක් මන්ත් එන්ඩ් එක වෙනකල් ඉන්නකො.. අනික ඔයාලගෙ ගෙවල් වලින් ප'මිශන් නැතුව කොහොමද යන්නෙ.. නෑ බං කෙල්ලො දෙන්නෙක් එහෙම එවයිද මං අහන්නෙ.."

" තවුසෙගෙ එදා ඉදන් තිබ්බෙ බොරුව තමා.. මම කිව්වෙ මහීශා.. මෙකා කිව්වෙ කොහොමද.. ඉර දෙන්නම්, හඳ එන්නම්, තරු දෙන්නම්, පණ දෙන්නම්, වකුග-මහ් අරකයි මෙකයි කියලා.. මට තවුසෙ එපා.. මම යනවා ගෙදර.. ඩ්‍රයිවර්ට කතාකරනවා!!!!!!!!!"

ආශි බිමින් නැගිටලා කැඩිලා තිබ්බ කොණ්ඩෙ උඩට කල්ලා ගෙඩියක් බැඳගත්තා..

" ඒ ඒ මොකෝ මේ.. ආශි උඹ යන්නද.. ඇයි අඩන්නෙ.."

මටත් නිකන් ඉන්න බැරි කමට ගිහින් උන්ගෙ කතාව මැද්දෙන් පැන්නා විතරයි ආශි දදා ඉදපු හීල් එකෙන් එකක් කකුලෙ දාගෙන අනිත් එක අතේ තියාගෙන මං ගාවට නොන්ඩි ගගහා පැන පැන ආවා..

" මම යනවා ෂනෙරු.. ගුඩ් නයිට්..ලව් යූ.."

" ඒ මොකෝ යන්නෙ.. උඹලා රණ්ඩු වුනාද.."

@Shan

" නෑ හලෝ මේකෙ තේරුමක් නෑ.. මම යනවා.."

" ඉතින් මොකක්ද වුණේ කියපන්කො.."

" මේ තවුසෙ මට කෑගහන්නෙපා.. ගහනවා හීල් එකෙන්.. උඹත් උඹලගෙ ඉස්කෝලෙ අනිත් හරක් වගේ තමා.."

ආශි මගේ කොලර් එකෙන් හොල්ලලා හොල්ලලා හීල් එකත් උස්සලා මට ගහනත් ගියා.. යකෝ මම මොනා කලාටද..

" මොකද ලමයිනේ මේ කෑගහන්නෙ.. මොකක්ද වුනේ.."

මේ සේරම යුද්ධ මැද්දෙ ආධ්‍ය අයියා දිව්‍යලෝකෙන් අපායට වඩින දිව්‍යලෝකෙ දේවදූතයා වගේ හිමින් හිමින් තාලෙට පඩිපෙළ බැහැගෙන ඇත් ගමනින් අපේ ළඟට ඇවිත් එයාගෙ මහා කරුණාබර කටහඬ අවදි කලා.. මරු කතරට දිය පොදක්..

" පොඩි වලියක් බං.."

" ඒ මොකෝ.. කොයි කපල් එකද වලි ඇදගත්තෙ.."

ආධ්‍ය අයියා ගිහින් සෝෆා එකෙන් වාඩිවෙලා නඩුව විසඳන්න ඉදිරිපත් වුණා.. අනේ දෙයියනෙ මේ මනුස්සයා නම් කවදහරි හරියන්නම ඕන ජීවිතයක් තමා.. කිසි අහිතක් නැතුව අපේ සියලු පවුල් ප්‍රශ්න වලට මැදිහත් වෙලා ඒවා සාමකාමීව විසඳලා දෙනවා.. කාගෙ මස්සිනාද ඉතින්.. මගේනෙ.. මගෙ ආධ්‍ය අයියා..

" මේ කියානුයි ආශියි අයියෙ.. ආශිට ට්‍රිප් එකක් යන්න ඕන කියනවා.. කියාන් අයියට නෙක්ස් වීක් රගර් මැච් එකක්ලුනෙ.."

සෙනුකයා කියාන් අයියා දිහා සානුකම්පිත හදවතින් බලාගෙන රණ්ඩුව පාපොච්චාරණය කලා..

" ඒකද මේ.. ඉතින් මේ සතියෙ යන්නකො ළමයි ඉවරනෙ.."

" මේ සතියෙ..??"

@Shan

ආශි ඒකට සයිලන්ස් වෙලා හීල් එක මගේ අතට දීලා ගිහින් ආධ්‍ය අයියගෙ එහාපැත්තෙන් ඉඳගත්තා.. මොනෞත්තක්ද මේක මගේ අතට දුන්නෙ.. මේකිට නම් සිරාම ට්‍රැක් තමා..මහීශා කොහොම ඉන්නවද මට හිතාගන්න බෑ..

" ඔව් මෙ සතියෙ යන්න ඉවරනෙ.. වීකෙන්ඩ් එකේ හොඳයිනෙ.. අනික දැන් ඉතින් මේගොල්ලො එක්සෑම් කල්ලා ස්ට්‍රෙස් එකේනෙ ඉදියෙ.. පොඩ්ඩක් ට්‍රිප් එකක් ගිහින් එන්ජෝයි කල්ලා රිලැක්ස් වෙලා එන්න.. මොකෝ කැම්පස් ගියාම ඕගොල්ලො සතුටින් ඉන්නවා කියලයැ.."

ආධ්‍ය අයියා කණ්ණාඩිදෙක ගලවලා ඇඳුමෙන් ග්ලාසස් දෙක පිහිදගෙන ආයෙම දාගත්තා..

" ඇයි කැම්පස් ගියාම සතුටින් ඉන්න බැරිද.. අපිට ඒ ලෙවෙල් කරද්දි කිව්වෙ කැම්පස් ගියාම ආතල් එකේ ඉන්න පුලුවන් කියලනෙ.."

මහීශා ආධ්‍ය අයියගෙන් ඇහුවහම ආධ්‍ය අයියා අපි සේරම දිහා මහා සානුකම්පිත බැල්මක් හෙලුවා.. නිකම් 'හරි පව්' වගේ බැල්මක්..

" මම මොකුත් කියන්නෑ.. මගෙන් අහන්නත් එපා.. ගිහිල්ලම බලාගන්න.. මට ඇඩෙන්න එනවා.."

" සිරාවට ඇඩෙන්න තරම් ආතල්ද.."

" ම්ම්.. හුගක් ආතල්.. ගිහින් බලන්නකො.. ඒකනෙමේ අපි මෙහෙම කරමු දැන් කවුද මෙතන මේ සතියේ ට්‍රිප් එකක් ගියොත් එන්න පුළුවන් අයට ඉන්නෙ.. අපි ඡන්දයක් තියලා බලමු.."

ඡන්දයක් තියමු කියලා කිව්ව පාර මගේ ඔලුවේ එකපාරටම මහින්ද මහත්තයා ඇඳිලා මැකිලා ගියා.. දෙයියනේ දැන් අල ගනන් තමා..

" මේ සතියේ නම් අපි ෆ්‍රී.. ලබන සතියේ බදාදා ඉඳන් නම් කතාකරන්නෙපා.. අපිට ඉස්කෝලෙ වැඩ ලොට් එකක් තියෙනවා.."

" ඒ මොනවද බං උඹලගෙ ඉස්කෝලෙ ඔච්චර වැඩ.. යකෝ බැලුව දවසක ඇත්නම් උඹලා වැඩ.. නොකරන දවස් නෑනෙ.."

@Shan

මහීශා දන්නවා ලබ්බක් තමා..

" යකෝ.. !! ඉස්කෝලෙ සාගා එකට ප්‍රැක්ටිස් පටන්ගන්නවා.. මම ඔකෙස්ට්‍රා එකේ මෙන් කන්ඩක්ටර්.. මම ඒකට යන්න ඕන.. ඊටපස්සෙ වරද් ගමේ යන්න ඕන.. ඌට ක්ලබ් එකේ සෙල්ලම් කරන්න යන්න තියෙනවා.. රධ්‍ය අයියලා කෝර් එකට ඉන්නවා.. අපේ බැජින් සෙරමනි එක එනවා.. අයුක අයියට අයි ඊ එල් ටී එස් රෙඩි වෙන්න තියෙනවා.. කියාන් අයියට රගර් මැච් එකකුත් එනවා.. කීයක්ද.. බුදාම්මෝ.. යන මගුලක දැන්ම යං.. ආයෙනම් හෙල්ලෙන්නවත් බෑ.. අපි බිසී.."

සෙනුකයා අපිට තියන වැඩ ගොඩ මතක් කල්ලා දුන්නා.. හරිම සෝක්.. මටත් ඔය කියනකල්ම මතක් වුනේවත් නෑ.. දැන් මනසේ ඒවා හොල්මන් කරනවා කරනවා වගේ..

" ඒ උඹලා ඉස්කෝලෙ ඔච්චර වැඩ ගොඩක් කරනවද බං.. කොහොමද ඒ ලෙවෙල් ලිව්වෙ..උඹලා ඒවත් කරනවා මේවත් කරනවා.. රධ්‍ය අයියට අයිලන්ඩ් රෑන්ක් එකකුත් ආවා නේද.."

" ගැම්මක්තමා ඉතින්.. උඹලා වගේ නහටු කෙල්ලො දන්නවද බං අපි කරන වැඩ තොගේ.."

" ආ ආ අපිට ඒවා වැඩක් නෑ.. දැන් එතකොට මේ සතියෙ යනවද.. ශුවර්ද.. කියාන් අයියෙ මොකද.. මේ සතිය අවුලක් නැද්ද.."

" මේ සතිය ශේප්.."

" අර අර ඒක හරියට කියන්නෙ නෑ ශේප් කිය-"

" නෑ නෑ අම්මපල්ලා යනවා.. දැන් හරිනෙ.. අනේ බං මගේ ඔලුව කකියනවා වගේ.."

කියාන් අයියා අර රධ්‍ය අයියා හැමතිස්සෙම කරනවා වගේ ඔලුව දෙපැත්ත අතගාගෙන සෝෆා එකට හේත්තු වුණා..

" දැන් එතකොට කෙල්ලො දෙන්නට මොකද කරන්නෙ.. මෙතන ඔක්කොම කොල්ලොනෙ ඉන්නෙ.. එන්න දේව්ද මුන්ගෙ ගෙවල් වලින්.."

@Shan

" මම ගෙදරට සුදුපාට බොරුවක් කියලා එනවා.. මහීශාත් සුදුපාට බොරුවක් කියලා එනවා.. එතකොට හා නෙ.."

" මොකක්ද බං ඒ සුදුපාට බොරුව.. එහෙම ඒවත් තියෙනවද.."

" ඔව් හලෝ.. සුදුපාට බොරු කියන්නෙ නරක වැඩක් කරන්නෙ නැති වුනාම.. අපි ඉතින් ට්‍රිප් එකක්නෙ යන්නෙ.. අනික.. අනික අනේ මේක විසි එක්වන සියවසේ අලුත් අදහස් තියෙන්න ඕන රටක්නෙ.. ගියාම මක් වෙනවද.. මම අපේ අම්මිගෙන් අහලා කියන්නම්.. අම්මි හා කියයි.. නේද මහීශෝ.."

" මම.. මම් .. ෂනෙරුවා එන නිසා අපේ ගෙදරින් ශේප්.. අවුලක් වෙන එකක් නෑ.."

" ආ එහෙනම් මහීශා එන නිසා අපේ ගෙදරිනුත් අවුලක් නෑ.."

" මමත් ෂනෙරුව පාවා දීලා ගෙදරින් එනවා.."

සෙනුකයයි මහීශායි මාව පාවා දීලා ගෙදරින් එන්න ප්ලෑන් කලා.. පාවා දීමේ මූල බීජය වුණේ මම.. දැන් මම කවුරු පාවලා දීලද ගෙදරින් එන්නෙ..

" ජස් මෙහ්.. මම ඔයාව පාවලා දීලා ගෙදරින් එන්නද.."

" මම්.."

මම රධ්‍ය අයියව පාවලා දීලා ගෙදරින් එන්න හිතාගත්තා..

" ඉතින් දැන් අපි විතරද බං යන්නෙ.. කෝ ලොකුවට කවුරුත් නෑනෙ.."

" ඔය ඉන්නෙ ලොකුවට දෙතුන් දෙනෙක්ම.."

" අයියෝ නෑ සෙනුකයා.. අපි ඉතින් සම වයස්වල වගේ උන් නෙ.. වැඩිහිටියෙක් යන්න එපැයි.. නැත්නම් ගෙදරින් එන්න දෙන්නෙ නෑනෙ.."

මහීශා ගැටලුව සවිස්තරාත්මකව දිගාරිද්දි හැමෝම අහිංසක මල් මල් මූණු ටිකක් හදාගෙන ආධ්‍ය අයියා දිහා හැරිලා බැලුවා.. අපේ ආධ්‍ය අයියා සුදුවෙලා..

@Shan

" ඒක පස්සෙ හොයාගන බැරියැ අනේ.. නේද.. ඒකනෙමෙ ආධ්‍ය අයියෙ.. කොහොමද මේ දවස්වල හොස්පිට්ල් එකේ වැඩකටයුතු එහෙම.. වෝඩ් එකේ ලෙඩ්ඩු හොදින් ඉන්නවද.."

" ලෙඩ්ඩු හොදින් ඉන්නවනම් හොස්පිට්ල් ඒව්ද බං.. උඹලා මොනවා අහනවද මන්දා.. ඔක්කොම ඉන්නෙ අසාධ්‍ය ලෙඩ්ඩු තමා.."

" අයියෝ එහෙමද.. ඉක්මනට නිව- සොරි සොරි සොරි නිරෝගී සුවය ලැබෙන්නෝන.. මොකක් වුණත් පව් නෙ නේද.. අපිත් කවදහරි යන්න ඉන්න හොස්පිට්ල්නෙ ඕවා.."

" මම.. ඒ කාලෙ වෙද්දි මම කොහොම හරි දුශ්කර පළාතකට හරි මාරුවක් හදාගෙන ජෙනරල් හොස්පිට්ල් එකෙන් යනවා නංගි.."

" ඒ මොකද අයියෙ.."

" නෑ උඹලා ආවහම මට හිතාගන්න බෑ ලෙඩ්ඩුන්ට යන කලදසාව ගැන.. ඒකයි.. ශෝක් දොස්තරලා ටික.. "

" මමනම් ජෙනරල් හොස්පිට්ල් එන්නෙ නෑ.. මම යනවා සොයිසා එකට.. චූටි බබාලව ගන්න.. අනාව්.."

ආශි නොපෙනෙන බබෙක් අත් දෙකේ තුරුල් කරගෙන නළවනවා වගේ ඇක්ට් කරද්දි රධ්‍ය අයියා කියාන් අයියට කින්ඩියට හිනාවෙනවා මම දැක්කා..

" හොදයි හොදයි.. දැන් ඔගොල්ලො කොහෙද යන්න හිතාගෙන ඉන්නෙ.."

" නුවර එළියෙනම් බෑ.. වෙන ඕන තැනක යමු.."

" අපෝ ඔව් බං.. ඉස්කෝලෙනුත් දෙපාරක් ගියා නුවර එළියෙ.."

" අපි ඇල්ලෙ යමුද.."

" ඇල්ලෙ..?? මම කලින් ගිහින් නෑ හැබැයි.."

" අපි මෙඩිකල් කොලේජ් ඉද්දි එකපාරක් ගියා ඇල්ලෙ.. එහෙනම් මරු තමා.."

@Shan

" ඇල්ලෙ යන්න තිබුණා..ඉතින්.. ඔයත් එනවනම්.. අපිට මොකක් වුණත් ආධ්‍ය අයියව හලලා යන්න බැනෙ.. අපේ ලොකු මස්සිනානෙ.. එහෙම යන එක හරිද මං අහන්නෙ.. ආධ්‍ය අයියේ.. අයියට වුණත් වගකීමක් තියෙනවා.. මල්ලිලා මෙහෙම ට්‍රිප් එකක් යද්දි පොඩි පහේ නිවාඩුවක් දාලා අපිට හවුල් වෙන්න.. නේද ෂනෙරුවා.."

" ඔව් ඔව් ආධ්‍ය අයියා ඉතින් බෑ කියන්නෑ බං.. මම දන්නවනෙ.."

" උඹ දන්නවද.."

රධ්‍ය අයියා මගෙන් අහද්දි මම විශ්වාසෙන් ඔව් කියන්න ඔලුව වැනුවා..

" එනව නේද.. අයියගෙ අක්කෙක් එහෙම ඉන්නවනම් එන්න කිව්වට කමක් නෑ ඉතින්.. හැබැයි අපේ මහීශා වුණත් ඉන්නවා.. තනියක් නෑ අයියට.."

ආශි මහීශා දිහා අමුතු බැල්මක් දාගෙන ආධ්‍ය අයියට කිව්වහම ආධ්‍ය අයියා රතු වෙලා පොඩ්ඩක් කැහැලා ඉදගෙන ඉදපු පුටුවෙන් නැගිට්ටා..

" බලමුකො.. ඉස්සෙල්ලම නිවාඩු ගන්න එපැයි.."

" හා..!! අපි යන්නෙ මොකේද ට්‍රේන් එකේ යමුද.."

" ආ..මේ ට්‍රේන් වල කොහෙවත් යන්නෙ නෑ.. ප්‍රයිවට් වෙහිකල් එකක විතරයි යන්න පුලුවන්.. මෙගොල්ලො එක්ක ඔවගෙ ගිහින් මට බෑ වගකියන්න.. මම කියන විදියට ඉන්නවනම් මම එනවා.. නැත්නම් ඉතින් අයාන්ව තමා එවන්න වෙන්නෙ.. අපි දන්නෑ.."

" අන්ද්වෙ..!!!!! මගේ හැලකිඹුල් මස්සිනා මෙකට ගාවගන්න එපා අයියෙ.. ප්ලීස්.. අපි ඔයා ඉන්න කියන්නෙ තනි කකුලෙන්ද එහෙම ඉන්නම්.. අනේ අයාන් අයියවනම් එපා.. එහෙම වුණොත් මම ඩයිහයිඩ්‍රජන් මොනොක්සයිඩ් බීලා මැරෙනවා..!!" ( H2O )

ආශි ආධ්‍ය අයියගෙ කකුලෙ එල්ලිලා ආයෙම ලතෝනි දෙන්න පටන් ගත්තම මහීශා ඇවිත් ආශිගෙ අතකින් ඇදලා කෙලින් කලා.. ඒකිට වුණත් ලැජ්ජ ඇතිනෙ මේ ඩ්‍රාමා ක්වීන් මෙහෙම හැසිරෙද්දි..

@Shan

" ම්ම.. ඩයිහයිඩ්‍රජන් මොනොක්සයිඩ්ද බොන්නෙ නංගි.. හොඳයි හොඳයි.. මේ කෑමකන්න ඇවිත්.. දැන්නම් නිමිලත් ඇති.."

ආධ්‍ය අයියා මහීශා දිහා ලාවට බලලා හිනාවෙද්දි මහීශා උගුර පාදගෙන උඩ බලාගත්තා.. මෙතන යමක් සිද්දවෙනවා වගේ මට තේරෙනවා.. යකෝ!! ඒ කියන්නෙ මෙකිට කැමති කොල්ලොත් මේ ලෝකෙ ඉන්නවද..

" ඔයාලා කෑම හැදුවද.."

" නෑ ෂනෙරුවා.. අයියා ඕඩර් කලා.. ඇවිත් ටිකක් වෙලා.. කොහෙද උඹලා කාමර ලොක් කරන් බිසීනෙ.."

මහීශා මගේ උරහිසේ හැප්පිගෙන කුස්සිය පැත්තට ගියා.. යකෝ මෙකි.. දෙන්න හිතයි..ඇහැළ ගහක් ගලවලා..

" අනේ පලයං.. ගෙම්බි.."

මහීශා යන ගමන්ම මට මැද ඇඟිල්ලක් දික් කරගෙන කුස්සියෙ දොරෙන් නොපෙනී ගියා.. ඒ එක්කම ආශි හිමින් සැරේ සොෆා එක දිගට ඇදිලා ගිහින් රවාගෙන ඉදිය කියාන් අයියට හේත්තුවක් දැම්මා.. හේත්තුවක් දාලාත් බලන්නෙ නැති තැන ඒකි සොෆා එකේ තිබ්බ කොටයක් මූණට තදකරගෙන ඒකෙ මූණ ඔබාගෙන ඉදියා.. රධ්‍ය අයියයි අයුක අයියයි සෙනුකයයි මොකක් හරි වැදගත් දෙයක් කතා කර කර ඉදියෙ.. මට ඒක ඇහුනෙ නැති නිසා මම මගේ ඉස්සරහා ප්ලේ වෙන ඩ්‍රාමා එක දිහා බලාගෙනම ඉදියා..

ආශි කොට්ටෙට මූණ තදකරගෙන අඩනවද කොහෙද උරහිස් හෙල්ලෙන විදියෙන් මට තේරුණා.. ආයෙම අර ඉණ ගාවට දිග රැලි රැලි කොණ්ඩෙ ලිහිලා පහළට වැටිලා..

" ආශූ.. බබා ඒ මේ ඔයා අඩනවද.."

ආශි මූණ රතු කරන් ඇස් දෙකේ කඳුලු වාන් දානවා වගේ.. ඔලුව උස්සලා කියාන් අයියා දිහා බැලුවා..

" අඩ අඩ ඉද්දිත් අඩනවද අහන්නෙ.. මගුල.. අඩනවා තමා පේන්නැද්ද.."

@Shan

කියාන් අයියා ඒ උත්තරේට කොර වෙලා ගියා.. ඇත්තනෙ පේන්නැද්ද පගයට ඒ ළමයා අඬනවා..

" අඬන්නෙපා ඉතින්.. ඔයත් මෙතන කැහැගුවනෙ බොරුවට.. කේන්තියන්නැද්ද කියන්න.."

" ආ ?? මම ?? කෑගැහුවා ?? කොයිවෙලේද ?? ඇයි ඔයා බොරු කියන්නෙ.." *සුරුස්*

" ආ ඔව් කෑගැහුවෙ නෑ තමා.. ඒකනෙ.. දැන් කඳුලු පිහාගන්නකො.."

කියාන් අයියා ආශිගෙ මූණෙ තිබ්බ කඳුලු පිහිදලා උස්සලා උකුලට ගත්තා.. මුන් දෙන්නා බලාගෙන යද්දි හරි ලව්ලි කපල් එකක්නෙ.. මම හිතුවෙ කෙලින්නෙ පිස්සු විතරයි කියලා.. ආශිගෙ ඇග වටේ කියාන් අයියා අත් දෙක බැඳගෙන කම්මුලට හාද්දක් දුන්නා.. එතකොට නම් මෙච්චරවෙලා වැලහින්න වගේ අඬ අඬ ඉදපු එකී යන්තම් හිනාවුණා.. ඊටපස්සෙ කියාන් අයියා එයාගෙ අතේ දාගෙන ඉදපු හා කන් දෙකක් තියන රෝසපාට බූල්බෑන්ඩ් එක අරගෙන ආශිගෙ කොන්ඩෙ එකතු කල්ලා ඒකෙන් ගැටගැහුවා..

" වරද්.. අම්මට කතාකල්ලා කිව්වනම් හරි ලේට් වෙනවා කියලා.. දැනුත් ටිකක් රෑ වෙලානෙ.."

" මම..? මම අම්මට කිව්වා.."

" ඔයා කිව්වද.."

" ඔව්.."

මම රධ්‍ය අයියගෙ පිටට තට්ටුවක් දාගෙන කුස්සියට ගියා.. ආධ්‍ය අයියයි මහීශායි කෑම මෙසෙට තියනවා.. මම හිමින්සැරේ මහීශා ගාවට කිට්ටු කලාම ඒකී අපරාධකාරයෙක් දිහා බලනවා වගේ මං දිහා හෙන සැක හිතෙන විදියට බලලා සින්ක් එක ගාවට යද්දිම මම ඒකිට කකුලට කකුලෙන් එකක් ගැහුවා..

" ආදරණීය කකුල් මාට්ටුව.."

@Shan

මහීශා එතන තිබ්බ හැදි වගේකුත් පෙරලගෙන වැටෙන්න ගිහින් ආධ්‍ය අයියගෙ ඇග උඩට වාරු වුණා විතරයි ආධ්‍ය අයියා දෝත බඳලාම මහීශාව අල්ලගත්තා.. කිසි රොමැන්ටික් පොසිශන් එකක් නෙමෙ හැබැයි.. අනික ආධ්‍ය අයියනම් මොකෙක්ද මන්දා.. අරකිව අල්ලගන්නවත් පණ නෑ.. දෙන්නම ඇදගෙන බිම පතබෑවුණා.. යකෝ මේ මනුස්සයගෙ මල්ලි හොදයිනෙ බලන් යද්දි.. අපිව වැටෙන වැටෙන සැරේ අල්ලගත්තා.. මෙකට ඒක.. සැක්.. මම උන් දෙන්නා මූණට මූණ බලන් ඉන්න අතරේ හිමින් සැරේ කුස්සියෙන් ලිස්සලා ලිස්සලා කෑම මේසෙන් වාඩිවුනා.. ඊටපස්සෙ මහීශා නැගිටලා ඒකිම ආධ්‍ය අයියවත් නැගිට්ටුවා..ටොප් බොටම් මාරුවෙලා වගේ.. කමක් නෑ එහෙමත් හොදයිනෙ.. ආධ්‍ය අයියට බර වැඩ කරන ඕන නෑ..

ඊටපස්සෙ හැමෝම ඇවිත් කෑම කාලා යාන්තම් නමය හමාරට ගෙදර යන්න ආවා.. ආශිගෙ ඕවර් ඇක්ටින් දගලානා නැත්නම් කලින් එනවනෙ.. මෙකිව ට්‍රිප් එකක් එක්කන් ගිහින් අපිට මොන මොන අකරතැබ්බ වලට මූණ දෙන්න වෙයිද මට හිතාගන්න නෑ.. කොටින්ම හිතද්දිත් මගේ ඇග කිලිපොලා යනවා.. මම කාර් එකේ යන ගමන් එළියබලාගෙන කල්පනා කලා.. හැබැයි මම ආශි ගැන හිතපු ටිකම ටිකකට කලින් රධ්‍ය අයියා මගේ නම දාලා කිව්වා.. මම එහෙම වද දෙනවද.. මූට නම් පිස්සු තමයි..

" වරද්.."

" ම්ම්.."

" ඔයා ලබන සතියෙ ගෙදර යනවා කිව්වෙ.. ඇත්තටද.."

" ඇයි මම ඔයාට කිව්වෙ.. ආච්චිඅම්මව බලන්න යන්න ඕන කියලා.."

මම සීට් එකට හේත්තුවෙලා රධ්‍ය අයියගෙ මූණ දිහාබැලුවහම ආයෙම මූණ දෙකක් කරගෙන ඉස්සරහා බලාගෙන ඉන්නවා..

" ඇයි එහෙම ඇහුවෙ.."

" නිකම්.."

" ඉතින් ඇයි දැන් මූණ නරක් කරන් ඉන්නෙ.."

@Shan

" මම..? නෑ.."

" නැත්තෙ නෑ එහෙම තමා.."

" ම්ම්.."

" ඔයත් එනවද.. ගමේ යන්න.. මාත් එක්ක.."

" මො-කක්.. මම..?"

" ඔව් ඉතින්.. යමු.. ඔයාලගෙ අම්මගෙන් අහලා කියන්න.. අනික අම්මා ගිහින් දවස් දෙක තුනකින් මම යන්නෙ.. ඔයාට ලබන සතියෙ ලොකු වැඩක් නෑනෙ.."

" ම්ම්.. බලමුකො.."

මුගෙ තියන ලොකුකම තමා.. ඇති වැඩක්නෑ ලබන සතියෙ.. ඒ වුනාට බලමු ලු.. දෙන්න හිතයි.. ගැටපොලොස් කොට්ටෝරුවට..

" බල බල ඉන්නෙ මොනවද.. මම තනියම ගමේ ගියොත් අර අල්ලපු-"

" නෑ නෑ මම එන්නම්.. උඹ ඔච්චර කියනවනම්.."

ඕකනෙ කියන්නෙ.. ලොකුකම නිසානෙ මේ සේරම..

" අපේ ඉස්සරහ ගෙදර ගෑණි මොකක්ද අර දුන්න කොළකෑල්ල.."

" ඔයා ඒකත් දැක්කද.. සිරාවට අයියෙ.."

" ම්ම්.."

" ඒ අක්කගෙ ෆෝන් නම්බර් එක දීලා කෝල් එකක් ගන්න කිව්වා.."

" කෝ නම්බර් එක.."

" දන්නෑ.. මම හිතන්නෙ ඒක ඔයාගෙ ඇඳ උඩ හරි කොහේහරි ඇති.."

" ම්ම්.."

@Shan

මම හිමීහිට රධ්‍ය අයියා කලව උඩ තියාගෙන ඉදපු අතකින් අල්ලගත්තා.. මගෙ ගැටපොලොස් කොට්ටෝරුවට තරහා යනවනෙ ඉතින්.. සියාතාත්තා..

"

*When you're not around meI swear, I got nothing to do, yeahIt's makin' me wonder what I did before I had you, yeahI can't go backOh, I hate how much I love you*

.."

රධ්‍ය අයියා මගේ ඇගිලි වල එයාගෙ ඇගිලි පටලගෙන තදින් අල්ලගත්තා.. ඊටපස්සෙ මගේ අතින් පොඩ්ඩම පොඩි කිස් එකක් තිබ්බා..

අපි ඉදියේ අපේ ගෙදර ඉස්සරහා.. ගෙදර ලයිට් දාලා ඉස්සරහා දොර වහලා..

" මම යන්නම්.."

මම යන්නම් කිව්වත් එයා මගේ අතින් අල්ලගෙනම ඉදියා..

" ම්ම්.. ගුඩ් නයිට්.."

මම එයාගෙ සීට් එකපැත්තට නැමිලා එයාගෙ කම්මුලෙන් හාද්දක් තිබ්බා.. එයා මගේ කම්මුලෙන් අතක් තියලා මගේ තොල්වලින් පෙක් එකක් තිබ්බා..

" ගුඩ් නයිට්.."

මම කාර් එකෙන් බහින්න ගිහිල්ලත් ආයෙම රධ්‍ය අයියා මගේ අතින් ඇදලා අරගෙන මගේ තොල් වලට පහත් වුණා.. එයා මාව රිදෙන්නම කිස් කලා.. කටට ලේ රහ දැනෙනකල්ම.. එහෙම දැනුනත් විනාඩි දහයක් විතර මම දගලලා දගලාලා රධ්‍ය අයියගෙන් එහාට වුනා.. ඒකනම් සිරාවටම රිදුනා මට..

" උඹට නම්බර් ගන්න.. එක එක ගෑනුන්ගෙ.."

" තවුසෙ.. තවුසෙනම් මහ දුශ්ට.. හැකරුල්ලා.. පලයං යන්න.."

@Shan

මම දොර දඩාස් ගාලා වගහෙන ගේට් එක අරින්නත් හදලා ආයෙම හොඳවයින් දෙකක් රවලා රධ්‍ය අයියගෙ දිහා බැලුවා.. හිනාවෙන්නෙ මගුල.. දෙන්න හිතයි.. ඉඳපන්කො.. ට්‍රිප් එකක් යනවනෙ.. මම තෝ කනවා.. මම රධ්‍ය අයියට මැද ඇඟිල්ලත් දික් කරගෙනම ගේට් එක වහලා ගෙදරට දුවගෙන ගියා..

සමාවෙන්න අනේ.. ඊතරී ඊයෙ අම්මගෙ ගුටි දෙකක් කාලා දුක හිතිලා ඉදියෙ.. මගෙ පූස් කොල්ලෙක් කොහෙද ඉන්න පිස්සු පූසෙක්ගෙන් ගුටි කාලා තුවාල කරන් ඇවිත් අම්මා මට බැන්නා මම හරියට එයාලා බලාගන්නෙ නෑ.. බලාගෙන ඉන්න බැයිනම් මොකටද කාණු අස්සෙ ඉඳන් උස්සගෙන ගෙදර ගෙනාවෙ යැයි යැයි කියලා.. සැමක්.. අපේ අම්මා මහ දුස්ටයි.. මම සමාජ මාධ්‍යවලම පල කරනවා..

එන්නාම්.. ලව් යූ.. ❤

මගෙ දළඹු ලමයින්ට මම ආදරේනෙ.. හුහ්

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 70 කොටස

" කොල්ලො.."

" ඕ මාමෙ.."

" ගෙදර පලයන්කො මගුල.. උඹට කොළඹ ඉඳලා එපාවෙන්නෙ නැද්ද මං අහන්නෙ.. "

" එන්නම් එන්නම්.. ආවට ඉතින් මාමා නැනෙ ගෙදර.."

" මම නැතිවුණාට උඹ වරෙන්කො.."

" එනවා අයියෝ.. ලබන සතියේ විතර එන්න හිතාගෙන ඉන්නෙ.. ඕක කියන්නද මේ තකහනියක් පාන්දර කෝල් කලේ.."

" ඒකටයි තව වැඩක් කියන්නයි තමා.. මම මේ උඹට ගන්නෙත් තඩි ගලක් උඩ නැගගෙන.. පිං දීපන් අපි වගේ මාමලා ලබන්නත්-"

" ආ ඇති ඇති අපො.. ගත්ත එක කියපංකො මාමෙ.. වෙන ලබ්බවල් කියවන්නෙ.."

" මම ට්‍රාන්සර් එනවා.. ආයෙම නාරාහෙන්පිට කෑම්ප් එකට.."

" අඩෙ සිරාද.. මරුනෙ මාමෙ.. මම හිතුවෙ මාමා ආයෙ ජීවිතේට කොළඹ එන එකක් නැමයි කියලා.."

" එන්නම නෙමෙ හිටියෙ.. ඒ වුණාට මේ ජීවිතේ තේරුමක් නෑ බං.. කැලයක් අස්සට වෙලා.. මෙහේ බලන්න ලෙඩ්ඩු මොකෙක්වත් නෑ.. දවසම නිකන් ඉන්නෙ බිලට් එකට වෙලා.. ඇඳවල් වල මකුණොයි.. සැක් මේ උබනම් කවදාවත් ආමි එකටනම් එන්න එපා.. මේක මහ කරුමක්කාර ජීවිතයක්.."

" මම එන්නෙ නෑ තමයි ඉතින්.. දැන් කවද්ද එන්නෙ.."

@Shan

" අපිට ප්‍රමෝශන් ඇවිල්ලා  බං.. ඉතින් නාරාහෙන්පිට ආවහම මම එහේ බිලට් එකේ නවතින්නෙ නෑ.. ක්වාටස් නවතිනවා.."

" කොහෙ.. වත්තලද.."

" ම්ම්.. මට අක්කා කිව්වා උඹ බෝඩ් වෙන්න ඉන්න කතාවක්.."

" ඔව් මාමෙ.. ක්ලබ් එකේ වැඩ වලටයි ඉස්කෝලෙ වැඩ වලටයි මෙහෙන් බෝඩ් වෙන්න බැලුවෙ.. ලොකු අම්මලගෙ තැන් වල හැමදාම නිකම් බල්ලො වගේ වැටිලා ඉන්න බැනෙ.. වැඩ ගොඩක් තියෙනවා කරගන්න.. බෝඩ් වෙන එක හොඳයි කියලා හිතුණා.."

" ඒකතමයි ඒකතමයි.. ඒ වුණාට බෝඩ් වෙන්න ඕන නෑ.. වරෙන් මාත් එක්ක ක්වාටස් නතර වෙන්න.. උඹට ඔවගෙ ඉන්න බෑ.. මම දන්නැද්ද.. බෝඩ් වෙලා උඹ හිතනවා වගේ ආතල් එකේ ඉන්න බෑ බං.. එපාවෙනවා.. මම මේ නාරාහේන්පිට එන වැඩේට කැමති වුනෙත් උඹවත් ඉන්න නිසා.."

" අම්මගෙන් අහුවද මාමා.."

" ඔව් අක්කා කිව්වා උඹෙන් අහන්න කියලා.."

" මටනම් අවුලක් නෑ.. කොහෙත් එකයි.."

" දැන් ඉස්කෝලෙත් යන නිසා මට පුලුවන් නෙ වැඩට යන ගමන් උඹව ඉස්කෝලෙන් දාගෙනම යන්න.. අනික මට නයිට් සෙට් වෙනවා.. හැමතිස්සෙම ගෙදරකත් නෑ.. කාලා බීලා ඉන්න තියෙන්නෙ.. මේ මාසෙ නෙමේ.. ලබන මාසෙ අන්තිම හරියෙ මම එනවා කොළඹ.. ලෑස්තිවෙලා ඉඳපිය.."

" හා මාමෙ.."

" මම තියනවා.. ආ අනිත් එක.. යන ඇල්ලක පරිස්සමින් යන්න ඕන.. දන්නවනෙ.. ඔවගෙ ගිහින් ගෙදර පල.. මම මේ ගලෙන් වැටිලා මැරෙන්න කලින් මම තියනවා.. බුදුසරණයි.."

" ආ හා.. බුදුසරණයි.."

@Shan

මම කෝල් එක කට් කල්ලා ඇදේ අනිත්පැත්ත හැරුණා.. අපේ මාමා කොළඹ එන එක ගැනනම් ඇත්තටම සතුටුයි.. අර කැම්පස් කාලෙ කොහෙද යන නැට්ටිච්චියෙක්ට අහුවෙලා ඒ මනුස්සයගෙ තරුණ කාලෙම නිකරුනේ ගෙවිලා ගියා.. ආමි එකට ගිහිල්ලත් පුදුම දුකක් වින්දෙ.. කැළණිමුල්ලෙ ට්‍රේනින් යද්දි අපේ මාමා.. කලබල කාලෙ.. දෙදාස් හතේ.. මම පොඩියි එතකොට හුගක්.. අපේ අම්මයි ආච්චියි ඉදියෙම ඇඩුව කදුලෙන්.. මාමා ට්‍රේනින් ගියා ගියාමයි අවුරුදු දෙකක් යනකල් කිසිම ආරංචියක් තිබ්බෙ නෑ.. අනික මමා ආමි එකට ගියෙ මොන මගුලටද මට හිතාගන්න බෑ.. ඒකත් කලබල කාලෙ.. ඩෙන්ටල් ඩොක්ටර් කෙනෙක් විදියට ඩිග්‍රි එකයි පත්වීමකුයිත් ලැබුණත් ඒ සේරම දමලා ගහලා ආමි එකට ගියා.. ඒ ගිහින් ඒකෙ මෙඩිකල් කොප්ස් වල ඩෙන්ටල් ඩොක්ටර් කෙනෙක් වුණා..

අවුරුදු දෙකකට පස්සෙ මාමා ගෙදර එද්දි අපේ අම්මලා හිතාගෙන හිටියෙම මාමා බෝම්බෙකටවත් අහුවෙලා මැරිලා තමයි කියලා.. ඒ කාලෙ අපේ ගමෙ හුගක් අය හිටියා හමුදාවෙ.. ඒ සේරම මැරුණා.. අපේ ආච්චිම උගන්නපු ළමයි කීදෙනෙක් මැරුණද.. දෙදාස් නමයෙ කලබල ඉවරවුණාම අපේ මාමා ගෙදර ආවෙ බඩට බුලට් එකකුත් බස්සගෙන.. තුවාල පිටින්.. ඒ කාලෙ මෙඩිකල් කොප්ස් කියලා නෑ සේරම යුද්දෙට ගියානෙ.. මාමා ඉදලා තිබුණෙ අනුරාධපුර පැත්තෙ.. අවුරුදු එක හමාරක්ම..

ඉතින් වෙඩි වැදිලා තුවාල වෙලා ඒවත් සනීප වෙනකල්ම මාමා ගමෙ ගෙදර හිටියෙ.. ඒ කාලෙ මාමට පාලුත් නෑ.. මම හුගක් පොඩියිනෙ.. මට මතකයි මාමා තමයි මාව මොන්ටිසෝරි එක්කගෙන යන්නෙ.. ඒ කාලෙ මම තාත්තා නෑ කියලා යාලුවොන්ට කියන්න ලැජ්ජයි වගේ නිසා මාමා පෙන්නලා ඒ තාත්තා කියලා කියනවා..

දෙක වසරට යනකල්ම මම මහ කැත විදියට ඒ බොරුව කල්ලා දවසක් පන්තියෙ කෙල්ලෙක් පන්තිය මැද්දෙම ඒ මගේ තාත්තා නෙමෙයි මාමා කියලා ඒකිගෙ අම්මා කිව්වා කියලා මට කෑගැහුවා.. ඉතින් එදා ඉදන් මම ඒ බොරුව ආයෙම කිව්වෙ නෑ කාටවත්.. මේ වෙනකල් කාටවත්ම කියලා නෑ..

මගේ තාත්තා මාව දාලා ගිහින් තමා.. ඒක කියන්න මම ලැජ්ජ වෙන්නෙ නෑ.. ලැජ්ජ වෙන්න තැනට මමවත් මගේ අම්මවත් වැඩ කල්ලා නෑ..

@Shan

හැබැයි මිනිස්සුන්ගෙ කටවල් අපිට වහන්න බෑ..

කොහොම වුණත් මගේ ජීවිතේටම තාත්තා කියලා කටපුරා කියන්න පුලුවන් මනුස්සයෙක්ට ඉදියෙ මගේ මාමා විතරයි.. මම පොඩි කාලෙ අසනීප වුණාම වඩාගෙන වෙල පුරාම ඇවිද ඇවිද කෑම කවනවා.. තියා මගේ නැපි පවා පොඩි කාලෙ මාරුකරන්නෙ මාමාලු.. කවමදාවත් අපේ මාමා අපේ ලොකුඅම්මලා වගේ අම්මට පෙර වැරදි කිය කිය දොස් කිව්වෙ නෑ.. මාමා හැමදාම කිව්වෙ අම්මට ආයෙම කසාදයක් කරගත්තත් වැරදි නෑ කියලා.. කවමදාවත් කිව්වෙ නෑ මම පවුලට බරක් කියලා.. මට අනාථයා කියලත් නෑ.. ඉදලා හිටලා පොඩ්ඩක් බැන්නට යාලුවෙක් වගේ..

මම නැගිටලා අම්මා හොයාගෙන කුස්සියට ගියා.. අම්මා කංකුං වගයක් තෝරනවා..

" ආ නැගිට්ටද සුදුමහත්තයා.."

" ඔව් අම්මෙ.. කෝ දෙන්න ඔක.. මම සුද්ද කල්ලා දෙන්නද.."

" අනේ එහෙනම් මට අර පොල් ගෙඩිය ගාලා දෙනවකො කොල්ලො.. මෙක මම කරන්නම්.."

" ම්ම්.."

මම පොල් ගෙඩියක් අරගෙන ගිහින් ඒක එළියට අල්ලලා බිඳලා සෝදලා ගාන්න ගත්තා..

" අම්මෙ.."

" ඕ.."

" මාමා කතාකලා.."

" ආ මොකද කිව්වෙ.."

" මාමා කොළඹ එනවා කියන්නෙ.."

" ඒකතමා නේද.. හොඳයි අනේ මටනම් හිතට සහනයක්.."

@Shan

" මටත් ක්වාටස් එකේ නවතින්න එන්න කිව්වා.. මම යන්නද.."

" මාමා ගාව නිසා මට හිතට බරකුත් නෑ.. අනික ඉතින් උඹලා දෙන්නා එකතුයිනෙ.. සුදුමහත්තයා කැමතිනම් යන්න.."

" ම්ම්.. මම යන්නම්.."

" මේ උඹ ගිහින් මට පොඩි උදව්වක් කල්ලා දීපන්කො.."

" මොක..??"

" ඔය මාමා තකහනියක් කොළඹ එන්නෙ මොකක් හරි උරවක්කරමාලයක් ආයෙම එල්ලගත්තද දන්නෙ නෑ කරේ.. පොඩ්ඩක් හොයලා බලලා කියපන් මට.. කියන්න බෑනෙ.. එකපාරකුත් නිකරුනේ අමාරුවක වැටුනා.."

" මම හිතන්නෙ නෑ අම්මෙ.. මාමට එහෙම කවුරුත් ඇති කියලා.. අනික ඉන්නවනම් මාත් එක්ක කියනවනෙ.."

" ම්ම්.. පොඩ්ඩක් හොයලා බලන්නකො කෝකටත්.. මම හෙට ගෙදර යනවා.."

අම්මා ඉදුනු පලා කොළ ටික අල්ලලා එළියට විසික් කරලා සින්ක් එක ගාවට ආවා..

" මම ලබන සතියෙ එන්නම්.. රඨ්‍ය අයියත් එන්න ආසයි කිව්වා.. "

" එන්න කියන්නකො ඉතින් එහේ.. කොච්චර හොඳද.. මම ආව්විට කියන්නම්.. අඩුපාඩුවක් නෑනෙ.. මෙහෙ වගේ නෙමෙයිනෙ.."

" මම කියන්නම්.. එයා අම්මගෙන් අහන්න ඕන කිව්වා හැබැයි.."

" හා.. දැන් කවද්ද ඔය ඇල්ලෙ යනවා කිව්වෙ.. කවුරු කවුරුද එන්නෙ.."

" අනිද්දා යනවා කියලා හිතාගෙන ඉන්නෙ.. මමයි සෙනුකයි තව අපේ ඉස්කෝලෙ අයියලා වගේකුයි ආශියි මහීශායි ඔක්කොම යනවා.."

" අර පුතා.. කවුද ලමයෝ.. මට නම මතක හිටින්නෙම නෑනෙ.. ආ රඨ්‍ය පුතාගෙ අයියත් යනවා කිව්වද.."

@Shan

" ඔව්.. එනවා කිව්වා.."

" ලොකු පිරිමි ළමයිනෙ දැන් ඉතින්.. ගියාට කමක් නෑ.. අර ගෑණු ළමයි දෙන්නා පරිස්සමට බලාගන්න.. අපේ කාලෙ වගේ නෙමෙයිනෙ දැන් ඉතින් නිදහසේ හැදෙන ළමයිනෙ.."

" ම්ම්.."

" කොල්ලො.. වැඩක් නැත්නම් මිදුල පොඩ්ඩක්.."

" හා හා.."

මම අම්මට පොල් ගාලා කිරි ටිකත් හදලා දීලම කනේ එයාපොඩ් එකක් ගහගෙන ඉදලත් අරන් මිදුලට බැස්සා.. හෙන කාලෙකින් අතුගාන්නෙ.. මම වත්තෙ කොනක ඉදන් හිමිහිට තාලෙට සිංදුවකුත් කිය කිය අතුගාගෙන එද්දි එහා ගෙදර කමනි ඇන්ටිගෙ දුව වැලේ රෙදි වනනවා.. මම ඒක දැක්කෙ නෑ වගේ බිම බලාගෙනම අතුගාගෙන ආවා..සැක් දැක්කොත් දවසම ඉවරයි..

*සටස්* *සටස්*

මෙ අක්කා රෙදි සද්දෙන් ගසනවා ගසනවා.. ඔච්චර ගසන්න ඕනද මං අහන්නෙ.. අවධානෙ ඕනවෙලාද කොහෙද.. ඒවා ගනන්ගන්නෙ නැතුව මම වැට ගාව අතුගගා ඉද්දි අපේ ගෙදර ඉස්සරහින් කාර් එකක් නතර කලා.. ඒ එක්කම කාර් එකෙන් බැහැලා ගෙදරට දුවගෙන දුවගෙන ආවෙ ආශි.. ඊට පිටිපස්සෙන් මහීශාත් සාක්කුවට අත් දෙක දාගෙන හිමින් හිමින් ගේට් එකත් වහගෙන මාව දැක්කෙ නෑ වගේ ගේ ඇතුළට ඇවිදගෙන ගියා.. ඕකිගෙ ලොකුකම තමා කොහොමත්.. ආශි දුවගෙන ඇවිත් 'බොහ්' ගාලා මගේ කරේ එල්ලුනා.

" හායි ඩියර්.. ගුඩ් මෝනින්.."

" ගුඩ් මෝනින්.. මොකෝ උදේ පාන්දර මෙහේ.."

" පොඩි වැඩකට බං ආවෙ.. උඹව උස්සන් යන්න.."

" ඒ කොහෙද.."

@Shan

ආශි මගෙන් එහාට වෙලා හිටගත්තහම මම බිමට නැමිලා අම්මගෙ මල් පාත්ති අස්සෙ තිබ්බ වල් පැල වගයක් අතින් උදුරලා දැම්මා.. ආශිත් ඒ ගමන් බිමට නැමිලා වල් පැල වගයක් උදුරලා දැම්මා..

" අම්මා ලස්සනට ඉන්දලා නේද.."

" ම්ම්.. මේ පැළ ජාතිය අම්මට ගෙනැත් දුන්නෙ උඹ නේද.."

" ඔව් අනේ.. අපේ ගෙදරත් ඕවා පැල වගයක් තිබ්බා.. අපේ අම්මා කිව්වා අම්මටත් ගෙනත් දෙන්න කියලා.. ඒ වුණාට අපේ ගෙදර මෙච්චර ලොකුවට හැදුනෙ නෑ බං.. මැරිලා ගියා.. අම්මගෙ අත් ගුණේ තමා.."

" ම්ම්.."

" මෙන්.. ජ්ස්.. කවුද බං අර වැට ගාව ඉදන් උඹ දිහා බලාගෙන ඉන්න වට්ටිඅක්කා.."

ආශි රහසින්වගේ මගෙන් අහද්දි මම හැරිලා පිටිපස්ස බලලා ආයෙම ඉස්සරහා හැරුණා.. මෙකි තාම රෙදි වනනවද.. යකෝ රෙදි හෝදනත් වෙලා.. තාම වැල ගාව..

" අර බං මම දවසක් කිව්වෙ.. අල්ලපු ගෙදර අක්ක කෙනෙක් පස්සෙන් ආවා කියලා.. අන්න ඒකි.."

" කවුද.. අර කමනි කියන තේඋඩිච්චිගෙ දුවද.."

" ඔව් ඔව්.."

" සැක්.. උඹ වගේ හෙන ලුක් එකක් තියන එකෙක් එක්ක මේ ගෑණිට හැරෙන්නවත් පුලුවන්ද.. පිස්සු හු## තමා.. ඌජ්ස්-

ආශි ඉක්මනට අත් දෙකෙන් කට වහගත්තා.. ඒකිට හැමතිස්සෙම අමතක වෙනවා ඒකි ඉන්නෙ කොල්ලො එක්ක කියලා.. ඒකනිසා කුණුහර්පයක් කිව්ව ගමන් කට අත් දෙකෙන්ම වහගන්නවා..

" බබා.. අනේ නැගිට්ටින්නකො පැටියො.."

@Shan

ආශී එකපාරම හෙන ගහන්න වගේ ඉඳගෙන හිටිය තැනින් නැගිටලා බෙරිහන්දෙන්න ගත්තා.. එහා ගෙදර අක්කගෙ අතින් පනිට්ටුවත් බිමට වැටුණා..

" පිස්සුද බං.."

" *පොඩ්ඩක් ඉඳපන්කො* අනේ ඔයා ඕවා කරන්න ඕනද ඩියර්.. කෝ දෙන්න මම කරන්න.. ඉඳලා හිටලා මගේ නැන්දම්මට මම උදව් කරනන්ත් එපැයි.. කෝ කෝ බබා අනේ ඔයා එහාට වෙන්නකො."

ආශී ඒකිගෙ අතේ තිබ්බ පූස් කන් දෙකක් තියෙන හැන්ඩ්බෑග් එක මගේ ඇගේ ගහලා ඉඳල ඉල්ලගත්තා.. අහල් අටේ හීල් එකකුත් දාගෙන ඉඳලක් අරගෙන ෆැශන් ශෝ එකක වගේ මිදුල් අතුගාන එකියක් දැක්කමයි මම..

" පුලුවන්ද.."

" පුලුවන්ද අහන්නෙ අනේ.. මේවා මම නැතුව වෙන කවුරු කරන්නද.."

මම ශේප් එකේ පිටිපස්ස හැරිලා බලද්දි ටහුක් කමනි ඇන්ටිත් වැට ගාවම අතුගානවා..අක්කා රෙදි ආයෙම අරගෙන පනිට්ටුවට දාගෙන වැලේ වනනවා..

" ඔයාට මහන්සිනෙ.."

" පිස්සුද බබා.. මම ගෙදරත් මේවා කරනවා.. අනික අපි නෙක්ස්ට් ඉයර් එකේ එන්ගේජ් වුනාම කොහොමත් ලිවින් ටුගෙදර් ඉන්නනෙ හිතාගෙන ඉන්නෙ..I'm used to this already.. "

" ම්ම්.. ඉක්මනට අතුගාන්නකො එහෙනම්.."

මම ආශීගෙ හැන්ඩ්බෑග් එකත් කරක කරන පැත්තකට වෙලා ඉද්දි මේකි අර තඩි හීල්ස් දෙකත් දාගෙන අතුගාලා ඉඳල ගෙනැත් මට දීලා කමනි ඇන්ටිටත් රවලා මාව ඇදගෙන ගේ ඇතුළට ගියා..

" මේවා මේ කන්ට්‍රැක්.."

" කන්ට්‍රැක්.. කවුද උඹට කන්ට්‍රැක් දුන්නෙ.."

@Shan

" උඹේ බෝයිෆ්‍රෙන්ඩ් තමා.. මගේ බෝයිෆ්‍රෙන්ඩ් එක්ක කියලා තිබ්බෙ.. මගෙ වරද් සුදු කුක්කු පැටියා දිහා අල්ලපු ගෙදර ඉන්න බාබායිගා යකින්න බලාගෙන ඉන්නවා.. ඉතින් මම කන්ට්‍රැක් එකක් බාරගත්තා.. අද ඇවිත් ඇක්ට් කරන්න.. වාසනාවට මගේ ටයිමින් හොඳයි.."

යකෝ රධ්‍ය අයියත් මාර ඩයල් එක තමා..

" උඹේ කටට මක් වෙලාද.. රතු වෙලානෙ.."

" සිරාවට.. හුගක් පේනවද ඒක.."

" නෑ නෑ ලොකුවට නෑ.. ඒත් මගේ සූක්ශම ඇහැට පේනවා.. මෙහෙම ළං වෙලා බලද්දි.."

ආශි මගේ මූණ කිට්ටුවටම එද්දි මහීශා පිටිපස්සෙන් ඇවිත් ආශිව ඇදලා ගත්තා..

" උඹලා දෙන්නා මක් කරනවද මේ.."

" නෑ මහීශෝ.. මෙ ෂනෙරුවගෙ කට කාලා රධ්‍ය අයියා.. ඒක පෙන්නුවා මම.."

" උඹ අනුන්ට කියන්නෙ.. උඹේ බෙල්ල කෑවෙ කවුද.."

මහීශා කිසි හිතක් පපුවක් නැහුව අශිගෙ ස්කිනර් එකෙන් පේන රතු පාට මාක් ගොඩක් ඇඟිල්ල දික් කල්ලා පෙන්නද්දි ආශි බෙල්ල වහගෙන අහකට වුණා..

" මදුරුවෙක් කෑවා.. ඇයි මගුල.. උඹ තනිකඩයි කියලා මම මක් කරන්නද.."

" මම පව් බං.. එක්සෑම් ඉවරවෙලා උඹලා ලව් හරි කරනවා.. මම..??මම මොකද කරන්නෙ.. මම උඹලට ශොපින් යන්න එනවා.. බෙයිික යාලුවො.."

" ඉතින් අර ආධ්‍ය අයියා ඉන්නෙ.. ඊයෙත් බදාගෙන ඉදියා නේද කුස්සියෙ.."

" අනේ පගෝ.. උඹට මම කියන්නෙ නෑ.."

@Shan

මහීශා මගේ ඔලුවටයි ආශිගෙ ඔලුවටයි ඇනලා ගිහින් මගේ ඇදෙන් ඉදගත්තා.. ඔලුවට ගහන්නෙපා යකෝ ඔහොම.. පහුගිය කාලෙම ගනන් හදන්න ගිහින් එක ගානටක එක ගානෙ අර මිනිහගෙන් ටොකු කාලා.. මෙ යන විදියට මොලේ හිල් වෙලා තමයි නවතින්නෙ..

" ඔකේ.. දෙන්.. තව ටිකකින් රධ්‍ය අයියා එනවා කිව්වා.. ෂනෙරුවා.. රෙඩි වෙන්නකො ඩියර්.."

" රධ්‍ය අයියා කොහෙ එන්නද.. උඹලා කොහේ යන්නද මේ ආවෙ.."

" මම ආවෙ ආන්ටි එක්ක යන්න.."

මහීශා නෙල්ලි ගෙඩියක් කටෙ ඔබාගත්තා.. ඒක දැකලා මගේ මූණ ඇඹුල් වෙලා ගියා..

" අපේ අම්මත් එක්ක මක් කරන්නද.."

" මම ආන්ටි එක්ක අපේ ගෙදර අද කේක් එකක් හදන්න පුරුදු වෙනවා.. අපේ අම්මා කිව්වා ගිහින් ආන්ටිව එක්කන් එන්න කියලා.. අනික ආන්ටි යන්නනෙ ඉන්නෙ.. අපේ අම්මා දැන් ඉදන්ම අඩනවා.."

" එහෙමද.. ම්ම්.. එතකොට උඹ ආවෙ මොකටද.. උඹටත් අපේ අම්මව ඕනද.. යකෝ මේක හරි මගුලක්නෙ.. අම්ම මගේ.. ඉල්ලන් එන්නෙපා.."

" අයියෝ නෑ ඩියර්.. මම අම්මව එක්කන් යන්න නෙමේ ආවෙ.. අපේ අම්මිත් අද මහීශාගෙ ගෙදර ඉන්නෙ.. එහේ එයාලගෙ Secret Little Rendezvous එකක්.. සෙනුකලාගෙ අම්මත් මහීශාලාගෙ ගෙදර යනවා.."

" සිරාවට.. අම්මා කිව්වෙවත් නෑ.."

කොහොමත් අපේ අම්මා ඕවා මට කියන්නෙ අන්තිම මොහොතෙ යන්න ඇදගෙනනෙ.. එන්නෙ නැතැයි පව හලලා හලලා.. ඇඳුම් මෝස්තරයි මූණෙ ගාන ඒවයි. ඕවා තමා ගිහින් වැඩිහරියක් කතාකරන්නෙ..

" මෙහෙමයි බබා.. මම කන්ට්‍රැක් එකක් බාරගත්තනෙ රධ්‍ය අයියගෙ.. සෝ මම මගේ ඇක්ට් එක දිගටම කරගෙන යනවා උඹ මෙහෙන් යනකල්ම.. ඒකෙ ගාස්තුව විදියට රධ්‍ය අයියා පොරොන්දු වුණා මාත් එක්ක ෂොපින්

@Shan

යන්න එන්න.. පොරොන්දු වුනා කිව්වෙ.. මම බලෙන් කියාන් අයියට කියවලා පොරොන්දු කරවගත්තා.. ඉතින් රධ්‍ය අයියා උඹ නැතුව එන්නෙ නැනෙ.. දැන් දෙන්නම යං මාත් එක්ක ශොපින් කරන්න.."

" අනේ මේ අපිව අල්ලගන්නෙ.. කෝ උඹේ මිනිහා.. ඌ එක්ක පලකො.."

" මගේ මිනිහට මට වඩා රගර් මැච් එකක් ලොකුවෙලානෙ.. එයාට අද ප්‍රැක්ටිස්.. එන්න වෙන්නෙ නෑ.."

" අපෝ උඹත් එක්ක ශොපින් ගිහින්-"

" මොකක්ද අප්පා.. මම මොකක් හරි කිව්වොත් කාටවත් බෑ.. ඔයාලා මගේ යාලුවො නෙමේ.. ඒකනෙ මෙහෙම කරන්නෙ.. මම කිව්වෙ මහීශා ඔයා විතරයි බබා මගේ හොදම යාලුවා හැමදාටම.. මේ හැමෝම මහ බොරුකාර-"

" ආ ඉදහන් ඉදහන්.. නාල එන්න.. මගුල.. පුදුම කරුමයක් තමා.."

" අන්න එහෙම.. මම යනවා මගේ ආන්ටිව හොයාගෙන.."

ආශි බෑග් එක මගේ ඇදට විසික් කරගෙන යන්න ගියා.. හීල් එක ගැලෙව්වහම මෙකි හෙන කොටයිනෙ යකෝ.. සැක්.. කියාන් අයියත් මාර ඩයල් එක තමා.. සයිස් එකට හොයාගන්න එපැයි..

" අඩෝ ෂනෙරුවා.. කියාන් අයියා පව් නේ බං.."

" අපි නම් කිව්වා ඕවා.."

" කමක් නෑ උන්ට හොදනම් අපිට මොකෝ.. කියාන් අයියා නැතුව වෙන එකෙක් කොහොමත් මෙකි එක්ක ඉන්නෙත් නෑ.. රූපෙටවත් රැවටිලා පස්සෙන් ආවොත් තමා.."

" මම්.. මම ඇදුමක් දාගෙන එන්නම්.. අඩෝ මේ උඹට වැඩක් නැත්තම් මෙක අයන් කල්ලා දාපන්කො.."

මම අල්මාරියෙන් සුදු ඩෙනිමකුයි කළු සුදු හරහට ඉරි තියෙන ශර්ට් එකකුයි ඇදට දැම්මහම මහීශා මටත් බැන බැන ඒක ගුලි කරන් අයන් කරන්න ගියා.. මම මේ උදවු කරන්නෙ මෙකිට.. තේරෙන්නැද්ද මන්දා.. ආධ්‍ය

@Shan

අයියව අල්ලගන්න නම් මුලින්ම හොඳ ගෘහනියක් වෙන්න ඕන.. යහපත් වෙන්න ඕන.. පොඩි තැන ඉඳලම ට්‍රේන් කරන්න එපැයි..

කොහොම හරි මම ඇඳගෙන ඉවරවෙලා ඩෙග් දෙකකුත් දාගෙන එළියට වෙලා පාඩුවෙ ඉද්දි අර බේසික ආශි ඒකිගෙ බෑග් එක අස්සෙන් දුඹුරුපාට අයි ලයිනර් එකක් උස්සගෙ ඇවිත් මගේ හොඳට තිබ්බ ඇස් දෙක යට ගාලා ඇඟිල්ලෙන් අතුල්ල අතුල්ල මොකක්ද මගුලක් කලා..

" අම්මෝ.. ලස්සනයි අප්පා.."

" ඕකට කියන්නෙ වල් පාට.. හැබැයි උඹට ඔහොම සිරාවටම ලස්සනයි.. කළුපාටට වඩා දුඹුරු ලස්සනයි තමා.."

" ඉතින් බං මුගේ ඇස් දෙක කොහොමත් දුඹුරුනෙ.."

" මට ඉන්න දීපන් පාඩුවෙ.. ඔය ඇති.. ආයෙ ආවොත් නම් ගහනවා උඹලා දෙන්නට.."

මම සපත්තුව පෙන්නලා කිව්වහම අපේ අම්මත් ඇඳගෙන කියාගෙන එළියට ආවා.. මහීශා යන්න නැගිට්ටා..

" සුදුමහත්තයා.. මම ගමනක් යනවා..~ කලින් ගෙදර ආවොත් ඔයා කෝල් එකක් දෙන්න.."

" හා පරිස්සමට ගිහින් එන්න.."

" යමු ආන්ටි.."

මහීශා අපේ අම්මගෙ අතේ එල්ලිලා යන්න ගියාම මමයි ආශියි ඉස්තෝප්පුවට වෙලා රධ්‍ය අයියා එනකල් බලාගෙන ඉදියා.. ටිකකින් එයාගෙ කාර් එකත් ඇවිල්ලා ගේට් එක ගාවින් නතර කලා..

" මස්සිනා ඇවිල්ලා.. යමු යමු.."

ආශි උඩ පැනැන දුවගෙන ගිහින් කාර් එකේ පිටිපස්සෙ සීට් එකෙන් ඉඳගත්තම මම හිමින් ගිහින් ගේට් එකත් ලොක් කල්ලා යතුර සාක්කුවට දාගෙන පැසෙන්ජර් සීට් එකෙන් ඉඳගත්තා..

@Shan

මූ යකෝ..

රධ්‍ය අයියා ඩ්‍රොප් ඩෙඩ් හැන්ඩ්සම්.. ශේඩ්ස් දෙකකුත් දාලා අත් හිර වෙන්නම කළු ශර්ට් එකක් ඇදලා කළු රිප්ඩ් ජීන් එකක් ඇදලා.. සුදුපාට ඩෙග් දෙකක් දාලා.. මම ඉතින් වැඩිය බලන්න හොඳ නැති නිසා ඉක්මනට ඉස්සරහා බලාගත්තා.. ඒ වුණාට ලස්සනයිනෙ..

" ඕ ගෝඩ්.. ඔයාලා නම් සිරාම මැචින් කපල් එකක් තමා ගයිස්.. ලුක් හව් කූල්.. ජස්ට් වාව!!! ඇම් ඔබ්සෙස්ඩ් විත් දෙම් ඕල්රෙඩි.. ගෝඩ් හෙල්ප් මී ප්ලීස්.."

ආශි ඉස්සරහට අත දික් කල්ලා ඒ සී එක වැඩි කරන ගමන් බටර් ගාන්න ගත්තා.. ඒකි කියන කතාවෙ ඇත්තක් තියෙන්න පුලුවන් ඒ වුණාට මෙකිගෙ හැටි අපි දන්නැද්ද.. ඔකි බටර් ගානවා..

" මොකද ෂනෙරු ඔහොම බලන්නෙ.. මම බටර් ගානවා නෙමෙ හලෝ.. සීරියස් කිව්වෙ.. ඔයාලා දෙන්නා වගේ හෙන හැන්ඩ්සම් දෙන්නෙක් එක්ක ශොපින් යන එකම කොච්චර දෙයක්ද.. ලව් යූ ගයිස්..මම්වාහ්.."

ආශි මගේ උරහිසටත් එකක් ගහගෙන පිටිපස්සට වුණා..

" කොහෙටද යන්නෙ නංගී.."

" ආ අයියා.. Crescat Boulevard යමුද.. මම ශොපින් කරන්නම්.. ඔයාලා දෙන්නට බෝරින් වේවි.. You Know Girl's Things.. ඔයාලා ඇවිදලා හිමිහිට එන්නකො.. හා ද.. කොහේහරි යනවනම් මට ටෙක්ස්ට් කරන්න.."

" කේ.."

" පොඩ්ඩක් ඉන්නකො.. ගයිස් I'll tell you something to enjoy.. SCOPE එකේ Pope Exorcist කියලා මූවි එකක් තියෙනවා.. ඒකනම්.. මරු.. මම මහීශා එක්ක බලන්න ගියා.. සිරාවටම ඒක මරු.. වැඩි වෙලාවකුත් නෑ.."

" මම ප්ලෑන් කල්ලා තිබ්බෙ එහෙම තමයි.. now I'm going there anyway.. ඔයාට පික් කරන්න ඕන වුනාම කෝල් කරන්න.."

" You're planning everything without even telling me.."

@Shan

" All you have to do is come with me.. Just trust me.. Wherever I go, I guarantee that you will enjoy it to the fullest.."

මම හිනාවෙලා ඉස්සරහා බලාගත්තා.. මගේ ගැටපොලොස් කොට්ටෝරුවා කියන එකක් තමා.. ඊටපස්සෙ ආශිව Crescat Boulevard එකෙන් ඩ්‍රොප් කල්ලා රධ්‍ය අයියා OGF එකේ පාකින් ලොට් එකෙන් කාර් එක පාක් කලා.. මම ශුස් දෙකේ ලිහිලා තිබ්බ ලේස් දෙක ගැටගහත්තා..

" යමු..??"

මම ඔලුව උස්සලා කාර් එකෙන් එන අමුතු ස්මෙල් එක මොකක්ද කියලා බැලුවා.. නැග්ග වෙලේ ඉදන්ම ඒක එනවා.. ඒකනම් මාරම සුවදයි..citrus woody සුවදක්.. එක්ක ලෙමන්?? ඒ වගේ සුවදක්.. මුලින් දැනුනට වඩා ටිකක් වෙනස් වෙලා දැනෙනවා.. ඒත් ඒක මාරම මාරම සුවදයි.. මම පොඩ්ඩක් රධ්‍ය අයිඅගෙ බෙල්ල ගාවට මූණ කිට්ටු කල්ලා බැලුවා..

" ඔයා ප'ෆියුම් එක මාරු කලාද.."

" මම්.. ඒක හොද නෑ වගේද.."

" නෑ නෑ මෙක මරු.. අර කලින් පාවිච්චි කරපු එකට ඔලුවෙ කැක්කුම අල්ලනවා.."

" එහෙමද.. මම ගන්නකොටත් නිකමට හිතුවා.. ඔයා මෙකට ආස වෙයි කියලා.."

" ඒ ඇයි.."

" නිකන් ඉතින්.. හිතුනා.. I can guess what you think.. Radhya's Secrets.."

" සිරාවට.. ආ එහෙනම් කියන්න දැන් මම මොකක්ද හිතන්නෙ කියලා.."

" පොඩ්ඩක් ඉන්න පොඩ්ඩක් ඉන්න.. මට ඒක ඇහෙනවා ඇහෙනවා වගේ.."

රධ්‍ය අයියා බොරුවට ඇස් දෙකත් පියාගෙන එයාට මොකක් හරි ඇහෙනවා වගේ ඇක්ට් කලා.. යවන්න තියෙන්නෙ රහපාන්න..

@Shan

" කේ.. ඇහුණා.. ඔයා දැන් හිතන්නෙ මොකක්ද කියලා.. I want to kiss this handsome sweet guy in front of me who is my precious boyfriend so badly.. එහෙමනෙ.."

රධ්‍ය අයියා හෙන බැරෑරුම් මූණක් හදාගෙන කියද්දි මගේ කම්මුල් දෙක රතු වෙලා ලේ පිරිලා පිපිරෙන්න වගේ ආවා..

" පිස්සුද.."

" ආ නැද්ද.. එහෙනම් ඔයාගෙ ඉස්සරහා ඉන්න එක්කෙනාට හිතෙන්නෙ එහෙමයි.. මම හිතන්නෙ අපි දෙන්නා හිතන ඒවා මට මාරුවෙලා ඇහිලා.."

රධ්‍ය අයියා මගේ තොල් වලින් ඉක්මනට පෙක් එකක් තියලා එහාට වුණා.. පාකින් ලොට් එක ලාවට කළුවර වුණත් මට එයාගෙ දිග ඇස්පිහාටු තියෙන ඇස් දෙක හොඳට පේනවා..

" Can I have the permission?"

රධ්‍ය අයියා ආයෙම මගේ කම්මුලකින් අතක් තියලා මගේ මූණට පහත් වුනා.. මගේ අතක් එයාගෙ ශර්ට් එකක් ගුලි කරගෙන එයාව ළගට ඇදලා ගත්තා.. එයාගෙ දිග ඇස් පිහාටු මගේ ඇස් වල ගෑවෙනවා.. එයා සැරින් සැරේ ඇස් උස්සලා බලද්දි ඇහිපිහාටු මගේ ඇස් වලට යටින් ගෑවෙනකොට මාව සිහියෙන් ඈතකට ඈතකට ඇදිලා ගියා..

රධ්‍ය අයියා එයාගෙ සීට් බෙල්ට් එක කලබලෙන් ගලවලා දාලා ඒ අත මගේ ඉණ වටේ යවලා මාව එයාගෙ පැත්තට ඇදලා ගත්තා.. මම මගේ අනිත් අත එයාගෙ උරහිසින් තියාගත්තා.. මම කිසි දෙයක් හිතලා කරන්නෙ නෑ.. ඒවා ඉබේටම වෙනවා.. ඒවා එහෙම වෙන්න ඕන කියලා හිතින් කියනවා..

රධ්‍ය අයියා මගේ තොල් වලින් පෙක් එකක් තියලා මගේ යටිතොල එයාගෙ තොල් අතරට අරගෙන එකම රිදම් එකකට උරවන්න ගත්තා.. මගේ ඇස් ඒ එක්කම බාගෙට පියවෙනවා.. ආයෙම දිගෑරෙනවා.. හරියටම ඩ්‍රග් එකක් වගේ.. මමවත් දන්නෙ නෑ ඇයි එහෙම වෙන්නෙ කියලා.. එයා ගාවින් එන සුවඳට මාව ඇදිලා යනවා වගේ මට දැනෙනවා.. ඒක හරිම නරක විදියට මාව සෙඩියුස් කරනවා.. මම එයාගෙ ශර්ට් එකෙන් තව ටිකක් ඇදලා අරගෙන මගේ ලගට ගත්තා.. මට ඒ සුවඳින් මාව වහගන්න ඕන කියලා හිතෙනවා.. රධ්‍ය අයියා මගේ කම්මුලක තිබ්බ අත

@Shan

කම්මුල්,බෙල්ල දිගේ පහලට අරගෙන ගිහින් මගේ පපුව ගාවින් නතර වුණා.. මගේ ඇගේ රස්නෙ වැඩි වෙනවා මට දැනෙනවා.. රධ්‍ය අයියගෙ අතක ඇගිලිතුඩු හිමිහිට මගේ පපුව උඩ මොනවාහරි හොයාගෙන යද්දි මම එයාගෙ උරහිසක් රිදෙන්නම අල්ලගත්තා.. මගේ ඇගිලිපාරවල් එයාගෙ බෙල්ලෙ හිටියා.. විනාඩි දහයක් විතරම අපි දෙන්නගෙ අතරෙ තිබ්බ ටෙන්ශන් එක එකපාරම කැඩිලා ගියේ මගේ අතක් රධ්‍ය අයියගෙ බෙල්ට් එක ගාව නතර වුණු නිසා.. රධ්‍ය අයියා මගේ අතක් තද කල්ලා අල්ලගෙන මාව එහාට කල්ලා මගේ කම්මුලකින් හාද්දක් තිබ්බා..

" අපි යමු..??"

මම මොකුත් නොකිය කාර් එකෙන් බැස්සා.. රධ්‍ය අයියගෙ ඇඳුම තැනින් තැන පොඩි වෙලා.. ඇත්තටම මේ දවස්වල මගේ සිහියට මොනවා වෙලාද මට හිතාගන්න බෑ.. එක්කො ඇගේ තියන හෝමෝන වැඩියෙන් වැඩකරන්න අරගෙන.. මොකක් හරි..

මම සාක්කුවට අත් දෙක ඔබාගෙන හොර බළලා වගේ රධ්‍ය අයියට එහාපැත්තෙන් යද්දි රධ්‍ය අයියා මගේ කරට අතක් දාගෙන මාව ළඟට ගත්තා..

" ඒකනම් පිස්සුවක් තමා වරද්.."

"....."

" I think.. it would be better if it happened inside a bedroom in a villa with a beautiful romantic environment rather than in a parking lot.."

" ඕක නවත්තගන්න.."

" ඇයි මම නවත්තන්නෙ.. මම කියන්නෙ ඇත්ත කතාවක්.. ඇවිදින ආට් වර්ක් එකක් ළඟ තියාගෙන ඒක මේ පාකින් ලොට් එකක බලන්න තරම් පිස්සු ඩයල් එකක් වගේ මාව ඔයාට පේනවද.. මම කියන්නෙ වරද්.. වෙයිට්.."

රධ්‍ය අයියා අපි ගාවින් කීපදෙනෙක් අපිව පහුකරන් යද්දි මට ඇතුලට යන්න ඩෝ එක අල්ලගෙන හිටියා.. තියේටර් එක තිබ්බෙ උඩම නිසා එයා දිගටම කතා කර කරම ගියා..

@Shan

" මොකක්ද මම කිව්වෙ.. ආ ආට්වර්ක් එක.."

" ම්ම්.."

" ඉතින් ඔයා හිතන්න ඔයා ආට් වර්ක් එකක් නම් මම ඊස්තීට් කෙනෙක් කියලා..ඊස්තීට්ස්ලා එහෙම විනාඩි පහෙන් ආට්වර්ක් බලලා ඉවරකරන්නෙ නෑ.. එයාලා ලොකු වෙලාවක් ගන්නවා ඒකට.." ( *

**An aesthete**

is someone who loves and appreciates works of art and beautiful things )

" රධ්‍ය අයියෙ..!!"

" මේ අහන්න බබා.. ඔයා දන්නවද දහ නමවෙනි සියවසේ Frederic Leighton කියලා ආටිස්ට් කෙනෙක් ඇඳලා තියෙනවා Flaming June කියලා ආට් එකක්.. මම ඒකට මාර ආසයි පොඩිකාලෙ.. මට ඔයාව දැක්ක පළවෙනි දවසෙ ඒ ආට්වර්ක් එකේ ඉඳපු Flaming June ව මතක් වුනා.. ඉතින් Flaming June වගේ වික්ටෝරියන් මහෝගනි ලී රාමුවක් දාපු ආට්වර්ක් එකක තනි අයිතිකරයා මම කියලා හිතද්දි මටත් එනවා අර ඉතාලියෙ ඉන්න ධනපති පන්තියේ තෙල් සායම් චිත්‍ර සල්ලිදීලා ගන්න සල්ලිකාර කලෙක්ටර් කෙනෙක්ට වගේ මාර කික් එකක්.. සී..?? ඇනටම ඔයා දිහා කී දෙනෙක් බැලුවද.."

" කොහෙන්ද ඔච්චර කියවන්න පුරුදුවුනේ.. මම හිතන්නෙ මෙච්චර කාලෙකට ඔයා ඔහොම කතාකලාමයි.. ප්‍රපෝස් කරපු දවසෙවත් ඔච්චර කියෙව්වෙ නෑ.."

" එහෙම එකපාරට එනවා කතාකරන්න ගටක්.. පස්සෙ ඒක නැතිවෙලා යනවා.."

" එහෙමද.."

මම දිගටම සාක්කුවට අත් දෙක ඔබාගෙන ඉදියා.. ඊටපස්සෙ අපි ටිකට්ස් අරගෙන තියේටර් එකට ඉහින් ඉඳගත්තා.. අදනම් පිස්සුම පිස්සු දවසක්.. අපි දෙන්න ඉඳගත්තෙත් හෝල් එක කොනේම තිබ්බ සීට්ස් දෙකක.. හෝල් එක ඔක්කොම ෆුල් වෙලා තිබ්බෙ.. හරිනම් මේ සීට්ස් දෙක එපැයි ඉස්සෙල්ලම

@Shan

යන්න.. එක්කො රධ්‍ය අයියා කලින් බුකින් එකක් දාලා තිබ්බද දන්නෙ නෑ.. අපිට එහාපැත්තෙන් ඉඳගෙන හිටියේ ෆොරින් කපල්ස් දෙකක්.. මම එක එක ඒවා හිත හිත මගේ අතේ තිබ්බ කෝක් එකේ ස්ට්‍රෝ එක කටෙ ගහගත්තා.. එයා මට කලින් බබා කියලද කිව්වෙ..??

පාකින් ලොට් එකෙත් ලේට් වුණු නිසා අපි ඇවිල්ලා විනාඩි පහකින් විතර මූවි එක පටන්ගත්තා.. මූවි කැටගරි එක හොරර් ත්‍රිලර් එකක්.. ඒකනිසා බෝරින් ගතියක් තිබ්බෙ නෑ.. පටන් අරගත්ත වෙලාවෙ ඉඳන් ඉවර වෙනකල්ම හොඳට තිබ්බා.. රධ්‍ය අයියා මගේ අතකින් අල්ලගෙන ඉදියෙ.. සැරින් සැරේ එයා අතින් හාද්දක් දෙකක් තියනවා මට දැනුනා.. එකම එක වතාවක් මගේ තොල් වලින් පෙක් එකක් තිබ්බා.. එච්චරයි.. අපි දෙන්නම චීස් දාපු පොප්කෝන් එකක් කකා මූවි එක බැලුවා.. අපි යාලුවෙන්න කලින් එයා කියලා තියෙනවා ෆිල්ම් හෝල් එකක ගිහින් කපල් එකක් වුනාම රොමැන්ටික් වුණත් හොඳ බිහේවියර් එකක් තියෙන්න ඕන කියලා.. මොකද අපේ වටේ ඉන්න මනුස්සයොන්ට අපි නිසා අන්කොම්ෆටබල් එන්වයරමන්ට් එකක් හැදෙන්න පුලුවන් නිසා.. ඒකත් ඇත්ත ඉතින්.. ටිපිකල් කපල් එකක් ෆිල්ම් එකක් බලන්න යනවා කියන්නෙ මොකක්ද.. ඒකෙ ගිහින් හැ#### එකනෙ.. මම කියන්නෙ මගේ මතේ.. ඒක එක එක අයට වෙනස් ඇති.. මම දන්නෙ නෑ..

මමත් රධ්‍ය අයියා කියනවා වගේ කියන්නෙ යන යන හැම තැනම අසභනේ වගේ හැසිරෙන්න ඕන නෑනෙ.. නිකමට හිතන්න අපි හැමෝම එකට ඉන්න වෙලාවක අයුක අයියා-සෙනුක , ආශි-කියාන් අයියා නැත්නම් මම-රධ්‍ය අයියා හෙන වල් විදියට හැසිරෙනවනම් අපිට අවුල් නැද්ද ඒක.. අවුල් නෙ.. හෙන අපහසුයිනෙ.. ඕවා තමයි අපේ සෙට් එකේ තියරිය.. හැමෝම ඉන්න තැනක ආතල් එකේ ඉන්නවා.. උන් උන්ගෙ ප'සනල් ලයිෆ් වෙනයි.. මේවා වෙනයි..

ඉතින් අපි නිදා~හසේ මූවි එකත් බලලා එළියට එද්දිම වගේ ආශිත් මැසේජ් එකක් දාලා තිබ්බා එයා පැය බාගෙකින් ගන්න එන්න කියලා.. අපි දෙන්නා OGF එකෙන් ආපහු Crescat Boulevard එකට ආවා.. ඒකෙ ෆුඩ් කෝට් එක නියමයි.. ගොඩක් අයිටම්ස් තියෙනවා ට්‍රයි කරන්න.. මමත් පලවෙනි පාරට මේකෙ ෆුඩ් කෝට් එකෙන් ට්‍රයි කරන්නෙ..KAFFI එකෙන් මම iced mocha එකකුයි රධ්‍ය අයියා matcha frappe එකකුයි අරන් අපි දෙන්නා ටේබල් එකකින් ඉඳගෙන හිටියා ලන්ච් එක ගන්න ආශි එනකල්.. ඒකි නේල් ස්පා එකකද මොකකද ගියා කිව්වනෙ..

@Shan

" ආධ්‍ය අයියා එනවා කිව්වද.."

" ඔව්.. ඒකා කොහොමත් එනවා.. බොරුවට එදා අර නංගිගෙ අවධානෙ ගන්න රඟපෑවනෙ.."

" අයියලා මල්ලිලා කොහොමත් දන්නවා හොඳට රඟපාන්න.."

" අනේ මෙ හිටපන්.."

" ඉතින් ඇත්තනෙ.. මේ මොකක්ද ඔයා අර ආශිට දුන්නු කන්ට්‍රැක් එක.. ඒකි උදේපාන්දර ඇවිත් නටපු නැටුමට මම හිතුවෙ අල්ලපු ගෙදර අක්කා බඩ වෙයි කියලා.."

" අර බ්‍රෙසියර් අඳින්නැති ඇන්ටි නේ.."

" නෑ අනේ ඇන්ටිගෙ දුව.."

" ආ.."

රධ්‍ය අයියා හෙන මනමාල හිනාවක් දාගෙන එයාගෙ ෆ්‍රැප් එකෙන් උගුරක් බිව්වා..

" මොකද හිනාවෙන්නෙ.."

" නිකන් නිකන්.. ඔයාට මේක ට්‍රයි කල්ලා බලන්න දෙන්නම්.."

රධ්‍ය අයියා මම මොකුත් කියන්න කලින්ම frappe එකේ බටේ අරගෙන මගේ කටේ ගැහුවා.. සැක්..මේ මොන මගුලක්ද මේ.. මම මූණ අහකට අරගෙන ඒක අමාරුවෙන් ගිල්ලා.

" සැක්.. මොනවද බං මේ බොන්නෙ.."

" ඒක රසයිනෙ.. නැද්ද.."

" පොල්කිරියි කෙසෙලුයි එළකිරියි.. සැක්.."

" සැක් නෙමෙ ඒක රසයි.. අපි දෙන්නගෙ ටේස්ට් එක දෙකක්.. ඒකයි.."

@Shan

" ම්ම්.. මොකක් හරි.."

මම අර මගුලෙ රහ යන්න මගේ මෝකා එක බිව්වා..

" අපේ මාමා ඊලග මාසෙ මෙහෙ එනවා කිව්වා.. මම මාමා එක්ක ක්වාටස් නතරවෙන්න ඉන්නෙ.."

" මොකක්..??ඔයා මට එහෙම එකක් කිව්වෙ නැනෙ වරද්.."

" මමත් අද උදේ මාමා එක්ක කතාකලේ.. එයාට ට්‍රාන්සර් ඇවිල්ලා ඒකනිසා එනවලු.."

" ඒක හොඳයි.. ඔයා තනියම ඉන්න එක මටත් හිතට හරි නැතුව ඉදියෙ.. මාමා එක්කනම් ඉතින් හොඳයිනෙ.. මමත් නැනෙ.."

" ම්ම්.. ආ අපේ අම්මා කිව්වා ඔයාට එන්න කියලා ගමේ යන්න.. "

" සිරාවට අම්මා හා කිව්වද.."

" ම්ම්.. අපි දෙන්නට මේ මාසෙම එකට ඉන්න සෙට් වෙනවා.. හොඳ නැද්ද.."

" කවුද කිව්වෙ හොඳ නැහැ කියලා.. It's called luck.."

" මගේ ලක් එකේ හැබැයි හිලක් තියෙනවා.. Don't expect too much about the future කියලා ඔයාමනෙ කියන්නෙ.."

" එහෙමත් එකක්නම් තමයි හැබැයි.. අපි තියරියක් හදාගමු දැනට සතුටින් ඉන්න ඕන කියලා.. ඒකට අරක කම්පෙයා කල්ලා අදාල තැනට වැඩ කලානම් හරි.."

" ඔයා කියන එකක් තමයි ඉතින්.. ඒකනෙමෙ කෝ ඔයාගෙ අතේ තිබ්බ රිංග් එක.."

මම මගේ අත දිහා බලලා රධ්‍ය අයියගෙන් අහද්දි එයා හිනාවෙලා ටිශූ එකකින් කට පිහිදගත්තා..

" තියෙනවා.."

@Shan

" කොහෙද තියෙන්නෙ.."

" ඔයාට ඇත්තටම ඒක ගැන සිහියක් නැද්ද වරද්.. එහෙනම් මම හෙන සාර්ථක බෝයිෆ්‍රෙන්ඩ්කෙනෙක් තමා.. My boyfriend forgets everything when I am around.."

" වටේ යන්නැතුව කියනවකො.."

" බබා ඔයාට අහුවුනේ නැද්ද මගේ කරේ මාලයක් තියෙනවා.. ඒකෙ මුද්ද තියනවා.."

රධ්‍ය අයියා සිල්වර් චේන් එකක් උඩට ඇදලා පෙන්නද්දි මම බිම බලාගත්තා.. සැක් වරද්.. හරිම සෝක් උඹෙ සිහිය නම්..

" අහ්.."

" ඒක ඇඟිල්ලට හිරයි වගේ.. කලින් නම් එහෙම තිබ්බෙ නෑ දැන් ටිකක් තදයි.. This ring is so precious to me.. මේක එහෙම නැතිවෙන්නෙ නෑ.."

" ඔව් තවුසෙ ඕක නැතිකරගත්තොත් ඉතින් මැරුම් කන්න තමා.."

රධ්‍ය අයියා හිනාවෙලා මට ඇහැක් ගැහුවා.. මේ ගෙවෙන දවසනම් මම ආසම දවස්වලින් එකක්.. මගේ ස්ට්‍රෙස් එක, ජීවිතේ ගැන තිබ්බ කලකිරීම ආයෙම මගෙන් ඈතකට පාවෙලා යනවා වගේ..

ටිකකින් ආශිත් ආවහම අපි තායි එක්ස්ප්‍රස් එකෙන් චීස් කොත්තුවකුත් කාලා ශර්ට් දෙකතුනකුයි තව ඕන දේවල් ටිකකුයි අරගෙන ගෙදර එන්න ආවා.. මම ගෙදර එද්දිත් අම්මා ගෙදර ඇවිත් හිටියෙ නෑ.. මම බෙල්ල ගාව අලුතින් පේන රතුපාට කැළලට අයිස් කැටයක් තියාගෙන නාලා කියලා සෙටියට වෙලා නරුටෝ බැලුවා අම්මා එනකල්ම..

***Flaming June**

is a painting by Sir Frederic Leighton, produced in 1895. Painted with oil paints on a 47-by-47-inch square canvas, it is widely considered to be Leighton's best-known work in the 21st century, much reproduced in

@Shan

posters and the like. It shows a sensuous version of his classicist Academic style..

ඩේට් එකට සහභාගී වූ සැමට ගෞරවයෙන් බුදුසරණයි.. මම ආයෙම වරද් පුතාගෙ ගොටුකොළ සම්බෝලෙ හදන්න යන්නෙ.. ඒකගෙ සිහිය පිහිටවා ගන්න ඕන නිසා.. ට්‍රිප් එකෙන් සෙට් වෙමු.. එන්න මිතුර අපි සතුටු වෙමු..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 71 කොටස

" කෝ බං මේ සෙනුකයා.. ඩයල් එකගෙ තාත්තා උදේම කොක්කක් දැම්මද දන්නෙ නෑ.."

" පිස්සුද අනේ.. මට එයා කතාකලා උදේ..පොඩ්ඩක් පරක්කු වෙයි කියලා කිව්වා.."

" මම වත්සල්ට කතාකරන්නම්.."

අපි ඉදගෙන හිටියේ රධ්‍ය අයියලගෙ ගෙදර එළියේ කෑල්ලේ ඉඳගෙන.. ට්‍රිප් එක යන්න.. අපේ අම්මා ඊයේ ගමේ ගියා.. මම ට්‍රිප් එක ගිහින් ආපු පහුවදාම රධ්‍ය අයියත් එක්ක ගමේ යනවා..ඊටපස්සෙ දවස් තුනහතරක් ඉඳලා තමා ආයෙම එන්න හිටියේ.. අපිත් එක්ක ට්‍රිප් එක යන්න සයෝන් අයියත් ආවා..

සයෝන් අයියා ගැන කියනවනම්.. එයා අපේ ඉස්කෝලෙ ගේම්ස් කැප්ටන්.. රධ්‍ය අයියලව පොඩි කාලෙ ඉඳන්ම අඳුරනවා.. හරිම හොඳයි.. මට රධ්‍ය අයියා කිව්වේ එයා අපි දෙන්නා ගැන මුල ඉඳන්ම දැනගෙන ඉඳලා තියේලු.. සෙනුකයයි අයුක අයියයි නම් එයා හුඟක් ළඟ යාළුවෙක්.. දැනගත්තත් එයාට ඒක එහෙම ප්‍රශ්නයක් නෙමේ.. මාත් එක්ක ඉස්කෝලෙදි වැඩ වලට හුඟක් උදව් කරනවා සයෝන් අයියා.. වැඩිය යාලුවෙක් කියලා කවුරුත් කරේ තියාගෙන ඉන්නෙ නෑ.. හැමෝම යාලුවො වගේ තමා.. එයා ඉන්නෙ රධ්‍ය අයියලගෙ ලේන් එකට එහා ලේන් එකේ.. එදා අපිත් එක්ක ක්‍රිකට් ගහන්න ආවනෙ.. ආධ්‍ය අයියා කිව්වා සයෝන් අයියටත් එන්න කියන්න කියලා..

අපි යන්න ඉදියෙ උදේ පාන්දර හයට වුණත් වෙලාවල් එහෙ මෙහෙ වෙලා උදේ ගමන හවස දෙකට වැටුණා.. සෙනුකයට ඉස්කෝලෙ ඔකෙස්ට්‍රා එකේ වැඩක් වැටිලා හදිසියෙම ඒකට දුවගෙන යන්න වුන නිසා.. කොහොම වුනත් දැන් අපි ඔක්කොම ඉදගෙන හිටියේ සෙනුකයා එනකල්.. අයුක අයියා අසනීපෙන් නිසාම අපි එයාව ලොකුවට වැඩවලට ගන්නෙ නැතුව රිලැක්ස් එකේ ඉන්න ඇරියා.. තව මාස දෙකකින් අයියා ඕස්ට්‍රේලියා යනවා.. අවුරුදු ගානකට ලංකාවට එන එකක් නෑ කියලා සෙනුකයා කිව්වෙ.. අයුක අයියගෙ සීයා මහමැතිවරණෙට ඉල්ලනවා.. අයුක අයියට

@Shan

ඒවට ජොයින් වෙන්න කියලා ගෙදරින් බල කරනවලු.. ඉතින් එයාට ඕන මහමැතිවරණෙට කලින් කොහොමහරි පැනගන්න..

සෙනුකයා හිනාවෙලා කතාකලාට ඉන්නෙ අවුලෙන්.. ඒ වුණාට ඌම කියන්නෙත් මේකට වෙන විසඳුමක් නැනෙ.. ඔසී යන වැඩෙත් සෙට් කරගත්තෙ මාර ගේමක් දීලා.. ඉතින් අතට ආපු චාන්ස් එක මිස් කරගන්න බැනෙ..

අයුක අයියා පොඩ්ඩක් එහාට ගිහින් සෙනුකයට කෝල් එකක් ගන්න හැදුවා විතරයි සෙනුකයා අතින් කටින් එල්ලගෙන ගේට් එකෙන් ඇතුළට ආවා..

" අඩෙ සමාවෙන්න ඕන ප්‍රමාද දෝසයට.. ගයනිකා මැඩම්ගෙ හෙන බාල්දියක් සෙට් වුණා.."

" අවුලක් නෑ බං.. වරෙන් වරෙන්.."

අයුක අයියයි කියාන් අයියයි වෑන් එකට බෑග්, මැට්, ගිටාර්, පික්නික් බොක්ස්, ලැගේජ් අරවා මේවා දාලා පුරවලා ඩිකි එක වහලා දැම්මා..

" යකෝ මෙච්චර බඩු තොගයක්.."

" ඔව් බං.. මෙතන හෙන ගොඩක් ඉන්නවනෙ.."

" ඒකතමා.. තව මොකුත් නැනෙ.."

" නෑ නෑ.."

ආඪ්‍ය අයියා අඩුපාඩු මොකුත් තියද බලලා ගෙදර දොරවලුත් වහලා ලන්ච් බොක්ස් තිබ්බ බෑග් එකකුත් අරගෙන වාහනේ ගාවට ආවා..

" නගින්න එහෙනම්.. කවුද ඩ්‍රයිව් කරන්නෙ.. මාරුවක් දාගමු මගදි.."

" මම ගන්නම් මේ ටික.."

කියාන් අයියා ඩ්‍රයිවින් සීට් එකෙන් වාඩිවුණාම සයෝන් අයියා පැසෙන්ජර් සීට් එකෙන් ඉඳගත්තා..

@Shan

" ලේඩීස් ෆස්ට.. සයිඩ් ප්ලීස්..~"

ආශි රෝස පාටින්ම ඇඳගෙන රෝස පාට හෙන ලොකු හිල්ස් දෙකකුත් දාගෙන ඔක්කොම තල්ලු කරගෙන ගිහින් ලාස්ට් සීට් එකට ඉස්සරහා සීට් එකෙන් ඉඳගත්තහම ඒකිගෙ හොඳම යාලුවා ගිහින් ඒකිට එහාපැත්තෙන් ඉඳගත්තා.. රධ්‍ය අයියා ලාස්ට් සීට් එකේ ඉඳගත්තහම මම එයාගෙ එහාපැත්තෙන් වාඩිවුනා.. ආධ්‍ය අයියා මං ගාවින් වාඩිවුනා.. සෙනුකයයි අයුක අයියයි ඉස්සරහම සීට්ස් වල ඉඳගත්තා..

" පොඩ්ඩක් ඉඳපන්.. පොඩ්ඩක් ඉඳපන්.. මේ ට්‍රිප් යනවා වගේ නෙමේ.. මං කියන විදියට ඉන්න ඕන තේරුනානෙ.."

ආධ්‍ය අයියත් මහපගයා වෙන්න එනවනෙ ඉතින්.. කන ගාව ඉඳගෙන බෙරිහන් දෙනවා..

" බොන්න බෑ.. බොන්න ගේන්න බෑ.. බොන්න පොළඹවගන්න බෑ.. අරහෙ මෙහෙ මගෙන් අහන්නැතුව නාන්න බෑ.. කෙල්ලො දෙන්නෙක් එක්කගෙන ආවනම්.. ඒ ළමයි බලාගන්න ඕන.. තේරුණානෙ.. එච්චරයි.."

" තා මොකුත් නැද්ද.."

" නෑ නෑ.."

මම හිමීට රධ්‍ය අයියගෙ කන ගාවට කිට්ටු කලා..

" ඇපෝ මස්සිනාට මොනවා වෙලාද අනේ.."

" ගනන් ගන්නෙපා.. ඔහොම තමා.."

රධ්‍ය අයියා මගේ කොණ්ඩෙ අවුල් කල්ලා මගෙ කර වටේ අතක් දාගත්තා..

" මෙ එහෙනම් අපි යනවා ඈ.. මොකුත් දාලා ආවෙ නෑනෙ.. දාලා ආවනම් කරන්න දෙයක් නෑ.. ආයෙ ගන්න යන්නෙ නෑ.."

කියාන් අයියා වෑන් එක මේන් රෝඩ් එකටත් දාලා තමා යනවා කියන්නෙ.. අනේ මෙහෙමත් මැට් අලයක්..

@Shan

ආධ්‍ය අයියා එයාගෙ යාලුවෙක්ගෙ රිසෝට් එකක තමා නවතින්න රෙඩි කලේ.. ආධ්‍ය අයියගෙ මෙඩිකල් කොලේජ් එකේ හොඳම යාලුවෙක් කිව්වා.. ඒ රිසෝට් එක ෆොරින් ෆැමලීස් වලට දෙන එකක්ලු.. මේ දවස්වල කවුරුත් නැති නිසා ආධ්‍ය අයියට ඕන කාලෙකට ඉන්න කියලා දීලා.. රධ්‍ය අයියගෙ කියාරායි රෙක්සියි ආශිගෙ ගෙදර බලාගන්න දැම්මා.. වැන් එක සයෝන් අයියගෙන් හොයාගත්තා..

" අඩෝ මම හිතුවෙ බං අපේ ට්‍රිප් එකත් වට්සැප් ගෲප් එකකටම සීමා වෙයි කියලා.."

" මෙහෙම ඇත්තටම එකක් යනවමයි හැබැයි.. ගෲප් නම් කොච්චර තිබ්බද බං.."

" ඒ ෂනෙරුවා උඹට මතකද එකොළහෙ ට්‍රිප් එක ගිහිල්ලා උඹ බස් එකේ සීට් එකක් ගැලෙව්වා.."

සෙනුකයා ඉස්සරහා ඉඳන් කෑගහලා කියද්දි මම ශේප් එකේ ඔලුව පහත් කරගත්තා.. ආධ්‍ය අයියා ඉස්සරහා කාඩ් කුඩු වෙන්නයි පුතේ යන්නෙ..

" ඇයි උඹ අර තේවත්තක දෙමළ කෙල්ලෙක් ටෝක් කලේ.. අම්මෝ අම්මෝ.."

" ඇයි බං මූ ක්ලාස් එකේ ට්‍රිප් එක ගිහින් බස් එකේ වලියක් දාගෙන ක්ලාස් එකේ එකෙක්ට ගැහුවෙ.. කොහෙද බං ඒ.. ඉසිපත-"

" ඕක නවත්තගනින්කො මගුල.."

" ආ ඇයි උඹ නවත්තගන්න කියන්නෙ.. ආධ්‍ය අයියා ඉන්න නිසාද.. මේ ආධ්‍ය අයියෙ අයියා ඔය තියාගෙන හුරතල් කරන එකා කරපු මදාවි වැඩ මෙතන කියන්න ගියොත් අපිට දවස් ගානක් කියන්න පුලුවන් හරිතෙ.. මේකා එකපාරක් බැඩ්මින්ටන් ටූනමන්ට් ගිහින් මූට දිනන්න හම්බුනේ නෑ කියලා අනිත් පැත්ත එකාට සපත්තුවක් විසික් කල්ලා ගැහුවා.. කියෙද්ද මහීශා ඒ.."

" අටෙද්ද කොහෙද බං.."

" ඔව් ඔව් සර්ගෙන් ගුටිත් කෑවා.. ඇපෝ සනෙරුවා.."

@Shan

" අනේ බල්ලො කටවහන් ඉඳපන්.."

මම තව ටිකක් ඔලුව පහත් කරගෙනම ඉඳියා.. මේ මොන මගුලක්ද.. යන යන තැන බයිට් වෙනවා..

" ඇත්ත කියද්දි රිදෙනවා තමා.."

" මම කියන්නද උබ අර එකපාරක් බෑන්ඩ් ශෝ එකක ගිහින්.."

" ආ මොකක්ද මොකක්ද.."

" උඹ අර ලේඩීස් වොශෲම් එකක් අස්සට රිංගලා.. අර.."

මම බාගෙට කිව්වා විතරයි අයුක අයියා පටාස් ගාලා පිටිපස්ස හැරිලා මං දිහා බලලා සෙනුකයා දිහා බැලුවා..

" ඒ මොකක්ද වත්සල්.."

" ඉන්න ඉන්න අයුක අයියෙ මම කියන්න.. මූ ලේඩීස් වොශෲම් එකකට ගිහින් ඒකෙ අක්කලා ගොඩක් එකපාර කෑගස්සලා එළියට ආවේ.. යනකොට අක්කා කෙනෙක් නම්බර් එක දුන්නෙ.. ඊටපස්සෙ උඹ ක්ලාස් එකේදි ඒ අක්කට කතා-"

"  මොකක්ද උබ කියන්නෙ.."

" ඇයි ඇයි.."

" ඇයි මොක්ද උඹ.."

" ඇයි උඹ මොකද.."

" ඇයි ඇයි.."

" ඇයි.."

" ඇයි ගහන්නද.."

" ඇයි උඹ.. ආ ගහපන් බලන්න.."

@Shan

" ඇයි බෑ කියලා හිතුවද.."

" ඇයි බෑ තමා.."

මම කකුලෙ තිබ්බ සපත්තුවක් ගලවලා සෙනුකයට විසික් කල්ලා ගැහුවම ඒකා උගේ සපත්තුවක් මට එව්වා..

" ආ ඇති ඇති ඇති.. උඹලා කොහෙන්ද බං මේ කොකු දෙක හොයාගත්තෙ ආ රධ්‍ය.. අයුක.."

මම සෙනුකයට රවලා අහක බලාගත්තා.. ඒ වුණාට මට කාත් එක්ක හරි රණ්ඩු වෙන්න ඕන වගේ දැනෙනවනෙ.. සෙනුකයගෙ පලිය වෙන කාගෙන්හරි ගන්න ඕන.. නැතුව ඇග රිදෙනවා රිදෙනවා වගේ..

" වරද්.. එකවිදියක ඉදපන්..!!"

" මොකද ඔයා.."

" මොකද අහන්නෙ.. දඟලන්නැතුව ඉදපිය.."

" ඇයි ඔයා නිකම්.. ගහන්න වගේ කතාකරන්නෙ.."

" මම දැන් එහෙම කතාකලාද.."

" ඔව් මොකද ගහන්නද.."

" පිස්සුද බං.."

" ආ දැන් මට පිස්සු.."

" නෑ නෑ එහෙම කිව්වෙ-"

" එහෙනම් කලින් කිව්වෙ පිස්සු කියලා.."

" මො-මොකක්."

" ඔව් තවුසෙ මට පිස්සු කියලා මාව පිස්සන් කොටුවට ගිහින් දානවා කිව්වා.."

@Shan

" වරද්.. යකෝ ඔහොම බොරු කියන්නෙපා.."

" මට බොරුකාරයා කියලත් කිව්වා.. ඔව් ඔව් මම තමා බොරුකාරයා.."

රඩ්‍ය අයියා ඇස් දෙක පොඩි කරගෙන මං දිහා බලාගෙන ඉදියා..

" මොකක්ද අයුක අයියෙ කියන්නෙ.. දැන් මමද වද දෙන්නෙ.."

" වත්සල්.. දැන් මම එහෙම එකක් කිව්වද.."

" නැනෙ මම වදයක් නෙ.. මම යනව ගෙදර.. "

" ඒපාර මොකද .."

" මොකද අහන්නෙ.. මොකද මොකද.. මොකද තමා.. අහන හැටි විතරක්.."

" මුන් දෙන්නට මක් වෙලාද බං.. අපෝ කනත් රිදෙනවා අනේ.. ඇබයක්වත් දෙන්නකො කනේ ගහගන්න.."

ආශි මහීශා කනේ අහගෙන ඉදිය එයාපොඩ් එකක් ඉල්ලගෙන කනේ ගහගත්තා.. මෙකි යකෝ බටු ඇටේ.. දෙන්න හිතයි..

" මොකක්ද දොඩම් ගෙඩිය කිව්වෙ.."

මම ආශිගෙ නිල්පාටින් ලොක්ස් කලර් කල්ලා තිබ්බ කොණ්ඩ කැල්ලකින් ඇද්දා..

" ආව්වා~ මොකද තවුසෙට වෙලා තියෙන්නෙ.."

" ඇව්වාහ්.. මොකද හලෝ අපේ ඉස්කෝලෙ පාටින් කොණ්ඩෙ පාට කලේ.."

ඒ එක්කම සෙනුකයත් පිටිපස්ස හැරුණා..

" අඩෙ සිරාවට ආශි.. උබ මොකද අපේ ඉස්කොලෙ පාටින් කොණ්ඩෙ පාට කලේ.. එච්චර ලව්ද අපේ ඉස්කෝලෙට.."

" මේ තවුසෙලා මගෙන් ගුටි කන්න යන්නෙ හරිද.."

@Shan

" අඩෙ සෙනුකයා.. උබට කවුරුහරි කතාකරනවා ඇහුණද බං.."

මම ආශිව ඉග්නෝර් කල්ලා සෙනුකයගෙන් අහද්දි සෙනුකයා කනට අතක් තියාගෙන පොඩ්ඩක් අහගෙන ඉදියා..

" නැනෙ බං.. අගුටුමිට්ටෙක් කෑගහනවා වගේ නම් ඇහෙනවා.."

" මොකක්ද බූරුවා කිව්වෙ.. තවුසෙ මටද අගුටුමිට්ටා කිව්වෙ.."

" තොප්පිය හරිනම් දාගනින් ඉතින්.. අපි කිව්වෙ නැනෙ උඹටමයි කියන්නෙ කියලා.."

" ඒ වුණාට මටනෙ කිව්වෙ.."

" ඔව් කිව්වා තමා.. ඇයි.. දෙන්නෙ උබට.. අපේ ඉස්කෝලෙ පාටින් කොණ්ඩෙත් පාට කරන්.."

" මම ආසම පාට ඒක.. අම්මපා සනෙරුවා .. පල් සෙනුකයා.. උඹලා අද මගෙන් කනවා.."

ආශි අර මල් වගයක් අල්ලලා තිබ්බ රෝස පාට හෑන්ඩ්බෑග් එකෙන් දිගට හරහට අහුවෙන අහුවෙන හැම එකාටම දෙන්න ගද්දි මම සීට් එක අස්සට පහත් වෙලා ඒකිගෙ හෑන්ඩ්බෑග් පාරවල් වලින් බේරුණා.. සේරම රධ්‍ය අයියට වැදුනා..

" ආඅහ්හ්හ්හ්හ්හ්~ බලන්න මහීශා.. මෙ බූරුවො දෙන්නා මගේ කොණ්ඩෙ ඇද්දා.. මගේ කොණ්ඩ කට්ටත් කැඩුණා.. කියාන් අයියේ~~~~~~~~~~~~~~~~~~~~~~~~~~~"

" කියැන් ඇයියේ.. එක්ස්කියුස් මෙ දොඩම් බිබික්කම බේරගන්න ප්ලීස්~~"

" බූරු වස්සා.. මම තවුසෙගෙ මූණ ගලවනවා දැනගනින්.."

ආශි මම කිසිසේත් බලාපොරොත්තු වුනේ නැති විදියට සීට් එකට දණ ගහලා මගේ පැත්ත හැරිලා මගේ කම්මුලෙන් කුට්ටියක් ගැලවිලා එන්නම පාරක් අල්ලගත්තා.. යකෝ මෙකි නියපොතුත් අලෝගෙන රිදෙනවා අම්බානෙක.. සිරාවටම මගේ මූණ ගලවන්නද කොහෙද යන්නෙ..

@Shan

" ආ..ආ..ආ.. අම්මෝ ඒ මහීශා මෙකිව ගනින් බං.. මගෙ මූණ අතෑරපන් යස්සනියේ.."

" තවුසෙ මොකටද මගේ කොන්ඩෙට එක එක ඒවා කියන්නෙ.. ආ.. ආයෙ කියනවද.. කියනවද.. කියපිය.. කියනවද.."

" නෑ නෑ අම්මෝ අහකට පලයන් මල යස්සනී.."

මම ආශිගෙ අත් දෙක කොහොම හරි මගේ මූණෙන් ගලවගෙන ඒකිව ඉස්සරහට තල්ලු කල්ලා දැම්මා.. අම්මෝ බූවල්ලෙක් මූණ අල්ලගත්තා වගේ..

" ෂනෙරු.. සෙනුක.. ඉන්න දීපන් ඒ කෙල්ලට පාඩුවෙ.."

" ඔයාගෙ සුදුදෝණිට ගහද්දි සිදුණද.."

මම කියාන් අයියගෙන් අහද්දි කියාන් අයියා ෆොන්ට් මිරර් එකෙන් රවලා මං දිහායි සෙනුකයා දිහායි බැලුවා.. ආශි ඇරගත්තනෙ ටැප් එක.. සැක් මෙකිට හැම ලබ්බටම ඇඬෙනවද යකෝ.. පොඩ්ඩක් ඉදපන්කො මහීශා වගේ ගැම්මට..

" වරද්..!!!"

" හරි හරි අනේ.. මමද පටන්ගත්තෙ.. අර සෙනුකයා තමා ඕන්නැති මගුල් කියවන්න ගත්තෙ.."

" අඩෝ මම නෙමෙයි.. උඹ-"

" වත්සල්!!"

සෙනුකයා ගස් බල්ලා අයුක අයියගෙන් පිට පැලෙන්න හොඳ පාරක් කාලා ඉබ්බෙක් කට්ට  අස්සෙ හැංගෙනවා වගේ ඉස්සරහා බලාගත්තා.. ඒ වුණාට සෙනුකයටයි මටයි මෙහෙම දුර ඉඳන් ට්‍රිප් ගිහින් පුරුදු නැනෙ.. ඌයි මායි යන හැම මගුලෙම යන්නෙ එකටනෙ පොඩිකාලෙ.. මම හිමිහිට රධ්‍ය අයියගෙ ඇගට හේත්තුවක් දාගත්තහම රධ්‍ය අයියා මට දෙකක් රවලා ශටර් එකට හේත්තු වෙලා ඇස් දෙක පියාගත්තා..

" ඔයා මොකද අනේ කරන්නෙ.."

@Shan

" ම්ම්..?? මම මේ පේශන් කෙනෙක්ගෙ රිපෝට් එකක් බැලුවා.."

" හොස්පිට්ල් එකේද.."

" නෑ නෑ මම ඩිස්පෙන්සරි එකක බෙහෙත් දෙන්න යනවනෙ.. ඒකෙ මගේ පේශන් කෙනෙක්.. ලිපිඩ් ප්‍රොෆයිල් එකක් බලලා ඩබල් චෙක් කරවගන්න මට වට්සැප් කරලා රිපෝට් එක.."

" ඉතින් දැන් මොකද එයාට.."

" එයාට කලින් Atorvastatin ෆයිව් මිලිග්‍රෑම් දෙන ගමන් හිටියේ.. මාසෙකට පස්සෙ මේ ආයෙම චෙක් කලේ.. අඩුවක් නෑ තාම.."

" එහෙමද.."

" ම්ම්.. මේ මිනිස්සු හරියට කෑමක් බීමක් පාලනය කරන්නෙ නෑ.. ඉතින් ලෙඩ කොහෙ අඩු වෙන්නද.. අපි නිකම් කට කැඩෙනකල් කියනවා විතරයි.. මගුල.. දවසක් මගෙන්ම ඇහුවා මනුස්සයෙක් මේකට සිංහල වෙදකම් කලොත් මොකද කියලා.. සිංහල වෙදකම් කරන්න ඕනනම් මගුලකටද මගේ ළඟට ආවෙ.."

" ඔයා කේන්ති ගන්න එපා හලෝ.. වයසට ගියොත් එහෙම.. පව් නෙ.. මෙ අහන්නකො ආධ්‍ය අයියෙ.. මම මේ ඔයාගෙන් හෙන කාලෙක ඉඳලා අහන්න හිටියෙ.. අයියගෙ හිත ගිය අක්කෙක් නැද්ද හොස්පිට්ල් එකේ හරි කැම්පස් එකේ හරි.."

" ඒ මොකෝ එහෙම අහන්නෙ.."

" කුතුහලේට දැනගන්නනෙ.."

" ම්ම්.. කැම්පස් යන කාලෙ එක්කෙනෙක් හිටියා.. කෙල්ලෙක් හරිද.. ඒ කෙල්ල මගේ හොඳම යාලුවා එක්ක යාලු වුනා.. මට එහෙම ඉතින් ලව් කියලා අපේ ගෙදර ඉන්න එකාට වගේ මැරීගෙන ලව් කරන්න ඕනමයි කියලා එච්චර මෙච්චර එකක් තිබ්බෙ නෑ.. ම්ම්.. ආයෙම.."

ආධ්‍ය අයියා මොකක් හරි කියන්න ගිහින් නැවැත්තුවා.. හරියට දුක හිතුනා වගේ.. මම ඕන්නැති මගුල් අහලා අයියගෙ හිත රිදෙව්වද මන්දා..

@Shan

" ආයෙම.. මම පත්වීම ලැබෙනකල් මුල්ම කාලෙ ගියා ට්‍රේනින් එකකට ආමි හොස්පිටල් එකක සිවිල් ඩොක්ටර් කෙනෙක්ට.. අපේ අප්පච්චි දාලා දුන්නෙ.. එතන හිටියා-"

" ආධ්‍ය අයියෙ මෙතන ඉඳන් ඩිරෙක්ශන්ස් හරියටම ශුවර් නෑ ගන්නවද.."

" ආ ඉන්න.. මම එන්නම්.."

කියාන් අයියා ඉස්සරහා ඉඳන් ආධ්‍ය අයියට වාහනේ ගන්න එන්න කියපු නිසා ආධ්‍ය අයියා වාහනේ නැවැත්තුවට පස්සෙ බැහැලා ඩ්‍රයිවින් සීට් එකට ගියා..

" රණ්ඩුකරගන්නෑ හරිද.."

ආධ්‍ය අයියා සයෝන් අයියත් එක්ක කතාවක් දාගෙන යද්දි සෙනුකයා අයුක අයියත් එක්ක අපි ඉඳපු සීට් එකට ආවා.. මම හිටියේ වෙන කල්පනාවක.. ආධ්‍ය අයියා ඒ කාලෙ කෙල්ලෙක් එක්ක යාලුවෙලා ඉඳලද.. ඒකත් බ්‍රේක් වුනු නිසාද දන්නෙ නෑ දුකින් හිටියෙ.. කෙල්ලෙක් වෙන්න ඇති.. වෙන්න ඕනනෙ.. ආධ්‍ය අයියා ගල් ඉබ්බා වගේ පොතේම ඉන්නවා මිසක් ඌ කැමති මොක්කුන්ටද කියලා හොයාගන්නවත් කතාකරන්නෙ නැනෙ.. සැක්.. මේකනම් හොයාගන්නම වටින කාරණයක් තමා..

" මොනවද බං කල්පනා කරන්නෙ.."

" මොකුත් නෑ බං.. අඩෝ උඹ නැතුව පාලුවෙන් ඉදියෙ.."

මම සෙනුකයගෙ කරට අතකුත් දාගෙන ඉස්සරහට නැමුනා.

" මහීශා.. මෙ උඹට කවදහරි කොල්ලෙක් ගැන වැරදිලාවක් අදහසක් පහළ වෙලා තියෙද බං.."

මහීශා කනේ ගහගෙන ඉඳපු ඇබ දෙකත් ගලවලා අපේ පැත්ත හැරුණා.. යකෝ මේකි දවසට කරගෙන තියෙන හරියක්.. ඇහිබැමේ ඉරි දෙකක් යවලා කොණ්ඩෙත් අන්ඩර්කට් එකක් ගහලා.. කොල්ලෙක්ම වගේ තමා.. බලන් යද්දි ආශි විතරයි කාන්තාරෙට දිය පොදක් වගේ කෙල්ලෙක්ට ඉන්නෙ.. ඒකත් ගර්ලි අල්ට්‍රා පෝ මැක්ස්..

@Shan

" ඇයි උඹ එහෙම අහන්නෙ.."

" නිකන් බං.. දැනගන්නනෙ.. උඹ කෙල්ලොන්ට ආසත් නෑ කොල්ලොන්ට ආසත් නෑ.. මොක්කුන්ටද ආස.."

" මොකෙක්ටවත් නෑ.."

" සිරාවට.. රධ්‍ය අයියා හොඳ නැද්ද.."

මම පාඩුවෙ නිදාගෙන යන මගෙ ගටපොලොස් කොට්ටෝරුවා පෙන්නුවහම මහීශා මගේ දිහා බලලා හිනාවුනා..

" අන්න රධ්‍ය අයියා හොඳයි තමා.."

" ආ හොඳ වුනාට කමක් නෑ ඉස්සරහා බලාගෙන පලයන්.. කොලු කෑල්ල.."

මමමහීශගෙ ඔලුවට එකක් ගහලා බලෙන්ම ඉස්සරහා හැරෙව්වා.. ආවා මෙතන ඉල්ලගෙන.. දෙනව උඹට බම්බුවක් තමා.. බලාගෙන ඉඳපන්.. මගේ හිතේ තාම ගියේ නැති තරහට මම මෙස් එකක් ගලවලා ඒක මහීශාගෙ උකුළ උඩට දැම්මහම ඒකී මෙස් එක අල්ලලා ජනේලෙන් එහාපැත්තට විසික් කලා..

" බේසික කෙල්ල.. උඹ මොකක්ද ඒ කලේ.."

" කලේ..?? උඹ මොන එහෙකටද ඒක මගේ ඇගට දැම්මෙ.. එපා නිසානෙ.."

" සැක් සෙනුකයා.. මේ ගැනුනම් මහ.. කමක් නෑ මම රෝසපාට මෙස් වලට ආසත් නෑ කොහොමත්.."

මම අනිත් මෙස් එකත් ගලවලා එලියට විසික් කලා..

" සෙනුකයා මගේ සපත්තුව කෝ බං.. ඒ ඒක එහෙම එළියට විසික් කරන්නෙපා ඈ අපේ මාමා මගේ හැපිබර්ත්ඩේ එකකට අරන් දුන්නු බ්‍රෑන්ඩඩ් සපත්තු දෙක.."

" ඉස්සරහා ඇති බං.. කෝ මගේ එක.."

@Shan

" ආශිගෙ කකුලගාව.. අර.."

මම ඇඟිල්ල දික් කල්ලා සපත්තුව තිබ්බ තැන පෙන්නුවහම ආශි ඉසකුඩිච්චි මූණක් හදාගෙන අපි දෙන්නා දිහා රවලා බැලුවා..

" පස්සෙ ගමු බං.."

ආශිගෙ ඉසකුඩිච්චි මූණ ඇල්ලුවෙ නැති සෙනුකයා හිමින් සැරේ අයුක අයියගෙ ඇගට හේත්තුවක් දාගෙන නිදාගන්න රෙඩි වුනා.. කිසි ගතියක් නැනෙ මෙ මිනිස්සු.. ට්‍රිප් එන්නෙ නිදාගන්නද.. සේරම නිදි මස්සිනායි සයෝන් අයියයි ඇරෙන්න.. පැය හයක්ම එහෙම්පිටින්ම ගමනට යන නිසා මමත් පොඩ්ඩක් පිටිපස්සට හේත්තුවක් දාගත්තා..

යනවා යනවා යනවා.. අන්තිමට මම විතරයි අවදියෙන් හිටියේ.. හැන්දෑවෙ පහට විතර ඇති.. මම හුඩී එකේ හෙඩ් කවර් එක ඔලුවට දාගෙන එළිය බලාගෙන හිටියා.. එළියෙ ලාවට වහිනවා.. මේ මනුස්සයා ආපු වෙලේ ඉඳන් නිදි නිදි නිදි.. දැන්නම් හෙන කේන්තියි මට.. මෙච්චර වෙලාම ෆෝන් එකේ ගේම් ගහලා ඇස් දෙකත් රිදෙනවා.. ආඩ්‍ය අයියවත් ළඟ නැනෙ කතාකර කරවත් ඉන්න.. මම සෙනුකයා දිහා බැලුවහම ඌ අයුක අයියගෙ උරහිසට හේත්තුවෙලා ගුලිවෙලා ඉබි පැටියා වගේ නිදි..

මගේ ඉස්කෝලෙ ඉබ්බා දන්නවද දන්නෑ මම ට්‍රිප් එකක් යනවා කියලා..

" ජස් මෙහ්.. ඔයා නිදිද.."

මම කට කපලා නිදාගෙන ඉන්න රඩ්‍ය අයියගෙ ශර්ට් එකෙන් දෙපාරක් විතර ඇද්දා..

" අයියෙ.."

"....."

" නැගිටිනවකො කම්මැලියිනෙ.."

"....."

රඩ්‍ය අයියා කතාකරන්නෙ නැති නිසා මම රඩ්‍ය අයියගෙ අතක් අරගෙන මගේ කර වටේ දාගෙන බලෙන්ම තුරුල් වුනා.. හැමදාම මේ ලව් වලට

@Shan

ආධුනික කොට්ටෝරුවෝ වගේ ඉන්න බෑනෙ.. අඩුම තරමෙ මේ රිලේශන්ශිප් එකේ ටොප් මනුස්සයා විදියට මමවත් ෆෝවර්ඩ් වෙන්න ඕනනෙ..

පොඩ්ඩක් ඉන්න.. මම නේද ටොප්??

මම රධ්‍ය අයියගෙ පපුවෙන් ඔලුව තියාගෙන මම කවුද කියලා කල්පනා කලා.. මම නෙමෙයිද ටොප්.. ඒක මනින්නෙ උසෙන්ද.. සැක් සෙනුකයත් නිදිනෙ.. ඌ නම් අර එක එක මලවිකාර ටීවීසීරිස් බලලා දන්නව කවුද ටොප් කියලා.. මම මෙච්චර කල් වෙච්ච දේවල් කල්පනා කල්ලා බැලුවා කවුද ටොප් කියලා..

වැඩි සම්භාවිතාවයක් තියෙන්නෙ මම ටොප් නොවීමටනෙ.. මම කෝකටත් ගූගල් සර්ච් කල්ලා බැලුවහම ඒකෙ වෙන වෙන මගුල් වගයක් රිසාල්ට්ස් වලට සජෙස්ට් වෙලා ඇවිත් තිබ්බා.. දැන් මෙකෙ තියන හැටියට මම ඒක දැනගන්න නම් මේකා එක්ක-

සැක්.. මම මොනවද මේ හිතන්නෙ..

මම ෆෝන් එක ඔෆ් කල්ලා සීට් එක අස්සට දැම්මා.. එළියෙ වැස්සට ශටර් එකේ මීදුමක් වගේ බැදිලා.. මම ඇගිල්ලකින් ඒකෙ ඉරක් ඇන්දා..

" නිදිමතද.."

මම කල්පනා කර කර ඉදලා එකපාරටම උඩ ගියේ රධ්‍ය අයියා කන ගාවින්ම හෙන ගොරෝසු බය හිතෙන කඩකින් කතාකරපු නිසා.. ආයෙ කියන්නෝන නිදාගෙන නැගිට්ටගමන් කතාකරන්න එපා කියලා.. බය හිතෙනවනෙ.. මම කතානොකර ඉදපු නිසා මට දැනුනා එයා මගේ නළලට වැටිලා තියෙන කොණ්ඩෙ උස්සලා මගේ නළලින් හාදුවක් තිබ්බා.. මම රධ්‍ය අයියා ඇදගෙන ඉදපු ස්වෙට්ශර්ට් එකට මූණ ඔබාගෙන තව ටිකක් රධ්‍ය අයියට කිට්ටු වුනා.. අර සනීප හිතෙන රස්නෙ එයා ගාවින් මට දැනෙනවා..

රධ්‍ය අයියා එයාගෙ කකුලක් උඩ තිබ්බ, බාගයක් හුඩී එකෙන් වැහිලා තිබ්බ මගේ අතේ ඇගිලි එයාගෙ අතේ පටලගෙන ඒ අත පපුවෙන් තියාගත්තා.. මගේ අතට එයාගෙ අතේ තියන රස්නෙ ගතිය දැනෙනවා.. මම ඔලුව උස්සලා එයා දිහා බැලුවා.. එයාගෙ දිග ඇහිපිහාටු තියෙන ඇස් නිදිමතට

@Shan

බාගෙට පියවිලා වුණත් මගේ මූණ දිහාවට හැරවිලා තිබුනා.. ඒවා දිහා බලාගෙන ඉන්න ඉන්නම මට හිතෙන්නෙ මගේ වටේ තියන මොකුත් මට දැනෙන්නෙ නෑ කියලමයි.. ඒක දැනට කාලෙකට කලිනුත් මට එහෙමම දැනුනා වගේ අදත් දැනෙනවා..

මම එයාගෙ අතින් මගේ අත ගලවගෙන ඒ සනකම් ඇහිබැම දිගෙ මගේ ඇගිල්ලක් අරගෙන ගියා.. රධ්‍ය අයියා වෙනසක් නැතුවම මගේ දිහා බලාගෙන ඉන්නවා.. ඒ බැල්ම හරි බරයි.. ගැඹුරුයි.. මගේ පපුව සැරින් සැරේ හිරිවැටීගෙන යනවා.. මගේ දබරැගිල්ල එයාගෙ ඇහිබැම අවුල් වෙන පැත්තට ඉරක් ඇදගෙන ගිහින් ආයෙම හරි පැත්තටක් ඉරක් ඇදගෙන ගියා.. නැත්නම් ඒවා අවුල් වෙනවනෙ..

" මොකද මේ.."

" මොකුත් නෑ.."

එයා ආයෙම මගේ අත අරගෙන එයාගෙ අතේ පටලගත්තා..

" තව හුගක් දුරද.."

" පැය දෙකක් විතර යයි.. වහිනවනෙ.."

" ම්ම්.."

එයා මගේ උරහිස වටේ එතිලා තිබ්බ අතින් මගේ කම්මුලක් ඇගිලිවලින් සිනිඳුවට අතගෑවා..හොඳයි.. ආදරේ කියන්නෙ පතුලක් පේන්නෙ නැති ආගාධයක් නම් මම දැන් ඒකෙ ඇතුළට ඇදගෙන වැටෙන ගමන් හිටියා.. අඩුම තරමෙ මට අදහසක් නෑ මේ ආගාධයට පතුළක් තියෙනවද කියලවත්.. මම පොඩ්ඩක් උඩට ඇදිලා ගිහින් රධ්‍ය අයියගෙ නිකට හරියෙන් හාදුවක් තිව්වා.. එයාගෙ පපුවෙ උඩ තියන මගේ අතට පවා මට එයාගෙ හාට්බීට් එක වැඩිවෙනවා දැනෙනවා.. හොඳට තියෙන අත් වලට දාඩිය දානවා දැනෙනවා..

**ඇයි මම මෙ තරමට ආදරේ කරන්නෙ**

.. ඒ එක්කම රධ්‍ය අයියා මගේ එක කම්මුලක් එයාගෙ ලොකු අතකින් අල්ලලා පහත් වෙලා තොල් වලින් පෙක් එකක් තිබ්බා.. එකක් නෙමේ

@Shan

දෙක තුනක්ම.. තියලා මගේ කොණ්ඩෙන් ඇවිස්සුවා..

" ආදරේ හිතෙනවා.."

මම රධ්‍ය අයියගෙ මූණට කල්ලා රහසින් කියද්දි රධ්‍ය අයියගෙ මූනෙ හිනාවක් ඇඳුනා.. හැමතිස්සෙම කිසි හැඟීමක් නැතුව තියෙන මූණේ මගේ ළඟදි විතරක් හැඟීම් පිරිලා තියෙනවා දකින්න මම හරි ආසයි.. මම රධ්‍ය අයියගෙ ඇඳුමේ කරෙන් අල්ලලා මගේ මූණ දිහාවට පහත් කරගෙන එයාගෙ තොල් වලට පහත් වුණා.. රධ්‍ය අයියා මොකුත් නොකරම මාව තදින් අල්ලගෙන ඉදියත් මම එයාගෙ කොලර් එක අතෑරලා බෙල්ල යාන්තම් ඇඟිලිතුඩු වලින් අතගෑවා.. විනාඩි දෙකතුනක් කිසිම දෙයක් නොකර ඉඳපු රධ්‍ය අයියා පෙරලා මගේ තොල් මාරුවෙන් මාරුවට කලබලයක් නැතුව එයාගෙ තොල් වලට මැදිකරගද්දි මම එයාගෙන් එහාට වෙලා බෙල්ල දිගේ මගේ තොල් ඇදගෙන ආවා.. එයාගෙ Adam's apple එක ගාවින් පොඩි පෙක් එකක් තිබ්බහම එයා සීට් එකට ඔලුව ගහගෙන අර දිග ඇස් පිහාටු තියෙන ඇස් උඩ අතට හරව ගත්තා.. මම එයාගෙ ශර්ට් එක එහාට කල්ලා කොලර් බෝන් එක හරියෙන් ලාවට හාදු කීපයක් තියලා ඒවා තදින් උරවන්න ගත්තහම එයාගෙ අතක් මගේ පිට මැද්දෙන් නතරවෙලා මගේ හුඩී එක ගුලිකරගන්නවා මට තේරුණා..

" හ්හ්-ව්-වරද්!!"

මම එක අතකින් එයාගෙ කට තද කල්ලා වහලා දිගටම කොලර් බෝන් එක කිස් කරන ගමන් ස්වෙට් ශර්ට් එක අස්සෙන් අතක් දාගත්තා.. එයා එකසැරේම මගේ අත අහකට කරන්න මූණ හැරෙව්වත් මම ආයෙම රධ්‍ය අයියගෙ තොල් වලට බර වෙලා එයාව කිස් කලා..

" අහ්-වරද්-අත-ගන්නහ්!!"

මම එයාගෙ පපුව උඩ හිමින් සැරේ ඇහිලි ඇදගෙන ඇදගෙන යද්දි එයා මගේ අත එළියට අරගෙන අනිත් අතහ් එකට තියලා තද කල්ලා එකට අල්ලගෙන මගේම පපුවට තියලා තද කලා..

" හැබයි වරද්..!!"

" ඇයි..?? මම මොකද කලේ.."

@Shan

මම රධ්‍ය අයියගෙ අත වලින් මගේ අත් දෙක ඇදලා අරගෙන එයාගෙ අතක් බදාගෙන උරහිසට හේත්තු වුනා.. රධ්‍ය අයියා හයියෙන් හයියෙන් හුස්ම ගන්නවා වගේ මට තේරෙනවා.. හැමෝම හිටියේ නිදාගෙන.. ආධ්‍ය අයියා විතරක් ඇහැරගෙන.. යන්න තව වෙලා යන නිසා මම හිමිහිට ඇස් දෙක පියාගත්තා..

මම ආවා~

ඔයාලා පවර් බොටම්ලට එච්චර ආස නෑ වගේද..

කතාව ඉස්සරහට හුගක් තියෙනවා.. ඒත් මගේ හිතට වද දෙන ප්‍රශ්නෙ මෙක දිග වැඩිවුනොත් කියවන අයට එපාවෙයිද කියලා හිතෙනවා.. ඉස්සරහට ප්ලොට් ට්විස්ට් ගනනාවක් ඒවි.. අපි බලමුකො ඈ..

යන්නාම්.. ලව් යූ.. ❤

රධ්‍ය : වරද්!! මං දිහා ඔහොම බලන්න එපා..!!

වරද් : ඉතින් මේ මම බලන විදියනෙ..

*ඌ බලන විදිය*

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම් යම් කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 72 කොටස

" ෂනෙරුවා..
නැකිටපා............................................................න්!!!!!!!!!!!!!!!!!!!!!!!"

මම උඩ ගිහින් ඇහැරුනේ කන ගාවින්ම මහා හයියෙන් මොකෙක් හරි අමුතු සතෙක් කැගහපු නිසා.. මම මල් වත්තක ඔංචිලි පැද පැදගෙ හිටියෙ.. මේකට කොහෙන්ද මේ ගල් ඉබ්බි ආවෙ..

" උඹේ මූණෙ මම තේක හලන්නද.. ඔය අයියවත් නැගිට්ටුවන් පහළට එනවද.."

මම ඔලුවෙ ඉඳන් වහගෙන ඉඳපු බෙඩ්ෂීට් එක පහළට ආලා හැරිලා බැලුවහම මහීශා ඉන්නවා තේ දෙකකුත් අතේ තියාගෙන මහසෝනා වගේ ඇඳ ගාව..

" තියලා පලකො.. මම එන්නම්.."

මහිශා කකුල උස්සලා මගේ කොන්දටත් පාරක් ගහගෙනම තේක නයිට් ස්ටෑන්ඩ් එක උඩින් තියලා දොර වහන් යන්න ගියා.. මම පොඩ්ඩක් නැගිටලා මොලේ ප්‍රොසෙස් කරගන්නගමන් හිටියේ.. මම කොහොමද මේ සුදුපාට කැනපි එකක් දාපු විසාල කාමරේක ඉන්නෙ කියන එක ගැන..

හරි නෙ..

මම ඊයෙ ඇල්ලෙ ආවනෙ.. සැක් ඔලුව විකාර වෙනවා උදේ පාන්දර.. මේ ගල් ඉබ්බි ඇවිත් මාවත් හොල්මන් කලා යන්න ගියා.. මම එහෙමම ඇඳේ අනිත් පැත්තෙ බ්ලැන්කට් එක උසලා බලද්දි රධ්‍ය අයියා ඉන්නවා අත පය හතර අට පොලේ දාගෙන කටත් ඇරගෙන මොකෙක්ද වගේ නිදාගෙන.. රෙද්ද කැලේ..

රෙද්ද කැලේ කිව්වෙ.. ඊයෙ අපි එන්න හෙනට රෑ වුණා.. එන්න හිතාගෙන හිටියෙ හත හමාර විතර වෙද්දි වුණත් ඊටපස්සෙ කෑම කන්න හොටෙල් එකකා ගිහින් එතන කෙලින්න ඕන සේරම පිස්සු බයිලා කෙලලා රිසෝට් එකත් හොයාගෙන වැස්සෙම එද්දි රෑ වුණා..

@Shan

රිසෝට් එක කොහොමද කියලා මම දන්නෙත් නෑ.. මොකද රෑයෙ බෑග් එකක්වත් අරගෙන නෙමේ කාමරේට ආවෙ.. මම හීනෙන් වගේ දැක්ක විදියට මේක මාරම ලස්සනයි.. සම්පූර්නෙන්ම ලෑන්ඩ් එකම අඉට දීලා තිබුනා.. ඒකෙ මැද්දෙ තනිකරම වුඩ් තීම් එකට තට්ටු දෙකකට මේක හදලා තිබුනේ..පි හිටියේ උඩ තට්ටුවෙ කාමරේක.. මෙ කාමරේ ඇඳවල් දෙකක් තිබුනා.. අනිත් එකේ සෙනුකලා හිටියේ.. ආශිටයි මහීශාටයි පහළ කාමරයක් ඕන කිව්ව නිසා උන් දෙන්නට පහළ දීලා උඩ කාමර දෙකේ අපි හිටියේ.. අපිට ඉස්සරහා කාමරේ සයෝන් අයියයි කියාන් අයියයි.. ආධ්‍ය අයියා පහළ තනි කාමරේක නතර වුනා.. එයා ඉතින් ලොකුයිනෙ.. අපි එක්ක ඉන්න බෑ සද්දෙ වැඩී දගලනවා පරක්කුවෙලා අපි නිදාගන්නෙ කියලා එයා ගියා ඒ කාමරේ භාවනා කරන්න.. පිස්සු මස්සිනෙක් තමා..

රෑටපස්සෙ මගේ එහාපැත්තෙ නිදාගෙන ඉන්න ගැටපොලොස් කොට්ටෝරුවට ඇඳුමක්වත් මාරු කරගන්න බෑ නිදිමතයි කියලා එහෙමම බාත්‍රෝබ් එකකුත් පටලන් ඇවිත් ඇඳට පැනලා ඔලුවෙ ඉඳන් වහගෙන නිදාගත්තා.. මමත් ඇගහෝදගෙන ඇවිත් නිදාගත්තා.. සෙනුකයා කීයට නිදාගත්තද දන්නෙ නෑ.. කොහොම උනත් දැන් නම් උන් දෙන්නම නැගිටල ඇඳත් හදලා අල්මාරියත් අස් කල්ලා පහලට ගිහින් හිටියේ.. මෙ මනුස්සයට තමා උදේ නැගිටලා මේක පොඩ්ඩක් අස් කරන්න බැරි..මම කේන්තියට රධ්‍ය අයියා මගේ ඇග උඩින් දමාගෙන ඉඳපු කකුලයි අතයි අයින් කල්ල දාලා වොශෲම් එකට ඉහින් මූණ සෝදගෙන දත් මැදගෙන ආවා.. සෙනුකයා උදේ අපේ ලැගේජ් දෙකත් ගෙනැත් කාමරෙන් තියලා තිබ්බ නිසා මම ඒ දෙකත් අස් කල්ලා ලැගේජ් දෙක ඇද අස්සට දාලා තේක අරගෙන බිව්වා.. ඒක ඇල් වෙන්නත් ගිහින්.. සැක්..

" මෙ නැගිටින්නකො.."

" ම්ම්..හ්හ්..තාම උදේනෙ.."

රධ්‍ය අයියා මොනවදෝ තනියම මුමුණ මුමුණ කොට්ටෙ මූනට තියලා තදකරගත්තා..

" නැගිටිනවා..........................................................හ්!!!! බලපිය දැන් උදේ පාන්දරද කියලා ඉස්සෙල්ලා.. දවල් වෙලා පුපට එළිය වැටෙනකල් නිදාගන්නවා.. මොකෙක්ද මන්දා.. ඇහුවමනම් කියන්නෙ කොහොමද.. බුදුඅම්මො.. උදේපහට නැගිටලා කොළඹ හතේ දීව්වලු.. කැඩෙට කලාලු..

@Shan

කැම්පින් ගියාලු.. ඒකට මම පොඩ්ඩක් නිදාගත්තනම් බලන්න තිබ්බා.. අර කලර්ස් නයිට් එකේ හම්බුණ මෙඩ්ල් එක තලලා දානවා දැනගන්නවා.. මෙඩ්ල් එක විතරක් නෙමෙ දැන් තවුසෙ නැගිට්ටෙ නැතිවුනොත් අම්මපා තවුසෙගෙ ඇ-"

රධ්‍ය අයියා එකසැරේටම හෙන ගහන්න වගේ නැගිටලා වොශෘම් එකට දිගින් දඩාස් ගාලා දොර වහගත්තා..

" කිරි ඉබ්බා.."

මම රධ්‍ය අයියට ඇඳ හදන්න තියලා පහළට ඇවිදගෙන ගියා.. වෝහ්~ මේ රිසෝට් එක සිරාවටම මාරම ලස්සනයි තමා.. ආධ්‍ය අයියා කිව්ව විදියමයි.. ඔක්කොම ඩිසයින් කල්ලා තිබ්බෙ වුඩන් තීම් එකට.. වහලෙ කැනපි දාලා තැනින් තැන පොඩි පොඩි පැළ වර්ග එල්ලලා තිබ්බා.. පඩිපෙළ බූල් බූල් කාපට්ස් දාලා සාලෙ ලොකු සෝෆා එකක් දාලා ඒවට බ්ලැන්කට්ස් දාලා හෙන කොසී වයිබ් එකක් එන්න ගෙදරක් විදියටම හදලා තිබ්බා.. මම පඩිපෙළේ පැන පැන පහලට එද්දි ආධ්‍ය අයියයි අයුක අයියයි කුස්සියෙ මොනවද කරනවා.. සැන්ඩ්විච් වගයක් හදනවද කොහෙද..මහීශා සයෝන් අයියා එක්ක පීස් එස් ෆයිව් එකක් අතේ තියාගෙන ගේම් ගහනවා.. සෙනුකයා එළියේ පිලොව්ස් දාලා හදලා තිබ්බ ස්වින්ග් චෙයාර් එකේ පැද්දි පැද්දි ෆෝන් එකේ මොනවද බලනවා.. මම ගිහින් සෙනුකයගෙ කකුලකින් ඉඳගත්තහම උෘ මාව කකුල් දෙක උඩ ඉන්දවගත්තා..

" මොනවද උඹ බලන්නෙ.."

" ගයනිකා මැඩම් මැසේජ් වගයක් එවලා බං.. ඒක බැලුවා.. මේ ඔකෙස්ට්‍රා එකනම් හිසරදයක් අප්පා.."

" මොකෝ අවුල.."

" එක එක අවුල් බං.. දන්නැද්ද.. වැඩක් කරන්න ගියාම එපාවෙනවනෙ.."

මම සෙනුකයගෙ ඇඟට හේත්තුවක් දාගෙන පැද්දි පැද්දි ඉද්දි රධ්‍ය අයියා ඇඳුමකුත් දාගෙන කුස්සිය පැත්තට යනවා මම දැක්කා.. කුමාරයා සිරියහනෙන් බහින වෙලාව.. උදේ දහයට.. හරි සෝක්..

@Shan

" හවසට  Nine Arches Bridge සන්සෙට් ව්ව් එක බලන්න යනවා කියලා ආධ්‍ය අයියා කිව්වා.."

" එහෙමද.. හොඳයි හොඳයි.."

මම දෙපැත්තට පැද්දි පැද්දි එළියට ඇහැ දාලා වටපිටාව බැලුවා.. මුලු ගාඩ්න් එකේම තනකොළ අල්ලලා තිබ්බෙ.. මාරම ලස්සනයි.. ගස් වලින් පිරිලා ගිහින්..මම මෙහෙම තැනකට ආවමයි.. මම තාප්පෙ දිගේ ඇහැ යවාගෙන දිගට දිගට යද්දි ඈත හරියෙන් පේනවා තාප්පෙ උඩ මොකෙක් හරි හිටගෙන ඉන්නවා.. එතන ගහේ අතු වලට පේන්නෙත් නෑ.. මේ හරියෙ වඳුරො ඉන්නවද.. වඳුරො නිල් පාටට අදින්නෑනෙ ඒ වුණාට.. මොණරෙක්ද.. මොණරු ඉන්නෙ අපේ ගමේනෙ.. මෙහෙ කොහෙද මොණරු.. ඒකදේශීය වෙන මොකෙක් හරි සතෙක්ද දන්නෙ නෑ..

" ඒ සෙනුකයා.. අර තාප්පෙ උඩ ඉන්නෙ කවුද බං.. වඳුරෙක්ද.."

" වඳුරො කොහෙන්ද යකෝ මෙහේ කෝ බලන්න.."

සෙනුකයත් එබිල හොඳට බැලුවා.. ඒකා හෙලවෙනවා තමා.. ගහේ අතුත් එක්කම හෙලවෙනවා..

" ඒ වරෙන් බලන්න.."

" නිට්ටෑවෙක්ද දන්නෑ නෙහ්.."

" පිස්සුද පගො.. වරෙන් යන්න.."

මමයි සෙනුකයයි ඈතින් පේන  තාප්පෙ හරියට යද්දි ඒ වඳුරා සිංදුවක් කියනවා ඇහෙනවා..

" අයි ගේව් සෙකන්ඩ් චැන්ස් ටිව් කිව්පි~ඩ්

බ- නව් ඇම් ලෙෆ්ට් හීර් ස්ටිව්පි~ඩ්

ඌව්- ද වේයි හී මේක්ස් මී ෆීල් දැට් ලව් ඉස්න්ට් රියල්

කිව්පිඩ් ඉස් සෝ~ ඩම්බ්.."

@Shan

අපි එනවා දැක්කහම තාප්පෙ උඩට වෙලා හිටගෙන ගහේ අත්තකුත් අල්ලගෙන හිටපු සිංදු කියන වඳුරා අපිට අතක් වැනුවා..

" හායි මේ ඔයාලටත් උගුරැස්ස ඕනද.."

සිංදු කියන වඳුරා, ආගි අතු ටිකත් එහාට මෙහාට කරගෙන මූණ දාලා අපිට හායි කිව්වා..නිල් පාට ලොකු පිජාමා එකකුත් ඇඳගෙන බූල් බූල් සපත්තු දෙකකුත් දාගෙන මේකි මේ තාප්පයක් උඩ මක් කරනවද.. පැජන්ට් එකක් කරනවද..

" උඹ කඩනවනං අපිට දාපන්.."

" ඉන්න ඉන්න.."

ආයෙම ආගි අතු අතරේ නොපෙනී ගියා.. මමයි සෙනුකයයි ඒකි පහළට දාන උගුරැස්ස කකා තාප්පෙට හේත්තුවක් දාගෙන ඉඳියා..

" මේ බං උඹ ඉනිමගක්වත් නැතුව කොහොමද මේකට නැග්ගෙ.."

" කියාන් අයියා මාව මෙතනින් තිබ්බා.."

" සිරාවට.. කෝ දැන් ඩයල් එක.."

" එයාගෙ කැලරීස් බර්න් වෙන්න දුවන්න ඕන කිව්වා.. අර ලබන සතියෙ මැච් එකක්ලුනෙ.. ඉතින් මට උගුරැස්ස කඩලා දෙන්න කිව්වහම මාව උස්සලා මෙතනින් තියලා එයා වටයක් දුවලා එන්නම් කිව්වා.. එතකන් මම උගුරැස්ස කෑවා.."

" මේ උඹ ඕවා වැඩිය කන්නෙපා.. අසනීප වේවි.."

" හරි හරි අනේ.. මම මහීශාටත් කඩලා සාක්කුවෙ දාගත්තා.. මේ මනුස්සයා තාම නෑනෙ.."

ආගි තාප්පෙන් වාඩිවෙලා කකුල් දෙකත් වන වන අපි එක්ක කියව කියව හිටියා..

" මේ උඹට බහින්න ඕනනම් වරෙන්.."

@Shan

" බෑ අනේ මෙතන මරු හලෝ.. ඒ අන්න අන්න පූසෙක්.. අර අර.. අනාව්.."

ආශී තාප්පෙන් පොඩ්ඩක් එහාට වෙන්න වාඩිවෙලා ඉඳගෙන ඉඳපු නැට්ට ලොකු පූසෙක් පෙන්නලා මැරෙන්න හැඳුවා.. ඌ මෙකිගෙ කෑගැහිල්ල ඉවසගන්න බැරුව තාප්පෙන් බිමට පැනලා පදුරක් අස්සට ගියා..

" බලපන්.. සතාවත් බය කලානෙ.."

" අනේ පලයන්.. මේ ඒකනෙමේ උඹලට පේනවද අර ඈතට වෙන්න තියන පොඩි ගෙයක් වගේ එක.."

" ඕ.."

" ඒකෙ ඉඳපු අයියා කෙනෙක් උදේ කිව්වා වත්ත පල්ලෙහා පොකුණක් තියෙනවා කියලා.. අපි යමුද වෙලාවක.."

" උඹ මොකකටද ඒ අයියලා එක්ක කතාකරන්න ගියේ.."

" මම නෙමේ කියාන් අයියට කිව්වෙ.. මමත් අහගෙන හිටියා.. එයාලා තමා මෙහෙට ලන්ච් එකයි ඩිනර් එකයි සර්ව් කරන්නෙ.. තව ක්ලීන් කරන්න එන්නෙත් ඒ ගොල්ලො.."

" ආ ඒවා කලාට කමක් නෑ උබ වැඩිය කතාවට යන්න ඕන්නෑ.. පාඩුවෙ ඉඳින්.."

" ඒකතමා.. අපි බැලුවෙ මේ නිට්ටෑවෙක් මොකද තාප්පෙ උඩ කියලා.. බලද්දි අපේ දොඩම් බිබික්කමනෙ.."

" මේ ආයෙ තවුසෙ මගේ යකා අවුස්සගන්න යන්නෙ හරිද.. "

" ආ නෑ නෑ නෑ මොකුත් කියන්නෑ අපි නිකමට මතක් කලේ.."

ඒ එක්කම බුල් සෙරෙප්පු දෙකක් අහසින් පාවෙලා ඇවිල්ලා අපි දෙන්නගෙ මූණු දෙකේ වැදුණා..

" ආශූ.. එන්න බහින්න.. ඔයා උගුරුස්ස කඩාගත්තද.."

@Shan

අපිට තාප්පෙ එහාපැත්තෙන් කියාන් අයියගෙ ස්වීට් වොයිස් එක ඇහෙනවා ඇහෙනවා වගේ..

" ඔයා එන්න පරක්කු උනේ ඇයි.."

" මේ පාර දිගට තියෙනවා.. මම පොඩ්ඩක් එහාට එහාට ගිහින් ආවා.. පොඩ්ඩක් ඉස්සරහට වෙන්න පොඩි පොඩි මල් ගොඩාක් තියෙනවා.. ලස්සනයි ආශූ.. යමුද වෙලාවක.."

" අනේ.. අපරාදෙ මටත් එන්න තිබ්බා.. ඔයා මේක මටද ගෙනාවෙ.."

" ඔව් කෝ එන්න බහින්න.. සෙරෙප්පු දෙක කොහෙද.. මේ මඩ ගෑවෙනවනෙ.."

" මේ තාප්පෙ එහාපැත්තෙ ඉන්න සෙවල ගෙම්බො දෙන්නා ඒක ගත්තා.."

" ගෙම්බොන්ට මොකටද බබා සෙරෙප්පු.."

" ඒ ගෙම්බො දෙන්නා සෙරෙප්පු දාන ගෙම්බො දෙන්නෙක්.. කෝ එහාපැත්ත හැරෙන්නකො.."

ආශූ මටයි සෙනුකයටයි රවලා තාප්පෙන් එහාපැත්තෙ ඉඳපු කියාන් අයියට කියලා එයාව බිමට බස්සවගත්තද කොහෙද.. ටිකකින් ඉස්සරහා ගේට්ටුව ඇරගෙන කියාන් අයියා ආශිවත් පිටේ තියාගෙන රිසෝට් එක පැත්තට ඇවිදගෙන යනවා අපි දැක්කා.. ආශි කැලෑ මල් කිණිත්තක් අතේ තියන් ඒක ඉස්සරහට අල්ලගෙන සුපර්මෑන් වගේ කියාන් අයියගෙ බෙල්ලත් බදාගෙන බෙරිහන් දිදී යනවා..

" උන් දෙන්නා දැක්කහමත් සතුටු හිතෙනවා.."

සෙනුකයා උගුරුස්ස ගෙඩියක් කම්මුලේ පුරෝගෙන තාප්පෙට හේත්තුවුනා..

" ඒ කිව්වෙ.."

" ඒ කිව්වෙ බං.. උන් දෙන්නට විතරනෙ කිසි ප්‍රශ්නයක් නැත්තෙ.. ආශි කෙල්ලෙක් කියාන් අයියා කොල්ලෙක්.. කවදහරි උන්ගෙ ගෙවල් වලින්ම ඔකට කැමති වෙන්නෙ නැතෑ.."

@Shan

" ම්ම්.. එහෙම එකක් නම් තමා.. ඔවා අද හිතලා ඉවරකරන්න පුලුවන් දේවල් නෙමේනෙ බං.."

මම සෙනුකයගෙ කරට අතක් දාගෙන මගේ ළගට ඇදලා ගත්තා..

" අඩෝ මාවත් කරේ තියන් පලයන්කො සෙනුකයා.."

" අනේ මේ නටපං.. අර ඇතුලෙ ඉන්නෙ.. කරේ තියන් බැරිනම් වඩාගෙන ##############"

සෙනුකයා ගස් බවවා මාව තප්පෙට තල්ලු කල්ලා දාලා ගේ ඇතුළට දුවගෙන ගියා.. මමත් හිමින් හිමින් වටේ පිටේ සිරි නරඹ නරඹ ඇතුළට යද්දි රධ්‍ය අයියා තනියම කිචන් එකේ කවුන්ටර් එකට හේත්තු වෙලා මොනවද බොනවා.. මගෙ පොලොස් කොට්ටොරුවට පාළු හිතිලද.. අවධානෙ ගන්න යන්න ඕන..මම හිමිහිට රධ්‍ය අයියට ගිහින් හේත්තුවක් දාගත්තා..

" මොනවද බොන්නෙ.."

" ග්‍රීන් ටී එකක්.. ඕනද.."

මම එයා බොන මග් එකෙන් උගුරක් බීලා අමාරුවෙන් ගිල්ලා.. සැක් මේ මොන මගුලක්ද.. මගේ මූණ දිහා බලාගෙන ඉදලා රධ්‍ය අයියා මහා හයියෙන් හිනාවුනා..

" මෙකට මීපැණි දාගත්තෙ මොන එහෙකටද.."

" ඇයි රස නැද්ද.."

" ඊයා හලෝ.. බොන්නෙම මල ජරාවල් විතරයි..ජ්කැහ්.."

" මල ජරාව නෙමේ..දැන් ලබන සතියෙ ඉදන් ක්ලබ් එකකට යන්න නේද ඉන්නෙ.. ගියාම දේවි දිග ඩයට් ශීට් එකක්.. එතකොට තේරෙයි.."

" එතකොට තේරුණාම ඇති ඉතින්.."

" එහෙමද.."

රධ්‍ය අයියා මග් එක සෝදලා තියලා ට්‍රේ එකක් අතට ගත්තා..

@Shan

" යමු කෑම කන්න.."

" ඇයි පහළ නෙමේද කන්නෙ.."

" නෑ නෑ කාමරේට යමු.."

රධ්‍ය අයියා මගේ අතකිනුත් ඇදගෙන උඩ තට්ටුවට ගියා.. සෙනුකයයි අයුක අයියයි උඩ තට්ටුවේ සෝෆා එක උඩ තියාගෙන සැන්ඩ්විච් වගයක් ගිලිනවා.. මහීශා ඒකිට කන්නවත් සිහියක් නෑ ගේම් එකක් ගහනවා එක එක පොසිශන් වලට සෝෆා එකේ ඉඳගෙන සයෝන් අයියත් එක්ක.. මෙකි සයෝන් අයියට සෙට් වෙයිද.. සැක් මෙ මහීශා සේරම කොල්ලොන්ට ජෝඩු කරන කැත පුරුද්ද නවත්තගත්තනම් හරි වගේ..

" ඔයා ලැගේජ් එකේ තිබ්බ ඔක්කොම ඇඳුම් අල්මාරියෙන් දැම්මද වරද්.."

" මම.. ඔයා ආධ්‍ය අයියගෙ ඇඳුනුත් උස්සගෙන ආවද.."

" නෑ..?? ඇයි එහෙම ඇහුවෙ.."

" එහෙනම් ඔයා එක ජාතියෙන් ශර්ට් දෙකක් අරගෙන ඇවිල්ලා.. මන්දා.. මම ඒක නවලා තිබ්බා.."

" කෝක අර කළුපාට එකද.."

" ඔව්.."

" ආ ඒක අපේ අයියගෙ නෙමේ.. ඔයාට ගත්තෙ.."

" මට..?? කොයිවෙලාවද.. ඇයි ඒ.."

" ඇයි ඒ අහන්නෙ.. ගත්තා ඉතින්.. මට ඔයාව මතක් වුණා.."

" ඒ වුණාට.. දැනටම අපේ ගෙදර ඔයාගෙ ඇඳුම් වගයක් තියනවා.. මට දෙන්නත් බැරිවුනා.. හැමතිස්සෙම ඕනවට වඩා විය-"

" මම කියලා තියෙනවා.. ඕක ගැන කතාකරන්න එපා කියලා.. බලන්න.. මට බෝයිෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්නවා ඉතින්  I put you first in

@Shan

**everything**

.. ඔයා අඳින පළඳින එකේ ඉඳලා මට interfere වෙන්න අයිතියක් තියෙනවා.. you should accept whatever I give.. Just don't argue with me about it again.."

මම රධ්‍ය අයියා දේශනා කරන සේරම දේවල් ඔලුව වන වන හොඳට අහගෙන ඉන්නවා වගේ පෙන්නලා එයා ඇඳේ එයාගෙ එහාපැත්තෙන් ඉඳගෙන ට්‍රේ එක උකුළ උඩින් තියාගත්තා..

" මෙතනට එන්නකො.."

" ආ..??"

රධ්‍ය අයියා එයාගෙ කකුල් දෙක මැද්දෙන් තියන ඉඩ පෙන්නලා මට එතෙන්ට එන්න කිව්වහම මට ඒක ප්‍රොසෙස් කරගන්න බැරුව කට ඇරගෙන එයා දිහා බලාගෙන හිටියා.. ඒකනිසාම රධ්‍ය අයියා මාව උස්සලා අරගෙන කකුල් දෙක මැද්දෙන් තියාගෙන මගේ පිට එයාගෙ පපුවට හේත්තු කරගත්තා.. ඊටපස්සෙ බ්ලැන්කි එක කකුල් දෙකට දාලා ඇඳ යටින් bed desk එකක් අරගෙන ඒකෙන් ට්‍රේ එක තිබ්බා.. මේ යකාට මාව උස්සන්න පුලුවන්ද..

රධ්‍ය අයියා මාව ගුලි කල්ලා පොඩි වෙලා යන්නම තුරුල් කරගෙන කම්මුල ඇතුලට එබෙන්න හාද්දක් දුන්නා.. ආයෙමත් එකක් දුන්නා.. මට දැන් එකසැරේට මතක් වෙනවා දැනට මාස හත අටකට කලින් මම කකුල පැටලිලා ගිහින් මෙකගේ ඇඟේ වැදුනහම රතුවෙලා බය වෙලා එක විකාරයක් වුනු හැටි.. ඒ කාලෙ මාව පේන්නවත් බෑ වගේ රගපාපු හැටි.. වචනයක්වත් කතානොකරපු හැටි.. බකමූනෙක් වගේ මිම් මිම් ගගා ඉඳපු හැටි.. මටම විශ්වාස කරන්න බෑ මේ ඉන්නෙත් ඒ ඉඳපු මනුස්සයාමද කියලා..

මම සැන්ඩ්විච් එකක් අරගෙන පාඩුවේ කන්න ගත්තා..

" මේ අයියෙ.. දැන් අපි ගමේ යනවනෙ.. කොයි වෙලාවටද යන්නෙ.."

" ආ අම්මා කතාකලා.. ඔයා හිටියෙ නැති නිසා මම ආන්සර් කලා.."

@Shan

" මොකද කිව්වෙ.."

" පරිස්සමට ආවද මොකද කරන්නෙ ඕවා තමයි.. මම හිතාගෙන හිටියේ රෑට යන්න.. එතකොට වාහනත් එච්චර නෑ.."

" මම් ඔයා රෑ යන්නකො.. අපේ පැත්තෙ අලි ඉන්නවා.."

" සිරාවට.."

" ඔව්.. එහේ පාරවල් වල රෑට හෙනට ඉන්නවා.. තියා අපේ ගමේ මිනිස්සු රෑට අටෙන් පස්සෙ එළියටවත් බහින්නෙ නෑ.."

" ඒ මොකද.. ඔයා දන්නැද්ද අලින්ට මතුරන මෙච්චා එකක්වත්.."

" සැක් අනේ සජිත් ප්‍රේමදාස ඉදියනම් අහගන්න තිබ්බා.. අර මොකක්ද අන්තරාල- අර අනේ කිව්වෙ දවසක්.."

" සිරාම ට්‍රැක් උබටනම්.. "

රධ්‍ය අයියා කන ගාව ඉඳ ඉඳන් මහා හයියෙන් හිනාවෙන ගමන් මගේ කටට සැන්ඩවිච් එකක් එබුවා.. මම ඒක හපලා හපලා ගිලලා රධ්‍ය අයියගෙ පපුවට හේත්තු වෙලා උරහිසට ඔලුව තියාගත්තා..

" මෙ පොඩි වැඩක් අහන්නද.."

" කියන්න.."

රධ්‍ය අයියා හැපීකව චීස් කෑල්ලක් කටේ ඔබාගන්න ගමන් කොලේ ගුලි කල්ලා ප්ලේට් එකට විසික් කලා.. හැපීකව්වා හැපීකව් කනවා.. මෙකනම් ඉතිහාසගත වෙන්න ඕනම කාරනාවක්..

" ඔයා ආධ්‍ය අයියගෙ අර ලව් එක ගැන මොනව හරි විස්තරයක් දන්නෙනැද්ද.."

" කොයි එකද.. කීයක් තිබ්බද බං අපේ අයියට.. මම දැනුවත්වම හතරක් විතර තිබ්බා.."

@Shan

" මො-මොකක් කිව්වා.. හතරක්..?? මේ ආධ්‍ය අයියට.. මගේ කණ්ණාඩිදාන එක්කෙනාට.."

" ම්ම්.."

" මට කිව්වෙ දෙකයිනෙ.."

" හතරම හිතේ තියාගෙන හීටියා විතරයි.. ලව් අරහං වෙලා ඉන්නෙ.. ඒකයි බඳින්න බෑ කියන්නෙ.. දැන් තිහකුත් වෙනවා.. අප්පච්චිලාම කීයක් ප්‍රපෝසල් ගෙනාවද.. කැමතිවුනේ නෑ.."

" එහෙමද.. එහෙනම් මම ආධ්‍ය අයියවත් බඳින්නද.."

"....."

" නෑ නෑ හලෝ නිකම් කිව්වෙ.. මම කව්වෙක් හොයාගෙන ඉන්නෙ බඳින්න.. ඇඤ්ඤ මේ ඉඤ්ඤෙ මගේ හැපිකව්වා.."

මම මුව කමල හට්ටියක් කරගෙන ඉන්න රධ්‍ය අයියගෙ කම්මුලට හාද්දක් දුන්නා.. රධ්‍ය අයියා මාරම clingy කැරැක්ටර් එකක්, සමහර වෙලාවට.. ඉක්මනට මූඩ් ගහනවා.. දුක හිතෙනවා.. හෙනට ආදරේ බලාපොරොත්තු වෙනවා.. ඉක්මනට ජෙලස් හිතෙනවා.. ඇගේම ඇලෙන්න එනවා.. ආයෙම ඒකෙ අනිත්පැත්ත වෙන්නත් පුලුවන්.. avoidant සයිඩ් එක මට ලොකුවට පෙන්නන්නෙ නැතිවුනාට අනිත් සියලු සකල සත්ත්වයාටම රධ්‍ය අයියා avoidant කැරැක්ටර් එකක් තමයි.. ඇගේ ගෑවුණත් ටක්ගාලා එහාට යනවා.. වැඩිය කතාබහක් නෑ.. බිම බලාගෙන ඉන්නවා.. මම ඔය කැරැක්ටර් දෙකම දන්නවා.. කොයි එක වුනත් ඉතින් මම මේ මනුස්සයට හෙනට ආදරෙයි..

" කියන්නකො අනේ.."

" ම්ම්.. අයියා ගැනද.. ඒකගෙයි මගෙයි වයස් පරතරේ පොඩ්ඩක් හිතලා බලනවකො.. මම ඔහොම ඒවා කොහේ දැනගන්නද.."

" ම්ම්.. ඔයාට විස්සයිනෙ.. එයාට විසි නමයයි.. එතකොට නමයක්නෙ.."

@Shan

" විසි නමයම නෙමෙ හරිනම් තිහයි.. එතකොට මට වඩා දහයක් වැඩිමල්.. මම එකවසරෙදි අපේ අයියා දහයෙ.. මාව වඩාගෙන ගිහින් ක්ලාස් එකෙන් තියලා රණ්ඩුවෙන්නෙ නැතුව ඉන්න කියලා යනවා.. අපේ ප්‍රයිමරියට අපිට යන්න දෙන්නෙ නෑනෙ.. ආයෙම මම දොළහමාරට ඉස්කෝලෙ ඉවරවෙලා අර ගල් බැම්මට වෙලා එක හමාර වෙනකල් ඉන්නවා අයියා එක්ක ගෙදර යන්න.. "

" අනේ~ ආදරේ හිතෙනවා ඔය දෙන්නටනම්.."

" ඉතින් එයා කැම්පස් යද්දිත් මම හිටියෙ ප්‍රයිමරියෙ.. පොඩි එකෙක්ට ඇවිත් අයියා ඕවා ගැන කියනවද බං.."

" මිම්.. අයියා ඉතින් කෙල්ලොන්ටනෙ කැමති.."

" මිම් .. මිම්.."

රධ්‍ය අයියා අමුතුවට හිනාවෙලා බෙඩ් ඩෙස්ක් එක බිමින් තිබ්බා..

" ඇයි හිනාවෙන්නෙ.. එයා බයිය බබෙක්ද.."

" මං දන්නෑ අර ඉන්නෙ පහළ.. ගිහින් අහගන්න එකයි ඇත්තෙ.."

" අනේ මෙ අයියගෙන් ඕවා අහන්න බෑ.. පිස්සුද.."

මම රධ්‍ය අයියගෙ බූවලු අඩු ටිකෙන් ගැලවෙන්න පොඩ්ඩක් දඟලලා දඟලලා එහාට වෙන්න ගියහම රධ්‍ය අයියා මාව තව ටිකක් අත් දෙක තද කල්ලා බදාගත්තා.. මගේ ඇටකටු තැලිලා පොඩි වෙලා යනවා කොයිවෙලාවක හරි.. මෙ අඩුවලට අහුවෙලා.. රධ්‍ය අයියා මගේ බෙල්ලයි උරහිසයි අතරෙ තියන ඉඩෙන් මූණ තියාගෙන ශර්ට් එක එහෙමෙහෙ කල්ලා මගේ ඉණ හරියෙන් තද කල්ලා ඇල්ලුවා..

" මෙච්චර කෙට්ටු මොකද වරද්.. යකෝ ඩයට් කරන එකෙක්ටවත් නෑනෙ මෙහෙම ඇඟක්.."

" ඩයට් කලේ නැතුවට මම ගේම්ස් ප්ලේ කරනවනෙ.."

" ඒ වුණාට.. ස්පෝර්ට්ස් කරන උන්ගෙ ඇඟවල් මෙහෙම නෙමෙ.. මීටවඩා වෙනස්නෙ.. ඔයාගෙ ඉණ හරියටම මෙතනින් කැඩිලා තියෙන්නෙ

@Shan

කොහොමද.."

" මම දන්නෙ නෑ.."

" ඇවිදින ආට්වර්ක් එකක්නෙ.. I forgot completely.. මම වික්ටෝරියන් මහෝගනි ෆ්‍රේම් එකක් දාලා ළඟින් තියාගන්නනෙ ඉන්නෙ.."

රධ්‍ය අයියා මගේ කම්මුල් දෙකෙන් පොඩි වෙලා යන්නම අල්ලලා තොල් වලින් පෙක් එකක් තිබ්බා..

" අනේ රධ්‍ය අයියෙ.."

" This esthete called Radhya is now preparing to see what is the priceless art work he has.."

රධ්‍ය අයියා මාව ඇඳෙන් හාන්සිකරවලා මගේ කකුල් දෙක උඩින් ඉඳගත්තා.. එයාගෙ මූණෙ තියන පුදුම හිතෙන සැහැල්ලු ගතිය.. හේතුවක් නැතුවම ඉබේම ඇඳිලා තියෙන හිනාව.. ඇස් වල දිස්නෙ.. මට තදින්ම දැනුනා.. මම එයා තරමටම සැහැලුවෙන් හිනාවෙන ලස්සන පිරිමි ලමයෙක් මීට කලින් දැකලා තිබුනේ නෑ.. කම්මුල් වලට ලාවට ලේ පිරිලා රතුවෙලා තිබ්බත් ඒකෙනුත් එයාගෙ ලස්සන තව වැඩි කලා.. විශ්වාස කරන්න.. මට හිතුනා ඒ හිනාව හැමදාම එයාගෙ මූණෙ තියයෙන්න මට පුලුවන් හැමදේම කරන්න.. එක්තරා විදියකට කාලෙකට කලින් මම මෙච්චර පරාර්ථකාමී නෑ.. ඒත් දැන් එකම එක මනුස්සයෙක් වෙනුවෙන් විතරක් මම ආත්මාර්ථකාමීත්වයයි පරාර්ථකාමීත්වයයි අතරේ නොසෑහෙන දෝලනය වෙනවා..

එයා මගේ දුහුල් සුදුපාට ෂර්ට් එක කොනෙන් අල්ලලා ඒක හිමිහිට උඩට කල්ලා මගේ ඉණ දිගේ ඇඟිලි අරගෙන ගියා.. එයා ඉන්නෙ මගේ මූණ ඉස්සරහාමයි.. මට ලැජ්ජයි.. කවමදාවත් මම මෙහෙම ඉඳලා නෑ.. කාටවත්ම මෙහෙම මගේ ඇඟ පෙන්නලා නෑ.. එහෙම කවුරුත් බලන්න උත්සාහා කල්ලත් නෑ.. රධ්‍ය අයියා වුනත් පහුගිය කාලෙ මං දිහා ඕනවට වැඩිය බලන්නෙ නෑ.. කලින් වතාවල එයාගෙ ඇඟිලි මාව ඇල්ලුව වුණත් එයා මාව දැකලා තිබ්බෙ නෑ.. මට මගේ කම්මුල් රතු වෙනවා ඇති කියලා මූණට දැනුන රස්නෙන් තේරුනා..

@Shan

රඨ්‍ය අයියා මගේ ශර්ට් එක අහලින් අහල හිමිහිට උඩට උස්සගෙන එද්දි එයාගෙ ඇස් මගේ මූණ දිහාවට එක තප්පරේකටවත් හැරවුනේ නෑ.. මම මූණ උඩින් අතක් තියාගෙන මගේ මූණ නොපෙනෙන්නෙ වහගෙනම ඉදියා.. මට දැනෙනවා ශර්ට් එක පපුවේ උඩටම ඇවිලා ඇගේ සීතල හුළං වදිනවා.. රඨ්‍ය අයියා ශර්ට් එක අත් දෙකින්ම පන්නලා දාලා ඒක මගේ ඇගෙන් අයින් කල්ලම දාලා ඇදේ කොනකට විසික් කල්ලා දැම්මා.. මට මෙතනම දියවෙලා යන්න ඕන!! මේ දැන්ම..

" වරද්!! ඔ-ඔයා.."

රඨ්‍ය අයියා ඇස් දෙකත් ලොකු කරගෙන මගේ දිහා බලාගෙන ඉද්දි මම එක අතකින් මගේ පපුව වහගත්තා..

" එපා එපා.. ඒවා-මාරම ලස්සනයි වරද්.. උඹ මනුස්සයෙක් නෙමෙයි නේද.. මිම්.."

රඨ්‍ය අයියා මගේ මූණට පහත් වෙලා මගේ පපුව උඩ තිබ්බ අත අයින් කල්ලා ඒ අත එයාගෙ අතේ පටලගෙන ඇදට තියලා තද කෙරුවා..

" පිස්සු හැදෙනවා වරද්.."

රඨ්‍ය අයියා මගේ තොල් වලින් පෙක් එකක් තියලා මගේ කම්මුල අතකින් අල්ලගෙන මගේ තොල් එයාගෙ තොල් වලට හිර කරගත්තා.. එයා කියනවා වගේම ඊස්තීට් කෙනෙක් ආට්වර්ක් එකක් දිහා බලන්නෙ කොහොමද.. එයා ඒ හැම එකක්ම මගෙන් හෙව්වා.. මම එයාගෙ අතින් මගේ අත ගලවගෙන මගේ අත් දෙක එයාගෙ බෙල්ල වටේ ඔතාගත්තා..

රඨ්‍ය අයියගෙ අත් මගේ ඉන දෙපැත්තෙන් තියන හීනි නැමුම් හැම එකක්ම දිගේ ඇගිලි අරගෙන යනවා.. හිමිහිට උඩට.. ආයෙම පහලට.. ආයෙම උඩට.. මම එයාගෙ උරහිස හිල් වෙලා යන්නම තදින් අල්ලගෙන ඉවසගෙන ඉදියා.. රඨ්‍ය අයියා මගේ බෙල්ල මැද්දෙන් හාදුවක් තියලා මගේ දිහා ඇස් උස්සලා බැලුවා.. මට තේරෙන්නෑ එයාගෙ මූණෙ තියෙන්නෙ කොයි වගේ බැල්මක්ද කියලා.. ආසාවකුත් එක්ක ආදරේ පිරුනු හරි අමුතු පෙනුමක්..මම කවමදාවත් දැකලා තිබ්බෙ නැති පෙනුමක්..

" මම කොතනින්ද නවත්තන්න ඕන වරද්.. මට තේරෙන්නෙ නෑ.."

@Shan

රඩ්‍ය අයියා රහසින් වගේ මුමුණද්දි මම ඇස් දෙක තදකල්ලා පියාගත්තා..

" Stop where you want to stop.."

රඩ්‍ය අයියා මගේ පපුව උඩ තැනින් තැන අගිලි ඇදගෙන ගියා.. මට දැනෙනවා.. එහෙන් මෙහෙන් හාදුවක් තියනවා.. ඒ එක්කම මට එයාගෙ තොල් වල උණු ගතිය පපුවේ පැත්තකින් දැනෙන්න ගත්තා.. මම බෙඩ්ශීට් එක අත් වලට ගුලි කරගෙන තොල් තුවාලවෙන්නම හපාගෙන ඉදියා.. එයාගෙ තොල් එකම රිදම් එකකට මාව අවුස්සලා දානවා..

" අහ්-අනෙහ්-රඩ්‍යහ්.. අයියේ.."

මම එයාගෙ කොණ්ඩෙ අහුරක්ම අතට ගුලි කරගත්තහම එයා මාව හැපුවා.. හැම වතාවකම වගේ මම මේ වතාවෙත් මේ වෙන දේට කැමති වේගෙන එනවා මට ඇග ඇතුලින් දැනුනා.. ඒක මට නවත්තගන්න බෑ.. මට මගේ වටේ වෙන්නෙ මොනවද කියලවත් තේරෙන්නෙ නෑ.. රඩ්‍ය අයියා එන්න එන්නම හරි සිහියෙන් ඈතට යනවදෝ මට හිතුනා.. එයා එකසැරේම මගේ අත් දෙක උඩට කල්ලා අල්ලගෙන මගේ මූණට පහත් වුනා.. මම එයාගෙ අත් අතෑරගෙන එයාගෙ ශර්ට් එකට යටින් පිට දිගේ මගේ අත් අරගෙන ආවා.. මගේම නියපොතු පාරවල් වලට එයාව සැහෙන්න තුවාල වුනා..

මම එයාව ඇග උඩින් එහාට තල්ලු කල්ලා දාලා එයාගෙ ඇග උඩින් ඉදගත්තා.. රඩ්‍ය අයියා ඉදියේ හතිදාන ගමන් ඇස් රතුම රතු කරගෙන.. එයා මාව අල්ලන්න අත දික් කලත් මම එයාගෙ අත් දෙක අල්ලලා ඇඳේ වියලට තියලා තද කරගත්තා.. ඊට්පස්සෙ අනිත් අතින් එයාගෙ ශර්ට් එක ඇදලා දාලා කාමරේ කොනකට විසික් කල්ලා දැම්මා.. රඩ්‍ය අයියා හිටියේ බයවෙලා වගේ..

" ඔයාට එච්චර ලේසි වෙන්නෙ නෑ.."

" මම ලේසි දේවල් වලට කොහොමත් කැමති නෑ බබා.."

රඩ්‍ය අයියා මගේ අත් දෙක ගලවගෙන මාව ඇදට තියලා තද කරගත්තහම මම එයාගෙ බෙල්ලෙන් අල්ලගත්තා.. රඩ්‍ය අයියා කට කොනෙන් හිනාවෙලා මගේ කට දෙපැත්තෙන් අල්ලගත්තා..

@Shan

" මොනවද ඔයාට ඕන වරද්.."

මම එයාගෙ බෙල්ල තද කල්ලා අල්ලගෙන එයාගෙ තොල් වලට පහත් වුනා..

" ඔයාට මොනවද ඕන.."

මම රධ්‍ය අයියගෙ පපුව දිගේ ඇගිලි අරගෙන යද්දි එයාගෙ ඇස් උඩට පියවෙනවා මම දැක්කා..

" අහ්-ම්.. වරද්.."

" ම්ම්..? කියන්න.."

රධ්‍ය අයියා මගේ අතකින් තද කල්ලා අල්ලගෙන මගේ පපුවට පහත් වුනා.. මම එයාගෙ තොල් වලින් අතක් තියලා එයාගෙ නලලට හාදුවක් දුන්නා..

" පරක්කු වෙනවා.. ඔයා වෙලාව දැක්කද.."

රධ්‍ය අයියා ටික වෙලාවක් අත් දෙකින් මූණ වහගෙන මගේ උකුලෙන් ඔලුව තියාගෙන ඉද්දී මම ඇද කොනේ තිබ්බ මගේ ශර්ට් එක ඇදගත්තා..

" ආර්හ්.. ඕක ඇදගෙනම ඉන්න.. ප්ලීස්.. මගේ ඔලුව රිදෙන්න ගත්තා.."

රධ්‍ය අයියා මගේ බඩට මූණ තදකරගෙන හයියෙන් හයියෙන් හුස්ම ගනිද්දි මම එයාගෙ කොණ්ඩෙ පිටිපස්සට කල්ලා කොණ්ඩෙ අස්සෙන් ඇගිලි අරගෙන ගියා.. එයා ලොකු හුස්මක් අරගෙන පහල දානවා මට ඇහුණා..

" මාව තුරුල් කරගන්නකො වරද්.."

මම රධ්‍ය අයියට තුරුල් වෙන ඒ පැත්ත හැරිලා අතක් දික් කලාම රධ්‍ය අයියා මාව බදාගෙන මගේ පපුවෙ මැද්දට මූණ හිරකරගත්තා.. මම අත් දෙකෙන්ම එයාව බදාගෙන තුරුල් කරගෙන ඉදියා.. එයාගෙ කොණ්ඩෙ අස්සෙන් සැරින් සැරේ ඇගිලි අරගෙන ගියා.. මට එයාගෙ ඇගෙන් එන අර රස්නෙ දැනෙනවා.. එයාගෙ සුවඳ මාව වහගන්නවා වගේ.. ඇස් දෙක බර වෙිගෙන එනවා.. මම රධ්‍ය අයියව තව ටිකක් තුරුල් කරගෙන බ්ලැන්කට් එක ඇගට දාගත්තා..

@Shan

" සනීපයි.."

රධ්‍ය අයියා ලාවට මුමුණද්දි මට නින්ද යාගෙන එනවා වගේ දැනුනා..

මේවා ලියන ඕතර්:

#ඒවානැතුවබෑබං #ගංජාගහන්නහිතෙනවාතනිකඩවමේවාලියද්දි

මෙගොල්ලො නතරවෙලා ඉන්නෙමෙ වගේ එකක කියලා මවාගන්න පුලාන්ද..

#රධ්‍ය_පුතේඇස්දෙකවහනිදපන්
#ඔක්කොමපැත්තකින්තියලාමමමූවසෙටකරගන්නවා

මම ගිහිනෙන්නම් හලෝ.. ඕගොල්ලො සතුටින් ඉන්නකො.. ඊටපස්සෙ අපි සතු............ටු වෙමු.. ඉමහ් ඉමහි..

#ආධ්‍ය අයියා බෝධි සත්ත්වයෙක් නෙමෙ බොලව්

එන්නාම්.. ලව් යූ.. ❤

***මට ඕන එයාලගෙ රිලේශන්ශිප් එක බිල්ඩප් වෙන විදිය පෙන්නන්න ඇත්තටම.. මම කොච්චර සාර්ථකද දන්නෙ නෑ.. මු කාලෙ රධ්‍ය-වරද් , මැද්දෙදි රධ්‍ය-වරද් , දැන් ඉන්න රධ්‍ය-වරද් අතරෙ ඔයාලට වෙනසක් වගේ එකක් තේරෙනවාද.. ***

හැමදාම වගේ කතාව වෙනුවෙන් ඔයාලගෙ හැම කමෙන්ට් එකක්ම හැම සපෝට් එකකටම මම හුගක් ආදරෙයි වගේම ස්තූතියි.. උම්මවහ්..

ප.ලි.

@Shan

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 73 කොටස

" අනේ එපා.. අම්මා.."

මාව එකපාරම ලොකු නින්දක ඉඳලා ගැස්සිලා ඇහැරුණා.. පපුව වේගෙන් ගැහෙන ගමන් මාව දාඩියෙන් පෙඟිලා ගිහින් තිබුනේ.. ඒත් එළියෙ තියෙන්නෙ පුදුම සීතලක්.. මම බ්ලැන්කට් එක ඇහෙන් අයින් කල්ලා දාලා පපුවට දෙතුන්පාරක් ගහගත්තා..

මම මොකක්ද දැක්කෙ.. මොනවද වුනේ කියලවත් මට මතකයක් නෑ.. මම රධ්‍ය අයියා දිහා බලද්දි එයා හොඳටම නිදි.. සෙනුකලත් නිදි.. පාන්දර තුනට විතර ඇති.. බැල්කනි එකේ දොර ඇරලා දාලා හුළං කාමරේට වදිනවා.. දොර වහන්න අමතක වෙලාද..

මම සද්දයක් නැතිවෙන්නෙ හිමින් නැගිටලා ගිහින් බැල්කනි එකේ දොර වහලා උඩ අගුල තද කල්ලා එන්න හදද්දිත් මට පේනවා උඩ තට්ටුවේ බැල්කනියට ආධ්‍ය අයියගෙ කාමරේ ලයිට් දාලා තියෙනවා.. අපි ඉඳපු කාමරේ වතුර තිබ්බෙත් නැති නිසා මම හිමිහිට පහලට බැස්සා වතුර බෝතලයක් අරගන්න..

හවස අපි ඔක්කොම Ninearch Bridge එකට ගිහින් සන්සෙට් එක දිහා බලාගෙන ඉදියා.. අර පහළ තියන තේ පැල තිබ්බ හරියෙ ඇවිදින්න ගියා.. පාලමේ ගැට්ට උඩට වෙලා සෑහෙන්න වෙලා පිස්සු කෙළ කෙළ ඉදියා.. අද උදේ යන්න හිටියේ ලිට්ල් ඇඩම්ස් පීක් එකට හයික් එකක්.. උදේම ගිහින් හුගක් හවස් වෙන්න කලියෙන් ආපහු රිසෝට් එකට එන්නයි හිතාගෙන ඉදියේ.. ඊටපස්සෙ අපි කතාවෙලා හිටියෙ හොරර් මූවි එකක් බලන්න..

මම සද්දයක් නැතුව පඩිපෙල බැහැගෙන කුස්සියට ගිහින් ෆ්‍රිජ් එකෙන් වතුර බෝතලයක් අරගෙන කවුන්ටර් එකට හේත්තුවෙලා වතුර බොද්දි ඇහැ කොණට පෙනුනා සාලෙ මොකක් හරි එහාට මෙහාට වෙනවා.. හරි ඉක්මනට.. ඒක කොච්චර ඉක්මනට මට පෙනිලා නොපෙනිලා ගියාද කියනවනම් මට ආයෙමත් හිතාගන්න බැරිවුනා මට කලින් එහෙම එකක් පෙනුනද කියලා..

අඩෝ හොල්මන්ද..

@Shan

මම වතුර බීලා බෝතලේ එහෙමම තියලා ආයෙම උඩට දුවන්න ලෑස්තිවෙද්දි මම දැක්කා මගේ ෆෝන් එක සෝෆා එක උඩ වයිබ්‍රේට් වෙනවා..

මගේ ෆෝන් එක සෝෆා එක උඩට ආවෙ කොයි වෙලාවෙද..???

මම පඩිපෙල දිගේ උඩට දුවන්න හදලත් ආයෙම ගිහින් ෆෝන් එක අතට ගත්තා.. ෆෝන් එක අම්බානෙක රත් වෙලා.. මට මේ හෙන ගනන් ෆෝන් එකක් නෙමේ තියෙන්නෙ.. පොඩ්ඩක් පාවිච්චිකරපු ගමන් රත් වෙන හෙන දෙකයි පනහෙ ෆෝන් කබලක් තිබ්බෙ.. මගෙත් නෙමෙයි අම්මයි මමයි හවුලෙනෙ පාවිච්චි කරන්නෙ..

මම ෆෝන් එක අතට ගද්දිම වයිබ්‍රේට් වෙන එක නැවතිලා ගියා.. ඒ එක්කම මාව උඩ ගිහින් බිම වැටිලා මැරෙන්න ගියේ රඩ්‍ය අයියා හොල්මන වගේ බ්ලැන්කට් එකත් ඇඟ වටේ ඔතාගෙන පහළට බහිනවා දැකලා.. මේ මිනිහා මාව මරනවා කොයි වෙලේ හරි..

" වරද්.. ඔයා මොකද පහළ කරන්නෙ.."

" මම බය වුණා මනුස්සයෝ..!! ඔය මොන මගුලක්ද ඇඟ වටේ ඔතාගෙන ගේ පුරා ඇවිදින්නෙ.."

" මමද ගේ පුරා ඇවිදින්නෙ.. මම බලද්දි ඔයා ඇඳේ නෑ.. ඒකයි ආවෙ.."

" ආ මම වතුර බොන්න පහළට ආවා.. හදිසියේ ඇහැරුණා.."

මම ෆෝන් එක අතට අරගෙන රඩ්‍ය අයියා ගාවට ගියාම එයා මං දිහා අමුතුවට බලලා අතේ තිබ්බ ෆෝන් එක දිහා බැලුවා..

" එන්නකො කාමරේට යන්න.."

රඩ්‍ය අයියා මගේ අතිනුත් අල්ලගෙන කාමරේට ගිහින් ඇඳට නොයා බැල්කනි එකට ආවා.. සෙනුකලා හොඳටම නිදි.. කාමරේ කතාකල්ලා උන් දෙන්නගෙ නින්ද කඩන්න ඕන නැති නිසා වෙන්න ඇති..

" ඇයි බයවෙලා වගේ ඉන්නෙ.."

" මොකුත් නෑ.. මම පහළට යද්දි ෆෝන් එක සෝෆා එක උඩ තිබ්බා.."

@Shan

" සෝෆා එක උඩ..??"

" ඔව්නෙ.."

" සෝෆා එක උඩ තියෙන්නෙ කොහොමද වරද්.. ඔයයි මමයි දෙන්නම අම්මට කතාකල්ලා නිදාගන්න ගියේ.. ඒක තිබ්බෙ ඇඳේ නෙමෙයිද.."

" ඒකතමා මාත් කල්පනා කලේ.. ඔයා රෑ ඇහැරිලා පහලට ගියේ නෑ නේද.."

" නෑ.. ඉතින් ගියත් ඔයාගෙ ෆෝන් එක ඕන නෑනෙ.. මේ ලයිට්ස් තියෙන්නෙ දිගටම ඕන් කල්ලා.."

" ම්ම්.. අනේ මන්දා.."

මම බැල්කනි එකේ ලී අත්වැටට හේත්තු වෙලා ආධ්‍ය අයියගෙ කාමරේ දිහා බලාගෙන හිටියා.. රධ්‍ය අයියා බ්ලැන්කට් එක මගේ ඇගට දාලා කාමරෙ පැත්ත හැරිලා අත් වැටට හේත්තු වුනා..

" ඔයා රෑ බැල්කනියෙ දොර ඇරියද වරද්.."

රධ්‍ය අයියා අහද්දි මම ආධ්‍ය අයියගෙ කාමරේ පැත්තෙන් ඇස් දෙක අරගෙන බය වෙලා වගේ රධ්‍ය අයියා දිහා බැලුවා..

" මම ඇරියෙ නෑ පිස්සුද.. ඇයි එහෙම අහන්නෙ.."

" නෑ ඒක හුළඟට වදින සද්දෙට මම ඇහැරුනේ.. ඒ බලද්දි ඔයා ඇඳේ හිටියෙ නෑ.."

" මො-මොක.. මම නැගිට්ද්දිත් කාමරේ බැල්කනි එකේ දොර ඇරලා තමා තිබ්බෙ.. මමමයි ඒක අගුලු දාලා පහළට ගියේ.."

" ආ..??"

" ඔව් ඇත්තමයි.. මම ඒක වැහුවා.. වහලා පහලට ගියේ.."

" එහෙම වෙන්න බෑනෙ.."

@Shan

" බෑ නෙමෙයි චුණා.. ඒ ගිහින් ටිකකින් තමා ඔයා ආවෙ.. අඩෙ මොනමගුලක්ද.."

" සමහරවිට ඔයාට අගුල උඩට දාන්න බැරිවෙන්න ඇති.. ආයෙම හුළගට ඇරුණද දන්නෑ.. ඕක හිතන්නෙපා.."

රධ්‍ය අයියා මගේ කොන්ඩෙ අවුල් කල්ලා කියද්දි මම එයා ගාවට ගිහින් බ්ලැන්කට් එක එයාගෙ වටේ දාලා මමත් ඒක අස්සට පැනගත්තා.. රධ්‍ය අයියා ගාව උණුම උණුයි.. හීටරයක්ම තමයි..

" ඇයි හදිසියේ අවදිවුනේ.. නයිට්මෙයර් එකක් දැක්කද.."

" ම්ම්.."

රධ්‍ය අයියා මාව එයාගෙ බූවලු අඩු වලින් ඔතාගෙන උස්සලා ලී අත්වැටෙන් ඉන්දුවා..

" වැටෙයි අනේ.."

" එහෙම වැටෙනවද බොල.. මම අල්ලගෙනනෙ ඉන්නෙ.. නටන්නැතුව ඉඳපිය.."

මම ඒ චුණාට කෝකටත් රධ්‍ය අයියගෙ උරහිසින් අල්ලගත්තා.. මෙක එහෙම කිච්චට වැටුණොත් එහෙම.. හැපීකච්චට බඳින්න එක්කෙනෙක් නැතිවෙනවනෙ..

" මොකක්ද දැක්ක නයිට්මෙයර් එක.. "

" දැන් මතක නෑ.. මාව නිකන් කොහේටහරි ඇදගෙන වැටෙනවා වගේ.. මට එහෙම හැමතිස්සෙම පේනවා.. ඒ චුණාට අද අවදි වුනා එකසැරේම.."

" එහෙමද.. දැන් ඒක ඉවරනෙ.. ආයෙම ඇත්තටම වැටුනොත් මෙතනින් තමා.."

රධ්‍ය අයියා මාව එහාපත්තට තල්ලු කරන්න වගේ හදලා ආයෙම පපුවට තුරුල් කරගත්තා..

@Shan

" පිස්සු හැදීගෙන එනවද.. මගේ පපුවත් රිදෙන්න ඇල්ලුවා.. මරනවා මාව කොහොම හරි.."

" ඇයේද බය වෙන්නෙපා.."

රධ්‍ය අයියා මගේ කම්මුල් දෙක පොඩ් වෙන්නම අල්ලලා තොල් වලින් පෙක් එකක් තිබ්බා.. මම එයාගෙ කර වටේ අත් දෙක යවාගත්තා..

" මට නිදිමතයි.."

" මම ඔයාගෙ නයිට්මෙයර් එක ඔයාගෙන් ඈතට යවන්න හදන්නෙ.. All you have to do is close those luminescent eyes.."

මම හිනාවෙලා මගේ ඇස් දෙක පියාගත්තහම එයා මගේ කම්මුලකින් උණුහුම් අතක් තියලා මාව පරිස්සමට කිස් කලා.. මගේ බඩේ සමනල්ලු එක සැරේට දාස් ගානක් තටු ගහලා පියාඹනවා වගේ.. මම එයාගෙ කම්මුලක් උඩින් මගේ අතක් තියලා සිනිඳුවට ඇඟිලිතුඩු වලින් අතගෑවා.. එයාගෙ කම්මුල් හුගක් සිනිදු නෑ.. කටු කටු ඇනෙනවා ලාවට.. රධ්‍ය අයියා මාව තව ටිකක් තුරුල් කරගෙන බ්ලැන්කට් එකෙන් වහගත්තා..

විනාඩි පහලොවක් විතර යන්නැති.. අපි දෙන්නම හිටියේ වෙනම ලෝකෙක.. අපේ වටේ වෙන මොකුත්ම අපි දෙන්නට දැනුනේ නෑ.. ආදරේම විතරක් හිතෙන වෙලාවක.. මම ඉදියේ එයාට තුරුල් වෙලා..

***සලා·········***

මම එකපාරම ගැස්සිලා පිටිපස්සට යන්න ගියත් රධ්‍ය අයියා මාව ඇදලා අරගෙන පපුවට තුරුල් කරගත්තා.. කොහේහරි වීදුරුවක් බිඳුනා.. ආධ්‍ය අයියගෙ කාමරේ ලයිට්ස් ඒවෙද්දි ඔෆ් කල්ලා තිබ්බෙ.. රධ්‍ය අයියා මාව බිමින් තියලා මාව එයාගෙ පිටිපස්සට කරගත්තා..

" මොකක්ද ඒ.."

" මොකක් හරි බිඳුනා නේද.. පහලින් ඇහුනෙ.."

" ඔව් ආධ්‍ය අයියගෙ කාමරේ පැත්තෙන් නේද.."

" ආශිලා නැගිටලාද දන්නෙ නෑ.."

@Shan

ඒ එක්කම අපිට බලල්ලු පොරකන සද්දයක් ඇහුණා.. ඒ සද්දෙට මම ආයෙම සැරයක් බයවෙලා රඩ්‍ය අයියගෙ ශර්ට් එක තද කල්ලා ගුලි කරගත්තහම එයා මගේ අතකින් අල්ලගත්තා..

" මම හිතන්නෙ අර බළලෙක් වෙන්න ඕන.. වෙන මොකුත් නෙමේ.. ඔයා ඇතුලට යන්න වරද්.."

" ඉතින් ඔයත් එන්නකො.. එළියෙ ඉන්නෙ ඇයි.."

රඩ්‍ය අයියා ටිකක් වෙලා එළිය බලාගෙන ඉඳලා බැල්කනි එකේ දොරත් වහලා කර්ටන් එකත් ඇදගෙන ඇදට ඇවිත් නිදාගත්තා.. මම එයාගෙ පපුවට මූණ තියාගෙන ඇස් දෙක පියාගත්තා.. රඩ්‍ය අයියගෙ ඇඟිලි මගේ කොණ්ඩෙ අස්සෙන් තැනින් තැන නතරවෙලා එහෙමම නැවතිලා එයාගෙ අත පහළට කඩා වැටුණා.. මටත් ඒ එක්කම නින්ද ගියා..

" වත්සල්.. සුදූ නැගිටින්න.. ගිහින් ලෑස්ති වෙන්න.."

" ම්හ්.. අනේ බෑ නිදිමතයි.."

" එන්න එන්න.. ඔය ඇති නිදාගත්තා.. කෝ නැගිටින්න.. සුදූ..!!"

මම මූනට කොට්ටෙ තියාගෙන බ්ලැන්කට් එක අස්සටම වෙලා රඩ්‍ය අයියගෙ අතකට හේත්තු වෙලා කකුලක් එයාගෙ ඇඟ උඩින් දාගත්තා.. රඩ්‍ය අයියත් මාව අත් දෙක අස්සට ගුලි කරගත්තා..

" රඩ්‍ය.. මෙ නැගිටිනවකො.. උඹලා නිදිපෙති ගහලද මෙච්චර නිදාගන්නෙ... අර කියාන්ලා ඇඳගන්නවත් එක්කන්.."

" මල්ලි.. නැගිටින්නකො.."

අයුක අයියා මගේ කකුලෙන් දිගටම අදිද්දි මම බ්ලැන්කට් එක මූණෙන් අහක් කල්ලා ඇඳේ ඉඳගත්තා..

" ම්හ්..??"

" ගිහින් චේන්ජ් කරගන්න ෂනෙරු.. අරගොල්ලො යන්න ලෑස්තිත් වෙනවා.."

@Shan

" මිම්.. මිම්.."

මම මගේ එහාපැත්තෙ නිදාගෙන ඉන්න රධ්‍ය අයියට කකුලෙන් එකක් ඇන්නා..

" මේ නැගිටින්නකෝ.."

" මම නිදි අනෙ.."

රධ්‍ය අයියා එහාපැත්ත හැරිලා කොට්ටෙ මූන උඩින් තියාගත්තා.. අම්මපා මේ මිනිහා එක්ක මේ වෙලාවට යන තරහා.. අයුක අයියා බැරිම තැන සෙනුකයව උස්සගෙන ගිහින් වොශෲම් එකේ තියලා ශවර් එක ඇරියද කොහෙද.. උදේ පාන්දරම සෙනුකයගෙ උච්ඡ ස්වරය බිත්ති හරහා දෝංකාර දීලා අයුක අයියට මේ ලෝකෙ ඔක්කොම සත්තුන්ගෙ නම් කියලා බනිනවා ඇහුනා.. අයුක අයියා ඒ එක්කම එළියට පැනගත්තා විතරයි ඒකාකාර ප්‍රවේගයකින් පියාඹගෙන ආපු ටූත්පේස්ට් එකක් අයුක අයියගෙ ඇඟේ වැදී නොවැදී ගියා..

" ඒක මෙහෙට දෙනවා!!!"

අයුක අයියා ආයෙම වොශෲම් එකේ දොර බාගෙට ඇරලා ටූත්පේස්ට් එක ඇතුලට දාලා දොර වහගෙන ඇඳුම් වගයක් මදින්න ගත්තා..

" මම මදින්නද ඕක.. අයියා ගිහින් චේන්ජ් කරගන්න.."

මම නැගිටලා මූණට වැටිලා තිබ්බ කොණ්ඩෙ අත් දෙකින් පිටිපස්සට කරගෙන අල්මාරිය ඇරියා..

" පුලුවන්ද ඔයාට.."

" මම කරන්නම්.."

අයුක අයියා අයන් එක එහෙමම ඕෆ් කල්ලා ටවල් එකත් කරට දාගෙන වොශෲම් එකට ගියා.. මම අඳින්න ඇඳුමක් හොයාගෙන රධ්‍ය අයියා ගාට ගිහින් ආයෙම කතාකලා.. පස්සෙ ලොකු.. උඩදාගෙන නිදාගෙන ඉන්න හැටි විතරක්.. මුළු ඇඟම වහගෙන පස්ස විතරක් එළියෙ..

" මේ කෝකද අඳින්නෙ.. මේකද මේකද.."

@Shan

මම හැන්ගර් එකක දාලා තිබ්බ කළුපාට ශර්ට් එකකුයි තද කොලපාට ශර්ට් එකකුයි පෙන්නලා ඇහුවහම මේ හකරුල්ලා පස්ස දෙපාරක් විතර වනලා ආයෙම නිදාගන්න හැදුවා..

" අර අයන් එක අම්මපා ගෙනැත් ඇහෙන් තියනවා අයියෙ.. පරක්කු වෙනවා නැගිටපිය!!"

මම රඩ්‍ය අයියා පොරවගෙන ඉදපු බ්ලැන්කට් එක ඇදලා අරගෙන ගුලි කල්ලා විසික් කල්ලා පුපට පයින් පාරක් දුන්නහම යාන්තම් ඇස් දෙක ඇරලා මරන්න වගේ ඇදෙන් ඉදගත්තා..

" ඇයි.."

" කෝකද අදින්න දාන්නෙ.."

" කළු එක දාන්න.."

" කළු ඇදගෙන එන්නෙපා.. මම කොළ එක දානවා.. කළු විතරද මේ ලෝකෙ පාටකට තියෙන්නෙ.."

" දැන් කළු එක දාන්නෙ නැත්තන් මොන එහෙකටද ඇහුවෙ.."

" ස්වයං වින්දනයට.. නැගිටලා ඇඳ හදනවා.."

මම අර අපේ අම්මා වගේ හෙන ඇදුම් ලොට් එකක් තියාගෙන ඔක්කොම අයන් කල්ලා අයුක අයියල ඉදපු ඇඳ උඩින් තිබ්බා..

" මේ ඒකනෙමේ.. කවුද අර පාන්දර කෝල් කලේ වරදේ.."

" ආ ඒක බලන්න බැරිවුනානෙ.. කෝ ෆෝන් එක.. බලන්නකො පොඩ්ඩක්.."

මම මගේ සපත්තුදෙක හොයලා ලේස් එක හරිගස්සනගමන් රඩ්‍ය අයියට කිව්වහම එයා ඇදේ වාඩිවෙලා මගේ ෆෝන් එක බැලුවා..

" ඔයාලගෙ මාමා.. ඇයි දන්නෙ නෑ හදිසියෙ ගත්තෙ.."

" මැසේජ් එකක් තියලා නැද්ද.."

@Shan

" ආ තියෙනවා.. ඇයි කෝල් කලේ කියලා අහලා තියෙන්නෙ.."

" මොකක්.. පිස්සුද මාමට.."

" මාමට වැරදිලාද දන්නෙ නෑ.."

" එහෙම වෙන්නැති.. කොහොමත් අපේ මාමට පොඩි ට්‍රැක් ගතියක් තියෙනවා.."

මම ඇදෙන් ඉදගත්තහම රධ්‍ය අයියා මගේ කම්මුලකින් හාද්දක් තිබ්බා..

" හොදට නින්ද ගියාද.."

" ම්ම්.."

ආයෙම රධ්‍ය අයියා මගේ කම්මුල් දෙක දෙපැත්තෙන් අල්ලලා තොල් වලට පෙක් එකක් තිබ්බා.. ඒ එක්කම අයුක අයියා සෙනුක එක්ක එළියට ආවා..

" ඔයා වොශ් එකක් දාගෙන එන්න.."

" හලොව් ගායිස්.. ඔයාලා චේන්ජ් කරනවදෝ.. කවුරුහරි ඇවිත් මේ ට්‍රේ එක ගන්නකො ප්ලීස්.. මගේ අත් දෙක රිදෙනවා.."

මම ඇදුම් ටික අරගෙන වොශෲම් එකට යද්දි රධිය අයියා ලාවට දොර ඇරලා ආශි ගෙනැත් තිබ්බ ටී ට්‍රේ එක ඉල්ලගත්තා..

" කෝ අනේ මගේ ආධ්‍ය අයියා.. ආධ්‍ය අයියේහ්~"

අපි ඔක්කොම සාලෙට වෙලා යන්න ලෑස්තිවෙන ගමන් හිටියේ.. මහීශා පික්නික් බොක්ස් එකක් රෙඩි කරනවා.. කියාන් අයියා රධ්‍ය අයියත් එක්ක එළියට ගියා මේක ක්ලීන් කරන අයට කී එක දෙන්න ඕන කියලා.. ආධ්‍ය අයියා එළියට ආවෙ නැති නිසා මම එයාළු කාමරේට දෙපාරක් තට්ටු කල්ලා ඇතුළට යද්දි ආධ්‍ය අයියා මොනවහරි බෙහෙත් වගයක් බොනවා මම දැක්කා.. මම ආවා දැක්කා විතරයි ආධ්‍ය අයියා ඉක්මනට කාඩ් එකක් ලොකර් එකට දාලා වහලා සාක්කු දෙකට අත් දෙක ඔබාගත්තා..

" ඔයා එළියටවත් එන්නැනෙ අයියෝ.. මම ආවා ඔයා හොයාගෙන.."

@Shan

" ගුඩ්මෝනින් චූටියෝ.."

ආධ්‍ය අයියා හිනාවෙලා මගේ කොණ්ඩෙ ඇවිස්සුවා..

" ඔයා රෑ වෙනකල් ඇහැරලා හිටියා නේද.."

" මම..? අ-ආ ඔව් නින්ද යන්නෑ අනේ.. පුරුදුවෙලා ඇහැරලා ඉදලාම.."

" එහෙමද.. මම පහළට වතුරබොන්න ආවහම දැක්කා කාමරේ ලයිට් දාලා තියෙනවා.."

" අහ්.. කෝ පොඩී.."

" එයා එළියට ගියා කී එකක් දෙන්න ඕන කියලා.."

ආධ්‍ය අයියා අයිවරි පාට ටර්ටල් නෙක් ජර්සි එකක් ඇඳලා දුඹුරුපාට ලූස් පැන්ට් එකක් ඇදලා ඉදියේ.. එයා හරි පියෝ ලුක් එකක් තියෙන එක්කෙනෙක්.. කියන්න තේරෙන්නෑ.. අමුතු හිත ඇදිලා යන ලස්සනක් තියෙනවා.. අපේ අම්මත් කියලා තියෙනවා ආධ්‍ය අයියා රධ්‍ය අයියට වඩා වෙනස් හරි නිම්මච පාටක් තියෙනවා කියලා.. රධ්‍ය අයියට තියෙන්නෙ මහ ආඩම්බර පාට නපුරු ලුක් එකක්නෙ..

" ඇයි අයියෙ බෙඩ් කවර් එක චේන්ජ් කලේ.. මෙකෙ මෙට්‍රස් එක විතරනෙ තියෙන්නෙ.."

මම ආධ්‍ය අයිඅගෙ ඇදේ වාඩිවෙලා බම්ප් වෙන ගමන් ඇහුවා..

" මගේ අතින් වතුර වගයක් හැලුනා උදේ.. ඒක හෝදන්න දැම්මා.. ක්ලීන් කරන්න ආවහම එකක් දාන්න කිව්වනම් හරි.."

" මම.. ඒකතමා නේද.."

මම නැගිටලා යන්න හැදුවත් ආධ්‍ය අයියා මගේ අතින් අල්ලගෙන මගේ නළලට හාද්දක් දීලා මගේ කොණ්ඩෙ ආයෙම අතින් හදලා 'හරි ලස්සනයි' කිව්වා.. එයා හිටියේ ටිකක් සුදුමැලි වෙලා.. නිදිමරපු නිසාද දන්නෙ නෑ..

ඊටපස්සෙ අපි Little Adam's Peak එකට එන්න ආවා.. ඒකනම් මාරම අත්දැකීමක් තමා.. මම කලින් ලොකුවට හයික් වලට ඇවිත් නෑ.. ආගි

@Shan

කිව්වා එයාලා ගයිඩ් කරද්දි එකපාරක් හයිකින් කල්ලා තියනවා කියලා.. ඒ පැත්ත මාරම ලස්සනයි.. හැබැයි ගොඩක් ඇවිදින්න තියෙනවා.. අපි මාරම විදියට හයික් එක එන්ජෝයි කලා.. මම හිතුවෙ නෑ ඇල්ලෙ එන එක මෙච්චරම ශෝක් වැඩක් වේවි කියලා..

" අනෙ මෙ කියාන් අයියෙ.. දැන් තවුසෙට මාව පේන්නෙ ඉත්තෑවෙක් වගේද ආ..??"

" කවුද බබා ඔයාට ඉත්තෑවෙක් කිව්වෙ.."

" එහෙනම් උදේ කිව්වෙ මට ඉත්තෑවි කියලා.. කටු ගොඩක් කිව්වෙ.."

" ඉතින් උදේ කිව්ව එකට දැන් බැනලා හරියනවද.."

" මට ඒක දැනුයි මතක් වුනේ.. කම්බි පණුවා.."

ආශි බිමින් කෝට්ටක් අහුලගෙන හැමෝටම ඇන ඇන ඉස්සරහින් යනවා.. ඒකි නිල් පාටින් කලර් කරපු කොණ්ඩ කැලි දෙපැත්තට පද්ද පද්ද පැන පැන වටේම තියන දේවල් අපිට පැහැදිලි කල්ලා දෙනවා.. මාර්ගෝපදේශිකාවක් ය කියන්නෙ.. අනේ මන්දා මටයි සෙනුකයටයිනම් මෙලෝ ලබ්බක් තේරුනේ නෑ.. අපි දෙන්නා පිටිපස්සෙන් හතරවටේ ඉන්න උන්ට එක එක ඒවා කිය කිය හිමින් හිමින් එන්න ආවා..

" උඹට කියන්න බං.. මෙන්න පුප.. දෙන්න හිතයි බේසික ගෑනිට.."

" අපරාදෙ නම්බර් එකක්වත් දැනගන්නනෙ තිබ්බෙ.."

" ඒ අඩෝ මේ රධ්‍ය අයියගෙ ගෙදර ඉස්සරහා කැල්ලට අපි කෝල් එකක් ගමුද.."

" මං ගාව නම්බර් එක නෑ බං.."

" ඒ උබ ගාවනෙ.. මං ගාව තියෙනවා.."

" අඩෝ ඒ බේසික කෙල්ල උඹටත් දුන්නද නම්බර් එක.."

" නෑ නෑ එදා රධ්‍ය අයියගෙ ඇඳ උඩ තිබිලා මම හොයාගත්තෙ.. උඹලා දෙන්න කලින් ගෙදර ගියානෙ.."

@Shan

" සිරාවට.. ගමුත.."

" ඉඳහන්.. ආ තියේ තියේ.."

සෙනුකයා හිමිහිට ඉස්සරහා ගෙදර අක්කගෙ නම්බර් එකට ඩයල් කල්ලා ස්පීකර් ඔන් කලා.. අපිට ඉස්සරහා ඉඳපු කියාන් අයියයි රධ්‍ය අයියයි අයුක අයියයි අපි දිහා එකපාරම හැරිලා බැලුවා..

" කාටද ඔය ගන්නෙ.."

" කැමිලා පාකර්ට අනේ.. පොඩ්ඩක් ඉන්නකො.."

රධ්‍ය අයියා ෆෝන් එකට එබිලා මට ලාවට රවලා ඉස්සරහා බලාගත්තා.. කියාන් අයියා අපි ගාවට ආවා..

" අඩෝ මල්ලෙ.. මේ අර අරියා නේද.. අර අපේ එකාගෙ ගෙදර ඉස්සරහ ඉන්නෙ.."

" යැස්.."

" ටහික්.. මගේ පරන කැල්ල.."

" සිරාවට!!!!! අඩෝ කියාන් අයියෙ.. උඹ මෙකී එක්කත් යාළුවෙලා හිටියද.."

" කැගහන්නෙපා ඕයි.. අර ඉස්සරහා ඉන්න කෙල්ල මාව මෙතනම අවසන් ගමන් යවාවි.."

සෙනුකයා කෝල් එක කට් කල්ලා කියාන් අයියා දිහා රවලා බැලුවා..

" මේ කියාන් අයියෙ.. තවුසෙ අපේ එකීව රවට්ටනවා නෙමෙ නේද.."

සෙනුකයා කේන්තියෙන් අහද්දි කියාන් අයියා බයවෙලා වගේ නැවතුනා.. රධ්‍ය අයියා හැරිලා ඇවිත් මගේ කරට අතක් දාගත්තා..

" උබට පිස්සුද බං.. මම දන්නවා.. මගේ අතේ සැහෙන්න වැරදි තිබ්බා.. ඒ වුණාට.. ආශුව එහෙම මම පාවිච්චි කරන්නෑ.."

@Shan

" හැබැයි අයියෙ.. මොකක් හරි ලබ්බක් කල්ලා අහුවුනොත්නම්.. අම්මපා උඹව තියන්නෑ.."

සෙනුකයා විහිලුවෙන් වුනත් ටිකක් තදින් කියද්දි කියාන් අයියා සෙනුකයා දිහා බයවෙලා වගේ බලාගෙන ඉදියා..

" උඹලට පේනවද මම එහෙම කරනවා වගේ.."

" පිස්සුද බං.. අපි නිකම් කිව්වෙ.. අපි දන්නවා දැන් හැදිලා ඉන්නෙ කියලා.."

මම ගිහින් කියාන් අයියගෙ පිටට එකක් ගැහුවා..

" ඕන මනුස්සයෙක්ගෙ අතින් වැරදි වෙන්නැද්ද කියහන්.. වෙනවනෙ.. දැන් ඉතින් ඒවා වෙලා ඉවරයි.. උබ අර කෝච්චිය බඳින දවසට කියහන් මමයි සෙනුකයයි එන්නම් බෙස්ට්මන්ලට.."

" උබලට කසාදෙකට කතාකරන්නත් බයයි.."

" අනේ මේ අයියෙ උබ අර මල් පොකුරද මොකක්ද එක විසික් කරද්දි ආශිට කියහන් අපි දෙන්නගෙන් එකෙක්ට ගාන්ට අතට දාන්න කියලා.. අපි බැරිවුනත් මේ ඉස්සරහා දෙන්නගෙ අතට වුනත් කමක් නෑ.."

" මොන??.. මල් පොකුරද විසික් කරන්නෙ ඒ.. මම දන්නෙ නෑ බං.."

" මල් පොකුර නෙමේ ආශිව උස්සලා දාපන් අපි අල්ලගන්න.. මහ මැටි අලයක් තවුසෙනම්.."

අපි කතාකර කර යද්දි අර අක්කගෙන් සෙනුකයට කෝල් එකක් එනවා.. අම්මටසිරි.. ඇරියා අක්කා..

" ෂනෙරු උඹ කතාකරහන්.."

" අපි ඕවට නෑ.."

කියාන් අයියා ශේප් එකේ ඉස්සරහට ලිස්සල ගියාම අපිට මහීශා සෙට් වුණා..

" ඔන්න ගන්නවා ඈ.."

@Shan

" හලෝව.."

" හේයි.."

" ම්ම්.. කවුද මේ කතාකරන්නෙ..??"

" ඔයා මාව දන්නවා.. පොඩ්ඩක් මතක් කල්ලා බලන්නකො.."

ඒ එක්කම සෙනුකයා මගේ අතින් ෆෝන් එක උදුරලා ගත්තා..

" මම මේ නම්බර් එක දන්නෙ නැහැනෙ.. ප්ලීස් මේ කවුද කියනවද.."

" ම්ම්.. You gave me your number when we met once.."

" ඔහ්.. මේ අර ජිම් එකේ ඉදපු හොට් බෝයි නේද.."

අරියා අක්කා එයා වටේ යන කරත්තයක් කියලා අපි දෙනෝදාහක් මැද්දෙම කන්ෆර්ම් කලා.. සැක් මගේ ගැටපොලොස් කොට්ටෝරුවට කියන්න ඕන ගේ ඇතුලට වෙලාම ඉන්න කියලා.. මගේ මනුස්සයටත් කෙළ හැලුවද දන්නෑ..

" නෝප් නෝප්.. අපි මීට වුනේ නම් ක්‍රිකට් මැච් එකකදි.."

" ඌප්ස්.. මේ ඔයාද.. මම හිතුවා කෝල් එකක් නොගනීවිද කියලා.."

" ගන්නෙ නැතුව ඉන්න තිබ්බා.. ඒ ඔයා නොවුනනම්.."

" ඔහ් අනේ~"

" ඔයාට හරිම හොට් නේබර්ස්ලා ඉන්නවා නේද..ලයික්.. ඔයාලගෙ ගෙදර ඉස්සරහම දෙන්නෙක් ඉන්නවනෙ.."

මම හිමීට රධ්‍ය අයියා දිහා රවලා බැලුවහම ඒකා ගස් කොළං බල බල යන්න ගත්තා.. මේකා මේ ගෑනි එක්ක මල්ගස් වටේවත් දුවලද..

" අපෝ අනේ ඔයාලා කියන්නෙ අර අපේ ඉස්සරහා ගෙදර රූඩ් බෝයි ගැනද.. එව් අනේ.. මමනම් ජීවිතේට කතාකල්ලාවත් නෑ.."

@Shan

" ඇයි අනේ ඒ.."

" එයාලා අපි එක්ක කතාකරන්නෙ නෑ අපි එයාලා එක්ක කතාකරන්නෙ නෑ.."

" එහෙමද.. ඉතින් කියන්නකො ඔයාගෙ විස්තර කොහොමද කියලා.."

" මම අනේ මේ ජිම් එකේ ඉන්ට්‍රක්ටර් කෙනෙක්ගෙන් ඇඩ්වයිසස් වගයක් ගන්න කෝල් එකක් එනකල් හිටියේ.. වට් අ සප්‍රයිස්.. මට ඔයා කතාකලානෙ.."

" ඔයා ඒකට සප්‍රයිස් වුනාද.."

" ඔෆ් කෝර්ස්.. ඔයා වගේ සෙක්-ඌප්ස් අයි මීන් ඔයා වගේ බෝයි කෙනෙක් කෝල් එකක් ආපු එකම සප්‍රයිස් එකක් තමයි.. වෙන් අයි සෝ දෝස් අයිස්.. I want to give you my all.."

ඒ එක්කම සෙනුකයගෙ ෆෝන් එක උඩින් ගියා.. අයුක අයියා ෆෝන් එක අරගෙන කෝල් එක කට් කල්ලා ෆෝන් එක රාජසන්තක කරගත්තා විතරක් නෙමේ.. සෙනුකයවත් රාජසන්තක කරගත්තා.. මම දැක්කා මහීශා ශේප් එකේ ලිස්සලා සයෝන් අයියා ගාවට යනවා.. උන් දෙන්නා ආපු වෙලේ ඉඳලා මාවල් මූවි එකක් ගැනම කියවනවා.. කියවනවා කියවනවා ඉවරයක් නෑ.. ඔක්කොම ගේම්ස් ගැනයි මූවීස් ගැනයි ව්‍රෙස්ලින් මැච් ගැනයි.. මේකිටනම් මෙහෙම ගිහින් කොල්ලෙක් සෙට් කරගන්න බෑ.. අර මුස්ලිම් කෙල්ල එක්කම යන්න වෙයිද දන්නෙ නෑ.. මිම්.. සහසා..

මම හිමින් සැරේ රධ්‍ය අයියගෙ ඇඟිලකින් අල්ලගත්තා..

" මොකෝ අනේ කතාකරන්නැත්තෙ.."

" මේ ඔයාට අපේ අයියා ඇවිදින විදියේ මොකක් හරි අවුලක් පේනවද.."

" මම ඇහුවා.. කකුල උලුක්කු වෙලා එයාගෙ.."

"එහෙමද.."

" ඔව්.. මේ එන්නකො ඔයාට රහසක් කියන්න.."

@Shan

රඨ්‍ය අයියා හිම්හිට මං ගාණට පහත් වුණාම මම එයාගෙ කම්මුලට හාද්දක් දුන්නා.. ඒයගෙ ඇස් ස්පාර්ක් වෙනවා එතකොට.. ආදරේ හිතෙනවා..

අපි ඇවිදලා ඇවිදලා මාරම එක්ස්පීරියන්ස් එකක් ගත්තෙ.. ආඨ්‍ය අයියා සැරින් සැරේ ෆෝන් එක බලනවා ආයෙම සාක්කුවට දාගන්නවා.. එයා පොඩ්ඩක් අවුලෙන් ඉදියෙ.. මම ගියොත් නම් මගේ කොණ්ඩෙ අවුල් කල්ලා හිනාවෙනවා.. ඉඳලා හිටලා තමයි කතාකලේ.. අපි ඉතින් දහලන්නෙ නෑනෙ ආඨ්‍ය අයියට වද වෙන විදියට..

අපි කාලා බීලා හවස ගෙදර එද්දි හවස හතරට විතර ඇති.. ඇවිත් හැමෝම වොශ් දාගෙන ඇවිත් මූවි එකක් බලන්න හිටියේ.. මමයි රඨ්‍ය අයියයිත් නාලා සාලෙට ඇවිත් මහීශා මූවි එකක් තෝරනකල් ඉඳගෙන හිටියා.. පැය බාගෙකින් විතර හැමෝම සාලෙ ඉඳගෙන හිටියා.. මහීශා ඒකිගෙ ආසම මූවි එක ඇනබෙල් දාලා මුලු ගෙදරම ලයිට්ස් ඕෆ් කල්ලා ඉස්සරහා දොරවලුත් වහලා ඇවිත් ඉඳගත්තා.. ඔක්කොන්ටම සෝෆා එකේ ඉඳගන්න ඉඩ නෑනෙ.. ආශි විසාල ඉඳගන්න හදපු ටෙඩියෙන් බිම දාගෙන ඒකෙ උඩ පතබැව්ලා ඉද්දි කියාන් අයියා ටවල් එකකුත් අතේ තියාගෙන ආශිගෙ කොණ්ඩෙ පිහිදනවා.. සෙනුකයයි අයුක අයියයි මට එහාපැත්තෙ ඉඳගෙන හිටියේ.. ආඨ්‍ය අයියා තනියම පුටුවක ඉඳගෙන.. මහීශා ආශි ගාව ඉඳගෙන අර වගේම ටෙඩියෙක් බිම දාගෙන.. ඊට එහාපැත්තෙන් සයෝන් අයියා ඉඳගෙන හිටියා.. හවුස් ෆුල්..

මම ඇනබෙල් පස් පාරකට වඩා බලලා තියනවා මහීශා නිසාම.. මූවි එක පටන් අරන් පැය බාගයක් විතර ගියාම මගේ එහාපැත්තෙ ඉන්න එකා ගිහින් අයුක අයියගෙ ඇගටම ඇලුනා.. එයිටීන් ප්ලස් පටන්ගන්නයි යන්නෙ.. මම ශේප් එකේ රඨ්‍ය අයියගෙ ගාවට වෙලා හේත්තුවක් දාගෙනම හිටියා..

" පොඩී.. ඔය දෙන්නට මහන්සි නම් කාමරේට යන්න.."

ආඨ්‍ය අයියා රඨ්‍ය අයියට කියද්දි රඨ්‍ය අයියා අමුතුවට ආඨ්‍ය අයියා දිහා බලාගෙන හිටියා..

" ඕන නෑ අයියේ.."

" අනේ මගේ ඇඟ රිදෙනවා වගේ.."

@Shan

මම පොඩ්ඩක් ඔළුවට අත තියාගෙන සෝෆා එකට හේත්තු වුනා.. ඔක්කොම මූවි එකට වශී වෙලා නිසා මම කියන ඒවා ඇහුනේ රධ්‍ය අයියට විතරයි..

" වරද්.. ඒ මොකද.."

" ඇවිදලා මහන්සි වගේ.. මම කාමරේට යන්නද.."

" මම එන්නම්.. යමු.."

මම ආධ්‍ය අයියට ඇහැක් ගහගෙන කාමරේට දුවලා ගියාම රධ්‍ය අයියත් මගේ පස්සෙන් කාමරේට ආවා.. මම කාමරේ දොර වහලා ඇවිත් බොහ් ගාලා ඇඳට පැන්නා..

" මම ඔයාට මොනවහරි හදාගෙන එන්නද.. ගොඩක් අමාරුනම්.."

" එහෙම ඕන නෑ.. එන්නකො මෙතෙන්ට.. I want to snuggle and cuddle with my botifie right now.."

මම ඇඳේ මගේ එහාපැත්තට තට්ටුවක් දැම්මහම රධ්‍ය අයියා හෙන මනමාල හිනාවක් දාගෙන ඇවිත් බ්ලැන්කට් එක අස්සට ඇඟ ඔබාගත්තා..

" ඔයාට මොනවා වෙලාද.."

" දැන්හොඳ ළමයා වගේ නිදාගන්නකො.."

මම රධ්‍ය අයියව දෝත බදලාම තුරුල්කරගත්තහම ඒක දහලලා දහලලා මගේ අත් අස්සෙන් එහාට පැනගත්තා..

" ඒ මොකටද මම නිදාගන්නෙ.."

" මමත් නිදාගන්න නිසා.."

" හරි ඉතින් ඔයා නිදාගන්න.. මම ඉන්නම්.."

" අනෙ මේ එහෙම බෑ.. මේවට කියන්නෙ.. අර මොකක්ද..ආ!! කපල් ගෝල්ස් කියලා..මම නිදාගන්නවනම් ඔයත් හොඳ ලමයා වගේ නිදාගන්න ඕන.."

@Shan

" ඒක හරි වැඩක්නෙ.."

මම බ්ලැන්කට් එක ඇඟෙන් ගසලා දාල කකුල් දෙක දෙපැත්තට දාලා රධ්‍ය අයියගෙ ඇඟ උඩින් ඉඳගත්තා.. එයා මං දිහා බයවෙලා වගේ බලාගෙන ඉදියා..

" මොකක්ද කියන්නෙ.. නිදාගන්න බැයිද.."

" ඒ පාර මොනවා වෙලාද.."

" ඔයාට බැරිද මං වෙනුවෙන් පොඩ්ඩක් නිදාගන්න.."

" හරි ඉතින් ඇයි ඒ.."

" මම ඔයාව රේප් කරන්නෙ නෑ අයියෝ.. කෝ ඇස් දෙක පියාගන්නකො.. හොඳ හැපීකච්චනෙ.."

මම රද්‍ය අයියගෙ ඇස් දෙක අත් දෙකෙන් වහැව්වා.. නිදාගනින් මා පුතා.. වද දීලා මගෙන් මරුම් කාලා සදහටම නිදාගන්න වෙන්නෙ නැත්නම්..

" වරද්..!! මොකක්ද වෙලා තියෙන්නෙ.."

රධ්‍ය අයියා මගේ අත ගලවලා එකට තියලා අල්ලගත්තහම මම වටපිට බලලා මොකක් හරි රෙද්දක් තියද බැලුවා.. ම්ම්.. ම්ම.. අපරාදෙ මට රෙදිපටියක් හොයාගෙන කලින්ම තියන්නනෙ තිබ්බෙ.. ආ මේ තියෙන්නෙ ලේන්සුවක්..

මම ඇඳ කොනේ තිබ්බ කළපාට ලොකු ලේන්සුව අරගෙන ඒක රෝල් කල්ලා පටියක් හදාගෙන රධ්‍ය අයියගෙ අත දෙක බැඳලා දැම්මා..

" ව-වරද්.. මේක ලිහනවා.. මෙ මොන මගුලක්ද කරන්න යන්නෙ.."

" ච්ජ්.. නිදාගන්නවකො අනේ.. අත් දෙක බැඳලා තිබ්බහමවත් නිදාගන්න බැරිද.."

" මේක ලිහනවා.. වරද්!!!!!!!!!!!!"

මෙ යකා බෙරිහන් දෙනවනෙ...

@Shan

" කැගහන්න එපා අනේ.. කෝ එන්න ඔයාව මම තුරුල් කරගන්න.."

මම රධ්‍ය අයියගෙ ඇග උඩින් බැහැලා එයාව තුරුල් කරගත්තා.. මෙකා අත් දෙකේ ගැටගහලා තිබ්බ ලේන්සුව ඒ ටිකට ලිහාගෙන විසික් කල්ලා දැම්මා..

" මොකක්ද කරන්න හදන්නෙ වරද්.."

" නිදාගන හදන්නෙ අනේ.. කෝ එන්න එන්න මට ඔයාව කඩ්ල් කරන්නෝනනෙ.."

මම රධ්‍ය අයියව අල්ලලා මගේ පැත්තට හරෝගෙන තොල් වලට පෙක් එකක් දුන්නා.. ඊටපස්සෙ එයා ටික වෙලාවක් මගේ දිහා බලාගෙන ඉදලා මගේ අත් දෙක ඇදට තියලා තදකරගෙන මගේ තොල් වලට පහත් වුනා.. මෙ යන විදියට පුතේ මේ යකා නිදාගන්න එකක් නෑ වගේ..

" අහ්ම්.. එපා අනේ.."

රධ්‍ය අයියා මගේ ඇඟ උඩටම ඇවිල්ලා මගේ බෙල්ල පුරාම තැනින් තැන හාදු තිය තිය හයිකී තියන්න ගත්තා.. මම දහලලා එයාගෙන් අයින් වුනා..

" අනේ නිදාගමුකෝ~"

" ඉතින් ඔයා නිදාගන්න.. මට නිදිමතක් නෑ ලොකුවට.."

දැන් නම් මල් පෝච්චියකින් ඔලුවට දෙන හිතෙනවනෙ.. මනුස්සයො කොහොමද නිදි කරවන්නෙ.. ඩයිසපැම් එකක්වත් විද්දනම්.. ඒවා ගන්න යන්න බෑනෙ.. මෙකට නින්ද පලයාන් ඒස්වාහ පුඃ..

" මේ.."

" මම්..??"

" මේ ඔයාට මම කුක්කු දෙන්නම්.. නිදාගන්නවද.."

මම රධ්‍ය අයියගෙන් අහද්දි ඒකා බයවෙලා වගේ මගේ දිහා බලන් ඉදලා, ටිකකින් මහ අමුතු විදියට හිනාවෙලා මගේ එහාපැත්තට ඇවිත් හොද

@Shan

ළමයා වගේ බැල්න්කට එකත් පොරවගෙන කොට්ටෙන් ඔලුව තියාගත්තා..

" ඇත්තටමද අහන්නෙ.."

" ඔව් නිදාගන්නවා කියලා ප්‍රොමිස් වෙන්නෝන හැබැයි.."

" ආ හා නිදාගන්නම්..මට නිදිමතයි කොහොමත්.."

සැක් මේකා මහ වල් කව්වෙක්නෙ.. මගේ පපුව දිහා බලාගෙන මාව ළඟට ඇදලා අරගෙන තොල් වලට පෙක් එකක් තිබ්බා.. ඇයි මම එහෙම එකක් කිව්වෙ.. වරද්.. උබ නම් ඉල්ලගෙන නෙමේ බේදාගෙන කන්නෙ..

රධ්‍ය අයියා මගේ දිහා අර දිග ඇස් පිහාටු තියන ඇස් දෙක යටින් බල බල ශර්ට් එක උස්සලා උඩට කලා.. ඊටපස්සෙ මගේ දිහා බලාගෙනම පපුව මැද්දෙන් හාද්දක් තියලා පපුවෙන් තොල් තියාගත්තා..

" මේ ඉක්මනට නිදාගන්න හරිද.."

රධ්‍ය අයියා මගේ දිහා බලාගෙන ඇස් පිය තුනක් විතර ගහලා මගේ අතක් අරගෙන එයාගෙ කොණ්ඩෙන් තියාගත්තා.. තියාගෙන මාව අර බූවලු අඩු වලින් තද කල්ලා බදාගත්තා.. ඇගත් හිරිවැටෙනවා වගේ.. දාඩියත් දානවා..

මම රධ්‍ය අයියගෙ කොණ්ඩෙ අස්සෙන් ඇගිලි හිමිහිට අරගෙන යද්දි එයා ඇස් පියාගත්තා.. එයාගෙ දිහ ඇස් පිහාටු මගේ පපුවේ ගෑවෙනවා..

" ආහ්ව්~ හපන්නෙපා අප්පා.. නිදාගන්නවකො ඉක්මනට.."

මම රධ්‍ය අයියව පපුවට තුරුල් කරගෙන ඇස් දෙක පියාගෙන හිටියා.. එයාගෙ අත් මගේ පිට දිගේ උඩට පල්ලෙහාට හිමින් හිමින් අරගෙන යනවා.. මම තොල් පටවල් හපාගෙනම ඉදියා.. රධ්‍ය අයියා සැරින් සැරේ ඇස් ඇරලා මං දිහා බලනවා.. ආයෙම ඇස් පියාගන්නවා.. කොහොම හරි පැය බාගෙකට විතර පස්සෙ රධ්‍ය අයියා නිදාගත්තා.. එයා නිදාගද්දි ලාවට ගොරවනවා.. මම පොඩ්ඩක්වත් ඇනෙන්නැතිවෙන්න එයාගෙ අත් අස්සට කොට්ටයක් ගහලා හිමින් සැරේ ඇඳෙන් බැහලා කාමරේ දොරත් වහගෙන එළියට යන්න ගියා.. සැක් මගේ පපුවත් රිදෙනවා ලිංගික අල්ලස් දීලා..

@Shan

" කෝ පොඩී නිදිද.."

" අනේ මේ ආධ්‍ය අයියෙ.. මම කේන්තියෙන් ඉන්නෙ හරිත.."

අන්නාසියෝ!!! කොහොමද ඉතිම්.. ඕතරීට වැඩ ගොඩගැහෙනවා අයියෝ හැමදාම මැදියමේ තමානෙ එන්න වෙන්නෙ.. කමක් නෑනෙ නේද.. ආ ඒකනෙ.. ඔව් ඔව් කමක්නෑ.. ඔයාලා දන්නවනෙ මම ඉතින් ඔයාලට හෙන ලව් කියලා.. අපේ ආදරේ අපි විතරක් දැනගත්තම ඇති සුදාම්මියලා/ සුදාත්තියලා..

සැක් නේද අනේ.. මම මොනවත මේ කියවන්නෙ..😂😭

ආ!! මට රීඩර් දළඹුපැංවෙක් එව්වා එයාගෙ හිතේ මැවිලා ඉන්න රධ්‍යගෙයි වරද්ගෙයි පික්කු දෙකක්.. ලෙම්මී සෝ යූ ගායිස්..





රධ්‍ය

#ඒකටනම්කෙළත්_හිරවුනාහරිතෙ * ඇත්තටම ඒ කොල්ලා ලස්සනයි අනේ.. උම්මවහ්



වරද්

#ආදරේසුන්දරවරදක්මතමා *හෙන සෝක් අනේ.. ඔයාලා මැවෙනවා කිය කිය මේ ඕතරීට ෆොටෝ එවලා පාලනය කරගෙන ඉන්න හිත මෙව්වා කරන්න එපා.. දමනය වෙලා ඉන්නෙ..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

@Shan

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 74 කොටස

" තවුසෙලාට කේක් එකක්වත් හරියට බේක් කරගන්න බැරිද අනේ.."

" මේ උඹ කටපියාගෙන ඕක හදපන්කො.."

" හැබැයි ආයෙම බැටර් එකට අත දාන්න ආවොත් නම් අම්මපා මේක තවුසෙගෙ මූණෙ ගහලා මම යනවා යන්න.."

ආශි ඒප්‍රන් එකකුත් ඇඳගෙන කුස්සියට වෙලා කේක් එකක් හදන්න බැටර් එකක් හදනවා ආධ්‍ය අයියත් එක්ක.. මමයි සෙනුකයයි බැටර් එකෙන් පොඩ්ඩක් රහ බලන්න ගිහින් රෝලින් පින් එකෙන් පිට මැද්දටම හොඳවයින් දෙකතුනක් කාලා මූණ ඇද කරන් කවුන්ටර් එක උඩ වාඩිවෙලා හිටියා..

" මහීශා වැඩේ හරියට කරයිද බං.."

" ඔව් ඔව් ඒකි මොකක් හරි කරයි.. සයෝන් අයියෙ තනියම කන්නෙ ඕකෙන් අපිටත් දෙනවකො.."

" එකක් දෙන්නම්.. මේක කාලා කේක් එකට දාන්නෙ මොකක්ද.."

" එකක් දෙන්න අනේ.. ඔයා විතරයිනෙ නපුරු නැති එක්කෙනෙක්ට ඉන්නෙ.. සයෝන් අයියා මගේ.."

" අනේ මේ පාඩුවෙ ඉඳපන්.."

සයෝන් අයියා මටයි සෙනුකයටයි ස්ට්‍රෝබෙරි ගෙඩියක් බෙදාගෙන කන්න දීලා ඒක අරගෙන පැන්ට්‍රි එකකට එබුවා.. ආධ්‍ය අයියා කේක් ට්‍රේ එකක බටර් ගගා ඉන්න ගමන් නහය උඩට අදිනවා මට ඇහුනා.. මස්සිනා ලෙඩ වෙලාද..

" ආධ්‍ය අයියෙ ඔයා ලෙඩ වෙලාද අනේ.. හරි අමුතුයි අද.."

මම ආධ්‍ය අයියගෙ පිටට ඇගිල්ලෙන් ඇන්නහම එයා බයවෙලා වගේ මගේ මුණ දිහා බැලුවා.. මේ අයියා මමියක් වගේනෙ අප්පා.. සුදුමැලි වෙලා බයත්

@Shan

හිතෙනවා..

" මොකක්ද චූටි.."

" අයියා අසනීපෙන්ද ඉන්නෙ.. ඔලුව කැක්කුමයිද තාම.."

" ඔව් අනේ.. මේ ඔලුවෙ රදයක් අල්ලලා සීතල නිසා මම හිතන්නෙ.. උදව්වක් කරනවද.."

" කියන්න අයියේ.."

" මෙකෙ බටර් ටික ගාලා මේ නංගිට පොඩ්ඩක් උදවු කරනවද.. මම පොඩ්ඩක් කාමරේට ගිහින් එන්නම්.. හා නෙ.."

" ඕක මොකක්ද අනේ.. කෝ දෙන්න.."

සෙනුකයා බටර් එක ආඩ්‍ය අයියගෙන් ඉල්ලගත්තහම ආඩ්‍ය අයියා කාමරේට ඇවිදගෙන ගියා.. මට ආඩ්‍ය අයියව අදනම් අල්ලන්නෙ නෑ.. හරි අමුතුයි.. රඩ්‍ය අයියගෙන්වත් අහන්න එයාව නැගිට්ටුවන්නත් බැනෙ.. මම ආඩ්‍ය අයියා කාමරේට ගිහින් දොර වහගන්නකල් ඉදලා ඒ පැත්තට ගිහින් කැරකි කැරකි ඉදියා.. මම දන්නවා අනුන්ගෙ දේවල් හියන්න හොද නෑ තමයි..ඒ වුණාට මම හොද මනුස්සයෙක් නෙමෙයි.. ආඩ්‍ය අයියා කාටහරි කෝල් කරනව මම හිතන්නෙ මට තැනින් තැන ඇහෙනවා වගේ.. මම ගිහින් හිමින්සැරේ දොරට කන තියාගත්තා..

" මොන කරුමයක්ද දෙයියනේ මේක.. මොකක්ද ඔයාට වෙලා තියෙන්නෙ.."

" ප්ලීස් අනූ මම කියන දේ එකපාරක් අහන්න.. මට මැරෙන්නද කියන්නෙ ඔයා.. මොකක්ද මේ කරන දේවල් වල තේරුම.."

" එන්න හිතන්නවත් එපා.. ඔයා විහින් මාවත් අමාරුවෙ දාන්නද හදන්නෙ.."

" අප්පච්චිගෙ වැරදි වලට මම පලි නෑ අනූ.. ඔයාට මගෙන් පලිගන්න මෙහෙම කිසිම හේතුවක් නෑ.. තමුසෙට කිසි හිතක් පපුවක් නෑ අනූ..

@Shan

කවදාවත් මං ගැන ඔයා එකසැරයක් හරි හිතලා තියෙනවද.. නැනෙ නැනෙ.."

" මම විතරද.. ඔයා කතාකරන්නෙ හරියට මම-මම තනියම"

" එපා.. හැබැයි අද ආවොත්වත් මම අම්මපා මැරෙනවා අනූ.."

" මම තියනවා.. මට කතාකරන්න එපා.. වෙච්ච හැමදේම අමතක කල්ලා දාන්න.. ප්ලීස්.. මගේ වැරැද්ද මම පිලිගන්නවා.. ආයෙම කතාකරන එපා.."

" අනූ- හලෝ.. හලෝ.."

" පිස්සු මිනිහා.. මාව කැවා.."

මට ආධ්‍ය අයියගෙ කාමරේ වොශෲම් එකේ දොර හයියෙන් වැහෙනවා ඇහුණා.. එයා කිව්වෙ මොකක් කියලද.. අනූ කියන්නෙ කෙල්ලෙක්ද.. මිනිහා කිව්වෙ කෙල්ලෙක්ටද.. මොන මගුලක්ද මෙ හොඳට ඉදපු ආධ්‍ය අයියට වෙලා තියෙන්නෙ..

" ෂනෙරුවා.. මෙ කෝල් එකක් එනවා!!!!!!!!!!!!"

" ඕ ඉදහන්.."

මම ගිහින් පෝන් එකට ආපු කෝල් එක ආන්සර් කලා.. කෝල් කලේ ආච්චිඅම්මා.. ආච්චිඅම්මා විස්තර අහලා ගෙදර එනෙන් කවද්ද ඕවා මෙවා අහලා ෆෝන් එක තිබ්බා.. අපේ අම්මා රට උයනවලු.. ඉක්මනට එන්න කියලා සැරින්සැරේ කිව්වා.. ආච්චිඅම්මට මම නැතුව පාලු හිතිලද කොහෙද.. මගෙ කැන්ඩි ලමිස්සි..

" කෝ දිපන් මම ඔක දාන්නම්.."

" මෙක හැදුනහම අයිසින් කරන්නත් ඕන අනේ.. ඔයාලා දන්නවද අයිසින් කරන්න.."

" අපි දන්නෙ නෑ බං.. හෝම්සයන්ස් පීරියඩ් එකෙත් කලේ කකා ඉන්න එක විතරයි.. හදන්න ඉගනගත්තෙ නෑ.."

" වැඩක් නෑ අනේ ඔයාලා.."

@Shan

" ආශු~ බබා ඔයා අර පාර්සල් ටික කොහෙන්ද තිබ්බෙ.."

" කොයි පාර්සල්ද.."

" ඇයි අනේ මම අර හවස ගෙනැත් තිබ්බෙ.. පාර්සල් වගයක්.."

" ආ ඒක.. මගේ කාමරේ තියෙන්නෙ.."

" ගෙනැත්දෙන්න ආශු ඒක මට.. ඔයාලගෙ කාමරේට මම යන එක හරි නෑනෙ.."

" ඉන්න ඉන්න.."

" අනේ ඔයා රසට හැදෙන්න ප්ලීස්~"

ආශි කේක් බැටර් එක බටර් ගාපු තැටියට දාලා අවන් එකේ හීට් එක හදලා ඒක දිහා බලාගෙන අත් දෙක එකට එකතු කරගෙන ප්‍රේ කල්ලා යන්න ගියා.. මෙකිනම් පිස්සු කැරොල් කරත්තයක් තමා.. සයෝන් අයියා ස්ට්‍රෝබෙරි එක පෙන්නලා මට ඇඟිල්ලකුත් දික් කරගෙන තර්ජනය කලල කුස්සියෙන් යන්න ගියා.. මමයි සෙනුකයයි කුස්සියේ ලයිට්ස් ඕෆ් කල්ලා සාලෙට එන්න ආවා.. මහීශා අයුක අයියා එක්ක ඇල්ල ටවුන් එකට ගියා.. දුර කඩෙකින් ඒකිගෙ ෆෝන් එක හදාගන්න ඕන කියලා.. ආයෙ පැයකටවත් ඒවි කියලා හිතන්න බෑ..

" සයෝන් අයියෙ පොඩ්ඩක් එනවකො.. ඩිනර් ගන්න ලේට් වෙනවා කියලා අරගොල්ලොන්ට කිව්වෙ නෑනෙ අපි.."

" අඩෝ ඔව් නේද.. වරෙන් කියලා එමු.."

සෙනුකයා ආධ්‍ය අයියා එක්ක මෙක බලාඅන්න අයගෙ ගෙදරට ගියාම මම විතරයි සාලෙ ඉතුරු වුනේ.. ආශුයි කියාන් අයියයි එළියේ ස්වින්ග් චෙයාර් එකේ ඉඳගෙන උන් දෙන්නගෙ කතාවක්.. මම හිටිහිට ආධ්‍ය අයියගෙ කාමරේට තට්ටුවක් දැම්මා..

" ඔයා ඉන්නවදෝ~.. මම එන්නම්.."

" එන්න එන්න.."

@Shan

ආධ්‍ය අයියා ඇඳේ හාන්සිවෙලා ඉඳලා මම එද්දි නැගිට්ටා..

" ඔයාට මොකක් හරි ප්‍රශ්නයක් නේද අයියෙ.. මට කියන්න බෑ වගේ එකක්ද.."

" එහෙම නෑ චූටියො.. මේ යාලුවෙක්ගෙ ප්‍රශ්නයක් මට කියනවා.. මේ ඔලුව රදේ අස්සෙ ඒකත් වැඩිවුනා.."

" මම ඔලුව අතගාන්නද.."

මම ආධ්‍ය අයියා ගාවට කිට්ටු වෙන්න ගියාම ආධ්‍ය අයියා කටත් අල්ලගෙන වොශෲම් එකට දුවලා ගියා.. එයාට දොර වහගන්නවත් වුනේ නෑ කොමෝඩ් එක ගාව දණගහගෙන කාපු බීපුවා සේරම වොමිට් කරන්න ගත්තා.. මම ඉක්මනට දුවගෙන ගිහින් ආධ්‍ය අයියව ඇගට වාරු කරගෙන එයාගෙ පිට අතගෑවා.. අයියා හොඳටම වොමිට් කරනවා.. හුස්ම ගන්නවත් බෑ..

" කැහ්-ඔ-ඔයා යන්න චූටියො.. ම-මම එන්න-ම්.."

ආධ්‍ය අයියට කියලා ඉවරකරගන්න හම්බුනෙත් නෑ ආයෙම වොමිට් කරන්න ගත්තා..

" පිස්සු කියන්නෙපා ඔයාට හොඳටම අමාරුයි.. මොකද මේ.. ඇඟත් රස්නෙයි හොඳටම.."

ආධ්‍ය අයියා මට වාරු වෙලා නැගිටලා සින්ක් එකට ගිහින් කට හෝදගත්තා.. හෝදගෙන මූනත් සෝදලා සින්ක් එකට ඔලුව පහත් කරගෙන හිටියා.. මම ටවල් එකකින් එයාගෙ මූණ පිහිදුවා..

" චූටියො.. මගේ ලොකර් එකේ ඩොම්පෙරිඩෝන් ටැබ්ලට් වගයක් ඇති.. ඒකක් ගෙනැත් දෙන්නකො.. වතුර එකක් එක්ක.."

" ඉන්න ඉන්න අයියා හාන්සි වෙන්නකො.. මම අරන් එන්නම්.."

මම ගිහින් ලොකර් එකෙන් නිල් පාට පෙත්තක් අරගෙන වතුර එකක් ආධ්‍ය අයියට දුන්නහම එයා ඒක බීලා එහෙමම ඇඳට කඩාගෙන වැටුණා..

" පොඩීට කියන්න එපා චූටි.. ප්ලීස්.."

@Shan

" එහෙම කොහොමද ඔයා හොඳටම අසනීපෙන් නෙ ඉන්නෙ.."

" ලොකු අමාරුවක් නෑ මට අනේ.. එහෙනම් මට උදව්වක් කරන්නකො.. මගේ බෑ එකේ ඇති.. ආ නෑ එක්කො මම ගන්නම්.."

ආධ්‍ය අයියා මොකක් හරි මතක් වෙලා වගේ ගිහින් බෑග් එක ඇරලා කලුපාට පොකට් එකක් එළියට අරගත්තා..

" මගේ ෂුගර් ලෙවෙල් එක බැහැලා මම හිතන්නෙ.. චූටි ආර් බී එස් බලන්න දන්නවද.."

( Random Blood Sugar Test -

**This measures your blood sugar at the time you're tested**

. You can take this test at any time and don't need to fast (not eat) first. A blood sugar level of 200 mg/dL or higher indicates you have diabetes )

" ඔව් මම දන්නවා.. මම බලන්නද.."

" අනේ බලන්න"

ආධ්‍ය අයියා පොකට් එක මගේ අතට දීලා ඇදෙන් හාන්සිවුනාම මම එයාගෙ අත අරගෙන මැද ඇඟිල්ල කොටන් එකකින් පිහිදලා ඇඟිල්ල විදලා ඒකෙන් ලේ බිංදුවක් අරගෙන ස්ට්‍රිප් එකකින් තියලා මැශින් එකට සෙට් කලා.. විනාඩියක් විතර ගියාට පස්සෙ රිසාල්ට් එක පෙන්නුවා..

" ඔයාගෙ ෂුගර් ලෙවෙල් එක බැහැලා තමයි.. ඇයි මේ.."

මම මැශින් එකේ තිබ්බ රිසාල්ට්ස් ආධ්‍ය අයියට පෙන්නුවහම එයා ඒක දිහා බලලා ආයෙම කොට්ටෙට ඔලුව තියාගෙන ලොකු හුස්මක් පහල දැම්මා..

" මට Hypoglycemia එනවා ලමයෝ සැරින් සැරේ.."

( Hypoglycemia is

**a condition in which your blood sugar (glucose) level is lower than the standard range**

@Shan

. Glucose is your body's main energy source. Hypoglycemia is often related to diabetes treatment. But other drugs and a variety of conditions — many rare — can cause low blood sugar in people who don't have diabetes )

" මොකක්..?? ඒ කොහොමද.."

" ඉස්සර කැම්පස් ඉද්දි ඕක මට හැදෙන්න ගත්තෙ කන්නෙ නැතුව ඉදලා.. දැන් සැරින් සැරේ එනවා ඉදපු ගමන්.."

" ඉන්න ඉන්න මම ටී එකක් හදාගෙන එන්නද.. ඇපල් ජූස් හරි වෙන මොනවහරි.. අයියා කැමතිදෙයක් තියද.."

" ම්ම.. ටී එකක් හදාගෙන එන්නකො එහෙනම්.. චූටි කොහොමද මේවා ගැන දන්නෙ.."

" අපේ ගෙදර සුවසේවකයො ඉන්නවා හෙන ලොට් එකක්.. මම ඕවා ගැන දන්නවා.. මට බෙහෙත් දෙන්නත් පුලුවන් ඔයාලගෙ කැත අකුරු වලට.."

" මාරයිනෙ.. අපේ එකත් ඉදලා ඉදලා වහලා තියෙන්නෙ අමුතු මලකට තමා.."

" හැඤ්ද් වහගත්තා තමා.. ඔයාගෙ මහලොකු මල්ලිබබා.."

" හා හා දැන් ගිහින් මොනවහරි හදන් එන්නකො.. මට මෙතනම කලන්තෙ දැම්මොත් ඔයාට උස්සගෙන යන්න තමා වෙන්නෙ.. කමක් නැනෙ.."

" මොනවා අහනවද මන්දා.. ඉන්න ඉන්න.. විනාඩි පහෙන් එන්නම්.."

මම දුවලා කුස්සියට ගියාම ආශී අවන් එක ගාවට වෙලා අත් දෙකත් ගුලි කරගෙන ඒක දිහා බලාගෙන ඉන්නවා..

" අනිමිසලෝචන පූජාවද.. මේක දිහා බලාගෙන ඉන්නෙ.."

" නෑ අනේ.. කැමක් හැදුවහම ඒකට ආදරේ දාන්න ඕන කියලා අපේ අම්මා කියනවා.. මම මේ ඒකට අදරේ දෙනවා.. ඒක ලස්සනට බේක් වෙන්න.."

" උඹටනම් පිස්සු බං.. මම මානසික වෛද්‍යවරයෙක් වුණොත් මගේ පළවෙනි පේශන් වෙයන්.."

@Shan

" අනේ මේ යනවා යන්න.. මම මේක හැදුවේ ආ~දරෙන්.. තවුසෙලා වගේ ඔටුවොන්ට ඒක තේරෙනවද.."

" ඔව් මම ඔටුවනෙ.. තේරෙන්නෑ.. උඹ ඔටු කිරි බොනවද.."

" බ්වැක්.. අහකට යනවා.."

ආශි මට රවලා මාවත් තල්ලු කරගෙන සාලෙට යද්දි රධ්‍ය අයියා එනවා ඇස් දෙකත් පිහිදදා පහලට.. මම් අවන් එක උඩින් රෙද්දක් දාලා වෝට කෙට්ල් එක ගහලා පැන්ට්‍රි එකට හේත්තු වුනා..

" ඔයා අවදි වුණාද.."

" මහ්.. කොහෙද ගියේ නිදාගන්න ඕන කියලා.. මම නැගිට්ද්දි ඔයා නෑ.."

" මට ඇහැරුණා.. ඉතින් පහළට ආවා.."

" කෝ අයුකලා.. ගෙදර කවුරුත් නැනෙ.."

" අයුක අයියා මහීශා එක්ක එළියට ගියා.. සෙනුකලා එළියෙ..කියාන් අයියාත් ඔය හිටියා.. "

" එහෙමද.. කාටද මේවා හදන්නෙ.."

" ආධ්‍ය අයියට.. ඔයාටත් ඕනද.."

" එපා දැන් බොන්න බෑ වගේ.. මොකක්ද මේ එන සුවද.."

" කෝකද..?? ආ මේ අර පහල ගෙදර මොනවහරි හදනවද කොහෙද.."

රධ්‍ය අයියා අවන් එකට අත තියන්න යද්දි මම පැනලා රධ්‍ය අයියව අල්ලගත්තා..

" ඔයා අද හෙන අමුතුයි වරද්.."

" ඒ මොකද.."

රධ්‍ය අයියා මාව උස්සලා පැන්ට්‍රි එක උඩින් ඉන්දුවා..

@Shan

" මම හදන්නම්.."

" හා.."

රධ්‍ය අයියා ටී එකක් හදනකල් මම එතන තිබ්බ පෙයාර්ස් ගෙඩියක් කපලා ඒක ප්ලේට් එකකට දැම්මා..

" අපේ අයියට බ්ලඩ් ෂුගර් අඩුවෙලා නෙ..නේද."

" ම්ම්.. එයා අමාරුවෙන් ඉන්නෙ.."

" මම හිතුවා.. වැනි වැනි ඉද්දි.. මොකක් හරි එකක් තමයි කියලා.."

" ඇයි අනේ එහෙම කියන්නෙ.."

" කියන්නෙ..?? ජේන්නැද්ද.. කන්නෙ නැතුව ඉඳලා.. හිතලා හිතලා ස්ට්‍රෙස් වෙලා ලෙඩක් හදාගෙන දැන් දුක් විදිනවා.. "

" එහෙම කියන්න එපා.. උවමනාවෙන් හදාගෙන නෙමෙයිනෙ.. දුශ්ටයි තවුසෙ.."

මම රධ්‍ය අයියට රවලා පැන්ට්‍රි එකෙන් බිමට පැන්නහම රධ්‍ය අයියා මොකක් හරි මතක් වෙලා වගේ කල්පනා කරන්න ගත්තා..

" අපේ අප්පච්චි එකපාරක් අයියට ගැහුවා අසනීපෙන් ඉද්දි.. මට අයියා අසනීප වෙනකොට ඒක මතක් වෙනවා.."

" මොකක්.. ගැහුවා..ඒ මොකටද අසනීප වෙලා ඉද්දි ගැහුවෙ.."

" පිරිමියෙක් වගේ ඉන්න බෑ.. වෙලක් නොකෑවහම ඔහොම ලෙඩ වෙනවද අරකයි මේකයි කියලා.. මම එදා අප්පච්චිගෙ යුනිෆෝම් එක කතුරකින් කැපුවා.. අන්තිමට අයියයි මාවයි කාමරේකට දාලා දවසක්ම වහලා තිබ්බා.. අම්මා ගෙදර ඇවිත් තමා අපිව එළියට ගත්තෙ.."

රධ්‍ය අයියා ඔය දේවල් කියද්දි මගේ ඇහේ මාලු නටනවා.. එයාගෙ අප්පච්චි හිතාගෙන ඉන්නවද දන්නෙ නෑ එයා කරන කියන හැම එකම හරියි කියලා.. කවදහරි දවසක මට ඔය මනුස්සයට කතාකරන්න හම්බුනොත්නම්... හොඳවයින් දෙකක් කියනවා.. හැමදාම මම හිතින්

@Shan

එයාගෙ අප්පච්චිට බනිනවා කියලා හිතාගෙන මවාගන්නවා.. ඇත්තමයි කවදහරි දවසක් ආවොත් මම කියන එක කියනවාමයි.. හිතාගෙන ඉන්නෙ හමුදාව තියෙන්නෙ ගෙදර කියලද දන්නෙ නෑ.. අම්මා නම් හොදයි.. අප්පච්චි තමා.. මල ඇණේ..

මම ඇගිලිතුඩු වලින් ඉස්සිලා රධ්‍ය අයියගෙ කම්මුලකින් හාද්දක් තිබ්බා..

" ඔයා ඕක හදාගෙන එන්න එහෙනම්.."

මම ඩේටස් වගයක් ෆ්‍රිජ් එකෙන් අරගෙන ඒකත් පෙයාර්ස් ප්ලේට් එකෙන් තියාගෙන ආධ්‍ය අයියගෙ කාමරේට යන්න යද්දි රධ්‍ය අයියා මගේ කම්මුලකින් අල්ලලා තොල් වලට පහත් වෙලා පෙක් එකක් තිබ්බා.. මම ආධ්‍ය අයියගෙ කාමරේට එද්දි අයියා කොට්ටෙට මූණ ඔබාගෙන ඉන්නවා.. මම ආඪ්ධ්‍ය අයියගෙ පස්සට එකක් දුන්නහම එයා නැගිටලා ඇද විට්ටමට හේත්තු වුනා..

" කේලම කිව්වද.."

" අනේ මම කිව්වෙ නෑ.. එයා දන්නවා ඔයාට හච්මක් ගියත් මොකද කියලා.."

" එහෙමද.."

මම රටඉඳි ගෙඩියකට ටූත්පික් එකකින් ඇනලා එක ආධ්‍ය අයියගෙ කටේ එබුවා..

" ඔයා මොකද කන්නෙ නැතුව ඉන්නෙ.. ගහනවා හරිද.."

" මටද.."

" ඔව් ඇයි බැරිද.."

" නෑ නෑ පුලුවන්..මම ලයිව් දැකලා තියෙනවා ඔයාගෙ ආත්මාරක්ශක සටන් කලාව.. තුවාල ලබපු අයට බෙහෙතුත් දාලා තියෙනවා.."

" ගැම්මක් තමා නේ.. මේ ඔක්කොම කන්න ඔයා.. තොත්ත බබා වෙන්නෙ නැතුව.. වයසයි නේද හැටපහක් විතර.."

@Shan

" අඩෙ මල්ලි එච්චර නෑ ඔහොම අපහස කරන්න එපා.."

" අපහස කරන්නෙ ඉතින්.. ඇත්තනෙ කියන්නෙ.. කන්න කන්න.. මෙකයි මෙකයි මෙකයි.. හොදට හපලා ගිලින්න හොදේ.."

මම පෙයාස් කෑලි තුනක් අරගෙන ආධ්‍ය අයියගෙ කටේ එබුවා.. හොදට පැණිරස කන්න එපැයි.. ආධ්‍ය අයියට කතාකරගන්නවත් බැරුව අර සේරම මටත් රවාගෙන කන්න ගත්තා..

" ඔය ලෙඩ්ඩුන්ට කවන හැටිද වරද්.."

රධ්‍ය අයියා ටී එක ගෙනැල්ලා කබඩ් එක උඩින් තියලා මගේ ගාවින් වාඩිවුනා..

" මොකක්ද කිව්වෙ ඇහුන්නෑ.."

" ලෙඩ වෙලා ඉන්න මනුස්සයොන්ට කවන හැටිද ඇහුවා.."

" එතකොට මට එදා කැව්වෙ.. මම ලෙඩවෙලා ඉද්දි.. බලෙන් කිරි එකක් අරගෙන කටේ ගහලා.. ඊටපස්සෙ කැනියුලා එකෙන් ඇදලා දැම්මෙ.. අර දවසක් පැස්ටා ගැන්ද මගේ කටේ එබුවෙ..බලෙන්.. මතක නැද්ද.. එතකොට මම ලෙඩවෙලා නෙමෙද හිටියෙ.. අනේ මේ.. මම දවසක් තවුසෙට කැව්වා.. කොච්චර රසට අනලා ලස්සනට කැව්වද.."

" රසට..?? බත් එකේ තියන සේරම මිරිස් අනලා අනලා කැව්ව එකද.."

" ආ මිරිස් කන්නෝන තමා.. හරි මගුලක්නෙ.. මිරිස් කන්නැතුව විසිකරන්නද.. ආධ්‍ය අයියා ආදරෙන් හදලා එවපු එකනෙ.."

" හනේ ඒපාර මගේ ප්‍රෙශරුත් බැස්සද කොහෙද.. රණ්ඩු නොකර ඉදින්කො උබලා දෙන්නා.."

" අයියගෙ ප්‍රෙශර් අඩු වෙලා මගේ ප්‍රෙශර් වැඩිවෙලා කොයි වෙලේ හරි අපි දෙන්නම මෙකා නිසා මැරිලා යනවා.."

" මම නිසා මැරෙන්නත් පින තියෙන්න ඕන.. මැරෙන්න නම් මොකටද මාත් එක්ක යාළුවුනේ.."

@Shan

" කවුද යාලුවුනේ.."

" තවුසෙනෙ.."

" මමද අර බැඩ්මින්ටන් මැචස් දවසට කලින් දවසෙ පන්තියට වෙලා අඩ අඩ හිටියෙ.. අම්මොහ් නේද වරද්.."

" මොකක්ද කියන්නෙ.."

" ඇයි.. ඇත්තනෙ කියන්නෙ.. මම ක්ලාස් එකට එද්දි ඉන්නවා මූණ කජු ලෙල්ලක් වගේ කරගෙන.. දුක වැඩි නිසාද රැකට් එකත් පඩිපෙලේම දාලා පන්තියට ආවෙ.. කෝච්ගෙන් ගුටියකුත් කැවා කියලා සයෝන් කිව්වා.."

" අනේ මම මූට ගහනවා අයියෙ හරිද.."

" ගහපිය බලන්න.. උස්සලා විසික් කරනවා ජනේලෙන් එහාපැත්තට.."

මම එතන තිබ්බ කොට්ටයක් අරගෙන රධ්‍ය අයියගෙ මූණ මැද්දටම දමලා ඇරියා..

" ආ තව ඔලුව රිදෙනවා කියලා බොරුවට කැහැලා රහපැවත් එක්ක.. අයියා දන්නැනෙ වරද්ගෙ ඇක්ටිං.."

" කට වහගන්නවා!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

" ඇයි මම කට වහන්නෙ.. ඇත්තනෙ කියන්නෙ.. ආව් ආව්..හපන්නෙපා යකෝ.."

මම රධ්‍ය අයියගෙ බෙල්ලෙන් අල්ලලා ඇඳට තියලා තදකල්ලා කොට්ටයක් අරගෙන මූණට තිබ්බා.. මැරිය ගැටපොලොස් කොට්ටෝරුවා.. ආධ්‍ය අයියා ඉස්සරහා මගේ නම්බුව කනවා..

රධ්‍ය අයියා මූණෙන් කොට්ටෙ අරගෙන විසික් කල්ලා මාව අත් දෙකට උස්සලා ගත්තා.. මූ යකෝ.. අලි මස් ගිලිනවද.. මාව මෙහෙම කලින් මොකෙක්වත් උස්සලා නෑ.. කලන්තෙ වගේ..

" තියනවා මාව බිමින්.."

@Shan

" උස්සලා විසික් කරන්න යන්නෙ.."

" අනේ ආධ්‍ය අයියේ.. මේ මම තවුසෙව මරනවා!!!!!!!!!!!!"

" මරපන් බලන්න.."

රධ්‍ය අයියා මාව උස්සලා ආධ්‍ය අයියගෙ එහාපැත්තට විසික් කලා.. මම වැටුනු පාර ඇඳ හතර පාරක් විතර බම්ප් වෙලා මගේ ඔලුවත් හෙල්ලිල්ලා ගියා.. මුගෙ ආච්චිට.. මම නැගිටලා රධ්‍ය අයියගෙ බෙල්ලෙන්ම අල්ලලා උරහිස හිල්වෙලා යන්නම පාරක් හපලා බඩට හොඳ පයින් පාරක් දෙන්න ගියාම රධ්‍ය අයියා කලින්ම මගේ කකුල් දෙක අල්ලගත්තා.. ඒ වුණාට මගේ නියපොතු වලට ඒකාගෙ පිට කීතු කීතු වෙන්නම සීරිලා ගියා.. කමක් නෑ ශර්ට් එකට උඩින් නෙ..

" මූනම් හොර බළලෙක්ද කොහෙද.."

" ඉවසීමෙන් සැනසීම ලැබේ..!!"

ආධ්‍ය අයියා හොඳ....ම හොඳ හුස්මක් උඩට අරගෙන පහළට දාලා අපි දෙන්නා එක්කම ස්මයිල් ඉන් පේන් හිනාවකින් හිනාවුනා.. සැක් ලෙඩාව අමතක වුනානෙ.. මම ආධ්‍ය අයියා ගාවින් ඉඳගෙන අයියගෙ ඔලුව අතගාලා ඉතුරුවෙලා තිබ්බ පෙයාර්ස් කෑල්ලත් කටේ එබුවා..

" ඉක්මනට සනීප වෙන්න අනේ.. ඔයා නැතුව පාලුයි.. ඔක හපලා කන්න.."

ආධ්‍ය අයියා ඒක හපලා හපලා අමාරුවෙන් ගිලලා ටී එකත් බීලා ඇඳෙන් හාන්සි වුනා..

" මගේ සීනි නැග්ගද කොහෙද.."

මම ආධ්‍ය අයියගෙ ඇහට බ්ලැන්ක්ට එකක් දාලා නැගිටලා රධ්‍ය අයියා ගාවට ගියා..

" කන්න කතාකරන්නම් අපි.. අයියා නිදාගන්න.."

රධ්‍ය අයියා මාවත් ඇදගෙන ආධ්‍ය අයියගෙ කාමරෙන් එළියට ආවා.. ආශි කේක් එකත් උස්සගෙන හිමීට ඒකිගෙ කාමරේට යනවා මම දැක්කා.. ආ

@Shan

අයිසින් කරන්න ඕන කිව්වනෙ.. තාම අටහමාරයි.. දුර කඩෙන් ෆෝන් එක හදාගන්න ගිය මහීශා තාම ඇවිල්ලත් නෑ..

" ආධ්‍ය අයියා කොහෙන් හරි වැටුණාද ඒයි.."

" ඇයි..??"

" මොකද අයියගෙ ඇඟේ තැනින් තැන නිල් වෙලා තියෙන්නෙ.. ඒක සිම්ටම් එකක්ද.. නෑනෙ.."

" අනේ මන්දා.."

හෙට උදේට නැඟිටලා ඉතුරු එක කියවන්නෝ.. ඉල්ලපූ.....ම නිසානෙ මෙක දුන්නෙ ඉතින්.. ආදරේ නිසානෙ මේ හැමදෙයක්ම.. අනූ කියන නැට්ටිච්චි/නැට්ටිච්චා කවුද..

ආධ්‍ය පැන් බේස් එක : කවුරු උනත් කමක් නෑ තලනවා ඇ#ට 2ක..

ජයවේවා..!!

එන්නාම්.. ලව් යූ.. ❤

( කතාව මතක නෑ වගේනම් 21 වැප්ප කියෝලා බලමන.. වරද්ගෙ ඇක්ටින් වල සුට්ටක් තියේ..)

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම**

@Shan

කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 75 කොටස

" නැගිටපන් ෂනෙරුවා.."

" උඹට පේන්නැද්ද නැගිටින්න විදියක් නෑ කියලා.."

" මොනෞත්තක්ද ඕයි.. කොහොම හරි නැකිටලා වරෙං රෑ දොළහට කිට්ටුයි.."

මම රධ්‍ය අයියා බූවල්ලෙක් වගේ මගේ ඇඟපුරාම ඔතාගෙන ඉන්න අඩු එකින් එක ගලවගන්න හැදුවා විතරයි මාව කලින් පාරටත් වඩා තද කල්ලා බදාගෙන රධ්‍ය අයියා මගේ පැත්ත හැරුණා.. සෙනුකයා එහෙමම බිමට පහත් වුනා..

මහීශා අයුක අයියා එක්ක දුර කඩෙන් ෆෝන් එක හදාගෙන එද්දි නමයට විතර වුණා.. අයුක අයියට එපාවෙලා තිබ්බෙ කියලා මූණ දැක්කහම තේරුණා.. මහීශා ඇල්ල ටවුන් එකේම අයුක අයියව හෙන වටයක් අරගෙන ගිහින් තිබ්බා.. පව් මොකක් වුණත්..

ඒ අස්සෙ ආගි කේක් එකක් පාට දෙකකින් අයිසින් කලා ඒකිගෙ කාමරේට වෙලා පැයගානක් ස්ප්‍රින්කල්ස් අලව අලව හිටියා.. ඒකනිසා මහීශා ඒකිගෙ කෑම එකත් අරගෙන උන් දෙන්නගෙ කාමරේට ගිහින් දොර වහගත්තා.. ඊටපස්සෙ හැමෝම කෑම කාලා ඉක්මනට නිදාගන්න ආවා.. අයුක අයියනම් මහන්සී කියලා කලින්ම නිදාගත්තා.. දවල් හයික් එකකට ගිහින් හැන්දෑවෙ ඉදන් රෑ වෙනකල් ෆෝන් හදන්න ඇවිදලා ඒකා හිටියෙ මහන්සියෙන්..

" උඹ නැගිටලා වරෙන් හිමින්.. ඕකා නැගිටින්නෑ.."

මම රධ්‍ය අයියගෙ අත් දෙක අස්සෙන් පහලට රූටලා කොහොම හරි ඇඳෙන් බැහැලා කාමරේ දොර ඇරියා.. කියාන් අයියා මල හොල්මන වගේ මූණට ඉටිපන්දමක් අල්ලගෙන ඉදලා සෙනුකයා ඌට බයවෙලා ආයෙම දඩාස් ගාලා දොර වැහුවා..

" ඌට නේද බං ඊරියකා කියන්නෙ.. අඩෝ අපේ දොර ඉස්සරහා.."

" ඊරියකා නෙමේ බල්ලො රීරියකා.. ඒ හිටියෙ කියාන් අයියා.."

@Shan

" සිරාවටට.."

" උඹත් මහ පිස්සු පකෙක් තමා.."

මම සෙනුකයව එහාට තල්ලු කල්ලා දොර ඇරියහම ආශි කොටට කොටේ තඩි බෝ එකක් කොණ්ඩෙ ගහන් රෝස පාට පිජාමා එකකුත් ඇඳගෙන නිල්පාටයි කහපාටයි කලර්ස් දෙකෙන් ඩෙකරේට් කරපු කේක් එකක් උස්සන් ඒකෙ වටේ හාට් වගේ කපපු ස්ටෝබෙරි පෙති තියලා කැන්ඩල්ස් ගහගෙන ඔක්කොම තල්ලු කරගෙන දොර ගාවට ආවා..

" උඹනම් බේසික කෙල්ලෙක් ආශි.."

" මොකද මොකද.."

" උඹෙ කොණ්ඩෙට එක එක ඒවා කිව්ව පලිය ගන්නද කේක් එක ඉස්කෝලෙ පාටින් ඩෙකරේට් කලේ.."

" ඔව් ඇයි.. ඔයාලට කොහොමත් ඉස්කෝලෙ හෙන ලොකුයිනෙ.."

" ලොකුයි තමා දොඩම් බිබික්කම.. යකෝ කොළඹ හතෙන් බාගයක්ම තියෙන්නෙ අපේ ඉස්කෝලෙ තමා.."

" අනේ මේ කේක් එක ගහනවා හරිද මූණෙ.. අපි දන්නෙ නැද්ද ඔය ඉස්කෝලෙ හැටි.."

" ඇයි ඔක්කොම දන්නවද.."

" මේ ළමයව කේන්තිගස්සන්නෙ නැතුව ඉන්නකො.. ඒ....හ් බොලාගෙ රණ්ඩු බේරලා මගේ නැගපු සීනිත් බැස්සා.."

ආධ්‍ය අයියා කාමරේ දොර ඇරගෙන ඇතුළට ගියාම කියාන් අයියා රධ්‍ය අයියා ගාවට ගිහින් ඒකව අත් දෙකට උස්සගෙන ඇවිත් නිදාගෙන ඉඳපු අයුක අයියගෙ ඇඟ උඩට දැම්මා.. දෙන්නම උඩ ගිහින් එකපාර අවදිවෙලා ඇස් දෙක ලොකු කරගෙන දෙන්නට දෙන්නා දිහා බලාගෙන ඉන්නවා.. සීත මාරුතේ වෙලී මා ගතේ~

" හැපි හෙළුවෙන් ඉන්න ඩේ මගේ සුදුඅම්මියා.. මගේ සුදුදෝණියා.. ආදරෙයි අහස පොළොව වැලි ගල් ගස් මුද තරම්.. දිස් ඉස් යෝර්

@Shan

සුදුනාත්තියා කියාන්.. උම්මවාහ්.."

කියාන් අයියා රධ්‍ය අයියවයි අයුක අයියවයි එකට අල්ලලා තියලා බදාගෙන දෙන්නගෙම කම්මුල් වලට කිස් එකගානෙ දුන්නා.. ඒ දෙන්නට තාම වෙන දේ හරියට ප්‍රොසෙස් කරගන්න බෑ වගේ.. රධ්‍ය අයියා මගේ දිහා බයවෙලා වගේ බලාගෙන ඉදියා..

" මි-මොන.."

ඒ එක්කම මහීශා අර බේබි පවුඩර් එකක් අරගෙන දෙන්නගෙම ඔලු දෙකට උඩින් අල්ලලා ඒක හැලුවා.. සෙනුකයා පාට ආට කොලකෑලි තියෙන බොක්ස් එකක් හැලුවා.. ආශී ඒකි කඩාගත්තු මල්පෙති වගේකින් පොඩ්ඩ පොඩ්ඩ දෙන්නගෙම ඔලුවලට දැම්මා.. මෙකි හිතුවද මෙක හනිමූන් එකක් කියලා.. මම ඒ එක්කම ඇඳ යට තිබ්බ ස්නෝ ස්ප්‍රේ එකක් අරගෙන ඒ දෙන්නමයි මගේ වටේ ඉන්න උන්වයි සේරම නැවිලා යන්න ඇල්ලුවා..

" ෂනෙරුවා.. උබනම් මහ බල්ලෙක්.. යකෝ අපිට ඇල්ලුවෙ.."

" ඒකනමා මගේ එකම සතුට පොක්ක.."

" උබලා මොනවද බං මෙ කරන්නෙ.. යකෝ පවුඩර්.. හයියෝ ඇඳ.."

" කියාන් අහකට පලයන් මගේ කොන්ද රිදෙනවා.."

රධ්‍ය අයියයි හිමින් හිමින් සෙන්ස් එකට එන ගමන් හිටියේ.. කියාන් අයියා ඇදෙන් බැහැලා ඇවිත් ආශී අතේ තියාගෙන ඉදපු කේක් එකේ කැන්ඩල්ස් පත්තු කලා..

" හැපී බර්ත්ඩේ අයියලා..

**We all wish you both a very happy birthday 'nd wish you success in everything you do.. be happy with your boyfriends forever.. We love you soooooooooo much..😘**

"

ආශී කටපාඩම් කරගෙන වගේ ඇස් දෙක නටව නටව කියපු විශ් එක අහලා ඉවරවෙලා ඒ දෙන්න නැගිටලා මූනූ ගසාගත්තා.. ඊටපස්සෙ

@Shan

දෙන්නම ලාවට හිනාවෙගෙන අත් බැඳගෙන විශ් එකක්කල්ලා ආශිගෙ අතේ තිබ්බ කේක් එකේ කැන්ඩ්ල්ස් නිවලා කේක් කටර් එකකින් ඒකෙ පීස් දෙකක් කැපුවා..

" හැපිබර්ත්ඩේ පොඩී.. මගේ කොල්ලා දැන් ලොකුයිනෙ.."

රධ්‍ය අයියා ආධ්‍ය අයියට කේක් කෑල්ලක් කැව්වහම ආධ්‍ය අයියා රධ්‍ය අයියගෙ කම්මුල් දෙකම ඉස්සිලා කිස් කල්ලා ඔලුව අතගෑවා.. ඊටපස්සෙ එයා මටත් පීස් එකෙන් කෑල්ලක් කැව්වහම මමත් හග් එකක් දුන්නා..

" හැපී බර්ත්ඩේ.. ආදරෙයි.."

රධ්‍ය අයියා හිනාවෙලා මගේ දිහා ආදරේම ආදරේ හිතෙන විදියට බලලා අනිත් අයටත් කේක් කැව්වා.. අයුක අයියටත් ආධ්‍ය අයියා කිස් දෙකක් දුන්නා.. ඊටපස්සෙ සේරටම කේක් කවලා හැමෝම ඇදෙන් වාඩිවෙලා ඉතුරු කේක් කෑවා නෙමෙයි නෑවා.. අර කියාන් අයියට තියන විසේට කේක් එක අරගෙන සුදුඅම්මියගෙ මූණෙ ගාන්න ඕන කියලා පාට දෙකෙන්ම රධ්‍ය අයියගෙ මූණෙ ඉරි ඇඳලා ඊටපස්සෙ ඒක දුරදිග ගිහිල්ලා සේරම කේක් නාගත්තා.. ඊටපස්සෙ ඉතුරුවා තමා කෑවෙ..

" ඒ කේක් එක රසයි.. කවුද හැදුවෙ.."

රධ්‍ය අයියා කියද්දි ආශි කොණ්ඩ කෑල්ලකුත් කරක කරක මං දිහා ඇහිබැමක් උස්සලා බැලුවා..

" ආශි හැදුවෙ.."

" ඔව්.. මම මගේ හදවතින්ම කෑමක් හදද්දි එන ආදරේ ඒකට දාලා ඒක බේක් වෙනකල් ලගින්ම ඉදලා හැම ස්ප්‍රින්කල් එකක් ගානෙම ඔයාලගෙ ඉස්කෝලෙට බැන්නා.. එතකොට අවුට්පුට් එක ලස්සනටම ආවා.."

" යෝ ගයිස්.. දැට්ස් මා ගර්ල්පෙන්.."

" අඩෝ මේ ඉතුරුටික හෙට සෙලිබ්‍රේට් කරමුත.. නිදිමතයි යකෝ.. හයික් ගිහින් හන්දිපත් රුදාව වගේ.. දැන් ඉතින් ඔයාලා එන්ජෝයි කරන්නකො.. අපි කැපුනා.."

@Shan

කියාන් අයියා, ආශියි මහිශායි ආධ්‍ය අයියයි අපිට ගුඩ් නයිට් කියලා පහළට යනකල් ඉඳලා හිමින්සැරේ මං ගාවට කිට්ටු වුණා..

" අපි මූවීස් වල දැකලා තියෙන විදියට කපල් ඔවා සෙලිබ්‍රේට් කරන්නෙ හෙන රොමැන්ටික් විදියට.. මොකද කියන්නෙ.. රධ්‍ය පුතාට ස්ටැමිනා එකක් ගෙනැත් දෙන්නද.. ස්ටැමිනා, ඩියුරෙක්ස්, ට්‍රෝජන්, මැන්ෆෝර්ස්.. එනි ෆ්ලේවර්ස් ලයික් ස්ට්‍රෝබෙ-"

" කියාන්!!!!!!!! පිස්සු හු## පලයන් මගෙන් කන්නැතුව..!!"

රධ්‍ය අයියා ආශි අපේ කාමරේ දාලා ගියපු බූල් සපත්තුවක් උස්සලා කියාන් අයියගෙ පිට මැද්දටම විසික් කල්ලා ගහද්දි කියාන් අයියා කාමරෙන් ගිහිල්ලත් ඉවරයි..

" මෙ ටික අස් කල්ලා නිදාගනිල්ලා ඈ.. ගුඩ්නයිට්.."

සයෝන් අයියත් මහා හයියෙන් හිනාවෙවී කාමරේ දොර වහගෙන යන්න ගියා.. රධ්‍ය අයියා ඇඳෙන් නැගිටලා පේපර් සර්වියට් එකකින් ඇඟේ තිබ්බ අයිසින් පිහිදදා අල්මාරිය ඇරියා..

" මෙ මම යනවා නාගන්න.. ඇඟම ඇලෙනවා යකෝ.."

රධ්‍ය අයියා ටවල් එකත් කරේ දාගෙන ශෝට් එකක් අතට ගත්තා..

" උබ ඉතින් හිනාවෙයන්.. ශේප් එකේ ඇඟ බේරගෙන.."

රධ්‍ය අයියා ඇඳගෙන ඉද්පු ශර්ට් එක ගලවලා මගේ උකුළට දමලා ගැහුවා.. මෙකගෙ ඇඟ යකෝ..!!

" හොට් වෝටර් දාගෙන නාගන්නවා.."

මම රධ්‍ය අයියා දිහා වැඩිය බලන්නැතුව කොස්සක් අරගෙන කාමරේ අතුගාලා බැල්කනි එකට දාලා ඒකෙන් ඩස්ට්බින් එකට ඇම්මා.. සෙනුකයා ඇඳේ රෙදි මාරුකරනවා කියාන් අයියට බැන බැන.. මම කොස්සත් තියාගෙන බැල්කනි එකට වෙලා ආද්‍ය අයියගෙ කාමරේ දිහා බලාගෙන ඉද්දි ආධ්‍ය අයියා කෝල් එකක ඉන්නගමන් ඇවිත් කර්ටින් එක වහලා කාමරේ ලයිට්ස් ඔෆ් කලා.. ආධ්‍ය අයියව දැක්කහම මට එක එක ඒවා

@Shan

හිතෙනවා.. අනේ මන්දා.. කියාගන්න තේරෙන්නෙ නෑ.. හිතෙන්නෙම එයා මාව සැහෙන්න දන්න කෙනෙක් කියලමයි..

" ෂනෙරුවා.. මේක අල්ලපන්කො බං.."

සෙනුක ඇඳ රෙද්ද මාරු කරන නිසා මම බැල්කනි එක එහෙමම ඇරලා තියලා ඇවිත් ඇඳ රෙද්ද හදන්න උදවු කලා.. අයුක අයියත් වොශ්රූම් එකට ගිහින්.. උන් දෙන්නා කතාකරන සද්දෙ අපිට ඇහෙනවා..

" මේ බං.. මම උඹට කියන්න හිටියේ.. අපි අර පහළ ගෙදර ඉන්න උන් හම්බෙන්න ගියානෙ ඩිනර් ලේට් වෙනවා කියන්න.. අපෙන් ඇහුවනෙ කවුද මල්ලිලා රෑ එළියට ගියේ කියලා.."

" රෑ එළියට?? පිස්සුද බං.."

" පිස්සු නෙමෙ සිරා.. අර කෙල්ලො දෙන්නෙක් පහළ ඉන්නවා.. කවුද ආවෙ කියලා හොයන්න එපැයි.."

" කීයට..??"

" පාන්දර පහට විතර කිව්වෙ.."

" ඒ වෙලේනම් කොහොමත් වෙන්න බෑනෙ බං.. ඔන්න තුනට වගේ නම් මට ඇහැරුණා.."

" මන්දා බං.. කමක් නෑ හෙට විතරනෙ.. අපි යනවනෙ.."

" ම්ම්.. ආධ්‍ය අයියා බෙහෙත් මොනවහරි ගන්න ගියාද දන්නෙ නෑ.. එයා අසනීපෙන් හිටියෙ.."

" ආ ඔව් මම දැක්කා හන්දිය හරියෙ ෆාමසියක් තියනවා.. ඒත් බං උදේ පහට.."

" බලමු බලමු.. මොකක්ද කියලා.."

සෙනුකයා ඇඳෙන් ඉදගෙන ශර්ට් එකක් මාරුකරගත්තා.. ඒ එක්කම අයුක රඩිය අයියයි අයුක අයියයි වොශ්රූම් එකේ ඉඳලා එළියට ආවා..

@Shan

" වත්සල්.. එළියට එන්නකො.."

අයුක අයියා ටවල් එක රැක් එකට දාලා සෙනුකයට කතාකලාම සෙනුකයා ශේප් එකේ බැල්කනි එකේ කර්ටන් එකත් ඇදගෙන බැල්කනි එකට ගියා.. රධ්‍ය අයියා බාත්‍රොබ් එකක් ඇදගෙන ලයිට්ස් ඔෆ් කරගෙන ඇඳට ආවා.. මම කොනට වෙලා බ්ලැන්කට් එක ඔලුවෙ ඉඳන් දාගෙන වහගත්තා.. රධ්‍ය අයියා ගාව ග්‍රීන් ඇපල් ශවර්ජෙල් සුවඳයි..

" මෙ මගුලෙ පටිය ලිහෙන්නෙ නැනෙ.."

" ඒහ් මොකද කරන්නෙ.. ඔක ගලවන්නෙ ඇයි.."

" ගලවන්නෙ.. නිදාගන්න.. වෙන මොකකටද.."

රධ්‍ය අයියා බාත්‍රොබ් එක ගලවලා බිමට විසික් කල්ලා මගේ ගාවට ඇවිත් මාව බූවලු අඬුවලින් බදාගත්තා.. සැක් මෙකා අන්ඩවෙයාර් එක පිටින් නේද ඉන්නෙ..

" ඇඳුමක් දාගෙන එන්නකො අනේ.."

" ඇඳුම් තියෙන්නෙපැයි දාගන්න.. මම ගෙනාපු ඇඳුම් ඉවරයි.. හෙට අඳින එක විතරයි ඉතුරු.."

" අනේ අයියෙ.."

මම රධ්‍ය අයියා ගාවින් දහලලා දහලලා එහාට වුණා.. රධ්‍ය අයියා ආයෙම මං ගාවට ඇවිත් අඩු ටික ඔතාගත්තා කලින්ට වඩා තදට.. එහෙම කල්ලා මගේ කකුල් දෙක මැද්දට ඇවිත් මගේ පපුවට නිකට තියාගෙන මං දිහා බලාගෙන හිටියා..

" මොකද.."

" මො-මොකුත් නෑ.. ආර්හ්.. ඇඟ උඩ දහලන්න එපා අයියෙ.."

" කවුද දැහලුවෙ ඉතින්.."

රධ්‍ය අයියා බ්ලැන්කට් එක අරගෙන දෙන්නවම වැහෙන්න දාලා තව උඩට ඉස්සිලා මගේ උරහිස ගාවින් මූණ තියාගෙන මගේ කම්මුලකින් අත

@Shan

තියාගත්තා.. එයා නාලා ආපු නිසා කොන්ඩෙත් තෙතයි.. ඇඟත් සීතලයි..

" මට පොඩ්ඩක්වත් මතක් වුනේ නැනෙ අද මගේ බර්ත්ඩේ එක තියනවා කියලා.. පොඩ්ඩම පොඩ්ඩක්වත් මතක් වුනේ නෑ.."

" කමක් නෑ අපි මතක් කලානෙ.. හැපීකවවගෙ හැපීබර්ත්ඩේ එකනෙ.."

මම රධ්‍ය අයියගෙ කොණ්ඩෙ අතකින් ගසලා කම්මුලක් මිරිකලා අල්ලගත්තා..

" මෙහෙම ඔයා එක්ක මගේ එකබර්ත්ඩේ එකකටවත් ඉන්න ලැබෙයි කියලා I never thought in my life.. අඩුම තරමෙ මම මෙහෙම හීනයක්වත් දැකලා තිබ්බෙ නෑ වරද්.. ඒකත් මගේ coming of age එකටම.."

" ඒකතමා කියන්නෙ.. හිතන්නෙ නැති දේවල් වෙනවා කියලා.."

" ...ආදරේ හිතෙනවා වරද්.. ඔයා මං ගාව ඉන්න වෙලාවට මට දැනෙනවා මාව සනීප වෙනවා වගේ.. අවුරුදු ගානක් තුවාලවෙලා දුක්විඳපු මනුස්සයෙක් ටික ටික සනීපවෙනවා වගේ.. ඒක මගේ ඇඟ ඇතුලෙන්ම මට දැනෙනවා.. ඕ ශිට්.. කොහොමද මම ඒක ඔයාට එක්ස්ප්ලේන් කරන්නෙ.. සිරාවටම එහෙම දැනෙනවා.."

රධ්‍ය අයියා මගේ අතක එයාගෙ ඇඟිලි පටලලා අතේ තිබ්බ මුද්දට හාදුවක් දුන්නා..

" මම ඔයාට ආදරෙයිනෙ.. එහෙම හිතෙන්න එපැයි.."

" මිම්.."

රධ්‍ය අයියා මගේ ඇඟ උඩින් එහාට වෙලා මාව එයාගෙ අතක් උඩින් තියාගෙන තුරුල් කරගෙන නලලට හාද්දක් දුන්නා..

" The knight who owns His Majesty's heart.."

" ඔයා දැන් නයිට් කෙනෙක්ද.."

" ඔව්.. පිරිමි ළමයෙක් අවුරුදු විසි එකකට එනවා කියන්නෙ නයිට් පදවියට සුදුසුකම් ලබනවා කියන එකලු.. ඒකයි විසි එකේදි කොල්ලොන්ට කී වෙන්

@Shan

හදවන්නෙ.. තව කියනවා එහෙම කියන්නෙ ගෙදර ගෘහමූලිකයෙක්, කී හෝල්ඩර් කෙනෙක් වෙන්න සුදුසුකම් ලබන එකලු..

" වෝහ්~ මම කී වෙන් දෙන ට්‍රැඩිශන් එක ගැන අහලා තිබ්බා වුණාට තේරුම දැනගෙන හිටියේ නෑ.."

" ඒකතමා කියන්නෙ The value of having a lover who knows every~thing.."

රධ්‍ය අයියා මගේ තොල් වලින් පෙක් එකක් තිබ්බා..

" එතකොට නයිට් කාගෙ හදවතද අයිති කරගෙන ඉන්නවා කියන්නෙ.."

" මුලින්ම His Majesty තමයි නයිට්ගෙ හදවත හොරකම් කලේ..  ඉතින් ඒක නිසා නයිටුත් His Majesty ගෙ හදවත අයිති කරගෙන ළග තියාගත්තා.."

" ඔයා ර්සී පීසී ලෙමන් ස්ක්වීසී වගේ හරිම චීසී හලෝ.."

" ඒක ලස්සන ෆෙයරි ටේල් එකක් හරිද.. මම කවදහරි මගේ ළමයට කියලා දෙනවා.. කොහොමද His Majesty නයිට්ගෙ හදවත හොරකම් කලේ කියලා.."

" එහෙමද.. හොදයි හොදයි.."

මම රධ්‍ය අයියා ගාවට තුරුල් වෙලා එයාගෙ කකුල් දෙක අස්සෙන් කකුලක් දාගත්තා..

" මේ.."

" ම්ම..?"

" මට ඔයා නැතුව හුගක් පාලු හිතෙයිද.."

රධ්‍ය අයියා මම කියපු එකට මොකුත් නොකියා මගේ ඔලුව පිටිපස්සෙන් අල්ලලා පපුවට හේත්තු කරගත්තා..

" මම ඉක්මනට එනවා වරද්.."

@Shan

" ඉක්මනට එන්න.. ආවොත් ආයෙ යන්නෙපා.. මට දුක හිතෙනවා.. මම ආස දේවල් මගේ ලග තියෙන්නෙ නෑ ඒවා අතෑරිලා යනවා.."

" එහෙම කියන්න එපා වරද්.. එහෙම වෙන්නෙ නෑ.."

" මට පාළු හිතෙනවනෙ.. මම-මම මොකද ක-හ්හ්-කරන්නෙ.. මට-ත් ඔයාට වගේ ත-නියම ඉන්න හැටි-අ-අමතක..වෙලා-වගේනෙ.."

" වරද්!!??"

" ම්ම්..??"

මම ඇස් වලට උනපු උනුම උනු කඳුලු ශර්ට් එකේ කරෙන් පිහිදගත්තා.. මගේ පපුවට ඊයම් බරුවක් බස්සලා වගේ කැක්කුම් කරනවා.. උගුර හිරවෙනවා වගේ..

" පපුවට තියලා ඉකිගහන්නෙපා වරද්.. මගේ පපුව කකියනවා.. දැන් නාඩා ඉන්න.. තව කල් තියෙනවනෙ.. ම්ම්.."

" ඔයා ඉක්මනට එන්න.. මම අඩන්නෙ නෑ.."

රධ්‍ය අයියා මගේ තොල් වලට පහත් වෙලා පෙක් එකක් තියලා තොල් අහකට නොගෙනම එහෙමම ඉදියා.. එයාගෙ හුස්ම කැඩි කැඩී මගේ මූණෙ වදින්නෙ..මට කලුවර නිසා මොකුත් පෙනුනෙ නෑ.. මම රධ්‍ය අයියගෙ බෙල්ල වටේ අත් දෙක ඔතාගෙන එයාව මං ගාවට පහත් කරගත්තා..

" ඔයාට බර්ත්ඩේ ප්‍රසන්ට් එපාද.. මගෙන් අහන්නැද්ද.."

" ප්‍රසන්ට් එක තියෙන්නෙ කොහොමත් මං ගාව තමා.. අහන්නෙ මොකටද.."

" නෑ අනේ.. මම මේ ඇත්තට අහන්නෙ.. එපාද.."

" දැන් මොනවද ඉතින් තියෙන්නෙ.."

" ඔයා ගෙදර ගියාම.. ඔයාගෙ අල්මාරියෙ යටම තට්ටුවේ තියන ලාච්චුව ඇරලා බලන්න.. මම ඒක මෙහෙ ගෙනාවෙ නෑ.."

@Shan

" මොකක්.. ඇත්තටමද ඔය කියන්නෙ.."

" ඔව්.."

" කොයිවෙලාවෙද ඔහොම එකක් තිව්වෙ.."

" ඒක වැඩක් නැනේ.. ඔයා ගියාම බලන්නකො.."

මම ඉස්සිලා රධ්‍ය අයියගෙ තොල් වලින් පෙක් එකක් තියලා එයාගෙ යටිතොල මගේ තොල් වලට මැදි කරගෙන එකම තාලෙකට උරවන්න ගත්තා.. එයාගෙ හුස්මගන්න වේගෙ වෙනස්වෙනවා මට දැනුනා.. එයා මගේ පිට මැද්දෙන් අත් යවලා මාව උස්සලා එයාගෙ උකුලෙන් තියාගත්තා.. ඒ අත් මගේ ශර්ට් එක අස්සෙන් පිට පුරාම දුවනවා.. මම මගේ ශර්ට් එක ගලවලා විසික් කල්ලා දැම්මා..

රධ්‍ය අයියා මගේ කම්මුලක තියන අත් හිමින් පහලට අරගෙන බෙල්ල හරියට එද්දි මට එයාගෙ තොල් වල ලේ රහ දැනුනා..

" ව්-වරද්..!!"

රධ්‍ය අයියා මගේ කොන්ඩෙ අස්සෙන් අත් යවලා මාව තව එයාගෙ මූණට ලං කරගත්තා.. එයාගෙ එක අතක් මගේ පපුව දිගේ පහලට යනවා.. මම එයාගෙ උරහිස් තද කල්ලා මිරිකලා අල්ලගත්තා..

" ආහ්ව්~"

රධ්‍ය අයියා මගේ බට්වීක් එකක් හයියෙන්ම අල්ලද්දි මම එයාගෙ තොල් වලින් එහාට වෙලා ඉනෙන් ඉස්සුනා.. එයාගෙ අනිත් අතත් මාව හයියෙන් අල්ලනවා..

" ඔයා ඒකට කැමතියි වරද්.."

රධ්‍ය අයිඅය මගේ පපුවෙන් තොල් තියාගෙන කතාකරද්දි මම එයාගෙ කොණ්ඩෙන් අල්ලලා මගෙ පපුවට තදකරගත්තා.. මගේ ඇඟ ඇතුලෙන් රස්නයක් දැනෙනවා..

" ඇ-ඇති.. නවත්තන්න.. අහ්-අයියෙ.. සෙනුකලා.."

@Shan

මට ලාවට බැල්කනියේ කර්ටන් අස්සෙන් සෙනුකවයි අයුක අයියවයි පෙනෙද්දි මම රධ්‍ය අයියගෙ අත් දෙකෙන් අල්ලලා එයාව නතරකල්ලා එහාට වුණා..

" බබා come to your senses.. එන්න නිදාගමු.."

රධ්‍ය අයියා මාව කිටි කිටියේ තුරුල් කරගෙන මගේ නලලට හාද්දක් දුන්නා.. එයා එහෙම කිව්වට නිදාගන්න බෑ.. මට එයාව දැනෙනවා.. එයාටත් මාව දැනෙනවා.. මම ඇස් දෙක පියාගෙන ඒක අමතක කරන්න ට්‍රයි කලා.. රධ්‍ය අයියා එක අතකින් මගේ කොණ්ඩෙ අතගානවා.. ඒ සනීපෙට මම ඇස් දෙක පියාගත්තා.. ලාවට වගේ නින්ද යාගෙන එද්දි රධ්‍ය අයියා ටිකකින් හිමිහිට ගොරවන සද්දේ මට ඇහුණා.. බැල්කනි එකේ දොර වැහෙන සද්දෙ එනකල්ම අවදියෙන් ඉදපු මට ඊටපස්සෙ මොකුත්ම ඇහුණෙවත් පෙනුනෙවත් නෑ..

**"නරක සමනලයා~"**

මට නිදිමතා......................යි

එන්නාම්... ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 76 කොටස

" කොහෙ යන්නද.. මාත් එක්ක නටන්න ලෑස්තිවෙන්නෙපා.. කොහෙවත් යන්නෙ නෑ..!!!"

" අනේ~ මගේ ඇඳුම් ඔක්කොම එහේනේ.. මට යන්න දෙන්නකො.."

"....."

" යනවද.. හා ද.. යන්නම්ද.."

"....."

" එහෙනම් මම යනවා ඈ.."

" දැන් මම මොකක්ද කිව්වෙ.."

" ඔයා එක්ක නටන්නෙපා කියලනෙ.. ඇයි මොකද කෑගහන්නෙ.."

" දැන් දවස් ගානකින් ගෙදර කවුරුත් හිටියෙත් නෑ.. මේ රෑ යන්න ලෑස්තිවුනොත් වරදී.. අම්මපා මම අඩු කඩනවා.."

" මගේද.."

"....."

" මගේද.. කියනවකො.. මගේද කඩන්නෙ.. ආව්.. මොන මගුලක්ද ටොකු අනින්නෙ.. මා වවුලා.."

" ගිහින් ඇඟ සෝදගෙන එන්න.."

" මට බෑ.."

" එකපාරයි අහන්නෙ.. සෝදනවද නැද්ද.."

" නෑ.. ආ~ආධ්‍ය අයියේ.. මාව බිමින් තියනවා..!!!!!!!!!!! අම්මා~තවුසෙට පිස්සුද.. එපා එපා!! හැබැයි රධ්‍ය අයියෙ-"

@Shan

*ජබො:::::::*

" තවුසෙ මෝඩ තඩි උගරු කැස්බෑවා.. ඔහොම ඉඳපන්.. මම අද තව්සෙගෙ ඇටකටු ගලවලා රෙක්සිට කන්න දානවා.. අරිනවා දොර.. ආර්ඡ්!!!! ආධ්‍ය අයියේ රධ්‍ය අයියා මට කරදර කරනවා.. එන්නකෝ.. අයියේ.. තවුසෙගෙ කකුල් දෙකේම ඇඟිලි උලුවස්සෙ විතරක් නෙමෙ හැම පුටු කකුලකම හැම මේසෙකම හැම බිත්-"

" බබා මේ ටවල් එක.."

රධ්‍ය අයියා වොශෲම් එකේ දොර ඇරල මගේ අතින් ටවල් එක තියලා කටත් උල් කල්ලා කිස් එකකුත් දීලා දොර වහගෙන යන්න ගියා..

" -හැම බිත්තියකම වැදියන් ඒස්වාහ පුඃ ..හොට කැත ගැටපොළොස් කොටටෝරුවා.. හිතක් පපුවක් නැති කිරි ඉබ්බා.."

රධ්‍ය අයියා කාමරේ ටීවී එක හයියෙන් දාගන්නවා මට ඇහුණා..

" වර~ද්.. ඔයාට ඇහසෝදන්න මම තාර පැටියෙක් ගෙනැත්දෙන්නද.."

රධ්‍ය අයියා දොරට අමුතු තාලෙකට තට්ටුවකුත් දාලා එහාපැත්තෙ ඉඳන් කෑගැහුවා..

" මගෙන් මුකුත් අහගන්නැතුව යනවා යන්න..!!"

මම උගට තවත් පැහැදිලි කල්ලා වැඩක් නැති නිසා ඇඳුම් ටික ගලවලා කිළුටු ඇඳුම් දාන බාස්කට් එකට විසික් කලා.. අපි හවස තුනට විතර තමයි රිසෝට් එකෙන් එන්න ආවේ.. ආධ්‍ය අයියට හෙට වැඩට යන්න තියෙන නිසායි හුගක් රෑ වෙලා ඇවිල්ලා ඩ්‍රයිව් කරන්නත් අමාරු නිසායි තුනට ආවෙ.. මෙහෙට එද්දි අට වුණා.. ආශිලා මහීශාලා කියාන් අයියලා සෙනුකයා ඔක්කොම එයාලගෙ ගෙවල් වල ගියා.. සයෝන් අයියත් දැන් ටිකකට කලින් තමයි ගෙදර ගියේ..

මේ දවස් ටිකේම එයාලා එක්කම ඉඳලා, යද්දි නිකම් වැස්සක් වැහැලා පැව්වා වගේ දැනෙනවා.. හරිම පාලුයි..

@Shan

අපේ අම්මා ගෙදර නැති වුණත් මට ගෙදර යන්නම ඕන වුණා.. දැන් දවස් කීයක්ද. මම ගෙදරත් නෑ.. අනික මගේ ඇඳුම් ඔක්කොම කිළුටු වෙලා.. ට්‍රිප් ගියා වගේ නෙමෙ ඇවිල්ලා ඒවා සෝදලා වේලලා කීයක් වැඩ තියද.. මම රධ්‍ය අයියගෙන් ඇහුවහම රෑ මම යන්නද කියලා මට ටොක්කක් ඇනලා ගෙදර රෙදි හෝදන ලොකු බේසමට මාව අතෑරලා යන්න ගියා.. මහ පොල් කාවයියෙක් තමා..

ඒ අස්සෙ මට ඇහෙනවා දොර එහාපැත්තෙ ඉඳන් හයියෙන් සිංදු කියනවා..

" තාරපැටියා ඇඟ සෝදලා ඉවරද.. එන්නකො කන්න.."

" ඉන්නවා පොඩ්ඩක්.."

මම ඇඟට වතුර දාගෙන සබන් කෑල්ල අතට ගත්තා..

" සුරංග නාවී මගේ~

හදක් වගේ පායලා~"

අනේ මට මුගේ කටේ මේ සබන් කෑල්ල ඔබන්න ඇත්නම්..

" තවුසෙටත් සුරංග නාන එක තමා පේන්නෙ නේද.."

මම දොරෙන් එහාපැත්තෙ තියෙන්නෙ වෙනම ලෝකයක් කියලා හිතෙන් මවාගෙන ඉවසදරාගෙන ඇඟ සෝදලා ඇඳුමක් ඇඳගෙන එළියට එද්දි රධ්‍ය අයියා විසිල් එකකුත් ගහගෙන ඇඳ හදනවා.. මම මාව වතුර බේසමට අතෑරිය කේන්තියට කණ්ණාඩිය ගාවට ගිහින් කොලෝන් බෝතලේ ඔලුවට හලාගෙන දඩාස් ගාලා ඒක මේසෙ උඩින් තිබ්බා.. ඒ සද්දෙට රධ්‍ය අයියා හැරිලා මං දිහා බැලුවා..

" මොකද.."

" මොකුත් නෑ.."

මම ඇදෙන් වාඩිවෙලා ඔලුව පිහිදාගෙන පිහිදාගෙන පිහිදාගෙන ගියා..

" මේ වරද්.."

@Shan

"....."

" සිරාවටම අහන්නෙ තාර පැටියෙක් එපාද.. කහ පාට පීක් පීක් ගාන එකෙක්.."

"....."

" තාරපැටියට මල පැනලද.. හරි හරි ඔයා පිහිදාගෙන එන්නකො.."

රධ්‍ය අයියා මට කේන්තිගියපු එක සත එකකටවත් ගනන් ගන්නෙ නැතුව එයාගෙයි මගෙයි බැක්පැක් දෙක කවුච් එකට හැලුවා.. ඒකෙ අස්සෙ ගැම්පු බෝතල්, පනාවල්, ජෙල්, ඩියුඩ්‍රන්ඩ්, ප'ෆියුම්, බාගෙට කාපු චිවින්ගම්, මදුරුවොන්ට ගාන ක්‍රීම, වොලට්, බෙල්ට් අරවා මේවා ලොට් එකක් තිබ්බා.. මම ටවල් එක රැක් එකෙන් දාලා ගිහින් රධ්‍ය අයියට ඒක අස් කරන්න උදවු කලා..

" මේ වරද්.. ඔයාගෙ අන්ඩවෙයාර් එකක් නේද මේ.."

රධ්‍ය අයියා කොළපාට අන්ඩවෙයාර් එකක් මට පෙන්නලා ඇහුවා.. මම ඔය වගෙ ඒවා ප්‍රසිද්ධියේ පේන්න තියන්නෙ නෑ කියලා මම එකහෙලාම දන්නවා..

" මගේ නෙමෙ මනුස්සයෝ.. ඕකට මං වගේ දෙන්නෙක්ට බහින්න පුලුවන් පේන්නැද්ද.."

" මගේ එකක්ද.. සැක්.."

රධ්‍ය අයියා ඒක එහාට දාලා බෑග් එක අස්සට අතක් දාලා ඒක හොදට ගැසුවා.. ඒ එක්කම සර සර ගාලා බිමට හැලුනේ කළුපාට පොඩි පෙට්ටි වගයක්.. මම එකක් අතට අරගෙන බැලුවා..

යකෝ..!!!!!!!!

" මේ කාගෙද.."

" කොයි?? මොන??"

@Shan

" කොයි කියලා අහන්නෙ මේ කොන්ඩම් කාගෙද.. තවුසෙ ට්‍රිප් යද්දි ඒවත් ගෙනියනවද.."

රධ්‍ය අයියා පැනපු ගමන් මගේ කටේ දෙපැත්තෙන් අල්ලාත්තා..

" කෑගහන්නෙපා යකෝ.. අපේ අයියට ඇහේවි.. මොන කොන්ඩම් එකක්ද.. මම ඔහොම මගුල් ගෙනිච්චෙ නෑ.."

" නැත්තෙ කොහොමද.. මේ තියෙන්නෙ.. මම අරගෙන ගිහිල්ලද.."

" ඔයා ඇත්තට ගෙනිච්චද නැනෙ.."

" ගෙනිච්චා ප#ක්.. මට පිස්සු කියලා හිතුවද.."

" මම ජීවිතේට ඔහොම මගුලක් ෆාමසියකට ගිහිල්ලවත් ඉල්ලලා නෑ.. අයුකගෙද දන්නෙ නෑ.."

" ඉතින් අපේ බෑග් එකේ තියෙන්නෙ.."

" පාවිච්චි කරපු එකක් නෙමෙයිනෙ.. උඹට ගෙදර  ගෙනියන්න බැරි නිසා දැම්මද දන්නෑ.. නැත්තන් අපේ අයියගෙ වෙන්නත් බෑනෙ.."

" ඒ වුණාට මේකේ ආධ්‍ය අයියගෙ බඩු වගේකුත් තිබ්බා.. අනේ මන්දා ඕන එකක්.. මෙන්න මෙක ගන්නවා.."

මම ස්ටැමිනා බොක්ස් එක රධ්‍ය අයියගෙ අතට විසික් කල්ලා බඩු ටික පිලිවෙලට තියෙන තැන්වලින් තිබ්බා..

" චූටියෝ~ කන්න එන්නෝ~"

ඒ එක්කම ආධ්‍ය අයියා හෙන ගහන්න වගේ දොරත් ඇරගෙන කාමරේට ආවා.. රධ්‍ය අයියා ශේප් එකේ ස්ටැමිනා එක කලිසමේ පොකට් එකක් අස්සට ඔබාගත්තා..

" ආ දෙන්නම වොශ් දැම්මද.. එන්න කමු.. මම පොඩ්ඩක් ටවුන් එකට යනවා ළමයි.."

" ඒ මොකද.."

@Shan

" මගේ ස්ටෙත් එක ඩිස්පැන්සරියෙ දාලා ඇවිල්ලා.. ඒක ගන්න යන්න ඕන.. හෙට හොස්පිටල්නෙ.."

" මම දැක්කනෙ අයියගෙ ස්ටෙත් එක පහල තියෙනවා.."

" ඒකනෙමෙ පොඩී.. අනිත් ඩුවල් රිදම් එක.. ඒක යාලුවෙක් ඉල්ලගත්තා.. ගන්න යන්න ඕන.. අනේ මගේ පළවෙනි පඩියෙ අසූදාහ!!"

" ඒක එච්චර ගණන්ද අනේ.. "

" ඔව්නෙ.. එන්න එන්න කන්න.. බඩගිනී මටනම්.."

ආධ්‍ය අයියා දොර වහගෙන යන්න ගියා..

" දාලා ආවලු.. යාලුවෙක් ඉල්ලගත්තලු.. ඔයාට තේරුණාද මොකක්ද ඒ කිව්වෙ කියලා.."

රධ්‍ය අයියා අමුතු විදියට දොර දිහා බලාගෙන ඉඳලා මාත් එක්ක බෑග් අස් කල්ලා පහළට ගියා.. යද්දි ආධ්‍ය අයියා කෑම ප්ලේට්ස් වලට දාලා කුස්සිය අස්කරනවා..

" ලමයි ඔගොල්ලො හෙට කීයටද යන්නෙ  එතකොට.."

" රෑට යනවා කියලා ඉන්නෙ අයියෙ.. මෙ ජස් මාව උදේ ගෙදර ගිහින් දාන්න හරිද.."

" ඒ මොකටද.."

" මොකටද අහන්නෙ ඇයි මම ගෙදර යන්නැද්ද.."

" ඕන්නෑ.."

රධ්‍ය අයියා ෆ්‍රයිඩ් රයිස් හැන්දක් කටෙ ඔබාගෙන කකුලක් හොල්ල හොල්ල කනවා.. දෙන්න හිතයි.. මම දෙකක් රවලා ලූනු කොළයක් කටෙ ගහගත්තා..

" වලිද.."

@Shan

" මිමි.. වරද්ට පීක් පීක් ගාන තාරපැටියෙක් දුන්නෑ කියලා තරහවෙලා ඉන්නෙ.."

ආඩ්‍ය අයියා ඒකට මහා හයියෙන් හිනාවුණා.. මූ කියන බොරු යකෝ.. මම කොයිවෙලාවෙද එහෙම එකක් කිව්වෙ.. මම තාරපැටියෙක් ගැන අඩුම තරමෙ සඳහනක්වත් කලේ නෑ..

" චූටිට තාරපැටියෙක් ඕනවෙලාද.."

" බොරු අයියෙ.. මොකද තවුසෙ බොරු කියන්නෙ.."

" මම මොකටද බොරු කියන්නෙ.."

රඩ්‍ය අයියා තව හැන්දක් කටේ ඔබාගත්තා.. මම රඩ්‍ය අයියගෙ කට දෙපැත්තෙන් අල්ලලා ඒකටම විලිපේස්ට් එකෙන් මෙස හැන්දක් පුරෝලාම කටේ එබුවා.. ඒකා හිරවෙලා මැරෙන්න ගියා.. මෙස හැන්දක් නෙමෙ පොල්කටු හැන්දක් පුරෝලා මිරිස් කුඩුයි ගම්මිරිස් කුඩුයි කවන්න තියෙන්නෙ..

" කැහ්-කැහ්-කැහ්.. අයියෙ වතුර වතුර.."

රඩ්‍ය අයියා වතුර බොනකල් මම කෑම එක කලබලේට කාලා සාලෙට දුවගෙන යන්න නැගිට්ටා විතරයි මේකාත් මගේ පාර පස්සෙ පන්නන්න ගත්තා.. දිවියෙක්ද යකෝ මෙච්චර හයියෙන් අඹවන්නෙ.. මම පණ කඩාගෙන සෝෆා වලටයි බල්ලොන්ටයි උඩින් පැන පැන මගේ පණකෙන්ද බේරගන්න දිව්වා.. දුවලා ගෙදරින් එළියට පැනගත්තා..

" ආඩ්‍ය අයියේ.. අනේ එන්නකෝ~"

" උඹව අදනම් හමගහනවා වරද්.. ඉඳපන්.."

" අනේ ආඩ්‍ය අයියේ.. මූට යකෙක් වැහිලා.."

" වරද් නැවතියන්.."

මම දුවගෙන දුවගෙන උඩට ගිහින් ආඩ්‍ය අයියගෙ කාමරේට පැනලා දොර අගුල් දාගත්තා.. මේ පොල් කාවයියා මගේ පස්සෙ පියාඹගෙන ඇවිත්

@Shan

කොටන්න යනවනෙ.. මම ආධ්‍ය අයියගෙ කාමරේ දොර වහලා ඒකට හේත්තු වෙලා හති දැම්මා.. අම්මෝ මේකෙ සුවඳ..

"වෝහ්~"

මම ඒ වෙලාවෙ තමයි ආධ්‍ය අයියගෙ කාමරේ හරියටම දැක්කෙ.. කලින් ඇවිල්ලා තිබ්බට ඉන්නෙ නැහැනෙ.. මුළු කාමරේම එක කුණුපොදක් නැතිවෙන්න අස් කල්ලා.. පිලිවෙලට රාක්ක වල ලොකු පොත්, පොඩි පොත් අඩුක් කල්ලා පොඩි මල් පෝච්චි තියලා ලස්සනම ලස්සනට අස් කල්ලා තිබ්බා.. ඇඳත් එක රැල්ලක් නැතිවෙන්න පිරිසිදුයි.. කාමරේ රෝස සුවඳයි.. මම දැක්කා ආධ්‍ය අයියගෙ ෆෝන් එක ඇඳ උඩ රිංග්ස් යනවා..

**Anuu(2) Calling...**

ටසිරි.. මෙ අර අනු කියන කෑල්ල නේද.. ෆෝන් එකේ ස්ක්‍රීන් එකේ වැටිලා තිබුනෙ blur කරපු කොල්ලෙක්ගෙ ෆොටෝ එකක්..නළුවෙක්ද.. සැක් මෙ මගුලෙ මූණ පේන්නෙ නැනෙ.. කොල්ලෙක්ගෙ ඇයි ෆොටෝ එක දාගෙන ඉන්නෙ.. අප්පච්චි දැනගනී කියලද දන්නෙ නෑ.. ඒ එක්කම කෝල් එක කට් වෙලා මැසේජ් එකක් සෙන්ඩ් වුණා..

" ශාක්‍ය.. මේක අන්තිම වතාව වෙන්න ඕන.. ආයෙ මට කතාකරන්න හිතන්නවත් එපා.."

කවුද යකෝ මගේ මස්සිනාට පල් පාට් දාන පොල්කටු මාලෙ.. මෙ අයියට කියන්න ඕන පිරිමි පෞරුශය ඉස්සරහට දාලා ආධිපත්‍ය පතුරගන්න කියලා.. මම ආයෙ ඔපදූප හොයන්නැතුව ශේප් එකේ දොර ගාවට ඇවිල්ල දොරට කන තියාගත්තා.. පොල් කාවයියා පියාබලා කුඩුවට ගිහිල්ලද කොහෙද.. මම ශේප් එකේ දොර ඇරලා කකුලක් එළියට තිබ්බා විතරයි දොර ළඟ හිටපු යෝධ මනුස්සයා මාව ආධ්‍ය අයියගෙ කාමරේ බිත්තියට තද කල්ලා කටට අතක් තියලා වහගත්තා.. තද කල්ලම වැහුවා..

" කාපිය ලුණු.. උද්ධච්ච තාරාවා.."

" ඹ්වැක්~ ඕක්~ ඊයා~ ඇක් ~ඹ්වැක් තුහ්.. තවුසෙ හිතක් පපුවක් නැති-ඹ්වැක්~ කෑත චවුලා.. මට වමනෙ යන්න එනවා.. මොන හු-"

" කුණුහර්ප කිව්වොත් බෝතලේම කවනවා වරද්.."

@Shan

මම රධ්‍ය අයියගෙ අත ගසලා වොශෲම් එකට දුවගෙන ගිහින් කට හෝදගත්තා.. මේකා මගේ කටට ලුණු අහුරක්ම ඔබලා කටත් වහගෙන ඉඳපු නිසා ලුණු රහටයි තිත්ත රහටයි මට ඔක්කාරෙට එන්න වගේ.. ඒ එක්කම ආධ්‍ය අයියා කාමරේට ආවා..

" හයියෝ තාම මරාගන්නවද.."

" බ්වැක්~ ආධ්‍ය අයියේ මේ ගෙම්බා ලුණු වගයක් මගේ කටේ එබුවා.."

" මොකටද මට මිරිස් කැව්වෙ.."

" මොකටද මට තාරපැටියා කිව්වෙ.."

" ඉතින් උඹනෙ තාරපැටියෙන් ඕන.. ගෙනැත්දුන්නැත්තං බැල්කනියෙන් පහලට පනිනවා කිව්වෙ.."

" ආහ්.. මේ කෑදත්තා කියන බොරු..!!! බොරු ආධ්‍ය අයියේ.."

මම රධ්‍ය අයියගෙ කකුලට පයින් ගැහුවා..

" මම මොකටද බොරුකියන්නෙ.. අයියා ටවුන් ගියාම වරද්ට කහ පාට අර පීක් පික්.. මොකක්ද වරද්.. ඔයාට පීක් පීක් ගාන එක්කෙනෙක් නේද ඕන කිව්වෙ.. අන්න ඒකෙක් ගේනවද.."

" ම්ම්.. ගේන්නම් ගේන්නම්.. මට ඇඳගන්න දීලා දෙන්නම දැන් කාමරෙන් එළියට ගිහින් නිවීසැනසිල්ලෙ මරාගන්නකො හොඳද.."

මම ආධ්‍ය අයියටයි රධ්‍ය අයියටයි දෙන්නටම රවලා කාමරේට ඇවිල්ලා කකුල් දෙකත් සෝදගෙන ඇඳ උඩ ඉදිය කියාරා බදාගෙන කොට්ටෙට ඔලුව තියාගෙන ඇස් දෙක වහගෙන හිටියා.. මම විනාඩි විස්සක් විතර හිටියා.. කියාරා මගේ මූණ ඉව කරනවා.. මම එයාව අත් දෙකෙන්ම බදාගෙන මූනට කිස් එකක් දුන්නා..

" චූටියෝ.. මම ගිහින් එන්නාම්.. මේ මෝඩයගෙ ෆෝන් එක බැල්කනියෙන් පහළට විසික් කරන්න ආයෙම මොනාහරි කිව්වොත්.."

ආධ්‍ය අයියා මගේ පස්සට තට්ටුවක් දාගෙන එළියට ගියා.. අම්මෝ මෙයාගෙ රෝස සුවඳ.. මාව ඒකට ඇදීලා යනවා වගේ..

@Shan

" මේ අයියෙ තාරපැටියෙක් ගේන්න හොඳද.."

" පොඩි!!!"

" පීක් පීක් ගාන එකෙ~ක්.."

රධ්‍ය අයියා කෑගහලා ආධ්‍ය අයියට කියනවා මට ඇහුණා.. මම කියාරව අත් දෙකට බදාගෙන ගුලි වෙලා ඇස් දෙක උණ්ඩි කරගෙන පියාගත්තා.. මට ඇහුණා කාමරේ දොර වැහෙනවා..

" කියාරා.. මම මොකක්ද කියලා තියෙන්නෙ.."

කියාරා එකපාර මං ගාවින් නැගිටලා යන්න හැදුවත් මම එයාව අල්ලලා තද කල්ලා බදාගත්තා..

" ඔයා යන්නෙපා.. මගේ කියාරා.."

කියාරා ආයෙම කුන් කුන් ගාලා මගේ උරහිසටත් අතක් තියාගෙන මං ගාවින් ඉඳගත්තා..

" මේ වරද්.. එන්නකො පොඩ්ඩක්.."

" යනවා යන්න.. අල්ලන්නෙපා මාව.."

" කලින් කියන්න එපැයි.. මම දැන් අල්ලල ඉවරනෙ.. එන්නකො එන්නකො.."

" බෑ.."

*වටාස්*

" Happiness is having your boyfriend's butt bouncy like a caramel pudding.."

" අහකට යනවා!!!!!!!!!!!!!!!!!"

" එහෙනම් නැගිටින්නකො.. නැත්තම් ආයෙම ගහනවා.."

@Shan

මම කියාරව අතෑරලා නැගිටලා ඇස් දෙක වපර කරගෙන එලිය බලාගෙන හිටියා.. රධ්‍ය අයියා මං ගාවින් වාඩිවෙලා අර බූවලු අඩු වලින් මාව ඔතාගෙන ඇඳට පෙරළුණා..

" යනවා එහාට.."

" අපි මේ තාර ප්‍රශ්නෙ විසඳගමු.."

" මම තාරාවෙක් නෙමෙයි.."

රධ්‍ය අයියා මගේ තොල් වලට පෙක් එකක් දුන්නහම මම එයාගෙ පපුවට අහලා අහක් වුණා.. එනවා මෙතන ඉඹින්න..මගේ කටේ ලුණුත් දාලා.. කලපු කොට්ටෝරුවා..

" Don't

**ever**

avoid my kisses.."

රධ්‍ය අයියා එක අතකින් මගේ කම්මුල් දෙපැත්ත අල්ලගෙන රිදෙන්නම මගේ තොල් හැපුවා.. ඊටපස්සෙ ආයෙම එතන හිමින් කිස් කරද්දි මම එයාගෙ පපුවට අත මිට මොලවලා ගහලා ගහලා එහාට වුණා..

" ආව්.. ලේත් එනවා.."

" පොඩ්ඩක් ලේ ආවහම මක් වෙනවද.. එතකොට ඔයාට මේක එපාද.."

රධ්‍ය අයියා ලොකු ප්ලාස්ටික් බෝල් එකක් පෙන්නලා අහද්දි මම ඒකදිහා බලලා ආයෙම එළිය බලාගත්තා.. මොකක්ද දන්නෙ නෑ.. කන දෙයක්ද.. කැමකට සටන පාවලා දෙන එක වැරැද්දක්ද.. මගේ දණ්ඩනීති සංග්‍රහයෙ එහෙම එකක් තියෙනවද කියලා මම කල්පනා කලා..

" මොකක්ද.."

රධ්‍ය අයියා තොල හපාගෙන හිනාව නවත්තගන්නවා මම දැක්කා.. සැක් වරද්.. උබනම් හත්පොලේ ගාගන්නවා..

@Shan

" A special ice cream from Radhya's ice cream shop to this gentleman.. This is made by adding KitKat and Nutella to many scoops of ice cream and extra honey for a special recipe.. One kiss is all it takes~"

රධ්‍ය අයියා හැන්දෙන් බෝල් එකේ තියන ඒවා කලවම් කල්ලා හැන්දක් මගේ කට ගාවට කරද්දි මම එළියම බලාගෙන කට ඇරියා.. මෙකටත් ලුනු දාලද දන්නැනෙ.. ඒ වුනාට ඒක කැවහමනම් තාරපැටියව පැත්තකින් තියලා කන්නම හිතුණා..

" අනේ මේ ලොකුකම පැත්තකින් තියලා මෙක කනවා.. ගෑණුන්ටවත් නෑ මෙච්චර මායම්.."

රධ්‍ය අයියා මගේ පිටට දබෝස් ගාලා හයියෙන් පාරක් දීලා බෝල් එක ඇදෙන් තියලා ගිහින් බැල්කනි එකේ දොර වහන්න හැදුවා.. ඒ වහන්න හදලත් ටිකක් වෙලා පාර දිහා බලාගෙන ඉඳලා මට කතාකලා..

" මෙ වරද්.."

" ම්ම්.."

" පොඩ්ඩක් එන්නකො.."

මම ඇදෙන් නැගිටලා බැල්කනි එකට ගියා..

" ඔයාට පේනවද අතන බයික් එකක් නතර කල්ලා තියෙනවා.."

" කොතන..?? ආ ඔව්.. අර ලයිට් කණුව  ගාවද.."

"ම්ම්.."

මම හොදට බැලුවහම මට ඒක දැකලා හුරුයි වගේ පෙනුනා.. මම කලින් කොහේහරි මේක දැකලා තියනවනෙ.. මට හොදට මතකයි..

" මම ඒක කොහේහරි දැකලා තියෙනවනෙ ඒයි.."

" දැකලා තියෙන්න ඕන.. හොදට බලලා කියන්නකො.."

@Shan

මම බැල්කනි එකේ කණුවට හේත්තුවෙලා පේන්නැතිවෙන්න හොඳට බලාගෙන හිටියා..

" මට මතක් වෙන්නෙ නෑනෙ.. කවුද.. අපි දන්න කවුරුහරි ද.."

" ම්ම්.."

ඒ එක්කම රධ්‍යා අයියට කෝල් එකක් ආවා.. රධ්‍යායියා කෝල් අයිඩී එක මට පෙන්නුවා..

**Kiyannn Calling...**

" අයාන් ද.. ඔව් ද.."

" ම්ම්.. ඒකතමා උඹට ගෙදර යන්න එපා කිව්වෙ.. කොහෙද මොලේ ඇඟ පුරාමනෙ.."

රධ්‍ය අයියා මගේ අතින් ඇදලා කාමරේට දාලා බැල්කනි එකේ දොර වහලා කර්ට්න් එක ඇදලා දැම්මා..

" ඕ කියපන්.."

" ආ නෑ නෑ බං.. මාත් එක්ක ඉන්නවා.."

" හරි හරි.."

" හරි බං.. අවුලක් නෑ.."

" ඒකා මොකද මෙහේ කරන්නෙ.."

" මම හිතන්නෙ ඔයාට හායි කියලා යන්න ඇවිත් තියෙන්නෙ.. මගුලක් අහන්නැතුව යනවා ඇදට..!!!!!!!!"

" මට බනින්නෙ.. මොන රෙද්දක්ද.."

මම ඇදට ගිහින් අයිස්ක්‍රීම් බෝල් එකේ ඉතුරුටික කන්න ගත්තහම රධ්‍යායියා ටේබල් ලැම්ප් එක ඔන් කල්ලා අනිත් ලයිට්ස් ඕෆ් කල්ලා ඇදට

@Shan

ආවා.. මම පොඩ්ඩක් රධ්‍ය අයියට කිට්ටු වෙලා පැත්තකින් හේත්තුවක් දාගත්තා..

" අනේ ඒ පුත්තලම් බූරුවගෙ කට විතරයි.. දෙන්න හිතයි මැරිලා වැටෙන්න.."

" දෙයි මැරිලම වැටෙන්න.."

" ඈයි දැන් කලින් සද්ද නැතුව ඉඳලා ආයෙම එන්නෙ.. මම ඕකගෙ ඇට දෙක තලලා දානවා.."

මම හිතින් මවාගත්තා.. ඔය අයාන් කියන පුත්තලමෙන් ගෙනාපු බූරුවගෙ මුළු ඇඟම තලලා දාලා වකුගඩු දෙකයි හදවතයි විකුණලා මම ඒකෙන් ශෝන් මෙන්ඩිස්ගෙ කොන්සර්ට් එකක් බලන්න යනවා.. I love it when you call me senorita~

" මේ.."

රධ්‍ය අයියා මොකක් හරි කල්පනා කරන ගමන් හිටියේ.. සැක් මෙ බූරුවෙක් ඇවිල්ලා මූඩ් එක කාලා දැම්මනෙ..

" අයියෙ.."

" ම්ම්.."

මම ඉවරවුනු බෝල් එක පැත්තකින් තියලා රධ්‍ය අයියව මගේ පැත්තට හරවගෙන එයාගෙ මූණ අත් දෙකෙන්ම අල්ලගත්තා.. එයා ගැස්සිලා වගේ මගේ ඇස් දිහා බලාගෙන හිටියා.. මම එයාගෙ තොල් වලින් පෙක් එකක් තියලා එයාගෙ නලලට මගේ නලල තියාගත්තා..

" I don't want anyone to come and disturb us when we are together.."

" ම්ම්.."

" අපි ඔයාගෙ ඩයරි එක කියවමුද.. ඔයා දවසක් කිව්වෙ කියවමු කියලා..???"

@Shan

රධ්‍ය පැන්බේස් එකයි ආධ්‍ය පැන්බේස් එකයි අයුක පැන්බේස් එකයි ගිනිතියන්න හුමිතෙල් හොයාගෙන යන බේසික වෙරි මින්සි..

විහිලුවක් කලේ පිස්සු කෙල්ලොහ් ටික / කොල්ලොහ් ටික..

එන්නාම්.. ලව් යූ..❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 77 කොටස

" මම කවද්ද අනේ පරිසර දිනේට පැළයක් හිටවන්න ගිහින් මල් බාල්දිය ඇහේ හලාගත්තෙ.. මට මතක නෑනෙ.."

" මම හිතන්නෙ අටේදි ඉස්කෝලෙ පරිසර දිනේ දවසෙ.. මටත් හරියටම දැන් මතක නෑ බං.."

" සැක් නේද.. හෙන චාටර් මමනම්.."

මාම් රධ්‍ය අයියගෙ බඩ උඩින් ඔලුව තියාගෙන කහපාට කවර් එකක් තියන පොතේ එහා පිටුව පෙරළුවා.. ඒකෙ අස්ස තව එක එක කොළ අරවා මෙවා තිබිලා වැටෙනවා.. මම ඒවා අරගෙන පැත්තකින් තිබ්බා.. සැක් මෙක කියෙව්වහම මට මගෙ පරණ සතා ගැන මහා ලැජ්ජාවක් දැනිලා බැල්කනියෙන් පැනලා මැරෙන්නම හිතෙනවා.. මියුසික් රූම් එකේ ගිටාර් කම්බියකට අත කපාගෙන අඬපු එකත් තියනවා..

රධ්‍ය අයියගෙ අකුරු බෝල වගේ ලස්සනට රවුමට පිළිවෙලට එකම සයිස් එකෙන් බලන්න ආස විදියට තියනවා.. ඒකට මගේ නමය වසරෙ පොතක් අරගෙන බැලුවොත් බල්ලො බත් කන්නෙ නෑ.. මගේ අකුරු හෙනම කැතයි.. කැතයි කියන්නෙ.. කැතම කැතයි.. අකුරු, ඉලක්කම්, ග්‍රීක් අකුරු ඔක්කොම එකවගේ තමා.. මට බෝල කර කර ලියන්න තේරෙන්නෙ නෑ. කියවගන්න පුලුවන් විදියට විතරයි ලියන්න පුළුවන්.. ඒක ඉතින් මගේ වැරැද්දක් නෙමෙයිනෙ.. රධ්‍ය අයියා ඩයරි එක ලියලා තියෙන්නෙ ඉංග්ලිශ් වලින්.. තැනින් තැන සිංහල සිංදුකෑලි ලියලා තියනවා ඇපොස්ට්‍රොෆීස් දාලා..

හැබැයි ඒක ඩයරියක්ම කියන්නත් බෑ.. හැමදාම කරපුවා ඒකෙ ලියලා නෑ.. සමහර පිටු කුරුටු ගාලා තියෙනවා..

" දැන් මේකෙ ජුනි පහෙන් පස්සෙ ආයෙම ලියලා තියෙන්නෙ ජුනි දාසයනෙ.. කෝ ඉතුරු ටික.."

" එහෙම තමා.. හැමදාම ඕවා ලියන්න බෑනෙ.."

" ඔයා පොඩිකාලෙ ඉඳන්ම මේවා ලියනවද.."

@Shan

" ම්ම්.."

" කොයිකාලෙ වගේ ඉඳලද.."

" පහේ විතර ඉඳලා.. අපේ අයියා මට එකපාරක් ඩයරි එකක් ගෙනැත් දුන්නා නිල්පාට, සොනික් ඉන්න එකක්.. ඊටපස්සෙ කිව්වා මට කියන්න බැරි මොනව හරි තියනවනම් ඒකෙ ලියන්න එයා බලන්නම් කියලා.."

" ඊටපස්සෙ.."

" ඊටපස්සෙ මම කාටූන් ගැන, අප්පච්චි ගැන, කන්න ආස දේවල් ගැන ඒකෙ ලියලා අයියට දුන්නා.. ඒ ඩයරිය ඉවර වුණාම ආයෙම එයා මට එකක් ගෙනැත් දුන්නා.. ඔහොම ඔහොම පුරුද්දකට ගියා.. දැන්නම් අයියා ඩයරි එක බලන්නෙ නෑ.. ඔයා  ගැනත් අයියා දැනගත්තෙ ඕක කියවලා.."

" මොකක්.."

" ම්ම්.. අර අල්මාරියෙ උඩම ලාච්චුවෙ ඇති පොත් වගයක්.. ඒකෙ අළුපාට කවරයක් දාපු පොතක් ඇති ගේන්නකො.."

මම එයාගෙ අල්මාරිය ඇරලා ඔය කියපු පොත හොයාගෙන ඇවිත් එයාට දුන්නා.. එයා හෙන වෙලා පිටු වගයක් පෙරලලා පෙරලලා මොකක් හරි හොයාගෙන මගේ පැත්ත හැරෙව්වා..

"     has the most beautiful eyes in the world, but I have never seen a child as stupid and crazy as      anywhere.. Silly stupid kid.."

" ඕක දැකලා මගෙන් ඇහුවා කවුද මල කියලා.."

" කවුද ඉතින් මල.."

" මම ඒ දවස්වල ඔයාගෙ නම දාලා ලියන්න අවුල් අවුල් වගේ නිසා මලක් දාලා ලිව්වෙ.. ඊටපස්සෙ දිගටම මලක්ම දාලා ලියන එක හොඳයි කියලා හිතුවා.."

" මම තාම ඉන්නෙ මේවා ලිව්වෙ ඔයාමද කියලා මොළේට ප්‍රොසෙස් කරගන්නකල්.."

@Shan

" ප්‍රොසෙස් කරගෙන ඉවරවෙන්නකො.."

රධ්‍ය අයියා මගේ කොණ්ඩෙ අවුල් කල්ලා අළුපාට පොත වහලා පැත්තකින් තිබ්බා..

" ආ ඉන්න ඉන්න මේක මට මතකයි.. මේ අපි අර සිංහබාහු බලන්න ටවර්හෝල් ගිය දවසෙ නේද.. එදා ඔයා මගේ පිටිපස්සෙ පෝලිමේද හිටියෙ.."

" ම්ම්.."

" ඔයාලා කලින් බලන්න ගියේ නැද්ද.."

" අපේ එකට තමා ඕගොල්ලොත් එක්කන් ගියේ.. අපිට දහයෙදි ඒක පෙන්නන්න යන්න වුනේ නැනෙ.."

" මෙහෙම බලද්දි අපි හැමදාම හම්බෙලානෙ කොහේදිහරි.. ඒ කියන්නෙ මම කරපු කියපු සේරම චාටර් වැඩ ඔයා බලාගෙන ඉඳලා තියද.."

" ම්ම්.. ඇත්තටම ඇයි ඔයා එදා ටවර් එකේදි මහානාමෙ කොල්ලෙක්ට ඩිස්පොසිබල් කප් එකකින් ගැහුවෙ.."

" ඌ මගේ සපත්තුවෙ මඩ ගෑවා.. ඒකනිසා.. ඔයාට මතකද සිංහයා ඩ්‍රාමා එක නවත්තලා ස්ටේජ් එක කොණට ඇවිත් අපිට බැන්න හැටි.."

" ම්ම්.."

" ඒ වුණාට මට අන්තිම ටිකේ නින්ද ගියා.. එදා මම අසනීපෙන්ද කොහෙද හිටියේ උණ හැදිලා.."

" මම දැක්කා මැඩම් ඇවිත් උණ බලලා යනවා.."

" අනේ අපේ මැඩම්ලා හරි හොඳයි නේද.. ඒගොල්ලො නම් ජීවිතේට අමතක වෙන්නෙ නෑ.. "

" ඔයා ප්‍රයිමරියෙ හිටියෙ නැනෙ.. ඒ කාලෙ අපේ තුන වසරෙ මැඩම් අපේ පොත්වල හරි දාලා තරු දන්නෙ නෑ.. රන් පුතා කියලා හැපි ෆේස් එකක් ඇඳලා දෙනවා.."

@Shan

" මේ ලෝකෙ ඉන්න හොඳම මැඩම්ලා හිටියෙ අපිටද කොහෙද.. අදට දැක්කහමත් මාර ආදරෙන් කතාකරනවා.."

" ම්ම්.."

මම රධ්‍ය අයියා එක්ක කතා කර කර පොතේ අනිත් පිටුව හැරෙව්වා.. මේක කියවද්දි ඈත කාලෙට ඇදිලා යනවා වගේ දැනෙනවා.. සමහර දේවල් මට අමතක වෙලා තිබ්බත් කියවද්දි මතකෙ අලුත් වෙනවා.. හරි ලස්සන කියුට් නවල් එකක් කියවනවා වගේ.. ජීවිතෙන් බාගයක්ම ගෙවුනෙ ඉස්කෝලෙනෙ.. ඒ මැඩම්ලා සමහරු අද ඉස්කෝලෙනෑ.. විශ්‍රාම ගිහින් වුණත් ඉදලා හිටලා ඉස්කෝලෙදි හම්බුනාම ඔලුව අතගාලා පුතා කියලා කටපුරා කතාකරනවා.. ඇත්තෙන්ම ඉස්කෝලෙ කාලෙ කොච්චර ආදරේ හිතෙන එකක්ද කියලා දැනෙන්නෙ ඉස්කෝලෙ ගිහින් ඉවර වුණාම.. මම හිතන්නෙ මගේ ජීවිතේ මම හැමදේම හොයාගත්තෙ.. වැඩිපුරම සතුටෙන් හිටියේ ඉස්කෝලෙ කාලෙ..

" මම මදර්ස් කැන්ටින් එකේ ඇන්ටිට මලක් කඩලා ගිහින් දුන්නෙ කවද්ද.. සිරාවට?! "

" ඔව් දවසක් අපි එහෙට යද්දි හිටියා වැටෙ එල්ලිලා චතුසුද්ද මලකුත් අතේ තියාගෙන පස්ස දික් කරගෙන ඔපදූප කියව කියව.. අපිව දැකලා කියාන්ගෙ ඇහෙන් වැදීගෙන දිව්වෙ.. දුවලා ගිහින් ලිස්සලා වැටුණා.. ඊයා වරද්.. මඩ ගොඩකම පතබෑවුණා නේද.."

" අනේ මේ.. තවුසෙලා ඉතින් මොන මගුලකට අවේලාවෙ කැන්ටිමට ආවෙ.."

" අවේලාවෙ කැන්ටින් එන අය බලන්න තමා.. ඉන්ටවල් එකේ ඇවිත් ගන්න දන්නැද්ද.."

" මම කෑම ගන්න නෙමේ එහෙට යන්නෙ.. ඇන්ටිව හම්බෙන්න.."

" ඒ මොකටද.."

" එයා හරි හොඳයි.. තවුසෙ ජුනියර් ප්‍රිෆෙක්ට් කෙනෙක් වෙලා අපේ පන්තියෙ ඩියුටි ආපු එකට ඒ දවස්වල මමනම් හිටියෙ මාර තරහෙන්.. එලවගන්න අපි කැරැලකුත් දියත් කලා.. හැමදාම මොනවහරි එකකට මට

@Shan

කැගහලා බනිනවා.. ඒ කාලෙ ඉඳන්ම දුස්ටකම ඉහවහා ගිහින් තිබ්බෙ.. දෙන්න හිතයි සුදුකොකා..කොට කලිසමකුත් ගහගෙන ප්‍රින්සිපල් කියලද හිතන් හිටියෙ.."

" ඔව්.. එහෙම තමා හිතන් හිටියෙ.. උඹට බුදුපහන පත්තුකල්ලා තියන්න විතරයි බාර දුන්නෙ.. එකදවසක් හරියට පත්තු කරනවද.. නෑනෙ.. අතුගාන්න ඕන නැති නිසා ලේසි එකක් බාර දුන්නහම ඒකවත් හරියට කරන්නෑ.. මල පනින්නෙ නැද්ද.."

" හැමතිස්සෙම ඉතින් මල පැන්න ගමන් නෙ ඉන්නෙ.."

" මොකක්ද කිව්වෙ.."

" මොකුත් නෑ.."

"ඒ ඒ ඔය පිටුව කියවන්නෙපා..මෙහෙට දීපිය පොත.."

රධ්‍ය අයියා එකපාරටම පොත ඇදලා ගත්තා..

" ඒ මොකද ඒ.. බෑ බෑ කියවන්න ඕන.. දෙනවා මෙහෙට.."

" හැබැයි උඹ එකපාරක් හරි හිනාවුනොත් ගහනවා පිට පැලෙන්න වරද්.."

" හැරි හැරි ඇකේ්.. දෙනවකෝ මෙහෙට්ට.."

මම පොත ඇදලා ගත්තා..

" I feel like I can't keep this in my heart anymore.. Why does my chest hurt so much..? Why was I looking at you..? Don't get close to me.. I don't like this.. What the hell is love..? මේ මොකද අනේ මේ.."

" මොකුත් නෑ.. නිදාගමු.. ඕක කියෙව්වා ඇති..මෙහෙ දෙන්න ඕක.."

" බෑ බෑ කියන්නකො අනේ.. ඇයි මෙහෙම ලිව්වෙ කියලා.."

" නිකම්.. දෙන්න ඕක මෙහෙට්ට.."

@Shan

" අනේ කියන්නකෝ~ පොඩ්ඩක් ඉන්න මේක අර එදා මම ඔයාට කන්ෆෙස් කරපු දවසෙ ලිව්ව එකක්ද.. කෝ දිනයක් දාලවත් නැනෙ.."

" මි..."

" ඈ සිරාවටම මේ එදාද.. හරි ඉතින් කවුද දන්නෙ ඔයා කැමැත්තෙන් හිටිය කොල්ලා මම කියලා.. මමත් ඒකක් කිව්වෙ තරහට තමා.."

" තරහට..?? අනේ මේ නිකම් පලයන් බං යන්න.."

" නෑ නෑ තරහටමත් නෙමේ.. ඒ වුණාට ඒ දවස්වල යමකිසි දෙයක් තිබ්බා.. අනික ඔයා මාත් එක්ක හැමතිස්සෙම ගහගන්න වගේනෙ කතාකරන්නෙ.."

" මම එදානම් සිරාවට හිතුවා ආයෙ උඹ එක්ක කතාකරන්නෙ තියා හිතන්නෙවත් මූණවත් බලන්නෙ නෑ කියලා.."

" අනේ~ මම ඔයාගෙ හිත රිද්දලද.. එහෙනම් මොකටද අර මලක් ෆෝන්කවර් එක අස්සෙ දාගෙන හිටියෙ.."

රධ්‍ය අයියා මගෙන් පොත උදුරලා අරගෙන බෙඩ් කබඩ් එක උඩින් තිබ්බා..

" එදා ඔයා ඇඩුවත් එක්කද.. ඒකට තීන්ත බොඳ වෙලා තිබ්බෙ.. අපෝ අනේ හැපිකව්වා ඇඩුවද.. හරි හරි කවුද ඉතින් දන්නෙ.. ඔයාගෙ කුළුදුල් ආදරේ පුදන්න ඉන්නෙ මට කියලා.. මට උනත් ඉරිසියා හිතුනා කියාන් අයියා ඒක ගැන පැහැදිලි කරපු විදියට.. මම ඉතින් ඔයාට ආදරේනෙ.."

" මම ඇඩුවෙ නෑ!!"

" ඒකතමා මම තමයි ඇඩුවෙ.."

මම රධ්‍ය අයියගෙ තොල් වලින් පෙක් එකක් තියලා ඇඟ උඩින් දිගාවෙලා අත් දෙකින්ම එයාව බදාගත්තා.. අවුරුදු විසිඑකේ අලි පැටියෙක් හුරතල් කරන්න වෙච්ච අසරණ මම.. ඒ එක්කම හෙන ගහන්න වගේ ආධ්‍ය අයියා දොර ඇරගෙන කාමරේ ඇතුළට ආවා.. රධ්‍ය අයියයි මමයි ඒකට බයවෙලා එයා එහා කොණට පෙරලිලා මම මෙහා කොණට පෙරලිලා කොට්ටෙන් මූණ තියාගත්තා..

@Shan

" මම ඔයාලට කතාකලා ඇහුනෙ නැද්ද ලමයි.."

" අයියා ආවද.."

" ඔව්.. මම බැලුවෙ ලයිට් දාලා නිසා නිදි නැද්ද කියලා.."

ආධ්‍ය අයියා ඇඳ ගාව තිබ්බ රීඩින් ටේබල් එකේ පුටුවෙන් වාඩිවුනා..

" කෝ අනේ ඔයාගෙ රෝසමල් සුවඳ එන්නැනෙ.."

" චූටි ඒකට කැමතිද.."

" ඔව් ඇදිලා යනවා වගේ.."

" It's a gift from my little brother.. He has good choices anyway.."

" රධ්‍ය අයියද ඒක දුන්නෙ.. ඔව් එයාගෙ චොයිසස් හොඳ නිසානෙ මාව තෝරගත්තෙ.. නේද ඒයි.. කියන්නකො ඔව් නේද.."

මම රධ්‍ය අයියගෙ අතකට ඇඟිල්ලෙන් ඇන්නහම ආධ්‍ය අයියා හයියෙන් හිනාවුණා..

" මම හිතන්නෙ පොඩී ඒකතමා ජීවිත කාලෙටම තෝරගත්ත හොඳම එක.. නේද පොඩි.."

" ම්ම්.. හොඳම එක.."

රධ්‍ය අයියා ස්මයිල් ඉන් පේන් හිනාවකින් ආධ්‍ය අයියා එක්ක හිනාවුණා..

" මොකත ඔයා නිකම්-"

" පොඩී ඒ ළමයව අවුස්සගන්නැතුව ඉන්නකො.. මේ ඔයාලා හෙට යන්නෙ හවසනෙ.. මම රෑටකලින් ගෙදර එනවා.. මම ආවට පස්සෙ යන්න හරිද.."

" හරී~ ඔයාගෙ ස්ටෙත් එක හම්බුණාද.."

@Shan

" මොන..?? ආ.. ඔව ඒක හම්බුණා.. එහෙනම් ඔයාලා නිදාගන්නකෝ.. මම යන්නම්.."

ආධ්‍ය අයියා නැගිටලා පුටුව තිබ්බ විදියටම මෙසෙ අස්සට කලා..මෙයා නම් පිලිවෙලකමේ උපත වෙන්න ඕන..

" ගුඩ් නයිට් ආධ්‍ය අයියේ.. මාව හීනෙන් දකින්න අද.."

" අයියේ කෝක්ටත් පිරිත් දාගෙන නිදාගන්න.."

" අනේ මේ කටවහන් නිදාගන්නවද.. මම දැක්කහම ඔයාට බය හිතෙයි පිරිත් දාගෙන අනිත් පැත්ත හැරිලා නිදාගන්න.. මම නිදි ගුඩ් නයිට්.."

" මේ වරද්.. හොටෙල් ට්‍රාන්සිල්වේනියා එකේ සමර් වැකේශන් බලමුද.. එනවකෝ නැගිටලා.. නිදිමත නැනෙ.. ඊටපස්සෙ පිරිත් දාගෙන නිදාගමු.."

" ආ......................හ්!! පොල් කාව-"

මම ඔලුව හියාගෙන ඉදපු කොටෙ උස්සලා රධ්‍ය අයියට ගහන්න යද්දිම බිම තිබ්බ රතුපාට බිංදු වගයක් ඇහැට පෙනුනා..

" ඒ මේ මොනවද.."

මම ඇදෙන් බැහැලා ගිහින් බිමට පහත් වුණා.. රධ්‍ය අයියත් ඇදෙන් බහැලා මං ගාවට ආවා..

" මේ කාමරේට කොහෙන්ද ලේ වගයක්.."

මමයි රධ්‍ය අයියයි එකසැරේට මූනට මූණ බලාගත්තා.. ඒ කියන්නෙ-

" අයියා..??!!"

හායි දළඹුවනේ.. කොහොමත..

මම ඔයාලට දෙයක් කියන්නයි හදන්නෙ..

කතාවෙ මේ කොටස් ටික මට ඉක්මනට යවාගන්නයි ඕන කතාවෙ පීක් එකට එන්න නම්.. ඒත් මට පොඩ්ඩක් බිසී නිසා ලියද්දි වෙලා යනවා..

@Shan

සමහර වෙලාවට සැරින් සැරේ ඔය වචන දෙසීයක් විතර කොටන්නෙ බස් එකේ යනගමන් හරි නැත්නම් මහ රෑට.. ඉඩ ලැබෙන වෙලාවක..

කතාව ස්ලෝ වැඩියි වගේ ඔයාලට දනෙනවා ඇති.. මේක එකපාරම කියවලා ඉවරකරන කෙනෙක්ට එහෙම දැනෙනවා ඇති.. ඒත් මට ඕන එකපාර යාලුවෙලා ලව් කල්ලා සෙක්ස් කල්ලා ඒ විදියෙ රිලේශන්ශිප් එකක් ගොඩනගන්න නෙමෙයි.. ඔයාල දන්නවනෙ ඉතින් කොටස් හැටහතක්ම ඇඳුනා එයාලා ආදරේ කරන්න පටන්ගන්නම..

රධ්‍ය කියන කැරැක්ටර් එක ඩිවලොප් කරන්න ටිකක් අමාරුයි.. මමම එයාව බිල්ඩ් කල්ලා තියෙන විදිය කම්ප්ලිකේටඩ් කියලා හිතෙනවා ලියද්දි.. තේරෙනවනෙ.. කොල්ලො උනාම.. කතාකරන හැසිරෙන විදිය වෙනස්නෙ.. ඉතින් ඒකයි අනිත් එක එයා හුගක් පොඩි කාලෙ තනියම ගෙවපු කෙනෙක්.. එයා වරද් ගාව කම්ෆටබල් සෝන් එකක් හදාගන්න ට්‍රයි කරනවා.. මොකද එයාට එහෙම ඉන්න තියෙන්නෙ වරද් ගාව විතරනෙ.. රධ්‍ය චීසි කල්ලා මම කතාව සවුත්තු කලා කියලා මට ඉන්බොක්ස් කෙනෙක් ඇවිත් බැනලා වගේ කතාකල්ලා තිබ්බා.. ආයෙම මගේ කතා කියවන්නවත් හිතෙන්නෙ නෑ කියලා තිබ්බා.. මම ලොකුද කියලත් අහලා තිබ්බා..

ඔයාලගෙ හැම රික්වෙස් එකක්ම මම ආදරෙන් බාරගන්නවා.. අදහස් ප්‍රකාශ කරන්න ඕපන්ලි.. මම ඒකට ආසයි.. ඒත් පොඩ්ඩක් කාරුණික වෙන්න.. මමත් අධිසංවේදි හදවතක් තියන මනුස්සයෙක් නිසා.. ඔයාලා රික්වෙස්ට් එකක් කලොත් මම ඒක කොහොමවත් මග අරින්නෙ නෑ..

මෙහෙම දේවල් මම කතාවල ලියන්නෙ නෑ සාමාන්‍යයෙන්.. ඒත් මට ඉන්බොක්ස් ආපු පොඩි පොඩි මැසේජස් වගේකට මට දුක හිතුනා..

සමාවෙන්න මම කාගෙහරි හිත රිද්දුවනම්.. මම මගේ උපරිමෙන් මේක ලියන්න ට්‍රයි කරනවා.. ස්තුතුයි..

එන්නාම්.. ලව් යූ.. ❤

රධ්‍ය අයියගෙ ඩයරිය මදි වගේ කියලා හිතන්නෙපා සුදාම්මිලා මම ඒක දෙන්නම් ඉස්සරහට සැරින් සැරේ..

ප.ලි.

@Shan

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 78 කොටස

" ආධ්‍ය අයියගෙ අනූ කවුද කියලා හොයාගන්න ඕන.."

" ඔයා කිව්වෙ ඔයා එයාලා කතාකරනවා අහගෙන හිටියා කියලා.. මොනවද එදා කිව්වෙ.."

" ම්ම්.. මට ලොකුවට ඇහුනෙ නෑ හරිද.. හම්බෙන්න එන්න හිතන්නවත් එපා කිව්වා.. එයාගෙ වැරැද්දක් තියනවා කිව්වා.. ඔයාලගෙ අප්පච්චි ගැනත් මොනවදො කිව්වා.. මමනම් හිතන්නෙ අර කැම්පස් එකේ බැඳපු කෙල්ල බැන්ඳට පස්සෙ ආධ්‍ය අයියගෙ පස්සෙන් එනවද කොහෙද.."

" එතකොට ඊයෙ රෑ අතේ වීදුරු කටුවක් ඇනගෙන ආවෙ.."

" ඔයා හිතනවද ඔක සූව බ්ලේඩ් එකකට කැපිලා කියලා.. ආධ්‍ය අයියා දැන් කොහොමත් ටික දවසක ඉඳලා අමුතුයි.. මටනම් වැඩිය අල්ලන්නෙ නෑ.."

" ම්ම්.."

රධ්‍ය අයියා කිවන් අයිලන්ඩ් එකට හේත්තු වෙලා ලූනු වගයක් සුද්ද කරන ගමන් කිව්වා.. එයයි මමයි හිටියෙ දවල්ට කෑම හදන ගමන්.. මම තාම අපේ ගෙදර ගියේ නෑ.. ආධ්‍ය අයියා උදේම හොස්පිටල් ගියා..

ඊයෙ රෑ රධ්‍ය අයියගෙ කාමරේ ලේ පැල්ලම දැකලා මම ආධ්‍ය අයියගෙ කාමරේට යද්දිත් අයියා දොර අගුලු දාගෙන හිටියේ.. අපි කතාකල්ලා කතාකල්ලා හුග වෙලාවකින් තමයි දොර ඇරියේ.. ඒ වෙලාවෙ තමයි දැක්කෙ අයියගෙ අත ගැඹුරට මොකකට හරි කැපිලා ගිහිල්ලා තියනවා.. එයා ඒකට ලේන්සුවක් බැඳගෙන බොරුවට මොකුත් දන්නැති බබා වගේ කතාකලේ.. රධ්‍ය අයියගෙ අත ඇදලා අරගෙන බලෙන්ම බැලුවහම තමයි ආධ්‍ය අයියා තුවාලයක් ගැන කිව්වෙ.. ඒකත් මහ පුංචි පහේ ගොං බොරුවක්..

ආධ්‍ය අයියට බොරු කියනවා වගේ ඒවා හරියට කරගන්න පුලුවන් කැරැක්ටර් එකක් නෙමෙ.. ගොත ගැහෙනවා.. බොරු අමතක වෙනවා.. බයයි.. ඕනවට වඩා නිමිලා ඉන්න නිසා එයා කලබල වුණු ගමන් හොඳට තේරෙනවා..

@Shan

ආධ්‍ය අයියා කිව්වෙ අත ඩිස්පැන්සරි එකේ තිබ්බ සූව බ්ලේඩ් එකකට කැපුණා කියලා වුණත් හොඳට පේනවා ඒක වීදුරු කටුවකට හරි වෙන මොකකට හරි කැපිලා ගිහින් කියලා.. ඊටපස්සෙ රධ්‍ය අයියට තරහ ගිහින් ආධ්‍ය අයියට කෑගැහුවට පස්සෙ ආධ්‍ය අයියා කිව්වා ටික කාලයක් දෙන්න එයා හැමදේම කියන්නම් කියලා.. රධ්‍ය අයියා කිව්වෙනම් ඔය 'ටික කාලෙ' කිව්වට ජීවිතේට ඕක ගැන කියන එකක් නෑ කියලා.. ආධ්‍ය අයියා ඒක ඒ වෙලාවෙ ප්‍රශ්නෙ මගාරින්න කියපු එකක් කියලා හොඳට තේරෙනවා..

" අපේ ගෙදර කොහෙන් ගියත් අප්පච්චිව ගෑවෙන්නෙ නැති තැනක් නෑ.."

" ම්ම්.."

මම මොකුත් නොකියා කටපියාගෙන හිටියා.. කොහොම වුනත් මට එයාලගෙ පවුලෙ ප්‍රශ්න වලට අතදාන්න අයිතියක් නෑනෙ..

" අනූ කියන්නෙ කෙල්ලෙක් නැතුව කොල්ලෙක් වෙන්න බැරිද වරද්.."

ඒ එක්කම මම ග්‍රේට් කර කර ඉඳපු කැරට් කෑල්ල ඉවරවෙලා මගේ ඇඟිල්ල ඒකට අහුවුනා..

" ආව්.."

මම අත ගසලා ටැප් එකට ඇල්ලුවහම රධ්‍ය අයියා කර කර ඉඳපු වැඩේ දාලා සින්ක් එකට එබුණා..

" ඔය මොකක්ද කරගත්තෙ.."

" නෑ නෑ ඒක එච්චර එකක් නෙමෙ.. පොඩ්ඩක් සීරුණා.. කැපෙන්න කලින් මම අත ගත්තා.."

මම අත වතුරෙන් සෝදගෙන දෙපාරක් තුන්පාරක් ගෑසුවා.. හොඳවෙලාවට අත ලේ එන්නම කැපුනෙ නෑ.. යන්තම් සීරුනා විතරයි..

" ඉන්න මම ප්ලාස්ටර් එකක්-"

" පිස්සුද.. මගේ අත කැපිලා නෑ අනේ.. මොකක්ද ඔයා කලින් කිව්වෙ.."

" කෝ පෙන්නන්න.."

@Shan

මම ඇහිල්ල රධ්‍ය අයියට පෙන්නුවහම එයා ඒක බලලා මට රවලා පැත්තකට වෙලා ඉන්න කිව්වා..

" ඔයා කියන්නෙ ආධ්‍ය අයියා බැරිවෙලාවත් වැරදිලාහරි කොල්ලෙක් එක්ක යාලුවෙලා කියලද.."

" ම්ම්.."

" මොකක්..?? වෙන්න බෑ.. එයාව දැක්කහම එහෙම පේන්නෑනෙ.."

" දැන් මාව දැක්කහම එහෙම පේනවද.."

" ම්ම්.. නෑ.."

" ඒකතමා.. අපි දන්නෙ නෑනෙ.. මම උදේ ෆෝන් එක බැලුවහම අනූ කියලා කන්ටැක් එකක් තිබ්බෙ නෑ.."

" ඔයාගෙ අයියට ශාක්‍ය කියලා කියනවද.. ආධ්‍ය ශදිල් නේද අයියගෙ නම.."

" අන්තිම කැල්ල.. ඉශාක්‍ය.. කාලයක් එයා කැම්ප් එකකද මොකකද වැඩ කලා ඒ කාලෙ එහේ අය ශාක්‍ය කියලා කිව්වා.."

" අයියගෙ කැම්පස් කාඩ් එක මොකක්ද.."

" ආදි.."

" එහෙමද.. හැබැයි මට එයා දවසක් කැම්ප් එකක මොකක් හරි කතාවක් කියාගෙන ආවා.. ඒක කියන්න හම්බුනේ නෑ.. අයියා ප්ලේබෝයි කෙනෙක්ටවත් අහුවෙලාද.."

" දන්නෑ.. අයියට මැරෙන්න ඕන වෙලා තමයි.."

රධ්‍ය අයියා දඩාස් ගාලා ලුණු බෝතලේ සික්න් එක උඩින් තිබ්බා.. මාවත් ගැස්සිලා ගියා..

" ඉන්නකො පොඩ්ඩක්.. ඔයා කේන්ති අරගෙන ඒ මනුස්සයව තව බය කරනවා.."

@Shan

" ලබන අවුරුද්දම මම නෑ.. මොන මගුලක් කරගනීද කවුද දන්නෙ.."

" ආධ්‍ය අයියා හිතන්නෙ බලන්නෙ නැතුව එහෙම වැඩ කරන කෙනෙක් නෙමෙයිනෙ.. අපි හොයාගමුකො කොහොමහරි.."

" Feelings like love make people fools වරද්.."

එයා පෑන් එක දිහා බලාගෙන සුදුලුනු වගයක් තෙම්පරාදු කරද්දි මම ලූනු හැන්ද අතේ තියාගෙන එහෙමම එයා දිහා බලාගෙන හිටියා.. ආදරේ කරද්දි මිනිස්සු මෝඩ වෙනවා ඇති.. මට ආච්චිඅම්මා කියලා තියෙනව ආදරේ වගේ හැඟීම් එන්නෙ හදවතින්මයි කියලා.. ඒකලු අපි කොච්චර පරිනත මනුස්සයෙක් වුණත් ආදරේ ඉස්සරහා ඒ සේරම අමතක කල්ලා දාලා වෙනස් මිනිස්සු වගේ හැසිරෙන්නෙ..

" ඔයා කියන එක ඇත්තක් තමයි.. ආදරේ කරද්දි මිනිස්සු මෝඩ වෙනවා.."

" එහෙමයි කියලා හැඟීම් වලට වහල් වෙන්න ඕනද.."

මට එයා කියපු එකට හයියෙන් හිනා ගියා.. ඉබේටම.. එයා පෑන් එක පැත්තකින් තියලා මගේ දිහා බැලුවා..

" හැඟීම් වලට වහල් වෙන්නැතුව ආදරේ කරන්න බෑ.."

" ඒ මොකද.."

" මොකද කියලද අහන්නෙ.."

මම වතුර බේරෙන්න තිබ්බ පැස්ටා එක අරගෙන ගෑස් එක ඕෆ් කල්ලා එයාව එහාට කලා..

" ඔයාම හිතලා බලන්නකො.. මම කියන්නම ඕනද.."

රධ්‍ය අයියා හිනාවෙලා අයිලන්ඩ් එකට හේත්තුවුනා..

" මොකක්ද දැන් කියන්නෙ.."

" ඔයා ඔය ගැහීම් වලට වහල් වෙන කතාව කවුරුහරි කියනවා ඇහිලා කියපු කතාවක්නෙ.. ඒක ඉබේටම කියවුණා..???"

@Shan

" අපි එහෙම කියමුකො.."

" හැඟීම් වලට වහල් වෙන එක නරක දෙයක් නෙමෙයි.. එහෙනම් මෙච්චර දවසක්ම අපි කල්ලා තියෙන්නෙ නරක දේවල් විතරයි.."

" ඒක වෙන කතාවක්නෙ.."

" වෙනම කතාවක් නෙමේ.. ඔක්කොම අයිති එකම කතාවකට තමා.. ආධ්‍ය අයියා හොයන බලාපොරොත්තු වෙන ආදරේ එයාට ලැබෙන්නෙ එහෙමද දන්නෙ නෑනෙ.. අනික ආධ්‍ය අයියගෙ ඩික්ශනරි එකේ ආදරේ කියන වචනෙ කොහොම එකක්ද අපි දන්නෙ නෑ.."

" ම්ම්.. ම්ම්.. එහෙම එකක් තියනවා තමා.."

" ඒකනෙ කියන්නෙ.. මම ඔයාට පොඩි වැඩක් කියන්නද.."

රධ්‍ය අයියා පැස්ටා එකට පෑන් එකේ තිබ්බ ඒවා කලවම් කල්ලා පැත්තකින් තියලා ඒකට පැන්ටා පේස්ට් එකක් මික්ස් කල්ලා වහලා තිබ්බා.. ඊටපස්සෙ මාව උස්සලා කිචන් කවුන්ටර් එකෙන් ඉන්දුවා..

" මොකක්ද වැඩෙ.."

මම රධ්‍ය අයියගෙ උරහිස වටේ අත් දෙක බැඳගත්තා..

" මට ඔයා හිටියා වගේ ඔයාට අයියා ඉන්නවා.. ඒ වුණාට අයියට කවුද ඉන්නෙ.. ඔයා කවදහරි හිතලා තියද.. ගෙදරක ලොකුම ලමයා වෙන එක මම දන්න විදියට හරි අමාරුයි.. අප්පච්චිලා ගෙදර නැති වුණාම ඔයාව ඒ වගේම බලාගන්නෙ කවුද.. අයියනෙ.. ඉතින් එයාට පාළු හිතෙන්නෙ නැද්ද.. අයියට ආදරේ කරන්න හොඳ නැද්ද.. එයා නිදහසේ ආදරේ කරයි.. ඔයා ලිමිට් එකේ ඉඳගෙන ඒවට ඉන්වෝල් වෙන්න.. එයාට ඔයා පොඩ්ඩක් මොනව හරි කිව්වත් දුක හිතෙනවා.. පව් ආධ්‍ය අයියා.."

රධ්‍ය අයියා මගේ කම්මුලකින් අතක් තියලා තොල් වලින් පෙක් එකක් තිබ්බා..

" I still don't understand who you are Varadh.."

" ළමායි~ ඔයාලා කොහේද ඉන්නේ.."

@Shan

රධ්‍ය අයියා මං  ගාවින් එහාට වුණා..

" අපි කුස්සියේ.."

ආධ්‍ය අයියා හෙන බඩු තොගයක් උස්සගෙන බැරුබැරුව ගෙනැත් කෑම මේසෙ උඩින් තිබ්බා..

" අයියා සුපර්මාකට් ගියාද.. මට කියන්න තිබ්බනෙ.. මම ගේනවනෙ.."

" ඕන්නෑ පොඩී.. දෙපාරක් යන්න ඕන නෑ මම ගෙනාවා.. අපො ඔයාව යවන්න හොඳම එක්කෙනා.. කියන එක නෙමේ ගේන්නෙ.."

" ඔව් ආධ්‍ය අයියෙ මෙයාව කොන් කරමු.."

ආධ්‍ය අයියා මං ගාවට එන්නත් හදලා ඉක්මනට පිටිපස්සට ගියා..

" මේ දැන් ඉන්ෆ්ලුවෙන්සා එකක් යනවා.. ඕ පී ඩී එකේ ලෙඩ්ඩු පිරිලා.. මම වොශ් දාගෙන එන්නම්.."

" හොඳ~ ගඳ~ ළමයා.."

ආධ්‍ය අයියා මහ හයියෙන් හිනාවෙවී උඩ තට්ටුවට යන්න ගියා.. මම ටක්ගාලා කිචන් කවුන්ටර් එකෙන් පැනලා ආධ්‍ය අයියා මේසෙ උඩ දාලා ගියපු ෆෝන් එක අරගත්තා..

" ප්ස්.. එන්නකො.."

රධ්‍ය අයියත් මගේ එහාපැත්තෙන් ෆෝන් එකට එබුනා..

" වට්සැප් බලන්න.. ඒකෙ ඇති සමහරවිට.."

මම වට්සැප් ලොග් වුණාම ඒක පිරිලා ගිහින් තිබ්බෙ එක එක පේශන්ලගෙ රිපෝට් වලිනුයි.. බැජ් වල හදපු ග්‍රෑප් අරවා මේවා.. රීඩ් කරපු නැති මැසේජ්ම තියනවා හාරසිය ගානක්.. ඇපෝ ආධ්‍ය අයියනම් මොනවගේ කැරැක්ටර් එකක්ද කියලා මට හිතාගන්න බෑ..

" කෝ මොකුත් නැනෙ.."

@Shan

" නෑ නෙමෙයි..මේ ආධ්‍ය අයියා සිම් එකක් අයින් කල්ලා.."

" ඔව්මයි නේද.."

" අපි කොහොමද සිම් එක හොයාගන්නෙ.."

" අපරාදෙ වරද්.. ඊයෙ අපිට නිකම් හම්බුනු චාන්ස් එක.. මිස් වෙලා ගියානෙ.."

" ඔව් අර ලුණු අහුරක් ගෙනැත් පිස්සුවක් කෙලියනෙ.."

" මමද විලිපේස්ට හැන්දක් අරගෙන මගෙ කටේ ඔබාගත්තෙ.."

" තවුසෙ තමා පීක් පීක් ගාන තාරාවෙක් මතක් කල්ලා මුලින් පටන්ගත්තෙ.."

" කිව්ව වෙලාවෙ ගිහින් පාඩුවෙ නාගත්තනම් ඉවරනෙ.."

" මාව මොකටද බේසමට-"

" තාම ඔය රණ්ඩුව ඇදෙනවද චූටි.. දෙවෙනි ඉනිම වගේනෙ.."

" නෑ අයියෙ.. මේ හැපිකව චීස් කෑල්ලට පොඩ්ඩක් නට් ලූස්නෙ.."

මම ශේප් එකේ රධ්‍ය අයියට ෆෝන් එක දුන්නහම රධ්‍ය අයියා ඒක හීමින් මෙසෙ උඩින් තිබ්බා.. ආධ්‍ය අයියා මෙසෙ උඩ තිබ්බ ෆයිල් දෙක තුනකුයි ෆෝන් එකයි අරගෙන ආයෙම උඩට ගියා..

" ආධ්‍ය අයියා මොකද ගුලි කාලා වගේ අද හිනාවෙන්නෙ.."

" ගුලි කෑවද දන්නෙ නෑ.."

" මෙ අයියට ලව් සික්ද කොහෙද හලෝ.. මෙවා හිතලා මගේ කොණ්ඩෙත් සුදුවෙනවා.."

" ඊළගපාර ක්‍රිස්මස් එකට එකට සැන්ටට ඇදගෙන යන්න පුලුවන්.."

@Shan

රඨ්‍ය අයියා මම රෝලින් පින් එක අතට අන්න යද්දිම කුස්සියෙන් යන්න ගියා..සැන්ටා? සැන්ටා පෙන්නනවා මම.. පොලොස් කොට්ටෝරුවට..

ආධ්‍ය අයියා උදේ ගෙදරින් ඉයේ මූණ දෙල් ගෙඩියක් වගේ කරගෙන.. දැන් එනකොට ඒක වෙනස්වෙල ආයෙම මල් පැලයක් වෙලා.. එක්කො ආධ්‍ය අයියට ඉගෙනගෙන වැඩි වෙලා පිස්සු.. නැත්තන් මට මේ ගැටපොලොස් කොට්ටෝරුවා එක්ක ඉඳලා පිස්සු..

" ඕන පුපක්.. ආධ්‍ය අයියට පිස්සු තමා.."

මම කවුන්ටර් එකෙන් බැහැලා කියාරා කුඩුවෙන් එලියට අරගත්තා..

" මොකත ඔවා අමුතුවට බලන්නෙ.."

මම කියාරා එළියට ගත්තහම රෙක්සි මට පොඩ්ඩක් ගොරවලා ඔලුව උස්සගෙන බලාගෙන හිටියා..

" ඔයා මට ආදරේ නැනෙ.. මාත් ආදරේ නෑ.. අපි තරහකාරයො.."

රෙක්සි මාව සහ එකකට ගනන් ගන්නෙ නැතුව කුඩුවෙන් එලියට ඇවිදගෙන ගිහින් ගෙදර දොරෙන් නොපෙනී ගියා.. අයිතිකාරයොන්ගෙ ඌස්නෙ ගහලා.. වෙන මොකක්ද..

" එන්න මගෙ කියාරා... බෝලගෙඩිය.. එක එක උද්ධච්ච පෙට්ටි කිකිලියොන්ගෙ ලොකු කම් බලන්නෝන නැනෙ.."

කියාරා මගේ පස්සෙන් ඇවිත් මම සෝෆා එකෙන් ඉඳගත්තම මගේ උකුළ උඩින් මූණ තියාගත්තා.. මම එයාගෙ බඩ වටේ අත් දෙක බැඳගෙන සෝෆා එකේ පෙරලිලා හිටියා.. කියාරා දිවත් ඇදගෙන බෙල්ල ඇද කරගෙන මගේ මූණ දිහාබලාගෙන හිටියා..

" මොකද ඔහොම බලන්නෙ.."

" මගේ රූපසොබාවට හිත වහ වැටුණ නේත.."

" හරි හරි මම දන්නවා මම හෙන ලස්සනයි කියලා.."

" ඔහොම බලන්න එපා මට ලැජ්ජ හිතෙනවා අනේ.."

@Shan

" මම ඔයාට ක්‍රවුන් එකක් හදන්නද මල් වලින්.. ඒ වුණාට මෙහේ මල් නැනෙ.."

" ඔයා එක එක කොල්ලො දිහාබලන්නැතුව හොඳ කෙල්ලෙක් වගේ හැදෙන්නෝන හරිද.."

" මමත් හැදුනෙ එහෙම තමයි.. මගෙන් ඉගනගන්න.. හරිද.."

" ඔයාට බඩගිනිද.. බඩගිනි වුණාට කරන්න දෙයක් නෑ.. පොඩ්ඩක් ඉන්න ඉවසගෙන.."

කියාරා එක අණ්ඩක් අරගෙන මගේ කට උඩින් තිබ්බා.. මේ බේසික කෙල්ලත් හැදිලා තියෙන්නෙ අයිතිකාර කොට්ටෝරුවා වගේම මහ උද්ධච්ච විදියට තමා.. පේනවනෙ.. පේනවනෙ.. එහෙම කොහොමද මගේ කට වහන්නෙ.. මම කියාරාගෙ අණ්ඩ අරගෙන පැත්තක දැම්මා..

" ඔයා කොහොමද මගේ කට වහන්නෙ ආ.. මේ කියාරා-මිමි"

කියාර ආපහු ඉස්සරහා අඩු දෙකම මගේ මූණ උඩින් තියලා හයියෙන් බුරන්න ගත්තා.. මෙකි යකෝ.. දෙන්න හිතයි.. කන් දෙක ගලවනවා මම.. දන්නෑ වරද්දගෙ හැටි..

" කියාරා පෙට්ටි කිකිලි.. යනවා යන්න..මම තරහයි.."

මම කියාරා අයින් කල්ලා දාලා යන්න හැරෙද්දි රඩා අයිආ මං දිහා බලාගෙන කට තද කරගෙන යන්න ගියා.. මම දුවගෙන ගිහින් උඩ පැනලා පස්සට එකක් දුන්නා කකුලෙන්.. ගිහින් සෝෆා එක උඩට පතබෑවෙන්න

" පෙට්ටි කුකුලා.. මොකත තවුසෙ හිනාවෙන්නෙ.."

" ආව් බං මගේ කොන්ද.. කවුද හිනාවුණේ.."

" එහෙනම් දැන් හිනාවෙගෙන ගියේ.."

" කවුද?? මම?? පිස්සුද.."

" ඔව් මට තමා පිස්සු මම යනවා ගෙදර.."

@Shan

" ආ ඔව්.. මම ඒ ඒක කියන්න ආවෙ.. කාලා යන්න ඕන.. ගිහින් ඇඳුම් අරගෙන එහෙමම යමු.."

" නෑ මම තනියම යනවා.. ගිහින් ඇවිත් ආධ්‍ය අයිය එක්ක යාළුවෙලා පැනලා යනවා.. තවුසෙ ඉන්නවා අර ඉස්සරහ ගෙදර උඩැක්කිය එක්ක.. නැත්තම් අනූද කනූද අර කතාකරන්නෙ ආධ්‍ය අයියට කවුද.. ඌව කසාද බැඳගන්නවා.. ආධ්‍ය අයියා මගේ!!!!!!!!!"

ඒ එක්කම පඩිපෙල බැහැගෙන ආපු ආධ්‍ය අයියා අන්තිම පඩිය මගෑරලා කකුල තියන්න ගිහින් එහෙමම අත් වැට අල්ලගත්තා.. ඊටපස්සෙ මං දිහා බයවෙලා වගේ බැලුවා..

" මොකක් මොන අනුවෙක්ද.."

" අනුවෙක් නෙමෙ පනුවෙක්.."

හායිම් සුදාම්මිලාහ්..

පනුවට කොටන්න ඉන්න ආධ්‍යත් කුකුලෙක්.. කුකුල් පවුල සහ නරි පවුල.. ම්ම්..

ගමෙ ගිහින් මක්කාහරි වෙයිත.. රහස්පරීක්සක දළඹු හමුදාව විමසිල්ලෙන්..

ඒකනෙමෙ අයාන් ආධ්‍ය හොඳ නැහැද.. දෙන්නම අයියලා.. අයන්නෙනෙ නමුත් පටන්ගන්නවා.. පොඩි මෙව්වා එකක් නැද්ද.. ආධ්‍ය අවයව ජාවාරම් කරනවා.. ඕගොල්ලො මේවා දන්නෙ නැහ්..

ඒවගෙන් පස්සෙ.. ඔයාලා ඔක්කොටම හුගාක් හුගාක් හුගාරියක් ස්තූතියි ඊයේ දාප් කමෙන්ට්ස් වලට.. කතාව ලියන්නෙ නැහැ අද කියලා හිත හිත ඉද්දිත් කමෙන්ට්ස් දැක්කහම මට ලියන්නම ඕන වුනා.. හැමදාම ඩේලි දීලා මේ මැසේජ් වගේකට මගේ ප්‍රතිපත්ති බිඳගෙන හරියන්නෑ..

ඔයාලා දක්වන සහයෝගයට(සහයෝගී දළඹු හමුදාව)හුගාක් ආදරෙයි වගේම ස්තූතියි.. ඒකනිසා අද ඩබල් අප්ඩේටුවක් දෙනවා කියලා මම කියන්න කැමතියි.. ලොකු එකක් දෙද්දෙඃ..

@Shan

ඩබල් අප්ඩේට් දෙන්න හරි රටක් ඉතුරුවුනේ කවුරු නිසාද.. පොඩ්ඩක් කල්පනා කරලා බලන්න..

බේසික වෙරි ගියා.. එන්නාම.. ලව් යූ.. ❤



ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 79 කොටස

" මේ හැබැයි මම තවුසෙට ගහනවා හරිද.."

" කටපියාගෙන ඉන්නකො.."

" Good evening sir..!"

රධ්‍ය අයියා හෙන ලස්සන හිනාවකුත් දාගෙන බැස්කින් රොබින්ස් එකේ අයිස්ක්‍රීම් කවුන්ටර් එකට ගියා.. මම දන්නවා.. මෙකා අද ගම කනවා කියලා.. මට හිතාගන්නත් බෑ රධ්‍ය අයියට අද මොනවා වෙලාද කියලා.. ආපු වෙලේ ඉදලම කෙලින්නෙ පිස්සු විතරයි..

මම දවල් වෙන්න අපේ ගෙදර ගිහින් මට උවමනා ඇඳුනුයි තව දේවල් වගේකුයි අරගෙන එහෙමම ගෙදර එන්න ආවා.. අපේ ගෙදර ගැන කියනවනම්.. ඒකෙන් ගන්න දෙයක් නෑ.. අම්මගෙ මල් පාත්ති අස්සට කොළරොඩු වැටිලා වත්ත අතුගාලා නැතුව පාලුවෙලා ගිහිල්ලා.. අම්මා ගෙදර නැති වෙනකොට ගෙදර හරි පාළු පාටයි.. ආයෙම ඉතින් වත්තෙ මිදුල අතුගාන්න අපේ අම්මා එන්නෙ නැනෙ..දැන් ගමේ ගෙදර මිදුළ පුරාම මල් වවනවා ඇති.. මම ඒ කාලෙ දිය දහයා කියලා කාටූන් එකක් බැලුවා පහේදි.. මමයි මාමයි අම්මට කිව්වෙ තුරුලි කියලා.. ඇයි ඉතින් අල්ලන අල්ලන තැන ගස් පැල කරනවනෙ.. තුරුලි සමානයි දේදුණු.. දේදුණු කියන්නෙ අපේ අම්මට.. දෙව්ලි කියන්නෙ අපේ ලොකු අම්මට.. දේව් කියන්නෙ අපේ මාමට.. මගේ නමේ වරද් කෑල්ල තියලා තියෙන්නෙ මාමා.. ෂනෙරු කෑල්ල අපේ ආච්චි.. උද්යෝග කෑල්ල අපේ අම්මා.. අමුතු නම් තිබිල්ලක් තමා අපේ ගෙදරත් තිබිලා තියෙන්නෙ..

මොකක් හරි කල්පනා කරන්න ගත්තහම ඉවරවෙන්නෙ වෙන මගුලකින්.. ඉතින් මම අපේ පාලුවට යන්න ගිය ලොකු අම්මලා ඉන්න දීපු ගෙදරට ගිහින් ඇඳුම් වගයක් අරගෙන රධ්‍ය අයියා එක්ක ගමේ එන්න ආවා.. මම කිව්වා හවස වැඩී.. යද්දි රෑ වෙනවා.. හෙට උදේ යමු කියලා.. කොහෙද මේ මනුස්සයට රෑම යන්න ඕන කිව්වනෙ.. අම්මපා අලියෙක්වත් මහදී හම්බුනොත් උඹ නටපං කියලා මම කැලේ පාරෙන් යාලටවත් වදිනවා.. හැබැයි යාලට වැදලා දිවියෙක්වත් හම්බුණොත් ගෞරවයෙන් බුදුසරණයි තමා.. එක්කො ශේප් එකේ රධ්‍ය අයියගෙ කිට්ටුවට වෙලාම ඉන්න ඕන..

@Shan

ඒකා අලියොන්ට මතුරන මන්තරයක්වත් දන්නවද දන්නෙ නැනෙ.. සැහවුනු කුසලතාවයක් තියද කවුද දන්නෙ.. අලි හීලෑ කරන්න පුලුවන් වග දැනගත්තොත් මම අයියට සර්කස් එකක් දාලා දෙනවා..

ඉතින් කොහොමහරි අපි ගාලු පාරෙන් කතරගමට එන්න ආවා.. අච්චර හයිවෙ එකක් තියෙද්දිදි ඒකත් එන්නම ඕන වුණේ දුර පාරෙන්.. හද්දා දුරයි අපේ ගෙදරට.. මගදි කිව්වොත් ඇඟේ ජුරයි වරද් යැයි යැයි කියලා.. රෝද හතරම ගලවලා මම එල්ලනවා බෙල්ලෙ..

මේ ගමන ආවට.. අදම ගමට යන්න පුළුවන් වෙයි කියලා මට තියෙන්නෙ හෙන සැකයක්.. මොකද මේ දැනුත්, මෙ මනුස්සයට කොල්ලුපිටියෙ ඒකත් බැස්කින් රොබින්ස් එකෙන්ම අයිස්ක්‍රීම් එකක් කන්න ඕන වුණා.. මහ හැන්දෑවෙ.. හත හමාරට විතර..??

" Very good evening.."

" May I know your order..?"

" Um..  Can you recommend something.. special for this angry bird with a pouty~ face..?"

රධ්‍ය අයියා මගේ කර වටේ අතක් යවලා මාව ඇඟට හේත්තු කරගෙන අහද්දි මම කැප් එක පහළට ඇදගෙන ඒක මූණ වැහෙන්න දාගත්තා.. මේ මිනිහා මාව කනවා..

" Sure Sir.. How About Waffle Bowl Sundae..??"

" Do you think it will fix this pouty face.. එනිවේ ඒක හොඳයි.. බබා ඔයා ඒකට කැමතියි නේද.."

මම හිටියේ හෙනට අන්කම්ෆටබල් වෙලා..මේ යකා නටන පිස්සුව අපිට එහාපැත්තෙ ඉදපු ආච්චියි සීයයි තුන් හිනාවෙවී බලාගෙන ඉන්නවා.. කැශියර් එකේ අයියයි ඕඩර් එක දාන අයියයි මං දිහා බලලා හිනාවෙලා අර කිව්ව මොකක්ද එක හදන්න ගත්තා.. මම හිමිහිට රධ්‍ය අයියගෙ ඉණ ගාවින් නියපොතු වලට අහුවුනු හරිය අල්ලලා හයියෙන් ඇද්දහම ඒකා ගැස්සිලා ගිහින් මගේ උරහිස වටේ තිබ්බ අත තද කලා..

@Shan

" Very lovely brothers.."

එහාපැත්තෙ දම්පාට ලිප්ස්ටික් එකක් ගාගෙන ඉඳපු ආච්චි රධ්‍ය අයියගෙ පිටට තට්ටුවක් දාද්දි මම කැප් එකට අස්සෙන් ලාවට හිනාවුණා..

" Um..

**Actual**

Brothers.."

රධ්‍ය අයියා අනිත් පැත්තට ඇක්වුවල් කැල්ල බර කල්ලා කියලා හිනාවුණාම ඒ ආච්චි යන්න ගියා.. අපේ ඕඩර් එක ලැබුණහම මම පාලර් එකේ හිටිය මොකෙක්වත් දිහා නොබලා කෙලින්ම කාර් එකට දුවගෙන ගියා.. මෙ මිනිහා කොහේහරි ගියොත් මාවම අල්ලගෙන බයිට් කරනවා..

" ඒක ආතල් වැඩෙ වරද්.. ඇක්වුවල් බ්‍රදර්ස්.. බල්ලි බබා ඕනද මෙක.."

" මාව කාපන්.."

මම අයිස්ක්‍රීම් කප් එක ඇදලා ගත්තා..

" පස්සෙ කමු.. හැශ්ටැග් revenge.."

මම හැන්ද අරගෙන කටේ අහගත්තා..

" ඔච්චර කේන්ති ගන්න හොඳ නෑ වරද්.. සිරාවටම කොණ්ඩෙ සුදුවුනොත්.."

" මගෙනෙ.. සුදුවෙන්නෙ.. සුදාම්මියා කළුවට ඉන්නකොහ්.."

මම සුදාම්මියා කිව්වා විතරයි රධ්‍ය අයියයගෙ මූන හට්ටියක් වෙන්න ගත්තා..

" වරද්!!"

" වරද් තමා රත්තරං.. එන්නකො ඔයාට මෙ සන්ඩෙ එකෙන් කටක් කවන්න.. කෝ ආ කියන්න~ ඔන්න එයාප්ලේන් එකා~ක්"

@Shan

" ඕක නවත්තගනින්.."

" ඇයි මම නවත්තගන්නෙ.. ඔන්න අහගන්න ඈ.. මම මේක ටික්ටොක් වර්ශන් එකෙන් කරන්නෙ.."

මම අයිස්ක්‍රීම් හැන්ද රධ්‍යා අයියගෙ කටේ ඔබලා ජීයර් එක උඩ තිබ්බ අත අරගෙන මයික් එකක් වගේ මූණට ලං කරගත්තා..

" උඹ දන්නවද සුදුඅම්මියෝ.. ආදරේ කියන්නෙ රත්තරං.. එහෙම නවත්තගන්න පුලුවන් දෙයක් නෙමෙයි.. ඒක එන්නෙ මහබඩවැලෙන්මයි.. ඔයාගෙ ආදරෙත් හරියට මහබඩවැලේදි අධික ලෙස ජීරණය වෙලා ජලය අවශෝශනය කරගත්තු ආහාර කොටසක් වගේ.. තියාගෙන ඉන්නම බෑ.. පිටකරන්නමයි හිතෙන්නෙ.."

" ඒව වරද්.. ඕක නවත්තගන්නවා.."

" ඒත් ඒ ආදරේ අස්සට වැටිච්ච.. තුච්ච වැලි ගල් කැලි.. මගේ බඩෙ උණ්ඩුකපුච්චයට ගිහින්.. මට.. උණ්ඩුකපුච්ච ප්‍රදාහය ඇතිකලා.. ඒක ඉදිමුණා.. පිපිරුණා.. මගේ ආදරෙත් රත්තරං.. ලැට් යන්න බැරිවුණ, ඇපෙන්ඩි වලින් මැරුණ මිනිහෙක්ගෙ වගේ.. පිටකරගන්න කලින් කොහෙන්දෝ ආසදනය වෙලා..ඉබේම මැරිලා ගියා.."

" මොනමගුලක්ද-"

" සුදුඅම්මියෝ ආසාදනය වෙන්න කලින් පිටකරන්න දෙන්න.. ජීවිතේ කියන්නෙ පරිපථයක්නම් ඒකෙ දුවන්නෙම ඔයාගෙ ආදරේ කියන ධාරාව විතරයි.. මම ඔයාට ආදරෙයි.."

මම රධ්‍යා අයියගෙ පැත්තට හැරිලා එයාගෙ මූණ හරවගෙන තොල් වලින් පෙක් එකක් තිබ්බා.. දසකයේ හොදම කන්ෆෙස් එක..

" මගේ ඔලුව කකියන්න ගත්තා.."

" මම අත-"

" නෑ නෑ එපා.. ඕක කන්නකො.. උඹට මලබද්ධෙද.."

" පිස්සුද අනේ.."

@Shan

" එහෙනම් පිටකරගන බෑ කිව්වෙ.. ඩල්කොලැක්ස් එකක් ඕනද.."

" ඩල්කොලැක්ස් එක අරගෙන ගහගන්නවා- ගහගන්නවා සාක්කුවෙ.. මගුල.."

මම හැදි හය හතක් විතර එකදිගට අයිස්ක්‍රීම් එකෙන් කාගෙන ගියා.. මෙක හෙන රසයිනෙ අප්පා.. කන්න කන්න ආස හිතෙනවා.. රධ්‍ය අයියා මින්ට් ෆ්ලේවර් අයිස්ක්‍රීම් එකක් අරගෙන ආඩුවෙ කකා යනවා.. කන්නෙම මේ ලෝකෙ මිනිහෙක්ට හිත හදාගෙන කන්න පුලුවන් ඒවා නෙමෙයි.. දන්නවනම් ටූත්පේස්ට් ටිකක් ෆ්‍රිජ් එකට දාලා කවනවනෙ..

රධ්‍ය අයියා ෆෝන් එක අරගෙන සිඳුවක් දැම්මා.. මම සීට් බෙල්ට් එක ගලවලා පිටිපස්සට ඇදිලා ගිහින් සීට් එකේ පොකට් එකේ ගහලා තිබ්බ කහපාට කවරයක් දාපු පොත ඇදලා ගත්තා.. ඊටපස්සෙ සපත්තු දෙක ගලවලා දාලා කකුල් දෙකහ් හොඳට උඩට අරන් පොත දිගෑරගෙන ෆෝන් එකේ ටෝච් එකත් ගහගහ්තා..

" ඕක මෙහෙත් ගෙනාවද.."

" නැතුව.. මම මේක කියවන්න ඕනනෙ.. ඒකට මම ආසයි.. ඒකෙ අයිතිකාරයට ආසම ආසයි.."

මම අහැ කොනෙන් බැලුවහම රධ්‍ය  අයියා ඩෝ එකට අතක් තියාගෙන හෙන මනමාල විදියට හිනාවෙනවා.. ඇඹල රධ්‍ය.. මූගෙ තියන මනමාලකම යකෝ..

මම ඊයෙ නවත්තපු තැන ඉඳලා කියවන්න ගත්තා.. මම ලෙඩ වුනු එක ගැනත් තියනවා.. එදා මාව ගෙදරින් බස්සලා යද්දි එයාට හිතුනලු එයා හෙන මැටීරියල් බෝයිෆ්‍රෙන්ඩ් කෙනෙක් වගේ කියලා.. තව එයා මාව පළවෙනියට කිස් කරපු දවස ගැනත් කියලා තිබ්බා.. මම බැඩ්මින්ටන් ගහනවා බලන්න ආපු නැති එක ගැන එයාට අවුල් ලු.. මගේ අත කැඩුන වෙලේ එයාට දැනුනු හැටි කියලා තියෙනවා.. එදා මගේ නළලට කිස් එකක් දුන්නු එක ගැන කියලා තිබ්බා සික් රූම් එකේදි.. මට දැන් ඔක්කොම එකපාරට ෆ්ලෑශ්බෑක් වගේ පේන්න ගන්නවා.. මම ඒ පොත අස්සෙ අතරමං වෙලා ඉද්දි රධ්‍ය අයියා මගේ දැහැන බිඳලා මහා හයියෙන් සිංදුවෙ වොලියුම් වැඩි කල්ලා දාගත්තා..

@Shan

" I'm hurting, baby, I'm broken down

I need your loving, loving

I need it now.."

" කට වහගන්නකො අනේ.. මම වැඩක්නෙ.."

" When I'm without you

I'm something weak

You got me begging, begging

I'm on my knees.."

" ආර්හ්!! අයියේ.."

" I don't wanna be needing your love

I just wanna be deep in your love

And it's killing me when you're away, ooh, baby.."

රධ්‍ය අයියා මගෙන් පොත අරගෙන ඒක වහලා පිටිපස්සට විසික් කල්ලා පැත්තක තිබ්බ වතුර බොතලයක් මයික් එක වගේ අල්ලගත්තා..

" 'Cause I really don't care where you are

I just wanna be there where you are

And I gotta get one little taste.."

**" Your sugar.."**

**" Yes, please.."**

" Won't you come and put it down on me..?"

@Shan

" I'm right here, 'cause I need.."

" Little love, a little sympathy.."

" Yeah, you show me good loving

Make it alright

Need a little sweetness in my life.."

රධ්‍ය අයියා ෆෝන් එක මට දීලා ඒක ඇස් වලින් පෙන්නුවා.. එයා සිංදු කියමු කියලද කියන්නෙ..

" ඔයාට මං එක්ක හැරෙන්නවත් බෑ හලෝ.."

" let's see.."

මම ෆෝන් එක අරගෙන සිංදුවක් මාරු කලා..

" Not too long ago, I was dancing for dollars (eeoow)

Know it's really real if I let you meet my mama (eeoow)

You don't want a girl like me I'm too crazy

Fore every other girl you meet its fugazy (okurrrt).."

" I'm sure them other girls were nice enough

But you need someone to spice it up

So who you gonna call? Cardi, Cardi

Come and rev it up like a Harley, Harley

Why is the best fruit always forbidden?

I'm coming to you now doin' 20 over the limit.."

@Shan

" The red light, red light stop, stop (skrrt)

I don't play when it comes to my heart (let's get it though)

I don't really want a white horse and a carriage

I'm thinkin' more of white Porsches and karats

I need you right here 'cause every time you call

I play with this kitty like you play with your guitar.."

" 'Cause girls like you run 'round with guys like me

'Til sun down when I come through

I need a girl like you, yeah yeah.."

රධ්‍ය අයියා මගෙන් ෆෝන් එක අරගෙන ආයෙම සිංදුවක් වෙනස් කලා.. අපි දෙන්නම කන පැලෙන්න සිඳු දාගෙන සිඳු අහනවා.. රෑ වෙගෙන එන නිසා සෙනග පාරවල් වල අඩුවෙන් එන්නෙ.. අනික මේකා ඇරලා යනවනෙ හැටට හැටේ..

" Sí, sabes que ya llevo un rato mirándote

Tengo que bailar contigo hoy (DY)

Vi que tu mirada ya estaba llamándome

Muéstrame el camino que yo voy.."

" Oh, tú, tú eres el imán y yo soy el metal

Me voy acercando y voy armando el plan

Solo con pensarlo se acelera el pulso (oh yeah)"

" Ya, ya me estás gustando más de lo normal

@Shan

Todos mis sentidos van pidiendo más

Esto hay que tomarlo sin ningún apuro.."

**"Despacito"**

" Quiero respirar tu cuello despacito

Deja que te diga cosas al oído

Para que te acuerdes si no estás conmigo

Despacito

Quiero desnudarte a besos despacito

Firmar las paredes de tu laberinto

Y hacer de tu cuerpo todo un manuscrito (sube, sube, sube)

(Sube, sube) Oh.."

" ඔක පරණයි සුදාම්මියෝ~"

" Bardi (Cardi)

He say he wanna touch it, and tease it, and squeeze it

While my piggy bank is hungry, my nigga, you need to feed it

If the text ain't freaky, I don't wanna read it

And just to let you know this punani is undefeated, ay

He say he really want to see me more.."

" I said we should have a date, where? At the Lamborghini store

I'm kinda scary, hard to read, I'm like a ouija board

@Shan

But I'ma boss, bitch, who you gonna leave me for?

You hoes got no class, you bitches is broke still

I'll be talkin' cash while I'm poppin' my gold grill (uh)

I'm a hoe, rich bitch and I work like I'm broke still (Cardi)

But they love be so fake, but they hate be so real (uh)

El booty sobresale de mi traje

No traje pantiesito pa' que el nene no trabaje

Es que yo me sé lo que tú cree que tú no sabe

Dice que no quiere pero se quiere comer el equipaje.."

" Báilame como si fuera la última vez

Y enséñame ese pasito que no sé

Un besito bien suavecito, bebé

Taki taki

Taki taki, rumba.."

" ඇයෙද් අලුත් එකක්ද ඔය.."

" A lucky, lucky girl

She got married to a boy like you

She'd kick you out if she ever, ever knew

'Bout all the - you tell me that you do

Dirty, dirty boy

@Shan

You know everyone is talking on the scene

I hear them whispering 'bout the places that you've been

And how you don't know how to keep your business clean.."

" Mummy don't know daddy's getting hot

At the body shop, doing something unholy

He's sat back while she's dropping it, she be popping it

Yeah, she put it down slowly

Oh-ee-oh-ee-oh, he left his kids at

Ho-ee-oh-ee-ome, so he can get that

Mummy don't know daddy's getting hot

At the body shop, doing something unholy (woo).."

අපි හෙන වෙලාවක් සිංදු කිය කිය වාහනේම දෙවනත් කලා.. වින්ඩෝවස් පහලට කල්ලා හෙන හයියෙන් මහ රෑ කවුරුත්ම නැති පාරක පිස්සො වගේ සිංදු කියන එකත් මාර ආතල් වැඩේ.. ස්පැනිශ් සිංදු වලට අපි වෙනම ලැන්ග්වේජ් හදලත් කිව්වා.. එතකොට වෙලාව දොළහට ඇති.. මගේ උගුර ලෙප්ට් වෙලා තිබ්බෙ.. මම වාහනේ ඩෝ එකට පිට තියලා ඉදගෙන කකුල් දෙක රධ්‍ය අයියගෙ උකුල උඩින් තියාගත්තා.. වින්ඩෝ එකෙන් එළියට මගේ කොණ්ඩෙ වැටිලා ඒවා හුළගට ගහගෙන යනවා.. රෑ මුදු හුළගයි මෙක යන වේගෙ නිසා ඇතිවෙච්ච හුලගයි.. සේරම මට දැනෙද්දි මම පහුවෙන අහස දිහා බලාගෙන ඉදලා ඇස් දෙක පියාගත්තා..

හුළං මගේ කොණ්ඩෙ අස්සෙන් එහෙට මෙහෙට යනවා.. කියාගන්න බැරි නිදහසක් මට දැනුනා.. සිරාවටම මෙක හීනයක්නම්.. මෙ කලෙ හීනයක්නම්.. මට නැගිට්ටින්න ඕන නෑ.. ජීවිත කාලෙම කෝමා වෙලා වගේම ඉන්න හිතෙනවා.. මනුස්සයො ජීවත්වෙනවා කියලා කියන දැනෙන හැගීම මෙක වෙන්නැති කියලා මම හිතාගත්තා..මට දැනුනා රධ්‍ය අයියා මගෙ එකකුල පහලට රූට්ටලා යන්න නොදී ආයෙම උකුළ උඩින්

@Shan

තියාගන්නවා.. එයා මියුසික් ඔෆ් කල්ලා තිබ්බෙ ඒ වෙද්දිත්.. එක අතකින් මගේ අළුපාට සොක්ස් එකක් පහළට උඩට රෝල් කරනවා.. මම මගේ අතකින් කොණ්ඩෙ පිටිපස්සට තල්ලු කරගෙන ඇස් පියාගෙන හිටියා.. හුගක් වෙලා.. මට නින්ද ගිහින් නෙමෙයි හිටියේ.. ඒ වුනාට නිදාගන්නවා හා සමානම හැගීමක හිටියා.. ටිකකින් මට ඇහුනා මොකක් හරි කෑන් එකක් කැඩෙන සද්දයක්.. මම ඔලුව උස්සලා බැලුවා..

රධ්‍ය අයියා Carlsberg බියර් කෑන් එකක් කඩලා උගුරක් බිලා ඒක පැත්තකින් තිබ්බා.. ඊටපස්සෙ මගේ දිහා බලලා අතක් දික් කලා.. මම ඒ අත අල්ලගෙන කෙලින් වුනාම එයා ශටර්ස් වහලා දැම්මා..

" ඔයා ඇල්කොහොල් ගන්නෙ නැනෙ.."

" ඉදලා හිටලා බියර් එකක් බොනවා.. එච්චරයි.. ඒකෙ මහාලොකු ඇල්කොහොල් ප්‍රසන්ටේජ් එකක් නැනෙ.."

" මම.."

මම බාගෙට සීට් එකට හේත්තුවක් දාගෙන රධ්‍ය අයියා දිහා බලාගෙන හිටියා..

" වරද් එපා!!!"

මම හිමිහිට සොක්ස් දාපු කකුලකින් රධ්‍ය අයියගෙ ශෝට් එකේ බටන් එක ගලවන්න පුලුවන්ද කියලා ට්‍රයි කර කර හිටියේ.. අපරාදෙ කෑගැහුවෙ නැත්තම් මට ඒක ගලවගන්න තිබුණා..

" මම මොකක්ද කලේ.."

" කලේ..?? කකුල එකවිදියක තියගෙන ඉන්න.."

" ඌප්ස්.. සොරි සොරි.."

රධ්‍ය අයියා මගේ දිහා බලලා ආයෙම බියර් කෑන් එක අරගෙන උගුරක් බිව්වා.. තනියම බොන්නෙ මටත් දෙන්න එපැයි.. මම පව් නැද්ද.. අනික ඇල්කොහොල් මීන්ස් නතින් ටු දිස් ගයි..

" මටත්.."

@Shan

" මොනවද.."

" carlsberg බොන්න ඕන.."

රධ්‍ය අයියා මට නෝන්ඩියට හිනාවෙලා කට අතකින් වහගත්තා..

" මොකද නිකම්- හිනාවෙන්නෙ ඔවා.."

" නෑ නෑ කවුද හිනාවුනේ.."

මම බියර් කෑන් එක අරගෙන උගුරු පහ හයක්ම හෙන අමාරුවෙන් බිව්වා.. ඇත්තටම අර වාටර් නැති වෙන්න ඕන කියලා මගුලක් හිතිලා තමා එහෙම බිව්වෙ.. මගේ උගුර ලෙප්ට් වෙන්න ගියා.. බොහොම හොඳයි පලවෙනි පාර බියර් අත්දැකීම.. රධ්‍ය අයියා මගෙන් කෑන් එක උදුරලා ගත්තා.. උදුරලා ගත්තු එකත් හොඳයි.. ඒ ජරාව තිත්තම තිත්තයි.. මල ජරාවක්ම තමා.. හැබැයි පොඩ්ඩක් උගුරෙන් පල්ලෙහාට ගියාම අමුතු අටියකුත් තියෙනවා.. ඇග උනු වෙනවා වගේ.. ම්ම්.. රසයි..

" ආ බිව්වනෙ.. දැන් නටන්න නම් ලෑස්තිවෙන්නෙපා.. නිදාගන්න.."

" ඒ මොකත *හික්* නිදාගන්නෙ.."

"....."

" ආ ඇයි ඒ.."

"....."

" කියන්නකො ඇයි නිදාගන්නෙ.."

" ඔක නිසා තමා බොන්න එපා කිව්වෙ.."

" ඔයා මට බොන්න එපා කිව්වද *හික්* බොරු කියන්නෙපා අයිසෙ නෙමෙ අයියෙ.. අයියෙ.."

"....."

" This is a modern fairy tale

@Shan

No happy endings

No wind in our sails

But I can't imagine a life without

Breathless moments

Breaking me down, down, down, down.."

" වරද්.. නිදාගන්න දැන්.. You're drunk.."

" I'm not drunk.."

" ම්ම්.."

රධ්‍ය අයියා මං දිහා බලලා හිනාවෙලා පහලට රූට්ටලා වටෙන්න ගිය කකුල අරගෙන උකුළ උඩින් තියාගත්තා..

" ඔයා හරී~ම හොඳයි.."

" මම..?? ඒ මොකද එකපාරටම.."

" එකපාරටම නෙමේ අනේ.."

මම ඇඳුමෙන් ගලවගත්ත නූලක් ඇඟිලි දෙකේ පටලගෙන රධ්‍ය අයියගෙ උකුලෙන් කකුල් දෙක අරගෙන ඒක පපුව ගාවට ලං කරන් නමාගෙන සීට් එකට හේත්තු වුනා..

" ඔයා කොහොමත් හොඳයි.."

" එහෙමද.."

" ම්ම්.. මම කල්පනා කලේ.. මම කල්පනා කරන්නෙ.. ඇයි ඔයාගෙ ඇස් පිහාටු දිගට තියෙන්නෙ.. ඇයි ඒ.."

" එහෙම හොඳ නැද්ද.."

@Shan

" නෑ එහෙම හොඳ නැත්තෙ නෑ.. එහෙම හොඳයි.. මම ඒවට ආසයි.. මම ඒවා දිහා බලන් ඉන්නවා.."

" ම්ම්.."

" මට ඉස්කෝලෙ මතක් වෙනවා.."

" එක සැරේම..??"

මම ඉස්සරහා පේන ලොකු කණුවක් දිහා බලාගෙන හිටියා.. අපි ඉන්නෙ ගාල්ල හරියෙද.. කොහේහරි.. මම මේ පැති ගැන දන්නෙ නෑ.. දැන් මහ පාන්දරනෙ..

" එකසැරේම නෙමෙ.. මම තව අවුරුද්දකට කිට්ටුවෙන්න ඉස්කෝලෙ යන්න ඕනනෙ.."

" ඔයා හෙඩ්ප්‍රිෆෙක්ට් වෙන්නෙ කැමත්තෙන් නෙමෙයිද.."

" නෑ කැමතියි.. හද්ද වන්නියෙ ඉඳලා කොළඹ තියන හොඳම ඉස්කෝලෙට ගිහින් ඒකෙ හෙඩ් ප්‍රිෆෙක්ට් වෙනවා කියන්නෙ.. හොඳයිනෙ.."

" ඔයා කොළඹ ඉන්න කැමතියිනෙ.."

" ඔව්.. මම ආදරේ දේවල් තියෙන්නෙ එහෙ.. ඔයා ඉන්නෙත් එහෙ.. මෙහෙ මට කවුරුත් නෑ.. මම ඉපදුනා විතරනෙ.."

" ඇයි පරණ ඉස්කෝලෙ..??"

" මම ඔයාට ඒ ගැන කියල නෑ නේද හුගක්.. මට එහේ යාලුවෙක් නෑ.. යාලුවො නෑ.. මට කවුරුත් ආස නැනෙ.."

" ඒ ඇයි.. එහෙම වෙන්න හේතුව මොකක්ද.. ඔයාට අකමැති අයත් ඉන්නවද.."

" අපෝ ඔව්.."

මම ඇස් දෙක පියාගෙන කල්පනා කලා.. මට අකමැති අයව.. ලිස්ට් එකක්ම ඉන්නවනෙ..

@Shan

" ගොඩක් ඉන්නවා.. අපේ ලොකුඅම්මා.. ලොකුතාත්තා. එහේ ලොකු අයියා.. වෙලාවකට වගේ අපේ අම්මා.. පරණ ඉස්කෝලෙ යාලුවො.. තාත්තා.. පරණ ඉස්ක්ලෙ ටීච.. තව ගොඩක්.."

" ඇයි ඉස්කෝලෙ යාලුවො තරහවෙන්න හේතුව..??"

" එහෙ අය වෙනස්.. මෙහෙ වගේ නෙමේ.. මට හිනාවෙනවා.. කවුරුත් ආස නෑ මගේ තාත්තා නැනෙ.. මාව හම්බුණොත් කාලකන්නියි කියනවා.. අනේ මන්දා.. මම එහෙම නෑ..

ආච්චිඅම්මයි මාමයි කියන්නෙ මම එහෙම නෑ කියලා.. මම කවදාවත් ගමේ ජීවත් වෙන්නෙ නෑ.. මම ආස නෑ, මට ආස නැති අය ඉන්න තැන් වල ඉන්න.."

" ඔයා එහෙම තැන්වල ඉන්න ඕන නෑ වරද්.."

" ම්ම්.. මම කොළඹ ආපු මුල් කාලෙ මට හිතුනා මම මෙහෙට අයිති කෙනෙක් නෙමෙයි කියලා.. මම කොහෙටවත් අයිති කෙනෙක් නෙමෙයි කියලා මම හිතුවා.. මට ඉංග්‍රීසි බෑ.. එහෙම කොන් වෙලා ඉද්දි මට මේ ලෝකෙ හොඳම යාලුවා හම්බුනා.. සෙනුක තමයි මගේ පලවෙනි යාලුවා.. එයා තාම මගේ හොඳම යාලුවා.. එතනින් පස්සෙ මේ වෙනකල්ම අලුත් අය හැමදාම මට හම්බෙනවා.. දැන් අයිති නෑ වගේ හැඟීම දැනෙන්නෙ නෑ.. ගමේ ඉස්කෝලෙ වගේ කවුරුත් මගේ ස'නේම් එක අහන්නෙ නෑ.. ඒක නැතිවුනා කියලා කවුරුත් මට හිනාවෙන්නෙ නෑ.. No one will underestimate me.. I believe that nobody can do that.."

" Surely.. no one can stop you now.. you are going at it like a shot fired from a gun.. ඔයා දැනටමත් ඒම් එකකට යන ගමන් ඉන්නෙ වරද්.."

" මම දන්නවා.. අවුරුදු විස්සකට මේ ඇති.."

මම කකුල් දෙක පහළ දාලා රධ්‍ය අයියා දිහා බැලුවා..

" මම ඔයාට ආදරෙයි.."

රධ්‍ය අයියා හිනාවෙලා මගේ කම්මුලකට තට්ටුවක් දැම්මා..

@Shan

" මමත් ඔයාට ගොඩක් ආදරෙයි.."

" මට ජීවිතකාලෙටම හම්බුනු හොඳම කෙනා ඔයා.. කලින් මට එහෙම අය හම්බෙලා නෑ.. ඉස්සරහටත් හම්බෙන එකක් නෑ.. මම දැන් මේ ලෝකෙ බයම දේවල් වලින් එකක් තමයි ඔයාව නැතිකරගන්න එක.. ඒක එහෙම වෙන්න ඕන නෑ.."

" එහෙම වෙන්නෙ නෑ.."

මම ලොකු හුස්මක් පහල දාලා රධ්‍ය අයියා දිහාවට හැරුණා..

" මට හග් එකක් ඕන.."

රධ්‍ය අයියා එකපාරම හැරිලා මගේ දිහා බලලා ආයෙම ඉස්සරහා බලාගත්තා.. අපි දිගටම ආවෙ මූදුවෙරළ පේන මානෙමයි.. රෑට මුහුදෙ සද්දෙ වැඩියි වගේ හිතෙනවා.. මූදට බය හිතෙනවා.. පාරෙ කවුරුවත්ම හිටියෙ නෑ.. පේන මානෙක අඩුම තරමෙ වාහනයක්වත් නෑ.. රධ්‍ය අයියා කාර් එක පාර අයිනකට කල්ලා නවත්තලා සීට් එක පිටිපස්සට ඇදගත්තා.. එයාට අමාරු ඇති.. පැයගානක්ම ඩ්‍රයිව් කරන එක අමාරුයිනෙ.. කකුල් හිරිවැටිලා වගේද දන්නෙ නෑ.. එයා එයාගෙ අත් දෙක දෙපැත්තට කල්ලා මට කතාකලා.. මම පොඩ්ඩක් එයාගෙ පැත්තට ඇදිලා ගිහින් එයාගෙ බෙල්ල කර වටේ අත් දෙක ඔතාගෙන උරහිසේ ඔලුව ගහගත්තා.. එයා ගාව අර උණු රස්නෙ දැනෙනවා.. ඒක කොච්චරටම සනීපද කියනවනම් මට ඒක කියන්න වචන එන්නෙ නැති තරම්.. ඒක විඳින්නම ඕන හැඟීමක්..

රධ්‍ය අයියා මාව උස්සලා අරගෙන එයාගෙ උකුලෙන් තියාගත්තා.. එයා ගාව ගුලිවෙන්න තරමට ඉඩ තියෙනවා.. මම කකුල් දෙක මං ගාවට ලං කරගෙන රධ්‍ය අයියගේ බෙල්ලයි උරහිසයි අතරෙ ඉඩට මූන තියාගත්තා.. එයා ගාව අර අලුත් ප'ෆියුම් එකේ සුවඳ දැනෙනවා.. මම ඒකට ආසයි..

" වරද්.. ඔයා මම යන එක ගැන හැමතිස්සෙම හිතනවද.."

" ම්ම්.."

රධ්‍ය අයියා මගේ පිට උඩ ඉඳලා පහලට එහකොට ආයෙම පහල ඉඳලා උඩට තාලෙකට අතගානවා.. මම එයාගෙ කොන්ඩෙ පිටිපස්සෙන් ඇඟිලි අරගෙන ගියා.. එයා සීට් එක පිටිපස්සට ඇදගෙන තිබුනු නිස එයායි

@Shan

ස්ටියරින් වීල් එකයි අතර ඉඩ හැදිලා තිබ්බා.. ඒකනිසා රධ්‍ය අයියා කකුල් හොඳට දිගෑරගෙන හිටියා..

" Hugs were invented to let people know you love them without having to say anything.."

මම රධ්‍ය අයියගෙන් පොඩ්ඩක් මෙහාට වෙලා එයාගෙ කම්මුල් අත් දෙකින අල්ලගත්තා.. ඒවා ලාවට ගොරෝසුයි.. කටු කටු වගේ දැනෙනවා.. මම එයාගෙ තොල් වලින් පෙක් එකක් තිබ්බා.. එයා මගේ තොල් වලට පහත් වෙලා මාව පරිස්සමට කිස් කලා.. මගේ ඇස් මත් වෙලා පියවෙන්න එනවා.. එයා හුගාක් වෙලා මාව තුරුල් කරගෙන හිටියා.. මම හිතන්නෙ මම හොඳින් කියලා දැනෙනකල්ම එහෙම හිටියා.. ඇත්තටම ඒක බෙහෙත් එකක් වගේ.. පොඩ්ඩ පොඩ්ඩ මගේ වේදනාව ඇබ්සෝබ් කරගන්නවා.. මම මේ ලෝකෙ දන්න ආදරේ හිතෙනම හග් එක එයා.. feel safe and loved..

මගේ ඇස් පියවෙලා යනවා එක්කම මට එයා මගේ නලලට දිගම දිග හාදුවක් දෙනවා දැනුනා..හාදුවක්ම නෙමේ.. එයා එයාගෙ තොල් මගෙ නලලෙ පැත්තක් තදකරගෙනම හිටියා.. ඊටපස්සෙ මට හොඳටම නින්ද ගියා..

" වරද්.. වේක් අප්.."

මම අවදි වුනේ රධ්‍ය අයියා මගේ උරහිසට තට්ටු කරනවා දැනිලා.. කාර් එකේ වෙලාව පාන්දර හතර හමාරයි කියලා වැටෙනවා.. අපි එච්චරවෙලා ආවද.. මට කොයිවෙලේද නින්ද ගියේ.. මම මූණ අත් දෙකෙන් පිහිදගෙන සීට් එකේ කෙලින් වෙලා ඉඳගත්තා.. සීට් එක පහළට කඩලා තිබුනේ..

" බබා.. මේ හරියෙ ඉඳන් මට කියන්න.. ඔයා දන්නවා නේද.."

" මම්ම්?? ඔව් මෙහෙම දිගටම ගිහින් ඔය ඉස්සරහා පාරෙන් වමට.."

" මේකද.."

" ඔව්.. ඔය කඩයක් තියෙන්නෙ.. ඔතනින් දිගට ගියාම හම්බෙන පලවෙනි අතුරුපාරෙ ඉවරවෙන ගෙදර.."

@Shan

" හරි හරි.."

අපි ගෙදර ගාවටම ඇවිල්ලත් එක්කන්.. අම්මගෙන් කෝල් දෙකතුනකුත් ඇවිල්ලා.. රධ්‍ය අයියට මහන්සිත් ඇති හොඳටම..

අපි ගෙදරට යද්දි ගෙදර මිදුලේ නව කාර් එකක් නතර කල්ලා තිබ්බා.. ආච්චිඅම්මා ඉස්තෝප්පුවෙ.. අපේ ගෙදර අය කොහොමත් හතරට අවදිවෙනවා.. වැඩිම වුනොත් හතර හමාර වෙයි.. නැත්තන් පහ..

" මෙ ඉන්නෙ ආත්තම්මා නේද.."

රධ්‍ය අයියා හෑන්ඩ්බ්‍රේක් එක අදලා සීට්බෙල්ට් එක ගලවල ස්ලිපර්ස් දෙකක් දාගත්තා.. මම මෙස් දෙකත් ගලවලා දාලා කොන්දෙ හිරි යවාගත්තා..

" ඔව් මෙ ඉන්නෙ ආත්තම්මා.. අර ඉන්නෙ ඉතින් ඔයා දන්නවනෙ.. අපේ අම්මා.."

මමයි රධ්‍ය අයියයි හිනාවෙගෙන වාහනෙන් බැස්සට මගේ හිතේ තියන අනිත් ප්‍රශ්නෙ මෙ කාර් එක කාගෙද.. ඒ එක්කම රධ්‍ය අයියා මට ඇඟිල්ලකින් ඇනලා පැද්දෙන ඔංචිල්ලාව පෙන්නුවා..

" වරද්.. ඔයාට අයියා කෙනෙක් එහෙම නෑ නේද.. අර කවුද.."

යකෝ හොල්මන් වගේ.. මෙ මොන මගුලක්ද මෙ ගෙදර පාන්දර හතරට ඔන්චිල්ලා පදින්නෙ.. මම පැද්දෙන ඔංචිල්ලාව දිහා බැලුවා..

මොකක්!!!!!!!!!!!!!!!!!!!!

" මාමා...!!!!!!!!??"

" ආ..??



එන්නාම්.. ලව් යූ ❤

ප.ලි.

@Shan

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 80 කොටස

" කිරිපුතේ~"

අපේ මාමා ඔන්විල්ලාවෙ ඉඳන් අමුතු හීනාවකුත් දාගෙන මගේ දිහාට ඇවිදගෙන ආවා.. කවුද යකෝ කිරිපුතා.. ඒක ඇහුනා විතරයි අම්මයි ආච්චියි රධ්‍ය අයියයි තුන්දෙනාම හිනාවුණා..

" මාමෙ!!!"

" මොකද මොකද .. මේ වරද්ගෙ හොඳම යාලුවා කිව්වා නේද.. යමු පුතා ඇතුළට.. කිරිපුතේ ගෙට වරෙන්.. නැත්තන් එළියෙන් ඉඳපන්.."

" පාඩුවෙ ඉන්න දේව්.. ආපුගමන්ම ඒ ළමයා අවුස්සගන්නෙ නැතුව.. එන්න පුතාලා ගෙට.."

අපේ මාමා මාව එහාට විසික් කරලා රධ්‍ය අයියගෙ රට අතකුත් දාගෙන ගෙට ගියා..මෙක යකෝ.. හරි මගුලක්නෙ.. මාව පිලිගන්න මොකෙක් වත් නෑ.. මම හිමින්සැරේ අම්මට කිට්ටු වුණා.. අම්මා මගේ අතේ තිබ්බ බෑග් එක ගත්තා..

" අම්මා නැතුව ගෙදර පාළුයි.."

" දන් ආවනෙ ඉතින්.. මහන්සිද.."

" ටිකක්.. මට නෙමෙ රධ්‍ය අයියයට මහන්සි ඇති..පැය කීයක් ආවද.."

" මම කාමරේ ලෑස්ති කලා.. ගිහින් ඇඟ සෝදගෙන කන්න එන්නකො.. ඊටපස්සෙ හොඳට නිදාගන්න.."

අපේ අම්මා මාව එක්කගෙන ගෙට යද්දි මාමා රධ්‍ය අයියට එයාගෙ කාමරේ පෙන්නන්න එක්කගෙන ගිහිල්ලා.. ආච්චිඅම්මා කිරි වීදුරු දෙකක් ගෙනැල්ලා මේසෙ උඩින් තිබ්බා..

" සුදුමහත්තයා ඇදිලා ගිහිල්ලා.."

@Shan

අපේ ආච්චි අම්මගෙ තියරියට අනුව මම කවදත් ඇදිලා ගිය එකාය.. ඒ වුණාට එහෙම කියන්නෙ අර බොරුවට වගේ.. ඇදිලා ගිහින් කිය කිය කවන්න පුලුවන්නෙ එක එක ජාති.. අපේ ඉස්කෝලෙහාමිනෙත් කපටිම නෑ.. මම ගිහින් ආච්චිඅම්මගෙ කම්මුලට හාද්දක් දුන්නහම ආච්චි 'මල කෝලන්' කියලා මගේ බඩට එකකුත් ඇනගෙන කුස්සියට ගියා..

" ඒ අයියේ~"

" පුතා වොශ් එකක් දාගෙන එන්නකො.. පැය ගානක ඩ්‍රයිව් එකක්නෙ.. මහන්සිත් ඇතිනෙ.."

" එහෙමම නෑ මාමෙ.."

මේක යකෝ..මාර ලව් එකක්නෙ.. පැය ගැනක ඩ්‍රැයිව් එකැක්නෙ යැයි යැයි තමා.. අපේ මාමා මම ආවා කියලා ගනන් ගත්තෙවත් නෑ.. පොඩ්ඩක් පුදුම වෙලා ඇවිත් මට හාද්දක්වත් දීපන් එහෙමවත් නෑ..

" එහෙන් කීයටද පුතාලා ආවෙ.."

" ටිකක් රෑ වුණා මාමෙ.. ඒත් රෑ ආපු නිසා ලොකු මහන්සියක් නෑ.."

" ඒකනම් ඇත්ත තමා.. මමත් මේ ඊයෙ හවස ආවෙ.. වරද් කියලා තිබ්බෙ එයා එනවා කියලා විතරනෙ.. පුතා එනවා කියලා තිබ්බෙ නෑ.."

" ආහ්.."

රඩ්‍ය අයියා ගැනු ලමිස්සි වගේ අපේ මාමට ඇඹරි ඇඹරි උත්තර දෙනවා.. මම දොර රෙද්ද එහාට කරගෙන කාමරේට ආවා..

" මේ මාමෙ.."

" මොකද.."

" මොකද ඔවා නිකම්.. ගහන්න වගේ කතාකරන්නෙ.."

" ගහන්න තමා ඇයි.."

" මට කලිසමක් දෙනවා.."

@Shan

" අමුඩයක් එපාද.."

" අනේ මේ මාමෙ!!!"

" මගේ අල්මාරියෙ ඇති.. පුතා වැඩිය හිතන්නෙපා අපේ කිරිපුතාට පොඩ්ඩක් ට්‍රැක්.."

රධ්‍ය අයියා මම දිහාබලලා නොන්ඩියට හිනාවුනා.. උඹ හිනාවෙයන් ඉතින්.. සේරම එකතුවෙලා මටම හිනාවෙයල්ලා.. මම දොර රෙද්ද 'පොහ්' ගාලා ගස්සගෙන කාමරෙන් යන්න ගිහිල්ලා ඒක ඇඟ වටේ ඇඹරිලා හිර වෙලා තව ටිකක් වාටර් වුණා.. අම්මට කියන්නෝන අලුත් කර්ටන් දාන්න කියලා..

මම මාමගෙ අල්මාරියෙන් ශෝටකුයි මගේ ශර්ට් එකකුයි අරගෙන ගිහින් හොඳට නාලා සුවඳ ගගහා එද්දි අම්මා කුස්සියේ උයනවා ආච්චි එක්ක.. මාමා එළියෙ කා එක්කද කතාකරනවා.. මම ටවල් එක බෙල්ලෙ පටලගෙන හිමින් සැරේ රධ්‍ය අයියගෙ කාමරේට එබුණා.. එයා නාලා කොණ්ඩෙ පිහිදනවා ඇඳේ ඉඳන්..

" ඔයා වොශ් දැම්මද.."

රධ්‍ය අයියා මගේ පැත්ත හැරිලා ඔලුවෙ තිබ්බ ටවල් එක කර වටේ දාගත්තා..

" ඔව්.. මෙහේ වතුර මාර සීතලනෙ වරද්.."

" ළිඳේ වතුර සීතලයි කොහොමත් උදේට.. ඔයාට අනිත් එකෙන් නාන්න තිබ්බනෙ.. ඒකෙ උණුවතුර තිබ්බා.."

" නෑ නෑ ඒක මරු.. සීතල වුණාට සනීපයි.. මහන්සි ගතියත් ගියා.. ඒ වරද්.. සිරාවට මෙහේ මරුනෙ.."

" එහෙමද.."

" ඔව්.. මාරම ගෙදරක් වගේ.. මම කලින් මෙහෙම පැත්තක ඇවිල්ලා ඉඳලම නෑ.."

" ඉතින් අපි ටික දවසක් ඉමු.. මෙහේ එහේ වගේ බෝරින් නෑ.."

@Shan

මම ගිහින් රධිය අයියගෙ කාමරේ ජනේලෙ ඇරියා.. ඒ කාමරේ තියෙන්නෙ ගෙදර වෙල පැත්තට වෙන්න.. වත්තෙන් වෙලට බහින්න පොල් කඳවල් දෙකක් දාලා ඒකා උඩින් ලී දාලා පොඩියට පාලමක් වගේ එකක් හදලා තියෙනවා.. එතන යටින් ඇලපාරක් යන නිසා.. එතනින් ගිහින් වෙලට බහින්න පුලුවන්.. එහාට වෙන්න දිගටම තියෙන්නෙ වෙල් යාය..

" වවෝහ්~"

රධ්‍ය අයියා ජනේලේ ගාවට ඇවිත් වෙල් යාය දිගා බලාගෙන හිටියා.. මේ කාලෙ ගොයම් පැහෙන කාලෙ නිසා හැම පැත්තෙම ගොයම් ගස් උසට වැවිලා.. ලියදි නිල්ල ගැහිලා වගේ තියෙන්නෙ.. ඈතින් උදේ ඉර නැගගෙන එනවා මෙහෙට පේනවා..

" මෙහේනම් පිස්සු හැදෙනවා.. අපේ අයියටත් එන්නනෙ තිබ්බෙ.."

" ඔව් අපරාදෙ.. හොස්පිටල් නැත්නම් එන්න තිබ්බා.."

" ඒකතමා.."

රධ්‍ය අයියා ෆෝන් එකෙන් ෆොටෝ එකක් ගහලා ආධ්‍ය අයියට සෙන්ඩ් කලා.. ඒ එක්කම වගේ ආධිය අයියගෙන් කෝල් එකක් ආවා..

" පොඩී.. ඔයාලා පරිස්සමට ආවා නේද.."

" ඔව් අයියෙ.. අයියා උදේ වැඩට යනවද.."

" අද තියටර් පොඩී.. මම උදේ ගිහින් එන්න රෑ වේවි.."

" කෝ මටත් දෙන්නකො අනේ.. හායි ආධ්‍ය අයියේ.."

" ආ චූටියො.. මොකද අපේ එක්කෙනා කියන්නෙ ගම හොඳයිලුද.."

" ඔව් අනේ.. ඔයාත් එන්නනෙ තිබ්බෙ.. අපරාදෙ.."

" ඊළඟපාර මමත් එන්නම්කො හොඳද.. මම දැන් යන්න රෙඩි වෙන්න ඕන ළමයි.. බායි.. ටේක් කෙයා.."

" බායි.. හුළගෙ පා කල්ලා කිස් එකක් එව්වා.. අල්ලගන්න.."

@Shan

ආධ්‍යායියා හිනාවෙවී කෝල් එක කට කල්ලා දැම්මා.. රධ්‍ය අයියා ජනේලෙ එල්ලිලා එළිය බලාගෙන ඉන්නවා.. මම ෆෝන් එක ඇඳ උඩට දැම්මා..

" කෝ මෙ ළමයි දෙන්නා~ එන්න ළමයි කෑම කන්න.."

අපේ අම්මා කාමරේට එන්නෙ නැතුව එළියේ ඉඳන් කතාකලා..

" ඉන්න එන්නාම.."

" වරද්.. කොහෙද අර එහා ගෙදර ගෑණියෙක් ඉන්නවා කිව්වෙ.."

ඒකද මෙච්චරවෙලා ජනේලෙ එල්ලිලා බලලා තියෙන්නෙ.. සැක්.. මම හිතුවෙ පරිසරේ සුන්දරත්වය බලනවා කියලා.. හරිම අගෙයි වරද්ගෙ බෝයිප්‍රෙන් නම්.. ඉරිසියාව ඉහේ ඉඳන් බෙරෙනවා..

" කොහෙ  ගෑණුද අනේ.."

" ඇයි එහාගෙදර ඉන්නවා කිව්වෙ.."

" ඉතින් හත්දෙයියනේ එහාගෙදර ඉන්නවා කියලා දැන දැනත් මගෙන් අහන්නෙ.."

" ඉතින් කෝ.."

" කියන්නකෝ~

මටමයි ආදරේ~ ආදරේ~ කාටවත් නොවෙයි කියලා~"

" වරද්..!!"

" මේ පස්සෙ පෙන්නන්නම් සුදාම්මියා ඔයා එන්න කන්න.."

මම යන්න යද්දි ඔටෝම උලුවස්සෙන් එහාට විසික් වුනා.. රධ්‍ය කියන පොලොස් කොට්ටෝරුවා මගේ පස්සට පයින් පාරක් ගැහුවා.. අපේ මාමා ඉස්සරහා දොර  ගාව කෝල් එකක.. හිනාවෙවී.. කකුලෙ ඇඟිල්ලකින් සිමෙන්ති පොලොව හාරනවා.. මම රධ්‍ය අයියට කෑම කාමරේට යන්න කියලා පිටිපස්සෙන් මාමට කිට්ටු කලා.. කෙල්ලෙක්වත් සෙට් කරගෙනද

@Shan

අපේ අම්මා කිව්වා වගේ.. මගේ මාමව උදුරගන්න ඒ පාර කවුද ආපු පොල් කුරුමිණිච්චි..

" නෑ නෑ.. එහෙම එකක් නෙමේ.. ඔයාට පිස්සුද.."

මූට කොහොමත් පිස්සු තමා.. ඒක දැනගෙන නෙමේද යාලුවෙලා තියෙන්නෙ..

" හා පරිස්සමට ගිහින් එන්නකො එහෙනම්.."

ඇයි මෙච්චර දවසක් පරිස්සමින් නෙමේද ඉදලා තියෙන්නෙ.. සමයං..

" මම දන්නැද්ද ඔයාගෙ කෑම.. වෙලාවට කනවා.. අසනීප නොවී.."

මෙච්චනෙ ලව්.. හතලිහ වෙනකල් ඉන්න ඕන වුණාද මේ මනුස්සයට ලව් කරන්න.. හරිම ශෝක් පුතේ උඹේ මාමා නම්..

" මම ළඟදි එන්න ඉන්නෙ.. බලමුකො.."

මම තව ටිකක් බල බල ඉන්නෙ නැතුව මාමගෙ ෆෝන් එකට පිටිපස්සෙන් කිට්ටු වුණා..

" තාත්තී~ අක්කි මගේ කොණ්ඩෙ ඇද්දා.. අනේ තාත්තී අම්මිට එන්න කියන්නකෝ~"

මාමා එකපාර ගැස්සිලා ගිහින් ෆෝන් එක අනිත් කනට මාරු කරගත්තා.. මම කෙලින් හිටගෙන මාමට ඇස් පිය දෙක තුනක් ගැහුවා..

" තාත්තී~.."

" සාකි මම ඔයාට පස්සෙ ගන්නම්.."

" නෑ නෑ අපේ අක්කගෙ පුතා.. මගේ ළමයි කොහෙද මෙහේ.."

" හරි ටේක් කෙයා.."

මාමා ෆෝන් එක කට් කල්ලා කලිසමේ සාක්කුවට ඔබාගත්තා..

@Shan

" සුදුමහත්තයා!!!!"

" මොකද මොකද අනේ.. මම කිරිපුතා.. ඔහේට අමතකවුණයි.."

" උඹට බැරිද ඇත්තටම මට හරියනවා බලාගෙන ඉන්න.."

මම මාමගෙ අත යටින් රිංගලා අත අරන් මගේ කර වටේ දාගත්තා..

" පිස්සුද ඒයි.. ඔයාට හරියනවනම් හොදයි.. කවුද සාකි කියන්නෙ.. කැල්ලද.."

" එහෙම මගුලක් නෙමේ.. කැගහන්න එපා අම්මට ඇහෙන්න.."

" පිස්සුද මේවා අපේ අපේ කතා නෙ.. කවුද සාකි කියන්නෙ.."

" යාලුවෙක්.. උඹ දන්නෙ නෑ.."

" කමක් නෑ අපි දැනගනීනෙ නේද කවදහරි.. නේද මමෙ.. නේ.."

" ඔව් ඔව් දැනගනී.."

" ඒකද මාමා නාරාහේන්පිට එන්නෙ.. ඌව්.. ඌව්.."

" මට ඕන විදියටද හමුදාව වැඩ කරන්නෙ.. නටන්නැතුව ඉදපන්.. එහෙම මගුලකට නෙමේ.. උඹ තනියම නිසා මම කලින්ම ට්‍රාන්සර් ඉල්ලුවෙ.. අනික අර කැලේ මොකෙක්වත් නෑ දත් බලන්න.."

" එහෙමද.."

" ම්ම්.. අනික බිලට් එකේ ඇඳේ ඉන්න බෑ මකුණො ඉන්නවා අම්බානෙක.."

" ඔයා මකුණො කන්නෙ නෑ අනේ.. අපි දෙන්නා බදාගෙන වෙලීගෙන ඉමු මෙහෙ ආවම.."

" අනේ මේ උඹ වෙන කාමරේක ඉදපන්.. එනවා රිංගන්න මගේ අස්සෙම.."

" ආදරේටනෙ හලෝ.. ප්ස් මෙහ්.. දැන් ඔයා බැන්දා කියලා හිතමු.."

@Shan

" එහෙම බඳින්නෙ නෑ.."

" හිතමු හිතමු.. මම කිව්වෙ හිතමු කියලනෙ.. ඔය වයසට එහෙම කවුරුත් සෙට් වෙන්නෙත් නෑ තමා අනික.. එහෙම වුණොත් මට මාමගෙ දේපලත් ලියා දෙන්න ඈ.. එතකොට මට වැඩිදුර ඉගනගෙන මහන්සි වෙන්න ඕන නෑනෙ.."

" දෙනවා මම උඹට.. පකක්.. බලාගෙන ඉඳපන්.."

මම මාමගෙ අත ගසලා එහාට වුණා..

" ඕනත් නෑ.. මම ආච්චිඅම්මට කියලා ලියාගන්නවා.. තියාගන්නවා තවුසෙගෙ දේපළ.."

" හා.. තියාගනවා තමයි බොල.. ඒකනෙමෙ කවුද අර කොලුවා.. හෙන හැදිච්ච නිමිච්ච තැන්පත් පොරක් නේද.."

" ඔව් එයා ඇල්වතුරත් නිමලා බොන එක්කෙනෙක්.. අපේ ඉස්කෝලෙ ඩිපියුටි ගේම්ස් කැප්ටන්.. මගේ හොඳ යාලුවෙක්.."

" එහෙමද.. මේ බං.. මට ඒ කොල්ලගෙ මූණ දකිද්දි දැකලා හුරුයි වගේ තේරෙනවනෙ.. මම උඹෙ පේරන්ට්ස් මීටින් ආපු වෙලාවකවත් දැකලා තියෙද.."

" ඒ අයියා කෙනෙක් හලෝ.. අපිට වඩා වැඩිමල්.. ඔයා වෙන කාවහරි මතක් කරගෙන වෙන්න ඇති.."

" ම්ම්.. ම්ම්.. මොකක් හරි.. දැන් මොකද ඉස්කෝලෙ වැඩ.."

" ඒක කියන්නම්.. හැබැයි මට පොඩි වැඩක් දැනගන්න ඕන.. මාමා අපේ තාත්තට සිරාවට මොකද කලේ.. එකපාරම ඒ මනුස්සයා එදායින් පස්සෙ සද්දයක්වත් නැතිවුණා.."

" මම අහිංසකයි.. මම මොකුත් කලේ නෑ.. පාඩුවෙ දතක් ගලවන් ඉන්න මටනෙ උඹ මෙහෙම කියන්නෙ.."

" අනෙ නිකම් යනවා යන්න.. මම දන්නවා මෙක පස්සෙ ඉන්න අදිසිද මොකක්ද හස්තය මමා කියලා.. නරක සමනලයෙක් වෙන්නැතුව කියන්න

@Shan

මට මොකක්ද වුනේ කියලා.."

" මම ඉතින් මස්සිනා හම්බෙලා පොඩ්ඩක් නිවිසැනසිල්ලෙ කතාකලා.. උම්මා එකක් දීලා යන්න කිව්වා.."

" එහෙමද.. උම්මා එකක් විතරද දුන්නෙ.."

" ඔව් ඩයල් එක උම්මා එකේ සැරට සතියක් ඉස්පිරිතාලෙ හිටියා.. පිස්සු හු## ආයෙ ආවා උගේ කෙරුවාව පෙන්නන්න.. ඊළඟපාර හරවන්නෙ බෙල්ල මම අනිත්පැත්තට.."

මම මාමා ගාවින් තව පොඩ්ඩක් එහාට වුණා.. මේ මනුස්සයා හොඳ වෙලාවට සීනි පැනි වගේ හොඳම හොඳයි.. කේන්ති ගියාම මල යකෙක් වගේ කඩාපනිනවා..ඉස්කෝලෙ කාලෙත් වලි දාගෙන ගෙදර එන්නෙ කියලා අපේ ආච්චි කෑගහනවා.. කැම්පස් ඉද්දිත් එක එක මගුල් වලට වලි දාගෙන හොස්පිටල් ඉද්දි අපේ අම්මට නුවර යන්න වුණා මේ මනුස්සයව බලාගන්න..

" බය හිතෙනවා හලෝ.. මොන මගුලක්ද මම යනවා.."

මම එනන් ආවහම මාමා මගේ කර බෙල්ල අතක් දාගෙන මාව ඇදලා ලගට ගත්තා..

" තාත්තෙක් ඕන නෑ උඹට.. මම ඉන්නවනෙ.. ඌ මොකටද.. මම උඹට ආදරෙයිනෙ.."

" කැහ්-කැහ්-මරන්නද හදන්නෙ.. දන්නවා දන්නවා.."

මම බෙල්ල අතෑරවගෙන මාමගෙ අතින් අල්ලගත්තා.. සැක් මගේ කොට.. මේ මනුස්සයා හෙනකඳයා වගේ උසයි.. මම පපුවට ඇගිල්ලෙන් එකක් ඇන්නා..

" ආහ්ච්~ අල්ලන්නෙපා බං.. තුවාලවෙලා ඉන්නෙ.."

මම ඉක්මනට මෙහාට වුනා..

" තුවාල වෙලා..?? ඒ මොනව කරන්න ගිහින්ද..අපේ අම්මා දන්නවද..??"

@Shan

මම කෑගහද්දි මාමා මගේ කට දෙපැත්ත තද කල්ලා අල්ලගත්තා..

" ශ් ශ් කෑගන්නෙපා යකෝ.. උඹට දෙයක් කියන්න බෑ ලතෝනි තියනවනෙ.."

" කෝ පෙන්නන්නකො මාමෙ.. මොකක්ද වුනේ.. ඇයි මේ තුවාල වුණේ.."

මම මාමගෙ ශර්ට් එකේ කර එහාට කල්ලා බලද්දි පපුව පැත්තක් ප්ලාස්ටර් කල්ලා.. තඩි ප්ලාස්ටර් එකක්.. පපුවෙ පැත්තක්ම වැහිලා..

" ලොකු එකක් නෙමෙ බං.. නහින්නැතුව ඉඳහන්.."

" මොනවද මාමෙ කරගන්නෙ.. මගුල.. පරිස්සමට ඉන්න දන්නෙ නැද්ද.. මම කියනවා ආච්චිඅම්මට.."

" මේ වීදුරුකට්ටකට කැපුණා බං කෑම්ප් එකේදි.. ලොකු එකක් නෙමේ.. ඉඳහන්කො ගෙදර මනුස්සයො බය නොකර.."

" කතාකරන්න එපා මාමෙ තවුසෙ මාත් එක්ක.."

" උඹත් උඹෙ ඉස්කෝලෙ ඉන්න අනිත් උද්දච්චව හැත්ත වගේම තමා.."

මම මාමව එහාට තල්ලු කල්ලා දාලා බිත්තියට හේත්තු වුනාම ආච්චිඅම්මා සාලෙට ආවා..

" ආ මරු මාමයි බෑණයි.. එන්න කන්න.. දැන් කොයි වෙලේ ඉඳලද කතාකරන්නෙ.."

" ඉන්න ආච්චිඅම්මෙ.. මම එන්න.."

මම මාමටත් ගස්සගෙ ඇවිත් කෑම මේසෙන් ඉඳගත්තා.. යකෝ රඩ්‍ය අයියෙ.. මේ මොන මගුලක්ද.. මේකා කනවා කනවා කනවා.. හෙන පිඟානකට බෙදාගෙන.. අපේ ආච්චි කතාකර කර තව බෙදනවා.. අම්මත් එක එක ඒවා ගෙනැත් මේසෙන් තියනවා.. අපේ ආච්චිඅම්මා ඒත් හිනාවෙවී බෙදනවා.. කොහෙද දන්නෑ අර කරනවයි කිව්ව ඩයට් එක..

" පුතා තව බෙදාගෙන කන්නකො.. මේ හැදෙන වයසට හොඳට කන්න එපැයි.."

@Shan

ආච්චි මටත් බෙදලා රධ්‍ය අයියටත් කජු මාළුවෙන් හැන්දක් බෙදුවා..

" ඇති ආත්තම්මෙ.. මම දැනටම හුඟක් කෑවනෙ.."

" එහෙම කියලා කොහොමද.. හැදෙන වයසට හොඳට කන්න බොන්න ඕනනෙ.. දේව්.. පුතා!!! කෝ මේ ළමයා.. එන්න කන්න.."

මම බෙල්ල දික් කල්ලා සාලෙ බැලුවා.. ඔය ඉන්නෙ මට රව රව උළුවස්සට හේත්තුවෙලා.. දුෂ්ට ගාමිනී..

" මෙ දේව් අනුරාග්.. ඇවිත් කනවා මගෙ ආච්චිඅම්මව කෑගස්සන්නැතුව.."

ආච්චිඅම්මව කෑගස්සන්නෙපා බොලව්..

රධ්‍යපුතා ගමේ ඇවිල්ලනෙ.. ඒ ළමයට කන්න දෙන්න පාඩුවෙ..

මම සෑ වෙලා ආයෙම එනවලු ඈ..

එන්නාම් ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුණකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 81 කොටස

" ආච්චිඅම්මෙ.. අන්න අන්න එහාගෙදර රක්තපාත කිකිලි මෙහෙට එනවා.. මේ මම නෑ කියන්න හොඳේ.."

" මෙහ් කොල්ලො.. ඔහොම හිටු.. මම කොහොමද නෑ කියන්නෙ.. මෙ වාහන දෙකකුත් මිදුලෙ.."

" මට බඩේඅමාරුවක් හැදිලා ටොයිලට් එකේ කියන්න.."

මම එකසැරේට පිටිපස්සට හැරිලා දුවගෙන ඇවිත් කර්ටන් එකෙන් එහාපැත්තෙ ඉඳපු කළුගලක හැප්පිලා කර්ටන් එකත් කඩාගෙන එහෙමම බිමට පතබැවුණා.. අදනම් කනවා අම්මගෙන් පුප රත් වෙන්න. ඒ වුණාට දැන් දුවන්න ඕන ජීවිතේ බේරගන්න.. මම බිම වැටිලා ඉන්න එකාවත් පාගගෙන දුවන්න ගිහින් ආයෙම රෙද්දෙ පැටලිලා දෙවෙනි පාරටත් එහෙමම බිම ඇදගෙන වැටුනා..

" අම්මෝ කොන්ද බං.. මොන ලබ්බක්ද කරන්නෙ මේ.."

අම්මටසිරි කර්ටන් එකෙන් වැහිලා ඉන්නෙ රධා අයියද.. මම කර්ටන් එක උස්සලා පොඩ්ඩක් මූණ බැලුවා.. ඔය ඉන්නෙ ඉන්දියන් කතාවක, සාරිපොටෙන් ඔලුගෙඩිය වහගෙන ඉන්න, අලුත් බැඳලා ගෙදරට ආපු ලේලි පොඩ්ඩ වගේ.. ඔලුවත් කර්ටන් එකෙන් වහගෙන.. මොට්ටුවක් තිබ්බනම්.. සුවප්නා රොටීද කවුද වගේ ඉඳී..

" ආත්තම්මෙ.. මෙහේ අයියා ආවයි~"

උඹෙ අයියලා මෙහේ නෑ බේසික කෙල්ලේ..

" ආ.. ඉන්න බලන්න දුව.. සුදුමහත්තයා~!!!"

" කවුද වරද්.."

" මෙ අල්ලපු ගෙදර රක්තපාතෙ හැදිච්ච එකියක් ඉන්නවා.. ගෙට එබෙන්න කලින් මට යන්න මේ රෙද්ද ලිහලා දෙනවකෝ.."

@Shan

මම අල්ලපු ගෙදර 'අ'යන්න කිව්වා විතරයි රධ්‍ය අයියගෙ මූණ හට්ටියක් වුණා..

" ඇයි ඉතින් දුවන්නෙ.."

" දුවන්නෙ..? මට බෑ ඒකි එක්ක කතාකරන්න.. මල වාත කෝච්චියක්.. කෝච්චියක් නෙමෙ දුම්රිය දෙපාතමේන්තුවක්.."

මම රධිය අයියගෙ ඇඟ උඩ බිම වැටීගෙන එහා ගෙදර කෙල්ල ගැන පැහැදිලි කරද්දි අපේ මාමා එතනින් යන්න ගිහින් ආයෙම රිවස් එකට ඇවිත් අපි දෙන්නා දිහා බලාගෙන හිටියා..

" මේ මොකද ළමයි මේ.."

" අනේ මාමෙ රෙද්ද පැටලිලා.. ලිහලා දෙනවකො.. මම වෙලේ, අර මැද්දෙ පැලට යනවා.."

" මේ යක්කු ගස් නගින වෙලාවෙ උඹ පැල්වල පැල් රකින්න යන්නද.. ඔය පුතාගෙ ඇඟ උඩින් නැකිටපිය.."

මාමා අපි දෙන්නා පැටලිලා ඉඳපු රෙද්ද ලූස් කල්ලා ආයෙම කර්ටන් එක තිබ්බ විදියට හදලා තිබ්බා.. මොකද මාමා වුණත් දන්න්නවා අපේ අම්මගෙ දේවල් ඇල්ලුවත් මියපරලොව යන්න වෙන බව..

" සුදුමහත්තයො~!!! අනේ දුවේ ඒකා ගෙදර නෑ වගේ.. නාන්න ගියාද දන්නෙනෑ.."

" ආ එහෙමයි ආත්තම්මෙ.. අයියා උසස්පෙළ ලියන්න ඇති නේ.."

" ඔව් දුවේ.."

ඒ එක්කම රධ්‍ය අයියා හොර බලලා වගේ ෆෝන් එකත් ඔබ ඔබ ගෙදර ඉස්සරහා පුටුවෙන් වාඩිවුණා.. ටහුක්.. මේ කෙල්ල මාව දැක්කා නේද.. මම මාමා දිහා අසරණ විදියට බලද්දි මාමා මාව දැක්කෙ නෑ වගේ එතනින් යන්න ගියා.. ඉඳපන්කො මාමෙ.. මම අම්මට උඹෙ සාකිට රාකිද ගැන කියලා ගුටි ගස්සනවා..

" ආහ්.. අයියේ.. ඔහේ ආවැයි.."

@Shan

මම අතින් ඔලුව පිටිපස්ස කසාගෙන ලාවට හිනාවෙගෙන සාලෙට ගියා.. ඉන්නවා රක්තපාතෙ හැඳුනු බේසික කෙල්ල රෝසපාට මල් මල් ගවුමකුත් ඇඳගෙන කොණ්ඩෙත් කඩාගෙන.. කොණ්ඩෙට මම ආස කොල්ලෙක් නෙමෙනෙ නම්ගි..මම ආස ලොකු පස්සක් තියෙන, තරහවුණාම අයිස්ක්‍රීම් දෙන, ඩයරි ලියන, තැන්පත්, මැත්ස් කල්ලා අයිලන්ඩ් රැන්ක් දාපු, කැඩෙට් කරන, උස, හැන්ඩි, ඉස්කෝලෙ අඩුම තරමෙ ඩිපියුටි ගේම්ස් කැපාවත් වෙන්න පුලුවන්, උණු උණු හීටරයක් වගේ කොල්ලොන්ට.. මේවා කොහොම කියන්නද ඉතින්.. නම්ගිට තේරෙන්නෙ නෑ.. මට තේරුම් කරන්නත් බෑ..

" ආහ් නංගි එන්න ඇතුළට.."

මම රධ්‍ය අයියා දිහා බලලා ආයෙම නංගි දිහා බැලුවා..

" අයියා කවදැයි ආවෙ.. මං බලාගෙනත් උන්නා.."

රධ්‍ය අයියා දෙපාරක් විතර කැහැලා කනේ ඉයර්ෆෝන් එකක් ගහගත්තා.. මාව කාපන් නංගි..

" මම අද උදේ ආවෙ නංගි.."

" ආ ඒකතමා.. මේ අයියගෙ යාලුවෙක් ය.."

එහාගෙදර නංගි රධ්‍ය අයියව පෙන්නලා ඇහුවා.. යාලුවෙක් නෙමෙ නංගි මගේ බෝයිපෙන්.. කොහොමද දෙයියනේ මේවා කියන්නෙ..

" ඔ-ඔව් නංගි.. යාලුවෙක්.. හොඳම යාලුවා.. නංගි ඉස්කෝලෙ යන්නෙ නැද්ද අද.."

" නෑ අයියෙ.. අපේ පුංචිඅම්මලා ගමේ ඇවිල්ලා.. අද නැවතුණා.. මම හවසට එන්නම්කො පුංචිඅම්මගෙ දුවත් ඉන්නවා ඇවිල්ලා.. අයියට මතක නැතුව ඇති දැන්නං.."

" අහ් ඔව් ලොකු මතකයක් නෑ නංගි එහෙනම් මම යන්නම්.."

" හා අයියෙ.. මම මේ ඔහේව බලලා යන්න ආවෙ.. යන්නං අයියේ.."

@Shan

අර කෙල්ල වාඩිවෙලා ඉඳපු රධ්‍ය අයියටත් අත වනාගෙන ඉස්තෝප්පුවේ පඩි දෙකත් බැහැගෙන එහා ගෙදරට දුවගෙන ගියා..

" ඔහේ දැං ඇවිත් මෙහෙන් ඉඳගන්න.."

රධ්‍ය අයියා කක්කුටු මූණක් හදාගෙන මට ඇවිත් ඉඳගන්න කිව්වහම මම රවාගෙන ගිහින් සෙටියෙන් ඉඳගත්තා..

" මේ අර කිව්ව ගෑණිද.."

" ම්ම්.. මල කරුමයක් අප්පා..  මේ බේසිකිච්චි ඉස්කෝලෙ ගිහිල්ලත් නෑ.."

" ඉතින් උඹට අමාරුද.. ඉස්කොලෙ ගියේ නැතිවුනාම.."

" පිස්සුද අනේ.. මොකද ඔයා කේන්තියෙන් කතාකරන්නෙ.. මම මොකක් කලාටද.."

" මොකුත් නෑ.."

රධ්‍ය අයියා ආයෙම ෆෝන් එකට එබුණා.. ඔක්කොම එකයි.. ඔක්කොම එකම එකයි.. ආධ්‍ය අයියා එක්ක යාලු වුනානම් කියලා හිතෙන්නෙ මේ වෙලාවට තමා.. කොහෙද ඒ දේවදූතයට පනුවෙක් හම්බෙලානෙ කොට කොට කන්න.. මාව හැමපැත්තෙන්ම විසික් වෙනවා.. මම නැගිටලා එළියට යන්න ගියාම රධ්‍ය අයියත් ෆෝන් එක සෙටියට විසික් කල්ලා මාත් එක්ක එළියට ආවා..

මිදුල අතුගාලා අතුගාලාම ඒක මැට්ටටම පෑදිලා තියෙන්නෙ.. හරි පිරිසිදු පාටයි.. වෙලෙන් හැමතිස්සෙම මේ පැත්තට එන හුළඟ නිසා ඉස්තොප්පුවේ මැටි වලින් හදලා එල්ලලා තියන කුරුලු පැටව් ඉන්න macramé එකේ කුරුලු පැටව් එකට එකට වදිනවා.. උන්ගෙ හොට අඟ චෙරි ගෙඩි වගේ පේන්න එල්ලලා තියන සීනු එතකොට හීනියට සද්ද වෙනවා.. ගම කියන්නෙ වෙනමම පැත්තක්.. ගම කියද්දිම මගේ ඔලුවට එන්නෙම අපේ ගෙදරයි මගේ කාමරෙයි වෙලයි ආච්චිඅම්මයි.. මම වෙනදා වගේ ඉස්තෝප්පු කණුව අත් දෙකින්ම බදාගෙන වෙල පැත්තෙන් එන හුළඟට මූණ අල්ලගෙන හිටියා.. ඒ හුළං මැළ කොණ්ඩෙ උඩට උස්සගෙන මූණෙ වැදිලා අතගාගෙනම යන්න යනවා.. ඒ එක්කම මට රධ්‍ය අයියා කතාකරන සද්දෙ ඇහිලා මම ඒ පැත්තට දුවගෙන ගියා..

@Shan

" පාණ්ඩුවද වරද්.. හයියෙන් කරනවකො.."

" මොනෞත්තක්ද මේ.. මගේ කොන්දත් රිදෙනවා.."

" කමක් නෑ.. මහලොකුවට ෆිට්නස් තියෙනවා කියනවා නේද.."

" ඉතින් මගුල.. දැන් පැයබාගයක් විතර.. අනේ බැහ් මට මහන්සී.."

" බෑ බෑ උඹ පොරොන්දු වුණා පැයක් කියලා.."

" බෑ අනේ කොන්ද රිදෙනවා.. අත් දෙකත් රිදෙනවා.."

" රිදෙන්නෙ නැති තැනක් නැද්ද.."

" තියනවා.. පොඩ්ඩක් ඉන්නවා මම රට කියලා දෙන්නම්.."

" හා.. ඒක රටනෙ.. දැන් හයියෙන් ඕක කරනවකො.."

" අනේ මේ නටපං.. මගේ කොන්ද රිදෙනවා.. ආච්චිඅම්මෙහ්.. අම්මෝ.. අලියෙක්ද තවුසෙ.."

" මේ වරද්.."

" මොකද.."

" ඔයා ඔංචිලි වාරම් දන්නවද.. ඒවට කියන්නෙ ඔංචිලි වාරම් කියල නේ.."

මම ඔංචිල්ලාවෙ වටෙන් ඇවිල්ලා ඉස්සරහින් හිටගත්තා.. ඉඳපන් මම උඹට ඔන්චිලි වාරම් පෙන්නන්න යන්නෙ.. පැය බාගෙකට වැඩිය තල්ලු කල්ලා තල්ලු කල්ලා මේ අලි පැටියව.. මගේ කොන්දෙ පොටත් ගියා.. මම ඉස්සරහට ආවා විතරයි ඔංචිලි පදින ගැටපොලොස් කොට්ටෝරුවා බිමට කකුල ගහලා ඔංචිල්ලාව නවත්තගත්තා..

" ඉඳපන් උඹට මම ඔංචිලි වාරම් කියලා දෙන්න.. ඔහොම ඉඳපන්.."

මම දාගෙන ඉඳපු සෙරෙප්පුව ගලවලා අතට අරගත්ත ගමන් රධ්‍ය අයියා මට ටිකක් ඉන්න කියලා අතින් පෙන්නලා ඇස් දෙක හීනි කරගෙන පාර දිහා බලාගෙන හිටියා..

@Shan

" ඒ වරද්.. අන්න හාවෙක්.."

මම පිටිපස්ස හැරිලා බැලුවා විතරයි.. ටහුක්..!! පැනලා දිව්වා නේද මේ කහවේනා.. ඉදපන් රධ්‍යපුතේ අදනම් ඇට2කම තලනවා ගලක නෙමේ වංගෙඩියෙ දාලා..

" ඉදපන්.. අයියෙ.. ගහනවා උඹට.. ඔහොම ඉදපන්.. මම හාවා පෙන්නන්න.."

රධ්‍ය අයියා ගේ වටෙන් දුවලා වෙල ගාව තිබ්බ පොල් කඳවල් දෙකෙන් වෙල නියරට පැනලා නියර දිගේ අස්සයා වැහිලා වගේ දුවගෙන ගියා.. මමත් සෙරෙප්පුවක් අතේ තියාගෙන අනිත් සෙරෙප්පුව ඇලට වට්ටගෙන ඒකා පස්සෙන් අබෝගෙනම ගියා.. අතාරින්නෙ නෑ පුතේ..

" ඒ වරද්.. හාවො දැක්කද.."

" හාවො පෙන්නන්න ඔහොම නැවතියන්.. හදේ හාවා පෙන්නන්නම්.."

" එපා එපා.. දැන් ඇති ඒයි.. මේ නියරෙ මැද්දෙන් කානුවක් කපලා.."

" මම තවුසෙගෙ ඔලුව මැද්දෙන් කානුවක් කපනවා!!!!!!!"

රධ්‍ය අයියා වක්කඩ උඩින් පැනගෙන වෙල මැද්දෙ තියන පැලත් පාස් කරගෙන දුවගෙන දුවගෙන ගියා.. මමත් ඒ පස්සෙන් දුවගෙන ගියා.. නියර මැද්දෙ කානු ලු.. අහපල්ලකො.. පැහිච්ච වී කරල් ඇඟේ ගෑවිලා ඇඟත් කසනවා.. මම වෙල මැද්දෙ පැල පහුකරගෙන ඉස්සරහට දුවගෙන ගිහින් වටපිට බැලුවා.. කෝ මෙකා.. දුවගෙන ගිහින් ගහ ඉවරවෙන හරියෙන් බස්නාවටවත් පැන්නද.. නෑ වෙන්න බෑ.. බස්නාව දැක්කහම පනින්න හිතෙන්නෙ මොන බූරුවටද.. මඩ ගොඩකවත් පතබැවුණාද දන්නෑ.. මම එහෙමම සෙරෙප්පුව මූණ ගාවට තියාගෙන ඉර එළියෙන් බේරිලා හැරිලා යන්න හැදුවා විතරයි මාව බොහ් ගාලා ලියද්දකට ඇදගෙන වැටුණා..

" ශ්හ්.. කෑහගන්නෙපා.. මේ අර මාමා ඉන්නවා.."

" මොන- තවුසෙට පිස්සු හැදිලද.. බෙහෙත් ගන්න යමන්.. මගේ ඇඟේ මඩත් ගෑවුණා.. බලනවකො.."

@Shan

" මේ මේ අර මාමා මොකක්ද අර අතන පැලේ කරන්නෙ.."

" කෝ කොතනද.."

" අර බං.. අරහෙ.. ඔය කොහෙද බලං ඉන්නෙ.."

රධ්‍ය අයියා මගේ ඔලුවට එකක් ගහලා අපිට පිටිපස්සෙන් තිබ්බ පැල පෙන්නුවා.. ටසිරි.. යකෝ අපේ මාමා මොනවද මේ පැලේ තනිපංගලමෙ කරන්නෙ.. මම ලියද්දෙ ගොයම් පැලත් අම්බරුවා වගේ පාගගෙන සෙරෙප්පුව රධ්‍ය අයියගෙ අතට දීලා පැල පිටිපස්සෙ පොල් අත්තට මුවා වුණා.. රධ්‍ය අයියත් මගේ සෙරෙප්පුව අතේ තියාගෙන ඇවිත් පොල් අත්තට මුවා වෙලා ඒකෙ හිලකින් ඇහැ දමාගත්තා.. අපේ මාමා කෝල් එකක.. ආහ්.. සාකි වෙන්නති.. ඉසකුඩිච්චිය.. මාමගෙ හරි සිහියත් උදුරගෙන වගේ ඒ සැරේ.. හිනාව බලන්න එපැයි මූණෙ තියන..

" මම්..?? ඒ කාලෙ ඉතින් මෙහෙම ෆෝන් තිබ්බෙ නැනෙ කතාකරන්න.."

" ඔයා කියන එකෙත් ඇත්තක් තියනවා තමයි.. ඒත් මෙතන ප්‍රශ්නයක් නෑ කියන්න බැනෙ සාකි.."

" මට තේරෙනවා.. ඒ වුණාට.."

" නෑ හරි හරි.. මම කතාකරන්නෙ නෑ.. ඔයා කියන්නකො..කාලද ඉන්නෙ.."

" හැමතිස්සෙම කැවද අහන්නෙ..?? ඔයාට තියන ඔය ලෙඩේ නිසානෙ.. දැන් මම ඒක ඇහුව එක වැරදිද.."

" මම්.. ඒක රිදෙන්නෙ නෑ එච්චර.."

" හැමදාම මොකක් හරි කල්ලා සොරි කිව්වහම මම ඔක්කොම අමතක කල්ලා දාන්න ඕන?? අනේ ඔයාගෙ තියරි.."

" ඔව් ඔව් මම දන්නවා.. හොඳට දන්නවා.. කොහොමද කිව්වෙ.."

" ඔය ඉස්කෝලෙ ගැන අහලා මගේ කන් දෙක ගොඩ වෙලා තියෙන්නෙ.. අපි වෙන දෙයක් ගැන කතාකරමුද.."

@Shan

" ඔව් ඔව් හොඳම එක තමා.. වෙන්න ඉන්න හෙඩ් ප්‍රිෆෙක්ට්ගෙන්ම මට ඒක තේරෙනවා.."

" කවුද අහන්නෙ.. අපේ පොඩි අක්කගෙ පුතා.."

" ඔය මලමගුල් වගේ නෙමේ.. ඔයා එන්න අපේ ආදරවන්තයන්ගේ සටන බලන්න.. අන්න මැච්.."

" කෝ මල්ලි..?? ආ ට්‍රිප් එකක් ගියා කිව්වා නේද.."

" එහෙමද.. මෙහෙත් ඉන්නවා දෙන්නෙක්.. මෙ සාකි.. මම ඔයාට කියන්න හිටියෙ.. අපේ පුතාගෙ යාළුවටත් පොඩ්ඩක් ඔයාගෙ වගේ ශේප්කට් තියනවා.. අනේ මන්දා.."

" මොකක් කිව්වා.. මට ඔයාව හැමතැනම පේන්න අරගෙන..?? අනේ මෙ ඉදහන් බං.."

" ම්ම්.."

" ආ හා පරිස්සමින් ඉන්න.. ගෙදර ගියාම ගන්නකො.."

" අහ් මොකක් කිව්වා..?? ඇහුන්නෑ.."

මාමා ගුලි කාලා වගේ හයියෙන් හිනාවෙන්න ගත්තා.. මගේ මොලේ දැන් දුම් දාගෙන එන්නෙ.. අව්වටත් කරවෙනවා.. මෙ කතාව අහලා තව ටිකක් ඔලුව රදේ ඇල්ලුවා..

" ආදරෙයි ආදරෙයි.. ඔක කිව්වෙ නෑ කියලනෙ බෝතල් කට්ටක් උස්සන් ඇවිත් මට ඇනලා ගියේ.."

" ටේක් කෙයා.."

මම රඨ්‍ය අයියගෙ මූණ දිහා බලලා වොමිට් කරනවා වගේ පෙන්නුවහම රඨ්‍ය අයියා හිනාවෙලා කටට ඇඟිල්ලක් තියලා කෑගහන්නෙපා කිව්වා.. ඊටපස්සෙ මාමා ෆෝන් එක තිබ්බ ගමන් අපි පොල් අත්තට මුවා වෙල සද්ද නොකරම හිටියා.. මාමා ටිකක් වෙලා වෙල දිහාබලාගෙන ඉඳලා හුස්මක් පහළ දාලා විසිල් පාරකුත් ගහගෙන නියර දිගේ ගේ දිහාවට යන්න

@Shan

ගත්තහම අපි දෙන්නා වටෙන් ඇවිල්ලා පැලේ ඉඳගත්තා.. සැක්.. මඩ ඇඟේම වේලිලා..

" මාමගෙ ලව් එක නගලා යනවා වගේ නේද.. Lovers' quarrel එකක් ගැන කිව්වෙ.."

" එයා රිච්මන්ඩ් එකේ.. මං වගේම තමා.. ස්කොලශිප් වලින් ඒකට ගියා.."

" එහෙමද.. ඕවා වගේද අපේ බැට්ල් එක.. කොච්චර හොඳද.."

" අනේද කියන්නෙ.."

මම පැදුරෙ පෙරලිලා පොල් අතු වියලා වහල සෙවිලි කල්ලා තිබ්බ වහලෙ දිහා බලාගෙන හිටියා.. ඒකෙ වියපු පොල් අතු දිරලා ගිහිල්ලා දැන් තැනින් තැන අහස පේනවා.. රඪ්‍ය අයියා මගේ බඩ උඩ තිබ්බ අත් දෙක අයින් කල්ලා එතනින් ඔලුව තියාගෙන මං ගාවින්ම ඇලවුණා..

" මෙහේ හරි නිදහස් වරද්.."

" ම්ම්.."

" මාමා ඇයි බැඳලා නැත්තෙ.. එයා කාටහරි කැමැත්තෙන් නේද ඉන්නෙ.."

" මම කල්පනා කලෙත් ඒකගැන තමා.. දැන් ඉතින් හොඳටම ඒක ඇහුණනෙ.. කැමති වුණු එකනම් හොඳයි.. ඒත් කවුද ඔය ඉසකුඩ්ච්චිය.. අනික මට පොඩ්ඩක් කතාව ඇල්ලුවෙත් නෑ.. පස්සෙ කියන්නම්කො.."

" කවුරුහරි වෙන්නැති නේ.."

" ඔව් මෙ කාලෙ මල්සරා සට සට ගාලා විදගෙන යනවා වගේ පෝලිමට.. ආඪ්‍ය අයියටත් මලක් හම්බෙලා.. අපේ මාමටත් මලක් හම්බෙලා.. අපේ යාලුවො ඔක්කොන්ටමත් මල් හම්බෙලා.. කවුද දැන් මෙතනින් සිංගල්.."

" ඇයි අර නංගි.. මහීශා.."

" ආ ඔව් ඒකි.. ඒ වුණාට ඒකිට කැමති මල් ඔනතරම් ඉන්නෙ.."

@Shan

රධ්‍ය අයියා ලාවට හිනාවෙලා මගේ අතක ඇඟිලි එයාගෙ අතක පටලගත්තා..

" මේ වෙල ඉවරවෙන්නෙ කොහෙන්ද වරද්.."

" ඔයා බලන්න කැමතිද.."

" ඔව්.. යමුකො.."

" මේකෙ මායිම තියෙන්නෙ ගඟ කිට්ටුව.. මම ඔයාට බස්නාව පෙන්නන්නද.."

" ඒ මොකක්ද බස්නාව කියන්නෙ.."

" බස්නාව කියන්නෙ.. ඔයා දන්නවා නේ අපේ ගෙදර ගාවින් යන ඇල.."

" ඔව් මාළුපැටව් ඉන්න එකද.."

" අන්න හරි.. ඔක වටෙන් යනවා මහ ඇලක් වගේ.. කුඹුරට වතුර හරවලා තියෙන්නෙ ඒකෙන් නෙ.. ඒ ඇලේ වතුර ගඟට වැටෙන තැනට තමා කියන්නෙ බස්නාව කියලා.. ඒක දැක්කහම බය හිතෙනවා.."

" එක්කන් යන්නකො.."

" යමු.."

රධ්‍ය අයියා නැගිටලා මට නැගිටින්න අතක් දුන්නා..

" මේ වරද්.. ඒකෙ නාන්න පුළුවන් නේද.."

" ම්ම්.. තොටුපොළක් තියෙනවා පලු ගහක් ගාව.. එතන නාන්න පුලුවන්.."

" නාමුකො.."

" දැන් උදෙත් නැවෙ.. හෙට යමු.. අසනීප වේවි.. මේ අව්වෙ ගිහින් නාලා.. හැපීකව්වා අසනීප වුණොත් පාලු හිතෙනවනෙ.."

@Shan

රධ්‍ය අයියගෙ කම්මුල් දෙපැත්ත ලාවට රෝසපාට වුණා.. අනේ එයා දිහා බලන් ඉද්දි ආදරේ හිතෙනවා.. මම ආසයි එයා එක්ක දුවලා පැනලා සෙල්ලම් කල්ලා නිදහසේ ඉන්න.. එයා නියම යන්ග් බෝයි කෙනෙක් වගේ පේන්නෙ එතකොට.. අර ආඩම්බරකම පේන්න ඇත්තෙවත් නෑ..

" හෙට.. හැබැයි අනිවාරෙන් එක්කන් යන්න ඕන.."

" හරි හරි අනේ.. මේ කිට්ටුව තියන එකනෙ.. අපි බස්නාව බලලා ගෙදර යමු.."

මම ඉස්සිලා අද හෙන ප්ලේෆුල් වයිබ්ස් විසි කර කර ඉන්න රධ්‍ය අයියගෙ කම්මුලෙන් හාද්දක් තිව්වහම එයා හිනාවෙලා මගෙ ඉණ වටේ අතක් දාලා මාව ළඟට ඇදලා ගත්තා.. මම එයාගෙ කර වටේ මගේ අත් දෙක පටලගත්තා..

" මම නිදාගෙනනම් ඉන්නෙ.. මාව අහැරන්න එපා වරද්.. ප්ලීස්.."

රධ්‍ය අයියගෙ ඇස් මගේ දිහා බලාගෙන සැරින් සැරේ දෙපැත්තට මාරුවෙනවා.. අර අපි පොතක් කියවද්දි ඒක දිහා බලාගෙන ඉන්නෙ.. දෙයක් කියවන්න උත්සහ කරද්දි අපි ඇස් දෙක හසුරුවන්නෙ.. අන්න ඒ වගේ.. හැමතිස්සෙම ප'ෆෙක්ට් විදියට ඇඳලා පැලඳලා ඉන්න රධ්‍යට වඩා මෙහෙම ශෝටක් ඇඳලා, කිසිම මැච් ගතියක් නැති බැගී ශර්ට් එකක් ඇඳලා, එහෙ මෙහෙ මඩ පැල්ලම් ගාගෙන, කොණ්ඩෙ පිලිවෙලක් නැතුව ඇස් දෙකට වට්ටගෙන, හිනාවෙවී කතාකරන 'රධ්‍ය' කියන කැරක්ටර් එකට මම හුගාක් ආදරේ කලා.. වගේම හිතේ පැත්තකම හරි ආත්මාර්ථකාමී ආඩම්බරයක් තියෙනවා.. එයා එහෙම ඉන්නවා මේ ලෝකෙන්ම දකින්නෙ මම විතරයි කියලා හැඟීමක්..

" ඔයාව කවුරුත් ඇහැරන්නෙ නෑ.."

රධ්‍ය අයියා මගේ ඇස් වලට යටින් හාදුවක් තියලා මගේ දිහා බලාගෙන හිටියා.. මම එයාගෙ ඇස් මගැරලා ලාවට තොලත් හපාගෙන වෙන පැත්තක් බලුවහම එයා අමුතු හිනාවක් මූණෙ තියාගෙන මගේ මූණ ආයෙම එයාගෙ පැත්තට හරව ගත්තා.. මගේ කම්මුල් රත් වෙනවා වගේ.. බඩේ සමනල්ලු තටු ගහලා පියාඹනවා වගේ.. රධ්‍ය අයියා මගේ කොණ්ඩෙ පිටිපස්සෙන් ඇඟිලි යවලා එයාගෙ මූණ පොඩ්ඩක් ඇල කරගෙන මගේ තොල් වලට පහත් වුණා..

@Shan

එයා එකසැරයක් විතරක් මගේ තොල් විනාඩි ගානක් උරවලා ආයෙම පෙක් එකක් තිබ්බා.. ආයෙම තව පෙක් එකක් තිබ්බා.. මගේ කම්මුලක් එයාගෙ අතකින් වැහිලා තිබ්බෙ.. මගේ ඇස් පියවෙනවා.. ආයෙම ඇරෙනවා.. ආයෙම මත් වෙලා වගේ පියවෙනවා.. හුස්ම ගන්න වේගෙ පවා වෙනස් වෙනවා.. රධ්‍ය අයියා අන්තිම පෙක් එකත් මගේ තොල් වලට තියලා එහාට වුණා.. මම එයාගෙ කරේ තිබ්බ සිල්වර් චේන් එකේ අමුණලා තියෙන මුද්ද දිහා බලාගෙන හිටියා..

" කලින් මට ඔයා ගාව ඉද්දි හරිම cozy and comfortable ගතියක්

homy ෆීලින් දැනුනා.. දැන් It feels like living.."

" I love you without limits.. ඔයාට පුළුවන් ඔයාගෙ ගෙදර මාව කරගෙන ඒකෙම ඔයා කැමති විදියක ජීවත් වෙන්න.."

" I'm already doing it.. ඔයා මගේ ගෙදර නම් මම ඒ ගෙදර කී හෝල්ඩර් වෙන්නම්.."

මම රධ්‍ය අයියගෙ කම්මුලක් සිනිඳුවට අතගාලා එහාට වෙලා එයාගෙ අතකින් අල්ලගත්තා.. ඊටපස්සෙ පැලෙන් එළියට ඇවිත් නියර දිගේ බස්නාව පැත්තට ඇවිදගෙන යන්න ගත්තා..

" කී හෝල්ඩර් එකක් ගැන කිව්වහම මට මතක් වුනේ ඔයා අර බර්ත්ඩේ එක දවසෙ කිව්ව කතාව.."

රධ්‍ය අයියා මගේ අතින් අල්ලගෙන මගේ පිටිපස්සෙන් හිමිහිට අඩිය තිය තිය ආවා..

" කෝක..??"

" අර අවුරුදු විසි එකේ කී චේන් එකේ ට්‍රැඩිශන් එක.. ගෙදර කී හෝල්ඩර් කෙනෙක් වෙන්න පුළුවන් කියලා.."

" ආ.. මම කලින්ම ගෙදරක් හොයාගෙන හිටියේ.. ස්ථිර පදිංචියට ගියේ ළඟදි.. කොහොම වුනත් ඉතින් ඔප්පුව අයිති වෙලා තිබ්බෙ කලින් ඉඳලම මට තමා.."

@Shan

" එහෙමද.. ඉඩම් හිමි වැවිලිකරු රධ්‍ය ශනව් හෙලාක්ශ.."

" ඔව් වවනවා ඒවා බලාගන්නවා ඉඩමකුත් තියනවා.. ධනපති පංතියෙ තමා.."

අපිනම් ගෙදරින් දැවැද්ද දෙනකල් ඉන්නෙ.. ඔය එක පංතියක්කත් ආදාල නෑ සගෝර්...!

මේ දලඹු පැංචොන්ගෙ සතුට දැක්කහම එකපාර නොටිෆි බලන්න ආපු මට සුබරකුත් ලෝඩ් වුණා.. යකො මෙච්චර සතුටක්.. මට දරාගන්න බැරුව පපුව පැලිලා කන්ථක අස්සයා වගේ මැරිල යයි හරිත..

පිස්සු කෙල්ලොහ් ටික../ කොල්ලෝහ් ටික..

@shenun අයියණ්ඩි ගණ පිහිටලා නම් හදලා දුන්නට හැමෝගෙන්ම හාද්ද ගානෙ ඔනිත.. ආදරෙයි ඈ..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 82 කොටස

" අප්පේ.. එහෙනම් මේ පුතාට හරි පාලු ඇති මයෙ හිතේ ගෙදර.."

මම අපේ ගෙදර සක්කිලි පූසවත් අත් දෙකෙන් බදාගෙන ඉස්තෝප්පුවට එද්දි රධ්‍ය අයියා අපේආච්චි ගාවින් ඉඳගෙන හෙන පව වගයක් හලනවා.. අපේ ආච්චිටත් ඉතින් මේ ගහක් ගලක් වගේ ඉන්න සුදුමහත්තයව අමතකවෙලා වෙන පුතෙක් ලොකු වෙලානෙ.. අම්මා මිදුලෙ වේලෙන්න දාපු මිරිස් පැදුරක් තුනී කරනවා.. මාමා ඔංචිල්ලාවෙ ඉඳගෙන බුලත් කොළයක් අතේ තියාගෙන ඒක දිහා බලාගෙන ඉන්නවා.. මේකා බුලත් කොළයක් අරගෙන ගුරුකමක්වත් කරනවද.. කන්නෙ නැතුව මක් කරනවද.. මම පූසව අත් දෙකෙන් උස්සලා වටයක් කැරකිලා ඔංචිල්ලාව පැත්තට ඇවිදගෙන ගියා..

" ඕ සාකි සාකී රේ සාකි සාකී

ආ පාසආ රාහ් නා ජේ කොයී බාවායිශ් බාකී..

ඕ..සාකි  සාකී රේ සාකි සාකී.."

මාමා උඩ ගිහින් බිම වැටිලා ඉක්මනට අපේ අම්මා දිහා බැලුවා..

" සුදුමහත්තයා උඹ මගෙන් කනවා.."

" ඇයි මම ඔයාගෙන් කන්නෙ.. මම සිංදුවක් කිව්වෙ.."

රධ්‍ය අයියත් මගේ දිහා බලලා ලාවට හිනාවුණා.. අනේ මාමෙ අපි අහගෙනනෙ ඉදියෙ.. වෙලේ පැලට වෙලා කැඩුව මල් වට්ටියෙ තරම.. ආදරෙයි ආදරෙයි කියලා දෙපාරකුත් කිව්වා.. මාව කාන්තාර ඔටුවෙක් වගේ පේනවද දන්නෑ..

" උඹ මොකටද අහක ඉන්න මං ගාවට ඇවිත් සිංදු කියන්නෙ.."

" මම ගුණදාස කපුගේ නෙ.."

@Shan

" මම් ගුණදාස කපුගේට සෙම අමාරුව හැදිලා වගේ.. අහකට පලයං.. මට මේක පදින්න දීලා.."

මාමා ඔංචිල්ලව අත් දෙකින් අල්ලගෙන එකපාරක් පැද්දුනා.. මේ ඔංචිල්ලාව ගලවලා දැම්මනම් හරි.. මාර මගුලක්නෙ.. මේ එදර සේරම ගෑණු ලමිස්සියො වගේ මේකම බදාගෙන ඉන්නවා.. හරිනම් මේක මගේ.. මටනෙ මේක හදලා දුන්නෙ.. මේ කඹෙන් හරකෙක් බැන්දනම් මීට වඩා හොදයි..

" ඕ සාකි සාකි රේ සාකි-"

" මොන හ්-හත්තක් පිපිලා මේ කොල්ලො.. අඩෙ අර.."

මාමා නැහැදිච්ච කුණුහර්පයක් කියන්නත් ගිහින් අපේ අම්මා හැරිලා බැලුව නිසා ඒක හත්තකට පෙරලලා කොහොඹ ගහ මුල කඩි ගුලක් මට අත දික් කල්ලා පෙන්නුවා..

" කෝ.. පිස්සුද මාමෙ.. මේ කඩි ගුලක්නෙ.."

" කඩි ගුලට කලින් ඔතන හත්තක් පිපුණා.. 'පකයා'.."

මාමා පයන්නෙන් පටන්ගන්න කැල්ල රහසින් කියලා මට රැව්වා.. ඊටපස්සෙ බුලත් කොලේ දිහා බලාගෙන ඉදලා ඒක ගුලි කල්ලා කොහොඹ ගහ මුලට දැම්මා..මෙන්න යකෝ..!! දත් දොස්තරයා බුලත් කොලේ විසික් කලා.. මේක අටපට්ටමටම දාන්න වටින්න කාරනාවක්.. මම ගිහින් බුලත් කොලේ අහුලගෙන ඇවිත් ශර්ට් එකෙන් වැලි පිහිදලා ආයෙම මාමගෙ ඔඩොක්කුවට දැම්මා..

" කනෝ කනෝ මම අම්මට කියන්නෑ.."

" මම බුලත් කන්නෑ.."

මාමා එයාගෙ බෝල ඇස් දෙක ලොකු කරගෙන හෙන අහිංසකයා වගේ ඔංචිල්ලාවෙ කඹේට බූණ හේත්තු කරගත්තා.. මුගේ වෙස් මාරු කිරිල්ල තමා.. කෙල්ලො රැවටුනොත් රැවටෙන්නෙ.. රඩ්‍ය අයියට පස්සෙ මාමා තමා හොදම වෙස් මාරු කරන නාග වර්ජින් මෙල්..

@Shan

" ඒ මොකෝ කන්නැත්තෙ.. එහෙනම් මම බුලත් වැල කපලා දානවා ඈ.."

" හා.. කපලා අම්මට කියපන් ගම්මිරිස් වැලක් යවන්න කියලා.."

මම කොහොඹ ගහට හේත්තු වෙලා මාමගෙ දිහාට නැමුනා.. මේකා සිරාවටම හැදිලද ඒ කියන්නෙ.. මේක වෙන්න බැරි දෙයක්නෙ.. කෝ යකෝ මගේ පරණ නොසන්ඩාල මාමණ්ඩියා..

" මේ සිරාවට මාමෙ.. මොකද මේ.. බුලත් කනවටයි සිගරට් බොනවටයි දෝණි කේස්ද.."

" එහෙම මගුලක් නෑ.. මොන දෝණියෙක්ද.. ඒව බං.."

" ඇයි දෝණියෙක් නෙමේද.. සුදුඅම්මියෙක්ද.."

සුදුඅම්මියෙක් ඉන්නෙ මටනෙ.. මගේ සුදුඅම්මියා ආච්චිඅම්මට කතන්දර කියලා දෙනවනෙ වැලිතලප කෑල්ලකුත් කකා.. ඔයයි මාගෙ වල්ග තරුව..මගෙ අහසෙ පෑයු එළිය.. ආදරේට නේ.. ඔච්චමක් නේ කලේ.. පිටසා~ක්වල රෝස කැකුළ..

" එහෙම වලාමක් මට නෑ.. උඹට ඔලුව අමාරුවද.."

" නෑ පුපේ අමාරුව.. අනේ කියනවකො කවුද සාකි කියන්නෙ කියලා.. මමත් හැම එකම උබට කියනවනෙ මාමෙ.."

" පොඩ්ඩක් කියන්නම්.. හැබැයි මට උඹත් අර කුරුඳුවත්තෙ කෑල්ල ගැන කියපන්.."

" හා බාගෙ බාගෙ සමානයි.. මම කියන්නම් මුලින්.. එයා සුදුයි.. ලස්සනයි.. චොක්ලට් කන්නෙ නෑ.."

" ආ ඉදපන් මගේ බාගෙ කියන්න.. එයත් සුදුයි.. උසම නෑ.. චොක්ලට් කනවා.."

මම පයින් මාමගෙ කකුලට එකක් ගැහුවා..

" සැක්.. ඒ මොන ලබ්බක්ද ඒ කිව්වෙ.. එහෙම නෙමෙ සවිස්තරාත්මකව කියන්න ඕන.."

@Shan

" ඉතින් උඹ කිව්වෙ අච්චරයිනෙ.. මම කියන්නෙ මෙච්චරයි.."

" මගේ එක්කෙනාට ලොකු පස්සක් තියෙනවා.."

මාමා මගේ දිහා ඇස් දෙක ලොකු කරගෙන බලාගෙන හිටියා..

" මගේ එක්කෙනාටත් හෙන ලොකු පස්සක් තියෙනවා.."

යසයි.. මාමත් අල්ලගෙන තියෙන්නෙ තඩි පස්සක් තියන එක්කෙනෙක්ද.. කමක් නෑ.. මම හිමිහිට රධ්‍ය අයියගෙ පස්ස දිහා බලාගෙන හිටියා.. මම ලොකු කල්ලා ගන්නම්කො සුදුඅම්මියගෙ පස්ස.. මේ වරද් ඕවද කල්ලා තියෙන්නෙ..

" පස්සක් තිබ්බට වැඩක් නෑ මොලේ නැතුව ඇති.. නැත්තම් ඔහේ වගේ එකෙක් එක්ක යාලුවෙයිද.."

" අනේ නිකම් පලයන් බං යන්න.. ඔය කුරුඳුවත්තෙ කෙල්ලටත් මොලයක් නැතුවැති උඹ වගේ එකෙක් එක්ක යාලුවෙන්න.."

" පිස්සු හැදෙයි.. මම ඇවිල්ලා අපේ ඉස්කෝලෙ වෙන්න හෙඩා.. ජ්ෆ්ෆ්ට්..අනික අපේ ඉස්කෝලෙ තමා පරණම බිග් මැච් එක තියෙන්නෙ.. තවුසෙලගෙ ඉස්කෝලෙ මීඩියම් තුනකින් උගන්නවද නැනෙ.. ජර්මන් උගන්නනවද නැනෙ.. රහහලක් තියෙනවද නැනෙ.. ලස්සන කොල්ලො ඉන්නවද නැනෙ.. අනික ප්‍රසිඩන්ට්ලා ඉන්නවා.. මිනිස්ටර්ස්ලා ඉන්නවා.. අපි ඇවිල්ලා හෙන පොශ් ස්කූල්ස්වල ඩිසිප්ලින් ඇතුව හැදුනු මැනර්ෆුල් බෝයිස්ලා.. අවර් ස්කූල් හැස් ද මෝස්ට් පවර්ෆුල් මොටෝ.. ලර්න් ඕ ඩිපාර්ට්.. ඉෆ් යූ ඩෝන්ට් වෝන්ට් ටු ලර්ට්.. ගෙට් ද ෆක් අවුට්.. සී..??"

මාමා මගේ දිහා බලාගෙන ඉදලා ඇස් දෙක කරකලා ඔංචිල්ලවෙ පැද්දෙන්න ගත්තා..

" උඹලගෙ ඉස්කෝලෙන් ලියලා දෙනවද බං.. කවුරුහරි එක්ක ඉස්කෝලෙ ගැන කතාකරද්දි ඔය ටිකම අනිවාරෙන් කියන්න ඕන කියලා.. මහ ### පම්පෝරියක්නෙ මේක-.."

" අනේ මේ පලයං මාමෙ.. මට අර නැවයි තරුතුනයි දැක්කහම එකපාරටම මහ කොලොම්බස් හැඟීමක් එනවා.. අනාත මාරුතේ කුණාටු සාගරේ

@Shan

වගේ.."

" අපේ ඉස්කෝලෙට එක එක ඒවා කියන්නෙපා උඹලගෙ ඉස්කෝලෙ ලොකු නෑ හරී.."

" අපිට ලොකුයි.. අම්මෙ මෙන්න මාමා බුලත් කනවා~"

මම පුසව බිමට විසික් කරගෙන ගෙට දුවලා යද්දි උඩින් ආපු සෙරෙප්පුවක් මගේ පිටේ වැදීගෙන අනිත් සෙරෙප්පුව ඔලුවට උඩින් ගියා.. මම කාමරේට දුවගෙන ගිහින් දොර වහගත්තා.. ඇවිලුවාට පස්සෙ සැහැවිලා ඒක දිහා බලාගෙන ඉන්න ඕන කියලා මාමම තමා මට ඉගැන්නුවේ.. ඒක වෙනමම ආතල් එකක්.. මම කාමරේ වහලා මගේ ෆෝන් එක අරගෙන හයියෙන් සිංදුවක් දාගත්තා.. දවල් රධ්‍ය අයියට බස්නාව පෙන්නන්න ගිහින් මට වැවක මූලික අංගවල ඉඳලා පහැදිලි කල්ලා දෙන්න වුනු නිසා, රධ්‍ය අයියා මගෙන් හොඳ ගුටි දෙක තුනකුත් කාලා ආපහු ගෙදර එන්න ආවා.. ඊටපස්සෙ එහාගෙදර රක්තපාත කිකිළි ඒ කිකිළිගෙ පුංචිගෙ දුව කියන ඇම්බැට්ට කිකිළිත් එක්ක අපේ ගෙදර ආපු ඇවිල්ලා මගේ සුදුඅම්මියට කෙළ හලන්න ගත්තු නිසා සුදුඅම්මියා ළිදෙන් නාන්න ආසයි කියලා පනිට්ටුවයි ටවල් එකයි අරගෙන ළිඳට ගියා.. මමත් නම්ගිලාට යන්නම් කියලා ළිඳට ඇවිත් රධිය අයියත් එක්ක ඇඟ සේදුවා.. මොකද අපි දෙන්නම අර ලියද්දෙ පෙරලිලා ඔපදූප හොයලායි, ගොයම් ගස් වල බූවට සීරිලා කසලායි, ඇඟවල් ජරාවාස වෙලා තිබ්බෙ.. මගේ සෙරෙප්පු දෙකත් මට නැතිවුනා.. එකක් ඇලේ ගහගෙන ගියා.. අනිත් එක අර හැකරැලි පෙම්වතා පැලේ අමතක කල්ලා ඇවිල්ලා..

මම ජනේලෙන් එළිය බලන් ඉද්දි එකපාරටම ප්ලේ වෙවී තිබ්බ ශෝන් මෙන්ඩිස්ගෙ ට්‍රීට් යූ බෙටර් එක ඕෆ් වෙලා මාව තඩි වලහෙක් ඇවිත් වෙලාගත්තා.. මම ජනේලෙ වහලා රධ්‍ය අයියා පැත්තට හැරුණා..

" ඔච්චර ඔවා කන්න එපා අනේ.. සීනි අමාරුව හැදෙයි.."

රධ්‍ය අයියා වැලි තලප ගිලිනවා ගිලිනවා ඉවරයක් නෑ.. එයා කාලා නැහැල්ලු වැඩිය ඒවා.. අපේ ආච්චි හදපු බන්දේසියම ඉතින් එයා ආපු වෙලේ ඉඳලා ගිලිනවා..

" ඒක රසයි.. මේ ඔයාලගෙ ආත්තම්මා හරි ශෝක් වරද්.. ආත්තම්මා හුගක් දේවල් දන්නවා නේද.. මම එහෙම සරල මිනිස්සුන්ට මාර ආසයි.."

@Shan

" මමත් ආදරේම ආච්චිඅම්මට.."

රධ්‍ය අයියා වැලිතලප කෑල්ල හපලා හපලා ගිලලා මගේ කම්මුලට හාද්දක් දුන්නා.. මම එයාගෙන් එහාට වෙලා බිත්තියට හේත්තු වුණා.. මට ඉල්ලීමක් සහ යුතුකමක් තියෙනවා කරන්න.. පස්සෙ බැරියැ හුරතල් වෙන්න..

" මේ.. මගේ ඇඳෙන් හාන්සිවෙන්නකො.."

රධ්‍ය අයියා ඇහිබැමක් උස්සලා මගේ දිහා අමුතු විදියට බැලුවා..

" ඒ මොකටද.."

" හාන්සිවෙනවකො ඉතින් කියන්න.. මෙහෙම මුනින් අතට.."

" මට බෑ.."

ඕකනෙ කියන්නෙ.. මේ මිනිහගෙ ඕනවට වඩා ලොකුකමනෙ.. මාමා කිව්වත් වගේ අපේ ඉස්කෝලෙ අවුලක්ද.. නෑ නෑ වෙන්නබෑ.. අපි එහෙම නෑ.. මම රධ්‍ය අයියගෙ පිටට තල්ලුවක් දාලා ඇඳේ මුනින් අතට පෙරළගෙන කකුල් දෙක උඩින් වාඩි වුණා.. රධ්‍ය අයියා දඟලලා දඟලලා පස්සෙ මැරිලා වගේ එහෙමම හිටියා.. මම.. ඔය තියෙන්නෙ වට්ටක්කා පුඩිම වගේ පිම්බිලා.. මාමට සෙකන්ඩ් වෙන්න බෑ සුදූඅම්මියෝ..ඔයාගෙ පස්ස අපි ලොකු කල්ලා ගන්නම ඕන.. මේ වරද් ඒ වෙනුවෙන් ඕනම අවදානමක් ගන්න සූදානම් වෙලා ඉන්නෙ.. මම වටාස් ගාලා පස්සට පාරක් රධ්‍ය අයියට දුන්නා..

" මොකද බං.. වෙලා තියෙන්නෙ.."

" මොකුත් නෑ අනේ මම ඔයාගෙ පස්ස ලොකු කරන්න යන්නෙ.. ඔය කලිසම ගලවනවකො.."

රධ්‍ය අයියා එකසැරේම බයවෙලා වගේ හැරිලා මගේ දිහා බැලුවා..

" නිකන් ඉන්නවා වරද්.. මේ මොන- එහාට යනවා මගේ ඇහෙන්.."

" බෑ ඕක ගලවනවා.."

@Shan

" බෑ බෑ යනවකො.."

" බැරි මොකක්ද.. මේ නටන්නැතුව ඉන්නවා.."

මම රධ්‍ය අයියගෙ මූණට කොට්ට දෙකතුනක් තියලා බඩ වටෙන් අතදාලා කලිසමේ බට්න් එකෙන් ගලවලා සිප් එක ඇද්දා.. යටකලිසම් ඇඳගෙන මං ගාව නිදාගන්නහ් හොඳයි.. මට උවමනාවකට තමා පොඩ්ඩක්.. සමයං..

" ඒ වරද්..!!!!!!!!!!!!!!!!!!"

මම රධ්‍ය අයියගෙ මූණට පොරවන රෙද්දත් දාලා කලිසම පහලට ඇද්දා.. අනේ මේ මාමට පිස්සු.. රධ්‍ය අයියගෙ පස්සට ගහන්න පස්සක් කොහේවත් නෑ.. මම අත දිගැරලා පාරක් දුන්නම ඒක බවුන්ස් වෙලා ගියා.. ඊටපස්සෙ අත් දෙකෙන්ම හොඳට රධ්‍ය අයියගෙ පස්ස මසාජ් කරන්න අත්තගම රධිය අයියා දඟලලා දඅලලා අර රෙද්ද මූණෙන් අහකට ගත්තා..

" ආර්හ්!! ඕක නවත්තපිය.."

" මේ ඔයා කෑගහන්නැතුව ඉන්නවද.. මම වැරදි වැඩක් කරන්නෙ නෑනෙ.."

මම ආයෙම වටාස් ගාලා පාරක් රධ්‍ය අයියගෙ පස්සට දුන්නහම රධ්‍ය අයියා ආව් ගාගෙන කොට්ටෙ මූණ ඔබාගෙන ඇඳ රෙද්ද ගුලි කරගත්තා. මම හොඳට මගේ පුංචි ලස්සන අත් දෙකෙන් රධ්‍ය අයියගෙ තඩි පස්ස හිමින් හිමින් ගානට මසාජ් කලා..

" ආව්.. ඔයාගෙ පස්ස ලොකු වීමේ රහස මොකක්ද ඒයි.."

" පොඩ්ඩක් ඉඳපන් මම රහස උඹට කියලා දෙන්නම්.. මගේ කකුල් දෙක උඩින් නැගිට්ටහම.."

මම රධ්‍ය අයියා කියන වාචාල කතා ගනන් ගන්නැතුව විනාඩි පහලොවක් විතර පස්ස අල්ල අල්ල ඉඳලා අත් දෙක රිදෙන්න ගත්තු නිසා එහෙමම රධ්‍ය අයියගෙ එහාපැත්තට පෙරළිලා ගිහින් කොට්ටෙ බදාගත්තා.. අත් දෙක රිදෙනවා මගේ..

" අනෙ මේ මොකක් හරි කල්ලා පස්ස ලොකු කරගන්න හරිද.. මට ලැජ්ජ කරන්නැතුව.."

@Shan

රඩ්‍ය අයියා මුනින් අතට ඉඳගෙනම කලිසමේ බටන් එක දාගෙන මාව ඇදලා අරගෙන අතක් උඩින් තියාගත්තා..

" ඒ මොකටද ලැජ්ජ වෙන්නෙ.."

" අපේ මාමගෙ ඉසකුඩිච්චියගෙ පස්ස ලොකුලු.."

රඩ්‍ය අයියා හිනාවෙලා මගේ තොල් වලින් පෙක් එකක් තිබ්බා.. අනේ මෙ මට හාදු දිදී ඉන්න මූඩ් එකක් නෑ.. අපේ මාමගෙ සාක්කිච්චව හොයාගන්න ඕන.. අනික මොකද අර පැලේදී අපේ ඉස්කෝලයක් ගැනයි මම ගැනයි කිව්වෙ.. මොකක් හරි මගෝඩි වැඩක් තියෙනවා අපේ මාමගෙත්.. එකපාරට වෙනස් වෙලා.. හැදිලා.. හෙන පිලිවෙල වෙලා.. කැම්පස් යන කාලෙවත් ඔය ගොයියා ඔහොම පිළිවෙලට ඉඳලා නෑ.. එක කාලයක් හිටියා ඊටපස්සෙ ඒක නැතුව ගියා..

" ඉතින් හොඳයිනෙ.."

" අනේ මෙ තවුසෙ එහෙනම් ඉස්සරහත් ලොකු කරගන්නවා.. අපේ මාමට සෙකන්ඩ්වෙන්න බෑ.."

මම රඩ්‍ය අයියට කියද්දි ඒකා ඉහේ ඉඳලා දෙපතුළටම රතු වෙලා මූණ කෙෑරොක් කරගත්තා..

"උඹ මොනවා කියවනවද මට තේරෙන්නෑ.. කට වහන් ඉඳපන්.. මට නිදිමතයි.."

ඊටපස්සෙ අලුත බැඳපු මනාලි හනිමූන් එකට ඇවිත් 'අදනම් බෑ අයියා' කියනවා වගෙ මාව එහාපැත්ත හරවලා අර බූවලු අඩු ටිකත් මගේ ඇඟ වටේ ඔතාගෙන බෙල්ල අස්සෙ මූණ ගහගෙන ඇස් දෙක පියාගත්තා.. මම අඩු වලට අහුවුණු ගොදුර වගේ හෙල්ලෙන්නැතුවම ඉද්දි රඩ්‍ය අයියා ගොරවන සද්දෙ ඇහෙන්න ගත්තා.. අද ආවා විතරයි නටලා නටලා නිදාගත්තෙවත් නැනෙ හරිහැටි.. මහන්සිද දන්නෑ..

" අපේ මාමගෙයි අපේ ඉස්කෝලෙයි පටලැවිල්ල මොකක්ද.."

මම ආයෙම මුල ඉඳන් මාමා කෝල් එකෙන් කතාකරපුවා මතක් කරගන්න ට්‍රයි කලා..

@Shan

ගංජා ගහන්නෝන ප්‍රස්න..

මේ දළඹු ලමයිනේ.. ඕතරී අර බඩ්ඩ ඊළග චප්පෙ කියන්නම්.. ඊළඟ එක දිගටත් දෙන්නම් හොදේ.. උදේ නැගිටලා කියවන්ටකො.. කෝමත් දිග ඒවටලුනෙ ආම්ස.. මම නෙමේ කිව්වෙ ඔය ළමයිමයි ඈ..

එන්නාම්.. ලව් යූ.. ❤

මට ඔයාලා නැතුව පාලු හිතුනා අයියෝ..(ලොකු හග් එකක්)

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 83 කොටස

මම රෑ නැගිට්ටුනේ මගේ කාමරේ ජනේලෙ එහාපැත්තෙන් කුටු කුටු ගාන සද්දයක් ඇහිලා.. අද මට ලොකුවට නින්ද ගියේ නෑ.. පොඩි සද්දෙකටත් ඉක්මනට ඇහැරෙන ලයින් එකක් තිබ්බෙ.. රෑ රධ්‍ය අයියා එයාගෙ කාමරේට නිදාගන්න ගිහින් ඒ කාමරේ ඉඳලා කෝල් කල්ලා තනියම නිදාගන්න බෑ කියලා අමුතු වන්නමක් නටන්න අරගෙන.. අන්තිමට ඒකා උගේ කාමරේ ජනේලෙන් පැනලා ගේ වටෙන් ඇවිත් මගේ කාමරේ ජනේලෙන් මගේ කාමරේට ඇවිත් දැන් ගොරව ගොරව නිදි.. ඒ මදිවට යටකලිසමකුත් විතරක් ඇඳන්, ජනේලෙන්වත් මොකෙක් හරි එබුනොත් බී එස් වෙන නිසා මම කාමරේ ජනෙල් දොරවල් සේරම අගුලු දාලා ෆෑන් එකත් පහටම දැම්මා..

" අනේ මන්දා.. මට හිතාගන්නත් බෑ සාකි.."

මම හොඳට ජනේලෙ එහාපැත්තෙ කතාකරන ඒවා අහගෙන හිටියා.. කොහෙද මේ රධ්‍ය අයියා වලස් තඩියා වගේ කන ගාව ඉඳන් ගොරවනවා මෙලෝ මගුලක් ඇහෙන්නෙ නෑ.. මම රධ්‍ය අයියගෙ අඩු ටික සේරම හිමින් පැත්තකින් තියලා හිමිහිට නැගිටලා ජනේලෙට කන තියාගත්තා.. මාමගෙ මෙ හුටපටේ මට එන්න එන්න වැඩිය අල්ලන්නෙ නෑ වගේ දැනෙනවා.. වෙලාවක හිතද්දි මොකක් හරි අවුල් ගොඩක්, පැටලවිල්ලක් තියෙනවා කියලමයි හිතෙන්නෙ..

"  නාරාහේන්පිට එන්න නම් තමා ඉන්නෙ.. ඒ වුණාට.. මට එච්චර හොඳක් පේන්නෑ ඒකෙ.."

" අපි මෙක කොහෙන්ද කතාකරන්න පටන්ගන්නෙ.. ඔයාම කියන්නකො.. දැනට අවුරුදු හතරකට කලින් නවත්තපු තැන ඉඳලද.."

" ආ ඔව් ගෙදර අය නිදාගන්න ගියා.. මම එළියෙ ඉන්නෙ.."

" අපි නවත්තපු තැන ඉඳලා වෙච්ච හැමදෙයක්මමට මතකයි සාකි.. මම මැරිලා ඉපදුනේ නෑ.. ඒ වුණාට මටම හිතෙනවා මැරිලා වගේම හිටියනම් හොඳයි කියලා.."

@Shan

" වෙලාවකට සේරම දමලා ගහලා යන්න හිතෙනවා.. අවුරුදු හතළිහක් මගේ ජීවිතේ ගෙවිලා ගියා.. මම තාමත් ජීවිතේ මට ඕන සතුට හොයාගෙන නෑ.. අනිත් හැමෝම සතුටු වෙනවා ඇති මං ගැන.. ඒ වුණාට අර මනුස්සයෙක්ට දැනෙන ආත්මතෘප්තිය කියන දේ මට දැනෙන්නෙ නෑ.."

" ඔයාට ඒකට කරන්න දෙයක් නෑ දරුවෝ.. ඔයා ජීවිතේ හරියට පටන්ගත්තා විතරයි.."

" මොකද මට මතක නැත්තෙ.. අර බෝතල් අඩි දෙකකුත් දාගෙන ඇවිත් මගෙ ඉස්සරහා දණගහලා වැන්ද දවසනෙ.."

" මට අම්මගෙ හිත රිද්දන්න බැනෙ සාකි.. මට මගේ අම්මගෙයි අක්කගෙයි හිත් රිද්දන්න බෑ වගේම ඔයාට ඔයාගෙ අම්මගෙයි අප්පච්චිගෙයි හිත් රිද්දන්න බෑ.. ඉතින් හොඳම දේ අයින් වුණු එක.."

" ඔයා අප්පච්චිට බනින්න යන්න එපා.. මම ඒකට කැමති නෑ.."

" සාකී!!! මොකක් වුණත් ඒ ඔයාව හැදුව වැඩුව දෙමව්පියෝ.. එකපාරකුත් කන පිරෙන්න කෑවා නේද ඔහොම කතාකරන්න ගිහිල්ලා.. කට වහගෙන ඉන්නවා.."

" මම තාත්තා කෙනෙක් නොවුණට මටත් ඉන්නවා ඇහේ තියාගෙන හදපු එකෙක්.. ඌ මට ඔහොම කිව්වොත් මගේ පපුව පැලිලා යාවි.. ඒකනිසා කවමදාවත් ඔහොම කියන්න එපා.."

" නෑ නෑ දරුවෝ බනිනවා නෙමෙ.. මම කියන්නෙ ඔයාට පේන්නෙ නැති ඇත්ත.."

" මල්ලි මුරණ්ඩු වුණාට ඔයා මුරණ්ඩු වෙන්න එපා.. ඔයා ඉස්සරත් මල්ලි ගැන කිය කිය අඩනවනෙ.. මම හිතුවෙ ලොකු වෙද්දි ඕවා ඇරිලා යාවි කියලා.."

" ඔයාලගෙ අප්පච්චි මාත් එක්ක තියන ඇරියස් ඔයා දන්නෙ නැතුව නෙමෙයිනෙ.. අර හොස්පිට්ල් එකම ඉස්සරහා මගේ කණටම ගැහුවෙ.."

" ඔයා දවසක් කිව්වා මතකද ගින්දර එක්ක සෙල්ලම් කලොත් පිච්චෙන්න වෙනවා කියලා.. ඉතින් පිච්චෙන්න තමා තියෙන්නෙ වෙන මොකක්ද.."

@Shan

" මට නම් හෙන ගහලා ගියාවෙ.. මගේ දරුවෙක් වගේ හදපු එකාගෙ කර දඬු උස් මහත් වෙලා අද ඌ හරි පිරිමියෙක් වගේ නැගිටලා ඉන්නවා.. මට කමක් නෑ මගේ එකා කා එක්ක යාලුවුනත්..මම දන්නවා ඌ එහෙම නරක දේවල් තෝරගන්නෙ නැහැයි කියලා.."

" මල්ලි කවද්ද යන්නෙ.."

" මම්.. මම්.. අඬන්න එපා දරුවෝ.. ඕවා හිතලා හිතලා තමා අන්තිමට ලෙඩෙක් ගානට වැටුණෙ.. මම දැක්කනෙ එදා.."

" අපි මොකක් හරි කරන්න බලමු සාකි.. දැන් ඕක කතාකරන එක නවත්තමුකො.. ඔයා අඬනවනෙ.."

" අපේ ගෙදර ඉන්න දෙන්නද.. අපේ එකානම් මහ නොසන්ඩාල වසවර්තියා.. අනිත් පුතානම් හරිම හොදයි.. මාත් එක්කත් හොදට කතාකලා.. පොඩ්ඩක් ඔයත් වගේ.."

" එහෙමද.. ඉස්කෝලෙ ගැන නම් පඩ ලයින් ටිකක් දුන්නෙ ට්‍රේනින් ඇවිල්ලා.. කලම්බු සෙවන් වල අලි ඔලු මානසිකත්වෙන් ඉඳලා කන්සාල්ටන් වෝඩ් එක මැද්දෙ බැන්නා විතරයි කදුලු පුරවන් ඇවිදන් ගිහින්-"

" ආ නෑ නෑ.. කියන්නෑ.."

" ඔයා ඉතින් වැඩිපුර කතාකරන එක්කෙනෙක් නෙමෙයිනෙ.."

"  ඇයි මගුල ග්‍රැජුවේශන් එකට ආවෙ.."

" මම හිතුවෙ නෑ ඉතින් මම දුන්නු ටයි එකම දාවි කියලා.. දැක්කම පුදුම හිතුණා.."

" ඔව් ඔව් මට උඹව දරුවෙක් වගේ.. කිරි එරුණෙ නැති ටික විතරයි.."

ඒ එක්කම මාමගෙ කටහඬ මට ඇහෙන්නැතුව ගියා.. මාමා ජනේලෙ ගාවින් එහාට ගියාද කොහෙද.. ශිට්..මට මේක අහගන්නම ඕන.. මොකක් හරි අමුතු දෙයක් වෙනවා.. ඇයි හැමතිස්සෙම සාකි රධ්‍ය අයියා වගේ කියන්නෙ.. අපේ ඉස්කෝලෙ ගැන.. ග්‍රැජුවේශන් එකකට ටයි??

@Shan

ගැණුලමයි ටයි දාන්නෙ නැහනෙ..

මම කට අත් දෙකෙන් වහගත්තා.. ඒ එක්කම රධ්‍ය අයියා එහාපැත්ත පෙරළිලා කොට්ටයක් බිම දාගත්තා..

" මිහ්.. වරද්.. කෝ ඔයා.."

මම ජනේලෙ ගාවින් ඇඳට ගිහින් කොට්ටෙ අරගෙන රධ්‍ය අයියා ගාවින් තිබ්බහම එයා ඇහැරුණා..

" ම්ම්.. මොකද කරන්නෙ.. නිදි නැද්ද.."

මම ඇඳෙන් හාන්සිවුනා..

" මම පොඩ්ඩක් ඇහැරුණා.. ඔයා නිදාගන්න.."

රධ්‍ය අයියා නැගිටලා කාමරේ තිබ්බ පොඩි ලයිට් බල්බ් එකක් දාපු ලැම්ප් එක ඔන් කලා..

" නයිට්මෙයර් එකක් දැක්කද වරද්.."

මමත් ආයෙම නැගිටලා ඇඳ වියලට හේත්තු වුණා..

" ම්ම්..?? නයිට්මෙයර් එකක් නෙමෙ.. අද එච්චර තදට නින්ද යන්නෙ නෑ වගේ.."

රධ්‍ය අයියා මගේ ඇස් වල වැටිලා තිබ්බ කොණ්ඩෙ අත් වලින් පිටිපස්සට කල්ලා මගේ මූණට එබුණා..

" ඇයි කලබලෙන් වගේ.. මොකක් හරි ප්‍රශ්නයක්ද.."

" ම්ම්.. නැත්තෙමත් නෑ.. මට අපේ මාමා කතාකරන සද්දෙ ඇහුණා ජනේලෙ එහාපැත්තෙ.."

" ආ අර කෙල්ල එක්කද.."

මම රධ්‍ය අයියා දිහා බලාගෙන හිටියා ටිකක් වෙලා.. එයා නම් සැහැල්ලුවෙන් කතාකලේ.. ඒත් මට සැහැල්ලුවක් දැනෙන්නෙ නෑ..

@Shan

" කෙල්ලෙක් නෙමෙයි.."

රධ්‍ය අයියගෙ මූණ ටිකක් වෙනස්වුණා වගේ මට දැනුනා..

" මොකක්..?? ඔයා කියන්නෙ අර අපි පැලේ අහගෙන හිටියෙ මාමා කතාකරනවා.. කෙල්ලෙක් නෙමෙයි කියලද.."

" ඔව් ඒ කොල්ලෙක්.. ඔයා පොඩ්ඩක් මතක් කල්ලා බලන්නකො.. ඒ වෙලාවෙ ඉස්කෝලෙ ගැන කිව්වා අපේ.. මම ගැන ඔයා ගැන කිව්වා.. හවස අපේ ඉස්කෝලෙ ගැන හෙනට දන්නවා වගේ කතාකලා.. ඒ සේරමත් පැත්තකින් තියමුකො.. මෙ දැන් මට ඇහුණු ඒවා.."

රධ්‍ය අයියා කොට්ටයක් අරගෙන උකුළෙන් තියාගෙන මගේ පැත්ත හරුණා..

" මොකක්ද ඒ.. මුල ඉඳන් හරියට කියන්නකො.. මට තේරෙන්නෙ නෑ.."

" මටත් ඇහුණෙ අපේ මාමා කතාකරන ඒවා විතරයි.. කවුරුහරි කොල්ලෙක්.. එක්කො මේල් නර්ස් කෙනෙක් නැත්නම් ඩොක්ටර් කෙනෙක්, සිවිල්ද නැද්ද දන්නෙ නෑ.. මාමට වඩා හුඟක් බාලයිද කොහෙද.. කලින් එයාලගෙ එෆෙයාර් එක නවත්තලා ආයෙම ඒක පටන්ගෙන වගේ.. අවුරුදු හතරකට විතර කලින්.."

" තව.."

" තව ඒ කොල්ලට මල්ලි කෙනෙක් ඉන්නවා.. සාකි කියන්නෙ ඇත්ත නමක් නෙමෙයි මම හිතන්නෙ.. ඒක අපේ මාමා කියන එකක්ද කොහෙද.. හරි නම දැනගන්න විදියක් නෑනෙ.. මොකද කරන්නෙ.."

" මාමගෙ ෆෝන් එකේ ඇතිද දන්නෙ නෑ.."

" මම හිතන්නෙ නෑ.. සිම් එකත් එයාගෙ නම්බර් එක නෙමෙයිද.. වෙන එකක් වගේ.. එතන සැහෙන්න ලොකු ප්‍රශ්නයක් තියෙනවද කොහෙද.. මාමා කතාකලෙත් අවුලෙන්.. එයා සතුටින් නෙමෙයිලු ඉන්නෙ.. අම්මගෙයි ආච්චිඅම්මගෙයි හිත රිද්දන්න බැහැල්ලු.."

" ඒ මොකක්ද වරද් ඒ.."

@Shan

" මට තේරෙන්නෑ අයියෙ.. මාමා ඇත්තටම සතුටින් නෙමෙයිද ඉන්නෙ.. මොකක්ද මේ වෙලා තියෙන්නෙ.."

රධ්‍ය අයියා ටිකක් වෙලා එළියෙ සද්ද වලට ඇහුම්කන් දීගෙන හිටියා ඉඳලා ඇඳේ තිබ්බ තිල්පාට සරම කරෙන් දාගෙන නැගිටලා දොර ගාවට ගිහින් මට එතෙන්ට කතාකලා..

" ඇයි.."

" ශ්.. ඔයාට ඇහෙනවද එළියේ කවුරුහරි කතාකරනවා.."

මම ටිකක් වෙලා අහගෙන හිටියා..

" මාමගෙ කාමරෙන් නේද.."

" ඔව් මගේ එකට එහාපැත්තෙ එකද කොහෙද.. අපිට ඒ කාමරේට ගියොත්නම් අහගෙන ඉන්න තිබ්බා.. ඒක හරි නෑ වගේද ඒ වුණාට වරද්.."

" අපි මැදිහත් වෙන්න යන්නෑනෙ.. මට ඕන දැනගන්න විතරයි.."

මමයි රධ්‍ය අයියයි කාමරේ ලයිට් ඕෆ් කරගෙන හිමින් හිමින් සාලෙ මැද්දෙන් අඩිය තියලා රධ්‍ය අයියගෙ කාමරේට ගිහින් ශේප් එකේ දොර වහගත්තා.. එහාපැත්තෙ සේරම මෙහා කාමරේට ඇහෙනවා.. මම එතන බිත්තිය ගාවින් වාඩිවෙලා ඇහෙන ඒවට කන් දීගෙන ඉද්දි රධ්‍ය අයියා ඒ කාමරේ නයිට් බල්බ් එක ඕන් කල්ලා ඇවිත් මං ගාවින් ඉඳගත්තා..

" ඔයා ඔය කොයි තීරනේ ගත්තත් පසුතැවෙනවා.. ඇයි අපි කතාකරන හැමතිස්සෙම එකම තැනකින් නවතින්නෙ.."

" වෙන්න තියන දේවල් අපිට නවත්තන්න බෑනෙ සාකි.. ඔයාගෙ අත මොකද.."

" වෙලාවට කෑම කන්න.. මල්ලිලා එන්නෙ කවද්ද.."

" එතකල් පරිස්සමට ඉන්නකො.. මම ට්‍රින්කො යන්න කලින් එන්නම්.."

" මහන්සිනෙ අද.. ඔයා දැන් නිදාගන්න දරුවෝ.. මම නිදහසේ ඉන්න වෙලාවක ගන්නම්කො.."

@Shan

" ආ කවුද එහෙම කතාකලේ.. ඔයාට පිස්සු.. මට දැනෙන්නෙ මමත් අවුරුදු තිස් හයේ කාලෙ හිටියා වගේ ඔයා එක්ක දැන් කතාකරද්දි.. ඇත්තටම කොහෙන්ද මගේ නම්බර් එක හොයාගත්තෙ.."

" රහස්?? අනේ මම දන්නැති උඹේ රහස්.. හරි හරි නිදාගන්න එහෙනම්.. ගුඩ් නයිට්.. මම.. හරි.."

මාමා නැගිටලා එළියට යනවා මට ඇහුණා.. මේ මනුස්සයා රෑට නිදාගන්නෙ නැද්ද මන්දා.. එහේ මෙහේ හක්මන් කරන්නෙ..

" වරද් අපි මේක පස්සෙ වෙලාවක කතාකරමු.. දැන් නිදාගන්න එන්නකො.. ලොකුවට හිහන්නෙපා.. ඔයාට කරන්න දෙයක් නෑ මෙතෙන්දි.."

" ම්ම්.."

මම ඒ කාමරේ ඇඳට ගිහින් කොට්ටෙට ඔලුව ගහගත්තහම රධ්‍ය අයියා ලයිට් නිමලා මාව එයාට ලං කරගත්තා..

" කලින් අපේ අයියා.. දැන් මාමා.. හෙන අසාමාන්‍යයි වගේ නේද.."

" අසාමාන්‍යයි කියන්නෙ.. බලන් යද්දි ලෝකෙන් බාගයක් ගේ ද.. සෙනුක අයුක අයියා මාමා ආධ්‍ය අයියා අපි වටේ ඉන්න බාගයක් එහෙමනෙ.."

" ම්ම්.."

රධ්‍ය අයියා මොකක් හරි කියන්න හදලත් ආයෙම කට වහගෙන මාව පපුවට තුරුල් කරගත්තා..

" ඔයා මොකක් හරි කියන්න ගියාද.."

" හෙට කියන්නම්.. පොඩි වැඩක්.."

ඕතරීට උන හැදිලා ළමයි.. මම එන්නම් හවසට ආයෙම.. දිගට ලියගන්න බෑ සුට්ටක් අමාරුයි.. මේ පව්කාරිට සමාවෙන්න දෙයියනේ..

එන්නාම්.. ලව් යූ.. ❤

@Shan

ප.ලි.

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 84 කොටස

" අම්මෙ.. දේව ටිකක් අමුතුයි වගේ.. අම්මට හිතෙන්නෙ නැද්ද.."

මම හිටියේ කුස්සියේ.. අම්මට පොල් ගාලා දෙනගමන්.. ආච්චිඅම්මා බංකුවකින් ඉදන් පලා වගයක් තෝරනවා.. අම්මා එළවලු කපලා ඒදනවා..

" මටත් හිතුනා.. කෝ ඉතින් මේ ළමයා අපිට කියන එකක් ද.."

" සුදුමහත්තයා.. උඹට මොනවහරි මාමා කිව්වද.."

මම පොල් කැල්ලක් කටින් කඩාගෙන මේසෙට හේත්තු වුණා..

" මටනම් මොකුත් කිව්වෙ නෑ.. ඔය ඉන්නෙ මාමා යස අගේට.."

" ම්ම්.. මරු එකාගෙන් තමා අපිත් මේවා අහන්නෙ.. ඔය ඉන්නෙ මාමගෙ නගරසභාවනෙ.. මාමව සුද්ද කරනවා සුදුමහත්තයා.."

ආච්චිඅම්මා හිනාවෙවී අපේ අම්මට කිව්වා..

" මොකක් වුණත් කමක් නෑ.. පොඩි ළමයි නෙමෙයිනෙ අම්මෙ.. දැන් අවුරුදු හතළිහක් වෙන මිනිහෙක්නෙ.. දැනුම් තේරුම් තියනවනෙ.."

" දේව නරක වැඩ කරන ළමයෙක් නෙමේ.."

ආච්චිඅම්මා මගෙන් ගාපු පොල් ටික ඉල්ලගෙන පැත්තක තිබ්බ ඇඹරුම් ගල සෝදලා ඒකට පොල් ටික දැම්මා.. ගෙදර කොස්ඇට කළුපොල් මාළුවක් හදන්න ආච්චිඅම්මා පොල් අඹරන්නද කොහෙද යන්නෙ.. මම අත් දෙක සෝදගෙන කුස්සියෙන් එන්න ආවා..

මාමයි රධ්‍ය අයියයි ගියා සිරිසෝම සීයගෙ ගෙදර.. ඒ සීයට දවල් කෑම එක දීලා එන්න.. සිරිසෝම සීයා කියන්නෙ අපේ ආච්චිගෙ ළඟ නෑදැයෙක්.. ඒ සීයගෙ ලමයි සීයට සලකන්නෙ නෑ.. ගෙදර තනියම ඉන්නෙ.. හරියට දැන් වැඩක් පලක් කරගන්න බැරි නිසා අපේ ගෙදරින් තමයි වේල් තුනටම කෑම දෙන්නෙ.. ඒ ඇරෙන්න සීයගෙ බෙහෙත් අඩුපාඩුත් ආච්චිඅම්මා හොයලා බලලා කරනවා.. අපේ ගෙදරනම් බෙහෙත් ගන්න සල්ලියක් වියදම්

@Shan

වෙන්නෙ නෑ.. ලොකු අම්මයි ලොකු තාත්තයි හොස්පිටල්ස් වල වැඩ කරන නිසායි ඒ ගොල්ලො ප්‍රයිවට් ඩිස්පැන්සරීස් දාගෙන ඉන්න නිසයි මෙහෙ එද්දි ආච්චිඅම්මා කියන බෙහෙත් අරගෙන එනවා..

මම ගෙදර පිහන් බඩු දාලා තිබ්බ කැබිනට් එක පහුකරගෙන යද්දි එහෙම්ම දැක්කෙ මාමගෙ කාර් එකේ යතුර කැබිනට් එක උඩ දාලා තියෙනවා.. මම නිකමට ඒකට ඇඟිල්ලෙන් තට්ටුවක් දාගෙන බාගයක් දුර ගිහිල්ලත් හැරිලා ආයෙම කැබිනට් එක ගාවට ආවා.. මාමගෙ වාහනේ මොකක් හරි තිබිලා සාකි ගැන හම්බෙයිද කියලා හිතට අමුතු අයිඩියා එකක් එනවා.. මම කී එක අරගෙන මිදුලෙ වාහන පාක් කල්ලා තිබ්බ තැනට ගිහින් කාර් එක ඇරලා ඇතුලට ගිහින් ඒක වහාත්තා..

වාහනේ පුරාම එක එක බඩු.. මෙක හත් අවුරුද්දකින් අස් කල්ලා නැද්ද කොහෙද.. කෑම කාපුවගෙ එක එක කොළ ටොෆි කොළ.. කාපට් වල වැලි.. සපත්තු ලොට් එකයි.. ඇඳුනුයි.. සැක්.. මෙ මනුස්සයට මිනිහෙක් ගේන්න කලින් පිලිවෙල පුරුදු කලානම් හරි වගේ..

මම පොඩ්ඩක් පැසෙන්ජර් සීට් එක උඩ තිබ්බ ෆයිල් ගොඩ අරගෙන පෙරළලා බැලුවා.. ඒකෙ තිබ්බෙ එක්ස් රේ රිපෝට්ස් වගයක් පේශන්ලගෙ.. වෙන තිබ්බෙ දම් පාට ස්ටෙත් එකකුයි මාමගෙ ඩොක්ටර්ස් අයිඩී එකයි පොඩි ලේන්සුවකුයි විතරයි.. මම ලේන්සුව අල්ලලා විසික් කල්ලා පිටිපස්සෙ සීට් එකටත් බෙල්ල දාලා බැලුවා වෙන මොනව හරි හම්බෙයිද කියලා.. වෙන මොකුත්ම තිබ්බෙ නෑ.. මම එහෙමම මූණ ස්ටියරින් වීල් එකට ගහගත්ත පාර මහා හයියෙන් හෝන් එක වැදිලා මාව උඩ ගිහින් විසික් වුණා.. නොදකින්.. වැඩක් කරන්න ගත්තොත් හත්පොලේ ගාගන්නවනෙ.. මම ශේප් එකේ වාහනෙන් බැහැලා රධ්‍ය අයියගෙ කාර් එකට මුවාවෙලා අම්මා එළියට එබෙන්න කලින් ගෙට දුවගෙන ගිහින් එහෙමම කාමරේට වැදුණා..

මෙ සාකිච්චව හොයාගන්න තියන කුතුහලේ එන්න එන්නම වැඩිවෙනවා.. දැන් නම් උණ රක්තපාතෙට වගේ..

මට සාකි නෙමෙ මොන කොල්ලෙක් එක්ක යාලුවුණත් කමක් නෑ ඒක මාමගෙ ජීවිතේනෙ.. ඒ වුණාට පහුගිය අවුරුදු වල වෙච්ච දේවල් මොනවද කියලා දැනගන්න ලොකු උවමනාවක් තියෙනවා.. මාමා සතුටින් නෙමෙ ඉන්නෙ කියද්දි මගේ පපුව රිදෙනවා.. මට ඔන ඇයි මාමා දුකින් ඉන්නෙ

@Shan

කියලා හොයාගන්න.. එයා එහෙම ඉන්න ඕන මනුස්සයෙක් නෙමෙනෙ.. අනික සාකිගෙ තාත්තා කණට ගැහුවයි කියන කතාව.. අවුරුදු හතරකට කලින් ග්‍රැජුවේශන් එකක්.. මට මේ සේරම දැනෙන්නෙ මහ පටලැවිල්ලක් වගේ..

මම මූණ අත් දෙකෙන් පොඩි කරගෙන පුටුවෙ වාඩිවෙලා සිවිලිම දිහා බලාගෙන හිටියා.. අම්මෝ මගේ අත් දෙකේ සුවඳ.. මම ආයෙම අතේ ඇඟිලිතුඩු නහයට අල්ලගෙන සුවඳ බැලුවා.. මම පොල් ගාලනෙ ආවෙ.. අත සුවඳවුනේ.. මාමගෙ කාර් එක ලැවැන්ඩර් සුවඳනෙ.. ඒකෙන් වෙන්නත් බැනෙ.. මට මේ සුවඳ හොඳට හුරුයි වගේ තේරෙනවා.. කවදාමහරි මේ සුවඳ මට දැනිලා තියේ..

ලේන්සුව ද..

මම සුටුස් ගාලා කාර් එකේ යතුර අරගෙන ගිහින් පැරෙන්ජර් සීට් එකේ දොර ඇරලා බිමට විසික් කලා තිබ්බ ලේන්සුව සාක්කුවෙ දාගත්තා.. ඒ එක්කම මාමයි රධ්‍ය අයියයි දෙවැට දිගේ එනවා මම දැක්ක නිසා හිමින්සැරේ කුස්සිය පැත්තෙන් දොරෙන් ගෙට ගිහින් මම කාර් එකේ යතුර කැබිනට් එක උඩින්ම තිබ්බා.. ලේන්සුව අරගෙන කොට්ටෙ අස්සට දාගත්තා..

මාමයි රධ්‍ය අයියයි ගෙදරට එනවා මට ඇහුණා.. ඒ එක්කම මගේ ෆෝන් එකට කෝල් එකක් ආවා..

**Ashiii Calling...**

" ආ කොහොමද ළමාතැනී.. මොකෝ හදිසියෙ අපි මතක් වෙලා.."

" හායි ෂනෙරුවා.. මොකද බං කරන්නෙ.. අම්මෝ අපි දැක්කා ඉන්ස්ටර් එකේ පෝස්ට් ගොඩ.. මොකෝ දෙන්නත් එක්ක හනිමූන් එකට ගියාද.."

" සැක් බං කොල්ලෙක්ගෙන් අහන ඒවද උඹ ඔය අහන්නෙ.."

" ඇයි හලෝ.. අපි අපිනෙ.."

" ඔව් ඔව් අපි අපි තමා.. මොකෝ හදිසියෙම.."

@Shan

" හදිසියෙ නෙමේ අනේ.. මම මෙච්චරවෙලාම සෙනුක එක්ක කතාකර කර හිටියෙ.. ඊටකලින් මහීශා එක්ක කතාකලා.. මේ ඔයාගෙ වාරෙ.. මාත් එක්ක කතාකරන්න දැන්.."

" ඇයි උඹ ජොබ් එකක් කරනවද.. මනුස්සයොන්ට සැරින් සැරෙ කෝල් කරන.."

" නෑ හලෝ.. මම කියාන් අයියගෙ රගර් මැච් එක බලන්න ආවා.. ඔයා දන්නවනෙ හලෝ මට රගර් ගැන මෙලෝම දෙයක් තේරෙන්නෙ නෑ.. ඉතින් මම මේ ටයිම් පාස් කරගන්නවා.."

" සැක් බං උඹනම්.."

" සැක් කියන්නෙ.. පහුගිය දවස් ටිකේම රගර් ගැන මූලික දැනුමක් ලබාගන්න ට්‍රයි කලා.. හරිම දුකයි කියන්න.. මට තේරෙන්නෙ නෑ මොකුත්ම.. ඒ ඒ අන්න කියාන් අයියා තව අයියා කෙනෙක්ව බදාගත්තා ඒයි.. අන්න අන්න එයාගෙ ඇඟ උඩට තා ගොඩක් පැන්නා.. ඒ හලෝ මේ මොකද මේ මිනිස්සු බෝලෙකට මරාගන්නෙ මෙහෙම.. දාඩිය දාන්නැද්ද මන්දා.."

මම මෙහාපැත්තෙ ඉඳගෙන ඔලුව පොඩ්ඩක් අතගාගත්තා.. මේකිට නම් ට්‍රැක් අම්බානෙකට.. අපරාදෙ කියාන් අයියා එක්කගෙන ගියේ..

" උඹ දන්න පකක් නෑ ගෙදර පලයන්.. පිස්සු කියෝනවා.."

" එහෙම බෑ කියාන් අයියට දුක හිතුනොත් එහෙම.. මම ඉවරවෙනකල් ඉන්නවා.. අපේ තාත්තත් ආවා.. මේ ඔයාට කියන්න හැපී නිවුස් එකක් තියෙනවා.."

ආශි ඇඳලා පැදලා කියද්දි මට හිතුණා සිරාවටම සතුටු හිතෙනව දෙයක් වෙන්න ඇති කියලා..

" ඒ මොකක්ද බං.."

" කියාන් අයියා අපේ ගෙදරට ඇවිත් කන්ෆෙස් කලා.. අනේ මට දුක හිතෙනවා ෂනෙරුවා.."

@Shan

මම නැගිටලා ගිහින් ජනේලෙ එල්ලුනා.. අඩෝ අපේ කියාන් අයියා ගැම්මක් තමා. ගෙදරටම ගිහින් අහලද.. අපේ ඉස්කෝලෙනෙ ඉතින්.. බොක්කෙන්ම එන ගැම්මක් තියෙනවනෙ..

" අඩෝ සිරාවට!!!! මරුනෙ බං..මට හිතාගන්නත් බෑ මොකෝ වුනේ.. අඩෝ උඹ ඇත්ත නේද කියන්නෙ.."

" ඔව් ඔව් හලෝ.. තාත්තා කිව්වා ස්ටඩීස් ඉවරවුණාම ඒ ගැන සලකලා බලන්නම් කියලා.. හැබැයි ගෙදර කට්ටිය කියාන් අයියට කැමතී වගේ.. ඒකනෙ අද රගර් මැච් එක බලන්නත් ආවෙ.."

" අම්මෝ ඕයි.. මාරම සතුටුයි.. කොච්චර දෙයක්ද.. ඉතින් කියාන් අයියලගෙ ගෙදර මොකද.."

" එහෙත් අම්මා දන්නවා.. තාත්තා නම් දන්නෙ නෑ කිව්වා.. මස්සිනා හැල කිඹුලා අවුල් නෙ.. නැත්නම් ඒ ආන්ටි හරි හොඳයි.. මාත් එක්ක දවසක් ශොපින් යමු කිව්වා.."

" කොහොම හරි ගොඩ දාගත්තා නේද ඉතින් උඹත්.. මොකක් වුණත් කමක් නෑ සතුටින් ඉඳපන්.. මට මාර හැපී ඕයි.."

" තැන්ක් යූ අනේ.. ඔයා මගේ හොඳ~ම යාලුවානෙ මහීශගෙන් පස්සෙ.."

අනේ මෙකිගෙ බටර් පාර..

" ඉතින් මොකෝ සෙනුකයා කියන්නෙ.. ආවත් හරි බං කතාකලේවත් නෑ.."

" ඕගොල්ලො ඉතින් බෝයිපෙන්ලා එක්ක බිසීනෙ.. සෙනුක සාගා ප්‍රැක්ටින් රෑ දහය දොළහා වෙනකල්.. එයාලා හෙන ලව්ලි කපල් එක අනේ.. අයුක අයියා හැමදාම සෙනුකව පික් කරන්න එනවා කියලා කිව්වා.."

" ඒකනම් එහෙම තමා.. උඹලා සාගා එනවද.."

" ඔයාලගෙ ඉස්කෝලෙ නිසා එන්න හිතෙන්නෙත් නෑ අප්පා.. කමක් නෑ මහීශා එනවනෙ.. ඒකනිසා එන්නෙ.."

" අනේ පලයං ගෙම්බි.."

@Shan

" මේ හලෝ අම්මා ඉන්නවනම් දෙන්නකො.. මට කතාකරන්න ඕන.."

" ඉදපන් ඉදපන් දෙන්න.. අම්මේ~හ්!!!!!!!!"

මම ෆෝන් එකත් අරගෙන ගිහින් අම්මගෙ කනේ තියලා එන්න ආවා.. මාමා ටවල් එකකුත් අරගෙන නාන කාමරේට යනවා දැක්ක නිසා මම ශේප් එකේ මාමගෙ කාමරේට එහා කාමරේට රිංගගත්තා..

" මම ඔයාව හෙව්වා.. කොහෙද හිටියෙ.."

" මගේ කාමරේ.. ආශි කතාකලා.. ඔයා ගෙස් කල්ලා කියන්න කියාන් අයිය ගැනයි ආශි ගැනයි හැපී නිව්ස් එකක් තියෙනවා.."

මම රධ්‍ය අයියගෙ එහාපැත්තෙන් වාඩිවුනාම රධ්‍ය අයියා මගේ මූණ දිහා බලාගෙන හිටියා..

" මොකක්ද.. මට කියාන් කතාකලේ නෑ ළඟදි නම්.."

" කියාන් අයියා ආශිලාගෙ ගෙදර ගිහින් කන්ෆෙස් කල්ලා.. ඒ සිරාවට මෙ ඌරු පැටියා මාරයිනෙ.. මම හිතුවෙ නෑ ජීවිතේට අපේ කියාන් අයියා ඔහොම කැරැක්ටර් එකක් කියලා.."

" මම.. ආශි නංගි හොඳයි.. මම මුලදි එච්චරම ඇල්ලුවෙ නෑ.. ඊටපස්සෙ තේරුනේ ඔක්කොම එකම බෝඩරේ කියලා.."

" ඒකනෙ.. ඒකි හෙන හොදයි.. ඔය පොඩ්ඩක් එහෙන් මෙහෙන් ට්‍රැක් ගතිය තමා තියෙන්නෙ.."

රධ්‍ය අයියා හිනාවෙලා කොට්ටයක් අරන් උකුලෙන් තියාගෙන ඒක බදාගත්තා.. එයා හිනාවුනේ හරි අමුතුවට.. ටිකක් දුකින් වගේ.. මම ඇයි කියලා අහන්නත් හදලා ඊටපස්සෙ කට වහන් හිටියා.. එයා එයාගෙ ෆෝන් එක අරගෙන පී ඩී එෆ් එකක් ඕන් කල්ලා මගේ අතට දුන්නා.. මම ෆෝන් එක මගේ පැත්තට හරවගෙන ඒක කියෙව්වා..

**Fresher Recruitment Interview for Engineering Faculty 2024 - Sir John Kotalawala Defense University**

@Shan

මම ඒකෙ තිබ්බ ඒවා කියවලා ෆෝන් එක පැත්තකින් තිබ්බා.. රධ්‍ය අයියා හෙන ලොකු කල්පනාවක වගේ බිම බලාගෙන ඉන්නවා..

මට ඇයි ටික දවසකටවත් අමතක වුණේ අපි ජීවත් වෙන්නෙ දුකයි සතුටයි අතරෙ දෝලනය වෙන ගමන් කියලා..

" ඔයා ලබන සතියෙ මුල වෙද්දි ගෙදර ඉන්න ඕන නේද.."

" ම්ම්.. කොහොමත් අනිද්දා යන්නනෙ ඉන්නෙ.."

මම මොකුත් නොකියා මගේ අත් දෙක දිහා බලාගෙනම ඉදියා.. මට මොකුත් කියන්න මතක් වෙන්නෙවත් නෑ..

" මම ලබන මාසෙ යනවා වරද්.. දියතලාවෙ මාස හයක ට්‍රේනින් පීරියඩ් එකක් යනවා.. අප්පච්චි කතාකලා.."

" ම්ම.."

මාස හයක් කියන්නෙ..?? එතකොට හුගක් වෙලාවට මගේ රිසාල්ට්ස් අවුට් වෙලත් තියේවි..

" මට සහමරවිට එන්න බැරිවෙයි.. කියලා හිතෙනවා.."

මම රධ්‍ය අයියා දිහා ඔලුව උස්සලා බැලුවා.. කමක් නෑ පොරොන්දු නම් කවුරු වුණත් දෙනවනෙ.. එකක් දෙකක් බිඳුනට තරහවෙන්න තරම් මම නපුරු නෑ.. මට එයාව තේරෙනවා.. මම එයාගෙ අතකින් අල්ලගත්තා..

" ඒකට කමක් නෑ.. ඔයා කවදාහරිම එනවනෙ.."

" ම්ම.."

රධ්‍ය අයියා ලාවට හිනාවෙලා මගේ අත අතෑරලා පැත්තකට කල්ලා කාමරෙන් නැගිටලා යන්න ගියා.. මම එයා එක්ක නැගිටලා ගියේ නෑ.. ඇඳේම වාඩිවෙලා හිටියා.. වෙන්න තියන දේවල් වෙනවා.. මං මොනවා කරන්නද..ඒ හැමදේම දිහා මට බලාගෙන ඉන්න වෙනවා.. මගේ පපුව කකියනවා වගේ.. දුකයි.. හෙනම දුකයි.. කියාගන්නත් බැරි තරම් දුකයි.. ඒත් මේ වෙලේ ඇඬෙන්නෙවත් නෑ.. මම නැගිටලා මගේ කාමරේට යන්න

@Shan

ගිහිල්ලත් ඒ වෙලාවෙම රධ්‍ය අයියගෙ ෆෝන් එකට කෝල් එකක් ආවා.. ඒක ආධ්‍ය අයියගෙන්.. මම කෝල් එක ආන්සර් කල්ලා කනේ තියාගත්තා..

" ආධ්‍ය අයියෙ.. මේ මම.."

" චූටියො.. මම ඔයාට ගත්තා ගත්තා.. ආන්සර් කරන්නෙ නෑනෙ ඉතින්.."

" ෆෝන් එක කොහේද දන්නෑ අයියෙ.. ආ..!! ඒක අම්මා ගාව තිබ්බෙ.."

" කමක් නෑ, කමක් නෑ දැන් මේ කතාකලේ.."

" ඉතින් කොහොමද අයියෝ ඔයාට.."

" මම හොඳින් ඉන්නවා චූටියො.. කෑම කන්න කැන්ටින් එකට ආවා.."

" එහෙමද.."

" ඒයි මේ මොකද මේ අපේ පොකට් රේඩියෝ එක වැහිලා ගිහිල්ලා.. ඔය හොඳින් නේද චූටියො ඉන්නෙ.. අපේ එකා රණ්ඩු කලාද.."

" අහ්.. නෑ නෑ රධ්‍ය අයියා හිටියා.. මම දෙන්නද.."

" දැන් මම ඒකද ඇහුවෙ.. ම්ම්..??"

" රධ්‍ය අයියා ලබන මාසෙ යනවා නේද අයියෙ.. මම දැක්කා ලෙටර් එක ඇවිල්ලා තියෙනවා.."

ආධ්‍ය අයියා තප්පර දහයක් පහලොවක්ම කතාකලේ නෑ.. මම කතාකලෙත් නෑ..

" මම හිතුවා.. චූටි ඕක දැක්කහම අවුල් යාවි කියලා.. මම මොකද චූටි කරන්නෙ.. අප්පච්චි මම කියන එකක් කනකට ගන්නෙ තියා මගේ මූණවත් බලන්නෙ නෑ ඔයා දන්නවනෙ.. අපේ ගෙදර අය කියන දේකට ඔලුව නමාගෙන ඉන්නවා ඇරෙන්න මට කරන්න කිසිම දෙයක් නෑ.."

" ම්ම්.. මම දන්නවා.. රධ්‍ය අයියා අවුලෙන් ඉන්නෙ.."

" පව් මගේ කොල්ලා.."

@Shan

ආධ්‍ය අයියා එහාපැත්තෙන් ලොකු හුස්මක් ගන්නවා මට ඇහුණා..

" චූටි වැඩක නෙමේ නේද ඉන්නෙ.."

" නෑ අයියෙ.."

" ආ.. මම ඔයා එක්ක නිදහසේ කතාකරන්න හිටියෙ.."

මම ආධ්‍ය අයියා එක්ක කතාකර කර ඇවිල්ලා එළියෙ ඔංචිල්ලාවෙන් ඉඳගත්තා..

" මොකක්ද අයියෙ.."

" ඔයාට තෑන්ක් කරන්න ඕන.. මගේ මල්ලි කවදාවත් නැතුව හරි ෆ්‍රීලි හිටියා පහුගිය කාලෙ.. මම ජීවිතේටවත් දැකලා නැති රධ්‍ය කෙනෙක් ඔයා මට ගෙනැල්ලා දුන්නට.."

" අනේ අයියෙ.."

" මට-මට මාර අවුල් මල්ලි.. ඔයාට කියන්න පොඩී කියන්නෙ මගේ ඇස් දෙක වගේ.. මට මාර වටිනවා චූටි.. ඔයා දන්නවද මට අවුරුදු දහයයි පොඩී ගෙදරට එද්දි.. අද වගේ මතකයි පොඩී මං ගාව නිදිකරවන්නෙ.. එයා මං ගාව ඉන්න හරි ආසයි.. මම මගේ ඇස් දෙකෙන්ම පොඩි ලොකුවෙනවා බලාගෙන හිටියා.. නැනී ගාවවත් ඉන්නෙ නෑ මගේ අතේමයි ඉන්නෙ.. මට ඒකව උස්සගන්නත් බෑ.. ඒ වුණාට බැරි බැරි ගාතෙ උස්සගෙන ඉන්නවා.. පුලුන් කොට්ටයක් වගේ..

චූටි දන්නවද පොඩී පළවෙනියටම අපේ ඉස්කෝලෙට ආපු දවසෙ කොල්ලෙක් එක්ක ගහගෙන මට එන්න වුණා ප්‍රයිමරියට.. එදා ඉඳන් හැමදාම මම පොඩීව වඩාගෙන ක්ලාස් එකෙන් තියලා රණ්ඩු කරන්න එපා කියලා යනවා.. එයාගෙයි මගෙයි ඒජ් ගැප් එක ගොඩක් ලොකුයිනෙ.. එයා ඉස්කෝලෙ ඇවිත් ටික කාලෙකින් මම ඉස්කොලෙන් ගියා.. එයා හයවසරෙදි මම කැම්පස් යනවා.. අපි දෙන්නා දුරස් වෙලා හිටියේ හුහක්.. අනිත් අයියලා මල්ලිලා වගේ නෙමේ.. පොඩීටයි මටයි ඉස්කෝලෙදිවත් මහා ලොකු කාලයක් ඉස්කෝලෙවත් යන්න වුණේ නෑ..

@Shan

ඉස්සර මගේ මේසෙට වෙලා ඉන්නවා රෑ දහය දොළහා වෙනකල්.. මම සෙමෙස්ටර් එන්ඩ් එක්සෑම් වලට පාඩම් කරද්දි.. මගේ පොඩ්ඩෙකා.. මේසෙ උඩම නිදාගන්නවා.. මම හොඳ අයියා කෙනෙක් වෙලා නෑ මල්ලි.. මට රධ්‍ය නැතුව ඉඳලා හුරු නෑ.. මට ගෙදර ඉන්න හිතෙන්නෙ නෑ.. අප්පච්චි එනව කියන්නෙ.. මල්ලි දන්නවනෙ..

එදා ඔයාව හම්බෙන්න එන්න ඕන කිව්වහම මම මහ රෑ එන්න දුන්නෙ පොඩී මං ගාව කියන්නැති හුඟක් දේවල් චූටි එක්ක කතාකරන නිසා.. එදා අඬ අඬා ඇවිත් මගෙන් වරද්ව ඉල්ලුවා.. ගෙනැත්දෙන්න කියලා.. කලින් දවසෙ අප්පච්චිගෙන් ගුටි කාලා කාමරේ හිටියේ දවසෙම.. මම හොස්පිටල් නයිට් කල්ලා ගෙදරට එද්දිම රණ්ඩුවක්.. මට තේරෙන්නෑ චූටි මම කොහෙන්ද මේවා ඔයාට කියන්න පටන්ගන්නෙ..

මම ඔයා, මමයි පොඩී ගැනයි හැමදේම දන්න නිසා මෙහෙම කතාකරන්නෙ.. වෙන කියන්න කවුරුත්ම නෑ චූටි.. මට විකාරයි වගේ.. පොඩී මාර ආසවෙන් හිටියේ කැම්පස් යන්න.. මාරම ආසාවෙන්.. තර්මොඩයනමික් ඉන්ජිනියර් කෙනෙක් වෙන්න ආසයි කියලා පොඩි කාලෙ හෙනම පිස්සුවෙන් හිටියෙ.. එහෙම වෙලා මාව බලාගන්නලු.. පිස්සු කොල්ලෙක් තමා.. එයා කැඩෙට් කෑම්ප් ගියාම මගැරෙන නෝට් එහෙම මම හොයලා ලියලා දෙනවා.. මම දන්න තරමින් කියලා දෙනවා පාඩම් එහෙම.. මට කම්බයින්ඩ් මැත්ස් බෑනෙ.. කැම්ප් ගිහින් එන්නෙ මැරිලා වගේ.. එච්චර ආසාවෙන් නෙමෙනෙ හිටියෙ.. පොඩි කාලෙ ඉඳපු දඟ කොල්ලා ලොකු වෙද්දි මට නැතිවෙලා ගියා චූටි.. නපුරු වුණා.. කතාකරන්නෙ අඩුවෙන්.. මාත් එක්ක විතරයි ඒත්.. අප්පච්චිලා එක්ක කට ගහගෙන යනවා.. මගේ ප්‍රශ්න වගේකටත් මැද්දට ඇවිත් පොඩී බැනුම් ඇහුවා සෑහෙන්න.. මම කාටද චූටි ආයෙම උයාගෙන ගෙදර එනකල් බලන් ඉන්නෙ.. ආස කෑම අහ අහා හදලා දෙන්නෙ.. පාළු හිතුනහම කතාකර කර ඉන්නෙ.."

ආධ්‍ය අයියා සැරින් සැරේ ඉකි ගහනවා මට ඇහුණා..

" අයියා වැරැද්ද පටවගන්න එපා ඔයාටම.. අයියට කරන්න දෙයක් නෑනෙ.. අයියලගෙ අප්පච්චිලා ගන්න තීරණ නෙ ඉතින්.."

" අප්පච්චිලා නෙමේ චූටි නරුමයො.. අපේ ජීවිත විනාස කල්ලා දැම්මා.. මගේ ජීවිතේ මට නැතිම කල්ලා දාලා මගේ පොඩි එකාත් මට නැති

@Shan

කරන්න ආ- ආපු-ස්ස් සොරි චූටි.. මම-මම ඔයාට පස්සෙ ගන්නම්.."

ආධ්‍ය අයියා ෆෝන් එක කට් කල්ලා දැම්මා.. මොන කරුමයක්ද දෙයියනේ මේ පල දෙන්නෙ මට තේරෙන්නෙ නෑ.. මම දැක්කා රධ්‍ය අයියා ඉස්තෝප්පු පඩියෙ වාඩිවෙලා පූසගෙ ඔලුව අතගානවා.. ලොකු කල්පනාවක වගේ.. මම ඔංචිල්ලාවෙන් නැගිටලා ගිහින් රධ්‍ය අයියා ගාවින් බිමින් ඉඳගත්තම එයා ඔලුව උස්සලා මගේ දිහා බැලුවා..

" පණුයියා කතාකලානෙ.."

" එහෙමද.."

" ඔව්.. ඔයාව මතක් වෙලා.."

" මට උදේ කතාකලා.. මොකද කියන්නෙ.."

" කැන්ටින් එකේ ඉන්නවා කිව්වෙ.. ඔයා නැති නිසා උයලවත් නෑ මම හිතන්නෙ.."

" මම.. ආත්තම්මා කිව්වා හවස මෙහේ පන්සලේ බෝධිපූජාවක් තියලු.. ගමේ හැමෝම එනවලු.."

මට රධ්‍ය අයියා කියන්න හදන එක වටින් ගොඩින් තේරුණා..

" අපි පන්සල් යමුද.."

රධ්‍ය අයියා මං දිහා බලලා හිනාවෙලා ආයෙම පූසා දිහා බලාගත්තා.. එයා හිතන ඒවා මට ඇහෙනවා ඇහෙනවා වගේ..



මේ ඉන්නෙ අපේ හැපීකව්වයි එයාගෙ පුංචි තාරපැටියයි..

ඔතරි ලෙඩ වෙලා ලේ බලන්න ගිහින් ඊටපස්සෙ හිමොග්ලොබිනුත් අඩු වෙලා කියලා කිව්වහම..#රියල්සැප..

එන්නාම්.. ලව් යූ.. ❤

@Shan

හෙට මට කියන්න ඕනමයි අර කතාව..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 85 කොටස

" අයියෙ.. අයියෙ.. මේ ඔයාට කෝල් එකක්.."

මමයි අපේ ගෙදර කට්ටියයි ගමේ කට්ටියයි සේරමලාම හිටියෙ ගමේ පන්සලේ.. මම පොඩි කාලෙ දහම් පාසල් ආවෙ මෙහෙට.. දැන් නම් මේ ආවෙ හුඟ කාලෙකින්.. පන්සලේ හාමුදුරුවෝ ආච්චිඅම්මගෙන් නිතර අහනවලු මුණුබුරා එන්නෙ නැද්ද කියලා.. මම ඉතින් මෙහෙ නැනෙ.. අද ඉතින් යනකොට ආච්චිඅම්මා කිව්වා ලොකු හාමුදුරුවෝ බැහැ දැකලාම යන්න කියලා..

පන්සලේ බෝධි පූජාවක්.. ගමේ හැමෝම වගේ පන්සලේ පිංකමක් තියෙද්දි ඒකට උදවු කරන්න එහෙම එනවා.. ඒ කාලෙ මගේ වයසෙ ඉඳපු උන් දැන් හෙන ලොකුයි.. අඳුනගන්නවත් බෑ.. දැක්කහම හිනාවුණාට මට එච්චරම මීටරේ නෑ කවුද හිනාවෙන්නෙ කියලවත්.. කොල්ලො මාර ඉක්මනට වෙනස් වෙනවනෙ..

රධ්‍ය අයියයි අපේ අම්මයි බුදු කුටිය ගාව ගිලන්පස වගයක් හදනගමන් හිටියේ.. මම ඊට පොඩ්ඩක් එහායින් බිම පැදුරු වගයක් එල එලා ඉද්දි රධ්‍ය අයියගෙ ෆෝන් එක රිංග් වෙන්න ගත්තා.. එයාගෙ ෆෝන් එක තිබ්බෙත් මගේ සාක්කුවෙමයි.. අරගෙන බලද්දි එයාගෙ අප්පච්චි.. ඒකනිසා මම ගිහින් රධ්‍ය අයියට කතාකලා.. එයා මං දිහා බලලා ආයෙම ෆෝන් එකේ කෝල් අයි ඩී එක බලලා මූණ මලවගත්තා.. මේ අප්පච්චි කතාකලොත් කාගෙහරි හිනාවක් නැතිවෙනවමයි.. එයා මගෙන් ෆෝන් එක අරගෙන මගේ අතිනුත් අල්ලගෙන බෝ මලුවෙනුත් එළියට ඇවිත් කවුරුත් වැඩිය නැති පැත්තකට ගිහින් කෝල් එක ස්පීකර් දාලා ආන්සර් කලා.. මෙක ගමේ පන්සලක් වුණාට හෙන ඉඩක් තියෙනවා පන්සල් වත්තට..

" අප්පච්චි.."

මම එයාගෙ අප්පච්චිගෙ කටහඬවත් අහලා තිබුණේ නෑ මීට කලින් කිසිම දවසක.. දැකලා තිබ්බ එකම එක අර සාලෙ තියන ෆොටෝ එක විතරයි.. මම එතන කණුවට හේත්තුවෙලා රධ්‍ය අයියා දිහා බලාගෙන හිටියා..

" රධ්‍ය තමුන් ලෙටර් එක කියවන්න ඇති කියලා මම හිතනවා.."

@Shan

" ඔව් අප්පච්චි.. කියෙව්වා.."

" කියෙව්වනම් වෙන්න අවශ්‍ය වැඩපිළිවෙල හොඳට තේරෙන්න ඇතිනෙ නේද.. මම සති අන්තෙ එනවා ගෙදර.. ආයෙම පලාලි යන්නෙ නෑ.. ඉන්ටර්ව්ව් එකට උවමනා තමුන්ගෙ සෙටිෆිකට්ස් රෙඩි කරගන්නවා.. නැත්තම් අර ගෙදර ඉන්න තමුන්ගෙ අයියට කියලවත් ඒවා හදාගන්නවා.. තේරුණාද.."

" ඔව් තේරුණා.."

" මොකක්ද මම කිව්වෙ.."

" සෙටිෆිකට්ස් රෙඩි කරගන්න.."

" මොනවහරි කියන්න තියද.. අම්මට කතාකරන්න ඕනද.."

" නෑ අප්පච්චි.."

ඒ එක්කම ෆෝන් එක කට් වෙලා ගියා.. අම්මෝ ඒ මනුස්සයගෙ සැර.. මෙහෙමත් කතාවරනවද යකෝ මිනිස්සුන්ට.. මම හිතාගෙන හිටියෙ මේ ලෝකෙ සැරම තාත්තා ඉන්නෙ සෙනුකයට කියලා.. බලන් යද්දි ඒක එහෙම නෙමෙයි වගේ..

අප්පච්චිගෙ කටහඬ හරි ගොරෝසුයි.. ටිකක් රධ්‍ය අයියගෙත් වගේ.. කියන්න ඕන එක රීතල වගේ.. හරිම කෙලින් කියනවා.. වැඩි වැල්වටාරම් නෑ.. කිව්වා.. තිබ්බා.. මටනම් ඔහොම බෑ.. අපේ මාමා කතාකලොත් පොඩ්ඩක්වත් ආදරෙන් කතානොකලොත් මගේ හිත හරියට රිදෙනවා.. අනික මාමා එහෙම කතාකරන්නෙ නැනෙ කොහොමත්.. අම්මා වුණත් සුදුමහත්තයා කියලා කතාකරන එකේ ආදරේ තියෙනවා කියලා මම හිතන්නෙ.. මේ මනුස්සයා ළමයින්ට කෙලින්ම නමම කියලා කතාකරනවා.. මම හිතුවෙ ආධ්‍ය අයියා කියනවා වගේ පොඩී කියනවා ඇති කියලා.. නම කිව්වත් කමක් නෑ.. නිකම් සෝල්ජර් කෙනෙක්ට කමාන්ඩ් කරනවා වගේ.. මාර මිනිහෙක් තමා..

" ඔයා කලින් අප්පච්චි කතාකරනවා අහලා නෑ කිව්වනෙ.. දැන් ඇහුවද.."

" ම්ම්.. අම්මත් එක්ක කතාකරන්න තිබ්බනෙ.. ඇයි නෑ කීවෙ.."

@Shan

" අම්මා අපි එක්ක කතාකරද්දි අප්පච්චි අම්මට බනිනවා ළමයි හුරතල් කල්ලා නරක් කරනවා කියලා.. අම්මා රෑ වෙලා ගනී.."

" එහෙමද.."

රධ්‍ය අයියා මගේ දිහා බලලා හිනාවෙලා කොණ්ඩෙ ඇවිස්සුවා..

" මොකද බයවෙලා වගේ බලාගෙන ඉන්නෙ.."

" වගේ නෙමෙ තමයි.. අපෝ ඔයාගෙ අප්පච්චි සැරම සැරයිනෙ.. මට ඔහොම කතාකළොත් එහෙම ඇඩෙව්.."

රධ්‍ය අයියා හිනාවෙගෙන මගේ අතින් ඇදගෙන ආයෙම පන්සල පැත්තට ගියා.. එයා මට පේන්න බොරුවට හිනාවෙලා ඉන්නවා.. ඒ වුණාට මට තේරෙනවනෙ.. එයා ඉන්නෙ හිතේ දුකින් කියලා.. අනික ආධ්‍ය අයියත් ඉන්නෙ දුකින්.. එයාගෙ අප්පච්චි ඇයිද දන්නෙ නෑ අයියට එච්චර හොඳින් කතාකරන්නෙ නැත්තෙ.. ආධ්‍ය අයියා කොච්කර හොඳද.. අඩුම තරමෙ මනුස්සයෙක්ගෙ හිත රිදෙන්න වචනයක්වත් කියන්නෙ නෑ.. සමහරවිට අප්පච්චි නිවුණු මනුස්සයොන්ට කැමති නැතුවැති.. මම ඕවා කල්පනා කර කර ඉහින් දඩාං ගාලා කොල්ලෙක්ගෙ ඇඟේ හැපිලා රධ්‍ය අයියගෙ අත අතෑරුණා..

" කොහෙද බං යන්- අඩෝ මේ ෂනෙරු නේද.."

හෙන උස කොල්ලෙක් මං ගානට නැමිලා මූණට එබුණා.. මේ කළුවරේ පතාක යෝධයෙක් වගේ ඇවිල්ලා ඇඟේ වැදිලා ෂනෙරුව අහන්නෙ. ෂනෙරු තමයි පගෝ.. රධ්‍ය අයියත් මගේ දිහා ඇහිඹමකුත් උස්සගෙන බලාගෙන ඉන්නවා.. මම අඩියක් විතර පිටිපස්සට ගියා..

" අ-ඔව්.. කවුද මේ..??"

ඒ කොල්ලා හිනාවෙලා ආයෙම උගේ උසට හිටගත්තා.. මොකෙක්ද අඩෝ මූ.. ජිරාෆ් කෙනෙක්ද.. උස විතරක් පොල් ගහක් වගේ..

" උඹ වෙනස්වෙලා.. අපිත් වෙනස්වෙලා.. බලපන් ඒකෙත් හැටි.. උඹට සහන් මතක නැද්ද.."

@Shan

මම පටස් ගාලා මගේ මොලේ සහන් කියල ෆයිල් එක කොහෙද සේව් කල්ලා තියෙන්නෙ කියලා හොයලා බලද්දි රධ්‍ය අයියා ඇවිත් මගේ කරට අතක් දාගත්තා.. සහන් අකලංකද.. නෑ ඒ මගේ ක්ලබ් එකේ එකෙක්නෙ.. සහන් නෙත්මිණ.. නෑ නෑ.. සහන් ඩි සිල්වා.. නෑ නෑ.. අසහනේද.. ශික් මේ මොනවද මතක් වෙන්නෙ.. එකපාරම බල්බ් එක පත්තුවුනා..

" අඩෝ.. සහන්.. සහන්.. මතකයි තමා.. අඳුනගන්නවත් බෑ.. අවුරුදු කීයකින්ද බං මේ දැක්කෙ.."

සහන් මාව බදාගෙන පිටට තට්ටුවක් දාලා එහාට ගියා.. සහන් කියන්නෙ මගෙ පහේ යාලුවෙක්.. පහේ නෙමෙයි පහ වෙනකල්ම හිටිය යාලුවෙක්.. යාලුවෙක් කිව්වට මම එච්චරම සහන්ට කැමතිම කියන්නත් බෑ.. කතාබහ කල්ලා හිටියා.. ඉස්කෝලෙ මාත් එක ටිකක් හරි හොඳට කතාකලේ ඌ විතරයි.. ඒ කාලෙ හිටියෙ හූණු පැටියා වගේ.. දැන් පොල් ගහක් වැඩි උසයිනෙ.. මම හරි සිහියට ආවෙ රධ්‍ය අයියා මගේ උරහිස කෙනිප්පු නිසා.. මේ අනිත් මනුස්සයා.. ඉරිසියාව දෙපිටින් බේරිලා යනවා..

" අවුරුදු හතරකින් වගේ නේ..?? මම දවසක් දැක්කා උඹ කඩේ ගාවින් යනවා.. කොහෙද වට පිටවත් බලන්නෙ නැනෙ.. හරියට දැක්කෙවත් නෑ.."

" අහ්.. සොරි බං.."

" ඒකට අවුලක් නෑ.. කොහොම හරි කතාකලානෙ.. මමත් දැන් මෙහේ නෑ ඕ ලෙවෙල් වලින් ඇලෝසියස් ගියා.. එහේ බෝඩ් වෙලා ඉන්නෙ.."

" අඩෝ එහෙමද.. හොඳයිනෙ බං.. මොනවද ඒ ලෙවෙල් කලේ.."

" ආට් කලේ.. දැන් එහේම ටියුශන් කරනවා ඕ ලෙවෙල් වලට.. මේවගේ ඇවිත් තේරුමක් නෑ බං.."

" ඒකනම් එහෙම තමා.."

" කවුද මේ.. උඹට අයියා කෙනෙක් හිටියෙ නැනෙ බං.."

මම හිනාවෙලා රධ්‍ය අයියගෙ පිටට තට්ටුවක් දැම්මා.. අඳුනගන්න මගේ වන් ඇන්ඩ් ඔන්ලි බෝයිපෙන් තමා.. වෙන කවුද.. මම වගේ ලස්සන මලකට වහපු නරක සමනලයා.. රධ්‍ය සනව් හෙලාක්ස අදිකාරි පුතා..

@Shan

" මගේ කසින් කෙනෙක්.. නිවාඩුවට මෙහේ ආවා.."

" අඩේ එහෙමද.."

සහන් රධ්‍ය අයියගෙ පිටට තට්ටුවක් දැම්මහම රධ්‍ය අයියා සහන්ගෙ අත දිහා බලලා මූණ දිහා බලලා හෙන පොඩ්ඩක් ලාවට තොල් දෙක දෙපැත්තට ඇදලා හිනාවුණා.. මේ මනුස්සයා මෙහෙමමයි.. පොඩ්ඩක් හිනාවෙයන්කො අයියෙ.. කට ගෙවෙනවද.. වෙන වෙලාවක බැලුවනම් කට කනේ තියාගෙන ඉන්නවා.. පිට මනුස්සයෙක් කතාකරපු ගමන්ම ලොකුකම ඔලුවට ගහනවා.. මම රධ්‍ය අයියගෙ බඩට වැලමිටෙන් එකක් ඇන්නා..

" ඉතින් මොකෝ බං වෙන්නෙ.. උඹ බයෝලු කලේ නේද.. එක්සෑම් මොකෝ.."

" ලිව්වා බං ඉතින්.. රිසාල්ට්ස් එනකල් කියන්න බෑ.."

" දැන් එහේමද ඉන්න අදහස.."

" එහෙම නම් තමයි.. මාමා එක්ක ඉන්නෙ.."

" මේ අයියත් බයෝද කලේ.. මම දැක්කා ඔය දෙන්නගෙ ෆොටෝ ෂනෙරුගෙ ඉන්ස්ටර් එකේ හැමතැනම දාලා තියෙනවා.."

" මම මැත්ස් කලේ.."

වැලමිටේ පහරට රධ්‍ය අයියා වචන දෙක තුනක් විතර යාන්තම් එළියට දැම්මා..

" ආ අයියා කැම්පස් සිලෙක්ට් වුණාද.."

කැම්පස් සිලෙක්ට් වුණාද අහන්නෙ මගේ හැපීකච්චට අයිලන්ඩ් රෑන්ක් එකකුත් තියනවනෙ ඉතින්.. හෙන සතුටක් දැනෙනවා..

" ඔව්.."

මම රධ්‍ය අයියගෙ කෙටි කතාබහෙන් අනිත් පාර්ශවයේ හිත රිදෙන්න පුලුවන් නිසා කතාව මැද්දට පැන්නා..

@Shan

" ඔව් බං.. මගේ කසින් බ්‍රදර්ට අයිලන්ඩ් රැන්ක් එකකුත් තියෙනවා.. නේද හලෝ.."

" අම්මටසිරි.. ගැම්මක් තමා.. උඹලා ඉතින් හෙන ලොකු ඉස්කෝල වල උන් නෙ.. මම දකිනවා නිතර උඹෙ ප්‍රොෆයිල් එකේ එක එක උත්සව වල ෆොටෝ දාලා තියෙනවා.. උඹත් කොහොම හරි ගේමක් ගැහුවා නේද ෂනෙරු.."

" හැමදාම එකම විදියට ඉන්න බැනෙ බං.. මෙ අපි යන්නම් අම්මා කතාකරනවා.."

මම එතනින් එන්න ආවා.. ඕනවට වඩා කතාබහ ඕන නෑ.. එහෙම කතාකරන්න ගිහින් මම නාගත්තු අවස්ථා බොහෝයි..

ඒ අස්සෙ අල්ලපු ගෙදර රක්තපාත කිකිළියි ඒ කිකිළිගෙ ඇම්බැට්ට කිකිළියිත් ඇවිත් පන්සලේ එහේ මෙහේ සක්මන් කරනවා මම දැක්කා.. අර පුංචිගෙ දුව කියන ඇම්බැට්ට කිකිළි මෙතන රධ්‍ය අයියට රබර් ඇහැ දාගෙන තමා ඉන්නෙ.. මම දැක්කනෙ.. ර්‍යෙත් රධ්‍ය අයියා ඔංචිලිපදිනවා බලාගෙන හිටියෙ.. හරියට නිකම් මේකිව තියලා තල්ලු කලා වගේ.. ඇඹරිලා ඇඹරිලා අන්තිමට ගෙට යන්න ගියා.. ඇයි අක්කට නැග්ගද අහන්නත් හිතිලා අක්කට නගින්න එකක් නැති නිසා මම කටපුප වහගෙන හිටියෙ.. නැත්නම් දනී වරදීට කියලා වැඩ වරද්දගත්තොත් වෙන දේ.. මමයි රධ්‍ය අයියයි අම්මා අම්මව හොයාගෙන යද්දිම අර සක්මන් කරන මළව පාලුයි දේවියො දෙන්නා අපේ ඉස්සරහට කඩාපාත් වුණා..

" ආනෙ.. අයියෙ.. ඔහේලත් ආවැයි පන්සලට.."

" ඔව් නංගි.."

රධ්‍ය අයියට මේකි කතාකරන විදියට ලාවට හිනාත් යනවද කොහද.. ඒකා බිම බලාගෙනම හිටියා..

" අපි හිතුවෙ ගෙදර වෙන්නැතිය කියලා.. අයියගෙ අම්මා අන්න හරේ හෙව්වා.."

"ආ ඒකතමා.. අපි යන ගමන් හිටියෙ.. යන්නම්.."

@Shan

මම එතනින් මාරු වෙලා ආවා.. සෝශල්පෝබියා වගේ ඉන්නෝන පැත්තකට වෙලා.. වැඩි සමාජ ආශ්‍රය ඕන නෑ.. මගේ ඉන්ස්ටර් එක එච්චර ප්‍රසිද්ධද යකෝ.. මම දන්නෙත් නෑ.. ඔච්නෙ ෆලෝවර්ස්ලා හෙන ගොඩක් ඉන්නවනෙ.. ඒ වුණාට හුගක් අපේ ඉස්කෝලෙම අයනෙ.. මාත් ඉන්ස්ටර් සෙලිබ්‍රිටි කෙනෙක් වෙයිද දන්නෑ.. එහෙම වුණොත් පියුමි හංසමාලිත් මට ඉරිසියා කරයිද දන්නෙත් නෑ.. කමක් නෑ.. පස්සෙ මම බ්‍රෑන්ඩ් ප්‍රමෝට් කල්ලා ඒකෙනුත් ගානක් හොයාගන්නවා.. ගැම්මක් තමයි.. ඒ වුණාට රධ්‍ය අයියගෙ මට වඩා ෆලෝවර්ස්ලා ඉන්නවනෙ.. බාගයක්ම අර එහාවැටේ පෙට්ටි කිකිළියොනෙ.. ඒක දෙගුණයක් විතර වුණේ අර 'අයියණ්ඩිගෙ හිත අද්දර නොකී කතා රැඳුණයි' කියලා අවුරුද්ද දවසෙ සිංදුවක් කියලා ඒක වයිරල් ගිය නිසා.. සැක් එදා මතක් වෙද්දි දැනුත් මට පුප හපාගෙනම මැරෙන්න හිතෙනවා..

" මෙහ්.."

" ම්ම්.."

" ඔයාට අර කෙල්ල දවල්ට ඇඳගෙන හිටපු ගවුමෙ පාට මතකද.."

" කොයි කෙල්ලද.."

" අර ඇම්බැ-සොරි අර එහාගෙදර කෙල්ලගෙ පුංචිගෙ දුවගෙ.."

" මම කොහොමද ගෑණුන්ගෙ රෙදිවල පාට දන්නෙ.."

" ඒකියන්නෙ මතක නෑනෙ නේද.."

" නෑ.."

" එහෙනම් කමක් නෑ.. මතක තියාගන්නත් එපා.."

" අනේ උඹෙ ඉරිසියාව.."

රධ්‍ය අයියා බෝ ගහ දිහා බලාගෙන මට නෙමේ වගේ කිව්වා..

බෝධිපූජාව තියලා හාමුදුරුවො බණට වැඩම කලාට පස්සෙ මමයි රධ්‍ය අයියයි මාමයි අපි තුන්දෙනාම මළුවෙ කොණම අල්ලගෙන තාප්පෙට හේත්තුවකුත් දාගෙන හිටියා.. රෑ වුණාම බණ අහන්න කම්මැලියිනෙ.. ඒ

@Shan

වුණාට රඨ්‍ය අයියා දොහොත් මුදුන් දීගෙනම වැඳගෙන බණ අහගෙන ඉන්නවා.. බෝයිපෙන් ඕනවට වඩා ඩිසිප්ලින් තියන මනුස්සයෙක්නෙ.. මාමත් හොඳට ඉඳගෙන ෆෝන් එකේ සාකිච්ච එක්ක චැට් කරනවද කොහෙද.. කමක් නෑ එන්නකො මාමෙ ක්වාටස්.. මම හොයාගන්න ඔය සාකිච්චව.. ගලවනවා පිහාට්ටෙන් පිහාට්ට හැංගී හැංගී බෙනේට කෙටුවට.. ඉඳපියකො..

ඒ එක්කම මට මතක් වුණේ ලේන්සුව.. ඒක කොට්ටෙ අස්සෙ නේද තාම.. සැක් අර ආශී කතාකල්ලා මගේ ඔලුව වෙනස්කලානෙ.. ගෙදර ගිහින් ඒක බලන්නත් ඕන.. මට කොච්චරනම් වැඩ ගොඩක් තියද.. මම ශේප් එකේ නින්ද ගිහින් වගේ මාමගෙ ඇඟට හේත්තු වෙලා මාමගෙ ෆෝන් එකට එබිලා බැලුවා.. මලක් තමා කඩන්නෙ.. මට පේනවනෙ.. සාකි කියලා සේව් කරගෙන වට්සැප් එකේ චැට් කරන්නෙ.. බිස්නස් එකවුන්ට් එකක් එක්ක.. හරියට පේන්නෙත් නෑ.. මම ඔලුව දාලා තව ටිකක් බලන්න ගියාම ඔලුව මැද්දටම ටොක්කක් පතබෑවුණා..

" මොකද මගුල අනින්නෙ.."

මම ඔලුව අතගාගෙන කෙලින් වුණා.. යන්තම් ටොකු නොකා ටික දවසක් හිටියා.. කලින් වතාවෙ තව ඩිංගෙන් අයිසැක් නිව්ටන්ගෙ ඔලුවට ඇපල් ගෙඩියක් වැටිලා ඌට මොලේ පෑදුනා වගේ මගේ ඔලුවට ටොකුම පාත්වෙලා පෑදිච්ච මොලෙත් කුරුවල් වෙනවා පිසික්ස් නිසා.. මම රවලා රඨ්‍ය අයියා දිහා බලලා, වැඳගෙන ඇස් දෙකත් පියාගෙන ඉන්න රඨ්‍ය අයියගෙ අත හයියෙන් පාරක් හාලා මාමගෙ පැත්තට හැරුණා.. රඨ්‍ය අයියා මාව අනන් ගන්නැතුව වැඳගෙනම හිටියා..

" උඹ මොකටද ෆෝන් එකට එබෙන්නෙ.."

" මට ඕන නිසා.. ඇයි යකෝ මගේ වෙන්න මාම-අයි මීන් නැන්දනෙ ඔය දැන් සාකි රේ සාකි සාකී කියන්නෙ.. ඉතින් මම හොයලා බලන්නැද්ද.. කවදහරි මගේ ළමයින්ගෙ ආච්චිඅම්මනෙ.."

" අනේ මේ උඹෙ ළමයින්ට කියපන් මට සීයා කියන්න එපා කියලා.. මම එච්චර වයස නෑ.."

" ඇයි ගැටිස්සෙක් කියලද හිතාගෙන ඉන්නෙ.. පුත්තලම් බූරුවො දාහකගෙ වයස.. එනවා මෙතන.."

@Shan

" ගහනවා සුදුමහත්තයා උඹට මම.."

" ආ ගහනවා බලන්න.. වැලි කවන්නෙ වැලි.. දැන් ඔවාට සාකි ලොකුනෙ.. එන්නෙපා මාත් එක්ක කතාකරන්න.."

" උඹනම් මහ.. මහ.. මොකෙක්ද මන්දා.. උඹ ගැන කියන්න වචන කටට එන්නෙත් නෑ.."

මාමා ආයෙම මගේ ඔළුවට ටොක්කක් ඇන්නා.. මම මාමගෙන් එහාට වෙලා රධ්‍ය අයියගෙ ඇහට හේත්තුවක් දාගෙන බණ ඉවරවෙනකල් ඉඳලා ලොකු හාමුදුරුවොත් බැහැදැකලා ඊටපස්සෙ පිරිත් නූලකුත් අතේ බැඳගෙන හාමුදුරුවොන්ට වැඳලා ගෙදර එන්න ආවා.. අම්මලා ආපු ගමන්ම ඇඟසෝදලා නිදාගන්න ගියා.. මම ඉතින් අර ලේන්සුව අරගෙන ඒක දිහා බලාගෙන ඉඳලා ඔළුවට ආධ්‍ය අයියව මතක් වෙලා එයාට කෝල් එකක් අරගෙන කියව කියව ඉඳලා ඇඟ හෝදගන්න ගියා..

අපේ මාමයි ආධ්‍ය අයියයි.. පිස්සු හැදෙයි තමා.. එක වගේ ප්‍රියුම් ගහන අය නැද්ද මේ ලෝකෙ.. දැන් මම ගත්තොත් හැමෝගෙම ප්‍රියුම් ගහනවනෙ.. ඒ වුණාට ආධ්‍ය අයියමයි ලේන්සුව දැක්කහම මතක් වෙන්නෙ.. අර සෙනුකයට කොලු කතා කියන්න එපා කියන්න ඕන.. ගෙදර ඉන්න උන්වත් ජෝඩු කරන්න පටන් අරගෙන මම.. හැබැයි ආධ්‍ය අයියව ගත්තොත් ම්ම්.. බලමූ..

ආධ්‍ය අයියා ඩොක්ටර් කෙනෙක්.. සිවිල් වැඩකල්ලා තියේ කැම්ප් එකක.. එතකොට අවුරුදු හතරකට කලින් ග්‍රුප්වෙට් වුණොත් එයාමයි.. එයාටත් කොල්ලෙක් එක්කම තමා හුටපටයක් තියෙන්නෙ කියලා අපි හිතාගෙන ඉන්නවා.. එතකොට අර අනුවා.. අපේ මාමා දේව් නෙ.. අනුරාග් කියන්නෙ..

දෙයියනේ.. එතකොට..

මම ඒක හිත හිත ගිහින් ගැම්පු බෝතලේ බ්‍රශ් එකට හලාගෙන ඒක කටේ ගහගත්තා..

" ඇක්.. තුහ්..........හ්!!!"

@Shan

මම ගිහින් හැන්ඩ් ශවර් එක කටටම අල්ලගත්තා.. මේ මොන මගුලක්ද මේ.. ඇක්කා.. හොඳයිනෙ.. ආධ්‍ය අයියා නිසා මම ශැම්පුත් කෑවා.. ආධ්‍ය අයියේ මාවත් ඇඹරල්ලා මාලුවට දාලා කාපන්..

මම ආයෙම ටූත්පේස්ට් එක දෙපාරක් බලලා ඒක බ්‍රශ් එකේ ගාගෙන කටේ ගහ ගත්තා.. ආධ්‍ය අයියා වෙන්න බැරි වෙන්න විදියකුත් නෑ හැබැයි.. අප්පච්චිගෙ කේස් එකකුත් තියෙන්නෙ එහේනෙ.. ඒත් අපේ මාමම වුණේ කොහොමද.. මම අහන්නෙ ඒක අසාමන්‍ය නැද්ද.. නිකන් මම එයාගෙ මල්ලි එක්ක යාලුවෙලා එයා අපේ මාමා එක්කම යාලුවුනේ..

හිමින් කල්පනා කරමුකො.. මුලින්ම ආධ්‍ය අයියා පිස්සු කෙලින්න පටන්ගත්තෙ කොයි කාලෙද.. ඇල්ලෙ ගිය කාලෙ.. එතකොට අපේ මාමා ඇල්ලෙ ආවෙ කවද්ද..

මාමා ඇල්ලෙ ගිය කතාවක් මට කිව්වෙ නැනෙ..

ඉතින් පිල්පිති හරක් පැටියෝ උඹට කියලද මාමා ආධ්‍ය අයියා එක්කම යාලු වුනේ.. නැනෙ.. ඒ කියන්නෙ රිසෝට් එකට මාමා ආවද එදා.. ඒකද සෙනුකයා මට අර පාන්දර පහේ කතාවක් කිව්වෙ.. එතකොට සේරටම කලින් මම කවුද කියලා ආධ්‍ය අයියා දැනගෙන ඉඳලද..

" වරද්.. ඉක්මනට එන්නකො.. නිදාගන්නෙ නැද්ද.."

මගේ දළඹු පැටික්කනේ.. ඔයාලා එවපු ගෙට්වෙල් සූන් මැසේජස් මට ජනේලෙන් ගලාගෙන ගලාගෙන එනවා..තැන්කූ මගේ ලස්සන ළමයිනේ.. ආදරේම ආදරෙයි..

එන්නාම් ලව් යූ ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

@Shan

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

## 86 කොටස

" නෑ නෑ වරද්.. මම කීයටවත් ඔකනම් විශ්වාස කරන්නෙ නෑ.."

" එහෙනම් ඉතින් නිකන් ඉන්නවකො.. මම ඇත්ත කල්ලා පෙන්නන්න.."

මට මාමයි ආධ්‍ය අයියා ගැනයි සැකයක් ආපු දවසේ ඉඳලා අද වෙනකල්ම හිතට හෙන අමුතුයි.. මේක හිතේ තියාගෙන ඉන්නම බැරි නිසා රධ්‍ය අයියට කිව්වහම ඒකා කියනවා විශ්වාස කරන්න බැහැල්ලු..

ඇත්තනෙ..

විශ්වාස කරන්න බෑ තමා.. මොන දෙයියද හිතන්නෙ මෙහෙම මගුලක් වේවි කියලා.. ඒ වුණාට මේ දැන් වෙලා තියෙන්නෙ.. මමයි රධ්‍ය අයියයි ගමේ ඉඳලා කොළඹ එන්න ආවා.. ක්ලබ් එකෙනුත් ජොයින් වෙන ඩේට් කියලා ඊ මේල්ස් දෙකක්ම එවලා තිබ්බ නිසායි රධ්‍ය අයියගෙ ඉන්ටර්විව් යන්න ඕන වැඩෙයි ඔක්කොම වැටිලා තිබ්බෙ එක පිට එක.. ගමේ නිදහසේ ඉඳලා කඩුවෙල එක්සිට් එකෙන් කාර් එක දැම්ම ගමන්ම අර කොළඹට ආපුවම දැනෙන ටෙන්ශන් එක දැනෙන්න ගන්නවා.. මම ශටර් එකට හේත්තුවෙලා පාරෙ පහුවෙලා යන වාහන දිහා බලාගෙන හිටියා..

" කොහෙද යන්නෙ.. අපේ ගෙදර..??"

" අපේ ගෙදර යමුකො.. හුග දවසක් නැනෙ.. ඔයා ඉඳලා රෑ වෙලා යන්න.. ඕන්නම් රෑටත් ඉන්න.."

" ම්ම්.."

රධ්‍ය අයියා කාර් එක අපේ ගෙදරට යන පාර පැත්තට හැරෙව්වා.. ගෙදර වල් විසාල වෙලා ඇත්තෙ.. මමත් හිටියෙම නැනෙ.. ඒ වුණාට එහෙම කියලා බෑ.. මාමා කොළඹ එනකල් මම මෙහෙ ඉන්න එපැයි තනියම හරි.. ඉස්කෝලෙ යන්නත් ඕන.. වැඩ නම් ඉගේ කෙස්ගානට තියෙනවා.. ඔක්කොමත් හරි ඔලුවට කිසි නිදහසක් දැනෙන්නෙ නෑ.. එකක් රධ්‍ය අයියා යනවා.. අනිත් පැත්තෙන් මාමගෙයි ආධ්‍ය අයියගෙයි හුටපටේ..

@Shan

මමයි රධ්‍ය අයියයි අපේ ගෙදර ආවා.. මිදුලෙ නම් කොළ වැටිලා තියෙනවා.. ගෙදර නම් අතුගාලා දූවිලි පිහලා මොප් කලානම් හරි.. ලොකුවට අවුල් වෙලා නෑ.. මම එදා ආපු දවසෙත් අස් කල්ලනෙ ගියේ අනික.. මම බෑග් අරවා මේවා ගෙයින් තියලා ගිහින් ගේට්ටුව වහලා ආවා..

" වරද්.. අපේ අයියා මෙහේ එනවා කියලා කිව්වා රැට.."

මම ගෙදර ජනෙල් දෙක තුනක් බාගෙට ඇරියා.. හවස හතරට විතර ඇති.. හයිවේ ආපු නිසා එච්චරම මහන්සියක් දැනුනේ නෑ..

"  හොඳයිනෙ.."

" රෑටකලින් මට අර කතාව කියන්න.."

" හා හා.. ඔයා ගිහින් වොශ් එකක් දාගෙන එන්න.. ඇඳුම් මගේ අල්මාරියෙ ඇති.. අහ් නෑ ඔයාගෙ ඇඳුම් වගේකුත් තියේ ඒකෙ.. හොයාගන්නවද~"

" හා.."

මට ඇහුණා රධ්‍ය අයියා මගේ කාමරේට ගිහින් දොර වහගන්නවා.. මම බෑග් අරවා මේවා අම්මගෙ කාමරෙන් තියලා කොස්ස අරගෙන ගේ අතුගාලා එහෙන් මෙහෙන් තිබ්බ මකුළුදැල් ටිකත් කඩලා දැම්මා.. අම්මපා මුන්ගෙ දැල් මේ ගෙදරම හදන්න ඕන වුණානෙ.. එක්කො පේන්නැති තැනක හදාගන්න එපැයි.. පේන තැන් වල හැදුවහමනෙ කඩලා දාන්න වෙන්නෙ.. අතුගාලා පාපිසිත් ගසලා මම එළියෙ ටැප් එකෙන් වතුරත් අරන් ඇවිත් ගේ මොප් කල්ලා දැම්මා.. අම්මා ඉද්දි කරන්නෙ එහෙමනෙ.. හැබැයි ගෙදර මොකුත් බඩු නෑ.. හෙට විතර යන්න ඕන මොනවහරි ගේන්න.. ගෙදර මොකුත්ම නෑ එළවලුවක් තියා නූඩ්ල්ස් පැකට් එකක්වත්.. මටනම් දැන් හෙන මහන්සී.. ගෙනැල්ලා උයන්නත් බෑ වගේ.. පැය බාගෙකට විතර පස්සෙ රධ්‍ය අයියා ටවල් එකකුත් කරේ දාගෙන එළියට ඇවිත් මගේ කාමරේට ගියා.. මමත් හිමින් සැරේ කාමරේට ගියා.. ඉස්සර කොහොමද කියන්නෙ.. කාමරේට එන්න බෑ.. එහෙම හරි නෑනෙ.. දැන් නම් කෙලින්ම ගිහින් පතබැව්ලාම ඉන්නවා.. මම රධ්‍ය අයියගෙන් ටවල් එක අරගෙන ඒක රැක් එකෙන් එල්ලුවා..

" මම වොශ් දාලා එන්නම්.."

@Shan

" ඉක්මනට එන්න හරිද.."

මම ඇඳුමකුත් අරගෙන වොශෲම් එකට ගියා.. ආධ්‍ය අයියේ මාත් එක්කම පැනලා යන්න ඉඳලා මට බූට් එකත් තිබ්බා නේද.. ඒ කියන්නෙ එදා මාමා පස්ස ලොකුයි කිව්වෙ ආධ්‍ය අයියගෙද.. ආරෙන් එන පස්සක්ද දන්නෙ නෑ ඕක.. රධ්‍ය අයියගෙ අප්ප-සැක්.. මම මොනවද මේ හිතන්නෙ..

මම ඉක්මනට වැඩිය මොකුත් හිතන්නැතුව නාගෙන කාමරේට එද්දි රධ්‍ය අයියා පස්සත් උඩ දාගෙන ෆෝන් එක ඔබනවා.. මම අත දෙපාරක් කරකලා හොඳවන් පාරක් රධ්‍ය අයියගෙ පස්ස පුපුරලා යන්නම දුන්නා.. මට මේ පස්සෙන් ගැලවෙන්න දෙන්න දෙයියනේ.. එක්කො රධ්‍ය අයියගෙ පස්ස ගලවලා දාන්න..

නෑ නෑ එපා එපා මා සතු වත්කම ඔය පස්සනෙ.. ගලවලා කොහොමද.. තව ටිකක් ලොකු කල්ලා ගන්නෙ නැතුව.. මම ආධ්‍ය අයියගෙ පස්ස මවාගන්න ට්‍රයි කලා.. සැක්.. මම බැලුවෙත් මගේ කව්වගෙ පස්ස දිහා විතරනෙ.. මම මගේ බෝයිපෙන්ගෙ පස්සට ලෝයල් පාටනර් කෙනෙක්.. රධ්‍ය අයියා ඉස් සෝ ලකී ටු හැව් සච් අ ලෝයල් එලම බෝයිෆ්‍රෙන්ඩ් කෙනෙක් ලයික් මී..

" මොකද බං පස්සටම ගහන්නෙ.. මම බයත් වුණා.."

" පස්සට නෙමෙද ගහන්නෙ.. කමක් නෑ කමක් නෑ.. මම තේකක් හදාගෙන එන්නද.. දැන්ම කන්න බැනෙ.."

" ඔයා තේ හදනවද.."

රධ්‍ය අයියා ඇඳෙන් නැගිට්ටා..

" ඔව් හදන්න යන්නෙ.."

" හා.. මේ වරද්.. මේ ෆොටෝ එක කොයි වෙලාවෙ ගත්ත එකක්ද.."

රධ්‍ය අයියා එයාගෙ ෆෝන් එකේ තිබ්බ ෆොටෝ එකක් මගේ පැත්තට හරවලා පෙන්නුවා.. ඒක අපි දෙන්නා ඇල්ලෙ ගිහින් ගහපු ෆොටෝ එකක්.. මමයි රධ්‍ය අයියයි මූණට මූණ බලාගෙන ඉන්නවා.. මම මොකක් හරි සක්කිලි කතාවක් කියනවද කොහෙද කෝටු කෑල්ලකුත් අතේ

@Shan

තියාගෙන.. රධ්‍යා අයියා මම ඔලුවෙ දාගෙන ඉඳපු කැප් එක අල්ලගෙන මූණට එබිලා ඉන්නවා.. මම ආසම ෆොටො එකක්..

" ආ ඔක ගත්තෙ ආගී.. රන්ඩම් ශොට් එකක් නේද.."

" ම්ම්.. ලස්සනයි.."

රධ්‍යා අයියා ෆොටෝ එක දිහා බලාගෙන ඉඳලා ෆෝන් එක ඔෆ් කල්ලා ඇඳෙන් නැගිට්ටා..

" ඔයා මොකක්ද අර කිව්ව කතාව.."

මම මොකුත් නොකිය මේසෙ උඩ තිබ්බ ලේන්සුව රධ්‍යා අයියගෙ අතට විසික් කල්ලා පුටුවට හේත්තු වුණා..

" මේ මොකක්ද.."

" ඔක කාගෙද කියලා නිකම් හිතලා බලලා කියන්නකො.. ඔයා දන්න කියන ස්මෙල් එකක් එන්නෙ.."

රධ්‍යා අයියා ලේන්සුව ඇඟිලි දෙකෙන් අල්ලලා නහය ගාවට කිට්ටු කල්ලා බැලුවා..

" අපේ අයියගෙනෙ.."

" හොඳටම ශුවර්ද.."

" ඔව් මේ ප'ෆියුම් එක මමමනෙ එයාට දුන්නෙ..Penhalison's Elisabethan Rose Eau De කියලා එකක්.. මම හිතන්නෙ නෑ මෙහේ ඔක පාවිච්චි කරන අය අහම්බෙන් හරි හම්බෙයි කියලා.."

" කේ.. ඔක මට හම්බුණේ අපේ මාමගෙ කාර් එකේ තිබිලා.. සී..?? ඔයාට මං කියන එක පිලිගන්නම වෙනවා."

මම රධ්‍යා අයියගෙ පිටාට් තට්ටුවක් දාගෙන කුස්සියට ගිහින් කේතලේට වතුර පුරවලා ලිපෙන් තිබ්බා.. ටිකකින් රධ්‍යා අයියා අතරමංවුණු මූණක් හදාගෙන ඇවිත් කුස්සියේ බැම්මට හේත්තු වුණා..

@Shan

" ඇයි මේ.."

" මට තාම හිතාගන්න බැනෙ වරද්.. මේක හෙන පිස්සුවක් වගේ කියලා හිතෙන්නෙ නැද්ද ඔයාට.."

" හිතෙනවා.. මොකද නැත්තෙ.."

" මම අයියගෙන් අහනවා.."

" මේ මේ පිස්සු කතාකරන්න එපා.. අයියගෙන් අහන්න ඕන නෑ..එයා කියනකල් ඉන්න.. අපි දන්නවා කියලා අහවන්න ඕන නෑ.."

" ඇයි.."

" අපි එයාගෙ හිතේ සැනසීම නැති කල්ලා දානවා වගේ නැද්ද.. එහෙම කරාම.."

" හරි.. මට ඔයා හරියටම කොහොමද දැනගත්තෙ කියන්නකො.. දැන් දවස් දෙකකුත් ගියා.. ඔයා අදමනෙ මට මේක කිව්වෙ.."

" මෙහෙමයි හරිද.."

මම කේතලේ ලිපෙන් අරන් ඒක තේකොළ එකට දාලා වහලා තියලා බැම්මටම හේත්තු වුනා..

" ඔයාට නිකම් ආධ්‍ය අයියා වෙනස්වුණා වගේ හිතුනේ කවදා ඉඳලද.. නෑ නෑ එක්කො මමම කියන්නම්.. අපි ඇල්ලෙ ගිය දවස මතකද.. එදා ආධ්‍ය අයියා අවුලකින් හිටියෙ නෑනෙ.. අපි එක්ක හොඳට කතාකර කර හිටියා.. එහෙම ඉඳලා ඇල්ලෙ ගිය ගමන්ම එයා වෙනස් වුණා.."

" ඒ කිව්වෙ.."

" ඔයාට මතකද දවසක් බැල්කනි එකේ දොර ඇරලා දාලා නිදාගත්තා කිව්වෙ.. අර මම නයිට්මෙයර් එකක් දැකලා නැගිටලා පහළට ගියේ.."

" ම්ම්.."

@Shan

" එදා මගේ ෆෝන්  එක ඇඳේ තිබ්බෙ නෑනෙ.. ඒක තිබ්බෙ සෝෆා එක උඩ.. ඔයා දැක්කනෙ.. උදේ ඔයා බලද්දි මාමා මැසේජ් දෙකක් එවලා තිබ්බෙ ඇයි කතාකලේ අහලා.. එදාම මතකද පහළ තට්ටුවෙ වීදුරුවක් බිඳිලා ඔයා පූසෙක් වෙන්නැති කිව්වෙ.. මම හිතන්නෙ ඒ පූසා ආධ්‍ය අයියා හරි අපේ මාමා හරි තමා.."

" පොඩ්ඩක් ඉන්න.. ඔයා කිව්ව නේද සෙනුක මල්ලි කිව්වා කියලා පාන්දර පහට විතර කවුද ආවා කියලා.."

" අන්න ඔව්.. එක්කො ඒ ආධ්‍ය අයියා.. නැත්තම් අපේ මාමා.."

රධ්‍ය අයියා බැම්මෙන් ඉඳගෙන මම හදලා දුන්න තේක අතට ගත්තා..

" ඊටපස්සෙ ඒ දෙන්නා අතර ඉතින් මොනවා වුණාද මම දන්නෙ නෑ.. කොහොම හරි ආධ්‍ය අයියා දැනගෙන ඉඳලා තියෙනවා අනුරාග් කියන්නෙ මගේ කවුද කියලා.."

" මම.."

" ඊටපස්සෙ එදා අපි ඩයරි එක කියව කියව ඉද්දි අත කපාගෙන ආවෙ.. අපේ මාමත් වීදුරුවකට කපාගෙන ඇවිත් තිබ්බා.. ඒ ඇරෙන්න අප්පච්චි ගැන කිව්වා.. ග්‍රැජුවේශන් එකක් ගැන කිව්වා අවුරුදු හතරකට කලින් තිබ්බ.. අනේ හෙන ගොඩක් තියනවා ඒයි.. මට දැන් මතක් වෙන්නෙත් නෑ.. කොහොම හරි අර සාකිච්චා මගේ පොඩි මාමා වෙන්න හදන්නෙ.."

එකපාරම රධ්‍ය අයියට තේක පිට උගුරෙ ගියා..

" මොක්-කැහ්-කැහ්.."

" හිරකරගන්නෙපා අනේ.. ඇත්ත කියන්නෙ.. එතකොට ඔයා මගේ හිච්චි මාමා වෙන්නෙ නැකමට.. සැක් අයියෙ.."

" මොන මගුලක්ද.. අපේ අයියටත්.. ආර්ග්!! මෙක හෙන ඩ්‍රාමා එකක් වගේනෙ වරද්.. මම ඔය මොකුත්ම දැනගෙන නෙමෙයිනෙ ඔයා එක්ක යාලුවුනේ.."

@Shan

" ඒකනමා කියන්නෙ.. එක්කො ආධ්‍ය අයියගෙ ලැබීම නමා.. පතාගෙනම ඇවිල්ලද කවුද දන්නෙ.."

" මන්දා.. අපේ අප්පච්චිත් එනවා වරද්.. අයියා මොනව කරන්න යනවද මට තේරෙන්නෙ නෑ.."

" එයා පොඩි ළමයෙක් නෙමෙයිනෙ.. කරන්න ඕන එක එයා කරයි.. ඔය හිච්චි මාමා වැඩිය කලබල කරන්නැතුව ඉන්නකො.."

ඒ එක්කම රධ්‍ය අයියා අත දිගැරලා මගේ පස්ස කිස් කන්න පාරක් දුන්නා..

" ආව් අනේ.. මොකද ගහන්නෙ.."

" ඔය මගුල් මට කියලා අහුවෙන්නෑ ආයෙ.. හිච්චි මාමා..?? ඒව වරද්.."

රධ්‍ය අයියා බැම්මෙන් බැහල ගිහින් මගේ මග් එකත් එක්ක සේදුවා..

" ඉතින් ඇත්තනෙ.. එක්කො අපේ මාමව අයියා විදියට බාරගන්න.. නැත්නම් ඔයා මගේ මාමා කියලා පිලිගන්න.."

" මෙතන ඇති මාමෙක් නෑ.. ඇහත් හිරි වැටිලා ගියා.."

රධ්‍ය අයියා ඒකටනම් සිරාවටම කැමති නැද්ද කොහෙද..

" මෙ වරද්.."

" ම්ම්.. කියන්නකො රාධාවනියෝ~"

අපි දෙන්නා රාමාවණය  ලියන්නත්තෙ හිටියෙ.. මම රාවණා.. මගෙ ගැටපොලොස් කොටෝරුවා රාමා.. දෙයාරා නෝ සීතලා නෝ මන්ඩෝදරීලා.. ඔන්ලි වූ ඔෆ් අස්.. දැන් ඒක අස්සට මෙ රෝමියෝ ජුලියට් කඩාවැදිලා පෙර අපර දෙදිග යා කලා.. එතකොට රෝමියෝගෙ ඥති පුතා රාවණා.. ජුලියට්ගෙ මල්ලි රාමා.. එතකොට රාවණාගෙ පොඩි මාමා ජුලියට් වෙලා රාමා මගේ හිච්චි මාමා වෙනවා.. නැත්නම් රාමා මගේ ස්වාමිපුරුශයා වෙලා මාමා වෙලා ඉඳපු රෝමියෝ රාවණාගෙ අයියා වෙනවා.. එතකොට මගේම අම්මා මට අක්කා වෙනවා.. එහෙම වුණොත් රධ්‍ය අයියගෙ අප්පච්චිත් මට අයියා වෙලා ලොකු අම්මා මගේ අක්කා

@Shan

වෙනවා..  මගේ ඔලුව ගැටගැහීගෙන එන්න යද්දි යද්දි වගේ මම ඔලුව ගස්සලා හරි සිහියට ආවා..

" එතකොට කවදහරි මගේ ළමයට මම අප්පච්චිත් වෙලා සීයත් වෙන්න ඕනද.."

සැක් රධ්‍ය අයියට ඔක්කොන්ටම කලින් මතක් වුනේ මේ ප්‍රශ්නෙද.. එහෙම වුනොත් මගේම ළමයට මම වක්‍රාකාරව සීයෙකුත් වෙනවා.. අනුකිච්චා සාකිච්චා.. අපිව මරාගෙන කාපියව්..

" ලාවට එහෙම තමා නේද.. වැඩිය හිතන්නෙපා.. රාමගෙ මොළේට ගැණුගැටේ වැටුනොත් එහෙම.."

" වැටෙනවා. .. වැටෙනව.."

" පකක් නේද.. නේ..?? ප-"

" වරද්!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

" ඒකතමා මුල ඉඳන්ම මම කිව්වෙ එක ගෙයි කමුයි කියලා.. ඇහුවෙ නෑනෙ~"

මම රධ්‍ය අයියා පොල්කටු හැන්ද අතට ගන්න කලින් දුවගෙන දුවගෙන ඉස්තොප්පුවට ආවා විතරයි ඉස්තෝප්පුවේ සපත්තු ගලව ගලව ඉඳපු ආධ්‍ය අයියගෙ ඇඟේ වැදිලා මාව ආධ්‍ය අයියගෙ අත උඩට කඩාගෙන වැටුණා.. අර හින්දි මෙගා නාට්ටිවල නිළිය නළුවගෙ අතට ලෑන්ඩ් කරනවා වගේ.. මම මගේ අත් දෙක ආධ්‍ය අයියගෙ කර වටේ දාගෙන කකුල් දෙකෙන් උඩ පැනලා අයියගෙ අත් දෙක උඩටම ආවා..

" මේ මොකද චූටියො.."

ආධ්‍ය අයියා මාව උස්සගෙන ගිහින් සෙටිය උඩින් තිබ්බා..

" ඉසාක්‍ය අයියව මතක් වුණා සෑහෙන්න.."

" ආ ඒ මොකෝ.. අර හිටියෙ ඔයාගෙ කව්වද කවුද.. එයා එපාද.."

" එපා.."

@Shan

මම ආඪ්‍ය අයියගෙ අතකින් ඇදලා අරගෙන මගේ ළඟින් ඉන්දවගත්තා.. හත්දෙයියනේ පොඩි මාමා නේද මේ ඉන්නෙ.. රෝස සුවඳ පොඩි මාමා.. මේ බෑණාව අන්දන්න ඔයාගෙයි ඔයාගෙ අනුකිච්චගෙයි රෙදි මදි.. හොඳවෙලාවට බේකර් වීදියෙ පොත් ටික හයේ හතේ කියවලා මූලික දැනුමක් ලබාගත්තෙ.. අර සෙනුකයා වොට්සන්වයි හෝම්ස්වයි ශිප් කල්ලා ඒ කාලෙ කියපු වලත්ත කතාවලට හිනා වුණාට මට සමාවන සේක්වා.. හඩ්සන් දෙවි පිහිටයි.. !!

" ඒ මොකෝ.. පොඩී මේකා කියන්නෙ ඔයාව එපාලු.."

රඪ්‍ය අයියා ආඪ්‍ය අයියට තේකක් ගෙනැල්ලා දුන්නහම එයා ඒක අතට අරගෙන හරිම හිමින් උගුරක් බීලා පීරිසියටයි කෝප්පෙටයි රිදෙයි වගේ ස්ලෝමෝශන් එකේ මේසෙ උඩින් තිබ්බා.. මම ඕවා දිහා බලාගෙන ඉද්දි වශී වෙනවා වගේ.. ආඪ්‍ය අයියා වැඩ කරන්නෙ හරි හිමින් පරිස්සමට.. ඒ වුණාට පිලිවෙලයි.. තේකක් බොන එක වුනත් කරන්නෙ හරි පරිස්සමට ලස්සනට..

" ඔව් අයියත් එක්ක පැනලා යන්නලුනෙ ඉන්නෙ.."

" ආ.. එහෙමද.. තා මොනවද කියන්නෙ.."

" මලක්ලු.. සමනලයෙක්ලු.. අයියා එක්ක පැනලා යනවලු.. පීක් පීක් ගාන තාර පැටියෙක් ඕනලු.. අනේ මන්දා "

" අනේ මේ යනවා යන්න.."

මම අත් දෙකින්ම ආඪ්‍ය අයියව බදාගත්තා.. මාමත් මාර කිච්චා තමා.. ඉඳලා ඉඳලා මගේ මනුස්සයගෙ අයියටම තට්ටු කලානෙ.. මේ දෙන්නා තරු බලන්න ගිහින් තියෙනවද දන්නෙ නෑ.. තරු බලන්න මීන්ස් අරක කරලා තියද දන්නෑ.. ලොකු අයනෙ.. කල්ලත් ඇති.. අහන්නත් හිතෙනවා~

" ආඪ්‍ය අයියෙ.. ඔයා තරු බලන්න ගිහින් තියේද කවදහරි.."

" වරද්!!!!!!!!!!"

රඪ්‍ය අයියා මට දෙතුන්පාරක්ම රැව්වා.. එයා දන්නවනෙ තරු බලන්නෙ මොකක්ද කියලා.. සැක් ආඪ්‍ය අයියා දන්නෙ නැනෙ..

@Shan

" ඒ මොකක්ද චූටි.."

" ආ ඒක තියෙන්නෙ ඇස්ට්‍රෝ සොසයිටි එකේ.. අයියා දන්නෑ අනේ.. ඉතින් කොහොමද මේ ටිකේ.."

" හොස්පිටල් තමා චූටි.. යනවා එනවා.. ඔච්චර තමා.. මම මේ ඩිස්පැන්සරි එකට යන ගමන් මෙහේ ආවෙ.. මම කැමත් අරගෙන එන ගමන් එන්නද.. මගේ අපොයිමන්ට්ස් වගයක් තියෙනවා.."

" අයියා යන්නද ආපු ගමන්.."

" ඔව් පොඩී.. ඉක්මනට එනවා.."

ආධ්‍ය අයියා එයාගෙ බෑග් එකෙන් ස්ටෙත් එකයි පෙන් ටෝච් එකයි අරගෙන අපිට යන්නම් කියලා ආයෙම කාර් එකට ගියා..ආධ්‍ය අයියා යන්න ගියා විතරයි රධ්‍ය අයියා මාව එයාගෙ පැත්තට හරවගෙන මගේ උරහිස් වලින් හයියෙන් අල්ලන් මාව බිත්තියට තියලා තද කලා..

" ආව්.."

මම රධ්‍ය අයියගෙ අත් වලින් රිදෙන නිසා ඒවා ගලවගන්න ට්‍රයි කරද්දි එයා මගේ අත් දෙක අරගෙන බිත්තියට තියලා එයාගෙ අක අතකින් අල්ලගත්තා.. ඊටපස්සෙ මගේ මූණ එයාගෙ පැත්තට හරවගෙන මගෙ තොල් වලින් පෙක් එකක් තිබ්බා..

" miss you.."

මාව එකපාරම ඇඟේ ඉඳන් රතුවෙන්න ගත්තා.. මෙහෙම රධ්‍ය අයියා මූණට එබෙනකොටමට පොඩ්ඩක් ලැජ්ජ හිතෙනවා..

" යන්න-කො.."

" When those cheeks turn pink, I forget myself.. I also forget the things around me.."

රධ්‍ය අයියා මගේ ඉණෙන් ඇදලා අරගෙන එයාගෙ ඇඟට හේත්තු කරගත්තා.. මගේ ඉණ එයාගෙ අතින් ඔන්නම් වියත් තුනක් විතර ඇති.. ඒ නිසා හැමතිස්සෙම එයා මගේ ඉණෙන් අල්ලගත්තහම ඒවා උවමනාවටත්

@Shan

වඩා එයාගෙ අත් වලට ෆික්ස් වෙනවා.. පස්ල් එකක පීස් එකක් හරිම තැනට සෙට් වෙනවා වගේ.. ඊටපස්සෙ එයා ශර්ට් එකත් උඩට ඉස්සෙන්නම ඉණ දිගේ අත් දෙක උඩට අරගෙන එනගමන් මගේ තොල් වලට ළං වුනා.. මගේ ඇඟ එයාගෙ ගොරෝසුත් නැති සිනිඳුමත් නැති අත් වලට ඉබේම ඇදිලා යනවා.. මම බිත්තියට තියනා තද කරගෙන උන්නු අත ගලවගෙන අත් දෙක රඩ්‍ය අයියගෙ කර වටේ දාගත්තා.. එයා නැමිලා ඉද්දි මං ගාවට උස වුණාට එහෙමම කෙලින් වුනාම මම මගේ කකුලෙ ඇඟිලිතුඩු වලින් ඉස්සෙන්න ඕන..

රඩ්‍ය අයියා මාව තව ටිකක් එයාගෙ ඇඟට තියලා තද කරගෙන මගේ යටිතොල තාලෙකට උරවන්න ගත්තා.. මගේ ඇස් අනන්තෙකට ඇදගෙන වැටෙනවා වගේ හැඟීමක් එක්ක ඇරෙනවා.. පියවෙනවා.. එයා මාව උස්සගෙන ගිහින් මගේ කාමරේ ඇඳ උඩින් තියලා මගේ ඇඟ උඩට ආවා..

" උඹ දැක්කහම ලෝබ හිතෙනවා වරද්.."

රඩ්‍ය අයියා මගේ අතක තිබ්බ මුද්දෙන් හාද්දක් තිබ්බා.. ඊටපස්සෙ ඒ අතේ ඇඟිලිවල ඇඟිලි පටලගත්තා..

" ඇයි..??"

" එහෙම හිතෙනවා.."

රඩ්‍ය අයියා මගේ මූණට පහත් වෙලා තොල් වලින් පෙක් එකක් තිබ්බා.. එයා ඒක කරන විදියට මගේ බඩේ සමනල්ලු පියාඹලා යනවා වගේ දැනෙන්න ගන්නවා..

" මට ඔයාව මතක තියාගන්න ඕන.. ආයෙම ඔයාව හම්බුණාම පොඩ්ඩක් හරි වෙනස් වෙලා තිබ්බොත් මට ඒක දැනෙනවනෙ.."

රඩ්‍ය අයියා මගේ ඇස් වලට වැටිලා තියෙන කොණ්ඩෙ අතකින් පිටිපස්සට කල්ලා ලාවට හිනාවුණා..

" මතක තියාගන්න.."

" ඔයා මාව දාලා යනවනෙ.."

@Shan

" ඒක දාලා යනවා නෙමෙයිනෙ.. මම ගිහින් ආපහු එනවා.."

" ම්ම්.."

මම එයාගෙ ශර්ට් එකේ නූලක් ඇදලා ඒක ඇඟිලි වල පටලගත්තා.. රධ්‍ය අයියා මගේ එහාපැත්තෙන් ඇලවෙලා ඇඳට වැලමිට තියලා මගේ දිහා බලාගෙන හිටියා.. මම කකුල අරගෙන රධ්‍ය අයියගෙ ඉණ ගාවින් දාගත්තා..

" අපි තරු බලන්නෙ කවද්ද.."

රධ්‍ය අයියා එකසැරේම මහා හයියෙන් හිනාවෙලා මාව අර බූවලු අඩු වලින් බදාගෙන එයාගෙ පපුව අස්සට හිර කරගත්තා.. මම කොහොමහරි දගලලා දගලලා මගේ මූණ එළියට දාගත්තා..

" දැන්ම තරු බලන්නෙ නෑ.."

තරු බලන්න එනවත මගෙ ලස්සන ළමයිනේ.. ට්වින්කල් ට්වින්කල් ලිට්ල් ස්ටාර්..

එන්නාම්.. ලව් යූ.. ❤

ම්ම්.. දලඹු හමුදාව තමා හොඳටම කරන්නෙ නේත.. මගෙ පිස්සු කෙල්ලොහ්.. ආදරෙයිනෙ..

රධ්‍ය මෙ සාකිච් අනුච්චි ලව් එක ගැන මොනවා හිතනවා ඇද්ද.. එකසැරේ අප්පච්චියි සීයයි උනොත් පච් පිරෙයිත..

ඒක ඉතින් දන්නෙ ඒ දරුවම තමා.. නේත ඒයිම..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

@Shan

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 87 කොටස

" ළමයි මේ නැගිටින්නකො.."

හොඳටම නින්ද ගිහින් හිටිය මට ඇහුණා කවුරුහරි මගේ කකුලෙන් නවත්තන්නැතුව අදිනවා.. මම කකුල ගසලා රධ්‍ය අයියගෙ කකුල් දෙක අස්සට මගේ කකුල ඔබාගෙන අතක් මූණ උඩින් තියාගත්තා.. උදේ පාන්දර කවුද යකෝ විලාප තියන්නෙ..

" පොඩී.. එන්න කෑම කන්න.."

" කෝ ඉතින්.. මම කීයෙ ඉඳන්ද කතාකරන්නෙ.."

මාව ඇඳේ කොණටම ඇදිලා ගිහින් ඇඳේ ඉන්දුනා.. මම ආයෙම අනිත්පැත්තට වැටිලා නිදාගත්තා..

" පොඩී.. මේ නැගිටින්න ළමයි.. කෝ කෝ කාලා නිදාගන්නකො.."

මම ලාවට එක ඇහැක් ඇරලා විලාප තියන පොල්කිච්චා දිහා බැලුවා.. පොඩි මාමා මොකද උදේ පාන්දර බෙරිහන් දෙන්නෙ.. ඔහොමනම් බෑ පොඩි මාමෙ අපේ මාමා එක්ක දීග කන්න..

" ආ අනිත් ඇහැත් ඇරගන්නකො ඔහොමම.. යකෝ එක ඇහැක් ඇරගන්න මම මෙතන දහාට වන්නමම නටන්න ඕනා.."

මම ඔලුව අත් දෙකෙන් අවුල් කරගෙන ඇඳේ ඉඳගත්තා..

" කවුද වන්නම නැටුවෙ අයියෙ.. ඇයි උදේ පාන්දර.."

ආධ්‍ය අයියා හිනාවෙගෙන මගේ ඉස්සරහා පුටුවෙන් ඉඳගත්තා..

" උදේ..?? මරු උදේ.. තාම වෙලාව නමයටවත් නෑ.. දෙන්නා එක්ක මම ගියාම මොනවහරි බිව්වද.."

මම කල්පනා කල්ලා බැලුවා.. මේම උදේ නෙමෙයිද.. හවසද.. නැනෙ හවසනෙ නිදාගත්තෙ.. ඒ කියන්නෙ මම තාම ඉන්නෙ අඳද.. අපරාදෙ උදේ

@Shan

කියලනෙ හිතුවෙ.. ආධ්‍ය අයියා අනුරාග් පොල්මල එක්ක යාළුවුණේ නැත්නම් මාත් එක්ක පවුල් කාලා උදේම නැගිටින්නැතුව ඉන්නවනෙ.. කොහෙද මගේ මනුස්සයා මේකට එච්චර කැමති නැනෙ.. අනික ඉතින්..

අනික ආධ්‍ය අයියගෙ මූණ දිහා බලාගෙන කොහොමද මම පවුල් කන්න අහන්නෙ.. සාන්තුවරයෙක් වගේ මනුස්සයෙක්නෙ.. මාත් එක්ක ඉඳලා රධ්‍ය අයියට හැදෙනවා වගේ හැමතිස්සෙම හැදෙන ඔලුවෙ රදයක් හැදුනොත් එහෙම.. රාවණාගෙ මාමගෙ ජුලියට පවනෙ.. රාවණාට දුක හිතෙනවනෙ.. අපේ මාමා ඒවි රෙද්දත් උස්සගෙන 'දම්සාරිව දීපන්' කියාගෙන මගේ ඔලුව කන්න.. ඊට මීට වැඩිය හොඳයි පැත්තකට වෙලා මගේ හැපීකච්චව බදාගෙන නිදාගන්න එක..

" අපි තේ බිව්වා අනේ.. ඔයත් එන්න නිදාගන්න.."

" මට ඔහොම මතේ නෑ.. නැති එකම හොඳයි.. මේ දෙන්නව ඇහැරන්න මෙතන දවුලක්වත් ගෙනැල්ලා ගහන්න ඕන.."

අනේ මේ ආධ්‍ය අයියෙ.. දවුලක් ගෙනැල්ලා ඔයාගෙ ගෙදරින් තියාගත්තනම් තමා හොඳම.. පොඩි මාමගෙ කට වැඩිවෙලා.. දෙන්නෙ පස්සට.. නෙමේ.. පිටට.. පස්සට දෙන්නෙ මගේ හැපීකච්චගෙ විතරයි..

" දවුල් ඕන්නෑ.. පොඩ්ඩක් ඉතින් හයියෙන් කතාකරන්න එපැයි.. මම ඇහැරෙනවනෙ.. අයියා කතාකරන්නෙ අයියට ඇහෙන්න විතරනෙ.."

" එහෙම තමා ඉන්න ඕන.. හා හා ඔය නිදාගෙන ඉන්න එක්කෙනාවත් ඇහැරන් එන්න ළමයා කෑම කන්න.."

ආධ්‍ය අයියා හිමින්සැරේ නැගිටලා මගේ කොණ්ඩෙ අවුල් කරගෙන කාමරෙන් එළියට ගියා.. පස්ස ලොකුයි තමා.. අපේ මාමා හරි..

" මෙහ්.. නැගිටින්න.."

මම රධ්‍ය අයියගෙ අතකින් ඇද්දහම ඒකා මගේ අත ගසලා අනිත් පැත්ත හැරුණා. මේ වරද්ගෙ අත ගසලා දැම්මා නේද.. මගේ අත ගසන්න එයා කවුරු කියලා හිතාගෙන ඉන්නවද දන්නෑ.. මම නැගිටලා කකුල දික් කල්ලා පස්සට හොඳ පාරක් දුන්නම රධ්‍ය අයියා ලාවට නැගිටලා මගේ දිහා බැලුවා..

@Shan

" මම..??"

" ආධ්‍ය අයියා ඇවිල්ලා.. කන්න එන්නලු.. එන්නකො.."

" ආ ඉන්න ඉන්න.. විනාඩි දෙකයි.."

රධ්‍ය අයියා ආයෙම ඇහැ වහගත්තහම මම රධ්‍ය අයියා ඇදගෙන ඉඳිය කලිසමෙන් පහළට ඇද්දා..

" ටහුක්.. වරද්!!!!!!!!!!!!!!!!!!!!!"

ඔය නැගිට්ටෙ.. මම නැගිටලා එළියට ගියා.. ආවා මෙතන නටන්න.. අයියයි මල්ලියි මට කියලා අර අපේ අම්මා කොකිස් බදින අච්චුව පස්සෙ තියාගන්න තමා ලැස්තිවෙන්න.. මම කුස්සියට යද්දි ආධ්‍ය අයියා කෑම, ප්ලේට්ස් වගේකට බෙදනවා.. මම එතන බැම්මට හේත්තු වුණා..

" බඩගිනියිද.."

" එච්චර නෑ අනේ.. ඔයාගෙ පණුවා කතාකලාද.."

" කොයි පණුවෙක්ද චූටි.."

" ඇයි අර අපිට පස්සෙ කියන්නම් කිව්වෙ අනුවෙක්ද පණුවෙක්ද  ගැන.. එයා අනේ.."

" අහ්.. අනූද.. කතාකලා කතාකලා.."

" එයා කොහොම කෙනෙක්ද ඉතින්.."

මම මොකුත් දන්නෙ නැති මැටි ගුලිය වගේ ආධ්‍ය අයියට දැළ එලලා මෙහාට වෙලා බලාගෙන හිටියා.. දැන් කියමු බලන්න අනූගෙ හැටි.. අයියට කලින් නෙ මම අනූව දන්නෙ.. මගේ ආධ්‍ය අයියව රවට්ටගෙනද දන්නෙ නෑ අනුරාග් ලොකු මාමණ්ඩි.. මස්සිනා කියන්නෙ අනිත් මස්සිනාගෙ යුතුකමක් හා වගකීමක්..

" අනූ.. එයා හොඳයි.."

" හොඳයි කියන්නෙ.. එයා අයියට උයලා එහෙමත් දෙනවද.."

@Shan

" ඔව්.. සමහර දවස්වලට.. මිරිස් වැඩි කෑම හදලා දෙනවා.."

" සැක්.. මාමා-ම- මස්ෂෙක්කා පෙති බැදලා වගේද.."

ආධ්‍ය අයියා හිනාවෙලා රතුම රතු වුණා.. මනමාලකම මේ මස්සිනාගෙ.. මම දැන් වැරදි දෙයක් ඇහුවද.. මස්ෂෙක්කා පෙති බැදලද ඇහුවහම ඒකෙ රතුවෙන්න දෙයක් තියද මං අහන්නෙ නෑනෙ.. මනමාල විසේ දොස්තර මහත්තයගෙ ඉහට ගහලා.. රධ්‍ය අයියට කියන්න ඕන අර මාව ඇදගෙන යනවයි කිව්ව සයිකැට්‍රිස්ට් ගාවට මව නෙමෙ පොඩි මාමව අරගෙන යන්න කියලා..

" ඒවා හදන්න දන්නෙ නෑ චූටි.. මොනවද අහන්නෙ ඔය.."

" මම ඔයාව ඉන්ටව් කරනවා.. ඔයා මේ රැදී සිටින්නේ විටවැට් විත් ෂනු සෙග්මන්ට් එකත් එක්ක.. ඔයා ගැන මට විස්තර කරන්න පුළුවන්ද.."

මම පොල්කටු ගැන්දක් මයික් එකක් වගේ අරගෙන ආධ්‍ය අයියට දික් කලාම එයත් ඇවිත් මං ගාවින් බැම්මට හේත්තු වුණා.. ආධ්‍ය අයියා සයිලන්ට් කැරැක්ටර් එකක් වුණාට වෙලාවකට තියෙනවා හෙන මරුමුස් දහලන ගතියක්.. නැත්තම් අපේ මාමට බෝතල් කට්ටකින් ඇනලා ඒවියැ..

" මම ගැනද.. මම ආධ්‍ය.."

" ආධ්‍ය ඉතුරු කෑල්ල.."

" ආධ්‍ය ශදිල් ඉශාක්‍ය අධිකාරි.."

අධිකාරි නෙමෙ පොඩි මාමෙ ඔයා ගමගේ කෙනෙක් වෙන්නයි ඉන්නෙ.. කමක් නෑ අධිකාරි කියලා කියමුකො..

" එතකොට දැනට ඔයාගෙ ජොබ් එක ගැන අපිට විස්තර ටිකක් කියනවද.."

" ඒක මම ආසාවෙන් කරන්නෙ.. මම නිසා සනීප වෙන හැමකෙනෙක් ගානෙම මට සතුටු හිතෙනවා.."

" මේ නිවේදකයට ඔයා ගැන ආදරේ හිතීගෙන එන්නෙ.. කමක් නෑ.. එතකොට ආධ්‍ය ,ඔයාට කියන අනිත් නම් මොනවද.. මං අහන්නෙ.. පෙට් නේම්ස් වගේ.. එහෙම..??"

@Shan

" ආ ගොඩක් තියනවා.. ගෙදර අය කියන්නෙ ලොකු කියලා.. ඒ ඇරෙන්න ඉස්කෝලෙ යාළුවො ශදී කියනවා.. කැම්පස් එකේ යාළුවො ආදි කියනවා.. හොස්පිටල් වෝඩ් එකේ අය කණ්ණාඩිදාන ඩොක්ට කියනවා.. දැන් එක්කෙනෙක් අයියෝ කියනවා.. මම්.. සමහරු සාකි කියලා කියනවා.."

" ඕ.. සාකි කියද්දි ඇයි ඔයා රතුවෙන්නෙ.. ඒක කවුරුහරි විශේශ කෙනෙක් කියන නමක් වගේ.. එහෙමද.."

මගේ ලූලා පැටියා ඇම කන්නයි යන්නෙ..

" අපි එහෙම කියමුකො.."

" ඉතින් අපිට ඒ විශේශ කෙනා ගැන විස්තර ටිකක් කියන්නකො.."

" අනේ චූටි.. මේ මොන-"

" අයියෝ කන්න එපා අනේ ලස්සන ඉන්ටවිව් එකනෙ.. කෝ කියන්න ඉතින්.. විශේශ කෙනා ගැන අපිට.."

" විශේශ කෙනා ඉතින් විශේශයි.. එච්චර තමා.."

" කවද්ද ඔයා එයාව මාධ්‍යට අඳුන්වලා දෙන්නෙ.. අපිත් ආසයි ඔයාගෙ විශේශ කෙනාව දකින්න.."

" මාධ්‍යට වසන් කල්ලා තියෙන්නෙ.. මාධ්‍ය දැනගත්තොත් මොනව කියයිද හිතාගන්න බෑ.."

අනේ අනේ පොඩි මාමෙ.. මාධ්‍ය සේරම දැනගෙන තමා ඔයා ගාව බබා වෙලා මෙ සේරම අහන්නෙ.. කොහෙද මෙ පවුලෙ දොස්තරලයි, අයිලන්ඩ් රැන්ක් දාපු වෙන්ඩ ඉන්ජිනියර්ස්ලයි, දත් දොස්තරලයි හිටියට වැඩක් නැනෙ.. මෙ ඒලෙවෙල් විතරක් කරපු එකාට වගේ මොලයක් නැනෙ..

" විශේශ කෙනා වැඩක් නෑ එයා පැත්තෙන් තියන්නකො.. ඔයාට යොමුවෙන අවසාන ප්‍රශ්න ටිකට තමයි අපි හැරෙන්න ඕන.. ඩොක්ට ආධ්‍ය ඔයා ඔයාගෙ වෙන්න මස්සිනා ගැන මොකද හිතන්නෙ.."

" මරු.. හොඳටම කරන්නෙ එයා තමා.."

@Shan

" එහෙමද.. ඔයා එයාට නේද වැඩිපුරම ආදරේ.."

" ඔව් ඔව් එයාට තමා.."

" අර පණුවට වඩා ආදරෙයි නේ.."

" ඔව් පණුවට වඩා ආදරෙයි.."

" එන්න අනේ උම්මා එකක් දෙන්න.."

මම පොල්කටු හැන්ද පැත්තකට දාලා ආධ්‍ය අයියගෙ කම්මුලෙන් ලාවට කිස් එකක් තිබ්බා.. ඒ එක්කම වතුර බිබී කුස්සියට ආපු රධ්‍ය අයියා අපි දෙන්නව දැකලා වතුර හිරකරගෙන මැරෙන්න ගියා..

" ඔයාටත් උම්මා එකක් ඕනද.."

රධ්‍ය අයියා ආධ්‍ය අයියා ඉන්න නිසා මම කිව්ව එක ඇහුණෙ නෑ වගේ ගිහින් වතුර වීදුරුව මෙසෙ උඩින් තිබ්බා.. අනේ මෙයාගෙ ලැජ්ජාව..

" පොඩී ඇවිත් ඉල්ලගන්න.. මම හිටියා කියලා මක් වෙනවද.."

" අනේ මේ අයියෙ.."

" ඇයි ඔයා අයියෙ ගාන්නෙ.. හරියට මම උම්මා දෙන්නෑ වගේනෙ කතාකරන්නෙ.."

" ඒකනෙ.. ඔයා එයාටත් දෙනවනෙ නේද.."

රධ්‍ය අයියා මම මොකක් හරි සක්කිලි කතාවක් කියයි වගේ මගේ ළඟ ඉඳන් ඇස් දෙකත් හීනි කරනෙම මගේ දිහා අමුතුවට බලාගෙන හිටියා.. කොහොමත් හම්බුණු දවසෙ ඉඳලා අමුතුවටනෙ මං දියා එයා බලන්නෙ..

" උම්මා විතරක් නෙමෙ කුක්-"

" වරද්!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

රධ්‍ය අයියා මගේ කට අත් දෙකින්ම වහගෙන ආධ්‍ය අයිය එක්ක ලාවට හිනාවුණා.. කියන්න දීපල්ලකො මට.. ඇත්තනෙ කියන්නෙ..

@Shan

" ආ හා.. මම මොකුත් හිතන්නෙ නැතුව ඉන්නම්.. ඇවිත් කෑම කන්න.."

මම රධ්‍ය අයියගෙ අත හයියෙන් හපලා බැම්මෙන් බැස්සහම රධ්‍ය අයියා ආධ්‍ය අයියා යනකල් ඉඳලා මගේ පස්ස කිස් කන්නම පාරක් අත දිගෑරලා දුන්නා.. මට ධූමකේතුත් පෙනුනා ඒකට..

" ආව්.. මොකද තවුසෙ ගහන්නෙ.."

" ගහන්න නෙමේ හම ගහන්න තියෙන්නෙ.."

" ඇයි.. අර කුක්කු දෙනව කිව්ව නිසාද.."

" වරද්!!!!!!!!!!!!"

" ඉතින් ඔයාට බොන්න හොඳනම් කිව්වම මොකද.. ආධ්‍ය අයියා මගේ ෆිට් එක නිසා මම කියනවා.."

රධ්‍ය අයියා මට දෙකක් රවලා වෙන පැත්තක් බලාගත්තා..

" මගේ ඔලුව කකියනවා.."

රධ්‍ය අයියා හැමතිස්සෙම කරන ඔලුව දෙපැත්ත අතගාගන්න එක කල්ලා මූණ හට්ටියක් වගේ කරගත්තා.. මම බැලරිනා වගේ පුලුවන් තරම් කකුල් දෙකේ ඇඟිලි තුඩු වලින් ඉස්සිලා අත් දෙකත් පිටිපස්සට බැඳගෙන හොඳ ළමයා වගේ රධ්‍ය අයියගෙ තොල් වලින් පොඩි පෙක් එකක් තිබ්බා..

" මූණ ඇද කරගෙන හිටියොත් තරු බලන්න එක්ක යනවා හරිත.. මම යනවා.."

මම ආධ්‍ය අයියව හොයාගෙන එද්දි රධ්‍ය අයියා අතරමං වෙච්ච නරක සමනලයෙක් වගේ මගේ දිහා ඇස් දෙකත් ලොකු කරගෙන බලාගෙන හිටියා.. එහෙම තමා, තරු බලන්න එක්කන් යනවා කියල හරි බය කල්ලා තියාගන්න ඕන.. ඒකට එයාට බය හිතෙන්න ඇති නේද..

වෙන්න ඇති.. කමක් නෑ මොකක් හරි..

මමයි රධ්‍ය අයියයි ආධ්‍ය අයියයි රෑට කෑම කෑවා.. එහෙම ඉද්දි තමා රධ්‍ය අයියට ගයනිකා මැඩම් කතාකල්ලා සාගා එකේ සෝලෝ ප'ෆෝම් කරන්න

@Shan

පුලුවන්ද කියලා ඇහුවේ.. රධ්‍ය අයියා ඒකට බලන්නම් කියලා මැඩම් බෑ කියන්න බැරි කමට ෆෝන් එක කට් කල්ලා පැත්තකින් තියලා මූණ ඇදකරගත්තා..

" මට බෑ.."

" බෑ කියන්නෙ.. බලන්නකො ආධ්‍ය අයියෙ.. අනේ යන්න කියන්නකො රධ්‍ය අයියට.. මොකක්ද අනේ.."

" බෑ බෑ යන්න බෑ.. මට ඔච්චගෙ සිංදු කියන්න බෑ.."

" පොඩ්ඩී යන්නකො.. මමත් එනවනෙ බලන්න.."

රධ්‍ය අයියා මූණ ඇද කරගෙන ගෑරුප්පුවෙන් පිගානට ඇන ඇන හිටියා.. යකෝ සාගා එකේ ප'ෆෝම් කරන්න ලැබෙන එකම කොච්චර දෙයක්ද.. ඒකට යන්න බැහැයි කියන්නෙ.. දෙන්න හිතයි පස්ස පුපුරන්න දැන්නම්..

" මට බෑ අයියෙ.."

" ඔයා මට ආදරේ නෑ නේද.."

මම පිඟාන මේසෙ මැද්දට තල්ලු කල්ලා අත් දෙක බැඳගෙන පුටුවට හේත්තු වුණා.. රධ්‍ය අයියා එකපාරටම ඇස් දෙක ලොකු කරගෙන මගේ දිහා බැලුවා..

" මො-මොකක්.."

" ඇයි සාගා යන්නැත්තෙ.."

" ඒකෙයි අරකෙයි තියන සම්බන්ධෙ..???"

" සම්බන්ධයක් තියෙනවා.. මම කොච්චර හෝප්ස් තියාගෙන හිටියද ඔයා සාගා යයි ප'ෆෝම් කරන්න කියලා.."

" මොකක්.. ඔයා කලින් දැනගෙනද හිටියෙ.."

" නැතුව.. ගයනිකා මැඩම් දවසක් මටයි සෙනුකටයි මියුසික් රූම් එකේදි කිව්වා.. ඔයාව දානවා කියලා.."

@Shan

" මට දැන් එහෙම සිංග් කරන්න බෑ වරද්.. ඒ පොඩිකාලෙනෙ.."

" ඇයි දැන් ලොකුද.. බෑ බෑ යන්න අනේ සාගා.."

" බලමු බලමු.."

" බලමු නෙමේ යන්න.. හොඳේ.. මගෙ හොඳ හැපීකච්චා.. මම හෙන අදරෙයිනෙ ඔයාට.. හා නෙ.."

මම පුටුවෙ කකුල් දෙකකින් මේසෙ ඉස්සරහට ඇදිලා ගිහින් රධ්‍ය අයියගෙ කම්මුල් දෙකෙන් ඇදලා බෝස් ගාලා ඉඳපු විදියටම පුටුවෙ කකුල් හතරෙන් වාඩිවුණා..

" ඔයාට මතකද අපි ගිය අවුරුද්දට කලින් එකේ කෝර් එකේ හිටියා.. ඒ සැරේ මරු නේද.."

" ඔව් අර බැක්ස්ටේජ් කරනමක් ගහලා තනි කකුලෙන් සිංදු කිව්වෙ.."

" අනේ යනවා.. එහෙම එකක් වුණේ නෑ.."

ආධ්‍ය අයියා හිනාවෙවී අපි දෙන්නා කතාකරන ඒවා අහගෙන හිටියා.. අපි සාගා එකේ ප'ෆෝම් කල්ලා තියෙනවා අවුරුදු දෙකක්ම.. කෝර් එකේ අපි දෙන්නම හිටියනෙ.. ඔක තියන කාලෙට ඔකෙස්ට්‍රා එකට වෙන වැඩක් කරන්න නෑ.. උදේ ඉඳන් හෙන රෑ වෙනකල්ම ප්‍රැක්ටිස්.. සෙනුකයා දැන් බිසී වෙලා ඉන්නෙත් ඔක නිසා.. කන්ඩක්ට් කරන්නෙ ඒකා නෙ.. හෙන මහන්සි ඇති.. කොච්චර ඉන්නවද අනික.. අපේ ඉස්කෝලෙ ලොකුම ඉවෙන්ට් එකක් සාගා කියන්නෙ.. ඉතින් ඒකට සැහෙන්න මහන්සි වෙන්න ඕනනෙ.. ඊස්ටර්න් මියුසික් උගන්නන සර් රධ්‍ය අයියට එකතුයි.. එයා වෙස්ටර්න් මියුසික් කලාට සිංහල සිංදු තමයි ලස්සනටම කියන්නෙ.. මට සිංහල සිංදු කියාගන්න බෑ.. කැතයි කියද්දි.. ලෙලවන්න බෑ අර විදියට.. ඉංග්ලිශ් ඒවනම් කියන්න පුලුවන්..කියලත් තියනවා හුඟක් තැන්වලදි..

" නැත්තෙ මොකද.. අයියට කියන්න.. මෙකා බැක්ස්ටේජ් එකේ නටන්න ආපු කෙල්ලො වගේකට මොනවද කියන්න ගිහින් වයර් එකකක පැටලිලා එතනම ඇදගෙන වැටුණා.."

" මේ කටවහගන්නවා!!!"

@Shan

" අම්මෝ පස්ස වැදුණා බිම.. ඒකටනම් වරද්.. මටත් කදුලු ආවා.. සොරි ඈ.."

" අනේ ආධ්‍ය අයියෙ මම මූට ගහනවා.."

මම මල් පෝච්චියෙන් මලක් ගලවලා අරගෙන රධ්‍ය අයියගෙ මූණට දමලා ගැහුවා.. ඒ එක්කම ආධ්‍ය අයියා මල් පොච්චිය පිටින්ම අරගෙන එහායින් තිබ්බා..

" ආ ගහගන්නෑ.. රධ්‍ය පාඩුවෙ ඉන්නෙ පොඩී.."

" ඇත්තනෙ කියන්නෙ.. හරි හරි මම ඒක කියන්නෑ.."

රධ්‍ය අයියා ආධ්‍ය අයියට පේන්නැතිවෙන්න මට හිනාවේගෙන කුස්සියට ගියා.. දත් ටික බඩට යවාගන්න තමා ඔය හිනාවෙන්නෙ.. පොල් කාවයියා..

" ආධ්‍ය අයියා දන්නැනෙ රධ්‍ය අයියා දවසක් ඉස්කෝලෙ හාමුදුරුවොන්ගෙන් ගුටි කෑවා.."

" ඒ මොකෝ ඒ.."

" මම ඇස් දෙකෙන්ම දැක්කා.. රධ්‍ය අයියා පන්තිය අතුගාලා නැතුව.. මහ මහ.. කෑදැත්තෙක්.. අම්මපා මම තලනවා ඇට දෙක තවුසෙගෙ දැනගන්නවා!!!!!!!!!!"

මම ගැරුප්පුවෙන් මේසෙට ඇන්න පාර ආධ්‍ය අයියා පුටුවෙ පස්සට ගියා.. සැක්.. මම මොකක්ද ඒ කිව්වෙ.. මිනිහගෙ ඇට දෙක තලලා තරු බලන්න යන්නෙ ආධ්‍ය අයියත් එක්කද උඹ.. ආධ්‍ය අයියා මොනවා හිතුවද දන්නෙ නෑ.. රධ්‍ය අයියා කියනවා වගේ 'ඒව් වරද්!!'. මම ලැජ්ජාවටම නැගිටලා පිඟානත් අරගෙන කුස්සියට වැදුණා..

" මේ වරද්.. ඔය හෙට කීයටද ක්ලබ් එකට යන්නෙ.."

" උදේ දහයට විතර.."

" ආ.. මේ ඔයාගෙ ප'සනල් ට්‍රේන හෙන සැරයි ඈ.. පොඩ්ඩක් සිහියෙන් වැඩ කරනවා.."

" ඒ කිව්වෙ.."

@Shan

" ඒ කිච්චෙ ගිහින් බලාගන්න.. එයාගෙ ගෝලයො දෙන්නෙක්ම නැශනල් ප්ලේ කලා.. ඔයාගෙ ලක් එක.. එයාවම ඔයාට සෙට් වුනේ.."

" එහෙමද.. අනේ මන්දා.. යන්නත් නිකම් මොකක්ද වගේ.. මම කලින් ගිහිල්ලම නැනෙ.."

" මම ඔයාව ඩ්‍රොප් කරන්න එනවනෙ.. එච්චර හිතන්න එපා.."

" ම්ම්.."

රධ්‍ය අයියා ලාවට හිනාවෙලා මගේ ඇස්වලට වැටුණු කොණ්ඩෙ පිටිපස්සට කල්ලා මූණට එබුණා..

" ඔයාට යන්න ඕන පාර මේකයි කියලා පෙන්නන්න විතරයි ඕන.. ඉතුරුටික ඔයා තනියම යන්න දන්නවා.. That's why I love you.."

රධ්‍ය අයියා මගේ කම්මුලකට පොඩි කිස් එකක් දීලා කුස්සියෙන් යන්න ගියා.. මම ඇස් දෙකත් ලොකු කරගෙන එයා යන දිහා බලාගෙනම හිටියා..

" මොකක්ද අනේ ඒ කිච්චෙ..???"

එන්නාම්.. ලව් යූ..

මගෙ ලස්සන ලමයිනේ.. ❤

මෙ සේරම මේකෙ ඉන්නවා කියලා හිතෙනවනෙ හලෝ.. පින්ටරස්ට් එකෙන් ඉස්සුවෙ.. ඔන් ඩ්‍රග්ස් බුලත් කන මාමා 😂

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

@Shan

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 88 කොටස

" Don't think I fit in at this party

Everyone's got so much to say (yeah)

I always feel like I'm nobody, mm

Who wants to fit in anyway?

'Cause I don't care when I'm with my baby, yeah

**All the bad things disappear**

And you're making me feel like maybe I am somebody

I can deal with the bad nights

When I'm with

**my baby**

, yeah

Ooh, ooh, ooh, ooh, ooh, ooh.."

මම කාර් එකේ පැසෙන්ජර් සීට් එකෙන් ඇදිල ගිහින් ඩ්‍රයිවින් සීට් එකේ ඉදගෙන ඉදපු රධ්‍ය අයියගෙ කම්මුලෙන් ඉක්මනට කිස් එකක් තිබ්බා.. එයා මං දිහා නොබලා ඉස්සරහා බලාගෙන ලාවට වගේ හිනාවුණා.. කොහොමත් සම්පූර්නෙන් එච්චර හිනාවෙන්නෙ නැනෙ.. මූණට රිදෙනවනෙ..

මම යන ගමන් හිටියේ බැඩ්මින්ටන් ක්ලබ් එකට.. අද මගේ ට්‍රේනර් මාව මීට් වෙන පළවෙනි දවස.. අද ඉදන් මාස ගානකට මම එයාගෙන් ට්‍රේන් වෙන්න ඕන.. එතකොට රධ්‍ය අයියා ඉස්කෝලෙට යනවා.. ගයනිකා මැඩම්ව හම්බෙන්න.. සාගා එකේ ප්‍රැක්ටිස් වලට..

@Shan

අදනම් මම පොඩ්ඩක් බයෙනුත් වගේ ඉන්නෙ.. මෙ රාධාවනී කිව්වනෙ කෝච් සර් සැරයි කියලා.. මොන වගෙ මරාලයක් ඉදිරි අවුරුදු කීපයට මට සෙට් වෙයිද දන්නෙ නෑ.. කොහොමත් මගේ ජීවිතේ මට වැඩි හරියක්ම සෙට් වුණේ මරාලම තමා..

" Are you excited..?"

" Yay.. a lot.."

මම කාර් එකේ ප්ලේ වෙන ජස්ටින් බීබර්ගෙයි එඩ් ශීරන්ගෙයි අයි ඩෝන්ට් කෙයා එකට පැද්දි පැද්දි හිටියේ..

" ඔයා අද ප්ලේ කල්ලා ඉවරවුණාම මම ඔයාට පීක් පීක් ගාන්නෙ නැති තාරපැටියෙක් ගෙනැත් දෙන්න ඉන්නෙ වරද්.."

ඔය.. ආයෙම පටන් ගත්තා තාර වන්නම නටන්න.. මම කොයි වෙලාවෙද යකෝ තාරාවෙක් ගැන සඳහනක්වත් කලේ.. එදා නාන්න ගියේ නැති එකටද මේ මනුස්සයා මෙච්චර මට අපහාස කරන්නෙ..

" ඇයි දැන් පීක් පීක් ගාන්නෙ නැත්තෙ.."

" ඔයා ඒකට ආස නෑනෙ.. මම සිරාවටමයි කියන්නෙ.. මං ගාව තාරපැටියෙක් ඉන්නවා ගෙදර.."

" අනේ යනවා යන්න.."

" බොරු කියලද දැන් කියන්නෙ.. ඇත්තටම ගත්තා.."

" මොන මගුලක්ද අයියෙ.."

" මගුලක් නෙමෙ ඒ ප්ලූශී එක හරි සොෆ්ට්.. ලයික් යොර් වෙස්ට්.."

රධ්‍ය අයියා මගේ දිහා බලලා පපුව දිහා බලලා කට කොනෙන් හිනාවුනා.. මම පපුව අත් දෙකෙන් වහගත්තා..

" මොනවද කියවන්නෙ.. පිස්සුද.."

@Shan

" පිස්සු නෙමේ.. මගේ අල්මාරිය ඇතුළෙ ඉන්න ඔයා දුන්නු 'මූ මූ' කිව්වෙ.. තාරපැටියෙක් ගෙනැත් දෙන්න කියලා.."

" මලවිකාර.. ඉස්සරහා බලාගෙන හරියට ඩ්‍රයිව් කරනවා.."

" හරියට තමා ඩ්‍රයිව් කරන්නෙ.. Your boyfriend's mood has become very happy today.. One of his hopes is coming true.. ඔයා ක්ලබ් එකට ජොයින් වෙනවා.."

" ඔයා ඒකට එච්චරම සතුටු වෙනවද ඒයි.."

" Of course.."

මම රධ්‍ය අයියා දිහා ලාවට ඇහැ කොනෙන් බලල සීට් එකට හේත්තු වෙලා මගේ සපත්තු දෙක දාගත්තා.. ආදරේ හිතෙන එක වැඩිවේගෙන එනවා වගේ..

" අහන්නකො.."

" ම්ම්.."

" දැන් මෙහෙම හිතන්න හරිද.. නිකමට හිතන්න කියන්නෙ.. හදිසියෙවත් මම ඔයාට කැමති නොවුණානම් එහෙම.. එතකොට.."

" එතකොට ඉතින්.. ඉන්නවා.. මොනව වෙන්නද.."

" නෑ අනේ මම කියන්නෙ ඔයාට දැනෙන විදිය.."

" උඹව කෑලි වලට කපලා සූට් කේස් එකක දාලා මූදට අතාරිනවා.."

රධ්‍ය අයියා කිව්ව විදියට මගේ ඇඟේ හිරිඅඩුත් පිපුණා.. මේ දාම ඝාතකයා එක්කද මම ජීවිත කාලෙම ආදරෙන් බැඳිලා ඉන්න යන්නෙ.. මරු වරද් පුතේ.. අවයව ජාවාරම්කාරයෙක්ද කොහෙද මේකා..

" අපෝ අනේ.. ඇඟත් හිරිවැටුණා.."

" නිකම් කිව්වෙ බං.. එහෙම වුණානම් මම තාම ඩයරි එක ලියනවා.."

@Shan

" ඇයි දැන් ලියන්නැත්තෙ.."

" ඩයරි ලියන්නෙ පාලු හිතුණහම.. දැන් මට පාළුවක් හිතෙන්නවත් වෙලාවක් තියද කියපන්කො.."

" නැනෙ නේද.. ඇත්තටම මටත් හුහ කාලෙකින් පාලු හිතිලා නැනෙ.. මාරයි ඒකනම්.."

" ම්ම්.."

" අහන්නකො.. ඔයාගෙ ඩේ'ස් විට් එකේ අද මොනවද කියලා තිබ්බෙ.. ඔයා එකක් අරගෙන කියෙව්වද.."

" ඔව්.. මෙ වරද් වරද්.. ඇත්තටම ඒක ඔයා ආදරේට දුන්නු එකක්ද මාව බය කරන්න දීපු එකක්ද කියලා මට හිතාගන්න බෑ.."

" ඇයි අනේ.. ආදරේටනෙ ලිව්වෙ.. මම අවුරුද්දක් තිස්සෙම ලියපු විට් ගොඩ.. මොකක්ද කියන්නකො මම මගේ හැපිකව්වට ලියලා තිබ්බෙ.."

" ඔයාගෙ ඇස් දෙක දැක්කහම මට ආදරේ හිතෙනවා.. ඒවා දිලිසෙද්දි-"

" ආ..හහ්.. ඇති මම දන්නවා.. ඉතින් ඒකෙ මොකක්ද බයවෙන්න හිතෙන දේ.."

මට මමම ලියපු ඒවා ගැන ලැජ්ජ හිතිලා කතාව වෙනපැත්තකට හැරෙව්වා..

" ඔයා ඒකෙ එහාපැත්තෙ පැන්සලෙන් ලියලා තිබ්බා චමිරු දිහා බැලුවොත් බටර් නයිෆ් එකකින් මගේ ඇස් දෙක උගුල්ලලා දානවා කියලා.."

" අහ්.."

මම හෙන ගොං හිනාවක් දාලා පාර දිහා බලාගත්තා.. සැක් එහෙනම් ඒක ලියන්නැත්තෙ පාට පාට පරෙයි සීසන් එකේ තමා.. ඉරිසියාවටනෙ එහෙම ලිව්වෙ.. අර ලියලා තිබ්බෙ ඉස් දෙයා සම්තින්ග් රෝන්ග් විත් මී.. අයි වුඩ් ගිව් යූ මයි ඇස් බ්ලා බ්ලා හැල්ලක්.. ඒ වුණාට වරද්.. උබට එදා හිතුණෙ නැනෙ මෙකා එක්ක යාලුවුනාම ඒවා කියවනවා කියලා.. ඇට දෙක තලනවා කියලම කී පාරක් ලියලා ඇත්ද පැන්සලෙන්.. ඒ දවස්වල මම

@Shan

සැරටම ලව් සික් එකෙන්ද කොහෙද ඉඳලා තියෙන්නෙ.. එච්චර පෙන්නුවෙ නැතිවුණාට..

ඩේ'ස් චිට් කියන්නෙ.. මම ඔක දුන්නෙ රධා අයියගෙ බර්ත් ඩේ එකට.. ලොකු ග්ලාස් Jar එකක් අරගෙන මම ඒකෙ පොඩි පොඩි මැසේජස් ලියලා ඒවා කොටුවට නමලා මගේ අල්මාරියෙ එකතු කලා.. මාස අටක් විතර එකතු කලා.. ඒ කාලෙ රට පාඩම් කර කර ඉඳලා කම්මැලි හිතුණහම මම ඒ4 එකක් තියගෙන හිටියා තනිරුල් ඉරි ගහලා පොත් මේසෙ මෙස රෙද්ද අස්සෙ.. ඔය කාලෙම තමා හිතුනෙ රධා අයියගෙ බර්ත්ඩේ එක එක නිසා මොකක් හරි ස්පෙශල් දෙයක් දෙන්න.. මතක හිටින දෙයක්.. කොමන් නැති එයාට ස්පෙශල් විදියට හිතෙන දෙයක්..

ඉතින් මම ග්ලාස් ජාර් එකක් අරගෙන පොඩි පොඩි චිට් වල එක එක හිතට එන වල්බූත මැසේජස් ලියලා ඒවා ඉරලා කොටුවට නමලා අර ජාර් එක ඇතුළේ එකතු කලා.. මාස අටක් තිස්සෙම එකතු කරපුවා ඒකෙ තිබ්බෙ.. කම්මැලි හිතුණහම ලියපුවා නෙ.. ගොඩක් චිට් මම එකතු කල්ලා තිබ්බා.. අම්මට අහුවුණානම් ඉවරයි තමා..

කොහොම හරි එහෙම දිව්හිමියෙන් පරිස්සම කල්ලා චිට් දාහක් විතරම දාපු ජාර් එකේ ලී මූඩිය වටේ නිල් පාට පේපර් රිබන් එකක් ගැටගහලා පොතක් අස්සෙ වේලලා තිබ්බ ඉස්කෝලෙ සේපාලිකා මල් දෙකතුනකුත් දාලා 'මූ මූ' කියලා මමම නම දාපු හැපීකච්චෙක් ඉන්න ජ්ලූශි එකක් එක්ක මම ඒක ගිෆ්ට් එකක් විදියට එයාගෙ අල්මාරියෙන් තිබ්බා.. දැන් එයා ඩේ'ස් චිට් කිය කිය හැමදාම එක ගානෙ ඒකෙන් අරගෙන කියවනවා.. මම දැක්කා ඒකෙන් එකක් දෙකක් ෆොටෝ ගහලා බ්ලැක් ඇන්ඩ් වයිට් කල්ලා ඉන්ස්ටර් අප්ලෝඩ් කල්ලා තියෙනවා..

" පැන්සලෙන් ලියලා තියන ඒවා කියවන්න එපා.. ආයෙම.."

" ඒ මොකද.."

" එපා හින්දා කියන්නෙ.. මට දැන් මතකත් නෑ මම මොනවද ලිව්වෙ කියලා.."

අපි හිටියේ ක්ලබ් එකේ පාකින් ලොට් එකේ.. මම කාර් එකෙන් බැහැලා ගිහින් පිටිපස්සෙ තිබුණු රැකට් එකයි ස්පෝර්ට්ස් බෑග් එකයි කරේ දාගත්තා.. රධා අයියත් බැහැලා කාර් එක වටෙන් මගේ පැත්තට ආවා..

@Shan

" ඔයා එනවද.."

" ඔව්.. ඉවරවුණාම මට කෝල් එකක් දෙන්න.. හරිද.."

" නෑ මම ඉස්කෝලෙට එන්නම්.. සෙනුකයවත් හම්බෙන්න ඕන.. හුඟ දවසකින් හම්බුනෙත් නෑනෙ.."

" ශුවර් ද..??"

" ඔව් ඔව් මම ඉස්කෝලෙට එන්නම්.. ඔයා ප්‍රැක්ටිස් කරන්න හොඳට.."

" ම්ම්.."

රධ්‍ය අයියා මගේ කොණ්ඩෙ අවුස්සලා ආයෙම ඒක හරියට ඇස් දෙකට වැටෙන්න හැදුවා..

" ආදරෙයි.."

මම ඉක්මනට කවුරුත් එන්න කලින් ඉස්සිලා රධ්‍ය අයියගෙ කම්මුලෙන් හාද්දක් තිබ්බා.. එයා ඉතින් හැමතිස්සෙම මට ආදරෙයි කියන්නෙ නෑනෙ.. ඉඳලා හිටලා කිව්වහම හුගාක් සතුටු හිතෙනවා..

ක්ලබ් එකට ආවට පස්සෙ තමා මට තේරුණේ මේක කොහොම තැනක්ද කියලා.. මම කලින්, ඉස්කෝලෙ කෝච්ගෙ ක්ලබ් එකේ ප්ලේ කරන්න ගිහින් තිබුණාම මම හිතුවෙ ඒක තමයි තියන ලොකුම ලස්සනම ක්ලබ් එක කියලා.. ඒත් දැන් මෙතනට ආවහම මගේ අදහස සම්පූර්ණෙන්ම වෙනස් වෙලා ගියා.. මම හිතන්නෙ මේක තමයි ලොකුම එක..

මාව එතනට එච්චර හුරු නැති නිසා ක්ලබ් එකේ පහළම ෆ්ලෝ එකේ ඉඳපු කෙල්ලො වගයක් මගේ දිහාම බලාගෙන ඉඳලා මාත් එක්ක ලාවට හිනාවුණා.. මාත් හිනාවේගෙනම ගියා.. ඒ වුණාට හිතට බයයි වගේ.. මම මෙතෙන්ට අලුත් කෙනෙක් කියලා ඒ හැඟීම හැම තප්පරේම හිතට දැනෙනවා.. ඒක අමුතුයි වගේ..

" Relax Varadh.."

" මට මෙතන පුරුදු නෑ වගේනෙ.. ඔයා කොහෙටද මාව මේ උස්සන් ආවෙ.."

@Shan

රධ්‍ය අයියා හිනාවෙගෙන ඔෆිස් රූම් එකක් ඇතුළට ගියා.. මමත් ඒ පස්සෙන්ම ඇදිලා ඇතුළට ගියා..

ඒ ක්ලබ් එකේ මැනේජර් ටිකක් මැදි වයසේ හොඳ පිරිමි කෙනෙක්.. කඩඩෙන් විතරයි කතාකරන්නෙත්.. ඒත් අර ආධ්‍ය අයියගෙ හොඳම යාලුවගෙ කන්ටැක් එකක් තිබුන නිසා මාව ආපුගමන්ම හග් එකකුත් දීලා පිළිගත්තා.. හුගක් වෙලා එක එක දේවල් ගැන කතාකලා.. ඊටපස්සෙ කන්ට්‍රැක් එකකුත් සයින් කරන්න වුණා.. මොකද එයාලා මට පේ කරලනෙ මාව එතන ප්ලේ කරන්න ගන්නෙ.. නැතුව මම පේ කල්ලා එතනට ප්ලේ කරන්න යන්නෙ නැහැනෙ..

ඔෆිස් රූම් එකේ පැය බාගයක් විතර ඉඳලා මැනේජර් මට එන්න කියලා මාව ප්ලේ රූම් එකට එක්කගෙන ගියා.. රධ්‍ය අයියා පරිස්සමට එන්න කියලා මගේ පිටටත් තට්ටුවක් දාලා ඉස්කෝලෙට යන්න ගියා.. මම බැඩ්මින්ටන් රැකට් එක දාපු බෑග් එකයි ස්පෝර්ට්ස් බෑග් එකයි කරේ දාගෙන හෙන ලැජ්ජාවෙන් වගේ මැනේජර් පස්සෙන් ගියේ.. හැම කෙනෙක්ම වගේ මම අලුත් නිසා මම දිහා බලන්නෙ අමුතු විදියට.. ඒක හරිම අන්කම්ෆටබල් විදියට මට දැනෙනවා..

" Coach already knows about you.. then all the best Shaneru.."

" K.. Thank you.."

මම දෙයියනේ කියලා ප්ලේරූම් එකේ දොර ඇරගෙන ඒකෙ ඇතුළට යද්දිම.. එකපාරටම.. මාව ගිහින් කළුගලක හැප්පුණා වගේ ඉස්සරහා හිටපු යෝධයගෙ පපුවෙ මගේ මූණ වද්දගත්තා..

" ආව්.."

මම නළලට අත තියාගෙන ආපහුම පිටිපස්සට බම්ප් වෙලා ගිහින් දොරේ වැදුණා.. බොහොම ප්‍රබෝධමත් ආරම්භයක්.. කවුද යකෝ දොර ගාව හිටගෙන ඉන්න පතාක යෝධයා.. මගේ නහයත් චප්ප වෙලා ගියාද කොහෙද.. මම නළලට අත තියාගෙන එහෙමම උඩ බැලුවා..

" හික්.."

කවුද අඩෙ මේ..

@Shan

මම බයටම තව ටිකක් ගිහින් දොරටම ඇලුණා.. දුටුගැමුණුගෙ සේනාවෙන් පැනලා ආපු යෝධයෙක් නේද යකෝව් මට ප'සනල් ට්‍රේනර් කෙනෙක් විදියට දීලා තියෙන්නෙ.. රධ්‍ය අයියේ මාව එක්කගෙන පලය~න්..

" It's already fifteen minutes late.. Don't even think about being this late again.."

අර උසම උස දඬාර මනුස්සයා මගේ මූණට එබිලා මට තර්ජනය කල්ලා පුටුවකින් ඉඳගත්තා.. කෝච් හෙන වයසයි.. කොන්ඩෙත් සුදුවෙලා.. ඒ වුණාට තියෙන්නෙ අර වයස ගියාට තරුණ ලුක් එකක් තියන කෙනෙක්ගෙ වගේ පෙනුමක්..මම හිමින් හිමින් බෑග් එක අත් දෙකින්ම අල්ලගෙන කෝච් ඉස්සරහින් හිටගත්තා.. කෝච් මගේ පාදාන්තයේ ඉඳලා ඔලුවෙ අන්තිම කෙස් ගහ වෙනකල් එකපාරක් හොඳට ස්කෑන් කලා..

" මොකක්ද නම.. මම අහන්නෙ සම්පූර්ණනම.."

" වරද් ෂනෙරු උද්යෝග.."

" ම්ම්.. දහ නමයයි.. එහෙමද.."

" ඔව්.."

මම නහය පොඩ්ඩක් අතින් හදාගත්තා.. ඒක පැත්තට ඇද වුණාද කොහෙද වැදුණු පාර..  කෝච් මගේ ඩීටේල්ස් තියන ෆයිල් එක පිටුවෙන් පිටුව පෙරළලා බලලා ඒක පැත්තකට තිබ්බා.. තියලා නැගිට්ටා..

" කොහොමද ඔයාගෙ හිස්ට්‍රි එක.. බැඩ්මින්ටන් වලට තියන.."

කෝච් මගේ වටේ වටයක් කැරකුණා.. ෆිල්ම් එකකට රඟපානවා කියලා හිතුවද දන්නෙනෑ..

" ග්‍රේඩ් සික්ස් වල ඉඳලා ප්ලේ කල්ලා තියනවා.. ඕල් අයිලන්ඩ් චැම්පියන්ශිප්ස් තුනක් තියනවා.. ස්කූල් බැඩ්මින්ටන් ක්ලබ් එකේ කැප්ටන් වෙලා ඉඳලා තියනවා.. ඒ ඇරෙන්න ස්කූල් කලර්ස් නයිට් එකේ බෙස්ට් ප්ලෙයර් ඔෆ් ද ඉයර් වෙලා තියනවා.."

@Shan

" මම.. ගුඩ්.. ඒ වුණාට ඔවර් කන්ෆිඩන්ට් පිට ඉන්න ඕන නෑ.. ඔය ඉස්කෝලෙම දැනට අවුරුදු තිහකට විතර කලින් මමත් බෙස්ට් ප්ලෙයර් ඔෆ් ද ඉයර් වෙලා ඉඳලා තියනවා.."

අප්පදබොල ඩයල් එක ඕල් බෝයි කෙනෙක්ද.. ගැම්මක් තමා.. ඒකෙන් නම් හිතට පොඩි කික් එකක් ආවා.. මම සර් දිහා බලලා හරිම ලස්සනට හිනාවුණාම සර් මං දිහා රවලා බැලුවා..

" මාත් එක්ක වැඩකරද්දි නැළවෙන්න වැනෙන්න බෑ.. තේරුණානෙ.. හරියට තිතට වෙලාවට වැඩේ සිද්ද්ධ වෙන්න ඕන.."

" ඔව් සර්.."

ඊටපස්සෙ කෝච් තව මොනවද බන වගයක් දෙසලා දෙසලා එයා කොච්චර සැරද කියන එකත් මට කියලා දීලා පළවෙනි දවස නිසා එක්සසයිසස් කරන්න පටන් ගත්තා.. මම මුල්ලින් හිතුවෙ මේකත් අර ඉස්කෝලෙ කරනවා වගේ හෙන ලේසියි ඉක්මනට කල්ලා දාන්න පුලුවන් කියලා වුණත්.. කියන්න දුකයි..

වරද්ට වැරදුණා..

මෙ කෝච් කාරයා මාව මරාගෙන කන්න පටන් ගත්තා.. මම චේන්ජ් කරගෙන ඇවිත් වෝම් අප් කරන ටිකටම රකට් එකේ මිටෙන් මම තුන්පාරක්ම කෑවා හොඳ පාරවල් ටිකක්..

" මොකක්ද නම.. සරනේරු නේද.. ඔහොම නැළවිලා බෑ.. මම පලපු ගවුමක් ගෙනැත් දෙන්නම් මොඩලින් පැජන්ට් එකකට යන්න.."

මම එකතැන දුවන එක නතරකල්ලා එහෙමම නැවතිලා සර් දිහා ඉසකුඩිච්චි මූණක් හදාගෙන බැලුවා.. ඕල් බෝයි නෙමෙ කවුරු වුණත් එහෙම අයිතියක් නෑ මගේ ශ්‍රී නාමය කෙලෙසන්න.. කෝච් කාරයා මට කියලා ඇට 2ක තලාගන්න තමා ලෑස්තිවෙන්නෙ..

" සර්.. ඉට්ස් ෂනෙරු. සරනේරු නෙමෙයි.."

" වටෙවර්.. මම කතාකරන්නෙ මට මතක විදියට.. හරි අප්.. හරි අප්.. වෙලාව නාස්ති කරන්න එපා.."

@Shan

මම සර්ට රවාගෙන ආයෙම දුවන්න පටන්ගත්තම ඒ එක්කම පිට මැද්දට හොඳ පාරක් වැදුණා රැකට් එකෙන්..

" දැන් ඔය මැටි පැගුවා ඇති.. ලැජ්ජයි අයිසෙ මෙවා දැක්කහම.. මෙක හරියන්නෙ නෑ.. මම ජිම් එකේ ඉන්ට්‍රක්ටර් මීට් වෙන්න ගියානම් හරි.."

" ඒ මොකටද.."

මම එකපාරම සර්ගෙ පැත්තට හැරුණා.. මොන මගුලක්ද.. ජිම් යන්න.. මෙ මම??

" ඒ මොකටද..?? ඔහොම ඇඟවල් තියාගෙන ප්ලෙයර්ස්ලා වෙන්න බෑ.. ඇඟ හදාගන්න ඕන මුලින්ම.."

" අනේ~"

මට පුරුද්දටම අර අනේ එක කියවුණා.. සර් මං දිහා කන්න වගේ බැලුවා..

" මොකක්ද කිව්වෙ.."

" අ-ආ.. මොකුත් නෑ.. මම අන්න කියලා කිව්වෙ.."

" ගන්නවා මෙ රැකට් එක.. අරගෙන අත් දෙක හොඳට දිගෑරලා ඔලුවට උඩින් අල්ලගන්නවා.. අත් දෙක කෙලින් කෙලින්.. හරි කෙලින්.. පපුව ඉස්සරහට.. කොන්දෙන් නමන්න එපා.. කෝ කෝ.. ආ දැන් මෙ කකුල අනූවට නමන්න ඕන.. අනූව අනූව අයිසෙ.. ඔය මොකක්ද.. හතළිස් පහනෙ.. බයෝ නේද කලා කිව්වෙ.. පිසික්ස් වලට පන්ති ගියේ නැද්ද.. ආ අන්න එහෙම.. අනිත් කකුල එකසිය අසූවටම කෙලින් කරගන්නවා.. අන්න රයිට් රයිට්.. කොන්ද කෙලින් ඕන.."

මම මූණත් රතු කරගෙන ඉහින් කනින් දාඩිය වක්කරගෙන සර් ඉන්න කිව්ව පොසිශන් එකට ඉඳලා තප්පර තිහක් යන්න වුනේ නෑ දබෝස් ගාලා පොළොවට ඇදගෙන වැටුණා.. ඉතින් හුග කාලෙකින් ප්‍රැක්ටිස් කලේ නැනෙ.. මොන මගුලක්ද.. කෝච් කාරලා මල පැනලා විසිල් කරගෙනම මගේ ගාවට ආවා..

@Shan

" ඔය සරනේරුවට තෙල් ටිකක් වක්කරගන්නවා.. හරි අප් හරි අප් නැගිටින්න.."

මම ආයෙම නැගිටලා රකට් එකොලුවට උඩින් උස්සගෙන හිටියා.. හන්දිපත් රුදාව වගේ අම්මෙ.. ආඩ්‍ය අයියට කියලා මෙලොක්සිකැම් එකක්වත් ඉල්ලන් බොනවා.. රඩ්‍ය අයියේ මාව එක්කගෙන පලයන්කෝ.. මාව මේ කොහේටද ගෙනැල්ලා අතෑරියේ..

" අනිත් දවසේ කොණ්ඩෙ මූණට වැටෙන්න බෑ.. බැන්ඩනා එකක් දාලා පස්සට හදාගෙන එන්න ඕන.. තේරුණානෙ.."

" ඔහ්-ඔව් සර්.."

" මොකද තටමන්නෙ.."

" නෑ නෑ.."

මම ආයෙම කොන්ද කෙලින් කරගෙන කොරවක්කා වගේ එක කකුලක් අනූවට නමාගෙන හිටියා.. කෝච්කාරයා නටන්න එන්නෙපා වරද්ට මල පනිනවා.. මම ඔයිට වඩා මිනිස්සුත් මෙච්චා කල්ලා තියෙනවා.. ඇයි යකෝ.. ඒ අස්සෙ මට රඩ්‍ය අයියගෙ අප්පච්චිවත් මතක් වෙලා මල පැන්නා..

" කකුල් මාරු කරන්න.."

මම කකුල් දෙක මාරු කල්ලා රකට් එක ඔලුවට උඩින් උස්සන් හිටියා.. අත් දෙකත් කකියනවා ඉන්න බෑ.. වතුර ටිකක්වත් බොන්න දෙන්නෙ නෑ මේ මනුස්සයා.. මම් අකොහොම හරි කාගෙන එහෙම විනාඩි දහයක්ම ඉදියට පස්සෙ සර් ස්කිපින් රෝප් එකක් ගෙනැත් මට විසික් කලා..

" නෙක්ස්ට් ස්ටෙප් එකට හැමතිස්සෙම රෙඩි වෙලා ඉන්න ඕන.. මෙතන රෙස්ට් කරන්න වතුර බොන්න ටොයිලට් යන්න, ඒවට වෙලාවක් නෑ.."

මම ස්කිපින් රෝප් එක අතට අරගෙන ඒක එකපාරක් ගසලා දිගෑරගත්තා.. හරි කතාවක් තමයි කියන්නෙ.. මම දැන් රකට් එකෙන් සර්ගෙ ඔලුවට දීලා බයෝ උගන්නනන්න ගන්නවා.. මනුස්සයො කොහොමද බහිස්‍රාවය කරන්නැතුව ජීවත් වෙන්නෙ.. එතකොට පෝෂනය වෙන්න ඕන නැද්ද..

@Shan

අපේ ඉස්කෝලෙ කියන්නත් ලැජ්ජයි.. ඉස්කෝලෙටත් ලැජ්ජකරනවා වෙළුසුමන කෝච්කාරයා..

" හරි පටන්ගන්න.."

" ඔහොම නෙමෙ ස්මූත්ලි කරගෙන යන්න ඕන.."

" අන්න රයිට්.."

" ඇඟ තමන්ට හසුරවන්න පහසු විදියකට එනකල්ම දිගටම කරන්න ඕන.. රයිට් රයිට්.. ඇටිස් ඉට්.."

කෝච් සර් ක්ලැප් කර කර මගේ වටේ කැරකෙන්න ගත්තා.. මට විතරක් උගන්නද්දි හෙන අවුල් අවුල් වගේ.. ඇයි ඉතින් හොර කරන්නවත් බැනෙ..

ඔහොම ඔහොම සර් මාව පැය තුනක් එක්සසයිය්සස් විතරක්ම කෙරෙව්වා.. ඒ අස්සෙ මගේ නමත් කෙලසනවා.. සරනේරුවක් ගගා.. මගේ නම ෂනෙරු කියලා මම දහපාරක් විතර කිව්වත් මේ වෙළුසුමන ඒක වැරදියටමයි කියන්නෙ.. අනික හති දැම්මහමත් ඒකටත් බනිනවා..

" ලස්සන වුණාට මදි ඒ වගේම වැඩත් ලස්සන වෙන්න ඕන.. තේරුණාද.. සරනේරු..???"

මම සර්ට නැතුව කණ්නාඩියට රවාගෙන නැමිලා සපත්තුවෙ ලේස් එක ගැටගහගත්තා..

" සතියට දවස් තුනක් ප්‍රැක්ටිස්.. තුනම හරි වෙලාවට මෙතනට එන්න ඕන.. තේරුණාද.."

" ඔව් සර්.."

" මෙහේ කැන්ටින් වල අරහෙ මෙහේ ඉන්න උන් එක්ක කුටු කුටු තියාගන්න බෑ.. මාත් එක්ක වැඩ කරනවනම් මේ රූම් එකෙන් එළියට යන්න බෑ.. මට පේන්නම බැරි දේ ඕපදූප.. වෙලාව නාස්ති කිරිල්ල.."

මම ෆේස් ටවල් එකකින් මූණ පිහිදාගෙන සර් ගාවට ගියා..

@Shan

" ක්ලබ් එකේ තර්ඩ් ෆ්ලෝ එකේ ජිම් ඉන්ස්ට්‍රක්ටර් ඉන්නවා.. වෙන්ස්ඩේ එයිට් තර්ටි වෙද්දි ඔයා ජිම් එකේ ඉන්න ඕන.. ඉන්ස්ට්‍රක්ටර් ළහිරු.. කියන්න මගේ ට්‍රේනර් කෙනෙක් කියලා.. තේරුණාද.."

" ඔව් සර්.."

" මම.. අනිද්දා වෙලාවට එන්න ඕන.."

" ඕකේ සර්.. ගුඩ් බායි.."

මම චේන්ජ් කරගෙන ස්කුල් ටී එකක් දාගෙන බෑග් අරවා මේවා අරගෙන ලිෆ්ට් තියන පැත්තට ගියා.. පඩිපෙල් බහින්න බෑ මගේ හන්දි ඔක්කොම තලලා කඩලා දාලා වගේ රිදෙනවා.. අනේ දෙයියනේ මම මැරෙයිද දන්නෙ නෑ.. මම ලිෆ්ට් එක පැත්තටයද්දි කෝච් කැප් එකක් දාගෙන මගේ දිහාට ඇවිදගෙන ආවා..

" සරනේරු.. හේයි.. stairs.. stairs.."

කෝච් මට පඩිපෙළ අතින් පෙන්නුවා.. පෙන්නලා එයත් පඩිපෙළ ගාවට ගියා..

" ආයෙම මෙහේ ලිෆ්ට් යූස් කරන්න බෑ.. ලේසියට තියන හැමදේම ඉක්මනට ඇඟ ලෙඩ කරවනවා.."

කියාගෙන සර් පඩිපෙළ බැහැගෙන පල්ලෙහාට බැස්සා.. සර්නම් කියයි.. වෙඑසුමනයා.. මම එපැයි බහින්න.. මම එතන වැටට කකුලෙන් ගහලා ඒ පාරෙ සැරට ඇඟිල්ලකුත් චප්ප කරගෙන තනි කකුලෙන් පැන පැන ගිහින් කොහොමහරි අන්තිම ෆ්ලෝ එකට ආවා.. ඒකෙ ටේබල් ටෙනිස් ගහන කෙල්ලො වගයක් ඉඳලා මගේ දිහා හෙන මනමාල බැල්මක් දාගෙන දුවගෙන ගියා.. බේසික කෙල්ලො.. දැන් මට මොකා දැක්කත් කේන්තී.. ආවා මෙතන බලන්න..

මම ටැක්සි එකකට අතදාලා ඒකෙ නැගලා එහෙමම ඉස්කෝලෙට ගියා.. බඩගිනියිත් එක්කන් හෙනට.. අර මනුස්සයා මට වතුර උගුරක්වත් බොන්නවත් දුන්නෙ නෑ.. ගෑනුලමිස්සි කිය කිය අපහාස කරනවනෙ.. පලපු ගවුමකුත් ඕනද ඇහුවා.. පලපු ගවුම් මම ඉතින් කියන්නෙ නෑ.. අහෝ මගේ අනාගත කාලය..

@Shan

මම ඉස්කෝලෙ ඇවිල්ලා මියුසික් රූම් එක දිහාට ඇවිදගෙන ගියා.. ලබන සතියෙ ඉස්කෝලෙත් පටන්ගන්නවා.. නිවාඩුව ඉවරයිනෙ.. අපේ බැජ් සෙරමනි එකකුත් එනවා.. වැඩ තොගයයි.. සේරම කරන්නත් ඕන.. මගේ ඔලුව විකාර වෙනවා මේවා හිතද්දි.. මම මියුසික් රූම් එක පැත්තට එද්දි එළියේ කට්ටිය ගිටාර් අරවා මේවා තියාගෙන කියව කියව ඉන්නවා.. බ්‍රේක් එකක් දීලද දන්නෙ නෑ.. මේ තියෙන්නෙ ඔකෙස්ට්‍රා එකනෙ.. කෝර් එක කොහෙද දන්නෙ නෑ.. මේ පාර මම ඒකෙ නෑනෙ.. වැඩ වැඩියි කියලා මම ගයනිකා මැඩම්ට කියලා අයින් වුණා.. රධ්‍ය අයියා රීස්ටර්න් මියුසික් රූම් එකේ ඇත්තෙ..

මම ඒ පැත්තට යද්දි සෙනුකයා මියුසික් රූම් එකේ එළියෙ අර කන්ඩක්ටින් කරන කළුපාට කූරත් අත අස්සෙ ගහගෙන කියව කියව ඉඳලා මාව දැක්කා විතරයි කූර එතන ඉඳපු එකෙක්ගෙ අතට දීලා කෙලගෙන මගේ පැත්තට දුවගෙන ආවා.. එනපොට හොඳ නෑ වගේ.. මම හැරිලා දුවන්නත් හදලා ආයෙම ඉන්න තැනම නැවතිලා මේ චණ්ඩ මාරුතයට මූණ දෙන්න හිතාගත්තා.. සෙනුකයා අත් දෙකත් දෙපැත්තට කරගෙන ඇවිත් එකපාරම..

" බේසික ප#යා.. උඹට මාව දැන්ද හු#තො මතක් වෙන්නෙ.. මම උඹව කනවා අදනම් ෂනෙරු ගස් බල්ලා..!!!"

මම රැකට එකයි බෑග් එකයි සේරම තණකොළ ගොඩේ අතෑරලා අනිත් පැත්තට දුවන්න හැදුවා විතරයි..

" ටහුක්.. සෙනුකයා.. බල්ලො.. මගේ කොන්ද..
අම්මාහ්!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

#සිද්ධාලේපටිකක්ගාමුත

#අයඩෙක්සික්මන්සහනයට

සෑ වෙලා එන්නම් දළඹු පැටික්කනේ.. මම ඔයාලට ආදරේම ආදරෙයි.. අපිට වහින්න එමනෙ..

එන්නාම.. ලව් යූ.. ❤

@Shan

බෝයිපෙන්ගෝල්ස් 😂

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 89 කොටස

" උඹ.. ගස් බල්ලා.. මට කතාකලාද.. ආ.. කියපන්.. කතාකලාවත්ද.. ප#යා.. මම උඹව කනවාහ්!!!!!!!!.."

" ආව්.. බං.. එහාට පලයන්කො.. උඹට මහසෝනා ගැහුවද.. අනේ.. මෙ මල්ලි මූව අහකට කරහන් හීනාවෙන්නෙ නැතුව.. අම්මෝ බෙල්ල බෙල්ල කැහ්.. කැහ් බල්ලො.."

සෙනුකයා මාව තණකොළ බිස්සෙ පෙරළගෙන බෙල්ලෙන් අල්ලගෙන හොලවගෙන හොලවගෙන ගිහින් හැපුවා අතේ මැණික් කටුව ගාවින්.. හදේ ආවාට වල ඉන්න හාවො පේන්නම.. අපි දෙන්නා දෙවෙනි වතාවටත් අසහනකාර ගැරඬි දෙන්නෙක් සංසර්ගෙ යෙදෙනවා වගේ ඉස්කෝලෙ තණකොළ බිස්සෙ පෙරළීගෙන ඉන්නවා.. ඒ කියන්නෙ මූටයි මටයි සිරාම අසහනේ හැදුනු ගැරඬි දෙන්නෙක් කියලා ඉස්කෝලෙට ඔප්පු කරන ගමන්.. මෙ පගයට වැටහෙන්නෙ නැද්ද ඉස්කෝලෙ හෙඩ් ප්‍රිෆෙක්ට්, ඩිට්‍යුටි ගේම්ස් කැපා වෙන්න ඉන්නෙ ඌයි මමයි කියලා.. බේසිකයා.. පොඩි උන් ඉස්සරහා කාඩ් කුඩු කරගන්නවා.. මොකක් වුණත් අයුක අයියයි රඩා අයියයි නම්බුව රැකගෙන හිටපු පට්ටම් දෙක.. අපි දෙන්නා අතින් ලෙප්ට් වෙලා යයි වගේ.. සීනියර්ස්ලගෙ වැරදි කියලා උන් සේරම බැනුම් අහනවා මට ඒ අස්සෙ මැව්ලා පෙනුනා..

මෙ පව්කාරයට සමාවෙන්න සුදුඅම්මියෝ..!!

මම සෙනුකයව අල්ලලා එහාට කල්ලා තනකොළ ගොඩේම එරමිණියා ගොතාගෙන වාඩිවුනා.. බැග් ටිකත් කැලේ..

" අම්මෝ බං.. කොන්දෙ පොට ගියා.."

" පොට..!! පොට නෙමෙ පකයගෙ යන්න තිබ්බෙ.. උඹට මාව අමතක වෙලා ඒකයි.. මම දන්නවනෙ.."

" එහෙම එකක් නෙමෙ බං.. ඉතින් උඹලත් සැහෙන්න බිසී නෙ.."

" අනේ පලයන්.. තුක් තුක්.."

@Shan

සෙනුකයා උගේ කටෙ තිබ්බ තණකොළ ටික තුහ් ගාලා එලියට දාලා කට පිහිදගත්තා.. අපරාදෙනෙ මා පුතාට කන්න නෙ තිබ්බෙ..

" කෝ අනේ කියාන් අයියගෙ සුදුදෝණියා.. නැද්ද මෙහේ.."

" සුදුදෝණියා උඩ දමාගෙන මැච් එක බලනවා.. මට සුදුඅම්මියා එක්ක එන්න කිව්වා.."

" අඩෝ.. හා හා.. කොහොමද සාගා එකේ වැඩ එහෙම.."

" අපෝ බං.. කතාකරන්න එපා.."

සෙනුකයත් තණකොල බිස්සෙ මගේ ඉස්සරහින් එරමිණියා ගොතාගෙන ඉදගත්තා..

" උඹට කියන්න.. සමහරු මගදි කියන්නෙ එදාට එන්න වෙන්නෙ නැහැල්ලු.. කොස්ට්යුම්ස් වලත් අඩුපාඩු ගොඩක් තියනවා බං.. ගයනිකා මැඩම්ට දැන් ඒවා කරන්න අමාරුනෙ.. හැම එකම මගෙයි අර මල්ලිලාගෙයි කරේ පැටවිලා.. එපාවෙලා ඉන්නෙ.."

" අම්මටසිරි.. ගයනිකා මැඩම් ප්‍රෙග්නට් නෙ.."

" ඔව් මෙ මාසෙලුනෙ ඇඩ්මිට් වෙන්නෙ.."

" උඹට ඒවත් කිව්වද මැඩම්.."

" මැඩම්ගෙ ගෙදර ගියා මමයි ඔකෙස්ට්‍රා එකේ අනිත් ලීඩර්ස්ලයි වැඩ වගේකට.. එතකොට කිව්වෙ.."

" එහෙමද.. උඹෙ මොකක් හරි වෙනසක් තියනවා සෙනුකයා.. අඩෝ ලස්සන වෙලා.. දෙයියනේ මගෙ බල්ලො.."

මම පැනලා සෙනුකයගෙ බෙල්ල බදාගත්තම ඌ මාව අහකට තල්ලු කල්ලා දැම්මා..

" පලයන්.."

@Shan

" ආෆ්ටර් සෙස් ග්ලෝව් ගැන අහලා තිබ්බට මම දැක්කෙ අදනෙ මගෙ වත්සල් පැටියෝ.. මිම්.."

" ඔව් උඹට ග්ලොව් නැතිවුණා කියලා අපි මක් කරන්නද.. මහ හු#න කතාවක් තමයි කිව්වොත් කියන්නෙ.."

" ඉතින් උඹලට කරන්න හොඳයි අපි කිව්වොත් වැරදී.. ඇනෙ පැලැම් යන්න.."

සෙනුකයා නැගිටලා මගේ බෑග් එක කරේ දාගෙන මට නැගිටින්න අත දුන්නා.. නැගිටගන්නත් බෑ හන්දිපත් රුදාවනෙ මට..

" අම්මො අම්මො අම්මෝහ්.. කොන්ද.. වසු ලබ්බා.. කැඩිච්ච කොන්ද උඩ නැගලා පොට ගිහිල්ලද කොහෙද සිරාවටම.."

" ආ මම අහන්න ආවෙ.. මොකෝ ක්ලබ් එකේ වැඩෙ.. අල්ලලා ගියාද.."

" අවුලක් නෑ.. කෝච් කාරයා වේප්සුමන වගේ තඩි පතාක යෝධයෙක් හරිද.. පොඩ්ඩක් එහෙ මෙහෙ වුණු ගමන් ඇහටම කඩාගෙන පනිනවා.. කේන්ති බං වෙලාවකට.."

" ඒ වුණාට ඩයල් එක හොඳයි කියලා මම අහලා තියනවා.. ඉස්සර අපේ කෝච් එහෙම කතාකරනවා.."

සෙනුකයා ඉතින් රොයිටරේ නිසා ඕවා සේරම දන්නවනෙ..

" උඹ ප්‍රැක්ටිස් කරන්න යන්නෙ නැද්ද.. මම ආපු නිසා උඹට ඒකත් පාඩුවෙනවා.."

" ඔව් ඔව් පාඩුයි.. මෙ ඉදපන් මගේ බෑග් එකේ මයිලෝ එකක් තිබ්බා.. මම උඹට අරන් තිබ්බෙ.."

" සිරාවට.. දීපන්කො.. මට මැරෙන්න මහන්සී.."

" ඉදහන් ගේන්න.."

සෙනුකයා එළියෙ ගල් බංකුවෙන් බෑග් එක තියලා රූම් එකට දුවගෙන ගියා.. සෙනුකයා ඔන්න ඕකයි මගේ හොඳම යාලුවා පටම අටවෙනි

@Shan

අවුරුද්දටත් රැකගෙන ඉන්න හේතුව.. අතිශයෝක්තියෙන් නැතුව කියනවනම් එලම යාලුවෙක්.. හෙන ගහලා ගියත් ළඟින් ඉන්නවා.. පොඩි කාලෙත් මූ ඔහොමයි.. ගෙදර අම්මා කේක් එකක් හැදුවත් මට ඉස්කෝලෙ ඇවිත් කෑල්ලක් අනිවාරෙන්ම දෙනවා.. ඒ ඇරෙන්න මම එන්නෙ නැතුව කෑමවත් කන්නෙ නෑ..

අයුක අයියා ආවට පස්සෙ සෙනුකයා වෙනස් වුණා කියලා බැලු බැල්මට පෙනුනට ඌ එහෙම වෙලා නෑ.. ඌ උගෙ කොල්ලා එක්ක වැඩිපුර ඉන්නවා.. ඉතින් හත්දෙයියනේ මම යාලුවා විතරනෙ..ඒ ඉන්නෙ ඌ ලව් කරන එකානෙ.. මං එක්ක ඉඳලා හරියන්නෙ නැහැනෙ.. එහෙම වුණත් සෙනුකයා මං ගැන වගේම මම සෙනුකයා ගැන ඇලට් එකේ ඉන්නෙ..

අපේ හොඳම යාලුවො ගැන්ග් එක හැදුනෙ අපි පොඩි කාලෙ.. මම සෙනුකයා දන්නෙ ඉස්කෝලෙන්.. එතකොට මහීශා දන්නෙ ක්ලාස් ගිහින් අපේ අම්මලා හොඳම යාලුවො නිසා.. ඊටපස්සෙ ආශිව අඳුනගත්තෙ මහීශාගෙන්.. පස්සෙ අපි හතරදෙනාගෙ අම්මලා හෙනට ෆිට් වෙලා අපි සෙට් එකක් වුණා.. ඉතින් දැන් වෙනකල්ම ඉන්නෙ ඒ සෙට් එකම තමා.. හැමතිස්සෙම කතා නොකලට අපි හරි එකතුයි.. දැන් ඒක ලොකුවෙලා වගේ දැනෙනවා උන්ගෙ බෝයිෆ්‍රෙන්ඩ්ලත් යාලුවො වෙච්ච නිසා.. ඒකත් හෙන පුදුම වැඩෙ.. රධ්‍ය අයුක කියාන් අයියලත් යාලුවොම වෙච්ච එක..

අයුක අයියයි කියාන් අයියයි හැබැයි ගොඩගියපු එකට රධ්‍ය අයියට තමා ක්‍රෙඩිට් වැටෙන්න ඕන.. ඒකා මුලින්ම මාත් එක්ක රණ්ඩුවෙවී හරි කතාකරපු නිසානෙ අයුක අයියා හිමීට සෙනුකයට බෝලෙ බස්සගත්තෙ.. කියාන් අයියයි ආශියි නම් කලින්ම යාලු වෙලා ඉඳලා තියෙනවා අපි දන්නෙ නැතිවුණාට.. එහෙම වෙලා කියාන් අයියට වෙන කෑලි හතරවටේ ඉඳලා ආශි එක්ක බ්‍රේක් වෙලා ආයෙම අපි මාර්ගෙන් ආශිව යාලුකරගත්තා.. මහීශා ගැන කියනවනම්.. අපෙ අසරණීට වැඩි වැඩියෙන් ලැබෙන්න ඕනා අපේ හැම ලව් එකකටම බොක්කෙන්ම සප් එක දීගෙන ඒ සේරම බලාගෙන තනිකඩව ඉන්නවට.. කොහෙද මෙකි සයෝන් අයියටත් කියලලුනෙ යාලුවො වගේ ඉමුයි කියලා.. මෙහෙම බලලා හරිගියේ නැත්තම් සහසා තමා බන්දන්නෙ.. කලින් අපි ආධ්‍ය අයියට සෙට් කරන්න හැදුව.. කොහෙද ඒ සාකිච්චා අපි ඔක්කොන්ටම කලින්ම දැල එලාගෙනනෙ ඉඳලා තියෙන්නෙ.. ඒකනෙ දැන් මගේම බෝයිපෙන් මගේ හිච්චි මාමා වෙලා එයා පොඩි මාමා වුණේ..

@Shan

" හම්මෙහ්.. මෙන්න වැඩක්.. කවුද යකෝ මේ.. මල්ලෙ.."

එකපාරටම කල්පනා කර කර පාඩුවෙ ඉඳපු මගේ පිට මැද්දට තඩි පාරක් පතබෑවුණා.. යකෝ!! ඇඟ රිදෙන දවසටමයි සේරම උන් ඇවිත් වද දීලා යන්නෙ.. බේසික්කො.. මම ඌට බනින්න උඩ බලාගත්තා විතරයි කියාන් අයියා දාඩියත් පෙරාගෙන මගේ එහාපැත්තෙන් ඉඳගෙන කරට අතදාගත්තා.. ඩයල් එකට රගර් මැච් ප්‍රැක්ටිසස් තිබ්ලද කොහෙද.. තඩි ඌරු පැටියා වගේ කොණ්ඩෙනුයි මූණෙනුයි දාඩිය පෙරෙනවා.. මම දහලලා දහලලා කියාන් අයියගෙන් එහාට ගියා..

" කාලෙකින් හලෝ ඔගොල්ලො දැක්කෙ.. කොහොමද ඉතින්.."

" කාලෙකින්.. අනේ මේ පලයන්.. උඹලා කපල් වෙලා හනිමූන් ගිහිල්ලා.. අරහෙ දෙන්නම තරහෙට ඉන්ස්ටර් අප්ලෝඩ් කරනවා.. උඹලා මොන වගේ මිනිස්සුද බං.."

" ආදරණීය මිනිස්සු ඒයි.. ආදරණීය මිනිස්සු.. කොහොමද ඉතින් ලයිප් එක.."

" ලයිප් එක.. අවුලක් නෑ ආතල් එකේ ඉන්නවා.."

" ඌප්ස්.. අපිට ආරංචියක් ආවා ආශිගෙ ගෙදරින් ගිහින් ඇහුවා කියලා.."

" ආහ්.."

කියාන් අයියා ෆේස් ටවල් එකෙන් මූණ පිහිදාගෙන උගේ මනමාල පැනි හිනාව ශේප් එකේ වහන් කරගත්තා.. අනේ ඉතින්..

" එයා එක්ක මම එහෙ මෙහෙ යනවා එනවා.. ඔවා වෙන උන්ගෙන් ආරංචි වුණොත් හරි නැනෙ බං.. ඒ කෙල්ලෙක්නෙ.. මම ඉතින් ගෙදරින්ම ගිහින් ඇහුවා.."

" ගැම්මක් තමා.."

" ඉඳහන් බං.. බලපන් අපේ තුන්මිතුරු සමාජය උඹලා ඇවිත් කඩාකප්පල් කරපු හැටි.. දැන් නම් දැනෙන්නෙ නිකම් මොන්ටිසෝරියක් බදාගත්තා වගේ හැඟීමක්.. අදත් රධ්‍ය එක්ක මම කතාකලෙ.. ඒකෙත් හැටි නේද..

@Shan

එකෙක් රට වටේම ට්‍රැවල් විත් වයිෆ්.. අනිකා මිනිහට බයයි.. මමත් ඉතින් මැච් බලන්න යනවා කෙල්ලත් එක්ක.. බිසී ලයිෆ්ස් විත් පාට්නර්ස්.."

" ඉතින් හොඳයිනෙ බං.."

" ඒත් අයි මිස් මයි සුදුඅම්මියා ඇන්ඩ් සුදුදෝණියා.. එයාලට එයාලගෙ සුදුඅප්පච්චියව මතක් වෙනව ඇති නේද.. මෙහ්.. මම ආදරේ සුදුඅම්මියා.. බලාගනින් හරියට හරින.."

බලාගන්නවා තමයි පගෝ.. මම උම්මා දීලා කුක්කු දීලා ආදරෙන් බලාගන්න මගේ හැපී කච්චනෙ.. කච්චෙක්ගෙන් කුක්කු ගන්නැතුව කුක්කු දෙන එකම අයිතිකාරයා මම වෙන්නැති.. රධ්‍ය අයියට වෙනම වෙලාවක් අරගෙන මේක පැහැදිලි කල්ලා දුන්නනම් හරි.. නැත්නම් මගේ වටිනාකම අඳුනගන්නෙ නෑනෙ.. ඒ වුණාට ඉතින් එයාම කියලා තියනවනෙ වටිනවා කියලා.. දැන් මම කිව්වොත් 'මාව ඔයාට වටින්නෙ නෑනෙ' කියලා ඒකට මූණ හට්ටියක් කරගනීවි..

රධ්‍ය අයියට කොහොම දේවල් කිව්වත් අහගෙන ඉන්නවා එයාගෙ නිර්මල පිවිතුරු ආදරේ අවතක්සේරු කල්ලා කතාකරන්නෙ නැතුව.. ඒ මනුස්සයට ඒවට හරී~යට හිත රිදෙනවා.. අර එකපාරකුත් එයාට කියන්නැතුව ගෙදරින් එළියට ගිහින් 'හිත රිදෙනවා වරද්' කිව්වෙ.. එහෙම කිව්වහම මට හෙනට දුක හිතෙනවා.. ඊටපස්සෙ ඇඬෙනවා.. ඊටපස්සෙ මම මගේ දුක අහන අයියට ඒවා කියනවා.. දුක අහන අයියා මගේ දුක අහගෙන ඉදියම මාමට ලව් කරන්න කෙනෙක් නැතිවෙනවා.. මාමා ත්‍රිකුණාමලේ ඉඳන් වේලෙනවා.. ඊටපස්සෙ කාන්සියට බුලත් කෑවොත් එහෙම.. දුක අහන අයියටනෙ පාඩුව වෙන්නෙ..

" මම එයාව බලාගන්නම්කො.."

" ඒ වුණාට බං.. මගේ එක කුස උපන් උන් දෙන්නා වගේ රධ්‍යයි අයුකයි.. දෙන්නම ලබන අවුරුද්දෙ යනවා.. මට පට්ටම අවුල් ඒකට.. යකෝ අපි තුන්දෙනා එකට ඉන්නෙ නැති වෙලාවක් කියහන්.. මගේ පපුවත් රිදෙන්න ගන්නවා මතක් වෙද්දි.."

" මම.."

@Shan

කියාන් අයියා ඈත පේන ඉස්කොලෙ වතුර ටැංකිය දිහා බලාගෙන ලොකු හුස්මක් පහළ දැම්මා.. කොච්චරවත් අමතක කල්ලා ඉන්න හැඟුවත් රහ නැති ඇත්ත රබර් බෝලෙ වගේ උඩට එනවා.. මම ඇඳුමෙ නූලක් ඇදලා අරගෙන ඒක ඇඟිල්ල වටේ ඔතාගත්තා..

" අන්න අන්න.. එයා එනවා.. මන්දාරම් කතාවේ~ සඳ කින්නරාවේ~"

එකපාරට කියාන් අයියා රධ්‍ය අයියා ශාන්ත ලීලාවෙන් මේ පැත්තට එනවා දකලා දුවගෙන ගිහින් රධ්‍ය අයියව වටයක් කැරකුවා.. සැක්.. රධ්‍ය අයියට කැරකෙන ඒවා ගැලපෙන්නෙ නෑනෙ.. කැරකෙන්නෙත් සීරුවෙන්.. රධ්‍ය අයියා කියාන් අයියව එහාට තල්ලු කල්ලා දාලා දෙකක් රවාගෙන ඇවිත් මං ගාවින් ඉඳගත්තා..

" අඩෝ මෙ මම පොඩ්ඩක් ගිහින් එන්නම්.."

කියාන් අයියට ඒ එක්කම කෝල් එකක් ඇවිල්ලා ෆෝන් එකත් කනේ ගහගෙන එහාඅ ගියා.. කොහොම හිටිය කියාන් අයියද මේ වගකීම් සහගත පෙම්වතෙක් වෙලා ඉන්නෙ.. ආදරේ හරි පුදුමයි කියලා සෙනුකයා හතේදි මට කිව්ව එක ඇත්ත වෙනවා තමා එහෙනම්.. මම කියාන් අයියා යනකල් ඉඳලා රධ්‍ය අයියා පැත්තට හැරුණා..

" මතක් වුණා ඔයාව.."

රධ්‍ය අයියා මං දිහා බලාගෙන ඉඳලා ආයෙම ඔලුව පහතට නමාගෙන එයාගෙ අත් දිහා බලාගෙන ලාවට හිනාවුණා..

" එහෙමද.. කීයටද ආවෙ.."

" දැන් හුඟක් වෙලා.. සෙනුකයා ඇතුළට ගියා.. මෙච්චරවෙලා එයා එක්ක හිටියෙ.."

" කොහොමද ක්ලබ් එකේ වැඩ.. අල්ලලා යනවද.."

" අපෝ අනේ.. මම ඔයාට පස්සෙ කියන්නම්.. හෙන ගොඩක් තියනවා.."

" ම්ම්.."

" ඔයාගෙ ප්‍රැක්ටිස් ඉවරද.."

@Shan

" තාම නෑ.. බලපන් උඹ නිසා කන කට්ටක්.."

" කටු කන්නෙපා අනේ.. මල කන්න.. මම රෝස මලක්නෙ.. රෝස මල ඕන කන්න.. කටු කන්න එපා.. දිරවන්නැති වුණොත් එහෙම.. ඇයේ හැපීකච්චො.."

මම රඩ්‍ය අයියගෙ කම්මුලක් ඇඟිලි දෙකෙන් අල්ලලා මාශ්මෙලෝස් එකක් වගේ පැත්තට ඇද්දහම එයා මගේ අතට පාරක් ගැහුවා..

" ආව් අනේ.."

" ආ.. අර සෙනුක මල්ලි එනවා.. මම පැය බාගෙකින් එන්නම්.. එතකල් ඉන්න හරිද.."

" හා.."

" ම්ම්"

රඩ්‍ය අයියා ආයෙම මියුසික් රූම්ස් තියන පැත්තට ඇවිදගෙන යද්දි සෙනුකයා එක්ක හිනාවෙලා මොකක්ද කිව්වා.. මොකක්ද දන්නෑ කිව්වෙ..

" එන්න ඒයි ඔයාට මයිලෝ එකක් දෙන්න.. මගෙ ආදර බව්වා.."

" දීපන්කො ඉතින්.."

" ඉන්න ඉන්න කඩලා බටේ ගහලම දෙන්න.."

සෙනුකයා මහා වල් විදියට මගේ දිහා බලලා පේපර් ස්ට්‍රෝ එක අරගෙන මයිලෝ එකට ගැහුවා.. ඒකත් මහ අමුතු පරිසර හිතකාමී බටයක් තමා.. පේපර් ස්ට්‍රෝ එක ඔතලා තියෙන්නෙ ඉටිකවරෙකින්.. මරු කන්සෙප්ට් එක ඒකනම්..

" උඹට මේ අහිංසක මයිලෝ එකෙනුත් පේන්නෙ වෙන වෙන ලබ්බවල්.. සැක් බං.. ඔහොම වනචරයෙක් වෙන්නෙපා කියාන් අයියා වගේ.."

" අඩෝ ආශිගෙ 'අහකට පලයං වනචරයා'.. කෝ ඒකා.. අද ඉස්කෝලෙ ඉන්නෙ.."

@Shan

" ඇවිත් අන්න හරේ මලක් කඩන්න ගියා.."

" එහෙමද.."

මම මයිලෝ එක කටේ ගහගෙන සෙනුකයගෙ උකුල උඩින් කකුලක් දිගෑරලා තියාගත්තා..

" උඹ මට ආදරෙයි නේද.."

" ඒ මොකෝ එකපාරම.."

" ආදරෙයිද කියපන්.. මහපපගයා වෙන්නැතුව.."

" ඕ ටිකක් වගේ.. ඇයි.."

" ආ එහෙනම් මගේ කකුල අතගාපන්කො.. සනෙරු මල තැලුවා අර වෙළුසුමනයා.. මගේ ඇග රිදෙනවා.. දුක අහන අයියගෙන් බෙහෙත් ඉල්ලගන්න ඕන ගියාම.."

" නොදකින්.. උඹ කිව්ව නේද ක්ලබ් ගිහින් අම්මටසිරි වෙන ප්ලෙයර් කෙනෙක් වෙනවා කියලා.. මේ වෙන හැටිද.."

" ඔව් බලාගනින්.. අම්මා.. කකුල් දෙක රිදෙනවා.."

මම එහෙමම බංකුවට කඩාගෙන වැටුණා.. සෙනුකයා බැන බැන පැය බාගයක්ම මගේ කකුල් දෙක අතගෑවා..

ඊටපස්සෙ පැය බාගෙකින් විතර රධ්‍ය අයියා ඇවිල්ලා අපි ගෙදර එන්න ආවා.. කියාන් අයියයි සෙනුකයයිත් අපි එක්කම එන්න ආවෙ.. ඒකනිසා කියාන් අයියට පැසෙන්ජර් සීට් එකේ ඉන්න කියලා මම සෙනුකයා එක්ක පිටිපස්සෙන් ඉදගත්තා.. ආදර බල්ලා නැතුව මමත් හිටියෙ හරි සාංකාවෙන් නෙ..

" මේ ෂනෙරුවා.."

" ඕ.."

" උඹ දන්නවද චමිරු සාජන් කෙනෙක් වෙලා.."

@Shan

මම ටක්ගාලා සෙනුකයා ඉන්න පැත්තට හැරුණා.. මට එහෙම එකක් රධ්‍ය අයියා කිව්වෙ නැනෙ.. දැන් ඒ පගයද ඉස්කෝලෙ කැඩෙට් සාජන්..

" මොකක් කිව්වා.. අර පරෙයි ප#යා සාජන්ද.."

" ඔව් බං.. බලහන්කො ඒකෙත් හැටි.. ඌ ඩිපියුටි හෙඩත් වෙනවා.. මටනම් ජේන්න බෑ ඕකව.."

" මටත්.. මේ රධ්‍ය අයියෙ ඔවා මට එහෙම එකක් කිව්වෙ නැනෙ ඒයි.."

" කොහොම එකක්ද.."

" අර සක්කිලි පරෙයියද කැඩෙට් සාජන්.."

" දන්නෙ නෑ.. වෙන්න ඇති.. මම දැන් ඒකෙ නැනෙ.."

" ඔයාට මතකද චමිරුගෙ කට ගාව බර්ත් මාක් එක මොන පැත්තෙද තියෙන්නෙ කියලා.."

එකපාරම රධිය අයියා ඔලුව හරවලා මං දිහා බයවෙලා වගේ බැලුවා.. මං දිහා බලාගෙන ඉඳලා හරියන්නෑ මනුස්සයෝ.. ඩ්‍රයිව් කරන වෙලාවට ඉස්සරහා විතරයි බලාගන්න ඕන.. මම රධ්‍ය අයියගෙ මූණ ආයෙම ඉස්සරහා හැරෙව්වා..

" ඒ මොකක්ද මල්ලෙ ඒ ඇහුවෙ.."

" ඉන්නකො පොඩ්ඩක්.. කියන්නකො ඔයාට මතකද.."

" මොකක්ද.."

" චමිරුගෙ බර්ත් මාක් එක.."

" මට උගේ මූණවත් මතක නෑ බං.. මොනවද අහන්නෙ.."

" ආ මතක නැත්නම් කමක් නෑ.. මතක තියාගන්නත් එපා.."

මම ආයෙම සීට් එකේ පිටිපස්සට ඇදිලා හේත්තු වුනා.. චමිරුවගෙ එහෙම ලපයක් තියෙනවා තමා කට ගාව.. වලත්ත පරෙයියා.. ඌ හිතුවද දන්නෑ

@Shan

මගේ සුදුඅම්මියා ලපේට රැවටෙයි කියලා.. මගේ ලප නෑ තමා.. ඒ වුණාට රධ්‍ය අයියා කැමති බැඩ්මින්ටන් ගහන දුඹුරුපාට ඇස් දෙකක් තියන අම්මටසිරි වෙන ගැම්මක් තියන මං වගේ කොල්ලෙක්ට විතරයි.. හැමදේටම වඩා රධ්‍ය අයියගෙ පස්ස වැදගත්..

" අඩෙ උඹට කියන්න බැරිවුණානෙ.. අපේ තාත්තට පොඩි වැඩක් මාට්ටු වෙන්න ඔන්න මෙන්න තියෙද්දි දසමෙන් බේරුණා.. යකො මතක් වෙද්දි මගේ බොක්කත් කූල් වෙලා යනවා.."

" ඒ මොකද බං.."

" තාත්තා ෆෝන් එක බැලුවා.. මම අයුක අයියව සේව් කල්ලා තිබ්බෙ ෂනෙරු 2 කියලා.. තාත්තා සේරම වැට් එක කියෙව්වා.."

" ඕයි.. සෙනුකයා.. උඹ කොහෙද බල්ලො තාත්තා ෆොන් එක බලනකල් හිටියෙ.. දන්නවනම් තාත්තා මගේ 2 තමා ලෙප්ට් කරන්නෙ.."

" ඉඳපන්කො ඉතින් කියන්න.. ඊටපස්සෙ ගැලරියත් බැලුවා යකෝ.. මට ඇඩෙන්න ආවා.."

" අඩෙ.. මොකුත් අහුවුනේ නැනේද.. මම හැමදාම උඹට කියනවා-"

" නෑ නෑ බං එහෙම මොකුත් ෆෝන් එකේ නෑ.. තාත්තා ලැප් එක බලන්නැති නිසා හොඳයි.. මම ඒකට දාගෙන තිබ්බෙ ඔක්කොම.. අනික මම අයුක අයියා එක්ක කතාකරන්නෙ වෙන ෆෝන් එකකින් නෙ.. මම බය වුණා ඒකවත් අහුවෙලාද කියලා.."

" බයහිතෙනවා පගයො.. උඹනම් මොකෙක්ද මන්දා.."

" ඒ ෆෝන් එක වහලෙ සිවිලිම අස්සෙ ගහලා තියන නිසා හොඳයි.."

" සිවිලිමෙ ඉන්න කලවැද්දා ඔක උස්සන් ගිය දවසට ගොඩා~ක් හොඳයි.. වෙන තැනක හංගගනින්කො.."

" අපේ ගෙදර වෙන තැන් නෑ බං.. කාමරේ දොර ලොක් කරන්නත් බැනෙ.. තාත්තා ඒක වහන්න විතරයි දෙන්නෙ.. තාත්තා පිරිවෙනට ගියාට පස්සෙනම් පොඩ්ඩක් ශේප්.."

@Shan

" කරන මගුලක් සිහියෙන් කරපන්.."

" තාත්තා මේ ළඟදි කිව්වා ගෑණුළමයෙක් එක්ක යාලුවුනාට කමක් නෑ හැම දේම කරන්න ඕන සීමාවක් තියෙනවා.. දැන් පොඩි ළමයි නෙමෙයිනෙ කියලා.."

" ම්ම්.."

" මම හිතාගෙන ඉන්නෙ කැම්පස් ගියාට පස්සෙ ගෙදරට කියන්න.."

" ඈ මොකක්!!!!!!!!!!!!!!!!!!!!!!!"

" ඔව් බං.. මට මේ හැංගිලා ලව් කිරිල්ල ඇති වෙලා තියෙන්නෙ.. යකෝ අපි කුඩු ගහන්නෑනෙ.. මෙච්චර වහන් වෙන්න.. මම තාත්තට කියනවා.. ඕන ලබ්බක් වෙන්ද්දෙන්.. කමක් නෑ.. ගෙදරින් යන්න කිව්වොත් යනවා.."

" ඒ වුණාට බං.."

" නෑ මම කියනවා.. අයුක අයියත් නෑනෙ එතකොට මෙහේ.."

" අනේ මන්දා.. උඹට හොඳයි කියලා හිතෙන දෙයක් කරගන්.."

" ම්ම්.. යේකටමා ශුඩුමාත්තියා..

ඉදගෙන හිටගෙන

පෙරලි පෙරලි එලිවෙනකන් මල් කැඩුවා

අද ෆෝන් එකවත් නෑ අපෙ අප්පොච්චා

පොලොවෙ ගහලා කැඩුවා

අද ෆෝන් එකවත් නෑ අපෙ අප්පොච්චා

පොලොවෙ ගහලා කැඩුවා.."ඉම්හි"

මම අතේ තිබ්බ ටිශූ එක රෝල් කල්ලා රවුලක් වගේ හදාගෙන ඒක මූණෙන් තියාගත්තා.. පැමිණි සියලු දුක් සෙනුකයා ඉන්නකල් ඉතින්

@Shan

පැණිරසයි වගේ තමා..

" ඉල්ල්ල්න්දාරි කාලේ උම්ම්ම්ම්ම්බල වාගෙ නොවේ අපි

කාලකණ්නි වැඩ කෙරුවෙ නැහ්.."

" කොහොමත් ඒ කාලෙ තාත්තේ මේ වගෙ නැනේ

ඉන්ටර්නෙට් ෆේස් බුක් තිබ්බෙ නෑ.." ( සනෙරු පගයා)

" අයියයියයියො අයියො අම්මියෝ මෙන්න තාත්තා ගහනෝ

අයියයියයියො අයියො අම්මියේ එළුව එළුව ගහනො.."

සෙනුකයා උගේ කවර් එක ඉස්කෝලෙ දාලා ආපු ගිටාර් එකේ පිටපැත්තට බෙරයක් ගගහා සිංදුවට සමවැදීගෙන එන්නෙ..

" සෙනුකයා බීට් ඩ්‍රොප් බීට් ඩ්‍රොප්- Hold on

අප්පොච්චි මතකදෝ

උඹ කොලුගැට කාලෙ නටපු නාඩගම්

කොලුකම් මං කළොත් වැරදියිදො

බෙල් බොටමක් ගහගෙන පෙම් කළ පෙම්වතා

පුතුගෙ ප්‍රේමයට දුශ්ටයා වෙලා

හර්දෙ මාළියා බිඳ දමා මෙයා

කන්බෙර පැලෙන්න සැර කතා කියා

somebody gonna get hurt daddy~

nobody cannot even try to stop me

yes i'm in love that beauty

@Shan

no i never feel guilty

you're in forties and i'm in twenties

yes i'm ready to face it

කොපමණ බාධා ආවත් work it

එපා පාරන්නට මේ අපගේ සිත් when you fall in love there's no exit!!"

" ඒ හුස්ම ටිකක් ගනින්.. යකෝ උඹලා දෙන්නා මුන් දෙන්නව කොහෙනද බං හොයාගත්තෙ.."

කියාන් අයියා අපේ සිංදුව මැද්දෙන් පැනලා කෑවා.. මගේ රැප් එක කඩාකප්පල් කල්ලා දැම්මා..

" හැයි මුකත උයා.."

" උඹලා දෙන්නට ඔහොම හැමතිස්සෙම බලයෙන් ජවයෙන් පිරිලා ඉඳලා මහන්සි නැද්ද බං.. සිරාවටම මටත් මහන්සී උඹලා දහලන දැහලිල්ල බලගෙන ඉඳලා.."

" උදේට නෙස්ටමෝල්ට් බොන්න ඒයිම්.. ආ නෑ තවුසෙ උදේට ගහලා අරිනවා නේද අර සප්ලිමන්ට් එකක්.. ඒකට ජවය එන්නැද්ද හලෝ.."

" උඹලගෙ ගංජා පවර් එක වගෙ ඒක වැඩ නෑ බං.."

" මෙ මෙ වනචරයා බලු කතා කියන්නෙපා.. ගංජා පැළයක් අපි ඇහින්වත් දැකලා නෑ.."

" ඔක නවත්තපන්.."

කියාන් අයියා එකපාරමමූණ හට්ටියක් කරගෙන රධ්‍ය අයියා දිහා බැලුවහම රධ්‍ය අයියත් ලාවට හිනාවෙලා කට පිහාගත්තා..

" ඔන්න ඇ මහින්දාගමනයේ ග්‍රීක් වර්ශන් එක මම කියන්න යන්නෙ.."

" අඩෝ කියහන් මොකක්ද මොකක්ද.."

@Shan

" ඔන්න බං ඇතීනද වීනස්ද කවුද අර ඉන්නෙ බං මීට් වල ෆයර්ටෝච් එක පත්තුකරන එක්කෙනා.. ඔන්න බං.. සුදු දිග ඇඳුමකුත් ඇඳගෙන, ගාල කඩාගෙන, රෙදිත් කඩාගෙන පටාචාරා වගේ..ම නෙමෙයි පටාචාරා දිව්වෙ ඇඳුම් නැතුවනෙ.. සැක් පටාචාරා කැල්ල මෙකට ගැලපෙන්නෑ.. ඔන්න දුවගෙන දුවගෙන දුවගෙන යනවලු හොඳේ.. කවුරු වගේද.."

" කවුරු වගේද.."

" මුවා වගේ!!!"

" ආහා ඉතින් ඊටපස්සෙ.."

" ඊට පිටිපස්සෙන් දුවගෙන එනවලු සිලිං බිලිං ගගා රා කළ අසූදාහක් පොවපු අටලොසක් අක්ශෞහිනියක් වගේ හයිය හත්තිය තියන විසාල ඇම්බැට්ට පිඹුරු තඩියෙක්.. කවුරු වගේද.."

" කවුරු වගේද.."

" තිස්ස වගේ.."

" හම්මට.."

" ඊටපස්සෙ අර ග්‍රීක දේවතාවිගෙ අහල් අටෙ හයි හීල් එක ගියාලු මොකක් අස්සටද බං.."

" කාණුවක් අස්සට නේ.."

" අන්න හරි කාණුවක් අස්සට.. එහෙම ගිහින් ග්‍රීක් ගොඩ්ගෙ රෙද්ද සුළඟේ පාවි ගිහින් අපි ඉස්සරහා දණ්ඩ නමස්කාරය කළාලු.. කවුරු වගේද.."

" කවුරු වගේද.."

" කවුරුත් වගේ නෙමෙ.. ඒක මම නිකම් ඇහුවෙ.."

" ආ.."

" ඊටපස්සෙ අර පිඹුරු තඩියා දුන්න උලුක් කරගත් දේවානම්පියතිස්ස වගේ කෙළගෙන ඇවිත් අර දේවදූතිකාවක් වගේ ඉන්න මාරදූතිකාවගෙ ඇඟටම

@Shan

පතබැවුණාලු.. ඒකට කියන්නෙ කොහොම කියලද දන්නවද.."

" නෑනෙ.."

" ඒකට කියන්නෙ ෆෝල් ඉන් ලව් කියලා.."

" ආ හා.. ඉතින්.."

" මේ ෂනෙරු!!!"

" ඉතින් වෙස් මාරු කරන පිඹුරු තඩියා ෆෝල් ඉන් ලව් නෙ දැන් අර ග්‍රීක දූතිකාවට.. එහෙම වෙලා එයාගෙ හිත ආතරෙන් මුසපත් වෙලා හැමදාම හයිලෙවෙල් හංදියෙ ගුවන් පාලම අස්සෙයි, දෙල්කඳ පොල ගාවයි, මරදාන ස්ටේශන් එකෙයි කොටින්ම ලොතරැයි කූඩු අස්සෙ, බස් හෝල්ට් වල, සිසිජී එක ගාව, ඉස්කෝලෙ ඉස්සරහා කැෆේ එකේ, කැරමල් පම්කින් එකේ පවා රැකගෙන ඉඳලා අර දූතිකාව දැලේ දාගත්තලු.."

" වැව්.."

"  ෂනෙරු ගහනවා මා උඹට දැන්.."

" අපි බයයි ඔවාට.."

" හැබැයි රධ්‍ය.. මම-මම-"

" වරද් ඕක ඇති දැන්.. උඹ ඕවා ගනන් ගන්නෙපා.."

" ඔව්.. අපි ඇත්ත කතාකලාට ඔයා ගනන් ගන්නෙආ සුදාත්තියා.."

කියාන් අයියා අපි සේරටම රවලා ස්පෝර්ට්ස් බෑග් එකත් තුරුල් කරගෙන සීට් එකට හේත්තුවෙලා ශටර් එකෙන් අහක බලාගෙනම ඉඳියා.. ඇත්තනෙ කිව්වෙ ඉතින්.. මහින්දාගමනය ග්‍රීක වර්සන් එක..කියාන්ශියාගමනය..

ඔතරිට උණ ලමයි.. ඒකයි ඊයෙ රෑ එන්න බැයිවුනේ.. අද පුලුවන් වුඹත් එන්නම් හොදේ..

එන්නාම්.. ලව් යූ..    ❤

@Shan

ලව්ලි බෑනා විත් හිස් හිච්චි මාමා ඇන්ඩ් පොඩි මාමා 😂

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුණකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 90 කොටස

" ඉට්ස් බෝයිපෙන්ඩ් උස්සගෙන යන ටයිම්.. ඔහොම ඉන්නෝ~"

මම රධ්‍ය අයියලගෙ ගෙදරින් කාර් එක පාක් කල්ලා එයා එළියට අඩිය තිබ්බා විතරයි කාර් එක වටෙන් දුවගෙන ගිහින් රධ්‍ය අයියගෙ කරේ එල්ලුනා.. එහෙමම මම බිත්තියකට වප්ප වුණු හූනු පැටියා වගෙ බිමට රූටගෙන වැටෙන්න ගිහිල්ලා රධ්‍ය අයියා මගේ කකුල් දෙකෙන් අල්ලලා උස්සගෙන ආයෙම පිටෙන් තියාගත්තා..

" දහලන්නැතුව ඉඳපන්කො එක විනාඩියක්.."

" ආ එහෙම කොහොමද.. දහලන්න ඕන කාලෙ දහලලා කියලා ඉන්න ඕන.."

රධ්‍ය අයියා මාවත් උස්සගෙන ගෙට යද්දි මම ඒ මනුස්සයාගෙ බෙල්ල වටේ අත් දෙක ඔතාගෙන උරහිසින් නිකට තියාගත්තා.. ගෙට යද්දිම සාකිච්චා මල් ගහක්ම බිම හෙළනවා.. අපි එනවවත් දැක්කෙ නෑ.. මම හිමීට රධ්‍ය අයියගෙ කනට පාත් වුණා.. මේ ආධ්‍ය අයියා සෝෆා එකේ හාන්සිවෙලා සවුන්ඩ්ස් මියුට් කරපු හව් ටු ට්‍රේන් යොර් ඩ්‍රැගන් දාගෙන කොට්ටෙකුත් තුරුල් කරගෙන හිනාවෙවී මල් කඩනවා.. කණ්ණාඩි දෙකත් රූට්ටලා නහය අද්දරටම ඇවිල්ලා.. දැක්කහම මතක් වෙන්නෙ බොස් බේබි කණ්ණාඩි දාලා වගේ.. අවුරුදු තිහක් වුණාට හෙන යන්ග් බෝයි ලුක් එකක් තියෙන්නෙ.. ඕකට තමා අපේ මාමා රැවටෙන්නැත්තෙ..

" අපි උඩට යමු.. එයාට මල කඩන්න දීලා.."

" ම්ම.."

මම රධ්‍ය අයියගෙ පිටෙන් බැහැලා හිමින් හිමින් පඩිපෙළ දිහාට අඩිය තිබ්බා..

" කවුද කියන්නෙ මගෙ ලොකුකම කියලා.. ඔයාට විකාරද.."

" ඔව් දන්න කියන කාලෙ ඉඳන්ම එහෙමනෙ.. ඔය හරියෙ වරායක් තියනවා නේද.."

@Shan

" නැව් නගින්න.. වෙන මොකකටද.."

" හෙන කැලේක ඉඳන් කෝල් එකක්වත් ගන්න බැනෙ.."

" ඔව් ගහක් උඩ නෙමේ පර්වතයක් උඩ හරි කමක් නෑ ගන්න ඕන.. මම කිව්වද ඔයාට ඔය වන්නියෙ යන්න කියලා.."

" අනේ හරිම දුකයි.. පව්.. ඇඩෙන්න එනවා.. මම අඩන්නද.."

සැක් මාමා ගහක් උඩ නැගගෙනද කෝල් එක අරන් තියෙන්නෙ.. ඕකතමා කියන්නෙ ලව් සික් එක ඔලුවට ගහගන්න එපා කියලා.. ආධ්‍ය අයියා ලොකුවට කතාකරද්දි හුරතල් වෙන්නෙ නෑ.. මට දැනෙන්නෙ හෙන පරිනත වෙච්ච නාකි ජෝඩුවක් ඌමනා දේවල් කතාකරනවා වගේ එයාගෙ කටහඬින්.. අපි දන්නෙ නෑ මාමට ඉතින් එයාගෙ සාකි හෙනට වටිනව ඇතිනෙ.. හොඳ වෙලාවට මම හොඳ බෝයිපෙන් කෙනෙක් හොයාගත්තෙ.. නෑ එයානෙ මාව හොයාගත්තෙ.. හැබැයි මමත් එයාව දැනගෙන හිටියනෙ.. හිටියට කැමති නෑනෙ.. කැමති නැතිවුණාට දැන් යාළුවෙලා ඉන්නෙ.. කමක් නෑ කෝමහරි රධ්‍ය අයියයි එයාගෙ ඇස් දෙකයි පස්සයි නහයයි ඇඟිබැමයි ඔක්කොම මගේ.. මම යන්න තියපු අඩියත් ආපහු පැත්තට හරවලා රධ්‍ය අයියගෙ කම්මුලට හාද්දක් දීලා ආධ්‍ය අයියා හැරෙන්න කලින් උඩට දුවගෙන ආවා..

" අපේ අයියත් මාරමනුස්සයෙක් තමා.."

රධ්‍ය අයියා කාමරේට ඇවිත් දොර වහලා සොක්ස් දෙක ගලවලා ගානට හරියට බින් එකට විසික් කලා..

" ඒ මොකද එහෙම කිව්වෙ.."

" නෑ ඉතින්.. පුරුදු නෑ වගේ ඔහොම කතාකරනවා.."

" පුරුදු වෙන්න වෙයි.. ඒකනෙමේ.. ඔයා මට කිව්වෙ නෑනෙ එයා ඒ දෙන්නට කැමතිද අකමැතිද කියලා.. ඔයාගෙ ඔපිනියන් එක කොහොම එකක්ද.."

" මගේද.. මට එහෙම ප්‍රශ්නයක් නෑ.. ඔයා කියද්දි නම් මුලින් හෙන සප්‍රයිස් එකක් වගේ දැනුනා.. ඒත් ඉතින් අයියා සතුටින් ඉන්නවනෙ.."

@Shan

" එහෙනම් කමක් නෑ.."

" අද ක්ලබ් එක මොකද.."

මම කවුච් එකෙන් ඉඳගෙන කකුල් දෙක උඩට අරගෙන ක්ලබ් එකේ මුල ඉඳලම වෙච්ච දේවල් රධ්‍ය අයියට කියන්න මතක් කරගත්තා.. මාව දාලා ගියනෙ පස්සත් උඩ දාගෙන.. එතන ඉඳන්ම කිව්වනම් හරි..

" ඔයාට කියන්න ඔයා මාව දොර ළඟ දාලා ගිය වෙලේ මට දුක හිතුනා.."

" ඒක කිව්ව ටෝන් එක විතරක්.. මම ඔයාව ගිහින් මහලු නිවාසෙකට දැම්මා වගේනෙ.."

" එහෙම තමා අනේ දැනුනෙ.. ඔයාට තේරෙන්නෑ සුදාම්මියා මගේ දුක.. ඉතින් හරිද.. මම දොර ඇරගෙන ඇතුලට ගියා.. ගිහින් මොකුත්ම කරගන්න හම්බුණේ නෑ දොර ගාව ඉඳපු වෙලුසුමනයගෙ ඇඟේ වැදිලා බම්ප් වෙලා ගිහින් දඩාස් ගාලා දොරේ වැදුණා.."

" වෙළුසුමන..??"

" ඔව් ඔව් වෙළුසුමන.. මගේ කෝච්කාරයා.. ඔයාට කියන්න ඔයාටත් වඩා උසයි.. නිකන් ශුගර් ඩැඩී කෙනෙක් වගේ.. වයසයි.. කොණ්ඩෙත් ඉදිලා තියෙන්නෙ.. ඒත් හිතන් ඉන්නෙ හරි තරුණයා.. තාරුණ්‍යයේ පොපියන චමත්කාරය කියලා.. මට අද අපහාස කල තරම්.. මම කෝච්ගෙ ඇ- අහ්ම් මම කිව්වෙ එහෙම කියන එක හොඳ නෑනෙ මම අලුතින් ගිය ළමයෙක්නෙ.."

" ඉතින්.."

" ඉතින් මුලින්ම මට බැන්නා ලේට් වුණා කියලා.. ආයෙම ලේට් වෙන්න එපා කිව්වා.. ඊටපස්සෙ ස්පෝර්ට්ස් හිස්ට්‍රි එක ඇහුවා.. ඩයල් එක අපේ ඉස්කෝලෙමයි ගිහින් තියෙන්නෙ.. ඕල් බෝයි කෙනෙක්.. මම ඉතින් ඒකනිසා මනුස්සකමට හිනාවුණාම කෝච් මට රැව්වා.. නැලවෙන්න තියාගන්න එපා කියලා.. හරියට තිතට වැඩ කරන්න ඕනලු එයාට.."

" ඇත්ත තමා.."

@Shan

" අනේ මේ.. නිකන් ඉන්නවා.. කවුද නැලවුනේ.. මම නැලවුණේ නෑ.. මම පපුව ඉස්සරහට දාගෙන ගැම්මෙන් හිටියෙ.."

රධ්‍ය අයියා මගේ පපුව දිහා බලලා ආයෙම මූණ දිහා බැලුවා..

" ඉතින්.."

" ඊටපස්සෙ විනාඩි පහළොවක් විතර එයා කොච්චර සැරද, ඩිසිප්ලින් කියන්නෙ මොනවද, කාලය කොච්චර වැදගත්ද බලා බලා ඔහොම හැලි ගොඩක් කියවලා ඒ වෙලාව නාස්ති කලා.. එයාට නාස්ති කරන්න හොදයි මම කළොත් තමා.. ඊටපස්සෙ.."

මම මූණ ඇදකරගෙන රධ්‍ය අයියා දිහා බලාගෙන හිටියා.. ඒ කෑල්ල මම කියන්නම ඕන ද.. කිව්වොත් මට ජීවිත කාලෙම පසුතැවෙන්න සිද්ද වෙයිද..

" ඇයි නැවැත්තුවෙ.. ඊටපස්සෙ.."

" ඊටපස්සෙ සර් මට..මට- සරනේරුව කිව්වා.."

රධ්‍ය අයියා හොදට මගෙ මූණ දිහා බලාගෙන ඉඳලා තොලක් හපාගත්තා.. ඊටපස්සෙ ටික ටික කට පුම්බගෙන ඉඳලා හෙන ගහන්න වගෙ කාමරේ දෙක වෙන්න හයියෙන් හිනාවෙලා මැරෙන්න හැදුවා. හිනාවෙලා හිනාවෙලා මම දුන්නෙ කකුල් පාරකින් කවුච් එකෙනුත් බිමට පතබැව්ලා බිමත් බදාගෙන හිනාවෙන්න ගත්තා.. හරි හිනා.. අපිටනම් හිනායන්නෙ නෑ..

කොහොම වුණත් ඒක තමා අවුරුදු විස්සකට මම කරපු ලොකුම මෝඩ වැඩේ..

" අම්මොහ්.. වරද්.. සරනේරු.. ඒක.. හම්මොහ්.. හුස්ම.."

" ඕක නවත්තපන්.."

" සරනේරු කියන්නෙ.. අම්මොහ්.."

" කැත වවුලා..!!"

@Shan

" සරනේරු.. කේන්ති ගන්නෙපා බ-බබා.."

" රධ්‍ය අයියෙ!!!!!!!!!!!!!!"

" මලකඩ කන.. සරනේරුලු වරද්.. ඒක.."

" අනේ මේ නටපං.. මගුල.."

මම බිම පතබෑවිලා ඉන්න රධ්‍ය අයියගෙ බඩට පාරක් කකුලෙන් ගැහුවා..

" හරි හරි කවුරුත් හිනාවෙන්නෙ නෑ.. ඊටපස්සෙ.."

" මොකුත් නෑ.. තවුසෙ පලයන්.. මම කැමති ආධ්‍ය අයියට.."

" සර- වරද්.. මේ බලන්නකො.. ඇයි අපේ අයියට කැමති.."

" මම තවුසෙට කැමති නැති නිසා.."

" ආ කමක් නෑ.. මම ඔයාට පීක් පීක් ගන්නැති තාරපැටියෙකුත් ගෙනාවා.."

" යනවා යන්න.."

මම ගස්සලා පුප්පලා ආධ්‍ය අයියව හොයාගෙන යද්දි ආධ්‍ය අයියා පඩිපෙළ නැගනෙන දේව දූතයා වගේ ඇවිත් මම එන වේගෙට මගේ ඇහේ හැප්පුනා.. මම ආයෙම දෙවෙනි වතාවටත් ආධ්‍ය අයියගෙ අත උඩට මනමාලි වගේ ලෑන්ඩ් කරාම රධ්‍ය අයියා දෝත බඳලම මම පහළට රෝල් වෙලා යන්න නොදි අල්ලගත්තා..

" චූටියො.. තා පොඩ්ඩෙන් බිම.."

" ඔයා මට වැටෙන්න දෙන්නැතුව අල්ලන් ඉන්නවනෙ.."

මම ආධ්‍ය අයියගෙ සංසුන්කමින් පිරුණු හැඩ මූණ දිහා බලාගෙන ඇහි පිල්ලම් දෙක තුනකුත් ගහලා කෙලින් වුණා.. මාමා දන්නවනම් මම එක ගෙයි කන්න ලැස්තිය කියලා.. මාව බුලත් හපයක් කල්ලා දාවි..

" ආවා කියලා කියන්නවත් බෑ නේද.. හොරු දෙන්නා වගේ ගෙට එනවා.."

@Shan

" අනේ යන්න හොරෙක් ආවනම් එහෙම ගෙදරම අතගාගෙන ඔයාවත් උස්සන් තමා යන්නෙ.. හව් ටු ට්‍රේන් යොර් ඩ්‍රැගන් ලම්සනයිද.."

හව් ටු ට්‍රේන් යොර් ඩ්‍රැගන් එකට වඩා හව් ටු රයිඩ් යොර් බෝයි ලස්සනයි.. කොහෙද මේවා කටට එනවා.. සෙනුකයා හරි රධ්‍ය අයියා වගේනම්කියන්න තිබ්බා.. මෙ වැඩිහිටි සමාජයට මගේ නොහොබිනා කතා කියන්න පුළුවන්ද.. බැහැනෙ..

" ලස්සනයි ලස්සනයි.. කෝ පොඩී.."

" අනේ මේ ඔය ගැටපොලොස් කොට්ටෝරුවා ගැන කතාකරන්නෙපා.. මම යන්න යන්නෙ.."

" ආ යමු යමු.. මම කොයිවෙලේ ඉඳලද බලන් ඉන්නෙ ගෙදර එනකල්.. ගිහින් කමු.."

" ඔයා කැමත් හැදුවද අයියෝ.. හරි වදේ නේද මම නිසා.. එහෙම නෑ නෙහ්.."

" අපොයි ඔව්.. වදේ තමා.. යමු යමු පහළට.."

මම ආධ්‍ය අයියත් එක්ක පහළට ගිහින් එයා කැම බෙදලා දෙනකල් මගේ කතාවෙ ඉතුරු ටික එයාට කිව්වා.. මේවා හිතේ තියන් ඉඳලා පුපුරලා ගියොත් එහෙම.. ඒකටනෙ මට හිත හොඳ දුක අහන අයියෙක් දීලා තියෙන්නෙ..

" ඔයාට කියන්න මගෙන් ඇහුවා පලපු ගවුමක් ඕනද කියලා පැජන්ට් එකකට යන්නෙ.. ලස්සන තිබ්බට මදිලු වැඩත් ලස්සන වෙන්න ඕනලු.. පිස්සු තමා.. ඒ මදිවට ලිෆ්ට් එක යූස් කරන්න දුන්නෙත් නෑ.. මම අහන්නෙ මගෙ නම ෂනේරු නෙ.. සරනේරු නෙමෙයිනෙ.. මම කැමතිම නැත්තෙ මගේ නම කෙලෙසනවට.. වරද් කියන කැල්ලට එහෙම මොකක් හරි කිව්ව නම් මම අපේ මාමට කියලා දත් ටික උගුල්ලනවා වෙළුසුමනගෙ.."

" කාට කියලා..??"

ආධ්‍ය අයියත් ඉතින් හෙන ආස ඇති අපේ මාමා ගැන අහන්න.. ඉඳපන්කො අඹරන්න මම..

@Shan

" අපේ මාමා අනේ.. ඔයා දැකලා නැනෙ.. ගමේ ගියානම් බලන්න තිබ්බා.."

" එහෙමද.."

" ඔව් මාමනෙ වරද් කියනකැල්ල තිබ්බෙ.. අපේ මාමා ඔහොම හිටියට මහ බුලත් මඩිස්සලයක්.. හමතිස්සෙම බුලත්මයි කන්නෙ.. තුන්වේලටමත් කනවනෙ.."

ආඪ්‍ය අයියා හිනාවේගෙන ඉදියට බත් ඉක්මනට ඉක්මනට බෙදාගෙන යනවා මට දැනුණා.. මට කරපු කියපු අපහාස වලට මම පලිගන්නවා මාමෙ..

" මාමා ඩෙන්ටල් ඩොක්ට කෙනෙක්නෙ.. බුලත් කන්න හොඳ නැනෙ චූටි.."

" ඒකතමා.. නොමහ ගියානෙ පහුගිය ටිකේ.. එයාව හදාගන්න කවුරුහරි හොයාගන්න ඕන.."

" ඒකනම් හරි තමා.. අපරාදෙනෙ ඔයාගෙ මාමා.."

" ඔව්.. අනික නාන්නෙත් නෑ අනෙ.. වැඩක් නෑ අපේ මාමා ගැන කියලා.."

" අපෝ නාන්නෙත් නැද්ද ඔයාගෙ මාමා.."

" නෑ කම්මැලිලුනෙ.. ඒකතමා හැටි.. නේද අනෙ.."

" ඕ-ආ.. එහෙමද.. ඒකතමා.. එන්නකො කන්න.."

ආඪ්‍ය අයියා මගේ අතට කෑම එක දුන්නම මම ඒකත් අරන් හැරෙද්දි රඪ්‍ය අයියා මහ කැත හිනාවක් දාගෙන මගේ දිහා බලාගෙන ඉඳලා වතුර වීදුරුවක්ම ගහලා ඇරියා.. උඩරංචාමඩමෙන් ඇහිඳ ගත්ත ගස්බෙල්ලා..

" පොඩී ඇති කන්න.."

" බෙදලා.."

"ආ බෙදාගන්න බෙදාගන්න.. හැමදාම මම බෙදුවහම වැඩියි කියලා නටනවනෙ.."

@Shan

" ඒකතමා බෙදාගැනපන්.."

මම බෝංචි කැල්ලක් කටේ පැත්තකින් තියාගෙන හපාගෙන හපාගෙන ගියා.. මාමට නම් මරු.. උයන්න පුලුවන් හබ්බෙක් ඉන්නවනෙ.. මට..?? කමක් නෑ පොශ් කෑම හරි උයාගන්න පුලුවන් අවුලක් නෑනෙ.. උයන්න පුලුවන්ද ඇහුවහම හෝඩියම දන්නවයි කියන්නෙ.. පිස්සු කවුවෙක් තමා..

" ලස්සන වුණාට මදි ඔක්කොම කන්න ඕන.."

රධ්‍ය අයියා මං ගාවින් නැගිටලා ගිහින් පිහාන සෝදගත්තම ආධ්‍ය අයියා ද නෝට් බුක් කියලා නිකොලස් ස්පාර්ක්ස් ගෙ එක්දාස් නමසිය බර ගනන් වල රොමැන්ටික් නවල් එකක් දිගෑරගෙන මං ගාවින් වාඩිවුණා.. ඉස්සරනම් කියෙව්වෙ ඉතින් රිසර්ච් පේපර්ස්නෙ.. පොඩි මාමා දියුණුවෙලා.. හැබැයි නවල් එක රොමැන්ටික් වුණාට ඇලී , නෝආ ගෙ තුරුලෙ මැරෙනවා හොස්පිටල් එකේ ඇඳක් උඩදි.. ඒ දෙන්නම මැරෙනවා.. හරි අමුතු දුක හිතෙන ඒත් සතුටුත් හිතෙන කතාවක්.. ඇත්තම ආදරණීය කතාවක්.. මම ඔක කියෙව්වෙ අටේදි.. අපේ ලයිබ්‍රි එකෙන් පොත ගන්න බැරි වෙලා ඊටපස්සෙ දවසක් ඔක ගයනිකා මැඩම් ගාව තියනවා දැකලා ඉල්ලන් කියෙව්වා.. ඒ මැඩම හරි හොඳයි.. මට ඒ පොත දුන්නා කියවන්න කියලා..

**" I am nothing special; just a common man with common thoughts, and I've led a common life**

...But in one respect I have succeeded as gloriously as anyone who's ever lived: I've loved another with all my heart and soul; and to me, this has always been enough.."

මම පොතේ මට මතක තියෙන ලයින් එකක් කිව්වහම රධ්‍ය අයියා කෑම එකත් බෙදාගෙන ඇවිත් මගේ ඉස්සරහින් ඉඳගත්තා..

" The best love is the kind that awakens the soul; It brings us to many other things; It plants a fire in our hearts and brings peace to our minds.."

ආධ්‍ය අයියයි මමයි එකපාරම පාඩුවෙ කෑම එක අනාගෙන කන රධ්‍ය අයියා දිහා බැලුවා ..

" ඔයා ඒක කියවලා තියේද.."

@Shan

" ඔව් මම කැමතිම නවල් එකක්.. රොමැන්ස් කැටගරි එකෙන්.."

" ආ ඔව්.. මම මේක ගත්තෙත් පොඩීගෙ කලෙක්ශන් එකෙන්.."

මම කල්පනා කලා කලා.. මගේ ඔලුවේ මොකක් හරි පත්තුවෙන්න හදනවා.. ඒත් නිමිලා යනවා.. මම ඇස් දෙක පියාගෙන කල්පනා කලා.. වුණා.. වුණා.. කල්පනා වුණා..!!

" ආ තවුසෙ..!!!! තවුසෙ මගේ පොත ගත්තා.. දවසක්.."

රධ්‍ය අයියා හිමිහිට මට ඇහැක් ගහලා කෑම එකෙන් කටක් කෑවා.. මම කකුල දික් කල්ලා රධ්‍ය අයියගෙ කකුලට පාරක් ගැහුවහම ඒකා මගේ කකුල් දෙක එහෙමම ලොක් කරගත්තා.. මම ඇදලා ගන්න හැදුවත් බැරිවුණා..

" ඇයි ඉතින් මෝනින් එසෙම්බ්ලි යන්නෙ නැතුව පන්තියට වෙලා නවල් කියෙව්වෙ.."

" මගේ බඩ එදා ඇත්තටම රිදුණා.."

" ඒ මොකක්ද චූටි ඒ කතාව.. මම දන්නෙ නෑනෙ.."

" ආධ්‍ය අයියෙ මේ පොලොස් කොට්ටෝරුවා මම ඔක කියව කියව ක්ලාස් එකේ ඉද්දි පොත ගත්තා.. එසෙම්බ්ලි ගියේ නෑ කියලා.. ඒ ද නෝට්බුක් පොත තමා.. දැන් නෙ මට මතක් වුනේ.. මම පණ බයේ හිටියෙ ගයනිකා මැඩම්ට පොත දීගන්න විදියක් නැතිවෙයිද කියලා.."

" ආහ්.. මට දැනුයි මීටර් වෙන්නෙ මෙයාලගෙ ලව් එක බිල්ඩ් අප් වෙන්න ඇත්තෙ කොහොමද කියලා ..එහෙමත් වුනාද.."

" ඔව්.."

" ඇයි පහුවදා මම ගෙනැල්ලා දුන්නැද්ද ඒක.. ඒවා කියන්නෙ නෑ.."

" ඇයි මට පොතෙන් ඔලුවට ගහලා ගියේ.. ඇයෙ කියැව්වොත් දණගස්සනවා යැයි යැයි මගුලක් කියලා ගියේ.."

" දණගස්සනවා තමා.."

@Shan

රඩ්‍ය අයියා ආඩ්‍ය අයියට පේන්නෙ නැතිවෙන්න මගේ දිහා අර හෙන දිග ඇස් පිහාටු තියන ඇස් දෙක යටින් බලලා ලාවට හිනාවුණා.. සැක්.. මොකක්ද ඒ කිව්ව කතාව..

" ඇයි තවුසෙට නැගලද.."

මම රඩ්‍ය අයියගෙ කට විතරක් හොලවලා ඇහුවහම රඩ්‍ය අයියා උරහිස් අකුලලා 'දන්නෑ' වගේ සයින් එකක් දීලා පාඩුවෙ කන්න ගත්තා.. මම කකුල ඇදලා මං ගාවට ගත්තා..

" හැලපයා.."

" මෙයාලා අවුරුදු හතක්ම වෙන් වෙලා ඉන්නවනෙ.. දුක හිතෙනවා ඒකටනම්.."

ආඩ්‍ය අයියා පොතේ පොඩ්ඩක් කියවලා ඒකෙ අස්සට බුක් මාක් එකක් දාලා කාණ්ණාඩිදෙකත් ගලවල ඒකෙ උඩින් තියලා පුටුවෙ පස්සට හේත්තු වුණා..

" ඔව්.. නෝවා ලෝක යුද්ධෙට යනවනෙ.. ලස්සනයි ඒත්.."

" මම මේ කාලෙකින් කියවන්නෙ.. නයිට් තියන දවස්වලට ගිහින් කියවන්න හොඳයි.."

මම ආඩ්‍ය අයියා කිව්ව එකට ඔලුව වනලා කෑම කාලා ඉවරවෙලා ගිහින් පිහාන සේදුවා..

" ලස්සන වුණාට මදි.. පිහාන හරියට හෝදන්නෝන.."

" අනේ මේ.. මම ඒක බලාගන්නම්.."

" හනේ මේ වලිකොකු දෙක එක්ක ඉඳලා මගේ ඔලුව කැක්කුම ගත්තා.."

මම ඒ වුණාට ආඩ්‍ය අයියට හිනාවෙලා රඩ්‍ය අයියට රවාගෙන කාමරේට ගිහින් ස්පෝර්ට්ස් බෑග් එකේ ඔබාගෙන ආපු ශෝටයි ටීශර්ට් එකයි අරගෙන වොශෲම් එකට ගිහින් හොඳට නාගත්තා.. මහන්සිවෙලා මහන්සිවෙලා ඇඟට වතුර වැටෙද්දි මාරම සනීපයි.. මම අර නවල් එක ගැන කල්පනා කලා..

@Shan

මටත් ලාවට දැනෙනවා මමත් එක්දාස් නමසිය හතළිහේ දකුණු කැරොලිනාවෙ සීබෲක් දූපතේ සැණකෙලියක් බලන්න ගිහින් ආදරේ මුලින්ම දැක්ක නෝවා කැල්හෝන් වගේද කියලා.. නැත්නම් අවුරුදු දාහතේදි හැමිල්ටන් උරුමක්කාරිය වෙච්ච ඇලී හැමිල්ටන්ද කියලා.. මමත් නෝට්බුක් එකේ හිටියනම්..මම හිතන්නෙ මේ ගෙවෙන්නෙ නෝවායි ඇලීයි ගත කරපු මුල්ම වසන්ත කාලය.. ඒ කාලෙ එයාලා හුඟක් සතුටින් හිටියා නෝවාගෙ අර අතෑරලා දාපු පරණ ගෙදර.. ඒත් ඉතින් හැමදේම කඩාකපල් වුණානෙ හැමිල්ටන් පවුලෙන් නෝවා දුප්පත් කියලා දැනගත්තම.. ඇලීව ගෙනැල්ලා හිරකරගත්තා.. නෝවා දෙවෙනි ලෝක යුද්ධෙට ගියා.. අවුරුදු හතක්ම ගෙවිලා එයාලා හම්බුනාම ඇලී විවාහ ගිවිස අරගෙන..ලස්සන ලෝයර් කෙනෙක් එක්ක.. අන්තිමට හැබැයි එයාලා එකතුවෙනවා.. ඒත් ඇලීට ඇල්ශයිමර් කියන ලෙඩෙ හැදිලා මතකෙ අමතක වෙනවා.. සැරින් සැරේ නෝවා මතක් වෙනවා.. ආයෙම අමතක වෙනවා.. ඔහොම ඉද්දි එකදවසක් උදේම රෝහලේ හෙදියක් දකිනවා ඇලී නෝවා රෝහල් ඇඳක එකිනෙකාගෙ තුරුලේ සාමදානෙන් සැනසිල්ලේ ස්වර්ගයට ගිහින් ඉන්නවා.. අන්තිමේදි කුරුල්ලො දෙන්නෙක් පියාඹලා යනවා.. ඒකතමයි කතාව.. කෙටියෙන්.. දුක හිතුණත් ලස්සන කතාවක්.. කතන්දර කියන්නෙ වෙනම ලෝකයක්.. ඒක දැනෙන්නෙ කියවන කෙනෙක්ටම විතරයි..

නවල් එකක් අස්සෙ මට ගෑණුකෙනෙක් වගේ ලොකු තොප්පියක් දාලා බටර්කප් මල් කිනිත්තක් අතේ තියන් මිටියාවතක් දිගේ හුළඟෙ යන දිග ගවුමක් ඇඳන් තාලෙට සිංදුවක් මුමුණන ගමන් යන්නත් පුලුවන්.. නැත්නම් පිරිමිකෙනෙක් වගේ ලොකු බොත්තම් අල්ලපු අනර්ඝ කබායක් ඇඟේ දාගෙන බස්තමෙන් පොළොවට තට්ටු කර කර අශ්ව කරත්තෙකින් ගමන් යන්නත් පුලුවන්.. එහෙමත් නැත්නම් දඟ කොල්ලෙක් වගේ මුළු ගමක් දෙවනත් කරන්නත් පුලුවන්.. ඕනම විදියක ජීවත් වෙන්න පුලුවන්.. ඒ හැඟීම තේරෙන්න නම් ඉතින්..කියවන්නම ඕන..

කොහොම වුණත් ඒකෙන් කියලා දෙනවා, ජීවිතේ සමස්තයක් විදියට ගත්තම අංගසම්පූර්ණ එකක් නෙමෙයි කියලා.. ජීවිතේ කියන්නෙ එකට එකතුවුනු අංගසම්පූර්ණ කථාංගවල එකතුවක් කියලා.. ඉතින් අපි සර්වසම්පූර්ණ නැති නිසා වාද විවාදවලට පැටලෙන්න වගේම සමහරදේවල් වලදි එකඟතාවයකට එන්නෙ නැතිවෙන්න පුලුවන්.. කොහොම වුනත් සම්බන්ධයක් අතරෙ ආදරේ තියන තාක්කල් 'ප්‍රශ්න' ඒ බැඳීම ශක්තිමත් කරනවා කියලා..

@Shan

( It teaches you that

**life isn't perfect as a whole**

. And life really is just a series of perfect moments strung together. You'll get into arguments and disagree from time to time because no one's perfect. But as long as there is love between you, fights will only make your relationship stronger..)

මම ඇඳුමත් ඇඳගෙන වොශෲම් එකෙන් එළියට එද්දි රඨ්‍ය අයියා සිංදුවක් අහනවා මේසෙ උඩ කොලේකුයි පෑනකුයි තියාගෙන.. සාගා එකෙ වැඩක්ද දන්නෙ නෑනෙ.. මම ටවල් එක රැක් එකෙන් දාලා කොලෝන් ටිකක් ඔලුවට හලාගෙන ගිහින් ඇඳේ පෙරළිලා හිටියා.. හරිම මහන්සී.. ඇඟ රිදෙනවා.. පැය බාගෙකින් විතර රඨ්‍ය අයියා ඇවිත් මං ගාවින් ඇලවෙලා අර බූවලු අඬු වලින් මාව බදාගත්තා..

" නිදිද.."

" නෑ.. ඇඟ රිදෙනවා.."

මම රඨ්‍ය අයියා ඉන්න පැත්තට හැරිලා එයාගෙ අත උඩින් ඔලුව තියාගත්තා..

" පේන්කිලර් එකක් දෙන්නද.."

" එපා බිව්වම ගැස්ට්‍රයිටීස් එනවා.. මම මෙහෙම ඉන්නම්.."

" ම්ම්.. ටික දවසක් යද්දි ඔක අඩුවේවි..

රඨ්‍ය අයියා මගේ මූනට වැටිලා තියන කොණ්ඩෙ ඔක්කොම අල්ලලා අතින් පිටිපස්සට කල්ලා නලලෙන් හාද්දක් තිව්වා.. එහෙම කොණ්ඩෙ අතින් පිටිපස්සට කරද්දි දැනෙන සනීපෙටම ඇස්පියවෙනවා..

" ටිකක් නිදාගන්න එහෙනම්.."

" ම්ම්.."

@Shan

මම රධ්‍ය අයියට ටිකක් කිට්ටු වෙලා එයාගෙ තොල් වලින් පෙක් එකක් තිබ්බා.. එයා ලාවට හිනාවුණා.. මම ආසයි එයාගෙ ඇස් දිලිසෙනවට.. ඒ තුනී කඳුලු පටලෙ එක්ක ඇස් දිලිසෙද්දි ආදරේ හිතෙනවා.. එයා මගේ කම්මුලේ පැත්තකින් අතක් තියලා මගේ තොල් වලා පහත් වෙලා හුගක් වෙලා හිටියා.. සෑහෙන්න වෙලාවක්.. මට කොච්චරද කියලා මතක නෑ..මම එයාගෙ ලා දුඹුරු පාට දුහුල් ශර්ට් එක අත් දෙකෙන් ගුලිකරගෙන ඉද්දි දන්නෙමත් නැතුව මගේ ඇස් බරවෙනවා වගේ දැනුනා..

මට අන්තිමේදි මතක තිබ්බෙ රධ්‍ය අයියා මාව කොට්ටෙකින් තියලා කාමරේ ලයිට් ඕෆ් කරන්න යනවා විතරයි.. මට ඇහේ අමාරුවටම එහෙමම නින්ද ගියා..

" තාරපැටියා.."

හායිම්.. මම ආවා ලමයිනේ.. අර ද නෝට්බුක් නවල් එක.. හම්බුණොත් අනිවාරෙන්ම කියවන්න හරිද.. මම ආදරෙන් ඉල්ලන රික්වෙස්ට් එකක්..

මම පහළින් කතාව ඔන්නම දාන්නම් සමරි එකක් වගේ.. උඩ කිව්ව එක තේරුනේ නැත්නම්..

එන්නාම්.. ලව් යූ.. ❤



#හරිමපෞ

(මම දන්නවා දිග වැඩී.. ඉමිහි.. කැමතිනම් විතරක් කියෝලා බලමන)

In a modern-day nursing home, an elderly man named Duke  begins to read a love story from his notebook to a female fellow patient .

The story begins in 1940. At a carnival in Seabrook Island, South Carolina, local country boy Noah Calhoun sees seventeen-year-old heiress Allie Hamilton for the first time and is immediately smitten. She continuously refuses his persistent advances until their well-meaning friends lure them together; they then get to know each other on a midnight walk through empty Seabrook.

@Shan

Noah and Allie spend an idyllic summer together. One night, a week before Allie is to leave town, she and Noah go up to an abandoned house called The Windsor Plantation. Noah tells her that he hopes to buy the house, and Allie makes him promise that the house will be white, with blue shutters, a walk-around porch, and a room that overlooks the creek so she can paint. They intend to make love for the first time, but are interrupted by Noah's friend Fin () with the news that Allie's parents have the police out looking for her. When Allie returns home, her disapproving parents ban her from seeing Noah again.

Allie fights with Noah outside and the two decide to break up. Allie immediately regrets the decision but Noah drives away. The next morning, Allie's mother reveals that they are going home that morning. Allie frantically tries to find Noah, but is forced to leave without saying good-bye. The Hamiltons then send Allie to New York, where she begins attending Sarah Lawrence College. Noah, devastated by his separation from Allie, writes her one letter a day for a year, only to get no reply as Allie's mother keeps the letters from her. Noah and Allie have no choice but to move on with their lives. Allie continues to attend school, while Noah and Fin enlist to fight in World War II. Fin is killed in battle.

Allie becomes a nurse for wounded soldiers. There, she meets the wealthy Lon Hammond, Jr. (), a well-connected young lawyer who is handsome, sophisticated, charming and comes from old Southern money. The two eventually become engaged, to the joy of Allie's parents, although Allie sees Noah's face when Lon asks her to marry him.

When Noah returns home, he discovers his father has sold their home so that Noah can go ahead and buy The Windsor Plantation. While visiting Charleston to file some paper work, Noah witnesses Allie and Lon kissing at a restaurant, causing Noah to go a little crazy, convincing himself that if he fixes up the house, Allie will come back to him.

While trying on her wedding dress in the 1940s, Allie is startled to read about Noah completing the house in the style section of a Raleigh newspaper and faints. She visits Noah in Seabrook and he invites her to

@Shan

dinner, during which Allie tells Noah about her engagement. Noah questions whether Allie's future husband is a good man and she reassures Noah that he is. Later in the evening, Noah invites Allie to come back tomorrow.

In the present, it is made clear that the elderly woman is Allie suffering from dementia, which has stolen her memories and Duke is her husband. Allie does not recognize their grown children and grandchildren, who beg Duke to come home with them. He insists on staying with Allie.

The next morning, Allie and Noah go rowing on a nearby lake and begin to reminisce about their summer together. As a rain storm starts Noah rows to shore, where Allie demands to know why Noah never wrote to her. After the revelation that Noah had indeed written to Allie, they share a passionate kiss, before making love into the night.

The next day, Allies mother appears on Noah's doorstep, telling Allie that Lon has followed her to Seabrook after Allie's father told him about Noah. Her mother takes Allie out for a drive to show her that there had been a time in her life when she could relate to Allie's present situation. On returning to Noah's, she hands her daughter the bundle of 365 letters that Noah had written to her. When alone, Noah asks Allie what she is going to do; Allie is confused and confesses that she doesn't know. Noah asks her to just stay with him, admitting it is going to be really hard, but he is willing to go through anything because he wants to be with her. Confused as ever, Allie drives off.

Allie drives to the hotel and confesses to Lon, who is angry but admits that he still loves her. He tells her that he does not want to convince his fiancée that she should be with him, but Allie tells him he does not have to, because she already knows she should be with him.

The film goes back to the elderly couple, and Duke asks Allie whom she chose. She soon realizes the answer herself; young Allie appears at Noah's doorstep, having left Lon at the hotel and chosen Noah. They embrace in reunion.

@Shan

Elderly Allie suddenly remembers her past before she and Noah/Duke joyfully spend a brief intimate moment together; after originally finding out about her illness, she had herself written their story in the notebook with the instructions for Noah to "Read this to me, and I'll come back to you." But soon Allie relapses, losing her memories of Noah yet again. She panics, and has to be sedated by the attending physician. This proves to be too difficult for Noah to watch and he breaks down. The next morning, Noah is found unconscious in bed and he is rushed to the hospital; he later returns to the nursing home's intensive care ward. He goes to Allie's room later that night, and Allie remembers again. The next morning, a nurse finds them in bed together, having both died peacefully holding each other's hands. The last scene shows a flock of birds flying away.

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 91 කොටස

දවස් ඉක්මනට ඉක්මනට ගෙවිලා යනවා වගේ මටනම් දැනෙන්නෙ.. මම එහෙම වෙනවට කැමති නෑ.. තව සති තුනකින් මම රධ්‍ය අයියා නැතුව ඉන්න පුරුදු වෙන්න එපැයි.. ඊයේ අම්මා මාත් එක්ක පැයක් විතර කතාකලා..ක්ලබ් එකේ විස්තර ඇහුවා.. ආච්චිඅම්මත් කතාකලා.. මාමත් එන්නලු ඉන්නෙ ළඟදි.. පවුලෙ පැත්තෙන් ගත්තොත් හැමදේම හොඳින් සිද්ධ වෙනවා.. රධ්‍ය අයියගෙ අප්පච්චි හෙට කොළඹ එනවා.. එයාගෙ අම්මා රට යන්නලුනෙ.. කන්සාල්ටන් කෙනෙක් වෙන්න ඉගනගන්න.. රධ්‍ය අයියනම් කියන්නෙ එයාලා දෙන්නටම අම්මා යන එක ගැනවත් කිසි දුකක් හිතෙන්නෙ නැහැල්ලු.. පොඩි කාලෙ ඉඳන්ම අම්මා ලොකුවට ළඟ නැති නිසා එයාලට දැන් අම්මයි තාත්තයි ගෙදර ඉන්නකොට අමුත්තො දෙන්නෙක් එක්ක ඉන්නවා කියලා වගේලු දැනෙන්නෙ.. ආධ්‍ය අයියත් අප්පච්චි ගැන කියනවට කැමති නෑ එච්චර.. දවසක් මට කෝල් කරද්දි කිව්වනෙ ජීවිතේ කඩාකපල් කරන්න ආපු නරුමයෙක් වගේ අප්පච්චිව පේන්නෙ කියලා..

කොහොමවුණත් මම කැමති නෑ රධ්‍ය අයියයි ආධ්‍ය අයියයි අප්පච්චිට බනිනවට.. එයාල ඉගනගත්තෙ දෙමච්පියොන්ගෙ සල්ලි වලින් නෙ.. අතපය හතර හොඳට හදලා තියෙන්නෙ ඒ මිනිස්සු.. එහෙනම් මම කොච්චර අපේ තාත්තට වෛර කරන්න ඕනද.. මම ජීවිතේටම දැකලා තියෙන්නෙත් එකපාරයි.. ඒකත් ළමයෙක් තමන්ගෙ තාත්තව දකින්න ඕන නරකම විදියට.. ඒත් මගෙ හිතේ වෛරයක් නෑ.. කලකිරීමක් එක්ක තියෙන්නෙ මහ එපාකරපු හැඟීමක්.. කොහොම වුණත් අවුරුදු දහ අට වෙනකල්ම තාත්තා මට ඉගනගන්න සල්ලි දුන්නනෙ.. සමහරවිට එහෙම දුන්නෙ උසාවි නියෝගයක් නිසා වෙන්න ඇති.. කමක් නෑ.. එහෙම හරි ඒක දුන්නනෙ වෙලාවට කලාවට..

මම හැමතිස්සෙම නැහුනෙ අනුන්ගෙ හීන මත්තෙ විතරයි.. මම බයෝ කලේ මගේ උවමනාවට නෙමෙයි කොහොමවත්.. ඒ මුලදි.. මම කැමති වුණේ නෑ බයෝ සෙක්ශන් එකේ වාඩිවෙලා පිසික්ස් ගනන් මැද්දෙ හිරවෙලා බයෝ පොත් අස්සෙ අතරමං වෙන්න.. ඒත් දැන් හිතෙනවා.. නෑ එහෙම වුණු එක හොඳයි කියලා.. අම්මගෙ කීමට කළා වුණත් විභාගෙ ඉවරවුණාම හිතෙනවා, මෙඩිසින් බැරිවුණොත් වෙන මොකක් හරි කරගන්න පුලුවන් නෙ කියලා.. දැන් ඉතින් ගිය හකුරට අඩලා වැඩක්

@Shan

නැනෙ.. මම එක්සෑම් එක ලියලත් ඉවරයි.. රිසාල්ට්ස් ගැනත් මට යාන්තමින් විශ්වාසයක් තියෙනවා.. අඩුම ඒ දෙකයි බී එකක්වත් ඒවි කියලා.. එහෙම ආවත් මට කමක් නෑ.. මට ඒ ඇති..

මම උදේම නැගිටලා අටට ගෙදරින් යන්න හයට විතර සුදු කැකුළු බත් එකක් රයිස් කුකර් එකට ගහලා ලූනු තෙල් දාලා පොල්සම්බෝලයක් හදාගත්තා.. හොඳ වෙලාවට කෑමක් උයාගන්න තරම් දැනුමක් තියෙනවා..

අද උදේ අට හමාරට ජිම් එකට යන්න කිව්වනෙ කෝච්.. ලාහිරුද තදහිරුද කව්ද ඉන්නවා කිව්වනෙ.. එතකොට මම ගිහින් ඔය ලාහිරුට කියන්න ඕන මම කෝච් එදිරිමාන්නගෙ ට්‍රේනර් කෙනෙක් කියලා.. වෙළුසුමනයට පෙනුම වගේම නමත් ගානට ඇවිල්ලා තියනවා.. එදිරිමාන්න.. මාන්නයනෙ එදිරි වෙලා ඇවිල්ලා තියෙන්නෙ.. ඒවගෙත් හැටි තමා.. මාන්නක්කාර වෙළුවුමන..

මම කෑම හදලා ගේ අතුගාගෙන අතුගාගෙන ගිහින් ඉස්තෝප්පුවෙන් දූවිලි ටික එළියට ගසද්දිම මම ඇහැ කොනෙන් දැක්කෙ එහාගෙදර දූතිකාව වැලේ රෙදි වනනවා.. මම දැන් මෙහෙට ඇවිත් අවුරුදු හතක් වෙනවා.. හැමදාම වගේ දකින්නෙ වැලේ රෙදි වනනවා විතරයි.. මම මොකුත් දැක්කෙ නෑ වගේ කොස්සත් අරගෙන ගෙට යද්දිම මට ඇහුණා නයෙක් මට ස්ස් ස්ස් ගානවා.. මම එකපාරම නැවතිලා නයා කොහෙද කියලා බැලුවා.. කලිස-කෑහ් මොකුත් නෑ..

" ස්ස්.. ස්ස්.. මල්ලි.."

මම ආයෙම වටයක් කැරකිලා අල්ලපුගෙදර රෙදි වැල පැත්ත බලද්දි කමනි ඇන්ටිගෙ දූ කුමාරි වැලේ එල්ලිලා මට ජ්ස් ජ්ස් ගානවා.. මෙ ගෑණිට උදේපාන්දර නැගලද වැලේ එල්ලිගෙන මට කතාකරන්නෙ.. මම කෝකටත් කොස්සත් අරගෙන වැට අද්දරට ගියා.. ඇයිද දන්නෑනෙ කතාකලේ..

" ඕ.."

" මල්ලි තනියමද ගෙදර ඉන්නෙ.."

නෑ මම ඉන්නෙ අන්තඃපුරේ පිරිවරාගෙන අක්බාර් වගේ.. මහ ගොං කතා තමා උදේ පාන්දර අහලා මගේ ඇගේ මාළු නටවන්නෙ..

@Shan

" ඕ ඇයි.."

මම ලාවට හිනාවෙලා කතාකලා.. ලොකුවට හිනාවෙන්නෙ නෑ ඔය බේසික ගෑණු දෙන්නා එක්ක.. ඕකිගෙ අම්මා තමා මට අපේ අම්මව අල්ලලා ගම පුරා ජරා කතා කියලා තිබ්බෙ..

" කවුද අර මෙහෙ යන එන අනිත් මල්ලි.. අර බයික් එකකින් එන්නෙ.. මල්ලිගෙ යාළුවෙක්ද.."

යාලුවෙක් නෙමේ රාවණාගෙ ආදර රාමා දඩුමොණරෙන් එන්නෙ රාවණාව බලලා යන්න..

" ඕ යාළුවෙක් අක්කෙ.."

" ආහ්.. ඒකතමා මම බැලුවෙ.. කවුද කියලා.. මල්ලි ඇයි තනියම.."

අර මාරදූතිකාව දෙකට තුනට නැමිලා බාල්දියේ තිබ්බ රෙද්දක් අරගෙන මගේ දිහා හෙන වලත්ත විදියට බැලුවා.. සැක් මේ ගෑණි නැමුණ පාර කිරිමණ්ඩලේම දිස් වුණා.. මට සිරාවටම හෙන අප්පිරියාවක් ඇතිවුණා මේ ගෙදර ගැන..

" තනියම නෙමේ අක්කෙ.. මම යනවා.."

මම අක්කට දෙකක් රවලා ගෙදරට එන්න ආවා.. මොනෞත්තක්ද යකෝ ඒ වුණේ.. මෙහෙම ගෑණු මම ජීවිතේට දැකලා නෑ.. අපිත් කෙල්ලො ආශ්‍රය කරනවා.. උන්ට සිරාවටම ගරු කරන්න ඕන.. මෙකනෙ වැඩේ.. කුඩෙකුයි කොට සායකුයි අන්දලා යවන්න තියෙන්නෙ කොටුවෙ බෝ ගහ යටට.. හරි අමාරුවෙන් අක්කා ඇත්තෙ.. හිතුවද දන්නෑ මට නගිනවා ඇති කියලා.. අක්කගෙ අහවල් මණ්ඩලේ දැක්කහම.. ඒ එක්කම ෆෝන් එක රිංග්ස් වෙනවා ඇහුන නිසා මම කාමරේට ගිහින් ඒක කනේ තියාගෙන ඇඳෙන් වාඩිවුණා..

" ආ මාමෙ.. මොකෝ උදේපාන්දර.."

" ඇයි අපිට ගන්න බැරිද.. මූ යකෝ.."

@Shan

" එහෙම එකක් නෙමේ අනේ.. නිකමට ඇහුවෙ.. ඉක්මනට එන්නකො මෙහේ.."

" ඒ මොකෝ.. තනියම ඉන්න බයද කොල්ලො උඹට.."

" බය නෑ ඒ වුණාට.."

" ඉදහන් මම එනවා ඉක්මනට.."

ඔව් ඔව් ඉතින් දැන් කොහොමත් ඉක්මනට ඒවි.. සාකිච්චා බලන්නත් පුලුවන් නෙ එතකොට.. හැමදාම.. දෙන්නට පෙම් කෙලින්න.. පව් ඉතින් ඒත්.. ආධ්‍ය අයියා බලාගෙන ඇත්තෙ මාමා කොළඹ එනකල්.. බෝතල් කට්ටකින් අනින්න..

" එන්න එන්න.. ඔයාගෙ සාකිරේ බලාගෙනනෙ ඇත්තෙ.."

" අනේ මේ පලයං බං යන්න.."

" ආව් ආව්~ අනෙ අම්මො අපේ මාමගෙ හිනාව.. උෘවූ.."

" මෙ මොනෞත්තක්ද.. උඹ නටපං.. මම අහන්න ගත්තෙ අතේ වියදමට සල්ලි තියද කියලා.."

" ඔව් ඔව්.. දැන් නම් ඕනවටත් වඩා තියනවා.."

" උවමනාවක් වුණොත් මට කතාකලා කියන්න ඕන හරිද.. දැන් යනවද ක්ලබ් එකට.."

" ඕ යන්න කියලා හැදුවෙ.. ගිහින් හවසට එන්නෙ.."

" මම.. පරිස්සමට ගමන් බිමන් යන්නෙ.. තේරුණානෙ.. රෑ වෙනකල් ඉන්නෙ නැතුව එන්න ඕන.."

" හා මාමෙ.."

" එහෙනම් මම තියනවා ඈ පිටී යන්නෝන.. බුදුසරණයි.."

@Shan

" බු- කට කලා නේද.. මේ ඔක්කොම එකයි.. හරියට කියන්න දෙන්නෙ නෑ තියනවා.. අනිත් දවසෙ සරණ පතන්න හොඳ නෑ.."

සරණ කිව්වහම මට අර සිදු එකේ පොඩි හාමුදුරුවො මතක් වුනා.. සරණ දුවන දිවිල්ලට වැඩලා බෑ දුවන්නම වෙනවා කියන්නෙ.. සක්කිලි පූසො ඔහොමම තමා.. එකතැනක ඉන්නෙ නෑ.. මම ඕවා දාහක් දේවල් කල්පනා කර කර ගිහින් කෑම බෙදාගන්නකොට මට ඇහුණා කවුරුහරි මිදුලේ වාහනයක් නවත්තනවා.. සුදාමිමියා උදේම ඇවිල්ලද කොහෙද.. මම කෑම එක බෙදලා මේසෙන් තියලා අත් දෙක පිහාගෙන ගෙදර ඉස්සරහට ගියා..

" උදේම නැගිටලා මිදුලත් අතුගෑවද.."

රධ්‍ය අයියා හෙල්මට් එක ගලවලා ඉස්තෝප්පුවේ බැම්ම උඩින් තියලා සෙරෙප්පු ගලවලා ගේ ඇතුළට ආවා..

" ඔව්නෙ.. මම හිතුවෙ ඔයා එන්න දවල් වේවි කියලා.. මම තාම කෑවෙත් නෑ.."

" දැන්ම යන්නෙ නෑ මම නිකන් උදේම ආවෙ.."

" අහ් ඒක මිසක්.."

මම රධ්‍ය අයියා ගේ ඇතුළට යනකල් ඉඳලා අත දෙපාරක් කරකලා හොඳ පාරක් පස්ස බම්ප් වෙන්නම දුන්නා.. රධ්‍ය අයියා මට දෙකක් රවලා ගේ ඇතුලෙ සෙටියෙන් ඉඳගත්තා..

" අත පය තියාගෙන ඉන්න බෑ නෙ.."

" බෑ.. මේ ඔයා කාලද ආවෙ.. කෑවට කමක් නෑ ආයෙම කමු.."

මම කුස්සියට ගිහින් තව පිහානක් අරන් සෝදන්න යද්දි රධ්‍ය අයියත් කුස්සියට ආවා..

" කවනවකො.."

" ආ..?? කමක් නැද්ද.."

@Shan

" කමක් නෑ.. ලස්සන වුණාට මදි තමන්ගෙ කොල්ලට කවන්නත් දැනගන්න ඕන.."

" හැබැයි මම ඇත්තටම ආධ්‍ය අයියා එක්ක පැනලා යනවා.. තවුසෙ මට එක එක කතා කියන නිසා.."

" හා මම මාමත් එක්ක පැනලා යන්නම්.."

මම ගත්තු පිඟාන පැත්තකින් තියලා රධ්‍ය අයියයි මාමයි එකට තියලා මවාගන්න ට්‍රයි කලා.. ඊයා.. රධ්‍ය අයියා ඇහැළ මල් ගහපු ඔංචිල්ලාවක් පැද පැද ඉද්දි අපේ මාමා තල්ලු දානවා.. කොහොමත් මුන් දෙන්නට ඔංචිල්ලාවෙ වාඩිවුණාම නැගිටගන්න බැරි අමාරුවක් තියනවනෙ.. එතකොට කවුද ඔතන ටොප් වෙන්නෙ.. අපේ මාමා බොටමෙක්ට ගැලපෙන්නෙ නැනෙ.. ඒවුණාට රධ්‍ය අයියව බොටම් කරන්නත් බෑ.. මොන මගුලක්ද ඒ.. මම අවුරුදු උත්සවේ දවසෙ රධ්‍ය අයියගෙ කනේ ඇහැළ මලක් ගැහුවට තුන් හිතකින්වත් මෙහෙම දෙයක්නම් බලාපොරොත්තු වුනෙ නෑ.. ඒ අස්සෙ මට ආධ්‍ය අයියවත් මැව්ලා පේන්න ගත්තා.. ආධ්‍ය අයියා කණ්ණාඩිදෙකත් දාගෙන මහාචාර්යතුමා වගේ මට රිසර්ච් පේපර් එකක් කියලා දෙනවා.. මම ඉක්මනට ඔලුව ගසලා හරි සිහියට ආවා.. සුදුඅම්මියව දෙන්න විදියක් නෑ..

" පැන පැන යන්න කැන්ගරුවෙක්ද.."

" මෙන්න මෙතනින් වාඩිවෙලා කාපන්.. කැන්ගරුවො ගැන අහනවා.."

රධ්‍ය අයියා පුටුවක් ඇදගෙන මගෙ ගාවින් වාඩිවුණා..

" අත කන්නෙ නෑ.."

" හරි හරි බං.."

මම පිගානෙන් කටක් අනලා රධ්‍ය අයියට කැව්වා..

" වරද්.."

" ම්ම්.."

" කීයටද ඔයාගෙ ක්ලබ් එකේ වැඩ ඉවරවෙන්නෙ.."

@Shan

" අට හමාරටනෙ එන්න කිව්වෙ.. මම හිතන්නෙ එකොළහට විතර ඉවර වෙයි.."

" ආ.. අයුකට ඔයා එක්ක කතාකරන්න ඕන කිව්වා.."

" අයුක අයියටට.. ඒ මොකද.."

" අයුක ලබන සතියෙ යනවනෙ.. ඊටකලින් කතාකරන්න ඕන ඇති.."

" අයුක අයියා ඉතින් ලොකුවට කතාකරන එක්කෙනෙක් නෙමෙනෙ.. මාත් එක්කත් ඕන්නම් වචන දහයකට වඩා කතාකල්ලා නැතුව ඇති.."

" ම්ම්.. ඒ වුණාට ඌ හොඳ එකා.."

" ඒකනම් ඇත්ත.. අයුක අයියා ගියාම සෙනුකයට හෙනට පාළු හිතේවි.. දැනුත් අපිට කියන්නෙ නැතිවුණාට ඌ ඉන්නෙ දුකින්.."

" ආ තව.. ගයනිකා මැඩම් ඔයාට එන්න කිව්වා හවස මැඩම්ව මීට වෙන්න.."

" ඇයි කිව්වෙ නැද්ද.. ආ කියනවකො හයියෙන්.."

" බෑ මේ සුදුළූණු තියෙනවා.."

" ඇයි සුදුළූණු වසද.. මල සමයං.."

මම ආයෙම බත් කටේ තිබ්බ සුදුළූණු කෑල්ල අයින් කල්ලා අනලා රධ්‍ය අයියගෙ මූණට ලං කලා.. ඊටපස්සෙ පුරුදු විදියටම ඉබ්බා කිරිමැටි- නෑ නෑ කිඹුලා කිරිමැටි ගිලිනවා වගේ මගේ අතත් එක්කම බත් කට කෑවා..

" මම එන්නද පික් කරන්න එකොළහට.."

" එපා.. මම එන්නම් ඉස්කෝලෙට.. එනකොට අයුක අයියා.."

" මම අයුකට ඉස්කෝලෙට එන්න කියන්නම්.."

" හා.. එහෙම කියන්න.."

@Shan

" ඔයා රසට උයනවනෙ.. ආත්තම්මගෙ කෑම වගේ.. රසයි.."

" එහෙමද.."

මම ලාවට හිනාවෙලා තව කටක් අනලා රධ්‍ය අයියට කැව්වා.. මෙකා කොච්චර කැව්වත් කනවනෙ.. ඒ වුණාට කියන්නෙ ඔකද.. ඩයට් කරනවා.. ග්‍රීන් ටී බොනවා.. කමක් නෑ ඉතින් එයා ඉන්නෙත් ටික දවසනෙ.. ඊටපස්සෙ හුඟ කාලෙකින් එනෙනෙත් නැනෙ.. මට පාළු හිතෙනවා..

" අනේ මට ජිම් යන්න බෑ අප්පා.."

" ඒ මොකද.."

" මට බෑ.. අනික මම මෙහෙම ඉන්න කැමති.. නැත්නම් මම සප්ලිමන්ට් බීලා මහත්වෙලා අර කියාන් අයියා වගෙ ඌරු පැටියෙක් වෙනවා.."

රධ්‍ය අයියා එකපාරටම හයියෙන් හිනාවුණා..

" මොකද හිනාවෙන්නෙ.."

" කියාන් වගේ..?? කියාන් කරන ඒවගෙන් දෙක තුනක් කළොත් මට උඹව උස්සගෙන හොස්පිටල් යන්න තමා වෙන්නෙ.."

" ඇයෙ යැයි යැයි තමා.. මෙන්න මෙක කනවා.."

" එහෙම ලොකුවට වර්ක් අවුට් කරන්න නෑ මම දන්න තරමට.. ජිම් ගිහින් එතන ඉන්න උන් එක්ක හිනාවෙවී කියව කියව ඉන්නැතුව වැඩෙ කරගෙන එන්න ඕන.."

" ඇයි.."

" මොකුත් නෑ.. මමනම් කියන්නෙ ගැළපෙනම කෝච් හම්බෙලා ඉන්නෙ ඔයාට.."

"....."

" තාරපැටියෝ.."

@Shan

" මේ.. වැඩිය කියවන්නෙපා හරිද.."

" ඇයි.."

" මම-මම- තවුසෙව තරු බලන්න එක්කන් යනවා හරිත.."

" දැන් මම ඒකට බය වෙන්න ඕනද.. සරනේරුවක් කතා කරයි.."

මම කකුල දිගෑරලා රධ්‍ය අයියගෙ කකුල් දෙක මැද්දටම පාරක් දෙන්න ගියාම ඒකා මගේ කකුලෙන් අල්ලගත්තා..

" ඒ වරද්!!!!!!!!!!!!!"

" මොකද.."

" උඹට ඒ පාර මොකක් වෙලාද.."

" මම තවුසෙගෙ ඇට 2ක තලලා දානවා.. මට සරනේරුව කියාගෙන ආවොත්.."

" මම හදපු නමක්ද ඒක.. මට කෑගහන්නෙ.. ඔයාගෙ කෝච්චනෙ කියන්නෙ.."

" ඔව් මම ඒ මාන්නක්කාර වෙළසුමනයගෙත් තලනවා තමා මට එක එක ඒවා කියාගෙන ආවොත්.."

" තාරපැටියට කේන්ති ගිහිල්ලද.."

රධ්‍ය අයියා මගේ කකුලෙන් අල්ලගෙනම වතුර එකක් වීදුරුවට දාගෙන බිව්වා.. මමත් ඉතුරු බත් ටික කාලා කකුල ගසලා ඇදලා අරගෙන ගිහින් පිහාන සේදුවා..

" වරද්.."

"....."

" වර~ද්.."

@Shan

".....''

" ච-"

" මොකද මොකද.. ඇයි වරද් තමා.."

" ඇයි කෑගහන්නෙ.. මම නිකම් කතාකලේ.."

" මම වොශ් එකක් දාගෙන ලෑස්තිවෙලා එන්නම්.. ඉන්න හරිද.."

" Take your time.."

මම හැරිලා යන්න ගිහිල්ලත් ආයෙම නතරවුණා..

" මේ.. මගේ ඇඳුම් ටික අයන් කල්ලා දෙන්නකො.."

දෙනවා උඹට මම..

-මීට ඉම්සර රධ්‍ය සනව් හෙලාක්ස

සරනේරුවක් කතාකරයි මැයෙන් වාක්‍යක් කොටාන යන්න..

රැට දිග එකක් කොටලා දෙන්නම්.. අයුක පෑන් බේසම වෙනුවෙන්.. උම්මවහ්.. ජිම ගිහින් සරනේරුව මක්කා කරගනීවිත..

ඒක දැනගන්න රැටත් එමන..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

@Shan

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 92 කොටස

" හෙට අප්පච්චියි අම්මයි දෙන්නම එනව නේ.."

" ම්ම්.."

" ඔයා අවුලෙන්ද ඉන්නෙ.."

" ටිකක්.. ම්ම්.. කියන්න තේරෙන්නෙ නෑ.."

" මෙ ඔයා ආයෙම ආවහම අපි පන්සල් යමු..??"

" ඒ මොකෝ එකපාරටම පන්සල් යන්න මතක් වුණේ.."

" ඇයි හොඳ නැද්ද.. මට හිතුණා යන්න ඕන කියලා.."

" යමු යමු.. Let's go anywhere you want.."

" ඇත්තටමද කියන්නෙ.. ඕන තැනකට හා ද.."

රධ්‍ය අයියා මගේ දිහා බලලා ආයෙම ඉස්සරහ බලාගෙන ඩ්‍රයිව් කරන්න ගත්තා..

" ඔව්..??"

" ආ එහෙනම් අපි තරු බලන්න යමු.."

මම කම්මුලට අතකුත් තියාගෙන රධ්‍ය අයියගෙ මූණ දිහාම බලාගෙන ඉද්දි මම දැක්කා එයාගෙ කනක් රතුවෙලා කම්මුල් දෙකත් රෝසපාට වෙනවා..

" උඹටනම් ලැජ්ජාවක් නෑ වරද්.."

" මට..?? ඇයි කලින් දැනන් හිටියෙ නැද්ද ඔයා.."

" නෑ කලිනුත් දැනගෙන හිටියෙ.."

@Shan

" එහෙනම් ඉතින් රතුවෙන්න ඕනයැ ඕකට.. මල විකාරනෙ.. ඇයි ඔයා තරු බලන්න යන්නැද්ද.."

" ඕක නවත්තගනින්.."

" බැ.. මම නවත්තන්නෙ නෑ.. ඔයාටත් මාව නවත්තන්න බැ.. කාටවත්ම බැ.. මම දැන් ඔයාව මෙතන රේප් කරන්නයි යන්නෙ~.."

" වරද්..!!"

" කියන්න.."

" ඔය කට එක විනාඩි පහකට පොඩ්ඩක් වහගෙන ඉන්නවකො.."

" විනාඩි පහකට..?? ඒ මොකද.. ඔයාට බෑ මගේ කට වහන්න.."

" අර පිටිපස්සෙ ප්ලාස්ටරයක් ඇති අරන් දෙන්න මට.."

" ඒ මොකටද.. කොහෙද තුවාල වුනේ.. එන්න මම බලන්නම්.."

මම රධ්‍ය අයියගෙ අත ඇදලා ගත්තම රධ්‍ය අයියා ඉස්සරහා බලාගෙනම මගේ කට දෙපැත්තෙන් හයියෙන් අල්ලගත්තා..

" කටට අලවන්න.. කටට.. පොඩ්ඩක් ඕක වහගෙන ඉන්නවකො.."

" ආව් අනේ.. රිදෙනවා කම්මුල අල්ලන්නෙපා.. සැක්.."

මම රධ්‍ය අයියගෙ අත ගසලා දැම්මා..

" මොකද..??"

" මම හිතුවෙ ඔයා මට අර ඩ්‍රාමා වල වගේ කිස් එකක් දෙන්න යනවා කියලා.. කියවනවා වැඩි නිසා.."

" ඩ්‍රාමා බලන එක නවත්තපන් එහෙනම්.."

" මම ඩ්‍රාමා බලන්නෑ කොහොමත්.. සෙනුක බලද්දි ඒවට එබිලා බලන් ඉන්නවා.. මම බලන්නෙ නරුටෝ.."

@Shan

" ඔව් අමුතුවෙන් බලන්න දෙයක් නෑ.. කණ්ණාඩියක් ඉස්සරහා හිටගත්තනම් ඔක්කොම විදියෙ ඩ්‍රාමා බලාගන්න තිබ්බා.."

" ඒකනෙ.. ඔයා තනිකරම නෙට්ෆ්ලික්ස් ඇප් එකක් තමා මෙ පැසෙන්ජර් සීට් එකේ වාඩිකරන් යන්නෙ.."

" ඔව් ඔව්.."

" සුදුඅම්මියා.. ඔයාට ආදරේ හිතෙනවා ඒයි.."

මම රධ්‍ය අයියගෙ කම්මුල් දෙක අල්ලලා දෙපැත්තට ඇද්දහම රධ්‍ය අයියා මූණ ඇද කරගෙන අහකට ගත්තා..

" මම ඔයාට සිංදුවක් කියන්නම්.."

"....."

" නිය රටා මවනවා වගේ එකක් හරි නෑ නේද.. ආ මෙ සනුක සාගා එනවා නේද.. වෝව්..මේ පාර සාගා එකනම් මිස් කරගන්න හොඳනෑ.. මගේ බෝයිපෙන් ප'ෆෝම් කරනවා සාගා එකේ.. නේද.. නේ.."

" ම්ම්.."

" ඉන්න ඉන්න මම සිංදුවක් කියන්න.. ඔන්න හරිද.. අහම්..

Can you stay up all night?

Fuck me 'til the daylight

34, 35 (yeah, yeah, yeah, yeah)

Can you stay up all night? (All night)

Fuck me 'til the daylight

34, 35 (yeah, yeah, yeah, yeah).. ලස්සනයි නේද.."

" මොනවහරි උදේ පාන්දර බිව්වද.."

@Shan

" ඕ මයිලෝ දාලා කිරි බිව්වා.. ඔයා දන්නවද 34 + 35 කීයද කියලා.. දන්නවනෙ.. මැත්ස් වලට අයිලඩ් රන්ක් එකකුත් තියනවනෙ.."

"....."

" කියන්නකො කීයද කියලා.. 34 + 35.. "

" 69 යි.."

" Means I wanna 69 wit' ya', no shit

Math class, never was good.."

රධ්‍ය අයියා මගේ දිහා බලලා දෙකක් රැව්වම මම කකුල් දෙකත් සීට් එක උඩට අරගෙන හෙන හයියෙන් හිනාවුණා.. මූණ නම් ඒක බලන්නම වටිනවා.. කේන්තියෙන් පිපිරිලා යන්න ඔන්න මෙන්න තියන බැලුම් බෝලයක් වගේ.. අබ වුට්ටක් විසික් කරානම් ඒත් පිපිරිලා යනවා.. මම ඇදිලා ගිහින් රධ්‍ය අයියගෙ කම්මුලෙන් හාද්දක් තිබ්බා..

" ඇයි රවන්නෙ.. මම කියන එකක් නෙමෙ.. අරියානා ග්‍රැන්ඩ් තමා සිංදුවෙ අන්තිමට එහෙම කියන්නෙ.."

"....."

" To be young and in love in New York City

To not know who I am but still know that I'm good long as you're here with me

To be drunk and in love in New York City

Midnight into morning coffee

Burning through the hours talking

Damn, I like me better when I'm with you

I like me better when I'm with you

@Shan

I knew from the first time, I'd stay for a long time 'cause

I like me better when

I like me better when I'm with you.."

රධ්‍ය අයියා රවගෙන ඉඳපු ඉසකුඩිච්චි මූණෙ යන්තම් හිනාවක් ඇඳෙනවා මම දැක්කා..

" It's not New York City.. It's Colombo City.."

" ඔව් නේද.. Anyway, I like me better when I'm with you.."

අපි හිටියේ ක්ලබ් එකේ පාකින් ලොට් එකේ.. මම ගලවලා තිබ්බ සපත්තු දෙක හරියට කකුල් දෙකට දාගෙන ලේස් එක තද කල්ලා ගැටගහගත්තා..

" මම එන්නද.."

" එපා.. ඔයාටත් පරක්කුනෙ.. මම යන්නම්.. හවසට එන්නා~ම්.."

මම කාර් එකෙන් බැහැලා යන්න හදලත් ආපහු සීට් එකේ පිටිපස්සට ඇලවෙලා රධ්‍ය අයියගෙ තොල් වලින් පෙක් එකක් තිබ්බා..

" පරිස්සමින් එන්න.."

" පරිස්සම් වෙන්න එපැයි ඒයි.. රෑට තරු බලන්න යන්න තියෙනවනෙ.."

රධ්‍ය අයියා පරිස්සමින් එක්ක කිව්වහම මම කට කැඩිච්ච කතාවක් කියලා ඇහැක් ගහගෙන දුවගෙන දුවගෙන ක්ලබ් එකට ගියා.. දැන් ළාහිරු හොයාගන්න එපැයි සේරම පැත්තකින් තියලා.. මම ක්ලබ් එකේ ජිම් එක තියන ෆ්ලෝ එකට ලිෆ්ට් එකේම ගියා.. මාන්නක්කාර වෙළඳසුමන අද නැනෙ.. ඉඳපන් කෝච්සර් මම අද යන්නෙත් මේ ලිෆ්ට් එකේම තමා.. එහෙම නැතිවුණොත් මගේ නම වරද් නෙමේ..

මම ස්පෝර්ට්ස් බෑග් එකත් කරේ එල්ලගෙන සාක්කුවට අත් දෙක ඔබාගෙන ජිම් එකේ දොරෙන් ඇතුළට යද්දි ජිම් එකේ කොල්ලො දෙන්නෙක් වර්ක් අවුට් කරනවා.. උන්ට මම ආවා කියලා ගානක්වත් නෑ කන් වල එයාපොඩ්ස් ගහගෙන ඉන්න නිසා.. එකෙක් වෙට් ලිෆ්ටින්

@Shan

කරනවා.. උගේ ඇඟ දිහා බලලා කණ්ණාඩියෙන් පේන මගේ ඇටිකිති ශරීරෙ මට පේනුනම මට වහ කන්න හිතුනා..

" ඌට මට වගේ ඉණක් නෑනෙ.. "

මම මගේ හීනියට ගානට තියන ඉණ දිහා බලාගෙන කල්පනා කර කර ඉද්දි මගේ පැත්තට ඇවිදගෙන ආවෙ මට වඩා පොඩ්ඩක් විතර උස අයිය කෙනෙක්.. මම ඌ එක්ක හිනානොවී එන හැටි බලාගෙන හිටියා.. සයිකල් හැන්ඩ්ල් එකක් ගිලලා වගේ.. ඒ අස්සෙ මට කියාන් අයියවත් මතක් වුණා..

" කෝච් එදිරිමාන්නගෙ ට්‍රේනී බෝයි නේද මේ.."

" අ.. ඔව්.. ළහිරු..??"

" යා යා මම ළහිරු.. එතකොට මේ.."

" ෂනෙරු.."

" අහා.. කෝච් මට ඔයාගෙ ඩීටේල්ස් දුන්නා.. මම දිගටම ඔයාගෙ ඉන්ස්ට්‍රක්ටර්.."

මම ලාවට හිනාවෙලා ඔලුව වැනුවා.. වැඩිය කතාකරන්න යන්න ඕන නෑනෙ.. ඉස්කෝලෙ සම්ප්‍රදාය ඉස්සරහට ගෙනියන්න එපැයි..

ඊටපස්සෙ ළහිරු මට ෆයිල් එකක ක්ලිප් කරපු වර්ක් අවුට් ප්ලෑන් එකක් ගෙනැත් දුන්නා.. ඒකෙ තියන විදියට වර්ක් අවුට් කරගෙන යන්න.. මුල්ම ටික නම් හැම ඇක්ටිවිටි එකකටම තිබ්බෙ පැය බාගයක් වගේ.. ඉස්සරහට යන්න යන්න ටයිම් වැඩි කල්ලා දාලා තියෙනවා.. මම ඉතින් හෙන ආතල් එකේ එයාපොඩ්ස් දෙකත් කනේ ගහගෙන ට්‍රෙඩ්මිල් එක ගාවට ගිහින් ඒකත් ඔන් කරගෙන දිව්වා.. මේක හරිම ලේසිනෙ.. මේ ක්ලබ් එකේ කෝච් නැතිවුණාම ඇතිවන සාමකාමී පරිසරය තමයි නිදහස කියලා කියන්නෙ.. 'නිදහසට' මගෙන් නිර්වචනයක්.. වේළසුමන හිටියනම් මෙතන ලතෝනි තියයි.. සරනේරු අරම කරන්න.. සරනේරු මෙහෙම කරන්න.. අයිසෙ කෑද බීලද ආවෙ.. කියලා..

අනිත් එක.. කෑද කියන්නෙ කොච්ච ගුණ කෑමක්ද.. අපේ ආච්චිඅම්මා තමා එහෙම කියන්නෙ.. දැන් ඔය ඉස්සරකාලෙ වේළසුමනලා එහෙම බීලා

@Shan

තියෙන්නෙත් කැඳ ජාති තමා.. කෝවගෙ ඇඟ විතරයි වෙළසුමනගෙ වගේ.. මොලේනම් අර ඉස්කෝලෙ පොකුණෙ ඉන්න ඉබ්බා තරම්වත් නෑ.. මගේ ඉබ්බා පරිස්සමින් ඉන්නවද මන්දා.. අද ගියාම පොකුණට එබෙන්න ඕන..

මම කිය කිය හිටියෙ කැඳ ගැනනෙ.. ඉතින් අපිට දහය වසරෙදි අපේ ඉතිහාසෙ උගන්නපු සර් කිව්වා සද්ධර්මරත්නාවලියෙද කොහෙද සඳහන් වෙලා තියෙනවා කියලා ඉස්සර කෑමබීම වල කැඳ ප්‍රධාන තැනක් උසුලනවා කියලා.. එහෙම තමා මම කටපාඩම් නම් කලේ.. කැඳ කිව්වහම ඉතින් කොච්චර කැඳ තියද.. කොළකැඳ තියෙනවා, කුරක්කන් කැඳ තියෙනවා, පොල්කිරි කැඳ තියෙනවා, සුදුළූණු කැඳ තියෙනවා.. අන්න සුදුළූණු කැඳ වලින් තඩි වීදුරුවක් හොඳයි මගෙ බෝයිපෙන්ට පොවන්න..

බෝයිපෙන් කිව්වහම මතක් වෙන්නෙ අර මම ගමේ ගිහින් ඉද්දි එකපාරක් ගැටපොලොස් කොට්ටොරුවට ගෑණියෙක් සෙට් වෙන්න එපා කියලා සාප තියපු හැටි.. මගේ කටනම් එච්චර හොඳ නැද්ද කොහෙද.. කොහොමහරි අන්තිමට ගෑණියෙක් සෙට් වුණේ නෑනෙ.. ඒකටත් මමමනෙ කර ගැහුවෙ.. ඒත් ඉතින් කර ගැහුවාම කියන්නත් බෑ.. මමත් පොඩ්ඩක් කරේ නැග්ගනෙ ඩයල් එකගෙ.. කමක් නෑ කොහොම වුණත් දැන් ඌටයි මටයි දෙන්නටම ගෑණු නැහැනෙ.. ගෑණුනම් ඕනෙත් නෑ.. අනික රධා අයියා වගේ හෙන සෙක්සි පස්සක් තියෙන ගෑණු කොහෙන් හොයාගන්නද.. මට සුදුඅම්මි හොඳයි.. මගෙ සුදුළූණු කැඳ වීදුරුව..

" සරනේරු.. අයිසෙ ඔය කැට්වෝක් එක නවත්තනවා.."

එකපාරටම මම පියවි ලෝකට පතබෑවුණේ මගේ ඉස්සරහින් කෝච කාරයා මැවිලා පේන්න ගත්තු නිසා.. හරිනෙ.. මම පොරට කොච්චර කැමති නැද්ද කියනවනම් මට මැවිලත් පේන්න අරගෙන වගේ.. මම පොඩ්ඩක් ඇස්පිය ගහලා බැලුවා..

අඩෝ!!!! නෑ නෑ වෙළසුමනයා වැඩලා තමා.. මම කෝච්ට මනුස්සකමට හිනාවුණාම කෝච් ඇවිත් ට්‍රෙඩ්මිල් එකේ ස්පීඩ් එක දෙගුණයක් කල්ලා දැම්මා..මම හිතුවෙවත් නැති වෙලාවකම වෙගෙ වැඩි වෙච්ච නිසා තා ඩිංගෙන් බිම පතබෑවෙනවා..

" හරි අප්.. කොන්ද කෙළින්.. කොන්ද කෙළින්.. පපුව ඉස්සරහට.."

@Shan

කෝච් මගේ ඉස්සරහා ඉඳගෙන ලතෝනි තියන්න ගත්තා.. මේ ආත්මයේ මට නිදහස හිමි නැතුව ඇති සමහරවිට.. මොකක් කරන්නද.. මගේ ලැබීම තමා..

අන්තිමට මම හෙන ලේසියි කියලා කරන්න ගත්තු ට්‍රෙඩ්මිල් එකේ වැඩේ ඉවරවුණේ හති දුසිමක් විතර හලාගෙන ඇඳ පුරාම දාඩිය නාගෙන.. ඊටපස්සෙ මම කෝච්ගෙ පස්සෙන් පුල් අප් බාර් එක ගාවට ගියා.. ළහිරුත් ඊට ටිකක් එහායින් හිටියෙ..

" තර්ටි මිනිට්ස්ම එපා.. ෆිෆ්ටීන් මිනිට්ස් මුලින් ප්‍රැක්ටිස් කරමු.."

මම ඔලුව වනලා මම වගේ දෙකක් උස පුල් අප් බාර් එක දිහා බලාගෙන ටිකක් වෙලා කල්පනා කලා..කෝච් මම එක්සසයිසස් පටන් ගන්නකල් අත් දෙකත් බැඳගෙන හෙනකඳයා වගේ බලාගෙන ඉන්නවා.. උස මදියි කියන්නත් ලැජ්ජයි මොකක්ද වගේ.. මේ ජිම් වල ඉන්න ඉන්ස්ට්‍රක්ටර් හැතිකරේට තේරෙන්නැද්ද මං අහන්නෙ මම වගේ පොඩ්ඩක් උසින් අඩු මිනිස්සු මෙකට යනවා එනවා කියලා.. එක්කො බංකුවක්වත් හොයාගෙන ඇවිත් තියාගන්නද.. මම හෙනකඳයා වගේ සර් දිහා ඇහැ යටින් බැලුවහම පොර හිමින්සැරේ කට පිහිදගන්නවා මම දැක්කා.. ඒ එක්කම වගේ ළහිරු මම ඉන්න පැත්තට ඇවිදගෙනාඅවා..

" උස මදි වගේ නෙහ්.."

" ඒකතමා.."

ළහිරු මං ගාවට ඇවිත් මං දිහා බලලා ආයෙම පුල් අප් බාර් එක දිහා බැලුවා.. බලන්න දෙයක් නෑ බෑ තමා..

" Let me help you.."

ළහිරුවා මම මොකුත් කියන්නත් කලින්ම ඇවිත් මාව උස්සලා බාර් එකට කිට්ටු කරන්න යද්දිම කෝච් බැඳගෙන හිඳපු අත් දෙකත් ලිහාගෙන ළහිරුගෙයි මගෙයි මැද්දෙන් හිටගත්තා.. උස නෑ කියලා ඒකටත් බනිවිද දන්නෙ නෑ.. වෙඑසුමනයා..

" මම ෂනෙරුව බලන්නම්.. ළහිරු කරපු වැඩේ කන්ටිනිව් කරන්න.."

@Shan

" ඔකේ සර්.."

ළහිරුවා ආයෙම යන්න ගියාම සර් මාව අත් දෙක යටින් උස්සලා පුල් අප් බාර් එක ගාවට කිට්ටු කලා.. මම අත් දෙක දිගෑරලා ඒක අල්ලගත්තා.. මාව නිකන් ඉස්සුවෙ කුකුල් පැටියෙක් ඇඟිලිදෙකෙන් අල්ලලා උඩට විසික් කරනවා වගේ.. ඔය කිව්වෙ මගේ නම හරියට..

" හරිද.. සරනේරු..??"

සැක්..

" ආ ඕ හරි සර්.."

මම බාර් එක අල්ලගෙන කකුල් දෙක අකට බැඳගෙන උඩ පහත වෙද්දිත් සර් මගේ ගාවටම වෙලා බලාගෙන හිටියා.. හරියට මම මෙ දැන් වටෙයි මෙ දැන් වැටෙයි වගේ.. ටිකකින් සර් එහාට වුණා.. ඒත් සර් එතන තිබ්බ කණුවකට හේත්තුවෙලා ෆයිල් වගයක් බල බල මොනවද ටික් කලා.. එකොළහට පහක් විතර තියලා මම දාඩිය පෙරාගෙන හති දමාගෙන ජිම් එකෙන් එලියෙ තිබ්බ බෙන්ච් එකක ඉඳගෙන ටවල් එකකින් ඇඟ පිහිදගත්තා.. මහන්සී මහන්සී මාරම මහන්සී.. ඒ එක්කම සර් ඇවිත් මං ගාවින් හිටගත්තා.."

" පළවෙනි දවස හොඳයි.. අනිත් දවස් වලටත් මෙහෙම මහන්සි වෙන්න ඕන.."

" හරි සර්.. සර් මෙහෙ ආවෙ..??"

" ඇයි මම එන්න හොඳ නැද්ද.."

" අපෝ නෑ නෑ සර් එන්න.. එහෙම හොඳයි.."

නොදකින් මගෙ කට.. හොඳයි ගලක තියලා මිරිස් ටිකක් දාලා අඹරන්න.. අපරාදෙ ඇහුවෙ..

" සරනේරු..??"

මම ඔලුව උස්සලා සර් දිහා බැලුවා..

@Shan

" ඉටස් ෂනෙරු සර්.. ෂ-නෙ-රු ඉටස් ෆ-මම කිව්වෙ මම ෂ-නෙ-රු.."

" සරනේරු..??"

මම මගේම නියපොත්තක් කටෙ ගහගත්තා.. ඇයි මම මගේ නම මෙ මාන්නක්කාර වෙළසුමනයට හරියට ප්‍රනවුන්ස් කරන්න එක සැරයක් හරි කාලෙ නාස්ති කලේ.. මමනම් අම්මා කියනවා වගේම පොල් පිත්තෙන් කපාගත්තු එකෙක් වගේනෙ හැසිරෙන්නෙ..

" වෙළසුමනයා.."

මම කට අස්සෙ තියාගෙන කේන්තියෙන් මිමිණුවාම සර් මගේ දිහා ඇහිබැමක් උස්සලා බැලුවා..

" වට් ඩිඩ් යූ සේ..??"

" ආ නතින් නතින්.. අම් ජස්ට්.. හහ.."

මම ගොං හිනාවක් දාලා නැගිට්ටා චේන්ජ් කරගෙන ඉස්කෝලෙට යන්න..

" සර්.. මම යන්නම්.."

" කොහෙද යන්නෙ.. ස්කූල් ටීශර්ට් එකක් දාගෙන..??"

" ආ මම ඉස්කෝලෙට යනවා සර්.. වැඩ වගේකට.."

" ඇයි තමුන්ද ඉස්කෝලෙ හෙඩ් ප්‍රිෆෙක්ට් වෙන්න ඉන්නෙ.. ඔච්චරට ඉස්කෝලෙටම දුවන්නෙ ඉවරවුණු ගමන්.."

අන්න අන්න මාන්නක්කාර වෙළසුමනයෝ ඔයාට වැරදුනා.. අර වෙන්නායි එක්ස්ප්‍රස් එකේ සාරුක් හායි කියන්නෙ.. අලුවාකාරයා අවතක්සේරු කරන්නෙපා කියලා.. මටත් කියන්න තියෙන්නෙ ඒකම තමා.. අවතක්සේරු කරන්නෙපා හෙනකදයෝ.. මම සර්ට කට කොනෙන් හිනාවෙලා පොඩ්ඩක් ළගට කිට්ටුවෙලා උඩ බැලුවා.. මොකද ඒකා වෙළසුමනයා උසම උසයිනෙ.. කෝච් මං දිහා ඔලුව පොඩ්ඩක් නමලා බැලුවා..

" මම තමයි හෙට ප්‍රිෆෙක්ට් වෙන්න ඉන්නෙ.."

@Shan

" ආ..??"

" මම තමයි අපේ ඉස්කෝලෙ හෙඩ් ප්‍රිෆෙක්ට් වෙන්න ඉන්නෙ.. මම බැජ් එක ගත්තම ගෙනැල්ලා පෙන්නන්නම් සර්ට.."

සර් මං දිහා ඇස් දෙකත් ලොකු කරගෙන බලාගෙන ඉද්දි මම දුවගෙන දුවගෙන ලිෆ්ට් එක පැත්තට ගියා.. හුටා!! ටවල් එක අමතක වුනා!!

මම එහෙමම යූ ටර්න් එකක් ගහලා ආයෙම ටවල් එකත් අරගෙන පඩිපෙළ බැහැගෙන බැහැගෙන පල්ලෙහාට දිව්වා.. හහ්.. ආවා මෙතන.. ඉදපන්කො බැජ් එකත් ගහගෙන මගේ අර බ්ලෙසර් එකත් දාගෙන ෆොටෝ එකක් ගහලා දානවා වට්සැප්.. එහෙම හිතාගෙන අන්තිම පඩියට පැන්නා විතරයි තා ඩිංගෙන් හොම්බෙන් යනවා.. කවුද යකෝ පඩිපෙළ මොප් කලේ අවෙලාවෙ..

මම හිතට එන සේරටම බැන බැන පාරට ඇවිල්ලා ටැක්සි එකක් අල්ලගෙන ඉස්කෝලෙට පියාඹලා යන්න ගියා.. සෙනුකයගෙ ප්‍රේමවන්තයා හම්බෙන්න තියෙනවනෙ.. අයුක අයියා කතාකරන්නෙ හෙන කලාතුරකින් නිසා මේ වගේ අවස්තා මගැරගන්න හොඳ නෑ.. කියාන් අයියා නම් ඉතින් වක්කඩේ කඩපු බොම්බයිමොටයිකාරයා වගෙ කියවනව අකියවනව ඉවරයක් නෑනෙ.. ඒ වගේද අයුක අයියා..

මම ඉස්කෝලෙට එද්දි එකට විතර ඇති.. ගයනිකා මැඩමවත් හම්බෙන්න කිව්වනෙ.. මම ඉස්කෝලෙන් බැහැලා අයුක අයියට කෝල් එකක් ගත්තම දෙපාර රිංග්ස් වෙන්න කලින් ආන්සර් වුණා..

" අයියා ඉස්කෝලෙද ඉන්නෙ.."

" ඔව් ෂනෙරු.. නුග ගහ ගාව බෙන්ච් එකට එනවද.."

" ආ මම ඔයාව දැක්කා.. ඉන්න එන්නම්.."

මම බැග් එකත් එල්ලගෙන ඉස්කෝලෙ ඈතම ඈත පෙනුනු නුග ගහ ගාවට දුවගෙන දුවගෙන ගිහින් බෙන්ච් එකෙන් ඉඳගත්තම අයුක අයියා ලාවට හිනාවුනා.. හිනාවෙලා මට ෆැබ් එකේ අයිස් කොෆී එකක් මගේ ඉස්සරහින් තිබ්බා.. ෆැබ් එක.. රධ්‍ය අයියයි අයුක අයියයි කොයි ලෝකෙ ගියත් කෑම උස්සන් එක ප්ලේස් එක..

@Shan

" තැන්ක් යූ.. අයියා ඇවිත් හුඟ වෙලාවක්ද.."

" ටිකක් වෙලා.. මම රධ්‍යව හම්බෙන්න ගියා.. ක්ලබ් එකේ වැඩ කොහොමද.."

" කරගෙන යනවා.. අවුලක් නෑ ඉතින්.. හැබැයි ඒකෙ කෝච් හෙන සැරයි.."

" එහෙමද.. මහන්සි වෙලා ප්ලේ කරන්න.. You've got the talent.. Don't waste it.."

" ම්ම්.."

මම අයිස් කොෆී බොටල් එක කඩලා ඒකට බටේ දාගෙන උගුරක් ඇද්දා.. අයුක අයියා හෙන ලොකු හුස්මක් අරගෙන කතාකරන්න පටන් ගත්තා..

" ෂනෙරු මල්ලි.. මම මේ කියන ටික හොඳට හිතට ගන්න හරිද.."

මම ඔලුව වනලා බෙන්ච් එකේ අයුක අයියා පැත්තට හැරුණා..

" ඔයා ඉස්කෝලෙ හෙඩ් ප්‍රිෆෙක්ට් වෙනවා.. ඒක දැනටම බෝඩ් එක ඩිසයිඩ් කල්ලා ඉවරයි.. හිතට අරගෙන බැජ් එක වෙනුවෙන් ඉස්කෝලෙ වෙනුවෙන් මහන්සි වෙන්න.. තේරුණාද.. මට ඔයාලගෙ බැජින් සෙරමනි එක වෙනකල් ඉන්න වෙන්නෙ නෑ.. මට මල්ලිව හම්බෙලාම කතාකරන්න ඕන වුණා.."

" මට තේරෙනවා අයියේ.."

" ම්ම්.. අනික චමිරුගෙන් පරිස්සම් වෙලා ඉන්න.. මම ඔයාව විශ්වාස කල්ලා මේ දේවල් කියන්නෙ.. ඔයා ඒක රකීවි කියලා මම දන්නවා.. චමිරු කියන්නෙ මගේ රිලේශන් කෙනෙක් ඇත්තටම.. රිලේශන් කෙනෙක් කියන්නෙ.. අම්.. මම කොහොමද මල්ලි ඔයාට මේක කියන්නෙ.. එයා අපේ තාත්තගෙ ප්‍රයිවට් සෙකට්‍රිගෙ පොඩි පුතා.."

" ආ මොකක්..???"

" ම්ම්.. මල්ලිට මම කියන්න ඕන නැනෙ.. අපේ තාත්තා ගැන.. ඉතින් චමිරු කියන්නෙ මගේම ලේ තියන තව එක ළමයෙක්.. ඒ තරහට තමා ඔයාට මුලින්ම මාව පාව දීලා ඔයාගෙ යාළුවොන්ට බොරු කියලා තිබ්බෙ..

@Shan

පස්සෙයි දැනගත්තෙ චමිරු රධ්‍යට කැමතියි කියලා.. කොහොම වුණත් චමිරු ඉන්නෙ ඔයා එක්ක කේන්තියෙන්.. ඒ නිසා පරිස්සමින් වැඩ කරන්න.. මෙච්චර කාලෙකට මෙහෙම ඇටෑක් දෙන්නෙක් හෙඩ් -ඩිපියුටි හෙඩ් වුණාමයි.."

" මම ඔය බවක් දැනන් හිටියෙ නෑ.. සෙනුක දන්නවද අයියෙ.."

" එයා දන්නවා.."

" ම්ම්.."

මම චමිරු ගන මුල ඉඳලා හිතන්න ගත්තා.. ඒ කියන්නෙ ඒකනිසාද එදා මතීශ මට අයුක අයියව අල්ලලා අරම කතාවක් කිව්වෙ..

" මල්ලි.. මම ඔයාගෙන් මෙච්චර කාලෙකට කිසි දෙයක් ඉල්ලලා නෑ.. ඒත් මම ඉල්ලන්නෙ මට මේ ලෝකෙ ඉල්ලන්න පුලුවන් ලොකුම උදව්ව.. ෂනෙරු.."

අයුක අයියා මගේ අත් දෙකෙන් අල්ලලා ගුලි කරගත්තා.. මම ඒ නුහුරු අත් වල උණුහුමට අත් දෙක පණ නැති කරගෙන හිටියා..

" මම සෙනුක එක්ක ඉන්නවා අයියෙ.."

" මල්ලි.. ප්ලීස් මට මගේ කියලා දේවල් වලට ඉන්න එකම එක්කෙනා වත්සල්.. ෂනෙරු ප්ලීස් මගේ වත්සල්ව තනි කරන්න එපා.. මාවතේරුම්ගන්න බලන්න.. එයා හොඳට ඉගෙනගෙන කැම්පස් ගිහින් ලොකු කොල්ලෙක් වෙනකල් ඒ අත් දෙක අතාරින්න එපා මල්ලි.. මම දන්නවා ඔයත් රධ්‍යගෙ ප්‍රශ්න එක්ක ඉන්නෙ අවුලෙන් කියලා.. ඒත් මට මේ දේ ඉල්ලන්න ඉන්න එකම එක්කෙනා ඔයා විතරයි.."

" මම දන්නවා අයුක අයියෙ.. මම සෙනුක එක්ක ඉන්නවා.. ඔයා බය වෙන්න එපා.."

" වත්සල් මගෙ අම්මෙක් වගේ.. ඌ කොල්ලෙක් තමා.. ඒ වුණාට මට එයා නැත්නම් කවදාවත් මෙහෙම ඔයා ඉස්සරහවත් කතාකරන්න වෙන්නෙ නෑ මල්ලි.. මම හරි ආදරෙයි වත්සල්ට.. හැමදේම ඉවසගෙන දරාගෙන එයා වගේ වෙන කවුරුත්ම මාත් එක්ක ඉන්නෙ නෑ.. එහෙම තියෙද්දි තමා

@Shan

වත්සල් එක්සැම් කලේ.. වත්සල් දුක හිතුණට පෙන්නන්නෙ නෑ මල්ලි.. බය හිතුනොත් ඔයාට කතාකරනවා මිසක්.. අනේ ඒකනිසා වත්සල් ගාවින්ම ඉදපන් මල්ලි.. මට යන දිහාවක සැනසීමෙන් ඉන්න පුලුවන් එයා නිසා විතරමයි.."

" අයියා ගිහින් ඉක්මනින්ම සෙනුක ගාවට එන්න.. එයා බලාගෙන ඉන්නවා කොච්චර කාලයක් ගියත්.. මම සෙනුක ගැන දන්නවා.."

" ෂනෙරු.. මට මේ කරන උදව්වට මම ඇත්තටම-"

" මොනවද අයියෙ මේ කියන්නෙ.. අයියා ගිහින් පරිස්සමට වැඩ කරගන්න.. මම සෙනුකයා එක්ක ඉන්නවා.. ඌ මගේ අනිත් කොපිය වගේ එකානෙ.."

මම අයුක අයියගෙ ලොකු අත් දෙකෙන් තද කරගෙන අල්ලන් ඉදලා අතෑරියා.. සෙනුක ඩොකෙක් වෙන්න කලින්ම මනුස්සයෙක් ජීවත් කරපු එකෙක්.. අයුක අයියටයි සෙනුකයටයි නම් කවදාවත් වරදින්න එපා කියලමයි මම හිතන්නෙ.. ඒ දෙන්නා කාටවත් වරදක් නැති හරි පාඩුවෙ ඉන්න දෙන්නෙක්.. අයුක අයියා මගේ ඔලුව අතගාලා බෙන්ච් එකෙන් නැගිට්ටා..

" අයියා යන්නද.."

" ඔව් ෂනෙරු.. මම සෙනුක පික් කරන්න හවස එනවා.. ඇඳුම් වගයක් ගන්න යන්න තියෙනවා.."

" ආ හා අයියෙ.. මම යන්නම් එහෙනම්.. ගයනිකා මැඩම්ව හම්බෙන්න එන්න කියලා තිබුණා.."

" රධ්‍ය ඇති රූම් එකේ.. ඔයා යන්න.."

මම අයිස් කොෆී එකත් අරගෙන බෑග් එකත් කරේ එල්ලගෙන අයුක අයියටත් බායි කියලා මියුසික් රූම් එක දිහාවට ඇවිදගෙන යන්න ගත්තා.. පරෙයියා මාර ඩයල් එකක්නෙ.. මගේ ජීවිතේ හැමදාම සප්‍රයිස් සප්‍රයිස්.. දැන් මට පුදුම වෙලාම හෙන හති.. මම මියුසික් රූම් එකේ දොරට තට්ටු කල්ලා ඇතුළට ගියා.. ගයනිකා මැඩමෙ සපත්තු දෙක තියෙනවා.. රධ්‍ය අයියගෙ ෂෙග් දෙක තියනවා.. තව සපත්තු කුට්ටම් දෙක තුනක් තියනවා..

@Shan

ඔකෙස්ට්‍රා එක වෙනමනෙ ප්‍රැක්ටිස් කරන්නෙ.. මම දොර ඇරගෙන ඇතුළට යද්දි රධ්‍ය අයියා බිම ඉඳගෙන ගිටාර් එකක කම්බියක් දානවා.. සෙනුකයා මැඩම්ගෙ ටේබල් එකේ පැත්තකින් කොලේකුයි පෑනකුයි තියාගෙන මොනවද ලියනවා.. තව මල්ලිලා වගයක් පියානෝ එක ප්ලේ කරනවා.. මම ඇතුළට එනවා දැක්කම රධ්‍ය අයියා මාත් එක්ක හිනාවෙලා මැඩම්ව පෙන්නුවා..

" ආ ෂනෙරු පුතා.. මම බලාගෙන හිටියෙ එනකල්.."

" දැන් ෂනෙරුට හරියට වැඩනෙ මැඩම්.."

සෙනුකයා මහපගයා වගේ මැද්දෙන් පැන්නා.. මම මැඩම් එක්ක හිනාවෙලා මෙසෙට හේත්තුවක් දාගත්තා..

" මැඩම් කතාකලෙ..??"

" ආ හදිසියක් නෑ.. මෙහෙන් ඉඳගන්නකො.. රධ්‍ය~ පුතා ඔක හරිද.."

රධ්‍ය අයියා ගිටාර් එකත් අරගෙන නැගිට්ටා..

" හරි මැඩම්.. ඒත් මෙක එච්චර හුරු නෑ වගේ.. මම කලින් එකම ප්ලේ කරන්නද.."

" පුතාට ඒක ලේසිද.."

" ඔව්.."

" එහෙනම් අපි ඒක ගමු.. මෙක ඔකෙස්ට්‍රා එකට දෙමු.."

" හරි මැඩම්.."

මැඩම් රධ්‍ය අයියා එක්ක කතාකල්ලා මගේ පැත්ත හැරුණා..

" මම ෂනෙරු පුතාට කතාකලේ වැදගත් වැඩකට.. දැන්නම් කට්ටි පනින්න ලැස්තිවෙන්න බෑ හොදේ.."

" ඒ මොකක්ද මැඩම්.."

@Shan

" ඔයාලා අර අවුරුදු උත්සවේ සින්ග් කලානෙ.. ඒ කාලෙ ඒ වීඩියෝ එක ස්කූල් පේජ් එකේ ශෙයා වුණානෙ හුගක්.."

මම ඒක මතක් වෙච්ච නිසා ලේන්සුවෙන් මූණ පිහිදාගත්තා.. සැක්.. හැමතැනම සෙයා වුණා තමා.. මේ හැකරුල්ලා තමා සේරටම වග කියන්න ඕන..

" ඉතින් මැඩම්.."

" ඉතින් පුතා.. ඕබී එකෙන් රික්වෙස්ට් කල්ලා තියෙනවා සාගා එකට බැරිද ඔය දෙන්නගෙන අයිටම් එකක් දෙන්න කියලා.. මම ෂනෙරු පුතා බිසී නිසා ඒක පොඩ්ඩක් පස්සට දැම්මෙ.. ඒත් මේ අයිටම් වල පොඩි වෙනස්කම් ටිකක් වුනානෙ.. නේද සෙනුක පුතා.."

" ඔව් මැඩම්.. දැන් මියුසික් බ්‍රේක් එක පස්සට දාලනෙ.. එතන හිස්තැන පුරවන්න අනිවාරෙන් අයිටම් එකක් දාන්න ඕන.. රධ්‍ය අයියටයි ෂනෙරුටයි පුලුවන් නෙ අපිට ඒක කවර් කල්ලා දෙන්න.."

" ඔව් පුතාලා.. මට මේ වැඩ අස්සෙ කරන්න දෙයක් හිතාගන්න අමාරුයි.. ෂනෙරු පුතාට බැරිද වැඩ පොඩ්ඩක් එහෙ මෙහෙ කරන් මේකට ඉන්වෝල් වෙන්න.."

" අම්.."

මම කල්පනා කරන්න හදද්දිම සෙනුකයා මට රවලා මොනවද කුටු කුටු ගගා මැඩම්ව පෙන්නුවා..

" අවුලක් නෑ මැඩම්.. මම එන්නම්.."

මම සෙනුකයගෙ මූණ දිහා බලාගෙන මිමිනුවම සෙනුකයා මැඩම්ට පේන්නැතිවෙන්න කට උල් කල්ලා මට කිස් එකක් එව්වා..

" අනේ ලොකු දෙයක්.. මගේ ඔලුවෙ තිබ්බ බරක් නිදහස් වුණා.. ඔය දෙන්නා යාලුවො නිසා මේ වැඩේ අමාරුවෙන එකක් නෑ.."

යාලුවො නෙමේ මැඩම් බෝයිපෙන්ලා.. ඒ ඉස්සර තමා යාලුවො විතරයි වෙලා හිටියෙ.. මම හිමිහිට රධ්‍ය අයියට කකුලෙන් එකක් ගැහුවම රධ්‍ය

@Shan

අයියා මගේ කකුල පාගගෙන පිටට එකක් තඩිබෑවා මැඩමට පේන්නැතිවෙන්න..

" එහෙනම් පොඩ්ඩක් මෙහෙට වෙන්නකො.. මම ඔයාලට අයිටම් එක විස්තර කරන්නම්.. මෙහෙමයි මේක ප'ෆෙක්ට් විදියට තියෙන්න ඕන ළමයි.. මම ඔය දෙන්නවනම් පොඩි කාලෙ ඉදන්ම දන්න නිසා ඔයාලගෙ ටැලන්ට් එක ගැන සැකයක් නෑ.. ස්ටේජ් එක දෙන්නටම හුරුයිනෙ.."

මම ඉතින් මැඩම්ගෙ බටර් පාරට ලිස්සලා නොවැටී හිටියා..

" එතකොට මෙන්න මෙහෙමයි හරිද වෙන්නෙ.."

සෙනුකයා මැඩම්ගෙ ටැබ් එක අරන් ටයිම් ටේබල් එකක් පෙරළගත්තා..

" අයිටම් කීපයක්ම තියෙනවා මුලින්ම හරිද.. මේ ටිකෙන් පස්සෙ කන්ඩක්ට' චේන්ජ් වෙනවා.. මෙන්න මේ ටිකේ තමයි මම ඉන්නෙ.. ඔය දෙන්නා ප'ෆෝම් කරන්නෙ මෙන්න මේ තියන ටයිම් පීරියඩ් එකේ.. ඒ කියන්නෙ බී ඇන් එස්ලගෙ අයිටම් එකෙන් පස්සෙ තියන විනාඩි පහේ මියුසික් බ්‍රේක් එකෙන් පස්සෙ.. ඒ වෙලාවෙ තමා ක්වික් ස්ටේජ් ඩෙකරේශන්ස් වලට වෙන් කරන්නෙ.."

" අහා.."

" ඉතින් මෙහෙමයි අපි අයිටම් එක ප්ලෑන් කලේ.. සෝන්ග් එක señorita.."

සෙනුකයා ටැබ් එක වහල පැත්තකින් තිබ්බා.. ගයනිකා මැඩම් අපි කියන දේවල් අහගෙන හිටියා.. සනෙරු Camila Cabello වෙන්නයි යන්නෙ..

" ෂනෙරු ඩ්‍රෙස් කරන්නෙ වේටර් කෙනෙක්ට.. වේටර් කෙනෙක් කිව්වට.. ටිකක් රෙඩ් න්' බ්ලැක්.. ඩාර්ක් යෙලෝ.. ඒ වගේ තීම් එකක් යන්නෙ.. මුල පාර්ට් එක ඉවරවුනාම ටිකකින් කොස්ටියුම්ස් මාරු වෙන්න ඕන.. මම පස්සෙ ඒක පැහැදිලි කරන්නම්.. එතකොට රධ්‍ය අයියා කැශුවල් ස්ලීව්ලස් ශර්ට් එකක් වගේ.. අපි බලමු.. ඔහොම තමා වැඩේ වෙන්නෙ.. හරිද.."

" ම්ම්.. ම්ම්.."

" සතියයි තියෙන්නෙ ගයිස්.. වැඩේ ප'ෆෙක්ට් වෙන්න ඕන.."

@Shan

" කල්ලා බලමු.."

ඊටපස්සෙ අපි තුන්දෙනා ගයනිකා මැඩම් එක්ක ටිකවෙලාවක් කතා කර කර ඉඳලා එළියට එන්න ආවා.. ශෝන් මෙන්ඩිස්ගෙ කොන්සර්ට් එකක් බලන්න යන්න ඉඳලා ඇත්තටම ශෝන් මෙන්ඩිස් වෙන්න වුනාමෙ..

මම කිව්වෙ.. මගේ ජීවිතේ තියෙන්නෙම සප්‍රයිස් තමා..

" වරද්.. අයුක මීට් වුනාද.."

" ඔව් මම ඔයාට පස්සෙ කියන්නම්.."

මම රධ්‍ය අයියට හිමිහිට කියලා දුවගෙන ගිහින් සෙනුකයගෙ කරට අත දාගත්තා..

" අම්මො අම්මො කපල් එක.. හෙන ෆේමස් වෙයි වගෙ.."

" අනේ පලයන්.. උබ තමා මැඩම්ට මේවා කියන්න ඇත්තෙ.."

" එව්වා උඹට අදාළ නැනෙ.. කොහොම හරි දැන් ඉතින් සනෙරු සෙන්යොරිටා වෙන්නයි යන්නෙ.."

" කට වහන් පලයන්.."

" ආ මෙ ඒකනෙමෙ.. උඹට මම කියන්න හිටියෙ.. මතකද බං අර අපි දෙන්නගෙ ෆේස්බුක් ෆේක් එකවුන්ට් දෙක.."

" කීයක් හැදුවද බං.. කොයිඑකද.."

" අර බං අපි ආගිට නම්බර් එකක් දුන්නු කොල්ලෙක් ටෝක් කලේ.."

සෙනුකයා රහසින් කියද්දි මම ශේප් එකේ හැරිලා රධ්‍ය අයියා දිහා බැලුවා.. දැනගත්තොත් පේක් එකවුන්ට් පෙන්නයි සුදුඅම්මියා..

" අර අඹගහමුදුනෙ එකද.."

" අන්න ඔව් ඒකතමා.. ඒක අයුක අයියා දැකලා අද රධ්‍ය අයියට පෙන්නුවා.."

@Shan

" නොදකින්.. සිරාවට.. සැක්.. උබ මොකටද ඒකට ලොග් වුනේ.."

" නිකමට බං.. ලොගවුට් වෙන්න අමතක වුනා.."

" බූරුඅලියා.. කලොත් කරන්නෙ ඔහොම එකක් තමා.."

" හරි හරි බං ඉතින්.. රධ්‍ය අයියා ඔවා ගනන් ගන්න එකක් නෑ.. බලලා උඹට හිනාවුනා.."

" ඒ සිනහව පසුපස තමා භයානක මිනිසා සැඟවිලා ඉන්නෙ.. උඹ දන්නවද.."

" සිරාවට.. මම හිතුවෙ කලිසම අස්සෙ කියලා.. සොරි බං.."

" අනේ පගයා කට වහගෙන යමං.. කිව්වොත් කියන්නෙ මහ හු#න කතාවක් තමා.."

අපි දෙන්නගෙ ෆේස්බුක් එකේ ඔය කියන ෆේක් එකවුන්ට් දෙකේ නම් දෙකත් මහ හු#න නම් දෙකක් සුද්ද සිංහලෙන් කිව්වොත්..

සෙනුකයගෙ එක "අඹගහමුදුනෙටකේබදින්නෙ"

මගේ එක " ටකේඅරගෙනපඅ#කෙබදින්නෙ"

ඉතින් මනුස්සයෙක්ට ඔක පෙන්නන්න පුලුවන්ද.. බෑනෙ.. ඒ කොල්ලට හෙන ආතල් එකක් දීලා අපි සාම ගිවිසුමක් ගහලා හිටියෙ වහාම ඩිලිට් කරන්න.. කොහෙද සෙනුකය ගම කාලනෙ..

ඊටපස්සෙ සෙනුකයා වොශෲම් යනවා කියලා හැරිලා ගියා.. මම රධ්‍ය අයියා ගාවට කිට්ටු කලා..

" අපි ප්'ෆෝම් කරන්නයි යන්නෙ.."

" මම.. මොකක්ද අර ෆේස්බුක් එකවුන්ට් එක.. මට අයුක ගෙනැල්ලා පෙන්නුවෙ.."

" ආහ්.. මේ.. මෙහෙමයි.."

@Shan

මම විස්තරේ පැහැදිලි කල්ලා දීලා ඉවර වෙද්දි මගේ අහිංසක ඔලුව ටොකුම පස්පාරක් කාලා හිටියා.. රධ්‍ය අයියා මාව හදන්න බෑ කියලා කිව්වා.. මම මොකෙක්ද ඇහුවා.. මාව මරන්න වටිනවා කිව්වා.. ඔහොම වැඩ කල්ලා අහුවුනොත් මකනවා කියලත් කිව්වා.. මම මකන්නෙ මැපඩ් ඉරේසර් එකකින්ද අහලා ආයෙම පිට මැද්දට හොඳ පාරක් කෑවා.. ඊටපස්සෙ මගේ මලක් වගේ හිත තැලිලා පොඩිවෙලා මම දුකින් තණකොළගොඩේ ඉඳගෙන ආධ්‍ය අයියා එක්ක යාලුවෙනවාමයි කියලා දිවුරුවාම රධ්‍ය අයියා ටිකකින් දුක හිතිලා මට ඉස්කෝලෙ පී ඇන්ඩ් එස් එකෙන් මෆින් එකක් අරන්දෙන පොරොන්දුවට යාළුකරගත්තා..

රධ්‍ය පුතාගෙ වෙහෙසකර දවස් මෙසේ ගෙවීයන වගයි.. හයිය ඇතිප්ලාස්ටරයක් ඒ දරුවට කියාගෙන යන්න බලන්න.. පෞනෙ..



#සෙයුක

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 93 කොටස

" මේ ඔයා යනවද~.."

"....."

" අයියෙ.. මේ නැගිටිනවකො ආපු වෙලේ ඉඳලා පතබැව්ලා ඉන්නෙ.."

මම මගේ කාමරේට ගිහින් ලයිට් එක ඔන් කරද්දි රධ්‍ය අයියා ඇඳේ හරහට දපලා පිඹුරු තඩියා වගේ නිදි.. හවස ආපු වෙලේ ඉඳන් කෑවා නෑවා පස්ස උඩ දාගෙන නිදි එක විතරයි කරන්නෙ.. මම එතකල් ගේ අතුගාලා ඇඳුම් සේදුවා.. ඊටපස්සෙ උයපු භාජන අස් කල්ලා දාලා නාගෙන නිදාගන්න ලෑස්ති වුනේ.. ඒ වුණාට රධ්‍ය අයියගෙ අප්පච්චි හෙට එනවලුනෙ උදේම.. එයා ඊටකලින් ගෙදර යන්න ඕනනෙ..

මම ඇඳෙන් ඉඳගෙන රධ්‍ය අයියගෙ උරහිසෙන් හෙලෙව්වා..

" පොඩ්ඩක් අවදි වෙන්නකො ඒයි.."

" මිම්.. මිම් ."

" ඔයා අද ගෙදර යනවද.."

" හෙට හෙට.."

රධ්‍ය අයියා ආයෙම අතින් පැත්තට පෙරළිලා මගේ කොට්ටෙත් බදාගෙන ඇස් දෙක පියාගත්තා.. මමත් කාමරේ ලයිට් එක ඔෆ් කල්ලා රධ්‍ය අයියගෙ ඇඟ උඩින් පැනලා බිත්තියෙ කොණට ඇවිත් කොට්ටෙන් ඔලුව තියාගත්තා..

සෙනුකයා එක්ක කතාකරන්නත් ඕන.. ඒත් ඒකට හොඳ වෙලාවක් හම්බෙන්නෙ නැහැනෙ.. අයුක අයියත් ලබන සතියෙ යනවා.. ඌ ඇත්තෙ හෙන අවුලෙන්.. ඒ වුණාට ඉස්කෝලෙ වැඩක් එක්ක බිසී නිසා කතාකරන්නවත් වෙලාවක් හම්බෙන්නෙ නෑනෙ.. ඉරිදා උදේ සෙනුකයගෙ ගෙදර යන්නත් හිතෙනවා.. උගේ තාත්තා ගෙදර නිසා ගියාට ඕවා කතාකරන්නත් බෑ.. ඔන්න ඔහේ එක්කො ඉරිදා යනවා.. ඉරිදට

@Shan

ප්‍රැක්ටිස් නෑනෙ.. උගේ තාත්තා මාව දන්න නිසා ලොකුවට ඇඟිලි ගහන්න එන එකක් නෑ අපි කතාකරන ඒවට..

මම ඉරිදා සෙනුකයගෙ ගෙදර යන්න හිතාගත්තා.. උගේ ගෙදර යන්න ඉතින් උගෙන් අහන්න ඕන නෑනෙ.. ඒ ගෙදර දොර ඕනවෙලාවක ඇරලා තියෙන්නෙ.. මම ගියාම සෙනුකයගෙ අම්මා වුණත් හොදට කතාකල්ලා කෑම හදලා දෙනවා.. මම ඉස්සර එහෙ පාඩම් කරන්න යනවනෙ ඒ ලෙවෙල් වලට.. ඌ මෙහෙ එනවා..මම එහෙ යනවා.. උගේ ගෙදරයි මගේ ගෙදරයි වෙනස් නෑ..

ටිකකින් රධ්‍ය අයියා කොට්ටෙන් හරියට ඔලුව තියාගෙන මගේ පැත්ත හැරුණා.. මම හිටියේ බිත්තිය අයිනේ අත් දෙකත් බඩ උඩින් බැඳගෙන මල මිනිය වගේ වහල දිහා බලාගෙන..

"වරද්.."

" ඔයා ඇහැරුණාද.."

" මම්.. දැන් වෙලාව කීයද.."

" නමයට කාලයි.. ඔයා අද යන්නෑනෙ.."

" උදේ ශේප් එකේ යනවා.. මම අයියට කිව්වා.."

" ඒ එහෙනම් කමක් නෑ.."

මම රධ්‍ය අයියා ගාවට කිට්ටු වුණාම රධ්‍ය අයියා මගේ පපුවට මූණ තියාගෙන අත් දෙකෙන්ම මාව හයියෙන් බදාගත්තා.. මම එයාගෙ කොණ්ඩෙ හිමිහිට අතගෑවා..  නාලා නිදාගෙන එයාගෙ කොණ්ඩෙ තාම තෙතයි..

" ඔයාගෙ කොණ්ඩෙ තෙතයි තාම.."

" වේලෙයි උදේ වෙද්දි.."

" ඔලුවෙ කැක්කුම හැදෙයි උදේ වෙනකල් ඉදියොත්.."

@Shan

මම මගේ අතින් රධ්‍ය අයියගෙ කොණ්ඩෙ එහෙට මෙහෙට ඇවිස්සුවා.. ෆැන් එකට වෙලෙයිනෙ එතකොට.. ඒ එක්කම රධ්‍ය අයියා මගේ පපුවට තව ටිකක් තුරුල් වුණා.. එයා එහෙම පපුවට තුරුල් වෙලා හුස්ම ගනිද්දි, උණුම උණු හුස්ම මගේ පපුවෙ වදිද්දි ඇඟ හිරිවැටිලා යනවා වගේ දැනෙනවා.. රධ්‍ය අයියා කකුලකුත් මගේ ඇඟ උඩින් දාගත්තා..

" අද අයුක අයියා දවල් කතාකලානෙ.."

" මම අහන්න හිටියෙ.. මොකද කිව්වෙ.."

" ඔයා කලින් ඉඳන් දැනගෙනද හිටියෙ චමිරු කියන්නෙ අයුක අයියගේ.."

" මම දැනගෙන හිටියෙ.. ඒකතමා ඔයාට කිව්වෙ චමිරු එක්ක වැඩිය කතාවට යන්න ඕන නෑ කියලා.."

" මම ඉතින් ඒ ගොබ්බ පරෙයියා එක්ක කතාකරන්නෑනෙ කොහොමත්.. දැක්කහම මට කේන්ති යනවා.. සැක්.. මෙ දැනුත් මට උගේ බම්බු මූණ මැවුණා.."

" මවාගන්න එපා.."

රධ්‍ය අයියා හිනාවෙලා මගේ පපුව මැද්දෙන් මූණ අහකට අරගෙන අරගෙන කොට්ටෙන් ඔලුව තියාගත්තා..

" රණ්ඩුවලට පැටලෙන්න යන්න එපා.. තේරුණානෙ.. අනිත් එක.. අයාන්.. ඌ ආයෙම මොනවහරි කියාගෙන ආවොත් කියාන්ට කියන්න.. ඕන්නම් අත දිගැරලා දෙන්න කනට.. එක එකාට බයේ ජීවත් වෙන්න ඕන නෑ.. ඔයාට තේරෙනවනෙ.. ඔයාගෙ හිත ඇතුළෙ තියන 'අනේ මම මෙහෙම කළොත් අනිත් කෙනාගෙ හිත රිදෙයිනෙ' කියන හෙන පරාර්ථකාමී ෆීලින්ග්ස් පොඩ්ඩක් අඩු කරගන්න වරද්.."

" ඒ ඇයි එහෙම කියන්නෙ.."

රධ්‍ය අයියා මගේ කම්මුලකට අත තියාගෙන මගේ දිහා බලාගෙන හිටියා..

" එහෙම ජීවත් වෙන්න උඹයි මමයි ඉන්නෙ සුරංගනා ලෝකෙක නෙමෙයිනෙ.. ඔයා ලොකුයි.. දැන් අවුරුදු විස්සක් වෙනවා

@Shan

තේරෙනවනෙ.. හැමෝම වෙනස් වෙද්දි ඒ එක්කම ඔයත් වෙනස් වෙන්න.."

" ම්ම්.. ඒ වුණාට ඔයා වෙනස්වෙන්න එපා.."

" මම වෙනස් වෙන්නෙ නෑ.."

මම රධ්‍ය අයියා මගෙ කම්මුලෙන් තියාගෙන ඉඳපු අත අරගෙන මගේ ඇඟිලිවල පටලගත්තා..

" හදිසියෙ මම එදා ට්‍රේන් එකෙන් වැටුණනම් එහෙම.."

" වැටුණනම් ඉතින් මොනව කරන්නද.. මැරෙන්න තමයි වෙන්නෙ.. එදානම් මම උඹට අම්මපා දෙනවා නුගේගොඩ ටවුන් එක මැද්දෙම කනට වරද්.. මොන සිහියෙන්ද ඉන්නෙ.."

" සිහියෙන් තමා අනෙ හිටියෙ.. මගුල.. මගේ අත ලිස්සුවා.."

" ලිස්සුවා..?? ලිස්සුවා තමයි.. යකෝ එදා මම උබව අල්ලගත්තෙ නැත්නම් උඹෙ මිනිය තමා ගෙදරට ගේන්න වෙන්නෙ.."

" හරි හරි අනේ ආයෙම ඉතින් ට්‍රේන් එකේ ගියේ නැනෙ..මට බනින්නෙ.."

" බැනලා මදි.. උඩ දාගෙන ෆුට්බෝඩ් යන්න.. ඔක්කොම කල්ලා ඉවරවෙලා ඇම්බැට්ට මූණක් හදාගෙන හිටිය හැටි විතරක්.. උබත් එකයි උඹෙ යාලුවා.. අන්න ඌත් එකයි.."

" එක වෙන්නෙ කොහොමද ඒයි.. දෙකයි දෙකයි.. එයයි මමයි දෙන්නෙක්නෙ.. එයා එක්ක එක්කෙනෙක් වෙන්න ගියොත් අයුක අයියා මාව උස්සලා පොලේ ගහයි.."

" උඹට ඉතින් කියලා වැඩක් තියද.. හැම එකම විහිලුවට ගන්නවා..'"

" එහෙම නෙමෙ ඉතින්.. මම ඇත්තනෙ කිව්වෙ.. ඕන්නම් අපි දෙන්නා එක්කෙනෙක් වෙමු.."

"....."

@Shan

" කොහොමහරි ඉතින් ඔයා අල්ලගත්තනෙ.. මම මලේ නෑනෙ.. එහෙම මැරෙනවද අනේ මම වගේ මිනිස්සු.. මම මලොත් හොල්මනක් වෙලා ඇවිත් ඔයා නානකොට පස්ස දිහා බලාගෙන ඉන්නවා හරිද.."

" ආය පටන්ගත්තා.."

" ආ.. ආයෙ පටන්ගත්තා කියන්නෙ.. හරි කතාවක්නෙ.. මම මගේ බෝයිපෙන්ගෙ පස්ස ගැන කතානොකර ආධ්‍ය අයියගෙ පස්ස ගැන කතාකරන්නද.. ඒකටනෙ අපේ මා-"

" වරද්..!!"

" නෑ ඉතින්.. ඇත්තනෙ.. ඔයාට කියන්න දවසක් මාමා මගෙන් ඇහුවා මම යාලුවෙලා ඉන්න එක්කෙනා කොහොම එක්කෙනක්ද කියලා.. ආ නෑ මම ඇහුවෙ මාමගෙන්.. අපේ දත් දොස්තර මාමා හිතාගෙන ඉන්නෙ මම කුරුඳුවත්තෙ කෙල්ලෙක් එක්ක යාලුවෙලා ඉන්නවා කියලනෙ.. ඒ වුණාට මම යාලුවෙලා ඉන්නෙ කොට්ටාවෙ කොල්ලෙක් එක්කනෙ.. හරිද.. කොහොම හරි මම කිව්වා මම යාලුවෙලා ඉන්න එක්කෙනා කෙට්ටුයි, සුදුයි, චොක්ලට් කන්නෙ නෑ කියලා.. ඊටපස්සෙ අපේ මාමා කිව්වා එයා යාළුවෙලා ඉන්න එක්කෙනා සුදුයි, කෙට්ටුයි, චොක්ලට් කනවා කියලා.. ඊටපස්සෙ මම ඉරිසියාවට කිව්වා මම යාලුවෙලා ඉන්න එක්කෙනාට ලොකු පස්සක් තියෙනවා කියලා.. ඊටපස්සෙ අපේ මාමත් කිව්වා එයා යාලුවෙලා ඉන්න එක්කෙනාටත් ලොකු පස්සක් තියෙනවා කියලා.."

" මොනවද කියවන්නෙ වරද්.."

" ඇත්තනෙ කියන්නෙ.. ඒ දවස්වල ඉතින් මම දැනගෙන හිටියෙ නෑ අපේ මාමගෙ සාකිච්චා මගේ මස්සිනා කියලා.. කොහොම වුණත් ඇම් සෝ ලකී ටු හැව් අ බෝයිපෙන් ලයික් යූ.. දිස් බම්පි බූටි බිලොන්ග්ස් ටු මී.."

මම රධ්‍ය අයියගෙ ලොකුම ලොකු ශෝට් එක පිපිරෙන්න වගේ තිබ්බ පස්සට දෙපාරක් විතර ඇඟිල්ලෙන් ඇනලා තුන්වෙනි පාරත් අනින්න යද්දි රධ්‍ය අයියා මගේ අත අල්ලලා එහාට කලා..

" එක විදියක ඉන්නකො වරද්.."

@Shan

" මම හුඟක් විදිවලට ඉන්නවා ඒයි.. මේ මම ඔයාගෙන් ප්‍රශ්නයක් අහන්නම්.. අවංකව උත්තර දෙනවද.. එහෙම නැතිවුණොත් මම අද ඔයාව තරු බලන්න එක්ක යනවා.."

" මොකද බං ඔච්චර හදිසි තරු බලන්න යන්න.."

" හදිසි නෑ.. දන්නැද්ද.. ඇම් අ හෝර්නි මලක්.."

රධ්‍ය අයියා ඇස් දෙක හෙන ඩ්‍රැමටික් විදියට රෝල් කල්ලා මගේ ඇඟ උඩින් කකුල අහකට ගත්තා..

" මොකක්ද මම අවංකව උත්තර දෙන්න ඕන ප්‍රශ්නෙ.."

" ආ ඉන්න අහන්න.. උත්තරදෙන්න ඕන හොඳේ.. ඔයා මම බැඩ්මින්ටන් ගහන වරද් නොවී අර මූණෙ ලපයක් තියන චමිරු වගේ වුනානම් ඒත් මට ආදරෙයිද.."

රධ්‍ය අයියා ටිකක් වෙලා මගේ දිහා බලාගෙන හිටියා.. ඉඳපන්කො චමිරු වෙලා ආදරෙයි කිව්වොත් මරාගෙන මැරෙනවා.. හැබැයි චමිරු 'වගේ' කියලනෙ කිව්වෙ.. චමිරු නෙමෙයිනෙ.. ඒ ඉන්නෙත් මමමනෙ.. නෑ කිව්වොත් ඒත් මරාගෙන මැරෙනවා.. කපටි ගැටපොලොස් කොට්ටෝරුවා..

" මොකක්ද ඒ ඇහුවෙ.."

" ඇහුවෙ අහපු එක තමා.. කියන්නකො ඒයි ඔයා එහෙම වුනානත් ඒත් මට ආදරෙයිද.."

රධ්‍ය අයියා ටිකක් වෙලා මගේ මූන දිහා බලාගෙන හිටියා..

" මට නිදිමතක් එනවා.. අම්මො අම්මො නිදිමතයි.."

ටිකකින් රධ්‍ය අයියා කොට්ටෙ මූනඔබාගෙන නිදාගන්න යද්දි මම ඒකගෙ කොට්ටෙ ඇදලා අරගත්තා..

" ඔයා ප්‍රශ්නෙන් මගෑරලා යන්නනෙ හදන්නෙ.. එහෙනම් ලෑස්තිවෙනවා තරු බලන්න යන්න.."

@Shan

මම නැගිටලා රධ්‍ය අයියගෙ ඇග දෙපැත්තෙන් කකුල් දෙක දාලා ඇඟ උඩින් ඉඳගත්තා..

" නෑ නෑ.. ඒක නැතුව වෙන එකක් අහන්න.. මම උත්තර දෙන්නම්.."

" වෙන එකක්..?? ඒ මොකද.."

" අපි කවුරුත් වම්රුට ආස නෑනෙ.."

මම බෙල්ලත් ඇල කරගෙන රධ්‍ය අයියා දිහා බලාගෙන හිටියා.. රධ්‍ය අයියා හිටියෙ මගේ අත් දෙකෙන් තද කල්ලා අල්ලගෙන උඩට කරගෙන..

" ඔහොම බලන්නෙපා බං හොල්මන් බෝනික්කෙක් වගේ.. බයත් හිතෙනවා.."

" කවුරු..?? ඇනබෙලා වගේද.."

" ඔව් ඔව්.."

" එහෙනම් මම ඇනබෙලා වුණානම් ඔයා ඒත් මට ආදරෙයිද.."

මම බෙල්ල අනිත් පැත්තටත් හරවලා ඇස් දෙක හීනි කරගෙන රධ්‍ය අයියා දිහා බලාගෙන හිටියා.. එයා පොඩ්ඩක් වෙලා කල්පනා කලා..

" ඔයා කවුරු වෙලා හිටියත් ආදරෙයි.."

" ශුවර්ද.. මම මමියක් වුණත්.. සොම්බියෙක් වුණත්.."

" දැන් කියලා වෙනසක් නෑනෙ.."

" මොකක්ද කුටු කුටු ගාන්නෙ.."

" ඔව් ඔව් ඔයා මොකෙක් වෙලා හිටියත් ආදරෙයි.."

" කලින් මට කැත සොම්බියා කිව්වා නේද.. ඉන්නවා මම ආධ්‍ය අයියට කියනවා.."

@Shan

මම අත් දෙක ගසලා ෆෝන් එක හොයාගන්න යද්දි රධ්‍ය අයියා මාව උස්සලා පොලවෙ ගහන්න වගේ ඇඳ උඩට තල්ලු කල්ලා මගේ කකුල් දෙක උඩින් අර තඩි පස්ස තියාගත්තා.. අම්මෝ මේකගෙ බර.. මගේ ඇටකටු ටික වප්ප වෙලා යයිද මන්දා..

" ආව්.. නැගිටිනවකො.. මගේ කකුල කැඩෙයි.."

" එහෙම කැඩෙන්නෙ නෑ.."

" මගේ කකුල ඇටකටු කැඩිලා බිඳිලා ඇවිදගන්න බැරුව හිටියත් ඔයා මට ආදරෙයිද ඒයි.."

" ඔව් ඔව් උඹ නයෙක් වෙලා මං ගාවට ඇවිල්ලා දස්ට කල්ලා මම මැරිලා ගියත් ආදරෙයි.. එකපාරට මොකක්ද හැදුනු පිස්සුව.."

" නයින්ට කිරි පොවන්න එපා කියලා අපේ ආච්චිඅම්මා කියලා තියෙනවා .. ඔයා මගෙන් කුක්කු බොනවනෙ.. ආයෙ ඉල්ලන්නෙපා.."

" නෑ නෑ මම නයි නටවනවා.. මේ වරද් නිදාගනින්.. හෙට ඉස්කෝලෙට යන්නත් ඕන.."

" එහාට වෙන්නකො ඉතින් මගේ කකුල් දෙක උඩින්.."

රධ්‍ය අයියා මගේ නලලට ඇඟිලි දෙකක් එකතු කල්ලා ටුක් ගාලා පාරක් ගහලා ඇඳට පැනලා සීට් එක පොරව ගත්තා.. මාත් හිමින්සැරේ ඒක අස්සටම රිංගලා රධ්‍ය අයියගෙ අත් දෙක මැද්දට ගුලියක් වගේ රෝල් වුණාම නැහැදිච්ච රධ්‍ය අයියා මගේ ශර්ට් එක අස්සෙ අත දාගාන්න ආවා..

" අත ගන්න එහාට.."

" ඒ මොකටද.."

" ඇයි දැන් මම කිව්වෙ.. නයින්ට කුක්කු පොවන්න හොඳ නෑ.."

" ඉතින් මම නයෙක්ද.. උඹනෙ නයා.."

" මම නයෙක් නෙමේ.. අනික මාව විසවෙයි තවුසෙට.."

@Shan

" එහෙම විස වෙන්නෙ නෑ.. මේ ඇවිල්ලා නයින්ට කිරි පොවනවා නෙමෙ නයාගෙන කිරි බොනවා.."

රථ්‍ය අයියා සීට් එක ඔලුවෙ ඉඳන් වහගෙන මගේ ශර්ට් එක බෙල්ල ගාවටම ඉස්සුවා..

" මට මහ කැත දෙයක් මතක් වුණා.. මොනවද හලෝ කියවන්නෙ.."

" උඹනම් මහ..මොකෙක්ද මන්දා වරද්.. ඔව්.. උඹට ඔක මතක් නොවුනනම් තමා පුදුම වෙන්න ඕන.."

" මම කිව්වෙ මට හිතුණු එකනෙ.."

" දැන් කට වහන් නිදාගන්නකො.."

" මට දෙක වෙනකල් ඇහැරලා ඉඳලා පුරුදු වෙලා නින්ද යන්නෙ නෑ.. මම කතාවක් කියන්නද.."

රථ්‍ය අයියා මගේ ඉන ගාවින් අල්ලලා හයියෙන් තදකලා..

" මොකද ඔවා.. එහෙන් මෙහෙන් අල්ලන්නෙ.."

" නිදාගනින්කො වරද්.. මහන්සි නැද්ද.."

" නෑ.. මම ජීවයෙන් පිරිච්ච-"

" පීක් පීක්-"

" මේ අයියෙ ගහනවා මම තවුසෙට හරිද.."

" ආ ගහපන් බලන්න.. අල්ලලා ජනේලෙන් එළියට විසික් කරනවා.."

" ඊයා ඒයි.. ජනේලෙන් විසික් කරන එව්වා කියන්නෙපා.. මට අර කළුතර සීන් එක මතක්වෙනවා.."

" ඒවා මතක් නොකර හොඳ ළමයා වගේ නිදාගන්න දැන්.."

@Shan

රධ්‍ය අයියා මගේ කට උඩින් අතක් තියාගෙන ඇස් දෙක පියාගත්තම මම අත අහකට විසික් කලා..

" ඒ පාර මොකද.."

" මම ඔයාට අර ටීවී වල යනවා වගේ නිදාගන්න කලින් ගුන්ඩ්නයිට් කිස් එකක් දෙන්නද.."

" ඒ මොකද එකපාරටම.."

"එකපාරට හිතුණා.. දෙන්නම්.."

මම රධ්‍ය අයියගෙ කම්මුල දෙපැත්තෙන් අල්ලගෙන තොල් වලින් පෙක් එකක් තිබ්බා..

" හරිද.."

" මගේ මූණේ කටු ඇනුනා.."

මම රධ්‍ය අයියගෙ මූණ දෙපැත්ත අල්ලලා බැලුවා..

" කටුඅලේ.. මෙ ඔයාගෙ දැන් හෙනට රැවුල වැවෙනවනෙ.. ඒ කියන්නෙ ඔයා දැන් ලොකු ළමයෙක් නේද.."

" හනේ වරද්.."

" පොඩ්ඩක් කට වහන් ඉන්නකො.. කියනවා කියනවා ඉවරයක් නෑ.."

රධ්‍ය අයියා මට ඕන එකක් කියවන්න කියලා ඇස් දෙකත් ඇරගෙන වහළ දිහා බලාගෙන ඉද්දි සිවිලිමෙන් සද්දයක් ආවා..

" ඒ අන්න අර කලවැද්දා ඇවිල්ලා.."

" මොකා.."

" අපේ සිවිලිමෙ කලවැද්දෙක් ඉන්නවා ඒයි.. ඌ ඉස්සර මම පාඩම් කරද්දි ඔකෙ ඇවිදිනවා.. අදත් ඇවිල්ලා.."

@Shan

" කලවැද්දටවත් නිවනක් නෑ ඔය කියවිල්ල නිසා.. ඒකයි ඌ සද්ද කරන්නෙ.."

මම රධ්‍ය අයියගෙ කටට අතක් තියාගෙන ඌ සද්ද කරන ඒවා අහගෙන හිටියා.. කලවැද්දා කලවැද්දියක් ගෙනැල්ලද මන්දා.. දෙතුන්දෙනෙක්ම සද්දකරනවා.. එක්කො කලවැද්දා අපේ ගෙදර පාටියක් දැම්මද දන්නෙත් නෑ.. ටිකකින් ඌ සද්ද කරන එක නැවතිලා ගියාම මම රධ්‍ය අයියගෙ අතක් ඇදලා අරගෙන ඒ අත උඩින් ඔලුව තියාගෙන එයාගෙ පපුවට හේත්තු වුණා..

" උදේ යන්න කලින් මාව ඇහැරන්න හරිද.."

" ම්ම්.."

" පාළුයිනෙ ඔයා නැතුව.. ඔයාට ගිහින් කෝල් එකක්වත් ගන්න බැරිවෙවි නේ.."

" බලමුකො.."

රධ්‍ය අයියා මගේ කොණ්ඩෙ ලාවට ඇවිස්සුවා.. මම එයාගෙ බෙල්ලෙ තිබ්බ රිංග් එකක් දාපු සිල්වර් චේන් එක උඩට ඇදලා අරගෙන ඇගිල්ලෙ පටලගත්තා..

" මම ඉරිදා සෙනුකලගෙ ගෙදර යන්න හිතාගෙන ඉන්නෙ.."

" එහෙමද.. ඔයා යන එක හොඳයි.."

" ඔව් මම එහේ ඉඳලා එන්නම්.. සෙනුක එක්ක කතාකරන්න ඕන.."

" ම්ම්.."

" හෙට අප්පච්චි ඉන්න නිසා එන්න බෑ නේද.."

" මම එන්න බලන්නම්.."

" අප්පච්චි බැන්නොත්.."

@Shan

" ඇයි අපිට ප්‍රැක්ටිස් තියනවා කියලා එන්න පුලුවන්.. හෙට කොහේහරි යමුද.."

" මිම්.. හා.. යමු.."

" යමු.. දැන් නිදාගන්න.."

රධ්‍ය අයියා මගේ තොල් වලට පහත් වෙලා හාද්දක් තිව්වහම මම එයාගෙ මාලෙ අතට ගුලි කල්ලා අල්ලගත්තා.. එයා එහෙමම මගේ අත මාලෙන් අතඅරවගෙන ඒ අතේ ඇඟිලි පටලලා ඇඳට තියලා තද කෙරුවා.. එයාගෙ සීතල තොල් මගේ තොල් වලින් ඈත්වෙන තප්පර කාලකටත් මම හයියෙන් හුස්ම අල්ලනවා.. අර හැමතිස්සෙම දැනෙනවා වගේ මත් වෙන ගතියක් එක්ක මගේ ඇස් බාගෙට පියවෙනවා.. ආයෙම ඇරෙනවා.. මම රධ්‍ය අයියගෙ දුහුල් ශර්ට් එකේ මැද්දෙන් ගුලි කල්ලා අල්ලගත්තහම රධ්‍ය අයියා මාව එයාගෙ ඇඟ උඩට අරගෙන එක අතක් ඉණෙන් තියාගෙන අනිත් අත මගේ ශර්ට් එක යටින් පිට පුරාම යැව්වා.. ගොරෝසුත් නැති සිනිඳුත් නැති සීතල ඇඟිලිතුඩු මගේ පිට පුරාම දුවද්දි මම රධ්‍ය අයියගෙන් එහාට වෙන්න දැගලුවා.. ඒත් එයා මගේ ඉනෙන් දිගටම තදින් අල්ලගෙන උන්නු නිසා මට හෙලවෙන්නවත් ඉඩක් තිබුණේ නෑ..

" අහ්-අ-අයියෙ.."

රධ්‍ය අයියගෙ අතින් මගේ ශර්ට් එක කරෙන් පැන්නිලා ඇඳේ කොණකට විසික් වෙනකොටත් මම හිටියේ එයාගෙ උකුළ උඩ.. එයාගෙම කොණ්ඩෙ අහුරක් මගේ අතට ගුලි කරගෙන, අමාරුවෙන් අමාරුවෙන් කැඩිච්ච හුස්ම අල්ලන ගමන්..

" වරද්.."

රධ්‍ය අයියගෙ තොල් මගේ කොලර්බෝන් එකේ මැද්දෙන් වදිද්දි මගේ නියපොතු එයාගෙ පපුව මැද්දෙන් සීරිගෙන පල්ලම් බැස්සා.. මටවත් හරිහැටි අඳුන ගන්න බෑ.. මට දැනෙන්නෙ මොනවද මම කරන්නෙ මොනවද කියලා.. මට දැනුනු එකම දේ වුණේ මාව තව තව මේ හැමදේකටම නොසෑහෙන්න අබ්බගි වෙනවා කියලා විතරයි.. රධ්‍ය අයියගෙ අත් මගේ ශෝර්ට් එකේ බැන්ඩ් එක ගාවින් නැවතිලා මගේ ඉණ දෙපැත්තෙන් තද කල්ලා අල්ලගත්තා..

@Shan

මම එයාගෙ මූන දෙපත්තෙන් මගේ අත් තියලා එයාගෙ තොල් වලට පහත් වෙලා ඒවා මගේ තොල් වලට මැදිකරගත්තා.. එයා මොකුත් නොකරම හිටියා.. ඒත් සැරින් සැරේ ඒ අත මගේ ඉණ දෙපැත්තෙන් උඩ පල්ලෙහා යනවා.. සමහර වෙලාවට පපුවෙන් නතරවෙනවා.. අකීකරුයි වගේ අවුස්සනවා.. ඒ හැම වතාවකම රධ්‍ය අයියගෙ ඇඟේ කොහේමහරි මගේ නියපොතු පාරක් දිගට පාට වුණා..

පැය බාගෙකට විතර පස්සෙ කාමරේම ඉතුරුවෙලා තිබුනෙ සිවිලිමෙ කැරකෙන ෆෑන් එකේ සද්දෙයි, මම හුස්ම අල්ලන සද්දෙයි විතරයි.. මම හිටියෙ රධ්‍ය අයියගෙ පපුව අස්සටම ගුලි වෙලා.. එයා හිටියේ මාව ගුලි කරගෙන.. එයා ගාව හැමදාම මට ගුලිවෙන්න තරමට ඉඩ තිබුණා.. ඒ හුස්ම මගෙ නලලෙ වදින විදියට ලෝබ හිතෙනවා.. අර පපුව මැද්දෙන් ගලාගෙන එන උනුහුමයි ඒ සුවඳටයි මට ලෝබ හිතෙනවා.. මම එයාගෙ පපුව මැද්දෙන් තොල් තියාගෙන ඉඳලා ටිකකින් එහාට ගත්තා..

" දවසක මගෙම කරගන්න.. මගේ විතරක්.. මම බලාගෙන ඉන්නවා.."

රධ්‍ය අයියා අර සනීප හිතෙන විදියට එයාගෙ ලොකු අතකින් මගෙ නළලට වැටිලා තිබ්බ කොණ්ඩ කැලි සේරම අල්ලලා පිටිපස්සට කල්ලා එතනින් හාද්දක් තිව්වා..

" සනීපයි ඔයා ගාව.."

" දැන් නිදාගන්න.."

රධ්‍ය අයියා මාව තුරුල් කරගෙන ඇඟට උඩින් බෙඩ්ශීට් එකක් පොරවලා මාව එයාගෙ බූවලු අඩුවලින් තදකල්ලා බදාගත්තා.. ඒක තමයි.. මගේ ගෙදර..

රධ්‍යගෙ අප්පච්චිත් සාගා බලන්න එනවා

මීට වහලේ කලවැද්දා ලෙස රහපෑ බේසික වෙරි මින්සි

ආයෙම එන්නම් මගෙ ලස්සන දළඹු ළමයිනේ.. ඔය හැමෝන්ටම මම ගොඩාක් ගොඩාක් ආදරෙයි වගේම මම හුගක් සතුටු වෙනවා ඔයාලා හැමෝම වගේ ආදරණීය පාඨක දළඹුවො ගොඩක් මට ලැබුනු එක ගැන..

@Shan

හැමදේකටම මම හුගාක් ආදරෙයි.. ඒ වගේම ස්තුතියි.. (වචන වලින් කියලා නිමකරන්න බැ යම්කුනේ)

එන්නාම්.. ලව් යූ.. ❤



Literally Radhya's love language = hugging like an octopus

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 94 කොටස

මම හිටියේ ස්ටේජ් එකේ මෙහා කොනේ.. රධ්‍ය අයියා හිටියෙ එහා කොනේ.. ඉස්කෝලෙ ඩ්‍රාමා මැඩම්, ගයනිකා මැඩම්, ඊස්ටර්න් මියුසික් සර් තුන්දෙනාම ඕඩියන්ස් එකේ වාඩිවෙලා ඉන්නවා.. මම සුදුපාට ලේන්සුවත් නමලා අතේ දමාගෙන ස්ටේජ් එකේ තිර රෙද්ද අස්සෙන් සෙනුකයා පස්ස දික් කරගෙන කන්ඩක්ට් කරන හැටි බලාගෙන හිටියෙ.. ඔකෙස්ට්‍රා එකත් ඉන්ස්ට්‍රූමන්ට්ස් තියාගෙන ස්ටේජ් එකේ පිටිපස්සෙන් ස්ටෙයාස් පහකට ඉදගෙන ඉන්නවා.. ස්ටේජ් එක මැද්දෙ උස ස්ටූල් එකක් තිබ්බා..

" හරි.. ෂනෙරු මෙ පැත්තෙන් එනවා.. රධ්‍ය, ෂනෙරු එනකොට තප්පර පහක් විතර පහුවෙලා එන්න ඕන.. හරිනෙ.."

මම අපේ ඩ්‍රාමා මිස්ට තම්බ්ස් අප් එකක් දුන්නා .. දැන් මේ අර සෙන්යොරීටා මෙච්ච එක ප්‍රැක්ටිස් වෙනවනේ.. ඒ අස්සෙ මට ඇනුමකුත් යන්න ඇවිල්ලා මම කට තද කරගෙන වහගත්තා.. නිදිත්මතයි..

" K.. One Two Three.."

මම කොන්ද කෙළින් තියාගෙන අර ලේන්සුවත් අතේ තියාගෙන ස්ටේජ් එක මැද්දට ඇවිදගෙන ඇවිදගෙන එද්දි රධ්‍ය අයියා එහාපැත්තෙ ඉදන් ඇවිදගෙන එනවා.. මැද්දෙදි මම රධිය අයියගෙ ඇඟේ හැප්පෙනවා එතන ලේන්සුව වැටෙනවා.. ඊත් මම මගක් දුර ගිහින් නැවතුනාම රධ්‍ය අයියා ගිහින් ස්ටූල් එක උඩින් වාඩිවෙලා ගිටාර් එක අතට ගන්නවා.. මම එහෙමම ස්පොට් ලයිට් එක මැද්දෙ නැවතිලාම ඉන්නවා.. එහෙම තමයි පොතේ හැටියට වෙන්න තිබ්බෙ..

ඊත් සිද්ධ වුණේ..මම ඇවිදගෙන ආවා.. රධ්‍ය අයියත් ගමකට ගහන්න වගේ ඇවිදගෙන ආවා.. මගේ ඇඟේ හැප්පුනා.. මම එහෙමම පිටිපස්සට විසික් වෙලා ගිහින් ස්ටූල් එකේ ඉන්දවුනා.. ලේන්සුව කැලේ.. ගයනිකා මැඩම් සාරිපොටෙන් කට වහගත්තා..

" ඔය ලමයිනේ.. ගහගන්න වගේ යන්නෙ නෑ.. කට් කට් කට්.. ෂනෙරු.. රධ්‍ය.. මෙතන ඔයාලගෙ භාවයන් ප්‍රකාශ වෙන්න ඕන හොඳට.. සින්දුව

@Shan

ඇහට ගන්න.. ෂනෙරුගෙන් පේන්න ඕන වෙහෙසකාරී චරිතයක්.. මහන්සි වුණු දුක හිතුණු පෙණුමක්.."

ඩ්‍රාමා මැඩම් දනි පනි ගාලා ස්ටේජ් එක මැද්දට දුවගෙන ඇවිත් අපි දෙන්නව පැත්තකින් තියලා මැඩම් රගපාන්න ගත්තා.. ඉතින් හත්දෙයියනේ අවුරුදු හතක් මෙකයි මමයි ඉගනගත්තෙ මියුසික් විතරනෙ.. ස්ටේජ් ඩ්‍රාමා වල රඟපාන්න ඉගෙන ගත්තයැ.. මැඩමුත් මාර කතා තමයි කියන්නෙ.. අපි දෙන්නම පැත්තකට වෙලා මැඩම් රඟපාන දිහා බලාගෙන හිටියා.. මහන්සි නැත්නම් මහන්සි පෙණුමක් ගන්නෙ කොහොමද.. ඉස්කෝලෙ වටේ වටයක් දුවලා ආවනම් අන්න මහන්සි වෙන්න තිබ්බා..

" තේරුණාද.. අනිත් එක රධ්‍ය.. ඔයාගෙන් පේන්න ඕන හරිම සාමාන්‍ය පිරිමි ළමයෙක්ගෙ චරිතයක්.. සැහැල්ලුවෙන් ඉන්නවා වගේ.. ඔයා බිමට නැමිලා ලේන්සුව ඇහිදගන්න පෝස් එක පාවා ප'ෆෙක්ට් වෙන්න ඕන.. තේරුණාද.."

" ඔව් මැඩම්.."

යැයි මැඩම් තමා.. ඇවිදින්නෙත් මාච්පාස්ට් කරන්න වගේ.. අනික මොන මගුලක්ද හත්දෙයියනේ මෙ ලේන්සුවෙ කතාව.. මං කියන්නෙ.. එහෙම එකක් ඕන නෑනෙ මෙකට.. එතකොට මෙක නිකම් බී එල් ඩ්‍රාමා එකක් වගේනෙ අර සෙනුකයා බලන.. කොහෙද ඊස්ටර්න් මියුසික් සර්ට ඕන වුණානෙ මෙක හෙන ක්ලාසි යුනික් එකක් කරන්න.. දැන්නම් මෙක දමලා මට යන්නත් හිතෙනවා.. ඒ වුණාට මෙක දමලා ගියොත් මගේ ගැටපොලොස් කොට්ටෝරුවා වෙන එකෙක් එක්ක මෙක පුරුදු වෙනවා.. එතකොට මට මල පනිනවා.. හරිනම් රධ්‍ය අයියා මට සලකන්න ඕන මීටවඩා.. මම එයා වෙනුවෙන් කන කට්ටට.. මොකෝ මම එයාට වද දෙනවා කියලද නෑනෙ.. අපි හොඳ වැඩි වුණා..

" හරි අප්.. ආයෙම තැන් වලට යන්න.. හරි අප් හරි අප්.."

මැඩම් ක්ලැප් කල්ලා ස්ටේජ් එකෙන් බැහැලා ගියා.. සෙනුකයා ඒ අස්සෙ මට කින්ඩියට හිනාවෙනවා.. මම උගටත් ශේප් එකේ මැද ඇඟිල්ල දික් කරගෙන ආයෙම තිර රෙද්ද අස්සට රිංගගත්තා.. එකසැරේම ස්ටූල් එකට අඳුරු කහපාට ස්පොට් ලයිට් එක වැටුණා.. ඒකට හේත්තු කල්ලා ගිටාර් එකක් තියලා තියෙනවා.. ඉස්සරහින් මයික් එකක් ස්ටෑන්ඩ් කල්ලා තියෙනවා..

@Shan

" K.. One Two Three.."

මම ආයෙම කොන්ද කෙළින් තියාගෙන ලේන්සුව අතේ දමාගෙන බිම බලාගෙන ස්ටේජ් එක මැද්දට ඇවිදගෙන යද්දි මගේ කෙළින්ම හුහාක් ඩිම කරපු ස්පොට් ලයිට් එකක් වැදෙනවා.. මගේ ෆුට්ස්ටෙප්ස් විතරයි හැමතැනම ඇහෙන්නෙ.. අනිත් ඔක්කොම නිශ්ශබ්දයි.. මම ඇවිත් විනාඩි පහකින් විතර කලිසම් සාක්කු වලට අත් දෙකත් ඔබාගෙන සෙන්යොරීටා එකේ මියුසික් එක විසිල් කරගෙන රධ්‍ය අයියා ඇවිදගෙන එනවා.. ස්ටේජ් එකේ කතිරයක් ගහපු තැනදි එයා මගේ ඇගේ හැප්පුණාම ලේන්සුව බිමට වැටුනා.. මම එහෙමම ඇවිදගෙන ඇවිදගෙන ගිහින් මගක් දුරදි ලාවට හැරිලා රධ්‍ය අයියා දිහා බලනවා.. එතකොටත් එයා මං දිහා බලාගෙන ඉන්නෙ.. ඊටපස්සෙ නැමිලා බිම වැටුණු ලේන්සුව අතට අරගෙන ගිහින් ස්ටූල් එකේ ඉඳගෙන එක කකුලක් නමලා බාර් එකෙන් තියාගන්නවා..

" නො වෙයො ලා හොරාදෙ වෙර්තේයි ඔත්‍රා වෙස්.."

" තෙ ගුස්තරීආ සලිර් කොන්මීගො..?"

ඩ්‍රාමා මැඩම් ක්ලැප් කරගෙන පුටුවෙන් නැගිට්ටා..

" අන්න හරි.. ඇටිස් ඉට් බෝයිස්.. ඒ විදියට තමයි.. තව ටිකක් ෂනෙරුගෙ කැරැක්ටර් එක බිල්ඩප් වෙන්න ඕන.. බට් අයි ලව් දිස්.."

එකපාරම ස්පොට්ස්ලයිට්ස් නිමිලා ස්ටේජ් එකේ ලයිට්ස් ඔන වුණා..

" දැන් ෂනෙරුගෙ ඩයලොග් එකෙන් පස්සෙ ඔයා ටක්ගාලා ගිහින් උඩ ඇඳුම අයින් කල්ලා දාලා රෙඩ් ලොන්ග් ස්ලීව්ඩ් එකට මාරුවෙන්න ඕන.. තේරුණාද.. එතකොට ස්ටේජ් එකෙයි ඕඩියන්ස් එකෙයි ලයිට්ස් ඔෆ් වෙනවා.. ඔකෙස්ට්‍රා එකෙන් විනාඩියක මියුසික් එකක් ප්ලේ වෙනවා.. රධ්‍ය ඔයාගෙ ලෙදර් ජැකට් එක ගලවලා ඔයා ගාවට එන කෙනාට දෙන්න ඕන.. දීලා ස්ලීව්ලස් ශර්ට් එක උඩට කල්ලා හදාගන්න ඕන.."

" කේ මැඩම්.."

" හොඳට මතක තියාගන්න.. විනාඩියයි ඔය දෙන්නටම තියෙන්නෙ.. විනාඩිය ඉවරවුණාම ස්ටේජ් එකේ ලයිස් ඔන් වෙනවා.. දෙන් ෂනෙරු සින්ග් කරන්න පටන්ගන්නවා.."

@Shan

" හරි මැඩම්.."

" අපි සිංහින් පාට එක කන්ටිනිව් කරමු.."

ගයනිකා මැඩම් බැරිමරගාතෙ නැගිට්ටින්න හදද්දි ඊස්ටර්න් මියුසික් සර් මැඩම්ට වාඩිවෙන්න කියලා අපි ගාවට ආවා..

" ගයනිකා ඔතන ඉඳන් අඩුපාඩු කියන්න.. I will take care of it.."

ඊටපස්සෙ දිගටම තිබුණේ සිංහින් ප්‍රැක්ටිසස්.. මුලින්ම ගයනිකා මැඩම්ට අපි දෙන්නගෙ කටහඬවල් දෙක වෙනම අඳුනගන්න පුලුවන් වෙන විදියට කියන්න පුරුදු කලා.. කොල්ලොම දෙන්නෙක් නිසා දෙකම එක වගේ වෙනවනෙ.. ඒත් රධ්‍ය අයියට හෙනටම හයිපිච් එකට සින්ග් කරන්න බෑ.. එයාගෙ කටහඬේ තියන්නෙ ගොරෝසු ගතියක්.. ගොරෝසු ඒත් පැහැදිලියි.. මගේ කටහඬ හයිපිච් යනවා, අරවගේ ගොරෝසු නෑ.. ඉතින් මම කැමිලායැ ඒ වගේම සිංදු කියන්න.. එහෙම කිව්වොත් එහෙම මෙතන ඉන්න උන්ගෙ කන් පැලිලා ගිහින් වෙන මගුලක් වෙනවා.. කැමිලගෙ සිංදුවක් වොලියුම් වැඩිකල්ලා ඇහුවොත් අන්තිම හරියට යද්දි කන්දෙක ලෙප්ට් වෙලා තියෙන්නත් පුලුවන්.. ඒ වුණාට මම ආසම එයාට..

අන්තිමට පැය දෙකක් විතර ප්‍රැක්ටිස් කල්ලා මැඩම් බ්‍රේක් එකක් දීලා එළියට ගියා.. ඔකෙස්ට්‍රා එකේ ඉඳපු කට්ටියත් ඉන්ස්ට්‍රූමන්ට්ස් ටික දමලා එළියට ගියාම මම ස්ටේජ් එක මැද්දෙම බිම ඉඳගත්තා.. උගුරත් කකියනවා සිංදු කියලා.. සෙනුකයා මහ පගයා වගේ අර මොකක්ද කුර වන වන ඇවිත් මං ගාවින් ඉඳගත්තා..

" ඒ බං ෂනෙරුවා.. උඹලා දෙන්නා අර මුල්ම කැල්ලෙ කුණුහර්පෙන් බැනගන්නවද බං.."

" මම දන්නෑ.. මගෙන් අහන්න එපා.. හනේ මට වතුර ටිකා~ක්.."

රධ්‍ය අයියා වතුර බිබී හිටපු බෝතලේ මගේ පැත්තට විසික් කරාම මම ඒක අල්ලගත්තා..

" රධ්‍ය අයියෙ.. කියන්නකො මොකක්ද මුලින් ඔගොල්ලො කියන්නෙ.."

@Shan

" ¿Te gustaría salir conmigo? කියන්නෙ Will you go out with me? කියන එකට.. No veo la hora de verte otra vez කියන්නෙ I can't wait to see you again කියන එකට.."

" අම්මටසිරි එහෙමද.. එතකොට ඇයි ඕක ස්පැනිශ් වලින්ම කියන්නෙ.."

" ඉතින් යකෝ señorita කියන්නෙ ස්පැනිශ් වලින් බැඳපු නැති කෙල්ලොන්ට කියන නමනෙ.."

" ඒ කියන්නෙ.. අඩෝ උඹද දැන් මෙතන බැඳපු නැති කෙල්ල.. සැක් සනෙරු.."

" අනේ මේ.. මගෙන් කුණුහර්ප අහගන්නැතුව ඉඳහන්.. මට මේක කරන්න බෑ.. ලැජ්ජයි.."

" ඒ මොකෝ ලැජ්ජ.. මෙ රධ්‍ය අයියත් කරන්නෙ හොඳට.."

" එහෙම තමා.. මට ලැජ්ජයි.."

" උඹට එහෙම ඒවා දැනෙනවද බං ඉතින්.."

" දැනෙනවා තමා.. ආ අන්න අයුක අයිය එනවා.."

" දෙයියනේ සුදුදෝණියා..!!!"

සෙනුකයා ස්ටේජ් එක මැද්දෙ ඉඳන් අත වැනුවහම අයුක අයියා ඒක ගනන් ගන්නෙ නැතුව හිමින් සැරේ පාඩුවෙ අපේ දිහාවට ඇවිදගෙන ඇවිත් රධ්‍ය අයියා ගාවින් ඉඳගත්තා.. ඊටපස්සෙන් සයෝන් අයියයි කියාන් අයියයිත් ආවා.. මෙගොල්ලො මොකද මෙහේ..

" අම්මටසිරි සුදුඅප්පච්චියත් ඇවිල්ලා.. මොකෝ මෙහේ.."

" සුදුඅප්පච්චියා ආවෙ සුදුඅම්මියව බලලා යන්න.. කොහොමද රත්තරනෙ ඔයාට.. මගෙ සූකිරිබඩ්ඩ කෙට්ටු වෙලා.."

කියාන් අයියා රධ්‍ය අයියගෙ කම්මුල් දෙක අත් දෙකෙන් තලලා දාන්න ලෑස්තිවුණාම රධ්‍ය අයියා අත ගසලා මෙහාට වුණා..

@Shan

" එහාට පලයන් කියාන්.."

" සුදුඅම්මියා නරක් වෙලා මේ මදාවි බෝඩරේ එක්ක ඉඳලා.."

" කවුද මදාවි බෝඩරේ.."

" උඹලගෙ වයසෙ ඉන්න සේරම උන් තමා.. උඹ.. මෙන්න මූ.. මගේ ගෑණී.. මගෙ ගෑණීගෙ ගෑනි.. සේරම.."

" කියාන් අයියා අත දික් කර කර කතාකරද්දි මම දැක්කා ඩයල් එක එක අතක නියපොතු ටික පාට පාටින් පාටකරගෙන ඉන්නවා.. මම සෙනිකව අත ඇදලා ගත්තා..

" අඩෝ කියාන් අයියෙ උඹ ඩ්‍රග් ක්වීන් කෙනෙක් වුණාද බං.. ඒ ඒ මෙන්න කියාන් අයියා කියුටෙක්ස් ගාගෙන ඇවිල්ලා.. ඊයා බං රෝස පාට දම්පාට.. මෙ මොනෞත්තක්ද මේ.."

මම හැමෝටම කියන් අයියගෙ අත පෙන්නුවාම ඔක්කොම ඒකට එබිලා බැලුවා..

" අඩෝ කියාන් අයියෙ සිරාවට.. උබ අපිට හොරෙන් මොනවද කරන්නෙ මෙ.."

" සෙනුකයා කටවහගනින්.. ගහප් උස්සලා පොලොවෙ.."

" බලන්නකො අයුක අයියෙ.."

සෙනුකයා හැම මගුලම කරගෙන අන්තිමටම කියන ජාතික උදාන වාක්‍ය 'බැලැඤ්ඤකො ඇයුක ඇයියේ.. ඇඤේ..'

" මෙහෙ දීපන් මගේ අත.. ආවා මෙතන ප#ක් බලන්න.."

" එහෙම එකක් බැලුවෙ නෑ අයියෙ.. බොරු කියන්නෙපා.."

" මේ රඩ්‍ය මම මුව දැන් මරාගෙන කනවා හරිද.."

" ඇයි මරාගෙන කන්න උඹ මෝරෙක්ද.."

@Shan

මම ඉඳගෙන හිටපු තැනින් ශේප් එකේ නැගිට්ටහම සේරම මගේ දිහා බලාගෙන හිටියා..

" අහකට පලයං වනචරයා~"

" පර ෂනෙරුවා.. ඉඳපන් උඹට මම.."

මම සයෝන් අයියගෙ කකුල් දෙක උඩින් පැනලා බැක්ස්ටේජ් එකට දුවගෙන ගිහින් එතන පඩිපෙළත් බැහැලා නවරහහල වටෙන් ඇවිත් එතනින් ආයෙම දුවගෙන දුවගෙන ආපු පාර වයර් කැල්ලක පැටලිලා බිම ඉඳගෙන හිටපු අයුක අයියගෙ ඇඟ උඩටම පතබෑවුණාම කියාන් අයියත් ඒකෙම පැටලිලා මගේ ඇඟ උඩට කඩාගෙන වැටුණා.. ඒකනම් සිරාවටම තරු පෙණුනා.. අපරාදෙ රධ්‍ය අයියා පෙන්නනකල් හිටියෙ..

" අම්මෝ.. කොන්ද පගයො.. අහකට පලයන්.. අනේ රධ්‍ය අයියෙ.. මූව අහකට ගන්නවකෝ.."

මම අයුක අයියගෙ ඇඟ උඩින් නැගිටගන්න බැරුව දඟලනකොට රධ්‍ය අයියා මූණ හට්ටියක් කරගෙන නැගිටලා ඇවිත් කියාන් අයියගෙ පුපටත් දෙකක් පයින් ගහලා මාවත් උස්සලා නැගිට්ටුවා.. අයුක අයියා තාම බිම පතබෑවීගෙනම ඉන්නවා..

" අයුක.. උඹට අවුලක් නැනෙ.."

" අම්මෝ කොන්දෙ පොට ගියා බං.."

අයුක අයියා පොලොව බදාගෙන ඉඳලා හිමින් සැරේ නැගිට්ටහම මම රධ්‍ය අයියගෙ පිටිපස්සෙන් හිටගෙන ශේප් එකේ සමාජෙන් වහන් වෙලා හිටියා.. ඒ එක්කම කියාන් අයියා දබෝස් ගාලා මගේ පිට මැද්දයි එහාපැත්තෙ ඉඳපු සෙනුකයගෙ පිට මැද්දටයි හොඳ පාරක් දමලා ඇරියා..

" ආව්.. මොකද තවුසෙ ගහන්නෙ.. පිස්සුද.. ආ.."

" සෙනුක අහකට පලයන්.."

" ඇයි ඇයි මොකද ගහගන්නද.. ආ වරෙන් බලන්න.."

@Shan

සෙනුකයා කියාන් අයියගෙන් අරික්කාලක්වත් නෑ ශර්ට් එකේ අත් දෙකත් උස්සගෙන ගහගන්න ගියාම කියාන් අයියා සෙනුක ගාවටම පහත් වෙලා නලලට තට්ටුවක් දැම්මා..

" ඇයි ගහන්නද.."

" ගහනවා තමයි හලෝ.."

සෙනුකයා කැරකිලා කියාන් අයියගෙ බඩට පාරක් කකුලෙන් ගහන්න ගියාම කියාන් අයියා උගේ අණ්ඩ රීක් බෝලයක් අල්ලගන්නවා වගේ එක අතකින් අල්ලගත්තා.. ඒ එක්කම සෙනුකයා බිමට ඇදගෙන වැටෙන්න කලින් අයුක අයියා පැනලා ඌව අල්ලගත්තා..

" මේ ඔයා මගේ යාළුවට අත තියන්නෙපා හරිද.. මම තවුසෙගෙ ඇට2ක තලලා දානවා.."

" අනේ මේ..ඉදපන්.. තලයි ඇටේම.."

" තලනවා තමයි යකෝ.."

මම බිම තිබ්බ ගිටාර් එක ගන්න යද්දිම රධ්‍ය අයියා පැනලා ගිටාර් එක උස්සලා උඩට කල්ලා අල්ලගත්තා..

" වරද්..!!!"

" ඇයි මොකද ඔවා.."

" මේ ගිටාර් එකෙන් මූට ගැහුවම උඹයි මමයි ප්ලේ කරන්නෙ මොකෙන්ද.."

" ඇයි අපි ජූනියර් බෑන්ඩ් එකේ මෙලෝඩිකා ගැහුවෙ.. මෙලෝඩිකාවක් හොඳයිනෙ.."

රධ්‍ය අයියා මට දෙකක් රවලා ගිහින් ගිටාර් එක පැත්තකින් තියලා ආවා..සැක් මට මැවිලා පේනවා රධ්‍ය අයියා ගැම්මට ඇවිදගෙන ස්ටේජ් එක මැද්දට ගිහින් මෙලෝඩිකාවකින් සෙන්යොරීටා ගහනවා.. හෙන අවුල් වගේ.. මම ඔලුව ගසලා හරි සිහියට එද්දි සෙනුකයා අයුක අයියගෙන් ගුටි කාලා මූන ඇද කරගෙන ඉන්නවා..

@Shan

" අම්මෝ බං.. උඹලා පවුල් කන හැටි දැක්කහම මට හිතෙනවා සදා තනිකඩව ඉන්න.."

සයෝන් අයියා පැත්තකින් තිබ්බ ස්ප්‍රයිට් බෝතලයක් අරගෙන විකිස් ගාලා ඒක කැඩුවා..

" ඒ මොකද අයියෙ.."

" නෑ නිකම්.. දන්නැද්ද.."

" කියනවකො කියාන් අයියෙ.. මොකද ඔවා නියපොතු පාට කරගෙන ඉන්නෙ.."

" ඉන්නෙද.. ඉන්නෙ උඹලගෙ වයසෙ මම කරගහගෙන ඉන්න එකී ඉන්නවනෙ.. ඊයෙ ගියා ශොපින් යන්න ඕන කියලා.. උඹට කියන්න බං.. අර ගෑණු උලන්නෙ අරහෙ මෙහෙ.. මොනවද.. කන්සීලරුයි ලිප්ස්ටිකුයි කියුටෙක්ස් ටිකයි සේරම ටෙස්ට් කරන්න ඒකි මාව විද්‍යාගාර මීයා කරගත්තා.. අපේ අම්මගෙ නේල් පොලිශ් රිමූ කරන එක හොයාගන්න බැරිවුණා උදේ එද්දි.. උඹලා හිතුවද මම ඩ්‍රග් ක්වීන් කෙනෙක් වුණා කියලා.. නොදකින්.."

" සැක්.. ඒකද මේ.. කවුද දන්නෙ.."

" මුන්ගෙ වයසෙ සේරම එකයි.. කටනම් තියෙනවා අරහෙම කරනවා මෙහෙම කරනවා කියලා.. කැරපොත්තෙක් දැක්කහම ලතෝනි තියාගෙන ගේවටේ දුවනවා.. අනේ බොලාගෙ කෙරුවාව.."

" එහෙම නෑ හරිද.. බලු කතා කියන්නෙපා.. නේද රධ්‍ය අයියෙ.. නේද කියනවකො.. නේ.."

" ම්ම්.."

" දැක්කනෙ.."

රධ්‍ය අයියා ටිකකින් ඔලුව දෙපැත්ත මසාජ් කරගන්නවා මම දැක්කා.. හැපිකච්චට මේ කියාන් පරයා තමා හිසරදේ හදවන්නෙ..

" එච්චා වැඩක් නෑ.. මොකෝ සාගා එකේ වැඩ.."

@Shan

" කරගෙන යනවා.. තව දවස් ටිකයිනෙ.. ෂනෙරුලගෙ අයිටම් එක ලේට් නිසා ඒකෙ වැඩ තමා තියෙන්නෙ.."

" එහෙමද.. අඩෝ උඹලා සිංදුව කියපන් මමයි අයුකයයි සයෝනුයි ඇවිත් නටන්නද ඒකට.."

" ඊයා ඕයි.."

" මම සුදුදෝණියව අරගෙන මෙන්න මෙහෙම කරකලා උම්මා එකක් දෙන්නම්.."

කියාන් අයියා අයුක අයියව ඇදලා අරගෙන අත උඩට වට්ටගෙන මූණට පාත් වෙන්න ගියාම ඉරිසියාකාර සෙනුකයා කියාන් අයියගෙ බෙල්ලෙන් අල්ලගත්තා..

" අතෑරපන් මගේ මනුස්සයව.."

" ආ අනේ මේ.. නටපන් සෙනුක.. සුදුදෝණි උඹෙ වෙන්න කලින් මගේ වුණේ.. අනික මගේ සුදුඅම්මියත්.."

" කියාන් කැහ්-අහකට වෙයන් බං.. මේ රධ්‍ය.."

" උම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්මවාහ්!!"

ඒ එක්කම කියාන් අයියා අයුක අයියගෙ බෙල්ලෙන්ම අල්ලන් හෙන තඩි උම්මා එකක් දුන්නා අයුක අයියට..

"....."

" තවුසෙ පර කොහිල කැස්වටුවා.. මොකක්ද ඒ කලේ.."

" සුදුදෝණියට තොත්තුවක් දුන්නා ඇයි උඹ මොකද.."

" කැහ්-උඹට පිස්සුද බං.. අහකට වෙයන්.. මේ රධ්‍ය මූට මොකද මේ වෙලා තියෙ-කැහ්-කැහ්"

" කියාන්!!!"

@Shan

" සුදුඅම්මියටත් කිස් එකක් ඕනද.. අනේ~"

" හනේ ඔක නවත්තගනිල්ලා යකුනේ.. උඹලට පිස්සු තද වෙලාද.."

සයෝන් අයියා අයුක අයියව කියාන් පිඹුරු ග්‍රහනයෙන් ඇදලා මෙහාට ගත්තා.. ආවා මෙතන මූකලන් සූකරයා මගේ හැපීකව්වගෙ මූණ ඉඹින්න..

" මේ උඹලගෙ අප්පච්චිත් එනවනේ සාගා එකට.."

" ඈ මොකක්..??"

මම ඉක්මනටම රධ්‍ය අයියා දිහා හැරිලා බැලුවා..

" ඕල්බෝයිස්ලා එනවනේ ඉතින්.."

" මම.. ඒව්.."

රධ්‍ය අයියා ඕනවට එපාවට කියලා ස්ප්‍රයිට් බෝතලේ ඉල්ලගෙන ඒක බිව්වා.. මොකක්ද යකෝ ඒ කිව්වෙ.. රධ්‍ය අයියලගෙ අප්පච්චි සාගා එනවද.. මම දන්නෙත් නෑ.. රධ්‍ය අයියා කිව්වෙත් නෑ..

" ඡනෙරු උඹ මාමණ්ඩිව ටෝක් කරහන් එදාට ගිහින්.."

" ඒ කොහොමද.."

" අප්පච්චි ගාවට ගිහින් කියහන් එදා කිව්ව රූප් එක.."

" අනේ මේ.."

මම කියන් අයියට රවලා අනිත් අය කියවන දේවල් අහගෙන හිටියා.. අප්පච්චි කියද්දිත් බය හිතෙනවා.. එයා මොනවහරි මම හම්බුණාම කියයිද දන්නෙ නෑ.. මම එහෙ නිතර යනව එනවත්නෙ.. අම්මා හොඳයි වුණාට.. අප්පච්චි..

මම ඇඳුමෙ නූලක් ඇදලා අරගෙන ඒක ඇඟිලිවල පටලැන අනිත් අය හිනාවෙන කතාකරන දිහා බලාගෙන හිටියා.. අනේ දැන්නම් බය හිතෙනවා.. මට බෑ මේක කරන්න.. මම ගයනිකා මැඩම්ට කියලා අයින් වෙනවා..

@Shan

රධ්‍ය අයියා මං දිහා ටිකක් බලාගෙන ඉඳලා මගේ අතක එයාගෙ ඇඟිලි පටලගෙන අත හයියෙන් තද කල්ලා අල්ලලා අතෑරියා.. මම එයාදිහා ඔලුව උස්සලා බැලුවා..

" Don't even think about it.."

" ම්ම්.."

බ්‍රේක් එක ඉවරවෙලා ආයෙම හෝල් එකට මැඩම්ලා ආවහම සයෝන් අයියලා එළියට ගියා.. වයිස් ප්‍රින්සිපල්ස්ලා දෙන්නෙකුත් ඇවිත් හිටියේ හවස ප්‍රැක්ටිසස් බලන්න.. ආයෙම ලන්ච් එක බ්‍රේක් එකක් දුන්නායින් පස්සෙ රෑ අට වෙනකල්ම අපිට ඉස්කෝලෙ ඉන්න වුණා.. කොස්ටියුම්ස් හදන්නයි අනිත් වැඩ වලටයි.. එහෙම ඉඳලා ඉස්කෝලෙන් එළියට එද්දිත් හුංගක් රෑ වෙලා.. කියාන් අයියලා එතකොටත් ගෙදර ගිහින්.. අයුක අයියත් සෙනුක එක්ක යනකල් ඉඳලා මමයි රධ්‍ය අයියයි බයික් එක ගාවට ආවා..

" ඔයා දවල් ඉඳන් අවුලෙන් ඉන්නෙ ඇයි වරද්.."

" ආ..?? මම.. නෑ.."

" බොරු කියපන්.. මට නැතුව වෙන එකෙක්ට.."

රධ්‍ය අයියා හෙල්මට් එක අරගෙන මගේ ඔලුවට දාලා ක්ලිප් එක තද කලා..

" මට බය හිතෙනවා.."

" බය වෙන්න ඕන වැරැද්දක් කල්ලනම් නෙ.. ඔයා මොකක්ද කරපු වරද.."

" මන්දා.. මට තේරෙන්නෙ නෑ.."

මම රධ්‍ය අයියගෙ උරහිසෙන් අල්ලගෙන බයික් එකට නැග්ගා..

" අපි කොහේහරි යන්නද යන්නෙ.."

" ම්ම්.."

" එතකොට ගෙදර..??"

@Shan

"....."

රධ්‍ය අයියා මොකුත් නොකියා බයික් එක ස්ටාට් කරගෙන යන්න පටන්ගත්තා.. මම එයාගෙ ජැකට් එකෙන් තද කල්ලා අල්ලගත්තා.. මට ඇඬෙන්න එනවා.. එයා මම නිසා පවුලෙ හැමෝම එක්ක ප්‍රශ්න දාගෙන අන්තිමේ මොකක් හරි ලොකු දෙයක් වෙයි කියලා හැමතිස්සෙම මගේ හිත කියනවා.. මම රධ්‍ය අයියගෙ පිටට මූණ තියාගෙන ඇස් දෙකේ අගිස්සෙ පිරිලා තියෙන කඳුලු වෙලිලා යනකල් බලාගෙන හිටියා.. ඒත් කඳුලු වෙලිලා යන්නැතුව අලුත් වෙලා ඇස් අගිස්සෙ පිරිලා පහළට කඩාගෙන වැටිලා කම්මුල් දිගේ ගලාගෙන යනවා.. ඉඳලා හිටලා වුණත් හිතට බයක් දැනෙද්දි ඇඬෙනවා.. මම ඇස් දෙක පියාගෙන  මොකුත්ම දේවල් දිහා නොබලා හිටියා.. හුළං පාරවල් ඇවිත් මගේ මූණෙ වැදීගෙන යනවා.. විනාඩි විස්සකින් විතර රධ්‍ය අයියා බයික් එක නතර කල්ලා මම එයාගෙ බඩ මැද්දෙන් අල්ලගෙන ඉඳපු අත උඩින් අත තියාගත්තා..

" වරද්.. බහින්න.."

මම රධ්‍ය අයියගෙ උරහිසින් අල්ලගෙන බයික් එකෙන් බැහැලා හෙල්මට් එක ගලවගත්තම එයත් බැස්සා.. බැහැලා මගේ මූණට වැටිලා තියන කොණ්ඩෙ ඔක්කොම පිටිපස්සට කල්ලා අල්ලගෙන මගේ මූණට එබුණා..

" මෙහෙ බලන්න.."

මම ඒත් බිම බලාගෙනම හිටියා.. දැන් මේ මනුස්සයා දිහා බැලුවොත් ඇඬෙනවනෙ.. එයා මාව උස්සලා බයික් එකෙන් ඉන්දුවා..

" කෝ බලන්නකො.."

" මම..??"

" මොකුත් වෙලත් නැතුව බොරුවට අඬනවනෙ.."

" එහෙම නෑ.. මට බය හිතුණා.."

" බය හිතෙන්න ඕන මම ඔයා ගාව නැත්තම් නෙ.. දැන් ඉන්නවනෙ.."

" ඒ වුණාට ඔයා යනවනෙහ්.."

@Shan

මම ඇස් වලට ඔන්නැති විදියට උනන උණුම උණු කඳුලු ශර්ට් එකේ කරෙන් පිහිදාගත්තා.. ඒ වුනාට මට ඉකි ගැහිලා ඇඩෙනවා.. මොන මගුලක්ද මට ඇඩෙන්නෙ.. මම ඉකි ගැහෙන්නැතිවෙන්න තොල් පටවල් තදකල්ලා පියාගෙන හිටියා.. රධ්‍ය අයියා මාව හිමින් සැරේ පපුවට හේත්තු කරගත්තා.. මම ඔහේ එයාගෙ පපුවට හේත්තු වෙලා හිටියා..

" අඩන්න එපා වරද්.."

" ම-ම හිතලා අඩන්නෙ නෑ.."

" මම ඉක්මනට එනවනෙ.."

" ඒ වුණාට.. ඒ වුණාට.. ඔයාට- තේරෙන්නෑ අයියෙ.."

මම රධ්‍ය අයියගෙ ශර්ට් එක තද කල්ලා අල්ලගෙන මිට මොළවලා එයාගෙ පපුවට පාරක් ගැහුවගම එයා ගැස්සුනා.. අපි හිටියෙ මවුන්ට් ලැවිනියා වල Barracuda එකේ ඉස්සරහා තියන පාකින් ලොට් එකේ.. ඒ හරියෙ එච්චර ලයිට්ස් මොකුත් නෑ.. ඇතුළේ ඇකොස්ටික් මියුසික් ප්ලේ වෙනවා ඇහෙනවා.. මනුස්සයෝ මේ වෙලාවෙ හරි නිදහසින් එහේ මෙහේ ඇවිදිනවා හිනාවෙනවා කතාකරනවා මම දැක්කා.. කවුරුත්ම අපි දෙන්නෙක් ඉන්නවා කියලවත් ඒ දිහා විශේශෙන්වත් බැලුවෙ නෑ.. රෑ නමයත් පහුවෙලා තිබ්බත් සෙනඟ සෑහෙන්න හිටියා..

" මොනවද මට තේරෙන්නැත්තෙ.."

" මම දන්නෑ.."

මම රධ්‍ය අයියගෙ ශර්ට් එකෙන්ම මූන පුරාම තිබ්බ කඳුලු පිහාගත්තා..

" අපි ඉස්සරහට වෙන්න තියන දේවල් අමතක කල්ලා දැනට අඩන්නැතුව ඉමුද.."

" ඒ කියන්නෙ ඉස්සරහට මොකුත් වෙව්ද.."

රධ්‍ය අයියා මගේ මූන දෙපැත්තෙන් අල්ලගෙන මගේ මූන ගාවට කිට්ටු වුණා..

" ඉස්සරහට හුඟක් දේවල් වෙව්.."

@Shan

" එතකොට..??"

" එතකොටත් මම දුර ඉඳන් හරි ඔයා ගාවින් මෙහෙම ඉන්නවා.."

" ඒ කොහොමද.."

" එහෙම තමයි.. ඉන්නවා.. ඔයා බලන්නකො.."

" නොගිහින් ඉන්නකො අයියෙ.. මම කැමති නැනෙ ඔයා යනවට.."

මම අත් දෙකෙන්ම මගේ ඇස් වලට උනන කඳුලු පිහාගත්තා.. රධ්‍ය අයියට කියන්න මොකුත්ම නැතුව මං දිහා උත්තරයක් නැතුව බලාගෙන හිටියා.. ඇයි මම එයාගෙන උත්තර නැති ප්‍රශ්න අහන්නෙ.. මට සැරින් සැරේ මොනවා වෙනවද වෙලාවකට හිතාගන්න බෑ..

" ගිහින් ඉක්මනට එන්න.. මට පිසික්ස් වලට එස් එකක් තියෙයිද දන්නෙ නෑ.."

රධ්‍ය අයියා ටිකකින් ලාවට හිනාවුණා..

" අඩු කඩනවා එහෙම තිබ්බොත්.."

මම බයික් එකෙන් බැහැලා සපත්තුවෙ ලිහිලා තිබ්බ ලේස් එක ගැටගහගත්තා..

" අපි යමු..??"

" Barracuda යනවද The station යනවද.."

මම රේල් පාරෙන් එහාපැත්තෙ තිබ්බ ස්ටේශන් එක දිහා බලාගෙන හිටියා.. දෙකටම යන්නෙ ඉතින් කන්නනෙ..

" අනේ මන්දා.. ඔයා කියන්න.."

" ඔයා කියන්න.. කොහෙද යන්න ඕන කියලා.."

මම එහායින් තියන ස්ටේශන් එක දිහා බලාගෙන හිටියා.. රේල් පාර පැනලා ගල් ගොඩේ ඒකට යන්න බෑ වගේ හිතුණා..

@Shan

" Barracuda යමු.."

රධ්‍ය අයියා මගේ කොණ්ඩෙ අවුල් කල්ලා අතකින් අල්ලගත්තා..

" ඔයා එහෙට ගිහින් අඩන්නැත්තන් යමු.."

මම රධ්‍ය අයියගෙ අතේ නියපොතු හිටින්න පාරක් තදකලා.. අපි ගිහින් ටේබල් එකකින් ඉදගත්තා.. අවුරුදු විසි ගනන් වල විතර පිරිමි ළමයි දෙන්නෙක් ස්ටේජ් එකක් වගේ තියන තැන ගිටාර් එකක් ප්ලේ කර කර සින්දුවක් කියනවා.. සින්දුව කියන කොල්ලගෙ අතේ පත්තුවෙන සිගරට් එකක් තිබ්බා.. කොන්ඩෙ කර්ලි ඇස් දෙකට වැටෙන විදියට හදලා තිබ්බෙ.. ගිටාර් එක ප්ලේ කරන කොල්ලගෙ ගිටාර් එකේ පැත්තකින් සිල්වර් හාට් එකක් තියන ටැග් එකක් එල්ලලා තිබුණා..

I'm out of my head, out of my mind, oh, I

If you let me, I'll be

Out of my dress and into your arms tonight

Yeah, I'm lost without it

Feels like I'm always waitin'

I need you to come get me

Out of my head, and into your arms tonight, tonight..

" ඔයා බීච් යන්න හෙන ආසයි නේද.."

" ම්ම්.. කොහොමද කිව්වෙ.."

" නිකමට හිතුණා.. මමත් ආසයි.."

" නිදහස් .. මම ඔයා එක්ක මෙහෙ එන්න හිතාගෙන හිටියේ.."

" ඒ මොකද.."

@Shan

" විශේශයක් නෑ.. I am a lover who likes to go everywhere with my boyfriend.."

රධ්‍ය අයියා ඒක කිව්වෙ හරියට ලොකු වැදගත් දෙයක් පැහැදිලි කල්ලා දෙන්න වගේ..

" I am also a lover who loves to go wherever my boyfriend takes me.."

" That means a

**'perfect match'**

.."

රධ්‍ය අයියා හිනාවෙලා පුටුවට හේත්තු වුණා..

" ඔයාට කියන්න වරද්.."

" ම්ම්.."

" මම වෙලාවකට හිතනවා That I can take even the biggest risk in this world for your lovely smile.."

රධ්‍ය අයියා අමුතු හිනාවක් කට කොනේ තියාගෙන එහෙම කියද්දි මම එයා දිහා නොබලා අපිට උඩින් එල්ලලා තිබුනු පොඩි පොඩි කහ පාට ලයිට් බල්බ්ස් ලයින් එක දිහා බලාගෙන හිටියා.. මගේ කම්මුල් වලට ලේ පිරෙනවා වගේ දැනෙනවා..

" It's getting better when you're blushing.."

" ඔක නවත්තගන්න.."

" ඇයි මම නවත්තන්නෙ.. මම කරන්නෙ මගේ බෝයිෆ්‍රෙන්ඩ්ව අගය කරන එක.."

" ඇයි හදිසියෙම..??"

" ඒක මෙහෙමයි.."

@Shan

රධ්‍ය අයියා හෙන ලොකු කතාවක් කියන්න වගේ අත් දෙකේ ඇඟිලි එකට බැඳගෙන මේසේ ඉස්සරහට නැමුණා.. මම එයා දිහා බලාගෙනම හිටියා..

" මට වෙලාවකට හිතෙනවා කතාකරන්න ඕන කියලා.. අර මම ඔයා ෆ්ලෙමින්ග් ජූන් වගේ කිව්ව දවසෙ.. අපි මූවි ඩේට් එකකට ගියේ.. අන්න එදා වගේ.. එකපාරටම හිතෙනවා.. කතාකරනවා.."

" ආ ඔව්.. එදානම් ඔයා සෑහෙන්න කතාකළා.."

" ඒකනෙ.. අදත් එහෙම දවසක් කියලා හිතාගන්න.."

" ම්ම්.. හරි.."

" මට දැන් හිතෙනවා ටයිම් ට්‍රැවල් කල්ලා මම ඒ ලෙවෙල්ස් කරද්දි හිටපු කොල්ලා ගාවට ගිහින් කියලා එන්න.. Bro, you don't need to worry.. In two years, your ඩයරියේ ඉන්න මල will be your boyfriend කියලා.."

මට ඒකට හිනා ගියා.. රධ්‍ය අයියා මෙහෙම සැහැල්ලුවෙන් කතාකරන්නෙ ඉඳලා හිටලා නිසා මම ආසයි ඒකට කරදර කරන්නෙ නැතුව අහගෙන ඉන්න.. මම දකින්න ආසම කැරැක්ටර් එක, එයා මෙහෙම නිදහසේ ඉද්දි මං ගාවට එනවා.. ඒ එක්කම වේටර් කෙනෙක් ඇවිත් cranberry juice jug එකක් තියලා ග්ලාසස් දෙකකට ඒකෙන් ටිකක් වක් කල්ලා ගියා..

" ඩයරියේ ඉන්න මල ගැන දැනට මොකෝ හිතන්නෙ.."

" That is the only precious thing that I love yesterday, today and tomorrow.. මේ වරද්.."

මම cranberry ග්ලාස් එකෙන් උගුරක් බිව්වහම ඒකෙ තිබ්බ අමුතු තිත්ත සැර ගතියට උගුර ලාවට දැවිල්ල අල්ලනවා වගේ දැනුනා..

" ම්ම්.."

" නිකමට හිතන්න ඔයා මගෙයි අපේ අයියගෙයි ලයිෆ් එකට ආවෙ නැත්නම් අපේ අයියා තාම ඔයාගෙ මාමව හොයාගන්න බැරුව දුක් වෙවී ඉන්නවා.. මට වෙලාවකට සතුටු හිතෙනවා අපේ අයියා මාරම

@Shan

සැහැල්ලුවෙන් ඉද්දි.. එයා අන්තිමට ඔහොම මනමාල හීනාවක් දාගෙන හිටියේ දැන් අවුරුදු ගානකට කලින් නෙ.."

" ආඪ්‍ය අයියා හරි-.. අනේ මන්දා.. එයා මාරයි නේද.. කවදහරි එයා හොඳම හොඳ තාත්තා කෙනෙක් වේවි.."

" මටත් හිතෙනවා.."

" දැනටම එයා ඔයාව බලාගන්න විදිය.. එතකොට අපේ මාමා ගැන හොයලා බලන විදිය.. මෙහ්.. ඒකනෙමේ.. එයාලා බබෙක් හදාගනී නේද.."

" ඔව් සමහරවිට.."

" එතකොට මම අන්කල් කෙනෙක්.."

" නැනෙ අයියා කෙනෙක්.."

" ඒ කිව්වෙ.."

" ඉතින් ඔයාගෙ මාමගෙ බබා.. අයියා නෙමෙයිද.."

" ඉතින් අපේ මාමා යාළුවෙලා ඉන්නෙ ඔයගෙ අයියා එක්කනෙ.. මම යාලුවෙලා ඉන්නෙ ඔයා එක්ක.. ඒ ඔයාගෙ අයියා නිසා මගෙත් අයියා.. එතකොට අයියගෙ පුතා අංකල්.."

රඪ්‍ය අයියා ඔලුව කසාගෙන cranberry ග්ලාස් එක වටයක් කැරකුවා..

" මට ඇත්තටම මෙ නෑදෑ සම්බන්ධෙට වඩා ඉක්මනට අවකලනෙ තේරුණා.. කමක් නෑ.."

ඊටපස්සෙ ආයෙම වේටර් කෙනෙක් ඇවිල්ලා හෙන ප්ලේට්ස් ගොඩක් මේසෙන් තියලා යන ගියා.. මම ඒ කෑම මොනවද කියලා හරියටම අඳුනගන්න ට්‍රයි කලා.. රඪ්‍ය අයියා හෙන ගොඩක් කනවනෙ.. හැමදාම කොහේහරි ගියොත් කෑම ලොට් එකක් ඕඩර් කල්ලා මේසෙ පුරෝගන්නවා.. ඊටපස්සෙ ඒක ඉවරවෙනකල්ම කකා කියව කියව ඉන්නවා.. ඒක කොහෙහරි ගියාමත් එහෙමයි.. අපේ ගෙදර ආවහමත් එහෙමයි..

@Shan

" ඔයාට මතකද අර දවසක් ඔයා අපේ ගෙදර ඇවිල්ලා අපි දෙන්නා cuttlefish devil එකක් හැදුවා.."

" ආ ඔව්.. ඒක මාරයි නේද අනේ.."

" ඔව්.. අර මොකක්ද බබා ඔයා කෑම රස වුණාම කියන වචනෙ.. ආ Heavenly~ සිරාවටම ඒක මරු.."

" අපි ආයෙ දවසක කෑමක් හදමු.."

" මම.. ටිකක් කොම්ප්ලිකේටඩ් රෙසපි එකක් ට්‍රයි කල්ලා බලමු.."

" හා.."

" ඔයා එක්ක මම ඉන්න හැමතිස්සෙම මට හිතෙනවා වරද්.. 'That's what love is, dude'.. අර කියන්නෙ හරිම කෙනා ජීවිතේට ආවහම ඒක මාරයි, මාරම විදියට දැනෙනවා කියලා.. අන්න එහෙම.. Like Everytime.. මම මටම කියාගන්නවා මගේ චොයිසස් කොච්චර හොඳද කියලා.."

" I lo~ve you.."

" I love you mo~re.."

රධ්‍ය අයියා මගේ ප්ලේට් එකට කෑම බෙදලා එයාගෙ ප්ලේට් එකටත් බෙදාගත්තා..

" Such a gentleman.."

" Anything for you.."

එයයි මමයි හුඟ වෙලාවක් හිනාවෙවී කතාකර කර කෑම කෑවා.. එතන හුඟක් හිටියේ ෆොරින් අය.. ඒ ඇරෙන්න ලොකල් කපල්ස් ගොඩක් හිටියා.. සීෆුඩ් ඇන්ඩ් ග්‍රිල් රෙස්ටොරන්ට් එකක් නිසා ඒකෙ මෙනූ එකේ තිබ්බෙ ඔක්කොම වගේ සීෆුඩ් විතරමයි.. එළිමහනෙ වගේ හදලා තිබුණු තැනක් නිසා එතන වැල්ල තිබ්බෙ.. බිම.. රධ්‍ය අයියා මම ඉස්සරහට කලා තියාගෙන ඉඳපු කකුල් දෙකට දෙපැත්තෙන් එයාගෙ කකුල් දෙක තියාගෙන හිටියා.. සමහරවෙලාවකට මගේ සුළඟිල්ලෙන් අල්ලගන්නවා.. නැත්නම් අත තද කල්ලා අල්ලගන්නවා.. මම එයා කියන විකාර කතාවලට

@Shan

හිනාවෙච්, ඒ ඔක්කොම අහගෙන හිටියා.. කලින් ඇඩුවෙ මමමද කියලා මට හිතාගන්න බෑ.. ඇඩුවෙ ඇයිද කියලත් මට අමතක වෙන තරමට මම හිටියේ සතුටින්.. මාරම නිදහසේ.. කාලා බීලා අපි ගෙදර එන්න එළිඅය ආවහම රඩ්‍ය අයියා මාව උස්සලා බයික් එක උඩින් ඉන්දලා හුගාක් වෙලා මාව කිස් කලා.. සෑහෙන්න වෙලාවක්.. ඒ වෙලේ කවුරුත් එතනින් ගියේවත් හිටියෙවත් නෑ.. මහා සද්දෙන් අපිට ළඟින් ට්‍රේන් එකක් ගියත් ඒ සද්දෙවත් ඇහෙන්නැතිවෙන්න මම අර මත් වෙන හැඟීමෙ ගිලිලා හිටියා.. එයාගෙ ලොකු උනුහුම් අත් මගේ ඉණ වටේ පැටලිලා තියන විදිය.. එයා මගේ තොල් වලට කිට්ටු වෙන විදිය.. ඒ හුස්ම ඇවිත් මගේ මූණෙ වදින විදිය.. මගේ තොල් උඩම එයාගෙ තොල් තියාගෙන ආදරෙයි කියන විදිය.. මම ඒවට කොච්චර ආදරේ කරනවද කියන්න මට අදහසක් නෑ.. මූදු හුළඟ අපි දෙන්නගෙ අතරෙ තිබ්බ පුංචිම ඉඩෙන් පවා ගලාගෙන ගියා..

අවසානෙ අපි ගෙදර එද්දි රෑ එකොළහමාරයි.. මම බයික් එකෙන් බැහැලා ෆෝන් එක එළියට ගත්තා..

" පරිස්සමින් ඉන්න.. මම ගිහින් කතාකරන්නම්.. හෙට හවස ප්‍රැක්ටිස් ඉවරවෙලා ඉස්කෝලෙට එන්න.."

" ඔයත් පරිස්සමින් යන්න.. අප්පච්චි බනින එකක් නැද්ද රෑ වුණා වැඩියි කියලා.."

" කවුද දැන් ගෙදර යන්නෙ.. මම අයියා නයිට් කරන ඩිස්පැන්සරි එකට ගිහින් එයාගෙ රූම් එකෙන් වොශ් එකක් දාගෙන නිදාගැනලා හෙට උදේ ගෙදර යනවා.."

" ඒ මොකද.."

" අයියා නැතුව ගෙදර ඉන්න බෑ.."

" අයියව මතක් කලා කියන්න.. මම යන්නම්.."

මම යන්නත් ඇවිලල හැරිලා රඩ්‍ය අයියගෙ නළලින් හාද්දක් තිබ්බා.. රඩ්‍ය අයියා මගේ ඇඟ වටේ අතක් දාගෙන මාව එයාට තුරුල් කරගත්තා..

" ආදරෙයි.."

@Shan

රධ්‍ය අයියා රහසින් මගෙ කනට කල්ලා කියද්දි මම එයාගෙන් එහාට වෙලා බැක්පැක් එකත් කරේ දාගෙන ගෙදරට දුවගෙන ආවා.. ආයෙමමගේ බඩේ සමනල්ලු දාස්ගානක් තටු ගහලා පියාඹන්න පටන් අරගෙන..

දළඹු ළමයින්ට කියන්න බඩඩක් ගෙනාවෝ.. නුදුරු අනාගතයේ අනුසාකි කතාව බලාපොරොත්තු වෙන්න.. එයාලට මොකද වුණේ කියලත් දැනගමු.. හාත..



But if you like causing trouble up in hotel rooms

And if you like having

**secret little rendezvous**

If you like to do the things you know that we shouldn't do

Then baby, I'm perfect

Baby, I'm perfect for you

And if you like

**midnight driving with the windows down**

And if you like

**going places we can't even pronounce**

If you like to

**do whatever you've been dreaming about**

Then baby, you're perfect

Baby, you're perfect

@Shan

So let's start right now

- perfect  by One Direction -

අහලා බලන්ඩෝ~

එන්නාම්.. ලව් යූ..

❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 95 කොටස

" සරනේරු, ස්පීඩ් එක හොඳයි..බට් මීට වඩා ක්වික් පෝසස් වලට රෙඩි වෙලා ඉන්න ඕන.. නොට් වූ බෑඩ්.."

මම ඔලුවට දාගෙන ඉඳපු රතු පාට බැන්ඩනා එක ගලවලා බෑන්ග්ස් වල දාඩිය පිහාගෙන බිමින් ඉඳගත්තා.. මේ වෙළසුමනයා නාකි වුණාට හොඳට ප්ලේ කරනවනෙ.. සමහරවිට පොර මට ඔය කිව්වට ඇත්තටම කොළ කැඳ එහෙම බොනවත් ඇති..

" සර් මට අනිද්දා එන්න වෙන එකක් නෑනෙ.."

මම හෙන බයෙන් බිම බලාගෙන වෙළසුමනයගෙන් ඇහුවම වෙළසුමනයා මගේ දිහා රවලා ඇස් දෙකත් උණ්ඩි කරගෙන බැලුවා..

" ඇයි අනිද්දා එන්න වෙන්නෙ නැත්තෙ.."

" සර් මට ඉස්කෝලෙ වැඩක් තියෙනවා.."

" මොන වැඩක්ද.."

" ඇයි ඉස්කෝලෙ සාගා එක.. ඒකෙ ප'ෆෝම් කරන්න මමත් ඉන්නවා.."

" සාගා..??"

" ඔව්.."

" මොකක්ද ප'ෆෝම් කරන්නෙ දැන්.."

සැක් මෙකට බැරිද පොඩ්ඩක් හිනාවෙලා මාත් එක්ක කතාකරන්න මං අහන්නෙ.. ඔහොම රවාගෙනම ඉන්න ඕන නෑනෙ හැමතිස්සෙම..

" ඒක බලන්න ඉතින් පන්දාහක් දීලා ටිකට් අරන් එන්න.. මම කියන්නෙ නෑ.."

@Shan

මම මොකටද මේ වයසක වෙළුසුමනයට සෙකන්ඩ් වෙන්නෙ.. එහෙම ඕන නැනෙ.. පොඩ්ඩක් ලොකුකමේ ඉන්න ඕන.. අනික අපි නැහිලා සාගා ප්‍රැක්ටිස් කරන්නෙ මූට ඒක ස්පොයිල් කරන්නද.. නැනෙ නැනෙ.. ඇවිල්ලා බලාගන්න එකයි ඇත්තෙ..

" හරි එහෙනම්, එදාට ප්‍රැක්ටිසස් වෙන දවසකට මම දානවා.. මේ මාස දෙකේ හොඳ තත්වෙකෙට ඇවිත් පෙන්නල ඊළඟ ටූනමන්ට්ස් දෙක වින් කළොත් මාස හයකින් ක්ලබ් එකෙන් යන සිංගප්පූර් ටුවර් එකට මම තමුන්ව සිලෙක්ට් කරගන්නවා.."

ඒකට මගේ කට බිමටම ඇරුණා.. අඩෙ සිරාවට.. වෙළුසුමනයා කිව්වෙ සිංගප්පූර් ටුවර් එකක් සෙට් වෙනවා කියලද.. දෙයියනේ මෙකනම් ගිහින් මගෙ ගැටපොලොස් කොට්ටෝරුවට කියන්නම ඕන..

" ඇ-ඇත්තටමද.."

" ඔව් සමහරවිට.. හොඳට ප්ලේ කළොත් තමුන්ට ටුවර් කීපෙකටම යන්න පුලුවන් වේවි.."

" වෝව්!!"

මම රැකට් එක අත් දෙකින්ම බදාගෙන බිම පෙරළුණා.. අනේ අප්පා මට ශටිල්කොක් එක කාලා ගිලින්න තරම් සතුටුයි.. ආයෙ මම අනිත් පැත්තටත් පෙරළුනා..

" මම කිව්වෙ වේවි කියලා.. දැන් නැගිටලා එක්සසයිස් කන්ටිනිව් කරනවා..!!"

කෝච් මගේ කකුලකට පයින් ගහලා කිව්වහම මම හිතේ කහටක් නැතුවම නැගිටලා දත් තිස්දෙකම එළියට දාලා හිනාවෙලා, බැන්ඩනා එක දාලා කණ්ණාඩියෙන් බලාගෙන කොණ්ඩෙ හදාගත්තා.. ඒ හදාගෙන ස්කිපින් රෝප් එක අතට ගත්තා විතරයි ක්ලබ් එකේ ස්ටාෆ් එකේ කොල්ලෙක් දොර ඇරගෙන ඇතුළට ආවා..

" එක්ස්කියුස් මී සර්.. මිසිස් එදිරිමාන්න සර්ව මීට් වෙන්න පුලුවන්ද අහනවා.."

@Shan

මම ආයෙමෙ කණ්ණාඩිය ගාවට දුවගෙන ගිහින් බොරුවට කොණ්ඩෙ හදනවා වගේ බලාගෙන හිටියෙ නාකි මනමාලයගෙ මූණ ලාවට එළිවෙනවා.. ඕක තමා කියන්නෙ හැට පැන්නත් වඳුරා යන්නෙ බිමින් කියලා..සැක් නෑ.. උඩින් කියලා.. ඒ වුණාට කෝච් සර් යන්නෙ බිමින් නෙ.. හැබැයි සර් වඳුරෙක් නෙමෙ.. හැටපැන්නත් කෝච් යන්නෙ පඩිපෙළෙන් වගේ එකක් හොඳයි..

" එයාට එන්න කියන්න.."

මම කොණ්ඩෙ හදන මුවාවෙන් ශේප් එකේ අර ලොකු වෝල් මිරර් එක ගාවටම වෙලා මිසිස් එදිරිමාන්නව බලාගන්න පෙරුම් පුරාගෙන හිටියා.. අහන්න ඕන මේ වගේ වෙළසුමනයෙක් හොයාගත්තෙ කොහෙන්ද කියලා.. යකෝ මෙහෙම මිනිස්සුන්ටත් ආදරේ කරන කාන්තා පාර්ශවයක් ඉන්නවනෙ.. ගෙදර ඉද්දි වයිෆ්ට බයිනවද දන්නෙ නෑ.. එක්කො නැතුව ඇති.. වයිෆ්ට බය ඇති ඩයල් එක..

මම හෙන වයස ආන්ටි කෙනෙක් බලාපොරොත්තුවෙන් දොර දිහා බලාගෙන හිටියත් එකසැරේම දොර ඇරගෙන ඇතුළට ආවෙ හෙන පොඩි ලස්සන හුරුබුහුටි කෙල්ලෙක්.. අවුරුදු විසි පහක?? විසි හතරක විතර.. මාරම ලස්සනයි ඒ ගෑණුළමයා.. කොණ්ඩෙ උරහිසේ ගෑවෙන්න කොටට කපලා ස්ට්‍රේට් කල්ලා.. සුදුම සුදුයි.. හිනාවෙද්දි කම්මුල් දෙක වලගැහෙනවා.. දැන් මේ ඉන්නෙ මිසිස් එදිරිමාන්නද.. යකෝ මම සප්‍රයිස් වෙලා වෙලා තා ටික දවසකින් රධ්‍ය අයියට වගේ ප්‍රෙශර් අමාරුව වැඩිකරගන්නවා..

මම කණ්ණාඩියෙන් මූණ අහකට අරගෙන ස්කිපින් රෝප් එක එකපාරක් ගසලා ඒක දිගෑරගත්තා..

" හදිසියෙම මොකද තාන්වී.."

" අනේ පුතාට සනීප මදිනෙ.. මම කාර් එකේ තියලා ආවෙ.. උදේ ඉඳලා වොමිට් කරනවා ඉවරයක් නෑ.."

" මම එද්දි පුතා හොඳට හිටියනෙ.."

" ඒකතමා කියන්නෙ.. ඔයාට එන්න පුළුවන්ද.. මට දුව එක්ක අමාරුයි දැන් හොස්පිටල් ගිහින් වැඩ මැනේජ් කරගන්න.."

@Shan

" අම්මි.. පොඩ්ඩක් ඉන්න.. ෂනෙරු.. ඔයාට හවස සාගා ප්‍රැක්ටිස් තියෙනවා කිව්වා නේද.."

" ඔව් සර්.."

" තව විනාඩි විස්සකින් ඉවරයිනෙ මෙහෙ ප්‍රැක්ටිසස්.."

" අ.. සර් මට අද කලින් කොහොමත් යන්න ඕන.. ටයිම් එහෙ මෙහෙ වුණාට ප්‍රශ්නයක් නෑ.."

මම සර්ගෙ කලබල වෙන්න මූණ දිහා බලාගෙන කිව්වහම තාන්වී මාත් එක්ක හිනාවුණා..

" තැන්ක් යූ පුතා.. තාන්වී This is Shaneru.. ෂනෙරු This is my wife, Taanvi.."

" ඔහ්.. Hi, nice to meet you Mrs. Taanvi.."

" හායි ෂනෙරු.. මම ඔයා ගැන අහලා තියෙනවා.."

" You guys talk.. මම ධනුශ්කව මීට් වෙලා එන්නම්.. ගිම්මී අ සෙකන්ඩ්.."

කෝච් හෙන කලබලෙන් දොරත් ඇරගෙන එළියට ගියා ක්ලබ් එකේ මැනේජර්ව මීට් වෙන්න.. කලබල වෙනවනෙ ඉතින් පුතාට අසනීපයි කිව්වනෙ.. තාන්වී මගේ දිහා බලාගෙන ඉඳලා ආයෙම සැරයක් හිනාවුණා..

" මම ඔයාව දැකලා තියෙනවා.. බිග් මැච් එකේදි.."

" ඔහ්.. මටනම් මිසිස් එදිරිමාන්න එහෙම මතකයක් නෑ.."

" ඔව් මමත් අහම්බෙන් දක්කෙ.. ඔයාව මතක හිටියා.. හස්බන්ඩ් ගෙදර ඇවිත් ඔයාගෙ ෆොටෝ එකක් පෙන්නුවම තමයි මට මතක් වුණේ.."

" අහ්.. is it.."

" සොරි ෂනෙරු ඔයාලට ඩිස්ටර්බ් කලාට.. උදේ ඉඳලා පුතාට උණ හොඳටම.. වොමිට් වෙනවත් එක්කන්.. තාම එයාට මාස දෙකයි.. මම

@Shan

මොකුත්ම දන්නෙත් නැහැ.. එයාගෙ ටච්න් අඩනවා ඉවරයක් නෑ.. ඒකනිසා මෙහෙ ආවෙ.. එක්ස්ට්‍රීම්ලි සොරි ෂ-"

" No need to say sorry මිසිස් එදිරිමාන්න.. මටත් අද පොඩි වැඩ වගයක් තියෙන නිසා කලින් යන්න ප්ලෑන් කලේ.."

" ආ.. ඒකතමා.. අපි වෙලාවක නිදහසේ කතාකරමුකො.. මට තාන්වී කියන්න.. මිසිස් කියන්න ඕන නෑ.."

" කේ.. I pray for a speedy recovery for your baby.."

" තැන්ක්ස් ෂනෙරු.. මම යන්නම් එහෙනම්.. God bless you.."

තාන්වී මගේ පිටටත් තට්ටුවක් දාගෙන කෝච් ආවම රූම් එකෙන් යන්න ගියා.. සර් මට පොඩි බායි එකක් වගේ එකක් දීලා තාන්වී එක්ක යන්න ගියා..

වෙළුසුමන පියාඹලා යන්න ගියා..

නිදහසේ කවුරුත් නැති රූම් එකේ මම තනියම බිම තැන තැන වැටිලා තිබ්බ ශටල්කොක්ස් ඔක්කොම එකතු කල්ලා බින් එකකට දාලා ඇඳුමකුත් චේන්ජ් කරන් ඉස්කෝලෙට යන්න ලෑස්තිවුණා.. සර්ගෙ බබාට හුහක් අමාරුයිද දන්නෙ නෑ..

මම එළියට එන ගමන් කල්පනා කලේ කෝච් ගැන.. යකෝ වයස අවුරුදු පනස් පහක්වත් වෙනවා කෝච්ට මම දන්න විදියට.. වයිෆ්ට විසි හතරක් වගේ.. හැබැයි තාන්වී නම් හොඳයිද කොහෙද.. මාත් එක්කත් හොඳට කතාකලානෙ.. ඒත් සර්ගෙ ඒජ් එකට බබාලා පොඩි වැඩි නැද්ද මන්දා.. කවදහරි අපේ මාමටත් ඕකතමා වෙන්නෙ.. වයසට ගිහින් ෂුගර් ඩැඩී කෙනෙක් වෙලා ආධ්‍ය අයියා එක්ක ළමයෙක් හදාගන්න..

මම ටැක්සි එකක ඉස්කෝලෙට යද්දි හාස තුන හමාරට විතර ඇති.. නවරඟහල දෙක වෙන්න ඔකෙස්ට්‍රා එක ප්ලේ කරනවා.. මම ශේප් එකේ බැක්ස්ටේජ් එකේ දොරෙන් රිංගලා ගිහින් ස්පෝර්ට්ස් බෑග් එක පැත්තකින් තියලා රධ්‍ය අයියා ඉන්නවද කියලා කර්ටන් එක අස්සෙන් ඔලුව දාලා බැලුවා. සෙනුකයා ඉන්නවා ස්ටේජ් එකේ.. ඌට කතාකරන්නත් බෑනෙ.. කෝ මගේ ගැටපොලොස් කොට්ටෝරුවා.. මම තා ටිකක් කර්ටන් එකේ

@Shan

එල්ලිලා නැමිලා ඉස්සරහට එබෙද්දි, හෙන ගහන්න වගේ මහා හයියෙන් කවුරුහරි මගේ පශ්චාත් භාගයට අත දිගැරලා දුන්නා.. ඒ පාරටම මම බිම දබෝස් ගාලා කර්ටන් එකේ ලිස්සගෙන තලගොයා පොලොවෙ ගැහුවා වගේ බිම පතබැවුණා..

" තාරාවෙක් වගේ පස්ස දික් කරන් මොනවද බලන්නෙ.."

" ආව් අම්මාහ්.. මොන මගුලක්ද ඕයි.. හෙනයක් ගැහුවා වගේ.."

මම පස්සත් අතගාගෙන බිම ඉඳගත්තම රධ්‍ය අයියා මට නැගිටින්න අතක් දික් කලා..

" ගහද්දි රිදෙනවා තමා.."

මම රධ්‍ය අයියට රවාගෙන අත අල්ලන් නැගිට්ටා..

" එහෙමද ගහද්දි හුඟක් රිදෙනවද..??"

" ඔව් නේ.."

" මම ඔයාට ගහන්නද.."

මම රධ්‍ය අයියගෙ අත දිගේ ඇඟිලි ඇද~ගෙන උරහිස ගාවට එද්දි රධ්‍ය අයියා බයවෙලා වගේ අත එහාට ඇදගත්තා.. මම ඉතින් බය වෙන්න දෙයක් කිව්වද.. නෑනෙ..

" පාඩුවෙ ඉඳින්.."

" මේ ඒකනෙමෙ ඔයාට කියන්න.."

මම බැක්ස්ටේජ් එකේ පොඩි පඩිපෙළෙන් ඉඳගත්තා.. රධ්‍ය අයියා මගේ ඕපෙ අහන්න එතන බිත්තියට හේත්තුවෙලා අත්දෙක බැඳගත්තා..

" මාර වැඩක් වුණානෙ.."

" මොකක්ද.."

@Shan

" අපේ කෝච්ගෙ වයිෆ් ආවනෙ ක්ලබ් එකට.. එයාගෙ නම තාන්වී කියලා.. හෙන ලස්සනයි හරිද.. නිකමට ගෙස් කල්ලා කියන්න බලන්න කොච්ගෙ වයස කීයක් විතර ඇද්ද.."

රධ්‍ය අයියා ටිකක් වෙලා කල්පනා කලා..

" හතලිහක් වගේද.. පනහක්.???"

" නෑ අනේ විසි හතරක් විතර.. හෙනම බාලයි සර්ට වඩා.. මම හිතුවෙ ලුක් එක විතරයි ශුගර් ඩැඩී කෙනෙක් වගේ කියලා.. බලද්දි ඇත්තටම ඒකා ශුගර් ඩැඩී කෙනෙක්ද කොහෙද.."

" මොකක්.."

" ඔව් සර්ට බබාලා දෙන්නෙකුත් ඉන්නවා.. ට්වින්ලා.. දුවෙකුයි පුතෙකුයි.. මිසිස් එදිරිමාන්න කිව්වෙ එයාලට තාම මාස දෙකලු.. එක්කෙනෙක් අසනීප වෙලා.."

" එහෙමද.."

" ඔව් ඒකනිසා මම කලින් ආවා.."

" ඒක හොදයි.. එන්වෙ.. Love has no limits.."

" ම්ම්.. අපේ පාර්ට් එක ප්‍රැක්ටිස් කරන්නෙ කීයටද.."

" තව ටිකකින් පටන්ගනී.. ඔයා කෑම කාලද ආවෙ.."

" තාම නෑ අනේ.. මම කෑම ගෙනාවා අපි කාලා ඉමුද.."

" හා.. පහල ක්ලාස් එකකට යමු.."

මම බෑග් එකේ තිබ්බ ලන්ච් බොක්ස් එකයි වතුර බෝතලෙයි අරගෙන පහළට ගිහින් දහයෙ පන්තිකාමරේක දොර ඇරගෙන ඒක ඇතුළට ඇවිත් කෑම එක පැත්තකින් තියලා අත හෝදගද්දි රධ්‍ය අයියත් ඇපල් ගෙඩියක් උඩ දදා ක්ලාස් එකට ආවා..

" ඔය කොහෙන්ද.."

@Shan

" මැඩම් දුන්නෙ.."

රධ්‍ය අයියා ඇපල් ගෙඩිය මට දීලා ගිහින් අත හෝදගත්තා..

" අද උදේ ගෙදර ගියාද.."

" ඔව්.. ඊයෙ අයියා ගාවනෙ හිටියෙ.. ඒකනිසා අප්පච්චි මොකුත් කිව්වෙ නෑ.."

" එහෙනම් කමක් නෑ.."

" ඒ වුණාට අයියා උදේ කිව්වා අයියගෙ කාමරේ අවුස්සලා කියලා අප්පච්චි.. කේන්තියෙන් හිටියෙ අයියා.."

" ආ..??"

" ම්ම්.. මගේ කාමරෙත් බලලා තිබ්බා.."

" මොකුත් අහුවෙලා නැනේද.."

මම කලබලෙන් රධ්‍ය අයියා හිනාවෙලා මගෙ කොණ්ඩෙ ඇවිස්සුවා..

" ඇයි මම කුඩු හංගනවද මොනවහරි අහුවෙන්න.."

" නෑ මගේ ඇඳුම් එහෙම ඔයාගෙ අල්මාරියෙ තියෙනවා නේද.."

" අප්පච්චිට ඒවා මතක නෑ.. අහුවෙන්න මොකුත් තියනවද බං මමයි අයියයි.."

" ඒ කිව්වෙ.."

" අයියයි මමයි එහෙම ඒවා හංගන්නෙ නෑ.. පේන්නම තියලා තියෙනවා කොහේහරි.. එතකොට කවුරුත් බලන්නෙ නෑ.."

" ම්ම්.."

මම කෑම එක පෙට්ටියෙන් අරගෙන මෙසෙන් දිගෑරියා.. රධ්‍ය අයියා සේරටම කලින් පපඩමක් අරගෙන කරස් ගාලා ඒක හැපුවා..

@Shan

" ඔක තියලා ඉස්සෙල්ලම බත් කනවකො.."

" අනාගෙන කෑවත් නිකම් කෑවත් කන එකනෙ.."

" යැයි යැයි තමා.. තවුසෙ ඔකත් කාලා ඊටපස්සෙ මගේ එකත් අරගෙන කාපන්.. හැමදාම මගේ පපඩම හොරකම් කරනවා.."

" ඉස්සෙල්ල කන්න දැනගන්න එපැයි.. මම මොනා කරන්නද.. දැක්කොත් මම අරගෙන කනවා.."

" ඔව් ඔව් ලන්ච්ශීට් එකත් අරගෙන කනවා.. ආ අමතක වුණානෙ.. දවසක් ඔයා ලන්ච්ශීට් එකත් කෑවා නේද.. මට කරාබුනැට්ටක් කවලා.."

" කට වහක් කාපන්.."

" හැමදාම කියනවා කට-"

රධ්‍ය අයියා අල කෑල්ලක් දෙකට කඩලා මගේ කටේ එබුවා..

" හොඳ ළමයෙක් වගේ කෑවොත් මම මේ සැරේ නානකොට ළඟ තියාගන්න රබර් තාරපැටියෙක් අරන් දෙනවා.."

මම අර අල කෑල්ල හපලා හපලා හෙන අමාරුවෙන් ගිල්ලා..

" අනේ මේ මම කිව්වා කියලා හිතාගන්නවා.."

" හා.. අන්න උන් තමයි පීක් පීක් ගාන්නෙ.."

රධ්‍ය අයියා ආයෙම තාර වන්නමක් අල්ලගෙන නටන්න ගත්තු නිසා මම මගේ පාඩුවෙ කෑම එක අනාගෙන කන්න පටන් ගත්තා..

" ඔයා උදේ හැදුවද.."

" ඔව් වෙලා තිබ්බ නිසා කෑම හදාගෙන ආවා.."

" No one can cook as good as my boyfriend.."

@Shan

රඨ්‍ය අයියා ශේප් එකේ උගේ පපඩමත් අරගෙන කාලා මගේ පපඩමත් අරගෙන ඒකත් කෑවා.. කාලා ඉවරවෙලා තමයි ඊටපස්සෙ බත් කන්නෙ..

" වරද්.. මගේ කොන්ද රිදෙනවනෙ.."

" ඒ මොකද ඒ.."

" දන්නෙ නෑ.."

" ඉන්න මගේ බෑග් එකේ ප්ලාස්ටර් එකක් තිබ්බා ඒක දෙන්නද.."

" කාලා ඉවරවෙලා දෙන්න.."

" හා.. හැපීකච්චා වයසට යනවා.."

" අනේ මේ ඉඳපන්.."

රඨ්‍ය අයියයි මම කෑම කාලා අර ඇපල් ගෙඩියත් දෙකට බෙදාගෙන කකා ආයෙම නවරහහලට යද්දි ඉස්සරහා පඩිපෙලේ චමිරු තනියම ඉඳගෙන බිම බලාගෙන කල්පනා කරනවා මම දැක්කා.. අම්මෝ ඩයල් එක දැක්කෙත් හුඟ කාලෙකින්.. කමක් නෑ දැන් ඉස්සරහට හැමදාම හම්බෙනවනෙ.. මෙ ටික දවසට පරෙයියව නොදැක්කට කමක් නෑ.. මට ඒ එක්කම අයුක අයිය කියපු කතාවත් මතක් වුණා..

" චමිරු මොකෝ මෙහේ.."

" අද කැඩෙටස්ලගෙ මොකක්ද තියෙනවා පහළ.."

" ආ.. චමිරු අවුලෙන් වගේ නේද ඉන්නෙ.."

" මෙන්න මෙහෙ වරෙන්.. ඇයි දුක අහන අයියා වෙන්නද.."

" දුක අහන අයියා කිව්වහම මට ආඪ්‍ය අයියව මතක් වෙනවනෙ ඒයි.. අන්න නියම දුක අහන අයියලා.. මගේ දුකත් අහලා, මල්ලිවත් දීලා, කෑමත් හදලා දෙනවා.. ශෝක් නේද.. නේ.. නේද.. හිච්චි මාමෙ.."

" වරද්!!"

@Shan

" මේ මම ඔයාගෙන් අවංකවම උත්තර දෙන්න ඕන ප්‍රශ්නයක් අහන්නද.."

" මොකක්ද ඔයා පාට වෙනස් කරන කටුස්සෙක් වුණොත් ඒත් ඔයාට ආදරෙයිද වගේ එකක්ද.."

" නෑ නෑ අනේ.. එහෙම එකක් නෙමේ.. මේ ඒයි සිරාවට එහෙම වුණොත් ආදරේද.."

" අහන්න ගියපු එක අහන්නකෝ.."

" හා.. ඔයා අවංකව කියන්න ඔයා කැමතිද මම ඔයාට මගේ හැපිකව්වා කියනවට.."

" මාව උඹට චීස් ෆැක්ටරියක් වගේ පේනවද.."

මම ඔලුව උඩ පහල කරාම රධ්‍ය අයියා ඩ්‍රැමටික් විදියට ඇස් දෙක රෝල් කල්ලා ඉස්සරහා බලාගත්තා.. මම අත දිගෑරලා වටපිට බලල හොඳ පාරක් රධ්‍ය අයියගෙ තඩි පස්සට දුන්නහම ඒකා එක අතකින් පස්සත් අල්ලන් පඩිපෙළ නැගගෙන ගියා.. මම තියන වලත්තකමට රධ්‍ය අයියට පිටිපස්සෙන් තියන තියන අඩියක් ගානෙම පස්සට ඇන ඇන ආවා.. ඇයි අර පඩියට අඩිය තියන්න කකුල උස්සද්දි බොටම පුපුරන්න වගේ පස්ස පේනවනෙ..

" ඕක නවත්තනවා වරද්.."

" මට බෑ.. ඇම් ඔබ්සෙස්ඩ් විත් දිස් පස්ස.. ආ මේ ඉන්න ප්ලාස්ටර් එක ගේන්න.."

මම රධ්‍ය අයියව ඇදගෙන ගිහින් මගේ ස්පෝර්ට්ස් බෑග් එකේ තිබ්බ ප්ලාස්ටර් එකක් අරගෙන එයාගෙ කොන්දෙන් අලවලා එතන පොඩ්ඩක් අතගෑවා..

" මම ගෙදර ගිහින් මසාජ් කරන්නද.."

" ම්ම්.."

" අඩෝ සනෙරු පගයා.. මම මේ උඹව හොයන්න ආවෙ.."

@Shan

" දෙයියනේ මේ පව්කාරයට එච්චර ආදරයක්.."

සෙනුකයා දුවගෙන දුවගෙන ඇවිත් මගේ කරට පැන්න පාර ඌයි මායි දෙන්නම එතන බිම ඇදගෙන වැටුනා.. රධ්‍ය අයියා ඔලුව දෙපැත්ත අතගාගෙන එතන පුටුවෙන් ඉදගත්තා..

" මේ පව්කාරයා ඔය පව්කාරයට හදවත පැලෙන්නම ආතරෙයි.."

" වාවගන්නත් බැරුව චූබරකුත් ආවා සන්කද.."

" එන්න දෙයියො ලැට් එකට යමන.."

"ඒ මේ එහාට පලයන්.. මෙතනින් මිනිස්සුත් යනවා.."

මම සෙනුකයව එහාට කල්ලා නැගිටලා ඌවත් නැගිට්ටුවා..

" රධ්‍ය අයියෙ පොඩි උදව්වක් කරන්නකො.."

" මොකක්ද.."

සෙනුකයා නැගිටලා හොදපගයා වවගේ රධ්‍ය අයියා ගාවට ගිහින් හෙන අහිංසක විදියට ඇහුවා.. ඌයි මායි ගානට රහපානවා.. රධ්‍ය අයියා ඉස්සරහා ඌ අහිංසකයා වගේ ඉන්නවා.. අයුක අයියා ගාව මම අහිංසකයා වගෙ ඉන්නවා.. අපි දෙන්නම පිස්සු පගයො දෙන්නෙක් වගේ හැසිරෙන්නෙ අර කියාන් අහකට පලයං වනවරයා ගාව විතරයි..

" අයියෙ අර අතන තියන වයලින් බෝ එක අරන් දෙන්නකො.."

සෙනුකයා හෙන විසාල කබඩ් එකක් උඩ තියෙන වයලින් බෝ එකක් පෙන්නලා රධ්‍ය අයියට ඒක අරන්දෙන්න කිව්වා.. කවුද යකෝ මෙච්චර උඩ මේවා තියන්නෙ.. මුන්ට පිස්සුද.. රධ්‍ය අයියා එතෙන්ට උස නැතිනිසා පුටුව ඇදගෙන එතෙන්ට තියලා ඒකට නැගලා බැලුවා උස ඇතිද කියලා.. උඩ පැනලත් බැලුවා..

" කවුද මේක මෙතන තිබ්බෙ.."

" ඊයේ ඉදන් ඔතන තියෙන්නෙ.. මල්ලි කෙනෙක්ගෙ.. යාළුවෙක් විහිළුවට ඒක ඔතන්ට විසික් කලාලු.. බැරිද අයියෙ ගන්න.."

@Shan

" උස මදිනෙ.."

" කවුද යකෝ ඔහොම විහිළු කරන්නෙ.."

" අනේ මේ උඹ ඉඳපන්.. ඇයි උඹ දවසක් මගේ සපත්තුව ඉස්කෝලෙ එහාවත්තෙ වැටේ එල්ලලා ආවෙ.."

" ඉතින් උඹ මොකටද කලින් දවසෙ මගේ බෑග් එකේ ගඩොල් කැටයක් දැම්මෙ.."

" ආ ඒකවැඩක් නෑ අයියට බැරිවෙයිද ගන්න.. අයියා පුටුවට නැගලා ෂනෙරුවව උස්සලා ගන්න බැරිද.. සනෙරු බැයිනම් මාව උස්සන්න අයියෙ.."

මම සෙනුකයව එහාට තල්ලු කල්ලා මැද්දෙන් හිටගත්තා.. රධ්‍ය අයියා උස්සන්නෙ මාව විතරයි.. නැත්නම් මම ගිහින් අයුක අයියට කියනව මාව වඩාගනින් අයියෙ කියලා..

" වරද් මෙහෙ එනවා.."

" මේ පුටුව පෙරළුණොත් ප'ෆෝම් කරන්න නෙමේ හොස්පිටල් නවතින්න වෙන්නෙ.."

" කටපියන් එනවකො.."

" ඔව් සනෙරු පලකො.. කැඩෙට් කරපු එකෙක් එක්ක නේද යාළුවෙලා ඉන්නෙ.."

මම සෙනුකයට රවල අර ලී පුටුවට කකුලක් තියලා සෙනුකයගෙ අතකුත් අලගෙන ශේප් එකේ පුටුවට නැග්ගහම රධ්‍ය අයියා මගේ ඉනෙන් අල්ලලා මාව උඩට ඉස්සුවා.. මම ඉස්සිලා ඉස්සිලා ඒක ගන්න් අයද්දි.. මමත් ඉතින් පොඩ්ඩක් උසින් අඩුයිනෙ.. මේ කාලකන්නි මෙක තියපු උඩ යකෝ.. හෙනම ගහපන්.. මම තව ටිකක් ඉස්සෙන්න පුලුවන්ද බැලුවා..

" පුලුවන්ද බං.."

" අඩෙ උස මදි ඔයි.."

@Shan

" මොකක්ද වරද්.. ඕක ගන්න උස මදිද..You're too short.."

" OK put some inches in me then.. මගුලක් අහනවා.. ගත්තා ගත්තා.."

මම ඉස්සිලා අර බඩකඩිත්තුව අරගෙන බිමට පැන්නහම රධ්‍ය අයියත් මූණ රතු කරන් හට්ටියක් වගේ හදාගෙන පුටුවෙන් බිමට බැස්සා..

" මේක අරන් ගිහින් අතුල්ලගන්න කියපන් මල්ලිගෙ-"

" අඩෝ අඩෝ කෑගහන්නෙපා!!!"

සෙනුකයා මගෙන් බෝ එක ඉල්ලගෙන එහා කාමරේට ගියාම මම රධ්‍ය අයියා පැත්තට හැරුණා..

" සුදුඅම්මියා මොකද රතුවෙලා.."

" පාඩුවෙ ඉඳපන්.."

" බෑ ඒයි ඔයාගෙ සෙස්සි බොඩි එක දැක්කම හෝර්නි වෙනවා.."

රධ්‍ය අයියා මට ටොක්කක් ඇනගෙන ස්ටේජ් එකට යද්දි මමත් ඒ පස්සෙන්ම ගැරඩියා වගේ ඇදීගෙන ගියා.. මම යද්දි ඔඩියන්ස් එකේ කොනක චමිරු සර් කෙනෙක් එක්ක ෆයිල්ස් වගයක් තියාගෙන බලනවා මම දැක්කා.. එයා මං දිහා බලාගෙන ඉඳලා රධ්‍ය අයියා දිහා බලලා දුකින් ඒත් ලාවට හිනාවුණා..

" වරද් ඔයාගෙ මයික් එක.."

මම චමිරු දිහා බලාගෙන රධ්‍ය අයියා දුන්න මයික් එක ගද්දි චමිරුගෙ මූණෙ තිබ්බ දුක හිතෙන පුංචි හිනාවත් නැතිවෙලා යනවා මම දැක්කා.. එයා ඇත්තටම රධ්‍ය අයියට ආදරේ ඇති.. ඒත් චමිරු, මමත් රධ්‍ය අයියට ආදරෙයිනෙ..

මට මොහොතකට දැනුනා දෙන්නෙක්ගෙ කතාවෙ තුන්වෙනි පාර්ශවයක් වෙන්න වෙන එක කොච්චර දුකද කියලා.. වෙනදට ඉන්න දරදඬු චමිරු වගේ නෙමෙයි.. එයාගෙ මූණ තිබ්බෙ හරියට හෙම්බත් වෙලා.. දුකින් පිරිලා ඉතිරිලා ගිහින්.. මට දුකයි.. එයාගෙ දුක මට දැනෙනවා.. මම

@Shan

මොනවා කරන්නද.. වෙන ඕනදෙයක් ඔයා එක්ක බෙදාගන්න තිබුණා අහිතක් නැතුව මට.. මම ආදරේ කරන කෙනා ඇරෙන්න..

රධ්‍ය අයියා මං ගාවට ඇවිත් 'කොයි ලෝකෙද ඉන්නෙ' කියල ආහලා මයික් එක කණට පිටිපස්සෙන් රඳවද්දි මම ඒත් චමිරු දිහා බලාගෙනම වයර් එක ඇඳුම අස්සෙන් දාගෙන ඉණේ තිබ්බ බෑන්ඩ් එකේ ක්ලිප් කරගත්තා.. උඹට මාත් එක මෙච්චරට තරහා උබත් රධ්‍ය අයියට හුහක් ආදරේ නිසාද බං..

ඒ එක්කම චමිරු මගේ දිහා බලලා ගැස්සිලා වගේ අහක බලාගත්තා..

" වරද් කොයි ලෝකෙද ඉන්නෙ.."

" අ..ආ?? නෑ මම බැලුවෙ.. මොකුත් නෑ.."

ඇත්තටම මම හිටියේ චමිරුගෙ ලෝකෙ.. උගේ ලෝකෙ කොහොම ඇද්ද කියලා මට දැනිලා තිබ්බෙ නෑනෙ මීට කලින්.. මගේ කතාවෙ හැමතැනම රධ්‍ය අයියා ඉන්නවා වුණාට දුරින් ඉඳන් බලාගෙන ඉන්න ඌට රධ්‍ය අයියා උගේ කතාවෙ අහලකටවත් ඇවිත් නෑනෙ.. ඌට ඇත්තටම කොහොම වේදනාවක් ඇද්ද..

ටිකක් අමුතු වුණාට මම එයාගෙ කතාවෙ දුෂ්ටයා වෙලත් එයා දිහා බැලුවෙ දුකින්.. මගේ හිතේ අහලකවත් එහෙම පැල්බැඳගත්තු තරහක් නෑ ඌ එක්ක.. ඒ වුණාට මට රධ්‍ය අයියා එක පොඩ්ඩකටවත් මගෙන් එහාට කරන්න හිත දෙන්නෙ නෑ.. එහෙම කරන්නත් බෑ. කලාට වැඩකුත් නෑ..

උඹට ආදරේ කරන එකෙක් මත්තෙ නැහියං චමිරු.. උඹ වෙන වත්තක තියන ගහකට වතුර දාන්න ගිහින් ළඟ තියෙන ටිකත් නැතිකරගන්නවා..

රධ්‍ය අයියා මම දිහා බලලා මං බලාගෙන ඉඳපු දිහා බලලා ඒක පොඩ්ඩක්වත් ගනන් ගන්නෙ නැතුව ඉහින් ගිටාර් එකක් අරගෙන ඇවිත් ඒක ස්ටූල් එක ළඟින් තිබ්බා..

මට සතුටුයි.. රධ්‍ය අයියා දැනගෙනත් එයාට චමිරු ආදරේ කරනවා කියලා ඒ ගැන හිතන්නෙවත් නැතුව මට විතරක්ම ආදරේ කරන එක ගැන.. හැබැයි ඒක චමිරුට අසාධාරන ඇති..

මොනවා කරන්නද.. ලෝකෙ අසාධාරණයි තමයි..

@Shan

" Come to your senses වරද්.."

මම රධ්‍ය අයියා දිහා බලලා සිහියට ඇවිත් ස්ටේජ් එකේ කර්ටන් එක ගාවට ගියා.. රධ්‍ය අයියා එහා කොණට ගියා.. ඒ එක්කම චමිරු නැගිටලා එළියට දුවගෙන ගියා..

I'm in love with you but unfortunately, you love someone else. I will always cherish every moment we spent together as if it were a dream come true. You used to be my world and everything, but now I can only walk away.. (Chamiru)

එන්නාම්.. ලව් යූ..❤

මගෙ දළඹු පැටික්කනේ.. වෙඑසුමන සීනි අප්පච්චි කෝව් ස' පිහිටයි..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 96 කොටස

" කොහෙද ඉන්නෙ.. මම කීපසැරයක්ම කතාකළා.. ඔයා ආන්සර් කලේ නැනෙ.."

" ඇයි මම මැසේජ් එකක් දැම්මනෙ අද සෙනුකලගෙ ගෙදර යනවා කියලා.. අප්පච්චි ඉන්න නිසා කෝල් කලේ නැත්තෙ.."

" අහ්- මම දක්කෙ නෑ මැසේජ් එක.. දන් ඔය යන ගමන්ද.."

" ඔව්.. තාම බස් එකේ... දැන් ළඟයි.."

" කීයටද ගෙදර එන්නෙ.. හුඟක් හවස් වෙව්ද.."

" ඔයා අපේ ගෙදර එනවද.."

" ඔයා එන වෙලාව මැසේජ් එකක් තියන්න.. අපේ අයියා අද නයිට්.. මම ඒකනිසා අයියා එක්ක එළියට යනවා.."

" මම.. හුඟක් හවස් වෙන්නෙ නෑ මම හතරට විතර එන්නම්.."

" ශුවර්නෙ.. හතරට එනවනෙ.."

" ඔව් ඔව්.. මම ඒ වෙලාවට එන්නම්.."

" හා පරිස්සමට යන්න එහෙනම්.."

" හරි බුදුසරණයි.."

මම ෆෝන් එකට් කල්ලා සාක්කුවට දාගන්න ගිහින් ආයෙම රධ්‍ය අයියගෙ ඊයෙ කොන්දෙ කැක්කුම මතක් වෙලා නම්බර් එක ඩයල් කල්ලා කනේ තියාගත්තා..

" වරද්..??"

" අයියෙ.. දැන් ඔයාට මොකද.. ඊයෙ කොන්ද රිදෙනවා කිව්වෙ.."

@Shan

" ඒක අහන්නද මේ තකහනියක් කෝල් කලේ.."

" කියනවකො.."

" ඒක අඩුවෙලා ගියා.. මම හිතන්නෙ නිදාගෙන ඉදපු විදියෙ අවුලක්ද කොහෙද.."

" ඔව් එකවිදියක ඉන්න බෑ ඇඳේ නටනවනෙ.. ඒ වුණාට බාම් මොනාහරි ගාගන්න.."

" ඒව වරද්.. ඔහොම කියද්දි මම හෙන නාකියි වගේ හිතෙනවා.. එහෙම අමාරුවක් නෑ බං මට.."

" හා හා හැව හැව ගාන්න නම් දන්නවා මොක නැතත්.. මේ මම තියනවා එහෙනම්.."

මම ෆෝන් එක කට් කල්ලා සාක්කුවට ඔබාගෙන සෙනුකයලගෙ ගෙදර ගාව හෝල්ට් එකෙන් බැහලා පලවෙනි පටුමගෙන් ගෙදරට යන්න හැරුණා.. ඉරිදා සෙනුකගෙ තාත්තා ගෙදර ඇත්තෙ.. අංකල් පොඩ්ඩක් අමුතු කැරැක්ටර් එකක්.. ඒ වුණාට හොඳයි.. මාත් එක්ක නම් හොඳට කතාකරනවා මම සෙනුකයගෙ හොඳම යාළුවා නිසා... ඒ ඇරෙන්න වෙන කා එක්කවත් අපේ යාළුවොන්ගෙන් කතාකරන්නෙ නෑ ලොකුවට.. මම සෙනුකලගෙ ගෙදර බෙල් එක ගැහුවම සෙනුකලාගෙ අම්මා ඇවිත් ගේට් එක ඇරියා..

" ආ.. මේ ෂනෙරු පුතානෙ.. මම බලාගෙන හිටියේ.."

" ගුඩ් මෝනින් ආන්ටි.."

" ගුඩ් මෝනින් පුතා.."

සෙනුකගෙ අම්මා රතු පැනක් අතේ තියාගෙන කණ්ණාඩිදෙක ගලවලා අතට අරගෙන මාත් එක්ක ගේ ඇතුළට ආවා.. සෙනුකයගෙ ගෙදර කියන්නෙ මකන කැල්ලක් බිම වැටුණත් දෝංකාර දීලා ඇහෙන ගෙයක්.. ඒකයි මූ අයුක අයියා එක්ක කෝල් කරද්දි කොට්ටෙ අස්සෙ ෆෝන් එක ගහගෙන කතාකරන්නෙත් මම හිතන්නෙ.. මම ඇතුළට යද්දි සෙනුකගෙ තාත්තා ඉස්තෝප්පුවෙ හෙන තඩි පොතක් තියාගෙන ඒක කියවනවා..

@Shan

" ආ මේ ෂනෙරු පුතානෙ.. ඉලන්දාරියා හුඟ කාලෙකින්.."

" ගුඩ් මෝනින් අංකල්.."

" මෝනින් මෝනින්.. සෙනුක උදේ ඉදන් බලාගෙන ඉන්නෙ පුතා එනකල්.."

" පොඩ්ඩක් පරක්කු වුණා අංකල්.. දන්නැද්ද බස් වල එන්න ගියාම.."

" ඒකනම් එහෙම තමයි.. බස් වල එන යන රාජකාරිය ඉතින් මොකට කතාකරන්නද.."

මම අංකල් එක්ක හිනාවෙලා ගෙට යද්දි සෙනුක ගෙදර කෑමමේසෙ වාඩිවෙලා පේපර් තොගයක් බලනවා.. මාව දැකලා ඩයල් එක ලතෝනි තියාගෙන පුටුවෙන් නගිට්ටා..

" අම්මෝ.. මම කොයි වෙලේ ඉදන්ද බලන් ඉන්නෙ.."

" පොඩ්ඩක් පරක්කු වුණා.. බස් නෑනෙ උදේ එච්චර.."

" ආ ඒකතමා.. අම්මෙ මම ෂනෙරු එක්ක කාමරේට යන්නද.."

" ෂනෙරු පුතා උදේ කෑම අරගෙනද ආවෙ.."

" ඔව් ආන්ටි.. මම කෑම අරගෙන ආවෙ.."

" ආ එහෙනම් ඔය දෙන්නා කතාකරන්නකො.. මම බොන්න දෙයක් හදාගෙන එන්න.."

සෙනුකයා මාවත් ඇදගෙන උගේ කාමරේට ගිහින් දොරට පාපිස්ස තියලා දොර වහගත්තා.. උගේ අම්මා තාත්තා ඉන්න තැන උඹ බං කියාගන්න බෑ.. අංකල් ඒවට කැමති නෑ.. අපේ අම්මනම් ඒ අතින් හොදයි.. අම්මත් මට බං කියලා කියනවනෙ.. යාළුවො එක්ක මොනවා කතාකලත් අම්මා එච්චර ඇඟිලි ගගහා හොයන්න එන්නෙ නෑ.. ඒකනෙ රධ්‍ය අයියත් අපේ ගෙදර ඇවිත් කතා කර කර ඉදලා යන්නෙ..

" පගයා.. මම කීයෙ ඉදන්ද බලාගෙන ඉන්නෙ තෝ ගෙදර එනකල්."

@Shan

" පියාඹලා එන්නයැ.. නගින්නැතුව ඉඳපන්කො.."

මම සෙනුකයගෙ ඇඳේ පෙරලිලා ඇඳේ ඉඳපු තඩි වලහගෙ බඩට මූණ තියාගත්තා.. සෙනුකයගෙ දුඹුරු වලහා.. ඌ ඉන්නවා ඇඳෙන් බාගයක් විතර.. තාත්තා බර්ත්ඩේ එකකට හෙන පොඩිකාලෙ ගෙනැත් දීපු ටෙඩියෙක්.. දැන් මූට ඒ වලහව නැතුව නින්ද යන්නෙ නෑ..ඌ පරණ නිසා ඇහැකුත් නෑ.. දවසක් අපි දෙන්නා හයේදි උගේ නැතිවුණු ඇහැ වෙනුවට නිල් පාට රවුම් බොත්තමක් දාලා එතන මැහුවා..

" දැන් උඹ කසාද බැඳලා ගෙදරින් යන දවසකටත් මේ වලහා ගෙනියනවද බං.."

" නැතුව.. ගෙනියනවා.."

" එතකොට අයුක හායිට මොකද වෙන්නෙ.. දෙයියනේ දෙයියනේ අසරනයා බිම නිදාගනී.."

" ඒකත් හොඳයි නේ බං.. බිම නිදාගන්න එක.."

" මම්ම්.. ආසයි වගෙ.."

" අනේ මේ ඉඳහන්.. ඒකනෙමේ උඹට ගෙදර ඉන්න බය නැද්ද බං.. තනියම.."

" තනියම නෙමේනෙ.. රධ්‍ය අයියා හැමතිස්සෙම වගේ එනවා.. අනෙ මේ උබ වගේ හොල්මන්වලට බය හත්වලාමක් නෙමේ මම.. අපි ඇවිල්ලා හෙන ගටක් තියන කොල්ලො.."

" ඇපෝ උඹෙ කයිය විතරයි.."

" කයිය විතරක් නෙමේ ප-"

" සැක් බල්ලො.. ඔය කට වහගනින්.."

සෙනුකයා මගේ මූණ මැද්දට කොට්ටෙකින් දමලා ඇරියා..

" මෙ ඒකනෙමේ අයුක අයියව හම්බෙන්න යන්නෙ නෑ..??"

@Shan

" යන්න විදියක් නෑනෙ බං.. අදත් තාත්ත ගෙදරනෙ.."

" අපරාදෙ රධ්‍ය අයියලගෙ ගෙදරවත් උඹලා දෙන්නට හම්බෙන්න තිබ්බා දැන් එහෙ අප්පච්චි ඇවිල්ලනෙ.."

සෙනුකයා මං ගාවින් ඇදේ හාන්සි වුණා..

" මේ රධ්‍ය අයියලගෙ අප්පච්චි කොහොම ඩයල් එකක්ද බං.."

" හෙන සැරයිද කොහෙද යකෝ.. මම දැකලා නෑ.. ඒත් ආධ්‍ය අයියයි රධ්‍ය අයියයි නම් කියනවා නිතරම.."

" ම්ම්.. මට අයුක අයියා කියලා තියෙනවා.. අමුතු කැරැක්ටර් එකක්ලු.. අනේ මන්දා බං.. උඹට බය හිතෙන්නැද්ද.."

" හිතෙනවා.. ඒත්.. මොනවා කරන්නද බං.."

" ඔන්න මම කිව්වයි කියලා මතක තියාගනින්.. ඔය අප්පච්චියා තමා කවදහරි මෙතන ලොකුම බාල්දිය වෙන්නෙ.."

" ම්ම.."

මම තඩි වලහව බදාගෙන උගේ බඩට මූණ තියාගත්තා.. සෙනුක මගේ පිටට තට්ටුවක් දාලා කොණ්ඩෙ ඇවිස්සුවා..

" උඹට මම ඉන්නවනෙ.. අප්පච්චිව දුම්මල ගහලා පන්නලා සුදුඅම්මියව උස්සන් එමු.."

සෙනුකයා දෝත බදලා මාව අල්ලගෙන මාව උගේ ඇඟ උඩට පෙරළ ගත්තා..

" අඩෝ මේ පොඩිකාලෙ නෙමේ.. එහෙට්ට පලයන්.."

" ඇයි පොඩි කාලෙ වෙන්න ඕනද උඹව බදාගන්න.. හු#න කතා කියන්නැතුව ඉඳපන්.."

මම සෙනුකයගෙ ඇඟ උඩින් එහාපැත්තට පෙරළිලා වහල දිහා බලාගෙන හිටියා.. අම්මටසිරි සිවිලිමේ සීට් එකක් ගලවලා නේද මේ පරයා.. සුදුම සුදු

@Shan

සිවිලිමෙ ඇහිලි පාරවල් දෙකතුනක් තියෙනවා මගේ සූක්ශම ඇහැට අහුවුනා.. මම නැගිටලා ඇඳ වියලෙට කකුල තියලා අනිත් කකුල ජනේලෙට තියලා සිවිලිමෙ සීට් එකක් ඉස්සුවා විතරයි බොහ් ගාලා පොඩි සෙල් ෆෝන් එකක් ඇඳ උඩට වැටුණා.. තව ලියුම් වගේකුත්..

" ටසිරි.. උඹ සිරාවටම සිවිලිමෙ හැන්ගුවද බං.."

" ඒ ලියුම් ටික කොට්ටෙ අස්සට දාහන්.. අම්මා ආවොත් එහෙම.."

මම ඉතින් ඒ දෙන්නගෙ ලෙටර්ස් කියවන්න ගියේ නෑ.. මොකක් වුණත් පෞද්ගලිකත්වයක් කියලා දෙයක් තියෙනවනෙ.. එහෙම හරි නෑනෙ..

" කොහෙද බං උඹ මේවා මෙ දමන්නෙ.."

" වෙන තැනක් නෑනෙ බං.. අනික මේ බලහන් අයුක අයියගෙ අකුරු.. මෙහෙම අකුරු කෙල්ලො ලියන්නෙ නෑ කියලා ටීචර්ස්ලාම දෙන්නෙක් ඉන්න ගෙදරක මිනිස්සුන්ට නොතේරෙන්නෙ නැනෙ.."

" ඒකනම් ඇත්ත තමා.. සීගිරි කුරුටු ගී වගේ ඒයි.. අපි සහෝදරයෝ~"

" අඩෝ මේ උඹට කියන්න බං.. මේ ළඟදි අපේ ගෙදර ඔය ගේ සීන් වග-බං බැජින් සෙරමනි එකත් එනවා.. කලිසමක් අලුතින් මහන්නත් ඕන.. දවසක යමුද බ්ලූන්ගෝල්ඩ් එකට ශර්ට් එකක් ගන්න.. "

මම එකපාරම සෙනුකයා මොන කුණුහර්පයක් කියනවද කියලා හිතාගන්න බැරුව උගේ මූණ දිහා බලාගෙන හිටියා..

" පුතාලා.. මම කාමරේට එනවා.."

" එන්න අම්මෙ.."

ටිකකින් සෙනුකගෙ අම්මා පැෂන්ෆෘට් වීදුරු දෙකක් ට්‍රේ එකක තියාගෙන කාමරේ ඇතුළට ආවා.. ඒකයි මේ මූ එකපාරට කලිසමක් ගන කියවන්න ගත්තෙ.. යසයි..

" මේ දෙන්නනම් තාම පොඩි ළමයි වගේ.. මේක බොන්නකො.. මට වාර විභාගෙ පේපර්ස් වගයක් බලන්න තියෙනවා.. සිංහල දන්නවනෙ ඉතින්.. රචනායි විචාරයි.."

@Shan

" අපි හෙල්ප් කරන්නද ආන්ටි.."

ඒ එක්කම සෙනුකයා මගේ අතක් කෙනිත්තුවා..

" ඔය දෙන්නා කාලෙකින් නෙ නිදහසේ ඉන්නෙ.. මම තාත්තා එක්ක ඒක බලන්නම්.."

සෙනුකගෙ අම්මා අපි දෙන්නත් එක්ක හිනාවෙලා කාමරේ දොර වහගෙන එළියට ගියා.. මම ගිහින් ග්ලාස් එකක් අරගෙන පුටුවෙ දෙපැත්තට කකුල් දෙක දාගෙන සෙනුකයගෙ පැත්ත හැරුණා..

" හොඳ පොඩ් උන් තමා.."

" අනේ මේ.. අහපන්කො ඉතින්.."

" මොකක්ද කියාගෙන ආවෙ.."

" අපේ ගෙදර ළඟදි ඔය ගේ සීන් වගයක් ගැන අම්මයි තාත්තයි කතාවුණා හරිද.. මම සාගා එකේ වැඩ වගයක් කර කර හිටියෙ.. තාත්තා උගන්නන්න යන පිරිවෙනේ හාමුදුරුවරුවො කෙනෙකුයි ඇබිත්ත කොල්ලෙකුයි මොකක්ද හුටප්පරයක්.. තාත්තා බනිනවා බනිනවා ඉවරයක් නෑ.. අම්මටසිරි වෙන්නම බැන්නා.."

" සිරාවට.. අම්මා මොකෝ කිව්වෙ.."

" අම්මත් බැන්නා.. ඉතින් බං හාමුදුරුවො කෙනෙක්නෙ.. මම දන්නවා ඔකෙ දෙපැත්තක් තියෙනවා තමයි.. එහෙමයි කියලා බං ඉතින් අපිට ඔකට හොඳ කියන්න බැනෙ.. අම්මා බැන්නෙ ඒක ගැන කියලා.."

" ඉතින්.."

" අන්තිමට අම්මා කිව්වා අම්මලගෙ ඉස්කෝලෙත් ඔහොම ඒවා අහුවෙලා තියලු..!! අම්මා කියනවා ඒක දැන් ලෝකෙ බහුතරයක් සාමාන්‍යීකරණය වෙිගෙන යන නිසා අපිත් ලෝකෙ වෙනස් වෙද්දි ඒක විවේචනය නොකර හැඩගැහෙන්න ඕනලු.."

" ඒකනම් ඇත්ත තමා ඉතින්.."

@Shan

" ඒ වුණාට තාත්තා කියන්නෙ මානසික ලෙඩක්ලු.. පස්සෙ දෙන්නා ඕකට ආගිච් කරගත්තා.."

" අඩෝ.."

" ඔව් බං.. තාත්තා ඉතින් හෙන සාම්ප්‍රදායිකයි උඹ දන්නවනෙ.. අම්මනම් එහෙමම නෑ.. අම්මත් ඔය හෙන පඩි කතා කිව්වට එයා පිළිගන්නෙත් නෑ එයාගෙ පුතා කොල්ලෙක්ට කැමතී කියලා. ප්‍රශ්නෙ තමන්ගෙ නොවෙනකල් හැම උත්තරේම දාර්ශනිකයි.."

" අනේ මන්දා බං.. දැන් එතකොට උඹ කැම්පස් ගියාම කියන එක ශුවර්ද.."

" ඔව් මලත් මම ගෙදරට කියනවා.. මට මෙහෙම හංගන් ඉන්න බෑ බං.. මටම දැනෙනවා මම හෙන අපරාධකාරයෙක් වගේ කියලා.. මේක කියන්නැතුව ඉවසන් ඉඳලා මාව පුපුරලා යයි කියලා හිතෙනවා.. මම ඒකනිසා ඕනදෙයක් වෙද්දෙන් කියලා ගෙදරට කියනවා.."

" ඔව් ඒකනම් එහෙම තමා.. මොන ප්‍රශ්නෙ ආවත් අයුක අයියා උඹ එක්ක ඉන්නවනෙ.."

" මම.. ඒත් ඉතින් එයත් යනවනෙ.."

සෙනුකයා වීදුරුවෙන් බීම උගුරක් බීලා ඒක පැත්තකින් තිබ්බා..

" අපිට සේරම ලැබෙන්නෙ ටික කාලෙකට ළඟ තියාගන්න විතරයි.. අපි දෙන්නා එකට මොකක් හරි කරුමයක් කල්ලද මන්දා.."

" එහෙම නෙමෙ බං.. හැමදේම වෙන්නෙ හොඳටයි කියලා හිතපන්.."

" උඹට වෙන හැමදේම හොඳ වුණාට මට එහෙම නෑ සෙනුක.."

මම ශර්ට් එකේ කරෙන් ඇස් අගිස්ස පිහිදගත්තා..

" ෂනෙරුවා.."

" අච්චර හොඳ රිසාල්ට්ස් තිබිලත් රධ්‍ය අයියට තිබ්බනෙ මොරටුවෙ යන්න.. දැන් කොහෙද තියන කැම්ප් එකකට යන්න හදන්නෙ.. උඹට තේරෙන්නෑ.. ඌ ගාව හිනාවෙලා ඉඳලම මට හෙන මහන්සී බං.. මට කියන්න කවුරුත්ම

@Shan

නෑ.. රඩ්‍ය අයියා එක්ක ඉන්න හැමතිස්සෙම මට හිතෙන්නෙ මේ අපි එකට ඉන්න අන්තිම තප්පරේද කියලමයි.. මං ගාවට එන සේරම දේවල් ඉක්මනටම අතඇරිලා යනවා.."

සෙනුක මං ගාවට ඇවිත් මේසෙට හේත්තුවෙලා මාව ඇඟට වාරු කරගෙන ඔලුව අතගෑවා..

" එහෙම වෙන්නෙ නෑ.. උඹ නාඩ ඉඳපන්කො.."

" කවුද බං ඉතින් දන්නෙ.."

" මම දන්නවනෙ.. උබ ඉඳහන් විකාර නොහිතා.. කොච්චර කල් ගියත් ඌ උඹ නැතුව වෙන එකෙක් ගාවට යන්නෙ නෑ.. මම ඒකා වගේ ආදරේ කරන එකෙක් මීට කලින් දැකලා නෑ.."

" ම්ම්.."

" උඹ ඉඳලා හිටලා කියනවනෙ උබ හෙන කාලකන්නියි කියලා දැනෙනවා කියලා.. පොඩ්ඩක් කල්පනා කල්ලා බලපන් උඹ එහෙමද කියලා.. යකෝ උඹ ඉන්න අහලකටවත් අනිත් උන්ට කිට්ටු වෙන්නවත් පුලුවන්ද බැනෙ.. උබ මෙහෙට එද්දි මොකුත්ම නැති නිකන්ම ෂනෙරු.. තියා උබට සහතිකේකට තිබ්බෙ ශිෂ්‍යත්වෙට එකසිය අනූ හතරක් ගත්ත එක විතරනෙ.. ආ..?? දැන් බලපන්.. ෆයිල් මිටියක් හදන්න උඹ ගාව සහතික තියනවා.. බ්ලෙසර් එකක් පිරෙන්න බැජ් තියනවා.. ඉස්කොලෙ හොඳ නමක් තියනවා.. ගුරුවරු ආදරෙයි.. කොහොමහරි කැම්පසුත් උඹ යනවා මම දන්නවා.. යකෝ අඩන්න හේතු හොය හොය ඉන්නෙ නැතුව මේ ඉන්න ටිකේ සතුටු වෙයන්.."

" ම්ම්.."

" අනික උඹට දාහකින් හොයාගන්න බැරි පාට්නර් කෙනෙක් ඉන්නවා.. බලපන් ඌ උඹට තාත්තෙක් වගේම ආදරෙයිනෙ.. කොයි වෙලාවෙද උබව තනි කලේ.. අනික ෂනෙරුවා.. ඒකා උඹට ආදරේ වෙලත් උඹව පරිස්සමට ළඟ තියාගෙන ඒ ලෙවෙල් ඉවරවෙනකල්ම හිටියනෙ.. වෙන එකෙක් එහෙම ඉන්නවද.. උබ හිතනවා වැඩී.. අනික මහදි රඩ්‍ය අයියා ගෙදර ඒවි.. එතකොට උඹට බලන්න බැරියැ.."

@Shan

" ම්ම්.."

" මම එපැයි මෙතන පස් කකා අහන්න.. උඹ තමා බබා.. වරෙන් වඩාගෙන වටයක් කරකන්න.."

" අනෙ පලයන්.. කරකන්න- මම උඹට කියන්නෑ.. දැන් අයුක අයියගෙ සීයගෙ කේස් එක මොකෝ බං.."

මම ශේප් එකේඑ හිතේ දුකටත් එක්ක සෙනුකයගෙ පැශන් වීදුරුවත් දමලා ඇරියා.. ඌ බොන්නෙත් නෑ කූල් යනකල් තියලා තියනවා..

" උඹට කියන්න වෙලාවක් සෙට් වුණේ නැනෙ.. පරිසර ඇමතියා සැරටම මහමතිවරණෙට බැහැලලු ඉන්නෙ.. මෙ ටිකේ ගෙදර එච්චර නැහැල්ලුනෙ.. අයුක අයියා රැස්වීම් දෙකතුනකට ගිහින් සපෝට් කරනවා වගේ සයිඩ් ගහලා ඉන්නවා කිව්වා.. සේරම කරන්න හොරෙන් නෙ.."

" බලහන්.. ඒ ඇමතියා ඉන්නෙ කොහොමද.. යකෝ පූජවට්ටි සීය දෙසීය දේවාල වලට පුදනවා නේද.. බලන් යද්දි මුන් ඔක්කොම එකයි.."

" සැක් බං.. මට ජේන්නම බැරි සබ්ජෙක්ට් එක ඔය පොලිටික්ස්.. හත්පොලේමනෙ.. ඕකට ගෑණුලු හතරවටේම.."

" ම්ම්.. දවසක් අයුක අයියා කියෙව්වා ඔහොම එකක් ගැන.. අප්පච්චිත් එහෙමලුනෙ.."

" ඒ අනිත් හත්වලාම.. ඒකා නිසා තා ඩිංගෙන් එදා මතකනෙ.."

" ම්ම්.. දැන් අයුක අයියට මොකෝ බං.."

" ඉස්සර වගේම අවුලක් නෑ.. ඒ වුණාට පොඩ්ඩක් තාත්තා ඔය ඕනනැති මගුල් කිව්වහම කෑගහනවා බනිනවා මුලු කාමරේම පොලොවෙ ගහනවා.."

" ඈ.."

" නෑ බං.. දන්නැද්ද කේන්ති ගියාම යකෙක් වගේ.. බනිනවා වටෙ තියන දේවල් මතක නෑ.."

@Shan

" මේ අයුක අයියා..??"

" ම්ම්.."

" මට හිතාගන්නත් බෑ.. අයුක අයියා හෙන සයිලන්ට් පොරක්නෙ.."

" ඒ උඹලා එක්කනෙ බං.. දැන් බලපන් රධ්‍ය අයියා කතාකරන්නෙ උඹ එක්ක විතරනෙ.. මූණදිහා බලලා අපි එක්ක හිනාවෙන්නෙවත් නෑනෙ.. ඒ වගේ තමා.."

" ඕවා එක්ක අයුක අයියා රට යන එක ගැනත් පොඩ්ඩක් බයයි.."

" හ්ම්ම්.. ඒත් ඩොක්ටර් නම් කිව්වා දැනට තත්වය පාලනය කරගෙන යන නිසා කමක් නෑ කියලා.."

" එහෙම කිව්වට ඉතින්.."

" වෙන කරන්න දෙයක් නෑනෙ ෂනෙරුවා.. සෙමෙස්ටර් එක මැද්දෙ යන්න බෑ කියනවනෙ.. මේ ඉලෙක්ශන් එකකුත් එනවා.. යන එක හොඳයි මමනම් කියන්නෙ.. අර අයුක අයියගෙ ඒස පවුල තමාමේ සේරටම මුල.."

" ම්ම්.. චමිරුගෙත් පොඩි ප්‍රශ්නයක් නේ.."

" උඹ දන්නවද ඒක.."

" මට අයුක අයියා කිව්වෙ.."

" ඔව් බං චමිරුගෙ අම්මනෙ අයුක අයියගෙ තාත්තගෙ සෙකට්‍රි.. චමිරුට අක්කා කෙනෙක් ඉන්නවා අම්මගෙ පලවෙනි කසාදෙන්.. ලොකු අක්කා කෙනෙක්.. දැන් ලංකාවෙ නැහැල්ලු චමිරු හම්බෙන්න ඉද්දිම තාත්තා අක්කවත් අරගෙන ඩිවෝස් වෙලා රට ගිහින්.."

" එහෙමද.."

" ඊටපස්සෙ දැන් ඔය චමිරු ඉන්නෙ අම්මත් එක්ක.. අම්මා හෙන ලස්සනයි උගේ.. වෙනම තාත්තා අපාර්ට්මන්ට් එකක් අරන් දීලා ඒකෙලු ඉන්නෙ.. අයුක අයියා මෙහෙ ගෙදර ඉන්න නිසා එක්කන් එන්න විදියක් නැහැල්ලු.."

@Shan

" අම්මෝ බං බලන් යද්දි අයුක අයියා ඉන්නෙ අපායකනෙ.. මටනම් බෑ ඔහොම පිස්සන් කොටුවක ජීවත් වෙන්න.."

" අහද්දිත් පිස්සු වගේනෙ බං. ඉතින් ඒකතමා කියන්නෙ අයුක අයියා යන එක හොඳයි කියලා.."

" ඔව් ඔව් ඕවා ඇහුවහම මටනම් හිතාගන්න පුලුවන් ගෙදර තත්වෙ.."

" තමන්ගෙ පුතා ඉස්සරහා ගෑණු තුන් හතරදෙනා එක්ක හැ#නෙන අප්පෙක්ගෙන් ඔයිට වඩා දෙයක් බලාපොරොත්තු වෙන්න බැනෙ.. අයුක අයියට ගෑණු පේන්න බෑ ඒකනිසා.. යාළුවොන්ට ඉන්නෙත් ආශියි මහීශායි විතරයි.. අපි දෙන්නගෙ යාළුවො නිසා.. ඒ ඇරෙන්න කා එක්කවත් කතාකරන්නෙ නෑනෙ.."

" මම බං මුල් කාලෙ හිතාගෙන හිටියේ අයුක අයියා හෙන පොරක් නිසා කතානොකර ඉන්නෙ කියලා.. ඇයි බං ක්‍රිකට් ටීම් එකෙත් ලීඩර්නෙ.. සල්ලිත් නාන්න තියෙනවා.. උබට මතකද ඩයල් එක බස් එකකවත් යන්න දන්නෙ නෑනෙ ඒ කාලෙ.."

" ම්ම්.. දැන්නම් හැදිලා ඉන්නවා.. එහෙම පුයර බබ්බු වගේ ජීවත් වෙන්න බැනෙ හැමදාම.."

" උඹත් ඉඳල ඉඳලා ටෝක් කරානෙ ඉතින් කොහොමහරි.."

" ම්ම්.. අමෝ නේත.."

සෙනුකයා හෙන මනමාල හිනාවක් දාගෙන මගේ සාක්කුවෙන් ෆෝන් එක ඇදලා ගත්තා..

" මේ දුර කඩෙන් ටොපි අරන් එමුත.."

" අඩො යමුකො.."

" හා හැබැයි මේ අර හන්දියෙ කඩේ ගාව බෑ හරිද.. ඒ කඩේ කෙල්ල මට පේන්නබෑ.."

" කවුද ටිකිරිලියාද.. හා හා ඊට එහා අර ඇඹුල් චෙරි ගහ ගාවට යමු ඈ.."

@Shan

" අර කැම්පස් අයියලා වගයක් ඉන්න බෝඩිම ගාව එකද.. බෑ උන් ජනේලෙ ජොක්කු වනලා තියනවා.."

" දැන් කොහෙද යන්නෙ එතකොට.. උබම කියහන්.."

" ඉඳහන් කියන්න.. ආ.. උබට මතකද අර හතරමං හංදිය පහුවෙද්දි තියන වතුසුද්ද ගහ.. ඒ හරියට යමං.."

" දෙයියනේ මගෙ පව්කාරයට මේ පව්කාරයා ආතරෙයි.. උම්මා!!"

" තාත්තට කියහන් එළියට යනවා කියලා.."

මමයි සෙනුකයයි හිමින් සැරේ එළියට ඇවිත් දුර කඩෙන් ටොපි අරගෙන එන්න එළියට ගියා.. දුර කඩෙන් ටොපි අරගන්න එළියට යනවා කියන්නෙ අපේ රහස් බාසාවක්.. පොඩි කාලෙ සෙනුකයයි මමයි හද්ද වලත්ත කතා ගෙදර කතාකරන්නබැරි නිසා ගෙදර අයට ටොපි ගේන්න යනව කියලා ලේන් එක ඉවරවෙන හරිය වෙනකල්ම ඇවිද ඇවිද කියව කියව ගිහින්.. අවසානෙ හන්දියෙ කඩෙන් පහේ අයිස් පැකට් අරගෙන කකා ආයෙම ගෙදර එනවා..

හන්දියෙ කඩේ ටිකිරිලියා කියන්නෙ කාලයක් මමයි සෙනුකයයි ටෝක් කරපු නංගි කෙනෙක්.. දවසක් අපි ඒ නංගි බඩු තුණ්ඩුවෙ පිටිපස්සෙ ලියලා තිබ්බ නම්බරයක් අරගෙන ගිහින් ජනේලෙ ජොක්කු වනලා තියන බොඩිමේ අයියා කෙනෙක්ට දීලා ආවා.. ඒ බෝඩිමේ ඉන්නෙ නම් මල පෙරේතයො ටිකක්.. උඩ තට්ටුව හතරදෙනෙක් බදු අරගෙන ඉන්නෙ.. පහළ අංකල් කෙනෙක් ඉන්නවා බෝඩිම බලාගන්න.. මුන්ගෙ වයිෆයි වල නම් තමයි මරු.. ඒ හරියෙන් යද්දි පෙන්නනවා 'puca sududa' කියලා වයිෆයි ඇඩ්‍රස් එකක්.. තව 'connect wunoth denawa dekak' කියලා එකකුයි 'katta gannawada katta' කියලා එකකුයි.. අපි හැමදාම යද්දි ඕක අහුවෙනවද බලනවා.. එහෙම එකක් පෙන්නනවනම් ඩයල් ටික ගෙදර ඉන්න දවසක් තමා..

ඒකත් පහුවෙලා ගියාම හම්බෙන හතරමං හදියේ වතුසුදු ගහ ගාව අපි කියව කියව කැරකි කැරකි ඉඳලා කඩෙන් අයිස් පැකටුත් අරන් ගෙදර එනවා.. දැන් සෙනුකයා මම එහෙ ගෙදර ආවම දුර කඩෙන් ටොපි ගේන්න යනවා කියලා ෆෝන් එකත් කනේ ගහන් අයුක අයියා එක්ක මල් කඩ කඩ යනවා.. මම උගේ තනියට යනවා.. නැත්නම් ඉතින් රඩ්‍ය අයියට වැඩක්

@Shan

නැත්නම් මම ඒකට කෝල් එකක් අරගෙන මොකක් හරි ඔපයක් කියවනවා..

අපි දෙන්නා ගේට්ටුව ඇරගෙන එළියට ගියා විතරයි සෙනුකයා මගේ ෆෝන් එකෙන් අයුක අයියට කෝල් එකක් අරගෙන හෙන මනමාල හිනාවක් දාගෙන ෆෝන් එක කනේ ගහගත්තා.. මේ වෙලාවට සෙනුකයට තණකොළ ගහක් ගලවලා දුන්නත් ඌ කනවා.. ඒ තරමට සිහියෙන් ඉන්නෙ.. මම උගෙ කලිසම අස්සෙ දිරච්ච පොල් කොළයක් ගහලා ඒක වීඩියෝ කල්ලා ස්ටේටස් දැම්මා..

' හිරට තදට කොටට ඇඳලා යන්නෙ කොහෙද-.."

අන්තිමේ අපි දුර කඩෙන් ටොපි ගේන්න පැයකට එළියට ගිහින් දවල්ටත් කාලා ගේම් වගේකුත් ගහලා උගේ සෙල් ෆෝන් එක ආයෙම සිවිලිමෙ ගහලා මම ගෙදර එන්න ආවා.. සෙනුකයා මාත් එක්ක තනියට හෝල්ට් එකට ඇවිත් බස් එකක් එනකල් ඉඳලා ගෙදර ගියා.. මම ගෙදර එද්දි හතර හමාර විතර වෙලා.. ඇවිල්ලා නාලා ගේ අතුගාලා ඉවරවෙලා ඉස්තෝප්පුවට වෙලා පාර දිහාබලාගෙන ඉද්දි රධ්‍ය අයියා බයික් එකෙන් අපේ ගෙදර ආවා පුරුදු විදියටම ෆැබ් එකෙන් බෑග් එකකුත් උස්සගෙන.. හැපීකව් චීස් පැක්ටරිය මගේ..

" ආ සුදුඅම්මියා.. ෆැබ් ගිහින් වගේ.."

රධ්‍ය අයියා සුදුඅම්මියා කිව්ව ගමන් කට ඉරක් කරගත්තා.. එයාලා සුදු පවුල.. අපි පව්කාර පවුල.. සුදුඅම්මියයි සුදු දෝණියයි සුදුඅප්පච්චියයි.. අපේ පවුලෙ ඉන්නෙ පවුකාරියො දෙන්නයි පව්කාරයො දෙන්නයි.. පව්කාර පවුල.. සැක්.. හෙන මොංගල් වගේ..

" ඇවිත් හුහක් වෙලාද.."

" ඔව් දැන් හුහක් වෙලා.. ඔයා එන්න පරක්කු වුණානෙ.."

මම ඉස්තෝප්පුවෙ බැම්මෙන් පැනලා රධ්‍ය අයියගෙ පස්සෙන් ගෙට ගියා..

" ඔයා කාලද ඉන්නෙ.."

" දවල්ට නෑ.."

@Shan

" ආ..?? ඒමොකද.. දැන් හවස් වෙලානෙ.."

" කන්න හිතුනෙ නෑ බං.. ඔයා කෑම හදලද තියෙන්නෙ.."

" ඔව්.. හැදුවා ඔයා හවස එනවා කිව්වනෙ.. මම බෙදන්නද.."

" බඩගිනී.. බෙදන්නකො.."

මම කුස්සියට ගිහින් පිගානක් සෝදලා අරගෙන බත් බෙදන්න යද්දි රඩ්‍ය අයියා ටිකකින් කුස්සියට ඇවිත් එතන බැම්මට හේත්තු වුණා..

" වරද්.."

" ම්ම්..??"

" ඔම්ලට් එකක් හදලා දෙන්නකො.."

" ඔම්ලට් එකක්..?? ඉන්න ඉන්න.."

මම පිහාන පැත්තකින් තියලා බිත්තර තියපු තැන හොයන්න ගත්තා.. සැක් මේ බඩු තියන තැන් අමතක වෙනවනෙ.. මම බිත්තර කේස් එකෙන් බිත්තර දෙකක් අරගෙන ඒක බෝල් එකකට කඩලා දාලා ඒකට ළූණුයි අමුමිරිසුයි දාන්න ඕන ඒවයි දාලා කවලම් කල්ලා පෑන් එක රත්වෙනකල් තියලා ඒකට දාලා වහලා තිබ්බා..

" ඔයාට හොඳට උයලා පුරුදුයි නේද.."

" අපේ පවුලෙ කාන්තා පක්ශය වැඩිනෙ.. මාමයි මමයි පොඩිකාලෙ ඉඳන්ම සේරම ගෑණුවැඩ කරනවා.."

රඩ්‍ය අයියා හිනාවෙලා හට්ටියේ තිබ්බ කැරට් සලාදෙන් කෑල්ලක් අරගෙන කටේ දාගත්තා..

" මොකද අවුලෙන් වගේ.."

මම රඩ්‍ය අයියගෙන් ඇහුවහම රඩ්‍ය අයියා මගේ දිහා බලලා ගෑස් එක ඕෆ් කලා.. ඊටපස්සෙ එයාම පිහාන අරගෙන බෙදාගන්න පටන්ගත්තා..

@Shan

" අප්පච්චි මොනවහරි කිව්වා නේද.."

" මට නෙමේ.. අයියට.."

" ඒ මොකද.."

" කැත වචනයක් කියලා බැන්නා.."

රධ්‍ය අයියා කෑම බෙදාගෙන මෙසෙන් වාඩිවුණාම මමත් ගිහින් එයාගෙ ඉස්සරහින් ඉඳගත්තා..

" ඒ මොනවා කලාටද.. ආධ්‍ය අයියට බනින්නෙ.."

" අයියට බනිද්දි අවුල් යනවා.. මම අප්පච්චිට බැනලා අප්පච්චි කිව්වා ඕනදිහාවක පලයන් ගෙදර එන්න එපා කියලා.."

" ඔයා මොනවද කියන්න ගියේ.."

" මෙකයි වුණේ හරිද.. අපේ අයියට අර අසනීපයක් තියනවනෙ.. ඔයා දන්නවනෙ.."

" ඔව හයිපොග්ලයිසීමියා නෙ.."

" ඔව් අද පොඩ්ඩක් ශුගර් අඩුවෙලා අමාරුවෙන් හිටියේ.. අප්පච්චි ඒක දැකලා කිව්වා කෙලින් කටින් ඉදපන් පො- ඔහොම කියලා කැත විදියට අයියට කතාකලා.."

" අයියගෙ අම්මා මේවා බලාගෙන ඉන්නවද අයියෙ.. මොන මගුලක්ද හැම එකටම ආධ්‍ය අයියටම බනින්නෙ.."

" පිස්සු.. ඒ ගෙදර සේරම උන්ට පිස්සු.. අම්මට අප්පච්චිගෙ කට වහන්න බෑනෙ.. අම්මත් බයෙන් ගෙදර ඉන්නකොට.."

" මෙහෙම කිව්වට මොකුත් හිතන්නෙපා.. ඒ වුණාට අප්පච්චි හරිම ආත්මාර්ථකාමියි අයියෙ.. මම මුලදි ඔච්චර දෙයක් හිතුවෙ නෑ.."

" මම.."

@Shan

මම රධ්‍ය අයියගෙ අනිත් අත අත් දෙකෙන්ම අල්ලගත්තා.. එයා දුකින් ඉද්දි මගේ පපුව රිදෙනවා වගේ දැනෙනවා..

" ඔයා දුක් වෙන්න එපා.. මනුස්සයො වැරදි දෙයක් කරනවනම් කවදාමහරි ඒවට පසුතැවෙන්න වෙනවා.. ඔයා කේන්ති අරගෙන අප්පච්චිට බැනලා කලබල කරන්න යන්න එපා.."

" එහෙමයි කියලා අයියට ජරා කතා කියලා බනිනකල් ඉන්න බෑනෙ.."

" ඒකත් එහෙම තමා.. ඒත් පුලුවන්තරම් ගෙදර රණ්ඩු අඩුකරගන්න බලන්න අයියෙ.. ගෙදරක හැමතිස්සෙම රණ්ඩුවෙන එක හොඳ නෑනෙ.."

" ම්ම්.."

රධ්‍ය අයියා මගේ ඇඟිලි අස්සෙන් එයාගෙ ඇඟිලි පටලගෙන තද කල්ලා අල්ලගෙන හිටියා..

" කෑම හොඳයිද.."

" රසයි..ඔයා මොනවා හැදුවත් කන්න හිතෙනවා.."

" ඇත්තට.. ඒ මොකෝ.."

" රස නිසා ඉතින්.. හොඳ ළමයා වගේ මේකට බත් බෙදාගෙන එන්නකො.."

රධ්‍ය අයියා මට පිහාන දීලා හෙන අහිංසක විදියට මං දිහා බැලුවා.. මට මේ යකාව සාක්කුව අස්සෙ දාගෙන බලාගන්න තිබ්බනම් කියලා හිතෙන්නෙ මේ වෙලාවට තමා..

" කෝ දෙන්න.."

මට මේ වෙන දේවල්වල අවසානයක් පේන තෙක් මානෙක පෙනුනෙ නෑ.. අඩුම තරමෙ මට කරන්නවත් දෙයක් හිතාගන්න බෑ.. එයාලගෙ පවුලෙ ප්‍රශ්න ගොඩයි.. මට තේරුම්ගන්න බැරි ඇයි අප්පච්චිට පොඩ්ඩක් මනුස්සයෙක් වගේ හිතන්න බැරි.. එයා ආමි ඔෆිසර් කෙනෙක් හරි රටේ ජනාධිපති වුණත් ගෙදර ලමයින්ට ගෑණිට හරිහැටි සලකන්න එපැයි.. අනික නරක ළමයිනුත් නෙමේ ඒ ළමයි හොඳට හැදිලත් තියෙනවා.. එහෙම වෙලත් ඇයි ආදරේ කරන්න බැරි කියලා මට තේරෙන්නෙ නෑ.. කොහොම

@Shan

වුනත් අප්පච්චි සැහෙන්න පව් පුරෝගන්නවා ගෙදර මිනිස්සුන්ගෙ හිත් රිද්දලා.. ඒ අස්සෙ සාගා එකටත් එනවා කිව්වහම බඩ පපුවත් කූල් වෙලා යනවා..

රධ්‍ය අයියා කාලා නාගෙන කාමරේ ෆෑන් එක දාගෙන මගේ ඇඳේ හාන්සිවෙලා කොට්ටෙට මූණ ඔබාගෙන ඉන්නවා මම කාමරේට එද්දි.. මම කාමරේට ගිහින් ඇඳෙන් ඉඳගත්තහම රධ්‍ය අයියා ඔලුව උස්සලා මං දිහා බැලුවා.. එයාගෙ ඇස් දෙක ලාවට රතුවෙලා රෑ නාපු නිසා..

" ඔලුව රිදෙනවද.."

" ම්ම්.."

" අපරාදෙ ආපු ගමන් නාන්න තිබ්බෙ ඔයාට.. මම පැනඩෝල් දෙකක් දෙන්නද.."

" එපා බිව්වා.. මගේ ඔලුව ටිකක් අතගානවද වරද්.. ප්ලීස්.."

මම කාමරේ ලයිට් එකත් ඕෆ් කරගෙන කොලොන් බොත්ලෙත් අරන් ඇඳ වියලෙට හේත්තු වුණාම රධ්‍ය අයියා මගේ පපුව උඩින් ඔලුව තියාගෙන මාව තද කල්ලා බදාගත්තා.. හුගක් තද කල්ලා බදාගෙන පපුවට කම්මුලක් තද කරගත්තා.. මම කොලෝන් බොතලෙන් ටිකක් ඔලුවට දාලා ඔලුව අතගාද්දි රධ්‍ය අයියා ඇස් පියාගෙනම හිටියා.. එයාගෙ සිණිඳු කඩාහැලෙන කොණ්ඩ ගස් අස්සෙන් මම ඇඟිලි අරගෙන යද්දි මගේ ඇඟ වටේ තිබ්බ අත් තව තව තද වෙනවා මට දැනුණා..

" සනීපයි වරද්.."

" ඉක්මනට අඩුවේවි.. ඔයා නිදාගන්න.."

" අපිට හිතේ සැනසීමෙන් ජීවත් වෙන්න පුළුවන් වේවිද..??"

" අනිවාරෙන්ම, පුළුවන් වේවි.."

" ම්ම්.."

" ඔයා ආස කොහොම ඉන්නද.."

@Shan

රඩ්‍ය අයියා මගේ පපුවට නිකට තියාගෙන මං දිහා බලාගෙන හිටියා.. හුඟක් වෙලා බලාගෙන ඉඳලා ලාවට හිනාවුණා..

" ඔයත් එක්ක.."

" තව.."

" පොඩි ගෙයක් හදාගෙන.. උදේට වැඩට යන්න.. හවසට ගෙදර එන්න.. සතුටින් ඉන්න.. මහා ලොකු දේවල් ඕන නෑ.."

එයාගෙ බලාපොරොත්තු පිරිච්ච කටහඬ ඇහුණහම මම දන්නෙ නෑ ඇයිද කියන්න මගේ ඇස් කෙවෙනිවල කඳුලු එක තප්පරේට පිරිලා ගියා.. වචන එයාගෙ වුනාට වැඩිපුරම රිද්දගත්තෙ මම.. මම ඉක්මනට ශර්ට් එකේ කරෙන් ඇස් පිහාගත්තා..

" ඔයා-ඔයා එහෙම ඉන්න ආසනම්.. එහෙම ඉන්න පුළුවන්.."

" මට පාළු හිතෙනවා වරද්.. උඹ මං ගාව නැතිවුණාම, අයියා දුකින් කතානොකර ඉන්නකොට, මහ මූසල ගතියක් දැනෙනවා.."

" මම ඔයා ගාව ඉ-ඉන්නවනෙ.. ඒකනිසා එහෙම දැනෙන්නෙ නෑ.. ඔයා ඉක්මනට ආපහු එනවනෙ.. මම බලාගෙන ඉන්නවා.."

රඩ්‍ය අයියා මගේ කම්මුලක් එයාගෙ ලොකු උණුහුම් අතකින් අල්ලගත්තා.. මම එයාගෙ අතක් උඩින් අත තියාගත්තා..

" මම මීටකලින් එච්චරකල් මගේ ගෙදර දාලා ගිහින් ඉඳලා නෑ.."

දවසක් සර් කෙනෙක් කිව්වා : පුතා දවසක් එනවා, එදාට හරියනවා, එදායින් පස්සෙ හැමදාම හරියනවා කියලා.. හරියන දවස එනකල් ඉවසන්න ඕන ඉතින්..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

@Shan

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 97 කොටස

" මන බැන්දු හද රැන්දු

අදරැති සුර ලන්දු

කොයි යන්නෙ ඔමරි පපා.."

" වත්සල්...!!"

" හිත ඇත්තෙ නුඹෙ ළඟමයි

හද ඇත්තෙ නුඹෙ නමටයි

ඉන්නකො මාගෙ සුදා.."

" අඩෝ සෙනුකයා උඹේ අංශප්ලකය ගැලවෙයි යකෝ ඔච්චර ගස්සන එපා.."

ස්ටේජ් එකේ කෙල්ලො වගයක් ළහිරුගෙයි අනුශ්කගෙයි සිංදුවකට නටනවා.. ඒ දෙන්නා සාගා ඇවිත් ප'ෆෝම් කරන එකකට.. සෙනුකයා ස්ටේජ් එක පිටිපස්සෙ ඉඳන් උන්ට නටලා එක කෙල්ලෙක් ඒක දැකලා වැරදිලා ඒ කෙල්ල උන්ගෙ ඉස්කෝලෙ නැටුම් මැඩම්ගෙන් බැනුනුත් ඇහුවා.. මූට එකපාර අමුතු ආතල් එකක් ගහලා..

" මේ අපරාදෙ කියාන් අයියෙ.. ආශිට නටන්න යන්න තිබ්බෙ.."

" ඔය නටන ටික මදැයි තව මොනවා නටන්නද .."

අපි හිටියෙ නෙළුම් පොකුණේ හෙට තියන සාගා එකට රිහසල් කරන ගමන්.. මේ ටිකේ හෙන රෑ වෙනකල්ම සාගා ප්‍රැක්ටිස් තිබ්බා.. මටත් එකම සිංදුව දාස්වතාවක්ම කියලා සෙන්යොරීටා කිව්වහම වමනෙ යන ගාන්ටම සිංදුව එපාවෙලා තිබ්බෙ.. රධ්‍ය අයියගෙත් ගිටාර් එක ගහලා ගහලා ඇඟිල්ලෙත් ප්ලාස්ටර් එකක් බැඳගෙන ඉන්නෙ.. අපේ ඉස්කෝලෙ සාගා එක කිව්වහම ඒක තමයි ස්කූල් ඩිවොලොප්මන්ට් සොසයිටි එකෙන් හෙන කොස්ට් එකක් දරලා කරන අයිකනික්ම ඉවෙන්ට් එක.. ළමයි අටදාස්

@Shan

තුන්සීයක් ඉන්න ඉස්කෝලෙක මෙහෙම ඉවෙන්ට් එකක් තියනවා කියන්නෙ.. ලේසිවැඩක් නෙමේ.. ඔකෙස්ට්‍රා එකේම සම්පූර්නෙන්ම ඉන්නවා තුන්සීයකට හාරසීයකට කිට්ටු වෙන්න.. ඉතින් හැම කෙනාම එකම මට්ටමට එනකල් ප්‍රැක්ටිස් කරවලා හෙන කට්ටක් ඇදලා තමයි සාගා එකට රෙඩි වෙන්නෙ.. ඊයේ ඉවෙන්ට් ඒකේ ඔක්කොන්ගෙම කොස්ට්‍යුම්ස් රෙඩි කල්ලා ඉවර කලා.. අද දවසෙම රිහර්සල්.. හෙට තමයි සාගා එක තියෙන්නෙ.. ආධ්‍ය අයියත් එනවා කිව්වා සාගා එකට.. එයාගෙ කලින් යාළුවො එක්ක..

සාගා එකට ගර්ල්ස් ස්කූල්ස් කීපෙකින් ඩාන්සින් ඉවෙන්ට්ස් වගේකුයි සිංහින් පාට්ස් දෙක තුනකුයි දාලා තිබ්බා.. තව ආට්ස්ට්ලාත් හෙන ගොඩක් එනවා.. ඉතින් පන්දාහක්නෙ ටිකට් එක.. ගොඩක් එන්න එපැයි.. අපේ ඉස්කෝලෙන් ප්'ෆෝම් කරන්න හිටියේ මමයි, රධ්‍ය අයියයි, එන්ඩින් ෆියුශන් එකට කලින් සෙනුකයයි, තව අයියලා වගේකුයි, අපේ වයසෙ එකෙකුයි විතරයි.. උදේම ඉස්කෝලෙ ඔකෙස්ට්‍රා එක හෙන බඩු ගොඩක් පුරෝගෙන නෙළුම්පොකුණට ඇවිත් ස්ටේජ් එක හදලා ඒවා හරි තැන් වලින් තියලා රෙඩි වෙද්දිම දහය හමාර විතර වුණා.. ඊස්ටර්න් මියුසික් සර් බනිනවා බනිනවා ඉවරයක් නෑ අපිට කිසි සිහියක් නැහැල්ලු.. ඉතින් මගුල අපි මක් කරන්නද ඉර මුදුන් වෙනකොට දවල් වෙනවා තමයි.. අතින් අල්ලලා ඉදපන් කියලා ඉර නවත්තන්නයැ..

ඒ අස්සෙ උදේම එකෙක් උගේ තම්මැට්ටමෙ ස්ටික් දෙක ඉස්කෝලෙ දාලා ඇවිත් ගයනිකා මැඩම්ගෙන් හොඳ පාරවල් දෙක තුනකුත් කෑවා.. මැඩමුත් ඉන්නෙ බබා අරන් පැත්තකින් හරි තියලා මේ ඉවෙන්ට් එක කරන සිහියෙන්.. මම ඉතින් ඔය සේරම කලබල අස්සෙ පාඩුවෙ රධ්‍ය අයියා ගාවින් ඉඳගෙන කින්ඩජෝයි වලට හම්බුණු හෙන චූටි සුදුපාට පෝනි පැටියෙක්ගෙ රෝසපාට නැට්ට ගලවලා අයින් කරන්න විදියක් හිත හිත හිටියේ.. එහෙම ඉද්දි තමා සෙනුකයා ඔටොවුන් වෙලා නටන්න ගත්තෙ..

" මේ බං ෂනෙරු මල්ලෙ.."

" ඕ.."

" අර බං උඹලා දෙන්නා පටන්ගන්න කලින් මොකක්ද කුණුහරුප දෙකක් කියනවනෙ.."

" ඒ කුණුහර්ප නෙමේ බං.. මේ රධ්‍ය අයියෙ මූට කියපංකො පොඩ්ඩක්.."

@Shan

" සුදුඅම්මියා ඔයා ඉන්න රත්තරං පාඩුවෙ.. මම් උඹෙන් නෙ ඇහුවෙ.. දැන් ඒ දෙක තියනවනෙ.."

" මොන දෙකට.. ඇට දෙකද.."

" මූ එක්ක කතාකරන්න බෑ බං.. වලත්තයා.."

කියාන් අයියා මගේ ඔලුවට ටොක්කක් ඇනලා මං ගාවට තව ටිකක් කිට්ටු උනාම මම ගිහින් රධ්‍ය අයියගෙ ඇඟට ඇළුනා.. අලි තඩි වලස්සු දෙන්නෙක් මැද්දට තැළුණු මී වදයක් වගේ.. මාව මිරිකෙනවා..

" මම අහන්න ගියේ.. ඒ දෙකේ තේරුම මොකක්ද බං.."

" ආ කියාන් අයියෙ මං කියන්නම්.."

සෙනුකයා ඒපාර මගපගයා වගේ රධ්‍ය අයියගෙ උකුල දිගේ ඇදිලා අපේ කතාවට හොට දාගත්තා..

" කියපන් බලන්න.."

" ඒ මුලින්ම රධ්‍ය අයියා අහන්නෙ 'මල්ලිහ්.. ලැට් එක කොයි පැත්තෙද' කියලා.. එතකොට අපේ එකා කියන්නෙ 'අයියාහ්.. ලැට් යන්නෙ බඩෙඅමාරුවක්ද' කියලා.."

කියාන් අයියා මහා හයියෙන් සෙනුකයට පහක් ගහලා හිනාවෙලා වැඩිකමට පුටුවෙන් ඇදගෙන බෝස් ගාලා බිම පතබෑවුණා.. සැක් ලැජ්ජාවෙ බෑ නංගිලා වගේකුත් මූට හිනාවුණා..

" අඩෝ.. ඒකද එච්චර මගුලක් කල්ලා අහන්නෙ.."

" ඔව් අයියෙ.. නේද රධ්‍ය අයියෙ.."

" වත්සල් එක විදියක ඉන්න..!!"

" හැයි ඔවා කෑගහන්නෙ.. ඔයාට ඕන්නම් අපි දෙන්නා සිංදුවක් කියමු ශුඩුඅයියෙ.. හාද.."

@Shan

සෙනුකයා අයුක අයියගෙ කම්මුලක් දිගට හයියෙන් අදලා අතෑරියා.. අයුක අයියා කම්මුල අල්ලගත්තා..

" ශිඹින්න දෙන්න ඔය දෙතොල් උම්මාහ්..

මං ආසයි වද්දගන්න තිස්තුන්දාහහ්.."

" එහෙනම් ගිහින් අධිබලැති විදුලි රැහැනක එල්ලියන්.."

" අනේ මේ උඹ පලයන්.. උඹට ඉරිසියාව අපි දෙන්නගෙ ලව් එකට.."

" ඔව් ඔව්.."

" කොහොමත් අපි දෙන්නා දන්නවා අපි දෙන්නට මුළුලෝකෙන ඉරිසියයි කියලා.. නේද ශුඩුඅයියෙ."

සෙනුකයා අයුක අයියගෙ අත අස්සෙන් අතක් දාගෙන හෙන අමුතු ලයින් එකක් දුන්නා..

" අනේ ඔව්.. ඉවසගන්න බෑ.. මේ ඉරිසියාව වැක්කෙරෙනවා.."

" කොහෙන්ද.. කකුල් දෙක අස්සෙන්ද.."

" නෑ.. උඹෙ- කිව්වා කියලා හිතාගනින්.."

රධ්‍ය අයියා රවාගෙන අපි දෙනා දිහා බලාගෙන ඉඳපු නිසා මම කටවහගෙන පැත්තකට වුණා..

" සෙන්යොරීටා ඕන නෑ උඹලා දෙන්නා සිංහල එකක් කියපන්.."

" කොයිවගේ එකක්ද.."

" මෙහෙමයි මල්ලෙ.. උඹ කියපන්

'සුරංගනා~වියක්වදෝ~ මලෙන් උපන් ලියක්වදෝ~ තනිවී කිමදෝ.. අසමි සමාවී..'

කියලා.. හරිත.."

@Shan

" ඉතින්.."

" රධ්‍ය කියහන් එතකොට '

කුමාරයෙක් මම උපන්නෙ මලින්.. වැදපන් පෙම ඉල්ලන්න කලින්.. වටෙ යන බස් නවත්තන්න අපෙ හිත් යකො ඩිපෝත..'

කියලා.. කොහොමද එහෙම හැඩද.."

" හැඩයි ප#ක්.."

මම ඉස්සරහා තිබ්බ නෙක්ටො බෝතලේ අත දික් කල්ලා ගන්න යද්දිම සෙනුකයා නෙක්ටො බෝතලේ අරන් දුරින් තිබ්බා..

" එච්චා නෑ.."

" දෙනවකෝ.. තිබහයි.."

" තිබහයිනම් බීපන් සීතල නොකළ පිරිසිදු පාණීය ජලය.."

ඌ පී ඇන් එස් එකේ වතුර බෝතලයක් අරන් මට දික් කලා..

" අනේ ඕයි.."

" උඹ ඔච්චා බීලා උගුර බැරිවෙලාවත් ලෙප්ට් වුණොත්.. මමද රධ්‍ය අයියත් එක්ක සෙන්යොරීටා නටන්නෙ.."

" ආසත සෙන්යොරීටා නටන්න.."

මම සෙනුකයට වල් හිනාවක් දාලා රධ්‍ය අයියව පෙන්නුවහම සෙනුකයා උගේ පැණි හිනාව දාගෙන අයුක අයියා දිහා හැරිලා බැලුවා.. අයුක අයියා සෙනුකයට රවලා අහක බලාගත්තා.. ඒ අස්සෙම කියාන් අයියා අපේ කතාව මැද්දට පැන්නා..

" බොරුකියන්න ඕන නෑ මම නම් ආසයි.. සුදුඅම්මියා එක්ක කිරිකොරහා උනත් නටනවා.. සුදුඅප්පච්චි ගොට් නෝ ප්‍රොබ්ස්.."

" සුදුඅප්පච්චි සුදුඅම්මියට එච්චර ආතරෙයිද.."

@Shan

" සුදුඅම්මියටයි සුදුදෝණියටයි දෙන්නටම ආතරෙයි.."

" දෙයියනේ දෙයියනේ.."

" මේ පච්කාරයො දෙන්නට ආතරේ නැද්ද අයියෙ.."

" නොදකින්.. මාගේ ස්වර්ග රාජ්‍යය විනාශ කිරීමට ආ දුෂ්ට මංකොල්ලකාරයො දෙන්නා.. අහර දහර පාලා මගෙ කොල්ලො දෙන්නා දැලේ දාගත්තා.."

" ආ.. අනේ මේ.. අපිනම් දැලේ දාගත්තෙ නෑ හරිද.. ඒ දෙන්නා තමා දැල එලාගෙන ඒකට පැන්නෙ.. බලහන්කො ෂනෙරු.."

" ඒකතමා.."

" ආ ඒ කියන්නෙ උඹලා බබ්බු.."

" බබ්බු තමයි ඇයි මොකද.."

" බබ්බු නෙමේ.. උඹලා බම්බු.. බම්බු.."

" ඉදපන් උඹට බම්බුව පෙන්නන්න.. කටහැකර කොහිල ඇටිකිච් ගෙවල පෙරේත චනචරයා~.."

සෙනුකයා උදේ වතුර බෝතලෙත් උස්සගෙන පුටුවෙන් නැගිට්ටහම කියාන් අයියා ස්ටේජ් එකේ පඩිපෙළෙන් බැහැලා ඩ්‍රෙසින් රූම් එක තිබ්බ පැත්තට දුවගෙන ගියා.. අයුක අයියා ඒ දිහා කම්මුලට අතක් තියාගෙන මහා දුක හිතෙන අසරණ මූණකින් බලාගෙන ඉද්දි රධ්‍ය අයියා අයුක අයියගෙ පිටට පොඩි තට්ටුවක් දැම්මා..

" මුන්ට එක විදියක ඉන්න බැරි ඇයි බං.."

" ඔව්වා ඔහොම තමා.."

මමත් රධ්‍ය අයියගෙ උකුළට වතුර බෝතලේ විසික් කරගෙන නැගිටලා යන්න ගියා.. එක විජියක ඉන්න හැයි යැයි තමා.. බලයක් ජවයක් නැති සීයාතාත්තලා දෙන්නා.. සෙනුකයා එක්ක එකතුවෙලා මුන් දෙන්නට සෙවනගල ගුලියක්වත් කැව්වනම් හරි..

@Shan

ඊටපස්සෙ අර බාලිකා පාසල්වලින් ආපු උඩින් යන මහා නර්ථන ශිල්පිනියො ටික නටලා නටලා යන්න ගියාම අපේ ඉවෙන්ට් දෙක තුන දිගටම ප්‍රැක්ටිස් කලා.. රධ්‍ය අයියගෙ ඇහේ හැප්පිලාම දැනටම මගේ උරපත්ත ගහලා ගිහිල්ලා වගේ.. ඇයි යකෝ වැදෙනවා කියලා මෙහෙමත් හැප්පෙන්න පුලුවන්ද.. දවසට විසිතිස් පාරක්ම හැප්පෙන්න එපැයි.. රධ්‍ය අයියට නැමිලා ලේන්සුව ඇහිඳලාම කොන්දෙ කැක්කුමත් අල්ලලා.. පව් මගෙ හැපීකව්වා.. ගෙදර ගියාම බාම් ටිකක්වත් ගාන්න ඕන.. මෙච්චර අඩුවයසෙන් කොන්ද කඩාගෙන බැනෙ.. කොච්චර දේවල් තියන කරන්න.. පිස්සු හැදෙයි..

ඊටපස්සෙ අද දවසෙ අන්තිම පාරටත් රධ්‍ය අයියයි මම ඇහේ හැප්පිලා ලේන්සුව වට්ටගෙන සිංදුව කියලා ඉවරවෙද්දි හවස හයයි.. මැඩම් කිව්වා අදට ඇති ගෙදර යන්න රෑ වෙන්න කලින් කියලා.. ඒකනිසා රධ්‍ය අයියයි මමයි කාර් එකේ ගෙදර එන්න ආවා.. අද ආධ්‍ය අයියා ගෙදර නැහැල්ලු.. මම නම් හිතන්නෙ ආධ්‍ය අයියා හිතලම නයිට් ඩියුටි දාගන්නවා හැමදාම ගෙදර එන්න බැරිවෙන්න.. ඒකතමා ඔච්චර නයිට් ඇදලා ඉතුරුටිකත් කොහේහරි ඩිස්පැන්සරියක වැඩ කරන්නෙ.. 24 අවර්ස් ඩොක්ටර් කෙනෙක් වැඩකරනවා කියන්නෙ පිස්සු හැදෙනවනෙ.. ආධ්‍ය අයියා ජෙනරල් හොස්පිට්ල් එකෙත් ඉන්නෙ ඇක්සිඩන්ට් වෝඩ් එකේ.. ඒකනිසා වැඩත් වැඩියි.. එහෙමත් කල්ලා ආයෙම ප්‍රයිවට් බෙහෙත් දෙන්නත් යනවා.. ඉතින් කන්න වෙලාවක් නෑ.. නාගන්න වෙලාවක් නෑ.. වැඩ වැඩ වැඩම විතරයි.. මගේ ආධ්‍ය අයියා පව්..

" වරද්.."

" ම්ම්..??"

" එළියෙන් කෑම අරන් යමු.. ඔයාට ගිහින් දැන් උයන්න මහන්සිනෙ.."

" එහෙම ඕන නෑ මම හදන්නම්.."

" අද ගෙදර කෑම හදන්නෙ නෑ!!.. ගෙදර ගිහින් කාලා බීලා නිදාගන්න ඕන.. හෙට දවල් ඉඳලා රෑ වෙනකල්ම සාගා එකට බිසී වෙනවනෙ.."

" හා එහෙනම්.."

" ම්ම්.. මම ඕඩර් කරනවා එහෙනම්.."

@Shan

රධ්‍ය අයියා ෆෝන් එක අතට ගත්තහම මම එයාගෙ අතින් ඒක ඉල්ල ගත්තා..

" මොනවද කන්නෙ.."

" I've no idea.. ඔයා ඩිසයිඩ් කල්ලා මොනවහරි ඔඩර් කරන්න.."

" හා.."

" වරද්.."

" ඕ.."

" ඔයාලගෙ මාමා කොළඹ එන එක ඇත්තටම හොඳයි.. මට ඒකෙන් නිදහසක් දැනෙනවා.."

" ඒ කිව්වෙ.."

" ඒ කිව්වෙ.. අපේ අයියා  ගැන ඔයාලගෙ මාමා හුහක් හොයලා බලනවනෙ.. එයා ගැන වදවෙන්නවත් කවුරුත් ඉන්නවා.. මම බයෙ හිටියේ අයියා තනිවේවි කියලා.."

" ඔයා බයවෙන්න එපා.. අපේ මාමයි මමයි දෙන්නම ඉන්නවනෙ.. ආධ්‍ය අයියව බලාගන්න.."

" ම්ම්.."

" මම ඔඩර් කලා.. මෙ ඒක එන්න කලින් ගෙදර යමු හරිද.. සැක් නැත්නම් දවසක් වගේ ඒ මනුස්සයා ගේට්ටුව ගාව හිටගෙන ඉදී.."

" ඔයාලගෙ එහාගෙදර ඇන්ටිට කියමුද තේකක් දීලා එහෙන් තියාගන්න කියලා.."

රධ්‍ය අයියා හිනාවෙලා මගේ උකුළ උඩ තිබ්බ අතක එයාගෙ අත පටලගත්තා..

" ඇපෝ එයා බ්‍රේසියර් අඳින්නෙ නෑ ඒයි.. ඒ මනුස්සයට සසර එපාවෙයි.."

@Shan

" ඔව් නේ.. ඉක්මනට යමු එහෙනම්..I've got a little craving.. Better go soon.."

" ඒ මොකක්ද.."

" මොකුත් නෑ.. Just said.."

රධ්‍ය අයියා හෙන මනමාල හිනාවකුත් දාගෙන මගේ ශර්ට් එක අස්සෙන් අතක් දාගෙන පපුවෙ පැත්තක් හයියෙන් ඇල්ලුවා..

" මේ මොකද.."

මම රධ්‍ය අයියගෙ අත අරගෙන එහාට විසික් කලාම ආයෙම ශර්ට් එක අස්සෙ අත දාගෙන පපුව මැද්දෙන් ඇඟිලි දෙකකින් අල්ලලා උඩට ඇද්දා..

" ආහ්-ආව් මනුස්සයෝ.. මොන මගුලක්ද කරන්නෙ.."

" I love teasing you till you blush.."

රධ්‍ය අයියා හිනාවෙවී ශර්ට් එක අස්සෙන් අත අරගෙන මගේ කම්මුලකට හාද්දක් දුන්නා.. මම එතන පිහිදගත්තා.. පිහිදගෙන ෂටර් එකෙන් අහක බලාගත්තා.. ඇයි ජස්ට් ලැව් යූ ටිල් යූ බ්ලා බ්ලා තමයි..

" තාරපැටියෙක් කේන්තිගන්නයි යන්නේ.."

" අයියෙ!!"

" අයියෙ!! පාඩුවෙ ඉන්නකු ඇත පැය තියාගෙන ඉහි ඉහි.. ඒව වරද්.. එහෙම නේද කියන්න ගියේ.."

" නෑ එහෙම නෙමේ.."

" අයි ලව් ඉට් වෙන් අයි කෝල් යූ තාරපැට්ටා..~"

"....."

" මේ බලන්නකො වරද්.. මම ඔයාට අර අග්ලි ඩක්ලින් ලේඩිබර්ඩ් බුක් එක ගෙනැත් දෙන්නද කියවන්න.."

@Shan

"....."

" අග්ලි ඩක්ලින් එපාද.. ප්‍රිටී ඩක් වරද් කියලා එකක් ලියලා මම පබ්ලිශ් කරනවා.. හොඳද.."

"....."

" ඔයා මොනවද බබා රට කන්න ඕඩර් කලේ.."

මම වාචාල රධ්‍ය අයියා පැත්තට හැරිලා දෙකක් රැව්වා..

" තාර මස්.. හොඳද.."

" එහෙම තමන්ගෙ ජාතිය කන- හරි හරි ඉවරයි ඉවරයි.."

" මම තාරපැටියෙක් නෙමෙයි!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

" කේන්තිගන්න ඕනද ඕකට ඉතින්.. මේ මම ඔයාට ෆන්කි ඩර්ට්ලගෙ සිංදුවක් කියන්නම්.."

" එපා.. මෝඩ පලහැටියා.."

රධ්‍ය අයියා අපේ ගෙදර ළඟින් කාර් එක නැවැත්තුවහම මම ගේට් එක ඇරගෙන ඇතුළට ගියා.. ගිහින් ආයෙම කාර් එක ඇතුළට ගන්නකල් ඉඳලා ගේට් එක වහගෙන ගෙට යද්දි රධ්‍ය අයියා මාව ගේ ඇතුළට ඇදලා අරගෙන බිත්තියට තද කල්ලා මූණට පහත් වුණා..

" තරහ වෙලාද.."

ඊටපස්සෙ මගේ තොල් වලින් පෙක් එකක් තිබ්බා..

" නෑ අයියෝ.. එහෙට වෙන්නකො.."

" බෑ.."

" අනේ.."

@Shan

රධ්‍ය අයියා මගේ කම්මුලකට අතක් තියාගෙන මගේ මූන උඩට හරවලා තොල් වලට පහත් වුණා.. මේ මනුස්සයාට හිටිගමන් මක් වෙනවද කියන්න දන්නෙ දෙයියො තමයි ඉතින්.. Clingy boyfriend ultra pro max..

රධ්‍ය අයියා මගේ ඉණ ලඟින් අල්ලලා මාව එයාගෙ ඇඟට හේත්තු කරගත්තා.. එයා ඇස් පියාගත්තහම දිග ඇස්පිහාටු මගේ මූණේ ලාවට ගෑවෙනවා මට දැනෙනවා.. එයාම මගේ කකුලක් අරගෙන එයාගෙ ඉණට තියලා තදකරගෙන මාව උස්සලා අරගෙන ගිහින් කාමරේ ඇඳ උඩට අතෑරියා.. ඊටපස්සෙ හෙන මරුමුස් විදියට හිනාවෙලා කාමරෙන් එළියට ගියා.. ඒපාර පිස්සු හැදීගෙනවත් එනවද.. මම මෙස් දෙකවත් ගලවන්නැතුව කකුල් දෙකත් ඇඳ උඩට අරගෙන ගිය එකා ආපහු කාමරේට එනකල් බලන් හිටියා.. විනාඩි පහක් විතර ගියා.. මට ඇහුණා ගෙදර ඉස්සරහා දොර ලොක් කරනවා.. ටිකකින් රධ්‍ය අයියා අතේ තිබ්බ වොච් එක පන්නලා මගේ දිහාබලාගෙන ඒක මේසෙ උඩින් තියලා මං ගාවට ආවා.. අදනම් පුතේ බයහිතෙනවා වගේ.. අයින්වෙලා පයින් ගියානම් හරි..

" ඇ-ඇයි..??"

" කෑම ඇවිල්ලා තිබ්බා.. ඒක ගන්න ගියේ.."

" අහ්.. එහෙමද.."

මම හෙන ඔක්වර්ඩ් විදියට හිනාවෙලා ශේප් එකේ නැගිටලා යන්න ගියාම රධ්‍ය අයියා මගේ අතින් අදලා මාව ඇඳ උඩට වට්ටගත්තා..

" කොහෙද යන්නෙ.."

" ආ..??"

රධ්‍ය අයියා මගේ මූණට පහත්වෙන ගමන් තොල් දිහා බලාගෙන අහද්දී මම ඇඳ රෙද්ද හයියෙන් අත් වලට පොඩිකරගත්තා.. මම අරගත්තු හුස්මවත් පහළ දාගන්න කලින් රධ්‍ය අයියා මාව ඇග්‍රෙසිව් විදියට කිස් කරන්න පටන්ගත්තා.. මම එයාගෙ පපුව මැද්දෙන් ශර්ට් එක ගුලි කල්ලා අල්ලගත්තහම එයා මගේ ශර්ට් එක අස්සෙන් අත ලිස්සගෙන වගේ උඩට ඇදගෙන ආවා.. එතකොටත් මම එයාගෙ කර වටේ අතක් යවාගෙන හිටියේ.. මම හුස්ම ගන්න බැරිම තැන රධ්‍ය අයියගෙ කොන්ඩෙ අහුරක් අතට අල්ලගනිද්දී එයා මගෙන් එහාට වෙලා මාව උස්සලා එයාගෙ

@Shan

උකුලෙන් ඉන්දුව ගත්තා.. ඒ වෙලාවෙයි මම එයාගෙ ඇස් දෙක හරියටම දැක්කෙ..

ඒවා..

ඒවා මම කවදාවත්ම දැක්කෙ නැති තරම් බය හිතෙන විදියට මත් වෙලා තිබුණෙ.. එයා හිනාවුණත් ඒ හිනාවෙන විදියත් මට මොනවගේ එකක්ද කියලා හිතාගන්න වුණේ නෑ.. එයා ලොකු හදිසියකින් වගේ මගේ ශර්ට් එක උඩට කල්ලා කරෙන් පන්නලා විසික් කල්ලා දැම්මා.. දාලා මගේ ඉණ දෙපැත්තනෙ අත් දෙක තියලා ඒවා ගාණට සීරුවට උඩට ඇදගෙන ආවා.. මම දැනුන ලැජ්ජාවටම තොලකුත් හපාගෙන එයා දිහා බලාගෙන ඉද්දි එයා ඉස්සරහට නැමිලා මගේ තොල් වලින් පෙක් එකක් තිබ්බා.. ආයෙම එයා දිහා බලද්දි අර කලින් තිබ්බ පෙනුම දකින්න තිබ්බෙ නෑ.. කලින් ඉදපු රධ්‍ය අයියම මං ගාව හිටියා.. මම එයාගෙ උරහිසට මූණ තියාගත්තා.. සැරින් සැරේ පාට මාරු කරනවා.. බයත් හිතෙනවා..

" මොකද මේ.."

" බය හිතෙනවනෙ මගුල.. එකපාරට මක් වෙලාද.."

රධ්‍ය අයියා හිනාවෙලා මාව ආයෙම කොට්ටෙ උඩින් තියලා මගේ එහාපැත්තෙන් හාන්සි වුනා..

" තරු බලන්න යන්න කතාකරන්නෙ.. ඒ වුණාට මොකද මෙතන දියවෙලා වැක්කෙරෙන්න ගන්නවා.."

" කවුද වැක්කෙරුණෙ.."

" මම මම.. මම තමා වැක්කෙරුනෙ.."

" ඒකනෙ.."

" මම ඇත්තටම අහන්නෙ වරද්.. ඇයි උඹ ඔච්චර ලස්සන වෙන්නෙ.. අවුරුදු විසි හතරක් පහක් වෙද්දි උඹ මොනවගේ වෙයිද හිතාගන්න බෑ.."

" මගේ ඔය කියන තරම් ලස්සනක් නෑ අප්පා.. මලවිකාර.."

@Shan

" මම විකාර වෙලා ඉන්නෙ.. ඒවා වැඩක් නෑ.. ඉටස් Time to satisfy my cravings.. කට වහන් මෙන්න මෙහෙම මාව බදාගෙන ඉන්න.."

රධ්‍ය අයියා මාව බාදාගෙන පපුවට තොල් තියලා මාව අර බූවළ අඩු ටිකෙන් ඇටකටු පොඩිවෙලා යන්නම තද කල්ලා බදාගත්තා.. එයා සැරින් සැරේ ඇස් උස්සලා මං දිහාබලාගෙන ඉන්න නිසා මම ඇස් දෙකත් පියාගෙන මූණ කොට්ටෙට තද කරගෙන හිටියා.. මේ මනුස්සයට ලැජ්ජාවක් කියලා නාමයක් නෑ.. නැහැදිච්ච හැපීකච්චා..

I love you without knowing how, or when, or from where. I love you simply, without problems or pride: I love you in this way because I do not know any other way of loving but this, in which there is no I or you, so intimate that your hand upon my chest is my hand, so intimate then when I fall asleep your eyes close..

හෙට දිගම දිගම දිගම දිග~ වැප්පකින් එන්නම්.. මොකද ඒක ඇම්තටම දිගයි.. ඉම්හි..

සාගා එකට මොකක් වෙවිද.. දුමශ්ටයා එන්ටර් වෙලා පෙම් කැකුල වප්ප කල්ලා දාවිත..

පෙම් කැකුළ ආරස්සා කරන දලඹු හමුදාව : වරෙන් යකෝ!! අප්පච්චිව අපිට ලොකු නෑ හර්තේ...

එන්නාම්.. ලව් යූ.. ❤

මීට වරද්ගෙ රෑ කෑම එක උස්සන් වහලට ගෙනිහින් කන බේසික කලවැද්දා වෙරි මින්සි.. එමන කමන..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

@Shan

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 98 කොටස

" ඌප්ස්.. අයුක අයියා අපිට තරු මිලියන පනහක් දීලා තියෙනවා.. තැන්ක් යූ අයුක අයියා.. ලව් යූ.. උම්ම්ම්මවාහ්!!!!!!"

" වත්සල් ගිහින් චේන්ජ් කරගෙන එන්න!!!"

" ලයික් කරා~න්න.. කමෙන්ට් කරා~න්න.. ශෙයා කරා~න්න.. අමතක කරන්න එපා.."

" ඕයි සෙනුකයා.. උඹේ බෝ එකයි මගේ බෝ එකයි මොකක්ද හොයලා දීපන්.."

" කාගෙ වුණත් මොකෝ බං.. ඔන්න ඔහේ ඕන එකක් දීපන්.."

" ප#යො අද ලැස්තිවෙන්නැද.."

" ඉන්න ශුදුඅයියෙ මම පස්සෙ ඔයාගෙන් තරු ඉල්ලන් ඒකෙබාර් නටන්න එන්නම් හොදේ.."

සෙනුකයා අයුක අයියගෙ බඩට එකක් ගහගෙන ඩ්‍රෙසින් රූම් එක පැත්තට දුවගෙන ආවා.. ඌ වෙස්ට්කෝට් එකවත් අදින්නැතුව ඔහේ ශර්ට් එකයි ට්‍රවුසර් එකයි ඇඳගෙන ගිහින් අයුක අයියත් එක්ක හුරුතල් වෙනවා.. මරු කන්ඩක්ටර් ඔකෙස්ට්‍රා එකට ඉන්නෙ.. මෙහේ වැඩ කෝටියක් තියාගෙන ඌ ගිහින් ලව් කරන්න..

" ෂනෙරුවා මගේ වෙස්ට්කෝට් එක කෝ බං.."

" ආ මෙක ඇඳගනින්.. ගියා ලව් කරන්න ඔක්කොම තියෙද්දි.."

" ශුදුඅයියටයි මටයි ඉරිසියා කරනෙපා.."

මම සෙනුකයගෙ සුදුපාට ශර්ට් එක කලිසමට යට කල්ලා වෙස්ට් කෝට් එක අන්දලා බෝ එක ඌට දාගන්න කියලා ඒකව ඇඳගෙන ගිහින් ලස්සන අක්කා කෙනෙක් ළඟ තිබ්බ පුටුව ගාවට තල්ලු කලා.. සෙනුකයා කොලර් එක උඩට උස්සගෙන අක්කට හෙන පැණි හිනාවකුත් දාගෙන බෝ එකත්

@Shan

හද හද ගිහින් පුටුවෙන් වාඩිවුණා මේකප් කරන්න.. ඩ්‍රෙසින් රූම් එක නිකම් කඩිගුල ඇවිස්සිලා වගේ.. ඔකෙස්ට්‍රා එකට ඉන්න සේරම ඒකෙ මේකප් කරනවා, එහෙට දුවනවා, මෙහෙට දුවනවා ඉවරයක් නෑ.. ඉවෙන්ට් එක පටන්ගන්න තිබ්බෙ හරියටම පැය එකහමාරක් වගේ.. අපි ප'ෆෝම් කරන ඉවෙන්ට් තියෙන්නෙ හුඟක් රෑ වෙලා නිසා අපිට මගදි චේන්ජ් කරගන්න පුලුවන් කිව්වා.. අර ලස්සන අක්කා සෙනුකයට ඇස් දෙක වහගන්න කියලා මොනවද බදාම වගයක් ගාන්න ගත්තු නිසා මම එතනින් එන්න ආවා.. රධ්‍ය අයියා අයුක අයියත් එක්ක පැත්තක කතාකර කර ඉන්නවා..

" වත්සල් කොහෙද මල්ලි.."

" මේකප් කරනවා අයියෙ.."

" ම්ම්.."

අයුක අයියා එහෙට මෙහෙට වෙලා සෙනුක දිහා ඇස් දෙක හීනි කරගෙන ඉදලා අර අක්කා දිහත් බලාගෙන ඉදලා රධ්‍ය අයියා පැත්තට හැරුණා..

" රධ්‍ය මම එළියට යනවා.. කියාන්ලා ඇවිල්ලත් ඇති සමහරවිට.."

" උඹ යනවද.. හා එහෙනම්.. උවමනාවක් වුණොත් කෝල් එකක් දීපන් මම එන්න.."

" හරි හරි.."

අයුක අයියා මගේ පිටටත් තට්ටුවක් දාගෙන එළියට යන්න ගියා..

" මේ.."

" ම්ම්..??"

" ආධ්‍ය අයියා එන්නෙ කීයටද.."

" පටන් ගන්න ලං වෙලා ඒවි.. ඇවිත් කෝල් කරන්නම් කිව්වා"

" එතකොට අප්පච්චි..??"

@Shan

" අම්මව හොස්පිටල් එකෙන් පික් කරන් එනවා කිව්වෙ.."

" අම්මත් එනවද.. වෝහ්.."

" ම්ම්.. ඊයෙ කිව්වා එන්න ඕන කියලා.."

" මරු මරු.. මම ගිහින් ආන්ටිව බදාගෙන් උම්මා එකක් දෙනවා.."

" ඊටකලින් අපේ අම්මා ඇවිත් ඔයාව බදාගනී.."

" ඔව් නේද.. අපේ අම්මා කිව්වා ආන්ටි අම්මා එක්කත් දවස් දෙකතුනක්ම කතාකලා කියලා ගමේ ඉද්දි.."

" ම්ම්.."

" එතකොට ආන්ටි මොනවගෙන්ද කන්සාල්ටන් කෙනෙක් වෙන්නෙ.."

" dermatology කියලා කිව්වෙ.."

" අම්මත් යනවනෙ නේද ළඟදි.. හැමෝම අපෙන් දුරට යනවා.. අයුක අයියත් අනිද්දා යනවා.. දැන්මම පාළුයි මටනම්.."

රධ්‍ය අයියා මගේ කම්මුලට තට්ටුවක් දාලා හිනාවුණා..

" දවසක ඔක්කොම එකට එකතුවේවි.."

" මම එහෙම විශ් කරනවා.."

ඒ එක්කම ස්ටාෆ් ඩියුඩ් ඉන්න අංකල් කෙනෙක් ඔකෙස්ට්‍රා එකෙ සර් එක්ක ඩ්‍රෙසින් රූම් එක ඇතුළට ආවා.. සෙනුකත් හිටියේ මේකප් කල්ලා ඉවරවෙන ගමන්.. ඌ මොකක්ද කොළයක් බලනවා..

" Ok boys.. All those who are finished with their dresses go to the stage now and do their intense check to see if there are any defects.. hurry up.. make it quick.."

" පහුගිය අවුරුදු දෙකේම තිබ්බෙ නැති නිසා මෙ පාර ඉක්මනට ටිකට්ස් සෝල්ඩ් අවුට් වෙලා නේද.. හුඟක් ඉන්න නිසා පොඩ්ඩක් බයයිත් වගේ.."

@Shan

" බයවෙන්න දෙයක් නෑ.. ඔයිට වඩා ස්ටේජ් වල නටලා තියෙනවනෙ.."

" අනේ මේ.."

" ඇයි අර ලිට් සොසයිටි එකෙන් කරපු ඩ්‍රාමා එකක එකපාරක් කෙල්ලෙක්ට ඇඳගෙන රඟපෑවා නේද.. ඒ කාලෙ ලැජ්ජ තිබ්බෙ නැද්ද.."

" ඊයා අයියෙ.. මතක් කරන්නෙපා ඒ මගුලනම්.."

" මං ගාව ෆොටෝ එකකුත් තිබ්බා.. හෙන ලොකු හැට් එකක් ඇඳන් පිම්බුණු රෝසපාට ගවුමකුත් ඇඳගෙන.. කුඩේකුත් කරක කරක.. එදානම් සිරාවටම ෆ්ලෙමින්ග් ජූන් වගේ තමා.."

" ඒක මෙ හෙන පොඩි කාලෙ වෙච්ච එකක්නෙ.. ඕක අල්ලන් කියවන්නෙපා.."

" පුනරුද සමයේ උගත්, නවකතාවලට ලැති සුන්දර යුවතිය.."

" උඹට ගහනවා මම.."

" මම කිව්වෙ ඩ්‍රාමා එකේ කැල්ලක්..ඇයි ඔයාට කේන්ති යන්නෙ.. අපි එළියට යමුද.."

" හා.."

" ඉන්න මම ඇඳුම් ටික ස්ටෝල් එකකින් තියලා එන්නම්.."

" ආ පොඩ්ඩක් ඉන්න.. මෙ ටිකත් තියන්නකො.."

" ම්ම්.."

මම මගේ ඇඳුම් ටිකත් රධ්‍ය අයියගෙ ඇහේ ගහලා හිමින්සැරේ සෙනුකයා ගාවට ලිස්සලා ගියා.. සෙනුකයා හෙන ලස්සනයි වෙස්ට් කෝට් එක ඇඳලා කොණ්ඩෙ උඩට කල්ලා ජෙල් කල්ලා හැඳුවහම.. හෙන හැන්ඩ්සම් ලුක් එකක් තියෙන්නෙ.. මගේ හිතත් පොඩ්ඩක් ඇදේ ගියා ඌ දැකලා..

" මෙ පච්කාරයා ලස්සනද ඒයි.."

@Shan

" මේ පච්කාරයගෙ හිත මන්මත් වෙලා ගියා දෙයියනේ.. විල් යූ මැරි මී.."

" ඕ මයි පකින් ගෝශ්.. අයි විල්.. අයි විල්.."

" සිරාවට.. මාර ලස්සනයි ඒයි.. මම උඹට ගෙදර අරං යනවා.."

" අරන් යන්න ඕන නෑ මම එන්නම්.. මේ මම යනවා එහෙනම්.. හොඳට ප්'ෆොම් කරගන් හොඳේ.. හරිනෙ.. අයුක අයියා හම්බුණොත් කියපන් මම ස්ටේජ් එකට ගියා කියලා.."

" හා.. ඕල් ද බෙස්ට් කොමලො.."

" විශ් යූ ද සේම්.. බායි .."

සෙනුකයා අඩි පහක් විතර ගිහින් ආයෙම ඔලුව කස කස මං ගාවට දුවගෙන ආවා..

" අඩෝ මගේ කුර දීපන්.. සැක්.."

" මං ගාව නෑ.. ස්ටේජ් එකේ ඇති.."

" ආ ඔව් ඔව්..හරි බායි ඈ.."

ආයෙම සෙනුක දුවගෙන දුවගෙන ස්ටේජ් එකට යන පඩිපෙළේ දොර ඇරගෙන කර්ටන් එක අස්සෙන් නොපෙනී යන ගියා.. නෙද්දකින් සිහිය නෑ පගයගෙ ලොරි ටෝක් දුන්නට.. මමත් සුදු අත් දිග ශර්ට් එක කළු කලිසමට යට කල්ලා බෝ එකක් දාගෙන ඇඳගෙන හිටියේ.. රඨ්‍ය අයියත් ඒ කිට් එකමයි.. කෝර් එකේ හැමෝම අඳින්නෙ ඒ කිට් එකම නිසා අපි දෙන්නට ප්'ෆෝම් කරනකල් ඒක ඇඳගෙන ඉන්න වුණා.. රඨ්‍ය අයියා අත් දිගට ඇන්දහම පපුව පිපිරෙන්න වගේ.. මම බලාගෙන ඉන්නෙම ඉස්සරහා අර මහා පීඩනේක ඉන්න බටන් එක ගැලවිලා විසික් වෙලා යනකල්.. එයාගෙ අත් පිම්බිලා ලොකුවට පේනවා.. හී ඉස් සෝ ටෝල් ඇන්ඩ් හැන්ඩ්සම් ඇස් හෙල්.. හිස් මල ගොට් හෝර්-

" වරද් යමු.."

" හා.."

@Shan

මම රධා අයියා ගාවට ආවම එයා මගේ කම්මුල් දෙක පොඩිවෙලා වප්ප වෙලා යන්නම අත් දෙකින් මිරිකලා දැම්මා.. අපි එළියට එද්දි මෙන් ඩෝ එක ගාව කට්ටිය එනවා.. හෙන ගොඩක් ඇවිත් වගේ.. එළියෙත් වාහන පාක් කරන්න හෙන ට්‍රැෆික් එකක් සෙට් වෙලා.. මමයි රධා අයියයි කට්ටිය අස්සෙන් එහෙන් මෙහෙන් රිංගලා පහළට ගිහින් කියාන් අයියලව හොයාගන්න ට්‍රයි කරා.. දොඩම් බිබික්කමයි ඒකිගෙ කොලු කැල්ලයි දෙන්නම එනවා කියලත් කිව්වනෙ කියාන් අයියා එක්ක.. ටිකකින් රධා අයියා කෝල් කල්ලා අපි ඉන්න හරිය කිවහම මම දැක්කා ඈත තියා අහල් අටේ සුදුපාට හීල් දෙකක් දාගෙන අත් නැති ලාවට පිම්බුනු කොට ගවුමක් ඇඳගෙන පූස් කන්දෙකක් තියන සුදුමපාට පර්ස් එකක් උඩට උස්සගෙන අපෙ පැත්තට එන කෙල්ලෙක්ව.. ඒකි දුවගෙන දුවගෙන ඇවිත් බොහ් ගාලා මගේ ඇඟට පැන්නා.. මම දෝත බඳලම ඒකි අල්ලගෙන බිම පතබැවෙන්න ගිහින් රධා අයියට වාරුවෙලා කෙලින් කටින් හිටගෙන හිටියා.. ඊට පිටිපස්සෙන් බැගී කළුපාට ශර්ට් එකකුයි බැගී පැන්ට් එකකුයි බූට්ස් දෙකකුත් දාගෙන අතෙත් මුදු හෙන ලොට් එකක් දාගෙන කොලු ගමනින් ඇවිදගෙන ආවෙ මහීශා.. යකෝ මුන්.. නිකම් සෙලිබ්‍රිටිලා වගේනෙ.. ඊටත් පිටිපස්ස්සෙන් සප්‍රයිස් වෙච්ච මනමාලයෙක් වගේ අත් දෙකින්ම කට වහගෙන රධා අයියා දිහාට දුවගෙන ආවෙ කියාන් අයියා.. දුවගෙන දුවගෙන ඇවිත් ඒ අලිපැටියා රධා අයියව උස්සලා බිමින් තිබ්බා..

" සුදුඅම්මියව බලන්න සුදුඅප්පච්චි ආවා.."

" අර මිනිස්සුත් බලනවා.. එහෙට පලයන් කියාන්.."

" කෝ මගේ සුදුදෝණියා.."

" දැන් ඒවි.."

" ඕමෝ!!! ෂනෙරු අද ප'ෆෝම් කරනවා!!!!!! ඔයා දන්නෙ නෑ මමනම් ඔයා නිසාමයි ආවෙ ඒයි.. නැත්නම් මේ ඔයාලගෙ ඉස්කෝලෙ ඒවට එහෙම එන්න හිතෙන්නෙත් නෑ.. අයි ලිටරලි හේට් බ්ලූ ඇන්ඩ් ගෝල්ඩ්.."

ආගි පුරුදු විදියටම ඒකිගෙ අපේ ඉස්කොලෙට තියන වෛරක්කාර අඳෝනාව පටන්ගත්තා.. මේකිට මොන තරහක්ද මන්දා අපේ ඉස්කෝලෙත් එක්ක මෙච්චර.. යකෝ ඒකෙන්ම කොල්ලෙකුත් යාලු කරගෙන.. අපිටම බනිනවා.. ඔහොම බැන්නට සමහරවිට වෛරය විදියට පිට කරන්නෙ ඒකිගෙ රුචිකත්වයද දන්නෙ නැනෙ..

@Shan

" ම්ම්.. ෂනෙරු රධ්‍ය අයියවම අල්ලගන්නවනෙ කොහෙන් ගියත්.."

" පලයන්.. ලබ්බක් කතා නොකර.."

" ආව් ආව් ඒයි.. මේ.. මම ෂනෙරුට පොඩි බඩ්ඩක් ගෙනාවා අනේ.. ඉන්නකො දෙන්න.."

ආශි අර පූස් කන් දෙකක් තියන බූල් බූල් පොඩි බෑග් එක අවුස්සලා පොඩි පෙට්ටියක් එළියට ඇදලා ගත්තා..

" ආ.. ඔයාට බබල්ගම් බොක්ස් එකක්.. රස~ම රසයි.. මම ඔයාටයි අයියටයි ඉතුරු කරගත්තේ.."

" අඩෝ මම හිතුවෙ වෙන මගුලක්.. සැක් සොරි ආශි.."

" ඊක්කා අනේ.. ඔයාලා මහ වල් මහීශා.."

ආශි ඒකිගෙ හෙන තඩි සුදුපාට බෝ එකක් දාලා වනාගෙන ආපු කොණ්ඩෙ රැල්ලක් ගස්සලා පිටිපස්සට දාගත්තා.. ඒ සැරේ කොණ්ඩෙ බ්ලොන්ඩ් කරගෙන.. කියාන් අයියට හොඳයි මෙකිව බෝනික්කා වගේ අරගෙන යන්න කොහේ හරි යද්දි..

" මෙ ෂනෙරු.. මගේ කොණ්ඩෙ ලස්සනයි නේද.."

" ඇයි නිල් පාට එකට මොකද වුණේ.."

" ආර්හ්! අයි හේට් ඉට්.. ඔයා කියන්නෑනෙ.. රධ්‍ය අයියා.. ඔයාට හොඳ ෆැශන් සෙන්ස් එකක් තියනවනෙ.. කියන්නකො මගේ කොණ්ඩෙ ලස්සනයි නේද.."

ආශි කොටට කොටේ රධ්‍ය අයියා ගාවට ගිහින් වටයක් කැරකිලා ඇහුවහම රධිය අයියා කන්ෆියුස් වෙලා වගේ ආශි දිහා බලාගෙන හිටියා..

" ම්ම්.. හොඳයි.."

" දැට්ස් මා බෝයි.. අපේ මිනිහට තමා මාව නාකි ආච්චියෙක් වුනේ.. අගයක් නෑ.. අගයක් නෑ.."

@Shan

" පිස්සුද බබා.. ඔයා ඔහොම හෙන ලස්සනයි.. අර කවුද බං අර හිම ගෑණියෙක් ඉන්නෙ.. අර පූස් පූස් ගගා හිම විදින්නෙ.."

" සැන්ටද අයියෙ.."

" සැන්ටා ගෑණියෙක්ද මල්ලෙ.. නෑ නෑ අර පලපු දිග ගවුමක් ඇඳගෙන එහෙට මෙහෙට දුවන්නෙ.."

" ආ.. කිම් කාඩෑශියන් නේද.."

" අපෝ නෑ නෑ.. අර බං ලෙට් ඉට් ගෝ කිය කිය ලතෝනි තියන ගෑණි.."

" එල්සා බං.. එල්සා.."

" ආ අන්න ඔව්.. එල්සා වගේ.. හරිම ලස්සනයි.."

" ඒක කියපු කැත විතරක්.. සැක්.. ආයෙනම් තවුසෙගෙ මැච් බලන්න මම එන්නෙ නෑ කියලා හිතාගන්නවා.. මම යනවා අනේ ඇතුලට.. එළියේ ඉඳලා දාඩියත් දානවා.."

" ආ උඹලා යමං එහෙනම්.. අපි එන්නම් ටිකකින්.. අයුකටත් එහෙට එන්න කියපන්.. ඌ සමහරවිට සෙනුක මල්ලි එක්ක ඇත්තෙ.."

" සුදුඅම්මියා බයවෙන්න එපා.. සුදුඅප්පච්චි සුදුදෝණියව උකුලේ තියාගෙන බලාගන්නෙ.. ඒ ඇට්ටර මදාවියා.. අපි යනවා ඈ.."

" පලයන් පලයන්.. වනචරයා.."

" ජ්ෆ්ෆ්.. ඇට්ස් ඉට්.. බායි ගයිස්.."

ආශියි කියාන් අයියයි ෆොටෝස් දෙකතුනකට ඉන්න ගෝල්ඩන් බ්ලූ කාපට් එක දිගේ ෆොටෝ බූත් එක පැත්තට යද්දි මහීශා සාක්කුවට අත් දෙකත් දාගෙන මගේ ගාවට කිට්ටු වුණා..

" අඩෝ මේ.."

" මොකෝ.."

@Shan

" මේක ඉවරවෙන්නෙ කීයටද බං.."

" රෑ වෙයි.. අම්මා කලින් එන්න කිව්වද උඹට.."

" ආ නෑ.. මේ රෑ වෙනකල් කියන්නෙ මට ගේම් එකේ ලෙවෙල්ස් දෙක තුනක්වත් ඉවර කරගන්න පුලුවන්.. අපි කැපුණා.. බායි.."

මහීශා මගේ පිටටත් තට්ටුක් දාගෙන කියාන් අයියලා ඉන්න පැත්තට ගියාම මම එතන තිබ්බ බැම්මට හේත්තුවක් දාගත්තා.. සාගා එකට එක එක විදියේ කටිය හෙන ලස්සනට ඇඳලා පෝලිමට එනවා.. හිනාවෙනවා.. බදාගන්නවා.. කතාකරනවා.. මිනිස්ටර්ස්ලා දෙතුන්දෙනෙකුත් එනවා කියලා තිබ්බනෙ.. ඒ නිසා පොලීසියෙනුත් ගේට් එක ගාව හිටියා..

මමනම් කියන්නෙ මේ ඇමතියො මෙච්චර රකින්න ඕන නෑ.. මොකටද.. අපරාදෙනෙ අපේ සල්ලි.. බඩ තඩි නාකි ඇමතිලා.. මම ආසම නැත්තෙ අගමැතියට.. ඒ කියන්නෙ අයුක අයියගෙ තාත්තට.. සීයා පරිසර ඇමතියනෙ.. හොර ඇමතියා.. බොරුවට මිනිස්සුන්ට පේන්න මහා විසාල පහන් පූජාවල් ස්පොන්සර් කරනවා, වෙහෙර මල් වලින් නාවනවා.. ඒ වුණාට කැසිනෝ දෙකතුනකම ශෙයාහෝල්ඩර් කෙනෙක්.. ඒවගෙ හොරෙන් ප්‍රොස්ටිටියුට්ස්ලා තියාගෙන ඉන්නවා.. ඩ්‍රග් ඩීල්ස් කරනවා.. සැක්.. හෙනම ගහපන් මෝඩ ඇමතියට.. දැන් ඌ පැරලයිස් වෙලාද මොකක්ද වෙලාලුනෙ.. මට තේරෙන්නෑ සෙනුකයා ඔච්චා කොහොම ඉවසගෙනබලාගෙන ඉන්නවද කියලා.. බලන් යද්දි උගේ රහසිගත ජීවිතේ දේවල් වැඩිද කොහෙද..

When it comes to politics.. I can't hold back my anger..

අනික දහස් ගානක් නෙළුම් මල්, අර මල්, මේ මල් වෙහෙර විහාර වලට පුදලා මොකටද.. ඒකෙන් පින් අයිති වෙනවද.. බුදුහාමුදුරුවො ඇත්තටම දේශනා කල්ලා තියන ධර්මය වෙනම එකක්.. අපේ මිනිස්සු මවාගෙන ඉන්න එක වෙනම එකක්.. මලක් පූජ කල්ලා ඒක පරවෙන දිහා බලන් ඉඳලා බුදුහාමුදුරුවො මෙනෙහි කරන්න කිව්වෙ අනිත්‍ය.. එත් අපි ඒ දිහා බලාගෙන හිතේ පුරෝගන්නෙත් ආසාව.. අනික දැන් ඔය මල් පුදන මිනිස්සුමද අස් කරන්නෙත්.. නැහැනෙ.. එතකොට අස් කරන මනුස්සයා තමයි හැමදාම අනිත්‍ය මෙනෙහි කරන්නෙ.. අපේ ආච්චි කියන්නෙ පූජා කරන්න මලක් කැඩුවත් මුළු ගහම වට්ටියට ගන්න එපා කියලා.. මොකද මල් පැණි ගන්න සත්තු කොච්චර ඉන්නවද.. එයාලට ඒවා ඉතුරු කරන්න

@Shan

ඕන කියලා.. හැමදේම කරන්න ඕන හැමතිස්සෙම ගානකට ලු.. ආච්චිඅම්මා කියනවා ආච්චිඅම්මා තරුණ කාලෙ සීයා නැතිවෙලා මරණෙ සාලෙට ගෙනාවහම ආච්චිට හිතාගන්න බැරිවුණාලු මේ ආච්චිඅම්මා ඉන්නෙ හීනෙකද කියලා.. එතකොට අපේ මාමා අත දරුවා කාලෙලු.. සීයා නැතිවෙලා තියෙන්නෙ ඇක්සිඩන්ට් එකකින්.. ඒ කාලෙ මේ වගේ ලොකු ඉස්පිරිතාල තිබිලා නැති නිසා ඔලුවට ලේ බැහැලා දවසකින් නැතිවෙලා.. මේ හොඳට ඉඳිය මනුස්සයා පහුවදා මිනී පෙට්ටියකින් ආවහම.. මටනම් ඒ දුක හිතාගන්නවත් බෑ..

ඉඳලා හිටලා ආච්චිඅම්මා මාත් එක්ක යනවා අපේ වත්ත පල්ලෙහා සීයගෙ සොහොන ගාවට.. ගිහින් ඒ හරිය සුද්ද කල්ලා ඉඳගෙන ඉඳලා එනවා.. ආච්චි කියනවා තරුණ කාලෙ මිනිස්සු ආදරේ කරන්නෙ සීමාවක් නැතුවලු.. ඒකනිසා වෙන්වීම් දරාගන්න බැරිලු.. මැරෙන්න පවා හිතෙනවලු.. ආච්චිටත් එහෙම හිතුණලු.. ඊකෙන් පස්සෙ ආච්චි දේවල් වලට බැඳෙන්න හරි බයයිලු.. හැබැයි ඒ වුණාට ආච්චිඅම්මා ආච්චිගෙ ළමයි තුන්දෙනාටම වඩා මට ආදරෙයි.. මට තුවාලයක් හරි වුණොත් එහේ ඉඳන් පපුවෙ අමාරුව හදාගන්නවා.. ආච්චිට මං ගැන තියෙන්නෙ අනුකම්පාවක් එක්ක එකතුවුණු හරි අමුතු ආදරයක්.. ආච්චිඅම්මා කියන්නෙ මටනම් ලෝකයක් වගේ.. මෙහෙමයි කියලා නිමකරගන්න බෑ.. මම හිතන්නෙ සීයගෙන් පස්සෙ ආච්චිඅම්මා වැඩිපුරම ආදරේ මටද කොහෙද..

" මොනවද කල්පනා කරන්නෙ.."

මම එකසැරේම ආච්චිඅම්මගෙ ලෝකෙ ඉඳලා නෙළුම් පොකුණට කඩාගෙන වැටුණා..

" ආ..?? නෑ නිකම්.. ගෙදර කට්ටිය මතක් වුණා.."

රධ්‍ය අයියා මං දිහා බලාගෙන මගේ අතකින් අල්ලගත්තා..

" අම්මා මෙහෙ හිටියනම් අද එනවනෙ.."

" අපෝ මේක බලන්න එන්නෙ නැති එකක් ගැන නෙමේ.. ඒවුණාට.. ගෙදර අය නිතර මතක් වෙනවා.."

" ආයෙම නිවාඩුවක් ආවම ගෙදර ගිහින් එන්න පරිස්සමට.. අම්මා බලාගෙන ඇත්තෙ.."

@Shan

" ම්ම්.. අපි හැමෝම අන්තිමට එකට ඉන්නෙ අදනෙ.. මගේ හිතට මාරම දුකයි වගේ.. අයුක අයියව දැක්කහම අපි එකට හිටිය කාලේ මතක් වෙනවා.."

" ම්ම්.."

" ඉක්මනට දවස් ගෙවිලා ගිහින් නේ.. මමනම් මෙච්චර ඉක්මනට අවුරුද්දෙ අන්තිම ඒවි කියලා හිතුවෙ නෑ.."

" හැමදේම අපි හිතන විදියටම වෙන්නෙ නෑනෙ.. නේද.."

" ඒකනම් එහෙම තමා.. කෝ අනේ ආධ්‍ය අයියා.. තාම නෑනෙ.."

" පාකින් එකේ කිව්වා.. ඒවි දැන්.."

" ම්ම්.."

" හතටත් කිට්ටුයි.. තාම කට්ටිය එනවනෙ.. මෙපාර ඉවෙන්ට් එක ලොකුවටම ඕගනයිස් කල්ලා.."

" පහුගිය කාලෙම තිබ්බෙ නෑනෙ.."

" ඒකෙත් හැටි කියන්නෙ ඒයි.. අපි මහින්ද මහත්තයට බැන්නට දැන් මෙක තියන්නෙත් මහින්ද රාජපක්ස හෝල් එකේනෙ.. සැක් නේද.. අපිට මෙ මනුස්සයගෙන් ගැලවීමක් නැද්ද කොහෙද මේ ආත්මෙට.."

" මොනවද බං කියවන්නෙ.."

" ඉතින් ඇත්තනෙ කියන්නෙ.. එහෙ බැලුවත් රාජපක්ස.. මෙහෙ බැලුවත් රාජපක්ස.. හැබැයි ඔයාට වගේ රාජපස්සක් නම් මම කොහේවත් දැකලා නෑ.. ඒකෙන් මට ගැලවීමකුත් නෑ.."

" වරද්.."

" ඇයි අනේ.. මේ බලන්නකො අර අතන ඉන්න කෙල්ල ඔයා දිහා බලනවා වැඩී.."

" කොහෙද.."

@Shan

" කොහෙවත් නෑ.. මලසමයං.. අදකාලෙ ඇහැට කනට පේන කොල්ලෙක්ට පාරෙ බැහැලා යන්න නෑ ආවා මෙතන බලන්න.. තේඋඩිච්චි.. තෝ දන්නෑමගෙ හැටි.. ගහනව තොට වැලි.."

" මොනවද කුටු කුටු ගගා කියවන්නෙ.."

" මොකුත් නෑ අනේ.. මම ඔයාට උම්මා එකක් දෙන්නම් ඇතුලට ගියාම.."

" ම්ම්.. මේ අපේ අයියා තාම නෑ...න්- බ-බබා මේ.."

" ඇයි මොකද වුණේ.."

රධ්‍ය අයියා එකසැරේම කියන්න ගිය එක පටලගෙන කොහේද පැත්තක් දිහා බලාගෙන ගොත ගහන්න පටන්ගත්තු නිසා මම රධ්‍ය අයියා බලාගෙන ඉන්න පැත්ත හැරිලා කෙලින්ම දුර බැලුවා.. බලාගෙන බලාගෙන යද්දි මම දැක්කා.. මම දැක්කා..

" ඒයි අයියෙ අර අයියා අපේ මාමා වගේ නේ පොඩ්ඩක්.."

මම අපේ මාමා වගේම, ඊට ලස්සන කොල්ලෙක් රධ්‍ය අයියට පෙන්නුවහ රධ්‍ය අයියා මං දිහා රවලා බලලා පිට මැද්දෙන් හොඳ පාරක් කෙනිත්තුවා..

" බලපන් අයියා මාමා වගේමද කියලා.."

" ඔව් අර.. ඒ අන්න එයා අපේ පැත්තට ඇවිද.. ටහික්කෙන්න යකෝ අනුකිච්චා සාගා ඇවිද්දල.."

අපේ මාමා කොණ්ඩෙ උඩට හදලා හෙන සුදුවට දිලිසි දිලිසි කළුපාට බ්ලෙසර් එකට රතුපාට වී ශේප් කර කපපු ශර්ට් එකකුත් ඇඳගෙන මනමාල හිනාවකුත් දාගෙන මගේ දිහාවට ඇවිදගෙන එද්දි මම දුවගෙන දුවගෙන දුවගෙන හයියෙන් ගිහින් මාමගෙ බෙල්ලෙ එල්ලුණා.. යකෝ මෙහෙමත් සප්‍රයිස් කරනවද.. මේ අද උදෙත් ත්‍රිකුණාමලේ ඉන්නෙ කියපු එකා එකපාරම සාගා එකෙන් මතුවෙලා ඉන්නවා දැක්කහම.. මට නිකම් තෝන්තුවට වගේ.. මාමා මගේ පිටට දෙක තුනක් තඩිබාලා මාව බිමින් තිබ්බා.. තියලා මං ගානට පහත් වුණා.. සැක් ඒ අස්සෙ කඳුලුත් එනවා.. මම හීනෙන් වගේ හිතුවා තමා අපේ ගෙදර කවුරුහරිත් සාගා ඇවිත් මම සිංදු කියනවා බලාගෙන ඉඳීවි කියලා.. ඒත්.. ඒක ඇත්තටම වෙයි කියලා මම

@Shan

තුන්හිතකින්වත් හිතුවෙ නෑ.. මට සතුටටම කම්මුල් දෙක දෙපැත්තෙ ලේ පිරිලා පිපිරෙන්න වගේ ඇවිත් ඇස් දෙකේ කඳුලුත් පිරුණා..

" මා-මෙ.."

" සුදුමහත්තයව බලන්න මාමා ආවා.."

" ම-මම හිතුවෙ-වත් නෑනෙ.."

" මගෙ පොඩ්ඩිකා තනියම තියලා මම ඉන්නවද එහෙම.. ඈ බං.."

මාමා මාව ළඟට අරගෙන කරට අතකුත් දාගෙන ඔලුව මැද්දට චොක් ගාලා කිස් එකක් දීලා ලස්සනට හදපු කොණ්ඩෙ අවුල් කල්ලා දැම්මා.. ඊටපස්සෙ මාවත් ඇදගෙන රධ්‍ය අයියා ගාවට ගියා..

" රධ්‍ය පුතත් ඉන්නෙ.."

" කොහොමද මාමෙ.."

" හොඳින් ඉන්නවා කොල්ලො.. අද ඔය දෙන්නම ප්'රෝම් කරනවා නේද.."

" ඔව් මාමෙ.."

හැයි මාමෙ තමා.. මාමව උස්සලා පොලේ ගහන්න හිතෙනවා.. ඒකත් එකටම මාව බලන්න විතරක් නෙමෙ එන ඇත්තෙ.. සාකිච්චවත් බලන්න පුලුවන් නෙ.. ඒත් දැන් සාකිච්චා මෙතෙන්ට පියඹගෙන ආවොත් සාකිච්චට කන්න වෙනවා අනුකිච්චගෙන් හොඳ පාරවල් දෙකතුනක්.. ඒකා දන්නෙ නෑනෙ රධ්‍ය අයියා ආධ්‍ය අයියගෙ මල්ලි කියල.. මාමගෙ ලස්සන බලන්න එපැයි.. මෙ සේරම ඇයි මෙහෙම ලස්සන වෙන්නෙ.. දැන් මෙ ඉන්නෙ අවුරුදු හතළිහක් වෙන මනුස්සයෙක් කියලා කියන්න බෑනෙ.. රූපෙටද දන්නෙ නෑ ආධ්‍ය අයියත් රැවටුනේ.. අහගන්න තියෙනවනම්.. අපරාදෙ.. ආදරේ කරද්දි ලස්සන වෙනවයි කියනවනෙ.. එහෙමද දන්නෙ නෑ.. රධ්‍ය අයියත් ඊයෙ මට ලස්සනයි කිව්වෙ.. මමනම් ඉතින් ඇවිල්ලා කොහොමත් හෙන ලස්සනයි මම දන්නවනෙ..

රධ්‍ය අයියයි මාමයි විස්තර කතාකරන අස්සෙ මම ටිංකර්බෙල් වගේ උන් දෙන්නගෙ මැද්දට වෙලා වට පිට බල බල ඉද්දි මම දැක්කා මදිපාඩුවත්

@Shan

සුරලොවෙන් බැහැලා මෙ පැත්තට ඇවිදගෙන එනවා.. මම රධ්‍ය අයියගෙ කකුල පෑගුවහම ඒකා මට රවලා ආයෙම මාමා එක්ක කියවන්න ගත්තා.. බැරිම තැන මම ආධ්‍ය අයියට අත වනලා අපි ඉන්නෙ මෙහෙ කියලා පෙන්නුවා.. එතකොට ආධ්‍ය අයියා එයාගෙ සුර ගමනින් අපි දිහාට පාවෙගෙන ආවා..

අනේ ඇයි මට එකගෙයි කන්නම හිතෙන්නෙ!! මේ මනුස්සයා දැක්කහම.. ආධ්‍ය අයියනම් ඇත්තටම බැහැලා තියෙන්නෙ සුරංගනා ලෝකෙන්ද කොහෙද.. ඒ තරම් නිම්ච්ච පෙනුමක් තියෙන්නෙ.. අද ග්ලාසස් දෙක දාලා ඇවිත් හිටියෙ නෑ.. ඒ වෙනුවට තදම තද නිල් පාට ලස්සන ලෙන්ස් දෙකක් දාලා, ලා නිල් පාට දණහිස ළඟටම දිග කෝට් එකක් ඇඳලා සුදුපාට ට'ට්ල් නෙක් ශර්ට් එකට සුදුපාට ට්‍රවුසර් එකක් ඇඳලා හිටියෙ .. මාරම ලස්සනයි.. එයා එච්චර ෆැශනබල් විදියට අඳින්නෙ නෑ සාමාන්යෙන්.. ඒත් හැබැයි රධ්‍ය අයියා ළඟදි කිව්වා දැන් ටිකක් අඳින විදිය ගැන හිතනවලු.. පෙනුම ගැනත් හිතනවලු.. ඇත්ත තමා ආදරෙ කරද්දි එහෙනම් මිනිස්සු ලස්සන වෙනවා තමයි..

ආධ්‍ය අයියා මට ලාවට අත වනලා මම ඉන්න පැත්තට ඇවිදගෙන ආවා.. මාමා හිටියෙ මට පිටුපාලා රධ්‍ය අයිය එක්ක කතා කර කර.. මාමා මාව සප්‍රයිස් කලා වගේ මම දැන් මාමව සප්‍රයිස් කරන්නයි යන්නෙ..

" චූටියො.. මම ඔයාලව හොයාගන්න බැරුව හිටියෙ.."

" මම ඔයා එනකල්මයි හිටියෙ අයියො.."

" එහෙ-ම්ම්-කැහ්.."

ඒ එක්කම අපේ මාමයි රධ්‍ය අයියයි මම කතාකරන්නෙ කාත් එක්කද කියලා බලන්න අපි දෙන්නා දිහා හැරුණු පාර ආධ්‍ය අයියගෙ අර ලෙන්ස් දාපු ඇස් දෙක පොල් ගෙඩි දෙකක් සයිස් ලොකු වෙලා ස්ටක් වුණා.. ඒ කියන්නෙ මොකුත්ම කරන්නෙ කියන්නෙ නැතුව අපේ මාමා දිහාබලාගෙන ගල් පිලිමයක් වුණා.. අපේ මාමත් එකපාර බයවෙලා වගේ ආධ්‍ය අයියව දැකලා අඩියක් පිටිපස්සට ගියා.. මම ශේප් එකේ ඒ දෙන්නගෙ දර්ශන පථයෙන් අයින් වෙලා රධ්‍ය අයියට ඇහැක් ගැහුවම රධය අයියා හිනාවුණා..

" අහ්ම්.. එක්ස්කියුස්මී ගයිස්..??"

@Shan

ඒ එක්කම ආධ්‍ය අයියා පටස් ගාලා බිම බලාගත්තහම මාමා මගේ දිහා බයවෙලා වගේ බැලුවා..

" ආ.. ඔව් ඔව්.."

" ආධ්‍ය අයියේ මේ ඉන්නෙ මගේ මාමා.. අනුරාග්.. එතකොට මේ රධ්‍ය අයියගෙ අයියා ආධ්‍ය.. මම හුහක් ළඟින් දන්නවා.."

" හ්-හායි මිස්ටර් අනුරාග්.. නයිස් ටු මීට් යූ.."

" නයිස් ටු මීට් යූ ටූ ආධ්‍ය.."

අපේ මාමා ආධ්‍ය අයියගෙ අත හෙන හයියෙන් අල්ලලා උඩට පහළට කලාම ආධ්‍ය අයියගෙ ඇස් වලට යටින් කම්මුල් හෙන තදට රතුපාට වුණා.. ඒ එක්කම ආධ්‍ය අයියා අත ඇදලා අරගෙන කෝට් එකේ සාක්කුවට ඔබාගත්තා..

" මාමේ ඉවෙන්ට් එක පටන්ගන්නත් කිට්ටුයි.. ඔයාලා ඇතුළට යනවද දැන්.."

" ආ.. ඔව්.. ආධ්‍ය will you join me.."

අපේ මාමා ටිකක් කේන්තියෙන් ආධ්‍ය අයියා දිහා බලාගෙන 'මූට දෙකක් දෙන්න ඇත්නම්' වගේ කටහඬින් කිව්වහම ආධ්‍ය අයියා ලාවට හිනාවුණා..

" Sure Mr. Anurag.. My pleasure.. පොඩී මම ඔයාලව හම්බෙන්නම්.."

" හරි.."

රධ්‍ය අයියා ගේට් එක පැත්ත බලලා ඈතින් එන අම්මව පෙන්නුවහම ආධ්‍ය අයියා කලබල වෙලා වගේ ඉක්මනට අපේ මාමගෙ අතිනුත් ඇදගෙන ඇතුළට ගියා.. හරි පවු මේ කපල් එකනම්.. මුළු ලෝකෙටම හොරෙන් ලව් කරනවා කියලා හෙන ගැම්මෙන් හිතාගෙන ඇත්තෙ.. එච්චා කොහෙද මං ඉන්නකල්.. මෝඩ අනුකිච්චයි මෝඩ සාකිච්චයි.. රෙස්ට් ඉන් පීස් ලස්සන ආධ්‍ය අයියෙ.. අපේ මාමා අයියට මොනා කරයිද දන්නෙ නෑ..

" වරද්.. අපි ඇතුළට යමු.."

@Shan

රධ්‍ය අයියා ඈත එන අම්මලව දැක දැකත් මාව ඇදගෙන ඇතුළට යන්න යද්දි මම එතන නැවතුනා.. එයාලගෙ අම්මා දැක්කා අනික මම ඉන්නව කියලා මෙතන.. එහෙම යන එක හරිද.. ආන්ටි හිතයි මගේ හෙන ලොකුකම කියලා.. බයේ හැංගෙන්න මම වැරද්දක් කරන්න එපැයි..

" ඉන්න ආන්ටි එක්ක කතාකල්ලම යමු.. මොකද හදිසිය.."

" වරද්.. ප්ලීස් එන්න.."

ඒ එක්කම ආන්ටි අපිව දැකලා හිනාවෙවී එන අපි ඉන්න පැත්තට ආවා.. දැන් ඉතින් කොහෙ යන්නද..

" Hi Darling.."

" ආන්ටි..!!"

රධ්‍ය අයියගෙ අම්ම ඇවිත් මට හග් එකක් දීලා කම්මුලක් අල්ලල හිමින් මිරිකුවා.. මාව රතුවෙනවා වගේ කම්මුල් වලින් අල්ලද්දි..

" It's been a long time since I saw Shaneru.. කොහොමද ඉතින්.. රධ්‍ය නම් ගෙදරදි ඔයා ගැන කියනවා.."

මම රධ්‍ය අයියා දිහා බැලුවහම එයා ලාවට හිනාවුණා..

" හොඳින් ඉන්නවා ආන්ටි.. අම්මා කිව්වා ආන්ටි කතාකලා කියලා.."

" අනේ දේදුණු.. මට කිව්වා අද එන්නෙ වෙන්නෙ නෑ කියලා මම ඇහුවම.."

" ඔහ්.."

" කමක් නෑ මම ආවනෙ.. ඔය දෙන්නම බලන්න.."

" අම්මා.. අප්පච්චි එනවා.."

ඒ එක්කම රධ්‍ය අයියගෙ අම්මා මගෙන් එහාට වුණා.. එයාගෙ මූණෙ තිබ්බ ආධ්‍ය අයියගෙ වගේ ලස්සන හිනාවත් නැතිවෙලා ගියා.. මම රධ්‍ය අයියගෙ අප්පච්චි එන දිහා බැලුවා.. මම කලින් කවමදාවත් දැකලා තිබ්බෙ නැනෙ මෙ මනුස්සයව.. ඒ බලාගන්නම තමා මමනම් පෙරුම් පුරාගෙන හිටියේ..

@Shan

මම දුර බලද්දි අපි ඉන්න පැත්තට මැදි වයසේ රධිය අයියගෙම පෙණුම තියන ඊටවඩා ටිකක් උස මූණෙ හිනාවක් කියන නාමයක් නැති පිරිමි කෙනෙක් ඇවිදගෙන එනවා මම දැක්කා.. මේ ඉන්නෙ අප්පච්චිද.. දැක්ක පළවෙනි වතාවෙන්ම මට හිතුණා මොන වගේ චරිතයක්ද කියලා.. මූණෙ හිනාවක් කියලා නාමයක් නෑ.. උස මහත ගානට මේන්ටේන් කරනවා වගේ.. ෆිට් එකට ඉන්නවා.. වට පිට බලන්නෙ නැතුව කෙලින්ම අපි ගාවට ඇවිත් ආන්ටි ගාවින් හිටගත්තහම මම රධ්‍ය අයියගෙ පිටිපස්සට වුණා.. මේ මනුස්සයා දැක්කහම බය හිතෙනවා..

" රධ්‍ය!! එළියෙ මොකද කරන්නෙ.."

" අයියා එනකල් හිටිය අප්පච්චි.."

" ඇවිල්ලද.."

" ඔව් ඇතුළට ගියා.."

අප්පච්චි රධ්‍ය අයියා දිහා බලාගෙන කතාකරන ගමන් මං දිහා රවලා බලාගෙන ඉහේ ඉදන් දෙපතුළ වෙනකල්ම දෙපාරක් තුන්පාරක් හොඳට ස්කෑන් කරනවා මම දැක්කා.. ඔහොම බලනකොට බය හිතෙනවනෙ.. මම කැමති නෑ එහෙම අපහසුතාවයක් දැනෙන විදියට බලනවට.. මට බෑල්මටම ඇඬෙන්න වගේ ආවා..

" මේ කවුද.."

රධ්‍ය අයියා පිටිපස්ස හැරිලා මගේ දිහා බලලා ආයෙම අප්පච්චි දිහා බැලුවා..

" ෂනෙරු.. මගේ පාට්නර්.."

අප්පච්චි රධ්‍ය අයියා දිහා ඇහිබමක් උස්සලා මහා මරුමුස් විදියට බැලුවහම රධ්‍ය අයියගෙ අම්මා අප්පච්චිගෙ අතින් ඇදලා යන්න කතාකලා..

" පාට්නර්..??"

" සිහින් පාට්නර් අප්පච්චි.."

" Do It Properly, When Introducing Someone රධ්‍ය!!"

@Shan

" සොරි.."

" මොකක්ද..!!"

අප්පච්චි ටිකක් සැරෙන් ඇහුවහම රධ්‍ය අයියා අප්පච්චි දිහා කෙලින් බලාගෙන ආයෙම හයියෙන් සොරි කියලා කිව්වා..

" සොරි අප්පච්චි.."

"

**idiot**

.. ඇතුළට යනවා!!"

" අපි යමු ප්ලීස්.."

අප්පච්චි අමුතු විදියට මං දිහා බලාගෙන ඉද්දි ආන්ටි ආයෙම කතාකලා..

මම හිතලම ලාවට එයා එක්ක හිනාවුණාම එයා මං දිහා එක හිනාවකින්වත් බලන්නෙ නැතුව මේන් ඩෝ එක දිහාවට ඇවිදගෙන යන්න පටන් ගත්තා.. රධ්‍ය අයියගෙ අම්මත් හෙන අසරණ වෙලා වගේ රධ්‍ය අයියා දිහා බලාගෙන ඉදලා මාත් එක්ක හිනාවෙලා ඒ පස්සෙන් ගියා.. රධ්‍ය අයියා මගේ අතින් අල්ලගත්තා.. අනේ මට බය හිතෙනවනෙ.. මට ගෙදර යන්න ඕන වගේ.. අපරාදෙ මම ඉවෙන්ට් එක කරන්න බාරගත්තෙ.. මට තිබ්බා කලින්ම ගයනිකා මැඩම්ට කියලා අයින් වෙන්න..

මගේ ඇස් අග කඳුලු පිරීගෙන පිරීගෙන එද්දි මම ඉක්මනින් ඇස් දෙක පිහාගත්තා.. මොන මගුලක්ද ඕන එකටයි එපා එකටයි හැම හු#තකටම ඇඩෙන්නෙ.. ගෑනියෙක්ට වගේ..

" වරද්.. ඇතුළට යමු.."

" ම්ම්.."

රධ්‍ය අයියා ඩ්‍රෙසින් රූම්ස් තියන පැත්තට යන ස්ටෙයාර්ස් නැගගෙන උඩට යද්දි මම එයාගෙ පස්සෙන් හිමි හිමින් ඇවිදගෙන ආවා.. නෙළුම්පොකුණ ඉස්කෝලෙ පාටින් එළියයි.. හැමතැනම මිනිස්සු එහෙට දුවනවා මෙහෙට

@Shan

දුවනවා.. මට ඒ හැමෝ අස්සෙන්ම දුවගෙන ගෙදර හරි මාමා ගාවට හරි යන්න හිතෙනවා.. එකපාරම තනිවෙලා වගේ දැනෙන්න ගන්නවා..

මම ඩ්‍රෙසින් රූම් එක ඇතුලටයද්දි ඒකෙ මේකප් ආටිස්ට්ලා කීපදෙනෙක් විතරයි ඉන්නෙ.. විනාඩි පහකින් ඉවෙන්ට් එක පටන්ගන්නවා කියලා එනවුන්ස්මන්ට් එකක් ගියා.. මම ඇතුළට ගිහින් කවුරුත් නැති තැනකින් වාඩිවෙලා එයාපොඩ්ස් දෙක එළියට අරගෙන ඒක කනේ ගහගෙන සිංදුවක් දාගෙන වොලියුම් එක සීයටම වැඩි කරගත්තා.. රධ්‍ය අයියා පේන්න හිටියෙත් නෑ..

රධ්‍ය අයියා කිව්ව වෙලේ ඇතුළට යන්න තිබ්බෙ.. මමත් හිටියනෙ ආන්ටිව හම්බෙන්න ඕන කියලා.. දැන් නම් මට හොදටම තේරෙනවා ආධ්‍ය අයියා අප්පච්චිට බනින්න හේතුව.. මාර මනුස්සයෙක්නෙ.. අපේ මාමත් ඉන්නෙ ආමි එකේ තමා ඔහොම කෑගහන්නෙ නෑනෙ කවදාවත් ගෙදර අයට.. ආන්ටි පව් එයා අන්තිම වෙලේ බලාගෙන ඉඳපු විදියට මට හුගක් දුක හිතුණා.. මම ඕවා කල්පනා කර කර ඉද්දි රධ්‍ය අයියා ඇවිත් මගේ එහාපැත්තෙන් ඉඳගත්තා.. එයා හිටියෙත් හවස හිටියා වගේ සතුටින් නෙමෙයි.. මම එයාපොඩ් දෙක ගලවලා පැත්තකින් තිබ්බා..

" සොරි වරද්.. ඔයාගෙ හිත රිදුණා නේද.."

" කාගෙද.. මේ මගේ.."

"....."

" මම එහෙම රිද්දගන්නවද අනේ.. ඔයාට විකාරද.. මොකෝ අප්පච්චි මට බැන්නයැ.."

" Don't pretend වරද්.."

" හරි හරි.. මෙහෙමයි.."

" ම්ම.."

" මගේ හිත රිදුණෙ අප්පච්චි ඔයාට කෑගැහුව නිසා.. මට පොඩ්ඩක් බය හිතුණා.. මම මනින්නෙ අපේ මාමගෙ මිම්මෙන් නෙ.. එයානෙ මගේ තාත්තා වගේ ඉන්නෙ.. ඒකනිසා.. පොඩ්ඩක් ඉතින් බය වුණා.."

@Shan

"....."

" කෝ අනේ කතාකරන්නකො.."

" කියන්න.."

" මේ ඔයා මූණ පැණිවලල්ලක් කරන් ඉන්න එපා.. ඔහොම බැනෙ සිංදු කියන්න.."

"....."

" මම ඔයාට උම්මා එකක් දෙන්නම් අප්පච්චිව හම්බුණා කියලා අමතක කරන්න ඕන හාද.."

"....."

" මේ එන්නකො ඔයාට බඩ්ඩක් කියන්න.."

මම පුටුවෙන් නැගිටලා රධ්‍ය අයියගෙ අතකින් ඇද්දා..

" මට ටිකක් පාඩුවෙ ඉන්න දෙන්න වරද්.."

" පාඩුවෙ ඉන්නනම් මොකටද මාත් එක්ක යාළුවුණේ.. එච්චා හරියන්නෙ නෑ පාඩුවෙ ඉඳපු කාලෙ ආයෙ එන්නෙ නෑ..එන්නකො එන්නකො.."

" කොහෙද.."

" බඩ්ඩක් කියන්න අරහෙට.."

මම ඇඟේ තියන සේරම හයිය අරගෙන රධ්‍ය අයියව ඇදගෙන ගිහින් කවුරුත් ඉන්නවද කියලා වටපිට බලලා අපේ ඇඳුම් එල්ලලා තිබ්බ චේන්ජින් ස්ටෝල් එක අතුලට ගිහින් ඒකෙ දොර වහලා ඇතුළින් ලොක් කලා.. රධ්‍ය අයියා බයවෙලා වගේ මගේ දිහා බලාගෙන හිටියා.. මම එයාව පිටිපස්සෙ තිබ්බ පුටුවෙන් බලෙන්ම ඉන්දලා එයාගෙ උකුල උඩින් කකුල් දෙක දෙපැත්තට දාලා ඉඳගෙන් කර වටේ අත් දෙක ඔතාගත්තා..

" වරද්..??"

@Shan

" ඇයි..?? ඔයා අවුලින් ඉන්න ඕන නෑනෙ.. ඔයා වැරැද්දක් කලේ නෑනෙ.."

" ම්ම්.."

" දැන් ඒක අමතක කල්ලා දාන්න.. ඔහොම මූණ එල්ලගෙන ඉද්දි දෙන්න හිතෙනවා පුප පුපුරන්න දෙකක්.. මගුල.."

රධ්‍ය අයියා මං දිහා පොඩ්ඩක් වෙලා බලාගෙන ඉඳලා ලාවට හිනාවුණා..

" උබටනම් පිස්සු බං.."

ඊටපස්සෙ එයා මාව උස්සලා උඩට කල්ලා ඉන්දුවගෙන තොල් වලින් පෙක් එකක් තිබ්බා..

" මටද.. ඒකට කමක් නෑ.. ඔයාට පිස්සු නෑනෙ.. නේද.."

" ම්ම්.."

" මම අර ජීජී හැඩ්ඩගෙ සැවේජ් කැට්වෝක් එකෙන් අප්පච්චිගාවට ගිහින් මෙහෙම කොණ්ඩෙ ගස්සලා කියලා එන්නද 'ඇම් අ ම'ෆකින් ස්ටාර්බෝයි' කියලා.."

රධ්‍ය අයියා ඊටපස්සෙ හෙන හයියෙන් හිනාවුණා..

" කියලා එන්න.."

" හිනාවෙලා ඉන්නවකො මූණ නිකම් කැඩිච්ච ක්‍රීම් ක්‍රැකර් එකක් කරන් ඉන්නෙ නැතුව.. මම ඉතින් ක්‍රීම් ක්‍රැකර් එකට ආදරෙයිනෙ.."

" ක්‍රීම් ක්‍රැකර්..??"

" ඔ ක්‍රීම් ක්‍රැකර් දෙකක් අරගෙන ඒකෙ මැද්දෙන් හැපිකව චීස් කෑල්ලක් තියලා කනවා.. මේ ඒක සිරාවටම රහයි හරිද.. ඔයා මාමයිට කනවනෙ.. ඒවත් පොඩ්ඩක් දාලා කන්න.."

" ම්ම්.."

මම රධ්‍ය අයියගෙ නළලට නළල හේත්තු කරගත්තා..

@Shan

" I still love you even when there are a thousand reasons to stop everything with you Varadh.."

" I don't care if there are a million or a thousand reasons.. I won't let you stay away from me.. When you find it hard to hold on, tell me and I will hold on.."

රධ්‍ය අයියා මාව තව තද කල්ලා බදාගෙන මගේ ඇස් දෙක දිහාම ඇස්පිය ගහන්නෙවත් නැතුව බලාගෙන හිටියා.. මම කකුල් දෙකත් දෙපැත්තට වන වන වඳුරුපැටියා වගේ රධ්‍ය අයියගෙ උකුළ උඩ ඉඳගෙන හිටියා..

" ඉවෙන්ට් එකත් පටනරගෙන.. අපි යමුද කියාන් අයියලා ඉන්න පැත්තට.. ගිහින් අර කපල් එක කොහෙද හොයාගමුද.."

" ම්ම්.. යමු.."

මම රධ්‍ය අයියගෙ කම්මුල් දෙක කට උල් වෙන්න දෙපැත්තෙ අල්ලලා පෙක් එකක් තියලා උකුලෙන් නැගිටලා ගිහින් දොර ඇරලා බෙල්ල දෙපැත්තට දික් කල්ලා කවුරුත් ඉන්නවද කියලා බලලා එළියට පැනගත්තා.. ටිකකින් රධ්‍ය අයියත් ස්ටෝල් එක ඇතුළින් එළියට ආවා..

කියාන් අයියලා ඉඳගෙන හිටියේ බැල්කනි එකක.. මොකක් වුණත් මුන් ටික කොහෙ ගියත් හොඳම තැන අල්ලගන්න නම් දන්නවා.. එදත් බිග් මැච් ගිහින් වෙනම තැනකනෙ හිටියෙ.. අයානයා ආවද දන්නෙ නෑ අද.. කොතලහිබුට්ටා.. මමයි රධ්‍ය අයියයි ශේප් එකේ ගිහින් අපි දෙන්නට තියලා තිබ්බ සීට්ස් වලින් ඉඳගත්තා.. හෝල් එක පිරෙන්නම කට්ටිය ඇවිල්ලා.. සෙනුකයා ඔකෙස්ට්‍රා එක මැද්දෙ තිබ්බ පොඩි ස්ටේජ් එකේ මහපගයා වගේ හිටගෙන අර ස්ටික් එක එහෙටයි මෙහෙටයි වනනවා.. අයුක අයියා වශී වෙලා වගේ සෙනුකයගෙ පස්ස දිහා බලාගෙන ඉන්නවා.. සෙනුකට පහළින් ඔකෙස්ට්‍රා එකේ සර් එහෙට මෙහෙට ඇවිත් ඇවිද කන්ඩක්ට් කරන්න හෙල්ප් කරනවා..

" මේ වරද්.. අර කොනේම සීට්ස් දෙක පේනවද.."

" කෝ කොහේද.."

" ඔය කොහෙද බං බලන්නෙ.. අර අරහෙ.."

@Shan

රඩ්‍ය අයියා මගේ ඔලුව හරි පැත්තට අල්ලලා හැරෙව්වහම මම බෙල්ල දික් කල්ලා පාට පාට ලයිට්ස් මැද්දෙන් කොනේම සීට් දෙකේ ඉඳගෙන ඉන්නෙ කවුද කියලා අඳුනගන්න ට්‍රයි කලා.. ඔය ඉන්නෙ ලා නිල්පාට කෝට් එක.. හොඳ වෙලාවට ආඩ්‍ය අයියා අපිට අඳුනගන්න ලේසි පාටක් ඇඳන් ආවෙ.. දෙන්නත් එක්ක මුල්ලක් අල්ලන් හොඳට කියවනවද කොහෙද.. නෑ.. එක්කො අපේ මාම බනිනවද දන්නෙ නෑ.. ආඩ්‍ය අයියගෙ මූණ බලන් බනින්න පුළුවන්ද ඒත් මං අහන්නෙ.. බැනෙ.. වෙළසුමනයා තාන්වී අක්කා එක්ක ආවද දන්නෙත් නෑ සාගා බලන්න.. හෙන ටෝකක් දුන්නනෙ එනවා ග්‍රේට් ඕල්ඩ් බෝයි කෙනෙක් කියලා.. ඔය කිව්වට එන්නෙ නැතුවත් ඇති.. මොකෝ මම සර්ගෙ පුතායැ ඔච්චර උවමනාවෙන් එන්න.. සමයංනෙ මමත් හිතන්නෙ..

සාගා එකට හෙන ආටිස්ට්ලා තොගේකට ඉන්වයිට් කල්ලා තිබ්බා.. කාංචනා අනුරාධි අක්කා දිග කොණ්ඩෙ පද්ද පද්ද ආලේ මල් කියන දිහා බලාගෙන මම කල්පනා කලේ මම දවසක රඩ්‍ය අයියගෙ අප්පච්චිගෙ මූණටම ගිහින් කියලා රඩ්‍ය අයියව පන්නගෙන අපේ ගෙදර ගෙනත් හිරකරගෙන මම එයාව බලෙන්කසාද බැඳගන්න හැටි.. එහෙම හොඳයිනෙ.. ඊටපස්සෙ ෆුට්බෝල් ටීම් එකක්වගේ ළමයි හදාගන්නවා.. එතකොට රඩ්‍ය අයියට මාව දාලා යන්න බැනෙ.. ඕන හිතක් දරුවො ඉස්සරහා උණු වෙනවනෙ.. මම රඩ්‍ය අයියගෙ පිටට තට්ටුවක් දැම්මා.. හැමදේම ඉක්මනට හරියාවි..

නැත්නම් අප්පච්චිව දාලා රපුන්සල් බී එල් එක ගහනවා මම.. අප්පච්චි, දිග කළුපාට කොණ්ඩයක් තියන හැඩකාර රඩ්‍ය අයියව හිරකරගෙන ඉන්නවා එක්ටැම්ගේක.. මම තමා එයාගෙ අතයි, අර ලොකු පස්සයි පතාගෙන එන කුමාරයා.. රඩ්‍ය අයියා කොණ්ඩෙ පහළට දැම්මම මම උඩට නැගගෙන යද්දිම අප්පච්චි මාව බිමට තල්ලු කල්ලා දාන්න හදනවා.. ඊටපස්සෙ එක්ටැම්ගේ රකින කියාන් මකරා මාව එයාගෙ පිටේ තියාගෙන එක්කන් යනවා.. ආයෙම මම ඇවිත් රඩ්‍ය අයියව පන්නගෙන දුර ඈත මාළිගාවක තියාගෙන පරිස්සමට බලාගන්නවා.. ගැම්මක් තමා.. මම ආයෙම හැමදේම හරියයි කියන්න රඩ්‍ය අයියගෙ පිටට තට්ටුවක් දැම්මා..

" මොකද බං තට්ටු දාන්නෙ.."

" හැමදේම ඉක්මනට හරියාවි ඒයි.."

@Shan

" මොනවද.."

" මම මකරා පිටේ ඇවිත් ඔයාව පන්නගෙන යනවා.."

" මොකක්..??"

" අ-ආ!! නෑ නෑ මොකුත් නෑ.. මම නිකම් කිව්වෙ.."

සැක් හිතන ඒවා කටිනුත් කියවෙනවා.. කාංචනා අක්කා හැඩ කෙල්ල මොකක් වුණත්.. මම දැක්කා ආශි කාංචනා අක්කව ගිලින්න වගේ ඒ දිහා බලාගෙන ඉන්නවා.. ඊටපස්සෙ කියාන් අයියට මොනවහරි කියනවා..

" මේ මල්ලෙ.."

" ඕ.."

" අද වහී නේන.."

" ඒ මොකද ඒ.."

" ඇයි දිනේස් සෙංකඩගල කිව්වනෙ.."

" අප්පටසිරි ඔව හැබැයි.. වහීනම් තමා.."

" අද ප'ෆෝම් කරන්න ඉන්න බෝයිස්ලා දෙන්නා කවුද.."

" ආ වෙයිට්.. ෂනෙරූ මේ ඔයාලට කතාකරනවා.."

ආශි පිටපස්ස හැරිලා අපිට කතාකලා..

" මල්ලිලා රෙඩි වෙන්න යන්න.."

" කේ.."

රඩ්‍ය අයියා අනිත් අයට ඩිස්ටර්බ් වෙන්නෙ නැතිව්දියට නැගිටලා මගේ අතිනුත් ඇදගෙන ආයෙම ඩ්‍රෙසින් රූම් එකට යන්න ගියා.. අපිට ඉවෙන්ට් එක තියන්න පැයක් තියෙනවා.. රඩ්‍ය අයියා මේකප් එකට එහාපැත්තෙ රූම් එකට එකට ගිය නිසා මම මගේ කළුපාට ෆිටඩ් ට්‍රවුසර් එකයි වෙස්ට්

@Shan

එකයි ඇඳගෙන මේකප් ආටිස්ට් ගාව තිබ්බ පුටුවෙන් ඉඳගත්තම ඒ අයියා මගේ බෙල්ල වටේ සුදුපාට රෙද්දක් දාලා කොන්ඩෙ පුරාම පාට පාට ක්ලිප් ගොඩක් ගහලා නළලට වැටිලා තිබ්බ සේරම කොණ්ඩෙ උඩට ඉස්සුවා..

" මල්ලි ලෙන්ස් දෙක අයින් කරනවද.."

මම ඇස් දෙක කරකලා ඌ දිහා බැලුවා.. මම කවද්ද ලෙන්ස් දැම්මෙ..

" ලෙන්ස්..??"

" මල්ලි ලෙන්ස් දාලා නේද ඉන්නෙ.."

" නෑ නෑ මේක මගේ නැචුරල් කලර් එක.."

මම හිනාවෙලා කිව්වහම ඒ අයියා මගේ ඇස් දෙකට එබුණා..

" ඔහ් සොරි සොරි.. මම හිතුවෙ.."

" ඒකට කමක් නෑ.."

ඒ අයියා පැය බාගයක් විතර මාව එහෙට මෙහෙට හරව හරව මේකප් කලා.. අඩුම තරමෙ මටවත් මාව හරියට අඳුනගන්න බැරිවෙන විදියට.. ඇස්වල මැස්කේරා අඩලා පහලට වැක්කෙරෙනවා වගේ ඇඳලා ඇස් අගින් ස්පාර්ක් වෙන ස්ටෝන්ස් තුනක් රතුපාටින් ඇලෙව්වා.. කොණ්ඩෙ අවුල් වෙන්න අවුස්සලා උඩට කල්ලා හදලා ඇස් වලට වැටෙන්න කැලි දෙකක් පහළට කල්ලා මූස් කලා.. ඊටපස්සෙ රෝස පාට පේන්නෙ නැති ගානට වගේ බ්ලශ් එකක් අරගෙන පොඩ්ඩක් ටච් කල්ලා තොල් වල නැචුරල් කලර් එකට ගැලපෙන්න ලිප්ස්ටික් එකක් ගෑවා.. මම කලින් මේ මගුල් ගාලත් නෑ.. අම්මගෙ වැස්ලින් ලිප් බාම් එක අරගෙන හොරෙන් ගෑවට..

ඊටපස්සෙ මම පුටුවෙන් නැගිටලා මුලින්ම අර ලෝන්ග් ස්ලීව්ඩ් රතුපාට සිල්ක් ඇඳුම ඇඳලා කළුපාට ස්කාෆ් එකක් බෙල්ලෙ බැඳගෙන ඊට උඩින් සුදුපාට ස්ලීව් දෙකක් ෆික්ස් කරපු වෙස්ට්කෝට් එක ඇන්දහම අර අයියා මට සපත්තුදෙක දාලා දුන්නා.. කලිසම ෆිට් නිසා නැමෙන්න බෑ.. මට හිතෙනම මේක ඉරිලා යයි කියලමයි.. ඇඳුම් දෙක තුනක් ඇඳලා දාඩිය නිසා මම ඒසී එක කෙලින් ඉඳගෙන සිංදුව ප්‍රැක්ටිස් කර කර හිටියේ.. ටිකක්

@Shan

වෙලාවකින් රධ්‍ය අයියා සම්පූර්නෙන්ම ඇඳලා ඉවරවෙලා එහා කාමරේ ඉඳන් මං ඉන්න පැත්තට ඇවිදගෙන ආවා.. ඒ එක්කම,

මගේ හුස්ම හිරවෙලා මම මැරිලා යන්න ගියා..

රධ්‍ය අයියා මගේ දිහා බලාගෙන ඇවිත් මං ගාවින් ඉඳලගෙන මූණට එබුනා.. මම ඇස්පිල්ලම් දෙකක් ගහලා මූණ එහාට ගත්තා.. රධ්‍ය අයියා ලෙදර් ජැකට් එකක් දාලා ඊට යටින් වී නෙක් ස්ලීව්ලස් ශර්ට් එකක් ඇඳලා හිටියේ.. මූණ ඇහැ ගාවින් කතිරයක් වගේ හිටින්න පැච් එකක් හදලා කොණ්ඩෙ එකමපැත්තකට වැටෙන්න හදලා ජෙල් කල්ලා තිබ්බා.. හෙනම හොට්.. හොට් කියන්නෙ.. මට විස්තර කරන්න තේරෙන්නෑ.. මැස්කේරා ගාලා හදපු දිග ඇහිපිහාටු නිසා එයා මාරම සෙක්සි කැරැක්ටර් එකක් වෙලා පෙනුනේ.. මට රධ්‍ය අයියව අල්ලලා සාක්කුවෙ දාගෙන ගෙදර ගෙනිහින් හංගන් ඉන්න හිතුණා.. මම රධ්‍ය අයියා දිහා කන්න වගේ බලාගෙන ඉද්දි එකපාරටම ඇස් දෙක කන වෙලා යන්න ෆ්ලෑශ්ලයිට් එකක් වැදිලා මාව ගැස්සිලා හරි සිහියට ආවා..

" මොකද අනේ.."

" මෙහෙ බලන්නකො පොඩ්ඩක්.."

රධ්‍ය අයියා එකදිගට ෆොටෝ හය හතක්ම ක්ලික් කරගෙන ගිහින් ෆෝන් එක බෑග් එකට දාලා වැහුවා..

" අපි ඇවිත් සෙල්ෆි එකක් ගමු.. හාද.."

" ම්ම්.."

" ඔයා ප්‍රැක්ටිස් වුණාද.."

" ඔව්.. වරද් මෙ ප්ලාස්ටර් එක ගහන්නකො.."

රධ්‍ය අයියා ඩෙටෝල් ප්ලාස්ටර් තුනක් අරගෙන මගේ උකුලට දැම්මා.. මම එයාගෙ ගිටාර් ස්ට්‍රින්ග්ස් වලට තුවාල වෙච්ච ඇඟිලි වලට අලුතින් ප්ලාස්ටර් අලවලා කොල ටික ගුලි කල්ලා ඩස්ට්බින් එකට දැම්මා..

" හුහක් රිදෙනවද.. අපරාදෙනෙ ගිටාර්පික් එකක් ගන්න තිබ්බෙ.."

@Shan

" අවුලක් නෑ.. "

" රධ්‍ය.. පුතාලා.. ඔයාලා රෙඩිද.."

ගයනිකා මැඩම් බැරු බැරුව පඩිපෙළත් නැගගෙන අපි ඉඳගෙන හිටපු තැනට ඇවිත් ඉඳගත්තහම අපි නැගිට්ටා..

" ඔව් මැඩම්.."

" හැමදේම මතකයිනෙ නේද.. හුඟක් ටෙන්ශන් වෙන්න එපා.. ඔයාලා දෙන්නා විතරක් ස්ටේජ් එකේ ඉන්නවා කියලා හිතන්න.. ටේක් ඉට් ඊසි.. අයි බිලීව් ඉන් යූ ටූ.."

" තැන්ක් යූ මැඩම්.."

මැඩම් අපි දෙන්නගෙ පිටට තට්ටුවක් දාලා බැක්ස්ටේජ් එකට යන්න කිව්වා.. රධ්‍ය අයියා මගේ අතකින් අල්ලලා තද කල්ලා අතෑරියා.. හරියට කලබල වෙන්න එපා කියන්න වගේ.. කියලා එයා ස්ටේජ් එකට පහළින් තියන හෝල්වේ එකෙන් එහාපැත්තට ගියා.. මම පපුවට දෙතුන්පාරක් ගහගෙන මාවම සන්සුන් කරගන්න ට්‍රයි කලා.. කොච්චර ස්ටේජස් වල ඉඳලා තිබ්බත් හිතට බය හිතෙනවනෙ.. මම කර්ටන් එක මෑත් කල්ලා ස්ටේජ් එක පැත්ත බැලුවා.. කර්ටන් එක ක්ලෝස් කරන්න හදන්නෙ..

මම මයික් එක හරියට කනේ රඳවගෙන කර්ටන් එක වැහුණට පස්සෙ ස්ටේජ් එක මැද්දෙන් ඉස්සරහම කර්ටන් දෙක අතරට ගියා.. සෙනුක ඒ බ්‍රේක් එකේදි මං ගාවට දුවගෙන ඇවිල්ලා පිටට තට්ටු කල්ලා පපුවට පාරක් ගැහුවා..

" හරියට කරහන්.. අවුලක් නෑ හරිද.."

සෙනුකයා ආයෙම වතුර ටිකක් බීලා ඒකා ඉන්න තැනට ගියා.. ස්ටේජ් එක පුරාවටම ඒ විනාඩි දෙක තුනට කැන්ඩල්ස් තියපු ස්ටෑන්ඩ් තියලා ඩෙකරේට් කලා.. මැද්දෙ ස්ටූල් එකක් උසට තියලා ඒකට ගිටාර් එකක් හේත්තු කල්ලා තියෙනවා.. මම හෙන ලොකු හුස්මක් අරගෙන හිමින් හිමින් ඒක පහලට පහලට දැම්මා..

" 1.. 2.. 3.. 4.."

@Shan

කර්ටන් එක ඕපන් වුණා.. මට මම ඉඳපු තැනට මුලු ඕඩියන්ස් එකම පේනවා.. හැමෝම බලාගෙන ඉන්නවා.. මම මගේ මයික් එක ඔන් කරගත්තා.. බැක්ග්‍රවුන්ඩ් එකෙන් ඇහෙන නැහෙන මියුසික් එකක් යද්දි මම ගානට නවපු සර්වියට් එක අතේ දාගෙන හැමදේම එපාවෙලා ගියපු වේටර් කෙනෙක් වගේ ස්ටේජ් එක මැද්දට ඇවිදගෙන එද්දි මගේ ෆුට්ස්ටෙප්ස් වලට මැච් වෙන සවුන්ඩ් ඉෆෙක්ට් එකක් බැක්ග්‍රවුන්ඩ් එකෙන් ප්ලේ වුණා.. රධ්‍ය අයියා විසිල් කරගෙන මගේ දිහාට ඇවිදගෙන ආවා.. එයාගෙ මූනෙන් පෙණුනේ හරිම සැහැල්ලු කොල්ලෙක්ගෙ පෙනුමක්.. මාරම ලස්සනයි.. එහෙම ඇවිත් මගේ ඇඟේ ලාවට හැප්පුණා.. මගේ අතින් ලේන්සුව බිමට වැටුණා.. මම ටිකක් දුර ගිහින් ස්පොට් ලයිට් එක ගාව නතරවෙලා එයා දිහා හැරිලා බලද්දි එයා නැමිලා ලේන්සුව ඇහිඳ ගත්තා..

" No veo la hora de verte otra vez.."

" ¿Te gustaría salir conmigo?.."

ඒ එක්කම ඕඩියන්ස් එකේ ස්ටේජ් එකේ ලයිට්ස් ඕෆ් වුණා.. මම දුවගෙන ගිහින් උඩ ඇඳුම ගලවලා විසික් කල්ලා ස්කාෆ් එක හදාගෙන ශර්ට් එක උඩට ඇදලා ඒකෙ පැත්තක් විතරක් කලිසමට යටවෙන්න හදාගත්තා.. හරියටම විනාඩියක් මියුසික් බ්‍රේක් එක ප්ලේ වුණා.. කනේ රඳවලා තිබ්බ මයික් එක ගලවලා අනිත් මයික් එක අතට අරගෙන ඒක ඔන් කරගත්තා..

" I love it when you call me señorita

I wish I could pretend I didn't need ya

But every touch is ooh, la-la-la

It's true, la-la-la

Ooh, I should be running

Ooh, you keep me coming for ya.."

මම ස්ටේජ් එක මැද්දට ස්පොට් ලයිට් එක දිගේ ඇවිදගෙන යද්දි රධ්‍ය අයියගෙ කෑල්ල එනකොට එයා ඉඳගෙන ඉඳපු ස්ටූල් එකේ ස්පොට් ලයිට් එකේ බ්‍රයිට්නස් වැඩිවුණා..

@Shan

" Land in Miami

The air was hot from summer rain

Sweat dripping off me

Before I even knew her name, la-la-la

It felt like ooh, la-la-la

Yeah, no

Sapphire moonlight

We danced for hours in the sand

Tequila sunrise

Her body fit right in my hands, la-la-la

It felt like ooh, la-la-la, yeah.."

මම එයාගෙ කෑල්ල පටන්ගත්තහම මයික් එක එතන තිබ්බ ස්ටෑන්ඩ් එකේ රඳවලා ඒක අත් දෙකින්ම අල්ලගත්තා..

" I love it when you call me señorita

I wish I could pretend I didn't need ya

But every touch is ooh, la-la-la

It's true, la-la-la

Ooh, I should be running

Ooh, you know I love it when you call me señorita

I wish it wasn't so damn hard to leave ya

@Shan

But every touch is ooh, la-la-la

It's true, la-la-la

Ooh, I should be running

Ooh, you keep me coming for ya.."

රධ්‍ය අයියා මම සින්ග් කරද්දි ගිටාර් එක ප්ලේ කරන ගමන් වෙලාවකට මං දිහා බලලා හිනාවෙනවා.. එතකොට මට ඉබේම හිනායනවා.. ඊළඟ කොටසෙදි මම මයික් එක ස්ටැන්ඩ් එකෙන් ගලවලා අතට ගත්තා..

" Locked in the hotel

There's just some things that never change

You say we're just friends

But friends don't know the way you taste, la-la-la

'Cause you know it's been a long time coming

Don't you let me fall, oh.."

මම රධ්‍ය අයියගෙ උරහිස අල්ලගෙන එයාගෙ වටෙන් ඇවිදගෙන ගිහින් එයාගෙ පිටට හේත්තු වුණා..

" Ooh, when your lips undress me

Hooked on your tongue

Ooh, love, your kiss is deadly

Don't stop..

I love it when you call me señorita

I wish I could pretend I didn't need ya

@Shan

But every touch is ooh, la-la-la

It's true, la-la-la

Ooh, I should be running

Ooh, you know I love it when you call me señorita

I wish it wasn't so damn hard to leave ya

But every touch is ooh, la-la-la

It's true, la-la-la    (true, la-la)

Ooh, I should be running

Ooh, you keep me coming for ya.."

රධ්‍ය අයියා ගිටාර් එක පැත්තකින් තියලා මයික් එක ගලවලා අතට අරගෙන මගේ පැත්ත හැරුණා.. මමත් හිටියේ එයාගෙ පැත්ත හැරිලා.. එයාගෙ පපුව දිගේ දාඩිය බේරෙනවා.. ලයිට්ස් වලට දිලිසෙනවා..

" All along I've been coming for ya    (for ya)

And I hope it meant something to ya   (ooh)

Call my name, I'll be coming for ya

Coming for ya, coming for ya, coming for ya.."

" For ya

For ya    (oh,

**he**

loves it when I call)

For ya.."

@Shan

අන්තිම කැල්ලෙදි එයාට තිබ්බෙ මගේ බෙල්ලෙ තිබ්බ කළුපාට ස්කාෆ් එක ගලවලා ගන්න..

" Ooh, I should be running

Ooh, you keep me coming for ya.."

එයා මගේ ස්කාෆ් එක ගලවලා අතට අරගෙන සිංදුවේ එන්ඩ් එකට ආවහම මුලු ඕඩියන්ස් එකම මාරම හයියෙන් චියර් කරන්න පටන්ගත්තා.. මාරම හයියෙන්.. ඉස්සරහා ඉඳගෙන ඉඳපු ප්‍රින්සිපල් සර් අත දෙක උස්සලා ක්ලැප් කරනවා මම දැක්කා.. අපි දෙන්නා අත් දෙක අල්ලගෙන ඔලුව නමලා හැමෝටම බොව් කල්ලා ස්ටේජ් කර්ටන් එක ක්ලෝස් වුණාට පස්සෙ බැක්ස්ටේජ් එකට ගියා.. සෙනුකයා මට තම්බ්සප් එකක් දීලා කට උල් කල්ලා කිස් එකක් දුන්නා.. අපි බැක්ස්ටේජ් ගියා විතරයි ඊස්ටර්න් මියුසික් සර් අපි දෙන්නව බදාගෙන හෙන වර්ණනා ගොඩක් කිව්වා.. කොහොමහරි හැමෝම අපි දෙන්නගෙ අයිකනික් ප'ෆෝම් එකෙන් පස්සෙ ඇවිත් අපිට විශ් කලා.. මොකද ඉස්කෝලෙන්ම තියෙන්නෙ සිහින් ඉවෙන්ට් පොඩ්ඩයිනෙ.. අනිත් ඔක්කොම කරන්නෙ ඉන්වයිටඩ් ආටිස්ට්ලා..

ඉතින් කොහොමහරි ඒක හරියට කරපු නිසා හිතට මාරම සතුටුයි.. ලොකු බරක් නිදහස්වුණා වගේ හිතේ තිබ්බ.. මම අර සිල්ක් ශර්ට් එකට දාඩිය නිසා උඩ බට්න් දෙකක් ඇරගෙන කොලේකින් පවන් ගහගත්තා..

" You did it well Varadh.."

" You too.. you are really cool.. ඒක ස්ටේජ් එක නොවුණනම් මම ඔයාව බදාගෙන උම්මා එකක් දෙනවා ඒයි.."

ඒ එක්කම වෙස්ට් කෝට් එකත් ගලවලා අතේ දාගෙන අපි දිහාවට දුවගෙන ආවේ සෙනුකයා.. ඌ දුවගෙන දුවගෙන ඇවිත් මගෙයි රධ්‍ය අයියගෙයි ඇඟට පැන්නා..

" අඩෝ ෂනෙරුවා..!!ඒකනම් සිරාවට පට්ට ඔයි.. ජස්ට් වාව.."

" අම්මෝ උඹ බරයි යකෝ.."

@Shan

මම සෙනුකයව අල්ලලා බිමින් තිබ්බා..

" මගේ අත් දෙකත් කකියනවා බං.."

" අතගාන්නද.."

" හා.."

සෙනුකයා මං ගාව තිබ්බ ස්ටූල් එකෙන් ඉඳගත්තා.. ඒ එක්කම අපි ඉඳගෙන හිටපු රූම් එකේ දොර ඇරුණා.. මම හිතුවේ ගයනිකා මැඩම් වෙන්න ඇති කියලා.. ඒත් අපි ඉඳගෙන හිටපු දිහාට බර අඩි තිය තිය වේගෙන ඇවිදගෙන ආවෙ,

" අප්පච්චි.."

" තමුන්ගෙ අයියට මේ දැන්ම මෙතෙන්ට එන්න කියනවා.. යනවා..!!"

" ඒත්-"

" රධ්‍ය!!!"



සමාවෙන්න ළමයිනේ.. මට ඊයෙ කතාව දෙන්න බැරිවුණානෙ  හවස කාස් ගිහින් ගෙදර එද්දි පරක්කු වුණා.. ඊටපස්සෙ කතාව ලිය ලිය ඉද්දි නින්ද ගියා.. ඉම්හි ඉම්හි..

ආධ්‍ය පුතා ලෙප්ට් ද වැටි..

වචන හයදාහක් ලිව්වා දළඹුහටයිනි.. මෙ ඇත්තිට කමෙන්ටුවක් දාගෙන යමන..

එන්නාම්.. ලව් යූ..    ❤

ආ තව බඩඩක් තියෙනවා කියන්න.. මෙ ස්ටෝරි එක නොන්ෆික් විදියට කියවන මගේ ආදරණීය දළඹු කොල්ලෙක් මට එයා ඉමැජින් කරගෙන ඉන්න විදියේ ෆොටෝස් ටිකක් එව්වා.. කීපදෙනෙක්ගෙ විතරයි හරිත..

@Shan

ෂෙනෙරු( ඇස් දෙක දුඹුරු කියලා හිතාගන්න)

සෙනුක

දේව

ආධ්‍ය

කෝච් එදිරිමාන්න

තැන්ක් යූ සෝ මච් කොම්ලො..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 99 කොටස

" අයියෙ මේ අහන්නකො.. එහෙම මොකුත් වෙන්නෙ නෑ.. අපි ගිහින් එයා සීට් එකේ ඉන්නවනම් කතාකරමු.. එච්චරයි.. හරිද.."

" අප්පච්චි මාමව දැක්කද දන්නෙ නෑ වරද්.."

" නෑ නෑ මෙච්චර ගොඩක් අස්සෙ දකින්න විදියක් නෑ.. මට ශුවර්.. ප්ලීස් කලබල වෙන්නෙ නැතුව අපි හොයමුකො.."

රධ්‍ය අයියා ඇවිත් ඩ්‍රෙසින් රූම් එකේ කෑගහලා බම්බුවක් නටපු නිසා පැත්තක හිටිය සෙනුකයත් හොඳටම බය වුණා.. ඊටපස්සෙ රධ්‍ය අයියා ආධ්‍ය අයියා හම්බෙන්න පහළට ගියා.. මේ අප්පච්චි කියන මනුස්සයා එක මොහොතකට හොඳින් කතාකරන්නෙ නැනෙ.. ආධ්‍ය අයියට කතාකරන්නෙ තමුන්ගෙ අයියා කියලා.. එදා අර ගමේ පන්සලේ ඉද්දිත් ෆෝන් එකෙන් කතාකලේ එහෙමයි.. යකෝ තමන්ගෙ පුතාට මේ මනුස්සයා කතාකරන්න දන්නෙ නැනෙ..මමපා දවසක මට දෙකක් කියන්න හම්බුනොත්නම් කියනවා අප්පච්චිට කන් දෙකේ ඇහිලි ගහගන්න..

මමයි රධ්‍ය අයියයි ආධ්‍ය අයියා ඉඳපු සීට් එක ගාව තිබ්බ එක්සිට් ඩෝ එකෙන් ඇතුළට ගිහින් එයාලා සිට් එකේ ඉන්නවද බැලුවා.. මට කළුවර නිසා එච්චරම පෙනුනෙ නෑ.. අනික රධ්‍ය අයියා මගේ ඉස්සරහා නිසා මගේ දර්ශනපථයම එයා වහගෙන තිබ්බේ.. රධ්‍ය අයියා තප්පර පහක් විතර එහෙට මෙහෙට වෙලා අයියා ඉන්නවද බලලා මාවත් ඇදගෙන එළියට ගියා..

" අයියා සීට් එකේ නැනෙ.."

" මොකක්..??"

" ඔව්.."

" කෝල් එකක් ගන්න කෝල් එකක්.."

@Shan

රධ්‍ය අයියා කලබලෙන් ෆෝන් එක අරගෙන දෙපාරක් තුන්පාරක්ම පාස්වර්ඩ් එකත් වරද්දගෙන අයියට කෝල් එකක් ගත්තා..

" ආන්සර් කරන්නෙ නැද්ද.."

" නැනෙ.. වරද් මොකද කරන්නෙ.."

" අහන්නකො.. ඔයා එළියට ගිහින් බලන්න පාකින් ලොට් එකේ අයියගෙ කාර් එක තියද කියලා.. මම ඇතුළේ ඉන්නවද බලන්නම්.. හරිද.."

" හම්බුණොත් මට කෝල් එකක් දෙන්න ඉක්මනට.."

මම අපේ මාමට කෝල් එකක් අරගෙන ඒක කනේ තියාගෙන කෝකටත් ආයෙම එයාලා හිටි තැනට එබිලා බැලුවා.. ආධ්‍ය අයියත් නෑ මාමත් නෑ.. කොහෙ ගියාද මන්දා.. මට එකපාරට යන්න තැනක් මතක් වෙන්නෙත් නෑ.. මම බැල්කනි වලින් පහලට එබි එබි හොයන්න ඕන හැමතැනම ඒ හරියේ බැලුවා.. මේකත් හෙන විසාලයිනෙ තනි මට හොයන්නත් බෑ.. අන්තිමේ මම කොහොමහරි වොශෲම් එක හොයාගත්තා.. ඒක තිබ්බෙ පහළ.. කවුරුත්ම හිටියෙ නැති නිසා මම ෆෝන් එකත් සාක්කුවේ ගහගෙන සද්දයක් නැතිවෙන්න වොශෲම් එකේ දොර ගාවට ගිහින් අරිනවද නැද්ද කියලා කල්පනා කලා.. මුන් දෙන්නා ඇතුළෙ මොන මගුලක් නටනවද දන්නෙ නැනෙ හිටියොත්..

ඒත් වැඩිවෙලා වොශෲම් එක ගාව ඉන්න බැරි නිසා මම ශේප් එකේ දොර ලාවට ඇරලා බෙල්ල දාලා බැලුවා.. දෙයියො බැලුවා වගේ ඇරිය ගමන්ම ස්ටෝල්ස් පේන්නෙ නෑ.. එතන බිත්තියක් තිබ්බෙ.. මම බිත්තියට පිට තියාගෙන හිමිහිට ඇදිලා ගිහිල්ලා බිත්ති දාරෙන් ඇහැ දාලා බැලුවා.. ආධ්‍ය අයියා සින්ක් එකට පහත්වෙගෙන ඉන්නවා.. අපේ මාමා ආධ්‍ය අයියගෙ ලා නිල් පාට කෝට් එක අතේ පටලගෙන ආධ්‍ය අයියගෙ පිට දිගට අතගානවා..

" ඔයාට හුහක් අමාරුද.."

" මට-වතුර -අනූ.."

" අපි හොස්පිටල් යමු සාකි.. පිස්සු නටන්න ලෑස්තිවෙන්න එපා.."

@Shan

" එහෙම අමාරුවක් නෑ..අහ්-මගෙ ඉන්හෙලර් එක අරන් දෙන්න.. කෝට පොකට් එකේ.."

" ඔයා බ්ලීඩ් වෙනවා .."

" ආ..??"

" ඔය.. කෝ මෙහෙට හැරෙන්න පිහිදන්න.. මොනවද ළමයෝ මේ කරගන්නෙ.."

" මගේ පපුව කැක්කුමයි අනූ.. මට ගෙදර යන්න ඕන.."

" අර අපායට යන්න.. මගෙන් කුණුහර්ප අහගන්නෙ නැතුව මේ පැත්ත හැරෙනවා..!!"

මාමා ආධ්‍යා අයියව ඇහට වාරු කරගෙන පේපර් ටිශූ එකකින් මූණ පිහිදැම්මා.. එතකොටයි මම ආධ්‍යා අයියගෙ මූණ කණ්ණාඩියෙන් දැක්කෙ.. එයාගෙ නහයෙන් ලේ ගලාගෙන යනවා.. ගිහින් අර සුදුපාට ඇඳුමට වැටිලා ඒකෙත් තැනින් තැන ලේ බිංදු පැල්ලම් හැදිලා..

" මම කොහෙද යන්නෙ.. මට බෑ දෙයියනේ මෙහෙම ජීවත් වෙන්න.. එක්කො මට මැරෙන්න දෙන්න අනූ.. මගේ ඔලුව පැලෙන්න රිදෙනවා.."

" අපි හොස්පිටල් යමු.. මට තව මොකුත් අහන්න ඕන නෑ.."

" අප්පච්චි දැනගත්තොත් මාව මරාවි.. අනේ මම මොකද කරන්නෙ.."

ආධ්‍යා අයියා මාමගෙ බ්ලෙසර් එක අත් දෙකට ගුලි කරගෙන මාමගෙ පපුවෙන් ඔලුව තියාගත්තා.. එයා සුදුමැලි වෙලා ගිහිල්ලා.. මෙච්චර දවසක්ම හිනාවෙලා ලස්සනට ඉඳපු ආධ්‍යා අයියගෙ ලස්සන මූණ අස්සෙ හැංගිච්ච විරූපී දුක හිතෙන මූණ මම දැක්කෙ ඒ වෙලාවෙයි..

" මොකුත් කරන්නෙ නෑ.. මේ දැන් හොස්පිටල් එන්න ඕන.. ඉතුරුටික මම බලාගන්නම්.."

" ඔයා අප්පච්චි එක්ක රණ්ඩු වෙන්න යන්න එපා ප්ලීස්.."

" රණ්ඩු කරන්නෙ නෑ.. මම කියන දේ අහන්නකො.. දැන් යමු.."

@Shan

" අද කලින් පොඩීවත් අරගෙන යන්න හිටියේ අනු.. මම ඔයාට කිව්වෙ, මට ගෙදරින් ප්‍රපෝසල් එකක් ගෙනාවා කියලා.. ඩිනර් එකට ගියේ නැතිවුණොත් අප්පච්චි මාව නොමර අමරාවි.. අහ්- අන්තිමට මගෙ පොඩ්එකා රණ්ඩුවලට පැටලෙනවා.. ප්ලීස් අනු.. මම කියන දේ පොඩ්ඩකට අහන්නකො.. මම අදට යන්නම්.. මට එහෙම ලොකු අමාරුවක් නෑ.."

" තමුසෙගෙ ඔය අප්පච්චි කියන එකා නිසා මට උඹව එකපාරකුත් නැතිවුණා ශාක්‍ය.. ඕන දෙයක් කරගනින්.. මට උඹට මේවා හැමදාම පැහැදිලි කල්ලා පිස්සු හැදිලා ඉන්නෙ.."

ආධ්‍ය අයියා එහෙමම බිමට කඩාගෙන වැටෙන්න ගිහින් මාමට වාරු වෙලා අර ඉන්හෙලර් එක කටට තියලා එකපාරක් ප්‍රෙස් කලා.. මාමා ආධ්‍ය අයියා දිහා අසරණ විදියට බලාගෙන ඉඳලා ආධ්‍ය අයියව තුරුල් කරගෙන ඔලුවට තොල් තදකරගෙන ඉදියා මම දැක්කා.. මීට කලින් මම ජීවිතේ කිසිම දවසක මාමගෙ ඇස් වල කඳුලු තියනවා දැකලා නෑ.. ඒ වුණාට මම අද දැක්කා.. මාමගෙ ඇස් වලින් කඳුලු කැට දෙක තුනක් දිලිසීගෙන කම්මුල් වලින් පල්ලම් බහිනවා.. මගේ පපුව ගැහෙනවා එකසිය ගානට.. ආධ්‍ය අයියට මොකක්ද තියන ප්‍රශ්නෙ කියලා මම දන්නෙ නෑ.. ඒත් හිතට හොඳ හැඟීමක් දැනෙන්නෙත් නෑ.. මම රධ්‍ය අයියට මැසේජ් එකක් දැම්මා ආධ්‍ය අයියව හම්බුණා කියලා..

" මාත් එක්ක කේන්ති ගන්න එපා.."

" ඔයා එක්ක කේන්තියක් නෑ.. දැන් ඔයාට යන්නම ඕනද.."

" ඔව්.. පොඩී බයවෙලා ඇති මාව හොයන්න ගිහින්.. මට කෝට් එක දෙන්න.."

" ඒ දෙන්නා අපි ගැන මොනවහරි දන්නවද.."

" නෑ.. එයාලා දන්නෙ නෑ.."

" හෙට මාත් එක්ක ඔයාගෙ කවුන්සිලර්ව හම්බෙන්න යන්න ඕන.. තේරුණානෙ.."

" මම එන්නම්.. දැන් මට යන්න දෙන්නකො.."

@Shan

ආධ්‍ය අයියා හිනාවෙලා මාමගෙන් එහාට වෙලා කෝට් එක ඇඳගත්තා.. මාමා බිත්තියට හේත්තුවෙලා ආධ්‍ය අයියා දිහා බලාගෙන හිටියා..

" සාකි.. ඇයි මට ඔයා කලින් ඩිප්‍රෙශන් ගැන කිව්වෙ නැත්තෙ.."

" කියන්න කාලයක් වුණේ නෑනෙ.. අපි කතාකරන්න ගත්තෙත් මේ ළඟදි නෙ.."

" මහ පුදුම ලොකුකමක් තියෙන්නෙ මුගේ.. දෙන්න හිතයි.."

අපේ මාමා ආධ්‍ය අයියට දෙකක් දෙන්න වගේ ගිහින් අත උස්සලා දෙකක් රැව්වහම ආධ්‍ය අයියා හිනාවෙලා මූණ පිහිදගෙන ලිප් බාම් එකක් අරගෙන සුදුමැලි වෙලා තිබ්බ තොල් වල ගාගෙන තව මොනවද පවුඩර් වගේ එකක් මූණෙ තැනින් තැන ටච්-අප් කරගත්තා..

" ගිහින් මට ටෙක්ස්ට් කරන්න.. ඔයාට යන්න ඕනමනෙ.."

" මම ඉතින් ගියා කියලා ඒ කෙල්ලව බඳිනවයැ.. හෙට හම්බෙමු.."

" ම්ම්.."

ආධ්‍ය අයියා එන්න බෑග් එක අරගෙන මාමගෙ මූණ හරියට ලං වෙද්දිම මම හරි සිහියට ඇවිත් පටාස් ගාලා දොරෙන් පැනලා උඩට දිව්වා.. මම යද්දි රධ්‍ය අයියා මේන් ඩෝ එකෙන් එළියේ සාක්කුවට අත් දෙකත් ඔබාගෙන මම එන දිහා කලබලෙන් බලාගෙන ඉන්නවා..

" කෝ වරද් අයියා..??"

" එයා ඉන්නවා.. අහන්නකො අද අයියට ප්‍රපෝස් කරපු කෙල්ලෙක් බලන්න ඔයාලා ඩිනර් එකට යනවද.."

" මම ඒ ගැන දන්නෙ නම් නෑ.."

" ඔව් ඔව් අද යනවා.. තව ටිකකින් ආධ්‍ය අයියා ඒවි.. එයා අසනීපෙන් ඉන්නෙ.. ප්ලීස් අයියව තනි කරන්න එපා.. එයා ගාවින්ම ඉන්න.."

" අ-අයියට මොකද වරද්.."

@Shan

රධ්‍ය අයියගෙ ඇස් වල එක තප්පරේට කඳුලු පිරෙනවා මම දැක්කා..

" දැන් ඔක්කොම කියන්න බෑ.. ඔයා අයියා ගාවට යන්නකො.. මම මාමව හම්බෙන්න යනවා.."

" හරි.."

මම ආපස්සට දුවගෙන දුවගෙන මාමව හම්බෙන පාරේ හිටගෙන හිටියා.. රධ්‍ය අයියා අප්පච්චිලා ඉඳපු ඩ්‍රෙසින් රූම් එක පැත්තට ගියා.. ටිකකින් අපේ මාමා ඈත එනවා දැක්කහම මම මාමා ගාවට දුවගෙන ගියා..

" මොකද කොල්ලො.."

" කොහෙද අනේ යන්නෙ..මම හැමතැනම ඔයාව හෙව්වා.."

" මම පොඩි කෝල් එකක් ගන්න ගියා අර හරියට.. දැන් ගෙදර යනවද.."

" සෙනුකත් ඉන්නවනෙ.. මම ඉන්නවා.."

" ම්ම්.."

" මාමෙ මට මාමගෙ ෆෝන් චාජර් එක දෙන්නකො හදිස්සියකට.."

" දැන්..?? යාළුවෙක්ගෙන් ඉල්ලගනින් බං.."

" අනේ මාමගෙ එක දෙන්නකො.. වැඩි දුර නෑනෙ මෙතනනෙ පාකින් එක.."

" පුදුම වදයක් උඹගෙන් නම් තියෙන්නෙ.."

" අනේ.. ඉක්මනට එන්න හොඳේ.."

මම ආධ්‍ය අයියගෙ අප්පච්චි ටිකකින් මෙ හරියට එන්න කලින් මාමව කාර් එකට යවලා සෙනුකයව හම්බෙන්න ඩ්‍රෙසින් රූම් එකට ආවා.. එද්දි අප්පච්චි ආධ්‍ය අයියට බනිනවා.. සෙනුකත් රූම් එකේ හිටියා.. ඌ එයාපොඩ් දෙකක් ගහගෙන හෙන අපහසුවෙන් වගේ පැත්තකට වෙලා ඉන්නවා.. මම ශේප් එකේ සෙනුක ගාවට ගියා.. සෙනුක මට ඇස් වලින් අප්පච්චිව පෙන්නලා මූණ ඇදකරගත්තා..

@Shan

" එතනත් ගිහින්  ගෑණියෙක් වගේ හැසිරෙන්නෙ නැතුව කොන්ද කෙළින් තියාගෙන පිරිමියෙක් වගේ ඉන්නවා.."

" සොරි අප්පච්චි.."

" සොරි..?? නටන්න ඕන නාඩගම් සේරම නටලා තව සොරි කියන්නත් එනවද.."

" අප්පච්චි.. අයියා මොකුත් කල්ලා නැතුව බනින්න එපා..!!"

අප්පච්චි ආධ්‍ය අයියා දිහා බලාගෙන ඉදලා රධ්‍ය අයියා දිහා රවලා බැලුවා..

" රධ්‍ය.. තමුන් ගැනත් මම හොදට බලාගෙන ඉන්නෙ.. දැන් කටගහගෙනත් එනවද..!!!"

" අප්පච්චි කෑගහන්න එපා.. කට්ටිය ඉන්නවා.. ප්ලීස් පොඩ්ඩ.. අපි යමු අම්මා එළියෙ ඉන්නවා.."

" ආධ්‍ය!! මේ ප්‍රපෝසල් එකත් තමුන් රිජෙක්ට් කළොත් ලෑස්තිවෙලා ඉන්නවා.. මම කරන දේ බලාගන්න.."

" අප්පච්චි..!! අයියට කෑගහන්න ගත්තොත් මම අයියව අරගෙන ගෙදර යනවා!!!"

රධ්‍ය අයියා ආධ්‍ය අයියගෙ අහින් ඇදගෙන කාමරෙන් එළියට ගියාම අප්පච්චි මං දිහා උඩ ඉදන් පල්ලෙහාට බලලා කාමරෙන් එළියට ගියාම සෙනුකයා එයාපොඩ්ස් දෙක ගලවලා පැත්තකින් තිබ්බා..

" අම්මෝ බං.. එළියට පැනගන්න විදියක් නැතුව මම මෙ හිටියෙ.."

" ඔලුවත් කකියන්න ගත්තා.."

" මෙ ශනෙරු.. අඩෝ උඹට බය නැද්ද යකෝ.. මගේ පපුවත් ගැහෙනවා ඒ මනුස්සයා උඹ දිහා බැලුව හැටි මතක් වෙලා.."

" අනේ මන්දා බං.. මට තේරෙන්නෙත් නෑ.."

" උඹ දැන් යන්නද..??"

@Shan

" මම්.. උඹ තාම ප'ෆෝම් කල්ලත් නැනෙ.. ඉන්නම්.."

" එහෙම අවුලක් නෑ බං.. රධ්‍ය අයියත් ගියානෙ.."

" පිස්සුද හු#තො මම ඉන්නම්.. කොහොමත් ඔකෙස්ට්‍රා එකේ වැඩ ඉවරවෙනකල් උඹට එන්න බැනෙ.. මෙහෙම ඉමු.."

" හරි එහෙනම්.."

සෙනුක නැගිටලා එළියට ගියාම මම මගේ බෑග් එකට ඇඳුනුයි අනිත් දේවලුයි සේරම දාගෙන රධ්‍ය අයියට මැසේජ් එකක් තිබ්බා මම මේක ඉවර වෙලාම ගෙදර යනවා කියලා.. සාගා එකම එපාවෙලා ගියා.. ආයෙ කවදාවත් නොඑන්න තරමට.. අපරාදෙ කලින් රධ්‍ය අයියගෙ හිත හදපු එක අප්පච්චි ඇවිත් කාලා දැම්මා.. අපි බෙහෙත් දාන්න දාන්න අපච්චි ඇවිත් රධ්‍ය අයියගෙයි ආධ්‍ය අයියගෙයි හිත් වල තුවාල පාරලා යනවා.. මට තේරෙන්නෑ මොනවා කරන්නද කියලා..

අද සෙනුකයගෙ අම්මලගෙ ඉස්කෝලෙත් අනඳ ප්‍රතිභා තියන නිසා ආන්ටි සෙනුකගෙ ප'ෆෝන් එකට ඉඳලා ආයෙම ඒ ඉස්කෝලෙට යනවා කිව්වලු.. ආයෙ මෙහෙ එන්න ඕන නැනෙ සෙනුකව ගන්න.. දැන් රෑ වෙලානෙ.. සෙනුක වැඩ ඉවර වුනාම අපි එක්ක යන්න හිටියා.. අම්මලා එහෙමම ආනන්දෙ ඉඳලා ගෙදර යනවා කියලා කිව්වා.. එහෙම ලේසියි.. සෙනුකයගෙ ප'ෆෝමන්ස් එක තිබ්බෙ අන්තිමටම.. ඒක ට්‍රැඩිශනල් විදියට තිබ්බ එකක් නිසා ගින්දර වගේ නැගලා ගියා.. ඒවගෙන් පස්සෙ ඌ අපේ ඉස්කෝලෙ මියුසික් ක්ලබ් එක වෙනුවෙන් කරපු කියපු දේවල් වලට අගය කිරීමක් විදියට සෙනුකගෙ මියුසික් මාස්ටර් ස්ටේජ් එකේදි සෙනුක ගැන කිව්වා.. ඌ මියුසික් වලින් අපිට හිතාගන්නවත් බැරි තරම් ඉස්සරහට ගිහින් ඉවර එකෙක් ඇත්තටම.. ඒ ටැලන්ට් එකට අපිට කිට්ටු වෙන්නවත් බෑ.. මම හිතන්නෙ නෑ අපේ ඉස්කෝලෙ ආට් එකේවත් එච්චරට හදාරපු කෙනෙක් ඉන්නවා කියලා.. ඒවගෙන් පස්සෙ ඔකෙස්ට්‍රා එකේ කට්ටියත් වැඩ ඉවර කල්ලා හිටපු අයටත් බායි කියලා අපි මාමා එක්ක  ගෙදර එන්න ලෑස්ති වුණා..

අපි එළියට ඇවිත් මාමගෙ කාර් එක ගාවට යද්දි මාමා අපි එනකල් බලාගෙන ඉන්නවා.. අපි දෙන්න බෑග් ටිකත් ඩිකි එකෙන් දාගෙන පිටිපස්සෙන් නැග්ගා.. සෙනුක අපේ මාමව දන්නවා.. මාමා මගේ

@Shan

පේරන්ට්ස් මීටින් එනවනෙ ඒ කාලෙ නාරාහේන්පිට වැඩ කරද්දි.. අනික සෙනුකයා අපේ ගෙදර නොදන්න එකෙක් නෑ.. ඌ තමයි මට කිට්ටුම..

" අංකල් දේව.. අම්මෝ හුඟ කාලෙකින්.."

" සෙනුක පුතා.. කොහොමද කොල්ලො ඉතින්.."

" හොඳින් ඉන්නවා අංකල්.. අංකල්ට කොහොමද.."

" අපිත් හොඳින් ඉන්නවා.. ඉස්කෝලෙ ඩිපියුටි ගේම්ස් කැප්ටන්ලු නේද."

" අම්මෝ අංකල් දන්නවද.. ගැම්මක් තමා නේ.."

" ඔව් ඔව්.. ගැම්ම.."

" අංකල් ඒකට කියන්නෙ ෆ්‍රෙන්ඩ් ගෝල්ස් කියලා.. අපේ ෂනෙරුවා හෙඩ් මම ඩීජීසී.. මේ අංකල් බැජින් සෙරමනි එන්න හොඳේ.."

" බලමුකො.. ෂනෙරු නම් නිතර කියනවා සෙනුක ගැන.."

" කියන්න එපැයි අනේ.. මම එයාගෙ හාට් එකනෙ.."

" බල්ලො.."

" ඇයි ඒයි.. මම ඔයාගෙ හාට් එක නෙමේද.."

" නෑ අක්මාව.."

" ආ ඔක නවත්තගනිල්ලා.. බෝක්කු කටවල් දෙක.."

" ඉතින් අංකල් දේව.. අපි මොකො ලොකු වෙද්දි අඩුවෙන් කතාකරන්න ඕන කියලා නීතියක් නැනේ.. මගේ කටනම්.. කට මගේනම්.. කාටවත් ඇයි වේදනා.."

අපේ මාමා හෙන හයියෙන් සෙනුකයා කියන අටල්පහුරු වලට හිනාවෙවී ගියා.. මටනම් කොටින්ම හිනාවෙන්නවත් මූඩ් එකක් නෑ.. රඨ්‍ය අයියා මොනවා කරගෙනද දන්නෙ නෑ.. මතක් වෙද්දිත් පපුව ගැහෙනවා.. මම

@Shan

ශටර් එකට මූණ ගහගෙන යද්දි සෙනුකයා මගේ අතින් අල්ලගෙන මොකද ඇහුවා.. මම මොකුත් නෑ කියලා ඔලුව තියාගෙනම ආවා..

අපේ මාමා එක්ක මම රධ්‍ය අයියගෙ අප්පච්චිව සංසන්ධනය කල්ලා බැලුවා.. අපේ මාමත් ආමි එකේමයි.. ඒත් මොනතරම් හොඳද.. අපිට කොච්චර ආදරේද.. ආධ්‍ය අයියටත් හුඟක් ආදරෙයි.. අප්පච්චි අම්මට ආදරේ බවක් මට පෙනුණෙ නෑ.. අම්මා ජීවත් වෙන්නෙ බයෙන් වගේ.. මම ඇස් දෙකටම දැක්කනෙ.. අම්මා හැසිරුණ විදිය.. අනික අපේ මාමා කවදාවත් ඔහොම ළමයින්ටනම් ජීවිතේට කඩාගෙන පනින්නෙ නෑ.. තාත්තා නොවෙලත් මට ආදරේ කරන්නෙ තාත්තා වගේමයි.. කටපුරා මට සුදුමහත්තයා,කොල්ලො කියලා ආදරෙන් කතාකරනවා.. ඉඩ තියන හැමවෙලාවෙම මාත් එක්ක කතාකරනවා.. විහිලු කරනවා.. ආදරේ පිරිච්ච මනුස්සයෙක්.. තාත්තෙක් වෙන්න වදන්නම ඕන නෑ කියලා මට හොඳටම තේරෙනවා..

සෙනුක එයාගෙ ගෙදරින් දාලා මාමයි මමයි අපේ ගෙදර ආවා.. ඇවිත් මාමා මට ඔලුවෙයි මූණෙයි ගාපුවා අතුල්ලගෙන හොඳට නාගන්න කියලා කිරි එකකුත් හදලා දීලා එයත් වොශ් දාගෙන අම්මගෙ කාමරේට ගිහින් ඇඳුම් මාරුකරගෙන ඒකෙ නිදාගන්න හදාගත්තා..

" සුදුමහත්තයා.."

" ඕ.."

" රධ්‍ය පුතාගෙ තාත්තා උඹ එක්ක කතාකලාද.."

" නෑ මාමෙ.. ඇයි.."

" ම්ම්.. මොකුත් නෑ.. ඩයල් එක අපේ කෑම්ප් එකේ දැන් ඉන්නෙ.."

" මාමා කොහොමද දන්නෙ.."

" ආධ්‍ය මාත් එක්කනෙ බං හිටියෙ.. අර රධ්‍ය පුතාගෙ අයියා.."

" ආ ඔව්නෙ.. එයා ආධ්‍ය පුතා මාමෙ.. ආධ්‍ය ආධ්‍ය ගාන්නෙ.. ඉතින්.."

@Shan

" උබ දන්නවද කලින් අධිකාරි ලුතිනන් කර්නල් කෙනෙක් වෙලා පලාලි හිටියෙ.."

" ඇයි මේජර් කෙනෙක් නෙමේද.."

මාමා හිනාවෙලා මගෙ ඇඳෙන් ඉඳගත්තා..

" මේජර් කෙනෙක් වෙලා හිටියේ ඉස්සර නාරාහේන්පිටම ඉද්දි.. මම ඩයල් එක දන්නවා.. එච්චර ඇයි හොඳයියක් නෑ.. ඊටපස්සෙ තමා අවුරුදු තුනකට පලාලි ගියේ.. දැන් ඩබල් ප්‍රමෝට් වෙලා බ්‍රිගේඩියර් පට්ටම ගහලා මෙහෙටම ඇවිල්ලා.."

" එහෙමද.. රධ්‍ය අයියා එච්චර එයාලගෙ අප්පච්චිට ආස නෑ කියලා තියෙනවා.."

" මම.. කොහොමහරි කමක් නෑ රධ්‍ය පුතා නම් හොඳයි, ඒත් එයාලගෙ අප්පච්චිලා අම්මලා එක්ක කතාවක් තියාගන්න යන්න එපා.. තේරුණානෙ.."

" ම්ම්.."

" දැන් නිදාගන්න හොඳ ළමයා වගේ.."

" මාමෙ.. හෙට මම අඳුරන යාළුවෙක් රට යන නිසා ඩිනර් එකක් තියනවා.. මම හවස් වෙලා එහේ යන්නද.."

" කොහෙද තියෙන්නෙ.. මම ගිහින් දාන්නම්.."

" Mövenpick එකේ.."

" අම්මෝ බං.. කවුද උඹෙ ඔය සල්ලිකාර යාළුවා.."

මාමා විහිලුවෙන් වගේ ඇහුවත් අහන විදියෙන් තේරෙනවා එයාටහැමදේම හරියටම දැනගන්න ඕන කියලා..

" අර පරිසර ඇමති.. සිංහවංශ.. අන්න එයාගෙ මුණුබුරා රට යන්නෙ.."

@Shan

" ආ.. උබලගෙ ඉස්කෝලවල ඉන්නෙ ඉතින් ඔය වගේ උන් තමා.. ගිහින් හැබැයි පරිස්සමට එන්න ඕන සුදුමහත්තයා..!!"

" හරි හරි අනේ.."

" හැරි හැරි ඇකේ් තමා.. දැන් නිදාගනින්.. මමත් යනවා නිදාගන්න.."

" හා.."

මම ඇඳෙන් නැගිටලා මාමට වැද්ලා ඇඳට පැනලා ඔලුවෙ ඉඳන් වහගත්තහම මාමා මගේ ඔලුව අතගාලා කාමරේ දොර වහගෙන එළියට ගියා.. ගියාම අම්මගෙ කාමරේ දොර වැහෙනවා මට ඇහුණා.. මම ෆෝන් එක අරගෙන බැලුවහම වෙලාව රෑ එකොළහමාරයි.. රධ්‍ය අයියා මගේ මැසේජස් සීන් කල්ලා ඒත් රිප්ලයි නෑ.. මොකක් හරි ප්‍රශ්නයක්ද දන්නෙ නෑ..මට බයයි හිතට.. රධ්‍ය අයියා හැමතිස්සෙම රණ්ඩුවලට පැටලෙන්න යනවනෙ.. මම මහන්සි වුණත් නැගිටලා රෑ දෙක විතර වෙනකල්ම බිත්තියට ඔලුව ගහගෙන හිටියා.. රධ්‍ය අයියා පහුගිය ටිකේම නිදාගත්තු කොට්ටෙ එයාගෙ ප'ෆියුම් සුවඳයි.. ඒ සුවඳට මගේ පපුව රිදෙන්න ගන්නවා.. මම කොට්ටෙ පපුවට තුරුල් කරගෙන නින්ද යන්න දෙන්නෙ නැතිවෙන්න ඇස් දෙක ඇරගෙන හිටියා.. ඒත් මහන්සී.. හුහක් මහන්සි වුණානෙ.. දැන් නම් රධ්‍ය අයියා ගෙදර එන්නත් වෙලා හැබැයි.. එයාට නින්ද ගිහින්ද දන්නෙ නෑ..

මට බිත්තියට ඔලුව තියාගෙන ඉද්දි නින්ද යාගෙන වගේ එනකොට එකපාරම අතේ තියාගෙන ඉදපු ඕන් එක වයිබ්‍රේට් වුණා.. මම ඉක්මනට ෆෝන් එක ආන්සර් කල්ලා කනේ තියාගත්තා..

" වරද්.. ඔයා අවදියෙන්ද හිටියේ.."

" නින්ද ගියේ නෑ.. මම ඔයා කතාකරනකල් හිටියේ.."

" අප්පච්චි ඉන්න නිසා ෆෝන් එක ගන්න විදියක් තිබ්බෙ නෑ .. පරිස්සමට ගෙදර ආවා නේද.."

" ඔව්.. මාමා එක්ක ආවා.. මොකද වුණේ.."

@Shan

" වරද්.. මට නිකම පිස්සු වගේ බං.. අයියා හොඳටම සුදුමැලි වෙලා.. ගෙදර ඇවිත් බාත්‍රූම් එකේ ෆේන්ට් වෙලා වැටුණා.. ඇහුවහම හොස්පිට්ල් යන්න දෙන්නෙත් නෑ.. කාටවත් කියන්න දෙන්නෙත් නෑ.. මම මොකද කරන්නෙ.."

" මාමත් අයියව හොස්පිට්ල් එක්කන් යන්න හැදුවා.. මම කලින් වොශ්රූම් එකේ දැක්කනෙ.. එයා යන්න දෙන්නෙම නෑ.."

" අයියා බෙහෙත් අහුරු ගනන් බොනවා.. ඉන්හෙලර් ඉන්ජෙක්ශන් අරවා මේවා කාමරේ ලාච්චුවක් පිරෙන්නම දාලා.. මට හෙන අමුතුයි වගේ වරද්.."

" මටත් වැඩිය ඇල්ලුවෙ නෑ.. අයියා ඩිප්‍රෙශන් වලට බෙහෙත් ගන්නවා නේද.."

" ම්ම්.. මේ ගෙදර ඉඳලා එහෙම එකක් නොහැදුනොත් තමයි පුදුම.."

" අපි බලමුකො.. කොහොම හරි හොයාගන්න.."

" මම තව දවස් හතරයි වරද් ඉන්නෙ.. මාමා අයියව බලාගනී නේද.."

" ඔව් ඔයා බයවෙන්න එපා.. අපි බලමුකො හරිද.. දැන් නිදාගන්නවද.."

"නෑ අයියට සේලයින් එකක් දෙනවා.. ඒක ඉවරවුණාම මම නිදාගන්නවා.."

" ඒකහොඳයි.. මේ අස්සෙ අප්පච්චි එක්ක රණ්ඩුවෙන්න යන්න එපා අයියෙ.."

රධ්‍ය අයියා ලොකු හුස්මක් පහල දානවා මට ඇහුණා..

" ම්ම්.. ඔයාට මහන්සී නේද.. මම ගයනිකා මැඩම්ට යනවා කිව්වෙත් නෑ.."

" මම කිව්වා ඔයා කලින් ගියා කියලා.. ඒකනිසා අවුලක් නෑ.."

" ම්ම්.. දැන් නිදාගන්න.. හෙට හම්බෙනවනෙ.."

" පරිස්සමින් ඉන්න.. බුදුසරනයි.."

@Shan

" බුදුසරනයි.."

මම ෆෝන් එක කට් කල්ලා කොට්ටෙත් බදාගෙන ඇඳේ හාන්සිවුණා.. ඇලීයි නෝවායි නෝට්බුක් එකේ එකට ගතකරපු පලවෙනි වසන්ත කාලේ ඉවරවෙලා ගියා වගේම.. මට දැනෙනවා.. මමත් සතුටින් උන්නු කාලෙ ඉවරවෙගෙන යනවා..

මගෙ දළඹු ළමයිනේ.. ඔයාලගෙන් ඉල්ලන්න තියෙන්නෙ ඕතරීව විශ්වාස කරන්න.. ඉස්සරහට මොනවා ආවත් සේපාලිකා මල් පිපෙනවාමයි..

එන්නාම්.. ලව් යූ.. ❤

**Out and proud.. Be who you are..**

**#pride_month**

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 100 කොටස

" පරිස්සමට ගෙදර එන්න ඕන සුදුමහත්තයා..!!"

" දැන් මේ කීවෙනි සැරේටද අප්පා ඕක කියන්නෙ.. මම එන්නම්.. එන්නම් එන්නම්.."

" ම්ම්.. මම පොඩි වැඩ වගේකට එළියෙ ඉන්නෙ.. උවමනාවක් වුණොත් කෝල් එකක් දෙන්න හොඳද.."

" හා.. ඇයි මාමෙ එළියෙ ඉන්නෙ.."

" යාළුවෙක් හම්බෙන්න යනවා.. ඇයි.."

" ඕ යාලුවෙක්.. හා හා එහෙනම් මම යනවා.."

මම සීට්බෙල්ට් එක ගලවගෙන වාහනෙන් බැස්සහම මාමා මම හොටෙල් එක ඇතුළටම යනකල් බලාගෙන ඉඳලා යන්න ගියා.. හෙට අයුක අයියා යන නිසා අද ළඟම යාළුවන්ට එයාගෙන් ඩිනර් එකක් රෙඩි කල්ලා තිබුණා movenpick එකේ.. දැනටමත් වෙලාව රෑ අටට විතර ඇති..

දවල් වරුවෙම මාමා ගෙදර හිටියෙ නෑ.. ඇඳගෙන කියාගෙන එළියට ගිහින් එද්දි හුගක් හවස් වුණා.. ඒ ඇවිත් තමයි ආයෙම මාව දාන්න මෙහේ ආවෙ.. සමහරවිට ආධ්‍ය අයියත් එක්ක කවුන්සිලර්ව මීට් වෙන්න යන්න ඇති.. එහෙම කතාවක් කිව්වනෙ ඊයෙ.. කොහොමහරි කමක් නෑ ආධ්‍ය අයියා ළඟින් ඉඳන් එයාට හැමදේම කතාකරන්න කෙනෙක් හිටියොත් හිතට සැනසීමයි..

මම ප්‍රයිවට් ඩයිනින් රූම් එකේ නම්බර් එක හොයාගෙන දිගටම ඇවිදගෙන ගියා..

කලින් මෙවගෙ ඇවිල්ලත් නෑ.. රධ්‍ය අයියා එක්ක අරහෙ මෙහෙ ඇවිදින්න ගිය දවස්වල ඇරෙන්න මම මෙහෙම තැන්වලට ඇවිල්ලම නැති තරම්.. මමත් එහෙමයි.. සෙනුකයත් එහෙමයි.. සෙනුකයා උඩ පැන පැන හිටියට ඉන්නෙ පට්ටම අවුලෙන් කියලා මම දන්නවා.. කොහෙද ඒ පගයට දුක හිතුණට පෙන්නන්නෙ නැනෙ.. අයුක අයියා ආයෙම ලංකාවට එන එක

@Shan

ශුවරුත් නෑ ඩිග්‍රි එක ඉවරවෙනකල්.. අනික සෙනුකයා මෙහේ ඉඳන් එහේ යන්න කියලයැ.. උගේ එදර අය එහෙම ආවට ගියාට ඕස්ට්‍රේලියාවට ටිකට් හදලා දෙන්නෙ නැහැනෙ.. කියාන් අයියා නම් කිව්වා මගදි එයා යන්න හිතාගෙන ඉන්න කතාවක්.. කියාන් අයියලාගෙ ෆැමලි එක කරන්නෙ බිස්නස්.. ඒකනිසා නිතර එයාලගෙ ගෙදර අය රට යනවා එනවා.. කියාන් අයියා කිව්වා එහෙම සැරේක අයුක අයියා බලන්න එයා යනවා කියලා.. කියාන් අයියා එන් එස් බී එම් එකේ ප්‍රයිවට් ඩිග්‍රි එකක් කරන්න හිතාගෙන ඉන්නෙ.. කොහොමත් එයාට කැම්පස් යන්නම තරම් ළකුණු එක්සෑම් එකෙන් තිබ්බෙ නෑ.. ඒකා උවමනාවෙන් ඒක කළෙත් නෑ.. රධ්‍ය අයියා කිව්වෙ රගර්ම බදාගෙන හිටියා මිසක් කියාන් අයියා ඉස්කෝලෙ වැඩවලට එච්චර උනන්දුවක් නෑ කියලා..

මම ඩයිනින් රූම් එකේ දොර ඇරගෙන ඇතුලට යද්දි හැමෝම වගේ ඇවිල්ලා.. මම කට්ටියට මූණ පිරෙන්න හිනාවෙගෙන හිමිච්චා වගේ ගිහින් රධ්‍ය අයියටයි ආශිටයි මැද්දෙන් තිබ්බ පුටුවෙන් ඉඳගත්තා.. අවිත් හිටියේ සෙනුකයි, ආශියි, මහීශායි, සයෝන් අයියයි, අභිරු අයියයි, මමයි, රධ්‍ය අයියයි, කියාන් අයියයි, අයුක අයියයි.. සාමාන්‍යෙන් ඉතින් කට්ටිය හුඟක් හිටියා..දිග ටේබල් එක පිරෙන්නම එක එක කෑම ජාති, ලිකර් බෝතල් පෝලිමට තියාඅ තිබ්බා.. ඒ ගොල්ලො හෙන කයියක් මම යද්දිත්..

" දෙයියනේ මේ පච්කාරයා බලාගෙන හිටියා සනෙරු මල පායනකල්.."

සෙනුකයා මගේ පැත්තට සර්වියට් එකකින් දමලා ගැහුවහම මම ඒක අල්ලගත්තා..

" මේ පච්කාරයගෙ දැස පලාගෙන කඳුලැලුත් එනවා.."

" සුවර්ද දෑසමයි කියලා.."

" මේ පොඩි පගයො දෙන්නා එකට තියන්න හොඳ නෑ බං.."

" ආ ඇයි කියාන් අයියෙ.."

" උඹලා මගේ කොල්ලො දෙන්නා හොරකම් කරපු පාපකාරි මදාවියො දෙන්නා.. දැක්කහම මට ඒකමයි මතක් වෙන්නෙ.."

@Shan

කියාන් අයියා වක්කඩේ වගේ කියවද්දි මම ශේප් එකේ අහිරු අයියා දිහා බැලුවා.. මා හිතාගෙන හිටියේ ඩයල් එක මොකුත් දන්නෙ නැතුවැති කියලා.. ඒත් ඌ හිනාවෙවී අපි කියන ඒවා අහගෙන ඉන්නවා.. එක්කො ඉස්කෝලෙම දන්නවද දන්නෙ නෑ මම රධ්‍ය අයියා එක්ක යාළුයි කියලා.. බලන් යද්දි ඉස්කෝලෙ ටොප් බෝඩ් එකම දන්නවනෙ සීන්කෝන් එක..

" අපි දිහා නොබල ඉඳපන්.. ඉවරනෙ.. ඉරිසියාව තවුසෙගෙ.."

සෙනුකයා කියාන් අයියා එක්ක රණ්ඩුව කන්ටිනිව් කරගෙන යද්දි රධ්‍ය අයියා එයාගෙ අත මගේ උකුළ උඩින් තිබ්බා.. මම ඒ අත් අල්ලගත්තා..

" ඔයා ඇවිත් හුඟක් වෙලාද.."

" ම්ම්.. ඔයා පොඩ්ඩක් පරක්කුයි.."

" මාමා එද්දි පරක්කු වුණානෙ.. ඔයාට කියන්න දේකුත් තියෙනවා.."

" මටත් තියෙනවා.."

" පස්සෙ කියන්නම්.."

මම රධ්‍ය අයියා එක්ක හිනාවෙලා අනිත් අයගේ කතාබහ වලට එකතු වුණා..

" අම්මෝ බං.. මේ අවුරුදු දෙකනම් ජීවිතේට අමතක වෙන්නෙ නෑ.."

" ඇත්තමයි අනේ.. ඔයාලට කියන්න මමනම් වැඩිපුරම සතුටින් ඉඳපු අවුරුද්ද.."

කියාන් අයියා හෙන අවුලෙන් ග්ලාස් එකකට වයිට් ලේබල් බෝතලයක් හලාගෙන ඒක ගහලා ඇරියා..

" සිරාවට.. කොච්චර දේවල් තිබ්බද බං.. ස්පෝර්ට්ස්මීට් තිබ්බා.. කැම්ප් ගැහුවා.. ට්‍රිප් ගියා.. අවුරුදු උත්සව තිබ්බා.. කලර්ස් නයිට්ද අරවා මේවා අස්සෙ මුන් ටික ඒලෙවෙලුත් ලිව්වනෙ.."

" ම්ම්.."

@Shan

" අඩෝ පට්ට දුකයි බං.. අයුකයයි රධ්‍යයි නැතුව.."

" අයියලා දෙන්නා නැතුව මුන් දෙන්නා කොහොම ඉදීද මන්දා.."

මහීශා කිව්වහම රධ්‍ය අයියා මගේ අත තද කල්ලා අල්ලගෙන ඉඳලා අතෑරියා.. මටත් තාම අදහසක් නෑ.. මම කොහොම ඉදීද කියලා.. ඒ ඇන අඩුමහිතන්නවත් මම බයයි..

" ආයෙම දවසක හම්බෙමුකො.. උඹලා අපි ඔක්කොම මෙහෙම එක මෙසෙක.."

" අනිවාරෙන්.."

හැමෝම මුළු අවුරුද්දක් පුරාවට අපි කෙලපු පිස්සු කියව කියල කතාකලා.. හිනාවුණා.. ඒ අස්සෙ කියාන් අයියයි අභිරු අයියයි අයුක අයියයි බිව්වා.. අපිනම් කෑම කෑවා විතරයි.. රධ්‍ය අයියත් අනිත් අයගෙ කතාවලට හිනාවෙලා පැත්තකට වෙලාම හිටියා.. ටිකකින් කියාන් අයියා පුටුවෙන් නැගිටලා ගෑරුප්පුවක් මයික් එක වගේ අල්ලගෙන ඩයිනින් ටේබල් එක ඉස්සරහට වැනි වැනී ඇවිදගෙන ගියා.. ඒකට වැඩිවෙලා හොඳටම..

" අහම් අහම්.. කැහ් කැහ්.."

" ඔයි කියානයා.."

" ඇටෙන්ශන් ප්ලීස් ලේඩීස් ඇන්ඩ් ජෙන්ට්ල්මන්.. මම අද මෙතනට ආවෙ.. ඔක්කොන්ටම කලින් හැමෝගෙන්ම අවසර ගන්න.. හර්ත.."

" ඒයි කියාන්.."

" පොඩ්ඩක් ඉන්න.. වෙයිට් වෙයිට්.. අවසර ගන්න ඕන.. ජස්ට් කීප් යොර් ෆකින් ඇටෙන්ශන් ඔන් මී ගයිස්.."

ඒ අස්සෙ රධ්‍ය අයියා අයුක අයියා දිහා හෙන අසරණවෙලා වගේ බලාගෙන ඉඳලා මූණ පිහාගත්තා මම දැක්කා.. බෝයිපෙන්ගෙයි, හොඳම යාළුවගෙ බෝයිපෙන්ගෙයි පට් රෝල් වෙන්නයි වගේ හදන්නෙ..

" මුලින්ම මගේ නැපියේ ඉඳන් යාළුවා සුදුඅම්මියගෙන්ද, අනිත් නැපියේ ඉඳන් යාලුවා සුදූදෝණියාගෙන්ද, උන් දෙන්නා කට්ට කාලා දාගත්තු වෙට්ට

@Shan

පිත්තල මිදාවියො දෙන්නගෙන්ද, මගේ සුරූපී ප්ප්ප්‍රියම්හිකාවගෙන්ද,"

" මේ මිනිහා මාව කනවා.."

ආශි ඒ අස්සෙ කියාන් අයියට රවාගෙන රතුම රතු පාට වයින් වීදුරුවක් දමලා ඇරියා..

" ප්‍රියම්හිකාවගේ හොඳම යාළුවා මගේ බොක්ක මහීසා නම්ගිගෙන්ද, සයෝන් පුතාගෙන්ද අභිරු පුතාගෙන්ද අවසරයි.."

" මේ උබට වැඩිවෙලා කියාන් මෙහෙ වරෙන්.."

අයුක අයියා නැගිටලා කියාන් අයියා ගාවට යන්න හදද්දි කියාන් අයියා වැනි වැනි ඇවිත් රධ්‍ය අයියගෙ කරට අතක් දාගෙන රධ්‍ය අයියව ඇදලා අරන් මූණට කිස් එකක් දුන්නා.. ඊටපස්සෙ රධ්‍ය අයියවත් ඇදගෙන ගිහින් අයුක අයියගෙත් කරට අත දාගෙන එතන පුටුවෙන් ඉඳගත්තා.. සෙනුකයා ශේප් එකේ ලිස්සලා මං ගාව පුටුවෙන් ඉඳගත්තා..

" අද කෙලින් කටින් යන්න වෙන්නෙ නෑ වගේ.."

" මන්දා.. ඌටත් හිතේ අමාරුව ඇත්තෙ.."

" උඹලා දෙන්නා හිතක් පපුවක් නැතුව මාව දාලා යනවට.. මෙක බීපන්.. ප#යො දෙන්නා.."

කියාන් අයියා බාගෙට ඉවරවෙලා තිබ්බ වයිට් ලේබල් බෝතලේක ඉතුරු ටිකට සෝඩා හලලා ඒක රධ්‍ය අයියගෙ කටේ ගහලා ඉතුරු ටික අයුක අයියගෙ කටේ ගැහුවා.. රධ්‍ය අයියා මම දන්න විදියට එච්චර බොන්නෙ නෑ.. ඒකා මූණ ඇද කරගෙන අර බෝතලෙන් උගුරු දෙක තුනක් බීලා කට පිහිදාගත්තා..

" ඒ ඒ කියාන් ඔය ඇති බං.."

" උඹලා ඉඳපන්කො.. මෙ ප#කො දෙන්නට කිසි ගානක් නෑ මම මෙහේ තනිවෙනවා කියලා.. ඈ රධ්‍ය.. උඹලගෙ අර අප්පච්චිගෙ අම්මටහු-කැහ්-කැහ්-"

" කියාන් අයියෙ.. මෙ..!!"

@Shan

" උඹලා මුන් දෙන්නා එක්ක පට්ට හැපී එකේ ඉද්දි මට හෙන සතුටු හිතුනා මචං.. උබට කියන්න.. මේ කියාන්.. ඕන හු#තකට උබලා දෙන්නා එක්ක ඉන්නවා.. අයුකයා.. උඹ.. ආයෙ මෙහෙ වරෙන් ඈ.. උඹලා මාව දාලා ගිහින් නාවොතින්.. හෙනම ගහපන්.. බේසික කොල්ලො දෙන්නා..කැහ්-"

ඊටපස්සෙ කියාන් අයියා තව ග්ලාස් එකක් අරගෙන කටට හලාගෙන රධ්‍ය අයියවයි අයුක අයියවයි අතෑරලා මමයි සෙනුකයි ඉන්න තැනට ඇවිත් අලිපැටියා වගේ අපේ ඇඟට බර දීලා කරට අතක් දාගෙන පහත් වුණා..

" සනෙරු මල්ලෙ.. උඹට පේනවද අර-අර අතන රවාගෙන ඉන්න ප#යව.. රධ්‍ය.. මගෙ සුදුඅම්-මියව.. අන්න ඒකා.. උඹට ලව් කරන්නෙ කොට කලිසම අඳින කාලෙ ඉඳලා.. ඔය මෝඩ මූසලයට මම කිව්වා.. ගිහින් අහපන්.. උඹෙන් කියලා.. මූ හොඳ වැඩී හර්තෙ බං.. උගේ හිත පට්ට.. මෙන්න මෙතනින්ම"

කියාන් අයියා මිට මොලවලා මගේ පපුවට පාරක් ගැහුවා..

" මෙන මෙතනින්ම.. බොක්කෙන්ම ලව් උඹට තමා.. උඹලා බැඳපල්ල ඈ.. මාත් බඳිනවා මගෙ සුදු කෙල්ලව.. මගේ වෙඩිමට උඹලගෙ මිනිස්සු දෙන්නා එවපල්ලා.. අනික සෙනුකයා.. උඹ.. මගේ අයුකයව බලාගනින්.. මම දන්නවා-මම දන්නවා උඹ තමා ඒක බොක්කෙන්ම කරන්නෙ.. හර්ත.. අර මුල් කාලෙ දුන්නා වගේ හු#න ලයින් නම් දෙන්න එපා පුතෝ.. මකනවා මම උඹව.. මදාවියො දෙන්නා.."

කියාන් අයියා ආශි ඉඳපු පුටුවට බර වෙලා ආශිව එහෙට තල්ලු කල්ලා ඒකෙන් ඉඳගත්තා.. ආශි ගිහින් මහීශගෙ ඇහේ වැදිලා යාන්තම් නොවැටී වාරු වුණා..

" අඩෝ දුකයි බං.. මොන මගුලක්ද උබලට අපිට මේ වුණේ.."

" ඕයි රධ්‍ය රධ්‍ය.. වැටෙයි යකෝ..!! මෙන්න මූව අල්ලගනින්.."

නැගිට්ටින්න ගිහින් පැටලිලා බිම ඇදගෙන වැටෙන්න ගිය රධ්‍ය අයියව සයෝන් අයියා අල්ලගෙන පුටුවෙන් ඉන්දුවා.. මේ මොන මගුලක්ද මේ ඩිනර් එකකට ඇවිල්ලා කරගත්තේ.. ඒ අස්සෙ රධ්‍ය අයියා මෙලෝ සිහියක් නැතුව වටේටම හලාගෙන බොහොම අමාරුවෙන් ඔට්ටු වෙලා වීදුරුවකට

@Shan

විස්කි වගයක් හලාගෙන ඒක බීගෙන බීගෙන ගිහින් දඩාස් ගාලා ග්ලාස් එක බිම අතැරියා..

" කියානයා.. මචං.. මම එනවා හරි.."

රධ්‍ය අයියා කියාන් අයියට ඇඟිල්ලක් දික් කල්ලා කියලා මූණ අත් දෙකින්ම තද කල්ලා පිහිදගෙන පුටුවට වාරු වුණා.. ඒ අස්සෙ ආශිටත් වෙරි වෙලා.. ඒකිත් එහෙට වැනෙනවා මෙහෙට වැනෙනවා.. අභිරු අයියත් බීලා.. එතන පිස්සුවක් වගේ වුණා..

" සෙනුකයා අයුක අයියව අල්ලගනින්.. අර පුටුවෙනුත් බිම ඉන්නෙ.."

" මොන මගුලක්ද බං.. දැන් මුන් එක්ක කොහොමද අපි ගෙවල් වල යන්නෙ.."

" බලමුකො මොකක් හරි කරගන්න.."

" මම කිව්වා මේ මිනිහට බොන්න එපා කියලා.. ශිට්!"

සෙනුක බැන බැන ගිහින් අයුක අයියව හෙන අමාරුවෙන් සයෝන් අයියා එක්ක උස්සලා පුටුවෙන් තිබ්බා.. අයුක අයියනම් නාලා ඉන්නෙ.. බොනවා බොනවා ඉවරයක් නෑ..

කොහොම හරි රෑ දොළහා විතර වෙනකල්ම රධ්‍ය අයියයි, අයුක අයියයි, කියාන් අයියයි, අභිරු අයියයි, ආශියි බීලා එතන එක පිස්සුවක් කෙලියා.. මම මේ හැමදේම දිහා බලාගෙන හිටියේ මහා හිස් හැඟීමකින්.. ඒගොල්ලොන්ට දුක ඇති තමා.. රධ්‍ය අයියත් බිව්වට පස්සෙ මෙහෙම ඉන්නවා මම දැක්කමයි.. අප්පච්චිත් ගෙදර ඉන්නවා.. මේ මනුස්සයා මොන මගුලක් කරනවද මට හිතාගන්න බෑ.. මෙහෙම ගෙදර යන්න පුළුවන්ද අනික.. ආධ්‍ය අයියටවත් කෝල් එකක් ගත්තනම් හරි.. ඒත් ආධ්‍ය අයියා මොන ලෝකෙ ඉන්නවද දන්නෙත් නැනෙ..

අන්තිමට කොහොම හරි කෙලින්න ඕන සේරම පිස්සු කෙලලා අයුක අයියා වීදුරු දෙකක් විතර බලෙන්ම සෙනුකයටත් පොවලා සියලු තත්ත්වයන් සාමකාමී වුණා.. සෙනුකයට නම් ඔය ශොට් දෙක දැනෙන්නවත් ඇති කියල මම හිතන්නෙ නෑ.. ඕකා අමු බෙබද්දා ඔහොම

@Shan

හිටියට.. ඌ අයුක අයියව එක්කන් යන්නම කියලා කලින්ම කියලා තිබුණෙ..

" ගෙදර යමු බං.. මම ආශිව අපේ ගෙදර එක්කන් යනවා..මෙහෙම ගියොත් ආශිගෙ ගෙදරින් කේස් වේවි.. කියාන් අයියවත් ගෙදරින් දාගෙනම යනවා.."

" හා එහෙනම්.. උඹට අවුලක් නැද්ද.."

" නෑ නෑ.. මරු ගෑනියි මිනිහයි.. බේබද්දො දෙන්නා.."

" ම්ම්.. සයෝන් අයියත් යනවා කිව්වනෙ.."

සයෝන් අයියා හෙටෙල් එකෙ වේටර් කෙනෙකුත් හෙල්ප් එකට අරගෙන් අහිරු අයියවත් වාරු කරගෙන පහළට ගියාම මහීශාත් ආශිවයි කියාන් අයියවයි එක්කගෙන යන්න ගියා.. මම බිම වැටිලා පෙරලීගෙන ශර්ට් එකේ බොත්තම් ටිකත් බාගයක් ගලවගෙන ඉන්න රධ්‍ය අයියා ගාවට ගිහින් තියන කේන්තියට පයින් එකක් ඇන්නා.. කාපන් මාව.. මම දැන් කොහොමද මේකව ගෙදර ගිහින් ඇරලන්නෙ.. අප්පච්චි මාව මරලා රෙක්සිට කන්න දාවි..

" එන්න දැන් යමු ගෙදර.."

" ම්ම්.."

" එන්නකො.. කෝ අත දෙන්න.."

මම රධ්‍ය අයියගෙ අතින් ඇදලා ළඟ තිබ්බ පුටුවකුත් අල්ලගෙන බොහොම අමාරුවෙන් නැගිටලා රධ්‍ය අයියව උරහිසට වාරු කරගත්තහම ආයෙම දෙන්නත් එක්කම බිම ඇදගෙන වැටුණා..

" කෙලින් ඉන්නවකො අයියෙ.."

ඒ එක්කම වේටර් කෙනෙක් රූම් එකට ඇවිත් දොර ගාවින් හිටගත්තා...

" Do you need any help sir..?"

" Ya ya.. Can you help me carry him to the car..?"

@Shan

" Sure sir.."

ඊටපස්සෙ මම වේටර්ගෙ උදව්වෙන් රධ්‍යා අයියවත් අරගෙන ගිහින් කාර් එකේ පිටිපස්සෙ දොර ඇරලා රධ්‍යා අයියව කාර් එක ඇතුළට දාලා වේටර්ට තැන්ක් කල්ලා වාහනේ ස්ටාට් කල්ලා ඒසී ඕන් කලා.. දැන් ලයිසනුත් නැතුව හරිහැටි මෙක එලවගන්නත් බැරුව කොහොමද ගෙදර යන්නෙ.. මට මෙකව මරාගෙන කන්න හිතයි.. බෝතලයක්ම කට ගහගෙන බීලා..

" මහ්.. වරද්.."

" ඕ.. ඔයාට වොමිට් වෙන්න වගේද.."

" නෝප්!! නෝප්!! වොමිට් කරන්නෙ නෑ.."

" ඔහොම ඉන්න පොඩ්ඩක් එහෙනම්.."

මම පිටිපස්සෙ සීට් එකේ පැත්තකින් වාඩිවුණාම රධ්‍යා අයියා නැගිටලා ඇදිලා ඇවිත් මගේ උරහිසේ ඔලුව තියාගත්තා..

" වරද්.."

" ම්ම්..??"

" ගෙදර.."

" ඔයාට ගෙදර යන්න ඕනද.."

රධ්‍යා අයියා පොඩි ළමයෙක් වගේ මගේ අතක් බදාගෙන තව ටිකක් මගේ ළඟටම ඇදිලා ඇවිත් බෙල්ල අස්සෙ මූණ තියාගත්තා..

" මගේ ගෙදර.."

" යන්න ඕනද.."

" නෑ එයා ඉන්නවා.. මෙතන.. වාඩිවෙලා.."

රධ්‍යා අයියා කතාකලේ වචනෙන් වචනෙ.. හරි හිමින්.. ඇහෙන නෑහෙන ගානට..

@Shan

" කවුද.."

" මගේ ගෙදර.."

මම රධ්‍ය අයියගෙ මූණ බැලුවහම එයාගෙ මූණට හොඳටම දාඩිය දාලා.. ඇස් දෙකත් පියාගෙන මගේ අතකුත් බදාගෙන ඉන්නවා.. එයා මගේ අත පොඩ්ඩක්වත් අතඇරියේ නෑ.. හරියට මම එයාව මේ මොහොතේ දාලා යයි වගේ.. තදින්ම අල්ලගෙන හිටියා.. රධ්‍ය අයියා ගෙදර කියන්නෙ මටද.. මගේ පපුවෙ පැත්තක් හිරිවැටීගෙන යනවා වගේ දැනුනා.. එයා හරි අහිංසකයි මේවෙලේ.. පොඩි ළමයෙක් වගේ..එහෙම වචනෙන් වචනෙ අමුණලා කතාකරද්දි..

" අයියා.. මට වරද්.. දැක්කහම.. හංගගන්න හිතෙනවා.."

"....."

" එයා.. ගණන්.. වරද්දනවා.. මට.. කේන්තියනවා.."

"....."

" අප්පච්චිට.. යන්න කියන්න.. මට කැම්පස්.. යන්න දෙන්නකො.."

"....."

" අයියා.. මම.. තනිවෙනවනෙ.."

"....."

" අයියා නැතුව.. වරද් නැතුව.. මට නිදාගන්න බෑ.. අම්මට යන්න.. එපා කියන්න.."

" අයියෙ.."

" වරද්.. මගෙ.."

" ඔයාගෙ..??"

" මගෙ හැමදේම.. මගෙ ගෙදර.."

@Shan

" ඔයාට වතුර ඕනද.. මිමි..??"

මම ටිශූ එකක් අරගෙන ඒ සී එක වැඩිකල්ලා රධ්‍ය අයියගෙ බෙල්ලෙයි මූණෙයි තිබුණු දාඩිය පිහිදැම්මා.. එයාගෙ මූණ පිහිදාද්දි රධ්‍ය අයියා මගේ අත අරගෙන එහාට කල්ලා එයා ටිශූ එක ඉල්ලගෙන මූණ පිහිදාගත්තා

" ඒ ලෙවෙල්.. ඉවරවෙනකල්.. මම.. වරද්ට.. මොකුත්.. කියන්නෙ නෑ.."

" ඇයි මොකුත් නොකියන්නෙ.."

" එයාට කරදරයක්.. එහෙම.. ඕන නෑ.."

" එයාට ඔයා කරදරයක් නෙමෙයි.."

" මගෙ වරද්.."

" වරද් ඔයාගෙද.."

" මිමි.. මගෙ.. වරද්.."

" ඇයි වරද්ට ආදරේ.."

රධ්‍ය අයියා එකසැරේම ඇස් දෙක ඇරලා ටිකක් වෙලා ඉස්සරහා බලාගෙන ඉඳලා ලාවට හිනාවුණා.. හරියට එයාට මොනවහරි මතක් වෙනවා වගේ.. මම එයා දිහා බලාගෙනම හිටියා..

" වරද්ට.. ආදරෙයි.."

" හේතුව.."

" හේතුවක් නෑ.."

" හේතුවක් නැද්ද.."

" නෑ.. ආදරෙයි.. එච්චරයි.."

" එහෙමද.."

@Shan

" ම්ම්.. එයා.. මෙඩිසින්.. යනවා.. මම ඉන්ජිනියර් කෙනෙක්.. වෙනවා.."

" වරද් මෙඩිසින් යයිද.."

" ඔව්.. එයා.. බැඩ්මින්ටන්.. ප්ලේ කරනවා.."

" තව.."

" වෙලාවට කන්නෙ නෑ.. බෙහෙත් අමතක කරනවා.."

" ඔයා මොකද කරන්නෙ.."

" මතක් කරනවා.."

"....."

" වරද්.. කිව්වා.. This is a modern fairy tale.. No happy endings.. No wind in our sails.. But I can't imagine a life without.. Breathless moments.. Breaking me down.. කියලා.."

ටිකකින් රධ්‍ය අයියගෙ උරහිස ගැස්සෙනවා මට දැනුනා.. ආයෙම එයා අඬනවා.. මම ආසම නැති දේ.. එයා අඬන එක.. මේ දෙවෙනි වතාව..

" අප්පච්චි..හ්හ්-ගහනවා.."

" අයියෙ.. අනේ අඬන්න එපා.."

" මගේ මෙතන.."

රධ්‍ය අයියා මගේ අත අරගෙන එයාගෙ ශර්ට් එක එහාට මෙහාට කල්ලා පපුවෙන් තියාගත්තා..

" එතන අඬනවා.."

මම රධ්‍ය අයියගෙ නළලින් හාද්දක් තියලා එයා පපුවට තුරුල් කරගත්තා.. මම කවදාවත් හිතුවෙ නෑ ආදරේ කරන්න.. කිසිම කෙනෙක්ට බැඳෙන්න.. ඒකත් පිරිමියෙක්ටම..

@Shan

ඒත් දැන් හුඟ කාලෙක ඉඳලා මම හරිම නරක විදියට මනුස්සයෙක්ට ඇබ්බැහි වෙනවා.. මේ මොහොතෙත් මම දැන් විනාඩියකට කලින් ආදරේ කරනවටත් වඩා රධ්‍ය අයියට ආදරේ කරනවා.. රධ්‍ය අයියා මගෙ පපුවෙ මූණ අතුල්ලලා පපුව උඩින් කම්මුලක් තියාගත්තා..

" අපි ගෙදර යමු.. කෝ එහාට වෙන්නකො දැන්.."

" බෑ..වරද්ට.. ඩ්‍රයිව්.. කරන්න බෑනෙ.."

" වරද්ට යන්තම ඩ්‍රයිව් කරන්න පුලුවන් කවවො.. ලයිසන් නැති එක තමා අවුලකට තියෙන්නෙ.."

" බෑ බෑ.. මම කරන්නම්.."

" මෙන්න මෙහෙ.. බැලුම්බෝල පුම්බන්න තමා යන්න වෙන්නෙ.. මෙතනින් වාඩිවෙන්නකො.."

මම රධ්‍ය අයියව සීට් එකට හේත්තු කල්ලා ඩ්‍රයිවින් සීට් එකෙන් වාඩිවුණා.. මාමගෙ කාර් එක වාහන නැති ගමේ පාරෙ පැද්දට.. මෙහෙ කවමදාවත් ජීවිතේට ආසාවකටවත් මම ඩ්‍රයිව් කල්ලා නෑ.. පැසෙන්ජර් සීට් එකේ වාඩිවෙලා ගිලින්න විතරනෙ මම දන්නෙත්.. හොදවැඩෙ වරද්.. උඹට මාමා කට කැඩෙනකල් කිව්වනෙ පුරුදුවෙයන් කියලා.. දැන් හරිනෙ අමාරුව..

" පොලිසියෙන් නම් ඉන්න එපා දෙයියනේ.."

මම තුස් තුන් කෝටියක් දෙවි දේවතාවොන්ගෙ පිහිට පතාගෙන කාර් එක ස්ටාට් කල්ලා රිවස් කරගෙන පාකින් ලොට් එකෙන් එළියට දාගත්තා.. පපුවත් ගැහෙනවා.. මොකෙක් හරි ලයිසන් එක පෙන්නන්න කිව්වොත් මොකක්ද පෙන්නන්නෙ.. මූණ තමා පෙන්නන්න වෙන්නෙ.. අයිඩී එකක්වත් ළඟ නෑනෙ.. නැත්නම් ඒකවත් පෙන්නන්න තිබ්බා..

ඒ වුණාට දෙයියෝ බැලුවා වගේ කොහේවත් පොලිසියෙන් හිටියෙ නෑ.. මමත් ඉබ්බා යන්න වගේ හෙන හිමින් කාර් එක ඩ්‍රයිව් කරගෙන ගෙදරට යනකල් පැය දෙකක් ඩ්‍රයිව් කරගෙන ආවා.. පොඩි එකෙන් ට්‍රයිසිකලයක් පැදගෙන ගියානම්.. මට ශුවර්.. ඌ මට කලින් ගෙදරට පදිනවා.. අපිව පහුකරගෙන කොටින්ම කිව්වොත් මිනිස්සුත් ඇවිදගෙන ගියා.. මටම ලැජ්ජයි මතක් වෙද්දිත්.. කොහොම හරි මම ගෙදරට එද්දි මාමා මුළු ගෙදරම

@Shan

ලයිට් දාලා ඉස්තෝප්පුවට වෙලා බලාගෙන ඉන්නවා.. මගේ මූණ පෙනිලද මන්දා.. දුවගෙන කාර් එක ගාවට ආවා.. මට මේක කපලා ඇතුලට දාගන්න තේරෙන්නෙ නෑ.. මාමා දුවගෙන ඇවිත් ශටර් එක ගාවට පහත් වෙද්දි මම තියන අහිංසකම හිනාව දාලා මාමට හිනාවුණා.. අදනම් කනවා පුතේ..

" සුදුමහත්තයා!!! දැන් වෙලාව කීයද.."

" අනේ මාමෙ.. මම කියන්නම්.. ප්ලීස් ඉස්සෙල්ලම මේක පාක් කරන්නකො.."

" බැහැපන් එළියට.. අදනම් අඩු කඩනවා උඹලා දෙන්නගෙ.."

මම හෙමින් සැරේ එළියට බැස්සහම මාමා කාර් එකට නැගලා කාර් එක වත්ත ඇතුළට දාලා බැස්සා.. මම ගේට් එක වැහුවා.. මාමා මට දෙකක් රවලා ඇතුලෙ ඉදපු රධ්‍ය අයියව අත් දෙකට උස්සගෙන ගේ ඇතුළට ගියා.. මට ගෙට යන්නත් මොකක්ද වගේ.. ගියොත්නම් කනවා මට ශුවර් ශුවර්.. හොදටම ශුවර්.. මම කකුල් දෙකත් අද්ද අද්ද හිමිහිට ගෙට බඩගාද්දි මාමා ෆෝන් එකත් කනේ ගහගෙන ඉස්තෝප්පුවට ආවා..

" ආධ්‍යද කතාකරන්නෙ.. ඔයාට වරද්ගෙ ගෙදරට එන්න පුළුවන්ද.."

මාමා ෆෝන් එක කට් කල්ලා මං ගාවට ඇවිත්මගේ කනෙන් අල්ලගෙන ගේ ඇතුලට ගෙනිහින් දොර වැහුවා..

" උඹට අද මම.. මම.. ඉදපන්.."

මාමා අම්මගෙ වේවල්වලින් හදපු මල් මිටියෙ මලක් ගලවලා විසික් කල්ලා ඒක දිගැරලා දෙපැත්තට වන වන මං ගාවට ආවා..

" අනේ මාමෙ.."

" මාමෙ..?? යකෝ.. මෙච්චර රෑ වෙලා.. තනියම වාහන අරන් ඔහොම එනවද.. කියපන්. එනවද.. එනවද.."

" ආව් ආව්.. රිදෙනවා.. අනේ ගහන්න එපා අප්පා.."

මාමා දිගට හරහට මට වේවැල වනාගෙන ගියා.. ඒවා හීනි නිසා එච්චර රිදෙන්නෙ නෑ. ඒ වුණාට මාමා ගහද්දි දුක හිතෙනවනෙ..

@Shan

" එන මගදි කරදරයක් වුණානම්.. කාටද කියන්නෙ.. ආ.. උඹලට මේවා විහිලු.. අද කාලෙ අහන්න දකින්න තියන දේවල් එක්ක.. මගේ පපුව නතරවෙනවා තව ටිකකින්.."

මාමා ආයෙම වේවැල උස්සලා මට පාරක් ගහන්න යද්දි ගෙදර දොර ඇරගෙන ඇතුළට ආවෙ ආධ්‍ය අයියා.. මෙච්චර ඉක්මනට ආවෙ.. මේ ළඟද ඉඳලා තියෙන්නෙ.. ගුටි කන අස්සෙ මට ඒවත් මතක් වුණා.. මාමා මට ගහන්න වේවැල ඉස්සුවා විතරයි මම ආධ්‍ය අයියව ඉස්සරහට දාලා ගිහින් ආධ්‍ය අයියගෙ පිටිපස්සෙන් හැංගුණා.. තා ඩිංගෙන් මාමා මගේ සූර දූතයට වේවැලෙන් ගහනවා.. මාමා ආධ්‍ය අයියව දැකලා ලාවට හිනාවෙන්න ගිහින් ආයෙම මාව දැකල මල පැන්නා..

" ඇයි මේ.."

" ඇයි..?? ඇයි කියලා අහන්න ඕන අන්න අර කාමරේ දාපලා ඉන්න එකාගෙනුයි.. මෙන්න මේ අපේ ගෙදර හරකගෙනුයි තමා.."

" ඔයා කලබල නොකර ඉන්නකො මිස්ටර් අනුරාග්.. මේ ළමයත් බයවෙනවා.."

" ඒකතමා මගුල.."

මාමා අත දික් කල්ලා මගේ පිට මැද්දට පාරක් දුන්නහම ආධ්‍ය අයියා මාමට දෙකක් රවලා මාව තුරුල් කරගත්තා..

" ඇයි චූටි.. මොකද වුණේ.. ඔයාලා ඩිනර් එකට ගියාද.."

" මරු ඩිනර් එක.."

මාමා ආධ්‍ය අයියටයි මටයි රවලා සෙටියෙන් ඉඳගත්තා..

" ඩිනර් එක කියන්නෙ.. මේ.. රධ්‍ය අයියයි යාළුවොයි පොඩ්ඩක් ලිකර් ගත්තනෙ.. මේ.. වෙරි වෙලා.. ඩ්‍රයිව් කරන්න බැරි නිසා.. මම ඩ්‍රයිව් කලේ.."

" මොකක්..?? චූටි..!! මොනවද ළමයි මේ කරන්නෙ.. දෙයියනේ.. කරදරයක් වුණානම් එහෙම.. කෝ රධ්‍ය.."

" කාමරේ.."

@Shan

" දෙන්නම වැරදී චූටි.. ඔයාලා ගියේ ඩිනර් එකකට කියලනෙ.. බලන්න කරන වැඩ.. මම අල්ලගන්නම්කො රධ්‍යව.."

" අල්ලගනී.."

මාමා ආධ්‍ය අයියට රැව්වහම ආධ්‍ය අයියා මාමා දිහා බලලා කට ඇද කරගත්තා..

" මොකක්ද මිස්ට අනුරාග්.."

" මොකුත් නෑ.. ආධ්‍ය ඩිස්පැන්සරි එකේද හිටියෙ.."

" ඔව්.. ඔයාගෙ කෝල් එක නිසා ආවෙ.. රෑ පේශන්ස්ලා නැනෙ.."

මම ආධ්‍ය අයියව ඉස්සරහට තල්ලු කල්ලා බිත්තියට හේත්තු වුණා..

" එයා ආධ්‍ය පුතා.. මාමෙ.."

" උඹ ඉඳපන් කට වහගෙන.. පොල්පිති හරකා.. අක්කා කියනවා වගේ මූ නම් කපාගෙන තියෙන්නෙ පොල්පිත්තෙන් තමා.."

" මොනවද ඔයා මේ ලමයට කියන්නෙ.. චූටි ගිහින් වොශ් එකක් දාගෙන එන්න..මම මාමා එක්ක කතාකරන්නම්.."

මම ආධ්‍ය අයියට හිනාවෙලා කාමරේට රිංගලා මගේ ඇඳේ දපලා ඉන්න රධ්‍ය අයියගෙ පස්සට දෝත බදලම එකක් ගැහුවා.. මදැයි මේකා නිසා මම විඳින අපහාස ගොඩ.. අනික මුන් දෙන්නගෙ රැහිල්ල යකෝ.. මෙහෙම රහපාන්න නළුවොන්ටත් බෑ.. හිතාගෙන ඉන්නෙ මම කොණ්ඩයක් බැඳපු චීනෙක් කියලා වෙන්න ඇති.. මෝඩ සාකිච්චයි මෝඩ අනුකිච්චයි..

මම ටවල් එකත් අතේ දාගෙන සාලෙ මැද්දෙන්ම දුවගෙන නාන කාමරේට ගිහින් දොර වහගත්තා.. සෙනුකයා ගෙදර ගියාද දන්නෙ නෑ.. ශේප් එකේ අම්මා විතරක් ඇහැරිලා හිටියොත් හොඳයි.. අනික අර ආශි.. බේබද්දී.. ආයෙම හම්බුනොත් කොට වෙන්න ඔලුවට ගහන්න තියෙන්නෙ බේසික කෙල්ලගෙ..

මම සුටුස් ගාලා ඇඟ හෝදගෙන ඇඳුමකුත් ඇඳගෙන අර දෙන්නා කතාකරන්නෙ මොනවද කියලා ශේප් එකේ අහගෙන හිටියා.. කල දූටු කල

@Shan

වල ඉහගන්න ඕන කියලා සෙනුකයා මට කියලා දීලා තියෙනවා..

" සොරි අනූ.. මම හිතුවෙ නෑ මෙච්චර දෙයක්.. අනේ කැගහන්න එපා එයාලා බයවෙනවනෙ.."

" සාකි මේ ළමයි මෙහෙම නලවලා හදලා හරියන්නෙ නෑ.. අද මොකක් හරි කරදරයක් වුණානම් එහෙම.."

" ඒගොල්ලො එහෙම කරගන්නෙ නෑ.. යාළුවා යන නිසා දුකෙන් ඉන්න ඇත්තෙ.. සිටුවේශන් එක පොඩ්ඩක් තේරුම්ගන්නකො ළමයො.."

" ඒ වුණාට කරපු වැඩේ වැරදී.. ඔයා ඒකට සුදුහුණු ගාන්න හදන්න එපා.."

" මම එහෙම කලේ නැනෙ.. වැරැද්දක් තියෙනවා තමා.. ඒත් පරිස්සමට ගෙදර ආවනෙ.. පස්සෙ අවවාද කරමු.. ළමයින්ට ගහන්න යන්න එපා.. මම කැමති නෑ.."

" මම ඒක බලාගන්නම්කො.. දැන් ආයෙම ඩිස්පැන්සරි එකට යන්න ඕනද.."

" ම්ම්.. යන්න ඕන.. ළඟනෙ තියෙන්නෙ.. නර්ස් පේශන්කෙනෙක් ආවොත් කෝල් කරන්නම් කිව්වා.."

" ඉන්න මම තේ එකක් හදන්නම්.."

" මම පොඩීව බලලා එන්නද.."

" ම්ම්.."

මම බොරුවට ටැප් එක ඇරලා දැන් නාගෙන එළියට ආපු එකා වගේ ටවල් එකෙන් මූණත් පිහිදදා කාමරේට ආවා.. ආධ්‍ය අයියා රධ්‍ය අයියා ගාවින් ඉදගෙන එයාගෙ ඔලුව අතගානවා..

" පොඩී.. නැගිටින්නකො.."

" ම්ම්.."

" මොනවද මේ කරන්නෙ ළමයො.. මම බයවුණානෙ.."

@Shan

" මම.."

" කොච්චර කතාකලත් ඔච්චර තමා අයියෙ.."

" එයා හෙන ප්‍රෙශර් එකක ඇත්තෙ.. නැත්නම් මෙහෙම කවදාවත් කරන්නෙ නෑ.. අනික ඔයා ඉද්දිත් මෙහෙම හැසිරෙන කෙනෙක් නෙමේ පොඩී.."

" අපි ඔක්කොම දුරට වෙනවනෙ.. එයා ඒකෙන් අවුලෙන් ඉන්නෙ.."

" මට තේරෙනවා.. කමක් නෑ පරිස්සමට ආවනෙ.. ආයෙනම් මේ වගේ ගමන් යන්න එපා.. ඔයාලගෙ මාමට කේන්ති ගිහිල්ලා.."

" හුම්.."

" මාමා බයවෙලා.. ඔයාට ගැහුවට පස්සෙ දුක හිතේවි.."

" ඒකතමා.. අද රධ්‍ය අයියා අපේ ගෙදර ඉන්නෝද අයියෙ.."

" ඒකතමා මම කල්පනා කලේ.. මෙහෙ ඉඳලා උදේට යද්දි මම එක්කන් යන්නම්.. මාත් එක්ක හිටියා කියලා ගෙදරට කියනවා.."

" හා.."

ඒ එක්කම අපේ මාමා තේකකුත් අරගෙන මගේ කාමරේට ආවා..

" සා-ආ-ආධ්‍ය.. ආ.."

" තැන්ක් යූ අනුරාග්.."

ආධ්‍ය අයියා තේකත් අරගෙන කාමරෙන් එළියට ගියාම මම රධ්‍ය අයියගෙ මේස් දෙක ගලවලා ශර්ට් එකත් ගලවලා පැත්තකින් තිබ්බා.. හොඳටම නින්ද ගිහින් ගොරවනවත් එක්කන්.. ඊටපස්සෙ අර පත සයිස් ඩෙනිමත් ගලවලා මං ගාව තිබ්බ ශෝට් එකක් රධ්‍ය අයියට අන්දලා රෙද්දක් පෙරෙව්වා.. රධ්‍ය අයියා ටිකක් ඇහැරිලා එහෙට මෙහෙට වෙලා ආයෙම නිදාගත්තා.. මමත් කාමරේ ලයිට් ඕෆ් කල්ලා ඇඳෙන් හාන්සි වුණා.. රධ්‍ය අයියත් එක්ක ඔට්ටු වෙලා මගේ හන්දිපත් රුදාවත් වැඩි වුණා.. මට ලාවට

@Shan

අපේ මාමයි ආධ්‍ය අයියයි ඉස්තොප්පුවේ කතාකරන ඒවා ඇහෙනවා වගේ... ඒ අස්සෙ නින්දත් යාගෙන එනවා..

" අප්පච්චි කෝල් කල්ලා බනිනවා අනූ.."

" ඕක ඕෆ් කල්ලා දාන්න.."

මම ආවා..



ඕතරීට වැඩ කෝටියයි ළමයි.. ඒවත් කොරන් යන අස්සෙ තමා අප්ඩේට් දෙන්නෙ.. ඔයාලගෙ මැසේජස් හැම එකකටම මම රිප්ලයි කරන්නම් ඉඩ හදාගත්තු වෙලාවක හොදේ.. මම මෙහෙ එන්නෙත් රෑ වෙලානෙ.. සමාවෙන්නෝ.. සියලු දෙනා තේරුම් ගනිත්වා.. ඒස්වාහා පුහ්ඃ..

එන්නාම්.. ලව් යූ.. ❤

ජයග්‍රාහී සියවෙනි එපිසෝඩුව.. මාත් එක්ක ඉන්න හැම දළඹු හටයෙක්ටම මම හුගාක් ආදරෙයි.. උම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්ම්වාහ්..!

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 101 කොටස

" අර්හ්.. කොහෙද මේ.."

" අයියේ.. අයියේ වෙලාව කියද~"

මම උදේ නාගෙන කාමරේට ඇවිත් ඔලුව පිහිදාද්දි රධ්‍ය අයියා ලාවට ඇස් ඇරලා හෝන්දු මාන්දු වෙලා කාමරේ අඳුනගන්න බැරුව, අපේ ගෙදර කුස්සියේ, උදේ ඇවිල්ලා මිස්ට අනුරාග්ට උයන්න උදව් කරන, ආධ්‍ය අයියට කතාකලා..

" නැකිටපිය බෙබද්දා.."

රධ්‍ය අයියා ජනේලෙන් එන ඉර එළියට ඇස් දෙක හීනි කරගෙන මගේ දිහා බලාගෙන ඉඳලා ඇඳෙන් ඉඳගෙන බිත්තියට හේත්තු වුණා..

" වරද්..??"

" ඕ.."

" මම ඇයි මෙහේ.."

පෙනේද මේ මනුස්සයා මොකුත් මතක නෑ වගේ රඟන හැටි.. දැන් නම් මට මේ රඟන රූඟුම් බලලා ඇතිවෙලා ඉන්නෙ.. අරහෙත් දෙන්නෙක් මම ගොනා ගානට දාලා හද්ද බාලාංශෙ රූඟුමක් රඟනවා.. ඒ අස්සෙ මගේ මිනිහත් රඟපාන්න පටන් අරගෙන.. අම්මපා හිතුනොත් සේරම පැත්තකින් දාලා නාමෙල් මාලිනී පුංචි තියටර් වගේ මාත් දානවා ලොකුවට තියටර් එකක්.. හොස්පිටල් තියටර්ම යන්න ඕන කියලා නීතියක් නැනෙ.. මම තියටර් යන්නෙ මෙහෙම.. හිච්චි වරද් පුංචි තියටර්.. ඔය තියෙන්නෙ ලස්සනට නමත්.. දාලා මංගල දර්ශනේට මල්වඩම් අනවශ්‍යයි පෙන්නනවා.. එක්කො බල්ලොත් එක්ක බැත් හොඳයි.. ඒකට සෙනුකයට එන්නම කියන්න ඕන.. ලෝරන්ස්ගේ මනාලිත්.. මම්.. මම්.. ඕන පුපක්..

" මැම හැයි මෙහේ තමා.. ඇත්තටම ඔයාට මොකුත් මතක නැද්ද ඒයි.."

@Shan

රඩ්‍ය අයියා ඔලුවත් දෙපාරක් තුන්පාරක් කසලා දෙපැත්තට වැනුවහම මම බයවෙලා ඇඳෙන් වාඩිවුණා.. අනේ පුතේ..

" ඒ කියන්නෙ-ඒ කියන්නෙ ඔයාට ඊයෙ අපි අතරෙ සිද්දවුණු කිසිම දෙයක් මතක නැද්ද අයියෙ.."

රඩ්‍ය අයියා ටිකක් වෙලා මගේ දිහා අමුතුවට බලාගෙන ඉඳලා පොරවන රෙද්ද උස්සලා ඇඟ දිහාත් බලාගෙන හිටියා.. ආයෙම ඇස් දෙක ලොකු කරගෙන මගේ දිහා බලලා, මම රැක් එකේ දාලා තිබ්බ එයාගෙ ඇඳුම් දිහාත් බලලා ආයෙම පොරවන රෙද්ද ඇඟට තියලා තද කරගත්තා..

" මොක-මොකක්..??"

" ඇයි පුදුම වෙලා වගේ.."

" ඊයෙ මොකක්ද වුණේ..??"

රඩ්‍ය අයියා නහුතෙටම බයවෙලා අඬන්න ඔන්න මෙන්න මූණක් හදාගෙන මගෙන් අහද්දි මට හිනා යන්න ඇවිල්ලා මැරෙන්න හැදුවත් මම දත කාගෙන දුක හිතෙන මූණත් හදාගෙන රඩ්‍ය අයියගෙ මූණට පාත් වෙලා කම්මුලෙන් පෙක් එකක් තිබ්බා..

" ඇයි අපි තරු බලන්න ගියා මතක නැද්ද.. ඔයා මගේ වුණේ.."

ඒ එක්කම රඩ්‍ය අයියගෙ හුස්ම හිරවෙලා ඒකා මැරෙන්න ගියා..

" ක-කවුරු කාගෙ වුණා..??"

" ඔයා.. මගේ.."

රඩ්‍ය අයියා මගෙන් එහාට වෙලා ඇඳේ කොණටම ගියාම කොන්දත් අල්ලගෙන එහෙමම පහත් වුණා.. මම්.. ඊයෙ බිම පතබෑවුණානෙ.. කොන්ද රිදෙනවා ඇති තමා.. සේරම වාසිය වරද් පැත්තට..

" අනේ.. ඔයාට ගොඩක් රිද්දලද මම අයියෙ.. අනේ සොරි.."

" මොන මගුලක්ද කළේ වරද්.."

@Shan

" සො-සොරි.. ඔයාට පේන්කිලර්ස් මොනවහරි.. පෙනඩෝල් දෙන්නද.. සොරි සොරි මම හිතන්නෙ මම ඔයාට රෆ් වුණා වැඩී.. ඩික්ලොෆැනක් සෝඩියම් සපොසිට්‍රි එකක් දුන්නනම් හරි.."

" මම උඹව මරනවා.."

රධ්‍ය අයියා මාව පිටිපස්සට තල්ලු කල්ලා දාලා කොන්දත් අල්ලගෙන ඇඳෙන් නැගිටලා ගිහින් අල්මාරියෙන් ශර්ට් එකක් අරගෙන ඇඳගත්තා..

" ඇයි මාව මරන්නෙ.."

මම රධ්‍ය අයියට පේන්න අපේ අම්මා රෑට ඇඟේ ගාලා නිදාගන්න ගෙනැල්ලා දුන්නු පෙයාස් එකේ නිල් පාට බේබි ක්‍රීම් බෝතලේ අරගෙන දෙපාරක් තුන්පාරක් ගසලා අතට හලාගෙන ඒක අත් දෙකේ ගාගෙන රධ්‍ය අයියා දිහා බැලුවහම රධ්‍ය අයියා මං දිහා බයවෙලා වගේ බලාගෙන ඉඳලා පොඩ්ඩක් එහෙටයි මෙහෙටයි ඇඹරිලා බැලුවා..

" රිදෙනවද ඒයි.."

" ඊයෙ මොකක්ද වුණේ කියපන්..!!"

" මොනවා වෙන්නද.. ඔයා නාගසලං වෙන්න බීලා, ඔයාට කරදර කරන්න කියලා මාව මහ නරක විදියට පොළඹ ගත්තා.. Oh god..!! you are so hot ඒයි .. that makes me crazy.. ඔයාම තමයි කිව්වෙ Whatever you do, don't stop.. I need you inside of me.. I love when you push me against the-"

" වරද්!!!!!"

" කමෝන්..!! මම මේ කියන්නෙ ඔයා කරපුවා තමයි.. දැන් ලැජ්ජ වුණාට කරන්න දෙයක් නෑ.."

රධ්‍ය අයියගෙ මූණ දෙකක් වෙලා, රතු වෙලා, පිපිලිලා යන්න ඔන්න මෙන්න තියෙද්දි මට බකස් ගාලා මහා හයියෙන් හිනා ගියා.. හෙන ආතල්.. දෙයියනේ මගේ මනුස්සයගෙ මූණට අබ අහුරක් විසික් කලානම්.. ඒක පුපුරලා යනවා සුවර්..මම හිනාවෙලා හිනාවෙලා දෙකට තුනට නැමිගෙන එහෙමම ඇඳට පතබෑවුණාම රධ්‍ය අයියා අත දිගෑරලා හොඳ පාරක් මගේ පශ්චාත් භාගයට දමලා ඇරියා..

@Shan

" උඹට-උඹට මම වරද්..ඉඳපන්.. දුවන්නෑ..!!"

රධ්‍ය අයියා මගේ මේසෙ උඩ තිබ්බ දිග අඩිරූලත් අරගෙන වන වන මගේ පැත්තට එද්දි මම ඇඳ ගාව තිබ්බ ජනේලෙන් එළියට පැනලා ගේ වටෙන් කුස්සියට දුවගෙන යද්දි කෙලගෙන රධ්‍ය අයියත් කුස්සියටම ඇවිල්ලා.. මම බ්‍රේක් නැතුව ගිහින් දෙහි වගයක් මිරික මිරික ඉඳපු ආධ්‍ය අයියවත් පෙරළගෙන පාපිස්ස ලිස්සලා ගිහින් පුප බිම ඇනගත්තා..

" චූටියො.. මොකද මේ.."

" ඉඳපන් වරද්..!!!"

" අනේ අයියෙ.. මූට පිස්සු හැදිලා.."

" පොඩී!!!"

" මොකද බං මේ නටන්නෙ.."

" ආව්.. ආව්.. යනවා.. ආවොත් ගහනවා රධ්‍ය අයියෙ!!"

" වරද්!!!!!!!!!!!!!!"

මම ආධ්‍ය අයියව අල්ලලා අපේ මාමගෙ ඇහේ ගහලා කුස්සියේ දොරෙන්ම පැනලා එළියට දුවගෙන ගියාම රධ්‍ය අයියත් කගවේනා වගේ දුවගෙන ඇවිත් මගේ ශර්ට් එකේ කොලර් එකෙන්ම අල්ලගත්තා..

" ඉඳපන් දහලන්නැතුව.."

" ආධ්‍ය අයියේ!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

රධ්‍ය අයියා මගේ කට දෙපැත්තෙන් අල්ලගත්තහම මම රධ්‍ය අයියගෙ බෙල්ලෙන් අල්ලගත්තා.. අල්ලගෙන ගිහින් ගෙදර ඉස්සරහා තිබ්බ පිහිඹියා ගහට තද කරගත්තහම, රධ්‍ය අයියා මාව පිටිපස්සට තල්ලු කල්ලා උස්සලා අරගෙන ගහට තද කලා..

" අනේ.. ආධ්‍ය අයියෙ එන්නකෝ!!!!"

" ආධ්‍ය අයියෙ..!!? කට කඩනවා මම.."

@Shan

රඩ්‍ය අයියා අර අඩිරුලෙන් මගේ කකුල් දෙකට දීගෙන දීගෙන යද්දි මට අතට අහුවුණ පිහිඹියා කොළ ටික ගුලි කල්ලා වප්ප කල්ලා රඩ්‍ය අයියගෙ කටේ එබුවා..

" කැහ්-තුහ්-තුහ්"

" කාපිය කොළ.. හැකරල්ලා.."

රඩ්‍ය අයියා මගේ ඉණ වටේ අතක් යවලා මාව උස්සගත්තහම මම කකුල් දෙක ගසලා ගසලා බිමට බැහැගන්න ට්‍රයි කලා.. මෙ යකා උසයිත් එක්කන්.. පොල් ගහක් වගේ.. ඒ මදිවට මම ඉන්නෙ උඩු යටිකුරුව.. මට පේන්නෙ ඔක්කොම ඔලුවෙන් හිටගෙන.. ඒ අස්සෙ එහාගෙදර අක්කත් ඔලුවෙන් හිටගෙන කටත් ඇරගෙන අපේ ගේ දිහා බලාගෙන රෙදි වනනවා මගේ ඇස් දෙකට අහුවුණා.. රඩ්‍ය අයියා මාව අර ටවල් එක කරේ දාගන්නවා වගේ කරේ දාගෙන ගෙට ඇවිදගෙන යද්දි මමත් අත් දෙක බිමට එල්ලගෙන එහෙටයි මෙහෙටයි වැනි වැනී පරඬැල වගේ හිටියා.. ඔලුවත් ගැස්සුනාද කොහෙද.. ඔලුවෙන් හිටගෙන.. ඒ අස්සෙ මගේ දර්ශන පථේට රඩ්‍ය අයියගෙ ලොකු පස්ස අහුවුනා විතරයි මම ඒ කලිසමෙන් අල්ලගත්තා..

" තියපිය මාව බිමින්.."

" උඹව ගිහින් ලිපට දානවා.."

" හැබැයි කලිසම ගලවනවා හරි.."

" ගලවපන් බලන්න.. කරන දේ බලාගන්න.."

" ඇයි මොකද ඔවා.."

මම දඟලන නිසා රඩ්‍ය අයියා මාව ගිහින් සෙටියට අතැරියා ඔලුවෙන් හිටගෙන ඉන්නම.. මම ඊටපස්සෙ උඩුකුරු වෙලා උඩ පැනලා රඩ්‍ය අයියගෙ අර තඩි පස්සට පාරක් දුන්නහම රඩ්‍ය අයියා ගිහින් බිත්තියේ වැදුනා..

" අලි විසේද බොලාට.. සුදුමහත්තයා!!!"

@Shan

" බලන්න මාමෙ.."

නොදකින්.. මේ රඨ්‍ය ගැටහැලප පොලොස්කොට්ටෝරුවා.. බැලැන්න මැමෙ ගාගෙන මාමගෙ අස්සෙ රිංගගත්ත හැටි විතරක්.. දෙන්න හිතයි.. තරු පේන්න.. මගෙ තමා වැරැද්ද.. අපරාදෙ ආඨ්‍ය අයියට කැමතිවෙන්න තිබ්බෙ.. කැමතිවෙලා යාලුවෙලා මුන් දෙන්නව බලෙන්ම කසාද බන්දනවා.. එතකොට ඉන්නෙ නැතැයි ඔංචිලි පැද පැද ජීවිත කාලෙම.. මමයි ආඨ්‍ය අයියයි එකට හොස්පිටල් ගිහින්, එකට ගෙදර එනවා.. ඇවිත් සතුටින් ජීවත් වෙනවා..

" රඨ්‍ය අයියා පටන්ගත්තෙ මාමෙ.."

" බොරු මාමෙ.."

" බොරු නෙමේ.. මූ මට කිව්වා, මම අහක බලාගෙන දාපු රොටියක් වගේ කියලා.."

රඨ්‍ය අයියගෙ ඇස් දෙක පොල් ගෙඩි දෙකක් සයිස් ලොකු වුණා..

" අම්මෝ වරද්.. බොරු කියන්නෙපා.."

" සුදුමහත්තයා..!! ගහනවා උඹට.. නටන්නැතුව ගිහින් තේක බීපිය.. මෙ අනිකා.. අර දෙහි එක අල්ලලා පොවනවා මං.."

මාමා මටයි රඨ්‍ය අයියටයි ටොකු දෙකක් ඇනගෙන ගිහින් කුස්සියට තල්ලු කලාම මම ලිස්සලා ආඨ්‍ය අයියගෙ අස්සට රිංගගත්තා.. කවුරු වෙනස්කම් කලත් මගෙ මස්සිනා වෙනස්කම් කරන්නෙ නෑ.. මම ඒක දන්නවනෙ..

" ඉවරද නටලා.. වරද්ලගෙ මාමෙ.. කරපිංච කොහෙද තියෙන්නෙ.."

එකපාරම පලවෙනි කිරි උගුර පාඩුවෙ කටට අරගත්තු මටයි රඨ්‍ය අයියටයි කිරි එක නහයෙන් ආවා.. නෑ නෑ මගේ නහයෙන් ආවෙ කිරි.. රඨ්‍ය අයියගෙ නහයෙන් ආවෙ දෙහි..

" කැහ්-කැහ්-කැහ්"

" කැහැහ්-කැහ්-කැහ්"

@Shan

" කැහ්-කැහ්-කැහ්-අයියෙ-කැහ්"

" කැහ්-කැහ්-කැහ්"

" කැහ්හ්හ්!!"

" උඹලට කාසෙද ඒසැරේ.."

" කැහ්-නෑ නෑ.. මම යනවා.. කැහ්.. අම්මො නහය.."

" මමත්..කැහ්"

මම කිරි එකත් අරගෙන මූණත් පිහිදාගෙන සාලෙට එන්න ආවහම රධ්‍ය අයියත් ශේප් එකේ ලිස්සලා මගේ පස්සෙන්ම ආවා.. අහපල්ලකො.. ඒ සැරේ වරද්ලගෙ මාමලු.. යසයි ආධ්‍ය අයියෙ.. දවසක දැනගත්තොත් එහෙම ඔය කරපු රහපැම් වල බිහයින්ඩ් ද සීන්ස් අපි දන්නවා කියලා.. අර පැස්බරාද මොකාද පුප උඩ දාගෙන වැලි අස්සෙ මූණ ගහගන්නෙ.. ඒ වගේ අපේ ගමේ මිදුලෙ දෙන්නටම මම වල ගානෙ හාරලා දෙනවා ඔලුව ඔබාගන්න.. ඔලුව බැරිනම් මුළු ඇඟම හරි කමක් නෑ..

" අපේ අයියා කවදා ඉඳන්ද රහපාන්න පටන්ගත්තෙ වරද්.."

" මම හිතන්නෙ හුඟ කාලෙක ඉඳලම රහපාන්න පුළුවන් සාකිච්චට.. සැක් නේද ඒයි.."

" ඒව් අපේ අයියා.."

" මටත් ලැජ්ජ හිතුණා ඒකටනම්.."

මම කිරි එක බීගෙන බීගෙන ගිහින් ශර්ට් එකේ කරෙන් කට පිහාගත්තා..

" උඹට ලැජ්ජාව වගේ ඒවා දැනෙනවද.."

" ඕ.. හැබැයි මෙහෙමයි.. දැනෙන එකතරා වෙලාවක් තියෙනවා.. හැමතිස්සෙම නෑ.."

" මම්.. මම නාගන්න යනවා.. මෙන්න මෙකත් හෝදන්න.. හොඳ ළමයනෙ.."

@Shan

රධ්‍ය අයියා දෙහි වීදුරුව මගේ ඇහේ ගහලා පුපත් උඩදාගෙන කාමරේට වැදුනහම මම හොඳට මූණ පිහිදගෙන ආයෙම කුස්සියට ගියා.. දෙන්නත් එක්ක උයනවා හෝ ගාලා.. වරද්ලගෙ මාමයි.. අනිත් එක්කෙනා රධ්‍ය පුතාගෙ අයියා පුතා වෙන්න ඇති.. අම්මප මගෙ හිතට බ්‍රේක් නැතුව වචන ගලාගෙන එනවා.. කියාගන්න විදියක් නැති හැටි.. මම ගිහින් වීදුරු දෙක හෝදලා රැක් එකෙන් තියලා එතන බංකුවෙන් ඉඳගත්තා.. දැන් කරපල්ලකො බලන්න ලව්.. මේ වරද් ඉන්නකල් එච්චා හඳේ තමා.. අපිව මේ රවට්ටන රැවැට්ටිල්ලට.. ඔස්කාර් සම්මානයක් අරගෙන අපේ මාමගෙ ඔලුවට දමලා අරින්න තියෙන්නෙ..

" සුදුමහත්තයා.."

" ඕ.."

සාකිච්චගෙ අනුකිච්චෝ..

" අර කරපිංචා ගහෙන් ඉති දෙක තුනක් කඩන් එන්න.."

" දැන්.."

" නැතුව.. කෑම කාලා කොළේ නිකන් කන්නද.. උඹත් මහ-"

" චූටියො.. ගේන්නකො.."

ආධ්‍ය අයියා මගේ දිහා බලලා අර සුර හිනාව පා කල්ලා එච්චහම මම පුටු කකුලටත් ගහගෙන නැගිට්ටා.. මේ හිනාව නිසා තමා අපි චූණත් අසරන වෙන්නෙ.. මූණ බලන් කොහොම බැ කියන්නද.. මම එළියට ගිහින් කරපිංචා ඉති තුනක් ගනන් කල්ලා කඩාගෙන ආවා.. වැඩිය කඩන නරක ළමයි හෙම නොවේ අපි..

" කෝ රධ්‍ය.."

" නාන්න ගියා අයියෙ.."

" මාමා වැඩට යන්නෙ නෑ.."

" යන්න ඔන.. මේ ටිකේ නිවාඩුවක් දැම්මා.. ලබන සතියේ අපි යනවා මෙහෙන්.."

@Shan

" අපි මෙහෙන් යනෝද.."

" ම්ම්.."

" යන්නත් දුකයි වගේ අනේ.."

" ඒ මොකෝ චූටි.."

" නෑ ඉතින් මම අවුරුදු හතක්ම මෙහෙනෙ හිටියෙ.."

" එහෙම තමා චූටි.. අකමැත්තෙන් වුණත් සමහර දේවල් කරන්න වෙනවනෙ.. නේද.."

ආධ්‍ය අයියා මගේ හිත හැදෙන්න එහෙම කිව්වහම මාමා හැරිලා ආධ්‍ය අයියා දිහා බැලුවා..

" ඒකතමා.."

" දැන් චූටි ඉස්කෝලෙ හෙඩ් ප්‍රිෆෙක්ට්නෙ හෙට ඉඳලා.."

" අයියලා නැතුව පාළුයි ඒත්.."

" මාස ටිකනෙ.. ඉක්මනට ගෙවිලා යාවි කියලා හිතමුකො.. ඔය දෙන්නා කොච්චර හොඳද.. මං වගේ මුල්ලකට වෙලා ඉන්නෙ නැතුව ඉස්කොලෙ හැම වැඩේටම ඉදිරිපත් වෙනවනෙ.."

" ඇයි අයියා ගියේ නැත්තෙ.."

" මම වැඩිය ආස නෑ දුවලා පැනලා ඉන්න.. ලයිබ්‍රි එකට හරි ලැබ් එකට හරි වෙලා තමා ඉන්න පුරුදුවෙලා හිටියේ.."

" කමක් නෑ ඔයා ඉතින් ලස්සනයිනෙ.. ජේන්න ගිහින් කවුරුහරි උස්සන් ගියානම් එහෙම.."

" ආධ්‍යව උස්සන් යන්නත් කට්ටිය ඉඳලද.."

අපේ ඉරිසියාකාර මාමා අපේ කතාව මැද්දෙන් උදැල්ල දැම්මා..

@Shan

" නැතුව.. හිටියා නේද අයියෙ.. ඔව් නෙ.."

" පිස්සුද චූටි.."

ආධ්‍ය අයියා අපේ මාමා දිහා ලාවට බලලා මගෙන් පිස්සුද ඇහුවහම මාමගෙ මූණ හට්ටියක් විතර වුණා.. වෙලා ලුණු බෝතලේ දඩාස් ගාලා මේසෙ උඩින් තිබ්බා..

" මොකද මාමෙ සද්ද කරන්නෙ.. ආධ්‍ය අයියා ආස නෑ සද්ද කරනවට.. නේද අයියෙ.."

" ම්ම්.."

" උඹ කටපියාගෙන අන්න අරහෙට පලයන්.. ආවා උයන අස්සෙ මගුලක් කතාකරන්න.."

" ඇයි ඔවා එලවන්නෙ අපිව.."

" එලවන්නෙ. මෙතන බෙලෙක්කෙ වගේ කියවනවා කියවනවා සිහියෙන් වැඩක් කරගන්නත් නෑ.."

" හරි ඉතින් අපි යන්නම්.. ඉවරනෙ.. මෙයාගෙ සද්දෙ.. බුලත් කන බුලත් හප්පා.."

" සුදුමහත්තයා..!!!"

මම කුස්සියෙන් නැගිටලා කාමරේට දුවගෙන ආවා.. දැන් අහපන් බැනුම බුලත් කනවට.. දත් දොස්තර මාමෙ.. මම කාමරේට ඇවිල්ලා පිලිවෙලට අස් කල්ලා තිබ්බ ඇඳේ පෙරලිලා වහල දිහා බලාගෙන හිටියා.. අපි මෙහෙන් යන්නනෙ ඉන්නෙ.. යන්නත් දුකයි වගේ.. අම්මයි මමයි තනියම ඉදපු කාලෙ මතක් වෙනවා.. ඉස්කෝලෙ ඇරිලා අතුරුපාර දිගේ දුවගෙන ඇවිත් ගේට්ටුවෙන් ඇතුළට පුරුද්දට පැනගෙන එන හැටි.. අම්මා ඉස්තෝප්පුවට වෙලා බලාගෙන ඉන්න හැටි.. අම්මගෙ මල් පැළ පාත්තිය.. අඹ ගහ ගාව ගල් බංකුව.. කොළරොඩු හිරවෙන වවුල් බෙට් පිරිච්ච පීල්ල.. මගේ ඇද ගාව ජනේලෙ කාමරේ, කාමරේ බිත්තියක් වැහෙන්නම ගහපු ඇනිමි පෝස්ටර්ස්.. හැමදෙයක්ම මට මතක් වෙච්.. දැනටත් එළියට බැස්සහම පේන ගල් බංකුව දැක්කහම මට මතක් වෙන්නෙ සෙනුකයා,

@Shan

මම, ආශි, මහීශා ඔකෙ ඉඳගෙන වල්පල් කියවන හැටි.. රධ්‍ය අයියා ගනන් කියලාදෙන හැටි.. අම්මා හිත රිදෙන කතාවක් කිව්වහම අඩ අඩ ආච්චිඅම්මට දුක කියන්න යන හැටි..

ඒත් ඉතින් අපි හැමදාම නවතින්න මේවගෙ ඇවිල්ලා නැනෙ.. යන්න වෙන දවසට යන්න වෙනවා..

මම පරණ දේවල් මතක් කරගෙන මනෝ පාරක් ගහන් කාමරේ ඉද්දි රධ්‍ය අයියා නාලා සුවඳ ගගහා කාමරේට ඇවිත් දොර වගහෙන මං ගාවට ඇවිත් මූනට අල්ලලා කොණ්ඩෙ ගැසුවා.. මුළු කොණ්ඩෙම වතුර මගේ මූණට විසික් වෙන්න..

" ඒයි.. අයියෙ!!"

" අයියා තමා.. ඇයි.."

" මගේ මූණෙ වතුර විසික් වුණා.. ටවල් එක මෙහෙට එනවා!!"

රධ්‍ය අයියා මට ටවල් එක දුන්නෙ නැති නිසා මම කොට්ටෙන් මූණ පිහිදාගත්තා..

" මෙ ඒයි.. මම ඔයාට කියන්නම් සාකිලගෙ මල්ලි කියලා.. ඔයා මට කියන්න අනූලගෙ පුතා කියලා.. හොඳයි නෙ.."

" මම.."

" තාම ඔලුව රිදෙනව වගේද.."

" දැන් නෑ. නැවම අඩු වුණා.."

" හොඳවැඩේ බේබද්දට.. බිව්වට.."

රධ්‍ය අයියා ටවල් එක රැක් එකට දාලා ඇවිත් මං ගාවින් ඉඳගෙන මගේ අත් දෙකින් අලගත්තා.. එයා නාපු නිසා අත් දෙක සීතලම සීතලයි.. ඊටපස්සෙ මගේ කම්මුලකින් හාද්දක් තිබ්බා..

" සොරි වරද්.. ඊයෙ.. ඇත්තටම මොනවා වුණාද මට මතක නෑ ලොකුවට.. මගේ වැරැද්ද.. මට නොබී ඉන්න තිබ්බා."

@Shan

මම රධ්‍ය අයියගෙ අත් දෙකේ මගේ ඇඟිලි පටලගෙන අල්ලගත්තා..

" එහෙම ඕන නෑ.. That's fine.."

"  It won't happen again.."

රධ්‍ය අයියා මගේ කම්මුලකින් අල්ලලා මගේ තොල් වලින් පෙක් එකක් තිබ්බා.. තියලා මාව බූවල්ලෙක් වගේ බදාගෙන ඇඳේ පෙරළුනා..

" අයුක ඩ්‍රොප් කරන්න රෑට යන්නත් ඕන.."

මම දහලලා දහලලා රධ්‍ය අය්‍යගෙ අත් දෙක අස්සෙන් මූණ එලියට දාගෙන එයාගෙ පපුව උඩින් මූණ තියාගත්තා..

" සෙනුක..??"

" මම සෙනුක මල්ලිවත් එක්කගෙන යනවා.."

" එතකොට මම.."

" ඔයාවත් එක්කගෙන තමා යන්නෙ.."

" අයුක අයියා යනවා කියලා තාම මගේ හිතට තාම විශ්වාස කරගන්න බැරුව ඉන්නෙ.. එයා ඉක්මනට ඒවිද.."

" ම්ම.. ඒවි.."

" එතකොට ඔයා..??"

" මමත් එනවා.."

" අපරාදෙ අපේ තරුන කාලෙ.. ඔයා කැම්පස් ගියානම් අපිට හම්බෙන්න තිබ්බනෙ.. දැන් මම හෙට ඉඳන් ඔයා නැතුව ඉස්කෝලෙ යන්න ඕන.. මුල ඉඳන් ස්පෝර්ට්ස්මීට් අරවා මේවා.. කරන්න හිතෙන්නෙ නෑ අනේ.. මට ආයෙම ඉස්කෝලෙ යන්න හිතෙන්නෙම නෑ.. පොඩ්ඩක්වත් නෑ.."

රධ්‍ය අයියා මගේ කොණ්ඩෙ අවුස්සලා මාව තව ටිකක් තුරුල් කරගත්තා..

@Shan

" සේපාලිකා ගහට පාළු හිතේවිනෙ.."

" ගහට විතරනෙ පාළු.."

" ගහටයි.. ගහේ අයිතිකාරයටයි.. ගහේ අයිතිකාරයගෙ අයිතිකාරයටයි.. ඔක්කොන්ටම පාළුයි.."

" ඔයා එක්ක වෙලාවකට මට කේන්ති යනවා.."

රධ්‍ය අයියා මාව කොට්ටෙ උඩින් තියලා ඔලුවට අතකුත් තියාගෙන අතට වාරුවෙලා මගේ මූණට එබුණා..

" මම නිසා..??"

" මිම්.. මොකුත් නෑ.."

" නැත්තෙ නෑ.. ඒ මොකක්ද ඒ.."

" නෑ.. ඔයා ඉතින්.."

" ඉතින්.."

" ඔයා හැමතැනම ඔයාව මතක් වෙන්න දේවල් හදලා හදලා යනවා.. මම ඒ සේරම දිහා බලාගෙන ඔයාව මතක් කරන් ඉන්න ඕන.. හෙන අසාධාරනයි වගේ නැද්ද.."

" හ්ම්ම්.."

" ඔයා හෙට විතරනෙ ඉන්නෙ.. හවස එළියට යමුද.. හාද.."

" යමු.. ඔයාට කොහේද යන්න ඕන.."

" කැමති තැනක.. අප්පච්චි කමක් නැද්ද.."

" අයියට කියලා බලමු.."

" හා.."

@Shan

" වරද්.. ඔයාට මතකද මම ඔයාව පළවෙනියටම කිස් කළේ කොහෙද කියලා.."

" ඔව්.. සික් රූම් එකේනෙ.. අර මම.. ආම් ස්ලින්ග් එකක් දාගෙන ඉදපු දවසෙ.."

" අර මැච් එක බලන්න ආවෙ නැහැයි කියලා අමුතු ලයින් ගොඩක් දුන්නෙ.."

" අනේ මෙ ඉන්නවා.. හැබැයි කියන්න බෑ තවුසෙ මම අර ෆේන්ට් වුණ දවසෙ හොරෙන් කිස් කලාද දන්නෙ නෑ.."

" පිස්සුද උඹට.."

" ඔව් නේද.. ඔයා ඉතින් හෙන හැදියාව ඇති හොඳ ළමයනෙ.. මට මතකයි හරිත.. අර මගෙ කැනියුලා එක ගලවලා දාලා කටේ කිරි එකක් ඔබලා ඉවරවෙලා, ඇඳුම් ගලවපන් කිව්වෙ.."

රධ්‍ය අයියා හයියෙන් හිනාවෙලා මගේ නලලට ඇඟිලි දෙකකින් තට්ටුවක් දැම්මා..

" ලමයි.. මම ඇතුළට එනවා.."

ආධ්‍ය අයියා එළියෙ ඉදන් කතාකරපු පාර මම ඇඳෙන් පරලිලා ගිහින් කොණටම වෙලා ඉඳගත්තම රධ්‍ය අයියා මෙහා කොණෙන් ඉඳගත්තා..

" එන්න අයියේ.."

" කන්න එන්න ළමයි.. පොඩී නැවද.. අප්පච්චි කතාකරනවා ගෙදර එන්නලු.."

" ඒ මොකද.."

" ගිහින් බලමුකො.. දෙන්නම එන්න ඉක්මනට.."

ආධ්‍ය අයියා එළියට ගිහින් විනාඩි දහයකින් විතර මම එළියට යන්න යද්දි අපේ මාමා සෙටියේ ඉඳගෙන ආධ්‍ය අයියගෙ වැලමිට ගාව්න් සේලයින් බටයක් ගැටගහලා ලේ එකක් සිරින්ජර් එකකට ගන්නවා.. මම දොර

@Shan

රෙද්දට මුවා වෙලා බලාගෙනම හිටියා.. මාමා ලේ අරගෙන ටියුබ් තුන හතරකට දාලා ඒක අරගෙන කාමරේට ගියාම ආධ්‍ය අයියා අත කොටන් එකකින්පිහිදගෙන ෂර්ට් එකේ අත පහලට කරගත්තා..

" අනූ.. මේ අහන්නකො.."

ආධ්‍ය අයියා ටිකකින් මාමා ගියපු කාමරේට ගියාම මම ශේප් එකේ බිත්තිය දිගේ ඇදිලා ගිහින් කාමරේ දොර ගාව නැවතුනා..

" මොකුත් අහන්නෙ නෑ සාකි.. මට මොකුත් කියන්න එපා.."

" මම හොඳින් ඉන්නවනෙ අනූ.. ඇයි මේ ඔයා මෙහෙම හැසිරෙන්නෙ කියන්නකො.."

" දැන්වත් ඔය රහපාන එක නවත්තගන්න ශාක්‍ය.. ENOUGH..!! JUST FUCKING ENOUGH!!"

" අනූ.."

" මේ අහන්න සාකි.. මම ඔයාට ආදරේ නිසා මේ සේරම කරන්නෙ.. පොඩ්ඩක් මට මේ වැඩටික කරගන්න ඉඩදෙන්න.. ප්ලීස්.. මාව කේන්තිගස්සන එපා!!"

හායි මගෙ දළඹු පැංචනේ.. හත්තික්කේ මෙකෙනම් ඉන්නෙ දළඹු හටයොම තමා.. ඒ අස්සෙ සේනාවත් එක් රැස් කල්ලා.. යසෛ යසෛ..

මගෙ පිස්සු කොල්ලොහ් කෙල්ලොහ් ටික.. ආදරෙයිනෙ ඉතින් සිව්ලිමෙන් එකක්ම.. මේ කලවැද්දා..

එන්නාම්.. ලව් යූ❤

අද මින්සියට නැග්ගක් හම්බුණා..



තැන්කුූ සෝ මච් මගෙ ලස්සන ලමයෝ @withlove_seokjinnie .. අනේ මම ආදරේම ආදරෙයි.. ❤❤❤❤❤❤

@Shan

තව පොඩි බඩ්ඩක් හම්බුණා දළඹුව්වියෙක්ගෙන්.. එයාගෙ හිතේ මැවිලා ඉන්න කතාවෙ කැරැක්ටර්ස් ටිකකගෙ ෆොටෝස්..

වරද්

වත්සල්

රධ්‍ය

අයුක

ආධ්‍ය

අනුරාග්

කියාන්

ආශි

මහීශා

@Shan

අහිරු

සයෝන්

තැන්කූ සෝ මච් මගෙ දළඹුවච්චියෝ..

❤❤❤❤❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 102 කොටස

" our father..."

ස්කූල් ඔෆ් අවර් ෆාදර්ස් ඇන්තම් එක කියද්දි මම හිටියේ මේන්හෝල් එකේ ප්‍රිෆෙක්ට් බෝඩ් එකේ ඉස්සරහම ලයින් එකේ කොනේම හිටගෙන.. අවසානෙ මම තනි සුදුපාට බ්ලේසර් එකත් ඇන්දා.. අළුපාට හෙඩ් ප්‍රිෆෙක්ට් බැජ් එකක් තව අවුරුද්දක් ඉස්කෝලෙ යනවා.. මගේ එහාපැත්තෙ හිටියෙ චමිරු.. ඊට එහාපැත්තෙ නෆ්‍රාස්, සෙනුක, ජොනතන්.. මේ අවුරුද්දෙ සීනියර් ප්‍රිෆෙක්ට් බෝඩ් එකේ ටොප් බෝඩ් එක විදියට සිලෙක්ට් වෙලා හිටියේ අපි.. ජොනතන් කියන්නෙ අපි එක්ක පොඩි කාලෙ ඉඳලා හිටපු පට්ටම හොඳ කොල්ලෙක්.. අපි ඉස්සර ඌට කියන්නෙ දෙවියන්ගෙන් ලැබිච්ච තෑග්ග කියලා.. දවසක් උගෙන් කොමස් හාමුදුරුවො නමේ තේරුම ඇහුවහම ඌ කිව්වෙ ඒකෙ තේරුම දෙවියන්ගෙන් ලැබුණු තෑග්ගලු.. එදා ඉඳන් අපි ඌට විහිළු කරනවා.. ඩයල් එක බර්ගර්.. එච්චර සිංහල කතාකරාන්නත් බෑ.. ඒ වුණාට සුපර් ටැලන්ටඩ්.. අයුක අයියා එහෙම ජොනතන්ට හොඳට එකතුයි.. අයුක අයියා එකතුයි කියන්නෙ ඌ එසේ මෙසේ ඩයල් එකක් වෙන්න බෑ කොහොමත්.. මේ පාර ස්කූල් ක්‍රිකට් ටීම් එකේ කැපා ජොනා.. බිග්මැච් ප්ලේ කරන්න ඉන්නවා..

මම ඉස්සරහා බලාගෙන ඇන්තම් එක කියන අතරේ හිමින් සැරේ චමිරුගෙ බෙල්ල අස්සෙන් සෙනුකයා කොහේද බැලුවා.. සෙනුක උදේ ඇවිල්ලත් හොඳට කතාකලේ නෑ.. ඇස් දෙක රතුම රතු වෙලා ඉදිමිලා.. ඒකට උඩින් ෆවුන්ඩේශන් එකක් ගාගෙන ඇවිල්ලත් තිබ්බෙ.. ඒකා සුදු නිසා පොඩ්ඩක් අඩපු ගමන් මූණ රතු වෙලා ඇස් දෙක වටේ ඉදිමිලා වගේ පේනවා.. සැක් මේ චමිරුවා මැද්දෙන් හිටගෙනනෙ.. නැත්නම් මට නෆ්‍රාස්ට කියලා එතෙන්ට යන්න තිබ්බා.. මම කෝකටත් ඔලුව උස්සලා හෙනකඳයා වගේ ඉන්න ඩිපියුටි හෙඩා දිහා බැලුවහම ඒකා පපුව ඉස්සරහට දාගෙන හරි කෙළින් සීරුවෙන් ඇන්තම් එක කියනවා.. මේ කැඩෙට් කරන් උන්ට වෙලාවකට සමයං තමා.. ඇන්තම් එකේ මියුසික් එක හරියටම අන්තිම තප්පරේ වෙනකල් නතර වෙනකල් කොහේවත්ම බලන්නෙ නෑ.. ඔලුව නමන්නෙවත් මොකුත් නෑ.. හුස්ම හිර කරගෙන පපුව ඉස්සරහට දාගෙන මූණත් පුම්බගෙන ඉන්නවා.. මම ඉතින් හැමදාම දැකලා තියනවනෙ.. බෝයිපෙන් ඉන්නෙත් එහෙමනෙ..

@Shan

ඇන්තම් එක ඉවරවුණාට පස්සෙ මම ශේප් එකේ ආයෙම චමිරු දිහා බැලුවහම චමිරු මං දිහා ඇහිබැමක් උස්සලා අමුතු විදියට බැලුවා.. මම උගට රවලා පුටුවෙන් ඉඳගන්න යද්දිම නෆ්‍රාස් මට කතාකලා..

" ප්ස්.. මෙහ්.. උඹ ඕන්නම් සෙනුක  ගාවට වරෙන්.."

" හා.."

මම ශේප් එකේ කාටවත් අහුවෙන්නෙ නැතිවෙන්න නෆ්‍රාස්ගෙ සීට් එකට ගියාම නෆ්‍රාස් මට උගේ සීට් එක දීලා මෙහාට පැනගත්තා.. සෙනුකයා තාම අඬනවා.. මට හිතාගන්න බෑ මේකව කොහොම පරක්කරගන්නද කියලා.. මම ආවහම සෙනුක අතේ පෙහිලා තිබ්බ ටිශූ එකෙන් ඇස් දෙක යට පිහිදගෙන ඉඳගත්තා.. රධ්‍ය අයියලා හිටියෙ ප්‍රින්සිපල් සර්ගෙ සීට් එකට පිටිපස්සෙ රෝ එකේ වාඩිවෙලා.. එතන.. අයුක අයියගෙ පුටුව කියාන් අයියට එහාපැත්තෙන් හිස් වෙලා තිබ්බා.. මම වාඩිවෙලා සෙනුකගෙ අතට තට්ටුවක් දැම්මා.. කට්ටිය ඉන්න නිසා මොකුත් කියන්න විදියකුත් නෑ.. මේක මෙහෙම අඬ අඬ ස්ටේජ් එකට ගිහින් කොහොමද.. හෝල් එක පිරෙන්නම කට්ටියත් ඉන්නවා.. ටීචර්ස්ලත් ඉන්නවා..

මට මතක් වුණේ ඊයෙ රෑ.. අයුක අයියව ඩ්‍රොප් කරන්න කටුනායක ගිය වෙලේ වෙච්ච දේවල්.. මම දන්න කියන කිසිම කෙනෙක් මීටකලින් ඔහොම රට ගිහින් නෑ.. ඇත්තටම මම එයාපෝට් එකට ගියෙත් ඒ පළවෙනිවතාවට.. කලින් ගිහිල්ලම තිබ්බෙ නෑ..අයුක අයියගෙ කියන්න පවුලෙන්වත් ලොකු කෙනෙක් කවුරුත්ම ඇවිත් හිටියෙ නෑ.. හැමදේටම දුවලා පැනලා වැඩ කළේ කියාන් අයියයි රධ්‍ය අයියයි.. අපි යද්දි කියාන් අයියා අයුක අයියත් එක්ක එයාපෝට් එකට ඇවිත් හිටියෙ..

අයුක අයියගෙ ෆ්ලයිට් එක තිබ්බෙ රෑ එකයි ගානකට.. ඒ වුණාට කලින් යන්න ඕනනෙ එතනට.. සෙනුකයා මාත් එක්කමයි හිටියෙ.. ඌ පේන්න හොඳට හිනාවෙලා 'මම හොඳින් මචං අවුලක් නෑ' කියනවා.. ඒ වුණාට හෝ ගාලා කඳුළු වැක්කෙරෙනවා.. කතාකරගන්නවත් බෑ උගට.. සෙනුකයා දුක හිතුණහම කවදාවත් මම දුකින් ඉන්නෙ කියලා කියන්නෙ නෑ.. ඌ අඬන්නෙ නැත්තෙ නෑ අඬනවා.. අඬන්නෙ මම හොඳින් කිය කිය.. ඊයෙත් එහෙමයි.. අයුක අයියත් හිටියෙ මාරම අවුලෙන්.. දැන් ඒ මොහොත මතක් වෙද්දිත් මගේ පපුව හිරවෙන්න එනවා.. මට හිතාගන්න බෑ සෙනුකයා ඇත්තටම ඒ වෙලේ කොහොම හිටියද කියලා..

@Shan

අන්තිමට අයුක අයියා යන්න කලින් සෙනුකයව තුරුල් කරගෙන හුඟාක් වෙලා හිටියා.. අපි හිටියෙ ඈතින් උන් දෙන්නට කතාකරන්න දීලා.. සෑහෙන්න වෙලා ඔලුව ඉඹ ඉඹ අයුක අයියා දාහක් දේවල් සෙනුකයට කිව්වා.. ඌ ඒ සේරම ඔලුව වන වන අහගෙන හිටියා විතරයි.. කතාකලේ නෑ.. කතාකරගන්නත් බෑ.. අන්තිම මොහොතෙත් පරිස්සමට ඉන්න, ඉස්කෝලෙ වැඩ ටික කරගන්න, රිසාල්ට්ස් අවුට් වුණු ගමන් අයියට කෝල් කරන්න කියලා අයුක අයියා සියවෙනි සැරේටත් සෙනුකයට කිව්වා.. මම ඒ දෙන්නගෙ රිලේශන්ශිප් එක ඇතුලෙ පෞද්ගලික දේවල් ලොකුවට හාර අවුස්සන්න යන්නෙ නෑ.. ඔය ඉඳලා හිටලා වලියක් දාගෙන සෙනුකය අමූණ දෙක කරන් ඉද්දි ඒක බේරන්න උදවු කරනවා ඇරෙන්න.. මොකක් වුණත් අයුක අයියා සෙනුකයට මාර විදියට ආදරෙයි. ඒකා හැමතිස්සෙම අකියන්නෙ.. 'වත්සල් කොල්ලෙක් වුණත් මට අම්ම කෙනෙක් වගේ' කියලා.. මම හිතන්නෙ ඇත්තටම අයුකා යියට ගැලපෙනම කෙනා තමයි පහුවෙලා වුණත් ලැබිලා තියෙන්නෙ.. රධ්‍ය අයියත් ඇස් දෙකේ කඳුළු පුරවගෙන හීයා.. යද්දි අයුක අයියව බදාගෙන ඔලුව අතගාලා පරිස්සමට පලයන් කියලා කිව්වා.. කියාන් අයියත්..

අයුක අයියා මං ගාවට ඇවිත් ඔලුව අතගාලා 'වත්සල් එක්ක පරිස්සමට ඉන්න මල්ලි..' කියලා කම්මුලට තට්ටුවක් හිනාවෙලා ලැගේජ් එකත් අරගෙන ගේට් එකෙන් නොපෙනී ගියා.. ආයෙම එයා හැරිලවත් බැලුවෙ නෑ.. සමහරවිට හැරිලා බලන්න බැරුව ඇති.. ඒත් මම විශ් කරනවා සෙනුකයට කොහොම හරි අයුක අයියව හම්බෙන්න චාන්ස් එකක් ලැබෙන්න කියලා..

රධ්‍ය අයියා ඔක්කොම කාගෙන හිටියට.. මම දන්නවා එයා ඉන්නෙ ඔක්කොන්ටම වඩා ප්‍රෙශර් එකක කියලා.. සමහර වෙලාවට ඔලුව කැක්කුමයි කියාගෙන ඔහේ ඇඳේ වැටිලා ඉන්නවා.. කල්පනා කරනවා.. මගෙන් මොකද කරන්නෙ කියලා අහනවා.. මොනවද මේ වෙන්නෙ අහනවා.. ඒ හැමතැනකදිම මට සිද්ද වුණා අකමැත්තෙන් වුණත් කතානොකර නිහඬ වෙලා ඉන්න.. මොකද මං ගාව ඒ කිසි එකකට උත්තර නෑ.. උත්තර දෙන්නෙ කොහොමද මම දන්නෙ නෑ..

අයියගෙ අසනීප, අප්පච්චිගෙ ඉවරයක් නැති රණ්ඩුයි ප්‍රශ්නයි, ආධ්‍ය අයියගෙ ප්‍රපෝසල් එකේ ප්‍රශ්නෙයි, අම්මා රට යන එකයි, එයාගෙ හීන නැත්තටම නැතිවෙලා ගියපු එකයි, අකමැත්තෙන් දියතලාවෙ යන්න වෙන එකයි, හොඳම යාළුවා ලංකාවෙන් ගිය එකයි එයාට කල්පනා කරන්නයි දුක්

@Shan

වෙන්නයි දාහක් ප්රශ්න තිබ්බා.. මට වෙලාවකට හිතෙනවා මම එයාගෙ හිතේ තියන දුක ඇබ්සෝබ් කරගන්න ස්පොන්ජ් එකක් වුණානම් කියලා.. ර්යෙත් යන්න කලින් කිව්වා එයාට ජීවත්වෙන්න ඉතුරුවෙලා තියෙන එකම හේතුව මමයි අයියයි විතරයි කියලා.. දැන් ආධ්‍ය අයියට මාමා ඉන්න නිසා එයාට හිතට සහනයක්ලු..

" A senior prefect is a member of the most senior prefectorial group of College:

**The Prefects' Council**

. Selected based on the criteria of academics, co-curricular and extra-curricular, senior prefects are appointed on a probationary basis after completing the final exams at school.."

Of these only a handful are appointed as Senior Prefects. Since they have completed their final examinations, they are senior to any other student of the college. Hence their disciplinary powers extend to all students of College.."

And they effectively stay another year at school, monitoring and supporting all its academic, co-curricular and extracurricular activities in general. From amongst the Senior Prefects are chosen the Head Prefect to lead all prefects of the college, and the Prefects' Top Board, which consists of the Head Prefect (HP), the Senior Deputy Head Prefect (SDHP) and five Deputy Head Prefects (DHPs).."

මම ඉස්කෝලෙ මීඩියා යුනිට් එකේ කොල්ලෙක් කියන ස්පීච් එක අහගෙන ඉන්න ගමන් සෙනුකයගෙ අතින් අල්ලගත්තා වැඩිය නෝට් නොවෙන්න. සෙනුකයා වෙන කල්පනාවක ඉඳලා වගේ ගැස්සිලා ඇස් දෙකත් ලොකු කරගෙන මගේ දිහා බලාගෙන ඉඳලා ඉක්මනට පුටුවෙ කෙළින් වෙලා ඉඳගත්තා..

" ඕ බං.. ඇයි..??"

" ඇයි අහන්නෙ.. ඔලුව කැක්කුමයිද.."

@Shan

" මම.. පොඩ්ඩක්.. ලොකු අවුලක් නෑ.."

සෙනුකයගෙ නහයත් බර දාලා.. කටහඬ වෙනස්වෙලා ගිහින්..

" ශුවර්ද.. මම පෙනඩෝල් දෙකක් ඉල්ලන එන්නද.."

" පිස්සුද බං.. මෙන්න මෙහේ ඉඳපන්.. මට එහෙම අමාරුවක් නෑ.."

පැය බාගයක් විතර සෙරමනි එක ඇදගෙන ගියාම පරන සීනියර් බෝඩ් එකට එයාලගෙ සෙටිෆිකේට්ස් දෙන වෙලාව පටන් ගත්තා.. ඒකෙන් පස්සෙ තමා අපිට කැන්ඩල් ලයිට් කල්ලා ඕත් එක කියලා බැජ් ගන්න තිබුණේ.. මුලින්ම සීනියර් ප්‍රිෆෙක්ට්ස්ලට සෙටිෆිකේට්ස් දුන්නහම අන්තිමට ටොප් බෝඩ් එකට සෙටිෆිකේට්ස් දුන්නා..

"

**At this time, we would like to express our special thanks to all the brothers who have held senior positions in the 2023 Prefect Board of the school and invite them on the stage to receive the certificate of honorable and disciplined completion of their service..**

**Ayuka Shalya Sinhawansha (HP)Kiyaan Sadesh De Zilva ( DHP)Sayon Sathsara Perera ( GC )Radhya Shanaw Helaksha Adhikari (DGC )Abhiru Gaurawa Ekanayake ( DGC )..**

"

අයුක අයියා ඇරෙන්න අනිත් හැමෝම ස්ටේජ් එකේ හිටියා.. ඉස්කෝලෙ හැම වැඩකම පිළිගැනීපේ කතාව හරන එච් පී අද සෙරමනි එකේ නැති එක ලොකුවටම දැනුනා.. අයුක අයියට තියන ප්‍රවුඩ්ෆුල් ලුක් එක, ඒ හැසිරීම වුණත් ඉස්කෝලෙට මැච් වෙන්න මාරම ගතියට තිබ්බා.. මම අයුක අයියගෙ කැරැක්ටර් එකට ආසම එයා වැඩක් කරන්න ගත්තොත් ඒක බැහලම කරනවා.. වැඩි කලබල නෑ කතාබහ නෑ.. අවශ්‍ය දේට විතරයි.. රධ්‍ය අයියත් එහෙමයි.. කියාන් අයියත් ඔය වැල් බයිලා කෙලගෙන හිටියට ස්කූල් ඩී එච් පී පොසිශන් එකේ ඉද්දි යකා වැහිලා වගේ.. ඒකට බැහැලා වැඩ කරනවා.. මූ අර අවුරුද්ද මුලදිම අපිට හෙන පාට් එකකුත් දැම්මෙ. බයෝ කරන එවුන් නේද.. ඇවිද ඇවිද ඉන්නෙ මොකද හැයි යැයි කියලා..

@Shan

මට අදටත් මතකයි මමයි සෙනුකයයි ඉස්සර අපි යාළුවො කියලා ළඟින් තියාගෙන ඉඳපු උන් දෙනෙකුයි අපේ මේස පුටු ටික නැතුව ඒවා හොයන්න පහළට ගිය වෙලේ ඉස්ස ඉස්සෙල්ලාම මුන් ටික ඉස්කෝලෙ අඹ ගහ ගාව ගල් බංකුවල වාඩිවෙලා ඉඳපු හැටි.. කාලෙ කොච්චර ඉක්මනට ගෙවිලා ගිහිල්ලද.. හිතාගන්න බෑ..

ඊටපස්සෙ අලුත් ප්‍රිෆෙක්ට් බෝඩ් එක ස්ටේජ් එකට ගෙන්නලා හැමෝගෙන අතට ස්කූල් කලර්ස් වලින් ඩෙකරේට් කරපු කැන්ඩල් එක ගානෙ දීලා ඒවා පත්තු කලා.. මම හිටියේ ඉස්සරහම රෝ එකේ.. චමිරුවට එහාපැත්තෙ.. දැන් ඉතින් ඉස්කෝලෙ හැම ලබ්බටම මම ඉන්න එපැයි මුගේ එහාපැත්තෙ..  ඉටිපන්දම අරන් මට මූ රවද්දි පුපේ ගහන්න හිතයි.. ඇයි මගුල.. මම මොකුත් කරලත් නැතුව හැමතිස්සෙම රවනවා රවනවා ඉවරයක් නෑ.. එක්කො මූ කැමති මටද කොහෙද..

" I promise to do my very best at all times, to set a high example in my own conduct wherever I may be, to carry out my duties loyally and efficiently, to use the authority that has been given me firmly, but fairly and wisely, and to uphold the honor of my school always.."

ඊටපස්සෙ අර ඉටිපන්දම ඉස්සරහට කල්ලා අල්ලගෙන ඕත් එක කියලා ඉවර කලා.. ඒ ගමන්ම ප්‍රින්සිපල් සර් අපි ඉන්න රෝ එක මැඟැරලා අනිත් හැමොගෙම තනි සුදුපාට බ්ලෙසර්ස් වල ස්කූල් ලෝගෝ එක ගහපු සිල්වර් බැජ් එක ගානෙ ගහගෙන ගියා.. මම ඉස්සරහා බලගෙනම හිටියා.. කෝ අනේ අපේ මාමා.. කොයි ලෝකෙ ඉන්නවද මන්දා.. එන්නම් කියලා කිව්වනෙ..

**" Accordingly, the brothers who are selected for the new senior top board of our school are as follows..,Deputy Games Captain - Senuka Watsal DissanayakeDeputy Games Captain - Jonathan AndreGames Captain - Mohammad Nafraz NazirDeputy Head Prefect - Chamiru Ashwin SinhawanshaHead Prefect - Varadh Shaneru Udyoga.. We wish you all the best for your prefect leaderships and we trust that you will behave in a manner that will keep the school proud.. Thank you.. "**

සෙරමනි එකට ආපු ග්‍රේට් ඕල්ඩ් බෝයි චීෆ් ගෙස්ට් අපි පස් දෙනාගෙම බැජස් බ්ලෙසර්ස් වල පින් කල්ලා හෑන්ඩ් ශේක් කල්ලා ස්ටේජ් එකෙන්

@Shan

බැහැලා ගියාම මට විනාඩි පහක විතර කතාවක් කරන්න තිබ්බා.. ඊටපස්සෙ ජොනාටත්.. සෙනුකයට කතාකරන්න කටහඬ අවුල් නිසා ජොනා ශේප් එකේ කතා කල්ලා අපි ස්ටේජ් එකෙන් බැහැලා ඇවිත් සෙරමනි එක ඉවරවෙනකල්ම ඉඳගෙන හිටියා.. හෝල් එකේ හයසීයක් වගේ ඉන්නවා.. ප්‍රයිමරි බෝඩ් එකයි, ජූනියර් ප්‍රිෆෙක්ට්ස් බෝඩ්, එකයි කලින් ඉදපු බෝඩ් එකයි, අපියි, පේරන්ට්ස්ලයි, ටීචර්ස්ලයි.. එතකොට ඉතින් ගොඩක්නෙ.. මම අද තමා චමිරුගෙ අම්මව පලවෙනි වතාවට දැක්කෙ.. එයා මාර ලස්සන ආන්ටි කෙනෙක්.. චමිරු වගේ පුතෙක් ඉන්නවද කියන්නත් බැරි තරම් තරුණ පාටයි.. හැබැයි චමිරු අම්මා එක්ක එච්චර කතාකරන්නෙ නෑ වගේ.. මම දැක්කා උදේ අම්මගෙ අත ගසලා දාලා යනවා.. බලන් යද්දි ප්‍රශ්න නැති ගෙදරක් මම දන්න කියන උන්ට නෑ.. හැබැයි සෙනුකයගෙ ගෙදර මරු.. එහේ අම්මයි තාත්තයි මාර අවබෝදයක් තියන කපල් එකක්.. එකම වගේ මතෘකා තමා කතා කලත් කතාකරන්නෙ.. දෙන්නම ගුරුවරුනෙ ඒකනිසා..

අන්තිමේ දවල් වෙන්න සෙරමනි එක ඉවරවුණාම කියාන් අයියලා අපි ගාවට ඇවිත් විශ් කල්ලා හග් කලා.. රධ්‍ය අයියත් අපි ගාවට ඇවිත් අපි පස් දෙනාට හග් එක ගානෙ දීලා විශ් කලා.. ඒ වුණාට ඒ හැලපයා මගේ පස්ස කෙනිත්තුවා.. ඉඳපන් මම පස්සෙ අල්ලගන්න.. මම රධ්‍ය අයියට දෙකක් රැව්වහම සයෝන් අයියා අපි දෙන්නට හිනාවෙගෙන එහාට ගියා..

" මේ උඹලා අපේ නම තියාගෙන වැඩ කරපල්ලා ඈ.. අන්තිමේ උඹලව පුරුදු කරපු හැටි කියලා අපිට අහගන්න වෙයි.."

" අපි හදනවා ඉස්කොලෙ අම්මටසිරි වෙන්න.. ඔයාලට ඇඩෙයි.."

" හා හදපන්, අපි ඇවිත් අඩන්න.. උබට මම පස්සෙ කියන්නම් අඩන හැටි මදාවියා.."

මම ගිහින් සෙනුකයගෙ කරට අතක් දාගෙන මං ගාවට ඇදලා ගත්තා.. ඌ එතකොට පොඩ්ඩක් හිනාවෙලා මගේ කරටත් අතක් දාගත්තා..

" සෙනුක මල්ලෙ.. මෙහ්.. උඹ සිරාවට ජොනා එක්ක ජෙලද බං.."

" පිස්සුද හලෝ.. ඒ මොකද.."

@Shan

" නිකම්.. අයුකයා එකතු නිසා මම හිතුවෙ.. දන්නැද්ද.. උබලට කියන්න අපේ ගැනිනම් අපේ ගෙදර බල්ලගෙ ඉඳන් ඉරිසියයි.. උඹලා කොල්ලොනෙ.."

" මේ අපේ ජොනා එක්ක.. ඉරිසියා වෙන්න.. උබට ට්‍රැකද අයියෙ.. ඌ අපේ බොක්කක් නෙ.."

" වරද්.. මාමා එනවා.."

මම අර අලි තඩියො මැද්දෙන් මූණ දාලා අපේ මාමා එන පැත්ත බලාගෙන හිටියා.. එතන හිටියෙ මමයි, රධ්‍ය අයියයි, සෙනුකයයි, කියාන් අයියයි විතරයි.. සෙනුකගෙ අම්මා මැද්දෙදි ගියා ඉස්කෝලෙ වැඩවගයක් කියලා..

" ටසිරි.. කොල්ලෙක් නේද ඒ.. උබ මාමා මාමා ගාන්නෙ.."

" කොල්ලෙක් නෙමෙ හලෝ.. හතලිස් ඇදිරියත් ගහලා ඉන්නෙ.."

මම දුවගෙන දුවගෙන ගිහින් මාමව බදාගත්තහම මාමා මගේ ඔලුව අතගාලා පිටට දෙකතුනක් තඩිබෑවා.. මේ මනුස්සයගෙ රෝසමල් සුවඳ යකෝ..!!

" අංකල් දේව.. හායි!!!"

" හායි සෙනුක පුතා.. අහ් රධ්‍යත් ඉන්නෙ.. මම මේ හදිසියෙ ආවෙ.. හොස්පිට්ල් ඉඳලා.."

" දැන් යනෝද.."

" මම්.. සුදුම-ආව් මොකද බං.."

" වරද් වරද්!!!.. වරද් කියන්න..!!"

මාමා කියාන් අයියලා ඉස්සරහා මට සුදුමහත්තයා ගාන්න ගිය නිසා මම මාමගෙ කකුල පෑගුවා.. සැක් ඇහුණනම් ජීවිතකාලෙම මට එක එක ඒවා කියයි..

" ඒ මොකද.. කිරිපුතාව ගෙදරින් ඩ්‍රොප් කරන ඕනද.."

@Shan

එකපාරටම කියාන් අයියා රධ්‍ය අයියගෙ පිටට දබෝස් ගාලා පාරක් ගහගෙන ඇඟිලි ටික කටේ ගහගෙන අනිත් පැත්ත හැරුණා.. සැක් මෝඩ පොල්පිති මාමා.. ඔය කලේ ගොං වැඩක්.. සෙනුකයත් හිනාවෙනවා.. කවුද යකෝ කිරිපුතා..

" මේ මාමෙ..!! මොන මගුලක්ද.."

" අම්මෝ. අංකල් ඒකනම් මරු ඈ.. එල.. කිරිපුතා.."

" වනචරයා..!!"

" කිරිපුතේ..හ්.. !!!"

" තෝ පිස්සු හු#තා.. ඉඳපන්.."

කියාන් අයියා මගේ පිටට ගහගෙන හෝල් එකෙන් එළියට දුවගෙන ගියාම මම උගේ පස්සෙන් එළවගෙන ගියා.. සෙනුකයයි රධ්‍ය අයියයි මාමා එක්ක කතාකර කර ඉඳල කොහොම හරි හවස දෙක විතර වෙද්දි අපි ගෙවල් වල එන්න ආවා.. රධ්‍ය අයියා මාව ගෙදරින් දාන්නම් කිව්ව නිසා මාමා ආපහු හොස්පිටල් ගියා මිනිස්සුන්ගෙ දත් ගලවන්න.. ආධ්‍ය අයියට බය නැද්ද මන්දා දත් ගලවන මිනිස්සු එක්ක යාළුවෙලා ඉන්නෙ.. කවදාහරි මම කියන්නෙ නිකම විහිලුවටවත් අපේ මාමට බූට තියන්න හොඳ නෑ.. කවුද දන්නෙ ස්නායුවක් එක්කම ඇදලා ගත්තොත් එහෙම ඇනස්තීසියාවත් දෙන්නෙ නැතුව.. මොන දෙයියට කියන්නද.. මමනම් පොඩිකාලෙ ඉඳන්ම දත් දොස්තරලට බයයි.. අපේ මාමට ඇරෙන්න..

" ඔයා පහට විතර රෙඩි වෙලා ඉන්නවද.."

රධ්‍ය අයියා ඩ්‍රයිව් කරන ගමන් මගේ අතක ඇඟිලිවල එයාගෙ ඇඟිලි පටලගෙන අත උඩට හාද්දක් දුන්නා..

" හා.. අපි කොහෙද යන්නෙ.."

" ගිහිල්ලා බලමු.."

මම තාම විශ්වාස කරන්නෙ නෑ මම හුඟ කාලෙකට රධ්‍ය අයියා එක්ක ඉන්න අන්තිම පැය කීපෙ මෙක කියලා..

@Shan

" මට සෙනුක ගැන මාරම අවුල් ඒයි.."

" ම්ම්.. අයුක තව ලැන්ඩ් කල්ලත් නැතුව ඇති.."

" මෙල්බර්න් වලට යද්දි කීය වෙනවා කියලද කිව්වෙ.."

" හවස් වේවි.. ෆිෆ්ටීන් අවර්ස් ෆ්ලයිට් එකක් කිව්වනෙ.. හෙට විතර ඔයාට කතාකරයි.."

ඔව් හෙට රධ්‍ය අයියා මෙහේ නෑ යනවනෙ.. එතකොට අයුක අයියා මට කතාකරාවි.. රධ්‍ය අයියයි මමයි එකට යුනිෆෝම් ඇඳලා ඉන්න අන්තිම දවස අද.. අදින් පස්සෙ එයා කවමදාවත් ස්කූල් යුනිෆෝම් අදින එකක් නෑ.. මාත් එක්ක ඉස්කෝලෙ එන්නෙත් නෑ.. ඉස්කෝලෙ ඇරිලා හෝල්ට් දෙකක් විතර පයින් ඇවිදගෙන එන්නෙත් නෑ.. බස් එකේ මාව ජනේලෙ අයිනට දාලා ඉඳගෙන එන්නෙත් නෑ.. කැන්ටිමෙන් මෆින් අරන් දීලා යාළුකරගන්නෙත් නෑ.. සේපාලිකා ගහ ගාව මල් කඩන්න එන්නෙත් නැහැ.. ඉන්ටවල් එකට යන එන ගමන් ආධ්‍ය අයියා හදලා එනව බත් කටක් කවාගන්න විදියකුත් නෑ.. ගේට් ඩියුටි ඉද්දි පිටිපස්සට වෙලා කැගහන්නෙත් නෑ.. මට ඔවා මතක් වෙද්දි පිස්සු වගේ ඔලුව රිදෙනවා.. මට පාළුයිනෙ දෙයියනේ..

" ඔයා.. ඉස්කෝලෙ කාලෙ ගැන මොකද හිතන්නෙ.."

" ඉස්කෝලෙ කාලෙ.. මම ආසම කාලෙ.."

" තව.."

" කියන්න විදියක් තේරෙන්නෙ නෑ.. I will never forget all the little things that happened.. The best thirteen years of my life.. ඔයාට කියන්න වරද්.. අපේ අයියල ඉස්කෝලෙන් අවුට් වෙද්දි අයියා කිව්වා එච්චර දැනුනෙ නැහැල්ලු ඒක.. අපි වගේ නෙමෙයිනෙ ඒගොල්ලො පොතේමයි හිටියෙ.. ඒත් අපි අයින් වෙද්දි හරියට ජීවිතෙන් කොටසක් ඉස්කෝලෙ තියලා යනවා වගේ දැනෙන්නෙ.."

" ම්ම.. ඒකනම් හරියටම හරි.. එහෙම තමා දැනෙන්නෙ.."

@Shan

" මට හිතෙනවා අපි තව අවුරුදු පනහකින් මේ ඉස්කෝලෙට අඩිය තිබ්බත් අපිට දැනේවි අපි අවුරුදු දාසයේ දාහතේ කොල්ලො කියලා.. ඕල්ඩ්බෝයිස්ලා කියන්නෙ ඔය බැක්ටු ස්කූල් වල එහෙම.."

" ඔව්.. ගේට් එකෙන් ඇතුළට එද්දිම හිතෙන්නෙ නිකම් ගෙදරකට ආවා වගේ.. ඉස්කෝලෙ කොච්චර ළඟද අපිට.."

" අපේ අයියට කැම්පස් එකවත් සෙට් වුණේ නෑ හරියට.."

" එයාට ඉතින් අල්ලලා ගිහින් තියෙන්නෙ කැම්ප් එකේ සිවිල් ඩොකා පට්ටමනෙ.. අම්මපා නළුවට දෙන්න හිතෙනවා දැන්නම් දෙකක්.."

" මාමගෙයි අයියගෙයි රිලේශන්ශිප් එක මරු නේද වරද්.."

" ඇයි ඒ.."

" It Called පරිණත කපල්.. මම අහගෙන ඉදලා තියෙනවා කතාකරන ඒවා.. දවසක් දේශපාලනේ ගැන කතාකලා.."

රධ්‍ය අයියා මහා හයියෙන් හිනාවුණා.. සැක් කසාද බැදපු නැති අඩුව විතරයි උන් දෙන්නගෙ තියෙන්නෙ හැබැයි..

" මමත් අහගෙන ඉදලා තියෙනවා.. අනුකිච්චයි සාකිච්චයි කිච්බිච් ගානවා.."

" වරද්ලගෙ මාමෙ.."

" කරපිංචා කොහෙද.."

මමයි රධ්‍ය අයියයි වාහනේ දෙක වෙන්න මහා හයියෙන් හිනාවුණා..

" අම්මෝ ඒයි.. පිස්සු හැදෙනවා.."

මම රධ්‍ය අයියගෙ ෆෝන් එක අන්ලොක් කරගෙන ෆොන්ට් කැම් එක ඕපන් කලා..

" Look here~"

@Shan

මම ෆොටෝ එක ක්ලික් කරන්න යද්දිම රධ්‍ය අයියා මගේ කම්මුලකට හාද්දක් දුන්නා.. මගේ ඇස් දෙක ලොකු වෙලා හෙන හොල්මන් විදියට ෆොටෝ එකක් වැදුනහම රධ්‍ය අයියා ෆෝන් එක උදුරලා අරගත්තා..

" ඩිලීට් කරන්නෙ නෑ!!"

" හරි හරි මෙහෙ බලන්නකො.. කෝ දෙන්න ඕක මෙහෙට.."

මම රධ්‍ය අයියගෙන් ෆොන් එක අරගෙන එයාගෙ තොල් වලින්ම කිස් එකක් තියලා ෆොටෝ එකක් අරගෙන ෆෝන් එක ආපහු රධ්‍ය අයියට දුන්නහම රධ්‍ය අයියා හිනාවෙලා ෆොටෝ එක දිහා බලලා ඒක උකුල උඩින් තියාගත්තා..

" That's cool.. White blazers.. Prefect badges.. School uniforms.. Just a pretty simple school couple.."

" Cool..!!"

රධ්‍ය අයියා ගෙදර ගේට් එක ඉස්සරහින් කාර් එක නතර කලා..

" පහට එන්න.. I want to see you beautiful today.. simple but attractive.."

" Gotcha!!"

මම බෑග් එක අරගෙන කාර් එකෙන් බැහැලා ගෙදරට යද්දි රධ්‍ය අයියා මම ගේට් එකෙන් ඇතුළට යනකල් ඉදලා යන්න ගියා.. මට තනියම හිටපු කාලෙ අමතක වෙලා ගිහිල්ලා තමයි.. ඔව්!! මම ඒක අමතක කරලා..

ලැජ්ජ වෙලා එයා එක්ක බෑ...

එන්නාම්.. ලව් යූ.. ❤

ඕතරි නිදාගන්නයි යන්නේ... ♀ ♀

ප.ලි.

@Shan

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 103 කොටස

මම ගෙදර ගියපු ගමන්ම මගේ ප්‍රිෆෙක්ට් බැජ් එකේ ෆොටෝ එකක් ලොකුවටම ගහලා, සෙරමනි එකේදි පීස් සයින් එකකුත් එක්ක ගත්තු මගේ ෆොටෝ එකකුත් එක්ක මාන්නක්කාර වෙළෙඳසුමනයට සෙන්ඩ් කලා..

" see I'm the

**HEAD PREFECT**

..   "

ආවා මෙතන මට කින්ඩි දාන්න.. හිතාගෙන ඇත්තෙ හරි ලොකුයි කියලා.. තාන්වී අක්කට කියලා බන්නන්න තියෙන්නෙ.. එදා මම මැසේජ් එකක් දාලා සාගා ආවද ඇහුවහමත් මොකුත් කිව්වෙ නෑ.. ආවද දන්නෙත් නෑ.. කොහෙද මට අන්තිම වෙනකල්ම එතන් ඉන්න බැරිවුණානෙ.. මාමණ්ඩි ඇණ බවුසරයක් වෙලා දහාටසන්නිය නටන්න ගත්තනෙ.. මම මැසේජ් එකයි ෆොටෝ දෙකයි යවලා අම්මටත් කෝල් එකක් අරගෙන ආච්චිඅම්මා එක්කත් කතා කල්ලා ගිහින් නාගෙන ඇඳුම් සේදුවා.. හෙට ඉඳලා ඉස්කෝලෙ යන්නත් එපැයි.. මුල ඉඳලා ස්පෝර්ට්ස් මීට් වලට දහලන්නයි.. මතක් වෙද්දිත් උණ හැදෙන්න වගේ..

පහුගිය ගෙවුණු කාලෙ හීනයක් වගේ.. හීනයක්වගේ කිව්වෙ.. හීනවල විතරනෙ ඉඳලා හිටලා හරි අපි මවන ලෝකයක් දකින්න පුළුවන්.. හෙට ඉඳන් මම හීනෙන් ඇහැරිලා ආපහු පරණ ජීවිතේට යන්න ඕන.. ඒත්.. හුඟ කාලයක් හීනෙකම පැරලයිස් වෙලා ඉඳලා දැන් මට පරණ ජීවිතේ හුරු නැහැ වගේ දැනෙනවා.. අද රෑ ගෙවිලා ඉවරවුණාට පස්සෙ මම කවදා ආයෙම රධ්‍ය අයියව දකින්නද.. අඩුම තරමෙ අයුක අයියටයි සෙනුකටයි වගේ අපිට කෝල් එකක්වත් ගන්න තිබුණනම්.. මට එයාගෙ කටහඬ හරි අහන්න තිබ්බා.. මම හිතන්නෙ මට කිසිම දවසක රධ්‍ය කියන කැරැක්ටර් එකට වෛර කරන්න බැරිවෙයි.. එහෙම හිතන්නවත් බැරිවේවි.. ඉස්සරහට මොනවා වුණත් එයා මං වෙනුවෙන් කැප කරපු කාලයට මම සැහෙන්න ණයයි.. ගෙවාගන්නවත් බැරි තරමට ණයයි..

@Shan

කාලෙ කියන්නෙ ආපස්සට ගන්න පුළුවන් දෙයක් නෙමෙ.. ඒකට වටිනාකමකුත් කියන්න බෑ.. ඉතින් මනුස්සයෙක් එච්චර දෙයක් මං වෙනුවෙන් කැප කලා කිව්වහම එතනින් එහා මට මොකුත්ම බලාපොරොත්තු වෙන්න පුළුවන්ද.. එක්කො කවදහරි වැරදිලාවත් මම නැශනල් බැඩ්මින්ටන් ටීම් එකට සිලෙක්ට් වුණත් ඒකටත් ක්‍රෙඩිට් එක සම්පූර්ණෙන්ම යන්න ඕන රධ්‍ය අයියට.. මොකද අපේ ගෙදර කවුරුත්ම කැමති නෑ මම සෙල්ලම් කරනවට.. එයා එදා කාර් එකේදි නිකමට කියපු කතාව ඇත්තටම හැබෑ කල්ලා දේව් කියලා මට පොඩ්ඩක්වත් හිතුණෙ නෑ.. එක අතකට එයා මගේ ජීවිතේට අහම්බෙන් හම්බුනු පුදුම ගොඩක්..

අනික ඒ ලෙවෙල්.. ඒ ලෙවෙල් මුල් කාලෙ මම හරියට වැඩක් කරගන්න බැරුව අනාගෙන කාගෙන හිටියෙ.. කොටින්ම දහතුන පටන්ගත්තු ගමන්ම එක්සෑම් එකේ ළකුණුත් මට තිබ්බෙ හතළිස් පනස් ගනන්.. මම කොච්චර හීන මානෙකින් හිටියද කියනවනම් මම ඒ ළකුණු ඇති කියලා හිතලා මගේම හිත සතුටු කරගත්තා.. යන්නං වාලෙ ක්ලාස් ගියා.. ඉඳගෙන ඉන්නවා එනවා..

මම නම් කියන්නෙ

**ඉස්කෝලෙ යන**

ළමයෙක්ව මොටිවේට් කරන්න ඕන, අවධානෙ දෙන්න ඕන, ධෛර්‍යමත් කරන්න ඕනම කාලෙ ඒ ලෙවෙල් කාලෙ.. ඒ කාලෙ කියන්නෙ තනිකර ප්‍රශ්න ගොඩක්.. පුදුම පීඩනයක්.. දැන් ඒ ගතකරපු කාලෙ ගැන මතක් කරද්දි මටම හිතාගන්න බෑ ඒ හැමදේම මම දරාගත්තද කියලා.. ගෙදරින් කොහොමත් මාව ඔල්රෙඩි ට්‍රැශ් කෑන් එකට දාලා තිබුණෙ.. අම්මා වුණත් මට කොච්චර හිත රිදෙන කතා කියලා ඇත්ද.. පවුලෙ අය, ආච්චිඅම්මයි මාමයි ඇරෙන්න.. මම කොච්චර දවස්වලට බස් හෝල්ට් එකකට වෙලා ඔහේ බලාගෙන ඉඳලා ඇත්ද.. ඒ හැමදේම එකදිගට එකදිගට දරාගෙන ඉඳලා මාව පිපිරිලා යන්න තරමට පීඩනෙන් හිටිය කාලෙක තමයි මට රධ්‍ය අයියා හම්බුණේ..

මුලදි මම එයාට ලොකුවට මං ගැන කියන්න ගියේ නැතිවුණත් මම හිතන්නෙ එයාට අදහසක් තිබ්බා මට තියෙන්නෙ මොනවගේ ප්‍රශ්නද කියලා.. හුඟක් දවස්වලට මගෙන් හේතුවක් අහන්නෙ නැතුවම එයා මගේ හිත හදනවා.. පස්සෙ අපි කතාකරන්න ගත්තහම එයා මං ගැන නොදැන

@Shan

හිටිය දෙයක් නැති තරම්.. මට ජීවිතේ පළවෙනිම සැරේට කිසිම සීමාවක් නැතුව කතාකරන්න කෙනෙක් හම්බුණාම දැනුනේ පුදුම නිදහසක්.. කොච්චරවත් කතාකලත් මට එයා එක්ක කියන්න හැමදාම හුඟක් දේවල් තිබුණා.. එයා ඒවා අහන් හිටියා.. එයත් එයා ගැන මාත් එක්ක කියනවා.. මම අහගෙන ඉන්නවා.. අපි කොච්චර කතාකල්ලා ඇත්ද.. වැඩකට ඇති දේවලුයි නැති දේවලුයි ඇති තරමක් කියවනවා.. එහෙම කාලෙ ගෙවෙද්දි හිතට හරි සැහැල්ලුවක් දැනෙනවා..

අපි දෙන්නගෙම කතාව පටන්ගත්ත තැන ඉඳලා හරි හිමින් ගලාගෙන ගියේ.. මුලින්ම අඳුරන්නෙ නැති අය, ඊටපස්සෙ අඳුරන අය, ඊටපස්සෙ යාළුවෝ, හොඳම යාළුවෝ ඔහොම ඔහොම දැන් වෙනකල්ම ඒක ගලාගෙන ආවා.. මම ආසයි ඒක තව ඉස්සරහටත් ගලාගෙන යනවනම්.. මගදි හිඳෙන්නෙ නැතුව..

රධ්‍ය අයියා ඒ ලෙවෙල් කිට්ටු වුණු කාලෙ මාත් එක්ක හිටිය තරම්.. මම හිතන්නෙ නෑ මගේ ජීවිතේ කිසිම දවසක මට ඒ තරමට වටිනාකමක් දීපු මනුස්සයෙක් හම්බවේවි කියලා.. බැන බැන හරි එයා මං ගාවම ඉඳගෙන මට හයියක් වුණා.. ඇත්තටම මගේ හීන මානෙ නැතිකල්ලා හොඳ රිසාල්ට් එකක් ගන්න ඕනමයි කියන තැනට මයින්ඩ් සෙට් එක ගෙනාවෙ එයා.. මම හිතෙන්නෙ එයා බෝයිෆ්‍රෙන්ඩ් කියන කැරැක්ටර් එකට වඩා මට දැනුනා..

මම දවල්ට කාලා නාලා හවස් වෙනකල් පොඩ්ඩක් නිදාගත්තා.. රධ්‍ය අයියා ඇඳුම් හදාගන්න ඕන කිව්වනෙ යන්න.. ආයෙම මට ඇහැරෙද්දි හතර විතර වුණා.. මාමා අද නයිට් කිව්වනෙ හොස්පිට්ල් එකේ.. ආධ්‍ය අයියට ඔන්කෝල් වැටිලලු.. හෙට රධ්‍ය අයියා යන්න කලින් ආධ්‍ය අයියා ගෙදර එනවා කියලා කිව්වා.. මම ආයෙම ගිහින් වොශ් එකක් දාලා අල්මාරියත් ඇරගෙන අඳින්නෙ මොකක්ද කියලා කල්පනා කලා.. කල්පනා කල්ලා කල්ලා අන්තිමට කළුපාට රිප්ඩ් ජීන් එකකට කළුපාට ශර්ට් එකක් අඳින්න හිතුවා.. ඒකට ගැලපෙන කළුපාටයි සුදුපාටයි බෙග් දෙකකුත් එළියෙන් තියලා මම ඇවිත් ඇඳගත්තා.. කොහොම හරි පහ වෙද්දි දොරත් ලොක් කල්ලා යතුර ජපන් රෝස පැලේ අස්සට දාලා එළියට එද්දිත් රධ්‍ය අයියා කාර් එක ගේට් එක  ගාව නතර කරගෙන හිටියා.. වෙලාවට වැඩකරන බෝයිපෙන්.. මම දුවගෙන දුවගෙන ගිහින් ගේට් එකත් වහගෙන කාර් එකට නැග්ගා.. ඒ ගමන්ම මට මහා හයියෙන් හිනා ගියා..

" අදත් ඇක්චුවල් බ්‍රදර්ස් කියලා අහගෙන ගෙදර එන්න පුළුවන්.."

@Shan

රඩ්‍ය අයියා හිනාවෙවී කාර් එක හරවලා පාරට දැම්මා.. එයත් ඇඳගෙන ඇවිත් තිබ්බෙ කළුපාට රිප්ඩ් ජීන් එකකට බැගී කළුපාට ශර්ට් එකක්.. ඒ වුණාට කලිසම් දෙකේ පැව් දෙක හරි වෙනස්නෙ.. කමක් නෑ..

" කළුපාට තාරාවො ඉන්නවද වරද්.."

මම හිනාවෙවී ඉඳලා එකසැරේම මූණ හට්ටියක්වගේ හදාගත්තා.. ආයෙම තාර වත්නම.. මොන මගුලක්ද මන්දා මේ මිනිහට හැමතිස්සෙම තාරාවෙක්ම මතක් වෙන්නෙ..

" නෑ කළුපාට තාර බූතයො ඉන්නවා.. මම ඒකෙක්ට ඇඳගෙන ආවෙ.."

" එපා එපා මගේ ඉමැජිනේශන් එක රුයින් කරනවා ඔයා.. කහ තමා හරි පාට.."

" ඇත්තද.. කහද හරි පාට.."

"යෙප්!.. අම්මා කතාකලාද.."

" ඕ.. ආච්චිඅම්මත් කතාකලා.. ඔයාව මතක් කරන්න කිව්වා.."

" එහෙමද.."

රඩ්‍ය අයියා ලාවට හිනාවුණා..

" ඔයා යන්න කලින් ආච්චිඅම්මා එක්ක කතාකරනවද.. හා ද.."

" මම කතාකරන්නම්.. ආත්තම්මා දවසක් මට කතාකලා.. ඔයාට කියන්න බැරිවුණානෙ.."

" ඈ..?? මොනවද කිව්වෙ.."

" ඒවා අපේ අපේ කතා.. තාරාවොන්ට ඒවා කියන්නෙ නෑ.."

" අනේ මේ.. නටපං.. තාරාවෙක් ගැනම කියවනවා.. ඇත්ත කියනවා තවුසෙට මගේ රූපසොබාවට ඉරිසියා හිතිලනෙ ඔහොම කියන්නෙ.."

@Shan

" ම්ම්.. ම්ම්.. රූප සොබාවට.. හිත වහ වැටුණට.. ආල කතා නොදොඩන්න හො-"

" අයියෙ!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

" මොකද බං කෑ ගහන්නෙ.. පස්ස ගිනිගත්ත තාරාවෙක් වගේ.."

" ම්ම්.. පස්ස කිච්චහම මතක් වෙන්නෙම ඔයාව ඒයි.."

රධ්‍ය අයියා ඒ සැරේ මූණ හට්ටියක් කරගෙන ඉස්සරහා බලාගත්තා..

" සුදුඅම්මියගෙ පස්ස.."

" ඕක නවත්තගනින්.."

" ඇයි මම නවත්තගන්නෙ.. එදා මම ඔයාව තරු බලන්න එක්කන් ගියේ.. එදා මම දැක්කනෙ.."

"....."

" බොරුකියන්න ඕන නෑනෙ ඒයි.. මම නම් කැමති වුණේ ඔයගෙ පස්සට තමා.. Am obsessed.."

"....."

" අයුක අයියා ගිහින් ඇතිද දැන්.."

" ම්ම්.."

මම ඩෙග් දෙක ගලවලා දාලා කකුල් දෙක සීට් එක උඩට අරගෙන සීට් එකට හේත්තු වුණා..

" ඔයාට කොහොමද දැනෙන්නෙ.. අයුක අයියා ගිය එක ගැන..??"

රධ්‍ය අයියා ලොකු හුස්මක් පහළට දාලා මගේ උකුල උඩ තිබ්බ අතක එයාගෙ අත පටලගත්තා..

" ඌ දුරයි කියලා මතක් වුණාම මාර පාළුවක් දැනෙනවා.."

@Shan

" අයුක අයියා ඔය ගියාට ආයෙ ඒවි කියලා මට නම් ලොකු ශුවර් එකක් නෑ.."

" ම්ම්ම්.."

" එයා මෙහෙන් ගියේ හැමදේම එපාවෙලා වගේ.. ආවත් එන්නෙ සෙනුක නිසා තමයි.. නැත්නම් එන්න රීසන් එකක් නෑනෙ.."

" සෙනුක මල්ලි බලන්න නම් ඒවි අනිවාරෙන්.. හැබැයි ලංකාවෙ නතර වෙවිද කියන්න බෑ.."

" ම්ම්.. වෙලාවකට මෙහේ ඉන්න එකත් එපාවෙනවා තමයි.. ඒත් දාලා වෙන කොහෙටවත් යන්න හිතෙන්නෙත් නෑ.."

" අපේ අයියට තියන ලෙඩේ ඔයාට තියෙන්නෙත්.."

" ඒ කිව්වෙ.."

" අපේ අයියත් කියනවා මෙහේ නිදහස් අධ්‍යාපනෙන් ඉගනගෙන එයාට වෙන රටකට ගිහින් වැඩ කරන්න හිත දෙන්නෙ නැහැල්ලු.. හෙන ගුණමකුවෙක් වගේ දැනෙනවලු.."

" මටත් එහෙම හිතෙනවා.. ඕනම කෙනෙක් තමන් ජීවත් වුනු හැඩගැහුණු පරිසරේට හුරුවෙලානෙ ඉන්න පුරුදු වෙලා තියෙන්නෙ.. ටික කාලෙකට කොහේහරි වෙන රටකට ගිහින් ජීවත් වෙන එක අවුලක් නෑ.. ඒත් හැමදාම එහෙම ඉන්න අමාරුයි.."

" ම්ම්.."

" ඔයා මොකද හිතන්නෙ.."

" ඔයා කියන විදියත් හිතෙනවා.. ඒත් සමහරවෙලාවල් වලට මෙහේ මිනිස්සුන්ගෙ හෙන විකාර අදහස් නිසා එපාවෙනවා.. මම කියන්නෙ මිනිස්සුන්ගෙ අදහස් මීටවඩා දියුණු වෙනවනම් සොසයිටි එක මීටවඩා හොඳවෙන්න තිබුණා.."

" ඔව්.. ඒක හරි.. කොළඹ හොඳයි කියමු.. දුර පළාත් වලට යද්දි මිනිස්සු තාම ඉන්නෙ ගල් යුගේ.. එයාලා හිතන විදිය එයාලට හොඳ ඇති.. සාම්ප්‍රදායිකයි

@Shan

කියලා හිතන එකෙන් ඔය කියන විදියට විනයක් හැදෙනවනම් ඉතින් මෙ රට මෙහෙම නෙමේ සිංගප්පූරුව වගේ තියෙන්නෙ එපැයි.. මල සමයං.."

" ඒ ක්‍රමෙ twenty-first century එකට මැච් වෙන්නෙ නෑ.."

" අනික ලෝකෙ ඉස්සරහට යද්දි අපි දැනගන්න ඕන වෙනස් වෙන්න.. දැන් අපි හිතන දේවල් සමහරවිට තව අවුරුදු විස්සකින් සොසයිටි එකට මැච් වෙන්නෙ නැතිවෙන්න පුළුවන්.."

" That's the point... everything changes.."

" ඔය කාලෙ වෙද්දි අයුක අයියගෙ අදහස වෙනස් වෙලා තියෙයිද දන්නෙ නෑ නේද.."

" මට ලාවට හිතෙනවා වරද්.. අයුක චමිරු එක්ක පස්සෙ කාලෙක කතාකල්ලා සමගියෙන් ඉදීවි කියලා.."

" ඒ මොකද.."

" අයුක කොයි වෙලාවකවත් චමිරුට බනින්නෙ නෑනෙ.. කියන්නෙ උගෙන් පරිස්සම් වෙලා රණ්ඩු කරගන්නැතුව ඉන්න කියලා.."

" එහෙම වුණොත් හොදයි ඉතින්.. මොකක් වුණත් එයාලා සහෝදරයොනෙ.. අකමැත්තෙන් වුනත් පිලිගන්න වෙනවා.."

" ම්ම්.."

" මෙහ් ඒයි.. බෝයිපෙන් වෙන එකෙට හග් කරලා මල පැන්නහම කන්න හොද දෙයක් කියනවකො.."

රධ්‍ය අයියා මං දිහා එකපාර බලලා ඉස්සරහා බලාගත්තා.. මම කිව්ව එක ඇහුණෙ නෑ වගේ.. පෙනේද නරි කව්වා.. හිතේ ඇති මම අමතක කල්ලා දාලා ඉන්න ඇති කියලා.. දවල් ගිහින් බදාගත්තා සක්කිලි පරෙයියව..

" කියන්නකො.."

" මොනවද.."

@Shan

" එහෙම වුණාම කන්න හොඳ දෙයක්.."

" නියඟලා අල පොල් එක්ක හොඳයි.."

" නියඟ-මොකක්ද තවුසෙ කිව්වෙ..!!! ආ මාව මරාගනන් නේද ඕනවෙලා තියෙන්නෙ.. ආස ඇති.. පොලොස් කොටටෝරුවා.. ගියා මෙතන බඩාගෙන, විශ් කල්ලා, උම්මා දීලා, උඩදාලා, කරකන්න.."

" කවුද උඩදාලා කරකන්න ගියේ.. උඹට පිස්සුද.."

" ඇයි ගියේ.. මෙන් හෝල් එකේදි.."

" මම මනුස්සකමට පිටට තට්ටුවක් විතරයි දැම්මෙ.. උඹට ඒක පේන්නෙ උඩදාලා කරකනවා වගේද.."

" ඔව්.. මට පෙනුනෙ එහෙම තමා.. කොහොම හරි ඇල්ලුවනෙ උඹව.."

" ඉතින් වර-"

" ඉතින් වැරද් යැයි යැයි නෙමෙ කොහොමහරි ඇල්ලුවනෙ.. හා නැද්ද.. නෑ කියන්න බැනෙ.. පාඩුවෙ අත පය තියාගෙන ඉන්න බැරිද කටින් විශ් කල්ලා.. තියන ශෝ එකට එතන ඉන්න සේරවම බදාගෙන උම්මා දීලා දැන් එනවා හොඳ එකා වෙන්න.. අර සක්කිලි පරෙයියටත් මාර ආතල් ඇති.. ගිහින් බදාගත්තහම.. 'දෙයියනේ දෙයියනේ කැඩෙට් කරන රධ්‍ය අයියා' , 'මගේ අයියා පැටියා' මාව බදාගත්තනෙ.. අර වරද් කියන එකාව පන්නලා මම කොහොම හරි රධ්‍ය අයියව අයිති කරගන්නවා තමා කියලා ඌ මට ඇසිඩ් ගැහුවොත් එහෙම.. කියන්න බැනෙ.. එතකොට එතන වැරදිකාරයා කවුද.. තවුසෙ.. තවුසෙ නිසා තමා අහක හිටිය මට ඇසිඩ් පාරවල් කන්න වුණේ.. ඊටපස්සෙ, හැමදාම ඔයාව බදාගෙනම ඉන්න පුලුවන් කියලා පෙන්නනන්නත් එක්ක සක්කිලි පරෙයියා හොස්පිටල් එකේ ඇඳක් උඩ වැටිලා ඉන්න මට ඇවිත් හිනාවෙලා යාවි.."

" දැන් කවුද ඔයාට ඇසිඩ් ගැහුවෙ.."

" චමිරු.."

" මොකටද.."

@Shan

" තවුසෙව අයිති කරගන්නනෙ.. වෙන මොකකටද.. එක්කො මේක හරියන්නෙ නෑ තවුසෙ ලෑස්තිවෙනවා අද රෑට තරු බලන්න යන්න.. චමිරුවා මොනවහරි කියාගෙන ආවොත් මම කියනවා 'අනේ චමිරු, රඨ්‍ය අයියා නිසා මගේ කුස තුල පුංචි පුතු පැටියෙක් ඉන්නවා' කියලා.."

රඨ්‍ය අයියා ස්ටියරින් වීල් එකට තඩිබාගෙන මහා හයියෙන් හිනාවෙන්න ගත්තා.. දෙන්න හිතයි පුප රත් වෙන්න දෙකක් දැන්නම්..

" ඒව වරද්.."

" ඇයි මොකද ඔවා.."

" නෑ නෑ.. දැන් එහෙම කියලා.. ඊටපස්සෙ..??"

" ඊටපස්සෙ ඉතින් මොනවා කරන්නද.. මම චමිරුට ඇසිඩ් ගහනවා.. ලැබ් එකේ තියනවා ඩයලූට් කරපු නැති සල්පියුරික්.. ඇසිසිටන් අක්කව ටෝක් කල්ලා බෝතලයක් උස්සලා දමලා අරිනවා.."

" උඹ දාම ඝාතකයෙක්ද.."

" ටිකක් විතර.."

" අපි බයවෙන්න ඕනද.."

" බයවෙන්න ඕන තමා.."

රඨ්‍ය අයියා මට කින්ඩියට හිනාවුණා.. මම මූණ ඉස්කුරුප්පුවක් වගේ හදාගෙන රඨ්‍ය අයියා දිහා රවලා බැලුවා.. මොකද දන්නෑ හිනාවෙන්නෙ..

" මොකෝ.."

" නෑ නෑ.. ඔයාට වතුර ටිකක් ඕනද.."

" එපා.. කියපන් මොකද තවුසෙ බලූ විදියට මට හිනාවුණේ.."

" නෑ මට වැරදිලා පොඩි දෙයක් මතක් වුණා.. ඒකයි.. දාම ඝාතකයා කිව්වහම.."

@Shan

" මොකක්ද.."

" අර බබා ඔයාට මතකද ප්‍රිෆෙක්ට් රූම් එකේ අපේ බඩු අස් කරපු දවස.."

" ඕ.."

" අන්න එදා කැරපොත්තෙක් පියාඹගෙන ආවා කියලා දාමසාතකයා පුටු වගේකුත් පෙරලගෙන ඇදගෙන වැටුනු හැටි මතක් වුණා.."

රධ්‍ය අයියා ආයෙම මහා හයියෙන් හිනාවෙන්න ගත්තා..

" ආ ඒකද.. ඒක මෙහෙමයි.. ඕනම මනුස්සයෙක්ට තියෙනවා-"

" ඉන්න ඉන්න මම කියන්නම්.. ඕනම මනුස්සයෙක්ට ජීවිතේ තියෙනවා දුර්වලතාවයක්.. ඔයාගෙ එක තමා කැරපොත්තා පියාඹන එක.. ඒකනෙ.."

" අන්න හරි රත්තරං.. ඔයා හරියටම කිව්වා.. අපේ සුදුඅම්මියා හරිම ෆෝවඩ් නෙ.."

" ෆෝවඩ් මගුලක් නෙමේ.. උබ වෙච්ච ලැජ්ජාව මකාගන්න හෙන බොරුවගයක් ඇදබෑවනෙ.. කැරපොත්තො අප්පිරියයි අනේ.. ලේස් එක පැටලිලා වැටුනෙ.. අන්තිමට කිව්වා මම තල්ලු කලා කියලත්.."

මම පාඩුවෙ කට වහගෙන ශටර් එකට ඔලුව තියාගෙන අහක බලාගෙනම ආවා.. ගැටපොලොස් කොට්ටෝරුවොන්ට තේරෙනවද කැරපොත්තො පියාබද්දි බය හිතෙනවා කියලා.. අනික ඌ එදා කෙලගෙන මගේ පැත්තටමයි ආවෙ.. දුඹුරුපාට කැත තඩි කැරපොත්තා..

" එතකොට තවුසෙ මකුළුවොන්ට බය එක.. ඒක.."

" ඒක වෙන කතාවක්නෙ.."

" වෙන කතාවක් වෙන්නෙ කොහොමද.. මකුළුවො හෙන අහිංසක සත්තු ජාතියක්.. කැරපොත්තො නම් පියාඹනවා කියලා කියන්න පුලුවන්.. මකුළුවා..??"

" උඹට ඒකෙන් වැඩක් නෑනෙ.."

@Shan

" සැක්.. කතාව දාහකට ගහන්න.. මකුළුවෙක් දැක්කහම කොස්සත් උස්සගෙන ළමිස්සි වගේ නටනවා.."

" අනේ පලයං.. සිරිමැටි සිත්තරාවි.. ආවා මෙතන මකුළුවො ගැන කියලා දෙන්න.."

මම ක්ශනිකව රධ්‍ය අයියා පැත්ත හැරුණා.. මොකක්ද යකෝ ඒ කිව්වෙ.. මූ කොහොමද ඒක දන්නෙ..

" මොකක් කිව්වා.."

"....."

" තවුසෙට සෙනුකයා හැම ලබ්බම කියනවද ඇවිල්ලා.."

" කේලම් කියන්න ගිහින් තමා සෙනුක මල්ලි ඇවිත් මට කිව්වෙ.."

" ඌ ජනහිතකාමී රැජිණ වුණා කියලා මම මක් කරන්නද.. පකයා.."

ඔය සිරිමැටි සිත්තරාවි සීන්කෝන් එකනම් නොදකින්.. මගේ පොඩිකාලෙ නම්බුව නැතිකල්ලා දැම්මෙ ඔක තමා.. ඒ කාලෙ ළමා මානසිකත්වෙට මම කරපු හද්ද ගොං වැඩක් තමා..

මම සිරිමැටි සිත්තරාවිට රඟපාන්නම කියපු එක..

දවසක් අපිට අමුතු කොරියන් පිස්සුවක් ගහලා ආශියි, මහීශායි, සෙනුකයි අපේ ගෙදර ආපු වෙලාවක අපි රෝල් ප්ලේ එකක් කලා.. අපිට පී ටී එස් වල අත්වැඩට ක්ලේ වගේකුත් ගෙනැල්ලා ගෙදර තිබ්බා.. අර මැටි ගුලි වලින් මාල හදන්න තියෙන්නෙ.. අන්න ඒකට.. ඉතින් මාලෙ හදන්න එච්චර මැටි ගියේ නෑ.. එදා අපි සෙල්ලම් කරන්න ඔය මැටි ටික අරගත්තා.. මුලින් කෑම හදමු, චංගුම් කරමු කියලා ලෑස්ති වුණේ.. ඒත් ආශි කිව්වා ඒකිට හැමදාම හන් පාලිකාව වෙන්න බෑ වෙනස් එකක් කරමු කියලා.. ඉතින් අපි සිරිමැටි සිත්තරාවි කරන්න පටන්ගත්තා.. සෙනුකයා රජතුමාට හිටියෙ.. අර බේසික කෙල්ලො මාව සිරිමැටි සිත්තරාවිට දාලා මම කෝප්පයක් හැදුවහම ඒකට වස කලවම් වෙලා රජතුමා වලකජ්ජ ගැහුවම මගේ හිස ගසා දමන සීන් එකක් කරන්න ගියේ.. වදකයො දෙන්නට ආශියි මහීශායි හිටියේ.. මම

@Shan

හිතුවෙ නෑ මේ සෙනුක පගයා ඒක ඇවිත් රඪ්‍ය අයියගෙ කනේ තියයි කියලා..

ඒකත් මම අයුක අයියට කේලමක් කියන ගිහින් තමා වැඩේ දෙල් කරගත්තෙ.. දවසක් මම අයුක අයියට කිව්වා සෙනුකයා ජනහිතකාමී රජිණ වුණා කියලා.. අයුක අයියා ඕක අල්ලගෙන සෙනුකයට විහිලු කරන්න ඇති.. එහෙම තමා මේ පගයා අනිත් පැත්තට සිරිමැටි සිත්තරාවිගෙ කතාව රඪ්‍ය අයියට කියන්න ඇත්තෙ.. සැක්..

" සෙනුකයට පිස්සු.. මම දන්න සිත්තරාවියෙක් නෑ.."

ඒ අස්සෙ දවසක් ආශි කියාන් අයියට කියලා මම කිව්වයි කියලා, අයුක අයියයි රඪ්‍ය අයියයි වූතාවුයි වන්තියෑනුයි වගේ කියලා.. මම එහෙම ලබ්බක් කිව්වෙ නෑ.. ඒකි තමා ඒකිගෙ හිතේ තියන ඒවා මට හරවලා අර වනවර කියානයගෙ කනේ තියන්නෙ.. ඔක්කොම බේසමෝ මාවම මරාගෙන කාපියව්.. වූතාවු කොච්චර හැඩද.. රඪ්‍ය අයියට අං දෙකකුත් නෑ අනික..

" අපි දන්නෙ තාර පැටවු විතරයි.."

" ඒකත- අයියෙ!!!!!! ඕක නවත්තගන්නවා.."

" මම මොකක්ද කලේ.."

මම අත මිට මොළවලා ස්ටියරින් වීල් එකේ මැද්දට පාරක් ගැහුවම හෝන් එක වැදුණා.. හරියටම කලර් ලයිට් එකක් සෙට් වෙලා තිබ්බෙ.. අපිට ඉස්සරහින් ඉඳපු බයික් එකේ අයියා හැරිලා රඪ්‍ය අයියට රැව්වහම රඪ්‍ය අයියා අත දිගැරලා මගේ ඔලුව මැද්දටම හොඳපාරක් අතැරියා..

" වරද්..!!"

" මුකක්ද වැරද් වෙලා තියෙන්නෙ.. ඉම්හි ඉම්හි.. ඇත පය තියෑගෙන පැඩුවෙ ඉඳ්ඳ බැරිත.."

රඪ්‍ය අයියා මං දිහ ටික වෙලාවක් බලාගෙන ඉඳලා හෙන ඩ්‍රැමටික් විදියට අයි රෝල් කල්ලා ඔලුව දෙපැත්ත අතගාගත්තා..

@Shan

" ආ මෙ ඔයාට කියන්න පොඩි බඩ්ඩක් තියෙනවා.."

" මොකක්ද.."

" මගේ ට්‍රේනින් පීරියඩ් එක කෝච් ඉවරකරනවා කිව්වා.. ලබන මාසෙ ඉඳන් මම ප්ලෙයර් කෙනෙ~ක්..'

" Seriously.. What..?"

රධ්‍යා අයියා පුදුම වෙලා වගේ මම දිහා බලාගෙන හිටියා..

" Yep.."

" Wow වරද්.!! I am so proud of you.. සිරාවටම නේද ඔය කියන්නෙ.."

" ඔව්.. කෝච් කිව්වා ඉස්සරහට මැචස් දෙකතුනක් තියෙනවා කියලා.. වෙල්සුමනයා ලාවට වගේ හොඳයිත් එක්කන් ඒයි.."

" හොඳයි නෙමේ.. ඔයාට හරියනම එක්කෙනා හම්බෙලා තියෙන්නෙ.. දැන් හෙට ඉස්කෝලෙ ඉවරවෙලා ප්‍රැක්ටිස් යනව නේ.."

" ම්ම්.."

" ගිහින් හවස් වෙන්න කලින් ගෙදර එන්න ඕන හරිද.. එහෙමෙහෙ රවුම් ගහන්න තියාගන්න බෑ.. මාමා එන්නත් රෑ වෙනවනෙ.. මොනවහරි උවමනාවක් වුණොත් අපේ අයියට කතාකල්ලා කියන්න.. එයා ළඟනෙ ඉන්නෙ.."

" හා.."

" අනිත් එක.. ස්පෝර්ට්ස්මීට් කියලා උඩ පැනගෙන හැම එකම කරන්න යන්න එපා.. ඔයාලගෙ පහළ බැජ් එක ඉන්නවනෙ.. ඔයා ඒවා බලනවා විතරයි.. ලොකුවට ඉන්වෝල් වෙන්න යන්න එපා.. ඇත්තටම ටොප් බෝඩ් එකට හවුස් එකක් නැනෙ අපි හොරෙන් උදවු කලාට.. ඔයයි සෙනුක මල්ලියි දෙන්නම ඇෆ්‍රොඩයිඩ් එකේම ඉන්න එපා.. අනිත් ඒවත් බලන්න.. බලලා හවුස් එකේ කේලම් කියනවා නෙමෙයි.."

" හරි හරි අනේ.. අපෝ.."

@Shan

" අනික.. වෙලාවට කාපිය.. කලන්තෙ අල්ලන්නෙ නැතුව කලින් වගේ.."

" කන්නම් කන්නම්.. අනික කවුද කලන්තෙ දැම්මෙ..."

රධ්‍ය අයියා කාර් එක පාක් කලේ හිල්ටන් එකේ පාකින් ලොට් එකේ..
යකෝ!! මේ මනුස්සයට මක් වෙලාද..

" ඒ මේ මොකද.."

" ඇයි.."

" මෙහේ ආවෙ.."

" ඩිනර් අවුට් එකකට.."

රධ්‍ය අයියා හිනාවෙගෙන වාහනෙන් බැහැලා ඇවිත් මගේ පැත්තෙ දොර ඇරියා.. සැක් මම සපත්තු දෙකවත් දාලා නෙමෙයි හිටියේ.. මම ඉක්මනට සපත්තු දෙක් දාගෙන ලේස් එක ගැටගහන්න කම්මැලිකමට ඒක ගුලි කල්ලා සපත්තුව අස්සෙම ගහගත්තා.. ඊටපස්සෙ රධ්‍ය අයියගෙ අතින් අල්ලගෙන එළියට බැස්සා..

" This is too much.."

" But we can talk freely without getting any special attention.."

එයා එහෙමම මාව කාර් එකට හේත්තු කරගෙන තොල් වලින් පෙක් එකක් තිබ්බා.. මම රධ්‍ය අයියගෙ පපුවට අත් දෙක තියලා එයාව එහාට කරන්න හැදුවත් එයා මගේ අත් දෙක එකට තියලා අත් වලිනුත් හාද්දක් තිබ්බා..

" See, I can even kiss you wherever I want.. No one is looking at us.."

රධ්‍ය අයියා මගේ අතක එයාගෙ අත පටලගෙන ඇතුළට යන්න ගත්තා.. අනේ මන්දා.. එයා සමහරවෙලාවල් වලදි එකපාරට මෙහෙම ඉන්න ගත්තහම මට අමුතුයි වගේ.. ඒත් එයා කිව්වා වගේ කවුරුත් අපි දිහා අමුතුවට බැලුවෙ නෑ තමයි.. කවුරුත් විශේශ අවධානයක් දුන්නෙත් නෑ.. ඒකෙන් හිතට පොඩි නිදහසක් දැනුනා..

" Emperor's Wok හොඳද GRAZE Kitchen හොඳද.."

@Shan

මම මොකුත් හිතාගන්න බැරුව බලාගෙන හිටියා.. මගෙන් අහලා වැඩක් නැනෙ මම ඔය එකකටවත් ගිහිල්ලා නෑ..

" I have not been here before.."

" GRAZE Kitchen යමු.. ඔයා මෙහේ ඇවිත් නැතිවුණාට ඔයාගෙ හොඳම යාළුවා නිතර මෙහේ එනවා.."

" සෙනුකද.."

" අයුකගෙ ෆේවරිට් ප්ලේස් එක ග්‍රේස් කිචන් එක.. ඉස්සර නිතර එනවා අපි තුන් දෙනා.. දැන් වෙන වෙනම එනවා.. We have boyfriends and girlfriends, so now we come separately.."

" Mm.. Benefits of having fucking richy rich boyfriends.."

රධ්‍ය අයියයි මමයි ග්‍රේස් කිචන් එක තිබ්බ ෆ්ලෝ එකේ වින්ඩෝ එක අයිනෙම තිබ්බ කැන්ල්ස් පත්තු කරපු ටේබල් එකකින් ඉඳගත්තා.. මෙක නිකන් හෙවන් එකක් වගේ.. මාරම ලස්සනයි.. ග්‍රැනයිට් ඩිසයින්ස් වලට කහපාට ඩිම් ලයිට්ස් වැටිලා ඒවා රිෆ්ලෙක්ට් වෙද්දි හෝල් එකේ අමුතු රොමැන්ටික් ගතියක් තියෙනවා.. කට්ටියත් හුඟක් ඩිනර් වලට ඇවිල්ලා හිටියා..

" It's insanely beautiful here.."

රධ්‍ය අයියා පුටුවෙ පිටිපස්සට හේත්තු වෙලා අත් දෙකත් බැඳගෙන මගේ දිහා බලාගෙන ඉද්දි මම ඇහිලි එකට පටලගෙන එයා දිහා නොබලා ඉන්න ට්‍රයි කලා.. එහෙම බලාගෙන ඉන්නකොට මගේ කම්මුල් දෙපැත්තට ලේ පිරිලා රතු වෙලා පිපිරෙන්න වගේ එනවා..

" Stop staring at me.."

" You are blushing.."

" අයියෙ!!"

" වරද්.. මම ඔයාගෙන් ප්‍රශ්නයක් අහන්නම්.. අවංකව උත්තර දෙන්න පුළුවන්ද.."

@Shan

" පුලුවන්.. මොකක්ද ප්‍රශ්නෙ.."

" ඔයාව ඇත්තටම විශ්වාසද ඉස්සරහට එන කාලෙ මොන වගේ ප්‍රශ්නයක් වුණත් ඔයාට මම ලඟ නැතුව දරාගන්න පුළුවන් කියලා.."

රධ්‍ය අයියා මේසෙට අත් දෙක තියාගෙන බර වෙලා බැරෑරුම් මූණකින් අහද්දි මම ටිකක් වෙලා කල්පනා කලා..

" ඔව්.. පුළුවන්.."

" හොඳටම විශ්වාසද.."

" ඔව්.. ඇයි එහෙම අහන්නෙ.."

රධ්‍ය අයියා මගේ අතක එයාගෙ අත පටලගෙන මගේ ඇඟිල්ලක තිබ්බ හෝලික්‍රොස් එකක් ගහපු මුද්ද ඇඟිල්ලකින් කැරකුවා..

" I really like people who give straight answers.. හරිනම් මම බලාපොරොත්තු වෙන්න ඕන ඔයා කියයි කියලා 'අපි බලමුකො ඉස්සරහට මොනවා වෙයිද දන්නෙ නෑනෙ' වගේ උත්තරයක්.."

" ඉස්සරහට මොනවා වෙයිද කියන්න නම් දන්නෙ නෑ තමයි.. ඒත් මට විශ්වාසයක් තියෙනවා කවදාමහරි අපිට චාන්ස් එකක් ලැබෙයි කියලා.."

" ඔයාට ඇත්තටම එහෙම දැනෙනවද.."

" ඔව්.. I believe in you.."

" Oh God වරද්.. You have no idea how much I love you.. සමහර වෙලාවට ඔයා කතාකරන වචන අහන් ඉද්දි හිතට මාර නිදහසක් දැනෙනවා.. මම හිතන්නෙ මම ජීවිත කාලෙටම ගත්තු හොඳම තීරන වලින් එකක් තමයි ඔයාට ආදරේ කරන්න හිතපු එක.."

" ඒ ඇයි.."

" එහෙම තමයි.. ඔයා දවසක් කිව්වා නේද ඔයා විශ් කරනවා මේ ලෝකෙ හැමදෙයක්ම දවසක් හරි ආදරේ ලබන්න ඕන කියලා.."

@Shan

" ම්ම්.."

" මම විශ් කරනවා ඒ හැම කතාවකම ඔයා වගේ කෙනෙක් ඉන්න ඕන කියලා.. වරද්.. ඇත්තටම.."

මම හිනාවෙලා රධ්‍ය අයියගෙ අතින් අල්ලගත්තා..

" මම ඔයාට ආදරෙයි.."

" මම කොහොමද උඹව නොදැක එච්චර කල් ඉන්නෙ වරද්.. මට මාර පාළුයි.."

" ඔයා ඉක්මනට එනවනෙ.. මම බලාගෙන ඉන්නවා.."

" රිසාල්ට්ස් එන්න කලින් එකසැරයක් හරි එන්න පුළුවන් වුණොත් හොඳයි.. ඒත් මට ශුවර් කරන්නම බෑ.. ඔයා දන්නවනෙ.."

" ඒකට කමක් නෑ.. මම තරහ වෙන්නෙ නෑනෙ.. මේ අවුරුදු ටික ඉක්මනට ගෙවිලා යාවි.."

" ම්ම්.."

" මටනම් ඔයාව කොහේ ගියත් මතක් වේවි.. ඉස්කෝලෙත් ගියාම පාළු හිතෙනවා.. පරණ දවස් මතක් වුණාම හිතට දුකයි.."

"....."

" අම්මත් යනව නේද.. අවුරුද්ද මුල.."

" ම්ම්.. අප්පච්චි වැඩි කැමැත්තකුත් නෑ අම්මා යනවට.."

" එහෙමද.."

" එයා අපි කරන මොනවටද කැමති.. මම හිතන්නෙ අම්මා ඔයා ගැන ලාවට දන්නවා.. දවල් මගෙන් ඇහුවා ෂනෙරු එක්ක ඩේට් එකකටද යන්නෙ කියලා.."

මම එකපාර එයා කියපු කතාවෙන් ශොක් වුණා.. අම්මා දන්නවා??!

@Shan

" මොකක්.."

" බයවෙන්න දෙයක් නෙමෙයි.. අම්මා ඔවා ගැන දන්නවා.. අප්පච්චි වගේ නෙමෙයි.. අනික එයා ඔයාට කැමතියි.."

" ඒවුණාට බයත් හිතෙනවා.."

" මම ඊළඟපාර ගෙදර ආවම අම්මට ඔයා ගැන කියනවා.."

" මොකක්ද.."

" මම ඔයා එක්ක යාළුවෙලා ඉන්නෙ කියලා.."

" එතකොට අම්මා ගෙදර නැනෙ.."

" ඔව්.. කොහොම වුණත් මම කියනවා කියලා හිතාගෙන ඉන්නෙ.."

" අප්පච්චි..??"

" අප්පච්චිට ඕන මගුලක් කරගන්න කියනවා.. මට ඔය මනුස්සයා මතක් කරන්න එපා වරද්.. ඇත්තටම මම ජීවිතේට දැකපු එපාම කරපු මනුස්සයා මගේ අප්පච්චි.. තනිකරම අපිව කන්න ආපු හිසරදයක් වගෙයි මට පේන්නෙ.."

" එහෙම කියන එක හොඳ නෑ අයියෙ.. අප්පච්චි කවදහරි තෙරුම් ගනී.."

" එයා තේරුම්ගනිද්දි වෙන්න ඕන සේරම වෙලා තියෙයි.."

" එහෙම වෙන්නෙ නෑ.. මොනවා වුණත් මම ඔයා එක්ක ඉන්නවනෙ.."

රධ්‍ය අයියා ලාවට හිනාවෙලා නැගිටලා මාත් එක්ක බුෆේ එක තිබ්බ තැනට ගියා.. වීක්ඩේස් ඩිනර් එකට එක එක අයිටම් හුඟක් එතන තිබුණා.. මොනවා කන්නද හිතාගන්න බැරි තරමට දේවල්.. මමයි රධ්‍ය අයියයි රෑ නමය විතර වෙනකල් කතාකර කර කෑවා.. එයා එක්ක ඉන්න හැම මොහොතෙම මට වෙලාවක් ගෙවිලා යනවා දැනෙන්නෙ නෑ.. ඒ වගේ තමයි අදත්.. අපි හුඟාක් දේවල් කතාකලා.. ඉස්සරහට මොනවා වෙයිද කියලා හිතුවා.. අපි දෙන්න ගැන කතාකලා.. රධ්‍ය අයියා හරි සැහැල්ලුවෙන්

@Shan

මාත් එක්ක ඒ මුළු වෙලාවෙම හිටියේ.. එයාගෙ හිනාවෙනකොට තියන අමුතු ලස්සන මම හුඟක් වෙලා අද දැක්කා..

අපි කාලා බීලා ආයෙම කාර් එකට එද්දි නමය හමාර විතර වෙලා තිබුණා.. අපි එද්දි වගේ නෙමෙයි යනකොට රධ්‍ය අයියා හිටියේ දුකින් වගෙ මට තේරුණා.. ගෙදර එන ගමනුත් එයා හුඟක් කතාකලේ නෑ.. කලින් වගේ හිනාවුණෙත් නෑ.. ඉදලා හිටලා අපිට ඉස්සරහින් යන වාහනේක එළියෙන් මම දැක්කා එයාගෙ ඇස් වල තුනීවට කඳුලු පටලයක් බැඳිලා තියෙනවා.. එයාට හැමදේටම වඩා දුක එයාගෙ ලොකුම හීනෙ පණ ගහන්නත් කලින්ම මැරිලා ගිය එක..

ඒ දවස්වල කොච්චර කියනවද එයා මොරටු යන්න ආසයි කියලා.. එයා මට කියලා තියෙනවා එයා ආසාවෙන් හිටියලු කැම්පස් ගිහින් හැම සති අන්තෙම මාව බලන්න එන්න.. සිකුරාදට ගෙදර ඇවිත් එළියට යන්න.. ඇවිදින්න.. එයාගෙ අලුත් ජීවිතේ ගැන මාත් එක කියන්න.. වීක් එන්ඩ් එකේ මාව ක්ලබ් එකට ඇරලන්න.. මගේ රිසාල්ට්ස් අවුට් වුණාමමට කලින් එයාට බලන්න.. හරියට මම එයාගෙ රිසාල්ට්ස් බැලුවා වගේ.. ඊටපස්සෙ මමත් කැම්පස් යන්න ගත්තම ඒ ගැන එයා එක්ක කියනව අහගෙන ඉන්න.. ඒත් ඒ හැමදේම හීනයක් වෙලා නැත්තටම නැතිවෙලා ගියාම මට හිතාගන්න පුලුවන් එයා ඉන්න පීඩනේ කොච්චරක්ද කියලා.. එයත් තාම හුඟක් පොඩි ළමයෙක්.. තවම ජීවිතෙන් කාලක්වත් ගෙවලා ඉවර නෑ.. එච්චර දේවල් දරාගෙන ඉන්න බැහැ කියලා මම දන්නවා.. එයා හෙට යන ගමන නොගියානම් හැමදේම ඕනවටත් වඩා හොඳින් සිද්ධවෙන්න තිබුණා..

අපි ගෙදර එද්දි එකොළහටත් කිට්ටු කල්ලා.. රධ්‍ය අයියා කාර් එක පාක් කල්ලා මාත් එක්කම ගෙදරට ආවා.. මාමා අද එන්නෙත් නැහැනෙ.. එද්දි හෙට උදේ වෙවි.. මම සපත්තුදෙක රැක් එකෙන් තියලා කාමරේට යද්දි රධ්‍යායියා මගේ අල්මාරිය ඇරගෙන ඉඳලා ඉක්මනටම ඒක වැහුවා.. වහලා ඇවිත් මගේ ඇඳෙන් වාඩිවුණා.. මම එයා ගාවට ගිහින් කකුල් දෙක දෙපැත්තට දාලා උකුලින් ඉඳගෙන බෙල්ල අස්සෙ මූණ ගහගත්තා.. එයා යන්න කලින් මට ආසයි, අර අමුතු, හිත ඇදිලා යන ප්‍රියුම් සුවඳට කිට්ටු වෙලා එයා ගාවම ඉන්න.. මගේ පපුව පැත්තක් හිරිවැටීගෙන යනවා.. පුදුම විදියට රිදෙනවා.. මට තවම විශ්වාස කරන්න බැහැ එයා යනවා කියලා.. මම ඇස් දෙක තද කල්ලා පියාගෙන රධ්‍ය අයියගෙ කළුපාට ශර්ට් එක අතකට ගුලි කල්ලා අල්ලගත්තහම රධ්‍ය අයියා මාව තද කරගෙනම

@Shan

බදාගත්තා.. ආයෙම මේ බූවළු අඩු ටිකට හිරවෙලා නිදාගන්න දවසක් එනකල් මට බලාගෙන ඉන්න වේවි..

" පාළු හිතෙනවා.."

මම අමාරුවෙන් පටලගත්තු වචන ටිකක් රධ්‍ය අයියට කිව්වහම මට දැනුනා මගේ උරහිසට එයා මූණ තදකරගන්නවා.. ටිකකින් එයාව ගැස්සෙනවා තේරුණා..

" අයියෙ.."

මම එයාගෙන් එහාට වෙන්න හැදුවත් එයා මාව තද කල්ලාම බදාගෙන ඇඟට තියලා හිරකරගත්තා.. හුස්ම ගන්නවත් බැරිවෙන්නම.. කලින් වතාවල් වල නම් විනාඩියක් දෙකක් එයාගෙ ඇස් වල කඳුලු පිරිලා වේව්ලා ගියාට අද පැය බාගයක්වත් යනකල් එයා ඇස්වල කඳුලු වේලගත්තෙ නෑ.. ඒවා මගේ ශර්ට් එකේම වැටිලා තෙත් වෙලා ගියා..

" මම යන්න ඕන වරද්.."

ටිකකින් රධ්‍ය අයියා ඇස් දෙක බලන්නවත් බැරි තරමට රතු කරගෙන ඇඳෙන් නැගිටලා යන්න හැදුවත් මම එයාව අතකින් අල්ලලා නතරකරගත්තා.. අනේ ඒ මේ මොහොත නම් වෙන්න එපා..

" ටිකක් වෙලා ඉඳලා යන්න.."

" ම්ම්.."

මම රධ්‍ය අයියා ගාවට ගිහින් එයාගෙ මූණට ලං වෙලා තොල් වලට බර වුනා.. එයා මාව බිත්තියට තියලා තද කරගත්තම මම කර වටේ අත් දෙක පටලගෙන තව ටිකක් එයාව මං ගාවට ඇදලා ගත්තා.. ඒ හාදුව කලින් වගේ වේගෙන් හුස්ම උඩට පල්ලෙහාට යන එකක් වගේ වුණේ නෑ.. මට සමහර වෙලාවකට කඳුලුවල රසත් දැනුනා.. රධ්‍ය අයියා මාව උස්සලා මේසෙන් ඉන්දලා මගේ බෙල්ල පැත්තකට ඇල කල්ලා හුහක් වෙලා තොල් උරාබිව්වා.. මගේ තොල් පැලිලා ලේ රස දිවට දැනෙනකල්ම..

ඒ විනාඩි පහලොවක විතර අවසානෙදි මම හිටියේ හුස්ම පොදක්වත් ගන්න බැරුව.. මම එයාගෙන් එහාට වෙලා හුස්ම අල්ලන්න ගත්තු

@Shan

තප්පරේටවත් එයා එහාට වෙලා හිටියෙ නෑ.. ආයෙම මම එයා ගාවටම ඇදිලා ගියා.. අඩුම තරමේ මගේ සිහියවත් හරිහැටි තිබ්බද කියලා මට නිච්චියක් නෑ.. මම ඇඳ උඩට ආවෙ කොහොමද, ඇඟේ තිබ්බ ඇඳුම් සමහරක් ඇඳ පාමුල වැටුනේ කොයි වෙලාවෙද කියලවත් මට මතකයක් තිබ්බෙ නෑ.. කොහොම වුණත් ඒ දේවල් නවත්තන්නත් මට පැහැදිලි හේතුවක් තිබ්බෙත් නෑ.. රධ්‍ය අයියා මගේ බෙල්ලට පහත් වෙලා පැත්තකින් තොල් තියලා තදින් උරවද්දි මම එයාගෙ කොණ්ඩෙ අහුරක්ම අතකට ගුලි කරගෙන හිටියා.. එයාගෙ උඩ ඇඳුමක් නැති පපුවෙ තැනින් තැන මගේ අතින් සීරිලා තුවාල වුනා..

" අ-අයියෙ.."

මම ඉවසගන්න බැරිම තැන එයාගෙන් එහාට වෙන්න දැඟළුවත් එයා මාව ඇඟට තදකරගෙනම හිටියා.. ඒ අතරින් එයාගෙ අත් වල සීතල ඇඟිලි මගේ පපුවෙ තැනින් තැන වදිද්දී මම හිටියේ පියවි සිහියෙන් ගොඩාක් ඈත..

" වරද්.. එ-එපා.."

මගේ අතින් රධ්‍ය අයියගෙ ට්‍රවුසර් එකේ බෙල්ට් එක අන්බකල් වෙද්දි එයා මගේ පපුවට තියාගෙන ඉඳපු තොල් වලින් පපුව තව ටිකක් තදින් උරවන්න පටන් ගත්තහම මගේ අතින් බෙල්ට් එක අතෑරිලා ගියා.. එයාගෙ තොල් උණුවට පපුව උරවද්දි ඇඟ ඇතුලින් අමුතු රස්නයක් දැනෙනවා.. මම ඇඳ රෙද්ද තද කල්ලා අතට ගුලි කරගෙන ඇස් පියාගනිද්දි, රධ්‍ය අයියා මාව උස්සලා අරගෙන උකුලින් තියාගෙන බදාගත්තා.. එයාට හොඳටම දාඩිය දාලා තිබුනෙ.. ඒ වගේම මටත්.. මම හති දාගෙන එයාගෙ පපුවට කඩාගෙන වැටුණා.. රධ්‍ය අයියා මාව අත් දෙකින්ම තුරුල් කරගෙන නලලට තොල් තියාගත්තා.. එයාගෙ බොඩි හීට් එක වැඩිවෙලා මේ වෙලාවෙ හැඟීම් වල අන්තෙටම ඇවිල්ලා තියෙනවා මට දැනුණත්.. එයා මාව පපුවට තියලා තුරුලු කරගත්තු මොහොතෙ ඉඳන් මගේ සිහිය කුරුලු පිහාට්ටක් බිම වැටෙනවා වගේ හිමින් හරි තැනට ආවා..

" This is not the right time.."

" S-Sorry.."

රධ්ය අයියගෙ පපුවට නිකට තියාගෙන මම හිමින් කියද්දි එයා මගේ කම්මුලකට හාද්දක් දුන්නා..

@Shan

" No need to say sorry.. I know the limit.."

එයා බිම වැටිලා තිබ්බ ශර්ට් එක ඇඳගෙන ඇඳෙන් නැගිට්ටා.. නැගිටලා මගේ මූන පුරාම හාදු ගොඩාක් තිබ්බා.. තියලා තියලා අවසානෙදි තොල් වලිනුත් පෙක් එකක් ටිබ්බා..

" හෙට ඉස්කෝලෙ යන ඕනනෙ.. දැන් වොශ් දාලා නිදාගන්න.."

" හා.. ඔයා යන්න කලින් මට මැසේජ් එකක් තියන්න.. මම බලාගෙන ඉන්නවා.."

" ම්ම්.."

එයා ආයෙම මගේ ඔලුව අතගාලා මගේ අතක පැටලිලා තිබ්බ එයාගෙ අත ගලවගෙන යන්න හැදුවත් මම ඒ අත තද කල්ලාම අල්ලගෙන හිටියා.. එයා මං දිහා බලලා ලාවට හිනාවෙලා අත අතාරවගෙන කාමරෙන් එළියට ගිහින් ඉස්සරහා දොරත් වහගෙන යන්න ගියා..

එයා යන්න ගියා..

මම එතනම බිත්තියට හේත්තු වෙලා රූටලා බිමින් ඉඳගෙන කකුල් දෙක පපුවට ලං කරගත්තා.. මම මාස ගානක් තිස්සෙ වෙන්න එපා කියලා හිතපු දේ සිද්ධ වෙනවා.. මගේ ඇස්වල මෙච්චර වෙලාව අකමැත්තෙන් හංගගෙන හිටපු සේරම කඳුලු එකසැරේ රූටලා කම්මුල් දිගේ පහළට වැටෙන්න ගත්තා.. මම ඉකි ගහලා ඇඬුවා.. අතේ තිබ්බ මුද්ද තොල් වලට තද කරගෙන පුලුවන් තරම් ඇඬුවා.. පැය ගානක්..කොච්චර වෙලාවක්ද මතක නෑ.. අන්තිමේ මට එහෙමම නින්ද යාගෙන එද්දි ෆෝන් එක ඇඳ උඩ වයිබ්‍රේට් වෙනවා හීනෙන් වගේ දැක්කා.. ඒත්..

මට බෑ..

මට මහන්සී..

මට පාළුයි..



@Shan

**We all take different paths in life, but no matter where we go, we take a little of each other everywhere..**

separation කියන එක නරක දෙයක්ම නෙමෙයි.. it can help couples gain perspective on their relationship and actually strengthen it.. ( මේක කිව්වෙ අයුකටයි සෙනුකටයි ඈ )

මගේ දුක අහපල්ලා.. ඒක අහන්න මොකෙක්වත් නෑ.. මම ඊයෙ පණ දාගෙන ලියපු වචන දෙද්දාහක්ම උදේ වෙද්දි නෑ.. අප්පාවෙ..මගේ හිත තුණ්ඩන් වෙන්න කැලි කැඩිලා ගියා.. යකූ දෙදාහක් කියන්නෙ.. දෙයියනේ.. එහෙම වුණානම් දවල් දෙන්න තිබ්බා.. වට්පෑඩ් එකේ ආච්චිට හුංගම යන්න හිතෙනෙ මේ වෙලාවට තමා.. රෑට එන්නම් ආයෙම අනේ.. මේ ළමයට සමාවෙන්න..

එන්නාම්.. ලව් යූ.. ❤

GRAZE KITCHEN

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 104 කොටස

" පාසලේ හය ශ්‍රේණියේ සිට ඉහළ ශ්‍රේණිවල මාධ්‍ය සියල්ලෙන්ම අධ්‍යන කටයුතු සඳහා සම්බන්ධ සියලුම ගුරුභවතුන් ප්‍රධාන ශාලාව කරා රැස් වන්න..

නැවතත් එම නිවේදනය-.."

" ෂනෙරු ප්‍රිෆෙක්ට්ස් ඩියුටි බුක් එක කෝ.. අද ඔක්කොම සයින් කළාද.."

" ඕ පොඩ්ඩක් ඉඳපන් මම බලනවා.."

" ඉක්මනට ඕක බලලා ප්‍රිෆෙක්ට්ස් ඩියුටි යවපන්.."

" චමිරු~"

මම හිටියෙ ඉස්කෝලෙ ප්‍රිෆෙක්ට්ස් රූම් එකේ ඩියුටි චෙක් කරන ගමන්.. අද වාරෙ අලුතින් පටන්ගත්ත දවස නිසා උදේ වරුවම ටීචර්ස් මීටින් එකකට අරගෙනයි තිබ්බෙ.. ඉස්කෝලෙ ටීචර්ස්ලා මීටින් එකක් ගත්තම ඒ වෙලාවෙදි ප්‍රිෆෙක්ට්ස්ලා තමන්ගෙ ක්ලාසස් වල ඩියුටි යන්න ඕන..

" ඇයි.."

මම ඩියුටි සයින් කරපු පොතට මූණ ඔබාගෙන ඉද්දි චමිරු හෙනකඳයා වගේ ඇවිත් මං ගාවින් හිටගෙන පොතට එබුනා.. මම මූණ ඉස්සුවා විතරයි චමිරු මගෙ නහය ගාව.. මම මෙහාට වෙලා පුටුවෙන් නැගිට්ටා..

"චමිරු ස්කූල් රවුන්ඩ්ස් යන්න ඕන.."

" මිම්.."

චමිරු ඩියුටි බුක් එක වහලා පැත්තකින් තියලා එළියට ගියාම මමත් එළියට ගියා. සෙනුකයි ජොනතනුයි මීටින් එකට ගිහින්.. ස්පෝර්ට්ස් මීට් එකේ වැඩ වගේකට.. මාත් එක්ක ඉන්න ඉතුරුවුණේ චමිරුයි නෆ්‍රාසුයි විතරයි..

@Shan

චමිරු අත් දෙකත් පිටිපස්සට බැඳගෙන පපුවත් ඉස්සරහට දාගෙන මගේ ඉස්සරහින් යද්දි මම ඌට පොඩ්ඩක් එහාට වෙලා අත් දෙක සාක්කුවට ඔබාගෙන එන්න ආවා.. මූ මාත් එක්ක කතාකරන්නෙ නැනෙ.. මටත් ඕන්නෑ කතාකරන්න.. මොකටද සක්කිලි පරෙයියට සෙකන්ඩ් වෙන්නෙ..

ඌයි මමයි ග්‍රේඩ් සෙවන් වල ක්ලාසස් බලන්න ගියාම ඒවගේ ඔක්කොම ප්‍රිෆෙක්ට්ස්ලා ඇවිල්ලා හරියට ඩියුටි කරනවා.. බලන්න දෙයක් තිබ්බෙ නෑ.. අටත් එහෙමයි.. ඒ පොඩි උන් හොඳයි.. හැබැයි නමයෙ ඉඳන් ඉන්නවා මහ හද්ද ඇට්ටර උන් ටිකක්.. පොඩි පක්කො හිතාගෙන ඉන්නෙ උන් තමා ඉස්කෝලෙ ලොකුම උන් කියලා..

චමිරු මහ ක්ලාස් එකක යාළුවෙක් එක්ක කතාකරන්න නතරවුණු නිසා මම නමයෙ පන්තිවලට යන්න තියන පඩිපෙලේ උඩට යද්දි තුන්වෙනි තට්ටුවෙ වහල උඩ යන්න උන් කෑගහගන්නවා.. ඒකත්.. හොඳ සුද්ධ සිංහලෙනුයි අණ්ඩර දෙමළෙනුයි.. මම දුවගෙන ඉක්මනට උඩට යද්දි පාවෙලා ආපු සපත්තුවක් මගේ ඔලුවට උඩින් ගිහින් පිටිපස්සට වැටුණා..

මම උඩට දුවගෙන එනවා දැක්කහම කොරිඩෝ එකේ මරාගත්ත උන් ටික බැම්මට උඩින් පැනගෙන ගිහින් මොකුත් වුනේ නෑ වගේ පන්ති වලින් වාඩිවුණා.. පන්තියක කොස්සක් දෙකට බිඳලා කොරිඩෝ එකේ දාලා.. මෙවා දැක්කහම තමා මට මාරයා ආවේස වෙන්නෙ.. මරුනෙ ඉස්ස ඉස්සෙල්ලම ඩියුටි කරන්න පටන්ගත්තා.. මම ගිහින් දෙකට බිඳුනු කොසුපොල්ල අරගෙන ටැමිල් මීඩියම් ක්ලාස් එකට ගියා.. සුදු මල්ලිලාට පන්ති මාරුවෙලා වාඩිවෙලා තියෙන්නෙ..

" මොකක්ද මෙතන වුණේ.."

"....."

" ක්ලාස් මොනිටර් කෝ.. නැගිටින්න.."

ටික වෙලාවකින් සුද්පාටයි රතුපාටයි මොට්ටුවක් තියාගත්තු කණ්ණාඩි දාපු කොල්ලෙක් නැගිටලා පන්තිය ඉස්සරහට ආවා..

" මොකක්ද මෙතන වුණේ.."

" අ-අයියා.. යෙහා පන්තියෙ ළමයි අපේ පන්තියට කොළගුලි එවනවා.."

@Shan

" ඉතින්.."

" ඉතින්-ඉතින්-අපේ පන්තියෙ-"

මොනිටරයා ගොතගගහා මොනවද මගුල් වගයක් කියවගෙන යද්දි චමිරුත් පඩිපෙළ නැගගෙන උඩට ආවා.. ඇවිත් අර කැඩිච්ච කොස්සයි මගේ අතේ තිබ්බ කොසු පොල්ලයි දිහා බලාගෙන ඉඳලා බර අඩි තිය තිය මං ගාවට ඇවිදගෙන ඇවිත් හිටගත්තා..

" මොකක්ද ප්‍රශ්නෙ.."

" මම උඩට එද්දි මේ පන්ති තුන ගහගන්නවා.. දැන් මොනිටර්ගෙන් ඇහුවම මොනිටර් දන්නෙ නෑ මොකක්ද වුණේ කියලා.."

චමිරු පන්තියෙ ළමයි මරාගෙන කන්න වගේ ස්කෑන් කල්ලා කොරිඩෝ එකට ගියා..

" ඔය අන්තිම පෝලිම.. එළියට.."

මම අන්තිම පෝලිමෙ ඉඳගෙන හිටපු සිංහල මීඩියම් ක්ලාස් එකේ උන්ට නැගිටලා එළියට එන්න කිව්වහම මදාවි රෑන එළියෙන් ඇවිත් හිටගත්තා.. චමිරු ගිහින් එහා පන්තියෙ ඉඳපු ටැමිල් මීඩියම මදාවි රෑන එක්කන් ඇවිත් කොරිඩෝ එකෙන් හිට්ටුවා..

" මොකක්ද මෙතන වුණේ.."

" අයියෙ මේ ටැමිල් එකේ උන් උදේ අපේ කොස්ස අරගෙන ඒකෙ උන්ගෙ නම ගහගෙන.."

" බොරු අයියෙ.. ඒක අපේ පන්තියෙ කොස්ස.. මුන් හොරාට ළඟ තියාගෙන හිටියේ.."

" මොකක්ද උඹ කිව්වෙ පර දෙම-"

" නවත්තගනින් ඔය නාඩගම...!!! කාලකන්නි වගේ රණ්ඩුවෙනවා.. බලපන් සෙක්ශන් එකේ අනිත් පන්තිත් උඹලා වගේද කියලා.."

@Shan

චමිරු අර සිංහල මීඩියම ක්ලාස් එකේ එකෙක්ගෙ කනෙන් ඇදලා කැඩිච්ච කොස්ස දික් කල්ලා අනිත් වැඩකරන පන්ති පෙන්නුවම ඌ බිම බලාගෙන කාගෙන හිටියා..

" දැන් තොපිද ඉස්කෝලෙ ඉන්න චණ්ඩි.. ආ.. එහෙමද හිතාගෙන ඉන්නෙ.. ෂනෙරු මුන්ගෙ එස් ආර් බී ටික අරගෙන ප්‍රිෆෙක්ට් රූම් එකේ තියන්න.. ක්ලාස් ටීචර්ස්ලා හම්බෙලා අපි කතාකරන්නම්.."

" අනේ අයියෙ.. එහෙම කර-"

" පන්තියට පලයන්.."

" අයියෙ-"

" මොකක්ද මම දැන් කිව්වෙ.. පන්තියට පලයන් කියලනෙ..!!!!!"

" සොරි අයියෙ.."

මම ක්ලාස් එකේ මදාවි රූනගෙ එස් ආර් බී ටික එකතු කරගෙන පහළට එන්න ආවා.. ඇඟට අමාරුයි වගේ මුළු ඇඟම රිදෙනවා.. ඔලුවත් කැක්කුමයි.. ආපු වෙලේ ඉඳලා එහෙට දුවනවා මෙහෙට දුවනවා.. වැඩ කෝටියක් විතර මැද්දට හිරවෙලා.. මට පිස්සු වගේ.. පහුගිය ටිකේ හිතේ නිදහසේ හිටියා මොකුත් ඉස්කොලෙ වැඩ නැතුව.. දැන් නම් හිතෙනවා මොකට මේ බැජ් එකක් ගත්තද කියලා.. පහළ පන්තිවල මීක් කියන සද්දයක් නෑ හැමෝම ළමයි පැවරුම් කරනවා.. අනික පන්තිවල ප්‍රිෆෙක්ට්ස්ලත් හිටියා.. මට මැද මිදුලට ගියාම දහය එකොළහ සෙක්ශන් පේනවා.. ඒවගෙ ළමයි වැඩ.. මම එහෙමම එතන තිබ්බ කණුවකට හේත්තු වෙලා අර එස් ආර් බී ටිකත් තියාගෙන චමිරු එනකල් හිටියා..

ඊයෙ රෑ එහෙමම නින්ද ගිහිල්ලා උදේ අවදි වෙද්දි හතර හමාරයි.. පරක්කු වෙලා පැයබාගයක්ම.. මම ඇඳුම් අයන් කල්ලා තිබ්බෙත් නෑ.. හදිසියෙ ඔක්කොම කරගෙන ගෙදරින් එළියට බහිද්දි හයට කාලයි.. ස්කූල් බස් එකත් ගිහින් නිසා මට එන්න වුණේ පාරෙ බස් එකේ.. එහෙම වෙලා ඉස්කෝලෙට එද්දි හතත් පහුවෙලා.. සෙනුකයව උදේ ඉඳන් හම්බුනේ ගුඩ් මෝනින් කියන්න විතරයි.. ඒකා එහෙට දුවනවා මෙහෙට දුවනවා ඉවරයක් නෑ වැඩ කෝටියක් ඔලුවට පැටවිලා.. මමත් උදේ ඉඳලා උඩට පහළට පඩිපෙල් නැගලා, පණිවිඩ වලට ගිහිල්ලා, ගේට් ඩියුටි, ග්‍රවුන්ඩ්

@Shan

ඩියුටි චෙක් කල්ලා ඉවරවෙද්දි හොඳටම මහන්සි.. ඉස්සර අයුක අයියලා මේවා ගානක් නැතුව වගේ කලාට දැන් නම් තේරෙනවා මේක කොච්චර වගකීමක්ද, අමාරුද කියලා..

මම මගේ අතේ මැණික් කටුව ගාව තිබ්බ රතුපාට ඇඟිලිපාර දිහා බලාගෙන හිටියා.. අත විතරක් නෙමේ ඇඟම තැනින් තැන රතුපාට වෙලා.. රිදෙනවා.. ඔලුවත් කැක්කුමයි පැලෙන්න වගේ.. අද ගෙදර ඉන්න තිබ්බනම් කියලා හිතෙනවා අනන්තවත්.. ඒත් බෑ හවස ප්‍රැක්ටිස් යන්නත් තියෙනවනෙ.. ඒකට නොගිහින් බෑ කොහොම හරි යන්නම ඕන..

" අසනීපෙන්ද.."

මම එකසැරේ උඩ ගියේ චමිරුවා මං ගාවින් හිටගෙන හයියෙන් කතාකරපු නිසා.. මම කණුවට හේත්තු නොවී කෙලින් වෙලා හිටගත්තා..

" නෑ.. උඩට යනවද.."

" ම්ම්.."

මම උඩට එන්න ආවා.. ඉස්කොලෙ ඔය හැටි බලන්න දෙයක් නෑ.. දැන් ගිහින් පෙනඩින් දෙකක්වත් බීලා පැත්තකට වෙලා නිදාගන්න ඕන.. සෙනුකයා ඇවිල්ලා හිටියොත් හොඳයි රූම් එකට.. මට දැන් සියදාස්වෙනි වතාවටත් හිතෙනවා අපරාදෙ අද ඉස්කෝලෙ ආවෙ කියලා.. කිසි වැඩක් හරියට කරගන්න බෑ වගේ.. එක්සැරේට මට මොකුත් ඔලුවට දාගන්න බෑ.. හුරු වෙන්න ඕනම දේකට කල් යනවනෙ.. මම හිටියේ ඒ හුරු නැති මානසිකත්වෙන්.. මගේ වටේ තියන පරිසරේට මාව හැඩගැහෙනකල් කිසිම දෙයක් මට හරියට කරගන්න බෑ.. මම රූම් එකට යද්දි සෙනුකයා රූම් එකේ ෆයිල්ස් වගයක් හදනවා.. මම ඇවිත් ඌ ගාවින් ඉඳගෙන ඩෙස්ක් එකට ඔලුව තියාගත්තා..

" ෂනෙරු.."

" ම්ම්.."

" ඔලුව කැක්කුමද.."

" ම්ම්.. බෑග් එකෙන් පෙනඩින් දෙකක් අරන් දීපන්කො.."

@Shan

" කන්නෙ නැතුව පෙනඩීන් බොන්න.. අනේ මේ නටන්නැතුව වරෙන් ඉස්සෙල්ලා කාලා ඉමු.."

" කන්න බෑ ඔයි.."

සෙනුකයා ෆයිල් එක වහලා නැගිටලා රූම් එකෙන් එළියට ගියා.. ගිහින් විනාඩි පහකින් විතර ආයෙම ඇතුළට ආවා.. ඇවිත් මං ගාවින් ඉඳගත්තා..

" වරෙන් උඹට අතේ ගාගන්න බැරිනම් කවන්න.."

මම ඔලුව උස්සලා පොඩ්ඩක් සෙනුකයා දිහා බැලුවා.. ඌ කෑම එක මේසෙ උඩින් තියලා මගේ දිහා බලාගෙන ඉන්නවා..

" කන්න බෑ බං.. සිරාවටමයි කියන්නෙ.."

" ඒකට කමක් නෑ.. කෝ මෙහෙ හැරෙනවකො.."

මම පුටුව උගේ පැත්තට හරවගෙන වාඩිවුණාම සෙනුකයා බත් මුල දිග ඇරලා මට වතුර බෝතලේ අරන් දුන්නා..

" ඔහොම බෑනෙ ෂනෙරුවා.. පොඩ්ඩක් ඉවසලා ඉඳපන් ටික දවසකින් උඹට හුරුවේවි.."

" මම්.. අයුක අයියා කතාකලාද.."

" තාම නෑ බං.. ගත්තද දන්නෙත් නෑ උදේ වැඩ තිබ්බනෙ.. මට යද්දි එයාගෙ පරන ෆෝන් එක දීලා ගියේ.."

" එතකොට අයියට එකක්..??"

" අලුතින් එකක් ගන්නවා කියලා කිව්වෙ.. දැන් ඒ මගුල හංගන්න මම කාමරේ වලක් හාරනවා හිතුණොත්.."

සෙනුකයා කට ඇද කරගෙන ඒක කිව්ව හැටියට මට හිනාගියා.. ඌ මට බත් කටක් අනලා කැව්වා..

" අම්මට කියහන් උඹ සල්ලි එකතුකල්ලා සෙකන්ඩ් හෑන්ඩ් එකක් ගත්තා කියලවත්.. දැන් ඉතින් ඉස්කෝලෙ ගිහින් ඉවරනෙ.. තාත්තා අවුලක් වෙන

@Shan

එකක් නෑ.."

" එහෙම තමා හිතාගෙන ඉන්නෙ.. බලමුකො.. අම්මා විශ්වාස කරයිද බං ඉතින් ඇපල් නිව් මොඩල් එකේ ෆෝන් එකක් මම සල්ලි එකතුකල්ලා ගත්තා කිව්වහම.."

" ටසිරි.. සල්ලිකාර පුත්තුනෙ.. අම්මට කියපන් මෙ පව්කාර පුතා වකුගඩ්ඩක් වික්කා අම්මෙ කියලා.."

" වික්කා මම උඹට කියන්නෙ නෑ.. ආ ගාපන්.. පකයා.."

" අද හවස ප්‍රැක්ටිස් යන්න බෑ බං.."

" මම උබට කියන්න හිටියෙ.. අද බැරිද කෝච්ට කියලා පොඩ්ඩක් එහෙ මෙහෙ කරගන්න.. උඹට අද එච්චර හරි නෑ වගේ.. බලපන්කො මූණත් එක්ක ඉදිමිලා.. බයත් හිතෙනවා.."

" ම්ම්.. බලමු.."

" මම දන්නව බං දුකයි තමා.. මොනවා කරන්නද.. මෙ ටික පොඩ්ඩක් ඉවසගෙන ඉදපන්.."

" ම්ම.."

" රධ්‍ය අයියා උදේ ගිහිනද.."

" මැසේජ් එකක් දාලා තිබ්බා.. අප්පච්චි කියලා ෆෝන් එක ගෙදර තියලා යන්න කියලා.. ගියත් ඉතින් කොහොමත් පාවිච්චි කරන්න බෑ, ඇතුළට ගියාම ගන්නවනෙ.."

" අම්මටසිරි ඉතින්.."

" ඉතින් ෆෝන් එක අයියට දුන්නා කියලා තිබ්බා.."

" මාස හය ඉවරවෙනකල් අයියට එන්න බැරිවෙයිද බං.. දවසකට හරි.."

" බැරිවේවි.. එන්නෙ දෙන්නෙ නැහැල්ලුනෙ.. සමහරවිට මාස හයෙන් පස්සෙත් එන්න බැරිවේවි.. ඒකෙ රූල්ස් හෙන ස්ට්‍රික්ට් නෙ.."

@Shan

" බලපන්කො.. කෝල් එකක්වත් ගන්න විදියක් තියෙනවනම්.."

" කෝල් නොගත්තට නම් කමක් නෑ.. ගිහින් පරිස්සමට ඉන්නවනම්.. ගියෙත් අකමැත්තෙන් නෙ.. අපරාදෙ බං ඒකා මහන්සිවෙලා ගත්තු ළකුණු.. අර අප්පච්චිනම් මහ-"

" වෙන්න තියන දේවල් නවත්තන්න බෑ ෂනෙරුවා.. උඹ හිත හදාගනින්.. අයියා ඉක්මනට ඒවි.."

" ම්ම.."

සෙනුකයයි මමයි කෑම කාලා ගිහින් මූන හෝදගෙන ඇවිල්ලා බෙහෙත් බිව්වා.. ඊටපස්සෙ සෙනුකයා බලෙන්ම කෝච්ට කතාකල්ලා අද එන්න වෙන්නෙ නෑ කියලා මට කියලා කියවෙච්චා.. චේඑසුමනයා කොයිවෙලෙ හරි මලපැනලා මට රැකට් එකෙන්ම මැරිලා වැටෙන්න දෙනවා ප්‍රැක්ටිස් එන්නෙ නැති එකට.. ඒ වුනාට අදනම් ඇත්තටම යන්න බෑ.. ගියත් හිත එකතැනක තියාගෙන ප්ලේ කරන්න බෑ.. මට පොඩ්ඩක් හිත හදාගන්න නිදහසේ ඉන්න ඕන කියලා හිතෙනවා..

හවස දෙක වෙනකල්ම ඉස්කෝලෙ ඉදලා මම ගෙදර යද්දි තුන හමාර විතර වුණා.. ඉස්සර ආසාවෙන් ඉස්කෝලෙ ඉදන් ගෙදර ගියත් මට දැන් එහෙම දැනෙන්නෙ නෑ.. ඒකත් හෙන අමතර වෙහෙසක් වගේ.. මම ගෙදර එද්දි මාමා ගෙදර ඇවිල්ලා ගෙදරත් අස් කල්ලා කෑමත් හදලා හොඳටම නිදි.. මහන්සි ඇති හොස්පිටල් ඉදලා ඇවිල්ලා.. මම ඒ නිසා සද්ද නොකර කෑම කාලා රෙදි සෝදලා නාගෙන කාමරේට ඇවිත් ඇඳේ වැටිලා හිටියා..මම මොකක් හරි ගෙදර ඇවිත් කරන්න හිටියා.. ඒත් දැන් මතක් වෙන්නෙ නැනෙ..

මොකක්ද මම කරන්න හිටියේ..

මම ආයෙම කොට්ටෙ අස්සෙ මූණ ගහගෙන කල්පනා කලා මොකක්ද මට අමතක වුණේ කියලා.. කොට්ටෙන් මට රධ්‍ය අයියගෙ ප'ෆියුම් එකේ සුවඳ දැනෙනවා.. මම දන්නවා අඩලා හරියන්නෙ නෑ.. මූන එල්ලගෙන හිටියා කියලා ආයෙම එයා එන්නෙ නෑ.. මම මොකක්ද කරන්නෙ.. මගේ පපුව සැරින් සැරේ රිදෙන එකට මම මොකක්ද කරන්නෙ.. මෙච්චර කාලයක්ම එයා ඉස්සරහා මම හැමදේම ඉවසගෙන හිටියනෙ.. පුලුවන් තරම්

@Shan

අඩන්නැතුව ඇහැට උණන කඳුලත් හිරකරගෙන හිටියා.. ඒත් දැන් තනියම නිසා එහෙම ඉන්න බෑ..

මම හුඟ කාලෙකින් ආයෙම තනියම ඉන්නවා.. මම ඇස් දෙක පියාගෙන එයා මගේ ජීවිතේට එන්න කලින් මම ඉඳපු විදිය මතක් කරගන්න ට්‍රයි කලා.. මම අවුරුදු දහ අටක්ම එහෙම හිටියා.. මට අමතක වෙන්න විදියක් නෑ.. එක්කො මම අවුරුදු දෙකකින් ඒ සේරම මතකෙන් අයින් කල්ලා දාලද..

මම වහලෙ සිවිලිම දිහා හැරිලා ඔහේ බලාගෙන හිටියා..

එක්කො මෙහෙන් යන එක හොඳයි.. මෙහෙම ගියොත් මට පිස්සු හැදෙනවා.. එයාට ආයෙම එන්න බැරිද දන්නෙ නෑ.. එක්කො ඇත්තම ගිහ්ල්ලද.. මම හීනයක් දකිනවද දන්නෙ නෑ..

මම ෆෝන් එක අරගෙන එයාගෙ නම්බර් එක ඩයල් කල්ලා නිකමට කනේ තියාගෙන හිටියා.. මෙච්චර කාලෙකට ඒක ඕෆ් කල්ලා තිබ්ලම නෑ.. දෙපාරක් තුන්පාරක් රිංග්ස් යද්දි ආන්සර් කරනවා..

" ඔබ ඇමතූ අංකය ක්‍රියාවිරහිත කර හෝ ආවරණ කලාපයෙන් බැහැරව ඇත.. කරුණාකර-"

මම ෆෝන් එක කට් කල්ලා ඇඳේ පැත්තකට විසික් කලා..

" සුදුමහත්තයා.. මම එනවා.."

මාමා මගේ කාමරේට එනගමන් කියද්දි මම ශර්ට් එකේ කොලර් එක උස්සගෙ ඇහට රෙද්දක් දාගෙන පොරවගත්තා.. ඇහුවොත් එහෙම පැල්ලම් කොහෙන්ද කියලා.. මාව මරාවි..

" එන්නෝ~"

" මොකද බං ඇවිල්ලා කතාකරේ නැත්තෙ.. අද ප්‍රැක්ටිස් කිව්වනේ.."

" අද මේ.. කෝච්ට කතාකල්ලා කිව්වා එන වෙන්නෙ නෑ කියලා.."

" ඒ මොකද.."

@Shan

" ඔලුවෙ රදයක් ආවා ඉස්කෝලෙදි.."

" නාවොත් තමා පුදුමෙ.. උබ අඩලා අඩලා බලපන් මූණෙ හැටි.. ඇස් දෙක ගොරකා ලොඩි දෙකක් වගේ.."

මාමා ඇවිත් මං ගාවින් ඉදගත්තා..

" මොකෝ මේ.."

මම මාමගෙ උකුල උඩින් ඔලුව තියාගෙන ඇස් දෙක පියාගත්තම මාමා ඇදට හේත්තු වෙලා මගේ ඔලුව අතගෑවා.. මට එහෙම ඉද්දි විනාඩි දහයකින් පහළොවකින් විතර නින්ද යාගෙන එද්දි මගේ ෆෝන් එකට කෝල් එකක් එනවා ඇහුණා.. මාමා ඒක ආන්සර් කල්ල කනේ තියාගත්තා.. තියාගෙන මගේ ඇඟට පොරවන රෙද්ද දාලා හදලා ආයෙම ඔලුව අතගාන්න ගත්තා.. මාමා කතාකරන ඒවයි ෆෝන් එකේ අනිත් පැත්තෙන් කතාකරන එකයි දෙකම මට හොදට ඇහෙනවා..

" චූටියො.."

" ම්ම්.. චූටි තමා කතාකරන්නෙ.. මොකක්ද වෙන්න ඕන.."

" මෙ ඔයාද.. කෝ චූටි.. මම ඔයාට ගත්තා.. ආන්සර් කලේ නෑ.."

" නින්ද ගියා පොඩ්ඩක්.. මෙකටත් නින්ද ගිහිල්ලා.. ඔලුව කැක්කුමක් ඇවිල්ලා.."

" ගැස්ට්‍රයිටිස්ද දන්නෙ නෑ.. ඔයා බැලුවද.. චූට්ට පොඩ්ඩ ඇත්නම් වැඩිවෙනවා.."

" ගැස්ට්‍රයිටිස් නෙමේ.. මෙ ඔලුව කැක්කුම අඩලා.. ඇහුවට කිව්වෙත් නෑ මූණ එල්ලගෙන ඉන්නවා.."

" එහෙමද.. පොඩී ගෙදර නැතුව ඉන්න හිතෙන්නෙ නෑ අනූ.. හෙන පාළුයි වගේ.."

" මට රෑ කොල්ලා කතාකලා යනවා කියන්න.."

" එහෙමද.."

@Shan

" මොකද කරන්නෙ.."

" මගේ බ්ලඩ් ෂුගර් බැහැලා.. පොඩ්ඩක් නිදාගන්න බැලුවෙ.. ඇඟට හරි අමාරුයි අනූ.. වෙනදා වගේ නෙමෙ.. ඊයෙ වෝඩ් රවුන්ඩ්ස් යද්දිත් ෆේන්ට් වෙන්න ආවා.. මට අර රිපෝට්ස් ටික බලන්න පුලුවන්ද.."

" ම්ම්.. ඒක මම කැබින් එකේ තියලා ආවෙ.. පස්සෙ දෙන්නම්.. මට කොහොමත් කතාකරන්නත් ඕන.. ඔයාට පුළුවන් වෙලාවක මෙහේ එනවද.."

" හා.. මම එන්නම්.. Everything is fine, right..?"

" ඔව්.. එහෙම ලොකු අවුලක් නෑ.. ඔයා මහන්සි වෙනවා වැඩියි ඒකයි.."

" අම්මා මේ මාසෙ යන්න ඉන්නෙ.."

" එහෙමද.."

" අම්මා ඔයා ගැන කොහොමත් අර ප්‍රශ්නෙන් පස්සෙ දන්නවනෙ.. මගෙන් ඇහුවා අද.."

" ම්ම්.. ඉතින්.."

" මම කිව්වා අපි කතාකරනවා කියලා.. දැන් අම්මත් ගියාම මම අප්පච්චි එක්ක මෙහේ හිරවෙනවා.. ඇයි මමම අනූ.."

" ඔයාම හිතලා බලන්න.. මම ඔයාට පැහැදිලි කල්ලා දුන්නා.. අවුරුදු තිහක් වෙනවා.. සාකි.. ඔයාට තාම බෑ ඔයාගෙ පොඩිකාලෙ ඔයාගෙ හිතේ බලෙන්ම පැල කල්ලා තියෙන ඔය බය නැතිකරගන්න.."

" මම ට්‍රයි කරනවනෙ අනූ.. Give me some time.."

" ඔයාගෙ කවුන්සිලර් මීට් වුණ වෙලේ කියපුවා අහගෙන නෙ හිටියෙ.. නේද.. දැන්වත් තමන්ගෙ ජීවිතේ තීරන තනියම ගන්න පුරුදු වෙන්න ඕන.. ඔයා කොහොමද ඔතනින් එහාට ජීවිතේ හදාගන්නෙ.. හැමදාම ගේ අස්සෙ හිරවෙලා ඉන්නද කල්පනාව.."

" එහෙම නෙමෙ.."

@Shan

" You have been emotionally abused for a long time and you have taken a lot of damage.. මට ඔයාට පොඩි ළමයෙක්ට සීනිබෝල හංගනවා වගේ හැමදේම හංගලා කතාකරන්න බෑ.."

" මට තේරෙනවා.."

" මට අදටත් හිතේ තියන ලොකුම ගිල්ටි ෆීලින් එක මට ඔයාව මෙහෙම තියෙද්දිත් යන්න වුණු එක.. එක අතකින් මේ හැමදේටම වරද තියෙන්නෙත් මගේ අතේමයි.."

" එහෙම කියන්න එපා අනූ.. ඔයාගෙ වැරැද්දක් නෑ.. වෙන්න තියෙන දේවල්නෙ වුණේ.."

මාමා මාව උස්සලා කොට්ටෙන් තියලා කාමරේ වහගෙන එළියට ගියා.. යකෝ මගේ ෆෝන් එක නේද ඒකාගෙ වගේ ගෙනිහින් කතාකරන්න.. මරු.. එක්කො හොඳ වෙලාවට අපි කවුරුත්ම ෆෝන්වල ෆොටෝ තියාගන්නෙ නැත්තෙ.. කවදහරි ගෙවල් වලින් ලැප්ටොප් වල ෆෝල්ඩර් බැලුවොත් ගෙදරින් කෙලින්ම දොට්ට තමා.. මමයි සෙනුකයයි විශේශෙන්ම..

ආධ්‍ය අයියයි අපේ මාමයි අවුරුදු ගානක් කතානොකර, අඩුම තරමෙ දෙන්නට දෙන්නා ගැන මොකුත්ම දන්නෙත් නැතුව කොහොම හිටියද මට හිතාගන්න බෑ.. එක්කො රධ්‍ය අයියා දවසක් කිව්වා වගේ ආධ්‍ය අයියා දුක්වින්ද කාලෙ ඉවරවේගෙන යනවද දන්නෙත් නෑ.. එයා කිව්වනෙ එයාට එහෙම දැනෙනවා කියලා..

මම හැපීකව්වගෙ ලෙමන් ප'ෆියුම් සුවඳ එන කොට්ටෙ අත් දෙකින්ම බදාගෙන ඇස් දෙක පියාගත්තා.. එයා මොනවා කරනවද දන්නෙ නෑ.. යාළුවෙක් හදාගත්තොත් හොඳයි.. ඒත් තියන ලොකුකමට කා එක්කවත් කතාකරන්නෙත් නැනෙ.. ඉක්මනට එන්න හම්බුණොත් හොඳයි මැද්දෙදි.. සෙනුකයට රෑ වෙලා ගන්න ඕන අයුක අයියා ගියාද කියලා අහන්න.. ඒත් අඩුම තරමෙ උන් දෙන්නට හිතේ හැටියට කතාකරන්න හරි පුලුවන්.. මම කොහොමද රධ්‍ය අයියට කතාකරන්නෙ.. අනේ කටහඬවත් අහන්න තිබ්බනම්.. මහා ලොකු වෙලාවකට නෙමේ.. තප්පර දෙක තුනකටවත්..

මම එළියේ කළුවර ගස් කොළන් වහගන්නවා වගේ මගේ හිතට දැනෙන පාළුවටත් මාව වහගන්න ඉඩ දීලා ඔලුවෙ ඉදන් පොරවගෙන ඇස් දෙක

@Shan

තදකල්ලා පියාගත්තා.. එයා මං ගාව හිටියනම් අර විසාල බූවළු අඩු තියන හීටරේට ගුලි වෙලා නිදාගන්න තිබ්බා..

මට රධ්‍ය අයියව වැඩිපුරම මගැරෙන්නෙ මට එයාව ඕනමයි කියලා හිතෙන කාලෙක..

දළඹු සේනාවට පොඩ්ඩක් සන්සුන් වෙන්න කිව්වහම :

අර අප්පච්චි තමා හලෝ ඔක්කොන්ටම මුල.. බනින්න එයැයිට.. මට නෙමෙ.. මේ කලවැද්දා දැන් ගෙදල් මාරුකරන්නත් එපැයි.. බඩු ලැස්ති කරනවා.. මම අනේ ඔයාලට ආදරේම ආදරේ අප්පා.. මේ කතාවට මෙච්චර ආදරේ වේවි කියලා ලියන්න පටන්ගත්තු කාලෙ මම හීනෙකින්වත් හිතුවෙ නෑ.. ඒත් මට හම්බුනු හැම රිඩර්කෙනෙක්ම මාරම සපෝට්ව්.. I have the best readers there is no doubt about it.. මේ හැමදේකටම මම හුහාක් ආදරෙයි..වචනෙන් කියන්න බැරි තරම්.. ❤

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 105 කොටස

" අම්මෝ බං පට්ට අව්වක්නෙ තියෙන්නෙ.."

" උඹ කැප් එක ඉස්කෝලෙ දාලද ආවෙ.."

සෙනුකයා ස්ටේඩියම් එක මැද්දෙන් හැල්මේ දුවගෙන ඇවිත් මම ඉඳගෙන හිටපු හට් එක ඇතුලෙ බංකුවකින් ඉඳගත්තා.. මමයි ජොනායි නෆ්‍රාසුයි ඇත්ලටික් සිලෙක්ශන්ස් වලට සුගතදාස ස්ටේඩියම් ඇවිල්ලා පොඩි ළමයි තේරගන්න ඒවා දිහා බලාගෙන හිටියේ.. අපිට කරන්න තියෙන්නෙ බලාගෙන ඉන්න එක තමා කොහොමත්.. අනිත් ඒවා හවුස් කැප්ටන්ලනෙ කරන්නෙ.. ඔක්කොම ඉවරවුණාම ෆයිනල් රිසාල්ට්ස් ටිකයි ඒවට තෝරගත්තු ළමයි ටිකගෙයි නම් අරගෙන ගෙදර යන්න තමා තියෙන්නෙ.. මෙහෙට දවල් තුනට විතර පායනවා අව්වක් අම්මටසිරි වෙන්න.. පැය බාගයක් විතර හිටියොත් කලන්තෙ දාලා තමා නතරවෙන්නෙ..

" ඔව් බලපන්කො.. සැක්.."

" ආ මේක බීපන්.. උඹට තියාගෙන හිටියේ.."

මම මගේ අතේ තිබ්බ යෝගට් ඩ්‍රින්ක් එක සෙනුකයට දැම්මා.. අපි කලින් බීලා හිටියෙ.. සෙනුකයා ඇත්ලටික් සර් එක්ක වැඩ වගේක හිටිය නිසා දෙන්න බැරිවුණා.. අපිට පොඩ්ඩක් එහායින් චමිරු තනියම වාඩිවෙලා හැන්ඩ්ෆ්‍රී දෙකත් කනේ ගහගෙන පුටු ඇන්දට හේත්තුවක් දාගෙන ඇස් පියාගෙන ඉන්නවා.. කොහොමත් අපි සෙට් එකත් එක්ක පොර ඉන්නෙ නැනෙ.. තනියම තමා ඉන්නෙ.. සෙනුකයා බෝතලේ කඩලා බොන්නත් ගිහින් චමිරු ඉඳපු නිසා අපෙන් ඌව පෙන්නලා ඇයි ඇහුවා.. නෆ්‍රාස් දන්නෙ නෑ කියන්න උරහිස් ඇකිළුවා..

" අඩෝ ඌටත් එන්න කියපන්.."

" එන්න කියන්න කතාකරන්න එපැයි බං.."

" මම කතාකරන්නද.."

" අපිට අවුලක් නෑ එන්න කියපන්.."

@Shan

ජොනතන් නැගිටල චමිරු ගාවට ගිහින් චමිරුගෙ උරහිසට තට්ටුවක් දැම්මහම චමිරු ගැස්සිලා ඇහැරුණා..

" කියන්න.."

" ඒ වරෙන් අතෙන්ට.. මෙතන තනියමනෙ.."

" මෙහෙම හොඳයි.. අවුලක් නෑ.."

" මෙන්න මෙහෙ වරෙන් බං.. නැගිටහන්.."

ජොනතන් බලෙන්ම චමිරුව ඇදගෙන ඇවිත් සෙනුකයට එහාපැත්තෙන් ඉන්දෙව්වා.. අපි ගාවට ඇවිත් චමිරු හෙන අපහසුවෙන් වගේ හිටියේ.. මම ඉන්න නිසාවත්ද දන්නෙ නෑ කියලා මට හිතුණා.. සෙනුක උගේ ඩ්‍රින්ක් එක චමිරුට දුන්නහම චමිරු සෙනුක දිහා බයවෙලා වගේ බලාගෙන ඉඳලා ඔලුව දෙපැත්තට වනලා ග්‍රවුන්ඩ් එක දිහා බලාගත්තා.. යකෝ ලොකුකම මුගෙ.. මස්සිනා අතින් දෙන දෙයක් බොන්න පින නෑ.. ඒකට බලන්න මම කොච්චර ආසාවෙන් මස්සිනා දෙන දෙයක් කන්නෙ බොන්නෙ..

**මයි බෝයිපෙන්'ස් අයියා'ස් රෙස්ටොරන්ට් ඊස් ද බෙස්ට්**

.. අයියගෙ අමතක නොවන ඇඹරැල්ලා මාළුව තමා මාව පිස්සෙක් කලේ..

" අනේ මේ උඹෙ ශෝ එක නැතුව මේක බීපන්.. රෙද්ද.."

සෙනුකයට මල පැනලා අර බෝතලේම අල්ලලා චමිරුවගේ කටේ ගැහුවා.. හොඳ වැඩේ.. මගේ හොඳම යාළුවත් එක්ක ප්‍රශ්න ඇතිකරගන්න එක එච්චර හොඳ දෙයක් නෙමෙ චමිරු සක්කිලි පරෙයියො..

" ඛ්කැහ්-කැහ්-මොන මගුලක්ද බං.."

චමිරු සෙනුකයට රවලා අර බෝතලේම තරහටම එක හුස්මට බීලා හිස් බෝතලේ සෙනුකයගෙ අතින් තිබ්බහම සෙනුකයා මූණ ඇදකරගත්තා.. සෙනුකයා මහපගයා හොඳ වැඩේ පැන පැන දෙන්න යනවට.. හරිනෙ පුජේ අමාරුව දැන්..

" අඩෝ සෙනුකයට හුළං තමා දැන් බොන්න වෙන්නෙ.."

@Shan

ජොනතන් වෛරයේ ගිනිදැල් ඇස් දෙකේ ස්පාර්ක් වෙන සෙනුකයට හීන් වතුර පාරක් ගහන්න හැදුවත් ඒක හරිගියේ නෑ.. මේ වෙලාවට වතුර නෙමෙ හරිනම් දාන්න ඕන පිදුරු.. මුන්ටත් පිස්සුනෙ..

" චමිරු මොකක්ද හලෝ ඒ කලේ.. පව් සෙනුකයා.. මනුස්සකමටනෙ දුන්නෙ.."

මම හරි බැරෑරුම් මූණකින් චමිරුට බනිද්දි සෙනුකයා අර බෝතලේ අඹරලා අරගෙන චමිරුවගෙ කමිසෙ අස්සට එබුවා.. චමිරු එකපාරම පුටුවත් පෙරලගෙන බිම ඇදගෙන වැටුනා..

" මෝඩ හිකනලා.. උඹ මොකද මගේ යෝගට් එක ඔක්කොම බිව්වෙ.."

" මට ඕන නිසා.."

" අරන් දීපන් එකක් දැන්.."

" මට බෑ.."

චමිරුවා ලාවට හිනාවෙගෙන පුටුවෙන් නගිට්ටහම සෙනුකය උගෙ බෙල්ලෙන්ම අල්ලගත්තා..

" වරෙන් ගිහින් මට යෝගට් එකක් අරන් දෙන්න.."

" අතෑරපන් කොලර් එකෙන්.."

" බෑ.. උඹ එන්නෙ නැද්ද..ආ.. කියපන් නැද්ද නැද්ද.."

සෙනුකයා චමිරුගෙ කොලර් එකෙ අල්ලගෙන හොලවගෙන හොලවගෙන ගියාම චමිරු ආයෙම පොඩ්ඩක් හිනාවෙලා බෑග් එකෙන් වොලට් එක අරගෙන සෙනුකයට දුන්නා..

" ඔක දික් කල්ලා හරියන්නෑ ගොබ්බ පරෙයියො.. ගිහින් අරන් දීලා මට පොවපන්.."

" උඹට පිස්සුද.."

" ඔව් පිස්සු.. ඇයි.."

@Shan

" ආ වරෙන් වරෙන්.. අරන් දෙන්නම්.. උඹලටත් ඕනද.."

චමිරු අපෙන් ඇහුවහම මම උගට රවලා උඩ බලාගත්තා.. ආවා මෙතන බලන්න.. මගෙ පස්ස ලොකු කොටවෝරු පුංචව මගෙන් හොරකම් කරන් මටම ඇසිඩ් ගහන්න ඉන්න සක්කිලි පරෙයියා.. හිතේ ඇති මෙතන බදාගන්න..

" උඹ ඉතින් ගේනවනම් අපි බොනවා.. නැද්ද මචං.."

" වරෙන් වරෙන් කියවන්නැතුව.."

සෙනුකය චමිරුගෙ කොලර් එකෙන් අල්ලගෙන කන්ටිම පැත්තට ඇදගෙන ගියා.. අන්න මරු මස්සිනාලා.. සෙනුකයා මුගේ මූණටම සක්කිලි පරෙයියා කිව්වා නේද හත්දෙයියනේ.. මේ බේසිකයගෙ කටනම් හරිම ශෝක්.. කොහොමද අහුවොහ් එහෙම පරෙයියා කියන්නෙ ඇයි කියලා.. මමනම් කියනවා උඹ මගේ සුදුපාට කැඳ වීදුරුවට පාට පාට ලියුම් දුන්නු නිසා තමා පරෙයියා කියන්නෙ කියලා.. අනික චමිරු වගේ එකෙක් ගැලපෙනවද මං අහන්නෙ රඨා අයියට.. නැනෙ.. උන් දෙන්නම එක උස වගේ..  පතාක යෝධයො වගේ.. බුම්මගෙනමයි ඉන්නෙත්..

රඨා අයියට හරියන්නෙ සිරිමත් වගේ හුහක් හොඳ, හිත ලස්සන, එයාගෙ අයියත් ආදරේ, හැන්ඩ්සම් මාමා කෙනෙක් ඉන්න, බැඩ්මින්ටන් ගහන, බයෝ කරපු, ඉස්කොලෙ හෙඩ් ප්‍රිෆෙක්ට් වෙලා ඉන්න, ඇස් දෙක දුඹුරුපාට, කුක්කු දෙන බෝයිපෙන් කෙනෙක්ව.. එහෙම අය ඉතින් හොයාගන්න නැනෙ.. මම විතරයි ලෝකෙටම ඉන්නෙ..

රඨා අයියා මොනවා කරනවද දන්නෙ නෑ..

මම රඨා අයියා ගැන හිත හිත ඉද්දී සෙනුකයා චමිරුවත් ඇදගෙන ආයෙම අපි ඉන්න පැත්තට එනවා මම දැක්කා.. මේවා අයුක අයියලා දැක්කනම් පපුවෙ අමාරුව හදාගන්නවා අනිවාරෙන්ම.. යකෝ!! ඇත්වෙලා හිටපන් කියපු එකාගෙන්ම ගිහින් යෝගට් ඉල්ලගෙන එනවා.. සෙනුකයා තමා දවසකටවත් මිනිහා.. ඌ කොච්චර නපුරුයි කියලා පෙන්නුවත් හිත අර.. මොකක්ද.. උණු වෙන්නෙ.. වෙඩරු පිඩ.. අන්න ඒක වගේ.. කොයිවෙලෙත් උණුවෙනවා.. මගේනම් එහෙම උණුවෙන්නෙ නෑ ඌව දැක්කහම බොරු කියන්න ඕන නැනෙ.. යකඩයක් උණු කල්ලා පුපේ

@Shan

තියන්න හිතෙනවා.. ඔය ඉඳලා හිටලා දවසක තමයි ඌ පව් කියලා හිතෙන්නෙත්..

ඊටපස්සෙ ආයෙම යෝගට් වගයක් බිබී අපි හවස් වෙනකල්ම හට් එක අස්සට වෙලා හිටියා.. චමිරුත් ඔය අපි කියන එකකට ඉඳලා හිටලා හිනාවුණා.. මටනම් තේරුණේ සෙනුකයට හෙන උවමනාවක් තියෙනවා ඌව කතාවට අල්ලගන්න.. වෙලාවක මුගෙ ඔලුවට දෙකක් ඇනලා අහන්න ඕන මොකක්ද වෙලා තියෙන්නෙ කියලා.. අනික චමිරුත් දැන් හෙන අමුතුයි.. සෙනුකයයි මාත් එක්කයි ලාවට හිනාවෙනවා.. කතාකරනවා.. මටනම් චමිරුවව පොඩ්ඩක්වත් ශුවර් නෑ.. මට අමතක නෑ අර මතීශලා එක්ක වුණු ප්‍රශ්නෙ කලින්.. මූ නිසානෙ ඒ සේරම වුණේ.. සැක් මේ සක්කිලි පරෙයියා රධ්‍ය අයියා එක්ක රන්ටැඹෙත් යන්න ඇති එහෙනම්.. මගෙ හැපිකව්වා නිදාගන්නකල් ඉඳලා බලාගෙන හිටියද දන්නෙ නෑ.. ආවහම මූණෙ කහ ටිකක් ගාලා එළකිරි වලින් නාවන්න ඕන.. ලප චමිරුවා.. දහර වලිග ලප වානර..

සිලෙක්ශන් ඉවරවෙලා මමයි සෙනුකයයි ගෙදර එන්න ආවා.. ඌට හැමදාම සුගතදාස එකට අවොත් කැන්ඩොස් හැන්ඩ්මෙඩ් චොක්ලට් ශොප් එකෙන් චොක්ලට් බාර් එකක් අරන් ඕන ගිලින්න..මම ඌට චොක්ල බාර් එකකුත් අරගෙන දීලා එතනින් වමට තියන පාරෙ එකසිය හැත්ත හය බස් පාරට ඇවිදගෙන යන්න ගත්තා..

" උබට එපාද.."

" ඔච්චර පැණිරහ කන්න බෑ බං.."

" බැරි මොකෝ.. පුලුවන් පුලුවන්.. මේ පවුකාරයා වෙනුවෙන් කටක් කන්න දෙයියනේ.."

සෙනුකයා අර චොක්ලට් එකෙන් කෑල්ලක් කඩලා අරගෙන මගේ කටේ ගැහුවා..

" අඩෝ මේ උඹට මේ පාරෙ යද්දි යමක් මතක් වෙන්නෙ නැද්ද.."

" මොන.."

@Shan

මට මතක් වෙගෙන ආවත් මතක් වුණේ නෑ වගේ සෙනුකයවත් ඇදගෙන ඉක්මනට ඉක්මනට යන්න ගත්තා..

" උඹ උඹටම රට හරකා කියාගත්තෙ.. ඊයා ෂනෙරුවා.. උඹ අර කියාන් අයියා ඉස්සරහම උඹටම බැනගත්තු හැටි.. නොදකින්.."

" කට වහන් වරෙන් පාඩුවෙ.."

" ඊටපස්සෙ බස් එකේ පැණි හල හල ආවෙ.. මම දැක්කනෙ.. අම්මෝ නේත.."

" ඕක නවත්තගනින් පකයො.."

" නවත්තගන්න බෑ හනේ.. මතකෙටම නැගෙනවා.. බොලාගෙ ආදර කතාවෙ ඇසින්දුටු සාක්ශිකාරයා විදියට.."

" උඹ මොනවද ඇහීන් දැක්කෙ.."

" හුහක් දේවල් ඒයි..මම ඉතින් මේවා කිව්වෙ නැතිවුණාට.."

මම සෙනුකයා දිහා බැලුවහම සෙනුකයා තඩි චොක්ලට් කෑල්ලක් කඩාගෙන ඒක හපන්න ගත්තා..

" ඕන්නම් එකක් කියන්නම්.."

" මොන..??"

" අර රිසෝට් එකේ.. රධ්‍ය අයියගෙ බර්ත්ඩේ එක දවසෙ.."

" සෙනුකයා!!!!!!!!!!!!!!!!!!!!!!!"

" ආ හරි හරි.. කට වහන් යන්නම්.. කේන්ති ගන්න ඕනද මගෙ පවකාරයෝ ඕකට.."

සෙනුකයා ගෑණු ළමිස්සි වගේ මගේ අත අස්සෙන් අතකුත් දාගෙන කියව කියව ඉස්සරහට ගියා.. බස් පාරට කිලෝමීටයක් එකහමාරක් විතර දුරයි.. අනික හවස් වෙලා ඒ හරියෙ එච්චර ඉන්නත් බෑ.. එහේ මෙහේ අමුතු

@Shan

ජාතියෙ මිනිස්සු ඉන්නවා.. උන්ට කොල්ලෙක් දැක්කත් කුඩු අරවා මෙවා ගහලා ඉන්න වෙලාවට ගානක් නෑ.. බලන්නෙ මහ අප්‍රසන්න විදියට..

අපි එහෙම ඇවිදගෙන යද්දි ඒ වෙලාවෙම අපි ගාවින් මොන්ටෙරෝ ස්පෝට් එකක් ස්ලෝ කල්ලා නතර කලා.. මම නැවතිලා බැලුවෙ අඳුරන එකෙක්වත්ද කියලා.. ටිකකින් ශටර් එක පහත් වුණා..

ඇතුළෙ හිටියෙ අලි තඩි බාව්වු ශර්ට් එකක් ඇඟේ දාගෙන බ්ලොන්ඩ් කරපු කොණ්ඩෙ උඩින් බැඳගෙන ඉදපු අමුතු ජීවියෙක්.. අපි දෙන්නා දැක්කා විතරයි ජීවියා අර හැලෙන බාව්වු ටීශර්ට් එකේ අතක් උස්සලා අපිට හායි කිව්වා..

" හායි ගා~යිස්.. ලිෆ්ට් එකක් ඕනදෝ.."

මම ශටර් එකෙන් මූන දාලා ඇතුළෙ ඒ ජීවියාගෙ අයිතිකාර පොල් බූරුවා ඉන්නවද බැලුවා.. ඌ සීට් බෙල්ට් එකත් දාගෙන උඩ කොක්කකිනුත් අල්ලගෙන ආශිට පිටිපස්සෙ සීට් එකේ ඉන්නවා.. හරිනම් ගෑණියි මිනිහයි ඉන්න ඕන ඉස්සරහනෙ.. මේ මොකද මේ පිටිපස්සෙ කරන්නෙ..

" නැගපල්ලකො ඉක්මනට.. මම යනවා හොඳේ ඕගොල්ලො දාලා.."

සෙනුකයා හනික මාව ඉස්සරහට තල්ලු කල්ලා ගිහින් කියාන් අයියා ගාවින් වාඩිවුණා.. මමද දැන් මෙකී එක්ක ඉස්සරහා යන්න ඕන..

" මොකෝ මේ පැත්තෙ.."

" බෝයිපෙන්ව පික් කරන්න යුනිවසිටි එකට ගියා ඒයි.. කොහොමද ඔයාලට.."

මම ඉස්සරහින් නගලා සීට් බෙල්ට් එක ඇද්දා විතරයි වාහනේ ඉස්සරහට අද්දපු පාර මාව ගිහින් සීන් එකේ වැදුනා..

" යකෝ..!! මොන මගුලක්ද කරන්නෙ.."

" සීට් බෙල්ට් දාගන්න අනේ.. ඔයාලා සීයලා වගේ.."

" ඕයි කියාන් අයියෙ උඹට පිස්සුද මෙකිට වාහනේ දුන්නෙ.."

@Shan

" මම දුන්නු මගුලක් නෑ බං.. අර යුනිවසිටි එකේ සේරම ඉස්සරහා මෙ හොල්මන ලතෝනි තියලා ඇඩුවා.. ලැජ්ජාවෙ බෑ.."

ඒ එක්කම ආශි මූණ ඉසකුඩුවච්චියක් කරගෙන කියාන් අයියා දිහා හැරිලා බැලුවා..

" මොකක්ද කිව්වෙ.. හොල්මනක්..??"

" මොන-කවුද- මොකුත් කිව්වද බං.. නෑ බබා.. ඔයා ඩ්‍රයිව් කරන්න.. මම මේ සෙනුකයට කිව්වෙ.. මූ අයුකයට ලැජ්ජ කරනවා.. පොඩි පකයා එකවිදියක ඉඳපන්.."

කියාන් අයියා පාඩුවෙ ඉඳපු සෙනුකයගෙ පිටට දෙපාරක් තඩිබාලා මූණෙන් ආශිව පෙන්නලා ස්මයිල් ඉන් පේන් හිනාවක් දැම්මා..

" කොහෙන්ද යකෝ ඔය ගෝනිය හොයාගත්තෙ.."

මම ආශි ඇඳගෙන හිටපු හෙන අමුතු විදියෙ ඇඳුම පෙන්නලා ඇහුවහම ආශි මට පොඩ්ඩක් ඉන්න කියලා ශටර් එක පහත් කලා.. කල්ලා මූණ එළියට දාගත්තා..

" මෙ හලෝ.. අයිසෙ.. බාප්පද ලයිසන් දුන්නෙ.. තවුසෙට පිස්සුද.. "

ඊටපස්සෙ මොන මොනවදෝ වගයක් කියලා ශටර් එක උඩට කරලා බොරුවට මූණට පවන් ගහගත්තා.. හැබැයි ඒ සී එක දාලා තියෙන්නෙ.. මන්දා.. මෙකිට පිස්සු කියලා අපිට අමතක වෙනවනෙ.. අපිට තමා පිස්සු..

" බලන්න ඒයි ඒ මිනිහා වමට සිග්නල් දාලා දකුණට හැරෙව්වා.. මට කේන්තී අනේ.."

කියාන් අයියා බාගෙට මැරිලා වගේ සීට් එකට හේත්තු වෙලා ඔලුව දෙපැත්ත අතගාගත්තා..

" උඹ කේන්ති නොගෙන ඉඳපන්.. මෙකප් එක අවුල් ගියොත් එහෙම.."

" අනේ මේ බොරු නොකිය ඉඳපන් ෂනෙරු.. මම මොකුත් ගාලා නෙමේ ඉන්නෙ.. මම අද පොඩි බඩ්ඩක් හැදුවා~~"

@Shan

ආශි සීට් එකේ නට නට යද්දි මම කෝකටත් ස්ටියරින් වීල් එකේ පැත්තකින් අල්ලගත්තා.. එකපාරට මල පැනලා කාණුවකට එහෙම කැපුවොත්.. කියාන් අයියගෙ වාහනේ අපරාදෙනෙ..

" මොනවද හැදුවෙ.."

" ලෙමන් එක්ස්ප්ලේන් ළමයි.. මම අද ගියා නැන්දම්මා එක්ක රිබන් කේක් එකක් හදන්න කියාන් අයියලගෙ ගෙදර.. හරිද.. මේ මනුස්සයා යුනිවසිටි ගිහිල්ලනෙ.. ඊටපස්සෙ මම කේක් හදලා කාලා ඔයාලටත් අරගෙන බෝයිපෙන්වත් පික් කල්ලා ඔයාලා ගන්න මෙහේ ආවා.."

" අඩෝ උඹට අපිටත් ගෙනාවද බං.."

" ඔව් ඒයි.. මහීශාත් ආසයි රිබන් කේක් කන්න.. මම ඉතින් අම්මගෙන් ඉල්ලගෙන ඔක්කොන්ටම ගෙනාවා.."

ආශි සියලු ලෝක සත්ත්වයාගේ මෑණියන් දැ වගේ අපිට කරුණු කාරණා පැහැදිලි කල්ලා දුන්නා..

" බලපන් කියාන් අයියෙ අපේ යාළුවො.. ගැම්මක් නේද.."

" ඕ.. ගැම්ම ඉඳපන් පෙන්නන්න.."

කියාන් අයියා අතේ බැඳගෙන හිටිය දිග ලේන්සුව දිගෑරලා අපිට අත පෙන්නුවා.. සැක්.. ඩ්‍රග් ක්වීන් ඒ සැරේ මෙහෙන්දි ගාගෙන..

" මේ කියපන් කියාන් අයියෙ.. උඹ ට්‍රාන්ස් වෙන්න ආසාවෙන් නේද ඉන්නෙ.."

" අනේ මේ එහෙම හුයන්නක් නෙමෙ.. මෙන්න මෙකි අපේ ගෙදර ඇවිල්ලා මම නිදි අතරෙ මෙහෙන්දි ලබ්බක් උස්සන් ඇවිත් පිටෙයි අත් දෙකෙයි ගාලා ගිහිල්ලා.. මම හෙන අමාරුවෙන් මේ ටික යවාගත්තෙත්.."

මම ආශි දිහා බලද්දි ඒකිට අපි කියන ඒවා ඇහෙන්නෙ නෑ සීට් එකේ ඉස්සරහටම ඇදිලා ගිහින් හැටට හැටෙ පාගගෙන ඩ්‍රයිව් කරනවා..

" සිරාවට.. අඩේ කොහොම ඉඳපු කියාන් අයියද මේ.. ඉස්කෝලෙ උන් මෙවා දන්නවනම් රෙදි නැතුව තමා එන්න වෙන්නෙ උඹට.."

@Shan

" කොහෙද අපිට හිත ගියොත් ඉතින් මෙහෙම එච්චා තමා.. තොපි දෙන්නා අමුතුවෙන් හොඳද.. බේසික පොඩි උන්.. අර පකයො දෙන්නත් 'ඇශේ බලාගනින් බං' යැයි යැයි කියලා ගියානෙ.. මම දැන් බොලා සේරම එකතු කල්ලා දමනවා ඩේ කෙයාර් එකක්.."

" අනේ නිකම් පලයන් බං අයියෙ යන්න.."

" ඒ අයුකයට වීඩියෝ කෝල් එකක් ගමුද.. ඌ කිච්චා හවසට ගන්න කියලා.."

" ගමු ගමු.. දැන් හැබැයි රෑ වෙලා ඇත්තෙ.."

" රෑ වුණාට කමක් නෑ සුදුදෝණියා සුදුඅප්පච්චි වෙනුවෙන් ඇහැරලා ඉන්නෙ.. මම දන්නවනෙ.. ඔය එක එකා වෙනුවෙන් නෙමේ.."

කියාන් අයියා සෙනුකයට රවලා අර උඩ කොක්කත් කෝකටත් අල්ලගෙනම කෝල් එකක් ගත්තා.. ඒ එක්කම ආශි හැරෙච්ච පාර මම ගිහින් ශටර් එකෙත් ඔලුව වද්දගත්තා.. මෙකිගෙන් තමා අහන්න ඕන ලයිසන් දුන්නේ බාප්පද කියලා.. යකෝ!! ජීවිතේට තියන ආසාව අතෑරලා තමා මෙකෙ යන්න ඕන.. මා අත දිගෑරලා දොඩම් බිබික්කමගෙ ඔලුව මැද්දට එකක් දුන්නහම ඒකි මගේ කොණ්ඩෙන් ඇදලා එහෙට්ට විසික් කලා.. පරට්ටි..

" සුදුදෝණියා නිදාගෙනද හිටියෙ රත්තරං.."

කියාන් අයියා ෆෝන් එකත් උඩට කල්ලා අල්ලගෙන කැම් එකට කිස් එකක් දුන්නා.. අයුක අයියා ආන්සර් කල්ලද..

" උඹ ඔය කොහෙද ඉන්නෙ.."

" මොන්ටිසෝරිය ගෙදර එක්කන් යනවා.. මේ උඹෙ සුදූ ඉන්නවා.."

සෙනුකයත් කියාන් අයියගෙ ෆෝන් එකට මූණ ඔබාගෙන අත වැනුවා.

" ෂනෙරු මල්ලියි ආශි නංගියි නැද්ද.."

" ඉන්නවා ඉන්නවා.. මේ.."

@Shan

කියාන් අයියා ෆෝන් එක මට දුන්නා.. අයුක අයියා කාමරේක ඉඳගෙන ලැප් එකේ වැඩ වගයක් කරනවා.. මම හිනාවෙලා හායි කිව්වා..

" රධ්‍ය ගියාට පස්සෙ කතාකලාද මල්ලි.."

" නෑ අයියෙ.. කතාකරන්න විදියක් නෑනෙ.. යන්න කලින් මැසේජ් එකක් දාලා තිබ්බා.."

" ආ.. මම ආධ්‍ය අයියට ගන්න හිටියේ.. මේ බඩු අස්කරන වැඩ අස්සෙ වෙලාවක් වුණේ නෑ.."

" අයියා ඉන්න තැන හොඳයිද.."

" අවුලක්ම නෑ..ශේප්.."

ඒ එක්කම ෆෝන් එක උඩින් ගියා..

" සුදුදෝණියා කාලද ඉන්නෙ.."

" ඔව්.. උඹලා මොකද කරන්නෙ.. කැම්පස් ගියාද.."

" ගියා බං.. එහෙම සෙට් වෙන එකෙක්වත් නෑ එහේ.. වැඩටික කරන් ඉන්නවා ඉතින්.."

" එහෙමද.."

" ඔව් කොහෙද මාත් එක්ක ඉඳපු බේසිකයො දෙන්නා මාව දාලා ගියානෙ රෙද්ද.. ඉක්මනට වරෙන්.."

" එන්නම් බං ඉතින්.. මෙහෙට ඇවිල්ලත් දවසනෙ.."

" සුදුඅප්පච්චි නැතුව පාළුද දෙයියෝ.."

" ඔක නවත්තපන් කියාන්.."

" එහෙම මේ ආදරේ නවත්තගන්න බෑ.. පච්කාර කතා කියන්නෙපා රත්තරං.."

@Shan

" අනේ මේ මම තියනවා.. පිස්සු හු#තා.."

අයුක අයියා ෆෝන් එක කට් කලා.. සෙනුකයා නම් ඉතින් හැමතිස්සෙම මල් කඩනවනෙ.. දැන් අමුතුවෙන් කඩන්න දෙයක් නෑ ඒ නිසා.. මටත් රධ්‍ය අයියට පොඩ් වෙලාවකට හරි කතාකල්ලා හොඳින්ද අහන්නවත් තිබ්බනම්..

" මේ ආශී උඹලගෙ ගෙදරද යන්නෙ.."

" මහීශාත් ඉන්නවා.. ගිහින් කාලා බීලා රෑ වෙලා ගෙදර යන්න පුලුවන් නෙ ඒයි.."

" ආන්ටි එදර ඉන්නවනෙ නේ.."

" ඔව් ඔව් අප්පා.. උඹලත් හෙන ඕවර්කෙයාරින් පිස්සු ඔටුවො ටිකක් තමා.."

ආශී උන්ගෙ ගෙදරින් වාහනේ නවත්තලා දොර ඇරගෙන එළියට පැන්නා.. මායි සෙනුකයයිත් වාහනෙන් බැස්සහම කියාන් අයියා ආන්ටිට යන්නම් කියලා ගෙදර ගියා.. අපි ටික ගේ ඇතුළට ගියා.. යද්දි මහීශා ටීවි එකේ ගේම් එකක් ප්ලේ කරනවා..

" ඔයාලා මූණ සෝදගන්නකො එහෙනම්.. මම තේ හදන්නම්.. රෑට කාලා ගෙදර යන්න පුළුවන් නෙ.."

" හා ආන්ටි.."

සෙනුකයව ඇදගෙන ආශී කාමරේට ගියාම මම මහීශා එක්ක පොඩ්ඩක් ඉඳලා ඊටපස්සෙ ආශීගෙ කාමරේට ගියා.. ඒ කාමරේට ගියාම, තියන එළියට ඇස් දෙක කණ වෙන්න එනවා.. මුළු කාමරේම රෝස පාටයි.. කොටින්ම කිව්වොත් අල්මාරියත් රෝස පාටයි.. මට හිතෙන්නෙ මම බාබි ගර්ල් කෙනෙක් වෙලා ඩ්‍රීම් හවුස් එකක හිරවෙලා කියලමයි.. ඒ අස්සෙ යන තැනම ඉන්නවා තඩි පෝස්ටරේක කොරියන් කොල්ලො වගයක් කියුට් විදියට හිනාවේගෙන.. ඊට යටින් ලව් මයිසෙල්ෆ් කියලා ගහලා තියෙනවා.. මම මේ කාමරේ තියන මනස විපරීත වෙන දේවල් දිහා නොබලා ගිහින් පුටුවකින් ඉඳගත්තා..

@Shan

" ඕගොල්ලොන්ට කියන්න අනේ.. අර අයාන් කියලා හැලකිඹුල් මස්සිනෙක් ඉන්නවනෙ කියාන් අයියලගෙ ගෙදර.."

" මොකෝ සීන් එක.."

සෙනුකයා ඇඳ ගාව බිමින් ඉඳගෙන බූල් බූල් කාපට් එක උඩ හිටිය රෝසපාට බල්ලෙක් බදාගත්තා..

" ඒ මිනිහා ඕනවට වැඩී.. මට දෙන්න හිතයි පක-උෆප්ස් සොරි.. උගෙ මූණ ගලවෙන්න දෙකක්.."

" උඹට මොනවහරි කිව්වද.."

" මට නෙමෙ අනේ.. අපි කට්ටියටම කියනවා මම හිතන්නෙ.. අපි අර ට්‍රිප් එකක් ගියානෙ.. ඒකටත් හෙන කතා ගොඩක් කිව්වලු කියාන් අයියට.."

" අයියා මොකෝ කියලා තියෙන්නෙ.."

" එයා අයාන් එක්ක කතාකරනෙ නැනෙ.. ඒ වුණාට ඩයල් එක අර ෂනෙරුගෙ පස්සෙන් එන සීන් එක නිසා ඇලට් එකේ හිටියනම් හරි.."

" ඌ මක් කරන්නද බං.. අනේ මේ නහින්නැතුව ඉඳපන්.."

මම බාත්‍රූම් එකට ඇවිදගෙන ගිහින් ආශි මූණෙ ගාන මොකක්ද ෆේස් වොශ් එකක් ගාලා මූණ සෝදගත්තා.. හෙන මහන්සි වගේ.. මම කණ්නාඩියෙන් පේන මම දිහාම බලාගෙන හිටියා.. මට මොකක් හරි මතක් වෙන වගේ හදනවා.. මොකක්ද මොකක්ද.. ඊයේ මතක් කරන්නත් හැදුවා.....

එකසැරේම පත්තු වුණා..

අල්මාරිය..!!

ඕතරීට නිදිමතයි ඒයිම..

එන්නාම්.. ලව් යූ.. ❤

@Shan

ආ ඒකනෙමෙ ඕතරීට මගේ ලස්සන දළඹුවච්චියෙක් බඩඩක් දුන්නනෙ.. මෙ තියෙන්නෙ එයාගෙ හිතේ ඇඳුණු රූප.. ඒවා හරිම ලස්සනයි අනේ.. මම ආදරෙම ආදරේයි..

@SamanthaJayangani

uwu ❤

😭😭❤❤

@Shan

ප.ලි.

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 106 කොටස

දවස් හරිම හිමින් ගෙවිලා යනවා වගේ දැනෙනවා.. දවස් හිමින් ගෙවුණත් මම හිටියේ බෙල්ල ගාවටම වැඩ ගොඩක හිරවෙලා.. උදේ ඉස්කෝලෙ යනවා.. ආයෙම හවස ප්‍රැක්ටිස් යනවා.. ගෙදර එනවා.. ලබන සතියෙ ටූනමන්ට් එකක් නිසා මට වැඩිපුර ක්ලබ් එකේ ප්‍රැක්ටිස් වෙන්න වුණා.. ඒ ඇරෙන්න ඉස්කෝලෙ ස්පෝර්ට්ස් මීට් එකට දවස් තුනයි තිබ්බෙ.. සෝශල් එකත් එනවා.. මම අඳින්න ඇඳුමක් ලෑස්තිකරගෙන නෙමෙයි හිටියේ.. කරන්න දාහක් දේවල් හිතේ තියාගෙන හිටියත් මට වෙලාවකට හෙන මහන්සියක් දැනෙනවා..

" Help me, it's like the walls are caving in

Sometimes I feel like giving up

But I just can't

It isn't in my blood.."

වෙලාව රෑ එක හමාරට විතර ඇති.. ෆෝන් එකේ ඇහෙන නෑහෙන ගානට සිඳුවක් ප්ලේ වෙනවා.. මම ලිය ලිය ඉඳපු ප්‍රීෆෙක්ට්ස් ඩයරි එක වහලා ඒකෙ අස්සට පෑන ගහලා බෑන්ඩ් එක දැම්මා.. හෙඩ් ප්‍රීෆෙක්ට් වෙනම ඩයරි එකක් මේන්ටේන් කරන්න ඕන එදිනෙදා වැඩ ගැන.. ඊටපස්සෙ සිකුරාදා වෙද්දි ප්‍රින්සිපල්ට කියලා ඒක සයින් කරවගන්න ඕන.. මටනම් ඉස්කෝලෙ ගමන එන්න එන්නම එපාවේගෙන එනවා වගේ දැනෙන්නෙ.. සමහර වෙලාවට මට එන කේන්තියට දිගට හරහට ළමයින්ට බැනගෙන යනවා.. එවෙලෙට එන කේන්තිය මෙහෙමයි කියලා වචනෙන් විස්තර කරන්න බෑ.. ඒ තරමට.. එහෙම වුණත් මට බැන්න එක ගැන පස්සෙ දුක හිතිලා පසුතැවෙන්න ගන්නවා.. එන්න එන්න ඔක්කොම දේවල් එපාවේගෙන යන කාලෙක මම හිටියේ.. ඒකට හේතු හුගක් තිබ්බා..

පළවෙනිම හේතුව ලොකු අම්මා අපේ අම්මට කතාකල්ලා මම එක එක විදියේ පිරිමි ළමයි එක්ක සම්බන්ධකම් තියෙනවා කියලා කියපු එක..

@Shan

මම ඇත්තටම එහෙම කියන්න හරිම හේතුවක් වත්, එහෙම කියන්නෙ ඇයිද කියලවත් දැනගෙන හිටියෙ නෑ.. මුලින්ම මට කතාව හැදුණේ කෝච් එක්ක.. ඊටපස්සෙ ක්ලබ් එකේ ජිම් ඉන්ස්ට්‍රක්ටර් එක්ක.. ඊටත්පස්සෙ තව ගොඩක් පිරිමි ගැන ලොකු අම්මා අපේ අම්මට කියලා තිබ්බා.. ලොකු අම්මට කොහෙන් මේවා ආරංචි වෙනවද මම දන්නෙ නෑ.. සමහරවිට එහේ ඉන්න මල්ලියි අයියයි මම ගැන හිතාගෙන ඉන්න විදිය එහෙම වෙන්න ඇති.. ඒවා ලොකු අම්මා එක්ක කිව්වහම ලොකු අම්මා කුපිත වෙලා සේරම අම්මගෙ කනේ තියනවා මදි පාඩු ලුණු ඇඹුලුත් එක්කම.. ඔක මාමට මම නොකිය ඉඳලත් පස්සෙ ආච්චිඅම්මා මාමට කතාකරපු වෙලාවක ඔය ප්‍රශ්නෙ ගැන කියලා තිබ්බා..

අපේ මාමා ලොකු අම්මට එච්චර ආස නෑ.. මුල අමතක උන් කියලා බනින්නෙ.. ඒ නියා මාමා පවුලෙ කවුරුත් එහෙම ඔලුවෙ තියාගෙන නෑ අරයට සල්ලි බාගෙ තියනවා, මෙයාට නෑ, අරය උගත්, මෙයා උගත් කියලා.. සේරටම සලකන්නෙ එකම විදියට තමා.. බනිනවනම් කෙලින්ම බනිනවා අරහෙ මෙහෙ වටෙන් ගොඩෙන් නොකිය.. ඉතින් මම නිසා කොහොම හරි මාමගෙයි ලොකු අම්මගෙයි ලොකු රණ්ඩුවක් වුණා.. අන්තිමේ ආච්චිඅම්මත් ඒකට හවුල් වෙලා ලොකු අම්මලා ආච්චිටත් බැනලා තිබ්බා අවජාතකයො ගේ අස්සෙ රිංගවගෙන වඳලා පවුල් වල උන්ගෙ මූණුවල දැලි ගානවා කියලා..

මට මතක් වෙන්නෙම අපේ අම්මා හැමතිස්සෙම කියවන මගේ කේන්දරේ ගැන.. ඒකෙ කියලා තිබ්බලුනෙ මම මගේ මූණෙත් දැලි ගාගෙන පවුලෙ උන්ගෙත් මූණු වල දැලි ගානවා කියලා.. ඔය කියන විදියට දැලි ගාන්නනම් මම ලිප් බොක්කෙ බැහැලා නිදාගන්න ඕන.. මාමා කියන්නෙ ඔය හු#තවල් හිතන්නෙ නැතුව පාඩුවෙ වැඩටික කරගෙන ගේමක් ගහපන් කියලා.. මම දැන් නම් කොහොමත් ඉන්නෙ පාඩුවෙ..

අපේ පවුලෙනම් කොයිවෙලෙත් ප්‍රශ්නනෙ සහෝදරයොන්ගෙ.. විශේශෙන්ම ඔය රණ්ඩුවෙ කොණක අනිවාරෙන්ම අවජාතක ලේබලේ වැදිච්ච මමයි, මගේ කේන්දරෙයි නම් තියෙනවමයි..

අම්මා මගෙන් ඇහුවා උඹට මානසික ලෙඩක්වත්ද කොල්ලො එක්ක අනවශ්‍ය සම්බන්ධකම් තියාගන්නෙ කියලා.. ඔය කියන හැටියේ සම්බන්ධකමක් තිබ්බෙ නෑ කියලා මම කට ගෙවෙනකල් අම්මට පැහැදිලි කල්ලා දෙන්න උත්සාහ කලත් අම්මගෙ අමුතු අමුතු චෝදනා නිසා මම

@Shan

අන්තිමේ පැහැදිලි කරන එක නවත්තලා කෙලින්ම කිව්වා අම්මට ඕන එකක් හිතාගන්න කියලා.. මාමා මොකුත්ම කිව්වෙ නෑ.. ආච්චිඅම්මත් එහෙමයි.. මට කිව්වෙ ඔය දේවල් නොහිතා වැඩකරගනින් කොල්ලො කියලා.. ආච්චිඅම්මා හරි මගේ පැත්තෙන් හිටගෙන ඉන්න එක මට සහනයක් වගේ දැනුනා..

ඉස්කෝලෙ යන, ක්ලබ් යන, වෙන වැඩකට වෙලාව දෙන හැමතිස්සෙම මගේ වටේ අමුතු දුක හිතෙන ගතියක් කැරකි කැරකි තියෙනවා මට දැනෙනවා.. පොතේ වචනෙන් කිව්වොත් මාර ශෝකානුකූල ගතියක්.. හෙන මූසලයි වගේ.. කොටින්ම සෙනුකයා එක්ක මම කතාකලෙත් මට ඕන්නම් විතරයි..

හෙට අපි මේ ගෙදරින් යන්න යනවා.. කොහොමත් මට කියලා කොළඹ ඇති ගෙයක් නෑනෙ.. ආච්චිඅම්මගෙ මහ ගෙදර තමා තියෙන තැනක වැටිලා ඉන්නවත් තියෙන්නෙ.. ඇඳුම්, පොත්පත් අස් කල්ලා ඔක්කොම කල්ලා ඉවරකල්ල තිබ්බෙ.. බඩු පොඩ්ඩක් විතරයි ආයෙම යද්දි ගෙනියන්න ඕන.. මාමා කලින්ම ගිහිල්ලා එතන වැඩ බලලා කල්ලා ඇවිත් තිබ්බෙ..

මම මගේ උකුළ උඩ තිබ්බ ලොකු තාර ජ්ලුශි එක බඩට තද කරගෙන උගේ ඔලුව උඩින් නිකට තියාගත්තා.. එයත් ගිහින් මාසයක් වෙනවා.. මම පුරුද්දට තාමත් සැරින් සැරේ පෝන් එක දිහා බලනවා..කොහොම හරි කෝල් එකක් ඒවිද කියලා.. ඒත් මේ වෙනකල් එයා මොකද කරන්නෙ කියලවත් මම දැනන් හිටියෙ නෑ..

මම වෙලාවකට කියාන් අයියයි ආශියි දිහා බලාගෙන ඉන්නවා.. සෙනුකයි අයුක අයියයි නිතර කතාකරන හැටි බලාගෙන ඉන්නවා.. මාමයි ආධ්‍ය අයියයි කතාකරන ඒවා අහගෙන ඉන්නවා.. හැමෝටම එයාලා ළඟ කෙනෙක් ඉද්දි මට මහා තනිකමක් එක්ක, පාළුවක්, අමුතු මූසල ගතියක් දැනුනා..

මාමත් මේ ටිකේ ඉන්නෙ මහා ප්‍රශ්න ගොඩක කියලා මට හිතෙනවා.. බලාගත්තු අත වෙලාවකට බලාගෙන ඉන්නවා.. කල්පනා කරනවා.. හූල්ලනවා.. ආධ්‍ය අයියත් මම දැක්කෙ දවස් දෙකතුනයි.. එයා මම ඉන්න වෙලාවට මෙහෙ එන්නෙම නැති තරම්.. හැබැයි හැමදාම වගේ කෝල් එකක්නම් ගන්නවා.. මම ඉන්න නිසා එයාලට එකට ඉන්න වෙන්නෙ නෑ කියලමයි මට හිතෙන්නෙ.. ඒකනිසා මම ක්ලබ් තියෙන දවසට ප්‍රැක්ටිස්

@Shan

ඉවරවෙලා ක්ලබ් එකේ රූෆ්ටොප් එකට වෙලා සිංදුවක් අහනවා.. නැත්නම් ඔහේ දිග බංකුවක ඉඳගෙන අහස දිහා බලාගෙන ඉන්නවා.. ක්ලබ් එකේ රූෆ්ටොප් එකේ සෝලා පැනල් වගයක් දාලා තියෙනවා මැද්දට වෙන්න.. ඒ හරිය නැතුව පොඩ්ඩක් එහාට වෙන්න බංකුවක් දාලා තියෙනවා. මොකෙක්වත් උඩට එන්නෙ නෑ.. මම ඉතින් මගේ ක්ලබ් එකේ රහසිගත ස්ථානය විදියට එතන තෝරගත්තා..

ළඟදි දවසක ආධ්‍ය අයියව හම්බෙලා කියන්න ඕන මම එයාලා දෙන්නගෙ සම්බන්ධෙ දන්නවා කියලා..

අධ්‍ය අයියා ඔය ප්‍රශ්නෙ නිසා තමා මාව ලොකුවට මූණට මූණ ගැහෙන්න එන්නෙ නැත්තෙ.. එයාට හිතේ වැරැද්දක් කරනවා වගේ හැඟීමක් ඇති මාව දැක්කහම.. දැන් ඔය මදැයි මම හිතේ තියාගෙන හිටියා අහවන්නෙ නැතුව.. කියලා දානවා.. ආධ්‍ය අයියත් එයාට ප්‍රපෝස් කරපු කෙල්ලව ගෙදරින් ඩ්‍රොප් කරන්න අකමැත්තෙන් වුණත් හැමදාම යනවා.. ඉදහිට අප්පච්චිගෙ බල කිරිල්ලට ඩේට් වලටත් යනවා.. රධ්‍ය අයියගෙ අම්මා ගිය සතියෙ යූ කේ ගියේ කන්සාල්ටන් කෙනෙක් වෙන්න ඉගනගන්න.. ඊටකලින් මාව මුණගැහිලා කතාකරන්න ආසයි කිව්වා.. ඉස්කෝලෙ ඇරිලා එන දවසක මම අම්මා එක්ක කැෆේ එකකට ගිහින් කතාකර කර හිටියා.. එයා හරි හොඳයි..

හිනාවෙලා හරි ලෙංගතු විදියට මාත් එක්ක කතාකලේ.. අපේ අම්මා ගැනත් ඇහුවා.. ඉස්කෝලෙ වැඩ කොහොමද.. ප්ලේ කරන ක්ලබ් එක මොකද.. ඉස්සරහට කරන්න හිතාගෙන ඉන්නෙ මොනවද.. ඔය වගේ දේවල් තමා කතාකලේ..

" ෂනෙරු පුතාට අපේ පුතා ගැන මොකද හිතෙන්නෙ.."

යන්න ටිකකට කලින් අම්මා මගේ අත් දෙකින්ම අල්ලගෙන අහද්දි, මම හිටියේ බයේ බිරාන්ත වෙලා වගේ මූණක් හදාගෙන ඇස් දෙකත් ලොකු කරගෙන අම්මා දිහා බලාගෙන.. එයා මොනවහරි දන්නවා කියලා මම දන්නවා.. ඒ වුණාට එකපාර ලොකුකෙනෙක් ඇහුවහම හිතට අමුතුයි වගේ..ආධ්‍ය අයියා විතරනෙ එයාලගෙ පවුලෙ කෙනෙක්ට දැනගෙන හිටියෙ.. අයියා නම් යාළුවෙක් වගේ.. ඕනම දෙයක් කියන්න පුලුවන්.. ඒත් අම්මා..

" රධ්‍ය අයියද.. එයා-එයා හොඳයි.."

@Shan

අම්මා හෙන හයියෙන් හිනාවුනා මම එහෙම කියපු වෙලාවෙ..

" හොඳයි විතරද.. තව මොකුත් නැද්ද.."

" මම්.. ලස්සනයි..??"

" තව.."

" එකපාර අහද්දි මතක් වෙන්නෙ නැනෙ.."

" ඔයා කලබල වෙලාද ඉන්නෙ.."

" ඔව්.. ගොඩක්.."

අම්මා ආයෙම හිනාවෙලා මගේ අත අතැරියා..

" එහෙනම් මම වෙන දවසක ඒ ප්‍රශ්නෙම අහන්නම්.. මට උත්තර දෙනවද හිතලා.."

" හා.."

ඊටපස්සෙ අම්මට මොකක් හරි මතක් වෙලා වගේ ඉක්මනට මූණෙ තිබ්බ සතුටු හිනාව නැතිවෙලා ගියා..

" රධ්‍යට මම යනවා කියන්නවත් විදිහක් නෑ.."

" අම්මට කියන්න මොනවහරි තියේනම් මම කියන්නද.."

" ඔව්.. සමහරවිට එයා පුළුවන් වුණු ගමන් ෂනෙරු පුතාට කතාකරයි.."

" එහෙම වුණොත් හොඳයි.."

" මට ඕන යනවා කියන්න විතරයි.. රධ්‍ය හිතාගෙන ඉන්නෙ මම එයාට ආදරේ නෑ කියලනෙ.."

අම්මගෙ ඇස් වල කඳුළු පිරීගෙන එද්දි එයා හිනාවෙලා ඇස් පිය ගහලා කඳුළු වෙලගත්තා.. ඊටපස්සෙ ටිශූ එකක නහයට තියාගත්තා..

@Shan

" අනේ අම්මා.. එහෙම දෙයක් නෑ.. රධ්‍ය අයියා අම්මා ගැන හැමතිස්සෙම මාත් එක්ක කියනවා.. එයා දන්නවා අම්මා ආදරෙයි කියලා.."

එයාගෙ අම්මා මං දිහා පුදුමෙන් වගේ ඇස් දෙකත් ලොකු කරගෙන බලාගෙන හිටියා..

" එයා එහෙම කිව්වද.."

" ඔව්.. නිතරම කියනවා.."

අම්මගෙ මූණෙ හරි අහිංසක හිනාවක් ඇඳිලා තියෙනවා මට ටිකකින් පෙනුනා.. එයා මේසෙ උඩ තිබ්බ ලැටේ කප් එක දිහා බලාගෙන හුඟක් වෙලා කල්පනා කලා.. මම එතකල් ඇඟිල්ලෙ දාගෙන ඉඳපු මුද්ද කරක කරක ලාවට කළු කරපු වීදුරුවෙන් එළිය බලාගෙන හිටියා.. එදා ලාවට අහස කළු කල්ලා තිබ්බා.. වහින්න ඔන්න මෙන්න වගේ..

" එයා එහෙම කියනවනම් මගේ හිතට හොඳයි.."

" අම්මා..??"

" රධ්‍ය අමුතුයි කියලා පුතාට හිතෙන්නෙ නැද්ද.."

මම ටිකක් වෙලා කල්පනා කලා..

" ඔව්.. රධ්‍ය අයියට පිස්සු හොඳටම.."

අම්මා ආයෙම මං දිහා බලලා හයියෙන් හිනාවුණා..

" ඒ මොකද එහෙම කියන්නෙ.."

" ඇයි එහෙම නැද්ද.."

" ඔව් ඔව්.. පිස්සු තමා.. ඒක ඇත්ත.. එහෙම නෙමෙ මම කියන්නෙ.. එයාගෙ ගුප්ත ගතිය ගැන මොකුත් හිතෙන්නෙ නැද්ද.."

" එයා එහෙම ගුප්ත නෑ අම්මා.. මටත් වඩා කියවන්න ගියාම ඉවරයක් නැත්තෙ එයා තමයි.. ආ.. හැබැයි ගිය අවුරුද්දෙ මුලදිනම් හිටියා ගෙම්බෙක් වගේ බුම්මගෙන.."

@Shan

" එහෙමද.. ඉතින්.. ඔයාලා කතාකරන්න ගත්තෙ කොහොමද.."

මම අම්මා දිහා බලාගෙන ටිකක් වෙලා හිටියා.. මම ඒක මෙතන කියන එක හොඳයිද කියලා මම දන්නෙ නෑ.. රධ්‍ය අයියා කිව්වනෙ එයාම අම්මට කියනවා කියලා.. ඒත් අම්මා අහද්දි මට නොකියා ඉන්නත් බෑ.. කතාවෙ හැටියට අම්මා හැමදේම දැනගෙන අහන්නෙ කියලත් මට තේරෙනවා..

" අපි කතාකරන්න ගත්තෙ ගිය අවුරුද්දෙ මුලදි වගේ.. මම තමයි අපේ හවුස් එකේ වයිස් කැප්ටන්ට හිටියෙ.. රධ්‍ය අයියත් හිටියෙ අපේ හවුස් එකේමයි.."

අම්ම හරි උනන්දුවෙන් ලොකු කතාවක් අහන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා වගෙ අත් දෙකත් බැඳගෙන මගේ දිහා බලාගෙන හිටියා.. එක අතකින් පරණ දේවල් මතක් කරන් කෙනෙක්ට කියන්න වෙන එකත් මගේ හිතට පොඩි වෙලාවකට හරි සතුටක් ගේනවා..

" මුලදි රධ්‍ය අයියා මාරම නපුරුයි.. කතාකරන්නෙ ගහන්න වගේ.. මම හිතන්නෙර කැඩෙට් සාජන් පට්ටමක් ඔලුවෙ තියාගෙන හිටිය නිසා තමා.. ඒ වුණාට කවුද අනේ එයාව ගනන් ගන්නෙ.. මමනම් ගනන් ගත්තෙ නෑ.."

" එහෙමද.. පුතාට බැන්නද.."

" බැන්නද කියන්නෙ අම්මෙ.. වැඩිපුරම කලේ බැනුම් අහපු එක තමා.. වරද් හරම කරනවා.. මෙහෙම කරනවා.. බ්ලා බ්ලා ඔහොම තමා කතාකරන්නෙ.."

" එතකොට ඒ කාලෙද රධ්‍ය, පුතාට කැමති කිව්වෙ.."

අම්මා මං දිහා හොරෙන් බලාගෙන හිනාවෙලා අම්මගෙ ප්ලේට් එකේ තිබ්බ චොක්ලට් පිරමීඩ් එකෙන් කෑල්ලක් ගැරුප්පුවෙන් කපාගත්තා.. මම ඔලුව පිටිපස්සෙන් අවුල් කරගෙන අම්මා එක්ක ලාවට හිනාවුණා..

" ඔ කැමති කිව්වෙ නෑ.. කියන්න දෙයක් තියෙනවා කියලා කිව්වා.."

" ඒ මොකද.."

" එයා ඒ ලෙවෙල් ඉවරවුණාම තමා මට කැමති කිව්වෙ.."

@Shan

" කැමති කියලද කිව්වෙ.. නැත්නම් කෙලින්ම ආදරෙයි කියලම කිව්වද.."

සැක්!! අම්මා සේරම දන්නවද කොහෙද..

" කෙලින් ආදරෙයි කිව්වා.."

" ඉතින් මොකෝ ඒ ලෙවෙල් ඉවර වෙනකල්ම.."

" ඉස්කෝලෙ යන කාලෙ ඒවා පටලගන්න ඕන නෑ කියලා රධ්‍ය අයියා කිව්වෙ.. ඒකනිසා ඒ ලෙවෙල් ඉවරවෙනකල්ම හිටියා.. එයා මට හුඟක් උදවු කලා එක්සෑම් ලියන කාලෙ.."

" මට ආධ්‍ය පුතා කිව්වා.. ටියුශන් මාස්ටර් කෙනෙක් වෙලා හිටියලු නේද..කොහොමද උගන්නනවා හොඳද.."

" හොඳයි.. ක්ලාස් එකේ සර්ටත් වඩා හොඳට කියලා දෙනවා.. හැබැයි හෙල්මට් එකක්වත් දාගෙන තමා ඉගනගන්න යන්න ඕන.. ඒ කාලෙ මගේ ඔලුව හෙල්ලිලා තිබ්බෙ ටොකු ඇනලම.."

" අපි එකපාර කතාව මැද්දට පැනලනෙ.. මට කියන්නකො ඔක්කොම මුල ඉඳලා අගට.. දැන් රධ්‍ය කියන්න දෙයක් තියෙනවා කිව්වෙ කොයි කාලෙද.."

" ඉන්නකො.. අම්මා මැද්දෙන් පනින්න බෑ .. මම කියාගෙන යනවා.. අහගෙන ඉන්න ඕන.."

අම්මා හිනාවෙලා ඔලුව වැනුවා.. ඇත්තනෙ අම්මට ඔක්කොම කියනකල් ඉස්පාසුවක් නෑනෙ.. අම්මත් පුතා වගේ නැතැයි.. ඉවසන්න ඕන ඔක්කොටම කලින්..

" මෙහෙමයි හරිද.. ඔන්න රධ්‍ය අයියා ඩිපියුටි ගේම්ස් කැප්ටන් වුණා.. ඒ කාලෙ තමා මම කතාකරන්න පටන්ගත්තෙ.. ස්පෝර්ට්ස්මීට් නිසා.. අපි දෙන්නා තරහම තරහයි.. මමනම් ඇත්තටම කිසිම හිතේ කහටක් නැතුව හිටියෙ.. රධ්‍ය අයියා තමා මාව දැක්කහම රවන්නෙ පුප්පන්නෙ.. මමත් ඒකනිසා ගනන් ගත්තෙ නෑ.. ඔහොම ඉද්දි කියාන් අයියා දවසක් කිව්වා රධ්‍ය අයියා කාටද කැමති කියලා නමය වසරෙ ඉඳන්.."

@Shan

" මොකක්.."

අම්මට ඒක අහලා එකපාර ලාවට කැස්සකුත් ඇල්ලුවා..

" ඔව්.. නමය වසරෙ ඉඳලා.. මම ඒ දවස්වල පොඩ්ඩක් පොඩ්ඩක් වගේ ලාවට නිකම් කැමැත්තෙන් වගේ හිටියෙ රධ්‍ය අයියට.. අපේ ඉස්කෝලෙ බැඩ්මින්ටන් ක්ලබ් එකේ ප්‍රසිඩන්ට් මම.. මැච් වලට දවසක් තියා කියාන් අයියා මට රධ්‍ය අයියා කැමැත්තෙන් ඉඳපු කෙනා ගැන හෙන විස්තරයක් කිව්වා.. එයාට අරහෙම ආදරෙයි, මෙහෙම ආදරෙයි.. මෙච්චර කාලයක් වෙන කවුරු දිහාවත් බලලවත් නෑ ඔහොම දේවල් කියලා..

මගේ හිත රිදුනා ඒකට.. මමත් කැමැත්තෙන් නෙ හිටියෙ.. මම ඉතින් මගේ යාළුවා එක්ක ක්ලාස් එකේ කතාකර කර හිටියෙ අවුලෙන්.. ජ්ලේ කරන්නවත් මූඩ් එකක් තිබ්බෙ නෑ. එදා තමා රධ්‍ය අයියා කිව්වෙ එයාට කියන්න දෙයක් තියෙනවා ඒ ලෙවෙල් ඉවරවුණාම කියන්නම් කියලා..

ආ අනික අපි දෙන්නා ඉස්සර ඔය අහම්බෙන් හම්බෙන සේපාලිකා ගහක් තිබ්බා ඉස්කෝලෙ.. මම දවසක් රධ්‍ය අයියට කිව්වා ඔයාගෙ ක්‍රශ් එකට හිතේ තියන දේ කෙලින්ම කන්ෆෙස් කරන්න කියලා.. එයා බෑ කිව්වා.. මම බලෙන්ම රධ්‍ය අයියට සේපාලිකා මලක් දීක් කල්ලා කිව්වා My feelings for you are a miracle.. Not like walking on water, but pretty darn close කියලා.. එහෙම කිව්වෙ එයාට එයාගෙ කැමැත්තෙන් ඉන්න එක්කෙනාට කියන්න..

එදා රධ්‍ය අයියා මටත් ගස්සගෙන අර මලත් අරගෙන තරහවෙලා යන්න ගියා.. මටත් ගානක් නෑ එච්චරම.. අනික මම ඊටකලින් කාටවත්ම එහෙම කැමැත්තෙන් ඉඳලත් නෑ.. පහුවෙලා දවසක මට රධ්‍ය අයියගෙ ෆෝන් කේස් එක අස්සෙ තිබිලා අර මල හම්බුණා.. එතකොට තමා මා ලාවට තේරුණේ රධ්‍ය අයියා කැමති කාටද කියලා.."

" එතකොට කැමැත්තෙන් ඉඳලා තියෙන්නෙ පුතාටද.."

" ම්ම්.."

" නමය වසරෙ ඉඳලා..?? මේ කොල්ලව තියන්න වටින්නෑනෙ.."

මම හෙන ගොබ්බ පගේ හිනාවක් දාලා ඉතුරුවෙලා තිබ්බ චොක්ලට් කේක් එක කටේ ඔබාගෙන හපන්න ගත්තා..

@Shan

" ඉතින් ඉතින්.."

" ඒක දැනගත්තට පස්සෙත් වෙනසක් නෑ ඉතින් රධ්‍ය අයියා පුප්පන ගෙම්බා වෙලාම හිටියා.. ටිකකාලයක් යද්දි අපි හැමදාම කතාකලා.. මුලදි පොඩි පොඩි දේවල්.. සිංදු, නවල්ස් ගැන වගේ දේවල්.. මිම්.. එහෙම තමා ඉතින්.."

අම්මා මං කියන දේවල් අහගෙන ඉඳලා පාර දිහා බලාගෙන ලාවට හිනාවුණා..

" ඊටපස්සෙ ඒ ලෙවෙල් ඉවරවුණාම ආදරෙයි කිව්වා..??"

" ඕ.. අම්මා මම කිව්වා කියලා රධ්‍ය අයියට කියන්න එපා හරිද.."

" ඒ මොකද ඒ.."

" එයා අම්මට කියනවා කිව්වා ඇවිල්ලා.. එක්කො අම්මා මම කියන එකත් අහලා, එයා කියන එක අහන පළවෙනි වතාව වගේ රඟපාන්න.."

මස්සිනාට රඟපාන්න පුළුවන් වුණු එකේ නැන්දම්මට රඟපාන්න බැරිවෙන්න බෑනෙ..

" හා.. එහෙම හොඳයි.. මම ඔයාව ගෙදරින් ඩ්‍රොප් කරන්නම්.."

අම්මයි මමයි කතාකර කර ඉඳලා අම්මම මාව ගෙදර ගාවින් ඇරලුවා.. අම්මා හරි හොඳයි.. දෙයක් කිව්වහම උවමනාවෙන් අහගෙන ඉන්නවා.. ආධ්‍ය අයියා වගේ.. කේන්ති ගන්න කෙනෙක් නෙමෙ පොඩ්ඩක්වත්.. හරි ලස්සනට හිනාවෙනවා.. උගත් පෙනුමක් එක්ක කරුණාවන්තකමක් මට දැනුනා.. හුහක් ළඟම කෙනෙක් වගේ හැඟීමක් දැනුනා.. ඒත් සැරින් සැරේ අම්මට මොනවහරි මතක් වෙනවා වගේ එකපාරම ගැස්සිලා කල්පනා කරනගන්නවා.. එක්කො ඇස් වල කඳුලු පිරෙනවා.. ආයෙම හොඳින් ඉන්නවා.. හිනාවෙනවා.. හැසිරෙන විදියෙ මට පොඩි අවුලක් වගේ තේරුණත් මම ඒක එච්චරටම ගනන් ගත්තෙ නෑ..

" මට ආධ්‍ය කිව්වා ෂනෙරුට මේ මාසෙ teenhood එක කම්ප්ලීට් කරනවා කියලා.. මිම්..??"

@Shan

මම අම්මා එක්ක හිනාවෙලා බෑග් එකේ පටියක් උඩට උඩට රෝල් කරගෙන ගියා..

" දැන් ඉතින් ටීනේජ් කෙනෙක් නෙමෙයිනෙ.. ෂනෙරු ලොකු වෙනවට කැමතිද.."

" අනේ මන්දා.. අකමැත්තකුත් නෑ.. කැමැත්තකුත් නෑ.. මේ වෙලේ නම් හිතෙන්නෙ ලොකු වෙන හොඳයි කියලා.."

" ඇයි මේ වෙලාවෙ..??"

" මට ඕන ඉන්ඩිපෙන්ඩන්ට් වෙන්න.. අම්මා දන්නවද දන්නෙ නෑ.. මට ඉන්නෙ අම්මා විතරයි.. ඉතින් දැන් හිතෙනව පවුලට බරක් නොවී ජීවත්වෙන්න ඇත්නම් කියලා.. ඒ ඇරෙන්න ලොකු වෙද්දි පොඩ්ඩක් පවුලෙන් ඈත්වෙන්න ඇත්නම් කියලා හිතෙනවා.."

අම්මා මගේ අත අරගෙන තද කල්ලා අල්ලගෙන ඇඟිලි වල අම්මගෙ ඇඟිලි පටලගත්තා.. අම්මා හිතුවද දන්නෙ නෑ මට ඉන්නෙ අම්මා විතරයි කිව්වහම දුක හිතුණා කියලා..

" ඇයි එහෙම හිතෙන්නෙ.."

" මගෙයි පවුලෙයි අදහස් වෙනස්.. හැමතිස්සෙම නොගැලපෙන ගතියක් දැනෙනවා.."

" ම්ම්.. නොගැලපෙන තැන් වලින් අයින් වෙන එක හොඳ දෙයක් තමයි.. මට අවුරුදු ගානක් ගිහින් තේරෙන දේවල්, ඔයා ඔය වයසෙන්ම තේරුම්ගන්න එක කොච්චර දෙයක්ද.."

" ඒ කිව්වෙ.."

" ඒක කියන්නෙ ආයෙම අපි හම්බුණ දවසක තමයි.."

" ආ ඒ කියන්නෙ මට අම්මව ආයෙ ඉක්මනට හම්බෙන්න පුළුවන්.. නේ..??"

" අනිවාරෙන්ම.."

@Shan

අම්මා අපේ ගෙදර ගාව පාරෙන් කාර් එක නවත්තලා, කාර් එකේ පිටිපස්සෙ තිබ්බ රතුපාට රිබන් එකක් ගැටගහලා තිබ්බ කළුපාට පේපර් බෑග් එක අරගෙන මගේ උකුළ උඩින් තිබ්බා..

" පළවෙනියටම බර්ත්ඩේ එකට විශ් කරන්නෙ මම.."

" තෑන්ක් යූ සෝ සෝ මච්.. මම ආදරෙයි.."

" දැන් යන්නකො එහෙනම්.."

මම බෑග් එකයි ස්පෝර්ට්ස් බෑග් එකයි අරගෙන කාර් එකෙන් බැස්සහම අම්මා මගේ පිටට තට්ටුවක් දැම්මා..

" මතකනෙ.. හම්බුණාම කියන්න දෙයක් තියෙනවා.."

" මතකයි මතකයි.. ඔක්කොටම කලින් රධ්‍යගෙන් අහන්න ඕන කොහෙන්ද මේ ඇස් නටවන බෝනික්කා හොයාගත්තෙ කියලා.."

අම්මා මට බායි කියාගෙන යන්න ගියාම මම ගෙදරට එන්න ආවා.. ඊටපස්සෙ අම්මා ලංකාවෙන් ගියා.. මට කතාකලේ නැහැ.. අම්මා මට දීලා තිබ්බෙ Dolce and Gabbana කහ පාට ලොකු හුඩී එකකුයි Armaf Club de Nuit Sillage ප'ෆියුම් එකකුයි.. ඒක මාරම සුවඳයි.. මට කලින් මෙහෙම හෙන බ්‍රෑන්ඩඩ් ප්‍රසන්ට්ස් හම්බෙලාම නෑ.. ආසයි හම්බෙනවනම්.. ඒත් මට ලැබෙන්නෙ මොන වගේ දේකින්ද මම ඒ ඕනම දේකින් සතුටු වෙනවා.. විශේශත්වයක් නෑ.. ඒත් මේ ගිෆ්ට් එක විශේශයි.. මොකද ඒක දුන්නෙ රධ්‍ය අයියගෙ අම්මා නිසා.. මාමගෙන් බර්ත්ඩේ එකට අයි ෆෝන් එකක් හම්බුණා.. සල්ලිකාරයා හම්බකරනවනෙ.. කලින් තිබ්බ ෆෝන් එක දැකලම මාමට කලකිරිලා වෙන්න ඇති තියෙන්න ඇත්තෙ.. ඒ ඇරෙන්න ආධ්‍ය අයියා පූමා එකේ sweatshirt දෙකක් එක්ක H24 by Hermès ප'ෆියුම් එකක් දුන්නා.. තව කවදාවත් නැතුව බර්ත්ඩේ ප්‍රසන්ට්ස් තොගයක්ම මට හම්බුණා.. ප්‍රිෆෙක්ට්ස් බෝඩ් එකෙනුයි, මල්ලිලාගෙනුයි, බැඩ්මින්ටන් ක්ලබ් එකෙනුයි, මාන්නක්කාර වේළුසුමනයගෙනුයි තාන්වී අක්කගෙනුයි, යාළුවොන්ගෙනුයි කොටින්ම කිව්වොත් චමිරුවත් මට හෙන තඩි ෆ්‍රෙන්ච් රෝස් බොකේ එකක් ගෙනැත් දුන්නා චොක්ලට් බොක්ස් එකක් එක්ක.. එකපාරම ඉතින් මෙහෙම තෑගි හම්බෙද්දි හෙන අමුතුයි.. කලින් අම්මා හදලා දෙන කිරිබතක් කාලා පාඩුවෙ ඉන්නවා වගේ නෙමෙනෙ..

@Shan

රධ්‍ය අයියා මගේ අල්මාරියෙ ඇතුළටම ඇතුළටම වෙන බෑග් දෙකක් දාලා තිබ්බා.. ඇරලා බලන්න හම්බුණේ බර්ත්ඩේ ගිෆ්ට් එක විතරයි.. අනික බලන්න තව මාස හතරක් පහක්වත් ඉන්න වෙනවා.. ඒක බලන්න කියලා තිබ්බෙ රිසාල්ට්ස් ආවට පස්සෙ.. මම ඉතින් ඒකනිසා බලන්න ගියේ නෑ.. එයා මම එහෙම කරයි කියලා බලාපොරොත්තුවෙන් නෙ දෙන්න ඇත්තෙ.. මම එදා බලාගෙන හිටියා බැරිවෙලාහරි මට රධ්‍ය අයියගෙන් කෝල් එකක්වත් ඒවිදෝ කියලා.. මම කියන්නෙ බැරිවෙලාවත්.. ඒත් කෝල් එකක් තියා මොකුත්ම ආවෙ නෑ.. මගේ හිතේ එහෙම කේන්තියක්, තරහක් නෑ.. ඒ වුණාට මවාගත්ත බලාපොරොත්තුවක් තිබ්බ නිසා දුක හිතුණා..

මම ෆෝන් එකේ ප්ලේ වෙවී තිබ්බ ප්ලේලිස්ට් එක ඕෆ් කල්ලා මේස ලාච්චුවේ තිබ්බ ලස්සන ලා නිල් පාට ග්ලිටර් කවර් එකක් තිබ්බ පුංචි හුරුබුහුටි පොත අරගත්තා..

"Little miracle that I love"

මට මෙච්චර කාලෙකට හම්බුණ ලස්සනම ගිෆ්ට් එක.. හම්බුණේ රධ්‍ය අයියගෙන්.. ඒක පොඩි පොතක්.. පිට කවරේ පුංචි පුංචි මල් ගොඩක් එම්බ්‍රොයිඩර් කල්ලා මහලා තිබුණා.. වාම ඒත් ලස්සනයි.. කොහොමත් රධ්‍ය අයියට තියෙනවා අමුතු පිස්සුවක් ලස්සන ලස්සන පොත්, පෑන් එකතු කරන.. හුඟක්ම පරණ පෙනුමක් තියෙන ඒවට එයා ආසයි.. අනික රධ්‍ය අයියා art journal

හදනවා නිකම් ඉන්න වෙලාවට.. එයාට ඒ වගේ ක්‍රියේටිව් දේවල් ලස්සනට කරන්න පුළුවන්.. මට වගේ කඩිකුලප්පුවක් එයාට නෑනෙ.. හෙන සංයමයක් තියෙන මනුස්සයෙක්නෙ..

ඒකෙ අපි දෙන්නා ඔය රන්ඩම්ලි ගහපු ෆොටෝස් ලස්සනට කපලා දින දාලා එක එක දේවල් ඇඳලා ලියලා එයා පොතක් හදලා තිබුණා.. කියන්න වචන නෑ ඒකනම් මාරම ලස්සනයි..දැක්කහම තේරෙනවා එයා ගොඩාරියක් මහන්සි වෙන්න ඇති කියලා.. අපි ගමේ ගිහින් අරගත්තු ෆොටෝ, ට්‍රිප් ගියපුවා, ඩේට් වලට ගියපුවා ප්‍රින්ට් කල්ලා එක එක පාට තීම් වලට ටේප්, ස්ටිකර්ස් අලවලා ආදරේ හිතෙන විදියට ඒක හදලා තිබුණා.. මම තාම ඔක්කොම බලලා ඉවර නෑ.. දවසට එක පිටුවක් බලනවා.. එකපාර බලලා ඉවරකරන්න හිතෙන්නෙ නෑ.. ඒ තරම් ඒකට ලෝබ හිතෙන නිසා..

@Shan

ඒකත් එක්ක තව තාරපැටියෙක් ප්‍රින්ට් කරපු කහපාට ඕවර්සයිස්ඩ් ටී ශර්ට් එකකුයි ඩකී ඩක් කියලා ගහපු සොක්ස් දෙකකුයි දීලා තිබ්බා.. කොහෙන් ගියත් ඉවරවෙන්නෙ අවසානෙට තාරාවෙක්ගෙන් තමා.. එතකොට තමා මට මාරයා ආවේස වෙන්නෙ.. එන්නෙ නැතැයි.. තාරාවො පෙන්නන්න මම.. හැකරැල්ලට.. පුදුම තාර වන්නමක් තමා ඒක.. මම සැහෙන වෙලාවක් පොත දිහා බලාගෙන ඉඳලා දෙකහමාරට විතර නිදාගන්න ඇඳට ගියා..

හිතට පුංචිම පුංචි නිදහසක් සතුටක් ගේන්න මතකෙකට හරි එන්න හිටියේ රධ්‍ය අයියා විතරයි.. මොකද මගේ වටේ තියන කිසිදෙයක් ගැන මට ස්ථිර සතුටක් බලාපොරොත්තු වෙන්න බැරි නිසා..

ඕතරී පමා වුණා පොඩ්ඩක්.. ඇලෙක්සා ප්ලේ ද සෝන්ග් 'මන්ද පමා'.. ඉම්හී.. එහෙම නෙමේ අනේ අපේ ගෙදරට නෑයො වගයක් ඇවිල්ලා දවසෙම හිටියා.. කාමරේට එන්න වෙලාවක් වුණේ නෑ.. සමාව දෙමින..

ඕ ලෙවෙල් බීසනෙත් පටම්ගත්තා නේන.. අපේ ගෙවල් ගාව ඉස්කෝලෙක කොම්ලො වගයක් නිල් පෙරාගෙන ගෙවල් වල යනවා දැක්කා දවාලෙ.. මම් පුතේ නිල් ගහගෙන සමරමින.. එච්චා හොඳ වැඩ.. ඊළඟ එන්නෙ නිලංකාර වෙලා යන සමය තමා..

උපෙ යන නම්ගිලාට මම්ලිලාට කියන්න තියෙන්නෙ මුල ඉඳලම හොඳට පාඩම් කරන්න.. තේරෙන්නෙ නැති තැන් පහුවෙන්න දාගන්නෙ නැතුව ඒ වෙලේම ක්ලියර් කරගන්න.. (මීට ඩ්‍රොප්සිපින් වෙච්ච උපෙ සිස්සාවක්) නැත්නම් සකබුම් වෙයි පුතේ.. අපි දන්නෙ නෑ..

මම දැක්කා ෆේස්බුක් ග්‍රෑප් එකක වරද් වගේ කියලා කවුද කෙනෙක් මෙන්ශන් කල්ලා ප්‍රශ්නයක් වෙලා තිබ්බා.. මගේ ළඟ කතාවෙ කොපියක්වත් නෑ ළමයි රිපෝට් වෙලා මොකක් හරි වුණොත් මම මං ගාව දාන්න ආයෙම කතාවක් නෑ.. ඒකනිසා ඔය හැම දළඹුවෙක්ම මොනවා හරි සෝශල් මීඩියා වල දාද්දි පොඩ්ඩක් සැලකිලිමත් වෙන්න.. එපා කියනවා නෙමේ අපිත් මොනවා හරි දැක්කහම ඒවා ශෙයා කරනවනෙ.. ඒත් දන්නැද්ද මේක සිරිලංකාවනෙ..

මම දැක්කා පහුගිය කාලෙක ගෑණුළමයි දෙන්නෙක් මැරි කරපු එකකට ලංකාවෙ යක්කයො දාපු හෙන හැලි කමෙන්ට්ස් වගයක්.. එච්චා දැක්කහම ළමයි, ස්ට්‍රේට් උන්ටත් බය හිතෙනවා.. ඒ තරම් සභ්‍යයි.. අපි ජීවත්වෙන ෆැන්ටසියයි රියල් ලෝකෙයි වෙනස් කියලත් මතකේ තියාගන්න.. තාම ඒ

@Shan

මානසිකත්වෙට ලංකාව ඇවිල්ලා නෑ.. ප්‍රයිඩ් මන්ත් එකට ස්ටේටස් එකක් දැම්මහම උඹ ලෙස්ද කියලා අහන සමාජෙක අපි තාම ජීවත් වෙන්නෙ.. (මීට එහෙම අහගත්තු ඕතර් බේසික වෙරි මින්සි)

සමාවෙන්න අයියෝ සීරියස් කතාවක් කිව්වට.. මම පොඩ්ඩිත්තක් මතක් කලා.. ඒනම්..

එන්නාම්.. ලව් යූ.. ❤

@flemi_kook අනේ මම ඒකට මාරම  මාරම ආසයි මගෙ දළඹුවච්චියෝ.. ගොඩක්ම ගොඩා~ක් ලස්සනයි.. (❁'◡'❁)❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 107 කොටස

" අම්මට ඇත්තටම මට වඩා ලොකුඅම්මා කියන ඒවද විශ්වාස අම්මෙ.."

" විශ්වාස කතාවක් නෙමෙයිනෙ.. මං අහන්නෙ.. අම්මපා උඹව කොළඹ ගෙනිහින් හැදුවෙ මේවා අහගන්නද වරද්!!"

මම ෆෝන් එක කනේ තියාගෙන මගේ අලුත් කාමරේ ජනෙල් ග්‍රිල් එකකට ඔලුව තියාගත්තා..

" උඹව එක අතකින් හැදුවට වඩා හොඳයි මෙන්න මෙ ගමෙ ඉස්කෝලෙටම දාගෙන මෙවගෙ තියාගත්තනම්.."

"....."

" ආයෙම ඔය ක්ලබ්ද මොකක්ද මගුලට යන්නෙ නෑ.. මට බෑ මෙච්චර අපහාස විඳින්න.. දාහක් කතා අහගෙන උඹලව හැදලා අන්තිමේ ඒකෙනුත් වුණේ අපිට විදවන්නමයි.."

මම හුස්මක් අරගෙන හිමින් ඒක පල්ලෙහාට දැම්මා.. මේවා අහලාම දැන් මට මහන්සී..

" අම්මා කිව්ව පලියට මට ඒක නවත්තන්න බෑ.. ඇයි අම්මෙ මට එක පොඩ්ඩකටවත් මම ආස දෙයක් කරන්න බැරි.. ආ..?? අම්මගෙ උවමනාවල් එපාවල් ඉෂ්ට කරන්න මම අකමැත්තෙන් වුණත් ඒ ලෙවෙල් කලානෙ.. ඇයි දැන් මේකටත් කෑගහන්නෙ.."

" කෑගහන්නෙ..?? කෑගහන්නෙ උඹලා නොමඟ යන්න කලින් හදාගන්න.. වෙන මොකකටද.."

" මම ගිය නොමඟක් නෑ.. අම්මගෙ ඔලුවට එක එක මනස්ගාත පුරවලා ඒවා නිසා මට කෑගහන්න එපා.."

" මහ එකා වගේ නැතෑ.. උඹව හැදුවට අපිට ගහන්න ඕන.."

" මම තියනවා අම්මෙ.."

@Shan

අම්මට පැහැදිලි කල්ලා දීලා තේරුමක් නැති තැන ෆෝන් එක කට් කල්ලා ඇඳට විසික් කල්ලා අනිත් පැත්ත හැරෙද්දි මාමා කාමරේ ඇඳ උඩ වාඩිවෙලා මං දිහා අත් දෙකත් බැඳගෙන බලාගෙන ඉන්නවා.. මම මාමා එක්ක ලාවට හිනාවෙලා ගිහින් පුටුවකින් ඉඳගත්තා..

" මොනවද කියන්නෙ පොඩිඅක්කා.."

" මොකුත් නෑ මාමෙ.. ඔය ඉතින් දන්නැද්ද.."

මාමා ඇඳට දෙපාරක් තුන්පාරක් තට්ටු කලල එතෙන්ට එන්න කිව්වහම මම මාමා ගාවින් ගිහින් ඉඳගත්තා.. මාමා මගේ කර වටේ අතක් යවලා මාව උරහිසට වාරුකරගත්තා.

" උඹ ක්ලබ් යන එකවත් වෙන කිසිම දෙයක් කවුරු කිව්වත් නවත්තන්නෙ නෑ.. තේරුණාද.."

" ම්ම්.."

" උඹට මුළු ලෝකෙම අනිත්පැත්තෙන් ඉඳගෙන කොච්චර බලුකතා කිව්වත් සුදුමහත්තයා.. ඒවා හයියක් කරන් නැගිට්ටින්න ඕන.. එහෙමනැතුව ජීවත් වෙන්න බෑ.. එහෙම ජීවත් වෙලා තේරුමකුත් නෑ.."

" හ්ම්.."

" මම කවද්ද ඔය මූණේ හිනාවක් දැක්කෙ අන්තිමට.. පොඩ්ඩක් හිනාවෙයන්කො බං.. රෙද්ද.."

" ඔලුව කැක්කුමයි මාමෙ.. අම්ම අපරාදෙ මාව උසාවියෙදි තාත්තට නොදී අම්මා ගාව තියාගත්තෙ.."

" ඇයි එහෙම කියන්නෙ.."

" මම නිසා අම්මලාට ලැජ්ජවක් වුනොත්.. මම නිසා ඇත්තටම ලැජ්ජද මාමෙ.."

" ඇයි උඹ රෙදි නැතුව පාරෙ යනවද.. නැනෙ.. ඔය හැටියට ලැජ්ජ වෙන්න.. අම්මපා අක්කා වුණේ නැත්නම් මම උඹෙ අම්මටයි ලොකු

@Shan

අම්මටයි හොඳවයින් කියලා.. ඔකුන් දෙන්නම වෙලාවකට එකයි.. මෙ කරන දේ මේ මතක නෑ.."

" කාටවත් බනින්න ඕන නෑ මාමෙ.."

" බනිනවා නෙමෙ.. අක්කට ඔච්චර මතක නැද්ද උඹ කරදඩු උස් මහත් වෙන්නත් කලින් ඒකිව බලාගන්න කාපු කට්ට.. එක එකාට ඕන ඕන සැරේ ගෙදරින් එළියට බැහැලා ගිය හැටි.. එච්චා.. අනේ මේ සුදුමහත්තයො ඔහොම හොඳ වෙලා නම් උඹට මේ ගමන යන්න හම්බෙන්නෙ නෑ.."

" හොඳ වෙනවා නෙමෙ මාමෙ.. හිතට දුකයි.. ඒත් සද්ද නැතුව ඉන්න එක හොඳයි.. ආච්චිඅම්මා කියලා තියෙන්නෙ නොගැලපෙන තැන්වලින් පාඩුවෙ අයින් වෙලා ඉන්න කියලා.. කට ගහගෙන යන්න එපා කියලා.."

මාමා හිනාවෙලා මගේ පිටට දෙපාරක් තුන්පාරක් තඩිබෑවා..

" ආච්චිඅම්මගෙ අස්සෙ ඉඳලා මූත් දැන් බණ කියන්න අරගෙන වගේ.."

" එහෙම නෑ අනේ.. මාමා හෙට වැඩද.."

" ඔව් බං.. දැන් රෑ වෙලා නිදාගනින්.."

" මම නිදාගන්නම් මාමෙ.. මාමා දැන් යන්න.. රෑවෙලානෙ.."

" ම්ම්.. හැබැයි නිදාගනින්.. මම ඇවිත් බලද්දි ඇහැරලා හිටියොත් දෙනවා පිට පැලෙන්න දෙකක්.."

මාමා මම නිදාගන්නකල් ඇඳ ගාව ඉඳගෙන ඉඳලා ටිකකින් ලයිට් නිමාගෙන කාමරෙන් යන්න ගියා.. හවස බීපු පිරිටන් එක නිසා කොහොමත් මට ඉක්මනට නින්ද ගියා..

මාමගෙ ක්වාටස් හිතුව තරම් නරක නෑ.. වත්තලනෙ තියෙන්නෙ.. ස්පෝර්ටස්මීට් ඉවරවෙලා පුරුදු විදියටම අපේ හවුස් එක වින් කලා.. හොරෙන් සපෝට් කරපු මටයි සෙනුකයටයි නෆාස්ටයි මාරම සතුටුයි.. ඒත් අර මගේ තියනවනෙ අමුතු මූසල ගතියක් දවසක් සතුටු වෙන්න වුණොත් සතියක් අඬන්න වෙන.. ඉතින් ස්පෝර්ටස්මීට් එක ඉවරවුණේ ඊයෙ හවස නම් රෑ වෙද්දි දැනගන්න ලැබුණෙ ආධ්‍ය අයියා හොස්පිටල් ඇඩ්මිට් කල්ලා

@Shan

කියලා.. මම තවම ගියේ නෑ අයියව බලන්න.. ක්ලබ් එකේ වැඩ වැඩිනිසා හෙල්ලෙන්නවත් විදියක් නෑ.. ඒත් හෙටනම් කොහොම හරි අයියව බලන්න යන්න මම හිටියේ.. මලත් යනවා.. මගේ හිතට හරි නෑ අයියව බලන්න යන්න බැරිවුණ නිසා.. මාමා නම් හැමදාම අයියව බලන්න යනවා කියලා මම දන්නවා..

පහුවදා ඉස්කෝලෙ ගියාම හෙන අමුතුයි.. ආයෙමු උගන්නන්න පටන්ගෙනනෙ.. අපිට කරන්න එහෙමට වැඩක් තිබ්බෙ නෑ.. මමයි සෙනුකයි ප්‍රිෆෙක්ට් රූම් එකටම වෙලා හිටියා.. මට දැන් වැටෙන වැටෙන තැන නින්ද යන අමුතු ලෙඩක් හැදිලා තියෙනවා.. ඇහේ අමාරුවටයි හිතේ අමාරුවටයි දෙකටම ඒක හොඳයි.. සෙනුකයා චමිරුව අන්තිමේ කොහොම හරි ෆිට් කරගත්තා.. මමනම් කතාබහ කලාට ලොකුවට ඇගෑල්ලුම්කමක් නෑ.. හායි කිව්වොත් හායි කියනවා ඇරෙන්න.. ඒ ඇරෙන්න අපි තුන්දෙනා කන්නෙ එකට.. ඉස්කෝලෙ ඇරිලා හෝල්ට් එකට යන්නෙත් එකට.. චමිරුටනම් ඩ්‍රයිවර් කෙනෙක් ඉන්නවා එකගෙන යන්න.. මම බස් එකේම එනවා.. සෙනුකයත් ස්කූල් බස් එකේ ගෙදර යනවා..

ක්වාටස් එකේ ඉද්දි මාමා උදේට නැගිටලා හැමදාම උයනවා.. මම හිතන්නෙ ආධ්‍ය අයියටත් අරගෙන යන්නෙ මාමම තමා කෑම.. මම දැක්කා උදේ පණ දාගෙන සුප් එකක් හදනවා.. මාමා උයලා මාව ඉස්කෝලෙන් දාගෙන හොස්පිටල් යනවා.. එද්දි එන්නෙ තනියම.. කෝච් සමහර දවස්වලට මව ඇරලන්න මගට ගෙනැත් දානවා..

ඉස්කෝලෙ තුනට ඉවරවෙලා මම එහෙමම ටැක්සි එහෙක ආධ්‍ය අයියව නතරකල්ලා තිබ්බ හොස්පිටල් එකට ගියා.. එයා නවත්තලා තිබ්බෙ ප්‍රයිවට් හොස්පිටල් එකක.. එකනිසා ඕනවෙලේක යන්න පුළුවන්.. මම රූම් එක හොයාගෙන ඇතුළට යද්දි ආධ්‍ය අයියා ඇඳේ හාන්සිවෙලා සනීපෙට නිදාගෙන ඉන්නවා.. එයා දිහා බලාගෙන ඉන්න එකම භාවනාවක් වගේ.. හරි නිවුණු පෙනුමක්නෙ තියෙන්නෙ.. නිදාගන්නෙත් මාර පිළිවෙළට.. ලා නිල් පාට හොස්පිටල් කිට් එකක් ඇඳලා හිටියෙ.. මූණ සුදුමැලි වෙලා ලේ කඳුලක් නෑ.. දැක්කහම මට හරියට දුක හිතෙනවා.. අයියනම් මට අසනීපයක් උනාම දුවගෙන එනවා.. මට අයියා වෙනුවෙන් මොකුත්ම කරන්න විදියක් නැනෙ..

@Shan

මම බැග් එක සෝෆා එක උඩින් තියලා අයියට ඇහරෙන්නැතිවෙන්න වොශෲම් එකට ගිහින් අත් දෙක සෝදගෙන ආවා.. මම ආයෙම එලියට එද්දි අයියා ඇහැරිලා මම එනකල් බලාගෙන ඉන්නවා.. මම දුවගෙන දුවගෙන ගිහින් අයියා ගාව තිබ්බ පුටුවෙන් ඉඳගත්තා..

" අයියෙ.. අයියට කොහොමද දැන්.. මම නිදි නිසා ඇහැරුවෙ නැත්තෙ.."

" එහෙමද.. මම නම් ඔයා එනකල් හිටියෙ උදේ ඉඳලා.."

" මම ආවනෙ.. ඊයෙ එන්න විදියක් තිබ්බෙ නෑ අයියො අපේ ක්ලබ් එකේ මැචස් වගේකට මේ ටිකේ ප්‍රැක්ටිස් කරනවා හුඟක් රෑ වෙනකල්.."

ආධ්‍ය අයියා හිනාවෙලා මගේ අතකින් අල්ලගෙන ඇඳට හේත්තු වුණා.. එයාගෙ අතේ ගහලා තිබ්බ සේලයින් එකේ බටේ මම පැටලෙන්නැතිවෙන්න එහාට කලා.. ඔක පැටලිලා කැනියුලා එකෙන් ගැලවිලා ආවොත් එහෙම මලෝත්තක් වෙන්නෙ.. මම යන යන තැන වැඩ දෙල් කරගන්න හොඳට දන්නවනෙ..

" ඒකට කමක් නෑ චූටියො.. මට ඔයාව බලන්නවත් එන්න විදියක් තිබ්බෙ නැනෙ.."

" අයියට මොකද මේ එකපාර වුණේ.. බලන්නකො මම කොච්චර බයෙන්ද හිටියේ.."

" පොඩ්ඩක් අසනීප වුණානෙ.. බලන්නකො.."

" බැලැක්කකො තමා.. හොඳ පොඩ්ඩ.. අසනීප තියාගෙන වැඩ කරන්න යනවා.. රෙද්ද.."

" බලනවකො ඉතින් වැඩිහිටියෙක් කියලා නැනෙ අපිට කිසි තැනක්.. පොඩිත් එකයි මෙකා අනික.. සේරටම වඩා හපන්.."

" කියන්නකො අනේ.. මොකක්ද වුණේ කියලා.. හැම එකම මට හංගන්නෙ නැතුව.."

" ලොකු දෙයක් නෙමේ.. ටික දවසක ඉඳලා ඇඟට පොඩ්ඩක් අමාරු වගේ තිබ්බා.. බලද්දි ප්ලේට්ලට්ස් බැහැලා.. දැන් නම් හොඳවෙගෙන යනවා.."

@Shan

" බොරුකාරයා.. බොරුමයි කියන්නෙ.. අම්මපා අයියව එක්කන් ගිහින් මම රහපාන්න දානවා.."

" ආ ඒ මොකෝ.."

මම ආධ්‍ය අයියගෙ සයිඩ් කබඩ් එකේ තිබ්බ සුප් බෝල් එක අරගත්තා..

" දැන් හවස්වෙලා.. අයියා මොකුත් කැවෙ නෑ නේද.."

" මම බොන්නම් චූටි.. කෝ දෙන්නකො කරදර නොවී.."

" හප්.. කරදර වෙයි මට මේක පොවන්න දුන්නෙ නැතොත්.."

ආධ්‍ය අයියා හිනාවෙලා ආයෙම ඇඳට හේත්තු වුණා.. මම සුප් එක හැන්දකට අරන් ටික ටික ආධ්‍ය අයියට පෙව්වා.. එයා කිසි කරදරයක් නැතුව ඔක්කොම හිමින් හිමින් බිව්වා..

" දැන් ඇයි මාව රහපාන්න යවන්නෙ.."

" බබානෙ නේද.. අපි මොකුත් දන්නෙ නෑ.. මමනම් ගොනා හරිත.."

ආධ්‍ය අයියා බයවෙලා වගේ මගේ දිහා බලාගෙන ඉඳලා ඇහිපිල්ලම් දෙක තුනක් ගැහුවා..

" චූටි..??"

" රිච්මන්ඩ් එකේ කොල්ලො ලස්සනද.."

" මොක්-කැහ්-කැහ්-කැහ්.."

ආධ්‍ය අයියා එකසැරේ සුප් එක හිරකරගෙන මැරෙන්න හැදුවා.. මේ ළමයට හරියට කැස්ස හැදෙනවනෙ සැරින් සැරේ.. මම පේපර් සර්වියට් එකක් අරගෙන ආධ්‍ය අයියට දුන්නා.. අයියා විනාඩි පහක් විතර නන්ස්ටොප් කැහැලා අන්තිමට ඇස් දෙකේ කඳුලු පිහාගත්තා..

" චූටි..?? මොනවද කියන්නෙ.."

@Shan

" කියන්නෙ..?? කියන්නෙ අපේ මාමව හොරකම් කරගත්තු සාක්ච්චා.. හරි ශෝක් අපිට හොරෙන් ගියා මෙතන ලව් කරන්න.."

" ඔයා කොහොමද දන්නෙ චූටි.."

ආධ්‍ය අයියා හෙන පුදුම හිතෙන මූණක් හදාගෙන මගේ මූණටම කිට්ටු වුණා.. මම ආධ්‍ය අයියගෙ නලලට ඇඟිල්ලක් තියලා ආයෙම කොට්ටෙට තල්ලු කලා..

" අපි දන්නවා මුල ඉඳලම.. ඔය දෙන්නට පොඩ්ඩක් රහපාන්න දුන්නා.. දන්නැද්ද.. හරි විනෝදයි හලෝ.."

ආධ්‍ය අයියා හෙන මනමාල හිනාවක් දාගෙන වීදුරු ජනේලෙන් එළිය බලාගත්තා..

" අපේ එකත් දන්නව නේ..?? ඔව් නෙ.."

" නැතුව.."

" ඒව චූටි.. මට අර ජනේලෙන් පැනලා මැරෙන්න හිතෙනවා.."

මම හිනාවෙලා අන්තිම සුප් හැන්දත් ආධ්‍ය අයියගෙ කටේ ගහලා බෝල් එක සෝදලා සයිඩ් කබඩ් එකෙන් තිබ්බා..

" ඔයා එතනින් පැන්නොත් අනුකිච්චා මාව අල්ලලා ඔයිට උස තැනකින් විසික් කරාවි පහළට.. මෙන්න මෙහෙ ඉන්නව අයියෙ.. උබලට රහපාද්දි ලැජ්ජ හිතුනෙ නැනෙ.. වරද්ලගෙ මාමෙ කරපිංචා නැද්ද.. අම්මෝ නේන.."

" චූටි..!!"

" චූටි නෙමෙ අයියෙ.. චූටිපුතා කියන්න.. ඔයා මගේ පොඩි මාමා වෙන්නයි යන්නෙ.."

" අනේ මේ ඉන්නවා.."

" මගේ මනුස්සයත් දැන් මට මාමා වෙනවනෙ.. මොනවද අයියෙ මේ කරන වැඩ මං අහන්නෙ.."

@Shan

ආධ්‍ය අයියා ඇඳෙන් නැගිටලා කකුල් දෙක පහළට දාගත්තා..

" මම ඇත්තටම-ඇත්තටම ඔයාට කියන්න හිටියෙ.. ඒත් හිතට බය හිතුණා ඔයා මාත් එක්ක තරහ වෙව් කියලා.. සොරි චූටි.. ඔය දෙන්නට බොරු කරන්න ඇත්තටම මට ඕන වුණේ නෑ.."

" එහෙම කියන්න එපා අයියො.. මමයි රධ්‍ය අයියයි ඒ දවස්වල ඔය දෙන්නගෙ රහසිගත ලව් එක රසවිඳලා සෑහෙන්න විනෝද වුණා.. අප සැමගේ සිත්සතන් ඔබ දෙදෙනාගෙ අති විශිෂ්ට රංගනයෙන් අමන්දානන්දයට පත් වුණා.."

ආධ්‍ය අයියා ඇඳේ තිබ්බ කොට්ටෙන් මගේ මූණ මැද්දට දමලා ඇරියා..

" මදැයි ලෝකෙට හොරෙන් ලව් කරන්න ගියා.. අමතක වුණානෙ හොඳම චීත්ත දෙක ඉන්නෙ ගෙවල් අස්සෙ දාගෙන කියලා.."

" ඒකනෙ.. ඒවුණාට අර සාගා එක දවසෙනම් මරුවට රහපෑවා හොඳේ.. හායි මිස්ටර් අනුරාග්.. නයිස් ටු මීට් යූ.."

" ඕක නවත්තගන්නකො චූටි.."

" නවත්තගෙන කොහොමද ඒයි මෙවා.. කොහෙද.. මෙවට හිනාවෙන්න අනිකත් ඉන්න තිබ්බෙ.. අපි ඉස්සරහා මිස්ට අනුරාග්.. අපි නැතිවුණාම අනූ.. කවුද අයියෙ.. අ..නූ.. අ යන්නයි නූ යන්නයි.. අනූ~"

" දෙන්න හිතෙනවා දෙකතුනක්.."

" ආ දෙන්න බලන්න.. පොඩි මාමගෙන් ගුටි කන්න අපිත් ආසයි.."

" ඔයා මාත් එක්ක තරහද චූටි.."

" පිස්සුද අයියෙ.. මොකට තරහ වෙන්නද.. හරි මගුලක්නෙ යකෝ.. ලව් කරාම තරහවෙන්න ඕනද.. ඒකනෙමෙ.. මම තාමත් අහන්නෙ.. රිවමන්ඩ් එකෙ කොල්ලො ලස්සනයිද.."

ආධ්‍ය අයියා ඇස් දෙකත් නටව නටව කකුල් දෙකත් පද්ද පද්ද ඇඳේ ඉඳගෙන කල්පනා කලා.. අනේ මේ.. මටනම් එකගෙයි කන්න බෑ.. දැන්නම් කොහෙත්ම එපා.. මෙකා බෝනික්කෙක්නෙ.. මම කලින් මෙවා දැකලා

@Shan

තිබ්බෙ නැති නිසා මුළා වෙලා ඉඳලා තියෙන්නෙ.. ඒවට තමා අපේ මාමව සලිත වෙලා යන්න ඇත්තෙ එහෙනම්..

" අවුලක් නෑ නේද.. හොඳයි.."

" මේ මනමාලකම යකෝ.. මටත් ලැජ්ජ හිතෙනවා දැන්නම්.."

මම කකුල් දෙකත් පුටුව උඩට අරගෙන ආධ්‍ය අයියගෙ උරහිසට පාරක් ගැහුවා..

" ඇයි කලේ මුළු හදින්ම ඔබ මට ආදරේ

නැතිදෝ ඔබ මා ගැන දන්නේ.."

" මං නෑ කලේ කිසි දිනකදි ඔබහට ආදරේ

නැතිදෝ ඔබ හට එය වැටහුනේ~"

මම ආධ්‍ය අයියට දෙකක් රැව්වා.. ආවා මෙතන සිංදු කියන්න..

" දැන් අනුකිච්චා ආවද සාකිච්චව බලලා යන්න.."

" මොකක්ද අනෙ ඒ.. පොල්කිච්චො වගේ.."

" ඔව් පොල්කිච් පැමිලිය.. කියන්නකො ආවද අපේ මාමා.."

" දවල් ආවා.. එයාට හොස්පිටල් එකේ වැඩනෙ.."

" එහෙමද.. අම්මෝ නේත.. හුහක් වැඩලුද.."

ආයෙම ආධ්‍ය අයියා මහ මනමාල හිනාවක් දාගෙන මට කකුලෙන් එකක් ගැහුවා..

" හුහක් වැඩ තමා.. ඔක නවත්තගන්න දැන්.."

" ඔයා වැරදි මිනිස්සු එක්ක තමා රහපැවෙ පුතේ.. ඒ මේ අපේ මාමට කියන්න එපා මම දන්නවා කියලා ඔය දෙන්නගෙ හුටපටේ.."

@Shan

" ඇයි ඒ.."

" එහෙම තමා.. දන්නෑ වගේ ඉන්න හොඳේ.. මාමා ඔක දැනගත්තොත් මට රධ්‍ය අයියා ගැන මාමට කියන්න වෙනවා.. ඒකනිසා එපා.."

" ම්ම්.. මට ඔයා එක්ක නිදහසේ කතාකරන්නත් ඕන වූටි.. දැන් ඉතින් දන්නවනෙ-.."

ඒ එක්කම ආධ්‍ය අයියට කෝල් එකක් ආවා.. ආධ්‍ය අයියා මං දිහා හොරෙන් බලලා ෆෝන් එක කනේ තියාගත්තා.. මේ වෙලාවට තමා රධ්‍ය අයියව මතක් වෙන්නෙ.. කමක් නෑ ආවහම මම ළඟම තියාගෙන ඉන්නවා මගේ හැපිකච්චව.. උම්මා ගොඩක් දීලා කුක්කුත් දීලා නිදිකරවලා කවලා පොවලා හදාගන්න ඕන..

" අනූ.. කියන්න.."

" ඔයා ඕෆ් වුණාද.."

" ආ නෑ එන්න එන්න.. අප්පච්චි හවස ඇවිල්ලා ගියේ.."

" මොකුත් ඕන නෑ ළමයො.. ඇවිත් යන්න එන්නකො.. අර ඔයාගෙ යාළුවත් ඉන්නවා මෙහේ.."

" මම කතාකරන්න ගියේ නෑ.. කැළුම් එක්ක මම කතාකරන්නෙ නෑ කොහොමත්.."

" ඒක හරි වැඩක්නෙ.. මෙතන ඉන්න ඩොක්ටර් නෙ.. අනික මගේ යාළුවෙක්ද කැළුම්.. ඔයාගෙ යාළුවනෙ.."

" හා පරිස්සමට එන්න.."

ආධ්‍ය අයියා ෆෝන් එක කට් කලා.. කවුද බොලේ කැලුම් කියන්නෙ.. කැළුම් නෙමේ මොකා වුණත් කමක් නෑ ඇත්වෙලා ඉන්න කියන්න ඕන.. මමත් කොච්චර අමාරුවෙන්ද ආධ්‍ය අයියව මාමා එක්ක බෙදාගත්තෙ.. ආවා මෙතන මස්සිනාට ලයින් දාන්න..

" තව ටිකකින් මාමා ඒවි.."

@Shan

" එහෙමද.. එහෙනම් මාරුවුණොනම් හොඳයි වගේ.."

" ඉතින් ඉඳලා මාමා එක්කම යන්න පුලුවන් නෙ චූටි.."

" බැනෙ.. මාමට මාව දැක්කොත් හුස්ම හිරවෙලා බොරුවක් ගොතාගන්න බැරුව අසරන වෙවි.. මම තා ටිකකින් යනවා.."

" එහෙමද.. චූටිට පාළුයි නේද පොඩී නැතුව.."

" ඔව් අනේ.. මගේ හැප්පියා.. ඉක්මනට ආවොත් හොඳයි.."

" ඉක්මනට ඒවි.. අපේ ගෙදරත් පොඩි ප්‍රශ්න වගයක් චූටි.. මම නිදහසේ ඔයාට කියන්නම්කො.."

" හා.. ඉස්සෙල්ලම පොඩි මාමා සනීපවෙන්නකො.. මම ලව් ස්ටෝරිය අහන්න බලන් ඉන්නෝ හොඳේ.."

" ම්ම්.. හා හා.. පරිස්සමට යන්න හොඳේ.. දැන් රෑ වෙලත් එක්කන්.. ටැක්සි එකක යන්න.. බස් වල යන්නැ..!!"

" හොඳමායි.. අපි කැපුණා.. වරද්දලගෙ මාමෙ.. කරපිංචා ති-"

" චූටි!!!!!!!!!!!!!!!"

මම බැග් එකත් කරේ දාගෙන ආධ්‍ය අයියගෙ මූනටත් උම්මා එකක් දීලා එළියට දුවගෙන ආවා.. කොහොමද මෙහෙම යද්දි අපේ මාමව මූණ හම්බුනොත්.. මරු වැඩේ.. මම ඕවා හිත හිත ඇවිත් ටැක්සි එකක ක්වාටස් එකට ගියා..

මම ආවා.. මම ගියා.. ආධ්‍ය අයියා මැරෙනකල් මාමගෙන් ආයෙම කරපිංචා ඉල්ලන එකක් නෑ කියලා කියන අය මෙන්න මෙහෙට ඇවිත් මට උම්මා එකක් දෙන්න ඒයි.. ඒ ස්ටෝරියයි බෝතල් කට්ටයි ඉක්මනට අහගන්න ලැබේවා කියලා පාර්තනා කරනවා.. ඉස්සරහට කතා ගොඩක් තියෙයි අහන්න.. ඉවසමින..

එන්නාම්.. ලව් යූ.. ❤



@Shan

වරද්ගෙනම් නෙමේ හැබැයි.. සොරි කට් තැන්කූ..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුනකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 108 කොටස

" ෂනෙරු.. ඔයා වැඩක නෙමෙයිනම් ඉන්නෙ පොඩ්ඩක් කතාකරන්න පුළුවන්ද.."

මම හිටියෙ ක්ලබ් එකේ රූටොප් එකේ මම හදාගත්තු තැන..කෝච් පැයක පොඩි ඉන්ටවල් එකක් දීලා තාන්වී අක්කව හොස්පිටල් එකෙන් එක්කන් එන්න ගියා.. පොඩි බබාලා දෙන්නට බෙහෙත් විදින දවසලු.. වෙළුසුමනයා මට ඔච්චා කියන්නෙ නෑ.. මට තාන්වී අක්කා එක්ක කතාකරනවා විතරයි ලාවට ඇහුණෙ.. නැත්නම් මාන්නක්කාරයා මට අපහාස කරනවා කෝප්ප හෝදනවා කියලා.. ඒ වෙලේ තමා අයුක අයියගෙන් කෝල් එකක් ආවේ.. අයුක අයියා ඉතින් නිතර මට කතාකරන්නෙ නැනෙ.. තියා අපි කාටවත්ම එහෙම කතාකරන්නෙ නෑ.. විශේශෙන් අපි ගැන දැනගන්න දෙයක් නෑ කොහොමත් සෙනුක දවසේ ක්‍රියාපටිපාටිය පැය විසිහතරෙම අයුක අයියට වාර්තා කරනවා..

" ඕ අයියෙ.. කියන්න.. වැඩක නෙමෙ ඉන්නෙ.."

" ක්ලබ් එකේද ඉන්නෙ.."

" ඔව්.. හෙට මැච් එකක් තියෙනවා.. මගෙ පළවෙනි එක නිසා අද රෑ වෙනකල්ම ප්‍රැක්ටිස් දාලා.."

" ආ.. හොඳට ප්ලේ කරන්න ප්‍රැක්ටිස් වෙලා.. කෑම එහෙම වෙලාවට ගන්නවා නේද.."

" ඔව් අයියෙ.. කැවෙ නැතොත් සෙනුකයා මාව මරනවා කියලා තර්ජනය කල්ලා පිහියක් පෙන්නුවා.."

අයුක අයියා ලාවට හිනාවුණා..

" රධ්‍ය කතාකලේ නෑ නේද මල්ලි.."

" තාම නෑ අයියෙ.. කතාකරන්න පුළුවන් වුණු වෙලාවක එයා ගනීවි කියලා ආධ්‍ය අයියා කිව්වා.."

@Shan

" දැන් මාස දෙකකටත් කිට්ටු වෙන්න එනවා.. මල්ලිට කතාකළොත් මට කියනවද.."

" හා අයියෙ.. මම කියන්නම්.. ඇයි මොකක් හරි පණිවිඩයක් කියන්නද.."

" විශේශ පණිවිඩයක් නම් නෑ.. ඒත් කතාකරන්න ඕන.. මම මල්ලිට කතාකලේ වෙන දෙයක් ගැන අහන්න.."

" ඒ මොකක්ද අයියෙ.."

මම බංකුවෙ කෙලින් වෙලා ඉදගෙන පිටිපස්සට හේත්තු වුණා.. හවස හීතල හුළඟ මගේ කොණ්ඩෙ පිපස්සට කරගෙන ගහගෙන යනවා.. හරි සනීපයි.. නිදාගන්න කියපු වෙලාව..

" පෙරේදා සෝශල් එකේ මොකක්ද වුණේ.. වත්සල් චමිරු එක්ක මොකක්ද අර හදාගෙන තියන අලුත් යාළුකම.."

" චමිරු ඉන්නෙ අපිත් එක්කනෙ අයියෙ.. ඒකා එහෙම නරක නෑ හිතන තරම්.. සෝශල් එකේනම් බීලා පොඩි පිස්සුවක් කෙලියා.. ඒ ඇරෙන්න චමිරු ඔය උගේ ප්‍රශ්න එහෙම ඇවිත් අපි එක්ක කියනවා.."

" තව..?? මල්ලි රධ්‍ය ඔක ගැන දැනගත්තොත් මටත් බැනුම් අහන්න වෙනවා.. මම වත්සල්ට කිව්වා කොහෙද අහන්නෙ නෑනෙ කියන කිසිදෙයක්.."

" මම රධ්‍ය අයියා ආවහම එයාට කියන්නම් අයියෙ.. කොහොමත් මමනම් ලොකුවට කතාවක් නෑ.. සෙනුක එක්ක තමා හිටි.."

" වත්සල් මොකක්ද කරන්න හදන්නෙ එතකොට..??"

" එයාට ඕනලු චමිරු හොඳ යාළුවෙක් කරගන්න.. ඒත් අයියෙ ඇත්තටම චමිරු නරක නෑ අපි හිතන තරම්.."

" චමිරු නරක නෑ තමා.. ඒත් වත්සල්ට ඔය පවුලෙන් ඈත් වෙලා ඉන්න කියන්න මල්ලි.. තනිකරම අහක යන කුණු ගොඩක් තමා ඔය ඇහේ හලාගන්න යන්නෙ.."

" මම සෙනුකට කියන්නම්කො.."

@Shan

" ඔයාලගෙ යාළුකම ප්‍රශ්නයක් නෑ මට.. කතාකලාට කෑවාබිව්වට අවුලක් නෑ.. ඒ වුණාට රධ්‍ය කොහොමවත් කැමති නෑ මල්ලි චමිරු එක්ක කතාකරනවට.. මල්ලි එක්ක ඌ ඕවා කියන්නෙ නෑනෙ.."

" ඒ මොකද කැමති නැත්තෙ.."

" චමිරු පොඩ්ඩක් වැනෙනවා වගේ නැද්ද.. ෂනෙරුට එච්චර මීටර් නැතුව ඇති ඒක ගැන.. වෙලාවකට ඌ මල්ලිට කැමති වගේ හැසිරෙනවා.. අනිත් වෙලාවට රධ්‍යට කැමති වගේ හැසිරෙනවා.. රධ්‍ය කැමති නෑ ඕවට.."

" ඈ.. මොකක්!!??"

" ම්ම්.."

" සැක් අයියෙ.. ඒ මොනෞත්තක්ද.."

" ඒක ඉතින් උගෙන් තමා අහන්න වෙන්නෙ.."

හැයියා.. මෙකා ත්‍රීසම් එකක්වත් පටන්ගන්නද ඒ සැරේ හදන්නෙ.. කවුද හිතුවෙ සෝශල් එකේ මූන ඉඹින්න ආවට ඔහොම මගුලක්.. අම්මපා තලනවා දැන්නම් ඇට දෙක සක්කිලි පරෙයියගෙ..

" දැන් මොකද කරන්නෙ.."

" කරන්න දෙයක් නෑ.. කොහෙද අපි පොඩ්ඩක් එහෙට මෙහෙට වෙනකල් ඉඳලා උඩ දමාගෙන යාළුකමුත් හදාගෙනනෙ.. රධ්‍ය ආපු වෙලාවක රෝසමල් පොකුර ගැන පොඩ්ඩක් කියලා බලන්නකො.. මොකද වෙන්නෙ කියලා.. අනේ මන්දා බං උබලනම්.. අර කියාන්ටවත් කිව්වනම් හරි බොලාගෙ ඔය හුටපටේ ගැන හොයන්න කියලා.."

" මෙහෙමයි.. නොදැන කල වරදට සමාව දෙන්න ඕන හරිනම්.. අපි මනුස්සකමටනෙ කතාකරන්නෙ.."

" මනුස්සකම තමා.."

" ඇයි මොකද අයුක අයියෙ.."

@Shan

" නෑ නෑ මොකුත් නෑ.. එක්කො රධ්‍ය ආවහම මම රධ්‍ය එක්කම කතාකරන්නම්.."

" මේ රධ්‍ය අයියා බනීවිද බං අයියෙ.."

" උඹට බනින එකක් නෑ.. ඒ වුණාට ඌට මල පනිනවා.."

" එහෙනම් හෝදගන්න කියන්න තියෙන්නෙ.."

" උඹලා එක්ක කතාකරන බෑ මගුල මම තියනවා.. උබත් එකයි.. උඹෙ යාළුවා.. අන්න ඒකත් එකයි.. පෙරලගන්නවලකො මොකක් හරි බාල්දියක්.. අම්මපා උබලා දෙන්නව හම ගහනවා.."

" අනේ අපි බය නෑ හරිත.. ෆෝන් එක තියලා ගිහින් අයියා වූ දාලා නිදාගන්න.."

අයුක අයියට බල පැනලා ෆෝන් එක කට කල්ලා '😑' ඉමොජි එකක් එවලා ඕෆ්ලයින් ගියා.. මුන්ට අර්ශස්.. මලබද්දෙ.. ඔක්කොම තියෙනවා.. සේරම අල්ලලා කොහිල අල කටු පිටින් ගිල්ලන්න තියෙන්නෙ.. අර සෙනුකයට කියන්න ඕන මිනිහගෙ කට වැඩී කියලා.. ළහපාතක හිටියනම් යාළුවගෙ මිනිහා කියලා නෑ අම්මපා මල් පෝච්චියකින් දෙන්නෙ ඔලුවට.. ආවා මෙතන කේලම් කියන්න.. කේලම් කියන්නත් ඉතින් මගේ මනුස්සයා කතාකරන්න එපැයි.. කේන්තිගියාම කුක්කු පොඩ්ඩක් දීලා යාළුකරගන්නවා..

රෙද්ද..

සෝශල් එකේ විස්තරේ ගැන කියනවනම් එදා හෙන ආතල් දවස.. නැටුවා නැටුවා කොන්දෙ පොට යනකල්ම.. අපේ බැජ් එකේ ඔක්කොම ඉන්නවා මීඩියම් තුනෙන්ම හයසීයක් විතර.. ඔය ඔක්කොම ඉතින් සෝශල් එකට ඇවිත් හිටියා.. පොඩි කාලෙ ඉඳන් එකට ඉන්න උන් නෙ.. අන්තිමට හම්බෙන දවස තමා සෝශල් එක.. එතනින් පස්සෙ ආයෙ ඉතින් කවද අහම්බෙයිද කියන්න බෑ.. සමහරු ලංකාවෙනුත් යනවා.. එදාමයි ආශිගෙයි මහීශගෙයි ඉස්කෝල වලත් සෝශල් තිබ්බෙ..

මම ඇන්දෙ තද කොළපාට කිට් එකකට, සුදුපාට පපුවෙ මැද්දට වෙනකල් කපපු ශර්ට් එකක්.. සැලොන් එකකින් පොඩි මෙකප් එකක් දාගෙන

@Shan

සෙනුකයා එක්ක සිනමන් ග්‍රෑන්ඩ් එකට යන්න ලෑස්ති වුණා..සෙනුකයා ඇඳලා හිටියේ ක්‍රීම් පාට කිට් එකක්.. ඔකට යන්න කලින් ඇඟිබැම හදන්න ගිහිල්ලා, දවසක්ම ඌටයි මටයි ඇඟිබැමෙ අයිස් තියාගෙන ඉන්නත් වුණා.. ඒවා ගලවද්දි අම්මටසිරි වෙන්න රිදෙනවා.. ඒ වුණාට යන්න එපැයි ලස්සනට..

ආශිලාගෙ සෝශල් එකට අඳින්න තිබ්බෙ සාරියි ඔසරියි.. ආශි ටැමිල් විදියට ඇඳලා හිටියෙ.. ඒකි කොහොම ඇන්දත් හැඩට ඉන්නවා.. හොඳ ෆැශන් සෙන්ස් එකකුත් තියෙනවනෙ.. එදා ඇවිත් හිටියේ මෙරූන් පාට ලොකු වර්ක් එකක් තියෙන සාරි එකක් ඇඳලා, තෝඩු දෙකකුයි, කොණ්ඩෙට තනි තැල්ලකුයි, අත් දෙකේ හෙන වලලු ගොඩකුයි දාලා කොණ්ඩෙ කර්ල් කල්ලා දුඹුරු පාටට පිට දිගට වැටෙන්න හදලා.. කියාන් අයියා හෙන ලෝබයි ඔකි ලස්සනට ඇඳගෙන එහෙ මෙහෙ එක්කගෙන යන්න.. කොච්චර පිස්සු කෙලගෙන හිටියත් ඌ උගෙ කෙල්ලට මාරම ආදරෙයි.. එදත් ඇවිත් තංගච්චි තංගච්චි කිය කිය ආශිව කන්න හැදුවා.. ඒ වුණාට.. එහෙම විහිළු කරාට කියාන් අයියා ඒකිට කතාකරන විදියට ආදරේ හිතෙනවා..

ඔක්කොමත් හරි.. මහීශා.. බලන්න එපැයි..අපේ කොළු කැල්ල එකසැරේම ගවුමක් ඇඳගෙන සෝශල් එකට ඇවිත් තිබ්බෙ.. ඒකිගෙ ඉස්කෝලෙ සෙමි ගවර්මන්ට් එකක්. ඒකනිසා ආශිට වගේ සාරි ඔසරිම අඳින්න කියලා නෑ. කැමති විදියකට එන්න පුලුවන්.. prom night තියෙන්නෙ.. අන්න ඒ වගේ එකක්.. ඉතින් මහීශා ඉණ ගාවටම පලපු කළුපාට සිල්ක් ගවුමකට කළුපාට ස්ටොකින්ස් දාලා මූණ වැහෙන්න නෙට් එකක් අල්ලපු හැට් එකක් දාලා ඇවිත් හිටියෙ.. කොහොම හරි ඒ වාහනේ ඇතුලෙ සේරම ජාතියෙ උන් හිටියා.. උන් දෙන්නම ලස්සනයි.. මහීශා එකසැරේ මෙහෙම දැක්කහම අපිට ඉතින් හෙන අමුතුයි.. කොල්ලෙක් වගේනෙ ඉන්නෙ.. හැබැයි එහෙමත් ලස්සනක් තියේ.. ඒකිට කොහොම ඇන්දත් ලස්සනයි..

" මේ ඇඳුමට ඇඟ කසනවනේ.. හයියෝ.."

ආශි සැලොන් එකේ ඉඳන් අර තඩි සාරියත් පටලගෙන වාහනේට නැග්ග වෙලේ ඉඳලා ඇඟ කසනවා ඉවරයක් නෑ.. සාරියෙ පොට තිබ්බෙ කියාන් අයියගෙ උකුලෙ.. ඒකෙ විසාලෙ තරමට සීට් එකේ ඉඩ මදී තියාගන්න..

" ඒ මොකද ඒ.."

@Shan

" මේ ඇනෙනවා.. මොනවද මන්දා.. මෙතන කසන්නකො අනේ.. ආච්චා.."

ආශි ඩ්‍රයිව් කර කර ඉඳපු කියාන් අයියගෙ අත අරගෙන පිට ගාවින් තියාගෙන කසන්න කියලා බෙරිහන් දෙන්න ගත්තා... කියාන් අයියා එක අතකින් ඩ්‍රයිව් කරනවා.. අනිත් අතින් අරකිගෙ පිට කසනවා.. ඔහොම යද්දි මහීශත් ඒකිගෙ හීල් එක දාගන්න නැමෙන්න බෑ ඇඳුම හිර වැඩී කියලා හීල් දෙක අරගෙන, මගෙයි සෙනුකයගෙයි උකුල උඩින් කකුල් දෙක තියාගත්තා..

" ඕක දාපන්කො බං.. ලබ්බ.. හුස්ම හිරවෙන්න එනවා මගේ.."

" උබලා මොන මගුල් ඇඳගෙන එනවද මන්දා.. කොහෙද මේකෙ ගාංචුව.."

" ඔය බලහන් බං.. ඇති කොහේහරි.. එක්කො මේකට ඩෙග් දෙකක්.. සැක්.. එකඑකාට සෙකන්ඩ් වෙන්න බැරි නිසා මෙහෙම යන්නෙ.."

" කාටද උඹ සෙකන්ඩ් වෙන්නෙ දැන්.."

" ඉන්නවා බං අමුතු උන් ටිකක්.. දන්නැද්ද.. ලන්ඩන් සෙක්ශන් වල.."

" සිරාවට.. මේ උබ ආශි යනවා වගේ කැට් වෝක් එකෙන් පලයන් ඈ.. මේ සරුවාලෙ ඇඳන් කකුල් දෙක ඈත් කර කර ගිහින් ඉරිලා යයි දුවේ.."

" අනේ හු#තක් කතානොකර ඔන්න ඕන දාපන්.."

මමයි සෙනුකයයි කොහොම කොහොම හරි අන්තිමේ අර තඩි හීල් එක දාන ටෙක්නික් එක හොයාගෙන ඒක මහීශාගෙ කකුලෙ පැටලුවා.. ඊටපස්සෙ මට ඒකිව ඉස්කෝලෙට ඇරලන්නත් යන්න වුනා.. හැමෝම ඇරලන්න කෙනෙක් එනවලු උන්ගෙ සෝශල් එකේ හෝල් එකට.. සෙනුකයා මහීශට වඩා පොඩ්ඩක් කොට නිසා මට තමා ඒකි එක්ක යන්න වුණේ..

" මහීශා එහෙම ලස්සනයි නේද ඒයි.."

ආශි මහීශා යනකල් ඉඳලා අපේ පැත්ත හැරුණා.. මම ඒකිගෙ අතක් අරගෙන අර සල සල ගාන වලලු ටික එකට වද්ද වද්ද ඒවගෙ හැඩ බැලුවා..

@Shan

සිරාවටම කෙල්ලො නම් පව.. උන් ඉතින් කොහේහරි යන්න ඕන වුණාම අපි වගෙ නෙමේනෙ.. කොච්චර ලැස්තිවෙන්න එපාද..

" ඒකි දෙව්දියටම ගති.."

" ඒකනෙමෙ අනේ.. ඔය දෙන්නත් මාර ලස්සනයි.. ඕගොල්ලො ඉතින් මොනවා ඇන්දත් ලස්සනයි හැන්ඩ්සම් නෙ.."

" ආඩම්බර වෙයන් අපි වගේ යාළුවො ඉන්නවට.."

" අනේ මට වෙන වැඩ නෑනෙ.. මලවිකාර.. අපරාදෙ අයුක අයියයි රඬ්‍ය අයියයි ඉන්න තිබ්බෙ.. ඒ දෙන්නා බලාගෙන හිටියා ඔය දෙන්නව සෝශල් එක්කන් යන්න.."

" මොනවා කරන්නද බං.. ඔය ෆොටෝ ගන්නවනෙ.. එතකොට පෙන්නන්නෙ බැරියැ.."

" ඔව් ඔව්.. ගොඩක් ෆොටෝ ගන්න ඈ.. මටත් එවන්න අරගෙන.."

ඒ එක්කම කියාන් අයියා අපේ කතාව මැද්දට පැන්නා..

" උඹලා වගෙ නෙමෙ සුදුඅම්මියයි සුදුදෝණියයි සෝශල් ගියේ.. අන්න කැලි.. මම.."

ටිකකින් සෙනුකයට මල පැනගෙන එන්න පටන්ගත්තා.. ඌ කැමති නෑනෙ අයුක අයියට කියාන් අයියා අයිතිවාසිකම් කියනවට..

" මේ අයියෙ අනුන්ගෙ මිනිස්සු ගැන කියවන්නතුව ඉඳපන්.."

" අනුන්ගෙ වෙන්නෙ කොහොමද.. යකෝ!! උන් දෙන්නා මගේ මේ අත්වල හැදුනෙ.. අත්වල.."

" ඇයි අත්වල හැදෙන්න උන් දෙන්නා මැටිපෝච්චි දෙකක්ද.."

" අනේද කියන්නෙ.. මේ ඔයා මගේ යාළුවො දෙන්නා කේන්ති ගස්සන්න එපා හරිද.."

" ආඩවනේ තංගච්චි.. කිමද මෙ කේන්තිගන්නෙ.."

@Shan

කියාන් අයියා ආශිගෙ නිකටින් අල්ලලා හෙලෙව්වහම ආශි කියාන් අයියගෙ අත ගසලා දැම්මා..

" මම තංගච්චි නෙමෙයි!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

" තංගච්චි.. එන්න බහින්න.. කොප්ප හෝදන්න පස්සෙ වෙලාවක.."

කියාන් අයියා ආශිලගෙ සෝශල් එක තියෙන හොටෙල් එකෙන් කාර් එක පාක් කල්ලා වටෙන් ඇවිත් ආශිට බැහැගන්න උදව් කලා.. ඊටපස්සෙ සාරියෙ රැලි ටිකත් හදලා නළලට කිස් එකකුත් දීලා පරිස්සමට එක්කන් ගිහින් ඇරලලා ආයෙම ආවා.. මූගෙ මනමාල හිනාව බලන්න එපැයි..

" අරුන් දෙන්නා ඉන්න තිබ්බෙ බං.."

කියාන් අයියා හෙන අවුලෙන් කියලා කාර් එක හරවගත්තා..

" මම.."

" රධ්‍ය කතාකලේ නෑ නේද ෂනෙරුවා.. අනේ බං අපිට කොල්ලව කන්ටැක් කරගන්නවත් විදියක් නැද්ද.."

මම සද්ද නැතුවම හිටියා.. විදියක් නෑ කියලා අපි හැමෝම හොඳටම දන්නවනෙ..

" පරිස්සමට ගිහින් සිහියෙන් ඉඳපන් හරිද.. උවමනාවක් වුණොත් කෝල් කරන්න.."

කියාන් අයියා අපි දෙන්නවත් දාලා යන්න ගියා.. ඒකා පුළු පුළුවන් හැම වෙලාවෙම අපි ගැන හොයලා බලනවා.. ඒ ඇරෙන්න ආශි, ජාතියේම මව්තුමිය, අපිව බේබිසිටින් කරන්න පටන් අරගෙන තියෙන්නෙ.. හැමතිස්සෙම කෝල් කර කර මැසේජ් කර කර කන්න බොන්න මතක් කරනවා.. කොහේහරි ගියොත් පික් කරන්න එනවා.. මහීශාත් නිතර අපි එක්ක කතාකරනවා.. දේවල් අහනවා.. මොකක් වුනත් අපිට හොඳ යාළුවො ටිකක් හරි ලැබිලා තියෙනවා

සෝශල් එක ඉතින් හෙන ලොකුවටම තිබ්බා.. මාරම ලස්සනයි.. සෙනුකයට බෙස්ට් ප'සනැලිටි එකට අවෝර්ඩ් එකක් හම්බුණා.. නෆ්‍රාස් Mr.

@Shan

Talented අවෝර්ඩ් එක ගත්තා.. ඒ ඇරෙන්න තව අවෝර්ඩ් ගොඩක් හම්බුණා එක එක අයට.. මටත් එකක් තිබ්බා Role Model of the year කියලා.. මම හිතුවෙ නෑ ඇත්තටම මට එකක් තියෙයි කියලා.. එකසැරේම අනවුන්ස් කලාම මාව උඩ ගියා..

ඔහොම රෑ වෙනකල්ම සෝශල් එක තිබිලා අන්තිමට බෙබාලා ටික සෙට් වෙලා බෝතල් වගයක් ඇරගෙන බොන්න පටන්ගත්තා.. මම දන්නෙ නැති තැන් වල බොන්න යන්නෙ නෑ.. ඇරත් බියර් විතරයි බීලා තියෙන්නෙත්.. අනික මේ දවස්වල බිව්වොත් මට ශුවර් මම නටන පිස්සු වලට බල්ලොත් පුපෙන් හිනාවෙන්න ගන්නවා.. රධ්‍ය අයියවත් නැනෙ.. අන්න ඒකා හිටියනම් බයක් නැතුව වහ හරි බොනවා.. බීලා කොච්චර වන්නම් නැටුවත් බලාගෙන ඉන්නවනෙ.. මොකුත් කියන්නෙත් නෑ.. අනික මගේ හිතේ කොහොමත් විශ්වාසයක් තියෙනවා එයා කොයි වෙලාවකවත් එයා දාගෙන ඉන්න සීමාවෙන් එහාට යන්නෙ නෑ කියලා.. ඒ හැඟීමම ඇති එයා ළඟ කැමති විදියකට හැසිරෙන්න.. මම දාපු සීමාවක් නෙමෙනෙ.. මටනම් සීමාවක් තිබ්බත් එකයි නැතත් එකයි.. මම ඕවා ගැන එච්චර හිතන්නෙත් නෑ.. සමහරවිට මම සැහැල්ලුවෙන් ගන්නෙ එයා ගැන දැනටම හිතේ විශ්වාසයක් තියෙන නිසා වෙන්න ඇති.. මොකක් වුනත් රධ්‍ය අයියා ළඟ ඉද්දි දැනෙන ආරක්ශාකාරී හැඟීම එයා නැති මේ කාලෙ මට දැනෙන්නෙ නෑ..

ඉස්සරනම් හිතේ විශ්වාසයක් තියෙනවා මම වැඩක් අවුල් කරගත්තහම මොන ලෝකෙ හරි ඉදලා රධ්‍ය අයියා ඒවි කියලා.. මම මාව අවුල් වෙන හැම තිස්සෙම එයාව බලාපොරොත්තු වුනත් දැන් එහෙම වෙන්න බැහැනෙ.. අනික මම එයාට පොරොන්දු වුණා එයා එනකල් හොදින් ඉන්නවා කියලා.. පොරොන්දුනම් කඩන්න පුළුවන්.. හැමෝම දෙන හැම පොරොන්දුවම රකින්නෙ නැහැනෙ.. ඒ වුනාට හිතක් බිදුනහම.. එයාගෙ හිත රිදුනහම අර කියන 'හිත රිදෙනවා වරද්' කියන වචන ටික මම අහන්න ආස නෑ.. වචනෙකින්වත් මට රධ්‍ය අයියගෙ හිත රිද්දන්න උවමනා නෑ.. මම නිකන් ආදරෙන් අන්ධ වෙලා වගේ කතාකරනවා කියලා හිතෙනවා.. ඒත් එහෙම නෙමේ..

ඇත්තටම හදවතට දැනුණු තැනකදි අනිත් කෙනාව වචනෙකින් හරි රිද්දන්න හිතෙන්නෙ නෑ.. ඒක හදවතින්ම එන්න ඕන හැඟීමක්.. විහිලුවක් කල්ලා තරගිහින් බැනගන්නවා ගහගන්නවා වගේ නෙමෙයි.. සමහර වචන තියෙනවා ඒවා පිහිතල, ඊතල වගේ මුවහත්.. පොඩ්ඩක් ගෑවුනත්

@Shan

ගැඹුරටම කපාගෙන යනවා.. මට මගේ වචන පිහිතුඩු කරගන්න ඕන නෑ.. මම ඇත්පදම් පිහිපාරවල් වලින් බැට කාපු මනුස්සයෙක්.. ඉතින් ඒ වේදනාව කොහොමද කියන්න මම දන්නවා.. මට ඕන නෑ වචනෙකින්වත් ආදරේ කරන මනුස්සයෙක් රිදවන්න..

අන්තිමේ ඩාන්ස්ෆ්ලෝ එකේ මම ජොනතන් එක්ක නට නට හිටියේ.. මං ගාවම සෙනුකයත් හිටියේ.. කොහොමත් අපි දෙන්නා හා වෙලා වගේ එකටමනෙ යන යන තැන ඉන්නෙ.. ගීනියම් රෑ සිංදුවට බීගෙන සේරම සිහියක් පතක් නැතුව නටද්දි මමත් ඒ අස්සට වෙලා හිතේ පාළුව යන්නත් එක්ක නැටුවා.. ලයිට්ස් ඩිම් ප'ප්ල් කල්ලා තිබ්බ නිසා වටේ පිටේ තියන දේවල් ගැනත් ලොකු ගානක් නෑ.. සෙනුක හැමතිස්සෙම මං ගාව හිටිය නිසා මට අවුලකුත් තිබ්බෙ නෑ.. ඒත් එකසැරේම චමිරු බීලා මගෙයි සෙනුකගෙයි මැද්දට ඇවිත් මාව උගේ ඇඟට තියලා තද කරගෙන මූණට පහත් වුණා.. සේරම වුණේ එක තප්පරේකින් වගේ.. මම මූණ අහකට ගද්දිම සෙනුකයා මං ගාවට පැනලා මාව බදාගත්ත නිසා චමිරුවා කෙලින්ම ගිහින් තොල් තිබ්බෙ සෙනුකයගෙ රෝසපාට කම්මුලේ..

සෙනුකයා ඒක එච්චර ගනන් ගත්තෙ නෑ වගේ පෙන්නලා චමිරුව එහාට තල්ලු කල්ලා මාව ඇදගෙන නඟාස්ලා ඉන්න තැනට ගියා.. සෙනුකයා මේ ටිකේ අමුතු ගේමක් ඇදගෙන යනවා කියලා මම දන්නවා.. හැබැයි මූ කියන්නෙ නැනෙ.. මහපගයා හංගගෙනනෙ ඉන්නෙ.. කොහොම හරි අයුක අයියා විස්තරේ දන්නවා.. රධ්‍ය අයියට අයුක අයියා ඔක කියන්න කලින් මම කියන්න ඕන.. එතකොට ඉවරනෙ.. මම මොකුත් වරදක් කල්ලා නැනෙ..

" සරනේරු.!!! පහලට එන්නෙ නැද්ද.."

මම එකපාර ගැස්සිලා නැගිට්ටුනේ මාන්නක්කාර වේළුසුමනයාගෙ කටහඩින්.. වේළුසුමනයා මං දිහා රවාගෙන බලාගෙන ඉන්නවා.. මම ලා~ස්සනට හිනාවෙලා ශේප් එකේ පඩිපෙල ළඟට ලිස්සලා ගියා.. පොඩි ප්‍රමාද දෝශයක් සිද්ද වෙලානෙ වරද් ට..

" වෙයිට්.. සරනේරු.. මේක තාන්වී දෙන්න කියලා දුන්නා.."

කෝච් මං ගාවට ඇවිත් නිල් පාටයි රෝසපාටයි කාඩ් එකක් දීලා පහලට බැහැගෙන ගියා..

@Shan

**Shaneru is cordially invited to Ben and Bella's six month birthday party.. Thank you..**

අම්මටසිරි කෝච්ගෙ බබාලා දෙන්නගෙ බර්ත්ඩේ පාටි එකටද මට ඉන්වයිට් කල්ලා තියෙන්නෙ..

මේ මට..??

" සර් සර්.. ටහු- අම්මෝහ් කකුල.. මේ සර් පොඩ්ඩක් ඉන්න.. වෙළුසු-"

" මොකද!!!??"

" මේක මටද.."

මම ඇස්පිල්ලන් දෙකතුනක් හගලා ලස්සනට විනීතව ඇහුවහම සර් මං දිහා අමුතු සතෙක් ගානට බලලා රැකට් එක දිගෑරලා දුන්නා පිට මැද්දට හොඳ පාරක්..

" ෂනෙරු කියන්නෙ මගෙ නමද.."

ආයෙම වෙළුසුමනයා ඇවිදගෙන ගියාම මාත් ඒ පස්සෙන් කකුල් දෙකත් අද්ද අද්ද ගියා.. ඇයි යකො ගහන්න ඕනද මං අහන්නෙ.. කිසි හිතක් පපුවක් නෑ මාන්නක්කාරයා..

" අයිසෙ සරනේරු ඔය කැට්වෝක් එක නවත්තලා ගිහින් අර රැකට් එක අරගෙන එනවා!!!!!!!!!"

ඔන්න මම ආවා.. හායි ළමායි.. කෝමද හොඳින් සැපෙන් සනීපෙන් ඉන්නවද.. තුන්සමයට ආසනේ.. ම්ම්.. චමිරුත් අනේ මන්දා.. පිස්සු කොල්ලහ්..

මේ ටිකේ කම්මැලි වගේත ළමයි කතාව.. රධ්‍ය අයියා කවදා ඒවිද..

එන්නාම්.. ලව් යූ.. ❤

**Some parts of everyday life with Radhya and Varadh -**

Teen Lovers

@Shan

having a secret little rendezvous - සේපාලිකා ගහ යට..

රධ්‍යගෙ කාමරය හවස් යාමයේ හිටිහැටියේ රෝමාන්තික වීම..

තනි අතින් පදවන වාහනය.. අනිත් අතින් වරද්ගේ අත පටලවා ගැනීම.. (ඇතැම් විට අනිසි ස්පර්ශය)

රධ්‍යගේ වියත් තුනක මිමම..

ඉටස් බෝයිපෙන්ව උස්සගෙන යන ටයිම්..

මුළුතැන්ගෙය තුළ කෝප්ප ලොරි ගනනක් සේදීම.. ඔමලට් සාදා දීම.. ( ආධ්‍යගේ ප්‍රේම පුරාණය සමච්චලයට ලක් කිරීම..

**ඔයාට කියන්න වරද් see more..**

)

හාදුවක් සඳහා උස ප්‍රමානවත් නොවීම සහ ඒ සඳහා ඇතිවන බහින්බස් වීම..

කුමක් හෝ කුපාඩි කතාවක අවසානයේ මරාගැනීම..

@Shan

ඉදහිට බියර් උගුරක් තොලගෑ තමාගේ දුක රධ්‍ය හමුවේ දිගහරින වරද්.. ( මම මගේ හිරකාරයව අවුරුදු දාහකින් see more...)

වරද් දුටු තැන රධ්‍යට හටගන්නා හදිසි බොරු හිසරදය හා ඒ මාර්ගයෙන් ඔලුව අතගාගැනීම.. (ඇතැම් විට කොන්ද, අත, කකුල...)

ගලපා ඇඳුම් පැළඳුම භාවිතය.. (ඉදහිට)

රිප්ඩ් ඩෙනිම් කියන්නෙ ආගමක් -මීට වරද්-

සියලු හිත් අමනාප අඩදබරයන්ගේ නිමාව.. (ඉටිස් කුක්කු දෙන ටයිම්)

ජිම් ගොස් තම පෙම්වතා වෙත සරාගී පිංතූර යැවීම..

ඒ සඳහා පෙරළා පිළිතුරු එවීම.. (වරද් ලෙප්ට)

වරද් යන්නට බය බව දැන දැනත් රධ්‍ය යතුරුපැදියම භාවිතය.. එයට හේත්තු වී සිටීම.. එසේ සිටීමෙන් ගැම්මක් ඇතැයි විශ්වාස කිරීම..

ගැළවීමක් නොමැති බූවළු අඩු..

@Shan

නිතර ඇඟිලි පටලාගැනීම..

උණුසුම් වැළඳගැනීම් සහ සිපගැනීම්..

හෙහෙ.. 😂❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 109 කොටස

" සිරාවට..?? ඊටපස්සෙ.."

" ඊටපස්සෙ බං දැන් අර තවාන් කියන බඩ්ඩ ඇවිත් කින්ට කියනවා පෝර්ශ්ව අල්ලලා හිර කරන්න කියලා.."

සෙනුකයා ග්‍රවුන්ඩ් එකේ තිබ්බ ගල් කැටෙකට පයින් ගැහුව පාර ඒක විසික් වෙලා ගිහින් පොඩි එකෙක්ගෙ සපත්තුවේ වැදුනා..

" හා.."

" ඉතින් වේගාස් ඇවිත් පෝර්ශ්ව පන්නගෙන බයික් එකේ යනවා.. ඊටපස්සෙ කින්ගෙ බොඩිගාඩ් හොයාගන්නව තවාන් කියන්නෙ බොරුකාරයෙක් කියලා.."

" බලද්දි උන් ඔක්කොම වටේ යනවනෙ.."

" උඹ ඉඳපන්කො පකයා මැද්දෙන් පනින්නෙ නැතුව.. ඊටපස්සෙ බලද්දි තවාන් කියන්නෙ වේගාස්ගෙ කලින් ලව් එක.."

" පොඩ්ඩක් ඉඳපන්.. දැන් ඔය වේගාස් කියන එකා කී දෙනෙක් එක්ක යාළුද බං.. කලින් පෝර්ශ්ලු දැන් තවානක් ගැන කියනවා.. එතකොට පීට් මොකෙක්ද.. අම්මපා මම පීට් වුණානම් ඇට දෙක තලනවා අරුගෙ.."

" අම්මෝ බං එහෙම සීන් එකක් වෙනවා ඒකෙ.."

" හෑ.. ඇට දෙකත් තැලුවද.."

" නෑ ඕයි කරන්ට එක අල්ලනවා.. වේගාස් පීට්ගෙ.. ඌ නම් මහ පිස්සු හු#තෙක්.. පස්පාරක් වෙඩි වැදිලත් මැරුණෙ නෑ බං.. අර බිග්ට එකපාරයි තිබ්බෙ ඌ මැරිලා වැටුණා.."

" සැක්.. උඹ ඔව්වා කොහෙන් හොයාගෙනද බලන්නෙ.."

@Shan

" හොයනවා නෙමේ ඒයි.. ඒක හෙන ප්‍රසිද්ධයි.. ඔන්නම් රධ්‍ය අයියා ආවහම උඹලා දෙන්නා බලපන්.. මරු.. අයියට කියලා පාන් කවාගන්න පුලුවන්.."

" වෙන මොකුත් කවාගන්න බැරිවෙයිද දන්නෙ නෑ.."

" උඹනම් මහා බල්ලෙක් ෂනෙරු.. සැක්.."

සෙනුකයා මගේ පිට මැද්දට දබෝස් ගාලා පාරක් දුන්නා.. ඌයි මමයි මේ ග්‍රවුන්ඩ් එකේ තණකොළ ගලවන උන් එව්වා හරියට ගලවනවද බලනවා.. ජොනතන්ට බිග්මැච් එකේ ප්‍රැක්ටිස් නිසා මේ ටිකේ ඩියුටි එන්න වෙන්නෙ නෑ කිව්වා.. දැන් උගෙ වැඩ ටිකත් සෙනුකයගෙ පිට පැටවුණු නිසා මම සෙනුකයගෙන් උගේ වැඩ වලින් බාගයක් ඉල්ලගත්තා.. ඈත වම්රු හීනි රීප්ප පටියක් වන වන කැඩෙට් කරන උන්ට කෑගහනවා.. ඉඳලා හිටලා ඒකෙන් හොඳපාරවල් නෙළනවත් අපිට ඇහුණා.. සක්කිලි පරෙයියා.. ආවා මෙතන තුන්සමෙ යන්න.. ගියානම් අම්මපා දනී මම කරන දේ.. අධිබලැති විදුලි කම්බියක් ගෙනැල්ලා අල්ලනවා අර සෙනුකයා කිව්වා වගේ..

" ඉතින් ඊටපස්සෙ මොකෝ වෙන්නෙ.."

" අන්තිමට ඉතින් කෝමහරි කිනුයි පෝර්ශුයි සෙට් වෙනවා.. වේගාසුයි පීටුයිත් සෙට් වෙනවා.."

" එතකොට අර පොඩි කපල් එක.."

" උන් දෙන්නා සෙට් වෙන්නෙ නෑ බං.."

" අඩෝ මම කැමැත්තෙන් හිටියෙ උන් දෙන්නට.. අපරාදෙ.."

" කිම තමා අර අහිංසකයට දුක් දෙන්නෙ. හැබැයි ආදරෙත් එක්කන්.. අනෙ මම දන්න ලබ්බක් නෑ.. ඕක ගිහින් හෙන කල් බං.. මට මතකත් නෑ වෙන දේවල්.."

" දැන් ඔව්වා උඹ බලනව කියලා අයුක අයියා දන්නවද.."

" ඌ කියනවා මම කුණුහර්ප බලනවලු.."

@Shan

" ඉතින්.."

" මම ඇහුවා කරන්න හොඳනම් බැලුවහම මොකද කියලා.."

" ආ එහෙනම් විශාල ශබ්දයක් ඇසෙනන් ඇති.. ගුටි කෑවත.."

සෙනුක මගේ දිහා බලලා මට රැව්වා..

" එච්චර හයියෙන් වැදුනෙ නෑ.. මේ ලෝකෙ ඇත්තට ඉඩක් නෑ බං.. ඒකයි.. ඌට එච්චා කරන්න හොඳයි.. කිව්වමම ලැජ්ජයි.."

" පොඩ්ඩක් ඉඳපන්.. එතකොට උඹලා තරු බලන්න ගියාද.. යකෝ සෙනුක.. වත්සල්.. පකයො..!!"

" කැගහන්නෙපා ඕයි.. මම බලන්න ගිය තරුවක් නෑ.."

සෙනුකයා අහක බලාගෙන කිව්වට මට උගේ මනමාල හිනාවෙන් තේරෙනවා යමක් වෙලා තියෙනවා කියලා.. තේරෙනවා නෙමේ මම කොහොමත් දන්නවා උන් දෙන්නා අතර එකපාරක් යමක් වුණා කියලා.. ඒකනිසා අයුක අයියා සෑහෙන කාලයක් අවුලෙන් හිටියා කියලත් දන්නවා..

" චමිරු මොකෝ කියන්නෙ.."

" ආ චමිරු පුතා.. ඒකා ඉන්නවා බං ඉතින්.. උඹ දන්නවද මේ ටිකේ චමිරු පස්සෙන් පොඩි එකෙක් එනවා.. නංගි කෙනෙක්.."

" ඇ..??"

" ඔව් ඔව් බං.. අල්ලපු වැටේ හොඳේ.. මූත් ලාවට කැමතී වගේ පෙන්නනවා.. කොහෙද උඹ එක්ක බෑනෙ.. උඹව දැක්කම ඌ පරන ට්‍රැකටම සෙට් වෙනවා.."

" මම මොන හු#තක් කලාටද.."

" උඹ තමා උගේ ක්‍රශ් එක.. රධ්‍යා අයියා නෙමේ.. කොහෙද අපේ මිනිස්සුන්ට එච්චා හිතන්න මොලේ නෑනෙ බං.. ඇත්තමයි කියන්නෙ, අයුක අයියයි රධ්‍යා අයියයි නම් වෙලාවකට බබ්බු.."

@Shan

" ලාවට වගේ ඇත්ත තමා.. දැන් මොකක්ද උබ කියාගෙන ආවෙ.."

" චමිරු කැමති උබට බං.. තේරෙන්නෙ නැද්ද.. මම පොරට හේත්තුවක් දාලා සේරම එදා බිගත්තු දවසෙ අහගත්තා.. මස්සිනා චමැරුවා.."

" එහෙම වෙන්න බැනෙ බං.. රධ්‍ය අයියගෙ නම අර ලියුම් වල ලියලා තිබ්බනෙ.."

" ඌ කපටී බං.. ඒකා හොඳටම දන්නවා රධ්‍ය අයියගෙ බෑග් එකට ඕක දැම්මොත් අනිවා උඹ දකිනවා කියලා.. ඌ හිතුවෙ උඹ අයියව සැක කල්ලා ප්‍රශ්නයක් වෙයි කියලා.. ඒත් එහෙම මොකුත් වුනේ නැනෙ. උඹයි අයියයි ඕක ගනන් ගත්තෙවත් නෑ.. උගේ ප්ලෑන සම්පූර්නෙන්ම අවුල් වෙලා ගියා.."

" අඩෝ!!"

" දැන් චමිරුට බය වෙන්න දෙයක් නෑ.. ඌ ගාව මොකුත් නෑ.. උඹලට ඉතින් අපි වගේ යාළුවො ඉන්න නිසා හොඳයි.."

සෙනුකයා නුග ගහකට හේත්තු වුණාම මම නුග වැලක් අතේ පටලලා ඒක ඇදලා ගත්තා..

" හරියට කියනවකො මොකක්ද වුණේ කියලා.. උඹ මට විස්තරයක් හරියට කියන්නෙ නැනෙ.."

" උඹට කියලා කොහොමද.. උඹ අපේ මිනිහගෙ කනේ තිබ්බොත් එහෙම..අහගනින් ඈ.. චමිරුවා රධ්‍ය අයියා එක්ක පට්ට තරහයි.. අනික ඉරිසියයි.. ඌ දන්නවා රධ්‍ය අයියා ඉස්සර ඉඳන් උඹ ගැන හිතේ තියාගෙන ඉන්නෙ කියලා.."

" ඒ කොහොමද බං ඒ.."

" ඇයි බං උන් එකට කැම්පින් සෙට් වෙනවනෙ පොඩිකාලෙ ඉඳලා.. කියාන් අයියලා එහෙම විහිලු කරද්දි ඌට ඇහිලා ඇති.. ඌ ඉතින් සිහිති ප්ලෑනක් ගැහුවා උඹවයි රධ්‍ය අයියවයි තරහා කරන්න.. අනික උඹව තනි කරගන්න ඕන නිසා මතීශලටත් කේලම් කියලා අපි එක්ක තරහා කෙරෙව්වා.. උඹට

@Shan

කතාව හැඳුනෙත් අයුක අයියා එක්කනෙ.. රධ්‍ය අයියා ගැන කොයි වෙලේකවත් සඳහනක් උනේ නෑනෙ.. උඹට මතකද ඒක.."

" ම්ම්.."

" ඒත් ඒ දවස්වලම අහිරු අයියලා ඕකාට බැනලා තිබ්බලු ආයෙම ප්‍රශ්නයක් ඇති කළොත් මේක විනය කමිටුවට කියනවා කියලා.. රධ්‍ය අයියා ගාව තිබ්බ ලියුම් ටිකත් සයෝන් අයියලා අරගෙන.."

" අඩෝ..!! අපි මොකුත්ම දන්නෙ නෑනෙ බං ඔය ගැන.."

" අපිට කියන්නෙ නෑනෙ බං ඉතින් ඒ කාලෙ.. උන් උන් ප්‍රශ්න විසඳගෙන.. යාළුවොනෙ.."

" එතකොට.."

" හැබැයි චමිරුවගෙ ෆෝන් එකේ උඹලා දෙන්නා මේ ගහක් අස්සෙ ඉඳගෙන කතාකරන ෆොටෝ වගයක් තියෙනවා.. මම දවසක් කෝල් එකක් ගන්න කියලා උගේ ෆෝන් එක ඉල්ලගත්තම දැක්කෙ.. එදා හරියටම බලාගන්න බැරිවුණා මට.."

" අම්මටසිරි.. බයත් හිතෙනවා යකෝ.."

" දැන් බයවෙන්න දෙයක් නෑ.. එදා මම උගට හොඳට පොවලා, ෆෝන් එක අරගෙන තියන සේරම ෆොටෝ ටික ඩිලීට් කලා.. උඹලා කලර්ඩ් කිට් ඇඳගෙන ඉස්කෝලෙ උඩහ කතාකර කර ඉන්න එකකුයි උඹ පූසෙක් බදාගෙන ඉන්න ඒවා වගේකුයි.. රධ්‍ය අයියත් හිටියා.."

" ආ එදා බං..අර කැම්ප් එකක් තිබ්බෙ ස්ටුවර්ඩ්ස්ලාට.. එදා වෙන්න ඇති.."

" ඕ.. තව උඹලා දෙන්නා එකට ඉන්න ෆොටෝ ගොඩක් තිබ්බා.. මූ එව්වා මොකට එකතු කරනවද මන්දා.."

" ඒකනෙ.. උගට හිතුණොත් ලීක් කරන්න වෙන්න ඇති.. මූ එක්ක කතාකරන්න නෙමෙ වටින්නෙ දැන් නම්.. බල්ලෙක්නෙ.."

" කේන්තිගන්න ඕන නෑ යකෝ.. ඔහොම ශේප් එකේ යමං.. උග හැබැයි දැන් ලාවට තේරුම් අරගෙන ඉන්නෙ උඹ ගැන හිතේ තියාගෙන හිටියට

@Shan

වැඩක් නෑ කියලා.. අනික මාත් උඹලා ගැන එක එක දේවල් කියලා උගට ඒත්තුගැන්නුවා ඌ හිතාගෙන ඉන්න දේවල් වෙන්නෙ නෑ කියලා.."

" ම්ම්.."

" මස්සිනා ගානට තියාගෙන ඉමු.. අර කෙල්ලත් ඇලට් එකේ ඉන්නෙ.. මුගෙත් අකමැත්තක් නෑනෙ.."

" ඒ වුණාට මට ඒ කෙල්ල ගැන බයයි.. මුගේ හැටියට.."

" අපි බලමුකො.. මම උගේ පස්සෙන් ඉන්නවනෙ.. රතු කොඩි පේන්න ගත්තොත් කෙල්ලට මූ ගැන කියලා කෙල්ලව අයින් කරනවා.. I am ready for everything මචං.. උගේ ෆෝන් එකේ තිබ්බ යම් යම් ෆොටෝ වගයක් මා සතුව තියනවා.."

" උඹ මාර යකෙක්නෙ ඕයි.. මේ මෙඩිසින් නොකර පලයන් පොලිසියට.. උඹව ගැලපෙන්නෙ ඒකට.."

" ඉඳපන් බං.. මේ උබ චමිරුට රවන්න ගොරවන්න යන්න එපා.. ඔච්චා කල්ලා තමා රධ්‍ය අයියවත් දාගත්තෙ.. එහෙම ඉග්නෝර් කරද්දි උගට උනන්දුව වැඩිවෙනවා.. මම වගේ බොක්කෙ හිටි එකෙන් කතාකල්ලා ඉඳපන්.. අරවා තියාගනින් රධ්‍ය අයියට පෙන්නන්න.."

සෙනුකයයි මමයි අර ළමයි ක්ලාස් වලට යනකල් ග්‍රවුන්ඩ් එකේ කැරකි කැරකි ඉඳලා ඔෆිස් එකේ මීටින් එකකට ගියා.. ආයෙම එදා හවස වෙන ඉස්කෝලෙක එක්සිබිශන් එකකටත් යන්න වුණා චමිරු එක්ක.. සෙනුකයා ගේම්ස් කැප්ටන් කෙනෙක් නිසා ඒවට එන්න විදියක් නෑ.. යන්න වුනේ පරෙයියටයි මටයි.. මම ඌ එක්ක වැඩි ඇයි හොඳැයියකුත් නැතුව සෙනුකයා කිව්වා වගේ ශේප් එකේ හිටියා.. අපරාදෙ කලින් දවසක මම මේ එව්වා ගැන දුක් වුණත් එක්ක.. මම හිතුවෙ මගේ පස්ස ලොකු හැපීකව්වගෙ මගෙන් පැහැරගෙන යන්න ආපු සක්කිලි පරෙයියෙක් කියලනෙ.. බලන් යද්දි වෙලා තියෙන්නෙ හීනෙකවත් මම දැක්කෙ නැති එකක්.. මූට ඇත්තටම මොකක් හරි අමාරුවක් වගේ තියද දන්නෙ නෑ මම වගේ මෙලෝ සසරකට නැති එකෙක් එක්කම යාළු වෙන්න.. එහෙම උනන්දුවක් අමාරුවක් තිබ්බ එක්කෙනෙක් හිටියා.. පස්සෙ ඉතින් එයාට මාත් එක්ක යාළුවුණාම ප්‍රෙශර් නගින්න ගත්තනෙ.. සමහර වෙලාවට එයාගෙ අයියටත් ප්‍රෙශර් නගිනවා.. අයියගෙ කැල්ලටත් ප්‍රෙශර් නගිනවා..

@Shan

අයියගෙ කැල්ලගෙ පොඩි අක්කටත් ප්‍රෙශර් නගිනවා.. ඒ සේරම පැත්තකින් තියමුකො.. මට රඩ්‍ය අයියගෙ පස්ස දැක්කහමත් නගින්නෙ.. එක්කො ඕන නෑ..

" මෙහ්.. වතුර තියද බං උඹ ගාව.."

" ඇති.. ඉන්න.."

එක්සිබිශන් එක ඉවරවෙලා මම ගෙදර එන්න අවහම චමිරුත් ඒ බස් එකටම ගොඩවුණා.. හතරට විතර බස් වල යන්න බෑ.. මාර සෙනගක් ඉන්නෙ.. ඌයි මමයි බස් එකේ මැද්දෙන් අල්ලගන්නවත් එකක් නැතුව මොක්කුද දෙන්නා වගේ තඩි ඇන්ටිලා දෙන්නෙක්ගෙ පස්සවල් වලට මැදි වෙලා තැලිලා පොඩි වෙලා එන්න ආවා.. කොහොම හරි මම චමිරුවගෙ නිල් පාට වතුර බෝතලෙත් අත අස්සෙ ගහගෙන හෙන අමාරුවෙන් හෝල්ට් දෙකක් විතර උඩ කොක්කෙ එල්ලිලා හිටියා.. ආයෙම බස් එකට හෙන සෙනඟක් නඟින්න ගත්තා.. ඒ මදිවට හැම හංදියක් ගානෙම පැයක් විතර බස් එක නවත්තගෙන ඉන්නවා.. චමිරුවට දාඩිය දාලා උගේ ශර්ට් එකත් තෙත වෙලා.. මම සාක්කුවෙ තිබ්බ ලේන්සුව ඇදලා අරගෙන මගේ මූණෙ තිබ්බ දාඩිය පිහාගත්තා.. උගෙ එමූණෙ තියන ඒවා පිහන්න මට ඕල්මාදෙ නෑ කොහොමත්.. මගෙ කහපාට ලේන්සුවකුත් ඌ ගාව තියෙනවා.. මට මහා කරුණාව පහළ වෙලා බැන්දනෙ එදා අතේ.. මටත් හොඳ වැඩේ..

" බෑග් එක ගනින්.. මේකෙ මට යන්න බෑ.."

" පිස්සු නටන්නැතුව ඉඳපන් බං.."

චමිරුවා රැක් එකේ දාලා තිබ්බ උගෙයි මගෙයි බෑග් දෙක අරගෙන මගේ අතිනුත් ඇදගෙන අස්සෙන් අස්සෙන් රිංගලා ගිහින් එකපාරටම බස් එකෙන් දඩාස් ගාලා බැස්සා.. මට මූට ගහන්න හිතයි දැන් නම්..

" යකෝ!!! චමිරු.."

" අර ලබ්බෙ යන්න පුළුවන්ද.. මෙන්න මෙහේ ටැක්සි එකක යමං.."

මම චමිරුගෙ අතේ තිබ්බ බෑග් එක ඇදලා අරගත්තා.. අපරාදෙ බස් එකට දීපු සල්ලි.. දැන් වෙනදා වගෙත් නෙමේ..හෙන ගානක් යනවනෙ බස් එකක

@Shan

යන්නත්.. ළඟදි ප්ලේ කරපු මැච් එකෙන් අපේ ක්ලබ් එක වින් කරපු නිසා මට බැන්ක් එකවුන්ට් එකට පේමන්ට් එකක් වැටිලා තිබ්බා හතළිහක.. ඒත් මම ගන්න ගියේ නෑ.. ගන්න තරම් උවමනාවකුත් නෑ මාමා දෙන නිසා..

ටිකකින් චමිරුයි මමයි ටැක්සි එකක එන්න ආවා.. ඌ මගින් බැස්සා එතෙන්ට ඩ්‍රයිවර් එනවා කිව්ව නිසා..

" පරිස්සමට පලයන්.."

" හරි එල.. උඹත් පරිස්සමෙන් යමං.."

මම ගෙදර එන්න ආවා.. ආධ්‍ය අයියා ඩිස්චාර්ජ් වෙලා ගෙදර ගිහින් නිසා අපේ මාමා ඉන්නෙ දාහට අරගෙන නිකම් දීලා වගේ.. ඒ අස්සෙ අර ප්‍රපෝස් කරපු මල සමයම ගේ අස්සෙ රිංගගෙන මගේ ආධ්‍ය අයියට සත්කාර කරනවලු.. මාමට ඉරිසියාවට වඩා තියෙන්නෙ දුක කියලා මට හිතෙන්නෙ.. කවුද ඇත්තටම කැමති එහෙම ආදරේ කරන එකාට වෙන වෙන ගෑණු ඇවිත් පුද සත්කාර කරනවට.. අපරාදෙ රධ්‍ය අයියා හිටියනම් මල සමයමගෙ කොණ්ඩෙන් ඇදලා එළියට දාන්නෙ.. අපේ ආධ්‍ය අයියට අත තියන්න..?? මට කවදහරි හම්බුණොත් නම් අම්මපා ආශිගෙ කොණ්ඩෙ කර්ල් කරන මැශින් එක රත් කල්ලා ඔබනවා කටේ..

මාමා ගෙදර එන්න හවස් වෙනවා.. තියටර් දවස් වලට රෑ වෙනවා.. අද තියටර් කිව්වනෙ.. ඒකනිසා එක්ක රෑ වේවි.. කෑම හදලා තියෙන නිසා මම නාලා ඇඳුමක් දාගෙන ඇවිත් කෑම කෑවා.. අපේ මාමා හෙන සැරට කෑම කන්නෙ.. ආධ්‍ය අයියට සැර කෑමජාති කන්න බෑනෙ.. ඇස් දෙකෙන් කඳුළු එන්න ගන්නවා.. ඊටපස්සෙ පොකිරිස්සෙක් වගේ රතුවෙලා කැස්ස හැදෙනවා.. එයා මලෙන් උපන් කුමාරයනෙ..

අන්න ඒකට ආධ්‍ය අයියගෙ මල්ලි.. කනවා කනවා කනවා තියන තරමක්ම කනවා.. සැරම සැර දුම් දාන එකේ ඉඳලා පැණිරස අයිස්ක්‍රීම් එක වෙනකල්ම කන්න පුළුවන්.. එළියට ගියාම රධ්‍ය අයියයි මමයි කිසිම මනුස්සයෙක් කන්නෙ නැති විදියට කෑම ඔඩර් කල්ලා කනවා.. චොප්සි නූඩ්ල් එකක් ගත්තොත් ඒකට ස්ටීම්ඩ් රයිස් ඔඩර් කරන් එකතු කල්ලා කනවා.. කොත්තු එකකට එකපාරක් ස්ටීම්ඩ් රයිසුයි, ඒ රෙස්ටොරන්ට් එකේ සීක්‍රට් රෙසිපි එකකට හදපු හෙන සැර චිලී සෝස් එකකුයි, ශ්‍රිම්ප් ඩෙවල් එකකුයි එකතු කල්ලා කෑවා.. ඒක කෑවෙ කොහොමද කියනවනම්.. පහුවදා රධ්‍ය අයියයි මමයි අසමෝදගම් බෝතලයක්ම දමලා ඇරියා.. මගේ

@Shan

ගැස්ට්‍රයිටිස් වැඩිවෙලා තුන්වේලටම ආධ්‍ය අයියා බැන බැන අයි වී දුන්නා.. ඒ වුණාට ඒක මාරම රසයි..

තව සැරයක් ගෙදර බටර් චිකන් එකක් හදන ගිහිල්ලා රධ්‍ය අයියයි මමයි කියව කියව තක්කාලි ඔක්කොම කාලා අන්තිමට චිකන් ටික නිකම් බැදලා ගම්මිරිසුයි ලුණුයි දාලා කෑවා.. අවසානෙ අපි තීරණයක් ගත්තා කෑමක් හදන්න කලින් නම තීරනේ නොකර අවුට් පුට් එක දිහා බලලා නමක් දාන්න.. ඔය හේතු නිසා ආධ්‍ය අයියා අපි කුස්සියේ අලුත් කෑම හදනවට එකහෙලා විරුද්ධයි.. අනිත් එක අපි දෙන්නටම රෑ තුනට දෙකට විතර බඩගිනි වෙනවා. ඒ වෙලාවට කුස්සිය පෙරලලා එක එක කෑම හිතෙන විදියට හදලා කනවා.. නූඩ්ලස්, සැන්ඩ්විච්, අයිස්ක්‍රීම්, සලාදකොලේකට සෝස් දාලා හරි කනවා.. නොකා නින්ද යන්නෙ නෑ..

When it comes to food.. there is no couple anywhere that does experiments like us..

මම කෑම කාලා ආධ්‍ය අයියට කෝල් එකක් අරගෙන ඇදේ හාන්සි වුණා..

" හලෝ~ව්.. කවුද මේ.."

සැක් මේ මල සමයම අයියගෙ ෆෝන් එක අරගෙන මොනෝත්තක්ද කරන්නෙ..

" අම්.. මම ඩොක්ට ආධ්‍යගෙ ස්පෙශල් පේශන් කෙනෙක්.. දැන් එයා බිසීද.."

" එයානම් නිදි මේ වෙලාවෙ.. කවුරු කියලද කියන්න ඕන.."

" ගෝඩ්.. එහෙමද.. මට පොඩි හදිසියකට ඩොක්ට ආධ්‍යට ගත්තෙ.. මගේ බබා නවත්තන්නෙ නැතුවම අඩනවනෙ.. පොඩ්ඩක් කතාකරන්න බැරි වෙව්ද.."

" වෙයිට්.. අයිල් වේක් හිම් අප්.."

මම කොට්ටෙ නියපොතු වලින් පහුරු ගගා ඒ සමයමගෙ කැත කටහඬ අහගෙන හිටියා..

" ආධ්‍ය.. ඩාලින්.. මේ ඔයාගෙ පේශන් කෙනෙක් කෝල් කරනවා.."

@Shan

" කවුද.. කෝ ෆෝන් එක දෙන්න.."

මම ෆෝන් එක ස්පීකර් ඔන් කල්ලා ඇඳ උඩින් තියාගෙන කොට්ටයක් බදාගත්තා..

" හලෝ.."

" ආ ඩොක්ට ආධ්‍යද.. අනේ බලන්නකො.. මට බබා හම්බෙන්නයි යන්නෙ.. විලිරුදාව වගේ.. මොකද කරන්න ඕන.. ආහ්!!! අයියාහ්.."

ආධ්‍ය අයියා එහාපැත්තෙ ඉඳන් මහා හයියෙන් හිනාවෙනවා මට ඇහුණා..

" එහෙනම් ඩොක්ටට එන්න වෙච්චි නේද.. ඩොක්ට බාප්පි වෙන්න යන්නෙ.."

" ඒකතමා.. පව් අපේ අනුක්ච්චත් ඉන්නෙ සාංකාවෙන්.."

" එයා ගෙදර ආවද චූටි.."

" කව්ද ආධ්‍ය ඔය කතාකරන්නෙ.."

" ප්ලීස් නෙතු ඔයා රූම් එකෙන් එළියට යනවද.."

" ඒ ඇයි මම යන්නෙ.. මට බැරිද මගේ ෆියුචර් හස්බන්ඩ්ගෙ කෝල්ස් මොනවද කියලා දැනගන්න.. එයාගෙ කාමරේ ඉන්න..??"

" Stay in your limits.. No one here is your future husband.. Just get out.. Stop the drama.."

" ආධ්‍ය..?? ඔයා මොනවද මේ කියවන්නෙ.. මට තේරෙන්නෙ නැහැ.."

මම එහාපැත්තෙ ඇහෙන කටහඬවල් වලට කන් දීගෙන හිටියා..

" චූටි.. මම ඔයාට පස්සෙ ගන්නද.."

" අයියට කරදර නැත්නම් මෙහේ එන්නකො.. අප්පච්චිත් ගෙදර නැනෙ.. ඔයාග පොඩි මස්සිනා ඉන්නෙ ඔයාව හොඳට බලාගන්න.. හා ද.."

@Shan

" කමක් නැද්ද.."

" ඔයාට ඕන වෙලේක දොර ඇරලා අයියො තියෙන්නෙ.. මෙන්න මෙහෙ එන්න විකාර නොකර.. මම අයියා ආස කෑමක් හදන්නම්.."

" ම්ම්.. එන්නම්කො එහෙනම්.."

ආඩ්‍ය අයියා කෝල් එක කට් කලාම මම වොලට් එක සාක්කුවෙ ඔබාගෙන පහළ තියන කීල්ස් එකට දිව්වා..

මගෙ දළඹුවනේ..............................................................

ද බිග් ස්ටෝරියෙන් එන්නම්.. එහෙනම්..
මමඉතින්යන්නයනවාමටයන්නාවසරයිමටාරංයන්නඇත්තේමෙමතකයවි තරයි.. ඉමහි..

චමිරු ගැන මොකත හිතෙන්නෙ.. එයා හොදයිනේද.. නාවලා ගෙට ගන්න බැරිවෙයිද.. පුලුවන් නෙ නේද..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 110 කොටස

" හලෝ මාමෙ.."

" සුදුමහත්තයා ගෙදර ආවද.."

" ඔ මාමෙ.. මම ඇවිත් කාලා බීලා ඉන්නෙ.. මාමා කෑවද.."

" තාම නෑ.. ඇවිල්ලම කනවා.. අද මේ මෙහෙට ප්‍රයිම් මිනිස්ටර් ඇවිත් වැඩ වැඩී බං.. තියටර් නැහිලා නැහිලා මේ ලබ්බකුත් පැටලුනා.."

" ආ මාමා එන්න රෑ වේවිද.."

" පොඩ්ඩක් විතර.. ඉවරවුණු ගමන් එනවා.. මොනවහරි ගේන්න ඕනද.."

" නෑ නෑ මාමා පරිස්සමට එන්න.. මම කියන්න ගත්තෙ ආධ්‍ය අයියා අද මෙහෙ එන්නම් කිව්වා.. කමක් නැද්ද.."

" කවුරු කිව්වා.. ආධ්‍ය..??"

ඔව් ඔව් මාමගෙ සාකිච්චා තමා.. රෙද්ද.. බොරුවට රඟනවා දන්නෙ නෑ වගේ.. දෙන්න හිතයි දැන්නම් පෑන් එකෙන් ඔලුවට දෙකක්..

" ඔව් අනේ.. අර රධ්‍ය අයියගෙ අයියා.."

" ආ.. මේ රෑ එනවා කිව්වද.."

" ඔව්.. ඔන්න එනවා හොඳේ.."

" හරි හරි.. පරිස්සමට ඉන්න එහෙනම්.. මම වැඩ ඉවරවෙලා එන්නම්.."

" හරි මාමෙ.. බුදුසරනයි.."

මම ෆෝන් එක කට් කල්ලා සෝෆා එකේ කකුල් දෙකත් උඩට අරගෙන දැස් අයාගෙන ආධ්‍ය අයියා එනකල් බලාගෙන හිටියා.. හරිනම් අපේ මාමා මට දෙන්න ඕන කීයක් හරි.. මම එයා ගැනත් හිතලා සාකිච්චව කැඳැල්ලෙන් මෙහෙට වඩම්මනවට.. ආධ්‍ය අයියා එයාලගෙ ගෙදර අර මල සමයමගෙ

@Shan

පුද සත්කාර මැද්දෙ ඉන්නෙ අකමැත්තෙන් කියලා මම හොඳට දන්නවා.. ආධ්‍ය අයියා ආස අපේ අනුරාග් කරන පුදසත්කාර වලට විතරනෙ.. ඔය එක එක නැට්ටිච්චියො වගේද අනික.. ඇහැට කනට පේන්න කොල්ලෙක් දැක්කොත් ඉවරයි.. ආවා මෙතන කරේ නගින්න.. ආධ්‍ය අයියා මගෙයි, රධ්‍ය අයියගෙයි, මාමගෙයි විතරයි.. හරිනම් මගේ විතරක් වෙන්න ඕන කියලා හරිගස්සන්න ඕන.. ඒත් කමක් නෑ.. මාමයි රධ්‍ය අයියයිත් මගේනෙ.. එයාලගෙ දේවලුත් ඉබේම මට අයිති වෙනවා..

ආධ්‍ය අයියයි, අයියගෙ මල්ලියි, අයියගෙ මල්ලිගෙ වෙන්න මස්සිනායි ඔක්කොම මගේ..

ඒ එක්කම වගේ මෙහේ ඩෝබෙල් එක වදිනවා මට ඇහුණ තප්පරේම මම දඩාස් ගාලා දුවලා ගිහින් දොර ඇරියා.. සාක්කිච්චට ඇතුළට පියාඹලා එන්න.. ආධ්‍ය අයියා කණ්ණාඩිදෙක ශර්ට් එකේ රඳවගෙන කොණ්ඩෙත් අවුල් කරගෙන නිදාගෙන හිටපු ගමන් ඇහැරිලා වගේ ඇවිල්ලා හිටියේ..

" චූටි.. ටිකක් පරක්කු වුණා ට්‍රැෆික් නෙ හරියට.."

" පරක්කු වුණාට මොකද අයියෝ.. ඔයා ඇතුළට එන්න.."

ආධ්‍ය අයියා කලින් මෙහෙට ඇවිල්ලම නෑ.. පළවෙනි වතාවට තමා ක්වාටස් එකට ආවෙ..

" මෙහෙ අවුලක්ම නෑනෙ චූටි.. අනුරාග් කිව්වෙ පොඩි වැඩි කතාවක්.."

" මෙහේ ක්වාටස් එච්චරම ලොකු නැහැල්ලුනෙ.. මටනම් කොහෙත් එකයි.."

" ඒක හොඳයි.. කොහේ වුණත් ජීවත්වෙන්න ඉගනගන්න එක.. මට එද්දි මාමා කතාකලා.."

" මොකෝ කියන්නෙ.."

" එනවද අහන්න ගත්තෙ.. පරිස්සමට එන්න කිව්වා.. අද තියටර් නිසා මහන්සි ඇති එයාටත්.."

@Shan

මම ආධ්‍ය අයියත් එක්ක මගෙ එකාමරේට ගිහින් ඇඳෙන් ඉඳගත්තම ආධ්‍ය අයියත් ඇඳෙන් ඉඳගෙන ඉන්හෙලර් එකක් සාක්කුවෙන් අරගෙන ඒක ඇද්දා..

" අයියට අසනීප ගතිය අඩු නැද්ද තාම.."

" අඩුයි චූටි.. පොඩ්ඩක් මහන්සි දැනෙනවා හිටි ගමන්.."

" ඩොක්ටර් මොකද කියන්නෙ.."

" කිව්වා.. තව ටෙස්ට් වගයක් තියෙනවා කරන්න.. ඒවගෙ රිපෝට් එනවා විතරනෙ.. මට බලන්න දෙන්නෙත් නෑ ඔයාගෙ මාමා ළඟ තියාගෙන ඉන්නෙ.. බලන්නකො.."

" එහෙමද.. ම්ම්.. අයියා හාන්සිවෙන්න අමාරුනම්.. මම මොකුත් ගේන්නද.. මම ස්මූති එකක් හැදුවා.."

" ආ ගේන්නකො බලන්න එහෙනම්.. මාත් තිබහෙන් හිටියේ.."

මම අයියට කාමරේ ඇඳෙන් ඉන්න දීලා මම හදපු ස්මූති එක අරගෙන ආවා.. ඒක එච්චර හදන්න අමාරු නෑ.. කිරියි පලතුරුයි දාලා බ්ලෙන්ඩ් කල්ලා හදන්නෙ.. මම දැකලා තියෙනවා මාමා ආධ්‍ය අයියට හදාගෙන යනවා අසනීප වුණාම.. මම ආධ්‍ය අයියට මග් එක දුන්නම අයියා හිනාවෙලා ඒක අරගත්තා..

" චූටිට ඉස්කෝලෙ වැඩද මේ ටිකේ.."

" බිග්මැච් එකේ වැඩ තමා අයියෙ.. ඒ ඇරෙන්න අද එක්සිබිශන් එකකට ඉන්වයිට් කල්ලා තිබ්බා.. ඒකට ගිහින් එද්දි හවස් වුණා.."

" කොහෙ එකක්ද.."

" වෙස්ලි එකේ.. අර රධ්‍ය අයියට ලියුම දීපු මොට්ට පරෙයියත් ගියා.."

ආධ්‍ය අයියා හයියෙන් හිනාවුණා..

" මොනවද අනේ ඔය දාන නම්.. පරෙයියො පොල්කිච්චො හැපීකච්චො.. ශෝක්.."

@Shan

" අපි කොහොමත් ශෝක් තමා හලෝ.. ඒකනෙමෙ.. කවුද අර මල හෝන්තුව ෆෝන් එක ආන්සර් කරපු.. අපරාදෙ රධ්‍ය අයියා ඉන්න තිබ්බෙ.. හිටියනම් දනී කරන දේ.. ආවා මෙතන.. ෆෝන් ආන්සර් කරන්න.. මෙ එයාට ඩාලින් අරවා මේවා කියාගෙන එන්නෙපා කියන්න හරිද.. මම ඔයාට ඩාලින් කියන්නම්.."

" අම්මෝ චූටි.. වැඩක්නෑ කතාකල්ලා.. නෙතු ලෝයර් කෙනෙක් හරිද.. මට නින්ද ගිය වෙලේ එයා මගේ ෆෝන් එක අරගෙන බලලා.. ඔයාගෙ ෆොටෝස් තියනවනෙ මේකෙ.. ඇහුවා කවුද කියලා.."

" ආ කියන්න තිබ්බෙ කැල්ල කියලා අයියගෙ.. කේන්ති යනවා මටනම්.."

" කේන්ති යනවා කියන්නෙ චූටි.. මටත් කේන්තියි.. එයා හිතාගෙන ඉන්නෙ දැනටම මගේ සේරම එයාගෙ කියලා.. අහන්නෙ බලන්නෙ නෑ කාමරේට එනවා.. ඇඳුමක් ඇඳගන්න නෑ.. හරි කරදරයි.. මම ඇත්තටම කැමති නෑ අනවශ්‍ය විදියට එහෙම කරදර කරනවට.."

" ම්ම්.."

මම ආධ්‍ය අයියා දිහා බලාගෙන හිටියා.. ආධ්‍ය අයියා මග් එක ඉවරනිසා ඒක පැත්තකින් තියලා ඇද වියලෙට හේත්තු වෙලා කොට්ටෙට ඔලුව තියාගත්තා.. එයා කොහොමත් ආස නෑ තමයි කාමරේට එනවට.. තියා රධ්‍ය අයියයි මමයිවත් යන්නෙ නෑ ඒ රෝසමල් සුවඳ කාමරේට.. අපි ගියාම ඒක වනසනවනෙ.. හැබැයි අපි ගියාටනම් මොකුත් කියන්නෙ නෑ අයියා.. ඒත් යන්නෙ නෑ.. එයා කැමති පොඩ්ම පොඩි සද්දයක්වත් නැති විදියට ඉන්න.. හැමතිස්සෙම පොත් කියවන නිසා සද්ද කරද්දි ඒවට ඩිස්ටර්බ් වෙනවා.. නැත්නම් අයියා නිදාගත්තම අපි උඩටවත් යන්නෙ නෑ.. එයා හැසිරෙන, ඉන්න විදියට ඇත්තටම හිතේ ගෞරවයක් තියෙනවා වැඩිහිටියෙක් කියලා.. කාමරෙන් එළියට ආවහම නම් අපි එක්ක හිනාවෙලා කතාකල්ලා ඉන්නවා.. ආධ්‍ය අයියා තනිකරම විශාඛාව වගේ.. දුවන්නෙවත් නෑ පොලොවට රිදෙයි කියලා.. මම එයාගෙ ඒ ගතියට හරි ආසයි..

" මේ අවුරුද්දෙ මැයි වලට වෙඩින් එක ගන්න කතාවකුත් කියනවා.. මට තේරෙන්නෙ නෑ චූටි මොනවා කරන්නද කියලා.. අනුරාග්ට කිව්වම එයත් පොඩ්ඩක් ඉවසල ඉන්න කියනවා.."

" මාමා මොකුත් කරන්නෙ නැද්ද එතකොට අයියෙ.."

@Shan

" වෙඩින් එකක් තියන්නත් මනාමාලයා ඉන්න එපැයි.. මේ අසනීප එක්ක මට පවුලක් නඩත්තු කරන්න බෑ චූටි.. මටම දැනෙනවා එන්න එන්න මගේ අසනීප ගතියත් වැඩිවෙනවා.. කියන්න ඉන්නෙත් ඔයයි අනුරාගුයි විතරයි.. පොඩීවත් ගෙදර හිටියනම්.."

මම ආධ්‍ය අයියගෙ අතකින් අල්ලගත්තා..

" එයා ඉක්මනට ඒවි.. අපි ඉන්නවනෙ ඔයා එක්ක.."

අයියා මගේ ඔලුව අතගෑවා..

" පොඩී අමුතු මලක් නවත්තලා ගිහිල්ලනෙ.. ඔයා නැත්නම් මට ජීවත් වෙන්න හේතුවක් හොයාගන්න බැරුව තාම විඳවනවා.. "

" ඒ කීව්වෙ.."

" ඔයා නිසානෙ මට ආයෙම අනුරාග්ව හම්බුණේ.. නැත්නම් මම තාම එයා ඉන්න දිහාවක් දන්නෙ නෑ.. අම්මත් ඇහුවා ගෙදර ඇවිල්ලා, කොහෙන්ද රධ්‍ය පුතා බෝනික්කෙක් හොයාගත්තෙ කියලා.. අපේ ගෙදරනම් ඔයාට මාර කැමතී.."

" කැමති වුණාට ලොකුම උදැල්ල ඉන්නෙ එහෙනෙ.."

" ම්ම්.. ඒකත් එහෙමනම් තමා.."

ආධ්‍ය අයියා ටිකක් වෙලා කල්පනා කලා..

" ඔයාට කියන්න හුඟක් දේවල් තියෙනවා.. අද හම්බුනු එක හොඳයි.."

" මොනවද ඒ.."

මම ඇඳෙන් ඉඳගෙන බිත්තියට හේත්තු වුණාම අයියා ආයෙම ටිකක් වෙලා කල්පනා කලා..

" අපේ අම්මා දන්නවනෙ අනුරාග් ගැන.."

" එහෙමද.. අම්මා මොකුත් අවුලක් නැද්ද ඒ ගැන.."

@Shan

" අම්මා එහෙම නෑ චූටි.. අපිව තේරුම්ගන්නවා හොඳට.. ඒත් එයාට ගෙදර තීරණවලට මැදිහත්වෙන්න අයිතියක් නෑ.. ඔක්කොම අප්පච්චි අයිති කරගෙන වගේනෙ ඉන්නෙ.. අම්මගෙ පවුලෙ අයත් අප්පච්චි නිසා අම්මා එක්ක කතාකරන්නෙ නෑ අප්පච්චිගෙ ප්‍රශ්නයක් නිසා.."

" ඉතින් ඔක මැරේජ් ප්‍රපෝසල් එකක් නේද.."

" මැරේජ් ප්‍රපෝසල් හැම එකම කතන්දරවල වගේ හරියන්නෙ නෑ චූටි.. එහෙමත් එකක් දෙකක් තමා හොඳ වෙන්නෙ.. ඒ ඇරෙන්න නිකමට හිතන්නකො ජීවිතේට දැකලවත් නැති, ආශ්‍රය කල්ලාවත් නැති මනුස්සයෙක් එක්ක දීග යන්නෙ කොහොමද.. මමනම් ඇත්තටම මැරේජ් ප්‍රපෝසල්ස් වලට කැමති නෑ.."

" ඒකනම් ඇත්ත තමා.. ඒත් ඉතින් අපේ තාත්තා අම්මා එක්ක අවුරුදු පහ හයක්ම යාළුවෙලා ඉඳලත් දාලා ගියේ.. කොයි එකත් අවංක නැත්නම් යනවා.."

" ම්ම්.. අපි මොනවද ජීවිතේ ගැන දන්නෙ එක අතකින්.. නේද.. හැමදේකටම කාසියේ දෙපැත්ත වගේ පැති දෙකක් තියෙනවනෙ.."

" අයියා කලින් කියන්න ගියෙ..??"

" ආ ඔව්.. අපේ අම්මා මේ පාර ගිහින් ආවම ඩිවෝස් එක ගන්න කතාවක් මාත් එක්ක කිව්වා.. අම්මට කතාකරන්නත් වෙන කවුරුත් නැනෙ චූටි.. පොඩ්ඩිත් ගෙදර නෑ.. අපේ ගෙදර අයට ඉන්නෙ අපි අපි කීපදෙනා විතරයි.. පොඩීනම් අපි එක්ක හුඟක් වෙලාවට එයාගෙ දේවල් කතාකරන්නෙ නෑ.. එයාට දැන් ඔයා ඉන්නවනෙ.. මටත් අනුරාග් ඉන්නවා ප්‍රශ්නයක් වුනාම කතාකරන්න.. හිත හැදෙන්නවත් දෙයක් කියන්න.. ඒත් අම්මට කවුරුත්ම නෑ චූටි.. එයා අපි පොඩි කාලෙ ඉඳලා හුඟාක් දුක් වින්දා.. පව් අපේ අම්මා.."

" ම්ම්.."

" ඒත් අම්මා ඩිවෝස් වුණොත් අප්පච්චි ළමයි අම්මට දෙන්නෙ නෑ කියනවා.. අම්මට ඕනදෙයක් කරගන්නලු.. මමනම් කමක් නෑ මට අවුරුදු තිහක් විතර වෙනවනෙ.. ආයෙම ඔකට මැදිවෙන්නෙ පොඩීව.. මට මෙච්චර අසරණකමක් මීට කලින් දැනිලම නෑ.. මගේ පොඩිඑකා හැමදාම ගෙදර ප්‍රශ්න වලට මැදි වෙනවා.. අනේ මම මොකද කරන්නෙ චූටි.. මට

@Shan

බැනෙ මං ගැන විතරක් හිතන්න.. පුළුවන්කමක් තියෙනවනම් පොඩ්ඩවත් අරන් මම ලංකාවෙන්ම යනවා.. ඒත් මේ අසනීප එක්ක හදිසියෙ මට මොනවහරි වුණොත් එයා තනිවෙනවා.. මට වෙන කරන්න දෙයක් ඇත්තෙ නෑ.. ජොබ් එකටවත් යාගන්නෙ හරි අමාරුවෙන්.. අනුරාග් කියලා කියලා දැන් ඔ පී ඩී මාරු වුණා.. වෝඩ් එකේ වැඩ කරගන්න බැරි තරමට වෙලාවකට හිසරදේ අල්ලනවා.."

" එහෙම මොකුත් වෙන්නෙ නෑ අයියෙ.. මොනවද මේ කියන්නෙ.."

ආඪ්‍ය අයියා හිනාවෙලා මගේ කම්මුලට තට්ටුවක් දැම්මා..

" මම කිව්වෙ වුණොත් කියලනෙ.."

" එහෙම වෙන්නෙ නෑ.. ආවා මෙතන විකාර බයිලා කියවන්න.."

" අපෝ හා හා.. ඔයා කියන දෙයක් තමා.."

" එතකොට දැන් මොකද කරන්න හදන්නෙ.."

" අම්මනම් එකම තීරණේක ඉන්නෙ ඩිවෝස් එක ගැන.. අපි බලමුකො.. ඔව්වා වෙනකල් ශුවර් කරන්න බෑ.. අප්පච්චි අපිට හදන්න බෑ කොහොමත්.. එයා වැරැද්ද තේරුම් ගන්නෙත් නෑ.."

" එතකොට රධ්‍ය අයියා.."

" ඒකතමා ප්‍රශ්නෙ චූටි.. එයා පොඩි කාලෙ ඉඳලම අපේ ප්‍රශ්න නිසා මාර විදියට අවුල් වෙලා ඉන්නෙ.. දැන් ගෙදර ඇවිත් මේවා දැනගත්තොත් පිස්සු හැදේවි.."

ආඪ්‍ය අයියා හැම වචනයක්ම කිව්වේ හරි දුකින්.. මට එයාගෙ වෙනස් වෙච්ච කටහඬින් එක හොඳටම තේරුණා..

" මොනවද අයියෙ මේ වෙන්නෙ.."

" බලන්න චූටි කරදර එන්නෙ එකපිට එක.. ඔයාටත් ගෙදර ප්‍රශ්නලු නේද.. මට අනූ කිව්වා.."

@Shan

" ඒකනම් එච්චර දෙයක් නෙමේ.. ඕවා මම නිතර අහගන්නවා.. දැන් එතකොට රඩිය අයියා ගෙදර එන දවසක් නැද්ද අයියෙ.."

" ආරංචියක් නැනෙ.. අප්පච්චි නම් දන්නවා.. එයා මාත් එක්ක කතාකරන්නෙ නෑ.."

" අප්පච්චි දන්නව නේද අයියගෙ අෆෙයා එක ගැන කලින් ඉඳලම.."

" චූටි කොහොමද දන්නෙ.."

" දවසක් අපි ගමෙ ඉද්දි අහන් හිටියනෙ වැරදීමකින්.."

මම හෙන ගොං හිනාවක් දාලා බෙල්ල කසාගත්තා..වැරදීමකින් නෙමෙ උවමනාවෙන්මයි අහගෙන හිටියෙ.. ඕව්ව කියලා පුළුවන්ද.. මම අනික සාක්ච්චා කියලා කොච්චර බැන්නද ආධ්‍ය අයියට.. පව්කාරයට සමාවෙන්න ඕන නොදැන කළ වරදට..

" ආ.. වීත්ත දෙකනෙ.. වැරදීමකින් නෙමේ.. අහගෙනම ඉන්න ඇති.."

" හරි ඉතින්.. කොහොමහරි වරද්ට ඇහිලනෙ.. බලන්නකො.. මට ඔයාලා දෙන්නගෙ ලව් එක ගැන කියන්නකො.. හොඳ සුදු ලස්සන ආධ්‍ය අයියෙ.."

ආධ්‍ය අයියා මං දිහා රවලා වගේ බැලුවා.. එයා එහෙම රවන්නෙ ඇත්තට නෙමේ.. අර සීනි බෝතලේ හොරෙන්කාපු පොඩි එකෙක් දිහා බලන්න වගේ රවලා බලන්නෙ..

" ඒක හෙන පරණ කාලෙ බෝරින් ස්ටෝරියක් චූටි.. එච්චර දේවල් ඇත්තෙ නෑ.."

" ආ අපි ඇන්ටික් බඩු වලට ආසයි.. ඔයා පණ්ඩිත වෙන්නැතුව කියන්නකො.. හපනවා හරිද..මස්සිනා කියලා බලන්නෙ නෑ.. මම හැපුවොත් තුවාල වෙනවා.."

මම මගේ කටේ උල් දත් දෙකයි අනිත් දත් සෙට් එකයි ආධ්‍ය අයියට පෙන්නුවහම ආධ්‍ය අයියා මගෙන් පොඩ්ඩක් එහාට වුණා..

" හපපුවා අපිත් දැකලා තියෙනවා.. බෙහෙතුත් දාලා තියෙනවා.. මම කියන්නම් ඔය කට වහගන්න චූටි.. බයත් හිතෙනවා.."

@Shan

" ඇයි මම වැම්පියෙක් වගේද.."

" පොඩ්ඩක් විතර.. ඒ වගේ තමා.."

මම අර රඩ්‍ය අයියා කරනවා වගේ ඇස් දෙක රෝල් කරගෙන ආයෙම බිත්තියට හේත්තු වුණා..

" මට අනුරාග් හම්බුනේ මම මෙඩිකල් කොලේජ් එකෙන් අවුට් වෙලා ආමි එකේ සිවිල් ඩොක්ටර් කෙනෙක් විදියට වැඩකරපු කාලෙ.. අප්පච්චි තමා ඒ කාලෙ ඒකට දාලා දුන්නෙ.. මුල්ම දවස්වල මම මොකුත්ම දන්නෙ නෑ හොස්පිටල් එක ගැන.. ඒක හෙන විසාලයිනෙ.. "

" කෝකද.. හොස්පිටල් එකද.."

" චූටි!!!"

" ඇයි ඇයි අනේ කෑගහන්නෙ.. හරි මම දැනගන්න ඇහුවෙ.. මොකද කෑගහන්නෙ.. දෙනවා දෙකක්.."

" අහගන්නකො.. ඉතින් දවසක් මාත් එක්ක වැඩකරපු යාළුවෙක්ගෙ දතක් පුරවන්න වෙලා අපි දෙන්නා ඩෙන්ටල් එකට ගියා.. අපිට ඒකෙන් ට්‍රීට්මන්ට්ස් ගන්න පුළුවන් එහෙම අවුලක් නෑ.. ඉතින් එදා යාළුවගෙ දත පිරෙව්වෙ ඔයාගෙ මාමා.."

"දතක් පුරවන්න ගිහින්ද යාළුවුනේ.. හයියෝ.."

" නෑ අනේ.. එදා ගියා විතරයි.. ඔයාගෙ මාමගෙ මාර ඕලුව තියෙන්නෙ.. හිනාවෙන්නෙවත් නෑ.. මෙහෙමයි හැබැයි මාස්ක් එකක් දාලා හිටියේ.. ඒ වුණාට පොඩ්ඩක් අනිත් ඩොක්ටර්ස්ලාවගේ හිනාවෙන්නවත් එපැයි.. එයා ඒ කාලෙ සීනියර් ඩොක්ටර් කෙනෙක්.. කොහොම හරි මමයි නදීරයි.. නදීර කියන්නෙ මගේ යාළුවා හොඳේ.. අපි එන්න ආවා.."

" ඊටපස්සෙ.."

" ඊටපස්සෙ ආයෙම නදීර දත පුරවලා කියලා ගානක් නැතුව ටොෆි වගයක් කාලා.. පුරවපු එක ඩැමේජ් වුණා.. ඉතින් ආයෙ පහුවදාත් ගියා ඩෙන්ටල් එකට මමයි යාළුවයි.. ඔයාගෙ මාමා නදීරට ඇඬෙන්න බැන්නා.. මහ පුදුම

@Shan

කටක් තියෙන්නෙ ඒ මනුස්සයගෙ.. ඊටපස්සෙ කොහොම හරි ආයෙම දත පුරවගෙන අපි ආවා හොඳේ.. එදා වැරදිලා මගේ පොතක් මම ඩෙන්ටල් එකේ දාලා ඇවිල්ලා.."

මම නියපොත්තක් කටේ ගහගත්තා.. හෙන ඉන්ටරෙස්ටින් ලව් ස්ටෝරියක්නෙ මේක..

" ආයෙම දවසක් මම ඕ පී ඩී එකේ බෙහෙත් දිදී ඉද්දි ඔයාලගෙ මාමා යුනිෆෝම් එකත් ඇඳගෙන කඩාගෙන බිඳගෙන මගේ රූම් එකට ආවා.. මම මූණ දැකලා තිබ්බට අඳුරගන්න පුලුවන් සුදු කෝට් එකයි ග්ලවුස් අරවා මේවා දාලා ඉද්දි විතරයි.. අරම තඩි බූට්ස් දාගෙන ඉද්දි මට එකසැරේ කවුද කියලා ඔලුවට ගියේ නෑ..

මම ඉතින් ඒක ගනන් ගන්නෙ නැතුව පේශන්ව බල බල හිටියා.. ඉවරවෙනකල්ම අනුරාග් දොර ළඟ හිටියෙ.. මම ගනන් ගත්තෙ නෑ.. ඩෙන්ටල් එකේ පාට් ඕපීඩී එකේ ඇවිත් දාන්න ඕන නෑනෙ.. මාත් පේශන්ගෙ නියපොත්තෙ ඉඳලා බලලා පැය බාගෙකින් විතර එයාව යැව්වෙ.. ඒ ඉවරවෙනකල්ම අනුරාග් දොර ගාව හිටියා.."

ආඪ්‍ය අයියා හෙන මනමාල හිනාවකුත් දාගෙන කියද්දි හොඳට හිටිය මටත් ලැජ්ජ හිතුණා.. මේක කොහෙද අනේ බෝරින්.. අපේ මාමත් යසයි.. ගෙදර පිස්සු කෙලියට එළියෙ ඉන්නෙ ඔලුවෙන් වෙන්න ඇති.. දැනගත්තු එක හොඳයි..

" ඊටපස්සෙ 'එක්ස්කියුස් මී ළමයා ඔයාගෙ පොතක් ඩෙන්ටල් එකේ දාලා ගිහින්' කියලා මට ඇවිත් මගේ පොත දීලා ගියා.."

" ඒකෙ අස්සෙ ලියුමක්වත් තිබ්බද අනේ.."

" මොන?? නෑ.. සිහියක් නෑ කියලා බැන්නා.. ලැජ්ජාවෙ බෑ චූටි.. අර නර්ස්ලා ඇටෙන්ඩන්ලා ඔක්කොම ඉස්සරහා මම බැනුම් ඇහුවෙ.. ආයෙම අපි හම්බුණේ නෑ කාලයක්.. ඔහොම ඉද්දි මාව ඕ පී ඩී එකෙන් වෝඩ් එකකට මාරු කළා.. ඒකෙ කන්සාල්ටන් හරිම සැරයි.. පොඩ්ඩ ඇත්නම් බනිනවා.. කෑගහනවා.. හොස්පිටල් එකේ ඇඩ්මිට් වෙලා හිටියෙත් සෝල්ජර්ස්ලනෙ.. මට බනිද්දි හරියට ලැජ්ජ හිතෙනවා.. මම කලින් බැනුම් අහලම නෑ ප්‍රොෆෙසර් කෙනෙක්ගෙන්වත්.."

@Shan

" ඔව් ඉතින් බැව් ටොප්නෙ.. නේත.."

" ම්ම්.. ඉතින් දවසක් කන්සාල්ටන් වෝඩ් එක මැද්දෙ මට බැන්නා මාර නරක විදියට.. මගේ වැරැද්ද නෙමෙ, නර්ස්ගෙ වැරැද්ද.. ඒත් බැනුම් ඇහුවෙ මම.. මට එදා ඇඬෙන්න ආවා.. කොහොම හරි කාගෙන පේශන්ලා ඉවරවෙනකල්ම බලලා මම වෝඩ් එකෙන් එළියට යද්දි අනුරාග් දොර ගාව හිටියේ.. මාව එයාගෙ ඇඟේ වැදිලා ස්ටෙත් එක බිම වැටුණා.. මම ලැජ්ජාවටම ඒක එහෙමම දාලා රෙස්ට් රූම් එකට ඇවිත් හොඳටම ඇඩුවා.. ඒකම නෙමෙ අඩන්න හේතුව.. ඒ කාලෙ ගෙදරත් ප්‍රශ්න ගොඩක් තිබ්බ කාලයක්.. ඉතින් මම ඇත්තටම හිටියෙ මාර දුකින්.. ටිකකින් නර්ස් කෙනෙක් ඇවිත් කිව්වා මාව හම්බෙන්න ඩොක්ට දේව් ඇවිල්ලා ඉන්නවා.. එළියට එන්න කියලා..

මම දන්න දේව් කෙනෙක් නෑ ඒ කාලෙ.. තියා අනුරාග්ගෙ නමවත් දන්නෙ නෑ.. මට අනුරාග්ව පේන්න බෑ.. මහ එපාම කරපු ඩොක්ටර්ස්ලගෙ ලිස්ට් එකේ දෙකට හිටියේ ඔය මනුස්සයා.. එකට අර කන්සාල්ටන්.. එදා ඇවිත් මට ස්ටෙත් එක දීලා ප්‍රශ්නයක්ද ඇහුවා..

මම නෑ කියලා කිව්වා.. ඊටපස්සෙ ලන්ච් ගන්න කතාකලා.. මම බෑ කිව්වහම එයා ගියා.. ගිහින් නදීර අතේ කෑම එකක් එවලා තිබ්බා අර ළමයා එක්ක කන්න කියලා.."

" ළමයා කියලද අයියට කතාකලේ අපේ මාමා.."

" ඔව් තාම හැම එකටම ළමයා ළමයා.. මම නිකම් දෙකවසරෙ පොඩ් එකෙක් ගානට දාලා කතාකරන්නෙ.."

" අයියත් ඉතින් එක එක ඒවා හැමතැනම දාලා එනවනෙ.."

" හිතලයැ කලේ.. ඔයත් ඔයාගෙ මාමා වගේ තමා.. එහෙම වෙන්න එපැයි ඉතින්.. අහන්නකො.."

" ඕ කියන්න කියන්න.."

" ඉතින් මම පහුවදා අනුරාග්ව හම්බුණාම කෑම එකට තැන්ක් කලා.. මෙ මනුස්සය මට වෙල්කම් කියලවත් කිව්වෙ නෑ චූටි.. අඩුම තරමෙ මම තැන්ක් කරපු එක ඇහුණෙවත් නෑ වගේ ගියා.. නදීර කිව්වා ආයෙම නම්

@Shan

මලත් ඔය මනුස්සයා දෙන වතුර උගුරක්වත් බොන්නෙ නෑ කියලා.. මාත් එහෙම හිතුවා.. හිතලා ආයෙම කතාකලේ නෑ.. සති දෙක තුනක්ම මූණට හම්බුණත් මම හිනාවුණේවත් නෑ.. ඕන්නෑනෙ එහෙම.."

" ඒකතමා.. ඕන්නෑ එහෙමනම්.."

" ඔහොම ඉද්දි මට පොඩ්ඩක් විතර අනුරාග් ගැන කැමැත්තක් වගේ එකක් ඇතිවුණා.. මම කලින් කැමැත්තෙන් පහ හයක්ම හිටියා.. ඔක්කොම ගෑණුළමයි.. කැම්පස් එකේ.. ඉස්කෝලෙ යන කාලෙත් කැමැත්තෙන් හිටියා එක්කෙනෙක්ට.. ඕවා හිතේ විතරයි තිබ්බෙ.. මට කම්මැලි කෙල්ලො එක්ක කතා කර කර ඉන්න.. පස්සෙන් යන්න.. මහන්සි වෙන්න.. මම හරි බෝරින් චරිතයක් චූටි.. ඔයාගෙ එක්කෙනා වගේ නෙමෙ.."

" එහෙම නෑ අනේ.. ඔයා ශෝක්.. ඒකනෙ අපේ මාමා සාකිච්චට කැමති වුණේ.."

ආඩ්‍ය අයියගෙ කම්මුල් දෙක රතුම රතුපාට වුණා මම බලාගෙන ඉද්දිම..

" ඊටපස්සෙ මම අනුරාග්ව හැමදාම උදේට දකින්න ඩෙන්ටල් එක පැත්තෙ යනවා.. නදීර ඕක දැනගෙන හිටියෙ.. එයා තමා මගේ සපෝටර් වගේ.. ඩොක්ටර් දේව් ගැන හොයලා දෙන්න කිව්වහම ඒකා සේරම විස්තර මට හොයලා කිව්වා.. කියලා සපෝටුත් කලා.. අනුරාග් කාලයක් යද්දි මාව උදේට හම්බුණාම හිනාවෙන්න ගත්තා.. ලාවට වගේ.. මමත් හිනාවෙනවා.. ඉඳලා හිටලා ගුඩ්මෝනින් කියනවා.. තේ බොන්න කැන්ටින් එකට යනවා.. අනුරාග්ට කැම්ප් එකේ එච්චර යාළුවො නෑ.. එයා එහෙම කතාකරන්නෙත් නෑ කා එක්කවත්.. හැබැයි ටික කාලෙකින් මාත් එක්ක හුඟක් ළඟින් කතාකලා.. පස්සෙ අපි ලන්ච් ගත්තෙත් එකට.. එයා යුද්ධෙ කාලෙ එයා මූනදුන්නු දේවල්, පවුල ගැන, ඕවා මාත් එක්ක කතාකලා.. මම අහගෙන ඉන්නවා.. එයා තමයි හුඟක් කතාකරන්නෙ.. මම අහගෙන ඉන්නවා..

දවසක් එයා එයාගෙ ලව්ස්ටෝරි එක ගැන කිව්වා. කැම්පස් යන කාලෙ ඉඳපු කෙල්ලෙක් ගැන..කතාවෙන් තේරුණේ අනුරාග් හරි ආදරෙයි කියලා ඒ කෙල්ලට.. කියද්දි සමහර වෙලාවට ඇස්වල කඳුළු පිරෙනවා.. මම අහගෙන හිටියා.. ඒ කෙල්ල වෙන කොල්ලෙක්ව බැන්දලු පස්සෙ.. අනුරාග් වෙඩින් එකටත් ගියාලු.. මට ඉරිසියයිත් එක්ක.. ඒත් දුක හිතුණා.. මම දවසක් ඒ

@Shan

කෙල්ලට බැන්නහම අනුරාග් මට හිනාවුණා.. මම කතාකරන්නෙ ඉරිසියා හිතිච්ච කෙල්ලෙක් වගේ කියලා..

මට එදා ඒකට කෙන්ති ගිහින් එයා එක්ක කතානොකර එන්න ආවා.. හවස අනුරාග් මගේ වෝඩ් එකට ඇවිත් මාව හම්බෙන්න හුඟක් වෙලා එළියේ හිටියා.. මම දැක්කෙ නෑ වගේ ඇතුළට වෙලා හිටියා.. අනේ මන්දා.. මම කලින් මෙච්චර ආදරේ කරන කෙනෙක්ට ලං වෙලා නැනෙ.. හිතට හරි අමුතුයි.. ඒ කාලෙ අනුරාග් මට පිස්සුවක් වෙලා තිබ්බෙ.. එයාගෙ වචනයක් ඇහුවත් මට මාර විදියට සතුටු හිතෙනවා.. දැක්කත් හිතට මොකක්දෝ වගේ.. ගෙදරින් ප්‍රශ්න වෙලා වෙලා අන්තිමෙ මට සතුටක් දැනෙන තැන වුණේ අනුරාග්.. එයාටත් ඒක තේරිලා මාත් එක්ක හුඟක් ළඟින් කතාකලා.. ඒත් අර දරුවෙක්ට වගේ සලකන එකට මම ආස නෑ..

ඔහොම ඉද්දි දවසක් අනුරාග් මට කතාකලා එයාට දෙයක් කියන්න තියෙනවා නිදහසේ කතාකරමුද කියලා.. මම හා කිව්වා.. ඒ කාලෙනම් අපි දෙන්නා හුඟක්ම ළඟ යාලුවො වගේ හිටියේ.. අනුරාග් නිතර මට කතාකල්ලා කෑවද, බෙහෙත් බිව්වද අහනවා.. මට හයිපොග්ලයිසීමියා කියලා දැනගත්තම එයා එක එක ස්වීට්ස් ජාති ගෙනත් දෙන්නත් ගත්තා.. දවසක් එකපාරට මගේ නලලට කිස් එකකුත් දුන්නා.. මම හයිස්කූල් ලවර් වගේ.. අනේ මන්දා.. මතක් වෙද්දිත් ලැජ්ජයි දැන්නම්..

එදා අපි ගියා ඩිනර් එකට.. ගිහින් කතාකලා.. එයාට එයාගෙ පරණ මතක වලින් නිදහස් වෙන්න ඕන කිව්වා.. එයාගෙ හිතේ කෙනෙක් ගැන තදටම කැමැත්තකුත් තියෙනවා කිව්වා.. මගෙන් ඇහුවම මොකද කරන්න ඕන කියලා.. මම කිව්වා කෙලින්ම කියන්න කියලා.. ඒ කියලා විනාඩි දහයක්වත් යන්න වුණේ නෑ අනුරාග් මට ප්‍රපෝස් කලා.. ඔයා හිතන්න චූටි.. මගෙ සීනිත් බැස්සා එදානම්.. එකපාර මෙලෝ ලැස්තියක් නැතුව කිව්වා මම ඔයාට කැමතියි සාකි.. යාළුවෙක් වගේ නෙමෙ.. එයාගෙ හිතේ මං ගැන ඊට එහාට දෙයක් තියෙනවා කියලා.."

ආධ්‍ය අයියා හැමදේම මතක් කර කර මට කියද්දි මට තේරුණා.. එයා ඒවා කියන්නෙ වෙනමම ලෝකෙක ඉඳගෙන.. හරියට ඉස්සර කාලෙක වෙච්ච සුරංගනා කතාවක් ලමයෙක්ට කියලා දෙනවා වගේ.. ආධ්‍ය අයියා හරි පොඩි ලෝකයක් හිත අස්සෙ තියාගෙන ජීවත් වෙන අමුතු කෙනෙක්.. හරි අහිංසකයි.. එයා වෙලාවකට හොඳ වැඩියි.. අපේ මාමා අයියට ආදරේ වෙන්න හේතුව ඒක වෙන්නැති..

@Shan

" ඊටපස්සෙ.."

" ඊටපස්සෙ අපි හුඟක් සතුටින් හිටියා.. මම අන්තිමට සතුටින් හිටියෙ ඒ කාලෙ.. අපි කොච්චරවත් කියවනවා.. නෑ නෑ.. එයා තමා කියවන්නෙ.. මම අහගෙන ඉන්නවා.. මට විහිළු කරනවා හැමතිස්සෙම.. ඒත් මාව පරිස්සමට බලාගත්තා.. අනුරාග් හරි හොඳයි චූටි.. එයා මං නිසා කොච්චර දේවල් ඉවසුවද.. ඒ කාලෙ ඔයා ගැනත් කියනවා.."

" ඒ මොනවද ඒ.."

" එයාට ඉන්නවලු ලස්සන පොඩි කොල්ලෙක්.. දහම දහලු.. අනුරාග්ගෙ දරුවෙක් වගේමලු.. චූටි හරි ලකී එයා වගේ කෙනෙක් ජීවිතේට ලැබෙන්න.. ඔයාට හරි ආදරෙයි.. නිතර කියනවා මතක් කරනවා.."

" ඊටපස්සෙ මොකද වුණේ.."

ආඩ්‍ය අයියා එකසැරේ කල්පනාවකට වැටුණා. එයාගෙ මූණෙ තිබ්බ හිනාවත් අඩු වුණා මම දැක්කා..

" ඊටපස්සෙ වෙන්න ඕන නරකම දේ වුනා.. අපේ අප්පච්චි දැනගත්තා අනුරාග් ගැන.. මගෙන් ඇහුවම මම කෙලින්ම කිව්වා ඒ මම ආදරේ කරන කෙනා කියලා.. එදා හොස්පිටල් එකේ ලොකු ප්‍රශ්නයක් වුණා.. අප්පච්චි අනූ එක්ක රන්ඩු කලා.. කනටත් ගැහුවා.. අනුරාග් මම නිසා සේරම දේවල් ඉවසන් හිටියා චූටි.. අප්පච්චිට මොකුත් කිව්වෙ නෑ.. අන්තිමට මට අකමැත්තෙන්ම එයාව අයින් කරන්න වුනා ගෙදරට පේන්න.. අප්පච්චි එච්චර හොඳ කෙනෙක් නෙමේ.. හිතුනොත් එයාට මනුස්සයෙක් මරන්න වුණත් පුලුවන්.. යුද්ධෙ කාලෙ එක එක දේවල් වලට මූණ දීලා අප්පච්චි යකෙක් වගේ.. එයාගෙ අතින් ඕන තරම් මිනිස්සු මැරිලා ඇති.. මට හරියට බය හිතුනා.. ඒත් අනුරාග් මාත් එක්ක කතාකලා.. මගේ ග්‍රැජුවේශන් එකටත් එයා ආවා.. ඒකෙන් පස්සෙ මට ජෙනරල් හොස්පිටල් එකේ පත්වීම ආවා.. නාරාහෙන්පිටින් මම අස් වුණා.. අනුරාග් මාව මඟාරින්න ගත්තා.. මට ඒක මුල ඉඳන් දැනුනා.. එහෙම වෙන එක සාධාරනයි.. එයාට හොස්පිටල් එකේ ලැජ්ජ වුණානෙ එදා සිද්ධියෙන්..

අන්තිමට මාසෙකින් අනුරාග්ට ට්‍රාන්ස්ෆර් ආවා.. එයා නොකියම ගියා.. නදීර අතේ මට ලියුමක් තියලා තිබ්බා හැමදාම සතුටින් ඉන්න.. එයා ගැන හොයන්න එපා.. ජීවිතේ හදාගන්න කියලා.. එයත් හැමදේම අමතක කරන

@Shan

උත්සාහ කරනවා කියලා.. එදායින් පස්සෙ ඔයා හම්බෙනකල් මම සතුටින් හිටිය දවසක් මට මතක නෑ..

එයා ගිහින් ටික කාලෙකින් මට ස්ට්‍රෙස් වැඩි වෙලා ඩිප්‍රෙශන් හැදුනා.. අම්මා පලාලි ගියා.. අප්පච්චිත් පලාලි ගියා.. මම පොඩී එක්ක ගෙදර තනිවුණා.. මම ඒ සේරමත් බලාගෙන පොඩීටත් ඉගැන්නුවා.. අවුරුදු විසිහතෙන් මම විඳින්න ඕන තරමට වඩා දුක් වින්දා.. ඕනතරම් නිදි නැතුව ඉඳලා ඇති.. චූටි.. ඒ කාලෙ මම හිටියේ මැරි මැරි.. කියන්න කවුරුත් නෑ.. නදීර ඩෙන්මාර්ක් ගියා මැරි කල්ලා.. යාළුවත් නැතිවුණා.. මම මේ හොඳට ඉන්නවා.. ඊටපස්සෙ වැටෙන වැටෙන තැන අඬනවා.. පස්සෙ මටම තේරුණා මගේ මොකක් හරි අවුලක් තියෙනවා කියලා.. එහෙම ගිහින් කවුන්සිලර් කෙනෙක් මීට් වුණා.. සයිකැට්‍රිස්ට්ලා මීට් වුනා.. මටම ලොකු උවමනාවක් තිබ්බා මාවම හොඳ කරගන්න.. ඒකනිසා අමාරුවෙන් බෙහෙත් බීලා හොස්පිට්ල් යනවා.. හොඳින් ඉන්නෙ කියලා පෙන්නන්න ට්‍රයි කලා.. පොඩීට මේව කියන්න බැනෙ චූටි.. අදටත් මේවා දන්නෙ ඔයා විතරයි.. පොඩී දන්නෙ නෑ.. දැනගත්තනම් එයත් දුක් වෙනවා..

කොහොම හරි අවුරුදු දෙකක් විතර ගියාම මම හොඳ අතට හැරුණා.. සම්පූර්ණෙන් නෙමේ.. සාමන්යෙන් අවුලක් නෑ.. මම අනුරාග්ව පැත්තකට කල්ලා ජීවත් වෙන්න හුරුවුණා.. ඔය කාලෙ අපේ පොඩී ගෙදර ඇවිත් කොල්ලෙක් ගැන කියවන්න ගත්තා.. එයාට පෙන්නන්න බැරිලු.. ගහන්න හිතෙනවලු.. නැටිල්ල වැඩිලු.. ප්‍රිෆෙක්ට් ඩියුටි කරන්න දෙන්නෙ නැහැලු.. දවසක් මඩ නාගෙන ගෙදර ආවා.. ඒ කොල්ලා මෙයාව මඩ ගොඩකට තල්ලු කල්ලා.. ගෙදර ඇවිත් ඇඩුවත් එක්ක.. හෙන පොඩියිනෙ.. කොට කලිසම් කාලෙ.. අපෝ ඊටපස්සෙ මම කලේම එයාගෙ නඩු අහන එක තමා.. මට හිතුණා ඉතින්.. පොඩී හැරෙන්නෙ මොකටද කියලා.."

මම කොට්ටෙ ඇස් දෙක ගාවටම කරගෙන ඇස් පිල්ලම් දෙක තුනක් ගැහුවා.. සැක් තල්ලු කලා කියලා අඩලත් එක්කද.. මේකයි ඉතින් ඇහේ වැදිලනෙ වැටුනෙ.. මාත් වැටුනෙ ඒ මඩ වලටමනෙ.. පෙනේද මේ පොල් කාවයියා මම තල්ලු කලා කියලා.. ආපු දෙන්කො කොණ්ඩෙ ගලවනවා කෙස් ගහෙන් ගහ.. කියන බොරු වලට..

" තල්ලු කලේ නෑ අයියෙ.. බොරු ඒකා කියලා තියෙන්නෙ.. හැමදාම මම කොටයි කියලා එසෙම්බ්ලි එකේ ඉස්සරහට දානවා.. එදා යන්න බෑ

@Shan

කිච්චහම පොඩි යමකිසි දෙයක් වෙලා ගහගත්තෙ.. කොහොම වුනත් රධ්‍ය අයියට වටින්නෑ පස්ස දික් කරන් ඇවිත් මාව ඉස්සරහට දාන්න එහෙම.."

" දැක්කනෙ ඔය.. මම තාම නඩු අහනවා.."

ආධ්‍ය අයියා හයියෙන් හිනාවුනාම මම ලාවට හිනවුණා..

" එතකොට ආයෙම කොහොමද සාකිච්චා අනුකිච්චව දාගත්තෙ.. ඒකට වරද් සනෙරු සම්බන්ධයි නේද.."

" අම්මෝ ඔව්.. එදා ට්‍රිප් එක ඉය දවසෙ මම ඔයාගෙ ෆෝන් එකට කෝල් එකක් එනවා දැක්කා මාමා කියලා නම්බර් එකකින්.. වට්සැප් එකේ ප්‍රොෆයිල් පික්චර් එක දැක්කගමන් මාව නිකන් කරකලා අතැරියා වගේ.. ඔයා කියන්නෙ චූටි මම හිතුවෙ හීනයක් කියලා.. කොහොම හරි මම නම්බර් එක ගත්තා ෆෝන් එකෙන්.."

" ආ හරි හරි.. එතකොට රිසෝට් එකේ හොල්මන අයියා.. නේ.. සැක් අයියේ.. මම බයත්වුණා එදානම්.."

ආධ්‍ය අයියා කොට්ටෙ බදාගෙන ලාවට හිනාවුණා..

" ඔව් එදා මම හොරෙන් ෆෝන් එක ගන්න ආවා ඔයාලගෙ කාමරේට.. තා ඩිංගෙන් අයුක මල්ලිගෙ ෆෝන් එක උස්සගෙන එන්නෙ.. මම එද්දි ඔයාලා හතරදෙනා හොඳට නිදි..

මම ෆෝන් එකෙන් නම්බර් එක ගන්න ගිහින් වැරදිලා අනුරාග්ට කෝල් එකක් යැවුණා.. ඩිලීට් කරන්න වුණේ නෑ ඔයා ඇහැරුණානෙ..මම බැල්කනියට පැනගත්තා.. මෙකා ඇවිත් මාව බැල්කනියට දාලා දොර වහලා ගියානෙ.."

මම හෙන හයියෙන් කොට්ටෙත් හපාගෙන හිනාවුණා.. යකෝ!! එදා මම අයියව බැල්කනියට දාලා දොර වහලත් ගිහිල්ලද.. සෝක් වැඩෙ..

" ඊට පස්සෙ මම බැල්කනියෙ දොර අමාරුවෙන් ඇරගෙන එන්න යද්දිම අපේ එකාත් ඇහරුණා.. මම ඉක්මනට පහළට දුවලා ෆෝන් එක සෝෆා එකට දාලා කාමරේට දිව්වා.."

@Shan

"ආ එදා අනුකිච්චා රිසෝට් එකට ආවනෙ.. නේද.. ඔව් නේ.."

ආධ්‍ය අයියා පුදුම වෙලා වගේ මං දිහා ඇස් දෙකත් ලොකු කරගෙන බලාගෙන හිටියා..

"  ඔයාල කොහොමද චූටි මේවා දන්නෙ ඔක්කොම.. බලන් ඉදලා වගේ.. යකෝ!! මෙ චිත්ත දෙක හම ගහන්න එපැයි.."

" අපි මොකුත් කලේ නෑ හරිද.. ඔය දෙදාහට කලින් අයට මොලේ නෑ අපිට වගේ.. ඒකයි.."

" අනේ හා.. ඒකතමා.."

" දැන් ඇයි එදා ආවෙ කාමරේට.."

" මගේ අතින් ෆෝන් එක රීසෙට් වෙලා නම්බර් එක ඩිලීට් වුණානෙ අනූගෙ.. ඒක ගන්න අවෙ.. එයාට රිසොට් එක තියන තැන කියන්න.."

" එතකොට වීදුරුව පොලොවෙ ගැහුවෙ අපේ මාමද, අයියද.."

" ඒක පොළොවෙ ගැහුවෙ මම.. අනේ ඇත්තමයි චූටි තා ඩිංගෙන් ඔයාලා දෙන්නා බැල්කනියෙ ඉදන් කරපු වැඩේ අනුරාග් දකිනවා.. ඔයාලා යවාගන්න මම අර ලස්සන මල් පෝච්චියත් බින්දා.."

සැක් එහෙමත් එකක් වෙලාද.. හරි ඉතින් කවුද දන්නෙ.. සෙනුකයත් අයුක අයියා එක්ක බැල්කනියට වෙලා ඉන්නෙ ඕනතරම්.. අපි හිටියොත් තමා.. ඔක්කොම පොල්කිච්චො පියාඹලා එන්නෙ..

" හරි ඉතින්.. ඔහොම කියන්නෙපා.. කවුද දන්නෙ මහ රට අනුකිච්චා පියාඹලා ඇවිත් කියලා.."

මම ඇස් දෙක යටින් ආධ්‍ය අයියා දිහා බැලුවහම ආධ්‍ය අයියා උඩ බලාගත්තා.. දැන් නෙ තේරෙන්නෙ බෙඩ්සීට් මාරුකල්ලා පහුවදා කොර ගැහුව හේතුව.. මෙච්චා කියන්න පුලුවනැයි මේ අයියට.. මගේ සහකාර හැපිකවචා ඉක්මනට ආවොත් හොඳයි.. ඔක්කොම ටික කියලා හිත නිදහස් කරගන්න ඕන.. මාව පිපිරිලා යන්න වගේ දැන්නම්.. රධ්‍ය අයියේ!!!!!!!!!!!!!!!!

@Shan

" ඊටපස්සෙ මොකද වුණේ.."

" ඊටපස්සෙ රණ්ඩු වුණා.. එයා හිත හදාගෙන ඉවරයි, මොනවද වැල් බයිලා වගයක් කිව්වා.. මම ඕවා ඇහුවෙ නෑ.. ඒ මනුස්සයා හිතන් ඉන්නෙ මම දෙකවසරෙ පොඩි එකෙක් කියලනෙ.. ඔහොම රණ්ඩු වෙලා අන්තිමට කොළඹ ගියා.. ආයෙ දවසක් රෑ අන්තිමට හම්බෙන්න එන්න කියලා අනුරාග් කිව්වා.. අන්තිමට හම්බෙන්න ගිහින් අපි රණ්ඩු වුණා.. හුඟක් රණ්ඩු වුණා.. අන්තිමට මම ඇඩුවා.. මටත් ඉවසන්න පුලුවන් තරමක් තියනවනෙ.. එයත් හුඟක් ඇඩුවා.. මට එදානම් ජීවිතේ එපාවුණා.. මම කේන්ති ගිහින් කාර් එකේ තිබ්බ ග්ලාස් ප්ලාස්ක් එකක් අරගෙන ඒකෙන් අනුරාග්ට දමලා ගැහුවා.. ඒක වැදුනෙ නෑ එහාපැත්තෙ තිබ්බ කණුවකට වැදුනෙ.. ඒක කුඩු වුණා.. පස්සෙ වීදුරු කැල්ලක් අරන් ගිහින් ඒ මෝඩ මනුස්සයට ඇන්නා.. මගේ අතත් කැපුණා.. අන්තිමට මමම බෙහෙත් දාලා එයාව ගෙදර යැව්වා.. එතනින් ප්‍රශ්න ඉවරයි ඉතින්.. දැන් ආයෙම කතාකරනවා.."

අන්තිම ටික ආඪ්‍ය අයියා කියද්දි මට හිනායන්න ආවා.. යකෝ!! මේකා සුරදූතයෙක් නෙමෙ යමපල්ලෙක්නෙ.. එහෙම බෑ කිව්වහම වීදුරුකටු වලින් අනිනවද..

" දෙකවසරෙම තමා අයියනම්.. මම ඒත් බැලුවා මොකද අපේ මාමා පපුව බැන්ඩේජ් කරන් ගෙදර ආවෙ කියලා.."

" එකසැරේට මට කන්ට්‍රෝන් නැතුව ගියා චූටි.. මම මෙච්චර බලන් හිටියෙ ඕව අහන්නද.."

" ඒකතමා ඒකතමා.. ඇත්ත.. කට්ටෙන් ඇනලා හරි යාළුවුනානෙ.."

" ඒකනෙ.. මොකද ඔයා හිනාවෙන්නෙ.."

ආඪ්‍ය අයියා මට කොට්ටෙකින් මූණ මැද්දට දමලා ඇරියා..

" හිනාවෙන්නෑ අනේ.. පිස්සුද.. දැන් ඉතින් ඔය ඉන්නෙ කපල් එක ආදරෙන් වෙළිලා ගැලිලා.. එහෙනම් එච්චරයි.."

මම අර මූණට දමලා ඇරිය කොට්ටෙ උස්සන් ගිහින් ආඪ්‍ය අයියගෙ උකුළ උඩින් තියලා ඒකෙන් ඔලුව තියාගත්තා.. ආඪ්‍ය අයියා මගේ කොණ්ඩෙ

@Shan

ඇවිස්සුවා.. තෙත ගතිය යන්න..

" චූටි එක්ක කතාකලාම හරියට හුඟ කාලෙක ඉඳන් අඳුරන කෙනෙක් එක්ක කතාකරනවා වගේ දැනෙන්නෙ.. අපේ අම්මා ඇවිත් කිව්වා.. චූටි දැක්කහම උස්සන් එන්න හිතුණලු.."

" අම්මා හරිම හොඳයි.. අම්මා මාත් එක්ක කතාවක් කියනවා කිව්වා ආයෙම හම්බුණාම.."

" එහෙමද.."

" ඔව්.. අම්මත් අයියා වගේ.. ඉක්මනට මෙ ප්‍රශ්න විසඳුනානම් නේද.."

" අනේ මන්දා චූටි.. දැන් ඉන්නෙත් කීයක් ප්‍රශ්න මැද්දෙද.. මට බයයි මට වුණු දේම ඔයාලට වෙයිදෝ කියලා.."

" එහෙම වෙන එකක් නෑ.."

" එහෙම වෙන්න ඔනෙත් නෑ.. පොඩීට පිස්සු හැදෙයි චූටි.. ඔයා දැකලා නෑ එයාට කේන්ති ගියාම.. මටත් බයයි ළඟට යන්න.. පොඩි මුරණ්ඩු කොල්ලෙක්නෙ.. අප්පච්චි පොඩි කාලෙ එහෙම එයාට ඇවිත් සාලෙ මැද්දෙන් දණ ගහන්න කියලා බෙල්ට් එකෙන් ගහනවා දිගට හරහට.. මෙකා නෙමෙයි රිදෙනවා කියලවත් කියන්නෙ.. අත් දෙක මිට් කරගෙන කාගෙනම ඉන්නවා.. අඬන්නෙවත් නෑ.. යකෙක්ම තමයි.. මටනම් බලාගෙන ඉන්න බෑ ඒ පාරවල්.."

" අප්පච්චි කවදාහරි මෙවා ගෙවාවි අයියෙ.. රඩ්‍ය අයියා එයාගෙ ප්‍රශ්න කීයක් හංගගෙනද මාත් එක්ක මගේ ප්‍රශ්න වලට මූන දුන්නෙ.. මමනම් හිතන්නෙ නෑ එයා වගේ කෙනෙක් වෙන කොහේවත් ඇති කියලා.."

" ඔයාලා සතුටින් ඉන්න ඕන.. මම කොහේ හිටියත් බලාගෙන ඉන්නවා.."

අඩ්‍ය අයියා මගේ කොණ්ඩෙ අතගාන ගමන් ඇස් දෙකපියාගෙන කියවද්දි මම දැක්කා එයාගෙ ඇස් අග්ගිස්සෙන් කඳිළි බිංදුවක් පේන නොපනෙන ගනට කොට්ටෙට වැටිලා මැකිලා යනවා..

මිහිරාව ආවා අනේ.. එන්න එන්න..

@Shan

පෞකාරිට මේ කතාවෙ චරිත ආරූඪ කරගෙන පිස්සු වගේ හැදිලා මොලේට ලියන්න මොකුත් ආවෙ නෑ වගේ එකක් වුණානෙ.. සමාව දෙන්න.. ආයෙම එහෙම වෙන්නෙ නෑ.. පොඩි බ්‍රේක් එකක් නැතුව දිගට කතාව ලිව්වම පිස්සු හැදෙනවා.. ඉම්හි ඉම්හි

එන්නාම්.. ලව් යූ.. ❤

වරද්

රධ්‍ය

ආධ්‍ය

අනුරාග්

අයුක

සෙනුක

ආශි

කියාන්

@Shan

මහීශා

අප්පච්චි

😂😂

ප.ලි.

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 111 කොටස

" ෂනෙරුවා.. උඹට කෝල් එකක් බං.. මේ ඇවිත් බලපන්කො.. මම වැඩක්.."

" කවුද බලපන්.."

" දන්නෑ ආ මේ මෙහේ කෝල් කෝඩ් එකක් නෙමේ.. ඇවිත් බලපන් ඔය බළලව අතෑරලා.."

" මොකක්ද කෝඩ් එක.. සික්ස් වන් ද.. උඹේ අයුක අයියා වෙන්නැති.."

" නෑ පගො ඩබල් ෆෝ.."

මම බිමට පාත් වෙලා බඩ අත ගගා හිටිය ඉස්කෝලෙ පොල්සම්බෝල පූසව අතෑරලා සෙනුකයා ළඟ තිබ්බ ෆෝන් එක ආන්සර් කරන්න ගියා.. ඌයි මමයි හිටියෙ ප්‍රැක්ටිස් රූම් එකේ.. උදේ පීරියඩ් වල උගන්නනවා ඉස්කෝලෙ කිසිම සද්දයක් නෑ.. මට කරන්න තරම් වැඩකුත් තිබ්බෙ නෑ.. සෙනුකයා නම් බිග්මැච් එක නිසා බිසී.. මා ගිහින් අඳුරන්නැති කෝල් එක ආන්සර් කල්ලා කනේ තියාගත්තා.. දනෙත් නෑ මේවගෙ රටවල් මොනවද කියලා..

" හලෝ.. ෂනෙරු පුතා..??"

මම ටිකක් වෙලා කටහඬ අඳුරගන්න බැරුව මොලේ ගැටගහගෙන මෙලෝ සද්දයක් නැතුව හිටියා.. පත්තුවෙන්න හදනවා.. හදනවා.. මේ කතාකරන්නෙ.. දෙයියනේ..

" අම්මා..!!"

" ආ මාව අඳුරගත්තා නේද.."

සෙනුකයා මගෙන් කවුද ඇහුවම මම රධ්‍ය අයියගෙ අම්මා කියලා රූම් එකේ කොනේ පුටුවකින් ඉඳගත්තා..

@Shan

" මට මතකයිනෙ කටහඬ.. ඒත් මේ වෙලේ කතාකරයි කියලා හිතුවෙ නෑ.. අම්මට කොහොමද.."

" අම්මා හොඳින් ඉන්නවා.. පුතා කොහෙද ඉන්නෙ.."

" මම ඉස්කෝලෙ ඉන්නෙ අම්මා.. තාම උදේනෙ.."

" ආ ඔවනෙ.. අයියෝ මට අමතක වුණා.. මම එහෙනම් පස්සෙ කතාකරන්නද.."

" එපා එපා.. මම මොකුත් වැඩක නෙමෙ ඉන්නෙ.. අම්මා කතාකරන්න.."

" කමක් නෑ නේද.. මේ දවස්වල මොනවද වැඩ.."

" ම්ම්.. ඉන්න බලන්න.. මේ දවස්වල අපේ බැට්ල් එක තියෙනවා.. ඒකට රෙඩි වෙනවා.. එතකොට තව ඉතින් ප්‍රැක්ටිස් යනවා.. ආ මම අර අම්මට එදා කිව්වෙ මැච් එකක් ගැන.. ඒකෙන් අපේ ක්ලබ් එක වින් කලා.. මරු නේද.."

අම්මා හිනාවෙනවා මට ඇහුණා.. ඒ ඇහෙද්දි අම්මා හිනාවෙන හැටි මට මැවිලා පේනවා..

" හොඳයිනෙ.. හරිම සතුටුයි.."

" අම්මා මොකද කරන්නෙ..??"

" මම.. පාඩම් කරනවා.. පොත් කියවනවා.. ඇවිදිනවා.. එතකොට.. ආ.. ෂොපින් කරන්න ගියා.."

" වෝහ්.. අම්මා ආද්‍ය අයියා වගේමයි.. එයත් ඔය වගේ පොත්ම කියවනවා ඉවරයක් නැතුව.. අම්ම දන්නවද අයියා නවල් එකක් කියවන්න පටන්ගත්තා the notebook කියලා.. ඒකෙ නෝවා ලෝක යුද්ධෙට ගියා ගියාමයි එතනින් එහාට පොත හොයාගන්නත් නෑ.."

" එහෙමද.. ආද්‍යට සබ්ජෙක්ට් එක ඇරෙන්න වෙන පොත් අල්ලන්නෙ නැනෙ.. හියුමන් ඇනටොමි වගේ පොතක් හම්බුණානම් ඉවරවෙනකල්ම කියවයි.."

@Shan

" ඔව් ඔව් ඒකනම් ඇත්ත.. ඒවුණාට රධ්‍ය අයියා එහෙම නෑනෙ.."

" එහෙම නැද්ද.."

අම්මා ආයෙම හිනාවුණාම මම මූණ ඇද කරගත්තා.. ආධ්‍ය අයියටයි අම්මටයි හිනාවෙන පිස්සුවක් ගහලා හැමතිස්සෙම හිනාවෙනවා.. රධ්‍ය අයියා වගේ බුම්මන් ඉන්න බැරිද දන්නෙනෑ..

" නෑ.. එයා ගොඩාක් නවල්ස් කියවනවා.. පාඩම් කරන පොත් වලටත් වඩා.."

" ඒක හොඳයි.. ඒ දෙන්නම එකවගේ වුණානම් බෝරින් වෙනවනෙ.. නේද.. ඔයා කැමතිද රධ්‍යත් ආධ්‍ය වගේ කණ්ණාඩි දෙකක් දාගෙන පුටුවක් උඩට වෙලා දවසෙම පොත්ම කියවනවට.."

මම කල්පනා කලා.. එහෙම ඒ මනුස්සයට එකතැනක ඉන්න බැනෙ.. කඩ්කුලපුව වගේ ලෙඩක් තියෙනවනෙ.. අන්න හැබැයි අපේ පවුලෙම ඉන්නවා එහෙම එක්කෙනෙක්ට කැමති එක්කෙනෙක්.. අපේ අනුරාග් මාමණ්ඩිට හිත ගිහින් තියෙන්නෙක් කණ්නාඩි දාන පොත් ගුල්ලෙක්ටනෙ..

" එපා එපා.. ඔය ඉන්න විදිය හොඳයි.."

" ඒකනෙ.. පුතා.. රධ්‍ය ඔයාට කතාකලාද.."

අම්මගෙ කටහඩ එකසැරේ වෙනස් වුණා..

" නාම නෑ අම්මා.. මට කෝල් එකක් ආවෙ නෑ මේ මාස තුනටම.. දැන් තුනකටත් කිට්ටුනෙ.."

" ඒකතමා මම බැලුවෙ.. ම්ම්.. එයා ගෙදරට කොහොමත් ගන්න එකක් නෑ කේන්තියට.. මම හිතුවෙ පුතාටවත් ගත්තා කියලා.."

" මම එයා මට කෝල් කරපු ගමන්ම අම්මට කතාකරන්නම්.. දැන් මං ගාව නම්බර් එක තියෙනවනෙ.."

" හා.. පුතාට කතාකලොත් මට කියන්නකො.. මේ ළමයා මගේ නින්ද නැතිකල්ලා දානවා.."

@Shan

මම සද්ද නැතුවම හිටියා.. රධ්‍ය අයියා දැක්කෙ නැතිවුණාට, එයාට අම්මා හුහක් ආදරෙයි.. ඒත් මට වෙලාවකට හිතෙනවා අම්මා කතාකරන්නෙ හරි සැහැල්ලුවෙන් කියලා.. එකසැරේට හිරගෙදරකින් පියාඹලා ගිහින් වගේ... එයා ආසම දේවල් කරනවා.. රධ්‍ය අයියට කිව්වොත් එයත් හුහක් සතුටු වෙයි..

" පුතාට පාළු නැද්ද මාස තුනකින් විතර රධ්‍ය කතාකරන්නෙවත්, දකින්නවත් නැතුව ඉදලා.."

" මම එහෙම ඉදලම නෑ.. පාළුම පාළුයි අම්මා.. ඒත් එයා ඉක්මනට ඒවි කියලා හිතන් ඉන්නවා.."

" මම මේ වෙලාවකට ඔයාලා දෙන්නා ගැන කල්පනා කරනවා.. මම හිතුවෙ රධ්‍ය කවදහරි ආදරේ කරන කෙනාට නපුරු වෙයි කියලා.."

" නපුරුයි තමා.. පොඩ්ඩක් විතර.. එයා හැමතිස්සෙම කියනවා, එයාට මොකක් හරි නරක දෙයක් වුණොත් ඒක එහෙම වෙන්න ඕන අන්තිම කෙනා එයා කියලා.. හැමතිස්සෙම ඒක මතක් කරනවා කියලා.."

" ඒ කිව්වෙ..??"

" ඒ කියන්නෙ.. මෙහෙමයි.. දැන් එයාට මොනවහරි දෙයක් නැතිවුණොත්, මොකක් හරි කරදරයක්, දුක හිතෙන දෙයක් වුණොත් එයා හිතනවා මේ දේ වෙන්න ඕන අන්තිම කෙනා එයා කියලා.. එයා අතින් ආපස්සට එහෙම දෙයක් වෙන්න හදන හැම වෙලාවෙම එයා මතක් කල්ලා ඒ දේවල් නොකර ඉන්නවලු.."

අම්මා ටික වෙලාවක් සද්ද නැතුව හිටියා..

" අම්මා..??"

" එයා තනියම හුහක් දේවල් පුරුදු වෙලා.."

" ම්ම්.."

" මට කවදාවත් එයාලා ගැන පසුතැවීමක් නෑ.. මට තියෙන්නෙ මං ගැනම පසුතැවීමක්.."

@Shan

" ඇයි එහෙම කියන්නෙ.."

" ඔයා ඒකට හේතුව දන්නවා පුතා.."

" මම.. ඒත් හැමෝම අම්මට හුඟක් ආදරෙයිනෙ.."

" ඒකනමා.. මෙහෙට හුඟක් සීතලයි.. අම්මා දැන් නිදාගන්න යනවා.. පරිස්සමට ඉස්කොලෙ ඉඳන් ගෙදර යන්න හරිද.."

" හරි අම්මා.."

" ඔයා එක්ක කතාකරාම මගේ හිත නිදහස් වුණා.. මම පොඩ්ඩක් අවුල් වෙලා හිටියෙ.. දැන් ඒක හරි.. බායි.. ටේක් කෙයා.."

" බායි අම්මා.. ටේක් කෙයා.. ලව් යූ.."

මම ෆෝන් එක කට් කල්ලා ඒක බෑග් එක අස්සට එබුවා.. අම්මා හුඟක් හොඳයි.. වෙලාවකට හිතෙනවා මගේ අම්මත් පොඩ්ඩක් හරි මාව තේරුම් ගන්න උත්සාහ කලානම් කියලා.. ඒත් ඔච්චා කවදා වෙච්ච හිතාගන්න බෑ.. අම්මට මොකුත් කියන්න බෑ.. ඔය මදෑ මම වෙනුවෙන් කල්ලා තියෙන දේවල් ගොඩ.. හැමදේම දරාගෙන මාව හදාගත්ත එකට.. මම කොහොමද හිතක් හදාගෙන අම්මට වචනයක්වත් කියන්නෙ.. මහ ගුණමකුවෙක් වගේ දැනෙනවා.. ඒත් අම්මා කොච්චර කැපකිරීම් කලත්, වෙලාවකට දුක හිතෙනවා.. සමහර අම්මලා ළමයින්ට දෙන ආදරේ දැකලා..හැමෝටම හැමදේම එක විදියට ලැබෙන්නෙ නෑනෙ.. මට අවස්ථාව තේරුම් ගන්න පුළුවන්..

" මොකෝ අම්මා කියන්නෙ.."

සෙනුක ෆයිල් එක වහලා පුටු ඇන්දට හේත්තු වුණා..

" විස්තර කතාකලේ.. මොකද කරන්නෙ අරවා මේවා.. රධ්‍ය අයියා කතාකලාද ඇහුවා.."

" මමත් කල්පනා කරන්නෙ රධ්‍ය අයියා කතා කරන්නෙවත් නැත්තෙ ඇයි කියලා.. කරදරයක් නැතුව ඉන්නවනම් කමක් නෑ.."

@Shan

" දෙන්නෙ නැහැල්ලුනෙ ට්‍රේනින් පීරියඩ් එකේදි.. පුළුවන් වුණු වෙලාවක කතාකරාවි.."

සෙනුකයා ටික වෙලාවක් ඉඳලා නැගිටලා ඇවිත් මගේ පිටට තට්ටුවක් දැම්මා..

" මචං.. There is nothing to fear if you love the right person.. වරෙන් කැන්ටිමට ගිහින් ස්ටාෆ් රූම් එකට යන්න ඕන.."

" ම්ම.."

මමයි සෙනුකයි පහළට යද්දි චමිරු රූම් එක පැත්තට එනවා දැක්කා.. සෙනුක දැකලා විසිල් එකකුත් ගහගෙන ඇතුළට ගියා.. චමිරු නම් අනේ මන්දා.. මොන වගේ එකෙක්ද කියලා.. ඌ අර නංගිටත් කැමැත්තෙන් ඉන්න ගමන් ඒ අස්සෙ මාත් එක්කත් අමුතු විදියට කතාකරනවා හිනාවෙනවා.. ඔක්කොමත් හරි මේ දවස්වල නිතර ක්‍රිකට් ටීම් එකේ මල්ලි කෙනෙක් එක්කත් ඇයි හොඳැයියක් තියෙනවා.. මට මූව සත එකකට ශූවර් නෑ..

එක්කො ඌ එක හිතකින් අර නංගිට කැමති වෙන්න ඕන.. නැත්නම් ක්‍රිකට් ටීම් එකේ මල්ලිට කැමති වෙන්න ඕන.. මටනම් කැමතිවෙන්න ඕන නෑ.. මම ඌට පොඩ්ඩක්වත් කැමති නෑ.. වටේ යන වටපරෙයියා.. පිහාටු ටික ගලවලා දාලා මුගෙන් සුප් එකක් හදලා අර නංගිට පෙව්වනම් හරි.. නංගි උඹට කැමතිවෙන්න වෙන එකෙක් හිටියෙම නැද්ද කියලා.. ඒකත් එකටම මට හිතෙනවා සිරාවටම මූ මගේ මනුස්සයටත් කැමැත්තෙන් හිටියද දන්නෙ නෑ.. එහෙම වුණානම් තමා දැනගන්නෙ වරද් වරං ගත්තහම හැටි.. තලනවා පකයගෙ ඇට දෙක..

ඊයෙ කෝච් මාන්නක්කාර වෙළසුමනයගෙ පොඩි බබාලා දෙන්නගෙ බර්ත්ඩේ එකට ගියා මහීශා එක්ක.. සෙනුකයා බිසී නිසා  එන්න වුණේ නෑ.. මම ඉතින් කෝකටත් බේත මහීශා හොයාගත්තා..

මම කලින් ඒ පොඩි ලමයි දෙන්නව දැකලා තිබ්බෙ නෑ.. කෝච්ගෙ ගෙදර මාර ලස්සනයි.. තට්ටු දෙකට හදපු ලස්සන ගෙදරක්.. තාන්වී අක්කා හුඟක් අයට ඉන්වයිට් කල්ලා තිබ්බෙ නෑ.. ළඟම යාලුවො කීපදෙනෙක්ට විතරයි කතාකල්ලා තිබ්බෙ.. ඔක්කොමත් හරි ඒ ඇම්බැට්ටට පොඩි කෙල්ල මහීශාගෙ ඇහේ වූදාපු එකත් හරි.. තාන්වී අක්කගෙ ඇඳුමක් ඇඳගෙන ඒකිට ගෙදර එන්න වුණේ.. මටනම් පොඩි ලමයි වඩාගන්න බයයි..

@Shan

කොයිවෙලේ අතැරේද දන්නෙ නෑ.. මම වඩාගන්නෙ පූසො විතරයිනෙ.. ඌත් දහලද්දි මම දබෝස් ගාලා බිමට අතාරිනවා.. අර ගමේ චූටියා.. සක්කිලි පූසා අතේ ඉන්න බැරිවුණාම හූරනවා.. හපනවත් එක්ක.. අපරාදෙ මම ඇවිදලා ඌට හොයලා දෙන කුප්පමේනියා ටිකත්.. ඌට නොදී මමම කනවා අනිත් සැරේ.. කුප්පමේනියා..

කෝච් ක්ලබ් එකේ වගේ නෙමෙ තාන්වී අක්කට පේන්න බොරුවට හෙන හොඳට මාත් එක්ක මගේ හරි නමින්ම කතාකලා.. නැත්නම් හැමතිස්සෙම 'අයිසෙ සරනේරු ඔය කැට්වෝක් එක නවත්තගන්නවා' කියලා කෑගහනවනෙ.. මම ඔක තාන්වී අක්කගෙකනේ තිබ්බා ඊයෙ.. ඒ අස්සෙ තාන්වී අක්කගෙ ලව් ස්ටෝරියත් අහගත්තා

මට කලින් කෝච්ගෙ හොඳම ගෝලයා තමා තාන්වී අක්කා.. හොඳම ගෝලයා ඒ මනුස්සයා බිරිඳ කරගෙන.. තාන්වී අක්කලගෙ ගෙදර ඒ මැරේජ් එකට පොඩ්ඩක්වත් කැමති නැහැල්ලු.. ඒ නිසා පවුලෙ අය අක්කව හොයන්නෙ නැහැ කියල කිව්වෙ.. ඒත් කෝච්ගෙ පැත්තෙ අයනම් හොඳයිලු.. තාන්වී අක්කා කිව්වෙ බබාලා ඉන්න නිසා එයාගෙ ගෙදර අය ටික කාලෙකින් කතාකරාවිලු.. ඇත්ත තමා ඔය පැනලා යන කෙල්ලොත් ආයෙම ගෙදර ඇවිල්ලා 'අම්මේ පව්කාරිට සමාවෙන්න' කියල වැඳලා ඇඬුවහම අම්මලා මූණ ඉඹලා බාරගන්නෙ.. අපේ අම්මට වගේ එහෙම වැන්දොත් කණට ගහලා ඉතුරු අරන් යන්න අමතක වෙච්ච බඩු ටිකත් ගෙයින් එළියට දානවා.. එහෙම බැලුවොත් මගේ නැන්දම්මා හරි හොඳයි.. මාත් එක්ක හොඳට කතාකරනවනෙ..

හැබැයි ආධ්‍ය අයියගෙ නැන්දම්මත් හොඳයි.. අපේ ආච්චිනෙ.. ආච්චි හොඳයි.. ඒත් මාමා කීයටවත් ඔක ගෙදරට කියන්නෙ නෑ කියලා මම දන්නවා.. මාමගෙ කැමැත්තනෙ.. ආධ්‍ය අයියලගෙ ගෙදර අර නෙතු මල සමයම ඇවිත් වෙඩින් එකට ලෑස්ති වෙනවලු.. තියන මාසෙ කල් ගියා කියන්නෙ.. අපේ මාමා මොකුත් නොකර බලාගෙන ඉන්න එක ගැන මට කුහුහලේකුත් තියෙනවා.. ඒත් කාමරේට ගියාට කිසිම දෙයක් හොයාගන්න බැහැනෙ.. මාමගෙ කාමරේ ලාච්චු ලොක් කල්ලා තියෙන්නෙ.. ආධ්‍ය අයියගෙ රිපෝට් එකක්වත් ඉස්සුවනම් මට දැනගන්න තිබ්බා මොකක්ද වෙන්නෙ කියලා..  තියා ආධ්‍ය අයියවත් එයාගෙ රිපෝට් මොකුත් දැක්කෙ නෑ කිව්වා.. මාමා ඔහොම සද්ද නැතුව ඉන්න එක ගැන සලකලා බලන්නම ඕන.. කොහොමත් කරන කියන දේවල් කාටවත් අහවන්නෙ නැනෙ.. ආධ්‍ය අයියත් නිතර අසනීප වෙනවා.. මට වෙලාවකට බය හිතෙනවා

@Shan

හැමදේම අමුතු විදියට සිද්ධ වෙද්දි.. රධ්‍යා අයියවත් හිටියනම් කියලා හිතෙනවා..

අම්මත් ගෙදර ඇවිත් යන්න කියනවා.. ගෙදර යන්න ඕන ආච්චිඅම්මව බලන්න.. අවුරුදුත් කිට්ටු වෙනවනෙ.. අවුරුද්දට ගමේ ඉන්න පුළුවන් වෙයිද කියන්න බෑ.. මාමා මෙහේ හිටියොත් මටත් ඉන්න වෙනවා..මම දැන් ගමේ ගියොත් මට ලෙසටම දෙසනවා.. කන පිරෙන්නම අහගන්න පුළුවන්.. ඒකත් කමක් නෑ මම කරපු දේවල් කියවනවනම්.. ඔක්කොම මම හීනෙකින්වත් නොකරපු දේවල්නෙ කියවන්නෙ.. ආච්චිඅම්මා මට මොකුත්ම කියන්නෙ නෑ.. අම්මටත් බනිනවා හැමතිස්සෙම විකාර කතා කියනවා කියලා..

ගෙදරින් පිට ඉන්න කල් ප්‍රශ්න මොකුත් ඔළුවට ආවෙ නැතිවුණාට කාමරේට ආපු ගමන්ම සේරම ප්‍රශ්න ඇවිත් ඔළුවෙ ගොඩ ගැහෙනවා.. වෙලාවකට මම හුඟක් වෙලා කල්පනා කරනවා.. පාළුයි.. කවුරුත් නෑ මං ගාව.. එහෙමයි කියලා අඬලත් බෑ.. මහ එපාකරපු හැඟීමක්.. ක්ලබ් එකේ ඉඳන් හති වැටෙනකල් ප්ලේ කරනවනම් ඒකත් හොඳයි.. ඒත් කෝච් නැති වෙලාවට මට ක්ලබ් එකට යන්න එපා කියලනෙ තියෙන්නෙ..

මම ඉස්කෝලෙ වැඩ ඉවරකල්ලා ගෙදර එද්දි හවස් වෙලා.. හුඟක් මහන්සියි.. දොර ගාවට ගියාම ගෙදර ඇතුළෙන් රණ්ඩුවෙන සද්දයක් ඇහෙනවා.. ආධ්‍යා අයියයි අපේ මාමයි.. එයාලා එහෙම රණ්ඩු වෙන්නෙ නෑ මම දන්න තරමින්.. මට බය හිතුණා.. මාමා කේන්තිගන්නෙ අඩුවෙන් නිසා කේන්තිගියාම මලයකෙක් වගේ.. මම සාක්කුවෙ තිබ්බ යතුර ඉක්මනට අරගෙන දොර අගුලට දාලා දොර ඇරියා..

" අනූ.. ඔයා මොනවද මේ කරන්නෙ..!!"

ඔතරී ර්ස් බැක් මගෙ දළඹු පැටවුනේ.. අද ඉඳන් හැමදාම උදේට මම සේපාලිකා නෙස්ටමෝල්ට් දෙන්න ගන්නවා.. ඊයෙ ඔතරීගෙ ජන්ම දිනේ තිබ්බනෙ.. දෙයියනේ දෙයියනේ පෞකාරිට දහනමයක් වුණා.. විශ් කරපු මගේ හැම දළඹු කෙල්ලෙක්ටම කොල්ලෙක්ටම හුගාරියක් ආදරෙයි.. මේ ටිකේ වැඩ ගොඩයි ළමයි.. මම ඉඩ හදාගන්න වෙලාවක අනිවාරෙන්ම ඔයාලට රිප්ලයි කරනවා.. හරිද.. පෞකාරි එක්ක තරහාවෙන්න එපා.. මම් ආදරෙයිනෙ..

එන්නාම්.. ලව් යූ.. ❤

@Shan

මට ඔයාලා හුඟක් මතක් වුණා අයියෝ..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 112 කොටස

මම දොර අරිනවත් එක්කම මට වඩා වේගෙන් දොර ඇදගෙන අපේ මාමා මගේ උරහිසේත් හයියෙන් වැදීගෙන හෝල් එකේ කොනේ පඩිපෙල බහැගෙන පහළට යන්න ගියා.. මම ස්කූල් බෑග් එකත් කරේ එල්ලගෙන පුදුම වෙලා අපේ මාමා ගිය දිහා බලාගෙන ඉඳලා ගේ ඇතුළ බැලුවහම ආධ්‍ය අයියා මූණ අත් දෙකින්ම වහගෙන එහෙමම සෝෆා එකට කඩාවැටුණා.. මම කරේ එල්ලන් හිටිය බෑග් එක එහෙමම පැත්තකට විසික් කල්ලා දුවගෙන ගිහින් ආධ්‍ය අයියව ඇඟට වාරු කරගත්තා.. අයියව වෙවුලනවා වගේ.. අපේ මාමට පිස්සුද මේ අසනීපෙන් ඉන්න අයියත් එක්ක මෙහෙම රණ්ඩු වෙන්නෙ.. මට මාමා එක්කත් කේන්ති ආවා.. යකෝ!! අසනීපෙන් ඉන්න මනුස්සයෙක් එක්ක.. වටේ පිටේ මිනිස්සුන්ටත් ඇහෙන්න ඇති..

" ආධ්‍ය අයියේ.. අයියේ.. මොකද මේ.."

මම ආධ්‍ය අයියව උරට වාරු කරගත්තහම ආධ්‍ය අයියගෙ ඇඟ සීතල වෙලා තියෙනවා මට දැනුණා.. මට බය හිතෙනවා..

" කතාකරන්නකො අයියෙ.. ඇයි මේ.. ඇයි ඔයාලා රණ්ඩු වුණේ.."

"....."

" අයියෙ.."

" මම.. චූටි.."

" අයියා අසනීපෙන් නේද.. මේ බලන්න ඔයා සීතල වෙලා.."

මම අයියව සෝෆා එකට හේත්තු කල්ලා එයාගෙ කණ්ණාඩි දෙක මූණෙන් ගලවලා පැත්තකින් තිබ්බා.. ඇඟ සීතල වුණාට අයියගෙ මූණට සීතලට ඒත් දාඩිය දාලා..

" චූටි මගේ.. ඉන්හෙලර් එක.. ඒක.."

" ඕ කොහෙද.. ඔයාගෙ සාක්කුවෙ නේද.."

@Shan

ආධ්‍ය අයියා ඔලුව පොඩ්ඩක් හෙලෙව්වහම මම සාක්කුවට අත දාලා ඉන්හෙලර් එක අරගෙන ඒක ආධ්‍ය අයියට දුන්නා.. මොනවද දෙයියනේ මේ වෙන්නෙ.. මම ආධ්‍ය අයියා ඉන්හෙලර් එක අදින දිහා බලාගෙන ඉඳලා එයාගෙ ශර්ට් එකේ උඩ බොත්තම් දෙක තුන ඇරියා.. හොස්පිටල් ගිහින් එහෙමම ඇවිත් තියෙන්නෙ.. ඊටපස්සෙ කකුලෙ තිබ්බ මේස් දෙකත් ගලවලා පැත්තකින් තිබ්බා..

" කරදර වෙන්න-කැහ්-එපා චූටි.."

" කරදරයක් නෙමේ.. අයියට හුස්ම ගන්න අමාරුද.. එන්නකො කාමරේට යමු.. මෙතන ඉන්න අමාරුයි.."

" කමක් නෑ චූටි.. එහෙම ලොකු ප්‍රශ්නයක්-කැහ්-නෑ.. මම හොඳින්.. පොඩ්ඩක් කලන්තෙ වගේ.."

ආධ්‍ය අයියා ඉන්හෙලර් එක අතට ගුලි කරගෙන ආයෙම සෝෆා එකට හේත්තු වුණා.. කලන්තෙට කියන්නෙ හොඳින් වගේද.. මේ අයියා එක්ක මට වෙලාවකට කේන්ති යනවා.. අනික අපේ මාමා.. එයා එක්කත් කේන්ති යනවා..

" අයියේ අපි හොස්පිටල් යමුද.. මම මාමට කතාකරන්නම්.. ප්ලීස්.. ඔයා හොඳින් නෙමේ ඉන්නෙ.."

" එපා චූටි.. එහෙම නෑ.. මම පොඩ්ඩක්.. රෙස්ට් කරන්නම්.. මට වතුර එකක් ගේන්නකො..

මම ආධ්‍ය අයියා දිහා බලාගෙන ඉඳලා නැගිටලා ගිහින් වීදුරුවකට වතුර එකක් පුරවගත්තා.. ඒ එක්කම ගෙදර ඉස්සරහා දොර ඇරිලා වැහෙනවා ඇහුණා.. මාමා ඇවිල්ලද කොහෙද.. මට තේරෙන්නෙ නෑ එයාලගෙ ප්‍රශ්න මොනවද කියලා.. ආධ්‍ය අයියම මට කියන එකක් ඇරෙන්න..

" කාමරේට යමු.. මුරණ්ඩුවෙන්න එපා සාකි..!! අම්මපා මම උඹට..!!!"

" කැගහන්න.. එපා.. චූටි-කැහ්-එයා ගෙදර.."

මම වතුර එක අතේ තියාගෙන එහෙමම හිටියා.. එකසැරේ මම සාලෙට ගියොත් හරි නැති නිසා.. දැන් කොහොමත් අපේ මාමට මට කියන්න

@Shan

වෙනවා එයාලා අතරෙ තියෙන්නෙ මොකක්ද කියලා.. මම ගෙදර එද්දි නැත්නම් ආධ්‍ය අයියත් අපේ ගෙදරම ඉන්න විදියක් නැනෙ.. මම මාමව අසරණ කළා වගේ හැඟීමක් එනවා.. එක්කො මට නැවිත් ඉන්න තිබ්බා.. මට එයාලා අතරෙ තියන ප්‍රශ්න ගැන දැනීමක් නෑ ලොකුවට.. කොහොම වුණත් අපේ මාමා කේන්තියෙන් ඉන්න හේතුව ගැන නම් මට තේරුමක් තිබ්බා..

ආධ්‍ය අයියා නෙතූ අක්කා එක්ක හැමතිස්සෙම අප්පච්චිගෙ බල කිරිල්ලට එහෙ මෙහෙ යනවා.. අපේ මාමා දැනුවත්ව.. ඩිනර් වලට.. නෙතූ අක්කව උසාවියෙන් ඩ්‍රොප් කරන්න.. සමහර වෙලාවට එයාගෙ ගෙදර ඔෆිස් එකටත් යනවා කියලා කිව්වෙ.. අපේ මාමා වෙලාවකට පව්.. මට මාමගෙ දුක දැනෙනවා.. මාමා ඔය හැම එකක්ම දන්නවා.. ආධ්‍ය අයියා හංගන්නෙ නැතුව ඔක්කොම මාමා එක්ක කිව්වත්.. මාමත් ආදරේ කරන මනුස්සයෙක්නෙ.. ආධ්‍ය අයියට මාමා එක්ක ඩිනර් එකකටවත් යන්න වෙලාවක් නෑ.. ගෙදර ආපු වෙලාවක තමා.. ඒත් ඒ සමහර වෙලාවට මම ඉන්නවා.. එතකොට මාමා කැමති නෑ ආධ්‍ය අයියා එක්ක ඉන්න..

අනික මට ඇහිලා තියෙනවා ආධ්‍ය අයියා මාමා කියන කියන හැම එකටම පොඩ්ඩක් ඉවසන්න අනූ, මට මේක කරන්න හිත හදාගන්න බෑ අරවා මෙවා කියනවා.. එයා බයයි වෙන්න ඇති.. ඒත් ඉතින් අවුරුදු තිස් ගානක් වෙන ලොකු කෙනෙක්නෙ.. ආධ්‍ය අයියා පොඩි කාලෙ ඉඳන් හැම එකකටම බය වෙලා හැදිලා දැනුත් එහෙමමයි.. අපේ මාමට ඕවා ඉවසගන්න බැරිම වුණාම ආධ්‍ය අයියට කෑගහනවා..

මම එයාලා කාමරේට යනකල් ඉඳලා වතුර එකත් අරගෙන කාමරේට ගාවට ගියා..

" මම මොකක්ද කරන්නෙ අනූ.. මට මහ අසරණ වෙලා වගේ හැඟීමක් දැනෙනවා.. එක්කො මට ඔයාට කතානොකර ඉන්න තිබ්බා.."

" පිස්සු කියවන්නැතුව හාන්සි වෙන්නකො.. හැමතිස්සෙම මොකක් හරි අල්ලගෙන හිතලා හිතලා, මම ජීවිතේට හිතන්නෙවත් නැති ප්‍රශ්න මවාගෙන දුක් වෙනවා.."

" එහෙම දෙයක් නෑ.. මම කිව්වෙ හිතුණු දේ.."

@Shan

" දැන් ඔයා මොකක්ද කරන්න හිතාගෙන ඉන්නෙ.. සොරි මම කලින් කැගැහුවට.. ඔයාගෙ මෝඩ වැඩවලට කේන්තියනවා සාකි.. මොන බම්බුවකටද අද හොස්පිට්ල් ගියේ.. මම කිව්වනෙ ඔයාට නිවාඩුවක් දාලා ගෙදර ඉන්න කියලා.."

" අප්පච්චි ගෙදර ඉන්නවා.. මට එහේ ඉන්න බැනෙ.. හිටියොත් නෙතු එනවා.. මම ආස නෑ.. මම එතනිනුත් කරන්නෙ වැරැද්දක්නෙ.. බොරු බලාපොරොත්තු දෙන එක.."

" ඔයා නෙමෙයිනෙ බොරු බලාපොරොත්තු දෙන්නෙ.. ඔයාගෙ අර අප්පච්චි.. මම කිව්ව එක ගැන හිතලා මට උත්තරයක් ඕන.."

" ඔයා කිව්ව දේ මට කරන්න බැරිකමක් නෑ.. එහෙම වුණොත් අපි දෙන්නගෙ ප්‍රශ්නෙට විඳවන්න වෙන්නෙ වෙන කට්ටියකට.. මට එහෙම කරන්න හිත හදාගන්න බෑ.."

" අනේ මේ බං.. අනිත් මිනිස්සු ගැන හිතන්න කලින් ඉස්සෙල්ලා තමුන් ගැන හිතලා ඉන්නවකො.. බණ දෙසනවා.. උඹත් අපේ අම්මා වගේ.. හැම මගුලටම බණම කියනවා.. අහන් ඉඳලා මගේ ඔලුව කකියනවා.."

" කකියනවනම් යන්න.. මෙතන ඉන්නැතුව.. චූටී!!!"

ආධ්‍ය අයියා දොර ගාව ඉන්න මට කතාකරනකොට ඒ කතාව අහගෙන ඉඳපු මම ගැස්සිලා ගියා.. හැමතිස්සෙම හොර ගල් අහුලලා දැන් මෙක පුරුද්දකට ගිහින් වගේ.. හරි ශෝක් වරද් උඹනම්..

" ඕ..!!!"

" එන්නකො පොඩ්ඩක්.."

මම දොර රෙද්ද එහාට කරගෙන කාමරේට එද්දි මාමා ඇඳ ගාව පුටුවකින් වාඩිවෙලා ආධ්‍ය අයියා දිහා මරාගෙන කන්න වගේ බලාගෙන ඉන්නවා.. මම ගිහින් වතුර වීදුරුව ආධ්‍ය අයියට දුන්නා.. දීලා අහින්සක මූණක් හදාගෙන මාමට හිනාවුණාම මාමා අත දිගැරලා මගේ පිට මැද්දට දබෝස් ගාලා තඩිබෑවා..

" මේ අනිකා.. උඹ කවදා ඉඳලද හොරගල් අහුලන්න තියාගත්තෙ.. "

@Shan

මම බයවෙලා ආධ්‍ය අයියට කිට්ටු වුණා.. මාමා දැකලා වගෙයි.. අදනම් කන්න තමා වෙන්නෙ..

" මොන.. කවුද හොරගල් ඇහිලුවෙ.. බලන්නකො ආධ්‍ය අයියෙ.."

" චූටිට බනින්න එපා අනුරාග්.."

" බනින්න නෙමේ තියෙන්නෙ හම ගහන්න.."

" ආ හම ගහන්න..?? ගහනවා බලන්න.. අපිට හොරෙන් කැලි ලයින් කරන්න.. එව්වා හදේ තමා මාමෙ.."

" මට ඕන්නම් මම ලයින් කරනවා.. උඹට ඇති රුදාව මොකක්ද.."

" මොකුත් රුදාවක් නෑ.. මම හිතුවා එදා පස්ස ලොකුයි කිව්වහම හොඳ කැල්ලක් ලයින් කරගෙන ඇත්තෙ කියලා.. මම දැන් දන්නවනෙ.. මොකද ලැප්ජද.."

" සුදුමහත්තයා!! උඹට ගහනවා මම.."

" බයයි මම.. හුහක්.."

මාමා මට දෙකක් රවලා ගිහින් බෙහෙත් කාඩ් එකක් අරන් පෙත්තක් කඩලා ආධ්‍ය අයියට දික් කලා..

" බීපිය මේක.."

ආධ්‍ය අයියා මාමට රවලා පෙත්ත ඇදලා ගත්තා..

" දැන් ඔයාලා රණ්ඩු වෙලාද.. හරි මෙහෙමයි.. මම ආධ්‍ය අයියගෙ හොඳම සහ විශ්වාසවන්තම යාළුවා නිසා මම ඔයාලා ගැන දන්නවා.. නේද ආධ්‍ය අයියෙ.."

මම ආධ්‍ය අයියට වැලමිටෙන් එකක් ඇන්නහම ආධ්‍ය අයියා ඔලුව වැනුවා..

" මම හිතුවා.. දැන් දැනගත්තනම් පල කාමරෙන්.. මට මේකා එක්ක විසඳගන්න ප්‍රශ්නයක් තියෙනවා.."

@Shan

" ඇයි ප්‍රශ්න විසඳන්න ඔයා සර්ලොක් හෝම්ස්ද.. අනේ මේ.. මගේ ආධ්‍ය අයියා එක්ක රණ්ඩුවෙන්න එපා.. මම ආස නෑ.."

" උඹ ආස නැතිවුණාට මම ආසයිනෙ.. කිව්වම අහලා නාගෙන වරෙන්.. යුන්ෆෝම් එක පිටින් මගේ ඇඳේ පෙරලෙන්නෑ.."

ඒක හරි මගුලක්නෙ!!

" ආ දැන් මම මේ ඉස්කෝලෙ ගිහින් ගෙදර ආවහම ඒකෙ ජරාව.. එතකොට රටේ ලෝකෙ තියන සේරම ලෙඩ්ඩු බලලා විසබීස ඇඟේ පිරිවරාගෙන ආපු ආධ්‍ය අයියා ඇඳේ හාන්සිවුණාම එව්වා.. එව්වා හොඳද.."

" කෝ අර මම හංගලා තිබ්බ වේවැල.. මුගෙ කට.. අම්මපා දෙන්න හිතයි.. කිව්වහම අහලා පල.."

" මම වේවැලට බය නෑ හරිත.. හැබැයි ඔයා මේ ආධ්‍ය අයියට අරවා මෙවා කියලා මාව කෝපගන්වන්න එපා.. මට හරියට කේන්තියනවා.. මමත් ආධ්‍ය අයියට ආදරෙයි.. නේද අයියෙ.."

මාමා ඒකට පොඩ්ඩක් බයවුණාද මන්දා නළලත් රැලිකරගෙන ආධ්‍ය අයියා දිහා බැලුවහම ආධ්‍ය අයියා මට ඔව් කිව්වා..

" එතකොට උඹේ කුරුඳුවත්තෙ කෑල්ලට මොකද වෙන්නෙ.."

" එයා දුර ගමනක් ගිහින් ඉන්නෙ.. එයාට කලිනුයි කොහොමත් මට ආධ්‍ය අයියට හිත ගියේ.."

" උඹට ලැජ්ජ නෑ සුදුමහත්තයා.."

" හුඟක් අය එහෙම කියනවා.."

" ගිහින් කෑම කාපන්.. හවස් වෙලා.. නාන්නෙත් නෑ.. හඩු පිටින් ඉන්නවා.."

මම ආධ්‍ය අයියා පැත්ත හැරුණා..

" ඔයාට මෙයා බැන්නොත් මට කතාකරන්න හරිද.. අනික ඔයා දන්නෑනෙ අපේ මාමා මේ ඊයෙත් බුලත් වගයක් කකා හිටියා.. ඊය නේද.."

@Shan

" ඇත්තද අනුරාග්.."

" මොන බුලත්ද.. මුගේ මේ බෙගල් විශ්වාස කරනවද.."

" බෙගල් නෙමෙ.. මම යනවා නාගන්න.."

මම නැගිටලා කාමරේ දොර ආවට ගිහින් අනිත්පැත්ත හැරුණා..

" මෙහ් වරද්දලගෙ මාමෙ.. කරපිංචා නැද්ද.."

ඒ එක්කම මාමගෙ කලිසමෙ බෙල්ට් එක මගේ දිහාවට පියාඹගෙන එද්දිම මම කාමරෙන් එළියට පැනගත්තා..

" චූටි!!!"

" සුදුමහත්තයා!!!"

මම මගේ කාමරේට ගිහින් ඇඳුමකුත් අරගෙන බාත්‍රූම් එකට රිංගගත්තා.. ඔයින් ගියා මදැයි.. මේ ගෙදර රට හරකා වගේ හැසිරෙන එකෙන් එක අතකින් මට හොඳයි.. මම මොනවා කරත් කවුරුත් එච්චර හිතන්නෙ නැනෙ.. මාමා කලින් ඉඳන් දැනගෙන හිටියද දන්නෙ නෑ මම එයාලා ගැන දන්නවා කියලා.. කොහොම හරි කමක් නෑ මම හිතපු තරම් ඒක සීරියස් වුනේ නැති එක ගැන සතුටුයි..

ආධ්‍යා අයියගෙ අසනීපෙ ගැන මට දැනගන්නම ඕන.. ඒත් මේ මාමා එක්ක කිසිදෙයක් කරගන්න බැනෙ.. ආධ්‍යා අයියනම් වචනයක් දෙකක් කිව්වහම හිම්හිට සේරම කියනවා.. ඒත් මේ මාමා ලෝකෙ කාලා වතුර බීලා අණ්ඩපාලයා වගේ ඒකගෙ කනෙන් රිංගන්න නම් මම අද්‍යෘශ්‍යමාන වෙන්න ඕන.. අනික මම හොස්පිටල් වල යන්නෙ නැනෙ.. ඒගොල්ලො කතාකරන සමහර ඒවා මට තේරෙන්නෙ නෑ.. තේරෙන භාශාවෙන් කියන්නෙ නැනෙ.. එක එක බෙහෙත් වල අමුතු නම් එහෙම.. මම දන්නෙ පොඩ්ඩයි.. එයාලා තරම් ඕවා ගැන දන්නෙ නෑ.. අම්මත් එච්චර ආධ්‍යා අයියගෙ අසනීප ගතිය ගැන දන්නෙ නෑ වගේ.. අම්මා දැනගත්තත් අම්මට කරන්න පුලුවන් දෙයක් නැනෙ.. මට තියෙන්නෙත් මෙවා ගැන කල්පනා කරන්න විතරයි.. ඒත් මගේ හිතේ විශ්වාසයක් තියෙනවා මාමා ඔහොම පෙන්නුවට එයාගෙ හිතේ මොකක් හරි දෙයක් ඇති ආධ්‍යා අයියගෙ මැරේජ් එක ගැන.. අනික නෙතුද කවුද ඒ මල සමයමට පිස්සුද මං අහන්නෙ ආධ්‍යා අයියට

@Shan

කැමතිවෙන්න.. මම හිතන විදියට ආධ්‍ය අයියට කෙල්ලො කැමතිවෙන කිසිම ගතියක් නෑ.. කෙල්ලො ආස අර කියාන් අයියා වගේ කොල්ලොන්ටනෙ.. සමහරවිට දේපළටද දන්නෑ.. එහෙම වෙන්නැති..

මම නාගෙන එළියට එද්දි අපේ මාමා කුස්සියෙ මොනවද කරනවා.. මම ටවල් එක ඔලුව වටේ ඔතාගෙන ගිහින් පැන්ට්‍රි එකට හේත්තුක් දාගත්තා.. මාමා කෝපි හදනවා..

" මට නැහ්.."

" ඉඳහන් පොඩ්ඩක්.."

" තරහද ඒයි.."

" ඒ මොකටද.."

" නෑ නිකම්.. තරහ නැත්නම් කමක් නෑ.."

" උඹට අහන්න මොකුත් නැද්ද.."

" ඇනට නෑ.. මම ඔක්කොම දන්නවා.."

මාමා හැන්ද සින්ක් එකට දාලා තේ පෙරන ගොට්ට අරගෙන සේදුවා..

" මම හිතුවෙ උඹ නාඩගමක් නටයි කියලා.. සේරම දැනගෙන හිම්මිච්චා වගේ හිටපු නිසා පස්සෙ හිතුණා දැගත්තට කමක් නෑ කියලා.."

" මාව මාමට හැත්තෑව දසකෙ බුලත් කන සීයෙක් වගේ පේනවද ඔකට ඔච්චර පුදුම වෙන්න.. අනික ඔීවා ඕනතරම් තියෙනවා.. මම දන්නම කී දෙනෙක් ඉන්නවද.."

" ඒ වුණාට අපේ ගෙදර ගැන උඹ දන්නවනෙ.. මම අමුතුවෙන් පැහැදිලි කල්ලා දෙන්න ඕන නෑනෙ ඒකගැන.."

" අපේ අම්මද.."

" මම.. අපේ අම්මත්.."

@Shan

" ආච්චිනම්.. මට වෙලාවකට හිතෙනවා කිව්වත් තේරුම් ගනී.. අපේ අම්මලා වගේ නැනෙ.."

" දේදුණු, දෙව්ලි දෙකම එකයි.. නම් දෙක විතරයි වෙනස්.."

" ඇයි දේව් හොඳත.."

" මම හොඳයි බොල කොහොමත්.. උඹලගෙ අම්මයි ලොකු අම්මයි වගේ ගිනිබෝම්බ දෙකක් නෙමේ.."

" ආ මේ අපේ අම්මට මොකුත් කියන්නෙපා හරී.. මට මල පනිනවා.."

" මම ඇත්ත කිව්වෙ.. උඹට කලින් මම අක්කලව දන්නෙ.. හැබැයි පොඩි අක්කා හොඳයි අර ලොකු අක්කා තමා.. අවුස්සන්නෙ.. එක එක හු#තවල් කියලා.. මල පනිනවා බං මට අපේ ගෙදර එක්ක වෙලාවකට.. අවුරුදු හතළිහක් වෙලත් තාම මම පොඩි එකෙක් කියලා එනවා හැම මගුලටම අත දාන්න.."

" මම.. මටත් ගෙදර ගිය වෙලේ කිව්වා මාමා ගැන හොයලා බලන්න කියලා.. මම හා කියලා නිකන් හිටියා.. ආච්චිනම් මොකුත් කිව්වෙ නෑ.. ඒ දවස්වල අනික ආධ්‍ය අයියගෙ එක මම දැනගෙන හිටියෙත් නෑ.."

" මට වෙලාවකට ඔලුව කකියනවා බං.. ශාක්‍යගෙ ගෙදරත් මහ.. උඹට රධ්‍ය කියලා ඇතිනෙ.."

" ඔව් කියලා තියේ.. ආධ්‍ය අයියා අවුලෙන් ඉන්නෙ රධ්‍ය අයියවත් ගෙදර නැනෙ.."

" දැන් සේරමත් හරි අර නෙතු කියලා පට්ටන්දරියෙක් ගේ අස්සෙ රිංගන්න අරගෙන.. අම්මපා අහුවුණොත් දතෙන් දත උගුල්ලලා දානවා නර්ව් එකත් එක්කම.. ලැජ්ජාවක් නැති ගෑණු.."

" එහේ අප්පච්චි මාමා එක්ක වලිලු නේද."

" වලි කියන්නෙ බං.. පෙරේදා.. මම උදේ ඔෆිස් එකට යද්දි හිටියා ඩයල් එක.. දැන් බ්‍රිගේඩියර් ලයින් නෙ දෙන්නෙ.. මාව දැකලා අමුතු හිනාවක් දැම්මා.. මාත් සතපහකට ගනන් ගත්තෙ නෑ.. මහ අමුතු හිතක් පපුවක් නැති

@Shan

මිනිගෙක්.. අධිකාරි කිව්වහම කොහොමත් කැම්ප් එකේ උන් කට ඇදකරගන්නවා.. ඔය යුද්දෙ කාලෙ ඉඳලා තියෙන්නෙ මුලතිව් වලලුනෙ.."

" එහෙමද.."

" ම්ම්.. ඒ කාලෙ යුද්දෙ නිසා වුණු කම්පනේකින් ඔයතරමට හිතක් පපුවක් නැති මනුස්සයෙක් වුණාද මන්දා.. එහෙම කියනවා කැම්ප් එකේ කොල්ලො.. ඒත් බං අධිකාරි විතරද යුද්දෙට ගියේ නැනෙ.. අපිත් ගියා.. යකෝ මට වෙඩිත් වැදුණා.. ඔහොම මගුලක් නැනෙ.. ඔය මනුස්සයගෙ තියන ගතිය ඕක.. කම්පනයක්වත් වෙන මොකුත් නෙමෙ.."

" අපි දන්නෙ නැනෙ ඉතින් හරියටම.. ආධ්‍ය අයියගෙ අම්මා මොකෝ කියන්නෙ.."

" එයා දන්නවා.. මාත් එක්ක කතාකල්ලත් තියේ.. හොඳ මනුස්සයෙක්.. අර අමනුස්සයෙක් එක්ක කොටු වෙලා පුදුම දුකක් වින්දෙ.. දැන් රට නිසා නිදහසේ ඇති.."

" ම්ම්.. මාමා හොඳයි කියලා හිතෙන දෙයක් කරන්නකො.."

මම මාමා හදලා දුන්නු කෝපි මග් එකේ හැන්ඩ්ල් එකෙන් අල්ලගෙන උගුරක් බිව්වා..

" ශාක්‍යට වෙලා තියෙන්නෙ.. මම මේ කියන්නෙ මට දැනුණු දේ හරිද.."

" කෝ අයියා.."

" නිදි.. නින්ද යන්න බෙහෙත් දුන්නා.."

" ආ.. මොකක්ද කියන්න ගියේ.."

මාමා කුස්සියේ තිබ්බ පුටුවකින් වාඩිවුණා..

" මම ශාක්‍යගෙ කවුස්න්සිලර් මීට් වෙන්න ගියා දවසක්.. එයා පොඩිකාලෙ ඉඳලම Mental isolation කියන එකට මූණ දීලා තියෙනවා.. ඕකට කියන්නෙ මානසික හුදකලාභාවය කියලා.. එහෙම වුණාම එයා හිතන්න පටන්ගන්නෙ එයා දුර්වලයි, එයා වෙනුවෙන් කවුරුත් නෑ කියලා.. ඉබේම සමාජෙන් ඈත් වෙන්න ගන්නවා.. හැබැයි එයාගෙ හොඳ කමක් තියෙනවා

@Shan

පොත පතට හුරු වුණු එක.. එයාගෙ ලෝකෙම තියෙන්නෙ පොතේ.. පොතක් අතට දීලා කාමරේක තිබ්බොත් දවසෙම නොකා නොබී හරි කියවනවා.. ඒකෙන් එයා බාහිර ලෝකෙත් එක්ක තියන කනෙක්ශන් එක සම්පූර්නෙන්ම බිඳලා දානවා..

දැන් ප්‍රශ්නෙ මෙහෙමයි.. පොඩි කාලෙන්ම ලමයෙක්ගෙ කොන්ද කඩලා දානවා.. ඉතින් ඒ ළමයා ලොකු වුණාට පස්සෙ වැඩිහියන්ගෙ බලය ඉස්සරහා නැගිටගන්න බෑ.. එයාලට පණක් නෑ.. ඇත්තම කතාව කියන්න එපැයි බං.. පණ නෑ.. ඕකයි ඔතන තියන ලොකුම ප්‍රශ්නෙ.. එයාට ආදරේ ඕනම කාලෙ ඒක නෑ.. ආරක්ශාව කියලා කොටු කරගත්තු එකෙන් එයාට ආරක්ෂාව දැනෙන්නෙ නෑ.. ශාක්‍ය හරි සොෆ්ට් ප'සනැලිටි එකක් තියන ළමයෙක්.. මම ඉස්සර ඉඳලම දන්නවා.. හැබැයි හොඳට හිතන්න පුළුවන්..

කැම්පස් කාලෙ මම අධ්‍යාපන මනෝ විද්‍යාව පොඩ්ඩක් කලා.. ඕකෙ තියනවා ටයිම් අවුට් කියලා ක්‍රමයක්.. ඒකෙදි කරන්නෙ ළමයෙක් වැරැද්දක් කරනවනම්.. පුලුවන් තරම් එයා එක්ක ඒ ගැන කතාකල්ලා වැරැද්ද වටහලා දෙන්න බලනවා.. ගහලා බැනලා ළමයි හදන්න බෑ.. එහෙම පුළුවන් ඒකට විදියක් තියෙනවා.. දැන් උඹව අපි හැදුවෙ.. මම කියන්නෙ ඒ වගේ.. සැර කළත් ඒකට ක්‍රමයක් තියෙනවා බං.. මේක තනිකරම මානසික අපයෝජනය.. හරිනම් මේවට නඩු දාන්නත් පුළුවන්.. ආධ්‍ය හොඳයි.. රධ්‍ය..! ඒ ළමයා ගැන කතාකරන්න මට වචන මතක් වෙන්නෙත් නෑ.. ඉස්සර ශාක්‍ය කියලා අඬනවා.. මල්ලිට අප්පච්චි ගහනවා එයාට ඉවසගෙන ඉන්න බෑ කියලා.. අම්මපා මම නම් කියන්නෙ ඔහොම උන්ට අප්පච්චිලා කියන්න වටින්නෙ නෑ.. ළමයි ගැන ගෑණි ගැන හරියට හොයන්න බලන්න බැරිනම් එක්කො නොබැඳ ඉන්න ඕන.."

" මම.."

" ඔක්කොමත් හරි ඕකා නිසා මට යන්න වුණා අර හද්ද වන්නියෙ.. ට්‍රාන්සර් කල්ලා.. ඒ අස්සෙ කිව්වා ආයෙම ආවොත් ශාක්‍යට කරන දේ බලාගනින් කියලා.. ඒ කාලෙ මට අකමැත්තෙන්ම අයින් වෙන්න වුණේ අධිකාරි ශාක්‍යට පන්න පන්න වද දෙන්න ගත්තා.. ඒකා කොහොමත් පිට මිනිස්සුන්ගෙන් පලි ගන්නෙ නෑ.. තමන්ගෙම එවුන්ගෙන් ඒක පිට කරනවා මිසක්.. අන්තිමට මම අයින් වුණා.. බලාගෙන ඉන්නෙ කොහොමද බං.. මම හිතුවෙ ශාක්‍ය හොඳ ගෑණියෙක් කසාද බඳී කියලා..

@Shan

තාත්තා කෙනෙක් වුණාමවත් හරි කෙලින් තීරණ ගනී කියලා.. මට එතන තමා ලොකුවටම වැරදුනේ..

මට ඕන ටික ටික හරි එයාගෙ මේ පවුල එක්ක තියන කනෙක්ශන් එක කඩලම දාන්න.. ඒක ඕන නෑ.. රධ්‍ය විතරක් හිටියම හොඳටම ඇති.. ඒකත් දැන් සීමාවකට එන්න ඕන.. මම ට්‍රයි කරනවා මොකක් හරි කරන්න.. මේකා මැරෙයි බං මෙහෙම ගිහිල්ලා.."

මාමාමග් එක අතට ගුලි කරගෙන බිම බලාගත්තා.. එයාට තව කියාගන්න බෑ කටහඬ හිරවෙන්න යනවා.. මට දැන් තේරෙනවා ඇයි ආධ්‍ය අයියගෙ හැසිරීම මෙහෙම කියලා.. මට අප්පච්චි ගැන දැනෙන කලකිරෙන ගතිය එන්න එන්නම වැඩි වෙනවා.. මේ කතාවෙන් පස්සෙ මට සම්පූර්නෙන්ම එපා වුණා..

" මාමා හරි කියලා හිතෙන දෙයක් කරන්න.. මේ සැරේ ආධ්‍ය අයියව අතාරින්න එපා.. එයාට මේවා දරාගන්න බෑ.."

" එකක් නෙමේ.. මන්දා.. උඹ හිතහන්, මට කැලි වලට කැඩිච්ච වීදුරුවක් අතට දීලා තිබ්බ විදියට හදපන් කිව්වහම.. මම කොහොමද බං එහෙම කරන්නෙ.. අදත් හවස මම කෑගහපු එක වැරදී.. ඒත් කේන්තියනවා.. මාත් මනුස්සයෙක් නෙ.. අපේ ගෙවල් වල ප්‍රශ්නයි.. කීයක්ද.."

" මට තේරෙනවා.."

" බලමු මොකක් හරි කරන්න.. ශාක්‍ය ඇහැරුණාම මට කෝල් එකක් දෙනවද කොල්ලො.. මම පොඩි වැඩ වගේකට එළියට යන්න කියලා.."

" හා මම කතාකරන්නම්.. බෙහෙත් දුන්නනම් අයියා අවදි වෙන එකක් නෑ දැන්ම.."

මාමා නැගිටලා මග් එක සෝදලා මං ගාවට ඇවිත් කොණ්ඩෙ අවුල් කලා..

" උඹවත් අඩුම තරමෙ තේරුම් අරන් ඉන්න එක හිතට සැනසීමයි.."

මාමා මගේ කරේ තිබ්බ ටවල් එකත් අරගෙන කාමරේට ගියාම මම ඒ දිහා බලාගෙන හිටියා.. හිතට හිතන ඕනමයි කියලා දේවල් හුඟාක් ගලාගෙන එනවා.. ඒත් කොහෙන් පටන්ගන්නද හිතාගන්න බෑ.. මම මග් එකේ තිබ්බ

@Shan

කෝපි මණ්ඩි ටික සින්ක් එකට හලලා ඒක හෝදලා කුස්සියේ ලයිට් එකත් නිමාගෙන මගේ කාමරේට ගියා.. ඉස්කෝලෙ වැඩ තොගයක් තියෙනවා ඉවරකරන්න..

මගෙ දළඹුවනේ.. මම ආවා.. ඔයලට කතාව සංකීර්ණයි වගේනම් මට කියන්න පුලුවන්ද.. සංකීර්නයි කියනෙ තේරෙන්නෙ නෑ ප්‍රශ්නාර්ත ඉතුරුවෙලා තියෙන තැන්.. මම හිතනවා මම හොදට ලියලා ඇති කියලා.. අනික ඔයාලගෙන් මට ලැබෙන කියලා නිම කරන්න බැරි සහයෝගයට මම කොහොම ස්තුති කරන්නද හිතාගන්න බෑ.. මම ආදරේම ආදරෙයි.. ආ මට කවර්ස් ගොඩක් හම්බුණා.. ඊළඟ වැප්පෙ ඒ ටිකත් දාන්නම් හොදේ..

අනුරාග් කියපු දේවල් වලට සම්බන්ධ පොඩි ආටිකල් වගයක් මම කියවලා තියෙනවා.. මට ළමයි නෑ තමා.. මම හෙන පඩි වදන් දෙන්නෙ නෑ.. ඒත් ඔයාලා එක්ක බෙදාගන්න හිතුණා ඒ ගැන.. කතාවටත් එහෙන් මෙහෙන් සම්බන්ධ නිසා මේක දාන්න හිතුනේ.. කවදාහරි ඉතින් මෙව්වා කියවන දළඹුවොත් දලඹු අම්මලා තාත්තලා වෙනවනෙ.. දැනටම මම දන්න අම්මිලා කීපදෙනෙකුත් ඉන්නවා.. 😘

එන්නාම්.. ලව් යූ.. ❤

පළවෙනි දේ,

"මාව අම්මලා හැදුවෙ ගහලාය. මම හොදය. එනිසා ළමයින්ට ගහන එක හොදය"

කියන සූත්‍රය පොඩ්ඩක් පැත්තකින් තියන්න වෙනවා දරුවන්ට ශාරීරිකව වද දීමේ හොඳ නරක ගැන කතා කරන්න නම්. මොකද ලෝකේ ඉන්න ඕනම කෙනෙක්ට අනුව තමා හොඳ කෙනෙක් තමා. ඕක මෙ සටහන කියවන අයියලට අක්කලට විතරක් නෙමේ. බඩේ බෝම්බයක් බැඳගෙන තමාව පුපුරගන්න හදන ඉස්ලාම් අන්තවාදියටත් පොදුයි. එනිසා ඒ සූත්‍රය පැත්තකින් තියමු මුලින්ම.

මෙතන තියෙන ප්‍රශ්නය මේකයි.

දරුවෙක්ව හදන්න, ඒ කියන්නේ දරුවෙක්ව සදාචාරාත්මක වර්ධනය කරන්න ඔහුව/ඇයව ශාරීරික වධහිංසාවට (වේදනාවට) සහ ලැජ්ජාවට පත් කිරීම කල යුතුද නැද්ද කියන එක. (පාසැලක වගේ නම් මේක වෙන්නේ

@Shan

ප්‍රසිද්ධියේ, පවුලක වගේ නම් තමාගේ සහෝදර සහෝදරියන් ඉදිරියේ වෙන්න පුළුවන්)

මුලින්ම කියන්න ඕන දරුවෙකුට ගහන එකෙන් කෙරෙන්නේ ඔහුගේ/ ඇයගේ හැසිරීම පාලනය කිරීම පමණක් බව. ඒ, දරුවාව බිය වැද්දීම මගින්. මෙතනදි බොහෝ විට ශාරීරික වේදනාවට පත් කිරීම (වේවැල් වලින් පහර දීම, ඉස්සර නම් ගහක බැඳලා දිමි ගොටු ඇමීම, දණ හැස්වීම) සහ තර්ජනය කිරීම (ආයේ කලොත් කටේ මිරිස් දානවා) , ලැජ්ජාවට පත් කිරීම (තෝ වගේ බූරුවෙක්, තොපිව හැදුවට වඩා හොඳයි යකෝ හරකෙක් හදා ගත්තනම්) වගේ ක්‍රම භාවිතා වෙනවා.

මේ දේවල් වලින් වෙන්නේ දරුවාව පාලනය කිරීමක්. බිය වැද්දීමක්. බිය වැද්දීම තුළින් සිදුවන්නේ අවබොධය තුළින් වන සදාචාරාත්මක වර්ධනයක් නෙමේ. තමාට වඩා බලවත් අධිකාරී බලයකින් (authoritative figure එකකින් ) එන නියෝග කොන්දේසි විරහිතව, ආපසු ප්‍රශ්න කිරීමකින් තොරව පිළිගන්න ළමයා පුහුණු කිරීමක්.

මේ මගින් ළමයාට මානසිකව වෙන හානිය ඉතා විශාලයි.

අධිකාරී බලයට බියෙන් නියෝග පිළිපදින දරුවා තුළ බිය මිසක හරිවැරැද්ද ගැන සැබෑ අවබෝධයක් නැහැ. අම්මා නැති වෙලාවට හොරෙන් සීනි කන ළමයා තමා පොලිසිය නැති බව දන්නා අතුරු පාරවල් වල හෙල්මට් එක නැතුව යන්නේ. මොකද ළමයාගේ හැසිරීම තීරණය වෙන්නේ අවබෝධය තුළින් නෙමේ, බිය කියන සාධකය මත නිසා. මොකද සීනි හොරෙන් කන එකේ හරි වැරැද්ද වගේම හෙල්මට් එක ඇම්මේ උවමනාව ගැනත් අවබොධයක් නැහැ. තමාගේ වැරැද්ද අල්ලලා දඬුවම් කරන්න කෙනෙක් නැත්නම් ඕනම ජඩ වැඩක් කරන සමාජයක් බිහි වෙන්නේ මෙහෙමයි.

ඊටත් වඩා දරුණුම දෙය තමා ළමයින්ගේ පෞරුෂත්වයට වෙන හානිය. ගොඩක් දරුවන් අම්මලාට තාත්තලාට බයයි. විශේෂයෙන්ම වැරදි කලාම ගුටි දෙන අම්මලා තාත්තලාට. ඉස්කෝලෙදී ගුරුවරුන්ට බයයි. ප්‍රින්සිපල්ට බයයි. ඒ කියන්නේ අදාල සිස්ටම් එකක් තුළ අධිකාරී බලය ඉස්සරහා ඇඹරෙන, දෙකට නැමෙන, සද්ද නැතුව ඉන්න, කීකරු බලු නකුටෙක් තමා මේ දෙමාපියනුයි, ඉස්කෝලෙනුයි කෙව්ටෙන් දක්කලා හදන්නේ.

ඉතින් මේ ළමයි තමා අර කව්ද කිව්වා වගේ බස් එකේදී කොන්දොස්තරට බය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගියාම එතන ඉන්න කැෂියර්ට පවා

@Shan

බය, ඉස්පිරිතාලෙට ගියාම එතන ඉන්න ඇටෙන්ඩර්න්ට්ලට බය, මන්ත්‍රීට බය, ඇමතිට බය, රජයට බය.. හැම දේටම බය නැට්ට පුකේ ගහගෙන ඉන්න කොන්ද පණ නැති ජාතියක් ඇති වෙන්නේ මෙහෙමයි.

තව එක දෙයක් කියන්නම්. මෙතන ඉන්න අය ගොඩක් වෙලාවට ළමයින්ට ගහන එකේ ඇත්තම හේතුව ළමයින්ව හොඳ පුරවැසියන් කරන එක නෙමේ. තමාට ළමයින්ගෙන් තියෙන කරදරෙන් මිදෙන්න. තමාගේ එදිනෙදා ජීවිතයේ පීඩනය ළමයාගේ ගොන් වැඩ වලින් තවත් වැඩි වෙන නිසා ඒ පීඩනය මුදා හරින්නයි ළමයට ගහන්නේ. "මම තොට කිව්ව නේද සැරයක්" කියල..ඒක තමයි ඇත්ත.

හයක් හතරක් නොතේරෙන ළමයෙක්ගේ ගොං වැඩ ඉවසන්න බැයි නම් ඔබ දෙමාපියෙක් වෙන්න සුදුසු කෙනෙක් නෙමේ. අපි හැමෝම මේ ලෝකෙට ළමයි ගේන්නේ අපේ ආසාවල් ඉෂ්ඨ කරගන්න, උවමනාවල් ඉෂ්ඨ කරගන්න. කවුරුත් ඇවිත් කන් දෙකට කෑගහන්නේ නැනේ 'අනේ අපිව මේ ලෝකෙට බිහි කරපල්ලා' කියල.

ඉතින් එහෙම තමාගේම කැමැත්තෙන් මේ ලෝකෙට ගේන ඒ අසරණයින්ගේ වැඩ ඉවසන්න බැයි නම්, ඒ තරම් හික්මීමක් නැත්නම් එක්කෝ සරමේ පිහා ගන්න, නැත්නම් කොන්ඩම් එකක් දාගන්න. ඒකයි වඩා හොඳ.

ලෝකේ දියුණු රටවල සත්ව හිංසාවට පවා නීති තියෙනවා. අපේ රටෙත් වැඩිහිටියෙක් තවත් වැඩිහිටියෙක්ට පහර දුන්නොත් නීතිය ඉදිරියට යනවා. ඒත් හයක් හතරක් නොතේරෙන, අසරණ දරුවන්ට පහර දෙන්න කිසිම කෙනෙක්ගෙන් තහනමක් නෑ. ඒ පහර කන එකෙන් තවමත් වැඩෙන මනසක් තියෙන ඒ දරුවන්ගේ මානසිකත්වයට වෙන බලපෑම ගැන හිතන්න එකෙක්ටවත් උවමනාවක් නෑ.

තව දෙයක්, මේකෙන් කියවෙන්නේ නෑ ළමයින්ගේ වැරදි වලට දඬුවම නොකර බලාගෙන ඉන්න ඕන කියලා. දඬුවම් කරන්න ඕන. ළමයාට හානියක් නොවන විදිහට.

උදාහරණයක් කියනව නම්, දරුවෙක් පාඩම් න්කර, ගෙදර වැඩ නොකර ඉන්නවා කියල හිතන්න. දරුවව ගෙනල්ලා වේවැලෙන් පුකට නෙලලා, දරුවව බිය වද්දලා, අපහාස කරලා දරුවාගේ මනස විනාස කරන එක නෙමේ කරන්න ඕන.

@Shan

දරුවාට අවබෝධය එන විදිහට දඩුවම් දෙන එක.

"පුතේ, අම්මයි තාත්තයො ඔයාට ගොඩක් ආදරෙයි. ඒත් පුතා මේ කරන වැඩේ ගැන නම් අපි කොහෙත්ම කැමති නෑ. ඔයා තේරුම් ගන්න ඕන ඉගෙන ගන්න එකේ වැදගත්කම. අපි ඔයාට කොච්චර ආදරේ වුනත් ඔයා මේ කල දේ ගැන දුකයි. දැන් ගිහින් ගෙදර වැඩ ටික කරලා එන්න. එතකන් අපි එක්ක කතා කරන්න එන්න එපා"

මෙන්න මේ වගේ දඩුවම් තමා ළමයින්ට දෙන්න ඕන. අම්මයි තාත්තයි කුණුහරපෙන් බැණ ගන්න., පොඩි දේකටත් මරා ගන්න පරිසරයකනම් ළමයා මෙහෙම කිව්වට සතේකට ගනන් ගන්න එකක් නෑ. මොකද හිංසාකාරී පරිසරය ළමයාගේ මනස තුළ සාමාන්‍යකරණය වෙලා නිසා. නමුත් අම්මයි තාත්තයි තමා එක්ක කතා නොකරන එකත් ශොක් එකක් තරම් වන ආදරයෙන් පිරුණ සාමකාමී පරිසරයක හැදෙන ළමයාට ඔය වගේ දඩුවමකුත් ලොකු බලපෑමක් කරනවා.

හැම දේකටම ගුටිකන ළමයා හිතන්නෙ ප්‍රශ්නවලට උත්තරේ හිංසාව කියලා. ඌ තමා ලොකු වෙලා කියන දේ අහන්නැති කෙල්ලට ගහන්නේ, පාරේ අනතුරක් වුනාම බස් එක කුඩු කරලා ඩ්‍රයිවර් ගේ අඩු කඩලා බස් එක ගිණි තියන්නේ. අපරාධ වලට එල්ලුම් ගහ ඕන කියන්නේ. මොකද දරුවා පොඩි කාලෙයේ ඉඳලා හැදුනේ ප්‍රශ්න වලට පිළිතුරු තියෙන්නේ හිංසාව කියන පරිසරයක් තුළ නිසා..

මගේ පියා කුඩාකාලයේ කළ වැරදි වලට දඩුවම් ලෙස ඔහුගේ පියා ඔහුව ගසක බැඳ දිමි ගොටු දැමූ අයුරු ගැන කථා මා කුඩා කාලයේ සිටම අසා තිබුණි. ඔහු එය මා හා පැවසුවේ ආඩම්බරයෙනි.රාජසභාවේ කිවිසුමක් යෑම වැනි වැරදි වලට පවා සිර රටවැසියන්ව උල තැබූ, රාජ උදහසට ලක් වූවන්ව ප්‍රසිද්ධියේ හිස ගසා, ඇතුන් ලවා පාගවා මැරූ රාජාණ්ඩු ක්‍රමය වර්ණනා කරන්නෙකු වූ මගේ සීයා තම දරුවාව යහමග යැවීමට සුදුසුම ක්‍රමය දරුවාට කෲර ලෙස වධහිංසා පැමිණවීම යැයි සිතීම ගැන කිසිම දිනක මා පුදුම වූයේ නැත.

"වේවැල් කෝටු නාරං සියඹලා අතු

කිතුල් පොල් ඉරටු වැල් කහඹිලිය අතු

මෙවැනි ඉපල් මගේ දැසට නොපෑ යුතු

@Shan

පමා නොවී යම් අකුරට මෙයින් මතු"

මීට දශක කිහිපයකට පෙර පැවති තත්ත්වයට සාපේක්ෂව වර්තමානය ගැන සතුටු විය හැකි බව සැබැවකි.එහෙත් අපරාධකරුවන්ට පවා මානව අයිතිවාසකම් ලබා දී ඇති, මනුසතුන්ගෙන් නොනැවති තිරිසනුන්ටද හිංසාවට පත් නොවීමට නීති රෙගුලාසි පනවා ඇති ලෝකයක, අප රටේ දිනපතාම දෙමව්පියන් සහ පාසැල් ගුරුවර ගුරුවරියන් අතින් ශාරීරික සහ මානසික වධහිංසාවට ලක් වන දරුවන් ගණන නොගිණිය හැකි තරම් වීම, සැබවින්ම අවාසනාවන්ත තත්ත්වයකි.

"සර් හොඳට ගහන්න. ගැහුවේ නැතිනම් මුන්ව හදන්න බෑ"

හයක් හතරක් නොතේරෙන කුඩා දරුවන්ව තමාට අවැසි අයුරින් හැඩගස්වා ගැනීමට පහර දෙන වැඩිහිටියන් එසේ කරන්නේ ඔවුන්ගේ වචනයෙන් නම් "දරුවන් නාස්ති වීමට ඉඩ නොදී" හදා ගැනීමටය.ඔවුනට අනුව හැඳි නොගා හදන හොද්දෙයි නොගහා හදන දරුවාගෙනුයි වැඩක් නැත.මිනිස් ශිෂ්ටාචාරය කෙමින් කෙමින් සදාචාරාත්මකව පරිණාමය වන අතරතුර අප කරන්නේ, වත්මනට කොහෙත්ම වැදගත් නැති, කල් ඉකුත් වී, මළකඩා කා ඇති රුවන් වැකි දෙසා බාමින් සමාජයේ දුර්වලම, අසරණම, අහිංසකම කොටස වන අප දරු පරපුර මත තම පීඩනය මුදාහැරීමය.

තමා පරිපූර්ණ මිනිසෙක්ය යන උද්දච්ඡ හැඟීමෙන් යුත් බොහෝ දෙමාපියන්, තම දරුවාට පහර දෙන්නේ තමාගේම අච්චුවක් හෝ තම ෆැන්ටසිය තුළ ජීවත් වන පරිපූර්ණ මිනිසෙකු හෝ ගැහැණියක තම දරුවා තුළින් නිර්මාණය කර ගැනීමටය.

ඔවුන් තම දරුවන්ට පහර දෙන්නේ කුඩා කාලයේදී සිය වැඩිහිටියන්ගෙන් ලැබුනු දඬුවම් නිසා තමා හොඳ මනුස්සයෙකු වූ හැටි ගැන පාරම්බාමිනි.

"අපේ තාත්තා අපිට ගැහුවේ බෙල්ට් එකෙන්. අපි අද මේ විදිහට ඉන්නේ තාත්තට පින් සිද්ධ වෙන්න"

කොපමණ සාධාරණීයකරනය කිරීම් ඉදිරිපත් කලද යමෙක් දරුවන්ට පහර දෙන්නේ දරුවාගේ හැසිරීම තමන්ට රිසි සේ පාලනය කිරීමේ අරමුණින් මිස, මනුෂ්‍ය සංහතියට යහපත් සදාචාරාත්මක ගතිගුණ වලින් හෙබි පුරවැසියෙක් බිහිකිරීමේ අරමුණින් නොවේ.ජීවිතයේ තමාට මුහුණ දීමට සිදුවන ප්‍රශ්න වලින් එකක් ලෙස සිය කුඩා දරුවාගේ නොමනා හැසිරීම

@Shan

දකින වැඩිහිටියා පහර දීමෙන් දරුවා මෙල්ල කොට, එම ප්‍රශ්නයට සොයන්නේ තාවකාලික විසඳුමක් පමණි.දීර්ඝ කාලීනව දරුවාට ඉන් ඇතිවන බලපෑම ගැන සිතීමට ඔවුනට උවමනාවක්, හැකියාවක් හෝ කාලයක් නැත.

තමා දරුවන්ට පහර දෙන්නේ ඔවුනට ඇති ආදරය නිසාය යනුවෙන් බොහෝ දෙමාපියන්, ගුරුවරුන් පැවසුවද (නොසලකා හැරිය හැකි තරම් සුළු අවස්ථා ප්‍රමාණයකදී හැර) බොහෝ අවස්ථා වලදී එය මිත්‍යාවකි. පහර කෑම් ලෙස දරුවා මතින් පිටවන්නේ බොහෝ වෙලාවට දෙමාපියන්ගේ එදිනෙදා ජීවිතයේ පීඩනයන්ය.වෙනයම් කෙනෙකු නිසා හෝ දරුවාගේ වරදක් නිසා ඇති වන කෝපය, කලකිරීම, සිත් රිදීම, පිළිකුල වැනි හැඟීම්ය.

"මහන්සි වෙලා ගෙදර ආවා විතරයි"

පහර දීම මගින් බියවද්දා දරුවෙකු තමාට කීකරු කර ගැනීමට උත්සහ කරනා යම් වැඩිහිටියෙක් වේ නම් ඔහු/ඇය පෙන්නුම් කරන්නේ දෙමාපියෙකු වශයෙන් සිය නොඉවසිලිවමත් බවය.සිය දරුවා සමඟ සහසම්බන්ධයක් ගොඩනගා ගැනීමට තමාට ඇති නොහැකියාවය.ගුරුවරයෙකු නම් ඔහු පෙන්නුම් කරන්නේ සිය වෘත්තිය අසමර්ථකමය.මෙම පහර දීම් මගින් සිදුකරන්නේ දරුවාව තාවකාලිකව පාලනය කිරීමක් පමණකි.

මෙසේ දරුවාගේ හැසිරීම් පාලනය කිරීමට;ශාරීරික වධවේදනා වලට ලක් කිරීම (උදා – වේවැල් වලින් පහර දීම, දණ ගැස්වීම, අතින් පහර දීම, පෙර කාලවලදී ගස් වල බැඳ දිමි ගොටු දැමීම)තර්ජනය කිරීම (උදා – ආයේ කලොත් කටේ මිරිස් දානවා, අඩු කඩනවා, ගෙදරින් එලෝනවා)නිග්‍රහ කිරීම මගින් ලජ්ජාවට පත් කිරීම (උදා – තෝ වගේ බූරුවෙක්, උඹ මුකුත්ම කරගන්න බැරි නිකමෙක්, උඹ තමා පන්තියේ ඉන්න මෝඩයා) වැනි ක්‍රම භාවිතා කෙරේ.මෙවන් ක්‍රම මගින් සිදුවන්නේ දරුවාව බිය වැද්දීම මගින් තමාට වඩා උසස් අධිකාරී බලයකින් (authoritative figure) පැමිණෙන විධාන කොන්දේසි විරහිතව අනුගමනය කිරීමට පුහුණු කිරීමක් මිස, දරුවා තුළ සැබෑ අවබෝධයෙන් සිදුවන සදාචාරාත්මක ගුණවගාවක් නොවේ (මෙම ක්‍රමය සුනඛයෙකු පහර දී හීලෑ කිරීම හා සමානය)

වරදට හේතුව පහදා දී එය නැවත නොකරන්නට අවවාද කිරීම සහ වරදට දුටු විට මුරුගයෙකු මෙන් පහරදීම එක හා සමාන නොවේ.පළමු

@Shan

අවස්ථාවේ දරුවා වරද තේරුම් ගනියි, ඉන් පසුව එයින් වැළකී සිටියි. දෙවැනි අවස්ථාවේ දරුවා පහර කෑමේ බය නිසා හැසිරීම පාලනය කර ගනී.පළමු ක්‍රමය දුෂ්කරය පළදායකය, දෙවැනි ක්‍රමය පහසුය, තාවකාලිකය.අධිකාරී බලයෙන්, තාවකාලිකව දරුවාගේ හැසිරීම් පාලනය කල හැකි වුවත් දීර්ඝ කාලීන වෙනස්කම් දැකිය නොහැකිය.

අම්මාගේ ගුටිය නොලැබෙන බවට සහතික වූ විට හොරෙන් සීනි කන කුඩා ළමයා, පොලිසිය නොමැති යැයි අනුමාන කරන පාරවල් වල හිස්වැසුම් නොපළඳා මෝටර්බයිසිකලයේ යන වැඩිහිටියකු බවට පරිවර්තනය වන්නේ මේ හේතුවෙනි.ඔහුගේ හැසිරීම් තීරණය වන සාධකය වන්නේ අධිකාරී බලයක උකුසු ඇස මිස පුද්ගලාවබෝධය නොවේ.තමා කරනා වැරැද්දකට දඩුවම් දීමට කෙනෙකු නොමැති විටක ඕනෑම ජඩ වැඩක් කිරීමට නොපැකිළෙන මිනිසුන්ගෙන් පිරි සමාජයක් බිහිවන්නේ මෙලෙසිනි.

අප හමුවේ ඇත්තේ සරල පැනයකි.(බොහෝ විට) ප්‍රසිද්ධියේ කෙරෙන ශාරීරික වධහිංසාවෙන් (වේදනාවට) සහ ලජ්ජාවට පත් කිරීමෙන් දරුවෙක්ව සදාචාරාත්මක ගුණවගාවකින් යුත් යහපත් මානසිකත්වයකින් හෙබි මනුෂ්‍යයෙක් බවට පත් කල හැකිද? නොහැකිද?මනෝ විද්‍යාඥයන්, අධ්‍යාපන විද්‍යාඥයන් හා දරුවන් සම්බන්ධ පර්යේෂණ කරනු ලැබූ විද්වතුන් නැවත නැවතත් තහවුරු කොට ඇත්තේ මෙවන් පහර දීම් නිසා දරුවා යහපත් හැසිරීම් පෙන්නුම් කරනවා වෙනුවට තවත් දරදඬු හැසිරීම් පෙන්නුම්කරනා බවය.වැඩිහිටියෙකු වූ පසුව කුඩා කල විඳි පීඩාවන් සමාජයට මුදා හරින බවය.

එසේම, විශේෂයෙන් පාසැලේදී ගුරුවරුන් (මොවුනට ගුරුවරු කියා ඇමතීමද ගුරු වෘත්තියට කරනා නිගාවකි) ප්‍රසිද්ධියේ දෙන ශාරීරික දඬුවම් සහ ප්‍රසිද්ධියේ කරනා ලජ්ජාවට පත් කිරීම් නිසා දරුවාගේ පෞරුෂත්වයට සිදුවන හානිය සුළුපටු නොවේ.අපේ මිනිසුන්, බස් එකේ යද්දි කොන්දොස්තරට බයය, ප්‍රාදේශීය ලේකම් කාර්‍යාලයකට ගිය විට මුදල් අයකැමිට බයය, ඉස්පිරිතාලයට ගිය විට සාත්තු සේවකට බයය, දොස්තරට බයය, තම ඡන්දයෙන් පත් කරන දේශපාලකයාට බයය.

මෙසේ අධිකාරී බලයෙන් හෙබි පුද්ගලයා ඉදිරියේ දෙකට නැමෙන, ඇඹරෙන, නැට්ට කකුල් දෙක අස්සේ ගහගෙන සිටිනා නිවට කීකරු බයාදු මිනිසුන් නිර්මාණය වන්නේ කුඩා කලදී දෙමව්පියන් සහ

@Shan

විදුහල්පතිවරුන්ගේ වේවැල මඟින් මොට කර දමනු ලැබූ පරපුරක හීන වූ පෞරුෂය හේතුවෙනි.එසේම පීඩනයන් යටතේ තම දෙමාපියන් හැසිරෙන ආකාරය නිරීක්ෂණය කරන දරුවා වැඩිහිටියෙක් වූ පසු එවන් අවස්ථා වලට ප්‍රතිචාර දක්වන්නේද තම දෙමාපියන් ප්‍රතිචාර දැක්වූ විලසටමය.තමාගේ අණසකට යටත් නොවන දරුවාට පමණක් නොව, බිරිඳට, පෙම්වතියට පවා පහර දෙන සැමියන් සහ පෙම්වතුන් බිහි වීමට ඔවුනගේ ළමා වයසේ අත්දැකීම් බලපාන්නේ මෙලෙසය. එසේම තමාට මුහුණ පෑමට සිදුවන ගැටළු වලට විසඳුම හිංසාව (violence) තුළින් සෙවීමට උත්සාහ කරනා මිනිසුන් බිහිවීමටද ළමා වියේ අත්දැකීම් දැඩි ලෙස බලපායි.

ලෝකයේ දැනටමත රටවල් 44 ක දරුවනට, නිවසේදී හෝ පාසලේදී පහරදීම නීතියෙන් තහනම් කොට ඇත මූලාශ්‍ර අප රටේද යම් තාක් දුරකට නීති සම්පාදනය කොට තිබුනත්, නීතිය ක්‍රියාත්මක කිරීමට සමාජය දක්වන්නේ මැළිකමකි.ඒ බොහෝ විට නීතියේ පිහිට පතන දෙමාපියන් සහ දරුවන් දෙස සමාජය 'ගුරු දෙවියාට' එරෙහි වූ ද්‍රෝහියන් සේ දකින නිසාය.දරුවෙක් බිහි කිරීමට බලාපොරොත්තු වන යම් වැඩිහිටියෙක් වේ නම්, ඔහුට/ඇයට හයක් හතරක් නොතේරෙන දරුවෙකුගේ නොහොබිනා ක්‍රියා දෙස ඉවසීමෙන්, උපේක්ෂාවෙන් බලා හැඟීම් වලට යටත් නොවී බුද්ධිමත්ව වැඩිහිටියෙකු සේ දරුවාගේ අනාගතය ගැන සිතා ප්‍රතිචාර දැක්වීමට නොහැකි නම් ඔහු/ඇය දෙමාපියෙකු වීමට සුදුසු නැත.දරුවෙකු බිහිකිරීමට සුදුසු නැත !ඔබ, අනෙකා මත තම පීඩනය පටවන පරපීඩිකයෙකු නම්,

සමාජයට සහ මිනිස් සංහතියට ඔබට කළ හැකි ලොකුම සේවය නම් දරුවෙකු බිහි කිරීම ගැන දෙවරක් සිතා බැලීමයි !

පෙර සඳහන් කල පරිදිම ආදි කාලයේ රුවන් වැකි සිහිකරමින්, කල් ඉකුත් වූ කසිකබල් ආකල්ප කරේ තියාගෙන සිය දරුවන් මත හිංසාව පතුරවන වැඩිහිටියෙකු නම් මින්පසු සිය දරුවාට පහර දීමට සිය අත හෝ වේවැල උස්සන විට කරුණාකර මේ වදන සිහි කැඳවා ගන්න,

-උපුටා ගැනීමකි-

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

@Shan

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 113 කොටස

" මේ කවුරුහරි එන්න කලින් ශේප් එකේ බැහැපන් සනෙරුවා.."

" ඉඳපන් ඉතින් රෙද්ද.. උඹ පොඩ්ඩක් සපත්තු දෙකත් දාන් නැඟලා බලපන් මෙකට.. ඔය කියන ඉක්මනට කඩන්න පුළුවන්ද කියලා.."

මම ඇත පේන අඹ ගෙඩියට අමාරුන් අත දික් කල්ලා ඒක නැට්ටෙන්ම කඩලා අරගෙන වැටෙන් එහාපැත්තෙ ඉඳපු චමිරුට විසික් කලා.. අපි තුන්දෙනා විතරයි අද ටොප් බෝඩ් එකෙන් ඉස්කෝලෙ ඇවිත් තියෙන්නෙ.. නෆ්‍රාස් පල්ලි යනවද මොකක්ද කිව්වා.. ජොනතන් ෆෙට අනිද්දා තියන බිග් මැච් එකට උඩ පැනගෙන සෙල්ලම් කරනවා.. රූම් එකේ ඉන්න කම්මැලි නිසා අපි අඹ කඩන්න ආවා.. මේවා කඩන්න ගිහින් තමා සැරයක් රධ්‍ය අයියා මගේ කලිසම මහලා දුන්නෙ.. ඒ අස්සෙ මට රධ්‍ය අයියව මතක් වෙලා දුක හිතුණු නිසා අඹ කඩන එක නතර කල්ලා ගහේ අත්තකින් ඉඳගෙන ගහ දෝතින්ම බදාගත්තා.. මම මෙකට නගින්නෙ අට වසරෙ ඉඳලා..

" මොකද බං ඔය.. සර් කෙනෙක් මැඩම් කෙනෙක් එන්න කලින් පහලට වරෙන්.."

" මට රධ්‍ය අයියව මතක් වෙනවා.."

" මේහ්.. බැහැලා මතක් කරපන්.. මාත් එන්නම් මතක් කරන්න.."

" උඹට තේරෙන්නැනෙ මගේ දුක.. උඹලා පලයන් මම පස්සෙ එන්නම්.."

මම පහළ ඉන්න සෙනුකයා එක කතාකරද්දි චමිරුවා කම්බි වැටෙන් රිංගලාගහ ගාවට ආවා..

" ඇයි..??"

" මූට ගහෙන් බහින්න බැහැයි කියන්නෙ බං.."

" ෂනෙරු වැඩ තියනවා.. ඉක්මනට එන්න.."

@Shan

මම චමිරු දිහා බලන්නැතුව ඈත ඉන්න කාක්කෙක් දිහා බලාගත්තා.. සක්කිලි පරෙයියා ආවා මෙතන මාව ගහෙන් බස්සන්න.. බහින්නෙ නැමයි.. ඇයි ඌ මට මක් කරන්නද.. මට මුගෙ මූණට දෙකක් ඇනගන්නකන් නින්ද යන්නෙ නෑ..

" මම එන්නෑ.. මේ චමිරු පලයන්.. මම උඹ එක්ක කතාකරන්නෙ නෑ.."

සෙනුකයා මට දෙකක් රැව්වා..

" ඒ මොකද.."

" උඹට ඒකෙන් වැඩක් නැනෙ පලයන්.. උඹ ඊයෙ මගේ බෑග් එකට කටුස්සෙක් අල්ලලා දැම්මනෙ.."

" හරි බං ඉතින් විහිළුවක්නෙ සනෙරුවා.. මේ වරෙන්.. ඒ ඒ හාමුදුරුවො වඩිනවා.. ටසිරි අන්න.. තැඹිලි පාටට.. අද හරි.."

මම එකසැරේට ග්‍රවුන්ඩ් එකේ කොන බලද්දි ඉස්කෝලෙ හාමුදුරුවො සිවුර දරාගෙන හනිකට අපි දිහාට වඩිනවා.. මම පටස් ගාලා ගහෙන් බිමට පැනගත්ත පාර සෙනුකයගෙ ඇඟ උඩටම පතබෑවිලා ඌ චමිරුවව අල්ලගන්න ගිහින් චමිරුවත් සෙනුකයගෙ ඇඟ උඩට වැටුණා.. මගේ කොන්ද ලෙප්ට් මේ බූරුවො දෙන්නා ඇඟ උඩ පතබෑවිලා.. මම හුස්මගන්න බැරුව මැරෙන්න ගියා..

" ඒ නැගිටපන්.. හාමුදුරුවො.. හරි අද හරි.. පකයට කිව්වා.. මම කිව්වා.. බැහැපන් කියලා.."

චමිරුවා ඉක්මනට හාමුදුරුවො දැකලා නැගිටලා සෙනුකයටයි මටයි නැගිටින්න අත දුන්නා.. මම කොන්දත් අල්ලගෙන බොහොම අමාරුවෙන් නැගිට්ටහම හාමුදුරුවො අර සිවුරෙ පොට පිටිපස්සට කරගෙන අපි දිහා රවාගෙන බලාගෙන අපි දිහාට ආවා.. මම බිම බලාගෙන අතේ තිබ්බ අඹ ගෙඩිය පිටිපස්සට කල්ලා අල්ලගත්තා..

" බොහොම අගේ ඇති වැඩක් කල්ලා තියෙන්නෙ.. ඈ බං.. උඹලා ඔය හොරෙන් අඹ කඩනවද.."

@Shan

සෙනුකයා හෙන ගොං හීනාවක් හාමුදුරුවොන්ට දැම්මහම හාමුදුරුවො සෙනුකයගෙ පස්සට වේවැලෙන් තට්ටුවක් දැම්මා.. රිදෙන්න නෙමෙ පොඩියට තට්ටුවක් දැම්මා..

" උඹලා කලිනුත් ඔකම කල්ලා මගෙන් පස්සවල් රත් වෙන්න කාලා.. දැන් ලොකුවට බැජ් ගහගෙනත් ඒකම කරනවනෙ.. ලැජ්ජා නෑ උඹලට.. බලපන් අර කලින් බැජ් අරන් ඉදපු උන් ටික.. ඒකට මේක.."

මට දහසක් සිතුවිලි එකසැරේට ඔලුවට කඩාපාත්වෙන්න ගත්තා.. අනේ හාමුදුරුවො දන්නැනෙ ඒ උපාසකයො ටික කරපුවා.. එව්වා එළිපිට කරන්නැති නිසා හාමුදුරුවො දන්නෙ නෑ.. අපි පොඩ්ඩක් පේන්න කලාම ඒක තමා ඔක්කොන්ටම අමාරුව..

" සමාවෙන්න හාමුදුරුවනෙ.."

මම කරබාගෙන හාමුදුරුවොන්ගෙන් සමාව ගත්තා..

" කැවට කමක් නෑ ඔව්වා හෝදලා කනවා.. අර මදර්ස් කැන්ටින් එකෙන් ලුණු ටිකකුත් ඉල්ලගෙන.. අපි මේ කෑගහන්නෙ ඔව්වා කනවට නෙමෙ බොල.. ගහෙන් වැටුනොත් හෙම.."

" එහෙමයි හාමුදුරුවනෙ.."

" දැන් වැටෙන් රින්ගලා එනවලා මේ පැත්තට.. ඈ ෂනෙරු උඹ හැමදාම මේකෙ උඩම බඩගාන්නෙ.. උඹට දොළදුකද.. මේ අනිකා.. නැට්ට වගේ.. හැම නසරානි වැඩකට උදව් කරනවා.."

හාමුදුරුවො සෙනුකයට ඒ සැරේනම් වේවැලෙන් පිට මැද්දට එකක් දීලා මටත් දෙකතුනක්ම දුන්නා.. සැප් බැජ් ගහගෙනත් මෙහෙම ගුටිකන පලවෙනි හෙඩ් ප්‍රිෆෙක්ට් මම වෙන්නැති ඉස්කෝලෙ ඉතිහාසෙටම ඉදපු..

" එතකොට උඹ කවද්ද මුන් දෙන්නට වැටුණේ.."

හාමුදුරුවො මාරයි.. අපිට තඩිබාලා වමිරුවට අතක්වත් තිබ්බෙ නෑ.. මේවා මාර අසාධාරණ වැඩ තමා.. මට ඒකටනම් මල පැන්නා.. ඇයි ඌත් වැටෙන් රිංගලා මේ පැත්තට ආවනෙ.. අනිත් ඌ අඹත් කනවනෙ.. ඉදපන් අඹ ඇටේ අරගෙන ගහනවා මම මුගේ පුපේ..

@Shan

" අපි යන්නම් හාමුදුරුවනේ.."

"ආ පොඩ්ඩක් ඉන්න.. සෙනුක ළමයා.. තාත්තට පොඩ්ඩක් මාව හම්බෙන්න එන්න කියනවද.. මම ළඟදි පිරිවෙන පැත්තෙ ගියා තාත්තා හිටියෙ නෑ.."

" තාත්තා අනුරාධපුරේ ගිහින් හාමුදුරුවනෙ.. මම ආවහම කියන්නම්.."

" එක්කො ඔය ළමයා කියන්නකො මට කෝල් එකක් දෙන්න කියලා.. මම ඒක කතාකරගන්නම්.."

" එහෙමයි හාමුදුරුවනෙ.."

මමයි සෙනුකයි චමිරුයි හාමුදුරුවොන්ට වැඳලා ග්‍රවුන්ඩ් එක මැද්දෙන් දුවගෙන කැන්ටිම පැත්තට ගියා.. බැන්නෙ නැති එක හොඳයි ලොකුවට.. ඒත් ගැහුවනෙ.. අනික චමිරු පරෙයියට ගැහුවෙත් නෑ.. මේ බෝ පැල දෙක වගේ ඉන්න සෙනුකයටයි මටයි තමා සේරම එන්නෙ පීඩා දෙන්න.. අපි තුන්දෙනා කැන්ටිමේ වැටට හේත්තුවක් දාගෙන හති අරිද්දි මම අත මිට මොළවලා චමිරුවගෙ පිට මැද්දට හොඳවයින් පාරක් ගැහුවා.. පකයා.. මූ ගුටි කෑවෙ නෑනෙ..

" මොකද ෂනෙරු.."

" තෝ මොකද හාමුදුරුවොන්ගෙන් ගුටිකෑවෙ නැත්තෙ.."

" මම මක් කලාටද ගුටි කන්නෙ.."

" අඩෝ මස්සිනාට ගහන්නෙපා.. හිත පාරනවා.."

" අඹ ඇටේ අරන් උඹේ පුපේ ගහනවා.. පරෙයියා.. ආයෙම අපි ගුටි කෑවොත් උඹත් ගුටි කාපන්.. අලිපුපෙන් ඇවිල්ලද.. සැක් මේ කැඩෙට්ට කරන උන් සේරම එකයි.. මට පේන්න බෑ.."

" ඉතින් සනෙරු උඹ යාලුවෙලා ඉන්නෙත් කැඩෙට් කරන එකෙක් එක්ක නේද.. යකෝ ඌ ඔෆිසර් කෙනෙක් උන දවසට උඹට උණ ගැනේවි එහෙනම්.."

" එයා විතරයි හොඳ.. මේ අනිත් උන් පේන්න බෑ මට.."

@Shan

චමිරු හිනාවෙලා වැටට කකුලකුත් තියාගෙන අඹ කෑල්ලක් හපලා කෑවා.. එළුවා වගේ.. මමත් ඌව කාලා දානවා කියලා හිතාගෙන අඹ කෑල්ලක් කඩලා අරන් හපාගෙන හපාගෙන ගියා..

" පොඩ්ඩක් ඉඳපන්.. ඇයි උඹලා හැමතිස්සෙම පරෙයියෙක් ගැන කියවන්නෙ.."

එකසැරේට මට හප හපා ඉඳපු අඹ කෑල්ල හිරවුණාම සෙනුකයා මගේ බෙල්ලෙන් අල්ලගත්තා..

" ඒ මැරෙන්නෙපා හරිත.. හිරවුණාද.."

" බෙල්ල හිරකරන්න එපා පගො.. කැහ්-කැහ්- අම්මො.."

" කෝ ඒක හරි මාර්ගෙට ආවද.."

" කැහ්-කහ්-කහ් අහ්.. එහෙට්ට පලයන් මට නිදහසේ කහින්න දීලා මගුල.."

මම සෙනුකවය එහාට කල්ලා නිදහසේ කැහැලා හිරවෙච්ච අඹ කෑල්ල හරි මාර්ගයට අරගත්තා..

" කියනවකො සෙනුක.. ඇයි උඹලා පරෙයියෙක් ගැන කියවන්නෙ.."

" ඒක උබට අදාළ එකක් නෙමෙ කොල්ලො.. පස්සෙ කියන්නම් කියන්න හිතුනොත්.."

" අනේ මන්දා.. උඹලට එක්කො මොකක් හරි මානසික ලෙඩක් තියෙනවා.."

" මූ බං මහ කුකුළෙක්.. උඹ එන්නෙපා අපි එක්ක කතාකරන්න.."

මම කැන්ටිමෙ අක්කගෙන් ඒ ගමන් වතුර එකක් ඉල්ලගෙන ආවා.. මෙ අක්කා විතරයි අපිට කෙල්ලෙක්ට කියලා වතුර උගුරක් හරි දෙන්න ඉන්නෙ.. අපේ ඉස්කෝලෙ මල්සර දෝණි..

" ඔව් ඈ චමිරු.. මමත් අහන්න හිටියෙ.. දැන් උඹ තරුවිට කැමති නැද්ද.. උඹ නම් මගෙන් කනවා.. අම්මපා උඹව මරනවා.."

@Shan

සෙනුකයට එකසැරේ මලපැන්නහම චමිරු ආයෙම සෙනුකයට හිනාවුණා..මේකට තමයි පිස්සු හැම ලබ්බටම හිනාවෙනවා.. ගුලි කාලා වගේ..

" තරුවි හොඳයි ඉතින්.. එහෙම අවුලක් නෑ.."

" එතකොට යොහාන් මල්ලි.. ඌ.."

" ඉතින් යොහාන්.. මොකද..??"

" උඹ ඌටත් කැමති නෙ.."

" එහෙම එකක් නෑ බං.. ඌ තමා පස්සෙන් එන්නෙ.. මම ඌට කැමති නෑ.."

" නෑ නෑ උඹ මේ මස්සිනාව නම් නටවන්න එපා හරිද චමිරු.. උඹ එතකොට මොකක්ද යොහාන්ගෙ ක්ලාස් එකට හැමදාම යන්නෙ.."

" යන්නෙ නිකන්.. ඩියුටි බලන්න.. ෂනෙරුත් එන්නෙ.. එච්චරයි.. උඹලා හිතන මොකුත් නෑ.."

" ඌට ඉන්න දීපන් පාඩුවෙ.. ආයෙ මල්ලි පස්සෙන් ආවොත් මට කියපන්.. මම පැහැදිලි කල්ලා දෙන්න.. හැබැයි මම ආස නෑ උඹ තරුවිට චීට් කරනවට.. ඒ කෙල්ල පට්ට අහිංසකයි.. උඹට තේරුණාද මම කියන දේ.."

" හරි හරි බං.. උඹ ඔක හැමතිස්සෙම කියනවනෙ.. තරුවි හොඳයි..මෙහෙමයි.. ආදරේම කියන්න බෑ.. ඒත් මම තරුවිට කැමති.."

" උඹ ආදරේ නැත්නම් ඒ කෙල්ලට බලාපොරොත්තු දෙන්නෙපා.. අපි දකිනවා උඹ කෙල්ල එක්ක කතාකරනවා ඉස්සරහා කැෆේ එකේ.."

" මම.."

" දැන් එතකොට උඹ ඇත්තට කැමති වෙන්නැතුව ආදරේ කරන එකෙක් නැද්ද මං අහන්නෙ.. හැම ලබ්බටම කැමති කියන්නෙ.."

මම ඔය කතාව මට ඇහුනෙ නෑ වගේ පාඩුවෙ ලුණු ගාගෙන මගේ අඹේ කකා හිටියෙ.. චමිරු එකපාර මං දිහා බලලා කොණ්ඩෙ පිටිපස්සට

@Shan

කරගෙන සෙනුකයට මාව ඇහෙන් පෙන්නුවා.. මම ඒක දැකලත් නොදැක්කා වගේ හිටියා..

" හිටියා.. දැන් නෑ.. එව්වා පරණ කතා.."

" උඹ ඒකට හිත අවුලෙන්ද ඉන්නෙ එතකොට.."

" මුල් කාලෙ පොඩ්ඩක් විතර.. දැන් සිරාවට එහෙම එකක් නෑ බං.. මට ෂනෙ-මම කිව්වෙ.. ඌ හොඳ යාළුවෙක් විතරයි.. "

" ආ මගෙන් අයුක අයියා ඇහුවා උබට කතාකරන්න පුලුවන්ද කියලා.."

" ඇයි චමිරු ගොළුද.. මූ උපන්දා ඉඳලා කටහඩ හොඳට හසුරනවා.. නැද්ද.."

සෙනුකයා මට දෙකක් රැව්වහම චමිරු හෙන හයියෙන් හිනාවුණා..

" ඒ මොකෝ අයියට මාව මතක් වෙලා.. පුළුවන් ඕන වෙලාවක ගන්න කියන්න.."

" ආ.. එහෙම නෙමේ බං.. අයුක අයියා නිතර අහනවා උබ ගැන.."

"අයියා මාත් එක්ක තරහයි බං.."

" උඹට විකාරද.. එහෙම මගුලක් නෑ.. උබ හිතින් මවාගන්න එව්වා ඔය.."

" දැන් කොහොමද අයියට.. එහේ හොඳද.. තාත්ති පහුගිය ටිකේම කන්ටැක් කරගන්න බැලුවා අයියව.. නැති හින්දා.. මට ඇහුණා ළඟදි සීයාතාත්ති එක්ක කියනවා. අයුක අයියව අතෑරලා දාන්න කියලා.. උඹ මෙහෙම කිව්වට අවුල් නැනෙ.. මම ඇත්ත කතාව කිව්වෙ.."

චමිරුවා එකසැරේ හෙන අහන්න වගේ මූණටම කිව්වහම සෙනුකයා අවුලක් පෙන්නන්නැතුව හිනාවෙලාම ඔක්කොම අහගෙන හිටියා.. ඒ වුණාට මම දන්නවා, දැන් මූ ඔක ගැන හිතලා අවුල් වෙනවා.. චමිරුවා කිසි නැන්නෙ හොඳ නරකක් කියලා දෙයක් දන්නෙ.. කියන එක හෙන ගහන්න වගේ මූණටම කියලා දානවා..

" එහෙම වෙච්ච එක හොඳයි.. අයුක බොසා ඔච්චට ආස නෑ.."

@Shan

මම සෙනුකයට කකුලෙන් හිමීට තට්ටුවක් දැම්මා චමිරුට පේන්නැතිවෙන්න..

" මම්.. මෙ බං මම යනවා පොඩ්ඩක් පහළට.. උබලා ඕන්නම් රූම් එකට පලයන්.. පොඩි වැඩක් තියේ.."

චමිරු එකසැරේ අපි දෙන්නගෙ පිටට තට්ටුවකුත් දාගෙන පහළට දුවගෙන ගියා.. මම සෙනුකයට පොඩ්ඩක් ලං වුණා..

" උඹ ඔච්චා ගණන් ගන්නෙපා.. අයියට කොහොමත් ඕනවෙලා තිබ්බෙ ඒකනෙ.. නැද්ද.."

" ඒකතමා.. එහෙම ගාණක් නෑ බං.. මට මෙ මතක් වුණේ ඕකම මටත් වුණොත් කියලා.."

" එහෙම වෙන්නෑ.. පිස්සුද.. අනේ මේ.. උඹලගෙ අම්මා ඔච්චා තේරුම් ගනී.. අනික අයුක අයියා නරක කෙනෙක් නෙමෙයිනෙ.. ඌ දුර ඉඳලත් උඹ ගැන කෙයා කරනවා.. කොච්චර ආදරේද.. අම්මලා තේරුම් ගනී.. බයවෙන්නෙපා.."

" මම.."

මම සෙනුකයගෙ පිටට තට්ටුවක් දැම්මහම ඌ මාත් එක්ක රූම් එකට එන්න ආවා.. මම දන්නවා මම කොච්චර මෙතන බෙර බැඳගෙන ගහලා නැටුවත් සෙනුකයා ඕක හිතන එක නවත්තන්නෙ නෑ.. ඒත් ඌ වෙනුවෙන් වචනෙකින් හරි උදව්වක් කරන්න ඇත්නම් මම කැමතියි.. මට කියලා හැමදාම ළඟින් උන්නු එකානෙ.. ඌට කොහොමත් ඉඳලා හිටලා ඔවා මතක් වෙලා අවුල් යනවා.. මොකද සෙනුක ගෙදර එක්ක ලොකු බැඳීමක් තියෙන ළමයෙක් නිසා.. උගේ අම්මා තාත්තා ඌට මාර ආදරෙයිනෙ.. මූත් හිත රිදෙන වැඩ කල්ලා නෑ.. දැන් ඔය කිව්වට, ගෙදරට කියන්න ඉන්නෙ කියලා අෆෙයා එක ගැන.. මටනම් හිතාගන්න බෑ මොනවා වෙයිද කියලා.. හැබැයි අම්මා තාත්තා ආදරේනම් එක මොහොතකට තමන්ගෙ ළමයව තේරුම් ගන්න බලන්න ඕන.. මට හිතේ විශ්වාසයක් තියෙනවා.. අම්මා නම් සෙනුකයගෙ කොහොමත් හොඳයි.. එයාවත් තේරුම් ගනීවි කියලා.. අම්මා පස්සෙ තාත්තට පැහැදිලි කල්ලා දේවිනෙ..

@Shan

සෙනුක රූම් එකට ඇවිත් ඉතුරුවෙච්ච ෆෝම් වගයක් පුරවන්න ගත්තු නිසා මම පැත්තකින් වාඩිවෙලා ෆෝන් එක ගත්තා.. තව ටිකකින් ඉස්කෝලෙන් බාගයක් රූම් එක ඉස්සරහ පිරේවි.. ගෙනාපු වැල ලෝඩ් කරපු පෙන් ටිකයි, චොක්ලට් පෙට්ටියි, ලියුම්, ප'ෆියුම්, කේබල්කෑලි අරවා මේවා අරගෙන යන්න.. මමත් මහපගයා වගේ සේරටම උපදෙස් දීලා බැනලා යවනවා.. මටනම් බනින්න හිතකුත් නෑ ඇත්තටම.. අපිත් යම් යම් දේවල් කල්ලා, ඒ කාලෙ ඉඳපු ලොකු අයියලගෙන් බැනුම් අහලා තියෙනවනෙ.. එකපාරක් අපි නවයෙ ඉද්දි ක්ලාස් එකේ කොල්ලෙක් යාළුවෙක්ට දෙන්න ස්මර්ෆ්ස් ලොස්ට් විලේජ් සී ඩී එකක් ගෙනැල්ලා ක්ලාස් එකේ ඉඳපු හෙනම වයස මැඩම් කෙනෙක් ගෑණු හෙළුවෙන් ඉන්න පීස් ගෙනැල්ලා කියලා ඕක ගිහින් ප්‍රිෆෙක්ට් අයියා කෙනෙක්ට දුන්නා..

අයියා ඕක ප්ලේ කල්ලම බලමු මැඩම් කියලා අයිටී ලැබ් එකට අරන් ගිහින් ප්ලේ කල්ලා බැලුවහම මුලින්ම නිල්පාට ස්ක්‍රීන් එකක ක්ලම්සි ස්මර්ෆ් වැටි වැටී දුවගෙන යන එකක් වැටුණලු.. අර අයියා ' බලන්න මිස් බ්ලූ ෆිල්ම් එකක් තමයි මේ මේක තිල්නෙ' කියලා..මැඩම්ට පල පැනලා අයියටත් බැනලා අපේ පන්තියෙ එකාටත් බැනලා සෙක්ශන් කෝඩිනේටර්ටත් කියලා සතියක් අපිට උගන්නන්න ආවෙත් නෑ.. අපිටත් බැන්නා නැහැදිච්ච ළමයි කියලා.. ඒත් මමනම් කියන්නෙ මැඩම් නොකියා ඉන්නෙ තිබ්බෙ අර ගෑණු හෙළුවෙන් ඉන්න පීස් කතාව.. එහෙම එව්වා අපි බැලුවෙ නැනෙ.. ඒත් එකසැරයක් ක්ලාස් එකේ කොල්ලෙක් පත්තර කෑල්ලක් ඉස්කෝලෙ ගෙනැත් ඔකනම් අපි ඔක්කොම කියෙව්වා.. පත්තර ට්‍රෙන්ඩ් කාලෙ අපි හිටියෙ නෑ ඒ අපේ මාමලාගෙ කාලෙ.. ඒ කාලෙ වැල පත්තර තිබිලා තියෙන්නෙ.. මාමා මට කියලා තියෙනවා දහම් පාසල් ගිහින් කියවලා එකසැරයක් සර් කෙනෙක්ගෙන් ගුටි කෑවලු.. ආධ්‍ය අයියා ඔව්වා දන්නවද දන්නෙ නෑ.. දන්නවනම් හුස්ම හිර කරන් මැරෙනවා.. එක්කො දන්නවත් ඇති.. තරු බලන්න ගියානම් ඔව්වා කුණුහර්ප වෙන්න බෑනෙ.. එක්කො දැන් මාමා පත්තර කියවන්නෙ නැති නිසා තියන ඒවා කල්ලා-

" ඕ ශිට්.."

මම කල්පනා ලොව මල් වනේ මගේ ට්‍රැකෙන් පිට පැනලා වෙන කුණුහර්පයක් හිතන්න ගිහින් ඒක හොඳ නැති නිසා හරි ට්‍රැක් එකට ආවා.. සැක් මාමා ගැනයි ආධ්‍ය අයියා ගැනයි නේද පුතේ හිතනන් ගියේ.. අපි පොඩි කාලෙ අපේ ක්ලාස් මැඩම් කෙනෙක් ප්‍රෙග්නට් වුණාම අපි බඩට හායි බායි කියලා තියෙනවා.. මම හයේ හතේදි එහෙම.. ඊටපස්සෙ ඕක

@Shan

වෙනස් වුණා අට නමයට ආවහම.. මැඩම් කෙනෙක් ප්‍රෙග්නට් වුණා කිව්වහම දැන් හිතෙන්නෙ වෙන වෙන ලබ්බවල්.. හොඳ නෑ තමා එහෙම හිතන්න..

ඒ වුණාට හිතෙනවනෙ..

මම ඒ කුණුහර්ප හිතන්නෙ නැතුව රධ්‍ය අයියගෙ චැට් එකට ගිහිල්ලා සුදුඅම්මියව මතක් වෙනවා කියලා මැසේජ් එකක් ලිව්වා.. ආපු වෙලාවක බලන්නෙ නැතෑ මම එවපු මැසේජ් හතළිස්පන්දාහම.. හිටපු ගමන් මම මල පැනලා ඔය චැට් එකට ස්ටිකර්ස් ඉමොජි කෝටියක් විතර ඔබාගෙන ඔබාගෙන යනවා.. මගෙ හැපීකව්වා කෝල් එකක්වත් තාම දුන්නෙ නෑ.. මම හැමදාම බලාගෙන ඉන්නවා එයාගෙන් කෝල් එකක් එනකල්..

වෙලාවකට හරිම පාළුයි.. මට කතාකරන්න ඕන.. හැමෝම මාත් එක්ක කතාකලාට මට කතාකරන්න කවුරුත් නෑ කියලා මම දන්නවා.. මගේ කතා අහන්න තරම් වටේ පිටේ අය හොඳින් නෙමෙයි ඉන්නෙ.. එයාලට එයාලගෙ ප්‍රශ්න තියෙනවා.. ඒවා අස්සෙ හිරවෙද්දි ඉබේම මාව පැත්තකට තල්ලු වෙලා යනවා.. මට එයාලා තේරුම්ගන්න පුලුවන්.. ඒත් මට රධ්‍ය අයියව ඕන.. මම දැනට හොයන නිදහසයි සතුටයි ඔක්කොම එයා යද්දි අරගෙන ගියා.. මම ගෙදරින් ඈත්වෙලා ගිහිල්ලා වගේ..

මම ඒ එක්කම ෆෝන් එක වයිබ්‍රේට් වුණු නිසා ස්ක්‍රීන් එක දිහා බැලුවා..

අම්මා : සුදුමහත්තයා.. වැඩ නැත්නම් මට කෝල් එකක් ගන්න.. ගෙදර වැඩකට..

මම මැසේජ් එක දිහා බලාගෙන හිටියා.. මොනවද අපේ ගෙදර වැඩ.. අවුරුද්දත් කිට්ටුව.. තව සති දෙකකින් අප්‍රේල් ලබනවනෙ.. මම ඒ ගමන් අම්මට කෝල් එකක් අරගෙන රූම් එකේ කොණකට ගියා.. ටික වෙලාවකින් අම්මා ආන්සර් කලා..

" කොල්ලො.."

" ඕ අම්මෙ.. කතාකරන්න කිව්වෙ..??"

" උඹ ඉස්කෝලෙද ඉන්නෙ.."

@Shan

" ඔව් අම්මෙ.. ඒත් කමක් නෑ කියන්න.."

" මම මේ කියන්න ගත්තෙ සුදුමහත්තයා.. සීයගෙ දානෙ.. ගිය අවුරුද්දෙ දෙන්නත් බැරිවුණානෙ.. ආච්චිඅම්මගෙ හිතේ දුකින් ඉන්නෙ.. බණක් කියවලා දානයක් දෙන්න.. අපි මේ බැලුවෙ ඒ වැඩේ ලෑස්ති කරගන්න.."

" අම්මා ලොකු අම්මලට කිව්වද.. මාමා එහෙම දන්නවද.."

" අක්කා දන්නවා.. මාමට ගන්නවා ගන්නවා ආන්සර් කරන්නෙ නෑ වැඩ වෙන්නැති.. සුදුමහත්තයා ලබන සතියෙ ගෙදර එනවද.. මට බෑ බං මෙව්වා හොයලා බලලා කරන්න පිරිමියෙක්වත් ගෙදර නැතුව.."

" මම එන්නම්.. මාමත් ඒවි.. කොහොමත් දානයක් දෙන එක හොඳයි.. මම එනකල් අම්මා ඉන්න එහෙනම්.. තනියම මොකුත් කරන්න යන්න එපා.."

" හා.. දවල්ට කෑවද.."

" තවම නෑ අම්මෙ.. ගිහින් කනවා.. අම්මලා කාලද.."

" උයනවා මේ.. මෙහේ උදේ වතුර බටයක් කැඩිලා රෑ එළිවෙනකල් වතුර ගිහින්.. ඒක හැදුවෙ මේ දැන්.."

" ඒ කොහොමද බටයක් කැඩුණෙ.. කොයි.. ඉස්සරහා එකද.."

" ඔව් අර වත්ත කොණට වෙන්න තියෙන්නෙ.. පස්සෙ මීටරෙන් වහලා හදනකල් උයාගන්න වුණේ නෑ.."

" කමක් නෑ ළිඳේ වතුර නෙ.. බට උඩට කල්ලා තියෙන හරිය පස් වලින් වැහුවනම් හරි.."

"ඒකතමා.. ආච්චිඅම්මටත් බෙහෙත් ගන්න යන්න ඕන හවස.. මට මෙහේ වැඩ ගොඩවෙලා සුදුමහත්තා.."

" ආ.. අම්මා එහෙනම් උයන්න දැන්.. වෙලා යනවනෙ.. මම මාමට කියලා එන්නම් ගෙදර.. හැබැයි සතියයි හොඳේ අවුරුද්දට ඉන්න වෙන්නෙ නෑ මට ආයෙ එන්න වෙනවා.."

" ඒ මොකද.."

@Shan

" මැච් එකක් ක්ලබ් එකේ.. අනික මට ඕන ඕන සැරේ නිවාඩු ගන්න බෑ අම්මෙ.."

" අනේ මන්දා උඹෙ ඔය බැඩ්මින්ටන් කෙරුවාව.. මමනම් කැමතිත් නෑ.. හා කෝකටත් ඇවිල්ලා යන්න.. මම තියනවා.."

" හා අම්මෙ බුදුසරණයි.."

මම ෆෝන් එක කට් කල්ලා පැත්තකින් තිබ්බා.. අම්මට ඉතින් කොච්චර කිව්වත් ඔච්චර තමා.. සැරින් සැරේ වෙනස් වෙනවා.. වෙලාවකට මම හොඳයි.. වෙලාවකට මම නරකයි.. වැඩක් කරගන්න තමා සේරටම මතක් වෙන්නෙ.. කමක් නෑ කොහොමත් ආච්චිඅම්මව බලන්න යන්න මට උවමනා වෙලා තිබ්බෙ.. දානෙට යන එක හොඳයි.. අපේ ගමේ සේරම එනවා සීයගෙ දානෙට.. සේරම කියන්නෙ විශේශෙන් ගමේ ආච්චිලා ඇන්ටිලා එහෙම.. ආච්චි ඉස්කෝලෙ හාමිනේ නිසා හැමෝම අඳුනනවනෙ.. වෙනසකටත් එක්ක යන එක හොඳයි..

මාමට කියන්න ඕන පුළුවන් වුණොත් ආධ්‍ය අයියවත් එක්කගෙන එන්න කියලා.. කොහොම හරි අප්පච්චිව කැමති කරවගෙන.. නැත්නම් මම වෙන ප්ලෑන් එකක් හරි ගහලා අයියව ගෙන්න ගන්නවා.. එයාට දැන් ඉන්න ප්‍රෙශර් එකත් එක්ක කොහේහරි යනවනම් හොඳයි.. නිදහසේ ඉන්න.. අපේ ගමේ ගෙදර හොඳයිනෙ..

මම ආවා මගේ දලඹුවනේ.. කතාවෙ ඉක්මනට වෙලාව පන්නනවා වගේද.. එහෙම නැනෙ.. මම මේ කාලෙ විශේශ දේවල් ටික තමා ඔය ලියන්නෙ.. ඉස්සරහට එන චැප්ටර්ස් ඔයාලා ආස ඒවා වේවි කියලා මම හිතනවා..

එහෙනම් දැම් එම්න මම ඔම්යාලට මම්ලක් දෙම්න..

ඉම්හි වැඩ ගොඩයි හලෝ ඉතින්.. ඔතරිට ඊයෙ කාස් නිසා දෙන බැරිවුණා.. දුකෙ නේන.. මට පුළුවන් නම් ඉතින් දවසට තුනක් හරි දෙනවා.. අම්මපල්ලා ඒ ලෙවෙල් ඉවරවුනාම ලියනවා සෙයුක ලව් ස්ටෝරිය දවසට දෙක ගානෙ දාලා.. සෙමද.. සේපාලිකා එකට ඇඩෙයි එනකොට..

@Shan

එන්නාම්.. ලව් යූ.. ❤

මට පොඩි බඩ්ඩක් හම්බුණා.. haloo

AchiniSewwandi

mignite

thank you soo much guys.. love thissss.. ❤❤❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 114 කොටස

" අනූ.. ඔයා මොකද හිතන්නෙ අපේ බිග්මැච් එක ගැන.. මරු නේද.."

" ම්ම්.. අවුලක් නෑ.."

" ඇයි ඒක ඕනවට එපාවට කිව්වෙ.."

" මොන..?? නෑ අනේ ඔයාලගෙ නීලමහා සටන අති උත්කර්ශවත් අයුරින් එකසිය හතළිස් පස්වෙනි වතාවටත් කරනවාය කියලා අලි පම්පෝරි ගහලා-"

" අනූ!!!!!!!!!!!!!!!"

" මොකද බං.."

" නවත්තගන්න.."

" ඔව්වා හොඳා බිග්මැච් දැකපු නැති උ-"

" අනුරාග්!!"

" ඔය දැක්කනෙ.. ඉස්කෝලෙ හැටි තමා.. පොඩ්ඩක් ඇත්නම් නැට්ට පාගගන්නවා.."

"....."

" සාකී~"

"....."

" ළමයා තරහවෙලාද.."

"....."

" මෙහ්.. නැන්දම්මා බලන්න යන්නෙ.. ඔහොම මූණ එල්ලගෙන බෑ.. මෙ බලන්නකො.."

@Shan

" ....."

" සා-"

" කට වහගෙන පාඩුවෙ යන්න.. මට නිදිමතයි.. නැත්නම් මම පොතක් කියවන්න ගන්නවා.. මාත් එක්ක කතාකරන්න එපා.."

" ආ මේ.. මොන පොත්ද.. නිකන් ඉඳහන්.. මේ යන ටිකටවත් ඔය මගුල පැත්තකින් තියලා.."

" පොත් වලට ඔහොම කියන්නෙපා අනූ.. ඔයාට ඇත්තටම හොඳක් නරකක් කියලා දෙයක් තේරෙන්නෙම නැද්ද.."

" එහෙම එව්වා මම දන්නෙ නෑ.. හොඳට හොඳයි නරකට නරකයි.. එච්චරයි.."

" මෙ මිනිහාට කියලා තේරුමක් නැනෙ.."

මම හොඳ හුස්මක් උඩට අරගෙන ඒක හිමිහිට පහළ දැම්මා..

" මෙහ්.. ඔය දෙන්නා පොඩ්ඩක් පාඩුවෙ රණ්ඩුසරුවල් නොකර යනවද.. මේ අසූ අනූ ගනන්වල මිනිස්සු ලව් කරන්නවත් දන්නෙ නෑ හරියට.."

මාමා වාහනෙ ෆොන්ට් මිරර් එකෙන් පිටිපස්සෙ සීට් එකේ මැද්දට වෙලා කකුල් දෙකත් දෙපැත්තට දිගැරගෙන වාමනයා වගෙ ඉන්න මං දිහා බැලුවා..

" ඇයි දෙදාහෙන් පස්සෙ උඹ දන්නවද.."

" දන්නවා හලෝ.. මම ලව් කරන හැටි දැක්කොත් ඔයාලා අඩාවි.."

" ඔව්.. චූටි ලව් කරන එක්කෙනත් අඩනවා අනූ සමහර වෙලාවට.."

මාමා ඒකට හයියෙන් හිනාවෙලා එකපාරම බයවෙලා වගේ ආධ්‍ය අයියා දිහා බැලුවා..

" මොකක්ද ඒ කිව්වෙ.. ඔයා කොහොමද දන්නෙ.."

@Shan

" ඇයි චූටි මගේ-"

" විශ්වාසවන්තම සහ හොඳම යාලුවා නිසා මම අයියට කිව්වා.. නේද අයියෙ.."

" ම්ම්.. ඒකතමා.."

මාමා ආඩ්‍ය අයියට දෙකක් රැව්වා..

" උඹ කියන්නවත් එපා ඒවා ගැන... දැන් මුගෙ බබරවක්කරේ ලස්සනද.."

ආඩ්‍ය අයියා ටිකක් වෙලා කල්පනා කලා..මට හිනත් යනවා වෙලාවකට.. ඈ යකෝ කල්පනා කරන්න තරම් දෙයක් තියද දවස් තුන්සිය හැට පහේම ළග තියාගෙන කවලා පොවලා හදන එකාගෙ..

" ඔව් ලස්සනයි.. හොදයි.. ගැලපෙනවා.."

" ඒ වුණාට මටනම් දකිනකල් ශුවර් නෑ.. කොහෙද මූ පෙන්නන්න බෑ කියනවනෙ.."

පෙන්නන්න බැරි කමක් නෑ ඉතින්.. පෙන්නුවොත් මොනවා කරාවිද දන්නෑනෙ.. රඩ්‍ය අයියටයි, මටයි, ආඩ්‍ය අයියටයි තුන්කට්ටුවටම අහගන්න තමා වෙන්නෙ කන් දෙක පුරෝලා..

" අනේ මේ අනුරාග්.. චූටිගෙ එක්කෙනා ලස්සනයි හරිද.. මොකෝ ඔයා දැකලා ශුවර් කරගන්න.. ඔයා හරි එක්කෙනානෙ.."

" මේකගෙ කට දැන්.. දෙන්න හිතෙනවා.. සුදුමහත්තයා උඹ තමා මගේ එකාවත් නරක් කල්ලා තියෙන්නෙ.. මේකා ඉස්සර හප් කිව්වත් අඩනවා.. දැන් තමා ගහන්නයි බනින්නයි.."

" ආ මේ.. මාව පවුල් ප්‍රශ්න වලටනම් ඇදා ගන්න ලෑස්තිවෙන්නෙපා.. හරිද.."

මම ශටර් එක ගාවට ඇදිලා ගිහින් ශටර් එකට මූණ තියාගත්තා.. ආවා මෙතන අහිංසක මාව අල්ලගන්න.. මම මේ මගේ මනුස්සයා නැතුව හද ශෝකෙන් ගෙදර යනවා.. එකෙක්ට කිසි ගානක් තියද.. නෑ.. මගේ දුක මටම විතරයි..

@Shan

ර්යේ අපේ ඉස්කෝලෙ බිග්මැච් එක තිබ්බා.. අපේ ඉස්කෝලෙ ගිය සැරේ වගේම කප් එක ගත්තා.. මේ පාර විශේෂයි කියලා මොකුත්ම නෑ.. ආශියි මහීශායි ආවා.. කියාන් අයියා බිසී නිසා ආවෙ නෑ.. ඩයල් එකත් මැසේජ් කරනවා විතරයි කෝල් එකක්වත් ගන්න වෙලාවක් නැහැල්ලු.. ඒ අස්සෙ ආධ්‍ය අයියා අපේ මාමත් ඇදගෙන ගියා බිග්මැච් එක බලන්න.. මාමා මැච් බලන්න මාර ආසයි.. හිත යටින් අපේ ඉස්කොලෙ එක්ක කොස්ස වගේ පෙන්නුවට එහෙම නෑ.. මට ශුවර් මේ සැරේ ආධ්‍ය අයියට කොහොම හරි ආදරවන්තයොන්ගෙ සටන බලන්න යන්න වෙනවාමයි.. එහෙම කිව්වහම ආධ්‍ය අයියා කියනවා.. ඒකෙ හෙන ගේ වයිබ් එකක්ලු තියෙන්නෙ.. ඔක කියලා ඒ දෙන්නා හෙනට ආගිව් කරගත්තා.. පස්සෙ හැමදාම වගේ අපේ මාමා ආධ්‍ය අයියට සොරි කියලා වැරැද්ද එයාගෙ කියලා පිලිගෙන පැත්තකට වුණා..

මමනම් හිටියේ මේ කපල් එක හදා වඩාගන්න අතදරුවගෙ චරිතෙට පන පොවලා පුදුමාකාර මහන්සියකින්..

ආධ්‍ය අයියා අනික දැන් ගෙදරට නයිට් ඩියුටි කරනවා කියලා හෙන බොරුව දාලා ක්වාටස් එකට වෙලා ඉන්නවා එයාගෙ පාඩුවෙ.. මාමා කැමති ආධ්‍ය අයියා ඉන්නවනම්.. එයා ගෙදර ඉද්දි ඉන්නෙ ලොකු පීඩනේකින් නිසා.. අනික මාමා ආස නෑ නෙතූ සමයම ආධ්‍ය අයියගෙ පස්සෙන් ඩාලින් ගාගෙන එනවට.. එයාලා දෙන්නා එකතුවෙලා එයාලගෙ එදා එදා වෙන දේවල් හරියට කතාකරනවා.. අපි කෑම කන්නෙත් එකට.. හුඟක් වෙලාවට.. මම එයාලා දෙන්නා කතාකරන ඒවා අහගෙන ඉන්නවා.. මාමා කැම්ප් එකේ විස්තර ආධ්‍ය අයියට කියනවා.. ආධ්‍ය අයියා හොස්පිට්ල් එකේ විස්තර අපේ මාමට කියනවා.. ඒ ඇරෙන්න එයාලගෙ සබ්ජෙක්ට්ස්වල අලුතින් අප්ඩේට් වෙන දේවල් ගැන කතාකරනවා.. ඒවගෙ හොඳ දේවල් මොනවද නරක දේවල් මොනවද කියලා කියනවා..

ආධ්‍ය අයියා ඇවිල්ලා ඇවිදින පුස්තකාලයක් වගේ.. ඒ කියන්නෙ නවල් අරවා මේවා නෙමෙ.. එයාට මෙඩිසින් සයිඩ් එකෙන් ඕනම එකකට ගානට ගලපලා උත්තර දෙන්න පුළුවන්.. අනික ඒවා විස්තර කරද්දි අපේ මාමා වශී වෙලා වගේ අහගෙන ඉන්නවා.. මාත් අහගෙන ඉන්නවා.. කෑම කාලා ඒ ගොල්ලො සමහරවෙලාවට මූවී එකක් බලනවා.. බියර් එකක් බොනවා.. මම කාමරේට වෙලා මගේ වැඩ කරනවා.. මටත් හෙන වැඩ තොගයක් පැටවිලා තියෙනවනෙ ඉස්කෝලෙන්.. ඒවගෙ වැඩ කල්ලා සිංදුවක් අහලා

@Shan

දොළහට විතර මළා වගේ නින්ද යනවා.. ආයෙම උදේ ඉස්කෝලෙ යන්න ඇහැරෙන්නෙ..

ඒ දෙන්නත් එක්ක ගෙවෙන ජීවිතේ මට ලස්සනයි වගේ හිතෙනවා.. අම්මයි තාත්තයි දෙන්නම හුහක් සමගියෙන් ඉන්න ගෙදරක් මොනවගේද කියලා අදහසක් මට දුන්නෙ එයාලා.. මම ඒ උනුසුම් ගතිය පිරුණු ආදරේ හිතෙන පරිසරේට කැමතියි.. රණ්ඩුවෙන්නෙ නෑ.. බැනගන්නෙ නෑ.. විහිළුවක් කල්ලා හැමෝම එකතුවෙන් සමගියෙන් ඉන්නවා.. මම හිතන්නෙ ආධ්‍ය අයියා තවදුරටත් ඉන්නෙ දුකින් නෙමේ.. එයාගෙ ඉස්සරට වඩා වෙනසක් පේනවා.. ආධ්‍ය අයියගෙ ජීවිතේ සීත කාලෙ ගෙවිලා මල් පිපෙන්න පටන් අරගෙනද කොහෙද.. මට හිතට සතුටුයි.. අපේ මාමත් ආධ්‍ය අයියව පරිස්සමට බලාගන්නවා.. වෙලාවට බෙහෙත් අරගන්න යනවා.. චෙකප් වලට යනවා.. එයාලගෙ ළඟම යාළුවො දෙතුන්දෙනෙක් එයාලා ගැන දන්නවා..

රධ්‍ය අයියා ආවොත් සතුටු හිතේවි.. අයියා දැන් ඉන්න විදිය දැකලා.. මම, අයියා මාමා නිසා සතුටින් හිටියත්.. රධ්‍ය අයියව මතක් වෙන වෙලේට එකසැරේම සබන් බෝලයක් පිපිරිලා යන්න වගේ ඒ සතුට බිඳිලා ගිහින් දුක හිතෙනවා.. මම ඒ ඒ වෙලාවට සතුටු හිතෙන්න මොකක් හරි හොයාගන්නවා ඇරෙන්න.. ජීවත් වෙලාම තියෙන්නෙ.. බලන් යද්දි.. සතුට කියලා අමුතු සායමක් තවරගත්තු පාළු සුදු හිස් කැන්වස් එකක.. එක එක අය එනවා.. පාට ගානවා.. ඒ පාට අව්වට මැකිලා යනවා.. කඳුලු වලට හේදිලා යනවා.. ආයෙම පාට ගානවා.. ආයෙම පාට මැකෙනවා.. කොහොම වුණත් මම සුදු කැන්වස් එක මතුවෙනවට කැමති නැහැ.. එහෙම වුණොත් මම හිර කරගෙන ඉන්න සේරම දේවල් එළියට පෙනෙයි කියලා මට බයයි.. හැමෝම මට දුක කියලා හිත නිදහස් කරගන්නකොට මම එයාලගෙ දුකත් මගේ කරගෙන මගේ දුකත් හිතේ හිරකරගෙන බලාගෙන ඉන්නවා..

මේ ගෙවෙන ජීවිතේ මට පට්ටම පාළුයි..

රධ්‍ය අයියා නැති එක එක හේතුවක් තමා.. ඒත්.. ජීවිතේ පාළුයි.. හැමෝම තමන්ගෙ හීනවලට පියාඹලා යද්දි මම ඉතුරුවෙලා කියලා හිතෙනවා.. මම ලොකුයි නිසා අම්මගෙ ඔඩොක්කුවට වෙලා කතාවක් කියන්න බෑ.. අම්මා මං එක්ක එහෙම ළඟින් ඉන්නෙ නෑ.. ආච්චිඅම්මත් මට දුරයි.. ළඟක ඉන්නවනම් මාව තුරුල් කරගෙන වරුවක්වුණත් ඔලුව අතගාවි.. මාමත්

@Shan

දැන් එයාගෙම ලෝකයක් හදාගන්න ගමන් ඉන්නවා.. හැමෝම එහෙමයි.. මං වටේ ඉන්න හැමකෙනෙක්ම.. සෙනුකයා වුණත්.. ඌට හැමතිස්සෙම මා එක්ක නැහෙන්න බෑ.. ඌට කියලා සෑහෙන්න ප්‍රශ්න තියෙනවා.. ඒවත් අස්සෙ මං එක්ක මෙහෙම ඉන්න එක හරි මට සතුටුයි.. ලොකු වෙද්දි මට දැනෙනවා මාව අමුතු පාළුවක් වහගන්නවා කියලා..

රධ්‍ය අයියා කියන්නෙ ඒක නැතිවෙන්න මට තියෙන එකම හේතුව.. එයා මගේ ජීවිතේට ආවෙ නැත්නම්..?? එතකොට මම කොහොමද ජීවත්වෙන්නෙ.. මම කවමදාවත් රධ්‍ය අයියා ගැන හිතුවෙ නැත්නම්.. රධ්‍ය අයියා මට ආදරේ කලේ නැත්නම්.. මම ඕවා හැමතිස්සෙම හිතනවා.. එයා මගේ උපන්දිනේට හදලා දුන්නු පොතත් මම බලලා ඉවරකල්ලා හුඟක් දවස්.. අනික එහෙමම නුස්සයෙක්ට, ආදරේ කරන කෙනගෙ කටහඬක්වත් ආරංචියක්වත් නැතිව මෙච්චර කල් ඉන්න පුළුවන්ද.. මන්දා.. වෙලාවකට හිතෙනවා අර කිව්වා වගේම එයාට තිබුණා එදා මං දිහා නොබලා අහක බලාගෙන යන්න.. එහෙම වුණානම් මේවා මීටවඩා වෙනස් වෙන්න තිබ්බා.. නෑ ඒක අතකින් මාමා, ආධ්‍ය අයියා සතුටින් ඉන්නවනෙ අපි නිසා.. ඒකවත් හොඳ දෙයක්..

මම අපි පහුකරගෙන යන ගස්කොළං දිහා බලාගෙන හිටියා.. මට කලින් රධ්‍ය අයියා එක්ක ගමේ ගියපු එක මතක් වෙනවා.. ඇත්තටම අපි දෙන්නා හීනෙක වගේ ජීවත් වුණු කාලෙකුත් තිබ්බනෙ.. ඒ කාලෙ ආයෙ කවදාවත්ම එන්නෙ නෑ.. ඒක ගෙවිලා ගිහින් ඉවරනෙ.. එයා මගෙන් ඇහුවා එයා නිදාගෙන ඉන්නවනම් ඇහැරන්න එපා කියලා.. ඒත් අපිට ඇහැරිලා යන්න වුණානෙ.. රධ්‍ය අයියා කතාකරපු නැති එකත් හොඳයි.. එතකොට ආයෙම දුක හිතෙනවා.. ඒත් ආසයි කටහඬවත් අහන්න තිබ්බනම්.. මම එයාට කොච්චර බැඳිලා ඉන්නවද කියලා එයා මං ගාව නැති මේ කාලෙ මට හොඳට දැනුනා.. එයා ඇවිත් මට තනියම ඉන්න හැටි අමතක කල්ලා ගියා.. ඒක සාධාරණ නෑ..!!

" චූටි.. ඔයා නිදිද.."

මම එකසැරේම ශටර් එකෙන් ඔලුව ගත්තා..

" නෑ මම නිදි නෑ අයියෙ.."

" මොකද අද ළමයා සද්ද නැත්තෙ.."

@Shan

" ඊයෙත් බිග්මැච් ඉවරවෙලා ප්‍රැක්ටිස් ගියානෙ.. ඇඟ රිදෙනවා.."

" ඔයා මහන්සි වෙනවා වැඩියි චූටි.. ඔහොම හොඳ නෑ.. මම දන්නවනෙ මොකද ඔය කියලා.."

" මහන්සියක් නෑ අනේ.. මම ආසාවෙන් ක්ලබ් යන්නෙ.."

" ප්‍රිෆෙක්ට් බැජ් එකටද ආස නැත්තෙ.."

" නෑ ඒකටත් ආසයි.. එහෙම මොකුත් විශේශ දෙයක් නෑ.. කම්මැලී.."

" ගෙදර ගියාම ඕක ඇරිලා යාව්.. අම්මත් බලන්න පුළුවන් නෙ.."

" ඒකතමා.."

මට ආධ්‍ය අයියා ඇස් වලින් 'එයා හේතුව දන්නවා අවුලෙන් ඉන්න එපා' කියන්න වගේ කියලා ඉස්සරහා හැරුණා.. මම සීට් එකට ඔලුව තියාගෙන ඇස් දෙක පියාගත්තා.. ඇත්තටම ඇඟ රිදෙනවා.. උණ හැදෙන්නද මන්දා..

අපි ගෙදර යද්දි හුඟක් හවස් වෙලා.. අම්මා මම කාර් එකෙන් බැස්ස ගමන්ම දුවගෙන ඇවිත් මගේ මූණ අතගෑවා.. අම්මා නොකිව්වට ඉන්නෙ මම නැතුව පාළුවෙන් තමා.. කේන්තිගත්තට.. අම්මනෙ..

අපි යද්දි ලොකු අම්මලත් ඇවිත් ..එහේ අයියයි මල්ලියි ඉස්තෝප්පුවට වෙලා අපි දිහා බලාගෙන ඉන්නවා.. එයාලා කොහොමත් මාව දැක්කහම බලන්නෙ පිටසක්වලයෙක් දිහා බලනවා වගේ තමා.. ඒ එක්කම අපේ ආච්චිඅම්මා ගේ ඇතුලෙ ඉඳලා දුවගෙන ආවා.. වත්තෙ හැමතැනම මනුස්සයො වැඩකරනවා.. ටෙන්ට් ගහනවා.. අතුගානවා.. එළියෙ ඉස්සරහා පේන්ට් කරනවා..

" සුදුමහත්තයා කෙට්ටු වෙලා.."

සුපුරුදු විදියට අපේ ආච්චිඅම්ම දුවගෙන ඇවිත් කෙලින්ම මගේ අතකින් අල්ලලා උඩට කල්ලා හෙලෙව්වා.. හරියට ඇටසැකිල්ලක් අල්ලන්න වගේ.. ඔහොමනෙ හැමදාම.. මම සූමෝ සටන්කාරයෙක් වගේ මහත් වෙලා ඇවිල්ලා මෙතන බැස්සත්.. සුදුමහත්තයා කෙට්ටු වෙලා ඇදිලා ගිහිල්ලා තමා..

@Shan

" අපි කෙට්ටු වුණාට කෙල්ල ලස්සන වෙලානෙ.. බලන්නෙපෑ පෙම් පාට.."

මම ආච්චිගෙ කම්මුලෙන් ඇද්දහම ආච්චි මගේ පපුවට පාරක් ගාලා එහාට වුණා.. අනේ ලැජ්ජාව.. ඊටපස්සෙ තමා ආච්චිට තමන්ගෙම පුතාව මතක් වුණේ.. ආච්චි පටස් ගාලා ආච්චිට පිටිපස්සෙන් හිටගෙන ඉන්න ආධ්‍ය අයියයි මාමයි දිහා බැලුවහම ආධ්‍ය අයියා එයාගෙ අර සුර හිනාව පා කල්ලා ආච්චිඅම්මට එච්චා..

" මෙ පුතා.. රධ්‍ය පුතාගෙ අයියා නේද.. මට ගිය පාර ආවහම කතා ගොඩක් කියලා ගියේ.. අනේ පුතාලට මහන්සිද.."

අපේ ආච්චි ආධ්‍ය අයියගෙ අත් දෙකින්ම අල්ලගෙන හරි ලෙංගතුව හිනාවුණා.. ආච්චිඅම්මගෙ හිනාව එහෙම තමා.. කොයි කාටත් ලෙංගතුයි.. ඒකනෙ රධ්‍ය අයියත් අත්තම්මා කියලා පණ දෙන්න වගෙ ඉන්නෙ..

" ලොකු මහන්සියක් නෑ අම්මා.. ඉක්මනට ආවා අදනම්.."

" ආධ්‍ය පුතා නිතර අපේ ගෙදර එනවා කොලඹදි අම්මෙ.."

අපේ අම්මා වාහනේ තිබ්බ මගේ බෑග් අරවා මෙවා ටික එළියට ගත්තා..

" ඇතුලට යමු.. පුතාලා කාලත් නැනෙ..කාලා පොඩ්ඩක් විවේකෙන් ඉන්න.. අනුරාග් ඔය බෑග් ටිකත් අරන් එන්නකො.."

අපේ ආච්චි මාමව සතපහකට ගනන් ගන්නැතුව ආධ්‍ය අයියව ඇදගෙන ගේ ඇතුළට ගියා.. මාමා කට ඇද කරගෙන ආධ්‍ය අයියගෙ බෑග් ටිකයි අනිත් බඩියි උස්සගෙන අපේ අම්මා ගාවට කිට්ටු වුණා..

" අපේ අම්මට අපි ගැන කැක්කුම නෑ අක්කෙ.."

" අන්න අරහෙට යන්න දේව්.. කැක්කුම තමා.. කෝල් එකක් දුන්නට ගන්නෙ නෑ.."

" හරි ඉතින්.. කෝපගන්න දේවල්යැ ඔච්චා.. මේ ඉන්නෙ සුදුමහත්තයට කිච්චනම් ඉවරනෙ.."

අපේ අම්මා මාමගෙ පිටට පාරක් දුන්නහම මාමා ගෙට ගියා..

@Shan

" සුදුමහත්තයා ආපු එක හොඳයි.. මෙච්චර කල් මොකෝ මම නොදැක ඉඳලා තියන එකක්ද.."

" මම ආවනෙ.. කෝ ලොකුඅම්මලා.."

" අන්න කුස්සියෙ.. උයනවා.."

" මිම්.."

මම ගෙදර දිහාවට එද්දි ඉස්තෝප්පුවෙ ඉඳපු ලොකුඅම්මගෙ පුතාලා දෙන්නා මං දිහා බලලා මූණට මූණ බලාගෙන නෝන්ඩියට හිනාවුණා.. මම ඒවා දැක්කෙ නෑ වගේ කරබාගෙන මගේ කාමරේට ගිහින් ඇඳුමක් අරගෙන නාන කාමරේට වැදුණා.. නිදහසේ ඉන්න කියලා ආවට.. ලොකුඅම්මලත් ඉන්නවනෙ.. මම කැමති නෑ එයාලා ඉද්දි ගමේ ඉන්න.. හැමදාම ආච්චි මම නිසා එයාලට බැනලා තමා කතාව ඉවරවෙන්නෙ.. අනික මම දැක්ක තැන අවජාතක ලේබලේ වදිනවා..ඒත් සීයගෙ දානෙ නිසා නැවිල්ලා බෑනෙ.. මම නානගමන් ඉද්දි එහාපැත්තෙ මිදුල උදලුගානවා ඇහෙනවා.. හෙට නෙමේ අනිද්දා පිරිත.. ඊටපස්සෙ දානෙ..

නාගෙන කියාගෙන මම හිමින්සැරේ මාමගෙ කාමරේට රිංගුවම ආධ්‍ය අයියා නාලා ඇවිල්ලා කොණ්ඩෙ පිහනවා.. මම අයියා ගාවින් ඉඳගත්තා.. එයා ගාව රෝසමල් සුවඳ එනවා හැමතිස්සෙම.. මල් වත්ත වගේ.. අයියගෙන් බෙහෙත් ගන්න පේශන්ලගෙ හිත පිරෙනවැති ඩොක්ටව දැක්කහමත්..

" චූටියො.."

" ඔයා නැවද අයියෙ.."

" ඔව් මෙහේ වතුව සීතලයි නේද.. මහන්සියත් යනවා වතුර ඇඟට වටුණහම.."

" රධ්‍ය අයියත් කලින් ඔහොම කිව්වා.. මොකත නැන්දම්මා හොඳද.."

" අනේ චූටි.."

@Shan

ආධ්‍ය අයියා ටවල් එක මාමගෙ ඉස්සර කාලෙ පාඩම් කරපු මේසෙ ගාව පුටුවෙ ඇන්දෙන් දැම්මා..

" අම්මා හරිම හොඳයි.. කතා කළත් හිත පිරෙනවා.. හරි ආදරෙයි.."

" ආ ඒකනෙ.. මම කිව්වෙ.. දැන් එනකල් නැටුවනෙ.. හැකේ මොකක් කියයිත දන්නෑ කියලා.."

" කවුද ඉතින් දන්නෙ.. ඔක්කොමත් හරි කියමු.. ඔයාගෙ අම්මා මට පුතා කිව්වහම.. ඒක.."

අයියා මූන හට්ටියක් කරගෙන කියද්දි මම ඇඳේ පෙරළිලා කොට්ටෙන් මූන වහගෙන හිනාවුණා.. ඔකනෙ කියන්නෙ මේ පවුලෙ නැකම් හැමෝටම මහා ප්‍රශ්නාර්ථයක්..

" දේදුණු අක්කා හලෝ.. අයියා අපේ අම්මටත් අම්මා කියනවා.. ආච්චිඅම්මටත් අම්මා කියනවා.. ඒ ඉන්නෙ රධ්‍ය අයියගෙ නැන්දම්මා.. අයියගෙ නෙමේ.."

" අනේ මේ හිනාවෙන්නැතුව ඉන්න චූටි.."

" අයියලා මල්ලිලා මෙතන එකම පවුල්වල මාමලා බෑණලා අල්ලගෙන.. දැන් ඉතින් අපේ අම්මට නෑනෙ කියන්න.. හැබැයි අයියෙ.. ඔයාට බෝම්බ දෙකක් වගේ නෑනලා දෙන්නෙක් හම්බෙලා ඉන්නෙ.. එක බෝම්බයක් හරේ උයනවා.. අපිට වගේ උයලා කවලා දුක අහන මස්සිනාලා ලබන්න පින තියෙන්නෝන.."

" ඔව් අපි නිසා හොඳයි ඉතින්.."

මම නැගිටලා ආධ්‍ය අයියගෙ මූණ පිරෙන්නම ලොකු හාද්දක් දීලා මෙහාට වෙන්න වුණේ නෑ අහසින් ආපු ටවල් එකක් මගේ මූණ මැද්දට වැදුණා..

" ඒ පාර මගේ එකාවත් අල්ලගන්න හදනවද.."

" අල්ලගන්නෙ මොනවද හලෝ.. කොහොමත් ආධ්‍ය අයියා මගේ තමා.."

" දෙනවා උඹට.."

@Shan

" හිතුණොත් මම රධ්‍ය අයියත් එක්කත් යාළුවෙලා එක ගේ කනවා.. හොඳ නැද්ද.."

මම හිමින්සැරේ පොඩි පහේ ගිනිකූරක් පත්තුකල්ලා මාමට අතැරියා..

" ඇයි ඒ හොඳට ඉන්න කොල්ලවත් නරක් කරන්නද.. අනික උඹට එහෙම මොලේ අමරුවක් නෑ උඹ වගේ එකෙක් ඇහේ ගහගන්න.."

ආධ්‍ය අයියා ශර්ට් එකේ කරෙන් ලාවට කට පිහිදගන්නවා මම දැක්කා.. අනේ මාමෙ..!! එහෙම බලද්දි මේ ලෝකෙ ලොකුම අමාරුව තියෙන්නෙ මාමගෙ වෙන්න බෑණට තමා.. ඇයි යකෝ අවුරුදු ගානක් ලව් කලේ.. මෙච්චා අහගන්නද.. පව් මගෙ හැපීකච්චා..

" කමක් නෑ.. මම යාළුවෙනවා.. දෙන්නම මගේ.."

" සිරාවට සුදුමහත්තයා.. උඹෙ ඔය කැල්ල ගැන සිරියස් එකම එක දෙයක්වත් මට කියපන්කො බං.. සාකි ඔයාවත් කියන්නකො.. මූ ගල් ආදා හැමතිස්සෙම ලිස්සලා යන්න නම් දන්නවා.."

මමා ඇවිත් මට එහාපැත්තෙන් ඉඳගත්තා.. මම පස්සත් උඩ දාගෙන ආයෙම කොට්ටෙ අස්සෙ මූණ ගහාත්තම ආධ්‍ය අයියා මගෙ එපිටට තට්ටු දෙක තුනක් දාලා අතගෑවා..

" එයා හොයාගෙන ඉන්නේ~"

" කවුද.."

" එයා හොයාගෙන ඉන්නෙ

**'මම ඔයාට ආදරෙයි.. ඒත්..'**

කියන එක්කෙනෙක් නෙමේ..

**'මම ඔයාට ආදරෙයි.. එච්චරයි..'**

කියන එක්කෙනෙක්.. නෙහ්.."

මම කොට්ටෙ අස්සෙ ඉඳගෙන ඔලුව වැනුවා.. මාමා හිනාවුණා..

@Shan

" එහෙනම් කමක් නෑ.. බලන් යද්දි ඔයානෙ වැඩිපුර මෙකගෙ කැල්ල ගැන දන්නෙ.."

" එයාගෙ කැල්ල මම අඳුරන එක්කෙනෙක්.. ඔයා දන්නෑ.."

" සුදුමහත්තයා..!!!"

අපේ අම්මා කාමැන් එළියේ ඉඳන් කෑගහද්දි මම ඇඳේ ඉඳගත්තා..

" ඕ අම්මේ.."

" එන්න කන්න.."

මම නැගිටලා මාමලාටත් එන්න කියලා කුස්සියට ගියා.. ඒ යද්දි කුස්සිරෙ දොර ගාව ඉඳලා ලොකු අම්මගෙ ලොකු පුතා මගේ උරහිසේ වැදුණු පාට මාව පිටිපස්සට විසික් වෙලා ගියා.. මම හිතලා වැදුනෙ නෑ.. ඌ තමයි හිතලම ඇවිත් ඇහේ වැදුණේ.. මම අයියට යන්න ඉඩ දීලා මෙහාට වෙලා හිටියා.. ඒකා ගියේ නෑ.. මගේ දිහා නෝන්ඩියට හිනාවෙගෙන බලාගෙනම ඉන්නවා..

" දැන්නම් පණත් නෑ වගේ මල්ලිට.. එච්චරට මහන්සි වෙලාද.."

මම ඔගේ කට කැඩිච්ච කතාව ගනන් ගන්නැතුව කුස්සියෙ තිබ්බ බත් පිඟාන අරගෙන මගේ කාමරේට ගිහින් දොර වහගත්තා.. පුදුම අමාරුව තියෙන්නෙ මුන්ට.. හිතුනොත් කෙලිනවා අම්මපා ඔලුකට්ට කුඩුවෙන්න.. මම වෙසකමෙ යනවා කියලා හිතුවද දන්නෑ..

" චූටියො මේ දොර අරින්න ළමයා.. චූටි!!"

ඔතරී දැලඹුවෝ හොයාගෙන ආවෝ..

මෙ ටිකේ බිසී ළමයිනේ ඇත්තමයි කියන්නේ.. ඒත් ඔයාලා කතාව වෙනුවෙන් බලන් ඉන්න නිසා ඉඩ ලැබෙන වෙලාවක මම ලියන්න ට්‍රයි කරනවා.. ඔයාලා ඔතර් කලවැම්දා එක්ක තරහා වෙන්නෙපා අනේ..

දානෙ ගෙදර මොනවා වෙවි කියලද හිතන්නෙ.. අපි කතාවෙ පීක් එකට ඇවිල්ලයි ඉන්නේ.. මෙතනින් එහාට මොනවා වුනත් හැමෝටම

@Shan

සේපාලිකා මල් පිපෙනවා.. මේ කතාවෙ නම ගැනත් ඔයාලට ඉස්සරහට මම කියන්නයි ඉන්නේ..

හෙන දේවල් ගොඩක් තියෙනවා අනේ.. මම හැමදාම දෙන්න උපරිම ට්‍රයි කරනවා.. ආයෙමත් කියන්නෙ.. ඔයාලා වගේ රීඩර්ස්ලා මට හමුවුණු එක ගැන මට හරිම සතුටුයි.. ආදරෙයි..

එන්නාම්.. ලව් යූ.. ❤





@Randikakushanthi තැන්කූ සෝ මච් ලස්සන ලමයෝ.. ඔතරීට හම්බුණු ලස්සන තැග්ගට මම හුඟාක් ආදරේයි..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 115 කොටස

මම කන්න ගත්තු බත් පිඟානත් පැත්තකින් තියලා ගිහින් ආධ්‍ය අයියා කතාකරන්නෙ ඇයි බලන්න දොර ඇරියා.. බලද්දි ආධ්‍ය අයියත් බත් එක අතේ තියාගෙන දොර ඉස්සරහා හිටගෙන ඉන්නවා.. මම එයාට එන්න කාමරේ පැත්තකට වුණාම අයියා මට හිනාවෙගෙනම ගිහින් මගේ පුටුවෙන් වාඩිවුණා.. මාත් ආයෙම දොර ලොක් නොකර වහලා ඇවිත් ඇඳෙන් වාඩිවෙලා බත් පිඟාන අතට ගත්තා..

" අයියා කෑම කාමරේ ඉඳන් කන්නෙ නෑ..??"

" බෑ අනේ.. මම මේ පොඩි මස්සිනා හොයාගෙන ආවා.. හොඳ නැද්ද.."

" හොඳයි හොඳයි.. මාමා කෝ.."

" අන්න ටවුන් එකට යන්න ඕන කියලා කන්නෙම නැතුව යන්න ලෑස්ති වෙනවා.. අටපිරිකර වගයක් ගේන්න ඕනලු.."

" ආ.. එහෙමද.."

" කවුද චූටි අර ළමයි දෙන්නා.. ලොකුඅම්මගෙ පුතාලද.."

" ඔව් අයියෙ.."

" මට රධ්‍ය විස්තරයක් කියලා තියේ.. මේ චූටි ඔයා ඒ ළමයි එක්ක කතාවට යන්න තියා මූණවත් බලන්න එපා.. මහ නොසණ්ඩාල ළමයි දෙන්නෙක්.."

" ඔව් පොල් බූරුවො දෙන්නා.. හිතාගෙන ඉන්නෙ හරි ලොකුයි කියලා.."

" ම්ම්.. ඒත් ඔයාලගෙ ගෙදර අය හරි එකමුතුයි නේද.. මම කියන්නෙ පොදු වැඩකදි වුනත්.. මම මෙහෙම කලින් ගෙදර දානයක් තියෙද්දි ඉඳලම නෑ.."

" හෙට මීටවඩා කට්ටිය ඒවි.. රෑ පිරිතත් තියෙනවනෙ.."

" මෙහේ ගහක් තියෙනවා කිව්වා නේද.."

@Shan

" ඔව් ඔව් ඇ මටනම් ඔච්චා පෙන්නන්න කියන්නෙපා.. මාමටම කියන්න.. අම්මෝ.. ගුටි කන්න වෙන්නෙ.."

" ඒ මොකද ඒ.."

" එහෙම තමා.. පොසෙසිව් බෝයිපෙන් ඔයාගෙ.. මම මේ මගේ මනුස්සයා නැති දුකින් ඉන්නවා.. ඔයාලා සතුටින් ඉන්නකො.."

" ඔය කිව්වට හෙට වුණාම ඔයාට එච්චා මතක නෑ.. මම දන්නවනෙ.."

" වැඩනිසාද.."

" ඔව්.. මේ ලොකුඅම්මා ඩොක්ට කෙනෙක් කිව්වා නේද.."

" ම්ම්.. එයා හෙන ඔලුවෙන් ඉන්නෙ ඒකනිසා.."

මම එහෙම කිව්වහම ආධ්‍ය අයියා මොකක් හරි හිත හිත ලාවට හිනාවෙලා ලස්සනට අනපු බත් කටක් හිමින් සැරේ කෑවා.. මේ මනුස්සයා කරන කියල හැම වැඩේම අසාමාන්‍ය ලෙස පිළිවෙල මොකද කියන්න මට තේරෙන්නෑ.. එච්චා දිහා බලාගෙන ඉන්න හිතෙනවා..

" ඔලුවෙන් ඉන්න ඉතින්.. මොකෝ ඩොක්ට කියලා හඳ අල්ලලා ඇවිල්ලයෑ චූටි.."

" ඔව් නීල් ආම්ස්ට්‍රෝන්ගෙ කලින් ආත්මෙලුනෙ ඔයාගෙ ලොකුනැනා.. එයා එක්ක ලේසි නෑ හරිද.. පොඩ්ඩක් පරිස්සමෙන් කතාබහ කරන්න.. මල බෝම්බෙ.. අපේ මාමා කැමති නෑ.. වලි හැමතිස්සෙම.."

" එහෙමද.. ම්ම්.. ම්ම්.."

ආධ්‍ය අයියා බත් පිඟාන දිහා බලාගෙන ආයෙම ලාවට හිනාවුණා.. ටිකකින් මාමත් කාමරේ දොර ගාව ඉඳන් ටවුන් යනවා කියාගෙන යන්න ගියා.. සාලෙ බඩුමුට්ටු අස් කල්ලා හෝදනවා.. ඒකනිසා ආධ්‍ය අයියයි මමයි කාලා ඉවරවෙලා ආච්චිඅම්මා එක්ක පන්සලට ගියා ලොකුහාමුදුරුවන්ට පිරිතට ආරාධනා කරන්න.. අපේ ආච්චිඅම්මටත් ආධ්‍ය අයියව හිතට අල්ලලා ගිහින් 'හරිම පිංපාට දරුවෙක්' කියලා සැරින් සැරේ කියනවා.. ලොකු හාමුදුරුවො අපි ආවාස ගෙයින් එළියට එද්දි පිරිත් නූල් දෙකක් අරන් ඇවිත් අතේ

@Shan

බැන්දා.. ඊටපස්සෙ ආච්චිඅම්මා හාමුදුරුවො එක්ක කතාකරනකල් අයියයි මමයි බෝමළුවෙ ඇවිද ඇවිද හිටියා..

ඒ වුණාට මගේ ඇඟට එච්චර හරි නෑ.. උණ හැදෙන්න වගේ.. ඇස් දෙක දනවා.. සීතල හුළං හවස් වෙලා ඇඟේ වදිද්දි මාව වෙවුලනවා වගේ.. ආධ්‍ය අයියා පැත්තක තිබ්බ ගල් කණුවක ලියලා තිබ්බ ඒවා කියව කියව ඉද්දි මම මල වටේ කැරකෙන බඹරා වගේ අයියගෙ වටේ කැරකි කැරකි අත් දෙකෙන් මාවම බදාගත්තා.. අයියා ටිකක් වෙලා ගල් කණුව දිහා බලන් ඉඳලා කණ්ණාඩි දෙක ගලවලා ශර්ට් එකේ කරේ රඳවගෙන මං ගාවට ඇවිත් මගේ නළලට අතක් තියලා උණ බැලුවා.. ඊටපස්සෙ බෙල්ලටත් අතක් තියලා අනිත් අත එයාගෙ බෙල්ලෙන් තියාගත්තා..

" චූටි.. ඔයාට උණනෙ.. මෙ මොකද.."

මම එහෙමම ගල් කණුවකට හේත්තු වුණා.. උණ නිසාද මන්දා අයියගෙ අතත් සීතලයි හොඳටම.. මට එහෙම දැනෙනවා..

" අනේ මන්දා.. සීතලයි වගේ පොඩ්ඩක්.."

" උගුර රිදෙනවද.. කන් අගුළුවැටිලා වගේ.."

" එහෙම නෑ.. ඒත් මේ රීයෙ ඉඳන් මස්ල් පේන් එකක් තියෙනවා කකුලෙ කලව හරියෙන්.. ඒක සැරින් සැරේ රිදෙනවනෙ.."

ආධ්‍ය අයියා මගේ කකුළ දිහා ටික වෙලාවක් බලාගෙන හිටියා..

" දැන්ද ළමයො කියන්නෙ.. දැන් ඒ අමාරු පිට පන්සලුත් ආවද.."

" ලොකුවට නෑ ඉතින්.."

" ගෙදර ගිහින් බලමු.. මම මාමට කියන්නම් එද්දි බැන්ඩේජ් එකකුයි පෙල් එකකුයි අරන් එන්න කියලා.."

" ම්ම්.."

" පොඩ්ඩක් ඉන්න හරිද.."

@Shan

ආධ්‍ය අයියා සාක්කුවෙන් ෆෝන් එක අරගෙන කනේ තියාගෙන පොඩ්ඩක් මගෙන් එහාට ගියා.. මගුල ගෙදර එන්නම ඕන වුණානෙ උණ හැදෙන්න.. දැන් උණ හැදුන එකටත් තව මොකක් හරි කතාවක් අහගන්න වෙයිද දන්නෙ නෑ.. එහෙමත් මනුස්සයො කට්ටියක් අපේ ගෙදර ඉන්නවනෙ.. මම ඔච්චා මතක් වෙන එක අමතක කරගන්න මූණ අත් දෙකින්ම අතුල්ලගත්තා..

අපේ ගමේ පන්සලේ තියෙන්නෙ අමුතු පාළුවක් එක්ක එකතුවුණු නිස්කලංක පරිසරයක්.. මම පොඩි කාලෙ, කාලයක් ලොකු හාමුදුරුවො ළඟ පොඩි හාමුදුරු නමක් හිටියා.. දහම් පාසල් ආවහම මට පොඩි හාමුදුරුවො ඇඳපු චිත්‍ර පෙන්නනවා.. පොඩි හාමුදුරුවො කෙනෙක් වෙන්න කලිනුත් මෙහේමයි හිටියේ.. ආච්චිඅම්මට හදාගන්න අමාරුයි කියලා හාමුදුරුවොන්ට ගෙනැල්ලා බාරදීලා.. පොඩි හාමුදුරුවො බෙරලිහෙල පැත්තෙ.. මම දහම්පාසල් ආවහම ඉන්ටවල් එකට බෝමළුවෙ කොනේ බැම්මෙ ඉඳගෙන චිත්‍ර බලනවා.. පොඩි හාමුදුරුවන්ට ලස්සනට චිත්‍ර අඳින්න පුළුවන්.. හාමුදුරුවො සමහර වෙලාවට මට කියලා සුභාශිතයේ කවි කියවගන්නවා.. මට ඒවගෙ තේරුම් පොඩි හාමුදුරුවන්ට තේරෙන විදියට කියාදෙනවා.. අපි එකම වයසෙ..

ඒත් ලොකු හාමුදුරුවො පහුවෙද්දි පොඩි හාමුදුරුවන්ව බැරගම පන්සලට යැව්වා.. එහේ ඉඳලා ඉගනගන්න.. මෙහේ දුශ්කර වැඩියි කියලා.. ඇත්ත තමා මෙහේ දුශ්කර කතාවනම්.. අනික පොඩි හාමුදුරුවන්ට ලොකු හාමුදුරුවො ලෙන්ගතුයි.. උනන්දුවෙන් ඉගනගන්නවා කියලා.. අපේ ආච්චිඅම්මා මම පොඩි කාලෙ දානෙ අරගෙන එද්දි පොඩි හාමුදුරුවන්ට කැවිලි හදාගෙන එහෙම එනවා.. ආච්චිඅම්මා කියන්නෙ සිවුරක් පොරවගෙන හිටියත් ඒ හැමෝටම ළමාකම දැනෙනවා කියලා.. මගේ ආච්චිඅම්මා හරි පුදුම මනුස්සයෙක්.. කුඹියෙක්ගෙ ඉඳලාම හැමකෙනෙක්ටම දනෙන දේ ඉක්මනටම අඳුනගන්නවා.. අනික ඉස්කෝලෙහාමිනේ වුණාට කවමදාවත් සැර කරන්නෙ නෑ ළමයෙක්ට.. ඉස්පිරිතාලෙකට තැපැල් කන්තෝරුවට එහෙම ගියාම ආච්චිඅම්මට ඉස්සර ගෝලයො ඇවිත් පෝළිමට වඳිනවා.. ආච්චි එක්ක තැනකට ගියොත් ඔහොම තමා.. ගෙදර තුන්දෙනාට වඩා කලේම අනිත් ළමයින්ට.. ඒත් ආච්චිට රුස්සන්නෙ නැති අයත් ඉඳලා හිටලා ඉන්නවා.. එයාට දැක්කගමන් කියන්න පුලුවන්..හොඳද නරකද කියලා..

@Shan

අපි අන්තිමට ගෙදර එද්දි මට සහලෝලාම උණ.. ආච්චිඅම්මා වැඩ අස්සෙ කලබල කරන්න උවමනා නැති නිසා මම කියන්න ගියේ නෑ.. අම්මටත් ඉහට උඩින් වැඩ.. ඒකනිසා අම්මට මං ආවද කියලා බලන්නවත් වෙලාවක් නෑ මම හිතන්නෙ.. මම හිමින්සැරේ මූණ හෝදගෙන ඇඳුමක් ඇඳගෙන කාමරේට වෙලා හාන්සිවෙලා හිටියා.. ගෙදර චූටියා සෙනහට බයවෙලා මගේ මේසෙ උඩ හොඳට ගුලිවෙලා නැට්ටෙන් මූණත් වහගෙන නිදි.. මම ඇඳේ හාන්සිවෙලා අත් දෙකින්ම කකුල අතගාගද්දි අම්මා කාමරේ දොර ඇරගෙන ඇතුළට ආවා.. ඇවිත් ලයිට් දැම්මා..

" සුදුමහත්තයා.. මේ මොකද.."

" ආ..??"

අම්මා දුවගෙන ඇවිත් ඇඳෙන් ඉඳගත්තා..

" මට ආධ්‍ය පුතා කිව්වෙ.. උණද.. මේ මොකද.. එනකොට හොඳට හිටියනෙ.."

" කකුල තැලිලා වගේ අම්මෙ.. ඒකට මම හිතන්නෙ උණ.."

" බලන්නකො කරගන්න වැඩ.. මම උණුවතුර ටිකක් රත් කරන් ඇවිත් තවන්නද.."

" එපා අම්මෙ.. මාමා බැන්ඩේජ් එකක්-"

" දේද්ද.. අර සෝමසිරි මාමා කතාකරනවා..!! මොකද මේ.."

මම ඇස් දෙක පියාගෙන කොට්ටෙන් ඔලුව තියාගත්තා.. ඔය ආවෙ මදිපාඩුව.. දැන් හරිනෙ.. ලොකුඅම්මගෙන් බෙහෙත් ගන්නවට වඩා හොඳයි කකුල කපාගන්නවා.. ලොකු අම්මා මං ගාවට ඇවිත් මං දිහා රවලා වගේ බලලා අපේ අම්මගෙන් ඇයි කියලා ඇහුවා..

" කකුළ තැලිලා අක්කෙ.. බලන්න සුදුමහත්තයා කිව්වෙත් නැනෙ.."

අම්මා මගේ මූණට වැටිලා තිබ්බ කොණ්ඩ කෑලි සේරම ටික අල්ලලා පිටිපස්සට කල්ලා නළලෙන් අත තියාගත්තා.. අම්මගෙ අතේ උණුහුමට සනීපයි වගේ.. ඔලුව අතගාද්දි..

@Shan

" ආ.. ඒ මොකක් කරන්න ගිහිල්ලද.. කොහෙද තැලිලා තියෙන්නෙ.."

ලොකු අම්මා ඇහුවහම මම කලව හරියෙන් පෙන්නුවහම ලොකු අම්මා ඇස් දෙක ලොකු කරගත්තා.. ලොකු කරගෙන මගේ කකුලට එබිලා බැලුවා.. සැක් දැන් ගමේම ඉන ගෑණු ඒවිද දන්නෙ නෑ ඉස්කෝලෙහාමිනේගෙ මුණුබුරාගෙ කකුල තැලිච්ච එක බලන්න..

" ඕක ඇරිලා යාවි.. බෙහෙත් මොනවහරි බිච්චහම.. දේදු අන්න අරහෙ වැඩ ගොඩයි ගිහින් බලන්නකො.. මම ගේ අස්කරන්න උදවු වෙන්න.."

ලොකු අම්මා මගේ කකුල ගැන සතපහකට ගනන් ගන්නැතුව අම්මට එන්න කියාගෙන එළියට ගියාම අම්මා මගේ ඔලුව ගාවට ඇදිලා ඇවිල්ලා කොණ්ඩ ගස් අස්සෙන් ඇඟිලි තුඩු යවලා පරිස්සමට අතගෑවා.. මම ඇත්තටම අම්මගෙන් එහෙම දෙයක්වත් බලාපොරොත්තු වුණු නිසා හිතට දැනුණු දුකට ඇස් වල කඳුළු පිරුණා.. අම්මා මං ගැන හොයන්නෙ නෑ වගේ ඉද්දි මට දුක හිතෙනවා.. අම්මා මේසෙ උඩ තිබ්බ කොලොන් බෝතලෙන් ටිකක් අරගෙන මගේ ඔලුවට හලලා ආයෙම ඔලුව අතගෑවා..

" මම කන්න මොනවහරි ගේන්නද.. ඔය ජිම් ගිහින් යකඩ උස්සලා තමා මේ කැක්කුම හදාගෙන ඇවිත් තියෙන්නෙ.."

අම්මා කියද්දි මම ලාවට හිනාවුණා.. අම්මා හිතන්නෙ ජිම් ගියාම යඩක උස්සන එක තමයි කරන එකම දේ කියලා..

" යකඩ උස්සන්නෑ අම්මෙ.. මාව අම්මට අලියෙක් වෙලා වගේ පේනවද.."

අම්මා මගේ ශර්ට් එක උඩට උස්සලා බඩට එකක් ඇන්නා..

" මොකෝ එහෙනම් මෙච්චර ඇඟ හයිය.."

" හයිය හත්තියට ඉන්නෙපෑ.. අම්මව බලාගන්න.."

අම්මා අමුතුවට හිනාවෙලා මගේ ශර්ට් එක පහළට දැම්මා..

" ගහක් ගලක් වගේ ඉඳලා උඹ අසනීප වුණාම බය හිතෙනවා සුදුමහත්තයා.. බැරි මගුල් නොකර ඉඳින්.."

" බැරි මගුල් මොනවද.."

@Shan

" අර එකසැරේකුත් බැඩ්මින්ටන් ගහන්න ගිහින් ඔපරේශන් එකකුත් කරන්න වුණා.. අම්මපා කකුලට මොනවහරි වුණානම් මම මොන දෙයියට කියන්නද.."

" එහෙම වෙන්නෑ අම්මෙ.. අපෝ.."

" කට වහගෙන ඉඳපන්.."

" ම්ම්.."

" සුදුමහත්තයා.."

" ම්ම්..??"

" උඹ කොළඹ ඉද්දි මම කියපුවාට උඹ මාත් එක්ක තරහද.."

" අර මොකට තරහ වෙන්නද.. ඔය කට ඉතින් අපිට වහන්න පුලුවනෑ.."

මම හිනාවෙලා කිව්වහම අම්මා මට පාරක් ගැහුවා..

" නිකන් ඉදින්.. උඹට හැම එකම විහිළු.. මට අසලි අක්කා කතාකලා.."

මම ඇස් දෙක ඇරලා අම්මා දිහා බැලුවා.. ටසිරි අක්කත් වෙලා ඒ සැරේ..

" ආධ්‍ය අයියලගෙ අම්මා..??"

" ඔව්.. උඹව හම්බුණා කිව්වෙ.. විස්තර ගොඩක් කිව්වා.."

" මොනවද විස්තර.. අම්මා හම්බුණා තමා.. රට යන්න කලින්..එකපාරක් ඉස්කෝලෙ ගාවට ආවා.. රධ්‍ය අයියත් දියතලාවෙ ගිහින්නෙ.."

" ඒකටනම් හරියට අක්කා දුක් වෙනවා.. මාත් එක්ක කිව්වා.. ආයෙ එන්න අදහසක් නෑ කිව්වෙ.."

" එහෙමද.."

" ම්ම.. මට කිව්වා උඹෙ ක්ලබ් එක ගැනයි ඉස්කෝලෙ වැඩයි.. කවුරුහරි කිව්වොත් මිසක් ඉතින්.. මොකෝ උඹ ඇවිල්ලා එව්වා අපිට කියන

@Shan

එකක්ද.. නැනෙ.. ඔය කලර්ස් නයිට් එකකට ගියොත් මිසක්.."

" තා මොනවද කිව්වෙ.."

" තව එංගලන්තෙ විස්තර තමා.. මෙහේ විස්තර ඇහුවා.. ඕවා තමයි.. හුහක් වෙලා කතාකලා.."

" මම්.. හොඳයි.."

" අසලි ඉන්නෙ මහ අමුතු ජීවිතේක නේද.. මට කතාකරද්දි තේරෙනවා.. ලොකු පසුතැවීමකින් කතාකරන්නෙ.."

" අපිට වැඩක් නැනෙ අම්මෙ.. ඒ පවුල්වල දේවල්නෙ.. අම්මගෙ අත රිදෙනවනම් ඇති.. මම පොඩ්ඩක් නිදාගන්නවා.."

" එහෙම රිදෙන්නෑ බං.. ඇයි උඹත් අත් දෙක ගෙවෙනකල් මගෙ කොණ්ඩෙ තෙල් ගාන්නෙ.. මෙක මහලොකු වැඩක්ද.. නිදාගන්නකො දැන්.."

මම ඇස් දෙක පියාගෙන අම්මගෙ උකුලෙන් ඔලුව තියාගත්තා.. වරදක් නොකරනම් බයවෙන්න ඕන නෑ කියන්නෙ ඇත්ත තමා.. රධ්‍ය අයියගෙ අම්මට ආධ්‍ය අයියා කිව්වද දන්නෙ නෑ මට ගෙදර ප්‍රශ්න වගයක් කියලා.. ඒකනිසා වෙන්නැති කතාකලේ.. කතාකල එක හොඳයි.. අඩුම තරමෙ අපේ අම්මා තේරුම් ගන්නැතෑ.. ලොකු අම්මා කියන හැම ලබ්බම හරි නෙමෙයි කියලා.. රධ්‍ය අයියගෙ අම්මා ඇත්තටම හොඳ මනුස්සයෙක්.. ඒක එහෙම හරි පැහැදිලි කල්ලා දුන්න එහ සිතට සහනයක්.. අම්මගෙ හිතේ පසුතැවිමක් ඉතුරුවෙලා ඇතිනෙ.. මම කොච්චර කතා ඇහුවද.. අම්මා වුණත් මෙහෙම ලොකු අම්මව අදහන්න ඕන නැනෙ..

හරි!! මම කොල්ලෙක්ට ආදරේ කරනවා තමා.. යකෝ ඉතින් මම මිනීමරලයැ උාට ලව් කරන්නෙ.. ඔච්චර අපරාධකාරයෙක් ගානට දාලා බලන්න.. ඇත්තටම මට මේවා ඉවසගෙන ඉඳලා ඇතිවෙලා තියෙන්නෙ.. දැන් මම ඉස්සරට වඩා එක්කො නපුරු ඇති.. එහෙම නොවී තියෙන්න බෑ.. මම කියලා ඉවසන් ඉන්න ඔච්චරටම මම රහත් වෙලා නැනෙ.. කියන කියන හැම බලු කතාවම අහගෙන ඉන්න තරම්.. රධ්‍ය අයියයි මාමයි කියන්නෙත් ඇත්ත තමා.. ඕනවට වඩා හොඳ වෙන්න හොඳ නෑ.. ලොකු අම්මට බයේ මම ගෙදරින් එළියට බැහැලා ගිය කාලයක් තිබ්බා.. මට ඒවා

@Shan

හොඳට මතකයි.. කළ හොඳ මතක තියාගෙන නොහොඳ අමතක කරන්න කිව්වට.. මම නම් කියන්නෙ නොහොඳ තමා හොඳටම මතක තියාගන්න ඕන.. ආයෙම නොහොඳක් නොවෙන්න බලාගන්න නම්..

ලොකු අම්මලට දැන් මට මුකුත්ම කියන්න බෑ.. මොකද මම මගේ තැන හදාගත්තෙ මගේ මහන්සියෙනුයි මගේ වටේ මුල ඉඳන් ඉඳපු අයගෙ සපෝර්ට් එකයි නිසා.. දැන් මාව ගෙදරින් එළියට ඇදලා දැම්මත් කමක් නෑ.. මට සැලරි එකක් හම්බෙනවා.. මැරෙන්නැතුව ගේමක් ගහලා ජීවත් වෙන්න පුලුවන්.. කැම්පස් ගියොත් එහෙමයි.. ඩිග්‍රියක් කරගත්තම ජොබ් කට්ටක් හොයාගන්නවා.. නැත්නම් ක්ලබ් එකේ සෙල්ලම් කරනවා මට යන්න පුලුවන් උපරිමේටම යනකල්.. එහෙම හරි කල්ලා අම්මව ජීවත් කරවනවා..

අනික ආඪ්‍ය අයියයි මාමයි වගේනම් මට එහෙම අතෑරලා ආලා ආදරේ පරිත්‍යාගයෙන් නිවන් දකින්වා කියලා හිත හදාගන්න බෑ.. මට විතරක් නෙමේ රඪ්‍ය අයියටත් බෑ.. නටන්න ඕන හැම සන්නියම නටලා හරි මම ඌ එක්ක විතරයි ඉන්නෙ.. ඒකත් මගේ වෙලාවට මට හම්බුණු එකා යකෙක් වගේ ඕන මගුලක් කාගෙන ඉන්නවා.. ඒකම ලොකු දෙයක්.. මට ගෑණියෙක් වගේ තොදොල් වෙන්න ඕන නෑ.. එහෙම වෙන්න ඕන තැන මම ඉන්නවා.. ඒ ඇරෙන්න මම සමාජෙට විහිලුවක් වගේ හැසිරිලා නෑ කොයිම වෙලාවකවත්.. අම්මට ඔය කියන තරම් මම නිසා ලැජ්ජ වෙන්න විදියක් නෑ.. මට දැන් මේ බයවෙලා ජීවත් වෙලාම ජීවිතේ එපාවෙලා තියෙන්නෙ.. ලොකු අම්මලව දැක්කහම මට කේන්තියි.. මට සේරම ආයෙ ආයෙ ඉඳලා මතක් වෙනවා..

මම දිගටම ඇස් පියාගෙන් උන්නු නිසා අම්මා මම නිදි කියලා හිතාගෙන ෂීට් එකකුත් මට පොරවලා ලයිට් ඕෆ් කරන් කාමරේ වහගෙන යන්න ගියා.. ටිකකින් මට ඇහේ අමාරුවට හොඳටම නින්ද ගියා මළා වගේ..

හීනෙන් පේන විකාර හීනයි වටේ පිටේ සද්ද බද්දයි එක්ක මම ආයෙම ඇහැරෙද්දි පාන්දර දෙකට විතර ඇති.. මේ පාන්දර දෙකනම් මහ පුදුම විකාරයක් තමා.. මම හිතන්නෙ මේ අවුරුදු දෙක තුනට පාන්දර දෙකට මම නිදාගෙන ඉඳලා තියෙන්නෙ හරිම පොඩි වෙලාවක් විතරයි.. මම අවදි වෙද්දි මගේ එහාපැත්තෙ කවුරුහරි මගේ අතේ වැලමිට හරියෙන් තදින් අල්ලගෙන ඉන්නවා වගේ.. මම ඇහැරිලා කළුවරට ඇස් හුරුවෙනකල් ඉඳලා බලද්දි එහාපැත්තෙන් රෝසමල් සුවඳක් එනවා..

@Shan

ආධ්‍ය අයියා කොයි වෙලාවෙද මෙතෙන්ට ආවෙ..??

මම කොට්ටෙ අස්සෙ තිබ්බ ෆෝන් එක අරගෙන ඒකෙ එළියෙන් බලද්දි ආධ්‍ය අයියා මං ගාව හොඳටම නිදි.. මගේ කකුලෙ නිල් පාට බැන්ඩේජ් එකක් ගැටගහලා අයියගෙ අත ගාව පෙල් ටියුබ් එකක් තියෙනවා.. මම අයියගෙ අත හිමිහිට එහාට කරලා නැගිට්ටලා කාමරෙන් එළියට ගියා.. ආධ්‍ය අයියා පව්.. එයාට මහන්සි ඇති.. අසනීපත් එක්ක කොහොමත් අයියට නිතරම නින්ද යනවා..

මම සාලෙට යද්දි අම්මලා නිදි.. මාමා දොරකොඩ ගාව ඉඳගෙන එළිය බලාගෙන ඉන්නවා.. මම හිමින් සැරේ මාමා ගාවට ඇවිදගෙන ගිහින් තට්ටුවක් දැම්මා විතරයි මාමා ගැස්සිලා ගිහින් මගේ පිටට දබෝස් ගාලා පාරක් අතෑරියා..

" ඒ.......හ්!!!!!!!! සුදුමහත්තයා.. උඹට ඒ සැරේ යකෙක් වැහිලද.."

මම දෙකට තුනට  නැමිලා හිනාවෙගෙන බිත්තියට හේත්තු වුණා.. අනුකිච්චා බය වෙලා..

" මොනවද මාමෙ කල්පනා කලේ.. මෙහෙ කරපිංචා ගහක් තියන තැනක්ද.."

" අනේ මේ.. පලයන්.. ලබ්බක් කතාකරනවා.."

" ලබ්බක් නෙමෙ අනේ.. කියනවකො.. මොකක්ද සීන් එක.."

" සීන් එක.. ආන් අර ගේ ඇතුළෙ ඉන්න ලොකු අක්කා කියන පිල්ලි-"

මම පැන්න ගමන් මාමගෙ කට වැහුවා..

" මේ ඇහුණොත් දන්නවනෙ.."

" ඇහිච්චදෙන්.. හිතාගෙන ඉන්නෙ මෙවා උන්ටම ගිය රට කියලා.. ආවා මනමාලියො ජෝඩු කරන්න.. "

" ඈ සිරාවට.. ඒ කවුද මාමෙ.."

@Shan

" මම දන්නෙ නෑ.. කොහෙද ඉන්න ගෑණියෙක්.. මම යනවා බං යන්න.. මගුල.. අම්මා නිසා ආවෙ.. මුන් ඉන්නව කියලා දන්නවනම් එන්නෙත් නෑ.. අම්මපල්ලා.."

" හරි බං මාමෙ ඉතින්.. දැන් ඒ කෙල්ල මෙහෙ එන්නෙ නෑනෙ.."

" එන්නෙ නැත්තෙ මොකද.. ලබන සතියේ එනවා කියන්නෙ.. හිටපන් උඹලගෙ අම්මගෙ සාරියක් ඇඳගෙන මම යනවා ගෑණියෙක් වගේ.. පවුලෙ නම්බුව උඩ යන්න.."

මම මාමා කියන ඒවට හිනාවෙවී මාමගෙ අතට හේත්තු වුණා..

" අනෙ මේ.. ඔහොම කියක් ආවද හලෝ.. කෝ නම්බර් එක හොයාගන්නවා.. කලින් ඒවට වගේ මම මාමගෙ අතදරුවට කතාකරන්නම්.. ඉවරනෙ.."

මාමා හිනාවෙලා මගේ කරට අතක් දාගත්තා..

" අඩේ ඒ මාවනැලෙ කෙල්ලනම් පව් බං.. ඇඩුවත් එක්කලු.."

" ඉම්හි.. අයියා.. මම හිමිතුවේ නෑ උයා මම්ට මිහෙම කරයිම් කියමලා.."

මගෙ දළඹුවනේ.. මම ආවෝ.. වරද් ළමයා ලෙඩ වෙලානෙ.. මලක්කත් අරන් එඤ්ඤ.. ඔතරී උදේ ඉස්කෝලෙ යමන ඕන අම්නේ..

එන්නාම්.. ලව් යූ..❤



ඔතරීට බඩ්ඩක් හම්බුණානෙ.. අනේ මගේ ලසෝ.. තැන්කු සෝ මච් ලස්සන කෙල්ලෙ.. මම ආදරෙයි..

ආහ් අපෙ කෙමල සේපාලිකා එකට වීඩියෝවක් හදලා මට එව්වනෙ.. නවල් ෆැන්ටසිය ගෲප් එකේ තියනවා.. කැමති අය බලන්ඩෝ.. මම ආදරේම ආදරෙයි අනේ.... 😭❤

ප.ලි.

@Shan

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 116 කොටස

" චූටි සේ.. සේ.. සේ.. මෙහෙ එන්නකො.. චූටි..!!"

මම ඊයෙ රෑ දෙකේ ඉඳලා තුනහමාර විතර වෙනකල් මාමා එක්ක පව හල හල ඔන්චිලි පැදලා නිදාගන්න ගියා.. ආධ්‍ය අයියා මම ආයෙම එද්දිත් ගොරව ගොරව නිදි.. පස්සෙ මම ආධ්‍ය අයියගෙ අත අස්සට පැනලා හොඳට ඔලුවෙ ඉඳන් වහගෙන නිදාගත්තහම මාමා ඇවිල්ලා ලයිට් එකත් ඕෆ් කල්ලා මාමගෙ කාමරේට ගියා.. මම උණු හැදිලා නිසා කොහොමත් මම ආධ්‍ය අයියව මං ගාව තියාගන්න කලින්ම ඉල්ලලා තිබ්බෙ.. මාමා ඉතින් අවසානෙ කොහොම හරි අකමැත්තෙන් වුණත් මට ආධ්‍ය අයියව දෙන්න කැමති වුණා.. කවුද ඉතින් මාමගෙන් අවසර ලැබෙනකල් බලන් ඉන්නෙ අනික.. මට ඕන්නම් මම ආධ්‍ය අයියා ගාව තමා නිදාගන්නෙ.. එයාගෙ රෝසල් සුවඳට නින්ද යනවා..

මම කණු ගාව ඉඳන් මට සේ සේ කියන්නෙ කවුද බලන්න මූණ උඩ හරිය වෙනකල් වහගෙන තිබ්බ රෙද්ද පපුව ගාවට ඇදලා බැලුවා.. බලද්දි ආධ්‍ය අයියා මෙසෙ උඩ ගුලිය වගෙ ඉන්න සක්කිලි චූටියට එන්න කියලා කතාකරනවා..

මේ ලෝකෙ චූටිලා දෙන්නෙක්ට වසන්න බෑ..!! අනික ආධ්‍ය අයියා චූටි කියන්නෙ මට විතරනෙ... මගේ හිතේ අපේ ගෙදර ඉන්න සක්කිලි චූටියා කෙරෙහි මහා පරිමාණ ඉරිසියාවක් ගොඩ ගැහුණා..

" චූටි.. සෙයි..සෙයි.. මෙහෙ එන්නකො..පූස්.. කිටී.. බළලෝ..

"

ටිකකින් චූටි මූණ උස්සලා ආධ්‍ය අයියා දිහා බලලා තඩි ඇනුමක් ඇරලා ආයෙම නිදාගත්තහම ආධ්‍ය අයියට හිනාගියා..

" චූටි!!!!!! සේ.. සේ.. සෙයි.. ආ චූටි ගුඩ්මෝනින්.."

ආධ්‍ය අයියා පූසා දිහා බලාගෙන ඉඳලා මම ඇහැරිලා කියලා දැක්ක නිසා මට ගුඩ්මෝනින් කිව්වා.. දැන් මට චූටි කියන නමත් එක්කත් හරියට කේන්ති යාගෙන එන්නෙ..

@Shan

" අනෙ මේ ඌ කිටී හරිද.. චූටි නෙමේ.. චූටිලා ඉන්නෙ මෙහෙ එක්කෙනයි.."

ආධ්‍ය අයියා මම කියපු එකට හයියෙන් හිනාවෙලා එයාගෙ අත උඩ තිබ්බ මගෙ ඔලුගෙඩිය කොට්ටෙ උඩට තියලා නැගිටලා මේසෙ උඩ හිටිය සක්කිලි පූසව අත් දෙකට අරගත්තා..

" මේකා මහ පුදුම ආඩම්බරයිනෙ.. අපේ ගෙදර ඉන්න දෙන්නා නම් උදේම ඇවිත් අපිවත් ඇහැරනවා.."

" ඒ බල්ලො අනේ.. මේ පූසොනෙ.. ඌ හිතාගෙන ඉන්නෙ ඔය, උගේ ගෙදර අපි නැවතිලා ඉන්නෙ කියලා.."

" ඒකනම් ඇත්ත තමා.. පොඩීගෙ කියාරායි රෙක්සියි නම් මීට වඩා හොඳයි.."

ආධ්‍ය අයියගෙ අත් දෙකේ ඉඳලා චූටියා දඟලලා දඟලලා බිමට පැනලා ජනේලෙන් එළියට ගියා.. ආධ්‍ය අයියා ශර්ට් එකේ ගෑවිලා තිබ්බ පූස් බූල් ටික ගසලා ශර්ට් එක හදාගෙන මගේ නළලට අත තියලා බැලුවා..

" උණ අඩුනෙ.. කකුල රිදෙනවද තාම.."

" උණ ගතියනම් දැන් නෑ.. ඒත් කකුල පොඩ්ඩක් කැක්කුමයි.."

" හවස් වෙද්දි බලමු අඩුවෙව්ද කියලා.. කෝ නැගිටලා ඇඳුමක් දාගන්න චූටි.. යන් යන් නැගිටින්න.."

" මම නිදි අයියෙ.. අන්න හරේ අපේ මාමා කරපිංචා කඩනවා.. ගිහින් උදව් වෙන්න.. මම-"

ඒ එක්කම කාමරේ මේසෙ උඩ තිබ්බ මගේ ඇඳුම් ගොඩ මගේ දිහාට පියාඹලා එනවා දැක්ක නිසා මම ඔලුවෙ ඉඳලා රෙද්දෙන් පොරව ගත්තා.. ඇඳුම් ටික ආකාසෙන් මගේ ඇඳ පුරාම වැටිලා විසිරිලා ගියා.. මනමාලිගෙ මංගල යහනෙ දාස් මල් පෙති ඉහුවා වගේ.. ඔක්කොමත් හරි ආධ්‍ය අයියගෙ මූණ තමා බලන්න වටින්නෙ..

" චූටි!!! දෙනවා දෙකක් මම.."

@Shan

මම හිනාවෙලා හිනාවෙලා බඩත් අල්ලගෙන එහෙමම වටයක් පෙරලෙන්න ගිහින් බොහ් ගාලා ඇඳ පාමුල රෙද්ද පැටලිලා වැටුණා.. ඒත් හිනායනවා.. අපේ මාමා වගේ නෙමෙ ආධ්‍ය අයියට ඉඳලා හිටලා කේන්ති ගියාම හරියට රතු වෙනවා.. බෙල්ලෙ ඉඳලා මුළු මූණම.. කේන්තිම නෙමෙ ලැජ්ජද කොහෙද..

මම බිම වැටිලත් දෙකට තුනට නැමිලා හිනාවෙද්දි ආධ්‍ය අයියා පුපුර පුපුර ගිනිගන්න හැටි දැක්කහම මට හුස්මගන්න බැරුව ඉද්දි එකසැරේට ඇඳවිට්ටමෙ කකුල වැදුණා බැන්ඩේජ් කරපු හරියෙන්.. මට ඒ පාරනම් රධ්‍ය අයියා එන්න කලින්ම තරු පෙනුනා..

" ආආආආආආආආආආආආආආආආආඅව්!! වැදුණා.."

" මොකද මොකද උදේ පාන්දර මේ බෙරිහන් දෙන්-සුදුමහත්තයා!!!!!!!!!!! ඔය මොකද බිම දහලන්නෙ.."

" චූටි ඇඳෙන් වැටුණා අනූ.."

" ආආආආආආආආආආආආආ!! මගේ ඇඟ වටේ රෙද්ද ලිහනවකො මාමෙ.. මට නැගිටින්න බෑ.. ආච්චිඅම්මෙ..!!! ආච්චිඅම්මෙ..!!"

මාමා ආධ්‍ය අයියා එක්ක හිනාවෙවී මාව පාච්චල් කරන නිසා මම ආච්චිඅම්මට කතාකලා.. කොහෙද මේ අපේ බෝයිපෙන්ලා නැති නිසානෙ මේ සේරම දුක.. ළඟ හිටියානම් නැගිට්ටලා උම්මා එකකුත් දෙනවනෙ.. එහෙනම් මට කුක්-

" ඉඳපන් ඉඳපන්.. සාකි මෙකව ඇදලා බිමට දැම්මද.."

" නෑ මේ චූටි.. ඔන්නැති කතා කියනවා අනූ.."

" මේ අයියෙ බොරු කියන්නෙපා හරිද.. බොරු මාමෙ.."

මාමා මාව ටිකකින් බිමින් ඇහිඳලා ඇඳෙන් තිබ්බා කේක් ගෙඩිය වගේ.. අනේ මේ ලබ්බ කපල් මේ කාමරේ අස්සෙ ගෙන්නගන්න හොඳ නෑ.. අද මට රධ්‍ය අයියව මතක් වෙනවා වැඩී.. රත් හීනෙන් පෙනුනා රධ්‍ය අයියා පැන පැන ලොකු තණකොළ පිට්ටනියක ඉඳන් මගේ දිහාවට දුවගෙන ඇවිත් මට අහසින් තරුවක් කඩලා දෙනවා.. මම සිහින එලාඑල දන්නෙ

@Shan

නැති නිසා තමා මේ සේරම.. තරුවක් කඩලා දුන්න එකෙන් අදහස් වෙන්නෙ.. මම තරුවක් වගේ එළිය දෙනවා කියලා වගේ එකක් වෙන්නැති.. තරුවක් නෙමෙ හඳ එපෑ දෙන්න.. කමක් නෑ තරුවක් හරි දුන්නනෙ.. ඒක වටිනවා.. ඒකෙත් එළිය තියෙන්නෙ.. රධ්‍ය අයියා දෙනවනම් තරුවක් නෙමෙ කළුකුහරයක් හරි ගන්නවා ගුරුත්වාකර්ශනේ ගැන හිතන්නැතුව.. රධ්‍ය අයියා උදේට තේ බීලද දන්නෙත් නෑ..

" මොනවද මූ කියන්නෙ.. අර කරපිංචා ජාතකේද.."

ආධ්‍ය අයියා මාමට ඔලුව වනලා මූණ ඇද කරගත්තා.. මාමට ආධ්‍ය අයියගෙ ඉසකුඩිච්චි මූණ දැකලා හිනාගියා..

" අනේ මගේ සුදුහාමිනේට ලැජ්ජ හිතුණද.. කෝ එන්න අප්පේ මූණ බලන්න.."

අපේ මාමා මහ මනමාල හිනාවක් දාගෙන ආධ්‍ය අයියගෙ අතට එකක් ගැහුවගම ආධ්‍ය අයියව තව ටිකක් රතුවෙලා රතුවෙලා පිපිරෙන්නම ආවා.. මේක හෙන ආතල් ඩ්‍රාමා එක හැබැයි..

" එයාට යන්න අනුරාග්.. මේ මොන විකාරයක්ද.."

" සුදුහාමිනේට කිරිකෝපි එකක් හදලා දෙන්නද.. එන්නකො යන්න.. කෝ.. එන්න එන්න.."

" ඒයි අනුරාග්!!.. අනේ මේ චූටි මේ මනුස්සයට යන්න කියන්නකො.. මේ අර අම්මත් ඉන්නවා.."

අපේ මාමා බලෙන්ම ආධ්‍ය අයියගෙ අතත් පටලගෙන කාමරෙන් එළියට යන්න හැදුවහම ආධ්‍ය අයියා උළුවස්ස බදාගත්තා..

" අම්මා හිටියම මොකද.. මේවා කියලා තියෙන්නෙපැයි අපෙ හාමිනේ.. එන්නකො.. කිරි කෝපි හදලා දෙන්න.."

" අනේ අනුරාග්!!!!!"

මාමා ආධ්‍ය අයියගෙන් උලුවස්ස අතෑරවගෙන සාලෙට ඇදගෙන ගියා.. අද හවස ඉඳන් පිරිතට එළියෙ කට්ටිය ලයිට් අදිනවා ජනේලෙන් පේනවා..

@Shan

අල්ලපු ගෙදර රක්තපාත කිකිළිගෙ කටහඬත් මට ඒ අස්සෙ එහෙන් මෙහෙන් ඇහෙනවා වගේ.. ලොකු අම්මගෙ පොඩි පුත්තරයට කිකිළිව සෙට් කල්ලා දෙන්න බැරිද දන්නෙ නෑ.. එහෙම වුණොත් දෙයියනේ කියලා අභිශේක් පොඩි පකයට කලවම් පලා මැලුමක් කාගෙන ජීවත් වෙන්න පුළුවන්.. ඒත් මමනම් කියන්නෙ මොකක් වුණත් කිකිළි හොඳ එකී.. වෙලාවකට පව් කියලත් හිතෙනවා.. මූට දුන්නොත් නැන්දම්මා වෙන්නෙ දෙවුලිච්චි ලොකුඅම්මනෙ.. ඔහොම නැන්දම්මලා නම් ලැබෙන්න හොඳ නෑ.. අන්න මට වගේ නැන්දම්මෙක් හොයාගත්තනම් නිදහසේ වසන්න තිබ්බා.. ඒත් අපේ ලොකුඅම්මා ඕන නෑ.. කිකිළිගෙන් අහන්න ඕන ඇමති පුතෙක් වගේ හොඳ නැද්ද කියලා.. එහෙම වුණොත් අපේ චමිරුවට දෙන්න පුළුවන්..

ඒත් බැනෙ..!!

චමිරුවට තරුවි ඉන්නවනෙ.. එහෙනම් චමිරුගෙ පස්සෙන් ආපු යොහාන්ට කිකිළී සෙට් කල්ලා දෙන්න බැරිද දන්නෑ.. නැත්නම් මාමට කතාකලා කිච්ච කෙල්ලට දෙනවා කිකිළිව.. කිකිළි ලෙස්ද දන්නෑ හැබැයි.. මහීශා.. ම්ම්.. එපා එපා ඒකිව දරාගන්න මෙ කෙල්ලට බෑ.. පව්.. රක්තපාතෙ වුණත් කිකිළි-මනුස්ස දුවක්නෙ.. අනේ මේ නංගි.. උඹට කපුකම් කරන්න මට බෑ.. උඹම හොයාගනින් කවුරු හරි.. ඔය ඉන්නෙ ඕනතරම් කොල්ලො.. මගේ ඇහේම එල්ලෙන්න ඉන්නෙ..

" සුදුමහත්තයා.. කොල්ලො වරෙන්කො එළියට.. මෙ තේක අල්ලන්න එළියෙ වැඩ කරන මාමලාට.."

ආච්චි යන ගම දොර රෙද්ද මෑත් කරගෙන බෙරිහන් දුන්නු නිසා මම ඇඳ පුරා තිබ්බ ඇඳුම් ටික නවලා හනික අල්මාරියට ඔබලා ගිහින් මූණ හෝදගත්තා.. මම මූණ හෝදගන්න යද්දි අභිශේකයයි උගෙ අයියා අනුශ්කයයි ආච්චිට කහ වගයක් දමාගෙන අඹරනවා.. හොඳවැඩේ.. අඹරපන් කහ නෙමෙ මිරිස්.. ආච්චිඅම්මා හොඳ වැඩී මුන්ට.. මම වගේනම් හොඳ නයි මිරිස් ටිකක් වෙලලා දෙනවා අඹරන්න.. ඔය දෙකට්ටුව එහේ ඉන්ටනැශනල් ස්කූල් එකක ඉගනගත්තෙ.. අයියා නම් දැන් මයික්‍රොබයොලොජි ඩිග්‍රියක් කරනවා ප්‍රයිවට්.. අනිකා ලන්ඩන් ඕ ලෙවෙල් කරනවා..

" ෂනෙරු අයියෙ.. මම ඔහේ හෙච්චා හැමතැනම.. නිදාගෙනෙයි හිටියේ.."

@Shan

මම කුස්සියේ බැම්මට හේත්තු වෙලා අම්මා හදන තේ එක ගෙනියන්න රෙඩි පිට ඉද්දි මම ගැස්සිලා ගියේ නක පිරිපස්සෙන් පලපු ටකරමක් බෙරිහන් දීපු නිසා.. මෙ ගෑණුන්ට පොඩ්ඩක් හිමින් කතාකරන්න බැරිද දන්නෑ.. හැමතිස්සෙම ගිරිය පලාගෙන කෑගහන්නෙ.. මම හිමිහිට පිටිපස්ස හැරුණහම අපේ අම්මට ලාවට හිනාගියා මම දැක්කා.. දෝණිත් හිනාවෙනවා මට.. මෙ බේසික කිකිළි ලැජ්ජ කරනවා..

" ආ නංගී.."

" අයියා තේක ගෙනියනවන්ං මම මේක අල්ලන්නං.."

ඒකි ළඟ තිබ්බ හැලප භාජනේ බදාගත්තහම අම්මා තේ ටික වක්කල්ලා බන්දේසිය මගේ අතේ තිබ්බා..

" වට්ටන්නෑ සුදුමහත්තයා..!"

" හැරි හැරි ඇකේ.. යැයි යැයි තමා.."

අම්මා තේ හැන්දෙන් මගේ ඔලුවට එකක් දුන්නහම මම ගොංපහේ හිනාවක් දාගෙන කුස්සියෙන් තේ අල්ලන්න එළියට ආවා.. කිකිළිත් අහස ඔලුවට කඩන් වැටුණා කියලා කලබල කළ කිකිළි වගේ උදේ නාලා වතුර බේරෙන කොණ්ඩෙ පද්ද පද්ද මගේ පස්සෙන් ඇදිගෙන එනවා.. මේකිට එක්කො මම වෙලාවක් අරන් පැහැදිලි කල්ලා දෙනවා නංගි මම ආස දිග කොණ්ඩ වලට නෙමෙයි කොට කොණ්ඩ වලට කියලා.. බෑ එක්කො.. ඊටපස්සෙ මේකි කොණ්ඩෙ කපාගනී.. එහෙනම් කියන්නෝන මම ආස ගවුම් වලට නෙමෙ කලිසම් වලට කියලා.. ආ නෑ සරම් වලට කියනවා.. එක්කො කෙලින්ම කියනවා කොල්ලොන්ට කියලා..

මම එළියෙ වැඩ කර කර ඉඳපු අයට තේ අල්ලගෙන අල්ලගෙන යද්දි ඈහැ කොනෙන් දැක්කා සුදුහාමිනෙයි සුදුහාමිනේගෙ නාකි මනමාලයයි ඔංචිලි පදිනවා.. යකෝ!! මිදුලෙ හැමතැනම මිනිස්සු වැඩ කරනවා.. මුන් දෙන්නා වෙනම ආණ්ඩුවකද.. අපේ මාමගෙ පැණිය අනික.. කොහොඹ ගහට හේත්තුවකුත් දාගෙන ආධ්‍ය අයියා එක්ක පච හලනවා.. ආධ්‍ය අයියත් ඔංචිල්ලාවෙ වාඩිවෙලා කඹෙත් අතට අඹරගෙන හිනාවෙවී මාමා එක්ක කියවනවා.. පුදුමයි අපේ මාමා ඔක වෙන කෙනෙක්ට වාඩිවෙන්නවත් දුන්න එක.. ගෙදර ඔන්චිල්ලාව බැන්දෙ මට වුණාට ඒකෙ සමබර අයිතියට වඩා වැඩි කොටසක් අපේ මාමට අයිතිව තියෙනවා.. ඒකනිසා ඔකෙ

@Shan

ලේසියෙන් වාඩිවෙන්න කාටවත් බෑ.. දැන් ඒකෙන් මගේ අයිතිය දෙකට බෙදිලා රධ්‍ය අයියා හතරෙන් එකක් අයිති කරගත්තා.. මට ඔක්කොම පැත්තකින් තියලා ඔංචිල්ලාවෙ කඹෙ අරගෙන ඒකෙන් තොණ්ඩුවක් හදාගන්න හිතෙනවා..

මම ඉවරවෙච්ච තේ බන්දේසියත් අරගෙන හිමින් සැරේ කපල් එක පැත්තට ඇවිදගෙන ගියා.. කිකිළි කොහෙ ගියාද දන්නෑ.. ආධ්‍ය අයියගෙ අතේ හැලපෙකුත් තියෙන්නෙ.. ඒකි හැලප අල්ලලා එක්කො යන්න ඇති ගෙට.. හොඳයි..

" මම හුඟ කාලෙකින් මෙ කන්නෙ.. ඔයා කන්නැද්ද.."

" මම ඔච්චා කන්න ආස නෑ ළමයා.."

" ආ..?? ඒ මොකද ඒ.."

" ඔය පොල්පැණියි කුරක්කනුයි.. සැක්.. මෙ කනවනම් ඕක කාපන්.."

ආධ්‍ය අයියා මාමට දෙකක් රවලා හැලපෙ කැන්ද කොලේ ගලවලා ගුලි කල්ලා මාමට දමලා ගැහුවා.. අන්න හරි එහෙම තමා ඉන්න ඕන.. වරද්ගෙ ආහාසෙ මගේ මස්සිනාට ඇවිල්ලා ඒකෙන් වරද්ගෙ මාමා පීඩා විඳිනවා..

" ආ චූටි.. ඔයා මේවා කනවද.."

" මම කෑවා අම්මගෙන් ඉල්ලගෙන.."

මම මාමට හේත්තුවක් දාගත්තහම මාමා මගේ කර වටේ අතක් දාගත්තා..

" ඌ කොහොමත් අම්මගෙන් ඉල්ලන් කන්න දන්නවා.."

" අනේ මේ මාමෙ..!!"

" පාඩුවෙ ඉන්න අනුරාග්.. මේ චූටි.. කවුද අර ලස්සන කෙල්ල.. අර හැලප දීලා ගියේ.. ඔයාට කැමතිලුද එයා.."

" මොන අර රක්ත-අල්ලපු ගෙදර නංගිද.."

" ඔව් අර රතු ගවුමක් ඇඳන් හිටියෙ.."

@Shan

" ආ දන්නෑ අනේ.. මට ඔච්චා වැඩක් නෑ.. මට කෑල්ලක් ඉන්නවනෙ.."

" ඔව් නේද.."

" ඇයි උඹට සම්පූර්ණ එකක් හොයාගන්න බැරිවුණාද.."

" එයා සම්පූර්ණ කෑල්ලක්.. නෙහ් අයියෙ.."

" මම්.. මම එච්චර ඒවනම් දන්නෙ නෑ ඉතින්.. වෙන්නැති.. චූටි කියන දෙයක් තමා.."

" මූ වගේ උන්ට කැමති වෙන කෙල්ලොත් ඉන්නවද බං.. දවසක ඔය බබරවක්කරේ හම්බුණාම අහනවා උඹට අහේනියද මූ වගේ ඇට්ටරයෙක්ම හොයාගත්තෙ කියලා.."

" අහලා..??"

" අහලා මොනව කරන්නද.. බන්දලා දෙනවා.. උඹ බැඳගත්තු බෙරේ ගහපන්.."

ආඪ්‍ය අයියා ඒකට මහා හයියෙන් හිනාවෙලා එකපාරක් පැද්දුණා..

" ඔව් චූටි.. බැඳගත්ත බෙරේ ගහන්න ඕන.. කියාන් මල්ලිත් කිව්වා දවසක්.."

මම මාමගෙ අතත් ගසලා බන්දේසියත් ආඪ්‍ය අයියගෙ ඇහේ ගහලා මල පැනලා ගෙන එන්න ආවා.. ඉඳපියකො කරන්න මම හොඳ වැඩක්.. අද රෑට පිරිත කියලා බලන්නෑ මාමයි ආඪ්‍ය අයියයි නිදාගෙන ඉද්දි දානවා අලිවෙඩි.. මට කරන අපහස වලට.. එක්කො මුන් දෙන්නගෙ ළමයට නම දානවා පිරකංචා කියලා..

උදේ වරුවේ ඉඳලා හවස වෙනකල් මට කකුලෙ අමාරුව දෙපිටින් පලයන් කියලා අරහෙටයි මෙහෙටයි දුවලා පිරිතට උදවු වෙන්න වුණා.. ඒ අස්සෙ පෝසිලේන් පිඟන් සෙට් එකකුත් තනියම හෝදන්න වුණා එළියේ ටැප් එකෙන්.. මෙච්චා බිඳුනොත් එහෙම අපේ අම්මා මට ගහන්නෙ බූ හනස්සෙන් තමා.. අපේ අම්මගෙ ප්‍රාණයත් හරි පොසිලේන් සැට් එකත් හරි.. ඒකනිසා දිව් දෙවැනි කොට තමා පිඟන් හේදුවෙ.. ආඪ්‍ය අයියා

@Shan

ආච්චිඅම්මට සෙට් වෙලා ආච්චිඅම්මා එක්ක දවල්ට කෑම හැදුවා.. අපේ ආච්චි අයියට හෙන ආදරේ නිසා අයියගෙන් එක එක ඒවා අහනවා.. කෑම හදන රහ ජාති කියලා දෙනවා.. අපි ගැන කියවනවා.. අයියගෙන් විස්තර අහනවා.. මට රධ්‍ය අයියා මතක් වුනා.. එයා දවසක් කිව්වා අපේ පවුලම මෙහෙම එකට ඉන්නවා බලන්න ආසයි කියලා.. එයාලගෙ අම්මත් හිටියනම් සම්පූර්ණෙන්ම පවුල ඉන්නවා.. අප්පච්චි ඉතින් කැමති නෑනෙ..

ඔහොම ඉද්දි හොඳම ජවනිකාව ආධ්‍ය අයියා එයාගෙ ලොකු නැනට සෙට් වුණා.. ආධ්‍ය අයියා ඩොක්ටර් කෙනෙක් වුණාට තියන නොලේජ් එකත් එක්ක ලොකුඅම්මට හැරෙන්නවත් බෑ.. අපේ ලොකුඅම්මා නම්බුව රැකගන්න එල්ල කරපු සියලු ප්‍රහාර වලට ආධ්‍ය අයියා සාර්ථක විදියට ප්‍රතිප්‍රහාර එල්ල කරන හැටි මමයි මාමයි කුස්සියෙ බැම්මට වෙලා අහගෙන හිටියා.. මෙන්න නැනලා මස්සිනාලා.. ගැම්මක් තමා මගේ ආධ්‍ය අයියා.. ලොකු අම්මා කොර වෙලා ඇඹරිලා යන්නම හොඳට හීන්ට් ගහලා උත්තර දුන්නා..

" චූටි.. කකුල අමාරුද ඔයාට.."

" මොනවා කරන්න යනවද කියලා දෙයියො තමා දන්නෙ.. ඔච්චර අමාරුවෙන්න.."

ලොකුඅම්මා බීම භාජනේ දිහා බලාගෙන කුටු කුටු ගගා කියද්දි ආධ්‍ය අයියට මලපැන්නා වගේ මම දැක්කා..

" ආන්ටි මොකක් හරි කිව්වද.."

" මොකුත් නෑ.. ඕක අඩුවෙලා යාවි.. නැටිල්ලට හදාගන්න අමාරු ඔච්චා.. අපි දන්නැද්ද.."

ලොකුඅම්මා භාජනේ දිහා බලාගෙනම ලාවට මැතිරුවා..

" ආන්ටිගෙ ෆැකල්ටි එක කොහෙද මෙහේ.."

" කරාපිටි.."

ආධ්‍ය අයියා ඒකට නෝන්ඩියට වගේ හිනාවුණා..

@Shan

" ඔය ළමයා කොහේද.."

" මම කලම්බු.. ඒ දවස්වල අයිලන්ඩ් ෆෝර්ත්.. ආන්ටිලා දන්නෙ නම් නැතුවැති.. මගේ මල්ලි මැත්ස් කලේ.. එයා අයිලන්ඩ් ලෙවන්ත්.."

ලොකුඅම්මගෙ ඇස් දෙක උඩයනවා මම දැක්කා.. ඇතිද දන්නෑ අහගත්තා..

" කොහොමද ඒ කාලෙ වැඩකටයුතු එහෙම.."

" ම්ම්.. විශේශ දෙයක් නෑ ආන්ටි.. ආ!! එකපාරක් මම කැම්පස් එකේදි ලියපු ආටිකල් එකක් ප්‍රොෆෙසර් කෙනෙක් The Lancet මැගසින් එකට දැම්මා.. මම ෆෝත් ඉයර් එකේ ඉද්දි.."

" The Lancet එකට..??"

" ඔව් ඒශියන් කන්ට්‍රි එකකට මුලින්ම තිබ්බෙ මගේ ආටිකල් එකක්.. බ්‍රේන් එක ගැන මම තනියම ඇනලයිස් කරපු පොඩි ප්‍රොජෙක්ට් එකක්.."

" ම්ම්.. හොඳයිනෙ.. ඔය ළමයගෙ අම්මත් ඩොක්ටර් කෙනෙක් කිව්වා නේද.."

" ඔව් ආන්ටි.. දැන් කන්සාල්ටන්ට් ස්ටඩීස් යන්නෙ.."

ලොකුඅම්මා මූණිච්චාවට හිනාවෙගෙන කුස්සියෙන් යන්න ගියාම අපේ මාමත් ආධ්‍ය අයියගෙ පස්සට දෙකක් දීගෙන ඇහැක් ගහලා කුස්සියෙන් යන්න ගියා.. යකෝ මම මේ නිතර දෙවේලෙ බදාගෙන ඉන්නෙ පට්ට බුලට් එකක්නෙ බලන් යද්දි.. කියලවත් නෑ කලින්.. මම හිමින්සැරේ නැගිටලා ආධ්‍ය අයියා ගාවට කිට්ටු වුණා.. මොලෙන් ටිකක් ඉල්ලගන්න වගේ බැරිද දන්නෙ නෑ මගේ බුද්ධිමත් මස්සිනාගෙන්.. අපේ මාමත් ඉඳලා ඉඳලා හොඳම ජාතියෙන් අමුතුම එකෙක් හොයාගෙන තියෙනවා.. ඒ එක්කම ගිය මාමා ආයෙම ආවා..

" ඒ සාකි.. මරු ඈ.."

ආධ්‍ය අයියා ලාවට හිනාවෙලා මගේ අතින් බීම වීදුරුවක් තිබ්බා..

" ආධ්‍ය අයියා මාරයිනෙ මාමෙ.."

@Shan

" කාගෙත.. මගේ තමා ඉතින්.."

මාමා බොරුවට ශර්ට් එකේ කොලර් එක උස්සගත්තා..

" අයියා ඒ කාලෙ හැමදාම බැච් ටොප් ද.."

" හැමදාම නෑ චූටි.. මම්.. ඉදලා හිටලා වෙනවා.. මට වඩා දක්ශ අය හිටියා.."

" එහෙම වෙන්න බෑනෙ.. අයියා නෙමේද දක්ශම.."

" මට ඒ දවස්වල සෑහෙන්න ඔලුවෙ හොයන්න දේවල් ගොඩගැහිලා සබ්ජෙක්ට් එකට පාඩම් කරගන්න වෙන්නෑ.. ඔය මම වෙනම කරපු පොඩි ප්‍රොජෙක්ට්ස් වලට එහෙම අවෝර්ඩ්ස් හම්බෙලා තියෙනවා.. ඒ ඇරෙන්න.. විශේශයක් නෑ ඉතින්.."

" මුගෙ බොරුව බං.. මූ තමා හැමපාරම බැච් ටොප්.. දෙන්නෙ බොට බොරු කිව්වොත්.."

මාමා ආධ්‍ය අයියගෙ අතට පාරක් ගැහුවම ආධ්‍ය අයියා හිනාවුණා..

" එකපාරක් වුණේ නෑ.. ඒ ඇරෙන්න වෙලා තියෙනවා.."

" මරුනෙ.. වෝහ්!!!!!!!! ඒ මාමෙ මට දෙන්නකො අයියව.. බැරිද.. එක ගෙයි කන්න වගේ.."

" නිකන් ඉදහන්. අනික මෙකා බැච් එකේ ටොප් වුනොත් තමා කොහොමත්.. නැතුව බලද්-"

" අනූ!!!!!!!!!!!"

ආධ්‍ය අයියා මාමට කකුලෙන් ගහලා කුස්සියෙන් කෑම කාමරේට තල්ලු කල්ලා එලෙව්වා..

හවස් වෙද්දි අපේ ගෙදරට කට්ටිය එන්න ගත්තා.. ගමේම උදවිය තමා.. රෑ පිරිත නිසා.. මමත් නාලා කකුලත් ඔතාගෙන සුදු ශර්ට් එකකට සුදු කලිසමක් ඇදගත්තා.. ගෙදර අනිත් අයත් ලෑස්තිවෙලා හිටියේ.. අනික කකුල තෙමුව නිසා කැක්කුම වැඩිවුණාද මන්දා.. කැක්කුම අල්ලලා ආයෙම

@Shan

උණු වගේ ඇවිල්ලා තිබ්බෙ.. උණු කියනෙ ර්යෙ වගේ සහලෝලා උණු නෙමේ.. ලාවට ඇඟ රස්නෙ ගතියක් තිබ්බෙ.. නෑව නිසා නිදිමතකුත් හිමින්සැරේ ලෝඩ් වෙලා ඇස් පියවෙන්න එනවා..

හවස හාමුදුරුවරු වඩිනවෙලාවෙ මම ආධ්‍ය අයියගෙ අස්සට වෙලා සාලෙ කොනක හිටගෙන හිටියා.. සාලෙ බඩු අස් කල්ලා ආසන පනවලා සුදුරෙදි දාලා තිබුනෙ.. ඉස්සරහා ස්ටූල් එකක් වතුර අරවා මේවා තියලා.. හාමුදුවරු වැඩම කලාට පස්සෙත් හුහක් කට්ටිය ගෙදරට ආවා ගියා.. අපේ ගෙදර කොහොමත් මේක වෙනවා.. සීයගෙ දානෙ නිසා.. පහුගිය අවුරුදු දෙක තුන කරගන්න විදියක් තිබුනෙ නෑ ආච්චිඅම්මට වැඩ වැඩිවෙලා කුඹුරුවල..

පිරිත පටන්ගත්තහම මාමා, අයියලා, මල්ලිලා, කිකිලිලා ඔක්කොම හිටියෙ සාලෙ.. මමත් ඒ එක්කම වාඩිවෙලා පිරිත් අහගෙන හිටියේ.. අම්මලා ඉතින් කුස්සියේමයි.. එන්න වෙලාවක් නෑ එළියට.. හෙට දවල්දානෙට දේවල් ලෑස්තිකරනවා.. මම උදවු කරන්න ගියාමත් වැඩ දෙක කරනවා කියලා බනින නිසා රෑ දහය හමාරට විතර මම ගෙදරින් පොඩ්ඩක් වෙනම තියෙන මගේ කාමරේට වැදිලා ඇඳේ හරහට හාන්සි වුණා.. ඇඟට මහන්සියට වැටුණුගමන් මලා වගේ ඇස්පියවෙනවා.. අන්තිමට මට කොහොම හරි නින්ද ගියා..

මම හිටියේ ලොකු නින්දක.. ඒත් ගෙදර පිරිත් කියන සද්දෙ මට ඇහෙනවා හොඳට.. කාමරේමයි කාමරේ ඉස්සරහා පොඩි කෑල්ලයි දෙකම කළුවරයි.. මම ඉන්න තැනට ජනේලෙන් එළියේ දාපු ලයිට් එකක එළියක් තිබ්බා මිසක්.. වෙන කිසිම එළියක් තිබ්බෙ නෑ.. මොකද ලයිට් දැම්මහම එනවා හැමෝම ඒගොල්ලොන්ගෙ නින්ද ගිය ළමයි මගේ ඇඳේ නිදි කරවන්න.. මම කැමති නෑ ඒකට..

ආයෙම නිකම් මම හීනෙන් වගේ ඇහැරෙද්දිත් කාමරේ කලුවරයි.. එළියේ මොකෙක්වත් නෑ.. ගේ ඇතුලේ සද්ද බද්ද නම් ඇහෙනවා මට ලාවට වගේ.. කාමරේ පොඩ්ඩක් වෙනම තියෙන නිසා මට ඒවා දොර වැහුවහම ඇහෙන්නෙ නෑ.. ඒ හීනෙන් වගේ ඇහැරුණු නින්දට ආයෙම මට ඇස් පියවිලා නින්ද ගියා.. ඇඟත් තාම රස්නෙට දැනෙන නිසා පුදුම තෙහෙට්ටුවක් දැනෙනවා..

" මම බයේ හිටියෙ.. පරක්කු වුණානෙ.."

@Shan

" උණ ගැනිලා.. "

"ම්ම්.."

මම ආයෙම පොඩ්ඩක් ඇහැ ඇරෙද්දි කාමරේ ගාවින් කටහඬක් ඇහුණා.. කාගෙද දන්නෙත් නෑ.. පාන්දර ආටානාටිය කියනවා මට ඇහෙනවා.. ඒක කියන විදියට මට පොඩිකාලෙ ඉඳලා බයයි.. අර සැර කරලා වගේ හාමුදුරුවරු ඒක කියන තාලෙට අමුතු බයක් හිතේ ඇතිවෙනවා.. අනික ආටානාටිය කියද්දි කාමරවල තනියම ඉන්නත් එපා කියලා කියන්නෙ.. මම විතරයි මේ පැත්තට ඉන්නෙත්.. මට එක සැරේ බයහිතුනු නිසා ඇඳ රෙද්ද අරගෙන ඔලුවෙ ඉඳන් පොරවගත්තා.. ආටානාටිය දේශනා කරන්නෙ යක්කු පෙරේතයො ගෙවල් වල ඉන්නවානම් ඒ බැල්මවල් අයින් කරන්න කියලා මම අහලා තියෙනවා.. එකසැරේට ගමෙ කනත්තයි, හොල්මන් ටීවී සීරිසුයි, සෙනුකයයි මහීශායි කියපු හොල්මන් කතායි ඔක්කොම මතක් වෙලා මට පිස්සු හැදෙන්න ආවා.. ඒ එක්කම මගේ කාමරේ පැත්තෙන් අඩි සද්දයක් ඇහිලා දොර අගුල කැරකෙනවා ඇහුණා.. ටහුක්කන්න යකෝ හොල්මනක්ද මේ.. මැරිච්ච සීයා කාමරේට ඇවිල්ලා.. මගෙ දෙයියනේ!!!

ඉතිපිසෝ හගවා අරහං සම්මම්-සම්ම

මට ඒ විනාඩියට දොර අගුල වැහිලා අඩි සද්දෙ මගේ දිහාවට එද්දි අත පය කකුල් දරදඩු කරගෙන මැරිච්ච එකා වගේම හිටියා.. ඒ අස්සෙ නිතර දෙවේලෙ කියපු ඉතිපිසෝ ගාථාවත් අමතක වෙලා.. ආච්චිඅම්මෙ සීයට කාමරේ වැරදිලා තමා මේ නම්.. මගේ ඇඳේ පැත්තක් බරවෙනවා මට දැනුණා.. මගේ පපුව දැන් නම් එළියටම පනිනවා මම දන්නවා.. ඊටපස්සෙ ඔලුවෙ ඉඳන් වහගෙන උන්නු රෙද්ද පහළට වෙලා මගේ තොල් වලින් තෙතට මොකක් හරි වැදෙනවා දැනුණා.. ඒ එක්කම මම අතට ක්ශනිකව අහුවෙච්ච කොට්ටෙ උස්සලා මාව මහ කළුවරේ ඉඹින්න ආපු එකාගෙ මූණට දලා ඇරලා ඌව පයින් පාගගෙන ඇඳේ එහාපැත්තට තට්ටු කල්ලා මූණට කොට්ටෙ තදකලා.. කුපාඩියා.. කවුද යකෝ මාව ඉඹින්න ආවෙ පිරිත් ගෙදර අස්සෙ.. මම කෝකටත් ෆෝන් එකේ ටෝච් එක ඔන් කරගත්තා..

ඒත්..

මට කුපාඩියා ගාවින්.. කලින් දැනිලා තියෙන ලෙමන් සුවඳක් දැනෙනවා වගේ.. මගේ ඔලුවට එකසැරේ පත්තු නොවුණට ටිකකින් ටාර් ගාලා

@Shan

එළියක් පත්තු වේලා, එළිය පත්තු වුණු පාරට් කලන්තෙට ඇවිත් පපුව හිරවෙලා මැරෙන්න ගියා.. මම කොට්ටෙට මූණ තදවෙලා දහලන එකාගෙ කොට්ටෙ අයින් කල්ලා මූණට ටෝච් එක ගැහුවා.. ඒ ගහපු ගමන්-

" ඕක අහකට ගන්නවා වරද්!!!!!!!!"

මම එකසැරේ ටෝච් එක ඇඳ උඩට අතැරලා ගිහින් කාමරේ ස්විච් එක ඔන් කලා.. යකෝ මේකා.. මේ පොල් කාවයියා.. ගැටපොලොස් කොට්ටෝරුවා.. මට එනවා කියලා මොනෞත්තක්ද කෝල් එකක්වත් දුන්නැත්තෙ.. තා ඩිංගෙන් මම පණ යනවා සීයට වැරදිලා මාව හොයාගෙන ඇවිල්ලා කියලා..

" රධ්‍ය අයියේ!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!ග්.. තවුසෙ.. බූරුවා.. මෝඩ හැලපයා.. එනවා.. කියලා.. මට.. කෝල්.. එකක්වත්.. ගත්තෙ.. නෑ.. තවුසෙව.. මම.. අද.. මරලා.. දානවා.."

මම අතට අහුවෙච්ච කොට්ටෙන් අහුවෙන අහුවෙන අතට ඇඳ උඩ වැටිලා ඉන්න රධ්‍ය අයියගෙ මූණ මැද්දැවට දමලා ඇරියා..

" ආව් බං.. ඕක නවත්තපිය.. වරද්.. ආ-ආ-ආව්.."

රධ්‍ය අයියා එකසැරේම නැගිටලා, මගේ අත් දෙකෙන් අල්ලලා, මාව උස්සලා, ඇඳ මැද්දට අතැරියා.. තා ඩිංගෙන් ඇඳේ පොලු ටික ගැලවිලා බිම වැටෙනවා..

" ආහ්ව්.. අයියෙ.. කීයටද ආවෙ.. මගුල.. කෝල් එකක්වත් ගන්න බැරිද.. කවද්ද ගෙදර ගිහ්-ම්ම්හ්"

මට කියන්න ගියපු වාක්‍ය ටික හරියට කියාගන්න හම්බුණෙත් නෑ රධ්‍ය අයියා මගේ අත් දෙක ඇඳට තියලා තද කරගෙන තොල් වලට පහත් වුණා..

එයා ආවා.. මංදාරම් කතාවේ...~

අම්මියෝ මම යාලුවෙලා හිටපු මනුස්සයා දුර ගිහින් ආවා වගේ දැනෙම්නෙ..

@Shan

හැපි හැපි හැපි.. ලල් ලල් ලල් ලල් ලා ලා..

ඔන්න උබර්ලගෙ රධ්‍ය අයියා එක්කන් ආවා.. දෙයියනේ ගේනකල් මේ ඕතර් කලවැම්දට සිව්ලිමේ ඉන්න දුන්නැනෙ.. දෙනවා පුපට දෙක්ක.. හරිත..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 117 කොටස

" අයියෙ!! එ-එහාට වෙන්-අනේ.. අයියෙ.."

රධ්‍ය අයියා මගේ තොල් වලින් පෙක් එකක් තියලා මුළු මූණ පුරාම හාදු තිව්වා.. එකක් දෙකක් නෙමෙ එකදිගට ගොඩාක්.. මම දහලලා දහලලා රධ්‍ය අයියගෙ අත් දෙක අස්සෙන් පහළට රූට්ටලා යන්න හැදුවහම රධ්‍ය අයියා මගේ ඉණෙන් අල්ලලා ආයෙම උඩට කල්ලා ඇඳට අතැරියා.. එයාගෙ මූණෙ තිබ්ලා ඇනෙන කටු වලට මට කිතිකැවෙනවා.. එතකොට හිනායනවා.. මම හිනාවෙලා හිනාවෙලා ඇස් දෙකෙන් කඳුළු ගලාගෙන ගිහින් කොට්ටෙට වැටෙනකල්ම හිනාවුණාට පස්සෙ රධ්‍ය අයියා මගේ කොණ්ඩෙ අවුල් කල්ලා නැගිටලා ඇඳෙන් ඉඳගත්තා.. ඇඳට දාලා තිබ්බ ශීට් එක පොඩි වෙලා ඒකෙන් ගන්න දෙයක් නෑ.. මම මූණයි ඇඟයි ඔක්කොම රතු කරගෙන ඇස් දෙකේ කඳුළු පිහාගෙන නැගිට්ටා.. පණත් නෑ වගේ දැන්නම්..

" හුස්ම ගන්නත් බෑ.. මෝඩයා.."

රධ්‍ය අයියා ලාවට හිනාවුණා..

" අසනීප වුණාද.."

මම ටිකක් වෙලා එයා දිහා බලාගෙන ඉඳලා හිමින් සැරේ රධ්‍ය අයියා ගාවට ඇදිලා ගිහින් එයාගෙ ලොකු අතකට හේත්තු වුණා.. එහෙම උණක් නෑ..

" කකුලෙ මස්ල්ස් වල පේන් එකක් තිබ්බෙ.. ඒකට වෙන්නැති.."

" කොහෙද.. තයිස් වලද.. මෙ කකුලද.."

" ම්ම්.."

රධ්‍ය අයියා මගේ කකුලෙ කලව ගාවින් අතක් තියලා පොඩ්ඩක් පහළට තද කලාම මම එයාගෙ අත අරන් එහාට කලා..

" අල්ලන්න එපා රිදෙනවා.."

@Shan

" හුහක් රිදෙනවද.. හවස බෙහෙත් ගෑවෙ නැද්ද.."

" ගෑවා.. මේකයි හරිද.. මම හවස ඇඟ සේදුවනෙ.. තෙමුණා.."

රධ්‍ය අයියා අර පුරුදු හට්ටි මූණ දාගෙන මගේ දිහා බලාගෙන ඉඳලා ඔලුව මැද්දටම ටොක්කක් අතෑරියා..

" උඹට කියලා වැඩක් නෑ.. ඔබාගෙනම ඉඳපන් වතුරෙ.. තව මොනවද කරගත්තෙ.."

" මේ ඔයා ගහන්න එන්නෙපා  හරිද.. මම ආධ්‍ය අයි-"

" පොඩී.. මම ඇතුළට එනවා.!!"

මට මගේ වාක්‍ය කියලා ඉවර වෙන්න වුණේ නෑ මගේ දුක අහන අයියා දොර ගාව ඉඳන් කතාකලා.. සමහරවිට මේ ඉන්නෙ මගේ ගළවා ගැනීමෙ දූතයාද දන්නෙ නෑ.. අවශ්‍ය හැමවෙලාවෙම පෙනී ඉන්නෙ.. දෙවියන් වහන්සේට මම කෙරෙහි අනුකම්පාවක් පහළ වෙන්නැති.. මලක් වගේ දරුවෙක් හැමෝම තලනවා කියලා.. ඒ අස්සෙ මට පොඩ්ඩක් විතර ලැජ්ජයිත් වගේ රධ්‍ය අයියා එක්ක කතාකරන්න.. මමත් අර අලුත බැඳපු මනමාලි වගේ අතකටම හේත්තුවක් දාගෙන මූණ බලන්නෙ නැතුව බිම බලාගෙනම හිටියා.. හුඟ කාලෙකින් නෙ ඉතින් දැක්කෙ.. පොඩ්ඩක් ලැජ්ජ හිතෙන්න එපැයි.. නැත්නම් හරිනෑනෙ..

" මොකද ළමයි කාමරේ යකා නටලා වගේ.."

" යකා නෙමෙ අයියෙ.. මෙන්න මේකා කියන්නෙවත් නැතුව ඇවිල්ලා නිදාගෙන හිටපු මට අතව-මම කිව්වෙ, නිදාගෙන හිටපු මට කරද-මේ, නිදාගෙන හිටපු මාව ඇහැරෙව්වනෙ.. මම හිතුවෙ අපේ සීයා ආච්චිගෙ කාමරෙයි මගේ කාමරෙයි පටලගෙන මගේ කාමරේට ඇවිල්ලා කියලා.. බලද්දි ඇඤ්ඤ මගේ හැපීකච්චනෙ ඇවිල්ලා තියෙන්නෙ.."

මම රධ්‍ය අයියගෙ මූණ චප්ප වෙලා පොඩි වෙලා යන්නම අත් දෙකෙන් අල්ලලා මූණට හාද්දක් දුන්නා..

" එහෙනම් උණගැනිච්ච අයට උණ හොඳවෙලානෙ.. දැන් බලාකියාගන්න කට්ටිය ඉන්න නිසා මම කැපුණනම් හරි.."

@Shan

" එහෙම එපා ඔයත් ඉන්න.. රධ්‍ය අයියත් ඉන්නවා.. අපේ මාමට කියන්න අපි එකගෙයි කනවා කියලා.."

" වරද්!!!!"

" චූටි!!!!"

" ආ හරි හරි මම විහිලුවක් කලේ.. මොකද කැගහන්නෙ.. අරගෙ පිරිත් කියනවා.. පිස්සුද.. අයියලාටයි මල්ලිලාටයි.. මේ ඔයා මෙතන හඩ්ඩා වගේ ඉන්නැතුව ගිහින් ඇඟ හෝදන් එන්න ඒයි.. බියර් බීලා ගන්දස්සාරෙ බෑ.."

" දෙනවා දෙකක් චූටි මම දැන්.."

" කරපිංචා කොළ දෙකක්ද.."

මම රධ්‍ය අයියා ගාවින් නැගිටලා පැන පැන ගිහින් අල්මාරියෙන් ටවල් එකක් ගත්තා.. ආධ්‍ය අයියා ආයෙම රතුවෙලා මූණ ඇද කරගත්තා.. මම ඉතින් කියන්නෙ මගේ හිතේ තියන දේවල්නෙ.. එකගෙයි කනවා කියන්නෙ මේ.. එහෙම මගුලක් නෙමේ.. මම ඉන්නෙ කොහේ වුණත් මම ආධ්‍ය අයියව උස්සන් ගිහින් තියාගෙන ඉන්නවා.. මගේ සාම දූතයා, දේවදූතයා, රැකවල් දූතයා, කැම දූතයා කියන දූත පාට ටික කරවගන්න..

" පොඩී එහෙනම් වොශ් එකක් දාලා පොඩි මස්සිනා එක්ක නිදාගන්න.. මම යනවා.. මහන්සිනෙ.. හෙට කතාකරමු.."

" ගුඩ්නයිට් අයියෙ.."

" ගුඩ්නයිට් ළමයි.."

ආධ්‍ය අයියා මගේ පිටට පාරකුත් ගහගෙන කාමරෙන් යන්න ගියා.. දැන් ඉතින් රධ්‍ය අයියා ආපු නිසා මාමගෙ කාමරේට අලිවෙඩි දාන්න වෙන්නෙ නෑ.. මොකක් වුණත් කපල් එක පවුනෙ.. අනික අපේ මාමා පපුවෙ අමාරුකාරයා.. කවුද දන්නෙ අලි වෙඩි දාන වෙලාවක දෙන්නා එක්ක තරු බලන්නවත්-

" වරද්.. කවුද අර අනිත් පිරිමි ළමයි දෙන්නා.. මම එද්දි ඉස්සරහා හිටියෙ.."

@Shan

" ආ.. අපේ ලොකු අම්මගෙ පුතාලා දෙන්නා.. අර මම ඔයාට කියලා තිබ්බෙ.."

" අහ්.. හරි හරි.. මම වොශ් එකක් දාගෙන එන්නම්.."

රධ්‍ය අයියා මගෙන් ටවල් එක අරගෙන මගේම අල්මාරියෙ තිබ්බ ඇඳුමකුත් අතේ පටලන් දොර ගාවට ගියා.. මම ඇඳේ පොඩිවෙලා තිබ්බ ශීට් එක හරියට හදන්න ඒක ගසලා කොට්ට ටික මෙසෙ උඩින් තිබ්බා..

" වරද්.."

" ම්ම්.."

රධ්‍ය අයියා දොර ගාවට ගිහින් මොකක් හරි මතක් වුණා වගේ මගේ පැත්ත හැරුණා..

" ඔයාට මගේ මොකක් හරි අවුලක් පේනවද.."

මම ටිකක් වෙලා ඇඳ රෙද්දත් අතේ තියාගෙන රධ්‍ය අයියා දිහා බලාගෙන හිටියා..

" ඔයාට කලින් හිටිය විදියට දැන් ඉන්න පුරුදු නෑ වගේනෙ.. ඒකද.."

" ම්ම්ම්.. ඔව්.. I thought I hurt you.. "

" එහෙම එකක් නෑ.. මට හිතුනා ඔයා awkward විදියට ඉද්දි එහෙම වෙන්න ඇති කියලා.."

රධ්‍ය අයියා ලාවට හිනාවෙලා දොර ඇරගෙන එළියට ගියා.. මම කාමරේ අස් කල්ලා පිළිවෙලට හදලා එළියට යද්දි අම්මයි ලොකුඅම්මයි කුස්සියේ සුදුළූණු වගයක් සුද්ද කරනවා තව ගමෙ නැන්දලා ආච්චිලා වගයක් එක්ක.. එහාගෙදර කිකිළිගෙ අම්මත් ඉන්නවා මම දැක්කා.. මාමයි ආධ්‍ය අයියයි ඉස්තෝප්පුවේ කතාකර කර ඉන්නවා.. වත්තෙ එහෙ මෙහෙ වැඩට උදවුවට ආපු අය කතාබහ කරනවා.. මම අම්මා උණුවතුර බෝතලේක දාලා තිබ්බ නෙස්කැෆේ එකෙන් මගේ මග් එක පුරෝගෙන කාමරේ ඇතුළට ගියා.. අභිශේක්ලා පේන්න හිටියෙ නෑ.. සමහරවිට නිදාගන්න යන්න ඇති.. ඒකත් හොඳයි නැති එකම.. ඔලුබක්කො දෙන්නා..

@Shan

මම මග් එක මගේ මේසෙ උඩින් තියලා ඇඳේ හරහට වැටිලා සිවිලිම දිහා බලාගෙන හිටියා.. මේකා මට කතාකල්ලා වත් කිව්වෙ නැනෙ එනවා කියලා.. කිව්වනම් මම අහන්නෙ.. කට ගෙවෙන්නෙ නැනෙ.. අනික.. කොහොමත් ඔය කට ගෙවෙන්නෙ නෑ තමා කවදාවත්.. ගෙවෙන්න මම වගේ කතාකරන්න ඕනනෙ.. අප්පච්චි රධ්‍ය අයියට එන්න දුන්න එකත් පුදුමයි.. ගෙදර ආපු ගමන්ද දන්නෑ ආවෙ.. කමක් නෑ මාව බලන්නනෙ ආවෙ..

මම වටයක් පෙරලිලා කොට්ටෙ අස්සෙ මූණ ඔබාගත්තා..

දැන් මම කොච්චර දේවල් මේ මනුස්සයට කියන්න එපාද.. අම්මා ගැනයි, අයියා ගැනයි, මාමා ගැනයි, ඉස්කෝලෙ ගැනයි, චමිරු ගැනයි, බිග්මැච් එක ගැනයි, අයියා අසනීපවුණු එක ගැනයි, ස්පෝර්ට්ස් මීට් එක ගැනයි, මගේ ක්ලබ් එකේ පළවෙනි මැච් එක ගැනයි, සෝශල් එක ගැනයි, බර්ත් ඩේ එක ගැනයි, අම්මා දුන්නු ගිෆ්ට් එක ගැනයි, කතාකරපු ඕපදූප ටිකයි, නෙතු සමයම ගැනයි, ගෙදර ඒවා ගැනයි.. කියන්න හිටපුවත් අමතක වෙලා වගේ.. කමක් නෑ ආපු ගමන් කියන්න ඕන නෑ කොහොමත්.. මෙහේ ටික දවසක් ඉන්නවනෙ. හිමින්සැරේ ඔක්කොම කියනවා.. මගේ මනුස්සයාට අපරාදෙ කන් දෙකක් විතරක් තිබුණේ..

රධ්‍ය අයියා කියන්නැතුව ඇවිත් ගුටිකෑව එක පැත්තකින් තිබ්බහම.. මම කොහොමත් ඉන්නෙ මේ දකින්නෙ හැමදාම දකින හීනෙක කොටසකද කියලා මට දැනගන්න ඕන නිසා කකුලෙන් ඇඳ විට්ටමට ගහලා බැලුවා..

' දඩාස් '

හම්මට.. හීනයක් නෙමේ.. වරදයා උබ දකින්නෙ හැබෑවටම වෙච්ච දෙයක් තමා.. මේ ගැටපොළොස් කොට්ටෝරුවට මම කුපාඩියා කිව්ව එක ඉල්ලා අස් කරගන්නවා.. හරිනම් ඒක මට වැටෙන්නෝන නම් තියන බකට් එකට ඇඩ් වෙන්න තියෙන වචනයක්නෙ.. සෙනුකයා මට කුපාඩියා කියලා බනින්නෙ හැමතිස්සෙම.. කියාන් අයියා රධ්‍ය අයියව හම්බුණාද දන්නෑ.. ඌ ගැනි දාලා ගිය මිනිහා වගේනෙ හිටියෙ.. යාළුවො නෑ කවුරුත් නෑ තනිවෙලා කියලා.. දවසක් මට සිංදුවක් කියලා මැසේජ් එකකුත් එව්වා 'හවසක මා~ නුඹදැක මං මුළා වී~ නිරුදක කතරේ තනි වූ දා~' කියලා.. ඌට කොහොමත් හොඳටම සික් එක ගහලා තිබ්බෙ සුදුඅම්මියයි සුදුදෝණියයි නැතුව..

@Shan

බලන් යද්දි අපි අඳුරන සේරම සුදුයිනෙ.. දැන් අපේ මාමත් ආධ්‍ය අයියට අලුත් නමක් හදාගෙන සුදුහාමිනේ කියලා.. එතකොට ඒ සුදුහාමිනේ.. මම සුදුමහත්තයා.. සෙනුකයා සුදූ.. අයුක අයියා සුදු අයියා.. ඒ ඇරෙන්න කියාන් අයියා සුදුඅප්පච්චි.. රධ්‍ය අයියා සුදුඅම්මියා.. අයුක අයියා කියාන් අයියට සුදුදෝණියා.. බලන් යද්දි අපි ඔක්කොම සුදුයි.. ආශියි මහීශායි ඇරෙන්න.. ආයෙ හම්බුණාම සුදු නංගිලා කියලවත් කියන්නෝන.. හරිනැනෙ..

" මේක මටද.."

කාමරේ දොර වැහෙනවා එක්කම මට රධ්‍ය අයියගෙ කටහඬ ඇහුණා..

" ආ ඔව්.. දැන් ඒක ගාණට නිමිලා ඇත්තෙ.. ඔයා කාලද ආවෙ.."

" ම්ම්.."

" අප්පච්චි මොකුත් කිව්වෙ නැද්ද.."

" මම ඇහුවෙ නෑ.. ගියා ඇඳුම් ටික ගත්තා.. ආවා.. අම්මා එයාට කියාවි.."

" ඇයි මේ.. රධ්‍ය අයියෙ..??"

රධ්‍ය අයියා ටවල් එක රැක් එකෙන් දාලා මගේ එක අරගෙන ඇඳ ඉස්සරහා පුටුවෙන් ඉඳගත්තා..

" මට එපාවෙලා ඉන්නෙ වරද්.. මම මේ පාර ආවෙ අර ලබ්බට යන්න නෙමේ.. මට කැම්පසුත් ඕන්නෑ මොකුත් ඕන්නෑ.. දමලා ගහලා යනවා යන්න කොහේහරි.. මට තේරෙන්නෑ බං.. රෙද්ද.."

රධ්‍ය අයියා මගේ එකේ රස්නෙට තිබ්බ නෙස්කැෆේ එක බීගෙන බීගෙන ගිහින් මේසෙ උඩින් තියලා කොණ්ඩෙ අතකින් පිටිපස්සට ඇදගත්තා..

" මොකද වුණේ.. කලබල වෙන්නැතුව කියන්නකො.. ඔයා දැන් නිදාගන්නවද.. මම පොඩ්ඩක් එළියට ගිහින් එන්නම්.. විනාඩියක් දෙන්න.."

මම ඇඳෙන් නැගිටලා කාමරේ ජනේලේ වහලා රධ්‍ය අයියා බීලා ඉවර කරපු මගේ එකත් අරන් ගිහින් කුස්සියෙන් තියලා අම්මට නිදාගන්නවා කියලා ආවා.. අම්මා රධ්‍ය අයියා කෑම කාලා නෑ කියලා හිතාගෙන මට කෑම එකක් බෙදාගෙන කාමරේට යන්න කිව්වහම මම රධ්‍ය අයියා කාලා ඇවිත්

@Shan

තියෙන්නෙ කියලා කාමරේට ගියා.. යද්දි රධ්‍ය අයියා ඇඳේ හාන්සි වෙලා අතක් මූණ උඩින් තියාගෙන ඉන්නවා.. මමත් ඒකනිසා ලයිට් නිමාගෙන දොර වහන් රධ්‍ය අයියගෙ ඇඟ උඩින් පැනලා බිත්තිය පැත්තට ගියා.. මම හිතුවෙ නෑ එයා ගිහින් එද්දි මෙච්චර අවුල් වෙයි කියලා.. රධ්‍ය අයියා ආධ්‍ය අයියා වගේ නෙමේ.. අප්පච්චි එක්ක ඇරගන්න යනවා හැමතිස්සෙම.. මේ සැරේ මට ඉවෙන් වගේ තේරුණා මොකක් හරි දෙයක් එහේ ගෙදර වෙයි කියලා..

" වරද්.."

" ම්ම්.."

" මට මහන්සී.. ඔලුව රිදෙනවා.. "

රධ්‍ය අයියා කතාකළත් මං දිහා හැරිලා බැලුවෙ නෑ.. මම එයා දිහාම කළුවරේ අතරින් තියන ලා එළියෙන් බලාගෙන හිටියා..

" මම අතගාන්නද.. ඔයාට නිදාගන්න ඕනද.."

" නිදිමත නෑ.. මහන්සී.."

" එන්නකො මෙහෙට්ට.. මම ඔයාට නින්ද යනකල් ඔලුව අතගාන්නද.."

රධ්‍ය අයියා ඉකක් වෙලා සද්දයක් නැතුව ඉඳලා මං ගාවට ඇවිත් මගේ උරහිස ගාවින් ඔලුව තියාගෙන එයාගෙ අත් වලින් මාව තද කල්ලා.. හුඟක් තද කල්ලා බදාගත්තා.. කොටින්ම මගේ හුස්මත් හිරවෙන්න ආවා..එයා මාව තද කල්ලාම බදාගෙන පපුවට මූණ තදකරගත්තා.. මම එයාගෙ සිනිඳු කොණ්ඩෙ අස්සෙන් මගේ ඇඟිලිතුඩු සීරුවට අරගෙන ගියා.. මම ආයෙ මෙහෙම දවසක් එනකල් බලාගෙන හිටියා.. හුඟක් දවස්..

" මොකද වුණේ.. මම ඔයා කෝල් කරාවි කියලා බලාගෙන හිටියා.."

" කෝල් කරන්න හිටියෙ.. ඒත් අමාරුවෙන් හිත හදාගෙන ඉන්න එක උඹ එක්ක කතාකල්ලා ආයෙ නැතිකරගන්න ඕන නැති නිසා කතානොකර හිටියා.."

" මට පාළු හිතුණා.. කමක් නෑ ඔයා ආවනෙ.."

@Shan

" ම්ම්.."

" ඔයාට මට මොනව හරි කියන්න තියේද.."

" කියන්න සෑහෙන්න දේවල් තියෙනවා වරද්.. පටන් ගන්න තැනක් හිතාගන්න බෑ.. මම දියතලාවෙ ගිහින් ජීවත් වුණේ අපායක ඉන්නවා වගේ.. තමන් අකමැත්තෙන් ඉන්න ඕනම තැනක් අපායක් වගේ තමයි.. මට ඒක තේරුණා.."

" ඉතින්.."

" මම ආයෙ යන්නෙ නෑ.. මට බෑ මාව වැදගත් නැති මිනිහෙක්ගෙ බම්බු හීන නිසා මැරෙන්න.. මම කැම්පස් ඇප්ලයි කරනවා.. ඕන මගුලක් වෙද්දෙන්.."

" ඔයාට කලින් හිතුණේ නෑ..??"

" හිතුණා.. ඒත් හිත හදාගෙන ගියානෙ අප්පච්චි කියන නිසා කියලා.. ගිය එක හොඳයි.. ඒකෙ හැටි දැනගත්තා ගිය එකෙන්.."

" ම්ම්.."

" මට එහෙම ඉන්න බෑ වරද්.. මට තේරුණා අපේ අයියා අර ගෙදර කාත් කවුරුත් නැතුව කොච්චර දුකක් විඳින්න ඇත්ද කියලා.. මමත් ඒ වගේම ආදරේ කරන මොකෙක්වත් ළඟ නැතුව නිකරුනේ කැම්ප් එකක් අස්සට වෙලා දුක් වින්දා.. සෑහෙන්න.. අච්චෙ කට්ට කනවා.. අතේ බෝන් එකක් ඩැමේජ් වෙලා සතියක් මම හොස්පිටල් එකේ.. අප්පච්චි කියන මිනිහට කතාකල්ලා කිව්වත් ඌ ආවෙවත් නෑ තමන්ගෙ ළමයා මැරිලද බලන්න.. මම මහන්සිවෙලා පාඩම් කල්ලා ලකුණු ගත්තෙ ඔහොම දුක් විඳින්න නෙමේ.."

" ඔයා මොකක්ද කරන්න හිතාගෙන ඉන්නෙ.."

" දන්නෑ.. මම අර ගෙදර ඉන්නෙත් නෑ.. අර මිනිහට අප්පච්චි කියන්නෙත් නෑ.. අම්මත් නෑ.. වරද්.. මම-මම මොක්-"

@Shan

රධ්‍ය අයියා කියන්න ගිය එක නවත්තලා මගේ ශර්ට් එකෙන් මූණ පිහාගත්තා.. මම කැමතිම නෑ එයා අඩනවට.. එයා කැම්ප් යන්න කලින් දවසෙත් හුහක් ඇඩුවා.. එහෙම වුණාම මට ඒක නිතර මතක් වෙන්න ගන්නවා..

" ශ්හ්.. අපි ආධ්‍ය අයියා එක්ක කතාකල්ලා බලමු.. ඔයා කැම්පස් එකට ඇප්ලයි කරන එක ශුවර්ද.."

" ඔව කැම්පස් නොගියත් කැම්ප් නම් යන්නෙ නෑ.. මට බෑ.."

" හරි එහෙම ඔන්නෑ.. දැන් ඔයා තනියම නෙමෙනෙ.. මම ඉන්නවා ආධ්‍ය අයියා ඉන්නවා.. අපි හැමෝම ඉන්නවනෙ.."

" ම්ම්.."

" අපි හෙට ඔයාලගෙ අම්මා එක්ක කතාකරමු.. ඔයාට කියන්න හුහක් දේවල් තියෙනවා.. ඊටකලින් ඔයා ආවහම කරනවයි කිව්ව එක කල්ලා ඉන්නෝන.."

" අම්මට කියනවා කිව්ව එකද.."

" ඔව්.. ඒක කිව්වට පස්සෙ තමා මම අනිත් ඔක්කොම කියන්නෙ.."

" ම්ම්.."

" ඔයා බය නැද්ද අම්මට කියන්න.."

" ඒ මොකටද බය වෙන්නෙ."

" ඔයාටයි මටයි බැන්නොත්.."

" බැනපුදෙන්.. ඇයි මම ආදරේ කරන්න ඕන කෙනා තෝරන්න වෙන කවුරුහරි ඉන්න ඕනද.. නෑනෙ.. මම කරන්නෙ මට කරන්න ඕන කියලා හිතෙන දේ.. කොහොමත් මෙතනින් ඉස්සරහට.."

" ආ.. මේ.. එව්වා හරියන්නෑ.. මම කියන විදියට ඕන ඉන්න.. ආවා මෙතන හිතන හිතන දේ කරන්න.."

@Shan

රධ්‍ය අයියට ලාවට හිනාවෙනවා මට තේරුනා..

" මොකද තවුසෙ හිනාවෙන්නෙ.."

" නිකම් නිකම්.. හැමතිස්සෙම කියවලා කියවලා.. දැන් නිදහසේ ඉන්න එකත් මට උඹ නැතිකල්ලා දාලා.."

" නිදහසේ ඉන්නෝන්නම් මාත් එක්ක යාලුවුණේ මොකටද.. මහණ වෙන්න යන්නෙපැයි.."

" ගියානම් නන්ද හාමුදුරුවොන්ට වුණා වගේ වැඩක් වෙන්නෙ.."

" එතකොට මම ජනපද කල්‍යාණීද.."

" අපි එහෙම හිතාගමුකො.."

" අනේ මේ.. කටවහගෙන ඉන්නවා.."

" මම කියන්නෙ ඇත්ත.. හැමතිස්සෙම ඇහෙනවා ඇහෙනවා වගේ 'මේ ඒයි' 'මේ ඒයි' ගානවා කන් දෙක ඇතුළෙන්.."

" ඔයාගෙ පස්ස ලොකුවෙලාද කොහෙද ඒයි.. මේ බලන්නකො අයියෙ.. මරුනෙ.."

මම තියන දස වලත්තකමට හීමින් සැරේ රධ්‍ය අයියා උඩ දමාගෙන ඉන්න පස්සෙන් පොඩ්ඩක් ඇල්ලුවහම රධ්‍ය අයියා මගේ අත අල්ලලා එහාට කලා.. කල්ලා මගේ ඇඟ උඩින් එහාටවෙලා කොට්ටෙ උඩින් ඔලුව තියාගත්ත..

" පාඩුවෙ ඉඳපන්.."

" පාඩුවවෙ ඉන්නෙ කොහොමද ඒයි.. ඔයාගෙ පස්ස දැක්කහම.. පිස්සුනෙ කතාකරන්නෙ.."

" අරහෙන් මෙහෙන් අල්ලන්නෙපා මට අද වෙරි වගේ.. සිරාවටමයි කියන්නෙ හරිද.."

@Shan

" ආ ඔව්.. මම අහන්න හිටියේ.. බියර් කෑන් කීයක් බිව්වද.. තවුසෙ මොකද තනියම බිව්වෙ අනික.. මටත් ඉතුරු කරන්නෙපෑ.."

" ඒ මොකටද.. සුරංගනා කතා ගොතලා ඇදබාන්නද.."

" සුරංගනා කතා නෙමේ.. බිව්වහම මිනිස්සු කියන්නෙ ඇත්ත.."

" ඒ වුණාට උබ වගේ පැහිච්ච තාරාවො කියන්නෙ බොරු.. අර දවසක් කිව්වෙ මම රධ්‍ය අයියව අවුරුදු සීයකින් දැකලා නෑ-"

" අනේ මේ අයියෙ.. එහෙම නෑ හරිද.. "

මම රධ්‍ය අයියගෙ කකුලට පයින් පාරක් දුන්නා.. රධ්‍ය අයියා එයාගෙ බූවළු අඩු ටික මගේ ඇඟ වටේ ඔතාගෙන මාව එයාගෙ අතක් උඩට ගත්තා.. මම එයාගෙ දිග ඇස් පිහාටු තියෙන ඇස් දිහාම බලාගෙන හිටියා.. ඒවා මට හුහක් මතක් වුණා.. මම ඉස්සිලා රධ්‍ය අයියගෙ කම්මුලකින් හාද්දක් තිච්චහම එයාගෙ ඇස් දිලිසුනා.. ඊටපස්සෙ මූණෙ හිනාවක් ඇඳුණා..

" මට පාළුයි ඔයා නැතුව.. ඉස්කෝලෙ යන්නවත් හිතෙන්නෙ නෑ.. ආයෙ කතාවත් නොකර ඉන්න එපා.. මම හුහක් බලාගෙන හිටියා.."

" ආයෙ එහෙම වෙන්නෙ නෑ.. මගේ තාරපැටියට පාළු හිතෙන්නෙ නෑ.."

රධ්‍ය අයියා මගේ කම්මුලක පැත්තකින් එයාගෙ උණුහුම් අතක් තියලා තොල් වලින් පෙක් දෙකක් තිබ්බා.. තියලා මගෙ නලලෙ පැත්තකටත් දිග හාද්දක් තිබ්බා.. මම ඇස් දෙක පියාගෙන එයාගෙ ශර්ට් එක අතට ගුලි කරගෙන අල්ලගෙන හිටියා.. එයා කිව්වෙ මගේ තාරපැටියා කියලද..

" It feels like coming home after a long winter.."

" The winter season ahead of us is more severe than this.. I hope that my home will keep me warm no matter how many cold seasons come.."

" ඔයාට මහන්සී.. ඔයා නිදාගන්න.."

රධ්‍ය අයියා මාව පපුවට තුරුල් කරගෙන ඇස් දෙක පියාගත්තා.. මගේ අතකට එයාගෙ පපුව ගැහෙන සද්දෙ පවා ඇහෙනවා.. එයාගෙ හුස්ම ඇවිත් මගේ කොන්ඩෙ වැදෙනවා තාලෙකට.. වෙලාවකට මාව තව ටිකක්

@Shan

එයාගෙ අඬුවලින් ඔතාගන්නවා.. පිටට තට්ටු කරනවා.. ඔහොම ටික වෙලාවකින් රධ්‍ය අයියා ලාවට ගොරවන්න ගත්තහම මගේ ඇස්දෙකත් බරවෙගෙන එනවා මට දැනුණා..



ඕතරී ආයෙ එන්නාම් ඉක්මනට මගෙ දළබුවනේ.. අපි ලැබූ ජය සමරමු.. හාත.. මොකද හිතන්නෙ ඉස්සරහට මක්කා වේවිද.. නෙස්ටමෝල්ට් බලය ජවය සක්තිය රධ්‍ය අයියගෙ පමස.. ♀

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 118 කොටස

' buzz buzz buzz buzz buzz buzz buzz buzz buzz x 1000 '

" ම්ග්.. ඕක එහාට ගන්නකො අනේ.."

' buzz *beep beep* buzz buzz '

" අයියෙ!!"

මට මලපැනලා මම රධ්‍ය අයියගෙ කකුලකට පයින් ගැහුවා.. කන ගාව තියාගෙන ෆෝන් එක ඔබනවා නිදාගන්නත් නෑ..

" අයියෙ තමා.. මේ බලපිය මගේ ෆෝන් එකේ ඩේටා ඔන් කරන්න බෑ ස්ටක් වෙනවා.."

මට එයා කියපු එක හරියට ඇහුණෙ නැති නිසා ඔලුවෙ ඉදන් වහගෙන රධ්‍ය අයියගෙ අත අස්සටම ආපහු රිංගගෙන ඇස් දෙක තද කල්ලා පියාගත්තා.. මට මොකුත් ඇහෙන්නෑ මම නිදි..

" මොනවද බං මේ එවලා තියෙන්නෙ.. වහලෙන් පැනලා මැරෙනවා..??"

නින්ද යාගෙන ලාවට ආපු මගේ ඇස් දෙක පොල් ගෙඩි දෙකක් සයිස් එකට ඇරුණා.. රෙදි ලෙප්ට් වෙන්නයි යනෙ පුතේ.. රධ්‍ය අයියා මැසේජස් ටික කියවනවා මගේ.. මම පොරවගෙන ඉදපු රෙද්ද ගුලි කල්ලා පැත්තකට විසික් කල්ලා රධ්‍ය අයියගෙන් ෆෝන් එක ගන්න අත දික් කලාම රධ්‍ය අයියා ඒක උඩට කල්ලා අල්ලගත්තා..

" මෙහෙට දෙනවා ෆෝන් එක.."

" මම.. මොකක්ද මේ.. අ.. මම තමයි.. බැට්මෑන්..?? ඒ වරද් සිරාවට ඔයාද බැට්මෑන්.."

" ෆෝන් එක දෙනවා!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

" බැට්මෑන් මැරුණෙ වහලෙන් පැනලද වරද්.."

@Shan

" නෑ ගර්ල්පෙන් එක්ක කැම්පින් ගිහින් අලියෙක් ගහලා මලේ.. මෙහෙ දීපිය ඕක.."

රධ්‍ය අයියා මාව කොට්ටෙ උඩට තල්ලු කල්ලා ෆෝන් එකත් උස්සගෙන කාමරෙන් එළියට දුවලා ගියා.. මමත් ඇගේ පැටලිලා තියන ඒවා ගසලා වැටි වැටි උගේ පස්සෙන් දුවගෙන ගියා.. හරිනෙ අමාරුව.. උඹනම් වරද්.. මාමා කියනවා වගේ ඉල්ලගෙන තමා කන්නෙ..

මම සාලෙට යද්දි පිරිතට වැඩම කරපු හාමුදුරුවරු ආපහු පන්සලට වැඩම කල්ලා.. ගෙදර ඉස්සරලා ටෙන්ට් ගහලා දානෙට ලෑස්තිවෙනවා.. මම ගේ එහාට මෙහේට යන මිනිස්සුත් පෙරළගෙන රධ්‍ය අයියා ගිය පැත්තට දුවගෙන යද්දි මෙකා මාමගෙ කාමරේට පැනලා දොර වැහුවා.. බ්‍රේක් නැතුව දුවගෙන ආපු මම තව ඩිංගෙන් දොරේ හැප්පිලා මූණ තලාගෙන මැරිලා යනවා..

" ඇරපන් දොර.. පොල් කාවයියා.. රධ්‍ය අයියේ!!!"

මම නිකමට දොර අරින්න ට්‍රයි කලාම ඉබේම අගුල කැරකුනා.. හහ්.. මූට අයිලන්ඩ් රෑන්ක් තිබ්බට මොලේ නෑ මට තරම්.. ඇතුළට ගියානම් ලොක් කරගන්නෙපැයි.. අනික යකෝ!! කපල් එකක් ඉන්න කාමරේකට ඔහොම යනවද කඩා බිඳගෙන..

මම ඇතුළට මූණ දාද්දි රධ්‍ය අයියා කාමරේ ජනේලෙට හේත්තුවක් දාගෙන හිනාවෙවී ෆෝන් එකේ මැසේජස් ටික කියවනවා.. ඇඳේ ආධ්‍ය අයියයි මාමයි නිදි.. ආධ්‍ය අයියනම් ඉතින් සුර දූතයා වගේ හරි ලස්සනට ඇඳ අවුල් කරගන්නැතුව එයාගෙ පැත්තට වෙලා මැද්දෙන් කොට්ටෙකුත් තියාගෙන නිදි.. අපේ මාමා කොට්ටෙ උඩින් අතකුයි කකුලයි දාගෙන බහිරවයා වගේ ඔහේ වැටිලා නිදි.. ඊයෙ වලියක්වත් ගිහින්ද මැද්දෙන් කොට්ටෙ වැටිලා තියෙන්නෙ.. මාමා බුලත් කාලා හරි සිගරට් එකක් හරි බීලා සුදුහාමිනේට අහුවුණාද දන්නෑ.. ශුවර් එකටම එහෙම වෙන්නැති.. නැත්නම් ඒ ගොල්ලො පුරුද්දක් විදියට මැදෙන් කොට්ටයක් තියාගෙන නිදාගන්නවද දන්නෙ නෑ.. නෑ එහෙම නෙමෙ.. ළමයෙක් ඉන්න කාලෙක ළමයා මැද්දෙන් තියන් නිදාගන්න පුරුදු වෙනව ඇති.. හැබැයි මේ මාමා ඉන්න හැටියට නම් ඒ පොඩි එකා තැලිලා හුස්මගන්න බැරුව මොකක් හරි වෙනවා.. මම කාමරේ දොර වහගෙන ගිහින් රධ්‍ය අයියගෙන් ෆෝන් එක උදුරලා ගත්තා.. බනිනවත් බෑ මේ දෙන්නෙක් නිදිනෙ රෑ නිදිමරලා..

@Shan

සැක් මේවා එව්වෙ මමද..

' මම මලක්.. ඔයා මී මැස්සෙක්.. මී මැස්සා මල නොතලා රොන් ගම්නෙ කොහොමත දම්නවත..' මේ මොනෞත්තක්ද මේ.. මට දෝදුද හත්වලාමෙ මෙහෙම එව්වා යවන්නෙ.. ඊට යටින් පූසෙක් මලක් බදාගෙන ඉන්න ස්ටිකර්ස් කෝටි දෙකහමාරක් විතර..

" වරද්.. මම රොන් ගන්න හැටි කියලා දෙන්නද.."

" අනේ මේ.. ඕන්නෑ.. කටපියාගෙන ඉන්නවා.."

" ලස්සන වුණාට වැඩක් නෑ රොන් ගන්න හැටි දැනගන්නෝන.."

මම රධ්‍ය අයියගෙ බඩට පාරක් ගැහුවහම රධ්‍ය අයියා නැමිලා මගේ කම්මුලෙන් හාද්දක් තිබ්බා.. මේ මනුස්සයට පිස්සු හැදිලද කොහෙද.. රාධාවනී උමතු වෙලා කැම්ප් ඉඳල ඇවිල්ලා..

" පිස්සුද.."

" මොකක්ද අර ඊයෙ රෑ කිව්වෙ ඔයයි අයියයි එකගෙයි කනවා කියලා මාමට කියනවා කියලා.. අයියට ඔයා කිව්වද අපි දන්නවා කියලා.."

" ඔව් දෙන්නටම කිව්වා අපි දන්නවා කියලා.. මම ඒක එක පස්සෙ කියන්නම් හරිද.. මාමා අපි ගැන දන්නෙ නෑ.. ඒත් මම කිව්වා මම රධ්‍ය අයියව යාළුකරගන්නවා කොහොම හරි කියලා.."

" ඒ පාර මොකටද ලෑස්තිවෙන්නෙ.."

" ලෑස්තිවෙන්නෙ.. ඔයාව තරු බලන්න එක්කන් යන්න.. මගෙ පස්ස ලොකු කව්වෝ.."

මම අත දිගෑරලා රධ්‍ය අයියගෙ පශ්චාත් භාගයට පාරක් දුන්නහම රධ්‍ය අයියා පස්සත් අල්ලගෙන එහාට වුණා..

" පාඩුවෙ ඉඳපන්.."

" බෑ ඔයාගෙ පස්ස දැක්කහම හෝර්නි වෙනවා.. සිරාවටමයි කියන්නෙ.. මේ දානෙ ඉවරවුණාම මම ඔයාට තරු පෙන්නන්නද.."

@Shan

රඩ්‍ය අයියා ඒක අහලා මූණ ඉස්කුරුප්පු ඇණයක් කරගෙන මගේ ඔලුව මැද්දට ටොක්කක් ඇන්නා.. ඉඳපන් මම නැන්දම්මට කියනවා.. පුතා එක්ක දීග යද්දි දාගන්න හෙල්මට් එකක් හරි වෙන මොකක් හරි එවන්න අම්මෙ කියලා.. අනික මේක ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය .. මෙහෙම කොහොමද පවුල් කන්නෙ..

" තරු විතරයි දැන් මදි වෙලා තියෙන්නෙ.. මෙහෙ වර යන්න.."

රඩ්‍ය අයියා මාවත් ඇදගෙන මාමගෙ කාමරෙන් එළියට ආවා.. ඇවිල්ලා මනුස්සයො අස්සෙන් ගිහින් ගිහින් මගේ කාමරේට වැදිලා දොර වහගත්තා.. අපේ ගෙදර වෙලාවට වැඩක් වැටිලා හැමෝම ගෙදර ඇවිත් තියෙන්නෙ.. ඒකනිසා යන්තම් එක කාමරේ දෙක ගානෙ ඉන්නවා.. නැත්නම් ආඩ්‍ය අයියට අපේ ආච්චිඅම්මා ආච්චිගෙ කාමරේ ගාවින්ම කාමරයක් ලෑස්තිකරවලා නිදිකරවගන්නවා..

" ඔයා අම්මටද කතාකරන්නෙ.."

" ආන්සර් කරන්නැනෙ.."

රඩ්‍ය අයියා ෆෝන් එක දිහා ටිකක් වෙලා බලාගෙන ඉඳලා ඒක ඇඳ උඩට විසික් කල්ලා මාව උස්සලා ඇඳ මැද්දට අතෑරියා.. මේක හරියන්නෑ.. මගේ ඇඳේ ඇඳපොලු ටික තව ටික දවසකින් ගැලවිලා බිමට වැටෙනවා මම දන්නවා.. ඊටකලින් කාලා මේකට මාව උස්සගන්න බැරිවෙන්න මහත් වෙන්න ඕන.. රඩ්‍ය අයියා මාව ඇඳ මැද්දට අතෑරලා මාවත් යටකරගෙන අලි පැටියා වගේ මගේ ඇඟ උඩින් දිගාවුණා.. ඊටපස්සෙ තොල් වලින් පෙක් එකක් තිබ්බා..

" අලිමස් ගිහිනවද ඒයි.. මෙච්චර බර.. මගේ හුස්මත් හිරවෙන්න වගේ.."

" සෝශල් එකට ගිහින් චමිරු එක්ක මොකක්ද නටපු අලුත් නැටුම.."

මම ඇස් දෙක ලොකු කරගෙන, මගේ ඇඟ උඩ දිගාවෙලා, මං දිහා පාඩුවෙ බලාගෙන ඉන්න, රඩ්‍ය අයියා දිහා බලාගෙන හිටියා.. මේ අයුක අයියා මහා චිත්තයෙක් බලාගෙන යද්දි.. කනේ තියලා වගේ කේලම.. හරිනෙ අමාරුව..

" කිරිකොරහා නැටුවනෙ.. හොඳනැද්ද.."

@Shan

" කිරිකොරහා පෙන්නනවා උඹට මම.."

" හා.. මම කොහොඹ අතු ටිකක් අපේ සුදුඅම්මියට ගෙනැත් දෙන්නම්.. ඔයා.. මේ මගේ ඉස්සරහා ඇඳුම උනා දාලා කොහොඹ අතු ටික ඉණේ බැඳගෙන නටන්න ඕන.. හරිද.."

" වරද්!!.. චමිරු මොකක්ද අර සෙනුක මල්ලි එක්ක කරන්නෙ.."

" උන් මස්සිනාලා මස්සිනාලා නේ.. අන්‍යෝන්‍ය බැඳීමක් ඇතිකරගන්න යන්නෙ.. හොඳයි නෙහ්.."

" දැන් ඒකට උඹේ තියන සම්බන්ධෙ මොකක්ද.."

" මගේ සම්බන්ධෙ ඇවිල්ලා මෙහෙමයි හරිද.. දැන් ඔයා ඉන්නවනෙ.. ඔයා ඇවිල්ලා මගේ කවුද.. මගේ බෝයිෆ්‍රෙන්ඩ්.. එතකොට මම ඔයාගෙ බෝයිෆ්‍රෙන්ඩ්.."

"...."

" අයුක අයියා ඔයාගෙ කවුද.. හොඳම යාලුවා.. එකවසරෙ ඉඳන්.. එතකොට ඔයා අර එදා මුවන්පික් එකේදි හතරගාතෙ බීලා කිව්වා අයුකයා උඹ මගේ එකා, මගේ බොක්ක, මගේ සහෝදරයා යැයි යැයි ගොඩක් මතකද.."

" ඉතින්.."

" ඉතින් අයුක අයියා ඔයාගෙ සහොදරයා වෙනවනම් අයුක අයියගෙ ස්ටෙප් බ්‍රදර් ඇවිත් ඔයාගෙත් මල්ලි.. ඔයා මගේ බෝයිෆ්‍රෙන්ඩ් නිසා මටත් එයා මල්ලි වෙනවා.. එතකොට අපි ඇවිල්ලා නෑයො වගේ මිනිස්සු.. ඒත් මටනම් ඕන්නෑ ඒ පරෙයියත් එක්ක අන්‍යෝන්‍ය බැඳීමක් ඇතිකරගන්න.. එහෙම ගියොත් මට වෙන්නෙ ඌ එක්ක දීග යන්න.. ඒත් මම තරුවි නංගිට චමිරුවා සෙට් කරන පක්ශෙට සප් එක දෙනවා.. තරුවි කියන්නෙ පරෙයියගෙ ගර්ල්ෆ්‍රෙන්ඩ් හරිද.. ඒ දෙන්නෑ ගැලපෙනවා.. අපි ඌට ඒක පැහැදිලි කල්ලා දුන්නා.."

රධ්‍ය අයියා ටිකක් වෙලා මගේ දිහා ඇස් දෙකත් ඔරවගෙන බලාගෙන හිටියා..

@Shan

" ඒ කියන්නෙ දැනගෙන තමා ඌ එක්ක කතාකරන්න යන්නෙ.. නේ.."

" මොකක්ද දැනගෙන ගියේ.."

" දැන් උඹ දන්නවනෙ චමිරු කලින් කැමති වෙලා හිටියේ කාටද කියලා.."

" දැනගත්තට වැඩක් නෑනෙ.. මම, ඔයා මට කියනවා වගේ මගේ තාර හදවතින්ම ලව් ඔයාට විතරයි.. එයාලා වැඩක් නෑ.. මෙහ් ඒකනෙමේ.. මම සෝශල් එකේ හැඩට හිටියා නේ.."

රධ්‍ය අයියා ලාවට හිනාවුණා..

" ම්ම්ම්.. ඔයා තමයි ලස්සනම.."

මගේ කම්මුල් දෙක එකසැරේ තද රතුපාට වෙලා ලේ පිරුණා.. රධ්‍ය අයියගෙ දිග ඇස්පිහාටු බාගෙට වහලා මං දිහා බලාගෙන ඉද්දි හරි අමුතුයි.. බඩේ සමනල්ලු ගොඩක් එකපාට තටු ගහලා පියාඹනවා වගේ.. එයා හැමතිස්සෙම එහෙම බලන්නෙ නැතුව එකපාර බලන විදිය වෙනස් කරගත්තහම මට හෙන කෝල ගතියක් දැනෙනවා.. මා එයා දිහා බලන්නැතුව සිවිලිම දිහා බලාගෙන හිටියා.. එක්කො ඇඟ උඩින් එහාටවත් ගියානම් මෙතනින් පැනලා යන්න තිබ්බනෙ..

" මොකො මේ රතුවෙලා.. පිපිරේවි ටිකකින්.."

" අනේ මේ.. එහාට වෙන්න අප්පා මගේ ඇඟ තලන්නැතුව.. කකුලත් රිදෙනවා.."

රධ්‍ය අයියා මගේ දිහා බලාගෙන ඉදලා හිනාවෙලා එහාපැත්තට පෙරළිලා ගියා.. මී මැස්සා මල තලනවා.. ඒ එක්කම ඇඳේ පත්තක තියන රධ්‍ය අයියගෙ ෆෝන් එකට වීඩියෝ කෝල් එකක් ආවා.. මම ඇදිලා ගිහින් ෆෝන් එක අතට ගත්තා..

**Ammi Calling...**

" කවුද වරද්.."

" අම්මා ගන්නවා.. ආ ආන්සර් කරන්න.."

@Shan

රඩ්‍ය අයියා මගෙන් ෆෝන් එක අරගෙන අවුල් වෙච්ච කොණ්ඩෙ හදාගෙන ෆෝන් එක කොට්ටෙකට හේත්තු වෙලා ඒක ආන්සර් කලා.. මම දර්ශන පථයෙන් අයින් වෙලා ස්ක්‍රීන් එක දිහා බලාගෙන හිටියා..

" පොඩී.. අම්මා ඔයා කතාකරනකල් බලාගෙන හිටියා.. ඊයෙ අයියා කිව්වෙ ඔයා එනවා කියලා.."

රඩ්‍ය අයියා හිනාවෙලා කම්මුලට අතක් තියාගෙන ෆෝන් එකේ ස්ක්‍රීන් එකට එබුණා.. මම අම්මා එක්ක වීඩියෝ කෝල් වලින් කතාකල්ලා නැති නිසා මට හිතුණා මේ ටික කාලෙට අම්මා හුඟක් පෙනුමෙන් වෙනස් වෙලා කියලා.. රඩ්‍ය අයියගෙ අම්මා ලස්සනයි.. රෝසපාට ස්කිනර් එකක් එක්ක සුදු ටයිට් ස්කර්ට් එකක් ඇඳලා කොණ්ඩෙ උරහිස ගාවට වවලා ලොකු කණ්ණාඩිදෙකට අම්මව තරුණ පාටට ලස්සනට පෙනුණා.. අම්මා නම් ඇත්තටම සතුටින් ඉන්නවා වගේ.. අම්මගෙ මූණ හරි එලියකින් පිරිලා ගිහින් තිබුණා..

" මම රෑ ආවා අම්මා.. වරද්ලගෙ ගෙදර.."

" හොර කොල්ලා අප්පච්චිට කිව්වෙ නෑ නේද.."

රඩ්‍ය අයියා ඇස් දෙක කරකලා මූණ ඇද කරගත්තා..

" අයියට කිව්වම ඇති.."

" ඒකට කමක් නෑ.. ඔය පැත්ත මොකද.. හොඳයිද.."

" ඔව්.. ආත්තම්මා ඉන්නවා.. වරද්ලගෙ අම්මා ඉන්නවා.. තව කට්ටිය වැඩ මෙහේ ගෙදර දානයක්නෙ.."

" දානයක් කිව්වහම මතක් වුණේ.. මට බඩගිනියි හොඳටම.. එළියට යන්න හැදුවෙ කෑමකන්න.. ඒත් දැන් දානෙකින්ම කන්න ඕන වගේ.."

" අම්මා කෑවෙ නැද්ද.."

" තාම නෑ.. අයියා කෝ පොඩී.."

" නිදි.. තව ටිකකින් ඇහැරේවි.."

@Shan

" ම්ම්.. මම දේදුණුට කතාකලා මේ දවස් ටිකේ.. එයාට හොඳටම බිසීද කොහෙද.."

" ඔව් අම්මට වැඩ දානෙ නිසා.."

අම්මා කණ්ණාඩිදෙක ගලවලා මේසෙ උඩින් තියලා කොණ්ඩෙ පිටිපස්සට හදාගත්තා.. හරියට මොකක් හරි ලොකු දෙයක් අහන්න ඉන්නවා වගේ.. මම මගේ ඇඳුමෙ වාටියෙ නූලක් ඇදලා අරගෙන ඒක ඇඟිල්ලක ඔතාගත්තා..

" පොඩීට මොනව හරි කියන්න තියෙනවද.. "

රධ්‍ය අයියා අම්මා දිහා බලාගෙනම හිටියා ටිකක් වෙලා..

" ම්ම්.. ඔව් කියන්න තියෙනවා.."

" Go on.."

" මම අම්මට කලින් මගේ සෙක්ශුවලිටි එක ගැන කියලා නෑ.. මම හිතන්නෙ මම කැමති පිරිමි ළමයින්ට කියලා.. මට ගෑණුළමයි ගැන කිසිම හැගීමක් දැනෙන්නෙ නෑ.."

අම්මා ඔලුව වන වන උනන්දුවෙන් අහගෙන ඉන්නවා වගේ පෙන්නුවා.. නැන්දම්මා රහපානවා ප'ෆෙක්ට්ලි..

" සෝ..??"

" මට බෝයිෆ්‍රෙන්ඩ් කෙනෙක් ඉන්නවා.. මට ඒක අම්මට කියන්න උවමනා වෙලා තිබුණේ.."

" අහා.. හොඳයි.."

" මම එයාව හුඟක් කල් ඉදන් දන්නවා.. අම්මත් එයාව දන්නවා.."

" ඒ කවුද.. මමත් දන්නෙ..?? කියාන් පුතාද.."

රධ්‍ය අයියා එකසැරේ මූණ වෙනස් කරගත්තා..

@Shan

" අම්මෙ!!!"

" කියන්නකො කවුද කියලා.. මම ගෙස් කලා විතරයි.."

" මගේ බෝයිෆ්‍රෙන්ඩ් වරද්.. කියාන් නෙමෙයි.. අම්මා වරද්ව දන්නවා.."

අම්මා ටිකක් වෙලා කල්පනා කල්ලා ෆෝන් එකට ආයෙම එබුණා..

" වරද්?? ෂනෙරු.. ද..??"

" ඔව්.."

" ඔයාට විශ්වාසද ඒක ආදරයක්මයි කියලා.."

රධ්‍ය අයියා අම්මා දිහා එක එල්ලේම බලාගෙන හිටියා..

" ඔව්.. මම ආදරෙයි.. සමහරවිට මම පිරිමි ළමයින්ගෙනුත් කැමති එයාට වෙන්න පුළුවන්.."

" අහා.. ඒත් ඔයාට තියෙන්නෙ ආකර්ශනයක්ද දන්නෙත් නෑ රධ්‍ය.. ඔයා කොහොමද ආදරේමයි කියලා කියන්නෙ.."

" නෑ මම ආදරෙයි.. "

" ඔයාට විශ්වාසද.. ආදරේමයි කියලා.. මම අහන්නෙ.. හිතට එකහව ඔව්ද.. ඔයාලා නොදැක ඉදපු කාලෙ ගැන මොකද හිතෙන්නෙ.."

" I can't even remember about it.. I feel homy around him.. When I saw him after a long time, I felt like I came home.. I have never used him in a wrong way.. I want to take care of him.. to see him in a good place.. for that I will be strong for him.. මම හිතන්නෙ ඒකට තමයි ආදරේ කියන්නෙ.."

අම්මා හයියෙන් හිනාවුණා..

" Can you take good care of him..?"

" ඔව් පුළුවන්.."

@Shan

" ඔයා එයාව කෙයා කරනවා කියලා කරන්න හිතාගෙන ඉන්නෙ මොනවද.. එයාව ගේ අස්සට දාලා හිර කරන් ඉන්නවද.."

රධ්‍ය අයියට ඒකට නෝන්ඩියට වගේ හිනාගියා..

" He can fly as far as he can fly.. I take care of love by keeping it in my heart, not by locking it in cages like

**other people**

.."

" රධ්‍ය.. ඔයා හැමතිස්සෙම මතක තියාගන්න ඕන ඔයා ආදරේ කරන්නෙ හැගීම් දැනීම් තියන හුස්ම වැටෙන මනුස්සයෙක්ට කියලා.."

" මම ඒක දන්නවා.."

රධ්‍ය අයියා ඇස් දෙක කේන්තියෙන් පුරවගෙන ස්ක්‍රීන් එක දිහා බලාගෙන හිටියේ.. සමහරවිට එයාට අප්පච්චිව මතක් වුණාද දන්නෙ නෑ..

" මම්.. මම්.. ෂනෙරු.. එයා ක්ලියර් පාත් එකක් තියන ළමයෙක්.."

" මම්.."

" ඔයා කොයිම වෙලාවකවත් එයාගෙ පාරට එන්නෙ නෑ රධ්‍ය.. තේරුණාද.. එයාට ඒ පාර හදලා දෙන්න ඕන.. හදලා ඔයා පැත්තකට වෙන්න.. එතනින් එහා එයා ඔයාගෙ බෝයිෆ්‍රෙන්ඩ් වුණත්, එයා එයාටම කියලා තනි ජීවිත කතාවක අයිතිකාරයෙක්.."

" මම්.."

" එතකොට එයා මොකද.. ඔයාට දැනෙන්නෙ කොහොමද.."

රධ්‍ය අයියා මං දිහා බලලා ලාවට හිනාවුණා..

" එයා මෙතන ඉන්නවා අම්මා.."

@Shan

" පොඩීට ලැජ්ජද.. හරි හරි මම පස්සෙ රහසින් අහන්නම්.. කෝ ෂනෙරු පුතා.."

මම ස්ක්‍රීන් එකට පේන්න අම්මට හායි කිව්වහම අම්මා මට හායි කියලා ඇහැක් ගැහුවා..

" අම්මා ලස්සනයි කොණ්ඩෙ ඔහොම තිබ්බම.."

මම රධ්‍ය අයියව එහාට තල්ලු කල්ලා ෆෝන් එක අතට ගත්තා..

" මෙක ලස්සනද.. මම තව දිගට වවනවා හිතුණොත්.."

" වෝහ්.. රපුන්සල්ද.."

" ඔව් අන්න හරි.. හොඳ නැද්ද.."

රධ්‍ය අයියා මගේ දිහා අමුතුවට බලාගෙන ඉන්නවා මම දැක්කා..

" එහෙම හොඳයි.. අම්මා කොහොමත් ඔය ලස්සනට ඉන්නෙ.. තව මොනවා හොඳ වෙන්නද.."

" මම අද ලස්සන බලු පැටියෙක් දැක්කා හරිද.. මට හිතෙනවා එක්කෙනෙක් ගෙනැල්ලා හදාගන්න.. බබා ඔයාට කියන්න අර පොමනේරියන් පොඩි අය ඉන්නෙ.. එයාලා හරි හුරතල්.. කියාරා රෙක්සිලා වගේ නපුරු නෑ.. ඒත් මම හුඟක් දවල්ට ගෙදර නැති නිසා ගේන්න බයයි.."

" එහෙනම් එපා.. එයාලා බලාගන්න ඕනනෙ හරියට.. අම්මා නැතුව දවල්ට එයාලට සාංකාව හැදේවි.."

අම්මා කම්මුලකට අතක් තියාගෙන මං දිහා බලාගෙන ඉඳලා හයියෙන් හිනාවුණා..

" බෝනික්කා.. ඔයා එක්ක කතාකර කර ඉන්න ගියොත් මට අද කන්න වෙන්නෙත් නෑ මේ විදියට.. මම පස්සෙ ගන්නම්.. ඔයාලා පරිස්සමට ඉන්නකො.. හරිද.. අම්මට ටිකකින් ලෙක්චර් යන්නත් තියේ.."

" හා අම්මා.. වෙලාවට කාලා බෙහෙත් බොන්න.. ආදරෙයි.."

@Shan

" ආදරෙයි.. "

මම අම්මට හොඳ සුපිරිවිකී හිනාවක් දීලා ෆෝන් එක කට් කල්ලා ඒක පහළට කරද්දි, ඒ සමාන්තරවම යකෙක් වගේ මූණක් හදාගත්තු පොල් කාවයියෙන් මගේ මූණ ඉස්සරහට මූණ දැම්මා..

" මම නැති ටිකට සේරම අනිත්පැත්ත ගැහුවද.."

" ආ අන්න ආච්චිඅම්මා කතාකරනවද කොහෙද මම පොඩ්-.."

" වරද්. මෙහෙ.. එනවා!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

මම ආවා පුතේ..

මම්ට මහන්සී..

මම යනවා පුතේ..

හම්නේ ඇම්තටම නිදිමතයි අම්නෙ.. නැන්දම්මත් ලෙං හුටපටේ දන්නවලු.. මාමාගෙ ඇඳ මැද්දෙ කොට්ටෙට හේතුව නම් කර වටිනා කරපිංචා මිටියක් දිනාගන්න..

එන්නාම්.. ලව් යූ.. ❤

ඕතරීට බඩ්ඩක් හම්බුණානෙ අනේ..

@__FoxY_003 තැම්කු සෝ මච් පනේ..

@lyz_8105 තැන්කු අක්කියෝ...

@Shan

අම්මියො පොල්කිච්චොන්ටත් කවර් එකක් ලසා එව්වනෙ..

ආදරෙයි මම හුහාක් දළඹු පැටවුනේ..        ❤❤❤



සරනේරු!! පුලුවන් දෙයක් කරපම්!!

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 119 කොටස

මම හිටියේ රධ්‍ය අයියත් එක්ක වෙච්ච මහා විසාල රණ්ඩුවක් දුරදිග ගිහින්, අපේ මාමගෙන් ගුටි කාලා, දුක හිතිලා, දානෙ ගෙදර කියලා බලන්නැතුව ඉස්තෝප්පුවෙ කොනකට වෙලා කිකිළිගෙ පුංචිඅම්මගෙ දුවගෙ එහාපැත්තෙන් ඉඳගෙන.. මම ඒ කෑල්ලව පෞද්ගලිකව දන්නෙ නෑ.. හැබැයි මම දන්නවා ඒ පුංචිඅම්මගෙ දුව කියන පෙට්ටි කිකිළී මගේ මනුස්සයට බැල්ම දාගෙන ඉන්නවා කියන එක විතරක්.. දෙනවා මම උඹට බලාගෙන හිටපන් අසමජ්ජාති කිකිළි කෑල්ල..

උදේ රධ්‍ය අයියා, එයා සැහෙන්න රැවටුණ එකට කේන්ති ගිහිල්ලා මගේ පාර පස්සෙ අඬෝලා මම කුස්සියෙන් එළියට පැනලා ආයෙ මාමලාගෙ ජනේලෙන් කාමරේට පැන්නහම සුව නින්දේ ඉඳපු අනුකිච්චයි සාකිච්චයි ඇහැරුණා.. ඇත්තෙන්ම මගේ හදවත පල්ලා මම ඒ දෙන්නව ඇහැරන්න හීනෙකින්වත් හිතුවෙ නෑ.. අනික මම එහෙම හීනෙන් උන් දෙන්නා ගැන හිතන්නෙත් නෑ කොහොමත්.. මම හිතන්නෙ මම ගැන.. රධ්‍ය අයියව තරු-

කොහොම හරි මම ඒ දෙන්නවත් අතවැරදීමෙන් ඇහැරලා කාමරෙන් යන්න ගියා විතරයි රධ්‍ය අයියා දොර ඇරගෙන ඇවිත් ගුලි කල්ලා චප්ප කරපු බුලත් කොළ වගයක් මගේ කටේ එබුවා.. මම රධ්‍ය අයියට හෙප්පුවෙන් ගහලා ඊටපස්සෙ ඒක මහා පරිමාණ රණ්ඩුවක් වෙලා.. මාමගෙ ඇඳ ගලවගෙන වැටෙන්න තරමට ගහ මරාගෙන.. ආධ්‍ය අයියා බේරන්න මැද්දට පැනලා එයත් ගුටි දෙකතුනකුත් වද්දගෙන.. පස්සෙ මාමා රධ්‍ය අයියටයි, මටයි, ආධ්‍ය අයියටයි තුන්දෙනාටම හොඳ පාරවල් ටිකක් ඇදබාලා එකට ඉන්න එපා කියලා කාමරෙන් එළියට දැම්මා.. ආධ්‍ය අයියට ඒකට මලපැනලා මාමට හෙප්පුව විසි කල්ලා ගහන්න ගිහින් පස්සෙ මාමා ආධ්‍ය අයියව ආයෙම ඇතුළට ඇදලා අරගෙන දොර වහගත්තා..

අනේ මටෝන්නෑ කෞරුවත්..

මම රධ්‍ය අයියා මට රවාගෙන මගේ ඉස්සරහින් වතුර වීදුරුවක් ට්‍රේ එකක තියාගෙන අල්ලගෙන යන දිහා බලාගෙන ඉඳලා දෙකක් රවලා ශේප් එකේ මිඩ්ල් ෆින්ගර් එක පොයින්ට් කලාම රධ්‍ය අයියත් මගෙ මිඩ්ල් ෆින්ගර් එක පොයින්ට් කල්ලා රවාගෙන යන්න ගියා.. මුගෙ ගැස්සිල්ල යකෝ.. දෙන්න

@Shan

හිතයි තරු පේන්න පුපට දෙකක්.. ගැටපොලොස් කොට්ටෝරුවගෙ.. ඒ එක්කම මගේ ෆෝන් එකට වට්සැප් එකේ මැසේජ් එකක් ආවා..

ටසිරි පුංචි පෞලක් හදලා දොඩම් බිබික්කම..

**Ashi created a group 'රාජකීයහැතිකරේ😬 & ලස්සනළමයි😇'**

ඒ නම දැකලා මට එකපාර හිතට ආපු කික් එක ශීඝ්‍රයෙන් පහළ බැස්සා.. මෙකිට මොන හේතුවකටද මන්දා මෙච්චර අපේ ඉස්කෝලෙ එක්ක ඉරිසියා.. කියාන් අයියට පුතෙක්වත් හම්බුනොත් කියන්න ඕන අපේ ඉස්කෝලෙටම දාපන් කියලා.. එතකොට ආගිට දෙයියනේ කියලා තව අවුරුදු දහතුනක්ම පේරන්ට්ස් මීටින් වලට අපේ ඉස්කෝලෙටම බඩගාන්න පුලුවන්..

" මොකක්ද බේසික කෙල්ලෙ ඒ දාපු නම.."

" එහෙම තමයි අනේ.. මට තවුසෙලව පේන්න බෑ.. නිල් කහ කැත රාස්සයො ටික.."

" ආශු!!!!!!!!!!"

" මොකත.."

" මේ නම වෙනස් කරපිය.."

" මට බැහ්.."

" මොකක්ද බං මේ ගෲප් එක.. අඩේ පුම්චි පවුලට ගෲප් එකක් හතලා.. ශුඩුඅයියත් ඉන්නවා"

" බලපන් ඒකෙ නම.."

" ඔකිගෙන් ඔච්චරට වඩා දෙයක් බලාපොරොත්තු වෙන්න පුළුවන්ද බං ඉතින්.."

" මේ සනෙරුමලගෙ ගෙදර දානයක්ලු හලෝ.. රධ්‍ය අයියත් එහෙ ගිහිල්ලා.."

@Shan

" ඔව් පකයට ආතල් ඇති දැන්.. මෙකෙන් මාව රිමූ කරපන්.. මම තාම තනිකඩයනෙ.."

" පිස්සුද රත්තරනෙ.. එහෙම ඔයා නැතුව කොහොමද අපි පවුල් හදන්නෙ.."

" උඹලා කඩාගත්තහම එච්චට මැදිහත් වෙලා මට එපාවෙලා තියෙන්නෙ.."

" කවුත හලෝ කඩාගෙන තියෙන්නෙ සනෙරුද.."

" පකයො!!!"

" ඇයි ඇයි අනේ මෙ රණ්ඩුවෙන්නෙ.. හොද ළමයි වගේ රණ්ඩුවෙන්නැතුව ඉන්න.."

" #ජාතියේමවතුමිය"

" මට මේ අවස්ථාවේ මෙකෙ කියන්න යමන් තියෙනවා.. මම මේ කාටවත් කිව්වෙ නැති කතාවක් කියන්නෙ

**@Ayuka Ayya**

අයුක මහා චීත්ත ජාතකය.. අයුක අයියා කියන්නෙ චීත්තයෙක්.."

" සමබර අනුග්‍රහය සෙනුකගේ යහපෝස.."

" යහපෝසයි ගුණදෙනා.. තාන තනන තම් දෙනා.."

" මගේ මිනිහට මොකුත් කියන්නෙපා බං.. හිත රිදෙනවනෙ.."

" උබර්ගෙ මිනිහා කරන වැඩ හරිද පගෝ.."

" ඔව් හැබැයි.. චීත්ත ලයින් තමා දෙන්නෙ.. අරක රධ්‍ය අයියට කියලා නේත.."

" ඔව්.. #චීත්ත_අයුක_ගෝ_හෝම් "

" මම මේ මිනිහට කිව්වා.. යකෝ තොත්තුව මස්සිනා දුන්නෙ මටනෙ.. මස්සිනාගෙන් තොත්තු ගන්න එක පෞ වැඩක්ද බං.. නෑනෙ.. දැන් උඹට

@Shan

ආඩ්‍ය බොසා තොත්තු එහෙම දෙනවනෙ.."

" ඒත් අනේ අයාන් හැලකිඹුලා මට තොත්තු දෙන්නෙ නෑ අනේ.."

" ආශු!!!"

" උගේ තොත්තු ඕන්නෑ.. කියාන් අයියා ඉන්නෙ උඹට තොත්තු දෙන්න.."

" මෙහ්.. උඹලට මම හොඳින් කියන්නෙ.. ඔය කපල් ගැන කතාකරන්න එපා.. මට මලපයිනවා.."

" තනිකම හුරු දෙනෙත පුරා~ උණු කඳුලැල් රූටා ගියා~ ඔබ නෑ නෙතු මානේ~ හමුවේවිද ආයේ~"

" මම යනවා.. රෙද්ද.."

" ඒ ඒ ඉඳපන්.. උඹට සයෝන් අයියගෙන් තොත්තුවක් ඕනද.."

" ඒ පකයගෙ තොත්තු මට ඕන්නෑ.. මට මොකෙක්වත් එපාආආආආආආආආආආආආආ!!!!"

" මෙන්න මෙකිට මද කිපිලා.."

" මහී බබා.. කේන්ති ගන්න එපා අනේ.. ඔයාලා මෙහෙම රණ්ඩුවෙද්දි අපිට එකට පවුල් කන්න බෑනෙ.. නේත.."

" අනේ අපිටනම් එකට පවුල් කන්න උවමනාවක් නෑ නම්ගී.. මම ඔබට ආස නෑ.."

" ඇක්කා අනේ.. මෙ සනෙරු මහ whocna කතාවක් තමා කිව්වොත් කියන්නෙ.."

" උප්ස් සොරි.. මම කුණුහර්පයක් කියන හිතුවෙ නෑ අනේ.."

" ආශු.. ඔය දැන් නිදාගන්න යනවා කියලා නිදාගන්න හැටිද.."

" නින්ද යන්නෙ නෑ අනේ.. මට මගේ සනෙරුමලයි සෙනුකමලයි මහීමලයි මතක් වුණා.."

@Shan

" මම..          පිට තමා.."

" කෝ බං රධ්‍ය අයියා.."

" වතුර අල්ලනවා.. මගේ කකුල කැඩිලා තියෙන්නෙ.."

" වම්රුගෙ තොත්තුවට කකුල කැඩුවද රධ්‍ය අයියා.."

" අනේ මෙ රධ්‍ය අයියට පාඩුවෙ ඉන්න කියන්න හරිද.. මගේ සනෙරුමලගෙ කකුල් කඩන්න.. මම අයියගෙ කොණ්ඩෙ රෝසපාටින් පාටකරනවා.. දැනගන්න..

**@Happy cowwa**

හරිද අයියෙ.."

" ඒ.. රධ්‍ය අයියා එහෙම ඉන්නවා මැවිලා පේනවා බං.."

" සුදුඅම්මියට බලු කතාකියන්නෙපා බේසික පොඩි උන් ටික.. මගේ රත්තරංට මම අතක් තියන්න දෙන්නෑ.."

" මම අත තියනවා.. මෙන්.."

මම දුවගෙන ගිහින් එළියේ ට්‍රේ එකක වතුර අල්ල අල්ල ඉන්නෙ රධ්‍ය අයියගෙ පිටට අතක් තියලා ෆොටෝ එකක් ගහලා ඒක සෙන්ඩ් කලා.. රධ්‍ය අයියා මාව සත එකකට ගනන් ගන්නැතුව මට රවලා ගස්සගෙන එතනින් යන්න ගියා..

" සුදුඅම්මියගෙන් ඇත්වෙලා ඉඳපන් පොඩි පගයා.. දෙයියනේ මගෙ පැටියා කෙට්ටු වෙලා.."

" අනේ මෙ කියාන් අයියෙ..!!"

" කියාන් ඔක නවත්තපන්.."

ඒ සැරේ එකපාරම අයුක අයියා හෙන ගහන්න වගේ ඔන්ලයින් ආවා.. හත්තික්කේ මම උඩ බලු කතාවකුත් කිව්වා දැක්කද දන්නෑ.. දකින්නැති තියන ගොං කමට මෙන්ෂන් කල්ලම කිව්වනෙ වීත්තයෙක් කියලා.. නෑ

@Shan

ඇත්තනෙ.. මගුල.. මම හිටියෙ ඌට කලින් චමිරුවා ගැන කියන්නනෙ සුදුඅම්මියට..

" සුදුදෝණියා.. මගෙ සුදුදෝණියට හවස් වෙලා නේත රත්තරනෙ.."

" #චිත්තායුක"

" අඩෝ අඩෝ ෂනෙරු.."

" මොකක්ද ඒ.."

" චිත්තායුක තෛලය කියලා එකක් තියෙනවා අයියෙ.. ඒක දවසට පස් පාරක් පස් දොරේ ගෑවහම තමන්ගෙ පෙම්වතා ලැට් එකේ කණ්ණාඩියෙන් පේන්න ගන්නවා.."

" 😂😂😂ටසිරි අයුකයා ඒකහ්.."

" 😐😑 "

" මේ හලෝ අනේ අහන්නකො.. ඒක රාජපුර හන්දි තෙලට වඩා හොඳයි නේද.."

" හන්දිතෙල මොකක්ද බං ඒක එක්ක.."

" ඇයි අයුක අයියට විතරක්.. එහනම් රධ්‍ය අයියටත් නිශ්පාදනයක් තියෙන්නෙපැයි.. හරිනෑනෙ.. සම අයිතීන් ලබාදෙන්න ඕන මම නම් කියන්නෙ..."

" අනේ මේ මගේ මිනිහට ඉන්න දීපන්.. එහෙම නිශ්පාදන ඕන්නෑ.."

" මල නොබඳින සරනේරු.. අධිකාරි සහ පුත්‍රයෝ මලනොබඳින සරනේරු.."

" ඕක නවත්තපන් බේසික්කො ටික.."

" ඒ අඩො ඒක මරු.. අධිකාරි පුත්‍රයො තමා හොඳටම කරන්නෙ.."

" මාමණ්ඩිට මක්කවත් කියන්නෙපා හරි.."

@Shan

" ඕමො ඕමෝ මෙන්න පක්ශපාතී බැණා.."

මම ඇහිල්ලකුත් කටේ ගහගෙන ෆෝන් එක දිහා බලාගෙන හිටියා.. ඒ එක්කම කියාන් අයියා වීඩියෝ එකක් සෙන්ඩ් කලාම මම ඒක ලෝඩ් වෙනකල් ඉදලා ප්ලේ කලා..

"

Take a ride with me

Neon jayuropgil wonhani

Barami eodirodeun ikkeulji

Stop, ireumeun beoryeo

Mr. Rover, rover, rover

I'm coming over, over, over

Call me Rover, rover, rover

I'm coming over

Ireumeun beoryeo, "Mr."

Meotdaero georeo nae tteutdaero

Siseoneun neomgyeo ganeun daero

Rover, rover, rover

I'm coming over, over, over

( rover by kai - tiktok challenge)

ඒකෙ තිබ්බෙ අපි අර ට්‍රිප් එක ගිහිල්ලා.. ආශියි මමයි සෙනුකයයි ආශිගෙ මන්නයක් පෙන්නලා කරපු තර්ජනේකට ඇවිත් ඒකි එක්ක ටික්ටොක්

@Shan

එකකට නටපු වීඩියෝ එකක්.. අන්තිම හරියෙ මහීශා දත් මැද මැද වීඩියෝ එක මැද්දෙන් යනකොට සෙනුකයා ඒකිට සෙරෙප්පුවෙන් ගහනවා.. ආශි දුවගෙන ඇවිත් වීඩියෝ එක නතර කරනවා.. මම ඉණට අත දෙක තියාගෙන කැමරා එක දිහා බලාගෙන ඉන්නවා.. මුල් ටික ගැම්මට නටාගෙන ඇවිත් අන්තිම හරියෙ ඒක චොර වුණු නිසා අපි ඕක හංගලා තියාගෙන හිටියෙ.. කොහොම හරි ඒක සුදු පාක්ශිකයන්ගෙ අතට ගිහිල්ලා.. දැන් ඉතින් හරි.. ටික්ටොක් කරන්න ගිහින් වස චාටර් විදියට බර්ත්ඩේ එකකදි සමාජ මාධ්‍ය වල ශෙයා වෙන්න පුළුවන්..

මම ඒක දිහා හිනාවෙවී බලාගෙන ඉදලා පොඩ්ඩක් වටපිට බල්න්න ඔලුව ඉස්සුවා විතරයි කෙලින්ම මගේ දර්ශන පථේට අහුවුණේ අලි විසාලෙට මගේ ඉස්සරහා හිටගෙන ෆෝන් එක දිහා නෝන්ඩියට හිනාවේගෙන බලාගෙන ඉන්න රධ්‍ය අයියව.. මම උඩට රවලා අනිත් පැත්ත බැලුවා විතරයි අර කුකුල් කැල්ල කටත් ඇරගෙන රධ්‍ය අයියා දිහා බලාගෙන ඉන්නවා.. මෙක නිකන් සමකෝණී ත්‍රිකෝණයකි ඔබත් මමත් ඇයත් සිටින වගේ.. මට ඒ සිංදුව ඔලුව වටේ ප්ලේ වෙනවා වෙනවා වගේ ඇහුණා.. මම ආයෙම රධ්‍ය අයියා දිහා බැලුවහම රධ්‍ය අයියා මගෙන් ෆෝන් එක අරගෙන ඇතුළට යන්න ගියා.. මම තරහවෙලා ඉන්නෙ කොහොමත්.. මාමගෙන් ගුටි කන්නත් වුණානෙ.. ෆෝන් එක බැරිනම් ඕන මගුලක්.. මම ආයෙම පුටුවට හේත්තු වුණා.. බඩගිනියි වගේ.. අර කොට්ටෝරුවා කන්නෙ කීයටද දන්නෙ නෑ.. අහන්නෝන..

" අර මෙතෙන්ට ආපු මල්ලි කවුද මල්ලි.."

" කවුරු.. අක්කා කියන්නෙ ඉශාක්‍ය අයියද.."

" අහ් එයා ඉශාක්‍යද.."

" ඔව් අක්කෙ.. මගේ හොදම යාළුවෙක්.."

" ආ.. එතකොට අර ඒ මල්ලිගෙ අයියද.. අර ඇතුළෙ හිටියෙ ඒ වගේ තව එක්කෙනෙක්.."

" ඔව් ඒ ඉශාක්‍ය අයියගෙ ලොකු අයියා.. ශාක්‍ය.."

" අහ්.. එක වගේ නම් නේ.."

@Shan

" ඒකතමා.. ඉශාක්‍ය අයියගෙ ගර්ල්ෆ්‍රෙන්ඩ් මගේ හොඳ යාලුවෙක්.."

" ආ එයාට ගර්ල් කෙනෙක් ඉන්නවද.. කොහෙද කොළඹද.."

" ඔව්.. ආධ්‍යා කියලා.. අපේ වයසෙ.."

" අහා.. නංගි මොනවද කරන්නෙ මල්ලි.."

" දැන් නම් ඉන්නවා අක්කෙ.. අපිට ඒ ලෙවෙල් ඉවරනෙ.. එයා බැඩ්මින්ටන් ප්ලෙයර් කෙනෙක්.. බයෝ කලේ.."

" එහෙමද.."

කිකිළීගෙ මූණ පරල වීගෙන එනවා මම හරිම උද්යෝගයෙන් බලාගෙන හිටියා..

"ඔව් ඒ දෙන්නා දැන් යාළුවෙලා හෙන කාලයක් වෙනවා.. රධ්-මම කිව්වෙ ඉශාක්‍ය අයියා කැම්පස් නිසා පොඩ්ඩක් බිසී.."

" ආ.. ඒකතමා නේද මල්ලි.."

" මම පොඩ්ඩක් අරහෙට ගිහින් එන්නම් අක්කෙ.."

මම නැගිටලා ගේ ඇතුළට එන්න ආවා.. එනෝ මෙතන ඇර කැව්ද මැල්ලි යැයි යැයි ගාගෙන.. ඒ අස්සෙ බඩගිනියි මෙ මිනිහා කන්නෙත් නෑ.. වතුර අල්ල අල්ලා ඉඳපන් මම කනවා.. මම ආධ්‍ය අයියා ගාවට ගිහින් පොඩි තට්ටුවක් දැම්මහම ආධ්‍ය අයියා මං දිහා බලලා හිනාවුණා.. මෙ අයියගෙ මනමාල හිනාව යකෝ.. මාමා කාමරේට ඇදලා ගත්තෙ-

" අයියෙ කෝ රධ්‍ය අයියා.."

" අන්න මාමා එක්ක කාමරේ.. තාම තරහද දෙන්නා.."

" නෑ අනේ.. තරහ නෙමෙ.. එයා මගේ ෆෝන් එක උස්සන් ගියා.. ඒකයි.."

" ආ මම දැක්කා ඔයාලා නටන විඩියෝ එකක් බල බල යනවා.. මටත් පෙන්නුවා.."

@Shan

" සැක් අයියෙ.. මේකා ගම කනවා.. අම්මටත් පෙන්නුවද දන්නෑ.. මොන මගුලක් කරවද මන්දා.."

මම ගස්සගෙන දමාගෙන මාමගෙ කාමරේට මූණ දාලා බැලුවහම රධ්‍ය අයියා මාමගෙ කාමරේ ඇඳේ හරහට දපලා ෆෝන් එකේ මොනවද බලනවා.. මම ගිහින් රධ්‍ය අයියට කකුල් එකක් ගැහුවා.. ඒකා මම දිහා බලලා ආයෙම ෆෝන් එක දිහා බලාගත්තා.. මාමා ලැප් එක දිග ඇරගෙන ඒකෙ වැඩක්..

" මොනවද බලන්නෙ.."

" අර නංගි ග්‍රෲප් එකක් හදලද.."

" ඕ බලනවකො ඒකෙ නම.."

" උඹටයි යාළුවොන්ටයි සේරම ට්‍රැක්නෙ.."

" අනේ මේ.."

මමත් රධ්‍ය අයියා ගාවින් ඇලවෙලා ෆෝන් එකට එබුණා.. මුන් ටික වැට් කරනවා කරනවා ඉවරයක් නෑ.. ඒ සැරේ චිත්තායුක තෛලයට පෝස්ටරේකුත් හදලා.. අයුක අයියා බැට් එකක් උඩට උස්සගෙන බිග්මැච් එකේදි ගහපු ෆොටෝ එකක්... තෛලෙ දාපු බොතලේට සෙනුකයා කට ඇරගෙන නිදාගෙන ඉන්න ෆොටෝවකට වටේට මල් ගහලා.. මහීශා තමා ඔච්චා කරන්නෙ.. තනිකඩ පගයා..

" කියාන්ශා මදන මෝදක ගුලි.. සැක් අයියෙ.. මොනෞත්තක්ද.."

" මොනවද බං උඹලා ඔය කියවන්නෙ.."

මාමා වැඩ කරන ගමන් අපි දිහා බලලා ආයෙම ලැප් එක දිහා බලාගත්තා..

" මේ යාළුවො ඉන්න ග්‍රෲප් එකක එකක් මාමෙ.."

" ම්ම්.."

" මාමා මොකක්ද ඔය කරන්නෙ.."

@Shan

" radiograph එකක් බලනවා.."

" එක්ස් රේ එකක්ද.."

" ම්ම්."

" මාමට කටවල් බලලා එපාවෙන්නැද්ද අනේ.."

" එපා කියලා ජොබ් එක දාලා ගෙදර නවතින්නයැ.. කරන්න වෙනවා පෙන්ශන් යනකල්ම.."

" ආඪ්‍ය අයියාටද වැඩ වැඩි මාමලාටද.."

" දෙකම එකයි බං.. අපිට නයිට් නෑ හැබැයි .. කැම්ප් එකේ ඩියුටි ඇරෙන්න.. සාකිට ඔන්කෝල් නයිට් සෙට් වෙනවනෙ."

" දුකයිද.."

" මොකක්ද.."

" නෑ නෑ අනේ.. මොකුත් නෑ..මම කිව්වෙ රඪ්‍ය අයියට.. අපේ ගෲප් එක ගැන.. නේ රඪ්‍ය අයියෙ.."

" ම්ම්.."

මම අපේ ගෲප්චැට් එක දිහාම බලාගෙන හිටියා.. උන් හෙනාතල් එකක් ගන්නවා ඒකෙ.. එක එක නිශ්පාදන එළියට දාලා.. ඒ අස්සෙ සෙනුකයා බඩත් වෙලාලු.. අයුක අයියට ඔස්ට්‍රේලියාවෙන් ඇපල් ගෙනැල්ලා දෙන්නලු.. රඪ්‍ය අයියා හොඳට මම වගේ මගේ ෆෝන් එකෙන් චැට් කරනවා.. මම පැත්තෙන් ඉඳගෙන ටයිප් කරන්න අදහස් සැපෙව්වා.. ගෙදර ඉස්සරහා කැල්ලට යන්න බෑ දකින දකින එක්කෙනාට හිනාවෙන්න තියෙන නිසා.. අනික අම්මගෙ යාලුවො දැක්කොත් මාව කම්මුලෙනුයි අතෙනුයි කකුලෙනුයි ඇදලා අංග වේදනය කරන්න හදනවා..මට දැනි දැනි අමාරුවෙ වැටෙන්න ඕන නෑ.. ආ තව අර පෙට්ටි කිකිළිගෙන් මැඵ ඉශාක්‍ය අයියව බේරගන්න ඕන..

අපි පැය බාගයක් විතර කාමරේ ඉද්දි ටිකකින් ආඪ්‍ය අයියා දොර ඇරගෙන කාමරේට ආවා.. එතකොට තමා මම දැක්කෙ මාමැ මේසෙ උඩ තියලා

@Shan

තිබ්බ පොඩි අයිෆල් ටවර් ස්ට්‍රැචූ එක නෑ කියලා.. මාමා ඕක මම දන්න කියන කාලෙ ඉඳලා තියාගෙන ඉන්නවා මම දැකලා තියෙනවා.. එකපාරම ඒකට මොකක්ද දන්නෑ වුණේ..

" ළමයි කන්න එන්න.. දැන් වෙලාව කීයද.."

ආධ්‍ය අයියට ඒත් කවුරුත් උත්තර දුන්නෙ නෑ..

" චූටි.. එන්න.. පොඩී.. මෙහෙ එන්නකො අනේ.. ඕක පැත්තකින් තියලා.. බඩගිනි නැද්ද.."

" අනූ!!!"

" කියන්නෝ~"

" කන්න එනවා.."

" සුදුහාමිනේට කේන්ති ගිහිල්ලද.."

" ඔය දෙන්නා එන්න කන්න.."

මාමා කණ්ණාඩිදෙක ගලවලා පැත්තකින් තියලා ආධ්‍ය අයියා පැත්තට හැරුණා.. මමයි රධ්‍ය අයියයි ශේප් එකේ ෆෝන් එකට මුවා වෙලා ඒ දෙන්නගෙ ප්‍රේම ජවනිකාව දිහා බලාගෙන හිටියේ..

" ඇයි යකෝ.. මටත් බඩගිනී.. උන් දෙන්නා විතරද කන්නෙ.."

" අත පය තියෙන්නෙ.. බෙදාගෙන්න කන්න බැරිද.."

" මොකද බං උදේ පාන්දර ඉඳලා බෙරිහන් දෙන්නෙ.."

" මොකුත් නෑ.. මේ පොඩී ෆෝන් එක තියලා එන්න.."

" මොකද අයියෙ තරහ ගිහින් වගේ.."

මම මේ සැරේ ආධ්‍ය අයියගෙ සාම දූතයා වෙන්න හිතාගෙනමගේ කටහඬ අවදි කලා.. අන්යෝන්‍ය උපකාරය වැදගත්නෙ මොකක් වුණත්.. මම ආදරේ මගේ මස්සිනානෙ..

@Shan

" එහෙම නෑ චූටි.."

" මෙන්න මේකට පැහැදිලි කල්ලා දීපන් පුළුවන් නම් මම සිගරට් බොන්නෙ නෑ කියලා.."

" ඔව් ඒකතමා.. මාමා සිගරට් බොන්නෑ අයියෙ.. බීඩි බොන්නෙ.. නේද.."

රධ්‍ය අයියා ඒ සැරේ මට කකුලෙන් එකක් ගැහුවා..

" සුදුමහත්තයා උඹට ගහනවා මම.."

" ඇත්තද චූටි.."

ආධ්‍ය අයියා ඒ සැරේනම් කතාකලේ අඩන්න ඔන්න මෙන්න..

" බොරු බොරු හලෝ.. මොන බීඩිද.. මාමා දුසිරිතෙන් තොරයි දැන්.. සුදුහාමිනේ කේස්නෙ.."

" එහෙනම් අල්මාරියෙ තිබිලා මට හම්බුණේ.. ඒක මොකක්ද.."

" ඒක හද්දා පරණ මගුලක් සාකි.. දැන් උඹට දිවුරලා දිවුරලා මට දිවුරන්න එකකුත් මතක් වෙන්නෑ.. උඹලගෙ අප්පච්චි පල්ලා බිව්වෙ නෑ.."

ආ ඒකනම් හැබැයි සලකා බලන්න ඕන දිව්රිල්ලක්.. ඇත්තටම මේකා බිව්වද දන්නෙත් නෑ..

" ඔව් ඔව් අයියෙ.. මමත් ඔන්නම් දිවුරන්නද මාමා සිගරට් බිව්වෙ නෑ කියලා.."

" චූටි!!"

" කරපිංචා කොළ ටිකක් ඔතලා අදින්න අනේ.. ඇඟටත් ගුණයි කියලා හිතලා.."

ඒ සැරේ රධ්‍ය අයියට බකස් ගාලා හිනා ගියා..

" අයියෙ.. ඒ කාලෙ මනමාලියො හෙප්පුව මනමාලයට දීලා වඳිනවනෙ.. අයියා ඇයි මාමට හෙප්පුවෙන් ගැහුවෙ.."

@Shan

" පොඩී ඕක නවත්තගන්න..!!"

" නෑ ඉතින් රධ්‍ය අයියා ඇත්තනෙ කිව්වෙ.. හෙප්පුව පියාඹලා යැව්වෙ.. හෙල කුල සිරිත වෙනස් වෙලා.."

" අනේ අනුරාග් මොකක්වත් නැද්ද මුන් දෙන්නට මට ගහන්න.."

මම හිමින් සැරේ නැගිටලා කාමරේ දොර ගාවට ගියාම රධ්‍ය අයියත් ෆෝන් එක පැත්තකින් තියලා එළියට ගියා..

" මොකකින්වත් ගහන්න ඕන නෑ අයියෙ.. අපි යන්නම්.. නෙහ්.."

" වරද්ලගෙ මාමෙ.."

" කරපිංචා නැද්ද.."

" උඹලා දෙන්නා මගෙන් කනවා දැන් සුදුමහත්තයා!!!!!"

මෙක බෝනස් එකක් දළඹුවනෙ.. හැමදාම ඉල්ලනෝ මෙ කලවැම්දට දෙන්න වෙලාවක් නැනෙ.. ආයෙ හෙට උදේ තමා එකක් දෙම්නෙ.. හරිත..

එන්නාම්.. ලව් යූ.. ❤

අධිකාරි සහ පුත්‍රයෝ😂😂

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම් යම් කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම**

@Shan

කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 120 කොටස

" මේ ඇඩුවොත් එහෙම අර අතන ඉන්න අයියට කන්න දානවා හරී.."

" මොනවද වරද් ඔය ළමයට කියන්නෙ.."

" අන්න ඒ අයියා කන්නයි එන්නෙ.. පේනවද ලොකු පස්සක් තියෙනව තඩි රාස්සයෙක්.."

" හැබැයි වරද්.."

" ඔන්න දැන් ඒ රාස්සයා ඔයා ගාවට.. ඇවිදගෙන ඇවිදගෙන ඇවිදගෙන ඇවිදගෙන.."

" වරද්!!!!!"

" ඇවිදගෙන ඇවිදගෙන ඇවිදගෙන.."

" ඕක නවත්තපන්..!!"

" ඇවිදගෙන ඇවිදගෙන ඇවිත්.."

" වරද්..!!"

" බුහහහහහහහා කෑලි කෑලි වලට හපලා කනවා හග් හග් හග් හා.."

එකපාරම මගේ අතේ ඉඳන් මගේ මූණ දිහා කන්න වගේ බලාගෙන හිටපු පොඩි එකා බෝල ඇස් දෙකේ කඳුලු පොදියක් විතර පුරෝගෙන මහා හයියෙන් බෑහිරි හගලා අඩන්න පටන් ගත්තා.. රධ්‍ය අයියා මගේ පස්සට පයින් පාරක් ගැහුවා..

" ඇඇඇඇඇඇඇඇඇඇඇ මම්මී මම්මී මම්මීඇඇ.."

" ඒ අයියෙ මෙන්න මේකා අඩනවනෙ.."

" ඔය ළමයව මෙහෙ දීපන් වරද්.."

@Shan

" කලින් මේ ළමයව බිම දාලා වට්ටන්න ගියා නේද.. බෑ බෑ දෙන්නෙ නෑ.."

" ඇඇඇඇඇ මම්මී.."

" චප් කටවහන් ඉන්නවකො පොඩි එකෝ.. අපි ඔය කාලෙ ඇඩුවෙ අම්මගෙන් කුක්කු බොන්න විතරයි.. සැක්.. මේ දැන් හැදෙන පොඩි උන් නම්.."

" ළමයව ඇඳෙන් තියන්න.."

" බෑ බෑ මේ ඇඳේ වූ දැම්මොත් එහෙම.. අපි දෙන්නා නිදාගන්නෙ මාමලා එක්කද.. අනික එයාලා රෑට තරු-"

" වරද්!!!"

" ඇඇඇඇඇඇඇඇඇ.."

" කන් අඩියත් පැලෙනවා මෙකිගෙ සද්දෙට.. සහන්කාරයගෙ නංගි බබා අඬන්නෙපා.. ඇඩුවොත් මම ඔයාව ගිහින් අර වෙල මැද්දට අතෑරලා එනවා හොදේ.."

" ඇඇ මම්මී.. මම්මී ඕනී.. මම්මී.."

" මම්මි ගියා ගල් අරඹෙ ඇතින්නි බලලා එන්න.. ඔයා දන්නවද නංගි ගල් අරඹෙ ඇතින්නිව.."

" හඟ්.. හඟ්.. මම්මී.. මම්මී.."

" පොඩ්ඩක් කට වහන් අහන්නකො මම ඔයාට ඇතින්නියෙක් ගැන නෙමෙ දේව් අනුරාග් කියලා ඇතෙක් ගැන කියලා දෙන්නද."

" ඇඇඇ..."

" ඔන්න නංගී ඒ ඇතාගෙ නැට්ටෙ එල්ලිලා ගියාලු ගමරාළ කෙනෙක් ආඩ්‍ය සදිල් ඉසාක්‍ය කියලා.."

" මොනවද බං ඔය කියවන්නෙ.. ඔය ළමයව මෙහෙ දෙනවකො.."

@Shan

" මේ ඉන්නෙ නංගී ඇත්ගොව්වා.. රඩ්‍ය සනව් හෙලාක්ස.. මම තමා මහාධිකාරම් වරද් සනෙරු උද්යෝග.. දන්නවද.. නැනෙ.. ඔව්වා ඉතිහාසෙට තියෙනවා.."

" මම්.. මම්.. මම්මී.."

" මම ඔයාට සිංදුවක් කියන්නද නංගි.."

රඩ්‍ය අයියා මං දිහා සසර කලකිරිලා වගේ බලාගෙන ඉඳලා ඇඳෙන් නැගිටලා ඇවිත් මගේ අතේ හිටපු සහන්ගෙ නංගිව වඩාගත්තා.. ඒ පොඩි එකාට තාම අවුරුද්දක් විතර ඇති.. අවුරුදු එකහමාරක්ද දන්නෑ.. හරිම පොඩී.. ඔලුවෙ මලකුත් ගහගෙන රෝසපාට මෙස් දෙකකුයි ලස්සන ගවුමකුයි ඇඳගෙන අයියයි අම්මයි එක්ක අපේ දානෙ ගෙදර ඇවිත් දවල් හොඳට මගේ ඇඳේ නිදාගෙන හිටියා.. දැන් හවස ඇහැරිලා අම්මගෙන් කිරි බීලා මටයි රඩ්‍ය අයියටයි බේබිසිටින් දාලා නංගිගෙ අම්මා අපේ අම්මලා එක්ක කයිය ගහනවා.. සහන් එළියේ ටෙන්ට් වගයක් ගලවන්න උදව් වෙනවා..

හවස් වෙලා නිසා ගෙදර අරගෙ මෙගේ අස් කරන්න අරගෙන.. ඒකටත් අඳුරන කට්ටියක් උදවු වෙන්න නැවතිලා තිබ්බා.. මේ ගෙදර කිසි වෙනසක් නැතුව තියෙන්නෙ මගෙ කාමරෙයි අපේ අම්මගෙ කාමරෙයි මාමගෙ කාමරෙයි විතරයි.. අනිත් ඒවා බඩු පුරවලා විනාසකාරී විදියට අවුල් වෙලා තියෙන්නෙ.. අනික අර ලොකුඅම්මගෙ පුත්තුදෙන්නා උන් දෙන්නා කොයිවෙලෙත් ෆෝන් වල එල්ලීගෙන බැනගන්නවා ගේම් ගහනවා.. පක් ගානවා.. කමෝන් ගානවා.. ඒවා දිහා බලන් හිටියහම මගේ ඔලුව විකාරවෙලා යනවා..

" ඒ අයියෙ මේ වට්ටන්නෙපා හොඳේ.. ඔයා මේ ලමයව වඩාගත්තම විහව ශක්තියත් වැඩී හෙනකඳයා වගේ උසට උසේ.."

" ඉන්නවකො පොඩ්ඩක්.."

රඩ්‍ය අයියා පොඩි කෙල්ලගෙ අත් දෙක යටින් උස්සලා අරගෙන පපුවෙන් තියාගත්තා.. ඒ එක්කම ඒ කෙල්ල දෙගුණයක් විතර අඩන එක වැඩිකල්ලා දුන්න වගේ පිටිපස්සට නැමෙන්න ගියා විතරයි මම පැනලා ඒ කෙල්ලගෙ පිට මැද්දෙන් අල්ලගත්තා.. මෙකි යකෝ.. නංගි බබා දන්නෑ මේ අයියලා

@Shan

දෙන්නට කියලා වඩවගන්න කොච්චර කෙල්ලො බලන් ඉන්නවද කියලා..දන්නවනම් ඔහොම අඬන්නෙත් නෑ.. වාසනාව නෑ පුතේ ඔයාට..

" මෙයාගෙ අම්මා කෝ වරද්.. එන්න කියමුද.."

" මෙච්චර අඬනවා ඇහෙන්නෙ නැද්ද මන්දා.. මම කතාකරන්නද.."

" එයාට බඩගිනි වෙලාද කොහෙද.."

" ඉතින් දැන් ටිකකට කලින් එයාගෙ අම්මා කිරි දුන්නෙ.."

" කියාරත් පොඩිකාලෙ විනාඩි පහෙන් පහට කිරි බොනවා.. මෙයත් එහෙමද දන්නෑ.."

" ඒ බල්ලොනෙ අයියෙ.. ඒ..හ් මොනවා කියනවද මන්දා.."

" බල්ලො නෙමෙයි!!.."

" නෑ අනේ ඔයාගෙ ප්‍රින්සස්.. සොරි සොරි.. ඒ ඔයාගෙ ප්‍රින්සස් එහෙම වුණාට මෙයාලා මනුස්සයොනෙ.. සංයුක්ත ගණිතය කල්ලා මොලේ කරවෙලා තවුසෙගෙ.."

" ඇඇඇඇඇඇ මම.. මම.. මමමීහ්හ්.."

" හප්.. අනේ නංගී මේ පොඩ්ඩක් කට වහගන්නකො අපිට මහන්සී බං.. රෙද්ද.."

මට මලපැනලා ගිහින් ඇඳෙන් වාඩිවුණා.. පුළුවන් එකෙක්ට එපෑ ළමයි බලාගන්න දෙන්න.. අපිට පුළුවන්ද ළමයි බලාගන්න.. ඔන්න කිරි සිහින දැක දැක ඉන්න උන් දෙන්නෙක් ඉන්නවා අපේ ගෙදරම.. උන් දෙන්නට එපෑ බලාගන්න දෙන්න.. අපිට මේ විනාඩි පහට මෙහෙම දැනෙනවනම් මේ කෙල්ලැ අම්මට කොහොම ඇත්ද දන්නෙනෑ.. රධ්‍ය අයියා අත් දෙකින්ම ළමයව බදාගෙන පිටටත් අතක් තියාගෙන ඒ කෙල්ලව අරගෙන කාමරේ පුරාම ඇවිදින්න ගත්තා.. මම ඒ දිහා බලන්නැතුව ඔලුව රිදෙන නිසා වහල දිහා බලාගෙන හිටියා.. පොඩි උන් නම් ඔන්නෑ.. බල්ලො දෙන්නෙක් ගන්නවා හදාගන්න.. අර මගෙ කියාරා බබා වගේ.. කොච්චර

@Shan

හොඳද.. ඔය ඉඳලා හිටලා මම කියවද්දි කටට අණ්ඩක් තිබ්බට.. ඒ පෙට්ටි කිකිළිත් හොඳයි..

" කවුද මේ අඩන්නේ~.."

එකපාරම..

එකපාරම මහා එළියක් එක්ක වඩින දිව්‍ය කුමාරයෙක් වගේ ආධ්‍ය අයියා කාමරේ දොර රෙද්ද මෙහාට කරගෙන මගේ කාමරේට මූණ දැම්මා.. ආධ්‍ය අයියා මූණ හෝදලා කොණ්ඩෙ ඉස්සරහ ටික පිටිපස්සට කල්ලා ලාවට වෝටර් බෑන්ඩ් එකකින් බැඳලා තිබ්බෙ.. එයාගෙ කොණ්ඩෙ කොහොමත් බෙල්ල ගාවට වෙන්න අමුතු වුල්ෆ් කට් එකක් කපලා තියෙන නිසා එහෙම වෝටර් බෑන්ඩ් එකක් දැම්මහම මාර ලස්සනයි.. එයා ඔච්චා කරන්නෙ නැනෙ සාමාන්යෙන්.. කොණ්ඩෙම මූණට දාගෙන කණ්ණාඩි දෙකකිනුත් ඇස් වහගෙනනෙ ඉන්නෙ.. කොහොමත් මේ දවස්වල අයියා හැඩට ඉන්නවා.. මට පෙරේදා කිව්වෙ ටැටූ එකකුත් ගහන්න හිතාගෙන ඉන්නවා කියලා..

අපේ මාමා නම් කැමතී අයියා ටැටූ එකක් කරනවනම්.. එයා ආස beauty bone එක ගාවින් සන්ෆ්ලවර් ටැටූ එකක් කරනවලු.. ඒකෙන් සිම්බලයිස් වෙන්නෙ

**happiness, loyalty, adoration, and vitality**

වගේ පොසිටිව් දේවල් ලු.. අයියා කියන්නෙ ටැටූ එකක් කරනවනම් ඒකට හොඳ තේරුමක් තියෙන්න ඕන කියලා.. අප්පච්චි ඒත් කැමති නැහැල්ලුනෙ ටැටූ කරනවට.. හැබැයි ළඟදි ඉඳලා ටික ටික ආධ්‍ය අයියා අප්පච්චිගෙ කන්ට්‍රෝල් එකෙන් ගිලිහෙනවා කියලා මට දැනෙනවා.. අප්පච්චි එපා කියලා දෙයක් කිව්වොත් ඒකම කරනවා.. කල්ලා බැනුම් අහන්න ගෙදර ඉන්නෙ නැනෙ.. බනින්නවත් දැන් අප්පච්චිට ළමයි දෙන්නා හොයාගන්නවත් නෑ.. අම්මා ඔක්කොම දැනගෙනත් එයාලට කැමති දෙයක් කරන්න ඉඩ දෙනවා.. අම්මා මාත් එක්ක කිව්වෙ එයාලා දැන් පාලනය වෙන වයසක නෙමෙයිලු ඉන්නෙ.. හොඳ නරක තේරෙනව වයස්වල නිසා කැමති දෙයක් කලාට කමක් නැහැල්ලු.. ආධ්‍ය අයියා ටැටූ එකක් කරනවනම් අම්මත් එකක් කිරනවා කිව්වෙ..

මරු නැන්දම්මා..

@Shan

" හොඳ දෙන්නටනෙ ළමයි බලාගන්න දීලා තියෙන්නෙ.."

ආධ්‍ය අයියා අතේ තියන වතුර ටික ශර්ට් එකේ පිහාගෙන සහන්ගෙ නංගිව ගානට උස්සලා ආගෙන වඩාගෙන පිටට දෙකතුනක් තට්ටු කල්ලා කම්මුලට හාද්දක් දුන්නා.. ඉරිසියයිත් වගේ දැන්නම්.. කම්මුලට එහෙම හාදු දෙන්න ඕන නෑනෙ ඉතින්.. රධ්‍ය අයියත් මූණ හට්ටියක් කරන් ඇවිත් මං ගාවින් ඉඳගත්තා..

" ඇයි අනේ මෙ අඩන්නෙ.. මෙ අයියලා ඔයාට වද දුන්නා නේ.."

" මම්මී.. මම්මී.."

" මම ඔයාට බඩ්ඩක් පෙන්නන්නද.. මම්මි වැඩක්නෙ පුතේ.."

" මම්.. මී.."

ආධ්‍ය අයියා සහන්ගෙ නංගිව උඩට කල්ලා උස්සලා එකසැරයක් උඩ දැම්මහම ඒ කෙල්ල එකපාර අඩ අඩ ඉඳලා මහා හයියෙන් හිනාවෙන්න ගත්තා.. ආධ්‍ය අයියා ආයෙම සැරයක් ඒ කෙල්ලව උඩදාලා බොහ් ගාලා බිමට අතෑරෙන්න දාලා අල්ලගත්තා.. අයියට හොඳට ළමයි නළවලා පුරුදුයි වගේ..

" අයියා කොහොමද ළමයි නළවන්න දන්නෙ.. මාරයිනෙ.."

" බේබිසිට්න් තමා.. මගේ යාළුවො සේරටම ලොකු ළමයි ඉන්නවනෙ.."

" මෙ අයියෙ.. ඔයාලා ළමයෙක් හදාගෙන මට මල්ලි කෙනෙකුයි රධ්‍ය අයියට පුතෙකුයි ගේන්නකො.. එක්කෙනෙක් නැත්නම් දෙන්නෙක් වුණත් අවුලක් නෑ.. ඕන්නම් ෆුට්බෝට් ටීම් එකක්ම ගේන්න.."

ආධ්‍ය අයියා නංගිව දෙපැත්තට පද්ද පද්ද ඉඳලා එකසැරේට බයවෙලා වගේ අපි දෙන්නා දිහා බලලා බෙල්ලෙ ඉඳන් රතු කරගත්තා..

" බලමුකො ඉතින්.."

රධ්‍ය අයියා මං දිහා බලලා ලාවට නහය කසාගෙන හෙන අමුතු හිනාවක් දැම්මහම මාත් රධ්‍ය අයියට ඇහැක් ගැහුවා.. හෙන ශෝක් මෙ ලව් එක දිහා බලාගෙන ඉන්න එක..

@Shan

" අවුරුද්දට මොකද කරන්නෙ පොඩී.."

" මට ගෙදර යන්න බෑ.. මම යන්නෙ නෑ.."

" එහෙම බැනෙ.. ගෙදර යමු.. චූටිටත් ක්ලබ් එකේ වැඩ තියෙනවා.. ඉස්කෝලෙ වැඩ තියනවා..මාත් හොස්පිට්ල් යන්න ඕනනෙ.. අනික ඔයාගෙ වැඩ වගේකුත් කරගන්න තියෙනවා.. අවුරුද්දට ගෙදර ඉන්නැතුව බැනෙ.."

" හරිනම් මම හෙට යන්න ඕන ආයෙම කැම්ප් එකට.."

ආඪ්‍ය අයියා නංගිබබාවත් වඩාගෙන ඇවිත් අපි ඉස්සරහා පුටුවෙන් වාඩිවුණා.. ඒ පොඩි එකා ආඪ්‍ය අයියගෙ දෙපැත්තට වැනෙන පෝනිටේල් එකත් එක්ක සෙල්ලම් කරනවා..

" කැම්ප් යන්න ඕන නෑ.. අම්මත් මාත් එක්ක කිව්වෙ ඔය ගමන යන්න දෙන්න එපා කියලා.."

" ඒ වුණාට ඒකෙන් එහෙම අයින් වෙන්න බෑ.. ලීවින් එක ගන්න අමාරුයි.."

" අමාරු වුණාට අපි ගමුකො.. අරගෙන අපිට මෙහෙ කැම්පස් එකකට ඇප්ලයි කරන්නත් බෑ.. පළවෙනි සෙම් එක ඉවරනෙ.. ශිට් අපි මෝඩ වුණා.. අප්පච්චිට කේ ඩී යූ වැඩේට ඕන බම්බුවක් ගහගන්න කියලා කැම්පස් පොත පුරවලා යවන්න තිබ්බෙ.."

" දැන් වෙච්ච දේ වුණානෙ.."

" වුණානෙ කියන්නෙ.. මම හැමදාම මොකකින් හරි වැඩේ අවුල් කරගන්නවා.. මට මාර පසුතැවීමක් තියෙන්නෙ.. ඒ දවස්වල තිබ්බ ප්‍රශ්න එක්ක මේ වැඩේ හරියට කරගන්න වුණේ නැනෙ.."

" දැන් මොකද අයියෙ කරන්නෙ.."

ආඪ්‍ය අයියා ටිකක් වෙලා කල්පනා කලා.. මෙ අප්පච්චි නිසා රඪ්‍ය අයියගෙ කැම්පස් ගමනත් මහා විකාරයක් වෙලා.. අප්‍රේලුත් ඇවිත් තාම මොකුත් කල්ලත් නෑ.. රඪ්‍ය අයියා ශිශ්‍යත්වෙ ෆේල් වුණාට ඕ ලෙවෙල් වලට ඒ

@Shan

දහයකුයි ඒ ලෙවෙල් වලට ඒ තුනකුයි රන්ක් එකකුයි තියෙන මනුස්සයෙක්නෙ.. ඕ ලෙවෙල් වලට රධ්‍ය අයියට ඒ දහයක් තියෙනවා.. මට වැරදුනේ නෑ.. ඒකා දෙවෙනි පාර ටැමිල් කල්ලා ඒකත් පාස් වුණා.. ඒ අයියටයි මල්ලිටයි මොකක් වුණත් සුපිරි මොළ දෙකක්නම් තියෙනවා..

" අපි බලමු චූටි.. ඉස්සෙලම කොළඹ ගිහින් ඉන්න ඕන.. අනුරාග් කිව්වා ලිවින් එක ගන්න විදියක්.. මේ මාස ටිකට පොඩීගෙ ට්‍රේනින් පීරියඩ් එකට ජේ කල්ලා ඒ වැඩ ටික ඉවර කරගෙන.. ඊටපස්සෙ ඉලෙක්ට්‍රිකල් වලට හොඳ කැම්පස් එකක් බලමු.. මන්දා අනේ.. අප්පච්චි දැන් හෙට ඉඳන් පටන්ගනී කෑගහන්න පොඩීව එව්වෙ නෑ කියලා..මටනෙ හැම එකටම බනින්නෙ.. දැන් මම තමා පොඩීවත් නරක් කල්ලා තියෙන්නෙ.."

" ඔය මිනිහා ගැන කතාකරන්න එපා.. මට ඕකයි යන්න බැරි ගෙදර.."

" නෙතු ඊයේ මෙහෙට කතාකල්ලා අනුරාග් ෆෝන් එක ආන්සර් කල්ලා තියෙන්නෙ.. දැන් මගෙන් වද දිදී අහනවා ඒ කවුද කියලා.. මම හිතන්නෙ එයාට මොකක් හරි තේරිලා වගේ ඉන්නෙ.."

" නෙතු කිව්වෙ අර ගෑණිද.."

" ම්ම්.."

" සැක් රධ්‍ය අයියට ඕන අනේ නෑනෙක් නෙමේ දත් දොස්තර මස්සිනෙක්.. ඉතින් ඒ මල සමයම මොකක්ද කියන්නෙ දැන්.."

" කොළඹ එන්නලු.. මට හිතෙන්නෙ නෙතු කන්න තමා යන්නෙ.."

" ඒ කාගෙන්ද ඒ.."

" ඔයාගෙ බෝයිෆ්‍රෙන්ඩ්ගෙන් තමා.. වෙන කාගෙන්ද.. පොඩී බල්ලො දෙන්නවත් ලිහලා තියාව් ගෙදරට එද්දි.. මම දන්නවනෙ හැටි මෙයාගෙ.."

රධ්‍ය අයියා ලාවට හිනාවුණා..

" එයාලා විතරක් නෙමේ අනේ ඕන්නම් මම තඩි සර්පයො දෙන්නෙකුත් අල්ලලා දෙන්නම් දොරකොඩින් ගෙනැල්ලා තියන්න.. ආවම දෂ්ට කරන්න.. කරලා මැරිලා යන්න.."

@Shan

" ඒක හොඳයි.. දෙන්නකො එහෙනම්.."

ආඪ්‍ය අයියා උකුලෙන් දඟලලා දඟලලා වැටෙන්න යන සහන්ගෙ නංගිව උස්සලා ආයෙම හරියට උකුලෙන් වාඩිකරගත්තා..

" වරද් රිසාල්ට්ස් එන්නෙ කවද්ද.."

" අපේ නම් තව මාස දෙකකින් එනවා කියලා කිව්වෙ.. කල් යයිද දන්නෙ නෑ.. බයයිත් වගේ මතක් කරද්දි.."

" මොකටද ඒ.."

" බයයි ඉතින්.. කොහොම රිසාල්ට් එකක් ඒවිද දන්නෙ නැනෙ.."

" ඒ වුණාට චූටි හොඳට වැඩ කලානෙ.. මෙඩිකල් කොලේජ් තමා.. කොළඹ එකට යන්න හරිද.. පේරාදෙණියෙ යන්න එපා.."

" ඒ මොකද අනේ ඒ.."

" කොළඹ හොඳයි.. මගෙත් කැම්පස් එකනෙ.. මේ පොඩී.. කොහොමද මෙකා නිල් පාට කිට් එක ඇඳලා ස්ටෙත් එකත් දාගෙන යද්දි.. මමනම් බලාගෙන ඉන්නෙ චූටි කැම්පස් යනකල්.."

" මට ඔහොම කැත විදියට බලාපොරොත්තු දෙන්නෙපා අයියෙ.. කවුද දන්නෙ මාමා වගේ දත් දොස්තර කෙනෙක් වගේ වෙන්න වුණොත් එහෙම.. පේරාදෙණියෙ යන්න වෙනවනෙ.."

" පේරාදෙණිය.. අර ඔයාගෙ මාමගෙ ප්‍රථම ප්‍රේමය එහේදිලු නේ හම්බුණේ.."

ආඪ්‍ය අයියගෙ මූණෙන් අපිට ඉරිසියාව එක්ක නැගුනු හිනාවක් හොඳට දිස්වෙමින් තිබුණා.. ඉතින් හත්දෙයියනේ අපේ මාමා කැම්පස් යද්දි අයියා හත වසරෙ වගේනෙ..

" ඔව් ඔව්.. ඒ කෙල්ල මාමට සපත්තුව තියලා මාරු වුණානෙ.."

" එහෙමත් කල්ලද අර මෙසෙ උඩ සිහිවටන තියාගෙන ඉන්නෙ.. අර අයිෆල් ටවර් එකක්.."

@Shan

" හැ සිරාවට ඒ කෙල්ල දීපු එකක්ද අයියෙ.. මම ඒක මෙ පාර දැක්කෙ නැනෙ.."

" මම ඒක වෙලට විසික් කලා.."

ආඪ්‍ය අයියා කේන්ති ගිහිල්ලා ඇහිබැමත් අකුලගෙන ජනේලෙ දිහා බලාගත්තා.. ආඪ්‍ය අයියා අපිට සුරදූතයා වුණාට මාමට මරදූතයාද මන්දා.. ඕකතමයි කියන්නෙ ලෝකෙට පරකාසේ ගෙදරට මරගාතේ කියලා.. මෙකා යකෝ අතට අහු වෙන හැම එකම අල්ලලා විසික් කරනවනෙ.. මුලින් ජ්ලාස්ක් එකක් විසික් කල්ලා මාමට ගැහුවා.. ඊයෙ හෙප්පුව විසික් කලා.. තව සිහිවටනෙකුත් වෙලට විසික් කල්ලා.. හිටිගමන් මාමට ලූණුගෙඩි වලින් විසික් කල්ලා ගහනවා.. මටත් ඇඳු ගොඩක් විසික් කල්ලා ගැහුවනෙ.. ආඪ්‍ය අයියව ඇත්ලටික් කරන්න යවන්න ඕන අපේ ඉස්කෝලෙ ඇත්ලටික් ක්ලබ් එකට.. අපරාදෙ.. පට් එක දාන්න, ජැවලින් එක දාන්න යන්න තිබ්බෙ.. එහෙම වුණානම් ඇතීනා එක ඇතල්ටින් වලින් හරි එක වෙනවනෙ.. ඒ වුණාට කාටවත් ඇෆ්‍රොඩයිට් එකත් එක්ක හැරෙන්නවත් බෑ ඉතින්.. මම ඒක නිකම් කිව්වෙ..

" ඒකනෙ.. අපි එතනින් අයියගෙ ෆොටෝ එකක් තියමු.. මොකද කියන්නෙ කර-"

" චූටි!!!"

" හරි නෑ මම නිකම් කිව්වෙ.. ඒ කෙල්ලගෙ වෙඩිමටත් අපේ මාමා ගියානෙ.."

" පිස්සු.. හිතාගෙන ඉන්න ඇති අන්තිම මොහොතෙ කෙල්ල පෝරුවෙන් බැහැලා ඇවිත් එයාව කසාද බඳී කියලා.. ඒකනෙමෙ.. ලොකු නෑනා අද රෑම යන්නලු නේද.."

" එහෙමද.. අනේ වාසනාවන්.. අපිට නිදහසේ ඉන්න පුලුවන් අම්මයි ආච්චියි එක්ක.. හෙට අපි ගමනක් යන්නයි ඉන්නෙ.. නෙහ් ඒයි.."

මම රඪ්‍ය අයියට වැලමිටින් ඇන්නහම එයා අර නංගිගෙ කකුලක් අල්ල අල්ල ඉඳලා එකසැරේ මං දිහා බැලුවා..

" මම.."

@Shan

" ඒ කොහෙද ඒ.. "

" අපි බීච් යනවා හෙට.. අයියත් එනවද.."

" අපි හවස කතරගම යන්න හිටියෙ ආච්චි එක්ක.. කන්ෆර්ම් නෑ ඉතින්.. පුළුවන් වුණොත් යනවා.."

" එහෙමද.. කිරිවෙහෙරෙත් යන්න එහෙනම්.."

" ඒකතමා.. මම හුඟ කාලෙකින් ගිහිල්ලා නෑ කොහේවත්.. කතරගමත් මේ ආවෙ මම දෙවෙනි සැරේට වගේ.."

" අයියා ඉතින් ඉස්කෝලෙ පොකුණෙ ඉබ්බා වගේ ඉන්නෙම හොස්පිට්ල් එක අස්සෙයි ගෙදර කාමරෙයි නෙ.."

" ඔව් වෙනසකටත් එක්ක යන එක හොඳයි.. ඔය දෙන්නනම් ඉතින් හැමවෙලාවෙම ඇවිදින්න යනවනෙ.."

" අපි එහෙම තමා.. තරුණ කපල් වෙනයි, වයස කපල් වෙනයි.. ඔයාලා ගිහින් වැඳලා පුදලා එන්නකො.."

" අනේ මේ එහෙම වයසක් නෑ හරිද.."

" ඔව් ඔව්.. ඒකතමා.. ආදරේට වයස අදාළ නෑනෙ අයියෙ.. අයියලා ඊළඟපාර අටමස්ථානෙ වඳින්න යන්න.."

" චූටි!!"

" ඇයි අනේ.."

" අටමස්ථානෙ නෙමෙ.. අපි අවුරුද්ද අන්තිමෙ අම්මව හම්බවෙන්න යන්න හිතාගෙන ඉන්නෙ.."

එකසැරේ රධ්‍ය අයියා ඇස් දෙකත් ලොකු කරගෙන ආධ්‍ය අයියා දිහා බැලුවා.. ආධ්‍ය අයියා හිනාවෙලා ආයෙම පොඩ්ඩක් රතු වුණා..

" අයියෙ.."

@Shan

" මම.."

" ඔයාලා.. අම්මව හම්බෙන්න යනවද.. ඒ කියන්නෙ.. එහෙ යනවා කිව්වෙ.. ඒ වරද්.. අයියලා බඳින්න යන්නෙ.. ඇත්තටමද ඔය කියන්නෙ.."

ආධ්‍ය අයියා ඇස් වලට වැටිච්ච කොණ්ඩ කැලි ටික පිටිපස්සට කල්ලා හදාගත්තා..

" එහෙම හිතමුකො.. "

" ඈ සිරාවට.. ආධ්‍ය අයියෙ..!!!!!! ඒ ඔය දෙන්නා අපිට කිව්වෙවත් නැනෙ.. බඳින්නද යන්නෙ.. යකෝ!!"

" එහෙම තමයි හිතාගෙන ඉන්නෙ.. බලමුකො.. නදීර කතාකළා ළඟදි.. එයත් වයිෆ් එක්ක එනවා කිව්වා.."

" නදීර කිව්වෙ අයියගෙ ඩෙන්මාක් ඉන්න යාළුවා නේද.."

" ඔව්.. අපි ගියොත් ඔයාලත් යනවා.. චූටිට ඒ කාලෙට රිසාල්ට්ස් අවුට් වෙලා ඉවරනෙ.."

" ඒ රධ්‍ය අයියෙ.. ඔයා මගේ හිච්චි මාමා වෙන්නයි යන්නෙ.. දෙයියනේ.. මගේ පස්ස ලොකු හැපීකවචෝ.."

මම ආධ්‍ය අයියව බදාගන්න බැරි නිසා රධ්‍ය අයියව දෝතින්ම බදාගෙන උරහිසෙන් කැල්ලක් ගැලවිලා යන්නම හපලා කම්මුලට හාද්දක් දුන්නා.. මෙකනම් බොන්න තරම් සතුටු වෙන්න දෙයක් තමා.. අපේ ගෙදරට නාකි වෙච්ච අනුකිච්චයි, ගෙදරට නාකි වෙච්ච සාකිච්චයි බඳිනවා..!!!

" හිච්චි මාමා..??!! ඔහ් චූටියො.."

ආධ්‍ය අයියා අර නංගිබබාවත් වඩාගෙන හෙන හයියෙන් දෙකට තුනට නැමීගෙන හිනාවෙන්න ගත්තා..

" ඔව් ඉතින්.. ඔයාලා කරන වැඩ වලට මට මගේ මනුස්සයා මාමා වුණා.. එක්කො මාමා මගේ අයියා වෙන්නෝන.. නැත්නම් අධිකාරි පුත්තු දෙන්නා මගේ මාමලා වෙන්නෝන.."

@Shan

" මේ වරද්.. අයියා තව ටික දවසකින් අධිකාරි නෙමෙ.. ඔයා තමයි අධිකාරි වෙන්න ඉන්නෙ.."

" ආ ඔව්නෙ.. අම්මෝ චූටියො.."

" මේ ඔයාලා දෙන්නා හිනාවෙන්නෙපා.. මට මලපයිනවා.."

" ඒ.. අයියා එතකොට ගමගේද.."

" වරද්ලගෙ මාමා ගමගේ නේද.. එහෙනම් එහෙම තමා.."

" මිසිස් ගමගේ.. ගෙදර වියදම සැරයි වගේ.."

" ආයෙ එකක් පටන්ගත්තද.. අර මනුස්සයා කියනවා වගේ දෙන්න තියෙන්නෙ පිට පැලෙන්න බොලා දෙන්නට.. හැම එකටම හිනාවෙවී ඉන්නවා.."

" ආයෙ කියන්නකො වරද්.. ඒ කැල්ල මරු.."

" ඒ වගේද අනේ වරද්ලගෙ මාමෙ කරපිංචා නැද්ද එක.."

" චූටි!!!!!!"

රධ්‍ය අයියයි මමයි හිනාවෙලා හිනාවෙලා අන්තිමට රධ්‍ය අයියා අත දිගැරලා මාගේ පිටට පාරක් දුන්නහම මම රධ්‍ය අයියගෙ කොන්දට පයින් පාරක් ගහලා රධ්‍ය අයියා බිම ඇදගෙන වැටුණා.. ඒ වැටිලත් මෙකා ගුලි කාලා වගේ කඳුලු එනකන්ම හිනාවුණා.. ඒකා හිනාවෙන දිහා බලාගෙන මාත් හිනාවෙලා හිනාවෙලා බඩත් අල්ලගෙන ඇඳේ වකුටු වෙලා හාන්සි වුණා.. අර පොඩි එකත් මොකුත් දන්නෙ නැතුව හිනාවෙනවා.. ආධ්‍ය අයියා රතු වෙලා..

" පොඩී.. චූටි.. නවත්තගන්නකො ඕක.."

" හමො.. බුලත් කොලේ.. බුලත්..හික්.. මිසිස් ගමගේ.. බුලත් කොලේ.. ලොකු.. වෙනකල්.."

" නවත්තන්නෙ නැහ්.. අයියෙ.."

@Shan

" හිනාවෙනවලා හිනාවෙනවලා.."

මම අමාරුවෙන් ඇහේ කඳුලු ටිකත් පිහිදගෙන ඇඳේ ඉඳගෙන මගේ මනුස්සයටත් නැගිටින්න අත දුන්නා.. රඨ්‍ය අයියා හිනාවෙලා හිනාවෙලා රතුම රතු වෙලා.. දිග ඇහිපිහාටු කඳුලු වලට එකට එකට ඇලිලා.. ඒ අස්සෙ මට මෙ මනුස්සයා හෙන සරාගී විදියට පේන්න ගත්තා..

" ඔන්න අපි දෙන්නා අයියට සිංදුවක් කියනවා හරිද.."

" අනේ චූටි.."

මම කණ්ණාඩි මෙසෙ උඩ තිබ්බ කොලොන් බෝතලේ අරගෙන මයික් එකක් වගේ කට ළඟට තියාගත්තා.. මම කියන්න යන්නෙ රඨ්‍ය අයියගෙ ආසම සිංදුව.. ඒකා මට ඒක කියලා තියෙන්නෙත් එකම එක සැරයයි.. බල කල්ලා හෙන අමාරුවෙන් අහගත්තෙ.. අද මෙක පිටින් දාගෙන ආයෙම අහගන්න ඕන..

" කෝකද වරද්.."

" අවතැන් හදේ අනේ අවතැන් හදේ.. දිස් ඉස් ෆෝ අවර් ගෲම් ටු බී, මයි බ්‍රදර් ඉන් ලෝ, ආඨ්‍ය ශදිල් ඉශාක්‍ය, වී ලව් යූ ෆ්‍රොම් ද බොටම් ඔෆ් අවර් හාට්ස්.."

රඨ්‍ය අයියා හිනාවෙවී මෙසෙ ගාවට ගිහින් ඒකට තට්ටුවක් දැම්මා..

" අනෝරා

හැඬුම් දී

නුවන් සේදී මෙසේ

ඇයිද කියන්න.."

" වෝ.. හෝ.."

" ඔබෙන් මා

අහන්නේ

@Shan

දුකක් වේ නම් හදේ

නිදුක දැනෙන්න.."

" නැවතුම්

නොවෙනා

රිදුමන්

හදේ කොනට පා කරමූ.."

" අප වෙන්

නොවනා

මොහොතේ.."

" පමණක් රැඳී හිදිමූ.."

" අවතැන් හදේ

සුසුමන් දැවේ

හසකැන් ඔබේ

හුස්මක් ගෙනේ.."

" හැබැහින් මගේ

නොවුණා නොවේ

හසහන මගේ

විතරක් නොවේ.."

" නිසොල්මන්

කලාවේ

@Shan

හැඟුම් ආදර හිතේ

දෝරෙ ගලන්න~"

" දොතොල් මත්

වුණාවේ

කොපුල් මත්තේ වෙලී

ඇස් වහන්න~"

" හැඩුමන්

සනසා

තුරුලේ.."

" ඔබ එක්ක මා ගෙවපු.."

" අප වෙන්

නොවනා

මොහොතේ.."

" පමණක් රැඳී හිඳිමු.."

" අවතැන් හදේ

සුසුමන් ඇවේ

හසකැන් ඔබේ

හුස්මක් ගෙනේ.."

" හැබැහින් මගේ

නොවුණා නොවේ

@Shan

හසහන මගේ

විතරක් නොවේ.."

" මේ ඇසිල්ලේ දැවෙන්නම්..

අරුත් නොවිමසන්..

ප්‍රියාවේ.."

" මා හිතත් ඔය හිතත්..

දෙලොවකින් මිදෙන මේ..

නිශාවේ.."

" නැවතුම්

නොවෙනා

රිදුමන්

හදේ කොනට පා කරමු~.."

" අප වෙන්

නොවනා මොහොතේ~"

" පමණක් රැඳී හිඳිමු~"

" අවතැන් හදේ

සුසුමන් දැවේ

හසකැන් ඔබේ

හුස්මක් ගෙනේ.."

" හැබැහින් මගේ

@Shan

නොවුණා නොවේ

හසහන මගේ

විතරක් නොවේ.."

රධ්‍ය අයියයි මමයි සිංදුව කියලා ඉවරවෙද්දි ආධ්‍ය අයියා හිටියෙ ශරීර උශ්ණත්වය ඉහළ ගිහින් ලැජ්ජාවෙන් රතුම රතු වෙලා ඇඟිලි ටික එකට තදකරගෙන.. අපි වගේ ස්ටේජ් වල නටලා කියලා සෝශල් වෙලා විලි ලැජ්ජාව නැත්තට නැතිකරගෙන නෑනෙ එයා.. ආධ්‍ය අයියගෙ ලැජ්ජාව කියන එක කොච්චරද කියනවනම් මාමා ළඟට ඇවිල්ලා අතට තට්ටුවක් දැම්මත් ආධ්‍ය අයියා මූණ රතු කරගෙන වෙන පැත්තක් බලාගන්නවා.. හැබැයි එහෙම ලැජ්ජාවටත් රතුවෙනවා.. මල පැන්නහමත් ඩයල් එක රතු වෙනවා..

" මේ හසහන නම් අපේ නෙමෙයි කොහොමත්.. අම්මෝ අපිට එපා.."

( හසහන - හංසයකු වැනි අංගනාව )

" අනේ ඕක නවත්තගන්න ළමයි.."

" මොකෝ මොකෝ මේ කාමරේ මෙච්චර සද්දෙ.. අරහෙටත් ඇහෙනවා හිනාවෙනවා.."

ඒ අස්සෙ මදිපාඩුවත් හිමින් සැරේ දොර රෙද්ද මෙහාට කරගෙන අපේ කාමරේට ආවා.. ආධ්‍ය අයියා නංගිබබාවත් වඩාගෙන නැගිට්ටා..

" සුදුහාමිනේ මම නැති ටිකට ළමයෙකුත් හැදුවද.."

" ඒ වරද්.. මාමා ආසයි වගේ නේ.."

" ඒකතමා ඒයි.."

රධ්‍ය අයියා ශේප් එකේ මගේ කනට කල්ලා කියලා ආයෙම ඇඳෙන් ඉඳගත්තා.. ඇත්ත ඉතින් මොකක් වුණත් ඒ දෙන්නත් ඒ වයසට ආස ඇති බබෙක් හදාගෙන ගෙදරකට වෙලා පාඩුවෙ ජීවත් වෙන්න.. එයාලා කොහොමත් හරි පාඩුවෙ ඉන්නෙ.. මමනම් ආසයි ඒ දෙන්නා එක්ක ඉන්න.. ඔය අපේ මාමා කියන විහිළුවකට හිනාවෙගෙන.. ආධ්‍ය අයියගෙන්

@Shan

බැනුමක් අහගෙන.. රහ කෑමක් කාලා.. ඒ ජීවිතේ මම ගත කල්ලා තියෙන නිසා මම දන්නවා ඒක ලස්සනයි කියලා.. මම විතරක් නෙමේ මේ දවසට රධ්‍ය අයියත් ඒකට කැමති වුණා කියලා මම හිතනවා..

" මොනවද අනූ කියවන්නෙ.."

" ඉතින් ඇත්තනෙ.. කාගෙද ළමයා.. මුන් දෙන්නගෙන් එකෙක් ළමයෙක්වත් හැදුවද.. හැබැයි මූණනම් අපේ ගෙවල් වල කාගෙවත් වගේ නෙමේ.."

" සහන්ගෙ නංගි මාමෙ.. ආධ්‍ය අයියා පස්සෙ ළමයි ගෙනේවි.. තවුසෙ මෙච්චර මාත් එක්ක කුපාඩි වැඩ හවුලෙ කියනවා.. අවුරුද්ද අන්තිමෙ බඳිනවා කිව්වෙ නෑනෙ.."

" සාකි ඔයා කිව්වද ඒක.."

" ම්ම්.."

" හරි බං ඉතින් දැන් දැනගත්තනෙ.. මෙ වැඩ අස්සෙ කියන්න පුලුවන්ද ඕවා.."

" කැත වැඩෙ හරින.. කමක් නෑ අපිට හද පතුලෙන්ම සතුටුයි ඈ.. ගෙදරට නාකි වේවි කියලා මම බයේ හිටියෙ.. දෙයියනේ කියලා මේ ගෙදර මට ලියපන් මාමෙ.. ධනපති පුතෙක්නෙ දීග ගන්න යන්නෙ.."

" දෙනවා උඹට මම.. බලන් හිටපන්.."

" බලන් ඉන්නවා තමා හලෝ.. කොහොම වුණත් අපි අපිනෙ.."

" ඇයි උඹට අම්මගෙ නමට තියන කුඹුරු අක්කර දහය.. ඒක තියෙන්නෙ.. මේ ගෙටනම් හොට දාන්න එන්නෙපා සුදුමහත්තයා.."

" මම පොල් ගහනවා.."

" ආ ගහපන් බලන්න.. මම උඹට මිරිස් අඹරනවා.."

" මොනා කියලද.."

@Shan

" ජීවිතේට කෙල්ලෙක් බඳින්න වෙන්න එපා කියලා.. බලන් හිටපන්.. ඊටපස්සෙ කළු තිර අඹරලා පහන් පැලක් අටවලා තුන්මංහංදියක පහනක් පත්තු කරනවා.."

" මම බයයි පහනට.. අනේ නිකන් පලයං මාමෙ.."

" උබත් පලයං සුදුමහත්තයා.. කට විතරයි.. ඒකනෙමේ.. මෙන්න මුං දෙන්නා කාමරේ අස්සෙම රිංගන් ඉන්නවා.. බොලා මල්වර වෙලාද.."

" ආ මාමා දන්නැනෙ.. රධ්‍ය අයියා වුණා.."

මාමා ලාවට හිනාවේගෙන රධ්‍ය අයියා දිහා බලාගෙන ඉඳලා රධ්‍ය අයියට කිට්ටු කලා.. රධ්‍ය අයියා පිටිපස්සට වුණා.. අනේ මාමෙ මගේ මනුස්සයා ආස නෑ ලංවෙලා කතාකරනවට.. එහෙම කතාකරද්දි කේන්ති යනවා..

" උඹ රධ්‍ය පුතේ.. මෙන්න මුගෙන් ඈතට වෙලා ඉඳපන්.. මම උඹේ හොඳට කියන්නෙ.."

" ඇ-ඇයි මාමෙ.."

" ඇයි අහන්නෙ.. උඹට පේන්නැද්ද මූ මායං වෙනවා.. හැබැයි උඹ වැරදිලාවත් මූව ඇඟේ ගහගත්තොත්.. මට උඹ ගැන දුකයි පුතේ.. අම්මාපල්ලා.. උබට හිස රුදාවක් අල්ලලා මැරිලා යනවා.."

" මොනවද අනුරාග් කියවන්නෙ.."

" මම ඇත්ත කියවන්නෙ.. මුගේ රුවටුනොත් මොකෙක් හරි ඔය බළල් ඇස් දෙකටයි මායං වලටයි තමා.. උඹත් නටන්නැතුව ඉඳපන්.. මකනවා දැනගනිය.."

මාමා මගේ පිට මැද්දට දබෝස් ගාලා පාරක් අතෑරියා..

" මම රධ්‍ය අයියා එක්ක යාලුවෙනවා කොහොම හරි.."

" අර දැක්කනෙ.. ශාක්‍ය මූට ලැජ්ජවක් නෑ.."

ආධ්‍ය අයියා හිනාවෙවී මෙසෙට හේත්තු වුණා.. අර නංගිබබාට රෝසමල් සුවඳට නින්ද ගිහිල්ලා..

@Shan

" ඇයි ලැජ්ජවෙන්නෙ.. මම රධ්‍ය අයියගෙ නමට වශියක් කරගන්නවා.."

" කරගනින්.. මට මොකෝ.. මගේ එකාගෙන් එහාට වෙලා ඉඳපන්.. රධ්‍ය පුතේ උබට ඕන්නම් යාලුවෙයන්.. හැබැයි උඹ හොඳ එකා බං.. මට සැහෙන්න දුකයි.."

මාමා හෙන දුකෙන් වගේ රධ්‍ය අයියගෙ පිටට තට්ටු දෙක තුනක් දැම්මහම රධ්‍ය අයියා උරහිස කරකලා මාමගෙන් පොඩ්ඩක් එහාට ගිහින් ගොං හිනාවක් දැම්මා.. අල්ලන්නෙපා අප්පා මගේ මනුස්සයව.. ඒකා ආස නෑ.. කොහොම කියන්නද මේවා.. මාමා ඒ අතැරියෙත් නෑ.. රධ්‍ය අයියගෙ ශර්ට් එකේ කරෙන් ඇතුලට අත දැම්මා.. මෙ මොන මගුලක්ද කරන්නෙ.. එච්චා අල්ලන්නෙපා මාමෙ.. මගේ දේවල්.. මම ආස නෑ..!!!!

" මම.. මම.."

රධ්‍ය අයියගෙ බෙල්ලෙ තිබ්බ සිල්වර් චේන් එක මාමා උඩට ඇදලා අරගෙන ඒක ඇස් දෙකට ලං කල්ලා බැලුවා.. රධ්‍ය අයියා හිටියේ හුස්මවත් ගන්නැතුව ගල් ගැහිලා.. දැන්නම් මටත් බය හිතෙනවා.. මම හිමින් සැරේ ආධ්‍ය අයියා ගාවට කිට්ටු වුණා.. හරි තමා අදනම්..

" උඹලා දෙන්නා මාව තම්බන්න.. අනේ නිකන් හිටපන් බං.. මෙන්න මූට දෙන්න තියෙන්නෙ දෙකතුනක්.."

මාමා රධ්‍ය අයියා දිහා බලාගෙන ඉඳලා ලාවට හිනාවුණා..

" ඇයි මාමෙ රධ්‍ය අයියට දෙකතුනක් දෙන්නෙ.."

" දැන් උඹලා දෙන්නා යාලුවෙලා කොච්චර කල්ද.. ආ සාකි..?? ඔයා එක්ක මට පොඩ්ඩක් කතාකරන්න ඕන.."

මාමා හැරිලා ආධ්‍ය අයියා දිහා බැලුවහම ආධ්‍ය අයියත් මලයා වගේම ගොං හිනාවක් දාලා නිදාගෙන ඉඳපු නංගිබබාව මගේ ඇඳෙන් තිබ්බා..

" මම ඔයාට කිව්වෙ නෑ ඉතින්.. එයාලම කියනකල් හිටියා.."

" රධ්‍ය.. යාලුවෙලා කොච්චර කල්ද.."

" අවුරුදු දෙකක් විතර.."

@Shan

" අවුරුදු දෙකක්..??"

" ඔව් මාමෙ.."

" ඒ කියන්නෙ මූ ඒලෙවෙල් කරන කාලෙද.."

" ඔව්.."

" හොඳටම විශ්වාසද.. උඹ වරද්ට කැමතිද.."

මාමා ඇහුවෙ රධ්‍ය අයියට කිට්ටු වෙලා හෙන අමුතු ටෝන් එකකින්.. මාමට මල පැනලා වෙන රෙද්දක්ද වෙයිද දන්නෙත් නෑ.. මටනම් දැන් සිරාවටම බයයි වගේ..

" ඔව්.. වරද්ට ආදරෙයි.."

" ආදරෙයි..?? එච්චරද.."

" ඔව්.."

" ම්ම්.. එහෙනම් ඉතින් හා බං.. මොන මගුලක්ද අර පැරඩ් ඉන්නවා වගේ සීරුවෙන් හිටගෙන කරන්නෙ.. මෙකා හුස්ම හිරකරගෙන මැරෙන්න හදනවනෙ.."

මාමා රධ්‍ය අයියගෙ පිටට එකපාර තට්ටුවක් දාලා හිනාවෙලා මෙහාට වුණා.. ආධ්‍ය අයියනම් කලින්ම වෙන්නෙ මොකක්ද කියලා දන්නවා වගේ හරි නිම්මච මනුස්සයා වගේ හිටියා..

" හැ මාමා බනින්නැද්ද.."

මාමා මට දෙකක් රැව්වා..

" උඹ මෙච්චර එකට ඉන්න මට කිව්වෙ නෑනෙ.. මෙකා එක්ක යාළුවෙලා ඉන්නෙ කියලා.. මූද දැන් අර කුරුඳුවත්තෙ කෑල්ල.. දුර ගිහින් ඉන්නවයි කිව්වෙ.."

" ඕ.."

@Shan

" මම එකක් කියන්නම්.. උඹලා ඕන මගුලක් කරගනින් අන්න අර අතන තියන ජනේලෙ වහගෙන.. කිච්කවාගන්නවයි.. මරාගන්නවයි.. අනේ මන්දා.. මරු උන් දෙන්නා යාළුවෙලා තියෙන්නෙ.."

" සැක්.. මාමා යම්කිසි දෙයක් දැක්කද.."

" දැක්කා.. මෙන්න මූ ඇවිල්ලා උඹෙන් ගුටි කාලා පස්සෙ දමාගෙන ඉඹිනවා.. මමයි ජනේලෙ වහලා ගියේ අන්තිමට.."

මමයි රධ්‍ය අයියයි බිම බලාගත්තා.. නෙද්දකින් මාමත් අයුක අයියා වගේ මහා චීත්තයෙක්නෙ..

" උඹ හොඳ එකා.. මෙන්න මූව බලාගනින් හොඳට.. උඹ අවුරුදු දෙකක් හිටියා කියන්නෙ අමුතුවෙන් පහදන්න දෙයක් නැනෙ.."

" මම.."

" අවුරුදු දෙකක් කොහෙද අනූ.. මේ දෙන්නා පොඩි කාලෙ ඉඳලා දන්නවා.. හයේ හතේ ඉඳලා.. එක ඉස්කෝලෙනෙ.."

" සිරාවට..??"

" ඔව් අපේ එක්කෙනා ඔය ඒ ලෙවෙල් ඉවරවෙනකල් හිටියේ අවුරුදු පහළොවේ හිත ගිය කොල්ලට කැමතී කියන්න.."

" රධ්‍ය!! මෙකා හිමිමිච්චා වගේ ඉඳලා.. උබලගෙ ඉස්කෝලෙ ඔච්චද කියලා දෙන්නෙ.."

" ආ මේ මාමෙ ඉස්කෝලෙ ගාවගන්නෙපා.. මල පයිනවා හරිද.."

" ඒකතමයි අනූ.. ඔයා හැම එකකටම අපේ ඉස්කෝලෙට බනින්න එපා.."

" ඉස්කෝලෙ අදාළ නෑ මාමෙ ඒකට.."

මාමා ටිකක් වෙලා අපි තුන්දෙනා දිහා බලාගෙන හිටියා..

" පොඩි කාලෙ ඉඳලම ලව් කරන්න උගන්නලා.. රටේ ලෝකෙ කොල්ලොන්ට කෙල්ලොන්ට ඇහැට කනට පේන්න පාරෙ බැහැලවත්

@Shan

යන්න විදියක් නෑනෙ.."

" අනේ මේ අනුරාග්.."

" මාමා කොහොමද එහෙම කියන්නෙ.. අපේ ඉස්කෝලෙට එක එක කතා කියන්නෙපා හරිද.. මාමා දන්නෙ නෑනෙ අපේ ඉස්කෝලෙ ගැන.. අපි තමා කොළඹ ගැම්මෙන්ම ඉන්න ඉස්කෝලෙ.. බලනවා හෙඩ් ප්‍රිෆෙක්ටම කොච්චර ලස්සනද කියලා.. අනික අවර් ස්කූල් හැස් ද මෝස්ට් පවර්ෆුල් මොටෝ එවර්.. අවර් ස්කූල් හැස් ද ඕල්ඩස්ට් බිග්මැච්.. ඇන්ඩ් ඕල්සෝ හැස් මෙනි ග්‍රේට් ඕල්ඩ් බෝයිස් ලයික්-"

" ඔන්න ඔය මගුල නවත්තගනින් බං.. අනේ දෙයියනේ මේ ඉස්කෝලයක් නිසා මම අවුරුදු ගානක් පුදුමාකාර කට්ටක් තමා කන්නෙ.."

" ඔයා ඉතින් අපේ ඉස්කෝලෙ ගාවගන්නෙ නැතුව හිටියනම් ඉවරයිනෙ.. බොරුවට.."

" ඔව් ඔව්.. ගාවගන්නෙ නෑ.. මෙන්න මෙහෙ එනවා යන්න.. අර නෙතුද මොකෙක්ද ගන්නවා ගන්නවා ඉවරයක් නෑ.. ඒක ආන්සර් කල්ලා කියපන් සපුමල් කුමාරයා මෙහෙ ළමයි වදනවා කියලා.."

" නෙතු..?? පුදුම වදයක් මේ ගෑණියෙක්ගෙන් තියෙන්නෙ.."

" පොඩ්ඩක් ඉඳපන් බදිනකල්.. නෙතුට බඩ වෙන්න දෙක තුනක් කියන්න මම.. ලැජ්ජාවක් නෑ කොල්ලොනෙ ගෙවල් අස්සෙ රිංගගෙන.."

" මම ගිහින් බලන්නම්.."

" ම්ම්.."

" අයියෙ.. මේ නංගිව සහන්ලගෙ අම්මට දෙන්නකො.. ආයෙ ඇහැරුණොත්නම් අපි නළවන්නෙ නෑ හරිද.."

" ආ.. මම දෙන්නම්.."

ආධ්‍ය අයියා යන්න ගිහිල්ලත් හැරිලා ආයෙ ඇවිල්ලා නංගිබබාවත් අරගෙනම කාමරෙන් යන්න ගියා.. මාමත් ඒ ගමන් යන්න ගිහින් දොර ගාව නැවතිලා මං දිහා හැරිලා බැලුවා.. මම ඇස් දෙකත් හෙන ලොකු කරගෙන

@Shan

අත් දෙකත් බැඳගෙන මාමට අහිංසක මූණක් පෙන්නුවම මාමගෙ මූණ් එලාවට හිනාවක් ඇදෙන්න ගිහිල්ලත් ආයෙම ඔලුව වනලා දුස්ට මූණම ආරෝපණය කරගත්තා..

" කකුලෙ බෙහෙත් ගාපිය නිදාගන්න කලින්.."

" හා මාමෙ.."

" පකයා.."

මාමා දොර වහගෙන යන්න ගියාම මම දුවගෙන ගිහින් රධ්‍ය අයියගෙ බෙල්ලෙ එල්ලිලා කකුල් දෙකහ් කොහොමහරි ඉන වටේ ඔතාගෙන ඒ මනුස්සයට වාරු වෙලා තොල් වලින් ලොකු හාද්දක් තිව්වා..

" ඇති යන්තම් ඒයි මාමට කිව්වා.. මම හිටියෙ හෙන අමාරුවෙන් ඕක කියාගන්න බැරුව.."

" තව කීයකට ඔක කියන්න වෙව්ද කියලා මම හිතුවෙ.."

" අපි මෙක සමරන්න ඕන.. එකක් ඇවිල්ලා මෙ අවුරුද්ද අන්තිමෙ මෙ දෙන්නා බඳින එක.. අනික ඇවිල්ලා අපි දෙන්නගෙ මෙව්ව එක මාමට කිව්ව එක.. අනික අයියා මෙ ටිකේ හිනාවෙලා ඉන්න එක.. තව ඔයා ගෙදර ආපු එක.. තව අර එහාගෙම්මම්ම-මම්හ්හ් අයියෙ!!"

" උඹෙ කට රිදෙන්නැද්ද ඔච්චර කියවලා.. මෙන්න මෙහෙ ඇඟ හෝදගෙන වර.. කකුලෙ බෙහෙත් ගාන්න.."

රධ්‍ය අයියා මාව දඩාස් ගාලා ඇඳට අතෑරලා ටවල් එක අරගෙන පුටුව උඩින් දැම්මා..

" රෑට කන්නැද්ද.."

" තාම හවසනෙ.. බඩගිනි නෑ දැන් නම්.."

" මම යනවා ඇඟහෝදන්න.. ඔයත් එනවත.."

" වරද්!!!"

@Shan

මම ටවල් එකත් අරගෙන නානකාමරේට වැදුනා.. වෙන කොල්ලෙක්නම් තමන්ගෙ එකා එක්ක නාන්න එනවනෙ.. මේ මනුස්සයා තමා නාන්නවත් එන්නැත්තෙ.. එක්කො රධ්‍ය අයියට එහෙම හැඟීම් පහල වෙන්නැද්ද දන්නෑ.. නෑනෙ පුතේ පහළ වෙනවා තමා.. උබට උණ හැදුනා මතක නැද්ද ඒකා ගිය දවසෙ තැලිලා තැලිලා.. සමහරවිට සෙනුකයා දවසක් කිව්වා වගේ තරු බලන්න යන එක වේදනාකාරි ඇති.. ඉල්ලගෙන කන්න ඕන නෑනෙ.. ඒත් ඉතින් අපිත් ඇවිල්ලා කපල් එකක්නෙ.. රධ්‍ය අයියා මම ඒ ලෙවෙල් ඉවරවෙනකල් ආදරෙයි කියන්න හිටියා වගේ..

ටසිරි.. එහෙනම් මෙකා බදිනකල් තමා ඉන්නෙ තරු බලන්න යන්න.. අනික රධ්‍ය අයියට නගින්නෙත් හෙන පබ්ලික් ප්ලේසස් වලනෙ.. අර එදා බිග්මැච් එක දවසෙ වගේ.. ශිට් ශිට්!! නෑ එදා එහෙම එකක් වුණේ නෑ.. අපි දෙන්නා නිකන් ඒක බලලා කොකාකෝලා නාගෙන බබ්ල් ටී එකක් බීලා ගෙදර ආපු එක විතරනෙ.. මම මොනවද මේ හිතන්නෙ.. රධ්‍ය අයියා ලස්සන කොල්ලා.. එහාගෙදර පෙට්ටි කිකිළි අම්මන්ඩි හිතාගෙන ඇති මගේ හැපීකව්වව දැලේ දාගන්න.. එව්වා හඳේ තමයි අක්කෙ.. චමිරුවට කියලා සුදුවෑන් එකකින්වත් උස්සන්න තියෙන්නෙ ඕකිව.. නැත්නම් ආධ්‍ය අයියට කියලා අල්ලලා වෙලට විසික් කරනවා.. නෑ නෑ වෙලට නෙමෙ බස්නාවට විසික් කරනවා..

පස්සෙ ඕකි බස්නාවට විසික් කල්ලා මලොත් එහෙම ගමේ කොල්ලෙක්ට වසන්න බැරිවේවි.. හොල්මනක් වෙලා ඇහැට කණට පේන්න ඉන්න කොල්ලොන්ට පාන්දර තුන හමාරට හතරට විතර ඇහට කඩාපැනලා නම අහවි.. ඔයා මගේ ඉසාක්‍යද කියලා.. නෑ කිව්වහම බෙල්ල කඩාගෙන කාවි.. එහෙම ඕන්නෑ.. මොකක් උණත් අපි ඔක්කොම කොල්ලොනෙ.. කොල්ලො කොල්ලොන්ට බලු වැඩ කරන එක නරකයි.. කියාන් අයියා තමයි කියන්නෙ..

අද කියාන් අයියා ආශි එක්කගෙන ජිම් ගිහිල්ලා ෆොටෝ වගයක් දාලා තිබ්බා ඉන්ටර් ස්ටෝරි වල.. ඒකෙ බිහන්ඩ ද සීන්ස් ගෲප් එකේ වැටිලා තිබ්බා.. ආශි ගිහින් කියාන් අයියට මෙලෝ වැඩක් කරගන්න දෙන්නැතුව ඒකෙ පිස්සුවක් නටලා ගුටි දෙකතුනකුත් කාලා ගෙදර ඇවිල්ලා අඬලා කියාන් අයියගෙ අම්මටත් කෝල් කල්ලා කියලා පුතණ්ඩියා ගුටි දුන්නා කියලා.. පස්සෙ කියාන් අයියා අම්මගෙන් බැනුම් අහලා ආයෙ හවස ආශිට මල් පොකුරක් ගිහින් දීලා යාලුකරගෙන.. ඊටපස්සෙ ආශිගෙ අම්මට මල් පාත්ති වගයක් හදන්න උදව් වෙන්නත් වෙලා.. මම හිතන්නෙ ඒකනම් මූ

@Shan

කරන්න ඇත්තෙ ලකුණු දාගන්න වෙන්නැති දුවව ඉල්ලගන්න.. කියාන් අයියා එයාට ආශි හෙන වදේ වගේ අපිට පෙන්නුවට උා කැමතී ආශි සකබ්බරයක් වගේ පිස්සු හෝන්තු මගුල් වැඩ කරනවට.. උගෙත් බොරුව තමා තියෙන්නෙ..

කොහොම වුණත් එදා මද කිපිලා දුවගෙන ඇවිත් අපි ඉස්සරහම අලි පැටියා දණනමලා, නුගේගොඩ හෙන කට්ටක් කැවෙ, දවසෙම ක්ලාස් එක ඉස්සරහට වෙලා බලාගෙන හිටියේ මෙකිව දාගන්නනෙ කියලා මතක් වෙද්දි උාට ඩම්බෙල් එකක් උස්සලා ඔලුවට අතැරගන්න හිතෙනවා ඇති.. ඒත් අනිත් මිනිස්සු මටත් ඔකම හිතනවද දන්නෑ කියලා මට වෙලාවකට හිතෙනවා..

නිකම් රධ්‍ය අයියා නමය වසරෙ ඉඳන් හිතේ තියාගෙන ඉඳලා හෙන කට්ටක් කැවෙ මං වගේ එකෙක්- ශිට් නැනෙ.. මම ඇවිල්ලා කොච්චර හැන්ඩියද.. මම නෙමෙ කියන්නෙත්.. එහා ඉස්කෝලෙ නංගිලා තමා.. නංගිලගෙ ස්පෝර්ට්ස් මීට් එකට ගිහින් මට ඔසරියක් ඇඳගෙන බීම එක අල්ලපු නංගිත් කොච්චර ඇඹරුණාද එදා.. ඒක බලාගන්න වුණේ නෑ අර ගොබ්බ සක්කිලි පරෙයියා මැද්දෙන් පැනලා 'නංගි සයිඩ් ප්ලීස් අයි කාන්ට් සී ද ග්‍රවුන්ඩ් ප්‍රොපර්ලි' ගැවනෙ.. ඒ නංගි ඊට්පස්සෙ මල පැනලා මූණ උරුක් කරන් යන්න ගියා.. ආ තව මගේ සෝෂල් එකේ සෙනුකයා බදාගෙන ගහපු ෆොටෝ වලටම කොච්චර හාට් තිබ්බද.. රොල් මොඩ්ල් ඔෆ් ද ඉයර් වෙන්නත් ලේසි නැනෙ.. කවදහරි මම සිරාම රෝල් මොඩ්ල් එකක් වෙව්ද දන්නෙ නෑ.. එක්කො නැතිවෙයි.. මම නටපු නැටුම් දන්නෙ මමනෙ.. රධ්‍ය අයියට කියන්න ඕන පුළුවන් වුණොත් නුවරඑළියෙ නාදගම බලන්න යමු කියලා.. ගිය අවුරුද්දෙ එක්සැම් නිසා ගියේ නැනේ.. සෙනුකයා නම් ගියා අයුක අයියා එක්ක.. මෙ මනුස්සයා එදා දවසෙම මට තඩි පත ඉලෙක්ට්‍රොනික් ගනන් වගයක් කියලා දුන්නා උඹට නාදගම විතරයි අඩු ගගා.. ඊට්පස්සෙ හැබැයි පොරොන්දු වුණා එක්කන් යනවා කියලා.. රධ්‍ය අයියා අර මල මගුල් කැම්ප් එකෙන් එළියට පැනගත්ත එකගැන නම් මට තියෙන්නෙ සෑහෙන්න සතුටක්..

මම යට කලිසමත් ඇඳගෙන ටවල් එකත් ඉණේ බැඳගෙන වට පිටේ වෙන මනුස්සයො ඉන්නවද බලලා සුටුස් ගාලා කාමරේට පැනලා දොර වහගත්තා.. ආච්චිඅම්මා කැමති නැනෙ මම ශර්ට් නැතුව ඉන්නවට.. බනිනවා.. ගිහින් ඇඳගනින් කමිසයක් කියලා. මම පොඩිකාලෙ එකපාරක් අම්මා මාව එළියෙ තියාගෙන කිරි දීලා, ඒක ආච්චියෙක් දකලා කිව්වලු

@Shan

කොළු පැටියා පාට වැටිලා කියලා.. පස්සෙ දවසෙ මගේ ඇහේ රතුපාට බිබිළි වගයක් ඇවිල්ලා ආච්චිඅම්මා බෙහෙත් කොළ දාලා තැව්වලු දවස් ගානක්.. ඕක තාම ආච්චිඅම්මා විශ්වාස කරනවා මට ඇස් වහ වැදෙනවා කියලා.. මම ඕවා වැඩිය විශ්වාස නොකලත් ආච්චිඅම්මගෙ හිත රිද්දන්න ඕන නැති නිසා මොකුත් කියන්නෙ නෑ ඒකට අනිත්පැත්තට.. හැම එකම ඔහොම හිතන්නෙ ඉතින් ආදරේ නිසානෙ..

මම කාමරේට යද්දි රධ්‍ය අයියා ෆෝන් එක දිහා බලාගෙන හෙන ලොකු වැඩක්.. මම ආවහම මගේ දිහා බලවෙලා වගේ බලාගෙන ඉඳලා ආයෙ ෆෝන් එක දිහා බලාගත්තා.. මම ගිහින් ඇඳෙන් ඉඳගෙන අර ආධ්‍ය අයියා ගෙනැල්ලා දීපු ජෙල් එක ටවල් එක එහෙ මෙහෙ කරගෙන කලව හරියෙන් ගාලා එක එක අතට අතුල්ලගෙන අතුල්ලගෙන ගියා..

" ඔය මොකක්ද කරන්නෙ.. ඕක එක අතකට ගාන්න වරද්.."

" මම දන්නෑ.. මම ලේසි පැත්තට ගාන්නෙ.."

" මෙහෙ දෙන්න ජෙල් එක.."

මම හිමින් සැරේ රධ්‍ය අයියා දිහා බලලා කුප්ප හිනාවක් දාගෙන ජෙල් එක එයාගෙ අතින් තිබ්බා..තියලා ඇඳෙන් හාන්සි වුණා.. ජනේලෙ වහලනෙ තියෙන්නෙ..

" කොයි හරියද රිදෙන්නෙ.."

" මෙතන.. මේ ඔක්කොම රිදෙනවා ඒයි.."

" ඊළඟ දවසෙ මස්ල් පේන් හරි වෙන මොකක් හරි වුණොත් කෝච්ට කියන්න කන්ටිනිව් කරන්න බෑ කියලා.. මේ කකුල රතුවෙලානෙ.."

රධ්‍ය අයියා මගේ කකුල ගාවින් ටවල් එක උඩට කල්ලා අර ජෙල් එක අතට අරගෙන ගානට පහලට අතගෑවා..

" ආව් ආව්.. අම්මෝ.."

" දඟලන්නැතුව ඉන්න.."

@Shan

" හිමින් අනේ.. රිදෙනවනෙ.. නැන්දම්මා බෝනික්කා කිව්වට මම ප්ලාස්ටික් නෙමේ.."

" ඒක මටත් පේනවා.. ප්ලාස්ටික් නෙමෙ කියලා.."

රධ්‍ය අයියා ඇස් යටින් මං දිහා බලලා කිව්වහම මම කකුලෙන් රදා අයියගෙ පපුවට පාරක් හිමිහිට ගැහුවා.. ඒකට එයාට හිනාගියා..

" වරද්.. ඇත්තට ඔයා පොඩ්ඩක් වෙනස් වෙලානෙ.. ජිම් යන නිසාද.. බඩ පිටිපස්සට ගිහිල්ලා තියෙන්නෙ.."

" වෙන්නැති නේ.. ඔයා එක්ක ඉද්දි තමා කාලා කාලා මහත් වුණේ.. දැන් කිලෝ හයක් අඩුවෙලා තියෙන්නෙ.. කොහොමද.."

" මේ මාස හතරට.???. ඩයට් කියලා නොකියා හිටියද.."

" කෝච් කන්න දෙන්නෙ නෑ ඒයි.. වෙළුසුමනයා මට සෑහෙන්න නීති දාලා තියෙන්නෙ ක්ලබ් එකේ.. කොටින්ම ඒ මනුස්සයා නැතුව ඇවිත් තනියම ප්‍රැක්ටිස් කරන්න දෙන්නෙත් නෑ.."

" ඒක හොඳයි.."

" ලිෆ්ට් එක පාවිච්චි කරන්න දෙන්නෙ නෑ.. හරියට කන්න දෙන්නෙ නෑ.. හැබැයි ඔයාට කියන්න කෝච් මැචස් වලදි නම් මාර සපෝට්ව්.. මගේ එක මැච් එකක් තිබ්බනෙ.. ඒකෙදි කෝච් හැම බ්‍රේක් එකකදිම මාර විදියට ඇවිත් මෝටිවේට් කරනවා.."

" ම්ම්.."

" ඒ අතින් නම් හොඳයි.. මගේ පාස්පෝට් එක හැදුවනෙ.. තව මාසෙකින් හරි මාස එකහමාරකින් හරි සිංගප්පූර් වල ටූනමන්ට් යන්න පුළුවන්.. තාම කන්ෆම් නෑ ඉතින්.. ඒත් කෝච් කිව්වා ප්ලේ කල්ලා බලමු කියලා.."

" I feel so happy and proud වරද්.. ඔයා හොඳට කරගෙන යනවා.."

" ඔයා නිසානෙ.. නැත්නම් මම ක්ලබ් එකකට ජීවිතේට ජොයින් වෙන්න හිතුවෙ නෑ.. මගේ ෆස්ට් කිස් එකේ ගිෆ්ට් එක.."

@Shan

රධ්‍ය අයියා මගේ අතක් අරගෙන එයාගෙ අතක පටලගෙන හාද්දක් දුන්නා..

" ඔයාට මතකද වරද් අර සීයා හම්බුන දවසෙ ඔයා කිව්වා ඔයා නැශනල් ප්ලේ කරන්න ආසයි කියලා.."

" මුද්ද දීපු සීයද.. ඔව්.. මම ආසයි.."

" ඔයා නැශනල් ප්ලේ කරනකල් ජ්ම් එක අතාරින්න එපා.. This is a good chance for you to show who you are to those who have called you down.."

" ඔයා මගේ මැච්ස් බලනවා නේද එහෙම වුනොත්.."

" ඔව්.. මම බලනවා.. ඔයා ප්ලේ කරන හැම එකක්ම.."

මම රධ්‍ය අයියැ ශර්ට් එකෙන් අල්ලගෙන එයා පැත්තට ඇදිලා තොල් වලින් පෙක් එකක් තිබ්බහම එයා මගේ ඇතින් ඇදලා මාව ඇහට හිර කරගත්තා.. මම එයාගෙ බෙල්ල වටේ අත් දෙක ඔතාගත්තා..

" ම්ම්..??"

රධ්‍ය අයියා මගේ මූණ ගාවටම කිට්ටු වුණාම එයාගෙ දිග ඇස් පිහාටු මගේ ඇස් වලටයටින් කම්මුලේ ගෑවෙනවා මට දැනුනා.. මම එයාගෙ ශර්ට් එක තද කල්ල මිරිකලා අතකින් අල්ලගත්තා..

" මම පහුගිය කාලෙ හැමදාම හිතනවා එදා ඔයා දිහා නොබලා හිටියනම් කියලා.. මට පාළු හිතුණා වරද්.. මම ආසාවෙන් හිටියෙ මෙහෙම පවුලක් එක්ක ඉන්න.."

" මම දැන් ඉන්නවනෙ.."

" Little Miracle That I Love.. If you didn't come into our lives, none of us would be here today.. මම, අපේ අයියා, මාමා අපි හැමෝම.. අපේ අම්මා කියනවා වගේ මට වෙලාවකට හිතෙනවා ඔයා ඔක්කොම කනපිට පෙරලයිද කියලා.."

" මම..??"

" ම්ම්.."

@Shan

රධ්‍ය අයියා එයාගෙ ලොකු අතක් මගේ කම්මුලකින් උණුහුමට තියලා තොල් වලට පහත් වුණාම මම එයාගෙ ශර්ට් එක තද කල්ලා දිගටම අල්ලගෙන හිටියා.. එයාගෙ අනිත් අත මගේ පිට පුරාම දුවනවා.. ඒ ගමන් මාව ඇඟට තද කරගන්නවා.. විනාඩි කීපෙකට පස්සෙ රධ්‍ය අයියා මබෙ කොලර් බොන් එක ගාවින් තොල් තියලා රතුම රතු පාට පැල්ලමක් හදලා මාව උස්සලා ඇඳෙන් වාඩිකෙරෙව්වා.. මම ගැලවෙන්න යන ටවල් එකත් අතකින් අල්ලගෙන එහෙමා හිටියහම රධ්‍ය අයියා මගේ කොලර් බෝන් එකේ තිබ්බ පැල්ලම ඇඟිලි තුඩු වලින් අල්ලලා හිමිහිට අතගෑවා..

" ඔයාට හෙට සෙලිබ්‍රේට් කරන්න ඕන කිව්වා නේද.."

" ඔව්.. මම කියන්නම්.. අපි දෙන්නා වැටෙන්න බොමුද.. අයියට කියලා යමු.. I'm ready to try something stronger than beer with my boyfriend for the first time.."

" Sure..?? Then let's go.."

" ඇත්තටමද.."

" මම්.. ඔයාට කියන්න පොඩි වැඩක් තියෙනවා වරද්.."

" මොකක්ද ඒ.."

" ඉස්කෝලෙන් ඊ මෙල් එකක් ආවා.."

" ඉස්කෝලෙන්..??"

මම කුතුහලෙන් පිරිලා ගියා.. අපේ වැරදි මොනවහරි කියලා නෙමෙයි වෙන්නැතිනෙ..

" මම ලබන මාසෙ ඉඳලා ඉස්කෝලෙ උගන්නන්න එනවා.. As a volunteer teacher.."

ඒත් මට හම්බුනු හීනෙකින්වත් හිතපු නැති උත්තරේට මගේ ඇස් දෙක් උඩ ගියා..

" ම්-මො-මොකක් කිව්වා..!!! ස්වේච්චාවෙන් ඇවිල්ලා උගන්නනවද.. අපේ ඉස්කෝලෙ..?? ඔයා..?? ලබන මාසෙ..??"

@Shan

" මිම්.."

" ආධ්‍ය අයියේ!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!එන්නකෝ~ "

" වරද් ටවල් එක!!!!!!!!!!!!!!!"

( මම දන්න විදියට ගොඩක් හොඳ රිසාල්ට්ස් තියන මොකක් හරි හේතුවක් නිසා යුනි ලේට් වෙන අක්කලා අයියලා ඉස්කෝල වල උගන්නනන්න එනවා.. රධ්‍ය සැර් කැම්පස් යනකල් ඉස්කෝලෙ එන්නයි යම්නෙ.. #හයවසරෙපොඩිඋන්වම්රුලෙප්ට්)

ඔතරී නෙස්ටමෝල්ට් ගෙනාවා.. එන්න එන්න බොන්න..

ඊයෙ දුන්නෙ නැනෙ.. ඔතරීට වැඩ ගොඩයි.. මැසේජ්ස් වලට එහෙම රිප්ලයි ලේට් නම් සොරි මගෙ ළමයිනෙ.. ඒ වෙලාවත් අරන් තමා මම කතාව ලියන්නෙ..මගේ දළඹුවෝ තේරුම ගනිත්වා..

ඔයාලට මොකෝ හිතෙන්නෙ.. නාකි ජෝඩුව බඳින්නයි යන්නෙ.. රධ්‍ය ලීවින් එක ගන්නවා.. අප්පච්චි කට පියාගෙන ඉන්න එක අශාමාන්‍ය නැද්ද..

ඔච්වා හිතන්නෙපා හෙට වැටෙන්න බොන්න එන්න.. සැමට ආරාධනා.. ගමෙ කියලා කසිප්පු බොන්නෑ හොදේ..

""" අවතැන් හදේ.. (සිංදුව පුලුවන් නම් අහන්න මම ආදරෙන් ඉල්ලනවා..)

එන්නාම්.. ලව් යූ.. ❤

ආධ්‍ය අයියට මෙක ගහගන්න මනාපය පල කරගෙන යන්න..

ඔයාලට කැරැක්ටර්ස් වල නම් වල තේරුම දැනගන්න ආසද.. මම දළඹුවෙක් කිව්ව නිසා හොයලා බැලුවා ඉතින්.. පහළින් දාන්නම..

**Varadh - lord of fire , lord GaneshRadhya - worshipful , one worthy of worship**

@Shan

**Adhya - godess DurgaAnurag - attachment , devotion , passion and eternal love**

**Ayuka - walking fragrance, walking flower , walking summerWathsal - mankind , friendly , energetic**

**Ashi - smile , joy , peaceful , love , starsKian - ancient, enduring one**

**Maheesha - the world**

**Ayan - gift from god**

**Asali - sweet like honey**

**Chamiru - a pioneering spirit**

දේවත්වයෙන් සලකමින මෙන් කැරැක්ටර් දෙමකට.. පේමනවනෙ..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 121 කොටස

" ගියා වගේ නෙමෙයි ළමයි.. පරිස්සමින්.. තේරුණානෙ.. රධ්‍ය පුතා මට ගිහින් කෝල් එකක් දෙන්න හොදේ.."

" හරි අම්මා.."

" දැන් ආයෙ පුතාලා එන්නෙ හෙටද.. කමක් නෑ පොඩ්ඩක් ඇවිදලා කියලා එන එක.. කොළඹ ඉතින් ගිහින් පණ යනකල් නැහෙන එකනෙ කරන්නෙ.. රධ්‍ය පුතාටයි ආධ්‍ය පුතාටයි අවුරුද්දටත් ඉදලාම යන්න තිබුණා.. අපරාදෙනෙ.."

" කොළඹ වැඩ වගයක් තියෙනවනෙ අත්තම්මෙ.. අත්තම්මා බලන්න අවුරුදු පහුවෙලා මම අනිවාරෙන් එනවා.."

" ආ පොඩී කොහොමත් අම්මා එක්ක ඉන්න ආසයි, පැණිරහ ගිලින්න පුළුවන් නෙ.."

" අයියෙ..!!"

" දැන් කොල්ලො උඹ ඉස්කෝලෙ උගන්නන්න යන්නෙ මොනවද.. ගණන් නේ.."

" ඔව් මාමෙ.."

" සුදුමහත්තයා..!!! මේ කොල්ලව බලාගෙන වත් හරියට හැදියන්.. ගල් ගෙම්බා වගේ ඉන්නවා උඩ පැන පැන.."

මාමා ගෙදර ඉස්සරහා ඉදගෙන බෙරිහන් දුන්න පාර කාමරේ ඇදුම් බෑග් එකට ඇදුම් ගුලි කර කර ඔබ ඔබ හිටපු මාව උඩ ගිහින් බිම වැටුණා.. මේ වයසක මනුස්සයා මේ වයසට මෙහෙම කෑගහන එක හරිද මං අහන්නෙ.. නැනෙ.. පපුවෙ අමාරුවක්කත් හැදුනොත් කසාදෙට කලින්.. මමද ආධ්‍ය අයියව බාරගන්නෙ.. හරි මෙහෙමයි බාරගන්න කැමති තමා.. ඒත් ආධ්‍ය අයියා ඊටපස්සෙ මුළු ජීවිත කාලෙම මූණ කෑදරොක් කරගෙන ඉන්නවා මම බලන්නෙපෑ.. එහෙම හරියන්නෙ නෑ.. දේවදූතයා කඳුළු හැලුවහම ස්වර්ගයට එළිය වැටෙන්නෙ නෑ..

@Shan

අනිකා.. මම යාලුවෙලා ඉන්න එකා.. ඊයෙ රෑ වෙනකල් කිය කිය හිටියේ වරද් හෙට ගිහින් හෙටම එමු.. එහෙම ඉන්න එක හරි නැනෙ නේද.. යැයි යැයි කියලා.. ඊටපස්සෙ පාන්දර තුනට මල නිදිමරගාතෙ නැගිටලා හොටෙල් එකක් බුක් කල්ලා පාඩුවෙ නිදාගෙන ඉදපු මාවත් නැගිට්ටවලා 'ඇඳුම් හදන්නකො තාර පැටියො අපි අද ඉදලා හෙටම එමු.. කමක් නැනෙ' කිව්වා.. මම ඒක ඇහුන්නෑ වගේ පුපට එළිය වැටෙනකල් නිදාගෙන.. ඇහැරුණේ නමයට විතර.. මම නැගිටිද්දි රධ්‍ය අයියා සපත්තුත් එළියෙන් තියලා ඇඳුනුත් මැදලා උදේටත් කාලා එළියේ ඔංචිල්ලාවෙ ඉදගෙන අපේ අම්මා එක්ක හෙන කයියක් දාගෙන ඉන්නවා.. මම නැගිටලා කාලා බීලා නාලා ඉවරවෙද්දි ඒකා ඇදගෙන එළියටත් ගිහිල්ලා ඉවරයි..

අපේ ගෙදර ඔක්කොම ඉස්තෝප්පුවට වෙලා සතුටු සාමීචියෙ යෙදෙනවා.. ආච්චිඅම්මා හාන්සිපුටුවෙ ඉදගෙන රධ්‍ය අයියවත් කිට්ටුවෙන් වාඩි කරවන් කියවනවා.. අම්මා මල් පැළ වගයක් හිටවන්න පාත්ති හදනවා.. ආධ්‍ය අයියා ඔංචිල්ලාවෙ පැද්දෙනවා.. මාමා කොහොඹ ගහට හේත්තු වෙලා සක්කිලි චූටියව අතගානවා.. කොහොමත් අපේ ගෙදර අයනම් 'ලොකු අම්මලා ඇරෙන්න' මෙහෙම තමා.. උදේට කාලා බීලා ඉස්තෝප්පුවට වෙලා කියවනවා.. මම ඒ වෙලාවට ආච්චිගෙ කකුල් වල බෙහෙත් තෙල් එහෙම ගානවා.. නැත්නම් ආච්චි කියවන පත්තරේකට එබිලා හොල්මන් කතාවක් කියවනවා.. නවල් එකක් කියවනවා.. නැත්නම් ෆෝන් එක හරි ඔබනවා..

වැස්සක් වැහැලා පායලා වගේ දානෙ ගෙදර වැඩ ඉවරවෙලා අපේ ගෙදර අර තියන නිස්කලංක කම ආයෙම ඇවිත් තිබ්බා.. ආධ්‍ය අයියට එහෙම ඉන්න එක මැජික් වගේලු.. එයාලගෙ ගෙදර උදේට කාලා බීලා කාමරවලට ගිහින් වැඩක් බලාගන්නවා ඇරෙන්න මෙහෙම කතා කරන්න වෙලාවක් වෙන් වෙන්නෙම නැහැල්ලු.. රධ්‍ය අයියනම් කලින් ඇවිල්ලා අපේ ගෙදරයි ගමයි දන්නවා.. ඇයි කලින් ආපු සැරේ ඇවිද්දනෙ හැම අස්සකම.. වරද් ගහට යමුද.. වරද් ජම්බු කඩන්න යමු.. වරද් ළිදට යමු.. වරද් වෙලට යමු.. වරද් පන්සල් යමු.. වරද් සෝමසිරි මාමට කෑම එක දෙන්න යමු.. වරද්.. වරද්.. වරද්.. මගේ කන් පිරිලා තියෙන්නෙ මගේම නමින්.. වරද්..

" අනුරාග්.. චූටි ඉන්නෙ කැම්පස් යන්නනෙ.. උඩ පැන්නම මක් වෙනවද.."

" කොහොමත් ඔයාට චූටිට මොකක් හරි කිව්වොත් හරි අමාරුවනෙ.."

@Shan

" අමාරුව නෙමෙ.. ඇත්තනෙ කියන්නෙ.. ඔය වයසෙ ඕවා කරන්නැතුව.. ඔයාගෙ වයසට ඇවිල්ලා ඔච්චා කරන්න පුළුවන්ද.. නේද අම්මෙ.."

" අනේ හා.. මූ ඔය අර පොඩි එකාට එක එක ඒවා කිව්වට.. මූ ඔය වයසෙ නඩපු නාඩගම් දන්නෙ අපිනෙ.."

" අනේ අම්මෙ.. ඔක නවත්තගන්නකො.."

" ආඪ්‍ය පුතාට කියන්න මේකා ඒ ලෙවෙල්ම දෙසැරයක් ලිව්වා.. අර ඉස්කෝලෙකට යවලා රස්තියාදු ගහලා ගහලා.. කොහෙද අපිත් ළඟ නැනෙ.. ඔන්න යන්තම් දෙවෙනිපාර තේරිලා තමා විශ්වවිද්‍යාලෙට ගැටුවෙ.. ඒ ගිහිල්ලත් උපාධිය අරගෙන ගියා හමුදාවක බඩගාන්න.. ගිහින් අවුරුදු දෙකක් විතර අන්තරස්දාන වෙලා ඉඳලා ආවා වෙඩි කාගෙන.. අම්මපා මූ වගේ වදයක් මේ කෙල්ලො දෙන්නා දුන්නෙ නෑ.. මම එපෑ මුන් දෙන සේරම ගින්දර උහුලන්න.."

" පොඩි අක්කෙ මේ අම්මට කියනවකො හැමෝම ඉස්සරහා ඔච්චා කියන්නෙපා කියලා.."

" මම මොනවා කියන්නද.. උඹ කරපුවානෙ කියන්නෙ.."

" අනේ රෙද්ද මම යනවා නාගන්න.."

" ඇයි දැන් උදේ නැවා නේව උඹ.."

" වරද් පරක්කු වෙනවා!!!!!!!!!!!!!!!!!!!!!"

" පොඩ්ඩක් ඉන්න එනවා~"

මම එළියට ඇවිත් බැක්පැක් එකයි අනිත් බෑග් එක රඪ්‍ය අයියට දුන්නහම එයා ගිහින් ඒක වාහනෙන් දැම්මා.. මම ආච්චිඅම්මගෙ කර බදාගෙන ආච්චිගෙ කම්මුලට හාද්දක් දුන්නා..

" නිකන් ඉඳුකො සුදුමහත්තයා.."

" එහෙම බෑ ලස්සන කෙල්ලො දැක්කහම ඉඹින්න හිතෙනවා.. නෙහ්.."

ආඪ්‍ය අයියා ඒකට හයියෙන් හිනාවුණා..

@Shan

" අපි ගිහින් එන්නම් ආච්චිඅම්මා.."

" අත්තම්මෙ ගිහින් එන්නම්.."

රධ්‍ය අයියා අපේ ආච්චිඅම්මට වැන්දහම ආච්චි රධ්‍ය අයියගෙ කොන්ඩෙ අතගෑවා..

" පරිස්සමට හරිද.. ඉලන්දාරිනෙ.. මුරණ්ඩු වැඩ කරනවා නෙමේ.."

" පිස්සුද කෙල්ලෙ.. මේ සුදුමහත්තයව විශ්වාස කරන්නකො.."

" විශ්වාස කරන්න හරි එක්කෙනා.. දේව මට ඉදල ගෙනැත් දෙන්නකො..!!"

අපේ අම්මා මල් බාල්දියත් උස්සගෙන අපි ඉන්න පැත්තට ආවා.. රධ්‍ය අයියගෙ අම්මා හැමතිස්සෙම වගේ අපේ අම්මා එක්ක කතාකරන නිසා අපේ අම්මත් දැන් රධ්‍ය අයියට සලකන්නෙ එයාගෙ පුතාට වගේ තමයි.. ඉඳලා හිටලා පිටටත් තඩිබාගෙන යනවා මොකක් හරි ගොං වැඩක් කළොත්.. දැනටමත් ආධ්‍ය අයියයි රධ්‍ය අයියයි නම් අපේ පවුල එක්ක කිට්ටුයි.. හැමෝවම දන්නවා.. අනික එයාලා දෙන්නටම ගෙදර අය ආදරෙයි.. අපි ගෙදර අයට වැඳලා කියලා වාහනේට නැගලා එන්න ආවා.. ආධ්‍ය අයියලා හවස අම්මයි ආච්චියි එක්ක ගමනක් යනවලුනෙ.. රෑට එළියෙන්ම කාලා ගෙදර එනවා කිව්වෙ.. අපි ගෙදර ආවා කියලා වැඩකුත් නෑ.. ගෙදර අය එන්න රෑ වෙනවනෙ..

" ඔයා ඔක්කොම ගත්තද.."

" ඔව්.. ඔයා කලින් කියන්න එපැයි යනවනම්.. ඇයි හදිසියෙම නවතින්න ඕන වුණේ.."

මම නැමිලා සපත්තුදෙක ගලවලා පැත්තකට දැම්මා..

" නිකම්.. වෙනසකටත් එක්ක.. හොඳ නැද්ද.."

" හොඳයි.. ඒත් ඉතින් ඒක පාන්දර තුනටද මතක් වුණේ.."

" ම්ම්.. ඒක දැක්කහම නැවතිලා බලන්න හිතුණා.. අපි නිතර මෙහේ එන්නෙ නැනෙ.."

@Shan

" මම කලින් ඔය කියන එක දැකලවත් නෑ.. කොහෙද තියෙන්නෙ.. හෙන ගාණක් වෙන්නැති නේද.."

" ටිකක් දුරට වෙන්න තියෙන්නෙ.. මේ වරද්.. ඇත්තද අර කුඹුරු ඔක්කොම ඔයාලගෙ අම්මගෙද.. ඉතින් එතකොට තාත්තා වන්දි එවන්න ඕන නැනෙ.. ඒවගෙන් ඉන්කම් එකක් තියෙනවනෙ.."

" මොන පිස්සුද අනේ.. අපේ නෙමේ.. දෙයි අපේ ලොකුඅම්මා මෙන්න ගන්න කියලා.. අනික ආච්චි තාම දේපළ බෙදලා නෑ.. කොහොම ලියයිද දන්නෙ නෑ ඉතින්.."

" එහෙමද.. දැන් ඔයා අපේ ගෙදරට කැන්දගෙන එනකොට මොනවද ඩවුරි එක හම්බෙන්නෙ.. දැනගන්නෙපෑ.. අපේ අම්මා අහලා කියන්න කිව්වා.."

" හම්බෙන්නෙද.. හම්බෙනවා ඉතින් ලස්සන හැඩට ඉන්න කොල්ලෙකුයි.. ඒ කොල්ලා එක්ක ගෙදර පිරෙන්න සිරියාවයි..  හොඳ නැද්ද.."

" සිරියාවෙ හැමතිස්සෙම යුද්ධනෙ බබා.."

" අනේ මේ කටපියාගෙන ඉන්නවා.. ඒකනෙමේ අප්පච්චි දැන් අද ඔයා කොළඹ නාවහම බනින්නැද්ද.. ඔයාලා ඔක්කොම කිසි ගානක් නෑ වගේනෙ ඉන්නෙ අයියෙ.."

" බනීවි.. බනීවි නෙමෙ Me and අයියා gonna die.."

රඩ්‍ය අයියා බෙල්ල ගාවින් හරහට ඉරක් ඇඳලා පෙන්නුවා..

" ඉතින් ඔයාලට බය නැද්ද.. මටනම් කියද්දිත් අප්පච්චිගෙ මූණ මැවිලා පේනවා.."

" අපි මුලින් හොටෙල් එකට ගිහින් බෑග් තියලා යනවද.. නැත්නම් බීච් ගිහින් හවසට හොටෙල් එකට යනවද.. කෝකද හොඳ.."

" ඔයා ප්‍රශ්නෙ මඟාරින්න එපා.. මම ඔකට කලින් උත්තර දුන්නා.."

රඩ්‍ය අයියා හුස්මක් අරගෙන පහළ දැම්මා..

@Shan

" එහෙම බයක් නෑ.. මොකටද බය වෙන්නෙ.. එයාට ඕන ඕන විදියට අපේ ගෙදර කවුරුත් නටන්නෙ නෑ..??"

" ම්ම්.."

" ඉස්සර අපි මුරණ්ඩු වුණොත් අම්මා බැනුම් අහනවා අප්පච්චිගෙන්.. දැන් අම්මා බැනුම් අහන්නෙ නෑ.. අපි මුරණ්ඩු වෙනවා.. අම්මා මුරණ්ඩු වෙන්න උදවු කරනවා.."

" අනේ මන්දා ඕගොල්ලො.."

" දැන් අයියත් පොඩ්ඩක් ගැම්මට ඉන්න නිසා මම මේ බලාගෙන ඉන්නෙ කොළඹ ගිහින් battle එකක් පටන් ගන්න.."

" ඉතින්.."

" අප්පච්චි කොහොම ෆයිට් කරයිද දන්නෙ නෑ.. ෆිෆ්ටි ෆිෆ්ටි.. එක්කො අපි දිනනවා.. නැත්නම් අප්පච්චි දිනනවා.. හැබැයි අප්පච්චි එච්චර ලේසි මනුස්සයෙක් නෙමේ.. සමහරවිට අපි මේ දැනට කරන කියන දේවල් ගැන අපි නොදන්න විදියකට එයා අප්ඩේට් වෙලා ඉන්න පුළුවන්.."

" අනේ මේ මාව බයනොකර ඉන්නවා.. ඔයාලා කාටවත්ම බය නැතිවුණාට මටනම් බයයි.. මොනවා වේවිද කියලා.."

" වෙන්නෙද.. මාමයි අයියයි මැරි කලාට පස්සෙ වරද්ව රධ්‍ය මැරි කරනවා.."

" අනේ වාසනාවන්.. අපි දෙන්නා බැඳලා හදමු ඒයි ෆුට්බෝල් ටීම් එකක්.."

" එකක්..?? දෙක තුනක්වත් හදමු.."

" මරුනෙ ඒයි.. අයි ලව් ද ප්‍රොසෙස් ඇක්චුවලි.."

රධ්‍ය අයියා එකපාරම මං දිහා බලලා පොඩ්ඩක් රතුවෙලා ඉස්සරහා බලාගත්තා..

" උඹ කොහෙන් ගියත් නවතින්නෙ ඔතනින් තමා.."

@Shan

" මෙ දවස්වල නිවාඩු නිසා සෙනඟ ඇති නේද බීච් එකෙත්.."

" ඔව්.. අනික වීකෙන්ඩ් එකක්මනෙ සෙට් වුණේ.. ඔයාලගෙ ගෙදර ඇවිල්ලා ඉන්න එක මාරයි වරද්.. මමනම් කියන්නෙ මාස දෙකතුනකට සැරයක්වත් මෙහේ එන්න ඕන.."

" මෙහෙ නිදහස් නිසාද.."

" ඒකයි.. අත්තම්මා බලන්නයි.. අත්තම්මා කියන ඒවා අහගෙන ඉන්න හිතෙනවා.. අනික මෙහේ කම්මැලි හිතෙන්න කිසිම දෙයක් නැනෙ.."

" ම්ම්.. ඔයාට ඕන්නම් අපිට එන්න පුළුවන්නෙ.. මාමත් දැන් දන්න නිසා.. ඒ අහන්නකො ඔයාට මතකද අර අපි ඇල්ලෙ ගිය දවසෙ ඔයා බැල්කනි එකේ දොර ඇරලා දාලා කියලා පහළට ආවෙ මාව හොයාගෙන.. අර අනේ මගේ ෆෝන් එක සෝෆා එක උඩ තිබ්බා කිව්වෙ.."

" ඔව්..??"

" මම අයියව බැල්කනි එකට දාලා දොර වහලනෙ පහළට ගිහින් තියෙන්නෙ.. එදා මාමා එහේ ඇවිල්ලා.. ආධ්‍ය අයියත් මාර ඩයල් එක තමා හරිද.."

" සිරාවට.. අයියද ඔවා කිව්වෙ.."

" ඔව් හරිද.. අයියගෙ ෆෝන් එක රීසෙට් කල්ල මාමගෙ නම්බර් එක නැතිවෙලා.. ඊටපස්සෙ මගේ ෆෝන් එකෙන් ඒක අරගන්න අපේ කාමරේට ඇවිල්ලා.."

" ඊටපස්සෙ.."

" ඊටපස්සෙ අයියා ෆෝන් එක අරගද්දි මට ඇහැරිලා තියෙන්නෙ.. එයා බැල්කනි එකට ගිහිල්ලා.. මම ඒකෙ දොර වහලා පහළට ගියානෙ.. ඊටපස්සෙ අයියා කොහොම හරි දොර ඇරගෙන පහළට එද්දි ඔයත් නැගිටලා ආවනෙ.. ඒ ටිකකින් තමා මාමා ඇවිල්ලා තියෙන්නෙ.."

" ඒකද.. අර-.. ආහා.. මට තේරුණා.. ඒව් වරද් අපේ අයියා.. මෙලෝ දෙයක් හරියට කරගන්න බෑ.."

@Shan

" බැරිමත් නෑ.. ඔයාට මතකනෙ අයියගෙ ඇක්ටින්.."

" ඉස්කෝලෙ යන කාලෙ ඩ්‍රාමනෙ කලේ.. ඒකද දන්නෑ රඟපාන්න පුළුවන්.."

" වෙන්නැති නේද.. පස්සෙ අපි දෙන්නා මුල ඉඳලම දන්නවා කිව්වහම අයියා කිව්වා හොස්පිටල් එකේ හිටියෙ හරිද.. ජනේලෙන් පැනලා මැරෙනවා කිව්වා ලැජ්ජාවට.."

" එහෙම කිව්වද.."

" ඔව්.. එයාට රිච්මන්ඩ් එකේ කොල්ලො ලස්සනයිලුනෙ.. මාර ලව් එක ඒක.."

" අයියා අපිට හොඳ වුණාට.. මාමට නම්.."

" දමලා ගහන්නෙ.. අතට අහුවෙන්නෙ මොකක්ද දමලා ගහනවා.. ඔයාට මතකද ට්‍රිප් එක ගිහින් ඇවිත් මම ඔයාලගෙ ගෙදර හිටියෙ.. එදා අයියා ස්ටෙත් එක ඩිස්පෙන්සරි එකේ දාලා ඇවිල්ලා ගන්න යන්න ඕන කිව්වනෙ.. රෑ මාමා හම්බෙන්න ගිහිල්ලා මාමා 'ඇපි මේක නැවැච්චමු ශාකි' කිව්වහම.. ආඪ්‍ය අයියා වීදුරු ප්ලාස්ක් එකකින් මාමට දමලා ගහලා.."

" ඒකද අපි ගෙදර යද්දි මාමා බැන්ඩේජ් වෙලාගෙන හිටියෙ.."

" ඔව් අයියම බෙහෙතුත් දාලා.."

රඪ්‍ය අයියා හයියෙන් හිනාවුණා..

" අයියා හෙන අමුතුයි හරිද.. ඔයාට කියන්න වරද් ඉඳලා හිටලා කේන්ති ගියාම එළවලු එහෙම කපන වේගෙට ඒවා උඩින් යනවා.. අඩුවෙන් කේන්ති යන්නෙ.. ගිය වෙලාවට.."

" මට තේරෙනවා.. පව් නේද අනුරාග් පුතා.."

" ඒගොල්ලො ලංකාවෙන් යයිද දන්නෙ නෑ වරද්.. මම හිතන්නෙ කතාවෙ හැටියට ඉන්න පාටක් නෑ වගේ.. මෙහේ ඉතින් ඉන්නත් බෑනෙ කොහොමත්.. දන්නවනෙ.. බබෙක් ඉන්න කාලෙට.."

@Shan

" බබ්බු පෙන්නයි ඔයාලගෙ අප්පච්චියි අපේ අම්මලයි.. රට යන එක හොඳයි.."

රධ්‍ය අයියා වාහනේ උඩ සන්ශෲෆ් එකේ කවර් එක අතින් ඇදලා මෙහාට කලා.. එතකොට වාහනේ ඇතුළට ග්ලාස් එකෙන් එළිය වැටෙනවා හොඳට..

" මිම්.. කෝච් කතාකළාද.. ඔයාට මැච් එකක් එනවනෙ.."

" කතාකළා.. සරනේරු!!! ගමට වෙලා හිටියම මමද තමුන්ගෙ මැචස් වලට ප්ලේ කරන්නෙ.. කරුණාකල්ලා ලබන සතිය වෙද්දි කොළඹ ඉන්න ඕන ගෑවා.. මට මුකුත් කියන්න දුන්නෙත් නෑ ෆෝන් එක කට් කලා.."

" කෝච් ඔයාගෙ ෆෝන් එක දැක්කොත් ගුටි කන්න වෙච් හරිද.."

" සේව් කල්ලා තියෙන විදියටද.. එහෙම තමා වෙළුසුමනයා කියලා සේව් කල්ලා මම බැට්මින්ටන් රැකට් එකකුයි බෙට්ටකුයි දැම්මා.. ඒ මනුස්සයා මගේ නම හරියට කියනකල් මම ඒක වෙනස් කරන්නෙ නෑ..!!"

" තාර පැටියට කේන්ති ගිහිල්ලද.."

රධ්‍ය අයියා මගේ දිහා බලලා කම්මුලකින් හයියෙන් ඇදලා අතෑරියා..

" කේන්ති නෙමෙයි තරහයි.. ඔය වෙළුසුමනයා හරියට මට අපහාස කරනවා.. අර තාන්වී අක්කා එක්කත් කිය කිය හිනාවෙනවා.."

" තාර පැටියා ඔවට කේන්ති ගන්න ඕන නෑ.. මෙ මම ඔයාට ඇත්තම තාරවෙක් ගෙනැත් දෙන්නද.."

මම එකසැරේට හැරිලා රධ්‍ය අයියා දිහා බැලුවා.. කියන්න බෑ මෙයා මොකක් හරි කිව්වහම ඒක කරනවා.. තාරාවෙක් ගෙනැත් දුන්නොත් එහෙම මම ඇඳ යටද ඌව හදන්නෙ. මාමා පෙන්නයි මට තාරාවො..

" අර මොකටද.."

" තාරාවො ආස නැද්ද තමන්ගෙ අය ළඟ තියාගන්න.. ආසයිනෙ..??"

" නෑ මෙ තාරාවා ළඟ තියාගන්නෙ පස්ස ලොකු සුදුඅම්මිලා විතරයි.."

@Shan

රධ්‍ය අයියා එකසැරේම කාර් එක පාර අයිනට කල්ලා නවත්තලා මං දිහා බැලුවා.. මමත් ඇස් දෙක ලොකු කරගෙන රධ්‍ය අයියා දිහාම බලාගෙන හිටියා.. එකපාරට ආදරේ හිතිලා කිස් එකක් දෙන්නද දන්නෑ යන්නෙ.. මම හෙන ලැජ්ජ හිතුණු එකා වගේ ශර්ට් එකේ නූලක් කරක කරක අත් දෙක දිහාබලාගෙන ඉද්දි රධ්‍ය අයියා මං ගාවට කිට්ටු වෙලා කම්මුලට තට්ටුවක් දැම්මා.. ඒ එක්කම සීට් බෙල්ට් එක අන්ලොක් වෙලා ඒක සරාස් ගාලා ඇදිලා ගිහින් දොරේ වැදුණා..

" බැහැලා ඇවිත් වාහනේ ගන්න වරද්.. හැමදාම ගිල ගිල පැසෙන්ජර් සීට් එකේම ඉදගෙන යනවා.. ඉදහන් කොළඹ ගියාම උඹව අල්ලලා දානවා ලර්නස් එකකට.."

" අනේ මේ.. මොන මගුලක්ද මට බෑ.."

සැක්.. මම මොනවද හිතුවෙ..

" බැරි නෑ ගෙනියන්න දන්නවනෙ.. බහින්න බහින්න.. කෝ.."

රධ්‍ය අයියා කිසි හිතක් පපුවක් නැති එකා වගේ කාර් එකෙන් බැහැලා ඇවිත් මගේ පැත්තෙ දොර ඇරලා මාව අතින් ඇදලා නැගිට්ටන්නෙ නැතිවුණාම උස්සලා බිමට දාලා ගිහින් පැසෙන්ජස් සීට් එකෙන් වාඩිවෙලා දොර වහගත්තා.. මූ යකෝ..!! හිටපන් වාහනේ අනිනවා පලු ගහක.. මට කරපු නින්දාවට.. මම අඩි හප්ප හප්ප ඇවිත් ඩ්‍රයිවින් සීට් එකෙන් වාඩිවුණා..

මෙ මනුස්සයගෙ අඩු දිග නිසා මම සීට් එකෙන් වාඩි වුණාම ස්ටියරින් වීල් එක තියෙන්නෙ හත් ගව්වක් විතර දුර.. රධ්‍ය අයියා මං දිහා බලලා කටත් පුම්බගෙන ඉස්සරහා බලාගත්තා.. මම අත දිගෑරලා රධ්‍ය අයියගෙ පිට මැද්දට පාරක් ගැහුවා.. ආවා මෙතන හිනාවෙන්න පොල් කාවයියා..

" මොකද තවුසෙ හිනාවෙන්නෙ.."

" හිනාවෙන්නෑ.. කවුද හිනාවුණේ.. ඔන්න ඔක ඉස්සරහට කරගන්නකො.."

" මට බෑ අනේ ඩ්‍රයිව් කරන්න.. මගේ කකුල කැඩිලා තියෙන්නෙත්.. මේ දැක්කනෙ.."

@Shan

" කමක් නෑ කකුල මම අතගාන්නම්.. ඕක මහලොකු දෙයක්ද.. ඕක ඉස්සරහට අරන් ගානට හදාගන්නකො.. තාරාවොන්ගෙ කකුල් කොටයිනෙ.."

" 5'7 කියන්නෙ කොටද මනුස්සයෝ.. මගේ වටේපිටේ ඉන්න සේරම මට වඩා උස වුණා කියලා මම මක් කරන්නද.. අනික.. අනික.. මම තාරාවෙක් නෙමෙයි..!!!"

මාමි දඩාස් ගාලා සීට් එක ඉස්සරහට ඇදගත්ත පාර සීට් එක ගිහින් ස්ටියරින් වීල් එකට ඇලිලා මැද්දට මම හිරවෙලා පර්ශු ටික කුඩු වෙලා මාව මැරෙන්න ගියා.. නොදකින් හැම ලබ්බම වෙන්නෙ මගේ නොහොදට තමා.. මම ආයෙම ඒක පිටිපස්සට කරගෙන මගේ ගානට සීට් එක හදාගෙන සීට් බෙල්ට් එක දාගත්තා..

" යමු.. පරක්කුයි අපි.. කෝ ගියර් එක ඩ්‍රයිව් දාන්න.."

" හැකේ මම දන්නවා.. ගියර් එක ඩ්‍රයිව් දාගන්නැතුව කටේ දාගන්නද.."

" කටේ දාගන්න මොනවහරි ඕනද.. මගේ සපත්තුව දෙන්නම්.."

රඩ්‍ය අයියා සපත්තුව පෙන්නලා අහද්දි මට දස වලත්ත කතාවක් මතක් වෙලා ඔලුව ගසාගෙන හරි සිහියට ඇවිත් වාහෙනේ හරවලා පාරට දැම්මා.. සෙනුකයා තමා මේවට වග කියන්න ඕන.. කොලු කතා බලලා ඇවිත් එව්වා මට කියනවා.. කියල මගේ මොලේ නරක් වෙගෙන එන්නෙ මට පේන විදියට.. ඌට කියන්න ඕන අනිත් දවසෙ ඔව්වා බැලුවහම අයුක අයියා එක්ක කියපන් කියලා..

" ඒ වරද්..!! ඉරි දෙක කපන්නෙපා බං.. ඔය මොකද කරන්නෙ.."

" ඉතින් කවුරුත් නැනෙ.. මට ඕන්නම් මම කපනවා.. ඇයි ගහන්නද.."

" එහෙම අපිට ඕන විදියට පාරෙ යන්න බෑ.. උඹ මාවත් හිරේ යවන්නද යන්නෙ.."

" ඔයාව හිරේට ගන්න යන්නෙ අනේ.. මෙහ් දැක්කනෙ මම ඕන්නම් කපනවා.."

@Shan

මෙහේ පාරවල් වල එච්චර සෙනඟ නැති නිසා මගේ හිතට අමුතු ගටක් ඇවිත් ඇක්ස්ලේටර් එක හැටටම පාගලා ඉස්සරහින් ගියපු වාහන දෙක තුන ටේක් ඕෆ් කරගෙන පිඹගෙන යන්න ගත්තහම රධ්‍ය අයියා පැසෙන්ජර් සීට් එකේ උඩ කොක්කෙන් අල්ලගෙන අනිත් අතින් ස්ටියරින් වීල් එකේ පැත්තක් අල්ලගත්තා..

" ඒ මරුනෙ වරද්.. මේ බ්‍රේක් එකෙන් කකුල ගන්න මෙහාට.."

" ඒක ඉබේම යනවනෙ එතෙන්ට.."

" නෑ නෑ ඒක පැත්තකින් තියාගෙන තනි කකුලෙන් කන්ට්‍රෝල් කරන්න.. ඇක්ස්ලේටර් එකත් එක්ක ඕක පැගුවොත් එහෙම.. අම්මගෙ වාහනේ හරිද.."

" මෙච්චර දවස් ඔයාගෙ වගේ රූහුවෙ අම්මගෙ වාහනේද අයියෙ.. සිරාවට.."

" අම්මා ඩ්‍රයිව් කරන්නෙ නෑ එච්චර.. මගේ වගේ තමයි.."

" ඇයි ඒ අම්මා ඩ්‍රයිව් කරන්නෙ නැත්තෙ.."

රධ්‍ය අයියා ස්ටියරින් වීල් එකේ පැත්තකින් අල්ලලා වමට කපලා පැත්තකින් අල්ලගත්තා..

" එකවතාවක් අම්මව ඇක්සිඩන්ට් වුණාලු.. එතකොට අම්මා ප්‍රෙග්නට්.. ඒ බබා ඇබෝර්ට් වෙලා.. ඊටපස්සෙ කාලයක් බබාලා නැතුව ඉඳලා මාව හම්බුණේ.. ඒකයි අයියගෙයි මගෙයි ඒජ් ගැප් එක වැඩි.."

එකපාරට රධ්‍ය අයියා කිව්ව කතාවට මාව ගැස්සිලා ගියා.. මට කලින් කවුරුත් එහෙම කතාවක් කියලා නැනෙ.. අම්මවත් කියලා නෑ.. අම්මා ඉඳලා හිටලා මට කතාකලත් සමහර වෙලාවට පැයක් විතර කතාකරනවා.. අම්මගෙ හුඟක් ප'සනල් දේවල් පවා මාත් එක්ක කියලා තියේ. ඒත් ඔහොම කතාවක් කවමදාවත් මම අහලා තිබුණෙ නෑ..

" ඔහ්.. I'm sorry.."

" That's okay.."

@Shan

මට ඊටපස්සෙ මුකුත් කියන්න මතක් වුණේ නෑ.. මට අම්මා ගැන, අම්මගෙ ජීවිතේ ගැන දවසින් දවස දැනෙන දුක ඕනවටත් වඩා වැඩිවෙනවා.. අපේ අම්මට තාත්තා හිටියේ නෑ තමා.. ඒත් අපේ අම්මා, අසලි අම්මා තරම් දුක් විඳලා ඇති කියලනම් මම හිතන්නෙ නෑ.. අම්මා මාත් එක්ක කතාකරද්දි කියනවා එයා රධ්‍ය අයියා ලැබෙන්න ඉද්දිත් මාස හත හමාරක් වෙනකල්ම හොස්පිටල් වැඩ කලාලු.. ඒ කාලෙ යුද්දෙ නිසා අම්මා නිතර දෙවේලෙ දකින්නෙ ලේ නාගත්තු මිනිස්සු විතරලු.. නර්ස්ලා කියනවලු අම්මට හොඳ නෑ බබෙක් ලැබෙන්න ඉද්දිත් වැඩ කරන්න, මෙහෙම නිතර දෙවේලෙ ලේම දකින්න.. කවදහරි ළමයට බලපායි කියලා.. ඒත් අම්මා ඒ ඔක්කොම ඉවසගෙන වැඩ කලාලු..

අම්මා කියනවා අම්මා මුළු ජීවිත කාලෙම මූණ දුන්නු භයානකම අත්දැකීම තමයි යුද්දෙ කියලා..

අප්පච්චිත් ගෙදර නැතුව, ආධ්‍ය අයියව පරිස්සමට බලාගෙන ඉස්කෝලෙ යවලා, රධ්‍ය අයියා හම්බෙන්නත් ඉඳලා, කාගෙවත් උදව්වක් නැතුව අම්මා තනියම හැම වැඩක්ම කළාලු.. මට හිතාගන්න බෑ ඕවා එක්ක බබෙකුත් ඇබෝර්ට් වුණාම ඒක අම්මට කොහොම දැනෙන්න ඇද්ද කියලා.. සමහරවිට අම්මා මට දවසක කියනවා කිව්ව කතාවෙ ඔය ඔක්කොම තියෙයි කියලා මම හිතනවා..

අම්මා කියනවා එච්චර අමාරුවෙන් හදපු ළමයින්ට හිතක් පපුවක් නැතුව ඒ ළමයින්ගෙම අප්පච්චි ගහනවා බනිනවා දකිනකොට අම්මට දරාගන්න බෑ කියලා.. අම්මා කෙනෙක්නෙ ළමයෙක් වදන එකේ අමාරුව දන්නෙ.. පිරිමින්ට කොහොමත් ඒවගෙ ගාණක් නැහැල්ලු.. ඉඳලා හිටලා එහෙමත් පිරිමියෙක් හම්බුණොත් මිසක්.. අම්මා කියන්නෙ දැන් අම්මට හැමදේකින්ම ඈත්වෙලා පාඩුවෙ ජීවත්වෙන්න ඕනලු.. මැරෙන්න කලින් වතාවක් හරි අම්මා ගැන හිතන්න ඕනලු.. අම්මා ආස කෑමක් කන්න.. අම්මා ආස ඇඳුමක් අඳින්න.. අම්මා ආස තැනක ඇවිදින්න යන්න.. හැමදාම තව කෙනෙක් වෙනුවෙන් ජීවත්වෙන එක අම්මා කියන්නෙ හරි අමාරුයිලු.. බැන්දහම දෙන්නා එක්කෙනෙක් වෙනවනෙ.. එතකොට එකිනෙක වෙනුවෙන් ජීවත් වෙන්න ඕන කිව්වත්.. අම්මා කියන්නෙ එහෙම හැඟීමක් අම්ම දැනුනෙ නැතිලු.. ඉතින් රධ්‍ය අයියත් දැන් ලොකු නිසා අම්මා හීමින් එයාලගෙන් ඈත්වෙලා, එයාලා ජීවිත හදාගෙන ඉස්සරහට යන හැටි බලාගෙන ඉන්න ඕනලු.. ඕවා තමා අම්මා මං එක්ක කියවන්නෙ..

@Shan

" මෙහ් දැන් ඔයා ඉස්කෝලෙ උගන්නන්න ආවම අපි සැර් කියන්න ඕනද.."

" ඒ මොකටද.."

" නෑ ඉතින් පොඩි උන් ඔයාට සැර් හැඤේ එන්නකො මගේ පොතට තරුවක් දාලා දෙඤ්ඤකෝ කියනවනෙ.. අපිත් උදේට ඩියුටි යනවනෙ.. දැන් ඔයා මල්ලිකා මැඩම්ගෙ පන්තිය බලාගන්නවනෙ.."

" ඔව්.."

" එතකොට උදේට ග්‍රීට් කරද්දි ගුඩ් මෝනින් රධ්‍ය සර් හැව් අ නයිස් ඩේ කියාගෙන යන්නෝනද.."

" ඔව් ඔව් කියාගෙන යන්න.. උඹලගෙ නල්ලමලේ ඩියුටිය මට බලාගන්න ඕනවෙලා තිබ්බෙ කොහොමත්.."

" බෑ මම ඇවිල්ලා ඔයාට සෙක්ශන් එක මැද්දෙ මෙන්න මෙහෙම කිස් එකක් දීලා කියනවා.. හැව් අ පකින් නයිස් ඩේ මගෙ සුදූඅම්මියො.. පරිස්සමට ඉන්න රත්තරං.. මම දවල්ට උයාව උකුලේ තියාගෙන කවන්නම කියලා.."

" ඔව් ඔව් එහෙම හරි කියලා-වරද්!!! ගුටි කනවා උඹ දැන් මගෙන්.."

රධ්‍ය අයියා මම දකුණට කපපු ස්ටියරින් වීල් එක මට බැන බැන වමට කැපුවා.. මේ මනුස්සයා මට නිදහසේ ඩ්‍රයිව් කරන්නවත් දෙන්නෑ..

" නීල නුවන් සනසන්නම්

රාධාවණී මා එන්නම්

වීණා සරින් නලවන්නම්

රාධාවනී මා එන්නම..~"

" රාධාවණී නෙමෙ සිග්නල් ලයිට් දාලා හරවනවා වරද්.. වැදුණනම් එහෙම පිටිපස්සෙන් ආපු මොකක හරි.."

@Shan

" වැදුන්නෑ අනේ.. වැදෙන්න පාරෙ මොකුත් තියද.. මම ඩ්‍රයිව් කරනවනම් කට පියාගෙන ඉන්න.. හරිද.. ඔයානෙ මාව මෙතන ඉන්දුවෙ.."

රධ්‍ය අයියා මට කියලා තේරුමක් නෑ වගේ හට්ටි මූණක් හදාගෙන සිට් එකට හේත්තු වුණා.. මම යන්නෙ මට ඕන විදියට.. මේ කැලේ මොකෝ සිග්නල් ලයිට් දදා හරවන්න දාහක් වාහන යන්නෙ නැනෙ..

" මියුරු හඬින් මා වෙත ළං

ළං වෙන්නා

තුරුළු වෙලා මුව සිප ගන්නම් මා

නුරාගිනී ඒ

නේක අනන්ත වූ ගීසර

ගයන්නම්..~"

" ඒපාර උඹට මාව ගෑණියෙක් වගේ පේන්න ගත්තද.."

" දෙඅදර සඳ කැන් දහර ඉසින්නී

සොඳුරු සරාගී නෙත ලෙලවන්නී

රුබර රාධා මා මන බන්දා

හැරදා යනු බෑ මා ප්‍රිය රාධා..~"

"....."

" කෝ ඒයි මෙහෙ හැරෙන්නකො.."

මම මූණ හට්ටියක් වගේ කරගෙන අහක බලාගෙන යන රධ්‍ය අයියගෙ මූණ බලෙන්ම මගේ පැත්ත හරවගෙන තොල් වලින් හාද්දක් තිව්වා.. තියලා කලව උඩින් අතක් උඩට අරගෙන එද්දි රධ්‍ය අයියා මගේ අත අරගෙන එයාගෙ ඇඟිලි වල පටලගෙන උකුල උඩින් තියාගත්තා.. සැක්

@Shan

මේ මනුස්සයව වරදට පොළඹගන්න විදියක් නැනෙ පොඩ්ඩක්වත්.. නමෙ වස් කැපිලද මන්දා..

" මෙතනින් කොයි පැත්තට.. ඇසිස්ටන් අක්කේ පාර කියපන් මම දන්නෙත් නෑ.."

" ටර්න් ලෙෆ්ට් වරද්.. මේ මැප් එකේ පෙන්නන්නෙ "

" ඒත් මේ oak ray කියලා තියෙන්නෙ මේ පැත්තටනෙ.."

" කෝ..?? ආ.. බෝඩ් එක තියන පැත්තට යමු එහෙනම්.."

" ඇසිස්ටන් අක්කා වීඩ් ගැහුවද.. අනිවා මේ අක්කා කියන්නෙ මේකෙ පිටිපස්සෙ පාරෙ මොකක් හරි තමා.. පිස්සුනෙ.."

" උඹට තරම් මොලේ නැනෙ මේකට.. ඔන්න ඕක හරවන්නකො.."

" මට වගේ මොළයක් තිබ්බනම් අක්කා මේ අනුන්ට පාර කිය කිය ඉන්නවද.. ඔයාටත් පිස්සුනෙ.. ඔයා ආඩම්බර වෙන්න ඒයි මං වගේ මොලේ ඇති කොල්ලෙක් ලැබුණු එක ගැන.. ආඩම්බරයි නේ.."

" ඩෝ එකේ වොලට් එක තියද වරද්.."

මේ මනුස්සයා මම කියන ඒවා සත පහකට ගනන් ගන්නැතුව දෙරේ තිබ්බ වොලට් එකක් මගෙන් ඉල්ලුවා..

" ඉස්සෙල්ලා කියන්න ආඩම්බරයි කියලා.."

රධ්‍ය අයියා මං දිහා හරිම මහන්සියෙන් බලාගෙන හිටියා..

" ඔව් ඔව් බර වැඩිවෙලා ඉන්නෙ.. දෙනවකො දැන්වත් වොලට් එක.."

මම රධ්‍ය අයියට දෙකක් රවලා ඩ් එකේ තිබ්බ වොලට් එක අරගෙන උකුළට දැම්මා.. බර වැඩිනම් නිදහස් කරගන්නෙපෑ.. වරෙන්කො අපේ ඉස්කෝලෙ උගන්නන්න.. මම ආයෙ මුළ ඉඳලා පලි ගන්නවා මේ සේරටම..

" උඹ හිතන ඒවා මට මෙහෙට ඇහෙනවා වගේ.."

@Shan

මමත් ඌ කිව්ව එක ඇහුනෙ නෑ වගේ වාහනේ ඇතුලෙ තිබ්බ නමක් ගමක් දනැති ස්ලිපර්ස් දෙක දාගෙන වාහනෙන් බැස්සා.. ඇත්තටම ඒ හොටෙල් එක ලස්සනයි තමා.. මම ඒ වුණාට කලින් මෙහෙම හොටෙල් එකක් ගැන අහලා නෑ. සමහරවිට ළඟදි ඕපන් කරපු එකක් වෙන්නැති.. මම වාහනෙන් බැස්සහම රධ්‍ය අයියත් වාහනෙන් බැහැලා මාවත් ඇදගෙන හොටෙල් එක පැත්තට ඇවිදගෙන ගියා.. මමත් සරුංගලේ වරල් සැලේ වගේ ඒ පස්සෙන්ම ඇදීගෙන ඇතුළට ගියා.. සිරාවට මේක මාර ලස්සනයි.. හැපීකවච්චත් මාර තැන් තමා හොයාගන්නෙ.. මෙහෙනම් අද රෑට නැවතුණත් පාඩු නෑ..

ඊටපස්සෙ කවුන්ටර් එකෙන් බුක් කරපු කාමරේ කී එකත් ඉල්ලගෙන ලන්ච් එකත් සර්ව් කරන්න කියලා රධ්‍ය අයියයි මමයි අපිට හම්බෙලා තිබ්බ රූම් එකට ගියා.. ඒ හොටෙල් එක කොළ පාටයි.. හුගක් ඕපන් වෙන්න හදලා තිබ්බෙ ග්ලාස් වලින්.. ඉතින් කර්ටන් එකක් පොඩ්ඩක් මෙහාට කරාම එළියෙ ඔක්කොම පේනවා..

" වෝහ්.. මෙහේ මරුනෙ.."

" ඔයා කැමතිද.."

" ඔව්.. මාර ලස්සනයි නේද.."

මම ස්ලිපර්ස් දෙක ගලවලා බූල් කාපට් එක උඩින් පැන පැන ගිහින් ඇඳ මැද්දට පතබැවුණා.. හනේ මේ ඇඳනම් රධ්‍ය අයියගෙ ගෙදර ඇඳටත් වඩා ශෝක්.. වැටුණගමන් නින්ද යනවා.. මම ඇඳේ වටයක් පෙරළිලා එළියෙ පේන දේවල් මොනවද කියලා හෙව්වා.. නිල්ම නිල් පාටට අහස පේනවා.. බිම කොළම කොළ පාටයි.. මට ඉස්සරහින් තියන ඒ සී එකෙන්, එන හුළං පාරවල් වලට මගේ මූණට වැටිලා තියෙන කොණ්ඩෙ ලාවට එහෙ මෙහෙ වෙනවා.. ටිකකින් රධ්‍ය අයියත් ඇවිත් මං ගාවින් හිටගෙන එළිය දිහා බලාගෙන හිටියා..

" පුළුවන් නම් මේ හොටෙල් එක අයිති කාටද කියලා ගෙස් කරන්න.."

" ඈ අපි දන්න කෙනෙක්ද.. මේ හොටෙල් එක..??"

" ම්ම්.."

@Shan

කවුද බොලේ අපි දන්න එක්කෙනා.. මෙච්චර හොටෙල් එකක් ගහන්න තරම්.. මම කල්පනා කලා.. කල්පනා කල්ලා කල්ලා කල්ලා අන්තිමට.. පත්තුවුණා..!!

" සිංහවංශ ඇමතියගෙ.. මම හරිනෙ.."

" ම්ම්.. අයුක තමා මේක ගැන කිව්වෙ.. ඌට මොනවද ඩොකියුමන්ට්ස් වගයක් ඕන කියනවා. ඒක ගනන්න් එක්ක තමා මෙහෙ ආවෙ.."

" එහෙමද.. මේක අයුක අයියගෙ නමට තියෙන එකක්ද.."

" පසුපැවරිල්ල යන්නෙ අයුකට හරි චමිරුට හරි.. අයුකට ඒක ක්ලියර් කරගන්න ඕනලු ලෝයර් එක්ක කතාකල්ලා.."

" කවුද ඔච්චා මෙහෙ ඉඳලා කරන්නෙ ඉතින්.."

" ඔයාගෙ යාළුවා තමයි.."

" අපේ සෙනුකයා..?? ටසිරි මූ යකෝ.."

අපේ සෙනුකයා දැන් කෙලින්ම අයුක අයියගෙ පවුලටම ඉන්වෝල් වෙලා ප්‍රශ්න විසඳවන.. මූ කිව්වෙවත් නැනෙ එහෙම එකක් ගැන.. මකන්නෙපෑ සෙනුකයව.. සමහරවිට ප'සනල් දේවල් මොනාහරි ඇති.. ඒත් මේකා හෙන ෆෝවර්ඩ් නෙ.. මම හිතුවෙ තාම බයගුල්ලා වගේ ඇමතිපුතාගෙ බොඩිගාඩ් කෙනෙක් දැක්කත් වෙවුලනවා ඇති කියලා..

මම රධ්‍ය අයියගෙ අතකින් ඇදලා මගේ ඇඟ උඩට වට්ටගත්තා.. මේකා ටොන් ගානක් බරයිනෙ.. තා ටිකෙන් මගේ පණ යනවා බෝයිපෙන්ව ඇඟට වට්ටගෙන.. මා රධ්‍ය අයියගෙ බෙල්ල වටේ අත් දෙක ඔතාගෙන කම්මුලට හාද්දක් දුන්නා..

" වරද්..??"

" ම්ම්..??"

" ඇයි මේ.."

" I missed you.. I missed you so much.."

@Shan

රධ්‍ය අයියා මගේ ඇස් දිහා මාරුවෙන් මාරුවට බලාගෙන ඉඳලා ලාවට හිනාවුණා.. එයාගෙ එකට ගැවෙන ඇහිබැම, දිග ඇස් පිහාටු ඒ බැල්ම.. මම හුඟක් ආසාවෙන් මතක තියාගෙන ඉන්නවා.. මම හුඟ කාලෙකට පස්සෙ අද ආයෙම එයාගෙ ඇස් ආදරෙන් පිරිලා ඉතිරිලා ගිහින් තියෙනවා දැක්කා.. මට පොඩ්ම පොඩි අදහසක්වත් නෑ මම පහුගිය කාලෙ ගෙව්වෙ කොහොමද කියලා.. ඒක හුඟක් අමාරුවුණා කියලා විතරක් මම දන්නවා.. ඇත්තටම.. මට එයාව හුඟක් මතක් වුණා..

"I also missed these strange brown eyes that took my very soul from me.."

රධ්‍ය අයියා මගේ ඇහිපිය වලට යටින් හිමිහිට හාද්දක් තිබ්බා.. තියලා මං දිහා හරි බර බැල්මකින් බලාගෙන හිටියා.. ඒ ඇස් වල තියන ආදරේ හිතෙන බැල්මට මාව ඉබේම රතුවෙනවා මට දැනෙනවා..

" If you blush like that, we won't go to the beach today.."

රධ්‍ය අයියා කට කොනකින් හිනාවෙලා එහෙම කිව්වහම මට හිනා ගියා..

" Why don't we go..??"

" ඒක දන්නෑ.. නිකන් ඉඳහන්.. අර මාමා කිව්වා වගේ උඹ මායං වෙනවා.. බලන් යද්දි අපි තමා පරිස්සම් වෙන්න ඕන.."

" යාළුවෙලා ඉන්න එකා ඉස්සරහා මායං වෙන්නැතුව.. ඔයා මාර කතානෙ කියම්ම්ම්හ්-ම්ම්!! අයියෙ..!!"

මා රධ්‍ය අයියගෙ පපුවට පාරක් ගහලා එයාව එහාට තල්ලු කරන්න හැදුවත් එයා පොඩ්ඩම පොඩ්ඩක්වත් එහාට ගියේ නෑ.. ඒ වෙනුවට මගේ ඉණ වටේ එක අතක් යවලා මාව එයාගෙ ඇඟට තද කරගෙන මගේ තොල් වලට පහත් වෙලා පොඩි පෙක් එකක් තිබ්බා.. මගේ අතක් ඉබේම එයාගෙ ශර්ට් එක ගුලි කරගත්තා..

" I love to hear the way you say 'අයියෙ' when you turn on.. It's so seductive.."

ඒ එක්කම රධ්‍ය අයාගෙ එක සීතල අතක් මගේ ශර්ට් එක යටින් උඩට ඇදගෙන එනවා මට දැනුණා.. මම ඒ නිසා එහෙටයි මෙහෙටයි ඇඹරුණා..

@Shan

" Arh..!! don't squeeze my chest hard.. it hurts because of youඅහ්.."

මම කියන්න ගිය එකත් මට අමතක වෙලා යන තරමට රධ්‍ය අයියා මගේ තොල් කිස් කරන්න පටන්ගත්තා.. හරියට දනක මාස හතරකට කලින් දවසෙ වගේ.. මගේ එක අතක් ඇඳට තියලා තද කරගෙන එයා මගේ ඇඟට තව තෙරපුණා.. ඒ විනාඩි ගානට අපි දෙන්නා අතට උපරිම ටෙන්ශන් එකක් තිබ්බා.. හුස්ම ගන්නවත් සිහියක් නැතුව එයා මගේ තොල් උරාබිව්වා.. මම ඒකට අකමැති වුණේ නෑ.. ඒ නිසාම මගේ අත් එයාගෙ කර වටේ එතිලා තිබ්බා.. සැරින් සැරේ එයාව සීරුවා.. ඊයෙ මගේ බෙල්ල ගාව තිබ්බ රතුපාට කැලල අද වෙද්දි ලා දම්පාට වෙලා තිබුන නිසා රධ්‍ය අයියා එතනින් පොඩි හාද්දන් තියලා මගේ ශර්ට් එක උඩට උස්සලා පපුවට පහත් වුණා..

" අ-අහ්.. හහ්.."

මගේ අතට රධ්‍ය අයියගෙ කොන්ඩෙ අහුරක් ගුලි වුණත් එයා කරගෙන යන වැඩෙ පොඩ්ඩක්වත් නැවැත්තුවෙ නෑ.. එයා මගේ දිහා ඇස් යටින් බලද්දි මම ඒ ඇස් මහැරලා උඩ අතට හරවගත්තා.. මගේ ඇස් පියවෙන්න එනවා.. සැරින් සැරේ.. වෙලාවකට ඒවා උඩ අතට දිගැරෙනවා..

" අහ්-අයියෙ-අ-හ්ම.."

*****ding dong****

" එක්ස්කියුස් මී සර්.. ලන්ච් සර්ව් කරන්න පුළු-"

රධ්‍ය අයියා 'ඕ ශිට්' කියාගෙන මගෙන් එහාට වෙලා ශර්ට් එකත් පහලට දාගෙන දොර අරින ගියාම මම කොට්ටයක් අස්සට මූණ ඔබාගත්තා.. එක්කො බීච් යන එක හොඳයි..!



oak ray

මම ආවා ලමයිනේ.. ඕතරිට නිදිමතයි අයියෝ.. ආයෙ ඉක්මනටම අප්ඩේටුවක් අරන් එන්නම් හොදේ.. මට බඩ්ඩක් හම්බුණා.. ඒ ටික ඊළඟ වැප්පේ දාන්නම් හරිද..

@Shan

මේ දවස්වල ඔතරීගෙ ජංගම දුකේ කොල්ලො වැහි වැහැලා.. පුදුමාකාර දළඹුවො ටිකක් තමා සංගම් හදාගෙන රධ්‍ය සොයන මෙහෙයුම දියත් කල්ලා තියෙන්නෙ.. #බයත්_හිතෙනවාබොලව්

එන්නාම්.. ලව් යූ.. ❤

Radhya - 6'

Waradh - 5' 7

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 122 කොටස

" ඒ මාර අව්වයිනෙ.. පිච්චෙනවා වගේ.."

මම මූණට උඩින් අතක් තියාගෙන රධ්‍ය අයියගෙ හෙවනැල්ලට මුවා වුණා..

" අර ලිට් සොසයිටියෙ රහපෑවා වගේ.. කුඩයක් ගෙනැත් දෙන්නද කරක කරක ඉන්නෙ.."

" කුඩෙ අරගෙන ගහගන්නවා-"

රධ්‍ය අයියා මගේ දිහා ඇහිබැම අකුලලා බැලුවහම මම පොඩ්ඩක් එහාට වෙලා හිටගත්තා.. ඒත් ඇත්තනෙ.. අර හෙන පොඩ් කාලෙ ගෑණියෙක්ට ඇඳගෙන ඩ්‍රාමා එකක හිටපු නිසානෙ මේ මිනිහා මට මෙහෙම අපහාස කරන්නෙ.. සිරිමැටි සිත්තරාවියි, කුඩ කෙල්ලොයි, ෆ්ලෙමින්ග් ජූන්ලයි මෙ ලෝකෙ ඉන්න සේරම ගෑණු චරිත මේ මනුස්සයට මගෙන් පේනවද දන්නෙ නෑ.. මටනම් රධ්‍ය අයියගෙන් පේන්න තියෙන්නෙ පස්සයි පොළොස් කොට්ටෝරුවෙකුයි විතරයි.. වෙන මොකුත්ම පේන්නෙ නෑ.. පස්ස විතරක් පෙනුනහම හොඳටම ඇති මටනම්.. මම කියන්නෙ ඒක ඉතින් ඇහැට කනට පේන්න තියනවනෙ.. කනට පෙන්නෑ හැබැයි.. ඇහැට පේනවා.. මගේ අතට දැනෙනවා..

" ගහගන්නවා??"

" සාක්කුවෙ අනේ සාක්කුවෙ.. මොකද ඔහොම බලන්නෙ.. මම ඔයාට සිප්පි කට්ටක් අහුලලා දෙන්නද ඒයි.."

" ඕන නෑ.."

" නැත්තෙ නෑ ඉන්න හොයලා දෙන්න.. සිප්පි කට්ටක්.. ඔයාට ලොකු එකක්ද ඕන.."

මම බිමට නැමිලා වැල්ලෙ සිප්පි කටු තියෙද කියලා බැලුවා.. රධ්‍ය අයියා තියන බලු කමට අර ලොකු තාරාවෙක් වගේ ශර්ට් එකම මට ඇඳගෙන එන්න කියලා සෑහෙන්න බලහත්කාරකම් කල්ලා, අන්තිමෙ බැල්කනියෙනුත් පහළට තල්ලු කරන්න ගිහිල්ලා මම ජීවිතේට තියන

@Shan

ආසාවට කහපාට තාරාවෙක් ඉන්න ලොකු ටී ශර්ට් එකයි ඒකට කොට ශෝට් එකකුයි ස්ලිපර්ස් දෙකකුයි  දාගෙන බීච් එකට එන්න ආවා.. අපි එද්දිත් හුඟක් අය බීච් එකේ ඉන්නවා. හුඟක්ම හිටියේ ෆොරිනර්ස්ලා.. එයාලා බිම මැට් එලාගෙන පස්සවල් උඩ දාගෙන අව්ව තපිනවා.. මටනම් තේරෙන්නෑ මේ ගිනිගහන අව්වෙ මොනවා තපින්න තියෙනවද කියලා.. ලංකාවෙ ජීවත්වෙන මනුසයෙක් හැටියට අපේ හම මෙහෙම හරි ඉතුරුවෙලා තියෙන එක හොඳයි අපි අව්වෙ ඉන්න තරමට.. ස්පෝර්ට්ස් මීට් කාලෙ ජැකට් අරවා මේවා දාගෙන හිටියත් අම්මටසිරි වෙන්න පිච්චෙනවා..

රධ්‍ය අයියගෙ කැම්ප් ට්‍රේනින් පීරියඩ් එක කොහොමද කියනවනම් එයාගෙ පාට සම්පූර්ණෙන්ම වෙනස් වෙලා තිබ්බෙ.. ඒකත් කළු නෙමේ.. ඇඟ තැනින් තැන පිච්චිලා වගේ දුඹුරු පාට පැල්ලම් හිටලා.. රධ්‍ය අයියා කැඩෙට් කරපු නිසා මම කොහොමත් එයාව දැකලා තියෙන්නෙ හුඟක් වෙලාවට පිච්චිලා ඉන්නවා තමා වවුල් පැටියා වගේ.. ඇත්ත පාට වැටිලා තිබ්බෙ කැඩෙට් වලින් අයින් වෙලා හිටිය ගිය අවුරුද්දෙ අන්තිම හරියෙ.. රධ්‍ය අයියගෙ ඇත්තම ඇඟේ පාට සුදුම නෙමෙයි.. දුඹුරුත් නෙමේ.. මැද හරියෙ පාටයි.. මීපැණි ගාලා වගේ අව්වට පේන පාටක්.. රධ්‍ය අයියා අව්වෙ හිටගෙන ඉද්දි ඉර එළිය ඇස් දෙකට වැටිලා ඒවා විනිවිද පේන්න ගන්නවා.. මම ඒකට කැමතියි..

" මේක සිප්පි කට්ටක්ද ඒයි.."

මම බොරුවට අවධානෙ ගන්න සිප්පි කට්ටක් අහුලලා රධ්‍ය අයියගෙ අතින් තිබ්බහම එයා ඒක දිහා බලාගෙන හිටියා..

" මේක sunray venus එකක්.. දන්නවද.."

මම ඔලුව වනලා නෑ කිව්වා.. ඇත්තටම මම සිප්පි කටු සේරම ජාති වලට සිප්පි කටු කියනවා ඇරෙන්න.. ඒවගෙ නම දැනගෙන ඉඳලා නෑ.. තියා එහෙම දැනගන්න ඕන කියලා අදහසක් මගේ තුන්හිතකටවත් මෙච්චර කල් ඇවිල්ලා නෑ..

" අයුක ශෙල් කලෙක්ටර් කෙනෙක්.. ඔබ්සෙස්ඩ් සී ශෙල්ස් වලට.."

" අයුක අයියා..?? සිරාවට.."

@Shan

" මම.. මමයි කියානුයි පොඩි කාලෙ අයුකයගෙ ගෙදර ගියාම ශෙල් කලෙක්ශන් එක බලනවා.. ඌ ගාව රෙයාම සී ශෙල්ස් පවා තියනවා.."

" මාරයිනෙ.."

කොහොමත් රෙයාම ඒවා ඇති තමා.. සල්ලි තියෙනවනෙ නාන්න ඒ කාලෙ.. සෙනුකයා මට දවසක් කිව්වා අයුක අයියගෙ කාමරේම උගේ ගෙදර විතර ඇතිලු.. එච්චර විසාලයි කියලා.. තනිකරම උඩ තට්ටුවෙ ඉන්න අයුක අයියා විතරලු.. සෙනුක දවසක් එහේ ගියා කිව්වනෙ.. අයුක අයියා ඇවිල්ලා තනිකරම අමුතු ඩයල් එකක්.. ඒත් අයුක අයියට කේන්ති යනවා.. කේන්ති ගියාම යකෙක් වගේ.. රධ්‍ය අයියා මාත් එක්ක කතාකරන ටිකවත් අයුක අයියා සෙනුකයා එක්ක කතාකරන්නෙ නෑ මම දැකපු විදියට.. සෙනුක කිව්වෙ අයුක අයියා ඕවර්තින්කර් කෙනෙක් කියලා.. හැමදේම උවමනාවට වඩා හිතලා හිතලා සෙනුක කවමදාවත් හිතන්නෙ නැති දේවල් පවා හිතලා දුක් වෙනවා කියනවා.. ඒකතමා ඒ දවස්වල වත්සල් මාව දාලා යනවා කියලා රධ්‍ය අයියට කියලා ඇඩුවෙ.. ඊටපස්සෙ සුයිසයිඩ් කරගන්නත් ගියා..

මටනම් හිතෙන්නෙ සෙනුකයා ඇරෙන්න අයුක අයියා එක්ක කාටවත්ම ඉන්න බෑ.. සෙනුකයා හැමදේම තේරුම් අරගෙන ඉන්න නිසා හොඳයි.. ඔහොම මුල් කාලෙ තිබ්ලා දැන්නම් සෙනුකයා ලිඩ් එක අරගෙන ඉන්නෙ.. අයුක අයියව ගානට හදාගෙන.. ඉස්සර බස් එකකවත් යන්න දන්නෙ නෑ.. ඩ්‍රයිවර් කකුල් දෙක ගාවට එනවා.. එක්කන් යනවා.. සර්වන්ට්ස්ලා ඉන්නවා.. හැමදේම අතට පයට කල්ලා දෙනවා.. ඒක නිසා අයුක අයියා මුරණ්ඩු පෙනුමයි.. ඔහොම මොකක් හරි වෙලා තමා සෙනුකයගෙන් හොඳවයින් කනේ පාරක් කාලා අහගන්න ඇත්තෙ..

" ඔයා දන්නවද සී ශෙල් එකක් කාටහරි දුන්නම ඒකෙ තේරුම මොකක්ද කියලා.."

" නෑනෙ.."

රධ්‍ය අයියා හිනාවෙලා සිප්පි කට්ට එක සැරයක් උඩ දාලා අල්ලගෙන ඒක සාක්කුවෙ ඔබාගත්තා.. ඊටපස්සෙ අපිට පොඩ්ඩක් එහායින්තිබ්බ මැට් එකේ ගිහින් ඉඳගත්තා.. මාත් හුළහට ඇවිස්සිලා තියෙන කොණ්ඩෙ අත් දෙකෙන් අල්ලගෙන ගිහින් රධ්‍ය අයියට ඉස්සරහින් කකුල් දෙකත්

@Shan

බැඳගෙන ඉඳගත්තා.. අපිට ඉස්සරහින් ලොකු කුඩයක් හිටවලා ඒකෙ හෙවනැල්ල තිබුණු නිසා මැට් එකට ඉර එළිය එච්චර දැනුණෙ නෑ..

" කියන්නකො තේරුම මොකක්ද කියලා.."

" Abundance & good fortune.. එච්චර ප්‍රසිද්ධ නැතිවුණාට සිප්පි කටු කියන්නෙ.. Like a symbol of love..

**intense love**

.."

" ඔයත් බලන් යද්දි ඇවිදින පුස්තකාලයක් වගේ එකක්නෙ.. මම හිතුවෙ ආඪ්‍ය අයියා විතරයි කියලා.. එහෙම නෑ..!"

" ඉතින් ඒ මගේ අයියනෙ.."

" ඔව්.. හැබැයි ආඪ්‍ය අයියා කියවන්නෙ එයාගෙ සබ්ජෙක්ට් එක ගැන විතරනෙ.. ඔයා හම්බෙන හැම එකම කියවනවා.. පොත්ගුල්ලො දෙන්නා.."

" ඒ වුණාට මම ළඟදි මොකුත්ම කියෙව්වෙ නෑ.."

" ඒ ඇයි.."

" නිකම්.. කියවන්න හම්බුණේ නැනෙ.."

" කැම්ප් හිටිය නිසාද.."

" ඔව්.. ඒත් ඊටත් කලින් ඉඳලා මම තාම හරියට කියවලා ඉවරකරපු මොකුත් පොත් නෑ.."

" ඔයාට කැම්පස් යද්දිනම් හුඟක් පොත් කියවන්න වෙව්.. ඉලෙක්ට්‍රිකල් අමාරුයි කියලා ආඪ්‍ය අයියත් කිව්වා.. මන්දා ඇයි ඔයා අමාරු ඒවම තෝරගන්නෙ.."

" ආස නිසා.."

@Shan

" හරි ඔයා දැන් ඉලෙක්ට්‍රිකල් ඉන්ජිනියරින් ඩිග්‍රි එක ගත්තා කියමුකො.. ඊටපස්සෙ.."

" ඊටපස්සෙ ආයෙ ඉගනගන්නවා.."

" මොකක්.."

" ඇයි.."

" ආයෙ ඉගනගන්නෙ ඇයි.."

" ආස නිසානෙ.."

රධ්‍ය අයියා මගේ විකාර වෙලා ගියපු මූණ දැකලා ආයෙම හයියෙන් හිනාවුණා..

" ඔයා කැම්ප් වලට හරියන්නෑ තමා.. එතකොට ඔයා ඉස්කෝලෙ යන කාලෙ කැඩෙට් කලේ..??"

" එකක්.. අප්පච්චිගෙ උවමනාවට.. අනික මම කැඩෙට් කලේ කැමැත්තෙන්.. ඒ කාලෙ මට ගෙදර ඉන්න උවමනාවක් තිබ්බෙ නැති නිසා කලා.."

" ඔයාට ඔක්කොම බැලන්ස් කරගෙන ඒලෙවෙල්ස් කරගන්නත් පුළුවන් වුණානෙ.. මාරයි අනේ.. මටනම් ඔහොම බෑ.."

" බැරි මොකද.. අර කලේ.."

" ඒක කරපු හැටි ඔයා දන්නවනෙ.. මගේ හොඳ පණ ගියා.."

" එදිනෙදා වැඩ එදිනෙදා කරන්න වරද්.. එහෙම තමා හැමෝම කරන්නෙ.."

රධ්‍ය අයියා හෙන චාටර් විදියට කියලා ස්ප්‍රයිට් කෑන් එකක් කඩලා මට දික් කලා.. මෙකා ප්‍රයිස් ගිවින් ස්ටේජ් එකේ කිව්ව තඩි පවෙ තමා ඔක.. එදිනෙදා වැඩ එදිනෙදා කරන කතාව.. තනිකර බොරුවනෙ.. එදිනෙදා වැඩ කරගන්නත් මෙකා ගෙදර ඉන්න එපැයි.. හැමදාම බැලුවොත් රන්ටැඹෙ බඩගානවනෙ.. මම ඇහුවම ඇයි එහෙම කිව්වෙ කියලා 'ඇයි හැමෝම

@Shan

කියන්නෙ එහෙම නෙමෙයිද' කියලා මගෙන් ඇහුවා.. මම ඉතින් කටපුප වහගෙන පාඩුවෙ හිටියා.. අහලා වැඩක් නෑ කියලා තේරෙනවනෙ..

" එහෙම නෙමෙ අනේ.. මම සිරාවට අහන්නෙ.. හැමදාම උඩින් පල්ලෙන් උත්තර දෙනවා විතරනෙ.."

" ඔයා කාපු කට්ටම මාත් ඇද්දා ඉතින්.. අපේ අයියා හිටියනෙ.. අයියා මාර විදියට මට එක්සෑම් එකට සපෝට් කළා.. කැම්ප් ගියාම නෝට් ඉල්ලලා ලියලා දෙනවා.. ක්ලාසස් වල සර්ලා හම්බෙලා කතාකරනවා.. විස්තර අහගෙන ගෙදර ඇවිත් කියලා දෙනවා.. කම්බයින්ඩ් නම් අයියට මෙලෝ දෙයක් තේරෙන්නෙ නෑ.. අන්තිම මාස වල ගෙදරටත් ටියුශන් ආවා.. මට සෑහෙන්න මගෑරිලා තිබ්බෙ කැඩෙට් නිසා.."

" අයියා ඔයාව තේරුම් අරගෙන ඉන්න එක කොච්චර හොඳද.. ඔයා මාර ලකී ආඪ්‍ය අයියා වගේ අයියා කෙනෙක් ලැබෙන්න.."

" මම.. අයියා සතුටින් ඉන්නවා දකින්න මම ආසාවෙන් හිටියෙ.."

" දැන් ඒ ආසාව හරිද.."

" ඔව්.. මගේ ආසාවල් වලින් හුඟක් හරි ගිහින් තියෙන්නෙ.."

" තව පොඩ්ඩයිද ඉතුරු.."

" එහෙම තමා.."

" එහෙනම් ඒ ඉතුරු ඔක්කොමත් හරියන්න කියලා තමා මම ඔයාට අර සී ශෙල් එක දුන්නෙ.. දැන් ඔක්කොම හරි යනවා.."

" එහෙමද.."

" ඔව්.."

රඪ්‍ය අයියා මං දිහා මොකුත් නොකිය බලාගෙන ඉඳලා ඉක්මනට වෙන පැත්තක් බලාගත්තා.. දවසක මට කවරුහරි කියවන්න පුලුවන් මොකක් හරි පවර් එකක් හම්බුණොත් මම ඉස්සෙල්ලම කියවන්නෙ රඪ්‍ය අයියව.. එයා හිතන දේවල් මට කියවන්න ආසයි..

@Shan

" මට ගෙදර යන්න හිතෙන්නෙ නෑ වරද්.."

රඨ්‍ය අයියා අතේ තිබ්බ ස්ප්‍රයිට් කෑන් එකෙන් උගුරක් බීලා පැත්තකින් තිබ්බා..

" ඔයාගෙ ගෙදර මම නෙමෙයිද.."

මම රඨ්‍ය අයියගෙ ඇඟිලි වල මගේ අතක ඇඟිලි පටලගත්තම එයා මගේ අතේ මුද්ද දිහා බලාගෙන ඉඳලා මගේ දිහා බැලුවා..

" ඔයා තමයි.."

" මට තේරෙනවා.. ඔයා හිතන්නෙ ඉස්සරහට වෙන්නෙ මොනවද කියලනෙ.. නේද.."

" ම්ම්.."

" මමත් හිතනවා.. මොනවා වේවිද කියලා.."

" අප්පච්චි අයියව අතෑරලා දාලා තියෙන නිසා අයියගෙන් බලාපොරොත්තු වෙන දේවලුත් මගෙන් බලාපොරොත්තු වෙනවා.. ඒ නිසා මට වෙලාවකට මොනවා වේවිද කියලා හරියටම කියන්න බෑ.."

" ඇයි අප්පච්චිට බැරි ඔයාලා 'ඔයාලා' විදියට පිළිගන්න.. මම දන්නවා අප්පච්චි ඔයා පස්සෙන් එළවනවා කියලා.. මට අම්මා කිව්වා.."

" අම්මා ඔයාට හරි එකතුයි නේද.."

" ඔයාගෙ ලෙඩෙන් පොඩ්ඩක් අම්මට තියෙනවා.. අම්මට මාව බෑණා වගේ නැතුව ලේලි වගේ පේන්න අරගෙන.. ලේලිලා නැන්දම්මලා ඔපදූප කියවන්නෙ.. ඒ වගේ අපි කියවනවා.."

" මුලින්ම හම්බුණේ කොහොමද.."

" අපි හම්බුණා මගේ බර්ත්ඩේ එකට සතියක් තියලා.. ඉස්කෝලෙ ගාවට ඇවිත් හිටියා.. ඊටපස්සෙ අම්මාමාත් එක්කගෙන කැෆේ එකට ගියා.. අපි දෙන්නා කේක් කකා කෝපි බිබී කියවලා කියවලා ආවා.."

@Shan

" මොනවද කිව්වෙ.."

" ඒවා කියන්නෑ.. අපේ අපේ කතා.. ඔයාටයි අපේ ආච්චිටයි තියෙන්නෙ.. ඒ වගේ.."

" එහෙමද.."

" ඔව් අම්මා තමයි මට මුලින්ම බර්ත්ඩේ එකට විශ් කලේ.. ඔයා අපි දැන් ඉන්න තැනට ඇවිල්ලත් නැනෙ.. කොළඹ ගියාම එන්න හරිද.."

" අපේ අයියත් ඉන්නෙ එහෙනෙ.."

" ඔව් මහගෙදර වගේ.. හෙන ආතල්.. ඒ ජෝඩුව එක්ක ඉන්න එකනම්.. ඔයාට ගියහම තේරෙයි.."

" ම්ම්.."

" මම ඔයාට දවසක් කිව්වා මතකද ඔයාගෙ මූණෙ හිනාවක් දකින්න මම ඕනම රිස්ක් එකක් ගන්නවා කියලා.."

" ඔව්.. මතකයි..??"

" ඒකනිසා හිනාවෙලා ඉදපන්.."

මම රධ්‍ය අයියගෙ මූණ ගාවට කිට්ටු වුණා.. ඉදලා ඉදලා මොකක් හරි එකක් කියනවා.. මට මෙලෝ විදියට තේරුම් ගන්න බැරි..

" ඒ මොකක්ද ඒ කිව්වෙ.."

" මොකුත් නෑ.. ඔයා සැන්ඩ් කාසල් හදනවද.."

" මම සැන්ඩ් කාසල් වලට ආස නෑ.. අපේ අම්මා මට දවසක් කිව්වා අපේ තාත්තා කැමතිලු ඒවා හදන්න.. අම්මා එක්ක බීච් ගියාම අම්මට හදලා දෙනවලු.."

" ඉතින්..??"

@Shan

" එයා අම්මට හදලා දුන්නෙ සැන්ඩ් කාසල් එකක් තමා.. ඒක කැඩිලා ගියානෙ.. මට ඕවා දැක්කහම අම්මා කිව්ව කතාව මතක් වෙනවා.. මම තාම හිතනවා අපේ අම්මව සතුටින් තියන්න පුළුවන් විදියක්.."

" අම්මා සතුටු වෙන්නෙ නැද්ද.."

" සමහර වෙලාවට සතුටු වෙලා හුඟක් වෙලාවට පසුතැවෙනවා.. අම්මා ඒක මට කටින්ම කියලා තියේ.."

" ඔයා නිසා කවුරුත් පසුතැවෙන්නෙ නෑ වරද්.. ඒක බොරු කතාවක්නෙ.."

" ඇයි.."

" ඔයා නිසා හැමෝම සතුටින් ඉන්නවා.. ඉස්සරහට එන කාලෙක අම්මා ඔයා ගැන හුඟක් සතුටු වේවි.."

" ඔයා එහෙම හිතනවද.."

" අනිවාරෙන්.. එහෙම වෙනවා.. "

" මම නිසා හැමෝම සතුටු වෙනවනෙ.. මම කවුරු නිසාද සතුටු වෙන්නෙ.."

රඩ්‍ය අයියා මං දිහා බලලා කට කොනෙන් හිනාවුණා..

" ඔයාගෙ ඉස්සරහා ඉන්නවා ඔයාගෙ සතුට වෙනුවෙන් ඕනම රිස්ක් එකක් ගන්න පුළුවන් මනුස්සයෙක්.."

" මම දැනට සතුටින් ඉන්න එකම හේතුව ඒක තමා.."

" බොරුවට ඒක මගෙන් අහගන්න ඕන නිසා.. අනේ මන්දා උඹත්.."

" එහෙම තමා අනේ.. කියන්න ඕන කටින්ම.. නැත්නම් ඔයා හිතේම තියාගෙන ඉන්නවනෙ.. අර කියාන් අයියට වෙනම නැග්ගක් දෙන්න ඕන ඒ දවස්වල ඔයාලගෙ ලව් වලට සපෝට් කලාට.. පව් අහින්සකයා.."

" අහින්සකයා නෙමේ.. උඹ දන්නෙ නෑ මට ඔකා කිව්වා 'මේ අවුරුද්දෙ උඹ ඇහුවෙ නැත්නම් ෂනෙරුව මම දාගන්නවා' කියලා.. අන්තිමට බැට්

@Shan

එකකුත් ඇල්ලුවා.."

" සිරාවට..?? අඩෝ මේකා මාරයිනෙ.. ඔයා ඒකද මට එදා හරම කිව්වෙ.. සැක් මම ඒ ඌරුපැටියටනම් මැරුණත් කැමති වෙන්නෙ නෑ.. ඔයා දන්නවනෙ මම කාටද කැමති කියලා.. ඔයාගෙන් පස්සෙ මම එයාට තමා කැමතිම.."

" අපේ අයියනෙ.."

" අන්න හරි.. ඔයාට ඒකට ඉරිසියා හිතෙන්නැද්ද ඒයි.. මම හිතුවෙ ඒ දවස්වල මම අයියට කැමති කිව්වහම ඔයාට මල පනී කියලා.."

" මල පනින්නෙ මොකටද.. කවුරු ගෙනාවත් අපේ ගෙදරටනෙ එන්නෙ.."

රධ්‍ය අයියා මහා වලත්ත විදියට මං දිහා බලලා ඇහැක් ගැහුවා.. මම උගෙට පයින් පාරක් ගැහුවා.. හිතේ ඇති එතකොට මස්සිනා එක්ක උකුලු මුකුලු කරන්න.. අනේ මෙහෙමත් මිනිස්සු.. එක ගෙයි කන්නද කොහෙද හිතාගෙන ඉඳලා තියෙන්නෙ.. මෙහෙමයි.. මට අදහසක් තිබ්බා කියලා.. මගේ මනුස්සයට එහෙම එකක් තියෙන්න ඕන නැනෙ..

" ලැජ්ජ නැද්ද අයියෙ තවුසෙට.. මස්සිනා එක්කද මගුල් නටන්න ලැස්ති වෙන්නෙ.."

" ඇයි මස්සිනා එක්ක මගුල් නැටුවහම නැටවෙන්නැද්ද.."

" සැක්.."

" මමනෙ කලින් දැක්කෙ.. කලින් දන්නෙ.. අයියගෙ වුණාට කරන්න දෙයක් නෑ.. අයියට ඕන කුදයක් ගහගන්න කියලා උස්සන් යනවා.."

" හැකේ යැයි යැයි තමා.."

" අපේ අයියට පිස්සුවක් තියේද උඹ වගේ එකෙක් කරේ ගහගන්න.. අර මාමා අහන්නෙ 'රධ්‍ය පුතේ උඹට හොඳටම විශ්වාසද මූවමයි ඕනෙ' කියලා.. මට වගේ අමාරුවක් අපේ අයියට නෑ.."

" ඔයා හුහක් අමාරුවෙන්ද හිටියෙ ඉතින්.."

@Shan

මම රධ්‍ය අයියගෙ මූණට කිට්ටුවෙලා ඇහුවහම රධ්‍ය අයියා මගේ නළලට ඇඟිල්ලක් තියලා මාව පිටිපස්සට කලා..

" ඔව් වරද්.. මාර අමාරුවෙන් හිටියෙ.."

" අමාරුව හොඳ කරන්නද.. පව් නෙ.."

රධ්‍ය අයියා වැලි ගොඩෙන් වැලි අහුරක් අත් දෙකට අරගෙන මගේ උකුළට අතැරියා.. ඊට්පස්සෙ තා එකකුත් අරගෙන උකුළටම අතැරියා.. අර දෙකවසරෙ පොඩි උන් කරන්නෙ.. අන්න ඒ වගේ..

" වරද් වැලලෙන හැටි දන්නවද.."

මම කකුල් දෙකේ වැලි ගසලා නැගිට්ටින්න හදද්දිම රධ්‍ය අයියා හෙන ගහන්න වගේ නැගිටලා පිටිපස්සට ගියා..

" වරෙන් අයියෙ වැලලෙන හැටි පෙන්නන්න.."

" ඕන නෑ.. මම ඇහුවෙ නෑනෙ.."

මම ඉස්සරහට ඉස්සරහට ඇවිදගෙන එද්දි රධ්‍ය අයියා මට කින්ඩියට හිනාවෙවී පිපස්සෙන් පිටිපස්සට ඇවිදගෙන යනවා.. එයාගෙ කකුල්වලයි මගේ කකුල් වලයි මූදු රල ඇවිත් වදිනවා.. මූදු රළ පිටිපස්සට යද්දි වැලි එක්ක මාවත් ඇදිලා යනවා වගේ.. කසිංජි සුවඳයි අපේ වටේ ඉඳපු අයගෙ සද්දෙයි එක්ක මූදු හුළඟයි.. මම ඒක කැමතියි.. අපි දිහා කීපදෙනෙක්ම අමුතු විදියට බැලුවත් මට ඒක එච්චර ගානක් ගියේ නෑ.. අමුතු බැල්මවල් බලාපොරොත්තුවෙන් තමා අපි දෙන්නම ආදරේ කරන ගත්තෙ..

" මේ වරද්.. ඔයාට මතකද ඔයා දවසක් කිව්වා.. ඔයා මාත් එක්ක යාළුවුනොත් ගිහින් මූදෙ පනිනවා කියලා.."

" තවුසෙ මගෙන් කන්න යන්නෙ හරිද.."

" ඔයා මූදෙ පනින්නැද්ද ඉතින්.. මම ගලක් උඩින් තියලා එන්නද.."

" අයියෙ..!!"

@Shan

ඒ එක්කම මහ මරිමොංගල් මූදු රලක් ඔලුවටත් උඩින් ගහගෙන ඇවිල්ලා මාව සම්පූර්ණෙන්ම නැවිලා ගියා.. හිතපු නැති වෙලාවට රළ ගැහුව නිසා මගේ කටෙත් එක්ක වතුර ගිහින් අර කට්ට ලුණු රහට මට ඔක්කාරෙට ආවා.. නෙද්දකින් මටමයි වුණොත් මහ වාටර් වැඩම වෙන්නෙ.. අයියෙ ගැවා විතරයි නාවගෙනම ගියා.. එක්කො මට භූමි දෝසද දන්නෙ නෑ.. වරද් පුතේ උඹ කට්ටඩි සීයෙක්ට කියලා දෙහි ටිකක් කප්පවගත්තනම් හරි වගේ.. මම කටේ තිබ්බ වතුර ටිකත් ශර්ට් එකෙන් පිහාගෙන වටපිට බලද්දි මැළු පොල් කාවයියා පේන්න හිටියෙ නෑ.. මම ඉස්සරහා කොහේවත් ඉන්නවද කියලා බලන්න අඩිය ඉස්සරහට තිබ්බා විතරයි මම බොහ් ගාලා වතුර ගොඩේම ඇදගෙන වැටුණා.. තල්ලු කරා නේද මේ ගස් පාත්තයා මාව..

" මේ මොකද වරද් ගොඩ පීනනවද.."

" ගොඩ.. ගොඩ නෙමේ.. උඹට මම.. ඉදපන් අයියෙ.. දුවන්නෑ..!!!"

" ඒ ඒ වරද් වැටෙයි.. ඔය මොන-කැහ්-කැහ්"

මම වතුර දෝතටම අරගෙන රධ්‍ය අයියගෙ මූණට දමලා ගැහුවා.. ඒකගෙත් කටේ ඉදලා වතුර ගියා.. හොදම වැඩේ.. මට කරන බලු වැඩවලට.. මගේ මුළු ඇඟේම වැලිත් ගෑවුණා.. වරෙන්කො ඉස්කෝලෙ උගන්නන්න.. මෙවට පලි ගන්න.. දැන් මමනෙ හෙඩ් ප්‍රිෆෙක්ට්.. බලාගන්න බැරියැ.. මේ වරද් වරං ගත්තහම හැටි..

අපි හවස් වෙනකල්ම බීච් එකට වෙලා හිටියා.. ඒ කියන්නෙ අපිට බීච් වොලිබෝල් ගහන්න සෙට් වුණා.. එතෙන්ට ආපු අපේම වයසෙ කොල්ලො කෙල්ලො සෙට් එකක් එක්ක.. ඊටපස්සෙ පණ යන්නම වොලිබෝල් ගැහුවා.. ඒ ගොල්ලොත් හෙන ජොලි කට්ටියක්.. අන්තිමට පැරදුණු සයිඩ් එකට බීච් එකේ ඉන්න කොහේහරි කපල් එකක් හොයාගෙන ගිහින් සාත්තර කියනවා වගේ රහපාන්න වුණා..

මට මතක් වුණේ අපේ යාළුවො.. අන්න යනවනම් ට්‍රිප්.. ඒ සෙට් එකත් එක්ක ඕන යන්න.. හැමජාතියෙන්ම එවුන් ඉන්නවා..කෙල්ලො නම් කෙල්ලො සුපර් ගර්ලි ආශි දාහකට හරියන්න ඉන්නවා.. අනිත් ඔක්කොම කොල්ලොනෙ.. මහීශා.. ඒකිගෙත් ඔක්කොම තියෙන්නෙ කොලු වැඩ විතරනෙ.. ආශි බලෙන්ම කෙල්ලෙක් කල්ලා තියන කියාන් අයියනම් මැද්දෙ හරියෙ ඉන්නවා.. ඒ ඇරෙන්න කවුරුත්ම කෙල්ලො ඒකෙ නෑ..

@Shan

කපල් ඉන්නවා.. තනිකඩයො ඉන්නවා.. ඩ්‍රග් ක්වීන්ලා ඉන්නවා.. ඇමති පුත්තු ඉන්නවා.. පස්ස ලොකු සුදුඅම්මිලා ඉන්නවා.. මං වගේ සිරිමත්ගෙ පෙර ආත්ම ඉන්නවා.. සෙනුකයා වගේ මහපගයො ඉන්නවා ඕන බලු වැඩකට විශාරද උපදෙස් දෙන්න.. කලින් පාර ට්‍රිප් එක ගිහින් කියාන් අයියා ආශිගෙ කොණ්ඩ කට්ටක් කඩලා ආශි ඒකට විලාප තියලා අඬලා අන්තිමට රධ්‍ය අයියා ඒකට මැදිහත් වෙලා ඒක විසඳලා කියාන් අයියට ඒ ජාතියෙන්ම කොණ්ඩ කට්ටක් හොයලා හොයලා අරන් දෙන්නත් වුණා.. හොඳම වැඩේ ඒ කොණ්ඩ කට්ටටත් ඌම අරන් දීපු එකක්.. තව කියාන් අයියා එකසැරේම අපි ඉන්න කාමරේට කඩාවැදලා සුදුදෝණියා එක්ක නිදාගන්න ඕන කියලා සෙනුකයව උස්සගෙන ගිහින් වෙන කොහේටහරි දමලා එනවා.. ඇවිත් අයුක අයියව බදාගෙන නිදාගන්නවා.. හිටපු ගමන් අපි ඉන්න ඇඳටත් එනවා.. ගෑණිගෙන් ගුටිකාලා බැනුම් අහලා පිටයනවා කියන්නෙ ඕකට තමා..

කොහොමහරි වොලිබෝල් ගහන්න ගිහිල්ලා රධ්‍ය අයියට හොඳ කක්කුටු අක්කෙක් සෙට් වෙලා.. ඒක දුරදිග යන්න ගිහින් නම්බර් එකත් දීලා.. අක්කා කෝල් මී සයින් එක රධ්‍ය අයියට පෙන්නුවහම රධ්‍ය අයියා ඒ කොල කැල්ලෙ කකා හිටපු චවින්ගම් එක ඔතලා ගිහින් ඩස්බින් එකකට අතැරියා.. ඒ අක්කගෙ මූණ තැලිච්ච කෙසෙල් ගෙඩියක් වෙච්ච විදිය තමා බලන්න වටින්නෙ.. හොඳ වැඩේ පරට්ට කක්කුට්ටුච්චි.. ආවා මෙතන ඇහැට පේන කොල්ලෙක් දැක්කහම නම්බර් එක දික් කරගෙන.. දෙනවා උඹට මම.. බලාගෙන ඉඳපන්..

හවස් වෙද්දි රධ්‍ය අයියට ආයෙම හොටෙල් එකට යන්න ඕන වුණා.. මටත් හෙන මහන්සියෙ හිටියෙ දවසෙම නටලා නටලා.. වැටිච්ච තැන නින්ද යන ගානට.. අපි නතරවෙලා හිටිය හොටෙල් එක ටිකක් බීච් එකට දුර නිසා යනකල්ම මම හොඳට නිදාගෙන හිටියේ.. ඒ වුණාට ඇඟේ වැලි වගේ නිසා හෙන අප්පිරියයි.. කොණ්ඩෙත් මූදු වතුරට ඇලෙනවා ඇලෙනවා වගේ.. අපි හොටෙල් එකට ගිය ගමන්ම මම ටවල් එකකුයි බාත්‍රෝබ් එකකුයි අරගෙන නානකාමරේට පැනගෙන හොඳට නාගත්තා.. රධ්‍ය අයියා අම්මට කෝල් එකක් ගන්න ඕන කියලා බැල්කනි එකට ගියපු නිසා.. නැත්නම් ඉතින් එන්න තිබුණා මාත් එක්ක නාන්න.. කොහෙද උනන්දුව මදිනෙ..

මම වැඩිවෙලා ගන්නැතුව නාගෙන සුවඳ ගගහා කාමරේට එද්දි රධ්‍ය අයියා මෙසෙ උඩ ටැබ් එකත් දිග ඇරගෙන කාත් එක්කද වීඩියෝ කෝල් එක්ක

@Shan

ගන්නවා.. මම හොඳට රෝබ් එකේ පටිය ගැටගහගෙන ගිහින් ස්ක්‍රීන් එකට එබිලා බැලුවා.. කවුද කතාකරන්නෙ කියලා..

" දැන් උඹට කොහොමද වෙන්න ඕන.."

" ඔෆිස් රූම් එකේ ඇති අබේසිංහ කියලා ඩයල් එකක්.. ගිහින් මට කෝල් එකක් ගනින්.. උඹට තියෙන්නෙ සයින් කීපයක් දාන්න විතරයි.. මම වත්සල්ට කියන්නම් කොළඹ ආවහම ඩොකියුමන්ට්ස් ටික ඉල්ලගෙන ලෝයර්ට දෙන්න කියලා.."

" ම්ම්.. එතකොට එච්චරද.."

" දැනට එච්චරයි.. මම උඹට උවමන වුනොත් කෝල් එකක් ගන්නම්.. ආ ෂනෙරු.."

අයුක අයියා මං දිහා බලලා කිව්වහම මම ඌට දෙකක් රැව්වා.. චීත්තයා..

" ආ අයුක අයියෙ.. මට මේ දැනුත් ඔයාව මතක් වුණා.."

" ඒ මොකද.."

" සබන් කැල්ලක් දැක්කහම.. මතක් වෙනවා අයියව.."

" වරද්.."

" ඔයා ඉන්න අනේ.. මම ඇත්තනෙ කියන්නෙ.."

" රඩ්‍ය.. මට කියාන් කිව්වා මෙකා ගහක්-"

" අයුක අයියෙ මේ ඔයාගෙ පිටිපස්සෙ කවුද මතුවෙනවා.. කොලුකාර කළුකුමාරයෙක්ගෙ ඔස්ට්‍රේලියන් වර්ශන් එකක්ද කොහෙද.. අපිට වැඩ තියෙනවා අනික.. බායි.. ටටා.."

මම කෝල් එක කට් කල්ලා දැම්මා.. මේ අයුකා අයියව ආපු දවසක පට්ටගහලා සෙනුකයගෙ අම්මට බෑග් එකක් මහලා දෙන්න තියෙන්නෙ.. අනික අපි ගස් නැගහම එයාට මොකටද.. ඒක නිකම් මලිත්ත ගහද්දි වංචලා අඩනවා වගේ වැඩක්නෙ..

@Shan

" මෙ ඒයි.."

" ම්ම්..?? නාලා ඉවරද.. එහෙනම් මම  යනවා.."

" හා.. අහන්නකො.. මලිත්ට ගහද්දි ඇයි වංචලා අඬන්නෙ.."

රඩ්‍ය අයියා මං දිහා මහා අමුතු විදියට බලලා ඒක සතපහකට ගණන් ගන්නෙ නැතුව එතනින් නැගිට්ටා..

" මම කොහොමද දන්නෙ.."

" ඒකෙ ට යන්න ගැලපෙන්නෑනෙ.. අන්න මලිත් ගහද්දි වංචලා ඇඬුවා වගේ එකක්නම් හරියනවා.. නේද.."

රඩ්‍ය අයියා නැගිටලා ගිහින් ටවල් එක අතට අරගෙන ශර්ට් එක ගැලෙව්වා.. මම ගිහින් හොඳට ඇඳේ ගුලි වෙලා මට උඩින් බ්ලැන්කට් එකකුත් දාගත්තා.. ඉටස් නිදාගන්න ටයිම්..

" උඹට තියෙන්නෙ මේ ලෝකෙ කිසිම මනුස්සයෙක්ට තියන ප්‍රශ්න නෙමේ.."

" ප්‍රශ්න අසමින් ඕන ඉගනගන්න.. ඔවාලා දන්නෑනෙ.. පීඩියාප්‍රෝ ඇඩ් එකක තිබ්බෙ.."

" ම්ම්.. මම නාගෙන පහළට යනවා හරිද.. ඔයා එතකල් නිදාගන්නවනම් නිදාගන්න.."

" ඇයි ඒ යන්නෙ.. අයුක අයියගෙ වැඩක්ද.."

" ඔව්.. මම එන්න වෙලා යයි.."

" හා.. ඔයා නාලා එන්න එහෙනම්.."

රඩ්‍ය අයියා වොශෲම් එක අතුළට ගිහින් දොර වහගත්තා..ඒක ඇරගෙන නාගන්න බැරිද දන්නෙ නෑ.. මම කොට්ටෙකුත් බදාගෙන ඒ සී එකෙන් එන හුළඟට මූණ අල්ලගෙන හිටියා.. හරි සනීපයි.. නින්ද යන්න වගේ..

ඇත්තටම ඇයි මලිත්ට ගහද්දි වංචලා ඇඬුවෙ..

@Shan

ඇයි..    ..??

ඔතරි ගිහින් එන්නම් ළමයි.. එකසිය පනහට කලින් මේක ඉවරවෙනවා කියල මේ අවස්තාවේදී මම කිසිදු සුවර් එකක් නැතුව කියන්න කැමතියි..

හරිත..

ඒ වගේම රධ්‍යගෙ වීව් එකෙන් කතාව අනිවාරෙන්ම දෙනවා.. හිච්චි සමන් නිදාගන්න යනෝ.. මහම්සී..

එන්නාම්.. ලව් යූ..    ❤

දළඹු පැංචෙක්ට වරදයා හම්බෙලා.. මට පික්කුවක් එච්චනෙ.. එයා හැඩයි නේද.. අනික රධ්‍ය අයියා ඔන්ලි ගැලැක්සි..

those eyes.. රධ්‍ය පුතා.. ammiyo

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 123 කොටස

" මෙහ්.. ඊස් දෙයා එනිබොඩි.. හෙලෝ සනෙරු.. මම මේ කතාකරන්නෙ කියාන්ගෙ ගෑණුළමයා.. හලෝ~"

" මමහ්.. කියහන්.."

මම මර නින්දක ඉඳලා ඇහැරෙද්දි කළුවරත් වැටිලා.. දැන් පැයක විතර ඉඳලා ෆෝන් දෙකම වයිබ්‍රේට් වෙනවා ඉවරයක් නෑ.. රධ්‍ය අයියත් මගේ එහාපැත්තෙ අහපය හතර අටපොලේ දාගෙන කටත් ඇරගෙන ගොරව ගොරව නිදි.. කෝල් එක නවතින්නෙ නැති නිසා බැරිම තැන මම ඒක ආන්සර් කල්ලා කනේ තියාගත්තා.. ඊට ටික වෙලාවකට පස්සෙ ගිරිය පලාගෙන අමුතු සතෙක් එහාපැත්තෙන් කෑගහනවා මට ඇහුණා..

" සනෙරුමල ඔයා නිදිද අනේ.. ඇයි නිදි.. ඔයාලා යමකිසි-"

" ආශු මොනවද ඔය අහන්නෙ.. ෆෝන් එක දෙන්නෙ මෙහෙට්ට.."

" චප්.. ඔයා කට පියාගෙන ඉන්නවද.. මම මේ සනෙරුට දෙකක් කියන්න ගත්තෙ.. අනිකා ඔහේ.. අන්ඩර්පැන්ට් තීෆ් මම අල්ලගන්නම්කො.."

" කියහන් මොකද.. හයියෝ උඹ නිදාගන්න දෙන්නෙත් නෑ මගුල.."

" ඔයා නිදි වුණාට අපි නිදි නෑනෙ.. මේ සනෙරු.. තමුන්ගෙ මිනිහා හදාගන්නවා හරී.. මම ආයෙ නොකිව්වයි කියන්න එපා.. අනිකා සෙනුක.. උාටත් මම කිව්වෙ නෑ කියන්නෙපා.."

" කිව්වෙ නෑ කියන්නෙ..?? ඉස්සෙල්ලම කියපන්කො මොකක්ද උඹ ඔය කියවන්නෙ කියලා.. උඹට පිස්සුද.."

" පිස්සු.. හහ්.. පිස්සු හැදෙයි තා ටිකකින්.. මට ප්‍රෙශර් වගේ අනේ.. අපේ මිනිහගෙ අල්මාරියෙ කොහොමද රධ්‍ය අයියගෙයි අයුක අයියගෙයි යටකලිසම තියෙන්නෙ.. මට පැහැදිලි කරන්න.. අපේ මිනිහා ජංගිහොරෙක්ද කොහෙද සනෙරු.. මටනම් මේවා හිතලා කොණ්ඩෙත් යන්න අරගෙන තියෙන්නෙ.."

@Shan

" ආශු!! බොගෙ කොණ්ඩෙ යන්නෙ එච්චා හිතලද ලෝකෙම තියන දහජරාව උලලද.. මේ ෂනෙරුවා.. මේකිට මොකක් වෙලාද බං මේ.."

" උන් යාළුවොනෙ බං.. එහෙම වෙන්නැති.."

" එහෙමද.. නැත්නම් මට සැකයි අනේ අපේ මිනිහව.. දැන් බලන්න මෙයා.. ඔයාල මගේ යාළුවො වුණා කියලා ඔයාලගෙ යටකලිසම් තියෙද මගේ අල්මාරියෙ.. නැනෙ.. කියද්දිත් බ්වැක් වමනෙට එනවා අනේ.."

" උඹට මගේ එකක් ගෙනැත් දෙන්නද අල්මරියෙ දාගන්න.. සෙනුකයගෙත් එකක් තිබ්බා අපේ ගෙදර.."

" මෙ සේරම පකයො* සොරි.. ඔච් පකයො තමා හරි වචනෙ.. සේරම පකයො එකයි.. මේ වෙලේනම් මම හිතලමයි කුණුහර්පයක් කිව්වෙ.. මට කේන්ති හුහක්.."

" කේන්ති ගන්නෙපා බං..දැන් බලහන් උඹට ඔය තියන ප්‍රශ්නෙ එක්ක ලෝකෙ ඉන්න මිනිස්සුන්ට තියන ප්‍රශ්න.. ආ.. උඹ දන්නවද බැඳුම්කර වංචාව කලේ කවුද කියලා.."

" අපේ මිනිහා නෙමෙනෙ.. නේද.."

" ඌ එච්චර දෙයක් කරන්න පුළුවන් එකෙක්ද බං.."

" නැනෙ.. ඒකතමා.. ඇත්තටම කවුද අනේ  බැඳුම්කර වංචාව කලේ.."

" මේ.. මම කියන්නම්.. උඹ ෆෝන් එක තියලා ගිහින් කියාන් අයියගෙ නියපොතු ටික පාට කරහන්.. ඒ වගේ යමක් කරහන්.."

" බෑ අනේ.. මම මේ බර්ත්ඩේ පාටියකට ඇවිල්ලා ඉන්නෙ.."

" කියාන් අයියලගෙ ගෙදර..?? අද ඩයල් එකගෙ බර්ත්ඩේ එක නෙමෙයිනෙ.."

" එයාගෙ නෙමේ අනේ.. අර හැලයගෙ.. හැලකිඹුලා ඉපදිලා තියෙන්නෙ අදලු.. අපේ ගෙදර අය මෙහෙ ආවා.. ඌ මට කේකුත් කැව්වා හලෝ..හැලකිඹුලා ගෙදරට අමුතු කොල්ලෙක් උස්සන් ඇවිල්ලනෙ.. එකෙක් නෙමේ අනේ දෙකතුනක්ම හිටියා.."

@Shan

" ඒ කවුද.."

" කවුද කියන්නෙ.. මෙල් ප්‍රොස්ලා තමා.. මෙ ගෙදර මිනිස්සුන්ට මෙ හැලකිඹුලා කරන දේවල්වල කිසි ගානක් නෑ ඔහේ ඉන්නවා.. ඔකතමා කියන්නෙ සල්ලි හම්බරකරන්න ගියාම පවුල අමතක වෙනවා කියලා.."

" මෙ කියාන් අයියත් ඔතන ඉන්නවා නේද.."

" ඉන්නවා අනේ.. මම මේ අපේ මනුස්සයා එක්කත් කිව්වෙ.. මෙ මිනිහා ඔයාගෙ පස්සෙනුත් ආවනෙ.. මට කේන්තී ඒකටනම් සැහෙන්න.."

" එව්වා දැන් වැඩක් නෑ.. දැන් ඌ එන්නෙ නැනෙ.."

" එන්නෙ නෑ කිට්ටුවෙන්න බැරි නිසා.. ඒ වුණාට මට අවස්ථාවක් හම්බුනොත් ඔකව පට්ට ගහලා මට බැග් එකක් මහගන්නවා.. ඇත්තමයි.."

" හරි හරි බං.. දැන් නහින්නැතුව ඉඳහන්කො.."

" හා.. මෙ කියාන් අයියට ඔයා එක්ක කතාකරන්න ඕනලු සනෙරු.. මම ෆෝන් එක දෙන්නද.."

" ආ හා.."

මම නැගිටලා ඇඳුමත් හදාගෙන ඇඳේ හෙඩබෝඩ් එකට හේත්තු වුණා.. සැක් මෙ බාත් රෝබ් පටලගෙන නිදාගන්නවට වඩා හොඳයි ඇඳුම ගලවලා පැත්තකින් තියලා ඇඳට පැනලා නිදාගන්නවා.. අනිකා.. ඌට එහෙමවත් ඕන් නෑ.. ඔහේ අන්ඩවෙයා එකක් ගහගන්නවා.. පොරවගන්නෙත් නෑ.. පුප උඩදාගෙන නිදාගන්නවා.. ලැජ්ජාවක් නැතුව හැදුනහම ඔහොම තමා..

" මෙ ෂනෙරුවා.. මම උබට කතාකරන්න හිටියෙ.. අපේ එකා ඔතන ඉන්නවද.."

" නිදි.. ඇයි.."

" නිදිනම් කමක් නෑ.. උගෙ අප්පොච්චා මට කෝල් කලා කියහන්කො.. අද උදේ.."

" නෑ..!! සිරාවට.. මොකද කිව්වෙ.."

@Shan

" රධ්‍ය කාත් එක්ක හරි ගෑණුළමයෙක් එක්ක සම්බන්ධයක් තියද ඇහුවා හරිද.. මම කිව්වා මම දැනුවත්වනම් නෑ අංකල්.. අපි එක්ක රධ්‍ය ඒවා කියන්නෙ නෑ කියලා.."

" ආ.."

" ඊටපස්සෙ ඇහුවා එදා සාගා එකේ රධ්‍ය එක්ක සින්ග් කළ ළමයා කවුද කියලා.. මම කිව්වා අංකල් ඒ අපේ ඉස්කෝලෙ දැනට ඉන්න හෙඩ් ප්‍රිෆෙක්ට් කියලා.."

" මොකද කිව්වෙ.."

" මොකුත් නෑ හරිද.. දන්නවනෙ ඩයල් එක.. එක විදියක්නෙ.. අපිට ඔච්චා කියයිද බං.. අපේ එකා කැම්ප් යන්නෙ නැති කේස් එක අප්පොච්චා සැරටම ඇදලා ගනී වගේ.. මම උඹට කියන්න ගත්තෙ පොඩ්ඩක් හෙව්ලෙන් ඉඳහන්.. උඹ ගැන යමක් දැනගෙනද මන්දා.. "

" එහෙමත් එකක්ද.."

" ම්ම්.. ඕන්නම් අපේ එකාට කියහන්.. නැත්නම් ඕන්නෑ.. ඌ ඔය හිටියට සෑහෙන්න හිතනවා මොනවා වෙව්ද කියලා.."

" මම දන්නවා බං.. අනේ මන්දා.. මටනම් බයයි ඔය අප්පච්චිට.."

" අනේ මේ බෑ නෙමෙ.. පිස්සුනම් නටන්නෙපා ෂනෙරු මල්ලි.. උඹ කෙලින් ඉඳහන් ඉස්සෙල්ල.. උඹටයි රධ්‍යටයි අපි ඉන්නවනෙ.. ආධ්‍ය බොසාගෙ මොකක් හරි කේස් එකක්ද බං.. මට හිතෙන්නෙ අප්පොච්චා කුපිත වෙලා ඉන්නෙ අපේ එකා එක්කත් වඩා ආධ්‍ය අයියා එක්කද කොහෙද.."

" එහෙමද.."

" ඔව්.. මමනම් සිරාවටම ඔය පව්ලෙ සීන් කෝන් දන්නෙ නෑ.. මට වැඩකුත් නෑ.. ඒ වුණාට රධ්‍ය ඉන්නෙ අවුලෙන් නිසා.. මන්දා බං.. පරිස්සමට හිටහන්.. ඉස්සෙල්ලම උඹලා දෙන්නා කොළඹ වරෙන්කො.."

@Shan

" මම.. මේ සතියේ එනවා.. කොහොමත් ඉස්කෝලෙ වැඩ වගයක් තියෙනවා.. එන්න ඕන.."

" උඹට මැචස් වගයක් ළඟ නේද.. සිංගප්පූර් වැඩේ මොකද.. හම්මටසිරි උඹ යන්නෙ එසේ මෙසේ ටූනමන්ට් එකකට නෙමේ ෂනෙරුව.. පත්තරේ ඉද්දිද දන්නෙ නෑ.."

" අනේ ඉඳහන් බං.. මම තියන්නම්.."

" හා හා පරිස්සමට වරෙන්.. බායි.."

" බායි.."

කියාන් අයියා කෝල් එක කට් කලාම මම ෆෝන් එක පැත්තකින් තිබ්බා.. එයා කොහොමද දැනගෙන තියෙන්නෙ.. අප්පච්චි ආධ්‍ය අයියගෙ හරි රධ්‍ය අයියගෙ හරි කාමරයක්වත් ඇරලා බැලුවද දන්නෙ නෑ.. එහෙම ඇරලා මොකුත් අහුවෙලාවත්ද.. මුන් දෙන්නගෙ ඩයරි දෙකවත්..!! නෑ නෑ එහෙම නම් වෙන්න එපා දෙයියනේ..

මම කාටද කියන්නෙ..

අම්මට කියන්නත් පුළුවන්.. නෑ එක්කො අම්මා දැනගත්තෙ කොහොමද ඇහුවොත් අප්පච්චි.. කොළඹ ගිහින් අම්මටසිරි වෙන්න හොඳ කැමක් නම් සෙට් වෙනවා මට හොඳට පේනවා.. එක්කො රධ්‍ය අයියා ගියානම්.. ඒත් බෑ එයා යන්නෙ නැමයි කියනවනෙ.. අපරාදෙ කැම්පස් යන්නත් නෑ.. මේ අප්පොච්චට කතාකල්ලා දෙකක් කියන්න තියෙනවනම් ඒකත් හොඳයි.. අම්මපා හම්බුනොත් චාන්ස් එකක්.. කියනවා කන් දෙකේ ඇඟිලි ගහගන්න අප්පොච්චට.. ගෙදර ගියාම ආධ්‍ය අයියා එක්ක කතාකරන්න ඕන..

මම කොට්ටයක් අරගෙන බඩට තියලා තදකරගෙන ඒක උඩින් මූණ තියාගත්තා.. ආධ්‍ය අයියලා වගේ අපිත් ලොකුවෙලා හිටියනම්.. මේ අවුරුදු විස්සෙ මටයි විසි එකේ රධ්‍ය අයියටයි මොනවද කරගන්න පුළුවන්.. මම තාම ඉස්කෝලෙ ගාටනවා.. රධ්‍ය අයියා තාමකැම්පස් වත් යන්නෙ නෑ.. අනික ආධ්‍ය අයියව අප්පච්චි අතෑරලා කියන්නෙ රධ්‍ය අයියව තව ටිකක් තදින් අල්ලගන්නවා.. එහෙම වුනොත් රධ්‍ය අයියා ඔය කියන විදියට නටන්න හම්බෙන්නෙත් නෑ.. මේ මනුස්සයා මොකට කොළඹ ආවද

@Shan

මන්දා.. නැවිල්ලා පලාලි බැරිනම් මන්නාරම බොක්කෙ හරි හිටියනම් ඉවරනෙ..

" මොනවද කල්පනා කරන්නෙ.."

මම එකසැරේටම උඩගිහින් ඇඳ දිහා බැලුවහම රධ්‍ය අයියා ඇහිබැමත් අකුලගෙන මගේ දිහා බලාගෙන ඉන්නවා කේන්තියෙන් වගේ.. මේකා කොයි වෙලේද ඇහැරුණේ..

" නෑ මේ ආශි කතාකලා.. කතාකල්ලා මගේ ඔලුව විකාර කලා.. ඒකයි.."

" ඇයි කතාකල්ලා තියෙන්නෙ.."

" ඔයාගෙ අන්ඩවෙයාර් එකක් ඇයි කියාන් අයියගෙ අල්මාරියෙ තියෙන්නෙ අහන්න.."

" කියාන් කතාකලේ..??"

" ආ නිකන් අනේ.. ආශි ලඟ හිටිය නිසා ඉල්ලගෙන කතාකලා.."

"....."

" ඇයි..??"

" මට ඇත්ත කියන්න වරද්.. මම අවදියෙන් හිටියෙ.."

රධ්‍ය අයියා ඇහට බ්ලැන්කට් එක දාගෙන නැගිටලා මං ආවින් ඇඳට හේත්තු වුණා..

" අප්පච්චි කියාන් අයියට කතාකල්ලා.. ඔයාට ගැණුළමයෙන් ඉන්නවද අහලා.."

" ම්ම්.. තව..?"

" සාගා එකේ සින්ග් කලේ කවුද අහලා.. කියාන් අයියා කිව්වා ඔයා කැම්ප් ගියේ නැති එකට අප්පච්චි කේන්තියෙන්ලු ඉන්නෙ.."

" එයා කියාන්ට කතාකල්ලද.."

@Shan

රධ්‍ය අයියා ඇඳේ කොට්ටයක් අස්සෙ තිබ්බ ෆෝන් එක එළියට ඇදලා අරගෙන ඒක අන්ලොක් කල්ලා අප්පච්චි කියලා තිබ්බ කන්ටැක් එක අන්බ්ලොක් කල්ලා ඒකට කෝල් එකක් අරගත්තා.. මෙ මොනවද මෙ කරන්න යන්නෙ..

" මොකක්ද ඔයා කරන්නෙ.."

" මොකුත් නෑ.."

රධ්‍ය අයියා මගේ කොන්ඩෙ අවුල් කල්ලා මාව එයාගෙ ඇඟට හේත්තු කරගත්තා.. මම දඟලලා දඟලලා එහාට ගියා.. අප්පච්චිට කෝල් එකක් ගත්තෙ.. බැනගන්නද..?? මම ෆෝන් එක එයාගෙන් ගන්න යද්දිම කෝල් එක ආන්සර් වුණා.. රධ්‍ය අයියා මගේ අත් දෙකින් අල්ලලා තදකරගත්තා..

" කියන්න.."

" ඔව් අයියා එක්ක.."

" අම්මා කියන්න ඇතිනෙ කොහෙද යන්නෙ කියලා.."

" මම එන්නෙ මට උවමනානම් විතරයි.."

" ඇයි මම ඔයා කියන දේවල් කරන්න ඕන..??"

" මම කරන්නෙ නෑ.. ඔයාට ඇයි ලැජ්ජ වෙන්නෙ.."

" ඔයා ලැජ්ජ වෙන්න ඕන ඔයා ගැනමයි.. මම ගැනවත් අයියා ගැනවත් නෙමෙයි.."

" මගේ අයියට මොකුත් කියන්න එපා..!!"

" මම කිව්වනෙ.. මම යන්නෙ නෑ!! පුළුවන් දෙයක් කරන්න.. " ඔයාට වැඳගෙන මම ඉන්නෙ නෑ..!!"

" කොයි පිරිමි ළමයෙක්ද.."

" ඔව්.. මම යාළුවෙලා හිටියත් ඇති වැරැද්ද මොකක්ද.."

@Shan

රධ්‍ය අයියා කට කොනකින් හිනාවුණා.. අනිත් පැත්තෙ කියන මොකුත්ම මට ඇහෙන්නෙ නෑ.. මොනවා කියනවද දන්නෙත් නෑ.. මේකා යාලුවෙලා ඉන්නෙ කොල්ලෙක් එක්ක කියලා කියන්නද හදන්නෙ..

" ඔව් මම රිලේශන්ශිප් එකක ඉන්නවා.."

" ඒක මගේ පෞද්ගලික දෙයක්.."

" අවුරුදු විසි එකක් කියන්නෙ මට තනියම තීරණ ගන්න අයිතියක් තියනවා කියන එක.."

" එයා පිරිමි ළමයෙක් නම් ඒකෙ ඇති වැරැද්ද මොකක්ද.."

" ඔයාට අනුව ඒක කොහොම පිස්සුවක්ද දන්නෙ නෑ.. මම සාම්ප්‍රදායික මිනිස්සුන්ට ආස නෑ.."

" අප්පච්චි ඇති..!!!"

" නෑ හොඳටම ඇති.. ඔයාගෙ වචනවලට මම බය නෑ.. "

" ගෙදර ආවම මොනවා බලාගන්නද.."

" මට- අපිට පාඩුවෙ ඉන්න දෙන්න.. මම තියනවා.."

රධිය අයියා ෆෝන් එක කට් කල්ලා පැත්තකින් තියලා මගේ අතින් හිමිහිට ඇදලා අරගෙන ඇහට හේත්තුකරගෙන අත් දෙකින්ම බදාගත්තා.. මම මොකුත්ම කියන්නෙ නැතුව ඔහේ හේත්තු වෙලා හිටියා.. මට එයාගෙ අප්පච්චි ගැන බය හිතෙනවා.. එක්කො මම කවදාවත්ම සැර තාත්තලා අත්විඳලා නැති නිසා.. මාමා මාත් එක්ක හැසිරෙන්නෙ යාලුවෙක් වගේ.. ඒ ඇරෙන්න අපේ ගෙදර පිරිමි ලොකු අය නෑ.. ඇත්තටම මට අදහසක් නෑ එයාගෙ අප්පච්චි කේන්ති ගිහින් මොනවා කරාවිද කියලා.. රධ්‍ය අයියත් කිසි ගාණක් නෑ වගේ පෙන්නන්න ට්‍රයි කරනවා.. ඒ කිව්වත් කියාන් අයියා කිව්වා වගේ එයා හිත ඇතුලින් හිතනවද දන්නෙ නෑ මොනවා වෙයිද කියලා.. අනික ඉස්කෝලෙ උගන්නන්න එන එකටත් අප්පච්චි කැමති වෙන එකක් නෑ..

මම රධ්‍ය අයියගෙ පිටට තට්ටුවක් දැම්මා..

@Shan

" මේ ඇයි ඔයා නමයයි නමය තියන කාමරයක්ම හොයාගත්තෙ ඉන්න.."

" ඇයි..??"

" නමයෙ ඉලක්කම් තියන කාමරවල හොල්මන් ඉන්නවා.."

" එහෙමද.. ඔයාට පෙනුනද.."

" පෙනුනෙ නෑ ඉතින්.. ඒ වුණාට මේකෙ ඉන්නවද දන්නෙ නැනෙ.. කියන්න බෑ.. කවුද දන්නෙ මහ කුප්ප හොල්මනක් ඇවිත් ඔයාට කරදරයක්වත් කලොත් එහෙම.. නේද.. මෝහිනී වගේ රෙදි අන්දන්න කියන හොල්මනක් ඉන්නවද දන්නෙ නෑ.."

" ඇති ඇති.."

" කොලුකාර හොල්මන් ඉන්නවද ඒයි.. මම දැනගන්න අහන්නෙ.."

" මොකද බං හොල්මන් ගැනම අහන්නෙ.."

" අහන්නෙ ඉතින් දැනගන්නනෙ.. අපිට හොල්මන් කාණ්ඩ වලට බෙදන්න පුලුවන් වුනොත් කොලුකාර හොල්මන් ස්ට්‍රේට් හොල්මන් කියලා කොටස් දෙකකට බෙදන්න පුලුවන් නෙ.. කළුකුමාරයා නම් ස්ට්‍රේට් පොරක් වෙන්න ඕන.. හැබැයි කවුද දන්නෙ ඔය කළුකුමාරයා කියලා ගෑණු බලන්න එන්නෙ මැරිච්ච ටොම් බෝයි කෙනෙක්ද දන්න නෑ.. මහීශා වගේ.."

රධ්‍ය අයියා මාව එහාට කල්ලා මූණට එබුණා..

" ඕක නවත්තගනින්.."

" ඔයා බයද.. බයවෙන්න එපා අනේ.. ඔයාට ගැහුවොත් ගහන්නෙ වරද්ගෙ හොල්මන තමා.. මම ඇවිත් පස්ස මිරිකලා යනවා රෑට.. කොහොමද.."

මම ඇහිබැමක් උස්සලා කිව්වහ රධ්‍ය අයියා එහාට වුණා..

" උඹට පිස්සුද.."

" ඔව් මනුස්සයො මැරෙද්දි අන්තිම මොහොතෙ හිතේ තියන තැනට ආසවෙන්ලු නෙ ඉපදෙන්නෙ.. මම ඔයා නානකොට කණ්ණාඩියෙන් පස්ස

@Shan

දිහා බලාගෙන ඉන්නවා.. කවුරුහරි ඔයාගෙ පස්ස දිහා වැරදි විදියට බැලුවොත් වරද්ගෙ මමියේ ශාපය වැදිලා ඒ මිනිස්සුන්ගෙ පස්සවල් කුඹිකාලා මැරෙනවා.. මරු නේ.."

" මරු මරු.."

" ඔයා බයවෙන්නෙපා අනේ.. මම මගේ වත්කම වගේ තියන ඔයාගෙ පශ්චාත් භාගය දිවිහිමියෙන් රකිනවා.."

මම රධ්‍ය අයියගෙ පස්සට අත කරකලා හොඳ පාරක් දීලා ශේප් එකේ පැත්තක් හයියෙන් ඇල්ලුවහම රධ්‍ය අයිය මගේ අත ඇදලා අරගත්තා.. මම අනිත් අතිනුත් අල්ලන්න ගියාම එයා ඒ අතත් තද කල්ලා අල්ලගත්තා.. මේක හරි මගුලක්නෙ..මට මගෙ මනුස්සයගෙ පස්ස වැරදි විදියට අල්ලන්න බැරිද..

" මට අල්ලන්න දෙනවා..!!"

" වරද්!!"

" මම වරද් නෙමෙ.. මෝහන්.. මෝහිනීගෙ මෙල් එක.. මගේ ළමයා අල්ලගන්න අයියා.. මට රෙද්ද හදාගන්න.."

මම අත් දෙක ඇදලා අරගෙන ඇඳේ තිබ්බ කොට්ටයක් අරගෙන රධ්‍ය අයියගෙ අත් දෙකේ ගැහුවා.. මෝහන්ගෙ ළමයගෙ අම්මා කවුද අහන්නෙපා.. අම්මලා නෑ.. මලෙන් උපන් කුමාරයෙක් ඉන්නෙ..

" පාඩුවෙ ඉඳපන්.."

" පාඩුවෙ ඉන්න තිබ්බා ඔයා අඩනිරුවතින් නිදාගන්නැත්නම්.. ඔයා මාව පොළඹවාගන්න ඔහොම නිදාගන්නෙ.."

" උඹට පිස්සු හැදිලද.. ඔය බළල් ඇස් දෙක ලොකු කරගෙන ඉන්නැතුව අහකට ගනින්.. බයත් හිතෙනවා.."

රධ්‍ය අයියා මධුසමෙට ආපු ගෑණුලමිස්සි වගේ බ්ලැන්කට් එක පපුව ගාවටම ඇදගෙන, ඇඳිලා ගිහින් ටේබල් ලැම්ප් එක ගාව තිබ්බ ස්විච් එක ඔන් කලා.. එතකොට කාමරේ රෝසපාට බල්බ් වගයක් පත්තු වුණා.. මම

@Shan

රධ්‍ය අයියා දිහා බලලා ඇහැක් ගැහුවහම රධ්‍ය අයියා බයවෙලා එතන තිබ්බ ඔක්කොම ස්විච් ටික දාගෙන දාගෙන ගියා.. කාමරේ නිකම් ප්‍රදීපාගාරයක් වගේ.. මගේ අනාගතයටත් වඩා මේක දීප්තිමත්නෙ යකෝ..

" මේ මොකත.."

" ඈතට වෙලා ඉඳපන්.. අම්මට කියනවා.."

" අම්මට මොනා කියන්නද.. මම අම්මට කියනවා 'අසලි අම්මේ රධ්‍ය අයියගෙ කිසිම ඇක්ටිව් ගතියක් නෑ මම ව්‍යාග්‍රා පෙත්-ම්මහ්හ්-අත අහක-ම්ම්ම්-අම්ම්ම්ම්මේහ්"

රධ්‍ය අයියා මගේ කට අත් දෙකින්ම වහගත්තා..

" උඹ කොහොමද ඔය හැම මගුලම දන්නෙ.."

" මම-මම-මම්ම්ම්මගුල.. අත ගන්නවකො කියන්න.. මට කිව්වෙ අපේ බයෝ සර්.. මට නෙමේ අපිට.."

මම රධ්‍ය අයියගෙ අත ගසලා දාලා ඇඳෙන් නැගිටලා ඇඳුම හරියට හදාගත්තා..

" මගේ ශෝටයි ශර්ට් එකයි අරන් දෙන්නකො වරද්.."

" බැහැලා ඇවිත් ගන්න.."

" මට බෑ..!!"

" ආ එහෙනම් ඔහොම ඉන්න.. ඔයා ඇඳුම් නැතුව හිටියත් මමනම් කැමති.."

" උබ වගේ ලැජ්ජාවක් නැති එකෙක් මම දැක්කමයි.."

රධ්‍ය අයියා මූණ ඉසකුඩිච්චියක් වගේ හදන් බලැන්කට් එකත් ඇඟ වටේ ඔතාගෙන ඇවිත් අල්මාරිය ඇතුලෙ තිබ්බ ඇඳුම් බෑග් එකෙන් ශොටකුයි ටීශර්ට් එකකුයි අරගත්තා.. සැක්.. මම නිකම් අතවර කලා වගේ හැඟීමක් දැනෙනවා රධ්‍ය අයියා මෙහෙම බිම දිගේ ඇඳෙන්න සලුපාලියට වගේ සලු ඔතාගෙන ඉද්දි.. මහා රාණි රධ්‍ය.. මම අධිරජ වරද් වෙනවා.. මව් රාණිට ආධ්‍ය අයියව ගන්නවා.. පිය රජාට අපේ මාමව අරගෙන මහ ඇමතිට

@Shan

කියාන් අයියව ගන්නවා.. උප බිසවක්..?? උප බිසවක් ඕන්නෑ.. මගේ දූ කුමාරියට අයුක අයියව අරගෙන උගේ අත පතාගෙන එන දුරබැහැර රාජ්‍යයක කුමාරයට සෙනුකයව ගන්නවා.. මහීශා හොඳයි උපදේශකට..ආශිව.. ඒකිව ගන්නෙ මොකටද.. ඒකිව හොඳයි මහ ඇමතියගෙ බේබි ගර්ල්ට..

" වරද්.."

මම යුවරජ කාලෙ සැරටම අභිශේක ගන්වලා ඊටපස්සෙ අවුරුදු දාසයෙන් සිල්ප පෙන්නලා රධ්‍ය අයියව සරන පාවා ගන්නවා.. ඊටපස්සෙ ඔටුන්නත් මගේ.. රධ්‍ය අයියත් මගේ.. රාජ්‍යත් මගේ.. ඔක්කොම මගේ.. මට කිරුල දීලා මාමටයි ආධ්‍ය අයියටයි හැමදාම තරු බලන්න යන්න පුළුවන්..

" වරද්.. !!!"

එයාලා තරු බලන්න ගිහින් තව පුත් කුමාරයෙක් ගෙනාවොත් මම නම දානවා දන්තජ කියලා.. මාමා දත් උගුල්ලනවනෙ.. දන්තජ උපැස් වගේ හොඳයි.. ආධ්‍ය අයියා කණ්නාඩි දානනිසා..

මම ඇඟිල්ලකුත් කටේ ගහගෙන ඇඳෙන් වාඩිවුණා..

" උඹෙ කන ඇහෙන්නැද්ද.. මනෝ ගහනවා.. කියන මෙලෝ දෙයක් ඇහෙන්නෙ නෑ.."

" චජ්.. මගේ ඉමැජිනේසන් එක රැයින් කලානෙ.. ඇයි ඇයි.. මොකද.."

" ඇඳුමක් ඇඳන් එන්න.. තව ටිකකින් ඩිනර් සර්ව් කරන්න එනවා.. ඔහොම ඉන්නද හදන්නෙ.."

" මෙහෙම හොඳ නැද්ද.."

" වරද්..!!"

" හරි හරි අනේ.. මගුල.. අර්ශස්ද.. පුප ගිනිගත්තු පැස්බරා වගේ බෙරිහන් දෙනවා.. ඔබනවා කොහිල අලයක්.."

රධ්‍ය අයියා අම්මා මට මහලා දුන්නු තනි නිල් පාට පිජාමා එකක් අරගෙන උකුලට දම්මහම මම කලිසම අරගෙන ඒකට කකුල් දෙක ඔබාගත්තා..

@Shan

ඔබාගෙන උඩට ඇදගත්තා.. රඩ්‍ය අයියා මං දිහා බලාගෙන ඉඳලා මම බැලුවහම අහක බලාගත්තා.. මොකුත් පේන්නැනෙ ඉතින්.. මම අපේ අම්මා කියලා තියෙන විදියට හැමතිස්සෙම අන්ඩවෙයාර් එකක් අඳිනවා.. මොකද මගේ වස්තර ගැන මට තියා අපේ අම්මටවත් ශුවර් නෑ.. මම උඩ කැල්ලත් ඇඳගෙන බොත්තම් දාගෙන අත් දෙක දිගට දාගත්තා.. දැන් කිසිම යකෙක්ට මාව අල්ලන්න බෑ මගේ මුළු ඇඟ වැහිලා තියෙන්නෙ.. මම රඩ්‍ය අයියා දිහා බලලා මූණ පිරෙන්න හිනාවුණාම රඩ්‍ය අයියගෙ මරුමුස් පෙණුම දියවෙලා හේදිලා ගිහිල්ලා එයත් ලාවට හිනාවුණා.. හිනාවෙලා එපැයි ඉන්න..

" කෝ එන්නෙ නැද්ද ඒගොල්ලො.."

"මිම්..?? ආ ඒවි.."

" අප්පච්චි මොකද කියන්නෙ.."

රඩ්‍ය අයියා මං ගාවට ඇවිත් නැමිලා මගේ නලලට වැටිලා තියන කොණ්ඩ කෑලි ටික අතින් පිටිපස්සට කල්ලා නලලට හාද්දක් දීලා තොල් තදකරගෙන හිටියා.. තප්පර තුන හතරක්.. මම හරි ආසයි මගේ කොණ්ඩෙ එහෙම අල්ලලා පිටිපස්සට කරනවට.. එතකොට ඇස් පියවෙනවා.. අනික රඩ්‍ය අයියා නලලට දෙන හාදු වලට කැමතියි.. මම මගේ පිජාමා එකේ කමිසෙ කොනක් අතකට ගුලි කරගෙන ඇස් දෙක පියාගෙනම හිටියා.. මට මතක් වෙනවා රඩ්‍ය අයියා මට මුලින්ම හාද්දක් දීපු දවස..

" උඹව දැක්කහම ලෝබ හිතෙනවා.."

" ආ..??"

රඩ්‍ය අයියා මගේ ඔලුව අතගාලා එහාට වුණා..

*****ding dong*****

" එක්ස්කියුස් මී සර්.. ඩිනර් සර්ව් කරන්න පුළුවන්ද.."

" Ya sure.."

රඩ්‍ය අයියා දොර ගාවට ගිහින් රූම් බෝයිට ඇතුළට එන්න ඉඩ දුන්නා.. මම ඇඳ උඩට වෙලා කකුල් දෙකත් බැඳගෙන ඒකා ඇතුළට එන හැටි බලාගෙන

@Shan

හිටියා.. ටසිරි බෝතලේකුත් ගෙනැල්ලද.. ඒ කියන්නෙ මගේ සිහිනය සැබෑවෙන්නයි යන්නෙ.. අදනම් බොනවා පුතේ වැටෙන්න.. මම ට්‍රේ එක උඩ තියන විස්කි බොටල් එකයි සෝඩා කෑන් දෙකයි දිහා බලාගෙන ලාවට හිනාවුණාම රූම් බෝයි බගේ දිහා බලාගෙන ඉඳලා එකපාරම රධ්‍යා අයියා දිහා බලලා ආයෙම මං දිහා බැලුවා.. මම ඉක්මනට උඩ බලාගත්තා.. නොදකින් ගල් මූසලයා බැලුව හැටි විතරක්.. විස්කි බෝතලේ අරන් ගහනවා මුගේ පුජේ මම.. ඔහොම බැලුවොත්..

" Can you hurry please..?"

රධ්‍යා අයියා දොර ගාව ඉඳන් කිව්වහම ඒකා ඉක්මනට බැල්කනි එකේ දොර ඇරගෙන එතෙන්ට ගියා.. අපි අද කැන්ඩ් ලයිට් ඩිනර් එකක් ගන්නයි යන්නෙ.. ඒකත බැල්කනියට ගියේ.. කෝමහරි කමක් නෑ මෙ අතුලට ආපු බුවාගෙ කොණ්ඩෙ මම ගිනිතියන්න කලින් ඕක හදලා ගියොත් හොඳයි.. චිත්ත අයියට කියන්න ඕන හොටෙල් එකේ ඉන්න රූම්බෝයිලා හරි නෑ කියලා.. කියන්න එපැයි.. කවදහරි සෙනුකයත් මෙකට ඇවිල්ලා ඌ දිහාත් වැරදි විදියට බැලුවොත් එහෙම.. අයුක අයියා එදාට සිරාවටම මුගේ ඔලුව ගිනි තියාවි.. මම මෙ කරන්නෙ කාගෙකාගෙත් හොඳට සමාජ සත්කාරයක්..

" වරද් නිදිමතයි නම් මූණ සෝදගෙන එන්න.."

මම ක්ශණිකව රධ්‍යා අයියා දිහා බලලා ඇස් දෙක උණ්ඩ් කරගත්තා.. ඒ මොකටද මම මූණ හෝදන්නෙ..

" නිදිමත න්-"

" මූණ.. හෝදගෙන.. එන්න.."

" ඉතින් ඇ-"

" වරද්!!"

" හරි ඉතින් මූණ හෝදන්නනෙ.. ඔකට කෑගහන්න ඕනද.. අසලි අම්මට කියනවා හරිද.. වැඩිය කියවගෙන ආවොත්.. ඇත්ත කියනවා තවුසෙ කෑදැත්තෙක් නේද.."

"....."

@Shan

" හරි යන්නම් ඉතින්.. ඔහොම බලන්න ඕනෙ නෑනෙ.. හැට් විතරක්.. ඇස් දෙක උගුල්ලනවා මම.."

මම ඇඳෙන් නැගිටලා රධ්‍ය අයියගෙ පස්සටත් ගහගෙන බාත්‍රූම් එක අස්සට රිංගගත්තා.. රධ්‍ය අයියට කියන්න ඕන සැරින් සැරේ වෙස් මාරුකරන්න එපා කියලා.. එයැයි නාග වර්ජින් මෙල් වුණාට මම එහෙම නැනෙ.. නාගලෝකෙන් මිනිහෙක් කරගහගත්තොත් පව් පිරෙයිද දන්නෙ නෑ.. නැතුවැති.. කැළණියෙන් ගඟ දෙබෑ කරගෙන ආපු නයා රධ්‍ය අයියද කියලා අහන්න ඕන.. අර හාමුදුරුවො කෙනෙක් කිව්වෙ අපිට විසාල ශබ්දයක් ඇසුණා කියලා.. ප්ලාස්ටික් බෝතලේක ගරඬි පැටියෙක්ද කොහෙද දාලා.. මට අදටත් තියෙන ලොකුම ප්‍රශ්නෙ උං ඔය කියන විදියට පොලොව පලාගෙන ගඟ දෙබෑකරන් ආවනම් ඇයි ප්ලාස්ටික් බෝතලේ දෙබෑ කරන් එළියට පැන්නෙ නැත්තෙ කියලා.. තාත්වික නැනෙ.. අනේ මෙ මගේ රධ්‍ය අයියා ඕකක් පලාගෙන ආවෙ නෑ.. එයා මලෙන් උපන් කුමාරයෙක්නෙ..

" කුමාරයෙක් මම උපන්නෙ මලින්.. වැඳපන් පෙම ඉල්ලන්න කලින්.. ම්ම්.."

මම රධ්‍ය අයියා ගාන හන්ටර් ලැබ් ෆේස් වොශ් එකෙන් ටිකක් අරගෙන අතුල්ලලා මූණෙ ගාගත්තා.. මම නැනෙ ඔය සෝබන කරන්නෙ.. අම්මගෙ වලං හෝදන විම් කෑල්ල ඇරෙන්න සන්ලයිට් හරි ගාලා මූණ හෝදගන්නවා.. ඇත්තටම එහෙම එකක් මට වුණා.. අම්මා මට ගෙනාපු ඩෙටෝල් සුදු සබන් කෑල්ලයි සුදු සන්ලයිට් කෑල්ලයි පැටලිලා මම ප්‍රැක්ටිස් ගිහින් ආපු දවසක ඒක යහමින් ඇඟේ ගාලා නෑවා.. ඊටපස්සෙ අම්මා ඒක දැනගෙන මාව ආයෙම නෑව්වා.. එක්කො පාට දෙකකින් ඒක ගේන්න ඕන.. හැමලබම මාව නොමඟ යවනවා.. වෙළසුමනයා ගාන සබන් ජාතිය මොකක්ද දන්නෙ නෑ.. ලක්ස් වෙන්නැති.. අපේ මාමා ගාන්නෙ cinthol එකක්.. ඒකනිසා මාත් පොදුවේ දැන් ඒක ගානවා.. අම්මා එක්ක හිටියොත් අම්මගෙ ෆේස් වොශ් එක ගානවා.. නැත්නම් ඩෙටෝල් ගානවා.. රධ්‍ය අයියලගෙ ගෙදර ගියොත් ගාන්නෙ එයාගෙ බොඩි වොශ් එක.. ඒ මනුස්සයා ඇඟ පිච්චෙනවා හමට හොඳ නෑ කියලා ගාන්නෙ හෙන ගනන් බොඩි වොශ් එකක්.. ක්‍රීඩ් ලව් ඉන් වයිට් කියලා.. මම නම් ඔහොම එකක් දැක්කෙත් පලවෙනියට.. ඒකෙ ජැස්මින්, මැග්නෝලියා, බල්ගේරියන් රෝස්, සැන්ඩල්වුඩ්, ඊජිප්ටියන් අයිරිස් ඔවා ඔක්කොම එකතුවෙලා එන සුවඳක් තියෙන්නෙ.. මන්දා උගෙත් පුදුම කැටයම් තියෙන්නෙ.. ගෑණුළමිස්සි වගේ ලෝකෙ පුරාම තියෙන ඒවා මූණෙයි ඇඟෙයි ගානවා..

@Shan

එක්කො අම්මා ඩර්මොටොලොජි කෙනෙක් නිසාද දන්නෑ.. හමට හොඳ ඒවා තෝරලා බලලා ගාන්නෙ.. අනිකා ආධ්‍ය අයියා.. ඒ මනුස්සයත් ලෝකෙම තියන ඒවා උසේ පිළිවෙලට වොශෲම් එකේ ගොඩගහන් ඉන්නවා.. හොඳවෙලාවට අයියලා මලෝට වෙන වෙනම නානකාමර තියෙන්නෙ.. එකක තිබ්බනම් ඔය කියන ප්‍රඩක්ට්ස් තියන්න වෙනම කාමරයක් ඒකට අල්ලලා හදන්න වෙනවා.. පුතාලා ඔහොමනම් අම්මා ඔයිට හපන් වෙන්න එපෑ..

" ටු ස්පෙයාර් මයි ප්‍රයිඩ්

ටු ගිව් යොර් ලැක් ඔෆ් ඉන්ටරෙස්ට්, ඇන්ඩ් එක්ස්ප්ලනේශන්

ඩෝන්ට් සේ ඇම් නොට් යොර් ටයිප්

ජස්ට් සේ දැන් ඇම් නොට් ප්‍රිෆර්ඩ් සෙක්ශුවල් ඔරියන්ටේශන්

ඇම් සෝ සෙල්ෆිශ්

බ- යූ මේක් මී ෆීල් හෙල්ප්ලස්, යාහ්

ඇන්ඩ් අයි කාන්ට් ස්ටෑන්ඩ් අනදර් ඩේ

ස්ටෑන්ඩ් අනදර් ඩේ

අයි ජස්ට් කයින්ඩ් විශ් යූ ව' ගේයි!!!!!!! ටඩා!!"

මම දොරත් ඇරගෙන එළියට ඇවිත් දොර ගාව හිටිය රධ්‍ය අයියට අතේ තිබ්බ වතුර පොඩ්ඩක් ඉස්සා..

" නෑ අම්මා සිංදු කියනවා.."

" දෙන්නද.. ඉන්න.. වරද් අම්මා කතාකරනවා.."

" කොයි අම්මද.."

"අපේ අම්මා.."

මම ඉක්මනට ෆෝන් එක අරගෙන කනේ තියාගත්තා..

@Shan

" අම්මා මොකද කරන්නේ~ අපිට හවස් වෙලා.. හායි.."

" අම්මට තාම හවස් වෙලා නෑනෙ.. මම දවල්ට කනවා.."

" අපි රෑට කන්න යන්නෙ.. අද අපි බීච් ගියානෙ.. මම රධ්‍ය අයියට සිප්පි කට්ටක් හොයලා දුන්නා.."

" මම දැක්කා දෙන්නා ෆොටෝ දාලා තියෙනවා.. මම කමෙන්ට් එකකුත් දැම්මා.. කොහෙද ඔගොල්ලො සෙලිබ්‍රිටිලනෙ.. අපේ කමෙන්ට්ස් පේන්නෙ නෑනෙ.."

" නෑ අනේ.. මොන සෙලිබ්‍රිටිලද.. ඔය ඉස්කෝලෙ යාළුවො තමා ඉන්නෙ.."

" ඉස්කෝලෙ යළුවො කෙල්ලොද.. බොරු කියන්නෙපා අනේ.."

" කෙල්ලොත් ඇති ඉතින්.. අපි බලන්නෙ නෑනෙ.. ෆොටෝ එකක් ගහනවා දානවා.. එච්චර තමා.."

" ඔයාලා කොහොම කිව්වත් ඔය දෙන්නා සෙලිබ්‍රිටිලා වගේ තමා.. ඔයා ශෝන් මෙන්ඩිස්ට ආසයිලු නේද.. ඔව් නේ.. මට රධ්‍ය කිව්වා දවසක්.."

" මම ආසයි නෙමෙ එයාව අදහගෙන ඉන්නෙ.. මගේ ශෝන් අයියා.."

" මෙහේ එයාගෙ කොන්සර්ට් එකක් තියේනෙ.. මට ඔයාව මතක් වුණා.. මමනම් ඔය අලුත් සිංදු අහන්නෙ නෑ ඉතින්.."

" එයා ලස්සනයි නේ.. මම හෙන කැමැත්තෙන් හිටියෙ ඩයල් එක කැමීලා එක්ක ඩේට් කරනවට.. ඒක කැඩුණානෙ.. කලින් හේලි එක්ක හිටියා.. පස්සෙ හේලි ජස්ටින්ව බැන්දනෙ.. ජස්ටින් සෙලීනව අතෑරියා.."

" ආ මම ඒක ගැන නම් දන්නවා.. ජස්ටින් බීබර්ට ආධ්‍ය ආස නිසා.."

" මට ආධ්‍ය අයියා කිව්වා.. එයාගෙ ආසම එක වන් ලෙස් ලොන්ලි ගර්ල් ලු නේද.. අම්මා ආසම කාටද.."

රධ්‍ය අයියා මාව වොශෲම් එකේ දොර ගාවින් මෙහෙට්ට කල්ලා ඒක ඇතුළට ගිහින් දොරවහගත්තා..

@Shan

" එල්විස් ප්‍රිස්ලිටයි, එල්ටන් ජෝන්ටයි.. ආ තව මැඩෝනටත් ආසයි.."

" අනේ.. මම එල්විස් ප්‍රිස්ලිගෙ අහලා තියෙන්නෙ එක සිංදුවයි හැබැයි.. එල්ටන් ජෝන්ගෙනම් අහලා තියෙනවා.."

" අහලා බලන්නකො.. ලස්සනයි.. අම්මා ආසම සැක්‍රිෆයිස් එකට.."

" බැක්ස්ට්‍රීට් බෝයිස්ලා හොඳ නැද්ද.. අම්මෝ අපේ මාමා නම් මාර කැමතී එයාලට.."

" ම්ම්.. මමත් ආසයි.. ද රෝලින් ස්ටෝන්ස්ලත් මරු.."

" අම්මෝ.. අම්මා සිංදු හුඟක් අහනවනෙ.. බොරු කියලා තියෙන්නෙ කලින් දන්නෙ නෑ කියලා.."

" අහනවා නිදහසක් ලැබුණහම.. අම්මට සිංදු කියන්නත් පුළුවන් හරිද.."

" වෝහ්.. ඇත්තමද.."

" ඔව් අම්මා නිසා තමා ඔයාගෙ අයියත් සිංදු කියන්නෙ.. "

" අම්මද රධ්‍ය අයියට පුරුදු කලේ.."

" නෑ නෑ පුරුදු කලේ නෑ.. එයා ආසයි.. මම ඉඳලා හිටලා සිංදු කියද්දි අහගෙන ඉන්නවා.."

" අහා.. අපේ අම්මටනම් සිංදු කියන්න බෑ.. අපේ ගෙදර කාටවත්ම බෑ අනේ.. මම විතරයි සිංදු කියන්නෙ.. සමහරවිට අපේ තාත්තට ලස්සනට සිංදු කියන්න පුළුවන් නිසා වෙන්නැති.. නැද්ද දන්නෙත් නෑ.."

" තාත්තට කිංදු කියන්න පුළුවන්ද.."

" ඔව් අම්මා කියලා තියෙනවා.. පුළුවන්ලු.. ඉස්කෝලෙ කාලෙ කියනවලු එයත්.."

" එහෙමද.. හොඳයි ඉතින් දැන් ඔය දෙන්නා කාලා බීලා මොකද කරන්නෙ.."

@Shan

" නිදාගන්නවා.. අම්මා එක්ක මම පොඩ්ඩක් කතාකරන්න ඕන වෙලා තිබුණේ.. කියාන් අයියා කතාකළානෙ.. මට කිව්වා අප්පච්චි කතාකළාලු.."

අම්මා එහාපැත්තෙ ඉඳන් ලොකු හුස්මක් අරගෙන පහළ දැම්මා. .අප්පච්චි ගැන කියවන එකම අම්මට හිසරදයක් වෙලා තියෙන්නෙ මම හිතන්නෙ..

" මම මොකක් හරි කරන්නම් බබා.. එයාට මොකක් හරි අහුවෙලා තමා ඔය.."

" මට හිතට හරි නෑ ඒත්.."

" මොකට බය වෙන්නද.. අපි කවුරුත් ඔයාට මොකුත් වෙන්න දෙන්නෙ නෑ.. අම්මව විශ්වාස කරන්නකො.. හරිද.. අම්මා බලාගන්නම් ඒක.."

" ම්ම්.. රධ්‍ය අයියට ආයෙම අප්පච්චි කැම්ප් යන්න කියයිද අම්මා.."

" යන්න කිව්වත් රධ්‍ය යන එකක්නම් නෑ.. එයාගෙ යුනිවසිටි ප්‍රශ්නෙත් විසඳගන්න ඕනනෙ.. ආධ්‍යට තනියම ඔක්කොම කරගන්න අමාරුයි මේ වෙලේ.."

" එයාට බෝයිපෙන් කෙනෙක් ඉන්නෙ.. තනි කොහෙද.."

" ආ අනුරාග්.. ඔව් එයානම් හුඟක් සපෝටිව් කෙනෙක් තමා.. මට වඩා ඔයා දන්නවනෙ නේද.."

" ඒකතමා..අම්මා දැන් කන්න.. මම කතාකල්ලා අම්මට නිදහසේ කන්නත් නෑ නේද.."

" එහෙම නෑ බබා.. මම පස්සෙ ආයෙම ඔයාට ගන්නම්කො.. හරිද.. කෑමකාලා නිදාගන්න.. ගුඩ් නයිට්.."

" ගුඩ් නයිට් අම්මා.. ආදරෙයි.."

මම ෆෝන් එක කට් කල්ලා බැල්කනි එකට ගියා.. ඒකෙ තිබුණු රවුම් මේසෙ උඩ ඉටිපන්දම් දෙක තුනක් පත්තු කල්ලා එළියෙන් එන හුළඟට ඉටිපන්දම් නිමෙන්නෙ නැතිවෙන්න ඒවට ග්ලාස් කවර් එකක් දාලා කහපාටට ලාවට එළියක් තියෙනවා.. හැමදාම මෙහෙම ෆැන්ටසියක් වගේ ජීවිතේක ඉන්න තියෙනවනම් හොඳයි.. ඔක්කොම කරදර වලින්නූයි

@Shan

ලෝකෙනුයි වහන් වෙලා වගේ.. ආයෙම කොළඹ ගියාම මට මොන මොන වගේ දේවල් වලට මූණ දෙන්න වෙයිද කියන්න බෑ.. මම ප්‍රශ්න වලට මූණ දෙන්නෙ උපන් දා ඉඳලමයි.. ඒත් මේක මම තනියම මූණ දෙන ප්‍රශ්නයක් නෙමෙයි නිසා හිතට හරි අමුතුයි..

තව මාස තුන හතරකින් ඉස්කෝලෙ යන්නත් නෑ.. රිසාල්ට්ස් අවුට් වුණාම මොකක් හරි කැම්පස් එකකට යාගන්න පුළුවන්.. කැම්පස් යන එකට වඩා ඇත්තටම මට හිතට අල්ලලා තියෙන්නෙ කල්බ් එකේ වැඩේ.. මොකද ඉගනගන්නවට වඩා මට සෙල්ලම් කරන්න පුළුවන්.. මගේ ජීවිතේ හැටි කියන්නෙ.. හැම මගුලකම මට තෝරගන්න එකක් ඉතුරුවෙනවා.. හැම එකම එහෙමයි.. මොකක් හරි කමක් නෑ හැමදේම මම හිතාගෙන ඉන්න විදියට හොඳට වෙනවනම්.. ඒත් ඒකත් එහෙම නෑ.. මම කලින් මෙහෙම හැමෝම ගැන හිතන්න මහන්සි වෙලා නෑ.. මගේ වටේ එකට්ටිය ගොඩ ගැහුණහම හිතට හරි බරයි.. හැමෝ ගැනම හොයලා බලන්න ඕන.. තනිකමක් නෑ තමා.. ඒත් මගේ හිතට හරි නෑ මගේ අතින් මොකක් හරි මිටක් අතෑරේවි කියලා.. එහෙමයි කියලා සේරම එකපාර බදාගන්නත් මට බෑ..

" මොනවද කල්පනා කරන්නෙ.."

මගේ ඇඟ වටේ අත් දෙකක් එතිලා මාව වැටට හේත්තු වුණාම මම මගේ ඇඟ වටේ එතිල තියෙන අත් දෙක දිහා බලාගෙන හිටියා.. ඒවා වෙලාවකට මට ගෙදරක් වගේ හරිම ආරක්ශාකාරී හැඟීමක් ගේනවා.. උණුහුමක් එක්ක එකතුවෙච්ච ආදරණීය ගතියක්..

" කල්පනා කලේ නෑ.. අපි හෙට යනවද.."

" ම්ම්.. යන්න ඕනනෙ.."

මම රධ්‍ය අයියගෙ දිහා හැරිලා එයාගෙ ඇස් දෙක දිහා බලාගෙන හිටියා.. කළුවරේ මට එයාගෙ ඇස් වල කියන්නෙ මොනවද කියලා පෙනුනෙ නැති වුණාට මගේ හිතේ අදහසක් තියෙනවා එයා 'මෙහෙම' මං දිහා බලාගෙන ඉන්නවා ඇති කියලා..

" වරද්.. මම ඔයාගෙන් කවදහරි මොකක් හරි ඉල්ලුවොත්.. ඔයා ඇයි කියලා අහන්නෙ නැතුව ඒක කරනවද.."

@Shan

" ආ..??"

මම රධ්‍ය අයියා ජීවිතේට මගෙන් ඉල්ලලා නැති ඉල්ලීම ගැන පුදුම වුණා.. එයා මගෙන් දේවල් ඉල්ලන්නෙම නැති තරම්.. කරන්න කියලා කෙලින්ම කියනවා විතරනෙ..

" මම.. ඔයාගෙන්.. කවදහරි මොකක් හරි ඉල්ලුවොත්.. මගෙන් ඇයි අහන්න එපා වරද්.. ඔයා ඒක මට කල්ලා දෙන්න..ඔයාට මාව විශ්වාසයිද.."

" විශ්වාසයි.. ඒත් ඇයි එකපාරම එහෙම දෙයක් ගැන ඇහුවෙ.."

රධ්‍ය අයියා හිනාවෙලා මගේ ඔලුව වජ්ජප වෙන ඔලුව අතඇවා.. මම ටිකකින් අවුල් වෙච්ච කොන්ඩෙ ඇස් දෙකෙන් අයින් කල්ලා උඩ බලාගත්තා..

" අහන්න ඕන නිසා.. උබට හැමවෙලේම විසේ.. දෙයක් අහන්න වෙලාව එනකල් බලන් ඉන්න ඕනනෙ.."

" මට විසයක් නෑ හරිද.. ඒත් මෙ දවස්වල නම් ඇත්තටම මාව අවුල් වෙලා ඉන්නෙ.."

" ඒ ඇයි.."

" ඔයා දන්නවා ඇයි කියලා.."

මම රධ්‍ය අයියගෙ පපුවට මූණ තියාගෙන් අත් දෙක එයාගෙ ඇඟ වටේ ඔතාගත්තා.. මම ආසයි එයා ආවින් එන සුවඳට..

" ප්‍රශ්න නොඑන දවස් නෑ වරද්.. හැමදාම ප්‍රශ්න එනවා.. අපි බලමු ඒවා හොඳ විදියට විසඳගන්න ක්‍රමයක්.."

" ම්ම්.. අපි බලමු.."

රධ්‍ය අයියගෙ අතක ඇඟිලි තුඩු මගේ කොණ්ඩෙ අස්සෙන් එහෙ මෙහෙ ගියා..

" වෙලාවකට පිස්සු වගේ බං.. මොන මගුලක්ද මේ කියලා හිතෙනවා.. මම උඹවත් මගේ ප්‍රශ්න වලට ඇදලා ගත්තද.."

@Shan

" පිස්සුද ඒයි.. එහෙම එකක් නෑ.. මමත් එහෙම කියන්න එපැයි එහෙනම්.."

" ඒවයි මේවයි වෙනස් නෙ.."

" වෙනසක් නෑ ප්‍රශ්න ප්‍රශ්නම තමා.. අපි ඔලුවට දාගන්න විදියයි වෙනස්.."

" අප්පච්චි තේරුම් ගන්නෙ නෑ වරද්.. උවමනාවකුත් නෑ.. එහෙම කරන්න ට්‍රයි කල්ලවත් බලන්නෙ නෑ.."

" එයා තේරුම් ගන්න කාලයක් ඒවි.. එතකල් බලන්න ඉන්න ඕන නෑ.. අප්පච්චි ඕන දෙයක් කරපුවාවෙ.. ඔයා ඔයාගෙ ගමන යන්න.. ඔයා දන්නවනෙ.. ඉස්කෝලෙන් පස්සෙ ඔයයි මමයි යන්නෙ පාරවල් දෙකක.."

" ම්ම්.."

" ඉතින්.. අපි එකට හරි.. තනි තනියෙන් හරි අපේ ගමන ගිහින් කොහේදිහරි හම්බෙනවා.. එතකල් අතාරින්නෙ එපා.. ඔයා මුලින් ඔයා ගැන හිතලා ඊටපස්සෙ වටපිටාව ගැන හිතන්න.."

" ඔයත්.. මම ඔයා ගැන හුඟක් බලාපොරොත්තු තියාගෙන ඉන්නවා වරද්.. ඒවා නැතිකරන්න එපා.. මම ආසාවෙන් දැකපු හීන ඔයා ගාව තියනවා.. ඒවා නැතිකරන්න එපා.. ආර්ග්.. කොහොමද මම උබට මේවා කියලා ඉවරකරගන්නෙ.."

" එහෙම වෙන්නෙ නෑ.. ඒවා මං ගාව තියනවා.. අනික.. ඔයාට අල්ලගෙන ඉන්න බෑ කියලා හිතෙන පැති අතෑරලා දාන්න.. අල්ලගන්නවා වගේම අතාරින්නත් ඉගනගන්න ඕන.."

" මම අතාරින්න ට්‍රයි කරනවා.. කොහොමත් මම අතාරිනවා.. එතනින් පස්සෙ ආයෙම ඒ පැත්තක්වත් මම බලන්නෙ නෑ.."

" ඔයා ඔයාට පුළුවන් උපරින් අන්තිම මොහොත වෙනකල් අල්ලන් ඉන්න.. ඊටපස්සෙ හිතෙන දෙයක් කරන්න.."

රධ්‍ය අයියා තව ටිකක් කිටි කිටියේ මාව තුරුල් කරගත්තම මාව එයාගෙ අත් අස්සෙ පොඩිවෙලා ගියා.. ඒත් එහෙම ඉන්න ආසයි.. රධ්‍ය අයියා ඉඳලා හිටලා කතාකරන දවසට මම කැමතියි.. කතාකරන්න හිතෙන දවසට මම

@Shan

කැමතී.. එයා ටිකකින් මාව එහාට කල්ලා විස්කි ග්ලාස් එකකට ටිකක් වක් කල්ලා මට ගෙනැත් දුන්නා.. මම ඒක දිහා බලාගෙන ටිකක් වෙලා හිටියා..

" වැටෙන්න බොන්න ඕන කිව්වනෙ.."

" නැතුව.. බොනවා තමා.."

" බොන්න ඕන නෑ සුවඳ ආවත් වැටෙනවා.. අර එකපාරක් මොක්ටේල් එකක්-"

" අයියෙ!!!"

මම රධ්‍ය අයියට රවාගෙන විස්කි ග්ලාස් එක පඩ පපුව පිච්චීගෙන යනම ඇදලා ඇරියා.. පස්සෙ හිතුණෙ අපරාදෙ බිව්වෙ කියලා.. මමත් ඉදලා ඉදලා පුදුම ආසාවල් තමා මේ මනුස්සයට කියන්න යන්නෙ.. ඒත් ඒකා ඉස්සරහා නිකම් බොරුවට චාටර් වෙන්න ඕන නැති නිසා මම ඉවස දරාගෙන අනිත් වීදුරුවත් වක් කළා.. රධ්‍ය අයියා මොකුත් නොකිය ස්ප්‍රයිට් කෑන් එකක් කඩාගෙන බොනවා..බොරුවටනෙ රහපාන්නෙ.. අපි දන්නැද්ද බෙබද්දගෙ හැටි.. මාමගෙන් ගුටිත් කෑවෙ එදා අමධ්‍යප සංගමේ කෙරුවාව නිසා..

" ඔයා බොන්නෙ නැද්ද.."

" අද බෑ.. "

" ඒ ඇයි.. බොන්න බොන්න.. රහපාන්නෙ නැතුව.."

මම කැම මේසෙ වටෙන් ගිහින් රධ්‍ය අයියගෙ උකුළ උඩින් හරි බරි ගැහිලා ඉඳගත්තහම එයා මාව ආයෙම උස්සලා හරියට ඉන්දුවගෙන ඇඟ වටේ අත් දෙක බැඳගත්තා.. මම එයාගෙ පපුවට හේත්තු වුණා.. හේත්තු වෙලා තව ග්ලාස් එකක අඩියට පොඩ්ඩක් වක්කරගෙන බීලා ඒක රධ්‍ය අයියගෙ අතට දුන්නා..

" ඇයි තවුසෙ බොන්නැත්තෙ.."

" ඕනනෑ.. අද බෑ වගේ.."

" ඔයා හෙන හොඳයි අනේ.. ඔයා බොන්නැති වුණාට මට බොන්න ගෙනැත් දෙනවනෙ.. හොඳ පුරුදු ඉස්සරහත් ගෙනියන්න ඕන.."

@Shan

" මිම්.."

" තවුසෙ දන්නැනෙ.. මම තවුසෙ එක්ක යාළුවුණ මුල් කාලෙ හිතාගත්තා අම්මටසිරි වෙන්න ආදරේ කරනවා කියලා.. පස්සෙ එහෙම කලා.."

"....."

" තාව එහෙම කරනවා.. තවුසෙ පහුගිය ටිකේම අර හු#තක ගිහිල්ලා දකින්නවත් නෑ.. මට පාළුයි ඒයි.. හොඳවෙලාවට තමා අවුරුද්ද ආවෙ.."

" පාළුද.."

" පාළුදත් අහනවා.. මම එපෑ ඉස්කෝලෙ යන්න.. දැන් ඔය කියන කෑම්ප් එකේ මම හිටියෙ නැනෙ.. තවුසෙට මාව එහෙම පේන්නෑ.. මම ඉන්නෙ.. තවුසෙයි මායි හිටපු තැන්වලමයි.. මට පාළුයි මතක් වෙනවා.."

"....."

" ආයෙනම් ඔහොම දුර යන්නෙපා.. තවුසෙ පැත්තක පාඩුවෙ උන්නු මට ලව් කල්ලා.. ඊටපස්සෙ දුර යනවා.. මට මම හිටපු හැටිත් අමතක කල්ලා.."

"....."

" සාධාරණ නැනෙ.. මේ වරද්.. ලව් කලොත් කරන්නෙ.. අර අලි ලොකුයි කියලා හිතාගෙන ඉන්න සිස්ස බටයට විතරයි.. අර ඉන්නෙ බැජ් එකක් ගහගෙන පුප උඩදාන් යන එකෙක් අපේ ඉස්කෝලෙ.. සැක්.."

"....."

" එක්කො තවුසෙට තිබ්බනෙ මාව කෝච්චියෙන් තල්ලු කල්ලා දාන්න.. එහෙනම් මෙහෙම මගුලක් නැනෙ.. රෙද්ද.. පාරවල් දෙකක් හරි මොකක් හරි.. ඉන්න දීපංකරේක ඉඳලා මාව හොයාගෙන වරෙන්.."

" වරද්.."

" වරද් තමා.. වරද්."

" ඔයාට කේන්ති ගිහිල්ලද ඔය.."

@Shan

" ඔව්.. තමා.. අන්න අර අප්ප-කැහ්.. ඒ මනුස්සයා මගෙන් අහගන්න යන්නෙ දෙකක්.. අම්මපා කියනවා ලුණුඇඹුල් ඇතුව.. ආධ්‍ය අයියට බැන්නොත් එහෙම.. ඔයා-ඔයා දන්නවද ඇප්ලාස්ටික් ඇනිමියා කියන්නෙ මොකක්ද කියලා.."

" ඇයි..?? එහෙම ඇහුවෙ.."

" මම කොහේහරි ඒක දැක්කා.. එකසැරේ මතක් වුණා.. හරි කමක් නෑ.. අපි අර නෙතු සමයං ගෑණිගෙ බ්‍රෙසියර් එකේ පටියක් අරන් ගැටගහන්න ඕන ආධ්‍ය අයියගෙ අතේ නෙමේ.. කියාරගෙ බෙල්ලෙත් නෙමේ.. ඔගොල්ලොන්ගෙ අප්පච්චිට පටියක් ඕනවුනොත් ඉල්ලගන්න කියන්න.. ආධ්‍ය අයියට ඔය දෙකයි පනහෙ බ්‍රෙසියර් පටි ඕන්නෑ.. අපේ මාමා එයාට රත්තරං මුද්දක් දාලා බලාගන්න ඉන්නෙ.."

" ම්ම්."

රධ්‍ය අයියගෙ පපුව ගැස්සෙන විදියෙන් මට එයා හිනාවෙනවා වගේ දැනුනා.. මම වෙරිමරගාතෙ වීදුරු කාලෙ ඒවා දෙකතුනක් අහලා ඔලුව උස්සගන්නත් බැරු බැරුව රධ්‍ය අයියගෙ මූණ දිහා බලාගෙන හිටියා..

" මීටවඩා නම් බොන්න බෑ.. දැනටම වැටිලා ඉවරනෙ.. වැටෙන්න බිව්වා.. දැන් කෑම කාලා නිදාගත්තම හරි.. හොඳද.."

" මට බෑ.."

රධ්‍ය අයියා හෙන ලොකු කෑම හැන්දක් අරන් කියව කියව උන්නු මගෙ කටේ ගැහුවා.. ඒත් මට තව බොන්න ඕනනෙ.. ඇයි තේරෙන්නෙ නැත්තෙ මේ කොට්ටෝරුවට.. මම ඒක හපලා හපලා ගිල්ලට පස්සෙ තව හැන්දක් පාවෙලා ඇවිත් මගේ කටේ නතරවුණා.. අන්තිමේට මට කොයි වෙලාවෙද මන්දා එහෙමම නින්ද ගියා වගේ මතකයි.. ඊටපස්සෙ රධ්‍ය අයියා මාව උස්සලා අත් දෙකට ගනිද්දි මට අහැරුණා.. ආයෙම බලද්දි මම හිටියේ ඇඳ උඩ.. මගේ උඩ කමිසෙ තිබුණෙත් නෑ.. මම ඒකෙ මොනවහරි හලාගත්තද මතකත් නෑ.. මට එහෙමම නින්ද ගියා.. හොඳටම නින්ද ගියා වගේ.. ඇස් දෙක බරවෙලා පියවෙලාම ගියා..

ඔතරී ආවෝ.. සමාවෙන්න ළමයි මම මේ කලින් ටයිප් කරපු එකක් දැම්මේ.. ඔතරීට යන යන තන ජබර කලන්තයක් අල්ලලා තියෙන්නෙ.. මම

@Shan

රිප්ලයි කරන්නම් සනීප වුණාම.. හොඳද..

එන්නාම්.. ලව් යූ..❤

මිස් යූ දඟබුවනේ..



දම්රු දඟඹු අක්කා.. තැන්ක් යූ සෝ මච් අනේ..



@lyz_8105 තැන්කූ සෝ මච් දළඹු අක්කෝ..

මම ආදරේම ආදරේයි.. ❤😘

**Thank you very much to everyone who wished me a speedy recovery.. I love you..** ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 124 කොටස

" ආධ්‍ය අයියා නිදිත.."

" මොකද උඹ.."

" නිදිද ඇහුවෙ.. ඇයි කැගහන්නෙ.. යකෝ!! මගේ මස්සිනා නිදිද කියලා දැනගන්න මට අයිතියක් නැද්ද.. මට තමා හරිනම් වැඩි අයිතිය.."

අපේ මාමා කාමරේ ඉඳන් ගස්සගෙන පද්දගෙන කුස්සියට යන්න ගියා.. නිකන් නෙමෙයි මටත් රවලා.. අද උදේම මමයි රධ්‍ය අයියයි ගෙදර එන්න ආවා.. ඊයේ බේබද්දා වගේ බීලා, බීපුවාට හරියන්න දෙහි වීදුරුවකුත් බීලා ගෙදර ඇවිත් නිදාගෙන මම ආයෙම නැගිට්ටද්දි දවල් තුනට විතර ඇති.. මම විතරක් නෙමෙ ආධ්‍ය අයියත් නිදාගෙන හිටියෙ අපි එනකොටත්.. මාමා පුප ගිනිගත්තු කාන්තාර ඔටුවා වගේ කාමරේට කැම උස්සන් යනවා.. ආයෙ කුස්සියට දුවනවා.. ආයෙම දොර රෙද්ද මෙහාට කල්ලා බලනවා.. ආයෙම යනවා.. අපේ අම්මා එනවද කුරුමානම් අල්ලනවා..

මටනම් පේන්නෙ ඊයෙ යම්කිසි දෙයක් වෙලා වගේ..

අපිට කමක් නෑ යම්කිසි දෙයක් වුණාට.. වෙන්න එපැයි.. නොවෙනවනම් නෙ බයවෙන්න ඕන. අපේ මාමා විටක් කාලා සිගරට් එකක් බිව්වට අඩපණ වෙලා නැතුවැති.. පිස්සු හැදෙයි.. නැග්ගෙ නැතොත් ආධ්‍ය අයියා අතට අහුවෙන එකෙන් දමලා ගහ- සැක්.. මම මේ මොනවද හිතන්නෙ..

'හිත දමනය කරගනින් වරද්'

මම එකදිගට ගලාගෙන එන දහසක් සිතුවිලි අහකට දාලා ඔලුවත් කස කස මම යාළුවෙලා ඉන්න මනුස්සයා හොයාගෙන ගියා.. ආවට පස්සෙ මම කට බලියන් නිදාගත්තා මිසක් රධ්‍ය අයිය කොහේද කියලා බැලුවෙ නැනෙ.. බලන්න දේකුත් නෑ අපේ ආච්චි එක්ක පව හලන එකමයි වැඩෙ.. නැත්නම් රෝන්දෙ යනවා.. එකතැනක ඉන්නෑ..

මමත් මාමා ගිය පස්සෙන්ම හිමින් සැරේ ගිහින් කුස්සියට එබුණා.. රධ්‍ය අයියා පොඩි හිරමනේ උඩ වාඩිවෙලා සියඹලා වගයක් කනවා.. අපේ මාමා කුස්සියෙ ඉඳන් එළියට යන දොර ගාව ඉඳන් දොරට තඩිබානවා.. සේරටම

@Shan

මනමාල විසේ.. ඒකයි මේ.. අනිකා රධ්‍ය අයියා.. මේකා බඩවෙලාද සියඹලා කන්නෙ.. බීපු වෙලේ මම අතින් යමක් සිදුවුණාද.. නෑනෙ.. එහෙනම් එක දවසින් බඩ වෙනවයෑ.. එහෙම වෙන්නෙ නෑ.. සංසේචනය වෙලා ලක්ශන පහළ වෙන්න ටික දවසක් යනවා.. අනික උෟට ළමයි හම්බෙන්නෑ කොහොමත්..

" උඹ මොකද ඔය සියඹලා ගීලින්නෙ ඔච්චර.. ඈ රධ්‍ය.."

" නිකම්.."

" නිකම් කියන්නෙ.. ඔච්චර කරන්න එපා බං.. අනික ඔච්චා ඇඹුල් නැද්ද.."

" නෑ.."

" උඹ බඩ වෙලාද.. නැත්නම් අපේ ගෙදර ඉන්න එකාගෙ ලෙඩේ බෝවෙලාද.."

" මොන..?? නෑ.. මම නිකම් කන්නෙ.. මාමෙ.. අයියා නැගිටින්නැද්ද දැන්ම.."

අපේ මාමා දොර උළුවස්සට හේත්තුවෙලා රධ්‍ය අයියගෙ පැත්ත හැරුණා.. රධ්‍ය අයියා සියඹලා පොත්තක් එක ඔට්ටු වෙනවා ඒක අතේ තියාගෙන කරක කරක..

" ඒකට සීනි බැහැලනෙ.. නැගිටීවි ටිකකින්.."

" ආයෙම..??"

" මම.. ඩෙක්‍රෝස් එකකුත් දීලා තියෙන්නෙ.. බලමුකො.."

මම කුස්සියට ගිහින් ෆ්‍රිජ් එකෙන් අයිස් කැටයක් අරගෙන මූණෙ තියාගත්තා.. අද ටිකක් රස්නෙයි දවල්.. අම්මයි ආච්චියි ටවුන් එකට ගිහිල්ලා බඩු වගයක් ගේන්න.. අපි හෙට කොළඹ යන්නනෙ ඉන්නෙ.. අර මාන්නක්කාර වේළුසුමනයා නහිනවා සරනේරු සරනේරු වරෙන් කොළඹ කිය කිය.. තාන්වි අක්කට කියන්නත් හිතෙනවා මනුස්සයා හඳාගනින් අක්කෙ.. පුදුම වදයක් දෙන්නෙ කියලා.. අනික මේ දවස් ටිකේ ගිලලා පොඩ්ඩක් මහත් වෙලාද මන්දා.. ඒකටත් මුළ ඉඳන් කෝචගෙන බැනුම

@Shan

අහන්න තියනවනෙ.. ඇත්තට මට කොච්චර වැඩ තියද කරන්න.. සියල්ලට ප්‍රථම මිනිස්කම..

" ආ නැගිට්ටද.."

" මම නැගිට්ටා පුතේ.. මේ අයියෙ එහාගෙදර කිකිළි මහීශාට කතාකල්ලනෙ.."

" මහීශාට..??"

" ඔව්.. ඒකි ඔයාගෙ නම්බර් එක ඉල්ලලා මම මහීශගෙ නම්බර් එක දුන්නා.. මහීශා අහලා තිස් හයක්වත් නැත්නම් කතාකරන්න එපා අක්කෙ කියලා.. අක්කට මල පැනලා බැනලා.."

" සිරාවට.. මොනවද කියලා තියෙන්නෙ.."

" ඊයා අනෙ චික් කියලා.."

රඩ්‍ය අයියා මහ කුප්ප හිනාවක් දාලා සියඹලා ඇටේකින් මට ගැහුවා..

" උඹලටම හරියන යාළුවො.."

" අපේ ගැන්ග් එක හෙනාතල් මාමෙ.. මාමා රිසෝට් එකට ඇවිත් නොකියම ගියානෙ.. කොහෙද දවසක් හිටියනම් බලාගන්න තිබ්බා.."

මාමා බයවෙලා වගේ මගේ මූණ දිහා බලලා ඊටපස්සෙ රඩ්‍ය අයියගෙ මූණ දිහා බැලුවා.. රඩ්‍ය අයියා මොකුත් ඇහුනෙ නෑ වගේ පාඩුවෙ සියඹලා කනවා.. මම අයිස් කැටේ අරන් අනිත් කම්මුලෙන් තියාගත්තා.. අපි දන්නෑ කියලා හිතේ ඇත්තෙ..

" මොන රිසෝට්ද.."

" ඇල්ලෙ ඇල්ලෙ.. ඇල්ලෙ රිසෝට් එක.."

" උඹලා මහා පුදුමාකාර චීත්ත දෙකක් තමා.. නොදකින්.."

" ඇල්ලෙ කරපිංචා තියත.. උගුරුස්සනම් තිබ්බා.. ආගි කඩලා දුන්නෙ.. මාමට ඉන්න තිබ්බෙ මමනම් කියන්නෙ.."

@Shan

" සුදුමහත්තයා!!!"

මාමා මට හොඳ දෙකක් කියන කට ඇරියා විතරයි,

" අනුරාග්!!! මේ එන්නකෝ..!! අනේ පොඩී..!!"

ආධ්‍ය අයියා කාමරේ ඉඳන් මරලතෝනි තියන්න ගත්තා.. අපේ මාමා ඒක ඇහිලා කාමරේට දුවගෙන ගියත් රධ්‍ය අයියා පාඩුවෙ සියඹලා කනවා.. යකෝ අයියා කැගැහුවනම් පොඩ්ඩක් බලන්න එපැයි.. මේකා මාර මල්ලි තමා.. මම රධ්‍ය අයියා ගාවට ගිහින් බිමින් ඉඳගත්තහම රධ්‍ය අයියා මටත් සියඹලා කෑල්ලක් කටේ එබුවා..

" ඇයි ඔයා යන්නැත්තෙ.. අයියා කතාකළානෙ.."

" මම යන්නෙ නෑ.."

" ඇයි ඒ.. ඒක හරි වැඩක්නෙ.."

" අයියා මකුළුවෙක් දැකලා.. ඔය ටෝන් එකෙන් කතාකරන්නෙ මකුළුවො දැක්කහම.."

" මොකක්.. යකෝ අයියෙ!!"

මම අත දිගෑරලා රධ්‍ය අයියගෙ පිට මැද්දට පාරක් දුන්නා.. මාර මනුස්සයෙක්නෙ.. ඒක කිව්ව කැත කිසි ගානක් නැතුව.. ගියේ නැති එක එක අතකින් හොඳයි තමා.. නැත්නම් අයියා මලෝ බයවෙලා අපේ මාමගෙ කරේ නැගලා ඒ වයසක මනුස්සයාගෙ කොන්ද කැඩුනොත් එහෙම.. මේ මාසෙ අන්තිමට අතිනත ගන්න ඉන්නෙත්.. පව් නෙ මොනව වුණත්..

" ඔයා කෑවද.."

" තාම නෑ.. අත්තම්මලා ආවහම කමු.."

" හා.."

" අයුක කතාකල්ලා ඔයාව ඇහුවා.. වෙලාවක ගන්න.. කතාකරන්න ඕන කිව්වා.."

@Shan

මම රධ්‍ය අයියගෙ මූණට එබුණා..

" මොනවද කිව්වෙ.."

" උඹ ප්‍රිෆෙක්ට් ඩියුටි කරන්නෙ ගස් උඩද.. කාපන් අපිවත් එක්ක.. දැන් අලුතින් එකෙකුත් හොයාගෙනනෙ ඉන්නෙ.."

" අනේ ඔය චීත්තයා කියන්නෙ බොරු සුදුඅම්මියො.. ඔයාට ඔයාගෙ වරද් විශ්වාස නැද්ද.."

රධ්‍ය අයියා මගේ මූණ දිහා බලාගෙන ටිකක් වෙලා හිටියා..

" නෑ..!!"

ඊටපස්සෙ කිසි විලිලැජ්ජාවක් නැතුව කෑහ් ගාලා ආයෙම අහක බලාගත්තා.. අම්මපා ආධ්‍ය අයියට කැමති වෙන්න තිබ්බෙ කියලා හිතේන්නෙ මෙ වෙලාවට තමා.. මෙච්චර පණ ඇරගෙන ලව් කරන මට වඩා අර කොහෙවත් ඉන්න චීත්ත අයුක අයියා ලොකු වුණානෙ.. සෙනුකයට කියන්න ඕන මිනිහා හරියට හදාගනින් කියලා.. දැන් ඔය ආශි හදාගෙන ඉන්නෙ ගානට කියාන් අයියව.. කොටින්ම කියාන් අයියා දන්නවා කොහොමද පිළිවෙලට මෙකප් එකක් කරගන්නෙ කියලා.. නියපොතු පාටකරන්නෙ කියලා.. පොර රගර් ගහන එක පැත්තකට දාලා මොඩලින් කරන්නලු ඉන්නෙ ඩ්‍රග් ක්වීන් කෙනෙක් වෙලා.. ඌට හොඳ අනාගතයක් හරි තියනවා.. අපේ කෙල්ල ගානට හදලා අරගෙන තියෙන්නෙ ඔය.. අපෙන් කැවොත් පිට යන්නෑ කියලා පච්කාර පවුලෙ ආදර්ශපාඨය වෙනස් කලානම් හරි..

" ඔයාට ඔයාගෙ බෝයිෆ්‍රෙන්ඩ්ව විශ්වාස නැද්ද ඒයි.."

" උඹලව විශ්වාස කරන්න එපා කියලා මහීශා නංගි කිව්වා.."

" ආ එයාද දැන් ඔයාගෙ යාලුවෙලා ඉන්න එක්කෙනා.. නෑනෙ.. ඒකනිසා ඔයා මාව විස්වාස කරන්න.. පච්කාරයෙක් වෙන්නෙ නැතුව.."

රධ්‍ය අයියා මම කිව්ව එක ඇහුනෙ නෑ වගේ නැගිටලා දර ලිප ගාවට ගිහින් ලිපට පිඹින බටේ අරගෙන දෙතුන්පාරක් පිම්බා.. එතකොට ගිනි අඟුරු රතුපාට වෙලා ඇවිලුනා.. මේකා උයනවද කුස්සියට වෙලා..

@Shan

" ලිපේ මොනවද ඒයි.."

" කජු වගයක්.. අම්මා කිව්වා බලාගන්න කියලා.."

" එහෙමද.."

මම ශීප් එකේ අයිස් කෑටේ එලියට විසික් කල්ලා රධ්‍ය අයියා ගාවට ගිහින් හිටගත්තම රධ්‍ය අයියා මගෙන් අඩියක් එහාට ගියා.. ඇත්ත තම කියලා තියෙන්නෙ.. මේ මිනිහට මාව විශ්වාස නෑ.. මම ඒත් උත්සහය අතාරින්නෙ නැතුව රධ්‍ය අයියගෙ පපුව වටේ අත් දෙක බැඳගෙන පිටට මූණ තියාගත්තා.. මලෙන් උපන් කුමාරයා ගිනි මද්දහනෙ නාලා ශවර්ජෙල් සුවඳයි ළඟ..

" තාම ඔලුව රිදෙනවද.."

" නෑ අනේ.. දැන් රිදෙන්නෙ නෑ.."

එහෙම ශේප් එකේ රධ්‍ය අයියගෙ ආම් කට් ශර්ට් එකේ අත් දෙක අස්සෙන් මගේ අත් දෙක ඇතුළට දාගෙන පපුව හයියෙන් ඇල්ලුවා විතරයි රධ්‍ය අයියා මගේ අත් දෙක ලොක් කල්ලා අල්ලගෙන ඇකිච්චා.. ඒ වුණාට දැන් පපුවට හිත ගිහින් ඉවරයි..

" වරද්!!!!!!!!!!!"

" ඇයි.. මොකද.."

"  ඕන නවත්තපන්.. මම ගහනවා උඹට.."

" ඔයා මට ගහන්න.. ගහනකන් තමා ඒයි මාත් බලාගෙන ඉන්නෙ.. කොහෙද ඇල්ලුවහම ඇතට යනවනෙ.."

රධ්‍ය අයියා මගේ අත් දෙක එහාට කල්ලා මගේ පැත්ත හැරිලා මාව උස්සලා බැම උඩින් ඉන්දුවා.. ඉන්දලා මගේ ඔලුව මැද්දටම හොඳ ටොක්කක් ඇන්නා..

" ආව්..!"

@Shan

" වරද් මට හය නමය ග්‍රේඩ් වල මැත්ස් සිලබස් එක හොයාගන්න ඕන.. ඔයා ඉස්කෝලෙ ලයිබ්‍රි එක ඇරලා තියන දවසට මට පොත් ටික ගෙනැත් දෙනවද.."

" මං ගාව තියනවා.. ඒකෙන් ඉල්ලගන්න ඕන නෑ.. ආ හැබැයි සිංහල මීඩියම් වලින්.. කමක් නැද්ද.."

" ඔයා ගාව තියේද.."

රධ්‍ය අයියා මගේ කම්මුලක් ගැලවිලා යන්නම හයියෙන් අල්ලගත්තා..

" කලින් කියන්න එපෑ තාර පැටියෝ.. කොළඹ ගියාම හොඳ ළමයා වගේ මට ඒ ටික ගෙනැත් දෙනවද.."

" මම තාරාවෙක් නෙමෙයි!!!!!"

" මල්ලිකා මිස්ගෙ අඩුපාඩුවට කෙනෙක් එනකල් මම පන්තිය බලාගන්නවා කිව්වනෙ.. උදේට ඇවිල්ලා මට වැදලා පලයන්.."

" දනගහලද දන්නෑ වඳින්නෝන.."

" පසඟ පිහිටුවලා.."

" හා.. මම එනවා හරිත වැඳලා යන්න.. දැන් මමයි හෙඩ් ප්‍රිෆෙක්ට් හරිද.. ඔයාට බයවෙලා ඉන්නෙ නෑ ඉස්සරවගේ කට පියාගෙන.."

" ඉස්සර කට පියාගෙනත් හිටියද.."

" හරි මෙහෙමයි නෑ තමා.. ඒත් ඉස්කෝලෙ මල්ලිලා මට බයයි හරිද.. ඔයා බලන්නකො.."

" ඒව් වරද්.. පොඩි ළමයි බයකරගෙනෙද චන්ඩියා වෙන හදන්නෙ.."

රධ්‍ය අයියා මට පල් විදියට හිනාවෙලා බැම්මට හේත්තු වුණා..

" අනේ මේ..!!"

@Shan

" ඇශෝ මේ රධ්‍ය අයියෙ.. කට පියාගෙන- එපා වරද්.. හැබැයි උඹව අල්ලලා ලිපට අතාරිනවා.."

" පුළුවන් දෙයක් කරපන්.."

මම රධ්‍ය අයියගෙ හැකර කට වැහෙන්නත් එක්ක ළඟ තිබ්බ කහ බෝතලේ අරගෙන මූණට හැලුවා.. ආවා මෙතන ලබ්බක් කතාකරන්න.. රධ්‍ය අයිය අමූණෙ තිබ්බ කහ ටිකක් අරගෙන නාලා නිදාගත්තු මගේ මූණෙ ඇතිලුවා.. ඊටපස්සෙ මූණ පිහිදාගෙන මම බැමෙන් බැහැලා එන්න කලින් සාලෙට පැනලා දිව්වා.. මමත් බැම්මෙන් බිමට පැනලා උගෙ පස්සෙන් සාලෙට දුවද්දි ආධ්‍ය අයියා කකුල් දෙකත් උඩට කරගෙන පුටුසැටියෙ වාඩිවෙලා ටීවී එක බලනවා.. මම ගිහින් රධ්‍ය අයියගෙ කලිසම කකුල් දෙක ගාවටම පාත් කල්ලා පුපට දෙකක් දීලා ඇවිත් මූණත් ගසාගෙන ආධ්‍ය අයියා ගාවින් වාඩිවුණා.. ආධ්‍ය අයියා මගේ කරවටේ අතක් දාගත්තා.. මෙන්න මනුස්සයො.. කොච්චර ආදරණීය මස්සිනෙක්ද..

" මොකෝ කහ නාගෙන.. වලියක්වත් ඇදගත්තද.."

" නෑ අනේ.. මම රධ්‍ය අයියගෙ මූණෙ කහ ගෑවා.. හොඳයිනෙ ගාන එක.. එයාට ආදරේ හිතිලා මගෙ මූණෙත් ගෑවා.."

" එහෙමද.. චූටිලගෙ රිසාල්ට්ස් එනවා ලබන මාසෙ.. දන්නවද.."

" සිරාවට.. කිව්වද එහෙම.."

" ඔව්.. කලින්ම එනවා මම හිතන්නෙ.. මම නම් එනකල් බලාගෙන හිටියේ.. පොඩිත් එහෙමයි.."

" අනේ මේ මට බයයි හරිද.. ඔහොම බලාපොරොත්තු තියන් කතාකරන්නෙපා බය හිතෙනවා.."

" හරි හරි.. ඒකනෙමෙ කොහොමද ඊයෙ ගමන.. හොඳද.. මට අම්මා කිව්වා ඔයාලා කතාකලාලු.."

" ඔව්..මාරයි අනේ.. අයියලටත් එන්නයි තිබ්බෙ.. ඊයෙ කියාන් අයියා කතාකල්ලා කිව්වා අප්පච්චි කතාකලාලු.."

@Shan

" මම්.. මටත් කතාකලා.. නෙතු කතාකරනවලු වෙඩින් එකට හොටෙල් එකක් බලන්න යන්න.."

" හොටෙල් පෙන්නයි අපේ අනුකිච්චා.."

" පිස්සු.. මම කොළඹ ගියාම කියක් වැඩ කරන්න ඔනද චූටි.. මේ ටිකේ ඩියුටි ටික ඇදලා දෙන්නෙත් මගේ යාළුවෙක්.. මම හිතාගෙන ඉන්නෙ ලබන අවුරුද්දෙ කන්සාල්ටන් පටන්ගන්න.."

රථ්‍ය අයියා එයාගෙ රෝස පට කම්මුල් පිරෙන්න හිනාවෙලා කණ්ණාඩිදෙක උඩටකල්ලා හදාගත්තා..

" වෝහ්.. එහෙමද.. මොනවගෙන්ද අයියා කරන්න හිතන් ඉන්නෙ.."

" හිතාගෙන ඉන්නේ.. මෙහෙමයි ඇනස්තිසියොලොජිස්ට් කෙනෙක් වෙන්න තමා මම කැමති.. නැත්නම් නියුරොලොජිසර්ජන් කෙනෙක්.. බලමුකො.."

" අයියා හොස්පිටල් මැනේජ්මන්ට් ලිච්චා කිව්වා නේද.. ඒකට මොකද වුණේ.."

" ඒක අමාරුයි චූටි.. මට හරියන්නෑ කියලා හිතුණා.."

" අයියට ගැලපෙනම ජොබ් එක තමා හම්බෙලා තියෙන්නෙ.. මම ඔයාට මාර කැමතී අනේ.."

" මට.. ඒ මොකද ඒ.."

" එහෙම තමා.. ඔයා ඇවිල්ලා රෝල් මොඩල් එකක්.. තේරුම්ගන්නෑනෙ.. හැමතිස්සෙම හැකෙද් මම එහෙම නෙමෙ ගානවා.."

" කාගෙත.. මගෙ තමා.."

මාමා මගේ ඔලුවට තට්ටුවක් දාගෙන ඇවිත් ඉස්සරහින් වාඩිවුණාම රථ්‍ය අයියත් ඒ පස්සෙන් ඇවිත් අයියා ගාවින් ඉඳගත්තා..

" අයියෙ.. අප්පච්චි කතාකල්ලා අයියට ගන්න කියන්න කිව්වා.."

@Shan

" ඒ මොකද.."

" අයියා කතාකරන්න එපා.. මම කිව්වා අයියා වැඩක කියලා.."

" එහෙමද.."

" මේ මනුස්සයා එළෝ එළෝ පලිගන්නවනෙ බං.. මොන මගුලක්ද.."

" අනේ මන්දා අනූ.. මටනම් පිස්සු වගේ වෙලාවකට.. මේ එක්කෙනෙක් කියලනෙ අප්පච්චිට එයා කැමති වෙලා ඉන්නෙ කාටද කියලා.."

" සිරාවට.."

මාමා රධ්‍ය අයියා දිහා බලලා පිටට එකක් ගැහුවා..

" එහෙම තමා ඉන්න ඕන කොල්ලො.. වැරද්දක් කරන්නැතුව කතා අහගන්න ඕන නැනෙ.."

" ඒක එහෙම වෙන්න ඇති.. ඒත් අප්පච්චි සේරම පැත්තකින් තියලා පොඩීට කසාදයක් හොයයිද දන්නෑ.."

රධ්‍ය අයියා ආධ්‍ය අයියට රවලා සෙටියට හේත්තු වුණා..

" දෙනවා මම.. අප්පච්චිට බලාගෙන ඉන්න කියන්න.. මගුල.. ඉදලා ඉදලා අපි යාළුවුනොත් තමා සේරම බාල්දි උස්සන් එන්නෙ.. පෝළිමේ පෙරළන්න.."

" මූ වෙන කසාදයක් කරගත්තොත් අපේ එකා ගෙදරට ඇවිත් බෙල්ල කපලා යයි.. නිකං ඉදහන් සාකි.."

" ඔව්.. ඔයා තමා ලියුම් ලියලා තියලා ගියේ.. නේද අනූ.. සතුටින් ඉන්න සාකි.. මම යන්නම්-"

අපේ මාමා හිමින් සැරේ සිවිලිම දිහා බලාගත්තා..

" ඊළඟපාර ලියුම තියන්නෙ සුදුහාමිනේගෙ අප්පච්චිට තමා.. සමාවෙන්න තුමනි.. කොල්ලව මම ඉස්සුවා කියලා.."

@Shan

ආධ්‍ය අයියට ඒකට ලාවට හිනාගියා.. නාකි කෝලම් තමා ඉතින්.. එහෙම වුනොත් මාත් ලියුමක් තියනවා නැන්දම්මා අතේ. සමාවෙන්න අප්පච්චි, රධ්‍ය අයියා මගේ.. දෙන්න විදියක් නෑ කාටවත් කියලා.. ඇයි යකෝ මිනිහෙක්ට කියලා ලෝකෙටම ඉන්නෙ මගේ මිනිහා විතරද.. වෙන ඕනතරම් ඉන්නෙ.. එක එක නැට්ටිච්චියොන්ට දෙන්න පුළුවන්ද එහෙම.. ආවොත් අම්මපා තලනවා මම ඇට දෙක.. කෙල්ලොන්ට ඇට නැනෙ.. හොම්බ තලනවා..

" දැන් හෙට ගියාට පස්සෙ තමා උඹලා දෙන්නට හොද හැටි අහගන්න වෙන්නෙ.."

@KimAera_TaeV thankuu sweetie❤

මම ආවා පුතේ.. හෙටින් පම්සෙ සකබුම් වෙන්නයි යන්නෙ.. දැම් ඉතින් කවාව ඉවරකොරන්නත් එපෑ..

හැමෝම හොදින් ඉන්නවා නේදෝ.. ඕතරීට පුම්ව් එකවුන්ට් එකේ ෆලෝවර්ස්ලා 1k වුණානෙ.. අවුරුදු තුනක් තිස්සේ මෙකෙ ලියනවා.. හරිම සතුටුයි.. 😫❤

හැමෝටම මලක් ගානෙ..

එන්නාම්.. ලව් යූ..❤

මගෙ දළඹු පැමිලිය..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

@Shan

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 125 කොටස

' නිල් පාටින් හැඩ මේ අහස

ආදරේ දුක වින්දා ද

මා ගාවින් උන් ඒ හීන

පාවෙලා යනවා දුර ඈත~'

මම හිටියේ අපිට පහුවෙන ගස්කොළං දිහා බලාගෙන.. ඊටවඩා ඉතින් හයිවේ එකේ වෙන බලන්න දෙයක් නැනෙ.. ඕන්නම් අපිට ඉස්සරහින් යන මාමගෙ කාර් එක දිහා බලාගෙන ඉන්න පුළුවන්.. ඒත් ඒක දිහා බලන් හිටියා කියලා මට හතරමහ නිධානෙ පහළ වෙන්නෙ නෑ.. උදේම අපි ගමෙ ගෙදරින් එන්න ආවා.. ආච්චිඅම්මව දාලා කොළඹ යන්නත් ලෝබයි.. පුළුවන් වුණානම් හංගගෙන උස්සන් එනවා මගේ ආච්චිඅම්මව.. ඒ තරමට ආච්චිඅම්මා පරිස්සමින් ඉදපන් කොල්ලො කියන වචන ටිකට හිතට පුදුම හයියක්.. කියලා නිමකරන්න බෑ.. සමහරවිට මම මගේ අම්මටත් වඩා ආච්චිඅම්මට ආදරේ ඇති.. මොකද පොඩි කාලෙ ඉදලම මගෙ එහිතට 'හොඳයි' කියලා තදින්ම කාවැදිලා තියන 'ගෙදරක් වගේ' හැඟීමක් ගේන කෙනා තමයි ආච්චිඅම්මා.. මම කවදාවත් හිතන්නෙ නෑ ආච්චිඅම්මා වයසයි කියලා.. එතකොට ඉබේටම ඇස් වලට කඳුළු උනනවා..

සමහර චරිත අපිට ජීවිතේ හම්බෙනවා.. එයාලා වයසට යන්න ඕනම නැහැ.. මේ ලෝකෙ අමරණීය වෙන දේවල් තියනවනම් ඒවා අතරට එයාලත් අනිවාරෙන් එකතුවෙන්නම ඕන..

ආච්චිඅම්මා නම් කියන්නෙ කවදහරි කළ හොඳ ඉතුරුවෙනවා කියලා.. එතකොට අපිට අමරණීය වෙන්න පුළුවන්ලු.. හොඳ කෙනෙක් විදියට.. නැත්නම් ඉතින් හිට්ලර් අමරණීය වෙලා තියෙන්නෙ හොඳ මනුස්සයෙක් විදියටයැ.. නැනෙ..

' දැනෙනා තුරු මා

ඉන්නද නුඹ ගාවින්~

@Shan

මියෙනා දිනයේ

කඳුලක රස විදි-'

කාර් එකේ ප්ලේ වෙවී තිබ්බ සිංදුව රධ්‍ය අයියා නවත්තලා දැම්මා.. ඒ එක්කම සිංදුව අහ අහ හිටිය මම එයා දිහා බැලුවා.. එයාගෙ මූණ ආපු වෙලේ ඉඳලම තියෙන්නෙ ලොකු අවුලකින් වගේ.. සමහරවිට කොච්චර කිව්වත් ගෙදර යන්න බය ඇති.. දුක විඳපු එකානෙ ඒකෙ අමාරුව දන්නෙ.. මම කොච්චර කිව්වත් මට ඒක තේරෙනවා විතරයි.. දැනෙන්නෙ නෑ.. මොකද මම එහෙම පිටේ හම පැලෙන්න කාගෙන්වත් බෙල්ට් පාරවල් කාලා නෑ.. මම කාගෙන්වත් ඔහොම තදින් බැනුම් අහලා නෑ.. මම  බැනුම් අහලා තියෙන විදියයි දුක විඳලා තියන විදියයි එයාට අනුව වෙනස්.. දුක දුකම තමා.. මම කිව්වෙ හිතට අරගන්න විදිය වෙනස්..

" ඇයි ඒක නැවැත්තුවෙ.."

" මම කැමතිනෑ.."

" ඉතින් ඔයාගෙ ප්ලේලිස්ට් එකේ ඒක තියනවනෙ.. එතකොට අකමැති වෙන්න විදියක් නැනෙ.."

රධ්‍ය අයියා ලාවට හිනාවෙලා මං දිහා බලලා ආයෙම ඉස්සරහා බලාගත්තා.. පොඩිම පොඩි වෙලාවකට හරි එයා මම නිසා හිනාවෙනවනම්.. මම කැමතියි..

" මම කැමති සමහර සිංදු තියනවා.. ඒවට කැමතී.. අහන්න ආස නෑ.."

"....."

" තේරුණාද.."

" ඔව් තේරුණා.. එහෙම ඒවා තියනවා.. මම  Alec Benjamin ගෙ "Let Me Down Slowly"අහන්න ආසයි.. ඒත් හිත එකතැනක තියාගෙන අහන්න බෑ.. ඒ වගේද.."

" ඒ වගේ තමා.."

" ඔයා සකායි* කියවලා තියෙනවද.. නැනේ.. පර්ල් එස් බක් ගෙ.."

@Shan

රධ්‍ය අයියා ටිකක් වෙලා කල්පනා කලා..

" නෑ.. මොකක්ද ඒක.."

" අපේ ලයිබ්‍රි එකේ තිබ්ලා මම කියවපු පොතක්.. මාරම ලස්සනයි.. ඒත් මම කවදාවත් ඒක දෙවෙනි වතාවෙ කියවන්නෙ නෑ.."

" හේතුව..??"

" හේතුව..එකක්.. මට හොඳට මතකයි හැම කොටසක්ම වගේ පොතේ තිබ්බ.. අනික ඔයා මේ සිංදුව අහන්න ආස නැති හේතුව තමා.. හැබැයි මොකක් වුණත් ඒක අනිත් ජපන් කතාවල වගේ නෙමෙයි ඒක හුඟක් වෙනස්.. මම කැමති ඒකට.. ඒකෙ සකායි හරි බොළඳයි කියලා වෙලාවකට හිතෙනවා.. ඇලන් මහ.. අවස්ථාවාදියෙක්.."

"....."

" ආ ඉන්න මම ඔයාට කැරැක්ටර්ස් කිව්වෙ නෑනෙ.. මෙහෙමයි හරිද.. දෙවෙනි ලෝක යුද්ධෙ අවසාන කාලෙ ඇලන් කියන්නෙ හමුදා නිලධාරියෙක්.. එතකොට සකායි කියන්නෙ සාම්ප්‍රදායික ජපන් පවුලක ලස්සන කෙල්ලෙක්.. එයා මාරම ලස්සනයිලු හරිද.. ඇලන්ට තියෙන්නෙ නිල්පාට ඇස් දෙකක්.. එයත් හුඟක් ලස්සනයි.. මුලින්ම දකින්නෙ සකායි ඉස්කෝලෙ යද්දි..

ඉතින් ඒ දෙන්නා යාළුවෙන්නෙ දෙපැත්තෙම පවුල් වල අකමැත්තෙන්.. මොකද ඒ කාලෙ එයාලා අතරෙ යුද්ධෙත් එක්ක ඇතිවෙච්ච ආකල්ප හරිනැති නිසා.. සකායිගෙ තාත්තනම් කොහොමවත් කැමතිවෙන්නෙ නෑ.. ඇලන්ගෙ අම්මත් එහෙමමයි.. ඇලන්ට ගිවිසගන්න කෙල්ලෙක් හිටියා.. එයාගෙ පොඩිමකාලෙ ඉඳන් හොඳම යාලුවා.. සකායිටත් කෙනෙක් ගෙදරින් කතාකල්ලා හිටියෙ.. කොහොම හරි ඒ දෙන්නා මාර කට්ටක් කාලා යාළුවෙලා පවුල් දෙකේ අකමැත්තෙන් බඳිනවා.. බැන්දට පස්සෙ සකායි ප්‍රෙග්නට් වෙනවා.. එයාලා  වෙනම ගෙදරක ඉන්නෙ.. ඇලන් සකායි ප්‍රෙග්නට් වුණාම මගාරින්න ගන්නවා.."

රධ්‍ය අයියා මං දිහා බලලා නෝන්ඩියට හිනාවෙලා ආයෙම ඉස්සරහා බලාගත්තා..

@Shan

" ඔක ලංකාවෙ කතාවක් නෙමෙ කියලා ශුවර් නේද.."

" ඔව් ඔව්.. හැබැයි ලංකාවෙ ආභාශය අරගෙන තියනවා වගේ නේද.."

" වගේ නෙමේ ඔක්කොම ඔය වගේ නෙමේද.. හරි ඊටපස්සෙ.."

" ඊටපස්සෙ සකායිට යෝජනා කරලා ඉදපු කෙනා එනවා සකායිව හම්බෙන්න.. එතකොට සකායි ප්‍රෙග්නට්.. ගෙදර තනියම ඉන්නෙ.. ඇලන් දන්නෙවත් නෑ සකායි ප්‍රෙග්නට් කියලා.. අරයා ඇවිල්ලා සුහපතලා යනවා.. ඒ මනුස්සයා පළවෙනිපාරම අඳුරගන්නවා සකායි ප්‍රෙග්නට් කියලා.. ඇලන් ඒ අඳුරගන්නෙත් නෑ.. ඇලන් ළමයට කැමති වෙන්නෙත් නෑ.. අන්තිමේදි ඇලන් යන්නම යනවා හොයාගන්නත් නැතිවෙන්න.. සකායිට දරුවා හම්බුණාම එයා දරුවව කෙනෙක්ට තෑග්ගක් විදියට දෙනවා.. තෑග්ගක්ම නෙමේ.. ඒත් එයා එහෙම කරපු එක හොදයි.. ඒ කාලෙ රටවල් දෙකේ තිබ්බ ප්‍රශ්න එක්ක.. ඉතින් ඇලන් අම්මගෙ පදේට නටන්න ඇමරිකාවෙ නවතිනවා.. සකායි ආපහු ජපානෙට යනවා.."

" ම්ම්ම්..?"

" ඔව් එයාව බාරගන්න යෝජනා කරපු කොල්ලා කැමතිවෙනවා.. ඇලන් කියන්නෙ..

**ඇලන් කෙනඩිට**

තිබ්බෙ සකායි එක්ක ඇත්තටම නයිට් ස්ටෑන්ඩ් එකක් ගහන්න විතරයි.. ඒක තද ආකර්ශනයක් වගේ.. ගත්තා.. අතෑරියා.. සකායි හරි මෝඩයි.. එයා රැවටුණා..

**ජොසුයි සකායි**

ඇත්තට ආදරේ කළා.. ඒත් වැරදි කෙනාට.. එයාට පෙනුනෙ නෑ කවුද ඇත්තටම ආදරේ කලේ කියලා.."

" Love is not fair to all වරද්.. ගැළපෙන්නෙ නැති කෙනෙක් එක්ක ආදරේ බෙදාගන්න ගියාම ඒක තමන්ටම හෙන විහිලුවක් වෙනවා.."

" ඔයා කොහොමද හරියටම කියන්නෙ.."

@Shan

" මගේ අම්මා.. එයා වගේ.. මම ඒක දැකලා තියනවා.."

" ම්ම්.. ඕවා හෙන සංකීර්ණ මාතෘකා.. නෙමේද.."

මම කකුල් දෙක් උඩට අරගෙන මේස් එකේ එම්බ්‍රොයිඩර් කල්ලා තිබ්බ කහපාට මලකින් ඇද්දා.. මගේ සපත්තු දෙක පිටටට ගැම්මට තිබ්බට අම්මා ගේන්නෙ හෙන හුරතල් පාට මේස්.. කොහේහරි මේස් දෙක ගලවන්න වුණොත් අම්මටසිරි වෙනවා.. අපේ අම්මගෙ වැඩ නිසා..

" නෑ ඔයා කතාකරන්න.."

" අනේ මන්දා ඒයි.. ඔයා මට හිත හැදෙන්න මොනවහරි කියන්න.. මම ඉන්නෙ හෙන අවුලෙන්.. ඔයත් එහෙමනෙ.. අප්පච්චි දැන් අද ගියාම මොනවා කියයිද දන්නෙ නෑ.."

රඩ්‍ය අයියා හිමින්සැරේ මගේ අතක ඇගිළි එයාගෙ අතට පටලගෙන උකුල උඩින් තියාගත්තා.. ඒවා රස්නෙයි..

" මම කිව්වනෙ.. ඒක එවෙලාවට බලමු.. අයියත් ඉන්නවනෙ අනික.."

" ඔයා දැන් අප්පච්චිට එපෙයා එකකුත් තියනවා කිව්වනෙ.. තියන පණ්ඩිතකමට.."

" මම වැරදි දෙයක් කිව්වෙ නැනෙ.. මට හංග හංග ඕව කරන්න බෑ.. තියනවනම් කියනවා.."

" ම්ම්.."

" ඔයා දන්නවද මම ඔයාව මුලින්ම දැක්කෙ කවදද කියලා.."

" ඔව්.. ඔෆිස් එක ඉස්සරහා දණ්ඩගහන් ඉඳපු දවසෙනෙ.. අටවසරෙ.."

සැක්.. මම හිතුවා හරි.. සොඳුරු හමුවීම් තියෙන්නෙ කතන්දර පොත් වල තමා.. මගේ ජීවිතේ නෙමේ..

" ඒ කාලෙ නෙමේ බං.. ඒ වෙන මගුලක්නෙ.."

" එහෙනම්.. කවද්ද මාව දැක්කෙ.."

@Shan

" දැක්කෙ බැඩ්මින්ටන් ක්ලබ් එකේ ආෆ්ටර් ස්කූල් ඉද්දි.. ඔයා බැඩ්මින්ටන් ගහන්න ආපු පළවෙනි දවසෙ අර නානකොට බේසමේ දාන තාරපැටියෙක් වගේ රැකට් එකත් උස්සන් මුල්ලකට වෙලා හිටියෙ.."

" තවුසෙ හතේ ඉදන් මට ලව් ද.. යකෝ!! මමයි සෙනුකයයි ඒ කාලෙ කොටු පනිනවා.."

" උඹලා දෙන්නා පනින කොටු අපි දැකලා තියනවා.. කැන්ටිම අස්සෙයි.. මල්ගස් අස්සෙයි.. තාප්ප අයිනෙයි.."

" ආ හරි ඉතින්.. අතීතයේ සිදුවුණු යම්කිසි දේවල්නෙ.. දැන් කියනවකො මට හතේ ඉදන් ලව් ද.."

" නෑ නෑ.. එදා ඇවිත් හිටියා දැක්කා අපි.. අපි කිව්වෙ මමයි අභිරුයි.. මතකද.."

" මැවකයි.. අහසින් බැහැලා වගේ පුප දික් කරන් එහෙට්ට යනවා මෙහෙට්ට යනවා.."

" පස්සෙ අභිරුවා කිව්වා 'රධ්‍ය උඹේ බැඩ්මින්ටන් කැප්ටන් සිහිනෙට කෙලවෙන්නයි යන්නෙ' කියලා.. ඔයා හවුස්මීට් ප්ලේ කරද්දි.."

" සිරාවට.."

" මම්.. කියානයා ඒක අහලා කිව්වා උඹව උස්සලා පොළොවෙ ගහනවා කියලා.. එහෙම කොහොමද අවුරුදු හයක් අපිනෙ ඉස්කෝලෙ හිටියෙ.. උඹ අලුතින් ඇවිල්ලා ටික ටික සෝශල් වේගෙන ආවනෙ.."

" අහා.. කියාන් කාරයා එහෙමත් කිව්වද.. මුගෙ ඇටදෙක තලන්නෙපෑ.."

රධ්‍ය අයියා තොලක් හපාගත්තා..

" ඊටපස්සෙ ඔයා මාව හැමදාම දැක්කද ඒයි.. මම පොඩිකාලෙ හැඩට හිටියත.."

මම රධ්‍ය අයියගෙ අත තදකල්ලා ඇහිපිල්ලම් තුන හතරක් ගහගෙන ගහගෙන ගියා..

@Shan

" මම දැක්කෙ නෑ.. උබව පේන්නෙත් නෑ කොටට කොටේ.. තාරපැටියා වගේ.."

මම රධ්‍ය අයියගෙ අහ ඇදලා අරගෙන හොඳට හිටින්න පාරක් හැපුවා.. මුගෙ පොලොස් කොට්ටෝරු කටනම් අම්මපා මේ වෙලාවට තමා ගලක උලන්න හිතෙන්නෙ.. කෑදැත්තා..

" තවුසෙ මහ හිවලෙක්.. පුප දික් කරන් යන ගස්වැද්දා.."

" ඇත්තනෙ.. ඒ කාලෙ අපේ කකුල් වලත් වැදි වැදි නේද දිව්වෙ.. මගේ තාරපැටියා~.."

රධ්‍ය අයියා ඔරව ඔරව හිටිය මගේ කම්මුලකින් ඇදලා හිමිහිට හාද්දක් දුන්නහම මම උඩ බලාගෙන හිටියා.. මට ඕන හාද්දක් නෑ..

" රෙද්ද.."

කේන්තී මටනම්..

" නෑ නෑ ඊටපස්සෙ මම ක්ලබ් එකේ හිටියෙ නෑ කැඩෙට් කරන්න ගියානෙ.. මම ඊටපස්සෙ එහෙම විශේශෙකින් දැක්කෙ නෑ.. ආයෙ හම්බුනේ කරුමෙට උබලගෙ පන්තියෙ ඩියුටි කරන්න වැටුනම නමය වසරෙ.."

" ආ පිපෙට් අයියා අපේ.. මට මතකයි ඒයි.. ඔයා කොටකලිසමයි බැජ් එකයි ගහගෙන උදේ හිටිපිළිමෙ වගේ පන්තිය ඉස්සරහා හිටගෙන ඉන්නවා.. කවුද දන්නෙ මගේ අනාගත බෝයිපෙන් කියලා.. දන්නවනම් ඔයාට මම වද දෙන්නැනෙ.. මගෙ හැපිකවවා.. පෞකාරයට සමාවෙන්න.."

" උඹ අපි යන හැමතැනම පේන්න ඉඳලා පොළඹවගත්තා.. ඇයි යකෝ දකින දකින තැන..උඹයි උඹෙ අර නල්ලමලේ යාළුවයි.. නිදහසේ කියවන්න ලයිබ්‍රි එකට ගියත් ඒකෙ ඉඳන් ඉන්නවා.. ග්‍රවුන්ඩ් එකට ගියොත් අඹගහ බදාගෙන ඉන්නවා.. කැන්ටිමට ගියොත් වැට බදාගෙන ඉන්නවා.. උඹ නැති තැනක් කියපන් බලන්න.."

" ඇයි ඔයාගෙ හිතේ.. ඒකෙත් හිටියා නේත.."

@Shan

" හිතේ නෙමෙ මට උබ එක්ක පුදුම කේන්තියක් තිබ්බෙ.. මට ඉස්කෝලෙ පේන්නම බැරි එකා වෙලා පස්සෙ කැමති හිතුනා.."

" ටෝක් කල්ලා බලන්නද.. ඇයි ටෝක් කලේ නැත්තෙ.."

" උඹව ටෝක් කරන්න ගිහින් ඒ කාලෙ හැටියට පහුවදා ඉස්කෝලෙ බැනර් ගහලා තියෙයි.. නයින් ඒ එකේ රධ්‍ය අයියා මගෙන් කැමැත්ත ඇහුවා කියලා.. අනේ හිටහන්.."

මම පොඩ්ඩක් කල්පනා කලා.. ඒ කාලෙ පොඩි කිචි බිචි ජාතකේ වගේ කුටු කුටු ගාන ලෙඩක් මට තිබ්බා තමා ඉතිම්.. ඒත් ඇහුවනම් නොසලකා ඉන්නෙ නැනෙ.. අඩුම තරමෙ අච්චර වද දෙන්නෙ නැනෙ.. පව් අනේ දවසක් මම වැස්සෙ ඇවිත් මුගෙ ඇඟට අල්ලලා කුඩෙත් ගැසුවනෙ..

" එහෙම බැනර් ගහන්නෑ අනේ.. පිස්සුද.. මම එහෙනම් හැමදාම පිපෙට් අයියට උම්ම එක ගානෙ දෙනවා.. ඔයා රන්ටැඹේ ගාටලා එනකල්ම මම කොච්චර බලන් හිටියද.. ඔයාට කියලා මගේ දවසෙ පන්තිය අතුගාවගන්න.."

"....."

රධ්‍ය අයියා මට දෙකතුනක් රැව්වා.. එහෙම තමා රධ්‍ය අයියා මට පන්තිය අතුගාන්න දෙන්නෑනෙ.. ඒකනෙ හැමදාම මල් ටික කඩලා වට්ටියෙන් තියලා පහන පත්තු කරන්න දෙන්නෙ.. මම ඒ කාලෙ හිතුවෙ එහෙම කරන්නෙ මම බාගෙට අතුගාන නිසා කියලා.. බලන් යද්දි මම හිතේ හිටපු නිසානෙ..

" වරද් අර රිසිට් එක කෝ.. ඒක දෙන්න.."

රධ්‍ය අයියා හයිවේ එක්සිට් එකේ ඉඳගෙන් ශටර් එක පහත් කල්ලා මගෙන් රිසිට් එකක් ඉල්ලුවහම මම අන්ද මන්ද වුණා.. මොන රිසිට් ද..

" කොයි.."

ඒ එක්කම ඔලුව මැද්දට හොඳ ටොක්කක් පාත් වුණා.. එතන හිටිය අංකලුත් ඒකට හිනාවුනා.. ඊටපස්සෙ මම රෝල් කල්ලා සුරුට්ටුවක් හදාගෙන ඉදපු රිසිට් එක රධ්‍ය අයියට දික් කලාම රධ්‍ය අයියා ඒක දිගෑරලා හෙන ලැජ්ජ

@Shan

හිතිච්ච එකා වගේ අර අංකල්ට දික් කලා.. අංකලයා රධ්‍ය අයියගෙන් මොකක්ද ඇහුවා ඒත් මම හිටියේ අහක බලාගෙන.. මූ මට ටොකු අනින එකට මොකක් හරි කරගන්න ඕන.. ඔලුවෙ අං දෙ-ශිට් නෑ.. මම කොහෙද අං දාගෙන ඉන්නෙ.. හැබැයි අං තියන මකරුත් ඉන්නවනෙ.. මම මකරෙක්.. රධ්‍ය අයියා කවුවෙක්.. අපේ ගෙවල්වලින් මේ සම්බන්ධෙට කැමති වෙන එකක් නෑ..

කොහොමත් කැමති නෑනෙ..

" සිහියෙන් ඉන්න වරද්.."

මකරයි කවුවෙකුයි අනික කොහොම තරු බලන්න යන්නද.. බෑනෙ.. මට ඒ ප්‍රොසෙස් එක තේරෙන්නෙත් නෑ.. මකරා හෙන විසාලයිනෙ..

" වරද්!!!"

ඕන නෑ මම වරද් ම වෙලා රධ්‍ය අයියා රධ්‍ය අයියම වුණොත් හොඳයි..

" අම්මපා.. වරද්!!!!!!!!!!!!"

" ඇයි ඇයි අනේ කෑගහන්නෙ.. මොකද.."

" මොන ලෝකෙද ඉන්නෙ.."

" ඔයා ඉන්න ලෝකෙම තමා.. දැන් ඕක අහන්නද මේ බෙරිහන් දුන්නෙ.."

" සිහියෙන් ඉඳපන්.. කතාකළාට ඇහෙන්නෙත් නෑ.."

මම හිමින් සැරේ රධ්‍ය අයියට බනින්න දීලා රධ්‍ය අයියගෙ ශර්ට් එක අස්සෙන් අතක් දාගත්තා.. රධ්‍ය අයියා ගැස්සිලා ගිහින් මගේ අත එළියට ඇදලා අරගෙන තද කරගෙන අල්ලගත්තා..

" ඕක නවත්තපන්.."

" ඔයාට නගිනවා වගේද.."

රධ්‍ය අයියා මගේ දිහා මරාගෙන කන්න වගේ බලලා දෙකක් රවලා ඉස්සරහ බලාගත්තා.. මගේ පාටමාරුකරන මුගටියා..

@Shan

" උඹට ලැජ්ජාව කියලා පොඩ්ඩම පොඩ්ඩක්වත් දැනෙන්නැද්ද.."

" දැනෙනවා.. මොකද නැත්තෙ.."

" මම හිතුවෙ නෑ කියලා.."

" මේ අර අංකල් මොකක්ද ඇහුවෙ ඒයි.. අර එක්සිට් එක ගාව.."

"....."

" කියන්නකො.."

" මල්ලි දහද ඇහුවා.."

රධ්‍ය අයියා ඒක කිව්ව විදියට මම කටත් පුම්බගෙන අහක බලාගත්තා.. සැක් වල් කතාමයි මගේ වලත්ත හිතට මතක් වෙන්නෙ.. මෙක හරියන්නෑ පොතක් පතක් කියවලා හිත දමනය කරගන්න ඕන.. ඒත් මම කියවන්නෙත් දමනය වෙන කතා නෙමෙයිනෙ.. මම මොකද මෙකට කරන්නෙ..

" වරද්.. අයියලා නැනෙ.."

" ඒගොල්ලො ගිහිල්ලත් ඇති දැන්.. ඔයා ගෙදර යන්නෙ කීයටද.."

" රුවෙලා යනවා.."

" හා.. මම ඔයාට මගේ ප්‍රිෆෙක්ට් ඩයරි එක පෙන්නන්නද.. ආ මට අම්මා දුන්න බඩ්ඩක් තියෙනවා.. මම ඔයාට ගියාම පෙන්නන්නම්.. අහන්නකො තව මට මෙඩ්ල් එකකුත් හම්බුණා.."

" ම්ම්.."

මම දවස්ගාණකින් පස්සෙ දකින කොළඹ දිහා බලාගෙන හිටියා.. අර හෙන නිස්කලංක පරිසරේක ඉඳලා මෙහේ ආවහම සද්ද බද්ද වැඩී වගේ.. හරිම වෙනස්.. අපි ක්වාටස් එකට එද්දිත් මාමලා ඇවිල්ලා ගෙටත් ගිහින් ඉවරයි.. ඊටපස්සෙ මමත් බෑග් අරවා මේවා ටිකත් උස්සගෙන දෙවෙනි තට්ටුවෙ තියන අපි ඉන්න ගෙදරට ආවා.. දවල්ට ක්වාටස් වල කවුරුත්ම නෑ.. සමහර දවසට ඉස්කෝලෙ ඇරිලා ආවහම මම විතරයි.. තව පහළ සිකියුරිටි අංකල්

@Shan

ඉන්නවා එච්චරයි.. ඩයල් එක මගේ හිට එක.. හැමදාම මට ඉස්කෝලෙ යන්න ගේට් එක ඇරලා දෙනවා.. දීලා ගුඩ් මෝනින් කියනවා..

රඩ්‍ය අයියා මුලින්ම ඉස්සරවෙලා ගිහින් දොර ඇරලා ඇතුළට අඩියක් තියන්න යද්දිම එහෙමම ගල් පිලිමයක් වුණා.. මටත් හෙන කුතුහලේ නිසා මාත් බෑග් ටිකත් උස්සන් රඩ්‍ය අයියගෙ අත අස්සෙන් මූණ දාගෙන ගෙට එබුණා විතරයි..

දෙයියන්ට ඔප්පුවෙච්චාවෙ අපේ මාමා මගේ මස්සිනාගෙ කට කනවා..

මම එහෙමම රූට්ටලා බිමට වැටෙන්න ගියාම රඩ්‍ය අයියා මාව අල්ලගත්තා.. අල්ලගෙන දොර වහන් හිමින්සැරේ සාලෙන් කාමරේට මාරුවුණා.. මම හිතන්නෙ ඒක ආඩ්‍ය අයියගෙ බලහත්කාරකමක්ද කොහෙද.. හරි කමක් නෑ.. මම ඕක දැක්ක පළවෙනි දවස නෙමෙනෙ.. මෙ ගෙදර ඉන්නවනම් ඕවා ඇසට හුරුකරගන්න වෙනවා.. නැත්නම් මම වගේ උඩබලාගෙන ඉන්න ඕන.. කොටින්ම මම දන්නවා කුස්සියෙ සිවිලිමෙ කොටු තිස් හයක් තියනවා කියලා.. ඒ වගේ..

මම කාමරේට ඇවිත් දොර වහලා සපත්තු දෙක ගලවලා රැක් එකෙන් තිබ්බා.. මේස් දෙකත් ගලවලා ඒකෙ අස්සෙන් ගැහුවා..

" මෙ කාමරේ කළුවරයිනෙ.. මරු.."

රඩ්‍ය අයියා ගවේශකයා වගේ මගේ පොත් මෙසෙට එබිලා ඉස්සහ තියන කණ්ණාඩිය බලාගෙන කොන්ඩෙ හදාගත්තා..

" ඔව්.. ඔයා ඉස්සරහා දොර ලොක් කල්ලද ආවෙ.."

" ම්ම්.."

රඩ්‍ය අයියා මං දිහා බලලා හෙන මනමාල හිනාවක් දැම්මා.. දොර වහන්නැතුව තිබ්බොත් හොඳට හිටී.. මාමගෙ යාළුවෙක්වත් ඇවිත් හොම්බ දැම්මොත්.. කපල් එකට බාධා වෙනවනෙ..

" I miss your old room.."

@Shan

රඩ්‍ය අයියා මාව උස්සලා මෙසෙ උඩින් තිබ්බා.. තියලා කකුල් දෙක මද්දෙන් හිටගත්තා..

" මටත්.."

මම රඩ්‍ය අයියගෙ පපුවෙන් නිකට තියාගෙන එයාගෙ ඇස් දිහා බලාගෙන හිටියා..

" අපි මොකද කරන්නෙ.."

රඩ්‍ය අයියගෙ අත් මගේ ඇඟ වටේ එතුනහම එයා පහත් වෙලා මගේ නළලට හාද්දක් දුන්නා..

" ඔයාට පන්සල් යන්න ඕන කිව්ව නේද.. අවුරුද්දට යමු.. තව දවස් දෙකතුනනෙ.."

" හා.."

" තව කොහෙද යන්න ඕන..??"

" අපි ඉතින් හම්බෙනවනෙ.. ඔයා මෙහේ එන්න.."

" එන්නම්.."

මම මගේ අත් දෙකින්ම රඩ්‍ය අයියව තද කල්ලා බදාගත්තා.. එයාගෙ පපුවෙන් එන 'එයාගෙ' සුවඳ මට එයා මගේ ඉස්සරහා ඉන්නවා කියලා හරියටම කියනවා..

" I want to stare into your eyes for the rest of my life.. They are like black holes.. I'm drawn to them.."

" drawn to them..?? Like how..??"

" මම ඒවගෙ ආදරේ තියද බලනවා.."

" තියෙද.."

@Shan

" ඔව්.. ඒකනිසා මම බලාගෙනම ඉන්නවා.. මං නිසා ආදරෙන් දිලිසෙන ඇස් තියෙන්නෙ ඔයාට විතරනෙ.. මම බලාපොරොත්තු වෙන විදියෙ.."

රධ්‍ය අයියා මං දිහා, මගේ මූණෙ හැම අඟලක් ගානෙම බලාගෙන ඉඳලා තව ටිකක් තදකල්ලා බදාගත්තා..

" මට උඹව මතක් වුණා වරද්.. මට මෙහෙම කරන්න එපා.."

රධ්‍ය අයියා ඒක කිව්වෙ හුහක් හිමින්.. එයාට ඇහෙන්න වගේ.. ඒ වුණත් ඒක මට ඇහුණා.. එයා මුමුණන්නෙ හරි අඩුවෙන්.. ඒත් එහෙම කතාකරද්දි මගේ කම්මුල් රතු වෙලා.. රතු වෙලා.. ඒවට ලේ පිරෙනවා..

මම රධ්‍ය අයියගෙ ශර්ට් එකේ කොලර් එකෙන් අල්ලගෙන එයාගෙ තොල් වලින් පෙක් එකක් තියලා මෙහාට වුණා.. පොඩි පොඩි දේවල් වලින් වුණත් සතුටු වෙන මනුස්සයොන්ට ආදරේ කරන්න ලේසියි.. ආදරේ විඳින්න ලේසියි.. රධ්‍ය අයියගෙ පපුව වේගෙන් ගැහෙනවා මගේ අතකට දැනුණා..

එයා මාව එයාගෙ ළඟට කිට්ටු කරගෙන තොල් වලට පහත් වුණා.. මට ආයෙම කලින් දැනෙන මත් වෙන ගතිය, මත් ගතියෙන් වගේ ඇස් ඇරෙන පියවෙන ගතිය දැනෙන්න ගන්නවා.. මම රධ්‍ය අයියගෙ ශර්ට් එක තදින් ගුලිකරගෙනම හිටියා.. එයාගෙ තොල්, මගේ තොල් එක්ක එකම රිදම් එකකට එහෙමෙහෙ යද්දි මම හිටියෙ හරි සිහියෙන් සැහෙන්න ඈත.. මේ හැඟීමයි දනීමයි දෙකම විස්කි වීදුරුවක් වගේ.. මම පෙරේදා බීපු එක වගේ නෙමෙයි.. ඊටත් වඩා මත් වෙනවා.. ඒක හැමතිස්සෙම දැනෙන්නෙ නෑ.. දැනෙන වෙලාවක් තියෙනවා.. ඒ වෙලාවෙදි ඒක අපි දෙන්නටම දැනෙන්න ගන්නවා..

මුලින් හරි හිමින් ගත්තු හුස්ම එන්න එන්න වේගෙන් වැටෙද්දි රධ්‍ය අයියා මාව අත් දෙකට උස්සගෙන් ගිහින් කොට්ටයක් උඩින් තිබ්බා.. තියලා මගේ ඇඟ උඩට ආවා.. මගේ නළලට වැටුණු කොණ්ඩ කැලි එයාගෙ අත් දෙකින්ම පිටිපස්සට වුණා.. ආයෙම එයාගෙ සීතල තොල් වගේ තොල් වල වැදෙද්දි මම රධ්‍ය අයියගෙ උරහිස තදින් අල්ලගෙන හුස්ම අල්ලන ට්‍රයි කළා.. අන්තිමේදි මගේ ශර්ට් එකේ බොත්තම් තැනින් තැනින් පැන්නිලා ගිහින් ඒක ඇහෙනුත් අයින් වෙලා කොහේටද වැටුණා.. එයාගෙ සීතල ඇඟිලි මගේ පපුව පුරාම දුවද්දි, මම බැරිමතැන කොට්ටෙට ඔලුව තදකරගෙන හීනියට එයාගෙ නම කෙදිරුවා.. එයා මගෙන් එහාට වෙලා

@Shan

ඇඟිලිතුඩු පපුව පුරාම ඇදගෙන යන ගමන් මගේ දිහා බලාගෙන ඉන්නවා.. අමුතු හිනාවක් එක්ක.. ඊට ටිකකින් රධ්‍ය අයියා මගේ අත් දෙක එයාගෙ අත් දෙකේ පටලගෙන මගෙ එපපුවට පහත් වුණාම මම තොල් පටවල් රිදෙන්නම හපාගෙන ලොකු හුස්මක් උඩට අරගෙන පපුවෙ හිර කරගත්තා.. ඒක.. ඒක හරි අමුතු හැඟීමක්.. මගේ ඇඟ අතුලින් ගිනිගන්නවා වගේ මට දැනුණා.. මගේ ඇස් පිය උඩ අතට හැරවිලා බොඳ වෙනවා වගේ..

" අහ්-අයියෙ-හ්හ්.."

රධ්‍ය අයියගෙ තොල් මගේ පපුවෙම තියෙද්දි එයා ලාවට හිනාවෙනවා මට දැනුණා.. හිනාවෙලා මගේ අත් දෙක තව තදකල්ලා අල්ලගත්තා.. අල්ලගෙන මගේ ඇඟ උඩින් එහාමෙහා වෙලා දිගැදුණා.. මේ වෙලේ ඒක.. කොහොමත් වෙන්න ඕන නෑ..

" එහ්-ආර්ග්.. එහාට.. වෙන්න.."

" Someone's got hard.. um..??"

" Errh.. FUCK!!"

රධ්‍ය අයියා හිතාමතාම මගේ ඇඟ උඩ එහෙ මෙහෙ වෙනකොට මම එයාගෙන් එහාට වෙන්න දැහලුවා.. මම හිටියෙ පොඩ්ඩක්වත් හොඳින් නෙමෙයි..

" Shh.. බබා.. let me help you.."

" අනෙහ්.. අයියෙ..!! බෑ.. එහාට වෙන්න.."

රධ්‍ය අයියා මගේ බෙල්ලෙ පැත්තකින් තොල් තියලා උරවන්න ගද්දි මම එයාගෙ අත් වලට හිරවෙලා තියන මගේ අත් මිටමොළවගත්තා.. මිටකලින් කිසි වතාවක මෙහෙම දැනිලා තිබුණෙ නෑ.. ඒක හරි අමුතුයි.. මාව ඇඟ ඇතුළින් ගිනිගන්නවා වගේ.. ඒත් මට ඒ දැනෙන හැඟීම මේ වෙලාවෙ දැනෙන්න ඕනමයි කියලා හිතෙනවා.. මම දහලලා රධ්‍ය අයියගෙ අත් දෙකින් මගේ අත් දෙක ගලවලා අරගෙන එයාගෙ උරහිස තදකල්ලා අල්ලගත්තා.. අනිත් අතින් එයාගෙ කොණ්ඩෙ අහුරක් අල්ලගත්තා..

@Shan

හිතාමතාම එයාගෙ ඇඟට හිරවුණාම රධ්‍ය අයියා මගේ තොල් වලින් හාද්දක් තියලා තොල් අල්ලගත්තා..

විනාඩිදෙක තුනකට පස්සෙ මම එහෙමම කොට්ටෙ උඩට කඩාගෙන වැටිලා ඇඟම පණනැතිවෙලා යනවා වගේ දැනුණහම රධ්‍ය අයියා මගේ බෙල්ල අස්සෙ මූණ තියාගෙන වේගෙන් හුස්ම ගන්නවා මට දැනුනා.. තාමත් එයාගෙ කොන්ඩෙ අහුරක් මගේ අත් වලට පැටලිලා තිබ්බා.. මම වේගෙන් උස් පහත් වෙන මගේ පපුව සන්සුන් කරගන්න ට්‍රයි කලා.. ඒ නිසාම ඇස් පියාගෙන එහෙමම කොට්ටෙට ඔලුව ගහගෙන හිටියා.. ටික වෙලාවකින් රධ්‍ය අයියා මගේ ඇඟ උඩින් අයින් වුණාම මම එයා දිහා බලාගෙන හිටියා.. මගෙ කම්මුල් රතුවෙලා පිපිරිලා යන්න වගේ.. ඇඟ හැමතැනක කැලල් හිටලා.. මගේ ඔලුව තනිකරම තිබුණෙ විකාරවෙලා වගේ..

රධ්‍ය අයියා ලාවට හිනාවුණා..

" I like to see you lying wasted in my arms.. This dark pink shade cheeks.. hickey marks literally drives me crazy වරද්.."

මම අනිත් පැත්ත හැරිලා කොට්ටෙට මූණ තදකරගත්තම රධ්‍ය අයියා මාව තද කල්ලා බදාගෙන එයාගෙ ඇඟ උඩට උස්සලා තියාගෙන උරහිසින් හාද්දක් තිව්වා..

" ඔයාට ලැජ්ජ හිතෙනවා නේද පොඩ්ඩක් වගේ.."

" අයියෙ!!!!"

හායි දළඹුවනේ.. මම ආවා..

හැමෝම හොඳින් ඉන්නවද..

මම ඔයාලගෙන් ඉල්ලීමක් කරනවා හැමෝම තේරුම් ගනී කියලා හිතනවා.. ඔයාලා කතාවට ආදරේ කරන එක ගැන මට ඇත්තටම සතුටුයි.. ඒත් මේකට කිසිම ඉස්කෝලයක් ගාවගන්න එපා කියලා මම ඉල්ලනවා.. මොකද හැමෝම එක වගේ හිතන අය නැනෙ.. මමත් කෙලින්ම ඉස්කෝලයක් නොලිය හින්ට්ස් දීලා තියෙනවා විතරනෙ.. මම අනවශ්‍ය ප්‍රසිද්දියක් මේ හරහා බලාපොරොත්තු වෙන්නෙ නෑ.. එහෙම අවශ්‍ය නැති

@Shan

නිසා.. හැමෝම තේරුම් ගනී කියලා හිතනවා.. අපි විහිලුවක් වුණත් සීමාවේ තියාගමු.. මම ඔයාලගෙන් ආදරෙන් ඉල්ලනවා වගේම මගෙන් කීපදෙනෙක් ඉල්ලලා තියෙනවා මේක ඔයාලට කියන්න කියලා.. එයාලා ඒවට කැමැත්තක් නෑ කියලා.. specially ig accs.. මම හිතනවා ඉස්කෝල අනවශ්‍ය විදියට කොහෙත්ම මේකට සම්බන්ධ කරගන්න එකක් නැහැ කියලා ඔයාලා.. ඇත්තෙන්ම ඒක අපහසුයි මට දකිද්දි..

මම හිතනවා ඔයාලා තේරුම් ගනී කියලා මගෙ දළඹු ළමයිනේ.. මේ දවස් මම ඉන්නෙ ලොකු ප්‍රෙශර් එකක.. මම විතරක් නෙමේ මගේ වයසේ හැමෝම.. ඉතින් මම හිතනවා ආයෙම.. තේරුම් ගනී කියලා.. හිත් රිද්දන්න නෙමේ කිව්වෙ..

හරිත.. 😘

එන්නාම්.. ලව් යූ.. ❤

* සකායි - ඒක හරිම ලස්සන පොතක් හලෝ.. ඔයාලට හම්බුනොත් මහාරින්නෙ නැතුව කියවන්න..

තැන්කූ මූනි බබා ආදරෙයි..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 126 කොටස

" තව මාසයයි සරනේරු!! තමුන් ප්‍රැක්ටිස් වෙන්න යොදවන කාලෙ හොදටම මදි.."

සැක්.. ඊයෙ මොන මගුලක්ද ඒ වුණේ.. මට.. මට.. වරදයා.. උඹට හොදම හොදම වැඩේ අහක හිටපු එකාව අවුස්සන්න ගියේ.. දැන් හරිනෙ අමාරුව.. මම කිව්වා පකයට ගැම්මෙන් ඉදපන් කියලා ඔය ලැප්ජාව පැත්තකින් තියලා.. අඩුම ඌ අල්ලන්නෙවත් නැතුව උඹ විහින් නැහිලනෙ ඔක්කොම-

" තමුන්ට මම ගේන්න කියපු ඩොකියුමන්ට්ස් ටික ගෙනාවද.."

නෑ ඉතින්.. කමක් නෑ එක්කො.. බෝයිපෙන් නෙ.. ආයෙ වැඩිය නටන්නැතුව අත පය තියන් ඉදපන්.. අසමජ්ජාති දඩුලේනා.. උඹට තියන විසේ නිසා තමා අර මාමා කියන්න වගේ.. හත්පොළේ ගාගන්නෙ.. ඒක අමතක වෙයාන්.. අමතක වෙයාන්.. අපරාදෙ කියාන් අයියා අර මට දවසක් කිව්ව කතාව මම අමතක කළේ.. 'අපේ එකා මොකත මූව දැක්කම වොශෲම් එකට මාරුවෙන්නේ~' මට තාමත් ඒ පුස් ඌරගෙ වචන කන් ඇතුළෙ රැව පිළිරැව් දෙනවා වගේ.. හොදයි හොඳ හුස්මක් ඇදලා උඩට ගනින්..

'මට ඊයේ වෙච්ච සියලු සබ්බ සකල මනාව අමතක වේවා.. ඒස්වාහ පුහ්:'

*වටාස්*

" ආව්.."

මගේ පිට මැද්දටම හරියටම ඒස්වාහ පුඃ එකේදි හොදවයින් රැකට් පාරක් වැදුණා.. මම ඒ එක්කම වෙළුසුමනයා දිහා රවලා බැලුවා..දැන් පැයක විතර ඉදලා මේ වයසක මනුස්සයා අර්ශස් අමාරුව හැදිලා වගේ කියවනවා කියවනවා ඉවරයක් නෑ.. ඉතින් හත්වලාමෙ මම ගමෙ යන්නැද්ද මගේ සුදුආච්චිව බලන්න.. කෝච්කාරයට තේරෙනවද මගේ කෙල්ලගෙ වටිනාකම.. නැනෙ.. අල්ලපු ගෙදර කිකිළි වුණත් මම නැතුව පාළුවෙන්නෙ ඉන්නෙ.. ගමට පායන පසළොස්වක හඳ තමා මම.. කාලෙකටනෙ පායන්නෙ..

@Shan

" මම කියන ඒවා අහගෙනද ඉන්නෙ..!!"

" ඔව් ගෙනාවා ඉතින්.. ලොකර් එකේ තියෙනවා.. ඕනද.."

කෝච් වෙළසුමනයා මට දෙපාරක් රැව්වා..

" ගිහින් ඒක අරගෙන එනවා!!!"

ආයෙම ඒ මනුස්සයා පුරුදු විදියට ගිරිය පලාගෙන බෙරිහන් දුන්නහම ඕක හැමදාම අහලා පුරුදු මම කකුල් දෙකත් අද්ද අද්ද ගිහින් ලොකර් එක ඇරලා ඒකෙ ෆයිල් එක අරගෙන ඇවිත් කෝච්ට දුන්නා.. මටත් දැන් අර කම්මලේ බල්ලට යකඩ තලන සද්දෙ වගේ.. හතරවටින්ම බැනුම් අහලා හොඳට පුරුදුයි.. ආධ්‍ය අයියා කිව්වා ඒක අනාගතේට වටිනවා කියලා.. ඇයිද දන්නෑ එහෙම කිව්වෙ.. ඩොකෙක් වුණාම බැනුම් අහන්න ඕන ඇති.. අයියත් බැනුම් අහලා දුවගෙන ගිහිල්ලනෙ වරද්දලගෙ මාමගෙ ඇඟේ හැප්පිලා පෙරළගෙන වෝඩ් එකේ එක මගුලක් වුණේ.. එතන එක මගුලක් අයියට සෙට් වුණා.. මම කලන්තෙ දාලා වැටිලා මල්ලිට තව මගුලක් සෙට් වුණා.. එකපවුලෙ මගුල් දෙකයි..

ඒ මගුල නිසා තමා අපේ අම්මගෙ මල්ලි මට අයියෙක් වෙලා මගේ මස්සිනා මට මාමා වුණේ..

" කවද්ද රිසාල්ට්ස් එන්නෙ..??"

පොඩි මාමා හොඳ එක්කෙනා මොකක් වුණත්.. ඔය දෙකයි පනහෙ කැලි නැන්දෙක් ගෙනාවනම් මට කරපිංචා කැල්ල මිස් වෙනවනෙ..

" ෂනෙරු!!!!!!"

" යස් කෝච්.. ඇයි.."

" මොන සිහියෙන්ද ඉන්නෙ.. දැන් මම ඇහුවෙ මොකක්ද.."

" රිසාල්ට්ස් එන දවසනෙ.. ලබන මාසෙ එනවා.."

" අහා.. එතකොට තමුන්ට කවදහරි තෝරගන්න වුණොත් බැඩ්මින්ටන්ද මෙඩිසින්ද තෝරගන්නෙ.. ම්ම්..?? මට පැහැදිලි උත්තරයක් ඕන.."

@Shan

මම කිව්වෙ.. මගේ ජීවිතේ තියෙන්නෙම තෝරගන්න ඒවා විතරයි.. එක්කො ඒක.. නැත්නම් මේක.. හැමතිස්සෙම මට ඔය තෝරගන්න වෙන වැඩේ සිද්ධවෙනවා..

" දෙකම.."

" දෙකම..??"

" ඔව්.. මම දෙකම කරනවා.. එකක් තෝරගන්නෑ.."

කෝච් ඇස් දෙකේ තිබ්බ කණ්ණාඩිදෙක පහළට කල්ලා මගේ දිහා කණ්ණාඩිදෙකට උඩින් බැලුවා.. මම හිනාවුනේ නෑ.. දැන් මම කොහොමත් මේ වයසක මාන්නක්කාර වෙළසුමනයා එක්ක හිනාවෙන්නෑ.. මොකද මට ප්‍රතිචාර දෙන්නෙ නැනෙ.. ඔයිට වඩා ප්‍රතිචාර නෙමේ, බලුබෙට්ටකට ගණන් ගත්තෙ නැති මිනිස්සු මාත් එක්ක දැන් යස අගේට හිනාවෙන්නෙ.. ඔහෙත් කවදහරි හිනාවෙව් එදිරිමාන්න මහත්තයෝ..

" මම්.. අපි බලමුකො ඉස්සරහට.. ඕක ඔය විදියටම උත්තර දුන්නොත් හොඳයි.."

මම ඔලුවට දාපු බෑන්ඩනා එක උඩට කරගෙන දාඩියට පෙඟිලා තියන කොණ්ඩ කැලිටික ගසාගත්තා.. කෝච් සර් ඔක්කොම ඩොකියුමන්ට්ස් හරිද කියලා බලලා ඒක වහලා පැත්තකින් තිබ්බා.. ඇති යන්තම් ගෙදර යන්න පුළුවන්.. රධ්‍ය අයියා ඊයේ රෑ වෙලා ගියා ගියාමයි කතාකලේවත් නෑ.. උදේ මාව ගන්න එනවා කියලා මැසේජ් එකක් තිබ්බා විතරයි.. මාමගෙන් අහන්නත් මාමා උදේම කෑම්ප් ගියානෙ.. අනිද්දා අවුරුදු.. අවුරුද්දකුත් තියාගෙනනෙ මම මේ ජිම් එකේ තැපලා ප්‍රැක්ටිස් ඉන්නෙ..

" එතකොට සර් කැන්ඩි වල මැච් එකට මොකද කරන්නෙ.."

" ඒකගැන මම හිතන්න ඕන.."

" දැන් ඕක කවදා ඉඳන්ද හිතන්නෙ.."

" මොකක්ද කිව්වෙ..!!"

@Shan

මාව ආයෙම ගැස්සිලා ගිහින් දිවත් හැපුණා.. මේ මනුස්සයට කොහිල අලයක් හොයාගන්න තැනක්.. සෙනුකයගෙන්වත් අහන්න ඕන.. අයුක අයියට කොහිල ගත්තෙ කොහෙන්ද කියලා..

" මොකුත් නෑ සර්.. හිතලා කියන්න කිව්වෙ.. මම දැන් යන්නද.."

කෝච් මං දිහා බලලා ඇස් දෙක උණ්ඩි කල්ලා ඔරලෝසුවට එබුණා..

" හෙටත් ප්‍රැක්ටිස්!!!"

" හෙට..?? හෙට පරණ අවුරුද්දනෙ.."

" ඇයි තමුන්ට පරණ අවුරුද්දට නාන්න එහෙම තියද.."

" නෑ.. මම එන්නම් සර්.."

" ම්ම්.. දැන් යන්න පුළුවන්.."

කෝච් නැගිටලා ගිහින් කෝච්ගෙ බෑග් එක රෙඩි කරගත්තහම මම බෑග් එක අස්සට ඇඳන් හිටපු ශර්ට් එක ඔබලා අලුත් එකක් දාගත්තා.. රධ්‍ය අයියා එන හින්දා බොටමක් ඕන්නෑ.. මෙහෙමම දුවලා යනවා.. මට ඇඳුමක් දාගන්න කම්මැලි අනික.. මම කලබලේ බෑග් එකත් උස්සගෙන ලිහිච්ච ලේස් දෙකත් ගුලි කල්ලා සපත්තුව අස්සෙම ගහගෙන පඩිපෙළ ගාවට දුවගෙන ගියා..

" සරනේරු!!!"

" සර්..??"

" අද කවුරු හරි එනවද පික් කරන්න..??"

කෝච් මගේ ශෝට් එක දිහා බලලා ඇහිබැමක් උස්සගත්තා.. මම හිනාවෙලා ස්පෝර්ට්ස් බෑග් එකේ පටියක් රෝල් කරගෙන ඒක ඇඟිල්ලක ඔතාගත්තා.. එනවා තමා..

" ඔව් සර්.."

@Shan

කෝච් මං දිහා බලලා හෙන හීනියට, පේන්නෙවත් නැති, පුංචි පහේ හිනාවක් දාලා පඩිපෙළ බහින්න ගත්තම මමත් ඊට පිටිපස්සෙන් සුවච කීකරු ගෝලයා වගේ ඇදුනා.. මම ඊයෙ රෑ ඉඳලනෙ බලාගෙන ඉන්නෙ රධ්‍ය අයියා එනකල්..

" කව්ද එන්නෙ.. මාමද.."

" නෑ සර්.."

" වෙන කව්ද.."

" යාළුවෙක්.."

කෝච් හැරිලා මං දිහා අමුතුවට බැලුවා..

" නෑ නෑ එයා නෙමෙ සර්.. ඒ මගේ හොඳම යාළුවෙක් එදා ආවෙ.. එහෙම එකක් නෑ.."

මට කෝච්ගෙ පැණි බැල්මෙන්ම තේරුණා ඒකා හිතුවෙ මොකක්ද කියලා.. එයා මගේ ගර්ල්පෙන් වුනොත් කියාන් අයියා මාව ගුලිකල්ලා රගර් ගහන්න ගනී.. අනික මට කොහොමත් කියාන් අයියට තරම් අමාරුවක් නෑ අර තොරොම්බල් දොඩම බිබික්කම දාගන්න.. මේ කෝචුත් පොඩ්ඩක් අයුක අයියා වගේ වෙගෙන එන්නෙ දැන්..

" වෙන කවුද යාළුවො.."

මේ මනුස්සයා එක්ක බෑනෙ මොන මගුලක්වත් හංගලා තියාගන්න.. හැමඑකම අහනවා.. කිව්වෙ නැතිවුණාම මම තමුන්ගෙ පර්සනල් කෝච්.. මම මේවා ගැන දැනගන්න ඕන යැයි යැයි ගානවා.. සමහරදවසට මාමා මාව ගන්න එනකල් කෝච් එළියට වෙලා මට එහාපැත්තෙන් හිටගෙන ඉන්නවා.. මාමා එක්කනම් කෝචා එකතුයි.. මාමට කියන්නෙ..'ඔව මිස්ටර් ගමගේ.. මේ කාලෙ හැටියට අපි වගකීමක් නැතුව හැසිරෙන එක හරිනැනෙ කියලා'.. කෝච් හොඳයි ඉතින්.. එහෙම අවුලක් නෑ.. අර්ගස් නැත්නම්.. හැමතිස්සෙම මට බනිනවනෙ.. හැබැයි මැච් එකකට ගියාමනම් බුදුඅම්මො ආදරේ.. ඉහවහා ගිහිල්ලා.. විනාඩි පහෙන් පහට ඇවිත් හෙල්ත් කන්ඩිශන් එක ගැන අප්ඩේට් වෙනවා..

@Shan

" යාළුවෙක්ම නෙමේ.."

මම කෝච් බහින පඩියටම ඉක්මනට බැහැලා ගිහින් පැත්තෙන් එබුණා.. කෝච්කාරයා අහක බලාගත්තා..

" මගේ බෝයිෆ්‍රෙන්ඩ්.."

කෝච් ඉක්මනට දෙතුන් පාරක් උගුර පාදගෙන කැස්සා.. ඊටපස්සෙ මගේ දිහා බලලා එච්චර පුදුම වුණේ නෑ වගේ ඉතුරු පඩි ටිකත් බැහැගෙන පහළට ආවා..

" රධ්‍යද ඇවිල්ලා තියෙන්නෙ.. තමුන්ගෙ බෝයිෆ්‍රෙන්ඩ් රධ්‍යද.."

කෝච් ගානකට ගන්නැතුව ඇවිදගෙන යද්දි මම ඉස්සරහින් හිටගෙන මාර්ගපථය අවහිර කළා.. දැන් මගෙ මොලේ ප්‍රශ්න ගොඩගැහිලා ගොඩගැහිලා ඇවිල්ලා එරර් එකක් වෙන්නයි යන්නෙ..

" සර් එයාව දන්නවද.. ඒ කොහොමද ඒ.."

" එයා තමා මට ඊමේල් එකක් දාලා තමුන්ට ට්‍රේන් කරන්න ඉල්លුවෙ.."

" ඈ.. එතකොට ඔගොල්ලො හම්බෙලා තියෙනවද.. කොහොමද රධ්‍ය අයියා මෙල් එක්ක දැම්මෙ.. එහෙම එයා දැම්ම පලියට සර් ප්‍රැක්ටිස් කරන්න බාරගන්නවද.."

කෝච් මට දෙකක් රැව්වා.. එයා කියවනවට ආස නැතුවැති.. ඒත් මම කුතුහලෙන් ඉන්නෙ මේ වෙලාවෙ..

" රධ්‍යගෙ අයියට කන්ටැක් තියනවා මෙහේ.. තමුන් දන්නැද්ද.."

" ඒක දන්නවා ඉතින්.."

" එහෙනම් ඉතුරු ටික කොහොමහරි හිතාගන්නවා.."

කෝච් මාව පාකින් ලොට් එක පැත්තට හරවලා තල්ලුවක් දාලා එයාලගෙ ඔෆිස් රූම් එකට ඇවිදගෙන ගියා.. මම හිතුවා රධ්‍ය අයියා මේ කෝච් එක්ක මොකක් හරි හුටපටයක් ඇති කියලා.. ඒකනෙ.. කොටටෙ එක්කත් ඉරිසියා

@Shan

මනුස්සයා මෙහෙම කෝච් මොනවා කිව්වත් ගන්න ගන්නැතුව කෝච්ගෙ පැත්තටම කතාකරන්නෙ..

බලන් යද්දි මම දන්නැති ගොඩක් දේවල් තියනවා..

මම පහළ පාකින් ලොට් එකට ඇවිත් රධ්‍ය අයියගෙ කාර් එක තියෙන්නෙ කොහෙද කියලා සර්ච් කල්ලා බැලුවා.. ටෙස්ලා එකක්.. ටෙස්ලා එකක්.. මේ මනුස්සයා ඇවිල්ලා නැද්ද..

කාර් එක පේන්න තිබ්බෙ නැති නිසා මම බෑග් එක කරේ එල්ලන් පාකින් ලොට් එකේ කොනටම ඇවිත් වටපිට බැලුවහම මම හොයපු ටෙස්ලා එක කොනේම පාක් කල්ලා තියනවා දැක්කා.. රධ්‍ය අයියා ස්ටියරින් වීල් එකට ඔලුව තියාගෙන ඉන්නවා.. මම ඉක්මනට දුවගෙන දුවගෙන ඒ පැත්තට යද්දිම වගේ රධ්‍ය අයියා නැගිටලා ශටර් එකෙන් මගේ පැත්ත බැලුවා.. බලලා මට එන්න කිව්වා.. හරි අමුතුයි..

මම එහාපැත්තෙ බිත්තය පැත්තට වෙන්න තිබ්බ රධ්‍ය අයියගෙ ඩෝ එකට ගාවට ගිහින් දෙපාරක් ශටර් එකට තට්ටු කලාම එයා කාර් එක අන්ලොක් කල්ලා බයවෙලා වගේ මං දිහා බලාගෙන හිටියා.. මම ඉක්මනට කාර් එකේ දොර ඇරලා එයාගෙ මූණ ගාවටම කිට්ටු වුණා.. මේ.. මේ මොකද වෙලා තියෙන්නෙ..

" අයියෙ..!! මේ ඇයි.. මේ.."

රධ්‍ය අයියා මොකුත් නොකියා මගේ කරේ තිබ්බ බෑග් එක අරගෙන පිටිපස්සෙන් දාලා කකුල් දෙකට තටුවක් ඇම්මා.. එයාගෙ මූණෙ තොල ගාවින් දම්පාට පැල්ලමක් හැදිලා ඇහැ ගාවින් සීරිලත් එක්කන්.. ඇස් දෙකත් අඬලා වගේ රතුවෙලා මැලවිලා ගිහිල්ලා.. මම මොකුත් නොකිය එයාගෙ සීරිලා තියන පැල්ලම ගාවට ඇඟිල්ලක් හිමිහිට තිබ්බම එයා අත ඇදලා මෙහාට කලා..

" මොකක්ද වුණේ.."

මම රධ්‍ය අයියගෙ කකුලකට හිමින්සැරේ වාරුවුනාම එයා මාව උස්සලා උකුළ උඩින් තියාගත්තා.. ඒ වෙලාවෙ පාකින් ලොට් එකේ කවුරුත් හිටියෙත් නෑ.. මම රධ්‍ය අයියගෙ කම්මුලකින් හිමිහිට අල්ලලා එයාගෙ තොල ගාව තිබ්බ දම්පාට පැල්ලම මහපට ඇඟිල්ලෙන් ඇල්ලුවහම රධ්‍ය

@Shan

අයියා මගේ දිහා බලාගෙන ඉඳලා ටිකකින් ඇස් වල කඳුළු පුරෝගත්තා.. මට මතක් වෙන්නෙ දවසක් රෑ එයා අපේ ගෙදර ආපු විදිය.. එදත් එයා ඇඬුවා.. එයාට දුක හිතිලා ඉවසන් ඉඳලා බැරිම වුණොත් ඇස් වල කඳුළු පිරෙනවා..

රධ්‍ය අයියා මගේ පපුවට මූණ තියාගෙන අත් දෙකින් මාව තදකල්ලා බදාගත්තා.. මට මොකුත් හිතාගන්න බැරුව එහෙමම ගල් ගැහිලා.. වචන පිටවෙන්නෙත් නෑ.. මම මෙහෙම දෙයක් බලාපොරොත්තු වුණේ නැනෙ.. මෙච්චර දෙයක්නම් කොහෙත්ම බලාපොරොත්තු වුණේ නෑ වෙච් කියලා.. මම හිමින් සැරේ රධ්‍ය අයියගෙ කොණ්ඩෙ අතගෑවා.. එයා හිමින් වුණත් ඉකි ගහද්දි උණු හුස්ම මගේ පපුවෙ තදට වදිනවා.. මම තව රධ්‍ය අයියව අතකින් බදාගත්තා.. මට දැනුනා මගේ ශර්ට් එක එයාගෙ අතකට ගුලි වෙනවා..

" අයියෙ.."

ටිකකින් රධ්‍ය අයියා මොකක් හරි මතක් වෙලා වගේ ඇස් දෙක පිහාගෙන මගෙන් එහාටවුණා.. ඒත් එයා අඬලා කියලා හොඳට පේනවා.. ඇස් වටේ රතුවෙලා තියන විදියෙන්..

" මොකද වුණේ.. මට කියන්නකො.."

" ම්ම්..?? අපි ගෙදර යමු.. අයියා ඇවිල්ලා ඇති.."

" හරි.. ඔයා කෑම කාලද ඉන්නෙ.."

" ගිහින් කමු.."

" ඇවිත් හුඟක් වෙලාද.."

මම පැසෙන්ජර් සීට් එකෙන් ඉඳගෙන සීට් බෙල්ට් එක දාගත්තම රධ්‍ය අයියා කාර් එකේ දොර ඇරලා ආයෙම ඒක තදට වහගෙන ලොක් කලා..

" ටිකක් වෙලා.. මම උදේ කියාන් හම්බෙන්න ගියා.."

" කියාන් අයියව..??"

" ඔව් ආවට පස්සෙ හම්බුණේ නැති නිසා ඒ පැත්තෙ ගිහින් ආවා.."

@Shan

" ඔෆිස් ද.."

" යුනිවසිටි එකට.."

" ඒක හොඳයි.."

රධ්‍ය අයියා මොකුත් නොකිය කාර් එක පාරට දාලා ඩ්‍රයිව් කරන්නගත්තා.. මටත් කියන්න මොකුත් මතක් වුණේ නැති නිසා කතානොකරම හිටියා.. ඇරත් මම හිතන්නෙ රධ්‍ය අයියා මේ වෙලේ කතාකරන්න ලොකුවට කැමැත්තකින් නෙමෙ හිටියේ.. අම්මා එක්කවත් කතාකරන්න තිබ්බනම් හොඳයි.. කොළඹ ආවහම අර කලින් දැනෙන පීඩනේම ආයෙ දැනෙන්න අරන් වගේ.. මගේ හිතට බය හිතෙනවා.. මෙහෙම වෙද්දි..

අනික රධ්‍ය අයියා දවසක් කිව්ව 'මම මොකක් හරි ඉල්ලුවොත් ඇයි කියලා අහන්නැතුව කල්ලා දෙන්න' කතාව නිතරම මතක් වෙනවා.. එයා ඇයි එහෙම කිව්වෙ කියලා මම දන්නෙ නෑ.. එක්කො එයා හිතන්නෙ මට පොඩි පොඩි දේවල් ලොකුවට මතක් හිටින්නෙ නෑ කියලා.. එහෙම හිතන එකත් එක අතකට හොඳයි.. කොහොම වුණත් රධ්‍ය අයියා කවදාවත් නැතුව මෙහෙම ඉන්න එකගැනනම් මට සැහෙන්න සැක හිතුණා.. වෙනදට මොනව කිව්වත් ගාණකට ගන්නෙ නැතුව ඉන්නවනෙ.. අනික මෙහේ එන්න කලිනුත් කිය කිය හිටියෙ අප්පච්චි මොකක් කිව්වත් එයා ගණන් ගන්නෙ නෑ කියලනෙ.. එක්කො ඒ මට කියන හැටි වෙන්නැති.. ඇත්තටම හිතේ අවුලක් තියෙන්න ඇති.. මට කොච්චරවත් හිතුණා රධ්‍ය අයියා නොකිව්වට ඉන්නෙ අවුලින් කියලා.. එයා සමහර වෙලාවට කල්පනා කරනවා ඔහේ පැත්තක් බලාගෙන.. එක්කො මම වැඩක් කරනවනම් මගේ දිහා බලාගෙන කල්පනා කරනවා.. එතකොට එයා හිතන දේවල් සමහර වෙලාවට මට මූණෙන් කියන්න පුළුවන්..

කොහොම වුණත් මම දන්නවා.. රධ්‍ය අයියා ඉන්නෙ ලොකු ප්‍රශ්නෙක හිරවෙලා කියලා.. ඒක ඉස්සර ඉඳන් එයා හිතුවා.. එයා ඉස්සර ඉඳන් හිතුවා මෙහෙම දවස් ආවොත් ඒකට මොකක්ද කරන්නෙ කියලා.. දැන් ඒ කාලෙ ඇවිල්ලා.. එයා කොච්චර හිතුවත් උත්තර හම්බුනේ නැති නිසා.. එයා ඇත්තටම ඉන්නෙ එකපැත්තකින්වත් එළියට ඒගන්න බැරුව හිරවෙලා..

එයාට දුක හිතෙන්න ඕනතරම් දේවල් තියනවා..

@Shan

මම ඒක දන්නවා.. ඉඳලා හිටලා හිත රිදුනහම මාත් එක්ක යුනිවසිටි මිස් වුණු එක ගැන කියනවා.. 'දුකක් නෑ වරද්.. මට තියෙන්නෙ පසුතැවීමක් විතරයි' කිව්වට.. එයාගෙ ඇස් මලානික වෙලා කල්පනාවට වැටෙන්නෙ දුක හිතුණහම තමා.. එයාට දුකත් එක්ක ලොකු පසුතැවීමක් තියනවා.. අනික කිසිම උදව්වක් නැතුව අසරණ කමක් දැනෙනවා.. එයාට හිතෙන හිතෙන දේ කරන්න අයියට වගේ ජොබ් එකක් නෑ.. අනික ආධ්‍ය අයියව පවුලෙන් කපලාම දාලා නිසා පවුලෙ ඊළඟ වගකීම කියන එක අප්පච්චි රධ්‍ය අයියගෙන් බලාපොරොත්තු වෙනවා.. ඒත් රධ්‍ය අයියට ඕන දේවල් අප්පච්චි එක්ක බලද්දි අහසයි පොළොවයි වගේ.. රධ්‍ය අයියට ඕන නිදහසේ ඉන්න.. පාඩුවෙ ඉන්න.. කාගෙවත් දේවල් ගැන උනන්දු නොවී හොඳින් ඉන්න.. එයා කොහොමත් ඉන්නෙත් එහෙමයි.. එක්කො අප්පච්චි තේරුම් ගන්න ඕන.. නැත්නම් එයාට කවුරුහරි තේරුම් කල්ලා දෙන්න ඕන.. ඒත් තේරුම් කරන්නත් ඒ මනුස්සයා ඉන්නෙ කෙනෙක් තේරුම් කරන ඒවා අහන මානසිකත්වෙක නෙමෙයිනෙ..

අපි ගෙදර ආවහම රධ්‍ය අයියා මම උඩට යනකල් ඉඳලා ටිකක් වෙලා කාර් එකේ ඉඳලා ඇතුළට ආවෙ.. අපි එද්දිත් අයියා අපේ ගෙදර ඇවිල්ලා.. මාමා කෝල් එකක.. මම ගිහින් ස්පෝර්ට්ස් බෑග් එක පැත්තකට දාලා අයියා ගාවින් ඉඳගත්තම අයියා අත් දෙකෙන් මූණ වහගෙන හොඳ හුස්මක් ගත්තා..

" චූටි ආවද.."

" රධ්‍ය අයියත් ආවා.. පහළ.."

" ඊයෙ ලොකු ප්‍රශ්නයක් වුණා චූටි..එයා මොනවද කිව්වෙ.."

" මට මොකුත්ම කි-"

" වරද් මම කාමරේට යනවා.. නිදාගෙන හිටියොත් ඇහැරන්න එපා.."

රධ්‍ය අයියා ආධ්‍ය අයියා දිහා නොබලා ගෙට ඇවිත් කෙලින්ම කාමරේට ගිහින් දොර වහගත්තා.. ආධ්‍ය අයියගෙ ඇස් දෙකේ බලාගෙන ඉද්දි කඳුළු පිරුණා.. කොහොමත් ඒ අයියා මල්ලි දෙන්නට දෙන්නා නැතුව බෑනෙ.. පොඩි වෙනසක් වුණත් ආධ්‍ය අයියට ලොකුවට දැනෙන්න ගන්නවා..

" මොකද අයියෙ.. කියන්නකො.. මොකක්ද වුණේ.."

@Shan

" ඊයෙ අප්පච්චි පොඩී එක්ක හොඳටම රණ්ඩු වුණා චූටි.. ගෙදර පිස්සුවක් වගේ.. අප්පච්චි ඉන්නෙ පුදුම කේන්තියකින්.. ඒ අස්සෙ නෙතුත් ඊයෙ ගෙදර ඇවිත්, පොඩී නෙතු එක්ක කතාකරන්නැතුව උඩට ගියා කියලා අප්පච්චි බැන්නා.. ඊටපස්සෙ අප්පච්චිට කේන්ති ගිහින් පොඩීට හොඳටම ගැහුවා.. මෙයත් බැනගන්න ගියානෙ.. ඊයෙ අප්පච්චි වෙඩින් ෆොටෝ එකත් පොළොවෙ ගැහුවා.. කවදාවත්ම මෙහෙම දේවල් වෙලා නෑ චූටි.. මට මැරෙන්න හිතෙනවා.."

ආධ්‍ය අයියා සෝෆා එකේ ඇන්දට හේත්තු වුණාම මම දැක්කා අයියගෙ ලේන්සුව ලේ පැල්ලම් වගයක් තියනවා.. ඒකත් මගෙ හිතේ ආයෙ ආයෙ හොල්මන් කරන්න ගත්තා..

" අප්පච්චි ඇයි මෙහෙම කරන්නෙ අයියෙ.. මොනවද බලාපොරොත්තු වෙන්නෙ.."

" මම දන්නෙ නෑ චූටි.. එයාට ඕන එයාගෙ මහැරුණු දේවල් සේරම පොඩී ලවා කරවගන්න.. ඒත් පොඩී එහෙම කරන්නෙ නැනෙ.. ඒකට කේන්තී.. කොහෙවත් ඉන්න අම්මටත් බැන්නා.. ළමයි හුරතලේට හදලා කාලකන්නි කලා කියලා.. ඕවට තමා මෙයාට කේන්ති යන්නෙ.."

" ම්ම්.."

ඒ එක්කම අපේ මාමා ඇවිත් කලබලෙන් ආධ්‍ය අයියගෙ ගාවින් ඉඳගත්තා..

" සාකි.. අපිට ඩෝනර් කෙ- ආ සුදුමහත්තයා.. ආවද.."

මාමා එකපාරම මගේ දිහා බලලා කියන්න ආපු එක ගිලගත්තා..

" ඔව් මාමෙ..රධ්‍ය අයියත් ආවා.."

" ම්ම්.. උඹ දන්නවද ඊයෙ ඒකා ගෙදර හොඳ වන්නමක් අල්ලලා අධිකාරියා අද උදේ හිටියෙ අහුවෙන එකාව මරාගෙන කන්න..මම උදේ දැක්කනෙ ඔෆිස් එකේ ඉන්නවා.."

" එහෙමද.."

" මට ටිකක් රධ්‍ය එක්ක කතාකරන්න ඕන.. සාකිට අද නයිට් ද.."

@Shan

" මම්.. පහුගිය ටිකෙත් හිටියෙ නෑනෙ.. අද නයිට් ඉන්නවා.."

" ඔයා අවුරුද්දටත් වැඩ දාගත්තද ළමයො.."

" ඔව්.. ගෙදර ඉන්න බෑනෙ අනූ.. හොස්පිටල් එක අනික හොඳයි.. මෙ දවස්වල වැඩ වැඩියි ඩොක්ටර්ස්ලා නැති නිසා.."

" මම්.. ඔයා එහෙනම් නයිට් යන්න.. රධ්‍ය මෙහේ ඉඳපුවාවෙ.."

" නෑ නෑ අනූ.. එයා ගෙදර යන්න ඕන.. අප්පච්චි නැත්නම් ආයෙම-"

අපේ මාමා එකපාරට නැගිට්ටා.. නැගිටලා ආධ්‍ය අයියගෙ මූණට එබුනේ කේන්තියෙන්..

" දැන් උඹලා දෙන්නා තාම ඔය මිනිහා කියන පදේට නටාගෙන ඉන්නවද.. ආ.. උඹනම් කොහොමත් එහෙමනෙ.. අරකා ඔය කියන ඒවා අහන්නෙ නෑ.. රධ්‍ය ඕන්නම් ඉඳී.. නැත්නම් ඌ කරන ඕන එක දන්නවා.. සාකි..!! මගේ යකා අවුස්සන්න ලෑස්තිවෙන්න එපා ආයෙ අප්පච්චි ගාගෙන ගිහින් කියන කියන පදේට නටන්න ලෑස්තිවෙලා.."

මම මාමගෙ අතින් ඇදලා නවත්තන්න හැදුවහම මාමා මගේ අත එහාට කල්ලා දාලා ආධ්‍ය අයියගෙ අතකින් තද කල්ලා අල්ලගත්තා.. ආධ්‍ය අයියගෙ ඇස් වල කඳුළු පිරිලා පොඩි ගනන් පහළට හැලෙනවා.. දැන් ඔක්කොම තියෙද්දි මාමත් වරං අරගෙන වගේ..

" අ-අනූ.."

" උඹට මම මෙච්චර නැහීගෙන ආදරේ කරනවා.. එකපාරක් පුළුවන් නම් මං ගැනත් හිතපන්.. මම කලිනුත් කිව්වනෙ.. මෙහෙම කරන්නෙපා සාකි.. මෙහෙම කරන්න එපා.."

" මාමෙ ඕක නවත්තන්නකො.."

" මම කිව්ව දේවල් ඒ විදියට වෙන්න ඕන ශාක්‍ය.. තේරුණාද.. මට මේ වැඩ ටික හරියට ඉවරකරගන්න නම්.. මම කියන විදියට ඉඳපන්.. මම උඹව හිරකරනවා තමා.. එහෙම හිතුවට කමක් නෑ.. හිතපන්.. උඹට පස්සෙ තේරෙයි.."

@Shan

මාමා අයියගෙ අත ගසලා දාලා කාමරේට ගියාම ආධ්‍ය අයියා මූණ පුරාම තියන කඳුළු අත් දෙකින් පිහිදාගෙන බිම බලාගෙන හිටියා.. මාමා කියන කතාවෙත් ඇත්තක් තියනවා තමා.. ඒත් ඉතින් හැමපැත්තෙන්ම බැලුවම හැමෝම අසරණයිනෙ.. ඒත් ආධ්‍ය අයියා මේ බයේ දහලන එකනම් මාමා ආස නෑ.. එයා ලොකුය්නෙ.. හැමෝම ගැන හිතලා වෙලාවක් තිබ්බොත් තමා එයා තමන් ගැන හොයන්නෙ.. අපේ මාමා එහෙම නෙමේ.. අනිත් හැමෝටම කලින් තමන් ගැන හිතන්න කියලා එයා කියන්නෙ..

" අයියා ගිහින් මාමා එක්ක කතාකල්ලා බලන්න.. ඔය කේන්ති ගියාට ඔයාට ආදරේනෙ.."

" ම්ම්.."

" යන්නකො දැන්.. ගිහින් කතාකරන්න.."

ආධ්‍ය අයියා මගෙ ඔලුව අතගාගෙන නැගිටලා මාමගෙ කාමරේට ගියා.. මම මගේ කාමරේට එන්න ආවා.. ක්වාටස් නිසා ඉතින් මේක හෙන පොඩි ගෙදරක්නෙ.. මුළු ගෙදරම එහෙම හෙනට ඇවිදලා කල්ලා ඉන්න අමාරුයි.. මම කාමරේට එද්දි රධ්‍ය අයියා කොට්ටයක් බදාගෙන හොඳටම නිදි.. සපත්තුදෙක පන්නලා කාමරේ කොනක තිබුනා.. මම ටවල් එක අරගෙන නාගන්න ගියා..

ආයෙම මම නාලා කියලා රෙදි වොශින් මැශින් එකට දාලා කාමරේට එද්දිත් රධ්‍ය අයියා හොඳටම නිදි.. දවල්ට කන්නෙත් නැතුවම.. එක්කො කන්න හිතෙන්නෙ නැතුවැති.. මටනම් හිත අවුල් වුණාම කන්න පිරියක් දැනෙන්නෙ නෑ.. එහෙමත් වෙලාවක කන්න ඕනවට කනවා මිසක්.. ඒත් නොකා හිටියොත් මැරෙන්න තරමට ගැස්ට්‍රයිටිස් වැඩිවෙනවා.. මම ගිහින් රධ්‍ය අය්යියා ගාවින් ඇල වෙලා කොට්ටෙකින් ඔලුව තියාගත්තා..

රධ්‍ය අයියා නිදාගත්තම හෙන අහිංසක පාටයි.. කම්මුලකුත් කොට්ටෙට තද වෙලා.. ඒත් කම්මුලේ තිබ්බ සීරිච්ච පාරයි තොල ගාව තිබ්බ පැල්ලමයි දැක්කහම මගේ පපුව ආයෙමත් හිරිවැටීගෙන යනවා මට දැනුණා.. මගේ හිතට දුකයි.. ඒත් කියන්න තේරෙන්නෙ නෑ.. මට මහ අසරණකමක් දැනෙනවා.. මට කරන්න පුළුවන් කිසිම දෙයක් නැතිනිසා.. ඒත් මම මට කරන්න පුළුවන් දෙයක් තියේනම් දෙපාරක් හිතන්නෙ නැතුව ඒක කරනවා.. මට හැමතිස්සෙම උදවු වුණාට මට රධ්‍ය අයියා වෙනුවෙන් දෙයක් කරන්න විදියක් නැති එක ගැන මම හැමතිස්සෙම දුක් වෙනවා..

@Shan

සමහරවෙලාවට මේ ප්‍රශ්නවලදි මම කරන්න ඕන මොකක්ද කියලා මම දන්නෙ නෑ.. මොකද මගේ පව්ලෙ මෙහැටි ප්‍රශ්න නැති නිසා..

මම රධ්‍ය අයියා ගාවට ඇදිලා ගිහින් එයාගෙ නළලට හාද්දක් තිව්වා.. තියලා මගේ පපුවට තුරුල් කරගත්තා.. මට එයාව දැනෙන්නෙ මං ගාව තියාගන්න ඕනම කෙනෙක් වගේ..

මම හැමතිස්සෙම 'මගේ' කියන්නෙ.. මම ඒකෙන් අදහස් කරන්නෙ ඒක මගේමයි කියලා.. ඒ කියන්නෙ මම හදවතින්ම හිතාගෙන ඉන්නවා ඒ දේ මගෙ කියලා.. එහෙම නැත්නම් ඒක මගේ නෙමෙයි.. රධ්‍ය අයියත් මට දැනෙන්නෙ 'මගෙම' කියලා කෙනෙක් වගේ..

රධ්‍ය අයියා මට තුරුල් වෙලා මාව එයාගෙ බූවළු අඩු වලින් ඔතාගත්තා මට හුස්ම ගන්න බැරිවෙන්නම.. ඊටපස්සෙ මගේ කකුල උඩින් කකුලක් දාගත්තා..

" ඔයා ඇහැරුවද මම.."

" නෑ.."

මම රධ්‍ය අයියගෙ පිටට තට්ටුවක් දැම්මා..

" ඔයා මට කියනැද්ද.."

" අයියා කිව්වනෙ.."

" ඒ අයියනෙ ඔයා නෙමේනෙ.."

රධ්‍ය අයියා ටිකක් වෙලා එහෙම ඉදලා මගේ පපුවෙන් මූණ අරගෙන මගේ තොල් වලින් පෙක් එකක් තිබ්බා.. තියලා කොට්ටෙන් ඔලුව තියාගත්තා..

" මට හිත හදාගන්න ඕන වරද්.."

" හිත හදාගන්න..??"

"ඔව්.. හැමතිස්සෙම මට තනිවෙද්දි අමුතු පාළුවක් මගේ වටේ තියනවා.. අනික මට ඇත්තටම හිත හදාගන්න ඕන.."

@Shan

" මොකක් ගැනද.."

" හුඟක් දේවල් ගැන.. ඔයා කොහොමද ඔයාට නොලැබෙන දේවල් ගැන හිතන්නෙ.. ඒ ගැන හිතද්දි මොනවද දැනෙන්නෙ.."

මම ඇඳ උඩ ඔහේ තිබ්බ රධ්‍ය අයියෑ අතක ඇඟිලි වල මගේ ඇඟිලි පටලගත්තා.. කරගෙන මං ගාවට අරගෙන අත් දෙකින්ම ඒ අත ගුලි කරගත්තා..

" වෙන්න තියන දෙයක් නවත්තන්න බැනෙ.. එහෙම කියලා හිත හදාගන්නවා.."

" මම.."

" ඔයාට එහෙම හිතන්න බැරුවැති මගේ ප්‍රශ්නයි ඔයාගෙ ඒවයි වෙනස්නෙ.."

රධ්‍ය අයියා මං දිහාම බලාගෙන හිටියා..

" ඔයාට මං වෙනුවෙන් දෙයක් කරන්න පුළුවන්ද.. මේ වෙලේ මම ඔයාගෙන් ඒක බල කල්ලම ඉල්ලනවා.. කමක් නැනෙ.."

" ඒ මොකක්ද.."

රධ්‍ය අයියා මං දිහා සැකෙන් වගේ බලාගෙන හිටියා.. එයාගෙ ඇස් එකසැරේ අමුතු විදියට බයකින් පිරිලා ගියා..

" ඔයා.. මුලින්ම හැමෝටම කලින් ඔයා ගැන හිතනව කියල මට පොරොන්දු වෙනවද.. මම ඔයාගෙන් බල කල්ලම ඉල්ලන්නෙ ඒක.. අයියා වගේ හැමෝම ගැන හිතලා අන්තිමට ඔයා ගැන හිතන්නෙපා.."

" ඇයි එ-එහෙම කියන්නෙ.."

" එහෙම තමයි.. ඔයත් මට කියනවනෙ.. මම අද ඔයාට කිව්වා.."

" ඒකෙන් කොහොමද මගේ ප්‍රශ්න වලට උත්තරයක් ගන්නෙ.."

@Shan

" හිතලා බලන්න.. ඒකෙ උත්තරේ තියනවා.. ඔයා ඒ වෙනුවෙන් ඕනම දෙයක් කරනවා.."

" කෝක වෙනුවෙන්.. මට ඔයා කියන එක තේරෙන්නෙ නෑ.."

" ඔයා, ඔයා ගැන හිතන්න ගත්තම තමන් වෙනුවෙන් ඕනම දෙයක් කරනවා.. ඒකට තමා තමන්ගැන ගැන කෙයා කරනවා කියන්නෙ.."

" එතකොට.."

" ඔයා ඔයාට ආදරෙයි.. මම මට ආදරෙයි.. ඒ ඇරෙන්න මම ඔයාටත් ආදරෙයි.. ඔයත් මට ආදරෙයිනෙ.. මට ආදරේ කරන්න ඔයා ඉන්නනම්.. ඔයා මුලින්ම ඔයාව ජීවත් කරගෙන ඉන්න ඕන.. එතකොට අපි දෙන්නට අපි ඉන්නවා.."

රධ්‍ය අයියා ටිකක් වෙලා මගේ දිහා බලාගෙන ඉදලා එකසැරේ හිනාවුණා.. හිනාවෙලා මගේ කම්මුලක් හිම්හිට ඇගිලිවලින් අල්ලලා පොඩි කලා.. මම මූණ අහකට ගත්තා..

" එතකොට හරිද.."

" ඔව්.. එතකොට හරි.. දැනට ඔයා අනිත් දේවල් ගැන හිතන්නෙ නැතුව ඔයාගෙ හීනවලට යන්න හරි පාරක් හිතාගන්නකො.."

" හිතලා..??"

" ඊටපස්සෙ ඔයා ඒ පාරෙ යන්න පටන්ගන්න ඕන.."

" ඒක හිතනවා වගේ ලේසි නෑ වරද්.. මම පාරක් හිතාගෙන හිටියත් මට මොකක් හරි අතාරින්න වෙනවනෙ.."

" ඇයි අතාරින්නෙ නැත්තෙ.."

රධ්‍ය අයියා මාව එයා ගාවට අරගෙන අතක් උඩින් තියාගෙන මූණට වැටිලා තියන කොණ්ඩෙ පිටිපස්සට කල්ලා මගේ ඇස් දෙකට එබුණා..

" එහෙම කරන්න තමයි මට හිත හදාගන්න බැරි.."

@Shan

" ආ ඒකද.. කලින් හිත හදාගන්න ඕන කිව්වෙ.."

" මිම්.."

" අල්ලගන්න ඕන අතාරින්න හිත හදාගෙන තමයි.."

මම හිනාවෙලා කිව්වහම රධ්‍ය අයියා මගේ කම්මුල දෙපැත්තෙන් තද කල්ලා අල්ලගෙන දෙපැත්තට හෙලෙව්වා..

" කට තලනවා උඹගෙ.."

" ආව්.. මහ්.. රිදෙනවා අනේ.."

" මොකක්ද ඒ කිව්ව කතාවෙ තේරුම.."

" පොඩ්ඩක් අත ගන්නවකො.. ආව්.. හක්කත් පැන්නද මන්දා.."

මම රධ්‍ය අයියගෙ අත ගසලා දාලා කම්මුල අතගාගත්තා.. ඇත්තටම හක්ක පැන්නද කොහෙද..

" කිව්වෙ ඇත්තනෙ.. අල්ලගත්තා වගේම අතාරින්නත් ඕන.. අපේ ආච්චිඅම්මා කියන්නෙ.. සමහරවිට ඔයා අතාරින එකෙන් දෙපැත්තටම හොදක් වෙන්න පුළුවන්.. මම කියන්නෙ හැමදාටම නෙමෙ මනුස්සයෝ.. මරන් කන්න වගේ බලන්නෙ.."

" ඉතින්..??"

" ඉතින් කියන්නෙ.. එච්චරයි.. ඔයා මොකක් කළත් මම ඔයාට සපෝට් කරනවා.. ඔයාගෙ බෝයිපෙන් සීගිරි සුකුමාලියෙක් නෙමෙ හලෝ.. තව්සෙ එහෙම මට සැලකුවට.."

මම හිමින් සැරේ රධ්‍ය අයියගෙ අත් දෙක අස්සට රිංගගෙන ඉසකුඩිච්චියක් කරන් ඉන්න මූණට ලං කල්ලා හාද්දක් දුන්නා..

" තරහද.."

" නෑ.."

@Shan

" නෑ නෙමෙ තරහ වෙලානෙ.. ඕකනෙ දෙයක් කියන්න බැරි.. මම කියන දේ ටිකක් අහනවකො.."

"....."

" අයියෙ.."

රධ්‍ය අයියා 'අයියෙ' කිව්වහම මොන මූඩ් එකේ හිටියත් දියවෙලා වැක්කෙරෙන්න ගන්නවා.. ඒකනිසා මම වැඩිය අයියෙ කියන්නැතුව ඒක තියාගෙන ඉන්නෙ හදිසියකදි පාවිච්චි කරන්න.. මම නිසා හොඳයි ඉතිම්.. මගෙ පාටමාරුකරන මුගටියට..

" ඔයා දැනට හොඳයි කියලා හිතෙන ඕනම දෙයක් කරන්න.. හරිද.. මම ඔයා එක්ක ඉන්නවනෙ.. ඒ වෙනුවෙන් මට කරන්න පුළුවන් උපරිමේ මම උදව් කරනවා.. ඇත්තටම මට ඕන ඔයාට උදව් කරන්න.. ඔයාට අතාරින්න ඕන පැත්ත දැනට අතාරින්න.. මම කවදාවත් ඔයා එක්ක තරහවෙන්නෙ නෑ.. තරහක් හිතේ තියාගන්නෙ නෑ.."

" ම්ම්.."

" අනික මම ඔයාට හැමදාම ආදරෙයිනෙ.. මම එච්චර මීටකලින් කෙනෙක්ට ආදරේ කල්ලත් නෑ.. ඒකනිසා දැනට ඔයා හිත හදාගන්න.. මම ඔයා එක්ක ඉන්නවා.."

" ඔයා ඕකෙන් පසුතැවෙන්නෑ කියලා විශ්වාසද.."

" ඔව්.. පොඩ්ඩක්වත් නෑ.. දුක හිතේවි ඒත් පසුතැවෙන්නෙ නෑ.. මම ඔයාට කියන්නෙ හිතට මේවෙලේ හිතෙන ඒවා නෙමෙ.. මට කියන්න කාලෙක ඉඳලා උවමනා වෙච්ච දේවල්.."

රධ්‍ය අයියා මාව පපුවට තියලා තුරුල් කරගෙන හිස් මුදුනට තොල් තියාගෙන හිටියා.. ආදරේ කියන්නෙ ජීවිතේම නෙමේ.. ජීවත් වෙන්න හොයාගන්න එක හේතුවක් විතරයි.. මම කියන්නෑ ආදරේ වෙනුවෙන් හැමදේම කැපකරන්න කියලා.. සමහරවෙලාවට කැපකරන්න වෙන දේවල් වලට අනිත් පැත්තට දෙගුණයක් හම්බෙන්නත් පුළුවන්.. ආදරේ හුඟක් ලස්සනයි.. මම ආදරේ නිසා ජීවත් වෙන්න ඉගනගත්තා.. මම නිසා කෙනෙක් ජීවත් වුණා.. මට ඒ හොඳටම ඇති..

@Shan

" මම අදටත් හිතනවා.. ඔයාට ආදරේ කරන්න ගත්තු එක මම ගත්ත හොදම තීරණේ කියලා වරද්.."

මම රධ්‍ය අයියගෙ ශර්ට් එක ගුලි කල්ලා අල්ලගත්තා.. එයා ඉදලා හිටලා කියන වචනයක් දෙකක් මගේ හිත අමුතු විදියට හිරිවට්ටනවා..

" මමත් ආදරෙයි.."

මම රධ්‍ය අයියගෙ පපුව මැද්දට තොල් තියාගත්තා.. එයාගෙ සුවඳට මම හරි ආසයි.. අනික එයාගෙ අත් අස්සට වුණාම හරි උනුහුමයි.. protective feeling එකක් දැනෙනවා..

මම හිතන්නෙ මම 'මගේ' කියලා කියන්නෙ මෙවට වෙන්න ඕන.. ඒ ඔක්කොමත් එක්ක එකතුණු ආදරේ පිරිච්ච මනුස්සයෙක්ට..

මගෙ පුම්චි ළමයින්නේ.. නරක සමනලයා ආවා..

මේ වෙලාවෙ එම්නෙ නෑ තමා.. ඒත් ආවා අනේ.. හිතුවෙ මම එන්නෑ කියල නේත...

පිස්සු කෙල්ලොහ්..

එන්නම්.. ලව් යූ.. ❤

තැන්කූ damru අක්කෝ.. අනේ.. ❤😘

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

@Shan

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 127 කොටස

" ඔය අතේ ඇලි ගෑවෙයි වරද්.."

" ආ..??"

මගේ අතේ තිබ්බ නිමිච්ච පහන රධ්‍ය අයියා ඉල්ලගෙන පැත්තකින් තිබ්බා.. අද කැළණියෙ සෙනඟ වැහි වැහැලා.. එහෙම හිටියත් පන්සලේ තිබ්බ නිස්කලංක බවේ අඩුවක් වෙලා තිබ්බෙ නෑ.. අර හඳුන්කූරු සුවඳයි.. මල් වලින් එන සුවඳයි.. හිතේ ඇතිවෙන නිමිච්ච ගතියයි නිසා අපි වටේ තියන දේවල් අපිට ඇහුණෙ නෑ.. හැමෝම තමන්ගෙ පාඩුවෙ වැඩක් කළා.. සමහරු ඇවිදිනවා.. සමහරු මල් පූජා කරනවා.. බබාලා හම්බෙන්න ඉන්න අම්මලා පැන්කළ අරගෙන බෝධිය වටේ යනවා.. ආච්චිඅම්මලා දොහොත් මුදුන් දීලා වැඳගෙන ඉන්නවා.. ඒ අතරින් පතර පන්සලේ පොඩි හාමුදුරු නමක් පිරිත් නූල් බෙදනවා..

හැන්දෑවයි කැළණි පන්සලයි කියන්නෙ.. වෙනමම එකක්..

හෙට අලුත් අවුරුද්ද වුණාට පුණ්‍ය කාලය කලින්ම ලැබුවා.. මම උදේ ප්‍රැක්ටිස් ගිහින් ගෙදර එද්දි රධ්‍ය අයියා ක්වාටස් එකට ඇවිල්ලා මාමා එක්ක කතාවක හිටියේ.. ආධ්‍ය අයියා අද නයිට් ඩියුටි කල්ලා එන්නෙ හෙට.. කොහොම හරි අන්තිමේ මාමා ආධ්‍ය අයියට කියලා කියලා නයිට් අයින් කරගත්තා.. නැත්නම් අයියා ඉන්නෙම හොස්පිටල් එකේනෙ.. අවුරුදු කියලා ගමේ වගේ මෙහේනම් ලොකු ලක ලෑස්තියක් තිබ්බෙ නෑ.. ඇත්තටම එහෙම ජයට අවුරුද්දක් කන්න අපේ හිත්වල මානසිකත්වයක් තියනවා ඇති කියලා මම හිතන්නෙ නෑ.. ඒ තරමට ප්‍රශ්න තිබුණා.. ඉතින් හෙට වැඩිම වුණොත් කිරිබත් හදලා නැකතට කාවි.. ඔච්චර තමා.. මටනම් කොහොම තිබ්බත් එකයි..

රධ්‍ය අයියට හවස පන්සල් එන්න ඕනවුණු නිසා අපි කැළණි ආවා.. මාමා මොකක්ද වැඩකට යන්න ඕන කියලා ඒ ගමන්ම එළියට ගියා.. සමහර විට ආධ්‍ය අයියා හම්බෙන්න වෙන්න ඇති..

" අද හරියට සෙනඟ නේද.."

@Shan

" ම්ම්.."

රධ්‍ය අයියා පහන් වැටේ නිමිච්ච පහන් පේළියකට පොල්තෙල් වක්කරන් යද්දි මම ඒවට පහන්තිර පෙහෙව්වා.. සමහර පහන් නිමිලා ගිහින් හුළඟට.. සමහර ඒවා රස්නෙ වැඩිවෙලා පුපුරලා.. අනිත් ඒවට තෙල් මදී.. මම පුපුරලා ගිය පහනක් හොඳ පහනක් උඩින් තිව්වහම රධ්‍ය අයියා ඒ පහනට පොල්තෙල් පිරෙව්වා..

මට පහන් අරවා මේවා දැක්කහම උපමා රූපක ඉබේ මතක් වෙනවා.. පහනුත් හරියට අපේ ජීවිතේ වගේ කියලා හිතෙන්න පටන්ගත්තම.. හිතාගෙන හිතාගෙන යනවා..

" දැන් කැන්ඩි යන වැඩේ මොකද.."

" මෙ සතිය අන්තිමෙ මැචස් තියනවා කිව්වා.. වෙළසුමනයා ඒක කිව්වෙ අන්තිමටනෙ.. බලන්නකො.."

" ඒ වුණාට ඔයා ප්ලේ කරන්න ඕන.."

" ආයෙ වැඩ වැඩිවෙන්න යන්නෙ ඒයි.. ඉස්කෝලෙත් ලබන සඳුදා පටන්ගන්නවා.."

මමයි රධ්‍ය අයියයි පහන් දෙකතුනක් පත්තුකල්ලා අනිත් ඒවා එතන ඉඳපු ආච්චිඅම්මට පත්තුකරන්න ඉඩ ඇරලා පහන් වැට ගාවින් මෙහාට වුණා.. ඒ ආච්චිඅම්මා ගාව මොකුත් තිබ්බෙ නෑ.. හඳුන්කූරක්වත්.. සමහරවිට ඒ ආච්චි ආස ඇති පහනක් පත්තු කරන්න.. අපි හිතුවෙ නැතිවුණාට පහනක් පත්තුකරගන්න පොල්තෙල් ටිකක් ගන්න බැරි කාලයක් මේක.. පහනක් ඕන්නෑ.. කන්න ගන්නම ටික ගන්නෙත් මිනිස්සු කොයිතරම් අමාරුවෙන්ද.. ආර්ථික ප්‍රශ්නනම් කොයි කාටත් තියනවා.. එහෙම නැති අය හොයාගන්න හරි අඩුයි..

" වරද්.."

" ම්ම්..?? මම මේ මල් ටික අර ආච්චිඅම්මට දීලා එන්නම්ද.."

රධ්‍ය අයියා ලාවට හිනාවුණා.. එයා කියන්න හැදුවෙත් ඒකද දන්නෑ.. ඊටපස්සෙ එයා හඳුන්කූරු ටිකක් එයාගෙ අතට අරගෙන ඉතුරුටිකත් මගේ

@Shan

අතින් තිබ්බා..

" දීලා එන්න.."

මම හඳුන්කූරු ටිකයි අපි ගාව තිබ්බ සුදුපාට නෙළුම් මල් ටිකයි අරගෙන ආච්චිඅම්මා ළඟට යද්දි ඒ ආච්චිඅම්මා අපි තියලා ගිය පහන් තව පහනක් අරගෙන පත්තු කරනවා.. ඒ දිහාම බලාගෙන.. හරි පරිස්සමට.. මට මගේ ආච්චිඅම්මව මතක් වුණා..

" ආච්චිඅම්මෙ.."

මම එකසැරයක් කතාකළත් ආච්චිඅම්මා බැලුවෙ නැති නිසා රඨ්‍ය අයියා දිහා හැරුණහම එයා අත් දෙකත් බැඳගෙන එහායින් මං දිහා බලාගෙන ඉන්නවා.. හරි ආදරේ හිතෙනවා එහෙම බලාගෙන ඉද්දි.. මම ආයෙම තව පොඩ්ඩක් ආච්චිඅම්මට ළං වෙලා කතාකළා..

" ආච්චිඅම්මෙ.."

එතකොට ආච්චි බයෙන් වගෙ ඉක්මනට පිටිපස්ස හැරුණා.. මම ආච්චිව බය කළාද මන්දා.. ආච්චි මං දිහා බලාගෙන ඉඳලා පහන් ටික දිහා බලලා මූණ අමුතු කරගත්තා..

" අනේ පුතේ මම-"

" ආච්චිඅම්මා මෙ මල් ටික ගන්නවද.. අපිට මෙ වැඩී.. අපි මල් පූජ කළා.."

මම මගේ අතේ තිබ්බ සුදුපාට නෙළුම් මිට ආච්චිඅම්මගෙ අත් දෙක අරගෙන බලෙන්ම ගුලි කලාම ආච්චි ඒක වැටෙන්නැතුව පරිස්සමට අල්ලගත්තා.. ඒ ආච්චි හරි කරුණාවන්ත පාටයි.. සුදු දිග සායට සුදු හැට්ටයක් ඇඳලා සුදු කොණ්ඩෙ තනි කරලට ගොතලා තිබුණා..

" අනේ බොහොම පිං.."

මම හිනාවෙලා හඳුන්කූරු ටිකත් ආච්චිගෙ අතේ තිබ්බහම ආච්චි මං දිහා බලාගෙන ඉඳලා ඇස් දෙකේ කඳුළු පුරවගත්තා..

" අනේ ආච්චිඅම්මෙ.. ඇයි මෙ.."

@Shan

" මට-අහ් නෑ.. මට එද්දි මොකුත් ගේන්න බැරිවුණානෙ පුතේ.."

" පන්සල් එද්දි මොකුත් ගේන්න ඕනද ආච්චිඅම්මෙ.. මෙහෙට එන්නෙ තියන ටිකත් අතාරින්න බලාගෙනනෙ.."

ආච්චිඅම්මා දිලිසෙන ඒත් කඳුළු පිරිලා තිබ්බ ඇස් දෙකෙන් ආයෙම මා එක්ක හිනාවුණා..

" ම්ම්.."

" මම යන්නම් ආච්චිඅම්මෙ.. පරිස්සමට.."

මම ආච්චිඅම්මගෙ අතේ පැත්තකට තට්ටුවක් දාලා රධ්‍ය අයියා ගාවට දුවගෙන ආවා.. රධ්‍ය අයියා මගේ ඔලුවට තට්ටුවක් දාලා මාත් එක්ක බෝ මළුව පැත්තට ඇවිදගෙන ආවා.. මමත් ඒ පස්සෙන් වැලි වල එරි එරී එන්න ආවා.. අපේ ආච්චිඅම්මා මොනවා කරනවද දන්නෑ මේ වෙලාවෙ.. නිදිද දන්නෑ.. නැනෙ අම්මා එක්ක පව හලනවැති..

" වරද්.. ඉස්කෝලෙ එක්ක ඔයාට ස්ට්‍රෙස් වගේද ප්‍රැක්ටිස් වැඩ.."

රධ්‍ය අයියා බෝ මළුවෙ පැත්තින් ඉඳගත්තම මමත් ඒ ළඟින් බිම ඉඳගත්තා..

" එහෙම නෑ අනේ.. කරගෙන යනවා.. දැන් පුරුදු වෙලා.. වැඩක් නැත්නම තමා මට උණ ගන්නෙ.."

" ම්ම්.."

" ඔයා එනවද කැන්ඩි යන්න.. මම ප්‍රැක්ටිස් දවස් දෙකේ ඔයාට රෙස්ට් එකේ ඉන්න පුලුවන්නෙ.. ඊටපස්සෙ අපි හවස ඇවිදින්න යමු.. ආයෙ මම ප්ලේ කරනවා බලන්නත් පුළුවන්.. අනේ~"

" මම එන්න ඕනද.."

රධ්‍ය අයියා මගේ ඇඟිලි වල එයාගෙ ඇඟිලි පටලගෙන මුද්ද හිමිහිට කැරකුවා..

" ඔව්.. අනික කෝච් දන්නවා ඔය මගේ බෝයිෆ්‍රෙන්ඩ් කියලා.."

@Shan

" මොකක්..!!"

රධ්‍ය අයියා එකසැරේ බයවෙලා වගේ මම දිහා බැලුවහම මට හිනාගියා..

" ඇයි..?? මම කිව්වා කෝච්ට.. ඒකනිසා ඔයා ආවට කමක් නෑ.. කමක් නෑ නෙමේ.. එන්න ඕන.. ඊටපස්සෙ අපි දෙන්නටම වැඩනෙ.."

" යමු.."

" හා.. අනික නිකන් හම්බෙන එකනෙ.. මට බෑ තනියම කැන්ඩි ගිහින් දවස් තුනක් ඉන්න.. I really miss this හොල්මන sitting next to me"

" But you have spent almost four months without me.."

" I missed you.."

" මෙහේ නිදහස් නේද.."

රධ්‍ය අයියා පිටිපස්සෙ බැම්මට හේත්තු වෙලා බෝගහ දිහා බලාගෙන කියද්දි මම එයා දිහා බලාගෙන හිටියා..

" නිදහස්.. ඊයෙ අප්පච්චි මොකද කිව්වෙ.."

" මොනව කියන්නද බං.. වෙනදා වගේ තමා.. රණ්ඩුවුණා.. බැන්නා.. නිදාගත්තා.."

" ම්ම්.."

" මට හිතට හරි අමුතුයි වරද්.. ඒ කියන්නෙ ඔයාට තේරෙන්නෙ නැද්ද අපි වටේ තියන දේවල් එන්න එන්න අවුල් වෙනවා කියලා.. මාමා.. අයියා.. අප්පච්චි.. අම්මා.. හැමදේම.. මට මොකක් හරි වැරැද්දක් තේරෙනවා.."

" මටත් එහෙම තේරෙනවා.. ඒත් එහෙමයි කියලා ඒක ගැන හිත හිත හිටියොත් අපිට අද දවස මිස් වෙනවනෙ.."

" ඒ ඇයි.."

@Shan

මමත් බැම්මට හේත්තුවෙලා පැත්තෙන් රධ්‍ය අයියගෙ අතකටත් හේත්තුවක් දාගත්තා..

" මේ බලන්නකො.. අපි දවසෙ වැඩිහරියක් කරන්නෙ අපිට පහුවෙච්ච දේවල් ගැන හිතන එකයි.. ඉස්සරහට වෙන්න තියන දේවල් ගැනයි හිතන එකනෙ.. එහෙම නෙමෙ.. අද මේ වෙලාවෙ.. මේ මොහොත ගැන හිතන්නකො.. මේ මොහොත අපිට ඇත්තට ප්‍රශ්න නැනෙ.. මොකෝ මෙහේ ඉන්න මිනිස්සු අපිට යනගමන් බැනගෙන යනවද.. නැනෙ..

ඒකනිසා මේ ප්‍රශ්නයක් නෑ කියලා හිතෙන වෙලාවෙ අනිත් ඒවා පැත්තකට කල්ලා ඉමු.."

" මම එහෙම කරන්න ට්‍රයි කරනවා.."

" මාමා මොකද කිව්වෙ අද.. ලීවින් එකේ වැඩෙ හරිද.."

" ඔව්.. ඒක කරගන්න පුළුවන් කිව්වා.. ආයෙ කැම්ප් එකට ගිහින් ඒ ටික ඉවර කරන් එනවා.. එතකොට නිදහස්.."

" එහෙම හොඳයි.."

රධ්‍ය අයියා මගේ අතක ඇඟිලි ටිකක් හයියෙන් තද කල්ලා ඇල්លුවා..

" පරිස්සමට වරද්.. ඔයා කරන හැමදේම පරිස්සමට.. මට ඕන ඔයා පරිස්සමට ඉන්න එක විතරයි.."

එයා දන්නවද දන්නැතිවුණාට මගේ හිතේ තදින්ම තියෙනවා එයා මාව පරිස්සම් කරනවා කියලා.. මගේ පපුවෙ පැත්තක් හිටිවැටෙනවා වගේ මට දැනුණා.. ආදරේ වෙලාවකට පපුවට බරයි කියන්නෙ.. මේකට වෙන්නැති..

" මම පරිස්සමට ඉන්නවා.."

" මම හිත හදාගන්න ට්‍රයි කරනවා.. ඔයා ඊයෙ කියපු එක ගැන මම හිතලා බැලුවා.."

" එහෙමද.. ඉතින්..??"

" ඔයා කියන කතාවෙ ඇත්තක් තියනවා.. කරන්න අමාරු වුණාට.."

@Shan

" අමාරු නෑ.. ඔයාට පුළුවන්.."

" ම්ම්.."

මම තව ටිකක් රඩ්‍ය අයියගෙ අතට හේත්තු වුණා.. අපි වටේ හෙන අමුතු කියාගන්න තේරෙන්නෙ නැති බර හුළඟක් කැරකෙනවා කියලා මම දන්නවා.. මටත් ඒක ඒ විදියට දැනෙනවා.. ඒත් එහෙම දැනුණා කියලා වෙන්න පුළුවන් නරකම දේවල් මොනවද කියලා මට අදහසක් තිබ්බෙ නෑ.. එයා වැටිලා ඉන්න වෙලාවක මම හයියක් වෙන්න ඕන කියලා මගේ හිත මට තදින්ම කිව්වා..

" අපි අද කොහේහරි යනවද.. තාම රෑවෙලා නැනෙ.."

" අද බෑ වගේ අනේ.. ඕන්නම් බෝතලයක් උස්සන් ගෙදර යමු.."

රඩ්‍ය අයියා ඒ කියලා කට ගන්න හම්බුනේ නෑ මගෙ ඔලුව මැද්දටම ටොක්කක් අතෑරියා..

" බෙබද්දෙක් වෙලාද ඒ සැරේ.. දෙනවා උඹට බෝතල්.."

" චිජ්.. ඔලුවට අනින්නෙපා මගුල.. දැන් මගේ ඔලුවෙ මැද්දෙන් වලක් හැදෙනවා ටොකු කාලම.. මෙහෙම පුළුවන්ද අපිට පවුල් කන්න.. මම තවුසෙට තරු පෙන්නනවා වැඩිය නටාගෙන ආවොත්.. හරිත.."

රඩ්‍ය අයියා හැරිලා මට කින්ඩියට හිනාවුණා..

" ඇත්තද.."

" ඇත්ත තමා.. මේ හැමදේම මගේ සැලසුමෙ කොටසක්.."

" මෙන්න මෙහෙ වරෙන් යන්න.. බොගෙ කට විතරයි.."

රඩ්‍ය අයියා මාවත් ඇදගෙන ගිහින් අර විසාල පඩිපෙළ බැහැගෙන බැහැගෙන ගියා..

" අනේ මේ කට විතරක් නෙමෙ හරිද.. මුළු ඇඟම හොඳට වැඩ කරනවා.."

@Shan

මම රධ්‍ය අයියගෙ අත ගසලා දාලා ඇවිත් කාර් එකට නැගලා සෙරෙප්පු දෙකින් එකක් ගලවටා රධ්‍ය අයියට විසික් කල්ලා ගැහුවා.. ඒත් ඌ සෙරෙප්පුව ගානට අල්ලලා ඒක එතන තිබ්බ ගහකින් එල්ලලා ආවා..

මුගෙ ආවචිට..

යකෝ වෙච්ස් සෙරෙප්පු දෙකක් දෙදාහක් වෙනවා.. මේක මේ මම දිවිහිමියෙන් රැකන් ඉන්න සෙරෙප්පු දෙක.. එච්චරමයි සෙරෙප්පු දෙකකට තියෙන්නෙත්..

" මේ සෙරෙප්පුව දීපන්..!!"

" උඹට එපා නිසානෙ විසික් කලේ.. ඔය කවුරුහරි ගන්නැතෑ.. අපි ගෙදර යමු.."

" ආ වරෙන්.. වරෙන් වාහනේට.. අදනම් මැරුම් කන්න තමා.."

මම ආයෙ වාහනෙන් බැහැලා ගිහින් අර ගහ උඩ අත්තක තියන සෙරෙප්පුව ගන්න ඉස්සුණා.. නොන්ඩි කොට කොට ඇවිත් කකුලෙ පොටත් ගියාද කොහෙද.. මම ඉස්සුනාම රධ්‍ය අයියා ඇහිලි පහම කටේ ඔබාගෙන උඩ බලාගත්තා..

" මේක අරන් දෙනවා!!!"

" පොඩ්ඩක් උස මදි නේද වරද්.."

" අයියෙ!!!!!!"

" ශ්හ්.. කෑගහන්නෙපා අර සීයෙකුත් බලාගෙන ඉන්නවා බබා.."

" ආ එහෙමනෙ.."

මම රධ්‍ය අයියා ගාවට පැන පැන ගිහින් කනෙන් ඇදගෙන ගහ ගාවට ඇවිත් උගේම කරට නැගලා මගේ ලා නිල් පාට සෙරෙප්පුව අරන් කකුලට දාගත්තා.. වටේම මිනිස්සුත් බලාගෙන ඉන්නවා.. කමක් නෑ ඇක්චුවල් බ්‍රදර්ස්නෙ..

" ඒ බිමින් තියනවා මාව.."

@Shan

රඨ්‍ය අයියා මාව උස්සගෙන ගිහින් කාර් එකෙන් තියලා ඇහැක් ගහලා ඇවිත් එහාපැත්තෙන් ඉඳගත්තා.. මම අත පුරෝලා හොඳ පාරක් රඨ්‍ය අයියගෙ පිට මැද්දට අතෑරියහම ඒකා මගෙ බෙල්ලෙන් අල්ලගත්තා.. මම උගෙ කොලර් එකෙන් අල්ලගත්තා..

" මොකෝ මේ මලපැනලා.. තාර පැටියට.."

" තව්සෙ.. වැලිගෙම්බා.."

මට මෙ රඨ්‍ය අයියා සීරියස් වෙලාවල් වල හිනාවෙන එක තමා පෙන්නන්නම බැරි.. දෙන්න හිතෙනවා මූණ මැද්දට එකක්..

" අපි ගෙදර ගිහින් කන්ටිනිව් කරමු මෙක.. හරිනැනෙ.. මේ කාර් එකේ ලයිට්ස් ඕන් වෙලා ඉස්සරහ ඉන්න සීයා මෙහෙ බලාගෙන ඉන්නවා.."

" සීයා මට කියලා ඇටදෙක තලාගන්න තමා දැන්නම්.. බලනවකො ඒයි මෙ මිනිස්සු ඔපදූප හොයන හැටි.. නේ.."

" ඒකතමා.."

මම රඨ්‍ය අයියගෙ බෙල්ල අතෑරියා.. ගෙදර ගියාම හම ගහලා මම බැග් එකක් මහගන්නෝනෙ.. මතක් වෙන්න තියාගන්න..

" අද ශෝන් අයියගෙ කොන්සර්ට් එකක් අනේ.. මට මැරෙන්න කලින් ශෝන් අයියව බලන්න යන්න ඕන.. ඊටපස්සෙ ඔයාගෙ ටේලර් අක්කවත් බලමු.. හා ද.."

" යමු.."

" Romeo, take me somewhere we can be alone

I'll be waiting, all there's left to do is run

You'll be the prince and I'll be the princess

It's a love story, baby, just say, "Yes"~"

@Shan

රධ්‍ය අයියා මගේ කර වටේ අතක් දාලා මාව ළඟට ඇදලා අරන් කම්මුලෙන් හාද්දක් තිව්වා..

"Marry me, Juliet

You'll never have to be alone

I love you and that's all I really know

I talked to your dad, go pick out a white dress

It's a love story, baby, just say, "Yes"~"

මම දහලලා දහලලා ඒ බූවලු ග්‍රහනයෙන් මිදුණා..

" ඒ අහන්නකො.. ස්කූල් ඇනිවසරි එක එනවනෙ.. ප්‍රිෆෙක්ට් කවුන්සිල් එකෙන් ඩ්‍රාමා එකක් කරන්න ඉන්නෙ.. ප්‍රසිඩන්ට් එනවත් එක්කනෙ.."

" වාව්..!! මොකක්ද කරන්නෙ.. ඩ්‍රාමා එක.."

" ඒක රහසක් අනේ.. ඔයා එදාට බලාගන්නකො.."

" හොදයි එහෙනම් මම උගන්නන්න එන එක.."

" ඔව්.. මරු කාලෙ සෙට් වුණේ.. සෙනුකයා තමා මියුසික් වැඩ බලන්නෙ.. මමයි චමිරුයි ජොනායි අකිලයි අපි කට්ටියක් ඉන්නෙ රහපාන්න.. අනිත් උන් සිංදු කියනවා.."

" එහෙමද.. ආ පොඩ්ඩක් ඉදහන්.. එතකොට ගමෙ ගීය වෙලේ අම්මට කියලා.. ඒව් වරද්.. මොකක්ද කරන්න හදන්නෙ.."

රධ්‍ය අයියා මං දිහා බයවෙලා වගේ බැලුවා..

" ඒකට තමා හලො රෙද්දයි හැට්ටෙයි මහගත්තෙ.. තවසෙ ඒකත් දැක්කද.."

" මම දැක්කා මෙශමන්ට්ස් ගන්නවා.. ඒත් කවද හිතුවෙ.. අනේ උඹලට ලැජ්ජ හිතෙන්නැද්ද බං.."

@Shan

" මොන ලැජ්ජද ඒයි.. මටනම් එහෙම එච්චා නෑ.. දෙනෝදාහක් මැද්දෙ වුණත් නටනවා.. ඔච්චා තියාගෙන පුලුවන්ද.."

" මට තේරෙනවා.."

මම ඇඟිල්ලක් කටේ ගහගෙන රධ්‍ය අයියා දිහා හොරෙන් බලලා ඇහැක් ගැහුවා.. එහෙම එකක් ඩ්‍රාමා එකේ තියෙනවනෙ..

" අනේ මේ.. නිකන් ඉඳපන්.. මේ මොකද.."

" ප්‍රිෆෙක්ට් කවුන්සිල් එක ඇවිල්ලා වෙනම ලෙවෙල් එකක් හලෝ.."

මම රධ්‍ය අයියගෙ අතක් බදාගත්තා.. මගෙ හැපිකච්චා අඩන්නයි යන්නෙ එදාට..

" ඒකනම් එහෙම තමා.. එක අතකින් ඔයාලගෙ බැජ් එක හෙන ෆෝවර්ඩ් නෙ වරද්.. අපේ ඩ්‍රාමා එක හදාගත්තෙ දවසක් තියා.. හෙන අමාරුවෙන් සයෝන්ට සාරියක් පටලලා.."

" හොඳ හෙඩෙක් ඉන්න නිසා තමා ඉතින්.. කොහෙද අයුක අයියට මගුල් විසේ ගැහුවනෙ ඒයි.. ටොප් බෝඩ් එකේ තුන්දෙනෙක්ම මගුල් විසේ ගහලා.. කොහේ හරියට වැඩක් කරගන්නද.."

" උඹැලට වගේ කුලප්පුවක් නැතුව අපිට ඒක විතරක් තිබ්බ එක හොඳයි.."

" හරි ඒ වුණාට අපි හොඳ නැද්ද.. අවංකව කියන්නකො.."

මම රධ්‍ය අයියගෙ ශර්ට් එක අස්සෙන් අතක් දාගන්න ගියාම රධ්‍ය අයියා අත ඇදලා අරගෙන තද කල්ලා අල්ලගත්තා.. මම ඒකනිසා අනිත් අත ඔබාගත්තා.. දැන් ඩ්‍රයිව් කරහන් තනි අතින්..

" හොඳයි.. හොඳ ටැලන්ටඩ් සෙට් එකක් ඉන්නවා.."

" ඒකනෙ.."

" දැන් එතකොට ඔයා ඉල්ලලද ගත්තෙ ඔක රහපාන්න.."

@Shan

" නෑ ඩ්‍රාමා මැඩම් ඇහුවා අනේ පුතා බැරිද ටීක්ට අඳින්න කියලා.. මම හා කිව්වා.. ටීක් එක පස්සෙ කියන්නම්.."

" එහෙම පොඩ්ඩක්වත් ලැජ්ජ හිතුණෙ නෑ..??"

" නෑ අනේ.. ඔයිට වඩා අපි සාගා එකේ ප්'ෆෝම් කළේ.."

" දැන් අටදාස් පන්සීයක් ඉස්සරහනෙ ඔය රඟපාන්න යන්නෙ.."

" යැස්.."

" ම්ම්.. හොඳයි හොඳයි.. වරද්!!! ගුටි කන්න යන්නෙ දැන්.."

රධ්‍ය අයියා ශර්ට් එක අස්සෙ තිබ්බ අතින් අතත් එළිඅයට අරගෙන මාව සීට් එක පැත්තට තද කලාම මම අත් දෙක පාඩුවෙ තියාගෙන යන්න හිතාගත්තා..

" ඒක මොකක්ද අනේ.. කෝ අර ගිය ඇනිවසරි එකේ වීඩියෝ එක.. පොඩ්ඩක් ඉන්නකො.."

මම ෆෝන් එක ඇදලා අරගෙන ප්‍රිෆෙක්ට්ස් කවුන්සිල් එකේ ගෲප් එකේ ගිය අවුරුද්දෙ ඩ්‍රාමා එක හොයලා හොයලා ඒක ප්ලේ කලා.. ඒක මාර ආතල් ඩ්‍රාමා එක.. ඉස්කෝලෙ හෙන ගැම්මෙන් ඉන්න උන් සේරම කොට කලිසම් ගහගෙන පොඩි උන්ට ඇඳලා සිංදුවක් කියනවා..

" එපා වරද්!!!!"

" ඉන්න අනේ.."

" හරිම හොඳයි හැම බබාම අද ඇවිල්ල වෙලසනින්

අපි පන්තිය පටන් ගනිමු

ආයුබොවන් ගුඩ් මෝනින්

ආයුබොවන් ගුඩ් මෝනින්.."

@Shan

සයෝන් අයියා සාරියකුත් පටලන් ගහගන්න වගේ ඇවිල්ලා පොත් මිටිය මේසෙ උඩින් තියලා ළඟ ඉඳපු ඉශාන් අයියගෙ ඔලුව අතගාලා පන්තිය වටේ වටයක් යනවා..

" අද පාඩම පටන්ගන්න කලින් සැවොම මේ අහන්න

ලොකු වුණාම වෙන්න කැමති

කවුද කියල මට කියන්න

අත උස්සල මට කියන්න.."

එතකොට එතන ඉන්න විස්සක් විතර අත් උස්ස උස්ස ඉදිරිපත් වෙනවා වගේ රඟපානවා.. ඊටපිටිපස්සෙන් කවුන්සිල් එකේම අයියලා වගයක් ඇත්ත සිංදුව කියනවා.. ඉන්ස්ටන්ට්ස් ප්ලේ කරනවා.. ඒ එක්කම අයුක අයියා නැගිටලා සයෝන් අයියා ගාවට එනවා..

" මානව හිමිකම් ගැන උද්ඝෝෂණ කරවන

NGO එකක් දමා ගන්නෙමි එහි මුල් තැන.."

ටිකකින් අභිරු අයියා මලකුත් උස්සන් ඒ පැත්තට එනවා..

" ගයන නටන ඉස්ටාර්ල දැක මගෙ බඩ දනවා

Season 10 එකේදි හරි මම තරුවක් වෙනවා.."

ඊටපස්සෙ උන් දෙන්නම තල්ලු කරන් තව අයියා කෙනෙක් ඉස්සරහට එනවා සුක්කානමකුත් අතේ තියාගෙන..

" තම තමාගෙ ගැන විතරක් දරුවනි හොඳ නෑ හිතන්න

ආස කෙනෙක් නැද්ද මෙතන රටට සේවයක් කරන්න.."

ඊටපස්සෙ මලිශ අයියා නැගිටලා බඩ අතගගා ඇවිත් සයෝන් අයියා වටේ කැරකෙන්න ගන්නවා.. සයෝන් අයියා සාරිපොටත් අතේ ඔතාගෙන අපේ ඉංග්‍රීසි මැඩම් වගේ සුකුමාල බැල්ම හෙලන් ඉන්නේ..

@Shan

" මම ඉපදුණු මගේ රටට නිහඬ සේවයක් කරන්න

මම ආසයි ජනාධිපති උපදේශක කෙනෙක් වෙන්න.."

ඊටපස්සෙ මියුසික් එකක් ප්ලේ වුණාම මගේ පොලොස් කොටටෝරුවා හෙට් සෙට් එකක් කරේ දාගෙන කොණ්ඩෙ හද හද ඇවිත් අමුතු ඇක්ට් එකක් දානවා..

" මාධ්‍යවේදියෙක් වෙනව මම නම් ලොකු වීලා

රටට සේවෙ කරනව ඉල්ලන සින්දුව දීලා

කැමතිම සින්දුව දීලා.."

බලන්නෙපෑ මුගෙ මනමාල හිනාව.. සයෝන් අයියටත් ලැජ්ජ හිතුණද කොහෙද අන්තිමට දුන්න ෆ්ලයින් කිස් එකට..

" මෙගා නාට්ටියක් කරමි කොටස් දෙතුන්දහක

එහෙන් මෙහෙන් රඟපානව මමත් එහෙක දෙහෙක

අනෙ අපිත් එහෙක දෙහෙක.."

ඊටපස්සෙ තමා සියලු චරිත අභිබවා සුදුඅපච්චියා සීන් එකට එන්ටර් වෙන්නෙ සන්ග්ලාස් දෙකකුයි ස්කාෆ් එකකුයි දාගෙන.. ඇවිත් කැරකිලා රධ්‍ය අයියට මලකුත් දික් කල්ලා හෙන ඇඩ් එකක් දානවා එතන..

" ඕක දීපිය මෙහෙට.."

රධ්‍ය අයියා ලැජ්ජාව දරාගන්න බැරිම වුණු තැන මගේ ෆෝන් එක ඇදලා ගත්තා.. ඔය කාලෙ රධ්‍ය අයියා අවුරුදු කුමාරයා වෙලා හෙන ෆේමස් කැරැක්ටරේ වෙලා හිටියෙ ඉස්කෝලෙ.. කොහොම වුණත් අපිනම් හොඳට එන්ජෝයි කළා. සුදු පවුල හැබැයි කොටකලිසම් ගහලා හිටපු විදියට පොඩි මොංගල් ලුක් එකකුත් ගහලා තිබ්බෙ.. ඒක හොඳයි මම මේ ගෑණියෙක්ට ඇඳන් නටන්න යන්නෙ..

අපේ ඉස්කෝලෙ පොඩි කාලෙ ඉඳලමකියන්නෙ බාහිර කුසලහා ජීවිතේට වැදගත් කියලා.. ඒ වගේම ඉන්න ගුරුවරු වුණත් අපිට ඒවට සැහෙන්න

@Shan

උදව් කරනවා පොඩි වයසෙදි.. ඉතින් මටනම් ස්ටේජ් වල සිංදු කියලා නටලා හොඳට පුරුදුයි.. ඉස්කෝලෙ යන කාලෙ මම නොකළ මගුලක් නෑ බලන් යද්දි.. හවුස් කැපා වෙලා හිටියා.. ස්ටුවර්ඩ් කෙනෙක් වෙලා හිටියා.. ක්ලබ් ප්‍රසිඩන්ට් වෙලා හිටියා.. හෙඩා වුණා.. සාගා ප'ෆෝම් කලා.. ගේම්ස් වලින් ඕල් අයිලන්ඩ් ප්ලේ කලා.. කොහොම හරි ඉස්කෝලෙ කාලෙ ලව් එකකුත් තිබ්බනෙ.. මෙච්චා කවදහරි මගෙ ළමයින්ට කියන්න පම්පෝරි විදියට තියාගන්න ඕන.. හැබැයි ඉතින් එච්චා එහෙම වුණාට ඇකඩමික් නම් හරකට වගේ පස්සෙන් මොකෙක් හරි ඉඳන් කරවන්න ඕන.. මම ආස නැනෙ එච්චර පාඩම් කරන්න.. ඒ ලෙවෙල් වලට බැහැලම වැඩ කලෙත් මාස පහයි.. ඒ පහේ කාගෙන කලා ඉතින්.. අනෙ මට ඔයිට වඩා කරන්නත් බෑ කොහොමත්..

" මේ ඔයාට මම නෝට් ටික හදලා දෙන්නද ඕන්නම්.."

" කොයි.."

" ඇයි දැන් ඉස්කොලෙ මහත්තය වෙල එනවනෙ ඉස්කෝලෙ.."

" ආ.. ඔයාට පුළුවන්ද.."

" කල්ලා දෙන්නම්.."

" ම්ම්.. අපි කැන්ඩි යන එකේ මම ගිහින් එහේ ෆ්‍රී ඉන්න වෙලේ හදන්නම්.. ඔයාගෙ වැඩ අස්සෙ මේවා පටලගන්න ඕන නෑ.. අනික කැන්ඩි ගියත් ඔයා දවල් වරුවෙ නෑනෙ.."

" හා.. උදව්වක් ඕන්නම් කියන්න.."

" පොඩි උන්ට නෝට් හදලා අකුරු කියවගන්න සෙනරත් පරණවිතාන ගෙන්නන්න වෙයි.."

" අනේ මේ.. පාඩුවෙ ඉන්නවා.."

රධ්‍යා අයියා මගේ ඉසකුඩිච්චි මූණ එයාගෙ පැත්තට හරවගෙන කම්මුල් දෙක වප්ප වෙන්න අල්ලගත්තා..

" කොට තාරාවට අපේ අම්මා කතාකරන්න ඕන කිව්වා.."

@Shan

මම රඩ්‍ය අයියගෙ අත ගලවගෙන මෙහාට වුණා.. බලහත්කාරකම් කරන්න එනවනෙ..

" මට.. ඇයි දන්නෑ නේද.."

" දන්නෑ.. ගිහින් කතාකල්ලා බලන්න.. මට බඩගින්නක් එනවනෙ වරද්.."

රඩ්‍ය අයියා හිමින් සැරේ එක අතකින් මගේ පපුවෙ පැත්තක් හයියෙන් ඇල්ලුවහම මම අත ගසලා දැම්මා..

" මාව කාපන්!!"

නරක සමනලයා දළඹු හමුදාව කරා ආවා..

ප්‍රස්න එමනවා තමා බම් ඉතින්.. ආවා කියලා මැරෙන්නයෑ..

(මීට බේසික මින්සිකා සිවිලිමේ සිට)

වරදයා රහන්න යන්නෙ මොකාටද..

ලෙන්චිනා සොකරි දික්තලා 😂

රඩ්‍ය පුතාගෙ හිත්තකයා ලැජ්ජ කරන්න මෙ කොල්ලා හදන්නෙ.. ඔන්න.. ඈ..

මට අද පොඩි වැඩක් හම්බුණානෙ.. මට හරියට සතුටු හිතිලා ඉන්නෙ.. (ඕතරයා බරයි හැබැයි)



මට හරි ආදරේ හිතුණා අනේ.. මම ඔයාලට හුගක් ආදරේ.. සනී අක්කා තැන්කු සෝ මච් අනේ..~ ❤

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

@Shan

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 128 කොටස

මෙ සැරේ අලුත් අවුරුද්ද මහා ලොකුවට කැමබීම හදලා සැමරුවෙ නැතත් ඒකට මම කැමති.. මොකද ආඩ්‍ය අයියත් අපේ ගෙදර ඇවිල්ලා හිටියෙ රඩ්‍ය අයියා එක්ක.. අප්පච්චි කැම්ප් එකේ අවුරුදු උත්සවේක වැඩ වගේකට නතරවුණ නිසා රඩ්‍ය අයියලට අපේ ගෙදර ආවා කියලා බනින්න කවුරුත් හිටියෙ නෑ.. මාර මනුස්සයෙක් තමා.. අවුරුද්දටවත් ගෙදර ඉන්නෙ නෑ.. එයාගෙ වගකීම් සේරම පැහැරහැරලා රඩ්‍ය අයියලගෙන් වගකීම් බලාපොරොත්තු වෙනවා.. මමනම් මෙහෙම චරිත තියන මිනිස්සු දැක්කමයි.. ඒත් අපේ මාමා කියන්නෙ එහෙම අය ඕනතරම් සමාජෙ ඉන්නවලු.. අපි දැක්කෙ නැතිවුණාට..

කොහොම හරි අවුරුද්ද දවසෙ රෑ ආඩ්‍ය අයියා මාමට හොරාට අඩියක් ගහලා හෙන පිස්සුවක් තමා කෙළියේ.. හොඳවැඩේ එක එක මගුල් ටෙස්ට් කරන්න යනවට.. මාමා ගෙණල්ලා පැන්ට්‍රි එකේ දාලා තිබ්බ විස්කි බෝතලේ උස්සලා ඒකට මොකුත් දාගන්නෙත් නැතුව බීලා කවදාවත් නැතුව එකපාර සිංදු කියන්න ගත්තම තමා මගෙත් අවධානෙ ඒ පැත්තට යොමු වුණේ.. නැත්නම් මමයි, රඩ්‍ය අයියයි, අපේ මාමයි රෑ වෙලා

**Klaus**

බල බල හිටියේ.. අපි කාටූන් බලනවනම් මාමත් බලන්න ඕන.. පොඩි කාලෙ මායි මාමයි කුඹිච්චි බලනවා හැන්දෑවට.. ඊටපස්සෙ හැමතිස්සෙම මට 'කුඹිච්චී කළු කුඹිච්චී' ගානවා.. මට ලාවට මතකයි ඩයල් එක ලෝකෙම තියන ඉසකුඩිච්චි නම් මට කියනවා.. පැපොල හැදිලා ඉදලා ලප වානරයා කියලත් අපහාස කල්ලා මම ළඟින් යද්දි 'හූබා හූබා' ගානවා..

හරි ඉතින් කොහොම හරි ආඩ්‍ය අයියගෙ අත් හඳාබැලීමට පින්සිද්ද වෙන්න සාලෙ ලයිට් ඕෆ් කරන් ටීවී බල බල හිටපු අපි තුන්දෙනා උඩ ගියේ ආඩ්‍ය අයියා වැනි වැනි ඇවිත් අපේ මාමා කියලා හිතාගෙන 'බොහ්' ගාලා රඩ්‍ය අයියගෙ උකුළ උඩට පතබෑවුණු වෙලේ.. රඩ්‍ය අයියත් ඒකටනම් සිරාම බයවුණා.. ආඩ්‍ය අයියා රඩ්‍ය අයියගෙ බෙල්ල වටේ අත් දෙකත් ඔතාගෙන මහා හයියෙන් අඩන්න ගත්තම මම දුවලා ගිහින් ලයිට් එක දැම්මා.. බලද්දි ඒකා නාගසලං වෙන්න ගහලා.. ළඟ විස්කි සුවඳින් තේරෙනවා.. මස්සිනා පොප්කෝන් හදන්න යනවා කියලා අපිව මුළා කල්ලා..

@Shan

" අනුරාග්.. මට කැරකෙනවා වගේනෙ.."

" අ-අයි-යෙ.. මේ මාමෙ.."

" අයියා කව්ද අනු.. මම ඔයාගෙ.. සාකි.."

රධ්‍ය අයියා ආධ්‍ය අයියව ශේප් එකේ සෝෆා එකෙන් තියලා මගේ අස්සට රිංගගත්තා.. අපේ මාමා ආධ්‍ය අයියා ගාවට ගිහින් ඔලුවට තට්ටුවක් දැම්මා.. ආධ්‍ය අයියා ඇස් දෙකත් හීනි වෙල්ල පියාගෙන අපේ මාමා දිහා බලලා මූණ පිරෙන්න හිනාවක් දුන්නා.. සුරදූතයා මත් රකුසා වෙලා..

" දොස්තර මහත්තයා වෙරි වෙලාද.."

රධ්‍ය අයියා මගේ කන ගාවට පහත් වුණා..

" ඒව් වරද්.. අපේ අයියා.."

" අයියට පාඩුවෙ ඉන්න කියන්න හරිත.. යකෝ මහසෝනා වගේ ඇවිත් ඉදගත්තම මට පපුවෙ අමාරුවටත් ආවා.. මම හිතුවෙ ක්වාටස් එකේ කොළුකාර හොල්මන කියලා ඒයි.."

" මෙහෙ එහෙම උනුත් ඉන්නවද.."

" ඉන්නවා කියලා මම හිතාගෙන ඉන්නවා ඒයි.."

ආධ්‍ය අයියා සෝෆා එක උඩ තිබ්බ රිමෝට් එක අරගෙන එකපාර මාමවත් තල්ලු කරගෙන නැගිට්ටා.. ආධ්‍ය අයියගෙ හිනාව තමා බලන්න වටින්නෙ.. රධ්‍ය අයියා ඉක්මනට ෆෝන් එක අරගෙන වීඩියෝ ඔන් කලා..

සහෝදරයො කියන්නෙ සහෝදරයොන්ට..

" ඇයීඊ්ඊ්ඊ්ඊ් කලේඒ්ඒ්ඒ්.....

මුළු හදින්ම ඔබ මට ආදරේඒ්ඒ්ඒ්ඒ්ඒ්ඒ්.....

නැතිදෝඔඔඔ ඔබ මාආආආ ගැන දන්නේඒ්ඒ්ඒ්ඒ්.....

මං නැඇඇඇඇ කලේඒ්ඒ්ඒ්.....

@Shan

කිසි දිනකදි ඔබහට ආදරේෂ්ෂ්ෂ්.....

නැතිදෝඔඔඔඕ ඔබ හට එක වැටහුණෝෂ්ෂ්.... කැහ්-කැහ්-කැහ්.."

" සාකි.."

" රුවටුනු තරම්ම්ම්ම්ම.....

ඔබ හින්දා ම෴.....

" කමෝන් අයියෙ.."

" කඳුලක තරමමමමමමමමම.....

දැනුණා ඔබෙන්න්න්න්න්....."

මමයි මාමයි එකපාර හැරිලා මහ කුප්ප හිනාවක් දාගෙන ආධ්‍ය අයියව වීඩියෝ රධ්‍ය අයියා දිහා බැලුවහම රධ්‍ය අයියා බැලුවා.. මූ යකෝ.. අයියා මෙහේ බීලා සරිගමයි පදනිසයි කනවා.. මෙකා මෙහේ දිව හපාගෙන ගෙනාතල් එකේ කැමෝන් ඇයියෙ ගගා අමුතු චූන් එකක් ගන්නවා..

" උඹලා එක්ක ඉඳලා මගේ ඔලුවත් කකියනවා.. බොලා දෙන්නා කාමරේට පල.."

" චජ්.. පොඩ්ඩක් ඉන්නකො මාමෙ.. ආධ්‍ය අයියා ඉතින් හැමදාම වැනෙන්නැනෙ.."

මම ගිහින් ආධ්‍ය අයියා ගාවින් ඉඳගත්තහම ආධ්‍ය අයියා මගේ උරහිසට කඩන් වැටුණා..

" ආර්හ් චූටි.. කැරකෙනවා වගේ.."

" අයියව කැරකෙනෝ වගේද.."

" ම්ම්.."

" මේ අයියෙ අයියා මාමට ආදරේ නේ.."

@Shan

" සුදුමහත්තයා!!!!!!!!!"

අපේ මාමා රධ්‍ය අයියගෙ ෆෝන් එක උදුරලා අරගෙන මගේ ඔලුවට පාරක් දුන්නා.. මේ ලබ්බ හරියන්නෑ.. මුන් සේරටම ඇඬෙන්න මම මම් ගන්නවා හිස ආවරණයක්.. අත වැදුණහම කරන්ට් එක වැදෙන්න වගේ.. එහෙම එව්වා තියද දන්නෑ.. තිබ්බොත් සනෙරු ඒක ගන්නවා..

" ආව් අනේ.. කියන්නකො.. අයියා ආදරේ නේ.."

" ඔය මිනිහට ආදරේ කර්මමමමමමමමමමහ්හ්!! මම!!"

" පල කාමරේට.."

මාමා අපිට රැව්වා..

" එන්න වරද් යන්න.. මලවිකාර.."

රධ්‍ය අයියා ගෑණුළමිස්සි වගේ මං ගාවට ඇවිත් මගේ අතින් ඇදන් කාමරේට ගියා..

ඔහොම තමා අලුත් අවුරුද්ද නිමා වුණේ.. අන්තිමට අපිදෙන්නා ටැබ් එකේ කාටුන් එක දාගෙන ඒක බලලා ඉවරකළා.. අපරාදෙනෙ.. මුළු රෑම ආධ්‍ය අයියා අපේ මාමට දෙන්න ඕන වද අසූහතරදාස් පන්සිය හැටම දුන්නා..

"අනූ ඔලුව රිදෙනවා.."

" අනූ වමනෙට එන්න වගේනෙ.."

" අනූ එන්නකෝ.."

" අනූ අනේ.."

මුළු රෑම අනූ අනූ අනූ තමා.. ආයෙ ආධ්‍ය අයියා උදේ නැගිටලා හොර පූසා වගේ කාමරේ අස්සටම වෙලා හිටියා.. හරියට නිකම් අපේ මාමා බීලා අයියට ලැජ්ජ කලා වගේ.. ඒත් අපේ මාමා බිව්වහම ඔහොම කියවන්නෑ.. කතාකරන්නෙත් නෑ.. වෙනදට වඩා බොහොම ආදරෙයි.. හිටි ගමන් අපේ අම්මට වළං එහෙමත් හෝදලා දීලා.. ආච්චිඅම්මා ගාව නිදාගන්නවා.. මාමගෙ චරිතෙ ඇතුළෙ හැංගිලා ඉන්න හෙන අහිංසක ආදරණීය චරිතෙ

@Shan

එළියට එන්නෙ බිව්වට පස්සෙ තමා.. නැත්නම් ඉන්නෙ 'කෙළියොත් කෙළිනවා පකයට අම්මා මුත්තා මතක්වෙන්න' කියාගෙන.. හෙන මැරයා වගේ.. ඒකනෙ ආච්චි හැමතිස්සෙම කියන්නෙ.. අනික අර දකුණු රටේ මැර ගැම්මයි අලි පත කුණුහර්ප ලොට් එකයි අපේ මාමට හොඳට පිහිටලා තියනවා.. කැම්පස් කාලෙත් එහෙමයි.. නුවර කියලා නෑ එහෙත් කරපු තරමක් කළේ නොසන්ඩාල වැඩමයි.. එහෙම වෙලා කෙල්ලෙක් දාගෙන මාමා නහුතෙටම කෙළවගත්තා..

අපේ අම්මා කියන්නෙ නම්, ඕනම කෙල්ලෙක් ආසයිලු මාමා වගේ හෙනට දහලලා කල්ලා ඉන්න කොල්ලොන්ට.. අපේ මාමට මුලින්ම තිබ්බෙ ක්‍රශ් එක ටියුශන් සර්ගෙ දුවට.. දුව ඉතින් මෙ වගේ එකෙක්ට කැමති වෙන්නෑනෙ කීයටවත්.. අනික ඒ කාලෙ එහෙමට අපේ ගෙදර සල්ලි ඇති ගෙදරකුත් නෙමෙලු.. ආච්චිඅම්මට උගන්නලා හම්බෙන පඩියෙන් තමා ළමයි තුන්දෙනා ජීවත් කල්ලා තියෙන්නෙ.. ඒ ඇරෙන්න කුඹුරු අනම් මනම් මාමලත් ලොකු වුණාම ලැබිච්ච ඒවා.. මොකද ලොකුඅම්මා මෙඩිකල් කොලේජ් ගියානෙ.. ගිහින් හම්බකල්ලා ගේ හොඳට හැදෙව්වා.. අපේ අම්මනම් මෙලෝ වැඩක් කල්ලා නෑ.. ආච්චි කියන්නෙ ලස්සන විතරයි මේකිගෙ කියලා.. මාමත් රස්තියාදුකාරයනෙ.. ඔය ලොකුඅම්මා මට හෙන මස්තබාල්දු චරිතෙ වුණාට යකඩ ගෑණියෙක්.. කාගෙන ඕන කට්ටක් දරාගෙන ඉන්න පුළුවන්.. එහෙම ආදරේ කියලා එකක් එයාගෙ ළමයින්ට මිනිහටවත් පෙන්නන්නෙ නෑ.. කට්ට කාලා හොඳට තැම්බිච්ච ගෑණු ඉන්නෙ හෙන ගැහුවත් දරාගන්න.. අන්න එහෙම එක්කෙනෙක් තමා ලොකු අම්මා.. එයා තනිකරම එයාගෙ මහන්සියෙන් තමා නැගිට්ටෙ.. අද ඔහොම තැනක ඉන්නෙ.. එයා විතරක් නෙමෙ.. එයාගෙ හස්බන්ඩ් ඉන්නෙත් ඒ හයියෙන්ම තමා.. ආයෙ ඉතින් මිනිස්සු පරාදයි..

අපේ අම්මා ගෙදර මල.. ඕන කෙනෙක්ට රැවටෙනවා.. අඬනවා.. බොළඳකමේ ප්‍රතිමූර්තිය.. අම්මගෙ ජීවිතේ ගෝල්ස් ඒ කාලෙ මොනවද ඇහුවම කියන්නෙ හැඩට ඉන්න එකලු.. ආච්චි වෙලාවකට මීහරක් බාන කියලා අම්මටයි මාමටයි බනින්නෙ.. පස්සෙ අපේ අම්මත් අර කියන යකඩ ගෑණියෙක් වුණා.. මම හම්බුණාම.. උසාවියකට ජීවිතේට පයක් ගහපු නැති එක්කෙනා හැම මාසෙම උසාවි ගැටුවා.. මාවත් වඩාගෙන.. ලෝයර්ස්ලා පස්සෙ ගියා.. දැන්නම් අපේ අම්මව එහෙම ලේසියෙන් තමබන්න බෑ.. එයා මිනිස්සු හැරෙද්දි දන්නවා.. ඒ වුණාට බොරු සෝබනේ පෙන්නලා යාළුකමින් ඉන්නවා.. මාමත් හමුදාවට ගියාට පස්සෙ අර සෙල්ලක්කාර චරිතෙ එයාගෙ ඇතුළේ හංගගත්තා.. සයිකල් කට්ටෙන් ගමේම කරක් ගහපු

@Shan

එකා ගමේ ආවම එළියටවත් බහින්නෙ නැති වුණා.. අනික මාමට ඒ ගමන් ගමන්ම තාත්තගෙ රෝල් එකත් කරන්න වුණා.. මගේ තාත්තා අපි දාලා ගියාට පස්සෙ..

ජීවිතේ සමහර සිදුවීම් වෙනවා.. ඒවට මූණ දුන්නයින් පස්සෙ හුඟක් දේවල් වෙනස් වෙනවා.. මිනිස්සු අමු අමුවෙ හිත් මරාගෙන ඒවා මුල්ලක වලලානවා.. අමුතු රූප ඇඟට ආරූඩ කරගෙන ආයෙම උපදිනවා..

හැබැයි ඒක මේ අවුරුදු විස්සෙ මට තේරෙන එකක් නෙමේ.. අනික, අමු අමුවෙ හිත් මැරුවට, වලලැම්මට.. මළවුනුත් වලෙන් නැගිටින වෙලාවල් එනවා.. හරියට අපේ මාමා බිව්වහම වගේ.. අර පොඩි කාලෙ ආච්චිගෙ අස්සෙ නිදාගන්න ඕන වගේ..

ඉතින් මම කිව්වෙ ඕන කෙල්ලෙක් ආසයිනෙ හෙන විසේ තියන කොල්ලොන්ට.. ඉතින් ඔය අපේ මාමගෙ කැම්පස් කෙල්ලත් ඒ වගේ.. ඒ කෙල්ලට තිබ්බෙ මාමට ආකර්ශනයක් විතරයි.. එහෙම බැඳලා පවුලක් හදාගන්න ඕන වගේ අදහසක් තිබ්බෙ නෑ.. ශෝ ඕෆ් වෙන්න 'මෙයා මගේ බෝයිෆ්‍රෙන්ඩ්' කියලා.. එහෙම එකක් තමා තිබ්බෙ.. අපේ අම්මලා ඒ කාලෙම කිව්වා ඕක හරියන්නෙ නෑ කියලා.. කොහෙද අපේ මාමා මුරණ්ඩුකමට රවටුණානෙ ඒ තේඋඩිච්චිට.. දැන් ළමයි තුන්දෙනෙක් එක්ක නුවර ඉන්නවලු.. හස්බන් මාකටින් මැනේජර් කෙනෙක්..

ඔහොම ඉඳලා තමා අපේ මාමට ආධ්‍යා අයියව හම්බුණේ.. ආධ්‍යා අයියනම් එච්චර දඟලන අයට කැමති නෑ.. ඒ වුණාට හොයාගෙන තියෙන්නෙ කඩිකුලප්පුව තියන එකෙක්නෙ.. මාමට පොඩ්ඩ ඇත්තම් මල පනිනවා.. කෑගහනවා.. ආධ්‍යා අයියා ඒක සතපහකට ගනන් ගන්නෙ නෑ.. ඔන්න දැන් අපේ මාමා මාමගෙ සීනියර් මොකෙක් හරි එක්ක මළපැනලා ඉන්න වෙලේක පැන හෙව්වම පැන නෑ..

" මොන හු#තක්ද.. මේ මෙසෙ උඩ පෑන් ගෙනියන එකා මොකාද.. තියන තැනකින් ගෙනත් තියපන්.. සුදුමහත්තයා!!!!!"

කියලා බෙරිහන් දෙනවා.. ටිකකින් ආධ්‍යා අයියා සන්සුන් ගමනින් එනවා..

" ආ පෑන.."

@Shan

පැන දුන්නා.. ගියා.. එහෙම සතේකට ගණන් ගන්නැති එක තමා එවෙලෙට කරන්න ඕන.. අයේ අනූ හුයේ අනූ ගාගෙන ගියොත් මාමට තව මල පයිනවා.. ආධ්‍ය අයියා ඕවා කොහොම හොයාගත්තද දන්නෑ.. ඕවා අපේ ගෙදර රහස්..

අනික ඉතින් විහිලුවක් කල්ලා ඉන්න වෙලාවට එහෙම ඉන්නවා.. ආතල් ඩයල් එක.. ඕන කුපාඩි වැඩකට සපෝට් කරනවා.. අනේ ඉතින් ඒකට අහුවෙන්නෙත් අර අසරණ ආධ්‍ය අයියා තමා.. අයියා ඉතින් මාමව සතේකට ගණන් ගන්නැති නිසා හොඳයි.. වෙන එකෙක්ටනම් හාටැටැක් දෙකතුනක්වත් මේ වෙද්දි ඇවිල්ලා..

" බලන්නකො අද ට්‍රැෆික් එකක් සෙට් වෙලානෙ වරද්.."

මම කොට්ටෙ අස්සෙන් මූණ අහකට අරගෙන වටේ පිටේ බැලුවා.. ට්‍රැෆික් තමා.. අද කැම්පස් එක ජනතාවට විවෘත කල්ලවත්ද.. නෑනෙ.. ආයෙ කරන එකක් නෑ සමහරවිට..

" ඇයි දන්නෑ.."

" මොකක් හරි ඇක්සිඩන්ට් එකක් වෙලා.. ඇති බං ඔය නිදාගත්තා.."

රධ්‍ය අයියා මගේ උකුළ උඩ තිබ්බ කොට්ටෙ අරන් පිටිපස්සට දැම්මා.. අනේ මගේ බවුන්ස් වෙන කොට්ටෙ.. එයත් මාත් එක්ක කැන්ඩි යන්න එනවා..

එහෙම නෙමේ මම ඒක ගෙනාවෙ වාහනෙ එයද්දි නිදාගන්න.. ඊයෙ රෑ රධ්‍ය අයියත් එක්ක ෆෝන් එකෙන් පච හල හල ඉඳලා නිදාගන්න වුනෙත් නෑ..

මමයි රධ්‍ය අයියයි හිටියේ නුවර යන ගමන්.. අවුරුද්දෙන් පස්සෙ මට කැන්ඩි මැච් එක නිසා මැච් එකට දවස් තුනකට කලින් අපිට එහෙ යන්න වුණා.. මෙහේ ක්ලබ් දෙකකුයි එක්ක මෙහේ විසිට් එකකට ආපු ජර්මන් ක්ලබ් එකක සෙට් එකකුයි ප්ලේ කරන්න හිටියෙ.. කෝච් මුලින් කැමතිවුණේ නෑ ඕකට යන්න.. මොකද ඒක මෙහේ තියන හෙන ලොකු ක්ලබ් හතරක් එකට එකතුවෙලා කරන ඉවෙන්ට් එකක් නිසා.. ඒකයි මෙච්චර කොස්ට් එකකින් ඉවෙන්ට් එක කරන්නෙ.. මමත් තාම ප්ලේ කරන්න අරගෙන මහලොකු කාලයක් නෑනෙ.. කෝච් කියන්නෙ එකසැරේ

@Shan

ප්‍රසිද්ධ වෙන එක නෙමෙයි වෙන්න ඕන ටිකක් මෙ ෆීල්ඩ් එකේ සෙල්ලම් කල්ලා හැමදේම ගැන දැනගෙන ඕනලු වැඩේට බහින්න.. ඒ කියන්නෙ මම තාම හරියටම මගේ ස්පෝර්ට්ස් ජීවිතේ පටන් අරගෙන නෑ.. ප්‍රැක්ටිස් කරනවා.. කොහොම වුනත් මම ඒකට හුඟක් කැමතියි..

" මෙ මම ඔයාට බඩ්ඩක් පෙන්නන්නද.."

මම ශර්ට් එක උස්සලා බඩ මැද්දෙන් ලාවට වල ගැහිලා තියන ඉර පෙන්නුවා.. බැඩ්මින්ටන් ගහනකොට අලි තඩියො වගේ ඇඟ හදාගනෙන් නැනෙ.. ඒකට වෙනම එක්සසයිසස් ටිකක් තියනවා.. ඒවා කන්ටිනිව් කලාම ඇඟ ගානට හැදෙනවා.. රධ්‍ය අයියා මගේ බඩට ඇඟිල්ලකින් ඇනලා ශර්ට් එක පහළට කලා..

" ලස්සනයි.."

" මම ඇවිල්ලා මලක්නෙ.. අපි ගිහින් හොඳට නිදාගමු ඒයි.. මටනම් හොදටම නිදිමතයි.."

" කොහෙද ඔයාට ඊයෙම අහන්න ඕන වුණානෙ ඔයාට තටු දෙකක් ආවනම් ඒත් ආදරෙයිද කියලා.."

" කුතුහලේ කුතුහලේ.. ඔයා මාව ඒන්ජල්ස් ලාස්ට් මිශන් එකේ කොල්ලා වගේ පියාඹලා ඇවිත් උස්සන් යන්න.. මම බැලේ නටනවා.."

රධ්‍ය අයියා ඔලුව අතගාගත්තා.. ඊයෙ සෙනුකය කිව්ව ඩ්‍රාම එකක් බලන්න ගිහින් මට සැහෙන්න කුතුහලයක් ආවා මටත් පිහාටු දෙකක් ආවනම් ඒත් රධ්‍ය අයියා මට ආදරේද කියලා හොයාගන්න.. පස්සෙ ඉතින් එයා කිව්වනෙ මම මොකෙක් වුනත් ආදරෙයි කියලා..

ඉදලා හිටලා ඔහොම එකක් අහලා රධ්‍ය අයියව අවුස්ස ගත්තම හෙන ආතල්.. නැතුව මට එහෙම සිප්පි ප්‍රශ්න අහන්න ඕන නෑ එයාගෙන්.. ඒ වුණාට රෑ දෙකට කතාකරන්න හේතුවක් හොයාගන්න එපැයි..

" මෙච්චර නටලා.. දැන් බැලේ නටන්නත් ඕනද.."

" ඔව් අනේ.. කවුරු මොනා කිව්වත් අපි නටපු නැටුම් දන්නෙ අපිනෙ.. මෙ නටපු එකක් තමා කවදහරි ඉතුරුවෙන්නෙ.. නැද්ද.."

@Shan

" ම්ම්.. මට ඊයෙ හවස අයුක කතාකලා.."

මම කකුල් දෙක උඩට අරගෙන ශර්ට් එකේ නූලක් ඇදලා ගත්තා.. අපේ එකා අයියණ්ඩිගෙ හිත රිද්දලද..

" මොකද කිව්වෙ.."

" විශේශයක් නෑ.. ඔයාව මතක් කරන්න කිව්වා.."

පුහ්.. එයැයිට අපි මතක් වෙලාලුද..

" අනේ මෙ අපිටනම් මතක්වෙන්නෑ.. බොරු කියන්න ඕන නැනෙ ඒයි.. මටනම් එහෙම විශේශෙන් මතක් කරන්න තරම් වටින්නෑ.."

" මොකද බං ඒකා එක්ක ඔයතරම් තරහා.."

" ඌ කේලම් කියනවා.. අනික.. අනික.. අයුක අයියා අර මහපගයා කරන කියන හැම එකටම මට බනිනවා.. එහෙම ඕන්නැනෙ.. නේද.. දැන් ඔයා මම කරන ඒවට සෙනුකට බනිනවද.."

"....."

" ඒකනෙ.. බනින්නෙ නැනෙ.. ඔයානම් ඔහොම හැදෙන්නෙපා ඒයි.."

" ම්ම්.."

මම රධ්‍ය අයියගෙ අතකට මූණ තියාගත්තා.. ඉස්සරහා බයික් එකේ ඉදපු කෙල්ල හැරිලා අපි දිහා මූණ 'ඒව්' කරගෙන බලාගෙන ඉන්නවා මම දැක්කෙ ඒ වෙලාවෙ.. මම රධ්‍ය අයියගෙ අත ඇදලා අරන් ගානට මැද ඇඟිල්ල විතරක් දිගැරෙන්න හදලා ඒ කෙල්ලට පෙන්නුවහම ඒ කෙල්ල ඉක්මනට ඉස්සරහා බලාගත්තා.. මෙහෙම කෙල්ලොන්ට හම්බෙන්න ඕන ආශි.. එහෙනම් වාහනේ ට්‍රැෆික් එකේම නතරකල්ලා.. බැහැලා ගිහින්.. කොණ්ඩෙන් ඇදලා අරගෙන ඇහ ප්‍රයිඩ් ෆ්ලැග් එකේ පාට මතුවෙන්නම දීලා එයි.. අනික ඒ කට එක්ක කතාකල්ලා දිනන්න පුලුවන්ද.. බැනෙ.. හරිනම් කියාන් අයියට අපි මීටවඩා අනුකම්පා කරන්න ඕන..

" පාඩුවෙ ඉන්න වරද්.."

@Shan

" මමයැ.. අර ඉස්සරහ ඉන්න කැල්ලට එපෑ කියන්න.. මම ඒකි දිහා බලන් හිටියෙ නැනෙ.."

ආයෙම ඒ බිලීකොක්ක හැරිලා අපි දිහා බැලුවා.. සැක් ට්‍රැෆික් එකත් මේ වෙලාවෙම සෙට් වුණානෙ.. මම රධ්‍ය අයියගෙ කොලර් එකෙන් ඇදලා අරගෙන තොල් වලට හාද්දක් දීලා හිමින් සැරේ ඇහැක් ඇරලා අර බිලී කොක්ක දිහා බැලුවහම ඒකි කොල්ලව බදාගෙන ඉස්සරහා හැරිලා ඉන්නවා.. හරිද දන්නෑ ආසාව..

රධ්‍ය අයියා මගේ කම්මුලකින් අල්ලලා ආයෙම මගේ තොල් වලටත් හාද්දක් දීලා කම්මුලටත් එකක් දුන්නා..

" මම ආසයි දවසක ඉන්ටවීව් එකකට යන්න.."

" කාගෙද.."

" එක්කෙනෙක් ඉන්නවා.. ඒත් යන්න පුළුවන් වෙයිද දන්නෑ.."

" ගියොත් මොකද කරන්නෙ.."

" කතාබහ කල්ලා එනවා.. මම හිතාගෙන ඉන්න කෙනා ඇත්තටම හෙන ආතල් පොරක්.."

" එහෙමද.."

" ඔව්.. මම ඔයාගෙ පස්ස ගැන මාධ්‍යට කියනවා.."

රධ්‍ය අයියා ඒ ගමන් මූණ ඉරක් කරගත්තා.. මම ආයෙම රධ්‍ය අයියගෙ අතකට මූණ තියාගෙන ඉස්සරහා බලාගෙන හිටියා.. දැන්නම් ට්‍රැෆික් පොඩ්ඩක් එහෙමෙහෙ වෙනවා වගේ.. ඒක හොඳයි.. ආවා මෙතන බිලී කොක්ක මගෙ හැපිකවච්චා දිහා බලන්න..

රෙද්ද..

අපි හවස තුනට විතර නුවරට ආවා.. නුවරට චුරු චුරු වැස්සක් පටන් අරගෙන තිබ්බ නිසා අපිට හොටෙල් එක හොයාගන්න ටිකක් වෙලා ගියා.. අපි ඉතින් නුවර ලොකුවට එන්නෙ නැනෙ.. ඒ වුණාට හාත්පසින්ම වෙනස් පැත්තක් තමා නුවර.. කාලෙකින් එන නිසා අගේ වැඩියි අපිට

@Shan

කොහොමත්.. අන්තිමට අපි රෝයල් කැන්ඩියන් එකට එද්දි තුනහමාර විතර වුණා..අ පි එද්දිත් කෝච් හොටෙල් එකට ඇවිත් හිටියේ.. තාන්වී අක්කත් ඒ එක්ක ඇවිත් තිබ්බා.. සමහර ටුවර් වලට ෆැමලි එක ජොයින් කරගන්න පුලුවන් වෙලාවල් එනවා අපිට.. ස්පොන්සර් කරන අය අනුව තමා ඉතින්.. තාන්වී අක්කා එහේ ඉඳලා ඇතිවෙලාද කොහෙද මෙහෙ ඇවිල්ලා තියෙන්නෙ..

රධ්‍ය අයියයි මමයි එයාලා එක්ක කතාකල්ලා අපේ රූම් එකට එන්න ආවා.. මම කොච්චර ශෝක්ද කියනවනම්.. ඇඳගෙන ආවෙත් නිකම් ගෙදරට අදින්න වගේ ශෝටකුයි ටී එකකුයි ඒකට සැන්ඩල්ස් දෙකකුයි දාගෙන.. කොණ්ඩෙවත් හරියට පීරන්නැතුව මොකාද එකා වගේ.. උදේ නිදිමතේ ඇඳුම් අයන් කරන්න කම්මැලි නිසා අහුවුණ එකක් දාගෙන ආවා.. අනිත් බෑග්නම් මම කලින් හදලා තිබ්බෙ..

රෝයල් කැන්ඩියන් එක නම් ඇත්තටම හෙන ලස්සන හොටෙල් එකක්.. මම ඉස්සර මේවට එන්න දැක්කෙ හීන.. අද මෙහෙම ආවට.. යකෝ සනෙරු උඹට ගිය කලක්..

අපි හිටපු රූම් එක ඩෙකරේට් කල්ලා තිබ්බෙ ඉස්සර කාලෙ මහනුවර යුගයේ එක එක චිත්‍ර අරවා මේවා වලින්.. කැන්ඩි වයිබ් එක ඒ විදියටම එන්න.. එළියෙ බැල්කනිඑක්ක තිබුණා.. කාමරේ නම් හෙන ලස්සනයි.. කම්ෆටබල් විදියට තිබුණා.. ඒ ෆ්ලෝ එකේ තිබ රූම් ඔක්කොම බුක් කල්ලා තිබ්බෙ ප්ලෙයර්ස්ලට විතරයි.. කොළඹ තව ක්ලබ් වගේකින් මැචස් වලට ඇවිල්ලා තිබ්බ නිසා..

මම රූම් එකට ඇවිත් ලැගේජ් එක පිටින් අල්ලලා අල්මරියට ඔබලා රධ්‍ය අයියගෙ ලැගේජ් එකත් ඒකෙ උඩින්ම දැම්මා.. පස්සෙ බැරියැ අස් කරගන්න.. රධ්‍ය අයියා ගිහින් ඇඳ උඩින් වාඩිවෙලා ෆෝන් එක සාක්කුවෙන් අරගෙන පැත්තකට දැම්මා.. මම හිමින් සැරේ රධ්‍ය අයියා ගාවට ගිහින් කකුල් දෙක දෙපැත්තට දාලා උකුළෙන් ඉඳගත්තහම රධ්‍ය අයියා මාව උස්සලා හරියට ඉන්දුව ගත්තා..

" මෙහේ මරු නේද.."

" ම්ම්.. මමත් මීටකලින් ඇවිල්ලම නෑ.."

" ඔයා කලින් කැන්ඩි ආවද.."

@Shan

" ඔව්.. කියානුයි අයුකයි එක්ක ආවා ට්‍රිප් එකක්.."

මම බෙල්ල හරවලා රධ්‍ය අයියා දිහා බලන් හිටියා.. ආශියි සෙනුකයි කියන වගේ මුන් තුන් දෙනා ගැන ඇත්තටම සැක හිතෙනවා දැන්නම්.. සුදුපව්ලෙ තුන්සම.. මම රධ්‍ය අයියගෙ කම්මුලට කම්මුලක් තියාගත්තා.. එළියෙ සීතලයි අම්මටසිරි වෙන්න.. වහිනවත් එක්කනෙ.. කාමරේ හීටර් එක ඔන් වෙලා අපිට දැනෙන්න ටික වෙලාවක් ගියා..

" Someone is very clingy these days.. මිම..??"

රධ්‍ය අයියා මගේ පිටට තට්ටුවක් දැම්මා..

" I miss you always.. මාත් එක්ක මෙහෙම ඉන්න.."

මම රධ්‍ය අයියවත් පෙරළගෙන එහෙමම ඇඳට වැටුණහම රධ්‍ය අයියා උඩට වෙලා කොට්ටයක් ඇදලා අරගෙන ඒකෙන් ඔලුව තියාගත්තා..

" පිහාටු කතා අහලා අපිටත් නිදිමතයි.."

" අපි නිදාගමු ඒයි.. හවසට නැගිටලා කාලා මොනාහරි කරමු.. තරු බලන්න යමුත.."

රධ්‍ය අයියා මාව එහාපැත්ත හරවලා බූවළු අඩු ටිකෙන් මාව ඔතලා බදාගත්තා..

" උඹයි මමයි බලන තරු හීනෙන් තමා.. නිදාගනින්.."

මම රධ්‍ය අයියගෙ කලිසම හිමින්සැරේ පහළට ඇද්දහම රධ්‍ය අයියා මගේ අත් දෙකිනුත් අල්ලගෙන මගේ බෙල්ල අස්සෙ මූණ ගහගත්තා.. තාන්වී අක්කගෙ බබාලා දෙන්නා බලන්න යන්න ඕන..



අනේ නරක සමනලයට ලස්සන කවි කියන හිරුමලක් හම්බුණානෙ.. මම ආදරේම ආදරෙයි නංගෝ.. හුඟක් ස්තූතියි..😘❤

මගෙ ළමයිනේ.. මම ආවෝ පියාඹලා උදේ පාන්දරම..

@Shan

නැගිට්ටිමන..!! 😎 එකශිය පනහට අපි ළං වෙනවා දෙයියනේ..

හැමෝම හොඳින් ඉන්නවා නේද.. නුවර ඉන්න දළඹුවෝ එම්මන මැච් එක බලම්න සනෙරුමලගෙ.. පෞනෙ..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

***

මට අද මහ අභූත චෝදනාවක් එල්ල වුණානෙ අහවලාගෙ මක්කද කොපි කළා කියලා.. මම රිප්ලයි කරන්න බැලුවහම ඒකා එකවුන්ට් එක අකුලන් ගිහින්..😩 ඒ කියන්නෙ නිකම් මෙක රැල්ලක් හරි මොකක් හරි වගේ යමක්ද.. රැල්ල වෙරලට ආතරෙයිද..

බොරුකියන්නෝන්නෑනෙ අනේ..😩 මම නම් කොපි කරන්න ආසයි.. ඒකෙන් මම වින්දනයක් ලබනවා.. අපහසුතාවයක් උනානම් සමාවෙන්නෝන.. ඒත් මමනම් කොපි කරනවා..😩 මම නවත්තන්නෑ.. පුලුවන් දෙයක් කරම්න.. ටටා..

@Shan

# 129 කොටස

" සරනේරු!!! අද වගේ ලේට් වෙන්න බෑ හෙට හරියටම උදේ හය වෙද්දි ජිම් එකේ ඉන්න ඕන..!!"

මම ඉන්ඩෝ ස්ටේඩියම් එකේ ප්‍රැක්ටිස් මැච් එකෙන් පස්සෙ පැත්තකින් වාඩිවෙලා වතුර බිබී ඉද්දි කෝච් වේළසුමනයා ඇවිත් මගේ ළඟින් වාඩිවුණා..

" හා සර්.."

" ෆ්ලික්සිබිලිටි එක මීට වඩා ටිකක් බිල්ඩ් අප් වෙන්න ඕන.."

" හා සර්.."

" ස්පීඩ් එක හොඳයි.. ඒත් මම මීට වඩා තමුන්ගෙන් බලාපොරොත්තු වෙනවා.."

" හා සර්.."

" සරනේරු!!!! තමුන් මම කියන එක අහගෙනද ඉන්නෙ.."

" හා ස-ඕ.. නෑ නෑ.. අහගෙන හිටියෙ.. ෆික්සිබිලිටි ඇන්ඩ් ස්පීඩ්.. මම කරන්නම්.."

" මොකක්ද.."

වේළසුමනයා මූණ හට්ටියක් කරගෙන ඇහිබැම අකුළ ගත්තා..

" මොකක්ද අහන්නෙ.. ප්ලේ කරන්නම් ඉතින්.."

කෝච් මට ආයෙම රවලා මම කරක කරක හිටිය රැකට් එක ඇදලා ගත්තම මම මූණ ඇද කරගත්තා..

" එනවා යන්න!!.."

@Shan

කෝචා 'එනවා යන්න' කිව්ව වචනෙත් එක්ක මගේ ජීවිතේ මහා අන්ධකාර ගුහාවකින් ඉටිපන්දම් එළියක් මතුවුණා වගේ හැඟීමක් දැනුනා.. මෙච්චරවෙලා දන්න කියන මොකෙක්වත් නැතුව මම හිටියෙ හෙන අපහසු ගතියකින්.. ඒ වුනාට මට යාළුවො කීපදෙනෙක් හම්බුණා.. එකෙක් අපේ බිග් මැච් එකේ ප්‍රතිවාදී ඉස්කෝලෙ පොරක්.. ඌ අශාන්.. අශාන් විතරයි හිතට අල්ලන එකෙක්ට හිටියේ.. ඒකා එක්ක පොඩ්ඩක් කියවලා විහිලුවක් කරන් මගේ වාරෙ එනකල් හිටියා.. අශානයා කියනවා ඌට නුවරින් හරි කෙල්ලෙක් සෙට් වෙන්න කියලා බාරයක් වෙන්න ඕනලු.. කලින් හිටිය කෑල්ල ඌට හෙන බූටක් තියලා මාරුවෙලා ගිහිල්ලා.. මගෙන් ඇහුවා කෑල්ලක් නැද්ද කියලත්..

මට මොකටද කෑලි..

මට ඉන්නෙ සම්පූර්ණ එකක්.. අපිට කෑලි වලින් වැඩක් නැනෙ.. අනික රධ්‍ය අයියා කෑල්ලක් වගෙ පෙනුනොත් උගේ ඇස් වල දෝසයක් තමා.. අලි යෝධයා වගේ.. අද එලාම් එක උදේ හවස මාරුකල්ලා තියලා ඒක වදින්නැතුව කෝචා දොරට තඩිබාලා තඩිබාලා තමා ඇහැරුණේ.. ඇයි ඊයෙ රෑ අර ගෲප් එකේ පාන්දර වෙනකල් චැට් කලානෙ.. රධ්‍ය අයියා එයාගෙ ෆෝන් එකෙන් චැට් කරන්නෙ නෑ හෙන වැදගත් එකා වගෙ ඉන්න ඕන නිසා.. ඔක්කොම කුණුහර්ප මගේ ෆෝන් එකෙන් තමා යවන්නෙ.. ඊයෙ අපි මහීශට කෑල්ලක් හෙව්වා.. සයෝන් අයියා මෙකිට කැමැත්තෙන් ඉදලත් මෙ බේසික කෙල්ල කැමති වෙන්නෙ නැනෙ.. සයෝන් අයියගෙ කට වැඩිලු.. දෙන්න හිතයි..

පස්සෙ සයෝන් අයියා නැතුව අභිරු අයියා හොඳද ඇහුවම අභිරු අයියා උස මදිලු.. හරි උස එකා වගේ ඒවා කියන්නෙත්.. ඊටපස්සෙ සහසා ඕනද ඇහුවම මෙකි හැරෙන හැරෙන පැත්තට කුණුහර්ප කියලා බැන්නා.. ඊටපස්සෙ ආශි සිංදුවක් කියලා වොයිස් එකක් දැම්මට පස්සෙ තමයි ඔක්කොම නිදාගන්න ගියේ.. ඒ සේරම අස්සෙන් සෙනුකයා අයුක අයියට සැමන් තෙල් දාන හැටිත් කියනවා..

" කපනවා ඕකගෙ ඇටදෙක මමනම්.."

" දැන් පෑන් එකට තෙල් දාලා ලූණු ටික දානවකො.."

" පෑන් එක රත් කරන්න ඕනද.."

@Shan

"    ♀ "

" අනේ මිනිහෝ ලිප පත්තු කල්ලා පෑන් එක තියපිය.. තියලා තෙල් රත්වෙනකල් ඉඳහන්.."

" කලින් කියන්න එපැයි.."

" සෙනුකයා ඉන්බොක්ස් පලයන්.. මෙ සයෝන් අයියගෙ ඇටදෙක තෙල් දානවා වගේ හැඟීමක් එනවා.."

පස්සෙ වැට් එක වීඩියෝ කෝල් එකක් වුණා.. සෙනුකයා මොකක්ද ලියන වැඩක් කර කර හිටියේ.. ආශි මූණෙ සුදුපාට පැක් එකක් අලවගෙන මල හොල්මන වගේ කැමරාවට එබීගෙන ඉන්නවා.. අපි හිටියෙ කලුවරේ.. අයුක අයියා උයනවා.. කියාන් අයියා කට ඇරගෙන කෝල් එකේම නිදි.. මහීශා වරං අරගෙන වගේ බනිනවා බනිනවා ඉවරයක් නෑ.. ඒකිට තනිකඩව ඉන්න බැරිලු.. මේවා දැක දැක ඉඳලා මනස දූසනය වෙනවලු.. ඒ වුනාට අහන අහන එකාට බෑ කියනවා..

මම කෝච්ගෙ කාර් එකේ පිටිපස්සෙ සීට් එකට වෙලා බෑග් එකත් බදාගෙන එළිය බලාගෙන ශටර් එකට නහය චප්ප කරගෙන හිටියේ.. නුවර කෙල්ලො ලස්සනයි තමා.. ඒ වුණාට අර අපේ මාමට බලුවැඩේ කරපු ගෑනි ඉන්නෙ මෙහෙ නිසා ඕන්නෑ.. බැටලු හම පොරොවගෙන ඉන්න යකින්නියො.. බොලාට පින නෑ අනුරාග් වගේ ඇවිලිච්ච ගමන් ඉන්න කොල්ලෙක් දාගන්න.. අනික අපිට ඕනෙත් නෑ.. අපේ මාමා කොට්ටාවෙන් දාගෙන ඉන්නෙ කිරි අලුවා කෑල්ලක්.. මොකෝ අර නැට්ටිච්චි අයිලන්ඩ් රෑන්ක් ගහලා තියද.. නැනෙ.. ආධ්‍ය අයියා වගේ ලස්සනත් නෑ.. ආධ්‍ය අයියා බිව්ව වෙලාවට දෝදු වගේ වුණාට හිත හොඳ මනුස්සයනෙ.. මමත් මගේ මනුස්සයා එක්ක යාළුවෙන්න ප්‍රධානම හේතුව අයියණ්ඩිගෙ ඇඹරුල්ලා මාලුවනෙ..

" මම්..මම්..අයියණ්ඩිගෙ හිත අද්දර නොකී කතා රැඳුනැයි~"

චමිරුවා පිත්තල බොත්තම් තියන කෝට් එකක් හොයාගත්තද දන්නෙ නෑ.. මූ එක්ක රඟපාන්න ගිහින් තරුවි නංගි මට නෙලලා යයිද.. නැනෙ.. අපි ඉස්කොලෙ වෙනුවෙන් නෙ මේ හැමදේම කරන්නෙ.. අනික තරුවි නංගිට එහෙම හිත හදාගෙන මට ගහන්න පුළුවන්ද.. සමයං තමා.. දැන් දවස් හතරකට කලින් මට චමිරු පරෙයියගෙන් අමුතු මැසේජ් එකක් ආවා..

@Shan

" මේ බං.. කෙල්ලෙක්ට දෙන්න හොඳ පොත් ටිකක් කියපන්කො.."

මම ඒක දැකලා එකසැරේ හාටැටැක් එකක් හදාගෙන ඒ මැසේජ් එක සෙනුකයට ෆෝවර්ඩ් කල්ලා මෙකට හේතු කාරණා සෙයා කරගත්තා.. බලද්දි තරුවි නංගිගෙ බර්ත්ඩේ එකලුනෙ.. පරෙයියා නංගිට පොතක් තෑගි දෙන්න හදන්නෙ.. නංගි පොත් කියවන එක්කෙනෙක්ලු..

"

**Lavyrle Spencer**

ගෙ

**Morning Glory**

හොඳයි.."

" ඒක හොඳ කතාවක්ද.. මම එච්චර පොත් කියවන්නෙ නෑනෙ බං.."

" ඒක ලස්සනයි.. තව

**Lisa Kleypas**

ගෙ

**Devil In Winter**

හොඳයි..

**Sarah MacLean**

ගෙ

**Never Judge a Lady by her Cover**

හොඳයි.."

" උඹ ඔය ආතල් එකට නෙමෙනෙ කියන්නෙ.."

@Shan

" පිස්සුද බං.. ඒ පොත් ටික ලස්සනයි.."

" හා.. එතකොට තව මොනවටද කෙල්ලො ආස.. උඹ දන්න යාළුවො ඉන්නවනෙ.."

" හැම කෙල්ලම එක වගේ නැනෙ බං.. මට ඉන්න උන් අහසයි පොළොවයි වගේ.. තරුවි නංගී මොන වගේද.."

" ම්ම්.. පොත් කියවන්න කැමතී.. පොඩි පොඩි දේවල් වලට ආසයි.. මහා ලොකු දේවල් බාරගන්න කැමති නෑ.. ඒ වගේ.."

" එහෙනම් උඹ හොදට හිතලා බලලා උබට හොදයි කියලා හිතෙන එකක් දීපන්.. ඔය වගේ කෙල්ලො කැමති අමුතු තෑගි වලට.."

" මම බලන්නම්.. තැන්ක් යූ ඇඩ්වයිස් වලට මචං.."

" එල.."

ඔච්චර තමා කතාකලේ.. මම ඕක රධ්‍ය අයියට පෙන්නුවහම රධ්‍ය අයියා පස්වනක් ප්‍රීතියෙන් පිනා ගියා.. පරෙයියට කෝකිලාවියක් සෙට් වෙච්ච එක ගැන.. දැන්නම් චමිරුවා අපිට ලාවට සෙට් වෙගෙන එන්නෙ.. මූත් තරුවි නංගිට ලව් කරන්න පටන් අරගෙනනෙ.. දෙයියනේ කියලා සෙනුකයගෙ පඩුර වැඩකලා.. ඉස්සරහට පාර්ලිමේන්තු මන්ත්‍රී චමිරු සිංහවංශ තමා ඉතින්.. ඕකා ඒ ලෙවෙල් වලට කලෙත් පොලිටිකල් සයන්ස්නෙ.. ඇති යන්තම් පරිසර ඇමතියට සෙට් වෙන මුණුබුරෙක් හම්බුණා.. අපේ අයුක බොසා අතැරලා.. අයුක අයියට සෙනුකයා එක්ක වැඩ තියනවනෙ.. සෙනුකයා හිතාගෙන ඉන්නෙත් අපි වගේ ෆුට්බෝල් ටීම් එකක් හදන්නලු.. කියාන් අයියට රගර් ටීම් එකක් හදනවා කිව්වා.. ගැම්මක් තමා..

" මතකනෙ.. වෙලාවට එන්-"

" හරේ.."

මම කාර් එකෙන් බැහැලා රැකට් එකයි ස්පෝර්ට්ස් බෑග් එකයි කරේ එල්ලගෙන ලිෆ්ට් එක පැත්තට දුවගෙන ගියා.. මගේ පස්ස ලොකු මුගටිපැටියා මොනවා කරනවද දන්නෙ නෑ.. ඉක්මනට යන්න ඕන.. ලිෆ්ට්

@Shan

එක ෆෝත් ෆ්ලෝ එකේ නැවැත්තුවහම මම ආලෝකේ වේගෙන් හෝල් වේ එක දිගට දුවගෙන ගියා..

ඔව් මේ අවස්ථාවේදි ෂනෙරු උද්යෝග ක්‍රීඩකයා සියලු බාධක අභිබවා කාමර අංක එකසිය හතර වෙත ඇදී යනවා.. ඉස්සරහා වංගුවෙන් හැරුණු පාට ටයිල් එක කිරිස් ගාලා ඇදිලා ගියා.. ඔක්කොම ෆ්ලෝ එකේ ප්ලෙයර්ස්ලා ඉන්ඩෝ ස්ටේඩියම් ගිහින් නිසා මොකෙක්වත් පේන්න නෑ.. මම අපේ කාමරේ දොර ඇදගෙන බෑග් එකත් කාමරේ මුල්ලකට විසි කල්ලා සෝෆා එකේ ඉඳගෙන පොතක් බල බල ඉඳපු රධ්‍ය අයියගෙ ඇඟ උඩට පැන්න පාර රධ්‍ය අයියා දෝත බඳලම මාව අල්ලගත්තා.. මම හති හලාගෙන රධ්‍ය අයියගෙ කම්මුලෙන් හාද්දක් තිබ්බා..

" I missed you.."

රධ්‍ය අයියා මගේ කම්මුලක් අල්ලලා පොඩි කළා..

" අද මොකද.. ප්‍රැක්ටිස් කළාද.."

මම කකුල් දෙකේ තිබ්බ සපත්තු දෙක ගලවලා පැත්තකට විසික් කල්ලා සෝෆා එකෙන් හරියට ඉඳගත්තා..

" ඔව්.. යාළුවො වගයක් හම්බුණා.. ඔයා මොකද කලේ.. මට නිකන් උන්මාද චිත්‍රා එක්ටැම් ගේ හිරකල්ලා ඉද්දි ගාමිණීට ඇතිවුණ හැඟීම ඇතිවුණා අනේ.. ඔයා මෙහේ තනියම ඉද්දි.. උන්මාද චිත්‍රා එක්ටැම් ගෙයින් කොණ්ඩෙ පහළට දැම්මම-"

" ඔය මොකක්ද ඔය කියන්නෙ.. ඒ රපුන්සල් බං.."

" ආ ඔව් එහෙම තමා.. කොහොම හරි මගේ ඇස්වලට කඳුලු ආවා.. මම ගාමිණී.."

රධ්‍ය අයියා හිනාවෙලා මගේ කොණ්ඩෙට දාලා තිබ්බ බැන්ඩනා එක ගලවලා ගත්තා.. මේ කෝචා එක්ක බැනෙ.. බැන්ඩනා එක නැතුව ගියොත් කොණ්ඩෙට රබර් බෑන්ඩ් දෙකක් දානවා කිව්වනෙ.. සැක් මම ගොළුබෙල්ලෙක් වගේ ඉදීවි..

" මම ලෙක්චර්ස් වගයක් බැලුවා.."

@Shan

" ආ.. අර ඔයා කිව්ව අයි ටී එකේද.."

" ම්ම්.."

" හොඳළමයෙක් වගේ එහෙම වැඩ කරන්න.."

මම රධ්‍ය අයියගෙ පස්සට තට්ටුවක් දැම්මහම රධ්‍ය අයියා මගේ අත ඇදලා ගත්තා..

" නාගෙන වර.. හවස ගමනක් යන්න.."

රධ්‍ය අයියා මාව නැගිට්ටුවලා ඉස්සරහට තල්ලු කලා..

" අපි ගමනක් යන්නද යන්නෙ.. ඉන්න මම වොග් එකක් දාගෙන එන්නම්.. ඔවත් එනවත.."

ඒ එක්කම පියාඹලා ආපු කවුච් පිලෝ එකක් මගේ මූණ මැද්දට වැදුණා.. ඉඳපන් කරන්න හැලයට.. මූ හැලයනම් මම සීදේවි වෙන්න එපෑ.. මම කිඹුල්ලුන්ට ආස නෑ.. මම මලක්.. රධ්‍ය අයියා සමනලයෙක්.. වණ්ණත්තුප්පුව්වි මගේ..

මම බාත් රූම් එකට ගිහින් කාමරේ පැත්තට වෙන්න දාලා තිබ්බ කර්ටන් එක සරාස් ගාලා ඇදලා දැම්මා.. මෙ රූම් එකේ බාත් රූම් එක කවර් කල්ලා තියෙන්නෙ වීදුරු වලින්.. වීදුරු කිව්වට අර ලාවට විනිවිද පේන වීදුරු ජාතියකින්.. ඉතින් ඇතුළෙ නානකොට එළියට පේනවා.. ඕන්නම් තමා අර කර්ටන් එකෙන් වහන්න පුළුවන්.. ඒ වුණාට දැන් මට එහෙම වහගන්න උවමනාවක් නෑ.. මම ශර්ට් එක ගලවලා පැත්තකින් තිබ්බා..

මට වීදුරුවෙන් පේනවා රධ්‍ය අයියා බොරුවට කවුච් එකේ ඉඳන් ටැබ් එකට එබීගෙන ඉන්නවා..

" I know you think that you know me

But you ain't even seen my dark side

It's reserved for you only

So, baby, do it right, do me right~.."

@Shan

" We can go all the time

We can move fast, then rewind

When you put your body on mine

And collide, collide

It could be one of those nights

Where we don't turn off the lights

Wanna see your body on mine

And collide, collide~.."

මම ශෝට් එකත් ගලවලා පැත්තකින් තියලා කණ්ණාඩියට තට්ටුවක් දැම්මහම රධ්‍ය අයියා මගේ දිහා බලලා වෙන පැත්තක් බලාගත්තා..

" මට ශවර් ජෙල් එක ගෙනැත් දෙන්නකො.. අයියෙ..!"

මම ශේප් එකේ ටවල් එකත් කරට දාගෙන බාත් රූම් එකේ මැද්දෙ තිබ්බ අයිලන්ඩ් එකට හේත්තු වෙලා හිටියා.. ඒක උඩ මල් වාස් එකකුයි ඉටිපන්දම් වගේකුයි බාත් සෝල්ට් පුරවපු ලී භාජනේකුයි තියලා තියෙනවා..

" දොර අරින්න.."

" ඇතුළට එන්න~.."

රධ්‍ය අයියා ශවර් ජෙල් එක ගෙනැල්ලා මගේ දිහාවත් බලන්නැතුව ඒක අයිලන්ඩ් එක උඩින් තියලා මට ටොක්කක් ඇන්නා..

" එනකොට ගේන්න දන්නැද්ද.."

" නෑනෙ.."

@Shan

රඩ්‍ය අයියා මට දෙකක් රැව්වා.. රවන්න හරි බලපු එක හොඳයි.. මමත් කට ඇදකරගෙනම හිටියා.. හරි..ටොකු අනින්න ඕන නෑනෙ එහෙමයි කියලා.. ඒක හරි අසාධාරණයිනෙ.. අර කරන්ට් වදින හෙල්මට් එක ඉක්මනට හොයාගන්න ඕන.. මේ ඔක්කොන්ටම ඇඩෙයි එතකොට.. රඩ්‍ය අයියා මාව උස්සලා අයිලන්ඩ් එක උඩින් තිබ්බා..

" දැන් නාන්නෙ නැද්ද.."

" නානවා.."

" දැන් මේ නානවද.."

" මේ නාන්න තමා යන්නෙ.."

මම හොඳ ළමයා වගේ රඩ්‍ය අයියට හාද්දක් දුන්නා.. මම හාදු දෙන්නැතුව ඇත්තට වෙන කවද එයාට හාද්දක් හරි දෙන්නෙ.. දෙන්න ඉතින් රඩ්‍ය අයියා කාගෙවත් ළගට යන්නෙ නෑනෙ.. මටනම් මස්සිනාගෙන් හම්බෙනවා ඉඳලා හිටලා එකක් දෙකක්.. මම මගේ වගකීම් ඉශ්ට කරන්නෙ මේ..

රඩ්‍ය අයියා මගේ කම්මුලකින් අල්ලලා තොල් වලින් හාද්දක් තිව්වා.. මම එයාගෙ කර වටේ අත් දෙක බැඳගත්තහම එයා මගේ තොල් වලට බර වුණා.. ඊටපස්සෙ කරේ තිබ්බ ටවල් එක එයාම ඇදලා අරගෙන පැත්තකින් තියලා මාව ඇඟට තියලා තද කරගත්තා.. මගේ පපුවට එයාගෙ හාට්බීට් එක දැනෙනවා වගේ.. මම එයාගෙ ශර්ට් එක අතකට ගුලි කරගෙන ඉද්දි..

එකපාරම..

ඒ කැඳැත්තා මාව උස්සගෙන ගිහින් බාත්ටබ් එකට අතෑරලා ශවර් එක ඔන් කලා..

" ආආආආආආආආආආආආආආආආ තව්සෙට මම.. හොම්බ දිග මුගටියා.. ඔහොම ඉඳපන්.."

මම බාත් ටබ් එකෙන් නැගිට්ටින්න කලින් රඩ්‍ය අයියා දොර වහගෙන එළියට ගියා.. මම තෙම්ච්ච කුකුළා වගේ ශවර් එක යටට වෙලා.. මුළු ඇඟම තෙමාගෙන.. සීතලේ ගැහි ගැහි ඉන්නවා.. මෙහෙම නෙමේනෙ..

@Shan

මම මුලින්ම හෝදන්නෙ ඔලුවනෙ.. ඊටපස්සෙ ශවර් එකට අතක් දානවා.. කකුලක් දානවා.. ඊටපස්සෙ හිත හදාගෙන මුළු ඇහම තෙමාගන්නවා..

*ටක්* *ටක්* *ටක්*

මම වීදුරුව දිහා බැලුවහම රධ්‍ය අයියා හෙන කුප්ප හිනාවක් දාගෙන වීදුරුවට හේත්තු වෙලා බලාගෙන ඉන්නවා..

" මොකද..!!"

" හොදට නාගන්න හරිද.. මම බලාගෙන ඉන්නේ.."

මම වතුර බේරි බේරි බාත් ටබ් එකෙන් බැහැලා ගිහින් කර්ටන් එක ඇදලා දැම්මා.. හිතාගෙන ඇති බලාගෙන ඉන්න.. පලාපොළහා.. අසලි අම්මට කතාකල්ලා කියනවා පුතා මට කරදර කරනවා කියලා.. මම ඊටපස්සෙ හොදට නාගත්තා..

නාලා ඉවාවුණාට පස්සෙ හවස කෝපි එකකුත් බීලා මමයි රධ්‍ය අයියයි ගමනක් එන්න ආවා.. ගමනක් කිව්වෙ.. දළදා මාළිගාවට ආවෙ.. මෙච්චර නුවර ඇවිල්ලත් මෙහෙ එන්නෙ නැතුව වැඩක් නෑනෙ.. මම සුදුපාට හුඩී එකකට සුදුපාට බැගී ට්‍රවුසර් එකක් ඇදලා අත් දෙක හුඩී එක අස්සට ඔබාගෙන ආවා.. මේකා නිසා සීතල වතුරෙන් නාලා හැන්දෑවෙ සීතලත් එක්ක.. මටනම් හෙන සීතලයි.. රධ්‍ය අයියා මෙලො ගානක් නැතුව ටීශර්ට් එකක්ම ඇදගෙන ආවා..

" මේ සතියට අපි දෙසැරයක් පන්සල් ආවා නේද.."

" ම්ම්.. එහෙම වෙලත් කෝ උඹ හැදෙන්නෑනෙ.."

මම හිමිහිට රධ්‍ය අයියගෙ අත අස්සෙන් අතක් දාලා කෙනිත්තුවා.. මල පනින කතාමයි කියන්නෙ.. කට ඇරියොත්..

" අනේ මේ.. ඒ වුණාට මම දහය වෙනකල් දහම් පාසල් ගියා.. ධර්මාචායීත් කළා.."

" මමත් ධර්මාචායී වෙනකල් කළා.."

මම අහක බලාගත්තා.. යැයි යැයි තමා..

@Shan

ඒ දවස්වල අපිට ළඟ දහම් පාසල් තිබ්බා.. මමයි සෙනුකයයි ආශියි ගියේ.. මහීශා සන්ඩේ ස්කූල් යන්නෙ පල්ලියට.. ඒකි ඇවිල්ලා කැතලික්.. අපි තුන්දෙනා විතරයි ඒකනිසා දහම් පාසල් ගියේ.. හැමදාම අපේ අම්මා මට සරමට කටු හැටහුටහමාරක් ගහලා තමා දහම්පාසල් යවන්නෙ.. මමයි ආශියි දහම්පාසලේ ශිශ්‍ය නායකයො වෙලා හිටියා.. ඕකට ගියා කියලා මමනම් අමුතුවෙන් ඉගනගත්තු සාරධර්මයක් නැති තරම්.. දහම් පාසල් පොතක් අතින් අල්ලන්නෙ නෑ.. අනික මට අභිධර්මය බෑ.. එච්චර ඒවා පාඩම් කරන්න ගියාම දහම් පාසල එක්ක එපාවෙනවා.. සෙනුකයයි මමයි හැමදාම සෙට් වෙන්නෙ භක්ති ගීත කියන්න.. මොකද ඌ හිටියෙ ඒ ක්ලාස් එකේ.. මම හිටියෙ බී ක්ලාස් එකේ.. ක්ලාස් කිව්වට මේ ඉස්කෝලෙ වගේ ක්ලාස් නෙමේ.. දිග හෝල් එකක වෙන වෙනම ක්ලාසස් වාඩිවෙලා ඉන්නවා.. හාමුදුරුවො ඇවිත් උගන්නනවා.. අපිට ඉතින් සෙනුකයව පේනවා.. ඒකනිසා රහස් කේත ක්‍රමයෙන් ඌයි මායි කතාකරන්නෙ.. ඊටපස්සෙ YMBA එක කිට්ටු උනාම උඩ දාගෙන පාඩම් කල්ලා කොහොමහරි ළකුණුගන්නවා.. සෙනුකයටනම් තාත්තා ගෙදර පාඩම් කරවනවා.. තාත්තා පිරිවෙනේනෙ.. ඉතින් මටයි ආශිටයිත් කියලා දෙන්න කතාකරනවා.. ඒ කාලෙ නම් මරු ඇත්තටම.. අපි උගෙ ගෙදර ගිහින් නටලා නටලා හවස් වෙන්න අපේ ගෙවල් වල එනවා..

( *YMBA-

**Young Men's Buddhist Association :**

These Examinations are open to any person interested in the study of Theravada Buddhism )

" මේ ඔයාලා නුවර ආවා කිව්ව නේ.. අයුක අයියයි.. කියාන් අයියයි එක්ක.."

" ම්ම්.."

" කවද්ද ආවෙ.."

" අපිට එක්සැම් ඉවරවෙලා.."

" ආ එතකොට අපි හිටියෙ නැනෙ.. නේන.."

@Shan

" හිටියෙ නෑ..'වෙලාවට'.."

රධ්‍ය අයියා කට අස්සෙ මොකක්ද තියාගෙන් හීමින් කිව්වා..

" මොකක්ද කිව්වෙ.. වෙලාවට කිව්වා නේ.. ආ එතකොට අපි වදේද.."

" ඒක සෙනුක මල්ලිගෙ ලයින් එකක්නෙ වරද්.. ඔයාගෙ ලයින් එකකින් කියන්න.. 'ආ තවසෙට ආතල් නේ අපි නැතුව' අන්න එහෙම.."

" අයියෙ!!!"

මේකා කොහොමද සෙනුකයගෙ ලයින් දන්නෙ.. ආ අයුක අයියගෙ දුක අහන අයියා රධ්‍ය අයියනෙ.. පව් මගෙ අහිංසකයා උන් දෙන්නගෙම දුක අහනවා.. හොඳවෙලාවට මම සුදූඅම්මියට දුක් දෙන්නෙ නැත්තෙ.. නැත්නම් සුදූඅම්මියට දුක කියන්න කෙනෙක් නැතිවෙනවනෙ.. එහෙම කරනවද මගෙ හැපිකව්වට මම..

මම හදිසියේ පැන නැගුලු ආලයට රධ්‍ය අයියගෙ පස්සට තට්ටුවක් දැම්මා.. අපි තාම හිටියෙ ගේට් එකෙන් මාළිගාව දිහාට යන ගමන්.. මෙහේටනම් ඉතින් සෙනඟ නැති දවසක් කියලා නෑ.. හැමදාම සෙනඟනෙ.. හැමෝම සුදු ඇඳගෙන මල් අරගෙන දළදාව වඳින්න යනවා..

" මෙහෙට ඇවිල්ලවත් එක විදියක ඉඳපන්.."

" බෑ..!! මෙහෙ රෑට ලස්සනයි නේද.."

" ම්ම්.."

" නුවර ලස්සන සනෙරු ආවම.. ඔය වැස්සට අනම් මනම් නෙමෙ.. ඔයා වුණත් පිළිගන්නවනෙ.. නේද.. නුවර ලස්සන සනෙරු ආවම කියලා.."

රධ්‍ය අයියා මගේ දිහා බලලා අමුතුවට හිනාවුණා..

" මේ වරද්.. ඔයා තාරපැටියෙක් වගේමයි.. ඔය හුඩී එකට.."

here we go again..

@Shan

" ඔක නවත්තපන්.. මම මෙතන නැත්නම් හයියෙන් කෑගහනවා.. තාත්තී චූබරයි කියලා.."

" වරද් හැබැයි!!!!"

මම හොඳ හුස්මක් උඩට ඇදලා ගත්තා..

" තාත්මහ්ක්මමමමමමමමමම!!මමම!!!"

" දෙයියනේ කියලා ඔය කට වහගෙන වරෙන්.."

මම රධ්‍ය අයියගෙ අත ගසලා දැම්මා..

" මගෙ කට වහන්න ඔයාට බෑ.. අල්ලන්නෙපා මාව.."

මම රධ්‍ය අයියව මඟ දාලා ඉස්සරහට ඇවිදගෙන ඇවිදගෙන ගියා.. සීතලම සීතලට හුළං පාරවල් ඇවිල්ලා මගේ මූණෙ වැදිලා කොණ්ඩෙ එහාට මෙහාට වෙනවා.. මම පෙනහළු පිරෙන්නම හොඳ හුස්මක් අරගත්තා.. දළදාවෙ නැවිත් නුවර එන එකේ වැඩක් තියේද.. නැනෙ.. මෙහෙට ආවහම හිතට දැනෙන්නෙ වෙනමම හැඟීමක්.. හරියට.. සැහැල්ලුවක් වගේ.. නිදහසක් වගේ එකක්.. මම කලින් නුවර ඇවිල්ලා තියෙන්නෙ දෙපාරක් නැත්නම් තුන්පාරක්.. මම නැවතිලා අහස දිහා බලාගෙන හිටියා.. පෝය ළඟයි නිසා හඳ පේනවා.. බාගෙකට පොඩ්ඩක් වැඩියෙන්.. ඊළඟට එන්නෙ වෙසක්නෙ.. රධ්‍ය අයියා ඇත්තටම ගෙදර ආපු එකනම් ලොකු දෙයක්.. මම ඒකට කැමතී.. ඒත් යුනිවසිටි නොයන එක.. අනේ මන්දා..

" එන්න.."

රධ්‍ය අයියා ඒ ටිකට මං ගාවට ආවා.. ඇවිත් මගේ අතින් ඇදගෙන ඇතුළට ගියා.. අපි යද්දි පහමාරට විතර ඇති.. හයහමාරට හැන්දෑ තේවාව පටන්ගන්න තියෙන්නෙ.. හැන්දෑ තේවාව, හැන්දෑ දූරය ඔහොම එක එක විදියට කියනවා.. හැන්දෑවෙ හය හමාරෙ ඉඳලා හතයි කාල වෙනකල් තේවාවෙ වතාවත් කරන්නෙ.. හයහමාරට දන්ත ධාතුව වැඩහිඳින කුටියේ දොර විවෘත කළාම හේවිසි මණ්ඩපයේ 'තේවා හේවිසිය' නතර කරනවා.. ඊටපස්සෙ පරමල් අයින් කල්ලා අලුත් මල් පූජා කල්ලා තමයි 'බොලපැන් පයිණ්ඩ' කරන්නෙ.. ආයෙම නවත්තපු තේවා හේවිසිය බොලපැන් පයිණ්ඩ කරද්දි පටන් ගන්නවා.. ආයෙ හතයි කාලට වැඩහිඳින කුටියේ

@Shan

දොරවල් වහලා 'තේවාව භාර කටයුතු' කරන්න ගන්නවා.. ඒ කියන්නෙ තේවාව භාර හාමුදුරුවරු ඇතිරිලි එළලා පැන් කුසලාන පිරිනමන එක.. සීනි, සූකිරි, ඇල්තෙලිජ්ජ පොඩි පාත්‍රාන තුනකට තියලා මී පැණි, එළගිතෙල්, ඉඟුරු ඉස්ම කුසලාන තුනක් පිරිනමනවා.. ඔය පළවෙනි ගිලන්පස පූජාව.. දෙවෙනි ගිලනස පූජාව තියන්නෙ රෑ අටට විතර.. පළවෙනි එකේදි තරම් දෙවෙනි එකේදි ගිලන්පස පාවිච්චි කරන්නෙ නෑ.. එතනින් හැන්දෑ තේවාව ඉවරයි.. ආයෙ කාටවත්ම ඇතුළට එන්න බැරිලු අලුයම් තේවාව වෙනකල්.. මමත් ඔක කලින් දැනගෙන හිටියෙ නෑ.. රධ්‍ය අයියා තමා කිව්වෙ..

අපි දළදාව වැඳලා ආයෙම එනකොට තේවාව පටන්ගන්න කිට්ටුයි.. ඒ කියන්නෙ හයහමාරට විතර ඇති.. රධ්‍ය අයියා එක්ක පන්සල් ගියාම ඉතින්.. ඒකා දොහොත් මුදුන් දීලා හෙන වෙලාවක් වඳිනවනෙ.. ඉස්කෝලෙදිත් එහෙමයි.. පන්සලකට ගියත් ඒත් එහෙමයි.. වැඳලා පුදලා ඉවරවුණාම තමා ආයෙම කතාකරන්න ගන්නෙ.. මමත් එතකල් බුදුන් වැඳලා මල් පූජා කළා.. එනකොට තමා මට ඔය තේවාව ගැන කිව්වේ.. මම එයා ඔය එක එක දේවල් ගැන් අකියලා දෙද්දි අහගෙන ඉන්න ආසයි.. පැහැදිලි කරද්දි පොඩ්ඩක්වත් වැරදි නැතිවෙන්න හැමදෙයක්ම මුල ඉඳලා මතක් කල්ලා තමා එයා පැහැදිලි කරන්නෙ.. හොඳටම විශ්වාස නම්.. නැත්නම් දන්නෙ නෑ කියලා කෙලින්ම කියනවා.. එයා දන්න දේවල් 'ඔක්කොම' කියනවා.. ඉස්සර පාඩම් කියලා දෙද්දිත් එහෙමයි.. හැමදේම හරියටම කියලා දෙනවා.. නවත්තන්න ඕන තැනින් නවත්තනවා.. මම ඉතින්.. හැමතිස්සෙම වගේ අහගෙන ඉන්නවා..

අපි වැව රවුමට එද්දි හුඟක් කළුවර වැටිලා.. තැන් තැන ගෑණු ළමයි පිරිමි ළමයි දෙතුන්දෙනා කතාකර කර ඉන්නවා.. සමහරු කැම්පස් ටීශර්ට්ස් ඇඳගෙන.. සෙනුකයගෙ හීනෙ තමා පේරාදෙණියෙ එන එක.. ඌ පාඩම් කරන්න ගත්ත තැනම කියන්නෙත් 'අඩෝ පේරාදෙණියට යන්න තියනවනම්' කියලා.. ඌ කොහොමත් මට වඩා සැහෙන්න හොඳට පාඩම් කළානෙ.. අනිවා පේරාදෙණියෙ එන්න පුලුවන් වේවි.. එන්න ලැබුණොත් හොඳයි..

" ඇත්තටම දැන් ඔයා මොකක්ද කරන්න හිතාගෙන ඉන්නෙ.."

මම රධ්‍ය අයියගෙ අතකින් අල්ලගත්තහම එයා මාව පාරෙන් මෙහා පැත්තට කලා.. කල්ලා ආයෙම මගේ අතින් අල්ලගත්තා..

@Shan

" ගොඩක් දේවල් තියනවා.. ඔක්කොම පටන්ගන්න කලින් වෙන්න ඕන දේවල් ටිකක් තියනවා.."

" ඒ කිව්වෙ.."

රධ්‍ය අයියා මගේ දිහා බැලුවා..

" හැමදේම වෙන්න පිළිවෙලක් තියනවනෙ.. මම හැමතිස්සෙම ඒ පිළිවෙල ගැන හිතනවා.."

" ම්ම්.. ඔයා හිතාගෙන ඉන්න හැමදේම ඒ විදියට වෙන්න කියල මම විශ් කරනවා.."

" ඔයා විශ් කරනවනම් එහෙම වේවි.. "

මම රධ්‍ය අයියගෙ අතින් තව ටිකක් තද කල්ලා අල්ලගත්තා.. කිරි මුහුද පිහාගෙන එන සීතල හුළඟයි.. අමුතු නිස්කලංක ගතියයි අපි වටේ ඕනවටත් වඩා තිබ්බා.. මම පොත්වල කියවපු නුවර.. එච්චරට විස්තර කල්ලා තියන ආදරණීය ගතිය අද මට වෙනදටත් වඩා දැනුනා.. සමහරවිට රධ්‍ය අයියා ඉන්න නිසා වෙන්න ඇති.. මම නිතරම කල්පනා කරනවා 'එයා' මගේ ජීවිතේට නාවනම් මොකක් වෙයිද කියලා.. එහෙනම් මම තාම ගෙදරට වෙලා උඩ බලාගෙන ඉන්නවා රිසාල්ට්ස් එනකල්.. ඇත්තටම මම ඒ ලෙවෙල් පටන්ගද්දි හිටියෙ මෙලෝ දෙයක් කරන්න හිතක් නැතුවනෙ.. එක අතකින් මට එයා ලැබුණ වෙලාව.. ඒක හොඳම වෙලාව වෙන්න ඇති.. ආදරේ කරද්දි අනිත් කෙනාට හයියක් වෙන්න ඕන කිව්වට.. මම ඒක අත්විඳලා තිබ්බෙ නෑ.. දැන් මට හිතාගන්න පුලුවන් ඒකෙ තේරුම මොකක්ද කියලා..

" වරද්.."

" ම්ම්.."

" මම කලින් නුවර ආපු වෙලාවෙ නිකමට හිතුවා ඔයත් එක්ක එන්න ඇත්නම් කියලා.."

මම රධ්‍ය අයියා දිහාබැලුවා.. මම හිතන්නෙ ආදරේ කරන හැමෝම එහෙම හිතනවා ඇති..

@Shan

" අපි ආවනෙ.. ඔයා දන්නවද මේ ගෙවෙන වෙලාවට මම මාර කැමතී.. මම මුලින් හිතලා තිබ්බෙ නෑ ගෑණුළමයෙක් එක්ක යාළුවෙන්න ඕනද.. පිරිමි ළමයෙක් එක්ක යාළුවෙන්න ඕනද කියලා.. අනේ මන්දා.. මට ඔයාට කැමති හිතුණා.."

" ඒ මොකද.."

" මම දන්නෑ.. ඉබේටම කැමති හිතුණා.. මට බර වචන වලින් ඒක තේරුම් කරන්න තේරෙන්නෙ නෑ.. කොහොම හරි මම ඔයාට ආදරෙයි.."

රද්‍ය අයියා මගේ කරට අතක් දාගෙන මාව ඇදලා ළඟට ගත්තා.. ඇදලා අරගෙන කන ගාවට මූණ ලං කලා.. එයාගෙ හුස්ම මගෙ බෙල්ලෙ වදිනකොට මම රතුවෙලා රතුවෙලා පිපිරෙන්න ආවා..

" ආදරෙයි..!!"



මම ආවා.. දැම් එන්නෙ අවේලාවෙ.. මගෙ දළඹු පැංචියොයි පැංචොයි හොඳින් ඉන්නවා නේද්දෝ..

එන්නාම්.. ලව් යූ..❤

*තේවාව ගැන පොඩි විස්තරයක්-

අලුයම තේවාව. (හීල් දාන පූජාව)

දළදා මැඳුරේ දෛනිකව සිදුකෙරෙන පුද පූජා හා වත් පිළිවෙත් සියල්ල "තේවා" ලෙස හැඳින්වේ. දිනපතා අලුයම තේවාව, නව පැ තේවාව සහ හැන්දෑ දූරය වශයෙන් තේවා තුනකි. අලුයම තේවාව "අලුයම දූරය" ලෙස ද හැඳින්වේ. එය දෛනිකව පෙරවරු 5.15ට ආරම්භ වේ. පළමුව හේවිසි වාදනය කෙරේ. අලුයම දූරය සඳහා තේවා කාරක භික්ෂූන් වහන්සේලා සිවුරු හැඳ ඊට උඩින් සහළ පටි බැඳ සූදානම් වේ. දෛනිකව දළදා මාළිගාවේ යතුරු පයින්ඩ කරන පිළිවෙතක් තිබේ. පළමුව රිදී දොර ද, පසුව රන් දොරද හැරිය යුතු වේ. දිවමන් බුදු හිමියන් උදෙසා කළ යුතු උදැසන සත්කාර සියල්ලම දළදා හාමුදුරුවන්ට ද එලෙසම පවත්වනුයේ මහත් ගෞරවයෙනි. උදැසන මුවකට දෝවනයට පැන් සූදානම් කිරීම, දැහැටි

@Shan

පිළිගැන් වීම සහ මල්පූජා කිරීම සිදු වේ. දළදා වහන්සේ උදෙසා පූජා කරනු ලබන්නේ සුදු සමන් පිච්චි මල් පමණි. මේ සියල්ල අවසන පත් කඩය එළා දළදා හාමුදුරුවන් වැඳ අත් සෝදා ආහාර පිරිණැමූ සියල්ල ලේන්සු වලින් වසා දමයි. මෙයින් අනතුරුව පූජා කළ දානය බැහැර කිරීම හෙවත් "බැහැගැනීම" සිදු වන්නේ ද දළදා චාරිත්‍ර අනුවය. එය රිදී පාත්‍රයෙන් පටන් ගෙන මහරන් පාත්‍රයෙන් අවසන් කිරීම පිළිවෙත ය.

නව පෑ පූජාව. (දහවල් බුද්ධ පූජාව)

දිනපතා පෙරවරු 9.30ට පමණ ආරම්භවන නව පෑ තේවාව හෙවත් දළදා හාමුදුරුවන්ට දිවා ආහාර පූජාව පෙරවරු 10.30ට අවසන් වේ. ඒ සඳහා සහභාගී වන්නේ තේවා කාරක භික්ෂූන් වහන්සේලා සහා අලුයම තේවාවේ නිරත වූ මුලාදෑනීහු වෙති. මේ පිරිස පළමුව උඩුමහළට ගොස් ගෙඩිය ගසති. ඉක්බිතිව දවල් හේවිසිය ආරම්භ වේ. තේවා භාර භික්ෂූන් වහන්සේලා දෙනම සහ වට්ටෝරුරාළත් පහන් දල්වා පරමල් ඉවත් කරනු ලබයි. අනතුරුව මල්පාවඩය ලෙස හඳුන්වන පූජාසනයේ එළන ඇතිරිල්ල එළා රිදියෙන් කළ මල්බන්දේසිය ගෙපරාලට දේ. හෙතෙම ඊට සුදු සමන් මල් පුරවා දළදා වහන්සේට පූජා කිරීමට භාර දේ. මේ කටයුතු පෙරවරු 10.15 පමණ වනවිට අවසන් වේ. එවිට හක්ගෙඩිඅප්පුත්, කත්තියනරාලත් දෙදෙනා ගෙපරාලත් මුළුතැන්ගෙයි සිට ආහාර පූජාව සඳහා "පයිණ්ඩ" කරගෙන පැමිණෙති. දළදා පූජාව සඳහා ගඳකෙළිය ඇතුලට ගත් ආහාර යළි බැහැර කිරීමේ කටයුතු මහුල්බෙර වාදන මධ්‍ය යේ සිදු වේ. එමෙන්ම මෙලෙස නව පෑ තේවාව අවසන් කරන්නේ ද ඒ ඒ රාජකාරි භාර නිළධාරීන් අදාල රාජකාරිය පරීක්ෂා කර දොරවල් වැසීමෙනි.

හැන්දෑ තේවාව. (සවස ගිලන්පස පූජාව)

හැන්දෑ තේවාව, "හැන්දෑ දූරය" ලෙසින් ද හැඳින් වේ. දිනපතා පස්වරු 6.30 සිට 7.15 දක්වා මේ වතාවත් සිදුකෙරේ. හැන්දෑ දූරය සඳහා සවස 6.30ට වැඩ හිඳින මාලිගාවේ දොර විවෘත කළ පසු හේවිසි මණ්ඩපයේ සිට වැයෙන "තේවා හේවිසි" නතර කෙරේ. පසුව පරමල් ඉවත් කර අලුත් මල් පූජා කරනු ලබයි. යළිත් "බොලපැන් පයිණ්ඩ" කරනවිට තේවා හේවිසි වාදනය ආරම්භ වේ. මෙහිදී ද මහරන් කෙණ්ඩියෙන් කුඩා රන් කෙන්ඩියට "බොලපැන්" රැගෙන අලුයම තේවාවේ දී මෙන් තේවා කටයුතු සිදු කරයි. පස්වරු 7.15 පමණ වනවිට වැඩ හිඳින කුටියේ දොරවල් වසා තේවා භාර කටයුතු සිදුකිරීමට සූදානම් වේ. එවිට තේවා භාර භික්ෂූන් වහන්සේලා

@Shan

ඇතිරිල්ල එළා පැන් කුසළාන පිරිනැමීම සිදු කරයි. සීනි, සූකිරි, ඇල්තෙලිජ්ජ සඳහා කුඩා පාත්රාන තුනක් ද පිළිගැන් වේ. තවද මී පැණි, එළඟි තෙල් හා ඉඟුරු ඉස්ම සහිත කුසළාන තුනක් ද පිරිණැමේ. මේ සඳහා "රන්කෝරාවක්" සහ "රිදීකෝරා" හතරක් භාවිත කෙරේ. ඒ අනුව කෝරා පහක බාහාලන පාන වර්ග හැන්දෑ දූරයේ දී පිළිගන්වයි. ගිලන්පස පූජා කිරීමේ පිළිවෙත් දෙදක් දැකගත හැකිය. එනම් පළමු ගිලන්පස පූජාව හා දෙවැනි ගිලන්පස පූජාව ලෙසිනි. දෙවැනි ගිලන්පස පූජාව සිදුකෙරෙනුයේ රාත්රී 8ට පමණය. දෙවැනි ගිලන්පස පූජාව සඳහා පළමු ගිලන්පස පූජාවට භාවිත කරනු ලබන පාන වර්ග සියල්ලම භාවිත නොවේ. දෙවැනි ගිලන්පස පූජාව සඳහා මී පැණි, සූකිරි, ඇල්තෙලිජ්ජ, එළඟි තෙල්, සීනි හා ඉඟුරු යොදාගැනීම සිරිතකි. චාරිත්‍රයක් ලෙසින් දෙවැනි ගිලන්පස පූජාව පැවැත් වීම ආරම්භ වී ඇත්තේ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා නිසාය.

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 130 කොටස

" අයි ලව් යූ ජැක්.."

" ඩෝන්ට් යූ ඩූ දැට්.. ඩෝන්ට් සේ යොර් ගුඩ්බායිස්.."

" ලිස්න් රෝස්.. යොර් ගොන ගෙට් අවුට් ඔෆ් හියර්.. යොර් ගොන ගෝ ඔන් ඇන්ඩ් මෙක් ලොට් ඔෆ් බේබීස් ඇන්ඩ් යොර් ගොන වොච් දෙම් ග්‍රෝ..!! ..අනේ මේ නටපන්.. මට බෑ මේක කරන්න.."

රධ්‍ය අයියා එකසැරේ බිමින් නැගිටලා ඇඳ උඩට ආවා.. මම බඩත් අල්ලගෙන හිනාවෙලා හිනාවෙලා ඇඳෙන් බිමට වැටුණා.. හෙනාතල් රධ්‍ය අයියා රඟපානවා.. හිච්චි ලියෝ..

අද හවස ප්‍රැක්ටිස් ඉවරවෙලා මායි රධ්‍ය අයියයි මූවි එක්ක බලන්න ගත්තා.. ඒ වුණාට ඒක කම්මැලී.. නින්ද යන්න වගේ ආපු නිසා අපි දෙන්නම රඟපාලා අපිම ෆිල්ම් පෙන්නගත්තා.. මම හිටියේ ලෑල්ල උඩ ඉඳන් ජැක්ගෙ අත්දෙක අල්ලගෙන ඉන්න රෝස්ගෙ කැරැක්ටරේට පණ පොවන ගමන්.. ලෑල්ල තමා ඇඳ.. බිම තමයි මූද.. රධ්‍ය අයියා හිටියෙ බිම.. මගෙ මූදු මංකොල්ලකාරයා..

" අපි එහෙනම් අර කාර් එකේ සීන් එක කරමු ඒයි.."

" මට බෑ..!!"

මම බිමින් නැගිටලා ඇඳ උඩට ආවා.. ඇවිත් රධ්‍ය අයියා ඉස්සරහින් ඉඳගත්තා..

" ඔයා අහලා තියද සාර සදිසි පෙති පේර නෙළන කළ.. වළගියදෝ මගෙ මෙවරයා~ කියලා එකක්.."

" ඒ මොකක්ද.."

" මම දන්නෙත් නෑ ඒයි.. ඉස්කෝලෙ මල්ලිලා වගයක් නට නට ඉද්දි අපි ස්කූල් රවුන්ඩ් යන ගමන් ඇහුව මල්ලි මොකක්ද නටන්නෙ කියලා.. ඌ කිව්වා අයියෙ මෙවර කවි කියනවා කියලා.."

@Shan

" අපිත් ස්කූල් රවුන්ඩ්ස් යන දවසක දැක්කා හරිද.. මෙන්න මෙච්චර විතර කොට තාරාවෙක් තාලම්පොටක් ගගහා වන්නමක් කියනවා.."

" අල්ලලා සාක්කුවෙ දාගන්න හිතුණා නේද.."

" උඹ ඒක කියන්නෙ ගස් උඩ නැගගෙනනෙ.. කොහෙ සාක්කුවෙ දාගන්නද.."

මම කොට්ටයක් අරන් ඒකෙන් රධ්‍ය අයියට ගැහුවා.. අපි අටේදි හිටිය පන්තිය ඇවිල්ලා.. ඒක වෙනම එකක්.. මාරම සාමකාමී ක්ලාස් එකක් විදියට තමා සෙක්ශන් එකේ ප්‍රසිද්ධ වෙලා තිබ්බෙ.. එක හේතුවක් සෙක්ශන් ෆස්ට් තර්ඩ් දෙන්නම හිටියෙ අපේ ක්ලාස් එකේ.. එහෙම දෙයක් ඇවිල්ලා අපේ ඉස්කෝලෙ වෙන්නෙ හෙන කලාතුරකින්.. අනික පන්තියෙ පනස් දෙනාගෙන් හතළිස් හයක්ම ප්‍රශංසනීය වාර්තා තියන උන්.. අපේ රිපෝට් එකේ ඔක්කොම සබ්ජෙක්ට්ස් වල ළකුණු එකතු කල්ලා ඇවරේජ් එකක් විදියට බැලුවහම සීයට හැත්ත පහට වැඩිනම් ප්‍රශංසනීයයි කියලා සීල් එකක් තියනවා.. අපි ඉතින් විභාගෙ කාලෙට පොතක් අරන් පිටිපස්සෙ ළකුණු ලිය ලිය විනාඩි පහෙන් පහට එකතුකරනවා.. මටත් වඩා සෙනුකයා තමා.. ඌට හොඳ අමාරුවක් තියෙන්නෙ අනිත් උන්ගෙ ළකුණු හොය හොය යන්න.. ඌ ඉතින් එකපාරක් සෙක්ශන් ෆස්ට් උනානෙ අටේදි..

ඉතින් අට වසරෙ ක්ලාස් එකේදි අපේ පන්තිය තිබ්බෙ ඊස්තටික් සබ්ජෙක්ට්ස් කලවම් පන්තියක් විදියට.. සෙක්ශන් එකටම එහෙම තියෙන්නෙ එකයි.. ඉඩ මදිවුණාම දාන්න.. අපේ ක්ලාස් එකේ හිටියා උඩරට නැටුම් කරන උන් ටිකකුයි, වෙස්ටර්න් මියුසික් කරන උන් බහුතරයයි, ඊස්ටර්න් මියුසික් කරන උනුයි, ආට් කරන උන් ටිකකුයි.. ආයෙ ඉතින් ඊස්තටික් පීරියඩ් දෙක කියන්නෙ.. ආතල් ලෝකයක් තමා.. එදාට කට්ටියක් වයලින් උස්සන් එනවා.. අපි රෙකෝඩර් අරගෙන එනවා.. සෙනුකයා ගිටාර් එකකුත් උස්සන් එනවා ඌට හවස ක්ලාස් තියන දවස් වලට.. අපි ඊස්තටික් ෆ්‍රී දවසක් සෙට් වුණාම පන්තියෙ බෙර ගගහා නටලා සිංදුකියලා සෙක්ශන් එක දෙක කරනවා.. අපේ පන්තියෙ මැඩම් හරිම හොඳයි.. හොඳයි කියන්නෙ.. අපිට කතාකරන්නෙ රත්තරං පුතාලා කියලා.. අම්මා කෙනෙක් වගේ.. මම අදටත් මගේ මුළු ජීවිතේම වැඩිපුරම ආදරේ මැඩම්.. චිත්‍රා මැඩම්.. අපිට ඉගැන්නුවෙ හෝම්සයන්ස්..

@Shan

ඔකෙ නටලා තමා දවසක් ඔෆිස් එක ඉස්සරහා දණ ගහන් ඉන්න වුණේ.. ඊටපස්සෙ මැඩම් ඇවිල්ලා මාව බේරගෙන එක්කගෙන ගියා.. රධ්‍ය අයියට මල්සරා විද්දා..

අටවසර කියන්නෙ අදටත් මගේ ජීවිතේ මම ගත කරපු හොඳම ඉස්කෝලෙ කාලෙ..

ඔය දැන් රධ්‍ය අයියා කියන්නෙ අපි නැටුම් කරන උන්ට තාලෙ අල්ලලා දෙනවා නටන්න.. වෛරොඩි වන්නම කියලා එකක් තිබ්බෙ අටේ සෙට් එකට.. උන් ප්‍රැක්ටිකල් වලට ගහක් යට අල්ලන් නටනකොට මමයි යාළුවොයි බැම්මට වෙලා උන්ට කවි කියනවා.. මැදුම තනි තිත- ජිං ගත ගො ගො.. අගය වඩන කවි වරුණා.. රහය දැනෙයි කළ රචනා.. මට උරණා නොව මෙදිනා.. මහතුගෙ අවසර රැගෙන සමාවා..

දැක්කනෙ මට තාම මතකයි..

" ඒ කාලෙ මතක් වෙනවා.. අපි පොඩි කාලෙ.. හෙන ලස්සනයි නේද.."

" ම්ම්.."

" ඔයාට මතකද ඉස්සර ලයිබ්‍රි පීරියඩ් එකේ අපි පොත් හංගලා එනවා.. දෙකයිනෙ ගන්න පුළුවන්.. අනිත් ලස්සන ඒවා කාටවත් හොයාගන්න බැරිවෙන්න හංගනවා.."

" මම මේ කල්පනා කරන්නෙ.. අපි නවයෙදි- මොකක්ද වුණේ කියලා.."

" ඒ මොකෝ.."

" මොකුත් නෑ.. මම පොඩි වැඩක් කියන්නම්.. හැබැයි උඹ මේක උඩදාගෙන ගිහින් සෙනුක මල්ලිගෙන් ඇහුවොත් නම් ආයෙ උඹට මොකුත් කියන්නෑ.."

මම හිමින් සැරේ රධ්‍ය අයියගෙ මූණට කිට්ටු වුණා.. රධ්‍ය අයියා පිටිපස්සට ගියා..

" මම අහන්නෙ නෑ.. පිස්සුද.. ඔයා මේ වරද්ව විශ්වාස කරන්න සුදුඅම්මියො.."

@Shan

" සෙනුක මල්ලි ස්කවුව කරන කාලෙ අයුකට ක්‍රශ් එකක් තිබ්බා.."

රඨ්‍ය අයියගෙ නොහිතපු නැති වචන වලට මගේ හුස්ම හිරවෙලා නවතින්න ආවා..

" ටහික්කෙන්න..!! කවුරු..?? මගෙ සෙනුකයද.. මේ මගෙ යාළුවා.. සෙනුක වත්සල්ද.."

" ම්ම්.."

" අඩෙ මම දන්නැනෙ.. තවසෙ කොහොමද ඕක දන්නෙ.."

" ඒ කාලෙ යම්කිසි සිද්ධි වගයක් වුණා.. මම දන්නෑ.."

" මට කියන්නෙ නෑ නෙහ්.. මම හොයාගන්නම්කො ඕකෙ අග මුල.. මෙච්චර බොක්කෙන් ඉඳලත් මේ පගයා මට කිව්වෙ නැනෙ.. මම තමා උගෙට හැම එකම කිව්වෙ.. අපරාදෙ තවසෙට කැමති හිතුනහම නොකිය ඉන්න තිබ්බෙ.."

" ඒකත් ඌ දන්නවා බං.."

රඨ්‍ය අයියා මගේ පිටට දබෝස් ගාලා පාරන් ගහලා හයියෙන් හිනාවුණා.. යකෝ!! සනෙරු.. උඹ රැවටිච්ච තරමක්..

" මුගෙ ආච්චිට.. සෙනුකයා.. බේසික පගා මට මොකුත් කිව්වෙ නෑ..!!!!"

" මගෙ තාරපැටියා රැවටිලා.."

" සැක් බං.. මගේ ජීවිතේම මුළාවක්ද කොහෙද.. ඒ වුණාට ඕකා අයුක අයියා එක්ක යාළුවුනාමත් මට කිව්වෙ නැනෙ.."

" අනේ මේ උඹලගෙ යාළුප්‍රශ්න පස්සෙ විසඳගනින්.. දැන් හෙට මැච් එක නේද.. මොනවද මේ උඹයි මායි කරන්නෙ.."

"අපි ප්‍රේමයෙන් මුසපත් වෙලා ඉන්නෙ.. ශුඩුඅම්මියට කුක්කු ඕනත.."

මම ඇස්පිල්ලම් දෙකතුනක් ගහලා රඨ්‍ය අයියා කිට්ටුවට ආවහම රඨ්‍ය අයියා හෙන මනමාල මූණක් හදාගෙන මගේ දිහා බැලුවා..

@Shan

" ඇත්තටද අහන්නෙ.."

" ඒ ඒ විහිලුවක්-ආව් අම්මාහ්.. මගෙ කොන්ද මනුස්සයො.. ශර්ට් එක.. අයියෙ.!!!!!!!!!!!!!"

රධ්‍ය අයියා, මගේ කියලා මම හිතාගෙන ඉන්නෙ එයැයිගෙ ශර්ට් එක අස්සෙට රිංගලා ශර්ට් කරෙන් අතක් උඩට කල්ලා මගේ කට තද කල්ලා අල්ලගත්තා.. වරදයා උඹ හැමදාම ඉල්ලගෙන කනවා..

මම කට වහගෙන ගිරේට අහුවෙච්ච මොකක්ද එක වගේ රධ්‍ය අයියගෙ බූචළු අඩු ටිකට මැදි වෙලා එහෙමම ඉද්දි නින්ද ගියා.. අද ප්‍රැක්ටිස් කල්ලා කල්ලා ඒ මහන්සියටත් එක්ක මම ආයෙ රෑ මැදදි ඇහැරුණේ නැතිම තරම..

මේ පොළොස් කොටෝරුවා ඇඳේ නටන නැටිල්ලට කවද හරි අපි දෙන්නගෙන් එකෙක් මැරෙනවා.. එක්කො ඇඳ පොලු ටික ගලෝගෙන වැටෙනවා.. සමහරවෙලාවට රධ්‍ය අයියා මගේ ඇඟ උඩිනුත් පෙරළිලා එහාපැත්තට යනවා.. ඒකා ඉන්න හැම පොසිශන් එකටම මාව ඇදලා අරගෙන බදාගන්නවා.. ඒකත් මේ සාමාන්‍ය මනුස්සයෙක් බදාගන්නවා වගේ නෙමේ.. අර තඩි අත් අස්සට මාව චප්ප වෙලා යනවා.. මමත් නිදිමරගාතෙ ඉන්න නිසා හොඳයි.. අම්මපා මගේ ඇටකට්ටක්වත් කැඩුනොත් මේකගෙ ඇටකටු සේරම මම තලනවා..

මම හිටියේ හෙන හිම ගොඩක ස්කූල් යුනිෆෝම් එකක් ඇඳගෙන.. බලන හතරවටේම හිම විතරයි.. මගේ කොණ්ඩෙත් හිම.. මගේ ඉස්සරහා හිටියෙ තඩි හිම වලහෙක්.. ඌ මාව කන්න මගේ පැත්තට ඇවිදගෙන එද්දි මම හිම ගොඩේ එරි එරි දිව්වා.. දුවලා දුවලා පස්සෙ තඩි හාවෙක් වැළු හිම ගොඩේම ගුලක් හාරගෙන ඒක අස්සට රිංගගෙන යද්දි මාව පාතාලෙකට ඇදගෙන වැටුණා.. ඒක දිගටම තිබ්බෙ මනුස්සයොන්ගෙ ඇටසැකිලි.. මම හෙන පතුලටම ඇදගෙන වැටෙනවා.. අම්මටසිරි වෙන්න කළුවර වෙගෙන එද්දි මට ඒ ගුහාව අස්සෙන් කටහඬක් දෝංකාර දෙනවා වගේ ඇහෙන්න ගත්තා..

" වරද්..!! පහමාරයි.. වේක් අප්.. වේක් අප්..!!!"

වරද්..?? රධ්‍ය අයියා කොහෙන්ද ගුහාවක් අස්සට ආවෙ.. මම මුගෙ ආහාර ජීර්න පද්ධතියේ ක්ශුද්‍ර ජීවියෙක් වෙලා ඉපදිලාවත්ද..

@Shan

" වරද්!!!!"

එකසැරේට ගුහාවට භූමි කම්පාවක් ඇවිල්ලා මාව කැරකෙන්න ගත්තා.. ඊටපස්සෙ මගේ පස්ස දෙදරන්න හොඳ පාරක් වැදුණහම මාව සුදුපාට බ්ලැන්කට් එකක් අස්සෙන් ලාවට ඇහැරුණා..

" නැගිටින්න වරද්.. රෙඩි වෙන්නෙ නැද්ද.."

මම අකුණක් ගැහුවා වගේ නැගිට්ටා.. හත්දෙයියනේ අද මැච් එක නේද පුතේ.. මම ඔලුවෙ ඉඳන් තිබ්බ බ්ලැන්ක්ට් එක අගමුල හොයාගන්න බැරුව ඒක හැමතැනම පටලගෙන බැරිමතැන ඒක අල්ලලා ගුලි කල්ලා විසික් කල්ලා රධ්‍ය අයියා කොහෙද කියලා බැලුවා..

" ගුඩ් මෝනින්.."

රධ්‍ය අයියා.. හෙන ලස්සන හිනාවක් දාලා මගේ අතින් දම්පාට ග්ලැඩියෝලි මල් පොකුරක් තිබ්බහම මම මොකුත් හිතාගන්න බැරුව ඒක දෝත බඳලා අල්ලගෙන පපුවට තදකරගත්තා.. මල් පොකුරෙන් එන ස්වීට් ෆ්‍රෙශ් සුවඳ මට මූණ ගාවින්ම දැනුනා.. මම මල් ටික දිහා බලලා ඇස් දෙක ලොකු කරගෙන රධ්‍ය අයියා දිහා බැලුවහම එයා නැමිලා මගේ නළලින් හාද්දක් තිබ්බා.. උදේ පාන්දරම මට දැන් පිස්සු වගේ..

" ගිහින් වොශ් එකක් දාගන්න.. හය වෙද්දි යන්න ඕනනෙ.."

" ආ.. ඔව්.."

මම විකාරෙන් වගේ ඔලුව වනලා ඇඳෙන් නැගිටලා මල් එක කවුච් ස්ටූල් එක උඩින් තිබ්බා.. මගේ ඇස් වලට කඳුළු උනනවා මට තේරුණා.. අඬන්න දෙයක් නෙමෙ වෙන්නැති.. ඒ වුණාට මගේ ඇහිපිහාටු තෙමාගෙන ඇස් වලින් පල්ලම් බැහැපු කඳුළු බිංදුවක් 'ටොක්' ගාලා ග්ලැඩියෝලි කිණිත්තක මල් පෙත්තක් උඩට වැටුණා.. මම ඇස් දෙක පිහාගෙන රධ්‍ය අයියා ගාවට ගිහින් ඉස්සිලා එයාගෙ උරහිව වටේ අත් දෙක ඔතාගෙන බෙල්ල අස්සෙන් මූණ තියාගත්තා.. අනිත් හැමදවසකටම වඩා මට සතුටු හිතුණා.. මගේ නම ගහලා පොඩි විශ් ටැග් එකක් එක්ක හම්බෙන මල් පොකුරක්.. ඒකත් රධ්‍ය අයියගෙන්.. මම එහෙම දේවල්වලට සීමාවක් නැතුව ආදරෙයි..

රධ්‍ය අයියා මගේ ඉණ වටේ අත් යවලා මාව තුරුළු කරගත්තා..

@Shan

" ඇයි කියනවකො මෙහෙම.. කරන්නෙ.."

" කොහොම..??"

මම තව ටිකක් රධ්‍ය අයියව තද කල්ලා බදාගත්තා..

" මොකුත් නෑ.."

මම රධ්‍ය අයියගෙ බෙල්ල ගාවින් හිමිහිට නොදැනෙන්න හාද්දක් තියලා රැක් එකේ තියන ටවල් එකත් අරගෙන බාත් රූම් එකට වැදුණා.. රධ්‍ය අයියා හිනාවෙවී මම යන දිහා බලාගෙන හිටියා..

*ක්ලික්*

මම දොර අගුල තද කල්ලා දොර ගාවම බිම වාඩිවුණා.. මගේ කම්මුල් ගිනිගන්නවා වගේ.. ඉස්සරහා තියන කණ්ණාඩියෙන් මාව රතුපාටට පේනවා.. සමහරවිට ආදරේ කල්ලා මට ඒක පිස්සුවක් වෙයිද මන්දා.. උදේ පාන්දරම මට හරිම සතුටක් දැනුණේ.. හැමතිස්සෙම වගේ නෙමේ.. ඉඳලා හිටලා වෙන සමහර සිද්ධි තියනවා.. ඒවා තදින්ම හිතට කාවදිනවා.. කාවදිනවා කියන්නෙ.. ජීවිතේට අමතක නොවෙන තැන්වල රැඳෙනවා.. මට පළවෙනියටම රධ්‍ය අයියා හාද්දක් දීපු දවසෙ රෑ මතක්වුණා..

ඇත්තට මගේ ජීවිතේ ලස්සන මතක කොච්චර එකතු වෙනවද..

මම නැගිටලා සින්ක් එක ගාවට ගිහින් මූණට වතුර දාගත්තා.. දවසක් රධ්‍ය අයියගෙ ඩයරි එකේ ලියලා තිබුණා..

'

**හැමතිස්සෙම අවුලන්න බලාගෙන ඉන්න දුඹුරුපාට ඇස් මං ගාවදි සැනසීමෙන් ඉන්නවනම.. ඇවිලෙන්නැතුව පරිස්සම කරනවා..**

'

මේ මනුස්සයා මට තේරුම් ගන්න බෑ.. එහෙම කරන්න ගන්න වෙලාව අපරාදෙ.. පිටින් පේන, මම ආදරේ කරන චරිතෙ මට තේරුම් ගියාට එයාගෙ ඇතුලින් ඉන්න අමුතු ගුප්ත අඳුරුපාට චරිතෙ මට තේරුම් ගන්න

@Shan

බෑ.. එහෙම ඕනත් නැහැ.. මට තේරුම් යන ටික ඇති.. මම හිතන්නෙ එයත් කැමති නෑ ඒ ගැන කවුරුත් හොයනවනම්..

එයාට එයා වෙන්නත් ඉඩක් තියන්න ඕන..

මම ඉන්ඩෝ ස්ටේඩියම් එකට යද්දි කෝච් ඇවිත් හිටියෙ නෑ.. ඒකනිසා මමයි තව යාළුවො දෙතුන් දෙනෙකුයි චේන්ජින් රූම් එකට වෙලා කියව කියව හිටියා.. මම කිව්වෙ අශාන්.. ඌ හොඳ එකා.. බොක්කෙන්ම කතාකල්ලා හිනාවෙලා ඉන්නවා.. සමහර උන් නම් හිටියා මගේ වයසෙම මට වැඩිය අල්ලන්නැති.. දැක්කත් ඇහේ වැදීගෙන යනවා.. රවනවා. හින්ට් පාස් කරනවා.. අනික මම ලොකු කාලයක් ට්‍රේන් වෙලා නැති නිසා මට කින්ඩියට හිනාවෙනවා..

මටනම් එහෙම අවුලක් නෑ ඉතින්..

ගියපාර මැච් එකේදිත් මට ඔහොමම වුණා.. ඒකෙදිනම් යාළුවෙක් හම්බුණෙත් නෑ.. කෝච් තමා ළඟින් හිටියෙ.. කොහොමත් ස්පෝර්ට්ස් කරනවනම් අනිත් පැත්තෙන් හුඟක්ම කනෙක්ශන්ස් බලපානවා.. හුඟක් වෙලාවට සල්ලි තමා.. ඒකයි කෝච් හැම මැච් එකම ප්ලේ කරන්නෙ නැතුව හිතලා බලලා හොඳ මැච් එකක් විතරක් භාරගන්නෙ.. මෙ මැච් එකටත් ස්පොන්සර් කරන නිසා මම ප්ලේ කරන ක්ලබ් එකට මම වින් කළොත් ගාණක් හම්බෙනවා.. මට කොහොමත් සැලරි එක වැටෙනවනෙ.. ඒ අමතරව තව ගාණක් වැටෙනවා..

මෙහෙ විසිටින් ඇවිත් හිටිය ජර්මන් ටීම් එකත් අපිව අඳුනගත්තා.. අශානයා කියනවා ජර්මන් කෙල්ලොත් ලස්සනලු.. අනේ මන්දා ඌටනම් සිකුරු උච්ඡ වෙලාද කොහෙද.. ආපු වෙලේ ඉඳලා කෙල්ලෙක් ගැනම කියවනවා.. මූට බූට් එක තියපු නංගි කවුද දන්නෙ නෑ.. පුළුවුඅන් වුණොත් මම හොයාගෙන ගිහින් කණට දෙකක් ගහලා එනවා.. මොකද උගෙ ඇඩියාව අහන් ඉන්න වුණේ මට.. අපෙ මහීශා වගේ.. නෑ නෑ නෑ නෑ.. නැති බණේම තමා..

" සරනේරු!! හරියට මම කිව්ව ඒවා මතක තියාගන්න.. තේරුණානෙ.."

මගේ ෆස්ට් රවුන්ඩ් එකේදි කෝච් ඇවිත් මගෙ පිටට දෙකක් ගහලා කියද්දි මම දැක්කා ෆොන්ට් රෝ එකේ රධ්‍ය අයියා තව අයියා කෙනෙක් එක්ක කතාකර කර ඉන්නවා.. ස්ටේඩියම් එක පිරෙන්නම කට්ටිය හිටියා..

@Shan

ඇනුවලි තියන මැච් එකක් නිසා බැඩ්මින්ටන් රිලේටඩ් අයට මේ මැච් ඉම්පෝටඩ් මැචෙකක්.. මමමගේ පුළුවන් උපරිමෙන් ප්ලේ කළා.. කොහොමත් බැඩ්මින්ටන් කියන්නෙ මගේ ඇහේ තියන අමුතු විසයක්.. එහෙම තමා ඉස්කෝලෙ කෝච් කියන්නෙ.. රැකට් එක අතට ගත්තම මට ඒක ඇහට දැනෙනවා.. එහාපැත්තෙ වික්ටර් ඇක්සෙල්සන් හිටියත් කමක් නෑ වගේ ගැම්මක් එන්නෙ හිතට.. ඔනම දෙයක් ආසාවෙන් කරද්දි ඒකට ඇබ්බැහිවෙනවා කියන්නෙ.. ඉතින් මටත් බැඩ්මින්ටන් කියන්නෙ එහෙම ගේම් එකක්.. රැකට් එක ගත්තොත් වනාගෙන වනාගෙන යනවා..

" The Shaneru Udyoga player has been named as the

**most talented player of this year by winning the overall victory in the Golden Racquets annual badminton tournament**

..

We respectfully invite him on the stage to receive his medal.. It is surprising that he won the victory among the players who have participated in the Golden Rackets tournament so far.. There is no doubt that

**Shaneru**

will challenge us again in the future.."

අන්තිමේ ඉතින්.. කොහොම හරි මම රැකට් එක වැනුවා..

මෙඩල් එක ගන්න ස්ටේජ් එකට හති දාගෙන නගිද්දි මම දැක්කා චෙන්ජින් රූම් එකේදි මට කෝචොක් කරපු උන්ගෙ කටවල් ඇදවෙලා යනවා.. මම ස්ටේජ් එකට නගින්න කලින් පහළ ඉදපු අශාන් මට ෆිස්ට් බම්ප් එකක් දීලා පොඩි හග් එකක් දුන්නා.. මගේ කම්මුල් වලට දාඩිය දාලා ඒවා ඇහිපිහාටුවලත් ගැවිලා දිලිසෙනවා.. ටූනමන්ට් එකේ චීෆ් ගෙස්ට් මට මෙඩල් එක දාලා හැන්ඩ්ශේක් කළාට පස්සෙ ලස්සන අක්කෙක් ඇවිත් මට මයික් එකක් දීලා ගියා.. මම මයික් එක අතට අරගෙන ඉස්සෙල්ලම පොඩ්ඩක් හිනාවුණා.. හිනාවෙන්නෙපෑ මම සතුටින්නෙ ඉන්නෙ..

" How do you feel about your victory..?"

@Shan

මම මයික් එක ඕන් කල්ලා තට්ටුවක් දැම්මා..

" Um.. To be honest, the most important thing for me was to participate in this competition today..

And I'm very happy with the victory I got today.. It was really unexpected.. but I believe I faced well for the competition..

First of all, I would like to thank my coach, Coach Edirimana.. Thank you sir.. Also, I would like to thank from the bottom of my heart the person who encouraged me to take the first steps in badminton life..

Thank you.."

මම ටිකක් ඔලුව පහත් කල්ලා ස්ටේජ් එකෙන් බැහැලා කෝච්ට හග් එකක් දුන්නා.. කෝච් එකපාරක් වැරැද්දුවටද කොහෙද මගේ පිටට බෝස් බෝස් ගාලා පාරවල් දෙකක් දීලා මාව එහාට කල්ලා මූනිවඡාවට හිනාවුණා.. ඉදපන් තාත්ව් අක්කට කියන්න.. වෙළුසුමනයා.. මම මෙඩල් එක ගලවගෙන චේන්ජින් රූම් එකට ගිහින් චේන්ජ් කරගත්තා.. හුහක් අය මට විශ් කලා.. මම ෆීල්ඩ් එකට අලුත් නිසා අඳුරගත්තා.. මම හැමෝ එක්කම සාමාන්‍ය විදියට කතාකල්ලා එළියට එද්දි රධ්‍ය අයියා කෝච් එක්ක පැත්තක කතාකරනවා.. ප්ලෙයර්ස්ලගෙ පේරන්ට්ස්ලා එහෙම ඇවිත් එතන සෙනහ හුගක් හිටියා.. මම දුවගෙන ගිහින් රධ්‍ය අයියට හග් එකක් දුන්නහම කෝච් ලාවට හිනාවෙලා එහාට වුණා.. මම මෙඩල් එක අරගෙන රධ්‍ය අයියගෙ අතේ තිබ්බා..

" මට හුහක් සතුටුයි වරද්.."

රධ්‍ය අයියා මෙඩල් එක අතේ ගුලි කරගෙන කියද්දි එයාගෙ වචන තුන හතරෙ තිබ්බ අව්‍යාජ ගතිය.. ඒ හැඟීම මට ඕනවටත් වඩා දැණුනා.. ඒක මම මීටකලින් දැකලා තියනවා.. ස්පෝර්ට්ස් මීට් එකේදි අපේ හවුස් එක වින් කලාම එයා මට විශ් කලේ.. ඒ වගේ.. මට දැන් මෙතනම රධ්‍ය අයියට හෙන ලොකු හාද්දක් දෙන්න හිතෙනවා..

" මගෙ වරද් කියන්න.."

@Shan

රධ්‍ය අයියගෙ මූණ ලාවට රෝසපාට වුනත් එයා මගේ කන ගාවට හිමිහිට පහත් වුණා..

" මගෙ වරද්..!!"

මම රධ්‍ය අයියගෙ පපුවට පාරක් ගහලා මෙහාට වුණා..

*cough* *cough*

ඒ එක්කම මම පිටිපස්ස හැරුණහම කෝවා හෙන මනමාල හිනාවකුත් දාගෙන අපි දෙන්නා දිහා බලාගෙන ඉන්නවා.. මමත් කෝව්ට රිප්ලයි පැණි හිනාවක් දැම්මහම කෝව් රවාගත්තා.. අපේ වෙඩ් අංකලේ නැත්නම් ඉතින් මෙකට එන්න වෙන්නෙ නෑනෙ.. තව තව දරුඵල ලබෙන්නෝනි වෙඩ්සුමනයාට.. ඒස්වාහ පුහ්ඃ..

" හවස පාටි එකක් ඇරේන්ජ් කල්ලා තියනවා.. කැමතිනම් ඔය දෙන්නා ජොයින් වෙන්න.. Excuse me.."

කෝවා රධ්‍ය අයියගෙ පිටට තට්ටුවක් දාලා අමුතුවට හිනාවෙලා එතනින් යන්න ගියා..

" අපි හොටෙල් එකට යමු.."

රධ්‍ය අයියා මාව ඉස්සර කරගෙන පාකින් ලොට් එකට ගියා.. අපි හොටෙල් එකට එද්දි හතරහමාර වෙලා.. මෙහෙට හැමතිස්සෙම වහිනවනෙ යකෝ.. දැනුත් හෙන චුරු චුරු වැස්සක් වහින්න අරගෙන තිබ්බෙ.. ඒකනිසා බැල්කනියෙ දොර අරින්න විදියකුත් නෑ.. මම නම් ඔය ඇරේන්ජ් කරපු පාටියට යන්නෙ නෑ කියලා හිතාගෙන හිටියෙ.. මොකද ගියාම කරන්නෙ සේරම එක්ක බීගෙන පිස්සු කෙළින එක විතරයි.. කෝවා මම බෝතලයක් දිහා බැලුවොත් හරි මට රැකට් එකෙන්ම ගහලා මරලා දාවි.. ඒකා කැමති නෑ හැමෝ එක්ක හිනාවෙලා කතාකරන්න යනවට.. හැමතිස්සෙම කියන්නෙ පාඩුවෙ ඉන්න කියලා..

මම කාමරේට ඇවිල්ලා සපත්තු දෙක පන්නලා පැත්තකින් තියලා ග්ලැඩියෝලි මල් පොතුර අතට අරගෙන ඒක දෙපැත්තට වැනුවා.. උදේ කලබලේ යන්න ගිහිල්ලා මල් එකවත් බලන්න වුණේ නෑනෙ.. දම්පාට ග්ලැඩියෝලි වලින් කියන්නෙ මොකක්ද දන්නෙ නෑ.. ඒකට මොකක් හරි

@Shan

තේරුම ඇති.. නැත්නම් රධ්‍ය අයියා ඒකම ගේන්නෙ නැනෙ.. ග්ලැඩියෝලි වගේ රධ්‍ය අයියට ඇවිදින මලක් හම්බෙලා තියෙන්නෙ.. ඒකම කොච්චර දෙයක්ද..

මම රධ්‍ය අයියා කාමරේට එනකල් ඉඳලා මල් පොකුරත් අතේ තියාගෙනම ඉස්සිල්ලා එයාගෙ තොල් වලින් හාද්දක් තිච්චහම රධ්‍ය අයා්‍ය මාව එහෙමම බිත්තියට තියලා මගේ ඉණෙන් අල්ලලා ඇඟට තද කරගත්තා.. මම එක අතකින් මල් පොකුර බදාගෙන අතින් අතින් රධ්‍ය අයියගෙ කොලර් එකෙන් අල්ලලා එයා මං ගාවට ඇදලා ගත්තා.. මම පොඩ්ඩක් උස මදිනෙ..

එයාගෙ තොල් සීතලට මගේ තොල් එක්ක පැටලෙද්දි මට අර මත් වෙන ගතිය දැනුනා.. රධ්‍ය අයියා මගේ කකුලක් උස්සලා ඉණෙන තියාගෙන මාව උස්සලා ගත්තා.. අරගෙන මාව එහෙමම ගිහින් ඇඳ උඩට අතෑරලා මගේ ඇඟ උඩට ඇවිත් මාව ඇග්‍රෙසිව් විදියට කිස් කලා.. මම එයාගෙන් ගැලවෙන්න ට්‍රයි කලෙත් නෑ.. මගේ ඇඟිලි එයාගෙ පිට දිගේ කීපසැරයක්ම උඩ පල්ලෙහා ගියා.. පැය බාගෙකින් විතර රධ්‍ය අයියා මගෙන් එහාට වුණාම මගේ ඇඟේ ලා රතු පාට පැල්ලම් නැති තැනක් තිබ්බෙ නෑ.. එයා කැමති විදියකට මම එයාගෙ අත් මැද්දෙ හෙම්බත් වෙලා වගේ හිටියා..

" Someone's boyfriend is feeling happy today.. Anything my lord..??"

" Can this knight let the Lord breathe a little..? මට-හ්හ් හුස්ම ගන්නත් බෑ.."

රධ්‍ය අයියා මගේ අතක් අරගෙන පිට අල්ලට හාද්දක් දුන්නා.. එයා හිටියේ හුඟක් සතුටින් කියලා විතරක් මට තේරුණා.. ඇත්තටම එයා මේකෙන් මෙච්චරට සතුටු වෙනවැති කියලා මම හිතුවෙ නෑ.. මට දැනුණ සතුට දෙගුණ වෙලා දැනුනහම මගේ කම්මුල් රතුපාට වෙලා පිපිරෙන ආවා.. රධ්‍ය අයියට කට කොනෙන් හිනාගියා..

" ඕක නවත්තගනින්.."



මගේ ලස්සන ළමයෝ.. මේ අකුරු වලට මම හුහාක් ආදරෙයි අනේ.. ලස්සනම ලස්සනයි..

@Shan

මට හුඟාක් හුඟාක් හුඟාක් සතුටුයි මේක කියවද්දි.. ඇත්තටම හුඟක් ස්තූතියි අක්කා..

මම ආදරෙයි..❤

කොහොමද ළමයිනේ.. (ඔතරී අපි පා~වෙන ලෝකෙ අහන ගමන්)

සනෙරු පුතා දිනුවලූ.. එයැයිට ඔය කැලෑමක් හරි දීගෙන යන්ට අනේ.. මට තමා ඉන්න හොඳම රීඩර්ස්ලා ඉන්නෙ.. ඔයාලගෙන් ලැබෙන ඇඩ්වයිසස්.. එතකොට කමෙන්ට්ස්.. වෝට්ස්.. කවර්ස්.. ලස්සනම ලස්සන කවි.. ඔයාලට මැවෙන රූප.. මේ හැමදේකට මම හුඟාක් ආදරෙයි.. 😘

එන්නාම්.. ලව් යූ.. ❤

The purple gladiolus flower represents

...

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුනවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 131 කොටස

" පරිස්සමට සුදුමහත්තයා..!! කියපුවා මතකනෙ.. වෙලාවට කෑම කාපන්.."

" හරේ.. මේ රෑවෙන්න කලින් ගෙදර එන්න හොදේ.."

" මම අද කලින් එනවා.. උඹට තමා කියන්න වෙන්නෙ.. හතර වෙද්දි ගෙදර නාවොතින් කකුල් දෙක කඩනවා.."

" හරි අනේ.. ඔයාගෙ මස්සිනා එක්කනෙ එන්නෙ.. අපේ හිච්චි ගුරුතුමා අද ඉස්කෝලෙ එනවනෙ.."

" උඹ උගට පේන්න මායම් වෙලා නටන්නැතුව.. පාඩුවෙ ඉදින්.."

" ඒක හරිම මගුලක්නෙ.. මම මායම් නොවී කවුරු මායම් වෙන්නද.. හරි හරි මම යනවා.. මාමා එනකල් ආධ්‍ය අයියා මායම් වෙනවැති.."

මාමා ස්කූල් ගේට් එක ඉස්සරහින් කාර් එක නැවැත්තුවහම මම බෑග් එක කරේ දාගත්තා.. මාමා මගේ බෙල්ලෙන් ඇදලා අරගෙන මරන්න වගේ කොණ්ඩෙට හාද්දක් දීලා දොරෙන් එලියට දැම්මා.. සැක්.. ඉස්කෝලෙට යන එන උනුත් බලන් හිටියා මාමගෙ තොත්තුව.. මම හැමදාම කියනවා ඉස්කෝලෙ ඉස්සරහා ඉඹින්න තියාගන්න එපා කියලා.. මේ අනුරාග් නැට්ට ගිනිගත්තු මාමණ්ඩියා ඒකනිසාම හැමදාම තොත්තු දීලා මාව කාර් එකෙන් එළියට දාන්නෙ.. මම කාර් එකෙන් බැහැලා මාමට දෙකක් රැව්වා..

" කිරිපුතේ.. පරිස්සමට වරෙල්ලා මාඅම්මා.."

" පලයන් මාමෙ.."

මම කාර් එකටත් පයින් එකක් ඇනගෙන ප්‍රිෆෙක්ට් බැජ් එකත් කමිසෙ රදවගෙන අත් දෙක උඩට නමාගෙන ඉස්කෝලෙට එන්න ආවා.. හයයි හතළිහයි.. මම ළමයි අස්සෙන් රිංගලා රිංගලා උඩට දිව්වා.. ටොප් බෝඩ් එක හයයි හතළිස් පහ වෙද්දි ඔෆිස් එකේ සයින් කරන්න එපැයි.. විනාඩි පහයි.. සනෙරු උද්‍යෝග දුවපාන්!!!

@Shan

අද ඉස්කෝලෙ දෙවෙනි වාරෙ පටන්ගන්න දවස.. ඊයෙ ඉස්කෝලෙ පේරන්ට්ස්ලට ශ්‍රමදානයක් තිබ්බ නිසා හොඳට පිරිසිදුව ඉස්කෝලෙ තිබුණා.. රධ්‍ය අයියා අද ඉස්කොලෙ එනවනෙ.. හය වසරට උගන්නන්න.. ඒ ක්ලාස් එකේ ඉඳපු මැඩම්ට හදිසියෙ කකුල ඔපරේශන් කරන්න වෙලා කොහොමත් පන්ති භාර අඩුවක් කලින් ඉඳන්ම තිබ්බා.. ඒකනිසා ප්‍රින්සිපල් සර් කියලා රධ්‍ය අයියට පන්තිය බලාගන්න කියලා.. එයා ගණිතයි ඉංග්‍රීසියි උගන්නන  ගමන් පන්ති භාර ඉන්නවා.. ඒ වුණාට එයාට පන්තියෙ දේවල් තනි තීරනේට කරන්න බෑ.. කෝඩිනේටරේගෙන් අවසර ඕන.. කෝඩිනේටරයා රධ්‍ය අයියට හෙන ලව්.. අද ස්කූල් රවුන්ඩ්ස් යනවනෙ.. සුදුඅම්මියට උම්මියක් දීලා එන්න පුළුවන්..

" අඩෝ ෂනෙරු.. ගුඩ් මෝනින්.."

චමිරුවා සයින් කරන තැන ඉඳලා මම ආපු ගමන් මගේ පිටට තඩිබෑවා..

" ගුඩ්මෝනින් බං.. පෑන දීපංකො.."

මම උගේ පෑන ඉල්ලගෙන සයින් කරද්දි සෙනුකයා ඔෆිස් එකේ ඉඳලා එළියට ආවා.. සෙනුකයා තනියට මස්සිනාව හැමතැනම එක්කගෙනද කොහෙද යන්නෙ.. හොඳයි හොඳයි මස්සිනාලා එකට ඉන්න එක.. මේ ලෝකෙ තියන ලස්සනම බැඳීම් වලින් එකක්ලුනෙ මස්සිනයි-මස්සිනයි බැඳීම.. නෑ නෑ.. නෑනා-මස්සිනා කතා අපිට අදාළ නෑ.. මොකද ආශියි අයාන් අයියයි මරාගෙන කන්න තරම් තරහ නිසා අපි මස්සිනාලා-නෑනලා අයින් කල්ලා ඉන්නෙ.. ඕන්නම් මස්සිනාලා-මස්සිනාලා ඉන්නවා.. එච්චරයි.. කොහොමත් ආධ්‍ය අයියා මගේ තමා..

" පෞකාරයෝ.. දෙයියනේ.. සුබෝදැසනක්.."

සෙනුකයා මගේ කරට අතක් දාගත්තහම චමිරුවා ඉස්සරවෙලා එන්න ආවා.. සෙනුකයයි මමයි පස්සෙන් ප්‍රිෆෙක්ට් රූම් එකට ආවා..

" අඩෝ අවුරුදු ජයද බං.."

" නෑ බං.. සිරාවටම.. මහින්ද මහත්තයා සිරන්ති එක්ක කිරි උතුරනවා ටී වී එකේ බලන් ඉඳලා පුරුද්දට.. දැන් ඒක නැතුව ජය නෑ බං.. මට බෑ බං.. කඳුළුත් එනවා.. මේ.."

@Shan

" අඩන්නෙපා බං.. රධ්‍ය අයියා කිරි ඉතිරුවෙ නැද්ද.."

මම සෙනුකයගෙ බඩ කෙනිත්තුවා.. අවලමා කිව්වොත් කියන්නෙ මහ බේසික කතාවක්මයි..

" මිම්.. ඉතිරුවා කිරි නෙමෙ පැණි.."

" එහෙමත.. ආසයි නෙහ්.."

" නැතුව.."

" අඩෝ මමනම් අද මෙ බලාගෙන ඉන්නෙ රධ්‍ය අයියා උගන්නන්න දකින්න.. කොමතේ බොසා සෙක්සන් එක හොල්ලන් ඉද්දි.. ආයෙ ගැම්මක් තමා සනෙරුවා.."

චමිරුවා අපි කියන ඒවා අහගෙන යන ගමන් ඉස්සරහා තිබ්බ ජේර අත්තෙන් පහළට ඇද්දා.. රෑ වැහැලා ඒකෙ කොළවල හෙනට වතුර රැඳිලා.. මාවයි සෙනුකයවයි නැව්ලා ගියා..

" හු#තො.."

" අඩෝ මස්සිනා කුණුහර්ප කියන්නෙපා මම අයියට කියනවා.."

" අයියා..?? ඕකා කතාකරකල් තමා මාත් ඉන්නෙ.. උඹට කියන්නෙ සනෙරු.. ඒකට ඊයෙ උණ හැදිලා.. හරිද.. මම කිව්වා බෙහෙත් ගන්න පලයන් පලයන් කියලා.. මුගෙ තියන මුරණ්ඩු කමට නෑ වත්සල් ඔන්නෑ උණුවතුර බොනවා ගගා හිටියා.. දැන් කතාකරගන්නත් බෑ.."

" අඩෝ සිරාවට.."

" මුන්ට කියලා වැඩක් නෑ බං.. ඇයි මාළිගාවෙ කුමාරයනෙ.."

" උඹ කේන්තිගන්නැතුව ඉදහන්කො.. ලෙඩ වෙන්නැතුව ඉතින්.. අපි මනුස්සයොනෙ.."

මම කේන්තියට රතුවෙගෙන ආපු සෙනුකයගෙ පිටට දෙකතුනක් ගහලා ප්‍රිෆෙක්ට් රූම් එකේ මගේ ඩෙස්ක් එකෙන් බෑග් එක තිබ්බා.. තියලා අද ඩියුටි පොත එළියට අරගෙන චමිරුවට දුන්නා.. ඌ තමා ඩියුටි අත්සන්

@Shan

කරන්න ඉන්නෙ අද.. මට පෙනී යනවා අම්බානෙක උන් ටිකක් මුගෙන් බලු කතා අහගන්නවා.. අපිනම් යාළුපිටි එකට අඩුපාඩුවක් දෙකක් තිබ්බහම ඒක ස්ටුවර්ඩ්ට පෙන්නලා ආයෙ කරන්න එපා කියලා කියනවා.. දෙපාරක් තුන්පාරක් කළොත් තමා බනින්නෙ.. ඒත් මූ එක්ක ඒවා බෑනෙ.. මූ අඩි හප්පලා බැනලා එතන දෙක කරනවා.. ඊටපස්සෙ එකෙක්ගෙ වැරැද්දට මුළු බෝඩ් එකම ගෙන්නලා හොඳ දේශනයක් තියනවා.. අපි පැයගානක් හිටගෙන ඌ කියන ඒවා අහගෙන ඉන්න ඕන.. මීටින් ඉවරවුණාම අත්සන් ගන්න ඕන.. මටනම් මූ එක්ක ඩියුටි කරන්න ගියාම එපාවෙනවා.. ප්‍රිෆෙක්ට් කෙනෙක් පොඩ්ඩක් හරි කොණ්ඩෙ වවලා තිබ්බොත් එදාට හරි.. ඉවරයි.. කොටින්ම මූට මැඩම්ලත් බයයිද කොහෙද.. රධ්‍ය අයියගෙ ඩියුටිය මූ ගානට කරනවා..

" ෂනෙරු..!!!!! කෝ මේකෙ ලියලා නෑනෙ.!"

මම සෙනුකයා එක්ක අතිශය පෞද්ගලික කතාවක යෙදිලා ඉන්න වෙලාවෙ හෙන ගහන්න වගේ චමිරුවා පොත මේසෙ උඩින් තිබ්බා.. මාවයි සෙනුකයයි ගැස්සිලා ගියා.. අම්මපා මූට..

" මොකද යකෝ!!!!!!!!"

මම එතන තිබ්බ පෑනෙන් පොත උඩට දමලා ගැහුවා.. මුගෙ ආච්චිට හාල් ගරන්න.. පොඩ්ඩක් හොඳින් කතාකරපන්කො.. තා ඩිංගෙන පපුවත් නතරවෙනවා..

" ඇයි.."

" බෙරිහන් දෙන්නැතුව හිමින් කතාකරපන්.."

"ආ.. හරි ඉතින්.. මේක ලියලා නෑනෙ උඹ.."

" උඹට ඕන්නම් ලියාගනින්.. රෙද්ද.."

මම නැගිටලා එන්න ආවා.. මූ හැමදාම ඔහොමමයි.. උදේ පාන්දර වලියක් ඇදගන්නවා.. වලිම නෙමේ.. ඒ ඌ කතාකරන විදිය කියලා මං දන්නවා. ඒ වුණාඅ පොඩ්ඩක් තියෙන්න එපෑ මනුස්ස කම කියලා එකක්..

@Shan

අර තරුවි නංගිට ඔලුවට දෙක්ක ඇනලා පැහැදිලි කල්ලා දෙන්න ඕන මිනිහව හරියට හදාගනින් කියලා.. ඇයි යකො.. යාලුවොන්ටවත් මූට හරියට කතාකරන්න බැරිද.. මං අහන්නෙ මූ තරුවි නංගිට කතාකරන්නෙත් ඔහොම තමා.. ඒ කෙල්ල අහිංසක කමට ඉවසගෙන හිටියට.. අපි දවසක් මුගේ ඩේට් එකකට සපෝට් කරන ගිහින් හොඳට ඇඳගෙන නැවා.. තරුවි නංගි මූ එක්ක යාලුවෙලා ඉන්නෙ ගෙදරට හොරෙන්.. ඉතින් මූ කියන කියන සැරේ ඩේට් වලට එන්න බැනෙ.. එදත් මූ එක්ක පැය දෙකක් විතර කතාබහකල්ලා නංගි යන්න හැදුවහම මූට මලපැනලා නංගිට හොඳටම බැන්නා.. ඒ කෙල්ල සේරම පැත්තක තියලා අඩන්න ගත්තා.. පස්සෙ මමයි සෙනුකයයි තමයි ඒකිව ගිහින් බස් එකට ඇරලලා පරිස්සමට ගෙදර යන්න කිව්වෙ..

ඒ කෙල්ල මූ හම්බෙන්න ඇවිත් තිබ්බෙත් ක්ලාස් එකක් කට් කල්ලා..

මම නම් ජීවිතේට ක්ලාස් කට් කල්ලා නෑ.. අවංකවම මට එහෙම කරන්න බෑ.. නිදිමතේ මූණෙ වතුර ගාගෙන හරි නැගිටන් පාඩම අහන් ඉන්නවා.. මට හිතට මහ වරදකාරි හැගීමක් එනවා එහෙම කරන්න ගියොත්.. තියා අසනීප වෙලා පන්ති නොගියත් නෝට් එක කාගෙන් හරි ඉල්ලගෙන ඒක හරි බලාගෙන ඊළඟ දවසෙ ක්ලාස් යනවා.. මටනම් විශේශෙන්ම ආර්ථික ප්‍රශ්න තිබුණ.. ක්ලාස් කට් කල්ලා කරක් ගහන්න තිබ්බා මට අපේ අම්මගෙ මූණ මැවෙන්නෙ නැත්නම්.. මම තාත්තට කැමති නෑ ඒක ඇත්ත.. හැබැයි එයාගෙ සල්ලි තමා හැම මාසෙම බැංකුවට එන්නෙ.. ඒක හම්බකරන්න ඒ මනුස්සයා දුක් විඳිනවා ඇති කියලා මගෙ හිත මට කියනවා.. කවුරු වුණත් මනුස්සයෙක්.. තාත්තගෙ ජොබ් එක මොකක්ද කියන්න මම දන්නෙ නෑ.. ඒත් මාසෙට දාහෙකොළ පනහක් එවන්න ඒ මනුස්සයා කට්ටක් කනව ඇතිනෙ..

මම කවදාවත් පන්සිය හම්බ කරන කාලෙ පන්දාගෙ ඇඳුම් අඳින්න ගියේ නෑ..

මට අදටත් ඒ වචනටික මතක් වෙනවා අපේ පන්තියක සර් කෙනෙක් කියපු.. දැන් නම් පන්දාහෙ ඇඳුම් ඇන්දට කමක් නෑ.. මොකද ඒවා මම හම්බකරපුවනෙ.. අනික මට නඩත්තු කරන්න කෙල්ලො හිටියෙ නෑ ඉස්කෝලෙ පහළ පන්තිවල.. අපේ වයසෙ ඕනතරම් උන් හිටියා අම්මගෙ තාත්තගෙන් හම්බෙන ක්ලාස් ෆීස් වලින් කෙල්ලො නඩත්තු කරපු.. නඩත්තු කරනවා කියන්නෙ මේ කෑම එකක් අරන් කන එක, පොඩි දෙයක්

@Shan

අරන් දෙන එක එහෙම නෙමේ.. රූම් යන්න.. බොන්න.. කෙල්ලො එක්ක ෆිල්ම් බලන්න යන්න.. ඕවා.. ගිහින් ඇවිත් හොඳට උන්ගෙ ෆොටෝ ගහගෙන ඒව උස්සන් පන්ති ඇවිත් ඒවා රසකල්ලා කියවනවා.. මමයි සෙනුකයයි ඕවට කැමති නෑ.. අපි සයිඩ් ගහලා ආගිලා එක්ක ඉන්නෙ.. නැත්නම් අපිට සෙට් වෙන උන් හිටියා.. ඒ වුණාට අර කෙල්ලො මුන් එක්ක යන්නෙ විශ්වාස කල්ලනෙ.. එහෙම අනිත් උන් ඉස්සරහා ඒ කෙල්ලගෙ නිරුවත ගැන කියන එකනම් මට ඇත්තටම මහ කලකිරීමක් වගේ දැනුනා.. ඒ කොල්ලොන්ට පොඩ්ඩක් හිතන්න බැරිද කියලා හිතුවා..

ඒ වුණාට ආදරේදි හැමෝම මෝඩයිනෙ.. ආදරේ මිනිස්සු මෝඩ කරවනවා..

කොහොම හරි එදා තරුවි නංගි හම්බෙන්න ගිය දවසෙ නංගි ගියාටත් පස්සෙ තමා අපේ එකාගෙ මොලෙට දුක හිතෙන්නෝන කියන මැසේජ් එක ආවෙ.. ඊටපස්සෙ පිස්සෙක් වගේ හෝල්ට් එකට ගිහින් නංගි ඉන්නවද බලලා කෝල් පන්සීයක් විතර මගින් මගට අරගෙන පරිස්සමට ගියාද අහනවා.. අනේ මන්දා චමිරු කරන ආදරේනම් බලාගෙන ඉන්න අපිටත් හිසරදේ හදවනවා.. ඌ හැමදාම කරන කියන දේවල් වලට පරක්කුයි.. හැමදේම එහෙමයි.. ඌ හැඟීම් එක්ක ගනුදෙනු කරන්න දන්නෙ නෑ.. ඒ වුණාට තරුවි නංගිට මාර ආදරෙයි.. පරිස්සම් කරන්න ඕන කියලා හිතේ හැඟීමක් තියනවා.. ඒ වුණාට ඌ දන්නෙ නෑ ඒකි වැඩිපුරම පරිස්සම් වෙන්න ඕන උගෙන් කියලා.. ඔහොම කේන්ති ගිහින් බැන්නහම හරියන්නෙ නෑනෙ.. කියාන් අයියත් හෙන නහරකාරයා තමා.. ඒ වුණාට ආගිට ඔහොම බනින්නෑනෙ..අපේ එකීට බැන්නොත් ඒකි අයන් එක රත් කල්ලා අරුගෙ මූණෙ තියාවි..

ඒත් තරුවි කියන්නෙ හෙනම අහිංසක කෙල්ලක්.. චමිරු කරන කියන දේකට ඒකි අකමැතිනම් කතාකල්ලා කියන්නෙත් සෙනුකට.. 'සෙනුක අයියෙ චමිරු අයියට කියන්න සිගරට් බොන්න එපා කියලා.. රෑවෙන්න කලින් ගෙදර යන්න කියන්නකො.. පරිස්සමට ගියාද බලන්නකො..' ඔහොම කතාකරනවා.. චමිරුව පොඩ්ඩක් සෙනුකයට බය නිසා ඌ ඒකාට කන්ට්‍රෝල්.. නැත්නම් මොන දෙයියා කිව්වත් අහන්නෙම නෑ.. දැන් අපි මූ අපිට කැගැහුවොත් ඌට බනිනවා.. හැදෙන්න එපෑ කොහොම හරි.. මූ මෙහෙම ගිහින් හොඳ අමාරුවක වැටෙනවා කියලා අපි තේරුම් අරගෙන හිටියෙ..

@Shan

මම බුදුමැදුරෙ බුද්ද පූජාව හරිද බලන්න ඒ පැත්තට ගියාම මල්ලිලා වගයක් එළිය අතුගානවා.. මම එනවා දැකලා ඇතුළට දිව්වා.. මම බුදුමැදුරෙ පඩිපෙළ නැගලා බුදුකුටියට යද්දි හෝ ගාලා සේරම වැඩ.. අනෙ මුන්ගෙ බොරුව..

" දෙනෙක් එන්නකො.. කෝ ක්ලාස් මොනිටර්.."

මම ඇහුවහම කණ්ණාඩි දාපු හිච්චි කොල්ලෙක් ඉස්සරහට ආවා..

" ස්ටුවර්ඩ් ක්ලාස් එකට ආවෙ නැද්ද.."

" නෑ අයියෙ.."

" ජූනියර් ප්‍රිෆෙක්ට්..??"

" න්-නෑ අයියෙ.."

සීනියර් එකානම් එන්නෙ නැතුවැති කොහොමත්.. අද අපිට මෙන්හෝල් එකේ ප්‍රෝග්‍රෑම් එකකට ඒක ලෑස්ති කරනවා..

" ක්ලාස් එක මොකක්ද.."

" සෙවන් ජේ.."

මම ආයෙම ක්ලාස් එක දිහා බැලුවා.. සෙවන් ජේ කියන්නෙ ටැමිල් මීඩියම් ළමයි කලවමේ ඉන්න ක්ලාස් එකක්.. මම දැක්කා සුදුපාට මොට්ටුවක් තියාගෙන ඉඳපු පොඩි කොල්ලෙක් පැත්තකින් වාඩිවෙලා මල් වගයක් හදනවා..

එහෙම ලස්සනයි.. හැමෝම එකට ඉද්දි..

" ස්ටුවර්ඩ්, ජූනියර් ප්‍රිෆෙක් දෙන්නටම මාව ඇවිත් හම්බෙන්න කියන්න.. තේරුණාද.."

" ඕ අයියෙ.."

" කෝ දෙන්නෙක් එන්න මෙහෙට.. ඉක්මන් කරන්න.."

@Shan

මොනිටර් ගියාම මගේ ඉණ ගාවට බටු ඇට දෙකක් ගහගන්න වගේ මං ගාවට ආවා.. සැක් මට මාව මතක් වෙනවා..

" ඇයි අයියෙ.."

" අර බුදුමැදුර කොනේ තියන කුණු ටික අයින් කරන්න ඕන.."

මම එන්න ආවා.. මම එළියෙ පඩියට අඩිය තිබ්බා විතරයි මෙච්චරවෙලා මීක් නොගා ඉඳපු උන් ටික ආයෙම හැව පැව ගාලා කියවන්න ගත්තා.. මම බුදුමැදුර පිටිපස්සට ඇවිත් මගේ සේපාලිකා ගහත් බලලා මල් දෙක තුනකුත් කමුස සාක්කුවෙ පොඩිවෙන්නෙ නැතිවෙන්න දාගෙන උඩ පන්ති ටිකත් බලාගෙන ප්‍රීෆෙක්ට් රූම් එකට එද්දි රූම් එකේ කට්ටිය පිරිලා.. ජොනතනුයි නෆ්‍රාසුයි රවුන්ඩ්ස් යන්න ලෑස්තිවෙනවා.. ඒ ගොල්ලො බැලුවෙ ග්‍රවුන්ඩ් එකයි.. ගේට් හතරයි.. එන් වී කිව් ක්ලාසක් ටිකයි ටෙක් එකයි.. අපි බැලුවෙ පොඩි පංති නමය වසර වෙනකල්.. හැම පංතියක්ම බලලා ඩියුටි ඉන්න උන්ගෙ පොත්වල අත්සනක් දාන්න ඕන..

" සොරි ෂනෙරු.."

මම බෑග් එකෙන් මගේ ස්කූල් ලෝගෝ එක ගහපු ඩයරි එක ඇදලා ගත්තහම චමිරු මගේ පිටට තට්ටුවක් දාලා මූණට එබුණා.. මම පිටිපස්සට වුණා.."

" ඒක අවුලක් නෑ.. වරෙන් රවුන්ඩ්ස් යන්න.. සෙනුකයා.. ඔයි.."

" ඕ...."

" වරෙන්.."

" ඉඳපන්.. පරිස්සමට ඉන්නවා හරිද.. මම ඇවිල්ලා කෝල් එකක් ගන්නම්.."

සෙනුකයා වොයිස් මැසේජ් එකක් යවලා ෆෝන් එක බෑග් එක අස්සට ඔබලා අපි ගාවට ආවා..

" මොකෝ අයුක අයියට.."

" උදේ බෙහෙත් ගන්න ගියාලු.. අද යුනිවසිටි යන්නෙ නෑ කියන්නෙ.."

@Shan

" අමාරු ඇති බං.. බෙහෙත් ගත්තහම අඩුවෙයි.. කාලලූද.."

" කැවෙ නැතුවලු බෙහෙත් බිව්වෙ.. මට නම් ප්‍රෙශර් වගේ මෙ මිනිහා එක්ක.. මීට හොඳයි බෝනික්කෙක් උස්සන් ඇවිත් ඌ එක්ක ලව කරනවා.."

චමිරුටයි මටයි සෙනුකයා කිව්ව විදියට හිනා ගියා.. අයුක අයියා ඉතින් අතට පයට සැපට හැදුණ එකානෙ.. ඒකා උයන්න දන්නෙ නෑ.. ඒ උයන හැටි ඇහුවහම අපිට ගිහින් ඌට උයලා දීලා එන්න හිතෙනවා..

" දැන් කන්නෙ කොහොමද.."

" මොනවහරි ඕඩර් කරගන්න කිව්වහම හා කිව්වෙ.. මං අහන්නෙ ඔක පොඩ්ඩක් හිතන්න බැරිද කියපන්කො.. මට රධ්‍ය අයියට දුක කියන්න ඕන දෙයියනේ.."

සෙනුකයා පොකුණ ගාව ගලට පයින් ගැහුවහම ගල විසික් වෙලා එහාට ගියා.. මම පොකුණට එබිලා මගෙ ඉබ්බා ඉන්නවද බැලුවා.. මේ ඉන්නෙ බොසා ආතල් එකේ ගලක් උඩට වෙලා.. පොකුණෙ කුමුදු මල් පිපිලා තිබිලා.. පොඩියට සුදුපාටට.. මෙ ඉබ්බා අපේ ඉස්කෝලෙ කවදා ඉඳන් ඉන්නවද මන්දා.. අපි දන්න කියන කාලෙ ඉඳලා මෙහෙ ඉන්නවා.. මගෙ ඉබ්බා.. මම මූ වගේ තනිකඩව ඉන්න හැදුවහමනෙ අර රධ්‍ය අයියා ගස්ස ගස්ස ඇවිත් මාත් එක්ක යාළුවුනේ.. මම ඉබ්බගෙ පොරොන්දුව කැඩුවා.. සමාවෙන්න ඉබ්බෝ.. පෞකාරයා පොරොන්දුව කැඩුවා..

" අඩෝ හෙඩා එනවා.."

අපි තුන්දෙනා වල්පල් කියව කියව උඩට එද්දි උඩ එකෙක් මැද්දෙන් කෑගහගෙන දුවනකොට. ඒ එක්කම පුටු පෙරළන සද්ද.. දුවන සද්ද එක්ක කොසු ඉදල් පාවෙන සද්ද වගයක් අපිට ඇහුනා.. අපි උඩට යද්දි සේරම උන් දොහොත් මුදුන් දීගෙන වැදගෙන ඉන්නවා.. ප්‍රිෆෙක්ට්ස්ලා කොරිඩෝ එකේ ඉඳගෙන උන්ට ඉස්සරහින් බුදුන් වඳිනවා.. අපි බුදුන් වඳින්න සෙට් වෙන්නෑ රවුන්ඩ්ස් යන නිසා.. මම ඉතින් දන්න කියන උන්ට හිනාවක් දාගෙන අරුන් දෙන්නා යනකල් ඉඳලා පිටිපස්සෙන් හිමින්සැරේ ආවා.. මට නැනෙ කඩිකුලප්පුව.. හොඳින් හිත දිනාගෙන ඉන්නෝන සයෝන් අයියා වගේ..

@Shan

" මේ රධ්‍ය අයියා මොන ක්ලාස් එකද බං. ඒ එක නේද.."

" ම්ම්.."

" දෙයියනේ දෙයියනේ සුදුඅම්මියා.. අපි එනවා.."

අපි හය සෙක්ශන් එකේ මුල්ම ක්ලාසස් ටික බලලා දෙවෙනි හටුවත් බලලා තුන්වෙනි තට්ටුවට යන්න නැග්ගා.. මෙකා බලන්න තට්ටු තුනක් බඩගාන්න ඕනද.. කමක් නෑ.. ආදරේ වේදනාවක් කියන්නෙ.. ආදරේ බෙහෙතක් කියනවා.. ආදරේ ගින්දරක් කියනවා.. ආදරේ සුන්දර වරදක් කියනවා.. ආදරේ පිස්සුවක් කියනවා..

මමනම් තාම ලංකාවෙ සිංදු වලට අනුව ආදරේ මොකක්ද කියලා හරියටම අඳුනගෙන නෑ.. මට අනුව ආදරේ කියන්නෙ.. ලොකු පස්සක් තියන හැන්ඩ්සම් සර්කෙනෙක්ට තමා.. ආධ්‍ය අයියගෙ මල්ලි වගේ..

" මෙහ්.. මට ළඟදි වීඩියෝ එකක් හම්බුණානෙ ලැප් එකේ තිබිලා.."

" ඒ මොකක්ද.."

සෙනුකයා පඩිපෙළ නගින්න වාරුවට මගේ අතේ එල්ලුනා..

"ලැප් එකේ අපේ උන්ගෙ ෆොටෝ තොගේ බං.. මම ඒක පෙන් එකකට දාගත්තා.. ඉස්කෝලෙත් උස්සන් එනවනෙ ලැප් එක.. උඹයි රධ්‍ය අයියයි ඇහේ පාට වගයක් ගාගෙන නටනවා නැටිල්ලක්.. පෞකාරයට නූල් බදින්නත් වෙනවා තා පොඩ්ඩෙන්.."

මාව රතුවෙලා ගියා.. මූ මොකක් දැකලද ඒ පාර..

" මොන.. උඹට පිස්සුද.."

" හිත-වත් දෙවියන් වෙත

ලියනවා ලියුමක් මම නුඹ ගැන

එච්චට ගොඩක් පිං මෙයාව

පාළු උනා නේද තව්තිසාව

@Shan

දැන් ෆුල් හැපනින් මගේ අපාය

ලෝදිය වෙනුවට ගලන්නේ හිනාව-"

" පකයො!!!"

" කියහන්.."

" ඕක නවත්තගනින්.."

මම උගුරත් ඇදගෙන උඩට එද්දි චමිරුවා ගිහිල්ලත් ඉවරයි..

" ස්පෝර්ට්ස් මීට් එකේ අවසානෙ මිසින් වෙලා හිටියෙ රධ්‍ය අයියා එක ගිනියම් රෑ නටන්න කියලා දැනගත්තනම් ඩීජේ අයියගෙ පුපට දෙකක් ගහලා ප්ලේ කරනවා සරාගයේ.. අඩෝ..!! සෙක්සි ඈ.."

" උඹලට කොහෙන්ද ඕක.."

" අහිරු අයියා එව්වෙ.. ආතල් නේ.. මෙක යවමුද අප්පච්චිට.."

" ඒකනම් ආතල් වැඩෙ.. යවමුත.."

" ඔව් රධ්‍ය අයියා උඹෙ ඉණෙන් අල්ලගෙන ඉන්න කෑල්ල යවමු හරිත.. ඒක තමා ගැම්ම.."

" මෙහෙ වරෙන් යන්න.. උඹට ආතල්ද.. බේසිකයා.. අඩෝ අහපන් මම ඇනිමි එකක් බැලුවා ඒක කියන්න තියේ.."

" සිරාවට.. මාත් එකක් බැලුවා.. මම උඹට කියන්නම්කො.. ඒකෙ කොල්ලා ආකිටෙක් කරන්නෙ.. අනිකා ඉන්ජිනියරින්.. මාර ආතල් ඔයි.."

" සිරාවට.."

මමයි සෙනුකයයි ඩී, සී, බී ක්ලාසස් වලට එබිලා යද්දි චමිරුවා ප්‍රීෆෙක්ට් කෙනෙක් අල්ලන් බනිනවා මුල්ලකට වෙලා.. පුදුමයි අද කෑගහලා බනින්නැද්ද දන්නෙ නෑ.. සෙනුකයා හෙන මනමාල මූණක් හදාගෙන ඒ ක්ලාස් එකේ දොරෙන් මූණ දාලා ඇතුළට ගියා.. අද මේ සෙක්ශන් එක පුදුම

@Shan

නිශ්ශබ්දයි.. පව් පොඩි උන් ටික.. ඔහොම තමයි ළමයො.. ඕගොල්ලො මෙ මාස කීපෙකටනෙ.. මේ අයියා ජීවිත කාලෙම ඉන්නෙපෑ..

මමත් හිමින් සැරේ ක්ලාස් එක ඇතුළට අඩියක් තිබ්බහම රධ්‍ය අයියා ක්‍රීම් පාට ශර්ට් එකකට කළු ට්‍රවුසර් එකක් ඇඳලා ගානට කොණ්ඩෙ හදලා හෙන හැන්ඩ්යා වගේ මේසෙකට හේත්තුවෙලා රෙජිස්ටර් එක බලනවා.. මාව දැකලා ඒකා රතුවෙලා රෙජිස්ටරේ වහලා පැත්තකින් තිබ්බා.. මමත් මනමාල හිනාවක් දාගෙන ගිහින් රධ්‍ය අයියගෙ මේසෙට හේත්තු වුණා.. සෙනුකයා මට මොකක්ද කියලා එළියට ගියා.. හොඳවෙලාවට හයවසරෙ ක්ලාස් වල බිත්ති උසට හැදුවෙ..

" ගුඩ්මෝනින් සර්.. උදේම ආවද.."

රධ්‍ය අයියා තව ටිකක් රතුවුණා.. ඇයි යකෝ ළමනෙ සර් කියන්න කිව්වෙ..

" ගුඩ්මෝනින්.. ඕගොල්ලො රවුන්ඩ්ස් එන්නෙ භාවනා කල්ලා ඉවරවුණාමද.."

මම කට ඇඳකරගත්තා. සැක්.. අපි යන්නෙ අපිට් අඹනවෙලාවට තමා.. ඇයි යකෝ. කකුල් දෙකෙන් එපෑ ඇවිදින්න. මොකෝ ඉස්කෝලෙ වටේ යන්න අමුතු දඩුමොනරයක් අපිට හදලා දීලා නැනෙ..

" එහෙම තමා.. අපි එන්නෙ ඒ වෙලාවට ඇයි මොකද.. සර් අපිට ගහන්නද.."

රධ්‍ය අයියට හෙන මනමාල හිනාවක් ගියා..

" ඇයි ගහන්න බැරිද.."

" අනේ මේ.. මම යනවා.. ඔයාට ෆස්ට් පීරියඩ් වැඩද.."

" තර්ඩ් එක නෑ.."

" ආ.. ඒ පැත්තෙ එනවද පුළුවන් වුනොත්.."

" ම්ම්.."

@Shan

මම රධ්‍ය අයියගෙ කම්මුලට වැටිලා තිබුණු ඇහිපිහාටටක් ඇඟිලි තුඩු වලින් එහාට පිස්සා.. ඕක අතේ තියලා පිඹලා පිඹලා මටනම් දැන් කිසිම විශ්වාසයක් නෑ.. මම ඇහිපිහාටු පිම්බ තරමට එහෙනම් මම මේ වෙද්දි මහින්ද මහත්තයටත් වඩා පොහොසත් වෙලා..

" මම යන්නම්.."

මම මගේ සාක්කුවෙ තිබ්බ සේපාලිකා මලක් අරගෙන රධ්‍ය අයියගෙ උකුළ උඩින් තිබ්බා.. එයා මගේ අතකින් අල්ලගත්තා.. මම රධ්‍ය අයියා දිහා බලද්දි රධ්‍ය අයියා මගේ දිහා බලාගෙනම ඉඳලා ඉක්මනට බිම බලාගත්තා.. මම රධ්‍ය අයියට කිට්ටු වෙලා තොල් වලට හාද්දක් දීලා අත අතාරවගෙන ක්ලාස් එකෙන් එළියට ආවා.. රධ්‍ය අයියා ඇස් දෙකත් ලොකු කරගෙන මගේ දිහා බලාගෙන ඉද්දි මම සෙනුකයවත් ඇදගෙන පහළට ගියා..

" සනෙරුමල සතු වෙලා~"

" කටවහන් වරෙන්..!!!"



සුබෝදෑසනක් මගෙ ලස්සන දළඹු කෙල්ලනේ.. කොල්ලනේ..

නින්ද නොයෙන හැම්දෑවේ සොඳුරුයිද කොයිතරම්..

දුක නැතුවමත් නොවෙයි ඔබ යන්න යනවනම්...

ඉම්හි..

එකෙක් වර රධ්‍ය අයියා ගාගෙන.. දැන් සර් කියාපල්ලා.. රධ්‍ය සර්.. රධ්‍ය සර්ගෙ දවස සුභ වේවා.. සනෙරුට ජයවේවා.. කියවන ඔබට ගෞරවයෙන් බී එස්.. මම ආදරේම ආදරෙයි..

එන්නාම්.. ලව් යූ.. ❤



මම ලියන පුංචි කතාවට හම්බෙන ලොකු ලොකු තෑගි වලට.. මම හරි ආදරෙයි ළමයෝ.. හුඟක් ස්තූතියි.. ❤

@Shan

ප.ලි.

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුනවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 132කොටස

" ඇම් හෙල්දි!! ඇම් වෙල්දි!! ඇම් රිච!! ඇන්ඩ.. ඇම් දැට බිච..!! සී.. ඉස් අයි කාන්ට් ඩූ දිස්.. නෝ වන් කැන්.."

මම ප්‍රිෆෙක්ට් රූම් එක මැද්දට ගිහින් මගේ සුවාමිපුරුසයො ටික එහාට මෙහාට කල්ලා ඉඩ හදාගත්තා..

" ඇම් හෙල්දි වෙල්දි නෙමෙ පකෝ හිනායන එක නවත්තන්න විදියක් කියපන්.."

කවිඳුවා එහෙමම හිනාවෙලා හිනාවෙලා පණ නැතුව පුටුවකට කඩාගෙන වැටුණා.. අපිටත් හිනා යනවා තමා ඉතින්.. මොනව කරන්නද.. ඉස්කෝලෙ වෙනුවෙන් නෙ කියලා හිත හදාගන්නවා.. අතිගරු ජනාධිපතිතුමාත් එදාට කඩා වදිනවලුනෙ.. මහින්ද මහත්තයවත් ආවනම්.. අනේ ඒ පිංපාට මූණ ආයෙ දකගන්න ඇත්නම්.. චිරං ජයතු මහරජාන-..!!

" හා හරි හරි.. ආතල් නෑ.. ෂනෙරුවා දුවගෙන ඇවිත් චමිරුගෙ උකුළ උඩින් වාඩිවෙයන්.. චමිරු මූව බිම දාන්නෑ.."

සෙනුකයා මහපගයා ස්ක්‍රිප්ට් එකත් අතේ තියාගෙන ඕවර් ඇක්ටින් දාලානා පාරක් දාලා ගියා.. මේ අර ඇනිවසරි අයිටම් එක පුරුදුවෙනවනෙ ප්‍රිෆෙක්ට්ස් කවුන්සිල් එක.. මෙපාර දෙන්නෙ දොඹෙන් යන්න.. දන්නෑ මේ ප්‍රිෆෙක්ට් බැජ් එක ගැන.. කියාන් අයියා අඩන්නම ඕන අපි ඩියුටි කල්ලා ඉවරවෙද්දි.. නැත්නම් මම උංට කඳුළුගෑස් ගහනවා.. නෑ නෑ.. අලි ඔලුවෙන් ඉන්න අනිත් පුතාණෝලා ටිකත් පෝලිමෙ හිට්ටලා කඳුළු ගෑස් ගහන්නෙ.. අරගලේ කැවට පස්සෙ කැවෙත් නැනෙ..

" අනේ මේ බං මට බෑ මෙක කරන්න.. ලෙංචිනාට අඳින්න.. කෙල්ලත් හිනාවෙනවා.. මේ මොනෞත්තක්ද.."

" ඒක අහගනින් ඩ්‍රාමා මැඩම්ගෙන්.. දැන් සිංදුව කියන කට්ටිය මෙහෙට වෙන්න.. රහපාන උන් මෙහෙට එන්න.. හරි වන්.. ටූ.. ත්‍රී.. ෆෝ.."

දේවි උදුම්බරාට ඉන්න කොල්ලා ගස්සගෙන පද්දගෙන නලවගෙන පැත්තක ඉඳන් අමුතු ලීලාවකින් මැද්දට ඇවිල්ලා වටයක් කැරකුණාම උගෙ

@Shan

කුමාරයා අරුගෙ කොණ්ඩෙ හදනවා.. සෙනුකයා සිංදුව කියන්න කිව්වට ඌ ඉන්නෙත් උඩ බලාගෙන මොකුත් දැක්කෙ නෑ වගේ.. මුන්ට මොන ලීලාද.. ගහගන්න වගේ ගස්සලා පද්දලා එන්නෙ.. මුන් හොඳයි එළාරටයි දුටුගැමුණුටයි.. මම අහන්නෙ ඇයි දුටුගැමුණු රජතුමාට එළාර එක්ක මෙච්චා වෙන්න බැරිවුනේ.. ඉතිහාසෙ වෙනස් කරනවා නෙමෙ.. පොර කාවන්තිස්සට ගැණු යටඇඳුම් යැව්වෙ පොඩි ගේ වයිබ් එකක් නිසාද දන්නෑ.. දැන් කාලෙනම් ඔහොම යවන්නෙ සුගර් ඩැඩීලනෙ.. රධ්‍යා අයියට කියන්නෝන මට යට ඇඳුමක් එවපන් කියලා.. එක්කො එපා.. උගෙ යට ඇඳුණුත් මගේ අල්මරිය අස්සෙ ඔබලා යනවනෙ.. දකින මිනිස්සු හිතයි මට අසහනේ කියලා..

ඉක්මන් සහනයට තරු බලන්න ගියානම් ඉවරනෙ..

" ඒක අවුලක්ම නෑ.. ඒ වුණාට සතිර ඔයිට වඩා කෙළි ගතිය එන්නෝන හරිද.. යකෝ!! අටදාහක් මැද්දෙ ලැජ්ජනම් කරන්නෙපා.."

" ඉතින් අපි කෙල්ලොද බං.. හා.. බලමු බලමු.."

" දැන් ශනෙරු වරෙන්.. චමිරු ඔය පුටුව ගහක අත්තක් කියලා හිතාගෙන වාඩිවෙයන්.."

චමිරුවා සීරුවෙන් ගිහින් පුටුවෙ ඉඳගත්තා..

" ආ දැන් ෂනෙරු ගිහින් කිව්ව විදියට මුගෙ උකුළ උඩ ඉඳගනින්.."

මමත් පොඩ්ඩක් දන්න කියන විදියට ගස්සලා පද්දලා චමිරුගෙ උරහිසට තට්ටුවක් දාලා අමනාප බිරින්දෑ වගේ ගෙට යන්න යද්දි චමිරු පරෙයියා මගේ අතකින් ඇදලා අරගෙන උකුළ උඩින් ඉන්දවගත්තා.. ඇයි මම අහන්නෙ මුගෙ පාටනර්ට මාවම දැම්මෙ.. මට ඕන ජොනතනයව.. මුගේ කිසි අන්දරේ ගතියක් නෑනෙ.. මූ හොඳයි ආරච්චි කෙනෙක්ට.. නැත්නම් මම ලෙච්චමීට ඇඳලා මූව වත්තෙ මහත්තයට ගත්තනම් ඒත් අවුලක් නෑ.. කොහොමත් මනමාල ලයින් දෙනවනෙ..

" ආ නයිස්.. මෙ චමිරු.. මූව නිකම බඳින්න යන හරකෙක් ඇදලා ගන්නවා වගේ නැතුව.. පොඩ්ඩක් ලාලිත්‍යට කරපන්.. අන්දරෙයි අන්දරේගෙ ගෑණියි නේද තොපිලා.."

@Shan

මම චමිරුවගෙ උකුළ උඩින් නැගිටලා එහාට වුණා..

" දැන් වරෙන් දික්තලා.. කෝ උඹෙ කාලගෝලයා.."

මම හිමින් සැරේ අනිත් උන් අස්සෙන් රිංගලා පුටුවකින් ඉඳගෙන සයිඩ් ගහලා හිටියා.. දැන් උදේ වරුවම මේක ප්‍රැක්ටිස් වෙනවා.. ඒ අස්සෙ මෙන්හෝල් එකේ වැඩකුත් තියනවා.. මම එපාවෙලා හිටියෙ.. අපේ සර් උගන්නනවද දන්නෑ.. උගන්නනවා ඇති.. හයවසරෙ ළමයින්ට සැර කරන්න එපා කියලනෙ ඉස්කෝලෙන් කියලා තියෙන්නෙ.. මූ තියන අහංකාරකමට බැන්නද දන්නෑ.. නැතුවැති.. මගෙ අන්ඩවෙයාර් එක පිටින් ඉන්න පොල් කැඳැත්තා..

ජීවිතේ රඟමඩලක් කියලා ශේක්ස්පියර් කිව්වට.. මගෙ ජීවිතේ හැම මගුලම මෙහෙම නාට්ටියක් වෙව් කියලා මම කීයටවත් හිතුවෙ නෑ.. මගේ ජීවිතේ ශෝකාන්තද.. දුක්කාන්තද.. නෑ රුකාන්ත.. රුකාන්තගෙ සිංදු අහන්න අපේ අම්මා ආසයි.. ම්ම්..ම්ම්.. හිත හිරිවැටුණාදෝ~.. ඇට දෙක දැ- සැක්.. මේ සෙනුකයගෙ කුණුහර්ප සිංදු දැන් මට කියවෙන්න අරගෙන..

" ෂනෙරු.. මේ උඹට එන්න කියලා..~"

මට මගේ නම කියලා එකෙක් බෙරිහන් දෙන සද්දෙ ඇහුණහම ඒකට බයවුණු පාර කම්මුලට තියාගෙන ඉඳපු අතත් ලිස්සලා ගිහින් මගේ හක්ක පැන්නා.. හැමදාම මේ පගයොන්ට කියනවා කෑගහන්න එපා කියලා.. කොහෙද සේරම වක්කඩවල් ටිකක්නෙ සෙට් වෙලා තියෙන්නෙ.. චමිරුවා විතරයි පාඩුවෙ ඉන්නෙ.. අනේ මේ ඌ පාඩුවෙ හිටිය තරමට හොඳයි.. සක්කිලි පරෙයියා.. මටනම් මුගේ අතීතයේ කළ සක්කිලි වැඩේට හෙන කේන්තී.. මට කැමැත්තෙන් වුණත් රධ්‍ය අයියට ලියුම් දෙන්න ඕන නැනෙ.. මං අහන්නෙ.. මම එපෑ ලියුම් දෙන්න මගෙ මනුස්සයට.. මේ ළඟකදි ඉඳලා මට රධ්‍ය අයියව හැමතිස්සෙම මිස් වෙනවා.. මම පෙග්නට්ද දන්නෑ.. පෞකාරයගෙ කුස තුළට පුංචි පුතු පැටියෙක් ඇවිල්ලා මාමෙ.. මාමා සීයා කෙනෙක් වෙන්නයි යන්නෙ.. එහෙම වුණොත් ආධ්‍ය අයියා සීයද.. මහප්පද..

මම නැගිටලා ප්‍රයිමරි ප්‍රින්සිපල් මදර් හම්බෙන්න පහළට ගියා.. අපේ ප්‍රයිමරියෙ ඉන්නෙ මදර් කෙනෙක්.. ටිකක් සැරයි.. ඒත් හරිම හොඳයි.. අපි යද්දි මදර්ගෙ ඔෆිස් එකට එහාපැත්තෙ හාමුදුරුවො පොඩි ඇච්චො ටිකක් දණගස්සලා බනිනවා බනිනවා ඉවරයක් නෑ..

@Shan

" උඹලා වගේ උන් තමා ලොකු වෙලා මේ රටවල් කන්නෙ.. මදාවි හැත්ත.."

*චටාස්* *චටාස්*

මම හිමින් සැරේ මදර් හම්බෙලා ළඟදි ඉස්කෝලෙන් කරන්න යන ප්‍රොජෙක්ට් එකකට උවමනා දේවල් අහගෙන ඒක ඩයරියෙ ලියාගෙන.. තව මදර් එක්ක කතාකර කර ඉඳලා පැය බාගෙකට විතර පස්සෙ එන්න ආවා.. ඉස්කෝලෙ වෙන හැම දෙයක් ගැනම මම දැනුවත් වෙනවා.. සාමාන්‍යයෙන් හෙඩ් ප්‍රිෆෙක්ට්ව තමා ඔවට සම්බන්ධ කරගන්නෙ.. මගේ වගකීම කියන්න ඕන දේවල් ටික ගලපලා ඒවා අදාළ පාර්ශව වලට කියලා ළමයි ලෑස්ති කරවන එක.. නැත්නම් දෙන නීති ළමයි පිළිපදිනවද බලන එක.. හෙඩ් ප්‍රිෆෙක්ට් කෙරුවාව එපා වෙන්නෙ ඉන්වයිටඩ් ඉස්කූල්ස් වලට හතරවටේ යන්න වෙන එක තමා.. එදාට බ්ලෙසර් අරව මේවා ටයි උස්සන් ඇවිත් පිළිවෙලට ඇඳලා යන්න එපෑ.. මට මගේ බ්ලෙසර් එකේ තියන බැජ් ටික අමුණන එකයි ඒවා වැටෙන්න නැතුව පරිස්සම් කරන එකයි තමා කරන්න බැරි.. අනික හෙනට අවධානෙ ගන්න වගේ.. යන යන තැන සලාං බලාං ගාලා වදිනවා.. ඒවත් අල්ලන් කිරි එරුණ එකා වගේ තැනකට යන්න ඕන.. මළගෙවල්ද, උත්සවද, කලා උලෙලවල්ද, ස්විමින් කම්පිටිශන්ස්ද එකී මෙකී නොකී හැම එකටම අපි යන්න ඕන ඉස්කෝලෙ නියෝජනය කරන්න.. සමහර වෙලාවට ෆ්ලැග් එක උස්සන්න වෙනවා.. අපේ ඉස්කෝලෙනම් සාමාන්‍ය විදිය උදේට ෆ්ලැග් එක උස්සන්නෙ කැඩෙට්ස්ලා.. ඒත් විශේශ දවසක මමයි නඹුසුයි චමිරුයි ඒක උස්සන්න ඉන්නවා.. එකපාරක් පොල්තෙල් පහනක් දල්වන්න ගිහින් ඒකට මගේ ඇඟිල්ලත් පිච්චුණා..

මම යන පාරෙ තිබ්බ ඇඹරැල්ලා කොළයක් කඩාගෙන හපාගෙන හපාගෙන ගියා.. ඒක ඇඹුල් රහයි.. මේ ගහේ ගෙඩි හැදුනහම මම ගෙඩිත් කනවා..  ගෙඩි නැත්නම් කොළ කනවා.. මොකුත් නැතිවුනොත් කඳ හරි කනවා.. මගේ ස්ට්‍රෙස් රිලීස් කරගන්නෙ ඇඹරැල්ලා ගහෙන්.. නැත්නම් රධ්‍ය අයියට මොකක් හරි කුපාඩි වැඩක් අටවලා ඒක හරියනකල් ඉඳලා හිනාවෙලා ස්ටෙස් එක යවාගන්නවා.. අයුක අයියට බලු කතා කියලා යවනවා.. ආශිගෙ කොණ්ඩෙට අපහාස කරනවා.. ආධ්‍ය අයියටනම් වද දෙන්න හිතෙන්නෑ.. අහිංසක මස්සිනා මගේ.. ඔය ළඟින් ගියොත් යමක් කියනවා ඇරෙන්න.. ඒකටත් එක්ක අපේ මාමා හොඳයි.. වැඩිය ඕන්නෑ..

@Shan

මාමෙ කොණ්ඩෙ සුදුවෙලා නේද කියල ඇහුවොත් ඇති.. ඩයල් එකට සැරටම මල පනිනවා..

" උඹ කටපියන් ඉඳපන්කො.. මගේ කොණ්ඩෙනෙ සුදුවෙන්නෙ.. උඹලා වයසට යන්නැනෙ.. පොල්පිති හරකා.. පොඩි අක්කා කියනවා වගේ උඹවනම් කපාගෙන තියෙ-"යැයි යැයි ගාලා මට බනිනවා..

උදේ දැක්කට පස්සෙ මගෙ ගැටපොලොස් කොට්ටෝරුවා ඇහැට දැක්කෙත් නෑ.. හරිනම් මේ පීරියඩ් එකේ පොර ලයිබ්‍රි එකේ ඉන්නවා කිව්වෙ.. වැඩිය බජනෙට යන්න හොඳත් නෑ.. මොකෙක් හරි බලූ කතාවක් කිව්වොත් එහෙම හරි නැනෙ.. ඒ වුණාට ළඟ ඉඳලා නොදැකත් බෑ.. කමක් නෑ.. පීරියඩ් හයක්ම දැක්කෙ නැනෙ.. දැන් ගියාට කමක් නෑ.. ලයිබ්‍රි එකේ වැඩිය පේන්නැති මුල්ලක් අල්ලන් කියවන්නෝන..

මම මගක් දුර ගිහින් ආයෙ හැරිලා ඇවිල්ලා ඇඹරැල්ලා ඉත්තක් කඩාගෙන ලොකු ලයිබ්‍රිය පැත්තට ගැටුවා.. අපේ ඉස්කෝලෙ ලයිබ්‍රි තුනක් තියනවා.. එකක් ප්‍රයිමරියෙ.. ඒකට අපි යන්නෙ නෑ.. අනික හය-නමය ලයිබ්‍රි එක.. ලොකු ලයිබ්‍රිය කියන්නෙ ඕ ලෙවෙල්, ඒ ලෙවෙල්, ටීචර්ස්ලාට සේරටම වෙන් වෙලා තියන එක.. අනිත් ලයිබ්‍රි දෙක වගේ නෙමෙ මේක හෙන විසාලයි.. එන්සයික්ලොපීඩියා, ඉස්කෝලෙ මැගසින්, පරනම පොත්, සඟරා, පත්තර, වෙන භාශාවල පොත් ඔක්කොම හොයාගන්න තියෙන්නෙ මේකෙ.. සෝෆා දාලා, ටේබල් දාලා හරිම නිස්කලංක පරිසරේක පිරිසිදුව තියාගෙන ඉන්න නිසා පාඩම් කරන්න නියමයි.. ඒකෙ සර්ලා දෙන්නා මම අඳුරනවා..

මම ලයිබ්‍රියෙ උඩතට්ටුවට බඩගාලා රධ්‍ය අයියා ඉන්නවද කියලා බැලුවා.. පහළ ඒ ලෙවෙල් ක්ලාස් එකක් ඇවිල්ලා.. උඩ තට්ටුවෙ තමා හුඟක් වෙලාවට මැඩම්ලා සර්ලා ඉන්නෙ.. දැන් ලාස්ට් පීරියඩ් නිසා කට්ටිය වැඩිය නැතුවැති.. ඒක හොඳයි..

මම හිමින් සැරේ උඩ තටුවට ගිහිල්ලා මගෙ පොල් කැඳැත්තා ඉන්න දිහාවක් බැලුවා.. උඩ එහාපැත්තෙ කොනේ සර්ලා මිස්ලා වගයක් පේපර්ස් වගයක් බලනවා.. මැද්දෙ දිගට පොත් රාක්ක හරස් කල්ලා.. මම ඒ පැත්තෙ නැතුව අනිත් පැත්තට මූණ දාලා බැලුවහම රධ්‍ය අයියා කොනේම ටේබල් එකේ පොතක් කියවනවා.. අයියලා මල්ලිලා පොත් කාවො වෙලා තමා ලබන ආත්මෙ ඉපදෙන්නෙ.. මම හිමින් සැරේ රධ්‍ය අයියා ගාවට ගිහිල්ලා

@Shan

හිටගත්තහම ඒ යකා ආසාවට හැරිලාවත් මං දිහා බැලුවෙ නෑ.. ඒ තරමට පොතේ ගිලිලා මැරෙන්නද කොහෙද යන්නෙ.. මම හෙමින් සැරේ රධ්‍ය අයියගෙ පපුවෙ පැත්තක් හයියෙන් ඇල්ලුවහම රධ්‍ය අයියා උඩ ගිහින් මගේ අතින් තද කල්ලා අල්ලගත්තා.. මම රධ්‍ය අයියට ඇස් පිල්ලම් දෙකතුනක් ගැහුවහම එයා මගේ අතින් අතැරියා.. මම අල්ලන්නැතුව වෙන කවුරු අල්ලන්න හැපිකච්චවගෙ කුක්-

" කොයි වෙලේද ආවෙ.."

මම රධ්‍ය අයියගෙ ඉස්සහා පුටුවෙන් ඉඳගත්තා..

" ටිකක් වෙලා.. මොකද කරන්නෙ.."

" පේන්නැද්ද.. මම මේ රොකට් එකක් හදනවා.."

" තරු බලන්න යන්නද.."

රධ්‍ය අයියා හෙන ඩ්‍රමා ක්වීන් වගේ ඇස් දෙක කරකලා පුටුවෙන් හරියට ඉඳගත්තා..

" ඔයාලගෙ ප්‍රෝග්‍රෑම් එක ඉවරද.."

" ඔව් ඒයි.. උදේ ඒක තිබ්ලා.. ඊටපස්සෙ ඩ්‍රාමා එක පුරුදුවුණා.. දැන් මදර්ගෙ ඔෆිස් එකට ගිහින් එන ගමන්.."

" ඔය කොට කකුල් දෙකෙන් කොහොම ඔච්චර දුරක් ඇවිදින්නද.. තාරාවෙක් උනාම හරි වදේ නේ.."

" අනේ මේ.. තච්සෙට මොකද ඔච්චර මගෙ කකුල ගැන අමාරුව.. ආසයිත.."

මම ශේප් එකේ රධ්‍ය අයියගෙ කකුල දිගේ මගේ කකුලක් ඇදගෙන උඩට එද්දි රධ්‍ය අයියා පුටුවෙ පිටිපස්සට වෙලා කකුල් දෙක ඇදලා ගත්තා.. ඊටපස්සෙ මට දෙකක් රැව්වා..

" පාඩුවෙ ඉඳපන්.."

" පාඩුවෙ ඉන්නනම් මම ඔයා එක්ක යාළුවෙනවද ඒයි.."

@Shan

"....."

" ඉස්කෝලෙ ඉවරවෙලා අපේ ගෙදර යමු..?? අප්පච්චි අද ගෙදරද.."

" හවස් වෙද්දි එනවා කිව්වෙ.. එතකල් ඉමු.. මම අයියා එක්කම යනවා.."

" හා.. මේ ඒකනෙමේ.. මොකද අද වැඩ.. හිතට ඇල්ලුවද.."

" ඔව් හොඳයි.. ඒ වුණාට ගිය සැරේ මන්ත්ලි ටෙස්ට් එකේ පේපර්ස් වගයක් තියනවා බලන්න.. ඒ පන්තිය අතෑරලා දාලා වගේ තිබිලා තියෙන්නෙ.. මල්ලිකා මැඩම් වෙනුවට කවුරුත් බලලත් නෑ.."

" දැන් ඔයා ඉන්නවනෙ.. සිලබස් කවර් කරගන්න බැරි මොකක් හරි ආවොත් තුන වෙනකල් ආෆ්ටර් ස්කූල් දාන්න.. සතියට එකක් වගේ.."

" මමත් හිතුවේ.. එක්සෑම් කිට්ටු වෙලා දානවා.. මම තාම උගන්නන්නෙ ගිය වාරෙ මැදහරිය.."

මම මේසෙ උඩ තිබ්බ රඩ්‍ය අයියගෙ අතක ඇඟිල්ලක මගේ ඇඟිල්ල පටලගත්තා.. එයාගෙ අත් රස්නෙයි..

" ඔයා ආයෙ ඉස්කෝලෙ දකින්න වෙන එකක් නෑ කියලා මම හිතුවෙ.."

රඩ්‍ය අයියා මගේ දිහා බලලා ලාවට හිනාවුණා.. එය අහිනාවෙන්නෙ දැනෙන්න නොදැනෙන්න ගානට වුණත් ඇස් දෙකෙන් බලන විදියෙන් එයා ඇත්තටම ආදරේ හිතෙන්න හිනාවෙනවා කියලා පේනවා..

" මමත්.. එහෙම හිතුවා.."

රඩ්‍ය අයියා මගේ අත තදකල්ලා අල්ලා අතෑරියා.. මාව පොඩ්ඩක් රතු වුණා..

" අයුක අයියා අසනීප වෙලාලු නේ.. සෙනුකයා අරගෙ මැරෙන්න හදනවා.."

" අයුක පව් වරද්.. අපි කවුරුත්ම නැතුව ඒකා එහේ තනියමනෙ ඉන්නෙ.. එහෙම ඉඳලම නෑ.."

@Shan

" තාම ගිහින් මාස කීයද.. අනේ මන්දා සෙනුකයා තව කොච්චරකල් ඉවසන්නද කියලා.."

" සෙනුක මල්ලි උදේ දිග මැසේජ් එකක් එවලා අයුකයට බනින්න කිව්වා.."

" ඔයා බැන්නද.."

" නෑ මම මැසේජ් එක ෆෝවර්ඩ් කලා.. අයුකයා බලාගන්න ඇතිනෙ.."

මම රධ්‍ය අයියගෙ අත ගසලා දැම්මා.. අනේ මෙහෙමත් මිනිස්සු.. යකෝ බනින්න කියලා එවපු මැසේජ් එක ෆෝවර්ඩ් කරාම හරියනවද.. සෙනුකයට කියන්න ඕන උඹෙ දුක මට කියපන් කියලා.. කොහොමත් අයුක අයියට බනින්න මට ආසාවක් තියෙනවා.. ඔලුව ලොකු ගෙම්බා.. කේලම් කියන නිසා තමා ඔහොම වෙන්න ඇත්තෙ..

" තව්සෙට පිස්සුද අයියෙ.."

" මම මොනා කරන්නද.."

" ඒ වුණාට.."

" උන් දෙන්නගෙ ප්‍රශ්න විසඳන්න ගිහින් අන්තිමට මම තමා වැරදි කරපු එකා වෙන්නෙ.."

මම උඩ බලාගත්තා.. ඒක සාමාන්‍ය තියරියනෙ.. බලන් යද්දි ඒක වැඩ නොකරන කෙනෙක් නෑ.. සමහරවෙලාවට රධ්‍ය අයියගෙයි මගෙයි වලි බේරන්න ඇවිල්ලා ආධ්‍ය අයියා වැරදිකාරයා වෙන්නෙ.. වැරදිකාරයෙක් නෙමේ පෞකාරයෙක් වුණත් මම එයාට හරි ආදරෙයි..

" එහෙනම් පාඩුවෙ ඉන්න ඒයි.. උන් දෙන්නා කොයිවෙලෙත් රණ්ඩු වෙනවනෙ.."

" උඹ හොඳ එකාද..."

" චජ්.."

@Shan

මම අමනාපෙන් පැත්තක තිබ පෑනක් අරගෙන රධ්‍ය අයියගෙ අතේ බලිකුරුට්ටක් ඇන්දා.. මම එහෙම රණ්ඩු වෙනවද.. මම කොච්චර හොඳට ඉඳලත්ද මේ මිනිහා මට කතා හදන්නෙ..

මම කේන්තියට රධ්‍ය අයියගෙ අත මැද්දට පෑනෙන් ඇන්නා.. රධ්‍ය අයියට ඒක ගානක්වත් ගියේ නැද්ද මන්දා.. අත දිහා බලලා ඇහිබැමත් අකුළගෙන මගේ දිහා බැලුවා..

" මම යනවා.."

" කොහේද.."

" මැරෙන්න.. ඇයි එනවද.."

" අද බෑ වගේ බබා.. වෙන දවසක එන්නම්.."

මම පුටුවත් පස්සට අදගෙන නැගිට්ටා.. අපරාදෙ මට ආධ්‍ය අයියා එක්කනෙ යාළුවෙන්න තිබ්බෙ.. දැනටත් මම පරක්කු නෑ හැබැයි.. ඉදපන් මම යාළුවෙනවා..

" මම-මම කැමති තව්සෙට නෙමේ-"

" අපේ අයියටනෙ.. ඒ.. ඒ.. වරද්..!! ඔහොම ඉන්න.."

මම ගස්සලා දාලා යන්න ගියා.. මුගෙ අප්පච්චිට රෙදි යාරයක් අරන් දෙන්න.. පොල් කෑදැත්තා.. කොහිල කැස්වටුවා..

" ටහු-"

මම බැන බැන යන ගමන් පොත් රාක්කෙක ඇණේකට කමිසෙ අහුවෙලා ආයෙම මාව පිටිපස්සට ඇදිලා ගියා.. නොදකින් මේ රාක්ක පාර මැද්දෙ හරස් කළ එකාගෙ හැමදාම පොඩි ඇහිල්ල මේස කකුලක හරි වැදෙන්න ඕන.. මම ක්ෂණිකව පිටිපස්ස හැරිලා රධ්‍ය අයියා දිහා බැලුවහම ඒකා පෑනත් කටේ ගහගෙන කුප්ප හිනාවක් දාගෙන පොත දිහා බලාගෙන ඉන්නවා.. මම එන්න ආවා.. අනේ මට ඕන්නෑ එකෙක්.. මම තනියම ඉන්නවා.. මට ආධ්‍ය අයියා ඉන්නෙ.. අපේ මාමා මගෙ අයියව උදුරගත්තෙ නැත්නම් මම හැමදාම ආධ්‍ය අයියගෙ අස්සට වෙලා ඉන්නවනෙ.. මගෙ

@Shan

රෝසමලේ නටුවෙ කටු.. මාමා තමා වනබඹරා.. වනබඹරෝ ඕහොම හිටු නෙමෙයිනෙ එතකොට.. වනබඹරෝ උඹ පලයන්.. රෝසමල මගේ..

අන්තිම පීරියඩ් එකේ ප්‍රෝජෙක්ට් රූම් එකට වෙලා මමයි චමිරුයි නෆ්‍රාසුයි රිපෝට් එකක් හද හද ඒ වැඩේ හිටියා.. සෙනුකයා අපිත් එක්ක හිටියෙ නෑ.. ඌ මේ ඉන්නවා මෙ චුත වෙනවා.. අපි හොඳම යාළුවො වුණත් එකට ඉන්න සෙට් වෙන්නෙ හරිම අඩුවෙන්.. සෙනුකයට ඉස්කෝලෙ මියුසික් රූම් එක ආරූඪ වෙලා නිසා බැලූ වෙලාවක ඇත්නම් ඒකෙ අස්සෙමයි රිංගගෙන ඉන්නෙ.. ඉස්සරනම් මාත් ඌ එක්ක ඕවගෙ රිංගන් ඉන්නවා.. දැන් වැඩ වැඩි නිසා එහෙම ඉන්න වෙලාවක් හම්බෙන්නෙ නෑ..

අන්තිමේ ඉස්කෝලෙ ඉවරවෙලා ගාථා කිව්වටත් පස්සෙ හරිනම් ප්‍රෝජෙක්ස්ලා පැය බාගයක් ඉස්කෝලෙ නවතින්න ඕන.. එහෙම කිව්වට අපිනම් එකයි හතළිස් පහට විතර එන්න ලෑස්ති වෙනවා.. හැමෝම ප්‍රෝජෙක්ට්ස්ලා සයින් කල්ලා ඉවරවුණාම පොත් ඔෆිස් එකට භාර දීලා අපිත් ඔෆිස් එකේ පොතේ සයින් කල්ලා තමා එළියට එන්නෙ.. ප්‍රැක්ටිස් තියන දවස්වලට මම කලින් ඉස්කෝලෙන් එනවා.. එකයි තිහටම.. නැත්නම් අර වෙළුසුමනයා නහින්න හදනවනෙ..

මම ප්‍රෝජෙක්ට් රූම් එකත් ලොක් කල්ලා සෙනුකයට යතුර දීලා අර පොල් කෑදැත්තා හොයාගෙන ඉස්කෝලෙ පාකින් ලොට් එකට ආවා.. මම යද්දි ඉන්නවා මනමාල හිනාවකුත් දාගෙන බයික් එකට හේත්තු වෙලා.. දෙන්න හිතයි.. මම රවාගෙනම බයික් එක ගාවට ගියා..

" මොකද වරද් මූණ නරක් කරගෙන.."

" මම පෙග්නට් වෙලා ඒයි.. මාර වැඩේ.."

රඩ්‍ය අයියා හෙල්මට් එකක් අරගෙන මගේ ඔලුවට ඒක එබුවා.. ඔබලා ලොක් කලා.. මම ඒක හරියට හදාගත්තහම රඩ්‍ය අයියා එයාගෙ බෑග් එක මට දුන්නා..

" සිරාවට.. ඇයි කලින් කිව්වෙ නැත්තෙ.."

" ළමයා භාරගන්නවද.."

" ගන්න වෙනවනෙ.. දැන් සති කීයද.."

@Shan

" සති තුනක් ඒයි.. මම දැන් අම්මලට මූණ දෙන්නෙ කොහොමද.."

" පැනලා යමු..??"

" බඩවල් උස්සන් පැන පැන යන්න බෑ.. ගෙදරට ඇවිත් අම්මලට කියලා මාව කසාද බඳින්න.."

" අම්මලා කැමති වෙයිද.."

මම රධ්‍ය අයියගෙ උරහිසින් අල්ලගෙන බයික් එකට නැග්ගා..

" කැමති වුනත් නැතත් දැන් පෙග්නට් වෙලානෙ.. ගිහින් මගෙ කකුල් දෙක අතගාප-හිමින් පලයන් අයියෙ.."

රධ්‍ය අයියා බයික් එක රේස් කරපු පාර මම හූනු පැටියා වගෙ ඉස්සරහට ඇදිලා ගිහින් උගේ පිටේ වැදුනා.. රධ්‍ය අයියා මගේ කකුලට තට්ටුවක් දාල එක අතක් අරගෙන ඉන හරියෙන් තියාගත්තා..

" පාඩුවෙ ඉඳපන් වරද්.. අරහෙන් මෙහෙන් අල්ලන්නැතුව.."

" මම එහෙම කළේ කවද්ද.. අනේ මේ බඩගිනී ඒයි ගෙදර යමු.. මට මහන්සී.."

" ළමයි හම්බෙන්න ආවහම එහෙම තමා.. වමනෙට වගේනම් කියහන්.."

" එල.."

මම රධ්‍ය අයියා කිව්වා වගේ හරිම හොඳට අතපය පාඩුවෙ තියාගෙන එන්න ආවා.. මේ වෙලාවට ට්‍රැෆික් හැමතැනම.. මම හුළඟට මූණ අල්ලගෙන හිටියා.. හතර වෙන්න කලින් නෙ මාමා එන්න කිව්වෙ.. තාම දෙකට විතර ඇතිනෙ.. ට්‍රැෆික් එකේ බයික් එක නතර කරගෙන මම රධ්‍ය අයියට හෙන පවයක් කියන්න ඉස්සරහට බෙල්ල දික් කලා විතරයි එහාපැත්තෙ පාර අයිනෙ ඉඳපු රස්තියාදුකාර පාට කොල්ලෙක් මට ඇහැක් ගැහුවා.. මාව එකපාරට ගැස්සිලා ගියා.. උගේ වින්ක් එකට නෙමේ.. උගේ ඇහේ එල්ලගෙන ඉන්න තොරොම්බල් ටික දැකලා.. යකෝ කටටයි නහයටයි හැම අගලෙම කරාබු එල්ලගෙන කහ පාටට කොණ්ඩෙ පාට කරගෙන.. ටික්ටොක් සුපර් මෑන් කෙනෙක්ද දන්නෑ.. මම ශේප් එකේ මූණ

@Shan

අතින් පැත්තට හරවගත්තා.. එක්කො අහන්න තියෙන්නෙ පකද බලන්නෙ කියලා..

" ජ්ස්.. ජ්ස්.."

" අරුගෙ හොම්බට දෙකක් අනින්න හිතයි.."

ඌ එහාපැත්තෙ ඉඳගෙන කොළ කැල්ලක් දික් කරන් පිඹිනකොට මම මූණ තවටිකක් එහාට හරවගෙනම හිටියා.. එහෙම කන්න වගේ බලාගෙන ඉද්දි හරි අපහසුයි.. ඕනම කෙනෙක්ට.. කොල්ලෙක්ද කෙල්ලෙක්ද කියන එක නෙමෙ.. බැල්මකින් වුණත් මනුස්සයෙක් දූෂනය කරන්න පුළුවන් කියන්නෙ.. මම හිතුවෙ රධ්‍ය අයියට ඒක ඇහුණෙ නැතුවැති කියලා.. ඒ වුණාට එයාට ඒක ඇහුණා.. රධ්‍ය අයියා හෙල්මට් එකේ ග්ලාස් එක උඩට කල්ලා ඒ පැත්ත බැලුවා.. මට ඉස්සරහා සයිඩ් මිරර් එකෙන් එයාගෙ මූණ පේනවා.. එකට හාවෙලා වගේ තියන ඇහිබැම කේන්තියට සැරින් සරේ ගැස්සෙනවා..

" ඇයි.. මොකක් හරි ප්‍රශ්නයක්ද.."

රධ්‍ය අයියා සද්දෙට ඇහුවහම වටේ පිටේ ඉන්න මිනිස්සුත් අර තොරොම්බල් කරත්තෙ දිහා බැලුවා.. ඌ එකපාර අන්දමන්ද වෙලා ගිගින් උඩ බිම බලන්න ගත්තා.. නිකන් ඌ මොකුත් කළේ නෑ වගේ.. අර කොළ කැල්ලත් ශේප් එකේ සාක්කුවටම ඔබාගත්තා..

" ප්‍රශ්නයක්නම් කියන්න.. විසඳගන්න පුළුවන් නෙ.."

" ඇයි මල්ලි මොකෝ අවුල.."

අපිට එහාපැත්තෙ ඉඳපු අයියා කෙනෙක් බයික් එක පිටිපස්සට කල්ලා රධ්‍ය අයියට තට්ටුවක් දැම්මා..

" නෑ බං.. මේ කොළකැලි දික් කරන් එනවා-"

" ඕයි අයියෙ..!! ඉස්කෝලෙ යන ළමයින්ට සූස් සූස් ගාන්න.. උඹට අසහනේද.. ඒකට වෙන එකෙක් හොයාගනින්.. හු#තා.. කාලකන්නි හැත්ත.."

@Shan

" කෙලිනවා උඹට දැනගනින්.. පාර කියලා බලන්නෙ නෑ.. ආයෙ පොඩි උන්ට සද්දෙ දැම්මොත්.."

" මල්ලී.. උඹ පලයන් දැන්.. මුන් එක්ක ඔච්චා කතාකල්ලා වැඩක් නෑ.. ජේනවනෙ දැනට ඉන්නෙත් වැදිලද කොහෙද.."

රධ්‍ය අයියා තොරොම්බල් කරන්නෙට දෙකක් රවලා අර අයියගෙ පිටට තට්ටුවක් දැම්මා..

" මම යනවා මචං.."

" හරි බං.. පරිස්සමට.."

රධ්‍ය අයියා අනිත් අයියගෙ පිටට තට්ටුවක් දාලා බයික් එක රේස් කරගෙන හෙන වේගෙන් එන්න ආවා.. සැමක්.. ඒ මොකක්ද ඒ වුණේ.. ඇත්තට අද කාලෙ උන්ට පුදුම අමාරුවක්නෙ තියෙන්නෙ.. අපි පොඩි කාලෙනම් ඉස්කෝලෙ යුනිෆෝම් එකට ගෞරවයක් හරි තිබුණා.. දැන් බලද්දි ඒකත් නැතිවෙලාද කොහෙද.. නැත්නම් ඔය නිව්ස් වලට යන්නෑනෙ.. අහවල්පැත්තෙ කෙල්ලෙක් ඉස්කෝලෙ යන ගමන් අතුරුදහන් වෙලා.. කොල්ලෙක් හෝටලේකට විකුණලා.. තාත්තා අතින් දූෂනය වෙලා.. කොච්චර අහන්න දකින්න තියෙනවද..

ඒ වුණාට ලංකාවෙ දෙදාස් පන්සීයෙ ඉතිහාසෙ තියනවනම් එච්චරයි.. හෙන ගහලා ගියත් කමක් නෑ.. දෙදාස් පන්සීයට මොකුත් නොවී.. බුදුඅම්මො!!

රධ්‍ය අයියා ක්වාටස් එක ගාවින් බයික් එක පාක් කල්ලා මම උඩට යනකල් ඉදලා එයත් ආවා.. දොර අරිද්දිම ඇහෙනවා ආධ්‍ය අයියා කිචි බිචි ගාන සද්දෙ.. අපි ගාව විතරයි ඩයල් එක පරිණත වැඩිහිටියා වෙලා ඉන්නෙ.. මාමා ළහපාතක ඉන්නවනම් පුදුම කැටයම් තමා අයියගෙත් තියෙන්නෙ.. බෝතල් කටටෙන් ඇනලා හරි යාළුවුනේ ආදරේ නිසානෙ ඉතින්..

" අපි ගෙදර ආවෝ~.."

" කෑගහන්න එපා බං.."

@Shan

මම රධ්‍ය අයියවත් ඇදගෙන කුස්සියට ගියා.. යද්දි අපේ මාමා හෝ ගාලා උයනවා.. ආධ්‍ය අයියා පුටුවකින් වාඩිවෙලා අපේ මාමට හෙන විසාල කතාවක් කියනවා.. ඇස් දෙකත් ලොකු කරගෙන කකුල් දෙකත් උඩට අරගෙන.. මම ආධ්‍ය අයියට හේත්තුවක් දාගත්තම ආධ්‍ය අයියා මාව උකුලෙන් වාඩිකරගත්තා..

" ගෙදරට සුනාමියක් ආවා වගේ.. මේකා ආවහම.."

රධ්‍ය අයියා ගිහින් අපේ මාමා කප කප ගිහිය තක්කාලි කෑල්ලක් කටේ ඔබාගෙන පැන්ට්‍රි එකෙන් ඉදගත්තා..

" අපි ආවහම එහෙම තමා මාමෙ.."

" පොඩී මොකද ඉස්කෝලෙ වැඩ.. හොදයිද.."

" අවුලක් නැහ්.. හොදයි.."

" හනේ අපේ හිච්චි ගුරුතුමා ශෝයි අයියෙ.."

" එහෙමද.. චූටි මොකෝ කලේ අද.."

" ඒකා ගෑණියෙක්ට අදිනවයි කියන්නෙ.. අනේ මන්දා මූටනම් එහෙම විළිලැජ්ජාවක් කියලා දෙයක් ඇත්තෙම නැද්ද කොහෙද.."

" මොකද නැත්තෙ.. එයාට තියනවා.."

අපේ මාමා රවලා රධ්‍ය අයියා දිහා බලලා තව තක්කාලි කෑල්ලක් කටේ එබුවා..

" උඹ කොහොමද උගෙ ලැජ්ජාව ගැන දන්නෙ.."

" අනුරාග් පාඩුවෙ ඉන්නකො.. ඔයා ඉස්කෝලෙ යන කාලෙ රස්තියාදු ගැහුවට චූටි එහෙම නැනෙ.. දැන් ඔයාට පුළුවන්ද රහපාන්න.."

" රහපාලා පෙන්නනන්නද.."

ආධ්‍ය අයියා මගේ බඩ බදාගෙන උරහිසින් මූණ තියාගත්තා..

@Shan

" හා.."

මාමා ආධ්‍ය අයියට දෙකක් රැව්වා..

" නාගෙන එන්න සුදුමහත්තයා.."

" අනේ කාලා.."

" නෑ නෑ දෙන්නම ගිහින් නාගෙන වර.. එතකල් කන්නෙ නෑ.."

" මොකක්ද මාමෙ.."

රධ්‍ය අයියත් මූණ ඇදකරගත්තා.. මම මාමට දෙකක් ගස්සගෙන නැගිටලා කාමරේට යන්න ගියා.. ඕන්නෑ මට.. මම නාලා පිනසේ හදාගෙන මැරිලා යනවා.. එතකොට තේරෙයි මගෙ අගේ කාට කාටත්.. මම කාමරේට ගිහින් ශර්ට් එක ගලවලා කරකලා කරකලා ගානට ඒක බාස්කට් එකට ලැන්ඩ් කලා.. වැඩ්ඩෙක් තමා.. මගේ කාමරේ ටිකක් කරුවලයිනෙ. මට හිතෙන්නෙම මගේ පුටුව උඩ හොල්මනක් ඉන්නවා කියලා.. රෑටත් මම ෆෝන් එකේ ටෝච් එක ගහලා බලනවා.. ඉන්නවා තමා.. කොඑකාර හොල්මන.. මම දිහා බලාගෙන.. එතකොට මම ඕකෙ වාඩිවුණාම ඌ හිතන්නෙ මම උගෙ උකුළ උඩින් වාඩිවුණා කියලා.. මේ පුටුව වෙලාවක මාමගෙ කාමරේට දාන්න ඕන.. හැබැයි ඒකට දාලා හොල්මන නරක් වුනොත් එහෙම.. ආධ්‍ය අයියත් ආවහම ඒකෙ ඉන්නවනෙ.. එක්කො හොල්මන ඔහොම ඉඳපුදෙන්.. මාත් එක්ක හිටියා කියලා කවුරුත් නරක් වෙන්නැනෙ.. ඌ උගේ පාඩුවෙන් ඉඳපුදෙන්.. මම මගේ පාඩුවෙ ඉන්නවා.. හැබැයි කණ්ණාඩිවලින් අරහෙන් මෙහෙන් පේන්න එන ඔට්ටු නෑ.. සිකුරුටි අංකල් කිව්වනෙ දවසක් මේ ක්වාටස් වල ඉස්සර ඩොකෙක් එල්ලිලා මැරුණයි කියලා.. ඒ ඩොකා හිටියෙ මෙකෙද දන්නෑ.. මලෞත්තයි.. මූට එල්ලෙන්න වෙන කාමරයක් තිබ්බෙ නැද්ද යකෝ මගේ කාමරේම එල්ලුනේ.. අනිවාරෙන් ලව් පලහිලව්වටක වෙන්නැති.. ඒකත් අංකලේගෙන් වෙලාවක අහගන්න ඕන.. ඇයි මලේ කියලා..

" වරද්.. ටවල් එක කෝ.."

මම එකසැරේ හොල්මනක් ගැන හිත හිත ඉඳලා රධ්‍ය අයියගෙ කටහඩ ඇහුණා විතරයි එහෙමම ඇඳ උඩට කකුල පැටලිලා ඇදගෙන වැටුණා.. රධ්‍ය අයියා මට මහ බලු විදියට හිනාවුණා..

@Shan

" මොන මගුලක්ද ඕයි.."

" ඇයි බයවුණේ.. හොල්මන කියලා හිතුවද.."

" කවුද බයවුනේ.. මගෙ කකුල පැටලුණා.."

" හා.. ටවල් එක දීපන්.. මම මුලින් යන්නෙ.."

" කබඩ් එකේ ඇති.. ගන්නවකො.. අත පය තියනවනෙ.."

රධ්‍ය අයියා මගේ ගාවින් යන ගමන් මගේ ඔලුවට එකක් ඇනගෙන ගියා.. මම අත කරකලා උගේ පස්සට පාරක් දුන්නහම රධ්‍ය අයියා ශර්ට් එක ගලවලා මගේ ඔලුවට දැම්මා.. දාඩිය පිටින්.. මම ඒක පැත්තකට විසික් කළා..

" තව්සෙට පිස්සුද.."

" ඇයි ගහන්නද.."

" ඇයි ගහන්න බැරිද.."

මම රධ්‍ය අයියගෙ බඩට පයින් පාරක් දුන්නහම රධ්‍ය අයියා මගේ කකුලකින් ඇදලා මාව ඇදෙන් බිමට දැම්මා.. මම උගේ කකුල හැපුවා..

" ආ...!!! වරද්!!!!!!!!"

" මොකද තව්සෙ මාව බිම දැම්මෙ.."

රධ්‍ය අයියා මගේ පිටට දෙකතුනක් තඩිබෑවහම මම උගේ බෙල්ලෙන් අල්ලගත්තා.. කැස්වටුවා.. මට ගහන්න..??

" අතෑරපන්.."

" තව්සෙ අතෑරපන් මුලින්ම.."

" මට බෑ.."

@Shan

මම රධ්‍ය අයියගෙ අහුවෙන අහුවෙන හැම තැනම හපාගෙන හපාගෙන ගිහින් ඌව බිම පෙරළගෙන උගේ ඇඟ උඩින් ඉඳගත්තා.. ඉඳගෙන බෙල්ලෙන් අල්ලගෙන බිමට තියලා තද කලා.. රධ්‍ය අයියා මගේ වෙස්ට් එකෙන් ඇදලා ගත්තා..

" උඹනෙ පටන්ගත්තෙ.."

" තව්සෙ මුලින්ම මගේ ඔලුවට ගැහුවෙ..ආ.. ආයෙ කරනවද.. කරනවද.."

රධ්‍ය අයියගෙ පපුවෙ පැත්තක්ම මගේ නියපොතු වලට හීරිලා ගියා.. මගේ බැනියමේ කට ගාවින් සරාස් ගාලා ඉරිලා ගියා.. ඊටපස්සෙ අහුවෙන අහුවෙන අතට මම ඌට ගැහුවා.. ඌ මට ගැහුවා.. අතින් පයින් ගහගෙන පොත් වලිනුත් ගහගෙන රධ්‍ය අයියා ඇඳ රෙද්දක් උස්සගෙන ඇවිත් මාව මමියක් වගේ මූණ විතරක් ඉතුරු කල්ලා ඔතලා කොන් දෙක ගැටගහලා ඇඳ උඩට අතෑරලා ටවල් එකත් අරගෙන කාමරෙන් යන්න ගියා.. මට හෙල්ලෙන්නවත් බෑ.. මමිය වගේ ඇඳ උඩ පතබෑවිලා හිටියා..

" ආධ්‍ය අයියේඒඒඒඒඒඒඒඒඒඒඒඒඒ!!!! එන්නකෝඕඕඕඕඕඕ!!!!!!!!!!!!!"

" අයියේඒඒඒඒඒඒඒ!!!!!!!!!"

*දඩාස්*

මම දඟලලා රෙද්ද ලිහාගන්න ගිහින් ඇඳෙන් බිමට පතබෑවුණා..

" චූටි!! මේ මොකද ළමයි.. කාමරේ වනසගෙන.."

" රධ්‍ය අයියා ඉන්න දෙන්නෑ අයියෙ.."

" පොඩීඊඊඊඊඊඊඊ!!! මෙහෙ එනවා!!!!!!!!!!!!!"

පෞකාර සමනලයා අවේලාවෙ ආවා දළඹු ළමයිනේ.. දෙයියනේ.. ඊයෙ දුන්නෑ නේත..

පෞකාරිට එක්සෑම් අනේ මේ සතියෙම.. සතියෙම කිව්වෙ.. හෙටයි, අනිද්දයි, ඉන් අනිද්දයි, ඊටපස්සෙ දවසට පස්සෙ දවසෙයි.. හෙට භෞතික විද්‍යාව තියෙම්නෙ..

@Shan

අපි පා~වෙන ලෝකේ~~~~

එන්නාම්.. ලව් යූ.. ❤

මට තෑගි වගයක් හම්බුණානෙ මගේ ආරණීයම ආදරණීය දළඹු පැටවුන්ගෙන්.. හුගක් ස්තූතියි අනේ.. මම හුගක් හුගක් ආදරෙයි.. මට හුහාක් සතුටුයි..😘❤❤❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 133 කොටස

" කව්ද මේකෙ දොර ලොක් කලේ.. සෙනුකයට පිස්සුද හැදිලද.."

මම ඉස්කෝලෙ වටයක් ගහලා ප්‍රිෆෙක්ට් රූම් එකට එද්දි ඒකෙ දොර වහලා.. වෙනදට ඕකෙ දොර වහන්නෙ නෑ ඉස්කෝලෙ ඉවරවෙනකල්.. ඉස්කෝලෙ ප්‍රිෆෙක්ට්ස්ලට වෙන ඉන්න තැනක් නැනෙ.. එහෙම කිව්වට මේකෙ අස්සෙ තියෙන්නෙ බෑග් ටික විතරයි.. ප්‍රිෆෙක්ට්ස්ලා එක එක වැඩවලට එළියට යනවා.. නැත්නම් ප්‍රයිමරිය පැත්තෙ, ග්‍රවුන්ඩ් එකේ, ස්පෝර්ට්ස් ක්ලබ් වල, ජිම් එකේ තමා වැඩිපුරම කට්ටිය ඉන්නෙ.. සෙනුකයා මට එකොළහට රූම් එකට එන්න කියලා ඌ මේක වහලා ගිහිල්ලද..

මම දොරට හිමින් තට්ටුවක් දැම්මහම ඒක ඇරුණා..

දවල් වැඩක් නැත්නම් රධ්‍ය අයියා කිව්වනෙ පුස්තකාලෙ පැත්තෙ ඇවිත් යන්න කියලා.. මම ඉතින් ඌ එක්ක පෙම් කෙළින්න හිතාගෙන එහෙ ගියාම ඒකා කපටි හිනාවක් දාලා හොඳ එකා වගේ කතාකල්ලා තඩි පේපර්ස් මිටියක් මගේ අත උඩ අතෑරියා.. මට ඉතින් රධ්‍ය සෑර්ගෙ පේපර්ස් මිටියම බලලා ඉවර කල්ලා දීලා තමා පුස්තකාලෙන් එන්න වුණේ.. රධ්‍ය අයියා මට පේපර්ස් බලන්න දීලා ලැප් එකකුත් දිග ඇරගෙන ලෙක්චර් එකක් බල බල හිටියා.. අපේ පුස්තකාලෙ නිසා හොඳයි ඉතින්.. උඩ තට්ටුවෙ මොකෙක්වත් නැනෙ.. හිතේ හැටියට ඉන්න පුළුවන්.. මමත් රධ්‍ය අයියට මොකුත් කරන්නැතුව හොඳ ළමයා වගේ පේපර්ස් ටිකත් බලලා දීලා පස්සටත් එකක් ගහගෙන එන්න ආවා.. එයාට පැය බාගෙකින් ලෙක්චර්ස් ඉවරවෙනවලු..

මම ප්‍රිෆෙක්ට්ස් රූම් එක ඇතුළට යද්දි චමිරුවා කොනේම මේසෙ ඔලුව තියාගෙන ෆෑන් එකත් දාගෙන නිදි.. මම ඌව ඇහැරන්නැතුව පාඩුවේ ගිහින් මගේ පුටුවෙන් වාඩිවෙලා ෆෝන් එක ඔබන්න ගත්තා.. වෙන වැඩක් නැනෙ කරන්න.. අයුක අයියට හොඳද දන්නෙ නෑ.. පහුගිය දවස් ටිකේම අපේ සුදුදෝණියට උණ හැදිලා කතාකරගන්නවත් බැරුවනෙ හිටියේ.. මේ රධ්‍ය අයියා නිසා එදා මට මාමගෙන් ගුටි කන්නත් වුණා.. මට විතරක් නෙමෙ හැබැයි රධ්‍ය අයියට ගුටි කාලා ඒක බේරන්න ගිහින් අපිව නරක් කරනවා කියලා ආධ්‍ය අයියත් දෙක තුනක් මාමගෙන් කෑවා..

@Shan

" උඹ තමා මුන් දෙන්නව නළවන්නෙ.. ශාක්‍ය..!!"

" ශාක්‍ය නෙමේ එයා ඉශාක්‍ය.. මෝඩ මාමා.."

අපේ මාමා හැබැයි අපිට වඩා සාපේක්ෂව අඩුවෙන් තමා ආඪ්‍ය අයියට දෙකතුනක් දුන්නෙ.. ඒක හෙන අසාධාරණයිනෙ.. එයාගෙ සුදුහාමිනේ වුණා කියලා.. කමක් නෑ ඔය කාපුවට ආඪ්‍ය අයියා මොකක් හරි දමලා ගහන්නෙ නැතැයි කොයිවෙලේක හරි.. අම්මාපල්ලා මම නම් ජීවිතේට හැරිලවත් බලලා බේරන්න යන්නෙ නෑ අපේ මාමව.. හිටපන්කො බලුත් විටක්වත් උස්සන් ඇවිත් ගහනවා කොට්ටෙ අස්සෙ.. රධ්‍ය අයියත් කිව්වා එහෙම කරමු කියලා.. කොහෙද ක්‍රියාවට නංවන්න වුණේ නෑ.. මට අර සිංගප්පූර් වල ටුවර් එකට හටත් උඩින් කෝච් වෙළුවා ප්‍රැක්ටිස් දාලනෙ.. හැමතිස්සෙම හැයි හැයි ගානවා.. කකුල පැටලිලා ඇදගෙන වැටුණත් හැමෝම ඉස්සරහා 'යූ ආ එම්බැරසිං මී' ගාලා කෑගහනවා.. නැත්නම් 'කැට්වෝක් එක නවත්තගන්නවා සරනේරු' 'මේක පැජන්ට් එකක් නෙමේ' 'ස්පීඩ් එක මදි' 'මම ඕවද කියලා දුන්නෙ' 'දුර ගමනක් යන්න ඕනනම් රිස්ක් එකක් ගන්න වෙනවා' කියලා බනිනවා.. දැන් ඒකා මට බනින්න කට අරිද්දිම මම මටම බැනගන්නවා.. එතකොට කෝචට අකලට වහින වැස්ස වගේ හිනාවක් යනවා.. අනේ ඉතින් ඒ ඉරටු මූණට හිනාවක් කැන්දනවා කියන්නෙම මටනම් මහාමෙරක් වගේ.. මොකක් වුණත් මගේ කෝචනෙ.. ගරු කරන්න එපැයි.. ඩයල් එක නොකිව්වට රහසින් වගේ මට ලව්ද කොහෙද.. ලව් කිව්වෙ මේ ගෝලයා ගුරුවරයා අතර තියන ලව් එක.. ඒ වුණාට රධ්‍ය අයියත් සර්නෙ.. නෑ නෑ එහෙම එකක් නෙමේ.. ඌ ගුරුවරයා වෙන්න කලින් සිස්ස බටයා කාලෙනෙ මම ලව් කලේ.. මම කිව්වෙ.. යූ නෝ වට් අයි මීන්.. ගුරු ගෝල ලව් එක..

" අයුක අයියෙ.."

මම කලින් දාපු මැසේජ් එකට අයුක බොසා රිප්ලයි එකක් දාලා තිබ්බා..

" ඇයි.."

" දැන් කොහොමත.."

" කාට.."

" ඇයි අයියෙ.. උණ හැදිලා හිටියා නේද.."

@Shan

" හොඳයි අවුලක් නෑ.."

" එච්චරද.. කාලද ඉන්නෙ.."

" තාම නෑ.. කන්න ඕන.. වත්සල් නැද්ද.."

" ඇයි බැනුමක් ඇහුවත.."

" ඔව් නේ.."

" මොකත වත්සලේ කිව්වෙ.."

" එහෙම නෑ.."

" පාඩුවෙ ඉන්න ෂනෙරු.."

" අයියා අහලා නැතිද.."

" වරද් ෂනෙරු පාඩුවේ නොහිදිනා වග.."

" හා.. කෝ රධ්‍ය.."

" ලෙක්චර් එකක.."

" ආයෙ හම්බුණාම මට කෝල් එකක් ගන්න කියන්න.."

" කියන්නම්.. සෙනුක ආවහමත් කියන්න ඕනද.. අවුලක් නෑ අදට රධ්‍ය අයියගෙ ජොබ් එක මම කරන්නම්කො.. මොකෝ සීන් එක.."

" ඔයාට කියලා මොකුත් කරවගන්න එපා කියලා රධ්‍ය කියලා තියෙන්නෙ.."

" ආ මේ.. එයාට පාඩුවෙ ඉන්න කියන්නකො.. ඉරිසියාවට අනේ ඕවා කියන්නෙ.. අයියා කියන්න දැන් මොකද ප්‍රශ්නෙ.."

" මොකුත් නෑ මොකුත් නෑ.. ඔයාලගෙ ගැන්ග් එක මම ජීවිතේට විශ්වාස කරන්නෙ නෑ.."

@Shan

" ආ එහෙමතේ.."

" ඔව්.."

" එහෙනම් අයියෙ උඹ නටපන්.. මම යනවා.."

" මේ වත්සල්ට කියන්න හරිද මට කෝල් එකක් ගන්න කියලා.."

" බෑ..!!!"

මම ෆෝන් එක පැත්තකින් තිබ්බා.. මාව මොකද ඔච්චර විශ්වාස කරන්න බැරි.. අයුක අයියට මම කතා හදන නිසාද.. එහෙම තමා.. ඌ තමා නයාට ගහලා පොල්ල වරද්දගත්තෙ.. මම පාඩුවෙ හිටියා.. ඒකා රධ්‍ය අයියට සෙනුකයගෙන් අහගෙන හැමදාම කේලම් කියනවා.. මගේ මනුස්සයා ඒවට කුපිත වෙන්නෙ නෑ තමා.. ඒ වුණාට මටත් දෙයක් කියන්න ඉතුරු කරන්න එපැයි.. රධ්‍ය අයියගෙ බෙස්ටිනෙ අයුක අයියා.. කියාන් අයියා කියන්න වගෙ උන් දෙන්නා එකට ඉද්දි ගෑණු දෙන්නා වගේ.. රහස් කියාගන්නවා.. ඇගේ එල්ලෙනවා.. කුටු කුටු ගානවා.. හිනාවෙනවා.. අමුතු අමුතු කෝලම් තියෙන්නෙ.. ආ තව බදාගෙන අඩන්නෙ.. කියාන් අයියා ඒකනිසා තමා උන් දෙන්නට සුදුඅම්මියයි සුදුදෝණියයි කියන්නෙ.. අපි ගාව හෙන සිංහ ලයින් දාලා අපි නැතුවුණාම කොමල කල්ලා හරියනවද මං අහන්නෙ.. නෑනෙ.. නරියො දෙන්නා.. ඔය බෙස්ටි කියන්නෙ හොරගෑනිට කියලා සෙනුකයට කියන්න තියෙන්නෙ.. ඒත් එක බෙස්ටි නෙමේනෙ.. අර සූකරයත් ඕකට ඉන්නවනෙ.. හොරගෑනු දෙන්නා එතකොට.. ඒත් එහෙම කිව්වොත් සෙනුකයා මගේ හොඳම පරම මිතුරා නිසා.. ඌ මගේ හොරගෑණි කියලා සුදුපෞල අපිට කතා හදයිද.. හදපුදෙන්.. ඔය කතාවලට පුලුවන්ද මේ සනෙරුමලයි සෙනුකමලයි වට්ටන්න.. පිස්සු හැදෙයි.. සෙනුකයා දෙක තුනයි අයුක අයියට බනින්නෙ.. පොර කටවහන් පැත්තකට වෙලා ඉන්නවා.. සෙනුකයා මගේකා.. පෞකාර පවුල සුදු පවුල යටත් විජිතයක් කරගත්තා..

මම ජනේලෙන් එළිය බලාගෙන කල්පනා කලා.. අම්මවත් මතක් වෙනවා හෙනට.. කොච්චර කිව්වත් ඉතින් මගේ අම්මනෙ.. වෙනදට පොඩ්ඩක් අවුස්සලා හරි අම්මව කෑගස්සන්නත් අම්මා දැන් නෑනෙ.. අම්මටත් පාළුයි කියලා අම්මා කියනවා.. ඒත් ආච්චිඅම්මා ඉන්න නිසා ලොකු පාලුවක් නැතුව ඇති.. මම අම්මා ගාව ඉන්නවා වගේ අපේ අම්මත් ආස ඇතිනෙ එයාගෙ අම්මා ගාව ඉන්න.. අනික අපේ අම්මට ආරක්ශාවක් උණුහුමක්

@Shan

දැනෙන්න ආච්චි ළඟ විතරනෙ.. මම ඉපදුණ දවසෙ ඉඳලා මාමා ඇරෙන්න කිසි පිරිමියෙක්ගෙ ආරක්ශාවක් ආදරයක් අපේ අම්මට දැනිලා නෑ.. මම ලොකු වුණාම නම් මම අම්මව පරිස්සම් කලා.. අම්මට ඒක දැනෙන්න ඇති කියලා මම හිතනවා.. ඒත් අම්මට හුඟක් ළඟ ආච්චිඅම්මා තමා.. හැම ඔපදූපෙම කියන්න.. කියලා හිනාවෙන්න, ඇඳුමක් ඇන්දහම ලස්සනයි කියන්න, කෑමක් හැදුවහම රසයි කියන්න ඉන්නෙ ආච්චිඅම්මා විතරයි.. අපි කවුරුත් අම්මා ගාව දැන් නෑනෙ.. එන්න එන්න මට අම්මව මග ඇරෙනවා.. ඒත් අම්මව හොඳින් බලාගන්න ඕන කියන එක මගේ හිතේ උඩින්ම තියනවා.. කවදහරි ගෙයක් දොරක් හදලා දෙන්න.. අම්මා එක්ක වාහනේක යන්න.. ඒ තැනට එන්න.. උපාධියක් ගත්ත කාලෙක අම්මා එක්ක ෆොටෝ එකක් ගන්න.. කොන්වොකේශන් එකට අම්මව ගෙන්නගන්න.. අම්මගෙ කටින් හොඳ වචනයක් අහන්න මාත් කැමති.. හැම පුතෙක්ගෙම හීන වගේ මගේ හීනවලත් ඒවා තිබුණා..

ළඟදි ආශිගෙ අම්මයි, සෙනුකයගෙ අම්මයි, මහීශගෙ අම්මයි, අපේ අම්මව බලන්න ගමේ යන්නලු හිතාගෙන ඉන්නෙ.. ඒකත් හොඳයි.. හුඟ කාලෙකින් ඒගොල්ලො හම්බුනේ නැහැනෙ.. මෙහෙ ඉද්දි නම් නිතර හම්බෙලා කතාබහ කරනවනෙ.. අපි හතරදෙනාගෙ අම්මලාත් අපි වගේම හෙන ආතල් ඩයල් ටිකක් තමා.. එයාලා නිසා තමා අපේ යාළුකම තව ටිකක් තදට තිබුණේ.. මොකක් වුණත් එහෙම යාළුවො ජීවිතේට ඉන්න ඕනමයි.. අදටත් මෙහෙමයි බං පොඩි ප්‍රශ්නයක් කිව්වොත් ඕන ලෝකෙක ඉඳල උන් එනවා.. පුළුවන් හැමපැත්තකින්ම උදවු කරනවා.. මට හම්බෙච්ච අවස්ථාවාදි දෙපිටකාට්ටු මිනිස්සු අතරෙ වෙනස් වෙන්නෙ නැතුව හැමදාම එකම විදියට ඉඳපු උන්ට මම හෙන ආදරෙයි.. යාළුකම කියන්නෙ හැමතිස්සෙම කතාකර කර ඇඟේ එල්ලීගෙන ඉන්න එක නෙමේ මට අනුව.. එහෙම බලද්දි සෙනුකයයි මමයි එකට ඉඳගෙන නිදහසේ කතාකරන්නෙත් හෙන අඩුවෙන්.. ඒත් මම දන්නවා ඌ එහෙම වුණාට මම ගැන හොයනවා.. හොයලා කටවහන් ඉන්නවා.. කොහේහරි වැරැද්දක් පේනවනම් කියනවා.. එච්චරයි.. උන්ටත් ජීවිත තියනවනෙ.. ආශියි මහීශායිත් එහෙමයි.. අපි එක්ක වැඩිය කතාබහ නොකළට හොයලා බලනවා..

මම ජනෙලෙ දිහා බලාගෙන ඉඳලා නිදාගෙන ඉන්න චමිරුවා දිහා බැලුවා.. මූට අද මොකක් වෙලාද.. වෙනදට සෙනුකයා එක්කම ඉන්නවනෙ.. අද සයිඩ් ගහලා ඉන්නෙ.. ඇහැරිලාද මන්දා.. ඔලුව තියන් හිටියට.. සෙනුකයත් තාම නෑ.. ගයනිකා මැඩම් බබා හම්බෙලා ආයෙම ඉස්කෝලෙ එන්න

@Shan

අරගෙනනෙ.. සෙනුකයා ඒකනිසා තමා ඔක අස්සෙන් එළියට එන්නෙ නැත්තෙ.. අනික ඇනිවසරි එකට ඉස්කෝලෙන් සිංදුවක් කරනවා.. ඒකෙ වැඩවලටත් සෙනුකයා හිරවෙලා.. ඒවුනාට එන්න එපෑ සනෙරුමල තනියමනෙ.. එක්කො ඊළඟ දවසෙ ඌ එක්කම ඔකට රිංගගත්තනම් හරි..

චමිරු එකපාර නැගිටලා අත් දෙකින්ම මූණ වහගෙන ටිකක් වෙලා හිටියා.. ඌ දන්නව ඇතිනෙ මම ඇතුළෙ කියලා.. මම ඒක ගනන් ගන්නැතුව මගේ මෙසෙට වෙලා ඉද්දි ඌ ටිශූ එකක් අරගෙන මූණ පිහිදාගන්නවා මම දැක්කා.. මොකක් හරි අවුලක් වෙලාද මූ අඩන්නෙ.. හරිනම් එහෙම අඩන ඩයල් එකකුත් නෙමෙ.. ගහන්න වගේනෙ ඉන්නෙ..

" මෙ චමිරුවා.. උඹ හොදින්ද.."

" ම්ම.."

මම ඌ කතාකරපු විදිය එච්චර හරි නැති නිසා උගේ මෙසෙ ළඟ තිබ්බ පුටුවක් ඇදගෙන මෙසෙන් වාඩිවුනා.. චමිරුවගෙ ඇස් දෙක රතු වෙලා..

" ඊයෙ රෑ බිව්ව නේ.. නෙද්දකින්.."

චමිරු මූණ අහකට හරගෙන ටිකක් වෙලා හිටියා..

" උඹ ගාව පෙනඩෝල් දෙකක් තියද.."

" ඇති.. දෙන්නම.."

" ම්ම.."

මම බෑග් එකේ තිබ්බ පෙනඩෝල් කාඩ් එකෙන් දෙකක් අරගෙන වතුර බෝතලේ එක්ක චමිරුට දුන්නා..

" හුහක් අමාරුද.."

" ම්ම්.."

චමිරු පෙනඩෝල් කාඩ් එක කඩලා පෙති දෙකක් අරගෙන ඒක බීලා වතුර බෝතලේ මට දුන්නා..

@Shan

" මොකටද බොන්න ගියේ.. උඹ ඉස්කෝලෙ එන්න ඕන කියලා දන්නවනෙ.."

" මම්.."

" උඹ ඕවා කරන නිසා තරුවි අවුලින් ඉන්නෙ.. පෙරේදත් කතාකල්ලා කිව්වා උඹ ගෙදර නෑ කියලා.. මොනවද බං මේ කරන්නෙ.."

" ඔය ගෑණුගැන මට මේවෙලේ කියන්න එපා.. දැන් ඒකිට දුක අහන අයියලත් ඉන්නවද.."

චමිරු මං දිහා බලලා නෝන්ඩියට හිනාවුණා..

" චමිරු!!!!!!!!!!!!!"

" මොකද..!!!"

" බලු කතා කියනෙපා හරි.. ඒකි මට කතාකලේ උඹ ගෙදර නෑ කියන්න මිසක්.. මම කාගෙවත් දුක අහන්න ගියේ නෑ.. උඹට මොකක්ද හැදිලා තියන පිස්සුව.."

මම ටිකක් සද්දෙන් කෑගැහුවහම චමිරුගෙ අත් දෙක මිලමෙළවුණා..

" ඇයි උඹ මං ගැන වදවෙනවද.."

චමිරු මහා හයියෙන් මේසෙට ගහගෙන නැගිට්ටහම මාව ගැස්සිලා ගියා.. මමත් පුටුවෙන් නැගිට්ටා.. ඌට ඇහට ගොඩවෙන්න මම මොකුත් කිව්වෙ නෑනෙ..

" මොන හු#තක්ද.. ඇහට කඩාගෙන පනින්නෙ.."

" ෂනෙරු!!! පාඩුවෙ ඉඳපන්.. මගේ දෑහැට පේන්න උඹ නාවට කමක් නෑ.."

චමිරු මගේ මූණ දෙපැත්තෙන් අල්ලගෙන මාව බිත්තිය පැත්තට තල්ලු කල්ලා දැම්මා.. මාව ගිහින් බිත්තියේ වැදුණා.. මම චමිරුගෙ අත ගසලා දාලා ඌව එහාට තල්ලු කරා..

" මම කවද්ද උබේ දෑහැට පේන්න ආවෙ.. ආ..!!!"

@Shan

" දැන් උඹ ඒක නෙමෙයිද කරන්නෙ.."

චමිරු මගේ උරහිසෙන් අල්ලලා ආයෙම බිත්තියට තියලා තද කළාම මම උගේ අත හිල් වෙලා යන්නම අල්ලලා අත එහාට කල්ලා දැම්මා.. ඌ බයවෙලා මගේ මං දිහා බලාගෙන ඉඳලා අඩියක් පිටිපස්සට තිබ්බා.. ඒ වුණාට උගේ ඇස් දෙක රතුවෙලා අත් වල නහර ඉලිප්පිලා තියන විදියට බය හිතෙනවා..

" මාව අල්ලන්න එ-

**උබට මොකක්ද මගේ තියන අඩුපාඩුව ෂනෙරු!!!!!**

"

චමිරුවා පිස්සෙක් වගේ ප්‍රිංෆෙක්ට් රූම් එක දෙක වෙන්න කෑගහද්දි මම ඌ දිහා බලාගෙන හිටියා..

" මි-මොක.."

" උඹ ඇයි ඔච්චර මුරණ්ඩු.. ඇයි ඇයි තරුවි උඹ වගේ නොවුනෙ.. මොන හු#තක්ද උඹ මට මේ දෙන වදේ.. මට මගේ පාඩුවෙ ඉන්න දීපන්.. උඹ දන්නෙ නෑ මම උඹ ළඟ ඉද්දි කොච්චර දේවල් හිතනවද කියලා.."

" ඕක නවත්තපං.."

" උඹ හොඳටම දන්නවා මම උඹට ආදරෙයි කියලා.."

චමිරු මං ගාවට කිට්ටු වෙලා මගේ මූණට පහත් වුණාම මම මූණ අහකට හරවගත්තා.. ඒත් ඌව තල්ලු කරන්න ගියේ නෑ.. එහෙමම වෙන පැත්තක් බලාගෙන හිටියා.. මට ඌට පැහැදිලි කරන්න දේවල් නෑ..

" මෙ පැත්ත බලපන්.."

" චමිරු!! මම හොඳින් කියන්නෙ.. උඹ ඔය ඉස්සරහට තිබ්බ අඩිය පිටිපස්සට ගනින්.."

" උඹ මුරණ්ඩුයි ෂනෙරු.. උඹ මාත් එක්ක කතාකරන එක වචනෙකින් හරි.. මගේ හිතට බලාපොරොත්තු දෙන එක නවත්තපන්.. මට උඹෙන්

@Shan

ගැලවෙන්න දීපන්.. මොන හු#තක්ද මේක.."

" චමිරු..!! එහාට වෙන්න..!!"

චමිරු මගේ දිහා බලාගෙන ඉඳලා පිටිපස්සට වුණා..

" උඹ හොඳට උඹෙන් අහගෙන බලපන්.. මම කවද්ද උඹට බලාපොරොත්තු දුන්නෙ.."

" උඹ හැමදාම ඒක කරනවා  ෂනෙරු.."

" උඹ හිතෙන් මවාගෙන ඉන්න දේවල් වලට මම පලි නෑ.. අනික.. උඹට ඇහැට කනට පේන දේවල් එක්ක උඹට හිතෙනවද මම උඹට බලාපොරොත්තු දෙනවා කියලා.."

චමිරු මං දිහා එක එල්ලෙම බලාගෙන ඉද්දි ඇස් වල කඳුළු පිරුණා..

" උඹ සිරාවටම රධ්‍යට ආදරෙයිද බං.."

"....."

" ඇයි උඹ ඌට කැමති වුණේ.. ඌට වඩා මම ඉස්සර වුණානම් උඹ මගේ වෙනවද.."

මම හොඳ හුස්මක් අරගෙන පහළ දැම්මා..

" මම හැමදාම උඹව එක එකාගෙන් හොයලා හිතනවා ඒ උඹ නෙමේ කියලා.. මට මෙහෙම කරන්නෙපා බං සිරාවටම.. රිදෙනවා.."

"....."

" මටත් ඕන උඹ රධ්‍ය එක්ක හුරුතල් වෙවී ඉන්නවා වගේ.. මාත් එක්ක ඉන්න.. මටත් ඕන උඹට ආදරේ කරන්න.. උඹව ළඟින් තියාගන්න.. උඹට මාව විශ්වාස නැද්ද ෂනෙරු.. කියපන්කො.."

"....."

@Shan

" උඹ අවස්ථාවක්වත් දෙන්නෙ නැද්ද.. ඇයි මට බැරි හිත හදාගන්න.. ප්ලීස් ෂනෙරු.. මට මෙහෙම කරන්න එපා බං.. උඹට අනුකම්පාවක්වත් නැද්ද කියපන්.."

" උඹ තරුවිට කරන්නෙ බොරුවක්ද..??"

මම චමිරුගෙන් ඇහුවහම ඌ අහක බලාගත්තා.. චමිරුගෙ ඇස් අග්ගිස්සෙන් කඳුලු බිංදුවක් බේරිලා කම්මුල් දිගේ පහලට රූටලා ගියා..

" චමිරු.."

" මම දන්නෙ නෑ.."

" දන්නෙ නෑ කියන එක උත්තරයක් නෙමෙ චමිරු.. උඹ ඒ කෙල්ලට ආදරේ නැද්ද.."

"....."

මම චමිරු ගාවට ගිහින් උගේ මූණ මගේ පැත්තට හරව ගත්ත චමිරු මගේ අතේ ඇඟිලි උඩින් උගේ අතක් තියාගත්තා.. තියාගෙන මගේ දිහා බලාගෙන හිටියා.. මම අත ඇදලා ගත්තා.. මට මහ වරදකාරී හැඟීමක් දැනෙනවා.. පෙරේදත් අඬ අඬ තරුවි නංගිගෙ කටහඬ ආයෙම ඇහෙනවා.. 'ෂනෙරු අයියෙ චමිරු අයියා ගෙදරත් නැනෙ.. ඉන්නෙ කොහෙද කියලා මට කාගෙන් හරි අහලා කියන්නකො.. මම ගෙදර ඉන්නෙ..' කියලා අඬ අඬ අහපු හැටි..

" උඹව විශ්වාස කරන්න කියලා.. කටක් ඇරලා කියන්නෙවත්.. කොහොමද බං.."

"....."

" උඹගෙයි මගෙයි යාළුකම නෑ කියලා හිතාගනින්.. ආයෙ උබේ දැහැට පේන්න මම එන්නෙත් නෑ.. තරුවි එන්නෙත් නෑ.. උඹට හැදෙන්න තිබ්ලත් උඹ හැදුනෙ නෑ.."

" ෂනෙරු.. අහන්න-"

@Shan

" ආදරේ කියන්නෙ උඹෙ ජීවිතේම වුණාට මට එහෙම නෑ.. ඒකනිසා පාඩුවෙ ඉඳපන්.."

" අනේ බං.. අහපන් මම කිව්වෙ-"

" එපා බං.. ඕන නෑ.. උඹ උඹෙන්ම අහලා බලපන්.. උඹට ආදරේ කරන්න සුදුසු එකෙක්ද කියලා.. මට ළඟින් ඉඳපු යාළුවො මට නැතිකල්ලා.. මට කතා හදලා.. උඹ කලේ හරි වැඩද.. ආදරේ කළානම් එහෙම කරනවද.. මතීශ හශාන් අපි එක්ක කතාකරන්නෙවත් නැත්තෙ.. මට අයුක අයියට කතා හැදුවෙ.. ඒකටද උබ ආදරේ කරනවා කියන්නෙ.. මම ඒවා ඔක්කොමත් අමතක කල්ලා උඹ එක්ක කතාකලානෙ බං.. උඹ ඒකට ප්‍රතිඋත්තර දුන්න විදිය ගැන මට මාර සතුටුයි. ඒකනිසා.. මචං.. ඕක නවත්තපන්.. දැන් ඇති.. ප්ලීස්.."

" ෂනෙරු..??"

" අනිත් එක.. උඹ දකින ෂනෙරුයි.. මමයි.. දෙන්නෙක්.."

" එතකොට.. රධ්‍ය..??"

මම යන්න හැරිලත් ආයෙම චමිරු දිහා බැලුවා.. උගෙ මූණෙන් අමමටසිරි වෙන්න අසරණකම මට පේනවා.. ඒ වුණාට මම මැරිලා ඉපදුනේ නැනෙ.. ඌට බොක්කෙන්ම උදව් කලේ අන්තිමට මෙහෙම අහගන්න නෙමේ කොහොමත්..

" රධ්‍ය..??"

" දැන් උඹ කිව්වෙ ආදරේ ජීවිතේම නෙමේ කියලා.. එහෙනම් ඇයි උඹ උඹෙ ජීවිතේම රධ්‍ය වගේ හැසිරෙන්නෙ.."

" ඌ ආදරේට කලින් මට ජීවිතේ දුන්නා.."

මම එන්න ආවා.. චමිරුගෙ මූණවත් බලන්න ආයෙනම් මට ඕන නෑ.. මම මොනවද හිතාගෙන හිටියේ.. මූ තරුවිට මාර ආදරේ ඇති කියලනෙ.. එක්කො මම ඉක්මනට මගේ වටෙ ඉන්න උන් විශ්වාස කරන්න යනවා.. ඒකනිසා තමයි මට හැමදාම කෙලවෙන්නෙ.. දැන් මම තරුවි නංගිට මොනවද කියන්නෙ.. මූ යොහාන් මල්ලිටත් කළේ ඕකම තමා..

@Shan

" ඒ.. ෂනෙරුවා.."

මම පහළට බහින පඩිපෙළේ ඉඳගෙන පහළ බලාගෙන ඉද්දි සෙනුකයගෙ කටහඬ මට එහාපැත්තෙන් ඇහුණා.. බලද්දි ඒකා ෆයිල් මිටියකුත් උස්සගෙන මගේ පැත්තට දුවගෙන එනවා..

" සෙනුක.."

" අඩෝ.. මට රධ්‍ය අයියව මහදි හම්බුණා.. පොඩ්ඩක් පරක්කුනා.. ඒ මොකෝ සීන් එක.."

" අනේ මන්දා බං.."

මම පඩිපෙළේ උඩම පඩියෙ අත්වැටෙන් ඉඳගත්තම සෙනුකයා මගේ එහාපැත්තෙන් ඉඳගත්තා..

" උඹ මූණ එල්ලන් ඉන්නෙ මොකෝ.. ජොනතනයා ගොබ්බ විහිළුවක් කළාද.."

" නෑ බං.. වම්රු.."

" ආයෙ වලිද.. මොකෝ වුණේ කියපන්කො.. ගල් බමුණා වගේ දෙක කරන් ඉන්නෙ.. ඔය මූණෙ පාරක් හීටලා නේද.."

සෙනුකයා මගේ මූණෙ පැත්තකට ඇඟිල්ලක් තියලා එතනින් පහළට තද කලාම මට රිදුණා..

" අර පකයා උඹට මොනවද කිව්වෙ..??"

" ඌ එක්ක යාළුවෙන්නෙයි කියන්නෙ.. පිස්සු හු#තෙක්.. ප්‍රිෆෙක්ට්ස් රූම් එක දෙක වෙන්න කැඟැහුවා.. මොකෙක් හරි ආවනම් තමා.."

" ඌ එහෙම කළාද.."

" ම්ම්.. මම ඌට දෙකක් කියලා ආවා එන්න.. මෙ අහපන්කො සෙනුක.."

මම සෙනුකයගෙ අත අස්සෙන් අතක් දාගත්තා..

@Shan

" ඌ තරුවිට බොරු කරනවා බං.. නංගිව අයින් කරපන්කො.."

" මටත් උඹට කියන්න ඕන වෙලා හිටියෙ.. අනේ මන්දා මූ මොනවා කරනවද මට තේරෙන්නෙ නෑ බං.."

" පව් ඒ කෙල්ල.. මොකක් වුණත් එක්සැම් අස්සෙ.. ඒකිව අමාරුවෙ දැම්මා වගේනෙ.."

" තාම හරි අමාරුවෙ වැටුණෙ නෑ.. දැන් අපේ මිනිහගෙන් කන පිරෙන්න අහගන්න වෙනවා.. බලපන්කො ඉතින්.. කමක් නෑ ඌව ළං කරගෙන නරකම වුණේ නැනෙ.."

" අපරාදෙ අයුක අයියා කට කැඩෙනකල් කිව්වා.. ඔකා එක්ක යන්න එපා කියලා.."

" ඒත් බං එකම බෝඩ් එකේ ඉඳගෙන රණ්ඩු වෙන්න බැනෙ.. පොඩ්ඩක් හිතපන්.. එහෙම වුණොත් ඌ කොන් වෙනවනෙ.. ජොනා නෆ්‍රාස් අපි එක්ක හිටි.. අනික මූව තරහා කරගත්තොත් ඔකා මොකක් හරි බලු වැඩක් කරනවා අනිත්පැත්තට.."

" ඒ වුණාට මමනම් ආයෙ කතාකරන්නෙ නෑ සෙනුක.. මට ඔහොම බොරුකාරයො පේන්න බෑ.."

" උඹ කතා නොකර ඉන්න එකම හොඳයි තමා.. දන් නංගිට කියන්න එපැයි.. දුක අහන අයියා සීසන් එකක් මෙ යන්නෙ මචං.. ආගිව හිමින්සැරේ තරුවිට හේත්තු කරමුද.."

" ඒ කොහොමද.."

" ඇයි බල්ලො.. අපි කොල්ලොනෙ.. අරකි ඇල්ම ගැල්ම දාලා කෙල්ලව ටෝක් කරගනී.. ඊටපස්සෙ අර ඒකිගෙ මොකක්ද බං.. අර බිචී වයිබ් එක කියලා දීලා කෙල්ලව හදලා ගනී.."

" ඔකි හරියට කරයිද.."

" මොකද නැත්තෙ.. කියාන් අයියට අහුවෙන්නැති වෙන්න හිමින්සැරේ කරගන්න බලමු.. සැක් මෙ මිනිස්සු තුන්දෙනා හොඳම යාළුවො වුණේ

@Shan

මොන ලබ්බකට මන්දා.."

" එහෙනම් ආශිලාගෙ ගෙදර යමුත අනිද්දා වගේ.."

" යමු.. අනික් එකාටත් එන්න කියමු.."

" හා.. දැන් මොකක්ද හරියටම කරන්නෙ.."

" අර චමිරුගෙ ෆොටෝස් ටික නංගිට පෙන්නනවා.. නංගි ශොක් වෙනවනෙ.. හිත හදලා පහදන වැඩේ අරකිට කරන්න කියමු.."

" කියාන් අයියට අහුවුණොත් හම ගහයි ඈ.."

" අනේ ඒ ඌරට බය කවුද.. අපේ එකී ගානට වැඩේ කරයි.."

" උඹ මහමොළකාරයනෙ.. කරපන්කො.."

" ම්ම්.."

සෙනුකයා ෆයිල් ටිකත් අත අස්සෙ ගහගෙන ළඟ තිබ්බ නෙල්ලි කොළයක් ඇදලා අතට ගත්තා.. අරගෙන ඒකෙ තිබ්බ කොළ එකින් එක ගළවලා විසික් කරන්න ගත්තා.. ළමිස්සි වගේ.. මට ලැජ්ජ හිතිලා මම එහාට වුණා..

" මේ මොකෝ.."

" අපේ මිනිහා කතාකළාද බං.."

" කොයි.."

සෙනුකයා නෙල්ලි නට්ටෙන් මට ගැහුවා..

" ඈයි යකෝ!! මට මිනිස්සු දාහක් ඉන්නවා වගේ පේනවද.. අර පිටරට ගිහින් ඉන්න පොල් බූරුවා තමා.."

" රණ්ඩු වුණා නේ..??"

" නෑ බං.. මෙලෝ වැඩක් හරියට කරගන්න බෑ.. මට මළ පැනලා පොඩ්ඩක් බැන්නා.."

@Shan

" එහෙමද.."

" ම්ම්.."

" ඔච්චා ඔහොම තමා.. අයුක අයියට කෝල් එකක් ගනින්කො.."

" මට බෑ..!!"

" ගනින් ගනින්.. ඌට උණ වැඩිවෙලා අන්න හරේ.. පව්නෙ බං.. උඹ විතරනෙ ඉන්නෙ.."

සෙනුකයා මං දිහා බලලා ඇස් දෙක් ලොකු කරගත්තා..

" ඇයි හොඳයි කිව්වෙ.. ආයෙ උණලුද.."

" ම්ම්.. ගිහින් කතාකල්ලා බලපන්.. මම මීඩියා එකට යනවා එනවුන්ස්මන්ට්ස් වගයක් දෙන්න.."

" හා එල.. අපි ගියා.."

මම පහළට බැහැගෙන එද්දි සෙනුකයා ෆයිල් ටිකත් උස්සගෙන උඩට දුවලා ගියා.. ඒ වුණාට චමිරු කියපුවා මට මතක් වෙනවා හැමතිස්සෙම.. මම හිතුවනෙ ඌ හැදිලා කියලා.. මම ඌව යාළුවෙක් වගේ ආශ්‍රය කරන්න හොඳයි කියලයි හිතාගෙන හිටියේ.. ඒත් සෙනුකගෙයි චමිරුගෙයි හොඳ බොන්ඩ් එකක් තිබුණා.. දැන් ඔක්කොම ෆක් වෙලා ගියානෙ..

ඉස්කෝලෙ ඉවරවුණාට පස්සෙ මම නෆාස් එක්ක ඔෆිස් එකට ගිහින් පොත් ටික භාරදීලා පාකින් ලොට් එකට ආවා.. සෙනුකයා චමිරු එක්ක ටිකක් කතාකරන්න ඕන කියලා කැඩෙට් රූම් ගියා.. මම යද්දි රධ්‍ය අයියා කාර් එකේ පිටිපස්සෙ දොරක් ඇදලා බිමට නැමිලා මොකක් හරි කරනවා.. මම බෑග් එකත් කරෙන් පන්නගෙන කාර් එකට ගාවට යද්දි රධ්‍ය අයියා හැරිලා මං දිහා බැලුවා..

" වරද් එන්නකො වැඩක් පෙන්නන්න.."

මම බෑ එක පැසෙන්ජර් සීට් එකට දාලා රධ්‍ය අයිඅය ගාවට ගිහින් වාහනේ ඇතුළට එබුනා.. ඒ එක්කම..,

@Shan

*මියැව්* *මියැව්* *මියැව්*

කළු සුදු හරිම පොඩිම පොඩි පූස් පැටියෙන් වාහනේ කාපට් එක උඩ ඉඳගෙන වෙවුළ වෙවුළ කෑගහනවා.. රධ්‍ය අයියා පූසගෙ ඔලුවට ඇඟිල්ලකින් චූටි තට්ටුවක් දාලා ඌව උස්සලා අරගෙන මගේ අත උඩින් තිබ්බා..

" අනේ~ කොහෙන්ද මෙයාව.."

" පන්තියේ ළමයෙක් ගෙනැත් දුන්නෙ.. ඉස්කෝලෙ ගාව පාරට අතෑරලා කවුරුහරි ගෙනැත්.."

" කොහේ..?? ඉස්සරහා ගේට් එකේද.."

" ම්ම්.."

මම පූස් පැටියව අත් දෙකට උස්සගෙන ඌව හරවලා බැලුවා.. කන් දෙකයි නැට්ටයි විතරයි උගේ කළුපාට.. තව බඩේ ලපයක් තියෙනවා.. අනිත් ඔක්කොම සුදුම සුදුපාටයි.. ඒත් පොඩ්ඩක් කිළුටු වෙලා වගේ..

" එන්න.."

රධ්‍ය අයියා මගෙ වාහනේ දොර ඇරලා මම වාඩිවෙනකල් ඉඳලා ඒක වැහුවා..

" අපි මෙයාව අරගෙන යනෝද.. ඔයා අරගන්නද ඉන්නෙ.."

" අපේ ගෙදර බෑනෙ.. කියාරා රෙක්සි ඉන්න නිසා.."

" එහෙනම් මම තියාගන්නද.."

රධ්‍ය අයියා මගේ කම්මුලකින් අල්ලලා පැත්තට ඇද්දා..

" එයාව අපිට තියාගන්න ඉඩ නෑනෙ වරද්.."

" ඒත් මෙයාව කොහේවත් දාලා නම් යන්න බෑ.. මම ගෙනියනවා.."

@Shan

" අපි පෙට් කෙයා සෙන්ටර් එකකට දෙමු.. එයා අසනීපෙන් නෙ ඉන්නෙ.. එයාලා හොදට බලාගෙන ගෙදරක් හොයලා දේවි.."

" අනේ.."

මම පූස් පැටියා ගැහෙන නිසා මගේ උකුළ උඩින් තියාගත්තා.. ඊටපස්සෙ ටිශූ බොක්ස් එකෙන් ටිශූ ටිකක් අරගෙන එයාව පිහිදැම්මා.. අපේ ගෙදර සක්කිලි චූටියව මතක් වෙනවා මට.. පන්සලේ හාමුදුරුවොනෙ ඩයල් එක ගෙදරට ගෙනැත් දුන්නෙ.. මගේ මූණ උඩ නිදාගත්තටමම හිත යටින් ඌට පොඩ්ඩක් ලව් වගේ ඉතින්.. පොඩ්ඩක් කියන්නෙ හෙන පොඩ්ඩයි..

" ඔයා කැමතිද.."

" එයා ගෙදරක් නැතුව ඉන්න ඕන නැනෙ.. අපි එයාව පෙට් කෙයා එකකින් තියමු.."

" ම්ම්.."

පූස් පැටියා ටිශූ එකට ගුලි වෙලා වටයක් කැරකිලා මගේ කකුලක් උඩින් ගුලි වෙලා බෝලයක් වගේ වකුටු වෙලා ඇනුමක් ඇරියා.. මම උගෙ මූණෙ පැත්තක් ඇඟිල්ලකින් හිමිහිට අතගෑවා.. රධ්‍ය අයියා මං දිහා බලලා හිනාවෙලා ඉස්සරහා බලාගත්තා.. මම සීට් එකට හේත්තු වුණා..

" අද මොකක් හරි වුණාද.."

" ම්ම්.. මම කියන්නම්.."

මම ටිකක් වෙලා එළිය බලාගෙන ඉඳලා රධ්‍ය අයියගෙ අතකට කම්මුලක් හේත්තු කරගෙන එයාගෙ පැත්තට ඇලවුණා.. ඒ සී එකට නින්ද යන්නත් එනවා මහන්සි නිසා..

" එපාවෙනවා අනේ.. මම අනිද්දා ආශිලාගෙ ගෙදර යන්න ඉන්නෙ.."

මට දැනුණා රධ්‍ය අයියා මගේ හිස් මුදුනට හාදුවක් දෙනවා..

" ගිහින් එන්න.."

" ම්ම්.. මට රෙක්සියි කියාරයි මතක් වෙනවා.."

@Shan

" අපේ ගෙදර එනවද.."

" අනේ මේ.."

රධ්‍ය අයියා මගේ කර වටේ අතක් යවලා මාව එයාට තුරුල් කරගෙන කම්මුලෙන් ආයෙම හාද්දක් තිව්වා..

" යමු යමු.. මම එන්නම් එක්කගෙන යන්න.."

" අප්පච්චි ඉන්නවනෙ.."

" දවස් දෙකකට නෑ.. අයියත් ඉන්නවා.. ගිහින් එමු.."

" ඒ දවස්වල නම් හැමදාම අපි එහෙ යනවා නේද.. ශෝක් නේ.."

" ම්ම්.."

" ඒ කාලෙ හුඟක් මතක් වෙනවා.."

" ඔයා අවුලෙන් ඉන්නෙ මොකද.."

" ගෙදර ගියාම කියන්නම්.. මට මෙහෙම ඉන්න දෙන්නකො.."

මම රධ්‍ය අයියගෙ උරහිසට හේත්තු වෙලාම හිටියා. එයා සැරින් සැරේ මගේ කම්මුලට තට්ටුවක් දානවා.. පොඩි කතාවක් කියනවා.. මම ඒවා අහගෙන ආවා.. මගේ ඔලුව රිදෙනවා.. ඒ වුණාට රධ්‍ය අයියා ගාව ප්‍රශ්න ඈතටයන අමුතු මැජික් එකක් තියනවා.. පූස් පැටියව පෙට් කෙයා සෙන්ටර් එකට දීලා එයාව බලන් ඉඳලා ආයෙම ගෙදර එනකල් මට නින්ද ගියා..

මම ආවා මගේ දළඹු ළමයිනේ..

පියඹා යනවා මා ආකාසයේ.. අප පාසලේ වාර විභාගය එකදිගට දවස් තුනක් දාපු සියලු‍ දෙනාට මාගෙ හදපිරි ප්‍රණාමය සහ හිතුනොත් ඩබල් අප්ඩේට්වක් ඔබ සඳහා ලබා දීමට මා බලාපොරොත්තු වෙමි..

අපිට 200k වුණා අනේව්.. මට ඒකට දළඹු පැටිච්චෙක් කේක් එකක් එව්වනෙ.. ඒමන බෙදාගෙන කමු..

@Shan

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 134 කොටස

" සීරියස්ලි.. ඌ එහෙම කල්ලද.."

ආශි ඔවර් ඇක්ටින් දහලානා වගේ පපුවත් අතින් අල්ලගෙන ඇස් දෙක පොල් ගෙඩි දෙකක් වගේ ලොකු කරගත්තා..

" ම්ම්.."

" හෙන ගහන්න එපෑ.. මම හිතුවෙ උඹලා දෙන්නා කිව්ව විදියට හැදිලා ඇති කියලා අනේ.."

" මටනම් ඌ මුල ඉදන්ම ඇල්លුවෙ නෑ.. බොරු කියන්න ඕන නෑනෙ.."

" ඒක වැඩක් නෑ.. දැන් උඹ කිව්ව විදියට කරනවද.."

" ඔව් ඔව් කාන්තාවක් වෙනුවෙන් කාන්තාවක් වුණාම නැගිටින්න ඕන මමනම් කියන්නෙ.. මම තරුවි නංගිට පැහැදිලි කල්ලා කියන්න බලන්නම්.. මෙහෙමයි හරිත.. මට ලොකුවට හිත හදන්න එහෙම තේරෙන්නෙ නෑ.. උඹලත් වරෙන්.. මාත් එන්නම්.. හවසට නංගි ඒව්ද.."

" එනවා කියලා කිව්වෙ.. මෙහෙමයි හරිද උඹ පොඩ්ඩක් නංගිට කියලා දීපන් මේ වෙලේ වටින්නෙ එක්සෑම් එක කියලා.."

" මට නම්බර් දීපන්කො ඉතින්.."

මහීශා මනමාල හිනාවක් දාගෙන කොණ්ඩෙ බෑන්ඩ් එක ගලවලා අතට අරගෙන කොණ්ඩෙ ගසලා හදාගත්තම ආශි දෙකක් රැව්වා..

" අනේ මේ.. පාඩුවෙ ඉන්න අනේ.. මේ ළමයා ඇත්තට දුකින් ඇත්තෙ.. මොනා වුණත් අපේ ඉස්කෝලෙ නංගි කෙනෙක්නෙ.."

" මම වගේනම් වෙන කොල්ලෙක් දාගන්නවා.. බොරු කියන්න ඕන නෑනෙ.. ඔය කට වටේ ලප තියන උන් ඔහොමමයි.."

" ලපේ මේකට අදාළ නෑනෙ..මෙන්න මෙකිට ගහපන් බං මොකකින් හරි.."

@Shan

" ඔකතමා කියන්නෙ තනිකඩ ජීවිතේ සැපයි කියලා.. අපිට නැනෙ ඔය එක එක ලප කැළි.. ආයෙ සැප තමා කොම්ලෝ.."

මම මහීශගෙ ඔලුවට රෝසපාට ටෙඩියෙක්ගෙන් ගැහුවා.. මේ කාමරේ ඉතින් උවමනාවකට පොතක් පෑනක් පැන්සලක් ගත්තත් රෝසපාට විතරයි තියෙන්නෙ.. ඒ මදිවට ජිමින් කියලා දස මනමාල මූනක් තියන කොරියන් කොල්ලෙක් මගේ දිහා කන්න වගේ තොලකුත් හපාගෙන බලාගෙන ඉන්නවා.. සැක් කියාන් අයියත් කිව්වා ආශිගෙ කාමරේට ඇවිල්ලා පෙම් බස් වත් දොඩන්න බැරිලු කොල්ලො ටිකක් උගේ මූණ දිහා කන්න වගේ බලාගෙන ඉන්න නිසා.. මෙකි බැන්ද කාලෙකත් මේ පෝස්ටර් ටික උස්සන් යයිද දන්නෑ.. එහෙම වුනොත් කියාන් අයියට බුදුසරණයි තමා.. මගේ කාමරේනම් ඇනිමි විතරයි තියෙන්නෙ කියලා හිතාගන්න පුළුවන්.. ඒ වුණාට මේ කොල්ලො ටික.. හැබැයි මොනා වුණත් ලස්සනයි ඉතින්.. පිස්සු හැදෙයි මම ඊටවඩා හැඩද කොහෙද..

එදා රධ්‍ය අයියා වුණු දේ කිව්වට පස්සෙ එයා ඔක්කොම අහගෙන ඉඳලා අනිත් පැත්තට කිසිදෙයක් කිව්වෙ නෑ.. අහගෙන ඉඳලා ඔලුව වනලා මාව ක්වාටස් එක ගාවින් දාගෙන ගෙදර යන්න ගියා.. රධ්‍ය අයියත් මේ දවස්වල බිසී නිසා මම කරදර කරන්න ගියේ නෑ.. අප්පච්චි දවස් දෙකකට ගෙදර නැහැල්ලුනෙ.. ඒ වුණාට මටනම් ඒ ගෙදරට යන්න හිතට මදිකමක් දැනෙනවා.. ඊයේ රධ්‍ය අයියගෙ අම්මා මාත් එක්ක හුඟක් වෙලා කතාකලා.. අවුරුද්ද අන්තිමේ ආධ්‍ය අයියා එංග්ලන්ඩ් යන වැඩේ ගැන.. තව රධ්‍ය අයියගෙ කැම්පස් යන දේවල් ගැනයි අම්මගෙ විස්තරයි කතාකල්ලා ඉවරවෙද්දි හෙන පාන්දර වෙලා.. අම්මට අයියලා දෙන්නව මතක් වෙනවලු.. ඉක්මනට ඒගොල්ලො බලන්න ඕනලු.. අප්පච්චි ගැනනම් මාත් එක්ක කතාකළේ නෑ.. අම්මා ඒ ගැන කතාකරන්න කොහොමත් අකමැතිනෙ.. මේ පාර ලන්ඩන් වල ෆැශන් වීක් එකක් බලන්න යන්න ඉන්නෙ කියලා කිව්වා.. අසලි අම්මා හෙනට දියුණු වෙලා කියලා අපේ මාමා කියනෙ.. අපේ මාමා එක්කත් අම්මා කතාකරනවනෙ..

අද අපි කතාකරගත්තු විදියට ආශිලාගෙ එදර ආවා.. සුදු පවුලට බොරු කියලා ආශිගෙ ගෙදර ෆිල්ම් බලන්න යනවා කියලා තමා තරුවි නංගිගෙ ප්‍රශ්නෙ විසඳන්න ආවෙ.. නැත්නම් අපි නංගිව හම්බෙන්න යනවා කිව්වොත් අයුක අයියා නහින්න හදනවා යන්න එපා ගගා.. චමිරුගෙ ප්‍රශ්න ඌම විසඳගනිලු.. ඒ වුණාට නංගිට එක්සැම් අස්සෙ චමිරු මොන මොන පිස්සු නටයිද අපි දන්නෙ නෑණෙ.. අනික ඔය ප්‍රශ්නෙ කොනක් මගෙයි

@Shan

සෙනුකගෙයි අතේ තියන නිසා අපි දෙන්නටම හිතේ හෙන වරදකාරී හැඟීමක් තියනවා.. අද හවස තරුවි නංගි ක්ලාස් එක ගාව කැෆේ එකට එනවා කිව්වා අපිව හම්බෙන්න.. චමිරු අර සිද්ධියෙන් පස්සෙ සමාව ඉල්ලලා මට මැසේජ් කල්ලා තිබ්බත් මම ඒක සීන් කල්ලා නිකම් හිටියා.. මට ඌ ගැන තියෙන්නෙ මහා කලකිරීමක්.. මම ඌව විශ්වාස කරපු එක ගැන ලොකු දුකක්.. කොහොමත් ආයෙ මම උගේ ඉස්සරහටයන්නෙ නෑ.. මම එහෙම කරනවා කියලා කිව්වනෙ.. අනික තව ටික දවසකින් සති ගානකට මට ඉස්කෝලෙ එන්න වෙන්නෙ නෑ ටුවර් එකට ප්‍රැක්ටිස් උදේ ඉඳලා රෑ වෙනකල්.. ඌයි මායි හම්බෙන්නෙ නැති තරමටම හොඳයි..

සෙනුකයත් චමිරු එක්ක කතාවක් ඇතිවෙලා දැන් සෙනුකයා කතාකරන්නෙත් ඌ එක්ක උවමනාම දේවල් විතරයි.. සෙනුකයටත් තියෙන්නෙ කලකිරීමක් කියලා මම හිතනවා.. මොකද ඌ ඇත්තටම චමිරුව හදන්න ට්‍රයි කලා.. ඌ හැදිලා ඇති කියලා විශ්වාස කලා.. ඒත් ආයෙම අපිට තේරුනේ චමිරු හදන්න පුලුවන් එකෙක් නෙමෙයි කියලා විතරමයි.. ඇත්තටම චමිරු අපේ හිත්වල මහා කලකිරීමක් ඇතිකළා.. මටනම් ඌ කිව්ව දේවල් වලටත් වඩා මෙච්චරකල් තරුවිට කරපු බොරුව ගැන මතක් වෙද්දි කේන්ති යනවා.. ඒ කෙල්ල මූ කරපු බොරුවට සෑහෙන්න ආදරේ කළානෙ.. මූ නිසා කොච්චර අඬන්න ඇත්ද.. අනික ඒකි හෙන අහිංසකයිත් එක්කන්.. චමිරු මොන හිතකින් එහෙම දෙයක් කළාද මට හිතාගන්න බෑ..

" දැන් ඔක්කොන්ටම කලින් අපේ සූකිරියට කියන්න එපෑ මම ෆිල්ම් බලනවා කියලා.. ඉන්න අනේ විනාඩියක්.. මම අපේ මිනිහට පවයක් කියන්න.."

ආශි ඇඳ උඩ තිබ්බ රෝසපාට ෆ්ලෆී කවර් එකක් දාපු ෆෝන් එක ඇදලා අරගෙන කුටු කුටු ගාලා මොනවද ටයිප් කල්ලා ඒක කනේ තියාගත්තා.. මම මහීශට පැත්තෙන් හේත්තුවක් දාගත්තා.. මහීශට හේත්තුවක්වත් දාන්න ඕන බලාගෙන.. මෙකි ඇණ කැලි එක එක සුකුරුත්තම් ඇඟ පුරා එල්ලගෙන ඉන්නවනෙ.. හෙන මැරයා වගේ..

" කියාන් අයියා ඔය සූකිරි කතාවෙ සුල මුල දන්නවනම් උඹව පොළොවෙ ගහයි.."

" එයාට අපි කියන්නෑනෙ මෙයා.."

@Shan

කියාන් අයියට ආශි සූකිරි කියන්නෙ සූකරයා කියලා මූණට කියන්න බැරි නිසා කියලා තාම ඩයල් එක දන්නෙ නෑ.. ඌත් ආශිට කක්කුට්ටි කියලා අපහාස කරනවනෙ අනික.. දැනගත්තත් කමක් නෑ මම නම් කියන්නෙ..

" හායි අයියා.. ඔයා වැඩකද.."

" ඔහ්.. I have the best man in the world අනේ.."

" වෙන්න ඕනද.. අහන්නකො.. මම මගේ යාළුවො එක්ක මූවි මැරතන් එකකට ජොයින් වෙන්න යන්නෙ.. මම හවස ඒකනිසා බිසී.."

" ආ නෑ නෑ.. එන්න එපා!!! නෑ මම කිව්වෙ බබා ඔයා වැඩනෙ.. මොකට කරදර වෙනවද.. ඔව් ෂනෙරුත් ඉන්නවා.. ඒකනෙ.. ඔව්.. හා.. පරිස්සමින් ඉන්න හරිද.. වෙලාවට කන්න.. ආදරෙයි.. බයි බායි.."

ආශි ෆෝන් එක කට් කල්ලා ඒක ඇඳ උඩට විසික් කළා..

" දිස් ඉස් හව් ටු සෙට්ල් යොර් බබා.. රධ්‍ය අයියටත් ඔය බොරුවම දැන් ඉතින් කියපන්.."

මම මගේ ෆෝන් එක හොයලා අරගෙන රධ්‍ය අයියගෙ නම්බර් එක ඩයල් කල්ලා කනේ තියාගත්තා.. බොරු කියන්න හිතෙන්නෙත් නෑ හැබැයි.. කමක් නෑ ඊටවඩා මේක අද විසඳගන්න එපැයි..

" ආ මේ ඔයා වැඩකද.."

" නෑ කියන්න වරද්.. මම ගෙදර ඉන්නෙ.."

" මම ආශිලගෙ ගෙදර ආවනෙ.."

" ඔයා මට උදේ කිව්වා..??"

" මම හවස එයාලා එක්ක මේ ෆිල්ම් එකක් බලන්න හදන්නෙ.. කෝල්ස් ආන්සර් කළේ නැතිවුනොත් ටෙක්ස්ට් කල්ලා තියනවද.."

" හරි.."

" බායි.."

@Shan

" ටෙක් කෙයා.."

රධ්‍ය අයියා ෆෝන් එක කට් කලා..

" අඩෝ මටත් කතාකරන්න මොකෙක් හරි හොයලා දීපල්ලා.. මහ තනිකඩ හුළඟක් හමාගෙන යනවා මේ හරියෙන්.."

මහීශා ආයෙම උගේ කොල්ලොනහී බණේ දෙසන්න ගත්තා.. අර මෙකි එක්ක පොඩි කාලෙ අත් අල්ලගෙන කැරොල් කිව්ව කොල්ලවත් හොයාගන්න තිබ්බනම.. මේ අඩෝවැඩියාව නවත්තගන්න..

" ඇයි යකෝ දැන් ටිකකට කලින් තනිකඩ ජීවිතේ ගැන උද්දාමයට පත් වෙලා හිටියා නේද.."

" අඩෝ එහෙනම් සයෝන් අයියට කෝල් එකක් දීලා කියපන්.. අයියා බබා මම හවස බිසී කියලා.."

මහීශට මල පැන්නා..

" ලබ්බ.. කටවහන් ඉඳපන්.. මම නම් කියන්නෙ චමිරුට ගහමු බං.. තරුවි ඇඩුවොත් ඒකිටත් ගහලා එතන ඉන්න සේරම මරලා දාමු.."

මහීශා අතේ තිබ්බ උල් උල් මුද්ද වටයක් කරකලා හෙන මැර හිනාවක් දැම්මා..

" අනේ මේ ඔබවටනම් මාව ගෙන්නගන්න එපා.. හරිද.. මම ලෑස්තිවෙන්න යනවා.. නංගිට එන්න කියන්නකො.."

ආශි ඒකිගෙ ඇඳුම් තියන අල්මාරිය ඇරලා පුටුවක් ඇදගෙන ඒකෙ උඩ නැගලා ඇඳුම් තෝරන්න ගත්තා.. සැක් මෙකිගෙ කොට යකෝ.. එහෙම කිව්වට.. මමත් මහ ලොකු උසක් නෑ තමා.. ඒ වුණාට මෙච්චර දොඩම් සීන් එකේ මම නෑ.. ඔය ඉරිසියාවට එක එක ගල් ඉබ්බො කතා හැදුවට.. මම උසයි හුහක්.. මට ඒක සෑහෙන්න ඇතිනෙ..

" ප'ප්ල් මෙක්ස් මී මෝ පවර්ෆුල්.. ඒත් මෙක හරියන්නෑ අනේ.. බලූ.. සැක් මේ පාටට මම ආස නැනෙ.. ලෙම්මි සී.. මහීශා අනේ මම මොකක්ද ඒයි අඳින්නෙ.."

@Shan

" කළුපාට ඇඳහන්.."

" අනේ මේ බෑ.. ඔගොල්ලොත් ඒ පාටම ඇඳන් ඇවිල්ලනෙ.. මම අඳිනවා සුදු.. කළුහංසයො මැද්දෙ ඉන්න එකම සුදු හංසයා මම විත-අම්මියෝ!!!!!!!!!!!!!!!!"

*දඩාස්*

ආශි පුටුව උඩ හංස නැටුම නටන්න ගිහිල්ලා ඒකත් පෙරළගෙන බිම ඇදගෙන වැටුණා.. ඒ එක්කම අල්මාරියේ ගහලා තිබ්බ ඇඳුම් කන්දක් ඒකිගෙ ඔලුව උඩට නාය ගිහිල්ලා ඒකි ඇඳුම් වලින් වැහිලා ගියා..

" ආර්හ්.. ශිට් ශිට්.. මෙක අසුභ ළකුණක්ද මන්දා.. සෙනුකමල මේ ඇඳුම් ටික නවන්න ඕන නෑ අනේ.. ගුලිකල්ලා අන්න අරකට දානොකො.. මම උස නෑනෙ.."

ආශි සුදුපාට කොට සායකුයි ජැකට් එකකුයි බ්ලවුස් එකකුයි හොයලා අරගෙන වොශ්‍රෑම් එකට වැදුනහම සෙනුකයා දෙස් දෙවොල් තිය තිය අරකිගෙ ඇඳුම් ටික ගුලි කල්ලා අල්මාරියෙ අස්සෙ එබුවා.. මට මගේ අල්මාරියත් මතක් වුණා.. ඒක නවන්න ඕන වෙලාවක.. කොහෙද මට වෙලාවක්නෙ නැත්තෙ..

" ඒ වුණාට ෂනෙරු.. මට අරූ ගැන දුකයි බං.."

" ඒත් ඌ කළේ හොඳ දෙයක් නෙමෙයිනෙ.. අර කෙල්ලගෙ එක්සෑම් අස්සෙ.. ඌ හරි කොල්ලෙක්නම් මෙහෙම හැසිරෙන්නෙ නෑනෙ.. බලපන් අපි ඒ ලෙවෙල් කරද්දි අයියලා ඔහොම නැටුවෙ නෑනෙ.."

" හැමෝම එක වගේ නෑනෙ බං.."

" ම්ම්.."

" තරුවි කියන කෙල්ලටත් පිස්සුනෙ මූට කැමති වුණේ.. ලපේ පෙනුනෙ නැද්ද මං අහන්නෙ.."

මහීශා ආයෙම ලපයක් අල්ලගෙන නටන්න පටන් ගත්තා..

" උඹට ලප එක්ක ඔච්චර කේන්ති මොකෝ.."

@Shan

" මම ලපවලට ආස නැහ්.."

" මෙකිට ශශිනි මතක් වෙලාද කොහෙද.. හා හරි උඹ ලපවලට ආස නැත්නම් කමක් නෑ.. හැබැයි සයෝන් අයියගෙනම් සම නිකැලැල්.."

" මුගෙ ආච්චිට හාල් ගරන්න.. පර කැස්බෑවා ආයෙ ඔකගෙ නම කිව්වොත් මම උඹලගෙ ඇස් උගුල්ලනවා.. දැනගනින්.."

" සයෝන් අයියා හරි හොඳයි හරිතේ.."

මහීශා ආශිගෙ මෙසෙ උඩ තිබ්බ මල් පෝච්චිය උස්සලා මට දමලා ගහන්න ගියාම මම සෙනුකයව ඉස්සරහට දාලා උගේ පිටිපස්සෙ හැංගුණා.. ඔවගෙන් ගහලා මම මළොත් එහෙම.. රඨ්‍ය අයියා කාගෙන්ද කුක්කු ගන්නෙ.. අනික ඒකා මම නැති වේදනාවට පපුව පැලිලා මැරුනොත් එහෙම.. පස්සෙ මැරිලා අපි දෙන්නම දිව්‍යලෝකෙ ගිහින් සුර විමනක් හදාගෙන ◌ාටිතල් එකේ ඉන්නවා.. එහේ ඉඩම් ගනන් නැතුවැතිනෙ එච්චර.. ඒත් මම කරන පෞකාර වැඩවලට මම අපායෙ ඉපදෙන්න තියන සම්භාවිතාවයත් වැඩී.. කොහෙ ගියත් අපේ ප්‍රේමයට තමා හැම බාල්දියම..

ටික වෙලාවකින් ආශි ඇඳුමකුත් ඇඳගෙන ටොක් ටොක් ගගා කණ්ණාඩිමෙසෙ ගාවින් ඉඳගත්තා.. ඒකෙ උඩ මෙ ලෝකෙ තියන හැම බ්‍රෑන්ඩ් එකකම එක එක සායම් පෙට්ටි තොගයක් තියනවා.. අපි ඇහුවහම ඇයි ඔච්චර ඔවා උලන්නෙ කියලා.. ඒක එයාගෙ සතුටලු.. අනික මේකප් තියෙන්නෙ ගාන්නලුනෙ.. ඔය කවුරු කොහොම කිව්වත් මේකප් දාපු කෙල්ලෙක් දිහාලු කොල්ලෙක් වුනත් හැරිලා බලන්නෙ.. මන්දා ඒකි තමා කියන්නෙ.. ඒ වුණාට මෙකි කියාන් අයියව හම්බෙලා තියෙන්නෙ පාටියකදි ඇහේ වැදිලා.. අපේ කියාන් පුතා ඇහේ වැදුණු පාර ප්‍රේමයෙන් මුසපත් වෙලා අපේ එකීව දාගෙන පස්සෙ වටේ ගිහිල්ලා.. ඔන්න ඔහොම හෙන හෙන සීන් වගයක් ගිහින් තමා ආයෙම යාළු වෙලා සියලු වැරදි වලින් ඈත් වෙලා හැදිලා තියෙන්නෙ..

" දැන් මම මොනවද අනේ කියන්න ඕන.."

" මෙහෙමයි මුලින්ම අඳුරගෙන ඉඳපන් හරිද.. ඊටපස්සෙ නංගිට මෙ වෙලේ වෙන දේවල් නැතුව එක්සැම් එක ගැන හිතන්න කියපන්.. "

@Shan

" චමිරු ගැන මොනවද කියන්නෙ.. අනේ මේ ඒකි හිතාවිද දන්නෙ නෑ මම චමිරුගෙ හොර ගෑණියෙක් කියලා.. කියන්න බැනෙ ඒයි ගෑණුනෙ.."

" එහෙම හිතන්නෙ නෑ.. නංගි කියාන් අයියා ගැන දන්නවා.. ඒකිගෙ හිත හදන්න බලපන්.."

" මට මහ වැරැද්දක් කරපු එකෙක් වගේ දැනෙනවා බං.."

" අනේ මේ සනෙරු.. ඔයා මොකක් කරන්නද කියන්නකො.. ඔයාගෙ වැරැද්දක් නෑ බොරුවට මූණ එල්ලන් ඉන්නවා.. නේද මහී.."

" නෑ ඉතින්.. මූ කියන එකේ ඇත්තකුත් තියනවනෙ බං.. නංගි හිතාවිද දන්නෙ නෑ ෂනෙරු නිසා ඒකිගෙ ලව් එකට කෙළවුණා කියලා.."

" ම්ම්.. තරුවිට පොඩි හිත යට කොක්කක් ෂනෙරු එක්ක තියනවා තමා.. මම සමහර වෙලාවට දැකලා තියේ.. ඒත් අපේ එකා මක් කරන්නද.."

" ඒවා වැඩක් නෑ.. අපි අපිට පුළුවන් දෙයක් කරමු.. නංගි ඕන මගුලක් හිතාගත්තුදෙන්.. "

මම පැත්තකට වෙලා හිටියා.. හැමෝගෙම ප්‍රශ්න වලට උත්තර දෙන්න ගියාට මට මොකක් හරි මගුලක් වුණාම ඒක මට විසඳගන්න බැනෙ.. ප්‍රශ්නෙ තමන්ගෙ නොවෙනකල් උත්තරේ දාර්ශනිකයි කියන්නෙ මේකටද දන්නෙ නෑ.. ඒ වුණාට මගේ හිතේ වරදකාරී හැඟීමක් ලොකුවටම තියෙන්නෙ මම නිසා කොහෙවත් ඉන්න කෙල්ලෙක්ගෙ හිත රිදුණු නිසා.. ඒකි අනික චමිරුට ඇත්තටම ආදරේ කළානෙ.. මාත් එක්ක තරහක් නැතිවෙන එකම තමා පුදුමෙ.. ඒත් චමිරුට තිබ්බනෙ කෙල්ලට ආදරේ නැත්නම් පැත්තකට වෙන්න..

අන්තිමට අපි තරුවිව හම්බෙන්න යන්න ඉඳපු කැෆේ එකට ගියා.. යද්දි තරුවි නංගි ක්ලාස් ඉවරවෙලා කැෆේ එකේ උඩ තට්ටුවෙ ටේබල් එකක ඉඳගෙන ඉන්නවා.. අපිව දැකලා අත වැනුවා.. ඒ වුණාට කෙල්ල අඩ අඩ ඉඳලා ඇස් දෙක හොඳටම රතුවෙලා.. සෙනුකයා මට තට්ටුවක් දාල ඔලුව වැනුවා.. හරියට මොකුත් කරන්න එපා පැත්තකට වෙලා ඉඳපන් කියන්න වගේ.. ආශි හිනාවෙලා නංගිට හග් එකක් දීලා නංගි ළඟින් ඉඳගත්තා.. අපි තුන්දෙනත් ගිහින් ඉඳගත්තම නංගි ආශිගෙ අත තද කල්ලා අල්ලගත්තා..

@Shan

" නංගි ඇවිත් හුඟක් වෙලාද.."

" නෑ සෙනුක අයියෙ.. දැන් ටිකකට කලින් ක්ලාස් ඉවරවුණේ.. මම හිමින් ආවා ඉතින්.."

" ඕ.. එහෙනම් කමක් නෑ.."

" අයියෙ.. මෙ අක්කයි අයියයි..??"

මහීශට මල පැනලා වගේ නංගිට දෙකක් රව්වම මම ඒකිට කකුලෙන් ගැහුවා..

" මේ අක්කලා දෙන්නෙක් හැබැයි.. කමක් නෑ.. මේ ඉන්නෙ ආශි.. මේ ඉන්නෙ මහීශා.. අපේ හොඳම යාළුවො දෙන්නා.."

" ඔහ්.. සොරි සොරි.. අනේ අක්කා.. මම හිතුවෙ-.. මම ඔයාලා දෙන්නා ගැන අහලා තියනවා.. ෂනෙරු අයියලා කියනවා.."

මහිශා අර අහිංසකී දිහා බලලා ඇස් දෙක කරකලා උඩ බලාගත්තා.. මෙකිට දෙන්න හිතයි.. මම ආයෙම ඒකිට කකුලෙන් එකක් ගැහුවම ඒකි මට කියලා හිතාගෙන ආශිගෙ කකුලට ගහලා ආශි අපි සේරටම රවලා නංගි දිහාබලලා සුරංගනා හිනාවක් පා කල්ලා ඇරියා..

" කොහොමද නංගො ඉස්කොලෙ වැඩ එහෙම.. කරගෙන යනවද.."

" ඔ-ඔව් අක්කා.. මේ දවස්වල වැඩ වැඩිනෙ.."

" ඒකතමා මේ දවස්වල මහන්සිවෙන තරමට තමා රිසාල්ට් එක එන්නෙ.. අපිටත් වැඩි දවසක් නොගිහිල්ලා රිසාල්ට්ස් එනවනෙ අනේ.."

" ඔහ්.. අද-අද චමිරු අයියා උදේ ක්ලාස් එක ගාවට ආවනෙ.."

තරුවි නංගි මං දිහා හොරෙන් බලලා ආයෙම ආශි දිහා බැලුවා.. මම ගාණකට ගන්නෙ නැතුව ඉන්න ට්‍රයි කළා..

" එයාට එයා එක නවත්තන්න ඕන කි-කිව්වනෙ.."

" ඒ ඇයි..?"

@Shan

" මම දන්නෙ නැහැ.. සමහරවිට එ-එයාට මං ගැන හිතේ හැඟීමක් නැතුවැති.."

තරුවිගෙ ඇස් දෙකේ කඳුළු පිරිලා ගියාම ආශි ටිශූ එකකින් නංගිගෙ කඳුළු ඉහිදැම්මා.. මම මගේ අත් දෙක තද කරගෙන අහගෙන හිටියා.. මට කතාකරන්න සුදුසු නෑ වගේ දැනෙන නිසා..

" එයා එහෙම කිව්වද ඔයාට.."

" ම්ම.."

" ඔයා මොකද කිව්වෙ.."

" මම මොකුත් කිව්වෙ නෑ.. කොහොමත් එයා ලොකු පවුලක කෙනෙක්නෙ අක්කෙ.. මම ගැ-ගැලපෙන්නෑ කියලා හිතෙනව ඇති.. ඒකට කමක් නෑ.."

ආශි නංගිව උරහිසට හේත්තු කරගත්තම තරුවි ඉකි ගහලා අඬන්න ගත්තා.. ඒ එක්කම වේටර් කෙනෙක් ඇවිත් අපි ඉන්න ටේබල් එකට ඩ්‍රින්ක්ස් වගේකුයි කේක් ප්ලේට්ස් වගේකුයි සර්ව් කල්ලා යන්න ගියා..

" චමිරු අයියා හැමතිස්සෙම ෂ-ෂනෙරු අයියා ගැන කතාකරන්නෙ.. මාත් එක්ක වුණත්.. මම හිතන්නෙ.. එයා හොයන්නෙ අයියා වගේ කෙනෙක්.. මම කොහොමද අයියෙ ඒ වගේ වෙන්නෙ.. මට චමිරු අයියා වෙනුවෙන් වෙන කෙනෙක් වෙන්න බෑනෙ.."

" නංගී ම-"

" මම දන්නවා අයියගෙ වැරැද්දක් නෑ.. ඔයා එහෙම කෙනෙක් නෙමෙ කියලා මම දන්නවා.. ඒත් මට-මට තියන දුක.. චමිරු අයියා දවසක් හරි මට ආදරේ කල්ලද අයියෙ.. මම මෙච්චර කාලයක්ම එයාට රැවටිලාද.."

" ඔයා ටික කාලයක් පාඩුවෙ ඉන්න නංගි.. හැමදේම අපි හිතන ඉක්මනට විසඳෙන්නෙ නැනෙ.. අපි චමිරුට කල් දෙමු.. එයා ඉන්නෙ හිත ගදාගන්න ප්‍රශ්නෙක.. හරිද.. දැනට ඔයා එක්සෑම් එකට ෆෝකස් වෙන්නකො.. අපි ඔයාට කිසිම බලපෑමක් කරන්නෙ නෑ.. ඒත් ඕනමවෙලාවක කතාකරන්න.. අපි ඔයා එක්ක ඉන්නවා හරිද.."

@Shan

" ඒත් අක්කෙ.. මට-අනේ මට කියන්න තේරෙන්නෙ නෑ.. මම කොහොමද හිත හදාගන්නෙ කියලා.. මෙච්චර කල් කාගෙවත් රිප්ලේස්මන්ට් එකක් වෙලාද මම ඉඳලා තියෙන්නෙ.. මට කවුරුහරි මාව පාවිච්චි කළා වගේ දැනෙනවා.."

තරුචි ආශිගෙ උරහිසට වාරු වෙලා හොඳටම අඬන්න ගත්තා.. ආශි අපි දිහා හෙන අසරන වෙලා වගේ බලාගෙන හිටියා..

" එහෙම කියන්නෙ කොහොමද.. නෑ නෑ.. අපි බලමුකො.. චමිරු ඔයාට ආදරෙයි.. නැත්තෙ නෑ.. එයාට ටික කාලයක් දෙමුකො.. අනික නංගා ඔයාට සම්පූර්ණ අයිතිය තියනවා නොගැළපෙන තැනකින් අයින් වෙන්න.."

" ම්ම්.."

" මෙ බලන්නකො.. ඉස්සෙල්ලම එයා වෙනුවෙන් දුක් වෙන්න කලින් ඔයා ඔයා ගැන හිතන්න.. හිත රිද්දගෙන අමාරුවෙන් අල්ලන් ඉන්න ඕනමයි කියලා එකක් නෑ.. සමහර වෙලාවට අතාරින එකෙන් ඔයාට සැනසීමක් දැනෙන්න පුළුවන්.. අපි හැමෝටම වැරදීම් අතපසුවීම් වෙනවනෙ.."

" ඔයා ආයෙම චමිරු අවස්ථාවක් ඉල්ලුවොත් දෙනවද.."

නංගි මම අහපු ප්‍රශ්නෙන් ඇස් දෙක ලොකු කරගෙන මගේ දිහා බලාගෙන හිටියා..

" ඇ-ඇයි එහෙම ඇහුවෙ.."

" අපි දන්නෙ නැනෙ.. හැමදේම වෙන්නෙ හොඳටයි කියලා හිතලා ආයෙම චමිරු තේරුම් ගනී එයා කරපු වැරැද්ද.. මාම කියන්නෙ නෑ වැරදි කරන හැම එකාම වැරදි හදාගන්නවා කියලා.. ඒත් ඔයා ආදරේ කරන කෙනානෙ.. ඔයා එහෙම වුනොත් ඒ අවස්ථාව දෙනවද.."

තරුචි ටිකක් වෙලා කල්පනා කළාම මම මගේ ඉස්සරහා තිබ්බ බීම වීදුරුවෙ බටෙන් ඒක දෙපාරක් තුන්පාටක් කැරකුවා..

" හිතලා බලන්න ඕන.. ඒත් එයා ආයෙ ඒක නොකර ඉඳීවිද.."

" ඒක ඔයාගෙ විශ්වාසෙ එක්ක බලපාන ප්‍රශ්ණයක්.."

@Shan

ආශි නංගිගෙ අතට තටුවක් දැම්මා..

" නංගා.. හැමතිස්සෙම හරිම ටිපිකල් ගෑණියෙක් වෙන්න ට්‍රයි කරන්නෙ නැතුව.. පොඩ්ඩක් ඊට එහා හිතන්න බලන්න.. අපි මේ බණ කියනවා නෙමේ.. ඒ වුණාට සමහර තැන් තියනවා ඉවසන්න වෙනවා.. නිහඬ වෙන්න වෙනවා.. ඒ වෙලාවෙ කලබල නොකර තියන විදියට මූණ දෙන්න.. අපි අවංකවම කතාකරමුකො.. ඔයා ෂනෙරු එක්ක මොකක් හරි හිතේ අමනාපයක් තියන් ඉන්නවානෙ.. එයාට මෙකෙදි කරන්න මොකුත්ම නෑ.. අපිට ෂනෙරුට ඇඟිල්ල දික් කරන්න තිබුනා එයා අනවශ්‍ය විදියට හැසිරුණානම්.. ඒත් ඔයයි මමයි අපි ඔක්කොම දන්නවනෙ.. එයාගෙ කිසි වැරැද්දක් නෑ.. පෙරේදා රණ්ඩුවෙනුත් පස්සෙ මෙකා ඉන්නෙ අවුලෙන්.. ෂනෙරු චමිරුට අවස්ථාවක් දුන්නෙ හොඳ යාලුවෙක් වෙන්න මිසක් වෙන දේකට නෙමේ.."

" ම්ම්.."

" දැනට ඔයා ඉස්කෝලෙ වැඩ ගැන අවධානෙ දෙන්න.. මම දන්නවා අපි කිව්ව පලියට කන්න අමාරුයි කියලා.. මමත් ඔයා වගේම ප්‍රශ්නෙකට මීට කලින් මූණ දීලා තියනවා.. ඔයත් ගෑණියෙක්.. මමත් ගෑණියෙක්.. මට ඔයාට දැනෙන දේ තේරෙනවා.. ඒකනිසා හැමදේටම නිහඬව මූණ දෙන්න.. ආදරේ කියන්නෙ ජීවිතෙන් එක කෑල්ලක් විතරයි නංගා.. ඔයා ඒක මත්තෙම නැහෙන්න ගියොත් අනික් ඒවා ඔයාට මඟ ඇරෙනවා..

චමිරුට වෙලා තියෙන්නෙත් ඒ දේමනෙ.. ඌත් ලැබෙන්නෙ නැති දෙයක් පස්සෙ දුවනවා ලැබිලා තියන දේවල් පේන්නෙ නැතුව.. ඒකනිසා නංගා ඔයා මේ වෙලාවෙ මොලේ කල්පනා කල්ලා වැඩ කරන්න.. අපි හිතමුකො ඉස්සරහට හොඳ දෙයක් වේවි කියලා.."

" ම්ම්.. තැන්ක් යූ අක්කා.."

" තැන්ක්ස් කරන්න ඕන නෑ හලෝ.. මෙක බොනවකො.. කව්ද ෂනෙරුද ඕඩර් කලේ.."

" මම නෙමේ.. මහීශද කොහෙද.."

මාම හැරිලා මහීශා දිහා බැලුවහම ඒකි ඇබ දෙකත් කනේ ගහගෙන ෆෝන් එකේ මොනවද කොටනවා.. නෙද්දකින් අහස කඩාගෙන වැටුණත් මෙකිට

@Shan

ගාණක් නැනෙ.. ඒ මදිවට මගේ බීම එකත් බීලා.. අනිත් දවසෙ දුක අහන්න එක්කන් එන්න ඕන දුක දැනෙන උන් විතරයි.. මේකිගෙ සංවේදී ස්නායුවල මොකක් හරි අවුලක් තියනවා..

" සෙනුක අයියා චමිරු අයියා එක්ක කතාකරන්නෙ නෑ කියලා එයා ඊයෙ අවුලෙන් හිටියෙ.. අයියලා තරහ වුණාද.."

" එහෙම නෑ නංගි.. කතාකරන්න ඕන.. වැඩනෙ මේ දවස්වල.."

" ආ ඒකතමා.. එයාට හොඳම යාළුවෙක්ට ඉන්නෙ අයියනෙ.. කතානොකර ඉන්න එපා.. එයා හැමතිස්සෙම පාළුයි කියනවා.."

තරුවි ඉක්මනට බීම එක බීලා ඉවරකල්ලා ඒක මේසෙ උඩින් තිබ්බා.. තියලා ටිශූ එකකින් මූණ පිහාගත්තා.. චමිරුට දැනෙන පාළුවට වඩා මම හිතන්නෙ අවුරුදු දහ නමයක් විස්සක් විතර අයුක අයියා ඔය ගේ ඇතුළෙම සැහෙන්න දුක් වින්දා.. සෙනුකයට ඔක කියන්න තරම් දෙයක් කියලා මම නම් හිතන්නෙ නෑ.. ඌ තරම් ඒක දන්න කෙනෙක් වෙන නැතුවැති..

" අම්.. මම යන්නම් අක්කා.. දැන් පරක්කුත් වෙලානෙ.. මම ගිහින් එන්නම් අයියෙ.."

" හරි කෙල්ලෙ.. මතකනෙ.. උවමනාව වුණොත් කෝල් එකක් දෙන්න හොඳේ.."

" හරී.."

තරුවි අපිත් එක්ක හිනාවෙලා බෑග් එකත් අරගෙන නැගිටලා යන්න ගියාම මහීශා මං ගාවින් නැගිටලා ගිහින් ආශි ගාවින් වාඩිවුණා.. ආශිගෙ බණ අහල මමයි සෙනුකයයි හිටියේ රහත් වෙලා වගේ.. පුදුමයි මේකි ඔහොම කතාකරනවා දැක්කෙ පළවෙනි වතාවට..

" අම්මෝ කව්ද බං ඒ අඬන කෝච්චිය.. සැක්..දෙන්න හිතුණා.."

" අනේ මේ.. හැම එක්කෙනාම එක වගේ නැනෙ අනේ.. ඒ ළමයා අහිංසක ළමයෙක්.. හැබැයි පොඩ්ඩක් දුශ්ටයිදත් මන්දා.."

@Shan

" අපිට වැඩක් නැනෙ බං.. දැන් අරූ එක්ක මම නටන්නත් එපැයි.. මොන කරුමයක්ද මන්දා මේකනම්.."

" රධ්‍ය අයියට කිව්වද උඹ.."

" කිව්වා.. එයානම් මොකුත් කිව්වෙ නෑ.. ඒ වුණාට.."

" අපි බලමුකො බං.. ශේප් එකේ පොරට වැරදි වැටහෙයිද දන්නැනෙ.."

මම පුටුවට හේත්තු වෙලා බීම එකේ ඉතුරුවෙලා තියන මින්ට් කොළේට ඇඟිල්ලෙන් ඇනලා ඒක වීදුරුව ඇතුළට වැට්ටුවා.. කන්නද දන්නෑ ගහලා එව්වෙ.. වේටර් අයියගෙන් අහන්න තිබ්බෙ.. මාම් ඒ වේටර් අයියා කොහේද කියලා බලන්න වටයක් ඔලුව කරකලා බැලුවා.. වේටර් අයියා වේටර් අයියා..

" ඒ බලපන්කො.. අර ඩයල් එක අපේ මිනිහා වගේ නේ.."

මම දුර ඇත බීම එකකුත් කටේ ගහගෙන දුර බලාගෙන ඉන්න සුදු හැන්ඩ් පොරක් පෙන්නලා අනිත් උන්ට කිව්වහම සෙනුකයා බිබී හිටපු එක නහයෙන් ආවා..

" පිස්සුද හු#තො.. ආතල් දෙන්නෙ.."

" කෝ අනේ.. මට පේන්නැනෙ.."

" අරහෙ බං.."

මහීශා ආශිගෙ බෙලෙන් අල්ලලා දර්ශන පථේට යොමු කලාම ආශි ඇස් දෙක් උණ්ඩි කල්ලා ඒ පැත්ත බැලුවා..

" මද්දු මස්සිනා වගේමයි.."

" මොන.."

" ඇයි අනේ.. රධ්‍ය අයියා මගේ මද්දු මස්සිනා.. අයුක අයියා පොඩි මස්සිනා.."

" ටසිරි.. එහෙමත් තියද.."

@Shan

" ඔව්.. මට මගේ මස්සිනා කියන හැලකිඹුලා ඇරෙන්න මේ ලෝකෙ හැම මස්සිනෙක්ම හොඳ-අන්න බොලේ අපේ මිනිහත් ඉන්නවා..!!!"

මම ආයෙම ඔලුව කරකලා බැලුවහම දුර ඈත ඉඳපු රධ්‍ය අයියා වගේ ඩයල් එක පුටුවෙන් නැගිට්ටා.. ඊට එහාපැත්තෙ ඉඳගෙන හිටිය එකත් නැගිට්ටට ගමන්..,

" හරිනෙ අමාරුව.."

" දුවමුත.."

" ඉඳපන්.. ඇක්කෙ නෑ වගේ වැදගත් දෙයක් කතාකරමු.."

මම කැප් එක ඇස් දෙක වැහෙන්නම මූණට පහත් කරගෙන ෆෝන් එක ඇදලා අරගෙන පාස්වර්ඩ් එකත් තුන්පාරක් වරද්දගෙන වට්සැප් ලොග් වුණා.. ඊටපස්සෙ උඩින්ම තිබ්බ ආධ්‍ය අයියගෙ චැට් එකට හාට් පොලිමක් යවාගෙන යවාගෙන ගියා.. ඒ එක්කම මගේ කැප් එක ගැලවිලා ගිහින් කොණ්ඩෙ සේරම ඇස් දෙකට වැටුණා.. මට අර අමුතු සුවඳ ප'ෆියුම් එක මූණ අගවින්ම දැනෙනවා වගේ.. මම ඇස් දෙක තද කල්ලා පියාගත්තා..

" වරද්.. ෆිල්ම් එක පෙන්නන්නෙ මෙහේද.."

රධ්‍ය අයියා මගේ කන ගාවටම පාත් වෙලා ඇහුවහම මම ඒ පැත්තට මූණ ඇල කරගත්තා.. මගේ මූණට ලේ පිරෙනවා වගේ.. සෙනුකයා මගෙන් පොඩ්ඩක් ඈතට වුණා..

" ඕ-ඔහ්.. ඔයා කොහෙද මෙහේ.."

" අපි මේ හුළං වදින්න ආවනෙ අයියෙ.."

" ඇයි ආශු.. බොලාගෙ ගෙදර හුළං හමන්නැද්ද.."

" හමනවා.. මේ.. අපි පොඩ්ඩක් ආවනෙ ඉතින්.. දන්නැද්ද.."

" මොනවද අපි දන්නැත්තෙ.."

රධ්‍ය අයියා මට දෙකක් රවලා ඇවිත් මං ගාවින් ඉඳගත්තා.. මම පොඩ්ඩක් මෙහාට වුණා..

@Shan

" ඔයාලා දන්නවද ඇයි මේ ලෝකෙ මෙච්චර ලස්සන කියලා.."

"....."

" අපි ඉන්න නිසා.."

" තොපි වගේ මිනිස්සුන්ට බොරු කියලා කැෆේ ගානෙ ඇවිත් දුක අහන හින්දා.. රධ්‍ය කියපන්කො බං ඉතින්.. අපිත් ෆිල්ම් එකක් බැලුවා මෙහෙ ඇවිල්ලා.."

කියාන් අයියා බනිද්දි ආශි වචනෙන් වචනෙට පුටුවෙ ලිස්සලා ගිහින් බොහ් ගාලා මේසෙ අස්සට රූට්ටලා වැටුණා.. මම සෙනුකයගෙ අතේ අල්ලෙ ඉරි කොච්චර තියනවද කියලා බල බල හිටියේ.. මූටනම් දරුඵල සැහෙන්න තියෙනවා වගේ.. ධන රේඛාවත් උඩටම තියන්නෙ.. අඩහඳ හැදෙනවද දන්නෙ නෑ..

" ඔයාලා කොහෙද අනේ මෙහෙ ආවෙ.."

" උඹලා කෝල් අරන් කට කරන්නෙ නැනෙ.. අපිටත් හවස ෆ්‍රී නිසා හොර අල්ලන්න මේ ආවෙ.. බලද්දි මගේ ගෑණි තව එකියක් බදාගෙන දුක අහනවනෙ.. අපි ඉතින් කොනට වෙලා හිටියා.."

" දුක අහනවා නෙමේ.. මම කියලා දුන්නෙ කාන්තාවක් වුණාම කොහොමද තනියම නැගිටින්නෙ කියලා.."

ආශි මේසෙ අස්සෙ ඉඳලා කිඅයන් අයියගෙ අත බදාගෙන නැගිටලා හරියට ඉඳගත්තා.. රධ්‍ය අයියා මං දිහා බලාගෙන ඉඳලා ලාවට හිනාගිහින් ආයෙම මූණ බම්බුවක් කරගෙන වෙන පැත්තක් බලාගත්තා..

" දැන් ඒ නංගි නැගිටීව්ද.."

කියාන් අයියා අහපු එකට සෙනුකයට මහ වල් හිනාවක් ගියා.. සැක් මේ පගා සීරියස් වෙලාවක් වල වල් කතා මතක් කරවනවනෙ..

" ඔව් ඔව්.. අපි යමු ඒයි ගෙවල් වල.. කියාන් අයියා.. මම ඔයාට ගෙදර ගියාම කෑමක් හදලා දෙන්නද.. ඔයාට මහන්සිනෙ.. ඔෆිස් එකේ වැඩත් කල්ලා යුනිවසිටිත් ගිහිල්ලා.. එන්න එන්න.. අපි යමු.."

@Shan

ආශි බෑග් එකත් කරේ දාගෙන නැගිටලා කියාන් අයියවත් නැගිට්ටුව ගත්තා..

" මමත් සෙනුක එක්ක කැපුණා එහෙනම්.. ෂනෙරු.. බායි හොක්ක.. අයියෙ අපි ගියා.."

මහීශාත් ශේප් එකේ ලිස්සලා සෙනුකයගෙ ඇහේ එල්ලුණා..

" හරි.."

ඊටපස්සෙ මාත් සමඟ මෙතනට පැමිණ සිටි සියලුම හල්ලන් මා හැරදා නික්මයන දිහා මම දෑස් දල්වාගෙන බලාගෙන ඉඳලා ශර්ට් එකේ නූලක් අරගෙන ඒක ඇඟිල්ලක පටලගත්තා.. ඔය කොරේ වරදයා.. උඹ මොකක් හරි කළොත් හත්පොළේම ගාගන්නවා..

මම තප්පර දෙකක් තුනක් විතර සද්ද කරන්නැතුව ඉඳලා රධ්‍ය අයියා කිට්ටුවට ගිහින් අමනාපයක් ලොකුවට නැති නිසා හේත්තුවක් දාගත්තා.. තරහ වෙලා බැනෙ.. ඊටපස්සෙ හිමින් සැරේ ඇස් දෙක කරකලා රධ්‍ය අයියා දිහා බැලුවා..

" මොකද ඒයි.."

රධ්‍ය අයියා මගේ දිහා ටිකක් වෙලා බලාගෙන ඉඳලා පුටුවෙන් නැගිට්ටා..

" ගෙදර යමු.."

මට එකසැරේම මල පැන්නා..

" අපි තරහ වෙන්නැද්ද..!! මේක හරි මගුලක්නෙ.."

" ඒකතමා ඉතින්.. වරෙන් ගෙදර ගිහිල්ලා තරහ වෙන්න.."

මම රධ්‍ය අයියට දෙකතුනක් රවලා පුටුවෙන් නැගිටලා පහලට ගියා.. අපරාදෙනෙ මම බය වුණේ.. මම හිතුවෙ මේ පොල් කෑදැත්තට මල පැනලා මට බනීවි කියලනෙ.. නෑ නෑ වරදයා.. උබ කාගෙන්වත් බැනුම් අහන්නෙ නෑ.. ඒකත් එකටම මුන් දෙන්නා තමා චිත්තයො දෙන්නා වගේ ඇවිත් අපිට බීම ඕඩර් කළේ.. අයුක අයියා නිසා අපිට අපේ මිනිස්සුත් හඳාගන්න

@Shan

නැතිවුණානෙ.. ඕකා තමා ඔය හද්ද චීත්ත ගති මුන්ට පුරුදු කල්ලා තියෙන්නෙ..

මම කේන්තියට වාහනේ ටයර් එකට පයින් එකක් ගැහුවා..

" යකෝ!! මම හරියට බොරු කියලා ආවා වගේන උඹ හැසිරෙන්නෙ.."

" කටවහන් ඉන්නවා!!!"

" ප්‍රෙග්නට් කිව්වා නේද.. ඔහොම කේන්ති ගන්න හොද නෑ වරද්.."

මම හැරිලා වටේ පිටේ මිනිස්සු ඉන්නවද බැලුවා.. මේ මිනිහා මට ලැජ්ජ කරනවා..

" කටවහන් ඉදපන්.. මොට්ට මාපිලා.. තවසෙට අද බබා හම්බෙන්නයි යන්නෙ.. ඉදපන්කො.."

වෙරි මින්සිකා ආවා...

මගෙ දලඹු පැටව්නේ.. අනේ හලෝ මේ වැඩ අස්සෙ ඩබල් අප්ඩේට් කියන්නෙ.. මට සිහිනයක් වෙලා ඔබේ ඔය ආතරේ.. හිත තාම දන්නෙ නෑ මම ඇයිද එසේ පැවසුවේ~

ඉක්මනටම අප්ඩේටුවක් ගේනවෝ~~

එන්නාම්.. ලව් යූ.. ❤



අනේ ඒක හරිම හරිම ලස්සනයි~ මම ආදරෙයි ලස්සන ළමයෝ..❤ 😘



මට තෑග්ගක් හම්බුණානෙ අනේ.. මේකා කියවද්දි මාව දියවෙලා දියවෙලා යනවා.. මම ආදරෙයි හුගක්.. ❤❤

ප.ලි.

@Shan

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 135 කොටස

" ඕක නවත්තන්න වරද්..!!"

" ඒක තමයීඊඊඊඊඊඊඊඊඊඊඊඊ හැරදාආආආආආ මම නොයන ඉනාආආආආආ

ඇත්ත තමයීඊඊඊඊ මට යන්නම බෑ හිතුනාආආආආආආආආආආආආ

සිල්ලාරේඒඒඒඒඒඒඒඒඒඒඒඒ!!!!!!!!!! හිත කොහෙදෝඕඕඕඕඕ දැනෙන දිනේඒඒඒඒඒ

සංසාරේඒඒඒඒඒඒඒඒඒඒඒ නොයනා මතක නුඹේඒඒඒඒඒඒ"

මම පිටිපස්සෙ සීට් එකට වෙලා අත් දෙකෙන්ම ශටර් එක බදාගෙන, හූරගෙන, නහය තැලිලා යන්නම වීදුරුවට මූණ හේත්තු කරගත්තා.. එළිය හිටපු ස්කූටර් ඇන්ටි කෙනෙක් මාව දැකලා බය වෙලා ස්කූටර් එක තව ඩිංගෙන් පලතුරු කඩයක් අස්සට කපලා තැඹිලිවල්ලක් උඩ පතබෑවෙනවා.. රධ්‍ය අයියා එක අතක් ඩෝ හැන්ඩ්ල් එකට තියාගෙන ඔලුව අතගාගත්තා.. මෝඩ ගැටපොලොස් කොට්ටෝරුවා..

" ඉවරද.."

" නෑ!!!!"

මම රධ්‍ය අයියට දෙකක් රවලා ආයෙම අර තැඹිලිවල්ල උඩ නගින්න ගිය ඇන්ටිගෙ ස්කූටරේ දිහා බැලුවම ඇන්ටි ගිහිල්ලා.. මේ ස්කූටර් නම්, හිටියා චුත වුණා.. ටික වෙලාවකින් බලද්දි පොල් ගහක් දිගේ යනවා.. ඒ වගේ තමා අපේ රටේ ස්කූටර් පදින්නෙ.. මේ රධ්‍ය අයියවයි කියාන් අයියවයි බ්‍රේක් නැති ස්කූටරේක නග්ගලා දහ අට වංගුවෙ යවන්න තියෙන්නෙ.. කරන අපහස වලට.. මම මේ දැනුත් පිටිපස්සෙ සීට් එකට පැනලා අමනාප වෙලා ඉන්නෙ රධ්‍ය අයියා නොකියා රෝන්දෙ ගියා කියලා බැන්න නිසා.. ඒකනම් මම බනින්නැද්ද අහලා ඉල්ලගෙනම කාපු එකක්.. ඒත් එහෙම බනින්න ඕන නෑනෙ මම කියන්නෙ.. කියලා යන්න තිබ්බා මුන් යන්න දෙනවනම්.. දැන් නම් මට හිතෙනවා මාතර පැත්තෙ ගිහින් ගුරුකමක් කල්ලා මට ටොප් වෙන්න.. ටොප් වුණොත් මම මේ මිනිහව මරාගෙන කෑලි කෑලි වලට කපලා කාලා තරු පෙන්නනවා..

@Shan

" කොහෙද යන්නෙ.."

" අපේ ගෙදර.."

මම ආයෙම සීට් එකේ දිගට හාන්සි වුණා.. ගෙදර යන්නෙ යැයි යැයි තමා.. මම ගිහින් ආධ්‍ය අයියට කියනවා මූ මට හැමෝ මැද්දෙම කැගහලා බැන්නා කියල.. ආධ්‍ය අයියා තෙල් හැන්ද රත් කල්ලා පිටේ තියයි රධ්‍ය අයියගෙ.. එහෙම කරන්නෙත් නැනෙ.. එක්කො එයා අපි දෙන්නට ඕන මගුලක් කරගන්න දීලා අපේ මාමා එක්ක මලක් කඩාවිද දන්නෙ නෑ.. මුන් සේරටම මගුල් විසේ ගහලා ඉහට.. නාකි වෙලත් පෙම් කෙළිනවා.. මේ අහිංසකයගෙ දුක අහන්න තමා එක ගැඩවිලෙක් නැත්තෙ..

" මොකෝ.."

" මට මල පැනලා ඉන්නෙ.. තව්සෙ කතාකරන්න එපා මාත් එක්ක.."

" ඒ මොකද.. මට ඕන්නම් මම කතාකරනවා.."

" ඒ වුණාට මට ඕන නැනෙ!!!"

" සිරාවටම උබට ළමයෙක් හම්බෙන්නද.."

මම නැගිටලා ඉස්සරහා සීට් දෙක මැද්දෙන් තියන ඉඩන් මූණ ඉස්සරහට දාගෙන රධ්‍ය අයියගෙ මූණට එබුණා..

" කියන්න බෑ.. සමහරවිට වෙලාද දන්නෙ නෑ.."

" මොකක්ද..??"

" ළමයෙක් හම්බෙන්න බං.. why am I so moody and nauseous..??"

" අයියගෙන් අහලා හරියටම කියන්නම්.. මම හිතන්නෙ ඔයාට මූඩ් ස්වින්ග්ස් පටන් අරගෙන.."

" තව්සෙත් ගෝඩාහය වගේ හැම ලබ්බම අයියගෙන්ම අහලා කියපන්.."

" ඉතින් මම බයෝ කලේ නැනෙ.. කරපු එකා කියන්නෙත් මහ අමුතු කතානෙ.."

@Shan

" මොකක්ද අමුතු කතාව.."

" නෑ නෑ.. ඒක හිතන්නෙ නැතුව පාඩුවෙ ඉඳහන්.. මගේ ඔලුවත් කකියනවා.."

" ඒකතමා හැන්දෑවට කූල් කල්ලා මොකුත් බොන්න එපා කියන්නෙ.. අර කියාන් සූකිරියා ඔයාට කූල් ඩ්‍රින්ක්ස් පෙව්වා නේද.."

"....."

මම රධ්‍ය අයියගෙ බෙල්ල වටේ අත් දෙක දාගත්තා.. දකින මනුස්සයෙක් හිතයිද දන්නෙ නෑ මම පිටිපස්ස සීට් එකේ ඉඳලා මේ මනුස්සයව මරන්න ට්‍රයි කරනවා කියලා.. එහෙම මරන්න පුළුවන්ද ඉතින්.. මම මේ ආදරේ කරනවා මගේ මනුස්සයට..

" අප්පච්චි එන්නෙ කවද්ද.."

" අනිද්දා.."

" දැන් අප්පච්චි හදිස්සියෙ ගෙදර හිටියොත් මොකද කරන්නෙ.."

" ඒ කිව්වෙ.."

" දැන් අප්පච්චි ගෙදර හිටියොත් ඔයා කියන්න ඕන 'අප්පච්චි අප්පච්චි!! මෙ ඉන්නෙ ඔයාගෙ කියුට් ලුකින් බෑණා පොඩ්ඩ ෂනෙරු උද්යෝග' කියලා.."

" ඊටපස්සෙ.."

" ඊටපස්සෙ මම අප්පච්චිට හෙප්පුව දීලා වඳිනවා.."

රධ්‍ය අයියා හැරිලා මගේ දිහා බැලුවා..

" උඹට පිස්සු හැදීගෙන එනවද.."

" ඇයි.."

" හෙප්පුව දෙන්නෙ අප්පච්චිට නෙමේ බං.. ඒක මනමාලයට දීලා වැඳහන්.."

@Shan

" වැඩිහිටියොන්ට මුලින් වදින්නැතුව සේරම දමලා ගහලා තව්සෙට වැන්දම හරියනවද.."

" එහෙනම් සේරටම වැඳහන් ඔය බඩකඩිත්තුව දීලා.."

" එහෙම ඕන නෑ.. මම ඉතින් ඕනමනම් තවුසෙට වදින්නම්.. දැන් දණගහලද වදින්න ඕන.."

" ම්ම්.."

මට හෙන කුප්ප හිනාවක් ගියා..

" බෑ.. මම කැමති ආඩ්‍ය අයියට.. මම එයාට මුලින් වැඳලා පස්සෙ ඔයාට වදින්නම්.."

රඩ්‍ය අයියා ටිකක් වෙලා කල්පනා කල්ලා මූණ ඇදකරගත්තා..

" ඒව වරද්.. එකගෙයි කනවා වගේ.. ඔව්වා වෙන මොකෙක්වත් ඉස්සරහා කියන්නෙපා.."

" එකගෙයි කෑවහම නරකද.."

" හොඳයි.. දේපළ පිට යන්නෑනෙ.."

" තව්සෙට තණ්හාව.. හැමතිස්සෙම දේපළක් ගැනම කියවන්නෙ.."

" ඔව් ඔව් මට තමා සේරම තියෙන්නෙ.. උඹ විතරයි හොඳ එකා.. හරිනෙ.."

මම ටිකක් වෙලා කල්පනා කලා..

" මම හෙප්පුවත් උස්සන් ගිහින් ආඩ්‍ය අයියට දනගහලා වදින්න යද්දිම සුදුපාට කෝට් එකක් දාගත්තු නාකි මනුස්සයෙක් ස්ටෙත් එකත් දාගෙන ඇවිත් සුදුහාමිනේගෙන් ඈත්වෙලා හිටපන් කියලා කණට දෙකක් ගහලා යාවිද.."

රඩ්‍ය අයියා තොලක් හපාගත්තා..

" උඹට පිස්සු බං.."

@Shan

" මට ඇති පිස්සුවක් නෑ.. ඇත්තනෙ කියන්නෙ.. ආධ්‍ය අයියට සුගර්ඩැඩී කෙනෙක් ඉන්නවනෙ.."

අපේ මාමගෙ කේන්දරෙත් මගේ වගේ තිබ්බද දන්නෙ නෑ පව්ලෙ උන්ගෙ මූණෙ දැලි ගාන කතාවක්.. නැතුවැති.. අපේ මාමා කරන වැඩ වලට දැලි නෙමෙ හරිනම් පව්ල් වල උන්ගෙ මූනෙ තාර තමා ගාන්නෙ.. බලන් යද්දි මගේ කේන්දරේ තමා සේරම ග්‍රහයො අනිත් අතට කැරකිලා පව වෙලා තියෙන්නෙ.. අනේ මෙ පාඩුවෙ කක්ශෙක ගමන් කරන් ඉන්න ග්‍රහයෙක් කොහොමද කියපන්කො සනෙරු උද්යෝගගෙ ජීවන ගමන ගැන තීරනේ කරන්නෙ.. කාගෙ නැතිවුණත් මමනම් ලොකු අම්මගෙ මූණෙනම් දැලි ගානවමයි.. දැලි බැරිනම් කළුපාට ෆැබ්‍රික් පේන්ට් එකක් හරි උස්සන් ගිහින් ගාලා එනවා.. ලොකු අම්මනෙ හැමතිස්සෙම දැලි කතාව ඇදලා ගන්නෙ.. ආධ්‍ය අයියගෙ ටැටූ එක රිදෙනවද දන්නෙ නෑ.. උඩ දාගෙන ගියානෙ ටැටූ එකක් ගහන්න.. අපේ මාමා ගෙදර එද්දි මාමගෙ අතේ කැලි නෑ නියපොතු පාරවල් වලට හීරිලා.. මට කියලා බෙහෙත් දම්ම ගත්තෙත්.. ආධ්‍ය අයියගෙ නියපොතු කප්පන්න ඕන.. ඒත් කපලනෙ ඉන්නෙ.. ඩොකෙක්නෙ.. නියපොතු ටික උගුල්ලලා දානවා කියලා බය කරන්න ඕන අපේ අනුරාග් සීයව හූරලා අහුවුණොත්..මොකක් වුණත් පවුනෙ අපේ මාමා.. අද ගියාම අයියගෙ ටැටූ එක බලන්න ඕන..

" මේ අයියට අරක රිදෙනවද තාම.."

" කෝක.."

" ටැටූ එක අනේ.."

" ආ ඒක.. රිදෙනවා ඇති.. ඇනස්තීසියා විදගෙන ඉන්නෙ හිරි වැටෙන්න.."

" එහෙමද.. එහෙනම් රිදෙනවැති නේ.. පව් අමගේ ආධ්‍ය අයියා.."

"....."

" මේ ඇත්තට ඔයා පොත්වල ඉන්න පෙම්වතෙක් නෙමේද.. ඉරිසියා හිතෙන්නැද්ද.. මං අහන්නෙ.. තවසෙට කොටටෙ එක්ක ඉරිසියා හිතෙන්නයි අයියා එක්ක ඉරිසියා නොහිතෙන්නයි හේතුවක් තියද.."

" එකගෙයි කනවනම් ඉරිසියා හිතිලා බෑනෙ වරද්.."

@Shan

මම රධ්‍ය අයියගෙ බෙල්ල හුරගෙන පිටිපස්සෙ සීට් එකට හේත්තු වෙලා ඇස් දෙක වපර කරගෙන හිටියා.. මුගෙන් අහනවට වඩා හොඳයි කට කළුගලක උලාගන්නවා.. නෑ නෑ මගේ කට නෙමේ.. මුගේ කට ඕන කළු ගලක අතුල්ලන්න.. මම මොකටද නිකන් හානි කරගන්නෙ මටම..

රධ්‍ය අයියා සාක්කුවෙ තිබ්බ රිමෝට් එකෙන් ගේට් එක ඇරලා වාහනේ පැත්තකින් පාක් කළා.. බුදුඅම්මෝ මේ ගෙදර දකින්නෙ හෙන මාස ගාණකින්.. රධ්‍ය අයියගෙ කාර් එක නැවැත්තුවා විතරයි රෙක්සිකා දුවගෙන දුවගෙන ඇවිත් දොරට කකුල් දෙක තියලා ඒක හුරන්න ගත්තා.. මම ඔය අහංකාර රෙක්සිකා ගණන් ගන්නෙ නෑ සතපහකට.. ඌ මාව ගණන් ගන්නෙත් නැනෙ.. මම ඌට දෙකක් රවලා අනිත් පැත්තෙන් බැහැගත්තා.. බහිනකොටම ගේ ඇතුළෙ ඉඳන් නිල් පාට අමුතු සතෙක් දුවගෙන දුවගෙන ඇවිත් මල් පෝච්චියකුත් පෙරළගෙන ගෙදර පිටිපස්සෙන් අතුරුදහන් වුණා.. ඒ එක්කම ආධ්‍ය අයියත් විශ්ණු දෙයියො වගේ නිල් පාට පෙරාගෙන බල්ලගෙ පස්සෙන් දුවගෙන දුවගෙන ගියා..

" කියාරා!!!! නවතිනවා!!!!!!!!!!!!!!!!"

" ඒ මොකද බං.."

රධ්‍ය අයියා රෙක්සිව එහාට කල්ලා ඇවිත් ගේ පිටිපස්සට මූණ දාලා බැලුවහම ආධ්‍ය අයියා රෙක්සිගෙ පටියෙන් ඇදගෙන ඇවිත් එළියෙ පැත්තක තිබ්බ ටැප් එක ගාවින් ගැටගැහුවා.. කියාරා නිල් පාටට මොකාද වගේ කන් දෙකත් පාත් කරගෙන බිම ලැගගත්තා..

" ඔහොම ඉන්නවා..!!!"

ආධ්‍ය අයියා කියාරට ඇඟිල්ලත් දික් කල්ලා දෙකක් සැර කල්ලා ශර්ට් එකත් ගස ගස ආවහම තමා මමත් ඇවිත් කියලා දැක්කෙ.. දැකලා මට සුරංගනා හිනාවක් පාකලා..

" චූටි.. ඔයා ආවද.."

" ඔව්නෙ.. අයියා මොකද මේ නිල් ගාගෙන ගේ වටේ දුවන්නෙ.. හෝලිද.."

" හෝලි තමා.. අන්න අරකිට පිස්සුද කොහෙද පොඩී.. ස්ටෝ රූම් එකේ තීන්ත බාල්දියක් ඇහේ හලාගෙන ඇවිත් මගේ ඇඳ උඩ නැගලා හැමතැනම

@Shan

ජේන්ට් ගාලා.."

" ආ..??"

" ඔව්.. මම නාගෙන එන්නම් චූටි.. පොඩී!! බල්ලව නාවනවා.. හදනවනම්.. මම කිව්වා ස්ටෝ රූම් එකේ දොර වහලා යනවා කියලා.. කොහෙද මම කියන එකක් අහන්නෙ නැනෙ.. පණ්ඩිතයිනෙ.."

ආධ්‍ය අයියා රධ්‍ය අයියගෙ ඇඟේ වැදීගෙන ගස්ස ගස්ස ගෙට ගියාම රධ්‍ය අයියා ආධ්‍ය අයියට දෙකක් රැව්වා..

" එයාගෙ ගණන්.."

" ඔයා ගණන් ගන්න එපා ඒයි.. ගිහින් බල්ලව නාවන්න.."

රධ්‍ය අයියා මගේ දිගා ටිකක් වෙලා බලාගෙන ඉඳලා කුප්ප හිනාවක් දාල මාව ළඟට ඇදලා ගත්තා.. මම ලේස් එක පැගිලා එහෙමම උගේ ඇඟ උඩට ඇදගෙන වැටුණා.. රධ්‍ය අයියා මාව උස්සගෙන ගේ ඇතුළට ගිහින් සෝෆා එක උඩට අතැරලා පස්සට අත කරකලා හොඳ පාරක් දුන්නා..

" your boyfie gonna punish you.."

මම සෝෆා එක උඩ මුනින් අතට ඉඳගෙන එහෙමම හැරිලා රධ්‍ය අයියා දිහා බැලුවා..

" මොකක්.."

" ඇයි.."

මට රධ්‍ය අයියා හිතන එක ඇහෙනවා ඇහෙනවා වගේ.. ඒ අස්සෙ වෙන කුණුහර්පත් මතක් වෙනවා.. අර සෙනුකයා හල්ලා එක එක මගුල් කතා ඇවිත් කියවලා අපේ ඔලුවවල් කුරුවල් කල්ලනෙ තියෙන්නෙ.. සැක්..

" මට බල්ලව නාවන්න බෑ..!!! ආධ්‍ය අයියේඒඒඒඒඒඒඒඒඒඒ- මහ්හ්ක්ක්ක්මමමක්ක්ක්ක්මම!!!!!!!"

රධ්‍ය අයියා මගේ කට අත් දෙකින්ම අල්ලගෙන සෝෆා එකට තියලා තද කලා.. මම රධ්‍ය අයියගෙ අත් දෙක අස්සෙන් රූටලා පහළට වැටුණා.. හිතේ

@Shan

ඇති මගේ කට වහන්න.. මෝඩ කලවැද්දා..

" බල්ලව නැව්වොත් මට මොනවද හම්බෙන්නෙ.."

මම අත් දෙකත් බැඳගෙන සෝෆා එකේ මෙහා කොනෙන් හරියට වාඩිවුනාම රධ්‍ය අයියා මට එහාපැත්තෙන් ඉඳගත්තා..

" මුකුත් හම්බෙන්නෙ නෑ.."

" ආ එහෙනම් බෑ.."

" උඹට හතරවටේ ගිහින් දුක අහන්න හොඳයි එක එක ගෑණුන්ගෙ.. කියාරව නාවන්න එන්න බෑ.. හරි බැනෙ.. බැනෙ.. ආයෙ අහන්නෙ නෑ..!!"

"....."

" මම යන-"

" එන්නම් එන්නම්.. රෙද්ද.. තව්සෙත් මහ ගෑණුළමිස්සි වගේ.. මට ඇඳුමක් දෙනවකො.. මේක ඇඳගෙන බල්ලො නාවන්න බැනෙ.."

" උඩ ඇති.. ඇඳගෙන එන්න.."

මම රධ්‍ය අයියගෙ කකුලත් පාගගෙන සොෆා එක වටෙන් ගිහින් පඩිපෙළ නැගලා උඩට ගියා.. කලින් එයාලගෙ සාලෙ තිබුණු වෙඩින් ෆොටෝ ආධ්‍ය අයියලගෙ ෆොටෝ මොකුත්ම බිත්තිවල නෑ.. ඒවා නැතුව ගෙදර හරි අපිළිවෙලයි.. පාළුයි වගේ.. කොටින්ම මම මාස ගාණකට කලින් දැක්ක ගෙදර නෙමෙයි මම දැක්කෙ.. ඔක්කොම වෙනස් වෙලා ගිහිල්ලා.. තැන් තැන් වල තියලා තිබුණු බඩු වෙනස් කල්ලා.. සුදුපාට බිත්ති ඔඩක් තියන හිරගෙයක් වගේ මටනම් ඒ ගෙදර පෙණුනේ.. ඉස්සර බිත්තිවල එක එක ෆොටෝ එල්ලලා ආධ්‍ය අයියා ලස්සනට ගෙදර තියාගෙන හිටියා.. හැමතැනම පාළුගතියක් අඩුපාඩුවක් නොවෙන්න.. ආධ්‍ය අයියා කිව්වනෙ අප්පච්චි වෙඩින් ෆොටෝ එක පොළොවෙ ගැහුවා කියලා.. ඊටපස්සෙ එයා ඔක්කොම ගෙදර ෆොටෝ ගලවලා අරන් තිබ්බලු.. අප්පච්චිලා පුතාලා රණ්ඩු වෙන නිසා..

මම ගිහින් රධ්‍ය අයියගෙ අමාරිය ඇරලා ඇඳුමක් අරගත්තා..

@Shan

එයාගෙ කාමරේනම් ලොකු වෙනසක් වෙලා තිබුණෙ නෑ.. ඒ වුණාට පාළු පාටයි.. වැඩිය මෙහෙ ඉන්නෙ නැති නිසාද මන්දා.. බැල්කනි එකේවත් දොර මතක ඇති කාළෙකින් ඇරලා නෑ වගේ.. බැල්කනි එකට එහාපැත්තෙ දූවිලි පිරිලා.. මම හිතුවෙ නෑ මේ ගෙදර මෙච්චර වෙනස් වේවි කියලා.. හරියට පවුල වෙන් වෙලා දෙපැත්තකට වුණාම වටේ පිටේ තියන දේවලුත් ඒ වෙනසට හැඩගැහිලා වගේ.. ඒ ගෙදර ඇතුළෙ මට කවදාවත් නැතුව මහා අමුතු පුරුදු නැති අඩුපාඩු ගතියක් දැනුණා..

මම පහළට යද්දි කියාරා ඉන්නවා මොකුත් කලේ නැති අහිංසකයා වගේ බිම ලැගලා කන් දෙකත් පාත් කරගෙන.. රධ්‍ය අයියා ගිහින් හෝස් එක ටැප් එකට සෙට් කළා විතරයි කියාරා කුලප්පු වුණා.. ඩයල් එක නාන්න කැමති නෑ වගේ..

" කියාරා!!! දඟලන්නෙ නෑ..!!"

රෙක්සිත් ඇවිත් අපිව පේන හරියෙන් ඉඳගත්තා..

" කියාරා ළඟදි නාලද ඉන්නෙ.."

" ම්ම්.. පෙරේදත් නෑවා.."

මම කියාරා ගාවට ගිහින් පොඩ්ඩක් නැවුණා..

" හායි පෙට්ටි කිකිළි මාව මතකත.. ඔව් නෙ.."

කියාරා මගේ කකුලකට අතක් තියලා ඉස්සුණා.. මම එයාගෙ ඔලුවෙ තිල් ගෑවිච්ච නැති තැනක් බලලා තට්ටුවක් දැම්මා..

" වරද් අර ශැම්පු එක අරගෙන එන්න.."

" තව්සෙ නාන්නෙ නැති නිසා තමා බල්ලොත් මෙහෙම නාන්න හොර වෙලා තියෙන්නෙ.. ඔයාලා මේ වගේ හැදෙන්නෙපා අප්පා.."

*බුහ්* බුහ්*

" අන්න හරි ඒකතමා.. රධ්‍ය අයියට පිස්සු.."

*බුහ්* *බුහ්*

@Shan

" ඔහ්.. රධ්‍ය අයියගෙ පස්ස ලොකුයි..?? ඒකනම් ඇත්ත කියාරා.. ඒ වුණාට ඔයා ඒ පැත්ත බලන්නෙපා.. එයාට අයිතිකාරයෙක් ඉන්නවනෙ.."

*බුහ්*

" අයිතිකාරයා මලක් වගේ..?? දෙයියනේ ඔයා මට ලැජ්ජ කරනවා මෙයා.."

*බුහ්* *බුහ්* *බුහ්*

රධ්‍ය අයියා මගේ කකුල් දෙකට වතුර පාරක් ඇල්ලුවා..

" කටවහගෙන මාව නාවපන්ලු.."

" අනේ මේ.. එයා ඒ කිව්වෙ මාව දැක්කහම එයාට ලස්සන මලක් මතක් වුණාලු.. ඒත් ඔයාව දැක්කම ඒ මල කන්න ආපු දළඹුවෙක් වගේ පෙනුණාලු.."

*බුහ්*

" අන්න ඒකනෙ කියාරා.. කොහෙද ඔයාගෙ ඩැඩාට තේරෙන්නෙ නැනෙ.. මොකක් වුණත් ඔයා වුණත් පිළිගන්නවනෙ මම සාරධර්ම වලින් පිරුණු ආගමට දහමට ලැදි මනුස්සයෙක් කියලා.."

මම ගැම්පු ගොඩක් කියාරගෙ ඇඟර හලලා එතනින් වාඩිවෙලා බ්‍රශ් එකකින් එයාගෙ නිල් පාට පේන්ට් ඇතිල්ලුවා.. රධ්‍ය අයියා පටියෙන් ඇදගෙන ඉන්නවා.. නැත්නම් මේ පෙට්ටි කිකිළි දහලනවනෙ..

" මේවා යන්නෙත් නෑ ඒයි.. නිල්කටරොලුමලෙන් ඉපදුනේ ඔයා නෙමේ නේද.. සැක්.."

" ඔක තදට අතුල්ලපන්.."

" බෑ එයාට රිදෙනවනෙ.."

" රිදෙන්නෙ නෑ බං.. ඔක මෙහෙට දීලා මේ පටියෙන් අල්ලගනින්.."

රධ්‍ය අයියා මගේ අතේ පටිය ගැටගැහුවා.. පෙනේද මේ මිනිහා මෙක මගේ අතේ ගැටගැහුවහම හරිද.. මූ දිව්වොත් එහෙම.. මාවත් ඇදිලා යනවනෙ..

@Shan

" ආ මල්ලිලා.. වැඩ වගේ.."

මම එහෙමම උඩ බැලුවා.. ආධ්‍ය අයියා නාලා ටවල් එකකුත් උස්සන් ඇවිත් මහා රාණි වගේ ගෙදර ඉස්සරහා බැල්කනියෙ ඉඳන් කොණ්ඩෙ පිහනවා.. මම ආධ්‍ය අයියට ඇස් පිල්ලම් දෙකතුනක් ගැහුවම එයා හිනාවුණා.. අපේ මාමා නාකි වෙනකල්ම ඉඳලා ටෝක්කල්ලා තියෙන්නෙ මොකෙක්ටවත් ටෝක් කරගන්න බැරි එකෙක්මනෙ..

" ආධ්‍ය අයියෙ.. රධ්‍ය අයියා අද කැෆේ එකකදි මට ගැහුවා.."

ආධ්‍ය අයියා ඇස් දෙක ලොකු කරගත්තා..

" මොකක්.. එතනත් ගිහින් රණ්ඩු වුණාද.."

" බොරු අයියෙ.. මොකද වරද් බොරු කියන්නෙ.."

" බොරු නෙමෙ.. අයියා ටැටූ එක ගැහුවත.."

ආධ්‍ය අයියගෙ මූණ අමුතු වුනා..

" අපෝ රිදෙනවා චූටි.. ආයෙනම් ජීවිතේට ටැටූ එකක් ගහන්නෙ නෑ.."

" හුහක් රිදෙනෝද.. එහෙනම් මම ටැටූ එකක් ගහන්න ඉන්න අදහස අතැරගන්නවා.. අපි රධ්‍ය අයියගෙ පස්සෙ එකක් ගහමු.. මොකද කියන්නෙ.. ඒයි මේ.. ඔයාගෙ පස්සෙ මොණරෙක් ගහමුද.."

"....."

රධ්‍ය අයියා මම කියපු එක ඇහුණෙ නෑ වගේ බල්ලව අතුල්ලගෙන අතුලගෙන ගියා.. ඒ අහිංසකී පලිද ඒකට මං අහන්නෙ.. නැනෙ.. මෙ රධ්‍ය අයියගෙත් කැටයම් තමා.. පස්සෙ මොණරෙක් ගැහුවා කියලා නරකක් වෙන්නෙ නැනෙ.. හැබැයි එක්කො ඕන නෑ.. ඕක ගහන්න ගිහිල්ලා මගේ මනුස්සයට ඇස්වහක්වත් වැදුණොත් මම කාට කියන්නද.. රධ්‍ය අයියගෙ අතේ දෙහි ගෙඩි දෙකකුයි මිරිස් කරලකුයි එල්ලුවනම් හරි ඇස්වහ කටවහ යන්න..

" මම තේ හදනවා.. ළමයි ඕක ඉවරවෙලා එන්න හරිද.."

@Shan

ආධ්‍ය අයියා සඳලුතලෙන් බැහැලා තේ හදන්න යන්න ගියා..

තේ හදනවනම් ඉතින්.. ආධ්‍ය අයියා තමා.. අනේ මන්දන්නෑ ආධ්‍ය අයියගෙ අත් ගුනේ හරි මොකක් හරි ගුණයක් වෙන්න ඇති එයා හදන හැම කෑමක්ම හරිම රසයි.. අපි හදන ඒවා වගේ නෙමේ.. ඒ වුනාට අයියා මුළු ලෝකෙටම උයලා දෙනවා අපේ මාමා උයද්දි බබා වගේ පුටුවක් අලන් කියව කියව ඉන්නවා විතරයි.. අමුතු තියරි තමා එයාගෙත් තියෙන්නෙ.. ආධ්‍ය අයියා හොඳයි මාමට කරපිංචා කඩන්න යවන්න..

මමයි රධ්‍ය අයියයි අර පෙට්ටි කිකිළි කියාරාව නාවලා වේලලා නාපු එකට පගාවට බිස්කටුත් දීලා නිදාගන්න ඇරලා එයාගෙ කාමරේට ආවා.. මම මතක ඇති කාලෙකින් මේකට ඇවිත් ඉඳලා නෑ.. හැබැයි මට මතක් වුණා.. රධ්‍ය අයියා නාලා එනකල් මම එයාගෙ ඇඳට වෙලා ඔහේ උඩ බලාගෙන හිටියා.. එයා ගාවින් එන සුවඳ මට ඇඳ හැමතැනින්ම දැනෙනවා.. මම ඒකට කැමතියි..

ඒ එක්කම පැත්තක තිබුණු මගේ ෆෝන් එක වයිබ්‍රේට් වුණා.. ස්ක්‍රීන් එකේ මැසේජස් වගයක් පොප් අවුට් වෙනවා..

**Chamiru Art (DHP)**

-ෂනෙරු.. ඔයා සඳුදා ඉස්කෝලෙ එනවද..

-මට ටිකක් කතාකරන්න දෙන්න..

-මම දන්නවා ඔයාට මං ගැන හොඳ හැඟීමක් නැතුවැති..

-එදා වුණු දේට මම හුඟක් පසුතැවෙනවා..

මම ෆෝන් එක දිහා බලලා ඒක පැත්තකින් තිබ්බා.. සඳුදා නෙමේ කවදා ගියත් මට චමිරු එක්ක කතාකරන්න හිතෙන්නෙම නෑ.. මම කියන්නෙ එයා මට කැමත්තෙන් ඉඳපු එක ගැන නෙමේ.. තරුවි නංගිට ආදරෙයි වගේ කරපු බොරුව ගැන.. ඌ උත්සාහ කලානම් නංගිට ආදරේ කරන්න.. බලාපොරොත්තු නොදී ඉන්න තිබුණා.. ඒකත් එක්සැම් අස්සෙ.. හරි කොල්ලෙක්නම් එහෙම කරන්නෙ නෑ.. ඒත් චමිරුලාට අනිත් මනුස්සයෙක්ගෙ දුක තේරෙන්නෙත් නැහැනෙ.. සැපටම හැදිලා ඉස්සෙල්ලම එයාට ඕන දේ තමා කරගන්න බලන්නෙ.. අනිකට හෙන

@Shan

ගහලා ගියත් කමක් නෑ.. සෙනුකයා ඕකුන් එක්ක කොහොම ඉන්නවද කියලා තමා මට හිතාගන්න බැරි..

රධ්‍ය අයියා වොශ් රූම් එකේ ඉදන් ඇවිල්ලා මම දිහා බලලා කණ්ණාඩිය ගාවට ගිහින් දාහක් ජාති මූණෙයි ඇහෙයි අතුල්ලගෙන කොන්ඩෙත් හදාගෙන අමුතු ඇක්ශන් වගේකුත් දාලා ඇවිත් පාඩුවෙ ඇදේ වැටිලා හිටිය මගේ ඇඳ උඩට පතබෑවුණා.. රධ්‍ය අයියා සීතලම සීතලයි.. මම රස්නෙයි.. එයා ෆෝන් එක අරගෙනෙ ඒකෙ තිබ්බ මැසේජස් ටික කියවලා පැත්තකින් තිබ්බා.. තියලා මගේ එහාපැත්තෙන් හරියට හාන්සි වුණා..

" වරද්.."

" මිම්.."

" ඔයා චමිරු එක්ක ටිකක් කතාකරන්න.."

මම රධ්‍ය අයියා දිහාවට හැරුණා..

" චමිරු එක්ක කතාකරන්න..?? ඒ ඇයි..??"

" සමහරවිට එයාට හිතේ තියන මොකක් හරි ඔයාට කිව්වහම නිදහස් දැනෙයි.. ඊටපස්සෙ හිත හදාගන්න බලාවි.."

" ඒත් චමිරු කරපු වැඩෙ හරිද.."

" ඒක එයාගෙ ප්‍රශ්නයක් වරද්.. ඔයාලා පුළුවන් තරමින් ඕකට මැදිහත් වුණානෙ.."

" මට යන්න බෑ.. මම යන්නෙ නෑ.."

රධ්‍ය අයියා හිනාවෙලා මගේ කම්මුලට තට්ටුවක් දැම්මා..

" ඔයා චමිරුගෙ තැන හිටියනම් මොකද වෙන්නෙ.. එහෙම ඔන නෑ.. මම චමිරුගෙ තැන හිටියනම්.. එතකොට මටත් හිත රිදෙනවා වරද්.. අවුරුදු ගාණක් නොකියා ආදරේ කල්ලා අන්තිම මොහොතෙ ඔයා වෙන කාටහරි ආදරේ කරන්න ගත්තනම්.. කොහොමද කියන්න හිත හදාගන්නෙ.. එකපාරට බෑ.."

@Shan

රඩ්‍ය අයියා කියපු කතාවට මගේ පපුව රිදෙන්න ඇල්ලුවා.. මම කැමති නෑ 'එයා මගේ ජීවිතේ නොහිටියනම්' කියන මාතෘකාවට..

" අනේ මේ.. එහෙම වෙන්නෙ නෑ.."

" මම කිව්වෙ වුණොනම්.. ඒකනිසා අන්තිම පාරට ඔයා ට්‍රයි කල්ලා බලන්න චමිරු එක්ක හොඳ යාළුකමක් ඇතිකරගන්න.."

" ඔයාමනෙ කිව්වෙ චමිරු වැඩිය ආශ්‍රය කරන්න එපා කියලා.."

" ඒ මම නැති ටිකේනෙ.. දැන් ඉන්නවනෙ.."

" ආ දැන් ඔයා හිටියම මම කාටවත් බයවෙන්න ඕන නැද්ද.."

" නෑ තමයි බොල.."

මම රඩ්‍ය අයියගෙ අතක් අස්සට රිංගගෙන කම්මුලෙන් හාද්දක් තිබ්බා..

" මෙහේ ගෙදර වෙනස්වෙලා වගේ.."

රඩ්‍ය අයියා මාව කිටි කිටියේ තුරුල් කරගත්තා.. එයාගෙ ඇඟේ තියන සීතල මගේ ඇඟට දැනෙනකොට ගිනියම් වෙලා වගේ තියන ඇඟට සනීපය දැනුණා..

" ගෙදරක් වගේ නෑ වරද්.. අපි මෙහෙට එනවා යනවා විතරයි.. එච්චරයි.."

" ඔයා මොකක් හරි හිතනවා නේද.. මේ දවස්වල.."

" මම හිත හදාගන්න ගමන් ඉන්නෙ.."

" ඒක හොඳයි.."

" ඔයා කියාරටයි රෙක්සිටයි හුහක් කැමතිද.."

" ඔව්.. රෙක්සි නම් පොඩ්ඩක් අහංකාරයිනෙ.. ඒත් මම ආදරෙයි.. කියාරා කොහොමත් මගේ කිකිළි කෙල්ල.."

රඩ්‍ය අයියා මගේ අතක තිබ්බ මුද්ද ඇඟිල්ලකින් කැරකුවා..

@Shan

" ම්ම්.."

" ඇයි..??"

මම රධ්‍ය අයියා දිහාම බලාගෙන හිටියා.. එයා හුඟ දවසක ඉඳලා මට මොකක් හරි කියන්න ට්‍රයි කරනවා කියලා මට තේරෙනවා.. මේ දැනුත්.. ඔයා ඒක කියන්න ට්‍රයි කරනවා.. ඒත් මොකක් හරි හේතුවක් නිසා ඒක නතරකරගන්නවා..

" Nothing... I have something to tell you.."

" මොකක් ගැනද.."

" මන්දා.. I feel something strange.. මේ දවස්වල මගේ වටේ වෙන දේවල් එච්චර හොඳ නෑ.. මට ඒක මොකක්ද කියලා හිතාගන්න බැරුව ඉන්නෙ.. මම මෙහෙම කියන්නෙ මොන හේතුවකටද මම දන්නෙ නෑ.. ඒ වුණාට පරිස්සමින් ඉන්න වරද්.. මොකක් කලත්.."

" ඔයත්.. පරිස්සමින් ඉන්න.."

" ම්ම්.."

රධ්‍ය අයියා කිසිම දෙයක් පැහැදිලිව දන්නෙත් නැතුව මට පරිස්සමින් ඉන්න කියද්දි.. ඇත්තටම මගේ හිතට බයක් දැනුණා.. මම රධ්‍ය අයියගෙ අත් අස්සට තව ටිකක් ගුලි වුණා..

" ඔයා මාව බය කරනවා.."

" මම ඉන්නවා වරද්.."

රධ්‍ය අයියා මගේ නළලෙ පැත්තට හාදුවක් දීලා තොල් වලිනුත් හාද්දක් තිව්වහම මගේ ඇස් පියවෙලා එයාගෙ කොලර් එකන් අල්ලගත්තා.. හැමදේම හොඳ විදියට වෙන්නෙ කොච්චර කාලෙකටද මම දන්නෙ නෑ.. අපි වටේ තියන අමුතු හුරු නැති ගතියට හේතුව මොකක්ද කියලා මම දන්නෙ නෑ..

" මේක modern fairytale එකක්ද.. no happy endings..??"

@Shan

" A modern fairytale with a happy ending.."

රධ්‍ය අයියගෙ කොලර් එකෙන් ඇදලා මම එයාව මගේ ළඟට තව ටිකක් ඇදගත්තා..

" ඔයාට මගේ හැඟීම් විශ්වාස කරන්න පුළුවන් කොච්චරක්ද.."

" I believe in you unlimitedly and unconditionally.."

" එහෙනම්.. එච්චරයි.. එතනින් එහාට මොකක් වුණත් මට වැඩක් නෑ.. you gave me the words.."

රධ්‍ය අයියා මගේ ඇස් විනිවිද යන බැල්මකින් බලාගෙන හිටියා.. මනුස්සයෙක්ගෙ ඇස් වලින් දැනෙන්න ඕන 'පරිස්සම් කරන හැඟීම' කියන දේ මම හුඟක්ම දැක්කෙ එයාගෙ ඇස් වලින්.. ඒක.. ඒක හරිම පිරිසිදු හැඟීමක් වගේ දෙයක්.. සමහරවිට මම එයා ඉස්සරහා ඕන දෙයක් කියලා කල්ලා ඉන්න ඒක හේතුවක් වෙන්න ඇති.. මොකද මගේ හිතේ ඇතුළෙම තැනක තියනවා 'එයා මාව පරිස්සම් කරනවා' කියලා හැඟීමක්.. එයාම පැලකරපු.. එයාම ඒක නඩත්තු කරගෙන යනවා.. ඒ නිසා රධ්‍ය අයියා ගාව මට ප්‍රොටෙක්ටිව් ෆීලින් එකක් දැනෙනවා.. ඒක මේ පළවෙනි පාරට එයාගෙ අත් දෙක මැද්දට මැදි වුණාම දැනෙන හැඟීමට වඩා වෙනස් එකක්.. කාලයත් එක්ක මම මේ ලෝකෙ ජීවත් වෙන්න පහසුම මනුස්සයා ගාවදි දැනෙන හිතේ සැනසීමයි ආරක්ශාවයි දැනෙන්න ගන්නකොට මම ඒකට සෑහෙන්න ඇබ්බැහිවෙලා තිබුණා.. එයා කොහේ හිටියත්. මොන තත්වෙක හිටියත්.. මං ගාව එයා වෙනුවෙන් ආදරේ පණගහනවා.. ආදරේ පණගහනවා කියන්නෙ මගේ හිත ඇතුළෙ ආදරයක් ජීවත් වෙනවා කියන එක.. ඒක සැරින් සැරේ මම ජීවත්වෙනවා කියලා මතක් කරනවා.. මම හැමතිස්සෙම ජීවත් වෙනවා කියලා දැනෙනවනම් දැන් කැමතියි..

එයා මට ජීවිතේ දුන්නා.. මම ඒ ජීවිතේට ආදරෙයි..

මගේ දළඹු ළමයිනේ.. ඔයාලා හොඳින් ඉන්නවා නේද්දෝ.. ඔන්න අදනම් නෙස්ටමෝල්ට් එකක් ගේන්න පුළුවන් වුණා..

චමිරු පුතා මොකක්ද කරන්න යන්නෙ..

@Shan

අහන්නකො හලෝ නිකමට හිතන්න.. ඔයාලා මේ කියවන්නෙ වරද්ගෙයි චමිරුගෙයි ස්ටෝරියනම්..

දෙයියනේ දෙයියනේ..

දළඹුවෙක්මයි මට ඔක කිව්වෙ..

#රධ්‍ය_විතරයි_අම්මෙ

#පරෙයියො_ඕන_නෑ

කිව්වට උබර්ලා චමිරුටත් ඇහැ දාගෙන ඉන්නෙ කියලා මම දන්නවා.. ඒ ළමයා දෙන්න ඉන්නෙ කියාන් අයියගෙ අයියට.. හොඳයිනෙ..

හෙහෙ..

නරක සමනලයා යන්නයි යන්නෙ..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 136 කොටස

" Good morning everyone, we invite our school's Head Prefect Shaneru Udyoga to the stage to address the morning's main assembly.."

ඉස්කෝලෙ ඇනිවසරි එකට කලින් තියන මෝනින් මෙන් එසෙම්බ්ලි එකට ඉස්කෝලෙ හැමෝම වගේ ග්‍රවුන්ඩ් එකට එන්න ඕන.. ඒකෙ මෝනින් ස්පීච් එක දෙන්න තිබුණේ මට.. මම උදේ පාන්දර දාහක් වැඩ අස්සෙ මලකුත් කඩලා බ්ලෙසර් එකත් බාගෙට දාගෙන ඒක හදාගෙන ස්ටේජ් එකට නැගලා හොඳ ළමයා වගේ ගිහින් මීඩියා එකේ මල්ලිගෙන් මයික් එක ඉල්ලගත්තා.. හොඳ ළමයෙක්නෙ කොහොමත්.. ඒ මදිවට ළාහිරු කිරණ කෙලින්ම ඇවිල්ලා මගේ ඇස් දෙකේ වදිනවා අම්මටසිරි වෙන්න.. මම ලාවට හෙවනැල්ලක් වගේ සෙට් වෙන තැනකින් හිටගත්තා..

" Good morning everyone..

Without further ado, let's talk about the reason for having the Morning Assembly..

We all know that there are only two days left for the school anniversary.. On that day, we highly expect you to be disciplined and courteous.. We must remind you that our school is at the top of Sri Lanka in terms of education and other aspects..

At this juncture, we would like to especially thank our school's Aesthetics Club for their immense support.. art circle, dancing society, English drama society, oriental music society, Sinhala drama society, Tamil dramatic society, Tamil karnatic music society, Western music society and all the student in there with cordinators, in-charge teachers, club heads, treasures..

I heartily congratulate the cadet students and scout brothers of the school for their achievements at the provincial level.. Also, we would like to thank the Community Service Club for successfully completing the process of repairing the old people's homes with the cooperation of all.. The social

@Shan

mission they have done at this time is great.. We are happy about the dedication of the students of our school..

During this week, the prefect council is conducting a classroom inspection of school students, so we look forward to your support for that and I request you all to take care to maintain academic balance..

Thank you..

මම හැමෝටම ඔලුව නමලා ස්ටේජ් එකෙන් බැහැලා සෙනුකයා ඉන්න තැනට ගියා.. අර පරෙයියා 'හම්බෙන්න ඕන' කියාගෙන උගෙ කුකුල් පිහාටු තොප්පිය සාක්කුවෙ ගහන් අතුරුදහන් වුණා වුණාමයි මම තාම ඇහැට දැක්කෙ නෑ.. අද ඒ ගොල්ලොන්ගෙ කවද එනවලුනෙ ඉස්කෝලෙට.. ඒකනිසා ස්කූල් කැඩෙට්ස්ලා යුනිෆෝම් ඇවිල්ලා එහෙට දුවනවා මෙහෙට දුවනවා.. ඒ දුවනගමන් තමා මට චමිරුවත් හම්බුණේ.. රධ්‍ය අයියත් එසෙම්බ්ලි එන්නෙ නැතුව මෙන් හෝල් එක අස්සට වැදිලා එතන ඉන්න අයත් එක්ක කතාකර කර ඉන්නවා.. කලින් සාජන්ලුනෙ ඉතින්..

" දැන් මද්දු මස්සිනා හා කිව්වද උඹ අරූ එක්ක කතාකරන එකට.."

" අවුලක් පෙන්නුවෙ නම් නෑ.. ඒ වුණාට ඉතින්.. දන්නැද්ද.."

" ම්ම්.. මට ඊයෙ කතාකල්ලා සෑහෙන්න දුක කිව්වා මිනිහා.. එදා උඹට කෑගහන්නෙ නැතුව ඉන්න තිබ්බලු.."

" අහපන්කො සෙනුකයා.. මම කොයි වෙලාවකවත් කිව්වද කියහන් ඌ මට කෑගැහුව එකට මම අවුල් ගියා කියලා.. ඒක නෙමේ මට තියන ප්‍රශ්නෙ මූ කරපු බොරුව ගැනනෙ.. ඒක ගැන මම කියන්නෙ.. මේ පකයා කියන ලබ්බක් තේරුම් ගන්නෑනෙ හරියට.."

" ඔය පවුලෙ උන්ට දෙයක් හොඳින් කියලා හරියන්නෑ තමා.. උඹ ඌ මොක කිව්වත් ගණන් ගන්නෙපා.. පාඩුවෙ ඉදහන්.."

" එහෙම තමා ඉන්නෙ.."

" ආශිට තරුවි නංගි කතාකල්ලනෙ.."

@Shan

" කෝල් කල්ලද.."

" ඔව්.. අනේ මන්දා ඒකිත් මේ හිතනවා මුගෙන් අයින් වුණු එක හොඳයි කියලා.. ආයෙම කියනවා මතක් වෙනවලු.."

" එහෙම තමයි බං.. හිත හදාගන්න අමාරු ඇති.. මොකක් වුණත් ඉතින් ආදරේ කරපු එකානෙ.."

" ඒවුණාට චමිරු කිව්වෙ ආයෙ තරුවිගෙ මූණ බලන්න බෑ කියලා.. උෟට මොකුත් රිලේශන්ශිප් ඕන නැහැල්ලු.."

" ම්ම්.."

මම මෝනින් එසෙම්බ්ලි එක ඉවරවෙනකල් පහළ ඉඳලා ළමයි හැමෝම පන්තිවලට යනකල් සෙනුකයා එක්ක ඉස්කෝලෙ වැඩ වගයක් ගැන ප්‍රින්සිපල් සර්ලා එක්ක කතාකර කර හිටියේ.. ස්කූල් ඩිරෙක්ටර් බෝඩ් එකත් එක්ක ප්‍රසිඩන්ට් තියන මීටින් එකකට ඉස්කෝලෙ හෙඩ් ප්‍රිෆෙක්ට් බෝඩ් එකට ඉන්වයිට් කල්ලා තියෙනවා Presidential Secretariat එකේ.. මේ සතියෙ සිකුරාදා.. ඒකෙ වැඩ වගේකුයි වෙස්ලි මැච් එකයි.. ඔහොම ඉතින් ඉස්කෝලෙ වැඩනම් හැමදාම ලොට් එකක් විතර තියනවනෙ.. ඕවා ප්‍රින්සිපල් සර්ලා එක්ක කතා කර කර ඉඳලා මම ප්‍රිෆෙක්ට් රූම් එකට එන්න ආවා..

අපේ මාමා මේ ටිකේ පරල වෙවීනෙ ඉන්නෙ.. අර කැලුමක්ද ගැලුමක්ද ආධ්‍ය අයියට පැණි හලන්න අරගෙනලු.. කැලුමා ඇවිල්ලා අපේ මාමා අඳුරන ඩොකෙක්.. ඒත් අපේ අනුරාග් සීයා කොහොමත් ලෑස්ති නෑ එයාගෙ රෝසමල වෙන කාටත් වෙන්න.. මගේ පුංචි රෝස මලේ.. මමයි නුඹේ වියපත් බඹරා.. නුඹ හීනෙන්වත් නොදකින කුමරා..~

නෑනෙ..!!

ආධ්‍ය අයියනම් අපේ මාමව හීනෙන් දැක දැක හිටියා කියලා මට ටක්කෙටම කියන්න පුළුවන්.. ආධ්‍ය අයියටත් අපේ මාමවම සෙට් වුනානෙ.. මම හිතාගෙන හිටියේ දේව්වා මගේ ආධ්‍ය අයියත් මගේ කියලා.. පස්සෙ මම කියන මහා පොදු සාධකේ කැපිලා ගිහින් උන් දෙන්නා 'අපි අපේ' වුණා.. මම දැන් කොනේ ඉන්නෙ.. කොනේ හිටියත් කමක් නෑ මටත්

@Shan

බෝයිපෙන් කෙනෙක් ඉන්නවනෙ.. මගේ පස්ස ලොකු හැප්පිකච්චා.. තාම මේන් හෝල් එකේ බොරුවට හිනාවෙනවද දන්නෙ නෑ..

මම ඔච්චා හිත හිත ගිහින් පුටුවකින් වාඩිවෙලා වතුර බෝතලේ කටේ ගහගත්තා.. වේළුසුමනයා අද ප්‍රැක්ටිස් දාලනෙ.. මම වේළුසුමනයට පොරොන්දු වුණා අද එද්දි කවියක් හදාගෙන එනවාමයි කියන්න කියලා.. හුදකලාව අවනඩුවක්.. වේලුසුමනයෝ~ ..ඉදපන් අද ගිහින් පැල් කවියක් කියනවා සර්ට ඇඩෙන්න.. මම නිසා කීදෙනෙක් අඩන්න ඉන්නවද මම අහන්නෙ..

මම පාඩුවෙ පැත්තකට වෙලා වාඩිවෙලා කල්පනා ලෝකෙ ගිලිලා ඉන්නකොටම අපේ ප්‍රිෆෙක්ට් රූම් එකේ ඉදපු සේරම දනිපනි ගාලා නැගිටිනවා මම දැක්කා.. කොහෙද මම පොඩ්ඩක් උස මදිනෙ.. මම පුටුවට කකුලක් තියලා සේරම අස්සෙන් ඔලුව දාලා බලනකොටම..

" Hey guys.. how are things these days.. අපිත් ආවා ඉස්කෝලෙ පැත්තෙ.."

මම හිමින් සැරේ පුටුවෙන් පාත් වුණා.. සූකිරිඅප්පච්චි මොකටද අද ඉස්කෝලෙ ඇවිත් තියෙන්නෙ..  සෙනුකයත් කොහේදෝ මන්දා ඉදලා මගේ ගාවට ඇවිත් පුටුවක් ඇදගෙන ඉඳගත්තා.. කියාන් අයියත් එතන ඉදපු උන් එක්ක හිනාවෙලා කතාකල්ලා අපි දෙන්න ඉදපු දිහාට ආවහම මම උඩ බලාගත්තා.. මූ එදා කිව්වා නේද මාව ටෝක් කරගන්නවා කියලා රධ්‍ය අයියට නොදී.. ගස් සෙවලයා.. හිතාගෙන ඇති මාව ටෝක් කරගන්න.. ආශිට කියලා කොණ්ඩෙ අයන් කරන එක මූණෙ තියවන්න තියෙන්නෙ කියන වනචර කතා වලට..

" ආ හෙඩා කෝමතේ.."

" තව්සෙ ආපු නිසා කිසි හොදක් නෑ දැන්නම්.. මොකද මෙහේ ආවෙ.."

කියාන් අයියා පුටුවක් ඇදගෙන අපි ගාවින් වාඩිවුණා..

" උබලව බලන්න ආවෙ නෑ කොහොමත්.. මම ආවෙ මගෙ සුදුඅම්මියා උගන්නන හැටි බලලා යන්න.."

" එයා උගන්නන හැටි බලන්න තමා මම ඉන්නෙ.. නැද්ද සෙනුක.."

@Shan

" අපි දන්නෑ.. පාන්දරට ගිහින් හැබැයි තොත්තු දීලා එනවා දැකලා තියනවා.."

" අඩෝ එහෙනම් අපේ එකාට ගුරුපඬුරුත් හම්බෙනවද.."

කියාන් අයියා හෙන මනමාල හිනාවක් දාලා කොණ්ඩෙ පිටිපස්සට හදාගත්තා.. මෙ යකා එන්න එන්න විසාල වෙලා අපි ඌ ගාව ඉද්දි නිකම කුඹියො රැනක් වගේ මට දැනෙන්නෙ..

" ගුරුපඬුරු දෙන්නැතුව කොහොමද.. ඒවා නිසි වෙලාවට දෙන එක ශිශ්‍යයොන්ගෙ යුතුකමනෙ.."

" අනේ ඔව්.. උබෙ යුතුකම.. කැෆේ ගානෙ ගිහින් ගෑණුන්ගෙ දූක අහන එකනෙ.."

සෙනුකයා ඇස් දෙක කරකලා පුටු ඇන්දට හේත්තු වුණා.. දැන් හැම මගුලටම මුන් තුන්දෙනා දූක අහන්න ගිය එකක් මතක් කල්ලා සැරින් සැරේ බනිනවා.. එක්කො එකපාර බැනලා ඉවරකරපන්.. එහෙමත් නෑ.. සැරින් සැරේ පොඩ්ඩ පොඩ්ඩ තියාගෙන හෙන අමුතු පලිගැනිල්ලක් යන්නෙ..

" අනේ මෙ එහෙම අහපු දූකක් නෑ හරිත.."

" එහෙනම් බදාගෙන හිටියෙ.. උඹලා වෙන මොකක් හරි රහපැවද එතන.."

" අපි බදාගෙන හිටියෙ නෑ හලෝ.. ඒක අහපන් ආශිගෙන්.."

" ඒකිගෙන් ඕවා අහනවට වඩා හොඳයි.. නෑ එක්කො ඕන නෑ.. කෝ දැන් මගේ සුදුඅම්මි කොහෙද ඉන්නෙ.. දෙයියනේ සුදුඅප්පච්චියා දුරකතර ගෙවන් ලෙක්චර් කට කරන් ආවෙත් ඌ බලන්න.."

" සුදුඅම්මියා මෙන්හෝල් එකේ.. අද කැඩෙට්ස්ලට මොකක්ද තියනවලුනෙ.."

අපි කියාන් අයියා එක්ක ඔපදූපයක් කියෝගෙන පාඩුවෙ ප්‍රිෆෙක්ට් රූම් එකට වෙලා හිටියම ඒකෙ හිටපු උනුත් එක එක වැඩ වලට එළියට ගියා අන්තිමට ඉතුරුවුණේ අපි තුන්දෙනා විතරයි.. ඒකනිසා සෙනුකයා ගෙනාපු කෑම එක අපි එකතුවෙලා කෑවා.. හෙන කාලෙකින් කියාන් අයියලා එක්ක

@Shan

කන්නෙ.. ඉස්සර ඇවිත් සුදුඅම්මියගෙන් කටක් කවාගෙනත් යනවනෙ.. එහෙම කාලෙකුත් තිබ්බනෙ අද මෙහෙම වුණාට.. අඩේ ඒ කාලෙ ඩිපියුටි ගේම්ස් කැපාගෙන් බත් කටක් කවාගන්නවා කියන්නෙ කොච්චර දෙයක්ද මං අහන්නෙ.. දැන් මේ දැක්කම හිනාවෙලා විතරක් ගියාට.. මගෙ පූස්පැටියා හොඳින් ඉන්නවද දන්නෙ නෑ.. සමහරවිට එයාට හොඳ ගෙදරක් හම්බෙන්න ඇති..කවුරු වුණත් ඒ අහිංසක සතාව ගෙනැල්ලා ඉස්කෝලෙ ඉස්සරහට දැම්ම එකානම් තිරිසනෙක්ටත් අන්තයි.. මමනම් කියන්නෙ හැමදේකටම අර විශාලත්වයෙන් සමාන ප්‍රතික්‍රියාවක් තියෙනවා වගේ උන්ටත් ඉන්න හිටින්න ගෙයක් නැතිවෙලා බලන්න ඕන.. තමන්ගෙ අඳුරන අයගෙන් ඈත් වෙලා.. අසරන වෙලා පාරක් අයිනෙ බඩගින්නෙ වැටිලා හිටියම තේරේවි ජීවිතයක් කියන්නෙ.. ඒක අතරමං කල්ලා දානවා කියන්නෙ.. මොනතරම් පවක්ද කියලා..

මම පොඩිකාලෙ අපේ ගමේ හිටියා කුකූ කියලා පොඩි බලු පැටියෙක්.. එයාගෙ අම්මා පාරෙ වාහනේකට හැප්පිලා සතියක් විතර ගිහින් නැතිවුණා.. එයාගෙ අනිත් සහෝදරයොත් පිරිමි සත්තු නිසා කට්ටිය අරගෙන ගියා.. අන්තිමට කුකූ විතරයි ඉතුරුවුණේ.. එයා හිටියෙ පාරෙ.. අපේ මාමා මම පොඩි කාලෙ කුකූට කන්න දෙනවා.. ඔහොම වෙලා කුකූ කොහොම හරි අපේ ගෙදර කෙනෙක් ගාණටම අපිට ලං වුණා.. ගේ ඇතුළට එන්නෙ නෑ.. ඉස්තෝප්පුවට වෙලා එයා හරිම පාඩුවෙ එන්නෙ.. මම ඒ දවස්වල ගමේ ඉස්කෝලෙට යන්නෙ පයින්.. මාමා හවසට එක්කගෙන ගෙදර එනවා.. කුකූත් මගක් දුරම මාව එක්කන් යන්න එනවා.. නැට්ට වන වන මගේ වටේ කැරකි කැරකී.. අදටත් මට කුකූව මතක් වෙනවා.. ඊටපස්සෙ ටික කාලයක් ගිහින් ආච්චිඅම්මා දවසක් එයාට කෑම තියලා කතාකරද්දි එයා ආවෙ නෑ.. පස්සෙ වෙලේ කුකූ මැරිලා ඉද්දි අපිට හම්බුණේ.. මම එදා හොඳටම ඇඬුවා කුකූ ගෙනැත් දෙන්න කියලා.. ගමේ මනුස්සයෙක් කුකූ ඒගොල්ලොන්ගෙ ගෙදර රෙදි ඇදන් යනවා.. ඒවා හපනවා කියලා වෙලේ වල්පැල වලට ගහන බෙහෙත් ජාතියක් කුකූට දීලා තමා එයා මැරිලා තියෙන්නෙ.. අපේ මාමා ඕකට ඒගෙදර මිනිස්සුන්ට හොඳටම බැන්නත් එක්කන්.. මොකක් වුණත් සමහර සත්තු ගාව තියන කෙළෙහි ගුණ මිනිස්සු ගාවවත් නෑ කියලා එදා මාමා මට කිව්වා.. ඇත්ත තමයි..

අපි කාලා ඉවරවෙලා අත හෝදන්න ටැප් එක ගාවට ගියා.. මම අතත් හෝදගෙන සෙනුකයයි කියාන් අයියයි එනකල් බිත්තියකට හේත්තුවක් දාගෙන ඉද්දි එකපාරටම වම්රුවා මගේ එහාපැත්තෙන් බූතපැටියා වගේ

@Shan

මතුවෙලා මට ඇඟිල්ලකින් තට්ටුවක් දැම්මා.. ඌව දැකලා මහදවාලෙ මම බයවුණත් එක්ක.. මහසෝනා වගේ තට්ටු දානවා..

" කැඩෙට් රූම් එකට පොඩ්ඩක් එනවද.."

" කැඩෙට් රූම් එකට..??"

" ම්ම්.."

" ඉඳහන්.. මේ අයියෙ.. මම පොඩ්ඩක් ගිහින් එන්නම්.."

කියාන් අයියා චමිරුවා දිහා රවලා බැලුවා..

" කොහෙද.."

" ෂනෙරු ගිහින් ඒව් අයියෙ.. උඹ ඉක්මනට වරෙන්.."

සෙනුකයා කියාන් අයියව ඇදගෙන යද්දි කියාන් අයියා මට ඇඟිල්ලක් දික් කලා රව්වා.. මම චමිරු එක්ක කැඩෙට් රූම් එකට එන්න ආවා.. ඉස්කෝලෙ කැඩෙට් රූම් එක හෙන කළුවරයි.. මම ආස නෑ මෙකෙ අස්සෙ වදින්න.. තියා රධ්‍ය අයියවත් ජීවිතේට මෙක අස්සට මට කතාකරන්නෙ නෑ.. ඒ වුණාට කැඩෙට් කරන උන් ඉන්නෙ මෙකෙ අස්සෙමනෙ..

මම චමිරු යනකල් ඉඳලා කැඩෙට් රූම් එක ඇතුළට ගියා.. ඒකෙ ඇඳවල් තුනක් එක්ක වහළ ගාවටම මෙට්ට වගයක් ගොඩගහලා කඹ, බාල්දි, බූට්ස්, ඇඳුම් හැමදේම තැන තැන තියලා තියනවා.. කැඩෙට් කරන උන්ට කැඩෙට් කියන්නෙ වෙනම ජීවිතයක් කියලා රධ්‍ය අයියා මට කියලා තියනවා.. වෙන්නැති.. මටත් එහෙම හිතනවා කරන උන් ඒකට මැරෙන හැටි දැක්කහම..

චමිරු ගිහින් ඇඳකින් ඉඳගෙන මට ඉස්සරහා තියන පුටුවක් පෙන්නුවා..

" ඉඳගන්න.."

" අද ඕගොල්ලොන්ට මොකක්ද තිබ්බෙ.."

මම චමිරු පෙන්නපු පුටුවෙන් ඉඳගත්තා..

@Shan

" අද මගේ අන්තිම දවස.. ආයෙ යුනිෆෝම් අඳින්නෙ නෑ.."

චමිරු හිනාවෙලා කියද්දි මට ගිය අවුරුද්දෙ රධ්‍ය අයියා යුනිෆෝම් ඉඳපු අන්තිම දවස මතක් වුණා.. එදා අපි පඩිපෙළේ වාඩිවෙලා හුහක් වෙලා කතාකර කර ඉඳලා ගෙදර ගියා.. වැස්සට තෙමුණත් එක්ක..

" ආ.. අපිට මේ අවුරුද්දෙ කලින්ම ඩියුටි පීරියඩ් ඉවරවෙනව නේ.."

" වෙලාවට එක්සැම් තිබ්බනෙ.. උඹනම් මෙඩිකල් කොලේජ් යාවි.."

මට හිනාගියා..

" උඹ කොහොමද හරියටම කියන්නෙ.."

චමිරු ඒකට මොකුත් කිව්වෙ නෑ..

" එදා වුණු දේට සොරි ෂනෙරු.. මම ඕනවට වඩා කලබල වෙලා ඔයාට කෑගැහුවා.. ඇත්තටම සොරි.."

මම චමිරු දිහා බලාගෙන හිටියා.. උගේ මූණෙන් ඇත්තටම පසුතැවෙන බව මට පේනවා.. ඒත් එයා වැරැද්දක් කලානම් පසුතැවෙන්න ඕනමයි කියන මතේ මමනම් ඉන්නෙ..

" මම.. තරුවි නංගි එක්ක කතාකළාද.."

" කතාකළා.. මට තවත් ඒක කරන්න බෑ ෂනෙරු.. ඔයා මං ගැන මොනවා හිතාගෙන ඉන්නවද මම දන්නෙ නෑ.. මම ඒක වෙනස් කරන්න ට්‍රයි කරන්නෙත් නෑ.. ඒත් මට බෑ හැඟීමක් නැතුව තව කෙනෙක්ට තවදුරටත් බලාපොරොත්තු දෙන්න.."

"....."

" මම කල්පනා කල්ලා කල්ලා තීරණේකට ආවා.. ආයෙම තරුවි එක්ක මට සම්බන්ධයක් පටන් ගන්න බෑ.. "

" උබ එහෙම හිතනවනම්.. ඒකට කමක් නෑ.."

@Shan

චමිරු ඇඳ ඉස්සරහට ඇදිලා මගේ අත් දෙක අරගෙන එයාගෙ අත් දෙකින් තද කල්ලා අල්ලගත්තා..

" මට අන්තිමට වතාවට මේක ඔයාට කිව්වා කියලා හිත නිදහස් කරගන්න ඕන ෂනෙරු.. මම ඇත්තටම උඹට ආදරෙයි.. මාරම ආදරෙයි.. මම හිතුවා අනිත් පැත්තට මට ලැබෙන හැමදේම වගේ උබවත් ලැබෙයි කියලා.. මම සැහෙන්න එහෙම හිතුවා.. කමක් නෑ.. ඒකට කමක් නෑ.. උඹ සතුටින් ඉන්නවනෙ.. මම හිත හදාගන්න ට්‍රයි කරනවා.. කවදහරි මම සම්පූර්ණෙන්ම උඹ ගැන හිතින් අයින් කරගත්තු දවසට.. තව කෙනෙක්ට ආදරේ කරනවා.."

" ම්ම්.."

චමිරුගෙ ඇස් වල එදා වගේම අදත් කඳුලු පිරිලා තිබ්බත් ඌ හිනාවෙලා කතාකළා.. මෙච්චර කාලෙකට.. මම චමිරු මෙහෙම කතාකරනවා දැකලා තිබුණෙම නෑ..

" තරුවිට මම ආදරේ කරන්න ට්‍රයි කළා ෂනෙරු.. එක්කො මට ගෑණුළමයි ගැන උනන්දුවක් නෑ.. නැත්නම් තරුවි මට ගැලපෙන්නෙ නෑ.. අනික මට එයා ගැන හිතේ තියෙන්නෙ ආදරයක් නෙමේ.. මගේ අතින් වැරදි වෙලා තියේ නෑ කියන්නෙ නෑ.. ඒත් වැරදි හේතු කරගෙන තවදුරටත් ඒ කෙල්ලත් බොරුවට දුක් විදින්න ඕන නෑනෙ නේද..

ඒකනිසා මම ඒක නවත්තනවා.. ප්ලීස් පුළුවන් නම් ඔයා තරුවි ගැන කතානොකර ඉන්න.. ආයෙම ඒක මට මතක් කරන්න එපා.. අනික.. අනික සෙනුක.. මට හුඟක් වටිනවා.. යාළුවෙක්ටත් වඩා වටිනවා, කියලා නිමකරන්න බැරි තරම්.. මට සෙනුකව නැතිකරන්නත් එපා.. සෙනුක නිසා අයියා මාත් එක්ක අයෙම කතාකරන්නෙ.. මට උඹලට වගේ පණ වුණත් දෙන යාළුවො නෑනෙ.. මගේ වටේ ඉන්න දෙතුන්දෙනා මට ඉතුරු කරපන්.."

" එයාලා ඔයාට නැතිවෙන්නෙ නෑ චමිරු.. ඔයා එක්ක ඉන්නවා.."

චමිරු මගේ අත් තව ටිකක් තදින් අල්ලගෙනම හිටියා..

" උඹට ආදරේ නොකර ඉන්න.. එක්කො මට-"

@Shan

චමිරු මොකක් හරි කියන්න ගිහින් ඒක නවත්තගෙන මගේ අත් දෙක අතෑරියා..

" ඔයා යන්න ෂනෙරු.."

මම පුටුවෙන් නැගිටලා චමිරුගෙ උරහිසට තට්ටුවක් දැම්මා..

" ඩ්‍රාමා එකට වරෙන් හරිද.."

චමිරු එකසැරේ ඇස් දෙකත් ලොකු කරගෙන මගේ දිහා බැලුවා.. බලලා ලාවට හිනාවුණා..

" එන්නම්.."

මම චමිරුට ෆිස්ට් බම්ප් එකක් දීලා කැඩෙට් රූම් එකෙන් එන්න ආවා.. මම නිසා කාටවත් කවුරුවත් නැතිවෙන්න ඕන නෑ.. එහෙම නැතිවෙන්නෙත් නෑ..

ඉස්කෝලෙ ඉවරවුනාට පස්සෙ රධ්‍ය අයියා කියාන් අයියා එක්ක මොකක් හරි කතාකරන්න පැයබාගයක් විතර ඉස්කෝලෙ නතරවුණා.. කියාන් අයියා තකහනියක් කෙලගෙන ඉස්කෝලෙ ඇවිල්ලා මොනවද ෆයිල් තොගයක් රධ්‍ය අයියට දීලා කතාබහ කල්ලා ඔෆිස් යනවා කියලා ගියා.. අපි ඉස්කෝලෙන් එද්දි වෙලාව දෙකට විතර ඇති.. ඉස්කෝලෙ හවස ප්‍රැක්ටිස් ඉන්න ළමයි ග්‍රවුන්ඩ් එක පැත්තටයද්දි මමයි රධ්‍ය අයියයි පාකින් ලොට් එකට ආවා.. අද මට ප්‍රැක්ටිස්නෙ..

" කියාන් අයියා මොකටද ආවෙ.."

මම සීට් බෙල්ට් එක ලොක් කරගත්තම රධ්‍ය අයියා අර ෆයිල් ටික පිටිපස්සෙ සීට් එකට දැම්මා..

" උගේ ඔෆිස් එකේ ප්‍රශ්නයක් වෙලා.. ඒකගැන කතාකරන්න ආවෙ.."

" ආ.. අහන්නකො.. මම චමිරු එක්ක කතාකළා.."

රධ්‍ය අයියා මම දිහා බලලා වාහනේ රිවස් කල්ලා පාකින් ලොට් එකෙන් එළියට ආවා..

@Shan

" චමිරු මොකද කිව්වෙ.."

" එයා තරුවි එක්ක ආයෙම සම්බන්ධයක් පටන්ගන්නෙ නෑ කිව්වා.. තව සෙනුකව එයාට නැතිකරන්න එපා කිව්වා.. අපි හිතනවා වගේ නෙමෙ.. හැමෝටම තමන්ගෙ ප්‍රශ්න තියනවා.. නේද.."

" දැන් තේරෙනවද මම ඇයි චමිරු එක්ක කතාකරන්න කිව්වෙ කියලා.. ම්ම්..??"

" තේරුණා.."

රඩ්‍ය අයියා මගේ උකුළ උඩ තිබුනු අතක එයාගෙ ඇඟිලි පටලගත්තම මම එයාගෙ අතිනුත් තදකල්ලා අල්ලගත්තා..

" දැන් අද කෝච්ට කියන්න කවියක් හොයාගත්තද.."

" නෑ ඒයි.. මම ගිහින් තණ්ඩලේ දෙන්න දෙපොළේ දක්කනවා කියලවත් කියනවා.."

රඩ්‍ය අයියට හිනා ගියා..

" හැබැයි උබ ආයෙම චමිරුගෙ ප්‍රශ්න වලට හරි මොකකට හරි ගිහින් මැදිහත්වෙලා බාල්දියක් ඇඟේ හලාගත්තොත්.. උඹව හමගහනවා මම.. ගියා නංගිලාගෙ දුක අහන්න.."

මම රඩ්‍ය අයියගෙ අත ගසලා දාලා මෙහාට වුණා.. මේ මිනිහා කවදා ඉඳන්ද මේ දුක අහන කතාවක් ගැන කියන්නෙ.. මම දැන් වහලෙන් බිමට පනිනවා..

" අනේ මේ අයියෙ..!!"

" අනේ මේ අයියෙ.. මම අහපු දුකක් ඈ.."

"....."

" කෝ කියන්නෙ නැද්ද.."

"....."

@Shan

" කියන්නකො වරද්..  මම කවුන්ට් කළාම කියන්න ඕන හරිද.."

" පාඩුවෙ ඉන්නවා..!!"

මම අහක බලාගෙන ඇස් දෙක වපර කරගෙනම හිටියා..

" ඒ ඒ වරද්.. මේ බලන්නකො.. වට් අ නයිස් ටයිමින්.. ඩොනල්ඩ් ඩක්ගෙ අලුත් මූවි එකක් ඇවිල්ලද..  අපි මේක බලන්න යමුද.."

ටිකකින් මගේ තියන කරුමක්කාරකමටම සැවෝයි එක ඉස්සරහා තඩි ඩොනල්ඩ් ඩක්ගෙ රූපයක් ගහලා සූන් කියලා අලුත් මූවි එකක රිලීස් කරන ඩේට් එකක් දාලා තියෙනවා දැකලා රධ්‍ය අයියා මැරෙන්න ගියා.. මම අනිත් පැත්ත බලාගත්තා.. මම ඩොනල්ඩ් ඩක් නම් මූ ඩේසි ඩක් වෙන්න එපෑ.. අනික මම ඌ වගේ නෑ.. මම කොහොමවත් තාරාවෙක් වගේ නෙමෙයිනෙ.. මේ මිනිහා මට අපහස කරනවා.. මට කියලා ඇටදෙක තලාගන්න තමා මේ නම් ලෑස්තිවෙන්නෙ..

" Who's got the sweetest disposition?

One guess. Guess who?

Who never, never starts an argument? (Hmm?)

Who never shows a bit of temperament?

Who's never wrong but always right? (Yeah?)~"

රධ්‍ය අයියා ඩොනල්ඩ් ඩක් කාටූන් එකේ තීම් සෝන්ග් එක ශටර් එකට තට්ටුවකුත් දදා කියන්න ගත්තම මම අත මිටමොළවලා ට්‍රැෆික් එකේම සුක්කානම මැද්දට ගහගෙන ගහගෙන ගියා.. හතර අතට හෝන් වැදෙනවකොට ඉස්සරහා ඉදපු අංකලයා රවලා රධ්‍ය අයියා දිහා බැලුවා..

" දෙනවා උඹට මම.."

" පිස්සුද තව්සෙට ට්‍රැෆික් එකේ හෝන් ගහන්න.."

මාත් ඉස්සරහා රවපු අංකලයගෙ ගැම්ම අරගෙන රධ්‍ය අයියට නෝන්ඩියට හිනාවුණා..

@Shan

" බාප්පද ලයිසන් දුන්නෙ.."

" කොහොමද හරියට කිව්වෙ.. ඔයා මාරයිනෙ වරද්.."

" සැක් ඒයි.. අර ඉස්සරහා අංකලයත් හැරිලා බැලුවා.."

" කමක් නෑ මම ස්ටිකර් එකක් අලවනවා බේබි ඔන් බෝර්ඩ් කියලා.. කව්ද බේබි ඇහුවොත් උඹව පෙන්නනවා.."

" හැයි හැයි තමා.. එළවන්න බැරිනම් වාහනේ දෙන්න.. ලැජ්ජ කරන්නෙ නැතුව.. ඒව නේද රධ්‍ය අයියෙ.."

" අනේ මේ උඹ කටපියාගෙන් ඉඳපන්.. වාහනයක් හරියට එළවගන්න බෑ.. දන්නෙ මොකක්ද.. වාඩිවෙනවා.. කකුල් දෙක උඩට ගන්නවා.. කියව කියව යනවා.. ඔච්චරනෙ..කොට තාරාවා.. "

මම රධ්‍ය අයියා වාචාල කමට කියවන එක ගනන් ගන්නැතුව හිමින් සැරේ අතක් දික් කල්ලා පපුවෙ පැත්තක් ඇලුවහම රධ්‍ය අයියා මගේ අතින් තද කල්ලා අල්ලගත්තා..

" අත පය තියන් ඉන්න බැරිද වරද් යැයි යැයි.. බෑ මම තියන් ඉන්නෙ නෑ.. මම තව්සෙ අහුවෙනකල් ඉන්නෙ කාලා දාන්න.."

මම ඇදිලා ගිහින් රධ්‍ය අයියගෙ කම්මුලෙන් හාද්දක් තියලා අනිත් පැත්තෙනුත් එකක් තිබ්බා.. ප්‍රෙශර් වැඩිවුණොත් එහෙම.. මගේ පොල් කැඳැත්තට.. එහෙම හොඳ නැනෙ.. මමම බැනගෙන මමම උත්තර දෙනවා.. රධ්‍ය අයියා ක්ලබ් එකේ පාකින් ලොට් එකෙන් කාර් එක නතර කළා..

" මම යන්නම් ඒයි.. පරිස්සමට යන්න හරිද.."

" මම්.. රෑවෙනකල් ක්ලබ් එකෙ ඉන්න බෑ.. ගෙදර යන්න ඕන.."

" හා.."

මම ස්පෝර්ට් බෑග් එකයි ස්කූල් බෑග් එකයි රැකට් එකයි කරේ එල්ලගත්තා.. දැන් මෙකත් උස්සන් පලයන්කො පඩිපෙලේ.. මේ වයසක වෙළසුමනයා නිසා ක්ලබ් එකේ මම තරම් දුක් විඳින්නෙ නෑ මොකෙක්වත්..

@Shan

රඩ්‍ය අයියා මගේ කම්මුලේ පැත්තකින් අතක් තියලා මගේ තොල් වලින් පෙක් එකක් තිබ්බා.. තියලා ආයෙම මට ඇත් වෙන්න දෙන්නෙ නැතුව එයාගෙ පත්තට ඇදලා අරගෙන ආයෙම මාව වෙගෙන් කිස් කලා.. මම රඩ්‍ය අයියගෙ කොලර් එක මගේ අතකට ගුලි කරගත්තා.. මගේ මූණට ලේ පිරිලා පුපුරන්න වගේ.. විනාඩි දෙකතුනකින් රඩ්‍ය අයියා එහාට වෙලා මගේ තොල් දිගේ ඇඟිල්ලක් ඇදගෙන ගියා.. මම ඇස් දෙකත් ලොකු කරගෙන රඩ්‍ය අයියා දිහා බලාගෙන ඉඳලා එහාට වුණා.. මේ මනුස්සයා එකපාර පාට මාරු කරනවා.. බයත් හිතෙනවා.. අනේ මාමෙ..

" අ-බායි.."

මම කාර් එකේ දොරත් ඇරගෙන අර බෑග් ටිකත් අතින් කටින් එල්ලගෙන ක්ලබ් එකට දුවගෙන දුවගෙන ගියා.. යද්දිම වෙඑසුමනයා ඉස්සරහා දොර ගාව, ඔරලෝසුව දිහා බලාගෙන, මරුමුස් මූණක් හදාගෙන මාව කන්න වගේ බලාගෙන ඉන්නවා.. දැන් ඔන්න කියන්නයි හදන්නෙ.. එකයි.. දෙකයි.. තුන-

" සරනේරු..!!!!!!!! විනාඩි දහයක් පරක්කුයි.. ඔය කැට්වෝක් එක නවත්තලා චේන්ජ් කරගෙන එනවා.."

ඕ යෑස් ඩබල් අප්ඩේටුවක් දුන්නා..

ආධ්‍යාත්මික සුවය..   ♀

උදේට එන්නාම්.. ලව් යූ..   ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

@Shan

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 137 කොටස

" කවුද බොලේ ඩ්‍රෙසින් රූම් එක අස්සෙ බෝනික්කො හැංගුවෙ.. අඩෙ.."

" ෆාතිමාවත් මෙච්චර හැඩට නෑ බං.. සිරාවටම.."

" අනේ හු#තො පලයන් මගෙන් කුණුහර්ප අහගන්නැතුව.."

මම දමලා ගහලා ඇවිත් ඩ්‍රෙසින් රූම් එකේ පැත්තකි කකුල් දෙකත් දිගැරගෙන වාඩිවුණා.. මීට වැඩිය හොඳයි රෙද්ද නැතුව තර්ස්ටන් වටරවුමෙ දුවලා එනවා.. අපරාදෙනෙ මම අන්දරේගෙ ගෑණි වෙන්න බාරගත්තෙ.. වරදයා උඹ හැමදාම ඉල්ලගෙනම කනවා.. නොදකින් නොදකින්.. මිනිහත් ඕඩියන්ස් එකේ ඉන්නව නේද.. ආධ්‍ය අයියෙ මාව හොස්පිට්ල් ගෙනිහින් දාන්නකො..

" ටසිරි හල්ලො.. මේ උඹද.."

කොහේදෝ මන්දා අස්සක ඉඳලා සෙනුකයා සරමකුයි උරහිස ගාවින් පැත්තෙන් ගැටගහන බැනියමකුයි ඇඳගෙන මාව හොයාගෙන ඇවිල්ලා මගේ මූණටම පාත් වුණාම මම පිටිපස්සට වුණා.. සැක්.. මම නිකන් ප්‍රදර්ශන භාණ්ඩෙ වගේ යන යන එකා දෙපාර දෙපාර හැරිලා බලනවා..

" කෝමතේ මගේ සෙස්සි කුක්කුදෙක.."

සෙනුකයා මගේ පපුව හරියන් අල්ලලා අත එහාට ගත්තා..

" උඹනම් ආයෙ ගෑණුන්ට අදින්න තියාගන්න එපා.. මම එහෙම වුණොත් උඹව කරකාර බැඳගන්නවා මගේ මිනිහට ඕන කුදයක් ගහගනින් කියලා.."

" දෙයියනේ මේ පෞකාරිව.."

" නැතුව මේ පෞකාරයා ඔයා වෙනුවෙන් ඕනම දෙයක්.."

මම පොඩ්ඩක් ගස්සලා කල්ලා අහක බලාගත්තම සෙනුකයා දෙකට තුනට නැමිලා හිනාවුණා.. අපේ ඩ්‍රාමා එකේ උන්ට සාපේක්ශව ඉතින් මම කොටයිනෙ පොඩ්ඩක්.. පොඩ්ඩක් කිව්වෙ pod+duck.. ඔය එක එක පොල්

@Shan

කැඳැත්තො මම කොටයි කියලා අපහස කළාට මමත් උසයි.. දැන් ආශි දොඩම් ගෙඩිය වගේ කොච්චර කොටද.. එහෙම බලද්දි මම හෙන උසයි..

" වරෙන් බොගෙ කොණ්ඩෙ මල ගහන්න.."

සෙනුකයා මගේ කොණ්ඩෙ තිබ්බ මල ගලවලා ගත්තා.. හොඳවෙලාවට රෙද්දට යටින් ජීන් එකක් අදින්න කිව්වෙ.. නැත්නම් මම ස්ටේජ් එක මැද්දෙම රෙද්ද කඩාගත්තොත් මොන දෙයියටද කියන්නද.. අන්දරේ මාව උස්සලා පොලොවෙ ගහවි.. අන්තිමට වෙන එකක් නටලා අතිගරු ජනාධිපතිතුමත් බයවෙලා සභාවත් බයවෙලා මගේ මිනිහත් බයවෙලා ඉස්කෝලෙ විනයභාර සර්ට හාට් ඇටැක් එකක්වත් හැදුණොත් එහෙම.. ඒ අස්සෙ මට නිකම් පළවෙනි පාරට මනමාලියෙක්ට ඇඳපු එකෙක්ට වගේ හැඟීමකුත් එනවා..

අපේ අම්මා ගෙදර ගිය වෙලේ මට හෙන ලස්සන කහපාට මල් මල් තියන රෙද්දක්ද.. චීත්තයක්ද කොහෙද.. චීත්ත කිව්වම මෙල්බර්න් වල ඉන්න අයුක පොඩි මස්සිනාවත් මතක් වෙනවා.. අනේ වෙලාවට කාලද දන්නෙත් නෑ.. සෙනුකයා කවන්න ඇති කෝල් එකක් දීලා.. ඌ අයුක අයියට කවන්නෙ..

" අනේ මේ මිනිහගෙන් තියන වදේ.. උඹ දැන් කනවද නැද්ද.. හා නෑනෙ.."

කිව්වම අයුක අයියා කනවා.. නැත්නම් ඊළඟට සෙනුකයා හෝඩිය කියවන්න ගන්නානෙ.. ඌ හෝඩිය කියවනවා කියන්නෙ කුණුහර්ප කියාගෙන යන එකට.. අයුක අයියා කුණුහර්ප කියන එකට බයයි.. අපේ එකා නම් හැමතිස්සෙම අයුක අයියට වදේ වදේ ගානවා.. බැරිවෙලා හරි අයුක අයියා 'මොන වදයක්ද වත්සල්' කිව්වොත්.. එතනින් එහාට අයුක අයියා ඉවරයි..

" හා දැන් මමද වදේ.. මම වද දෙනවනෙ.. සොරි සොරි ආයෙ වදයක් වෙන්නෙ නෑ.."

කියලා මූණ කුණ්ඩ හට්ටියක් කරගන්නවා.. අයුක අයියා ඒකට බය නිසා පාඩුවෙ කටවහන් ඉන්නෙ.. ඉතින් මම කියන්න ගියේ අපේ අම්මා මල් මල් රෙද්දකින් මට රෙද්දකුයි හැට්ටෙකුයි මහලා දුන්නනෙ.. ඇනිවසරි එකට නටන්න.. කහපාට හැට්ටෙයි මල් මල් රෙද්දයි.. කහමලියා වගේ.. මම උදේ ඒකත් ඇඳලා ඉස්කෝලෙට මේකප් කරන්න ආපු අයියණ්ඩිට කියලා හැටට

@Shan

හැටෙ මේකප් එකකුත් දාගත්තා.. මගේ ඇස් වලට එක්ස්ටෙන්ශන්ස් ඇලෙව්වහම හෙනම ගෑණු ලුක් එකක් එන්නෙ.. එක්කො අපේ අම්මා මාව ඉපදෙන්න කලින් ගෑණුලුක් එකක් මවාගෙන හිටියද දන්නෙ නෑ.. මම ඇස් දෙකට ලෙන්ස් දෙකක් හයි කරගන්නවා කළුපාටට.. එතකොට මොකෙක්වත් බලන්නෙ නැතිවෙයි.. නෙහ්.. ඊටපස්සෙ කහපාට බෙස් එකකුයි රෝසපාට බ්ලශ් එකකුයි ගාලා මාව හෙන බෝනික්කෙක් කලා නැගිට්ටලා යැව්වා.. දැන් මෙතනින් යන යන හැම එකාම හැරිලා මං දිහා බලනවා..

" අම්මටසිරි රධ්‍ය සර් එනවා නේද.."

" කෝ..!! අනේ මේ මාව හංගපන්.."

මම ඇඳගෙන හිටපු රෙද්ද උස්සලා ඒකෙන් මූණ වහගෙන් බිත්තිය පැත්තට හැරුණා.. මේ මිනිහා මාව මෙහෙම දැක්කොත් මුළු ජීවිතකාලෙ ඉරෙනකල්ම මේක අල්ලගෙන මට බලු කතා කියාවි.. රධ්‍ය අයියා අළුපාට ශර්ට් එකකුයි කළුපාට ට්‍රවුසර් එකකුයි ඇඳගෙන කොණ්ඩෙ ජෙල් කල්ලා උඩට හදලා හැන්ඩියා වගේ ගස්ස ගස්ස ඇවිත් සෙනුකයා ගාවින් හිටගත්තා.. මම පැත්තට හැරිලම හිටියා..

" ගුඩ් මෝනින් සර්.."

සෙනුකයා හෙන මල් මල් හිනාවක් පාකල්ලා ඇරියා..

" ගුඩ් මෝනින්.. අයුක කතාකළාද මල්ලි.."

" කතාකළා.. උදේ දුවන්න යනවා කිව්වා.."

" ආ.."

රධ්‍ය අයියා සෙනුක එක්ක කතාකරන ගමන් බෙල්ල දික් කල්ලා ඩ්‍රෙසින් රූම් එක ඇතුළට ඔලුව දානවා මම ඇහැ කොනෙන් දැක්කා.. යකෝ!! මෙතන වාඩිවෙලා ඉන්නෙ.. ජේන්නැද්ද තමන්ගෙ මිනිහව..

" කො මල්ලි වරද්.."

" වරද් ද..?? ඉන්නවා.."

@Shan

රධ්‍ය අයියා සෙනුකයා දිහා බලලා ආයෙම වටේ බැලුවා..

" කොහෙද.. මම උදේ දැක්කෙ නැනෙ ඇවිත් ඉන්නවා.."

" සිරාවට අයියා දැක්කෙ නැද්ද.."

රධිය අයියා ඔලුව දෙපැත්තට වැනුවා.. දෙන්න හිතයි.. මුගෙ හොම්බට දෙකතුනක්.. මට මල පැනලා මම රධ්‍ය අයියගෙ කලිසමේ බෙල්ට් එක ගාවින් අල්ලලා කලිසම පහළට ඇද්දම ඒකා කලිසම අත් දෙකින්ම අල්ලගත්තා..

" හු-"

" තවසෙට මිනිහා මෙතන ඉදන් ඉන්නවා පේන්නෙ නැද්ද.."

රධ්‍ය අයියා එකපාරට ඇස් දෙකත් ලොකු කරගෙන මගේ දිහා බයවෙලා වගේ බලාගෙන හිටියා..අඩෙ මාව දැක්කම බයත් හිතෙනවද.. සිරාවට..

" මේ කව්ද.. ව්-වරද්..??"

" වරද් නෙමෙ උඹෙ ආවච්අම්මා.."

රධ්‍ය අයියා මගේ මූණට පහත් වෙලා ඇස් දෙකට එබුණා.. එබිලා අමුතුවට හිනාවෙලා කෙළින් වුණා.. අඳුනගත්තද දන්නෑ.. ගස් ගෙම්බා..

" අපේ වරදිනී ලස්සනයි නේත අයියෙ.."

මම සෙනුකයගෙ කකුල පෑගුවා..

" ලස්සනයි නම් තමා.. මම හිතුවෙ ඇත්තටම කෙ- ඕගොල්ලොන්ගෙ අයිටම් එක කීයටද තියෙන්නෙ.."

රධ්‍ය අයියා හිනායන්න ඇවිත් කටත් අමුතුවට හදාගෙන සෙනුකයගෙන් ඇහුවහම උංටත් හිනාගියා.. පස්සෙ උන් දෙන්න එකතුවෙලා මහා හයියෙන් හිනාවෙන්න ගත්තා.. නොදකින්.. මම රෙද්ද ගසලා පහළට දාගෙන රෙද්ද හදාගත්තා.. ආධ්‍ය අයියා හිටියනම් මෙහෙම නැනෙ.. අපරාදෙ මට කැමතිවෙන්න තිබ්බෙ.. මම පරක්කු නෑ තාම හැබයි..

@Shan

" මේ අයියෙ.. මේ මල මුගෙ කොණ්ඩෙ ගහපන් හොඳේ.. මට වැඩ වගයක් තියනවා.. ගිහින් එන්නම්.."

සෙනුකයා හිනාවෙවී අර අරලිය මල රධ්‍ය අයියට දීලා සරමත් දෙපැත්තෙන් උස්සගෙන බැක්ස්ටේජ් එකට ගියා.. රධ්‍ය අයියා මල දිහා බලාගෙන ඉඳලා මගේ දිහා බැලුවා..

" කතාකරන්නෙපා මාත් එක්ක.."

" වරෙන් මේ මල ගහන්න.."

මම නැගිටලා අහක බලාගෙන ඔරවගෙන ඇස් දෙක වපර කරගෙන හිටියා..

" මොකෝ..??"

" මොකුත් නෑ.."

" උඹ එක එක වේශයන් මවාගෙන ආවහම මම මේ අඳුඅගන්න.. මාව දෙවිකෙනෙක් වගේ පේනවද.. මම දැක්කෙ නෑ ඇත්තටම.."

" ඇයෝ ඔව්.. මෙහ් මට දැන් ටිකක් ලැජ්ජයි වගේ ඒයි.."

" ඔයාට කවද්ද එහෙම ඒවා හිතුණෙ.."

" හිතෙනවා ඉඳලා හිටලා.."

රධ්‍ය අයියා අර අරලිය මල කොණ්ඩෙ බන් එකෙන් රුදෙව්වා.. ජොනතන් ඒ ළඟින් යන ගමන් ලාවට කැහැගෙන ගියාම මම උාට රැව්වා..

" මොකද උඹ.."

" මොකුත් නෑ මොකුත් නෑ කරගෙන පලයන්.. අයියෙ ගුඩ් මෝනින්... අඩෙ නෑ නෑ සර්.. බලහන් මේ අයියලා ඉස්කෝලෙටම අරක් අරගෙන.. අපි ඇත්තට අයියට සර් කියන්නද අයියා  කියන්නද.. සර් අයියා කියන්නත් බෑනෙ.. නේද බං.."

" අංකල් කියපන්.."

@Shan

ජොනතනයා ඇවිත් මගේ කරට අත දාගත්තා.. ඌ රාජකුමාරයෙක්ට ඇඳගෙනනෙ.. මම නිකම් රජකුමාරයගෙ හොර ගෑණිවගේ සැක්..

" අංකල් කියන්න පුළුවන්ද මේ වගේ හැන්ඩ්සම් කොල්ලෙක්ට නේද අයියෙ.. අයියා හොඳයි.."

රධ්‍ය අයියා සාක්කු දෙකට අත් දෙක ඔබාගෙන එතන බිත්තියට හේත්තු වුණා..

" අපේ ෂනෙරුවා හැඩයි නේත.. සිරාවටම පොඩි බෝනික් ලයින් එකක් තියෙන්නෙ.. ගැම්මක් තමා.. මූ වෙස් මාරු කරන නාග කන්‍යාවක් අයියෙ.."

රධ්‍ය අයියට හිනාගියා..

" උඹට ඕන්නැති ලබ්බක් නෑ.. පාඩුවෙ ඉඳපන්.."

මම ජොනාගෙ බඩට එකක් ඇන්නා.. තා ඩිංගෙන් උගෙ කිණිස්සද මොකක්ද රෙද්ද මගේ අතෙත් ඇනෙනවා..

" ඒ වුණාට බ්‍රදර්.. වෙස් මාරුකරන නාග කන්‍යාවකගෙ ආදරේ ලබන්නත් අපේ සර් මහාපරිමාණ කුසල කර්මයක් කල්ලා තියෙන්න ඕන.. දැන් ඔය උඹලගෙ ආගමේ කියනවනෙ.. පතාගෙන එන අරවා මේවා.."

මම ඇස් දෙක ලොකු කරගෙන ජොනතනයා දිහා බැලුවහම රධ්‍ය අයියත් මගේ දිහා බයවෙලා වගේ බැලුවා.. මූ කොහොමද දන්නෙ.. බයටම මගේ පපුවත් මොකක්ද වුණා..

ජොනතන් හිනාවෙලා රධ්‍ය අයියගෙ උරහිසට තට්ටුවක් දැම්මා..

" We all know that මචං.. රධ්‍ය අයියගෙ හාට් එක කොයිවෙලෙත් ව-ර-ද්.. ව-ර-ද් කියලා තමා බීට් වෙන්නෙ.. අනික මෙ විසි එක්වෙනි සියවසේනෙ.. උඹලා හිතුවද අපි ඇවිල්ලා එඩෙර යුගයේ එවුන් කියලා.. I literally love both of you from the bottom of my heart.."

ජොනතන් ගානක් නැතුව කිව්වට මම හිටියෙ තාමත් කරකලා අතැරියා වගේ..

" උඹ ඕකක් කවදා ඉඳලද දන්නෙ.."

@Shan

" more than 1 year.. ඔකනෙ උඹලට කියන්න බැරි රෙද්ද.. බය වෙලා වගේ මැරෙන්න හදනවා.. මටත් දැන් අවුල් යනවා හොදේ.."

" පිස්සුද එහෙම එකක් නෑ.. එකපාරම ඔහොම කිව්වම බය හිතෙනවනෙ.."

" එව්වා වැඩක් නෑ උඹලා තව අවුරුදු පහ හයකින් වෙඩිමක් ගන්නවනම් අපිට කතාකරපන් එච්චරයි.. නැත්නම් මම බලෙන් ඇවිල්ලා උඹලගෙ වෙඩිම කඩාකප්පල් කල්ලා දාලා බෝම්බයක් පුපුරනවා.."

" අඩෝ අඩෝ.."

" කෝ නෆ්‍රාස් නෑනේත.."

මමයි ජොනතනුයි වටපිට බැලුවා.. නෆ්‍රාස් ඉස්සරහා බෝම්බ කතා කිව්වහම ඌට මලපනිනවා කියලා මුළු ඉස්කෝලෙම දන්නවා.. ඌ හිතන්නෙ ඌට හින්ට් එකට අපි කියනවා කියලා.. ඒ වුණාට මෙ ජොනතනයා පගයා හැමතිස්සෙම බෝම්බ ගැන කියවලා නෆ්‍රාස් එක්ක වලි දාගන්නවා..

" එහෙනම් අපි කැපුණා හොදේ.. ෂනෙරු මලක් කඩලා හිමිහිට වරෙන් අරහෙට.."

ජොනතන් සළුවත් උස්සගෙන යන්න ගියාම මම පපුවත් අල්ලගෙන බිත්තියට හේත්තු වුණා.. තා ඩිංගෙන් හුස්මත් නවතිනවා..

" මූ බලහන්කො.."

රධ්‍ය අයියා ලාවට හිනාවුණා..

" ඔහොම හැමෝම හිතනවනම්.. මොනා කරන්න බැරිද වරද්.."

" හැමෝම එකවගේ නෑනෙ.."

" මම මේ කියන්න ආවෙ.. අද අප්පච්චිට ගෙස්ට් කෙනෙක් විදියට ඉන්වයිට් කල්ලා.. එයා එනවා.."

මම ආයෙම පපුවත් අල්ලගෙන බිත්තියට හේත්තු වුණා.. සැක් වරදයා උඹ මොන දිසාවෙන්ද අද ඇහැරුණේ මං අහන්නෙ.. උදේ පාන්දර ඉඳලාම

@Shan

ප්‍රෙශරුයි හාට් ඇටෑකුයි ඇවිල්ලා අන්දරේගෙ ගෑණි වෙන්න කලින් මම වලකජ්ජ ගහයිද මන්දා.. මෙක හරියන්නෑ ආධ්‍ය අයියට එන්න කියලා ප්‍රෙශර් බලවගත්තනම් හොදයි වගේ..

" අනේ මේ මොන- සිරාවටද කියන්නෙ.."

" මොකටද ඉතින් බය වෙන්නෙ.."

" බය හිතෙනවා ඒයි.. තව්සෙලාගෙ අප්පච්චි දැක්කම මට ගොක්කොළ පේනවා.."

" පිස්සුද.. එයා ආවා කියලා ඔයා කලබල වෙන්න ඕන නෑ.. එකපාරට දැකලා, කිව්වෙ නෑ කියලා මැරෙන්න හදන නිසා කිව්වෙ.."

" ම්ම්.. අදනම් මම රාහුකාලෙන් එළිබැහැලා තියෙන්නෙ.. මාමෙඒඒඒ!!"

මම බිත්තිය අත් දෙකෙන් බදාගෙන ගෑණි මැරිච්ච මිනිහා වගේ.. නෑ.. මිනිහා මැරිච්ච ගෑණි වගේ වැලපුණා.. මට බෑ මාමණ්ඩි ඉස්සරහා ගෑණියෙක්ට ඇඳගෙන නටන්න.. අනේ මාමෙ මාව එක්කගෙන පලයන්කො ඇවිල්ලා.. උඹගෙයි මගෙයි මාමණ්ඩි මාව රෝස් කල්ලා කාවිද දන්නෑ.. අසලි අම්මවත් ආවනම් කොච්චර හොඳද... අම්මෙ අනේ..

" අප්පච්චි දන්නව මම කවුද කියලා.."

" ම්ම්.."

" අනේ!!!!!!!.."

මම ආයෙම බිත්තිය බදාගෙන අඬන්න ගත්තා.. දෙයියනේ පුප හපාගෙන මම මැරිලා යනවා සුදුඅම්මියෝ..

" මම ඔයාගෙ යම්කිසි කෙනෙක් කියලත් දන්නවද.."

" මම හිතන්නෙ.. දන්නවා.."

මට කලන්තෙට ඇවිත් එහෙමම රධ්‍ය අයියගෙ ඇඟට කඩාගෙන වැටුණා.. මීට වැඩිය හොඳයි අවුරුද්දට සියඹලා අත්තෙ එල්ලපු රතිඤ්ඤ වැල බෙල්ල

@Shan

වටේ ඔතාගෙන ඒක පත්තු කරගෙන එහාගෙදර කිකිළි එක්ක වෙල වටෙන් දුවලා බස්නාවට පැන්නනම්..

" මොකද බං මේ.. මැරෙන්න හදන්නෙ.."

" අප්පච්චි එනවනෙ.."

" ඉතින් ඔක ඔච්චර නහින්න දෙයක්ද.."

" මේක නහින්න දෙයක් තමා.. අහෝ!! මාගෙ දුශ්ඨ මාමණ්ඩියා.. අපගේ ප්‍රේමයට අකුල් හෙලාවිද.."

" රඟපාන්නෙ නැතුව ඉදපන්.. "

" බෑ මම අන්දරේගෙ ගෑණිට යන්න ඉන්නෙ.. හෙප්පුව දීලා වදිමුත.."

" වැඳහන්.. මම යනවා හෝල් එකට.."

" හා.. ගුරුපඩුරු දෙන්න එපාද.."

" මූණ හෝදන් වරෙන් එහෙනම්.."

" යනවා යනවා.. මම ගිහින් මේ රෙද්ද ගලවලා බාල්කෙක එල්ලන් බෙල්ල වැල්ල දාගන්නවා.."

රධ්‍ය අයියා යන්න ගිහිල්ලත් හැරිලා මං දිහා බැලුවා..

" අපේ අයියටයි මටයි මොකද වෙන්නෙ එතකොට.."

මම අතේ තිබ්බ වළල්ල්ලක් ගලවලා රධ්‍ය අයියට ඒක විසික්කල්ලා ගැහුවම ඌ වලල්ලත් සාක්කුවෙ ඔබාගෙන යන්න ගියා.. කමක් නෑ තව වළලු තියනවනෙ.. මම කකුලෙ බැදලා තිබ්බ පාසළඹෙ ගෙජ්ජි ටිකත් සල සල ඩ්‍රෙසින් රූම් එක අස්සට වැදුණා.. අපේ ප්‍රිෆෙක්ට්ස්ලගෙන් කෙල්ලොන්ට ඇඳලා හිටියෙ පොඩ්ඩක් හරි පොඩියට ජේන උන් දෙතුන්දෙනෙක් විතරයි.. අනිත් උන් එහෙම ඇන්දනම්.. ඒකගැන හිතද්දිත් මට අලි විකාර රූප ටිකක් මැවෙනවා.. මාමණ්ඩි ස්ටේජ් එක මැද්දෙ ඇවිත් මගෙ කණට දෙකක් දීලා කියයි දන්නෙ නෑ පොඩි පුතාගෙන් ඈත් වෙලා ඉදපන් කියලා.. සැක් අපේ

@Shan

ඉස්කෝලෙ අලි ලොකුකමට ඉන්න ඉන්න සේරම ගෙන්නනවනෙ ඇනිවසරි එකට..

අපේ ඉස්කෝලෙ අද වගේ දවසට හැමෝම ටයි එක දාලා ඉස්කෝලෙ එන්නෙ.. ඔක දාන්න දෙන්නෙ විශේශ අවස්ථා වල විතරනෙ.. අපි හරි ආසයි පොඩිකාලෙ ටයි එක දාගෙන ඉස්කෝලෙ එන්න.. ඒත් මම ඒක ගැටගහන්න දනගත්තෙ දහයෙදි.. එතකල් අම්මා තමා පටලලා එවන්නෙ.. නැත්නම් සෙනුකයට කියලා දම්මගන්නවා..

අප්පච්චි මගේ කණට ගැහුවොත් මම මාමට කියනවා.. එයා දන්නෑ අපේ මාමගෙ හැටි.. ආවා මගේ කණට ගහන්න.. මම පුතාවත් උස්සගෙන පැනලා යනවා.. මගේ උන්මාදචිත්‍රාවනෙ.. රාධාවනී..

මම හතරවටින් බෙල්ල දාලා අන්දරේව හෙව්වා.. බලද්දි අන්දරේ සරමකුත් ඇඳගෙන කකුල් දෙකත් බෝක්කුව වගේ හදාගෙන සෙනුකයා එක්ක පච හලනවා.. මාත් ගිහින් සෙනුකයට හේත්තුවක් දාගත්තා..

" අම්මෙ අන්දරේ.."

" මොන මගුලක්ද බං මේ.. මට බෑ මේක කරන්න.."

" අනේ මේ.. බැරි මොකද.. පුළුවන් පුළුවන්.. සනෙරු අන්න උඹෙ මාමණ්ඩිත් එනවලු.."

" ඒකතමා නේත.. හරි වැඩේ.. මම හෙප්පුවක්වත් ගෙනාවෙ නෑනෙ.."

" හෙප්පු මොකටද.."

" මාමණ්ඩිට දීලා වඳින්න.."

චමිරුයි සෙනුකයි මහා හයියෙන් හිනාවුණා..

" උඹ අධිකාරි පවුලම ඇලේ දාගනද යන්නෙ.. මූ බලහන්කො.."

" මම කවදහරි ඔය අධිකාරි පවුල අඬවලා තමා පුතේ පස්ස බලන්නෙ.. දන්නෑ වරද් සනෙරු උද්යෝගගෙ හැටි.. මේ අර අන්තිමට කරන කතාවෙ කොළේ දීපන්.. කීයන් වැඩ කරන්නද මේ තනි මනුස්සයෙක් වෙච්ච මම.."

@Shan

මම චමිරු ගාව තිබ්බ හෙඩ් ප්‍රිෆෙක්ට්ගෙ ස්පීච් එක කියවගත්තා.. අතිගරු ජනාධිපතිතුමායි, බ්‍රිගේඩියර් අධිකාරි මාමණ්ඩියි, අධිකාරි පොඩි පුතාණෝගෙයි ඉස්සරහා මේක ටැපලුනොත් කෙලියක්නෙ වෙන්නෙ.. කලර්ස් පෙන්නන්න ඕන.. අද කතාකරනවා මම අමුතු ඇක්සන්ට් එකකින්.. අපේ මාමගෙ නම්බුවත් තියෙන්නෙ මගේ අතේනෙ..

කොහොම හරි ඉස්කෝලෙ ඇනිවසරි සෙලිබ්‍රේශන් එක පටන්ගත්තා.. කොහෙද ප්‍රිෆෙක්ට් බෝඩ් එක නාට්ටියක් කරන්නනෙ ඉන්නෙ.. ඒකනිසා ඊළඟට සීනියර් බැජ් එකට ඉන්න ස්ටුවර්ඩ් මල්ලිලා තමා හෝල් එකේ ඩියුටි බලාගත්තෙ.. අනික උන් පුරුදු වෙන්න එපැයි.. අපිත් ඔය කාලෙ ඔහොම තමයි මල්ලේ.. ගුටි කකා ඩියුටි කළේ.. උඹලනම් අපෙන් ගුටි කන්නෙ නැනෙ.. අපි ගුටිත් කැවා.. අර පොල් කැඳැත්තා තමා හැමදාම ටොකු ඇන ඇන යන්නෙ.. ඉඳපන්කො බැන්ද කාලෙක මම උඹෙ ඔලුව ගිනිතියනවා.. යාළුවුණාම ඔලුව කනවා කියලා විතරනෙ හිතාගෙන හිටිය.. අනේ ඒ කාලෙ මගේ යාළුවෙන්න ඉන්න අයියා වෙලත් රධ්‍ය අයියා හිටියනෙ..

අර දාහක් දෙකා ඉස්කෝලෙ හෝල් බැල්කනි එකෙයි සම්පූර්ණ හෝල් එකෙයි පිරිලා ඉතිරිලා ඉද්දි මම හිමින් සැරේ සෙනුකයා එක්ක ගිහින් බැක්ස්ටේජ් එකේ රෙද්ද මෑත් කල්ලා සෙනඟ දිහා බැලුවා.. ඒ එක්කම රධ්‍ය අයියගෙ මැදි වයසෙ වර්ශන් එක බුම්මගෙන ස්ටේජ් එක දිහා කන්න වගේ බලාගෙන ඉන්නවා දැකලා මගේ නෙමෙ සෙනුකයගෙ කකුල් දෙක පණනැතිවෙලා අපිට උඩින් චමිරුවත් එබුණු පාර තුන්දෙනාම එතනම ඇදගෙන වැටුණා.. කර්ටන් එකත් කඩාගෙන වැටුණනම් මලෞත්තක් වෙන්නෙ..

" දහලන්නැතුව ඉඳපන්කො.."

" උඹලා මොනවද එබි එබි බලන්නෙ.."

" මහින්ද මහත්තයා ඇවිල්ලද කියලා.."

" ඌ එන්නෙ නෑ.. අනික චමිරු ඉස්සරහා මහින්ද ගැන කියන්නෙපා බං.. ඌ ආස නැනෙ.."

" මුගෙ සීයා අනිත් පැත්තෙ නිසාද.."

@Shan

" පාඩුවෙ ඉඳපන් සෙනුක.."

" ඇත්තනෙ කිව්වෙ.. හැබැයි මූ ජනාධිපතිතුමාවනම් දන්නවද මන්දා.. අඳුරගන්න බැරියෑ සිකුරාදට ඩයල් එක ඉස්කෝලෙ ඩිරෙක්ට බෝඩ් මීටින් තිබ්බම.."

" ආතල් නේ.."

" ..ළමයි!!!!!!! මුලින් තියන අයිටම් එකට ප'ෆෝම් කරන අය එන්න.. ඉක්මන් කරන්න.. තව පැයබාගෙකින් අයිටම එක තියනවා.."

ඒ එක්කම ඩ්‍රාමා මැඩම් ඇවිත් කන ගාවින් බෙරිහන් දුන්නා..

" දන්නම් ලැජ්ජයි පුතේ.. මම මැරෙනවා.."

" මේක ඉවරවෙලා කතාවත් කල්ලා මැරියං.."

සෙනුකයා මාවයි චමිරුවයි ඇදගෙන ඩ්‍රාමා මැඩම් ගාවට ගියා.. අපිට නටන්න මොකුත් තිබ්බෙ නෑ.. ඉණ ගස්ස ගස්ස නටන්න අපිට පුළුවනෑ.. අපි පොඩි ඇක්ට් එකකට හිටියෙ.. තව කට්ටියක් සින්දුව කියනවා.. එච්චරයි.. නටන්න ගියානම් රෙද්ද ගැලවිලා යාවි මගේ..

අන්තිමට පොඩි රිහසල් එකක් තියලා අපේ අයිටම එක පටන්ගත්තා.. මට තිබුණෙ මැද්දෙ හරියක්.. ඔය අර පහුගිය කාලෙ ට්‍රෙන්ඩ් වෙන්න සිංදුවක් 'රජිණට ඇන්දා' කියලා.. අපි ඒක මොඩිෆයි කල්ලා හදලා ගත්තා.. ඒ කියන්නෙ ඒකෙ ඉන්න සේරම චරිත වලට ඇදලා කොටස් කොටස් බෙදාගෙන කරන්නෙ.. සෙනුකයා පැත්තකින් ඉඳගෙන ඉන්න පොතේ ගුරා.. ඌ එක්ක තව සිංදු කියන්න පුළුවන් සෙට් එකක් තමා සිංදුව කියන්නෙ.. සෙනුකයා ගිහින් ස්ටේජ් එකේ පැත්තෙන් පේළි තුනකට හදලා තිබ්බ පුටුවල ඉස්සරහින් ඉඳගත්තා.. තව කොල්ලො වගයක් සරමුයි ගවුනුයි ඇඳගෙන ගැමියො වගේ වාඩිවෙලා ඉන්නවා.. මම අන්දරේට මුවා වෙලා හිටියා.. මගේ මූණ රතුවීගෙන එන්නෙ මේ වගේ මගුල් වෙලාවල් වලට තමා.. චමිරු මං දිහා බලලා හිනාවෙලා ආයෙම ඉස්සරහා බලාගත්තා..

" Next.. our brothers of the Prefect Council are ready to entertain you with a creative item.. Thank you.."

@Shan

මීඩියා එකේ මල්ලි හෙන මනමාල හිනාවක් දාගෙන රෙද්ද අස්සට වුණාම චමිරු උගේ පිටට එකක් තඩිබෑවා..

" මොකද උඹලා.."

" මොකුත් නෑ අයියෙ.. පිස්සුද.."

" ගහපන් ඕකුන්ට මමනම් කියන්නෙ.. ඒ ඇව්වා.. පාඩුවෙ ඉඳපන් හිනාවෙන්නැතුව.."

" දැන් ඔය කපල් එකක්ද..ඈ.."

" උඹට ඒකෙන් වැඩක් නෑනෙ.. පාඩුවෙ එනවුන්ස් කරගෙන හිටියොත් හොඳයි.."

මම ඒ මල්ලිට පයින් එකක් දුන්නා.. මෙම් පොඩි ඇව්වො ඉන්නවා දෙන්න හිතයි කොට වෙන්න.. පොඩි පගා.. ඒ එක්කම ස්ටේජ් එකේ කර්ටන් එක දෙපැත්තට ඇදුනා.. අපේ ජොනතන් රාජකුමාරයයි උගේ උදුම්බරා දේවිටයි තමා මුලින්ම සිංදුව කියන්න තිබ්බෙ.. ඊටපස්සෙ දික්තලාටයි කාලගෝලටයි.. ඊටපස්සෙ.. ඊටපස්සෙ එක වැඩක් නෑ.. රෙද්ද..

" රැජිණට ඇන්දා

රජකුමරිට ඇන්දා..//

ලෙංචිනාට දික්තලාට ඇන්දා..

අන්දරේගෙ පව්ලට ඇන්දා..

අන්දරේගෙ පව්ලට ඇන්දා.."

ජොනතනුයි උගෙ දේවියි එහාපැත්තෙන් අතුරුදහන් වුණාම දික්තලයි කාලගෝලයයි රණ්ඩුවෙවී ස්ටේජ් එක මැද්දට ආවා..

" ඇයි දෙයියනෙ..

මතන නැද්ද..

@Shan

නාඩගමට රීටරේට..

නැතුවම බැරි.."

දික්තලා කාලගෝලයව තල්ලු කරපු පාර ඌ ගිහින් පොළොවෙ බදාගත්තා.. දික්තලාට හිටපු එකා පපුවත් ගස්සගෙන ඉස්සරහට ඇවිත්..

"මං නන්දා.."

ඌ ස්ටේජ් එකෙන් ගියාම චමිරු මාව අතින් ඇදගෙන ස්ටේජ් එකට මැද්දට ගිහින් බංකුවකින් ඉඳගත්තා.. මම ඌ එක්ක අමනාප වෙලා වගේ උගේ අත ගසලා දාලා මෙහාට වුණා..

" කෙල්ල කාලේ..

මැරෙනවා මට..

කොල්ලො අනේ මන්දා~.."

මම වලලු ටිකත් ගස්සලා පොඩ්ඩක් ස්ටේජ් එක ඉස්සරහට ආවහම කෝට් බෑයක් දාගත්තු කොල්ලෙකුයි රැවුලක් දාගෙන උඩට නැතුව ඉන්න කොල්ලෙකුයි තව හෙන තොගේකුයි මගේ දෙපැත්තෙන් හිටගෙන මගේ අත් දෙකින් අල්ලගත්තා..

මාස්ටර්ල මුදලාලිලා..

මාස්ටර්ල මුදලාලිලා..

'ඔයාව දේවි උදුම්බරා කළේ මං'

'දෙනව බොට නන්දා'

' අනේ පල යන්න පෙන්දා'

මාව බේදාගන්න බැරුව දෙපැත්තට අදින කොල්ලො ටික මම ගසලා බසලා දුවගෙන ඇවිත් චමිරුගෙ උකුළින් ඉඳගෙන අත් දෙක උගෙ බෙල්ල වටේ ඔතාගත්තා.. චමිරුවත් මාව ඇදලා අරගෙන වාඩිකරවගෙන නිකටින් හිමිහිට ඇල්ලුවා..

@Shan

" ඒ මං හින්දා.."

චමිරුවා මාවත් උස්සගෙන කර්ටන් එක එහාපැත්තෙන් අතුරුදහන් වුණා.. මම උගේ අත් දෙකින් බිමට බැස්සා..

" නාඩගමට ටීටරේට

නැතුවම බැරි.."

" මං නන්දා අනේ~"

ඊටපස්සෙ ලෙංචිනාගෙ පොඩි ඇක්ට් එකක් තිබ්බෙ.. ආයෙම මටමයි සිංදුවෙ කෑල්ලක් කියන්න තිබ්බෙ.. ලෙංචිනා කර්ටන් එක අස්සට එද්දි මම අඬාගෙන ගිහින් ස්ටේජ් එක ඉස්සරහා බිම ඇදගෙන වැටුණා.. හරියටම අධිකාරියා හිටිය පහළ මගේ මූණ ඉස්සරහමයි..

" අප්පච්චිට..

අම්මලාට..

කෙරුවලු මං නින්දා.."

අප්පච්චිට එහාපැත්තෙ ඉඳපු ප්‍රසිඩන්ට්ට හිනාගියා මම අප්පච්චිටම අත දික් කල්ලා රඟපෑවහම.. එයා හිමින්සැරේ කටවහගත්තා..

"කරුමේ හින්දා"

" හැටපිරුණත් තාමත් මට

පරණ නැටුම් පුළුවන් තව.."

මම කඳුලු පිහාගෙන නැගිටලා වටයක් කැරකුණා..

" මොකදෝ මන්දා.."

එතකොට රඟපාන්න ඉඳපු සේරම ස්ටේජ් එකට දුවගෙන ආවහම චමිරුවා මාව ඇදලා පිටිපස්සට ගත්තා..

@Shan

" අත්පුඩියට..

විසිල් හඬට..

කන් පිරිච්ච හන්දා.."

" තාමත් තනිකඩව ඉන්නෙ දේවි උදුම්බරා.."

" මං නන්දා.."

" රැජිණට ඇන්දා

රජකුමරිට ඇන්දා..//"

" ලෙංචිනාට දික්තලාට ඇන්දා..

අන්දරේගෙ පවුලට ඇන්දා..

අන්දරේගෙ පවුලට ඇන්දා.."

ඒ ටික වෙලාවට තිබ්බ පොඩි නැටුමක් වගේ එකකින් පස්සෙ අයිටම් එක ඉවරවුණා.. එතකොටම කර්ටන් එක වැහුණා.. සෙනුකයා මයික් එක ඕෆ් කල්ලා පැත්තකින් තියලා කටත් අල්ලගෙන එහෙමම බැක්ස්ටේජ් එකට වැදුනහම.. අපේ අභිමානවත් සිස්ස නායක මණ්ඩලේ සභාවම හිනස්සලා අඩුම කුඩුම ටිකත් උස්සගෙන බැහැලා යන්න ගියා.. ඩ්‍රෙසින් රූම් එකට යද්දිත් සෙනුකයා හිටියෙ නෑ.. මම ඒ මහපගයව හොයාගෙන චේන්ජ් කරන රූම් එකකට එබුනහම ඒ පකයා බඩත් අල්ලගෙන දෙකට තුනට නැමිලා අඩ අඩ හිනාවෙනවා.. මම ගිහින් උගෙ පයින් එකක් ඇනලා රෙද්ද ගලවලා කරේ දාගත්තා.. සැක්..

" අම්-අම්මොහ්- දෙයියනේ සනෙරු-අප්-අප්පච්චිගෙ මූණ-අනේ බං-මට හුම්ම.. හුම්ම.."

" ඕක නවත්තපන්..!!!!"

" මං නන්දා අනේ.. අම්මොහ්-"

" බේසික ඇටිකිච්චා.. මට ඇඳගන්න දීපන්.. රෙද්ද.."

@Shan

සෙනුකයත් උගේ ඇඳුම් ටික උස්සන් ඇවිත් මං ඉඳපු රූම් එක ඇතුළට වැදිලා සරම ගලවලා කරේ දාගත්තා.. මම පුටුවකින් වාඩිවෙලා බොරු කොණ්ඩෙයි මලුයි වළලුයි අරවා මේවා ටික ගලවලා බෑග් එකක් අස්සට එබුවා.. දැන් මේක ගිහින් ආශිට දෙන්න එපැයි.. හොඳවෙලාවට ඒකි ගාව එක එක විච්චූරන එකතුකරන් ඉන්නෙ ඒ කාලෙ නැටුම් කරපු නිසා..

" ආතල් නේ.. අම්මෝ බං.. මම හිතුවෙ මට වචන පැටලේවි කියලා.. අප්පොච්චගෙ මූණ.."

" කෝමතේ අත දික් කල්ලා දුන්නනම් නන්දා උඩ යන්න.. මෙන්න මේ හැට්ටෙ ගලවපන් බං.. පපුවත් හිරවෙන්න එනවා.."

" හැරියන්.."

සෙනුකයා මෙලෝ ලැජ්ජාවක් නැති එකා කලිසම බාගයක් උස්සගෙන මගේ ඇඳුම් ටිකත් ගලවලා දාන්න උදව් කල්ලා සුදු කලිසමයි ශර්ට් එකයි දාගෙන ටයි එක ගැටගහගත්තා.. මම මේකප් රිමූ කරන ලික්විඩ් එකෙන් බාගයක් කොටන් පෑඩ් එකකට ගලාගෙන මූණෙ අතුල්ලගත්තා..

" මම මූණ හෝදගෙන එන්නම් බං.."

" ඉක්මනට වරෙන්.. කතාව පුරුදු වෙන්නත් තියනවා.."

" හා.."

මම රූම් එකෙන් එළියට ඇවිත් වොශ්‍රූම් එකෙන් මූණ සෝදගෙන පිහිදාගෙන ආයෙම චේන්ජින් රූම් එකට යද්දි සෙනුකයා මගේ ඇඳුනුත් නවලා බෑග් එකට දාලා ගිහිල්ලා.. මම දොර හගෙන අත් දිග ශර්ට් එක ඇඳලා සපත්තු දෙකත් දාලා ස්කූල් ටයි එකත් බෙල්ලෙ දාගෙන එළියට ආවා.. මම එනකොට හැමතැනම සිස්ස නායකයෝ රෙදි ගලවන් ඒවා අඳිනවා..කයිය ගහනවා.. ඒ අස්සෙ ජොනතන් එකෙක්ගෙ පපුව කොච්චර ලොකුද බලනවා.. ඇයි ගෑණුන්ට ඇන්ද උන් හිටියනෙ.. නෙද්දකින් වලත්තයා..

" මම යනවා බං..

" හරේ.. ගුඩ් ලක්.."

@Shan

මම මෙන්හෝල් එකේ පිටිපස්සෙන් ඇවිත් ටීචර්ස්ලා ඉන්න තැන රධ්‍ය අයියව හෙව්වා.. මෙ මිනිහා කොයි ලෝකෙ ඉන්නවද හොයාගන්න බෑනෙ.. එක්කො මට හොයාගන්න පුළුවන් තැනක ඉන්න ඕන. මම මෙන් හෝල් එකේ එළියෙ බැල්කනියට වෙලා කවුරුත් නැති නිසා මගේ කතාව පුරුදුවුණා.. බැල්කනියට එන දොර ඇතුළෙන් වහලා නිසා මෙ හරියට මොකෙක්වත් එන්නෙ නෑ.. අනික ඉස්කෝලෙම පේනවා බැල්කනි එකට..

අප්පච්චියා මොනවා හිතුවද දන්නෑ.. හෙන රිලේටඩ් ලයින්ස් වගයක්නෙ තිබ්බෙත්.. අප්පච්චිට මම නින්දා කරන්නෑ දෙයියනේ..නින්දා කල්ලා කොහොමද පුතාව එක්කගෙන යන්නෙ.. එක්කො පුතාව එක්කගෙන යන එකම නින්දාවක්ද දන්නෙ නෑ..

මම බැල්කනි වැටට හේත්තු වෙලා බුදුමැදුර දිහා බලාගෙන හිටියා.. මෙතනට සේපාලිකා ගහ ගාව වෙන සේරම පේනවනෙ යකෝ.. සැක් මම මල් කඩන්න එනවත් රධ්‍ය අයියා බලන් ඉන්නව ඇති.. තනියම කියවන ඒවත් ඇක්කද දන්නෙ නෑ.. කමක් නෑ.. ඔන්න ඔහේ හිතාගත්තුදෙන්..

ටික වෙලාවකින් රධියා අයියගෙ හෙවනැල්ල මගේ වටේ කැරකෙනවා වගේ මට දැනුණා.. මම හැරිලා බලද්දි රධ්‍ය අයියා ඉන්නවා උසට උසේ හෙනකඳයා වගේ මගේ කොලේට එබීගෙන.. මම හැරිලා බැල්කනි වැටෙන් ඉඳගත්තා..

" ආ සුදුඅම්මියා.. කොහොමද.."

" වරදක් නෑ.."

" වරදක් නැත්තෙ කොහෙද අනේ වරද් මෙ ඉන්නෙ ඔයාගෙ ඉස්සරහා.."

" වරද් නෙමේ.. දැන් නන්දනෙ.."

රධ්‍ය අයියා හෙන නෝන්ඩි හිනාවක් දාලා මගේ අතින් අලගත්තා..

" ඔක උඩ නටලා වැටෙන්නද හදන්නෙ.. බැහැපන්.."

" බෑ මම ඉන්නෙ නැග ගමන්මයි.. දන්නැද්ද.. මෙ අහන්නකො ඔයාලගෙ අප්පච්චි හරියටම මගේ මූණ ඉස්සරහමයි හිටියෙ ඒයි.. මම හිතුවෙ ගහයි කියලා.. ප්‍රසිඩන්ට් නම හිනාවුණා පොඩ්ඩක්.."

@Shan

" හිනායන්නැතුව තියේද උඹ ගස්සන ගැස්සිල්ලට.. මම හිතුවෙ රෙද්දත් කඩන් වැටෙයි කියලා.. ඒව වරද්.. මම වීඩියෝ කල්ලා අම්මට යැව්වා.."

මම රධ්‍ය අයියගෙ බඩට එකක් ඇන්නා..

" සැක් අයියෙ.. මොන මගුලක්ද අම්මට යැව්වෙ.."

" අම්මලා දෙන්නම යැව්වා.. සොරි වැරදුණා.."

" මාමටත් යැව්වද.."

" ඔව්.. අයියටත් යැව්වා.."

මම බැල්කනියෙන් පහළ බැලුවා.. මෙතනින් වැටුණොත් මැරෙන එකක් නෑ අණ්ඩක් කැඩෙව්.. ගෙදර ගිහින් මාමගෙ කාමරේ බෙල්ල වැල දාගන්නවා.. මැළු කාමරේ කොහොමත් කොළුකාර හොල්මනක් ඉන්නවනෙ..

" මාව කාපන්.. පොල් කැඳැත්තා.. ඉඳපන් තව්සෙ නානකොට මම වීඩියෝ කරනවා.."

" කල්ලා..??"

මම පොඩ්ඩක් කල්පනා කලා.. ඒක සමාජ මාධ්‍යවල බෙදලා හරියන්නැනෙ..

" මගේ ප්‍රයෝජනය සඳහා තියාගන්නවා.."

රධ්‍ය අයියා මට දෙකක් රැව්වා.. හොඳ අදහසක් මොකක් වුණත්.. ඒත් පොඩි කැමරාවක් කොහෙන්ද හොයාගන්නෙ.. මගේ ෆෝන් එක තියන්න බෑනෙ..

" උබටනම් ලැජ්ජාවක් නෑ වරද්.."

" මෙ ටයි එක ගැටගහනවකො.."

රධ්‍ය අයියා මට රවාගෙනම මගේ ටයි එක හරියට ගැටගහලා බ්ලෙසර් එකත් හරියට හරිගැස්සුවා.. ආදරේ හිතෙනවා ඉතින්.. මගෙ අධිකාරි පුතානෙ..

@Shan

" තව ටිකකින් ඔයාගෙ ස්පීච් එක තියෙනවා නේද.."

" ඔව් මම දැන් යන්න ඕන.."

" ම්ම්.."

" ඔයා එන්නෙ නැද්ද.."

" මම ටිකකින් එන්නම්.. කෝල් එකක් ගන්න තියනවා.."

" හා.. මම යන්නම් හොඳේ.."

මම කොලේ රෝල් කල්ලා සාක්කුවෙ අස්සෙ ගහගෙන දුවන්නත් හදල ආයෙම අඩිය කරකලා රධ්‍ය අයියගෙ පත්ත හැරුණා..

" එන්නකො වැඩක් කියන්න.."

රධ්‍ය අයියා මගේ දිහාවට පහත් වුණා..

මම ඉක්මනට කවුරුත් එන්න කලින් රධ්‍ය අයියගෙ කම්මුලකින් හාද්දක් තිබ්බා.. තියලා පඩිපෙළ බැහැගෙන පහලට දුවද්දි රධ්‍ය අයියා ඇස් දෙකත් ලොකු කරගෙන මගේ දිහා බලාගෙන ඉඳලා හරි සිහියට ඇවිත් වෙන පැත්තක් බලාගත්තා.. රධ්‍ය අයියගෙ කම්මුල්, ඇස් වලට යටින් රතු වුණාම කියුට්.. හැමතිස්සෙම වෙන්නැනෙ..

Varadh :



Radhya :





නරක සමනලයා දළඹු රාජධානිය කරා අවේලාවේ පියාඹලා ආවා..

@Shan

'රජිනට ඇන්දා' අහලා නැත්නම් අහලා බලන්න.. හරිම ලස්සන සිංදුවක්.. මම ආදරෙන් කරන ඉල්ලීමක්..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 138 කොටස

" ඔයාට කියන්න ඒයි.. අප්පච්චි හිටියෙ මෙන්න මෙතන.. මම හිටියෙ මෙතන.. එකසැරේ අප්පච්චි මට අතට අත දුන්නනෙ.. මම හිතුවෙ මම මැරිලා වැටෙයි කියලා.."

" ඉතින්.."

" ප්‍රින්සිපල් සර් ඔෆිස් එකේ ලන්ච් එකේදි එතන ඉඳපු අයට අපිව ඉන්ට්‍රොඩියුස් කලානෙ.. එතකොට ප්‍රසිඩන්ට් ළඟම තමා අප්පච්චිත් හිටියෙ.."

" ආ.."

" ඉතින් ප්‍රසිඩන්ට් මගේ උරහිසට තට්ටුවක් දැම්මා 'වට් අ ටැලන්ටඩ් බෝයි' කියලා.. අප්පච්චි ඒකට හිනාවුණා ලාවට.."

රධ්‍ය අයියා කොට්ටෙ අත් දෙකින්ම බදාගෙන මගෙ මූණට එබුණා.. අපි දෙන්නා මෙ මගේ කාමරේ තඩි පවයක් හලන ගමන් හිටියෙ.. රධ්‍ය අයියා බිත්තිය පැත්තෙ.. මම එයාගෙ කකුල් දෙක මැද්දෙ..

" හිනාවුණා..?? හොඳටම ශුවර්ද.."

" නැත්නම් අනේ.. මම මූණ පිරේ~න්නම අප්පච්චි එක්ක හිනාවුණා.. අපරාදෙ ඒ ගමන්ම අහන්නයි තිබ්බෙ අප්පච්චියෝ පොඩි අධිකාරි පුතා මට කරකාර බැඳගන්න බැරිවෙයිද කියලා.."

" පොඩි එක්කෙනා කොහෙද.. දෙන්නමනෙ.. ඇයි අපි එකගෙයි කන්නෙ නැද්ද.."

" අන්න ඔව්.. මෙ තවසෙ එකගෙයි කන ඒවා කියන්නෙපා හරිද.. අපේ මාමට ඇහුණොත් මගේ ඇටකටු ටික කුඩු කල්ලා දාවි.. එහෙම වුණොත් ඔයාට තරු බලන්න කෙනෙක් නැතිවෙනවා.."

රධ්‍ය අයියා ඇස් දෙක කරකලා බිත්තියට හේත්තු වුණා.. මම රධ්‍ය අයියගෙ පපුව උඩින් නිකට තියාගෙන එයාගෙ මූණ දිහා බලාගෙන හිටියා.. රධ්‍ය

@Shan

අයියා නාකි වුණොත් මහ අධිකාරි මහත්තයා වගේම ඉදී.. එක වගේමනෙ.. අත හෝදන්න හිතෙන්නෙත් නෑ.. ශෝන් මෙන්ඩිස් අතට අත දුන්නා වගේ දැනෙන්නෙ.. ඒ වුණාට මම කාලා අත හේදුවා.. සොරි අප්පච්චි..

" සුදුහාමිනේ මගේ.. හදක් වගේ පායලා~.."

" පාඩුවෙ ඉන්න අනූ.. පේශන් කෙනෙක් දැන් කෝල් කරනවා කිව්වා.."

" ඉතින් කෝල් කළේ නෑනෙ.."

" මට මේක චෙක් කරන්න දෙන්නකො.."

" ඔය අටමගල පැත්තකින් තියනවකො.."

ඒ අස්සෙ අපේ මාමා සාලෙ ඉඳන් ආධ්‍ය අයියා එක්ක මැච් එක බලනවා..

" විනාඩියක් ඉන්න.."

" ඒහ් සාකි මුන්.. මේක ක්‍රිකට් මැච් එකක් කියලා හොඳටම ගුවර්ද.."

" අනේ මන්දා.."

" බෝලෙ තියාගෙන ඒකෙ උඩින් ඉඳගන්න කිව්වනම් හරි.. අන්න ඒකට අපි පොඩි කාලෙ මැච්.."

" ඔච්චර අමාරුවනම් ගිහින් ගහලා එනවකො.."

" කාට..??"

ඒ එක්කම රිමෝට් එක අහසින් ගිහින් බිමට වැටෙන සද්දයක් මට ඇහුණා..

" මගෙන් මුකුත් අහගන්නෙ නැතුව කකුල අතගානවා!!!"

" පුදුම වැඩක් උනානෙ මේක.. ආ මගෙත් අතගාපන්.. අපිත් තියටර් වල ඉඳලා තමා එන්නෙ.."

" දත් දොස්තරලට වඩා මට වැඩ තියේ.."

@Shan

" මම දැන් දත් දොස්තර.. උඹ මොන දොස්තරද.."

" හිත හොඳ දොස්තර.."

ආධ්‍ය අයියා කිචිබිචි ගාලා හිනාවෙන සද්දයක් ඇහුණා.. රධ්‍ය අයියා මාවත් අත් දෙක අස්සෙ ගහගෙන ඇඳෙන් හාන්සි වුණා.. ඒකට නිදිමත හැදිලද කොහෙද.. මමත් හොඳට රධ්‍ය අයියගෙ අත් දෙක අස්සට ගුලිගැහිලා හිටියා.. මාමලා සාලෙ ඉඳන් කතාකරනවා මට ඇහෙනවා..

" දැන් අරකට අපි මොකක්ද කරන්නෙ අනූ.."

" මම ඒක කරන්නම්කො.. ඒක ගැන කරදර වෙන්න ඕන නෑ.."

" ඒ වුණාට.. ඔයාට වදේ නේ මම.. ඇත්තම කියන්නකො.. ඔව් නේද.."

*ආව්*

" කුණුහර්ප අහගන්නැතුව චැනල් එක මාරුකරපිය.. ඔව් ඔව් උඹගෙන් පුදුම වදයක් තමා තියෙන්නෙ.. කියලා නිමකරන්න බෑ.. මම මේ මහමෙර දරාගෙනනෙ ඉන්නෙ.."

" මොකද ඔය කතාකරන විදිය..!!"

" එහෙම තමා අනුරාග් කතාකරන්නෙ.."

" කවදහරි ළමයෙක්වත් හරියට හදාගන්න බැරිවෙන්නෙ ඔය කට නිසා තමා.. මෙකෙ චැනල් මාරුවෙන්නැනෙ අනූ.."

" රිමෝට් එක අරගෙන චැනල් එකක් මාරුකරගන්න බෑ.. ඒ වුණාට ළමයි හදාගන්න කතාව.. කෝ මෙකෙ බැටරි දෙක.."

" මම කොහොමද දන්නෙ.."

" අර බලපන්.. ඒක පුටුව යට.. අම්මපා උඹ ආයෙම මොනව හරි විසි කල්ලා ගැහුවොත් මම උඹව උස්සලා පහළට විසික් කරනවා.."

" මම බයයි.. ශ්.. මෙ කෑගහන්නෙපා.. පේශන් කෝල් කරනවා.."

@Shan

මම ඇස් දෙක පියාගත්තා.. අර මේකප් උලාගෙන ඉඳලා ඇස් දෙකත් දනවා හොඳටම.. ටිකකින් මාමා අපේ කාමරේ දොර ඇරගෙන ඇතුළට ආවහම මම මාමා එන්න කලින් ඇඳ රෙද්ද අරගෙන ඔලුවෙ ඉඳන් වහගත්තා.. මේ මනුස්සයා ගොරව ගොරව නිදිනෙ..

" රෑට කන්නෙ නැතුව නිදිද.. සුදුමහත්තයා.. කොල්ලො.."

" කෑම හදලා කතාකරමු අනූ.. එයාලට මහන්සි ඇති අද.."

" මොනවද උයන්නෙ.."

" මම හදන්නම්.."

ආධ්‍යා අයියගෙ රෝසමල් සුවඳ මගේ මූණගාවින්ම දැනුනා..ටිකකින් මගේ මූණෙ තිබ්බ රෙද්ද පහළට කල්ලා හදලා රධ්‍යා අයියටත් පොරවලා මගේ කොණ්ඩෙත් මූණෙන් එහාට කල්ලා, ආධ්‍යා අයියා කාමරේ වහගෙන මාමත් එක්ක එළියට ගියා.. මටත් එහෙමම හොඳටම නින්ද ගියා..

ඇත්තටම ඒ දෙන්නා සතුටින් ජීවත් වෙනවා දකිනකොට මගේ හිත ඉබේටම පිරිලා යනවා.. එයාලගෙ ජීවිත වා හුඟාක් ප්‍රශ්න තියනවා කියලා මම දන්නවා.. විශේශෙන්ම ආධ්‍යා අයා්‍ා එයාගෙ ජොබ් එකයි අසනීපයි එක්ක හැමදේම හැන්ඩ් කරන්න අමාරුවෙන්.. අපේ මාමත් එහෙමයි.. ඒත් අපේ මාමගෙ තියරියට අනුව හෙන ගැහුවත් ඉන්න ඉන්න විනාඩියේ සතුටින් ඉන්න ඕන.. දැන් ඒක ආධ්‍යා අයියටත් බෝ වෙආද මන්දා.. එයාලා ඉඩ ලැබෙන හැම තිස්සෙම හුඟක් සතුටින් ඉන්නවා.. මම ඇත්තටම කලින් හිතාගෙන හිටියෙ අපේ මාමා වැඩිය රිලේශන්ශිප් ගැන කියවන්නෙ නැත්තෙ එයාට ඒවා එපාවෙලා නිසා කියලා.. ඒත් දැන් ආධ්‍යා අයියා එක්ක ඉන්න විදිය දැක්කම මට අපේ මාමගෙ ඒ සයිඩ් එක ගැන අයිඩියා එකක් ගන්න පුළුවන්.. ඇත්තටම අපේ මාමා ආධ්‍යා අයියට හොඳ හස්බන්ඩ් කෙනෙක් වේවි.. ආධ්‍යා අයියත් එහෙමම තමා.. එයත් හොඳට වගකීමක් අරගෙන කල්පනාව ඇතුව තමා හැමවැඩේම කරන්නෙ.. කොහෙද අප්පච්චිට තේරෙන්නෙ නැනෙ එයා ආදරේ කරන්න දන්නැති වුණාට අනිත් මනුස්සයොන්ට ආදරේ ඕන කියලා.. මට හිතෙනවා කවදාහරි අප්පච්චි පසුතැවේවි.. මොකකින් හරි.. ඔය වගේ හැසිරීම් රටා තියන මනුස්සයෝ පසුතැවෙනවා මම ඕන තරම් දැකලා තියෙනවා..

@Shan

රධ්‍ය අයියා මේ දවස්වල ඉන්නෙ මොකක් හරි හිතන ගමන් කියලා මට දැනෙනවා.. ඒ මනුස්සයා හැරෙන විදියෙන් මොකක් හරි හොර වැඩක් කරන්න යනවා කියලා මට ඉවෙන් වගේ දැනෙනවා.. ඒ වුණාට දන්නෙ නෑ වගේ ඉන්න එක කෝකටත් හොඳයි.. එයා හිතන්නෙ මට ගාණක් නෑ කියලා හරි මොකක් හරි.. මම අදහස් කරන්නෙ ආදරේ අඩුකමක් නෙමේ.. එහෙම එකක් මට කවමදාවත් එයා දැනෙන්න ඇරලා නෑ.. මගේ හිත ඒක හොඳටම දන්නවා.. ඒත් මට බොරුකියන්න බැරි නිසා මේ දවස්වල සිහිකල්පනාව අඩුවෙන් අමුතුවට හැසිරෙනවා.. වෙලාවකට කල්පනා කරනවා.. ඒ මනුස්සයට කල්පනා කරන්නත් මම ළඟ ඉන්න ඕන.. අර බ්ලැන්කට් එකක් ඇඟ වටේ ඔතාගෙන ඒකෙන් අපි උණුහුමක් බලාපොරොත්තු වෙනවා වගේ රධ්‍ය අයියත් ඒ උනුහුම මගෙන් බලාපොරොත්තු වෙනවා.. හැමතිස්සෙම.. මම කැමතියි එයාට බ්ලැන්කට් එකක් වෙන්න..

අපි ජීවත්වෙන ටික කාලෙ මමනම් කියන්නෙ හිත් අමනාපකම් තියාගන්න හොඳ නෑ.. හැබැයි අවස්ථාව අනුව වෙනස් වෙනවා.. කොහොමත් මගේ හිතේ මනුස්සයෙක් ගැන දීර්ඝකාලීන තරහක් රැඳෙන්නෙ නෑ.. කොටින්ම අද හෙට මතීශ මුණට හම්බෙලා කතාකළත් මම බොක්කෙන්ම කතාකරනවා.. ඉස්සර පරණ මගුල් හිතේ ගොඩගහන් ඉන්න ඕන නැනෙ.. ඒවා විසික් කල්ලා දැම්මමහම හිතට නිදහස්.. මං ගැන මිනිස්සු මොනවා හිතුවත් මට කමක් නෑ.. මම ජීවිතේට හම්බෙන එක එක මිනිස්සුන්ගෙන් මොකක් හරි යමක් ඉගනගන්න බලාපොරොත්තු වෙනවා..

අප්පච්චි වුණත් එහෙමයි.. මට අප්පච්චි ගැන බයක් හිතේ තිබ්බට.. එයාගෙ සමහර වැඩ ගැන කලකිරීමක් ඇතිවුණාට.. ඒ මනුස්සයා රට වෙනුවෙන් කැපකිරීමක් කළ මනුස්සයෙක්නෙ.. මොකක් හරි හේතුවක් නිසා දරදඬු වෙලා තියෙනවා ඇරෙන්න අප්පච්චිගෙත් හොඳ පැත්තක් ඇති.. මම එහෙම හිතනවා.. මම හරිද දන්නෙ නෑ..

කෝච් හැමතිස්සෙම මට කියනවා 'හැමතිස්සෙම වඩා දක්ශ ප්‍රතිවාදියෙක් බලාපොරොත්තු වෙන්න' කියලා.. මම ඔක මුල් කාලෙ හිතුවෙ නෑ එච්චර.. මට මෙ ලේසියෙන් දිනන්න තියන එකට මොකටද හෙන අමාරුවෙන් හුඟක් දක්ශ කෙනෙක් එක්ක ප්ලේ කරන්නෙ කියලා.. දවසක් කෝච් මට රැකට් එකෙන් පිට මැද්දට දීලා කිව්වා කෝච් කියන ඒවා ජීවිතේටත් එකතුකරගන්න කියලා.. මටනම් හුඟක් වෙලාවට වඩා දක්ශ ප්‍රතිවාදියෙක් හම්බෙනවා.. ජීවිතේදිත්.. හැමතැනම..

@Shan

මම පොඩි නින්දක් දාලා ආයෙම ඇහැරෙද්දි රෑ අටහමාර විතර වෙලා.. කුස්සියේ උයන සද්දෙ කාමරේට ඇහෙනවා.. රධ්‍ය අයියා ඇඳේ හිටියෙත් නෑ.. මම බෙල්ල කරකලා පුටුව දිහා බැලුවම රධ්‍ය අයියා පුටුව උඩ වාඩිවෙලා මොනවද ලියනවා.. මම ඇඳරෙද්දත් ඇහේ පටලගෙන ගිහින් රධ්‍ය අයියගෙ කකුලක් උඩින් වාඩිවුණා.. රධ්‍ය අයියා මාව උස්සලා හරියට ඉන්දුවගත්තා..

" අවදි වුණාද.."

රධ්‍ය අයියා ලිය ලිය හිටිය පොත වහලා ඒක අතකට යට කරගත්තා..

" ඔයා මොකද කළේ.."

" ප්‍රිෆෙක්ට්ස් ඩයරි එක බැලුවා.. ඔයා හොඳට කරගෙන යනවනෙ.."

" එහෙම තමා.."

රධ්‍ය අයියා මගේ කම්මුලකට කම්මුලක් හේත්තු කරගත්තා..

" ඔයාගෙ ටුවර් එක ළඟම එනවා නේද.."

" ම්ම්.. මම කලින් ප්ලේ කල්ලත් නෑ ඒයි ඔහොම ඒවගෙ.."

මම රධ්‍ය අයියගෙ ශර්ට් එකේ වාටියෙ නූලක් ඇදලා අරගෙන ඇඟිල්ලක ඔතාගත්තා..

" සමහරවිට මෙ ටුවර් එකෙන් පස්සෙ ඔයාට බැඩ්මින්ටන් කවුන්සිල් එකෙන් ලෙටර් එකක් ඒවිද දන්නෙ නෑ.."

මා ඇස් දෙකත් ලොකු කරගෙන රධ්‍ය අයියා දිහා හැරිලා බැලුවහම රධ්‍ය අයියා හිනාවුණා..

" අනේ මෙ.. විහිළු කරන්නෙපා.."

" ඇයි..??"

" එක ටුවර් එකකින් එහෙම වෙන්නෙ නෑනෙ.."

@Shan

" කියන්න බෑ.. Miracles can happen.."

" අපේ රිසාල්ට්ස් එන්න තව සති දෙකයි.. මට පිස්සු වගේ ඒයි.. ටුවර් එක අස්සෙ රිසාට්ස් ඇවිල්ලා.. මොන මගුලක් වෙයිද දන්නෙ නෑ.."

මම රධ්‍ය අයියගෙ පපුවට හේත්තු වුණාම එයා මගේ ඇඟ වටේ බූවළු අඩු ටික ඔතාගත්තා..

" It's funny to even think about such a thing.. ඔයා ඔයාව අඳුරගෙන නෑ තාම.."

" ඇයි..??"

" මම කියන්නෙ නෑ ඇයි කියලා.. ඔයාම හිතලා බලන්න.. හැමදේම තේරුම් ගත්තත් වැඩක් නෑ ඔයා ඔයාව අඳුරගන්නෙ නැතුව.."

" ම්ම්.. හායි මම වරද් ෂනෙරු උද්යෝග.. මාව අඳුරගන්න.."

මම මගේ ඉස්සරහා තිබ්බ කණ්ණාඩියට අත වනලා මාව අඳුනගත්තම රධ්‍ය අයියා හිනාවුණා..

" ඒක කිව්වෙ වයින් කරපු බෝනික්කෙක් වගේ.. අනේ මන්දා.. පරිස්සමට ඉඳහන්.. උඹව දැක්කහම මට ලෝබ හිතෙනවා.."

" ඔච්චර බෝනික්කි ලයින් තියනවනම් මට ඩෝල් හවුස් එකක් හදලා දෙනවකො.."

" දෙන්නම්.."

" සිරාවටද කියන්නෙ.. ලොකු බැල්කනි එකක් තියන එකක් හදන්න හරිද.."

" ම්ම්.."

" අප්පච්චි මොනවහරි කිව්වද.."

මම කණ්ණාඩිය රධ්‍ය අයියගෙ මූණ පේන විදියට හදාගෙන කණ්ණාඩියෙන් එයා දිහා බලාගෙන කතාකළාම එයත් කණ්ණාඩියෙන්

@Shan

ජේන මගේ දිහා බැලුවා.. ටේබල් ලැම්ප් එකෙන් එන ලා සුදුපාට එළිය කණ්ණාඩියට වැටිලා ඒක දිස්න දෙනවා..

" හැමදාම කියන ටික තමයි.. මම කේඩියූ එකෙන් අස් වුණ එක මතක් වෙන වෙන සැරේට බනිනවා.. කෑගහනවා.. ඔයා දන්නවනෙ.."

" ඉක්මනට හැමදේම විසදෙයි කියලා වගේ එකක් ඔයාට හිතෙනවද.."

රධ්‍ය අයියා ටිකක් වෙලා කල්පනා කළා..

" දැන් තත්වෙ හැටියට කොහොමවත් නෑ.."

" අපි මොකද කරන්නෙ.."

" අපි මොකක් හරි කරන්න ඕන.."

මට ලාවට හිනාගියාම රධ්‍ය අයියා මගේ උරහිස උඩින් මූණ තියාගෙන මගේ මූණට එබුණා..

" ඇත්තටම අපි මොකද වරද් කරන්නෙ.."

" ඔයා ඉක්මන් වෙන්නෙ නැනෙ.."

" That's the point.. I need to be quick.."

" As soon as possible.. because we cannot stop getting old.."

" දැන් ඔයා දන්නවද මම මොකක් ගැනද කතාකරන්නෙ කියලා.."

රධ්‍ය අයියා මගේ බඩ උඩ තිබ්බ අත් දෙකින් අල්ලගෙන ඇඟිලි පටලවගත්තා..

" නෑ.."

" එහෙනම් උත්තර දෙන්නෙ.."

" උත්තරදෙන්න ප්‍රශ්නෙ දැනන් ඉන්න ඕනද.. අමුතු නීතියක්නෙ.. මීටකලිනුත් මම උත්තර දුන්නෙ ප්‍රශ්නෙ අහලද.. ඔයා ඒක මට කියන්නෙ

@Shan

නෑනෙ.."

රධ්‍ය අයියා කණ්ණාඩියෙන් මගේ දිහා බලාගෙන ඉද්දි මගේ කම්මුල් ලාවට රතුපාට වුණා..

" ඔච්චර ප'ෆෙක්ට් වෙන්න එපා වරද්.. මට ඇත්තටම බය හිතෙන්නෙ උඹගෙ සමහර ගති දැකලා.."

" ප'ෆෙක්ට් දේවල් ලෝකෙ පවතින්නෙ නැති වගේ මොකක් හරි ඔයාගෙ ඔලුවෙ කැරකෙනවා නේද.."

" Of course.."

" මම ප'ෆෙක්ට් නෑ.. ඒකනිසා බයවෙන්න එපා.. මම ලෝකෙ පවතිනවා.."

මම රධ්‍ය අයියගෙ අතක් අරගෙන මේසෙ උඩින් තියලා පෑනකින් බලිකුරුට්ටක් ඇන්දා..

" Anyway.. උඹ ප'ෆෙක්ට් වුණත් නැතත් මම ආදරෙයි.. එච්චරයි.. That's the only thing I know.. There is no argument about it.. No matter what anyone says, I don't give a damn shit.. Just fuckoff.."

" අන්න හරි fuck it all man.. The key to a good life is not giving a fuck about more; it's giving a fuck about less, giving a fuck about only what is true and immediate and important.."

" Fuck it up.. fighting.."

" Fighting.."

රධ්‍ය අයියා මට ෆිස්ට් බම්ප් එකක් දුන්නා.. ඒ එක්කම අපේ මාමා දොර ඇරගෙන කාමරේ ඇතුළට ආවහම මම රධ්‍ය අයියගෙ කකුල් දෙකෙන් ලිස්සලා එහාට වැටුණු පාර රධ්‍ය අයියා මාව දෝත බඳලම අල්ලගත්තා..

" මොන මගුලක්ද මාමෙ..!!"

" ඇයි උඹලා නිදි නැද්ද.."

@Shan

මාමා කාමරේ ලයිට් එක දැම්මා..

" අපි කතාකර කර හිටියෙ.."

මම හිමිහිට රධ්‍ය අයියගෙ අත අතාරවගෙන ගිහින් හොඳළමයා වගේ ඇඳෙන් ඉඳගත්තා.. මාමා ඇස් දෙකත් හීනි කල්ලා මං දිහා බලලා රධ්‍ය අයියා දිහා බලලා ආයෙම මං දිහා බැලුවා..

" උඹට මූ කරදරයක්වත් කළාද.."

අපේ මාමා ඒක ඇහුවෙ මගෙන් නෙමෙ රධ්‍ය අයියගෙන්.. රධ්‍ය අයියා එකසැරේම ගල් ගැහුණා..

" න්-නෑ මාමෙ.."

" ඒකමිසක්.. වරෙන් කන්න.."

මාමා මට දෙකක් රවලා කාමරෙන් එළියට ගියාම රධ්‍ය අයියා මට නෝන්ඩියට හිනාවුණා.. දෙන්න හිතයි..

" මොකද නිකම.. අමුතුවට හිනාවෙන්නෙ.."

" කව්ද මම..?? පිස්සුද.. එන්න කන්න.."

" ආ දැන් මට පිස්සු.."

" අනේ මේ නන්දා!!"

මම ළඟ තියන පොතක් විසිකල්ලා රධ්‍ය අයියගෙ මූණ මැද්දට ගැහුවම ඒකා පොත ගානට අල්ලගත්තා..

" ආධ්‍ය අයි-"

" පොඩි චූටිට ඉන්න දෙනවා!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!!"

මම රධ්‍ය අයියට දෙකක් ගස්සගෙන කාමරෙන් එන්න ආවා.. මේ සතියෙම ගස්ස ගස්ස ඉහින් දැන් ඉබේම ගැස්සෙනව කොහෙද.. මේක හරියන්නෑ බැක් ටු වරද් වෙන්න ඕන.. සැක්.. මම හරි කෙලින් කුස්සියට ඇවිදගෙන

@Shan

ගිහින් කෑම මේසෙන් ඉඳගත්තා.. ආධ්‍ය අයියා පරිප්පු හදලා කියලා මට සුවඳින් තේරෙනවා..

" පොඩී..!! එන්නෙ නැද්ද.."

" ඔව් අයියෙ.. එන්නැතුව සිංදු අහනවා.."

" පොඩී!!"

" මම වොශ්‍රූම් එකේ අනේ.. පොඩ්ඩක් ඉන්න.."

රධ්‍ය අයියා වොශ්‍රූම් එකේ ඉඳලා බෙරිහන් දුන්නා.. අපරාදෙ මම කිව්ව බොරුව..

" වරදිනී කියලා ඈත අතීතෙ නටපු කෙල්ලෙක් ගැන දන්නවද සාකි ඔයා.."

අපේ මාමා සින්ක් එක ගාව ඉඳගෙන හෙන අමුතු ලයින් එකක් දුන්නම ආධ්‍ය අයියා කට තද කරගෙන මගේ දිහා බලලා වෙන පැත්තක් බලාගත්තා.. එතකොටම මදි පාඩුවත් ඇවිත් මගේ එහාපැත්තෙන් ඉඳගෙන කකුල් දෙකත් පද්ද පද්ද අපේ මාමා එක්ක හිනාවුණා..

" වරදිනී ලස්සනට නටනවා.. අයියා දන්නැනෙ.."

" පාඩුවෙ ඉන්න පොඩී.."

" ඇත්ත කොල්ලො.. වරදිනී ලස්සනට නටනවා තමා.. ඒ කාලෙ නටන්න ඕන සේරම නැටුවලුනෙ.."

" මාමෙ!!!!"

" උඹ මොකද නහින්නෙ.. අපි මේ උඹ ගැන කතාකරනවා කියලා හිතුවද.."

මම මේසෙ උඩ තිබ්බ මල් වාස් එකේ මල් ටික ගලවලා අරගෙන ඒකෙන් රධ්‍ය අයියට ගහගෙන ගහගෙන ගිහින් ඉතුරුවෙච්ච පෙති හැලිච්ච මල් කැලි ටික පෝච්චියෙන් ගැහුවා.. හැලපයා..

" අප්පච්චිට~ අම්මලාට~ කෙරුවලු මං නින්දා~"

@Shan

" වරදිනී නින්දා කල්ලද.."

" ඔව් මාමෙ.. මාමණ්ඩිගෙ මූණට සිංදු කියලා නින්දා කල්ලා.."

ආධ්‍ය අයියා මට පේන්නෙ නැතිවෙන්න බිත්තිය පැත්තට හැරිලා හිනාවෙනවා මට පේනවා.. මම අත් දෙකත් බැඳගෙන මූණ ඉසකුඩුවච්චියක් කරගෙනම හිටියා.. ඔයත් මට එහෙම කළානේද ආධ්‍ය අයියෙ.. මම එන්නෑ උඹලා එක්ක එකගෙයි කන්න..

" කන්න ළමයි.. විකාර කියවන්නැතුව.."

ආධ්‍ය අයියා කෑම භාජන ටික මේසෙ උඩින් තියලා පුටුවක් ඇදගෙන වාඩිවුණාම අපේ මාමත් ආධ්‍ය අයියා ගාවින් ඉඳගත්තා.. මම කකුලක් දික් කල්ලා මාමට දෙකතුනක් ගැහුවා..

" මොකද උඹ.."

" මොකද.. හිනාවෙන්නෙ.. බුලත් කන සුරුට්ටු මාමා.."

" අනේ නිකම් පලයන් වරදිනී යන්න.."

" අයියේ!!!"

" ඕක නවත්තගන්නවා අනූ..!!"

" එපා මාමෙ.. මාමා කියන්න.."

" පොඩී!!!"

" අයියෙ.. ප්‍රෙග්නට් කොල්ලොන්ට කන්න හොඳ කෑම මොනවද.."

මම මොකුත් ඇහෙන්නෙ නැති එකා වගේ පාඩුවෙ කෑම බෙදාගෙන අනාගෙන කන්න ගත්තා.. අනේ කියපුවාවෙ මට ඇහෙන්නෙ නෑ එක එක පොල් කැඳැත්තොයි බුලත් හපයොයි කියන බලු කතා..

" ඇයි උඹ අතින් කාවද බඩ වුණේ.."

@Shan

විනාඩි කීපයක් කෑම මේසෙ විසාල නිශ්ශබ්දතාවයක් පැවතුණාම රඩ්‍ය අයියා උගුර පාදලා ආයෙම මහදැනමුත්තා වගේ කතාකරන්න ගත්තා.. අම්මපා මුගෙ ඔක්කොම ටේබල් මැනසුයි අනිත් සමයනුයි යාළුවෙන්න කලින් තමා.. දැන් කොහෙද දන්නෙ නෑ ඒවා තියෙන්නෙ..

" ඇත්තටම මගේ අතින් වරද් ප්‍රෙග්නට් වුණා.."

අපේ මාමට කකා ඉදපු එක හිරවුණා.. ආඩ්‍ය අයියට කැස්සක් ඇල්ලුවා.. රඩ්‍ය අයියා කුපාඩි හිනාවක් දාගෙන මිරිස් කරලක් වරස් ගාලා හපලා කෑවා..

" කැහ්-කැහ්-කවද්ද.."

" ටික කාලයක්.. මොනව කන්න හොඳ.. අයියෙ අයියෙ.. කරපිංචා කෑද හොඳයිද.."

ආඩ්‍ය අයියා අත දිගෑරලා රඩ්‍ය අයියගෙ පිට මැද්දට පාරක් දුන්නා..

" මුගෙ කට බලහන්කො සාකි.."

" ඒකතමා.. හැදෙනවා දැන් හොඳ විදියකට.."

" මෙන්න මූ එක්ක ඉදලා තමා."

මම පාඩුවෙ බත් කටක් අනාගෙන කාලා මාමට දෙකක් රැව්වා..

" මම මක් කල්ලද.."

" ඇති ඇති.. ආයෙ කවුරුත් මොකුත් කතාකරන්නෙ නෑ.."

මම ආදරේ ආඩ්‍ය අයියට විතරයි.. දැක්කනෙ මගෙ සාම දූතයා.. මම හිතින් මාමටයි ආඩ්‍ය අයියටයි බැන බැන කෑම කාලා ඉවරකලා..

" චූටි තව බෙදාගෙන කන්න.."

" ඇති අයියෙ.."

" දැන් යන්න ඕන නේද.. අප්පච්චි එනවා කිව්වෙ.."

@Shan

" ඔව් අනූ.. පරක්කුත් වෙනවා.. තව ටිකකින් යන්න ඕන.. ඔයාට හෙට ඩියුටි කොහොමද.."

මම හිමින් සැරේ නැගිටලා කාමරේට වැදුනහම රධ්‍ය අයියත් පිහාන සෝදලා තියලා කාමරේට ඇවිත් මේසෙ උඩ තිබ්බ වොලට් එකයි බෑග් එකයි කරේ දාගත්තා..

" හෙට ඉස්කෝලෙ එනවනෙ.."

" ම්ම.. පරිස්සමින් ඉන්න වරද්.. මම යනවා.."

" හා.."

මම රධ්‍ය අයියගෙ අතකින් අල්ලගත්තම එයා නැමිලා මගේ නළලෙන් හාද්දක් තිබ්බා.. ඊටපස්සෙ මගේ කොණ්ඩෙ ඇස් වලින් එහාට කල්ලා හැදුවා..

" පරිස්සමට යන්න.. ගිහින් මැසේජ් එකක් දාන්න.."

රධ්‍ය අයියා මාව තුරුල් කරගෙන ඉඳලා දෙතුන්පාරක්ම ඔලුවට හාදු දෙකතුනක් දීලා ආධ්‍ය අයියත් ආවහම පහළට ගියා.. අප්පච්චි ගෙදර එන්න කලින් ඒ දෙන්නා ගෙදර යන්න ඕනනෙ.. අප්පච්චි එන්නෙ එකොළහට විතරලු.. තව හුඟක් වෙලා තියනවනෙ.. ආධ්‍ය අයියලා ගියාම ගෙදර හරි පාළුයි වගේ.. මම මාමා එක්ක කතාකර කර ඉඳලා නිදාගන්න ගියා..

හුඟක් ලස්සනයි මගෙ ලස්සන දළඹු කෙල්ලේ.. මම ආදරෙයි..😘

උදේ පාමදර නෙස්ටමෝල්ට් අරන් ආවා.. වෙකී වෙකී දළඹු ළමයිනේ..

ඉස්සරහට පොඩි ටයිම් ස්කිප් එකක් වෙනවා.. ඇත්තටම ස්ලෝ බර්න් කතා ලියන අය ඉන්නවනම් දන්නවා එහෙම ලියන්න කොච්චර සංයමයක් තියෙන්න ඕනිද කියලා.. කියවන්නත් එහෙම තමා.. ඒත් එහෙමයි කියලා දිගට අදින එක හරි නෑනෙ.. කතාව එතකොට ඇදෙනවා.. මම ඒක ලොකු ස්කිප් එකක් කරන්නෙ නෑ.. නොකරම බෑ ඒත්..

හරිත..

@Shan

ඉස්සරහට සරපරායිස් ගොඩක් එක්ක නරක සමනලයා එනවා දළඹුවො ටික හොයාගෙන..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුනවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 139 කොටස

" හත හමාරට මම එනවා.. රෙඩි වෙලා ඉන්න වරද්.."

මම කාමරේ නිදාගෙන ඉද්දි එකපාරටම ෆෝන් එක වයිබ්‍රේට් වුණා.. මම උඩ ගිහින් ඇහැරුණා.. තාම ප්‍රැක්ටිස් ගියපු ඇඳුම් පිටින්මයි.. එහෙමම මහන්සියට වැටිලා නින්ද ගියා.. මේ දවස්වල ඉස්කෝලෙ යන්නෙත් නෑ.. මට මුළු දවසක ප්‍රැක්ටිස්.. වෙළුසුමනයා යකෙක්ගෙන් වැඩ ගන්නවා වගේ මාව බන්දගෙන වැඩ ගන්නෙ.. ඒ මදිවට ජිම් එකේ ඉන්න ටයිම් එකත් වැඩි කල්ලා.. මට වෙලාවකට කෝචා එක්ක කේන්ති යනවා.. මූ මාව මරවනවනෙ.. මම කෝච්ට හිතින් බැන බැන ෆෝන් එක අරගෙන ස්ක්‍රීන් එක දිහා බැලුවා.. බලද්දි හැපිකව්වෙක් මැසේජ් එකක් එවලා..

හත්දෙයියනේ ඩේට් එකකට යන්න හිටියා නේද..

මම එහෙමම පෙරළුණු පාර ඇඳෙන් බිමට පත බැවුණා.. හොඳ වෙලාවට තාම හතයි.. පැයබාගෙන් ඇස්තිවෙලා ඉන්නත් ඕනනෙ.. මාමා තාම ගෙදර ඇවිල්ලත් නෑ.. මම අල්මාරිය අවුස්සලා අසලි අම්මා බර්ත්ඩේ එකට දුන්නු හුඩී එකයි කලිසමකුයි ඇද්අ උඩට විසික් කලා නානකාමරේට ගියා..

අනිද්දා මම ලංකාවෙන් යන්න ඉන්නෙ.. ආයෙ සතියකින් තමා එන්නෙ.. ටුවර් එක නිසා කෝච් සෑහෙන්න උනන්දු කරවනවා ඒ මැච් එක වින් කරන්නම.. එයා කියන විදියට මේක ලොකු ට'නින් පොයින්ට් එකක් වෙන්න පුළුවන්ලු.. මට එච්චරම ගාණක් නෑ ඔය හෙන විසාල මැචස් ගැන.. මම ඉස්සර බලන්නෙත් ටීවී එකේ.. නැත්නම් ෆෝන් එකේ ලයිව් දෙනකොට.. කවද හිතුවෙ ඇත්තටම ගිහින් ප්ලේ කරන්න පුළුවන් වේවි කියලා..

මේ ගෙවිලා ගිය කාලෙම මමයි රධ්‍ය අයියයි හිටියේ හෙනට බිසී වෙලා.. අපිට කතාකරන්නවත් ඉස්කෝලෙදි හම්බෙන්න වුණෙත් නෑ.. වාහනේ එනගමන් කතාකරන ටිකක් විතරයි.. එහෙම හරි කමක් නෑ එයා මං ගාව ඉන්නවනෙ.. වචනෙකින්හරි.. ඒකම මට ලොකු දෙයක්.. ආධ්‍ය අයියා මේ දවස්ටිකේ ආයෙම ඉන්නෙ අසනීපෙන්.. එයාට ගිය සතියේ ඉඳන් උණ, බහින්නෙ නැතුව.. ඒ මදිවට අප්පච්චි දන්නෙත් නෑ අයියට උණ කියලා.. මාමා තමයි අයියව හොස්පිටල් ඇඩ්මිට් කල්ලා හැමදේම කළේ.. නෙතු

@Shan

සමයම ඉඳලා හිටලා අයියව බලන්න එනවා.. ඒ ඇරෙන්න අප්පච්චිනම් ඇහින් ඇහැ ඇරලවත් අයියා දිහා බලන පාටක් නෑ කියලා මාමා කිව්වෙ.. අප්පච්චිට කොහොම හරි ඕන ආඪ්‍ය අයියව නෙතුගෙ ඇහේ ගහන්නම විතරයි.. අපේ මාමත් මේ ටිකේ එච්චර හොඳ සිහියකින් නෙමේ ඉන්නෙ..

ඔය දේවලුයි ආඪ්‍ය අයියගෙ අසනීපෙ නිසායි රඨ්‍ය අයියත් ඉන්නෙ හුඟක් අවුලෙන්.. මම මගේ පුළුවන් උපරිමෙන් එයා වෙනුවෙන් හිටියා.. එයාට දුක හිතුණහම කතාබහ කළා.. ඒත් රඨ්‍ය අයියගෙයි ආඪ්‍ය අයියගෙයි බොන්ඩ් එකේ තරමට ආඪ්‍ය අයියා අසනීප වුණු දවසේ ඉඳලම රඨ්‍ය අයියා හිටියෙ පොඩ්ඩක්වත් හිත හොඳින් නෙමේ.. ඒ ඇරෙන්න අප්පච්චි රඨ්‍ය අයියා එක්කත් දවසින් දවස කරන්නෙම රණ්ඩු වෙන එක.. රඨ්‍ය අයියත් එයාගෙ හිතේ තියන ඔක්කොම පීඩනේ රණ්ඩු වලින්ම පිට කලා දානවා.. අසලි අම්මත් මාත් එක්ක හුඟ කාලෙකින් කෝල් කල්ලා කතාකලේ නෑ.. මැසේජ් එකක් දැම්මොත් තමා.. මේ සතියේ අපේ රිසාල්ට්ස් එන්න බොහෝ දුරට ඉඩක් තියනවා..

රඨ්‍ය අයියගෙ ගෙදර වෙන රණ්ඩු වල මගේ නමත් කොහෙන් හරි ඇදිලා එනවා කියලා මම දන්නවා.. රඨ්‍ය අයියා මට ඒක කිව්වා.. අප්පච්චි අපි දෙන්නා ගැන හරියටම දැනගත්තු දවස කවද්ද කියලා මම දන්නෙ නෑ... හැබැයි දැනගත්තු දවසේ ඉඳන්ම රඨ්‍ය අයියව මරාගෙන කන්න හදනවා..

එහෙම තියෙද්දි තමයි මම යන්න කලින් රඨ්‍ය අයියා මට ඩේට් එකකට කතාකළේ.. ඉස්සරනම් අපි කොයිවෙලෙත් ඇවිද්දා.. ඒ වුණාට මේ කාලෙ හැටියට අපිට සෑහෙන්න වැඩ තිබ්බ නිසා කොහේවත් යන්නවත් නිදහසේ කතාකරන්නවත් බැරිවුණා.. හැමදාම එකවගේ නෑනෙ..

මම ඇඳගෙන ගෙදරත් වහගෙන එළියට එද්දි පහළ ගේට් එක ගාව ඉඳපු අංකල් මාත් එක්ක හිනාවුණා.. මාම් අංකල් එක්ක හිනාවේගෙනම පාරෙන් එහාපැත්තෙ නතර කල්ලා තිබ්බ රඨ්‍ය අයියගෙ කාර් එක ගාවට ගියා.. මම පැසෙන්ජර් සීට් එකෙන් ඉඳගෙන බෙල්ට් එක දාගන්න හැරුණහම තමයි දැක්කෙ රඨ්‍ය අයියගෙ වම් අත වැලමිට ගාව ඉඳලා පහලට ඔතලා තියනවා.. කළුවරේ වුණත් මට ඒක හොඳට පෙනුනා.. මම බෙල්ට් එක දාගෙන රඨ්‍ය අයියගෙ අත ඇදලා ගත්තා..

" අයියෙ..!! මොකක්ද ඔයා කරගත්තෙ.."

රඨ්‍ය අයියා අත එහාට අරගෙන ලාවට හිනාවුණා..

@Shan

" ලොකු දෙයක් නෙමේ.. මාමා ගෙදරද.."

" තාම ආවෙ නෑ.. අයියා හම්බෙන්න යන්න ඇති.. ඔයා මම අහපු දේට උත්තර දෙන්නකො.."

" පොඩි රණ්ඩුවක් වුණා.."

මම රධ්‍ය අයියගෙ අතේ බැන්ඩේජ් නොකරපු හරියෙන් හිමින් අල්ලලා මගේ උකුළ උඩින් තියාගත්තා.. මගේ හිත රිදෙන්න ගන්නවා..

" මේ කීවෙනි සැරේද.. ඔකෙ ඉවරයක් නැද්ද අයියෙ.."

" මම දන්නෙ නෑ වරද්.. මට කරන්නෙ මොකක්ද තේරෙන්නෙ නෑ.."

" මම නිසාද.."

රධ්‍ය අයියා ඩ්‍රයිව් කරන ගමන් හැරිලා මගේ දිහා බැලුවා.. බලලා ඒ අතින්ම මගේ කම්මුලකට තට්ටුවක් දැම්මා..

" ඔයා ඒකට මොකක් කරන්නද.."

" ඒත් මෙහෙම හැමදාම බෑනෙ.."

" බැරි නෑ.. මම ඕනම රිස්ක් එකක් ගන්නවා.."

" ඒත්-"

" Enough වරද්!!!"

රධ්‍ය අයියා ටිකක් තදින් කිව්වහම මාව ගැස්සිලා ගියා.. එයත් ඒකෙන් එකපාරටම අවුල් ගිහින් මගේ අත තද කල්ලා අල්ලගත්තා.. මගේ ඇස්වල එකසැරේම කඳුළු පිරුණා.. කවදාවත් නැතුව තදින් කතාකරද්දි මගේ පපුව රිදෙනවා වගේ මට දැනුණෙ.. ඒක හරියට.. මට කියන්න තේරෙන්නෙ නෑ.. එයා පොඩි වචනයක් හරි තදික් කිව්වහම මගේ ඇස් වල කඳුළු පිරෙනවා කියලා විතරක් මට තේරුණා.. මම ඇස්වල පිරුණු කඳුළු පහළට රූටලා වැටෙන්න නොදී අමාරුවෙන් රඳවගෙන හිටියත් මම කියන දේ අහන්නෙ නැති කඳුළු බිංදුවක් ඇහිපිල්ලම් වලින් පහළට කඩාගෙන වැටිලා මගේ අතට වැටිලා බිඳිලා ගියා..

@Shan

" වරද්.. මම-බබා ප්ලීස් අහන්න.. මම-අනේ අඩන්න එපා.. මේ බලන්න.."

මම රධ්‍ය අයියා දිහා බැලුවහම එයාගෙ ඇස් ගැස්සිලා ගියා.. මම එහෙමම බිම බලාගත්තා.. ඒත් ට්‍රැෆික් එකේ ග්‍රීල් ලයිට් පෙන්නපු නිසා එයාට දිගටම ඩ්‍රයිව් කරන්න වුණත් මගේ අත පොඩ්ඩක්වත් අතෑරියෙ නෑ.. මම අත එහෙමම තියාගෙන ශටර් එකෙන් එළිය බලාගෙන ආවා..

අන්තිමට අපි ඇවිල්ලා හිටියේ ගිය අවුරුද්ද අන්තිමේ දවසක් අපි ඇවිලා හිටිය මුහුදු වෙරළ කිට්ටුවටමයි.. රේල්වේ එක.. මුදු හුළඟ.. පොඩි පොඩි ෆෙයරි ලයිට් බල්බ්ස්.. barracuda කියලා නියෝන් ලයිට්ස් වලින් ජේන නිල්පාට බෝඩ් එක.. ඇතුළේ ප්ලේ වෙන acoustic මියුසික්.. මාව හුඟ කාලෙක ඈත අතීතෙකට අරගෙන ගියා.. මගේ හිතේ කලින් තිබ්බ දුක ඒකට කලවම් වෙලා ආයෙම ඒක දැනුණේ නෑ.. රධ්‍ය අයියා පාකින් ලොට් එකේ කාර් එක පාක් කල්ලා සීට් එක පිටිපස්සට කරගෙන මගේ දිහා හැරුණහම මම කලින් වගේම එයා එක්ක හිනාවුණා.. රධ්‍ය අයියා මාව පපුවට තුරුල් කරගත්තා.. මම එයාගෙ ශර්ට් එක අතකට ගුලි කරගත්තහම එයා මාව එයාගෙ උකුළ උඩට උස්සලා තියාගත්තා..

" මම අවුල් වෙලා ඉන්නෙ වරද්.. මම ඔයාව රිද්දන්න හිතුවෙ නෑ.."

" මම දන්නවා.. ඒක හිතන්න එපා.."

රධ්‍ය අයියා මාව තව තදින් තුරුල් කරගෙන උරහිසේ මූණ තියාගත්තා..

" ම-මගෙ අයියා.. වරද්.."

"....."

" මට එයා වෙනුවෙන් කරන්න පුළුවන් මොකුත්ම නෑ.."

" අයියෙ.."

" මට රි-රිදෙනවා වරද්.. අම්මා ගාවට යන්න ඕන.. අම්ම-ට එන්න කියන්න.. බැරිද.."

මම රධ්‍ය අයියගෙ පිට උඩට පහළට අතගෑවා.. එයා අඬද්දි ඉකි වැටෙද්දි පිටවෙන හුස්ම මගේ බෙල්ලෙ වදුනකොට.. අත් වෙවුලනකොට මගේ

@Shan

උරහිස අස්සෙම තව මූණ හංගගන්න හදනකොට.. මගේ හිත හැමදේටම වඩා පෑරුණා..

" මම ඉන්නවනෙ.. අපි අම්මා එක්ක කතාකරමු.."

" ම්ම්.."

මම රධ්‍ය අයියව අත් දෙකින්ම හුහක් තද කල්ලා බදාගත්තා.. මේ ලෝකෙ ජීවත් වෙන හැම කෙනෙක්ටම සමහර වෙලාවට, ඉඳලා හිටලා හරි උණුසුම් වැළඳගැනීමක් ඕන කියලා මම විශ්වාස කරනවා.. අනිවාරෙන්ම එහෙම වෙලාවල් වලදි ඒ කාට වුණත් ඒ වැළඳගැනීමට අයිතියක් තියනවා.. රධ්‍ය අයියා හුහක් වෙලා මගේ උරහිසේ මූණ තියාගෙනිද්දිම එයාගෙ හුස්මගන්න වේගෙ එකසමාන විදියට සන්සුන් වෙලා මගෙ පිට මැද්දෙ තිබුණු එයාගෙ අත් එහෙමම පහලට රූටලා වැටුණා..

එයා හිටියෙ නිදාගෙන.. මම එයාව සීට් එකට හේත්තු කලා මාත් පපුව උඩින් මූණ තියාගත්තා.. ඒසී එකෙන් එන හුළඟේ සද්දෙයි, අපි හුස්මගන්න සද්දෙයි, ඇරෙන්න වෙන ඇහුණේ එළියෙන් එන ගිටාර් සද්දයක් විතරයි.. අපිට ඉස්සරහින් තියන මූදු රළ ගොඩට ගහනවා.. වැල්ල හෝදගෙන මූදට ඇදිලා යනවා.. මම රධ්‍ය අයියගෙ පපුවට උඩින් මූණ තියාගෙන ඉද්දි එයාගෙ හදවත ගැහෙන සද්දෙ හොඳටම මට ඇහුණා..

ජීවිතේ ප්‍රශ්න අඩු කාලයක් ගෙවිලා ගිහින් ආයෙම මම හිතන විදියට සීත කාලයක් පටන්ගන්න යනවා.. සීත කාලෙදි මල් පිපෙන එකක් නැතිවෙයිද කියලා මට බයයි.. නෑ සීතකාලෙටත් මල් පිපෙනවා. එහෙම පිපෙන මල් ඕනතරම් තියනවා.. ඒත් වසන්ත කාලෙදි පිපෙන මල් සීතකාලෙට පිපෙන්නෙ නෑ.. රෑට පිපෙන මල් දවල්ට පිපෙන්නෙ නෑ..

අපි හිතන බලාපොරොත්තු වෙන දේවල් හරි කාලෙදි පොතේ හැටියටම වෙන්නෙ නෑ..

මගෙත් ලාවට ඇහැ පියවිලා ආයෙම අවදි වෙද්දී මම හිටියේ පිටිපස්සෙ සීට් එකේ.. හාන්සිවෙලා.. මගේ ඇඟ උඩින් රධ්‍ය අයියත් එහෙමම දිගාවෙලා මාව තදින් බදාගෙන හිටියා.. එයා ගාවින් ලාවට බියර් වලින් එන සුවඳක් ගලාගෙන එනවා.. ඒ ඇරෙන්න වාහනේ නතර කල්ලා තිබ්බෙ මූදු වෙරළක් ඉස්සරහා.. මෙතෙන්ට කොහොම ආවද මට මතකයක් තිබ්බෙ

@Shan

නෑ.. මම පොඩ්ඩක් එහාට මෙහාට වෙලා කකුල් හිරිවැටිලා තියන එක හරිගස්සගන්න ට්‍රයි කලාම රධ්‍ය අයියා ඇහැරුණා..

" ඔහ්-වරද්.."

" නෑ නෑ ඔයා ඉන්න.. මට ඇහැරුණා ඒකයි.."

රධිය අයියා මගේ පපුව උඩින් ආයෙම මූණ තියාගත්තම මම එයාගෙ කොන්ඩෙ අතගෑවා.. ඇත්තටම අද කොහෙවත් ගිහින් හොඳින් කතාකරන්න තරම් මූඩ් එකක් අපි දෙන්නටම තිබුණෙ නෑ.. යන යන හැම ඩේට් එකම ලස්සන වෙන්න ඕනමයි කියලා නීතියක් නැනෙ.. මටනම් මම ආදරේ කරන මනුස්සයා එක්ක කොහේ හිටියත් කමක් නෑ..

" දැන් දොළහත් පහුවෙලා.."

රධ්‍ය අයියගෙ කටහඬ වෙනදටත් වඩා ගොරෝසු ගතියට මට දැනුණා..

" ඔයාට ගෙදර යන්න ඕනද.."

" බැහැ..අප්පච්චි කෑගහනවනෙ.."

මට ලාවට හිනාගියා.. බියර් විතරක් නෙමේ මම හිතන්නෙ බීලා තියෙන්නෙ..

" අප්පච්චි මොනවා කියලද කෑගහන්නෙ.."

රධ්‍ය අයියා එයාගෙ තුවාල වුණු අත මගේ අත උඩින් තිබ්බා.. තියලා ඔලුව උස්සලා මගේ දිහා බලාගෙන හිටියා..

" ඔයාගෙ අත තුවාල වෙලානෙ.."

" ම්ම්.."

" මම අතගාන්න ඕනද.."

" ඔව්.."

" හා.. මම අතගාන්නම්.."

@Shan

ආයෙම රධ්‍ය අයියා ඔලුව තියාගත්තා.. මම එයාගෙ අත හිමින් රිදෙන්නෙ නැතිවෙන්න පහළින් අතගෑවා.. එයා ඉඳලා හිටලා බිච්චහම මතුවෙන අමුතු කැරැක්ටර් එකට මම ආසයි.. හැබැයි වෙනදට වඩා අවධානෙ බලාපොරොත්තු වෙනවා.. extra clingy character එකක් වෙනවා..

" අප්පච්චි මොකද කිව්වෙ ඔයාට.. ඇයි අත තුවාල වුණේ.."

මම වෙනදටත් වඩා ආදරෙන් එයා එක්ක කතාකළා..

" බෙල්ට් එකට.. කැපුණා.."

"....."

" අප්පච්චිට කියන්න මට වරද් ඕන කියලා.. මට බෑ අම්මා.. වරද්.. අයියා.. නැතුව ඉන්න.. මට එතකොට.. කවුරුත් නෑ.."

" එහෙම නෑ ඔයාට එයාලා ඉන්නවනෙ.. නේද.."

" නෑ.. අයියා අසනීප වෙලා.. එයා.. එයා එන්නෙ නැතිවෙයි කියලා-"

රධ්‍ය අයියා ආයෙම අඬන්න ගත්තා.. ඇත්තටම ආධ්‍ය අයියට තියෙන අසනීපෙ මොකක්ද.. මට නිතර එයාලා අතරේ කතාබහ වෙන වචන වගයක් මතක් වෙනවා.. මම ඒ මොනවද කියන්න දන්නෙ නෑ.. ඇහුවට කවුරුත් කියන්නෙත් නෑ..

" අයියට මොකද වුණේ.. ඔයා දන්නවා නේද.."

" ම්ම්.. අයියා අසනීප වෙලා.."

" මොකක්ද අසනීපෙ කියලා දන්නවද.."

" අසනීප වෙලා.."

" ම්ම්.. අයියට මොකුත් වෙන්නෙ නෑ හරිද.. එයා ඉක්මනට හොඳ වෙලා ආයෙම ඔයා ගාවට එනවා.."

" අප්පච්චි.. එන්න දෙන්නෙ නෑ.."

@Shan

" එහෙම වෙන්නෙ නෑ අයියෙ.."

" මට හිත රිදෙනවා.. වරද්.. මගේ හැමදේම නැතිවෙලා යනවා..මගේ හීන.. ඔක්කොම.. මම නැතිවෙනකල් බලන් ඉන්නවා.. මට බෑ.. මේක කරන්න.."

"....."

" ගෙදර යන්න විදියක් නෑ.. අප්පච්චි හමතිස්සෙම රණ්ඩුවෙනවා.. අයියා නෑ.. එයා අසනීපෙන්.. මගේ වරද්.. එයා-එයා.."

" එයා ඉන්නවා.. වරද් ඔයාගෙ ගෙදරනෙ නේද.."

" ඔව්.. එයා අනිද්දා යනවනෙ.. එයා ලස්සනට එයාගෙ.. හීන වලට.. පියාඹලා යනවා.. මම බලන් ඉන්න.. ආසයි.. මගෙ වරද්.."

"....."

" වරද් පරිස්සමින් ඉන්න.. ප්ලීස්.."

" ම්ම්.."

මගේ ඇස්වලට උනපු කඳුලු බිංදුවක් ආයෙම මගෙන් අහන්නෙ නැතුව ඇස් අගිස්සෙන් රූටලා වැටුණා.. මම මේ මනුස්සයට කොච්චර ආදරේද, කැමතිද කියන්නවත් මට මොකුත්ම මතක් වෙන්නෙ නෑ.. මං ගාව ඒකට වචන නෑ..

" ඔයාව මට නැතිවුණොත්.. මම කොහෙන්ද ඔයාව හොයාගන්නෙ.. මෙ ලෝකෙ කවුරුත්ම එහෙම ප'ෆෙක්ට් නෑ.."

" මම කිව්වනෙ.. එහෙම නැතිවෙන්නෙ නෑ කියලා.. එයා හැමතිස්සෙම ඔයා එක්ක ඉන්නවා.."

රධ්‍ය අයියා මගේ කම්මුලකින් අල්ලගත්තා.. වෙරි නිසා එයාගෙ ඇස් බාගෙට පියවිලා තිබුණත් මං ගාව හැමදාම ඉන්නවා වගේ වෙනසක් නැතුවම හිටියා.. මම එයාගෙ ඇස් වලින් මුලින්ම ආදරයක් දැක්කෙ කවදද.. එදා වගේම අදත් ඒවගෙන් ආදරේ වැස්සෙනවා..

"

@Shan

**මගේ පණ..**

පරිස්සමින් ඉඳපන්.. උඹ නිසා මම මේ මැරි මැරි ඉපදෙන්නෙ.."

මම ඇස් දෙකත් ලොකු කරගෙන එයා දිහා බලාගෙන හිටියා.. එක වචනෙකටත් මගේ පපුව ඕනවටත් වඩා ගැහෙනවා.. මට බයයි ඒක එයාට ඇහෙයිදෝ කියලා.. මගේ කම්මුල් වල රස්නෙ එයාගෙ සීතල අත් වලටත් දැනෙනවා..

" අ-අයියෙ.."

" ඔන්න ඔහොම- ඔන්න ඔහොම ඉද්දි..මගේ පපුව රිදෙන්න ගන්නවා.. වරද්.."

රධ්‍ය අයියා මගේ අතක් එයාගෙ පපුව උඩින් තියාගෙන මගේ තොල් වලින් හාද්දක් තිබ්බම මම පපුව උඩ තිබ්බ අත් ශර්ට් එකත් එක්කම ගුලි කල්ලා තදකල්ලා අල්ලගත්තා.. රධ්‍ය අයියා මගේ ඇඟ උඩින් නැගිට්ටා.. නැගිටලා ඩ්‍රයිවින් සීට් එකට ගිහින් ස්ටියරින් වීල් එකට ටිකක් වෙලා ඔලුව තියාගෙන හිටියා..

" අපි ගෙදර යන්න ඕන.."

ඩබල් අප්ඩේටු ගෙනාවා..

මම ආසම කොටස් තමා මේ ලියාගෙන යන්නෙ.. ඉතින් ඔයාලගෙන් ලැබෙන ලොකුම ලොකුම සපෝට් එකට මම හුගාක් ආදරෙයි මගෙ දළඹු ළමයිනේ..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

@Shan

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 140 කොටස

මම ආධ්‍ය අයියා ඇඩ්මිට් කල්ලා ඉදපු හොස්පිටල් එකේ රූම්ස් සේරම පහුකරගෙන දුවගෙන දුවගෙන ගියා.. මගේ හිතට හරි බරයි.. ආයෙම සතියකින් අයියව වත් කවුරුත් දකින්න වෙන්නෙ නෑ කියලා හිතුවහම.. මගේ පපුව එකසැරේට හිරිවැටිලා රිදීගෙන යනවා.. මේ ගෙවෙන්නෙ නම් හරි අමාරු දවස් ගොඩක්.. මගේ හිත නිතරම මට කියනවා..

"109"

මම රූම් එක ඉස්සරහා නැවතිලා මට පිටිපස්සෙන් ඇත එන රධ්‍ය අයියා දිහා හැරිලා බැලුවහම එයා ඔලුව වැනුවා.. මම කාමරේ දොර ඇරගෙන ඇතුළට යද්දි මාමා ඇඳේ පාමුලට වෙන්න ඔලුව තියාගෙන හොඳටම නිදි.. ආධ්‍ය අයියට ඔක්සිජන් මාස්ක් එකක් මූණට දාලා එකපැත්තකින් ලේ දෙනවා.. අනිත් අතට සේලයින් එකක් ගහලා.. මාමා ආධ්‍ය අයියගෙ අතකින් අල්ලගෙන හිටියා.. මම ඇතුළට ගිහින් මාමට තට්ටුවක් දැම්මම මාමා ගැස්සිලා ඇහැරුණා..

" සාකි-අහ්.. සුදුමහත්තයා.."

මම මාමට තුරුල් වුණා.. මම තාත්තෙක්ට වගේම මාමට හුඟක් ආදරෙයි..

" මාමෙ.."

මාමගෙ ඇඳුමෙන් එන සර්ජිකල් සුවඳ මගේ ඇඟපුරාම ගැවෙන්න ඇති.. මාමා මාව අත් දෙකින්ම බදාගෙන නළලෙ පැත්තකට හාදුවක් දුන්නා..

" අයියට දැන් කොහොමද.."

මාමා ආධ්‍ය අයියා දිහා බලාගෙන හිටියේ හරිම හිස් වෙච්ච ඇස් දෙකකින්.. මම කවදාවත් මාමා කියන කැරැක්ටර් එක ඇතුළෙ මෙහෙම හැඟීම් එළියට ඒවි කියලා බලාපොරොත්තු වෙලාම නෑ..

" අපි බලමු.. යන්න පරක්කු වෙනවා නේද.."

ඒ එක්කම රධ්‍ය අයියත් දොර ඇරගෙන ඇතුළට ආවා..

@Shan

" රධ්‍ය.."

" අයියට කොහොමද මාමෙ.."

" එයාව ෆේන්ට් වුණා ටිකකට කලින්.. බලමු.. තව ටිකකින් අයි වී එකක් තියනවා.."

" මාමට මහන්සිනෙ නයිට් කල්ලා මෙහෙ ඉන්නත්.. මම නවතින්නද.."

" එපා කොල්ලො.. මම ඉන්නම්.. උඹට තනියම කරන්න බෑ.."

" අනේ අයියට ඉක්මනට හොද වෙයි නේද.."

අපේ මාමා රධ්‍ය අයියා දිහා බලලා ආයෙම මගේ දිහා බැලුවා..

" ඔව්.."

" වරද් ඔයාට ලේට් වෙනවා.."

මම මාමා ගාවින් එහාට වුණා.. ආධ්‍ය අයියා හැමදාම ඔලුව අතගාලා කටපුරා 'චූටී' කියන්න නැතිවුණාම ඒකට මගේ හිත හුගක් රිදුණා.. හුගක් දැනුණා.. පාළු හිතුණා.. මේ දවසට දෙකට අයියා හුගක් වෙනස් වෙලා කෙට්ටු වෙලා ඇදිලා ගිහිලා.. සතු හතර පහකට කලිනුත් මාත් එක්ක හොදට කියව කියව ඉදලා අද සිහියක් පතක් නැතුව ඇදට නිදාගෙන ඉද්දි.. මට ඒක අදහගන්න බැරිවුණා..

" මම ගිහින් එන්නම් මාමෙ.. අයියව පරිස්සමට බලාගන්න.. මාමත් පරිස්සමින් ඉන්න.."

මම මාමගෙ කකුල් දෙක අල්ලලා දණගහලා වැන්දා.. මාමා මගේ ඔලුව අතගාලා පපුවට තුරුල් කරගත්තා..

" පරිස්සමට ගිහින් වරෙන් සුදුමහත්තයා.."

මාමා ටිකක් වෙලා ඉදලා මාව එහාට කලා.. මම ආධ්‍ය අයියා කිට්ටුවට ගිහිල්ලා එයාගෙ කම්මුලකින් හිමිහිට ඇල්លුවා.. ඒවා හුගාක් සීතලයි.. සුදුමැලි පාටයි.. ඇස් පියවිලා තිබ්බත් එයාගෙ මූණෙ හැමතිස්සෙම පේන්න තියන උනුසුම් කරුණාවන්ත පෙණුම එහෙමම තිබුණා.. මම ආධ්‍ය අයියගෙ

@Shan

කම්මුලට හාද්දක් දුන්නා.. මම මේ ලෝකෙ ආස කරන මනුස්සයොන්ගෙ ලිස්ට් එකේ උඩම ඉන්නෙ ආඪ්‍ය අයියා.. එයා මෙහෙම ඉන්න ඕන කෙනෙක් කියලා මම නම් කීයටවත් විශ්වාස කරන්නෙ නෑ.. අයියා ඉක්මනටම සනීප වෙලා මං ගාවට එන දවසක් ගැන මම හිතෙන් මවාගත්තා..

' ඉක්මනට සනීප වෙනවකො අයියෙ.. මට පාලුයිනෙ'

මම හිතින්ම ආඪ්‍ය අයියා දිහා බලාගෙන හිතුවා.. මම කිව්වට එයාට ඇහෙන එකක් නෑනෙ..

" අපි යමු.."

රධ්‍ය අයියා ආඪ්‍ය අයියා දිහාවත් බලන්නෙ නැතුව ඉක්මනට කාමරෙන් එළියට ගියාම මාත් මාමට කියලා එයාගෙ පස්සෙන්ම එන්න ආවා.. වාහනේදිත් අපි ලොකුවට කතාකලේ නෑ.. හරිනම් මම අද හුඟක් සතුටු වෙන්න ඕන.. ඒත් මට කිසිම සතුටක් දැනුණේ නෑ.. ආච්චිඅම්මයි අම්මයි නම් මං ගැන සතුටු වෙනවා.. එයාලා උදේම කහාකල්ලා සුභපැතුවා.. මම කටවචනෙට ඒවට උත්තර දුන්නා මිසක් හදවතින්ම ඒ සුභ පැතුම් භාරගත්තෙ නෑ..

මම කවමදාවත් කලින්ෆ්ලයිට් එකක ගිහිල්ලා නෑ.. එයාපෝට් එකට ආවෙත් අයුක අයියා රට යන දවසෙ විතරයි.. ඇත්තටම මගේ ජීවිතේට අත්දැකීම් එකතුවෙනවා.. දවසින් දවස.. මම මේ මැච් එක ප්ලේ කරන්නම ඕන.. මොකක් වුණත්.. මම කැමැත්තෙන් කරන දේ ඒක.. අනික මට රැකට එකත් එක්ක බැඳිච්ච හීන හුගාරියක් තියනවා.. ඒවා ඇත්ත කරගන්න මම මහන්සි  වෙන්න ඕන කියලා මගේ හිත මට කියනවා.. රධ්‍ය අයියා හැමතිස්සෙම කියනවා වගේ.. එයාව සතුටු කරන්න නම් මම ඉස්සරහට අඩිය තියන්න ඕනලු..

රධ්‍ය අයියා එයාපෝට් එකේ පාකින්ලොට් එකෙන් කාර් එක පාක් කළා.. එයාගෙ මූණ වෙනදටත් වඩා මැලවිලා තිබ්බෙ.. කෝච් ආවහම මට කෝල් එකක් දෙන්නම් කිව්වා.. මම ෆෝන් එක ඉස්සරහින් තියලා රධ්‍ය අයියගෙ අතකට හේත්තු වුණා..

" මගෙ හිතට හරි නෑනෙ.."

@Shan

රඩ්‍ය අයියා මගේ කර වටේ අතක් යවලා මාව එයාට තුරුල් කරගත්තා..

" ඒ මොකද.."

" දන්නෙ නෑ.. මට ඔයා නැතුව පාලුයි.."

" සතියයිනෙ.. ආයෙම ආවම අයියා සනීප වෙලා ඉදීවි.."

"....."

" මං ගාවට ඉක්මනට එන්න වරද්.. උඹ නැතුව මට තනියම මෙහෙ ඉන්න බෑ.."

" මම ඉක්මනට එනවා.. ඔයා කිව්වත් වගේ සතිය ඉක්මනට ගෙවිලා යාවි.."

රඩ්‍ය අයියා මොකුත් නොකිය මගේ නිකටින් අල්ලලා මූණ එයාගෙ පැත්තට හරවගෙන මගේ තොල් වලට පහත් වුණා.. ඉබේම මගේ ඇස් දෙක වැහිලා ගියාම රඩ්‍ය අයියා ඉණෙන් අල්ලලා මාව එයාගෙ පැත්තට ඇදගත්තා.. මගේ අතක ඇඟිලි එයාගෙ කොණ්ඩෙ අහුරකින් අල්ලගත්තා..

සෑහෙන්න වෙලාවකට පස්සෙ රඩ්‍ය අයියා මාව සීට් එකට හේත්තු කල්ලා මෙහාට වුණා.. ඒ වෙද්දි මගේ තොල්වලින් ආපු ලිප් බාම් එකේ අමුතු ආස හිතෙන රස තවදුරටත් දැනුණෙ නෑ වගේම මගේ බෙල්ල තැනින් තැන පැල්ලම් දෙක තුනක් හැදිලා තිබුණා.. රඩ්‍ය අයියා මගේ කොලර් එක උඩට කල්ලා ඒ පැල්ලම් දෙක වැහෙන්න ඇඳුම හැදුවා..

" යමු.."

මම වාහනෙන් බැහැලා ගිහින් මගේ ලැගේජ් එක එළියට අරගෙන පාස්පෝට් එකයි එයා ටිකට් එකයි ජැකට් එකේ සාක්කුවක ඔබාගත්තා.. ගමනක් යන්න අන්තිම මොහොතටත් මට ශුවර් නෑ මම ඔක්කොම දාගත්තද කියලා.. කමක් නෑ ඕන එකක්..

" Are you excited..??"

" I've never been on a flight before.."

" ඔයා ඉස්සරහට හුහක් යාවි.."

@Shan

" කවුද දන්නෙ.. නේද.."

මම ලැගේජ් එකත් අරගෙන එයාපෝට් එන්ට්‍රන්ස් එක ගාවට එද්දි මම ඇත තියාම තාන්වි අක්කව දැක්කා.. එයා මාව දැකලා අත වැනුවා.. ඒ කිට්ටුවෙන්ම කෝච් ඇස් දෙකත් හීනි කරගෙන මම එන දිහා බලාගෙන ඉදලා අහක බලාගත්තා.. මම බිම බලාගෙනම ගියා..

" ෂනෙරු.. රධ්‍ය.. හායි.. අම්මෝ අපි නම් හම්බෙන්නෙ හුඟ කාලෙකින් නේද.. ඔයාලට කොහොමද.."

" අපි හොඳින් ඉන්නවා.. අක්කට කොහොමද.."

" වෙනදා වගේම තමා අනේ.. බබලා එක්ක බිසී.. දැනුත් ආවෙ ඔයාට විශ් කරන්නම හිතාගෙන.. එයාලා දෙන්නා නැති එක්ක ගෙදර.."

" ඔහ්.."

තාන්වි අක්කා මට හග් එකක් දුන්නා.. දීලා උරහිසට තට්ටුවක් දැම්මා..

" ඕල් ද බෙස්ට් ෂනෙරු.. මමත් බැඩ්මින්ටන් ප්ලෙයර් කෙනෙක්නෙ.. මට කියන්න පුළුවන්.. You have a bright future... this is just the beginning.."

මම හිනාවෙලා එහාට වුණා..

" thanks.."

" ඉතින් රධ්‍ය.. මෙ දවස්වල කොහොමද.."

" එක්ස්කියුස්මී.."

කෝච් අපි එක්ක ටුවර් එකට ජොයින් වෙන සීනියර් ටීම් එකේ මෙම්බර්ස්ලා හම්බෙන්න එහාට ගියා.. රධ්‍ය අයියා තාන්වි අක්කා එක්ක හිනාවුණා..

" I'm doing well.."

" ඒකනම් හොඳයි.. මට පේන්නෙ නම් බෝයිෆ්‍රෙන්ඩ් යනවට එච්චර කැමති නෑ වගේ.."

@Shan

" A little bit.. actually.."

රධ්‍ය අයියා මගේ කර වටේ අතක් දාගෙන මාව ඇදලා ගත්තා.. තාන්වි අක්කා හිනාවුණා..

" If you two didn't really get together.. I don't even believe in love අනේ.. What a cute couple.."

" අක්කා..!!"

" Did you see.. this little boy is so cute.. රධ්‍යට මෙයාව නම් මොකක් හරි බැග් එකක දාලා හංගගෙන ඉන්න වෙවි.. මොකද මේ ෆීල්ඩ් එකේ ඩාක්සයිඩ් එක ගැන.. මම කියන්න ඕන නෑ.. ඔයාලා දන්නවනෙ.."

" I think he knows how to deal with those things very well.."

" You are very proud of your boyfriend, aren't you..??"

" අනිවාරෙන්ම.."

තාන්වි අක්කා මගේ කම්මුලකින් ඇදලා හිනාවුණා..රධ්‍ය අයියා මාව තව ටිකක් තදින් තුරුල් කරගත්තා..

" ඔයාලා දෙන්නා කතාකරන්නකො එහෙනම්.. මම පොඩ්ඩක් අර පැත්තට ගිහින් එන්නම්.."

තාන්වි අක්කා අපි එක්ක හිනාවෙලා එහායින් හිටපු අයට විශ් කරන්න ගියා.. ඇත්තටම එයා හරිම හොඳ වයිෆ් කෙනෙක් වගේ මට පේන්නෙ.. රධ්‍ය අයියා මාව එයා ඉස්සරහින් හිටවලා මගේ අත් දෙකින් අල්ලගත්තා..

" මතකයිනෙ.."

" ඔව්.. ඔයත් පරිස්සමට ඉන්න.. මම ඔයාට කෝල් කරන්නම්.."

රධ්‍ය අයියා ලාවට හිනාවුණා..

" මම්.."

@Shan

මම රධ්‍ය අයියගෙ අත් දෙකින් මගේ අත් දෙක ඇදලා ගන්න හැදුවහම එයාගෙ ඇස් වල කඳුළු පිරීගෙන ඇවිත් රතුවෙනවා මට දැනුනා.. මම ආයෙම ඒක නිසා එයාගෙ අත් දෙකින් අල්ලගත්තා..

" අනේ..!!"

රධ්‍ය අයියා ඉක්මනට අහක බලාගෙන ඇස්පිල්ලම් ගහලා කඳුළු වේලගත්තා..

" මම යන්නම්.. ගිහින් කෝල් එකක් දෙන්න.. මම හුඟක් ආදරෙයි වරද්.."

" මාත්.. ආදරෙයි.."

රධ්‍ය අයියා මගේ අත් දෙක අතෑරල මගේ කම්මුලට තට්ටුවක් දාලා යන්න ගියා.. ආයෙම එකසැරයක්වත් හැරිලා බලන්නෙ නැතුව.. එයා ඈත පේන්නෙ නැතුව යනකල්ම මම ඒ දිහා බලාගෙන හිටියා.. අන්තිම තප්පරේ වෙනකල්ම.. මම දුරම දුර කළුපාට තිතක් වෙලා මට නොපෙනිලා යන එයා දිහා බලාගෙන ඉද්දි මගේ පපුව රිදෙන්න ඇල්ලුවා.. ආයෙම තව එක විනාඩියකට එයා ගාවට දුවලා යන්න ඇත්නම් කියලා හිතුනහම මම ලැගේජ් එක තද කල්ලා අල්ලගත්තා.. එයාගෙ ප්‍රියුම් සුවඳ මගේ ඇඳුම්වල ගෑවිලා තියනවා.. මට ඒ සුවඳම දැනෙනවා..

" Shaneru let's go.."

මම එකසැරේට හැරිලා කෝව් දිහා බැලුවා.. කෝව හැමෝම යනකල් ඉඳලා අන්තිමට මාත් එක්ක ගියා.. මම මීට කලින් මෙවට ඇවිල්ලා තිබුණෙ නැති නිසා ඇත්තටම පුදුමයි.. හැමදේම මට අලුත් අත්දැකීම් වුණා.. මම කෝව ළඟටම වෙලා හිටියා.. අන්තිමට එයා බස් එකෙන් බැහැලා අපි සිංගපූර් වලට තියන ෆ්ලයිට් එකට ගොඩවුණා.. හැමදේම ඇතුළෙ මාව හුඟක් පොඩියට මට තේරෙන්නෙ..

කෝව මාවත් එක්කගෙ ගිහින් සීට් එකකින් ඉඳගත්තා.. පැය බාගෙකට පස්සෙ එනවුන්ස්මන්ට්ස් වගයක් දුන්නහම හැමෝම ඉඳගත්තා.. සීට්බෙල්ට්ස් දාගත්තා.. මමත් හැමෝම කරන එක කළා.. කෝව්ටනම් මෙක නිකම් කඩේට යනවා වගේ දැනෙනවා ඇති.. මට එහෙම නෑනෙ.. මම ඇස් කරක කරන ඉන්නවා දැකලා කෝව්ට හිනායන්න ආවත් කෝව් ඉක්මනට උගුර පාදලා අහක බලාගත්තා..

@Shan

" ඇයි.."

" මොකද..??"

" මොකුත් නෑ මොකුත් නෑ.. සර්ට මම කවියක් කියන්නද.."

කෝච් මම කියපු එක ඇහුණෙ නෑ වගේ සීට් එකට ඔලුව හේත්තු කරගත්තා.. ඒ වුණාට ලාවට වගේ හිනාවෙනවා මට පේනවා..

" We are currently third in line for take-off and are expected to be in the air in approximately seven minutes time.. We ask that you please fasten your seatbelts at this time and secure all baggage underneath your seat or in the overhead compartments.."

මම එහෙමම සීට් එකට හේත්තු වෙලා එයාපොඩ්ස් දෙක අරගෙන කනේ ගහගත්තා.. රධ්‍ය අයියගෙන් මැසේජ් එකක් ඇවිල්ලා තියෙනවා ස්ක්‍රීන් එකේ පෙනුණා..

" ❤ Bon voyage..!"

මම ඒක දිහා බලලා ඇස්දෙක පියාගෙන සිංදුවක් අහන්න ගත්තා.. හුඟක් වෙලාවට.. නොදන්න තැනක.. අතරමං වෙලා වගේ දැනෙන තැනක.. ලොකෙන් පොඩ්ඩකට ඈත් වෙලා.. මට පුංචි ඉඩකඩක් හදාගන්න.. පොතක් හරි සිංදුවක් හරි මට හොඳටම ඇති.. ඒවා මාව පොඩි ඉඩකඩකට කොටු කල්ලා නොදන්න ලෝකෙන් වෙන් කල්ලා තියනවා..

" What if our tomorrow means that we are here together?

What if we are taking chances just to lose it all?

Am I really crazy thinking 'bout this all together?

What if I've been missing,

The writing on the wall..?"

එකදිගට පැය තුනහමාරක් එන්න තියන නිසා මම සිංදු ඇහුවා.. වෙබ් නවල් එකක් කියෙව්වා.. බැරිම තැන නිදාගත්තා.. ආයෙ කෑවා.. ආයෙ නිදාගත්තා..

@Shan

කොහොම හරි මම තුන් හතරපාරක්ම නිදාගෙන අන්තිම වතාවට නැගිට්ටෙ කෝච්ගෙ අතකට හේත්තු වෙලා ඉඳලා.. කෝච්චුත් හොඳටම නිදි නිසා හොඳයි.. නැත්නම් පණ නෑ කියලා මට ඒකටත් බැනුම් අහන්න වෙනවා..

කොහොම හරි චැන්ගි වලට ලැන්ඩ් කරද්දි අපි මිනිත්තු විස්සක්ම කලින් ඇවිල්ලා තිබුණා.. මම ගලවලා හතර අතේ දාලා තිබ්බ ශූස් දෙක දාගෙන ජනේලෙන් එළිය බලාගෙන ආවා.. තමන්ගෙ රටෙන් වෙන රටකට ආවහම.. ඒ දැනෙන හැඟීම මම පළවෙනි වතාවට අත් විදින ගමන් හිටියා.. දැන් තියාම මහා ආගන්තුක හැඟීමක් දැනෙනවා.. වලාකුළු ජනේලෙට පහළින් තිබුණේ.. ඒවා පුළුන් ගොඩවල් වගේ.. ඒත් හැන්දෑ කළුවරත් එක්ක සිංගප්පූරුව තනිකරම උඩට පේන්නෙ ලයිට් හවුස් එකක් වගේ.. පුදුම ලස්සනක් තියෙන්නෙ.. මම ඇස් දෙකත් ලොකු කරගෙන කටත් අරගෙන ඒ දිහා බලාගෙන හිටියා..

" Singapore Airlines would like to give you a warm welcome to Changi Airport, where the local time is currently 18:00..

We are pleased to say the landing is approximately 20 minutes ahead of schedule, and we hope you have enjoyed the flight with us today..

The aircraft is still taxiing and customers are reminded to remain seated with their seatbelts fastened until the seatbelts signs are switched off..

We will be arriving at Terminal 2, and for customers with checked luggage, a reminder that our flight number today is the FBN123..

When we do arrive at the stand, please be careful when opening the overhead lockers, as items may have moved during flight..

Finally, thank you for flying with Singapore Airlines, especially our partner flier members, and our own Deluxe cardholders, your loyalty is hugely appreciated.."

එකදිගට තඩි හැලි එනවුන්ස්මන්ට්ස් වගයක් යද්දි මම ජනේලෙන් එළිය බලාගෙන ආවා.. පැත්තෙන් පේන තට්ටක් දැක්කහම මම පණ දාගෙන ඒ ලෙවෙල් කාලෙ පිසික්ස් වල බ'නූලි මූලධර්මය දාලා හදපු ගණන් මතක්

@Shan

වෙනවා.. වාත ප්‍රතිරෝධයයි.. ඒවට දාන සූත්‍රයි.. තටුවෙ ඉහළ කොටසෙ පීඩනෙයි.. පහළ කොටසෙ පීඩනෙයි.. තටුව මත යෙදෙන බලයයි.. වාත ස්ථර වේගයයි.. සම්ප්‍රයුක්ත බලයයි.. රධ්‍ය අයියගෙ ආසම ගණන්.. මට ජේන්න බෑ.. ඒ වුණාට ඉතින් ටොකු කකා කොහොම හරි හැදුවනෙ.. මේකෙ මුහුදු මට්ටමේ ඉදලා නියත උසකින් යද්දි එසවුම් බලය උත්පාදනය වෙන හැටි හොයන්න ගිහිල්ලම මම හිතුවෙ මගේ ඔලුව මැද්දෙන් වළක් හැදෙයි කියලා.. ප්ලේන් එකක් දුන්නු වදයක්..

චැන්ගි එයාපෝට් එක ගැන කියනවනම්.. ඒක දැක්කම පිස්සු හැදෙනවා.. ග්‍රීන් කන්සෙප්ට් එකට හදපු හෙන විසාල එයාපෝට් එකක්.. පුදුම ලස්සනයි.. ඒකෙ මැද්දෙ වෝට ස'කල් එක තද නිල් පාටට තිබුණෙ.. හුහක් සෙනග එහා මෙහා යනවා.. එක එක භාශාවලින් කතාකරනවා.. ඇත්තටම මම මේ ලෝකෙ කොච්චර පුංචි මනුස්සයෙක්ද කියලා මට දැනෙනවා.. මම මගේ කළුපාට ලැගේජ් එක උඩින් බැක් පැක් එක තියලා ඒකත් තල්ලු කරගෙන එක්සිට් එක ගාවට ගියා.. හැමතිස්සෙම වගේ කෝච් මං ගාවින් හිටියා.. වෙන රටක ඉදලා ගන්න හුස්ම පවා වෙනස් කියලා මට දැනුණෙ එවෙලෙයි.. මම ජැකට් එක ගලවලා අරගෙන ඒක ඉණේ බැදගත්තා..

රෑ වෙන්න කිට්ටුව නිසා.. සිංගප්පූරුව එකම පාට පාට ලෝකයක් වගේ.. ඇත්තටම මේ හැමදේටම සල්ලි ඕන නේද කියල මට හිතුණා.. ටුවර් එකට ස්පොන්සර් කරන අයම ට්‍රාන්ස්පෝට් හොස්පිටැලිටි පවා හොඳටම රෙඩි කල්ලා තිබුණා.. මාත් එක්ක හිටියේ තව ලොකු අයියලා දෙන්නෙක්.. එයාලා කලින් ඉදන් මම අඳුරන අය.. පාඩුවෙ ඉන්න සයිලන්ට් කැරැක්ටර් දෙකක්..

අපිට නවතින්න රෙඩි කල්ලා තිබුණෙ චැන්ගි කෝව් කියලා හොටෙල් එකක.. ඒකෙ තමා ටුවර් එකට ජොයින් වෙන හැමෝම නැවතිලා හිටියෙ.. මම මගේ රූම් එකේ කී එක ඉල්ලගෙන ලැගේජ් එක හෙල්පර් කෙනෙක්ට දීලා රූම් එකට ආවා.. කෝච් හිටියෙත් මේ ෆ්ලෝ එකේමයි.. අර අයියලා දෙන්නගෙ රූම්ස් මගේ එකට ඉස්සරහා තිබුණේ.. මම කෝච්ටත් කියලා රූම් එකට ඇවිත් දොර වහගත්තා..

ඊටපස්සෙ හොඳ හුස්මක් ගත්තා.. දුවගෙන දුවගෙන ගිහින් ඇඳට පැන්නා.. සපත්තු දෙකත් කොහේටද මන්දා විසි වුණා..

මම තාම ඉන්නෙ අදහගන්න බැරුව මොකුත්ම.. !!

@Shan

එහෙමමම බෙඩ් ස්ටෑන්ඩ් එක උඩ උස ග්ලාස් එකක නිල් පාට බීම එකක් තියනවා දැකලා ඒකත් අරගෙන මම මොනවද කියලා බලන්නෙ නැතුව බීගෙන බීගෙන ගියා.. ඒ කාමරේ තනිකර සුදුපාටයි.. ටීවී එකකුයි කබඩ් එකකුයි ටේබල් එකකුයි.. හරිම චාම්.. ලස්සන සිංගල් රූම් එකක්.. මම ඒක පස්සෙ බලන්න තියාගෙන අම්මට කෝල් එකක් ගත්තා.. කොහෙ ගියත් මුලින්ම මතක් වෙන්නෙ අම්මවනෙ..

අපේ අම්මට විස්තර කියලා ආච්චිවත් මතක් කරන්න කියලා හැරෙන තැපෑලෙන් රධ්‍යා අයියට කෝල් එකක් ගත්තා.. වෙනදා වගේම රින්ග්ස් දෙකතුනක් යද්දි එයා ආන්සර් කළා..

" වරද්.."

" මම හොටෙල් එකට ආවා.."

" හැමදේම හොඳින් නේද.."

" ඔව්.. ඔයා කොහේද ඉන්නෙ.."

" මම හොස්පිට්ල් ඉන්නෙ වරද්.. අයියට හවස සිහිය ආවා.."

මම නැගිටලා ඇඳෙන් ඉඳගත්තා..

" ආධ්‍ය අයියට මොකද අයියෙ..!"

" දැන් නම් ඉන්නවා.. මාමා ගෙදර ගියා ඇඳුමක් දාගෙන එන්න කියලා.. එතකල් මම ඉන්නවා.."

" අයියට කතාකරන්න අමාරුනෙ මාස්ක් එක නිසා.."

" ඔව්.. මම කියන්නම් ඔයා මතක් කළා කියලා.."

" හා.. ඔයා කෑම කාලද ඉන්නෙ.."

" තවම නෑ.. ඔයා..??"

" මමත් නෑ.. මතක් කල්ලා වෙලාවට කෑම ගන්න.. හරිද.. අසනීප වෙන්න එපා.."

@Shan

" I miss you.."

රඩ්‍ය අයියා හුස්මක් පහළ දානවා මට ඇහුණා.. මම ෆෝන් එක අනිත් කනට මාරු කරගත්තා.. මට එයාගෙ රූපෙ මගේ හිතේ මැවෙනවා..

" I really miss you too, it's not the same without you.."

" ඔයාට මහන්සි වරද්.. රෙස්ට් කල්ලා මට කෝල් එකක් ගන්න.. මම බලන් ඉන්නවා.."

" පරිස්සමින් ඉන්න අයියෙ.."

මම කෝල් එක කට් කල්ලා ෆෝන් එක පැත්තකින් තිබ්බා.. ඇත්තටම මහන්සි මට නෙමෙයි එයාට කියලා.. මට කටහඩින්ම තේරෙනවා..

දළඹුවොන්ගෙ නරක සමනලයා පාසැල් යන්නයි යන්නෙ..





Changi airport in Singapore..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 141 කොටස

මම පහුවදා උදේම නැගිටලා ප්‍රැක්ටිස් යන්න ලෑස්ති වුණා.. මට මැචස් පටන්ගන්නෙ හෙට.. ඉතින් අද දවසෙ උදේ ප්‍රැක්ටිස් වලට ගිහින් හවස රෙස්ට් එකේ ඉන්න කියලා කෝච් කලින්ම කිව්වා.. අන්තිම මොහොතෙත් නැහෙන්න ඕන නැහැ කියලා.. ඉතින් මම උදේ කෝචුයි අනිත් අයියලා දෙන්නා එක්කයි ප්‍රැක්ටිස් ගියා..

අලුත් රටක පළවෙනි වටාවට ඇහැරෙද්දි.. ඒක මට හුඟක් අමුතු අලුත් අත්දැකීමක් විදියට දැනුණෙ.. අලුත් මිනිස්සු.. අලුත් භාශාවල්.. අලුත් වටපිටාව.. ඒ හැමදේමත් මගේ හිතේ ආගන්තුකයෙක් කියන හැඟීම ඇතිකරනවා.. කෝච් ඉඳලා හිටලා මට කිට්ටු වෙලා වටේ පිටේ තියන දෙයක් ගැන කියලා දෙනවා.. ඒ ඇරෙන්න උදේනම් විශේශෙන් කතාකළේ නෑ.. හවස ෆ්‍රී නිසා අනිත් අයියලා දෙන්නා ඇවිදින්න යන්න මටත් කතාකළා.. ඒ වුණාට මට ඉන්නවා මහ උද්ධච්ච අමුතු කෝච්කාරයෙක්.. ඒක නිසා ඌ කෙලින්ම 'එපා!!!' කියලා මූණටම කිව්වා..

රධ්‍ය අයියා උදේ කතාකල්ලා එයා ඉස්කෝලෙ ගියා කියලා කිව්වා.. එයා සතියෙ දවස් පහම යන්න එපැයි ඉතින්.. ඒ ඇරෙන්න මාමා කතාකල්ලා විස්තර ඇහුවා.. ආධ්‍ය අයියා හොස්පිටල් එකේම ඇඩ්මිට් කල්ලා තාම එයාට කතාකරන්න පුළුවන් ගාණක නෑ කියලත් කිව්වා.. මට ආධ්‍ය අයියා ගැන මතක් වෙද්දි පපුව හිරිවැටීගෙන අමුතු බයක් හිතේ දහලනවා.. අනික එයාලා මගෙන් මොනවහරි හංගන්න ට්‍රයි කරනවා කියලත් මම දන්නවා.. විශේෂෙන්ම රධ්‍ය අයියා කතාකරන විදිය පවා අමුතුයි.. එයා ඉන්නෙ මේ කියන දේත් මේ අමතක වෙන තරම් කලබලේක.. මට ඒක එයා එක්ක කතාකරන හැම වතාවකම දැනෙනවා.. අනික මේ වතාවෙ මොකක් හරි වැරැද්දක් මට තේරෙනවා.. කොහේ හරි ලොකු අවුලක් තිබ්බත් මම ඒ ගැන මොකුත්ම දැනගන්න ට්‍රයි කරන හැම වතාවකම මාමා හරි රධ්‍ය අයියා හරි කතාව වෙන පැත්තකට හරනවනවා..

හවස මම හොටෙල් එකේ පැත්තක මේන්ටේන් කරන් යන ගාඩ්න් එක හරියට ගිහිල්ලා ඒ බැක්ලනි එකේ ඉඳන් පහළ බලාගෙන හිටියා.. මට හුඟක් ලොකු පාළුවක් දැනෙනවා.. අර මට උණුහුමක් ලැබෙන ගෙදර මම දාලා ආවා වගේ.. රධ්‍ය අයියා, මාමා, අයියා එයාලව මට මතක් වෙනවා..

@Shan

මම ඇයිද කියන්න දන්නෙ නෑ.. අපි සතුටින්ම හිටපු කාලෙ ආයෙම මතක් වෙනවා..

මම බැල්කනි වැටට අත් දෙක තියාගෙන පහළ බලාගෙන ඉද්දි මගේ එහාපැත්තෙන් ඇවිත් කවුරු හරි අත් වැටට බරවුණා..

" ඔතනින් පනින්නද හදන්නෙ..!"

මම ගැස්සිලා එහාට වුණා.. මේ වෙළසුමනයා..! ජීවිතේට හොඳින් කතාකරන්නෙ නෑ කියලා මම ලංකාවට ගියාම ඉන්ටවීව් එකක් තිබ්බොත් කියනවා.. ඇත්ත වශයෙන්ම මගේ කෝච් මට සලකන්නෙ හරකෙක්ට වගේ.. කිසිම නිදහසක් දෙන්නෙ නෑ. කටු කැලේ ගාල නොලිහා වද දෙනවා කියන්නෙ.. අපරාදෙ මම මූට හදාගෙන එන කවි.. ඒ කවි ටික එකතුකරන් ගිහින් තාන්වී අක්කට කිව්වනම් වටිනවා.. හිත හොඳ ගැණුළමයනෙ..

" මෙතනින් පැන්නොත් මැරෙයිද සර්.."

" පැනලා බලන්න.. මට ඒක ගැන හරි අදහසක් නෑ.."

මම කෝච්ට රවලා ඈත පේන පොඩි බිල්ඩින් එකක් දිහා බලාගෙන හිටියා.. අපරාදෙ ඇහුවෙ.. කෝච්ට බැරිද දන්නෙ නෑ  මෙතනින් පැනලා මැරුණෙ නැත්නම් ඇවිත් මට කියන්න..

" වෙ-ළ-සු-ම-න-යා.."

" මොකක්ද තමුන් කිව්වෙ.."

" ආ.. මම..??"

මම මූණ ඉසකුඩිච්චියක් කරගෙන සර් දිහා හැරිලා බැලුවා.. මට දෙයක් අහන්නත් තියනවා කෝච්ගෙන්.. හම්බුණු එක හොඳයි..

" ඔව්.."

" මට පොඩ්ඩක් කතාකරන්න පුළුවන්ද සර්.."

කෝච් මං දිහා බලලා වෙන පැත්තක් බලාගෙන ඔලුව වැනුවා..

@Shan

" මට මැච් එක ඉවරවුණ ගමන්ම ආයෙම යන්න පුළුවන්ද සර්.."

" හේතුව..??"

" අ.. මගේ එක්සැම් රිසාල්ට් එනවා මේ සතියෙ.. තව.. තව ගෙදර පොඩි ප්‍රශ්ණ වගයක් වෙලා.. මම අනිවාරෙන්ම ඉන්න ඕන ගෙදර මේ වෙද්දි.."

" ම්ම්.. හොඳටම විශ්වාසද කලින් යන්න ඕන කියලා.."

" ඔව්.."

" මම කතාකල්ලා බලන්නම්.. එහෙම වුණොත් මැච් එක හෙට ඉවරවෙලා, අනිද්දා රෑට තියන ෆ්ලයිට් එක බුක් කරන්නද.."

" ඇත්තටම මට ඒක ලොකු දෙයක් සර්.. තැන්කිව් සෝ මච්.."

" ම්ම්.. Take your time.."

කෝච් මගේ පිටට තට්ටුවක් දාලා හොටෙල් එක ඇතුළට ගියා.. වේළුසුමනයා ඉතින් වෙලාවකට හොඳ ළමයෙක් වගෙත් ඉන්නවා.. කෝච්ට තේරෙනවනම් ප්‍රශ්නයක් කියලා හරස් ප්‍රශ්න නාහා ඒ වැඩේ මාට කරන්න ඉඩ දෙනවා.. ඒ ගතියට මම හුඟක් කැමතියි.. කෝච් අර නපුරුයි කියලා පෙන්න ට්‍රයි කළාට ඇතුළතින් ඉන්නවා හරිම සොෆ්ට්-හාටඩ් මනුස්සයෙක්..

ඒ එක්කම මට චමිරුගෙන් කෝල් එකක් ආවා..

" හලෝ ෂනෙරු.."

මට ෆෝන් එක එහාපැත්තෙන් ඒ අරෙයි කටහඬ ඇහුණා..

" කියහන්.. උඹ ඉස්කෝලෙ ගියාද අද.."

" ම්ම්.. ඉස්කෝලෙ වැඩ ශේප් එකේ යනවා.. උඹට කොහොමද.."

" අවුලක් නෑ බං.."

@Shan

මම ඇවිදගෙන ගිහින් එතන තිබ්බ සෝෆා එකෙන් ඉඳගත්තා.. මාව ඒකෙ හෙන ඇතුළට එබුණා..

" රිලැක්ස් එකේ ඉඳලා ප්ලේ කරහන්.. වැඩිය ස්ට්‍රෙස් වෙන එපා.."

" ඒ මෙහේ මරුනෙ ඕයි.. උඹනම් ගෙදර යනවා එනවා වගේ එනවනෙ.."

" මරු තමා.. පරිස්සමින් ඉඳහන්.. නොදන්න ලබ්බවල් වල ඇවිදින්නෙ නැතුව.."

" ඈයෙ හා.. උඹ කියන්නකල් මම මේ හිටියෙ.. දැන් කිව්වනෙ.. යන්නෙ ඝෘ හලෝ.."

චමිරුට ලාවට හිනායනවා මට ඇහුණා..

" එහෙනම් හොඳට ප්ලේ කරහන්.. මම නිකමට ගත්තෙ.. මැරිලද බලන්න.. මැරිල නැත්නම් අවුලක් නෑ.. බායි.."

චමිරුවා එකසැරේම ෆෝන් එක කට් කලා.. අනේ මට ඌ එක්ක කොහොමත් කතාකරන්න ඕන නෑ තමා.. ඇයි ඌ එක්ක කතාකලාම මට හතරමහ නිධානෙ පහළ වෙනවද නෑනෙ.. මැරිලද බලන්න අනික මට අරගෙන අහරියනවද.. ගොං පරෙයියා.. මැරිලනම් මම කොහොමද ෆෝන් එකට ආන්සර් කරන්නෙ..

මම රධ්‍ය අයියගෙ නම්බර් එක ඩයල් කල්ලා ෆෝන් එක කනේ ගහනෙන ශෝට් එකේ සාක්කුව හරියෙන් තුළක් ඇදලා ගත්තා.. මාමණ්ඩියවත් ආන්සර් කළොත් තමා සනෙරු උඹට ධූමකේතු පේන්න ගන්නෙ.. ගෙදර නෙමෙයිද දන්නෙ නෑ.. උදේ මට කිව්වෙ ඉස්කෝලෙ ගිහින් හොස්පිටල් යනවා කියලනෙ.. අසලි අම්මගෙ ෆෝන් එකත් සතියක ඉඳලා වැඩ කරන්නෙ නෑ.. මම ගන්න ට්‍රයි කලා.. ටෙක්ස්ට් කළා.. ඩේටා ඕන් කල්ලත් නෑ.. රධ්‍ය අයියට කතාකළෙත් නෑ කියලා මට කිව්වෙ..

" වරද්.."

රධ්‍ය අයියගෙ කටහඬ ඇහෙද්දි මගේ හිතට සතුටක් එක්ක හරි හුරුපුරුදු ගතියක් දැනෙන්න ගත්තා..

@Shan

" ඔයා මොකක් හරි වැඩක නෙමෙයි නේද ඉන්නෙ.."

" මම ගෙදර ඉන්නෙ.. ඔයා මොකද කළේ.."

ඒ එක්කම රධ්‍ය අයියගෙන් වීඩියෝ කෝල් එකක් ආවා.. මම කොණ්ඩෙත් පොඩ්ඩක් හදාගෙන සෝෆා එක උඩට කකුල් දෙකත් අරගෙන හාන්සි වෙලා කොට්ටයක් ඔලුවට තියාගත්තා.. මේ වගේ සෝෆා එකක් ඕන ගෙදරකට ගන්න.. කෙලින්ම ඒකෙ වාඩිවුණාම එබෙන නිසා නැගිටගන්න බැරිවෙනවා.. මට ආදරේ සෝෆා එකක්..

" සුදුඅම්මියා නිදාගත්තද.."

" ම්ම්.."

රධ්‍ය අයියා කොණ්ඩෙත් අවුල් කරගෙන කොට්ටයක් බදාගෙන මූණෙ බාගයක් පේන විදියට ෆෝන් එක ඉස්සරහින් තියාගෙන හිටියා..

" පාළුයි අනේ.."

" පැල් කවියක් කියහන්.. පාළුව යන්න.."

මම රධ්‍ය අයියට දෙකක් රැව්වා..

" තව්සෙට වැඩක් නැනෙ.. මම මොන කවි කිව්වත්.."

" ම්ම්.."

මම රධ්‍ය අයියට මිඩ්ල් ෆින්ගර් එක පොයින්ට් කළාම එහාපැත්තෙනුත් මට ඒ වගේම රිප්ලයි එකක් ආවා.. ඒ එක්කම ෆෝන් එක සලබලාන් ගාල බිම කාපට් එක උඩට වැටුණා.. මගේ නෙමේ රධ්‍ය අයියගෙ.. මට කැමරා එකෙන් කියාරගෙ හොම්බ පේනවා.. මෙකි යකෝ.. පුදුම ආදරයක් හිතෙන්නෙ මට කියාරා ගැන.. හැමදාම කෝල් එකක්  ගත්තොත් එනවා දුවගෙන ලෝකෙ එහා කොනේ හරි ඉඳලා..

" කියාරා.. එහාටවෙන්න.."

*බුහ්* *බුහ්*

@Shan

" එයා ඕකෙ ඇතුළෙ නෑ.. කවර් එක හපන්නෙ නෑ කියරා!!!"

කියාරා ෆෝන් එක ඉව කල්ලා දිවත් ඇදගෙන මගේ දිහා බලාගෙන ඉඳියම මම කියාරට අතක් වැනුවා.. රධ්‍ය අයියා ෆෝන් එක අහුල ගත්තා..

" අප්පච්චි ගෙදර වරද්.. ඒකයි මෙයාලා කාමරේ.."

" ආ.. අද කලින්ම ඇවිල්ලද අප්පච්චි.."

" ඔව් අද ගෙදර එයාගෙ යාළුවො වගයක් ඇවිල්ලා.."

අම්මටසිරි අධිකාරි මාමණ්ඩිට යාළුවොත් ඉන්නවලුද..

" අහ්.. අයියව බලන්න ගියාද ඔයා.."

රධ්‍ය අයියා ආයෙම ඇදෙන් හාන්සිවුණා..

" ගියා ඉස්කෝලෙ ඉවරවෙලා.. අයියා අමාරුවෙන් ඉන්නෙ වරද්.. අනික මාමා මොකුත් කියන්නෙත් නෑ.. මට එන්න එපා කියලත් කිව්වා.."

" ඒ මොකද.."

" අප්පච්චි කැමති නෑ මම අයියා බලන්න යනවට.. බැරිවෙලා හරි අප්පච්චි හොස්පිටල් එකට ඇවිත් මාමව දැකලා කලබලයක් කළොත් කියලා.."

" එතකොට අප්පච්චිට පොඩිම උවමනාවක්අත් නැද්ද ආධ්‍ය අයියා ගැන දැනගන්න.."

" නෑ.. එයා හිතන්නෙ අර නෙතුද කව්ද අයිය බලන්න යනවා කියලා.."

" ම්ම්.. මට චමිරු කතාකළා.."

" මට ඉස්කෝලෙදි හම්බුණා."

රධ්‍ය අයියා බැන්ඩේජ් කරපු අත පොඩ්ඩක් ගසලා ඒ අත පැත්තක ඉඳපු රෙක්සිගෙ මූණ ගාවින් තියාගත්තා..

@Shan

" අපෝ මෙ රෙක්සිනම් මහ කම්මැලි එකෙක් ඒයි.. ජ්ස් මෙ.. අක්කෙ.. නැගිට්ටිනවකො.. මෝඩ රෙක්සිකා.."

රෙක්සි මම කියපු මෙලෝ මගුලක් ඇහුණෙ නෑ වගේ මූණ අනිත්පැත්තට හරවගෙන ඇස් පියාගත්තා.. රධ්‍ය අයියා ඒකට හිනාවුණා..

" ඔයාව ගණන් ගන්නෙ නෑ වගේ නේද.."

" හනෙහ්.. මාව ගණන් ගන්න ඕනත් නෑ.. මගේ ගාණ එයාට ගෙවන්න බෑ.."

" ගාණ කීයද.."

මම රධ්‍ය අයියට දෙකක් රැව්වා.. පෙනේද මෙ මිනිහා කියන කතා.. ගාණ කීයද අහනවා.. රධ්‍ය අයියා හෙන මනමාල හිනාවක් දැම්මා..

" ඇයි ගන්නද.."

" ඔව්.."

" හෙන ගණන්.. ඔයාට ගෙවන්න බෑ.."

" දියමන්ති වලින්ද හදලා තියෙන්නෙ.."

" අනේ මෙ දැන් කාලෙ වකුගඩ්ඩක්ම කීයක් වෙනවද ඒයි.. මගේ හදවතයි, මොලෙයි, අක්මාවයි, පෙනහළුයි, ඇටකටුයි ඔක්කොම ගත්තොත් කෝටි හයසීයක්වත්..?? ඔව් ඔව් එච්චර විතර වෙනවා.. කෝටි හයසීයක් ගෙවලා මාව අරගෙන යන්න පුළුවන්.."

" කාඩ් ද කෑශ් ද.."

" අයියෙ!!!"

මම කෑගැහුව පාර එතනින් ගියපු රූම් බෝයි කෙනෙක් බයවෙලා මං දිහා බැලුවා.. මම උගුට පොඩ්ඩක් හිනාවුණාම රධ්‍ය අයියා මූණ ඇදකරගත්තා..

" ඒ කවුද.."

@Shan

" දන්නෙ නෑ අනේ.. ස්ටාෆ් එකේ කවුරුහරි.."

" හිනාවෙන්නෙ මොකටද.. පාඩුවෙ ඉඳපන් හැම එකා එක්කම හිනාවෙන්න යනවා.."

මම ෆෝන් එක ඇස් දෙකටම ළං කරගත්තම රධ්‍ය අයියා එහාට ගියා.. ස්ක්‍රීන් එකෙන් මාව පිටසක්වල ජීවියෙක් වගේ පේනවා.. හරි කැතයි..

" මාගේ ඇස් දෙස බලනූ.."

"...."

" මෙතැන් පටන් නුඹ කොට්ටෝරුවෙක්.. කොට්ටෝරුවෙක්.."

"....."

" කොටෝරුවෙක් උන පලියට මෙතන කෙහෙල් ගස් වලට කොටන්න යනවා නෙමෙයි.. හොට ටැපලුනොත් කව්ද ලිහන්න එන්නෙ.. මම නම් එන්නෙ නෑ.. මට හුඟක් වැඩ තියන මනුස්සයෙක් ඔයා දන්නවනෙ.."

" ඔව්.. ගැණුන්ගෙ දුක අහ-"

" මේ මේ!! ඔක විතරක් කියන්න එපා හරිද.. මම මේ තමුන්ගෙ හොඳට දෙයක් කිව්වම එනවා මෙතන කට ගහගෙන.. හපනවා පස්ස කැල්ලක් ගැලවිලා යන්න.. තේරුණාද.. වරද් කියන විදියට ඕන ඉන්න.. මම දැන් ඔයාව කොට්ටෝරුවෙක් කල්ලා තියෙන්නෙ.. හොට පටලගන්නෙපා.. කෙහෙල් ගස් වලට කොටලා.."

" මුලින්ම දැක්කෙ කෙහෙල් ගහක් තමා හැබැයි.."

" මොකක්ද කිව්වෙ!!"

" ඒකට කොටන්න ගිහිල්ලා හොට පැටලුණා.. නේද කියාරා.."

*බුහ්*

" තව්සෙ මටද කෙහෙල් ගහ කියන්නෙ.. ආ.. ඔව් මම තමා කෙහෙල් ගහ.. මෝඩ හැලපයා.."

@Shan

රධ්‍ය අයියා කොට්ටෙට මූණ තියාගෙන මගේ දිහාබලාගෙන හිටියා.. මම අහක බලාගත්තා.. මට ඕන නෑ බලන්න..

" වරද් කාමරේට යන්න.."

මම නැගිටලා ෆෝන් එකත් මූණට හරෝගෙන මොකාද එකා වගේ කාමරේට ඇවිදගෙන ඇවිදගෙන ගියා.. කැමරේට යන්ඩඩ යැයි යැයි තමා.. මූ මට කෙහෙල් ගහ කිව්වනෙ.. අපහස කරන එකේ සීමාවක් නෑ.. මම නිසා මේවා ඉවසගෙන ඉන්නෙ.. කලිසමට බූමිතෙල් හාලා ගිනිතියන්න හිතෙන්නෙ මේ වගේ වෙලාවල් වලට තමා.. මම කාමරේට ගිහින් ඇඳට පැනලා උඩ අතට හැරිලා මොකාද එකා වගේ හිටියා.. ඒත් මගේ හිතට ගලාගෙන එන්නෙ මහ කුපාඩි අදහස්මයි.. සෙනුකයා තමා මේවට වගකියන්න ඕන.. මහපගයා කැවද දන්නෙත් නෑ..

" daddy~, daddy~, if you want it, drop the add'y.."

මම ඇහැ කොනෙන් කුප්ප හිනාවක් දාගෙන රධ්‍ය අයියා දිහා බැලුවම ඒකා අහක ඉන්න කියාරව අතගානවා මම කිව්ව එක ඇහුණෙ නෑ වගේ..

" Give me love, give me Fendi, my Balenciaga-"

"....."

රධ්‍ය අයියගෙ කම්මුල් දෙක රතුම රතු වුණා.. මට හයියෙන් හිනා ගියා.. අනේ මේ මනුස්සයා..

" daddy~"

"....."

" You know what you'd look good in..? My bed.."

" Really.. stop joking around.."

රධ්‍ය අයියා ඇස් දෙක කරකලා ආයෙම කියාරා දිහා බලාගත්තා..

" අනේ මේ ගැණුලමිස්සි වෙන්නෙ නැතුව මේ බලනවකො අයියෙ.."

@Shan

" මිම්..??"

" පොඩ්ඩක් ටර්න් ඕන් වෙයන්.. රෙද්ද.. මට මල පනිනවා දැන් නම්.."

" උඹ ඕවට කවදාහරි පසුතැවෙනවා.. බලන් ඉදපන්.."

මට හිනාගියා.. හිතාගෙන ඇත්තෙ එහෙම තමා..

" මේ මම..?? තව්සෙ දන්නෑ මගෙ හැටි.."

" එහෙමද.."

" ඔව්.."

රධ්‍ය අයියා මගේ දිහා බැලුවා..

" Do you know.. what my fav cocktail is..??"

" Mine is 'sex on the beach.."

" Mine is sex on a drive-way.."

" Awesome.. with you.."

" සෙක්ස් ඔන් ද බීච් තමා.. ඒක බීලා වැනි වැනි කියපුවා මම කියන්නද.."

" අයියෙ.."

මම රධ්‍ය අයියට දෙකක් රැව්වා.. මූගෙ ආච්චිට හාල් ගරන්න.. හැම ලබ්බම මතක තියාගෙන ඉදලා සැරින් සැරේ මතක් කල්ලා මට එක එක කතා හදනවා.. ඊටපස්සෙ ටික වෙලාවක් කිසි කතාවක් නැතුව එහෙමම හිටියා.. මගේ කාමරේ පොඩිම පොඩි සද්දයක් වත් නෑ..

" අම්මා කතාකලාද වරද්.."

" නෑ.. මම අපේ අම්මගෙනුත් ඇහුවා.. නෑ කියලා කිව්වෙ.."

" මිම්.."

@Shan

" මම ට්‍රයි කළා ගන්න.. සමහරවිට ෆෝන් එක කැඩිලද දන්නෙ නෑ.. අනික මම මැච් එක ඉවරවුණ ගමන් එනවා.. කෝච් කිව්වා කමක් නෑ කියලා.."

රධ්‍ය අයියා ඇස් දෙකත් ලොකු කරගෙන මගේ දිහා බැලුවා.. එයාගෙ ඇස් දිලිසෙනවා.. එකසැරේම පුදුම වුණාම..

" ඔයා එනවද.."

" ම්ම්.."

" එක හොදයි.. හෙට මැච් එක හොදට ප්ලේ කරන්න වරද්.."

" I try my best.."

" ඔයාට පුළුවන්.."

තව ටික වෙලාවක් කිසිම සද්දයක් නැතුව ගෙවිලා ගියා.. මට දැනෙනවා අපි හදාගෙන තියන ලෝකෙට පිටින් ඇත්ත කතාකරන්න ගියාම.. අපි දෙන්නටම කතාකරන්න මොකුත් නැතිවෙනවා කියලා.. කතාකරන්න ගියොත් කවුරුහරි කෙනෙක් අසරණ වෙනවා.. මගේ ප්‍රශ්න වලට එයාට උත්තර දෙන්න බෑ වගේම එයාගෙ ප්‍රශ්න වලට මට උත්තර දෙන්න බෑ.. අනික ඒවා අහන්න පුළුවන් දේවලුත් නෙමෙයි.. අපි දෙන්නම අකමැතියි හිත රිදෙන දේවල් කතාකරන්න..

" හැමදේම හොඳින් වේවි.. ඔයා හිතනවා කියලා මම දන්නවා.."

" හොඳින් වේවි කියලා මට කියන්න බෑ වරද්.. මගේ වටේ තියන දේවල්, මම ඔයාට හැමතිස්සෙම කියනවා වගේ හරි අමුතු විදියට සිද්ධ වෙන්නෙ.."

" අපි අවසානෙ ගැන විශ්වාස කරමු.. ඔයා දන්නවනෙ.. මම ඔයා මොකක් කළත් ඔයාගෙ පැත්තෙන් ඉන්නවා කියලා.."

" මම දන්නවා.. අද හදිසියෙම අප්පච්චිගෙ යාළුවො මෙහෙ ආවෙ ඇයි කියලා මට තේරෙන්නෙ නෑ.. එහෙම කවදාවත් ඇවිල්ලා නෑ.. මට පහළට එන්නත් එපා කිව්වා.."

" පෞද්ගලික කතාවක්ද දන්නෙ නෑනෙ.."

@Shan

" නෑ.. වෙන්න බෑ.. එයාට එහෙම කතා කා එක්කවත් නෑ.. මම හොඳට දන්නවා ඒක.."

" ඒත් ඔයා රණ්ඩු වෙන්න යන්න එපා.. ප්ලීස්.. මම කැමති නෑ පොඩ්ඩක්වත් ඔයා අප්පච්චි එක්ක රණ්ඩු කරගන්නවට.. ඒකෙන් වෙන්නෙ මේ තියන තත්වෙටත් වඩා දේවල් නරක අතට හැරෙනවා.."

" ම්ම්.. ඔයා රෙස්ට් කරන්න වරද්.. මම කතාකරන්නම්.."

" හරි.. ඔයත් පරිස්සමින් ඉන්න.."

" ඉන්න-"

මම ෆෝන් එක කට් කරන්න ගිහිල්ලත් ආයෙම එයා දිහා බැලුවා..

" ඕ.."

" මමත් ඔයා එක්ක ඉන්නවා.. ඔයාට ඕන හැමවෙලාවෙම.."

මම රධ්‍ය අයියා එක්ක හිනාවුණා..

" මම දන්නවා.. ඔයා ඕනම වෙලාවෙදි මාව හොයාගෙන එනවා කියලා.."

රධ්‍ය අයියත් ලාවට හිනාවුණා.. ආදරේ කරන්න ඕන හිතට සැහැල්ලුවක් දැනෙන්න මිසක් හිසරදයක් වෙන්න නෙමෙයි කියලා මට හැමතිස්සෙම රධ්‍ය අයියා මතක් කල්ලා දෙනවා.. මම එයා කියන සමහර පොඩි පොඩි දේවල්.. නොසලකන්න තරම් හිතෙන පොඩිම පොඩි වචනෙකට පවා.. හුගාක් ආදරේ කරනවා.. මම ඒවා මතක තියාගන්නවා අමතක නොවෙන්න.. ඒවා කවදාහරි ඕන වේවි කියලා මම හිතනවා.. හැම පොඩි දේම මතක තියාගන්න එක..

රධ්‍ය අයියා ෆෝන් එක කට් කලාම මම කාමරේ නිල්පාට පොඩි පොඩි මල් කිණිති තියන සිවිලිම දිහා බලාගෙන හිටියා.. හෙට මට ලොකු දවසක්.. අනිද්දා ගෙදර යන්න පුළුවන්..

නරක සමනලයා ආවා අනේ..

මේ චැප්ටර්ස් බෝරින් ඇති.. අපි ඉස්සරහා ගැන බලමු..

@Shan

හරිතෙ..

ආයෙ හිතුනොත් රටත් එනවලු මම..

එන්නාම්.. ලව් යූ..❤

❤❤❤❤ ඒක හරි ලස්සනයි අනේ..~

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 142 කොටස

" Who is this LITTLE boy.. gosh!! this is so much fun.."

මම මගේ රැකට් එක අතට තදකරගත්තා.. රබර් ග්‍රිප් එකට අත තදවෙලා රතුවෙලා යන්නම..

" Yes.. definitely fun!"

මම නෙට් එක ගාවට ඇවිත් එහාපැත්තෙ ඉඳපු උස පිරිමි ළමයට ෆිස්ට් බම්ප් එකක් දුන්නම ඌ මට නෝන්ඩියට හිනාවුණා.. හැමෝම එක වගේ හොඳයි කියලා අපිට කියන්න බැනෙ.. මේ වගේ හාල්පාරුවොත් ඉඳලා හිටලා මට සෙට් වෙනවා..

මැච් එකේ මගේ රවුන්ඩ් එක පටන්ගද්දි මෙහෙන් වෙලාව දෙකට ඇති.. මට එහාපැත්තෙ හිටියෙ මැලේශියා වලින් ප්ලේ කරන්න ආපු හොම්බට හැටක් අනින්න හිතෙන පිටසක්වල ජීවියෙක්.. ලංකාවෙ මම දැකලා, ප්ලේ කලා තියන ඉන්ඩෝ ස්ටේඩියම් වගේ නෙමේ.. මේක වෙනමම අත්දැකීමක්.. මම මෙහෙම තැන්වල ජීවිතේට ප්ලේ කල්ලා නෑ.. විශේශෙන්ම මෙච්චර සෙනගක් ඉස්සරහා.. කැමරා ඉස්සරහා.. හැමදේම පොඩ්ඩක් විතර මගේ හිතට බයක් ගැස්මක් එකතු කළත් මම හොඳ හුස්මක් අරගෙන පහළට දැම්මා.. කොච්චර කිව්වත් ඉවෙන්ට් එක පටන්ගද්දිම දැනෙන ටෙන්ශන් එක මට හරි හිසරදයක්.. ඉස්කෝලෙ මීට් එකක් නෙමෙයි, මම ලංකාව කොහේහරි නියෝජනය කරනවා කියලා දැනෙද්දි බයයි.. කෝච් කොච්චර රිලැක්ස් වෙන්න කිව්වත්.. ඒක ගේම් එකට එන්ටර් වෙලා විනාඩි පහ හයක් වෙනකල්ම ලොකු ප්‍රෙශර් එකක් දැනෙනවා.. අනික මේක ටීම් විදියට කරන ගේම් එකක් නෙමෙයි නිසා මට ලොකු හිතට අමුතු ගතියක් දැනෙනවා..

ඉස්කෝලෙදි ඕනතරම් වොලිබෝල් බාස්කට්බෝල් හොකී අරවා මෙවා ප්ලේ කල්ලා ඇති.. ඒත් මාත් එක්ක තව ලොකු කට්ටියක් නෙට් එකෙන් එහාපැත්තෙ ඉන්නවා.. බැඩ්මින්ටන් එතෙන්දි හුඟක් වෙනස් වෙන්නෙ හැමතැනම මම තනියමම ප්ලේ කරන නිසා.. මම පොඩිම පොඩි වැරැද්දක් කළත් ඒක සෑහෙන්න හොඳට පේන්න ගන්නවා.. අනික මුළු අවධානෙම ඕඩියන්ස් එකේ මගේ පැත්තට තියනවා..

@Shan

මම නෙට් එකේ ඇතට ඇවිල්ලා කෝච් දිහා බැලුවා.. ඒ ඇස් දෙක කෙලින්ම මගේ දිහා බලාගෙන හිටියා.. හරි තදින්.. උඹ මේක කරන්න ඕනමයි කියලා ඒවා කියනවා.. මම බැන්ඩනා එක උඩට කල්ලා හදාගෙන රැකට් එක අතට තද කල්ලා අල්ලගත්තා..

" Set your goals high, don't stop until you go there.."

මගේ එහාපැත්තෙ හිටිය එකා මට ඇහැක් ගහලා මට සමාන දුරකින් හිටගත්තා.. ප්‍රැක්ටිස් වලදිත් මූ මට කින්ඩිය දානවා.. මූණ ගලවලා අතට දෙන්න හිතයි..

*Whistle sound*

එහාපැත්තෙන් ශටල්කොක් එක හුළං කපාගෙන මගේ පැත්තට එද්දි මම කකුල් දෙක පෝස් එකට තියාගෙන් අප් දිහාම බලාගෙන හිටියා.. ටික ටික මගේ වටේ තියන දේවල් මට ඇහෙන්නෙ නැතුව යනවා.. මම ස්ටේඩියම් එකේ තනිවෙලා කියලා දැනෙද්දි කෝච් සර් මං දිහා බලාගෙන ඉන්න එක මම හිතින් ඇඳගන්නවා..

මට හැමදාම මැච් එකකට යන්න කලින් වගේ රධ්‍ය අයියගෙන් විශ් එකක් ආවා.. මම ඒක බලාපොරොත්තු වෙනවා වගේම එයා ඒක දන්නවා.. එතකොට මම නැගිටලා රෙඩි වෙන ගමන් හිටියේ.. රධ්‍ය අයියා මට කතාකළේ පොඩ්ඩක් කලබලෙන්.. ඒත් එයා ඒක පෙන්නන්නෙ නැතුව ඉන්න ට්‍රයි කළා..

" ගුඩ් මෝනින් වරද්.."

" ගුඩ් මෝනින්.. ඔයා ඉස්කෝලෙ යන ගමන්ද.."

" ආ.?? ඔව්.. මම යන ගමන්.."

" මොකෝ අමුතුවට කතාකරන්නෙ.."

මට ඇහුණා රධ්‍ය අයියා එහාපැත්තෙ ඉඳලා උගුර පාදනවා..

" එහෙම නෑ.. ඔයා රෙඩි වෙනවද.."

" ඔව්.. මම කලබල වෙලා ඉන්නෙ.. අනේ මන්දා.."

@Shan

මම සපත්තු දෙකේ ලේස් එක ගැටගහගෙන ඇඳ උඩ තිබ්බ ජැකට් එක ඇඟට දාගත්තා..

" කලබල වෙලා..?? ඔයා..?? සිරාවට එහෙම ජීවත් වෙනවද.."

" වෙනවා ඉතින්.. මම කලින් මෙහෙම දවසක ඉඳලා නෑ.."

රධ්‍ය අයියා එහාපැත්තෙ ඉඳන් ලාවට හිනාවෙනවා මට ඇහුණා..

" ඉස්සරහට හුහක් ඉඳීවි.. වැඩිය හිතන්න එපා.. ඇයි ඔයා ඊයෙ කිව්ව නේද අවසානෙ විශ්වාස කරනවා කියලා.."

" ම්ම්.."

" අවසානෙ ඔයා ට්‍රෝෆි එක ගන්නවා කියලා විස්වාස කරන්න.. එච්චරයි.."

" හා.. ඔයා අද කතාකරන විදිය මට වැඩිය අල්ලන්නෙ නෑ හැබැයි.. මොකද වුණේ.."

තප්පර දෙක තුනකට එයාවත් මමවත් කවුරුත්ම කතාකළේ නෑ..

" එහෙම නෑ වරද්.. ඔයා අද ප්ලේ කරනවා බලන්න මම එක්සයිට් වෙලා ඉන්නෙ.."

" අහා.. හොඳයි.."

" පරිස්සමට ඉන්න වරද්.. මම ආදරෙයි.. හොඳට ප්ලේ කරන්න.. හරිද.. මම බලාගෙන ඉන්නවා.."

" ම-.."

*රධ්‍ය!!-*

beep beep beep

මම ෆෝන් එක දිහා බලලා ඒක පැත්තකින් තිබ්බා.. හිතට හීනියට රිදුමක් දැනුණා..

@Shan

" මමත් ආදරෙයි.."

ඊළඟට අම්මා කතාකළා ආච්චි අම්මත් කතාකළා.. අද ආශිලාගෙ සෙනුකලාගෙ මහීශලාගෙ අම්මලා අපේ අම්මව බලන්න යනවලු.. අම්මා උදේ ඉඳලා කෑම හදලා ගෙවල් අස් කල්ලා ඒ වැඩලු.. කියාන් අයියට නම් අවුරුදු වගේ ඇති නැන්දම්මා කොළඹින් ගියා කිව්වහම.. ඒත් ආශිලගෙ තාත්තා ගෙදර ඉන්නවනෙ.. කියාන් අයියා මාමණ්ඩිව ගාණට ලයින් කරගෙන ඉන්නෙ.. ඒකනිසා ආශි එක්ක පෙම් බස් දොඩන්න වෙලාවක් හොයාගන්න පුළුවන්.. ඒ ඇරෙන්න සෙනුකයාඉස්කෝලෙ ගිහින් ඇත්තෙ.. ඌ හවස් වෙලා ආධ්‍ය අයියව බලන්න යනවා කිව්වා.. අම්මලා නැතුව ගෙවල් පාළුත් ඇති හැබැයි.. අපේ අම්මා එයාලව හම්බෙන්නෙ හුඟ කාලෙකින්.. පාළුවෙන් ඉඳලා කාලෙකින් යාළුවො හම්බෙද්දි අම්මට සතුටු ඇති.. ඊටපස්සෙ පරිස්සමින් ඉන්න.. කෑම බලාගෙන කන්න.. ඔහොම දාහක් දේවල් කියලා හොඳට ප්ලේ කරන්නත් කියලා අම්මා ෆෝන් එක තිබ්බා.. මාමගෙ ෆෝන් වැඩ නෑ.. කොහොමත් මාමව කන්ටැක් කරගන්න මට විදියක් තිබ්බෙ නෑ.. රධ්‍ය අයියගෙනුත් ඒ ගැන අහන්න බැරිවුණානෙ.. එයාටත් බලන්න යන්න විදියක් නැතුවැති.. මම ඒ දෙන්නා ගැන මොකුත්ම දන්නෙත් නෑ.. ඒකනිසා මම සෙනුකට කිව්වා යන දේවලෙක ගිහින් එන ගමන් හොස්පිටල් එකටත් පලයන් කියලා.. ගිහින් මාමවයි අයියවයි හම්බෙලා එන්න කියලා.. අඩුම තරමෙ එහෙම හරි ඒ දෙන්නා ගැන දැනගන්න..

" Well done..!"

මම එහෙමම බෙන්ච් එකට වැටුණහම කෝච් මට වතුර බෝතලයක් දික් කල්ලා ටවල් එකක් කරට දැම්මා.. මම වතුර බෝතලේ අරගෙන බීගෙන බීගෙන ගියා.. මාත් එක්ක ප්ලේ කරන්න ඇවිත් අලි ලයින් දාපු එකා ඉන්ජර්ඩ් වුණා.. පව් මොකක් වුණත් ඉන්ජර්ඩ් වුණ එකනම්.. ඔකතමයි කියන්නෙ කාටවත් මොකුත් කියලා හිත රිද්දන්න හොඳ නෑ අනිත් පැත්තට ඒවා එනවා කියලා.. ඒ මනුස්සයගෙ නම්බරේ ඉල්ලගෙන ඒක කියන්නත් හිතෙනවා.. අපේ ආගමේද දන්නෙ නෑ.. කර්මය විස්වාස කරනවද අහන්න ඕන..

ඒ හම්බුණ පොඩි බ්‍රේක් එකේදි මම ෆෝන් එක අරගෙන බැලුවා.. හේතුවක් නෑ ඉබේම බැලෙනවා.. මට අමුතු ලෙඩක් තියනවා කොහොමත්.. ඒ විනාඩි පහළොවේ බ්‍රේක් එකෙන් පස්සෙ සකන්ඩ් රවුන්ඩ් එක පටන් ගත්තා.. ඒක

@Shan

හිතුවට වඩානම් සැහෙන්න අමාරුවුණා.. මම මෙච්චර කාලෙකට ප්ලේ කරපු හොඳම ප්ලෙයර්ස්ලා මට පලවෙනි වතාවට හම්බුණේ ඒකෙදි.. ඇත්තටම අපි අතරයි එහාපැත්තෙ අය අතරෙයි සැහෙන තරගයක් තිබුණා.. එකට එක ළකුණු තිබ්බෙ.. මගේ කොණ්ඩෙ දෙපැත්තෙන් පිට දිගේ දාඩිය බේරීගෙන ඇඳුම තෙත වෙනවා.. එන්න එන්නම තරගෙ උණුසුම වැඩිවෙද්දි අන්තිම මොහොතෙ මටහිතුණා මේක කරන්න බැරිවෙයිදෝ කියලා.. ඒත් මම තියන හයිය සේරම එකතුකල්ලා කොහොම හරි ප්ලේ කළා.. දින්නෙ නැතිවුණත්, ගේම් එකට හොඳ අවසානයක් දෙන්න බලාපොරොත්තු වුණත්,

**" Varad Shaneru Udyoga who represented Sri Lanka set the record by winning the first place in the under-twenty-year-old event of the Singapore Badminton Tournament held by the Asian Badminton Clubs Association.."**

මම හිතුවෙවත් නැති විදියට වාසනාව මගේ පැත්තට කැරකුණා..

" The President of the Asian Badminton Club has been invited to the stage to look after the trophy for him who set a new record and gave a competitive match.."

ෆයිනල් රිසාල්ට් කියද්දි මම හිටියේ ඇස් දෙකේ කඳුළු පුරෝගෙන.. කෝච් මට අත්පුඩි දෙකතුනක් දුර ඉඳන් ගහද්දි මම දුවගෙන දුවගෙන ගිහින් කෝච්ව අත්දෙකින්ම බදාගත්තා.. කෝච් අඩි දෙකතුනක් පස්සට ගියත් මාවත් අනිත්පැත්තට තද කල්ලා බදාගත්තා.. ඇත්තෙන්ම මේ ලෝකෙ ඉන්න හොඳම කෝච්, මට හොඳ වැඩිහිටියෙක් විදියට මගේ ළඟින්ම ඉන්න කෙනා විදියට මම එයාට හුහක් ගරු කරනවා.. මට දෙයක් ලැබෙනවද ඒකෙ සම්පූර්ණ මහන්සිය කෝච්ගෙ.. ප්ලේ කළේ මම වුණත් කැපවීම් වැඩිපුර කළේ කෝච්.. මට අමතක නෑ.. කෝච් පලවෙනි වතාවට මම ජීවිතේට දැකලා නැති විදියට මාත් එක්ක හිනාවුණා.. මට සතුටටත් වඩා පුදුමයක් තිබ්බා.. හැමදේම මගේ වටේ වෙන දේවල් ඒ මොහොතෙ මට අස්සනට පෙණුණා.. සතුටු හිතුණා.. හරිම අවංක සතුටක්..මගේ නමත් එක්ක මගේ රටේ නම කියවෙද්දි ඒ දැනෙන හැඟීම..

මම හිතන්නෙ ඒක තමයි මගේ බැඩ්මින්ටන් ජීවිතේ මුලින්ම මට මගේ රට නියෝජනය කරන්න ඕනමයි කියන අමුතු කික් එක දුන්නෙ..

@Shan

මගේ අතට ලැබිච්ච විසාල මල් බොකේ එකයි සෙටිෆිකේට් එකයි ට්‍රෝෆි එකයි අරවා මාවා සේරම උස්සගෙන මම කැමරා එකට පොඩ්ඩක් හිනාවෙලා ඉක්මනට ස්ටේජ් එකෙන් බැහැලා ආවා.. ඒ එද්දිම මට අඩියක් ඉස්සරහට තියන්න වුණේ නෑ කැමරා වගේකුයි මයික් වගේකුයි උස්සගෙන ස්පෝර්ට්ස් චැනල් වගේකින් එතනට කඩාපැන්නා.. මගේ ඇස් දෙකත් ෆ්ලැශර්ස් වලට නිලංකාර වෙලා ගියා..

" What do you think about your victory..?"

මම එකපාරම ටිකක් පුදුම වුණා.. ඒත් ඒකනොපෙන්න ඉන්න ට්‍රයි කළා..

" um.. I'm so happy and surprised.."

කෝච් මාව ඇදලා පිටිපස්සට කළා..

" Excuse me.."

මම කෝච් එක්ක ස්ටේඩියම් එකේ ප්ලෙයර්ස්ලගෙ කැබින් එකට ආවා.. මාත් එක්ක ආව අනිත් අයියලා දෙන්නත් මට විශ් කලා.. හුඟක් අය මට විශ් කළා.. මම මල් බොකේ එක පැත්තකින් තියලා ෆෝන් එක බැලුවහම අම්මගෙන් කෝල් එකක් ඒ වෙලේම ඇවිල්ලා කට් වෙලා.. මම අම්මට ඉක්මනට කෝල් එකක් ගත්තා..

" අම්මා!!"

" සුදුමහත්තයා!! උඹ හොඳින් නේද.."

අම්මගෙ කටහඬේ මම සතුට කියන එක අඳුරගත්තා.. අම්මා මං ගැන සතුටින් කතාකරනවා..

" අම්මා.. මම-මම වින් කළා.."

" මට උඹ ගැන සතුටුයි කොල්ලො.. ඉක්මනට ගෙදර වරෙන්- කෝ කෝ සුදුමහත්තයද.. එහෙට පලයන් දේදුණූ.. මගෙ රත්තරනේ.."

අපේ ආච්චිඅම්මා දනි පනි ගාලා ෆෝන් එක ඇදලා ගත්තම මට හිනාගියා..

" ආච්චිඅම්මෙ.."

@Shan

" දෙයියනේ මගේ කොල්ලා.. උඹට තෙරුවන් සරණයි.. මම දන්නවනෙ මයෙ අම්මා දිනනවාමයි කියලා.. කරදරයක් නෑ නේද.."

" නෑ ආච්චිඅම්මෙ.. මම හොඳින් ඉන්නවා.. මට සතුටුයි හුහක්.. අනේ!!!!"

" ඉක්මනට ගෙදර වරෙන්.. අම්මයි මායි බලන් ඉන්නවා.."

" හරි ආච්චිඅම්මෙ.. මම පස්සෙ ගන්නම් හොදේ.."

" හා නිවිහැලහිල්ලෙ කතාකරන්න බැරියැ.."

මම ෆෝන් එක පැත්තකින් තියලා මුලින්ම මාත් එක්ක ප්ලේ කරපු ඉන්ජර්ඩ් වෙච්ච පිටසක්වලා ගාවට ගියා.. ඒකා මාව දැකලා අහක බලාගත්තා..

" are you alright..??"

ඌ ආයෙම මං දිහා බලලා අහක බලාගත්තා.. පුදුම ලයින් තමා මට දෙන්නෙ..

" Yeh.."

" ගොං හැලපයා.."

මම හිනාවෙලා හරී ලෙංගතු එකා වගේ ඌට කිව්වහම ඌ මගේ දිහා බලාගෙන ඉඳලා එහාට වුණා..

" what did you say.."

" Nothing.. I said get well soon.. Thanks a lot.."

මම පොඩ්ඩක් උගේ විදියට ඔලුව පහත් කල්ලා තැන්ක් කලාම උගේ මූණ තැලිච්ච කෙහෙල් ගෙඩියක් වෙලා ගියා..

" Thank you for what..?"

මම උගේ උරහිසට පොඩි තට්ටුවක් දැම්මා..

" i'm gonna go .. let's get to know each other if we meet again.."

@Shan

මම බෑග් එකත් කරේ එල්ලගෙන කෝච් ගාවට එන්න ආවා.. කෝච් එතන හෙන ලොකු කතාවක නිසා මම අහම්බෙන් හම්බෙන කීපදෙනෙක් එක්ක සුළුවෙන් කතාකල්ලා රධ්‍ය අයියට මැසේජ් එකක් දැම්මා.. සාමාන්‍යයෙන් එයාගෙ ඩේටා ඕෆ් කරන්නෙම නැති තරම්.. සිග්නල් නැතිවුණොත් මිසක්.. ඒත් එහෙට සිග්නල්.. මම මැසේජ් දෙකතුනක්ම යවලා කෝල් එකක් අරගෙන කනේ තියාගත්තා.. එයා ඉස්කෝලෙ ගිහින් ගෙදර එන්නත් වෙලා..

" ඔබ ඇමතූ අංකය ක්‍රියා විරහිත කර හෝ ආවරණ කලාපයෙන් බැහැරව-"

මගේ පපුව එකසැරේට අමුතු විදියට ගැහෙන්න ගත්තා.. මම ආයෙ දෙතුන්පාරක්ම කතාකළත් එයාගෙ ෆෝන් එක ඕෆ් වෙලා තිබුණේ.. ඒක එච්චර දෙයක් නොවෙන්න ඇති.. ඒත් මගේ පපුව උවමනාවට වඩා ගැහෙන ගමන් තිබුණා.. මම කලබලෙන් සෙනුකගෙ නම්බරේට කෝල් එකක් ගත්තා.. උගේ ෆෝන් එක වැඩත් නැති නිසා මහීශට අරගෙන අරගෙන ඒකි අන්තිමට ආන්සර් කලා..

" හලෝ මහීශා.. ඔයාලා කොහෙද ඉන්නෙ.."

" අ-අපි බං.. එළියෙ ඉන්නෙ.. කියහන්.."

" ඔයාලා හොස්පිටල් ගියාද.. ආධ්‍ය අයියට මොකද.."

මහීශා කතානොකර ඉද්දි වෙන කවුරුහරි ෆෝන් එක උදුරලා ගන්නවා මට ඇහුණා..

" අඩෝ ෂනෙරුවා.. මෙහේ අවුලක් නෑ බං.. උඹ හෙට එනවද.."

" සෙනුක මට බොරු කියන්නෙපා.."

මම බෑග් එකෙ පටිය අතට මිරිකගත්තා.. නෑ වැරැද්දක් කොහේහරි තියනවා.. මට ඒක මේ වෙලාවෙ ඉඳන්ම දැනෙනවා..

" බොරු නෙමේ.. ඉස්සෙල්ලම මෙහෙ වරෙන්.. උඹ කලබල වෙන්න ඕන න්-නෑ.."

" සෙනුක!!!!!"

@Shan

සෙනුක ෆෝන් එක කට් කළා.. ආයෙම ගත්තත් ෆෝන් එක ඕෆ් කල්ලා තිබුණේ.. මගේ කකුල් දෙක පණ නැතිවෙගෙන එනවා වගේ මට දැනුනම එතනම බිත්තියට වාරු වුණා.. කෝච් මං ගාවට ඇවිදගෙන ආවා..

" මොකක් හරි ප්‍රශ්නයක්ද.."

" න්-නෑ සර්.. හැ-හැමදේම හොඳින්.."

ඒ එක්කම අනිත්පැත්තට මට කියාන් අයියගෙන් කෝල් එකක් ආවා..

ලස්සන සමනලයො කොහෙන්ද ඔය පාට..

නරක සමනලයා යන්නයි යන්නේ.. අප්පච්චිගෙ යාලුවො ගෙදර ආවෙ ඇයි.. නිකම් එයා අමුතු ලයින් නේතෙ දෙන්නෙ..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 143 කොටස

මම හිටියෙ කටුනායක එයාපෝට් එකේ.. මේ වෙනකල් කියාන් අයියා ඇරෙන්න මට මොකෙක්වත්ම කතාකළේ නෑ.. මම පුදුම විදියට අසරණ වෙලා හිටියෙ.. හවස ෆ්ලයිට් එක අල්ලගෙන කොහොම හරි මම එන්න ආවා.. ඊයෙ මැච් එක ගැන, මම දින්න එක ගැන තිබ්බ සතුට එහෙම්පිටින්ම හේදිලාම ගියා.. මට හිතාගන්න බෑ මම සතුටු වුණාද කියලවත්.. මට තාම කියාන් අයියගෙ කටහඬ ඇහෙනවා ඇහෙනවා වගේ..

" ෂනෙරු පුළුවන් ඉක්මනට එන්න බලපන්.. මෙහෙ මොකක් හරි අවුලක් වෙනවා.."

ඒ එක්කම මගේ අතින් ෆෝන් එක බිමට අතෑරුණා.. කෝච් මාව වාරුකරගත්තෙ නැත්නම් මම එහෙමම ඇදගෙන වැටෙනවා.. ඇත්තමයි මුළු ජීවිතාකාලෙම මෙච්චර මගේ හිත බයවෙලා නෑ.. කලබල වෙලා නෑ.. මගේ පපුව හිරිවැටීගෙන රිදෙනවා.. ඇස් වලින් කඳුළු ගලාගෙන යන්න ඔන්න මෙන්න තිබිලත් මම ඒවා වට්ටන්නෙ නැතුව හිර කරගෙනම එන්න ආවා.. කෝච් හොඳවෙලාවට කවුන්සිල් එකත් එක්ක කතාකල්ලා මට අද එන්න චාන්ස් එක අරගෙන දුන්නා..

මම ලැගේජ් එක අතට තදකරගෙන සෙනුකව හෙව්වා.. සෙනුක මාව ගන්න එනවා කිව්වා.. එතකොට.. එතකොට කොහෙද මගේ මාමා.. රධ්‍ය අයියා.. එයාලනෙ හරිනම් මාව ගන්න එන්නෙ.. මම එහෙමම පුටුවක් උඩින් වාඩිවෙලා මූණ අත් දෙකෙන් පිහිදගත්තා.. එයාපෝට් එකේ නිතර යන එනවුන්ස්මන්ට්ස් මට කරදරයි.. මම කලබල වෙලා.. මගේ අත පය වෙවුලනවා.. මොකද මට දැනෙනවා මොකක් හරි වෙලා කියලා.. මම අත් දෙක එකට ගුලි කරගෙන පපුවට තියලා තදකරගත්තා.. ඒ ගිනිගන්නවා වගේ දැනෙන පීඩනේ එක එක්ක මට පිස්සු හැදෙන්න එනවා.. මගේ අසරණකම දැනුණේ මට විතරයි.. මම පිපිරිලා යන්න පීඩනේක ඊයෙ ඉඳලා ඉන්නවා කියලා දැනුණේ මට විතරයි.. රධ්‍ය අයියගෙ ෆෝන් ඔෆ් ආන්සර් නොකරන හැම වතාවෙම දැනෙන හිස් හැඟීම.. බලාපොරොත්තු නැතිවෙන හැඟීම ඒ ඔක්කොම දැනුණෙ මට විතරයි..

මම දැක්කා දුර ඉඳන් මගේ පැත්තට දුවගෙන එන සෙනුකව.. මම ඉක්මනට නැගිට්ටා.. මට ඉක්මනට රධ්‍ය අයියව හම්බෙන්න ඕන.. ඔයා හොදින්ද

@Shan

අහලා තුරුල් වෙන්න ඕන.. එයා හොඳින්ද.. හැමදේම හොඳින්ද අහන්න ඕන.. මේ වෙලේ මට ඕනම වුණේ ඒක විතරයි..

" ෂනෙරු.."

සෙනුක දුවගෙන ඇවිත් මාව බදාගත්තා.. මම මොකුත් නොකර එහෙමම බලාගෙන උන්නා..

" ඇ-ඇයි සෙනුක.. මොකද මේ.. අනේ මාව බය කරන්න එපා බං.."

" අපි දැන් ක්වාටස් එකට යන්න ඕන.."

ඒ එක්කම ඈතින් අපි දිහාට ඇවිදගෙන එන චමිරුව සෙනුකගෙ උරහිස අස්සෙන් මට පෙනුණා.. ඒ එක්කම මට ඇඩුණා..

" ක්-කෝ රධ්‍ය අයියා.. මාමා.. එයාලා කොහෙද.."

චමිරු ඇවිත් සෙනුකව එහාට කලා.. ඊටපස්සෙ මගේ ලැගේජ් එක ගත්තා..

" ඉස්සෙල්ලම ගෙදර යන්න ඕන.. එතකල් මොකුත්ම කියන්න බෑ ෂනෙරු.."

මම පිස්සුවෙන් වගේ ඔලුව උඩ පහළ කලා.. මට යන්න ඕන.. අපේ මාමා ගෙදර වෙන්න ඇති.. එයා ඉන්න ඕනනෙ.. මාමා සතිඅන්තෙ වැඩට යන්නෙ නෑ.. ආධ්‍ය අයියට කෑම හදනවා ඇති.. එයා ඉන්නවා මම දන්නවා..

මම හීනෙන් වගේ බොඩිගාඩ් කෙනෙක් ළඟ හිටගෙන ඉඳපු වාහනේට නැග්ගා.. මගේ වටේ තියන දේවල් මට දැනෙන්නෙ නැතුව යනවා වගේ.. කැරකිල්ලක් එක්ක ඔලුවෙ කැක්කුමක් එනවා.. මම එහෙමම සීට් එකට ඔලුව තියාගත්තම සෙනුක මාව අල්ලගෙන උගේ උරට හේත්තු කරගත්තා.. වත්තලට යනකල්ම මම එහෙමම හිටියා..

පැය බාගෙකට විතර පස්සෙ මම බැක්පැක් එක අවුස්සලා ගත්ත යතුරත් අතේ ගුලිකරගෙන හිටියේ ක්වාටස් එකට යන තැනම ගේට්ටුව ගාව.. උඩතට්ටුවෙ අපි ඉඳපු ගෙදර දොර වහලා.. මගේ හිතේ බලාපොරොත්තු කඩවෙන එක කොච්චර නරක විදියට දැනෙනවද කියනවනම්.. මට උඩට යාගන්න පණ නැතිවුණා.. මම එහෙමම ගල් ගැහිලා වගේ බලාගෙන ඉද්දි

@Shan

චමිරු මගේ අතින් ඇදගෙන උඩට නැගගෙන ගියා.. මගෙ කකුල් නවතිනවා.. මම දන්නෙ නෑ මට ඇයි මේවා දැනෙන්නෙ කියලා.. මොකුත්ම දෙයක් හරිහැටි නොදැනත් මම උවමනාවටත් වඩා කලබල වෙලා..

" ෂනෙරු දොර අරින්න.. ඉක්මනට.."

මම යතුර දාන පැත්තත් වරද්දගෙන දෙතුන්පාරක්ම ට්‍රයි කල්ලා එහෙමම අත මිට මොළවලා දොරට ගැහුව පාර යතුරට අත තදවෙලා කැපිලා ගියා.. චමිරු මාව එහාට කලාම සෙනුක දොර ඇරියා..

ඒ එක්කම..

ඒ එක්කම මාව.. එතනම ඇදගෙන වැටුණා.. මගේ පපුව නවතින්න එනවා.. කෝ මගේ මාමා.. එයා එයා..

" ඕ ශිට්..!! සෙනුක ඉක්මනට ඇතුළට ගිහින් දොර වහගමු.."

චමිරු මාව වාරු කරගෙන ගෙට යද්දි මගේ කකුලට පෑගුණේ කෑලි කෑලි වලට කුඩුවෙලා ගිහින් තියන..

රධ්‍ය අයියගෙ ෆෝන් එක..

මම ඒ දිහා නොබලා සාලෙ බිත්තිවල තැනින් තැන තියන ලේ පැලම් ළඟට ඇවිදගෙන ගියා.. මුළු ගෙදරම පිස්සුවක් වෙලා.. හැමදේම කුඩුපට්ටම් වෙලා.. අල්මාරිවල තිබ්බ ඇඳුම් සාලෙ තැන තැන වැටිලා.. මම ඇස් අදහගන්න බැරුව එහෙමම ගල් ගැහිලා බලාගෙන හිටියා.. මොනවද මේ වෙලා තියෙන්නෙ.. මගේ මාමා.. කොහෙද එයා..

" සෙනුක කාමර බලන්න.. මොකුත් තියද.."

" නෑ.. අපි මොකද කරන්නෙ.."

" කියාන් අයියට ගනින්.."

මම චමිරුගෙ අතේ මැණික් කටුව ගාවින් තද කල්ලා අල්ලගත්තම චමිරු බයවෙලා මම දිහා බැලුවා.. ඒත් උගේ අත් පවා වෙවුලනවා මට

@Shan

දැනෙනවා.. මට දැනගන්න ඕන මෙච්චරයි.. මොකක්ද වුණේ කියලා විතරයි..

" මොකක්ද වුණේ!! කෝ මාමා රධ්‍ය අයියා.. කෝ මේ ගෙදර මිනිස්සු..!!! දෙයියනෙගෙ නාමෙට මට කියපල්ලා මොන හු#තක්ද මේ වෙන්නෙ කියලා.. උඹලා මට නොකියන්නෙ මොනවද කියපන්.. ආ සෙනුක!!"

" ෂනෙරු.. මේ අහපන්.."

" මට කියපන් මොකක්ද වුණේ කියලා.."

චමිරු මගේ ලේ ගලාගෙන ගිහින් බිමට වැටෙන අත උගේ අතට තදකරගත්තා.. මම එහෙමම බිත්තිය දිගේ රූට්ටගෙන බිම වැටුණා.. මගේ අතෙන් බේරෙන ලේ මුළු මූණ පුරාම මගේ අතින් ගෑවුණා.. ලේ වලින් එන මලකඩ සුවඳ, බිත්ති වල තියන ලේ පැල්ලම්.. බිම පොලොවෙ ගහලා තියන රධ්‍ය අයියගෙ ෆෝන් එක.. මොනවද දෙයියනේ මේ වෙන්නෙ..

" රධ්‍ය අයියලගෙ ගෙදර කවුරුත් නෑ ෂනෙරු.. අප්පච්චි ගෙදර නෑ.. එයාලා ගෙදරින් ගිහින් කියලා අරියා කිව්වෙ.. පෙරේදා උදේම පිටත් වෙලා.. මම දන්නෙත් නෑ මොනවද වෙන්නෙ කියලා.. උඹට මොකුත් අවුලක් තේරුණේ නැද්ද.."

මම සෙනුක දිහා මගේ ඇස් දෙක ලොකු කරගෙන බලාගෙන හිටියා.. නෑ නෑ.. එහෙම වෙන්නෙ කොහොමද.. එහෙම වෙන්න බෑනෙ.. එයා මට උදේ කතාකලා.. හොඳට ප්ලේ කරන්න කිව්වා.. එයා ඉන්නවනෙ.. නැති වෙන්න විදියක් නෑ.. එයා මට නොකිය කොහෙවත් යන්නෙ නෑ.. මම සෙනුකව විශ්වාස කරන්නෙ නෑ.. එයා නැත්තෙ නෑ..

" නෑ නෑ.. සෙනුක.. බොරු කියන්න එපා.. අනේ මේක හොඳ විහිළුවක් නෙමෙයි.."

චමිරු මාව බදලා පපුවට හේත්තු කරගත්තම මම උගේ ශර්ට් එකේ කට අතට තදකරගෙන ඉකි නොගහා ඉන්නම ට්‍රයි කළා.. මට තේරෙන්නෙ නෑ මොකක් කරන්නද කියලා.. රධ්‍ය අයියා අන්තිමට කතාකරපු වචන මට ඇහෙනවා වගේ.. එයා මගේ ඉස්සරහා ඉන්නවා වගේම මට දැනෙනවා..

@Shan

" අයියයි මාමයි දෙන්නම හොස්පිටල් එකේ නෑ.. ආධ්‍ය අයියා ඩිස්චාර්ජ් වෙලා.. ඒත් රධ්‍ය අයියගෙ ෆෝන් එක මෙහේ තියෙන්නෙ..?? ආධ්‍ය අයියා ඩිස්චාර්ජ් වෙලා ආවට පස්සෙ.. ඒ කියන්නෙ රධ්‍ය අයියා මෙහේ ඇවිල්ලද.."

" ම-මම මොකුත්ම ද-දන්නෙ නැහ්හ්.. දෙයියනේ.. මගේ මාමා කොහෙද.."

සෙනුක මං ගාවින්ම දණ ගහගත්තා..

" මේ දවස් දෙකට මොකක් හරි වෙලා තියනවා.."

" මාමා.. ගෙනැත් දෙන්න සෙනුක.. එයා මට නොකියා යන්න යන්නෙ නෑ.. මම දන්නවනෙ.. මම දන්නවා බං.."

ඒ එක්කම ගෙදර දොර ඇරගෙන ඇතුළට ආවෙ කියාන් අයියා.. කියාන් අයියා එක්ක ආශි, මහීශා දෙන්නම ඇවිල්ලා හිටියා.. ආශි දුවගෙන ඇවිත් අපි ගාවින් දණගහගත්තා.. කියාන් අයියා බයවෙලා වගේ ගෙදර දිහා බලාගෙන ඉඳලා බිම වැටිලා තියන ෆෝන් එක අතට ගත්තා.. ඒ එක්කම කියාන් අයියගෙ ඇස් දෙක ලොකු වුණා..

" ර-ධ්‍ය.."

මහීශා ගේ ඇතුළට ගිහින් මාමගෙ කාමරේට එබුණා..

" ෂනෙරු.. අහන්න.. මුලින්ම ඔයා සාමන්‍ය වෙන්නකො.. අපි මේක හොයන්න කලින් ඔයා හොඳින් ඉන්න ඕනනෙ.."

ආශි ඒකිගෙ බෑග් එකෙන් ගත්ත ලේන්සුවක් මගේ අතේ බැඳලා මගේ මූණ අත් දෙකින්ම අල්ලගත්තා.. මගේ ඇස් කෙවෙනිවට පිරිලා තිබ්බ කඳුළු පොදියක් ඒකිගෙ අත් දෙක උඩට වැටිලා ගලාගෙන ගියා..

" එයාලා.. කොහෙද බං.."

මහීශා ඒ එක්කම කොළ වගයක් අරගෙන කාමරෙන් එළියට ආවා.. මම බයවෙලා ඒකි දිහා බැලුවා.. අනෙ මගෙ බලාපොරොත්තු කැඩිලා යන්න එපා..!! මහීශා ගිහින් ඒක කියාන් අයියගෙ අතට දුන්නම කියාන් අයියගෙ

@Shan

ඇස් දෙක ලොකු වුණා.. ඒ එක්කම මගේ දිහා බලලා ආයෙම කොළේ දිහා බැලුවා..

" ආශු..

කියන්නෙ..?? ෂදිල් ඉශාක්‍ය.."

" ම්-මොකක්..!!??"

චමිරු කියාන් අයියගෙ අතේ තිබ්බ කොලේ ඇදලා ගත්තා.. කී එකත් ගත්තා..

" ඒප්ලස්ටික් ඇනීමියා?? එහෙම එකක් කාටද තියෙන්නෙ.. ආධ්‍ය අයියට..??"

ආශි අත් දෙකින්ම කට වහගත්තා.. මම නැගිටලා ගිහින් චමිරුගෙ අතේ තිබ්බ කොළේ ඇදලා ගත්තා.. මට මේ නම හුරුපුරුදුවට ඇහෙන්නෙ.. ඒ කියන්නෙ.. අපේ මාමා මට කිසිදෙයක් නොකිව්වෙ..

" ක්-කොහෙද ආධ්‍ය අයියා.."

" ආධ්‍ය අයියට පෙරේදා රෑ අමාරුවුණා.. අයි සී යූ ඉද්දි මම රධ්‍ය වෙනුවට ගිහින් මාමා හම්බුණා.."

මම කියාන් අයියා දිහාම බලාගෙන හිටියා..

" ඊටපස්සෙ..??"

" මට මාමා හම්බුණා.. එයා හිටියෙ කලබලෙන්.. විශේශෙන් දෙයක් කතාකළේ නෑ.. රධ්‍ය පරිස්සමට ඉන්නවද ඇහුවා.."

" එතකොට රධ්‍ය අයියා මොකද ඔයාට කිව්වෙ.."

" රධ්‍ය මේ දවස් දෙකේ හොඳට කතාකළා.. හැබැයි මට තේරුණා අවුලක් තියනවා කියලා.. හදිස්සියෙම පෙරේදා රෙක්සිවයි කියාරයි අපේ ගෙදර ගෙනැත් දැම්මා.. ටික දවසකට බලාගන්න කියලා.."

" අහ්..??"

@Shan

" ඔව්.. මොකක් වුණත් රඩ්‍ය හැමදේම ගැන දැනගෙන ඉඳලා කල් තියා වැඩ කල්ලා වගේ.. මම ඊයෙ ඉස්කෝලෙට ගියාම උෘ කලින්ම අස්වීමෙ ලියුමක් දීලා.. අප්පච්චි ගැන කැම්ප් එකෙන් දැනගන්න විදියකුත් නෑ.. අපේ කවුරුත් නැනෙ බං.. අපි කොහොමද අප්පච්චි ගැන විස්තරයක් හොයාගන්නෙ.."

චමිරු ටිකක් වෙලා සාක්කුවට අත් දෙක ඔබාගෙන කල්පනා කරනවා මම දැක්කා.. මගේ ඔලුව එකම පටලැවිලක් වෙලා..

" මම හොයාගන්නම්.. රඩ්‍ය අයියගෙ අප්පච්චි ගැන හොයාගන්න විදියක් මම දන්නවා.. අපි බලමු.."

" අනේ චමිරු.. මොකක් හරි කරපන්කො බං.. මට මගේ මාමව හම්බෙන්න ඕන..මම ආච්චිඅම්මට, අපේ ගෙදරට මොනවද දෙයියනේ කියන්නෙ.. මම එද්දි හැමදේම නැතිවෙලා කියන්නද.."

මම චමිරුගෙ අත් දෙක එකතුකල්ලා මගේ අත් දෙකින් තද කරගත්තා.. මගේ අසරණකම කියාගන්න වචන නැති තරම්..

" ෂනෙරු.. උඹට මෙහෙ ඉන්න බැනෙ මෙහෙම.. අපේ ගෙදර අයාන් ඇවිල්ලා බං උඹව එහෙ ගෙනියන්න විදියක් නෑ.. දන්නවනෙ උගේ අමුතු අසහනේ ගැන.. සෙනුක මල්ලි.. ෂනෙරුව තියාගන්න පුළුවන් අවුලක් නැනෙ.."

" ඒකට අවුලක් නෑ.. ෂනෙරු යමන් අපේ ගෙදර.."

මම අසිහියෙන් එහෙමම ඔලුව වැනුවා..

" අද රෑට අපේ රිසාල්ට්ස් අවුට් වෙනවා.. ෂනෙරු ඔයා ගමේ ගියානම් මොකද.. මම කියන්නෙ මේ වෙලේ සෙනුකලාගෙ ගෙදර යන එක අවුලක් නෑ.. ඒත් අපි පොඩ්ඩක් එයාගෙ තත්වෙන් හිතලා බලමුකො.. ෂනෙරු අපි ගමේ යමු.. අම්මා ගාවට.."

" ම්ම.."

ආශි නැගිටලා මගේ කාමරේට ගිහින් ඒක අවුස්සනවා ඇහුණා..කියාන් අයියා මූණ අත් දෙකින් වහගෙන එහෙමම සෙටියෙ කොනකින් ඉඳගත්තා.. මේ ගෙදර තව එක විනාඩියක්වත් හිටියොත් මගේ ඔලුවෙ මැවෙන පරණ

@Shan

දේවල් එක්ක මට පිස්සු හැදේවි කියලා මට හිතුණෙ.. මට හදිසියෙම මගේ ආච්චිඅම්මව මතක් වුණා.. ආච්චිඅම්මගෙ ගාවට යන්න ඕන.. ගිහින් හැමදේම කියන්න ඕන කියලා හිතුණා.. මගේ ආච්චි මාව තේරුම් ගනී කියලා මොහොතකට හිතුණා.. මනුස්සයෙක් අසරණ වෙන්නම ඕන ඒ බර හිතට දැනෙන්නෙ.. අපි හොයන්නෙ ඔලුවෙ පිරිලා තියන මහා විසාල දේවල් ගොඩ කාටහරි කියලා ඒක බෙදාගන්න.. නිදහස් වෙන්න.. මට එකපාරම මගෙ ආච්චිඅම්මව මතක් වුණා..

" ෂනෙරු.. මම මගේ ඩ්‍රයිවර් දෙන්නම්.. ඔයා  ගමේ යන්න.. මම කියන්නෙ පස්සෙ නෙමේ.. මේ දැන්ම යන්න ඕන.."

චමිරු මගේ ඔලුව අතගාලා කිව්වම මම උඩ දිහා බලාගෙන ඉදලා ආයෙම බිම බලාගත්තා.. ආශි ගෝස් එකකට සේලයින් වක්කල්ලා මගේ අත පිහිදාලා ක්‍රීම් එකක් ගාලා ඒක ප්ලාස්ටර් කළා..

" ෂනෙරු යනවනම් මමත් යනවා.. අපේ අම්මත් ඉන්නෙ එහෙනෙ.."

" උඹලට මම නිසා කරදරයි බං.."

" අනේ මේ හු#න කතා කියන්න එපා.. අපි යමු.. උඹලගෙ ගෙදර ඇඳුම් තියද.. ශේප් නෙ.. යමං.."

සෙනුකයා නැගිට්ටා.. මාවත් නැගිට්ටුවගත්තා..

" මහීශා පුළුවන් නම් ගෙදර අස් කරන්න ඉදහන්.. මේ ලේ පැල්ලම් දැක්කොත් මිනී මරලා කියලා හිතයි.. මේවා අස්කල්ලා දාලා අපිත් යමු.. මම මෙහෙ ඉදන් කරන්න පුළුවන් දේවල් ටික කරන්නම්.. චමිරු මල්ලි.. මුන් දෙන්නව පරිස්සමට එක්කන් පලයන්.."

" අනේ මම ආච්චිඅම්මට කොහොමද දෙයියනේ කියන්නෙ.."

" අපි කොහොම හරි කියමු.. දැන් යමු.. උඹ මෙහෙ ඉදලා තව අවුල් වෙනවා.."

සෙනුක මාවත් එක්කන් පහළට එද්දි ආශියි මහීශායි කියාන් අයියයි උඩ නතරවුණා.. ආච්චිට මම හැමදේම කිව්වොත් තේරුම් ගනීවිද.. ආච්චිට මට බොරුවක් කියන්න හිත හදාගන්න බෑ..  අපේ අම්මට කිව්වොත් නම්

@Shan

කොහොමත් තේරුම් ගන්නෙ නෑ.. අඩුම තරමේ මාමා මට කිසිම දෙයක් කල් තියා කියලවත් තිබ්බෙ නෑ..

" එතකොට රධ්‍ය අයියා කොහෙද බං.. "

" අපි හරිම විස්තරයක් දන්නෙ නෑ බං.. මේ දවස්විකේ මොන මොනාහරි වුණා.. ඒත් හරි විස්තරේ මෙන්න මෙකයි කියන්න අපි දන්නෙත් නෑ.."

" ම්ම්.."

" සෙනුක එහෙනම් ඔයාලා යන්න.. මොකුත් උවමනාවක් වුණොත් මට කෝල් එකක් දෙන්න අනිවාරෙන්.. හරිද.."

චමිරු වාහනේ දොර ඇරියහම මම ඇතුළින් ඉඳගත්තා..

" උඹට එන්න බැරිවෙයිද අපිත් එක්ක යන්න.."

" සෙනුක..??"

" උඹලගෙ අම්මට කියහන් යාළුවෙක්ගෙ ගෙදර යනවා කියලා.. අපේ අම්මලත් එහේ ඉන්නෙ.. වරෙන්.."

" මම එන එක හොඳ මදි සෙනුක.. මම අනික ෂනෙරුව ලොකුවටට-"

" උඹත් වරෙන්, ගෙදර අවුලක් නැත්නම්.. ඒකට කමක් නෑ.."

චමිරු පුදුම වෙලා වගේ මගේ දිහා බලාගෙන හිටියා..

" ඒකනෙ.. යමන් යමන්.."

සෙනුකයා චමිරුවත් වාහනේ ඇතුළටම තල්ලු කළා.. ඊටපස්සෙ උෟත් නැගලා දොර වහගත්තා.. චමිරු හිටියේ කරකලා අතෑරියා වගේ..

" ගෙරද ගාවින් නවත්තහන් මම අපේ පියාණන්ට කරුණු පැහැදිලි කල්ලා අවසර අරගෙන ඇඳුම් ටිකකුත් උස්සන් එන්නම්.. හරිද.."

" ම්ම්.."

@Shan

මම සීට් එකට ඔළුව තියාගෙන හිටියා.. චමිරු මගේ කකුකට තට්ටුවක් දැම්මා හැමදේම හොඳින් වෙයි කියන්න වගේ.. ඒත් මටනම් කිසිම දෙයක් හොඳට වෙනවා කියාඅ පෙනුණෙ නෑ.. කලින් වතාවෙ මට කියලා ගිය එක මට එච්චර රිදුණෙනම්..,

මේ වතාවෙ නොකියම ගියාම මට කොච්චර රිදෙයිද කියලා එයාට පොඩ්ඩක්වත් අදහසක් තිබ්බෙ නැද්ද කියලා මගෙ හිත කියනවා.. ආයෙමත් මම ජීවිතේ තනිවෙයිද කියලා මට බය හිතුණා.. මට හුඟක් බය හිතෙනවා අයියෙ.. මොන ලෝකෙද මටත් කියන්නෙ නැතුව ගියේ..

*What is aplastic anemia?

What it is

Despite its name, aplastic anemia, or bone marrow failure, is more than anemia. Aplastic anemia is a rare but serious blood condition that occurs when your bone marrow cannot make enough new blood cells for your body to work normally. It can develop quickly or slowly, and it can be mild or serious. At this time, there is no way to prevent aplastic anemia.

රන්වන්පාටයි සමනලයා.. දළඹුවොන්ගෙ පණ අරන් ගියා..

ආයෙත් ඒවිද ඒ සමනලයා.. අපහට දුක් දෙන්නා..~

විශ්වාස කරන්න මේ මින්සිකාව..  හැමදේම හොඳින් වෙනවා.. ආච්චිඅම්මා හැමදේම තේරුම් ගනීවිද..??

එන්නාම්.. ලව් යූ..   ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

@Shan

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 144 කොටස

ජීවිතේ හැමදෙයක්ම වෙනස් වෙන්න යන්නෙ කොච්චර පොඩි වෙලාවක්ද කියන එක මට මගේ ජීවිතේ සමහර අත්දැකීම් වලින් දැනිලා තිබ්බත් ඒක තදින්ම දැනුනේ මේ පැය කීපෙදි.. මම ආයෙ ආයෙම හිතනවා බලාපොරොත්තු කඩ වෙන එක කොච්චර නරක දෙයක්ද කියලා.. ඒක කොච්චර වරදකාරී පසුතැවෙන හැඟීමක්ද කියලා.. මට පහුවෙන හැම ගහ කොළක්ම.. හැමදේම මගේ හිතේ පාරගන්නෙ නෑ කියලා පරිස්සම් කරපු හැම අහලක් ගානෙම මාව තුවාල කළා.. මෙච්චරකල් දුක දැනුණත් නොදැනෙන ගාණට මම ජීවත් වුණා.. ඒත් දැන් මට දැනෙනවා මම ඉන්නෙ පිච්චෙන හැඟීමක.. මට ඒක හොඳටම දැනෙනවා..

මට හිතේ තරහයි.. දුකයි.. මට හිතන්නම සෑහෙන්න දේවල් තිබුණා.. මට හිතන්න බයයි.. මට කලන්තෙට වගේ.. දැන් නම් මට හිතෙනවා මොකටද කෑවෙ නැත්තෙ කියලා.. මගේ නොසැලකිල්ල නිසා හුගක් දේවල් වෙනවා කියලමයි මට දැනෙන්නෙ.. අඩියක් තියපු තැනම මහා පාතාළෙකට කඩන් වැටෙනවා කියන්නෙ.. ඒක සුළපටු නෑ.. මම නැගිටගන්න ට්‍රයි කළා විතරයි.. පළවෙනි අඩියෙම මට හුඟක් දේවල් නැතිවුණා.. මම ඉස්සරහට යද්දි මට කොච්චර දේවල් නැතිවෙයිද මම දන්නෙ නෑ.. ආධ්‍ය අයියට සනීප වෙලාද ඩිස්චාර්ජ් වුණේ.. එයාලා නොකියා යන ගමනට බලෙන්ම ඩිස්චාර්ජ් වුණාද කියන්න දන්නෙ නෑ.. ආධ්‍ය අයියගෙ යාළුවො කවුද මම දන්නෙත් නෑ.. මාමගෙ යාළුවො මම අඳුරන්නෙත් නෑ.. අප්පච්චිගෙ අය කවුරුත් දන්නෙත් නෑ.. මම දන්න.. මම වැඩිපුරම දන්න කෙනත් ළඟින්ම ආශ්‍රය කලේ මම වෙලා.. මම මොකුත්ම නොදැනැන හිටියේ මගේ මොන නොසැලකිල්ලකටද මට හිතෙනවා..

ජීවිතේ හමුවීම් එක්ක වෙන්වීම් තියනවා කිව්වට.. මම බලාපොරොත්තු වුණු වෙන්වීම මේක නෙමේ..

මට අන්තිම වතාවක් දෙනවනම්.. එදා රධ්‍ය අයියා ගත්තෙ අන්තිම ෆෝන් කෝ එක කියලා දන්නවනම්.. එදා මාමට තුරුල් වුණේ අන්තිම වතාවට කියලා දන්නවනම්.. ආධ්‍ය අයියගෙ සිනිඳු කම්මුලක් ඇල්ලුවෙ අන්තිම වතාවට කියලා දැනුණනම් මම ඒ ඔක්කොම ආපහු ගන්නවා.. මට ආයෙම ඒවා හරිගස්සන්න ඕන.. ආයෙම මාමට තුරුල් වෙලා මාමට ආදරෙයි

@Shan

කියන්න ඕන.. රධ්‍ය අයියට ආදරෙයි කියන්න ඕන.. මට අවස්ථාවක් ඕන.. ආයෙ හැමදේම ආපස්සට ගිහින් හරිගස්සන්න..

ඒත්.. මම කොහොමද එච්චර ආත්මාර්ථකාමී වෙන්නෙ..

අපේ මාමා හිටියෙ පිච්චි පිච්චි කියන්න මම දන්නවා.. රධ්‍ය අයියා හැමතිස්සෙම හිතේ මොකක් හරි හංගගෙන කතාකරන බව මම දැනගෙන හිටියා.. ඒත් මම බලාපොරොත්තු වුණා ඒවා මට එක වතාවක් හරි කියයි කියලා.. මට මෙච්චර වේදනාවක් දේවි කියලා මගේ හීනෙකවත් තිබ්බෙ නෑ.. ඇත්තමයි තිබ්බෙ නෑ..

'අපි ඉස්සරහට වෙන්න තියන දේවල් අමතක කලා දැනට අඩන්නැතුව ඉමුද..'

'ඒ කියන්නෙ ඉස්සරහට මොකුත් වෙච්ද..'

'ඉස්සරහට හුඟක් දේවල් වෙවි..'

'එතකොට..??''

'එතකොට මම දුර ඉඳන් හරි ඔයා ගාවින් මෙහෙම ඉන්නවා..'

'ඒ කොහොමද..'

'එහෙම තමයි ඔයා බලන්නකො..'

'නොගිහින් ඉන්නකො අයියෙ.. මම කැමති නෑනෙ ඔයා යනවට..'

මම පියාගෙන ඉඅපු ඇස් අග්ගිස්සෙන් මගේ මුළු හදවතේම තියන ගල් ගැහිච්ච දුකෙන් අංශු මාත්‍රයක් තරම් දියවෙලා පහළට රූටලා වැටුණා.. ඒවා උණුම උනුයි.. ඒසී එකේ හුළං නිසා සීතල වෙලා තිබ්බ මූණ කඳුළු බිංදුවක් නිසා යන්තම් උණු වුණා.. මතක හිත රිද්දනවා.. මගේ තුවාල වලට ලුණු දානවා වගේ.. ඔව් බෙහෙත් නෙමෙයි.. හරියට ලුණු දානවා වගේ.. මට ලොකු තනිකමක් එක්ක අසරණකමක්, පාළුවක්, හිතේ මහා මූසල කමක්දැනුනා..

පැය ගාණක ගමනකින් පස්සෙ මම හිටියේ අපේ ගෙදරට කිට්ටුවෙන්.. මාමා ගැන ගෙදරට කියන්නෙ මොනවද කියලා මට හිතාගන්න බෑ..

@Shan

ආච්චිඅම්මගෙ මූණ බලාගෙන මට බොරු කියන්න හිත හදාගන්න බෑ.. ඒත් ආච්චිඅම්මා දැනගන්න ඕන.. මට මාමව ඕන කියලා දැනෙනවා.. අපි කිට්ටුවෙන් හිටියෙ පහුගිය පොඩි කාළෙ වුණත් මාමා දුර වැඩකරන කාලෙ මට අඩුම තරමෙ කතාකරනවා.. එයා පරිස්සමට ඉන්නවා කියලා මගේ හිත දන්නවා.. දැන් එහෙම දැනෙන්නෙ නෑ.. මට මගේ මාමව හුඟක්මතක් වෙනවා.. ඒ අඩුව සැහෙන්න දැනෙනවා.. මාමගෙ කුණුහරප වචන වල නොකියා තියන හයිය මට මතක් වෙනවා.. හැමතිස්සෙම මගේ පැත්තෙන් හිටගන්න කෙනෙක් මට නැතිවෙලා වගේ දැනෙනවා..

" අඩෝ පොඩි කාලෙ ආවට මතක නෑ බං.. මෙ හරියෙන් කොහේටද.."

මම කල්පනා වෙ ඉඳලා ගැස්සිලා ඇහැරුණා.. මම හිටියෙ කොනේම ශටර් එකට මූණ හේත්තු කරගෙන.. මගේ එහාපැත්තෙ චමිරුයි සෙනුකයි හිටියේ.. අම්මට කෝල් කල්ලා ගෙදර එනවා කිව්ව වෙළෙ ඉඳලා ආච්චිඅම්මා බලාගෙන ඉන්නෙ මම ගෙදරට අඩිය තියනකල්.. අද රිසාල්ට්ස් එනවා.. මම මාමට කියන්නනෙ හිටියෙ රිසාල්ට්ස් ආවහම.. ආධ්‍ය අයියා හැමතිස්සෙම කියෙව්වා.. එයාට ආසයි කිව්වා මම කැම්පස් යනවා දකින්න.. රධ්‍ය අයියට මහ ඇරුණු හීනවලට මමවත් යන්න ඕන කිව්වා..

ඒවා වචනම විතරක් වුණාට මම හැමදේම මතකෙ තියාගත්තා.. ගතවුණු කාලෙ මම උවමනාවෙන්ම මතක තියාගත්තත්..

දැනට මට ඒවා ගැන පසුතැවීමක් තියනවා.. අපරාදෙ මතක තියාගත්තෙ කියලා හිතෙනවා..

" තව ඉස්සරහා ලොකු කඩයක් හම්බෙනවා.. එතනින් දකුණුපැත්තෙ පළවෙනි අතුරුපාර ඉවරවෙන ගෙදර.."

" ෂනෙරු.. ගෙදර අයට මේවා දැන්නුවා කියලා ඔයාට ඒකෙන් හොඳක් වෙන්නෙ නෑ.. පුළුවන් තරම් හොඳින් ඉන්න ට්‍රයි කරන්න.. මම දන්නවා අමාරුයි කියලා.."

චමිරු ඉස්සරහා බලාගෙනම කිව්වා.. ඌටත් අහක යන කුණුගොඩක් ඇහේ දාගෙන මම නිසා වදේ.. වෙන වෙලාවකනම් යාළුවෙක් එක්ක ගෙදර යන්න මම ආසයි.. ඒත් මේ වෙලාවෙ ඒකට කිසිම මූඩ් එකක් මං ගාව නෑ.. මතක් වෙද්දිත් ඒක විහිළුවක් වගේ..

@Shan

" මම මොනවද බං මාමා ගැන කියන්නෙ.."

" ඒ ගැන හිතමු පස්සෙ.. දැනට මාමා ඉන්නවා කියමු.. එකසැරේට බෑ අම්මලත් ගෙදරනෙ බං.. අපි පොඩ්ඩක් වෙලාව එහෙ මෙහෙ වෙනකල් ඉමු.."

" ම්ම්.."

" ෂනෙරු කෑම කාලද ඉන්නෙ.."

මම ඔලුව වැනුවා.. මම නම් පුදුම කරුමෙකට මූණ දීලා තියෙන්නෙ.. මගේ හිතට මහන්සී වගේම මගේ ඇඟට.. කොච්චර මහන්සිද කියන්න.. හරිනම් මම මෙලහට කලන්තෙ දාලා ඇදගෙන වැටිලා.. දවස් තුනක් එකදිගට ප්‍රැක්ටිස් කලා.. මැච් එකකුත් ප්ලේ කල්ලා හරිනම් සතියක ටුවර් එකක් දුන්නෙ ඉතුරු දවස් දෙක රෙස්ට් එකේ ඉන්න.. මම අනිත්පැත්තටම දුවගෙන ආවා.. නින්දකුත් නෑ හරිහැටි.. කෑම බීමකුත් නෑ.. මට මං ගැනම මාර දුකක් දැනුණා.. හැමදාම මම මූණ දෙන ප්‍රශ්න එක්ක මම අසරණ වෙනවා..

" ගෙදර ගිහින් ඉස්සෙල්ලම කාලා ඉමු.. බෙහෙත් තියද.."

" නෑ.."

" ලෑස්තියක් වුණේ නෑනෙ බං.."

" මොනවද බෙහෙත් කියපන්.."

" ඕන නෑ චමිරු.."

" මම ඇහුව එකට උත්තර දීපන්..!"

" මේ ඉඳහන් මම කියන්නම්.. උඹ මූට කෑගහලා තව මගුලක් කරනවා.."

සෙනුකයා චමිරුගෙ ෆෝන් එක ඉල්ලගෙන මොනවද ටයිප් කල්ලා ආපහු දුන්නා..

" ඩැරන් මම ටෙක්ස්ට් කරපු බෙහෙත් ටික ඕන.. ඒ ටික අපිව ඩ්‍රොප් කළාට පස්සෙ ගෙනැත් දෙන්න.."

@Shan

" නෝටඩ.."

ඉස්සරහා ඉඳපු උස මහත ඩ්‍රයිවර් ෙ ඉස්සරහා මිරර් එකෙන් මං දිහා අමුතු වුදුයට බලලා චමිරු දිහාත් බලලා ආයෙම ඉස්සරහා බලාගත්තා..

" චමිරු උඹට අවුලක් නැද්ද ගෙදරින්.. මෙහෙම ආවට.."

" මම කිව්වා මමාට යාලුවෙක්ගෙ ගමෙ යනවා කියලා.. එයා තාත්තට කියයි.."

" අහ්.."

අයුක අයියගෙ තාත්තගෙ සෙකට්‍රිනෙ චමිරුගෙ අම්මා.. මට ඒක අමතක වුණා..

අපේ ගෙදර මහීශලාගෙ අම්මගෙ කාර් එක පාක් කල්ලා.. ආච්චිඅම්මා එළීයෙ ඉස්තෝප්පුවෙ ඉඳගෙන හිටියෙ.. මගේ පපුව පිච්චිලා ගියා.. මම හැමදාම මේ රූපෙ කොච්චර බලාපොරොත්තු වෙනවද දන්නෙ මමම විතරයි.. මොහොතකට මට සතුටක් දැනුණා.. මං වෙනුවෙන් කෙනෙක් ඉන්නවා කියන හැඟීම මට දැනුණා..

කාර් එක දැකලා ආච්චිඅම්මා මිදුලට ආවා.. මම ඉක්මනට දොර ඇරගෙන ගිහින් ආච්චිඅම්මව තුරුල් කරගත්තා.. ආච්චිඅම්මා මගේ අත් දෙක මැද්දට පොඩි වුණා.. ඒ බෙහෙත් තෙල් සුවඳ.. හිනාව.. මට මේ ලෝකෙ හැමදේටම වඩා වටිනවා දැනෙන්නෙ මේ වෙලාවට තමා.. මගේ අම්මා නොවුණාට, ලේ කිරි කල්ලා පෙව්වෙ නැතිවුණාට, මට අම්මා වුණේ මගේ ආච්චිඅම්මා.. ඒ ආදරේ කියලා විස්තර කරන්න මට වචන නෑ.. ආච්චිඅම්මා මුළු හිතේම තියන ආදරේ එකතුකල්ලා මට දුන්නා.. එතනින් එහාට එයා ගැන කියන්න තේරෙන්නෙ නෑ..

" සුදුමහත්තයා.. මයෙ කොල්ලා හොඳින් නේද.."

මම ආච්චිව තව ටිකක් තුරුල් කරගත්තා.. මගේ උගුර හිරවෙලා.. කටහඩ පොඩ්ඩක් හරි පිටවුණොත් ඇඬෙනවා මම දන්නවා.. දැනටම මගේ ඇස් වල කඳුළු පිරිලා..

" ආච්චිඅම්මෙ මාව මතකද දන්නෑ.. අම්මෝ කාලෙකින්.."

@Shan

සෙනුක කාර් එකෙන් බැස්සම චමිරුත් ටිකකින් ආවා.. කාර් එක හරවලා ආපහු ගියා..

" මේ පුතා..?? කෝ බලන්න මූණ ඉතින්.."

මම ආච්චිගෙන් එහාටවුණා.. ආච්චි සෙනුක ගාවට ගිහින් හොඳට මූණ දිහා බලාගෙන හිටියා..

" නිර්මලී දූගෙ පුතා නේද මේ.. මොකක්ද නම.. සෙනුර..සෙනුක පුතා..!!! දෙයියනේ කොල්ලො ලොකු වෙච්ච තරම.."

සෙනුක ආච්චිඅම්මව බදාගත්තා.. ආච්චි හරි ආසයි මගේ යාළුවොන්ට.. සෙනුක අපි පොඩිකාලෙ එකම එක සැරයක් ගමෙ ඇවිල්ලා තියෙනවා.. අපි නමය වසරෙදි..

" ආච්චිඅම්මනම් පොඩ්ඩක්වත් වෙනස් වෙලා නෑ.."

" එතකොට මේ ඉලන්දාරියා කව්ද.. මම නම් දැකලා නෑ මීට කලින්.."

" ආච්චිඅම්මෙ මේ මගේ හොඳම යාලුවෙක්.. මම ආච්චිඅම්මට කිව්වෙ.. චමිරු.. මාත් එක්ක ඉස්කෝලෙ ඩිපියුටි වැඩ කරන්නෙ.."

චමිරු ආච්චිඅම්මා එක්ක හිනාවුණා.. ආච්චි චමිරුගෙ පිට අතගෑවා.. චමිරු ඒත් පුදුම වෙලා වගේ ආච්චිඅම්මා දිහා බලාගෙන හිටියෙ..

" ආ මම දන්නවා.. සුදුමහත්තයා ඉස්කෝලෙ විස්තර කියද්දි මට නිතර කියනවා.. කොහොමද පුතේ.."

චමිරු බයවෙලා මගේ දිහා බැලුවම සෙනුක චමිරුගෙ කකුල පෑගුවා.. එහෙම මගුලක් මම කිව්වෙ නෑ.. ගොං චමිරු..

" අහ්.. මම හොඳින් ඉන්නවා.. ආච්චිඅම්මෙ.."

" යමු ඇතුළට.. මහන්සිත් ඇතිනෙ.. සුදුමහත්තයා කෙට්ටු වෙලා.. කන්නෙ නැද්ද ඒපාර.. කෝ ඉතින් මේ ගෙදර එකා අම්මට කතාකරන්නෙ නැනෙ.. මාමා හොඳින්ද කොල්ලො.. මම නරක හීනෙකුත් දැක්කා.."

මගේ බඩපපුව දාගෙන ගියා..

@Shan

" අංකල් දේව වැඩ ආච්චිඅම්මෙ.."

" ආ.. ඒකතමා.. කොහෙද මේ දරුවන්ට මේ වයසක අම්මව මතක් වෙන්නෙ නැනෙ.. මම එපෑ ගින්දර උහුලන්න.."

මම අත ගුලිකරගෙන ඇඩෙන්නැතිවෙන්න හිටියා.. මාමෙ.. මොනවද දෙයියනේ මේ කලේ..

" අද අපේ රිසාල්ට්ස් එනවනෙ ආච්චිඅම්මෙ.."

" ඔය ළමයි නැහුන හැටියට හොඳ ප්‍රථිඵලයක් ලැබෙන්නම ඕන.."

" ආච්චිඅම්මා කියනවනම් ඉතින් ආයෙ මොනාද.. ගැම්මක් ආච්චිඅම්මෙ.. අඩෝ ෂනෙරු මේ පාරවත් ආච්චිව දීපන්කො."

අපේ ආච්චි රතුවෙලා හිනාවුණා..

" නිකන් ඉදින්.."

" කෝ අම්මලා ආච්චිඅම්මෙ.."

ගෙදර මොකුත් සද්දයක් නැති නිසා මම ආච්චිඅම්මගෙන් ඇහුවා..

" අම්මලා පන්සල් ගියා සුදුමහත්තයෝ.. රෑවෙන්න ඒවි.. ආපු වෙලේ ඉදලා කිව්බිව්ය.. උඹලගෙ අම්මත් පාළුවෙන්නෙ හිටියෙ.."

" ඒකතමා.."

මම කාමරේට ඇවිත් එහෙමම පුටුවෙන් වාඩිවුණාම සෙනුක මාව අල්ලගත්තා.. මට කලන්තෙට වගේ.. හරි අමාරුයි ඇඟට..

" ෂනෙරුවා.."

" මගෙ පපුව රිදෙනවා බං.. ඔලුවත් කැක්කුමයි.. ගැස්ට්‍රයිටීස් වැඩිවෙලා.."

" ඉන්න ෂනෙරු ඩැරන් දැන් ඒවි.."

@Shan

මම ඇස් දෙක පියාගෙන එහෙමම සෙනුකගෙ බඩට ඔලුව තියාගෙන හිටියා.. සෙනුක මගේ ඔලුව අතගෑවා.. මේ කාමරේ ඇස් දෙක පියාගත්තත මතකෙ දෝංකාර දෙනවා වගේ.. මට මාමා නැතුව ගෙදර පාළුයි.. මාමට මට කියන්න තිබ්බා.. හැමදාම හිතේ තියාගෙන විතරක් ඉන්නෙ නැතුව.. මාමා පිළිගන්නෙ නැත්තෙ ඇයි මමත් ලොකු ළමයෙක් කියලා.. මට මාමා ඕනනෙ..

ආයෙම මට ඉකි ගැහිලා ඇඬුනා.. චමිරු ඒ එක්කම එළියට ගියා..

" අනේ බං.. නාඩා ඉදින්කො ආච්චිඅම්මා දැක්කොත් එහෙම.."

" අනේ මාමා කොහෙද සෙනුක.. මාමට කරදරයක්ද දන්නෙ නෑ.. අනේ මට බෑ දෙයියනේ.. මාමට කතාකරන්න කියපන්කො.. අනෙ..හ්හ්.."

මම සෙනුකගෙ බඩට මූණ තදකරගත්තා.. මගේ තාත්තා මාව දාලා ගියා හා සමානව මට දැනෙනවා..

" අංකල් දේව හොඳින් ඇති ෂනෙරු.. පොඩි ළමයෙක් නෙමෙනෙ උඹලා අපි වගේ.. මාමා කොහොම හරි දරාගන්නවා.."

" ඒත්-හ්හ්.."

" මාමා කොහොම හරි අයියව සනීප කරාවි ෂනෙරු.. දරාගන්න වෙනවා.. උඹට ඕනම වෙලාවක අපි ඉන්නවනෙ.. තේරුණාද.. ඉවසපන්..

**අනික උඹ ආදරේ කළේ බොරුකාරයෙක්ට නෙමෙනෙ**

.."

" එයා හොඳින් ඉන්නවද සෙනුක.. රධ්‍ය අයියා හොඳින් නේද.. එයාට කරදරයක් නෑ නේද.. අනේ බං.. මට එදා කළේ අන්තිම වතාවට කියලා හිතුණෙ නෑ බං.. හෙන ගහන්න වගේ සේරම වෙද්දි මම කොහොමද සේරම ඉවසන් ඉන්නෙ.."

" රධ්‍ය අයියා ඉන්නෙ අප්පච්චි එක්ක වෙන්න ඕන.. මොකද දෙන්නම ගිහින් තියෙන්නෙ එකට.. ඒත් ආධ්‍ය අයියට මොකද වුණේ කියන්නයි දන්නෙ නැත්තෙ.. අපිට කොහේහරි කොනක් හම්බෙයි ෂනෙරු..

@Shan

පොඩ්ඩක් ඉවසලා ඉඳපන්.. මම දන්නවා උඹේ හිතේ වේදනාව.. ඒත් මේ වෙලේ වැටිලා බෑ.. උඹ දන්නවනෙ රධ්‍ය අයියා මොන ලෝකෙ හිටියත් උඹ ගැන අහස උසට බලාපොරොත්තු තියන් ඉන්නෙ.. එහෙම එකෙක්ගෙ හිත රිද්දන්න එපා බං.. අපි හැමෝම අසරණ වෙන වෙලාවල් එනවා.. රධ්‍ය අයියත් එහෙමයි.. ඌ සෑහෙන්න අසරණ වෙලා උගේ අයියගෙ අසනීපෙ නිසා.."

" ඇයි එයා හැමදේම තනියම හිතේ තියාගෙන හිටියෙ.. මම කවද එතකොට.. ඇයි-ඇයි බං කියන්න බැරිවුණේ.. මට කිව්වනම් මම එයාව නවත්තන්නෙ නෑ.. මම හුඟක් ආදරෙයි බං රධ්‍ය අයියට.."

" අයියට හේතු තියෙන්න ඇති ෂනෙරු.. අපි අපේ පැත්තෙන් විතරනෙ දකින්නෙ.."

මම මොකුත් නොකිය හිටියා.. මට දරාගන්න තිබ්බා ඒ වචනෙකින් හරි මගේ හිත රිද්දලා මාව ඇදලා දැම්ම මනුස්සයෙක් නම්.. ඒත්.. ඒත් එච්චර වචනෙකින්වත් මගේ හිත රිද්දුවෙ නැති කෙනෙක් මට නැතිවෙද්දී.. මට බෑ දරාගන්න.. කොච්චර කොහොම කිව්වත්.. මම කොහොමද හිත හදාගන්නෙ.. එහෙම බැනෙ.. ඇයි අයියෙ ඔයාගෙ අප්පච්චි අපි හැමෝවම මෙහෙම අසරණ කළේ.. අසලි අම්මවත් කතාකළානම්.. එයත් ෆෝන් එක අයින්කල්ලම දාලද කොහෙද.. එකපාරට ජීවිතේට ඇවිත් මොනවද මේ කළේ..

" රධ්‍ය අයියත් උඹට ආදරෙයි බං.. මට වඩා උඹනෙ ඒක දන්නෙ.. මොකක් හරි එයාට ලොකු බලපෑමක් තියෙන්න ඇති.. අනික අප්පච්චි උඹලා දෙන්නා ගැනත් දන්න නිසා මට ඌට මොකුත් කියන්න බෑ බං.. උඹ ඔහොම අඬනවට මම කැමතිනෑ.."

" ම්ම.."

චමිරු කාමරේට ආවෙ අතේ පාර්සල් එකකුත් තියාගෙන.. ඊටපස්සෙ ඒකෙන් බෙහෙත් තෝරලා අරගෙන මේසෙ උඩ තිබ්බ වතුර ජොග්ගුව මගේ ළඟට ළං කළා..

" බෙහෙත් බොන්න.. ඊටපස්සෙ කෑම කාලා රෙස්ට් කරහන්.. උඹට මහන්සි පාටයි.."

@Shan

" ම්ම්.."

" මම ස්ලීපින් පිල් එකකුත් දැම්මා.. කමක් නැනෙ.."

මම වතුර එක අරගෙන බෙහෙත් අහුරම බිව්වා..

ආච්චිඅම්මා කෑම මේසෙට යවලා අපිට කන්න එන්න කිව්ව නිසා මම ගිහින් කෑම කාලා නාගෙන කාමරේට වෙලා හිටියා.. සෙනුකයි චමිරුයි මගේ කාමරේට එහා කාමරේ නැවතුණා.. අම්මලත් ඇවිල්ලා නිසා ගෙදර පිරිලා.. මම ඇවිත් එහෙමම ඇඳට වැටිලා ෆෑන් එක දාගත්තා.. කාමරේ ජනේලෙන් එන හුලග මගේ කකුල් වල වදිනවා.. ඒත් මගේ ඇස් හරි බරයි.. කවදාවත් නැති තරම් නිදිමතක් මට දැනෙද්දි මම ඇස් දෙක පියාගෙන ඒ තප්පරේම නින්දට වැටුණා..

ඩබල් අප්ඩේටු ගෙනාවෝ...

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 145 කොටස

මම ඇහැරෙද්දි හුහක් රෑ වෙලා.. ගෙදර සාලෙන් හිනාවෙන කතාකරන සද්දෙ ඇහෙනවා.. මම එහෙමම ෆෝන් එකේ වෙලාව බැලුවා.. ඒ එක්කම මගේ පපුව හිරිවැටීගෙන ගිහින් ෆෝන් එක ඉබේම බිමට අතෑරුණා.. මගේ ජීවිතේ මේ හීනයක් නෙමෙයි කියලා මට වෝල්පේපර් එකෙන්ම තේරුණා.. වෙනදට නොටිහි වැටෙන මැසේජ් එකක්.. මොකක් හරි තරහ යන කතාවක්.. මිස් කෝල් එකක්.. මොකුත්ම නැතුව අපි දෙන්නගෙ කළුසුදු ෆොටෝ එකක් විතරක් ඩිස්ප්ලේ වෙද්දි මගේ ඔලුවට මහා බර ගතියක් දැනුණා.. මම එහෙමම නැගිටලා බිත්තියට හේත්තු වුණා..

හවස හොඳටම නින්ද ගියානෙ.. ආයෙම පපුවෙ දැවිල්ලක් තිබ්බෙ නෑ.. ඒවුණාට ආච්චි හිනා සද්දෙ ඇහෙනකොට මගේ හිත ගැස්සෙනවා.. මම මාමා ගැන මොකද කියන්නෙ.. මට ඒක ගැන මොකුත්ම හිතාගන්න බෑ.. මගේ ආච්චිඅම්මා වයසයි.. මේවා කියලා මොකක් හරි වුණොත් කියලා මට බයයි.. මට මේ ලෝකෙ පන ගැහෙන හයියකට ඉතුරුවුණේ එච්චරයි.. මට සැනසීමකට තියෙන්නෙ එච්චරයි..

ඒ එක්කම ෆෝන් එකට කෝල් එකක් ආවා.. බලද්දි අයුක අයියා.. මම ෆෝන් එක ආන්සර් කල්ලා කනේ තියාගත්තා.. ජීවිතේට නොහිතපු හුහක් දේවල් වලට මම මූණදෙන්නෙ හැබැහින්ද මට විශ්වාස නෑ..

" මල්ලි.. ෂනෙරු.."

" අයුක අයියෙ.."

මට ආයෙම ඇඩුණා.. අද දවසට මම මේ අඬන කීවෙනි වතාවද මට හිතාගන්න බෑ.. අඬලා අඬලාම ඇස් වලට කඳුළු උනද්දි ඇස් දන්න ගන්නවා.. කටහඬත් වෙනස් වෙලා ගිහිල්ලා..

" මම දන්නවා.. පරිස්සමට ගෙදර ආවා නේද.."

" ඔව් අයියෙ.."

" බලහන් මම ලංකාවෙ හිටියනම් මොකක් හරි කරනවා.. මෙහේ ඉඳන් මට කරන්න පුළුවන් මොකුත්ම නෑ බං.. කියාන් ඉන්නවනෙ.. ඕනම වෙලාවක

@Shan

කියන්න ෂනෙරු හිතේ තියාගෙන ඉන්න එපා.. තේරුණාද.."

" කොහෙද අයියෙ රධ්‍ය අයියා ගියේ.. මම කිසිදෙයක් දැනගෙන නෙමේ හිටියේ.. අනේ මම දන්නෙ නෑ අයියෙ.."

" නාඩා ඉන්නකො.. රධ්‍ය මට පෙරේදා උදේ කතාකළා.. ඌ මොකක් හරි කියන්න හැදුවා බං.. අර උගෙ අප්පච්චි එක්ක මොන මගුලක්වත් කරන්න බෑ.. හරියටම ගත්තොත් ඌත් උගේ අප්පච්චි ගැන දන්නෙ නෑ.. එයා එතනින් සෑහෙන්න හිරවෙලා මල්ලි.. රධ්‍යට වැරැද්දක් කියන්නත් බෑ.. අනික ඔයාගෙ මැච් එක අස්සෙම මේ කරදර වේවි කියලා ඌ හිතුවෙත් නෑ.."

" මට කතානොකළට කමක් නෑ අයියෙ.. අනේ හොඳින් ඉන්නවනම් එච්චරයි.. මට මොකුත් ඕන නෑ.. ආධ්‍ය අයියට සනීපවෙලා අනිත් හැමෝම හොඳින් ඉන්නවනම් මට ඇති.. අයියෙ එයාලා හොඳින් ඇති නේද.."

" ඔව් ෂනෙරු.. අහන්නකො.. රධ්‍ය හොඳින් ඉන්නවා.. අපිට එහෙම හිතන්න පුළුවන්.. ඌ හදිසියෙම කරන්න පුළුවන් හොඳම දේ කළේ හැමෝ ගැනම හිතලා.. දවස් ගානක ඉඳන් රධ්‍ය මාත් එක්ක විස්තර වගයක් කිව්වා.."

" මොනවද එයා කිව්වෙ.."

" අප්පච්චි ගැන තමා.. එයා වටේ අමුතු දේවල් වෙනවා කියලා.. අප්පච්චි මූව හිර කරන්න ඕන හැමපැත්තෙන්ම හිර කරනවා.. ඒකයි ප්‍රශ්නෙ.. අනික ඌට ඉන්නෙත් උඹයි අයියයි විතරනෙ ෂනෙරු.. ඒ වෙනුවෙන් ඌ ඕනම රිස්ක් එකක් ගන්නවා.. මම දන්නවනෙ ඌ ගැන.. ඌට අම්මත් ඕනම වෙලාවෙ ළඟ හිටියෙ නෑ.."

" අනේ අයියෙ.."

" දැන් බය නොවී ඉඳහන්.. මම නම් කියන්නෙ රධ්‍ය ආධ්‍ය අයියගෙන් අයින් වුණා කියන්නෙ රධ්‍යගෙ පැත්තෙන් ඌ සේෆ්.. අයියගෙ අසනීපෙ ගැන තමා මට බයක් තියෙන්නෙ.. රධ්‍ය දැනගෙන හිටියෙ අසනීපෙ ගැන.."

" ආ..??"

@Shan

" ම්ම්.. රධ්‍ය දැනගෙන හිටියෙ හුඟ කාලෙක ඉඳලා.. ඌ කෑම්ප් එකේ ඉඳලා උඹලගෙ ගෙදර ඇවිත් ආයෙ කොළඹ ආපු දවසෙ ගෙදර ලොකු රණ්ඩුවක් වුණා.. දන්නවනෙ.."

" ම්ම්.."

" අන්න එදා ඉඳලා ඌ දන්නවා.."

" මම මොකුත්ම දන්නෙ නෑ අයියෙ.. මට මේ වෙලේ දැනෙන්නෙ මොනවද කියලා තේරෙනවද.."

" රධ්‍ය කොහේහරි මොකක් හරිම තියලා ගිහින් ඇත්තෙ ෂනෙරු.. උඹ හොඳට බලපන්.. රධ්‍යගෙ ෆෝන් එක හදවන්න බලපන්.. ඒ ඇරෙන්න උඹගෙ කාමරේ.. කොහේහරි මොකක් හරි තියෙනවා ඇති.. රධ්‍ය අන්තිමට ඇවිත් තියෙන්නෙ අයියව හම්බෙන්න වෙන්න ඕන.."

" ගෙදර හැමතැනම ලේ පැල්ලම් තිබ්බා.. එතකොට.. ඒ ඇයි.."

අයුක අයියා ටිකක් වෙලා කිසිම සද්දයක් නැතුව හිටියා.. මගේ පපුවෙ ගැස්ම වැඩිවෙනවා..

" මම හරියටම විස්තරේ කියන්න දන්නෙ නෑ ෂනෙරු.. මට නිකමට හිතෙනවා.. අප්පච්චි එදා ආවද කියලා.. කොහේහරි රධ්‍යට මිස්ටේක් එකක් වුණා.. නැත්නම් ඌ කරන දෙයක් හෙනට හිතලා බලලා කරන්නෙ.. මම දන්නවා බං ඌව.. අවුරුදු දාහතරක් මම ඌව හොඳට දන්නවා.."

"....."

" රධ්‍යගෙ අතින් ඌ කරන්න ගිය වැඩේ ගැස්සුණා.. මට සීයට දාහක් ඒකනම් ශුවර්.. නැත්නම් උඹව ඔහොම අඩවන එකෙක් නෙමෙයි බං ඌ.. උඹ දන්නවනෙ ඌ ආදරේ කරන්න ගියාම පිස්සෙක් වගේ ආදරේ කරනවා.. මට හෙන අවුල් බං.. මගේ ඔළුවත් පිස්සු වැටිලා වගේ.. අරගෙ කියානුත් පිස්සු කෙළිනවා.."

" එයාලා හොඳින් ඉන්නවනම් කමක් නෑ අයියෙ.. මට වෙන මොකුත් ඕන නෑ.."

@Shan

" එයාලා හොඳින් ෂනෙරු.. මට ඔයාට කියන්න තියෙන්නෙ මේ ඔයාගෙ ජීවිතේ එන වටිනම කාලෙ.. අඩලා වැටෙන්න එපා.. උඹට ඕනම වෙලේක මම ඉන්නවා.. වත්සල් ඉන්නවා.. කියාන් ඉන්නවා.. තේරුණානෙ.."

" ම්ම්.."

" අනික ෂනෙරු.. රධ්‍ය උඹ ගැන සෑහෙන්න බලාපොරොත්තු තියාගෙන හිටියේ බං.. ප්ලීස්.. ඌ ඉන්න තැනක ඉඳන් සැනසීමකින් ඉඳී.. පුළුවන් උපරිමෙන් වැඩ ටික කරගනින්.. හරිද.. අනික දැන් උඹ තව පඩියක් උඩට තිබ්බා.. රධ්‍යත් උගෙ ජීවිතේ ඉස්සරහට ගෙනියනවා.. මොන ලෝකෙ ඉදියත් උඹව ඌට අමතක කරන්න බෑ.. මාව විශ්වාස කරපන්.. මම ආවට ගියාට කියනවා නෙමේ.. තේරුණාද.."

" ම්ම්.."

" ඉස්සරහට කරන කියන හැමදේම හුඟක් හිතලා බලලා පරිස්සමට කරහන්.. රධ්‍ය උඹලා වෙනුවෙන් රිස්ක් එකක් ගත්තා කියලවත් මතක තියාගනින්.."

මම එහෙමම බිත්තියට හේත්තු වෙලා හිටියා.. ඇස් වලින් ගලන කඳුළුයි ඉකි වලටයි මට වචන පිටවෙන්නෙත් නැති තරම..

" මම තියන්නම් ෂනෙරු.. ඕනම වෙලාවක කතාකරහන්.. හරිද.. කන්ග්‍රැජුලේශන්ස්.. රිසාල්ට්ස් ඇවිල්ලා බලන්න.. බායි.."

අයුක අයියා කෝල් එක කට් කළා.. රිසාල්ට්ස් අවුට් වෙලා කියලද කිව්වෙ! මම ෆෝන් එක අරගෙන එහෙමම රිසාල්ට්ස් අවුට් වෙලාද බලන්න වෙබ් එකට ගියා.. ඔව් අද අවුට් වෙනවා කියලා ආශි කිව්වනෙ..

මම මතක හැටියෙන් ඉන්ඩෙක්ස් නම්බර් එක ගැහුවා.. මගේ පපුව තිබ්බෙ ගැහි ගැහී.. ඒ අස්සෙ මොන රිසාල්ට් එකක් ඇවිල්ලද දන්නෙ නෑ.. මේ දවස්වල එක පිට එක වෙන්නෙම මහා අවාසනාවන්ත දේවල් නිසා මට හිතුණෙ රිසාල්ල්ට් එකටත් මොකක් හරි වෙලා කියලා.. අන්තිමේ රිසාල්ට් ශීට් එක ස්ක්‍රීන් එකේ පෙන්නුවා.. මම ඇස් දෙක පියාගෙන අත තදකරගෙන ටිකක් වෙලා හිටියා..

කමක් නෑ මම පුළුවන් උපරිමෙන් කළානෙ..

@Shan

G.C.E A/L EXAMINATION

NEW Syllabus

NAME : VARADH SHANERU UDYOGA

INDEX NUMBER : *******

YEAR : 2023

STREAM : BIOLOGICAL SCIENCE

PHYSICS - A

CHEMISTRY - A

BIOLOGY - A

COMMON GENERAL TEST - 055

GENERAL ENGLISH - A

SUMMARY

Z-Score - 1.9653

District Rank - 35

Island Rank - 116

මම හීනෙන් වගේ රිසාල්ට්ස් බලලා එහෙමම ෆෝන් එක පැත්තකින් තිබ්බා.. මොන මගුලක්ද ඒ වැටුණෙ.. ඒක ඇත්තටමමට පේන එකක්ද.. නැත්නම් මම තාම ඉන්නෙ නිදාගෙනද.. මම කොට්ටෙ දිහා බලලා ආයෙම මගේ කකුලක් හූරගෙන බැලුවා.. නෑ මට දැනෙනවා.. ඒ කියන්නෙ මම ඉන්නෙ අවදියෙන් තමයි.. ඒ කියන්නෙ..

ඒ කියන්නෙ..

@Shan

ආයෙම මගේ පපුව වේගෙන් ගැහෙන්න අරගෙන අත් පවා වෙවුළුවා.. මම බලාපොරොත්තු වුණේ නැනෙ දෙයියනේ.. මේ මට උවමනාවටත් වඩා.. මම එහෙමම ඇඳෙන් බහින්න ගිහිල්ලා ඇඳ රෙද්ද පැටලිලා බිම ඇදගෙන වැටුණා.. ආයෙම ඒක ගුලි කල්ලා පැත්තකට විසික් කල්ලා සාලෙට යද්දි අම්මලා ආච්චිලා සෙනුකලා සේරම සාලෙ තේ බොනවා.. හෙන මහ රෑ තේ බොන්නෙ..

මම සාලෙට ගියා විතරයි සේරම හැරිලා මගේ දිහා උඩ ඉඳලා පල්ලෙහාට බැලුවා.. සෙනුකයා මට රැව්වා..

" මොකද මේ ඇස් දෙකේ හැටි.. සුදුමහත්තයා.."

ආච්චිඅම්මා නැගිටලා ඇවිත් මගේ මූණට එබුණා.. මම ඉක්මනට ඇස් දෙක පිහාගත්තා..

" අහ්.. නෑ නිදාගෙන නැගිට්ටටනෙ.. ඒකයි.."

ආච්චිඅම්මා මට සැකහිතෙන මූණක් පෙන්නලා ආයෙම හිනාවුණා.. මම දන්නවා දැන් කොයි වෙලේ හරි මාව තනියම අල්ලගෙන කියනකල්ම වද දෙන්න ගන්නවා.. එක අතකින් හිතේ තියන සේරම කියලා ඕන මගුලක් වෙද්දෙන් කියලා නිදහස් වෙන එක හොඳයි..

" අඩෝ ෂනෙරු උඹ නම් යකෙක් බං.."

සෙනුකයා ඇවිත් මාව බදාගත්තා.. උගේ උරහිස ගාවින් මට චමිරුව පෙනෙද්දි චමිරු මාත් එක්ක හිනාවුණා..

" මට තාම ශුවර් නෑ බං.."

මම සෙනුකට මිමිණුවහම මම දැක්කා අපේ අම්මගෙ ඇස්වල.. මූණෙ.. මම කවදාවත් නොදැකපු සැනසීමක් තියනවා.. සතුටක් තියනවා.. මූණ එළිය වැටිලා තියනවා.. අවංකවම මට මං ගැන මේ මොහොතේ සතුටක් දැනුණා.. මම අම්මගෙ හීනෙ කොහොම හරි අම්මට ගෙනැල්ලා දුන්නා.. අම්මා දැන් ඉඳලවත් මං ගැන පැහැදේවි කියලා මගේ හිතේ අමුතු සතුටක් පණ ගැහුණා.. අම්මා මාව උස් මහත් කරන්න කරපු කැපකිරීමට මම ආපස්සට දෙයක් දුන්නා කියලා මගේ මුළු හිතින්ම මහා විසාල සැනසීමක් දැනුණා.. අම්මට ඕන වුණේ මෙච්චරයි.. මම ඒක කොහොමහරි කළා..

@Shan

" කන්ග්‍රැජුලේශන්ස් පුතා.. බලන්න අනේ අපේ ගෙදර එක්කෙනා රිසාල්ට්ස් දැකලා දුවගෙන ගිහින් පඩිපෙළෙන් වැටිලා.. දැන් ඩිස්පැන්සරි එකට ගිහින්ලු ආවෙ.."

ආශිගෙ අම්මා ෆෝන් එක දිහා බලාගෙන දෙස් දෙවොල් තියද්දි මහීශගෙ අම්මා කම්මුලට අතක් තියාගත්තා..

" අපේ ගෙදරනම් ඕවගෙ වගක් නෑ.. අර මොකක්ද ප්ලාස්ටික් කෑල්ලක් අතට ගන්නවා.. ටීවී එක ඉස්සරහින් වාඩිවුණා.. සුනාමියක් ආවත් ගාණක් නෑ.. ඒකත් බලන්න ඕන මමමයි.."

" අපි නැත්නම් කොරයි.. නැද්ද නංගි.."

" අනේ හා.. ඇත්තටම.. කමක් නෑ දෙයියනේ කියලා ඒකත් කොහොම හරි ඉවරනෙ.. නේද.."

සෙනුකයා මාවත් ඇදගෙන චමිරුටත් එන්න කියාගෙන උන් දෙන්නා නැවතිලා ඉදපු කාමරේට රිංගගත්තා.. මම ඇදෙන් ඉදගත්තම චමිරු උටුවෙන් ඉදගත්තා.. මුන් දෙන්නගෙ රිසාල්ට්ස්වත් මම ඇහුවෙ නෑනෙ..

" ෂනෙරු.. දැන් අමාරුවක් නෑනෙ.."

" නෑ බං.. අඩෝ!! උඹලගෙ රිසාල්ට්ස් කොහොමද.. කියපන්කො.."

" උඹ මොකද කියන්නෙ.."

" සෙනුකයට නම් අනිවා ඒ තුනක් නැත්නම් මම ගඟේ පයිනවා.. රෑන්ක් එක කීයද.."

සෙනුක රතු වෙලා අමුතුවට ඇඹරිල මගේ ගාවින් ඉදගත්තා.. අයුක අයියත් කතාකළේ සතුටින් නෙ.. අනිවාරෙන්ම රෑන්ක් එකක්ම දාලා ඇති.. ඌ කොහොමත් පොත් ගුල්ලා වගේනෙ හිටියෙ ඒ දවස්වල..

" කොළඹින් නමය.."

මම පැන්න ගමන් සෙනුකයව බදාගත්තා.. මම දැනන් හිටියා කොහොමත් සෙනුකයා රෑන්ක් එකක් ගන්නවා කියලා.. උගේ දුකට සැපට ඉදිය යාලුවා

@Shan

විදියට මට සිරාම සතුටක් දැනුණා.. ඌ දාහක් ප්‍රශ්න මැද්දෙ කොහොම හරි ඒක කළානෙ..

" දෙයියනේ සෙනුක.. බං.. අනේ කන්ග්‍රැජුලේශන්ස්.. අඩෝ මට සතුටුයි බං.. උඹ සේරමත් අස්සෙ එක්සෑම් එකත් හොඳට කරගත්තනෙ.."

" නිකම් බටර් නොගා අහකට වෙයන්.. මස්සිනත් ඒ තුනක් දාලා හරිද මචං.. මම හිතුවෙ මේකා අර කැඩෙට් රූම් එක අස්සටම දිය වෙලා කියලා.. ඌත් ශේප් එකේ ගේමක් ගහලා ඉතින්.."

" සිරාවට චමිරු.."

" ම්ම්.."

මම සෙනුකගෙන එහාටවෙලා චමිරුටත් හග් එකක් දුන්නා.. චමිරුගෙ ඉස්කෝලෙ වැඩ ගැන කියන්න මම දැනගෙන හිටියෙ නෑ.. ඒ වුණාට බලද්දි ඌ මීටරයක් වගේ.. අයුක අයියගෙ මල්ලිනෙ..

" එහෙනම් මූත් ලෝ කොලේජ් යාවි.."

" අඩෝ අපේ ඉස්කෝලෙ ගැම්මක් බං.. මෙ සැරේ මෙඩිසින් විසි අටක් අපේ එකෙන්.. මට මාර සතුටුයි ඕයි.."

" සිරාවට..!! මරු මරු.. අපෙන් තා කවද දන්නෙ නෑ නේද.."

" අපේ ක්ලාස් එකෙන් දහයක් වගේ සෙට් වෙලා තිබ්බෙ.. අනිත් ඒවා ඉංග්ලිශ් මීඩියම් මම හිතන්නෙ.. ඇයි බං මැත්ස් එකේ උනුත් ඉන්නවනෙ.. ඒකෙනුත් හෙන ගොඩක් ඉන්නවලු ත්‍රී ඒස් තියන.."

මට, මගේ හිතේ, මම ඉගනගත්තු ඉස්කෝලෙ ගැන ලොකු ආඩම්බරයක් දැනුනා.. ඒකෙ කොටස්කාරයෙක් වෙන්න ලැබුණු එක ගැන විශේශෙන්ම ආඩම්බරයක් දැනුණා.. අවුරුදු ගාණක් ඉගනගත්තු ඉස්කෝලෙ වෙනුවෙන් යමක් කළා කියන හැඟීම දැනෙනවා.. මට ඒක රධ්‍ය අයියා කියලා තිබ්බා..

" අරුන් දෙන්නගෙ කොහොමද.. කතාකළෙත් නෑ බං.."

" උන් දෙන්නත් ගොඩ දාගෙන.. ආශි ඒක දැකලා දුවගෙන ගිහින් අණ්ඩක් කඩාගෙන.. අන්න ඩිස්පැන්සරි ගිහිල්ලා.."

@Shan

" අනේ සතුටුයි සෙනුක.. ඇත්තටම.."

මම සෙනුකව බදාගෙන උගේ බෙල්ල අස්සෙ මූණ ගහගත්තම සෙනුක මාව බදාගෙන පිටට තට්ටුවක් දැම්මා.. එයා බලන්න මං ළඟ නෑ තමයි.. ඒත් දැක්කහම සතුටු හිතෙයි.. මම එයා පසුතැවෙන්න මොකුත් කල්ලා නෑ කියලා මගේ හිත කිව්වා..

" අයියත් හිටියනම්.."

" ඌ සතුටට මැරෙයි බං.. දන්නවනෙ රධ්‍ය අයියා ටොකු ඇන ඇන උඹට ඉගැන්නුවෙ ඒ දවස්වල.."

" එයා සතුටු වෙව් නේද.."

" නැතුව.. මාමා, අයියා හැමෝටම සතුටු හිතේවි.. උඹ  කොහොම හරි අල්ලගෙන යනවා.. බලපන් හැමතිස්සෙම කඩා වැටෙන්නෙ නෑ.. උඹ මෙ මොහොතේ ඉඳලා හිතට ගනින්.. උඹේ හීන වලට යන්න.. උඹට රධ්‍ය අයියා පාර පෙන්නුවා.. යමන් කියලා ඇදගෙන ගියා.. දැන් උඹට තනියම යන්න පුළුවන්.. ඒකයි ඌ අයින් වුණේ.. ආයෙ ඕනම වෙලාවෙදි උඹලා හම්බෙවි.. අයුක අයියත් කිව්වෙ.. දෙයක් උනානම් හොඳට වුණා කියලා හිතන්න.. හැමදේම හොඳින් සිද්ධ වෙවි ෂනෙරු.. බලපන් ඉතින් ඩොකෙක් තමා කවදහරි.."

මට එහෙම කියද්දිත් අමුතු ආඩම්බරයක් මං ගැන දැනුණා..

" ෂනෙරුට ඔබ්ස'වර් එකේ ඉන්ටවීව් එකක් තියනවා.. උඹලගෙ කෝච් හවස කතාකළානෙ.."

" මොන..?? ඈ..??"

" ඔව් ඔව් බං.. උඹ නිදි නිසා මම කතාකළේ.. හැමදේම හොඳින්ද ඇහුවා.. උඹ පරිස්සමට ආවද ඇහුවා.. ඊටපස්සෙ තමා ඉන්ටවීව් එක ගැන කිව්වෙ.. අපිට මෙහෙ වැඩි දවසක් ඉන්න වෙන්නෙ නෑ ෂනෙරු.. ඉස්කෝලෙත් වැඩ ලොට් එකක් තියෙනවා.. අපි තුන්දෙනාම මෙහෙනෙ.. ජොනතන් කිව්වා මෙ ටිකේ අවුලක් නෑ කියලා.. ඒත් උඹට තියන වැඩ දන්නෙ උඹනෙ.."

" ම්ම්.."

@Shan

චමිරු පුටුවෙන් නැගිටලා සෙනුකගෙ එහාපැත්තෙන් ඉඳගත්තා.. ඒ වැඩ කන්දරාව මේ වෙලේ මතක් වුණාම මට පිස්සු හැදිලා තමයි නවතින්නෙ..

" ෂනෙරු.. ඔයාට දිගටම ක්වාටස් නවතින්න බැහැනෙ මාමා නැති නිසා.. අපි ඇනෙක්ස් එකක් වගේ රෙන්ට් කරමුද.. දැන් කරන්න ඕන වැඩටික සිහියෙන් කරගනින්.. ඒක සෙට්ල් කරගන්නෙ නැතුව එකපාර කොළඹ යන්න බෑනෙ.."

මම කල්පනා කළා.. අයුක අයියා කිව්වා වගේ අඬ අඬ හිටියොත් මට සේරම මහැරෙනවා.. කොහොම හරි, අමාරුවෙන් හරි මම ඉවසගන්න ඕන තමයි.. මාමා නෑ කියන්නෙ අම්මගෙයි ආච්චිගෙයි වගකීමත් මට තියනවා.. මම ළමිස්සි වගේ අඬ අඬ හිටියොත් මට කිසිම දෙයක් කරගන්න බැරි වෙනවා..

එකපාර ඇනෙක්ස් එකකට යන්න ගියොත් අම්මා අහවි ඇයි කියලා.. සේරටමත් ඉස්සෙල්ලා ආච්චිඅම්මට මේ විස්තරේ කියලා කරන්න ඕන මොකක්ද කියලා අහගන්න ඕන.. සමහරවිට ආච්චිඅම්මා තේරුම් ගනී.. මම කිව්වොත් අහවි..

" මෙහේ ඉඳන් තැනක් බලාගන්න බැරි වෙයිද බං.."

" ආවට ගියාට තැනක නතරවෙන්න බෑ.. හොඳ ආරක්ශාවක් තියන තැනක වෙන්න ඕන.. අනික නිස්කලංක තැනක් නම් හොඳයි.. පාඩම් වැඩ වලටත් කරදායක් නැති.."

" රෙන්ට් එක කීය වුණත් කමක් නෑ.. හොඳ තැනක් නම්.."

" පිස්සුද යකෝ.. රෙන්ට් එක කීය වුණත් නෙමේ.. ඔය හම්බෙන සල්ලියක් ඉතුරු කරගන්න බලපන්.. සාධාරණ ගානකට හොඳ තැනක් හොයාගන්න බැරිවෙන්නෙ නෑ.."

" විස්සකට විතර හොඳ නැද්ද.. කොළඹින් අඩුවටම තැන් හොයන්න බෑනෙ සෙනුකයා.."

" ආ ඔව්.. ඒ වගේ හොඳයි.. තනියම ඉන්නවා කියන්නෙ වියදම ටිකක් සැරයි ෂනෙරුවා.. කෑම බීම හැම එකේ ඉඳලම උඹට වියදම් කරගන්න වෙනවා.."

@Shan

" මොනව කරන්නද බං.. ඒකට නම් අවුලක් නැති වෙයි.. මොකද ක්ලබ් එකේ මේ මැච් එකටත් මට අසූවක් විතර වැටෙනවා.. ඒ ඇරෙන්න සැලරි එකකුත් හම්බෙනවනෙ.."

" ම්ම්.. ඒත් උඹ ශේප් එකේ වැඩ ටික කරගනින්.. ඉතුරුවක් තියාගන්න ඕන.. කවදහරි ඕන වුණොත් එතකොට උඹට තනියම ගේමක් ගහගන්න පුළුවන්.. තෙරුණාද.."

" ඔව.."

" මම තැනක් බලන්නම්.. දවසක් දීපන්කො.."

මම චමිරු දිහා බැලුවා.. මට චමිරු මං වෙනුවෙන් කරන දේවල් උපමනාවටත් වැඩි කියලා හිතුණා..

" උඹට මම නිසා කරදරේ නේද.."

" කියලා වැඩක් නෑ.. අපිටත් හම්බෙන්නෙ පුදුම යාළුවොනෙ.. කට පියාගෙන ඉදපන්.."

" අනේ මේ මරාගන්න එපා.. හරි චමිරු තැනක් හොයලා කියපන්.. ෂනෙරු, ආච්චි එක්ක කතාකල්ලා අම්මලාට කියන්න දෙයක් බලපන්.. උඹලගෙ අම්මා මෙහෙ ඉදන් සේරම අප්ඩේට් එකේ ඉන්නෙ හරිද.."

" ම්ම්.."

මම ඇඳ වියලෙට හේත්තු වුණා.. කරන්න හුඟක් දේවල් තියනවා.. මම ඉක්මනට තැනක් හොයාගෙන ක්වාටස් එකේ යතුරු බාරදෙන්න ඕන.. ඉස්කෝලෙ වැඩත් තියනවා.. ක්ලබ් එකේ වැඩත් තියනවා.. ඇයි.. ඇයි මට මං ගැන හිතලා අඩන්නවත් නිදහසක් නැත්තෙ කියලා හිතෙනවා.. මට මං ගැන කල්පනා කරන්නවත්.. මට නැතිවුණු අය ගැන කල්පනා කරන්න වත් නිදහසක් නෑ.. මම හැමපැත්තෙන්ම වගකීම් ගොඩකින් හිර කල්ලා දාලා..

අයුක අයියා කිව්වා වගේ කොළඹ ක්වාටස් එකේ මොනවම හරි ඇති.. රධ්‍ය අයියගෙ ෆෝන් එක කියාන් අයියගෙන් ඉල්ලගෙන හදවගන්න ඕන.. මම බලාපොරොත්තු වෙන විදියේ මොනවමහරි දෙයක් මට හම්බෙව් කියලා මගේ හිතේ විශ්වාසයක් ඇතිවුණා..

@Shan

සනෙරුගෙ අම්මා වගේ අනේ දැනෙම්නෙ.. පුදුම සතුටුයි.. අම්මියො~

සමනලයා ආවෝ~

සමනලයට වැඩ අනේ හරියට.. ටයිප් කරගෙන ඉවරවුණාම තමා දෙන්නෙ..

ඉම්හි මාව මරන්න කෝමතෙ හිත හදාගත්තෙ.. පෞකාරිගෙ තටු සිඳුණා..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 146 කොටස

" දැන් නම් මට නිවීසැනසිල්ලේ ඇස් දෙක පියාගත්තැහැකි.. මගෙ කොල්ලා ඒකත් හොඳට පාස් වුණානෙ.. උඹ දන්නෑ මේ ආච්චිඅම්මට කොයිතරම් සතුටුද කියලා.. ඈ කොල්ලො.."

" පාඩුවෙ ඉන්න ආච්චිඅම්මෙ.. ඇස් පියාගන්න හැයි හැයි තමා.."

" පරිස්සමට අඩිය තියලා වරෙන්.. මෙ පේනවනෙ ලිස්සනවා.."

මම අලුතින් බැඳපු නියර දිගේ ආච්චිඅම්මා පස්සෙන් ඇවිදන් ගියා.. අපේ වෙල මැද්දෙ නියර දිගේ ගියාම ගඟ පැත්තට යන්න ලේසි.. බස්නාවට පල්ලෙහායින් ගඟ අද්දර හෙනට දර තියනවා.. කවුරුත් කඩන්නෙත් නෑ.. ඒකනිසා මමයි මාමයි වෙනදට ඒ පැත්තෙ දර කඩන්න යනවා.. ආච්චිඅම්මා පණ්ඩිතයිනෙ.. මමයි සෙනුකයි ගිහින් එන්නම් කිව්වහම සෙනුකව ගෙදර තියලා ආච්චිඅම්මා මාවත් ඇදගෙන ගඟ පැත්තෙ ආවා.. ආච්චිඅම්මගෙ හිතේ හයිය මිසක.. ඇඟටනම් මෙවගේ මෙච්චර දුව ඇවිදින්න හයියක් නෑ.. ඒ වුණාට නොකරත් බෑ උණ වගේලු.. අපේ ආච්චිගෙත් අමුතු කතා තමා තියෙන්නෙ..

අපේ ආච්චි හෙන උජාරුවෙන් ඉන්න මම විභාගෙ පාස් වුණා කියලා.. හරියට ආච්චිඅම්මා කැම්පස් යනවා වගේ.. ඇත්තටම මගේ හිතේ විභාගෙ ගැන නම් පොඩිම පොඩි පසුතැවීමක්වත් නෑ.. හිතේ සැරින් සැරේ අළුයට අඟුරු වගේ උඩට එන ගිනි පුපුරු තිබ්බත් මෙ වෙලේ මම ඉවසගෙන හිටියා.. රඨා අයියා මම ළඟ නැති එක මිසක් අනිත් හැමදේම හොඳ විදියට සිද්ධ වෙනවනේ කියලා මම ටිකක් හරි හිත හදාගත්තා.. එයා එයාගෙ හීන වලට යන්න පටන් ගනී කියලා මම හිතුවා..

හැමදාම එහෙම ඉඳලා බෑනෙ.. එයාට මට වගේ ම හීන හුගාක් තිබ්බා.. මට හැමදේම නොකිව්වත් එයා එයාගෙ අනාගතේ ගැන සෑහෙන්න බලාපොරොත්තු තියාගෙන ඉඳපු කෙනෙක්.. ඒවා විනාසවෙන්න නොදී එයා අල්ලගෙන ඉදීවි කියලා මම දන්නවා.. කොහේ හිටියත් පරිස්සමට ඉන්නවා නම් එච්චරයි.. හැමෝම පරිස්සමින් ඉන්න ඕන.. මගේ මාමට ජීවිතේ සතුටින් පටන්ගන්න දැන්වත් පුළුවන් වෙන්න ඕන.. මාමා සතුටින් ඉන්නෙ ආඪ්‍ය අයියා ළඟනම් අනිවාරෙන්ම ආඪ්‍ය අයියා ජීවත් වෙන්නම

@Shan

ඕන.. මාමා ලේසියෙන් අතාරින එකෙක් නෙමේ.. මොකක්ම හරි කල්ලා එයා ගොඩ ඒවි කියලා මගේ හිතේ බලාපොරොත්තුවක් තිබුණා..

" දන්නවද සුදුමහත්තයෝ උඹලයි අම්මා ඉස්සර ගඟේ නානකොට කොණ්ඩෙ අන්න අරහෙ පාවෙනවා.. උඹත් අම්මා වගේ.."

" හැබැයි පාවෙන්න කොණ්ඩයක් නෑනෙ.."

ආච්චිඅම්මා මහා හයියෙන් හිනාවුණා..

" නැත්තෙ කොහෙද.. අපි දැක්කනෙ ගෑණු ළමිස්සියෙක්ට ඇඳගෙන නටනවා.. හැඩේ බෑ.."

මම ආච්චිඅම්මට මූණ ඇදකල්ලා ගිහින් ගඟේ පැත්තක තිබ්බ දිරච්ච කොහොඹ අත්තක අතු කඩලා කඩලා දැම්මා.. ආච්චිඅම්මා මම දර කඩනකල් ගලක් උඩින් ඉඳගෙන හිටියා..

" හූරගන්නෑ අත පය එහෙම.."

" හැරි ඇයෙද්.. ආච්චි මහ පණ්ඩිතයි අප්පා.."

" පණ්ඩිත නොවී පුළුවන්ද ගෙදර ඉන්න මිනිස්සු එක්ක.."

මම ආච්චිට යන්තම හිනාවෙලා දර ටික බිඳලා පොහොර උරෙන් තිබ්බා.. ගඟේ වතුර පාර සැරයි මේ කාලෙට.. ඇතින් බස්නාවෙන් වතුර හෝ ගාලා ගලාගෙන යනවා.. ඒ දිහා දැක්කමත් බය හිතෙනවා.. ඔය බස්නාව මැද්දෙන් විසාළ කුඹුක් මුලක් හරහට ගිහින් තියෙන්නෙ.. ඇළෙන් වතුර ඇවිල්ලා කුඹුක් මුළේ වැදිලා ගඟට එකතුවෙනවා.. මේ හරිය ගැඹුරුයි.. අනික කිඹුල්ලු අම්බානෙක ඉන්නවා.. අපි නම් වෙලාවක් වෙන් කරන් ඉන්නෙ ගඟේ එන්න.. ඒ වෙලාවට උන් වැඩිය එන්නෙ නෑ.. දවල් දෙක පහුවුණාම නම් මේ පැත්තෙ එන්න බයයි.. කිඹුල්ලු විතරක් නෙමේ සර්පයොත් හෙනට ඉන්නවා මෙහේ.. හොඳට බලාගෙන ඕන ඇවිදින්න.. දවසක් මට වැලි පොළඟෙකුත් පෑගෙන්න ගියා උඩ බලාගෙන ඇවිදලා..

මම සැරින් සැරේ ගල උඩ ඉඳගෙන ඉන්න ආච්චිඅම්මා දිහා බල බල පොහොර උරේ දර අඩුක් කල්ලා පිරෙව්වා.. ආච්චි මොකක් හරි කල්පනා කර කර ඉඳලා මට ආච්චිගෙ එහාපැත්තෙන් ඉඳගන්න කතාකලා.. මම අත්

@Shan

දෙකත් පිහාගෙන ගිහින් ආච්චිගෙ එහාපැත්තෙන් ඉඳගත්තම ආච්චි මගේ අත අස්සෙන් අතක් පටල ගත්තා..

" සුදුමහත්තයෝ.. උඹ මොනවද මගෙන් හංගන්නෙ ඒ පාර.. මට වැඩිය කල්කිරියාව අල්ලන්නෙ නෑ.."

මගේ බඩපප්පුව රත් වෙලා ගියා.. ආච්චිට තරහ යාවිද මම මේක කිව්වොත්..

" හංගනවා නෙමෙයි ආච්චිඅම්මෙ.. කියන්න ලොකු දෙයක් තියනවා.. ඒත් මට බයයි.. ඒක කියන්න.."

ආච්චි මගේ අතක් තද කල්ලා අල්ලගත්තා.. හරියට ඕනම දෙයක් කියන්න කියලා කියනවා වගේ.. මගේ ඇස් වලට ලාවට කඳුළු පටලයක් ඉනුවහම ඒක ගහේ හුළං පාරටම ටිකකින් වේලිලා ගියා..

" උඹට මට මොකුත් හංගන්න බෑ සුදුමහත්තයෝ.. අනික මම යම්කිසි දෙයක් දැනගෙනයි උඹට මේ කතාකරන්නෙ.."

මම බයවෙලා වගේ ආච්චිඅම්මා දිහා බැලුවා.. ලොකු පීඩනයක් දැනෙනවා..

" ම්-මොකක්ද ආච්චිඅම්මෙ.."

" ඒකට කලින් මට කියන්න තියන දේ කියාපන්කො.."

මම ආච්චිගෙ පැත්තට හැරුණා.. කමක් නෑ මොනවා වුණත් මම මේක ආච්චිඅම්මට කියනවාමයි කියලා හිත හදාගත්තනෙ..

" ආච්චිඅම්මා මොකුත්ම නොකිය මුලින් අහගෙන ඉන්න.. ප්ලීස්.. මාව තව අවුල් කරන්න එපා.. මට ඉන්නෙ ආච්චිඅම්මා විතරනෙ.."

" ම්ම්.."

මම හොඳ හුස්මක් ගත්තා..

" අපේ මාමා කෙනෙක් එක්ක සම්බන්ධයක් පටන් ගෙන තියෙනවා.. දැන් හුඟක් කල් ආච්චිඅම්මෙ.. ඉතින්.. ඉතින්-"

@Shan

" ඒ කවද සුදුමහත්තයා.. ඉතින් ඔක කියන්න බැරි තරම එකක්ද.. ගෑණුළමය කොහෙ කෙල්ලෙක්ද.. කැම්ප් එකේමද.."

මම ආච්චිගෙ ඇස් දිහා බලාගෙන හිටියා.. ඒ බොරපාට අහිංසක ඇස් වලට කඳුලක්වත් ඉනුවොත් මට මොකුත්ම දරාගන්න බැරිවෙනවා..

" ආච්චිඅම්මෙ.. ඒ කෙල්ලෙක්.. නෙමෙ.. කෙ-කෙල්ලෙක් නෙමෙ..

" එහෙනම් බැඳපු කෙනෙක්ද.. ගොත ගහන්නැතුව කියාපන්කො සුදුමහත්තයා.."

" න්-නෑ.. බැඳපු කෙනෙක් නෙමෙ.. එයා.. එයා පි-පිරිමි ළමයෙක්මයි.. මම කිව්වෙ අපේ මාමා යාළුවෙලා ඉන්නෙ තව පිරිමි ළමයෙක් එක්කමයි.."

" දේව..??"

ආච්චිඅම්මගෙ ඇස් දෙක එකසැරේට ලොකු වුණා.. මොකුත් හිතාගන්න බැරුව වගේ ගලාගෙන යන ගඟ දිහා ඇස් දෙක ලොකු කරගෙන බලාගෙන ඉද්දි ආච්චිඅම්මගෙ තොල් පටවල් වෙවුළුවා.. මම ආච්චිඅම්මගෙ රැළිවැටිච්ච අත බදාගෙන ආච්චිට තුරුල් වුණා.. අනේ අඩන්න එපා ආච්චිඅම්මෙ.. ඒක ආච්චි හිතනවා වගේ පවුකාරකමක් නෙමෙ.. ආච්චි ලාවට වෙවුලනවා මට දැනුනා.. මම මහ වරදකාරී හැඟීමක් දැනෙනවා..

" උඹ ඇත්ත නේද සුදුමහත්තයා කියන්නෙ.. ආච්චිඅම්මට බොරු කියනවා නෙමෙ නේද.."

" නැහැ ආච්චිඅම්මෙ.. අනේ සමාවෙන්න ආච්චිඅම්මෙ.. මම කිසිදෙයක් හැංගුවෙ නෑ.."

" උඹ මොකටද සමාව ගන්නෙ.. දේව එක්ක මට කතාකරන්න ඕන.."

මගේ පපුව ආයෙම හිරිවැටීගෙන ගියා.. මට මෙහෙම කරන්න එපා දෙයියනේ..

" ආච්චි මගේ කතාව අහලා ඉන්න.. ඉස්සෙල්ලම.. අනේ ආච්චිඅම්මෙ.."

" මම..?? සුදුමහත්තයා කියන්න.. දේව රවට්ලාද සුදුමහත්තයො.. කවුරුහරි මගේ කොල්ලා රවට්ටගෙනද.. ඇයි මට මේ වගක් නොකිව්වේ.. මේ

@Shan

අම්මව විශ්වාස නැතුවද රත්තරනේ.."

ආච්චිඅම්මගෙ ඇස් වල කඳුළු පිරුණා..

" අනේ නෑ ආච්චිඅම්මෙ.. ආච්චිඅම්මා දන්නවද.. මේ ලෝකෙ ලැබෙන්න පුළුවන් හොඳම කෙනා තමයි අපේ මාමට ලැබිලා තියෙන්නෙ.. මාමා හුඟක් සතුටින් ජීවත් වුණේ ආච්චිඅම්මෙ.. මාව විශ්වාස කරන්න.. මම මාමගෙ පැත්තට කතාකරනවා නෙමේ.. ඒත් මේක වැරැද්දක් නෙමේ ආච්චිඅම්මෙ.. මාමා නැවතුණේ ඇනෙන තැන.. මාමට ඇනිච්ච තැන ඒ අයියා ගාවනෙ.."

" මොන අයියා..??"

" ආ-ආඪ්‍ය අයියා.."

මම මිමිනුවා.. ආච්චිඅම්මා ගැස්සිලා වගේ මගේ දිහා බැලුවා..

" ආඪ්‍ය..?? අර දොස්තර කොලුවා....??"

" ඔව් ආච්චිඅම්මෙ.."

" දෙයියනේ කොල්ලො.. අර මෙහෙ ආපු උස කෙට්ටු හාදයා.. රඪ්‍ය කොලුවගෙ අයියා ගැනද මේ කියන්නෙ.."

" ම්ම්.."

ආච්චි මගේ මූණ දිහා බලාගෙන ඉද්දි මම බිම බලගත්තා..

" කොයි කාලෙ ඉඳලද.. මට හරියට විස්තරෙ කියාපන් ඉස්සෙල්ලා.."

" දැන් අවුරුදු පහ හයක්ම වෙනවා.. එයාලා හම්බුණේ අපි නිසා නෙමේ.. කලින් ඉඳලම දන්නවා.. ආඪ්‍ය අයියා ඩොක්ට කෙනෙක් වෙලා මුල් කාලෙ නාරාහෙන්පිට වැඩ කල්ලා.. එතකොට අපේ මාමව හම්බෙලා තියෙන්නෙ.. එයාලා හොඳට ගැලපෙනවා ආච්චිඅම්මෙ.. අපේ මාමා අයියට හුඟක් ආදරෙයි.. අයියත් එහෙමයි.."

" මගෙ අම්මෙ.. හෙන කාලයක්නෙ.."

@Shan

" ඕ.. ඊටපස්සෙ ආධ්‍ය අයියගෙ අප්පච්චි මේ සම්බන්ධෙ ගැන දැනගෙන ලොකු කලබලයක් ඇතිකල්ලා.. අපේ මාමා ත්‍රිකුණාමලේට ට්‍රාන්සර් කල්ලා.. ආයෙම අවුරුදු ගානකට පස්සෙ එයාලා හම්බුණේ මමයි රධ්‍ය අයියයි නිසා.. ඒත්-"

"....."

" ඒත් ආච්චිඅම්මෙ.. ආධ්‍ය අයියට අසනීපයක් තියනවා.. ඒප්ලස්ටික් ඇනීමියා කියලා.. ලොකු අම්මගෙන් ඕන්නම් ඒකගැන අහලා බලන්න.. ඒකට ආධ්‍ය අයියා අසනීපෙන් ඉන්නෙ ආච්චිඅම්මෙ.. එයාව පවුලෙන් අයින් කල්ලා තියෙන්නෙ.. අප්පච්චිවත් හොයන්නෙ නෑ.. ආධ්‍ය අයියා ඒ හැමදේම බලාපොරොත්තු වෙන්නෙ මාමගෙන්.. අනේ ආච්චිඅම්මෙ තේරුම් ගන්නකො.."

" ඉතින්.."

" ඉතින් ආධ්‍ය අයියට අසනීප වුණා ළඟදි, හුඟක් අමාරුවෙලා හොස්පිටල් හිටියෙ.. මම රට ගියානෙ.. ආයෙ එද්දි.. ල්-ලොකු ප්‍රශ්නයක් වෙලා.. කොළඹ කවුරුත් නෑ ආච්චිඅම්මෙ.. මම ඒකයි මෙහේ ආවෙ.. මාමා නෑ.. අයියත් නෑ.. රධ්‍ය අයියා ගැන ආරංචියකුත් නෑ.. අප්පච්චි මොකක් හරි ප්‍රශ්නයක් ඇති කල්ලා ආච්චිඅම්මෙ.. මම එද්දි හැමදේම නැතිවෙලා.. මම - මම ඒකයි ආච්චිඅම්මව හොයාගෙන ගමේ ආවෙ.. අහ්-අනෙහ්.."

මට ඉකිගැහිලා ඇඬුනහම ආච්චි මාව තුරුළට අරගෙන ඔලුව අතගෑවා.. ආච්චිඅම්මා කතානොකරම ඉද්දි මට බය හිතෙනවා..

" ආධ්‍ය පුතාගෙ අසනීපෙ මොන වගේ එකක්ද සුදුමහත්තයා.."

" ඒකට ඇටමිදුළු බද්ධයක් කරන්න ඕන.. ඇහේ අලුත් රුධිර සෛල හැදෙන එක අඩු වෙන එක වෙන්නෙ.. අයියට අමාරුවෙලා හිටියෙ ආච්චිඅම්මෙ.."

" මගෙ දෙයියනේ.. ඒ දරුවගෙ අම්මා කොයි ලෝකෙද ඉන්නෙ.. මං වත් ඔය වගක් දැනන් උන්නනම්.. උඹලගෙ මාමලා හිතාගෙන ඉන්නෙ මං යකෙක් කියලද සුදුමහත්තයො.. ඔය වගක් මට නොකිව්වෙ."

@Shan

" එයාලගෙ අම්මා රට ඉන්නෙ ආච්චිඅම්මෙ.. එයා කතාකළේ නෑ ළඟදි.. ඒ අප්පච්චි මහ අමුතු මනුස්සයෙක්.."

" ඉතින් හත්දෙයියනේ තමන්ගෙ ලෙයින් වදාපු දරුවනේ.. දැන් දේව් ඉන්නෙ ඒ පුතා ළඟද.."

" ඔ-ව් ආච්චිඅම්මෙ.. එහෙම වෙන්න ඕන.."

" දෙයියන්ගෙ පිහිටෙන් ඒ දරුවා සනීප වෙන්න ඕන.. ඒත් මගෙ හිතට දුකයි සුදුමහත්තයො.. ඒ කොල්ලා මට කටපුරා අම්මෙ කියලමයි කතාකරන්නෙ.. කවද දෙයියනේ ඔය වගක් දැනන් උන්නෙ.. හරි පිංපාට දරුවෙක් ඇත්තමයි.. හොඳ මිනිස්සුන්ටමයි කරදර වෙන්නෙ.."

ආච්චිඅම්මා මාමා ගැන කතානොකර ආධ්‍ය අයියා ගැනම කතාකරද්දි මොකුත් හිතලා නැද්දෝ මට දැනුණා.. එක්කො අපි ආච්චිඅම්මා ගැන හිතන් හිටියා වැරදිද මන්දා.. ආච්චිඅම්මට හැමෝම ආච්චිගෙම දරුවො වගේ.. මට ආච්චිඅම්මා ගැන මහා ආදරයක් දැනුණා..

**'මහපොළොවෙ පය ගහලා ඉන්න ආදරේ පුරොගත්තු මිනිස්සු'**

ආදරණීයම මිනිස්සු.. කාටවත් නැතිවෙන්න ඕන නෑ..

" දේව් ගියේ ඒ ළමයා ගැන ඇත්තටම හිතේ හැඟීමක් තියන නිසා කියලා සුදුමහත්තයට හිතෙනවද.."

" ඔව් ආච්චිඅම්මෙ.. මාමා අයියා වෙනුවෙන් ඕනම දෙයක් කරන ගාණට හිටියෙ.. අනේ මම හරි ආදරෙයි ඒ දෙන්නට.. මාමා හොඳින් ඇති නේද ආච්චිඅම්මෙ.. මගේ මාමා.."

ආච්චි මගේ ඔලුව අතගගා පාඩුවෙ ගලාගෙන යන ගඟ දිහා බාඅගෙන හිටියා.. ග්‍රීශ්මෙ හුළඟ වෙලුම්කාලා.. පුදුම රස්නෙයි.. අව්ව ගඟට වැටිලා ගඟ දිලිසෙනවා.. අපේ පැත්වල මේ කාලෙට ඉන්න හරි අමාරුයි.. ගස් කොළං තියනවනම් කමක් නෑ.. අපිට වෙල නිසා දැනෙන්නෙ නෑ..

" උඹලගෙ මාමා ගැන මං තරම් දන්නෙ කවුද බං.. ඌ මොන කට්ටක් හරි කාලා ජීවත් වෙනවා.. දේව් පොඩි එකෙක් නෙමෙ..ඌට හොඳට කට්ට කාලා හුරුයි.."

@Shan

" එතකොට එයාලගෙ සම්බන්ධෙ.."

" මම ඕවා ගැන අහලා තියනවා.. මමත් ඉස්කෝලෙක උගන්නපු මනුස්සයෙක් සුදුමහත්තයා.. මගේ අවුරුදු හැත්තෑවකට මේ කොණ්ඩෙ පැහුණෙ ගේ අස්සෙ වැදිලා ඉඳලා නෙමේ.. මම හුඟක් දේවල් දන්නවා.. කොහෙද උඹලාට මේ වයසක මනුස්සයා විශ්වාස නෑනෙ.."

" එහෙම නෙමේ ආච්චිඅම්මෙ.. හැමෝම එක වගේ නෑනෙ.."

" මට හිතට දුකයි දේව් මට ඔය වග නොකිව්ව එක.. ආඪ්‍ය හොඳ ගුණයහපත් දරුවෙක් කියලා මට දැක්ක ගමන්ම තේරුණා.. දෙයියනේ කියලා සනීප වෙලා ඉන්න තැනක දේව් සතුටින් හිටියොත් මට ඒ ඇති කොල්ලො.. මමත් මොකෝ හැමදාම ඉන්න ඇවිල්ලා නෑනෙ.. අන්තිමට ඌ තනිකඩව නොඉඳ ජීවිතේ ඉස්සරහට යන්න හිතපු එක ගැන මට සතුටුයි.."

මම ආච්චිඅම්මව තද කල්ලා බදාගත්තා.. මගේ ආච්චිඅම්මා..

" අපි මොනවද අම්මලට කියන්නෙ ආච්චිඅම්මෙ.. එයාලා ඔහොම හිතන්නෙ නෑනෙ.."

" මම ඒක බලාගන්නම්කො.. දැන් සුදුමහත්තයා කොළඹ කොහොමද ඉන්නෙ.. තනියමනෙ.."

" ඇනෙක්ස් එකක් ගන්නවා ආච්චිඅම්මෙ.. යාළුවොත් ඉන්නවනෙ.. දැන් කොහොමත් මම ලොකුයි අම්මට වද දෙන්න බෑ.. සැලරි එකකුත් හම්බෙන නිසා එහෙම කරන එක හොඳයි කියලා හිතුවා.."

" පරිස්සමින් කොල්ලො.. උඹ මගේ අතට ගත්තු පොඩිඑකාද කියලා මට හිතෙනවා.. කරදඬු උස්මහත් වෙනවා.. අද ඊයෙ වගේ මතක උඹ මේවගෙ දුවපැන්න හැටි.."

ආච්චි ගවුමෙ කරෙන් ඇස් කොනක් පිහාගත්තම මගේ ඇස් වලටත් කඳුළු ඉනුවා.. බෙහෙත් තෙල් සුවඳ හරි ආදරණීයයි..

" මම හැමදාම ආච්චිගෙ පොඩි කොල්ලා තමයි.."

ආච්චි මගෙ හිස් මුදුනට හාද්දක් දුන්නා..

@Shan

" මට රධ්‍ය පුතා කතාකළා.. මම ඒක ගැනයි අහන්න හැදුවෙ.. උඹලා දෙන්නගෙ මොකක්ද තියන හුටපටේ.. මට පැහැදිලි කරපන්.."

එකසැරේට මට කරන්ට් එක වැදුණා වගේ.. මෙහෙම ගිහින් පුදුම වෙලාම මම මැරිලා යයිද මන්දා..

" ක්-කවුද රධ්‍ය අයියා..??"

" ඒ අයියා තමයි.. ඒ අයියා මේ මල්ලිගෙ කව්ද කියලා ඉඳින් ඉස්සෙල්ලම.."

" අ-අම්.. ආච්චිඅම්මෙ.. මෙහෙමයි.. නෑ ඇත්තටම අපි ඉස්කෝලෙ හොඳ යාලුවො.. ආච්චි දන්නවනෙ.."

" ගොත ගහන්නැතුව කියපන්.."

ආච්චි ළඟ තිබ්බ කෝට්ටක් ඇදලා අරගෙන ඒකත් වන වන සැරෙන් කියද්දි මම ඉඳගෙන ඉඳපු ගලෙන් නැගිට්ටා..

" අනේ ආච්චි ගහන්නෙපා.."

" ගහන්නෑ.. කියපන්.."

ආච්චි මගේ කකුල් දෙකටම හොඳ පාරක් දුන්නා..

" ආව්-ස්ස්.. ගගන්නෑ කිය කිය ගහන්නෙ..!! ඉන්න පොඩ්ඩක්.."

" කියපන්.."

" මම ඒ අයියට කැමැත්තෙන් හිටියා.. අනේ ඉතින් වැරැද්දක් නෑනෙ.. ඒත් කාටවත් කිව්වෙ නෑ.. අම්මා දැනගත්තොත් මාව මරාවි.."

" ඒ අම්මනෙ.. මේ මම.. උඹෙ ආච්චිඅම්මා.."

" ඉතින්.. ඒකතමා දුවගෙ අම්මනෙ.. ආව්-ස්ස් අනේ අප්පා.. ගහන්නෙපා.."

මම අඬාගෙන එහෙමම වාඩිවුණා.. මගුල..

@Shan

" ඒ කොල්ලට කොන්ද පණ තියනවා මට කතාකල්ලා කියන්නවත් උඹලා දෙන්නා ගැන.. ඒකට මම හදපු එකා.. සේරම හිතේම තියාගෙන ඉඳපන්.. උඹලා හැදුව මට එපා ගහන්න.. මීහරක් තුන්දෙනා.. උබලගෙ අම්මයි මාමයි උඹයි සේරම එකයි.. සේරම එකයි.. මගේ පපුවෙ අමාරුව වැඩිකරන්නමයි නහින්නෙ.."

මම කකුල් දෙක පපුව ගාවටම ළං කරගෙන ඔලුව ගහගත්තා.. මට දුකයි.. හිතේ දුක වැඩිවෙනවා.. රධ්‍ය අයියා මොනවද කල්ලා තියෙන්නෙ.. ඇයි මම මැච් එකකට රට ගියේ..??

" එහෙම නෑ.. රධ්‍ය අයියා මටකියන්නෙ නැතුවම ගියා ආච්චිඅම්මෙ.."

" ඔය අඩනවද සුදුමහත්තයො.."

" න්-නැහැ.."

ආච්චි කෝට්ටෙන් මගේ පිටට තට්ටු දෙකතුනක් දැම්මා..

" මෙ වයසෙ පිරිමි ළමයි හරි මුරණ්ඩුයි.."

"....."

" රධ්‍ය පුතා හරි හොඳ කොල්ලෙක්.. පොඩ්ඩක් නපුරු පාට වුණාට.. මම දන්නවනෙ මගේ පාරෙ පස්සෙ ඇවිද ඇවිද කියවන හැටි.. ඒත් මට අන්තිමට කතාකරද්දි නම් ඒ ළමයා කතාකරන්නෙ මොකක් හරි ප්‍රශ්නෙකින් වගේ දැනුණා.."

" එයා මොකද කිව්වෙ.."

" හුහක් දේවල් කරන්න තියනවා කිව්වා.. වරද්ට පරිස්සමින් ඉන්න කියන්න කිව්වා.. ලොකු දේවල් කිව්වෙ නෑ.. ගෙදර අය මතක් කරන්න කිව්වා.."

" තව.."

" එච්චරයි.. හදිසියෙ කතාකළේ.. ඒත් සුදුමහත්තයා හැමතිස්සෙම ඒ ළමයට උඹ මත්තෙ නැහි නැහී ඉන්න බෑනෙ.. නේද.. ආදරේ කරනවා වගේම අනිත් පැත්තෙන් තමන් ගෙ ජීවිතේ ගැන ඕනම තීරණයක් ගන්න

@Shan

මනුස්සයෙක්ට අයිතිය තියනවා.. සුදුමහත්තයා තමන්ගෙ ගමන යන්න ඕන.. ඉස්සරහට මොන දේ වුනත්.. එහෙම තමයි පරිණත මනුස්සයෙක් ගොඩ නැගෙන්නෙ.. මිම්..?? තේරුණාද.. වෙන්න තියන දේවල් අපි කාටවත්ම නවත්තන්න බෑ.. හැමදේම වෙන්න හේතුවක් තියනවා.. හැමවෙලේම එහෙම හිතන්න.. ආයෙම ඔයාලා හම්බවෙද්දි මීට වඩා ජීවිතේ ලස්සන වෙලා තියේවි.."

" මිම්.."

" මම දන්නවා හිත හදාගන්න අමාරුයි.. ඒත් කරන්නම වෙනවා.. මම ගෑණියෙක් වෙලත් ගෑණුකම පැත්තකින් තියලා දාහක් ඒවට මූණ දුන්නා.. උඹට බැරි වෙන්නෙ නෑ.."

" මම එයාගෙ ගමන යන්න බාධාවක් වුනේ නෑ ආච්චිඅම්මෙ.. කොහේ හිටියත් පරිස්සමින් ඉන්නවනම් එච්චරයි.. හැමෝම පරිස්සමට ඉන්නයි මට ඕන.. මම එයාට කලින්ම කියලා තිබ්බෙ හරි තීරණයක් ගන්න ඉක්මන් වෙන්න කියලා.."

" ඉතින් ඒ ළමයා උඹගෙ වචනෙ විශ්වාස කල්ලා තීරණයක් ගත්තා.. දැන් සුදුමහත්තයා ඒ විශ්වාසෙ රකින්නයි ඕන.. තේරුණාද.. ආච්චිඅම්මා උඹ එක්ක ඉන්නවානෙ.."

" මම දන්නවා.."

ආච්චිඅම්මා මම නැගිටිනකල් ඉඳලා මගේ වාරුවෙන් නැගිට්ටා.. මම දන්නවා නොපෙන්නුවාට ආච්චි හිතෙන් මාමා ගැන වද වෙනවා.. ඒත් ආච්චි කියන චරිතෙ හරි පුදුමයි.. කියවලා ඉවරවෙන්නෙ නැති පොතක් වගේ.. මට මේ ආත්මෙට කියවලා ඉවරකරන්න හම්බෙන්නෙ නෑ.. මාමා හරි වාසනාවන්තයි මේ වගේ අම්මෙක් ලබන්න..

" යමං ගෙදර.. අපි මෙහෙ කියව කියව ඉන්නවා අව්වත් වැටිලා.."

මම දර මිටිය අරගෙන ඉණේ තියාගත්තා.. නැතුව ඔලුවෙ තියන් යන්නයෑ.. මම නාලා ආවෙ..

" මට අර ගෑණුළමිස්සිට ඇඳගෙන නැටුව හැටි මතක් වෙනවා සුදුමහත්තයො.. එක්කො සුදුනෝනා කියලම කියන්නද.."

@Shan

" අනේ මේ ආච්චිඅම්මෙ.. මට කේන්ති යනවා හොදේ.."

" ගෙදර යමං.. මම බයයි කේන්තියට.. අනේ උඹෙ කේන්තිය හොඳයි පොඩි ළමයි බය කරන්න.."

මම ආච්චිඅම්මව ඉස්සරකරගෙන කට පියාගෙන එන්න ආවා.. හිතට සැහැල්ලුවක් දැනෙනවා.. පොඩි සැහැල්ලුවක් නෙමෙයි.. ලොකු සැහැල්ලුවක්.. මට ආච්චිගෙ වචන හයියක් වුණා වගේ දැනෙනවා.. ඇත්තටම හයියක් තමයි..

ඩබල් අප්ඩේටුවා.............ක්!!!!!!!

සමනලයා නරක නෑ හරිද..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 147 කොටස

මම කොහොඹ ගහේ බැඳපු ඔංචිල්ලාවෙ පැද්දි පැද්දි පාර දිහා බලාගෙන හිටියා.. හවස සහන් ඇවිත් අපිව හම්බෙලා ගියා.. ඌත් එක්සැම් එක ගොඩ දාගෙන කොහොම හරි.. ඒකා හරි හොඳ එකා.. එනකොට අම්මා දුන්නයි කියලා අග්ගලා වගේකුත් උස්සගෙන ආවෙ.. ඊටපස්සෙ සෙනුකයා එහෙම ඌ එක්ක කතාකර කර ඉඳලා ගියා.. සහන් ටියුෂන් කරනවලු.. උගේ ගෙදර තාත්තා ළඟදි ඇක්සිඩන්ට් වෙලා මේ දවස්වල තාත්තා වැඩට යන්නෙ නැහැලු.. ඒකනිසා නංගිවයි අම්මවයි බලාගන්න සහන් කීයක් හරි හොයාගන්න ඕන නිසා ගාල්ලෙම ටියුශන් කරනවලු කීපදෙනෙක් එකතු කරගෙන.. ඒකෙන් හම්බෙන ගාණට බැංකුවෙ වැඩට ගිහින් හොයාගන්න ගාණ එකතුකල්ලා සේරම ගෙදරට දෙනවලු..

ඒ වගේ කොල්ලොන්ට නම් කවදා හරි මදි නොකියන්නම හරියන්න ඕන..

තව ආගිය තොරතුරු කතාකල්ලා මට මැච් එක වින් කළාටත් විශ් කල්ලා යන්න ගියා.. අද රෑ බස් එකේ ආයෙම ගාල්ලෙ යන්න ඕන කියලා..

ඔංචිල්ලාව පැද්දෙන වාරයක් ගානෙම ඒ හා සමානව මගේ හිතත් දෙපැත්තට පැද්දුණා.. සතුටු හිතෙනවා.. දුක හිතෙනවා.. මම දෙපැත්තටම දෝලනය වෙනවා.. හිතට හරි පාළුවක් තියනවා.. ඒක කියලා විස්තර කරන්න පුළුවන් එකක් නෙමේ.. මතක සැරින් සැරේ ඇවිත් මගේ හිත පාරලා යනවා.. උඹට පාළුයි කියලා ඇහිල්ලෙන් ඇන ඇනම මතක් කල්ලා දෙනවා.. මාමත් එක්ක, රධ්‍ය අයියා එක්ක මේ ඔංචිල්ලාවට රණ්ඩු වුණු හැටි මතක් වෙනවා.. මගේ වටේ ඒවා ඇහෙනවා ඇහෙනවා වගේ.. හැමතැනම හොල්මන් කරනවා.. අද ඊයෙ වගේ මතකයි අපි මේ මිදුළ පුරාම ඇවිද්දා.. මෝඩ රධ්‍ය අයියට පැළ ජාති ගැන කියලා දුන්නා.. අපේ මාමගෙ බෙහෙත් තෙල් වලට කිකිරිදිය හොයන්න යනවා.. මාමත් එක්ක සිරිසෝම මාමලාගෙ ගෙදර ගිහින් එනගමන් කඩෙන් සීනිබෝල උස්සන් එනවා.. එහා ගෙදර කෙල්ලගෙ තාත්තට බනිනවා..

මට රිදෙනවා මාමෙ.. ඒත් මාමටත් ජීවිතයක් තියෙනවනෙ.. මම ආච්චිඅම්මවයි, අම්මවයි බලාගන්නවා.. ඉන්න තැනක හොඳින් පරිස්සමට ඉන්නවනම් එච්චරයි..

@Shan

මම කටේ තිබ්බ සියඹලා ඇටේ 'පොහ්' ගාලා විසික් කල්ලා දැම්මා.. චමිරුවා නිදාගන්න ගියා හවස නිදිමතයි කියලා.. සෙනුක අම්මලා එක්ක කුස්සියෙ චූටි පූසව හුරතල් කරනවා..

මම පාර දිහා බලාගෙන ඉඳලා එකසැරේට කිකිළිගෙ ගෙවල් පැත්ත බැලුවහම මට කැගැස්සෙන්න ආවා.. ඒකි කොණ්ඩෙත් කඩාගෙන වැට අද්දරට වෙලා ඉස්සි ඉස්සි මේ පැත්ත බලාගෙන මල් කඩනවා.. මම ඉක්මනට උඩ බලාගත්තා.. ටිකකින් කිකිළි උන්ගෙ ගේට්ටුව ඇරගෙන වටෙන් ඇවිත් අපේ ගෙදර ගේට්ටුව ඇරගෙන මෙහෙට ආවා.. මම කිව්වා ආව්විට එළීය පේන ගේට්ටු ගහන්න එපා කියලා.. කොහෙද මට රැවුල නැනෙ.. මම කියන කිසි දෙයක් මේ ගෙදර උන් අහන්නෙ නැනෙ.. මම කනේ තිබ්බ එයාපොඩ් එක ගලවලා සාක්කුවට ඔබාගත්තා..

" අයියේහ්.. මම ඔහේව හම්බෙන්නමයි හිටියෙ.."

අපේ අම්මට මාව හම්බුණේ හුඟ කාලෙකට කලින් නංගී..

" අහ් නංගී.. කොහොමද.."

" අයියලාගෙ ප්‍රතිඵල ආවා නේ.. කොහොමෙයි.."

" හොඳයි නංගී.. ඒ තුනක් තියනවා.."

කිකිළි අත් දෙකෙන්ම කට වහගෙන මගේ පැත්තට දුවගෙන දුවගෙන ආවා.. මම ඔංචිල්ලාව නවත්තගත්තා.. මේ සෙනුක පගා කොහෙ ගියාද මන්දා..

" ඇත්තෙයි අයියෙ.. අනේ හරි සතුටුයි.."

" තැන්ක් යූ නංගී.. පාඩම් කරනවද.."

" ඕ අයියෙ.. මම අයියව ටීවී එකෙත් දැක්කා.. අර පිටරට ගිහින් බැඩ්මින්ටන් ගහනවා.. අයියා හරි ලස්සනයි.."

කිකිළි රතුවෙලා රතුවෙලා මැරෙන්න ගියාම සෙනුකයා ගේ වටෙන් චූටියවත් උස්සගෙන ඉස්සරහට ඇවිත් කිකිළිට මහා මනමාල හිනාවක්

@Shan

දැම්මා.. උගේ කම්මුලේ වල පේන්නම.. කිකිළී ආයෙ ඌව දැකලා විළිරුදාව හැදිලා වගේ ඇඹරෙන්න ගත්තා..

" අයියෙ මම යන්නෙයි.."

" ඔහෝ.. ෂනෙරු කව්ද මේ ලස්සන නංගි.. හායි නංගා.."

සෙනුකයා කොහොඹ ගහට හේත්තු වුණා.. මම හිටියෙ ඔංචිල්ලාවෙ වාඩිවෙලා.. චූටියා සෙනුකයගෙ අතෙන් පැනලා කිකිළිගෙ කකුල් දෙකේ දැවටෙන්න ගත්තා.. සක්කිලි බළලා..

" ආ අයියෙ.."

" මම ෂනෙරුගෙ හොඳම යාළුවා සෙනුක.."

" මම ලෝචනා.."

කිකිළි රතුවෙලා සෙනුක දිහා හොරෙන් බැලුවා.. ඉඳපන් මම මේක අයුක අයියට කියනවා..

" නංගි ඉස්කෝලෙ යනවද.. අද ඉස්කෝලෙ නැද්ද.."

" ගියා අයියෙ.. ෂනෙරු අයියව හම්බෙන්න ආවෙ.."

සෙනුක තොලක් හපාගෙන මං දිහා බලලා ලාවට ඇහැක් ගැහුවා..

" ෂනෙරු ඉතින් මෙහෙ එන්නෙ හදිස්සියෙන් නෙ.. නේ බං.. අඩෝ ආගිලාටත් එන්න තිබ්බෙ.."

" ඒ කව්ද අයියෙ.."

" ඒ ෂනෙරුගෙ~..."

කිකිළිගෙ මූණ එකසැරේ මැලවිලා ගියා.. ඒ පාර තව මගුලක් වගේ.. මාව මරාගෙන කාපියව් තොපි සේරම එකතුවෙලා.. මීට වැඩිය හොඳයි..

" ෂනෙරුගෙ හොඳම යාළුවෙක් නංගි.. නංගි බය වුණාද.."

@Shan

කිකිළි සෙනුකට දෙක්ක රැව්වා..

" ඒ මොකටෙයි මම බයවෙන්නෙ.. අයියට පිස්සුය.."

සෙනුක නංගිට මල් මල් හිනාවක් පාකල්ලා යැව්වම කිකිළි අසරණ වෙලා මගේ දිහා බලාගෙන හිටියා..

" මම නම් ෂනෙරු අයියට හරි කැමතී.. මමත් ලොකු වෙලා අයියා වගේ වෙනවා.."

සෙනුකයට කෙළ හිරවුණා..

" කවුරු වගේ.. ෂනෙරු අයියා වගේ.. ආ.. ඕ.. හොඳයි නරක නෑ.. ගැම්මක් නංගියා.."

" මේ අයියගෙ නම් කට වැඩී.."

කිකිළී මූණටම බෝම්බෙකින් දමලා ගැහුවා වගේ සෙනුකගෙ මූණටම දෙකක් රැව්වා.. ඊට පිටිපස්සෙන් මදිපාඩුවත් සිරියහනෙන් බැහැලා ඔලුවත් කස කස මෙ පැත්තට ඇවිදගෙන එද්දි කිකිළි හැරිලලා චමිරුවා දිහා බලලා ගල් ගැහුණා.. අනේ දෙයියනේ මල්සරා විදපන් දැන්.. විදපන්..

" සෙනුක, අයියා කතාකරනවා.."

" පස්සෙ ගන්නම් මම.. උඹ නැගිට්ටද.."

" ම්ම්.."

චමිරු කිකිළී දිහා උඩ ඉඳන් පල්ලෙහාට බලලා දෙකක් රැව්වා.. මම විතරයි මෙකිව පහළ ඉඳලා උඩට බැලුවෙ වෙල නියරෙන් බැහැලා.. කිකිළි චමිරුව දැකලා මූණ ඇදකරගත්තා.. හොඳ වැඩේ ආවා මෙතන තනි මම එක්ක කතාකරන්න.. මම ඕවට ආස නැනෙ නංගි.. මට බෝයිපෙන් කෙනෙක් ඉන්නවා..

" අයියලා මම යන්නෙයි.. පස්සෙ හම්බෙන්න එන්නම්.."

කිකිළී රතුම රතු වෙලා ආපු පාරෙන්ම දුවගෙන දුවගෙන ගියාම චමිරු කිකිළි දුවගෙන යන දිහා හැරිලා බලාගෙන හිටියා..

@Shan

" කව්ද බං ඒ.."

" එහා ගෙදර නංගි.."

" ඒකි බලනව ඇති මේ අයියා කාලෙන් කාලෙට ලස්සන යාළුවො උස්සන් ගෙදර එනවා.. මොන මගුලක්ද කියලා.. පව් බං.. ලස්සන කෙල්ල.."

" ලස්සන නම් දාගනින්කො.. මම අයුක අයියට කියනවා.."

" අයුක අයියා මෙල්බර්න් වල ඉඳන් රොටියක් හදනවා.. ඌට රොටිය ගැන කියලා දීලා මගේ ඔලුව කැක්කුමයි දැන්.."

මට හිනා ගියා.. අයුක අයියයි සෙනුකයි දුර කියලා නෑ.. තවත් ළං වෙලාද මන්දා.. උන් දෙන්නා දිහා දැක්කත් සතුටු හිතෙනවා..

" අයියා අඩුම තරමෙ කුස්සිය තියන පැත්තවත් දන්නෙ නෑ මම හිතන්නෙ.. මෙහෙ ඉන්න කාලෙ.."

" ඔව් ඔව්.. උඹලා සේරම මේ දිව්‍යලෝකෙන් බැහැලා ආපු සුරංගනා මිනිස්සුනෙ.. රෙද්දක් හෝදගන්න බෑ.. කෑමක් හදාගන්න බෑ.. බස් එකක යන්න දන්නෙ නෑ.. පිහානක් නවාගන්න බෑ-"

" අපෝ ඔක නවත්තගනින්.."

චමිරුගෙ පිට මැද්දට සෙනුකයා පාරක් දුන්නා..

" උඹලා තේරෙයි මම මෙච්චර කියන ඒවගෙ තේරුම.."

මම උන් දෙන්නට බැනගන්න දීලා ඔංචිලාවෙ පැද්දුණා..

" ෂනෙරු.. මම තැනක් බැලුවා.. එතන නම් හුඟක් හොඳයි.. ඉස්කෝලෙ කිට්ටුව.. ඔයාට දුර ප්‍රශ්නෙකුත් නෑ.."

මම චමිරු දිහා පුදුම වෙලා බලාගෙන හිටියා.. මූ යකෝ.. හොයාගෙනත් ඉවරද..

" ඇනෙක්ස් එකක්ද බං.."

@Shan

" ඇනෙක්ස් එකක් කිව්වට.. මෙහෙමයි ඒ ගෙදර හිටියෙ ආච්චිකෙනෙක්.. ළඟදි ආච්චි ඔසී ගියා.. ආච්චිගෙ පුතා ගේ රෙන්ට් කරන්න හිතාගෙන ඉන්නෙ.. දහ අටක් වගේ.. හැබැයි මට නම් තැන හිතට ඇල්ලුවා.."

" සිරාවට.. එහෙනම් හොඳයිනෙ බං.."

" ඔව්.. එයාලා කොහේවත් දාලා එහෙම නෑ රෙන්ට් කරනවා කියලා.. මම කතාකල්ලා දෙන්නම්.. තනි තට්ටුවෙ ගෙදරක් හොඳ සාමාන්‍ය ගාඩ්න් එකක් එක්ක.. කාමර තුනයි සාලෙයි.. උඹට ශේප් නෙ.."

" අනේ ලොකු දෙයක් බං වෙලාවෙ හැටියට.. උඹ කතාකල්ලා බලපන්කො.."

" හරි.. දැන් හෙට යනවනෙ කොලඹ.. ෂනෙරු ගෙනියන දේවල් ලෑස්ති කරගන්න.. මම අනිද්දා වෙද්දි කී එක ඔයාට බාරදෙන්නම්.."

" කී මනි සෙට්ල් කරන්න ඕනනෙ.. එකපාර කීයක් ඉල්ලනවද.."

" මාස හයක.. අවුලක් නෑනෙ.."

" ඒකට කමක් නෑ බං.. දහ අටකට කිව්වම පුදුමත් හිතුණා.. දැන් ඒ පැත්තෙන් හතලිහකටවත් ගන්න බෑ ගෙයක්ම.."

" ඒක මෙ කවුරුත් නැති නිසා බං රෙන්ට් කරන්නෙ.. ගෙදර මිනිස්සුන්ට සල්ලි වලින් ප්‍රශ්නයක් නෑ.. ප්‍රයිවට් රෝඩ් එකක තියෙන්නෙ.. අනික ෂනෙරුගෙ අංකල්ගෙ කාර් එකත් තියනවා.. ආවට ගියාට තැන් හොයලා නවතින්න බෑනෙ.."

" ම්ම්.."

මම චමිරුගෙ ෆෝන් එක ඉල්ලගෙන ෆොටෝ බැලුවා.. හොඳ ලස්සනට පිරිසිදු ගෙදරක්.. අනික කොළඹ හතේ ඉන්නෙ පොහොසත් මිනිස්සුනෙ.. අපේ ඉස්කෝලෙට විනාඩි විස්සක වගේ දුරක් තියෙන්නෙ මේ කියන හරියෙ ඉඳලනම්..

" කොහොම හරි ක්වාටස් එකේ යතුරු ඉක්මනට භාරදෙන්න ඕන.. ආශිලා අස් කලා කිව්වා.. ෂනෙරු ගිහින් බඩු ටික හෙටම පැක් කරගත්තනම්

@Shan

අනිද්දා වෙද්දි යාගන්න තිබ්බා.. මම උඹ එක්ක නවතින්නම්.."

" ඔව් ෂනෙරුට උදව්වක් ඕනනම් කියන්න.. මම එහෙනම් ඒක කතාකරනවා හොඳේ.."

" හා බං.."

චමිරු නම්බර් එකට කෝල් එකක් අරගෙන එහාට ගියා.. මට චමිරු ගැන යාලුවෙක් විදියට සතුටු හිතුණා.. උගේ හොඳ පැත්ත අපි දකින්නැතුව ජජ් කරපු එක නම් ඇත්තටම වැරදී.. සෙනුකයා මගේ උකුලෙන් ඉඳගත්තා.. අත්ත කඩාගෙන වැටුණොත් තමා මුගෙයි මගෙයි බරට..

" මස්සිනා හොඳ එකා නේද බං.."

" ඔව්.. ඇත්තටම චමිරු හොඳයි සෙනුක.."

" ඒකතමා බං මම කිව්වෙ.. මිනිස්සු ආවට ගියාට ජජ් කරන්න හොඳ නෑ.. හැබැයි උඹ උංට ඕනවට වඩා ළං වෙන්න නම් එපා පුතෝ.. රධ්‍ය අයියා ඇවිල්ලා පෝළිමට තියලා මගෙයි කියාන් අයියගෙයි අනිත් උන්ගෙයි කන් අඩි පලාගෙන යාවි.."

" පාළුයි සෙනුක.. මට හුඟක් මතක් වෙනවා.."

මම සෙනුකයගෙ පිටට මූණ තියාගත්තා..

" මම දන්නවා බං.. මේ වෙලේ කරන්න ඕන වැඩ ටික ඉස්සෙල්ලම කරගමු.. ආච්චි උඹලගෙ අම්මලට මොකද කියනවා කිව්වෙ.."

" මාමා කෙල්ලෙක් එක්ක යාළුවෙලා අපිට නොකිය රට ගියා කියලා කියනවා කිව්වා.. මාමට දෙකතුනක් බැනලා ආච්චිට කෝල් කල්ලා කිව්ව විදියට කියයි.."

" අම්මෝ බං උඹලගෙ ආච්චි පුදුම සැනසීමයි.. අම්මට දුක හිතෙයි ඒත්.."

" ඔව් අම්මා හරි ආදරෙයි මාමට.. හෙන ලව් එකක්නෙ තිබ්බෙ ඒ දෙන්නගෙ.."

@Shan

" එහෙම තමයි බං.. මාමා අවුරුදු ගාණක් මේ ගෙට දිය වෙවී හිටියා.. අන්තිමේ එයා ස්වාධීන වෙලා තීරණයක් ගත්ත එක ගැන අපි සතුටු වෙමු.. හැමදේම නරක පැත්තම හිතන්න හොඳ නෑ ෂනෙරු.."

" ම්ම්.. එහෙම හිතමු.."

සෙනුකයා පැත්තට හැරිලා මගේ කර වටේ අත් දෙක ඔතාගෙන මනමාලි වගේ ඉඳගත්තා.. ගමටම කොලුකාරයා වෙලා තමා දැන් මම නවතින්නෙ මේ පගාගෙ වැඩවලට..

" ඒයි චමිරු ෆොටෝ එකක් ගනින්කො.. අපි දෙන්නා ගැළපෙනවා නේද.."

" ඔය අත්ත කඩාගෙන වැටෙයි බං.."

" උඹ ගනින්කො..අත්ත කඩන් වැටෙන්නෑ මම පය බුරුලෙන් තියලා තියෙන්නෙ.."

චමිරුවා අපි දෙන්නට රවාගෙන ෆෝන් එක මගේ පැත්තට හැරෙව්වා.. සෙනුකයා මගේ උකුළ උඩ මනමාලි වගේ ඉඳගෙන එක එක හැඩතල වලට ෆොටෝ ගන්න ගත්තම ටිකකින් එතන එකම ෆොටොශූට් එකක් වුණා.. චමිරුවා ෆොටෝ වලට ඉන්නෙ නෑ වැඩිය.. ඌ අපි දෙන්නගෙ ෆොටෝ ගැහුවා.. මට වෙනදා වගේ නටාගෙන ඕවට යන්න හිතුණෙ නැතිවුණාට සෙනුකයගෙ හිත රිද්දන්න ඕන නැති නිසා එහෙන් මෙහෙන් දෙක තුනකට හිටියා..

මම හිතුවෙ නෑ හැම පොඩි දේකටම මගේ හිත මෙච්චර රිදේවි කියලා.. මට එයාව හුඟක් මතක් වෙනවා..

>>> ඔහොමම ඊළඟ කොටසට යන්ඩෝ >>>

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/**

@Shan

ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 148 කොටස

හිතක් රිදුණහම සාමාන්‍ය තත්වෙට ගේන්න කොච්චර අමාරුද කියලා මම හිතන ගමනුයි හිටියේ.. හිත පාරවන මතක අස්සෙම මම අතරමං වෙලා වගේ.. මම මතක් කරගන්න ඕනම නැති තැන් වලට මම ආයෙ ආයෙ ගිහින් මගේ හිත පාරගන්න තරමටම මම අසරණ වෙලා හිටියා.. හැමදේම හොඳින් වේවි කියලා හිතුවට මම ගෙවෙන ජීවිතේ ඉන්නෙ හුඟක් මහන්සියෙන්.. අඩුම තරමෙ මට පැත්තකට වෙලා අඬන්නවත්.. මං ගැන කල්පනා කරන්නවත් වෙලාවක් තිබුණෙ නෑ.. සිංගප්පූරු ගමනින් පස්සෙ හැමතැනින්ම සැලකිය යුතු අවධානයක් මට ලැබුණා.. අනික් පැත්තෙන් රිසාල්ට්ස් නිසා ඒ ලැබෙන අවධානෙට වටිනාකමක් ආවා.. මම ජීවිත කාලෙටවත් හිතුවෙ නැති පුදුම සහගත දේවල් මාව වටකරගෙන මාව අසරණ කල්ලා වගේ දැනෙනවා..

හරියට රඩ්‍ය අයියා මාව ආපහු හැරෙන්න බැරිවෙන තැනකට ගෙනිහින් අතැරලා දාලා වගේ.. එයාට හැරෙන්න පුළුවන් දුර මාත් එක්ක ආවා.. මාව එක්ක ආවා.. එයාට එන්න බැරි, මට ආයෙ හැරෙන්න බැරි තැනට ආවහම එයා මාව එතන තියලා එයාගෙ ගමන යන්න ගත්තා.. අනික් හැමෝමත් එහෙමමයි.. හිතේ කොනක ගොඩගහලා තියන පාළුව මාව නොමරා මරනවා.. හැමෝටම මම හොඳින් කියලා පෙන්නන්න හදන හැම වතාවෙම මම හිරකරගෙන ඉන්න 'මාව' සැහෙන්න අසරණ වුණා..

ඇහැට කඳුලක් උනන්න ඕනම නැති තැන් වලත් ඉබේම ඇස් වලට කඳුළු උනද්දි.. ඇස් රතුවෙද්දි.. මට අසරණ කමක් දැනුණා.. මම කැමති නෑ කඳුළු උනනවට.. මම හැම එකකටම අඬන්නෙ නෑ.. ඒත් මේ කාලෙ ඇතුළත මම නොසැහෙන්න ඇඬුවා.. ඇඬුව තරමට මටම හිතෙනවා දැන් ඇඬුවා ඇති කියලා..

මම ආයෙම අඬන්න ඕන නෑ කියලා මම හිතුවා..

අඩුම තරමෙ ඇස් වල කඳුළු උනන තරම දවසට එක වතාවක් වුණත් මට සතුටුයි.. මට ඒ ඇති.. මට හැමදේම අතාරින්න බෑ.. මම එහෙම අතැරලා බලන් ඉඳපු කෙනෙක් නෙමේ.. හැම වතාවකම නැගිට්ටා.. ඉතින් දැන් මම මානසිකව කඩාවැටිලා ඉන්න හැටි දැක්කම මට මං ගැනම ලැජ්ජයි.. ආච්චිඅම්මා කිව්ව විදියට හැමදේම හොඳින් විසඳෙනකල් මට ඉවසගෙන

@Shan

ඉන්න වෙනවා.. ආච්චි කියන්නෙ ඉවසීමෙන් සැනසීම ලැබෙනවලු.. ඉවසලා ඉවසලා අමාරුම තැනේදිත් ඉවසන්න ඕනලු.. ඒ කතාව මට එක අතකට ප්‍රැක්ටිකලි නැතිවුණත් මම ආච්චිගෙ වචන විශ්වාස කළා.. මොකද මට මගේ කියලා කෙනෙක්ට හයියකට හිටියෙ මගේ ආච්චිඅම්මා විතරයි..

උදේ ක්වාටස් එකට ඇවිත් මම මගේ ඇඳුම් පොත්පත් අවශ්‍යම දේවල් සේරම පැක් කරගත්තා.. මුළු දවසෙම සෙනුකයයි මමයි ආශියි බඩු පැක් කරපු එක කළේ.. ආශි කෙල්ලෙක් වුණත් මට කරන උදව් උවමනාවටත් වඩා වැඩියි.. අන්තිමේ උවමනා කියලා හිතුණු හැමදේම මම පැක් කරගත්තා.. මාමගෙ කාමරේ තිබුණු සමහර ෆයිල්ස්.. ඇඳුම් පැළඳුම් පවා මම අහුරගත්තා.. ආයෙ මේ ගෙදරට කෙනෙක් එනවනම් ඒ මනුස්සයට ඉන්න පුළුවන් විදියට මෙක හදලා තියන්න එපැයි.. කොහොම හරි අන්තිමට හවස් වෙද්දි මුලු ගෙදරම අපි තුන්දෙනා එකතුවෙලා අස් කළා..

මට ආයෙ මෙහෙට අඩියක්වත් තියන්න බෑ.. එහෙම උවමනාත් නෑ.. මට කිසිම වෙලාවකදි ඒ හයිය හිතට ආවෙ නෑ.. මට හැමදේම මතක් වෙනවා.. මගෙ ජීවිතේ ගෙවුණු සතුටු කාලෙ ආයෙම මතක් වෙනවා.. එහෙම තියෙද්දිත් මට මාමගෙ ක්වාටස් එකේ ඉන්න මොහොතත් ගෙවාගන්න හරි අමාරුවුණා.. විශේෂෙන්ම කොළඹ ආපු එකෙන් මගේ හිත හුගාක් රිදුණා..

රෑ වෙන්න ඇවිත් චමිරු අලුත් ගෙදර යතුර මට භාරදුන්නා.. මම බැන්ක් එකෙන් කී මනි ට්‍රාන්ෆර් කරලා කී එකත් අරගෙන මාමගෙ කාර් එකේම ඒ ගෙදරට ගියා.. යද්දිත් චමිරු ගේ යමතාක් දුරට අස් කරවලා තිබුණේ.. හුග කාලෙකින් ඉඳපු නැති ගෙදරක් නිසා කලින් මිදුලෙ එහෙම තණකොළ උවමනාවට වඩා වැවිලා කොළරොඩු හැමතැනම තිබ්බා.. රෑ යනකොට ඒවා ගාණට හදලා මිදුල අස් කල්ලා තිබ්බෙ.. මට ඒකම ලොකු දෙයක්.. මොකද හෙට ඉන්ටවිව් එකකට ගෙදරට එනවා.. මම ඒගොල්ලොන්ට දුන්නෙ මෙහෙ එඩ්‍රස් එක.. වෙන තැනක් නැනෙ.. මම හෙට උදේ වෙන්න කලින් ගේ අස් කරගන්නත් ඕන..

චමිරු ගැන කියනවනම්.. මට චමිරුට ස්තූති කරන්න වචන මදි.. කොයි වෙලාවකවත් මාව අසරණ කළේ නෑ.. ඌට මට වඩා සල්ලි තියනවා.. හැමදේම තියනවා.. ඒත් කොයිම වෙලාවකවත් 'උඹ සල්ලි තියාගනින් මම සෙට්ල් කරන්නම්' වගේ දේවල් කිව්වෙ නෑ.. මම දන්නවා ඌට එහෙම කියන්න ඕන වග.. හොඳටම ඒ මූණෙන් මට කියන්න පුළුවන්.. ඒත් ඌ තේරුම් අරන් හිටියා එහෙම දෙයක් කිව්වොත් මම අපහසුතාවෙට පත්

@Shan

වෙනවා කියලා.. ඒකනිසා ඌ දුවලා පැනලා කරන්න පුළුවන් හැම පොඩි උදව්වම මට කළා.. මේ වෙලේ මට හුඟක්ම වටින්නෙත් ඒකමයි.. මට යන්න බැරි තැන්වලට ඌ ගිහින් මට ඒ උදව් කළා.. කෙල්ලො දෙන්නත් අලුතින් ගිය ගෙදර අස්පස් කල්ලා දීලා බඩුත් අහුරන්න උදව් කල්ලා රෑ වෙනකල්ම ඉඳලා ගියේ.. මම සෙනුකයටත් ගෙදර යන්න කිව්වා.. ඌට හැමතිස්සෙම මාත් එක්ක ඉඳලා මහන්සියෙන් හිටියෙ.. උදේ ඉඳලා ගෙවල් දෙකක් එක්ක ඔට්ටු වෙනවා.. ගෙවල් මාරුකරන්න ගියාම ලේසි නෑ.. හැමදේම මුල ඉඳලම අස් කරන්න එපැයි..

අලුත් ගෙදර හරි නිස්කලංකයි.. හොඳ වටපිටාවක් තිබුණා.. ගේටම අල්ලලා පැත්තකින් වාහනයක් පාක් කරන්නත් ඉඩ තිබුණ නිසා මට එක ලේසි වුණා.. අනික ගේ අර පාළුවට යනවට රෙන්ට් කරන එකක් නිසා ෆ'නිචර් හැමදේමත් ගේ ඇතුළෙ තිබුණා.. ගෙදර අයිති අංකල් හරි හොඳයි.. මගෙන් විස්තර අහලා චමිරු එක්කත් කතාකල්ලා උවමනා වුණොත් අසල්වාසියොත් අඳුන්වලා දීලා තමා කතාව නතර කළේ.. මේ වෙලාවෙ හැටියට මට ඒක ලොකු උදව්වක් වුණා.. අනික ටික දවසකින් මෙඩිකල් කොලේජ් යන ළමයෙක් කිව්වහම ඒ මනුස්සයොන්ගෙ හිතේ පැහැදීමක් ඇතිවුණා.. කොච්චර කිව්වත් ගතිගුණ හොඳ වුණාම ඇති කියලා.. නෑ.. මනුස්සයො එක එක්කෙනාව මනින වටිනාකමක් තියනවා.. ඒකට හුඟක් වෙලාවට උගත්කමත් බලපානවා..

මට රධ්‍ය අයියා ඉඳහිට කියන වචන මතක් වුණා..

මම හිටියෙ කුස්සියෙ.. වෙලාවෙ හැටියට තේකක් හදාගන්න පුළුවන් තරමෙ දෙයක් පරණ ගෙදර ඉතුරුවෙලා තිබුණු නිසා මම තේ දෙකක් හදාගෙන ගිහින් ඉස්තෝප්පුවේ බල්බ් එකක් සෙට් කර කර ඉඳපු චමිරුට ගිහින් දුන්නා.. මම ආවහම චමිරු ගලවපු බල්බ් එක මගේ අතට දීලා අලුත් බල්බ් එකක් දාලා මට ගිහින් ලයිට් එක ඔන් කරන්න කිව්වා..

" මම හෙට ඔක කරගන්නම් බං.. මේක බීලා හිටහන්.."

චමිරු ලැඩර් එකෙන් බැහැලා මගේ අතේ තිබ්බ තේක අරගෙන එහායින් වාඩිවුණා.. මමත් පුටුවක් තිබ්බ තැනින් වාඩිවුණා..

" හෙටත් ඉඳලා අනිද්දම ඉස්කෝලෙ වරෙන්.. හෙට ඉන්ටවිව් එකක් තියනවා කිව්වනෙ.."

@Shan

" මම.. ඊටකලින් ගේ සම්පූර්ණෙන් අස්කරගන්න ඕන.. මම අනිද්දම එනවා.."

චමිරු මගේ දිහා බලලා හිනාවුණා..

" මෙහේ හොඳයිද.."

" ඔව්.. මේ වෙලාවෙ හැටියම මට උවමනාවටත් වඩා බං.. ඇත්තමයි උඹට හුහක් පිං මට උදව් කළාට.."

" අනේ උඹේ පින! තියාගනින්.. අහල නැද්ද යාළුවො වුණාම උදව් කරන්න ඕන අමාරුම වෙලාවෙදි කියලා.."

මම හිනාවුණා.. කවුරුත්ම නැති නිස්කලංක ගෙදර ඉස්තෝප්පුවට අහස පෙනුණා.. තනකොළ වවපු ගාඩ්න් එකයි.. ඉස්සරහා තිබ්බ නුග ගහ යට සිමෙන්ති වලින් හදපු පොඩි බංකුවටයි මම ආස වුණා.. මම මේ ගෙදර පුළුවන් උපරිමෙ හොඳින් ජීවත් වෙනවා..

" යාළුවො කියන්නෙ දුකේදියි සැපේදියි දෙකේම ඉන්න අයට.. "

" ඉතින්.."

" අමාරුම වෙලාවෙ විතරක් නෙමෙ එහෙනම් සතුටුමහිතෙන වෙලාවෙදිත් ඉන්න ඕන.."

" ළඟින් ඉන්න ඕනමයි කියලා නීතියක් නෑනෙ.. දුර ඉඳන් හරි යාලුවෙක්ට සතුටු වෙන්න පුළුවන්.."

චමිරුගෙ කටින් පිටවෙන 'යාලුවා' කියන වචනෙ ඌට හරි බර වැඩියි කියලා මට තේරුණා.. මම උගේ හිතේ තියන හැඟීම් හොඳටම දන්නවානෙ.. හිතා මතා රිද්දන්න ඕන නෑ කියලා හිතුණා.. ඌ යාළුවා කියන එකෙන් අදහස් කළේ උගේ ඒකපාර්ශවික ආදරේද මට හිතුණා..

" උඹ එහෙම කියනවනම් හරි ඇති.."

චමිරු මොකුත් නොකියා මම හදලා දුන්නු තේක පාඩුවෙ බිව්වා.. මාත් ඔහේ කළුවර අහස දිහා බලාගෙන හිටියා.. හඳනම් මෙලෝ හැඩයක් නැතුව අහසේ පායලා තිබුණා.. මෙකෙ ඔච්චර මොකක්ද හැඩේ කියලා මට

@Shan

හිතුණා.. හදට ඇරෙන්න තරු වලටත් ඇරෙන්න.. වලාකුළුවලටත් ඇරෙන්න.. ඉතුරුවෙච්ච කළුපාට ටිකට කවි හදන්න බැරිද මන්දා.. මම ලිව්වොත් කවියක්.. ලියනවා ඉතුරු කළුපාට ටික ගැන කියලා..

" උඹට ගෙදර යන්නත් රෑ වෙනවා.."

" ගෙදරට ආපු දවසෙම තනිපංගලමෙ ඉන්න ඕන නෑනෙ.. "

" ඇයි හොල්මන් එනවද.."

" කියන්න බෑ බං.. මේවා අඩුවට දෙන්නෙ හොල්මන්ද දන්නෑ.."

" අනේ මේ පාඩුවෙ ඉඳපන්.."

මම මග් එක පුටු ඇන්දෙන් තිබ්බම චමිරු හිනාවුණා..

" ඉක්මනට ලයිසන් එක හදවගනින්.. උඹට ඕන්නම් දවසින් හදලා දෙන්නත් පුළුවන්.."

" උඹලා හෙන හයික්ලාස් මිනිස්සුනෙ.."

" මෙක ඇනගන්නෙ නැතුව පාරෙ ගෙනියන්න පුළුවන් නෙ.."

" මොකද බැරි.. පුළුවන්.. ඒත් මම ඩ්‍රයිව් කරද්දි පාර ඇදේ යනවා හලෝ.."

" ම්ම.. වෙන්න ඇති.."

චමිරු මං දිහා එකපාරක්වත් හැරිලා බැලුවෙ නෑ.. ඒත් මාත් එක්ක සැහැල්ලුවෙන් කතාකළා.. එහෙම තියන එක හොඳයි.. අනවශ්‍ය පීඩනයක් ඇති කරගන්නෙ නැතුව..

" උඹලගෙ ගම හරි ශෝක් බං.. මම පොත්වල කියවලා තිබ්බට ඔහොම යාළුවෙක්ගෙ ගෙදර ගිහින් හිටියමයි.."

" ආයෙ දවසක වරෙන්.. මේ පාර ඉතින් හිත හොඳකින් නෙමෙනෙ හිටියෙ.."

" උඹ පාළුවෙන් නේද ඉන්නෙ.. මාමා නැතුව.."

@Shan

" ඔව් චමිරු.. මාමා නෙමෙයි.. මට තාත්තා වගේ දැනෙන්නෙ.."

මගේ ඇස් වලට ආයෙම කඳුළු ඉනුවා..

" එයාලා හොඳින් ඇති ෂනෙරු.. රධ්‍ය අයියා වුණත් දෙයක් කලානම් කලේ නොකර බැරිකමට.. අපි හැමෝම ජීවිතේ අසරණ වෙන තැන් එනවා.."

" ම්ම්.."

" උඹ දන්නවද රධ්‍ය කියන කැරැක්ටර් ෙක මගේ රෝල් මොඩල් එකක් වගේ.. මම සෑහෙන්න ඒ අයියට රෙස්පෙක්ට් කළා. කැඩෙට් කෑම්ප් වලදී මට ඕන වුණේ ඒ වගේ ප'සනැලිටි එකක් හදාගන්න.. මම හිතුවෙ ඌ හැම අතින්ම ප'ෆෙක්ට් මනුස්සයෙක් කියලා.. ඒ කියන්නෙ අම්මා ඉන්න, තාත්තා ඉන්න.. වැදගත් සහෝදරයෙක් ඉන්න.. හොඳ පවුල් පසුබිමක් තියන.. හැම අතින්ම පොහොසත් වෙච්ච කෙනෙක් කියලා.."

" ඒක එහෙම නෑනෙ.."

" ම්ම්.. එහෙමත් වෙලා රධ්‍ය අයියට උගෙ ආදරෙත් දෝතබදලම හම්බුණාමමට ඉරිසියා හිතුණා.. ඇත්තටම මේ හදවතට එකඟව කියන්නෙ.. උඹලා දෙන්නා එකාට එකා නැතිවෙන්න ඕන දෙන්නෙක් නෙමේ.. දුර ඉඳන් බලන් ඉන්න මටම පස්සෙ තේරුණේ මගේ හිතළුවක් නිසා උඹලා දෙන්නගෙ ආදරේට බාධාවක් වෙන්න ඕන නෑ කියලා.. අනික උඹ නිසා මට යාළුවො හම්බුණා.. උඹ හොඳ වැඩ්යි ෂනෙරු.. ඒත් මට උඹ ගැන මාරම සතුටුයි.."

"....."

මම සද්ද නැතුවම චමිරුව අහගෙන හිටියා..

" කවදහරි උඹ වගේ ජීවිතේ ඉස්සරහට ගෙනියන්න අම්මටසිරිවෙන්න කට්ටක් කන එකෙක්ට.. හරියන්නම ඕන.. පුළුවන් නම් මට මොකක් හරි ලක් එකක් තියනවනම් ඒකත් අරන් ඉස්සරහට පලයන්.. උබට ඕන සප් එකක් දෙන්න මම ඉන්නවා.."

" තෑන්ක්ස් චමිරු.."

@Shan

" මෙන්න මේ කෝප්පෙ හෝදලා තියලා ගේ අතුගාපන්.. මම බඩු ටිකක් ගෙනැල්ලා දාන්නද.."

" අනේ බං.. දැන් ඔය ඇති නැහුණා.. මම හෙට උදේම ගිහින් ගෙනැත් දාගන්නවා.. අනික අඩුපාඩු මතකත් නෑ ලිස්ට් එකක් ලියාගන්න ඕන.. බැංකුවටත් යන්න ඕන.."

" ම්ම්.. උඹ කාමරේ අස් කල්ලා ඉවරද.."

" පොත් ටික තියාගන්න ඕන බං.. ඒ ඇරෙන්න ඇඳුම්නම් වැඩිය නෑ.. තියන ටික අස් කරගත්තා.. මම කියාන් අයියගෙන් රෙක්සියි කියාරයි ඉල්ලගෙන මෙහෙ නවත්තගන්න බැලුවෙ.."

චමිරු ආයෙම ටික වෙලාවක් සද්දයක් නැතුව හිටියා..

" ඒකහොඳයි.. උඹට පාඑත් නැනෙ.."

" උඹට රෑ වෙනවා බං.. හෙට ඉස්කෝලෙ යන්නත් ඕන.. ඒකනිසා දැන් ගෙදර යමං.. මම උවමනාවක් වුනොත් සෙනුකට හරි උඹට හරි කෝල් එකක් දෙන්නම්.."

" ම්ම්.. අනිවාරෙන් කතාකරහන් හොදේ.. හෙට වැඩටික සිහියෙන් කරගනින්.. අනිද්දට සෙට් වෙමු.."

" හා.."

චමිරු පුටුවෙන් නැගිටලා ගේ ඇතුළට ගිහින් උගෙ වොලට් එකයි ෆෝන් එකයි කාර් එකේ කී එකයි අරගෙන එළියට ආවා..

" අර ගෙදර පිටිපස්සෙ ලයිට් එක රෑට දාලා තියපන්.. නයිට් බල්බ් එකක් නිසා අවුලක් නෑ.. එහෙනම් හරිනෙ.. අපි ගියා.."

" හා.. පරිස්සමට ගෙදර යන්න.. ගුඩ් නයිට්.."

චමිරු මට අත වනලා ගේට්ටුවෙන් එහාපැත්තෙ නවත්තලා තිබ්බ කාර් එකේ නැගලා යන්න ගියා.. ඌ යන්න ගියාම මම සෙරෙප්පුත් නැතුව ඇවිදගෙන ගිහින් ගේට්ටුව වහලා ඇතුළෙන් ලොක් කරගත්තා.. මට

@Shan

නිදහසක් දැනුණා.. තනිවෙන එක ගැන මට නිදහසක් දැනුණා.. මට ඒක විවේකයක් වගේ..

මම ආපු පාර දිගේම ආයෙම ගේ ඇතුළට ඇවිදගෙන ගියා.. තනි තට්ටුවෙ ගෙයක් වුණාට සාලෙට වඩා ටිකක් උසින් තමයි කුස්සියයි කෑම කාමරෙයි තියෙන්නෙ.. ඒකට පඩි පහක් විතර ගේ මැද්දෙන් හදලා තියනවා.. මම ඉන්න හිතාගත්තෙ මැද කාමරේ.. ඒක පොඩියට ලොකු ජනේලයක් එක්ක තිබුණු කාමරයක්.. හෙට කර්ටන් ටික හෝදලා වේලලා දාගන්න ඕන.. ඒ ඇරෙන්න නම් අස් කරන්න දෙයක් ඉතුරුවෙලා නෑ..

මම කෝප්ප දෙක සෝදනා නවලා තියලා ගෙදර ලයිට් නිමලා දොර ජනේලුත් වහගෙන මගේ කාමරේට ආවා.. පොත් තොගයක් එහෙමම ඇඳ උඩ.. ඒවා අස් කරන්නත් ඕන.. දැන් නම් මට මේ පොත් ඕනත් නෑ.. දන්න අඳුරන ඒ ලෙවෙල් කරන කෙනෙක් ඉන්නවනම් මොකුත් ලියලා එහෙම නැති ටියුට් බලලා දෙන්න තියනවනම් හොඳයි.. සමහර ඒවා මමත් දන්න අයියලාගෙන් ඉල්ලගත්තු ඒවා.. හැම පොතම සල්ලි දීලා ගන්න මටත් තිබ්බෙ නෑ.. ඒ ලෙවෙල් බයෝ මැත්ස් කරන කෙනෙක්ටනම් විවරණ පොත් එහෙම සෑහෙන්න වටිනවා.. හිතුණොත් ඉස්කෝලෙ ලයිබ්‍රි එකට දෙනවා..

මම හොඳයි කියලා තිබ්බ විවරණ පොත්, මොකුත් නොලියපු පාස් පේපර්ස් පොත්, ප්‍රැක්ටිකල් පොත් ටික තෝරලා පැත්තකින් තියලා දැනට උවමනා පොත් ටික විතරක් රාක්කෙ උඩම තට්ටුවෙන් තිබ්බා..

පොත් පත් අස් කරන්නම පැය දෙකක් විතර ගියාම මම නිදාගන්න ඇඳ හදලා නාගෙන කාමරේට ඇවිත් කාමරේ දොර වහගත්තා.. බිත්ති ඔරලෝසුවෙ බට්ටා කැරකෙන සද්දෙ විතරයි මගේ කන් වලට ඇහෙන්නෙ.. ඒ තරම් පාළුයි.. තනියි.. මට ආයෙ ආයෙම මාමා මතක් වෙනවා.. රඨා අයියලව මතක් වෙනවා.. මම එහෙමම ඇඳේ ඉඳගෙන හොඳටම ඇඬුවා.. හයියෙන්ම ඇඬුවා.. කවුරුත් මාව නවත්තන්න නැති නිසා මම ඕනතරම් ඇඬුවා.. ඉකි ගැහිලා හුස්ම කැඩෙනකල්.. හිතේ තියන පාළුව, දුක අඩුවෙනකල්ම ඇඬුවා.. වෙලාවකට කාගෙන නැගිටිනවාමයි කියලා හිතුවට.. හැමතිස්සෙම එහෙම ඉන්න බෑ.. එකසැරේ කඩාවැටෙනවා.. දුක-සතුට ප්‍රස්ථාරයක් ඇන්දොත් ඒක හැමතිස්සෙම විචලනය වෙනවා වගේ.. මම මොහොතකට කලින් සතුටු වෙන තැන ඉඳන් මේ තප්පරේ ඇඬුවා..

@Shan

කන, බොන, නිදාගන්න, ඇවිදින, කතාකරන හැම වතාවකම අඬන එක ලේසි දෙයක් නෙමේ.. මම කොල්ලෙක්.. නාඬා ඉන්න ඕන තමයි.. මම සමහරවෙලාවට මගේ අත් දෙක මිට මොළවගෙන 'හැමදේම හොදින්.. ඉක්මනට කාලෙ ගෙවෙනවා.. බයවෙන්න එපා.. ඔයාට මම ඉන්නවා..' කියලා මටම මුමුණගන්නවා..

මට ඉතුරුවෙලා හිටියෙ මගේ දුක බෙදාගන්න මමම විතරයි.. මම මාව හොදට තේරුම් අරගෙන මාවම බදාගත්තා..

'හැමදේම හොදින් වෙනවා.. ඉස්සෙල්ලම ඔයා ගැන හිතලා ඉන්න.. මෙහෙම අඬන්න එපා' කියලා මම මාවම සනස ගත්තා.. ඒ එක්කම මට අල්මාරියෙ මම පරිස්සමට අරන් තියපු රධ්‍ය අයියා රිසාල්ට් ආවම බලන්න කියපු පේපර් බෑග් එක මතක් වුණා.. තවටත් ඒකෙ කොනක්වත් පොඩිවෙලා නෑ.. මම හරි ආදරෙනුයි පරිස්සම් කරන්නෙ හැමදෙයක්ම.. මම ටවල් එකපැත්තකින් තියලා ගිහින් බෑග් එක පරිස්සමට අරගෙන කාමරේ ලයිට් නිමාගෙන ඇඳ පැත්තෙන් තිබ්බ කහපාට ටේබල් ලැම්ප් එක ඕන් කරගත්තා..

මම  හිතන්නෙ ඒක ඇරලා බලන්න කාලෙ ඇවිල්ලා.. මගේ රිසාල්ට්ස් ආවා.. ඔයා මං ළඟ නෑ.. ඉතින් මම අන්තිමේ මේක අවුස්සලා බලනවා..

ඇඳ කොනක තිබ්බ ෆෝන් එකේ මම ආසම කරන සිංදුවක් ප්ලේ වෙන්න දැම්මා.. මගේ වටේ නිහඬබව නැතිකරගන්න ඕන වුණා.. මට එහෙම ඉදලා හුරු නෑ.. මම දැන් නිදහසේ ඉන්නවා..

" Ya no duele como antes, no

La herida de tu amor sanó.."

පේපර් බෑග් එක ඇතුලෙ තිබුණෙ කළුපාට පැතලි බොක්ස් එකක්.. ඒක උඩ ස්ටිකී නෝට් එකක් අලවලා තිබුණා.. දැනටම මගේ පපුව රිදෙන්න ගන්නවා.. එයා කහපාට ස්ටිකී නෝට් එකක කළුපාට පෑනකින් ලස්සනට ලියලා තිබුණා..

""For my little miracle that I love""

@Shan

මා කළපාට බොක්ස් එකේ දෙපැත්තෙ තිබුණු මැග්නට් දෙක එහාට කල්ලා බොක්ස් එක ඇරියා.. මගේ ඇස් වල අද දවසෙ දාස්වෙනි වතාවටත් කඳුළු පිරුණා.. ඒක ඇතුලෙ තිබුණු තනි කළපාට ස්ටෙතස්කෝප් එකක්.. ඒකෙ ටියුබින් එකේ මෙටල් ටැග් එකක් අමුණලා තිබුණා.. ඒක පිටිපස්සෙ, මෙටල් ටැග් එකේ පේන්න නොපෙනෙන්න ආර් අකුරකට බැඳී වී අකුරක් තිබුණා.. එයා කලින්ම උවමනාවටත් බලාපොරොත්තු තියාගෙන ඉඳලා කියලා මට මේ බෑග් එක අරිනකල් මෙතරම් දැනුණෙ නෑ..

ළඟින් නැතිවුණත් මට ආදරේ දැනුණා..

මම ස්ටෙත් එකට යටින් තියලා තියන ලියුම අරගෙන ඒක දිග ඇරලා බැලුවා.. සමහරවිට අයුක අයියා කිව්වෙ මේක ගැනද දන්නෙ නෑ.. රධ්‍ය අයියගෙ එක පෙළට ලස්සනට ලියලා තියන අකුරු දැක්කහම මට ලෝබ හිතෙනවා.. මම ඒක කියවන්න ගත්තා..

වරද්,

මුලින්ම ඔයාට සුභපතනවා.. ඔයා කියපු ඔයාගෙ 'පුංචි ජීවිතේ' ඉස්සරහට තියාපු ලොකුම ලොකු අඩිය ගැන.. ඉස්සරහට එන වටිනම කාලෙ හැම තප්පරයක්ම මහන්සි වෙන්න.. ඔයා දැකපු හැම හීනයක්ම හැබෑකරගන්න කාලෙ ඔයාට ඉස්සරහට හමුවෙන්නෙ.. මම ඔයා ළඟින්ම ඉන්නවා.. හැමවතාවකම.. මම ඔයාව බලාගෙන ඉන්න පුළුවන් දුරකින් හැමදාම ඔයා ළඟින්ම ඉන්නවා..

මේ ලියුම කියවද්දි මම ඔයාගෙ එහාපැත්තෙ නැත්නම්.. දිගටම කියවන්න.. මට ඔයාට කියන්න හුඟක් දේවල් තියනවා වරද්.. නොකියා ඉන්න හිතාමතා හැංගුවා නෙමෙයි.. මට අයියා වගේම, ඒ සමානවම හිතට සැනසීමක් ගේන්න මට හම්බුණු එකම මනුස්සයා ඔයා විතරයි.. මම මුලින්ම 'ආදරේ' කියලා වචනයක් මගේ ඔලුවට දාගනිද්දි මගේ ඉස්සරහා ජීවිතේ ගැන ලොකුවටම හිතාගෙන හිටියෙ නෑ.. නිකන්ම නිකන් හීනයක් තිබුණා ඉහළට ඉගනගන්න ඕන කියලා.. ඒත් උඹ දිහා බලාගෙන ඉද්දි මට හිතුණා 'නෑ මම මගේ පුළුවන් උපරිමෙන්ම කරනවා' කියලා..

මම ආසයි මම ආදරේ කරන මනුස්සයා මේ ලෝකෙ ඉන්න වාසනාවන්තම කෙනා වෙනවනම්..

@Shan

මට ඕන මගේ හැම ගෝල් එකක්ම ඇචීව් කරගද්දිත් ඔයා මගේ ගාවින් ඉන්න.. ජීවිතේ ගෙවන හැම කාලෙකම ඔයාව ළඟින් තියාගන්න.. මම අදටත් හිතනවා.. ඔයාට ආදරේ කරන්න ගත්තු එක මගේ ජීවිතේ මම ගත්ත හොඳම තීරණය කියලා.. අදටත් ඒ ගැන මගේ හිතේ පොඩ්ඩක්වත්මපසුතැවීමක් නෑ.. ඉස්සරහටත් එහෙමයි..

මේක මම ලියද්දිත් මම ඉන්නෙ හොඳින් නෙමෙයි වරද්.. මට කේඩියු යන්න බෑ.. ඒත් අප්පච්චි මාව අසරණ කරනවා.. එයා මගේ අම්මව, අයියව ඇපේට තියාගෙන මට හුඟක් බලපෑම් කරනවා.. කවදාහරි ඒ ඇපේට ඔයත් එකතුවෙයි කියලා මට බයයි.. කවදාහරි එහෙම වුණොත්.. බැරිවෙලාවත් අපි දෙන්නගෙ ගමන පාරවල් දෙකකට බෙදුණොත් මම බය නැතුව ඔයාගෙ අත අතාරිනවා.. මම දන්නවා උඹ මොන කට්ටක් හරි කාලා තැනකට එන කොල්ලෙක් කියලා.. නියම කොල්ලෙක් කියලා.. කවුරු මොන කතා කිව්වත්  ඔයා 'වරද්' ම වෙන්න..

ආයෙම පාරවල් දෙක එකට හම්බුණු තැන ඉඳලා මම උඹව මලක් වගේ පරිස්සමට බලාගන්නවා.. මට විතරක් මලක් වෙලා.. ලොකෙටම පේන්න රූස්ස ගහක් වෙන්න.. ඔයාට මතකනෙ අපි දෙන්නම එහෙම කතාවක් ඇහුවා.. මට ඒ වචන අදටත් හිතේ නිතර ඇහෙනවා.. මම එනකල් පරිස්සමට ඉන්න.. හුඟක් ආදරෙයි..

රධ්‍ය.

මම එහෙමම කොට්ටෙ උඩට කඩාවැටුණා.. මම කොහොමද දෙයියනේ මගේ හිතට මේ කතාව තේරුම් කල්ලා දෙන්නෙ.. මට මොකුත්ම හිතාගන්න බැරිවුණා.. අපේ පාරවල් දෙක කොතනදිද ආයෙම එකට හම්බෙන්නෙ..?



ඕතරේ වරදයගෙ ඉන්ටවීව් එකට රෙදි මදිනවා අනේ.. මේ කාලෙ හැදෙන තරුණ දරුවො නම් අඤ්ඤ මන්දා..

මම සිද්ධියක් ඉවරකරන තැන ඉඳලා අනික පටන්ගන්නෙ නෑ දළඹු හටයිනි.. එමනිසා චැප්ටර් දෙකකට ලිව්වෙමි.. සමාවන සේක්වාහ්..

@Shan

අනිත් එක බලන්න ඒයි මේ ළමයගෙ හිච්චි පොත වගේ තව කතාවක් ලියවිලානෙ.. මම ඉතින් ඒ ඕතර් එක්කලා කතාබහ කළා.. මම හිතනවා මම හොඳින් එයාට කිව්වා කියලා.. එයා මගෙන් සමාව ඉල්ලුවා.. ඒත් ඇත්තටම කියන්න ඕන මගේ හිතනම් පොඩ්ඩක් රිදුණා.. මොකද මම කතාවෙ ලියන අකුරක් හා සමානව අවංකවම කියවන දළඹුවොන්ටත් හුඟක් ආදරෙයි.. එයාලගෙ කමෙන්ට් එකක් මැසේජ් එකක් නිසා තමයි මේක ලියන මගේ හිතට සතුටුක් ගේන බෙහෙත.. ඉතින් මම හිතනවා ආයෙම එහෙම දෙයක් නොවේවි කියලා..

මම මොකක් හරි වැරදි දෙයක් කියලා හිතක් රිදුණානම් සමාවෙන්න ඕන.. ඒත් මට මගේ මහන්සිය වෙනුවෙන් කතාකරන්න අයිතිය තියනවා.. මොකද මමනෙ හුඟක් වෙලාවට අහගත්තෙ කොපි කලා කියලා.. ඒ කතාව කියවපු කෙනෙක් හිටියනම් මම හිතන්නෙ තේරෙනවා මොකක්ද වුණේ කියලා.. ඉතින් ඒ නංගට මම සමාව දෙනවා වගේම මගෙන් වැරැද්දක් වුණානම් මම ඒකටත් සමාව ඉල්ලනවා.. ආයෙ එහෙම දේවල් නොකර ඉමු.. එතකොට කාගෙවත් හිත් රිදෙන්නෙ නැනෙ..

අනික මේක ප්‍රශ්න ඇතිකරන තැනක් නෙමේ ප්‍රශ්න අමතක කරවන තැනක්..

මගේ හැම දළඹුවෙක්ටම මම හුගාක් ආදරෙයි.. ඔයාලා මට ඇත්තටම ලොකු සතුටක්..

-නරක සමනලයා

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

@Shan

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 149 කොටස

" සිරී~ වට් ටයිම් ඉස් ඉට් නව්..??"

" ඉට්ස් ෆෝ ෆිෆ්ටීන්.."

මම දඩාස් ගාලා ඇඳෙන් බිමට වැටුණා.. හත්දෙයියනේ ඉස්කෝලෙ යන්න ඕන..!! ඊයෙ මහ රෑ වෙනකල් පිස්සු කෙලලා නිදාගද්දිම දොළහට කිට්ටු වුණා.. මට අද හොඳටම නින්ද ගියානෙ..

ආහ්.. නෑ.. නෑනෙ..!!

ශිට් ශිට්!! මම මොන රෙද්දකටද මෙච්චර මල පාන්දර ඇහැරෙන්නෙ.. ඉස්කෝලෙට පයින් යන්න විනාඩි විස්සනෙ.. පහමාරට ඇඳගන්න ගත්තත් ඇති.. ඒත් උයන්න එපැයි.. උයන්න ගියාම මල කරදරේ.. මම හිතාගෙන ඉන්නෙ මාසෙකට විතර පොල් එකසැරේ ගාලා ෆ්‍රිජ් එකේ දාගන්න.. ඇයි මගුල ගාන්න ගියාම මම එපෑ හිරමනේ උඩ නැගගෙන නටන්න.. පොල් ගාන්නෙ දවල්ට උයන්න.. උදේට මම කන්නෙ එලවලු එක්ක අහිංසක කෑම එකක්..

මම නැගිටලා ඇඳ හදලා ගිහින් කණ්ණාඩියට මූණ ඔබාගත්තා.. රෑ පුරාම අඩලා අඩලා ඇස් දෙක යට රතු වෙලා ගොරකා ලොඩ් දෙකක් වගේ.. දැක්කහම මටම බය හිතෙනවා.. මෙහෙම ඉස්කෝලෙ ගිහින් කොහොමද එසෙම්බ්ලි එකේ කතාකරන්නෙ.. අද හොඳට ඉස්කෝලෙ පලයන් වරදයා.. උඹ ඉස්කෝලෙ හෙඩා වෙලා මේ ඇඳුම ඇඳගෙන ඉරි බ්ලෙසර් එක දාලා ඉස්කෝලෙ යන්නෙ.. සුදු බ්ලෙසර් එක දාලා ඉස්කෝලෙ යන්නෙ.. වැල් වැල් බැජ් එක ගහන්නෙ මුළු ජීවිත කාලෙටම මෙච්චරයි.. දැන් ඉතින් ඊළඟ හෙඩා මල්ලිට සේරම භාරදෙන්න වෙනවා.. අපි ඉස්කෝලෙ හැමදාම නවතින්න ඇවිල්ලා නෑනෙ..

ඉතින් මේ ගෙවිලා යන්නෙ මගේ ඉස්කෝලෙ ජීවිතේ ශිෂ්‍ය නායකයෙක් විදියට ගෙවෙන අවසාන සතිය.. තව ටික දවසකින් මම මෙඩිකල් කොලේජ් යාවි.. මතක් වෙද්දිත් ඇහේ සමනල්ලු නටනවා වගේ.. ඇස් දෙක එක්කම මගේ කම්මුල් දෙකත් රතු වුණා.. දෙයියනේ කියලා මගේ කොන්ඩෙ වවාගන්න පුළුවන්..

@Shan

මම කුස්සියට ගිහින් ෆ්‍රිජ් එක ඇරගෙන එහෙමම බිමින් ඉඳගත්තා.. මොනවද ඉතින් උයන්නෙ.. මම තනියමනෙ ඉන්නෙ.. මටනම් මොක ඉව්වත් එකයි.. ඒත් බෑ ආච්චිඅම්මට පොරොන්දු වුණා වෙලාවට කනවා කියලා.. මම කැරට් බ්‍රොකලි ගෝවා වගයක් අරගෙන එළියෙන් තිබ්බා..

උදේ පාන්දර බත් කන්න තියනවනම් කොච්චර හොඳද.. ඒත් මේ ඉන්ස්ට්‍රක්ටර් අයියා හැමදාම කෝච්ට කියලා මගේ කෑම පුරුදු හොඳ නෑ කියලා බන්නවනවා.. මම ඔය වෙළ්ළාගෙන් ආයෙ බැනුම් අහන්නෙ නෑ.. ඊයෙ වුණත් ඉන්ටර්වීව් එකේ කිව්වෙ කොච්චර තඩි පව ගොඩක්ද.. මගේ කෝච් මට හුඟක් ආදරෙන් සලකනවා.. ගතිගුණ හරිම හොඳයි.. සොෆ්ට් හාටඩ් මනුස්සයෙක්..

සොෆ්ට් හාටඩ්..?? රෙද්ද තමා..

සරතේරු කැට් වෝක් එක නවත්තලා මෙහෙ එනවා..!! අයිසෙ තමුන් පැජන්ට් එකකද ඇවිදින්නෙ..!! හැරි ඇප් හැරි ඇප් ස්පීඩ් එක මදි..!! විනාඩි දහයක් පරක්කුයි!!!!! මෙහෙම කල්ලද BWF වර්ල්ඩ් ටුවර් ෆයිනල්ස් ප්ලේ කරන්න ඉන්නෙ..!! කිව්වා නේද සමර් ඔලිම්පික් ප්ලේ කරනවා කියලා..!! හැයි හැයි ගානවා.. මම ඉතින් ඕවා කිව්වෙ නෑ මගේ තියන මනුස්සකමට.. කිව්වනම් තමා වෙළ්ළා රැකට් එක සාක්කුවෙ ගහන් ගෙදර යන්නෙ..

කමක් නෑ මොකක් වුණත් වෙළ්වෙක් කොහෙන්වත් හොයාගන්න බෑනෙ.. මම කවි කියන්නෙ කාටද..

මම BWF ප්ලේ කල්ලා හම්බෙන මිලියන තිස් අට ගැන කල්පනා කලා ෆ්‍රිජ් එකත් ඇරගෙන ඒකෙ ඇතුලෙ තිබ්බ බිත්තර කේස් එක දිහා බලාගෙන.. මිලියන තිස් අටක් කියන්නෙ ලේසිපාසුද.. මම තනියම හම්බ කරපුවානෙ.. එහෙම වුණොත් හගනවා තට්ටු දෙකේ ගෙයක්.. දැන් පරණ දෙකයි පනහෙ හීන ටික එකතුකල්ලා ගාබේජ් බෑග් එකකටවත් දැම්මනම් හොඳයි.. ඉරිදට ඔබ්ස'වර් එකේ ලොකුවට පිටුවකම යන මගේ ආටිකල් එකත් ඒ අස්සෙ මට මතක් වුණා.. මම ඊයෙ හෙන පම්පෝරි ගොඩක් ගැහුවනෙ මං ගැන..

නෑ එහෙම නෙමේ මම වෙච්ච දේ ඉතින් කිව්වෙ.. පස්සෙ මටම හිතුණා පම්පෝරියක් නේද හැගුවෙ කියලා.. මමනම් කියන්නෙ මමනෙ දින්නෙ.. මම ගැන උජාරුවෙන් ඉන්න ඕන.. දවසක ලංකාවෙ මමත් ප්‍රසිද්ධ වුණොත්

@Shan

රහනවා අම්මටසිරි වෙන්න.. ඉදපල්ලා මම ලංකාවත් අඩවලා තමා පස්ස බලන්නෙ..

සෙට් යොර් ගෝල්ස් හයි.. උදේ පාන්දර පුදුම කික් එකක් තියෙන්නෙ..

මම සිංදුත් කියනවා.. ස්පෝර්ට්ස් ප්ලේ කරනවා.. එක්ස්ට්‍රා කරිකියුලර් කරනවා.. ස්කූල් හෙඩ් ප්‍රිෆෙක්ට් වෙලා ඉන්නවා.. ඒ අස්සෙ ලොකු අම්මගෙ තනි ඇහැට ඇඩෙන්න මෙඩිකල් කොලේජුත් යන්න පාස් වුණා.. සිංගප්පූරුත් ගිහින් ආවා.. ඉස්සරහට ලංකාවත් නියෝජනය කරනවා.. අම්මට කියන්න ඕන අම්මගෙ පුතා ගැන පම්පෝරි ගහන්න කියලා.. ආච්චිනම් කොහොමත් ඒක කරනවනෙ..

මම එනර්ජි පෝශන් එකෙන් හැඳි දෙකහමාරක් මගේ බෝතලේට හලලා අයිස් කැටයක් දාගත්තා.. එක අයිස් කැටයයි.. වතුරයි.. හුහක් සීත බිව්වම උදේට පීනසේ හැදිලා මැරිලා යයි කියලා අපේ මාමා කියන්නෙ.. දැන් ඉතින් හොල්ලන්න තමා තියෙන්නෙ..

" Shimmy shimmy yay, shimmy yay, shimmy ya (drank)

Swalla-la-la (drank)

Swalla-la-la (swalla-la-la)

Swalla-la-la

Freaky, freaky gyal

My freaky, freaky gyal "

මම අර මෙලෝ රහක් දැනෙන්නෙ නැති එළෝලු ටික සෝදලා ස්ටීම් වෙන්න තියලා ගිහින් බෑග් එක හදාගත්තා.. අපේ ආච්චිඅම්මගෙ බටුමෝජු එක්ක, පරිප්පුයි, ඇඹරල්ලා මාළුයි, මාළු ඇඹුල්තියලුයි, කහබතු- සැක්.. ඒවා අමතක වෙයන් ඉක්මනට.. මම කන්නෙ බ්‍රොකලි එක්ක ලුණු ගම්මිරිස් විතරයි.. තව කැරට් කනවා.. ගෝවා කනවා.. වට්ටක්කා කනවා.. නන්ෆැට් මිල්ක් බොනවා.. ඒ වුණාට මීකිරි- එහෙම ඒවා ඕන නෑ.. නන්ෆැට් තමා හොඳ.. අඩුම තරමෙ එනර්ජි ඩ්‍රින්ක් එකවත් චොක්ලට් රස නොවුණනම්

@Shan

මම පැලියගොඩ තෙල් කෝච්චියට බෙල්ල තියනවා.. හරි මගුලක් වුණානෙ මේක..

හතරහමාර වෙද්දි මම කුස්සියෙ අල වගයක් සුද්ධ කර කර අර තම්බපු එලෝලු එක කකා හිටියෙ.. දවට හොඳට කන්න එපැයි.. මම අල තෙල් දාල පුරුදු පරිප්පුවම හදාගන්නවා.. ඇවිත් පපඩමක් බැදගෙන ඒ තෙල්ම දාලා බිත්තරේකුත් බැදගෙන කනවා.. තෙල් ගණන් මේ දවස්වල.. ආච්චිඅම්මා කියන්නෙ පොඩ්ඩක්වත් නාස්ති කරන්න හොඳ නෑ කියලා.. ලිපේ පරිප්පු එකත් හැදිලා ඉවරවෙන්න ගිහින් නිසා මම අනිත් ලිපේ අල ටික තියලා ඒක හැදෙනකල් කෑමමේසෙට වෙලා ස්කූල් ඩයරි එක ලිව්වා.. ඒක දැන් සම්පූර්ණ වෙලා අන්තිම පිටු කීපෙ විතරයි ඉතුරු.. මේ අවුරුද්දත් හිතුවෙ නැති ඉක්මනට ගෙවිලා ගියා..

කෑම හදලා ඉවරවෙලා මම ඇඟ සෝදගෙන ඇඳුම් ඇඳගත්තා.. ශර්ට් එක මැද්දෙන් හිල් වෙලා ප්‍රිෆෙක්ට් බැජ් එකම ගහලා.. දැන් ඒක නැතුව මේක ඇන්දොත් කට්ට ගහපු හිල පේනවා.. එහෙම කැතයිනෙ.. මම කලිසම කරේ දාගෙන කණ්ණාඩිමේසෙ ළඟ තිබ්බ ස්ටූල් එකෙන් ඉඳගත්තා..

ඒ එක්කම මගේ ඇහැට අහුවුනේ කණ්ණාඩියෙන් පේන කළුපාට බොක්ස් එක.. තපරේකින් මගේ සම්පූර්න මූඩ් එක අනිත්පැත්ත ගැහුනා!

" නෑ නෑ වරද් අඩන්නෙ නෑ.. අයේ නෑ.."

මම ඒ දිහා නොබලා කණ්ණාඩියෙ ඉන්න මං දිහාම බලාගත්තා.. අද ඉස්කෝලෙ ගියාට එයා නෑ.. මම දන්නවා.. ඒත් එයා හොඳින් ඉන්නවා වරද්.. මෙච්චර ඔයාව අඩවගන්න එපා කියලා මම ලක්ශ වාරයක් මටම ජපකරගෙන අවසානෙ මගේ ඇස් වලින් ගලාගෙන ගියපු කඳුළු බිංදුවක් කම්මුල් දිගේ රූටලා ඇඳුමට වැටුණා..

මගේ මාමා කරදරයක් නැතුව ඉන්නවා ඇති.. එහෙම වෙන්න ඕන..

මම ඉක්මනට කඳුළු පිහාගත්තත්.. ඒ හැමසැරේම මට ඇඩුණා.. මම හොඳින් ඉන්න ට්‍රයි කරනවා.. මම එහෙම ඉන්න වෙලාවල් තියනවා.. ඒත් හැමතිස්සෙම හරිම අසාධාරණ විදියට මම විතරක් මතක රැඳිච්ච තැන්වල හිර වෙනවා.. ඒවා එක්කම ජීවත් වෙන්න වෙනවා.. එතකොට මම දරාගෙන ටිකත් ඉබේම පහළට ඇදගෙන වැටෙනවා..

@Shan

මම ආයෙම වතාවක් ඇඬුවා.. කණ්ණාඩි මේසෙට ඔළුව තියාගෙන ඇඬුවා.. අද දවසටම මම අඬන අන්තිම වතාව මේක.. ආයෙ නෑ.. මම මටම අඬන්න අවස්ථාව දුන්නා.. මම තනියම ඉන්න නිසා දුක් වෙන්න නිදහස තියනවා.. මම කම්මුල් ඇස් රතු වෙලා ඇහිපිහාටු තෙත් වෙලා එකට ඇලෙනකල්ම ඇඬුවා.. මෙච්චර ජීවිත කාලෙකට මම මෙහෙම දවස් ගණන් රැයවල් අඬලා නෑ.. මගේ කටහඬ පවා වෙනස් වෙලා.. මම දන්නවා.. ස්ට්‍රොප්සිල් එකක් කාලා කතාකරන පොඩ්ඩට විතරක් මම හොඳින් හිටියා.. මම විහින්ම විරූපී කරගෙන ඉඳපු මගේ මූණ දිහා බලාගෙන ඉඳලා පහළ ලාච්චුවෙන් කන්සීලර් එකක් අරගෙන තිත් ගොඩක් ඇස් යටින් තියාගත්තා.. හරි අමාරුයි.. කඳුළු නවත්තගන්න.. සමහරවිට මෙච්චර කාලයක්ම හිතේ හිරවෙලා තිබ්බ, ගල් වෙලා තිබ්බ හැඟීම් දියවෙන්න අරගෙන ඇති.. ඒකයි මෙච්චර ඇස්වලින් කඳුළු ගලන්නෙ..

කන්සීලර් දියවෙලා කඳුළුත් එක්ක පහළට වැක්කෙරෙද්දි මම ටිශූ එකෙන් මුළු මූණම පිහාගෙන ටික වෙලාවක් හිටියා..

" Give yourself time.. වරද්.."

මම මටම කාලයක් දුන්නා.. ආයෙම සාමාන්‍ය වෙන්න..ලෝකෙ හැම මනුස්සයටම තියනවා වගේ වෙස්මූණක් මම මටම හදාගන්න ගමන් තිබුණා.. අපි ලොකුවෙද්දි වෙස්මූණක් ඕනවෙනවයි කියලා දවසක් මාමා කියලා තිබුණා.. මට ඒක පොඩි කාලෙ තේරුණේ නෑ.. මම හිතුවෙ කඩේ විකුණන වෙස්මූණු කියලා.. නෑ.. ඒ කිව්ව වෙස්මූණ මේක වෙන්න ඕන..

' මට ඔයා නැතුව හුගක් පාලු හිතෙයිද..'

' මම ඉක්මනට එනවා වරද්..'

' ඉක්මනට එන්න.. ආවොත් ආයෙ යන්නෙපා.. මට දුක හිතෙනවා.. මම ආස දේවල් මගේ ලග තියෙන්නෙ නෑ ඒවා අතෑරිලා යනවා..'

' පපුවට තියලා ඉකිගහන්නෙපා වරද්.. මගේ පපුව කකියනවා.. දැන් නාඩා ඉන්න.. තව කල් තියෙනවනෙ.. මිම්..'

මම මුළු මූණම අත් දෙකෙන් තදට අතුල්ලලා පිහිදගත්තා.. අවුරුදු ගණන් පරණ, පාඩුවෙ ඉඳපු වචන උඩට මතුවෙලා මාව රිද්දන්න ගන්නවා..

@Shan

වෙලාව යන නිසා මම ඉක්මනට මූණෙ ඇස් වටෙ රතුවෙලා තිබ එක නැතිවෙන්න කන්සීලර් ගාගෙන ඇඳුණුත් ඇඳගෙන ගෙදර යතුර අරගෙන එළියට බැස්සා.. එළිය හරි නිස්කලංකයි.. හුරුපුරුදු හුළඟක් මගේ සුදු ඇඳුමත් පිහාගෙන එහාට ගලාගෙන යද්දි මම ගේට්ටුව ඇරගෙන ඉස්කෝලෙ යන්න ගියා..

පුරුදු විදියටම ඉස්කෝලෙ උදේ වැඩ ගෙවිලා ගියත් මම හිටියෙ කතාකරන්න ඕනම දේකට උත්තර දෙන මානසිකත්වෙක නෙමෙයි'.. ජොනතන්ලා වුණත් වෙනදා වගේ නැතුව පාඩුවෙ හිටියා.. මට පාඩුවෙ ඉන්න දුන්නා.. දවල් කියාන් අයියා කතාකල්ලා හෙට මම ඉන්න තැනට එනවා කිව්වා.. ඒ ගමන් මට රෙක්සියි කියාරයි ලැබෙව්.. එතකොට ගෙදර මම පාළුවෙන් නෙමේ ඉන්නෙ.. එයාලා දෙන්නත් ඉන්නවනෙ.. මම එයාලව පරිස්සමට බලාගන්නවා..

රධ්‍ය අයියා කලින් වතාවෙදි රෙක්සිටයි කියාරටයි හුඟක් කැමතිද ඇහුවෙ මේ නිසාද කියලත් මට හිතෙනවා..

එයා බලාපොරොත්තු වුණත් නැතත් මම ඒ දෙන්නව ඉල්ලගෙන බලාගන්නවා.. මම ඉතින් ලොකුවට ගමේ ගෙදර යන්නෙත් නැනෙ..

ඉස්කෝලෙ ප්‍රින්සිපල් සර් මට හම්බෙන්න එන්න කියලා පණිවිඩයක් එවලා තිබුණා.. මම ඔෆිස් එකට ගියාම සර් මට විශ් කළා.. හුඟක් ආඩම්බරවෙනවා කිව්වා.. මට ඒ වචනවලට හුඟක් සතුටු හිතුණා..

සේපාලිකා ගහ තාම මල් හලනවා.. අපි හම්බෙන අන්තිම දවස් කීපෙ.. සේපාලිකා ගහ ඉස්සරහටත් මල් හලාවි.. මට කාලෙකට කලින්, මහා රෑ මගේ පලවෙනි හාද්ද රධ්‍ය අයියා ඉල්ලගත්ත දවස මතක් වුණා.. ඇත්තටම මට එයාට තුරුල් වෙන්න තිබ්බනම්.. ඒ බුවළු අඩු ටික මැද්දට වෙලා ඉන්න තිබ්බනම්.. මම ආසම ප'ෆියුම් එක මගේ වටෙ කැරකෙනවනම්..

මගේ ලස්සනම උදේ වරු ගෙවිලා ගිහිල්ලා.. ආයෙ ඉස්කෝලෙ එන්නෙත් නෑ.. මට එන්න හිත හදාගන්නත් බැරිවෙව්.. ඉක්මනට මේ අමාරු කාලෙ ගෙවිලා මේ දුක මට සාමාන්‍ය වෙනවනම් හොඳයි.. මම ඉස්කෝලෙ ඉවරවෙලා සෙනුකලා එක්ක කතාකල්ලා ආයෙම ගෙදර ආවා.. චමිරු පුදුම වදයක් දෙන්නෙ ලයිසන් හදවගන්න කියලා.. ගෙදර වාහනයක් තියාගෙන ක්ලබ් එකට බස් වල ටැක්සි වල ගාටන්න එපා කියලා..

@Shan

සිංගප්පූරු ටුවර් එකෙන් පස්සෙ මට සති දෙකක නිවාඩුවක් හම්බුණා.. ඉතින් මේ දවස්වල මට ප්‍රැක්ටිස් නෑ.. මම ඉස්කොලෙ ඉවරවෙලා කාලා බීලා ගෙවල් අස් කල්ලා රෙදිත් සෝදලා හවස් වෙන්න තෝරගත්තු කොරියන් ඩ්‍රාමා එකක් දාගෙන බැලුවා.. ආශි සැරින් සැරේ මට කතාකල්ලා බල කරනවා ඩ්‍රාමා එකක් බලපන් කියලා.. මට නිකමට හිතුණා ගොබලින් බලන්න.. වැඩිය මම කොරියන් ඩ්‍රාමා බලන්නෙ නෑ.. රධ්‍ය අයියනම් හැමතිස්සෙම බලනවා.. ඉතින් මම ටීවී එක දාගෙන බ්ලැන්කට් එකයි කොට්ටෙයි උස්සගෙන ඇවිත් සාලෙට වෙලා මහා රෑ වෙනකල් ඩ්‍රාමා බැලුවා.. ආච්චිඅම්මා එක්ක, අම්මා එක්ක කතාකලා.. රෑට කෑම හදාගත්තා.. සිංදුවක් කිව්වා.. එළියෙ එහෙ මෙහෙ ඇවිද්දා.. ආයෙම ඇඳේ වැටිලා නිදාගත්තා.. මම මෙච්චර පාළුවෙන් කොයිම වෙලාවකවත් ඉඳලා නෑ..

ඒත් මම හුරුවෙනවා එහෙම ඉන්න..

නරක සමනලයා ආවෝ~

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 150 කොටස

" ලොකුමස්සිනාගෙ ජන්ම දිනේට මොකක්ද බං ඇඳගෙන යන්නෙ.. සැක් ඇඳුමක්වත් හදාගත්තෙ නෑ යන්න.."

" උඹට මොකක් ඇන්දත් හොඳයිනෙ.. තියන එකක් ඇඳන් යමන්.."

" ඉඳලා ඉඳලා අපේ බෙට්ටිත් පය ගැහුවෙ මාර අත්තකට තමයි නේද බං.."

මම අල්මාරිය ඇරලා හොඳ ඇඳුමක් අරගෙන අයන් බෝඩ් එක උඩින් දැම්මා.. අද ආශියි මහීශායි සෙනුකයි චමිරුයි අපේ ගෙදර ඇවිල්ලා ඉන්නෙ.. හවස කියාන් අයියගෙ බර්ත්ඩේ පාටි එකට යන්න.. දැන් ඉතින් ෂනෙරු ඉස්කෝලෙ ගිහිල්ලත් ඉවරවෙලා ඉන්නෙ.. කැම්පස් පොතත් පුරවලා යැව්වා.. මේ දවස් ගෙවෙන්නෙ හරිම මහන්සියෙන්.. ස්පෝට් ක්ලබ් එකේ ටූනමන්ට් එකකට පහුගිය සති දෙකේ මරවලා ප්‍රැක්ටිස් දාලා.. මම ගෙදර එනවා නිදාගන්නව ආයෙම ක්ලබ් එකට දුවනවා.. හිටියහම ප්‍රැක්ටිස් රූම් එකේම නිදාගන්නවා.. ගෙදර එන්නවත් පණක් නෑ සමහර දවස්වලට.. මොකෝ මම රකට් එක අතට ගත්තම ශටල්කොක් එක ඇවිල්ලා ඉබේ රකට් එකේ වදින්නෙ නැනෙ.. මම හැමදාම වරද්දන්නෙ නැතුවම ප්‍රැක්ටිස් කරනවා.. බොඩි මේන්ටේන් කරනවා.. ඔය දේවල් වල සේරගෙම එකතුවක් තමයි මම ගන්න මෙඩල් එකක ට්‍රෝෆි එකක වටිනාකමට මුල් වෙන්නෙ.. ඇත්තටම මම මගේ උපරිමෙන්ම හැම තපරයක්ම මහන්සි වුණා.. මොකද මට ඕන වුණා වැඩ එක්ක බිසි වෙලා මගේ වටේ තියන දේවල් අමතක කරගන්න..

ගිය සතියෙ අම්මා මෙහෙ ගෙදර ඇවිත් දවස් දෙකතුනක් ඉඳලා ආයෙම ගමේ ගියා.. ආච්චිඅම්මා තනියමනෙ.. එද්දි මට හෙන කෑම තොගයක් හදාගෙන අම්මා ආවෙ.. කෑම කිව්වෙ කල්තියාගන්න පුළුවන් කෑම තියනවනෙ.. ඒ වගේ දේවල්.. මේ දවස්වල නම් මට ඒක ලොකුවටම වටිනවා.. මොකද මම ගෙදර වැඩිය රැදෙන්නෙ නැති නිසා..

මේ අවුරුද්ද ඉවරවෙලා අලුත් අවුරුද්ද ලබන්න තිබ්බෙ ටික දවසයි.. දෙදාස් විසි පහ කියන්නෙ.. ඒක මගේ ජීවිතේ නොලබපු අත්දැකීම් හුඟක් ලැබෙන අවුරුද්දක් වේවි.. මොකද මම කැම්පස් යනවා.. මගේ අම්මා මම ගැන හුඟක් සතුටු වෙනවා.. පව්ලෙ හැමෝම.. ඉස්සර නිකන්ම නිකන් ඔහේ

@Shan

මෙලෝ රහක් නැතුව ඉඳපු එකා මේ වගේ තැනක ඉන්නවා කියද්දිත් මට අමුතු කික් එකක් ආවා..

පහුගිය ටිකේ මගේ සෝශල් මීඩියා එකවුන්ට්ස් වල සැහෙන්න වෙනසක් වෙලා තිබුණා.. එකසැරේට සාමාන්‍ය ප්‍රසිද්ධියක් ලැබුණු නිසායි නිතර එක එක බැඩ්මින්ටන් ඉවෙන්ට්ස් වල මම ඉන්න නිසායි ෂනෙරු කියන නම ස්පෝර්ට්ස් ෆීල්ඩ් එකේ ටීන් ප්ලෙයර්ස්ලා එක්ක ගැව්ලාම තිබුණා.. මම දැන් ටීන් නෙමෙ ඒක වෙනම කතාවක්.. ඒත් පොඩි ලුක් එකක් තියනවනෙ.. මම හිතාගත්තා ඉස්සරහට එන අවුරුදු හත මගේ උපරිමෙන්ම මහන්සි වෙලා හොඳ තැනකට එන්න..

මම බලාපොරොත්තු වුණා වගේම මගේ වටේ තිබුණු දුක සාමාන්‍යීකරණය වෙිගෙන එනවා.. ඉතින් මම ඒකටහුරුවුණා.. මගේ කෝච් වුණත් මාව හුහක් තේරුම් අරගත්තා.. ඒත් ඒ මනුස්සයා හැමදේම මගෙන් අහගන්න තාන්වී අක්කව ඉස්සරහට දාලා.. ඉතින් තාන්වී අක්කා මගේ ළඟම යාළුවෙක් වගේ මට දැනෙන්නෙ.. ඉඳලා හිටාඅ තාන්වී අක්කගෙ බබාලා දෙන්නව බලන්න මම කෝච්ලගෙ ගෙදර යනවා.. ගිහින් ඒ දෙන්නව හුරතල් කල්ලා තාන්වි අක්කා එක්ක කතාකල්ලා ගෙදර එනවා.. මගේ වටේ හුහක් වටින මනුස්සයො ටිකක් මොකක් නැතත් රැඳිලා හිටපු එක ගැන මට සතුටුයි..

අපේ ලොකුඅම්මා දැන් මාත් එක්ක පුදුම ලව් එකේ කතාකරන්නෙ.. පුදුම ලව් එකේ කිව්වට එහෙම ලොකු ලව් එකක් නෙමෙ.. පොඩ්ඩක් වෙනදට වඩා ගනන් ගන්නවා.. ඉඳලා හිටලා කෝල් එකක් එහෙම දීලා දුකසැප අහනවා.. ගෙදරත් ආවා අභිශේක් එක්ක.. ඌ නම් කාලකන්නියෙක් කියලා දවසක් ලොකුඅම්මා අපේ අම්මත් එක්ක කිව්වලු.. බලන්න ඒකෙත් හැටි.. දැන් අපේ ගෙදර කාලකණ්ණි ගෞරවනාමය මගෙන් අභිශේකයා අරගෙන.. ඌව අභිශේක ගන්වලා තියෙන්නෙ කාළකණ්ණියා කියලා.. 1/4කන්ණියා..

කියාන් අයියා මට රෙක්සිකා අක්කවයි කියාරා බෝලෙයි ගෙනැල්ලා දුන්නා බලාගන්න.. උන් දෙන්නා ඉන්න නිසා එහෙම ලොකු පාළුවක් දැනෙන්නෙ නෑ.. කොයිවෙලෙත් කියාරා නම් මම වොශෲම් එකට ගියත් දොර ගාව හිටගෙන ඉන්නවා.. සමහර දවස්වලට මම කාර් එකේ ගිහින් ගෙදර එද්දි කියාරා ගේට් එක ගාව බලාගෙන ඉන්නවා.. කෙල්ල දන්නවා මම ගෙදර එන වෙලාව.. හැබැයි පොඩ්ඩක්වත් පරක්කු වුණොත් එහෙම

@Shan

ඉවරයි.. හූ තියලා මුළු ලේන් එකම බය කරවලා එක පිස්සුවක් තමයි නටන්නෙ.. මගේ තනියට මම කතාකරන්නෙත් කියාරා එක්ක.. එයා හරිම මනුස්සයොන්ට ළඟ කෙනෙක්.. මම සමහරවෙලාවට ජනෙල් පඩිය උඩ ඉඳගෙන එළිය බලාගෙන ඉන්නවා..

ආ ජනෙල් පඩිය ගැන කියනවනම් සාලෙ පැත්තක තියන ජනෙල් පඩිය හුඟක් පළලට හදලා තියෙන්නෙ.. මම ඔතනට ගාණට සෙට් වෙන මැට් එකක් දාලා හදලා තියෙන්නෙ වාඩිවෙලා පොතක් එහෙම කියවන්න.. ඒ පැත්තෙන් හොඳට හුළඟ එනවා.. මම රෑට ඉඳගෙන එළිය බලාගෙන ඉද්දි කියාරාත් ඒක උඩට නැගලා මගේ උරහිසට හොම්බ තියාගෙන ඉන්නවා.. හරියට මට හග් එකක් දෙන්න වගේ.. බැරිවෙලාවත් මම අඬනවනම් එයා කුං කුං ගාලා මගේ ඇහේම දැවටෙනවා.. මම හුඟක් ආදරෙයි කියාරට..

අනිකා.. අර පරට්ටට රෙක්සිකා.. ඒකි ගැනනම් කතාකරන්න මට වචන මදි.. හැබැයි වැඩි කරදරයක් මුකුත් නෑ.. නාන්න එන්න කිව්වම පාඩුවෙ නානවා.. කන්න එන්න කිව්වම පාඩුවෙ කනවා.. රෑටපස්සෙ නිදාගන්නවා.. මාව නම් උගෙ බෙට්ටක් තරම්වත් ගණන් ගන්නෙ නෑ.. හැබැයි ගෙදරට උඩින් කපුටෙක්ටවත් පියාඹන්න දෙන්නෙ නෑ.. බුරනවා කියන්නෙ.. කන් අඩි පැලිලා මැරිලා යන්න තරමට බුරනවා.. රධ්‍ය අයියගෙ ශර්ට් එහෙම මගේ ඇඳුම් එක්ක කලවම් වෙලා මම ගෙනෙද්දි.. සමහර වෙලාවට මම ඒවත් අඳිනවා.. එතකොට කියාරා හිතන්නෙ මම රධ්‍ය අයියා කියලා.. අන්න එතකොට නැට්ට වනාගෙන බෝලයක් එහෙම කටින් උස්සගෙන එනවා මට විසික් කරන්න කියලා.. හැබැයි එයාව ලිහලා රෑට එහෙම තිබ්බොත් බැරිවෙලා හරි පාරෙන් කවුරුහරි ගියොත් ඉවරයි.. බුරලා දෙවනත් කරනවා.. ලේන් එකේ දැන් මේ ඩබල ෙහන ෆේමස්.. මම උදේට ට්‍රැක් කිට් එකත් ගහගෙන ඉස්කෝලෙ ගාවට එනකල්ම දුවනවා.. එතකොට මේ දෙන්නව උස්සගෙන තමා යන්නෙ.. එහෙම එහෙම වටයක් ගහලා බ්‍රවුන් බීන්ස් එකෙන් කොෆී එකකුත් අරගෙන ආයෙම ගෙදරට දුවලා එනවා.. මේ පැත්තෙ ආච්චිලා, සීයලා, අංකල්ලා, ආන්ටිලා මට එකතුයි.. උදේට මම පාර අතුගාන මනුස්සයාගෙ ඉඳලා ගුඩ්මෝනින් කියාගෙන යන්නෙ.. ගෙදර අයිති අංකලුත් මට 'නයිස් බෝයි' කෙනෙක් කියලා කතාකරනවා.. නේබර්ස්ලා මං ගැන එයා එක්ක කියනවලු.. ඉතින් මට සතුටු හිතුණා මම ප්‍රසන්න මනුස්සයෙක් වෙච්ච එක ගැන..

ගෙදර ඉස්සරහා මම ගිය පෝය දවසෙ ජපන් රෝස වගයක් පැළ කළා.. දැන් ඒවා ටිකක් ලොකුයි.. ළඟදිම මල් හැදෙයි.. ඒ ඇරෙන්න චූටි පතොක් පැළ

@Shan

වගයක් මගේ කාමරේ තියනවා.. අර පිස්සු කියාරා ඒවා කන්න හදනවා..

මම මේ ගෙවෙන ජීවිතේට ආසයි..

මම ඉඳලා හිටලා ෆ්‍රී වෙන දවසක මාවම ඩේට් එකකට අරගෙන යනවා.. ගිහින් කාලා කාලා රෑ වෙන්න ගෙදර එනවා.. සෙනුක ෆ්‍රී නම් ඌවත් එක්කගෙනම යනවා.. නැත්නම් චමිරු, ආශි, මහීශා, කියාන් අයියා එක්ක ක්ලියෝපැට්‍රා යනවා, කැප්‍රි යනවා, කොක්පිට් යනවා, ටූ සීරෝ සික්ස් මියුසික් ෆැක්ට්‍රි යනවා.. ක්ලබ් යන වැඩේ ආතල්.. හැබැයි සුදූඅප්පච්චි එක්ක විතරයි යන්න දෙන්නෙ.. කියාන් අයියා ගියාම ඉතින් නටන්න ඕන ඔක්කොම පිස්සු නටලා ආයෙ හෙන රෑ වෙලා ගෙදර එන්නෙ.. මම බොන්න යන්නෙ නෑ.. මට කම්ෆටබල් තැන් වල විතරයි ඩ්‍රින්ක්ස් ගන්නෙ කියලා මම මටම රූල් එකක් දාගෙන ඉන්නවා.. ඉතින් සෙනුකයා වැටෙන්න ගැහුව දවසට මම ඌවත් උස්සගෙන අපේ ගෙදර එනවා.. සෙනුකගෙ තාත්තා අපේ ගෙදර ඉන්න නිසා ඌට මොකුත් කියනෙ නෑ.. අපි ක්ලබ් ගිහින් පාඩුවෙ අපේ ආතල් එක අරගෙන එනවා.. එච්චරයි.. එතනින් එහා කවුරු මොන මගුල කිව්වත් ගණන් ගන්නෙ නෑ..

කියාන් අයියා මට පුදුම විදියට එකතුයි.. ඌයි මායි වලි තමා.. ඒත් එයාගෙ හොඳම යාළුවො දෙන්නා ළඟ නැති දුක, පාළුව මාත් එක්ක කියනවා.. සෙනුක එක්ක කියනවා.. ගෙදර එක එක ප්‍රශ්න එහෙම ඉඳලා හිටලා කතාකරනවා.. කියාන් අයියා කම්පනි එකේ වැඩ එක්ක සෑහෙන්න බිසී වෙලා ඉන්නෙ.. ඉතින් අපි හම්බෙන දවසට කෙලින්න ඕන සේරම පිස්සු කෙළිනවා.. ආශිත් කියාන් අයියගෙ වැඩ වලට මාර සපෝට් එකක් දෙනවා.. උන් දෙන්නා හොඳ කපල් එකක්.. හෙල්දි රිලේශන්ශිප් එකක්.. කියාන් අයියා ආශිට ආදරෙයි.. ආශිත් එහෙමයි.. එයාලගෙ වැඩ තේරුම් අරගෙන දෙන්නට දෙන්නා උදව් කරගන්නවා.. කියාන් අයියා පොඩ්ඩ් දේකින් වුණත් සතුටු වෙන මනුස්සයෙක්.. ඉතින් අපේ එකී හිටපු ගමන් ඒකිගෙ ආදරේ දාලා කේක් හදාගෙන ඔෆිස් එකට යනවා.. කියාන් අයියගෙ සෙකෙට්‍රි අයියත් හෙන හොඳයි.. හැබැයි කියාන් අයියා ඉරිසියයි..

අයුක අයියට එක්සෑම් කිට්ටු වෙලා එකදිගට වැඩ කිව්වා.. සෙනුක ඉතින් කොහොමත් තේරුම් ගන්න එකා.. ඌ මෙහේ ඉඳන් කරන්න පුළුවන් හැම උදව්වම අයුක අයියට කරනවා.. අර ලෝන්ග් ඩිස්ටන්ස් රිලේශන්ශිප් කියන්නෙ.. ඒකෙ හොඳ පැත්ත හොඳටම පෙන්නන දෙන්නා තමා අයුක අයියයි සෙනුකයි.. උන් දෙන්න නම් නිදාගන්නෙත් වීඩියෝ කෝල් ඔන්

@Shan

කරගෙන.. අයුක අයියට හෙන පාළුයිනෙ එහෙ ගිහින් තනියම ඉන්න.. සෙනුකයටත් මේ ටිකේ වැඩක් නැති නිසා හොඳයි..

හැමදේම හොඳින් වෙනවා.. මගේ වටේ තියන දේවල් කාලයත් එක්ක ඒවට අනුවර්තනය වෙලා.. දැන් ඒ විදියටම ගලාගෙන යනවා..

මම හිතනවා රධ්‍ය අයියත් හොඳින් ඉන්නවා ඇති කියලා.. එයා යුනිවසිටි යන්න පටන් අරගෙන ඇති.. කොහොම හරි එයා එයාගෙ හීනවලට යාවි.. පාරවල් එකට හම්බෙනකල් මම හොඳින් ඉන්නවා.. හිතට දුකක් දැනුණත් මම ඉවසගෙන ඉන්නවා.. ටිකකින් ඒක නැතිවෙලා යනවා..මගේ මාමත් සතුටින් ඇති.. එයාලා මැරි කල්ලද දන්නෙ නෑ.. ආධ්‍ය අයියා ඉක්මනින් සනීප වුණාම එයාලා බඳීවි..

මම දාහක් කතා කියලා මගේ හිත හදාගන්න උත්සාහ කළා..

" එහෙම තමා අනේ පය තියනවනම් දිරව්ව ඒවට පය ගහලා බෑනෙ.."

" මටත් පය ගහන්න අත්තක් හොයලා දීපල්ලාආආආආ!!!"

මහීශා අතේ තිබ්බ ෆෝන් එකත් පොළොවෙ ගහලා කියාරව බදාගෙන ඇඬේ වැටුණා.. අනේ දෙයියනේ මෙන්න මෙකිට කෙල්ලෙක් හොයලා දීපල්ලකො.. දැන් කොයි කාලෙ ඉඳලද තනිකඩව ඉන්නෙ..

සෙනුකයා හිමින්සැරේ මගේ කනට කිට්ටු වෙලා කුටු කුටු ගෑවම මට හිනාගියා.. චමිරු සෙනුකට දෙකක් රැව්වා.. ඒක හරියන්නෙ නෑ චමිරු අපේ එකීගෙන් එක්කො මැරුම් කනවා.. නැත්නම් අපේ එකී චමිරුගෙන් මැරුම් කනවා..

" ඇයි බං සයෝන් අයියට අකමැතිම කියලම උඹ කියන්නෙ.. කැමති වෙයන්කො.."

" ඔය පකයා මට එපා.. සැක්.. ඊට හොඳයි මම අයාන්කාරයව බඳිනවා.."

" අප්පේ මෙන්න වැන්දා.. පාඩුවෙ ඉඳපන්.. යකෝ අර උණුවතුරත් නිමලා බොන සයෝන් අයියටනෙ ඔහොම අපහස කරන්නෙ.. අද ඩයල් එක එනවද.."

@Shan

" ඒව් ඒව්.. හොඳට ඇඳගෙන පලයන් මහීශා.."

" මේ උඹලා හතරදෙනාට හොඳින් මම කියන්නෙ.. හරිද.. එක එක කොල්ලො මට සෙට් කරන්න එපා.. ඉස්සෙලම අර ආඪ්‍ය අයියව සෙට් කළා.. බලපන් මට වඩා අවුරුදු එකොළහක් වැඩිමල් ඒ අයියා.. මට දැනෙන්නෙම තාත්තා ළඟ ඉන්නවා වගේ.. ඊටපස්සෙ අර පකයා.. සයෝන්.. ඊටපස්සෙ අභිරූ.. අනේ මේ.. මම ඔය එකෙක්ටවත් ආස නෑ.."

" දැන් උඹට කෙල්ලෙක්ද ඕන.. ඒක කියපන්.. උඹෙ සෙක්ශුවලිටි එකවත් හරියට කියන්නෙ නැනෙ.."

මහීශා කට ඉරක් කරගත්තා..

" මම ස්ට්‍රේට් බල්ලනේ!!"

" එහෙනම් ඉතින් කොල්ලො පේන්න බැරි..??"

" එහෙම නෙමේ මගේ ටයිප් එකට සෙට් වෙන එකෙක් නැනෙ.. අන්න අයුක අයියනම් මරු.. මිම්.."

සෙනුකයා බිම තිබ්බ රබර් බෝලෙකින් මහීශට ගැහුවම ඒක බම්ප් වෙලා ගිහින් ආශිගෙ මූණ මැද්දට වැදුනා.. ඒකි කළුපාට ෆේස් මාස්ක් එකක් දාගෙන මූණට රතුපාට ලයිට් එකක් අල්ලගෙන ඉන්නවා උඩබැලි අතට මැරිලා වගේ..

" මොන හු#තක්ද මූණට දාන්නෙ.. ආර්හ්!! මගේ මාස්ක් එක..!! සොරි අනේ නරක වචනත් කියවෙනවා මට.."

චමිරු ආශි දිහා බලලා නෝන්ඩියට හිනාවුණා.. ඒ පගා රෙක්සිකාගෙ නැට්ට ගොතලා.. මූ යකෝ.. කෙල්ලොන්ගෙ කොන්ඩ ගොතන්නත් දන්නවනෙ..

" මොකද තව්සෙ හිනාවෙන්නෙ.. කනපලා ගන්න ආසද.."

" මොන..?? පොල්පලාද.."

චමිරුවා ඇඳෙන් පල්ලෙහාට ඇදගෙන වැටුණා.. හනේ දෙයියනේ මගේ සිරියහන නේද මූන් ටික මේ විනාස කරන්නෙ.. බල්ලොයි කොල්ලොයි

@Shan

කෙල්ලොයි සේරම ඒක උඩ..

" අපි මෙහෙයුමක් දියත් කරමු එහෙනම් මහීශට පය ගහන්න අත්තක් හොයන වැඩේට.."

" අඩෝ අපේ ක්ලබ් එකේ ඉන්නවා ටෙනිස් ප්ලේ කරන පොරක්.. ඌ හැබැයි ලස්සනයි.. හිත හොඳ එකා.."

" මට එපා.. මගේ කුළුදුල් ආදරේ පුදන්නෙ හැමදාම ඉන්න එකාට විතරයි.. එතකල් මෙහෙම හොඳයි.. දැන් බලපන් උඹලා.. නෑනෙ උඹලා සැපේ ඉන්නවා මට තමයි මොකෙක් වත් නැත්තෙ.."

" මෙකිට පිස්සු බං.."

" එක්කො සයෝන් අයියත් හොඳ-සැක්.. එපා එපා මම උගෙ මූණට හැළිවඳුරා කිව්වා.."

" ආ යසයි.. අද ගිහින් එහෙනම් හැංගිලාවත් ඉඳපන්.. ගොං හරකා.."

" මාව දැක්කහම උඹලට පේන්නෙ මම ලෙස් වගේද බං.."

මමත් මගේ විනාස වුණු සිරියහනේ පැත්තකින් ඉඳගත්තා.. ඒකනම් බොන්නම ඕන ප්‍රශ්නයක්..

" උඹ කොල්ලෙක් වගේ අඳින නිසා එහෙම හිතෙනවා ඇති.."

" අනේ ලබ්බ තමා..!! මනුස්සයෙක්ගෙ ෆැශන් සෙන්ස් එකෙන් කියන්න පුළුවන්ද ඒක.. මට හරි කේන්ති බං මාව එහෙම ජජ් කරද්දි.. අනික දැන් බලපන්.. කීයක්නම් රැල්ලට ලෙස්බියන් වෙලාද කියලා.. මම නම් දන්න දන්න එකා එහෙමයි.. හැබැයි උන් ඇහුවම ෆීල් වෙනවා කියන්නෙ කොල්ලෙක්.. ලව් කරන්නෙ කෙල්ලෙක්ට.. මටනම් පේන්න බෑ ඔය මගුල්.. අනික මම දන්නවා මම මොකක්ටවත් බලාපොරොත්තු දුන්නෙ නෑ කියලා.. බලන් යද්දි දැන් ස්ට්‍රේට් කපල් ඇත්තම නෑනෙ.."

" හැම මගුලම රැල්ලට තමා මේ කාලෙ යන්නෙ.. එහෙම ලව් කල්ලා සතියෙන් දෙකෙන් බ්‍රේක් වෙනවා.. ආයෙ එකක් හොයාගන්නවා..

@Shan

නටන්න ඕන දහ අට වන්නමම නටනවා.. ඒකත් සෙට් වෙන්නෙ නෑ.. ආයෙ වෙන එකක් හොයාගන්නවා.."

" මම එහෙම ආස නෑ බං.. දන් බලපන් උඹලා ලව් කරන්නෙත් එකම ජෙන්ඩර් වල-"

" අනේ මේ මම නෑ හරිද.. අපේ මිනිහා කොල්ලෙක්.. මගෙ සූකිරියා..~"

" දෙන්නැතුව ඉඳහන් පොඩ්ඩක්.. උගෙන් අමුතු ලයින් තියනවනෙ.. හා නැද්ද.."

අපිට හිනාගියා.. සැක් කියාන් අයියා මේවා දන්නවනම් බිල්ඩිමේ උඩම තට්ටුවෙ ඉඳන් පහළට පනින්නෙ.. ආශි ඇස් දෙකේ තියාගෙන ඉදපු පිපිඤ්ඤ පෙති දෙක අයින් කල්ලා අපේ දිහා බැලුවා..

" ඔව් නේද හැබැයි.. අනේ මන්දා ඒයි.. ඉතින් කියන්නකො.."

" ඉතින් බලපන්.. උඹලා ලව් කරන උනුත් එහෙමද කියලා.. ආදරේ කියන්නෙ මචං තේරුම් ගන්න එකට.. එහෙම නැතුව සෙක්ස් කරන එක, සෙක්ස් චැට් කරන එක නෙමේ.. මම ආස නෑ බං බොරුකාරයොන්ට.."

ඒකි කියන කතාවෙත් ඇත්තක් තියනවා තමා..

" ආ උඹලට කියන්න බං.. මේ පහුගිය දවසක මම ෆේස්බුක් එකේ, මම කිව්වෙ ෆේක් එකේ හොඳේ, ඔය මීම්ස් වගයක් බල බල ඉද්දි මට හම්බුණානෙ කොළඹ ගේ කොල්ලො කියලා ගෲප් එකක්.. එකක් නෙමේ බං හෙන ගොඩක් තියනවා.. මම ඉතින් හිතුවෙ ඔය අරිතලා හුමිලා කරගෙන යන මොකක් හරි ප්‍රොජෙක්ට් එකක් වගේ දෙයක් කියලා.."

මූනම් පිස්සු යකෙක් තමා..

" ඉතින්.."

" ඒකට ගිහින් බැලුවහම තියෙන්නෙ රාජගිරිය අවට්න් බොටම් කෙනෙක් නැද්ද, පංචිකාවත්ත පැත්තෙන් අවුරුදු දහ අටේ මල්ලිලා නැද්ද, ගෲප් සෙක්ස් ඔකේද, ඉන්බොක්ස් එන්න.. අඳුනගමු.. සෙක්ස් චැට් ඕකේ නම්

@Shan

මැසේජ් එකක් දාන්න.. ඔන්න ඔහොම හු#තවල් වගයක්.. සැක් බං.. බයත් හිතුණා.."

සෙනුකයා ඒක කිව්ව විදියට මගේ ඇඟත් එක්ක හිරිවැටිලා ගියා.. ඒ මොන හිරිකිත වැඩක්ද..

" යකෝ!! සිරාවට.."

" බ්වැක්කා අනේ.. මගේ ඇඟත් වෙව්ලලා ගියා.. මගේ මද්දු මස්සිනයි පොඩි මස්සිනයි පුළුවන්ද ඔවගෙ කිට්ටුවෙන්වත් තියන්න.. ලව් කරන්නත් ඕන වැදගත්කමක් තියාගෙන.. මම ආසම කැරැක්ටර් දෙකක් තමා මස්සිනාලා දෙන්නා.. දෙයියනේ පෞකාරි හරි ආදරෙයි.."

" ඔය මගුල් නිසා තමා රඨ්‍ය අයියා බැනලා ෆේක් එකවුන් ටික සේරම ඩිලිට් කරපන් කිව්වෙ.. මට දවසක් ඔය ගැන කිව්වා.."

" හෙන අප්පිරියයි බං.. වයිෆ් නැතිවෙලාවට ගෙදරට එන්නත් කතාකල්ලා තිබ්බා.."

" ඇක්කා අනේ.."

" ඔන්න ඔහොම තමා අද කාලෙ ලව්.."

" තිරිසන්නු වගෙයි.."

චමිරු සෙනුකයට දෙකක් රැව්වා..

" උඹට එපා කිව්වා නේද ඔය ලබ්බවල් වල යන්න සෙනුක.."

" හරි බං ඉතින්.. මම නිකමට ලොග් වුණේ.."

" ආයෙ පලයන්කො බලන්න.. මම අයියට කියනවා.."

" බැනෙ මුං එක්ක කොරන්න..

සෙනුකයා චමිරුව බදාගෙන වෙලාගෙන උම්මා එකක් දෙන්න ගියාම චමිරු සෙනුකයගෙ මූණ මැද්දෙන්ම අල්ලලා මගේ ඇඟට තල්ලු කළා.. පස්සෙ උගේ හාද්ද මගේ මූණෙ වැදුණා.. මූටනම් අසහනේ හොඳටම..

@Shan

අයුක අයියගෙන් අහන්න ඕන ලංකාවට එන්න විදියක් ඇත්තෙම නැද්ද කියලා..

" අසහනේද හල්ලො.."

සෙනුකයා මගේ උකුළ උඩින් ඉඳගත්තා..

" කොහොමද මගෙ පෞකාරයෝ හරියටම කිව්වෙ.. මේ පෞකාරයට අසහනේ කියලා.."

මම සෙනුකයව අල්ලලා පැත්තකින් තිබ්බා.. මූ එක්ක හරියන්නෙම නෑ වගේ..

" මම යනවා ලෑස්තිවෙන්න.. උබලත් ඇඳගනින්.. දැන් හවස්වෙලානෙ.."

මම නැගිටලා ගිහින් ටවල් එක කරේ දාගත්තා.. මහීශා නැගිටලා එහා කාමරේට ගියාම ආශිත් නැගිටලා ඇඳ ගසලා හදලා ලෑස්තිවෙන්න ගියා.. මම සේරටම කලින් වොශෲම් එකට පැනගත්තා.. ආශිවත් ඉස්සෙල්ලා ගියොත් හෙට තමා පාටියට යන්න වෙන්නෙ.. මම බෙල්ල ගාවට වැවිලා තියන කොණ්ඩෙ උඩට වෙන්න ෆ්ලෆී බෑන්ඩ් එකක් දාගත්තා.. මගෙ කොන්ඩෙ ඉක්මනට වැවෙනවා.. මම ඉතින් බෙල්ල ගාවට කොණ්ඩෙ වවලා මූණ දෙපැත්තෙන් දිගට කෑලි දෙකක් හිටින්න වුල්ෆ් කට් එකක් කැපුවා.. කොහොමත් මම ආසාවෙන් හිටියෙ එහෙම් අකල්ලා බලන්න.. දැන් පොඩි ඇනිමි ලුක් එකක් ඇවිල්ලා තියෙනවා.. එහෙමත් හොඳයි..

" දොර ඇරපන් හල්ලෝ.."

ඒ අස්සෙ අසහනකාරී සෙනුකයා දොර කඩන්න හැදුවා..

" මොකද බං.."

මම දොර ඇරියහම සෙනුකයා ඇතුළට ඇවිල්ලා ශර්ට් එක ගලවලා කරකලා කරකලා ඒක කිළුටු ඇඳුම් තියන බාස්කට් එකට දැම්මා.. මේ ගෙදර කළුපාට ඇඳුම් ඇඳගෙන හිටියොත් විනාසයි.. කියාරා ඇතිල්ලිලාම බූල් හිටිනවා....

" උඹටනම් ලැජ්ජ නෑ පගා.. කියන්න තියෙන්නෙ අයුක අයියට.."

@Shan

" අනේ මේ.. රඩ්‍ය අයියට කියපන් ඌට කලින් මේ පෞකාරයා උඹව දැකලා තියනවා කියලා.. නහින්නැතුව සබන් කෑල්ල දීපන්.."

මම ඌ ඇඟ තෙමාගන්නකල් ඉඳලා සබන් කෑල්ල දීලා එහාට තල්ලු කල්ලා ශවර් එක යටට ගියා..

" අර අයාන්කාරයා එනවා අද.. පරිස්සමට ඉඳහන්.. දන්නවනෙ.."

" අනේ මන්දා බං.. ඌට එනිටයිම් නැගලද ඉන්නෙ.."

" වෙන්න ඇති.. කොල්ලෙක් පේන්න බෑනෙ යකෝ.."

" ලොකුමස්සිනා ඉන්නවනෙ.. අනේ මන්දා කියාන් අයියගෙ ලඟින්වත් තියන්න බෑ අයාන්ව.."

" හැබැයි ඌ මීටරේ හරිද.. නැත්නම් රුහුණට යන්නෙ නැනෙ.."

" ආශිට පේන්න බෑ ඕකව.."

සෙනුකයා මහා හයියෙන් හිනාවුණා.. ආශි දැක්ක තැන අයාන්ට රවනවා.. පුප්පනවා.. පුළුවන් නම් ගහනවත් එක්ක.. ඒ නැනයි මස්සිනයි නම් දෙයියොම බලාගන්න ඕන.. හොඳම වැඩේ ඌ දන්නවලු ආශි හැලකිඹුලා කියන්නෙ ඌට කියලා.. අයාන් මෙකිව අවුස්සන්න එක එක මගුල් කියනවා.. මෙකි උඩ පැන පැන බනිනවා.. කියාන් අයියට රණ්ඩු බේරලා ඉවරයක් නෑ..

" අපේ මිනිහා නිදාගෙන ඉවරද දන්නෙ නෑ.. සැක් ළහපාතක නැනෙ.. නත්නම් ගිහින්පවයක්වත් හලනවා සිංහවංශ ඇමතියා ගැන කියලා.. බලපන්කො.. මට උරුම වුණේ මස්සිනාවනෙ.."

මම ඇඟ හෝදගෙන ඉවරවෙලා ටවල් එක ඉණේ බැඳගත්තා..

" මේ ඔය දෙන්නා එන්නෙ නැද්ද අනේ.. අපිට වොශ් දාන්න ඕන.. එන්න ඉක්මනට.. බලන්න අනේ.. වෙලාවත් යනවා.. ඕකෙ ඇතුළෙ පිට්ටු තම්බනවද.. "

මම දොර ලාවට ඇරගෙන එළියට පැනගත්තහම ආශි එහාපැත්ත හැරුණා..

@Shan

" හැයියා මම මොකුත් දැක්කෙ නෑ.."

මම සුටුස් ගාලා කාමරේට පැනගත්තම ආශි බාත්‍රූම් එකේ දොර ගාවින් ඉඳගත්තා.. ඊටපස්සෙ මම ඇඳගෙන කියාගෙන ඉවරවෙලා රෙක්සිගෙ මූණ අතගෑවා.. පව් අනේ මම ඉතින් ආදරෙයිනෙ මගෙ ආඩම්බරකාර රෙක්සිකා කැල්ලට.. බොරුවටනෙ කතාබහ කරන්නැතුව ඉන්නෙ..

මම රෙක්සිගෙ මූණ ඉඹගෙන ඉඹගෙන ගියාම කියාරා ඇවිත් අණ්ඩක් උස්සලා මගේ උරහිස උඩින් තිබ්බා..

" ඔයාටත් ඕනෙද.. හනේ මගේ බෝල කියාරා.. මම ගිහින් එනකල් පරිස්සමින් ඉන්න ඕන හරිද.."

*බුහ්*

" හොඳ කෙල්ල.."

මම දෙන්නගෙම ඔලුව අතගාලා නැගිට්ටා.. ඊටපස්සෙ එයාලගෙ කෑම දෙකත් ඇස්ති කල්ලා තියලා තිබ්බා.. එයාලා වෙලාව ආවහම තමයි කන්නෙ.. පුරුදු කල්ලා තියන විදිය එහෙම වෙන්න ඇති.. ඒ ඇරෙන්න කියාරා කංකුං කනවා.. ඒකිට පේන්න බෑ.. කැරට් කනවා.. බ්‍රොකලි කනවා.. මම කන ඕන එකක් එයත් කනවා.. රෙක්සිට එහෙම බෑ.. වඩම්මලාම දෙන්න ඕන කෑම එක.. කාලා වතුරත් බීලා බිස්කටුත් කාලා තමා එයා යන්නෙ.. මහ රැජිණ කියලා හිතාගෙන ඉන්නෙ.. අයිතිකාරයා වගේ නැතෑ.. ඉඳපන් රෙක්සිකා උඹත් කවදහරි අඩවන්නෙ මේ ෂනෙරු තමා..

අපි ඉතින් ලෑස්තිවෙලා හොටෙල් එකටයද්දි හුඟක් අය පාටි එකට ඇවිත් හිටියා.. කියාන් අයියගෙ ඉස්කෝලෙ යාළුවො, යුනි එකේ යාලුවො.. එතකොට බිස්නස්මන්ලගෙ පුත්තු.. ඔය සේරම අස්සෙන් අයාන් කාරයා වයින් ග්ලාස් එකකුත් කරක කරක කුකුළ් හිනාවක් දාගෙන මට ඇහැක් ගැහුවා.. මම අයාන් කාරයට මූණ පිරෙන්නම හිනාවුණාම ඌ බයවෙලා නැගිටලා යන්න ගියා.. ආවා මෙතන ඇස් ගහන්න.. උගුල්ලලා දෙනවා මාලයක් හදලා බෙල්ලට දාගන්න..

" හැපිබර්ත්ඩේ අයියා.. ලව් යූ සෝ මච් අනේ.. ඔයාගෙ ආයුශත් මට දීලා දිගු කල් සතුටින්ම ඉන්න ඕන.. මීට ඔයාගෙ සකලබකල ගර්ල්ෆ්‍රෙන්ඩ් ආශි..

@Shan

නැමෙනවකො කිස් එකක් දෙන්න.."

කියාන් අයියා මනමාලයා වගේ අමුතු ලීලාවකින් ඇවිදගෙන ඇවිත් ආශිව අතේ එල්ලගත්තා විතරයි.. ඒකි ගම කැවා.. කියාන් අයියා ආශිගෙ කකුල පෑගුවා.. ආශි කියාන් අයියගෙ සපත්තුව මැද්දෙන් හීල් එක තියාගත්තා..

" නැමෙන්න අනේ.."

කියාන් අයියා අර හැමෝම මැද්දෙ හිනාවක් දාගෙන පොඩ්ඩක් නැමුණහම ආශි කියාන් අයියගෙ තොල් වලින් පෙක් එකක් තියලා තුරුල් වුණා.. කියාන් අයියත් ආශිව තුරුල් කරගත්තා... පැත්තක ඉඳපු කෙල්ලො වගයක් මූණට ගෙන ගැහුවා වගේ මූණ නාඵ කරගත්තා..

" හැපිබර්ත්ඩේ හොක්ක.. සාමෙන් සතුටෙන් ඉන්න ඕන හරි.."

" තැන්කිව තැන්කිව.. අඩෝ මට ලැජ්ජයි ඔයි මෙ සේරම මැද්දෙ කේක් කපන්න.. මොන ලබ්බකට මේවට මම ආවද මන්දා.."

" පුරුදු වෙයන් ඉතින්.. ඉස්සරහට කරන්න එපෑ.."

" ජස් මෙහ්.. ඔයාගෙ මූණේ ලිප්ස්ටික් ගෑවුණා ඒයි.. මම පිහිදාන්නද.."

කියාන් අයියා රතු වුණා..

" ආශූ!!.."

" ඇත්තනෙ ඒයි.. අන්න මගේ නැන්දම්මා ඉන්නවා.. කෝ ඒයි අපේ අම්මලා.."

" නැන්දම්මලා අම්මලා සේරම පව හලනවා.. දැන් මදිපාඩුවත් හරි.. ඔයාව එක්ක යන්නද.."

" මම.. මම තව ටිකකින් යන්නම් අනේ.. මම සෙනුකලා එක්ක ඉඳලා යනවා.. කෝ මගෙ හැලකිඹුලා.."

" අදත් තොපි දෙන්නා රණ්ඩුවුනොත් නම්.. අම්මපා මම දමලා ගහලා යනවා ගෙදර හරිද.."

@Shan

ආශි මූණ ඇදකරගත්තා..

" හිමින් බැනපන්කො මනුස්සයො.. තවසෙගෙ කයින් නැට්ටිච්චියො පරම්පරාව මැද්දෙම මාව ලැජ්ජ කරන්නද යන්නෙ.. හැබැයි මම කැගහනවා තවසෙ අතින් මම බඩවෙලා කියලා.."

කියාන් අයියගෙ ඇස් දෙක ලොකු වෙලා හුස්මත් හිරවෙන්න ආවා..

" අඩෝ ආශි.."

" මෙ එන්න ඔයාට නැන්දම්මව මුණ ගස්සන්න.. අර මිත්‍රයො කියන පකයො දෙන්නත් නෑ.. සුදූඅප්පච්චියාට පාළුයි දෙයියනේ.. මගේ පපුව පැලිලා යන්න එනවා.."

" ඇයි උඹ කන්ඵකද අයියෙ.."

" අනේ මෙ පොඩි ඇච්චො දෙන්නා පාඩුවෙ ඉදපන්.. සුදූඅම්මියා මට එවපු ශර්ට් එක අද ඇඳගෙනත් ආවෙ.. ආදරේ වැඩිකමට.."

මම මගේ අතේ තිබ්බ පේපර් බෑග් එක කියාන් අයියගෙ අතින් තිබ්බා.. සෙනුකයගෙනුයි මගෙනුයි අපේ ලොකු මස්සිනාට CK ජොක්කු වගයක් ඔඩර් කළා.. දවස් හතට පාට හතක්.. ඇඳලා ෆොටෝ එකක් දාන්න කිව්වනම් හරි..

" තැන්කිව් ෂනෙරු මල්ලි.. සෙනුක මල්ලි.."

කියාන් අයියලගෙ තාත්තා එතනට ආපු නිසා කියාන් අයියා අමුතු වේශයක් මවාගත්තා.. වෙන වෙලාවට කියන කුණුහර්ප ඇහුවනම් තාත්තා බඩවෙනවා..

" හායි තාත්ති.."

ආශිට ලකුණු දහයයි..

" හායි දුව.. යූ ලුක් සෝ ගෝර්ජස්.. සෝ ලව්ලි ටුගෙදර්.. ඇවිල්ලා හුඟක් වෙලාද.."

" නෑ තාත්ති.. දැන් වගේ ආවෙ.. නේද.."

@Shan

කියාන් අයියා ආශිගෙ ඉණ වටේ අතක් දාගත්තා..

" ඔව් තාත්තා.."

කියාන් අයියලගෙ තාත්තා හුඟක් වෙලා අපිත් එක්ක කතා කර කර ඉඳලා ගියාම අපි ඉඳගෙන හිටියා.. අභිරි අයියලා සයෝන් අයියලත් ඇවිල්ලා හිටිය නිසා හුඟ කාලෙකින් කට්ටියම එකතු වුණේ.. හුඟක් රෑ වෙනකල් පාටි එක තිබ්බා.. පුදුමයි අයාන්කාරයා මාත් එක්ක කතාකරන්න තියා දිහාවත් බැලුවෙ නෑ.. ඒකනිසා මමත් හිතේ හැටියට කාලා බීලා පිස්සු කෙළගෙන හිටියා.. රෑ දොළහට විතර වමිරු මාව ගෙදරින් ඩ්‍රොප් කළා.. සෙනුකව උගේ ගෙදරින් දාන්න ඕන කියලා..

මම ගේට්ටුව අරින සද්දෙටම රෙක්සිකා මහා හයියෙන් ලතෝනි තියන්න ගත්තා..

" මම මම හලෝ.. කෑගහන එක නවත්තගන්නවකො.. හැපෝ කටේ සද්දෙ.. සෑ.."

රෙක්සි මාව ඉව කල්ලා වටයක් කැරකිලා ආයෙම ගෙට ගියාම ඇත ඉඳලා දුවගෙන ආපු කියාරා මගේ ඇඟට පැන්නා.. මම බැලන්ස් නැතුව එහෙමම තණකොල ගොඩේ පතබෑවුණා.. ඕකනෙ බැරි කරන්න.. පස්සෙ බොහොම අමාරුවෙන් කියාරවත් එහාට කරගෙන ගෙදරට ගිහින් ලයිට්ස් ඔන් කරගත්තා..

" ඔයාලා කෑවද ළමයි.. හොඳයිනෙ.. මට මහන්සී හලෝ.."

*බුහ්*

" දැන් මම නාලා ඇවිල්ලා නිදාගෙන හෙට උදේ දුවන්න යන්නෙ.. දැන් කොහෙ දුවන්නද.."

*බුහ්*

" මට ඇහෙන්නෑ මොකුත්.. එහාට එහාට.."

*බුහ්* *බුහ්*

@Shan

" අර බලන්න රෙක්සි කොච්චර හොඳද එයා වද දෙන්නෙ නෑ.. දැන් නිදාගන්න ගිහින්.. නැත්නම් අර හඳට බුරපන්කො.. හයියෝ.. කියාරා!!!!!!!!!!!!!!!"

මම කාමරේට ගිහින් ශෝටකුත් අරගෙන බාත්‍රූම් එකට ගියාම කියාරා පුරුදු විදියටම දොර ගාවින් හිටගත්තා.. අඩුම තරමෙ මට එයාලා ඉන්නවනෙ.. මම ගෙදර එනක බලාගෙන.. මට ඒකට සතුටු හිතුණා..

තැන්කිව් අක්කෝ.. ඒක හරිම හරිම ලස්සනයි.. ආදරෙයි..❤❤

නරක සමනලයා අප්ඩේට් දෙනෝනේ ඉක්මනට මෙ දවස්වල.. ඒකතමයි හලෝ මටත් පුදුමයි.. මම හිතන්නෙ මගේ අතේ මැජික් එකක් වැඩකරනවා..

වාසනාවන්!!

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 151 කොටස

මම උදේ නැගිටලා මූණ සෝදගෙන ට්‍රැක් කිට් එක ඇඳගත්තා.. ඊටපස්සෙ කියාරගෙයි රෙක්සිගෙයි බෙල්ට් දෙක අරගෙන සාලෙට එද්දි කියාරා මගේ පස්සෙන්ම ඇවිදගෙන ආවා.. එයාගෙ කකුල් දෙකනම් ගෙවෙනවා දැන් මෙච්චර පස්සෙන්ම ඇවිල්ලා.. මම පටිය උඩට කල්ලා රෙක්සිට පෙන්නුවම එයා පාඩුවෙ මං ගාවට ඇවිත් ඉඳගත්තා.. මම දෙන්නගෙම කරට බෙල්ට් එක දැම්මා.. දිව්වොත් එහෙම මොන දෙයියට කියන්නද මම..

ඊයෙ රෙක්සි බෙහෙත් විදින්න ගිහින් මාත් එක්ක තරහා වෙලා ඉන්නෙ.. ආපු වෙලේ ඉඳලම කතාකරන්නෙ නෑ.. මාව දැක්කම නැගිටලා යනවා.. මගෙත් හිත චුට්ටක් රිදුණා.. දැන් නම් යාළුවෙලාද කොහෙද.. ඉතින් මගෙ හොඳටයැ බෙහෙත් විදින්නෙ.. එයාගෙ හොඳටනෙ.. ඒක තේරෙන්නෙ නැනෙ මේ යක්සනීට.. දත් ටික උල් කරගෙන බෙරිහන් දෙන්න විතරයි දන්නෙ..

" අපි යමු ළමයි.. අද අපිට නිවාඩුනෙ.. ගෙදරට වෙලා මොකද කරන්නෙ.."

*බුහ්*

" මොකක් හරි කරමු බං.. දැන් දුවලා එමු.."

මම ගෙදර වහගෙන ගිහින් ගේට්ටුවත් ඇරගෙන එළියට එද්දි ඉස්සරහ ගෙදර ආන්ටි බැල්කනි එකේ බෝගන්විලා පැල වලට වතුර දානවා.. ආන්ටි මාව දැකලා අත වැනුවා.. මේ ලේන් එකේ මනුස්සයො හිතාගෙන ඉන්නෙ මම ඇවිල්ලා මේ අනාදිමත් පොහොසත් කොල්ලෙක් ගෙදරින් අයින් වෙලා තනියම ඉන්න අරගෙන කියලා.. ඇයි මෙහෙට හැමතිස්සෙම වාහන එනවා.. හිටපුගමන් චමිරුවා බොඩිගාඩ්ලා හතරපහක් විතර පිරිවරාගෙන ඇවිත් තේ බීලා යනවා.. කියාන් අයියලා සෙනුකලා හැමෝම එනවා.. හෙන ලොකු බල්ලො දෙන්නෙක් ඉන්නවා.. තනි මටත් බී එම් ඩබ්ලිව් එකක් තියනවා.. මම කියන්නෙ ඒ ටික තියන හැමෝම පොහොසත් කියලා නෙමේ.. ඒත් මනුස්සයො මනින මිමි තියනවනෙ..

අපේ මාමගෙ දිව්හිමියෙන් තියාගෙන ඉඳපු වාහනේ.. අඩුමතරමෙ හීරෙන්නවත් දෙන්නෙ නෑ.. ළමයෙක් වගේ බලාගත්තෙ.. ඕකෙ යන

@Shan

හැමතිස්සෙම මට මතක් වෙනවා.. අන්තිමට මම පාරෙ ඇදේ යන්න හරි හෙන ඉලීගල් විදියට ලයිසන් එක හදාගත්තා..

මම මූණට වැටිලා දුවන පාරට ගැස්සෙන කොණ්ඩෙ අත් දෙකෙන්ම පිටිපස්සට කල්ලා හදාගෙන කලිසමේ සාක්කුව අස්සෙ දාගෙන ඉඳපු කියාරගෙයි රෙක්සිගෙයි බෙල්ට් දෙක අතේ පටලගත්තා.. මම මේක අල්ලගෙන ගියාට එයාලා දෙන්නා තමා මාව ඇදගෙන යන්නෙ.. ලබන සතියෙ මම කැම්පස් යනවා.. ගිය සතියෙ මැච් එකක් තිබුණා අපිට.. කොහොම හරි ඒකත් මම වින් කළා.. මම වින් කරනවා.. බැන්ක් එකට සල්ලි වැටෙනවා.. සරලයි.. ඒවුණාට මම සැලරි එකටම නෙමේ ප්ලේ කරන්නෙ.. ඒක මගේ හිතට ලොකු නිදහසක් ගේනවා.. සැලරි එකෙන් මම මගේ ජීවත් වෙන වියදම හොයාගන්නවා.. නැත්නම් ගෙදරටම බරක් වෙලා ජීවත් වෙන්න වෙනවනෙ.. එහෙම ඉන්න එක මට පොඩි කාලෙ ඉඳලම මහා මදිකමක් වගේ දැනුණෙ.. හැබැයි දැන් මට ආත්ම තෘප්තිය කියන දේ දැනෙනවා..

මම මූණට හම්බෙන හැමෝ එක්කම හිනාවුණා.. කව්ද කියලා මම දන්නෙ නැතිවුණත් මගේ හිනාවක් ඒ මනුස්සයගෙ දවසෙ කොයිම හරි කෑල්ලක් හොඳ කරයි කියලා මම හිතුවා.. අනික උදේ පාන්දර එහෙම රවන්න හොඳ නෑ.. හෙට නත්තල් නිසා අද හැමතැනම පාරවල් පාළුයි.. වාහන මොකුත් නෑ.. දන්නෙම නැතුව නත්තලත් ඇවිල්ලා.. මගේ නේබර්ස්ලා හුඟක් කැතලික් අය නිසා හෙට මට කේක් හම්බෙන්න තියනවා.. ඒ ඇරෙන්න ඒ ලේන් එකේ මනුස්සයො හරි සමහියි.. එහෙම තැනක ඉන්න ආස හිතෙනවා.. පෙරේදත් ආච්චි කෙනෙක්ගෙ බර්ත්ඩේ එක තිබිලා මම ක්ලබ් එකේ ඉඳලා ගෙදර ආවම මට පොඩි ස්වීට්ස් බාස්කට් එකක් හම්බුණා.. මම කවමදාවත් මෙහෙම මනුස්සයො හමුවෙලා තිබ්බෙ නෑ.. එයාලගෙ සමාජ පංතිය හරි වෙනස් නිසා හිතන පතන විදියත් වෙනස්.. මට නිතරම පරිස්සමින් ඉන්න කියනවා..

රධ්‍ය අයියා මාත් එක්ක කතානොකර ගෙවෙන හතවෙනි මාසෙ විතර.. හැමදාම කැලැන්ඩරේ දින කපන මට ඒක සෑහෙන්න දැනුණා.. එහෙමයි කියලා මම අඬන්නද.. හැමදාම අඬන්න බෑ.. මම මුලින්ම මට ආදරේ කරන්න පටන් ගන්න හිතුවා.. ආයෙ ජීවිතේ මුල ඉඳන්ම පටන්ගන්න.. හිතේ කොනක අතීතෙ තියනවා තමයි.. ඒත් මට උවමනා කැම්පස් යන්න කලින් අලුත් මාව එළියට ගන්න.. මම මුලින්ම මගෙන් ආදරේ කරන්න පටන් අරගෙන ඒක ඉස්සරහට ගෙනියනවා කියලා හිතුවා..

@Shan

රධ්‍ය අයියගෙ බර්ත්ඩේ එක පහුවුණා..

මම ඒකනිසා හිත හැදෙන්නත් එක්ක අපේ ඉන්ට්‍රැක් එකෙන් කැම්පේන් එකක් තියපු වැඩිහිටි නිවාසෙට ගියා.. මොකද මට හොඳටම උවමනාවක් තිබුණා මගේ බැන්ක් එකේ එකතුවෙලා තිබුණු සල්ලි වලින් කොටසක් ඩොනේට් කරන්න.. මට එහෙම මහා ලොකුවට නෑ තමයි.. ඒත් මට පුළුවන් තරමෙ දෙයක් දීලා හිත සතුටු කරගන්න ඕන වුණා..

එල්ඩර්ස් හවුස් එකේ සිස්ටර් හරිම හොඳයි.. මාත් එක්ක හුඟක් කතාකළා.. මම එවෙලෙ ඇහුවම එදා හමුවුණු සීයා ගැන, සිස්ටර් මගේ ඉස්සරහින් ගෙනැල්ලා තිබ්බෙ මරණ දැන්වීමක්..

සාමදානයේ සැතපේවා!!

මගේ හිත හුඟක් රිදුණා.. සීයා බලන්න මම එදායින් පස්සෙ ආවෙම නැහැ.. මම බලාපොරොත්තු වුණා සීයව හමුවෙලා ටිකක් වෙලා කතාකරන්න.. මොකද ඒ සීයා කතාකරන්න ප්‍රසන්න මනුස්සයෙක්.. ඉතින් අන්තිමේ මට වුණේ ඉටිපන්දම් දෙකතුනක් ගෙනිහින් චර්ච් එකේ පැත්තක තිබ්බ සෙමෙට්‍රි එකේ ලොකු කුරුසේ පහළින් ගහලා එන්න විතරයි.. ඒ දවස මට අද වගේ මතක් වෙනවා..

සීයා කිසිම සද්දයක් නැතුව පොළොව අස්සට වෙලා හිටියෙ එයාගෙ ආදරේම නෝනගෙ සොහොනට එහාපැත්තෙන්.. මම හිතින් මවාගත්තා එයාලා ආයෙම ඉපදිලානම් ඒ ආත්මෙදිත් ආදරේ කරයි කියලා.. එහෙනම් එයාලා තවම හමුවෙලා නැතුවත් ඇති.. සීයගෙ නම තිබුණු සිමෙන්ති කොත මම තුන් හතර පාරක්ම අතගෑවා.. ඒක සීතලම සීතලයි.. මැරිච්ච මිනිස්සු සියගානක් නිදාගෙන උන්නු තැන පණ ගැහුණේ මට විතරයි.. කොහොම වුණත් ඒ නිස්කලංක, මූසල පෙනුම මගේ හිතට පොඩි සැනසීමක් ගෙනාවා.. සීයගෙ මුද්ද තවම මගේ අතේ තියනවා.. අනිත් මුද්දත් එයා ගාව පරිස්සමට ඇති.. සීයයි සීයගෙ නෝනයි හුඟක් ආදරෙන් හිටියා වගේ.. අපිත් ඉස්සරහට එන කාලෙ එහෙම ඉන්න බලාපොරොත්තු වෙනවා.. ඒත් අපි දැන් හුඟක් මහන්සි වෙනවා.. මට හීන ගොඩක් තියනවා සීයෙ.. එයාටත් හුඟක් හීන තියනවා.. හැමහීනයක්ම හැබෑ වෙලා ආයෙ අපේ පාරවල් එකට හමුවුණාම සමහරවිට මේ මුදු දෙක දිගටම දාන්න අපිට බැරිවේවි.. කොහොම වුණත් ඒවා පරිස්සමට අපි ගාව තියනවා..

@Shan

මම ගෙනිච්ච ඉටිපන්දම් තුන පහළින් පත්තුකල්ලා ඒ දිහා බලාගෙන හිටියා.. සීයව දැකලා තිබුණේ එක වතාවක් වුණාට මට අද වගේ සීයගෙ හැම වචනයක්ම මතකයි.. සීයගෙ මූණෙ තිබුණු රැළි දහස් ගානකට අස්සෙන් පිදුණු නිහතමානිකමයි, කරුණාවන්ත පෙනුමයි මට හරි ලෙංගතුව දැනෙනවා.. මෙ වගේ තැනකට එන්න හේතුව මම මොකක්ද දන්නෙ නෑ.. ඒත් සීයා කිසිම දවසක ආයෙම දුකින් ඉන්න එකක් නෑ.. මම සීයට හුඟක් ආදරෙයි..

ඉටිපන්දම් දිය වෙලා ඉටි පහළට වැක්කෙරිලා ගියා.. කෙනෙක් අපිව දාලා ජීවිතෙන් ගියාම ඉටිපන්දම් පත්තු කරන්නෙ ඒ කෙනාගෙ මතකය තවමත් අපි ඇතුළෙ ජීවමානව තියනවා කියලා කියන්නලු.. ඒ මතකයන් දීප්තිමත් කියලා කියන්නලු.. ඉතින් සීයත් මගේ මතකෙ ජීවමානව ඉන්නවා වගේම ඒ මතකය හුඟක් දීප්තිමත් එකක් තමයි..

හැබැයි මම සීයව බලන්න එන්න පරක්කු වුණා.. මම හිතනවා සීයා මමත් එක්ක තරහ නෑ කියලා..

" හොඳ ළමයි දෙන්නා මෙතනම ඉන්න ඕන හරිද.."

*බුහ්*

මම බ්‍රවුන් බීන්ස් එක ඉස්සරහින් කියාරයි රෙක්සියි තියලා ඇතුළට ගිහින් කෝපි දෙකක් අරගෙන ආවා.. දෙකක් ගත්තෙ.. ඒක හැමදාම පාර අතුගාන ආච්චිඅම්මට.. මට අමුතු ලෙඩක් තියනවා කොයි ආච්චිඅම්මව දැක්කත් මගේ ආච්චිඅම්මව මතක් වෙන.. අනික ඒ ආච්චි මාව දන්නවා.. මම දුවන්න එන දවසට ගෙදර මොනවහරි වැඩිපුර තිබ්බොත් ගෙනැත් ආච්චිට දෙනවා.. මට එහෙම මනුස්සයෙක් එක්ක කතාකරන්න ලැජ්ජ හිතෙන්නෙ නෑ.. එතනින් බිම බලාගෙන ආවොත්නම් හිතට හරි අමාරුයි.. මම මේ හෙන පොරක් කියනවා නෙමෙයි.. ඒත් අපි මනුස්සකම නැතිකරන්න ඕන නෑ.. සෝශල් මීඩියා වල ප්‍රසිද්ධ වෙන්න මනුස්සයොන්ට මනුස්සකම පෙන්නන්න ඕන නෑ.. මම ආයෙම වටේ පාරෙන් දුවගෙන එනකොට ආච්චිඅම්මා අර ලොකු කරත්තෙ පැත්තකින් නතරකරලා බිම ගැටෙට ඉඳගෙන මොනවහරි කනවා.. මාව එනවා දැකලා ආච්චිඅම්මා හුඟක් දන්න කෙනෙක් වගේ මාත් එක්ක හිනාවුණා.. මමත් ආච්චිඅම්මා එක්ක හිනාවුණා..

" ආච්චිඅම්මා කාලා නෙමෙයිද ආවෙ.."

@Shan

ඒ ආච්චිට ප්‍රෙශර් තියනවා.. මාත් එක්ක කියලා තියනවා..

" නෑනෙ දරුවො.. අද වැඩට එන්න පරක්කු උනා පාන්දර ඇහැරුණේ නෑ.."

මම මගේ අතේ තිබ්බ කෝපි එක ආච්චිගෙ අතට දුන්නා.. ආච්චි ඒක පරිස්සමට අත් දෙකින්ම අල්ලගත්තා.. ආච්චිඅම්මා ඉන්නෙ බොරැල්ලෙ පොඩි කාමරයක් කුලියට අරගෙන.. මිනිබිරී එක්ක.. මිනිබිරී තාම ඉස්කෝලෙ යනවා.. මම අපේ ගෙදර තියෙන දේවල් ගෙනැත් දෙනවා කිව්වෙ.. හුහක්ම මගේ ගාව තියන පොත්පත් ආච්චිට ගෙනැත් දෙනවා.. ඒ නංගිට ගිහින් දෙන්න.. මේ කාලෙ හැටියට පොතක් සල්ලි දීලම ගන්න හෙන ගාණක් යනවනෙ..

" ආ.. හෙන නත්තල්නෙ ආච්චිඅම්මෙ.."

" අපිට මොන නත්තල්ද පුතේ.."

මම ආච්චි ගාවින් බිම ඇනතියාගත්තා.. අද වහින්නද මන්දා.. වටපිටේ හරි කළුවරයි.. මේ කාලෙට කොහොමත් වහිනවනෙ..

" එහෙම කියන්න එපා ආච්චිඅම්මෙ.. නංගිත් එක්ක පල්ලි ගිහින් එන්න.. හිතටත් හොඳයිනෙ.. නත්තල මහා විසාලෙන් සමරන්න ඕන නෑ.. අපි තියන හැටියකට එපැයි සමරන්න.."

" ඒකනම් ඇත්ත.. පල්ලි යනවා කියලා මම හිතාගෙන උන්නෙ.."

" ඒක හොඳයි.. ආච්චිඅම්මා ගාව සල්ලි තියද.. ඉන්නකො.. මේක ආච්චිට නෙමෙ නංගිට හරිද.."

මම වොලට් එකේ තිබ්බ පන්දාහෙ කොළයක් ආච්චිගෙ අතේ ගුලි කලා.. මං ගාව මට ඇතිවෙන්න තියනවනෙ..

" අනේ පුතේ.."

" මම කිව්වනෙ.. ආච්චිඅම්මට නෙමෙ නංගිට.. ගෙදර අඩුපාඩු ටික අරගන්න.."

" පුතාට හුහක් පින්.. ජේසු පිහිටයි දරුවෝ.."

@Shan

" ආච්චිටත් ජේසු පිහිටයි.. මම ගිහින් එන්නම් හොදේ.."

මම එකතැනක ඉන්න බැරි මගේ රෙක්සිවයි කියාරවයි අරගෙන ගෙදර ආවා.. මුන් දෙන්නා එක්ක දුවලා මටත් හොදටම හති.. මම ඇවිල්ලා ජැකට් එක පන්නලා පැත්තකින් තියලා මොනවහරි හදාගන්න බැලුවා.. අම්මවත් මතක් වෙනවා.. ළඟදි ගෙදර යන්න ඕන.. කොණ්ඩෙත් කපාගන්න ඕන.. අපේ අම්මා කෑගහනවා කැම්පස් යන්න කලින් කොණ්ඩෙ කපාගන්න කියලා.. සෙනුකයා මෙහේ නෑ දැන්.. ඌ පේරාදෙණියෙ ගියා.. අන්තිමෙ මගේකා කොහොමහරි පේරෙට ගියා.. ගැම්මක් තමා.. පිළිමතලාවෙ බෝඩිමක් අරගෙන නැවතිලා ඉන්නෙ.. මගේ පාපතර මිත්‍රයො එහෙමයි කියලා මාව දාලා යන්නෙ නෑ ඉතින්.. ආශිත් මාත් එක්කම කොළඹට සිලෙක්ට් වුණා.. මහීශා මොරටුවෙ මෙඩිකල් සිලෙක්ට් වුණේ.. සෙනුකයා දුරට ගිය නිසා පාළුවකුත් තියේ.. ඒත් ආශි ඉන්න නිසා ලොකු අවුලක් නෑ.. ඒ වුණාට ආශි කියන්නෙ වෙනම එකෙක්.. සෙනුක කියන්නෙ මගේ අනිත් බාගෙ වගේ එකා..

" ලෙට්ස් මේක් අ ස්මූති සූසී~~"

*බුහ්*

කියාරා කවුන්ටර් එක උඩට කකුල් දෙක තියලා මම උයන දිහා බලාගෙන හිටියා.. දෙන්ඩ තියෙන්නෙ මෙකිට.. අහුවෙන හැම මගුලම කනවට.. මම කෙසෙල් වගයක් කපලා, ගස්ලබු වගේකුත් කපලා ඒක බ්ලෙන්ඩර් එකට දාලා ඔරේන්ජ් ජූස් වගේකුත් ඒකටම දැම්මා.. ඊටපස්සෙ ස්විච් ඔන් කල්ලා තියලා සැන්ඩ්විච් වගයක් එළියෙන් තියාගෙන ඒක පෑන් එකට දාලා රත් කරගත්තා.. ඊටපස්සෙ බිත්තර දෙකක් බැදගත්තා.. කෑවා.. ඉවරයි.. ආශි ගෙනැල්ලා තියපු කේක් එකක් එහෙමම ෆ්‍රිජ් එකේ තියනවා.. මම තියන පෙරේතකමට ඒක කන්නෙ නැතුව තියාගෙන ඉන්නෙ.. හෙට රෑට කන්න.. සෙනුකයා නැතුව පාළුයි.. නැත්නම් ඌවත් කතාකරගෙන මූවි එකක්වත් බලන්න තිබ්බා.. කමක් නෑ ඉඩක් හම්බුණාම නුවර ගිහින් එනවා.. සෙනුකයගෙ බෝඩිමෙ නැවතිලා දවසක් විතර ඉදලා එන්න.. හෙට සමහරවිට චමිරු ඒවි මෙහේ.. ඌට එන්න වෙලාවක් කලාවක් නෑ.. එකසැරේ කඩාවදින්නෙ.. කොයි වෙලේ හරි ඔකා රෙක්සි ලව්වා හොඳ පාරක් හපාගන්නවා අම්මාපල්ලා.. ගොං හරකට කියලා තියනව කෝල් එකක් දීලා වරෙන් කියලා කියලා.. කොහෙද ඌට ඒවා මතක නෑ.. මගේ හොර අල්ලන්නලු එන්නෙ..

@Shan

ඔව් මම මේක අස්සෙ අවයව ජාවාරම් කරනවනෙ..

උදේ කෑම කාලා ගෙදර අස් කල්ලා කියාරලාටත් කන්න දීලා මම නාගත්තා.. නාගෙන එළියට එද්දි වහිනවා අම්මටසිරි වෙන්නම.. වටේම හොඳටම කළුවරයි.. අකුණු ගහද්දි කියාරා බයයි.. රෙක්සිත් මගේ කාමරේ ඇඳ අස්සෙ රිංගගෙන ඉන්නෙ.. මම ඉතින් එයාලට කාමරේ ඉන්න ඇරලා පොතකුත් අරගෙන ජනෙල් පඩියෙන් ඉඳගත්තා.. දැන් එතන කොට්ට වගේකුත් තියනවා.. ගිය මාසෙ මම ෆෙයරි ලයිට්ස් වගයක් ගෙනැල්ලා ගෙදර හැමතැනම එල්ලුවා.. සමහර දවස්වලට මට ගෙදර ඉන්න අමුතු බයක් හිතෙනවා.. ආශි කිව්වා ගෙදර කළුවරේ තියන්නෙ නැතුව ෆෙයරි ලයිට්ස් එල්ලන්න කියලා.. ඒවා කහපාටට පොඩියට ගෙදර තැනින් තැන තියනවා.. ජනෙල් පඩියෙ උඩ හරියෙනුත් මම එල්ලුවා.. දැන් ගෙදර ලයිට් ඕෆ් කළාට කමක් නෑ.. කහපාට පොඩි පොඩි ලයිට්ස් හැමතැනම පේන්න තියනවනෙ.. මම දැන් මේ ගෙදරට කැමතිම කැමතියි.. මම ආස විදියට හැමදේම තියනවා.. මගේ ජපන් රෝස පාත්තියෙත් මල් පිපිලා.. කුස්සියේ ජනේලෙ කිට්ටුවත් පැල හුහක් තියනවා..

"වණ අරණක කුඩා නිවස - ලෝරා ඉන්ගල්ස් වයිල්ඩර්"

නත්තල් කාලෙ වයිබ් එක හොඳටම ගේන පොතක් තමා මට හම්බුණේ.. මෙ ළඟ පුස්තකාලයක් තියනවා.. මම ඒකෙ මෙම්බර්ශිප් ගත්තා.. සතියට පොත් දෙකක් ගෙදර උස්සන් ඇවිත් කියවනවා.. මේ ටිකේ ක්ලබ් යනවා ඇරෙන්න වෙන වැඩක් මට නෑනෙ.. මම ලෝරා එක්ක මගේ පාළුව බෙදාගත්තා..

උඩ අට්ටාලෙ කෑම අඩුක් කරන තැන ඉඳලා ලෝරා මේපල් පැණි සීනි හිම උඩට වක්කල්ලා ඒවා කන තැන වෙනකල්.. අම්මගෙ ලොකු බොස්තරොක්ක ගවුම ඇඳගෙන බාල්නටන තැන වෙනකල්.. ආච්චිඅම්මගෙ ගෙදර ගිණි උදුනෙ රස්නෙ තැන වෙනකල් මම පැයගානක්ම හිටියෙ ඒ පොත ඇතුළෙ.. එළිය වහිනවාවත්, හයියෙන් අකුණු ගහනවාවත් මට දැනුණෙ නෑ.. මම හිටියෙ ලෝරා එක්ක.. පොත අස්සෙ.. මේ පොත් මම හුඟ කාලෙකට කලින් කියවපු පොත්.. හරියටම මම හතේ අටේ කාලෙ කියවපුවා.. මම ඒ කාලෙ මතක් කරගන්න ආයෙම කියවනවා.. මාව අවුරුදු ගණන් පස්සට ඇදිලා යනවා.. මම ඒ මතක අස්සෙයි අකුරු අස්සෙන් ගිලිලා ගොඩ ඒගන්න බැරුවයි හිටියේ..

@Shan

අන්තිමට පොත එහෙමම තියෙද්දි මට නින්ද ගියා ජනෙල් පඩිය උඩ.. ඒක පළල් නිසා නිදාගන්න වුණත් ඉඩ තියනවා.. නින්දෙන්ම මට දැනුණා කියාරයි රෙක්සියි ඇවිත් මගේ ගාවින් ගුලි වෙනවා.. එළියෙ සීතලයි.. ජනෙල් වීදුරුවෙ වදින පොද පල්ලෙහාට ගලාගෙන වැටෙද්දි මම හිටියෙ නින්දෙ.. ඒ නින්ද මාව දුර ඈතකට ඇදගෙන ගියා.. මම පොඩි කාලෙ ජීවිතේ නින්දෙදි දැක්කා.. පොත් කියන්නෙ මැජික් එකක්.. මම දැක්කා පොඩි කාලෙ මම ලයිබ්‍රියෙ ඉඳලා පන්තියට දුවගෙන යනවා.. හොරෙන් පීරියඩ් වල පොත් කියවනවා.. සෙනුක එක්ක ඒවා කිය කිය හිනාවෙනවා.. මට සෙනුක නැතුව පාළුයි.. අපි දෙන්නා මෙහෙම දුරින් ඉඳලම නෑ.. අවුරුදු ගාණකින්.. මාව එන්න එන්නම තනි වෙනවා.. මගේ වටේ ඉන්න අය මගෙන් ඈත් වෙනවා.. මට ඒක තදින්ම දැනුණා.. පීටර්පෑන් එකේ වින්ඩි වගේ මම ලොකු වෙන්න ආස කළත්..

නෑ..!! මම කැමති නෑ ලොකුවෙන්න..

මගේ හිත ඇතුළෙ ජීවත්වෙන පොඩි ළමයා ලොකු වෙන්න කැමති නෑ.. වැස්සයි අකුණු සද්දෙයි මගේ හිතේ කඩාගෙන හැලෙන්න තියන වැහිවළාවකට පණ දෙනවා.. මම ආයෙම ඇහැරුණේ ඇස් දෙකේ කඳුළු පුරෝගෙන.. කොණ්ඩෙ තිබ්බ බ්ලූ බෑන්ඩ් එක බිමට වැටිලා.. රෙක්සියි කියාරයි නිදි.. මම එහෙමම කොට්ටයක් පපුවට තුරුල් කරගෙන ජනේලෙ පැත්ත හැරුණා.. මට තනිකමක් දැනෙනවා.. මගේ වටේ ලොකු පාළුවක් කැරකෙනවා.. මම ඇත්තටම සතුටින් ඉන්න ජීවිතේ පැත්තකට කල්ලා තනි මාව වෙන් කරගත්තොත් මගේ ඇතුළෙ ඉන්න මනුස්සයා ඉන්නෙ බිඳිලා.. මට ආයෙම සතුටින් ඉන්න ඕන.. මම මගේ හිත ඉල්ලන සතුට කොහේද තිබ්බෙ..

" ආච්චි-අම්මෙ-හ්හ්.."

මම කොට්ටෙ අස්සෙ මූණ ඔබාගෙන ඇඩුවා.. හිතේ තිබ්බ වැහිවළාකුළ කඩන් වැටෙන්න අරගෙන.. මගේ ඇස් අග්ගිස්සෙන් පහළට රුට්ටගෙන වැටුණා.. මගේ පපුව හුහක් රිදෙනවා.. මම දරාගෙනම ඉන්න ඕනද.. තාම පටන්ගත්තා විතරනෙ.. මම ඉවසන්න ඕන තමයි..

" ඔයා අඬන්නෙ නෑ ෂනෙරු.."

මම තව ටිකක් කොට්ටෙ අස්සට තුරුල් වුණාම රෙක්සි ඔලුව උස්සලා මගේ දිහා බැලුවා.. මම අත දික් කළාම එයා කියාරගෙ ඇඟ උඩින්

@Shan

පැනගෙන මගේ ගාවින් ගුළි වුණා.. මම එයාගෙ ඔලුව අතගෑවා.. රෙක්සිටත් එයා නැතුව පාලුයිනෙ.. මටත් පාළුයි තමා.. අපි ඉක්මනට එයාට එන්න කියමු..

*බුහ්*

රෙක්සි අහස දිහා බලාගෙන බිරුවා.. දැන් මොකක් හරි බලන්න තියෙනවනම් හොඳයි.. එළියෙ කළුවරයි ගේ ඇතුළෙ තියන ෆෙයරි ලයිට්ස් ලස්සනට මැව් වුණා.. මම කාමරේට ගිහින් බ්ලැන්කට් එක උස්සන් ඇවිත් මට හම්බුණු ස්වීට්ස් බාස්කට් එකත් ළඟට අරගෙන ටීවී එක දාගත්තා.. සෙනුකයා බලන්නම කියලා වද දීපු ඩ්‍රාමා එකක් තියේ.. මම බලන්න හිතාගෙන හිටියෙ..

" වෙරි බ්ලොසම් ආෆ්ටර් වින්ටර් "

නරක සමනලී ආවෝ..~ මට බඩඩක් හම්බුණානෙ..

මෙන්න මෙහෙම කොණ්ඩයක් තියන

මෙන්න මේ වගේ වරදයෙක් ලස්සනයි කියලා හිතුණා.. අර ඉම්නෙ සක්කිලි චූටියා කියලා හිතමු..

මට පිස්සු හලෝ..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

@Shan

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 152 කොටස

" ස්ටොප් එම්බැරසින් මී ෂනෙරු!!.."

" Ah yeah

සෙන්යොරීනා

ඔයා එක්ක බිව්වෙ මාගරීටා

මං ගමේ හිටිය කාලේ පැද්දෙ හයර් එකට ආටා

අපෙ එහා ගෙදර නීටා ගේ ඩෝට තමයි රීටා

මෙ මාත් එක්ක පැනලා ගිහින් රැට නෑ පරාටා

සල්ලි තරහ වෙලා මටම තිබ්බා සැරට බූටා

ඉතින් බෝට්ටුවට සල්ලි ගෙව්වෙ උකස් කරලා ආටා

මහ මුහුද මැද්දෙ උයන් කෑවෙ කරවල බං කට්ටා

උඹ දන්නෙ නෑ මං කාපු කට්ට මගේ සෙන්යොරීනා~

උඹට ලැජ්ජ හිතුණද පුතේ.. මේ බොඩිගාඩ් අයියෙ.. කවද ඩැරන් අයියණ්ඩි නේ.. මගේ ගායන හැකියාව කොහොමද.. ඔයාට ආඩම්බරයක් හිතුණද.."

පිටිපස්ස සීට් එකේ ඉදපු ඩැරන් බයවෙලා වගේ චමිරු දිහා බලලා මගේ දිහා බලලා ආයෙම ෆෝන් එක දිහා බලාගත්තා.. මේ මිනිහා එක්ක කතාකරන්න හොද නෑ.. ඇහ තඩි බූරු පැටියා.. මම ආයෙම ඉස්සරහ හැරුණා..

" උඹට ආඩම්බරයක් හිතුණද.. වෙන බරක්වත් හැදුණෙ නැද්ද.. ඊය බං.. කිසි රහක් නැති මිනිස්සු උඹලා..

චාඕ මල්ලේහ්

@Shan

ගැම්මට ඉතාලි ආවා

චාඕ මල්ලේ

හංගන් ඉඳහිට ඇඩුවා

චාඕ මල්ලේ

අම්මව බලන්න යනවා

චාඕ මල්ලේ (Hey) "

" අම්මව නෙමේ දැන් කැම්පස් පලයන්.. ආයෙනම් උඹව ඩ්‍රොප් කරන්න මම එන්නෙ නෑ.. බලන් ඉඳපන්.."

චමිරු මට රවලා ඉස්සරහා බලාගෙන හිටියා.. මම සනුක අයියගෙ ගැම්ම අරගෙන එළියෙ ඉස්කෝලෙ යන පොඩි නංගි කෙනෙක්ට අත වැනුවා.. ඒ කෙල්ල මට රවලා අහක බලාගත්තා.. මුන් යකෝ..!! අපි පොඩිකාලෙනම් ඔහොම නෑ..

" ඔය කිව්වට උඹ ආවනෙ දවස් දෙකක්.. අඩෝ පිනට ට්‍රාන්ස්පෝට් එකක් දීපන්.. මගේ ඩීසල් ටිකත් ඉතුරුයි.."

" පයින් පලයන්.. ඉවරනෙ.."

" බෑ සමිරුකා~.."

චමිරු මාත් එක්ක තරහටම ඉස්සරහින් හිට වාහනේට හෝන් දෙක තුනක් ගහලා හැටට හැටේ තනි ඉරත් කපාගෙන ඉස්සර කල්ලා ගියා.. ඕක තමා මට ඇමති පුත්තු පේන්න බැරි.. මුන්ගෙ අප්පලගෙ දේපළ කියලා හිතාගෙන ඉන්නවද දන්නෑ.. මරු නීතීඥයා.. මූ ලෝ කොලේජ් යන එකටත් ණයයි බලන් යද්දි..

" ඔය කුණුහර්ප නම කියන එක නවත්තගනින්.. බූරුවා.."

" බූරුවො මෙඩිකල් කොලේජ් යන්නෙ නෑ පගෝ.. මම ඇවිල්ලා දැන් කැම්පස් එකේ තරුවක්.. ඩැරන් අයියෙ මම තරුවක් වගේ නේද.."

@Shan

"....."

" ඒකනෙ.. ඩැරන් අයියත් කියනවා මම තරුවක්ලු.. අඩෝ අඩෝ උඹට කියන්න මට අක්ක කෙනෙක් පෙම් හසුනක් දුන්නා බං.. රෝස පාටින් ලියලා දුන්නෙ.."

" කෝ ඒක.."

මට ඒ අස්සෙ සක්කිලි පරෙයි ජාතකෙත් මතක් වුණා.. සැක් ලියුමක් කිව්වත් හිනා යනවා.. මූත් දෙන්නෙ අමුතු ආතල් නෙ ඉස්කෝලෙ යද්දි..

" ආශි බංකුවක් පිහිදන්න ඉල්ලගත්තා.."

චමිරුට ලාවට හිනාවක් ගියා.. අපේ සෙනුකයා දැන් පේරෙ යනවා.. අම්මටසිරි මගේකා.. බලන්න ගිය දවසට උම්ම එකක් දීලා වටයක් කරකලා මහවැලි ගඟට විසික් කරන්න ඕන.. වැල් පාලමෙ ගියාද දන්නෑ.. ඌ වැලක් බලන්න ඇති.. අසහනේනෙ.. මට අයුක අයියා එවපු මල් කළඹක් හම්බුණා ගිය සතියෙ.. අපේ පොඩි මස්සිනා සෙනුකටයි, මටයි, ආශිටයි, මහීශාටයි මල් කළඹ ගානෙ එව්වා.. චමිරුට චොක්ලට් බොක්ස් එකක් එවලා තිබ්බා.. ඌ මල්ලිනෙ.. ඌට ඉතින් වැඩි සැලකිලි වෙන්න ඇති.. කමක් නෑ ඕකා ලංකාවට ආවහම චොක්ලට් ඉල්ලගන්න ඕන.. ඒ අස්සෙ සෙනුකයගෙ චොක්ලට් ඕඩරෙත් පෙන්ඩින්.. මම ලබන සතියෙ ඉතාලි යනවා.. මම ඒකෙ සතුටෙන් උද්දාමයට පත් වෙලා ඉන්නෙ..

" ඔන්න පලයන් පරිස්සමට.."

චමිරු කැම්පස් ගේට් එකට පාරෙන් මෙහාපැත්තෙ කාර් එක නතට කළාම මම මගේ බැක්පැක් එක කරේ දාගත්තා..

" අපි කැපුණා කොල්ලො.. ඩැරන් අයියෙ.. ටටා.."

මම වාහනෙන් බැස්සම චමිරුවා ඇරලා දාලා යන්න ගියා.. වටේ ඉන්න මිනිස්සුත් මගේ දිහා අමුතුවට බැලුවම මම ඒ එකෙක්වත් ගණන් ගන්නෙ නැතුව පාර පැනලා ඇතුළට ඇවිදගෙන ගියා.. අපි මේ මෙඩිකල් කොලේජ් ආවට, කියන මෙලෝ මගුලක් තාම තේරෙන්නෙ නෑ හරිද.. එනවා විතරයි.. මාවනම් කරකලා අතැරියා වගේ.. ප්‍රොෆාගෙ කඩ්ඩට බඩ බොකුත් ඇඹරිලා යනවා.. ඒ ඇක්සන්ට් එක මෙලෝ යකෙක්ට තේරෙන්නෙ නෑ.. තියා බැජ්

@Shan

එකේ හොඳටම වැඩ පුළුවන් එකාට වුණත් එහෙම තේරෙන්නෙ නෑ ඉතින්.. දුකයි තමයි.. මොනව කරන්නද.. දැන් අවුරුදු හයක් විතර බඩගාන්න එපැයි මෙකෙ.. ආධ්‍යා අයියවත් හිටියනම් මෙ මොකක්ද කියලා අහගන්න තිබ්බා..

පහුගිය සතියෙ රැග් එකට සෙට් වුණා..

රැග් එක ආතල් වැඩේ.. අපිට මහා විසාලෙට රැග් එකක් තිබ්බෙ නෑ හැබැයි.. මේකෙ ඉන්න උන් ඉන්නෙ හෙන ඩිප්‍රෙශන් මානසිකත්වෙන් කියලා බැලූ බැල්මට පේනවා.. මම එහෙම කිව්වට.. එහෙමම නෑ ඉතින්.. ජ්‍යේෂ්ට උත්තමයො උත්තමාවියො හරි හොඳයි.. හැබැයි උන්ට තියන වැඩ කන්දරාවට රැග් කරන්නවත් වෙලාවක් නෑ.. ඔය ලාවට පුටුවක් උඩ නග්ගලා සිංදුවක් කියන්න කියනවා.. නැත්නම් ඇක්ට් එකක් කරන්න.. ඔව්වා තමා.. අපි ඉතින් තාම අලුත් උන් නෙ.. හරියට චාටර් කරනවා.. පහුගිය කාලෙම උපසම්ප්‍රදායක් ගැන කියලා දුන්නා.. ඒක අහලා මගේ මොලේ කුරුවල් වුණා.. සෙනුකයට ඒවා කිව්වහම ඌ කියන්නෙ ඊට හාත්පසින්ම වෙනස් ඒවා වගයක්.. මහීශත් එහෙමයි.. කැම්පස් එකෙන් කැම්පස් එකට වෙනස් හරි මොකක් හරි ඇති.. මේකෙ තෙම්පරාදු වෙලා එද්දි ෂනෙරුටත් ඔව්වා තේරෙයිනෙ.. ආධ්‍යා අයියනම් කැම්පස් එකට පණ ඇරලා.. ඉස්සර ඒගොල්ලො කැට කරපුවා, කැම්පේන් කරපුවා, ක්ලිනිකල් යද්දි වෙන ආතල් වැඩ එහෙම මාත් එක්ක කියවනවා.. මට කැම්පස් එකට පය ගහද්දිම මතක් වෙන්නෙ ඒ කතා..

කැම්පස් එන්න අරගෙන දැනට සති තුනකට කිට්ටු වෙනවා..

මාත් එක්ක කැම්පස් එකට පලවෙනිම දවසෙ ආවෙ ලොකුඅම්මා.. අපේ අම්මට කොලඹ එන්න විදියක් තිබ්බෙ නෑ.. මීටින් එකට ලොකුඅම්මා ඇවිල්ලා එතන ෆෝම් පුරවන අරවා මෙවා වලට ඉඳලා යන්න ගියා.. එයා දැන් හොඳවෙගෙන එනවා.. ලොකු අම්මා කොහොමත් දුශ්ට හිතක් තියන මනුස්සයෙක්නෙ.. එයා හිතුවෙ මම තාත්තා වගේ කියලා.. දැන් ඒ අදහස වෙනස් වෙලා.. ලොකු අම්මා මෙ දවස්වල වැඩ කරන්නෙ රිජ්වේ එකේ.. සමහර විට ඉස්සරහට ක්ලිනිකල් වලට ගියාම එහෙම ලොකු අම්මව හම්බෙන්න පුළුවන්..

දැන් මගේ වැඩ කන්ද ඉහටත් උසයි.. ටූනමන්ට් වලට යන ඒවත් එක්ක ඇකඩමික් බැලන්ස් කරන එක හිතන තරම් ලේසි නෑ.. පටන්ගත්ත තැනම මම දවස් තුනකට ලංකාවෙ නෑ.. ලෙක්චර් මිස් කරගන්නත් බෑ.. අනික අපේ

@Shan

ප්‍රොෆාට හෙනට කේන්ති යනවා.. පළවෙනි අවුරුද්දෙ බැජ් එක නිසා අපිව මේකෙ ඉන්න කිසිම එකෙක් බෙට්ටක් තරම්වත් ගණන් ගන්නෙ නෑ.. ඒත් ආසයි අයියලා අක්කලා නිල් පාට කිට් ඇඳගෙන උදේ කැම්පස් එනවා.. ස්ටෙත් සාක්කුවල දාගෙන සුදු කෝට් ඇඳලා යනවා බලන්න.. මටත් එහෙම කෙනෙක් වෙන්න.. මම තව අඩියක් ඉස්සරහට තියලා තියෙනවා..

මම ලෙක්චර් හෝල් එකට ඇවිදගෙන යද්දි ආශි ඉන්නවා බංකුවක වාඩිවෙලා මම එනකල් බලාගෙන.. ඒකි මම එනකල් ඇතුළට යන්නෙ නෑ.. එළියෙන් වාඩිවෙලා ඉන්නවා.. කැම්පස් එකේ හැමෝම උන් මාව දන්නවා.. මොකද පහුගිය ටිකේම මං ගැන එහෙ මෙහෙ කතාවගයක් පැතිරිලා තිබ්බ නිසා.. සාමාන්‍යයෙන් මම කොළඹ ප්‍රසිද්ධයි.. විශේෂෙන්ම කැම්පස් එකේ අක්කලා නම් මාව දන්නවා.. ගිහින් සතියක් වෙන්න හම්බුණේ නෑ බැජ් එකේම කෙල්ලෙක්ගෙන් මට ලියුමක් හම්බුණා.. හැබැයි දුක කියන්නෙ..

ඒකිගෙ මද්දු මස්සිනාට පණ ඇරලා ලව් එකේ ඉන්න යාළුවෙක් මට හිටියා..

ආශි නපුරුයි ඔය වගේ මගුල් කතාකරගෙන එනකොට.. කැම්පස් එකේ හුඟක් අය හිතාගෙන ඉන්නෙ මගේ කැල්ල ආශි කියලා.. හැබැයි මේකි ඉන්ස්ටර්ග්‍රෑම් මොඩල් කෙනෙක් කියලා දන්න ඒකිව ෆලෝ කරන උන් නම් දන්නවා මේකිගෙ ඇත්ත මිනිහා කවුද කියලා.. ඇයි වෝල් එක පුරාම ඉන්නෙ කියාන් අයියනෙ.. ආශියි මමයි බැජ් එකේ වෙනම ඉන්නවදෝ කියලා සමහරවෙලාවට මට හිතෙනවා.. මොකද මේකෙ උන් හිතාගෙන ඉන්නෙ අපේ හෙන ලොකුකම කියලා..ඇත්තට ආඩ්‍රේ කරලා නැනෙ ඉතින්.. දැනටම මට මොණරා කියලා කාඩ් එකක් හැදිලා ඉවරයි.. අපිව අඩ්‍රේ කරන එවුන් නම් දන්නවා අපි කවුද කියලා.. ඒ කියන්නෙ වටේ පිටේ ඉස්කෝලවල ක්ලාස් ගියපු දෙතුන් දෙනෙක්.. පහුවෙද්දි ඉතින් බැජ් එක ෆිට් වේවි.. තාම පටන්ගත්තා විතරනෙ..

අපේ බැජ් එකේ ඔක්කොම දෙසීයයි.. ඒකෙනුත් හෙන ලොට් එකක් අයියලා අක්කලා තමා ඉන්නෙ.. සෙකන්ඩ් ශයි තර්ඩ් ශයි කරපු අය.. ෆස්ට් ශයි එකෙන්ම ආපු අය හිටියෙ පනහක් වගේ.. පනහක් හෝ හැටක්.. ඔය වගේ ගාණක්.. මේක ඇවිල්ලා ඉස්කෝලෙ වගේ නෙමේ.. අපි කොළඹින් ආපු උන් වුණාට හොරොව්පතානෙ, කහටගස්දිගිලියෙ, හම්බන්තොට, අම්පාර ඔහොම එක එක පැතිවලින් ආපු උන්ගෙ කලවමක්.. ඒ අස්සෙ දෙමළ, මුස්ලිම්, ලන්සි කෙල්ලො කොල්ලොත් ඉන්නවා.. හරිම

@Shan

විවිධාංගීකරණය වෙච්ච බැජ් එකක්.. අයියලා එහෙම අනිත් උන් කතාකරන විදිය ඉමිටේට් කල්ලා හිනාවෙනවා.. හිත රිදෙන්න නෙමෙ.. විහිළුවට.. මමත් ඒ ගොඩට හැඩගැහෙන ගමන් හිටියා..

උදේ ලෙක්චර් එක පැය තුනයි.. ඒක ඉවරවෙලා ආශියි මමයි කැන්ටිමට ගියා.. ආශි දැන් කොණ්ඩෙ එහෙම කළු කල්ලා සංවරව ඉන්නෙ.. තොරොම්බලේ වගේ මෙකට එන්න බෑනෙ.. මෙකෙන් එළියට ගිය ගමන් ඉතින් හැව අරිනවා.. ඒක වෙනම කතාවක්.. අපි කැන්ටිමට වෙලා කියෝ කියෝ හිටියා.. කැම්පස් එක හෙන පරණ පාටයි.. හැබැයි මෙකෙන් ඉතින් ලංකාවට ඩොක්ටර්ස්ලා කීයක් බිහි වෙලා ඇත්ද.. ඒක ගැන හිතද්දිත් පුදුම හිතෙනවා.. මම සමහර වෙලාවට ක්ලොක් ටවර් එකත් එක්ක තියන සුදු ලොකු බිල්ඩිම දිහා බලාගෙන ඔච්චා කල්පනා කරනවා..

" අහපන්කො උඹ හෙට එනව නේද අපේ ගෙදර.."

ආශි රොටියක් අරගෙන ඒක කඩ කඩ පිඟානට දැම්මා..

" ඕ.. උඹලගෙ අම්මා එන්න කිව්වනෙ.."

" එන්න හොදේ.. මහීශාත් ඒවි.. අනේ හලෝ මට සෙනුකමල නැතුව හරි පාළුයි වගේ.. අපි යමුකො බලලා එන්න.. මූ අලුත් යාළුවො හොයාගෙනද දන්නෑ.."

මහපගාට එච්ච කොහෙද ඝනෙරු ඉන්නකල්..

" පිස්සු හැදෙයි.. සෙනුකයා මැරුම් කන්න තමා මගෙන්.."

" ඔච් මරන්න නෙමෙ වටින්නෙ.. බෙල්ල කපන්න.. මහවැලියට දාමු අනේ.."

" දාමු දාමු.."

" ආ මොණරා.. අඩෝ උඹලා තනියම රොටී කන්නෙ.. තිරිසන්නු වගේ හරිද.."

අපිට සීනියර් බැජ් එකක අයියා කෙනෙක් තඩි ගයනොකොලොජි පොත් වගයක් උස්සන් ඒ පැත්තෙන් යනගමන් මගේ ඔලුවට ගහගෙන ගියා..

@Shan

මුගෙ ආවට්ට.. ගොබිලයා.. උගේ කාඩ් එක තමා ගොබිලයා.. එහෙම කියන්න හේතුවනම් අපි දන්නෙ නෑ.. හැබැයි ගැලපෙන නම.. ඒ එක්කම බැජ් එකේ ලියුම් මහත්මිය ඇවිත් අපේ බංකුවෙන් ඉදගත්තා.. ආශිගෙ මූණ හට්ටියක් වගේ වුණා.. ලියුම් මහත්මිය කිව්වෙ මට ලියුම දුන්න කෙල්ල..

" හේයි ෂනෙරු.. ආරංචි ලබන සතියෙ ටූනමන්ට් එකක්ලු නේද.."

" ම්ම්.."

" ඔහ් ෂනෙරු.. ඩාර්ලින් අනේ දාඩියයි අප්පා.."

ආශි බොරුවට නැති දාඩියක් මවාගෙන පවන් ගගහා මගේ ඇඟට ඇලුණම පියුම් මහත්මිය ආශි දිහා මහ අප්‍රසන්න බැල්මක් හෙලුවා..

" වට්..??ඩාර්ලින්..??"

" යෙප්.. එනි ප්‍රොබ්ස්.."

" අම්.. නෝ.. එනිවේ.. විශ් යූ ඔල් ද බෙස්ට් ෂනෙරු.. අම් ගොන ගෝ.."

අර සකබඹරෙ වටෙන් ඇවිත් මට හග් එකක් දෙන්න ගියා විතරයි ආශි මගේ බෙල්ලෙ එල්ලලා තිබ්බ අයි ඩී එකෙන්ම ඇදලා එහාට ගත්තා.. අර කෙල්ල තා ඩිංගෙන් එතනම ඇදගෙන වැටෙනවා.. වැටුණනම් තමා.. පලපු සායෙ තව පැල්මක් හිටින්නෙ..

" තැන්ක් යූ සිතුමි.."

පියුම් මහත්මිය ආශිට හැටට හැටේ රවාගෙන එතනින් යන්න ගියා.. මෙ ගෑණිට නම් මොකක් හරි කරන්න වෙයි.. සිතුනි කියන්නෙ හෙන පොශ් කෑල්ලක් කොළඹ පහේ ඉන්න.. තාත්තා හොටෙල් එකක අයිතිකාරයෙක්.. ඉතින් මට පුපදා.. ගිය සතියෙ ඒ ගෑණිගෙ පම්පෝරිය කියන්න ගිහිල්ලා අක්කා කෙනෙක් හැමෝම මැද්දෙ වස වාටර් කළා.. කැම්පස් එකේ එහෙම ප්‍රසිද්ධියෙ පම්පෝරි ගහන්නෙ නෑ කවුරුත්.. මොකද හැම පංතියෙම අය මෙකෙ ඉන්නවනෙ.. ඒ ගෑණි මොක කළත් වාටර් වෙලා නවතින්නෙ පොශ් වෙන්න ප්‍රිටෙන්ඩ් වෙන නිසා.. මට පේන්න බෑ.. ඒත් කරන්න දෙයක් නැතිකමට හිනාවෙලා ඉන්නවා.. කොහොමත් ආශි ඉන්නකල් මම හිතන්නෙ නෑ කෙල්ලෙක් හතර මායිමකවත් පස් පාගන්න එයි කියලා..

@Shan

" නෙද්දකින් පිස්සු හෝන්තුව.. මට පේන්න බෑ අනේ.."

" පිස්සු හු#තක් තමා..බලපන්කො යන හැටි.."

මම ඇත යන සිතුමිට හිතින් දෙස් දෙවොල් තිබ්බා..

" අද හවස කියාන් අයියලගෙ පේරන්ට්ස්ලා අපේ ගෙදර එනවා ඒයි.. අර හැළකිඹුලත් එයි.. සැක් නේද.."

" අඩෝ ඒ කියන්නෙ.. සිරාවට උඹලා දෙන්නා ඉන්නද යන්නෙ.."

ආශි ලැජ්ජාවෙන් ඇඹරිලා කොණ්ඩ කැල්ලක් අතේ පටලගත්තා.. ආශිගෙ අම්මලා තාත්තලා හෙන ඕපන් මයින්ඩඩ් මිනිස්සු.. සාම්ප්‍රදායිකම නෑ.. කියාන් අයියලගෙත් එහෙමයි.. මට කියාන් අයියා පහුගිය දවසක කිව්වා ගෙදර අයගෙ අයිඩියා එකක් තියෙලු උන් දෙන්නව ලිව්න් ටුගෙදර් තියන්න.. කියාන් අයියා අවුරුදු විසි හතරෙන් කම්පනි එක භාරගන්නයි ඉන්නෙ.. ෆිෆ්ටි ෆිෆ්ටි ශෙයාර්ස් එන විදියට.. අනික අයාන්ගෙ කොටස.. ඉතින් කියාන් අයියා එන්ගේජ් වෙව් හුහක් වෙලාවට කම්පනි එක භාරගන්න කලින්.. එහෙම තමයි කිව්වෙ.. පස්සෙ වෙඩින් එකක් ගන්නවා කිව්වා ආශිගෙ ස්ටඩීස් ඉවරවෙලා.. උන් දෙන්නා ගැන නම් අහන්නත් ආසයි..

" දන්නෑ අනේ.. බලමුකො ඉතින්.."

" අමෝ අමෝ.. කියාන් අයියට ගිය කලක්.."

ආශි රොටී කැල්ලක් කටේ ඔබාගත්තා.. මමත් ඒකෙන්ම අරගෙන රොටිය කන්නෙ නැතුව ඒක දිහාබලාගෙන හිටියා.. මෙක ඉතින් කෑවට මෙලෝ රහක් නෑනෙ.. ගෙදර ගිහින් හදාගෙන මොනවහරි කන්න තියනවනම්.. මගේ කෑමවල අගේ දැන් තමා තේරෙන්නෙ.. කියාරයි රෙක්සියි මොනවා කරනවද දන්නෙ නෑ..

මම රොටී කැල්ල කටේ ඔබාගෙන ඈත බෙන්ච් එකක කණ්ණාඩි දාගෙන පොතක් කියවන අයිය කෙනෙක් දිහා බලාගෙන හිටියා..එකසැරේම ආධ්‍ය අයියව මතක් වුණා.. එයා හොඳින් ඇති කියලා මම හිතනවා.. අනිවාරෙන් හොඳින් ඉන්න ඕන.. එයා නැති අඩුව මට සෑහෙන්න දැනෙනවා..

@Shan

ඉඳලා හිටලා මතක් වෙන පොඩි පොඩි දේවල් වලට මගේ හිත රිදුණා.. ඒත් මම ඉවසගත්තා.. තවම පටන් ගත්තා විතරයි.. ලබන සතියෙන් පස්සෙ මගේ ජීවිතේ වෙනස් වෙනවා.. බොහෝ දුරට ශ්‍රී ලන්කා බැඩ්මින්ටන් ඇසෝසියේශන් එකෙන් මට ලියුමක් ඒවි..

එතනින් පස්සෙ හුගක් දේවල් වෙනස් වේවි කියලා මම හිතනවා..

නරක සමනලයගෙන් ඩබල් අප්ඩේටුවා............ක්!!!

හෙහේ වාඕ මල්ලේ.. ගැම්මට ඉතාලි ආවා..

ඕගොල්ලොත් සනෙරුගෙන් ඉල්ලගන්න හලෝ චොක්ලට්..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 153 කොටස

වෙලාව රෑ එකොළහමාරයි.. මම හිටියෙ මගෙ ජනෙල් පඩිය උඩ.. ගෙදර සේරම ලයිට්ස් ඕෆ් කළාම පොඩි පොඩි ලයිට්ස් පත්තුවෙනවා.. ඒවගෙන් ලස්සන එළියක් සාලෙට වැටෙනවා.. රෙක්සියි කියාරයි නිදි.. මම පාඩම් කරපු පොත් ටික එහෙමම සෝෆා එකේ දිග ඇරලා.. අද පාඩම් කරන්න හිතක් නෑ..

මම හිටියෙ කල්පනා කරන ගමන්.. උදේ ආශිගෙ අම්මව හම්බෙන්න මම ගියා..

මම හිතුවෙ ආන්ටි කතාකළේ යාළුවො මුණගැහෙන්න කියලා වුණත් ඇත්තටම ගියාම කිව්ව කතාව මට තාම හිතාගන්න බෑ.. මම ඒක ගැන හුඟක් කල්පනා කළා.. මම ජීවිතේට මූණ දෙනවා තමයි.. ඒත් එකසැරේට හැමදේම දරාගන්න..?? එච්චර හයියක් මං ගාව නෑ.. දැනට ගෙවෙන ජීවිතෙත් ගෙවාගන්නෙ.. වෙන කරන්නම දෙයක් නැතිකමට මිසක්..

අනේ මන්දා..

උදේ මම ආශිලාගෙ ගෙදර ගියාම ආශිගෙ අම්මා මාත් එක්ක හුඟක් වෙලා කතාකලා.. ඒ ආන්ටි හරි හොඳයි.. ආශි වගේම තමයි ගතිගුණ.. මම ඉතින් පොඩිකාලෙ ඉඳලම ආන්ටිව දන්නවනෙ.. අපේ අම්මත් එහෙමයි.. එයාලා හරිම එකතුයි..

ආන්ටි මගෙන් ඇහුවා අම්මා ආයෙම මැරේජ් එකක් ගැන හිතුවොත් නරකද කියලා.. මම එකසැරේට අහපු දෙයින් උත්තර නැතුව ඔහේ බලාගෙන හිටියා.. එක සැරේට මගේ ඔලුවට අකුණක් ගැහුවා වගේ.. මම කිසි දවසක එහෙම දෙයක් ගැන හිතුවෙ නෑනෙ..

ඇත්තටම සෙනුකලගෙ අම්මලා, ආශිලගෙ අම්මලා කලින් වතාවෙ ගමේ ගිහිල්ලා තියෙන්නෙ ඒකට.. අපේ අම්මට මැරේජ් ප්‍රපෝසල් එකක් අරගෙන.. ආන්ටි කියනකල් මම ඔය වගක් දැනගෙන හිටියෙවත් නෑ.. මාව දැන්මම පවුලෙන් අයින් කල්ලා වගේ.. මෙ කිසිම කෙනෙක් එයාලා කරන කිසිම දෙයක් මට කියන්නෙ නෑ.. මගේ අම්මවත්..

@Shan

මගේ පපුවට මහා විසාල බරක් දැනුණා.. අම්මට තිබුණා මට කියන්න.. මම අම්මගෙ පුතා නෙමෙයිද.. ඇයි මට නොකිව්වෙ.. ඔක වෙලා කොච්චර කාලයක්ද.. ඊටපස්සෙ මම ගමෙත් ගියා තනියම.. අම්මත් මෙහෙ ආවා.. අම්මා කිව්වනම් මම තරහ වෙනවද.. අම්මා මාව ඇත් කල්ලා..

අපි අතරෙ තිබුණ හිඩැස තව දෙදරුම් කාලා..

එක අතකට.. අම්මා මට කරන්න පුළුවන් තරම කළා තමයි.. ඒත් මමත් ආසයිනෙ අනිත් පුතාලට වගේ, අම්මයි මමයි ඉස්සර වගේ අම්මා හැමදේම මාත් එක්ක කියනවනම්.. ඒත් දැන් එහෙම නෑ වගේ.. අම්මත් මගෙන් දුරස් වෙන්න හදනවා.. අම්මා මට ඒක නොකිව්වෙ මොන හේතුවකටද මම දන්නෙ නෑ.. මට කෑගහලා අඩන්න තරමට දුකයි..

දරාගන්න බැරිම හිතේ දුකට, හිතේ තිබ්බ ගල් 'කරපු' හැඟීම් වලින් අංශු මාත්‍රයක් මගේ ඇස් අගිස්සෙන් කිසිම පාටක් නැතුව ඔහේ කම්මුල දිගේ පල්ලම් බැහැලා ගියා.. අවසානේ මම තනිවෙලා කියන බය හිතෙන, අඳුරු, කළුවර හැඟීම මාව වගහන්නකොට මම ඒ හැඟීමෙ හිතාමතාම ගිලුණා.. හැඟීම් වලට පාට නෑ කියන්නෙ කොහොමද.. තියනවා.. මට මේ දැනෙන හැඟීම කළුවරයි.. මම ප්‍රපාතෙක තනිවෙලා වගේ.. එකපැත්තකින් දෙයක් ලැබෙනකොට ඒ සතුට මැකෙන්න තව පැත්තකින් දෙයක් මට මගෑරුණා..

අම්මා ඒ අංකල් එක්ක කතාකරන්න අරගෙන දැන් ටික කාලයක්ලු.. ආශිලාගෙ අම්මලා හොඳට හොයලා බලලා තමයි ප්‍රපෝසල් එක ගෙනැත් තියෙන්නෙ.. ඒ අංකල් ලබන මාසෙ ලංකාවට එනවා.. දැනට ඉන්නෙ මෙහේ නෙමෙයි.. දැන් අවුරුදු දෙකකට කලින් එයාට ග්‍රීන් කාඩ් ලොටරි එකක් ඇදිලා ඇමරිකා වල පදිංචි වෙලා ඉන්නෙ එයාගෙ එකම පුතා එක්ක.. කිව්ව විදියටනම් හොඳ මනුස්සයෙක් වගේ..කම්පනි මැනේජර් කෙනෙක්.. පුතත් මැරිඩ් කිව්වා.. දැන් වයිෆ් එක්ක එහේම කැලිෆෝනියාවල පදිංචිවෙලා ඉන්නවලු.. එයා මියුසික් ප්‍රොඩියුසර් කෙනෙක්.. ඉතින් ඒ ෆැමලි එක ලබන මාසෙ ලංකාවට එනවා අම්මව බලන්න.. ඔක්කොම අත ළඟට ඇවිල්ලා තමා.. අම්මගෙ පුතා ඒක දැනගත්තෙ..

ඒකට කමක් නෑ..

අම්මට සතුටු ඇති.. අම්මා අවුරුදු දහනමයක් කිසිම රැකවරණයක් නැතුව හිටියනෙ.. දැන් ආයෙ එහෙම වෙන එකක් නෑ.. ඒ අංකල් හොඳ කෙනෙක් වෙන්න ඔන.. ආන්ටි කිව්ව විදියටනම්.. එහෙම වුණොත් අපේ අම්මා

@Shan

ඉක්මනට මැරි කරාවි.. අම්මගෙ සතුට හොයාගෙන අම්මා යන්න ඕන.. මං වෙනුවෙන් බලන් ඉන්න බෑනෙ.. මමත් මේ හැමදේම තේරුම් ගන්න ඕන බොරුවට අඩන්නෙ නැතුව.. මම දන්නෙත් අඩන්න විතරයි.. කිසිදෙයක් දන්නෙ නෑ.. මගෙන් වැඩක් නෑ.. පවුල ඇතුලෙ මම හැමදාම කොන් වුණා.. මගේ ආච්චිඅම්මා මට ඉන්නවනෙ.. ඒ හොඳටම ඇති.. ඒ ඕනවටත් වඩා වැඩියි.. ආච්චිගෙ හිතේ පිරෙන්නම මං ගැන ආදරේ තියේ..

මමත් මාමා වගේදෝ මට හිතෙනවා.. මාමත් එහෙමයි.. පවුලෙන් ඈත් වෙන්නම ට්‍රයි කළා හැමදාම.. මම නිසා ඒත් පවුලට බැඳිලා හිටියා.. අපේ අම්මා ඉන්නෙ මාමා එක්ක තරහින්.. ආච්චිඅම්මා අම්මලාට කියලා තියෙන්නෙ මාමා කෙල්ලෙක් එක්ක රට ගියා කියලනෙ.. ඒක අම්මලාට නොකිව්වා කියලා අම්මලා ඉන්නෙ තරහින්.. එක අතකට එහෙම වෙච්ච එක හොඳයි.. හැමදේම වෙන්නෙ හොඳට කියලා හිත හදාගන්න පුළුවන්..

මම මූණෙ තිබ්බ කඳුළු අත් දෙකින්ම පිහිදගත්තා.. රෑ අහසෙ තරු එක දෙකක් පායලා තියනවා.. එහා ගෙදර මිදුලෙ නුග ගහ අස්සෙන් මට ලස්සන හඳක් පේනවා.. අදනම් සම්පූර්ණෙන් හඳ පායලා.. හඳ ලස්සනයි සම්පූර්ණෙන් පෑව්වම.. මට හිතෙන්නෙ එහෙමයි.. ඒත් මම ආස ඉතුරු කළුවර ටිකට.. හැමෝගෙන හිත නිවෙන්නෙ හඳ දිහා බලාගෙන ඉද්දි නම් මගේ හිත නිවෙන්නෙ කළුවර දිහා බලාගෙන ඉන්නකොට.. මට මේ දවස්වල රධ්‍ය අයියව සෑහෙන්න මතක් වෙනවා..

එයා ඉන්න ඕනම දවස් මඟ ඇරිලා යනවා.. ආයෙ කොයි ලෝකෙ ඉඳලා හරි එනවා කියලා මම දැනගෙන හිටියත්.. තව කොච්චර කාළයක්ද.. කොයි තරම් රෑ දවස් මම ගෙවන්න ඕනද.. රෑට නින්ද යන්නෙ නෑ.. මට නිදාගන්න හිතෙන්නෙ නෑ.. අඬලා අඬලා හිතේ දුක නිවාගෙන උදේ නැගිටලා ලෝකෙට පේන්න හිනාවෙනවා.. හැමදේම සාමාන්‍යයි කියලා හිතෙනවා.. වෙලාවකට මට හිතෙනවා ගිහින් ඩොක්ටර් කෙනෙක් හමුවෙන්න.. හරියට නින්ද යන්න බෙහෙත් ටිකක් ඉල්ලගන්න.. සෙනුකවත් මගේ ළඟ හිටියනම් කියලා හිතෙනවා.. ඌ මගේ කම්ෆර්ට් සෝන් එකක්.. මට කැමති විදියක ඉන්න පුළුවන් ඌ එක්ක විතරයි යාළුවොන්ගෙන්.. ඒත් මම හිතාගෙන හිටියෙ ඉතාලි ගිහින් ආවහම සෙනුකව හම්බෙන්න යන්න..

මම කොට්ටයක් අරගෙන පපුවට තුරුළු කරගත්තා.. ඉස්සරහ දොර ඔහේ ඇරලා දාලා.. ගේ ඇතුළ රස්නෙයි.. අනික කවුරුත් එන්නෙ නැති නිසා මම

@Shan

දොර ඇරලම තිබ්බා.. රෙක්සිත් ඒ හරියෙන් නිදිනෙ.. බයවෙන්න දෙයක් නෑ..

සෝලෝ ඩේට් එකකට යන්නත් හිතෙනවා.. ගිහින් පොඩ්ඩක් ඇවිදලා එන්න.. ඒත් මොන ඩේට්ද මට ක්ලබ් එකෙන් එළියට ඒගන්නම හෙන අමාරුයි.. කැම්පස් එකෙත් වැඩ ගොඩ ගැහෙනවා.. මම මීටකලින් යුරෝප් කන්ට්‍රි එකකට ගිහිල්ලම නෑ.. මේ පළවෙනි වතාව මිලාන් යන.. මම අහලා තියනවා මිලාන් හුඟක් ලස්සනයි කියලා.. මේ වතාවෙනම් ඇවිදින්න යන එක යනවාමයි..

" When you hurt under the surface

Like troubled water running cold

Well, time can heal, but this won't

So, before you go

Was there something I could've said

To make your heart beat better?

If only I'd have known you had a storm to weather

So, before you go

Was there something I could've said

To make it all stop hurting?

It kills me how your mind can make you feel so worthless

So, before you go "

මම කටට ආපු සිංදුවක් බෙරිහන් දීලා කිය කිය ඉන්නකොට එකසැරේට රෙක්සි නැගිටලා එකපාරක් බුරලා ආයෙම ගිහින් පැත්තකින් ලැගගත්තා.. මම නිකමට දොර දිහා බැලුවා විතරයි..

@Shan

" මොන හු#තක්ද..!! ඕයි පගයො.. උඹට මම.. යකෝ ඔහොමත් එනවද ගෙවල් වලට.."

දොර ගාව හිටගෙන හිටියෙ මහා අලි පත යෝධයෙක් වගේ චමිරු.. තව ටිකෙන් මම පපුව හිරවෙලා මැරෙනවා.. දොලහටත් කිට්ටුයි මූ ආතල්දෙනවනෙ..චමිරු මං දිහා බලලා නෝන්ඩියට හිනාවුණා.. අම්මපා මේ වෙලේට තමයි මට මාරයා ආවේස වෙන්නෙ..

" උඹ බය වුනාද.."

" අනේ මේ.. පාඩුවෙ ඉඳපන්.. එක්කො කෝල් එකක් දෙන්න ඕන.."

" මම දුන්නා.. කෝ ඉතින් උඹ ෆෝන් ආන්සර් කරන්නෙ නැනෙ.."

" මම දැන් ඔය ජම්බු ගහ කපලා දානව අම්මාපල්ලා උඹ ඕකදිගේ බඩගාලා වත්තට පැන්නොත්නම්.."

" ඉණිමගක් තියපන් එහෙනම්.. උඹට කෝල් කලාට වැඩකුත් නෑ ෆෝන් ආන්සර් කරන්නෙ නෑ.. මනුස්සයො කොහොමද ගෙදරට එන්නෙ.."

චමිරු හැයි හැයි ගගා ඇවිත් ජනෙල් පඩියෙ එහා කොණෙන් ඉඳගත්තා.. ඉඳගෙන මගේ දිහා බලාගෙන හිටියා.. තරුවි නංගි අච්චර අතාරින්න බෑ බෑ ගගා දැහලුවෙ ඇයි කියලා දැන් නෙ මට තේරෙන්නෙ.. මූ ලස්සන එකානෙ.. මම උගෙ කට ගාව ලපේ නැතුව ඉමැජින් කරගන්න ට්‍රයි කළා..

" තේකක් හදාගෙන වරෙන්කො.."

" උඹ කාලද ඉන්නෙ.."

" නෑ බං.. අන්න අරහෙ සීයගෙ මොකක්ද මගුලකට යන්න වුණා.. ඒ මීටිම ඉවරවුණේ ටිකකට කලින්.. මේ පැත්තෙන් යන නිසා ගොඩවෙලා යන ආවෙ.."

" කන්නෙ නැතුව තේ බොන්න උඹට පිස්සුද පගො.. වරෙන් මම මොනවහරි හදන්නද.."

" උඹට කරදරේ නේ.."

@Shan

" ඔව් ඔව්.. උඹලත් මහ රෑ ගෙවල් වලට කඩාවැදලා පුදුම වදයක් තමා අපිට දෙන්නෙ.."

මම අතේ තිබ්බ කොට්ටෙන් උගේ මූණ මැද්දට දමලා ගහලා කුස්සියට ගියා.. චමිරු කියාරව අල්ලගෙන හුරතල් කරන්න ගත්තා.. මේ කියරා දැන් හැදෙනවා හොඳ විදියකට.. ජාතියටත් ලැජ්ජ කරනවා.. ගෙදරට හොරෙක් පැන්නොත් ඌත් එක්කත් හුරතල් වෙලා තමා නතර වෙන්නෙ..

" උඹ මොනවද කන්නෙ.."

" තියන දෙයක් හදහන්.. විශේශයක් නෑ.."

" තණකොළ පුඩිමක් ඕනද.."

චමිරු කියාරවත් එක්කගෙන ඇවිත් කවුන්ටර් එකට එහාපැත්තෙන් තියලා තියන උස ස්ටූල් එකක ඉඳගත්තා.. මම මෙහා පැත්තෙ කන්න හදන්න දෙයක් හැදුවා..

" උඹ කන ඒවා අපිට හදන්නෙපා බං.."

" බූරුවා.. ආ ඕයි මේ.. සෙනුකයා කතාකළාද බං.."

" මම.. ඌට සීතලයි කියලා මැරෙන්න හදනවා..බදාගෙන නිදාගන්න උඹව ඕනලු.."

දෙයියනේ දෙයියනේ මගේ පෞකාරයගෙ සීතල නැතිකරන්න ඉක්මනට යන්න වෙයි වගේ..

" මම මිලාන් ගිහින් යනවා මගෙ පෞකාරයගෙ සීතල නැතිකල්ලා දාලා උගෙ කැදැල්ල උණුහුමින් පුරවන්න.. පොඩ්ඩක් ඉන්න කියන්න ඕන.."

" මම්.. මම්.."

මම ෆ්‍රිජ් එකේ තිබ්බ ස්පැගටි පැකට් එකක් එළියෙන් තිබ්බා.. මම ඉතින් හෙන පොඩ්ඩනෙ හදාගෙන කන්නෙ.. ගෙදර සේරම ඉතුරුවෙන කෑම ෆ්‍රිජ් එක අස්සෙ.. කොටින්ම ලුණු බෑයක් ඉතුරුවුණත් ඒකත් ගිහින් ගහනවා.. මේවා සල්ලිනෙ.. ඇයි යකෝ මමනෙ හම්බකරන්නෙ.. එහෙම

@Shan

නාස්තිකල්ලා පුළුවන්ද.. මට ඔයා පහුවට පාවිච්චියට ගන්න අමතක වෙන එක වෙනම කතාවක්..

" මොකෝ කැම්පස් එකේ වැඩ.."

" අවුලක්ම නෑ.. කරගෙන යනවා.. අනේ තේරෙන්නෙ නෑ බං.. එක ස්ලයිඩ් එකක් දිහා වරුවක් බලන් හිටියත් මස්සඤං වගේ.."

" එහෙම කියලා බෑ.. කරපන් කරපන්.. මුලදී ඔහොම තමා.."

" ම්ම්ම්.."

මම භාජනයක් අරගෙන වතුර දාලා ලිපේ තිබ්බා..

" අපේ අම්මට ප්‍රපෝසල් එකක් ඇවිල්ලලුනෙ.."

" සිරාවට.. මොකක්ද ඒ සීන් එක.."

චමිරු ස්පැගටි කූරක් ඇදලා අරගෙන ඒක කටේ ගහගත්තා.. මම තක්කාලියි සුදුළූනුයි ටිකක් අරගෙන මයික්‍රෝවේව් ට්‍රේ එකෙන් තියලා ඒකෙ බටර් ගෑවා..

" ආශිගෙ ගෙදර ගියානෙ බං.. ආන්ටි කිව්වෙ, අම්මට ප්‍රපෝසල් එකක් ගෙනැල්ලලු.."

" ආන්ටි කැමතිද දැන්.."

" ම්ම්.. දැන් කතාකරන්න අරගෙනත් ටිකක් කල්.. මම දන්නෙ ඊයෙනෙ.. ආච්චිවත් කිව්වෙ නෑ බං.. ගෙදර වෙන දේවල් වලට දැන් මාව ගාවගන්නෙම නෑ.. මාවත් ශේප් එකේ කැපිලා යන්න හදන්නෙ.. එක අතකට ඒකත් කමක් නෑ.."

චමිරුගෙ මූණ වෙනස් වුණා..

" උඹට පිස්සුද.. විකාර කතානොකර ඉඳපන්.. දැන් කවුද ප්‍රපෝස් කල්ලා තියෙන්නෙ.."

@Shan

" මම ඒක දන්නෙත් නෑ බං ලොකුවට.. ආ ෆොටෝ එකක් දැක්කා.. හොඳ වැදගත් පෙනුමයි.. කම්පනි මැනේජර් කෙනෙක්ලු.. මැරීඩ්.. ලොකු පුතෙක් ඉන්නවා පුතත් මැරි කල්ලා.. අවුරුදු දෙකකට කලින් ග්‍රීන් කාඩ් ලොටරි එකක් ඇදිලා ඇමරිකා ගිහින් පදිංචි වෙලා ඉන්නෙ.. ලබන මාසෙ ලංකාවට එනවලු.."

" ටසිරි.. උඹ කොයි ලෝකෙද බං හිටියෙ.."

චමිරුගෙ වචන ඇත්ත..! මගේ පපුව එකසැරේට රිදෙන්න ගත්තම මම එහෙමම කවුන්ටර් එකට වාරු වුණා.. හැමදාම මගේ අතින් වැදගත්ම කොටස මගෑරෙනවා.. පහුගිය හැමදේමත් ඉවෙන් දැනගෙන හිටියත් මට කරන්න පුළුවන් කිසිම දෙයක් තිබ්බෙ නෑ.. හැමෝම මාව අසරණ කරනවා.. මාමව හොයාගන්න විදියක් නෑ.. ආධ්‍ය අයියා පැටලිලා නිසා.. රධ්‍ය අයියා ගැන ආරංචියක් නෑ.. අප්පච්චි පැටලිලා.. එයාලා හැමදේම කලින් ඉඳන්ම දැනගෙන ඒවට වැඩ කළා.. අඩුම තරමෙ මම පොඩි දෙයක්වත් දැනගෙන හිටියද.. නෑ.. මම මොකුත්ම දැනගෙන හිටියෙ නෑ.. ඒ වරදකාරි හැඟීම මගේ හිතින් යන්නෙම නෑ..

" ෂනෙරු.. මේ.. මොකද බං.."

චමිරු කවුන්ටර් එක වටෙන් ඇවිත් මාව ඇඟට වාරු කරගත්තා.. ඩොක්ටර් කෙනෙක් හමුවෙන්න යන්න ඕන.. මට ඒක හොඳටම දැනෙනවා.. මගේ ඔලුවෙ තියන පීඩනේ එන්න එන්නම වැඩිවෙනවා..

" ආ..?? මොකුත් නෑ.. මම හොඳින්.."

මම චමිරුගෙන් එහාට වෙලා උතුරන වතුර එකට ස්පැගටි ටික දැම්මා.. මයික්‍රොවේව් එක ඇරලා ට්‍රේ එකත් ඒකට දාලා හීට් වෙන්න ඇරියා..

" අසනීපෙන්ද.."

" නෑ බං.. පිස්සුද.. එහෙට පලයන් මට මෙක හදන්න.."

චමිරු මාව අතින් ඇදගෙන ගිහින් ස්ටූල් එකකින් ඉන්දුවා.. ඌ ඒප්‍රන් එකත් ගලවලා අරගෙන ඒක දාගෙන එළවලු වගයක් සේදුවා..

@Shan

" උඹට කරන්න පුළුවන් තරම උඹ කරන්නෙ.. හැමතිස්සෙම මනස්ගාත හිතන එක නවත්තපන්.."

" ඒත් මම මහ-කොහොමද ඒක කියන්නෙ.. මම මගෙ දේවල් එක්ක බිසී වෙනවා මිසක්.. මගේ වටේ දේවල් හොයන්නෙ නැනෙ.."

" උඹගෙ වැරැද්දක් නෑ.. මම දකින විදියට.. උඹට මේ පැහැදිලි කල්ලා දෙන දාස් වෙනි වතාව.. ඇයි උඹ හැම එකම ඇඟිල්ලෙන් ඇන ඇන අහ අහ හොයන්න ඕනද.. ආ..?? අම්මට උවමනාවක් තිබ්බනම් කියනවා.. එහෙම තිබ්බෙ නැති නිසා කිව්වෙ නෑ.. දැන් ඒකෙ උඹේ ඇති වැරැද්ද මොකක්ද.."

මම එහෙමම ඔලුව තියාගත්තා..

" මම දන්නෙ නෑ.."

" දන්නෙ නෑ නෙමේ.. උඹ පිළිගන්නෙ නෑ.. හැම එකම මුල ඉදලා හිතපන්. හැබැයි මම මේක උඹට කියන අන්තිම වතාව හරිද.."

චමිරු පිහිය දික් කල්ලා මට බැනලා සොසේජස් වගයක් කපාගෙන කපාගෙන ගියා..

" මොකක්ද.."

" ඉස්සෙල්ලම බලපන් කොහෙන්ද මේ ප්‍රශ්න පටන්ගත්තෙ.. රධ්‍ය අයියගෙ අප්පච්චි මෙහෙට ආපු දවසෙ ඉදලා.."

" ම්ම්.."

" ඉතින් රධ්‍ය දැනගෙන හිටියා මෙතන කොහේහරි කොයිවෙලේ හරි ඇවිලෙනවා කියලා.."

" උඹ මට සම්පූර්ණ කතාව කියන්නෙ නැනෙ චමිරු.. ආ..?? උඹ සැහෙන්න දේවල් දැනගෙන.. මගෙන් හංගනවා.. මම හොදටම දන්නවා උඹයි, අයුක අයියයි දෙන්නම එහෙමයි.. මම බබෙක් නෙමේ උඹලා හැසිරෙන විදිය නොතේරෙන්න.."

චමිරු මම කියපු එක ඇහුණෙ නෑ වගේ හිටියා.. එක අතකට අපරාදෙ කිව්වෙ..

@Shan

" දැන් උඹ මේවා දැනගත්තා කියලා මොකද කරන්නෙ.."

" මට හිත හදාගන්න දැනගන්න ඕන.."

" දනගන්න ඕන දේවල් තියනවා.. නැති දේවල් තියනවා.. ඒකනිසා දැනගන්න ඕන ටික විතරක් දැනගෙන ඉදපන් ෂනෙරු..!!"

චමිරු ඇස් දෙකත් රතු කරගෙන මට රවාගෙන බැන්නා.. මගේ ඇස් වල කඳුළු පිරුණා.. මගේ ඔලුව කැක්කුමයි.. ආච්චිඅම්මව මතක් වෙනවා.. මම ඇස් දෙක පියාගත්තා.. අඩන්න ඕන නෑ ෂනෙරු.. ඉවසගෙන ඉදපන්.. උඹ අඩන්න ඕන නෑ..

ටික වෙලාවක් යනකල් මට ඇහුණෙ උයන සද්දෙ විතරයි.. මම එහෙමම ඇස් දෙක පියාගෙන හිටියා.. සැහෙන්න වෙලාවකට පස්සෙ ගෑස් එක ඕෆ් වුණා.. චමිරු මගේ එහාපැත්තෙන් ඉඳගන්නවා මට දැණුනා..

" තෝ නම් මහ මුරණ්ඩු මගුලක් ෂනෙරු.. මෙහෙ බලපන්.."

මම ඇස් ඇරලා චමිරු දිහා බැලුවහම ඌ මගේ මූණෙ තිබ්බ කඳුලු පිහිදැම්මා..

" අඩන්නෙ නැතුව ඉන්නකො.. ඔයා ඩවුන් වුණාම මේ දේවල් කොහොමද අපි හරියට කරගන්නෙ.. ආ..?? ඔයා මේ වෙලේ හැමදේම අල්ලගෙන ඉන්න ඕන නිසයි මම නොකියන්නෙ.. අනික ඒ දේවල් දැනගත්තා කියලා උඹට කරන්න පුළුවන් දෙයක් නෑ.."

" උඹ මුල ඉඳලම හැම එකම ප්ලෑන් කළා.. මට උඹ එක්ක කේන්ති.. එහාට පලයන්.."

මම චමිරුගෙ අත ගසලා දැම්මා..

" ඒකෙන් උඹට නරකක් වුණේ නෑනෙ.. හරි මම දැනගන්න උඹට කියන්නම්..

මමයි රඩ්‍ය අයියව අන්තිම වතාවට හම්බුණේ..!!"

මගේ ඇස් දෙක ලොකු වුණා.. මම එකසැරේ ඔලුව උස්සලා චමිරුගෙ අතින් තද කල්ලා අල්ලගත්තා.. මගේ පපුව වේගෙන් ගැහෙනවා..

@Shan

" ම්-මොක-ක්??"

" නටන්නැතුව ඉඳපන්.. උඹ ලංකාවට එන්න දවස් දෙකක් තියා රූ හම්බුණා.. රධ්‍ය අපේ ගෙදර ආවා.."

" ඊටපස්සෙ.. මොකද වුණේ.. ඇයි මෙච්චර කාලයක් කිව්වෙ නැත්තෙ මට.."

" ෂනෙරු ප්ලීස් කාම් ඩව්න්.."

" චමිරු.. රධ්‍ය අයියා මොනවද උඹට කිව්වෙ..!"

" උඹට රධ්‍ය කිව්වද එයාලගෙ ගෙදරට අප්පච්චිගෙ යාළුවො වගයක් ආවා කියලා.."

මම කල්පනා කලා..

" ඔව් මට එදා කිව්වා.. ඇයි ඒ.."

" රධ්‍යගෙ අප්පච්චි හරියටම එදා තමා ආමි එකෙන් ලිව්ින් එක අරගෙන තියෙන්නෙ.. ඒ කියන්නෙ අප්පච්චි කලින් ඉඳලම ප්ලෑන් එකක් හිතේ තියාගෙන ඉඳලා තියනවා.. උඹට තේරෙනවද.. එහෙම මනුස්සයෙක් කිසිම දවසක සද්දයක් නැතුව ඔහේ බලාගෙන ඉන්නෙ නෑ.."

මාව කරකලා අතෑරියා වගේ වුණා..

" උඹලා සෙල්ලම් කළේ වැරදි මිනිහා එක්ක.. රධ්‍යගෙ අතින් අහුවුණා අප්පච්චිට උඹ කවද කියලා.. අනික ආධ්‍ය අයියා ගැනත්.. අප්පච්චි ඔක්කොම අප්ඩේට් එකේ හිටියෙ.. අනික උඹලගෙ මාමත් කැම්ප් එකෙන් අයින් වුණේ හුඟ දවසකට කලින්.. උඹව අවුල් නොකර තියන්න ඕන නිසා රධ්‍යයි මාමයි හැමදේම හංගන් හිටියෙ.."

" ආ..??"

" ඔව්.. සමහර දේවල් වලට මමත් උදව් වුණා.. කන්ටැක් තියනවනෙ සීයා එක්ක ඔවගෙ.. රධ්‍ය තමයි කිව්වෙ උඹ මෙහෙ ආපු ගමන් ගෙදර එක්කන් යන්න කියලා.. උඹත් මෙලෝ සිහියකින් හිටියෙ නෑ.. මට ඒ වැඩේ කරගන්න පුළුවන් වුණා.. මේක සෙනූකවත් දන්නෙ නෑ.. මමයි අපේ

@Shan

අයියයි විතරයි දැනගෙන හිටියෙ.. හැබැයි ෂනෙරු දැන් මෙතන ඕවා අවුස්සගෙන උඹ දහලන්න ගියොත්.. අම්මපා උඹ මගෙන් කනවා.. ඒකනිසා.. පාඩුවෙ.. ඉඳපන්..!"

" එතකොට ඒකද රධ්‍ය අයියා කලින්ම ආච්චිඅම්මට අපි ගැන කිව්වෙ.. මට ආපු ගමන් ගෙදර යන්න කිව්වෙ.."

" ම්ම්.."

" අනෙහ් චමිරු.. මොන මගුලක්ද බං.."

මම පපුවට අත තියාගෙන මාවම කාම් කරගන්න ට්‍රයි කළා.. නෑ නෑ එයාලා හොඳින් ඉන්නවා.. බයවෙන්න ඕන නෑ..

" ෂනෙරු ප්ලීස් දැන් ඕක නවත්තන්න.. මගෙන් අහන්න එපා.. මමත් අසරණ වෙනවා බං.."

" එතකොට ආධ්‍ය අයියා..??"

" ඒක හරියටම දන්නෙ නෑ.. මාමා වැඩකළේ වෙනම විදියකට.. මම කියන්නෙ, මම දන්න එකා ගැන විතරයි.. උදව් කළා කිව්වට හැම එකම මට හාරා අවුස්සන්න බැනෙ බං.."

" මට පිස්සු වගේ බං.. මගේ ඔලුව කැක්කුමයි.. මගේ කාමරේ ඩයිසපැම් වගයක් තිබ්බා.. එකක් ගෙනැත් දීපන්.. පෙනඩෝල් එකක් එක්ක.."

චමිරු මං දිහා බලාගෙන ඉඳලා නැගිටලා ගියා.. මම ඌ හදලා ඉවරවුණු පැස්ටා එක එහෙමම උසගෙන ගිහින් කෑම මෙසෙන් තියලා ගැරුප්පු දෙකක් පැත්තකින් තිබ්බා.. මට ළඟදීම පිස්සු හැදෙයිද මන්දා.. මාව වෙවුළනවා වගේ.. ඇහේ හයිය තිබ්බට හිතේ හයිය නැතිවේගෙන එනවා..

" කාලා බොන්න.."

චමිරු බෙහෙත් වගයක් ගෙනැල්ලා පැත්තකින් තියලා මං ගාවින් වාඩිවුණා..

" චමිරු.. මට බයයි බං.."

@Shan

චමිරු බය වෙලා මගේ දිහා බැලුවා.. මම මීට කලින් කිසිම දවසක චමිරුට එහෙම කියලා නෑ..

" ෂනෙරු.."

" මට දැනෙන්නෙ මම කොහේහරි කළුවර තැනක හිරවෙලා වගේ.. මට ඒක ගෙදරට එද්දිම දැනෙනවා.. තනියම ඉන්න හැමතැනකම දැනෙනවා.. අනේ බං.. සෝශල් මීඩියා වල ඉන්න මම.. කැම්පස් එකේ.. ක්ලබ් එකේ ඉන්න මම නෙමෙ ඇත්තම මම.. මට නින්දවත් යන්නෙ නෑ චමිරු.. ළඟකදි ඉඳලා මම හරියට කල්පනා කරනවා.. හිත එකතැනක තියාගෙන පාඩම් කරන්න බෑ.. ලබන සතියෙ ටුවර් එක යන්න ඕන.. ඒ අස්සෙ හිතේ මහා පසුතැවීමක් තියනවා.. මාව හැමෝම රිද්දනවා.. මගේ අම්මත්.. මාව හැමෝම දාලා යනවා චමිරු.. මට ආච්චිඅම්මව ඕන.. දෙයියනේ මට මොකක්ද බං වෙලා තියෙන්නෙ.."

චමිරු මගේ උරහිස වටේ අතක් යවලා සයිඩ් හග් එකක් දුන්නා.. මට මේ වෙලාවෙ ඒක මහා ලොකුවට දැනුණා.. ඌ යාළුවෙක් විදියට මං ගාවින්, මගේ පැත්තෙන් හිටගෙන ඉන්න එක ලොකු හයියක් වගේ දැනුණා..

" ශ්හ්.. ඒක ඉවරයි ෂනෙරු.. ඔයා හොඳින් ඉන්නවා.. දැන් අපි ඒක  ගැන නොහිතා ඉමු.. ඕක නිසා තමයි මම උඹට නොකිය ඉන්න හැදුවෙ.. අපි ඩොක්ටර් කෙනෙක් මීට් වෙන්න යමුද.."

" ම්ම්.."

" අපි යමු.. මම සෙනුකට කියන්නම්.. උඹ ලංකාවට ආවහම අපි සෙනුක හම්බෙන්න යමු.. මේ වෙලේ නම් වැටෙන්න එපා ෂනෙරුවා.. එහෙම වුණොත් හැමෝම කරපු කැපකිරීම් ඉබේම වතුරෙ යනවා.. උඹට මමයි සෙනුකයි ඉන්නවා.."

මම ගැරුප්පුවෙ ස්පැගටි ටිකක් පටලගෙන ඔහේ බලාගෙන හිටියා.. මට කිසිම දෙයක් හරියටකරගන්න බෑ.. මම ආදරේම අය මට මහ ඇරුණද..

" චමිරු.."

" ම්ම්..??"

@Shan

" මොකුත් නෑ.. අද උබ මෙහෙ නවතිනවද.. දැන් රෑ වෙලානෙ.."

" උදේට යනවා.. දැන් අතගගා ඉන්නෙ නැතුව මේක කාපන්.."

මම පාඩුවෙ කෑම කාලා ඉවරකළා.. ඊටපස්සෙ භාජන සෝදලා චමිරුට ඉන්න එහා කාමරේ ලෑස්ති කළා.. ඌ නරක එකෙක් නෙමේ.. මම අනිත් උන්ට දන්නෙ නෑ.. මම දන්නවා ඌ මට නරක එකෙක් නෙමේ කියලා.. මේ කාලෙට මට සෑහෙන්න මගේ ළඟින් හිටියෙ චමිරු.. අපි දෙන්නගෙ හොඳ යාළුකමක් තිබුණා.. ඌ ඒකට සෑහෙන්න ගරු කළා.. ඉඳලා හිටලා උගේ හිතේ තියන දුක මට කිව්වත්.. ඌ සීමාව දැනගෙන හිටියා..

ආදරේ හැමෝටම සාධාරණ නෑ..

මම බෙහෙත් බීලා මූණ හෝදගෙන ඇවිත් හාන්සි වෙලා හිටියා.. නිදි පෙති වලට නින්ද යනවා.. ඒත් ඒක ඔලුවට නිදහසක් දැනෙන නින්දක් නෙමේ.. මම මාවම ෆෝස් කරලා නිදාගන්නෙ.. අනික එකදිගට නිදි පෙති බොන්න බෑ.. මම මොකක් හරි කරගන්න ඕන..

මම නින්දක් එනකල් ඔහේ සිවිලිම දිහා බලාගෙන ඉද්දි චමිරු කාමරේට ඇවිත් පුටුවක් ඇදගෙන ඉඳගත්තා.. ඌ නාලා ඇඳුම් මාරු කරගෙන..

" මම මෙතන ඉන්නවා ෂනෙරු.. ඔයා නිදාගන්න.."

" ම්ම්.."

කවුරුහරි මගේ ළඟින් ඉන්නවා කියන හැඟීම මට හිතේ තිබ්බ බය පොඩ්ඩක් ඇත් කළා.. කළුවරට මාව ගිලගන්න දෙන්න බෑ.. ටික වෙලාවක් යනකල් චමිරු මේසෙ උඩ තිබ්බ පොතක් අරගෙන ටේබල් ලැම්ප් එක දාගෙන ඒක කියෙව්වා.. මගේ ඇස් ඉබේටම පියවුණා.. අදවත් මොකුත්ම නරක දෙයක් නොදැක, නොදැනී නින්ද යන්න ඕන කියලා මම හිතුවා.. මම නින්දෙන්ම ඇඳේ එහාපැත්ත හැරුණම ස්විච් එකක් ඕෆ් වෙනවා ඇහුණා..

" ගුඩ් නයිට් ෂනෙරු.."

@Shan

කතාවෙ නොතේරෙන තැන් තියද දළඹු හටයිනි.. තාම මේ ස්ටෝරි එක කම්ප්ලීට් වෙලා නෑ.. මේ කතාව අස්සට ඕතරී අවතීර්ණ වෙන්න එපෑ ඒක සම්පූර්ණ කල්ලා දෙන්න..

ඉස්සරහට හුඟක් දේවල් වේවි.. ෂනෙරුගෙ අම්මා සංකීර්ණ චරිතයක් නෙමේ.. ඒත් එයා සමහර වෙලාවට ෂනෙරුව රිද්දනවා.. දැන් වගේ.. ෂනෙරු අම්මා ගැන අවබෝධයක් ඇතුව හිටියට. අම්මා එහෙම නෑ.. හැම අම්මම එක වගේ නෑනෙ ළමයි..

කතාවෙ ඔයාලට එච්චර මතක නැති චරිතයක් ඉන්නවා.. එයා ඉස්සරහදි කතාවට සම්බන්ධ වෙනවා..

අදිනවා වැඩී වගේද. ඒත් මගේ හිතේ තියන මැවෙන ප්ලොට් එක තමයි මේක.. මම හොඳ අවසානයක් බලාපොරොත්තු වෙනවා.. අනික අනේ මම ලියන්නෙ හෙන කොට චැප්ටර්ස්නෙ.. දිගට ලිව්වනම් මේක අසූවකින්වත් නවත්තන්න තිබ්බා..

පෞකාර සමනායට කමා කරන්න දෙයියනේ..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 154 කොටස

" Questo fiore è per te.." (This flower is for you)

" ආ..??"

මගේ ඉස්සරහින් හිටගත්තු පුංචි රෝසපාට ගැණුළමයෙක් මට මලක් දික් කළා.. සුදුපාට ටියුලිප් මලක්.. එයාගෙ අතේ තව මල් පොකුරක්ම තිබුණා..

" for me??"

ආයෙම ඒ පුංචි ගැණුළමයා වයින් කරපු බෝනික්කියක් වගේ ඔලුව වැනුවා.. මම හිනාවෙලා ඒ මල ඉල්ලගත්තා..

" grazie.." (Thank you)

මම මල ඉල්ලගත්තු ගමන්ම එයා දුවගෙන දුවගෙන ගියා.. මම හිටියේ මිලාන් වල.. අවුට්ඩෝ කැෆේ එකක.. මිලාන් කියන්නෙ හවසට සෙනඟ හෙන ගොඩක් ඉන්න සිටි එකක්.. මම නැවතිලා ඉඳපු හොටෙල් එක තියෙන්නෙ මීට ටිකක් එහායින්.. හවස ගැලරියා විට්ටෝරියා එම්මානුවෙල් ශොපින් මෝල් එක බලන්න මම දන්න අයියා කෙනෙක් එක්ක ගියා.. ඒක බලන්න විතරයි හැබැයි යන්න පුළුවන්.. ඔක්කොම තියෙන්නෙ හයි කොලිටි එක්ස්පෙන්සිව් බ්‍රෑන්ඩ්ස්.. ගුචි.. ප්‍රාඩා.. ලූවි විටෝන්.. ෂැනල් වගේ ඒවා.. අපිට තාම ගන්න තියා හිතන්නවත් බෑ.. සමහරවිට ඉස්සරහට ගන්න පුළුවන් වෙයිද දන්නෙ නෑ ඉතින්.. එහෙම වුණොත් හොඳයි.. දැන් ඔය මම ගිය එක තමා ලෝකෙ පරණම ශොපින් මෝල් එක කියන්නෙ..

ඊටපස්සෙ මාත් එක්ක ආපු අයියා ආයෙම හොටෙල් එකට ගියා.. මටත් ඕන වුණේ ටිකක් තනියම නිදහසේ ඉන්න.. ඒකට කියාපු කැෆේ එකකුත් මට හම්බුණා.. මේක අවුට් ඩෝ ටේබල්ස් වල සර්ව් කළත් හුඟක් ලස්සනයි.. මල් වැල් යවපු පරණ ආරුක්කු එක්ක.. හරි පරණ වයිබ් එකකට හදපු තැනක්.. මම පෙපරෝනි පිට්සා එකක් ඕඩර් කරගෙන ඔහේ වාඩිවෙලා පාර දිහා බලාගෙන හිටියා.. හුඟක් අය හීටියත් හිතට පුදුම නිස්කලංකයි.. ලංකාව වගේ නෙමෙනෙ.. වෙනස් මිනිස්සු ඉන්න, වෙනස් පරිසරයක් තියන, වෙනස් භාශාවල් කතාකරන, වෙනස්ම රටක්.. ඒත් ආස හිතෙනවා..

@Shan

මම සුදුපාට ටියුලිප් මල පරිස්සමට එහාපැත්තෙන් තියලා මොක්ටේල් එකේ ඇලුමිනියම් බටේ කටේ ගහගත්තා.. මම මල් හම්බෙනව ආසයි.. මම යූටියුබ් එකේ එහෙම දැකලා තියන රන්ඩම්ලි එක එක අයට මල් දෙනවා.. මේ රටවල් හිතන පතන විදියෙ ඉඳලා වෙනස්නෙ.. වෙලාවකට හිතෙනවා ඒක නිදහසක්ද කියලා.. ලංකාවෙ ඇයි අපිට පාඩුවෙ ජීවත් වෙන්න බැරි.. ඇයි අනවශ්‍ය විදියට ජීවිත වලට බලපෑම් කරන්නෙ.. ඒක සාධාරණයිද.. අපිට රාමුවෙන් එළියට එන්නම බැරිද..

සමහරවිට කවදාවත්ම බැරිවෙයි..

අන්තිමේදි අම්මා මට ඒක ගැන කිව්වා.. ඒ කිව්වෙත් මම දැනගෙන කියලා එයාට දැනුන නිසා.. ඇයි කලින් කිව්වෙ නැත්තෙ ඇහුවම මට වැඩ නිසා කිව්වෙ නෑ කිව්වා.. මම අහන්නෙ ඒක හොඳ නිදහසට කාරණාවක්ද.. නෑ!! මම මගේ මොන වැඩේ තිබ්බත් අම්මව එකට, ආච්චිව එකට දාලා සලකන්නෙ.. මට අන්තිමේ අකමැත්තෙන් හරි තේරුණා.. 'කොච්චර කළත් වැඩක් නෑ' කියලා.. ඒක මගේ හදවතින්ම ආපු මහා කලකිරීමක්.. ආච්චිඅම්මා ඇරෙන්න හැමදේම මට කලකිරිලා තියෙන්නෙ.. ඩොක්ටර් හමුවෙන්න ගියාම මට සැහෙන්න උපදෙස් ගොඩක් දුන්නා.. මම මෙඩිකල් ස්ටුඩන්ට් කෙනෙක් කිව්වම ස්ට්‍රෙස් වෙන එක සාමාන්‍ය දෙයක් කියලා කිව්වෙ.. ඒක සාමාන්‍ය නෑ ඒ වුණාට.. මම ඉන්න ගින්දර දන්නෙ මමම විතරයි..

අන්තිමේ වම්රු වද දීලා දීලාම බෙහෙත් හරියට අරගෙන රෙස්ට් එකේ හිටියා.. ඌත් පව් එක අතකින්.. දාහක් වැඩ තියාගෙන වුණත් මාව බලන්න එනවා.. මගේ වටේ ඉන්න අය කොච්චර ඒත්තු ගැන්නුවත් මම තනිවෙලා නෑ කියලා.. ඒක මට දැනෙනවා.. ඒ පාළු අඳුරු හැඟීම මගේ වටේ කැරකෙනවා.. මම හොඳටම දන්නවා ඒක මගේ ළඟින්ම ඉන්නවා කියලා.. ඒක හරි බය හිතෙන හැඟීමක්..

මට ඩිප්‍රෙශන් වල පෙර ලක්ශණ පෙන්නනවා කිව්වා.. මම ජීවිතේ බයම දේ.. ඩිප්‍රෙශන්.. මගේ අම්මා ඒකෙන් දුක් වින්ද හැටි මම දැකලා තියනවා.. ආධ්‍ය අයියත් එහෙමයි.. මට ඒකෙන් ගැලවෙන්න ඕන.. මම හිතලා ඩිප්‍රෙශන් හදාගත්තා නෙමේ.. ඒත් මාව ඇඟ ඇතුළින් පිච්චෙනවා වගේ.. පපුව පැත්තක් හැමතිස්සෙම හිරිවැටෙනවා.. මට හරි අමාරුයි.. ඒ වෙලාවට මැරෙන්න හිතෙනවා.. වතුරක ගිලිලා ඉන්න හිතෙනවා.. මගේ ඇඟ පිච්චෙන එකෙන් මාව ගලවගන්න මට ඕන වුණා.. සමහර වෙලාවට

@Shan

ශවර් එක ඇරගෙන ඔහේ බිම වාඩිවෙලා ඉන්නවා.. ඒ පිච්චෙන හැඟීම මට අයින් කරගන්න ඕන.. මගේ ඇඟ ඇතුළෙන් පිච්චෙන වේදනාව මට ගුලි කල්ලා විසික් කරන්න ඕන.. එක්කො හිර කල්ලා ගල් කරගෙන ඉන්න හැඟීම් ඒ ගින්නට පිච්චෙන්න ඕන.. දියවෙන්න ඕන..

මගේ ඇඟ ඇතුළේ පියාඹනවා කියපු සමනල්ලුම දැන් මම වමාරන ගමන් හිටියා..

ලේ කැටි එක්ක.. මැරුණු, බිඳුණු අත්තටු හැම රකම මට පෙනුනා.. ඒ සමනල්ලු මගේ ඇඟ ඇතුළෙම මැරිලා ගිහිල්ලා.. මම වමාරනවා.. මාව තුවාල වෙනවා.. මගේ ඇඟ ඒවට තුවාල වුණා.. මම ඇඬුවා.. කෑගහලා ඇඬුවා.. සමහර වෙලාවට වමිරු මං ගාවින් හිටියා.. ආශි මං ගාවින් හිටියා.. මහීශා පුළුවන් හැම වෙලාවකම ආවා.. අන්තිමේ මට දැනෙනවා තව නම් බැහැ කියලා..

මම කොහොමද මගේ හයිය දිගටම තියාගන්නෙ.. මම ඉන්නෙ මගේ ඇතුළාන්තය එක්ක යුද්ධෙක.. හැමදේම හරියයි කිව්වට එහෙම වෙන්නෙ නෑ.. මට කවුරුහරි ඕන.. මගෙ කියලා මම අඳුනගෙන ඉන්න කවුරුම හරි මට ඕන.. මට තවම අවුරුදු විසි එකයි.. ඒ හැටි වයසක් නෑ.. මට හැමදේම දරාගන්න අමාරුයි.. මට සමාජෙ ගැන අත්දැකීම් අඩුයි.. ඒත් මම තවම අල්ලන් ඉන්න එක ගැන මට පුදුමයි..

මම ඈත පේන ලස්සන මනුස්සයො දිහා බලාගෙන කල්පනා කළා.. කොහොම හරි අල්ලගෙන ඉන්න ඕන ෂනෙරු.. මගින් දාලා යන්න පුළුවන් දුරක් නෙමෙයි උඹ ඇවිල්ලා ඉන්නෙ..දැන් අතෑරුණොත් අතෑරුණාම තමයි.. මම මගේ හිත ආයෙම වාරු කරගත්තා.. දවසකට ලක්ෂ වතාවක් කඩාන වැටෙනවා.. ඒ ලක්ෂ වතාවෙම මම ආයෙම නැගිටිනවා.. හිත හදාගන්නවා.. මගෙ හීන අතෑරෙන්න දෙන්න බෑ.. එහෙම වුණොත් මට මටම සමාව දීගන්න බැරි වෙනවා..

මගේ ඇතුළාන්තය එක්ක තිබ්බ යුද්ධෙ ආයෙම පුරුදු විදියටම යුධ විරාමෙකට ගියා.. ඒත් ආයෙම කොයි වෙලේ හරි මතුවෙනවා..

මම රධ්‍ය අයියගෙ ෆෝන් එක අරගෙන මේසෙ උඩින් තියාගත්තා.. මට බෙහෙතකට කියලා මගේ හිත හැදෙන්න තාම තිබුණෙ එයා මට දුන්නු ආදරේ විතරයි.. තනිකර පෙරාපු ආදරයක්.. ඒ මනුස්සයා ජීවිත කාළෙටම ඇතිවෙන්න මගේ හිතේ තියලා ගියා.. මම කිව්වා වගේම එයාට වෛර

@Shan

කරන්නවත් තරහා ගන්නවත් මගේ හිත හදාගන්න බෑ.. මොකද මම දන්නවා එයා කියන්නෙ කව්ද කියලා.. හැමෝටම වඩා හොඳට මම දැනගෙන හිටියා.. එයාට එයාගෙ හේතු දාහක් තිබුණා.. අතාරින්න හේතු කෝටියක් විතර තියාගෙනත් තමයි අපි ආදරේ කළේ.. සතුටින් හිටියෙ.. එයාගෙ පැත්තෙන් බැලුවොත්.. මම හිතන්නෙ නෑ ජීවිත කාළෙටවත් ඒ වගේ මනුස්සයෙක් මට හම්බෙව් කියලා..

මම රධ්‍ය අයියගෙ ෆොන් එකේ ප'සනල් ඩයරි එක ඕපන් කළා.. මටත් මෙහෙම දැනෙනවානම්.. එයාටත් මෙහෙමම දැනෙනවා ඇති.. අපි කිසි වැරැද්දක් නොකරත් දෙපැත්තකට වෙලා නොසෑහෙන්න විඳවනවා.. කවදහරි අපි හම්බෙන දවසක් වෙනකල්.. දැන්නම් මට හිතෙනවා එතකල් මම ජීවත් වුණොත් ඒකම ලොකු දෙයක්..

**"you look so much softer, so much calmer when you sleep"**

මගේ හිතට හීනියට සතුටක් ගලාගෙන ආවා.. ඩයරි එකේ තැනින් තැන පොඩි පොඩි නෝට්ස් තියනවා.. ඒවා දැක්කහම මගේ හිතට සතුටක් ගලාගෙන එනවා.. දුක පිරුණු සතුටක්.. කට කොනෙන් ඇදෙන හීනි හිනාවකින් මගේ මූණෙ ලේ නාළිකා පණ ගැහුවා.. හුහක් හෙමින් වුණත් මෙහෙම හරි මම හිනාවෙන එක මට ලොකු දෙයක්..

**"tonight is about you"**

මේ අපි යාළුවෙලාවත් නැති කාලෙ.. අවුරුදු දෙකකට කලින් ලියවුණ ඒවා.. ඩේට් එක දැක්කම තේරෙනවා.. ආයෙම ඒ කාලෙ එනවනම්.. මට හිතුණා.. අනේ මම හුහක් සතුටින් හිටියා.. හැමදාම හිනාවුණා.. මගේ වටේ ඉඳපු අය සතුටින් තිබ්බා.. දැන් අඩුම තරමෙ මමවත් සතුටින් නෙමෙ.. කොහේද අපි වරැද්දක් කළේ මම කල්පනා කළා.. ඒ වෙනකොටත් මගේ කෑම මේසෙ ඉවරවෙලයි තිබුණේ..

මගේ පුංචි සෝලෝ ඩේට් එකට පස්සෙ දවසෙ මැච් එක තිබුණා.. මම ඒකට හොඳට මූණ දුන්නා.. කෝච් කිව්වෙ මෙකට පාටිසිපේට් වුණාම ඇති ස්ට්‍රෙස් වෙන්න එපා කියලා.. කෝච් වචනෙන් විතරක් නෙමෙ වැඩ වලිනුත් හිටියෙ මගේ ලඟින්මයි.. ඇත්තෙන්ම එහෙම කෝච් කෙනෙක් ලැබුණෙ මගේ වාසනාවට කියලා හිතෙනවා.. මොකද මම ඉන්න සිටුවේශන් එක ගැන කෝච් එයාගෙ මට්ටමින් හොයලා බලලා තේරුම් ගත්තා.. සමහර වෙලාවට මට කියනවා හැමදේම මේ යන විදියට මූණ

@Shan

දෙන්න.. හොඳම දේවල් ලබාගන්න හුඟක් අමාරුයි කියලා.. මට ඒ වචන ටිකම ලොකු අස්වැසිල්ලක් වුණා..

මගේ ඒජ් ග්‍රෑප් එකෙන් තිබ්බ මැච් එකෙන් මට මෙඩල් එකක් හම්බුණා.. ලංකාව රෙප්‍රසන්ට් කල්ලා ලැබුණු දෙවෙනි මෙඩල් එකත් මං ගාව තියනවා.. මගේ නමයි මගේ රටේ එනමයි එකතුවුණාම මට ලොකු ආඩම්බරයක් දැනෙනවා.. දහස් වතාවක් කඩා වැටි වැටි වුණත් මම මගේ ජීවිතේ තව අඩියක් ඉස්සරහින් තිබ්බා.. මාසෙකින් මට ශ්‍රී ලංකා බැඩ්මින්ටන් ඇසෝසියේශන් එකෙන් ලියුමක් ඒවි.. ඒකෙන් පස්සෙ මම තව දුරටත් ට්‍රේන් වෙලා හොඳට වැඩ ටික කරගෙන ගියොත්.. මගේ ඊළඟ හීනෙත් හැබෑවෙයි.. මට එහෙම වුණොත් සමර් ඔලිම්පික් ප්ලේ කරන්න යන්න පුළුවන් වෙනවා..

මැච් එකෙන් පහුවදා පාටි එකක් තිබ්බා.. මම ගියේ නෑ.. යන්න තරම් හොඳ මානසිකත්වයක් තිබුණෙ නැති නිසා මම හොටෙල් එකේම නැවතිලා හිටියා.. කෝච් කියලා තිබුණ අමගේ හෙල්ත් කන්ඩිශන් එක මේ වෙලේ හොඳ නැති නිසා මම ආවෙ නෑ කියලා අනිත් අයට.. මට හුඟක් සෝශාකාරී තැන්වල රැඳෙන්න එපා කියලා ඩොක්ටර් කිව්වා.. හැම තිස්සෙම සිංදුවක් අහලා සැහැල්ලුවෙන් ඉන්න කිව්වා.. පොතක් කියවන්න කිව්වා.. උදේට පොඩි වෝක් එකකට යන්න කිව්වා.. කියාරලා එක්ක සෙල්ලම් කරන්න කිව්වා. හැමදේම ඇඟට පතට වෙහෙසක් නොදැනෙන්න කරගෙන යන්න කිව්වා.. ඔය කිව්වට එහෙම බෑ.. මම ඇඟ මහන්සි කළේ නැතොත් ඔක්කොම මැචස් පරාද වෙනවා.. කෝච් මං ගැන හුඟක් බලාපොරොත්තු තියාගෙන ඉන්නෙ කියලා මම දන්නවා.. ඉතින් මට මං වෙනුවෙන් මෙච්චර කරන කෝච්ගෙ බලාපොරොත්තු නැතිකරන්නෙ කොහොමද.. එහෙම කරන්න බැනෙ..

ඉතාලියෙ ඉඳපු දවස් තුනෙන් පස්සෙ මම ලංකාවට ආවා.. කැම්පස් එකේ වැඩ දවස් හතරට ගොඩ ගැහිලා.. ලෙක්චර්ස් මිස් වෙලා.. එක පිස්සුවක් වෙලා තිබුණේ.. දෙයියනේ කියලා ආශි හිටියා.. ඒකි මට නෝට්ස් ටික ෆොටෝ කොපි කල්ලා සේරම හදලා දුන්නා.. මගේ ලේසියට.. මොකක් වුණත් ආශි ඒකිගෙ උපරිමෙන්ම හැමෝ ගැනම හොයලා බලනවා.. මම ලංකාවට ඇවිත් පහුවදා කැම්පස් ගිහින් එහෙමම හවස නුවර යන්න ලෑස්ති වුණා.. සෙනුකයා හම්බෙන්න ඕන.. මම එච්චර නුවර පාරවල් දන්නෙ ත් නෑ.. කොහොම හරි හොයාගෙන පිළිමතලවට ගියා.. යද්දි හොඳටම වැස්ස.. මහක් දුරකදි මම වාහනේ පොඩ්ඩක් නතර කල්ලා ස්ටියරින් වීල් එකට

@Shan

ඔළුව ගහගෙන හිටියා.. හිත රිදෙන දේවල් මතක් වෙනවා.. මට හරි අමාරුයි.. ඒසී එක හයි ලෙවෙල් එකටම වැඩි කල්ලා තිබ්බත් මට දාඩිය දානවා.. ඉවසන්න බෑ.. වෙන එකෙක් වාහනේ ඇතුළෙ හිටියනම් ගල් වෙනවා.. ඒ තරමට..

කොහොම හරි මම චමිරුට කෝල් එකක් දීලා හරියටම සෙනුකයා නැවතිලා හිටිය බෝඩිම හොයාගත්තා.. මම යද්දි රෑ නමයට විතර ඇති.. මට ඕන වුණේ නොකියම ඇවිත් සෙනුකයව පුදුම කරවන්න.. අන්තිමට පිළිමතලාවට ඇවිත් මම සෙනුකයගෙ බෝඩිම හරියටම හොයාගත්තා.. පුදුම සතුටක් දැනුණෙ..

කාර් එකේ දාලා තිබ්බ පේපර් බෑග් තොගෙත් උස්සගෙන මම ගේට් එක ඇරගෙන ඇතුළට යද්දිම මගේ බඩ පපුව දාලා ගියා.. යන තැනම් මහ ගිරි දඹේට වගේ අලි පත පඩිපෙළක්.. මට අයුක අයියගෙන් අහන්නත් හිතුනා උඹගෙ මිනිහට දෝදුද කියලා.. යකෝ!! මේක නැගහම පණක් ඉතුරුවෙනවද.. ගොං හරකා හොයාගත්තොත් තැනක් මෙහෙම තමා..

මම හතරවටේට දෙස් දෙවොල් තිය තිය පඩි පෙළක් නැගලා බෝඩිමට ගියා.. යද්දි මුළු ගෙදරම ලයිට් දාලා.. එළියෙ අයියා කෙනෙක් වගේ කියන්න පුළුවන් මනුස්සයෙක් සක්මන් කර කර පාඩම් කරනවා.. සෙනුකයා හිටිය ගෙදර තව උන් දෙන්නෙක් ඉන්නවා කිව්වා ඉන්ජිනියරින් ෆැකල්ටි එකේ තර්ඩ් ඉයර් එකේ.. මෙ එක්කෙනෙක්ද දන්නෑ.. පොර මාව දැකලා ඉස්සරහට බෙල්ල දි කල්ලා හොඳ සර්ව පාරක් ඇම්මා.. මම මූණ පිරෙන්නම හිනාවුණාම ඒ අයියා ඇස් පිලම් දෙක තුනක් ගැහුවා.. එක්කො ඉන්ජිනියරින් කරන උන්ගෙ මොකක් හරි අවුලක්ද දන්නෙ නෑ.. සංවේදක ස්නායු හරියට වැඩ නෑ.. මොලේට පණිවිඩේ යන්නෙ පරක්කු වෙලා..

" හායි.."

බැරිම තැන මම අතක් වැනුවහම ඔන්න යාන්තම් මේ ලෝකෙට ආවා..

" මේ කව්ද..?? "

" අයියෙ සෙනුක ඉන්නවද ගෙදර.."

" සෙනුක?? ආ සෙනුක මල්ලි.. ඔව් මේ යාළුවෙක්ද."

@Shan

" ඔව් අයියෙ.."

" ආ ඉන්න ඉන්න.."

ඒ අයියා ගේ අස්සට මූණැ දැම්මා..

" සෙනුක මල්ලේඒඒඒඒඒඒඒඒඒඒඒඒඒඒඒඒඒඒහ්!! පහළට වරේඒඒඒඒඒන්.."

" මොකද බල්ලො කෑගහන්නෙ.."

ඒ සැරේ තව අයිය කෙනෙක් එළියට බැස්සා.. අපරාදෙ කෝල් එකක්ම දෙන්න තිබ්බෙ..

" මෙ සෙනුක මල්ලිගෙ යාළුවෙක් ඇවිල්ලා.."

අර අයියා පොල්කටු හැන්දකුත් අතේ තියාගෙන මගේ මූණට එබුණා.. එබිලා ඇස් දෙක ලොකු කරගත්තා..

" හම්මට.. මෙ අර ෂනෙරු නේද.. අඩෙ සෙනුක මල්ලිගෙ යාළුවා.. ඔහොම ඉඳහන් මල්ලෙ.. අරූ පාඩම් කරනවද කොහෙද.. ඔයි සෙනුක මල්ලි!! සඳළුතලෙන් බැහැපන්.. කවුද ඇවිල්ලා බලන්න.."

මම ගේ ඇතුළට ගිහින් මගෙ පොල්පිති නාම්බා එනකල් දැස් අයාගෙන බලාගෙන හිටියම අර අයියලා දෙන්නා කුටු කුටු ගගා දොර රෙද්දත් මෙව්ව කරගෙන කුස්සිය අස්සට වැදුණා.. පඩිපෙළක් තිබ්බට ගෙදරනම් හොඳයිද කොහෙද.. මල් එහෙම වවලා පිළිවෙලට තියාගෙන ඉන්නෙ.. උඩ තට්ටුවෙ සෙනුකයා ඉන්නෙ කියලා මට කියලා තිබ්බා.. ටිකකින් සෙනුකයා එනවා ඉරි ඉරි දිග කලිසමකුයි ඒකට සෙට් වෙන කමිසකුයි ඇඳගෙන පඩියෙන් පඩියට පැන පැන.. නෙද්දකින්.. මූ නම් මොකෙක්ද මන්දා..

" කවුරුද ආවෙ නිවසට කවුරුද ආවෙ..//"

"....."

" කවුරුද-හම්මට-මගෙ බල්ලො-ෂනෙරු රන්කදේ මයෙ අම්මා උඹ ආවද මේ පෞකාරයව බලන්න.. දෙයියනේ.."

@Shan

සෙනුකයා පඩිපෙළ බැහැගෙන බැහැගෙන ඇවිත් මගේ ඇඟට පැන්නා.. මම අතින් කටින් මලුත් උස්සගෙන ඌවත් දෝත බදලම අල්ලගත්තා.. සෙනුකයා මාව තද කල්ලා මිරිකිලා තැරිගැහිලා යන්නම පොඩි කළා..

" හම්මො-හුස්ම පගො.. අතෑරපන්.."

" අඩෝ උඹ කිවවෙත් නෑ මෝඩ මූසලයා.. මහ රෑම ඇවිලා.. ඒ වරෙන් උඩට යන්න.. මේ අයියේ මම උඩට යනවා හොඳේ.."

අර අයියා කෙනෙක් දොර රෙද්ද අස්සෙන් මූණ දැම්මා.. අර දෙවෙනියට ආපු අයියා..

"ආ හරි මල්ලි.."

සෙනුකය අමගේ අතින් ඇදගෙන පඩියක් ඇර පඩියක් කකුල තිය තිය උඩට දුවගෙන ආවා.. මාත් උගේ පස්සෙන්ම ඇදිලා ආවා.. දෙයියනේ පුදුම සතුටක් දැනෙන්නෙ මේ ගස් බල්ලව දැක්කහම.. උඩ තිබ්බෙ පොඩි සාලයක් වගේ කෑල්ල.. යන තැනම සෙනුකයගෙ කාමරේ.. සාලෙ පුරාම මුගේ පොත් කොළ කෑලි ලියපුවා අතුරලා වගේ.. කාමරේ නම් පිළිවෙලට තියනවා.. මම බෑග් ටික මේසෙ උඩින් තියලා එහෙමම ඉඳගත්තා.. මෙකෙ පඩිපෙළ් නැගලම හති මටනම්..

" උඹ පාඩම් කළාද.."

" ඔව් බං.. අඩෝ උඹට මහන්සිත් ඇති.. කාලද ආවෙ.. අම්මෙ මගෙ පෞකාරයා.. පුදුම සතුටක් දැනෙන්නෙ උඹව දැක්කහම බං.."

සෙනුකයා මාව ආයෙම බදාගත්තා.. හිතට සැනසීමක් දැනෙනවා.. මට ඌ ඉන්නවා කියලා හදවතට දැනෙනවා.. ටිකකින් සෙනුක මගේ මූණට එබිලා මූණ දිහා බලාගෙන හිටියා.. මම උගේ ඇස් මඟෑරලා අහක බලාගත්තා.. මට අයි කන්ටැක් තියාගෙන කතාකරන්න හරි අමාරුයි.. ලොකු කලබල ගතියක් දැනෙනවා..

" ඔය කරගෙන තියෙන්නෙ.. මට උඹ නැතුව පාළුයි ෂනෙරු.. සිරාවටම වෙන මොකෙක් එක්කවත් කතාකරන්න හිතෙන්නෙත් නෑ.."

@Shan

සෙනුක ටිකකින් අල්මාරියෙන් ඇඳුමක් අරගෙන ටවල් එකක් එක්ක මට දුන්නා..

" උණු වතුරෙන් වොශ් එකක් දාගෙන වරෙන්.. උඹව දැක්කහම බය හිතෙනවා.. මොනවද යකෝ මේ කරගෙන තියෙන්නෙ.. ඉක්මනට ගිහින් එනවකො.."

" කොහෙද වොශ්‍රූම් එක.."

" ආ වරෙන්.."

සෙනුක වොශ්‍රූම් එක තියන තැන පෙන්නුවහම මම ගිහින් වොශ් එකක් දාගත්තා.. උණු වතුර කියලා හිතාගෙන ඇල් වතුර ඇඟට හලාගෙන මට තරු පෙණුනා.. මූට සීතලයි කියලා නහින්නෙ ඇත්තටමද කොහෙද.. ඊටපස්සෙ කාලා බීලා පහළ අයියලා දෙන්නටත් ගුඩ් නයිට් කියාගෙන සෙනුකයගෙ කාමරේට ආවා.. ඒ කාමරේ ශෝක්.. සෙනුක පිළිවෙලට තියාගෙන ඉන්නවා.. ඩබල් ඇඳක් එක්ක.. ලොකුවට කාමරේ බඩු පුරවන් නෑ.. උගෙ යන යන තැන උස්සන් යන ගිටාර් එකයි.. ක්‍රිකට් ගහන බැට් අරවා මේවයි.. පිළිවෙළට තියලා තිබුණා..

" මෙහේ මරුනෙ ඕයි.."

" ඔව් ඔව්.. මම හන්තානට පායන හඳ ලස්සනද කියලා බල බල ඉන්නෙ මෙන්න මේ කවුළුවෙන්.. ආතල් නේ.. අඩෝ අපේ කැම්පස් එකේ ඉන්නවා බං කෑලි වගයක් උඹට කියන්න-පොඩ්ඩක් ඉඳපන් අපේ මිනිහා ගන්නවා.."

මූ ගැන නම් මට කවි සීපදත් කියවෙනවා.. සෙනුකයා ෆෝන් එක කනේ ගහගත්තා..

" ඔහ් කියන්න.. නිදි නැද්ද වදේ.."

" මේ ඔයා අඳුරන එක්කෙනෙක් මෙහේ ඇවිල්ලා.. දෙන්නද ෆෝන් එක.."

සෙනුකයා ස්පීකර් ඔන් කල්ලා ෆෝන් එක මගේ පැත්තට ඇල්ලුවා..

" ආ අයියේ.. කෝමතෙ.. මම මගෙ පෙම්කාරයව බලන්න ආවා හලෝ.."

" ෂනෙරු මල්ලි..?? අඩෙ මහ රෑම ආවද.."

@Shan

" ඔව් රෑ කියලා බලන්න පුළුවන්ද.. මගේ සන්කුට්ටට සීතලයිනෙ.."

අයුක අයියට එකපාර කැස්සක් ආවා.. මම ඉතින් ඇත්තනෙ කිව්වෙ.. කහින්න ඕනද ඕකට..

" උඹලට නම් ලැජ්ජාවක් නෑ බං.."

" ඇයි ඇතින් ඉඳන් ඔය තරම් රත්තරං.. මං ආවොත් ද ඔබ මට හිමි.."

" වස්සානයට අතවනලා ඉමු මග බලන්.. උද්‍යානයක කෙළවරට වී.."

" අපෝ උඹලා ඕන මගුලක් කරගනින්.. මම තියනවා.."

" වත්සල්ගෙන් ඈත් වෙලා ඉන්නද අයියෙ.. එපාද.."

" අපි කිව්වම උඹලා ඈත්වෙලා ඉඳී.. ආ මේ ෂනෙරු.. ඔය ගෙදර පහළ ඉන්න නල්ලමලේ ඉංජිනියරින් අයියලා දෙන්නා ගැන හොයලා කියපන්.. බායි.."

අයුක අයියට ස්පීකර් ඕන් කරපු එක අමතක වෙඅා අනවශ්‍ය තොරතුරකුත් මේ මැද්දට අතැරියා.. සෙනුකයගෙ මූණ මැද්දට අකුණක් ගැහුවා වගේ.. එක්කො ඕක මට මැසේජ් එකක් දාලා කියන්න එපෑ.. සැක් මේ ගොං අයියනම්..

" අර දැක්කද.. මේ මිනිහා කිව්ව බලු කතාව.. ඉඳපන් ආයෙ ඇඟේ හුඟේ ගාගෙන ආවොත් මම කියන්න දෙකතුනක්.. ඒවා වැඩක් නෑ.. මගේ හොර මනුස්සයා ආවනෙ.."

සෙනුකයා අත දික් කලා ස්විච් එක ඕෆ් කල්ලා ඇඳට ගිහින් උගේ අත උඩට තටුවක් දැම්මා.. මට අපි දෙන්නගෙ පොඩි කාලෙ මතක් වෙනවා.. තාම වෙනස් වෙලා නෑ.. මම පොඩි කාලෙ සෙනුකයගෙ අත උඩ ඔලුව තියාගෙන කියවන්නෙ.. මම ඇඳෙන් හාන්සිවෙලා වෙනදා වගේම උගේ අත උඩින් ඔලුව තියාගත්තම සෙනුකයට හිනා ගියා..

" අඩෝ අපි දෙන්නගෙ හිච්චි කාලෙ.."

" ම්ම්.."

@Shan

" මොකෝ පාඩම් වැඩ.. උඹ කරගෙන යනවනෙ.."

" අනේ මන්දා බං.. කරගෙන යනවා කියන්නෙ.. ඔව් ඉතින්.."

සෙනුකයා මගේ කොණ්ඩෙ අස්සෙන් ඇඟිලි යවලා අතගෑවා..

" ඒවා වැඩක් නෑ.. දැන් නිදාගනින්.. මං උඹ ගාව ඉන්නවනෙ.. අපි පස්සෙ කතාකරමු.."

මම ඇස් පියාගත්තා.. හුරුපුරුදු ගතියක් දැනෙනවා සෙනුක ළඟ.. මම සෙනුක කිට්ටුවටම ගිහින් ඇඳ රෙද්ද උඩට ඇදගත්තා.. මට මේ වෙලාවෙ ඕන මං ගාව කවුරුහරි ඉන්න එක විතරයි.. මම දන්නවා සෙනුකයා මගේ කිට්ටුම එකා.. ඒ හැඟීම මට දැනෙනවා.. හුඟ කාලෙකට පස්සෙ මට අපේ පොඩි කාලෙ මතක් වුණා.. ඒවා එක්ක හිතට සතුටක් දැනුණා.. අපරාදෙ මට සෙනුකව හොයාගෙන කලින් එන්න තිබුණා.. හුඟක් වෙලා නොගිහින්ම මට නින්ද ගියා.. සෙනුක මගේ ඔළුව අතගෑවා.. ඌ කොළඹින් එද්දි හිටිය ෂනෙරු නෙමෙයි දැන් ඉන්නෙ.. උගේ හිතට වද දෙනව ඇති.. මගේ ඇස් හැම තිස්සෙම රතු වෙලා.. ඇස්වල කිසි පණක් නෑ.. අත් වල නකල්ස් රතු වෙලා.. ලේම ලේ පාටයි.. මූණ සුදුමැලි වෙලා.. මගේ පෙනුමත් මගේ හිත වගේම මැලවිලා යන්න අරගෙන.. ඉස්සර ආසාවටවත් ගියේ නැති කොණ්ඩෙ දැන් අහුරු පිටින් යනවා.. මම හැමදාම වගේ ප්‍රාර්ථනා කළා.. මට මේ හැඟීමෙන් එළියට ඒගන්න ඕන.. ඒ අඳුරු හැඟීම ඉරාගෙන එළියක් හොයාගන්න ඕන.. මට මාවම හොඳ තත්වෙකට ගේන්න ඕන.. මම ඒක කරන්න ඕනමයි..

පොඩි වෙලාවකට  මට දැණුන හුරුපුරුදු හැඟීම මගේ හිත සතුටු කළා..

නරක සමනලයා ආවෝ.. කොහොමද ළමයිනේ ඉතින්..

ආ ඊයෙ ගෙසස් වල දෙක තුනක තිබ්බා හරි උත්තරේ.. දක්සයි නේතෙ.. එන්න මං ගානෙ දෙනවා ටියුලිප් මලක්.. ඉන්බොක්ස් මැසේජ් තොගයක් තියනවා දෙයියනේ.. මේ ඇත්තිට වෙලාවක් නෑ රිප්ලයි කොරන්න.. ඒ තියා මගේ වස්සැප් එකේ ඉමන ළමයි දම්නවා මම ඔන්ලයින් එම්නෙත් නෑ හනේ.. මම දවසකට දෙක තුනකට හරි රිප්ලයි කරනවා හොඳේ.. තරහ වෙම්න එපා..

හෙට ඩබල් අප්ඩේටු දෙන්න බලාපොරොත්තුවක් තියෙනවා..

@Shan

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුනකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

## 155 කොටස

සෙනුක.. සෙනුක හම්බුණාට පස්සෙ මගේ හිතට දැනුණු සහනෙ ගැන නම් මට කියලා නිම කරන්න බැරි තරම්.. සති අන්තෙ නිසා.. අපි ඇවිදින්න ගියා.. ඌ එක්ක ඉන්නකොට අර ඉස්සර ඉන්න මාවම ආයෙම එළියට ඇවිල්ලා කියලා මට දැනුණා.. මට උවමනා වුණේ ඒ අඳුරු හැඟීම අයින් කල්ලා මං වෙනුවෙන් කෙනෙක් ඉන්නවා කියලා හිතට දැනෙන්න ඇරෙන්න විතරයි.. මම මගේ කියලා හිතාගෙන ඉන්න.. මම ආදරේ කරපු අයගෙන මට හිටියෙ ඉතුරුවෙලා සෙනුක විතරයි.. මගේ අම්මා..

ඒ ගැන මම ආයෙම නොහිතා ඉන්න තීරණේ කළා..

මම කිසිම දෙයක් කරන්නෙ අනිත් පැත්තට දෙයක් බලාපොරොත්තුව නෙමේ.. ඉතින් ඒකට කමක් නෑ.. අම්මා අම්මගෙ ජීවිතේ ඉස්සරහට යන්න හදනවා.. මට සාම්ප්‍රදායික පුතෙක් වෙලා ඒකට අකුල් හෙලන්න බෑ.. මම මගේ හිත හදාගත්තා..

සෙනුක හරි අමුතු මනුස්සයෙක්.. ඌ හරියටම මාව කියවන්නෙ.. ඌ මගේ හැමදෙයක්ම බලන් ඉඳලා වගේ.. සමහරවිට අයුක අයියා නිසාද දන්නෙ නෑ.. මට සෙනුකගෙ යාළුකම.. ඒ ආදරේ දැනුණෙ මහමෙරක් වගේ.. මගේ අමාරුම තැන් වලදී සෙනුක මගේ අතින් අල්ලගෙන මාව ඇදගෙන ගියා.. එහෙම යාළුවෙක් ලබන්න.. අනිවාරෙන්ම මම පහුගිය ආත්මෙක මොකක් හරි පිනක් කරන්න ඇති කියලා මම නිතර හිතුවා..

සෙනුක හමුවෙන්න ගිය වෙලේ අපි දලදා මාළිගාවෙ ගියා. ඊටපස්සෙ ඌ නහින්න හැදුවා පේරාදෙණි ගාඩ්න් යමු කියලා.. ඊටපස්සෙ ඔය කඩචෝරු කකා ඇවිදලා නටලා කල්ලා මම කොළඹ ආවා.. තව මට ඔලුව පිස්සු වැටෙන පාඩම් වගේකුත් ඌ කියලා දුන්නා.. සෙනුකයට මට වඩා සැහෙන්න වැඩ පුළුවන්.. අනික ඌ සිංදු කියද්දි අහගෙන ඉන්න හිතෙනවා.. දකින උන් හිතන්නෙ එක අතකට අපි දෙන්නා කපල් එකක් කියලා.. සාමාන්‍යයෙන් යාළු කොල්ලො දෙන්නෙක් ඉන්නවට වඩා අපි දෙන්නට ස්කින් ශිප් තිබුණා.. ඉස්කෝලෙ උන් නම් සෙනුකයි මමයි කිව්වම අර අමුඩෙයි පුපයි වගේ තමා.. නැතුවම බෑ.. ඔය අමුඩෙ කතාව කිව්වෙත් සර් කෙනෙක් තමා.. මම විශ්‍රාම් යනවනම්.. ඌටත් බරේ හැදෙනවා.. කනවනම් කනවා.. නොකා ඉන්නවනම් දෙන්නම නෑ.. මගේ පොඩි කාලෙ

@Shan

ලස්සන වෙන්න එක හේතුවක් තමයි සෙනුක.. ඌ හුඟක් බිසී වුණත් පුළුවන් හැමවෙලේම මං ගැන හෙව්වා.. මමත් මට පුළුවන් තරමින් ඌ ගැන හෙව්වා.. ඉස්සර වගේ නෙමෙයි ඉතින්.. දැන් අයුක අයියා ඉන්නවනෙ..

ලොකුවටම සතුටු දැනුණ සති අන්තෙකට පස්සෙ මම කොළඹ ඇවිත් ආයෙම කැම්පස් වැඩයි ක්ලබ් එකේ වැඩයි එක්ක බිසී වුණා.. හිතුවා වගේම බැඩ්මින්ටන් ඇසෝසියේශන් එකෙන් මට ලෙටර් එක ආවා.. මෙම්බර් කෙනෙක් විදියට බැඳෙන්න.. මගේ දක්ශතාවය අනුව ඉතින් නැශනල් ප්ලේ කරන්න දාවි.. නැත්නම් වෙන මොකක් හරි වේවි.. කොහොම වුණත් දැනට මම ක්ලබ් එකේ නමින් තමයි ප්ලේ කරගෙන යන්නෙ..

ගිය සතියෙ අකිල අංකල්.. ඒ කියන්නෙ අපේ අම්මට ප්‍රපෝස් කරපු අංකල් එයාගෙ පුතා එක්ක ලංකාවට ආවා.. මමත් ඒකට ගමේ ගියා.. ඒ අංකල් ඇත්තටම හොඳ මනුස්සයෙක් තමයි.. මාත් එක්ක හුඟක් හොඳින් කතාකළා.. අනික සදෙව් අයියා.. ඒ කියන්නෙ ඉස්සරහට මගේ ස්ටෙප් බ්‍රදර් වෙන්න ඉන්න අයියා.. හරිම හොඳයි.. ඇත්තටම යාළුවෙක් වගේ.. මට වඩා අවුරුදු හයක් වැඩිමල්.. බබා තවම පොඩි නිසා වයිෆ් එක්ක එයාලා ඇමරිකා නතර කල්ලාලු ආවෙ.. අපේ අම්මව හමුවෙන්න.. ආච්චිඅම්මත් අකමැත්තක් පෙන්නුවෙ නෑ.. ඒත් ඔය අම්මගෙ සමහර දේවල් නිසා හිත අමනාපෙකින් තමා ඉන්නෙ.. ලොකු අම්මත් අම්මා මැරි කරන්න යන එක ගැන අකමැත්තක් පෙන්නුවෙ නෑ.. ආයෙ කලින් වගෙ මෝඩ වැඩ නොකර හොඳ තීරණයක් ගන්න එක හොඳයි කිව්වා..

සෙනුකත් එක්ක කතාකළාම එයා මට සෑහෙන්න ඇඩ්වයිසස් ගොඩක් දුන්නා.. මම අම්මා යන එක ගැන හිත රිදෙන්නෙ නැති තැන වෙනකල් හිත හදාගත්තා.. හිත පොඩ්ඩක්වත් නැතිවෙන්න රිදෙන්න නෙමේ.. අඩුම තරමෙ අඩුවෙන් දුක දැනෙන්න.. මට ඒ ඇති හොඳටම..

සදෙව් අයියා හුඟ දවසක් මෙහේ හිටියෙ නෑ සතියෙන් ආයෙම ගියා.. එහේ මෙහේ වගේ දිගනිවාඩු දෙන්නෙ නැහැල්ලුනෙ.. එයාට සෑහෙන්න වැඩ තියනවා කිව්වා.. තව මම ඉන්න ගෙදරට ඇවිත් කතාකර කර ඉන්නවා.. ඒත් අපේ චමිරු ලොකු අයියණ්ඩි කැමති නෑ කවුරුත් එහේ ගෙදර එනවට.. ඒකට මූණ ඇද කරගෙන හිටියා දවස් දෙක තුනක්.. ඉතින් හත්දෙයියනේ ආවහම එන්න කියන්නෙ නැතුව.. පලයන් කියන්නද.. අනික සදෙව් අයියා

@Shan

කියන්නෙ එහෙම නරක මනුස්සයෙක් නෙමෙයි.. හරිම හොඳයි.. ඕනම දෙයක් තේරුම් ගන්න පුළුවන් විදියේ මනුස්සයෙක්..

අපේ අම්මා මට වඩා සදෙව් අයියට එකතුයි වගේ.. හුඟක් ආදරෙන් කතාබහ කරන්නෙ.. අවසානෙ අම්මා සතුටින් ඉන්නවා දකින එක.. මගේ ජීවිතේ තිබ්බ එක බලාපොරොත්තුවක් ඒක.. මම හිතුවෙ මම ඉගනගෙන අම්මව සතුටින් තියනවා කියලා.. කමක් නෑ.. කොයි විදියකින් හරි අම්මා දැන් සතුටින් ඉන්නවා.. එයා හරි ලස්සනයි.. කොයි කාටත් අකමැති හිතෙන්නෙ නෑ.. අකිල අංකල් මගේ අම්මව හොඳින් බලාගනී කියලා මම විශ්වාසෙ තියනවා.. එහෙම නැතිවුණොත්.. අම්මා මං ගාවට අරං පරිස්සමට බලාගන්න එක මට බරක් නෙමේ.. මම කියන්නෙ මෙච්චරයි..

එයාව රිද්දන්න එපා.. ගැළපෙන්නෙ නෑ කියලා හිතෙනවනම්.. මට අම්මව දෙන්න.. මම අම්මට ඕන කොහොමද.. හැමදේම දීලා පරිස්සමට බලාගන්නවා..

ආච්චිඅම්මා හොඳ සනීපෙකින් නෙමෙයි ඉන්නෙ.. ඒකයි මට ප්‍රශ්නයක් වුනත් ආච්චිට කියාගන්න බැරි.. හිත නරක් කරන්න හොඳ නැති නිසා. අද වෙනකලුත් ආච්චිඅම්මා එයාගෙ පුතා.. ඒ කියන්නෙ මගේ මාමා ගැන එකම එක වැරැද්දක් වත් කිව්වෙ නෑ.. ආච්චිඅම්මා හරි පුදුමයි.. මට රුස්ස ගහක් මැවෙනවා.. හැමෝටම සෙවන දෙන.. හුස්ම දෙන ගහක්.. දැන් ඒ හග හුඟක් වයසයි.. අතු ඉති දරාගෙන ඉන්න අමාරුයි.. අවුරුදු හැත්තෑවක් කියන්නෙ.. පොඩි වයසක් නෙමෙයිනෙ.. මම ඇත්ත තත්වෙට මූණ දෙන ගමන් හිටියා.. අම්මා මෙච්චරකල් ආච්චිව බලාගත්තා වගේම.. මම මගේ ආච්චිඅම්මව බලාගන්නවා.. අම්මා වෙනුවෙන් මම ඒ වගකීම භාරගත්තා.. මොකද ආච්චි ලොකු අම්මගෙ නපුරු ගති නිසා එයා ගාව ඉන්න ආස නෑ.. ඉතින් මං ගාව ඉන්න තමා ආස.. මම හැමදාම හිතන්නෙ.. ආච්චිනම් වැරදිලා තමා මගේ ආච්චි වෙලා ඉපදිලා තියෙන්නෙ.. හරිනම් මගේ අම්මයි වෙන්න ඕන..

ළමයින්ට අම්මෙක් වෙන්න වදන්නම ඕනනෑ.. මම ඒක ඉහ මුදුනින්ම පිළිගන්නවා..

අකිල අංකල් එක්ක අම්මා කතාකරන්න අරගෙනත් හුඟක් කාලයක් නිසා ආපු වෙලේම එන්ගේජ්මන්ට් එක ගන්න ප්ලෑන් කල්ලා තිබ්බෙ.. අම්මගෙ පැත්තෙන් මට කරන සෑහෙන වගකීම් ගොඩක් තිබ්බා.. මට හරියට

@Shan

දැනෙන්නෙ මගේ දුවෙක් කසාද බඳිනවා වගේ.. හැම වැඩේම මට දුවලා පැනලා කරන වුණා.. මෙච්චර ලොකු පුතෙක් ඉන්නවා මට අත් දෙක බැඳගෙන ඉන්න බැහැනෙ..

අම්මගෙ එන්ගේජ්මන්ට් එකට තියෙන්නෙ සතියයි.. එන්ගේජ්මන්ට් එකක් කිව්වට.. එහෙමම නෙමේ.. අකිල අංකල් අපේ ආගමේ නෙමෙයි.. ක්‍රිස්තියානි.. අම්මා පළවෙනි වතාවට කසාද බඳින්නෙ පල්ලියක.. ලැජ්ජ වෙන්න ඕන නෑ.. මගේ උප්පැන්න සහතිකේට තියෙන්නෙත් ඉරක් විතරයි.. ඉතින් මගේ අම්මට මම හම්බුණේ කසාද බැඳලා නෙමේ.. හරි විදියට.. නිකම් කොළේක අත්සන් කල්ලා විතරයි.. කසාද බඳිනවා කියලා මම අදහස් කළේ හැමෝටම පේන්න ගන උත්සවයක් වගේ එකකට.. අන්න ඒ වගේ.. හොරෙන්ම පැනලා ගිහින් රෙජිස්ටාර් ගාව අත්සන් කරන එකට නෙමේ.. අත්සන් කරලත් මගේ උප්පැන්නෙට නම දෙන්න බෑ කිව්ව තාත්තෙක් ගැන..

ඒවා ඇවිල්ලා මම ජීවිතෙන් සදහටම බැහැර කරපු මාතෘකා..

සදෙව් අයියගෙ අම්මා නම් එයා පොඩි කාලෙම නැතිවෙලා.. එයා තාත්තා ගාව හැදිලා තියෙන්නෙ.. පස්සෙ රට ගියානෙ.. එයත් වගකීම් ඉටු කරන්න දන්න හොඳ පුතෙක්.. මම ඒකට ගරු කරනවා.. ආයෙම එන්ගේජ්මන්ට් එකට වයිෆ් එක්කම ලංකාවට එනවා කියලා කිව්වෙ.. මට තියන වැඩ මෙ සතියෙ දහගුණයක් වෙලා තියෙන්නෙ..

" නටන්නෙ නැතුව ඉඳපන්කො.. සයිඩ් මිරර් එක පේන්නෙත් නෑ.."

චමිරුවා මගේ කොලර් එකෙන් අල්ලලා මාව සීට් එකට දමලා ගැහුවා..

" මනුස්සයෙක් වුණාම මනුස්ස ගතියට ඉඳපන්.. බූරුවා.."

" මම මනුස්සයෙක් නෙමේ.."

මමයි චමිරුයි හිටියෙ ඩෙකරේශන්ස් වලට ඕන දේවල් වලට ෆ්ලෝරා එකකට යන ගමන්.. අද සෙනුකයා කොළඹ එනවා අම්මලව බලන්න.. හවසට අපි තුන්දෙනාට සෙට් වෙන්න පුළුවන්.. අපේ අම්මත් ළඟදි මෙහේ එනවා කිව්වා.. අනේ මන්දා මේ වැඩ කොහොම මැනේජ් කරගන්නද කියලා.. ඔක්කොමත් හරි අපිට එක්සෑම් කිට්ටු වෙනවා.. බඩ පපුව රත්

@Shan

වෙලා ඉන්නෙ ඒක නිසා.. පාඩම් කරන්න තියනවා අහස උසට නෝට් කන්දරාවක්..

මම චමිරුට දෙකක් රවලා ශටර් එකට ඔලුව තියාගත්තා..

" දැන් අම්මා යන්න කැමතිලුද.."

" ම්ම්.. පාස්පෝට් එකෙත් වැඩ හරිනෙ.. ඉතුරු වැඩ අකිල අංකල් කරයි.."

" උඹ මොකුත් හංගගෙන නෙමේ නේද ඉන්නෙ.."

" පිස්සුද බං නෑ.. අද හවස කැප්‍රි යමුද.."

" යමං.. කියාන් අයියත් එනවා කිව්වා.. මස්සිනත් මෙහෙ එනවනෙ.."

" අරුන් දෙන්නත් ඒවිද.."

" ඒවි නේ.. අහලා බලමු.. කෙල්ලො උස්සන් ගියා වගේ නෙමෙයි උඹලා එක්ක.. රෙද්ද.. කෙල්ලො විතරක් නෙමේ උඹත් එහෙමනෙ.. ඒකනිසා ගිහින් නටන්නැතුව පාඩුවෙ ඉදපන්.."

" ක්ලබ් යන්නෙ පාඩුවෙ ඉන්නද මල්ලෙ.. ආතල් දෙනවනෙ.."

චමිරු කට ඉරක් කරගෙන පාඩුවෙ හිටියා.. වැඩිය කතාකරන්න යන්න හොද නෑ.. මම තේරුම්ගත්ත එක දෙයක්.. මම මේ ලෝකෙ තියන හැම සබ්බ සකල මනාවම රධ්‍ය අයියා එක්ක කියවද්දි ඌ අහගෙන ඉන්නවා තමා.. ඒත් වෙන එකෙක් එක්ක කියවන්න ගියොත්.. ඒ කියන්නෙ මේ චමිරුවා ගේ එකෙක් එක්ක කියවන්න ගියොත් කෙළින්ම වාහනේ පදික වේදිකාවට කපලා.. බැහැලා පලයන් කියනවා.. අවධානමක් ගන්න ඕන නැනෙ බොරුවට..

" ම්ම්.. ම්ම්.. හද පලා යන දුක එකහු කරගෙන

ඉන්නවා මම මග බලන්හේතු හෙව්වේ ඔබේ රුව දැක ගන්න ආසා හින්දා මං

පුන්සදක් පායන්නේ කොහොමත්

@Shan

මාසෙකට සැරයක් නේ බං.."

චමිරුට ටික වෙලාවකින් මං ඉන්නවා කියලා අමතක වෙලා වාහනේ ගියපු සිංදුවක් කියවුණා.. ස්ටියරින් වීල් එකට තට්ටුවක් දදා ඌ සිංදු කිය කිය හිටිය හිටියෙ ෆුල් සීරියස් මූඩ් එකේ.. මම දැනගෙන හිටියෙ නැනෙ සමිරුකාට සිංදු කියන්න පුළුවන් කියලා.. බලන් යද්දි ඒකා ලස්සනට සින්ග් කරනවා..

" ඔබ පායනා දින කෙනෙකුට එළිය දෙන්නට

කාරි නෑ සඳ මගෙ ලොව එළිය නොවුණට

ඔබෙ ආදරේකට ආසයි හේතු වෙන්නට

කාරි නෑ සඳ ඔබ දැක-කැහ්-මහ්ම..

මොකද උඹ.."

චමිරු මුළු සිංදුවම මෙලෝ සිහියක් නැතුව මුමුණ මුමුණ ඉඳලා හදිසියෙම මං දිහා බලලා කැස්සක් හදාගත්තා..

" මොකුත් නෑ.. මොකද.."

ටික වෙලාවක් කිසිම සද්දයක් තිබුණෙ නෑ..

" මට පොඩි වැඩක් මතක් වුණා.. උඹ දන්නවද කැඩෙට් කරන උන් ඉස්කෝලෙ නවතිනවනෙ කෑම්පින් වලට.."

" ඔව්..??"

" උඹට කියන්න ඒ කාලෙ හෙන ආතල් බං.. රධ්‍ය අයියා සාජන්හිටපු කාලෙ ඩයල් එක උදේට තදයා වගේ ඉඳලා රෑට ආතල් දෙනවා.. දවසක් බෙරයක් උස්සන් ඇවිත් කැඩෙට් රූම් එක දෙක වෙන්න සිංදු කිව්වා.."

" හෑ.. උඹලා එව්වත් කරනවද.."

" රධ්‍ය අයියගෙ බැජ් එකේ ඉඳපු අනිත් උන් ආතල්.."

" මම හිතන් හිටියෙ මේ කැඩෙට් කරන උන්-නෑ එක්කො එපා.."

@Shan

" මොකද.. ඇයි උඹ හිතුවද කැඩෙට් කළා කියලා අපි මේ ගැහීම් දැනීම නැති මිනිස්සු කියලා.."

" ඔව්.. සිරාවට එහෙම හිතුවා.. කොහොමද හරියටම කිව්වෙ.."

චමිරු ඉස්සරහ යන වාහනේට මහා හයියෙන් හෝන් එකක් ගැහුවා.. කියලා තියනවා මේ පගාට තරහ ගියාම හෝන් එක උඩ වාඩිවෙන්න එපා කියලා..

" ඉතින් කියපන්කො.. උඹලා මොකද කරන්නෙ.."

" රධ්‍ය අයියට ලස්සනට සිංදු කියන්න පුළුවන් නෙ.. එක දවසක් මට මතකයි ඒකා 'මා ඉතින් යන්න යනවා' කිව්වා.. උඹට කියන්න.. පට්ට ලස්සනයි බං.."

" සිරාවට.."

" ඇයි උඹලා සිංදු කියන්නැද්ද.."

චමිරු පුදුමෙන් වගේ මගෙන් ඇහුවා..

" කියනවා.. හෙන අමාරුයි ඒ මනුස්සයට කියලා සිංදුවක් කියවගන්න.."

" කිව්වම උඹ අඩනවනෙ.. ඒකනිසා වෙන්න ඇති.."

මම හිනාවෙලා පාඩුවෙ හිටියා..

" ඉවසලා ඉඳහන්.. කැම්පස් අවුට් වුණ ගමන් උඹෙ සියලු දෝශ දූරීභූත වෙලා යයි.. "

" උඹ කොහොමද කියන්නෙ.."

" එහෙම තමා.. ඒකනිසා පාඩම් කරපන් හොඳට.. රිපීට් සෙට් කරගන්නෙ නැතුව.."

" ම්ම්.. එයා එයිද බං.."

චමිරු මගේ දිහා රවලා බැලුවා

@Shan

" කුණුහර්ප කතානොකර ඉඳපන්... ඌ එන්නෙ නැතුව.."

" ම්ම්.."

මම කල්පනාවට වැටුණා.. ඉක්මනට කාලෙ ගෙවිලා යනවනම්..

" ෂනෙරු යමු.."

" ආ..??"

චමිරු ශේඩ්ස් දෙකත් දාගෙන වාහනෙන් බැස්සම මාත් කොණ්ඩෙ ලිහිලා තිබ්බ පොඩි පෝනිටේල් එක හරියට දාගත්තා.. මේ කොණ්ඩෙ වැවෙනවා වැවෙනවා ඉවරයක් නෑ.. හිතුණොත් තට්ටෙ ගාණවා..

අපි ෆ්ලෝරා එකට ගිහින් ඩෙකරේශන්ස් වලට උවමනා දේවල් ඔක්කොම රෙඩි කළා.. සතියයි කියන්නෙ හරි පොඩි කාලයයිනෙ.. හැම මගුලම පැනගෙන කළාට මම අඳින ඇඳුමක්වත් තාම හොයාගෙන නෑ.. අකිල අංකල්ගෙ ෆැමලි එකේම හුඟක් අය ඉන්නවා.. මොකාද වගේ යන්න බෑනෙ.. වෙන්න ඩොකෙක්නෙ අනික මම.. ලේසි පාසුද.. කමනි ඇන්ටි හම්බෙලා වෙඩින් කාඩ් එකක් දෙන්නත් හිතෙනවා.. ඒත් ඕන නෑ.. කරපු පව් වලට පල්ලියට අඩිය තිබ්බ ගමන් හෙනයක්වත් ගැහුවොත් එහෙම කියන්න බෑනෙ..

හවස් වෙන්න සෙනුකයා ගෙදර ගියා කියලා කෝල් එකක් දුන්නා.. ඊටපස්සෙ රෑ ඔක්කොම එක්ක කැප්‍රි ගියා.. ආශිලත් ආවා අපිත් එක්කම යන්න.. ගිහින් නටලා නටලා පිස්සු කෙලලා මම පුරුදු විදියටම හතරගාතෙ දාලා ඉන්න සෙනුකයවත් උස්සගෙන මම ඉන්න ගෙදර ආවා.. රෙක්සියි කියාරයි පුරුදු විදියටම බුරාගෙන මගේ ඉස්සරහට ආවා.. සෙනුකයා ඉතින් බිව්වම හෙන චොර.. ඒක ගැන කතාකල්ලා වැඩක් නෑ..

" කැහ්-ෂනෙරු මයෙ අම්මා.. උම්බට මචං.. මම ඉන්නවනෙ.. කව්ද.. කව්ද කියපන්.."

මම උගේ අතක් අරගෙන මගේ කර වටේ දාගත්තා..

" ඔව් ඔව් උඹ ඉන්නවා.."

@Shan

" අන්න එහෙම.. මයෙ සුදු සනෙරුවා.. උඹ බඳින දවසට.. මේ සෙනුකව මල් කුමාරයට ගනිමි.. හර්තේ.."

" ගන්නම් ගන්නම්.. සපත්තුදෙක පන්නහංකො.."

" කොහෙ..?? සපත්තුගන්න යන්න.. මෙ රෑ.."

මගේ ඔලුව කකියන්න ආවා.. ඒ අස්සෙ කියාරත් හුරතල් වෙන්න උඩ පනිනවා..

" හනේ බල්ලො.."

මම නැමිලා උගේ සපත්තුදෙක පැන්නුවා..

" මචං.. සනෙරුගෙ මිනිහා.. අන්න හරේ.. අන්න හරේ.. ඌට පිස්සු හැදිලා-කැහ්-කැහ්-බ්වැක්-අන්න අපේ මිනිහා ඉන්නවා.."

" මොනවද බ ංකියවන්නෙ..මෙලෝ ලබ්බක් තේරෙන්නෙ නෑ.. නිදාගනිං දැන්.."

මම සෙනුකයව කාමරේ තියලා ෆෑන් එකත් දාලා ඇවිත් කියාරවයි රෙක්සියි අරගෙන හුරතල් කළා.. පව් දවසෙම මම නැතුව ඉන්නවනෙ.. හිතට දුකයි පාළුනිසා එයාලට..

අම්මා ලංකාවෙන් ගියාට පස්සෙ ආච්චිඅම්මා මෙහේ නතරකරගන්න ඕන.. අසනීප එක්ක ගමෙ තියන්න බෑනෙ..

සුබෝදෑසනක් පුංචි දළඹු ළමයිනේ..

ආයෙ රෑට එන්නම්.. හොඳේ.. තා ටික කාලෙකින් පුම්චි දළඹුවෝ සතුටු වෙන්නයි යන්නෙ..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

@Shan

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 156 කොටස

" හම්මට මොණරා ගුඩ්මෝනින්.."

" ගුඩ්මෝනින් මචං.. කෝ අපේ නාරි නැද්ද.."

" ඒකිගෙ ස්ටෙත් එක අමතක වෙලා.. ඒක ගන්න ගියා.."

ලෙක්චර් හෝල් එකේ ආශිගෙ නැත්නම් නාරිගෙ බෑග් එක තිබ්බ තැනින් මාත් දුවගෙන ඇවිත් වාඩිවුණා.. හෝල් එකේ පිටිපස්සෙම ඉන්නෙ කුම්භකරණයො.. උන් එක්ක සෙට් වුණොත් අනිවා අපිටත් නින්ද යනවා.. නිද්‍රාකාරයෙකේ වගේ උන්ගෙ වචන වලත් අම්මටසිරිවෙන්න නිදිමතක් තමා තියෙන්නෙ.. ඉස්සරහම පෝළිම් වල ඉන්නෙ බැජ් එකේ මීටර් ටික.. උන් ලෙකාලට ගොට්ට අල්ලනවා.. මැද්දෙ ඉන්නෙ ඉතින් අපි වගේ දෙපැත්තටම නැතුව පාවි පාවි ඉන්න උන්.. අපේ ලෙකාගෙ බලුකම කියන්නෙ නැගිට්ටවලා ප්‍රශ්න අහන්නෙත් අපෙන්මයි.. දවසක් මම පොතෙන්ම ඔලුවට කැවා එකක්.. ආශි එක්ක ඕපදූප හොයන්න ගිහින් අහපු ප්‍රශ්නෙට උත්තර දෙන්නැතුව..

" ඔය මැද්දෙ එකා.. නැගිටිනවා.. A Patient went into shock immediately after normal delivery ,likely cause is – Amniotic fluid embolism, PPH, Uterine inversion or Eclampsia ???"

" um..

**Postpartum hemorrhage**

"

" Physical exam reveals the uterus to be about 6 wk size. Vaginal bleeding is scanty with no discernible tissue in the cervical os. There are no palpable adnexal masses. The uterus is mildly tender. Ultrasonographic exam does not reveal a gestational sac. Which of the following should be recommended? Dilatation & curettage, Culdocentesis, Observation followed by serial B-HCG determinations or Diagnostic laparoscopy..?

@Shan

" s-sir??"

" අයිසෙ අහගෙන නෙමෙයිද ඉන්නෙ..!!"

ඒ එක්කම පියාඹගෙන ආපු මාකපෙන් එක මගේ ඔලුවෙ වැදී නොවැදී ගියා.. අපි බල්ලො වගේ අනේ.. බැනුම් අහනවා ඉවරයක් නෑ.. වෝඩ් එක මැද්දෙම ආශි දවසක් හොඳ බැනුම් තොගයක් අහලා වරුවක් ඇඩුවා.. ආයෙ මෙඩිකල් කොලේජ් එන්නෙත් නෑ.. බැනුම් අහන්නද මෙච්චර ඉගනගන්නෙ කියලා වැලපුණා.. ආධ්‍ය අයියා කියපු රුවන් වැකි මතක් වෙන්නෙ ඒ වෙලාවට තමා..

හරි දුකයි..

අපේ ෆස්ට් ඉයර් එක ඉවරවුණා.. සෙකන්ඩ් එකත් එහෙමයි.. දැන් ඔන්න තර්ඩ් එකේ අන්තිම සෙම් එකේ ඉන්නෙ.. දෙයියනේ කියලා ක්ලිකල් එහෙමත් යනවා.. නිල් පාට දිග කලිසමයි.. නිල් පාට කමිසෙයි ඇදලා.. ආයෙ සුදු කෝට් එක දාලා.. ස්ටෙත් එකත් හතරට පහට නමාගෙන සාක්කුවෙ ඔබාගෙන, පාට තුනෙන් හයිලයිට් තුනයි.. කළුපෑනයි.. නිල් පෑනයි.. සී ආර් පොත් ටිකයි ජීවිතේම වගේ.. ක්ලිකල් යනවා.. තියටර් යනවා.. කැම්පස් දුවනවා.. ආයෙම හොස්පිටල් දුවනවා.. ආයෙම ක්ලබ් එකට දුවනවා.. ආයෙම බැඩ්මින්ටන් ඇසෝසියේශන් එකට දුවනවා.. මම හිටියෙ දුවාගත්ත ගමන්මයි.. මොකක් වුණත් ජීවිතේ සෑහෙන්න දේවල් මට එකතු වුණා..

අපි ෆස්ට් ඉයර් එකේදි හන්තානෙ ට්‍රිප් එක ගියා.. හෙනාතල් අපේ උන් නම්.. ට්‍රිප් එකක් යන්න ගියාම.. කෑගහලා නටලා බස් එක දෙක කල්ලා ඔන්න හන්තානෙ ගිහින් ආවා.. බැජ් එකේ ජෝඩු ටිකට එහෙම ඉතින් වන වදුලේ වසන්තෙ තමා..මටනම් දුකට සැපට අතේ එල්ලන් යන්න ඉන්නෙ නාරිලතා විතරනෙ.. ඒකිත් එක්ක කියෝ කියෝ හන්තානෙ ගියා.. සෙනුකයවත් හම්බෙන්න සෙට් වුණා.. ඊටපස්සෙ අලුත් අවුරුදු උත්සවේ.. ඒකටත් නටන්න ඕන හැම නැටුමක්ම නැටුවා.. අවුරුදු උත්සවේ අනිත්පැත්තට ඊස්තටික් ක්ලබ් එකේ වැඩ.. ආයෙම කැට.. ඒ අස්සෙ ලෙක්චර්ස්.. අක්කලාගෙ අයියලාගෙ ගැලුම්.. අපේ උන් දාන කුප්පි.. හෙන රෑ හොස්ටල් අස්සෙ ලැගගෙන පාන් කකා කුප්පි ඇම්මා.. පුදුමෙ කියන්නෙ අර සෙම් එකක්ම තේරෙන්නෙ නැති එව්වා අපිට සතියෙන් පුළුවන් වෙන

@Shan

එක.. අන්න අක්කලා.. මල් තියලා වැන්දත් මදි.. අපිටනම් පෙනුණෙ දේවතාවියො වගේ.. පාන්දර තුන හතර වෙනකල්ම සමහර ගැලුම් තිබ්බා..

ඊටපස්සෙ නින්නාද තිබ්බා.. ෆැකල්ටියෙ මාව දැන් හෙන ප්‍රේමස්.. නංගිලා එහෙම හෝ ගාලා මම මැච් එකකට යනවනම සුභ පතලා යනවා.. කොටින්ම කියනවනම් අපෙන් රැග් කන්න පැන පැන ආපු උනුත් හිටියා.. අනේ දුකේ.. නින්නාදෙ අපි නග්ගලා ගත්තා සිංදු කියලා නටලා.. අපි තමා තිබ්බ සුපිරිම එක තිබ්බෙ කියලා සින්නො ප්‍රශංසා කළා..

හොඳම ආතල් එක පේරෙ-කොළඹ මැච් එක.. මමයි සෙනුකයයි බෝලින් බැටින් හිටියා.. අයුක අයියා හිටියනම් වහ කාලා මැරෙනවා අපේ එකාගෙ බැටින් වලට.. කෙලින්ම මම දාන බෝලෙ විකට් එකේ.. අනික හිනාත් යනවා.. ඇයි යකෝ හොඳම යාළුවානෙ ප්‍රතිවාදී පිලේ හිටියෙ.. අන්තිමට මැච් එක ඩ්‍රෝ වුණා ඒක වෙනම කතාවක්.. පස්සෙ තමා කට්ටිය අතරෙ ප්‍රසිද්ධ වුණේ මම දාන බෝලෙට ගැහුවෙ මගේ අනිත් භාගෙ කියලා.. පේරෙ උන් හරි සුහදශීලී මොකක් වුණත්..

ආයෙම මෙඩ්-ලෝ ඉවෙන්ට් තිබ්බා..මට අපේ ලොකු අයියණ්ඩි චමිරු සෙට් වුණා.. කොහෙ ගියත් අඳුරන එකෙක්නම් ඉන්නවාමයි.. හරි පුදුමෙකි.. මලක මලකි..!

මෙ අවුරුදු තුනට සෑහෙන දේවල් වෙනස්වුණා.. මට දැන් අවුරුදු විසි තුනක්.. කිව්වට හතරක්.. උපන්දිනේ පහුවුණානෙ.. රිජ්වේ එකේ ක්ලිනිකල් සෙට් වුණාම ලොකු අම්මා කැන්ටිමෙ ඉද්දි මම කැන්ටිමට රිංගලා ලොකු අම්මගෙ පර්ස් එකට විදිනවා.. එයා දැන් අමුතු වෙලා.. වෙනදා වගේ නෙමෙ හරි හොඳයි.. අම්මා ලංකාවෙන් ගියාට පස්සෙ ලොකු අම්මා මට කිට්ටු වුණා.. හොඳටද නරකටද දන්නෑ ඉතින්.. කොහොම වුණත් මමනම් හැමෝටම එක සේ හොඳින් සලකනවා..

අපේ අම්මගෙ වෙඩින් එක හුඟක් ලොකුවට තිබුණා.. මගේ මාමා ඇරෙන්න අපේ පව්ලෙ හැමෝම වගේ ආවා.. අම්මා වෙනුවෙන් මම කිසිම අඩුපාඩුවක් කළේ නෑ.. ගව්මෙ ඉඳලම සේරම කළේ මගේ අතින්මයි.. පොඩ්ඩක් මේ කාලෙ ආර්පීකේට කෙලවෙලා ඉන්නෙ පහුගිය ටිකේ වැඩියෙන් වියදම් වුණු නිසා.. ඒකත් ගාණට ශේප් එකේ බැලන්ස් කරගෙන යනවා.. අම්මා වෙඩින් එක දවසෙ ලස්සනට හිටියා.. පළවෙනි වතාවට මම අම්මව වෙල් එකක් යටින් දැක්කෙ.. ඇත්තටම ලස්සනයි.. දණහිසෙන්

@Shan

පහළට කොණ්ඩෙ කර්ල් කල්ලා.. සුදුපාට පිමබෙන ගවමකට.. මල් පොකුරක් අතේ තියාගෙන.. මගේ අතේ එල්ලිලා අල්තාරෙ ගාවට ගියපු හැටිමට තාම මතක් වෙනවා.. මට දැනුණෙ තාත්තා කෙනෙක් දුවෙක් බන්දද්දි දැනෙන හැඟීම.. මමම අම්මගෙ අත අකිල අංකල්ගෙ.. නෑ නෑ.. බාප්පගෙ අත උඩින් තිබ්බා.. මට විශ්වාසයි.. අම්මා එතනින් එහාට සතුටෙන් ඉදීවි..

අනිකා මගේ ඥාති පුතා.. සදෙව් අයියගෙ පොඩි එකා.. මට හෙන එකතුයි.. චූටි තාත්ති කියාගෙන මගේ අතේ එල්ලීගෙනමයි ඉන්නෙ.. ඒකට අවුරුදු පහක්.. පහක් වුණාට කට තියනවා නාකි සීය කෙනෙක්ගෙ වගේ.. ගිය සතියෙ සදෙව් අයියා ආවා ලංකාවට.. මාවත් බලලා යන්න.. එතකොට පුතණ්ඩියයි අක්කයි එක්ක ආවෙ.. අක්කා හරි හොඳ කෙල්ල..මට වඩා පොඩ්ඩයි වැඩිමල්.. එහේ සැලෝන් එකක වැඩකරන්නෙ.. ඒක නිසා මෙතු අක්කා අපේ ආශි එක්ක හෙනට සෙට් වුණා.. අම්මට ඇත්තටම හුඟක් හොඳ පවලක් තමයි ලැබිලා තියෙන්නෙ.. සදෙව් අයියා රධ්‍ය අයියා ගැන දන්නවා.. ලව් එකට හෙන සපෝට්.. ඒකා වෙඩිමෙ ඉඳන් ප්ලෑන් කරගෙන ඉන්නෙ කරන්න ඕන විදිය.. කොයි ලෝකෙකින් හරි උස්සන් ඇවිත් මලයට බන්දලා දෙනවා කියලා දහ අතේ දිවුරුවා.. ඌටනම් පිස්සු.. දැන් මට අර වයසට යන ෆීලින් එක දැනෙනවා.. අපේ වයසෙ සමහර යාළුවො බැඳලා.. අවුරුදු විසි හතරක් කියන්නෙ.. ආශිත් ලිවින් ටුගෙදර් ඉන්නෙ කියාන් අයියා එක්ක..

ඇත්තටම අපි ලොකු වෙලා.. දැනට අවුරුදු හයකට විතර කලින් හිටපු මාව දැන් වෙනස් වෙලා ගිහින් වගේ.. කාලෙත් එක්ක මගේ හිතේ තියන පාළුව එහෙමම සාමාන්‍ය දෙයක් වුණා.. හැබැයි අපේ ගෙදරට දේවතාවියෙක් වැඩලා ඉන්නෙ.. එයා ඉතින් පාළු හිතෙන්න දෙන්නෙ නෑ..

මගේ ආච්චිඅම්මා..

අම්මගෙ වෙඩින් එකෙන් පස්සෙ ආච්චිඅම්මව මම එක්කන් මෙහේ ආවා.. එකක් ආච්චිට දැන් ඇවිදින්න්න බෑ.. මමම ළඟ ඉන්න ඕන හැමදේකටම.. මම හරි ආදරෙනුයි මගෙ ආච්චිඅම්මව බලාගන්නෙ.. හැමදේම මගේ අත් දෙකින්ම කරන්නෙ.. ආච්චිව එකසැරේට පැරලයිස් වුණා.. දැන් එයා හුඟක් වයසයි.. ඉස්සර වගේ කිසිම දෙයක් බෑ දුවලා පැනලා කරන්න.. මේ අවුරුදු තුනට ආච්චිඅම්මව අවුරුදු දහයකින් වයසට ගිහිල්ලා වගේ..

@Shan

මම ප්‍රැක්ටිකල් දවස්වලට ඩෙත් බොඩීස් එක්ක දවසෙම ඉන්නෙ.. මුලදි පට්ට අප්පිරියයි වැඩ කරන්න.. ඇයි යකෝ මැරිච්ච මනුස්සයෙක් ඇඳක් වගේ එකක් උඩ තියාගෙන කොටස් කොටස් වලට වෙන් කරනවා කියන්නෙ.. ආශිට පළවෙනිම දවසෙ වමනෙ ගියා.. මට දවසක්ම කන්න බැරිවුණා.. දැන් නම් ඩෙත් බොඩි එක ඉස්සරහ තියාගෙන අනිමිසලෝචනේ හරි කරන්න පුළුවන්.. කිසි අවුලක් නෑ.. අපේ ආච්චිඅම්මව ප්‍රැක්ටිකල් දවස්වලට ගෙදර ගිහින් බදාගන්න වගේ ආවොත් දෙනවා මට අතට අහුවෙන එකෙන්.. 'සුදුමහත්තයා අහකට' කියලා.. මම ඉතින් විහිලුවකනෙ කරන්නෙ සුදුමැණිකෙට.. බොරුවට කෑගහනවා..

දැන් මගේ දින චර්‍යාව වෙනස්.. උදේම කියාරවයි රෙක්සිවයි උස්සන් දුවන්න යනවා.. උදේම කියන්නෙ හයට හතට නෙමේ.. පාන්දර පහට.. ඒක කරන්නම එපැයි.. බොඩි ෆිට්නස් නැතුව කොහොමද මම බැඩ්මින්ටන් ප්ලේ කරන්නෙ.. ඊටපස්සෙ පහමාරට ගෙදර එනවා.. එතකොට මට ඇහෙනවා ගෙදර පිරිත් දාලා උදේට..

" සං සාර සා රෝග විනීත නී සං.."

අපේ ආච්චි පිරිත් දානවා.. ඇද ළඟම මම ඔක්කොම ලෑස්ති කල්ලා තියන නිසා හොඳයි.. උදේම ආච්චිට සස්ටජන් එකක් හදලා දෙනවා.. ආච්චි නැගිටලා ඒක බොනකල් කෑම ලෑස්ති කරනවා.. මම උදේට කන්නෙ එළවලු විතරනෙ.. ආච්චි කැමති දෙයක් තමා ගෙදර හදන්නෙ.. එයත් බත් කන්න හුඟක් හොරයි.. රෑට දාහක් දේවල් කියලා තමා බත් කවාගන්නෙ..

ඔන්න උදේට කෑම ලෑස්ති කරනවා.. දවල්ටත් එක්කම.. හැන්දෑවට මම එනවනෙ.. ඒවා වහලා තියලා සේරම ලෑස්ති කරවලා ආච්චිව නාවනවා.. උණු වතුරෙන්.. ඊටපස්සෙ බෙහෙත් දෙනවා.. මටත් ඒ ගැන දැනුමක් තියන නිසා හොඳයි.. ගෙදරම ප්‍රෙශර් චෙක් කරනවා.. සීනි බලනවා.. ටෙස්ට් එකක් කරගන්න වුණත් මමම ගෙදරට සිරිංජර්ස් ගෙනැල්ලා ලේ අරගෙන හොස්පිට්ල් ලැබ් එකෙන් චෙක් කරවගෙන එන්නෙ.. ඊටපස්සෙ හතට ගෙදරින් යනවා.. කෙලින්ම කැම්පස් එකට.. උදේ ඉඳන් දොළහා වෙනකල් ලෙක්චර්ස්.. අනිත්පැත්තට ක්ලිනිකල් දුවනවා.. ඊටපස්සෙ වෝඩ් එකේ ඇඳෙන් ඇඳට ගිහින් පේෂන්ලගෙ හිස්ට්‍රි මාක් කරගන්නවා..

එකට කිට්ටු කල්ලා කන්සාල්ට්න් කඩාපාත්වෙනවා.. එතකොට ඉතින් බය වෙලා අරහෙට දුවලා මෙහෙට දුවලා පොත් එහෙම ලෑස්ති කරන් දත කට

@Shan

මැදගෙන ඉන්නෙ.. රෙඩ් බෙල්ට් නර්ස් නංගි කෙනෙක් සෙට් වුණොත් අපි කයියක් ගහගෙන එහෙමත් ඉන්නවා.. වෝඩ් එකේ නර්ස්ලත් හොඳ අය ඉඳලා හිටලා සෙට් වෙනවනෙ.. ඩොක්ට වෝඩ් රවුන්ඩ් යන්නෙ දොළහට.. කන්සාල්ටන් එන්නෙ එකට.. ඩොක්ට යන වෙලේට නර්ස් අර තඩි බෙහෙත් ට්‍රොලිය උස්සන් පස්සෙන් යනවා.. අපිට ඒ වෙලේට මොකුත් කරන්න නෑ.. එළියෙ කොරිඩෝ එකට වෙලා ඉන්නවා..

එකට කන්සාල්ටන් එද්දිම වෝඩ් එක අනිත්පැත්ත ගැහෙනවා.. සේරම පේශන්ස්ලව චෙක් කල්ලා අපිව ඩ්‍රෙසින් රූම් එකට ගෙන්නගන්නවා.. ප්‍රශ්න අහනවා.. ලෙඩ ගැන විස්තර කරනවා.. ඔය වෙලාවට බැනුනුත් අහනවා.. අපේ ටීම් එකේ මොනිටරේ කෙල්ලෙක්.. මුස්ලිම් කෙල්ලෙක්.. ඒකි හෙන හොඳ කෙල්ල.. හැමදාම ඒකි අපිව බේරගන්න මොනා හරි කියනවා.. බැනගෙන එනවා වගේ ලයින් එකක් යනවනම්..

හොස්පිට්ල් කෙරුවාව අහවර වුණාම මම ඇඳුම් මාරු කරන්නෙත් නැතුව ක්ලබ් එකට දුවනවා.. ක්ලබ් එකක් නෙමෙ දැන් දෙකක්නෙ.. ක්ලබ් එකේ ප්ලේ කරන්න දැන් බෑ.. මොකද මම ඇසෝසියේශන් එකේ ඉන්න නිසා.. ඒත් කෝච් මාව ප්‍රැක්ටිස් කරවනවා.. කෝච් නැති දවසට මට පහළ වයස්වල උන් මම ප්‍රැක්ටිස් කරනවනවා.. ලබන මාසෙ නැශනල් සිලෙක්ශන්.. මාව තෝරගනී කියලා මට ලොකුම ඔකු බලාපොරොත්තුවක් තියනවා..

පහුගිය අවුරුදු තුනට ටුවර් නමයකට විතර යන්න වුණා.. කොරියා ගියා.. ජැපෑන් ගියා.. තව යුරෝපියන් කන්ට්‍රි වලනම් ජර්මන් ගියා, ෆ්‍රාන්ස් ගියා.. හැම එකකටම දැන් ලංකාව රෙප්‍රසන්ට් කරන්න ඉන්නෙ මම.. බැඩ්මින්ටන්-ශ්‍රී ලංකා-ෂනෙරු ඔය තුන හැමතැනම තියෙන්නෙ එකට.. මාව දැන් නම් ලංකාවෙ නොදන්න උන් ඉන්නෙ පොඩ්ඩම පොඩ්ඩයි.. බහුතරේ දන්නවා.. සමර් ඔලිම්පික් යන්නත් ලොකු බලාපොරොත්තුවක් තියනවා.. ඒත් මම ඒකට ලෑස්තිවෙන්න ඕන.. රට යන්න සෙට් වුණාම සෙනුකයා, ආශි තමා ආච්චිව බලාගන්නෙ.. සෙනුක සති අන්තවල ගෙදර එනවනෙ.. මම ගිහින් ආයෙ අනිත්පැත්තට කලින්ම එනවා.. මොකද හැමෝම දන්නවා මම මෙහේ මෙඩිකල් ෆැකල්ටියෙ තාම ඉගනගන්නවා.. මට ඇකඩමික් වැඩ වැඩියි කියලා.. චමිරුත් අපේ ආච්චිට හුඟක් එකතුයි..නිතර බලලා යන්න එහෙම එනවා.. අපේ ආච්චි ඉතින් බණ අහනවා.. මගේ ටැබ් එකේ ඔය එක එක වැඩසටහන් අහනවා... කියාරලා එක්ක කතාකරනවා.. හුඟක් විවේකෙන් ඉන්නවා.. ගමේ ගෙදර දැන්

@Shan

වහලාම දාලා.. ලොකු අම්මා ඉදහිට ගිහින් අස්පස් කල්ලා දාලා එනවා.. ඒත් ලොකු අම්මත් කන්සාල්ටන් වලට රට යන්න ඉන්නෙ.. අන්තිමට මමයි ආච්චිඅම්මයි විතරයි ලංකාවෙ ඉතුරු වෙන්නෙ.. පවුලම රට..

උදේ තිබ්බ ලෙක්චර්ස් වලින් පස්සෙ අපි හොස්පිට්ල් ගියා.. දවල්ට කෑම කන්නත් බැරිවුණ නිසා ගිහින් රිපෝට් හදලා මමයි ආශියි කැන්ටිමට යද්දි ලොකු අම්මත් ඇවිත් තේකක් බිබී හිටියෙ..ලොකු අම්මා දන්නවා මම මේ වෙලේට ඩොක්ටර්ස් කැන්ටිමට එනවා කියලා.. මාව දැකලා එහාපැත්තෙ පුටුවට ඇඟිල්ලක් දික් කල්ලා ඇවිත් ඉදගන්න කිව්වා.. හිනාවෙන්නෙ අරවා මේවා නෑ ඉතින්.. උවමනා දේවල් තමා කතාකරන්නෙ..

" ලොකුඅම්මෙ.."

" කාලද ඉන්නෙ.."

ආශිත් ඇවිත් මගේ එහාපැත්තෙන් ඉගත්තා.. මම නෑ කියන්න ඔලුව වැනුවා..

" කාල ඉන්න.."

මම හෙන ගොංපහේ හිනාවක් දැම්මම ලොකු අම්මා ගිහින් කෑම වගයක් උස්සගෙන ආවා..මෙ ඉටපස්සෙ මමයි ආශිටි පාඩුවෙම කෑවා.. ලොකු අම්මා ෆයිල් එකක් දිග ඇරගෙන ඒක බලබල හිටියෙ..

" අම්මා කතාකළාද.."

"....."

" දරුවො!"

" ඕ.. ආ ලොකුඅම්මෙ.. අම්මා ළඟදි නම් කතාකළේ නෑ.. ගන්න ඕන.."

" ඇයි අම්මට ඇඟිල්ලෙන් ඇනලා පුතාව මතක් කරන්න ඕනද.."

මම සද්ද නැතුව හිටියා..

" මම කතාකරන්නම්කො.. මාමලා අම්මලා සේරම එකයි.."

@Shan

" අම්මට වැඩඇති ලොකු අම්මෙ.."

" ඒත් එකම එක පාරක්වත් ලංකාවට ආවෙ නැනෙ.. තමන්ගෙ අම්මගෙ වැඩ ටිකත් පුතාටම කියලා කරවගන්නවා.."

" එහෙම දෙයක් නෑ ලොකුඅම්මෙ.. මම කැමැත්තෙනුයි ආච්චිඅම්මව බලාගන්නෙ.."

ලොකු අම්මා මොකුත් නොකිය කණ්ණාඩිදෙක ඇඳුම් කරේ එල්ලගෙන පුටුවෙන් නැගිට්ටා..

" මම දැන් යනවා ළමයි.. කෑම කන්න.."

මම මොකුත් කියන්නත් කලින් ලොකු අම්මා නැගිටලා ගියා.. අම්මා ඉඳලා හිටල හදිසියෙන් නෙ කතාකරන්නෙ.. අනික අම්මට මාව පෙන්නන්න ලැජ්ජාවක් වගේ තියෙද දන්නෙ නෑ..මම ඉතින් කලින් හම්බුණු තාත්තා නැති පුතානෙ.. අනික සදෙව් අයියා අම්මට ආදරෙයි.. මට ආච්චිඅම්මා ඉන්නවනෙ.. හිතේ කොණකවත් මට තරහක් නෑ කා එක්කවත්.. මෙ දේවල් වෙන විදිය මට පුරුදුයි.. හැමදේම සාමාන්‍ය විදියට සිද්ධ වෙනවා.. අවුරුදු තුනක් දරාගෙන හිටියා වගේ.. ඉතුරු දෙකත් ඉක්මනටගෙවිලා යාවි.. අන්තිම අවුරුද්ද හොඳ දෙයක් සිද්ධ වේවි..

අම්මා කොන්වොකේශන් එකටවත් මාව බලන්න ඒවිනෙ.. ඒ ඇති..

නරක සමනලයා ආවෝ.. හෝලා..

හැමදාම මගේ දළඹු හමුදාවගෙ කමෙන්ට කියවලා බලන මම:



දෙයියනේ දෙයියනේ!!!

එන්නාම්.. ලව් යූ..❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

@Shan

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 157 කොටස

" කෝට් ඉන් අ ලාආආආආආආආආආආආයි(Caught in a lie)

සුන්ග්යොල්හෙත්දොන් නල් චජජ්වෝඕඕ.."(Sungyeolhaetdeon nal chajajwo)

" ඕක නවත්තගනින්කො බං.. හයියෝ මොන කුණුහර්පද උඹ ඔය කියවන්නෙ.."

" ආආර්හ්!! අර අයාන් හැලකිඹුලා ඊයෙ අපේ ගෙදර ඇවිත් මගේ මනුස්සයා අරන් දුන්න ඔක්කොම චොක්ලට් බාස්කට් එකම කාලා ගියා.. ශිබල් ගේසෙක්කියා.. පකින් අයාන්.. ගොං වලාම.. අනේ මට මස්සිනාව මාරු කරගන්න විදියක් නැද්ද දෙයියනෙ.. ශීබාල්!! ඔකට හොඳක් නම් වෙන්න එපා.."

" උඹ හංගලා තියන්න එපැයි.."

" මම ගෙදර හිටියයැ.. නැනෙ.. අපේ මිනිහා මොකක්ද මීටින් එකකට ගෙදරට ගෙන්නගෙන.. ඌට මාත් එක්ක තරහක් තියනවා.. දවසක් හෙයා ඩ්‍රයර් එකට පව්ඩර් හාලා ගිහින් තිබුණා.. ඉඳපන්කො.. ආයෙ වරෙන්.. මම කරන්න හොඳ වැඩක්.. පෑන් එක රත් කල්ලා මූණෙ තියන්නෙ මූණෙ.."

" හා හා.. එහෙම කරහං.. හොඳයි.."

මම ෆයිල් එකෙන් පවන් ගහගත්තා.. තාම ලෙක්චර් එක පටන්ගත්තෙ නෑ.. හැමතැනම එකා දෙන්නා රවුම් ගැහිලා කියවනවා.. මම හිටියෙ පුරුදු විදියටම මැද්දෙ පේළියෙ කොනේම.. මගෙ එහාපැත්තෙ ආශි..

" සනෙරුමලේ.. අපේ මහීසාගෙ අර මෙච්ච එකත් එනවා සති අන්තිමෙ.. දෙයියනේ මට සතුටුයි වගේනෙ.."

" ඇති යාන්තම්.. දෙයියනේ කියලා ඔකිට මිනිහෙක් සෙට් වුණා.. නිවන් ගියා වගේ දැනෙන්නෙ.."

@Shan

" හුම්.. අද කවද ඒයි අර එනවා කිව්ව අලුත් ලෙක්චර්.. මම දන්නෙත් නෑ රුපියලේ ඇවිත් කියනකල්..."

රුපියලේ කියන්නෙ බැච් රෙපා..

" නාකි ගිනිපුග්කාරයෙක් වෙන්නැති බං.. දන්නවනෙ අපිට සෙට් වුණොත් එහෙම එච්චා විතරනෙ.."

" ඒකතමයි හලෝ.. අත මෙහෙට දෙනවකො.."

ආශි මගේ අත ඇදලා අරගෙන බලිකුරුට්ටක් ඇන්දා.. මාත් ඉතින් ඒකි දෙන දස වද සේරම දරාගෙන ඉන්නවා.. දැන් අපි ෆෝත් ඉයර් ෆස්ට් සෙම් එකේ.. අපේ කොලු කැල්ලට, කෙලි කොල්ලෙක් සෙට් වුණා.. නෑ නෑ එහෙම නෙමේ.. මෙන්න මෙහෙමයි ඔය ප්‍රේම පුරාණය පටන්ගත්තෙ..

අපි දවසක් ගියා සේරම එකතුවෙලා සෙනුකයව බලන්න.. එදා ඉරිදා දවසක්.. මහීශත් ෆ්‍රී නිසා ඒකිත් ආවා.. මමයි, ආශියි, චමිරුවයි, කියාන් අයියයි අපි ඔක්කොම ගියේ.. අපි යද්දි සෙනුකයා ටවුමට ගිහිල්ලා අයිය කෙනෙක් එක්ක.. එක්කෙනෙක් ධනුජ.. අනිකා කවීශ.. ධනුජ කියන්නෙ අර පලවෙනි දවසෙ පොල්කටු හැන්දක් අතේ තියාගෙන හිටියෙ.. අන්න ඒකා.. කවීශ කියන්නෙ ලාවට ට්‍රැක් ඩයල් එක.. උන් දෙන්නා දැන් කැම්පස් අවුට් වෙලා.. සයිට් වල වැඩ කරනවා.. ධනුජ අයියා ඉන්නෙ නුවරමයි තාම.. අපි ගිහින් සෙනුකයා එනකල් උගේ කාමරේට වෙලා පිස්සු කෙල කෙල ඉද්දි, මමයි කියාන් අයියයි පහළට ගියා කන්න මොනවද ෆ්‍රිජ් එකේ තියෙන්නෙ බලන්න.. මහීශා ගේ ඉස්සරහා කෝල් එකක හිටියෙ.. සෙනුකයා ටවුමට ගිහින් පොත් වගේකුත් උස්සගෙන ගෙට ආවහම අපි සිප වැළඳගෙන කැරකිලා ඔක්කොම කරගෙන සාලෙට ගිහින් බලද්දි..

අපේ මහීශා ධනුජ අයියගෙ අත උඩ පතබැවිලා ඉන්නවා..

එකසැරේ අපි ආවා විතරයි දෙන්නත් එක්කම පැටලිලා බිම වැටිලා ධනුජ අයියගෙ අතේ තිබ්බ එළවලු බෑග් එකේ තක්කාලි ගෙඩි එහෙම උඩින් ගියා.. ඔන්න ඔහොම තමා ධනු-මහී ප්‍රේම වෘතාන්තය ආරම්භ වුණේ.. කොහොම හරි අපි නිතර එහෙ යන එන නිසා ධනුජ අයියා අපිත් එක්ක ෆිට් වුණා.. පස්සෙ නම්බර්ස් හුවමාරු කරගෙන මහීශගෙයි ධනුජ අයියගෙයි ලව් හුටපටේ පටන්ගත්තා.. මේ සති අන්තිමේ ඩයල් එක අපේ එකීට ප්‍රපෝස් කරන්න ඉන්නෙ.. ගෙවල් වලිනුත් කැමතියි.. ධනුජ අයියා ගම්පහ..

@Shan

ගෙවල් තියෙන්නෙ.. ඒත් කොළඹින් ගෙයක් ගන්න හිතාගෙන ඉන්නවා කිව්වෙ.. මහීශා දන්නෙ නෑ ඔය ප්‍රපෝස් කරන්න එන සීන් එක.. දැන් ඒකිගෙ ෆැශන් සෙන්ස් එක එහෙමත් වෙනස් වෙලා.. හොඳ වැදගත් ඩොකෙක් වගේ අඳිනවා පළඳිනවා.. අපි හැමෝම ඉතින් කාලෙත් එක්ක වෙනස් වුණානෙ.. එහෙම තමයි.. හැමදාම එකම විදියට ඉඳලා හරියන්නෙ නෑ..

අනිත් සුභ ආරංචිය.. මගේකා.. සෙනුකයා.. පියාගෙන් අයුක අයියට කැමැත්ත ගත්තා.. ඔය වෙනුවෙන් ඒකා අවුරුද්දකට වැඩිය සටන් කළා.. මුලින්ම ගෙදරින් ඒකව එළියට දැම්මා.. එහෙමමත් නෙමෙ මූ තමා බැහැලා ආවෙ.. අඩ අඩ ඇවිත් මාත් එක්ක කතාකලා..

ටික කාලෙකට පස්සෙ අම්මා යන්තම් කැමතිවුණා.. අම්මා මගෙන් කතාකල්ලා අහුවා අයුක අයියා කියන්නෙ කවද.. එයාලා අතරෙ මොනවද තියෙන්නෙ.. හොඳ කෙනෙක්ද කියලා.. අනික ලව් එකටත් දැන් හුඟක් කල් වෙනවනෙ.. අයුක අයියගෙ කියන්න වැරදි මුකුත් ඇත්තෙත් නෑ.. අනික සම්බන්ධෙ නිසා සෙනුකයා ඉගනීම කඩාකප්පල් කරගත්තෙත් නෑ.. ඔය හේතු සලකා බලලා අම්මා සෙනුකගෙ තාත්තට කරුණු පැහැදිලි කල්ලා දුන්නා.. දැන් මේ අවුරුද්ද අන්තිමේ අයුක අයියා ග්‍රැජුවේට් වෙනවා.. ලංකාවට ඇවිත් සෙනුකගෙ ගෙදරින් අහන්න ඉන්න.. මගේ එකටම ඉඳපු උන් අද සතුටින් ඉන්නවා.. හිතට සැනසීමයි..

අයුක අයියා පොඩ්ඩක් බයේ හැබැයි ඉන්නෙ.. සෙනුකයගෙ තාත්ත අමුතු ඩයල් එකනෙ.. සෙනුකයා විතරයි ගෙදර එකම ළමයා.. තාත්තා උාට පුදුම ආදරෙයි.. අන්තිමේදි ඒ තාත්තා තීරණේ කලා සමාජෙට බම්බු ගහන්න කියලා තමන්ගෙ පුතාගෙ සතුට ගැන හිතන්න.. අපේ එකා මැරුණෙ නැති ටික විතරයි තාත්තගෙන් කැමැත්ත ගන්න.. අයුක අයියා දැන් මාමණ්ඩියා එක්ක කතාකරනවා.. කෝල් වලින්.. උන් දෙන්නත් ඉක්මනට මැරි කල්ලා සෙට්ල් වෙනවා කිව්වා.. කියාන් අයියනම් කලින්ම එන්ගේජ් වෙලා කම්පනි එක භාරගත්තනෙ..

අපි කොච්චර දුරක් ඇවිල්ලද.. හිතාගන්න බෑ.. කොහොම වුණත් මට පෙනී යනවා එකදිගට හෙන ගහන්න වගේ මගුල් ටිකක්නම් සෙට් වෙනවා.. දැන් එහෙන් මෙහෙන් වෙඩින් කාඩ් එන්නත් පටන් අරගෙන.. නෆ්‍රාසුත් උගෙ ෆාතිමාව මැරි කළා.. දැන් ෆාතිමා ප්‍රෙග්නට්.. ජොනාත් වෙඩින් කාඩ් එක එව්වා.. යන්න තමා තියෙන්නෙ..

@Shan

මම සැරටම මනෝපාරක් ගහගෙන පැනත් කටේ ගහගෙන ඉන්න වෙලේ එකසැරේට අපේ රවුම් ගැහිලා ඉඳපු උන්ගෙ පුටු හරි පේළිවලට හැදුණා.. ඒ කියන්නෙ ලෙකා එනවා තමා.. අද තියෙන්නෙ anesthesiology පාර්ට් එකක්.. මමත් උගුර පාදලා හොඳට පුටුවෙන් ඉඳගෙන නාකි ප්‍රොෆා වඩිනකල් ඇස අයාගෙන බලාගෙන හිටියා.. ඇනස්තීසියොලොජිස්ට්ලා ඉතින් ලංකාවටම ඉන්නෙ කීයෙන් කී දෙනාද.. එන එකා මොකක් වුණත් සුපිරි වැඩ්ඩෙක් වෙන්න ඕන..

එකසැරේට දොර ඇරගෙන ආවෙ උස, කෙට්ටු, සුදු, තරුණ ඩයල් එකක්.. පට්ට ෆිගර් එකක් තියන.. ඇවිත් කිරිස් ගාලා සපත්තුවෙන් ලිස්සලා ගිහින් පොත් ටික පෝඩියම් එක උඩට විසික් කළා.. අප්පුඩියක් ගහලා අපේ පැත්තට හැරුණා.. මූණ පිරෙන්නම හිනාවුණා..

මට.. කලන්තෙට.. ආවා..!!!

" very good morning everyone!!"

මම ගල් ගැහිලා වගේ එහෙමම බලාගෙන හිටියා.. දෙයියනේ.. මම හීනයක් දකින්නෙ.. මේක හීනයක්.. ඔව් ඔව්.. නැකිටපන් ෂනෙරු.. උඹට පිස්සු හැදීගෙන එනවා.. උඹ මොනවද මේ දකින මනස්ගාත.. නැකිටපාන්.. මම අත හොඳට දිගැරලා චටාස් ගාලා කනේ පාරන් ගහගන්න ගිය  පාර ආශි අතේ එල්ලුණා.. ඒ වුණාට ඒකි ඉන්නෙත් පුදුමවෙලා.. මම ගහගන්න ගිය කණේ පාර ඒකි ඒකිට ගහගත්තා.. මාව  ගැස්සිලා ගියා.. ඒ කණ්ණාඩිදෙක.. හිනාව.. කොණ්ඩෙ.. ඇඳුම.. මැණික් කටුව ගාව තියන වොච් එක..

" ආධ්‍ය අයියෙ-හ්.."

"

**First let me introduce myself guys.. I'm Dr. Adhya Shadil Ishakya Gamage.. consultant obstetric anesthesiologist MBBS MRCS LRCP FRCA.. Clinical Lecturer in Anesthesia, University of Alberta, Canada..  Also, I am a medical student who studied in this university..**

"

@Shan

**(*MBBS**

**-**

**Bachelor of Medicine, Bachelor of SurgeryMRCS-**

**Member of the Royal College of Surgeons of EnglandLRCP-**

**Licentiate of the Royal College of PhysiciansFRCA-Fellows of the Royal College of Anaesthetists)**

(

*****

Clinical Lecturer in Anesthesia - නිර්වින්දනය පිළිබඳ සායනික කථිකාචාර්ය)

මම ආධ්‍යා අයියගෙ ලස්සන ඇක්සන්ට් එක වශී වෙලා වගේ අහගෙන හිටියා.. දෙයියනේ.. එයා.. එයා ජීවත් වෙනවා.. එයා එයාගෙ හීනෙට ගිහිල්ලා.. ඒ කිව්වෙ ගමගේ කියලද.. ඒ කියන්නෙ.. ඒ කියන්නෙ.. එයා??

මගෙ දෙයියනේ..!!

මම ආශී දිහා බැලුවම ඒකි හෝ ගාලා ටිශූ රෝල් කර කර නාහෙයි ඇස් දෙකෙයි තියාගන්නවා.. ආධ්‍යා අයියා හොඳට ලෙක්චර් හෝල් එක සර්ච් කල්ලා මාව පහුකරගෙනත් ගිහින් ආයෙම මං ගාව නැවතුනා.. මගේ පපුව වේගෙන් ගැහෙනවා.. මට පිස්සු වගේ.. අතත් වෙවුළලා පෑන බිම වැටුණා.. මෙ මනුස්සයා මාව බයකරනවා.. මේ හැමදාම දකින හීනයක් නෙමේ නේද.. ආධ්‍යා අයියා පුරුදු හිනාවෙන්ම මාත් එක්ක හිනාවුණා.. අවුරුදු පහකට පස්සෙ.. මම අවුරුදු දහනමයෙදි දැකපු හිනාව.. ආයෙම අවුරුදු විසි පහේදි දකිනවා.. මට මොකක්ද කරන්න ඕන හිතාගන්න බැරුව ගල් ගැහිලා අයියා දිහා බලාගෙන හිටියා.. අයියා හිනාවෙලා පෝඩියම් එක උඩ තිබ්බ ලේසර් ටෝච් එකක් අතට අරගෙන ලැප් එක කනෙක්ට් කල්ලා ප්‍රොජෙක්ටර් එක ඔන් කරගත්තා..

@Shan

ආධ්‍ය අයියගෙ පට්ටම් ටිකට මෙඩ්ඩොන්ගෙ ඇස් උඩ ගියා.. යකෝ.. අවුරුදු පහට..?? මේකා යකෙක්නෙ..!!

මම කටත් ඇරගෙන ආධ්‍ය අයියා දිහා බලාගෙන ඉද්දි ආධ්‍ය අයියා මට ඇඟිල්ල දික් කල්ලා නැගිටින්න කිව්වා.. මේ මනුස්සයා ආපු ගමන්ම මස්සිනාගෙ රෙදි ගලවන්නද යන්නෙ.. මම වෙවුල වෙවුල මොකාද එකා වගේ නැගිට්ටා.. කලිසමත් හැලෙන්න වගේ.. හොඳට කෙළත් ගිල්ලා..

" පුතා.. Why do we study Anaesthesia..?"

මේ අයියගෙ ආච්චිට.. කවද යකෝ පුතා..?? මේකා කැනඩාවටම විසික් වෙන්න දෙන්න හිතයි දැන් නම්..

" it can be a fulfilling and satisfying career with opportunities to learn and develop within the medical field sir.."

" good.."

මම වාඩිවුණා.. දාඩියත් දාලනෙ යකෝ මට..

කොහොම හරි මම කාගෙන ආධ්‍ය අයියගෙ ලෙක්චර් එක අහගෙන හිටියා.. මෙලෝ මගුලක් ඔලුවට ගියේ නෑ ඒක වෙනම කතාවක්.. ප්‍රොෆෙසර්ගෙ ගෙදරටම ගිහින් මම අහගන්නම්කො.. ඉඳපල්ලා මම පලි ගන්නවා..!! ආධ්‍ය අයියා ආවා කියන්නෙ.. අනේ රධ්‍ය අයියත් ඇවිල්ලද.. එයා ගැන මට දැනගන්න පුළුවන් වෙව් අයියගෙන්.. පැය තුනහමාරක ලෙක්චර් එකෙන් පස්සෙ හෝල් එකේ ඔක්කොම නැගිටලා එළියට ගියා.. ක්ලිනිකල් දුවන්න ඕනනෙ.. මමත් මගේ පොත් පත් ටික එකතු කරගෙන නැගිට්ටා.. ආධ්‍ය අයියා කණ්ණාඩිදෙක පන්නලා ඒක කෝට් එකේ ගහගෙන මං ගාවට ඇවිදගෙන ඇවිදගෙන ආවා.. ආශි තාම අඬනවා වචනයක්වත් කතාකරන්නෙ නෑ.. ආධ්‍ය අයියා මං ගාවටම ඇවිත් මාත් එක්ක හිනාවුණා.. මගේ පපුව ගැහෙනවා පිස්සුවෙන් වගේ.. දෙයියනේ මම දකින හීනයක් හැබෑ වුණා වගේ.. මමයි ආශියි අයියයි විතරයි හෝල් එකේ හිටියේ.. මගේ ඇස් වල එක තප්පරේට කඳුළු පිරුණා.. පපුව රිදෙනවා වගේ..

" චූටියො.."

@Shan

මම ආධ්‍ය අයියව දෝත බදලම අල්ලගත්තා.. දෙයියනේ මේ මනුස්සයා හැබැහින් ඉන්නවා තමා.. මට අයියගෙ ගාවින් එන රෝසමල් සුවඳ වෙනුවට වෙන සුවඳක් ආවෙ.. සීරියල් සුවඳක් වගේ.. බේබි කොලෝන්..?? මොකක් වුණත් ඒ රෝසමල් සුවඳ නෙමේ.. මං ගාව තියන අයියගෙ ලේන්සුවෙන් එන සුවඳ නෙමේ.. ආධ්‍ය අයියා මට වඩා උසයි.. මාව තද කල්ලම බදාගෙන හිස් මුදුනට හාද්දක් දුන්නා..

මේ කොච්චර කාලෙකට පස්සෙද.. මම අන්තිමට අයියව දකිද්දි එයා හිටියෙ නිදාගෙනනෙ..

" ආධ්‍ය අයියෙ.. අනේ.."

" අදට බැරිද ක්ලිනිකල් නොගිහින් ඉන්න.. මම..??"

මම ඔලුව වැනුවා..

" ලොකු අයියෙ.. ඔයා මාව අඬවනවා අනේ.. මම තරහම තරහයි ඔයා එක්කන්.. මම යනවා සනෙරු මල.. ආර්හ්.. මට ඇඬෙනවනෙ මගුල.."

ආශි ආධ්‍ය අයියට දෙකක් රවලා ටොක් ටොක් ගගා ඒකිගෙ දිග කරාබු දෙකත් පද්ද පද්ද යන්න ගියා.. ආධ්‍ය අයියා මාව උරහිසින් අල්ලලා මෙහාට කළා.. මට අහන්න කෝටියක් දේවල් තියනවා දෙයියනේ.. ආධ්‍ය අයියා මගේ කම්මුල් වල තියෙන කඳුළු අත් දෙකින්ම පිහිදුවා..

" මගේ පොඩි කොල්ලා සෑහෙන්න ලොකු වෙලානෙ.. චූටියො.."

" කොහෙද අනේ හිටියෙ.."

මම නාහෙන් කතාකළා.. ආධ්‍ය අයියා දිග හුස්මක් අරගෙන පිට කළා.. අපිට හුගක් දේවල් කතාකරන්න තියනවා.. මගේ මාමා කොහෙද.. අනේ එයා සනීපෙන් ඉන්නවා ඇතිනෙ.. මගේ ආච්චිඅම්මට මාමව දකින්න පුළුවන්..

" යමුකෝ කියන්න.. අන්තිමට කොල්ලා මෙඩිකල් කොලේජ් ආවනෙ.."

" රධ්‍ය අයියා කෝ..??"

ආධ්‍ය අයියගෙ මූණ එකසැරේ වෙනස් වුණා..

@Shan

" චූටි.. අපි.. අපි යමුද..??"

ආධ්‍ය අයියා මගේ අතින් ඇදගෙන එළියට ආවම මුළු කැම්පස් එක වටේම ඉඳපු උන් මං දිහා කන්න වගේ බලාගෙන හිටියා.. කැම්පස් එකට අලුතින්ම ආපු ප්‍රොෆා මම දාගෙන වගේ.. ඒ අස්සෙ ගැම්මකුත් ආවා මට.. ලේසි පාසු මනුස්සයෙක්ගෙද මම මේ අතින් අල්ලගෙන යන්නෙ.. ඒ නිසා මට විශ්වාසත් නෑ මේ ආධ්‍ය අයියගෙම අතද කියලා.. ඔක්කොම තියලා මම ආධ්‍ය අයියගෙ අතේ මුද්දක් තියද බැලුවා..

තියෙනවා තමා..!!!

එකක් වෙනුවට මාමා දෙකක්ම දාලා.. වෙඩින් රින්ග් එක උඩට තව පොඩි ඩයමන්ඩ්ස් අල්ලපු හීනි රින්ග් එකක්.. ඇති යන්තම් අන්තිමේ නාකි මාමා බැන්දා..

ආධ්‍ය අයියා කාර් එක අන්ලොක් කල්ලා මට නගින්න කිව්වා.. ටසිරි මුන්ට සල්ලි වැහි වහිනවද යකෝ.. බ්‍රෑන්ඩ් නිව් බී එම් ඩබ්ලිව් එකක්..??

" ඒ මේක අයියලාගෙද.."

" අයියලාගෙ නෙමේ.. අයියගෙ.."

මම කාර් එකට නැග්ගා.. සාක්කුවෙ ගහගෙන ඉඳපු ස්ටෙත් එක අරගෙන උකුළෙන් තියාගත්තා.. මේකනම් පරිස්සම් කරන්න මම විඳින දුක දන්නෙ මම විතරයි.. මටයන යන තැන දේවල් අමතක වෙන ලෙඩක් තියෙනවනෙ.. අනික මම මේකට හුඟක් ආදරෙයි..

" කවද්ද දෙයියනේ ආවෙ.. මම දන්නෙවත් නෑ.. කිව්වෙත් නෑ.. කෝල් එකක්වත් දෙන්න ඕනනෙ.."

" දැන් සතියක් වෙනවා චූටියො.. කොහෙද අනේ අපේ ගෙදර ලෙඩ්ඩු වැඩිවෙලා.. මේ ටිකේම හොස්පිටල් හිටියෙ.. ක්ලයිමේට් එක චේන්ජ් වුණාම අමාරුනෙ.."

" ආ.. මාමා කෝ.."

@Shan

" ගෙදර ගෙදර.. දැන් යනවනෙ.. ගියාම බලාගන්න.. ඔයාව දකිනකල් ඉවසිල්ලක් නැතුව ඉන්නෙ.."

" අයියලා කොහෙද ඉන්නෙ.."

" මවුන්ට් ලැවිනියා වලින් අපාට්මන්ට් එකක් ගත්තා චූටි.. එන්න ප්ලෑන් කළේ මාසයක් තියා.. ඒත් වැඩ වැඩී ගෙදර හොඳටම.. පහුගිය කාලෙ බිසි වෙලා හිටියෙ වැඩත් එක්කලා.."

" ආ.. අම්මෝ අනේ.. මෙයා ගහපු පට්ටම ගොඩ.. MBBS විතරක් කරන්න ඉන්න මට ලැජ්ජයි දැන්නම්.."

" ලැජ්ජ වෙන්නෙ මොකටද.. අපිට නැනෙ ඉන්ටනැශනල් මැචස් වලින් වින් කල්ලා ඉපදුණු රටේ ඇත්තම එකත් එක්ක ස්ටේජ් එකකට නගින්න වාසනාවක්.. ඔයා මාරයි චූටි.. මට පුදුම ආඩම්බරයක් දැනෙනවා.."

" අයියට.. දැන් හොඳයිද..??"

ආඪ්‍ය අයියා මං දිහා බලලා හිනාවුණා..

" කොහොමද පේන්නෙ.."

" හොඳින් ඉන්නවා.. නෙ.."

" ඔව්.. ට්‍රාන්ස්ප්ලාන්ට් එක සක්සස් වුණා.. ඉක්මනටම අපිට ඩෝනර් කෙනෙක් හොයාගන්න පුළුවන් වුණා චූටි.. නදීර තමයි සෑහෙන්නම උදව් කළේ.."

" ආ අයියගෙ හොඳම යාළුවා නෙ.. අර ඩෙන්මාක් ඉන්නවා කිව්වෙ.."

" අන්න හරි.. එයා සේරම වෙලාවට සෙට්ල් කළා.. හිතුවෙ නැති දේවල්නෙ වුණේ.. මම ඔයාට කියන්නම්කො.."

" මෙයාලා හෙන ලක්ශරි ලයිෆ්නෙ ගෙවන්නෙ.. අම්මෝ අනේ.."

මම ආඪ්‍ය අයියගෙ වාහනේ පිටිපස්සෙ තිබුණ ෂනල් බෑග් ටික දිහා බලලා කිව්වා..

@Shan

" එහෙම වෙන්න එපෑ.. ඇනස්තීසියොලොජිස්ට් කෙනෙක්ගෙ සැලරි එක එහේ අවුරුද්දට ඩොලර් ලක්ශ තුනක් වගේ.. එක්ස්පීරියන්ස් වලින් බැලුවහම ඊටත් වැඩී.. ඒ කියන්නෙ මෙහේ ගානෙන් මිලියන අනූ පහක් විතර.. මම දැන් අවුරුදු දෙකක් තිස්සෙ වැඩ.. අනික ලෝකෙ වැඩිම සැලරි යන ඩොක්ටර්ලගෙන් ඇනස්තීසියොලොජිස්ට්ලත් ඉන්නවනෙ.."

මගේ කට දණහිස ගාවටම ඇරුණා.. මගෙ අම්මේ..

" බුදුඅම්මො.."

" ඒ මමනෙ.. එතකොට අනුරාග්ට සැලරි එක එහේ අවුරුද්දට ඩොලර් ලක්ෂ දෙකක් වගේ එනවා.. ඒ කියන්නෙ මෙහෙන් මිලියන අනූ හතරක්..?? ඔව් ඒ වගේ.."

" සිරාවට..?? අඩෙ එහේ අවුරුද්දක් වැඩ කල්ලා මෙහේ හොටෙල් එකක් ගහන්න පුළුවන් නෙ අයියෙ.."

" ඒකතමා චූටියො.. අනික ඉගනගන්න එකේ වටිනාකම එහේදි හොඳට තේරෙනවා.. අපි දෙන්නා දැනටම මෙහේ ඇවිල්ලා අවුරුදු පහකට ඉන්නවත් හම්බකල්ලා තියනවා.. අනික මෙහේ ආවෙම.. බබාලා දෙන්නගෙ- ඌප්ස්.. අපරාදෙ මගේ සප්‍රයිස් එක.."

ආධ්‍ය අයියා එක අතකින් කට වහගත්තා.. දැන් නම් මේ අසරණයා මැරිලා යයි වගේ ආච්චිඅම්මෙ.. මම ඉක්මනට ගෙදර එනවා..

" බබාලා කිව්වෙ.. ඈ අයියෙ.. සිරාවටමද.. බබාලත් ඉන්නවද.. මගේ පල්ස් වැඩද බලපන් අයියේ.. උඹලගෙ සප්‍රයිස් නිසා මගේ පණ යනවා.. මාමට කියහල්ලා මට වෙනුවට සමර් ඔලිම්පික් යන්න කියලා.."

ආධ්‍ය අයියා ඒ සැරේ මගේ පල්ස් වැඩද කියලත් බැලුවා..

" වැඩ වැඩ.. අපි ගෙදර ගිහින් කතාකරමුකො.. යමු.."

ආධ්‍ය අයියා අහස උසට ගහපු මවුන්ට් ලැවීනියා වල සුපර් ලක්ශරි අපාට්මන්ට් එකක පාකින් ලොට් එකේ කාර් එක පාක් කළා.. මේවා දරාගන්න බෑ දෙයියනේ.. මම අර මොකාද එකා වගේ මෙඩිකල් කිට් එකත් ඇඳගෙන මෙලෝ රහක් නැතුව බැබලි බැබලි යන ආධ්‍ය අයියගෙ

@Shan

පිටිපස්සෙන් ඇදිලා ගියා.. හැමතැනම තියෙන්නෙ විසාල වීදුරු.. මට හිතාගන්න බෑ මුල් දෙන්නා කොහොම ලෝකෙ පෙරළුවද කියලා.. ඒ මදිවට මම මහප්පෙකුත් වෙලා.. මහප්පද අයියද.. අපේ මාමගෙ ළමයි මට මල්ලිලනෙ.. ඒත් මිනිහගෙ අයියගෙ ළමයින්ට.. මහප්පා නේද.. ඕන මගුලක්.. චූටි තාත්තා කියන්න කියනවා..

ඒත් මට දැනෙනවා එයාලත් එයාලගෙ ජීවිත මේ තැනට ගේන්න හුඟක් මහන්සිවෙලා වගේ.. මට සතුටු හිතුණා.. හැමෝටම තමන්ගෙ කියලා ජීවිත තියනවා.. මටත් මගේ ජීවිතේ ගැන බලාපොරොත්තුවක් ඇතිවුණා.. හැමෝගෙම හීන හැබෑවෙනවා.. හීනවලට පණ තියනවා..

හීනවලට පණ පෙව්වොත් ඒවා හීනම නෙමෙයි..!

ලිෆ්ට් එක ගිහින් හයවෙනි තට්ටුවෙ විතර නතර වුණාම ආධ්‍ය අයියා මගේ කර වටේ අතකුත් දාගෙන වෙල්වට් කාපට් එක දිගේ දිගටම ඇවිදගෙන ගිහින් ලොකු දොරක් ළඟ නැවතුනා.. ෆින්ගර් ප්‍රින්ට් එක තිබ්බා.. ඇතුළෙ කාලගෝට්ටියක් වගේ.. මාව ගල් ගැහුණා.. දොර ළඟම..

" Donne-moi mon jouet අව්‍යාන්.. ඔඩා මෙයා එක්ක බෑ.."

(මගේ සෙල්ලම්බඩුව දෙන්න)

" C'est à moi.. ආරුශ්.. මම ඒක මුලින් ගත්තෙ.. ඔඩා අයියා ඉන්න දෙන්නෙ නා.. ඔඩා.. ඔඩා එන්නකෝ.."

(ඒක මගේ)

පොඩි කියුට් ජර්සි දෙකක් ඇඳගෙන සාලෙ මැට් එක උඩ ඉඳගෙන හිටියෙ පුළුන් බෝල දෙකක්.. පුදුම ලස්සනයි දෙයියනේ.. මගේ ඇස් වල කඳුළු පිරුණා.. මම ශූස් දෙක ගලවලා පැත්තකින් තියලා ගෙට යද්දි බබාලා දෙන්නා ආධ්‍ය අයියව දැකලා බෙරිහන් දෙන්න ගත්තා..

" පපා.. අයියා ගානවා.. අයියා ආරු බබාව සිද්දනවා.. පපා.."

ඒ එක්කම උඩ පඩිපෙළ බැහැගෙන ආවෙ..

මගේ මාමා..

@Shan

එයා වෙනස් වෙලා.. හුහක්.. සෑහෙන්න වෙනස් වෙලා.. මාමා මෙලෝ සිහියක් නැතුව ටැබ් එක දිහා බලාගෙන පහළට ඇවිදගෙන එද්දි නිල් පාට කිට් එකක් ඇඳගෙන හිටපු බබා වැටි වැටී ගිහින් මාමගෙ කකුලක එල්ලුණා.. අනිත් එක්කෙනා තාම ඇවිදගන්න බැරිද කොහෙද..ආධ්‍ය අයියා ගිහින් වඩාගත්තා..

" ළමයි මොකද මේ රණ්ඩුවෙන්නෙ.. සුදුපුතා!! මම කියලා තී-"

එකසැරේට මාමා මගේ දිහා බැලුවා.. මාමා මගෙ ඉහේ ඉඳන් දෙපතුළ වෙනකල්ම බලාගෙන ඉඳලා එකසැරේට ආධ්‍ය අයියා දිහා බැලුවා..

" සුදුමහත්තයා!! දෙයියනේ මගේ කොල්ලා.. සුදුමහත්තයෝ.."

මම දුවගෙන දුවගෙන ගිහින් මාමව බදාගත්තා.. දෙයියනේ මගේ තාත්තා!! මට මැරෙන්න තරම් සතුටුයි.. මැරුණත් කමක් නෑ.. මම මාමව හම්බුණා.. මම හැමදාම බලාපොරොත්තු වුණු මගේ මාමා.. ඒ හයිය.. මං ගාව ඉන්නවා.. මම තව ටිකක් තද කල්ලම මාමව බදාගත්තා.. ආයෙනම් කොහේවත් යන්න එපා.. මට බෑ මාමා නැතුව ඉන්න.. මට නොකියා කොහේවත් යන්න එපා.. මාව මැරෙයි මාමෙ.. මම මේ හීනයක් නෙමෙයි නේද දකින්නෙ..

" මගේ කොල්ලො.. සුදුමහත්තයො.. උඹ ලොකු වෙලා

**රත්තරනේ**

.."

මාමා මාව තව ටිකක් තුරුල් කරගත්තා..

" මා-මෙ.."

මාමා වෙනදා වගේම මගේ නළලෙන් හාදු තියනවා මට දැනුණා.. ඒ හැඟීම මගෙන් ආයෙ ඈතට යන්නයි හදන්නෙ.. මට දැනෙනවා.. කළුවර හැඟීමට එන්න බෑ.. ආයෙම එන්නෙ නෑ කියලා.. මම මාමට තුරුල් වුණා.. අන්තිමට මගේ ජීවිතේට ආයෙම මාමා ආවා.. මගේ මාමා මට ආපහු හම්බුණා.. ආච්චිඅම්මා සතුටු වේවි හුහක්.. අන්තිමේ මුණුබුරොත් බැලුවා මගේ ආච්චිඅම්මා..

@Shan

" යූ නුති නුති බෝයි.. ඩෝන්ට් ඩෙයා ටු ටච් මා ඩඩා.. සයිඩ් ප්ලීස්.. පපා මෙ නුති බෝයි මා ඩඩා හග් කරනවා.. නූ නූ.. නූ හගීස්.. ඩඩාස් හගීස් ෆෝ අව්‍යාන්.. නොත් ෆෝ යූ.."

ඒ එක්කම අර පුංචි පුළුන් බෝලෙ ඇවිත් හැලෙන්න තියන මගේ කලිසමෙන් ඇද්දා.. මෙකෙ මැහුමක් ගහගන්න බැරිවුණු නිසානෙ මෙ සේරම.. මම සුටුස් ගාලා මාමව අතෑරලා කලිසම අල්ලගෙන ඒක උඩට ඇදගෙන අර කියවන එකාවත් වඩාගත්තා..

" ඇශේ මේ පණ්ඩිත සීයා අයියද මල්ලිද.."

ආඪ්‍ය අයියා රතු වුණා.. මාමා ආඪ්‍ය අයියගෙ පිටට තට්ටුවක් දාගෙන අනිත් බබාව ඉල්ලගෙන ගිහින් උකුළෙන් තියාගෙන සෝෆා එකෙන් වාඩිවුණා..

" ඔය ඉන්නෙ අයියා.. අර ඉන්නෙ මල්ලි.. අපෝ චූටි නඩු අහලා අපිට ඉවරයක් නෑ.. ඉන්නකො මම බොන්න දෙයක් හදාගෙන එන්න.. ඔයාලා කතාකරන්න.."

ආඪ්‍ය අයියා සුදු කෝට් එක ගලවලා පැත්තකින් තියලා කිචන් එකට ගියා.. ඕපන් කිචන් එකක් ඒ වුණාට.. සාලෙයි කිචන් එකයි දෙකම එකට.. ඒත් විසාල ඉඩක් තියනවා.. මම අර කොල්ලවත් උස්සගෙන ගිහින් මාමා ගාවින් වාඩිවුණා.. මං ගාව ඉන්නෙ අපේ මාමගෙ කොපියද කොහෙද.. අනිත් එක්කෙනා ආඪ්‍ය අයියා වගේම රෝස කම්මුල් තියන කොන්ඩෙ උරහිස ගාවට වවපු බෝලයක්.. මාව දියවෙලා යනවා වගේ..

" ගේමක් ගැහුවා නේන.."

" ආයෙත් ඉතින්.. ගැම්මක් තමා.."

" මොන ලෝකෙද මාමෙ හිටියෙ.. මම කොච්චර බය වුණාද.. හරිනම් මෙහෙම හොඳින් කතාකරන්න වටින්නෙ නෑ.."

ඒ අස්සෙ අව්‍යාන් මගේ බෙල්ලෙ තියන මාලයක් ඇදලා අරගෙන ඒක කටේ දාගත්තා.. ඉස්සර ළමයි වඩාගන්න බැරිවුණාට.. දැන් ඉතින් පුළුවන්.. සදෙව් අයියගෙ පොඩි එකත් වඩාගෙන ඉන්නෙ මමනෙ..

@Shan

" අපි හැමෝටම අපේ පැත්තෙන් කතා තියනවා බං.. ඒ වුණාට උඹව තනි කල්ලා ගියේ අම්මා හරි ඉන්නවා කියලා හිත හදාගෙන.."

" අම්මා මැරි කළා මාමෙ.. දැන් මෙහේ නෑ.. ඇමරිකා වල.. අවුරුදු හතරකට කිට්ටුයි ගිහින්.. ආච්චිඅම්මා ඉන්නෙ මෙහේ.. මම ගෙයක් රෙන්ට් එකට ගත්තා කුරුඳුවත්තෙන්.. හැමතැනටම ළඟයිනෙ.."

" මගේ අම්මට කොහොමද සුදුමහත්තයො.."

මට ආච්චිඅම්මගෙ සිරියාවන්ත මූණ මතක් වුණා.. අනේ ආච්චිඅම්මෙ හවස මම එද්දි ආච්චි සතුටු වෙන්නයි යන්නෙ..

" ආච්චිඅම්මා බලන්න හවස යමු.. ආච්චි හැමදේම දන්නවා.. ආධ්‍ය අයියා ගැනත්.. ඔයාලට බය වෙන දෙයක් නෑ.."

" මම්.. යමු.. මීට කලින් හම්බෙනවා කොල්ලො.. ආපු ගමන්ම මෙ දෙන්නා අසනීප වුණා.. අපේ වැඩත් එක්ක මාරුවෙන් මාරුවට හොස්පිටල් හිටියෙ.. ඔන්න ඊයෙ යන්තම් උණ අඩුවුණේ.. අපිනම් උඹව හැම තැනම දකිනවා.. මට ආඩම්බරයි සුදුමහත්තයො උඹ ගැන.."

" කමක් නෑ දැන් ආවනෙ.. මට තේරෙනවා.. ආච්චිඅම්මට මෙයාලා දැක්කම සතුටු හිතේවි මාමෙ.."

ආධ්‍ය අයියා අයිස් කොෆී තුනක් අරගෙන ඇවිත් මේසෙ උඩින් තියලා මං ගාවින් වාඩිවුණා..

" කතාකරන්නම් කොච්චර දේවල් තියද චූටි.."

" මම්.. මම ඔයාලා එනකල් බලාගෙන හිටියෙ.."

අව්‍යාන් මගේ අතින් බැහැලා ගිහින් ටීවී එක ඉස්සරහින් වාඩිවුණා.. ආරුශ් නිදි කිරනවා මාමගෙ පපුවට ඔලුව තියාගෙන..

" අනූ.. චූටිපුතාව නිදි කරවන්නකො.. මම එයාගෙ කිරි එක කාමරේ තියලා ඇත්තෙ.."

මාමා ආරුශ්ව උස්සගෙන නැගිට්ටා.. අනේ ආධ්‍ය අයියගෙ පොඩි වර්ශන් එක.. දැක්කම පොඩි කල්ලා සාක්කුවෙ දාගෙන යන්න හිතෙනවා.. කම්මුල්

@Shan

දෙක පිම්බිලා මාශ්මෙලෝස් වගේ.. රෝසම රෝස පාටයි..

මාමා යනක් ඉඳලා ආධ්‍ය අයියා මගේ අත් දෙකින් අල්ලගත්තා..

" චූටි.. මගේ පොඩී කොහේද..!!"

මට එකසැරේම බයක් දැනුණා.. ඒ කියන්නෙ.. ඒ කියන්නෙ ආධ්‍ය අයියා දන්නෙ නැද්ද.. රධ්‍ය අයියා කොහේද කියලා..

*ආරුශ් දේව්‍යන්

අව්‍යාන් දෙව්රාත්

එන්න එන්න හැමෝටම ෆ්‍රී හග්ස් දෙනවා.. අපි මේ ආධ්‍යාගමනය සමරමෝහ්..

බොලා දැන් මේ පොඩ් උන් දෙන්නට එහෙම මල්ලිලා ගානවා නෙමේ.. ආධ්‍ය අයියට අයියා කියපු සේරම පුතා කියන්නෝන.. හුම් තේරුණාද.. දැන් දිගට හරහට නැන්දලා වෙන්න ලෑස්තිවෙයල්ලා..

ඉතින් එදා ගෙදර වුණු දේ ඇත්තටම දැනගන්න එකතුවන්න වෙරි මින්සියාගෙ සේපාලිකාව සමඟ..

එන්නාම්.. ලව් යූ..❤

සිසිරෙට කොළ හැළුණ

**රුස්ස ගස් වල**

දලු ලාද්දි හුහක් ලස්සනයි ළමයි.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

@Shan

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 158 කොටස

" මට-මට සමාවෙන්න චූටි.."

ආධ්‍ය අයියා මගේ අත් දෙක තද කල්ලා අල්ලගෙන පපුවට තියලා තුරුල් කරගත්තා.. මෙච්චර වෙලාම තිබුණ ආධ්‍ය අයියගෙ මූණ, එයාගෙ හැගීම් සේරම එකසැරේ වෙනස් වෙලා වගේ දැනෙන්න ගත්තෙ.. එක සැරේට හැමදේම එකපේළියට වුණු නිසා මමත් හිටියෙ පුදුම වෙලා.. ආධ්‍ය අයියා තාම එයාගෙහිතේ සැනසීම හොයාගෙන නැද්ද..

" මේ මොකද අයියෙ.."

ආධ්‍ය අයියා මගේ උරහිසට වාරු වුණා.. අයියගෙ කොන්ද ගාවින් මට තවම කොටින් පැඩ් එකක් අහුවෙනවා..

" ඔයා හොදින්ද හිටියෙ චූටි.."

මම අයියගෙ පිට අතගෑවා.. චෙච්ච දේවල් වලට අපිට කරන්න දෙයක් නෑ.. අනික.. මිනිස්සු දරාගෙන උපරිමෙටම ආවම.. කලකිරෙනවා.. අතාරිනවා.. ඒකට කමක් නෑ කියලා නිහඬ වෙනවා.. මගෙ හිතේ හැගීමත් එහෙමදෝ මට හිතුණා..

නෑ.. මට සතුටුයි.. මගේ මාමා අවුරුදු දහනමයක් මං වෙනුවෙන් හිටියා.. මගේ පැත්තෙන් හිටගත්තා.. එහෙමයි කියලා මටම ජීවිතේ දියකරන්න ඕනද.. මගේ ඉපදුණු හැටියට මගේ මාමා පලි නෑ.. අවුරුදු හතළිහක්ම ඒ මනුස්සයා විදෙව්වා.. අද එයාගෙ සතුට එයා ගාව තියනවා.. ඉතින් මම සතුටු වෙන එක සාධාරණයිනෙ.. ආධ්‍ය අයියත් එයාගෙ වයසට වඩා සෑහෙන්න දරාගත්තා.. හරියට මම වගේම.. ඉතින් එයාලා සතුට හොයාගෙන ගිය එක වැරදිනෑ..

ඒත් මට කියන්නවත් තිබුණා.. දැන් ඒකට කරන්න දෙයක් නෑ.. මගේ හිතේ කිසි තරහක් නෑ.. මට පුදුම සතුටුයි.. මම හිතේ තරහ තියාගෙන ඒක වඩව වඩව හිටියනම් අද මේ තැන ෂනෙරු කියලා කෙනෙක් නෑ.. රුස්ස ගස් වුණාම දරාගන්න ඕන.. මම තවටත් දරාගන්නවා.. එයාලගෙ හිතේ

@Shan

මොකක් හරි පසුතැවීමක් කොතනක හරි තියනවා කියලා මට දැනෙනවා.. කොයි දේටත් වඩා පසුතැවීම කියන දේ.. මිනිස්සු නොමර මරනවා..

" එදා මොකද වුණේ කියන්නකො.. අයියගෙ වැරැද්දක් නෑ.. මම හොඳින් හිටියා.."

ආධ්‍ය අයියා ඇස් වල කඳුළු පිහිදගත්තා..

" එදා.. එදා ඔයා හිටියනම් චූටි.. එතන මිනියක් මැරෙන්න තිබ්බා දෙයියනේ.. මට අදට මතක් වෙද්දිත්.. මගේ පපුව රිදෙන්න ගන්නවා.."

අන්තිමේ හැමෝම හංගන දේවල් මම දැනගන්නද යන්නෙ..

" ඔයා ගිය දවසට පස්සෙ දවසෙ නදීර කෝල් කළා.. අපේ අතේ ඉතුරු කරපු හරිහමං සල්ලියක්වත් තිබ්බෙ නෑ චූටි.. අද මෙහෙම හිටියට.. ඒ දවස්වල සැහෙන්න බෙහෙත් වලටම වියදම් වුණා.. මට හොස්පිටල් යාගන්න බැරිවුණා.. අනූ ජොබ් එකෙන් අයින් වුණා.. සැහෙන්න දේවල් වුණා.. ඔයාට කියන්න පුළුවන් දේවල් නෙමේ චූටියො.. ඔයා හුඟක් පොඩි දරුවෙක්.. අපි අතරෙ තිබ්බ පීඩනේ ඔයාට කිව්වනම් ඔයාට ඒක ඉවසගන්න බෑ.. කොහොමවත් බෑ..

නදීර තමයි ඩෝනර් කෙනෙක් හොයලා අපිට එන්නත් සේරම වියදම් කළේ.. පස්සෙ අපි කැනඩා ගියේ.. සර්ජරි එකකටවත් වියදම් කරන්න අතේ තිබ්බෙ බොහොම පොඩි ගාණක්.. දන්නවනෙ ඒවගෙ වියදම.. මගේ යාළුවා මට සැහෙන්න උදව් කළා චූටි.. ඒකා හිටියෙ නැත්නම් මම මෙලහට මැරිලා ගිහිල්ලා.."

" පිස්සුද අයියෙ.."

" ඇත්ත කියන්නෙ චූටි.. ගිහින් සර්ජරි එක කල්ලා මම හුඟක් කල් එකතැන හිටියෙ.. අනූට ඩෙන්ටල් ඩොක්ට කෙනෙක් විදියට මුලින් වැඩට යන්න බැරිවුණා.. එහේ ඩෙන්ටල් සර්ජරි ඇසිස්ටන් කෙනෙක් විදියට අන්තිමට හොස්පිටල් ගිහින් වියදම හොයාගත්තෙ.. කනඩා වල ගිහින් එහෙම සැපක් වින්දෙ නෑ චූටි.. මෙහේට සල්ලි රුපියල් වුණාට එහේ එහෙම නෑ චූටි.. අවුරුදු එක හමාරක් යනකල් මාර කට්ටක් කැවෙ.. අන්තිමට මගේ හිතේ හයියට නැගිටලා එහේ එක්සෑම් ලිව්වා.. MBBS ඩොක්ට කෙනෙක් විදියට වැඩ කරන ගමන් අනිත් ඒවා ඉගනගත්තා.. අනූත් සර්ජන් කෙනෙක්

@Shan

වෙනකල් එක්සැම් ටික කරගත්තා.. පස්සෙ අපි කසාද බැන්දා.. උත්සව තියලා නෙමේ අත්සන් කල්ලා පලියක බැන්දෙ.. නදීර විතරයි අපි වෙනුවෙන් හිටිය එකම මනුස්සයා.. එයා ඒ කාලෙ ඩෙන්මාර්ක් ඉඳන් කැනඩා ආවා.. ඊටපස්සෙ යන්තම් අතට කීයක් හරි එන්න ගත්තම මෙයාලා දෙන්නව ගෙනාවෙ.. මෙ හම්බකරපු හැම සතයක් ගාණෙ අපි සැහෙන්න කට්ටක් කෑවා චූටි.. නොදන්න රටක තනිවෙනවා කියන්නෙ..

මේවා මෙහෙම වෙන්නෙ නෑ.. අර අප්පච්චි කියන එකා හිටියෙ නැත්නම්..!!"

ආධ්‍ය අයියා ඒ වචනෙ කියද්දිත් හිටියෙ දත් කුරු කන ගමන්.. මම දන්න ආධ්‍ය අයියට කේන්ති යන්නෙ නෑ වුණාට.. දැන් එහෙම නැද්ද මන්දා..

" අපි හැමදේම අනූගෙ අම්මට කියන්නයි හිතාගෙන හිටියෙ.. අනික මට පොඩීව අරගෙන යන්න ලොකු උවමනාවක් තිබුණා චූටි.. එයා මං ගාව හිටියනම් පරිස්සමට ඉන්නවා.. මම හැදුව වැඩුව එකා..හ්හ්-"

ආධ්‍ය අයියට ඉකි ගැහෙන්න ගත්තා.. මටත් ඇඬෙනවා.. මගේ රධ්‍ය අයියා කොයි ලෝකෙද දෙයියනේ ඔයා ඉන්නෙ.. මාව මෙහෙම බය කරන්න එපා..

" එදා රෑ පොඩී ක්වාටස් එකට ආවා අනූව හම්බෙන්න.. ඒ වෙද්දි වෙන්න ඕන සේරම වෙලා චූටි.. ඔයා ගැන.. ඔයාලගෙ හැම පොඩි විස්තරයක්ම අප්පච්චි දැනගෙන.. අප්පච්චි හෙව්වෙ අනූව නෙමේ ඔයාව.. පොඩී ආවට පස්සෙ අප්පච්චි හිතුවෙවත් නැති විදියට ක්වාටස් එකටම ආවා.. එදා.. එදා එතන මිනියක් මැරුණෙ නෑ පුදුමයි.. ලොකු රණ්ඩුවක් වුණා.. අප්පච්චි වියරු වැටිලා හිටියෙ.. පොඩීට අපි ඉස්සරහම සැහෙන්න ගැහුවා.. මම.. මම මොකද කරන්නෙ චූටි.. මම හදපු මගේ දරුවෙක් වගේ.. ඔයාගෙ නම කිය කිය ඔයාව ඇහුවා.. කොහෙන්හරි ඔයාව හොයාගෙන දෙකෙන් එකක් විසඳගන්නවා කිව්වා.. මගේම අප්පච්චි මට පිහියෙන් අනින්න ගියා චූටි.. ඔයාට මම කියන ඒවා හිතාගන්නවත් පුළුවන්ද.. මම හිටියෙත් යන්තම් හුස්ම ටික ගැටගහගෙන.."

මගේ ඇස් වලින් කඳුළු වැස්සක් වගේ කඩාගෙන වැටුණා.. ඇයි මේ..

" අන්තිමට ඒකටත් මැද්දට පැන්නෙ අනුරාග්.. පොඩි දුක් කන්දරාවක් නෙමේ චූටි.. මුළු ගේම අප්පච්චි අනින්පැත්ත ගැහුවා.. අන්තිමට පොඩී

@Shan

අප්පච්චිට පොරොන්දු වුණා කියන විදියටම ඉන්නම් අපිට කරදරයක් කරන්න එපා කියලා.. ඌ දණින් වැටිලා සමාව ඉල්ලුවෙ.. මම එහෙම රධ්‍ය කෙනෙක් ජීවිතේට දැකලා තිබ්බෙ නෑ චූටි.."

" එතකොට අසලි අම්මා..?? අනේ දෙයියනේ අයියෙ මොනවද මේ කියන්නෙ.."

" අම්මා ආයෙම ඒ අමනුස්සයට අහුවුණා චූටි.. අපි නිසා අපේ අම්මයි, පොඩියි ආයෙම ඒ මනුස්සයට කොටු වුණා.. අම්මා අප්පච්චිව ඩිවෝස් කරන්නෙ නෑ කිව්වා.."

" මගේ රධ්‍ය අයියා කොහේද අයියෙ.. අනේ එයා හොඳින් නේද ඉන්නෙ.."

ආධ්‍ය අයියා පොඩි වෙලාවක් එහෙමම හිටියා.. එයාට එකසැරේට ඇඬුවහම හුස්ම ගන්න අමාරුවෙනවා.. මම අයියගෙ පිට හිමින් අතගෑවා..

" පොඩී ඉන්නෙ අම්මයි අප්පච්චියි ගාව.. එයාලා අතින් පොඩිම පොඩි දේකින් හරි ඔයා ගැන දෙයක් පිටවුණොත්.. චූටි.. ඔයාව අර මිනිහා තියන එකක් නෑ.. මම අප්පච්චි ගැන හොඳට දන්නවා.. මනුස්සයෙක් එකසැරේ අතුරුදහන් කරන්න එයාට තප්පරක්වත් යන්නෙ නෑ.. අප්පච්චි පොඩීව එයාගෙ ගැටේට හිර කරන් ඉන්නෙ.. ඔයා නිසා එයා ඉවසනවා චූටි.. මගේ පොඩි එකා ගාවට මට යාගන්න විදියක් නෑ.. අපි ආයෙම කතාකළොත් අප්පච්චි අපිව නොමරා මරාවි.. මෙච්චර ගොඩනගාගත්තු දේවල් එහෙම්පිටින්ම නැතිවෙලා යනවා.. මම අසරණයි චූටි.. ඔයාට කතාකරගන්න සිය දහස් වතාවක් හිතුවා.. මට ඒකට හයියක් නෑ චූටි.. මගේ හිත ඇතුලින්ම තියෙන්නෙ මහා වරදකාරී හැඟීමක්.. හැමදේම වෙලා ඔයාව දාලම යන්න වුණා.. ආයෙම අපි කරදර අඩුවෙලා ජීවත් වෙන්න ගද්දි ඔයා හුඟක් දුර ගිහිල්ලා.. ඔයාගෙ රිසාල්ට්ස් ආපු දවසෙ අනුරාග් සෑහෙන්න ඇඬුවා.. අපි හදාපු ළමයි දෙන්නෙක් වගේ.. කොහොමද චූටි අපි දාලා ගියෙ..

මම මෙහෙම කිව්වට ඒ පසුතැවීම විස්තර කරන්න බෑ.. අන්තිමේ අනුගෙ අම්මා, ඔයාගෙ අම්මා ඔයා ගාව ඉන්නවා කියලා හිත හදාගත්තා.. අපි කතාකළොත් ඔයා ආයෙම අවුල් වෙලා බැරිවෙලාවත් අප්පච්චි ගැන හාරා අවුස්සන්න හිතුවනම්.. ඔයාට වෙන දේ හිතාගන්නවත් බෑ චූටි.. එයාට කනෙක්ශන් නැති තැනක් නෑ.. මේ වගේ රටක හැමදේම සල්ලි වලටයි දේශපාලනේටයි යටයි.. ඒත් ඔයාගෙ නම ඔයාගෙ හදාගත්තට පස්සෙ

@Shan

කොටවත් ලේසියෙන් ඔයාට ළං වෙන්න බෑ.. අන්තිමට අපි ලංකාවට එන්න තීරණේ කලේ චූටි.. අනුරාග් සැහෙන පසුතැවෙනවා.. අම්මට මේ දේවල් නොකිව්ව එක ගැන.. ඔයා ගැන.. ඊටත්වඩා මම පසුතැවෙනවා.. මට මගේ කියලා පවුලක් නැනෙ චූටි.. මගේ අම්මා නෑ.. අප්පච්චි කෙනෙක් නෑ.. මගේ සහෝදරයා නෑ.. අන්තිමට ඉතුරු වුණේ අනුරාග් විතරයි.. ජීවිතේ අසරණකම දැනෙනකොට මැරෙන්න හිතෙනවා චූටි.. අනුරාග් නදීර නැත්නම් මම මෙලහට මැරිලා.. අම්මපල්ලා.. ආඪ්‍ය කියලා කෙනෙක් නැතිවෙන්න තිබ්බා.. අනික නෙතු පුදුමාකාර වදයක් දුන්නෙ.. හැමපැත්තෙන්ම එන පීඩනේ වැටුනෙ අපි දෙන්නගෙ කර උඩට..

අන්තිමේ පොඩී ඒ සේරම එයාගෙ කරට අරගෙන අප්පච්චි ගාවට වුණා චූටි.. ඔයාට දැනෙනව.. දැනෙනවද මම සතුටින් ඉන්නවා කියලා.. මගේ පවුල විතරයි මට තියන සැනසීම.. එච්චරමයි.. මට දුකයි මල්ලී.. මගේ පොඩී එකා ළඟටවත් කිට්ටුවෙන්න තිබ්බනම්.. අපි එයාට ළං වුණොත් අප්පච්චි පොඩීව තද කරනවා. හැම එකටම ඔයාව ඇපේට තියාගෙන පොඩීව කන්ට්‍රෝල් කරනවා.. අම්මා විතරයි මගේ පොඩී එකාට ඉන්නෙ.."

ආඪ්‍ය අයියා සෝෆා කලිසමෙ සාක්කුවෙ තිබ්බ ඉන්හෙලර් එකක් අරගෙන ඒක කටට තියලා දෙතුන්පාරක් ඇද්දා..

" අප්පච්චි මේ කරන්නෙ වැරැද්දක් අයියෙ.. එයාට ඇත්තටම පිස්සු.. ඕක මානසික ලෙඩක්.. අසලි අම්මට කියන්නකො.. අප්පච්චිව බෙහෙත් ගන්න එක්ක යන්න කියලා.. එයාට අයිතියක් නෑ එහෙම ජීවිත වලට බලපෑම් කරන්න.. කොහෙත්ම බෑ.. ඇත්තමයි මම රඪ්‍ය අයියව හොයාගෙන යනවා අයියෙ.. මැරුණත් කමක් නෑ කියලා.. මොන කරුමයක්ද දෙයියනේ මේ.."

ආඪ්‍ය අයියා ඇස් දෙක පියාගෙන හිටියා..

" ඔය නිසා තමයි.. ඔයාව මේකට ඇදලා ගන්න බැරි චූටි.."

මට මහා අසරණකමක් දැනුණා.. මම වෙනුවෙන් කවුරුත් දුක් විඳින්නෙ මොකටද.. ඇයි අපි අමාරුවෙන් අල්ලගෙන ඉන්නෙ.. මෙච්චර දුකක් විඳගෙන අල්ලගෙන ඉන්න ඕනමද.. මම දෙපැත්තක අසරණ වුණා..

" මම කසාද බැන්දොත් අප්පච්චි අයියව අතාරීද.."

@Shan

ආධ්‍ය අයියා ඇස් දෙක ලොකු කරගෙන මගේ දිහා බලාගෙන හිටියා.. මම මොකක්ද කරන්න ඕන.. ඇයි හැමෝම සැනසීම හොයාගද්දි අපේ පව්ලෙ සැනසීම නැත්තෙ.. මගේ වයසෙ හැමෝම එයාලගෙ හීන වලට යනවා.. ඇයි.. මම..?? මම මොකක්ද හැමෝටම කරපු වැරැද්ද.. කවදාවත්ම නැති තරමෙ ආවේගයක් මට මගේ හිතට දැනුනා.. මට කේන්ති යන්නෙ නෑ.. දුක හිතෙනවා මිසක්.. ඒත් දැන් පුදුම ආවේගයක් දැනෙන්නෙ..

ආධ්‍ය අයිය මගේ අතින් තද කල්ලා අල්ලගත්තා..

" මගේ පොඩී එනවා චූටි!!! ඒ ගැනනම් හිතන්නවත් එපා.. මේ අයියා ඉන්නකල් ඒවා හිතන්නවත් එපා.. මම මේ වෙලේ ඉඳලා ඔයාගෙ ළඟින් ඉන්නවා.. පොඩී කවදහරි අප්පච්චිට විරුද්ධ වෙලා හිටගන්නවා.. තව ටික කාලයයි.. මට දැනෙනවා බං.. මගේ පොඩ් එකා කොහොම හරි එතනින් ගැලවෙනවා.. අනේ මල්ලි. වැඳලා ඉල්ලන්නෙ.. තව පොඩ්ඩක් ඉවසන්න.. මට ඉස්සර වගේ හයියක් නැත්තෙ නෑ.. මම ඔයාව බලාගන්නවා.. මාව විශ්වාස කරන්න.. අනේ චූටි.. මාව අසරණ කරන්න එපා බං.."

මට හයියෙන්ම ඉකි ගහලා ඇඩුණා.. ආධ්‍ය අයියා එයාගෙ පපුවට තියාගෙන මාව තුරුල් කරගත්තා.. මට පෙනුණා මාමා අපිට පිටිපස්සෙන් ඇස් දෙකේ කඳුළු පුරෝගෙන මං දිහා බලාගෙන ඉන්නවා.. මම ඇස් දෙක තද කල්ලා පියාගත්තා.. මට සතුටින් ඉන්න දෙන්න දෙයියනේ.. එක දවසක්..මැරෙන්න කලින් සතුටින් ඉන්න දෙන්න.. මම මොකක්ද මෙච්චරට කරපු පව..

මාමා මගේ එහාපැත්තෙන් ඇවිත් ඉඳගෙන මගේ පිට අතගෑවා.. හුඟ කාලෙකට කලින් ආධ්‍ය අයියා ගාවයි, මාමා ගාවයි ඉඳපු අවුරුදු දහනමයෙ කොල්ලව මට මතක් වෙනවා.. ආයෙම එයාලා ගාවදි මට ආරක්ශාවක් දැනෙනවා..

අපි හැමෝටම අපේ පැත්තෙන් කතා තියනවා තමයි.. ඒත් අප්පච්චි මේ දේවල් වලට කවදහරි විඳවනවා.. කවුරුත් නැත්නම්.. ඒක මම හරි කරනවා.. එයාට බෑ අපේ ජීවිත වලට මෙහෙම බලපෑම් කරන්න.. එයා ඉන්න ඕන මානසික රෝහලක.. නැත්නම් හිර කූඩුවක.. මට වෙන කොහේවත් සුදුසුයි කියලා හිතෙන්නෙ නෑ..

කොහොමවත් බෑ.. ඇත්තටම තනි වුණේ මම නෙමෙයි.. මම ආදරේ කරපු මනුස්සයා..

@Shan

හායි ළමයිනේ.. අපි ලස්සන කාලෙට කිට්ටු වෙනවා..

අපි හැමෝම කතාව කියවන්නෙ වරද්ගෙ පැත්තෙන් වුණාට ආධ්‍ය අයියගෙ පැත්තෙන් කතාව කියෙව්වනම්.. අසලි අම්මගෙ.. අනුරාග් ගෙ.. රධ්‍යගෙ.. එයාලට තියෙන්නෙ වෙනස්ම කතා..

අනික ඇත්ත ජීවිතේ සර්ව සාධාරණ නෑ.. හැමෝටම හැමතැනින්ම සාධාරණය බලාපොරොත්තු වෙන්න බෑ.. ඒකතමා ජීවිතේ කියන්නෙ කියලා මම හිතන්නෙ.. හිතන්නකො අපිට ඇස් දෙකක් තිබ්බා කියලා අංශක තුන්සිය හැටම එකපාර බලන්න බෑනෙ.. ඉස්සරහා බලාගෙන හිටියොත් පිටිපස්ස පේන්නෙ නෑ.. හැමෝගෙම හිත රිදෙන්නෙ නැතුව එහෙම ජීවත් වෙන්න අමාරුයි..

අපි රියැලිටියෙ ඉඳන් කතාව කියවමු.. ඔයාලට හිතන්න නිදහස සීයට සීයක් තියනවා.. මගේ කතාවෙත් සෑහෙන්න අඩුපාඩු ඇති.. ප'ෆෙක්ට් ඕතරියෙක් නෙමේ මං.. ඉම්හි.. ඒත් ඔයාලගෙ ප්‍රශ්න වලට උත්තර මම ඉක්මනට ගේනවෝ..

දන්නැද්ද.. ජීවිතේ කියන්නෙ හෙන අමාරුයිනෙ.. මල් එලපු පාරක් පෙන්නලා පලයං කියලා කවුරුත් කියන්නෑනෙ.. ඉස්සරට POV එක චේන්ජ් වෙනවා.. අපි පීක් එකේ උපරිමේට ඇවිල්ලා ඉම්නෙ..

වරද් අප්පච්චිට විරුද්ධ වෙලා හිටගනීද..?? රධ්‍ය..??

කතාවත් ඉවරවෙන්න ළඟයි අප්පාවෙ.. මගෙ දළඹු හමුදාව මිස් වෙනවා හුහාක්..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

@Shan

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 159 කොටස

" කෝ බං අපේ එකා.."

" මටනම් කලින්ම හම්බුණා.. බැක්ස්ටේජ් ඇති.."

අද අපේ කැම්පස් එකේ ෆැකල්ටි සේරම එකතුවෙලා කාම මියුසික් ඊව්නින් එකක් කරනවා.. නෙළුම් පොකුණේ.. මම සෙනුකටත් එක්ක ටිකට් ගත්තා.. කියාන් අයියා මෙ දවස්වල ලංකාවෙ නැති නිසා ආශි, අම්මලාගෙ ගෙදර ගිහින් ඉන්නෙ.. එන්න වෙන්නෙ නෑ කියලා කිව්වෙ.. මමයි සෙනුකයයි ආවෙම චමිරු ප'ෆෝම් කරනවා බලන්න.. අපේ ගෙදර ආධ්‍ය අයියයි බබාලා දෙන්නයි නැවතිලා.. ආධ්‍ය අයියා ආච්චි එක්කමයි ඉන්නෙ.. මගේ ආච්චි සතුටින් ඉන්නවා.. මට බලන්නත් හරි ආසයි.. එයා අන්තිමට මාමගෙ ලමයිනුත් හුරුතල් කරනවා..

මුලදි නම් මාමට හුඟක් බැන්නා.. කිසිමදෙයක් අපිට නොකිව්ව එක ගැන.. මගේ අසනීප ගැන.. හැමදේම මාමට කියලා බැන්නා.. ආච්චිඅම්මා හොඳයි වගේම තමා අනිත් පැත්තට බනින්න ගියාමත්.. ඉඳලා හිටලා බනිද්දි හිතට දැනෙනවා වැඩී.. මාමා මම කවදාවත් දැකලා නැති තරම් ඇඬුවා.. ආච්චිඅම්මගෙ කකුල් දෙක ගාව වැටිලා.. ඒත් ආච්චි අපේ ප්‍රශ්න දන්නෙ නෑ.. ඒවා දැනගන්න ඕන නෑ..

ලබන සතියෙ මම ඔලිම්පික් වලට ලොස් ඇන්ජලිස් යනවා.. අන්තිමට මම නැශනල් ප්ලෙයර් කෙනෙක් වුණා.. ඒ ගියාම අම්මව බලන්න පුළුවන්.. අම්මා මාත් එක්ක කතාකළා.. මාමා මොකක්ද කරන ලැජ්ජ නැති වැඩේ ඇහුවා.. ඒත් අකිල අංකල් ඒකට අම්මට දොස් කියලා තිබ්බා වගේම මමත් මගෙයි රධ්‍ය අයියගෙයි සම්බන්ධෙ අම්මට කිව්වා.. අම්මා මුලදි හුඟක් ඒකට අකමැති වුණත්, එයා ඉන්න රටේ ඕවා සාමාන්‍ය දේවල් වෙලා තිබුණ නිසා අකිල අංකල්ටයි සඳෙව් අයියටයි අම්මට ඒක පැහැදිලි කල්ලා දෙන්න පුළුවන් වුණා.. ලොකු අම්මා මාමට වචනයක්වත් කිව්වෙ නෑ.. පාඩුවෙ හිටියා.. බබාලා බලන්නත් හස්බන්ඩ් එක්ක එහෙ ගියා කියලා කිව්වෙ.. ආධ්‍ය අයියට බබාලා ගැන ඇඩ්වයිසස් දුන්නා කිව්වා.. කිරි දෙන්න ඕන කොහොමද.. කෑම දෙන්න ඕන දේවල් කොහොමද.. එයාලව ෆෝන් වල වැඩිය තියන්න එපා.. ඔහොම දේවල්..

@Shan

ලොකුඅම්මා තේරුම් අරගෙන ඉන්නවා.. මම කියන්නෙ 'මගේ තාත්තා' නෙමෙයි කියලා.. එයා වයසට යද්දි හුඟක් දේවල් තේරුම් අරගෙන.. ආයෙම එයාගෙ වචනෙන් මම කාලකණ්ණියෙක් නෙමේ..

ඒ වගේම ඉස්සරහට වෙන දේවල් මම මගේ වීදියට විසඳගන්න තීරණේ කළා.. මේ වතාවෙ මම දුර්වල මනුස්සයෙක් නෙමේ.. මම රුස්ස ගහක් වෙලා.. මට දැනෙනවා.. ඉක්මනට සීත කාලෙ ගෙවෙන්න යන්නෙ.. මම ඒ වෙනුවෙන් ඕනම දෙයක් කරන්න ලෑස්ති වුණා..

හුඟ කාලෙකට කලින් මේ හෝල් එකේම මමත් සිංදු කිව්වා මැව්ලා පෙණුනා.. හැමතැනම තියෙන්නෙ මතක.. මතක වලින් මගේ ලෝකෙම පිරිලා ගිහිල්ලා.. හැබැයි මගේ හිතට වෙනදා නැති හයියක් දැනෙනවා.. මම කාගෙන මගේ අන්තිම හීනෙටත් පය ගහලා.. එදිරිමාන්න කෝච් තවදුරටත් මගේ කෝච් නෙමෙයි.. ඒත් හැමදාම මට කතාකරනවා.. උපදෙස් දෙනවා.. එයා මම වගේම තව ප්ලෙයර්ස්ලා හදන්න මහන්සි වෙනවා.. මමත් කෝච්ගෙන් ඇඩ්වයිසස් ගන්නවා.. අයුක අයියා ලංකාවට එන්න කිට්ටුයි.. සෙනුකගෙ කොන්වොකේශන් එකට අයුක අයියා මෙහේ ඒවි කියලා එයා කිව්වෙ..

අයුක අයියා හරිම වාසනාවන්තයි.. එයාට අලුතින්ම අම්මෙකුයි තාත්තෙකුයි ලැබිලා.. සෙනුකගෙ අම්මා අයුක අයියට සලකන්නෙ එයාගෙම පුතාට වගේ.. තාත්තත් එහෙමයි.. අයුක අයියා මෙහෙ ඇවිත් බිස්නස් වැඩ පටන්ගන්න හිතාගෙන ඉන්නවා කියලා කිව්වෙ.. ඊට කලින් ගෙයක් අරගෙන සෙට්ල් වෙලා මැරි කරන්න ඕනනෙ.. වයසත් යනවනෙ.. මගේ යාළුවොන්ගෙන් නම් සුභ ආරංචි ගොඩයි.. මහීශා ලබන අවුරුද්ද මුළ බඳිනවා.. ඔන්න අපේ එකෙක් ඉස්ස ඉස්සෙල්ලාම යුග දිවියට යන්න යන්නෙ.. දැක්කනෙ බඳින්නෙ නෑ නෑ කියන උන් තමා මුලින්ම බඳින්නෙ... උදාහරණෙ මහීශා..

ටිකකින් හෝල් එක කළුවර වෙලා ස්පොට් ලයිට් එකක් මැද්දට වැටුණා.. ඊළඟට හිටියේ ප'ෆෝම් කරන්න අපේ ලොකු අයියණ්ඩි.. පලවෙනි වතාවට ඔකා ඔය සිංදු කියන්නෙ ස්ටේජ් එකක.. ඒකත් සෙනුකයගෙ වදේට.. අපි කැම්පස් ඉන්න අවසාන අවුරුද්ද.. ෆයිනල් ඉයර් එකටත් ඇවිල්ලා අපි දන්නෙම නෑ.. කාලෙ ගෙවෙන්නෙ හීයක වේගෙන්.. අපි අපේ වැඩ එක්ක බිසී වුණාම කාලෙ ගෙවෙනවා දැනෙන්නෙ නෑ..

@Shan

චමිරු අත් දිග සුදු ශර්ට් එකක් ඇඳලා ඒකට බ්ලැක් ට්‍රවුසර් එකක ඇඳලා ඉටාර් එකත් අරගෙන ඇවිත් මැද්දෙ තියන ස්ටූල් එකෙන් ඉඳගත්තා.. ඌ හරි ලස්සනයි.. වටේ තියන ලා රෝස පාට එළියට අපිට චමිරුව ලස්සනට පෙණුනා.. ඌ හැමදාම වගේ අපේ ළඟින්ම හිටියා.. ඒ ගමන්ම උගේ වැඩ ටිකත් ලස්සනට කරගත්තා.. පාර්ලිමේන්තු යන්න ඉන්නෙ බොසා.. ගැම්මක් තමා.. සීයට ගැළපෙනම මුණුබුරා අන්තිමේ හම්බුණානෙ..

ස්ටික් එක 1 2 3 4 කියලා බීට් එකක් දුන්නම චමිරු මයික් එක ළඟට කරගෙන හදාගත්තා.. මියුසික් ප්ලේ වෙන්න ගත්තා.. මම චමිරු දිහාම බලාගෙන හිටියා..

"ඔබෙ සුසුම් පවන් සලයි

මගෙ කොපුල් පුරා වෙලෙයි.."

සෙනුක හැරිලා මගේ දිහා බැලුවහම මට මහ වරදකාරී හැඟීමක් දැනුණා.. සෙනුක මගේ අතින් අල්ලගත්තා.. මේකද එදා ඌ මට කිව්ව 'ආසම සිංදුව'.. චමිරු මට කලින් කියලා තිබ්බෙ එයා අද කියන එක එයාගෙ ආසම සිංදුව කියලා.. ඊටත් වඩා ඒ කටහඬ.. හරියට භාවනාවක් වගේ.. මාව තප්පරේකට වෙන ලෝකෙකට ඇදිලා යනවා වගේ දැනුණා..

" ඔබෙ සුසුම් පවන් සලයි

මගෙ කොපුල් පුරා වෙලෙයි

ඔබේ සෙනේහස ගොඩ ගලයි.......

උණුහුමට මාව තෙමෙයි..."

මගේ ඇස්වල කඳුළු පිරුණා.. ඒක හදවතටම දැනෙනවා.. චමිරුගෙ මූණෙ එක්ස්ප්‍රෙශන්ස්..!!

" මා ඔබෙයි ඔබම කියයි

ඔබ මගේද මටම බයයි...//"

**ඔබ සඳක් වගේ හැඩයි.....හෙට අමාවකද සැකයි..**

@Shan

"

චමිරු ඔඩියන්ස් එක පුරාම ඇස් යවලා බලනවා මම දැක්කා.. මගේ ඇස්වලින් ගලාගෙන ආපු කඳුළු බිංදුවක් සෙනුකගේ අතට වැටිලා බිඳිලා ගියා..

" ඔබ හැගුම් බරව දොඩයි

ඒ වදන් කවිම තමයි..//"

**ඔබ වසන්තයක් වගෙයි.....හෙට ගිමන් කලද සැකයි.."**

" ඔබේ සුසුම් පවන් සලයි

මගේ කොපුල් පුරා වෙලෙයි..//

ඔබේ සෙනේහස ගොඩ ගලයි...

උණුසුමට මාව තෙමෙයි.."

එකසැරේටම සිංදුව ඉවරවුණාම ඔඩියන්ස් එක මීයට පිම්බා වගේ සද්දයක් නැතුව ගියා.. තප්පර දෙකක් යන්න වුණේ නෑ.. හැමෝම නැගිටලා හෝල් එක දෙක අප්පුඩි ගැහුවා.. මට ඒ අස්සෙ හොඳටම ඇඬෙනවා.. චමිරු ලාවට හිනාවෙලා ඇස් කොනක් පිහිදාගත්තම ස්ටේජ් එකේ ලයිට් ඕෆ් වුණා.. සෙනුකටයි මටයි කියන්න දේවල් නැතුව ගොළු වෙලා.. උඹව රිද්දන්න මම හීනෙකින්වත් හිතුවෙ නෑ චමිරු.. පුළුවන් නම් මට සමාවෙයන්..

" උඹ නාඩ ඉදහන්.. හැමෝටම බලාපොරොත්තු වෙන හැමදේම ලැබෙන්නෙ නැනෙ ෂනෙරුවා.."

සෙනුක මගේ පිටට තට්ටු කළා.. ආයෙම මියුසික් ප්ලේ වෙන්න ගත්තා.. මම ආයෙම චමිරු දිහා බලද්දි චමිරු මම ඉන්න තැන හොයාගෙන තිබුණා.. ඒත් මට ඒ දිහා බලන්න තරම් හයියක් නෑ.. මම වැරැද්දක් කල්ලා නෑ තමයි.. ඒත් හිත රිදෙනවා.. ඒක මහ අසරණ කරවන හැඟීමක්..

**tu safar mera, hai tu hi meri manziltere bina guzara, ae dil hai mushkiltu mera khuda, tu hi duaa mein shaamiltere bina guzara, ae dil hai mushkil**

@Shan

( you are my journey, you are my destination too,

to live without you, O heart, is difficult.

you are my god, and you are in my prayers too,

to live without you, O heart, is difficult.)

[The second line, tu hi mera khuda... means that you are my god and at the same time you are the one for whose wellness I pray to god.]

**mujhe aazmaati hai teri kami**

**meri har kami ko hai tu laazmi**

**junoon hai mera, banoon main tere kaabil**

**tere bina guzaara, ae dil hai mushkil**

( your not being there tests me.

you are necessary for every scarcity that I have.

[that is, every scarcity, every shortage in my life is fulfilled when you are there.]

it's my passion that I become good enough for you,

to live without you, O heart, is difficult.)

**ye rooh bhi meri, ye jism bhi merautna mera nahi, jitna hua teratune diya hai jo, wo dard hi sahitujhse mila hai to, inaam hai mera**

( this soul that is mine, and this body that is mine,

neither of them is so much mine, as they have become yours.

what you have given me, even though it's pain,

@Shan

it is a prize for me, since I have gotten it from you.)

**mera aasmaan DhoonDhe teri zameenmeri har kami ko hai tu laazmizameen pe na sahi, to aasmaan mein aa miltere bina guzara, ae dil hai mushkil**

( my sky looks for your earth, (that is, I'm sky, looking for you, earth.)

you are needed for every shortage of mine.

if not on earth, at least meet me in the sky,

to live without you, O heart, is difficult.)

**maana ki teri maujoodgi seye zindagani mehroom haijeene ka koi dooja tareekana mere dil ko maaloom hai**

( I get that this life of mine

is bereft of your presence,

but then my heart doesn't know

any other way to live.)

**tujhko main kitni shiddat se chaahoonchaahe to rehna tu bekhabarmohtaaz manzil ka to nahi haiye ek tarfa mera safar..**

( I love you with so much intensity,

if you want to remain unaware of it, remain so.

this one sided journey of mine,

is not dependent on reaching the destination.)

**safar khoobsurat hai manzil se bhimeri har kami ko hai tu laazmi..adhoora hoke bhi, hai ishq mera kaamiltere bina guzaara, ae**

@Shan

**dil hai mushkil................**

( this journey is more beautiful than the destination,

you are necessary to fulfill every scarcity of mine.

Even though incomplete, my love is complete (because of you)

It's difficult to live without you, O my heart.)

*ae dil hai mushkil-title track by Arjith Singh*

චමිරු සින්ග් කළේ පුදුම ආවේගෙකින්ද මට හිතුණා.. ඒ සිංදුවෙ වචනයක් ගානෙම ඊතල වගේ.. හරි තියුණුයි වගේම ඒ කටහඬට හිත රිදෙන්න ගන්නවා.. ඒ මොහොතට මුළු හෝල් එකම අමුතු දුකකින් පිරුණා.. සින්දුව ඉවර වුණාම චමිරු හැමෝටම ඔළුව නමලා ගිටාර් එක අරගෙන නැගිට්ටා.. ඒ එක්කම ස්පොට් ලයිට් එක ඔෆ් වෙලා ගියා.. චමිරුගෙ ඇස් රතු වෙලා තිබුණෙ.. සමහරවිට එයාගෙ හිතේ තිබ්බ ආවේගය සිංදුවකින් පිටකළාද මම දන්නෙ නෑ.. එතනින් පස්සෙ ඉවෙන්ට් එකේ ප්ලේ වුණේ මොනවද කියලවත් මට සිහියක් නෑ.. ඒත් මගේ හිත විශ්වාසෙන්ම දන්නවා මගේ හිත කොයිවෙලාවෙවත් දෙළොවක් අතර අතරමං වුණේ නෑ.. මම පළවෙනියටම ආදරේ කළේ රධ්‍ය අයියට.. දැනුත් ඒක බිංදුවක් වත් වෙනස් නෑ.. තාමත් ආදරේ කරන්නෙ එයාට.. ඒත් මට චමිරු ගැන දුකක් හිතුණා.. අනුකම්පාවක් නෙමේ.. මං අතින් නොදැනුවත්වම මට ළහ කෙනෙක් රිද්දවනවා.. සෙනුකයා කිව්ව වචන ඇත්ත තමයි..

ඉවෙන්ට් එක ඉවරවෙද්දි රෑ දහය හමාරට විතර ඇති.. අපි එළියට වෙලා චමිරු එනකල් හිටියා.. ආධ්‍ය අයියා බබාලා දෙන්නා එක්ක ගෙදර ආච්චිඅම්මව බලාගන්න නිසා හුහ කාලෙකින් මෙහෙම රෑ වෙලා එළීයට ආවෙ.. නැත්නම් මම ආච්චිඅම්මා තනියම නිසා ක්ලබ් එකෙන් කෙළින්ම ගෙදර දුවනවානෙ.. ආච්චිත් එන්න එන්නම අයෝබලත් වෙනවා.. ඉතින් අපි හැමෝම ආච්චි ගාව ඉන්න ඕනම වෙලාව මෙක..

ටිකකින් චමිරු අපි ඉන්න පැත්තට ඇවිදගෙන ආවා.. මම පුරුදු විදියටම චමිරු එක්ක හිනාවුණා.. අපි හුහක් හොද යාළුවො.. ඒ යාළුකමට හානියක් කරගන්න මට ඕන නෑ..

@Shan

" ඩෝ මස්සිනා.. පට්ට ඈ.. මට උඹ ගැන මාර හැපී මචං.."

" තැන්ක් යූ මස්සිනා.. මේ..... මම පොඩ්ඩක් ෂනෙරු එක්ක කතාකරන්න ඕන සෙනුක.. මට පොඩි වෙලාවක් දෙනවද.."

" ආ හරි හරි.. මට කාර් එකේ කී එක දීපන්.. උඹලා කතාකල්ලා වරෙන්.."

චමිරු කාර් එකේ කී එක දුන්නහම සෙනුක ඒකත් අරගෙන යනකල් චමිරු හිටියා.. සෙනුක ඈත යනවා චමිරු සාක්කුවට අත් දෙක දාගෙන බලාගෙන ඉඳලා මගේ පැත්ත හැරුණා..

" ඒක තමයි මම ආසම සිංදුව.."

මම හිනාවුණා..

" ඔයා ලස්සනට සින්ග් කළා චමිරු.. ඒ සිංදුවත් ලස්සනයි.."

" එහෙමද.."

" ම්ම්.."

ටික වෙලාවක් චමිරු මං දිහා බලාගෙන හිටියා.. අපි වටේ හුඟක් මිනිස්සු එහා මෙහා ගියත් විශේෂ අවධානයක් හම්බුණේ නෑ..

" මිනිස්සු පාපොච්ඡාරණය කරනවා අහලා තියේද.."

" ඔව්.. සමහරවෙලාවට.."

" මාත් අන්තිමවතාවට මං ගැන පාපොච්ඡාරණය කරනවා.. ඒත් මේක අන්තිම වතාව.."

චමිරු මගේ අත් දෙකින් අල්ලගත්තා.. චමිරු අත් ලාවට වෙවුළනවා මම දැක්කා.. මට දැනුණා..

" මේක ඉල්ලීමක් නෙමේ ෂනෙරු.. ඇත්තටම කියාගන්නයි ඕන වුණේ.. මම දන්නවා කවමදාවත් රධ්‍ය උඹ වෙනුවෙන් කරන කැපකිරීම් වලින් දශමයක්වත් මට කරන්න බෑ.. අද.. මේ මොහොතෙ.. මේ තප්පරේ

@Shan

වෙනකල්ම මම මගේ ඉස්සරහා හිටගෙන ඉන්න කෙනාට හදවතින්ම සැහෙන්න ආදරේ කළා.. ඒත් මචං.."

චමිරුගෙ කටහඬ බිඳුණා..

" මට තාම දැනෙන්නෙ මගේ ජීවිතේ ඉස්සරහට යන්නෙ නෑ වගේ.. අර කැඩෙට් කිට් එක ගහගෙන උඹට ලව් කරපු එකා වගේ මම තාම ඉස්කෝලෙ නතරවෙලා.. තවදුරටත් එහෙම බෑ බං.. මම අන්තිමට තීරණයක් ගත්තා.. මේක අන්තිම වතාවට උඹට කියන්න.. මම උඹට හරි ආදරෙයි ෂනෙරු.. ආදරේ විතරයි.. අම්මාපල්ලා කවමදාවත් එහෙම වැරදි විදියට උඹ ගැන හිතලා නෑ.. ඕන තැනක දිව්රන්නම්.. මගේ අතින් හුඟක් වැරදි වුණා.. මට සමාවෙයන්.. තරුවි රවට්ටන්න මම හිතුවෙ නෑ.. අවුරුදු පහක් ගිහිල්ලත් ඒ වරදකාරී හැඟීම මගේ හිතින් යන්නෙ නෑ.. උඹ කියන වචනයක් ගානෙම.. මගේ හිතේ ඒ ගැන පසුතැවීමක් තියනවා.."

" චමිරු.. ඒක වෙලා ඉවරයි බං.. අපි මෙ දේවල් අමතක කරන්න ඕන.."

" ඔව්.. අමතක කරන්න ඕන.. තරුවි දැන් කසාද බැඳලා.. ඒකිට දැන් ජීවිතයක් තියනවා.. මම මේ දේවල් කිව්වා කියලා වැඩක් නෑ තමයි.. හොඳයි.. උඹ දැන් උඹේ ජීවිතේ එන්න ඕන හින්පෙත්තටම ඇවිල්ලා ඉන්නෙ මචං.. තව එක අඩියයි.. උඹව අල්ලන්න මේ ලෝකෙ මොකෙක්ටවත්ම බෑ.. අනික උඹට නැහීගෙන ආදරේ කරන එකා.. රධ්‍ය.. උගේ හිත රිද්දන්න එපා බං.. දවසක උඹට තේරේවි රධ්‍ය කියන්නෙ මොන වගේ මනුස්සයෙක්ද කියලා.. උඹලගෙ ආදරේ දිහා බලාගෙන ඉද්දි මටත් ආදරේ කරන්න හිතෙනවා..

**හැබැයි මෙ වතාවෙ උඹට නෙමෙ**

.."

චමිරු සාක්කුවෙන් ගත්තු රතු පාට එන්විලොප් එකක් මගේ අත උඩින් තිබ්බා.. මට එකපාර හිතාගන්න බැරිවුණා.. චමිරු මගේ ඇස් වලට වැටිලා තියන කොණ්ඩ කැල්ලක් ඇඟිල්ලකින් පිටිපස්සට කළා.. අඩුම උගෙ ඇඟිල්ලක්වත් මගේ නළලෙ වැදුණෙ නෑ..

" මගේ වෙඩින් එකට අනිවාරෙන් උඹ එන්නම ඕන.."

@Shan

චමිරු මගේ අත් දෙකින් අතැරියා.. මට හුගක් සතුටු හිතෙනවා..

" මම අද වෙනකල් උඹට ආදරේ කළේ ඒකපාර්ශවික ආදරවන්තයෙක් විදියට.. මෙතනින් පස්සෙ.. මගේ හොඳම යාළුවා වෙයන්.. මම හිතන්නෙ මගේ හිතේ තියන හැඟීම මැරීගෙන යනවා ෂනෙරු.. මට ඒක දැනෙනවා.. උඹ දන්නවද කාලෙකට කලින් මුළු හිතින්ම ආදරේ කරපු දේවල් දිහා ආයෙම හැරිලා බලද්දි.. හිතට කිසිම අමුත්තක් දැනෙන්නෙ නැති වෙනකොට දැනෙන හැඟීම..

මට නිදහසක් දැනෙනවා බං.. උඹට නොසෑහෙන්න හරියන්න ඕන.."

චමිරු මාව බදාගත්තා.. මමත් චමිරුව අනිත් පැත්තට බදාගත්තා.. අපි හැමදාම හොඳ යාළුවො වගේ ඉන්නවා චමිරු.. මං ගැන හැඟීමක් නැති එක ගැන මට සතුටුයි.. උඹ වචනෙකින්වත් වැරැද්දක් මට කවදාවත් කල්ලා නෑ.. අමාරුම තැන් වල අල්ලන් ඉන්න හයියක් වුණාට.. මං ගාවින් හිටියට.. උඹට නොසෑහෙන්න පිං.. ඒ ණය ගෙවලා ඉවරකරගන්නත් බැරි තරම්..

ඉතින් හැමදේකටම ස්තුතියි.. චමිරු..

මම චමිරුගෙ පිටට තට්ටුවක් දාලා එහාට වුණා.. චමිරු මාත් එක්ක හිනාවුණා..

" උඹගෙ වෙඩිමට නොයා කාගෙ එකට යන්නද.."

" අපේ අයියත් එනවනෙ බං.."

" මට සතුටුයි මචං.. අඩෝ උඹත් බඳිනවා.. ගැම්මක් තමා.."

චමිරු මගේ පිටට මහා හයියෙන් පාරක් ගැහුවා.. සෙනුකයා කාර් එක නවත්තගෙන හෝන් එක උඩ වාඩිවෙලා.. ශටර් එක ඇරලා උගේ සපත්තුව ඒ හරහා එව්වම චමිරු ඒක අල්ලගෙන ළඟ තිබ්බ මල් පෝච්චියකින් තිබ්බා..

" අඩෝ ඕක දීපන් බල්ලො.."

" උඹට එපා නිසානෙ විසික් කළේ.."

" අඩෝ ෂනෙරු ඔන්න ඕක අරන් වරෙන්.."

@Shan

මම සපත්තුවත් අරගෙන ගිහින් වාහනේට නැග්ගා.. මට තාම මතක් වෙනවා නෙළුම් පොකුණේ අපි ප්'රෝම් කරපු සාගා එක.. ඇත පේන මල් පෝච්චි ගාව ඉඳගෙන අපි කතාකරපු හැටි.. එදා වුණු හැමදෙයක්ම.. මට ඒවා ඇත තියා මැවෙනවා..

" I still love you even when there are a thousand reasons to stop everything with you Varadh.."

" I don't care if there are a million or a thousand reasons.. I won't let you stay away from me.. When you find it hard to hold on, tell me and I will hold on.."

මම තවම ඔයාගෙ වචන විශ්වාස කරනවා.. සමහරවිට ඒවා නිසා මම ජීවත් වෙන්න හේතුවක් හොයාගන්නවා.. පුදුමයි..!! මගේ ජීවිතේ වෙන හැමදේකටම කොහෙන් හරි ඔයා ඉන්නවා..



ඇත්තටම ආදරේ කියනෙක මහ පුදුම දෙයක්..

ඒක හිමිවෙන මිනිස්සු සදාකාලික වාසනාවන්තයින් වෙනවා..

ඒක අහිමිවෙන මිනිස්සු අමරණීය ප්‍රේමවන්තයන් වෙනවා..

වැදගත්ම දේ,

ආදරේ හිමිවෙන එක හෝ අහිමි වෙන එක නෙමෙයි,

හමුවෙන එක..

-දුඹුරු වීදුරු ඇස්-

චින්තනී අමරසිංහ

එන්නාම්.. ලව් යූ..❤

ප.ලි.

@Shan

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..

- කථාංගයේ යම් යම් කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 160 කොටස

" උඹනම් සුදුමහත්තයා!!! අක්කා කියනවා වගේ පොල්පිත්තෙන් තමා කපාගෙන තියෙන්නෙ.. ගොං හරකා.."

*චටාස්*

" ආව් අනේ.. මොන මගුලක්ද.."

" ඇඳුමක් නෑ හරියට.. බලපන් අල්මාරිය ඇරලා..!! එකම තියාගෙන පට්ට ගහනවා.. දැන් අනිද්දා ගමනක් යන්න ඉන්නවා.. ඇත්තමයි උඹට ගාණක් නැද්ද කියපන්.. නැති එකෙක්නම් කමක් නෑ.."

අපේ මාමා මගේ කනෙන් අල්ලගෙන කියවගෙන කියවගෙන ගියා.. මේ මනුස්සයා නාකිත් එක්කන්.. මෙහෙම කේන්ති අරගෙන හරියනවද මං අහන්නෙ..

" මේ මාමට ප්‍රෙසර් හැදිලා මොකක් හරි වෙයි.. කේන්ති නොගෙන ඉන්නකො හලෝ.."

" උඹ නිසා තමා ප්‍රෙසර් තදවෙන්නෙ.. ඉඳපන් ගෙදර ගියාම.. උඹව හමගහනවා.. බැඩ්මින්ටන් ගහන්න නෙමේ යවන්න තියෙන්නෙ.."

" එහෙනම් කොහෙ යන්නද.. මාමා දන්නෙ නැනෙ.. මම මෙඩ්ඩෙක් නොවුණනම් පොල් කඩන්න යන්න හිටියෙ.."

මාමට හිනායන්න ඇවිල්ලා මගේ කන අතෑරලා ආයෙම රවාගත්තා.. ආධ්‍ය අයියගෙ සුදුඅප්පච්චි මට වද හිංසා දෙනවා අයියෙ.. දෙදරූ පියෙක් කතාකරන විදියද මං අහන්නෙ මේ.. දැන් ප්‍රෙසර් හැදිලා මොකක් හරි වුණොත් දරුපවුල මට භාරගන්න වෙයි.. ඉස්සරනම් ආධ්‍ය අයියව බාරගන්න මම කොහොමත් කැමැත්තෙන් හිටියෙ.. දැන් දරුමල්ලොත් ඉන්නවා.. අනේ මේ මට බෑ.. මගේ මිනිහා එකගෙයි කනවා කිව්වට එහෙම කන්න බැනෙ..

" ඔව් ඔව්.. පොල් කඩන්න පලයන්.."

@Shan

මාමා ශොපින් මෝල් එකේ පාකින් ලොට් එකෙන් කාර් එක නැවැත්තුවා.. මම අර අහල් දෙකේ ගෙදරට ඇඳගෙන හිටපු ශෝට් එක පහළට ඇදගත්තා.. මේ මොන විළි ලැජ්ජාවක්ද.. ගෙදරට වෙලා කියාරලාව හුරතල් කර කර හිටිය මාව, මාමා ඇදගෙන කාර් එකට දාගෙන ශොපින් කරන්න එක්කන් ආවෙ.. මම පස්සෙ හිමින්සැරේ ගන්න යනවනෙ.. අනික ටුවර් එකට යන්නෙ අනිද්දනෙ.. හෙට දවසක් තියෙන්නෙ..

මම කළුපාට මාස්ක් එකක් අරගෙන දාගත්තා.. මිනිස්සු මාව අඳුරගත්තොත් සිරාවටම පොල් කඩන්න යන ගමන් හිතාවි.. මාමා අනිත් පැත්තෙන් ඇවිත් මට බහින්න දොර ඇරියා.. මම සැන්ඩල්ස් දෙකේ පටි දෙක තදකරගෙන රාජකුමාරයා වගේ එළියට බැහැලා මාමගෙ අතේ එල්ලුණා..

" මම කාඩ් එක ගෙනාවෙ නෑනෙ.. මාමගෙන්ලු හොදේ.."

" දැන් එතකොට උඹ මාසෙකටම මෙහෙ නැද්ද.."

" නෑනෙ.. මාසෙකට පස්සෙ තමා රාජකුමාරයා මිලියන හයසිය තිස් නමයත් අරගෙන ලංකාවට එන්නෙ.."

" උඹ ඇවිලා නිවාස නය දෙන්න පටන්ගනින්.."

" බෑ අනේ.. ඒකටනෙ අපේ සජිත් මහත්තයා ඉන්නෙ.."

අනං මනං වානා.. සජිත් තමයි ඕනා!!

" මොනවද ගන්න තියන ඇඳුම්.."

" නයිකි ඇරෙන්න ඕන එකක්.. මම අඩිඩාස් විතරයි ප්‍රොමෝට් කරන්නෙ මාමෙ.. ඇයි අපි ඇග්‍රිමන්ට් එකක් සයින් කළානෙ.."

" උඹව මෙකට එක්කන් ආවට වැඩිය හොඳයි.."

මාමා මගේ ඔලුවට එකක් ඇන්නා.. යන යන එකා මගේ දිහා හැරිලා බලනවා.. මට ලැජ්ජ හිතිලා තව ටිකක් මාමගෙ ඇඟ අස්සට රිංගගත්තා.. මම ඉතින් ටුවර් එක යන නිසා කොණ්ඩෙ යටින් රතු පාට කරගෙන ඉන්නෙ.. අනික හාෆ් පොනිටේල් එකක් දාන්නම කොණ්ඩෙ වැවිලා තියෙනවා.. ඒකනම කපන්න කම්මැලිකමට.. පෙරේදා තමා කොණ්ඩෙ

@Shan

පාට කරගත්තෙ.. ආච්චිනම් කිව්වෙ මෙ කාලෙ ඔච්චා කරන්නෙ නැතුව කොයි කාලෙ කරන්නද සුදුමහත්තයො කියලා.. ආච්චිලගෙ කාලෙ මේවා තිබ්බනම් ආච්චි කිව්වා තනිකර කොණ්ඩෙ නිල් ගාගන්නවලු.. ඒකනම් පොඩ්ඩක් මහින්ද මහත්තයට බරයි වගේ.. එයා ඒ කාලෙ නිල් නෙ..

ආධ්‍ය අයියා මට විහිළු කරනවා ගිනි කුකුළා කියලා.. ඒ මදිවට මගේ නල්ලමලේ පුත්තු දෙන්නත්.. 'තුති තාත්ති ගිනි තුතුළා' ගගා ආධ්‍ය අයියව අනුකරණය කරනවා.. තුති තාත්ති බල්ලො දෙන්නා ලිහුව දවසට තමා ගිනි කුකුළ්ළු පේන්න ගන්නෙ තිබ්බටු ඇට දෙකට..

" කැන් අයි ටේක් අ සෙල්ෆි විත් යූ.. ප්ලීස් අයියා.."

එකසැරේට අපේ මාමා හැරිලා බැලුවා.. අපේ මාමා එක්ක කවුද අනේ සෙල්ෆි ගහන්න එන්නෙ.. එහෙම ආවා තරුණ කාලෙ.. දැන් එන්නෙ බෑණා එක්ක සෙල්ෆි ගහන්න.. මම ඒ නංගි එක්ක හිනාවුණා.. හිනාවුනාට පේන්නෙ නෑ මාස්ක් එක දාගෙනනෙ.. ඊටපස්සෙ ලාවට ඔලුව වැනුවා.. මාමා මට දෙකක් රවුවා..

" ඔව්.. පුළුවන්.."

ඒ නංගි මුළු ලෝකෙම ලැබුණා වගේ උඩ පැනලා එතන කැරකිලා කැම් එක ඔන් කරගෙන මාත් එක්ක සෙල්ෆි එකක් ගත්තා.. ඊටපස්සෙ ඒ කෙල්ල කොට නිසා මම ෆෝන් එක ඉල්ලගෙන සෙල්ෆි එකක් ගහලා දුන්නා.. පීස් සයින්-වී-වරද්-දබරැඟිල්ලෙ දාපු රින්ග් එක.. මම යන හැම මැච් එකකම ගහන ෆොටො එකක ඒ පෝස් එක තියනවාමයි.. මම හෙන ආසයි ඒකට..

ඒ එක්කම වටේ පිටේ ඉන්න අක්කලා නංගිලා හැරි හැරී බලන්න ගත්ත පාර අපේ මාමා මගේ අතින් ඇදගත්තා.. කර වටේ අතක් දාගෙන එතනම තිබ්බ ශොප් එක අස්සට වැදුණා.. අපේ මාමා හුඟක් අය හිතාගෙන ඉන්නෙ මගේ තාත්තා කියලා.. මම කිව්වෙ මාව නොදන්න අය.. ඒත් අම්මගෙ වෙඩින් එකේ ෆොටෝස් සෝශල් මීඩියා වල තියන නිසා කට්ටියට ප්‍රශ්නයක් ඇත්තටම මගේ වටේ ඉන්න අය කවුද කියලා.. ඒ මදිවට කැම්පස් එකට හරිම ප්‍රශ්නෙ ආධ්‍ය අයියා මගේ කවුද කියන එක.. කවුරුත් දන්නෙ නෑ ඒ මගේ වෙන්ඩ බ්‍රදර් ඉන් ලෝ කියලා.. ඒ අස්සෙ සිතු සෑහෙන්න රංගනයක් දුන්නා මම එයාට කැමති වෙලා ඉන්නවා කියලා.. ඒත් අපේ බැජ් එක දන්නවා ඇත්තට මොකක්ද වෙලා තියෙන්නෙ කියලා.. ඒකි තමා නැට්ට වගේ පස්සෙන් එන්නෙ.. මම ගණන් ගන්නෙ නෑ.. එහෙම ගණන් ගන්න

@Shan

තරම් ඇති දේකුත් නෑ ඒකිගෙ අර ආශියා කියන්න වගේ.. හිතුනොත් සිතුව දාලා මම උග්ගසේන කථාවස්තුව කරවනවා.. අර 'ගැල් අඳින්නවගේ පුත, දිය අඳින්නවුගෙ පුත' කිය කිය අපහාස කරන්නෙ මේකි තමා.. කළොත් කෙල්ලෙක්ට අපහසයක්මයි කරන්නෙ.. මම ආස නෑ එහෙම මිනිස්සුන්ට..

" මේක හොඳයි නේද.. මේක.. මේක.. ඉණ කීයද සුදුමහත්තයා.."

" එහෙම ඇහේ කැලි කැලි විකුණන්නෙ නෑ මමෙ.."

මාමා හැරිලා මගේ දිහා කන්න වගේ බැලුවා.. දබෝස් ගාලා පිට මැද්දටම හොඳවයින් පාරක් දුන්නා..

" සුදුමහත්තයා!!"

" හරි හරි ඇකේ.. මෙහෙමයි හරිද මෙන්න මේ හරියෙන් තිහයි.. මෙන්න මෙහෙන් විසි හයයි.."

මාමා මගේ දිහා බලාගෙන ඉඳලා මම උස්සගෙන ඉඳපු ශර්ට් එක පහළට දැම්මා.. එහෙම තමා ඉතින් තියෙන්නෙ.. තියන විදියයි මම කිව්වෙ.. අවර්ග්ලාස් එකක් වගේ හදාගෙන තියන බොඩි එකනෙ මගේ..

" උඹව නම් මේ ආත්මෙ හදාගන්න පුළුවන් එකෙක් නෙමෙ.."

" මම හැදිලා ඉවරයි.. මේක ලස්සනයි නෙහ්.."

මම කළුපාට ට්‍රවුසර් එකක් අරගෙන මාමට දික් කළා.. මාමා හෙන අප්පච්චි මූණක් මවාගෙන ඒක දිහා බලාගෙන හිටියා.. ඉස්සර හිටපු මාමා නෙමෙ දැන් අප්පෙක් වෙලා පුදුම නීති ගොඩක් දාන්නෙ.. දෙන්න හිතයි බුලත් කොටන වංගෙඩියෙන්ම එකක්..

" ඉරිච්ච මගුල් අඳින්න..?? වෙන එකක්.. වෙන එකක්.."

" අනේ මාමෙ.."

" අනේ පනේ නෙමෙ.. මේක හොඳයි.."

මාමා ඉරිලා නැති කලිසමක් අරගෙන ඒක බෑග් එකට එබුවා.. මම ඒකත් ඇඳගෙන වටේ පිටේ තියන ඒවා දිහා බලාගෙන පිටිපස්සෙන් ඇදිලා ගියා..

@Shan

ආරු බබා මොනවා කරනවද දන්නෙ නෑ..

" මාමෙ කන්න දෙයක්.."

" අරගෙන එන්න.."

" හා.."

මම සුටුස් ගාලා ශොප් එකෙන් එළියට පැනගත්තම තමා අමතක වුණේ.. මම සල්ලි ගෙනාවෙ නැනෙ.. ආයෙම රිවස් එකේ මාමා ගාවට ගිහින් සාක්කුවෙන් අහුවුනු ගාන උස්සගෙන උඩට ගියා.. ගිහින් බබල් මී එකෙන් බබල් ටී දෙකකුත් උස්සගෙන ආපහු එනකොට මාමා හෙන රෙදි තොගයක් බිල් කරනවා.. මම ළඟට ගිහින් මූණ දාලා බැලුවා..

අවුලක් නෑ.. මගේ සල්ලි නෙමෙනෙ.. එතන කැෂියර් එකේ ඉදපු අක්කා හරි කියුට් හිනාවක් මට දැම්මා.. හැබැයි අක්කෙ මගේ හිනාව ඔයිට වඩා කියුට්.. ආධ්‍ය අයියා තමයි කියන්නෙ..

BWF එකට ප්ලේ කරන්න යන නිසා මම ඉන්නෙ මේ දවස්වල පුදුම උද්යෝගෙකින්.. මගේ නමෙත් තියනවනෙ.. BWF, ඔලිම්පික් බැඩ්මින්ටන් වලට සමගාමීව යන දැනට ලෝකෙ තියන ලොකුම බැඩ්මින්ටන් ටූනමන්ට් එක.. ඒක සමාන මහද්වීප වල බෙදිලා යන විදියට තියෙන්නෙ.. සාමාන්‍යයෙන් බැඩ්මින්ටන් වගේ ස්පෝට්ස් වැඩිපුරම එන්නෙ ඒශියන් කන්ට්‍රීස් වලට.. චයිනා ජැපෑන් වගේ.. මේ සැරේ පළවෙනි වතාවට ලංකාව නියෝජනය කරන්න තේරිලා ඉන්නෙ මම.. ඒකත් ලංකා ඉතිහාසෙ පළවෙනි වතාවට.. සුසන්තිකා නැන්දගෙන් පස්සෙ.. අඩේ මේක දින්නොත් මාවත් පෙළපොතකට වගේ ඇඩ් වෙනවා..

එහෙම හිතද්දි ගැම්මක් නැතුව ඉන්න බැනෙ..

ඇත්තටම BWF Word Tour එක පටන්ගන්නෙ මේ සතියෙන්.. තවම සති මුළ.. අග වෙද්දි මම ලොස් ඇන්ජලිස් ඉන්න ඕන.. මට ඇසෝසියේශන් එකෙන් කෝච්ලා හතරක් දීලා තියනවා වගේම මේ දවස්වල කිසිම ඇඟට අහිතකර දෙයක් ගන්න මට තහනම් කල්ලා තියෙන්නෙ.. ඩ්‍රග්ස් වගේ දේවල්.. අපේ මාමානම් කියන්නෙ ඒවා ගහන්න ඕන නැල්ලු මගේ ඇඟේ නිකන්ම දුවන ඒවලු.. පිස්සු.. තව ඩයට් එක ගාණට තිතට කරගෙන යන්න ඕන.. කැම්පස් යන්න විදියක් නෑ මොකද මට දවසම ප්‍රැක්ටිස්.. ඒකයි

@Shan

ඇඳුමක්වත් ගන්න එන්න බැරිවුණේ.. අනික මම මාසෙක ඉඳලා අඩිඩාස් බ්‍රෑන්ඩ් එකේ Asian brand ambassador කෙනෙක් විදියට ඇග්‍රිමන්ට් එකක් සයින් කල්ලා තියෙන්නෙ.. එක වතාවක සමර් බැඩ්මින්ටන් කලෙක්ශන් එකක ෆොටෝශූට් එකකට හිටියා.. සමහර වෙලාවට ඉන්දියාවෙ ඒ බ්‍රෑන්ඩ් එකෙන් තියන ශෝ වලට ඉන්වයිට් කරනවා.. ඒවා මම ක්‍රීඩාවට අමතරව කරගෙන යන ඒවා.. ඒකයි මම හැමතැනම දැන් ෆේමස් වෙලා වගේ තියෙන්නෙ.. එතනින් ගියාම sporting asia, sportstar මැගසින් දෙකේ එකේ මගේ ඉන්ටවීව් දෙකක් තිබ්බා.. ඒ දෙකට ඇරෙන්න මම වෙන කිසිම ඉන්ටවීව් එකක් ඇක්සෙප්ට් කළේ නෑ.. මගේ වෙඑවත් කිව්වා එහෙම කරන්න ඕන නෑ කියලා..

ඒත් මම මුලින්ම ස්පෝර්ටින් ඒශියා එකේ ඉන්ටවීව් එකක් කරද්දි, මම තමා ලංකාවෙ පළවෙනියටම බැඩ්මින්ටන් මෙච්චර ජාත්‍යන්තරේට අරගෙන ගියපු කෙනෙක් විදියට හිටියේ.. අපේ රටේ හුඟක් ප්‍රසිද්ධ ක්‍රිකට් ටීම් එකනෙ.. මම තනියම ගේමක් ගහලා බැඩ්මින්ටන් උඩට ගෙනාවා.. තනියම නෙමේ.. මම එහෙම කිව්වට.. මගේ පිටිපස්සෙන් කී දෙනෙක්ගෙ මහන්සිය.. කැපවීම තියද.. ඒ හැමදේමත් එක්ක අද මම මේ තැන ඉන්නවා.. ඉතින් මම ඔය ඉන්ටවීව් එක කරලා ලංකාවට එද්දිම හතරවටේ අටෝගෙන ඉන්න යූටියුබ් චැනල් එකදිගට මගෙන් ඉන්ටවීව්ස් ඉල්ලුවා.. ඇත්තටම මට මගේ දුක මාකට් කල්ලා ලංකාවෙ අවධානෙ ඕන වෙලා තිබ්බෙ නෑ.. මොකද ඒ වෙද්දිම මට සැලකිය යුතු අවධානයක් ලැබිලා තිබුණා.. මෙහේ ඉන්ටවීව් කියලා කරන්නෙම මඩ ගහන එකනෙ.. ටිකකාලයක් හොඳ කියනවා.. ඊටපස්සෙ කොහේහරි කළු පැල්ලමක් හොයාගෙන ඒක පස්සෙ පන්නනවා.. මං ගැන දැනගන්න ඕන නිසා මම මැගසින් දෙකකට විතරක් උත්තර දුන්නා.. ඒ ඇති.. සමහරවිට ඊළඟ වතාවෙ ලෝකෙටම උත්තර දේවි..

මම අතේ තිබ්බ පේපර් කප් එක ඩස්ට්බින් එකට දැම්මා.. මාමා මගේ කර වටේ අතක් දාගෙන ළඟට ගත්තා.. මේ මනුස්සයා යන යන හැමතැනම මෙහෙමයි.. අද ගියාම දැන් බනී කොට කැලි ඇඳගෙන ආවා කියලා.. ඒත් මාමගෙනෙ වැරැද්ද..

" මම ගියාම ආච්චිඅම්මව බලාගන්න හරිද.."

" බලාගන්නැතුව.. ආච්චිව වඩාගෙන මම දුවනවා කොළඹ හතේ පුරාම.."

@Shan

මම මගේ කර වටේ තිබ්බ මාමගෙ අතේ ඇඟිලි වල මගේ ඇඟිලි පටලගත්තා.. මාමා මගේ ඔලුව මැද්දටම හාද්දක් දුන්නා.. වටේ පිටේ යන මිනිස්සුත් හැරි හැරී අපි දිහා බලනවා.. මෙ ඉන්නෙ මගේ බෝයිපෙන්.. ගෙ අයියගෙ හස්බන්ඩා.. දෙදරු පියාණෝ අනුරාග්..

අපි ගෙදර යද්දි ආච්චිඅම්මා චීල්චෙයා එකේ ඉඳගෙන ආරුයි අවියි එක්ක කියවනවා.. ආධ්‍ය අයියත් තේකක් හදාගෙන, කෑම දෙකකුත් තියාගෙන පැත්තකින් වාඩිවෙලා හිනාවෙවී ආච්චි කියන ඒවා අහගෙන ඉන්නවා.. එකසැරේට මාමගෙ ඇස් දිලිසුනා.. ඒ දිහා බලාගෙන ඉද්දි.. දෙයියනේ මේක නෙමෙයිද මනුස්සයෙක් ජීවිතේ ලබන ලොකුම සතුට.. පහුගිය කාළෙ මොන දේ වුණත් මේ පවුල දකිද්දි හිත සතුටින් පිරෙනවා.. ඒකත් හරියට අම්ම කෙනෙක් ඩිලිවරි එකකදි දරන වේදනාව බබාගෙ මූණ දැක්කම නැතිවෙලා යනවා වගේ හැඟීමක් වෙලා ඇති.. මම ඕනතරම් ලේබරූම් ඉද්දි දකිනවා.. කාමර දෙක වෙන්න කෑගහන අම්මලා.. අන්තිමේදි ආදරෙන් හිනාවෙනවා.. ඒ වෙහෙස වේදනාව පිරුණු ඇස් වලින් දෝරෙ ගලන ආදරේ පිරිච්ච සතුට තප්පරේට හැම අමාරුවම නැතිකල්ලා දානවා.. අම්මගෙ පපුවට බබාලා තුරුල් වෙලා උණුහුමට හැඩගැහෙනවා..

ඉතින් මම කොහොමද මාව වදාපු අම්මට වෛර කරන්නෙ.. තාත්තෙක් නැතුව විළි රුදාව ඉවසගෙන මාව මේ ලෝකෙට දීපු අම්මට වෛර කරන්නෙ.. කවමදාවත් වෛර කරන්නෙ නෑ.. එයා සතුටින් ඉන්න ඕන..ඒ ඇති.. එච්චරයි.. මට අනිත් දේවල් ඉවසගන්න දරාගන්න පුළුවන්.. මම පුතෙක් විදියට ඒ යුතුකම අකුරටම ඉෂ්ට කළා..

හැම දුකක් අන්තිමේම සතුටක් තියෙනවා..

" ඔය දෙන්නා ආවද.. ඔක්කොම ගත්තා නේද චූටි.."

" ඔව් අයියෙ.. මේ මොකද ආරු බබා කන්නෙ නැද්ද.."

මම බිම දණගගා ඉදපු ආරුව උස්සලා අතට වඩාගත්තම ඒකා මගේ කම්මුලක් හපාගත්තා.. ආධ්‍ය අයියා හයියෙන් හිනාවුණා.. අපේ ආච්චිඅම්මත්..

" එයා ආදරේ ඔයාටද කොහෙද.. බලන්න අනේ මේ සීරියල් එක කවාගන්න පුදුම දුකක් විඳින්නෙ.. දෙන්න හිතෙනවා දෙකක් දැන්.."

@Shan

ආරූ ආධ්‍ය අයියා දිහා බලාගෙන ඉඳලා අඩන්න කට හදාගත්තා.. මම දෙපාරක් තුන්පාරක් එහෙට මෙහෙට පැද්දිලා ඒකව හඳ පෙන්නන්න උස්සගෙන ගියා.. මාමා දඩාස් ගාලා ආධ්‍ය අයියගෙ පිට මැද්දට පාරක් දුන්නහම ආච්චිඅම්මා දෙස් දෙවොල් තියන්න ගත්තා.. ඒ අස්සෙ අව්‍යාන් බිල්ඩින් බ්ලොක්ස් වලින් අමුතු ගෙයක් හදනවා.. ආධ්‍ය අයියා සීරියල් එකයි බත් පිඟානයි තියාගෙන මනුස්සයගෙන් ගුටි කකා දහදුක් විඳිනවා..

" අනේ ළමයි එන්නකො කන්න.. සුදුපුතා.. කෝ ආ කියන්න.."

මාමා නසරානි අවියව වඩාගත්තා.. අප්පගෙම පුතානෙ.. ආපු දවසෙම මගෙ කලිසම ගලවන්නත් හැදුවා..

" චූටියො.. ඔය අතේ ඉන්න බඩ්ඩ මෙහෙට එක්කන් එන්න.."

" බඩගිනි නැතුවැති පුතේ.. කාලා වමනෙ කරයිද දන්නෑ.. එන්න සුදුපුතා ආච්චිඅම්මා මගෙ පුතාට කතාවක් කියන්න.."

ටිකකින් ඔන්න අවියා ආච්චිගෙ කතන්දරේට වහ වැටිලා මෙලෝ සිහියක් නැතුව ආධ්‍ය අයියා කවාපු බත් කටවල් ටික කෑවා.. අපේ මාමා ගේ ඇතුළෙ රෑ කෑම හදනවා.. මගේ අතේ ඉන්න එකා මගේ ඇඟ පුරාම කෙළ ගානවා.. කොහොම හරි හෙන යුද්ධයක් තියලා ආරූත් සීරියල් එක කෑවා.. අපේ ආච්චිඅම්මට නියම මුණුබුරෝ ටිකක් තමා සෙට් වෙලා තියෙන්නෙ.. මුණුබුරෝ මුණුබුරෝ නළවනවා.. ඒ අස්සෙ එක මුණුබුරෙක් පුතාව බැඳලා.. පුතා අනිත් මුණුබුරා එක්ක යාළුවෙලා.. අපේ පවුල කවදාහරි කලවම් පලාවක් වෙනවා..

" තුති තාත්ති තුතුලෙක්.."

" අනේ මේ.. ආධ්‍ය අයියේඒඒඒඒඒඒඒඒහ්!!"

මම ආරූවත් වඩාගෙන සෝෆා එකෙන් වාඩිවුණාම අවියත් පැන පැන ඇවිත් මගේ එහාපැත්තෙන් වාඩිවෙලා මගේ ඇඟට හේත්තුවක් දාගත්තා.. අනේ පුතේ චූදාන්නනම් එපා.. මට ආයෙ නාන්න බෑ..

" තුති තාත්ති තුති තාත්ති.."

දැන් මෙකගෙ දිවට මොකක් හරි වෙනවා තයන්නම කියවලා..

@Shan

" තුති නෙමෙ අවී බබා.. චූටි.. කෝ කියන්න.. චූ..ටි.."

" තුති.. තුති තාත්තා තුතිද, තුති තාත්තා කියන්නෙ.. ඔයා තුති නැනෙ.. ඔක්කු අයියෙත්නෙ.."

හරිනම් අයියා තමයි පුතේ.. කොහෙද ඉතින්.. මෙච්චා කතාකල්ලා වැඩක් තියේද..

" මම තාම චූටියි.. ශෝයි නේ.."

" තෝයි නැහ්.. අවී බබා විතරයි තෝයි.."

" ඇයි ඔයාගෙ පපා තෝයි-සැක් ශෝයි නැද්ද.."

" පපා තෝයි.. අත්තම්මා තෝයි.. ඩඩා තෝයි.. බට ජූවුසෙම්ම... මම්වෙහ්!!"

එකපාර අවී මගේ කම්මුලේ කෙළ තලියක් ගෑවා.. මොකක්ද ඒ අන්තිමට කිව්වෙ.. මුන් කැනඩා ඉඳලා ෆ්‍රෙන්ච් කතාකල්ලා බේබිසින් කරන මාවම අසරණ කරනවනෙ.. (je vous aime-මම ඔයාට ආදරෙයි)

" ආ.. හහ.. ම්මවෙහ්..!! ජූවුසෙම ජූවුසෙම.."

මම ගොංපහේ හිනාවක් දාලා අවීට හාද්දක් දුන්නා.. ආරු මගේ අතේම නිදි.. යනකොට අවදි කන්න පුළුවන් නිසා මම එයාව ගෙනිහින් අපේ ගෙදර ආඪ්‍ය අයියලා ආවහම ඉන්න කාමරෙන් තියලා ෆෑන් එක එකට දාලා දොර වහන් එළියට ආවා.. එද්දි අවී ගිහින් රෙක්සිගෙ හොම්බ අතගානවා.. රෙක්සි පොඩි බබාලට බුරන්නෙ නෑ.. කියාරා අවීගෙ ඇහේ ඇතිලෙනවා.. ඒකා එහෙමම එතනම ඇදගෙන වැටුණා..

බලන්න එපා වරදයා.. දැක්කෙ නෑ වගේ පලයන්..!!

මම උඩ බලාගෙන එන්න ආවා.. අපි බැලුවොත් තමා ඒකා අඬන්නෙ.. කුස්සියෙ ආච්චිඅම්මයි මාමයි ඕපදූපයක් කියවනවා.. මම කාමරේට එද්දි ආඪ්‍ය අයියා ලැගේජ් එකකුත් දිගෑරගෙන ඇඳුම් වගයක් අඩුක් කරනවා.. මමත් ගිහින් ඒකට උදව් වුණා.. මගේ දේවල්නෙ ඉතින් අයියා කරන්නෙ.. එහෙම හොඳ නැනෙ..

@Shan

" අම්මෝ අපේ ගෙදර ආපු පුංචි කොල්ලා ගියපු දුරක්.. මට තාම මතක් වෙන්නෙ පොඩී ඔයාව උස්සගෙන ඩිස්පැන්සරි එකට උස්සන් ආපු දවස.. ඒකා ඇඩුවත් එක්කලා.."

ආධ්‍ය අයියා කොන්දට අත තියාගෙන ඇදෙන් වාඩිවුණා..

" හෑ ඇඩුවා..??"

" ඔව් පොඩ්ඩක් විතර.. කේන්තියෙන් හිටියෙ ඔයා කන්නෙ නෑ කියලා.."

මට එදා මතක් වුණා.. දැනට අවුරුදු හතකට ඉස්සර.. අපි ගෙවුව ලස්සනම කාලෙ..

" ඊටපස්සෙ..??"

" ඊටපස්සෙ ඔයා නැගිටිනකල් දස වදයක් තමයි දුන්නෙ.."

" ඒ වුණාට අයියෙ නැගිට්ටම ඒකා මට බලහත්කාරකම් කරන්න ගත්තා.. අයියට කියන්න බොටම අරගෙන මගේ කටේ ගැහුවා.."

ආධ්‍ය අයියා මහා හයියෙන් හිනාවුණා.. අනේ මට එයාව හුඟක් මතක් වෙනවා.. ආධ්‍ය අයියත් ටිකකින් හුස්මක් පිටකල්ලා මගේ ඇඳුමක් අරගෙන නැමුවා..

" එයා දැන් කැම්පස් අවුට් වෙලා ඇති චූටියො.. ඉක්මනට අපි ගාවට ඒවි.."

මම බිම බලාගෙනම හිටියා.. කැම්පස් අවුට් වුණු ගමන් ඉබේ ප්‍රාතිහාර පාන්න බෑ තමා තැනකට එන්න.. මොකක් වුණත් අප්පච්චි මාව හොයාගෙන එන දවස වෙනකල් මම බලාගෙන ඉන්නවා.. එහෙම දවසක් ළඟදීම එනවා.. බොහෝ විට මේ අවුරුද්දෙම..??

" මමත් බලාගෙන ඉන්නවා.. අවුරුදු පහක් තිස්සෙ..?? එහෙම බලාගෙන ඉන්න එක ලේසිද අයියෙ.."

ආධ්‍ය අයියා අපි දෙන්නගෙ මැද්දෙ තියන ලැගේජ් එක පිටිපස්සට දාලා මාව එයාගෙ ඇඟට හේත්තු කරගත්තා..

@Shan

" ඔයයි මමයි සමහරතැන්වලදි එක වගේ.. ඒක ලේසි නෑ චූටි.. මම දන්නවනෙ.. ඒත් ඔයාලා අපි තරම් පරක්කු නොවී හැමදේම ළඟට ගනී.. මම හැමදාම ප්‍රාර්ථනා කරනවා.. ඉස්සර අපි හැමෝම පයට පෑගුණත් පොඩිවෙලා මැරිලා යන පැළ වගේ.."

" දැන් විසාල ගස් වගේ.."

" ඔව්.. ලේසියෙන් කාටවත් ළං වෙන්න බෑ.. මෙ අවුරුද්ද ඉවරවෙන්න කලින්.. අනිවාරෙන් හොඳ දෙයක් වෙයි චූටි.. ආයෙම ඔයාලා දෙන්නම මං ගාවට ආවම.. මම කොහෙවත් යන්න දෙන්නෙ නෑ.."

මම ආඩ්‍ය අයියට තව ටිකක් තුරුල් වුණා.. කරපු හැම කැපකිරීමකම ප්‍රතිඵල ලැබෙන්න ඕනමයි.. මම බලාගෙන ඉන්නවා..

" අපි කොහේවත් යන්නෙ නෑ.."

ඩබල් අප්ඩේටුවාආආආආක්!!!!

වරද් එක්ක සෙල්පි ගහන්න එමනෙ කවත..

එන්නාම්.. ලව් යූ ❤



ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 161 කොටස

" good morning sir.."

" oh..g-good morning.. I'll take this.. sorry.."

" that's fine sir.."

මම රූම් බෝයි ගෙනැල්ලා දුන්න ට්‍රේ එක අත් දෙකින්ම අල්ලගෙන ඒක අරගෙන ඇතුළෙන් තිබ්බා.. කාමරේට එන්නවත් ඉඩක් නෑ දොර ගාව තඩි බෑග් ගොඩකුයි මල් බොකේ ගොඩකුයි ගොඩගහලා.. කවද යකෝ මේවා මෙහෙම තියලා ගියේ.. එක්කො මම නිදාගෙන වැඩිද.. අඩු වයසෙන්ම මගේ මොලේ හොඳනැති වෙලා..

මම වෙලාව බලද්දි දවල් එකොළහත් වෙලා.. මේ ටයිම් ලයින් වෙනස් නිසා පුරුදු වෙලාවටම නින්ද යනවා.. මම දොර ගාව තිබ්බ සේරම මල් ටිකයි බෑග් ටිකයි උස්සගෙන ගිහින් ඇඳෙන් තිබ්බා.. ලොස් ඇන්ජලීස් වල ඉන්න ශ්‍රී ලන්කන්ස්ලා මට විශ් කල්ලා මේ දවස්වා සෑහෙන්න මල් එවනවා.. එක එක ගිෆ්ට්ස් එවනවා.. පොඩි බබාලා ඇඳලා එවන බෙස්ට් ඔෆ් ලක් කාර්ඩ්ස් හම්බෙනවා.. එක එක පොඩි පොඩි දේවල් එවනවා.. අනිත් දේවල් ගේන්න ප'මිශන් දීලා නෑ.. අනික මම කැමතිත් නෑ.. මම ඇඳ උඩ තියන චූටි කාඩ් එකක් අරගෙන දිග ඇරියා..

**Taliya-6ys oldie**

**WISH YOU LUCK HERO**

**I LOVE YOU ❤**

මට සතුටු හිතුණා.. අනේ උදේ පාන්දර නොවුණත් උදේ පාන්දරම මාව දියවෙනවා වගේ.. මම මල් බොකේ ටිකෙත් එල්ලලා තිබුණ ටැග්ස් එකින් එක කියවන ගමන් අත දික් කල්ලා මගේ කොෆී එක අරගත්තා.. දැන් මෙහෙම ඇවිත් සති තුනක්.. මම ඉන්නෙ පුදුම ස්ට්‍රෙස් එකක.. එකදිගට මැච්ස් විතරමයි.. රටවල් තුන්සිය එකසිය ගාණක් එක්ක මැච්ස් තිබුණා.. 1000, Super 750, Super 500, Super 300 and Super 100 කියලා ටූනමන්ට්ස් තියනවා.. ඔය හැම එකකින්ම වින් කළාම තමා ඒකෙන්

@Shan

තෝරගන්න අට දෙනෙක් ඔලිම්පික් ෆයිනල්ස් යන්නෙ.. කියන්න සතුටුයි.. අට දෙනා අස්සෙ මාත් ඉන්නවා.. BWF එකෙන් 2nd place එක මම වින් කළා.. ලංකාවෙ පළවෙනි පාරට..!!

මට සතුටුයි දෙයියනේ!!!

ලොස් ඇන්ජලිස් දැන් එකම පිස්සුවක් වෙලා තියෙන්නෙ.. ඔලිම්පික් වලට ලෑස්තිවෙනවා.. මම ආසම ඔලිම්පික් එක තිබ්බෙ මම පොඩිකාලෙ රියෝද ජැනයිරෝ වල..ඒකනම් පිස්සුවක්.. මම ගමේ ඉඳගෙන කට ඇරගෙන ඕක දිහා බලාගෙන හිටියා. ෆයර් වර්ක්ස්, ඒකෙ ඉවෙන්ට්ස්.. අම්මෝ පිස්සු හැදෙනවා.. දෙදාස් දාසයෙ සමර් ඔලිම්පික් එක.. අවුරුදු දෙළහකට පස්සෙ මම ටීවී එකෙන් දැකපු සමර් ඔලිම්පික් එක මම දැන් ඇස් දෙකෙන් දකිනවා.. ඒකෙ ප්ලේ කරන්න යනවා..

The Galen Center එකේ තමයි ඔලිම්පික් බැඩ්මින්ටන් ෆයිනල්ස් තියන්න ප්ලෑන් කල්ලා තියෙන්නෙ.. ලංකාවෙ හැමෝම අවුරුදු ගාණකින් පරණ ගැම්මෙන් ඔලිම්පික් බලනවා.. පහුගිය කාලෙම මැච්ස් වලින් එකදිගට වින් කරන්න පුළුවන් වුණ නිසා ඒක ලංකාවෙ ඉක්මනින් පැතිරුණා.. දැන් බැඩ්මින්ටන් ෆෑන් බේස් එක වැඩිවෙගෙන එනවා.. සමහරු බැඩ්මින්ටන් වලට ආසාවටම නෙමේ බලන්නෙ.. එහෙම හරි කමක් නෑ බලපන් මම නම් කියන්නෙ..

මම හොටෙල් එකේ වින්ඩෝ එක ඇරලා එතෙන්ට හේත්තුවක් දාගත්තා.. හැමතැනම පියාඹන සුරංගනාවියො ඉන්න ෆ්ලැග් එල්ලලා.. LA28.. මෙ වතාවෙ ඒක තමා ෆ්ලැග් එක.. පාරෙ තැන තැන ස්ට්‍රීට් සෝන්ග්ස් ප්ලේ කරනවා.. සමහරු යන එන ගමන් ඒවට නටාගෙන යනවා.. හරි අමුතු මිනිස්සු ඉන්න රටක්.. එයාලා වැඩ එක්ක වුණත් විනෝදකාමී ජීවිත ගෙවනවා.. අනික හැමදේම තියනවා මෙ රටේ.. නැති දෙයක් නෑ.. මම ලොස් ඇන්ජලිස් ඉන්නවා කියන්නෙ.. අපේ අම්මා ඉන්නෙ මේ කිට්ටුවම තමා.. මම හැමදාම වගේ අම්මව බලන්න යනවා..

අවුරුදු තුනකට පස්සෙ මම අම්මව දකින්නෙ..

එයා ඉස්සර හිටපු කෙනා නෙමෙයි දැන්.. සෑහෙන්න වෙනස් වෙලා.. ඉස්සර දණහිසෙන් පල්ලෙහාට ඇඳුම් ඇඳපු එක්කෙනා දැන් අඳින්නෙ අඟල් දෙකේ ශෝට්.. අකිල අංකල් අපේ අම්මව ලස්සනට බලාගන්නවා.. එයාට ඕන හැමදේම එයා කරනවා.. අනික විවෘත මානසිකත්වෙකට හුරුවෙලා..

@Shan

මනුස්සයො වෙනස් වෙනවා කියන්නෙ.. ඒකනම් පුදුමයි.. මම මේ අලුත් අම්මට හුඟක් කැමතියි.. එයා ඉන්නෙ මම වචනෙන් කිව්වට විස්තර කරන්න බැරි නිදහසකින් වගේ.. අන්තිමෙ මට අම්මා ගැන සැනසීමක් දැනෙනවා.. දැන් මම මෙහෙ ආපු නිසා අම්මා කෑම ජාති එහෙම හදලා බලාගෙන ඉන්නවා.. තව සඳෙව් අයියත් ඉන්නෙ මෙහේනෙ.. එයත් එනවා ගෙදර.. දවසක් ෆැමලි ඩිනර් එකක් තිබ්බා.. අකිල අංකල් හෙන ෆනී මනුස්සයෙක්.. හැමතිස්සෙම විහිළු කරනවා.. මෙතු අක්කා.. සඳෙව් අයියා.. මම.. අම්මා.. බාප්පා.. අපි ඇත්තටම හොඳින් සතුටින් ඉන්නවා.. අම්මා එයාගෙම පව්ලක දැන් ඉන්නවා.. අම්මා කියන්නෙ ඉක්මනට අම්මට අසලි අම්මා එක්ක කතාකරන්න ඕන කියලා.. මම දාහක් කතා කියලා ඒක මඟාරින්නෙ.. බාප්පා නම් දන්නවා ඇත්තම විස්තරේ.. ඒකනිසා බාප්පා අම්මට කියලා තිබුණා පොඩ්ඩක් මගේ කොන්වොකේශන් එකත් ඉවරවෙනකල්ම ඉඳලා ගෙවල් වලට කතාකරන්න කියලා.. අන්තිමෙ හැමදේම හොඳවිදියට වෙනවා.. රධ්‍ය අයියා එන්න විතරයි තියෙන්නෙ.. මගේ පැත්ත මම කොහොමහරි ගේමක් ගහලා සෙට්ල් කරගත්තා..

අනික අම්මා වද දෙනවා බඳින්නෙ නැද්ද, බඳින්නෙ නැද්ද කිය කිය.. මාමටත් මෙහේ එන්න කියලා කිව්වා වැකේශන් එකට.. අම්මා බබාලා දකලත් නෑනෙ.. මම හිතන්නෙ ලොකු අම්මයි බාප්පයි අම්මව සෑහෙන්න බ්‍රේන් වොශ් කල්ලා වගේ.. කොහොම හරි කමක් නෑ දැන් හැමදේම හොඳින් වෙනවනෙ.. එච්චරයි..

මම ඉවරවුණු කෝපි එක මෙසෙන් තියලා ජනේලෙ වහලා කොට්ටෙ අස්සෙ දාගෙන ඉඳපු පොඩි කොළ කෑල්ලක් එළියට ගත්තා.. ඒක ප්‍රින්ට් කරලා තියෙන්නෙ.. අත් අකුරු නෙමෙයි.. ඒත් මට මේක ලැබුණෙ..

ග්ලැඩියෝලි මල් පොකුරක් එක්ක.. දම් පාට..

මට හුඟක් දේවල් මතක් වෙනවා.. ඒ ඔයාද.. ඔයා හොඳින් ඉන්නවා කියලද කිව්වෙ.. හැමදේම ඉක්මනට හරිගස්සනම් කියලද මට කියන්නෙ.. අනේ ඒ ඔයා වෙන්න.. ඔයා හොඳින් ඉන්නවා.. අසලි අම්මත් හොඳින් ඉන්නවා නේද.. එතනින් ගැලවුණාද.. මට ඒ වචන අස්සෙ තියන පණිවිඩේ හංගලා තිබ්බෙ මොකක්ද කියලා ඔයා කියනවද..

**"The knight who owns His Majesty's heart.."**

නැත්නම් තාම ඔයා මගේ කියලද ඒ කියන්නෙ.. ඒක මම දන්නවනෙ..

@Shan

කමක් නෑ මේක එයාගෙන් නම්.. ඒ ලස්සන ග්ලැඩියෝලියා මල් පොකුර එයාගෙන් නම්.. මම ඒක සතුටින් භාරගන්නවා.. ඒකම මට අලුත් ආරම්භයක්.. මට එයා ඉන්න තත්වෙ තේරෙනවා.. ටික දවසයි.. ඔයා ඉක්මනින් අප්පච්චි ගාවින් අයින් වුණ තරමට එයා මාව හොයාගෙන එනවා.. එතනින් එහාට හැම ප්‍රශ්නයක්ම විසඳේවි.. මම එහෙම හිතාගෙන ඉන්නවා.. ඒත් ඉක්මන් කරන්න අයියෙ.. අවුරුදු ගාණක් අපි ඉවසනවා.. එහෙම ඕනනෑ..

ඔයා අසනීපයක් නැතුව ඉන්නවා නේද.. මාව බලාගෙන ඉන්නවනම්.. මම ඔයා පෙන්නපු පාරෙ ඉස්සරහටම ගියා.. මේ තරම ඕනවටත් වැඩියි.. හැමතිස්සෙම මට මතක් වෙනවා..

**ඔයා ඔයාගෙ ජීවිතෙත් අමතක කල්ලා මට ජීවිතේ දුන්නා**

කියලා..

මම ඒ ටැග් එකේ ෆොටෝ එකක් අරගෙන ඉන්ස්ටග්‍රෑම් අප්ලෝඩ් කළා.. දැන් මගේ එකවුන්ට් එක verified account එකක්.. වන් මිලියන් කිට්ටු වෙන්න ෆලෝවර්ස්ලා ඉන්නවා.. එක එක ෆීල්ඩ්ස් වල මනුස්සයො මාව අඳුරනවා..

**" Hurry up.. don't miss the chance.. everything will be fine.."**

එයා මොකක් හරි තේරුම් ගන්නෙ නැතෑ.. මම ඇඳුමක් දාගෙන හොටෙල් එකෙන් එළියට ආවා.. මේක ලොස් ඇන්ජලිස් වල තියෙන ෆයිව් ස්ටාර් හොටෙල් එකක්.. පහළ තියන හෝල් හතර එක එක සම්ප්‍රදායන්ට හදපු ඒවා.. පට්ට ලස්සනයි.. බිම බැලුවහම මූණත් පේනවා.. මම දැන් ඔලිම්පික් නෙමේ මින මගුල ගහලා ආවත් ලංකාවෙ මෙඩිකල් කවුන්සිල් එකට ඒක අදාළම නෑ.. ගිහින් ෆයිනල්ස් වලට පාඩම් කරන්න ඕන කියලා මතක් වුණාම.. මිස් වෙච්ච ඒවා කවර් කරන්න ඕන කියලා මතක් වුණාම..

තනි ඇඟට ඇඬෙනවා.. අනිත් ඇඟ කසනවා.. ඒකටත් ඇඬෙන්නද කොහෙද..

මම එළියට ගිහින් සාක්කුව අස්සට අත් දෙකත් ඔබාගෙන වටේ පිටේ දිහා බලාගෙන හිටියා.. ඉස්සරහා ස්ටාර්ස්බර්ක් එකක් පේනවා.. ඒත්.. මට

@Shan

මොකුත් කන්න බැනෙ හිතුණ හිතුණ වෙලාවට.. ඉදපන්කො මෙ මගුලත් ඉවරවෙලා මම කනවා පැලෙන්න..

>>>යමින යමින අනේ එහා එකට>>>

ඇත්තටම 2028 ඔලිම්පික් තියන්නෙ ලොස් ඇන්ජලිස් වල තමා.. ඒකෙ ලෝගො එක මම පහළින් දාලා ඇති.. විසි අවෙදි මෙ පෞකාරිව මිනිත්තුවකට හරි මතක් කල්ලා ඔලිම්පික් බලාපල්ලා.. ගුන බුස..

මෙ වගේ තමයි ඔලිම්පික් බැඩමින්ටන් කෝට එකක්.. (දෙයියනේ කියලා අපේ රටේ කොඩියක් තියන එකක් හොයාගත්තු මින්සි😎)

මම ඔලිම්පික් වලට ආසයි අම්නෙ.. කාදහරි බලමින යමින ඕන.. ඉමිහි..

ප.ලි.

**- මෙහි එන සියලූ පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 162 කොටස

මගේ බැඩ්මින්ටන් ජීවිතේට අවුරුදු දහ තුනක්.. මම රැකට් එකක් මුලින්ම අතට අරගෙන අවුරුදු දහ තුනකට පස්සෙ ලිම්පික් ප්ලේ කරනවා කියන්නෙ.. ඇත්තටම මේ වෙද්දිත් මගේ හීන මම දිනාගෙන ඉවරයි.. ඔලිම්පික් දින්නත් පැරදුනත් මේකට සහභාගී වෙන්න ලැබිච්ච එකමමට ලොකු දෙයක්.. මම ආපු ගමන හුහක් දුරයි.. ආපස්සට හැරිලා බලද්දි සතුටුයි.. අන්තිමේදී මම 28 ඔලිම්පික් වලදී බැඩ්මින්ටන් කෝට් එකක හිටගෙන හිටියා..

මම තරඟ කරන මිනිස්සු.. රිතල වගේ.. පුදුම වේගයක් ජවයක් තියෙන්නෙ.. හැමෝම එක හා සමානයි.. සේරම ෆයිනල්ස් හිටියෙ චයිනීස් ජැපනීස් අය.. සමහරු ඔලිම්පික්ම ප්ලේ කරන දෙවෙනි තුන්වෙනි වතාවල්.. මට දැනුණෙ මාව හුඟක් පොඩියට..

ඒත් එහෙමයි කියලා අතාරින්න බැනෙ..

ස්ටේඩියම් එකේ සෙනඟ පිරිලා.. මට අපේ රටේ ෆ්ලැග් එක එහෙන් මෙහෙන් පේනවා.. මගේ කිට් එකේ තියන අපේ රටේ ෆ්ලැග් එක.. මගේ නම.. මට ලැබිලා තියන අංකෙ.. මගේ රටේ නම මම නියෝජනය කරන එක.. ඒවා පොඩි දේවල් නෙමේ.. මේක මගේම හීනෙ.. මම පණ දෙන්න ආස කරපු හීනෙ..

ඇත්ත තමා.. හිතුවොත් මනුස්සයොන්ට කරන්න බැරි දේවල් නෑ.. අපි මහන්සි වෙන්න ඕන.. මහන්සිවෙලා කොහොම හරි හීන අල්ලගන්න ඕන.. නැත්නම් ඒවා අපෙන් දුරට යනවා.. මගෑරෙනවා.. ඉතින් අවුරුදු ගාණක මම කරපු හැම කැපකිරීමකම ප්‍රතිපලේ අදින් තීරණේ වෙනවා..

මම ප්‍රාර්තනා කළා.. මේ අවුරුදු ගාණ.. මම කළ කැපකිරීමක මහන්සිය අනිවාරෙන්ම තියනවානම් මට මේක වින් කරන්න පුළුවන් වෙන්නම ඕන.. හැමදාම හැමෝම කියන්නෙ මහන්සියෙ තරමට ප්‍රතිඵල තියනවා කියලා.. ඉතින් මම රැයවල් දවාලවල් බලනනැතුව මහන්සි වුණා.. මාව ඉන්ජර්ඩ් වුණා අනන්ත අප්‍රමාණ.. හැම මැච් එකම වින් කළේ නෑ.. සමහර වෙලාවට පැරදුණා.. කඩාවැටුණා.. ඇඩුවා.. දාහක් අතාරින්න අවස්ථා එද්දිත් මම අල්ලගෙන හිටියා.. අමාරුම වෙලාවෙදිත් මම ඉවසුවා..

@Shan

මට වැරදෙන්න කොතනකවත්ම ඉඩක් නෑ කියලා මම විශ්වාස කරලායි මගේ රැකට් එක අතට ගත්තෙ..

ටයිම් බෝඩ් එකේ තප්පර හතළිහ ගෙවෙන්න හරිම පොඩ්ඩයි.. මගේ නම මුළු ස්ටේඩියම් එකෙන්ම මට ඇහෙනවා..ඒ පීඩනේ මට දැනෙනවා.. ඇස් වලින් විතරයි දාඩිය දාන්නෙ නැත්තෙ.. කොහොම හරි මම මේක කරනවා කියලම මම හිතාගත්තා.. පහුගිය මැච් වල මම වින් කළේ සේරම සෙකන්ඩ් ප්ලේස්.. ලේසි නෑ අනිත් අය එක්ක තරඟ කරන එක.. මගේ රටේ ෆ්ලැග් එක ඈහැ කොනෙන් පෙනෙද්දි මට ලොකු විශ්වාසයක් ඇතිවෙනවා මං ගැන.. ඒක වචනෙන් විස්තර කරන්න පුළුවන් හැඟීමක් නෙමෙ..

කොහොමත්.. මේ රවුන්ඩ් එක දින්නත් නැතත් මට සිල්වර් මෙඩල් එකක් තියේ.. හැබැයි මම හිත යටින් ආස කළේ ගෝල්ඩ් මෙඩල් එකට.. ලංකාවෙ පළවෙනි ගෝඩ් මෙඩල් එක මං අතින් ලංකාවට ගෙනියන්න.. පළවෙනි වතාවට ගෝල්ඩ් මෙඩල් එකක් අරගෙන හැමෝටම මතක හිටින චරිතයක් වෙන්න..

මැච් එක ඉවරවෙන්න හරියටම මිනිත්තු දෙකක් තියා මගේ රැකට් එකේ වැදුණු ශටල්කොක් එක එහාපැත්තෙ ඉඳපු චයිනීස් පිරිමි ළමයා අතින් මිස් වුණා.. මම එහෙමම ගල් ගැහුණා..

" මොකක්ද.. ඒ.. වුණේ..!!!!!!"

එකසැරේට මගේ අතින් රැකට් එක අතෑරිලා බිම වැටෙද්දි මගේ වටෙන් සැහෙන්න සද්දයක් ඇහුණා.. මම ඒක බලාපොරොත්තු වුණ දෙයක් නෙමෙයි.. හිතපුවත් නැති වෙලාවක.. ඒක.. එහෙම වුණා..

එහාපැත්තෙ ඉඳපු පිරිමි ළමයා නෙට් එක ගාවට ඇවිත් මට අතට අත දුන්නා..

මගේ ඇස් වල කඳුළු පිරෙනවා.. ආච්චිඅම්මෙ..

මම ඒක අන්තිමට කළාද..!!

ටිකකින් මගේ රටේ ෆ්ලැග් එක මගේ අතට ගෙනැත් දුන්නම මම ඒකෙ කොණත් අතට ගුලි කරගත්තා.. මේක හීනයක් නෙමේ නේද.. මම ඒක

@Shan

කළා නේද.. ඔව් ඔව් මම ඒක කළා තමයි.. මගේ වටේ පිටේ හැමතැනින්ම මගේ නම කෑගහලා කියද්දි මම හිනාවෙවීම ඇඩුවා.. මට පෙනුණා කෝච්ලා වාඩිවෙලා ඉන්න තැන මගේ කෝච් ඉඳගෙන ඉන්නවා.. එයා අන්තිම මොහොතේ මාව බලන්න ආවා.. මම හැමදාම වගේ දුවගෙන ගිහින් කෝච්ට තුරුල් වුණා.. කෝච් අඩනවා.. මාත් අඩනවා.. කෝච් මගේ පිටට දෙකතුනක් තඩිබෑවා.. මම තව ටිකක් හයියෙන් ඇඩුවා.. මගේ හිතට දැනෙන දේවල් විස්තර කරගන්න තේරෙන්නෙ නෑ දෙයියනේ.. මගේ ඇස් වලින් හෝ ගාලා කඳුළු වැටෙනවා.. හැමෝම මම පොඩි එකෙක් වගේ කෝච්ගෙ ඇඟේ එල්ලිලා අඩනවා බලාගෙන ඉන්නවා.. ඒ අස්සෙ කැමරා තොගයක් මගේ පැත්තට හැරවිලා.. ෆ්ලෑශ්ස් වදිනවා.. එහෙන් මෙහෙන්.. ලංකාවෙ හැමෝම බලාගෙන ඇති..

" අහ්-හ්හ් අනෙහ් සර්.."

" ඔයා දිනලා ඉවරයි ෂනෙරු.. සොරි.. සරනේරු..!! නැලවෙන්නැතුව කෙලින් හිටගන්නවා..!!"

"....."

" තමුන් මට ලැජ්ජ කරනවා.."

මම කෝච්ගෙන් එහාටවෙලා කෙලින් හිටගත්තා.. කෝච් කියන්නෙ තරහින් නෙමෙ.. හිනාවෙවී.. මගේ අතපයේ ඉඳලා රතු වෙලා.. අනවුන්සර්ස්ලා මට සුභපතනවා.. හැමෝම මගේ දිහා බලාගෙන බෙරිහන් දෙනවා..  මම ඔයා කියපු තැනට ගියා. මට හිතාගන්න බෑ..!!! මට හරියට පිස්සු හැදිලා කරකලා අතෑරියා වගේ.. සෑහෙන්න වෙලාවක් මම ස්ටේඩියම් එකේ හිටියා.. හැමෝම විශ් කල්ලා.. මම අනිත් අයටත් විශ් කල්ලා අපේ රටේ බැඩ්මින්ටන් කමිටි එකේ මාත් එක්ක ආපු අයත් එක්ක මම ඇතුළට ගියා.. මෙන් සින්ගල්ස් ඉවරයි.. විමෙන් සින්ගල්ස් අපිට කලින් ඉවරවුණා.. දැන් විමෙන් ඩබල්ස් ප්ලේ කරන්න පටන් ගන්නෙ.. ඒකනිසා අපි යන්න ඕන..

මම එළියට එද්දි අපේ අම්මා මාව බදාගත්තා.. එයා අඩනවා..මටත් ඇඬෙනවා.. දැන් නම් අඩාලාම ඉකිත් ගැහෙනවා.. ඉස්සෙල්ලම මම මාව සන්සුන් කරගෙන ඉන්න ඕන.. අම්මා මට සුභ පැතුවා.. ලංකාවෙ හැමෝම මම දිහාබලාගෙන ඉන්න ඇති.. එහෙම හිතද්දි මටත් පිස්සු වගේ තමා..

@Shan

ඔලිම්පික් වලදි සෙරමනීස් තුනක් තියනවා.. මුල්ම එක ඕපනින් සෙරමනි එක.. ඊළඟට මෙඩ්ල් සෙරමනි එක.. අන්තිමට ක්ලෝසින් සෙරමනි එක.. ක්ලෝසින් සෙරමනි එකේදි අපේ හැම රටක්ම නියෝජනය වෙන විදියට පැරඩ් යනවා.. ෆයර්වර්ක්ස් තියනවා.. ඒක මාර ලස්සනයි.. ඉතින් මම මෙඩ්ල් සෙරමනි එක එනකල්ම හිටියා.. එදාට තමයි ඔක්කොම ස්පෝර්ට්ස් වල මෙඩ්ල්ස් දෙන්නෙ.. දවස් තුනකට පස්සෙ ඒ සෙරමනි එක පටන්ගත්තා.. මොකද බැඩ්මින්ටන් තිබ්බෙ හුඟක් අන්තිම හරිය වෙන්න.. මෙඩ්ල් සෙරමනි එක කියන්නෙ වෙනමම එකක්..

එදාට අපේ රට නියෝජනය වෙන විදියට අපි කිට් එක අඳින්න ඕන.. ස්විමින් කරන අය විතරයි ශූස් දාන්නෙ නැතුව ඉන්න පුළුවන්.. අපි වාඩිවෙන එකේ ඉඳලම ඒකට පිළිවෙලක් තියනවා.. මුලින්ම දෙන්නෙ පාටිසිපේට් රිබන් එක.. ඒක ලැබෙන්නෙ තරඟ වලට සහභාගී වුනු හැමෝටම.. තරඟ තහනම් නොවෙච්ච අයට.. ඉන්ඩිවිජුවල් ප්ලේ කරන අය වෙනම ඉඳගන්නෙ.. ටීම් ප්ලේ කරන අය වෙනම ඉඳගන්නෙ.. දෙවනියට රිබන්ස් ලැබෙන්නෙ 1-8 වෙනකල් ප්ලේසස් ගත්ත අයට.. එයාලට රිබන් දීලා ප'සනලි විශ් කරනවා..

අන්තිමට තමයි ප්ලේසස් පෝඩියම් එකට 1, 2, 3 නඟින්නෙ..

මම අවෝර්ඩ් සෙරමනි එකේ මගේ කිට් එක ඇඳලා කොණ්ඩෙ හාෆ් පෝනිටේල් එකක් දාලා දෙපැත්තෙන් ගොතලා හෙන අමුතු හෙයාස්ටයිල් එකක් දාගෙන හිටියෙ.. මම නෙමේ දැම්මෙ.. මට මේවා හෙන මැජික් වගේ අනේ.. ජීවිතේට ඔලිම්පික් ඇවිල්ලත් නෑ.. ස්ටේඩියම් එකේ අවෝර්ඩ් සෙරමනි එකට කට්ටිය පිරිලා මිලියන ගාණක්.. ඒ මිනිස්සු චූටි චූටි කුඹි කැලි වගේ මට පේන්නෙ.. ඒ තරමට පොඩියි.. මගේ එහාපැත්තෙ ඉඳගෙන හිටියෙ චයිනා වලින් ප්ලේ කරපු සිල්වර් මෙඩ්ල් එකේ අයිතිකාරයා.. ඒකා පචපච ගගා කියවන ඒවා මට මෙලෝ මගුලක් තේරෙන්නෙ නෑ.. ඊට එහාපැත්තෙ හිටියෙ බ්‍රොන්ස් මෙඩ්ල් දෙක අයිති දෙන්නා... මට මෙහාපැත්තෙ හිටියෙ කෙල්ලෙක්.. මම සැහෙන්න වෙලා බලාගෙන හිටියා බැඩ්මින්ටන් මෙඩ්ල්ස් දෙනකල්.. ඇයි හැම ස්පෝර්ට් එකක්ම මෙකේ ප්ලේ කරනවනෙ.. සනෙරු පුතාගෙ බැංකු පොත පිරෙන්න වගේ යන්නෙ... දැන්නම් ගුච්චි බෑග් එකක් ගන්න පුළුවන් වෙයි ලක්ශ හයක් දීලා.. අපේ ආච්චිඅම්මා සතුටටම අඬ අඬ මට කතාකළේ.. මට මැච් එක වෙලෙත් ආච්චිඅම්මව මතක් වුණා.. ආච්චි බලාපොරොත්තු වුණු විදියට මම මෙක වින් කළා..

@Shan

අඩෙ මම ගෝල්ඩ් මෙඩල් එකක් ගන්නවා..!!

මතක් වෙන වෙන සැරේට මට හෙන මනමාල හිනාවක් යනවා.. සැක්.. ලැජ්ජයි.. ඒ අස්සෙ එකසැරේට ඉස්සරහා තිබ්බ තඩි ස්ක්‍රීන් එකේ මගේ මූණ වැටුණා.. මම බයවෙලා හැරිලා බලද්දි මූණට කැමරාවක් අල්ලගෙන ඉන්නවා.. මම හිනාවුණා.. කම්මුල් දෙක රෝසපාට වුණා.. මගේ එහාපැත්තෙ ඉඳපු උනුත් හිනාවෙනවා..

මුගෙ ආවචිට..

අහකට ගනින් කැමරාව.. එක අතකින් අපේ මිනිහත් බලන් ඉන්නවද දන්නෑ.. මම ශේප් එකේ ඇඟිල්ලෙ මුද්ද තිබ්බ අත පෙන්නලා තට්ටුවක් දැම්මා.. ඒකෙ හෝලික්‍රොස් එක තියන කෙනෙක් දැක්කම හිතයි මම ආගමෙ කියලා.. ඕන එකක් හිතාගත්තුදෙන්..

ඊටපස්සෙ කැමරාව ආයෙම ස්ටේජ් එකට හැරෙව්වා.. අන්තිමට මම පුන පුනා බලාසිදි මගේ රත්තරං රවුම ගන්න අවස්ථාව ආවා.. මම පොඩ්ඩක් කොණ්ඩෙ ගස්සලා මගේ හෙන ගහන්න වගේ ඇවිදින වෝක් එකෙන් ප්ලේසස් පෝඩියම් එක ගාවට ඇවිදගෙන බිමින් හිටගත්තා.. ඇඩෙන්නත් වගේ දැන්නම්.. අපේ රටේ ෆ්ලැග් එක ලොකුවටම ස්ක්‍රීන් එකක පේනවා.. අන්තිමට මාත් ඉතිහාසගත වුණා..

**''Ladies and gentlemen, please direct your attention to the stage for the awards ceremony. It is mypleasure to announce the results for men-single for the Special Olympics badminton competition..''**

**-Winning the bronze medal is  Viktor Axelsen from the Kingdom of Denmark.-Winning the bronze medal is  Tanaka Haruto from the State of Japan.**

මගේ එහාපැත්තෙන් ඉඳපු දෙන්නා ප්ලේසස් පෝඩියම් එකේ එක පැත්තකට නගිද්දි එයාලා දෙන්නගෙන රටවල් වල ඇන්තම් ප්ලේ වුණා.. ඔලිම්පික් කමිටී එකෙන් ලොකු මල් බොකේ දෙකකුයි.. බ්‍රොන්ස් මෙඩල් දෙකකුයි ඒ දෙන්නට දාලා ප'සනලි විශ් කරලා අතට අත දුන්නා.. ඒ වුණාට මෙතන වෙවුලන්නෙ මම.. අර මුළු ඇඟම ගැහෙනව වගේ හැඟීමක් එක්ක මට දාඩියත් දාලා හොඳටම..

@Shan

**-Winning the silver medal is Zhang Wei  from  People's Republic of China.**

මගේ අතින් පැත්තෙ ඉඳපු චයිනීස් කොල්ලත් ප්ලේසස් පෝඩියම් එකට නැග්ගට පස්සෙ එයාටත් ලොකු මල් බොකේ එකත් එක්ක සිල්වර් මෙඩල් එකක් දැම්මා.. එයාලගෙ නැශනල් ඇන්තම් එක මියුසික් එකක් විදියට ප්ලේ වුණා.. මේ මෙඩල් ඩිසයින් කරන්නෙ අවුරුද්දෙන් අවුරුද්දට වෙනස් විදියට.. ඇත්තම රිදී රත්තරං වලින්.. ඒවට තේරුම් තියනවා.. අන්තිමට මගේ පැත්තට කැමරා එක හැරවුණා.. දැනටමත් ස්ටේඩියම් එක බෙරිහන් දෙනවා මට ඇහෙනවා.. මගේ අත් දෙකත් වෙවුළනවා වගේ.. ඒත් මම හිනාවෙලා හිටියා..

**-Winning the gold medal is  from Varadh Shaneru Udyoga**
**from Democratic Socialist Republic of Sri Lanka.**

මම  මගේ නම කියද්දි ප්ලේසස් පෝඩියම් එකට නැග්ගා.. ගෝල්ඩ් බෙඩල් එකක් එක්ක ලොකුම ලොකු මල් බොකේ එකකුයි සෙටිෆිකේට් එකකුයි මගේ අතින් තිබුණා.. අපේ නැශනල් ඇන්තම් එක ප්ලේ වෙද්දි මම සීරුවෙන් හිටගෙන හිටියා.. ඒත් මට හයියෙන් අඬන්න ඕන වගේ.. මට හිතාගන්න බෑ.. ස්ටේඩියම් එකේ තියන ලොකුම ලොකු ස්ක්‍රීන් එකෙන් මාව පේනවා.. මම ගල් ගීලලා වගේ ඉස්සරහා බලාගෙන හිටියා.. ඇන්තම් එක ප්ලේ වුණාට පස්සෙ එහාපැත්තෙ හිටපු අය මාව හග් කළා.. විශ් කළා.. ඊටපස්සෙ ගෲප් ෆොටෝස් ගත්තා.. අපේ කෝච්ලා එක්ක.. ඉන්ඩිවිජුවල් ෆොටෝස්.. අන්තිමට මෙඩල් එක හපාගෙන ඉන්න එකකුත් ගත්තා..

සිරාම රත්තරං තමා දෙයියනේ..

**''Ladies and Gentlemen, please recognize these outstanding athletes. THANK YOU..''**

අවෝඩ් සෙරමනි එකත් තිබ්ලා ක්ලෝසින් සෙරමනි එකත් තිබ්බට පස්සෙ මම ලංකාවට ආවා.. ඔලිම්පික් නම් ආතල් වැඩේ.. ලොස් ඇන්ජලිස් වල ලොකු පාටි එකකුත් තිබුණා.. මම අපේ කෝච්ව ඇදගෙන ගිහින් නැටුවා.. නටවලා ගන්න එපැයි.. ආයෙ කෝච්ගෙන් බැනුම් අහන්න ඕනත් නෑ.. අපේ අම්මලා බාප්පලා.. සෑහෙන්න සතුටු වුණා.. මම හිටියෙ සතුටින් පිස්සු වැටිලා.. ඒත් නිතරම රධ්‍ය අයියා මතක් වෙනවා.. මට විශ්වාසයි එයානම්

@Shan

සතුටට මැරෙන්න හදනවා ඇති.. ආර්හ්!! ඉක්මනට තව මාස ටිකක් ගෙවිලා ගියානම් ඒ ප්‍රශ්ණෙත් ඉවරවෙනවා..

මම ලංකාවට එද්දි එයාපෝට් එකේ මීඩියා වලින් පිරිලා.. එතන දෙක වෙන්න සෙනඟ.. මම හිංචි පිංචි වොයිස් කට් ටිකක් දීලා හිමින් සැරේ වාහනේට නැගලා මාරු වෙලා ගෙදර එන්න ආවා.. හම්බුණු මල් තියන්න ඉඩකුත් නැති තරම්.. ආයෙම මාසෙකට පස්සෙ ලංකාවට එද්දි හරි හුරුපුරුදු හැඟීමක් දැනෙනවා.. මගේ රටනෙ.. ඒ ගතිය වෙන කොහෙන්වත් ගන්න බෑ.. මාසෙකින් මම ආරු බබාව, අවී බබාව බලන්න යන්නෙ.. මගේ වයසක මාමයි, ආධ්‍ය අයියයි, ආච්චි කෙල්ලයි.. මම ගෙදර යනක හිටියේ ඇහිලි ගැන ගැන..

අන්තිමට ගෙදරින් නතර කරපු වාහනෙන් බැහැලා ගෙදර එද්දි මිදුලෙ වාහන පිරිලා.. මට කියන්න පුලුවන්.. චමිරුවගෙයි.. ආශිලාගෙයි.. මහීශලාගෙයි.. සෙනුකයගෙයි.. තව.. ආ අපේ මාමගෙයි.. තාන්වි අක්කගෙයි.. බුදුඅම්මෝ මුළු ගම්පළාතම මගේ ගෙදරට රැස් වෙලාද.. මේක නිකන් ප්‍රජා ශාලාව වගේනෙ..

මම ලැගේජ් එකයි මත් කළබවල් තොගෙයි උස්සගෙන බැරු බැරුව ගෙදරට එද්දිම එකසැරේට මාව වහගෙන යන්නම හොඳ ස්නෝ ස්ප්‍රේ පාරක් වැදුණා.. සෙනුකයා මාව බිම පෙරළගත්තා..

මට ඉන්න දීපල්ලා!!

" මගෙ සූකිරි කැටෙ.. මිම්වහ්.. අනේ මගෙ සනෙරු සුනකිච්චා.. මිම්වහ්.. ආදරෙයි පනේ.. මිම්වහ්!! උඹ නම් ගැම්මක් තමා ෂනෙරු.. මගේකා.. අඩෝ ඔලිම්පික් දින්නා නේද.. පිස්සු හැදෙනවා හු#තො උඹ දෙන ආතල් වලට.."

" එහෙට්ට පලයන් හල්ලෝ.."

" අනේ මගේ සනෙරු මලේ.. ඔයා මාව අඩවනවා දෙයියෝ.. මම හරි ආදරෙයි මේ ළමයට.."

" ඔය දරුවට ඉන්න දීපල්ලා යකුනේ.."

" මාසයක්ම මගෙ සනෙරුමල දැක්කෙ නෑ.. අඩෝ උඹ කෙට්ටු වෙලා බං.. ඒහ්.. කකුලට මොකද වුණේ.. මෙන්න මූ අණ්ඩ කඩාගෙන.."

@Shan

කියාන් අයියා සේරම උපේක්ශාවෙන් දරාගෙන ඉඳලා අනිත් උන් එහාට කල්ලා මාව නැගිට්ටුවා.. හත්දෙයියනේ මසල් පේන් එක ඩබල් වුණාද කොහෙද.. මම කටෙයි ඇහෙයි හැමතැන්ම තියන ස්ප්‍රේ ටික පිහිදගත්තා.. ගෙදර කට්ටිය පිරිලා.. හුහකාලෙකින් අපි එකතුවෙලා ඉන්නෙ.. ඒත්.. මේ.. ඈ..???

" අ-අයුක අයියෙ!!!"

" අර බලපන්.. අපි දැන් කොනේ ඉන්නෙ.."

මම දුවගෙන දුවගෙන ගිහින් අයුක අයියගෙ ඇඟට පැන්න පාර ඒකා පුටුත් පෙරළගෙන බිම ඇදගෙන වැටුණා.. දෙයියනේ  පොඩි මස්සිනා තමා මට ලැබිච්ච හොඳම සප්‍රයිස් එක..

" බුදුඅම්මෝ මගෙ කොන්ද.. කියාන්..!!"

" තෝ අයියෙ.. නිකමටවත් කිව්වෙ නෑ එනවා කියලා.. හලු වැඩ කරන්නෙපා අයියෙ.. සාප වෙනවා මේවා.."

" අහ-කැහ්-කැහ්.. අම්මෝ වත්සල් මේකව ගනින්.. කැහ්-"

" මදැයි සප්‍රයිස් කරන ගියා.. සුදුදෝණියගෙ පොට ගියාද කොහෙද.."

මම අයුක අයියගෙ බෙල්ලෙන් හොලවගෙන හොලවගෙන ගිහින් නැගිටලා එහාටවුණා.. ඉඳපන් උඹට දෙන්න මම..

" කන්ග්‍රැජුලේශන්ස් කොල්ලො.. අඩෝ ගැම්මක් බං.. අපේ එකා විතරයි අඩු.. ඕකව දැන් නම් මොන ලෝකෙ ඉඳල හරි උස්සන් එනවා.. බඩු දැන් ලංකාවෙනෙ ඉන්නෙ.."

මගේ හිත රිදුණත් මම ඒක නොපෙන්න හිටියා.. දැන් ඔයා තනියම තීරණයක් ගන්න ඕන කාලෙ අයියෙ.. මම බලාගෙන ඉන්නවා.. මොකක්ද ඒ අන්තිමට කිව්වෙ??

" සුදුමහත්තයා.. මගෙ අම්මා.. මෙහෙ වරෙන්කො..."

මම ආච්චිඅම්මා ගාවට ගිහින් දණගහගෙන උකුළෙන් මූණ තියාගත්තා.. ආච්චි මගේ මූණම අතගාලා ලොකු හාද්දක් දුන්නා..

@Shan

" උඹට වරදින්න විදියක් නෑ.. මම දන්නවනේ.."

" ආච්චිඅම්මෙ.."

මගේ ඇස් වල කඳුළු පිරුණා.. මම නිසා මගේ වටේ ඉන්න අය සෑහෙන්න සතුටු වෙනවා..

" තුඳුපුතාගෙ රතු තුතුළා ඇවිලා.. ඩඩා ලුක්!! රතු තුතුළා.."

මේකා මගේ පටි රෝල් කරනවනෙ.. හැයියා.. මම නිකන් බහුවිධ පක්ශියා වගේ.. ලංකාවෙ ජාතික කුරුල්ලට මාව ගන්න බැරිද දන්නෙ නෑ.. වළි කුකුළා නැතුව සනෙරු කුරුල්ලා..

එහෙමත් හොඳයි.. මම ගිහින් අවිව වඩාගත්තම ඒකා ජූවුසෙම්ම කියලා මගේ මූණෙ කෙළ ගොඩක් ගෑවා.. ආධ්‍ය අයියා පපුවටත් අතක් තියාගෙන මගේ දිහා සතුටින් බලාගෙන ඉන්නවා.. ඒත් ඒ ඇස්වලින් තව දුකකුත් පේනවා.. මම දන්නවා.. එයා නැති අඩුව සෑහෙන්න දැනෙනවා.. අනේ තව ටිකම ටිකයි.. ඒ පොඩ්ඩ අල්ලගෙනම ඉන්න වෙනවා අයියෙ.. නැත්නම් මේ කළ දේවල් වලිනුත් වැඩක් නෑ..

" තුති තාත්ති වදා.."

ආරුත් වැටි වැටි ඇවිත් මගේ කලිසමේ එල්ලුනාම මම එයාවත් වඩාගත්තා.. මහින්ද මහත්තයා වගේ දැන්නම්.. ළමයිම වඩාගෙන.. එයත් බලන් ඉන්න ඇති මම බැඩ්මින්ටන් ගහනවා..

දෙයියනේ..!!

" අඩෝ කමු බං.. උඹ එනකල් මේ බලාගෙන හිටියෙ කන්න.. අද ආධ්‍ය-මහීසා ස්පෙසල් කෑමවේලක් හදලා තියෙන්නෙ.. අයුක අයියත් ආවනෙ.."

සෙනුක අයුක අයියා දිහා බලලා මනමාල හිනාවක් දැම්මම කියාන් අයියා අයුක අයියව බදාගත්තා.. බලන් ඉඳපන් සෙනුක මූ ඉන්නකල් උඹේ මිනිහා උඹේ වෙන්නෙ නෑ..

" මගෙ සුදුදෝණියට අද කවන්නෙ සුදුඅප්පච්චියාමයි.."

" ඔය මනුස්සයට ඉන්න දීපන් මිනිහෝ.. බලන්න අනේ මෙයා එක්ක බෑ.."

@Shan

" කන්න එන්න ළමයි.. අපෝ ආයෙම දැන් ඉතින් මුළ ඉඳලා රණ්ඩු බේරපන්කො.."

" ආඪ්‍ය සුබසහන සේවාව.. පව්ල අවුල්නම් අවුල ලිහාගන්න අඳම පැමිණෙන්න..!!!"

" අඩෝ අඩෝ මාමට කේන්තියයි හොදේ.. දැන් ඉස්සර වගේ බෑ.. දෙදරු පියෙක්නෙ අයියණ්ඩි.. අයුක අයියේ ඔයා සුදුවෙලා හලෝ.."

" පාඩුවෙ ඉඳපන්.."

මාත් කියාන් අයියව අහකට තල්ලු කල්ලා සෙනුකයා එක්ක ගිහින් අයුක අයියගෙ කරට අතක් දාගත්තා.. සාලෙ හිටපු සේරම වගේ කුස්සියෙයි කෑම කාමරෙයි පිරුණා..

" මෙකා මටවත් කිව්වෙ නෑ බං.. පෙරේදා මම ගෙදර ඇවිත්, රෙදි වැලේ රෙදි වන වන ඉද්දි.. මෙන්න බොලේ වම්රුවා එක්ක එනවා.. තා පොඩ්ඩෙන් පනිට්ටුව පැටලිලා වැටිලා මැරිලා යනවා.."

" අඩෝ නෑ.. අයුක අයියා මාර සප්‍රයිස්නෙ දෙන්නෙ.."

" එහාට පලයන්කො ඇහේ එල්ලෙන්නෙ.."

" ඇහේ එල්ලෙන්නෙ නැතුව කරේ එල්ලෙන්නද කියන්නෙ.. කරේ එල්ලුණේ සෙනුක.. අපි ඇවිත් එල්ලෙන්නෙ ඇහේ.."

" අඩෝ සනෙරුමල චොක්ලට්ටුත් ගෙනැල්ලා.. පෞකාරයාට දියවැඩියාව හැදෙයි රත්තරනේ.."

" මේ පෞකාරයා මධුමේහයට බෙහෙත් දන්නවා මගෙ පෞකාරයෝ.. මෙට්ෆොමීන් එකක් ගහලා අරිමු.."

අයුක අයියා අපි දෙන්නගෙ අත් දෙක ගසලා දැම්මා..

" මේ මොන කෝලමක්ද.. කියාන්!!!!!"

සුදුදෝණියා අපිට ගස්සලා පද්ද පද්ද යන්න ගත්තා.. සෙනුකයා මගේ කනට ළං වුණා..

@Shan

" අප්පච්චි ලංකාවට ඇවිල්ලා ෂනෙරුවා.."

මගේ ඇස් දෙක ලොකු වුණා.. වැඩ හරි වගේ.. පුදුම සතුටක් දැනෙන්නෙ.. ඒකද එහෙනම් බඩු කිව්වෙ..??

" රධ්‍ය අයියා ඉක්මනට ඒවි.. මට සතුටුයි බං.. අපි ආයෙම අවුරුදු ගාණකට පස්සෙ එකට ඉන්නවා.. පිස්සු හැදෙයි.. අඩෝ!!"

" කෑගහන්නෙපා පගො.."

පපර පප්ප පා............ නරක සමනලයා ආවෝ..

ඔය දරුවොත් මල් එවන්න අනේ.. උඹලගෙ අයියව එක්කන් එන්න ළඟයි.. දැන් ආයෙ වැළපෙමු මිතුර..

අයුක පැන් බෙසම.. ආ යූ හැපිර්ර්ර්ර්!!!!!!!!!!

එන්නාම්.. ලව් යූ.. ❤

ඩබල් අප්ටේටු දුන්නා.. ඒකනිසා ආයෙම සෑහ්..

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම් පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 163 කොටස

" මම කිරිල්ලියක් තමයී.. මේහ්.. මගේ පිහාටු~~~"

" ඔකෙන් එළියට වරෙන් ෂනෙරු.."

" ඉදහ-හුක් මෙන්න මාව හිරවෙලා.. අඩෝ සෙනුකයා.. ආගි!! අඩෝ ගස් දෙබලේ හිරවෙලා.. අඩේ වරෙන්කෝ.. මහීශාආආආආආආආආආ"

" මේ පිස්සු හු#තට පදක්කමෙන් දෙන්න හිතයි දැන්.. මගේ අත අල්ලගනින්.."

මහීශා මල් කළඹ එක අතකින් උස්සගෙන අනිත් අතින් සාරිය උස්සගෙන ගහට කකුලක් තියලා දෙබළේ හිරවෙලා හිටිය මාව ඇද්දා.. මාව ගිහින් තව ටිකක් දෙබළ මැද්දෙ හිරවුණාම ආගිත් මල් කළඹ පද්ද පද්ද එතෙන්ට ආවා..

" කැදැල්ලෙ ඇතිවූ කිරිල්ලී වගේ..

දෙමාපියන් සෙවනේ..

ඌප්ස් අනේ මේ මොකද මේ.."

" මෙන්න මේ පගා දෙබළෙ හිරවෙලා.. ඇදපන් බං.."

ආගි මල් කළඹ සෙනුකයගෙ ඇගේ ගහලා මාව අනිත් අතින් ඇද්ද පාරට මම උන් දෙන්නවත් පෙරළගෙන තණකොළ ගොඩේ ඇදගෙන වැටුණා.. මල් පොකුරු උඩින් විසික් වුණා.. සැකේයියා.. අසමජ්ජාති අරලිය ගස් දෙබළෙ.. මගේ සායම හේදුවා..

" අයියෝ බං නටන්නැතුව ඉදපල්ලකො.. ලැජ්ජයි උඹලා එක්ක තැනකට යන්න.."

සෙනුකයා උඩින් ගිය මල් පොකුරු දෙකත් උස්සගෙන ඇවිත් මාව ඇහින්දා.. අරුන් දෙන්නගෙ සාරි දෙක කැළේ.. අනාගත දොස්තරලා හතරදෙනෙක් නේද මේ තිරිසන්නු වගේ හැසිරෙන්නෙ.. මම ඇගේ තිබ්බ

@Shan

තණකොළ එක දෙක ගසලා තද කොළපාට බ්ලෙසර් එක ගසලා බෝ එක හදාගත්තා..

අද අපේ චමිරු ලොකු අයියණ්ඩියගෙ විවාහ උත්සවෙ..

මම තමයි මනමාල යාලුවා.. සෙනුකත් මනමාල යාලුවා.. අනිත් උන් දෙන්නා මනමාලි යාලුවො.. මනමාල නංගි සම්පූර්ණෙන්ම ලංකාවෙ කෙල්ලෙක් නෙමේ.. එයාගෙ බාගයක් ඇමරිකන්.. අනිත් බාගෙ ලංකාවෙ.. ඉතින් අපි එක්ක එයා හෙන ෆිට්.. චමිරුවගෙ ලිලී මල..

එයාගෙ නම ලිලී..

අපිට වඩා අවුරුද්දක් ලිලී බාලයි.. හරිම ලස්සන ගෑණුළමයෙක්.. ඒ වගේම ලාමකයි.. හැමතිස්සෙම චමිරුගෙ අත අස්සෙ රිංගගෙන බයෙන් අපි එක්ක කතාකරන්නෙ.. මොකද අපි ගාව ඉන්න කෙල්ලො දෙන්නම ටිං බෙලෙක්ක දෙක වගේ විලාප තියනවනෙ.. එයාට මෙහේ ඒ තරමම හුරු නෑ.. කොහොම වුණත් චමිරු ලිලීට පොඩ්ඩක්වත් සැරෙන් කතාකරන්නෙ නෑ.. උගේ ඇස් දෙක ස්පාර්ක් වෙනවා ලිලීගෙ නම ඇහුවත්..

කම්පෙයා කරන එක හොඳ නෑ තමයි ඒත් චමිරු තරුවිට නම් ඔහොම සලකුවෙ නෑ.. මගේ හිතට පුදුම නිදහසක් දනෙනවා චමිරුගෙ සතුට දැකලා.. ඒ දෙන්නගෙ මැරේජ් එක සීයගෙන් ආපු ප්‍රපෝසල් එකක් වුණාට දෙන්නා කතාබහ කල්ලා අඳුරගෙන ආදරේ කරන්න අරගෙන තියෙන්නෙ.. චමිරු මට bachelor party එකේදි කිව්වෙ ඌ හිතුවේ නැහැල්ලු ආයෙම හිතේ ආදරේ කියන හැඟීම ඇතිවෙයි කියලා.. ඒත් ලිලීව දැක්කම හිතුණෙ ඊටවඩා වෙනස් හැඟීමක්ලු.. කොහොමත් චමිරුට ගැළපෙනම ටයිප් එකේ කෙල්ල තමා හම්බෙලා තියෙන්නෙ.. උන් දෙන්නා  ඔරුවක ඉඳන් ෆොටෝ ගහනකල් අපි මෙහේ ගස් අස්සෙ රිංග රිංග හිටියා.. මල් කුමාරයයි මල් කුමාරියි මොන ලෝකෙ ගියාද දන්නෑ.. මලහත්තිලව්වයි..

" අඩෝ කෝ අර පොඩි එකා.."

" අම්මා ගාව බං.."

මහීශා තද කොළපාට සාරියෙ පොට අරගෙන ඔලුවට දාගත්තා.. දැන් බලන්න එපැයි කෙල්ලගෙ ලස්සන.. කොණ්ඩෙ වවලා.. ඇඟ හදාගෙන.. උයන්න පුරුදු වෙලා.. කාටද ඉතින් ආඩම්බර.. ධනුජ අයියට තමා..

@Shan

" කළුත් වෙනවා මගුල.. අපිත් බඳින්නෙපෑ බං.. නැද්ද මං අහන්නෙ.."

" මම නම් අනේ දැන්ම බඳින්නෙ නෑ.. බැඳලා කරන්න දේ-ක්ක්ක්මමමමමමමහ්හ්හ්හ්!!!"

සෙනුකයා ආශිගෙ කට දෙපැත්තෙන් අල්ලගත්තා..

" ඔය කට වහගනින්..!!"

" ඇත්තනෙ කියන්නෙ.. බොරුකියන්න ඕන නෑ අනේ මමනම් පෝරුවෙ කලන්තෙ දාලා වැටෙයිද දන්නෑ.. අපෙ නෑදෑ වෙන නැන්දෙක් කිව්වනෙ අපි නෑහැදිච්චකමට ලිවින්ටුගෙදර් ඉන්නෙ කියලා.."

ආශි මල් බොකියත් බදාගෙන වාඩිවුණා.. කකුල් රිදෙනවා තමා ෆොටෝ වලටම උදේ ඉඳලා හිටගෙන.. මේ යකා ඔරු පදින්න ගිහින් තාම නෑ.. මාළු අල්ලනවද මන්දා.. මම ඈත කැමරමන් අයියා දිහා බලද්දි ඒකා බිම වැතිරිලා ෆොටෝ එකක් ගන්නවා.. චමිරුවා ලිලීගෙ දිගම දිග සුදුපාට ඔසරිපොටත් උස්සගෙන ඒකිගෙ පස්සෙන් යනවා..

" ඇන්ටිට- මම කියන්නෑ.. හු#ත.."

" අපේ ගෙදර මිනිහා ඇවිල්ලා බං.. මට තැනක් නැතිවෙලා තියෙන්නෙ.. අපේ අම්මා ලොකු පුතේ හැයිහැයි ගාගෙන ඒකා පස්සෙන්මයි යන්නෙ.."

" අයුක අයියා වශියක්වත් ගොඩදාලද.."

" කියන්න බෑ බං.."

අපේ සෙනුකයගෙ ගෙදර තමා මේ දවස්වල අයුක අයියා වැඩිපුරම කල් ගතකරන්නෙ.. අයුක අයියා ඉන්නෙ පුදුම සතුටෙන්.. නැන්දම්මයි මාමයි කියන්න බැරි තරමට එහේ ගෙදර අයට අයුක අයියා ළඟයි.. සෙනුකයා ඉබේම කැපිලා ගිහින්.. අපි ෆයිනල් එක්සෑම් ලිව්වා.. ඒකනිසා සෙනුකයත් මේ ටිකේ කොළඹ ඇවිල්ලා ඉන්නෙ.. සෙනුකයට ඉතින් පට්ටහැපී.. ඇයි දෙයියනේ මිනිහව හැබහින් දකින්නෙ කොයි කාලෙකට පස්සෙද.. අවුරුදු පහකට පස්සෙ.. හැබැයි ඉතින් මෙහෙන් යද්දි හිටපු උන් දෙන්නම තමා තවම ඉන්නෙ.. අපේ එකා අයුක අයියට කිරි එක්ක හදලා දෙනවා.. ඉස්තෝප්පුවෙන් වාඩිවෙලා බිස්කට් එකක් කඩාගන්නවා.. ආයෙ ඉතින්

@Shan

අහස කඩාගෙන වැටුණත් උන් දෙන්නට නෙමෙ වගක්.. සෙනුකයා උගේ කැම්පස් එකේ විස්තර අයුක අයියටට කියනවා.. අයුක අයියා එහේ විස්තර මූට කියනවා.. ගිය සතියෙ දෙන්නම ගෙවල් බලන්න ඇවිද්දා සැහෙන්න.. ඊටපස්සෙ යන්තම් හිතට අල්ලන තැනක් හම්බෙලා තිබුණා.. ඉක්මනටම ඒකෙ පේපර් වර්ක් ඉවරකරගෙන දෙන්නා පදිංචියට යන්න ඉන්නෙ..

අප්පච්චි පරණ කොට්ටාවෙ ගෙදර ඉන්නවා කියලා කියාන් අයියා කිව්වා.. මෙ දවස්වල මගේ වටේ සැහෙන්න දේවල් වෙනවා.. හොඳයි..!! ගිය සතියෙ මම කිසිම හේතුවක් නැතුව ඇක්සිඩන්ට් වෙන්න ගියා.. මගේ කාර් එකේ බ්‍රේක් වැඩනැතුව.. වෙලාවට අයුක අයියා ඉඳලා එයාට අවුලක් තේරිලා ඒක බැලුවෙ නැත්නම් සනෙරු වලපල්ලෙ තමා.. මම යන වේගෙට එකසැරේ බ්‍රේක් වැඩ නැතිවුණොත් ආයෙ ඉතින්..

ඒක  ගැන කතාකල්ලා වැඩක් නෑ..

අනිත් එක හොස්පිටල් එකේදි මට අමුතු කෝල්ස් එනවා.. පරිස්සම් වෙලා ඉන්න කියලා මැසේජ් එනවා.. පරිස්සම් වෙලා තමයි පගෝ ඉන්නෙ.. නැත්නම් මෙහෙම ජීවත් වෙන බෑනෙ.. අනිත් ආතල්ම වැඩේ තමා මගෙයි රධ්‍ය අයියගෙයි ෆොටෝස් වගයක් මට සෙන්ඩ් කල්ලා තිබුණ එක.. ඒකෙ කිසිම තැනක රධ්‍ය අයියගෙ මූණ පේන්නෙ නෑ.. මම ඉතින් වෙන මිනිස්සු එක්ක ඉඳලා නෑනෙ.. එකක් පාකින් ලොට් එකක ගත්තු ෆොටෝ වගයක්.. මම හිතන්නෙ අපි පළවෙනිම ඩේට් එක ගියපු දවසෙ.. අනික බැරාකුඩා එක ලඟ බීච් ක්ලබ් එකේ.. අනිත් එක.. හොඳම එක.. මමයි රධ්‍ය අයියයි ගමේ ගිහින් බීච් යමු කියලා නතරවෙලා හිටිය හොටෙල් රූම් එක ඇතුළෙ.. අතිශය පෞද්ගලික ෆොටෝස් වගයක් ඒ නම්.. ඔක ලීක් වුණොත් නම් මට හොඳ මඩපාරවල් ටිකක් කන්න වෙනවා.. මම දන්නවා.. අනික දැන් මාව නොදන්න කෙනෙක් නෑ.. වෙන්න පුළුවන් නරකම දේවල් වලින් පලවෙනි එක තමා ඔක.. රධ්‍ය අයියට ප්‍රශ්නයක් වෙන්නෙ නෑ.. මොකද එකකවත් එයා පැහැදිලිව පේන්න නෑ.. කෙලින්ම මට තමා ඇඟිල්ල දික් වෙන්නෙ මම එක එක මිනිස්සු එක්ක හොටෙල් වල නිදාගත්තා කියලා..

මට හිතාගන්න පුළුවන් රධ්‍ය අයියා මේ අවුරුදු ගාණටම මට කිසිම තොරතුරක් ඇහෙව්වෙ නැති හේතුව.. මේ මනුස්සයා ඉක්මනට මගේ මූණ ඉස්සරහට එනකල් මට කිසිම දෙයක් කරගන්න බැරි එකනෙ කරුමෙ.. මෙයා මෙහේ කියන්න රධ්‍ය අයියා ඉන්නෙ එහේ වෙන්න ඕන.. අසලි

@Shan

අම්මත් ඇති.. මගේ වාසියකට තියන එකම දේ එයා හැංගි හොරා දෙයක් කරනවා මිසක් මගේ කිට්ටුවට ලං වෙන්න විදියක් නැති එක..

මට විතරක් නෙමෙයි මේ ප්‍රශ්නෙ තියෙන්නෙ.. ආධ්‍ය අයියත් මේවට මූණ දෙනවා.. දවසක් ආධ්‍ය අයියා මාත් එක්ක ආරු බබාට බෙහෙත් විදින්න හොස්පිටල් ගියා.. එතකොට කවුරුහරි අපේ ලඟින් යනගමන් රස්නෙම රස්නෙ කෝපි එකක් ආධ්‍ය අයියගෙ ඇඟට හැළුවා.. මම ආරු බබාව ඇදලා ගත්තෙ නැත්නම් පොඩි එකාගෙ මූණ පිච්චිලා යනවා.. මම එදා වගේනම් කවමදාවත් බය වුණේ නෑ.. දෙයියනේ මාව මැරෙයි.. ආරු බබාට මොකක් හරි වුණානම්.. හැබැයි අපේ මාමට මේවගෙන් කිසිම ප්‍රශ්නයක් නෑ.. පුදුමයි ඒකනම්.. ආධ්‍ය අයියටයි මටයි විතරමයි මේ ප්‍රශ්න වෙන්නෙ.. හරිනම් මේ දවස්වල එළියටවත් බහින්න හොඳ නෑ.. මම මේ ඇවිත් හිටියට.. චමිරු ගාවනම් බය වෙන්න දෙයක් නෑ.. කොහොමත් ඌට බොඩිගාඩ්ස්ලා ඉන්න නිසා.. මට තියන ලොකුම බය මම නිසා මගේ වටේ ඉන්න අනතුරක් කරගනී කියන එක.. එදා කාර් එකේ අයුක අයියයි ආශියි දෙන්නම හිටියා.. මොකක් හරි වුණානම් කීදෙනෙක් විඳවාවිද..

මටනම් දැන් හොඳටම තේරෙනවා මේක මොකක් හරි මානසික ආබාධයක් කියලා.. මොකද හැමෝම හැසිරෙන විදියක් තියනවා.. මේ කරන කෙනා එක දේකට බයයි..

අප්පච්චිගෙ එකම දුර්වලකම.. රධ්‍ය අයියා..

එයා ඒ වෙනුවෙන් ඕනම දෙයක් කරනවා.. එතනින් පස්සට දෙයක් ගැන දැනගන්න නම් මානසික රෝහලකට ඇතුළත් කරන්න වෙනවා.. මම දැනට ගෙස් කරගෙන ඉන්නවා.. එයා එන දවස හරියටම කවද්ද කියලා.. ඒත් ඒ වෙලාවෙ කරන්න ඕන මොකක්ද කියලා හරියටම මට අයිඩියා එක්ක නෑ.. හිතුණු දේ කරනවා.. මේක චමිරුලාට කියන්න තිබුණා.. ඒත් වෙනකෙනෙක් දැනගෙන අප්පච්චිව ෆලෝ කරනවා කියලා දැනුණොත් අර ෆොටෝස් ටික විනාඩියකින් සෝශල් මීඩියා වල ශෙයාවේවි.. ලංකාව ඔවට සෑහෙන්න ඉන්ටරෙස්ටින්.. ඒක ගැන මම කියන්න ඕන නැනෙ..

මම අන්න ඒකට සෑහෙන්න බයයි.. මොකද මම අවුරුදු ගාණක් සෑහෙන්න කැපකිරීම් ගොඩක් කල්ලා හදාගත්ත නම.. ඒ වගේ දෙයක් වෙලා විනාස වෙනවා කියන්නෙ.. කවදාහරි මම රධ්‍ය අයියව බඳිනවනම් මම බය නැතුව

@Shan

ඒක ලෝකෙටම කියනවා.. ඒත් ලීක් වෙන එක.. ඒකත් අපි අතරෙ විතරක් තියෙන්නෙ ඕන ෆොටෝස්..!!!

ඒවා අපි ගහපුවානම් කමක් නෑ.. මට ඔය හොටෙල් එකේ ෆොටෝස් ගැනනම් සැකයි.. එදා කාමරේට ආපු රූම්බෝයි..

හැබැයි මම රධ්‍ය අයියා මොන වගේ කෙනෙක්ද කියලා සෑහෙන්න හින්ටස් ගොඩක් තැන තැන තියලා ගිහින් තියනවා.. අප්පච්චි සේරම හොයාගෙන මම එන්නෙ මොකාටද කියලා දැනගත්තොත් මගේ ඉස්සරහට ඒවි.. මට ආධ්‍ය අයියා ගැන බයයි.. එයා බබාලා දෙන්නෙක් ඉන්න තාත්තා කෙනෙක්.. ජීවිතේ පරිස්සම් කරගන්න ඕන.. හොඳවෙලාවට මේ දවස්වල මාමා වැඩිය ආධ්‍ය අයියට එළියට යන්න දෙන්නෙ නෑ.. මාමා මෝඩයෙක් නෙමේ.. එයා දන්නවා අපි හැරෙද්දි.. අනික ආච්චිත් දැන් ඉන්නෙ මං ගාව නෙමේ.. ආධ්‍ය අයියලා එක්ක.. ආධ්‍ය අයියලා අපාර්ට්මන්ට් එකෙන් මූව් අවුට් වෙලා ළඟදි කුරුඳුවත්තෙන් අලුතින් ගෙයක් ගත්තා.. මොකද බබාලට සෙල්ලම් කරන්නවත් අරකෙ ඉඩක් නෑ කියලා.. ඇත්ත තමා.. ඉතින් මම මේ දවස්වල ඉහට උඩින් වැඩ ගොඩගහන් ඉන්න නිසා මාමා ආච්චිව වෙනම කාමරයක් ලෑස්ති කරලා ඕන හැමදේම තියලා ආච්චිට පහසු විදියට ඒකෙන් රෙස්ට් එකේ ඉන්න ඉඩ ඇරියා.. කොහොමත් මගේ ගෙදර ළඟදි භාරදෙන්න ඕන.. අලුතින් ගෙයක් බලන්න ඕන..

තරුණ කාලෙ අවුරුදු විසි ගණන් ඉවරවෙද්දි මනුස්සයො ඉන්න පුදුම පීඩනේක.. ඇත්ත තමා.. ඒ අස්සෙ මගේ ෆයිනල් ඉවරනිසා ලොකු අම්මලා බල කරනවා රධ්‍ය අයියගෙ අම්මලා එක්ක කතාකරන්න ඕන කියලා.. මම තාම දාහක් බොරු කියලා ඒක පරක්කු කරන්නෙ..

" මල්ලි.. ඔය නංගිව ඉන වටේ අතක් යවලා පොඩ්ඩක් මෙහෙම ඇල කරන්න.."

මම ආශිව ඇල කල්ලා අල්ලගත්තා.. ඒ වුණාට මූණ බලද්දි හිනායනවනෙ පුතේ.. ආශි මගේ මූණ දිහා බලාගෙන ඉඳලා හිනාවෙලා හිනාවෙලා චමිරුවගෙ ඇඟට හේත්තුවෙලා ආයෙම හිනාවෙගෙන එහෙමම බිමට වැටුණා.. කැමරමන් අයියත් හිනාවෙනවා.. මෙතන සේරම ගුලි කාලා වගේ හිනාවෙනවා.. සැක්..

" අඩෝ මල්ලි.. හිනාවෙන්නෙපා බං.."

@Shan

" මෙකිගෙ මූණ දැක්කම හිනායනවා ඔයි.. හරි හරි එල.. ඌ.. හිනායන්නෙ නෑ ඒස්වාහ පුහ්.."

මම ආයෙම ආශිව ඇලකල්ලා අල්ලගත්තා.. චමිරුත් ලිලීව එක අතකට වට්ටගෙන ඇල කල්ලා අල්ලගත්තා.. මහීශාත් සෙනුකයගෙ කර වටේ අතක් දාගෙන ඇල වෙලා ඉන්නවා.. මෙවා මිනිස්සුන්ට පෙන්නුවොත් හුස්ම හිර වෙලා මැරෙයිද දන්නෑ.. කියාන් අයියා මාව රෝල් කල්ලා රගර් ගහන්න ගනීද.. නැනෙ.. නෑ නෑ.. එහෙම වුණොත් සුදුඅම්මියව දීලා ශේප්මන්ට් එකක් දාගන්නවා..

" දැන් ඔය නංගිව වඩාගන්න මල්ලි.."

සෙනුකයගෙ කට දණහිස ගාවටම ඇරුණා.. මහීශව සෙනුක වඩාගෙන..!!?? අනේ මාමෙ.. මෙකනම් බලන්නම වටිනවා.. දවසක් සෙනුකයා හතේදි මහීශා විල්බැරක්කෙ තියාගෙන පදින්න ගිහින් මෙකිව කුණුගොඩකට අතැරියා.. තාම මතකද දන්නෑ..

" සනෙරුමලට මාව බරක්ද අනේ.."

" පිස්සුද මේ පෞකාරයට ඔයා බරක් නෙමෙයි කෙල්ලෙ.."

මම ආශිව අත් දෙකට උස්සගත්තා.. මෙකි නොකා ඉන්න නිසා හොදයි. කොහොමද නිකම් කමනි ඇන්ටිගෙ දුව වගේ වඩාගන්න වුණොත්.. මෙතෙන්ට දොබකරයක් ගේන්න වෙනවා..

" හල්ලො මාව වැට්ටුවොත්නම් උඹ කනවා.."

" කටපියන් ඉදපන්කො.. රෙද්ද.."

සෙනුකයා මහීශව අත් දෙකට උස්සගත්තම එක අයිය කෙනෙක් ඇවිත් මනමාලිගෙයි අනිත් උන් දෙන්නගෙයි සාරි පොටවල් හදලා ගියා..

" දැන් මල් පොකුරු ටික උඩ දාන්න.. ආ නයිස් ශොට්..!!"

" ඉවරද බං.."

චමිරුවා පේපර් සර්වියට් එකක් අරගෙන දාඩිය පිහාගත්තා.. උගට ලිලීගෙ සාරිපොට උස්සගෙන ගිහිල්ලම හති වගේ..

@Shan

" අඩෝ අපේ මිනිහගෙන් අහන්න ඕන ෆොටෝශූට් මොකුත් නැතුව හදපානෙ පැනලා යන්න බැරිද කියලා.."

" අහපන්.. හමෝ ලිලී මම බැහ්.."

චමිරුවා අර කොට ලිලීගෙ උරහිසට අතක් තියලා ඇගේ සේරම බර දුන්නම ලිලී ගස්සලා උගේ ඇඟ අස්සටම වුණා.. මනමාලිගෙ බෙල්ල ගහලා යනවා මාල සීයක් විතර එල්ලගෙන ඉඳලා.. සිරාවට කෙල්ලො හෙන පව්නෙ.. මම ලිලී ගාවට කිට්ටු වෙලා දිගම මාලෙ අරගෙන බැලුවා.. මොනවගෙන්ද දන්නෑ මෙව්වා හදලා තියෙන්නෙ.. අගස්ති මාල වල ඇට වලට දාන්නෙ මොනවද..

" දැන් දෙවෙනි මනමාලයො දෙන්නයි මනමාලයයි එන්නකො.. ඔය මල්ලි මෙයාට රහසක් කියනවා වගේ.. අනිත් මල්ලි රැන්ඩම් ශොට් එකකට හිනාවෙන්න.. ආ හරි.. අන්න එහෙම.."

සෙනුකයා චමිරුවා බදාගෙන වෙලාගෙන ඌට කනට කල්ලා හොඳ කුණුහර්ප කතාවක් කිව්වම චමිරු තොල හපාගෙන හෙන අමාරුවෙන් ඉවසගෙන හිටියා.. මමත් හිනාවුණා.. ඔහොම එක එක විදියට ෆොටෝ හැටහුටහමාරක් විතර ගහලා අපි taj samudra එකට යද්දි දහයට විතර ඇති.. චාරිත්‍ර තිබ්බෙ දහය හමාර පහුවෙලා.. ටාජ් එකේ ක්‍රිස්ටල් බෝල්‍රූම් හෝල් එක තමා වෙඩින් එකට ඇස්ති කරලා තිබුණේ.. අපි යද්දි අයුක අයියයි, කියාන් අයියයි ධනුජ අයියයි වාඩිවෙලා කියව කියව ඉන්නවා.. අපි දැකලා අත වැනුවා.. වෙඩින් එකට හෙනට පාර්ලිමන්ට් එකේ මිනිස්ටර්ස්ලා ඇවිත් තිබුණා වයිෆ්ලා එක්ක.. තව අපේ ඉස්කෝලෙ, ෆැකල්ටියෙ කිට්ටුම උන්.. හැමෝම වගේ හම්බුණා.. ලොකු අයියගෙ අලි ඔලුවනෙ ඉතින්.. යාළුවොන්ට ඉන්නෙ අපි තමා.. ඒකනෙ මේ යාළු මනමාලයොන්ට ඇඳගෙන නැට්ට වගේ පස්සෙන් පන්නන්නෙ.. දෙයියනේ කියලා දෙවනි මනමාලියො අපේම උන් වුණේ.. නැත්නම් උස්සපන්කො නොදන්න අක්කලව.. අනේ මේ අපිනම් ඕවට ආස නෑ..

අයුක අයියව දැන් පවුලෙන් බැහැර කරපු එකෙක් වශයෙන් කිසිම පවුල එක්ක සම්බන්ධතා නෑ.. කවුරුත් අයුක අයියගෙයි චමිරුගෙයි සහෝදරකමට උදැල්ල දාන්න එන්නෙත් නෑ. සීයට ඕන කෙනා හම්බුණානෙ.. අයුක කියනෙ ඒ පවුලෙන් නිශ්පාදන දෝශයක් වෙලා

@Shan

එළියට දාපු එකෙක් විතරයි.. තියා අයියගෙ තාත්තවත් අයුක අයියව මූණට දැකලා හිනාවුණේවත් නෑ.. ඕනත් නෑ මමනම් කියන්නෙ..

අන්තිමට පෝරුවේ චාරිත්‍ර තියලා පැය ගාණක් අශ්ටක කිව්වා.. මනමාලි අපේ එකාට වැඳලා, ඇඟිලිවල නූල් බැඳලා, අත පැන් වක්කල්ලා, බෙර ගහලා කරන්න ඕන සේරම කල්ලා දෙයියනේ කියලා උන් දෙන්නා පෝරුවෙන් බැස්සා.. එතකල් මමයි, සෙනුකයි පෝරුවෙ පැත්තකින් හිටගෙන හිටියා.. චමිරුවා බයවෙලාද කොහෙද.. පව් අඩෙ.. කමක් නෑ ජීවිතේටම මේකට නගින්නෙ එකපාරනෙ..

චමිරුට මුද්ද දුන්නෙ මගේ අතින්මයි.. ඌ ඒක ගන්නකොට මාත් එක්ක හිනාවුණා.. මම මුළු හිතින්ම ප්‍රාර්ථනා කළා ඒ දෙන්නා සතුටින් ඉන්න ඕනමයි කියලා.. අනිවාරෙන්ම චමිරු හුඟක් ආදරණීය මනුස්සයෙක්.. ලිලී වාසනාවන්තයි.. ඒ අස්සෙ සෙනුකයා ටැප් එක ඇරගත්තා.. පස්සෙ ඌවත් නලවලා අයුක අයියට බාරදීලා මම කියාන් අයියට හේත්තුවක් දාගෙන කියව කියව හිටියා.. චමිරුලා ඇඳුම් මාරු කරන්න ගියා..

හවස් වෙලා හෙන පාටි එක.. මමයි සෙනුකයි බ්ලෙසර් අයින් කල්ලා වෙස්ට් කෝට් දෙකක් දාගෙන වෙන ශර්ට් දෙකක් ඇඳගත්තා.. අන්තිමට සෙනුකයා බීලා මාවත් ඇදගෙන පෝරුවට නැගලා.. කියාන් අයියා අපේ අත් දෙක බැඳලා ඒකට බියර් හාලා අයුක අයියට කියලා පෝරුවෙන් බස්සගෙන.. හෙන පිස්සුවක් නැටුවා.. ආශිටත් හොඳට වෙරි.. සාරි කැලේ.. හෙන කාලෙකින් අපි හැමෝම පිස්සු කෙළීයෙ.. අයුක අයියත් බීලා වැනි වැනි කියාන් අයියව අල්ලගෙන වත්සල් ගගා නැටුවා.. මමත් සෙනුකයව බදාගෙන නැටුවා.. ඊටපස්සෙ මිනිස්සු මාරුවෙලා.. එක පිස්සුවක් වුණා.. බැහැයි ආතල් වෙඩිම.. ඩාන්ස්ෆ්ලෝ එක අපේම උන් එකතුවෙලා දෙක කළා.. දෙයියනේ කියලා මාව එක්කගෙන යන්න මාමා ආවා.. මාමා මාව වාහනේ දාගෙන එහේ ගෙදර ගෙනිහින් ඇඳෙන් තියනවා විතරයි යන්තම් මතක.. ආධ්‍ය අයියා ඇවිල්ලා මගේ ශර්ට් එක මාරු කළා.. මමත් වෙරිකාරයා වෙලා සෑහෙන්න කියෙව්වා.. හුඟක්ම රධ්‍ය අයියා ගැන.. නන්ස්ටොප් කියවෙන්න ගන්නවා..

කොහොම හරි ලිලී විසික් කරපු මල් බොකේ එක මහීශා අල්ලගත්තා.. ඊළඟට ඒකි තමා.. චමිරු මගේකා.. හැමදාම සතුටින් ඉන්න ඕන එච්චරයි.. ඌට මම බොක්කෙන්ම ආදරෙයි..

@Shan

නරක සමනලයා ආවා.. ඊළඟ එක ලියනකල් ඉවසිල්ලක් නෑ දෙයියෝ..

වෙඩිමට ආවා නේතෙ.. කන්නෝන බොන්නෝන ආතල් එකේ ඉන්නෝන

නැද්ද.. ඒකනෙ.. ගැම්මක් තමා..

හැමදාම ජීවිතේ එකම තැන නතර වෙන්න ඕන නෑ.. අපි ඉස්සරහට යන්න ඕන.. මම හැමතිස්සෙම ඒක විශ්වාස කරනවා.. හරියට චමිරු වගේ.. දෙවෙනි අවස්ථා හැම එකක්ම වරදින්නෙ නෑ.. එයාලා හුහක් ආදරෙන් ඉදීවි..

එන්නාම්.. ලව් යූ..❤

**චමිරුගෙන් කාලෙකට කලින් ආදරේ කළ හදට,**

**මම හැමදාම ආදරේ කළේ හදට..ඔයා ආදරේ කළේ ඉතුරු කළුපාට ටිකට..**

**අපි නොගැළපුණේ එතනින්ම නෙමෙයිද..**

**ආයෙම හිනාවෙනකොට පරිස්සමට හිනාවෙන්න..ආයෙම නිදියනකොට නපුරු හීන නොදකින්න..**

**හැමදාම සතුට හමාගෙන ඇවිත් ඔයාව වැළඳගන්න..ඔය ඇස් දෙක එක දවසකට හරි සැනසීමෙන් පියාගන්න..**

**එතකල් කළුපාට ඉතුරු ටිකටත් නැති.. හදටත් කොහෙත්ම අයිති නැති..ඇතින් පායපු නමක් නොදන්න පුංචි තරුවක්..අමාවක දවසටත් හදට නොසෑහෙන්න ආදරේ කළා..**

**-ඒ තරුව නිමීගෙන යනවා ෂනෙරු.. මට ඒක දැනෙනවා.. ඔයාගෙ අතින් මුද්ද ගත්ත වතාවෙ හරිනම මගේ පපුවෙ පැත්තක් හිරිවැටීගෙන යන්න ඕන.. ඉස්සර වගේ.. ඒත් ඇයි මට මෙ තරම සතුටු..???**

**මාව මනුස්සයෙක් කළාට.. මනුස්සකම ඉගැන්නුවට.. දුන්නු විශ්වාසයට.. රැකපු හැම පොරොන්දුවටම.. හිත නොරිද්දුවට.. උඹට මම හැමදාම ණයයි-**

@Shan

https://youtu.be/AtkP70XvEhI

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුනවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 164 කොටස

" දෙයියනේ දෙයියනේ රෝල ඇතුළෙ මොකුත් නෑ සනෙරුමලේ.. මේක හිස්නෙ දෙයියෝ.. මේක ගන්නද අවුරුදු ගාණක් ගැටුවෙ.. ඇයි කියන්න අනේ මේක අස්සෙ දාලා මලක්වත් වෙන්න බැරිවුණේ.. මගේ තොප්පිය හදන්නකො.."

" මට අමුතු ගැම්මක් ඇවිත් තියෙන්නෙ මේ ලෝගුව නිසා.. තොප්පි හදන එක මට මදිකමක්.."

" අනෙ මෙ පගෙක් වෙන්නෙපා.. "

මම අතේ තිබ්බ රෝල බිම වැටෙන්නැතිවෙන්න උකුළ උඩ තියාගෙන ආශිගෙ ග්‍රැජුවේශන් කැප් එක හැදුවා.. දෙයියනේ කියලා කැම්පසුත් ගාටලා ඉවරයිනෙ.. දැන් MBBS ඩොකෙක් විදියට පත්වීමත් හම්බුණා.. දිවුරුම දුන්නත් එක්ක.. පුදුම සතුටක් දැනෙන්නෙ..

අපේ අම්මා ලංකාවට ආවා.. මගේ කොන්වොකේශන් එකට.. අම්මයි බාප්පයි ආශිලාගෙ ගෙදර අය එක්ක කතාකරනවා.. මමයි ආශියි ෆොටෝ ගන්න ගමන් හිටියෙ.. අයුක අයියා අපි දෙන්නටම මල් බොකේ දෙකක් ගෙනැත් දුන්නා.. තව කියාන් අයියත් ගෙනැත් දුන්නා.. හවස මම කලින් ප්ලේ කරපු ක්ලබ් එකේ අය පාටි එකක් ඔගනයිස් කල්ලා.. ඒකට යන්න හිතාගෙන ඉන්නෙ..

අවුරුදු ගාණක් මහන්සිවෙලා.. රිපීට් සෙට් කරගන්නෙ නැතුව හෙන කට්ටක් කාලා මේ ගත්තු උපාධියනම් මට සැහෙන්න වටිනවා.. බැඩ්මින්ටන් කරගෙන යන අතරෙනෙ මේකත් කරගත්තෙ.. ඇත්තටම මෙහෙම දවසක් එනකල් මම ඇඟිලි ගැන ගැන හිටියෙ.. හැම උසස්පෙළ කාලෙ ළමයෙක්ගෙම හිතේ තියන හීනෙ.. මේ ලෝගුව දාගන්න එක.. අම්මව තාත්තව එක්කගෙන කොන්වොකේශන් එකට එන එක..

ලංකාවෙ ඩොකෙක් වෙන්න කියන වචන වලින් අම්මටසිරි හෙන ලේසි වගේ එකක් කොහෙත්ම දැනෙන්නෙ නෑ.. ඒ ලෙවෙල් වලින් පස්සෙ කැම්පස් ජීවිතේ ආතල් වුණාට මෙඩ්ඩොන්ට එහෙමම නෑ.. මොකද අපේ උන්ට පාඩම් කරන්නම දවසට හම්බෙන්නෙ පැය දෙකක් වගේ.. ඒකත්

@Shan

සමහර දවස්වලට කැශුවලිටි සෙට් වෙනවා.. එහෙම වුණොත් උදේ 8-12 ක්ලිනිකල් ගිහින් ආයෙ 1-4 ලෙක්චර්ස් ඉඳලා ගෙදර දුවලා හය වෙද්දි වෝඩ් එකට යන්න ඕන.. කැශුවලිටි කියන්නෙ වෝඩ් වලට අලුතින් පේශන්ලා ඇඩ්මිට් කරගන්න දවස.. එදාට අපි ගිහින් පේශන්ලගෙ හිස්ට්‍රි එක සම්පූර්ණෙන් අරගන්න ඕන.. සමහර දවස්වලට රෑ එකොළහ මාරට කිට්ටුයි ගෙදර එනකොට.. පහුවදා කන්සාල්ටන් ඇවිල්ලා පේශන්ලගෙ හිස්ට්‍රි එක ඇහුවම අපි කියන්න දැනගෙන ඉන්න ඕන.. අපි එකොළහට ආවත් එතනින් පස්සෙ එන පේශන්ලගෙ හිස්ට්‍රි එක ගන්න ආයෙම මොකෙක් හරි අල්ලගන්න ඕන.. විනාඩියට දෙකට ඒවා මතක තියාගන්නත් බෑ.. මුළු දවසක් හිටගෙන විතරයි.. තර්ඩ් ඉයර් එකේදි මම ක්ලිනිකල් ආතල් කිව්වට එහෙම නෑ.. ෆයිනල් ඉයර් වෙද්දි මූණ හෝදගන්නවත් වෙලාවක් ඉතුරු වෙන්නෙ නෑ.. පුදුම ස්ට්‍රෙස් එකක් තියෙන්නෙ.. අනික අපේ කැම්පස් එකේ එක්සෑම්.. එපාවෙනවා.. සෙනුකයටනම් පේරෙ එහේ සෙම් දෙකට මාස හයකට සැරයක් එක්සෑම් දෙකයි එන්නෙ.. කොළඹ එහෙම නෙමේ..

ඒ අස්සෙ මගේ තත්වෙ හිතාගන්න පුළුවන්ද.. ආතල් එකේ ලොස් ඇන්ජලිස් ගිහින් මෙඩ්ල් අරන් ලංකාවට ආවා වගේම අන්තිම ටිකේ ෆයිනල් එක්සෑම් එකට යද්දි මට ඇඩිලා හිටියෙ.. වෙඩින් එනවා.. ඒවට නොගිහිල්ලම බෑ.. පාඩම් කරන්න අහස උසට.. සමහර ඒවා මතක හිටින්නෙත් නෑ.. අපි මෙලෝ රහක් නෑ කියලා අනික් ෆැකල්ටි වලින් කිව්වට උන් දන්නෙ නෑනෙ අපි කන කට්ට ඉතින්.. අන්තිම කාලෙ මට රිපීට් සෙට් වෙයි කියලා මම හෙන බයේ හිටියෙ.. දෙයියනේ කියලා ඕනම වෙලාවෙ ආද්‍ය අයියා ළඟ හිටියා.. ඒ මනුස්සයට පිං දුන්නට මදි.. මට කරපු උදව් ගොඩට.. සමහර සබ්ජෙක්ට් මට සම්පූර්ණෙන්ම මඟැරිලා තිබුණෙ ඔලිම්පික් නිසා.. ආද්‍ය අයියා සේරම මුළ ඉඳන්ම ඒවා කවර් කල්ලා දුන්නා.. එයාට ඉතින් හොඳට පුළුවන්නෙ.. ලංකාවටම ඉන්න ඇනස්තටිකල් ඩොකාලා හතරදෙනාගෙන් එක්කෙනෙක් මස්සිනා වෙන එකේ වාසිය තමා.. කොහොම වුණත් මාමා හැමදාම හොස්පිට්ල් එනවා මාව එක්කගෙන යන්න කොච්චර රෑ වුණත්.. පොඩ්ඩක්වත් පරක්කු වෙන්නෙ නෑ.. මම ඉන්න ගෙදර පාඩම් කරන්න ඕන නෑ කියලා එයාලගෙ ගෙදර තියාගෙන පාඩම් කරන්න කිව්වා.. ස්ට්‍රෙස් වැඩිමනම් අයියා ඔය කෑම හදන අරවට මෙවට මාව එකතු කරගන්නවා.. මමත් අර අම්මයි තාත්තයි මැද්දෙ හැදෙන පොඩි එවුන් ගාණට දාලා ඒ දෙන්නා සලකන්නෙ.. එයාලා ඇත්තටම මට සෑහෙන්න හයියක් වුණා..

@Shan

මට තාම මතකයි අපේ රිසාල්ට්ස් ආපු දවස.. ආධ්‍ය අයියත් ඉතින් අපේ කැම්පස් එකේමනෙ ඉන්නෙ.. එයා තමා මම උසස්පෙළ යන කාළෙ කොළඹම යන්න ඕන චූටියො කිය කිය වද දුන්නෙ.. අන්තිමේදි ඕන් ඇවිත් බැල්කනි එකෙන් පල්ලෙහාට අර රෝල් කරපු කොළ මිටිය විසික් කළාම රුපියලේ ගිහින් ඒක අල්ලගත්තා.. මට මතක් වෙනවා.. රධ්‍ය අයියා දවසක් මට ඔය ගැන කියපු විදිය.. සෙනුකයගෙනම් රිසාල්ට්ස් ටික පොකුණකටලු දැම්මෙ.. අනේ මන්දා එක එක සම්ප්‍රදායවල්නෙ කැම්පස් වල.. සෙනුකයගෙ කොන්වොකේශන් එක තිබිලා දැන් සතියකට කිට්ටු වෙන්න එනවා.. මමත් ගියා අපේ එකාට විශ් කරන්න.. රෝසමල් බොකේ එකක් උස්සගෙන.. අයුක අයියා ආවෙත් සෙනුකයගෙ කොන්වොකේශන් එකට කිට්ටු වෙලා ඒකටමනෙ.. සෙනුකගෙ තාත්තට හරි සතුටුයි.. කවදාවත් නැතුව තාත්ත ඇඬුවා.. අයුක අයියටත් ඒකටනම් එකපාර පුදුම හිතුණා.. මගේකා කොහොමහරි උගේ පව්ල එක්කම ගොඩ දාගත්තා.. මම පෞද්ගලිකව සැහෙන්න ගරු කරන චරිතයක්.. සෙනුකයා.. හිට් එකට කුණුහර්ප කියාගත්තට උගේ ගාව තියන කොලිටීස් මම කා ගාවවත් දැකලා නෑ.. අද මේ තැන ඉන්නවා දකිද්දි අම්මාපල්ලා මට පුදුම ආඩම්බරයක් දැනෙන්නෙ..

" අද හවස පාටි එකට එනවා නේද අනේ.."

" ඕ.. අඩෝ මට පුදුම නිදහසක් දැනෙන්නෙ බං.."

" කොන්වොකේශන් එක වෙනකල්ම අපේ ලොකු අයියා එයාගෙ ඩිස්පැන්සරි එකේ ප්‍රැක්ටිස් කරන්න තියාගත්තු එක හොඳයි නේද අනේ.."

" බලහන්.. ඒකත් චාන්ස් එක තමා.."

මම ඈතින් හිනාවේගෙන එන ආධ්‍ය අයියව දැකලා නැගිට්ටා.. මගේ මස්සිනා පොඩ්ඩ එනවා..!! අපේ අම්මත් ආධ්‍ය අයියලා එනවා දැකලා ඒ පැත්ත හැරුණා.. අපේ මාමත් ඉන්නවා.. අඩෙ..

මම අර කළු ලෝගුවත් දාගෙන දුවගෙන දුවගෙන ගිහින් මාමගෙ බෙල්ල බදාගත්තා.. එතන හිටිය සේරමත් හැරිලා බැලුවා.. මාමා මගේ ඔලුවෙ පැත්තකට හාද්දක් දුන්නා.. මට මාමවයි ආධ්‍ය අයියවයි දැක්කහම හුහක් සතුටු හිතුණා.. අන්තිමේ මම ඒකත් කොහොම හරි කළා..

" චූටියො.. May your cap fly as high as your dreams.."

@Shan

ආධ්‍ය අයියා අතේ තිබුණු මල් බොකේ එක මගේ අතින් තිබ්බම මම එයාටත් හග් එකක් දුන්නා.. අපේ අම්මා මෙහේ ආවට පස්සෙ ඉන්නෙ අකිල අංකල්ගෙ ලංකාවෙ ගෙදර.. පෙරේදා ආධ්‍ය අයියා ඩිනර් එකකට එයාලටයි හැමෝටමයි ඉන්වයිට් කළා.. ආච්චිඅම්මත් පවුලෙ හැමෝම ඉන්නෙ හුඟ කාලෙකින් නෙ.. ලොකුඅම්මලගෙ පවුලයි.. අම්මගෙ පවුලයි.. මමයි.. ආධ්‍ය අයියලයි.. බබාලයි හැමෝම හිටියෙ ආධ්‍ය අයියලගෙ අලුත් ගෙදර.. එදා ආධ්‍ය අයියට තිබ්බ ලොකුම ප්‍රශ්නෙ අපේ අම්මට කතාකරන්නෙ කොහොමද කියන එක..

මම අම්මෙ කියනවා.. ඒකනිසා රධ්‍ය අයියත් අම්මෙ කියනවා.. මාමා අක්කේ කියනවා.. ඒ වුණාට කලින් ආධ්‍ය අයියා අපේ අම්මට කිව්වෙ අම්මා කියලනෙ..අනික අපේ අම්මා අසලි අම්මගෙ යාලුවා.. අම්මගෙ යාලුවට අක්කා කියන්න බැනෙ.. අන්තිමට මම කිව්වා ඒකත් වරද්ලගෙ අම්මෙ කියලම කියලා දාන්න ඒයි කියලා..

ආධ්‍ය අයියා හැඳිමිටෙන් එකක් දුන්නා..  පස්සෙ පොඩුවෙ අම්මා කියලම කිව්වා.. පව් දෙයියනේ මගේ පොඩිමාමාමස්සිනා..

" මමත් දැන් ඩොකෙක් හරිත.. ලේසි නෑ.."

" ඔව් පොල් කඩන්නවත් ගියානම් ලොකු අම්මගෙ මූණෙ දැලිගාන්න තිබුණා.."

" දැලි ගාන්න මම දර ලිපක්ද මාමෙ.. කෝ මගේ පුත්තු දෙන්නා.. ගෙදර දාලද ආවෙ.."

" නෑ චූටියො.. කාර් එකේ ඉන්නෙ.. එක්කන් එන්න බැනෙ.. දෙන්නම නිදි.."

" අනේ.. ඒත් ඇහැරෙයිද දන්නෑ.."

" දැන්ම නෑ.. තව ටිකකින් යන්න ඕන.."

" පුතාලා.."

අපේ අම්මත් අපි ඉන්න්න තැනට ආවා..අම්මා කාලෙයින් ඔසරියට බැහැලා ඉන්නෙ.. හෙන ආඩම්බරෙන්.. පුතත් ඩොකෙක්නෙ.. ආං අර අපේ ගෙදර

@Shan

එහාපැත්තෙ කමනි ඇන්ටිව මට හම්බෙන්නෙ නැනෙ දෙකතුනක් කියන්න.. හම්බුණොත් ස්ටෙත් එක කරකලා දෙනවා දෙකක් දැන්වත් බ්‍රේසියර් දාපන් කියලා.. අම්මටයි දුවටයි දෙන්නටම.. අඩිඩාස් එකෙන් ස්පෝර්ට්ස්බ්‍රා එකක් අරන් දෙන්නද ඇහුවනම් හරි.. අනේ මම මගේ ස්ටෙත් එකෙන් මොකෙක්ටවත් ගහන්නෙ නෑ.. ඒක මට දුන්නෙ මම යාළුවෙලා ඉන්න එක්කෙනා.. ඒක තියන්නෙ මම ලෙඩ්ඩුන්ට විතරයි.. අර වැලමදුළු වලට මෙක තියන්නෙ නෑ.. අපහස කරපු හැටියට ඩල්කොලැක්ස් පෙති තුනක් එකපාර දෙන්න තියෙන්නෙ දවසෙම ලැට් එකේ ඉඳගෙන ඉන්න..

අපි කොන්වොකේශන් එක ඉවරවෙලා එන්න ආවා.. හවස පාටි එක්ක නිසා.. ගෙදර එනකල්ම ආරු නිදි.. කම්මුලකුත් කොට්ටෙට තද කරගෙන.. අනේ මාම් මේකව කනවා කොයිවෙලේහරි.. අනිකත් එහෙමයි.. මේ දෙන්නව මට ඉල්ලගන්න බැරිවෙයිද දන්නෙ නෑ.. අරං හදාගන්න.. ආඪ්‍ය අයියලගෙ ගෙදර එද්දි අපේ ආච්චි කාමරේ බණ අහනවා.. මම ආපු ගමන්ම ආච්චි ගාවට දුවගෙන ගිහින් බිමින් දණගහගත්තා..

" මගේ සුදුමහත්තයා.."

" ආච්චිඅම්මෙ.."

ආච්චි ලස්සනට හිනාවෙලා මගේ අතේ තිබුණු කැප් එක අතගෑවා.. මගේ මූණ අත් දෙකින්ම අල්ලගෙන නාලින් හාද්දක් තිව්වා..

" උඹලගෙ ලොකුඅම්මව මතක් වුණා.. ඉස්ස ඉස්සෙල්ලම උපාධියක් ගත්තෙ ඒකිනෙ.."

ලොකුඅම්මගෙ උපාධියෙදි ගත්තු ෆොටෝ එක අපේ ගමේ ගෙදර තාම තියනවා..

" මගේ සුදුමහත්තයා මේක කරනවා කියලා මමනම් දැනගෙනමයි උන්නෙ.. මට හරි සතුටුයි කොල්ලො.. උඹටනම් නරකක් වෙන්න හොඳ නෑ හීනෙකින්වත්.."

අපේ මාමා ටිකකින් කාමරේට ඇවිත් ආච්චි ගාවින් ඉඳගත්තා.. අපේ ආච්චිඅම්මගෙ මීහරක් තුන්දෙනාගෙන් පොඩිමීහරකා.. පව් අනේ ඒවුණාට එහෙම කියන්නෙ.. මාමා එහෙම නෑ.. මගේ වයසක මාමා..

@Shan

" මුගේ ඇස්වහ කටවහ යන්න වතුර කළයක් මතුරලා-"

" මගෙ ඔලුවෙ ගහන්න මාමෙ.."

" ඔය කිව්වෙ.. පොල්පිති හරකා.. අම්මෙ මූව නළවන්න හොඳ නෑ.."

" මාව නළවන්නැතුව මාමව නළවන්න කියනවද.. අර ආඩ්‍ය අයියා ඉන්නෙ.. නළෝග-මම්මම්මහ්හ්ක්ක්ක්ක්ක්!!!"

" දෙනවා උඹට දැන්.. එළියට පල.. මට ආච්චිඅම්මව නාවන්න.. පේනවද අම්මෙ මුගෙ කට.."

" ඒකා ඇත්තනෙ කිව්වෙ.."

මම හිනාවෙලා නානකාමරේට ඇවිත් ඇඟපත සෝදගත්තා.. නටලා නටලා බැජ් එකේ උන් එක්ක හෙන මහන්සී.. ඒකනිසා.. නාලා ඇඳුමකුත් ඇඳගෙන නිකමට මාම් අල්ලපුවත්තට මූණ දැම්මා.. මෙ ගෙදර අභිරහස් ගෙයක් කියලා මම ආරුට කතාවක් කියලා දුන්නනෙ.. අයිතිකාරයා දන්නවනම් එහෙම.. මාව ගස් එල්ලයි.. මම ටවල් එකත් වැලේ වනලා සාලෙට එද්දි අවී චිත්‍රයක් පාට කරනවා.. ආරුත් නැගිටලා කොට් එකේ අත පය ගගහා ඉන්නවා.. ඒකානම් හැදෙන්නෙ අමුතු හුරතලේකට..

" තුති තාත්ති.."

" ඕ.."

" තුති තාත්ති වත් ඉස්ස් දිස්.."

මම අවීගෙ පොතට එබුණා..

" අ මැංගෝ.. ඒක කලර් කරන්නෙ බ්ලූ නෙමෙයි බබා යෙලෝ.."

" යෙලෝ..??"

" ම්ම්.."

" ඒ ඇයි.."

@Shan

මට අපරාදෙ කිව්වෙ කියලත් හිතුණා.. දැන් දීපන්කො ප්‍රශ්න වැලට උත්තර.. මම කොට් එකේ ඉඳපු ආරුවත් උස්සගෙන ඇවිත් අවී ගාවින් වාඩිවුණා.. ටීවි එකේ බේබිටීවී දාලා ඒකෙ සමනලයෙක් සිංදුවක් කියනවා..

" මැංගෝ ඉතින් යෙලෝනෙ.."

" රතු තුතුළා බොලු කියන්නෙපා.. ඒවා ග්‍රීන් කලර්.. අපේ ගෙදල තීන ගහේ මැංගෝ ග්‍රීන්.."

" ගෙදල-අහ්ම.. ගෙදර තියන මැංගෝ හොඳට ඉදිලා නෑනෙ.. ඒකයි ඒ ග්‍රීන් වෙලා තියෙන්නෙ.. පුතා මේක යෙලෝ ගාන්නකො.."

" පපා!!!!!! මත යෙලෝ මැංගෝ ඕනී.. පපා!!"

ආධ්‍ය අයියා කුස්සියෙ ඉඳන් මූණ දැම්මා..

" මොකක්ද.."

" යෙලෝ මැංගෝ ඕනි අවීට.. තුඳුපුතාට.. ඩඩාත කියන්න.."

" යෙලෝ මැංගෝ නෙමෙ දැන් එන්න බත් කන්න.. උදේ කෑවෙත් නෑ හරියට.. මගේ සීනිත් බහිනවා මේ ළමයි දෙන්නෙක් නිසා.. පොඩ්ඩක් ඉන්න චූටියෝ.. මම මේ කෑම එක හදාගෙන එන්න.."

" අයියා ඕක හදන් එන්න.. මම ඉන්නම්.."

මගේ උකුළෙ ඉඳපු ආරු මගේ බෙල්ල  බදාගෙන ඇඟ දිගේ උඩට නැගලා කම්මුලක් හපාගත්තා.. උදේ මම ආරුට ඩොට් එකක් තිබ්බනෙ නළල මැද්දෙන්.. මේ යකා ඒක මකාගෙන..

" ආරුශ්.. තුති තාත්ති හපන්නෙපා.."

අවී අර පොඩි එකාගෙ පස්සට පාරක් හිමින් දුන්නා.. ආරු අත දික් කල්ලා අවීගෙ මූණ මැද්දෙන් අල්ලගෙන පහුරුගෑවා.. පස්සෙ අවී අඬාගෙන මගේ උරහිසට මූණ ගහගත්තා.. ආරුත් මහා හයියෙන් අඬන්න ගත්තම ආධ්‍ය අයියා කෑම එකකුත් උස්සගෙන ඇවිත් මං ගාවින් බිමින් ඉඳගත්තා.. මගේ කන ලෙප්ට් වෙලා වගේ යකෝ.. උපාධිය ගත්ත දවසෙම බිහිරි වුණා නේද.. දැන් කොහොමද ස්ටෙත් එකෙන් හාටබීට් එක බලන්නෙ..

@Shan

" මොකද ළමයි අඬන්නෙ.."

ලොකු අප්පොච්චි ආච්චිඅම්මගෙ කාමරේ ඉඳන් බෙරිහන් දුන්නහම ආරු මගේ බෙල්ල අස්සෙ තව ටිකක් මූණ ගහගත්තා..

" කෝ අවී මෙහෙ බලන්න.. අපාට ලෙක්චර් එකක් තියනවා දැන්.. ඉක්මනට මෙහෙ බලන්න.. කෝ.. සුදුපුතේ.."

ආධ්‍ය අයියා අර සැරදාන්නෙ නැති කෑම කටක් අනලා අවීට දික් කලාම ඒකා බත් ගුලිය හව් ගාලා හපලා ආයෙම මගෙ උරහිසට මූණ තියාගත්තා.. ඇයි හත්දෙයියනේ මාවම බදාගෙන අඬන්නෙ..

" අයියා කැම්පස් යන්නද.."

" නෑ චූටි.. ඔන්ලයින් ලෙක්චර් එකක්.. මෙහේ ඉඳන් කරන්නෙ.. "

" ආ.. ආරු මෙ එන්නකො ඔයාට බඩඩක් දෙන්න.."

මම පැත්තකින් තියලා තිබ්බ සීරියල් කප් එක අරගෙන ඒකෙන් හැන්දක් අරගෙන ආරුගෙ කට ළඟින් තිබ්බම ඒකා අහක බලාගත්තා.. අවී ආධ්‍ය අයියගෙන් පාඩුවෙ බත් කනවා..

" ආරු මට ආදරේනම් මෙක දැන් කනවලූ.. කෝ.. ආ කියන්න.."

ආධ්‍ය අයියට හිනාගියා.. ආරු මගේ ශර්ට් එක අස්සට අත ඔබාගත්තා.. මෙකා යකෝ!! මුගෙ ආච්චිට.. ඒ කියන්නෙ අපේ අම්මටනෙ.. අම්මනෙ ආච්චි.. කවුරුහරි.. පෙනේද.. මම ඒකගෙ අත අරගෙන එළියෙන් තියාගෙන තද කරගත්තා.. සැක්..

" ආරු!! දෙනව දෙකක්.."

" පපා කුක්කු.."

" ඒවා දෙන්නෙ මේවා කාලා ඉවරවුණාම.."

" අනේ ඔව්.. කන එකක් ඉක්මනට කාපල්ලා.. අපි ගාව ඔච්චා නෑ.. අනේ මෙ ආධ්‍ය අයයෙ මොනවද හලෝ මේ පුරුදු කල්ලා තියෙන්නෙ.."

@Shan

" මම කරපුවා නෙමෙයි අනේ.. මේකා විතරයි ඔහොම අමුතු විදියට හැදෙන්නෙ.. මගෙ සුදුපුතා එහෙම නෑ.. නේද.. කෝ ආ කියන්න.."

මහප්පගෙ ගති මේකට ගිහිල්ලද.. දෙයියනේ මාමෙ..

ආධ්‍ය අයියා අවීව තුරුල් කරගෙන හාද්දක් දුන්නා.. මේ කපටි ආරු ආධ්‍ය අයියා නිදාගන්නකල් ඉඳලා හැමදාම ශර්ට් එක ආස්සට රිංගගන්නවා.. හෙන ආතල් එකේ ඉන්නෙ ඒක අස්සට වෙලා.. අයියා මහන්සි වෙලානෙ ගෙදර එන්නෙ.. එයාට නින්ද යනවා හොඳටම මෙයාලව නිදි කළාට පස්සෙ.. මේ ආරුවා අවී අයියව එහාට තල්ලු කල්ලා රෑට අයියගෙ ශර්ට් එක අස්සට වෙලා ඒකත් කටේ ගහගෙන මනෝ ගහනවා.. සෑහෙන්න කල්පනා කරන්න දේවල් ඇතිනෙ.. ඊටපස්සෙ මොකක් හරි කියලා බැන්නොත් කේඅම ගිහින් ගොත ගගහා මාමට කියනවා.. මාමා ආරුව උඩ තියාගෙනනෙ ඉන්නෙ.. ආරුට හප් කිව්වත් මහ අප්පොච්චිට මල පනිනවා.. කේන්ති යනවා.. ඒ තියා ආධ්‍ය අයියටවත් බනින්න දෙන්නෙ නෑ..

" මම හවස අරකට ගිහින් එන්නම් අයියෙ.."

" පරිස්සමට චූටි.. මගෙ හිතට අද හරිත් නෑ.. ගිහින් එනකොට තනියම එන්න එපා.. මට හරි අනූට හරි කෝල් එකක් දෙන්න.. ඔයාව දාන්න කියලා මම අනූට කියන්නම්.. හොඳේ.."

" හා.. මම ඉතින් ගියා කියා බොන්නෙ නෑනෙ.. ඉක්මනට එනවා.. අද යන්න ලොකු මූඩ් එකකුත් නෑ අයියෙ.. ඇඟට හෙන මහන්සී.."

" මේ අවුරුද්දෙ එක දවසක් නිකන් හිටියෙ නෑනෙ ඉතින්.. ඔයා හරිනම් රෙස්ට් එකේ ඉන්න ඕන දවසක්වත්.. ලෙඩ වෙන්නකො ඔහොම ගිහිල්ලා.."

" හරි හරි ඉතින්.. අංගොඩ එච්චර වැඩ නෑනෙ නේද.."

" මරු පත්වීම හැබැයි.. වැඩ නැත්තෙ කොහෙද.. ගිහින් බලන්නකො ඔයාට එතකොට තේරෙයි.."

" අපි ගියා එකපාරක්.. කවද හිතුවෙ ඕකෙම ගාටන්න වෙයි කියලා.."

@Shan

ආධ්‍ය අයියයි මමයි කියව කියව ආරුටයි අච්ටයි කවලා ඊටපස්සෙ අපිත් කෑවා.. මාමා දවල් ආච්චිව නාවලා කවලා සාලෙට එක්කගෙන ඇවිත් ටී වී එක දාලා දුන්නා.. දවල්ට කෑවට පස්සෙ බබාලා නිදාගෙන මටත් ඒගොල්ලොන්ගෙ ඇඳේම නින්ද ගියා.. ආයෙ නැගිට්ටද්දි හුඟක් හවස් වෙලා.. කියාන් අයියගෙ මිස් කෝල් පහයි..

මම ඉක්මනට ගිහින් අතට අහුවෙන ඇඳුමක් දාගත්තම මාමා මාව හොටෙ එකෙන් ඇරලලා රෑ දාපු අපොයිමන්ට්ස් වගේකට හොස්පිටල් ගියා.. යද්දි අපේ යාළුවො අඳුරන අය හොටෙල් එකේ පිරිලා.. අපේ ග්‍රැජුවේශන් එකට පාටි එකක් ඇරේන්ජ් කල්ලා තිබ්බෙ.. සෙනුකයා.. අයුක අයියා.. ආශි.. මහී.. සේරම ඇවිත් හිටියා.. චමිරු මේ දවස්වල ලංකාවෙ නෑ සීයා එක්ක රට ගිහින්.. ආයෙ එන්නෙ සතියකින්.. මම ගිහින් ලොකුවට කැපිලා පේන්න ගියේ නෑ.. සෙනුකයා එක්ක සයිඩ් ගහලා චිප්ස් වගයක් ගිල ගිල කියව කියව හිටියා.. කොහොම හරි රෑ අටට විතර ඇති..

මට අන්නෝන් නම්බර් එකකින් කෝල් එකක් ආවා.. ඇතුළෙ පාටි එකේ සද්දෙ නිසා මම හෝල් වේ එක දිගේ ඇවිදගෙන ගිහින් එළියෙ බැල්කනි එකට වෙලා කෝල් එක ආන්සර් කළා.. ඒත් මට ඒ කෝල් එකෙන් ඇතුළෙ පාටි එකේ මියුසික් ඇහෙනවා.. එකසැරේට මට බය හිතුණා.. කෝල් එකත් එහෙමම කට් වුණා..

මම ආපු මෝඩකම හිතලා ආයෙම ඇතුළට යන්න ගියාමත් කෝල් එක ආවා.. කලින් නම්බර් එකෙන්ම.. අනික අද මේ හරියෙ කට්ටිය නෑ වගේ පේන්නෙ.. වෙනදටත් ක්ලබ් එකේ පාටි වලට ඇරේන්ජ් කරන්නෙත් මේ හොටෙල් එකමයි.. මට හදිස්සියෙ ආධ්‍ය අයියා කියපු කතාව මතක් වුණා..

'පරිස්සමට චූටි.. අද මගේ හිතට හරිත් නෑ'

මම කෝ එක ආන්සර් කල්ලා කනේ තියාගෙන බැල්කනි වැටට හේත්තු වුණා.. මොන මගුලක්ද.. කතා කරනවනම් එක්කො කතාකරන්න ඕන.. නැත්නම් ආයෙ නොගෙන ඉන්නෝන.. ඒ අස්සෙ මට මහ අමුත්තක් දැනුණා.. මාව කවුරුහරි ෆලෝ කරනවද..

" හලෝ.. කව්ද කතාකරන්නෙ.."

"....."

@Shan

" හලෝ.. හලෝ.."

"....."

" මොන පිස්සෙක්ද.."

මම එහාපැත්ත හැරිලා හොටෙල් එක ඇතුළට යන්න හැදුවා විතරයි මාව එහෙමම බැල්කනි වැටට තියලා කවුරුහරි බෙල්ලෙන් හිර කල්ලා අල්ලගත්තා.. මගේ අතින් ෆෝන් එක ලිස්සලා බැල්කනි එකෙන් පහළට වැටුණා.. මම හිටියෙ තට්ටු දෙකකින් උඩ.. සෑහෙන්න තරම් උසකින්.. මාව එකපාරට බයකින් වහගත්තා..

" උඹ.. මගේ.. පුතාගෙන්.. ඈත්වෙලා හිටපන්!!!"

මට ඒ කටහඬ අඳුරගන්න තප්පරයක්වත් ගියේ නෑ... මගේ බෙල්ල වටේ තියන අතේ ඇඟිලි තව තදවෙනවා දැනෙද්දි මාව බැල්කනි වැටටම හිර වුණා.. පිටට වාරුවක් නැති නිසා මාව පිටිපස්සට ඉබේම තල්ලු වෙලා යනවා..

" කැහ්-කැහ්-එහාට-ආහ්හ්!!"

" උඹට.. තේරෙන්නෙ.. නැද්ද.. කිව්වහම.. මට මගේ පුතාව ගෙනැල්ලා දීපන්..!!"

මට ඒ ඇස්වලින් දැනුණේ මරණ බයක්.. අනේ දෙයියනේ කවුරුත් නැද්ද..!! මාව තව තව පිටිපස්සට වෙනවා.. හුස්ම හිරවෙන්න වගේ.. බෙල්ල තදවෙන නිසා හුස්ම ගන්න බැරුව මම අත අරවගන්න ට්‍රයි කළා.. ඒ අත් සෑහෙන්න වයස වුණත් මගේ බෙල්ල හුහක් තදින් අල්ලගෙනයි හිටියෙ.. මේ වගේ මනුස්සයෙක් ඉස්සරහා මගේ හයිය කියන්නෙ.. ඒක ගණන් ගන්න තරමවත් දෙයක් කියලා හිතන්න බෑ.. මට මරන බය කියන දේ.. අනාරක්ශිත හැඟීම දැනුණේ නරකම විදියට.. මගේ පපුව ගැහෙන වේගෙ වැඩිවෙනවා.. කාගෙහරි උදව් ඉලන්න ඕන.. කතාකරගන්න බෑ.. මගේ ඇඟ පණනැතිවේගෙන එනවා ටිකෙන් ටික.. ඒත් මම ගැලවෙන්න ට්‍රයි කළා.. මේ හැමදේම වුනේ හරිම පොඩි කාළයක් ඇතුළත..

" එහාට-වෙනවා..!!"

@Shan

" මගේ පුතාව මට ගෙනැත් දීපන්.."

" කැහ්-මට-කැහ්-කැහ්.. බැහැ!!"

" මොකක්ද උබ කිව්වෙ.."

මාව තව තව වැටට හිරවෙද්දි එකසැරේම,

*ටකස්*

" ආහ්-අතාරින-කැහ්-සෙනුක..!!"

" මගේ පව්ල.. විනාස කලාට.. අපායටම පලයන්..!! මගේ පුතාව.. විනාස කළා.."

අත් වැට එකසැරේම බුරුල් වෙනවදෝ මට දැනුණා.. මම එච්චර උස නැති නිසා මාව එහෙමම එහාපැත්තට බරවුණා.. මරණ බය කියන දේ මට උපරිමයි.. මම ඒත් ගැලවෙන්න ට්‍රයි කලා.. ඒ එක්කම අයුක අයියා මං ඉන්න පැත්තට දුවගෙන එද්දිම.. මට හැමදේම පෙණුනෙ කරුවල වෙලා.. මගෙ උගුර ලේ රහ වේගෙන එනවා.. එකසැරේටම,

අප්පච්චි මාව වැටෙන් පහළට තල්ලු කළා.....

මම කිසිම වාරුවක් නැතුව තප්පර ගාණකින් අඩි ගාණක් පොළොවට ඇදගෙන වැටෙද්දි එකසැරේම හිතාගන්නවත් බැරි වේදනාවක් එක්ක.. මගේ මුළු ඇඟම පණ නැති වුණා..

මම.. කවුරුත්.. විනාස.. කළේ නෑ..!!

හායි=)

දැන් පීක් එක ඉවරයි.. ඊළඟ චැප්ටර් එකේ ඉඳන් මේක වෙනස් වෙනවා.. බාල්දියක් නෙමෙ හලෝ මේ..

මාව විස්වාස කරනවකො..

එන්නාම්.. ලව් යූ.. ❤

@Shan

ප.ලි.

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 165 කොටස

ජීවිතේ අමාරුකාල හැමෝටම එනවා කියලා කියමනක් තිබ්බට.. කවුරුත් ප්‍රාර්ථනා කරනවද ඒවා දීර්ඝකාලීන වෙන්න ඕනමයි කියලා.. නෑ..!! කවුරුත් එහෙම ප්‍රාර්ථනා කරන්නෙ නෑ.. කොයිම හරි දවසක ආයෙම හොඳ කාලයක් ලබනවා.. ඒත්,

රධ්‍යටට..??

එයාගෙ ජීවිතේ අවුරුදු හයකටම එහෙම හොඳ කාලයක් නොලැබිච්ච තරම.. ජීවිතේ හරි අසාධාරණයි..

" පුතා.."

"....."

" පුතා මම කියන දේ එකවතාවකට අහන්න දරුවො.. එයා හොඳින් ඉන්නවා.. අපි එහෙම විශ්වාස කරන්න ඕන.."

" කොහෙද.. කවද්ද.."

" ප්ලීස් පුතා.. මට ඔයා එක්ක මේ ගමන එන්න දෙන්න.."

**'We ask that you please fasten your seatbelts at this time and secure all baggage underneath your seat or in the overhead compartments. We also ask that your seats and table trays are in the upright position for take-off'**

" ඔයා මේ ගමන එන්න ඕන නෑ අම්මා.. මට දැන්වත් මගේ තීරණ ගන්න ඉඩ දෙන්න.."

" හොඳයි ඔයාගෙ තීරණේ ඒකනම්.. ටේක් කෙයා.. පුතා ගියාම අම්මට කතාකරන්න.."

රධ්‍යටට කරදරයක් වගේ දැනුණ එයාගෙ ටෙම්පර්ඩ් එක බිඳුණු ෆෝන් එක ඕෆ් කල්ලම දාලා ඒක සීට් එක ඉස්සරහා තිබුණ බෑග් එකට එබුවා.. නිදහස

@Shan

එක්ක දැනෙන දුකක්.. ඒක හරි අමුතු හැඟීමක්.. රධ්‍ය බලාපොරොත්තු වුණා අවසාන මොහොතෙ හරි නිදහස එක්ක දැනෙන සතුටක් ලබන්න.. ඒත් රධ්‍යට ලැබුණෙ නිදහස විතරයි.. එයාගෙ සතුට, සැනසීම එයාගෙන් හැමතිස්සෙම දුරට යන්න ගන්නවා..

වරද්ගෙ ඇක්සිඩන්ට් එක වෙලා දවස් දෙකක්.. එයා මේ වෙද්දි ඉන්නෙ අයි සී යූ එකක.. හුස්ම අදින ගමන්.. අඩුම තරමෙ රධ්‍ය දන්නෙ නැහැ එයාගෙ ජීවිතේම දීලා රැකගත්තු මනුස්සයා හොඳින් ඉන්නවද කියලවත්.. කොහොම වුණත් ගත වුණු හැම තප්පරේම රධ්‍ය වරද් වෙනුවෙන් දෙවියො පවා යැද්දා.. එයාගෙ ජීවිතේ හරි දීලා කමක්නෑ.. වරද්ව බේරගන්න.. ඒත් මේ අවුරුදු හයටම දෙවියො එයාව ඇහුවෙ නෑ..

දැනට අවුරුදු හයකට කලින් වරද් එක්ක තියන හැමදේම නවත්තනවා කියලා රධ්‍ය දිවුරුවෙ අධිකාරි ඉස්සරහමයි.. එයා අඬන්නෙ නෑ.. ලේසියකට ඇඬුවෙ නැතත්.. අසනීප වුණු අයියා දිහා බලාගෙන.. අසරණ වෙලා ඉන්න වරද් දිහා බලාගෙන රධ්‍ය ඉවසපු ඉවසිල්ල දන්නෙ එයාම විතරයි.. ඒ ඉවසීමට හිලව් වෙන්න දැන් හැමදාම රෑට රධ්‍යගෙ ෆෝන් එකේ ස්ක්‍රීන් එක කඳුළු බිංදු වලින් තෙමෙනවා.. කාමරේ තියන ප්ලුෂි එකට එයාගෙ හිතේ තියන දුක කියනවා.. වරද්ව හිතින් මවාගන්නවා.. ආයෙම සතුටින් ඉන්න කාලයක් වෙනකල් රධ්‍ය හීන දැක්කෙ එකක් දෙකක් නෙමෙ.. කෝටියක් විතර..

ආදරේ කරන්න ගද්දි රධ්‍ය ඇත්තටම පොඩි ළමයෙක්.. ආදරේ කියන්නෙ මොකක්ද කියලවත් හරියට නොදන්න.. හුරතල්.. නිහඬ.. පිරිමි ළමයෙක්.. එයාගෙ පවුල ඉපදුණු දා ඉඳලම ලස්සනට නොපෙනුනත් රධ්‍ය වටේ එයා ගොඩනගාගත්තු හරිම ලස්සන ලෝකයක් තිබුණා.. ඒකෙ හිටියෙ පොඩි දෙනයි.. එයාගෙ අයියා.. අම්මා.. වරද්.. යාළුවො දෙන්නා.. කියාරා.. රෙක්සි.. එච්චරයි.. එයාලව මවාගෙන රධ්‍ය හරි අපූරුවට හීනමාළිගා සැහෙන්න මැව්වා..

" Is there anything you want sir..?"

" Can I have a cup of coffee..?"

" Sure sir.."

@Shan

රධ්‍ය කල්පනා ලෝකෙන් මිදිලා කෝපි කෝප්පයක් ඇණවුම් කරලා ආයෙම ඇස් පියාගත්තා.. හිතේ අගුළු දාපු සේරම ලංකාවට පය තියද්දි එයා මතක් කරගෙන ඉන්න ඕන.. මොකද මෙතනින් එහාට එයා අලුතින් පටන් ගන්න ඕන.. ඉතින් අවසාන වතාවට මතක අලුත් වුණා..

ආධ්‍ය එක්ක මුහුදු වෙරළට ගිය දවසක ආධ්‍ය රධ්‍ය වෙනුවෙන් ලස්සන වැලි මාලිගාවක් හදලා දුන්නා.. ඒකෙ කැමති අයව එයාට මවාගන්න කියලා කිව්වා.. රධ්‍යගෙ අතේ තිබ්බෙ පොඩි ටූත්පික් වගයක්.. එයා පළවෙනි ටූත්පික් එක මාළිගාවෙ උඩම තැනක රැදෙව්වා..

" ඒ කව්ද පොඩී..??"

" ඒ මම.."

රධ්‍යට තිබුණේ හරි පොඩි උත්තර.. එයාගෙ අතේ තිබුණ අනිත් ටූත්පික් එකත් ඒ ළඟින්ම හිටෙව්වා..

" එතකොට මේ..??"

" දන්නෑ.."

රධ්‍ය හීනියට රතු වුණාම ආධ්‍ය හිනාවුණා.. ආධ්‍ය කියන්නෙ රධ්‍යව හදපු අම්මා.. වදපු අම්මටත් වඩා රධ්‍ය ආදරේ ආධ්‍යට.. එයාගෙ එක කුස උපන් සහෝදරයට..

" ඔයා ලොකු වුණාම මෙහෙම එකක් හදන්න.. දැන් අයියා කැම්පස් යන්න ඕනනෙ පොඩී.. ටිකකින් අපි ගෙදර යමු.."

" ඇයි අප්පච්චි අයියට ආස නැත්තෙ.."

ආධ්‍ය ලස්සනට හිනාවුණා.. ඒත් ඇස් වල කඳුළු පිරිගෙන එද්දි ආධ්‍ය මුහුදුවෙරළ දිහා බලාගෙන හිටියා.. එයාගෙ හිත රිදෙන්න තැනක් නොතිබ්බ තරම්.. එයා ඉවසුවා.. ආධ්‍යට අවුරුදු විසි එකක් වෙද්දි රධ්‍යට එකොළහයි.. ආධ්‍යට එයාගෙ දුක පොඩි දරුවෙක්ට කියලා නිදහස් කරගන්න පුළුවන් එකක් නෙමෙයි..

" මම අයියට ආසයි.. අයියට කවුරුත් ඕන නෑ.."

@Shan

රඨ්‍ය පුරුදු ආඩම්බරකාර මූණෙන්ම හරි ආදරනීය වචන කීපයක් පිට කළා.. ආධ්‍යට හිනා ගියා.. එයා හැමදාම එහෙමයි.. වයසට වඩා පරිණතව හිතනවා.. ආධ්‍ය මේ පුංචි ළමයට ආදරේ කරන්නෙ මහ මෙරක් වගේ.. රඨ්‍ය දවසින් දවස වැඩෙන පිරිමි ළමයෙක් වෙනවා බලාගෙන ආධ්‍ය හරි ලස්සනට සතුටු වුණා.. හරියට තමන්ගෙ අතින් හිටවපු කුඹුක් ගහක් අතු ඉති දාලා පැලවෙනවා වගේ.. රඨ්‍ය ආධ්‍යගෙයි අසලිගෙයි මැද්දෙ හැදුණා.. රඨ්‍යගෙ ජීවිතේට එයා එක්ක පොඩිම වෙලාවක් වෙන් කරන්න අකමැති අප්පච්චි මුලින්ම අත දාන්න ගත්තෙ එයා අට වසරෙදි.. ඒ කියන්නෙ අවුරුදු දාහතරෙදි.. අම්මගෙයි අයියගෙයි මැද්දෙ හදාගත්තු හීනමාළිගා ගොඩක ජීවත් වුණු අහංකාර පිරිමි ළමයා සම්පූර්ණෙන්ම නිහඩ වුණේ ඒ කාලෙදි..

" රඨ්‍ය.. තමුන් කැඩෙටින් පටන්ගන්න ඕන.."

ඒ වචන වල මහා බරක් නොතිබුණත් ඉස්කෝලෙ ලොකු අයියලා කැඩෙට් කිට් ඇඳගෙන මාච්පාස්ට් කරනවා බලාගෙන උන්නු රඨ්‍යට කැඩෙටින් කරන එක ගැන හිතේ ආසාවක් ඇතිවුණා.. අප්පච්චි එයාට හානියක් නොකරපු එකම ඉල්ලීම ඒක වුණත්.. එතනින් පස්සෙ අප්පච්චි එයාව හිර කරන්න පටන් ගත්තා.. එයාගෙ හීන.. එයාගෙ බලාපොරොත්තු මත්තෙ රඨ්‍යට ජීවිතේ දිය කල්ලා අරින්න වුණා.. ඇත්තෙන්ම අප්පච්චි බලාපොරොත්තු වුණේ.. තමන්ට මහ ඇරුණු තමන්ගෙ ඇතුළාන්තය කැමති පෞරුශය රඨ්‍යගෙ රූපෙන් මවාගන්න.. කොහොමත් අසලිගේ යෝජිත විවාහය කවමදාවත් සාර්ථක එකක් වුණේ නැහැ.. තමන්ගෙ බඩෙ උපන්න දෙවෙනි දරුවත් නැතිවෙද්දි ඒ අහිමි වෙච්ච වේදනාවත් අසලි දරාගත්තෙ තනියමමයි.. පෙර වාසනාවකටදෝ හැමදේම තේරුම් ගන්න ලොකු පුතෙක් අසලිට ලැබිලා හිටියා.. ආධ්‍ය ඇත්තෙන්ම මහ පොළොවේ පය ගහන්න සුදුසුම චරිතයක්.. සැහෙන්න වෙලාවට අසලි ආධ්‍යගෙ නිවුණු මූණ දිහා බාලාගෙන ඉඳලා හිත හදාගත්තා..

රඨ්‍යනෙ ඉස්කෝලෙ හිටියා අමුතු පිරිමි ළමයෙක්.. හරි ලස්සනයි.. පොඩි කාලෙ ඉඳහිට හම්බෙනවා.. ඒත් එයාව හැමදාම හමුවෙන්න අරගත්තෙ නමය වසරෙදි රඨ්‍ය කණිශ්ඨ ශිශ්‍ය නායකයෙක් විදියට ඊට පහළ පන්තියක රාජකාරි වැටුණ දවසෙයි.. අන්න එදා ඉඳලා අර අමුතු පිරිමි අමයා රඨ්‍යගෙ වැලිමාළිගාවෙ එයාට එහාපැත්තෙ හිටවපු ටුත්පික් එක හොරකම් කරගත්තා..

@Shan

රධ්‍යට මේ පිරිමි ළමයා සැහෙන්න කුතුහලයක්.. දුඹුරුපාට දිග ඇස්.. ඇස් අග්ගිස්සෙන් උඩට නැමිණු ඇස් පිහාටු.. කොයිවෙලෙත් නිදහසක් නැති කතාව.. අමුතු ජවය.. රධ්‍යට ඇත්තෙන්ම මේ පිරිමි ළමයා දිහා බලාගෙන කල්පනා කරන්න සැහෙන්න දේවල් තිබුණා.. ඇයි එයා එහෙම.. ඇයි එයා මෙහෙම.. රධ්‍යගෙ ඔලුවෙ හැමතිස්සෙම මේ දුඹුරුපාට ඇස්දෙක මවන්නෙ ප්‍රශ්ණාර්ථ ළකුණු ගොඩක් විතරයි..

හුගක් දවසට අයුක රධ්‍යට විහිළු කළා..

" උඹ අර කොල්ලට කැමතිවත් ද.."

" උඹට පිස්සුද.."

හැමදාම ඒ කතාව එතනින් නැවතුනත් රධ්‍ය හැමතිස්සෙම කොහේහරි ඉදගෙන දුඹුරුපාට ඇස් තියන පිරිමි ළමයා දිහා බලාගෙන හිටියා.. රධ්‍යට කේන්තියි.. ගෙදර ගිහින් පාඩමක් කරගන්නවත් බෑ.. හැමතිස්සෙම දුඹුරු පාට ඇස් දෙක රධ්‍යට වද දෙනවා.. කොයිවෙලෙත් බෙරිහන් දීගෙන එහෙට දුවන, මෙහෙට දුවන, රධ්‍යගෙ වචනයක්වත් අහන්නෙ නැති කටකාර පිරිමි ළමයා ඉඳහිට රධ්‍යගෙ මූණෙ නොදැනුවත්වම හිනා මවනවා..

" පොඩී මොකද තනියම හිනාවෙන්නෙ.."

" මම..?? නෑ..!"

රධ්‍ය ශිශ්‍ය හටයෙක් විදියට බැඳිලා ඒ පහුවුණේ දෙවෙනි අවුරුද්ද.. රධ්‍යට මාසයක්ම ඉස්කෝලෙ ඉන්න වුණේ නැහැ.. රන්ටැඹෙ ගිහිල්ලා ඉන්න කාලෙත් රධ්‍යට හරිම කුතුහළේ.. අර දුඹුරුපාට ඇස් තියන වදකාර කොල්ලා මොනවා කරනවා ඇත්ද කියලා.. ඇත්තෙන්ම රධ්‍යගෙ හිතේ උඩ හරියෙන් බරපතල අකමැත්තක් තිබුණත් පහළට යන්න යන්න තියෙන්නෙ කැමැත්තක්.. ඒත් එයා ඒක පිළිගන්න ටිකක් පහු වුණා..

" මොකද මේ නියපොතු වවාගෙන..??"

" ඒවා ඉතින් වැවෙනවනෙ.. අයියගෙ වැවෙන්නැහ්.."

@Shan

දවසක් බුදුන් වදින වෙලාවෙ රධ්‍ය වරද්ගෙ රෝසපාට නියපොතු ටික වවාගෙන ඉන්න එකට සැරෙන් කතාකළා.. ඇත්තෙන්ම එහෙම දිගට වවලා තිබුණෙ නැහැ.. එයාත් හොය හොය හිටියෙ කතාකරන්න මාතෘකාවක්.. වරද් හදිසියෙම රධ්‍ය බැඳගෙන ඉඳපු අත ඇදලා අරගෙන මූණ ඉස්සරහට කල්ලා හරව හරව රධ්‍යගෙ නියපොතු කොච්චර වැවිලද කියලා බැලුවා.. රධ්‍ය ඉස්කෝලෙ විනය අකුරටම පිළිපදින ළමයෙක්.. ඒත් බෑග් එකේ ස්මාර්ට් ෆෝන් එකක්නම් තිබුණා.. අයුකගෙ බල පුළුවන්කාරකමට කවුරුත් ඒ යාළුවො තුන්දෙනාගෙන් අනවශ්‍ය විදියට ප්‍රශ්න කරන්න යන්නෙ නෑ.. වරද්ගෙ සිනිඳු අත් පළවෙනි වතාවටම රධ්‍යගෙ අතක ගැවෙද්දි රධ්‍ය ගැස්සිලා ගිහින් කම්මුල් රතුම රතුපාට කරගත්තා.. ඒවා හුඟක් සිනිඳුයි.. හීනියට දාඩිය දාලා.. වරද් ටිකකින් රධ්‍යගෙ අත අතෑරියම රධ්‍ය ආයෙපැත්ත පලාතෙවත් වරද්ගෙ නියපොතු බලන්න ආවෙ නෑ..

" මේ බුදු පහන තියන්නෙ මමද..??"

" මට වර්ගමූලය තේරෙන්නෙ නෑ අනේ.. මලවදේ.."

වරද් එකසැරේට ඩෙක්ස් එකක් අස්සෙන් ඇවිත් මූණත් එල්ලගෙන බුදුපහනට තෙල් වක්කල්ලා බුදුපහන තියලා.. අනිත් දේවලුත් පුටුවක් උඩ නැගගෙන පිළිවෙළට තියලා එතනින් ඩෙස්ක් එකක් උඩට පැනලා එහෙමම ඇවිදගෙන ගිහින් එයා ඉන්න තැනින් බිමට පැන්නා.. කිසි හැදියාවක් නැති පිරිමි ළමයෙක්..!! දවසක් කිසිම හේතුවක් නැතුව රධ්‍යට වරද්ගෙ කතිර මැස්මකුත් සම්පූර්ණ කරන්න උදව් කරන්න වුණා.. වරද් ගාව කොලෝන් සුවඳයි.. වරද් ඉඳලා හිටලා සාක්කුවෙන් ලේන්සුවක් අරගෙන මූණ පිහිදාගෙන ආයෙම ලේන්සුව සාක්කුවට ඔබාගනිද්දි වරද් ගාවින් කොලෝන් සුවඳ සැරටම දැනෙනවා..

සමහර දවස් තිබුණා වරද්ගෙ මූණ මැලවිච්ච මලක් වගේ.. අඬලා.. ඇස් ඉදිමිලා.. ඔහේ මැලවිලා එහෙට මෙහෙට යනවා.. රධ්‍යට පුදුමයි.. වරද්ගෙ දුඹුරුපාට ඇස් කොයිවෙලෙත් තියෙන්නෙ දිලිසෙන ගමන් නෙ.. එකසැරේට මලානික වුණාම රධ්‍යගෙත් හිත හොඳනැති වුණා.. ඒ කාලෙමයි රධ්‍ය දැනගත්තෙ වරද්ගෙ තාත්තා නැති වග.. පන්තියේ නාමලේඛනේ අන්තිමට තියන ශිෂ්‍ය තොරතුරු වාර්තාවෙ වරද්ගෙ පියාගෙ තොරතුරු වල තිබුණෙ ඉරි කෑලි ගොඩක් විතරයි.. රධ්‍යගෙ හිත හුඟක් රිදුණා.. එහෙම රිද්දගන්න හේතුවක් නැනෙ.. ලෝකෙ පළවෙනියටම තාත්තෙක් නැතිව ඉපදුණු පුතා වරද් නෙමෙනෙ.. ඒත් රධ්‍යට තේරුම් ගියා

@Shan

වරද්ගෙ අමුතු දුඹුරුපාට ලොකු ඇස් අස්සෙ ලොකු දුකහිතෙන කතාවක් තියෙනවා කියලා.. එයා හිතුවා අවස්ථාවක් ලැබුණොත් කවදාහරි.. වරද් අඩවන්නෙ නැතුව.. හැමතිස්සෙම පරිස්සමින් බලාගන්නවා කියලා.

පොඩ්ඩක් ඉන්න..!! ඇයි එයා එහෙම හිතුවෙ.. බලාගන්න..?? ඒ මොකටද..

" අයුක අයියෙ.. මට ඔයාගෙ ස්කවුව් ලොග් බුක් එක දෙන්න පුළුවන්ද.."

රධ්‍යගෙ පන්තියේ රධ්‍ය, කියාන්, අයුක, අභිරු හිටියෙ අන්තිම පොළිමේ.. කවුරුත් ඒ තැන බලෙන් අත් පත් කරගන්න එන්නෙ නෑ.. එහෙම පුළුවන් කමක් තිබ්බත් කියාන්ගෙන් ගුටි කන්න කවුරුත් කැමති නෑ.. කියාන් නපුරුයි.. රණ්ඩුවට පැටළුනොත් ඉවරෙටම ඉවරයි.. දවසක් වරද්ගෙ ඩිම්පල් තියන යාළුවා ඉන්ටවල් එකේදි පන්තියට ඇවිත් අයුකගෙන් ස්කවුව් ලොග් බුක් එකක් ඉල්ලද්දි රධ්‍ය හනිකට පන්තියෙ දොර දිහා බැලුවා.. බලද්දි වරද් ඉස්සරහ පෝළිමෙ ඉන්න පිරිමි ළමයෙක් එක්ක ඒ විනාඩියටත් කදේ දාගෙන.. හෝ ගාලා කියවනවා.. වරද් කතාකරන වචනයක් ගානෙ එයාගෙ ඇස් ලොකු වෙනවා.. ආයෙම පොඩි වෙනවා.. පුදුමෙන් කට වහගන්නවා.. රධ්‍ය හරියට ෆිල්ම් එකක් බලනවා වගේම වරද් දිහා බලාගෙන හිටියා.. එකසැරේම අයුකගෙ විසාල ලොග් බුක් එක උස්සගෙන සෙනුක දුවගෙන පන්තියෙන් එළියට ගියාම වරද් පිටිපස්සෙ පෝළිමේ ඉඳපු රධ්‍යට සැලියුට් කරගෙන පන්තියෙ දොරෙන් අතුරුදහන් වුණා.. අයුක අමුතුවට කැහැලා කෑම කන්න ගත්තම රධ්‍ය දෙපාරක් රවලා පාඩුවෙ අහක බලාගත්තා..

" කෝ ඔයාගෙ යාළුවා.."

" එයාට ගැස්ට්‍රයිටීස් වැඩිවෙලා අයියෙ.. ක්ලාස් එකේ.."

මෝනින් එසෙම්බ්ලි එකේ ඉස්සරහම වගේ ඉන්නෙ හැමදාම වරද්.. කකුල් කොටයිනෙ.. හැමදාම රධ්‍යට මැසිවිලි කියනවා එයා හිතලමලු වරද්ව ඉස්සරහට දාන්නෙ.. එහෙමම කියන්න බෑ ඉතින්.. ඒ වුණාට රධ්‍ය ඉන්නෙත් ඒ හරියෙනෙ.. කොහොම පිටිපස්සට දාන්නද.. කොට නිසා ඉස්සරහා ඉන්න ඕන.. වරද් අසනීප වෙලා කිව්වම රධ්‍ය අයුකට එයාගෙ පන්තියත් බලාගන්න කියලා බොරු හේතුවක් හදාගෙන පන්තියට යද්දි වරද් ඔලුව තියාගෙන හොඳටම නිදි.. වරද්ගෙ නිල්පාට ස්කූල් ලෝගෝ එක තියන පව්ච් එකේ බෙහෙත් වගයක් බීලා ඒවගෙ කවර ඔබලා තිබුණා.. රධ්‍ය වරද්ව ඇහැරන්නැතුවම සද්දයක් නැතුව ගිහින් ෆෑන් එක දාලා ක්ලාස්

@Shan

එකේ ස්පීකර් එකේ ස්විච් එක ඔෆ් කළා.. නැත්නම් බුදුන් වදිනවා පන්තිය දෙදරන්න සද්දෙන් ඇහෙනවා.. රධ්‍ය හිටගෙන කිසිම හැගීමක් නැතුව හරි ආඩම්බරකාරයා වගේ වරද් දිහාම බලාගෙන හිටියා.. එයාගෙ කම්මුල් ඇයි රෝසපාට.. සමහරවිට හුහක් සිනිඳු ඇති.. රධ්‍ය ඇගිල්ලකින් වරද්ගෙ කම්මුලක් ලාවට ඔබලා බැලුවා.. මේකනම් දැන් උවමනාවටත් වඩා වැඩිවේගෙනයි එන්නෙ.. වහාම වරද්ගෙන් අයින් වෙන්න.. රධ්‍යගෙ මොලේ හදවතට පණිවිඩයක් එව්වා.. රධ්‍ය එයාගෙ හැගීම ආදරේ තමයි කියලා පිළි අරගෙන වරද්ගෙන් ඈත් වුණා.. එච්චර පොඩි වයසේදි එහෙම දේවල් ඕන නෑ.. වරද් සතුටින් ඉන්න ඕන.. එච්චරයි.. රධ්‍ය හැමදාම දුරින් ඉඳගෙන වරද්ට ආදරේ කළා.. එක දවසක් කරපු සෙල්ලමකින් ඒ ගැන අයුක, කියාන් දෙන්නත් දැනගත්තා.. ඊටපස්සෙ එයාලා හැමතිස්සෙම වරද්ව අල්ලලා රධ්‍යට විහිළු කළා.. ළඟින් ගියොත් ඇහට හරි තල්ලු කරනවා.. ඒත් රධ්‍ය ඈත්වෙලාම හිටියා.. වරද් එයාගෙ නිදහසේ හැදුණා..

" දොරමඬලේ...... ගිනිවැදුණේ..... තුන්හිතේ....... ගින්දරා....... දෙයියෝ........"

රධ්‍ය උඩ ගිහින් බිම වැටුණා.. වරද් පන්තියෙ මියුසිකල් ශෝ එකක් දාලා.. එතකොට රධ්‍ය එකොළහේ.. වරද් දහයේ.. එයාලගෙ පන්ති තිබ්බෙ මූණට මූණ බලාගෙන.. රධ්‍ය ක්ලාස් එකේ මොනිටර්.. ඉස්සරහා පන්තිය කෑගහද්දි එයාළට පැවරුමකට දුන්නු පේපර් එකට උත්තර ලියාගන්න බෑ කියලා රධ්‍ය මොනිටර් බැජ් එකත් ගහගෙන එළියට බැස්සා.. වරද්ට ගාණක් නෑ.. පන්තියම එකතු කරගෙන ස්වර්ණපාලියේ කියනවා.. රධ්‍ය ක්ලාස් එකට ගියා විතරයි ක්ලාස් එකම සද්දයක් නැතිවුණා.. බලද්දි වරද් පන්තියෙ නෑ.. දිග කලිසමක් ඉස්ස ඉස්සෙල්ලම ඇඳලා ඒකා හිටියෙ මහ උජාරුවෙන්.. රධ්‍ය එහෙමම නැමිලා ගුරු මේසෙ මේස රෙද්ද ඉස්සුවම වරද් හිමින් සැරේ එහාපැත්තෙන් රිංගලා ගිහින් හිටපු පුටුවෙන් වාඩිවෙලා පොතක් කියවන්න ගත්තා..

" ආයෙම කෑගහලා අහුවුණොත් කොඩිනේටර්ට කම්ප්ලේන් කරනවා.. ප්ලීස් බී සයිලන්ට්..!!"

රධ්‍යගෙ ඕ ලෙවෙල් ඉවරවෙලා ගෙදර ඉන්න කාලෙ කැඩෙට් වැඩවලට ඉඳලා හිටලා ඉස්කොලෙට යද්දි වරද් දකිනවා.. ඕ ලෙවෙල් කිට්ටු නිසා පාඩම් කරනවා පණ දාගෙන යාළුවා එක්ක.. දවසක් ළඟින් යනකොට සැළලිහිනි සදේශෙ කවියක් බෙරිහන් දීලා ඒකට කුණුහර්පත් දාලා

@Shan

පන්තියේ කියනවා.. ඒ වෙද්දිත් රධ්‍යගෙ ෆෝන් එකේ අරහෙන් මෙහෙන් 'වැරදිලා' වැදුණු වරද්ගෙ පිංතූර සැහෙන්න ගාණක් තිබුණා.. අප්පච්චිට අහු නොවෙන්න රධ්‍ය ඒවා ලැප් එකේ ෆෝල්ඩර් එකකට දාගෙන ඒකට පාස්වර්ඩ් එකකුත් දැම්මත්, අයියා එක්ක ඒවා කරන්න හම්බෙන්නෙ නෑ.. රධ්‍යගෙ අයියට ඉස්ස ඉස්සෙල්ලම වරද්ව අතටම අහුවුණා..

" කව්ද පොඩී මේ.."

" අම්.. එයා.. මගේ.. යාළුවෙක්!!"

" ඉතින් ඇයි මේ මෙච්චර ෆොටෝස් ගොඩක්.. අයියගෙන් හංගනවා නෙහ්.."

" එහෙම දෙයක් නෙමෙයි.. මම එයාට කැමතියි.."

ආධ්‍යගෙ ඇස් දෙක ලොකු වුණා.. එයා වගේම.. මල්ලිත්..?? එතකොටත් ආධ්‍යගෙ ජීවිතේ අනුරාග් හිටියා.. අනුරාග් එයාට හමුවුණු මුල්ම අවුරුදු.. ඒත් ආධ්‍ය මල්ලිව තේරුම් අරගෙන එයාට උපදෙස් දුන්නා.. ඉස්සරහට එන එක්සැම් එකේ බරපතලකම.. ගෙදර වාතාවරණය.. දැන්ම ඒ දේවල් අවශ්‍ය නැති වග.. රධ්‍ය ඒවා පිළි අරගෙන අයියට කීකරුව පාඩුවේ හිටියා.. කොහොමත් රධ්‍ය එයාගෙ හැඟීම් දැනෙන්න ඇරියෙ නෑ කවමදාවත් වරද්ට..

රධ්‍ය ඒ එවෙල් වලට ඉස්කෝලෙ එද්දිත් වරද් ඕ ලෙවෙල් කල්ලා ගෙදර.. ඊටපස්සෙ ටික කාලෙකින් රධ්‍යට ආරංචි වුණා වරද් තෝරගෙන තියෙන්නෙ බයෝ.. එයා ඉන්නෙ මැත්ස්/බයෝ සෙක්ශන් එකේ දෙවෙනි තට්ටුවෙ කියලා.. රධ්‍ය හිටියෙ තුන්වෙනි තට්ටුවෙ.. ඔය කාලෙ සයන්ස් ඩේ එකට රධ්‍ය සයන්ස් ක්ලබ් එකේ වයිස් ප්‍රසිඩන්ට් වෙලා හිටියා.. වරද් විශය සම්බන්ධ කිසිම දේකට සහභාගී වෙන්නෙ නෑ.. අනිත් ඒවටනම් පැනගෙන යනවා.. බැලූ බැල්මට වරද් බයෝ කලේ ආසාවෙන් නෙමේ වගේ.. ඊටපස්සෙ රධ්‍ය ඒ ලෙවෙල් ලිව්වා.. අප්පච්චි පලාලි ගියා.. රධ්‍යට එයාගෙ නිදහස ලැබුණා.. අයියටත්.. ඒත් අයියා හිටියෙ හොඳ තත්වෙකින් නෙමේ.. නිතර අසනීප වෙනවා.. ඇහුවට කියන්නෙ නෑ.. එයාගෙ කාමරේට රධ්‍යට එන්න දෙන්නෙත් නෑ.. රධ්‍ය ඒ නිසා ගියෙත් නෑ.. අයියා අසනීප හංගගෙන රධ්‍ය වෙනුවෙන් හිටියා.. ඔය කාලෙම ඉස්කෝලෙ ඩිපියුඩි හෙඩ් විදියට රධ්‍යට ඉස්කෝලෙ යන්න චාන්ස් එක හම්බුණා.. මේ වතාවෙනම් කියාන් හිටියේ වරද් මරලා හරි ගෙනැත් රධ්‍යට දෙන්න.. ඒත්

@Shan

රධ්‍ය කැමති වුණේ නෑ වරද්ට ඒ කාලෙ කරදර කරන්න.. හිතුවෙවත් නැති විදියට වරද් එයාගෙ හැඟීම් ගැන දැනගත්තා..

රධ්‍ය හිටියෙ මැරෙන්න වගේ.. වරද් එයා ගැන දන්නවා!!!

රධ්‍ය ඒ කාලෙ තරම් සතුටින් හිටියෙ නෑ වෙන කිසිම කාලෙක.. ඒත් අප්පච්චි එයාට කේ ඩී යූ යන්න බල කරන්න පටන් ගත්තා.. ඉඳ හිට ගෙදර ආවාම රණ්ඩු කළත් රධ්‍ය ගාව සැනසීමක් තිබුණා.. වරද් පෙනුමෙන් වගේම හදවතිනුත් හුගක් හොඳ ලමයෙක්.. රධ්‍යට වරද්ව ලැබුණා කියලා මතක් වෙන හැමසැරේකම පුදුම සතුටක් දැනෙනවා.. නිහඬ වෙලා ඉඳපු ආඩම්බරකාර රධ්‍ය වෙනුවෙට සැහැල්ලු පිරිමි ළමයෙක් එයාගෙන් මතුවුණා.. රධ්‍ය වරද්ව සතුටින් තියන්න උත්සහ කළා.. වරද්ගෙ දුඹුරුපාට බළල් ඇස් හරි ආදරණීයයි.. වරද් නොදන්නවා වුණාට ඒවගෙන් රධ්‍ය වෙනුවෙන් හැමතිස්සෙම ආදරේම වැස්සුණා.. රධ්‍ය වෙනුවෙන් විතරක්ම හිටියා.. කිසිම දවසක වෙන පිරිමි ළමයෙක් දිහාවත් ගෑණුළමයෙක් දිහාවත් වරද් උනන්දුවෙන් බැලුවෙ නෑ.. රධ්‍යගෙ හිත රිදෙව්වෙ නෑ.. වරද් හුගක් බයයි රධ්‍යගෙ හිත රිද්දන්න.. දෙතුන් වතාවක රධ්‍ය 'හිත රිදෙනවා වරද්' කියද්දි වරද්ට ලොකු වරදකාරී හැඟීමක් දැනුණා.. ඉතින් ඒ දෙන්නට දෙන්නා කවමදාවත් හිතක් රිද්දගත්තෙ නෑ.. ඒත් එයාලා වටේ තිබුණ දේවල් ඒ දෙන්නව සෑහෙන්න පීඩාවට ලක් කළා..

රධ්‍යට ඕන වුන, බලාපොරොත්තු වුණ ආදරේ තිබුණේ වරද් ගාව විතරමයි.. වරද්ටත් එහෙමයි.. රධ්‍ය එයාගෙ ආදරෙ හුගාක් පරිස්සම කළා.. එයාගෙන් වගේම අනිත් අයගෙන්.. වරද්ට හොඳ පැහැදිලි අනාගතයක් තියෙන බව රධ්‍ය දැනගෙන හිටියා.. එයාට ලොකු උවමනාවක් තිබුණා වරද්ගෙ වටේ තියන සේරම අනවශ්‍ය දේවල් අයින් කරලා ඒ පාර හදලා දෙන්න.. වරද් වෙනුවෙන් එයාට යුතුකමක් ඉශ්ට කරන්න.. රධ්‍ය ආදරේ කියලා අඳුනගෙන හිටියෙ හරි අමුතු දෙයක්.. ඇහට යට කරගන්න එක.. හැමතිස්සෙම එයා වටේ වෙලෙන්න ඕන කියන එක නෙමෙයි.. ආදරේනම් එයාගෙ ගමන යන්න උදව් කරන්න.. සතුටින් තියන්න.. එකිනෙකාගෙ අදහස් වලට ගරු කරන්න.. සැනසීමක් වෙන්න.. වගේ දේවල් තමයි රධ්‍යගෙ භාශාවෙන් ආදරේ කියලා හැඳින්නුවෙ.. රධ්‍ය විශ්වාස කළා අවසානය.. වරද් කිව්වෙ එහෙමනෙ.. 'අවසානෙ විශ්වාස කරන්න..' ඇත්තෙන්ම අවසානයේ රධ්‍යට ඕන වුණේ වරද් එයාගෙ ළඟම මනුස්සයා කරගෙන ජීවිත කාලෙම එයාව සතුටින් තියන්න.. වරද් තරම් රධ්‍ය තේරුම් ගත්තු මනුස්සයෙක් රධ්‍ය දැකලා තිබුණෙ නෑ.. සමහර වෙලාවකට රධ්‍යට

@Shan

ඕනවුණේ වරද්ගෙ එකම එක පොඩි වැළඳගැනීමක් විතරයි.. එයාලා ඇත්තෙන්ම ළඟයි..

හිතුවෙවත් නැති විදියට අප්පච්චි එයාලගෙ ජීවිත සම්පූර්ණෙන්ම කණපිට හරවන්න ගත්තා.. මුලින්ම තර්ජනය ආවෙ අසලිට.. වරද් එක්ක ආයෙම කතාකලා තිබ්බොත් වරද්ගෙ ජීවිතේට හානියක් වෙයිදෝ කියන බයට මුලින්ම නිහඬ වුණේ අසලි.. රධ්‍යවත් දැනගෙන හිටියෙ නෑ අම්මා මොකද එකසැරේම නිහඬ වුණේ කියලා.. ඊළඟට කෙලින්ම තර්ජනය එල්ල වුණේ රධ්‍යට.. රධ්‍ය මානසික ලෙඩෙක් ගානට දාලා අප්පච්චි සැහෙන අපහාස කළා.. රධ්‍ය හුඟක් රණ්ඩු වුණා.. එයාලා වෙනුවෙන් කතාකලා.. එකදිගට දවස් ගණන්.. රධ්‍ය ගනින්න බැරි බෙල්ට් පාරවල් කෑවා.. කම්මුල් පාරව කෑවා.. පව්ලේ හැම ප්‍රශ්නයක්ම රධ්‍යගෙ කර පිට පැටවුණා.. ඒ සේරමත් එක්ක වරද් එයාගෙ ගමන යන්න පටන් ගත්තා.. රධ්‍ය හැමදේම දරාගෙන වුණත් ඉන්න ඕන උපරිමෙ වරද් වෙනුවෙන් හිටියා.. රධ්‍යට අතාරින්න හේතු කෝටියක් විතර තියෙද්දිත් හැමදේම දරාගෙන හිටියා..

ඒත් දවසක ඒ හැම දරාගැනීමකම අවසානෙ එයාට අප්පච්චිට යටත් වෙන්න වුණා..

ආධ්‍ය අසනීප වෙලා රට යන්න හැමදේම ප්ලෑන් කල්ලා තියෙද්දි රධ්‍ය හිටියෙ හුඟක් අසරණ වෙලා.. එයාට ඕන වුණේ ආධ්‍යගෙ ඩෝනර් වෙන්න.. ඒත් අප්පච්චි ආධ්‍ය මැරිලා පලයන් කියලා කොනකට විසි කළා.. කොන්ද පණ නැති උන් මේ ලෝකෙට ඕන නෑ කිව්වා.. අප්පච්චිට ඕනවුණේ රධ්‍යගෙන් තවත් අධිකාරි කෙනෙක් විතරයි.. බොළඳ ප්‍රේමවන්තයෙක් නෙමෙයි.. අන්තිමෙ අසලියි ආධ්‍යයි කියන ඇප ගොඩටම වරද් කියන නමත් එකතු වුණා.. රධ්‍ය අප්පච්චිගෙ හැටි හොඳටම දැනගෙන හිටියා.. තමන් නිසා කොයි වෙලාවක හරි වරද්ගෙ ජීවිතේට හානියක් වෙයි කියන බය රධ්‍යට තිබුණා.. අසලි අධිකාරිට විරුද්ධ වෙලා නැගිටින්න ගත්තු පළවෙනි අඩියම කඩා වැටුණා.. අන්තිමෙ හැමෝම වෙනුවෙන් රධ්‍ය අප්පච්චිට යටත් වුණා.. එහෙම නොකළනම් අද වෙද්දි ආධ්‍ය, අනුරාග්, වරද් ජීවත් නොවෙන්න තිබුණා..

රධිය එදා රෑ එයාපෝට් එකට යද්දි හිත ඇඳුම දුන්නෙ එකපාරක් දෙපාරක් නෙමෙයි.. එයාට එයාගෙ ආදරේ කරන අයව ඕන.. හිතට තිබුණු එකම සතුට එයාගෙ අම්මා ලන්ඩන් වල ඉන්න එක විතරයි.. අන්තිමේ රධ්‍ය හැමෝම වෙනුවෙන් අම්මගෙයි අප්පච්චිගෙයි මැද්දෙ හැදෙන්න තීරණය

@Shan

කළා.. ඔක්ස්ෆර්ඩ් වල ඉලෙක්ට්‍රිකල් ඉන්ජිනියරින් ෆැකල්ටියට ඇතුළත් වුණා.. පුළුවන් උපරිමෙන් පාඩම් කලා.. අම්මා වෙනුවෙන් හිටියා.. හිතේ හයිය අමාරුවෙන් හරි තියාගෙන හිටියා.. කියලා පිටට පෙනුණත්..

එහෙම වුණේ නෑ..

රධ්‍ය කැම්පස් එකට යන්න ගද්දිම එයා හිටියෙ මානසිකව හුඟක් අවුල් වෙලා.. රධ්‍ය ආයෙම නිහඬ වුණා.. ඒත් දවසෙම කාමරයක් අස්සෙම තමන්ව හිර කරගෙන හිටියා.. අධිකාරි එයාගෙ කෙරුම් ගැන උජාරු කියවද්දි රධ්‍ය බිඳුණු වීදුරුකටු ගොඩක ඉඳගෙන සැහෙන කල්පනා කරනවා.. කොටින්ම එයා තනියම කියවන්න පවා පටන් ගනිද්දි අසලි හිටියෙ පුදුම අසරණ කමකින්.. අධිකාරි තමන්ගෙ පුතාගෙ අසනීප ගැන දැනගෙන හිටියෙ නෑ.. එහෙම මරුවෙක් එක්ක අසලි ජීවත් වුණේම මැරෙන්න බලාගෙන.. අසලි රධ්‍යගෙ හිත හැදුවා.. බැරිම තැන බෙහෙත් ගන්න එක්කගෙන ගියා.. අසලිගෙ යාළුවො රධ්‍යගෙ වටේ හිටියා.. ඒත් හැම මනුස්සයෙක්ම දරාගෙන සීමාවට ආවම සේරම අවුල් වෙන්න ගන්නවා.. හරියට කළයකට කට ගාවටම වතුර පිරවුණාට පස්සෙ පිට ගලනවා වගේ.. රධ්‍ය වේදනාව ඇතුළේ ගිලිලා හිටියා..

රධ්‍යගෙ පොඩිකාලෙ වැලිමාලිගාව රැල්ලට ගහගෙන ගිහිල්ලා.. එයා හිතුවෙ සදහටම වරද්ව අහිමි වුණා කියලා වුණත් අසලි ඒත්තු ගැන්නුවා.. වරද් හැමදේම දරාගන්නෙ එයා වෙනුවෙන්.. වරද් අද ඒ තැන ඉන්නෙ රධ්‍ය නිසා.. රධ්‍යගෙ කිසිම වැරැද්දක් නැහැ කියලා.. රධ්‍යගෙ ලන්ඩන් ජීවිතේ පළවෙනි අවුරුද්දෙ එයා ලෙඩෙක් වෙලා ඉඳලා පහුවට හිත හයිය කරගත්තා.. ආයෙම වඩා හොඳ විදියට නැගිටින්න.. වරද් සෝශල් මීඩියා වල එයාලට රිලේටඩ් දේවල් සැහෙන්න පෝස්ට් කරනවා.. වරද් හිතා මතාම එහෙම කළා.. රධ්‍ය දන්නවා වරද් එයාව බලාපොරොත්තු වෙන වග.. ඉතින් දෙවෙනි අවුරුද්දෙ ඉඳලා රධ්‍ය ආයෙම හිටපු මනුස්සයා වගේ වුණා.. පාඩම් කළා.. හිම වැටෙම සීතලේ නිදාගන්නෙ නැතුවම පාඩම් කළා.. එයා ගියේ පිළිගත් විශ්ව විද්‍යාලෙකට.. ඒ වෙනුවෙන් මහන්සි වුණා.. කාලය යෙදෙව්වා.. අධිකාරි පුරුදු විදියටම උදම් ඇනුවත් සැරින් සැරේ තර්ජන එල්ල කළා..

" උඹ ආයෙම ඌ එක්ක කතාකල්ලා තිබුණොත්.. මැරෙන්න ලෑස්ති වෙලා ඉඳපන්.."

@Shan

රධ්‍ය සුළු වැරැද්දක්වත් එයා අතින් නොවෙන්න අවුරුදු හයක් වැඩ කළා.. වරද් එන්න එන්නම ඉහළට යනවා.. ලංකාවෙ ප්‍රසිද්ධ වෙනවා.. එයාගෙ නම හදාගන්නවා.. කැම්පස් යනවා.. එයාගෙම හයියෙන් හැමදේම ගොඩනගා ගන්නවා.. රධ්‍ය එයාගෙ දිහා බලාගෙන හිටියෙ හරි ආදරෙන්.. වරද්ව මහපොළොවේ පැළකලේ රධ්‍ය නෙමෙයි.. ඒක ඇත්ත.. ඒත් පොහොර දාලා බලාගත්තෙ රධ්‍ය.. අමාරු කාල හුඟකට රධ්‍ය වරද් වෙනුවෙන් හිටියා.. දුරින් ඉඳන් වුණත් රධ්‍යට ආදරේ දැනුණා.. චමිරු එයාට වුණු පොරොන්දුව චමිරු ඉශ්ට කරනවා කියලා එයා දැනගෙන හිටියා..

කාලෙත් එක්ක වරද් ලංකාවෙ විතරක් නෙමෙයි ආසියාවෙත් සැහෙන්න සැලකිය යුතු තරම් ප්‍රසිද්ධියකට ආවට පස්සෙ එක දවසක් රධ්‍යට විවාහ යෝජනාවක් ගෙනාවා.. එදායින් රධ්‍යගෙ කේන්තිය පිපිරිලා මුළු ගෙදරම ඒ කේන්තියෙන් වහගත්තා..

" රධ්‍ය තමුන් දැන් කසාද බැඳලා ළමයෙක් හදාගන්න ඕන කාලෙ.. ඔය මානසික රෝගෙන් ගැලවිලා නියම පිරිමියෙක් වෙනවා..!!"

වරද්ට ඔලිම්පික් වලට තිබුණෙ මාසයයි.. රධ්‍ය තීරණයක් ගත්තා.. අම්මා එක්ක ගෙදරින් පැනලා යන්න.. ලන්ඩන් වල හැංගෙන්න ලේසියි.. අනික වරද්ට ළං වෙන්න දැන් ලේසියකට බෑ.. රධ්‍ය ලොකු රණ්ඩුවකින් පස්සෙ තමන්ගෙ අප්පච්චිව මරන්න පිහිය අතට ගන්න තැන වෙනකල්ම අප්පච්චි එයාව අසරණ කළා.. ඒත් එදා අනුරාග්ට අප්පච්චි පිහියෙන් ඇන්න හැටි රධ්‍යට ආයෙ ආයෙම මතක් වුණත් අසලි රධ්‍යව ඒ පවෙන් බේරගත්තා.. අන්තිමේ රධ්‍ය ගෙදරින් පැනලා ගිහින් ජීවත් වුණා.. අධිකාරි ලන්ඩන් වලින් ලංකාවට ආවා..ආසලි නොහිටින්න රධ්‍ය එහෙනම් මිනීමරුවෙක් වෙන්න තිබුණා..

වරද් ගෝල්ඩ් මෙඩල් එක අරගෙන ලංකාවට එද්දි රධ්‍ය එයාගෙ ජොබ් එකෙන් අයින් වෙන්න, හැමදේම ලෑස්ති කරගෙන හිටියෙ ලංකාවට එන්න.. ඇවිත් වරද් ළඟට යන්න.. අයියා ළඟට යන්න.. අම්මව එක්කන් යන්න.. හැම පොඩි දේම එයා ප්ලෑන් කරත්..

එයාට වඩා අප්පච්චි මේ වතාවෙත් අඩියක් ඉස්සරහින් හිටියා..

අප්පච්චි දැනගෙන හිටියා රධ්‍ය කොහොම වුණත් අවසානෙ එන්නෙ වරද් හරි ආධ්‍ය ගාවට හරි කියලා.. මුලින්ම අප්පච්චි ආධ්‍යව නැති කල්ලා දාන්න

@Shan

උත්සාහ කළත් අනුරාග් ඒකට හැමතිස්සෙම බාධාවක්.. ඉතින් ඊළඟ ඉලක්කෙ වුණේ,

වරද්..

වරද් හිතාමතාම රහපෑවා රධ්‍ය තමන් එක්ක තවම සම්බන්ධයක් තියාගෙන ඉන්නවා කියලා.. වරද්ට උවමනා වුණේ තමන්ගෙ ප්‍රසිද්ධියෙන් ප්‍රයෝජනේ ගන්න.. එයා ප්‍රසිද්ධ කෙනෙක් නිසා එයාට අතක්වත් තිබ්බොත් අධිකාරිට කෙලින්ම හිරේ යන්න වෙනවා කියලා දැනගෙන හිටියා.. ඉස්සර අධිකාරිට බලය තිබුණත්.. මේ වෙද්දි ඊටවඩා වරද්ට බලයක් තිබුණා.. වරද් අනුමාන කරගෙන හිටියා රධ්‍ය අප්පච්චිගෙන් ගැළවිලා ඉන්න වග..

ඒත් වරද් හිතුවෙවත් නැති වෙලාවක ආයෙම දේවල් කණපිට හැරුණා.. එයා වැරදි වෙලාවක වැරදි තැන හිටියා.. රධ්‍ය ආයෙමත් ලංකාවට එද්දි වරද් ලංකාවෙ හිටියෙ නෑ.. එයාගෙ ඇක්සිඩන්ට් එකෙන් පස්සෙ වරද්ගෙ අම්මා වරද්ව අරගෙන පහුවදාම ඇමරිකා ගියා.. එයාව සනීප කරගන්න.. වරද්ගෙ දකුණු කකුල පසාරු කරගෙන හිගින් තිබුණ කම්බිය නොසලකා හරින්න පුළුවන් දෙයක් නෙමෙයි.. හැමෝම වරද්ව ලංකාවෙන් යන්න උත්සාහ කළා..

වගේම අධිකාරි එයාට සුදුසුම තැන හම්බුණා.. ආධ්‍ය ඒ වෙනුවෙන් සාක්ශි ඉදිරිපත් කළා.. චමිරු හැමදේම කල් තියා පැහැදිලි කල්ලා නීතිමය මාර්ගෙන් උදව් කළා.. ඒත් හැමෝගෙන හිතේ වරද් ගැන තිබුණෙ ප්‍රශ්නාර්ථයක්..

රධ්‍ය දෙවෙනි වතාවටත් කඩාවැටුණා.. ලන්ඩන් වල ගත කරපු වෙහෙසකාරී අවුරුදු ගණනට පස්සෙ ආයෙම එයා මූණ දුන්නෙ ඊටත් හාත්පසින්ම නරක දේකකට.. රධ්‍යට දැනෙනවා ආයෙම එයාගෙ පරණ දේවල් ඉස්මතු වෙන්න ගන්නවා.. ඒකනිසා තමයි රධ්‍ය තනියම ලංකාවට ඇවිත් ආධ්‍යව හොයාගන්න උත්සහ කළේ.. නැත්නම් රධ්‍ය මේ වෙද්දිත් කැලිෆෝනියා වල.. ඒ වෙනුවෙන් අසලි ඉදිරිපත් වුණා..

හැම මතකයක්ම රධ්‍යගෙ ඇස් ඉස්සරහා මැවෙද්දි උණු කඳුළු බිංදු දෙකතුනක් රධ්‍යගෙ දිග ඇස් පිහාටු තෙමාගෙන ඇස් අගිස්සෙන් පල්ලම් බැස්සා..

**" මගෙ වරද්.. මම කිව්වා පරිස්සමින් ඉන්න කියලා.."**

@Shan

" මම හැමතිස්සෙම කිව්වා.. ඔයාට අමතක වුණාද.."

ආයෙම රධ්‍යට පිස්සෙක් වෙලා විඳවන්න බෑ.. රධ්‍ය ඉහළට ගත්ත හුස්ම එක්ක ලේ රහක් මුහු වෙද්දි ඉස්සරහා තිබුණු කෝපි කෝප්පෙ ඉවරවෙලා හුහක් වෙලා ගිහින් තිබුණා.. බෙහෙත් බොන්න වෙලාව හරි..

තාම ඉවර නැතෝ..

ඔයාලා දන්නවද මට මේ රධ්‍යගෙ අප්පච්චි කියන කැරැක්ටර් එක හදන්න උදව් වුණේ එක්තරා වෙලාවක දැක්ක කමෙන්ට් එකක්.. ලංකාවෙ පහුගිය කාලෙක තිබුණා ගැණුළමයි දෙන්නෙක්ගෙ වෙඩින් එකක්.. ඒකෙ එක කමෙන්ට් එකක් තිබුණා රිඇක්ට් හතළිස් හයක් එක්ක..

" මට මෙහෙම උන් ඉපදුනොත් කඩුවකින් කපලා හිරේ යනවා සැපයි.. අසමජ්ජාති කාලකණ්ණි.."

රධ්‍යගෙ අප්පච්චිලා මේ ලෝකෙ ඉන්නවා.. මම එකසැරයක් කියවපු පොතක් තිබුණා 'දයාබර ඩාලියා' කියලා.. ඔයාලා හමුවුණොත් කියවලා බලන්න.. ඒකෙ තාත්තා තමන්ගෙ දුවට විසි එක් පොලකට පිහියෙන් ඇරලා මරලා දානවා ඒ දුව වෙන ආගමක තරුණයෙක් එක්ක ආදරෙන් බැඳුණා කියලා..

ඇත්තටම මානසික රෝගියො කව්ද කියලා අපි හිතලා බලන්න ඕන.. නේද..

ඔයාලා හැමෝම කතාව ඇතුළේ නිදහසේ හිතනවා අනේ.. මට හරි ආස හිතෙනවා ලියන්න.. ඉස්සරහට එන කාලෙ ඔයාලා ආස වෙයි කියලා හිතෙනවා..

එන්නාම්.. ලව් යූ.. ❤

දැන් රධ්‍ය ඕන ඕන කියලා වරද්ව ඉලන්න ගත්තොත් දෙනවා දෙකක්.. නරක සමනලයා.. හර්තෙ..

ප.ලි.

@Shan

- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)

- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 166 කොටස

" අනු-මට කියන්නකොමට තේරෙන්නැනෙ කිසිමදෙයක්.. මගේ ළමයි දෙන්නා.. මොන-මොන වරදක් කළාටද මෙහෙම.."

ආධ්‍ය මේ දවස් තුනට අඬාවැටෙන දහස්වෙනි වතාව..

" අපි රධ්‍යව සනීප කරගන්න ඕන.. ඔයා මෙහෙම අඬලා කොහොමද දරුවො වැඩක් හරියට කරගන්නෙ.. අනික ඒකා ආවනෙ.."

අනුරාග් ආධ්‍ය ගාවින් ඉදගෙන ආධ්‍යව පපුවට තුරුලු කරගෙන සනසන්න උත්සහ කළත් ආධ්‍ය තව ටිකක් හයියෙන් අඬාවැටුණා.. සතුටු වෙන්න ඕන හැම එකකම ආධ්‍ය නොසැහෙන ඇඩුවා.. තමන්ගෙ සහෝදරයා අවුරුදු ගාණකින් දැක්කහම සතුටු වෙන්න ඕන වුණත් ආධ්‍යගෙ පපුව පිච්චිලා ගියා.. රධ්‍ය.. දැකපු මුල්ම වතාවෙ..

දිග ගුවන් ගමනකින් පස්සෙ රධ්‍ය ලංකාවේ පුරුදු හුළඟින් හුස්ම ගන්න ගමන් හිටියා.. ආධ්‍යගෙ ගෙදර ඇඩ්‍රස් එක ඩ්‍රයිවර්ට දුන්නයින් පස්සෙ රධ්‍ය තමන්ගෙ ඇහිලි වෙවුලන එක නවත්තගන්න හුහක් උත්සහ කළත් ගුවන්තොටුපොළේ අම්හිරි මතක රධ්‍යගෙ ඔලුව සම්පූර්ණෙන්ම අවුල් කළා.. ඒවා ආයෙම මතක් වෙනවා.. රධ්‍යගෙ ඔලුව ඇතුළෙ අකුණු පුපුරණවා වගේ වේදනාවක් දැනුණා.. එයාට ඒ වේදනාව කියලා විස්තර කරගන්න පුළුවන් එකක් නෙමෙයි.. අන්තිමේ පැයක විතර් ආමනකින් පස්සෙ රධ්‍ය හිටියෙ ආධ්‍යගෙ කුරුඳුවත්තෙ ගෙදර ගේට් එක ඉස්සරහා.. රධ්‍යට කලන්තෙ වෙන්න ඔන්න මෙන්න තියෙද්දි බිත්තියට වාරු වෙලා අමාරුවෙන් බෙල් එක දෙතුන්පාරක්ම ඔබාගෙන ඔබාගෙන ගියා.. ටික වෙලාවකින් ගෙදර ඇතුළින් හුරුපුරුදු බිරුම් සද්ද වගයක් ඇහෙද්දි රධ්‍ය ලැගේජ් හැන්ඩ්ල් එක අතට හයියෙන් ගුලි කරගත්තා.. ගේට් එක ඇරුණා..

" ක-කොල්ලො.. රධ්‍ය..!!!"

රධ්‍ය කලන්තෙ වෙලා බිම ඇදගෙන වැටෙන්න ගිය අන්තිම මොහොතේ අනුරාග් රධ්‍යව ඉක්මනින් වාරු කරගත්තා.. පැයගාණක ගුවන් ගමනෙ මහන්සියයි.. හිතට දැනෙන පීඩනයයි රධ්‍යගෙ ඇහේ හයිය අඩපණ කල්ලා තිබුණා..

@Shan

" මා-මෙහ්හ්.."

ඊළඟ මොහොතම රධ්‍යට හැමදේම කළුවර වෙලා පෙනෙද්දි ආධ්‍ය එයා දිහාට දුවගෙන එනවා විතරක් බොඳ වුණු ඇස් වලින් පෙනුණා..

ආධ්‍ය රධ්‍යව කාමරේකින් පරිස්සමට හාන්සි කරවලා නින්ද යන්න බෙහෙත් දුන්නා.. ආධ්‍ය එයාගෙ සහෝදරයා.. එයාට හැමදේම දැනෙනවා.. රධ්‍යගෙ මූණෙ තිබුණු වෙහෙස.. ඇස් වල මලානික පෙනුම.. අවසානයේ තමන්ගෙ සහෝදරයාත් තමන් වැටුණු වලටම ඇදගෙන වැටුණා කියන හැඟීම ආධ්‍යගෙ හිතට තදින්ම කාවැදුණා..

දිග නින්දකින් පස්සෙ රධ්‍ය අවදිවෙන්න බලාපොරොත්තු වුණේ කළුවර කාමරේකින් වුණත් එකසැරේ සුදුපාට බිත්ති වලින්, අඳුරු කහ පාට ලයිට් වලින් එළිය වුණු කාමරේ හැඩරුවින් රධ්‍ය හොඳ සිහියට එන්න උත්සහ කළා.. එයා කොච්චර වෙලාවක් නිදාගෙනද.. සමහරවිට පැය හයකටත් වැඩිය.. රධ්‍යගෙ ඇඳුම් මාරුවෙලා තිබුණා.. ඔලුව උඩින් තිබුණු ගෝස් වලින් එන කොලෝන් සුවඳ.. නිහඬ පසුබිම කපාගෙන ඇහෙන පිරිත් හඬ..

" මම ඉන්නෙ අයියා ගාව.."

රධ්‍යට ඉබේම මිමිණුනා.. රධ්‍ය ඒ කාමරේ දිහා හොඳට ඇස් ඇරලා බලද්දි එකසැරේම ඇස් නැවතුණේ මේසෙ උඩ තිබුණු උපාධි සහතිකේකුයි, කැප් එකකුයි, රෝලකුයි ගාව.. රධ්‍ය කලබලෙන් නැගිට්ටා.. හිස කැරකෙන ගතියක් තිබුණත් රධ්‍ය ඉක්මනින් මේසෙන් ඉඳගත්තා..

**" කොළඹ විශ්ව විද්‍යාලය - වෛද්‍ය පීඨය "**

රධ්‍යගෙ ඇස් වලට කඳුළු ඉනුවා.. පපුවෙන් එන හිරිය නොසලකා හරින්න පුළුවන් වුණත් ඇස් වල කඳුළු එහෙම නොසලකා හරින්න පුළුවන් වුණේ නෑ.. වරද් එයාගෙ හීනෙට ගිහිල්ලා.. හීන හැබෑකරගත්තා කියලා සාක්ශි තියලා.. යන්න ගිහිල්ලා.. රධ්‍යට මේවා දරාගන්න පුළුවන් කමක් තිබුණෙ නෑ.. තැන තැන තියලා තියෙන පොත් රධ්‍ය අතට අරගෙන පරිස්සමට ඒවා උඩ ඇඟිලි යැව්වා.. වරද්ගෙ තේරුම් ගන්න බැරි වැල් අකුරු.. පිළිවෙලක් නැති සටහන්.. එයා වෙනස් වෙලා නෑ..

**" belongs to V. Shaneru Udyoga "**

@Shan

රඩ්‍යාට දැනෙන සතුට කියාගන්න බැරි තරම්.. ඇත්තෙන්ම හදවතින්ම රඩ්‍යාට සතුටක් දැනුණා.. පොත් වලට යට වෙලා තිබුණු ස්ටෙත් එක.. තාමත් පරිස්සමට තියනවා.. ඒ මෙටල් ටැග් එක රඩ්‍යා මේකට දාපු දවසෙ වගේම තාම පරිස්සමට තියනවා.. අම්මා කිව්වා වගේම වරද් රඩ්‍යා වෙනුවෙන් ඉඳලා.. නොකියම ගියාට වරද් පොරොන්දු රැකලා.. ඕනම තැන ටික කාලෙකට බයක් නැතුව අතාරින්න කියපු කෙනාම පොරොන්දු රැකලා.. රඩ්‍යාට මේ මොහොතෙම වරද් ගාවට දුවගෙන යන්න ඇත්නම් හිතුණා.. ආයෙම වරද්ව තුරුළු කරගන්න.. හිම්හිට කම්මුලකින් හාද්දක් තියන්න.. රඩ්‍යාගෙ හිත කෑගහලා ඉල්ලුවා.. ආයෙ වරද්ව, අයියව මොහොතකටවත් දුරස් කරන්නෙ නෑ..!! එහෙම කරන්න කාටවත්ම බෑ.. රඩ්‍යා ස්ටෙත් එක පරිස්සමට එහායින් තියලා නැගිට්ටා.. ඒ දවස්වල දුවපැන පැන ඉඳපු කොල්ලා සෑහෙන්න ලොකු වෙලා.. රඩ්‍යාට ඒ කාලෙ මහැරුණා.. කමක් නෑ.. ඉස්සරහට එන කාලෙ මහැරෙන්නෙ නෑ..

රඩ්‍යා නැගිටලා සාලෙට යද්දි ආධ්‍යා කවුරුත්ම නැති සාලෙ පැත්තකින් වාඩිවෙලා ඇඳුම් ගොඩක් නමනවා.. රෑ එකොළහට විතර ඇති.. රඩ්‍යා මොකුත් නොකියම ගිහින් ආධ්‍යා ගාවින් ඉඳගෙන ආධ්‍යාට තුරුල් වුණා.. ආධ්‍යා එකසැරේ ගැස්සුණත් ටික වෙලාවකින් රඩ්‍යාව කිටි කිටියෙම තුරුල් කරගත්තා.. රඩ්‍යාගෙ අයියා ජීවත් වෙනවා කියන හැඟීමම රඩ්‍යාට සැනසීමක් ගෙනාවා.. එයා කරපු කැපකිරීම් වල ප්‍රතිඵල තියෙනවා..

" පොඩී.. ඔයා ඇහැරුණාද.."

ආධ්‍යාගෙ ඇඟිලිතුඩු රඩ්‍යාගෙ කොණ්ඩෙ අස්සෙන් එහෙ මෙහෙ යද්දි රඩ්‍යාගෙ ඇස් කඳුලු වලින් තෙත් වුණා.. ආයෙමත් එයාගෙ අයියා ඉන්නවා..

" අයියෙ.."

" අයියා ඉන්නවා.. ඔයා ගාව හැමතිස්සෙම අයියා ඉන්නවනෙ පොඩී.. ම්ම්..?"

ආධ්‍යාගෙ කටහඬ වෙවුළුවත් එයා ඒක නවත්තගෙනම හිටියා..

" අයියා සනීපෙන් නේද.."

රඩ්‍යා ආධ්‍යාගෙන් අයින් වුණා..

@Shan

" මම සනීපෙන් ඉන්නවා පොඩී.."

ආධ්‍ය රධ්‍යගෙ කම්මුලකින් අතක් තියාගෙන ඇස් දිහා බලාගෙන හිටියා.. රධ්‍ය ඇස් මහ ඇරලා බිම බලාගත්තා..

" මට හිතාගන්න බෑ ඔයා ඉන්නව නේද.."

රධ්‍ය සද්දයක් නැතුව හිටියා..

" අයියා බයවුණා පොඩී.. අයියා පරක්කු වුණා.. ආයෙ නම් කොහෙවත් යන්න එපා දෙයියනේ.. මම කොහොමද ඉවසගන්නෙ.."

ආධ්‍ය කම්මුල් දිගේ බේරෙන කඳුළු ඉක්මනට පිහාගත්තා..

" ආයෙම නරක දේවල් වෙන්නෙ නෑ පොඩී.. ඔයාගෙ වරද් ඉක්මනට සනීපවෙලා අපි ගාවට එනවා.. හොඳද.."

" ම්ම්.."

" කතාකරවකො පොඩී..!!"

රධ්‍යට ලාවට හිනාගියා..

" එනවා.."

ටිකකින් අනුරාග් ආරුව වඩාගෙන ඇවිත් රධ්‍ය ගාවින් ඉඳගත්තම රධ්‍ය ඇස් දෙක ලොකු කරගත්තා.. වරද්ගෙ මුළු වෝල් එක පුරාම ඉන්න පොඩි දරුවා.. ආධ්‍යගෙ පොඩි පුතා.. රධ්‍ය පුදුමෙන් ආරු දිහා බලාගෙන ඉද්දි ආරු රධ්‍යට අත දික් කල්ලා එකක් ගැහුවා.. ඒ අත් හුහක් චූටි.. රධ්‍ය එකපාර බයවෙලා එහාට ගියා.. මෙයාලව ෆොටෝ වලින් දැකලා තිබුණට රධ්‍ය කවමදාවත් හැබැහින් දැකලා තිබුණෙ නෑ..

" මෙකා දැන් කවද සාකි.. ලොකු තාත්තද.. අරකා චූටි තාත්තනම් රධ්‍ය ලොකු තාත්තා වෙන්න එපෑ.."

අනුරාග් ආරුව රධ්‍යගෙ අතින් තිබ්බම ජීවිතේට ළමයෙක් වඩාගෙන හුරු නැති රධ්‍ය බයවෙලා දෝත බඳලම ආරුව අල්ලගත්තම ආධ්‍ය අයියා හිනාවුණා..

@Shan

" ලොකු තාත්තම කියමු නේද.. මේ පච්ලෙ නැකම මටත් තේරෙන්නෙ නෑ අනේ.."

" පපා!! මේ කාද.. කාද ඔවා.. කාද.. කාද.."

ආරු රධ්‍යගෙ කම්මුල් දෙකෙන් අල්ලලා දෙපැත්තට ඇද්දා.. රධ්‍යට තාම හිතාගන්න බෑ මේ එයාගෙ අතේ ඉන්නෙ ආධ්‍යගෙ පොඩි පුතා කියලා..

" ඔයාගෙ.. ලොකු තාත්තා.."

" මෙන්න තදි තුතුළා නැගිතලා.. පපා..!!!"

ඒ එක්කම නයිට් කිට් එකක් ඇඳගෙන ඉඳපු පොඩි කොල්ලෙක් පැන පැන ඇවිත් ආධ්‍යගෙ ඇඟට පැන්නා.. ඒ ගෙදර ළමයි රෑට නිදාගන්නෙ නෑ.. ඇහැරගෙන පැන පැන යනවා විතරයි..

" කව්ද චූටිපුතා.."

අනුරාග්ට හිනාගියා..

" තදි තුතුළා.. රතු තුතුළගෙ පෝනියෙ ඉන්නෙ.. මත තුති තාත්ති කිව්වෙ තදි තුතුළා කියලා.."

ආධ්‍ය නවපු ඇඳුම් ටිකත් උස්සගෙන නැගිට්ටා..

" කන්න යමු.. මදෑ කන වෙලාව.. මම මේ ටික තියලා එන්නම්.. අනූ අම්මා නිදි නේද.."

" ඔව් කලින්ම නිදාගත්තා.."

රධ්‍ය ආරුව බදාගෙන ආධ්‍ය දිහා හැරිලා බැලුවා..

" අත්තම්මා ඉන්නවද..?? මෙහේ..??"

" ඔව්.. හෙට කතාකරන්න පොඩී.. ඔයා එක්ක අම්මා කතාකරන්න බලාගෙන හිටියෙ.."

@Shan

ආරු රධ්‍යගෙ අතින් දහලලා දහලලා බිමට බැහැලා දණගාගෙන ගිහින් බෝලයක් කටෙ ගහගත්තා.. අවී රධ්‍යගෙ මූණට එබිලා හොඳට බලාගෙන ඉඳලා එහාටවෙලා රධ්‍යගෙ කකුලට කකුලෙන් ඇන්නා..

" තදි තුතුළා නපුරුයි වගේ ඩඩා.."

" ඔව් පුතේ.. ඔය ඉන්නෙ ගෝනිබිල්ලා.. අර චූටි තාත්ති කියන්නෙ.. රට ඇවිත් උස්සන් යන්නෙ.."

" මාමෙ..!!"

" මොකද උඹ.. ඉංජිනේරුවෙක් කියලා අපිට ලොකු නෑ හරිද.. මගේ නල්ලමලේ බෑණව කසාද බඳින්න ලෑස්තිවෙයන්.. මෙ මාමා හොඳට හොඳයි නරකට නරකයි.."

" ආ..??"

" එල්ලනවා බාල්කෙක..!!"

මාමා රධ්‍යගෙ පිටට දබෝස් ගාලා එකක් ගහගෙන නැගිටලා උඩට ගියා.. රධ්‍ය ගෙදර ඉස්සරහ දොර ඇරගෙන එළියට බැස්සා.. ලන්ඩන් වල දැනෙන ආගන්තුක හුළඟ වෙනුවට මේ හුළඟ හුඟක් හුරුපුරුදුයි.. රධ්‍යට සෑහෙන්න කාලෙකින් නිදහසක් දැනුණා.. අයියා ගාව ඉද්දි තමන්ගෙ කම දැනුණා.. එයාලගෙ බබාලා දිහා බලාගෙන ඉද්දි සතුටු හිතුණා.. එයා කරපු කැපකිරීමෙ ප්‍රතිඵල තියෙනවා..

*බුහ්*

එකසැරේම ගෙදර පැත්තක ඉඳපු රෙක්සි බුරාගෙන ඇවිත් රධ්‍යගෙ ඉණ හරියට කකුල් දෙක තියලා ඉස්සුනා..

" රෙක්සි.. කියාරා.."

කියාරා රධ්‍යව ගණන් ගන්නෙ නැතුව පැත්තකට වෙලා නිදාගෙන හිටියා.. රෙක්සිගෙ බෙල්ලට දාපු පටිය වෙනස් කල්ලා.. රධ්‍ය බිමට පහත් වෙලා හති දදා ඇහ වටේ දුවන රෙක්සිගෙ බෙල්ට් එකේ නේම් ටැග් එක අරගෙන

@Shan

බැලුවා.. ඉස්සරහා රෙක්සිගෙ නම තියනවා.. පිටිපස්සෙ ප'මනට් මාකපෙන් එකකින්,

**' දුස්ට අමමණ්ඩි '**

" වරද්!!!"

රධ්‍යට පුරුද්දටමම කෑගැහුණා.. රෙක්සි නැගිටලා රධ්‍යට බිරුවා.. ඒ එක්කම ආරු ගෙදර ඉස්සරහට දණගාගෙන ඇවිත් උළුවස්ස අල්ලගෙන වැනි වැනි නැගිට්ටා.. රධ්‍ය ගිහින් පුරුදු නැතිවුණත් ආරුව හරහට වඩාගත්තා.. උඩ පඩියෙන් වැටුණොත් කියලා..

" ඔකු තාත්ති.. ලෙක්ශි.."

" ඉතින්..??"

" ලෙක්ශි හපනවා.. පපා..!!!"

" එයා.. හපන්නෙනෑ.."

රධ්‍ය අන්දොස් වෙලා රෙක්සි දිහා බලාගෙන ඉදලා, ආරුගෙ මූණ දිහා බලාගෙන ඉදලා, ආයෙම රෙක්සි දිහා බැලුවම ආරු විලාප තියලා අඩන්න පටන් ගත්තා.. රධ්‍ය ආරුව බය වෙලා එයාව හාල් ගෝනියක් වගේ උස්ස්සගෙන ගිහින් ආධ්‍ය අයියගෙ ඇහේ ගැහුවා..

" අයියෙ.. ආ.."

" පොඩ්ඩක් අල්ලගන්න පොඩී.. මම වැඩක්නෙ.."

" අනේ මම දන්නෑ.. ගන්න.."

" ළමයෙක් වඩාගන්න ඉගනගන්න දැන්.. චූටිනම් එකසැරේට දෙන්නවම උස්සගෙන නලොනවා.."

රධ්‍යගෙ ඇස් ලොකු වුණා.. මොකක්..?? වරද් ළමයි වඩාගන්නවා..??

" ක්-කවුරු.. වරද්..??"

@Shan

" වරද් තමා.. අම්මා එක්ක කතාකරන්න චූටි.. මාත් එක්ක දවල් අම්මා හුඟක් වෙලා කතාකළා.."

අවුරුදු ගණනකින්..

" මම ගන්නම්.. අම්මා වරද් බලන්න යනවා කිව්වද.."

" ඔව්.. එයා දේදුණු අම්මා හමුවෙන්න යනවා කිව්වා.."

" වරද්ට දැන් කොහොමද අයියෙ.."

" තාම සර්ජරි එකේ රිසාල්ට්ස් කියලා නෑ.. ලොකුවට ඩැමේජ් එකක් නෑ කියලා කිව්වෙ.."

" ම්ම්.."

රධ්‍ය හුඟ කාලෙකට පස්සෙ හිතේ සැහැල්ලුවෙන් රුකැමකට ඉඳගෙන හැමෝම එක්ක කෑම කෑවා.. රධ්‍යගෙ ඔලුවෙ තියන පීඩනේ එකසැරේම නැත්තටම නැතිවෙලා නොගියත් අඩුම තරමෙ ඒ පීඩනේ අඩුවෙලා තිබුණා.. පැනික් ඇටැක් එද්දි ගන්න බෙහෙත් නතරකරන්න ඕන කියලා එයාට හිතුණා.. දැන් අවුරුදු හයක් තිස්සෙම රධ්‍ය බෙහෙත් බොනවා.. එයාට හදිසියෙ එන පැනික් ඇටැක් වලින් ගැලවෙන්න.. මානසිතව ඇතිවෙන ආතතිය කියන්නෙ විහිළුවක් නෙමෙයි.. ඒ අඳුරු හැඟීම.. තමන්ගෙ ළඟ ඉන්න කෙනාවවත් අඳුනගන්න බැරි වෙන හැඟීම හොඳ දෙයක් නෙමෙයි.. අසලි අවුරුදු ගණනාවක්ම රධ්‍ය වෙනුවෙන් රධ්‍යගෙ අත්දෙක අතෑරියෙ නෑ.. එක දරුවෙක් තමන් ළඟින් වෙන් කල්ලා තව දරුවෙක් වෙනුවෙන් කැපවෙන්නම එයා හිත හදාගත්තා.. අවශ්‍ය කාලෙදි දරුවො අතාරින්න ඕන තමා.. ආධ්‍ය කියන්නෙ පොඩි දරුවෙක් නෙමෙයි. එයා ගාව එයාගෙ හයියට තව කෙනෙක් හිටියා.. ඒත් රධ්‍යට කවුරුත්ම හිටියෙ නෑ..

පහුවදා රධ්‍ය දවසෙම හිටියෙ ආච්චිඅම්මගෙ කාමරේ.. ආච්චිඅම්මා හිතාගෙන ඉන්නෙ වරද් පොඩි ඩැමේජ් එකක් නිසා රට ගියා කියලා.. ආච්චි රධ්‍යව අල්ලගෙන සෑහෙන්න වෙලා ඔලුව අතගෑවා.. ඉස්සර රධ්‍ය කියව කියව හැමතිස්සෙම ආච්චිඅම්මගෙ පස්සෙන් යන හැටි රධ්‍යට මැවිලා පෙනුණා.. ආච්චිඅම්මා හදලා දෙන වැලිතලප කෑල්ලක් කකා.. ගමේ ගෙදර ඉස්තෝප්පුවෙ ඉඳගෙන ඉන්න රධ්‍ය හරි ආසයි.. ඒ කාලෙ හීනයක් වගේ..

@Shan

මේ ලෝකෙ මනුස්සයෙක් ලබන්න ඕන ආදරණීයම හැගීම් ගොඩක් වරද් රධ්‍ය වෙනුවෙන් ගෙනැත් දුන්නා..

" දැන් කසාද බඳින්න ඕන වයසනෙ මගෙ පුතේ.."

රධ්‍ය ආච්චිඅම්මගෙ අත් දෙක අල්ලගෙන පරිස්සමට අතගෑවා.. ඉස්සර දුවලා පැනලා කෑම හැදුව.. හැම වැඩක්ම කරපු ආච්චිඅම්මා අද වෙද්දි හුඟක් වයසට ගිහිල්ලා..

" ඔව් අත්තම්මෙ.. වරද් සනීප වුණාම.."

කසාද බඳින කතාව ඇහුවත් හරි රධ්‍යව රතු වුණා.. ආච්චිඅම්මට හිනා ගියා.. තව අවුරුදු සීයක් ගියත් රධ්‍ය රතු වෙන එක නවත්තන්න බැරි වෙවි..

" අන්තිමට ඒකා බැදලා සතුටින් ජීවත් වෙනවනම්.. මට සැනසීමයි.."

" ඊටකලින් පොඩි වැඩ ටිකක් තියනවා අත්තම්මෙ.. ඒවත් ඉවරකරගත්තම අත්තම්මටත් එන්න බැරියැ.."

" නැතුව.. මේ ආත්තම්මා නැතුව මගුල් කන්න.. එච්චා හදේ තමා.."

ආත්තම්මා රධ්‍යට හිමින් පාරක් ගැහුවා..

" දැන් රත්තරනේ උඹ ඉංජිනේරු මහත්තයෙක් නෙ.. මේ දරුවො ලොකු වෙන හැටි.. අනේ ලෝබ හිතෙනවා කොල්ලො.."

ආච්චිඅම්මගෙ වචන මතුවුණේ හදවතින්මයි..

" අත්තම්මා සනීපෙන් ඉන්නකො.. අපි ලොකුවෙනවා බලාගෙන.."

ආත්තම්මා රධ්‍ය දිහා ආදරෙන් බලාගෙන හිටියා. තමන්ගෙ මුණුබුරාගෙ ආදරේ, හරි ආදරණීයයි.. අත්තම්මා හදවතින්ම ආශිර්වාද කළා.. හැමදාම සතුට ඇවිත් එයාලා වැළඳගන්නම ඕන..

" දැන් පුතා මෙහේ කොහෙද රස්සාවට යන්නෙ.. ළඟදි එච්චත් ලැස්ති කරගන්න එපැ.."

@Shan

" ප්‍රයිවට් කැම්පස් එකක ඇසිස්ටන් ලෙක්චර් කෙනෙක් විදියට උගන්නන්න යනවා.. මම මාසෙකට කලින් ඊමේල් එකක් දාලා ඒක සෙට්ල් කරගත්තා.. ඒ ඇරෙන්න කම්පනි එකක ඉලෙක්ට්‍රිකල් ඉන්ජිනියර් කෙනෙක් විදියට වැඩකරන්න ඉන්නෙ.."

" හොඳයි හොඳයි.. හරිම සතුටුයි.. මගෙ පුතා හැමදාම සතුටින් ඉන්න ඕන.. කරන කියන හැමදේම සාර්ථක වෙලා.. දැන් ඔය දෙපැත්තට වෙලා හිටියා මදැයි කොල්ලො.."

රධ්‍ය ආච්චිඅම්මා එක්ක හිනාවුණා.. මේ කරුණාව තමන්ගෙ අප්පච්චි ගාවත් තිබුණනම්.. මේ කතාව කොච්චර ලස්සන වෙන්න තිබුණද.. රධ්‍ය කල්පනා කලා..

හැම කැපකිරීමකම ප්‍රතිඵලයක් තියනවා.. ඒ ටිකම මදිද හිත හදාගන්න.. ආයෙම මල් පිපෙනවා.. සීත කාලෙ කළුවර ගෙවිලා ඉර පායන්න ගත්තම මල් පිපේවි.. අනිවාරෙන්ම මල් පිපෙනවා.. එයාලගෙ පාරවල් දෙක ආයෙදිම එකතු වෙලා..

මේ දවස් වෙනකල් රධ්‍ය මැච්ච හීන කෝටියම හැබෑවෙන්න අරගෙන.. ඉතින්.. ඒ මදිද...??

නාක සලමනේ ආවෝ..

මේ POV එක ඉවරායි.. රධ්‍ය සුදූඅම්මියා එනකල් බලාන උන්නු දළඹු හමුදාවට මේ පනිවිඩේ අරගෙන යමන ඒයි.. කෝ මගේ ඉදිරිපෙළ සෙබලියො ටික..

දැන් කියවන්න දම්සාරිලා.. බුදාම්මියෝ මට දැනෙන සහනෙ සහන්ටවත් දැනෙන්නෙ නෑ..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

@Shan

- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 167 කොටස

" සුදුමහත්තයා.. උඩ තියාගෙන ඉන්නෙ නැතුව ගිහින් ඇඳුමක් මාරු කරගන්න.. අර මනුස්සයො දැන් එනවත් ඇති.. ඔහොමද අවුරුදු විසි හයක් වෙන පිරිමි ළමයෙක් හැදෙන්නෙ.. ආ මං අහන්නෙ.. අකිල මේ ළමයට යන්න කියන්නකො.."

මම අම්මගෙ කන් කරච්චලේ ඇහුණෙ නෑ වගේ අතේ තිබ්බ ඩ්‍රැගන් ෆෘට් බැයට හැන්ද ගහලා ලස්සනට වටයක් කරකලා ඒක කටේ දාගත්තා.. මම නම් යයි ඇඳුම් මාරුකරගන්න.. අනික මට ඇවිදගන්න පුළුවනෑ.. මල සමයං.. අපේ අම්මා උදේ පාන්දර ඉඳලා කැලිෆෝනියාව දෙක කරනවා එහෙට දුව දුව මෙහෙට දුව දුව.. හොඳ වෙලාවට නේබර්ස්ලට සිංහල බෑ.. නැත්නම් මට පාරෙ බැහැලා යන්න බැරිවෙනවා.. අද ගෙදරට අම්මගෙ යාළුවො වගයක් එනවලු.. කාව බලන්නද.. මාව බලන්න..

මගේ මොනව බලන්නද..?? කලිසම ගලෝලා පෙන්නනන්නද..

ඒකත් මනමාලයෙක්..!! මනමාලයොන්ට ඇවිත් මගේ බලන්න තරම් දෙයක් නෑ.. හොස්පිටල් ඉඳලා මාසෙකට පස්සෙ යන්තම සිහිය ඇවිල්ලා රෝදපුටුවෙන් ගෙදර ඇවිත් ගෙන ගේමක් දීලා මම මේ ක්‍රචස් දෙකකට මාරුවෙලා ඉන්නවා.. අම්මට මගේ කැපකිරීම ගැන වගක් නෑ.. හැමතිස්සෙම.. මනමාලයො මනමාලයො මනමාලයො.. වරෙන්කො ඔය හෝතම්බුවා අද ගෙදරට.. ගහනවා ඩ්‍රැගන් ෆෘට් බැය ඔලුවෙ.. ආයෙ මනමාලයො නොබලන්න..

මම මේ රධ්‍ය අයියගෙන් එක කෝල් එකක් හරි ඒචි කියලා මඟ බලාගෙන ඉන්නවා සතියක් තිස්සෙ.. කාටවත් එයා ගැන ගාණක්වත් නෑ.. මම ඇහුවට කියන්නෙත් නෑ.. අසලි අම්මා කොහෙද දන්නෙත් නෑ.. අප්පච්චි හිරේට ගියා කියලා ආරංචිවුණා.. එහේ පොලිසියෙන් මෙහේ පොලීසියට පැමිණිලි කල්ලා මගෙන් කට උත්තරයක් ගත්තා.. ආච්චිඅම්මයි මාමයි අයියයි කතාකළා.. එයාලා රධ්‍ය අයියා ගැන දන්නෙ නැල්ලු..

" චූටිපුතා ගිහින් ඇඳුමක් මාරු කරගෙන එන්න.."

" මට බඳින්න බෑ බාප්පෙ.. මගුල.. අම්මට කියන්න අනේ.."

@Shan

" ඔන්න ඔහේ වෙනසකටත් එක්ක අද කෑම වැඩිපුර හැදෙනවනෙ කොල්ලො.. ආවට පස්සෙ බෑ කියමු.. මම ඉන්නවනෙ.."

බාප්පා මගේ පිටට එකක් තට්ටු කල්ලා මං ගාවින් වාඩිවුණා. අද ඉරිදා නිසා බාප්පට නිවාඩු.. අම්මා ආයෙම කොස්සක් උස්සගෙන ටීවී එක ඉස්සරහින් හිටගත්තා..

" යනවද නැද්ද.."

අම්මා මට කොස්ස දික් කල්ලා තර්ජනය කළා.. යකෝ!! අස්තියක්ම බිඳිලා ගිහින් ඇවිදගන්න බැරුව ඉන්න අහිංසයට නේද මේ තර්ජනය කරන්නෙ..

" මට බෑ!!"

" පෙනේද.. පෙනේද මේකගෙ කට.. උපන් දා ඉඳලා නැහැදිච්චකම.. කියන එකක් අහන්න බෑ.. ගිහින් ඇඳුමක් මාරුකරන් වරෙන්.. අපිටත් ලැජ්ජ කරනවා.."

මම අම්මට මූණ ඇදකරගෙන දුර තිබ්බ ක්රචස් දෙකත් අරගෙන එක කකුලකට වාරුවෙලා අමාරුවෙන් නැගිටගත්තා.. මැහුමක් කැඩුණොත් අම්මටසිරි වෙනවා.. නැගිටිද්දිම මට කෙඳිරි ගෑවුණා.. මගේ කලව ගාව ඉඳලා පහළට කකුල කම්බියකට ඉරාගෙන ගිහිල්ලා.. දනහිස ගාව බෝන් එකක් ඩැමේජ් වෙලා.. අත දාපු ආර්ම් ස්ලින්ග් එක අයින් කලේ පෙරේදා.. මාව දැන් නිකන් මමියක් වගේ.. ඊයේ අම්මා ගෙදරටම මනුස්සයෙක් ගෙන්නවලා කොන්ඩෙ කැප්පුවා.. ෆේශල් වගේකුත් දැම්මෙව්වා.. මගෙ ඉතින් කකුල පණ නැති නිසානෙ මේ සේරම.. අම්මා තමයි මං ගාව ඉඳගෙන කවන එකේ ඉඳලා කරන්නෙ.. ඒත් කොහෙන් ගියත් ඉවරවෙන්නෙ..

" වයසත් පහුවෙනවා.. ගෙදරට නාකි වෙන්නද හදන්නෙ.."

ඊටපස්සෙ මට මල පනිනවා.. මගේ කකුල හොඳවුණේ නම් හාස්කමකින් වගේ.. වෙන කොහේටවත් ඩැමේජ් වෙලා තිබුණෙ නෑ.. කකුලටයි අතටයි තමයි ලොකුවටම ඩැමේජ් වෙලා තිබ්බෙ.. තවම මගේ ඇඟපත රිදෙනවා.. මාව සනීපකරපු ඩොක්ටර්ස්ලට මම කොහොම පිං දුන්නත් මදි.. ඇත්තටම මෙහෙ නොගෙනාවනම් මම මේ කකුලෙන්ම මැරිලා යන්නත් තිබුණා.. දැන් කකුලට ප්ලේට්ස් දාලා ප්ලාස්ටර්ස් දාලා හෙල්ලෙන්නෙවත් නැතුව කලව ගාව ඉඳලම පහළට ඔතලා තියෙන්නෙ.. axilla crutches දෙකේ

@Shan

වාරුවක් නැතුව හිටගන්න මට හිතන්නවත් බෑ.. ඒකත් මගේම හිතේ හයියට නැගිට්ටා මිසක්.. වෙන එකෙක්නම් රෝදපුටුවෙ මෙලහකටත්..

" ඔය ඉතින්.. පරිස්සමට.."

අම්මා මාව අල්ලගෙන ඇවිත් මම ඉන්න කාමරෙන් තියලා අල්මාරියෙන් ඇඳුමක් අරගෙන අයන් කල්ලා මං ගාවින්ම තිබ්බා..

" ආවට පස්සෙ කැමති නැත්නම් නොකර ඉමු.. එන්න ඇහුවම බෑ කියන්න බැනෙ සුදුමහත්තයා.."

අම්මා මගේ ඔලුව අතගාලා යන්න ගියා.. හැයි හැයි තමා.. මගෙන් අහන්නෙත් නැතුව මෙතන මනමාලයො කතාකල්ලා.. මොන කරුමයක්ද මන්දා.. අනික ඔය එන එකා හෙන අමුතු මිනිහෙක්.. මම තියන කුතුහලේටම එනවයි කිව්ව මනමාලයගෙ නම්බර් එක බාප්පගෙන් ඉල්ලගත්තා.. මට බෑ මොකෙක්වත් බඳින්න.. මම බඳින්නෙ මගේ මිනිහා විතරයි.. මම දැම්මා කොටලා හිච්චි මැසේජ් එකක්..

' අයියෙ මම ෂනෙරු.. ටිකක් කතාකරන්න පුළුවන්ද..'

'කියන්න..'

'අයියෙ ඇත්තටම මට මේ ප්‍රපෝසල් එකට කැමති වෙන්න බෑ..අනික මට කෙනෙක් ඉන්නවා..'

'ඉතින්..'

මම සෙනුකයයි මමයි බදාගෙන ඉඹගෙන ගහපු ලස්සන ෆොටෝ එකක් අම්මගෙ ෆෝන් එකෙන් හෝතම්බුවට යැව්වා.. මගේ ෆෝන් එක දැන් නෑ.. ඒක එදා බිඳුනනෙ..

'අපි හුඟක් ආදරෙන් ඉන්නෙ..'

'මෙයාද ඔයාගෙ බෝයිෆ්‍රෙන්ඩ්..'

'ඔව් අයියෙ..'

@Shan

ඊටපස්සෙ ඒ කොහිල සිප්පියා මට කතාකළේ නෑ.. මම ඉතින් හිත රිදෙන්න මොකුත් කිව්වෙ නැනෙ.. රධ්‍ය අයියගෙයි මගෙයි ෆොටෝ ලැප් එකේ තියෙන්නෙ.. නැත්නම් යවනව පගාට ඒකක්ම.. කොහෙද ඉතින් අවශ්‍ය වෙලාවට කිසි දෙයක් මං ගාව නෑ.. දැන් අද ඇවිත් ඔය කේලම ඕකා අම්මට කියයිද.. සැක් මමත් ඕන්නැති වැඩනෙ කරන්නෙ.. එක්කො ෆොටෝ එක නොයවා ඉන්න තිබ්බා.. දැන් ඔය මනුස්සයා ලංකාවෙ ඉඳලා මෙහෙ එන්නෙම මාව බලන්නනෙ.. අම්මා මාව බලෙන් බන්දලා දෙයිද.. එහෙම වුණොත් ආධ්‍ය අයියට මාව තාවකාලිකව බඳින්න බැරිද දන්නෙ නෑ..

මම හැරෙන තැපැලෙන් අයියට කෝල් එකක් ගත්තා..

" චූටියො.."

" ඔයා වැඩද අනේ.. නැනෙ.. කැම්පස් එකේද.."

" මොන-ආ.. ඔව් මේ.. කැම්පස් එකේ චූටි.."

" ඔයාට බැරිද මගේ බෝයිෆ්‍රෙන්ඩ් වෙන්න.. මට උදව් කරනවකො.."

ඒ එක්කම එහාපැත්තෙන් මොකෙක් හරි කහින සද්දයක් මට ඇහුණා.. කවද යකෝ ක්ලිනිකල් ලෙක්චරර්ගෙ ෆෝන් එකට කට තියලා කහින එකා.. මාමට කියන්න ඕන අයියට කියන්න කියලා මිනිස්සු එක්ක ඔනවට වඩා කදේ දාන්න එපා කියලා..

" ඒ මොකද ඒ..(අන්න බලපන් උඹෙ මිනිහා තාම මගේ මිනිහා ගැන හිතේ තියාගෙන ඉන්නවා.. ඉක්මනට බැඳපන්)

ඒ අස්සෙ මට කුටු කුටු ගාලා අපේ මාමගෙ කටහඬත් ඇහුණා.. මෙයා කොහේද අනේ මේ ඉන්නෙ..

" අපේ ගෙදරින් මට කසාදයක් කතාකල්ලා.. ඌ දැන් ගෙදර එනවලු.. මට බෑ අනේ.. මම ඔයාට කිව්වෙ.."

" ඔන්න ඔහේ ආවම කතාකල්ලා යන්න කියන්න චූටි.."(මූ නම් පොල්පිති හරකෙක්ම තමා)

@Shan

" එහෙම කිව්වම යයිද.. මගේ රූපසොබාවට වහ වැටෙයිද අනේ.. නැනෙ.."

" ඒ ඒකනම් කියන්න බෑ හැබැයි.."(අනෙ උගෙ සොබාව)(එයා ලස්සනයි මාමෙ)

" මාව බයකරන්න එපා අනේ.. ඉඳපන්කො ආවොත් මම ගඩොල් බාගෙකින් දෙනවා ඔලුවට.. මම කිව්වත් එක්ක මට එක්කෙනෙක් ඉන්නවා කියලා.."

" හරි වැරදී නේද චූටි.. බලන්න ඉතින්.."(ඔකු තාත්තිත කිස් එකක් දෙමිනම්)

" වැඩක්නෑ අනේ.. මම තියනවා.. දැන් ඇඳගන්නෙපෑ..බායි අයියෙ.."

මම අම්මගෙ ෆෝන් එක ඇඳ උඩට දාලා ක්‍රවස් දෙක අරගෙන බාතෲම් එකට ගිහින් මූණ සෝදගෙන ස්වෙට් පැන්ට් එකයි හුඩී එකයි ඇඳගෙන කොණ්ඩෙ හාෆ් පොනිටෙල් එකක් දාගත්තා.. කවුරු ආවත් ලස්සනට ඉන්න එපෑ..

ඔය එන එක්කෙනා ලස්සනද දන්නෑ.. ලස්සන උනත් මට වැඩක් නැනෙ.. මගේ ඩ්‍රැගන් ෆෘට් බැයත් එහෙමම අතෑරලා ආවනෙ.. මෙ මිනිහෙක් එන්න අරගෙන පුදුම වදේ.. සදෙව් අයියත් නැනෙ තාම.. අනික මනමාලයො කලින් ඇවිල්ලත් නෑ මාව බලන්න.. මට ලැජ්ජයි..

මම පැන පැන කුස්සියට ගිහින් අම්මා ගාවින් හේත්තු වුණා..

" අම්මෙ.."

" ඕ.."

" බඳින්න බෑ අනේ.."

" එහාට යනවා විකාර නොකිය..!! දැන් මදෑ ඔය නාකි වුණා ගෙදරට.."

" මමනෙ නාකි වෙන්නෙ.. මට සල්ලි තියනවා තනියම ඉන්න පුළුවන්.. මට ඕන නෑ කවුරුත්.. මම ආස රධ්‍ය අයියව බඳින්න විතරයි.."

" ඒකා ගැන ආරංචියක් නැනෙ.."

@Shan

මම අම්මගෙ තක්කාලි භාජනෙන් තක්කාලි ගෙඩියක් අරගෙන කටේ දාගත්තා.. මේ මිනිහට මක් වුණාද..

" අනේ අම්මෙ මම නිදි කියන්නකො.."

" සුදුමහත්තයා සාලෙට යන්න.. මට වැඩ තියනවා.. මම කලින්ම කිව්වනෙ අද ඒ මනුස්සයො එනවා කියලා.."

මම අම්මට දෙකක් ගස්සලා සාලෙට ඇවිත් සෝෆා එකෙන් පතබෑවිලා කුෂන් දෙකකකුල් දෙක මැද්දෙන් තියාගත්තා.. මගේ ෆෝන් එකවත් නැනෙ.. ආච්චිඅම්මා මොනවා කරනවද දන්නෑ.. කාටවත් මං ගැන ගාණක් නෑ..

" බාප්පේඒඒඒඒඒ!!!"

" ම්ම්.."

" අනේ මට ලොකු නිදිමතක් එනවා.. ඇත්තට කියන්නෙ.."

" අකිල ඔය ළමයට විකාර නොකර ඉන්න කියන්න.."

" චූටිපුතා නිදිමත නම් නිදාගත්තුදෙන් දේදුණු.. කොල්ලට මහන්සි ඇතිනෙ.."

" ඇත්තටද.."

මම දනිපනි ගාල කාමරේට පැනගන්න ට්‍රයි කලා විතරයි අම්මා සාලෙට ආවා.. මම අම්මට දෙකක් රැව්වම අම්මත් මට රැව්වා.. මට ඕන නෑ කවුරුත්.. මගුල..

" යන්නෑ සාලෙන්!!!"

මම ආයෙම සෝෆා එකට හේත්තු වෙලා හුඩී කවර් එකෙන් ඔලුව වහගෙන ඒක අස්සට වෙලා ඇස් පියාගෙන හිටියා.. ඒ අස්සෙ එක එක මනෝ විකාරත් මට පේනවා.. මනමාලයා ආවම මම කියනවා අයියෙ මම හුහක් අයට කැමතී කියලා.. ම්ම්.. අයුක අයියව පෙන්නලා එයා තමයි මෙ සතියෙ බෝයිපෙන් කියනවා.. සතියකට මේන්ටේන් කරගන්න මං ගාව කොල්ලො ඉන්නවනෙ.. සෙනුක අනික මං ගැන අහිතක් හිතන්නෙ නෑ..

@Shan

" ආහහ්.. අනේ රඩ්‍ය අයියා කෝ...!!!"

මම හැරිලා බාප්පා දිහා බැලුවහම බාප්පා අමුතුවට හිනාවෙලා ටී වී එකේ චැනල් එක මාරුකල්ලා මට ඩිස්නි එක්ස් ඩී දාලා දුන්නා.. මම ඒකෙ ගියපු කාටූන් එක දිහා බලාගෙන හිටියා.. අච්චර උසකින් වැටිලත්..

ඒත් මං තාම පණපිටින් සඳමාලි!!

එහෙම ලේසියෙන් මැරෙනවද මම.. අනික මෙඩිකල් කවුන්සිල් එකෙන් මට අවුරුද්දකට ප'මිශන් දුන්නා සනීප වෙලා වැඩට එන්න.. පව් මගේ වේලුවත් හැමදාම කෝල් කල්ලා අසනීප අහනවා.. එන එකාට කියන්න ඕන මට ලිංගික බෙලහීනතාවෙ කියලා.. නගින්නැති කොල්ලොන්ට කවුරුත් ආස නැනෙ.. ඒත් මූ ගස්ලබ්බෙක් වගේ කමක් නෑ මම බාරගන්නම් සුදුමල්ලි කිව්වොත් එහෙම.. ඇයියා.. සුදුමල්ලි..?? ඒක හොඳයි සෙනුකට.. මට ඕන හැපිකච්ච විතරයි.. මූට මම පොල් ගහනවා ලංකාවට ගිහින්.. මට බෑ කැලිෆෝනියා වල ඉන්න.. අනික මාමා එක්ක එකගෙයි කෑවට මාමා තරහ වෙන එකක් නෑ.. මම තාම ආඩ්‍ය අයියට කැමතියි.. එයා හැඩට ඉන්නවනෙ.. මටත් හෙන ලව්.. අයියා කවදාවත් මට අකමැති කියන්නෙ නෑ මම දන්නවනෙ.. මම දැන් එන එකාට ආඩ්‍ය අයියව පෙන්නලා ඒ මගේ මනුස්සයා කියලා කියනවා..ආර්හ්! ඒත් බැනෙ කරුමෙට මම ප්‍රසිද්ධ මනුස්සයෙක් වුණානෙ.. අපේ පවුල ගැන හැමෝම දන්නවනෙ..

" පෙර දා මැවූ සිනාආආආආආආ

සැහවී කොහේ ගියාදෝඕඕඕඕඕ..."

බාප්පා මගේ ඔලුව අතගාගෙන කුස්සියට ගියාම අපේ අම්මා හැඩට ඇඳපැළඳගෙන පහළට ඇවිත් පනාවක් අරගෙන මගේ කොණ්ඩෙ පීරුවා.. මම ඇස් දෙක වපර කරගෙන හිටියා.. ඕන්නෑ..

" මොකෝ නිකන්.."

" මට බඳින්න බැහ්.."

අම්මා මගෙ කොණ්ඩෙ තිබ්බ බූල් එක ගලවලා වෝටර් බෑන්ඩ් එකක් දාලා ගැටගහලා දෙපැත්තෙන් කැලි දෙකක් දැම්මා.. ලස්සන කරන්න එපා

@Shan

අම්මෙ.. වහ වැටුණොත් එහෙම..

" දැන් ඔහොම ඉන්නවා එකවිදියක.. නටන්නෙ නැතුව.. ඊටපස්සෙ කැගහන්නෙපා කකුල ඉද්දුනා කියලා.. අපි එපෑ දහදුක් විදින්න.."

" දහ දුක් කියන්නෙ දුක් දහයක්ද අම්මෙ.."

අම්මා පනාවෙන්ම ඔලුව මැද්දට දෙකක් දුන්නා..

" මල්බිසෝව් මෙමට දුන්නු සතුට යළි ගත්තා..

නුඹ නිසා මං එක හිතින් පිදූ ආදරේ මැරුණා...හා.... හා...."

" මේ ළමයට පිස්සු හැදිලද කොහෙද අකිල.."

අම්මා කියලා ඉවරවෙන්න වුනේ නෑ ඩෝ බෙල් එක වදින්න ගත්තා.. මගෙ පපුව එකසිය ගාණට ගැහෙනවා.. අනේ මගෙ ආච්චිඅම්මෙ.. මුණුබුරා දෙවෙනි වතාවටත් පනින්නයි යන්නෙ.. සෙනුක මේ පෞකාරයට සමාව දීපන්.. මම ක්‍රචස් දෙක අල්ලගෙන නැගිට්ටින්න ගිහින් එහෙමම බොහ් ගාලා සෝෆා එකට වැටුණා.. කකුලත් ඉද්දුණා..

" හු#ත.."

අපේ අම්මා අමුතු සිරික්කියක් දාගෙන ගිහින් ඉස්සරහා දොර අරිනවා මට ඇහුණා.. ගෑණියෙක් වුණානම් ප්‍රෙග්නට් කියන්නවත් තිබ්බා.. මම මොකක්ද කියන්නෙ.. මට ගෑණියෙක් ඉන්නවා කියන්නයැ..

" අනේ මම බැලුවා පරක්කු මොකද කියලා.."

" දන්නැද්ද නංගි.. පොඩි ළමයි ලෑස්ති කරගන්න ගියාම වෙලා යනවනෙ.."

" ආච්.. දේදු ආච්අම්මි.."

මගේ ඇස් දෙක පොල්ගෙඩි දෙකක් සයිස් වෙලා පපුවෙ අමාරුව හැදිලා මැරෙන්න ආවා.. මේ මොනෞත්තක්ද මේ වෙන්නෙ.. අපේ මාමා මම කියන ඒවා සිරා අරගෙන අයියව මට දෙන්නද යන්නෙ..

@Shan

" පුතා..!!!! කොල්ලො ..දැක්ක කල් මම.. අම්මනම් පහුගිය ටිකේම මෙහෙ හිටියනෙ.."

මම ක්ශණිකව ක්‍රචස් දෙක අතර අරගෙන ඉස්සරහට ගිහින් විපරම් කරන්න හිතුවා.. එක්කො මම තාම හීන දකිනවා.. වරදයා උඹ කෝමා වෙලා පුතේ.. මනෝකාය සැරිසරනවා හතර දිබ්බාගෙ.. අම්මලගෙ ගෙදර ඉස්සරහා තියන ටිකේ ශු රැක් තියලා මල් හදලා පොඩි කැල්ලක් තියනවා.. එතනින් තමා සාලෙට එන්න ඕන.. මම ක්‍රචස් දෙකත් අල්ලගෙන ඉස්සරහට යද්දිම..

" අ-අම්මෙ.."

අපේ අම්මා මල් පොකුරකුත් උස්සගෙන මගේ පැත්ත හැරිලා හිනාවුණා.. අම්මගෙ පිටිපස්සෙන් උසට උසේ හිටගෙන හිටියෙ.. මොකක්!!

" චූටියො.."

වරද් උඹ මැරිලා දැන් මේ සැරිසරන්නෙ උඹේ ආත්මෙ මොකක් හරි තමා.. මගේ අනිත් කකුලත් පණ නෑ වගේ මට දැනුණෙ.. මම එහෙමම බිත්තියට හේත්තු වුනා.. මේ මොන මගුලක්ද මට පේන්නෙ..

" එන්න ඇතුළට.."

මම ඇස් දෙකත් ලොකු කරගෙන බය වෙලා බලාගෙන ඉද්දි.. අසලි අම්මා..!! අසලි අම්මා.. මේ ආධ්‍ය අයියලාගෙ අම්මා.. මං ගාවට ඇවිදගෙන ඇවිත් මාව බදාගත්තා.. මම මොකුත් හිතාගන්න බැරුව ගල් ගැහිල එහෙමම බලාගෙන හිටියා.. මට දැනෙනවද මේ.. මම හීනයක්ද දකින්නෙ..

" ඔයාට දැන් සනීපද පුතේ.."

" අ-ආ..??"

අසලි අම්මා මගේ නළලට හාද්දක් දුන්නා.. මම ඇස් දෙකත් ලොකු කරගෙන අසලි අම්මා දිහා බයවෙලා බලාගෙන හිටියා.. අනේ ආච්චිඅම්මෙ.. මගේ ඇස්වල තප්පරේට කඳුළු පිරුණා.. මේ මොනවද මේ වෙන්නෙ..

@Shan

" ඔව්.. සනීපයි අම්මෙ.."

අසලි අම්මා ඇතුළට ගියාම අයියයි මාමයි මට හිනාවේගෙන සාලෙට ගියා.. අම්මත් ගියා.. මම තාම ඉස්සර පැසේජ් එකේ හිටගෙන.. මගේ ඇස් වලට බොඳවෙලා පේනවා.. එයාව..!!! එයා මං ගාවට ඇවිදගෙන එනවා.. මම ක්‍රවස් දෙක තව හයියෙන් අල්ලගත්තා.. මෙ හීනයක්නම් මට නැගිටින්න ඕන නෑ දෙයියනේ.. මම බිත්තියට හේත්තු වෙලා එහෙමම බලාගෙන හිටියා.. ගෙදර ඇතුළෙ හැමෝම හිනාවෙන කතාවෙන සද්දෙ මට පැසේජ් එකට ඇහෙනවා.. මට මොකුත්ම හිතාගන්න බෑ.. මගේ පපුව ඕනවටත් වඩා හයියෙන් ගැහෙනවා..

**" වරද්.."**

මගේ ඇස් අග්ගිස්සෙන් කඳුළු බිංදුවක් රූටලා පහළට කඩාගෙන හැළුණා.. අවුරුදු කියකින්ද.. කොච්චර කාලෙකින්ද මම මේ නම අහන්නෙ.. මගේ කම්මුල් රතු පාට වුණා.. එයාගෙ අතේ තිබුණු දම්පාට ග්ලැඩියෝලි මල් පොකුර මගේ අතින් තිබ්බම මම ඒක තුරුල් කරගෙන පරිස්සමට අල්ලගත්තා..

" අ-අයියෙ.."

රධ්‍ය අයියා මගේ අතකින් අල්ලගෙන හිමීට මගේ අතින් හාද්දක් තිව්වහම මගේ මුළු පපුවම හිරි වැටිලා යනවා මට දැනුණා.. අනේ මේක ඇත්තක් වෙන්නෙ බැනෙ.. මම මල් පොකුරත් බදාගෙන බිත්තියටම ඇලිලා ඉද්දි රධ්‍ය අයියා මාව තුරුල් කරගත්තා.. මම එයාගෙ උරහිසට මූණ තියාගත්තා.. ඒ ප්‍රියුම් සුවඳ.. ආයෙම එයාගෙ සුවඳ දැනෙන ඇඳුම්.. රස්නෙ.. හැමදේම මට දැනෙනවා.. මට ඒවා අවසාන වතාවට දැනුණෙ කවද්ද.. මට මතකෙක නැති තරම් දුරට.. මට එයාගෙ සුවඳ පවා ආගන්තුක වෙන තරමට අපි වෙන් වෙලා හිටියා.. මම රධ්‍ය අයියගෙ උරහිසට මූණ තියාගෙන ඇඬුවා.. මට ඇඬෙනවා.. දෙයියනේ මම බලාගෙන හිටිය තරම්.. ඔයා දන්නවද.. මෙහෙම දවසක් එනකල්ල් මම ඉවසුව තරම්.. කඩාවැටුණ තරම්.. රධ්‍ය අයියා මගේ පිට දිගට අතගාද්දි මම එයාව එක අතකින් බදාගත්තා..

" ඔයා ඉන්නවා නේද.."

මම රධ්‍ය අයියගෙන් එහාට වෙලා එයාගෙ කම්මුලකින් අත තියාගත්තා.. අනේ ඒ ඇස්.. ඒවා දිලිසෙනවා.. එයා හුඟක් ලස්සනයි.. මට හිතාගන්නවත්

@Shan

බැරි තරමට උස් මහත් වෙලා.. අවුරුදු විසි එකේදි දැකපු පිරිමි ළමයා වෙනුවෙට හැඩිදැඩි පිරිමියෙක් වෙලා.. මට මගේ ඇස් අදහාගන්න බෑ..

" මම ඉන්නවා.."

රධ්‍ය අයියා මගේ ඉණ වටේ අතක් යවලා මාව එයා ගාවට ඇදගෙන මගේ තොල් වලින් හාද්දක් තියද්දි මම එයාගෙ ශර්ට් එක අතකට ගුලි කරගත්තා.. මගේ ඇස් ඉබේම පියවුණා.. මම මේ හැමදේම බලපොරොත්තු වුණා.. මට මෙ දේවල් එකසැරේ දරාගන්න බෑ.. මගේ කම්මුල් වලට ලේ පිරිලා රතු වෙනවා.. ආයෙම අවුරුදු ගාණකින් මගේ හදවත ගැහෙන වේගෙ වෙනස් වෙනවා මට දැනුණා.. මට රධ්‍ය අයියගෙ ගාවින් එන හුරුපුරුදු සුවඳ හොඳට දැනුණා.. විනාඩි ගාණකට පස්සෙ රධ්‍ය අයියා එහාට වෙලා මගේ කොණ්ඩ කැල්ලක් ඇස් දෙකෙන් පිටිපස්සට දැම්මා.. මම මල් පොකුර මූණට තියලා අල්ලගත්තා.. මගේ මූණ ගිනිගන්නවා වගේ..

" කෝ මේ ළමයි දෙන්නා.. එන්නෙ නැද්දෝ.."

ඒ එක්කම ආධ්‍ය අයියා ඉස්සරහට ආවහම මම රධ්‍ය අයියගෙන් මෙහාට වුණා.. ආධ්‍ය අයියා අමුතුවට හිනාවෙලා මගේ අතින් අල්ලගත්තා..

" මනමාලයා හොඳ නෑ වගේද චූටි.."

" අයියෙ!!!"

" පොඩී මේකා බඳින්නම බෑ කියනවලුනෙ.. අපි මොකද කරන්නෙ.. බලෙන්ම බන්දගමු.."

රධ්‍ය අයියා මගේ දිහා බලලා හිනාවුණා.. මේ අයියලා මල්ලිලා එකතුවෙලා මේ අහිංසකයා විහිළුවට ලක් කරනවා.. මම අත දික් කල්ලා රධ්‍ය අයියගෙ බෙල්ල පහුරුගෑවා..

" මොකද තව්සෙ මැසේජ් වලට රිප්ලයි කලේ නැත්තෙ.."

ආධ්‍ය අයියා ආයෙම ශේප් එකේ මාරුවෙලා 'මම ඔවට නෑ' කියාගෙන ගේ ඇතුළට ගියා..

" රිප්ලයි කරන්න පුළුවන් මැසේජ්ද එවන්නෙ.."

@Shan

සැක්.. වරදයා උඹනම් අම්මා කියනවා වගේම පොල්පිත්තෙන් කපාගෙන තමා.. මදැයි මිනිහට යවපු ෆොටෝස්..

" අනේ මේ.."

මම රධ්‍ය අයියව ඉස්සරහ දාලා ඒකගෙ පිටිපස්සෙන් සාලෙට ඇදිලා ගියා.. ලැජ්ජාවෙ බෑ.. බාප්පත් කැතට හිනාවෙනවා.. හොඳ වෙලාවට නිදාගත්තෙ නැත්තෙ.. මම ම පොකුර මූණට තියාගෙන ගිහින් අම්මගෙයි මාමගෙයි මැද්දෙන් ඉඳගත්තා.. රධ්‍ය අයියා අසලි අම්මයි ආධ්‍ය අයියයි ගාවින් ඉඳගත්තා.. අපේ අම්මා අසලි අම්මා ආපු වෙලේ ඉඳලා කියවනවා කියවනවා ඉවරයක් නෑ..

" ඔව් අක්කෙ.. උදේ ඉඳලා මෙතන යුද්ධයක් කරනවා.."

" බොරු කියන්නෙපා අම්මෙ.. බොරු අසලි අම්මෙ.. මම එහෙම කළේ නෑ.."

මම අම්මගෙ අතට එකක් හිමීට ගැහුවම අම්මත් මට හැමෝම මැද්දෙම පිටට එකක් දුන්නා..

" චූටි එහෙම කරන්නෙ නෑ අම්මෙ.. ඒකනෙ.. නේද.."

" නැත්තෙ කොහොමද මූ දන්නෙ යුද්ධ කරන්න තමා.. පේනවනෙ දැන් මමිය වගේ.."

අපේ මාමත් මාව බයිටට අල්ලගත්තම මම සෝෆා එකේ පිටිම පස්සට වෙලා වාඩිවෙලා මාමගෙ පිට කෙනිත්තුවා.. රධ්‍ය අයියයි ආධ්‍ය අයියයි දෙන්නම හිනාවෙනවා..

" අපේ බොනික්කා තව හැඩවෙලානෙ.."

මගේ කම්මුල් දෙක රතු වුණාම අම්මා හිනාවෙගෙන නැගිටලා කුස්සියට ගියා.. අනේ අම්මෙ!! මොන මගුලක්ද මගේ එහාපැත්තෙ මොකක්වත් නැනෙ..

ඊටපස්සෙ අපේ ගෙදර එක සතුටු සාමීචිය.. ඉවරයක් නෑ කිචි බිචි ගානවා.. මම මාමට මුවා වෙලාම හිටියා.. අපේ අම්මා මම කියපුවා එකක් නැර

@Shan

එතන ඉන්න මිනිස්සු සේරගෙම කනේ තියනවා.. ටිකකින් මදිපාඩුව සදෙව් අයියත් ආවා.. ඒකත් උඩ පැන පැන මාව බයිට් කලා.. පස්සෙ කෑම කාලා හැමෝම සාලෙ කතා කර කර ඉන්නෙ අස්සෙ මාමි හිමින්සැරේ කාමරේට පැනගත්තා.. හැමෝම ඔලුවටම ගහලා කොණ්ඩෙත් හෙන ගහලා වගේ අවුල් වෙලා.. මට බෑ රධ්‍ය අයියා එක්ක කතාකරන්න.. මට ලැජ්ජයි..

මම මල් පොකුරත් උස්සගෙන කාමරේට පැනලා ඒක මේසෙ උඩින් තිබ්බා.. තියලා විනාඩියක් යන්න හම්බුණේ නෑ ආයෙම දොරට තඩ්බානවා.. මම සද්ද නැතුව හිටියා.. අනෙ මාමෙ..!

" වරද් මම ඇතුළට එනවා.."

මම ඇඳෙන් වාඩිවෙලා බොරුවට අම්මගෙ ෆෝන් එක කොට කොට හිටියා.. සැක්.. මට මේ මොන මගුලක්ද වෙලා තියෙන්නෙ.. කෝ වරදයා උඹෙ ගැම්ම.. ඒක ගනින්.. මෙහෙම හරියන්නෙ නෑ දියවෙලා වැක්කෙරිලා..

මම මේ කසාදෙට කැමතියි ආච්චිඅම්මෙ..

රධ්‍ය අයියා කාමරේට ඇවිත් දොර වහලා ඇවිත් මං ගාවින් ඉදගත්තා.. මගේ බැන්ඩේජ් කරපු කකුල තිබුණෙ ඇඳ උඩ.. රධ්‍ය අයියා මං ගාවින් ඉදගත්තා.. මාව රතුම රතු වුණා.. රධ්‍ය අයියා හිනාවුණා..

" මොකෝ මේ.."

" මොකුත් නෑ.."

රධ්‍ය අයියා ෆෝන් එක මගේ අතින් අරගෙන එහාට කල්ලා තිබ්බා.. මම බයවෙලා රධ්‍ය අයියා දිහා බලාගෙන හිටියා.. මට හයියෙන් කෑගහන්න ඕන මේ කැලිෆෝනියාව දෙක වෙන්න.. රධ්‍ය අයියා මගේ අතක ඇඟිලි වල එයාගෙ ඇඟිලි පටලගත්තා..

" මොකද බං මේ රතුවෙලා මැරෙන්න හදන්නෙ.. බයත් හිතෙනවා.."

මම අහක බලාගත්තා..

@Shan

" කවුද රතු වුණේ.. හරි මගුලක්නෙ.. ඇයි මම රතු වුණාම කැතද.. ඒ මගෙ පාට.."

" නෑ නෑ රතු බැරිනම් තොරණක් වගේ පාට පාට වෙයන්.."

" කියනකල් හිටියෙ.. තව්සෙ මම එවපු මැසේජ් කාටහරි පෙන්නුවද.."

" මම්.. ආච්චිඅම්මට.."

මට වහලෙන් පැනලා මැරෙන්න හිතුණා.. අනේ ආච්චිඅම්මෙ ඔයත් මහ නරකයිනෙ..

" දැන් කකුල කොහොමද වරද්.. ඔයාට තවම රිදෙනවද.."

රධ්‍ය අයියා මගේ කකුල දිහා බලලා අතේ තිබ්බ මැහුම් පාරවල් දිහා බලාගෙන හිටියා.. එයාගෙ ඇස් වල කඳුළු පිරිලා එක තප්පරේට වෙනස් වුණා..

" මම හොඳින් ඉන්නවා ඒයි.. දැන් රිදෙන්නෙ නෑ.."

මම රධ්‍ය අයියගෙ අතකට හේත්තුවක් දාගත්තා..

" උඹ හැමදාම බොරු කියනවා වරද්.."

" එහෙම නෑ.. දැන් තව්සෙ ආවනෙ.. රිදුනත් කමක් නෑ අතට පයට වැඩ කරවගන්න පුළුවන්.."

" මම ඔයාව බලාගන්නවා.."

රධ්‍ය අයියා මගේ ඔලුව මැද්දට හාද්දක් දුන්නා.. අම්මගෙන් අහන්න ඕන කසාදෙ කවද්ද කියලා.. මම බඳින්න බැහැයි කිව්වෙ වෙන හෝතම්බුවොනෙ.. මගේ කොට්ටෝරුවව නෙමෙයිනෙ..

" මම බයවුණා.. ඔයා කතාකළේ නැතිවුණාම.."

" දැන් මම ඉන්නවනෙ.. ආයෙ පරණ දවස් එන්නෙ නෑ වරද්.. මම ඔයා ගාවින්ම ඉන්නවා.. පහුගිය අවුරුදු හයත් ඕන නෑ.. නවත්තපු තැන්වලින් පටන් ගන්න ඕනත් නෑ.."

@Shan

මම රධ්‍ය අයියට තට්ටුවක් දැම්මා..

" අපි අලුතින් පටන්ගමු.. මමත් ඔයා ගාවින් ඉන්නවනෙ.. මම ඔයාට ආදරෙයි.."

රධ්‍ය අයියා ආයෙම මගේ ඔලුව මැද්දෙන් හාද්දක් තිව්වා.. මම එයාගෙ කොලර් එකෙන් අල්ලගෙන මගේ පැත්ත හරවගත්තා.. රධ්‍ය අයියා මගේ දිහා බලාගෙන ඉඳලා ආයෙම මගේ තොල් දිහා බලාගෙන ඉඳලා මගේ මූණට පහත් වෙන ගමන් මාව කොට්ටෙ උඩින් තිබ්බා.. මම එයාගෙ ශර්ට් එක තද කල්ලා ගුලි කරගෙන අල්ලගෙනම හිටියා..

" Kiss me until I forget everything.."

රධ්‍ය අයියා මගේ තොල් වලින් එයාගෙ තොල් තියද්දි මම එයාගෙ කර වටේ අතක් යවලා අල්ලගත්තා.. විනාඩිය විනාඩිය අමුණලා ඔරලෝසුවෙ කටු සැහෙන්න වට ගාණක් කැරකෙනකල්ම මම හිටියෙ හොඳ සිහියකින් නෙමෙයි.. හීනෙකුයි හැබෑ ලෝකෙයි අතරෙ රධ්‍ය අයියගෙ අත් අස්සට හිරවෙලා.. මම වේගෙන් හුස්ම ගත්තා.. එයාගෙ සීතල අත් මගේ හුඩී එක අස්සෙන් එහෙට මෙහෙට යද්දි.. ඉඳලා හිටලා වෙලාවක මගේ බෙල්ලේ පැල්ලම් දෙකතුනක් හිටියා.. මගේ අතින් එයාගෙ ඇඟේ සීරුමක් දෙකක් වුණා.. අපි අතරෙ මහා පීඩනයක් නැතිවුණත් ඒ ගෙවුණු වෙලාව හීනයක් වගේ.. කවුරුත් බාධා කරන්නෙ නැති වෙලාවක මම හිටියේ වෙනම ලෝකෙක.. ආයෙම මාව හොඳ සිහියෙන් ඈතට යනවා.. මත් වෙනවා.. ඒ හැඟීම අවසාන වතාවට දැනුණටත් වඩා මට දැනුණා.. එයාටත්.. අන්තිමේ රධ්‍ය අයියා මගෙ නළලින් හාද්දක් තියලා මගේ දිහාම බලාගෙන හිටියා.. මම එයාගෙ ඇස් මහැරලා හිටියා.. මගේ ඇඳුම අවුල් වෙලා ගිහින්.. එයාගෙ අතින්ම එයා කියනවා වගේ මාව අවුල් වෙලා තිබුණා..

" ආදරෙයි.."

ආයෙම මගෙ මූණට ලේ පිරුණම එයා ආසම දෙයක් දිහා බලාගෙන ඉන්නවා වගේ මූණට අතකුන් තියාගෙන මගේ දිහා බලාගෙන හිටියා.. ටිකකින් නැමිලා ආයෙම මගේ තොල් වලින් හාද්දක් තිව්වා..

මට දැනෙනවා.. මගේ ඇඟේ දුවන සමනල්ලු ආයෙම ඉපදෙනවා.. වසන්ත කාලෙ මල් පිපෙද්දි සමනල්ලු පියාඹන්න ගන්නවා.. ඒ හැඟීමට.. මම.. හුඟක් ආදරෙයි..

@Shan

කෝ බලන්න මූණු ටික..

මම.. පිස්සු කෙල්ලොහ්..

දැන් මල් බාල්දි උස්සන් වරෙල්ලා මල් පිපෙනකොට වතුර දාන්න..මගෙ දළඹු හමුදාවට මම ආදරෙයි අනේ..

මගේ මනුස්සයා අපේ ගෙදර ආවා වගේ.. සම්තුටුයි..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 168 කොටස

" සුදුමහත්තයා මේ දොර අරින්න.."

" දෙයියනේ දෙයියනේ..!!!!!!!!!!"

මම බාත්‍රූම් එකට වෙලා බ්‍රශ් එකත් කටේ ගහගෙන තනියම හිනාවෙවී හිටියා.. ආන්තිමට මම කසාද බඳින්නයි යන්නෙ.. මට පිස්සු වගේ දෙයියනේ.. අපේ මිනිහා අන්තිමට ඇත්තටම ආවනෙ... ලැජ්ජ හිතිලා මගේ කම්මුල් දෙකත් රතු වුණා..

" සුදුමහත්තයා.."

මම බයවුණේ අපේ මාමා මට ආධ්‍ය අයියව බන්දන්න යනවා ඇති කියලා.. බුදුඅම්මො.. ළමයි දෙන්නෙක් එක්ක.. හරි ළමයි දෙන්නෙක් එක්කනම් කමක් නෑ.. උන් දෙන්නා කොහොමත් මගේනෙ.. ඒ වුණාට ආධ්‍ය අයියට දුක් දෙන්න පුළුවන්ද.. එයා හැඩට වැඩට හිටියට මගේ මිනිහා වගේ නැනෙ ඉතින්.. මාමට හොරෙන් බඳාගෙන හිටියට ආධ්‍ය අයියා ඇවිල්ලා මගේ මස්සිනා.. මස්ස්සිනා කියන්නෙ.. මස්සිනාට.. ම නෙමෙයි.. එයා මගේ සයිඩ් ලව් එක.. එයා මස්සිනෙක් වගේ නෙමෙයිනෙ අනේ.. මට ඊටවඩා ළඟයි..

" අනේ පුතේ ඔය ඇතුළෙ ඇති.. මෙලෝ සිහියකින් නෙමේ නෙ ඉන්නෙ.."

මම හෙන මනමාල හිනාවකුත් දාගෙන මූණ සෝදගෙන බාත් රෝබ් එකත් පටලගෙන එළියට ආවා. අද මම ඩේට් එකකට යන්නනෙ ඉන්නෙ. මම බඳින්න ඉන්න අයියණ්ඩිට ඇවිදින්න යන්න ඕනලු.. දැන් පලයන්කො ක්‍රවර්ස් දෙකත් උස්සගෙන ඇවිදින්න.. මොකෝ මම කකුල් දෙකෙන් ඕහේ ඇවිදගෙන යන්න යැ.. එහෙම බෑනෙ.. මම කාමරේට යද්දි රධ්‍ය අයියයි මගෙ පුත්තු දෙන්නයි ඇඳේ දපලා මොනාද බලනවා.. රධ්‍ය අයියා මාව දැකලා ඇඳෙන් නැගිට්ටා..

" ඔකු තාත්ති මේ කාද.."

රධ්‍ය අයියා ආයෙම අවීගෙ අතේ තිබ්බ ටැබ් එකට එබුණහම මම අල්මාරිය ඇරලා අඳින්න ඇඳුමක් හොයාගත්තා..

@Shan

" ඒ ඉන්නෙ බීස්ට්.. මේ ඉන්නෙ බියුටි.."

" බවීස්ට්..??"

" ඔකු තාත්ති අපේ තුති තාත්තිව අරගෙන යනෝද.. අපේ තුති තාත්ති අපි කාතවත් දෙන්නෙ නෑ.. ඔකු තාත්ති අරගෙන යන්නෙ නෑ නේ.. නෑ නේ.."

රඩ්‍ය අයියට හිනා ගියා..

" ලොකු තාත්ති පුතාගෙ චූටි තාත්තිව අරගෙන යන්න එපාද.."

" අපා.."

දෙයියනේ මම මගේ පුත්තු දෙන්නව හොඳට හදලා.. දැක්කා නේද පක්ෂපාතී ඥති පුත්තු හදාගන්න එකේ වැදගත්කම.. අපේ මාමා මාව හදාගත්ත ටෙක්නික් ටිකම දාලා මම මගේ පොඩි උන් දෙන්නව හදාගත්තා.. ආඩම්බරයි මට..

" මම උදව් කරන්නද.. ඉන්න.."

මම බැන්ඩේජ් එක ලිහපු කකුලෙ බැන්ඩේජ් එක ඔතාගන්න යද්දි රඩ්‍ය අයියා මාව උස ස්ටූල් එකකින් ඉන්දලා මගේ කකුල් දෙක ගාවින් ඉඳගත්තා.. මම කකුල් දෙක එහාට ගත්තා..

" ඒ නැගිටින්න.. මේ මොකද.."

රඩ්‍ය අයියා මගේ අතින් බැන්ඩේජ් එක ඉල්ලගත්තා.. ඊටපස්සෙ බෙතඩීන් තවරපු කොටන් එකක් අරගෙන මගේ බාත්‍රෝබ් එක එහාට කරන්න හැදුවම මම බාත් රෝබ් එක අල්ලගත්තා.. මේකා මගේ ඇහේ හැටි දැක්කොත් කලන්තෙ දාලා වැටෙයිද දන්නෙ නෑ..

" අත ගන්න වරද්.."

" මම කරගන්නම් ඒයි.. ඔක දෙන්නකො.."

රඩ්‍ය අයියා මගේ අත පැත්තකින් තියලා බාත් රෝබ් එක කලව ගාවට වෙනකල් එහාට කළාම එයාගෙ ඇස් ලොකු වුණා.. මම කිව්වනෙ ඕන නෑ කියලා මේ මනුස්සයට..

@Shan

" ව-වරද්.. මේ.."

" කෝ දෙන්නකො කොටන් එකයි පෝසෙප් එකයි.. මට පුළුවන්.."

රධ්‍ය අයියා හුඟ වෙලාවක් මගේ කකුල දිහා බලාගෙන ඉඳලා පෝසිප් එකට කොටන් එක අල්ලලා මගේ කකුලෙ සූච මාක් වටේ කොටන් එක හිමින් තිබ්බා.. මාත් එක්ක කතාකළෙත් නෑ.. ඊටපස්සෙ මම කිව්ව විදියට බැන්ඩේජ් එකත් ඔතලා Cast brace එකක් දැම්මා..

" ඔයාට රිදෙනවද තවම.. ඇවිදින්න අමාරුනෙ වරද්.. මම මෙච්චර එක්ක දක්කෙ නෑ.. ඊයෙ පෙන්නන්න කිව්වහම බෑ කිව්වෙ.."

" දැන් ඒක හොඳවෙගෙන යනවා අනේ. මම ඇවිදින්නෙනැතුව හිටියොත් තමා ප්‍රශ්ණයක් වෙන්නෙ.. ෆිසියෝතෙරපිස්ට් කෙනෙක් මම වැනල් කලා.. එයා කිව්වෙ ඇවිදින්න ට්‍රයි කරේ නැතොත් දිගටම වීල් චෙයා එකක ඉන්න වෙයි කියලා.."

" එහෙම කල්ලා ඇවිදින්න ගිහින් මැහුම් කඩාගත්තා..??"

මම බාත් රෝබ් එකේ පටියක් කටේ ගහගත්තා.. සැක් මේ අපේ අම්මා එක්ක බැනෙ මෙලෝ මගුලක් කරන්න.. හැම එකම බැණගෙ කනේ තියනවා.. අම්මව හම්බෙලා පෞද්ගලිකව කියන්න ඕන හැම එකම බැණට කියන්න එපා ඒක මගේ ආත්මාභිමානයට හරි නෑ කියලා..

" එහෙම තමා අනේ.. මම ඩොක්ටර් කෙනෙක් හරිද.. පොඩි එකෙක් ගාණට දාලා කතාකන්නෙපා.. අර කලිසම මට අන්දවනවකො.."

රධ්‍ය අයියා නැගිටලා මගේ ඔලුව මැද්දට ටොක්කාක් ඇන්නා.. මුගෙ ආච්චිට..

" මොකද තච්සෙ ගහන්නෙ.. ආධ්‍ය අයියේප්ප්ප්ප්ප්ප්-මහ්හ්හ්හ්හ්ක්!!"

" පොඩී ඔය ළමයව කැගස්සන්නැතුව ඉන්නවා.."

ආධ්‍ය අයියා සාලෙ ඉඳන් බෙරිහන් දුන්නහම මට මහ කුරිරු හිනාවක් ආවා.. හොඳ වැඩේ..

" බොරු අයියෙ.. මම මොකුත් කළේ නෑ.."

@Shan

මම රධ්‍ය අයියගෙ අත ගසලා කලිසම අන්දවගත්තා.. දැන් හරි..

" ඔකු තාතී බීස්ට් මැලුණනේ.."

රධ්‍ය අයියා දුවගෙන ගිහින් ෆෝන් එක ඇදලා අරගත්තා.. බීස්ට් මැරිලා හාද්දක් දුන්නහම පණ එක කැල්ල දැකලා මෙකා ඊටපස්සෙ අපෙන් හාදු ඉල්ලන්න ගනීද දන්නෑ.. අර අවියා මහ පණ්ඩිතයි.. ඔකා දෙයක් ඕන කිව්වොත් දෙනකල් අඩනවා.. ආධ්‍ය අයියා ඉතින් අවීගෙ හොඳ පපානෙ.. ඉල්ලන ඉලන හැම එකම ගෙනැත් දෙනවා.. ඒකට මාමා බනිනවා ලමයි නරක් කරනවලු.. වයස ගිහින් කසාද බැන්දම ඔහොම වෙනවා.. ආස දේවල් අරන්දෙන්නැතුව පොඩි ළමයින්ට.. අපේ මාමටත් විකාරනෙ..

" බීස්ට් දැන් ප්‍රින්ස් කෙනෙක් වෙලා.. මේ.."

" ඒ ඇයි.."

" බියුටි බීස්ට්ව මනුස්සයෙක් කළානෙ.."

" ඒ කොහොමද.."

" බියුටි මැජික් කෝට්ටුවක් අරගෙන එහෙම කළාලු.."

" මැජික් කෝට්ටුවක්..??"

අවී ටික වෙලාවක් කල්පනා කාලා.. ආරුටනම් ඔච්චර ඒවා තේරෙන්නෙ නෑ ඒකා දන්නෙ මලක් මී මැස්සෙක් දිහා දවසම බලාගෙන හිනාවෙන්න විතරයි.. නැත්නම් හුරතල් වෙනවා..පාට කූරක් අරගෙන බිත්ති පුරාම අඳින්න යනවා.. දවසක් ආධ්‍ය අයියා හෙන ගාණක් දීලා අරගත්තු මෙඩිකල් බුක් එකක් ආරු සම්පූර්ණෙන්ම කාලා දාලා තිබ්බා.. ඒකා පිටු කඩ කඩ ඒවා කටේ දාගෙන හපලා.. දත් දෙකයි තියෙන්නෙත් තාම.. සේරම ආවට පස්සෙ අපිවත් ඉතුරු වෙයිද දන්නෙ නෑ..

" ඔකු තාත්ති මත මැජික් කෝට්ටුවක් ඔනි.."

මම කට තදකරගෙන කණ්ණාඩිමෙසෙ ගාවින් වාඩිවුණාම රධ්‍ය අයියා හෙන අසරණ වෙලා වගේ අවී දිහා බලාගෙන හිටියා.. දැන් හොයාපල්ලකො මැජික් කෝට්ටු.. හොඳ වෙලාවට මැජික් කොස්සක් ගැන

@Shan

මතක් කළේ නැත්තෙ.. අපේ අම්මා ගාව තියනවා මැජික් නැති නිකන් කොසක් මට තර්ජනේ කරන්න අවිභාවිතා කරන..

" අපි ඩඩා බලන්න යමු.. එන්නකො අවි.. බඩ්ඩක් පෙන්නන්න.."

රධ්‍ය අයියා ආරුවයි අවීත් උස්සගෙන එළියට ගියා.. දැන් අපේ අහින්සක මාමා ලෝකෙ පෙරළලා හරි මැජික් කෝටුවක් ගෙනැත් දෙන්න එපෑ.. පව් දෙයියනෙ මගේ වයසක මාමා.. ටිකකින් රධ්‍ය අයියා හෙන පල් හිනාවක් දාගෙන කාමරේට රිංගලා දොර වැහුවා.. අපේ මාමට ටොපිය සෙට් වෙලා වගෙ.. මම කොණ්ඩෙ පීරලා හරි මැද්දෙන් බෙදුවා.. සැක් මහීශා ඉස්කෝලෙ යන කාලෙ වගේ.. ඒක හරියන්නෙ නෑ.. ටිකකින් රධ්‍ය අයියා ඇවිත් මගේ බඩ වටේ අත් දෙක බැඳගෙන උරහිසින් මූණ තියාගත්තා..

මම කොණ්ඩෙ පැත්තට පීරගත්තා..

" දැන් හෙට වෙද්දි ලංකාවෙ යයිද දන්නෑ ප්‍රසිද්ධ ක්‍රීඩක ෂනෙරු උද්යෝග තම පෙම්වතා සමඟ කැලිෆෝනියාවෙ නිවාඩුව ගත කරයි කියලා.."

රධ්‍ය අයියා හිනාවෙවී කියලා මගේ කොණ්ඩෙ පිටිපස්සට කල්ලා වෝටර් බෑන්ඩ් එකක් දැම්මා.. ඉස්සරහා කෑලි ටික ඇස් දෙකට වැටෙන්න හැදුවා..

" මම කිව්වෙ ඒයි.. මම ලංකාව අඩවලා පස්ස බලන්නෙ කියලා.. ඒගොල්ලො දැනගන්න කලින් මම ඒක ප්‍රසිද්ධ කරනවා.. ඉවරනෙ.."

" ඔයා හෙන සයිලන්ට් විදියට ඉඳලා ෆේමස් වුණ මනුස්සයෙක්නෙ.. එකපාර එහෙම දාන එක හොඳද.."

" ඉස්සෙල්ලම මට ෆෝන් එකක් හොයලා දෙන්න අනේ.. ඔයාගෙ එකෙන් ලොග් වෙන්නම්.."

" මම්.."

ඉඳපන්කො මම කරන්න..

" ඒත් පහුගිය කාලෙ පොඩි කටකතාවක් තිබ්බා මම යාළුවෙලා ඉන්නෙ කොල්ලෙක් එක්ක කියලා.. අපි දෙන්නා හතරවටේ ඇවිදලා ෆොටෝ දාපුවා තියේනෙ.."

@Shan

" මිම්.. I've got a little surprise for you.. ඉක්මනට යමු.."

රධ්‍ය අයියා මගෙ කම්මුලක් එබෙන්නම හාද්දක් දුන්නා.. ආයෙම එකක්.. ආයෙම එකක්.. මේ මනුස්සයට පිස්සු හැදිලා.. දැන් ඉතින් මම සප්‍රයිස් වුණා මදෑ.. මගුලට කලින් පපුවෙ අමාරුවක් හැදිලා මැරිලා ගියොත් එහෙම.. මට පණපිටින් ඉන්න ඕන සඳමාලි..

රධ්‍ය අයියා පහළට ගියාම මමත් ප'ෆියුම් එක වටේට ස්ප්‍රේ කරගෙන හිමින් සැරේ පහළට ගියා.. අද උදේ බාප්පා වැඩට යන්න ඇති.. අපේ අම්මයි අසලි අම්මයි කුස්සියට වෙලා කෝප්ප හෝදනවා.. ඉවරයක් නෑ.. ඊයෙ රධ්‍ය අයියලා රෑ වෙන්න ගියා.. ආයෙම උදේ ආවෙ.. ආධ්‍ය අයියලා අපාට්මන්ට් එකක් රෙන්ට් කල්ලනෙ මෙහේ මාසෙකට විතර.. ආච්චිඅම්මා බලාගන්න ලොකු අම්මා නැවතිලා එහේ.. ඊයෙ රෑ ආච්චි එක්ක පැයයි.. සෙනුකයා එක්ක පැය දෙකයි මලක් කඩලා.. හෙන රෑ වෙලා මම නිදාගත්තෙ.. මම කුස්සියට යද්දි අසලි අම්මා මාත් එක්ක හිනාවුණා..

" මගේ බෑණගෙ හැඩ බලන්නකො නංගි.."

" හැඩ වගේම වැඩත් තියනවනම් මදෑ අක්කෙ.. මේ ළමයා ආපු නිසා ඔය.. නැත්නම් ගේ දෙක වෙන්න සිංදු කිය කිය බෙරිහන් දෙනවා.."

" එහෙම තමා.. මේ වයසෙ ළමයිනෙ.."

" බලන්න අසලි අම්මෙ.. අපෙ අම්මට ගාණක් නෑ.."

මම වතුර එකක් පුරොගෙන බීලා අම්මගෙ කොණ්ඩෙ ගහලා තිබ්බ කට්ට ගලෝලා මෙසෙ උඩින් තියාගෙන ගියා.. අම්මගෙ කොණ්ඩෙ දණහිස ගාවට විතර.. බොහ් ගාලා ලිහිලා පැද්දුණා..

" අන්න දැක්කද.. කරපු නොසණ්ඩාල වැඩෙ.."

අසලි අම්මා හිනාවෙවී අම්මගෙ කොණ්ඩෙ අල්ලලා උඩට බැන්දා.. අම්මා පිහන් වගයක් ඇත්තට හෝද හෝද හිටියෙ.. මේ අම්මා මගේ සායම යවනවා.. මම වැදගත් පුරවැසියෙක්නෙ.. එහෙම කල්ලා ගිහින් කකුල උලුවස්සෙ වද්දගෙන මට තරු පෙනුණා..

" ආආආආආආආආආආආ!!!!!!! මාමෙ.. ආව් අනේ.."

@Shan

" මාමා අවීව වඩාගෙන කාමරේක ඉඳලා එබුණා..

" මොකද කෑ ගහන්නෙ සුදුමහත්තයො.."

රධ්‍ය අයියත් එළියෙ පැසේජ් එකේ ඉඳලා මූණ දැම්මා.. කෑගැහුවා සද්දෙ වැඩිද කොහෙද.. මම ගොංපහේ හිනාවක් වේදනාව දරාගෙනම දැම්මා.. නොදකින්..

" න්-නැහ්.."

මාමා මට දෙකක් රැව්වම රධ්‍ය අයියා ඇවිත් නැමිලා මගේ ශූස් දෙක දාගන්න උදව් කලා.. ඊටපස්සෙ කාර් එකෙන් ඉන්දුවා.. මෙහේ හැමදේම රෙන්ට් කරන්න පුළුවන් නෙ.. කාර් වුණත් එහෙම පුළුවන්.. මගෙ එමනුස්සයට හතරමහ නිධානෙ පහළවෙලාද දන්නෑ ෆෙරාරියක් රෙන්ට් එකට ගත්තෙ.. ලන්ඩන් වල ඉඳලා කුඩු බිස්නස් කල්ලද.. එහේ ඉලෙක්ට්‍රිකල් ඉන්ජිනියර් කෙනෙක් විදියට අවුරුද්දක් වැඩ කළානෙ.. මම දන්න විදියට අවුරුද්දකට ස්ටර්ලින් පවුම් හතළිස්දාහක් විතර ගෙවනවා.. සල්ලි තියනවා තමා.. දැන් ලංකාවෙ ඩොලර් එක නැගලනෙ..(රුපියල් වලින් මිලියන දාහතක් වගේ) සීනිඅප්පච්චි මගේ.. හැබැයි මාත් එක්තරා විදියක සීනි අප්පච්චියෙක් තමා.. සීනිඅප්පච්චිලා සීනිඅප්පච්චිලා දැන් ලව් කරන්නෙ.. ඔය හිච්චි බේබි බෝයිලා වැඩක් නෑ.. ගැම්මක් තමා..

" බැක් ටු පැසෙන්ජර් ප්‍රින්සස්.. මරු නේද ඒයි.. අපි කොහෙද යන්නෙ.."

" බ්‍රෙක්ෆස්ට් ගන්න යමු.."

" අපි ඩ්‍රයිව් ත්‍රෑ ගමු.. මම ඔයාට තැනක් කියන්නම්.. එතන මරු.."

" කේ.."

රධ්‍ය අයියා මගේ අතක් එයාගෙ අතක පටලගත්තා.. ඊටපස්සෙ හදිසියෙ මොකක් හරි මතක් වෙලා වගේ හිනාවුණා..

" හෙන කාලෙකට පස්සෙ නේද.."

" මම හිතුවෙ නෑ ආයෙම ඔයාව හම්බෙද්දි මම කැලිෆෝනියා වල ඉඳීවි කියලා.."

@Shan

මම ඇදිලා ගිහින් රධ්‍ය අයියගෙ කම්මුලෙන් හාද්දක් තිබ්බා.. එයා ලස්සනට හිනාවුණා.. අඩම්බරපාට හිනාවක් නෙමෙයි.. ඇත්තෙන්ම හරි සැහැල්ලු හිනාවක්.. බලන් ඉද්දි ලෝබ හිතෙනවා.. හුඟ කාලෙකට පස්සෙ මම නිදහසේ සතුටින් ජීවත් වෙනවා.. පහුගිය කාලෙ ගෙවිලා ගියාද හීනයක් වගේ.. ඇත්තටම මෙ දවස් වෙනකල් මම කොච්චර බලාගෙන හිටියද.. මගේ හදවතින්ම ලොකු සතුටක් දැනෙනවා.. ආයෙම අපි හිතේ බයක්, දුකක් නැතුව සතුටින් ජීවත් වෙනවා..

හැමතිස්සෙම ආදරේ කරන්න හරිම කෙනා තෝරගන්න ඕන.. මම විශ්වාස කරනවා.. අනිත්පැත්තට බලාපොරොත්තු වෙන ආදරේම ලැබෙයි කියලා..

" ලිලී ප්‍රෙග්නට් වෙලා ඒයි.. මට ඊයෙ රූ සෙනුකයා කිව්වෙ.. අද රෑට චමිරුට ගන්න ඕන.."

" හොඳයිනෙ.. මටත් චමිරු එක්ක කතාකරන්න ඕන.."

" ඔයාලා ලංකාවෙ හම්බුණේ නැද්ද.. ඇවිල්ලා මාසයක්ම එහේ හිටියනෙ.."

" හම්බුණා දවසක්.. ඒකට වැඩනෙ සැහෙන්න.."

" ඒකතමා.."

" ඔයා ලස්සන වෙලා වරද්.. ඇත්තටම.."

මම ශර්ට් එකේ නූලක් ඇදලා අරගෙන ඒක රධ්‍ය අයියගෙ ඇඟිල්ලක ගැටගැහුවා.. ගෙදර ගියාම රධ්‍ය අයියගෙ පස්ස ලොකුවෙලාද බලන්නෝන.. මට කොච්චර මතක් වුණාද ඉතින්.. නොකිව්වට..

" ඔයත්.."

" අම්මලා කියනවා වෙඩින් එක සති දෙකකින් ගමුලු.."

රධ්‍ය අයියා එකසැරේට හෙන ගහන්න වගේ කියලා දැම්මහම මම බයවුණා.. මොකක් සති දෙකකින්!!! එච්චර ඉක්මනට වෙඩින් එකකට ලෑස්තිවෙන්නෙ කොහොමද.. පිස්සු හැදෙයි.. යකෝ ගහෙන් ගෙඩි එන්න වගේ එහෙම මගුල් ගන්නවද.. අනික මොකෝ අපි හැමදාම බඳින්නද..

@Shan

අවුරුදු දහයක් පරණ ලව් එකක් මේක.. මම කිව්වෙ රධ්‍ය අයියට දහයයි.. මට අටක් විතර.. කොහොම හරි ඉතින් චිරාත් කාලයක් අපි ලව් කළානෙ..

" ඔයා මොකද කියන්නෙ.. දැන් මදෑ ඔය බලාගෙන හිටියා.."

" ඉක්මන් වැඩී වගේ නැද්ද.. නෑ මම කියන්නෙ එච්චර ඉක්මනට ලෑස්තිවෙන්නෙ කොහොමද.."

" කොහොමහරි ලෑස්තිවෙන්න නම් පුළුවන් ඉතින්.. කී දෙනෙක්ට කියන්නද.. හෙන තොගයක් ඉන්නවනෙ.. එහෙම වුණොත් මුලින්ම කාඩ් ප්‍රින්ට් කරලා යවන්න වෙව්.."

අඩෙ මම බඳින්න යන්නෙ ආච්චිඅම්මෙ!!

" එච්චර ලොකුවට ගන්නවද ඒයි.."

" හැමදාම බඳින්නෙ නැනෙ.. ලොකුවට ගන්න ඕන.."

" ඕ ඔයාගෙ හැම එකම ලොකුයි නේද.."

මම රධ්‍ය අයියා දිහා බලලා වල් හිනාවක් දැම්මහම රධ්‍ය අයියා රතු වුණා..

" උඹවනම් හදන්න බෑ.."

" ඔයා හදලා ගන්නකො ඉතින්.."

රධ්‍ය අයියත් එකසැරේ මහ වලත්ත හිනාවක් දාගෙන මගේ මූණ බැලුවා.. සැක් මුගෙ පැණි හිනාව..

" හදලා ගන්න දේවල් නම් නෑ වගේ.."

" ඒ සිරාද.. කැපවීම ඒයි.. මම ඔයා වෙනුවෙන් වර්කවුට් කල්ලා හදාගත්තෙ.."

රධ්‍ය අයියා ආයෙම හෙන හයියෙන් හිනාවුණා.. මේකගෙ හිනාව මහ වලත්ත වෙලානෙ.. කවුරුවත් ඉස්සරහා හිනාවෙන්න කියන්න හොඳ නෑ.. මගේ හැපිකච්චනෙ.. මගෙ බඳින්න ඉන්න අයියා.. මම ඇඳිලා ගිහින්

@Shan

ආයෙම රධ්‍ය අයියගෙ කම්මුලට හාද්දක් දුන්නා.. ඊටපස්සෙ එහෙමම ඇලවෙලා රධ්‍ය අයියගෙ ඇඟට හේත්තු වෙලා හිටියා..

ටිකකින් අපි ස්ටාර්ස්බක්ස් එකෙන් ස්ට්‍රෝබෙරි ලෙමනේඩ් දෙකකුත් අරගෙන EL HUERO ඩ්‍රයිව් තෲ එකෙන් කෑම අරගෙන ඉස්සර වගේම ඔපදූප කියව කියව යන තැනක් හරියට දන්නෙත් නැතුව ගියා.. අපි යන පැත්තෙ තිබ්බෙ මූද.. මේ කාලෙට කැලිෆෝනියා වල සෙනග පිරිලා.. හුඟක් අය බීච් යනවා.. ඒවුණාට ලංකාවෙ නැති නිදහසක් කැලිෆෝනියාවෙ වෙලාවකට දැනෙනවා.. ලංකාවෙනම් තේකක් බොද්දි ඒක වැරදිලා ඇහේ හැළුණත් මිනිස්සු ඒකටත් හැලි ලියලා දානවා.. එතකොට එපාවෙනවා.. එහෙම නෙමෙයි නිදහසේ ජීවත් වෙන්න ඕන.. එතකොට තමයි ජීවත් වෙනවා කියන හැඟීම දැනෙන්න ගන්නෙ..

Laguna Beach එක කියන්නෙ මම මෙහේ ආසම ආසම ආස තැනක්.. එක සැරයක් මම ඇවිල්ලා තියේ අම්මලා එක්ක.. කොටින්ම ඒකට කියන්නෙත් what California dreams are made of කියලා.. ඒ තරමම ලස්සන බීච් එක්ක ඇමරිකා වල තියෙන.. ලොස් ඇන්ජලීස් වලයි සැන් ඩියාගෝ අතරෙයි තියෙන ලගුනා වල වටේ තියන ගම්මාන වල හුඟක් කලාති තියනවා.. ඇවිදලා බලන්න.. පිංතූර අරගෙන තියාගන්න තරමම වටිනවා.. කඳු බෑවුම්.. කොළපාර තැනින් තැන තියන ගස්, පාඩුවෙ ඇවිදින මිනිස්සු.. මම බලාපොරොත්තු වෙන නිදහස හුඟක් තිබ්බෙ මුහුදු වෙරළවල් වල.. මුහුදේ නාන්න යන එක නෙමේ.. ඉඳගෙන බලාගෙන ඉන්න.. හිමිහිට රැල්ල කකුලෙ වද්දගන්න.. හුළං පාරට මූණ අල්ලගෙන ඉන්න.. ඉස්සර අපි හුඟක් දවසට බීච් ළඟ තියන රෙස්ටොරන්ට් වලටයන්නෙ අපි දෙන්නම බීච් එකට ආස නිසා.. හේතුවක් දන්නෙ නෑ.. දෙන්නම හුඟක් කැමතියි.. අන්තිමට අපි ඇවිලා නතරවුණේ එතන..

මම කාර් එකෙන් බැහැලා ගිහින් බොනට් එකට හේත්තු වුණා. එකම තැන ඉඳගෙන හිටියම කකුල නිකම් හිරිවැටිලා වගේ.. සෙනඟ එහෙ මෙහෙ යනවා.. ටිකකින් රධ්‍ය අයියත් ඇවිත් මගේ එහාපැත්තෙන් කාර් එකට හේත්තු වුණා.. හුඟ දවසකට පස්සෙ අපි දෙන්නා ආයෙම මුදු වෙරළක් ළඟ එකට ඉඳගෙන ඉන්නවා.. රධ්‍ය අයියා මගේ අතක එයාගෙ ඇඟිලි පටලගත්තා..

" මට තාම හිතාගන්න බෑ වරද්.."

@Shan

මම රධ්‍ය අයියට හේත්තු වුණා.. මුකුත් නොකියම මූද දිහා බලාගෙන හිටියා.. හරි නිදහස් හැඟීමක් හිතට දැනෙනවා.. ඒක දහස් වතාවක් කිව්වත් පැහැදිලි කල්ලා ඉවරකරගන්න පුළුවන් හැඟීමක් නෙමේ..

" අපි ලංකාවෙ ගියාට පස්සෙත් මෙහෙම නිදහසේ ඉඳීද.."

" අපිට අනිත් මිනිස්සු වැඩක් නෑ..  අපි ඉන්න ගෙදරට කවුරුත් එන්නෙත් නැත්නම්.. මම ඔයාගෙ එහාපැත්තෙන් ඉන්නවනම්.. එතනින් එහාට ඕන නෑ.."

" ඒක ඇත්ත.."

රධ්‍ය අයියා මගේ ඔලුව මැද්දට හාද්දක් දුන්නා..

" අපි හෙට ගමනක් යනවා.. ඔයා කැමති තැනකට.."

මම කෙලින් වෙලා රධ්‍ය අයියා දිහා බැලුවා.. අපි කොහේද යන්නෙ..??

" ආ..??"

රධ්‍ය අයියා හිනාවෙලා සාක්කුවට අත් දෙක ඔබාගත්තා..

" අය කරනවා.. එහෙම නිකන් දෙන්නෙ නෑ.."

" හෙන ගාණක් වෙන්නැති නේද.."

රධ්‍ය අයියා හිනාවුණා.. එයා කලින්ට වඩා දහස් ගුණේකින් සැහැල්ලුවෙන් හුස්ම ගන්නවා..

" Just a little sweet kiss.."

මම ඉස්සරහට නැමිලා රධ්‍ය අයියගෙ කම්මුලකින් අල්ලගෙන තොල් වලින් පෙක් එකක් තිබ්බා.. එයාව චුට්ටක් රෝස පාට වුණා.. මගේ ඇස් දිහාම බලාගෙන ඉඳලා ටිකකින් හරි සිහියට ආවා..

" ඔයාට.. මගෙන්.."

@Shan

රඬ්‍ය අයියා හතරැස් එන්විලොප් එකක් මගේ අතින් තිබ්බහම මම ක්‍රවස් දෙක අතට හිරකරගෙන ඒක ඇරලා බැලුවා..

මගෙ දෙයියනේ!!!

" ම්-මේක.. මටද..??? අනේ.."

මම පැනලා රඬ්‍ය අයියව බදාගත්තා.. කිටි කිටියෙම.. අපි වටේ ඉඳපු අය අපි දිහා බලලා හිනාවෙලා අපිව පහුකරගෙන ගියා.. සමහරු ආදරෙන් බලාගෙන හිටියා.. මට පුදුම සතුටුයි.. ඇත්තටම සතුට කියන්නෙ රඬ්‍ය අයියගෙ එහාපැත්තෙන් ජීවත් වෙන එක නෙමෙයිද.. ගෙවෙන හැම මොහොතෙම මම සතුටු වෙනවා..

" ඔයා ශෝන් මෙන්ඩිස්ට කැමතියිනෙ.. හෙට අපි ලස් වේගාස් යනවා.."

" මට.. පිස්සු වගේ.. අයියෙ.."

රඬ්‍ය අයියා ලාවට හිනාවෙනවා මට දැනුණා.. මම එයාගෙ කම්මුලට හාදු ගොඩාක් දීලා මෙහාට වුණා..

" අපි හෙට යනවා..??"

" තවසෙ මගේ පපුවෙ අමාරුව වැඩි කරනවා මෙහේට පය තිබ්බ වෙලේ ඉඳලා.."

රඬ්‍ය අයියා මගේ කර වටේ අතක් යවලා මාව එයාට තුරුල් කරගත්තා.. ඇත්තටම මම හිටියෙ හිතේ මල් යායක් පිපුණු ගාණට.. රඬ්‍ය අයියගෙ ගාව ඉද්දි දැනෙන හැඟීම හුළඟක් නම් ඒ හුළඟ මගේ හිතේ පැළවෙලා තියන මල් යායම හිමිහිට පිහගෙන යනවා.. එයාගෙ ආදරේ පොද වැස්සක්නම්.. මාව හීනියට තෙමනවා.. ඉර එළියක්නම්.. මට පිපෙන්න ඉඩ අරිනවා.. කොයි වෙලාවකවත් ඒක ඉඩෝරයක්වත්, මහා වැස්සක්වත්, සුළි කුණාටුවක්වත් නෙමෙයි.. හිතට හරි සැනසීමයි..

අපි හුඟාක් හවස් වෙනකල් ලගුනා වල හිටියා.. හවස කැෆේ එකකට වෙලා සින්දු ඇහුවා.. ඊටපස්සෙ බියර් කෑන් දෙකතුනක් ගහලා ගෙදර එන්න ආවා.. හුඟ කාලෙකට පස්සෙ ආපු ලස්සනම ඩේට් එකක්.. අපි දවසෙම හිනාවෙලා හිටියා.. අවුරුදු ගාණක දේවල් කතාකළා.. අපි ගෙදර

@Shan

එද්දි බාප්පා ගෙදර ඇවිත්.. අම්මයි අසලි අම්මයි කෑම ඇස්ති කරලා.. මේසෙ උඩ ලස්සන රෝස පොකුරකුත් තියනවා.. මාමයි ආධ්‍ය අයියයි බබාලා දෙන්නව එළියෙ තියාගෙන එයාලව හුරතල් කරනවා.. හරි පිරිච්ච පවුලක් වගේ.. මේ දවස්නම් ඉක්මනට ගෙවෙන්න එපා..

" අමයි දෙන්න ආවද.. කොහොමද අද.."

අසලි අම්මා වයින් ග්ලාස් එකක් පුරෝගෙන ස්ටූල් එකකින් ඉඳගත්තා..

" හොඳයි අම්මෙ.. මට පොඩි වැඩක් හම්බුණා.."

මම අතේ තිබ්බ එන්විලොප් එක අසලි අම්මට දුන්නම රධ්‍ය අයියා මගේ කාමරේට ගිහින් වොශ් එකක් දාගන්නවා කිව්වා.. මමත් අසලි අම්මා ගාවින් ඉඳගත්තා..

" කෝ බලන්න.. මයි ගෝඩ..!! බෝනික්කා අනිද්දා කොන්සට් එකකට යන්නනෙ.. මේ බලන්නකො දේදු.."

අපේ අම්මත් යන එක ගමන් ඒකට මූණ දාලා හිනාවුණා..

" අපි හෙට ලස් වේගාස් යනවා!!!"

" හොඳයි හොඳයි.. ගිහින්ම ඇවිත් අපි ඉතුරු ඒවා කතාකරගමුකො.. නේද.."

" ඒකතමා.. තව දවස් කීයද.. ලෑස්තිවෙන්නත් තියනවා.."

අර දැක්කනෙ.. මේ ගෙදර කොහෙන් ගියත් ඉවරවෙන්නෙ අපේ කසාදෙන් තමා.. මම හිමින් සීරුවෙ අසලි අම්මට හග් එකකුත් දීගෙන කාමරේට එද්දි බාත්‍රූම් එකේ රධ්‍ය අයියා ඉන්නවා ඇහුණා.. මම ගිහින් ඇඳේ හාන්සිවෙලා හිටියා.. අද මහා ගොඩක් ඇවිද්දෙ නැතත් කකුල ටිකක් රිදෙනවා.. තාම මේක අලුත්නෙ.. හරියන්න මාස දෙක තුනක්වත් යාවි.. මේ ක්‍රචස් දෙක නැතුව ඇවිදගන්න පුළුවන් වුණොත් ලොකු දෙයක්.. ටිකකින් රධ්‍ය අයියා ආවහමමමත් ගිහින් කකුල නොතෙමෙන්න නාගත්තා.. නාලා ආයෙම සාලෙට යනකොට ගෙදර හැමෝම කෑම මේසෙ වාඩිවෙලා.. මම ගිහින් රධ්‍ය අයියගෙයි මාමගෙයි මැද්දෙන් ඉඳගත්තා.. අපේ පවුල් කොච්චර කාලෙකින්ද එකතු වෙලා කෑමක් ගන්නෙ.. හුඟ කාලෙකින්.. අම්මා වෙනදටත් වඩා රසට කෑම හදලා තිබුණා.. හැමෝම හිනාවෙවී කතාකළා..

@Shan

ආධ්‍ය අයියා බබාලා දෙන්නට කවනවා.. මාමා ආධ්‍ය අයියට කවනවා.. අසලි අම්මා විහිළු කරනවා.. බාප්පා හිනාවෙනවා.. අපේ අම්මා අම්මගෙ විස්තර කියවනවා.. චූටි බබාලාත් කිසිදෙයක් තේරෙන්නෙ නැති කතාවලටත් හයියෙන් හිනාවෙනවා..

" හෙට කීයටද පොඩී මෙහෙන් යන්නෙ.."

" දවල් වෙලා අම්මා.."

" ආ.. පරිස්සමට හරිද.. මගේ බෑණව පරිස්සමට එක්ක එන්න ඕන.."

" දැන් රෑ වෙලා අක්කා යන්නද.. මෙහේ ඉඳලම යන්නකො.."

අපේ අම්මා අසලි අම්මගෙන් ඇහුවම අසලි අම්මා ආයෙම ග්ලාස් එකට වයින් පුරෝගත්තා.. අපේ අම්මටත් පිරෙව්වා..

" මමයි පොඩියි නවතිමුද.. අපි දෙන්නා ෆිල්ම් එකක්වත් බලමු දේදූ.. ආයෙ ඔයාලව බලන්න මෙහේ එන්න එපෑ.. නේද.."

" ඒක හොඳයි.. ආධ්‍ය පුතාලත් ඉන්නවද.."

" මෙයාලගෙ ඇඳුම් ගෙනාවෙත් නෑ අම්මා.. අපි යනවා රෑ වෙන්න.. හෙට උදේ එන්නම්කො.."

අපේ මාමා ආධ්‍ය අයියා දිහා බලලා හෙන මනමාල හිනාවක් දැම්මා විතරයි හැරෙන තැපෑලෙන් ආධ්‍ය අයියා මාමගෙ කකුලට පාරක් දුන්නා.. සැක් අපේ මාමනම්.. රධ්‍ය අයියා මට, රතුවෙලා ඉන්න අයියව පෙන්නලා ඇහැක් ගැහුවම අයියා අපි සේරටම පෝළිමේ රවාගෙන ගියා..

" පාඩුවෙ ඉන්න අනුරාග්.."

" ඉතින් ඇත්තනෙ.. කවුරුත් නැති එකේ.. පොඩ්ඩක් උනන්දු වෙයන්කො සාකි.."

" මාමෙ!! අපිත් මෙතන ඉන්නවා.."

මට මාමගෙයි අයියගෙයි රහස් සාකච්ඡාව කන වැටුණා.. මට විතරක් නෙමේ මගේ මනුස්සයටත්.. අපේ මාමා රවලා මං දිහා බැලුවා..

@Shan

" උඹලා දෙන්නා හරි හොඳ උන් දෙන්නනෙ.. පාඩුවෙ ඉඳපන්.. ආවා මෙතන ඒකටත් උදැල්ල දාන්න.."

මම ඉතින් උදැල්ල නොදා හිටියා.. ආධ්‍ය අයියගෙ මූණෙ රතුපාට බහින්නෙම නෑ කෑම ඉවරවෙනකල්ම.. ඊටපස්සෙ හුඟක් රෑ වෙන්න ආධ්‍ය අයියලා එයාලගෙ අපාට්මන්ට් එකට ගියා.. අම්මලා ෆිල්ම් එකක් බලන්න ගත්තු නිසා මමයි රධ්‍ය අයියයි කාමරේට ඇවිත් නිදාගන්න ගියා..

මම ඇඳෙන් හාන්සිවුණාම රධ්‍ය අයියා ලයිට් ඕෆ් කරගෙන මං ගාවින් හාන්සි වෙලා, මගේ කකුල ගාවින් කොට්ටයක් තියලා, බ්ලැන්කට් එක අස්සට ගුලි වුණා.. එයා හීටර් එකක් වගේ උණුම උණුයි.. මම මගේ උරහිසට තට්ටුවක් දැම්මහම රධ්‍ය අයියා මාව බූවළු අඩුවලින් තද කල්ලා බදාගෙන මගේ පපුවෙන් මූණ තියාගත්තා.. මම එයාගෙ කොණ්ඩෙ අතගෑවා.. අද හරි මහන්සී.. නින්ද යාගෙන එද්දි මට දැනුණා රධ්‍ය අයියා මගේ තොල් වලින් පෙක් එකක් තියලා මාව එයාගෙ අතක් උඩ තියාගන්නවා.. මට එහෙමම හොඳටම නින්ද ගියා.. හුඟ කාලෙකින් සැනසීමෙන් නිදාගත්තා..

" ගුඩ් නයිට් වරද්.."

මම හැමෝම කලින් වැප්පෙ දුන්නු වතුර එකතුකල්ලා වැවක් හැදුවා ජෙයියනේ.. වැවේ නම දළඹු වැව.. අපි වැවකුත් හැදුවා අපෙ හාමුදුර්වනේ..

අපි යමු ලස් වේගාස්.. ලැමස්ති වෙලා එමන..

එන්නාම්.. ලව් යූ..❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

@Shan

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 169 කොටස

" වරද් අවදිවෙන්න.."

" ම්ම්.."

" කෝ නැගිටින්න.."

" ම්ම්.. ම්ම්.."

මම අනිත් පැත්ත හැරිලා බ්ලැන්කට් එක ඔලුවෙ ඉඳන් පොරවගත්තම මම හීනෙන් වගේ දැක්කා රධ්‍ය අයියා නැගිටලා බාත්‍රූම් එකට යනවා.. මාත් ටිකකින් අවදි වෙලා බාත්‍රූම් එක අස්සටම රිංගගත්තා..

" නිදිමතයි ඒයි.. වෙලාව කීයද.."

මම ගිහින් දත් මැද මැද ඉඳපු රධ්‍ය අයියගෙ උරහිසට මූණ තියාගෙන ඇස් දෙක පියාගත්තා.. හෙන නිදිමතයි..

" හත හමාරයි.."

මම ටික වෙලාවක් ඉඳලා මගේ බ්‍රශ් එකට ටූත්පේස්ට් හලාගෙන ඒක කටේ ගහගත්තා.. මේ දත් මදින එකනම් මලවදේ.. අපේ මාමා දත් දොස්තර නිසා මම පොඩිම කාලෙ දත්මද්දන්නෙ ඒ මනුස්සයා තමයි.. උඩට පහළට පැත්තට.. යැයි යැයි ගගා දත් ටික ගෙවිලා යනකල් මද්දනවා.. නෑ හරිද.. ගෙවිලා යනකන් නෙමේ.. ඒ ගොල්ලොන්ට කියලා දෙන විදියට.. මාමගෙ නුවර එක්ස් කැල්ලට දැන් නම් ඇඬෙනවා ඇති මගෙ මස්සිනාව දැකලා.. මස්සිනාද.. චූටි මාමද.. මේ මගෙ එහාපැත්තෙ ඉන්නෙ හිච්චි මාමනෙ.. මගෙ බඳින්න ඉන්න හිච්චි මාමා..

මම නයිට් කිට් එකේ දිගට තිබ්බ අත උස්සලා කරකලා හොඳ පාරක් රධ්‍ය අයියගෙ පස්සට දුන්නා..

*චටාස්*

" වරද්!!!"

@Shan

" දෙයියනේ තව ලොකුවෙලා.."

" පාඩුවෙ ඉඳපන්.."

" පාඩුවෙ ඉන්නෙ මොකටද.. මේ අහනවකො.."

මම බ්‍රශ් එකත් කටේ ගහගෙන හිමින් සැරේ ඇඳිලා ගිහින් රඩ්‍ය අයියගෙ අතකට හේත්තු වෙලා ඇස් පිල්ලම් දෙක තුනක් ගැහුවා.. රඩ්‍ය අයියා බයවෙලා වගෙ මගෙන් එහාට වුණා..

" මෙහ්.."

" මොකද.."

" අපි තරු බලන්න යන්නැද්ද.."

රඩ්‍ය අයියා දත් මැද මැද ඉඳපු බ්‍රශ් එක කටේ ඇනගත්තා.. ඔච්චර බය වෙන්න ඕනද හත්දෙයියනේ ඒකට.. මම හිතුවෙ විසි හතක් වෙද්දිවත් මෙ මනුස්සයා ෆෝවර්ඩ් වෙලා ඉදීවි කියලා.. බලන් යද්දි මේ මනුස්සයව වරදට පොළඹවගන්න වෙන්නෙ මටමද කොහෙද.. හිටපන්කො හනිමූන් ගිය දවසට මම තෝ මරාගෙන කනවා.. ගැටපොලොස් කොට්ටෝරුවා..

" මම තව්සෙට තරු පෙන්නන්නද.."

" පෙන්නයි තරු.. අනේ මේ මූණහෝදගෙන කන්න යමං.. "

රඩ්‍ය අයියා මගේ පස්සට එකකුත් ගහගෙන මූණ හෝදගෙන වන වන එළියට ගියා.. මුගෙ ආච්චිට.. ඉඳපන්කො මම උඹට හොඳ වැඩක් කරන්න.. අර සෙනුකය නම් හැමදාම තරු බලනවැති.. මට තමා තරුවක් තියා සැටලයිට් එකක්වත් නැද්දෙ.. මගෙ පෞකාරයගෙන් අහන්න ඕන මනුස්සයට නගින්න දෙන්න හොඳ මොනවද කියලා.. කැලිෆෝනියාවල දූරියං නැද්ද දන්නෑ..ඇති හෙව්වොත්..

මම මූණ හෝදගෙන පහළට යද්දි අසලි අම්මා කණ්ණාඩි දෙකත් දාගෙන ලැප් එකේ මොනවද බලනවා.. අපේ අම්මා උයනවා.. අපේ අම්මනම් බලන වෙලාවක උයන එකනෙ වැඩේ.. වැඩක් නැති වුණාමත් උයනවා.. මේ දවස්වල ගොතන්න පුරුදු වෙලා.. ගොතනවත් එක්ක.. ඉඳලා හිටලා මගේ

@Shan

ළමයින්ටත් ඇඳුම් ගොතන කතා කියවගෙන එද්දි මම හිමින් සැරේ නැගිටලා එන්න එනවා.. දැන් මේ ගෙදර විසුමක් නැතිවෙලා තියෙන්නෙ.. එක්කො ළමයි.. එක්කො කසාදෙ..

" මගෙ බෝනික්කා නැගිටලා.."

මම අසලි අම්මගෙ ගාවින්ම ඉඳගත්තා..

" ආඪ්‍ය අයියලා ආවෙ නැද්ද අම්මෙ.."

" උදේම එන්න විදියක් නෑ කිව්වෙ.. බබාලගෙ වැඩ වෙන්නැති කොල්ලො.."

එකසැරේම රඪ්‍ය අයියා බිබී ඉඳපු කිරි එක නහයෙන් ආවා.. නෙද්දකින් මේ වනවර මිනිහා තමන්ගෙ අයියා ගැන හිතන නැහැදිච්ච සිතුවිලි.. හැබැයි මටත් ලාවට හිනාගියා ඉතින්.. අපේ මාමා රෑ හොඳටම අභ්‍යවකාශගත වෙලාද කොහෙද.. සැක් මොනවද මම මේ හිතන්නෙ.. වරදයා හිත දමනය කරගනින්..!! ඒ උඹෙ මස්සිනයි මාමයි..

" අම්මා අපි එකොළහට විතර යනවා.."

" මම්.. පොඩී බලන්න මෙවගෙන් හොඳ මොනවද කියලා.. ඔයාලා දෙන්නගෙ මොනවත් අයිඩියාස් තියද.."

අසලි අම්මා ලැප් එක රඪ්‍ය අයියගෙ පැත්තට හැරෙව්වම මමත් රඪ්‍ය අයියගෙ ඔලුවට උඩින් මූණ දාලා බැලුවා.. ටසිරි වෙඩින් කාඩ් නේද.. දෙයියනේ!! මම බඳින්නයි යන්නෙ ආච්චිඅම්මෙ..

" බබා ඔයා කොහොමද කැමති.."

රඪ්‍ය අයියා හැරිලා මගේ දිහා බැලුවා.. මම සීරියල් එක කකා හිටිය හැන්ද කටේ ගහගත්තා..

" අන්ඩර් සී තීම් එක ලස්සනයි නේද.."

" මම්.. ඒකට මොඩර්න් රෝයල් ලුක් එකක් ආවනම් ප'ෆෙක්ට්.."

" ආ ඔව් එහෙම හොඳයි.."

@Shan

" ඔයාලා දැන් ගිහින් ආවට පස්සෙ මම එපොයිමන්ට් එකක් සෙට් කරන්නම් වෙඩින් ප්ලැනර් කෙනෙක්ට.. ඊටකලින් මේ වෙඩින් කාඩ් වල වැඩේ ඉවර කරගන්න එපැයි.. එන මනුස්සයො ලැස්තිවෙන්න ඕනනෙ.."

අම්මලා වෙඩිමක් ගැන කියවද්දි මමයි රධ්‍ය අයියයි පාඩුවෙ කෑම කෑවා.. ඊටපස්සෙ එයා ඇඳුම් අරගෙන එන්න ඕන කියලා ආධ්‍ය අයියලගෙ අපාර්ට්මන්ට් එකට ගියාම මාත් කාමරේට වෙලා ඇඳුම් දෙකතුනක් ඔබාගෙන බෑග් එක හදාගත්තා.. මගෙ ශෝන් අයියෙ මම එනවා..!! දෙයියනේ මගේ ශෝන් මෙන්ඩිස් පිස්සුව තියෙන්නෙ මම පොඩිකාලෙ ඉඳලා.. මම පුදුම ආසයි එයාගෙ සින්දු වලට.. මම හෙන ෆෑන්බෝයිනෙ.. රධ්‍ය අයියා ආස ටේලර්ට.. ටේලන්ගෙ කොන්සර්ට් එකක් බලන්නත් යන්න ආසයි.. හුම්කම්පාවකුත් ඇති කල්ලා එන්න පුළුවන්.. මෙහෙ ඇවිල්ලා මම දන්නෙත් නෑ ශෝන් අයියගෙ කොන්සර්ට් එකක් තියනවා කියලා ලස් වේගාස් වල.. ආර්ග්!! රධ්‍ය අයියා ඒක මතක තියාගෙන ඉඳලද.. මේ මිනිහා මට පිස්සු හදවනවා..

ලස් වේගාස් වල තියෙන්නෙ හුඟක් ඇඩල්ස් ඔන්ලි හොටෙල්ස්.. කැසිනෝ.. ස්ට්‍රිප් ක්ලබ්.. නයිට් ක්ලබ්.. සින් සිටි කියලම කියන්න පුළුවන් ඉතින්.. මමත් එහේ යන මුල්ම වතාව මේක.. බැරිවෙලාවත් තනියම ගියානම්.. එක්කො ඔන්නෑ.. දැන් යනවනෙ..

දහය හමාරට විතර රධ්‍ය අයියා ආවම අපි එයාපෝට් ගියා.. හුඟක්ම ෆ්ලයිට් එකේ හිටියෙ කොන්සර්ට් එකටම යන කට්ටිය.. මේ දවස්වල එහේ කොන්සර්ට් වීක් එකක් තියෙනවා.. මාරයි..ෆ්ලයිට් එකෙත් සමහරු සින්දු කියනවා.. අපි හිනාවෙවී කියව කියව හිටියා.. කැලිෆෝනියා වලින් ෆ්ලයිට් එකක වේගාස් වලට විනාඩි හතළිස් පහක් විතර යනවා.. අපි හොටෙල් එකට යද්දිත් දවල් දෙකට විතර ඇති.. බෙලාගියෝ කියන්නෙ වේගාස් වල තියන ලස්සනම හොටෙල්ස් වලින් එකක්.. ඒකෙම කැසිනෝ එකකුත් තියනවා..

මම රූම් එකට ඇවිත් බෑග් ටික කබඩ් එකකින් දාලා තනිකරම වීදුරු වලින් හදලා තියන ඉස්සරහ වෝල් එකෙන් එහාපැත්ත බලාගෙන හිටියා.. ටසිරි මෙහේ පිස්සු හැදෙනවානෙ.. එළියෙනම් මේ කාලෙ රස්නෙයි.. ඒත් හොටෙල් එක ඇතුළට ඒ තරමට රස්නයක් දැනෙන්නෙ නෑ එයා කන්ඩිශන් කල්ලා තියන නිසා.. රධ්‍ය අයියා ඇවිත් මගේ පිටිපස්සෙන් හිටගත්තා.. මේකා මොකද රතු වෙලා ඉන්නෙ..

@Shan

" මෙහේ මරු නේද අනේ.."

" ම්ම්.."

" අපි කවද්ද ආයෙම ලංකාවට යන්නෙ.. ඔයා ඔෆිස් යන්නත් ඕනනෙ.."

රධ්‍ය අයියා එහාපැත්තෙ තිබ්බ කච්ච එකෙන් ඉදගත්තම මම ක්‍රචස් දෙක පැත්තකට කල්ලා හිටගන්න බැලුවා.. මේ මගුල එක්ක මට බෑ දෙයියනේ.. සමහර වෙලාවට කකුල කැඩිලා කියලා අමතක වෙලා මම ඇවිදගෙන යන්නත් හදලා ඇදගෙන වැටෙනවා.. ඒ වුනාට මට ඕන ඇවිදින්න.. රධ්‍ය අයියා මට දෙකක් රෑවහම මම එක ක්‍රච එකකට වාරුවෙලා හිටියා.. දෙකම ඕනත් නෑ.. එකක් තිබ්බනම් ඇති.. ඒත් අපේ දෝණි කෑගහනවා..

" වෙඩින් එක ඉවරවුණාම යමු.. තව ටික දවසනෙ.. එතකල් තියන ලෙක්චර්ස් දෙකතුන මට මෙහෙ ඉදන් කවර් කරන්න පුළුවන්.."

" ඒක හොඳයි.. මේ මම ඇඳුමක් මාරුකරන් එන්නම්.."

" ම්ම්.. බැන්ඩේජ් එක මාරු කරමු.. ඉක්මනට ගිහින් එන්න.."

මම කබඩ් එකෙන් ඇඳුමක් අරන වොශ්‍රූම් එකට ගියා.. මේක කපල්ස් වලට ඉන්න ඩිසයින් කරපු රූම් එකක් නිසා වොශ්‍රූම් එකේ උඩත් වීදුරු.. පහළත් වීදුරු.. අර මැද්දෙන් විතරක් ලාවට පේන්නැති වෙන්න ස්ටිකර් එකක් ග්ලාස් එකේ අලවලා තියනවා.. මම වොශ් දානකල් රධ්‍ය අයියා වැඩකට යනවා කියලා එළියට ගියා..

සති දෙකකින් මගුල තියනවා කියන්නෙ මගේ පෞකාරයත් කැලිෆෝනියා ඒවි එහෙනම්.. මම කොච්චර කාලෙකින් දැක්කෙ නැද්ද සෙනුකයව.. අනිත් උන් දෙන්නවත් එහෙම තමා.. එදා පාටි එකෙන් පස්සෙ මොකෙක්වත්ම දැක්කෙ නෑ.. මම නැගිටිද්දිත් අන්දොස් වෙලා වගේ දවසක්ම මොකුත් හිතාගන්න බැරුව හිටියා.. සැරින් සැරේ නින්ද ගිහින් නැගිටිද්දි වෙනස් වෙනස් මනුස්සයො එහෙට යනවා මෙහෙට යනවා.. ඇවිත් මගේ උණ බලනවා.. සිහිය ආපුම දවස්වල මට මැරෙන්න හිතුණා.. මට ආයෙම බැඩ්මින්ටන් පටන්ගන්න ලොකු අදහසක් හිතේ නෑ.. මෙහෙම කකුලක් තියාගෙන නම් කොහොමත් බෑ.. අනික මගේ ජොබ් එක ඒක නෙමෙයිනෙ.. ප්ලේ කරන කාලෙ යන්න පුළුවන් උපරිමේටම ගියා.. දැන් සේරම බදාගෙන කරන්නත් අමාරුයි අනික.. හොස්පිටල් යන්න ගත්තට

@Shan

පස්සෙ.. මම හිතන්නෙ මම මගේ හොබී එකට සමුදෙන්න කාලෙ ඇවිල්ලද කොහෙද.. ඒකත් හොඳයි.. දැන් මට බිසී වෙනවට වඩා නිදහසේ ඉන්නයි ඕන.. මහන්සි වෙන කාලෙ මහන්සි වුණානෙ.. ඒකෙනුත් ගොඩක් දුර ගියා.. මගේ පාර.. එතනින් ඉවරයි.. දැන් ඩොක්ටර් කෙනෙක් විදියට ඉස්සරහට යනවා.. මගේ හිතටත් සැනසීමයි..

අපි ලන්ච් එකත් අරගෙන කකුලත් ආයෙම බැන්ඩේජ් කල්ලා මහන්සියට නින්ද ගියා.. අනික මට බොන්න තියන බෙහෙත් වලට නින්දත් යනවා.. නැගිට්ටද්දි රෑ වෙලා.. රඩ්‍ය අයියා ඒත් පස්ස උඩ දාගෙන නිදි..මම රඩ්‍ය අයියගෙ අත් දෙක අස්සෙන් දහලලා දහලලා එහාට පැනගන්න හැදුවහම ඒකා ඇහැරුණා.. ඇහැරිලා බයවෙලා වගේ මං දිහා බලාගෙන හිටියා..

" ඔයාගෙ අත හිරිවැටෙයි.. මම මෙහෙම ඉඳලා.."

රඩ්‍ය අයියා මාව ඇදලා අරගෙන බදාගත්තා.. මාව ආයෙම බුවළු ග්‍රහණයට ලක් වුණා..

" එක විදියක ඉඳහන්කො.. මම බයත් වුණා.."

" බය වෙලා ඉන්න ඕන තමා.. දැන් බැදහම බයවෙලා ඉන්න හරිනෙ.."

" ඒ මොකටද.."

" එහෙම තමා.."

මම රඩ්‍ය අයියගෙ ශර්ට් එක අස්සෙන් අත් දෙක දාගත්තා.. රඩ්‍ය අයියා මගෙ කම්මුලට හාද්දක් දුන්නා.. ඩිම් වෙලා තියන කහපාට එළියෙන් මට පේනවා.. එයාගෙ ඇස් දිලිසෙනවා..ැදා වගේමයි දැනුත්.. මම එයාව දැක්ක පළවෙනිම දවසෙ එයාගෙ ඇස් දිලිසුණේ කොහොමද.. අදටත් ඒක එහෙමම තියනවා.. මට එයාගෙ බෙල්ලෙ තියන නෙක්ලස් එක අතට අහුවුනාම මම ඒක අරගෙන බැලුවා..

" මට ඔයා නැතුව පාළුයි ඒයි.. "

" මම ඉන්නවනෙ.."

@Shan

" ඒකතමා ආයෙ අතුරුදහන් නොවී ඉන්නවා.. නැත්නම් මම තවසෙට තරු පේන්න දෙනවා.."

රධ්‍ය අයියා මගේ අතට ඇඟිලි පටලගෙන ඒ අත ඇඳට තියලා තද කරගෙන මගේ මූණට පහත් වුණාම මම ඇස් දෙක පියාගත්තා.. එයා පරිස්සමට මගේ තොල් උඩින් තොල් තියාගත්තා.. ඒ පොඩි වෙලාවටත් අර මත් වෙන හැඟීම මට දැනුණා.. මම එයාගෙ කර වටේ අතක් යවලා එයාව මගේ පැත්තට ඇදගත්තා.. එයා තාම සීමාවක් තියාගන්නවා මට තේරෙනවා.. මම ඒක ගැන එයාගෙන් අහන්න යන්නෙ නෑ.. එයා මම ඇහුවත් කිව්වත් එතනින් එහාට යන්නෙ නෑ.. එදා වගේම මට ඒවා මතක් වෙනවා.. මුල ඉඳලම..

හුඟ වෙලාවකට පස්සෙ රධ්‍ය අයියා මගේ නළලට හාද්දක් දුන්නා..

" ඇඟට අමාරුයිද.. "

" නෑ.. දවල් බෙහෙත් බිව්වනෙ.."

" ඔයාට වෙඩින් එකකට මහන්සි වෙන්න අමාරුයිනෙ වරද්.. බොරුවට අමාරුවක් නෑ කියලා පෙන්නුවට.. ම්ම්..??"

රධ්‍ය අයියා මගේ කොණ්ඩෙ පිටිපස්සට කල්ලා අල්ලගෙන හිටියා.. හරි සනීපයි..

" එහෙම එකක් නෑ අනේ.. ඔයා ඉන්නවනෙ.. "

" ගෙදර ගියාම ඔයා රෙස්ට් එකේ ඉන්න.. "

පහුවදා මම කණ්නාඩිය ඉස්සරහට වෙලා හැට පැයක් විතර ලැස්ති වුණා.. ඇයි අනෙ මගේ ශෝන් අයියා බලන්නනෙ යන්නෙ.. ලේසි පාසුද.. බැරි වෙලාවත් ශෝන්ට රෝස මලක්වත් දීගන්න පුළුවන් වුණොත් මොන වාසනාවක්ද.. රධ්‍ය අයියා එයාම අරගත්තු ඇඳුමක් දීලා මට ඇඳගන්න උදව් කලා.. මම මූණෙ කහ පාට තරුවකුත් අලවගත්තා.. ඒකනම් පිම්පල් පැච් එක්ක හරිද.. මේ දවස්වල මගේ හෝමෝන වැඩකරන්න අරගෙන මූණෙ පැත්තක පිම්පල් එක්ක දාලා.. සාමාන්‍යයෙන් මගේ මූණෙ පිම්පල් එන්නෙ නෑ.. ආවහම මම ඒකට ඇනලා ඒක නැති කල්ලා දානවා.. අපේ අම්මා බනිනවා මූණෙ කැලල් හිටිනවා කියලා.. ඒත් මම ආස නෑ.. ඊටපස්සෙ මම එතන පිම්පල් පැච් එක්ක අලවගත්තා.. ඒකෙත් ලස්සනක් තියේනෙ ඉතින්..

@Shan

මම ඇඳගෙන ගියේ සිල්ක් අත් දිග කළුපාට ශර්ට් එකකුයි.. පැච් ට්‍රවුසර් එකකුයි.. කළුපාට හීනි ස්කාෆ් එකකුයි.. ඇන්කල් බූට්ස් දෙකකුයි.. තව සිල්වර් බෙලි චේන් එකකුයි.. කොන්සර්ට් එකකටනෙ යන්නෙ.. රධ්‍ය අයියත් කළුපාට ශර්ට් එකක් ඇඳලා ඒකට ඩෙනිම් ට්‍රවුසර් එකක්කට ලෙදර් ජැකට් එකක් දාලා.. මතක ඇති කාලෙක මම ලස්සනට ලෑස්ති වුණාමයි ගමනක් යන්න.. හුහක් වෙලාවට මම අතට අහුවෙන එකනෙ ඇඳගෙන යන්නෙ..

හවස වෙල්සී එකට යද්දි වෙලාව හයට විතර ඇති.. පිස්සු හැදෙන්න සෙනග.. හුහක් සෙලිබ්‍රිටීස්ලත් කොන්සර්ට් එකට එනවා කියලා තිබුණ නිසා පුදුම සෙනඟක් හිටියෙ.. ඒ වුණාට මම නම් ඕවර් එක්සයිටඩ්..!! මම මගේ ආසම සින්ගර් ගෙ කොන්සර්ට් එකකට යනවා කියලා මතක් වෙන හැමසැරේකම මට නිකන් අහසෙ ඉන්නවා වගේ ෆීලින් එකක් දැනෙනවා.. සමහරු අපි යද්දි ඉඳලා හිටලා අපි දිහත් හැරිලා බැලුවා.. මම රධ්‍ය අයියගෙ අතේ එල්ලිලා වෙල්සි එක ඇතුළට ගියා.. අපිට තිබුණෙ වී අයි පී ටිකට්ස් දෙකක්.. කොන්සර්ට් එක පටන්ගන්නකල්ම මම රධ්‍ය අයියා එක්ක කියව කියව හිටියා.. රධ්‍ය අයියා මම කියවනවා වැඩි කියලා කම්මුල් දෙකෙන් අල්ලලා ගැලවෙන්නම මිරිකලා ඉස්සරහට හරවලා මගේ බඩ මැද්දෙන් අත් දෙක දාගෙන හිටියා.. එහෙම කොහොමද මම කට පියාගෙන ඉන්නෙ.. මල සමයං..

අපිට පොඩ්ඩක් විතර එහාපැත්තෙන් කැමීලා ඇවිත් ඉන්නවා මම දැක්කා.. තව තැන තැන සෙලිබ්‍රිටීස්ලා ඉන්නවා.. සමහරු මම එච්චරම දන්නෙ නෑ.. මම දකින්න ආස වෙලා ඉඳපු හුහක් අය මගේ ඇස් ඉස්සරහා ඉන්නවා.. ඉතින් හත්දෙයියනේ මට සතුටු හිතෙන්නැද්ද..

ටික වෙලාවකින් ඕඩියන්ස් එක ඔක්කොම තද රතු පාට වෙලා ස්ටේජ් එක කළුවර වුණා.. ෆුට්ස්ටෙප්ස් වගයක් ඇහුණා.. විනාඩි දෙකක් තුනක් යන්න ඇති..

ශෝන් මෙන්ඩිස් පුරුදු විදියටම එයාගෙ ආම් කට් ශර්ට් එක ඇඳලා ගිටාර් එකත් කරේ එල්ලගෙන මයික් එක ගාව හිටගෙන ඉන්නවා.. එයා අපිට වඩා පොඩ්ඩම පොඩ්ඩයි ඉස්සරහින් හිටියෙ.. මට කලන්තෙට ආවා.. මුළු ඕඩියන්ස් එකේම ඉඳපු හයදාහක් විතර කන් පැලෙන්නම කෑගහනවා.. මමත් හෙන හයියෙන් කෑගැහුවා.. රධ්‍ය අයියා මාව එයාගෙ ඇඟට තුරුල් කරගත්තා.. එතකොට මට ක්‍රවුඩ් නැතුවත් හිටගෙන ඉන්න පුළුවන්..

@Shan

" Dude I feel insane, I feel crazy.."

ශෝන් මෙන්ඩිස් එයාගෙ අර ලස්සන ඇස් දෙක දිලිසෙන්නම හිනාවුණා.. ටිකකින් කැමිලා දිහා හැරිලා බැලුවා.. ආයෙම හිනාවුණා.. වෙල්සි එකේ උඩ සුදුපාට මල් එල්ලලා හැමතැනම... පොඩි පොඩි වළාකුළු වගේ හදලා.. ස්ටේජ් එක දෙපැත්තෙන්ම මිස්ට් එකක් වගේ හැදෙනවා.. ඒක නම් තනිකරම පිස්සුවක් තමයි.. එයා පළවෙනියටම සින්ග් කළේ ට්‍රීට් යූ බෙටර් එක.. මම ආසාවෙන් අහගෙන හිටියා.. එයා එක්කම කිව්වා.. ඒක විඳින්නම නම් ආසම ආටිස්ට්ගෙ කොන්සර්ට් එකකට යන්නම ඕන.. එයා එක්ක ඒ මොහොතෙදි කෑගහලා සින්දුවක් කියන්න නම්.. රධ්‍ය අයියා සැරින් සැරේ මගේ කම්මුල් දෙක අත් දෙකින් පොඩි කරනවා.. මම හිටියෙ රතුම රතුපාට වෙලා.. රධ්‍ය අයියා නැමිලා හාද්දක් දුන්නහම මම අත් දෙකින් මූණ වහගත්තා.. අපේ වටේ ඉන්න අයත් අපි දිහා බල බල ලාවට හිනාවෙනවා.. රධ්‍ය අයියා මාව වලස් පැටියෙක් වගේ බදාගෙනම හිටියා.. මට හිටගෙන ඉන්න ලේසි වුණා.. අනික ඉස්සරහා වැටක් වගේ තිබුණ නිසා මම ඒකත් අල්ලගෙනම හිටියා..

**" When I say youth I'm not talking about how old or young you are, I'm talking about a feeling.."**

" Now I see very cute couples surrounded by love everywhere.. I miss my love.. So this song is for the most lovely couples who have won their love through all the obstacles.."

මම හිටියේ ගල් ගැහිලා වගේ.. හත්දෙයියනේ ඒ මනුස්සයා මගේ දිහාත් බැලුවා නේද.. ආආආආආආආආආආ!!! මට හොඳටම පිස්සු වගේ.. ඒ අස්සෙ ඇඬෙන්නත් එනවා.. මුළු ඔඩියන්ස් එකම ආයෙම ඩිම් කරපු රතුපාට එළියකින් කළුවර වුණා.. මම ආසම සින්දුව.. ලොස්ට් ඉන් ජැපෑන්..මම රධ්‍ය අයියා මං ළඟ ඉඳපු නැති කාලෙ ඒක සෑහෙන්න ඇහුවා.. මගේ ජීවිතෙන් කොටසක් වගේ සින්දුවක්... රධ්‍ය අයියා මාවත් බදාගෙනම ගිටාර් එකේ මියුසික් එකටම දෙපැත්තට පැද්දුණා.. මම එයාගෙ අත් දෙකින් අල්ලගෙන හිටියා.. එයාගෙ ඇඟේ රස්නෙ මට දැනෙනවා.. දැන් කොන්සර්ට් එක පටන්ගෙන පැය එකහමාරක් විතර වෙනවා.. නටලා නටලා එකසැරේම රොමැන්ටික් මියුසික් ප්ලේ වෙද්දි මුළු ඔඩියන්ස් එකේම අමුතු රොමැන්ටික් ගතියක් තිබුණා.. ඒකට ආස හිතෙනවා..

@Shan

" All it'd take is one flight

We'd be in the same time zone

Looking through your timeline

Seeing all the rainbows, I

I got an idea

And I know that it sounds crazy

I just wanna see ya

All I gotta ask "

රධ්‍ය අයියා මගේ කන ගාවටම පහත් වෙලා ඒ සිංදුවම හිමින් මුමුණද්දි මම මූණ රතුම රතුපාට කරගෙන හිටියා.. එයා මාව සැරින් සැරේ තද කල්ලාම තුරුළු කරගන්නවා.. ඒ එක්කම හිමින් දෙපැත්තට වැනෙනවා..

" Do you got plans tonight?

I'm a couple hundred miles from Japan, and I

I was thinking I could fly to your hotel tonight

'Cause I-I-I can't get you off my mind

Can't get you off my mind

Can't get you off my mind (oh)"

" Yeah, I could feel the tension

We could cut it with a knife

I know it's more than just a friendship

I can hear you thinking 'bout it, yeah

@Shan

Do I gotta convince you

That you shouldn't fall asleep?

It'll only be a couple hours

And I'm about to leave"

" Do you got plans tonight?

I'm a couple hundred miles from Japan, and I

I was thinking I could fly to your hotel tonight

'Cause I-I-I can't get you off my mind

Can't get you off my mind

Can't get you off my mind"

" Do you got plans tonight?

I was hoping I could get lost in your paradise

The only thing I'm thinking 'bout is you and I

'Cause I-I-I can't get you off my mind

Can't get you off my mind

I can't seem to get you off my mind"

" Let's get lost tonight

Let's get lost tonight

Baby, you and

I can't seem to get you off my mind

@Shan

Let's get lost tonight

Let's get lost tonight

Baby, you and

I can't seem to get you off my mind"

" Do you got plans tonight?

I'm a couple hundred miles from Japan, and I

I was thinking I could fly to your hotel tonight

'Cause I-I-I can't get you off my mind

I can't get you off my mind"

" Do you got plans tonight, baby?

I was hoping I could get lost in your paradise

The only thing I'm thinking 'bout is you and I

And I-I-I can't get you off my mind

Can't get you off my mind

I can't seem to get you off my mind, yeah"

රධ්‍ය අයියා මාව හිමින් සැරේ එයාගෙන් අයින් කරවලා ඉස්සරහා වැටට හේත්තු කළා.. මම හිටියේ සින්දුවට වශී වෙලා.. ඒ එක්කම උඩ රඳවලා තිබුණු සුදුපාට මල් පහළට හැළුවන්න ගත්තා. ශෝන්ට සින්දුව කියන ගමන්ම හිනා ගියාම මම උඩ බලාගෙන හිටියා.. එක පොඩි මල් පෙත්තක් පාවෙලා ඇවිත් මගේ ඇහි පිල්ලමක වැදිලා පහළට වැටුණා..

" Let's get lost tonight

@Shan

Let's get lost tonight

Baby, you and

I can't seem to get you off my mind

Let's get lost tonight

Let's get lost tonight

Baby, you and

I can't seem to get you off my mind................."

සින්දුව ඉවරවුණාම හැමෝම හයියෙන් චියර් කළා.. මම හිටියෙ වෙනම සිහියක.. එතන හරියට සුරංගනා ලෝකයක් වගේ.. මල් පෙති එක්ක පොඩි පොඩි චිට්ස් පහළට වැටෙනවා.. ඒවගෙ පොඩි මැසේජස් ප්‍රින්ට් කල්ලා තියනවා.. ඒ එක්කම මගේ පිටිපස්සෙ ඉන්න අයගෙ අමුත්තක් මට තේරුණා.. හැමෝම මං දිහා බලාගෙන ඉන්නවා.. මම රධ්‍ය අයියව හොයාගෙන පිටිපස්ස හැරුණහම..

මගෙ දෙයියනේ!!!!!!!!!!!

මම එහෙමම පපුවත් අල්ලගෙන වැටට හේත්තු වුණා.. මම මැරෙයි දෙයියනේ.. මේ මනුස්සයා මාව පණපිටින්ම මරණවා.. මගේ ඇස් වලට කඳුළු හරි ඉක්මනට ඉනුවා.. මොනවද මේ වෙට වෙන්නෙ.. මට පිස්සු වගේ.. රධ්‍ය අයියා අඩි දෙක තුනක් විතර පිටිපස්සට වෙලා, හිනාවෙන ගමන් මගේ ඉස්සරහින් කකුළක් නමලා දණගැහුවා.. ඊටපස්සෙ ජැකට් එක ඇතුලෙන් පොඩි බොක්ස් එකක් අරගෙන ඒක මගේ පැත්තට හරවලා ඕපන් කළා..

**" Will you do me the honor of being my husband..?"**

මම එයාගෙ දිහාම බලාගෙන හිටියා.. මට වචනත් හිරවෙනවා..

**" y-yea.."**

@Shan

අපි වටේ හිටපු හැමෝම මං දිහා බලාගෙන චියර් කරද්දි රධ්‍ය අයියා නැගිටලා මගේ අතට වයිට් ගෝල්ඩ් වලින් හදපු ඩයමන්ඩ් එකක් අල්ලලා තියන රින්ග් එකක් දැම්මා.. ඊටපස්සෙ මගේ අතට කිස් එකක් දුන්නා.. මගේ අතුත් වෙව්ලනවා.. අපි වටේ හිටපු හැමෝම චියර් කරද්දි එයා මගේ මූණට පහත් තොල් වලින් පෙක් එක්ක තිබ්බා.. මම එයාට තුරුල් වුණා.. මගෙ පපුව පිස්සුවෙන් වගේ ගැහෙනවා.. ඇත්තෙන්ම මට පිස්සු වගේ.. මොනවද දෙයියනේ මේ වෙන්නෙ..

" අ-අයියෙ.."

" මම ආදරෙයි.. වරද්..!"

මම රධ්‍ය අයියව තව තුරුල් කරගත්තා.. කොන්සර්ට් එක ඉවරවෙන්න තිබ්බෙ පැය බාගයක් නිසා මම මොකුත්ම කතානොකර ඉස්සරහා හැරිලම හිටියා.. එතන හිටපු හැමෝම මං දිහා සැරින් සැරේ බලනවා.. මම හිතන්නෙ කොන්සර්ට් එකේ මෙන් කැරැක්ටර් එකටත් මාව මීටර් වුණා.. අපි හිටියෙ ඉස්සරහමයි.. රධ්‍ය අයියා ප්‍රපෝස් කරද්දිත් මට මොකුත්ම වටේ ඇහුණෙ නෑ.. මම සැරින් සැරේ මගේ අතේ තිබුණු මුද්ද දිහා බැලුවා.. ඒක දිලිසෙනවා.. හරිම ලස්සනයි.. මට විශ්වාස කරන්න බෑ.. එයා මගේ අතට දාපු දෙවෙනි මුද්ද.. මට පුදුම සතුටුයිනෙ.. මම මේ ජීවත් වෙන දවස් ගාණට කොච්චර සතුටු වුණාද.. මට හිතාගන්න බෑ..

කොන්සර්ට් එක ඉවරවෙලා හොටෙල් එකට එනකල් මම මොකුත් කතාකළේ නෑ.. රධ්‍ය අයියා මගේ දිහා බලලා කොන්ඩෙ අවුල් කළා.. ඒත් මට තාම හිතාගන්න බෑ.. මම දහස් වතාවක් විතර මගේ අතේ තිබ්බ මුද්ද අල්ලලා බැලුවා..

ඒක ඇත්තටම මගේ අතේ තියනවා!!

හොටෙල් රූම් එකට එනකල්ම රධ්‍ය අයියා මාව අල්ලගෙන හිටියා.. රූම් එකේ දොර වැහුණ ගමන් මම රධ්‍ය අයියගෙ කර වටේ අත් දෙක බැඳගෙන එයාගෙ තොල් වලින් හාද්දක් තිබ්බා.. එයා මගේ ඉණෙන් පරිස්සමට අල්ලගෙන මාව ඇහට හේත්තු කරගත්තා.. එයා හරි ලස්සනට හිනාවෙනවා.. මට හරිම ලෝබයි..

" මම ඔයාට ආදරෙයි.. අයියෙ..!"

@Shan

එයාව හිම්හිට රෝස පාට වුණා.. මම එයාගෙ තොල් වලින් තොල් තියාගත්තා.. කාමරේ තිබුණු පොඩි කැන්ඩ්ල්ස් දෙක තුන නිසා කාමරේ අමුතු රෝසමල් සුවඳකින් වහගෙන තිබුණා.. රධ්‍ය අයියා මාව අත් දෙකටම උස්සගෙන ගිහින් කවුච් එකෙන් පරිස්සමට හාන්සි කරවලා මගේ මූණට පහත් වුණා.. සැහෙන්න වෙලාවක් ගෙවිලා යන්න ඇති.. අන්තිමට මම අවුල් වෙච්ච ඇඳුම් එක්ක රධ්‍ය අයියගෙ උඩ ඇඳුමක් නැතුව තිබුණු පපුවට තුරුල් වෙලා හිටියා.. එයා මාව අත් දෙකින්ම බදාගෙන හිටියා.. මම තවමත් මගේ අතේ තියන මුද්ද දිහා බලාගෙන ඉන්නවා..

ඒක.. ඇත්තටම.. තියනවා..!!



(වෙරි ලිස්ට් එකේ ටික් එකක් දාන ගමන්)

ඒකත් හරි..

හෙහේ.. සමතුටුයිද.. කොමසර්ට් එක ලමසනයිතෙ..

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 170 කොටස

" පුතා ආවද.. අන්න වරද්නම් කාමරේ නිදි.."

" අපේ අම්මා ටිකකින් මෙහේ එනවා කිව්වා දේදුණු අම්මෙ.."

මම බලැන්කට් එක අරන මූණ වහගත්තා.. දවල්ට කාලා ඇඳට වැටුණා විතරයි මට හොඳටම නින්ද ගියා.. අනික මේ දවස්වල අපේ ගෙවල් වල සැහෙන්න වැඩ.. පෞකාර පවුලයි.. පෞකාර පවුලෙ උන් කරගහගෙන ඉන්න සුදු පවුලයි.. අපේ නෑදෑයොයි.. යාළුවොයි.. මම දන්න ප්ලෙයර්ස්ලයි.. තව හුඟක් අයයි සේරම කැලිෆෝනියා ඇවිල්ලා ඉන්නෙ.. මගේ ආච්චිඅම්මා කෙල්ලත්.. මොකටද..

අපේ වෙඩිමට තමා..

හැබැයි මමනම් සියලු වැඩකටයුතු වලින් ඇත් කල්ලා පැත්තකට කල්ලා තියලා තියෙන්නෙ මම අසනීප නිසා.. කියන තරන්ම ඉතින් අසනීපයක් නෑ.. සෙනුකයා උදේ වරුවම ආශියි මහීශයි එක්ක මෙහේ ඉඳලා හවස උන්ගෙ කොල්ලො එක්ක බීච් යනවා කිව්වා.. තව අපේ වෙන්ඩ අප්පොච්චා චමිරු මගෙ යාළු පරෙයියත් මෙහෙ ඇවිල්ලා ඉන්නෙ.. ලිලී එක්ක මේ දවස්වල යුද්ධ අල්ලනවා.. ලිලීගෙ මූඩ් ස්වින්ග්ස් වලට චමිරු හුඟක් දරුණු විදියට මූණ දෙන ගමන් ඉන්නෙ.. පව් අපේ අයියණ්ඩියා.. බැන්දහම ඔහොම තමයි ඉතින්.. ලිලීට පොප් කෝන් වල හොට් සෝස් ගාගෙන කන්න ඕන වෙලා උගේ බඩත් දනවා කියලා කිව්වා..

පහුගිය සතියෙම අපේ අම්මයි, බාප්පයි, අසලි අම්මයි, අයියලයි සේරම බිසී.. එකසැරේ වෙඩින් එකකට ලෑස්තිවෙනවා කියන්නෙ ලේසි නෑනෙ.. මුලින්ම වෙඩින් කාඩ්ස් ප්‍රින්ට් කල්ලා හදලා යැව්වා.. එදා කොන්සර්ට් එකට ගිහින් ගෙදර ආවත් හරි මම තාම එළියටවත් බැස්සෙ නෑ.. ගෙදරින් එළියට බහින්න දෙන්නෙ නෑ මගේ නලමලේ ෆියොන්සෙ.. ගෙදරට ඇවිල්ලා හම්බෙන කෙනෙක් හම්බෙනවා ඇරෙන්න එළියට බැස්සොත් මගෙ අනිත් කකුලත් කඩනවා කිව්වා.. අනේ ඉතින් මම බලන් ඉන්නවා එයැයි කකුල කඩලා යනකල්.. ගිය සතියෙ මගේ ඇඳුම් වලට මෙශර්මන්ට්ස් අරගෙන යන්නත් ගෙදරටමයි ආවෙ.. තව කොණ්ඩෙ හදන්න අරවට මේවට.. මගේ කාමරේ දැන් ඇඳුම් වලිනුයි එක එක බඩු වලිනුයි පිරිලා.. කාමරේ පැත්තක

@Shan

එල්ලලා තියනවා මගේ වෙඩින් එකට අඳින ඩ්‍රෙස් එක.. කළුපාට කවරයක් දාලා.. රධ්‍ය අයියට මම ඒක ඇඳලා පෙන්නුවෙත් නෑ.. බඳින දවසටම පෙන්නනවා කියලා හිතාගෙන ඉන්නෙ.. අපි දෙන්නම අඳින්නෙ නිල්-සුදු මික්ස් වෙලා තියන ඇඳුමක්. රධ්‍ය අයියගෙ බෙස්ට්මන්ට ඉන්නෙ අයුක අයියා.. මට ඉන්නෙ මගේ පෞකාරයා.. උන් දෙන්නා අඳින්නෙ තනි සුදු පාට ඇඳුමක්.. නිල් පාට බෲච් එකක් එක්ක.. කොහොම වුණත් ටික කාලෙකින් හරි වෙඩින් එකට සැහෙන්න ලැස්තියක් වුණා..

මේ සතියෙ රධ්‍ය අයියා මට ප්‍රපෝස් කරපු වීඩියෝ එක ශෝන් මෙන්ඩිස් එයාගෙ ඉන්ස්ටර්ග්‍රෑම් එකේ රීල් එකක් විදියට දාලා තිබුණා.. ඉතින් ඕක හෙනට වයිරල් වුණා.. ලංකාවෙනම් දැන් හැමතැනම ඉන්නෙ මම.. මමයි රධ්‍ය අයියයි ඉස්සර අරගෙන සෝශල් මීඩියා දාපු ෆොටෝස් කට්ටිය උඩට ඇදලා අරගෙන හැමතැනම ශෙයා කරනවා.. ඒ කියන්නෙ අවුරුදු හයකට කලින් ගත්තු ඒවා.. කොහොම වුණත් මට පේන්නෙ හේට් කමෙන්ට්ස් වලට වඩා අපි දෙන්නට විශ් කල්ලා කමෙන්ට්ස් වැටෙනවා.. ඒක මේ ලංකාවෙ ආකල්ප වෙනස් වෙච්ච මුකුත් ලබ්බක් නෙමෙයි..

අපේ රටේ උන් හෙන අවස්ථාවාදියි.. මටනම් කියන්න තියෙන්නෙ එච්චරයි.. මම හොඳට ඉගනගෙන තියනවා.. ඩොක්ට කෙනෙක්.. ලංකාවෙ පළවෙනියටම ඔලිම්පික් ගෝල්ඩ් මෙඩල් එකක් ගෙනැත් දුන්නෙ මම.. රධ්‍ය අයියා ඉලෙක්ට්‍රිකල් ඉන්ජිනියර් කෙනෙක්.. ඇසිස්ටන් ලෙක්චර් කෙනෙක් විදියට උගන්නනවා.. එතකොට අපි දෙන්නම හොඳ ඉස්කෝලවල ගිහින් තියනවා.. අපි දෙන්නගෙම ෆැමලි බැක්ග්‍රවුන්ඩ් එක හොඳයි.. රධ්‍ය අයියගෙ අයියා ලංකාවටම ඉන්න ඇනස්තටිකල් කන්සාල්ටන්ල හතරදෙනාගෙන් එක්කෙනෙක්.. මගේ මාමා ඩෙන්ටල් සර්ජන් කෙනෙක් කැනඩා යුනි එකක ස්ටඩීස් කරපු.. අසලි අම්මා ඩර්මොටොලොජිස්ට් කෙනෙක්.. මගේ අම්මා මැරි කල්ලා ඉන්නෙ බිස්නස්මන් කෙනෙක්.. අපේ යාළුවො හොඳ ජොබ් කරන සමාජෙ පිළිගත්තු තැන්වල මිනිස්සු.. ඔය දෙකයි පනහෙ ගොං ටෝක් දෙන උන්ට අඩුම තරමෙ අපි එක්ක හැරෙන්නවත් පුළුවන්ද.. බැනෙ.. අඩුම තරමෙ අපෙන්වත් ලංකාවෙ ගේ කමියුනිටි එකට පණිවිඩයක් ලැබෙනවනම් මම කැමතියි..

අලි ලොකුකමකට කියනවා නෙමෙයි.. ඒත් අර 'පහත් තැනින් යයි ගලා ජලේ' කියලා කතාවක් තියෙන්නෙ.. ඒක මේකට ඇඩ් කළානම් වෙලා තියෙන්නෙ මොකක්ද කියලා හොඳට හිතාගන්න පුළුවන්.. අනික මම

@Shan

වැදගත් විදියට මගේ සෝශල් මීඩියා වල මගේ මැරේජ් එක අනවුන්ස් කළා.. කොහොමත් මම එහෙම දහලන්නෙ නෑ සෝශල් මීඩියා වල.. හුහක්ම මට නම් ආවෙ අනාගතේට සුභ පතලා.. විශ් කල්ලා තමයි..

අපි දෙන්නගෙන ඉස්කෝලෙ කාලෙ මියුසික් ටීචත් අපිට කතාකළා.. අනේ~ අපේ ගයනිකා මැඩම්.. කතාකල්ලා හදවතින්ම සුභ පැතුවා.. මැඩම්ට ලාවට තේරිලාලු තිබුණේ.. අහලා හිත් නරක් කරගනී කියලලු මොකුත් කිව්වෙ නැත්තෙ.. රධ්‍ය අයියා දෙකට ගණන් කරගන්න බෑ වගේ හිටියට ඒ කාලෙ ඉඳන්ම මනමාලයා කියලා මැඩම් විහිළු කළා..

" වරද්.. ඔයා නිදිද.."

දොරට තට්ටු කරන සද්දෙ ඇහිලා මම ඔලුව උස්සලා වෙලාව බැලුවා.. හවස් වෙලා රධ්‍ය අයියා එනවා කිව්වනෙ..

" එන්ඩෝ.."

මම අවුල් වෙලා තියන කොණ්ඩෙත් ලාවට අතින් හදාගෙන ඇදිලා ගිහින් හෙඩ්බෝඩ් එකට හේත්තු වුණා.. රධ්‍ය අයියා ලොකුම ලොකු මල් බොකේ එකක් අරගෙන තව පේපර් බෑග් එකකුත් අරගෙන හිනාවෙගෙන ඇවිත්, පේපර්බෑග් එක මෙසෙ උඩින් තියල ලොකු රෝසමල් පොකුර මගේ අතට දුන්නා.. මම ඒක දෝත බඳලම අල්ලගත්තා.. අලුත්ම අලුත් රෝස.. හරිම සුවඳයි.. රධ්‍ය අයියා නැමිලා මගේ කම්මුලෙන් හාද්දක් තිව්වා..

" ඔයා කොයිවෙලේද ආවෙ.. මට නින්ද ගියා.."

රධ්‍ය අයියා මගේ ඇඳෙන් වාඩිවුණා..

" දැන් ටිකක් වෙලා.. මගේ බෝයිෆ්‍රෙන්ඩ්ව අන්තිම වතාවට බලලා යන්න ආවෙ.."

හෙට ඉඳන් හස්බන්ඩ් නෙ..

" ඔයාගෙ වැඩ ටික කරගත්තද.. අද දවල් යනවා කිව්වෙ.."

" ම්ම්.. ඒවත් ඉවරවෙලා තමයි ඔයාව බලන්න ආවෙ.."

@Shan

මම මල් බොකේ එක ඇඳ පැත්තකින් පරිස්සමට තියලා රධ්‍ය අයියගෙ අතකින් අල්ලගත්තා.. මාව රතුවෙනවා වගේ.. අනේ ආච්චිඅම්මෙ!!!! හෙට මගෙ වෙඩිම..

" අර පේපර් බෑග් එක ගෙනැත් දෙනෝකො.."

මම හිමින් සැරේ ඒකට ඔලුව දැම්මා.. බඩගිනීනෙ ඉතින්.. මම දන්නවනෙ මම බඳින්න ඉන්න අයියා හැමදාම එද්දි මොනාහරි ගෙනැල්ලා දෙනවා කියලා.. රධ්‍ය අයියා පේපර් බෑග් එක මගේ අතින් තිබ්බහම මම ඒක ඇරලා ඇතුළෙ තිබ්බ කප් කේක් වගේකින් එකකුයි මිල්ක්ශේක් එකයි අරගත්තා..

කප් කේක් එක දැක්කමහ මගේ යකා ආවෙස වුණා.. මුගෙ ආච්චිට..

" අයියෙ!!!!!!"

" ඒක ලස්සනයි නේද.. මට දැක්කහම ඔයාව මතක් වුණේ වරද්.."

" තච්සෙ.. ඉඳපන්කො හෙටින් පස්සෙ.. මම තච්සෙගෙ ඔලුව ගිනි තියනවා.."

" ඇයි උඹ හනුමද.. ගිනි තිය තිය දුවන්න.."

මම කප්කේක් එකේ ඉඳපු තාරාවව හපාගෙන හපාගෙන ගියා.. මෙ තාර වන්නම මම හිතුවෙ අවුරුදු හතකට පස්සෙවත් නැවතිලා තියෙයි කියලා.. මට වැරදුණා සඳමාලි! මගේ මිනිහා වෙනස් වෙන එකෙක් නෙමෙ.. ඌ තාම තාරාවෙක් ඉන්න මොකක් හරි දැක්කගමන් ඒක උස්සගෙන එනවා.. ශර්ට් එකක්ද.. ලේන්සුවක්ද.. කොටින්ම අපේ අම්මට කියලා තාරාවෙකුත් ගොතාගත්තා.. පුදුම මගුලක් තමා..

" මම ඔයාගෙ ක්‍රිශ්ණා හලො.. ඔයා මගේ රාධාවනී.. ඇයි මතක නැද්ද.."

රධ්‍ය අයියා මගේ කම්මුල් දෙක පොඩි වෙලා තැලිලා යන්නම අත් දෙකින් අල්ලගෙන නහය මැද්දට හාද්දක් දුන්නා.. මම එහෙහමම් හෙඩ්බෝඩ් එකෙන් රුට්ටලා කොට්ටෙ උඩට වැටුණටම රධ්‍ය අයියා මගේ තොල් වලට පහත් වෙලා හාදු ගොඩක් දුන්නා.. මම කප් කේක් එකත් උඩට අල්ලගෙන එහෙමම හිටියා.. ඒකගෙ මූණෙ කටු කටු ඇනෙනකොට මට

@Shan

කිචිකැවෙනවා.. ඒක දන්න නිසාම හැමතිස්සෙම මට කේන්ති ගියාම මගේ කම්මුලේ මූණ අතුල්ලලා යනවා.. ටිකකින් මගේ මූණ දන්න ගන්නවා..

" ආහ්ච්.. යනවකො.. අම්මෙ-හ්හ්"

මම හිනාවෙලා හිනාවෙලා පණ නැතුව ඇස් දෙකෙන් කඳුළු එනකල්ම ඇඳේ දැහලුවා.. කකුලට ප්ලාස්ටර් එකක් දාලා තියන නිසා හොඳයි..

" බොට පුදුම විසේ තියෙන්නෙ.."

රධ්‍ය අයියා මගේ කම්මුලක් හපාගෙන හිටියා..

" ආව් අනේ.. රිදෙනවා.. යනන්න අප්පා.."

මම රධ්‍ය අයියගෙ බුවළු අස්සෙන් රුට්ටලා පහළට යාගන්න හැදුවා විතරයි රධ්‍ය අයිඅය මාව උස්සලා ආයෙම කොට්ටෙ උඩට අතැරියා..

" පුතාලා~.."

ඒ එක්කම අසලි අම්මා හෙන ගහන්න වගේ දොර ඇරගෙන ඇතුළට ආවා විතරයි රධ්‍ය අයියා නැගිටගන්න ගිහින් බ්ලැන්කට් එක පැටලිලා මගේ ඇඟ උඩටම පතබැවිලා ඔලුව උස්සගන්න බැරුව මගේ බෙල්ල අස්සෙ මූණ හංගගත්තා.. සැක්.. අසලි අම්මා හොඳට සේරම බලාගෙන ඉන්නවා.. මෙ අම්මටත් අනේ මන්දා..

" හහ.. අම්මෙ.."

මම හෙන ගොං හිනාවක් දැම්මම අසලි අම්මා අද ගාවට ඇවිදගෙන ඇවිත් රධ්‍ය අයියගෙ උරහිසට ඇහිල්ලකින් ඇන්නා.. මටත් ලැජ්ජ්ජයි දැන්නම්.. මම අර මොකාද වගේ බෙල්ල කඩාගෙන කාපු තාරාවෙක් ඉන්න කප් කේක් එකකුත් උස්සගෙන එක අතකින්.. මහසෝනා ගහලා වගේ..

" මෙ මොකද පොඩී.. අලියෙක් වගේ මගේ කොල්ලගෙ ඇඟේ වැටිලා ඉන්නෙ.."

මම බ්ලැන්කට් එකක් අරගෙන ලැජ්ජාවට පත් වෙලා මැරෙන්න හදන මගේ වෙන්ඩ ස්වාමිපුරුශයගෙ ඔලුවෙ ඉඳන් වැහුවා.. දැන් කවුරුත් නැහ්..

@Shan

" එයා නිදි අම්මෙ.."

" මේ තප්පර දෙකට නින්දත් ගිහිල්ලා.. හරි වැඩේ තමා.. අහන්නකො බබෝ මම ඔයාට කියන්න හිටියෙ.."

අසලි අම්මා පුටුවත් ඇදගෙන ඇද ගාවින් ඉඳගත්තා.. දැන් ඉඳපන් ඔහොම ඔක අස්සට වෙලා..

" මොකක්ද අම්මෙ.."

" මම හෙට අඳින්න ඉන්න අඳුම අනේ.. අද ඒක ආවා.. මම ඔයාට පෙන්නන්න ආවෙ.. පහළට ගියාම පෙන්නන්නම් හොඳද.."

" වෝහ්.. ඒක ආවද.. ගැම්මක් තමා ලස්සනට ඇති අනේ.. ඔයාගෙ බෑණ පොඩ්ඩනෙ තේරුවෙ.."

" ඒකතමා.. මේ අපේ ලොකු ෆෝන් ආන්සර් කරන්නෙත් නෑ.. තව ටිකකින් මෙහේ එනවා කිව්වා.."

ඒ අස්සෙන් මට තේරෙනවා බ්ලැන්කට් එක අස්සෙ ඉන්න මනුස්සයා මගේ ශර්ට් එක අස්සට රිංගගත්තා.. මම අතකින් ඒක පහළට ඇදගත්තම රධ්‍ය අයියා ශර්ට් එක බෙල්ල ගාවටම උස්සලා පපුව මැද්දෙන් මූණ තියාගත්තා.. ඒ තියාගෙන නිකන් ඉන්නෙත් නෑ ඒකගෙ මූණෙ තියන කටු මගේ පපුවෙ වදිනවා..

" ආ-අහ්.. එහෙමද.. අ-ම්මෙ.."

" මම ගිහින් එන්නම් හොඳද.. ඔය නිදි එක්කෙනා අහැරුණාම පහළට එක්කන් එන්නකො.."

අසලි අම්මා රධ්‍ය අයියා උඩ දාගෙන ඉන්න පස්සට දෙකක් දීගෙන දොර වහලා එළියට යන්න ගියාම මම බ්ලැන්කට් එක ඉස්සුවා.. මේ මිනිහා..

" අයියෙ!!"

" ම්ම්.."

" ආව්.. එහෙට යනවා..!! මේ මොකද.."

@Shan

" බෑ.."

රධ්‍ය අයියා ආයෙම බ්ලැන්කට් එක අරගෙන ඔළුවෙ ඉඳන් වගහත්තා.. මම සිවිලිම දිහා බලාගෙන හිටියා.. මේ මනුස්සයා මොකක්ද මේ කරන්නෙ.. පිස්සු නදවෙලාද.. මට කියලා තරු පෙන්නගන්න යන්නෙ..

" අර අම්මත් දැක්කා.. ලැජ්ජ නෑ තවසෙට.."

රධ්‍ය අයියා මගේ පපුවෙ පැත්තක් හෙන හයියෙන් හැපුවහම ඉබේම මට තරු පෙණුනා.. ටිකකින් ඒකා බ්ලැන්කට් එක අස්සෙන් එළියට ඇවිල්ලා මගෙ කම්මුලෙනුත් හාද්දක් තිබ්බා..

" අම්මා කොහෙ දකින්නද.. අපි පහළට යමු.."

රධ්‍ය අයියා මගේ ඇඟ උඩින් නැගිටගත්තා.. බුදුඅම්මො මේ යකාගෙ බර.. මාව නිකන් තැලිච්ච රොටියක් වගේ.. රධ්‍ය අයියා මාව උස්සගත්තහම මම අර අලුත බැඳපු මනමාලි මධුසමේට උස්සන් යන මනමාලයගෙ වගේ.. මගේ අත් දෙක රධ්‍ය අයියගෙ කර වටේ බැඳගත්තා..

" මේ තව්සෙ මාව හනිමූන් එකටත් උස්සන් යනවා හරිද.."

රධ්‍ය අයියා ලාවට රෝසපාට වුණා..

" එච්චරද.."

" නෑ තියනවා.. පස්සෙ කියන්නම් හරිද.. දැන් මම කෑගහන්නත් ඕනද.. මම හෙන සෙස්සි නෙහ්.."

"....."

මගෙ මනමාල අයියා බයවෙලාද කොහෙද.. මම ආබාධිත කකුලත් පද්ද පද්ද හෙනාතල් එකේ රධ්‍ය අයියා උස්සන් යන දිහාව බලා ගමන් ඇරඹුවා..

" අනේ මේ දූරියන් හොයාගන්න තැනක් දන්නවද.."

" ඒ මොකටද.."

" මොකුත් නැහ්.."

@Shan

රඨ්‍ය අයියා මාව කවුච් එකෙන් තිබ්බා.. මම හෙන බබා වගේ අනේ මේ දවස්වල.. අතට පයටම වැඩ කල්ලා දෙන්න කට්ටිය ඉන්නවනෙ.. මගෙ ෆියොන්සෙ මාව උස්සගෙන යනවා.. නින්ද යනකල් ඉන්නවා.. කෑමත් කවන වෙලාවල් තියනවා.. උදේට හැමදාම ඇවිත් ඇහැරනවා.. මල් ගේනවා.. ස්වීට් බොක්ස් අරගෙන එනවා.. මට නම් රියල් මනමාලි හැඟීම දැනිලා තියෙන්නෙ.. ගෙදරින් එළියටවත් යන්න දෙන්නෙ නැනෙ.. මම හෙන ආදරෙයි අනේ මේ මනුස්සයට.. මම අදිලා ගිහින් රඨ්‍ය අයියගෙ කම්මුලට හාද්දක් දුන්නා.. අම්මයි අසලි අම්මයි ඇඳුම් අදිනවද කොහෙද.. ඒ දෙන්නා හෙට ෆැශන් ශෝ යනවා කියලා හිතාගෙන ඉන්නෙ..

" මගෙ සුදූඅම්මීයාහ්.. ඩෝ සුදූඅප්පච්චියා රත්තරංට බඩ්ඩක් ගෙනාවා.."

එකසැරේට ඒ රෝමාන්තික හැඟීම කඩාකප්පල් කරගෙන මගේ අති ජාත මිතුරු කැල සාලෙ ආක්‍රමණය කළා.. කට්ටිය බීච් ගිහිල්ලා.. කියාන් අයියා දුවගෙන ඇවිත් මගෙ මනුස්සයව බදාගත්තා..

" මගෙ පෞකාරයෝ.. මේ පෞකාරයා ඔයාව දෙන්න මලක් ගෙනාවා පණේ.. කීන දං මිටක් කඩන් ආවා මගේ මල්ලෝ~ කාටවත් නෙමෙයි මලයටයි ආ මල්ලෝ~"

සෙනුකයා කොහෙන්ද උස්සපු මලක් ගෙනැල්ලා මගෙ කණේ ගැහුවහම අයුක අයියා මූණ වහගත්තා.. මම මගෙ මිනිහව අහකට තල්ලු කල්ලා මගේ පෞකාරයව බදාගත්තා..

" මගෙ රත්තරන් මහන්සි පාටයිනෙ.. කෝ එන්න දාඩිය පිහිදාන්න.."

" එහාට පලයන් කියාන්..!!"

රඨ්‍ය අයියා නැගිටලා අයුක අයියා ගාවට ගියා..

" බලන්න අනේ.. හරි වදේ මේ මිනිහගෙන්.. සනෙරුමල ආ අනේ ඔයාට මම බොන්න දෙයක් අරගෙනයි ආවෙ.."

අශ් තඩි හැට් එකකුත් දාගෙන පද්ද් අපද්ද ඇවිල්ලා මගේ අතින් බීම එකක් තිබ්බා.. මහීශා ධනුජ අයියගෙ කරටත් අතක් දාගෙන බොක්කෙ ෆිට් එක වගේ එහෙට වැනි වැනි මෙහෙට වැනි වැනි ඉන්නවා.. නෙද්දකින් බෙබද්දි..

@Shan

" බලන්න අනේ අපේ මහී එතන බොන්න තියාගත්තනෙ.."

" වත්සල්..!"

ඒ අස්සෙ සෙනුකයා මගේ මුළු ඇහම බදාගෙන ලෙවකනවා.. ඉඹිනවා.. අයුක අයියගෙ ඉරිසියාව.. එයාට මෙච්චා නැනෙ.. මෙච්චා ඇවිල්ලා අපේ තින්ග්ස්..

" අඩෝ සුදුඅම්මියා මගෙන් වෙන් වෙන්න යන්නෙ.. දැනෙනා දුක මේ වාවනු බෑ.. කඳුලැල් දෙනෙතේ බාරගන්නෙ නෑ.."

" මූට පිස්සු රධ්‍ය.. ඕකා බීලා ඉන්නෙ.."

" පිස්සුද මල්ලෙහ්.. කව්ද බිව්වෙ.. සුදුනෝනාහ් කියන්න.. මම බිව්වතෙ.. ආ මැණිකෙ.."

ආශි තොප්පියත් පොළොවෙ ගහලා මගේ ගාවින් ඉඳගෙන මගේ උරහිසට මූණ තියාගත්තා..

" ඇයි උඹලා අපි මුන්ට කැමතිවුණේ සනෙරුමල.. ආආආආආආ!!!!!!! මට ඩිප්‍රෙශන් වගේ.. මට මේ මිනිහට දැන් විදින්න හිතයි බෙහෙතක් මොකක් හරි.."

" අඩෝ හිපොක්‍රටීස් ඇවිත් උඹට ගහලා යයි හරිතෙ.."

" කමක් නෑ අනෙ.. දන් සනෙරුමලත් හෙට බඳිනවනෙ.. අඩේ ඊටපස්සෙ මහී බඳිනවා.. ඊටපස්සෙ මාත් බඳිනවා.. සෙනුකයත් බඳිනවා.. අපි පව්ල් වෙන්නයි යන්නෙ මලේ.. ආආආආආ!!"

ඒ අනිත් බෙබද්දි.. බලද්දි සේරම බීලා ඇවිත් තියෙන්නෙ.. සෙනුකයා ඒ අස්සෙ මගෙ මූණ දිහා බලාගෙන ඇඟිල්ලකින් අතගානවා.. සැක්.. මම අයුක අයියා නෙමෙයිනෙ..

ඒ එක්කම අපේ අම්මා සාලෙට ආවා.. කියාන් අයියා අපේ අම්මව දැකලා උගෙ රේඩියෝව ඇරගත්තා..

" දේදුන්න වාගේ.. පායන්න ආයේ.. පායන්න ආයෙ කිව්වා..

@Shan

ඇ එන්නෙ නෑනෙ.. පායන්නෙ නෑනෙ.. දේදුන්නෙ පාට හෙව්වා.. ආන්ටිට කියන්න අපේ එකා හෙන හොඳහ්ම්ක්මම්බ්ම්ක්ක්-"

" පකයො ඔක නවත්තගනින්..!!"

අයුක අයියා කියාන් අයියගෙ කට අත් දෙකින්ම වහගත්තම අපේ අම්මා හිනාවෙගෙනම එළියට ගියා.. හොඳ වෙලාවට මුගෙ වෙරි භාශාව තේරුණේ නැත්තෙ.. නැත්නම් පෙන්නයි දේදුණු අපේ අම්මා..

හුහක් රෑ වෙනකල් ඔක්කොම හිටියෙ අපේ ගෙදර.. ආධ්‍ය අයියලත් ඇවිල්ලා කෑම කාලා හැමෝම රෑ දහයට විතර අපේ ගෙදරින් යන්න ගියා.. රධ්‍ය අයියා මට හෙන හාදු ගොඩකුත් දීලා නින්ද යනකල් ඉදලා, ආධ්‍ය අයියලා එක්ක අපාර්ට්මන්ට් එකට ගිහින් තිබුණා.. මට හොඳටම නින්ද ගියා..

හෙට අපේ වෙඩින් එක!!!



හැමෝම එන්න දෙයියනේ.. මෙයින් බෝතලයක් ගානෙ උස්සන් යන්න.. ඇතුළෙ රෝල කියවන්න හරිතෙ.. හෙට වෙඩිම.. අම්මියෝ!!!!!!!!!!!!

ලියන එකත් පුදුම වෙලා හලෝ ඉන්නෙ ඉතිම්.. ලම්සනට එන්න ඕනෙ හර්තෙ.. පිස්සු දළඹුවොහ් ටික..



එන්නාමි.. ලව් යූ..❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

@Shan

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 171 කොටස

" මේ අක්කට කියපන් මගෙ පෞකාරයව වැඩිය අල්ලන්නෙපා කියලා හරිතෙ.. අපිට මේවා මෙහෙම බලාගෙන ඉන්න පුළුවන්ද.."

" ඔය කට වහගනින්කො.."

සෙනුකයා හිනාවෙවී හොටෙල් රූම් එකක මාව අන්දවන අක්කට බනිනවා බනිනවා ඉවරයක් නෑ. ඒ අක්කා හිතන්නෙ අපි හෙන වැදගත් දෙයක් කතාකරනවා කියල.. ඒ වුණාට මේ පගා ආතල් ගන්නවා..

අනේ ආච්චිඅම්මෙ පැයකින් මම බඳිනවනෙ!!!

" මගෙ කට වහන්න ජනාධිපතිටවත් බෑ පගො.. අඩෙ මේ කිට් එක පට්ට ලස්සනයි නෙහ්.. කෝමතේ අපේ මිනිහා මගේ සරාගී දේහයට වහ වැටෙයිද සනෙරුවා.."

සෙනුකයා උගේ ඉස්සරහා කණ්නාඩියෙ පැත්තට හැරිල අමුතු පෝස් එකකට ඉඳගෙන උගෙම පස්සට ගහගත්තා.. මූට දැන් පිස්සුව තද වෙගෙන එන්නෙ.. යකෝ සොයිසා කාන්තා රෝහලේ වෛද්‍යවරයෙක් නේද මෙහෙම අසෝබන විදියට හැසිරෙන්නෙ..

" වහ වැටෙයි.. මගෙ පෞකාරයා කොහොමත් හැඩයිනෙ.."

" ආව් ආව් අද එක්කෙන්ක් රැට තරු බලන්න යනවලු.. කොහොම හරි කල්ලා මචං උඹෙ මිනිහව පොළඹගන්න බලපන්.. මම උඹට ටිප්ස් ඇන්ඩ් ට්‍රික්ස් කියලා දෙන්නත.."

" පාඩුවෙ ඉඳපන්.. උඹ උදේ පාන්දර මොනාහරි බිව්වද.."

" පිස්සුද බල්ලො.. අඩෝ අද මම හෙන හැපී එකේ ඉන්නෙ මගේ බොක්කෙ පිට් එක කසාද බඳින නිසා.. මේ අහිංසකයගෙ සතුට කඩාකප්පල් කරන්නෙපා..පෞකාරයා..!!"

ටිකකින් තව හෙන ලස්සන අක්ක කෙනෙක් ඇවිත් සෙනුකයගෙ තනි සුදුපාට කිට් එකේ බ්ලෙසර් කොලර් දෙක එකට යාවෙන විදියට බෲච්

@Shan

එකක දාලා හැදුවා.. ඒක නිල්පාටයි..මගෙ පෞකාරයා ලස්සනයි අයුක අයියෙ..!

" මම රධ්‍ය අයියව බලලා එන්නද සුදුමහත්තයො.. ඉස්සරහ කාමරේනෙ ඉන්නෙ.. අඩෝ අපේ මිනිහා ලැස්ති වෙලාද දන්නෑ.."

" උඹට මේ විනාඩියවත් අයුක අයියා නැතුව ඉන්න බැරිද.. එහ්.. ඇත්ත කියපන්.."

සෙනුකයා මගේ කන ගාවටම ලං වුණාම මාත් පොඩ්ඩක් මෙහාට වෙලා ඉඳගත්තා.. අපි ගාව ඉඳපු අක්කා ශූස් දෙක අරගෙන එන්නම් කියලා යන්න ගියා..

" උඹ අයියට වශියක් කළා නේද.."

" පිස්සුද බං.. මොන වශීද.. හැබැයි දවසක් ඉස්කෝලෙ ස්කවුට් කෑම්ප් එකකදි ඌට වැරදිලා කිස් එකක් දුන්නා.."

මගේ ඇස් දෙක ලොකු වුණා.. මේ පකයා බලහන්කො.. අපි දන්නෙත් නෑ..

" ගස්ලබ්බා.."

" ඒක වැරදිලා බං වුණේ.. එහෙම මගුලක් නෙමේ.. අපිට වෙන වැඩ නෑනෙ ඇමති පුත්තු ලයින් කරන්න.. ඌයි මායි දවසක් කඩේක වැඩ කරන්න ගියා.."

" හැ..??"

" ඔව් බං අර ස්කවුට් වල තියෙන්නෙ.. මම ඉතින් මගේ බාලදස්සයා එක්ක ගියා වැඩ කරන්න.. මරු එකා එක්ක ගියේ.. මේ මිනිහා හරියට බීම බෝතලයක්වත් කඩාගන්න දන්නෙ නෑ බං.. මට එදා නම් මල පැනලා ඌට ගැරුප්පුවකින් ගැහුවා.. ඒටපස්සෙ ඒකා තුවාල වෙලා.. ඇඩුවා කියහන්කො.."

මට හෙන හයියෙන් හිනා ගියා.. නෙද්දකින් අයුක අයියනම්.. මොකෙක්ද මන්දා.. ගැරුප්පුවකින් ගැහුවා කියලා මලෙන් උපන් සමනලයා අඩලත් එක්කන්..

@Shan

" නෑ..!! අඩෝ.."

" නෑ නෙමෙයි බං ඔව්.. ඊටපස්සෙ මම බෙහෙත් දැම්මා.. මෙච්ච මෙච්චක්විතර හීරිලා තිබ්බ එකට මේකා මට කියලා තඩි පත ප්ලාස්ටරයක් අලවගත්තා.. හැයියා.. ආයෙනම් මම ඒ බාලදස්සයා එක්ක මොකකටවත් ගියේ නෑ.."

" එතකොට බොලා කිස් කරේ කවද්ද.. උඹේ පළවෙනි මිනිහා වෙලා මම මෙ එකක්වත් දන්නෙ නෑ හල්ලො.."

" ආ ඒක වුණේ මෙහෙමයි හරිද.. මට ලැජ්ජයි ඒයි.."

සෙනුකයා උගේ කම්මුලේ හැදෙන වලවල් දෙක පේන්න හිනාවෙලා ඉස්සරහා තිබ්බ බීම එක අරගෙන බටේ කටේ ගහගත්තා.. නෙද්දකින් මනමාල හිනාව..

" අපි දෙන්නා ඉඳපු ටෙන්ට් එක කඩන් වැටුණානෙ මහ රෑ.. මේ මිනිහට ඒක විතරයි කරන්න දුන්නෙ.. රෑ එකට විතර මද සුළඟක් හමාගෙන ගියා.. සලබලාං ගාලා ටෙන්ට් රෙද්ද ඇගේ.. ඒක පැටලිලා මූ බයවෙලා මගේ ඇඟේ පතබැව්ලා.. බැන්ග්..!! කිස් එකක් දුන්නා.."

" මහ හු#න අතපසුවීම් එච්චනම්.. හරිද.."

" කව්ද දන්නෙ ඉතින් ඇමතිපුතා අනාගතේ මගෙ මිනිහා වෙයි කියලා.. අන්න බලපන් අපි හිතන්නෙ නැති දේවල් තමා වෙන්නෙ.. "

" දෙයියනේ දෙයියනේ මගේ සිස්සබටයයි උඹේ බාලදස්සයයි.."

" හොඳවයින් ඇඳගෙන නාගත්තා.."

මම සපත්තු දෙක දාලා ඉවරවුණාම ක්‍රව් එකකින් නැගිට්ටා.. මේ ඉන්නෙ සෙස්සි කැල්ල වගේ.. ආයෙ ඉතින් තව මොනාද.. ලංකාවම කළඹලා ගන්න වෙඩිමනෙ අපේ.. මම කණ්නාඩිය ඉස්සරහට වෙලා හැරි හැරි මගේ දිහා බලාගෙන ඉද්දි අපේ රූම් එකේ දොර ඇරගෙන අයුක අයියා මල් පොකුරකුත් උස්සගෙන ඇතුළට ආවා.. අයුක අයියා සෙනුකයා දිහා කට ඇරගෙන බලාගෙන ඉඳලා සෙනුකයගෙ කම්මුලක් මිරිකගෙන මං ගාවට

@Shan

ඇවිත් මගේ අතට මල් පොකුර දුන්නා.. නිල් පාට රෝසමල් තියන බොකේ එකක සුදුපාට කොළ තියනවා.. ඒක හරිම ලස්සනයි..

" You look drop dead gorgeous..!"

අයුක අයියා මල් බොකේ එක දීලා මගේ ඔලුවට තට්ටුවක් දැම්මා.. මම මල් එක පැත්තකින් තිබ්බා.. ආයෙම බොහ් ගාලා ස්ටූල් එකෙන් වාඩිවුණාම අයුක අයියගෙ මූණ අමුතු වුණා.. එයා එදා දැක්කනෙ මම බැල්කනි එකෙන් වැටෙනවා.. තාමත් මාව දැක්කම අයුක් අයියට ඒක මතක් වෙලා ඒකා මූඩ් ගහනවා.. ඒක දැන් වෙලා ඉවරනෙ..

" ඉක්මනට සනීපවෙයක් ෂනෙරු.."

" හොඳමයි හොඳමයි.."

අයුක අයියා කාමරේ දොර වහගෙන එළියට ගියාම අපේ මාමා කාමරේට ආවා.. සෙනුකයා මේකප් එක ටච් අප් කරගන්නවා.. මාමා මාව දැකලා එකසැරේට උඩ බලාගත්තා..

" මාමෙ.."

ටිකකින් මාමා අහක බලාගෙන ඇහැ කොණක් පිහිදගෙන මං ගාවට ඇවිත් මාව තැලිලා පොඩිවෙලා යන්නම බදාගෙන නළලට හාද්දක් දුන්නා.. ආයෙම එකක් දුන්නා.. මෙ දවස්වල මට ආදරේ දරාගන්න බැරුව මැරිලා යන ලයින් එකක් තියෙන්නෙ.. ඒ අස්සෙ මටත් ඇඬෙනවා.. මම ඉක්මනට ටිශූ එකක් රෝල් කරලා ඇස් යටින් තියාගත්තා.. මාමා මාව හුහක් වෙලා බදාගෙන ඉඳල පිට අතගාලා එහාට වුණා.. මාමා අඬනවා.. මම එයාව එහෙම දැකලා තියෙන්නෙ හරි කලාතුරකින්.. මට දුක හිතුණා..

" සුදුමහත්තයො.. සතුටින් ඉඳහන්.. උඹෙ මාමට හරි සතුටුයි බං.. මම හදලා වඩපු මගෙම පුතෙක් කසාද බඳිනවා වගේ.."

මම මාමගෙ පපුවට හේත්තු වුණා..

" මම මාමට ආදරෙයි.. මාමනෙ මාව හැදුවෙ.."

@Shan

මාමා මාව එහාට කල්ලා මගේ මූණ දිහාම බලාගෙන හිටියා.. ඉඳලා හිටලා අපේ මාමගෙ මූණ හරි ආදරේ පිරිලා ඉතිරිලා පේන වෙලාවල් තියෙනවා.. මට හිත ඇතුලෙ පුපුරලා යන්න තරම් සතුටක් තියනවා.. තමන් ආදරේ කරන මනුස්සයා කසාද බඳින එක.. හැම ආදරේ කරන කෙනෙක්ටම තියන හීනෙ.. හැබැවෙනවා කියන්නෙ.. මට කාලෙ පිටිපස්සට ගිහින් ඉස්කෝලෙ කාලෙ ඉඳපු මාව හම්බෙලා කියන්න හිතෙනවා.. ෂනෙරු උඹ රධ්‍ය අයියව අන්තිමේ කසාද බඳිනවා බං කියලා.. මට පුදුම සතුටුයි.. ආයෙම ජීවිතේ පටන් ගත්තු තැන ඉඳලා මම ඉන්නෙ පුදුම සතුටකින්..

" ෂනෙරු වෙලාව හරි නේද.. පහළට යමු.. අම්මා කෝල් කරනවා.."

මම මාමගෙ අතක් අල්ලගෙන නැගිට්ටා.. උපරිම මට විනාඩි දහයක් ක්‍රචස් නැතුව හිටගෙන ඉන්න පුළුවන්.. ඊටපස්සෙ නම් ඇදගෙන වැටෙනවා.. ඒ වුණාට මට ඇවිදගෙන යන්න ඕන.. මාමා මාව ඉණ වටේ අතක් යවලා අල්ලගත්තම මම මාමගෙ අතක එල්ලුණා.. මම මාමගෙ දණහිස ගාවට උස කාලෙත් මෙ අතේම මෙ විදියටම එල්ලිලා තියේ.. තාමත් එහෙමයි.. සමහරවිට තාත්තා කෙනෙක් ඉන්න කෙනෙක්ට අනිවාරෙන්ම දැනෙන්න ඕන මෙ හැඟීම වෙන්නැති.. ඒත් මාමයි මායි ළඟයි.. අපි අතරෙ හිඩසක් නෑ.. යාළුවො වගේ ඉන්නවා.. හැබැයි මාමා තාත්තා කෙනෙක් වගේම මං ඉපදුණ දවසෙ ඉඳලා මං ගැන හොයලා බලනවා..

මම ඇඳලා හිටියෙ තනි සුදුපාට මොඩර්න් රෝයල් කිට් එකකට සුදුපාට ඇන්කල් බූට්ස් දෙකක් දාලා අත් දෙකට මැණික් කටුව ගාවට වෙනකල් දැනෙන නොදැනෙන ගානට තියන ලේස් ග්ලවුස් දෙකක් දාලා.. කොණ්ඩෙ හාෆ් පොනිටේල් එකකට හදලා එකපැත්තක දිගට ස්ටෝන්ස් අල්ලලා.. මූණෙ පොඩි ලයිට් මේකප් එකක් දාලා.. ගෑණුළමයි බඳිනකොට වේල් එකක් දානවා වගේ මගේ ඇඳුමෙත් උරහිස ගාව ඉඳලා වර්ක් කරපු නිල් සුදු කළවම් වුණු දිග ටේල් එකක් තියනවා.. මම පහළට යද්දි සෙනුකයා ඒකත් උස්සගෙන පඩිපෙළ බැහැලා පහළට ආවා.. හැමතැනම ලා නිල් පාටට ඩෙකරේට් කල්ලා.. තීම් එන රෝයල් අන්ඩර් සී නිසා ඒකට මැච් වෙන හොටෙල් එක්ක තමා තෝරගෙන තිබුණේ.. ඇලෙක්සැන්ඩ්‍රියා බෝලෲමස් කියලා.. ඇත්තටම මම ඔය මොකුත් කලින් දැනගෙන හිටියෙ නෑ.. මාව පහුගිය ටිකේ කොනට දාලනෙ තිබ්බෙ.. මම කරේ දවසෙම කකා බිබී ඇඳ උඩට වෙලා ඉන්න එක විතරයි.. රධ්‍ය අයියා මාව මලක් වගෙ බලාගන්නවා කිව්වෙ ඒකටද දන්නෑ.. කොහොම වුණත් එයා හරිම ආදරෙන් මාත් එක්ක ඉන්නවා.. මට හුඟක් සතුටුයි..

@Shan

මාමගෙ අතේ එල්ලිලා ඉස්සරහා තිබුණු ලොකු ලී දොර ගාව නැවතුණා.. ඒක වහලා තියෙන්නෙ.. සෙනුක මගේ පිටිපස්සෙන් ඉන්නවා.. මම අනිත් අතින් මල් බොකේ එක අල්ලගත්තා.. අපි බඳින්නෙ අපේ ආගමේ විදියට නෙමෙයි.. බාප්පගෙ ආගමේ විදියට.. ෆාදර් කෙනෙක් ඉස්සරහා දිවුරුම් දීලා.. මගේ පපුව හෙන හයියෙන් ගැහෙනවා.. අනික මම හුහක් පුදුම වෙලා ඉන්නෙ.. කලින් මෙහෙම දේකට මූණ දීලත් නෑ.. මම මාමගෙ අත තද කල්ලා අල්ලගත්තම මාමා මගේ පිටට තට්ටුවක් දැම්මා..

" මට බයයි අනේ.."

" දැන්නම් මටත් නිකම මොකක්ද වගේ බං.. උඹලත් මගුල් කන්නෙ ලෝකෙටම කියලනෙ.."

මට හිනා ගියා.. අපේ වයසක මාමට කිසිතැනක සීරියස් වෙන්න බැනෙ.. යකෝ!! මගුල් දොරකොඩ ඉස්සරහා ඉඳන් පිස්සු කියවනවා.. සෙනුක මගේ උරහිස ගාව ඉඳලා හැතැක්මයක් විතර දිග අර සරුවාලෙ.. මම කිව්වෙ වේල් එක විහිදුවලා හැදුවා.. ඒකෙ රිදී පාට නූල් වලින් ලස්සන වර්ක් එකක් කල්ලා තියනවා.. මම කලින් ඇඳුම ඇඳලා තියා ඒක මොන වගේද කියලවත් රධ්‍ය අයියට පෙන්නුවෙ නෑ.. එයත් මට කිව්වෙ නැනෙ.. එහෙම ඕන්නැනෙ.. ඉතින් මම පලවෙනියටම එයාව වෙඩින් ඩ්‍රෙස් එකෙන් දකින්නෙ මේ වෙලාවෙ..

මගේ ඉස්සරහා තිබුණු ලොකු ලී දොර එකසැරේ දෙපැත්තට ඇරුණා.. ඇතුලෙ හරිම කාම් ලස්සන  මියුසික් එකක් හිමිහිට ප්ලේ වෙනවා.. ඒත් මගේ ඉස්සරහා දුමක් වගේ තියන නිසා මට පේන්නෙ නෑ මොකුත්ම.. මම මාමගෙ අත අල්ලගෙන ඉස්සරහට අඩිය තිබ්බා.. අනිත් අතින් මල් පොකුර තද කල්ලා අල්ලගත්තා..

මම හෝල් එකට අඩිය තිව්වා විතරයි මියුසික් එක වෙනස් වෙලා වෙනම තාලෙකට ප්ලේ වෙන්න ගත්තා.. යන පාර දිගටම ලස්සන මල් පෙති අතුරලා.. ඇත්තටම මේක මගේ හීන වල තිබ්බ වෙඩින් එකක් වගේ.. අපි ආපු ගමන මල් පෙති අතුරාපු පාරක් නොවුණට එයා එක්ක ජීවත් වුණු හැම තප්පරේකම එයා මාව මල් පෙතු අතුරපු පාරක එක්කන් යන්න උත්සාහ කළා.. ඇත්තෙන්ම තමන් ආදරේ කරන කෙනාව.. ජීවිතේ පළවෙනියටම ආදරේ දැනුණ කෙනාව.. පලවෙනියටම හාද්දක් දීපු කෙනාව.. පළවෙනියටම පව්ලෙන් ඇරෙන්න මාව පරිස්සම් කරන්න මහන්සි වුණු

@Shan

කෙනාම බඳිනවා කියන්නෙ.. මටනම් මේ ගෙවෙන හැම තප්පරේම හීනයක් වගේ..

කොහොමත් මම මේ දවස්වල ජීවත් වෙන්නෙ අමුතුම හීනෙක තමා..

හෝල් එකේ හාරසීයක් විතර හිටියා.. රධ්‍ය අයියගෙ යුනිවසිටි එකේ යාළුවො, අපි දෙන්නගෙම ඉස්කෝලෙ යාළුවො, ළඟම අය.. එතකොට ආච්චිඅම්මා, ලොකු අම්මලා, කෝච්, තාන්වී අක්කා, සදෙව් අයියලා හැමෝම ඉස්සරහින්ම ඉඳගෙන හිටියා.. මගේ කම්මුල් දෙක රත් වෙලා ගියා.. හෙන ගොඩක් කට්ටිය ඉන්නවනෙ.. මම බිම බලාගෙනම ඇවිදගෙන ආවා.. පොඩි පොඩි හිම පියලි වගේ හෝල් එක පුරාම වැටෙනවා.. තද නිල් පාටට.. ලා නිල් පාටට.. සුදු පාටට.. ඒක ඇත්තටම මේ ලෝකෙ තියන තැනකටත් වඩා ලස්සනයි.. මට පිස්සු හැදුණේ නැති ටික විතරයි.. දෙපැත්තෙම ඉන්න අය පහුකරගෙන මහක් දුර ඉස්සරහට යද්දි මට රධ්‍ය අයියව පෙණුනා.. එයාගෙ පිටිපස්සෙන් අයුක අයියා හිනාවේගෙනම අපි දිහා බලගෙන හිටියා.. රධ්‍ය අයියා එකසැරේම ඔලුව උස්සලා මගේ දිහා බලලා ආයෙම බිම බලාගත්තා.. මට හිනා ගියා.. එයා මාරම ලස්සනයි.. මම වගේම කිට් එකක් ටේල් එක නැතුව ඇඳලා.. බෲච් එකක් වගේ කිට් එක දෙපැත්තෙන් කොලර් දෙක එකට එකතු කල්ලා රිදී පාට වැල් දෙකක් එල්ලලා.. මගේ ඇඳුමෙ තරන්ම වර්ක් නැති.. සිම්පල් ඒත් අමුතු ඩීසන්ට් ලුක් එකක් තියන ඇඳුමක්.. එයා හරිම ලස්සනයි.. මගේ ඇස් වල කඳුළු පිරුණා..

රධ්‍ය අයියා මගේ දිහා බලාගෙන ඉද්දි එයාගෙ ඇස් රතුවෙලා ඉක්මනට බ්ලෙසර් එකෙන් සර්වියට් එකක් අරගෙන ඇස් පිහාගත්තා.. එයා හැමෝම ඉස්සරහා අඩනවා.. මූණ රතුම රතුපාට වෙලා.. මගේ ඇස් වලත් කඳුළු හෝ ගාලා පිරෙනවා.. මම මාමා එක්කම ගිහින් එයාගෙ ඉස්සරහින් හිටගත්තා.. මගේ අත් පවා වෙවුලනවා.. අපේ මාමා මගේ අතක් අරගෙන රධ්‍ය අයියගෙ අතක් උඩින් තිබ්බා.. රධ්‍ය අයියා ඇස් දෙකේ කඳුළු පුරෝගෙන මං දිහා හරි ආදරෙන් බලාගෙන හිටියා.. මමත් එයා දිහා බලාගෙන හිටියා..

අන්තිමේ අපි wedding aisle එකක් ඉස්සරහා හිටගෙන ඉන්නවා.. රධ්‍ය අයියා මගේ අත් දෙකෙන්ම තද කල්ලා අල්ලගෙන හිටියා.. මගේ අත් වලට ග්ලවුස් දාලා තිබුණත් වෙවුලනවා.. මට කියාගන්න තේරෙන්නෙ නෑ මේ හැඟීම කොයි වගේ එකක්ද කියලා.. රධ්‍ය අයියා අන්තිමට ෆාදර් දිහා බලලා ඔලුව වැනුවා.. ෆාදර් අපි දෙන්නා දිහාම බලලා ලස්සනට හිනාවුණා..

@Shan

අසලි අම්මා, අපේ අම්මා, ආධ්‍ය අයියා, මාමා, ආච්චිඅම්මා හැමෝම ඉස්සරහම ඉඳගෙන ඉන්නවා.. මගේ කම්මුල් රතුම රතු වුණා.. කඳුළු පිරෙන කොට ඇස්වලට, පපුවට සැහෙන්න බරයි.. මගේ කටහඬත් වෙවුලාවි කියලා මම හිතුවා.. සෙනුක මගේ පිටට තට්ටුවක් දැම්මා..

ටික වෙලාවකින් හැමෝම නැගිට්ටා.. රධ්‍ය අයියා මගේ අතීන්ම අල්ලගෙන ෆාදර්ගෙ පැත්තට හැරුණා..

"

**May the Lord in his goodness strengthen your consent and fill you both with his blessings..**

**What God has joined, men must not divide.**

**Amen.."**

රධ්‍ය අයියා මගේ අතින් තව තද කල්ලා අල්ලගන්නවා මට දැනුණා.. මගේ අත් සීතලම සීතල වෙලා ගිහින්.. අනික මට හුහක් වෙලා හිටගෙන ඉන්න අමාරුයි.. ඒත් මම පුළුවන් තරම් හිටගෙන ඉන්න ට්‍රයි කළා.. ඊළඟට ප්‍රතිඥ දෙන්න රධ්‍ය අයියා මගේ පැත්තට හැරුණා.. මම එයාගෙ ඇස් දිහාම බලාගෙන හිටියා.. ආයෙමත් කවදාවත් මෙහෙම අවස්ථාවක් එන්නෙ නැනෙ.. ඉතින් පළවෙනි වතාවටයි, අන්තිම වතාවටයි මම එයාගෙ ආදරේ පිරිලා ඉතිරිලා තියන රතු වෙච්ච ඇස් දිහා බලාගෙන හිටියා.. මට ඒවා හැමදාටම මතක තියාගන්න ඕන..

එයා කතාකරන්න පටන්ගත්තා..

" I am reminded of James 1:17 where it says that

**every good and perfect gift comes from above**

..

**Varadh Shaneru**

, you are truly a Gift from God and I promise to spend the rest of my life treating you as such.. I will cherish you always and never take you for

@Shan

granted.. I will lead you and guide you as Christ leads me.. I will follow His teachings and obey His commands.. I will lead by example, with patience, and with understanding.. I will be slow to anger, and quick to listen.. I will be a strong spiritual leader in our home through good times and bad, in joy and in sorrow.. I will love you and be faithful to you alone from this day forward until God calls us home.. This is my solemn pledge to you and to God.. Please accept this ring as a symbol of our covenant and my undying love for you.."

අයුක අයියා, රධ්‍ය අයියට රින්ග් එක දෙද්දි එයා මාත් එක්ක ලස්සනට හිනාවෙලා මගේ ග්ලව්ස් එකක් දාපු අත අල්ලගෙන මුදුවක් දාල තව ඒකට උඩින් හීනි දියමන්ති අල්ලපු මුද්දක් දැම්මා.. ඊටපස්සෙ මගේ අතට කිස් එකක් දුන්නා.. මගේ ඇස් වලට කඳුළු උනනවා විතරයි.. ඒවා වෙලිලා යන්නෙ නෑ.. ඊළඟට තිබුණේ මට මුදු මාරු කරන්න..

**" Radhya Shanaw, in the presence of God, our family and friends, I take you today as my husband..**

You are an answer to my prayers and I will spend the rest of my life thanking God for loving me enough to send me His very best.. I promise to be for you the helpmate God intended from the beginning.. I will honour you as my spiritual head. I will follow you as you follow Christ.. I will cover you in prayer.. I will work alongside you in support of your God-given vision for our family.. I will speak words of kindness and not criticism.. I will love you and be faithful to you alone from this day forward until God calls us home.. This is my solemn pledge to you and to God.. Please accept this ring as a symbol of our covenant and my undying love for you.."

මම මගේ අතට දුන්නු මුද්ද රධ්‍ය අයියගෙ අතට දැම්මා.. එයා හරිම ආසාවෙන් මම එයාගෙ ඇඟිල්ලට දාපු මුද්ද දිහා බලාගෙන හිටියා..

**" You may seal your vows with a kiss.."**

මගේ මූණ රතුපාට වුණා.. අසලි අම්මා ඉස්සරහම ඉඳගෙන අත් දෙකත් එකට එකතු කරගෙන අපි දෙන්නම දිහා හුඟක් ආදරෙන් බලාගෙන හිටියා.. රධ්‍ය අයියා මගේ ඉණ වටේ අතක්යවලා එයාගෙ ඇඟට තුරුල්

@Shan

කරගෙන මගේ මූණට පහත් වෙලා නිකටින් අල්ලගත්තා.. මගේ ඇස් ඉබේම පියවුණා.. මට දැනුණා එයාගෙ අතක මහපට ඇඟිල්ල මගේ තොල් මැද්දෙන් නතර වෙනවා.. ටිකකින් එයා මගේ තොල් වලින් හාද්දක් තියලා ඒ ගමන්ම ඇඟිල්ල පහළට ඇදගෙන ගියා.. මාව එකසැරේටම ගැස්සුණා..

එයා.. එදා වගේ..!!

අපි වටේ හිටපු හැමෝම හෙන හයියෙන් කෑගහනවා මට ඇහුණා.. මගේ යාළුවො.. පවුලෙ අය.. හැමෝම අපි දිහා බලාගෙන ඉද්දි රධ්‍ය අයියා මගේ නළලටත් හාද්දක් දීලා මාව ඇහට තුරුල් කරගත්තා.. එතකොට තමයි මට යන්තම් සහනයක් දැනුණේ.. මගේ කකුලට වාරුවක් නැතුව හිටියනම් මම තව ටිකෙන් ඇදගෙන වැටෙනවා.. මුලු හෝල් එක පිරෙන්නම සුදුපාට මල් පෙති වැටෙනවා.. හරිම ලස්සනයි.. ෆාදර් එයාගෙ ඩියුටි එක කල්ලා ඉවරවුණාම එතනින් එහාට වුණා.. අසලි අම්මා දුවගෙන ඇවිත් මාව බදාගෙන ඉඹගෙන ඉඹගෙන ගියා.. ඊට පිටිපස්සෙන් අපේ අම්මා හිනාවෙවී හිටියා..

" හැමදාම සතුටින් ඉන්න මගෙ ළමයි දෙන්නා.. අම්මා හරි ආදරෙයි ඔයාලා දෙන්නටම.."

අම්මා රධ්‍ය අයියටත් හග් එකක් දුන්නා.. ඊටපස්සෙ මගේ අතකින් අල්ලගත්තා..

" ඔයාට මතකද දන්නෑ.. මම හුඟ කාලෙකට කලින් ඔයාට කතාවක් කියන්නම් කිව්වා.."

" මට මතකයි අම්මා.."

"

**Thank you so much for bringing the homely feeling that soothes my son's life.. මම ඔයාට හරිම ආදරෙයි**

.."

අම්මා මගේ කම්මුලට තට්ටුවක් දාලා එහාට ගියා.. රධ්‍ය අයියා මාව තව ටිකක් එයාගෙ ඇහට තුරුල් කරගත්තා.. මගෙ හිත සතුටින් පිරිලා යනවා

@Shan

වගේ.. මගේ වෙඩින් එක දවසෙ.. ඊටත් වඩා මම දැන් ටිකකට කලින් කසාද බැන්දා කියලා හිතද්දිත් මට හරි අමුතුයි වගේ.. මම මගේ අතේ තියන මුද්ද දිහා බලාගෙන හිටියා..

හුඟක් වෙලා යනකල් අපි දෙන්නට විශ් කරන්න කට්ටිය ආවා.. සෙනුකලාගෙ අම්මලා.. ළඟම යාළුවොන්ගෙ පවුල් වල අය.. අපේ ජොනාත් උගෙ වයිෆ් එක්ක ඇවිත් හිටියා.. තව අහිරු අයියා.. සයෝන් අයියා.. මගේ කෝච්.. නෆ්‍රාස්.. චමිරු.. ක්ලබ් එකේ මම ළඟින්ම අඳුරන ප්ලෙයර්ස්ලා.. රධ්‍ය අයියගෙ යුනිවසිටි එකේ ෆොරින් යාළුවො.. ඔහොම හුඟක් අය.. අන්තිමේදි හිනාවෙලා හිනාවෙලාම මගේ හක්කත් පනින සයිස් එකට තිබ්බෙ..

මම අර දිග ටේල් එක උරහිස ගාවින් අන්බටන් කල්ලා පැත්තකින් තිබ්බා.. ඒක දාගෙන ඇවිදගන්නවත් බෑනෙ.. විශ් කල්ලා ඉවරවුණාට පස්සෙ ලන්ච් සර්ව් කරලා තිබුණා.. මම රධ්‍ය අයියගෙ අතේ එල්ලිලා අර වයින් කරපු එකා වගේ හැම කෙනා එක්කම හිනාවෙනවා.. හග් එකක් දෙනවා.. තැන්ක් කරනවා.. ආයෙම අර කොනට යනවා.. මේ කොනට යනවා.. බැරිම තැන මම මගෙ ආච්චිඅම්මා ගාවින් වාඩිවෙලා ආච්චිගෙ අතක එල්ලිලා හිටියා.. රධ්‍ය අයියා අම්මලගෙ බාල්දියකට අහුවෙලා එතන නතරකරගෙන කියවන්න තියාගත්තා..

" මගෙ සුදුමහත්තයා.."

මගෙ ආච්චිඅම්මා මගේ කම්මුලක් අතින් අල්ලලා මූණට හාද්දක් දුන්නම මම ආච්චිඅම්මව බදාගත්තා.. මගේ හැමදේටම ඉන්න පණ්ටිකනෙ ඉතින්..

" ආච්චිඅම්මෙ.."

" මට හරි සතුටුයි රත්තරනෙ.. මයෙ අම්මට වැඩි වැඩියෙනුත් ලැබෙන්න ඕන හැම සැප සම්පතක්ම.. ආච්චිඅම්මට ලෝබ හිතෙනවා කොල්ලො.."

ආච්චිඅම්මගෙ ඇස් වල කඳුළු පිරුණහම මගේ ඇසුත් ඉබේම කඳුළු වලින් බොඳ වුණා.. මම ආච්චිඅම්මව බදාගෙනම හිටියා.. ආච්චි හරි ලස්සනයි අද.. සුදුපාට ඔසරියක් ඇඳලා.. මුතු ඇටපොටක් දාලා.. සිරියාවන්ත පාටයි.. මට අපේ වෙඩින් එකේදිත් ආච්චිඅම්මා ගාවටම වෙලා ඉන්න ලැබිච්ච එක නම් වාසනාවක්.. මට හරියට ආච්චිව පහුගිය කාලෙ මතක් වුණානෙ..

@Shan

ටිකකින් රධ්‍ය අයියත් ඇවිත් බ්ලෙසර් එකේ බටන් දෙකත් ඔපන් කරගෙන මගේ ගාවින් වාඩිවෙලා කකුල් දෙක රිදෙනවා කිව්වා.. අපේ ආච්චි අපි දෙන්නට වයසයි කියලා විහිළු කරනවා.. ඊටපස්සෙ ආච්චිඅම්මට අසලි අම්මව සෙට් වුණා.. මේ අසලි අම්මනම් එයාගෙ වෙඩිම වගේ.. පුදුම ආතල් එකක් ගන්නෙ.. එහෙට දුවනවා.. මෙහෙට දුවනවා.. ඒ අස්සෙ මගෙ පුතණ්ඩියලා දෙන්නට හොඳ යාළුවෝ ටිකක් සෙට් වෙලා.. හැමතැනම දුව දුව සෙල්ලම් කරනවා.. අපේ වයසෙ හුඟක් අයට බබාලා ඉන්නවනෙ..

හැමෝම ලන්ච් ගන්න අස්සෙ ආධ්‍ය අයියා කෑම පිඟන් දෙකකුත් උස්සගෙන අපි වාඩිවෙලා ඉදපු ටේබල් එකට ආවා.. අපිට නෙමෙයි හරිත.. එයාට හෙන බඩගින්නක් ඇවිල්ලා.. අපි හිටිය තැන වාඩිවෙආ හිටියෙ අම්මලයි.. ආච්චිඅම්මලයි.. ඔක්කොම පවුලෙ කිට්ටු උදවිය.. රධ්‍ය අයියා ආධ්‍ය අයියා කන්න ගත්තු කට්ලට්ශ් කෑල්ලක් අරගෙන කටේ දාගත්තම ආධ්‍ය අයියා හැන්දෙන් එකක් දුන්නා.. හොදවැඩේ.. හොරෙන් කන්න යනවට.. බෙදාගෙන කාපන්කො..

" ඒක මගේ එක පොඩී.. ගිහින් බෙදාගෙන එනවකො.."

" ලොකු..!! මොකද ඔය සද්දෙ.."

" බලන්න අම්මා.."

" කෝ ආරුයි අචීයි.. අනුරාග් එක්කද.."

" ඔව් අරගෙ කියාන් මල්ලිලා ගාව ඉන්නවා.."

ආධ්‍ය අයියා ඒ කන ගමන් හැන්දක් අරගෙන මගේ ගාවට ප්ලේට් එක ලං කළා.. ආ නෑ.. මගේ ආධ්‍ය අයියා මටත් එක්ක කෑම ගෙනැල්ලා තියෙන්නෙ.. මම එයාට ලාස්සන හිනාවක් පා කල්ලා යැව්වහම.. එයත් රිප්ලයි හිනාවක් පා කල්ලා එව්වා.. රධ්‍ය අයියා මූණ හට්ටියක් කරගෙන ආධ්‍ය අයියා බොන්න ගෙනාපු ලෙමනේඩ් එකත් අරගෙන බුෆේ එක පැත්තට ගියා.. මුන් දෙන්නගෙ සීතල යුද්ධනම්.. මම ඔවා ගැන කතාකරන්න යන්නෙ නෑ.. මොකක් වුණත් මම ආධ්‍ය අයියගෙ පැත්තෙනෙ..

" ඔයා කන්න චූටි.. මල කෝලම්.."

@Shan

මම හැරිලා රධ්‍ය අයියා ගිය පැත්ත බැලුවහම ඒකා මාමා එක්ක ඔපයක් කියවනවා.. මේ දෙන්නගෙ ඇයි හොඳැයිය දැන් ඕනවට වඩා වැඩිවෙගෙන එන්නෙ.. ඉක්මනට උදැල්ලක් දාන්න ඕන..

ආපු හැමෝම කාලා බීලා ඉවරවෙද්දි හවස හතරට විතර ඇති.. ඒ වෙනකොට මාත් හෙන ගොඩක් කාලා රධ්‍ය අයියගෙ ඇඟට හේත්තුවක් දාගෙන හිටියෙ.. ඇයි අනේ අපේ වෙඩින් එකනම් මම නොකා ඉඳලා හරියනවද.. නෑනෙ.. මම හොඳට කෑවා අනිත් සේරම පැත්තකින් තියලා.. අපරාදෙනෙ.. මගෙ මනුස්සයත් එහෙමමම තමා.. අන්තිමට සෙනුකයා ඇවිල්ලා අපි කකා හිටපු පුඩිමත් උස්සගෙන ගිහින් ඇදගෙන ඇවිල්ලා ඉස්සරහින්ම තියලා තිබ්බ පුටු දෙකකින් වාඩි කල්ලා එහාට ගියා.. ඒ සැරේ මොන මගුලක්ද කරන්න යන්නෙ.. මම අන්දොස් වෙලා වටපිට බලද්දි හෝල් එකේම හිටපු උන් ටික වාඩිවෙලා අපේ දිහා බලාගෙන ඉන්නවා.. ඒ එක්කම හෝල් එකම කළුවර වුණා.. අපිට ඉස්සරහා තිබ්බ කැල්ලෙ විතරක් ලයිට් එකක් පත්තු වෙලා කියාන් අයියයි අයුක අයියයි හෙන ප්‍රොෆෙසර්ලා දෙන්නා වගේ ලැප් එකකුත් උස්සගෙන ප්‍රොජෙක්ටර් එකකට සෙට් කල්ලා රධ්‍ය අයියා දිහා බලලා මහා බලු හිනාවක් දැම්මා.. රධ්‍ය අයියගෙ ඇස් දෙක ලොකු වුණා..

" අද හරි වගේ.."

" ඇයි ඒයි.."

" මංගල සභාව මැද්දෙ රෙදි ගලවගන්න කැමතිද.."

" ඇයි අපි ඒක හනිමූන් එකේදි නෙමෙද කරන්නෙ.."

රධ්‍ය අයියා මගේ ඔලුව මැද්දටම ටොක්කක් ඇන්නා.. සැක් මෙ මිනිහා සේරම සභාව මැද්දෙ නේද මගේ ඔලුවට ඇන්නෙ.. මම ඒකගෙ උරහිස ගාවින් හැපුවා.. ඒත් හැපෙන්නෙ පැඩින් එකක් නිසා අත ඇදලා අරගෙන හොඳට මස් අහුවෙන තැනක් බලලා හොඳ පාරක් හැපුවා... ඒ එක්කම අර ඉස්සරහා ඉන්න උන් දෙන්නා කොහෙන්ද මන්දා මයික් දෙකකුත් උස්සගෙන ඇවිල්ලා රධ්‍ය අයියා ලෙක්චර්ස් වල ඉන්නවා වගේ බ්ලෙසර් දෙක පන්නලා අත් දෙක වැළමිට ගාවට නමාගෙන.. මට වැලලෙන්න හිතුණා.. අනේ ආච්චිඅම්මෙ..!!

@Shan

" Ladies and Gentlemen.. Permission is granted by all present.. Our warmest congratulations to my brother Radhya and brother Varadh who got married today.."

" First I would like to say that I am Ayuka and Radhya's best friend since grade one.."

" And this is Kian.. I am also Radhya's best friend since grade one.."

කියාන් අයියා හෙන ප්‍රශ්ණාර්ථයක් වගේ මූණක් හදාගෙන අපිව පහුකරගෙන පිටිපස්සෙ ඉඳපු අය ගාවට ගියාම රධ්‍ය අයියා ශේප් එකේ අයුක අයියට මැද ඇඟිල දික් කළා.. කෝ මුන්ගෙ ගෑණුමිනිස්සු.. පේන්නත් නෑ.. ඊළඟට උන් මොන දහාටසන්නිය නටයිද දන්නෑ මෙතන ඇවිල්ලා..

" Isn't it a question for all of you why the love between these two is so old..

**ladies**

.. right..??"

අයුක අයියත් අපිව පහුකරගෙන පිටිපස්ස්සට ගියාම මම මූණ වහගන්න මල් බොකිය හෙව්වා.. ඊටපස්සෙ ඒක මං ගාවට ගෙන්නගෙන මූණ වහගත්තා.. සැකේ..

" So we have prepared a complete presentation to

**kill!!**

your curiosity.."

උන් දෙන්නගෙ ෆ්ලුවන්ට් ඉන් ඉන්ග්ලිශ් ඇක්සන්ට් එකටනම් අහගෙන ඉන්න හිතෙනවා.. ඒත් මෙක අස්සෙ මොනවා තියෙයිද දන්නෑ.. අම්මගෙන් ගුටි කන්න වෙන මොකුත් අහුවෙයිද.. අයුක අයියා උගේ අමුතු ගැම්මෙන් ඇවිදගෙන ගිහින් ප්‍රසන්ටේශන් එකේ ස්ලයිඩ් එකක් ඕපන් කළා.. මුලින්ම තියෙන්නෙ හද්ද අජූත ෆොටෝ දෙකක් වෙන වෙනම දාලා.. උඩින් හැපි වෙඩඩ් ලයිෆ් කියලා ගහලා.. රධ්‍ය අයියා කොට කලිසමක් ඇඳගෙන ඉණට අත තියාගෙන බිම බලාගෙන ඉන්නවා.. මම බිමට නැමිලා අත් දෙකෙන්ම

@Shan

පොළොව හාරනවා.. ඕක අපේ ඉස්කෝලෙ පරිසර දිනේ.. මම අටෙදි තිබ්බ එකක්.. අපේ ශිශ්‍ය නායකයා මම හරියට පැලේ හිටවනවද බලනවා.. හැමෝම හිනාවෙන සද්දෙකුත් ඇහුණා..

මේ මල් පොකුර කැවොත් මම මැරෙයිද..???

" නෝනාවරුනි.. මෙන්න මෙ කාලෙදි ඉඳලා තමයි අපේ විවාහයට පත් නව යුවලගේ ආදර කතාව ආරම්භ වෙන්නෙ.. බලන්න ඒ දෙන්නගෙ තියන පුංචිපහේ සිරියාව.. නේද.."

අයුක අයියා කියාන් අයියා කියන හැම එකම ට්‍රාන්ස්ලේට් කරනවා..

" ඉස්සර දවසක මට මතකයි අපේ යාළුවා ග්‍රවුන්ඩ් එකේ පඩිපෙල ගාව.. අපේ ග්‍රවුන්ඩ් එකේ පඩිපෙළක් තිබුණා හොඳද.. ඔන්න ඔතන වාඩිවෙලා ඈත පේන මෙන්න මෙච්චක්විතර කුඹියෙක් දිහා බලාගෙන ඉන්නවා..

ඉතින් අපිට ඇත්තටම දරාගන්න බැහැ අපේ යාළුවා ඇයි මෙච්චර දුකින්, කලකිරීමෙන් ඉන්නෙ කියලා.. මම හිමින් සැරේ අපේ යාළුවා ගාවට කිට්ටු වෙලා තට්ටුවක් දාලා ඇහුවා..

' සබඳ ඔබ කිමද මෙහි වී කට අයා බලා සිටින්නේ කියලා "

" ඒකබොරුවක් නෝනාවරුනි මහත්වරුනි.. අපි ඒක ඇහුවෙ වෙන භාශාවකින්.. ඉතින්..??"

" ඉතින් මට හරි ලස්සන පිළිතුරක් ලැබුණා.. මොකක් කියලද හිතන්නෙ.."

" මොකක්ද.."

කියාන් අයියා බිමට නැමිලා රධ්‍ය අයියා එදා ඉඳපු පෝස් එකට කම්මුලට අතක් තියාගත්තා..

" එයා මට කැමති වෙන එකක් නෑ නේද බං.."

මුළු හෝල් එකේම හිටපු උන් හෙන හයියෙන් හිනාවුණා.. මුගෙ ආච්චිට.. මේ මිනිහා අපරාදෙ ඕක ඒ කාලෙම කියන්නයි තිබ්බෙ.. මේ මොන වේදනාවක්ද මේ..

@Shan

" අපි ඉතින් දුකට සැපට එකට හිටිය කොත්තමල්ලි යාළුවො නිසා හැමතිස්සෙම අපේ එකාගෙ ගැම්ම නග්ගලා තියනවා.. 'මචං ටික කාලෙනෙ.. අනිවා කැමති වෙනවා ඔන්න බලපන්කො!!!' "

" ඒ අස්සෙ මේ ඉන්න එකාත් ගොඩ ගියා.. ඒක වෙනම කතාවක්.. නේද අයුක.. අර කම්මුල්-"

" අහ්ම්.. ඉතින් කියාන්..??!!"

" ඉතින් මෙසේ දින වකවානු ගතවී යත්ම මොකක්ද වුණේ.. අපේ එකාගෙ ෆෝන් එකේ ස්ටොරේජ් ෆුල් වෙන්න ගත්තා.. ඇයි..?? අර අතන ඉන්න ලෝක ප්‍රසිද්ධ ක්‍රීඩයාගෙ අහඹු ඡායාරූප නිසා.. කොටින්ම අපේ ෂනෙරු කැන්ටිමට ගියත් ඒකෙත් ෆොටෝ අපේ එකාගෙ ෆෝන් එකේ වැදිලා තිබුණා.. ඔක අපිට අහුවුනේ දහය වසරෙදි.."

" ඇත්තෙන්ම ඒ ඡායාරූප වලින් මදක් අපි ළඟ තියනවා.. එහෙම නේද.. අපි බලමු.."

ඒ එක්කම ඉස්සරහ ස්ක්‍රීන් එකේ මගේ හෙන වාටර් ෆොටෝ වගයක් ප්ලේ වෙගෙන ගියා.. මම ඒ කාලෙ දිමි පැටියෙක් වගේ.. අමුතු සුදුපාටකට.. සැක් ඇනුමක් යන එකකුත් තිබ්බා.. කලිසම අස්සෙ කිරි පැකට් දාගෙන දුවන ඒවයි.. ග්‍රවුන්ඩ් එකේ සර්ලා එකතු කරගෙන ක්‍රිකට් ගහන ඒවයි.. අඹගහ උඩ නැගගෙන ඉන්න ඒවයි.. පන්තියෙ කොස්ස උඩ නැගගෙන ඉන්න එකකුත් තිබ්බා.. ඒ අස්සෙ බිග් මැච් එකේ ඇඟ පුරාම පාට ගාගෙන ඉස්කෝලෙ කොඩිය වන වන නටන වීඩියෝ එකකුයි.. ඊට පිටිපස්සෙන් රධ්‍ය අයියා සසර කලකිරිලා වගේ බෙල්ලත් ඇල කරගෙන මගේ දිහා බලන් ඉන්න වීඩියෝ එකකුයි.. හෙන තොගයක්.. අන්තිමට මටත් හිනාවෙලා හිනාවෙලා ඇඟ පනත් නැතුව ගියා.. අනේ හත්තික්කේ මේ මනුස්සයට වෙන වැඩක් තිබිලා නෑ.. මම ශේප් එකේ හැරිලා අපේ අම්මා දිහා බලද්දි අම්මා පුදුම වෙලා වගේ කටත් ඇරගෙන ස්ක්‍රීන් එක දිහා බලාගෙන ඉන්නවා.. පෞකාර පුතාට සමාවෙන්න අම්මෙ.. මට හිතින් හොරෙන් එක්කෙනෙක් පෙම් කල්ලනෙ..

" ඔහොම කාලයක් ගතවෙද්දි නෝනාවරුනි.. ඇත්තෙන්ම අපේ රධ්‍යගෙ මූණෙ දේදුන්නක් පායපු කාලයක් තිබුණා.."

@Shan

" මුල්ම දවස.. අපිට ස්පෝර්ට් මීට් එකේ වැඩ කතාකරගන්න රධ්‍යලගෙ ගෙදර දාගත්තු දවස.. අපේ රධ්‍යගෙ සිරියහනේ ෂනෙරු නින්දට වැටුණා.. හුදෙක්ම නින්දක් විතරයි නෝනාවරුනි..!! රධ්‍ය කියන්නෙ හෙන ප්‍රතිපත්තිගරුක මනුස්සයෙක්.. රෙස්පෙක්ට් බ්‍රදර්.. දැට්ස් වයි වී ලව් යූ.."

ඒ එක්කම ස්ක්‍රීන් එකේ රධ්‍ය අයියා කොට්ටයක් බදාගෙන අනිත් පැත්ත හැරිලා ඉන්න වීඩියෝ එකක් ප්ලේ වුණා.. කියාන් අයියද කොහෙද කැමරාවක් උස්සගෙන ළඟට ගිහින් රධ්‍ය අයියගෙන් අහනවා,

' මොකද බං කොට්ටයක් බදාගෙන කරන්නෙ..'

රධ්‍ය අයියා හෙන මනමාල හිනාවක් දාගෙන කැමරාව පැත්තට හැරිනවා..

' අඩෝ වරද් අපේ ගෙදර ආවා බං '

මගේ එහාපැත්තෙ ඉඳපු රධ්‍ය අයියා මූණ වහගත්තා.. අනේ අප්පා.. මම රධ්‍ය අයියව බදාගත්තා.. අපි ඉස්කෝලෙ කාලෙ හෙන කියුට්නෙ දෙයියනේ.. ඒ එක්කම හෝල් එකම හිනාවෙන සද්දයක් ආවා..

" දැක්කා නේද දේදුන්නෙ පවර් එක.."

" අපි ඊටපස්සෙ ටික කාලයක් යද්දි රධ්‍යගෙ හොරයක් අල්ලගත්තා.. ඔය ඉන්නෙ ඉස්කෝලෙ උපප්‍රධාන ක්‍රීඩා නායකයා නෝනාවරුනි මහත්වරුනි.. ඒකා උදේට උදේට මිසින් වෙනවා හැමදාම.. කටු කෑවෙ අසරන මම!! ඒක වෙනම කතාවක්.. ඉතින් ඔයාලා හිතන්නෙ එයා කොහේ ඉන්න ඇත්ද.."

අපි දෙන්නා ඉස්කෝලෙ සේපාලිකා ගහ අස්සට වෙලා කියව කියව ඉන්න ෆොටෝ වගයක් ප්ලේ වුණා.. ඒව මෙ මිනිහගෙ පැණි හිනාව.. ඒ වුණාට ඒව දකිද්දි ඉස්සර කාලෙ මතක් වෙනවා.. අපි දෙන්නම යුනිෆෝම් ගහගෙන ඉස්කෝලෙ ආපු කාලෙ.. කිසිම දේක බරපතලක් නැතුව පැයගණන් කියවපු කාලෙ.. ඇත්තටම අපි හුඟක් දුර ඇවිල්ලා..

කියාන් අයියලා එයාලගෙ ස්ටෙප් බයි ස්ටෙප් ලව් ස්ටෝරිය කියාගෙන යද්දි හෙන ගහන්න වගේ සෙනුකයා ඇවිත් ලැප් එකේ අර අපි දෙන්නා ගිනියම් රෑ නටපු එක ප්ලේ කලා.. ඊටපස්සෙ අර රිසෝට් එකේ කෙලපු පිස්සුයි.. අපේ අම්මගෙ කට බිමටම ඇරුණා.. අසලි අම්මත් ඒකට බය වුණාද

@Shan

කොහෙද.. මම මල් බොකේ එකේ කොළටක් හපාගත්තා.. අනේ මාමෙ.. වැරදිලා නැටුව එකක් ඒක..!!

" Well ladies and gentlemen.. these are the few words we really need to say..

Happy marriage රධ්‍ය.. ඒ වගේම ෂනෙරු.. ඔයාලගෙ ජීවිත වලට ආපු නොසැහෙන්න ප්‍රශ්න එක්ක.. මේ තැනට ඇවිත්.. ඔයාලගෙ වෙඩින් එකක අපිට කතාකරන්නම ලැබුණු එක මචං-"

කියාන් අයියගෙ කටහඬ බිඳුණහම අයුක අයියා කියාන් අයියගෙ පිටට තට්ටුවක් දැම්මා.. කියාන් අයියා කවමදාවත් නැතුව ඉමෝශනල් වෙලා ඇස් වල කඳුළු පුරෝගත්තා..

" අඩෝ සතුටුයි බං.."

රධ්‍ය අයියා නැගිටලා ගිහින් කියාන් අයියට හග් එකක් දුන්නම කියාන් අයියා රධ්‍ය අයියගෙ පිටට තට්ටුවක් දාලා ෆිස්ට් බම්ප් එකක් දුන්නා..

" හැමදාම සතුටෙන් ඉඳහන්.. ඇත්තටම අපි කියන්න ඕන නෑ.. රධ්‍ය හැමදාම සතුටින් ඉන්නෙ ෂනෙරු ගාව තමයි.. අපි දැකලා තියෙනවා.. උන් දෙන්නා අනිවාරෙන්ම එකට ඉන්න ඕන.. එහෙම නොවුණනම් මම ආදරේ විශ්වාස කරන්නෙත් නෑ.. ඉදිරියෙදි කරන හැමදෙයක්ම සාර්ථක වෙන්න වගේම තව වැඩිපුරත් එක්කම සතුටින් ඉන්න කියලා අපි හදවතින්ම විශ් කරනවා.. මේ ලෝකෙ තියන හොඳම බැඳීම් තියෙන්නෙ අපි අතරෙ.. සහෝදරයො නොවුණට.. රධ්‍ය.. ෂනෙරු.. අයුක.. සෙනුක.. මගේ ෆියොන්සෙ ආශු.. මහීශා.. අපි ඔක්කොම එක පවුලක් වගේ තමයි.. මේ පවුලට එකතුවෙන්න ලැබුණ එකම.. මට සැහෙන්න සතුටක්.. thank you.."

කියාන් අයියා එයාගෙ කතාව කරද්දි අපේ යාළුවො හැමෝම හිටියෙ ඇස් වල කඳුළු පුරෝගෙන.. හැමතිස්සෙම එහෙම කතාකරන්නෙ නැති එකෙක්.. මෙහෙම කියද්දි ඒක හිතටම දැනුණා.. ඇත්තටම අපිට හුඟාක් ඉස්සර කාලෙ ඇස් ඉස්සරහා මැවිලා පෙනුණා..

ටිකකින් රධ්‍ය අයියා මාව අතින් අල්ලගෙන ෂැම්පේන් ෆවුන්ටන් එක ගාවට එක්කගෙන ගියා.. ඊටපස්සෙ ෂැම්පේන් බොටල් එකක් කඩලා ග්ලාසස් වලට දාගෙන මාරු කරගෙන බිව්වා.. ඊටපස්සෙ වෙඩින් එකට ආපු එවුණුත් හොඳට බීලා හිටියෙ.. ඩාන්ස් ෆ්ලෝ එකේ රොමැන්ටික්

@Shan

මියුසික් එකක් ප්ලේ වෙද්දි කියාන් අයියා ආශිවත් එක්කගෙන ගිහින් හිමින් නටන්න ගත්තා.. මම පැත්තකින් වාඩිවෙආ හිටියෙ.. ටිකකින් අයුක අයියත් සෙනුකයගෙ අතින් අල්ලගෙන ඒකට එකතු වුණා.. නිල් පාටට හැමතැනම කළුවරට.. ඇත්තටම රොමැන්ටික්.. මම හරි ආදරෙන් එයාලා දිහා බලාගෙන හිටියා.. මහීශාත් එකතු වුණා.. ටිකකින් අපේ යාළුවො හැමෝම වයිෆ්ලා එක්ක, ෆියොන්සෙලා එක්ක නටනවා.. ආධ්‍ය අයියත් ඩාන්ස් ෆ්ලෝ එකට ආවා.. එයාලා රවුමට රවුමට නටනවා හරිම ලස්සනයි.. චමිරු.. අපේ අම්මා.. හැම කෙනෙක්ම..

" The night is still young.. If you give me your hand.. I can take you to another world

**My love**

.."

රධ්‍ය අයියා එයාගෙ අත මගේ පැත්තට දික් කළාම මාව රතු වුණා.. මම අතේ තිබ්බ ෂැම්පේන් ග්ලාස් එක පැත්තකින් තියලා එයාගෙ අතේ වාරුවෙන් නැගිට්ටා.. රධ්‍ය අයියා මගේ අතින් හාද්දක් තිබ්බා..

" My pleasure.."

රධ්‍ය අයියා මාව ලයිට්ස් ඩිම් වෙලා තියන ඩාන්ස් ෆ්ලෝ එකේ මැද්දට එක්කගෙන ගියා.. හැමෝම එයාලගෙ ලෝක වල පාඩුවෙ නටනවා.. මම රධ්‍ය අයියගෙ කර වටේ අතක් යවලා අල්ලගත්තා.. එයා මට හිටගෙන එන්න පුළුවන් වෙන විදියට මාව එයාගෙ ඇඟට හේත්තු වෙන විදියට මගේ ඉණ වටේ අතක් යවාගෙන මාව අල්ලගත්තා.. අපි දෙන්නගෙම මුදු දාපු අත් දෙක එකට පැටලිලා තියනවා.. මම රධ්‍ය අයියගෙ උරහිසින් අල්ලගෙන දෙපැත්තට හිමිහිට වැනුණා.. එයා ආදරෙන් මගේ දිහා බලාගෙන ඉන්නවා.. මගේ කම්මුල් රතු පාට වුණා..

" ඔයා හරි ලස්සනයි වරද්.. අද නම් කියන්න බැරි තරමටම ලස්සනයි.."

" ඔයත්.."

" ඔයාට මතකද මම ඔයාව වික්ටෝරියන් මහෝගනී ෆ්‍රේම් එකක් දාලා ෆ්ලෙමින් ජූන් වගේ බිත්තියක එල්ලුවොත්.. මට දැනෙනවා කියලා ධනපති

@Shan

පන්තියෙ තෙල් සායම් චිත්‍රයක් මිලදී ගත්තු කෙනෙක්ගෙ වගේ හැඟීමක්.."

" ම්ම්.."

රධ්‍ය අයියා මගේ නළලින් නළල තියාගත්තා..

*.....We are still kids, but we're so in loveFighting against all oddsI know we'll be alright this timeDarling, just hold my handBe my girl, I'll be your manI see my future in your eyes..........*

" දැන් දැනෙන්නෙ එහෙම නෙමෙයි වරද්.. ඒ චිත්‍රෙ ඇඳපු කෙනාට දැනෙන ඇත්තම මානසික සතුට.. ඒ චිත්‍රෙ තමන්ගෙ කියලා හිතෙද්දි දැනෙන නිහතමානී සතුට.. ඒ ආඩම්බර හැඟීම මට දැනෙනවා.. අයිති කරගන්නවට වඩා මේ දැනෙන සතුටට මාම් හුඟක් කැමතියි.."

" ඔයා නැත්නම් කවුරුත්ම ෂනෙරු කියන කැරැක්ටර් එක දන්නෙ නෑ තමයි.. Am the masterpiece.. You are the artist.."

" This artist is very proud of my walking oil painting.."

රධ්‍ය අයියා මගේ තොල් වලට පහත් වුණාම මම ඇස් දෙක පියාගත්තා.. අපි ආපු ගමන කොච්චර දුර වුණත්.. මහන්සි වුණත්.. අමාරු වුණත්.. දැන් මල් පිපෙනවනෙ.. මම ප්‍රාර්ථනා කරපු මගේ ආදරේ.. හැමදෙයක්ම මගේ ගාව තියනවා.. මට හුඟක් සතුටුයි.. සතුට කියන්නෙ ගලාගෙන යන ගඟක්නම්.. මම හරිම ආසාවෙන් ඒ දිගේ ගඟගෙන යන වතුර සීරාවක් වගේ.. කොච්චර කරදර ආවත් මෙතනින් ඉස්සරහට මම දිගටම ගලාගෙන යාවි.. මට ඒකම ලොකු සතුටක්..

" I have faith in what I see

Now I know I have met an angel in person

And he looks perfect.."

රධ්‍ය අයියා මගේ කණ ගාවට කල්ලා මුමුණද්දි මම එයාගෙ ඇඳුමෙ කර අතකට ගුලි කල්ලා අල්ලගත්තා.. එයාගෙ හුස්ම පැම්පේන් වල සුවඳත්

@Shan

එක්ක රස්නෙට මගේ කම්මුල් වල වදිනවා.. මගේ ඉණ වටේ තියන අත් සැරින් සැරේ තදවෙනවා.. මාව ආයෙම රතුවුණා..

**" I don't deserve thisYou look perfect tonight.."**

කැවත බිව්වතෙ.. දැම් යම්මු තරු බලම්න..

වචන හරදාස් හයසීයක් ලිව්ව හලෝ.. අමත රිදෙනවා..

(මෙකටත් හරියක් දාන ගමන්) ඒකත් හරි!!!

එන්නාම්.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 172 කොටස

" මෙක හරිම ලස්සනයි ඒයි.. වෝහ්..!!"

මම අතේ තිබ්බ මුද්ද කහපාට ලයිට් එළියට අල්ලලා ඒක දිස්නෙ දෙන විදිය රධ්‍ය අයියට පෙන්නුවහ එයා නැමිලා මගේ නළලට හාද්දක් දුන්නා..

" ඔයාට ඒක ලස්සනයි.."

මම හොටෙල් එකේ දාහතරවෙනි තට්ටුවට යන්න බටන් එක ප්‍රෙස් කල්ලා පැත්තකට හේත්තු වුණා.. මගේ අතේ අර දිග ටෙල් එකයි මල් බොකේ එකයි.. තව මගෙම බූට්ස් දෙකයි.. ඒක දාගෙන ඉඳලා මගේ කකුල් දෙක රිදෙන නිසා මම ඒක පහළදිම පන්න ගත්තා.. කොහොමහරි වෙඩින් එක ඉවරවුණේ දොළහත් කිට්ටු කල්ලා.. අපි නවතින්න හිතාගෙන හිටියෙත් ඒ හොටෙල් එකේමයි.. ඇලෙක්සැන්ඩ්‍රියන් බෝලෲම එක හුහක් ලස්සනයි.. මෙකෙන් තව එකකට ගිහින් එක රෑකට නවතින්න ඕන නැනෙ.. අනික හෙන මහන්සියි.. රධ්‍ය අයියා අසලි අම්මලා ආයෙම ගියාද අහන්න කෝල් එකක් අරගන්න කල් මම හේත්තු වෙලා හිටියා.. මේ ඇඳුම් ඇඳගෙන ඉඳලා දැන් ඇහක් කසනවා වගේ..

රධ්‍ය අයියා කෝල් එක කට් කල්ලා ෆෝන් එක සාක්කුවට දාගනිද්දිම එලිවේටර් එකේ දොර ඇරුණා.. රධ්‍ය අයියා මම හිතන්නත් කලින් නැමිලා මාව අත් දෙකට උස්සගත්තා.. මම අර සරුවාලෙත් ගුලි කරගෙන ඒක බදාගෙන මොකාද එකා වගේ රධ්‍ය අයියගෙ අත් දෙක උඩට වෙලා හිටියා.. අපි එළියට ආවහම දිගටම තිබ්බෙ රූම්ස් විතරයි.. ඒ ෆ්ලෝ එකේම පහක් විතර තිබුණා.. ඩිම් වෙලා තියන ලයිට්ස් මැද්දෙන් තැන තැන රතුපාට නියෝන් ටියුබ් පත්තුවෙනවා.. ඒත් ෆ්ලෝ එක පාළු පාටයි.. මම රධ්‍ය අයියගෙ කර වටේ අත් දෙක ඔතාගෙන එයාගෙ කම්මුලකින් හාද්දක් තිබ්බා.. රධ්‍ය අයියා රතු වුණා.. මේ මනුස්සයා කතාකරන්නෙ නැනෙ ආපු වෙලේ ඉඳලා..

" කී කාඩ් එක තියන්න.."

මම එහෙමම ඉඳගෙන කී කාඩ් එක දොරට ඇල්ලුවහම ඒක අන්ලොක් වෙලා ඇරුණා.. රධ්‍ය අයියා මාව උස්සගෙනම කාමරේ ඇතුළට ගිහින්

@Shan

කකුලෙන් පිටිපස්සට තල්ලුවක් දැම්මහම දොර වැහුණා.. ලොක් වුණා කියලා පොඩි බෙල් එක්ක වැදුණා..

රූම් එක දැක්කහම මම අද දවසට ලක්ශවෙනි වතාවට විතර.. ආයෙම පුදුම වුණා..!!!

ඇත්තටම ඒක හරිම ලස්සනයි.. කියන්න තේරෙන්නෙ නෑ.. ඉස්සරහා ග්ලාස් වෝල් එකෙන් රළ ගහන මූද පේනවා.. සම්පූර්ණ වීව් එකක්ම.. ඒවට දාපු දුහුල් කර්ටන් වලින් පවා මට එළිය පෙනුණා.. රඨ්‍ය අයියා මාව කවුච් එකෙන් තියලා අතේ තිබුණු ඒවා එහායින් තිබ්බා..

" වෝහ්..!! ලස්සනයි නේද.."

" ම්ම්.."

මම මගේ උඩ බ්ලෙසර් එක ගලවලා පැත්තකින් තිබ්බහම රඨ්‍ය අයියා මගේ කකුල් දෙක ගාවට නැමිලා සොක්ස් දෙක ගලවලා දැම්මා.. මම කකුල් දෙක මෙහාට ගත්තා..

" මම වොශ් එකක් දාගෙන එන්නම්.."

" ඔයා මුලින් ගිහින් එන්න.."

මම ළඟ තිබ්බ රැක් එකෙන් ටවල් එකක් අරගෙන බාත්‍රූම් එක ඇතුළට ගියා.. බාත්‍රූම් එක පුරාම මල් පෙති ඉහලා.. ඉටිපන්දම් පත්තු කල්ලා.. කාමරෙත් කළුවරම කළුවරයි.. ඉටි පන්දම් වලිනුයි, කහ පාට නියෝන් බල්බ් වලිනුයි එන පොඩි එළියක් ඇරෙන්න හැමතැනම තිබුණෙ කළුවර තමා.. මම ඇඳුම ගලවලා පැත්තකට කල්ලා කකුලෙ ප්ලාස්ටර් එකත් අයින් කල්ලා ශවර් එක යටින් හිටගත්තා.. දැන් කකුල තෙමන්න පුළුවන්.. ඒක නිසා නිදහසේ නාගන්න පුළුවන්.. ඒත් මොකකට හරි හේත්තු වෙලා තමයි.. පිටින් හොඳ වෙලා කැළල විතරක් තිබුණාට.. එක සැරයක් මැහුම් කඩාගත්තු නිසා ආයෙම බය හිතෙනවා.. බොරුවට අවධානමක් ගන්න ඕන නෑනෙ..

මම සෑහෙන්න වෙලාවක් ශවර් එක යට ඉඳගෙන කල්පනා කළා.. ඒ අස්සෙ හිතටත් මොකක්ද වගේ.. කලින් ඕනතරම් රඨ්‍ය අයියා එක්ක තනියම ඉඳලා තියනවා.. ඒ වුණාට අද දැනෙන හැඟීම හිතට හරි අමුතුයි.. වෙනස් වගේ..

@Shan

මට එළියට යාගන්නත් ලැජ්ජ හිතුණා.. ඇත්තටම එතකොට මම හිතුවා මම එයා ගැන කොච්චරක් විශ්වාස කල්ලද කියලා.. මෙච්චර කාලෙකට බයක් නොදැනුනේ.. එයා ගැන මගේ හිතේ විශ්වාසය කියන එක තදින්ම තිබුණු නිසා.. මගේ හිතට නොදැනිම.. එයා මගේ හිතේ සමහර සමහර දේවල් සෑහෙන්න වෙනස් කල්ලා තිබුණා..

අන්තිමට මම නාගෙන, බාත්‍රූම් එකේ තිබ්බ බාත් රෝබ් එකකුත් ඇඟේ පටලගෙන බිත්තියත් අල්ලගෙන එළියට අඩිය තියන්න දොර අරිද්දිම රධ්‍ය අයියා දොර ගාව.. ටවල් එකකුත් ඉණේ පටලගෙන.. මං දිහා ඇස් දෙකත් ලොකු කරගෙන බලාගෙන ඉන්නවා.. මම දොරට හේත්තු වුණා.. රධ්‍ය අයියා මගේ කම්මුලකින් අල්ලලා තොල් වලින් හාද්දක් තියාගෙනම ඇතුළට ගිහින් දොර වහගත්තා.. මාව ආයෙම සැරයක් රතු වුණා..

මගේ ෆෝන් එකට එක දිගට මගේ යාළුවො කියන අසමජ්ජාති හැතිකරේගෙන් මැසේජස් එනවා එනවා.. අර සෙනුකයා ඒ අස්සෙ උඩ පැන පැන ඇඩ්වයිස් දෙනවා.. බැරිම තැන මම ෆෝන් එක සයිලන්ට් දාලා ඒක කවුච් එකේ කොට්ටෙ අස්සෙ ගහලා ළඟ තිබ්බ වීදුරුවකට වයින් ටිකක් හලාගෙන ඒක බොන්න පටන්ගත්තා.. අද හෙන අමුතුයි වගේ.. මට මගේ වටේ එන්න එන්නම අමුතු පීඩනයක් දැනෙනවා.. හරියට.. මගේ කම්මුල් රතුවෙනවා වගේ.. හැමතැනම පත්තු කල්ලා තියන ඉටිපන්දම් වලින් ලැවැන්ඩර් සුවඳක් ගලාගෙන එනවා.. ඇඳේ හතර කොනෙන්ම බිමට වැටෙන්න දාලා තියන දුහුල් රෙදි අස්සෙන් ඇඳ පෙනෙනද්දි මම ඒ දිහා නොබලා හිටියා.. මගේ පපුව සමහර වෙලාවට වේගෙන් ගැහෙනවා.. ආසාවකටද බයකටද මන්දා.. සමහරවිට දෙකම එකට එකතුවෙලා දැනෙන කුතුහලේකට.. අනේ මන්දා..

මම තව වයින් ටිකක් ග්ලාස් එකට හලාගෙන බීගෙන බීගෙන ගියා.. මං ගාවින්.. ඇඟේ ගාපු රෝස මල් වල සුවඳ එන ශවල් ජෙල් එකත් එක්කම, වයින් වලින් එන සැර සුවඳකුත් දැනෙනවා.. මම කවුච් එකේ කොට්ටෙකට හේත්තුවෙලා ඔහේ මූද දිහා බලාගෙන හිටියා.. එළියේ හුහක් පහළින් පේන මූදෙ රැළි ගල්පර වල හැපිලා කිරි පාටට බිඳිලා යනවා.. දුහුල් තිර රෙදි අස්සෙන්ම මට පෙනුණා.. අහසෙ හඳක්නම් පායලා තිබුණෙ නෑ. කොහොමත් විශේශෙන් මම හඳකට ආස නෑනෙ.. මට හැමතිස්සෙම ඉස්සර ඉඳපු මාව මතක් වෙනවා.. දෛවයද.. මොකක් වුණත් මම ආපු දුර ගොඩක් විසාලයි.. මම වයින් ග්ලාස් එකට වැටුණු කහපාට නියෝන් එළිය වැදිලා දිලිසෙන රින්ග් එක දිහා බලාගෙනම හිටියා.. ඒක ඇත්තටම හරි

@Shan

ලස්සනයි.. මේක මගේ අතට වැටෙන වෙලාවෙ රධ්‍ය අයියගෙ ඇස් වල තිබුණු බැල්ම.. මම ආයෙම මතක් කරගත්තා.. මම ජීවත් වෙන්නෙ ලස්සන හීනෙක.. කවදාවත්ම විශ්වාස කළේ නෑ.. අපේ පාරවල් එකට හමුවුණු තැන මේ තරම් ලස්සන වේවි කියලා..

හුඟ වෙලාවකට පස්සෙ මම හිටියෙ ටිකක් විතර මත් වෙලා.. වයින් වලට ලොකුවට මත් වුණේ නැතිවුණත් කාමරෙන් එන ලැවැන්ඩර් සුවඳට මත් වෙනවා වගේ.. මගේ බෙල්ල පිටිපස්සෙන් උණුහුම් හුස්ම වදිනවා දැනෙද්දි මාව ගැස්සිලා ගියා.. රධ්‍ය අයියා මගේ බෙල්ල ගාවින් තෙත හාද්දක් තියලා කවුච් එකෙන් වාඩිවෙලා වයින් ග්ලාස් එකක් පුරවගත්තා.. මටත් පිරෙව්වා.. දැනටමම බෝතලෙන් බාගයක්ම වගේ හිස් කල්ලා තිබ්බෙ මම.. රධ්‍ය අයියා මාව එයාගෙ ඇඟට හේත්තු කරගත්තා.. මම් එයාගෙ උරහිසට ඔලුව හේත්තු කරගත්තා.. එයා මගේ ගාවින් වාඩිවුණත් මගේ පපුව වේගෙන් ගැහෙනවා..

**" In the end we won the battle.."**

*Cheers*

මම හිනාවෙලා මගේ වයින් ග්ලාස් එක රධ්‍ය අයියගෙ ග්ලාස් එකේ හිමිහිට වැද්දුවා.. ටිකකින් මමම නැගිටලා එයාගෙ උකුළින් ඉඳගත්තා.. රධ්‍ය අයියා මගේ ඉණ වටේ අතක් යවලා මාව එයාගෙ ඇඟට හිර කරගත්තා.. එයාගෙ ඇස් මත්වෙලා වගේ.. ඒ බැල්මට අහුවුණාම මට මාව හරි පොඩියට දැනුණා.. මාව දියවෙලා යනවා වගේ.. කම්මුල් රතුපාටට හැරුණා..

" මම ඔයාට දවසකට දාස්වෙනි වතාවට ආදරෙයි කිව්වත්.."

මම රධ්‍ය අයියගෙ මූණට කිට්ටු වුණා.. එයාගෙ බාගෙට මත් වෙලා තියන ඇස් වලින් මාව විනිවිද දකිනවා වගේ.. මම ඒ බැල්මට එක අතකින් ආසයි..

" මම..??"

මම එයා දිහා එකදිගට බලාගෙන ඉඳලා වෙන කල්පනාවකට වැටෙන්න යද්දි ආයෙම හරි සිහියට ආවා.. මට ආයෙම හැමදේම මුල ඉඳලාම කල්පනා කරන්න ඕන..

" ආදරෙයි කිව්වත්.. මදියි කියලා හිතෙනවා.."

@Shan

රධ්‍ය අයියා ග්ලාස් එකේ තිබ්බ වයින් ඔක්කොමට ටික හුස්මට බීලා ඒක පැත්තකින් තිබ්බහම මම එයාගෙ බාත් රෝබ් එකේ කරක් හිමිහිට පහළට කළා.. රධ්‍ය අයියා ලාවට කට කොනෙන් හිනාවුණා.. මම එතනට තෙත හාද්දක් දුන්නා..

" මම ඔයාගෙ මෙ සයිඩ් එක දැකලා නෑනෙ.. ඔයා මාර ෆෝවර්ඩ්නෙ බබා.."

" මම කොහොමත් හෙන ෆෝවර්ඩ්.. ඔයා එහෙනම් මෙ සයිඩ් එකත් අද බලාගන්න.."

මගේ ඇඟිලිතුඩු රධ්‍ය අයියගෙ බෙල්ල පිටිපස්සෙ එතෙද්දි රධ්‍ය අයියා මාව උස්සගෙන ගිහින් ඇඳ හතර පැත්තෙන් වැටෙන දුහුල් රෙදි එහාට කල්ලා මාව ඇඳ මැද්දට අතෑරියා.. මාව කොට්ට ගොඩක් උඩට වැටුණා.. මම එයාගෙ දරාගන්න බැරි බැල්ම මගෑරලා අහක බලාගත්තා.. ඇඳ හැමතැනින්ම ලැවැන්ඩර් සුවඳ දැනෙනවා..

" කොහොමත් ඔයාව දැක්කහම අමුතුවෙන් අවුස්සගන්න දෙයක් නෑ.. ඉබේම ඇවිස්සෙනවා.."

රධ්‍ය අයියා මගේ තොල් වලට පහත් වෙලා පෙක් එකක් තියද්දි මම එයාව මගේ පැත්තට ඇදගත්තා.. අපි දෙන්නා ගාවින්ම එන රෝසමල් වල සුවඳ එක්ක-ලැවැන්ඩර් සුවඳ ඉටිපන්දම් වල සුවඳ එකතුවෙලා අපි වටේ වෙනම ලෝකයක් හැදිලා තිබුණා.. පළවෙනි වතාවට එයා කිසිම තහනමක් නැතුව මාව අල්ලද්දි මම ඒ හැම ඇඟිලි තුඩු රටාවකටම, දහස් ගාණක් පහළට තියන ආගාධෙකට ඇදගෙන යනකොට.. එළිය වටපිටාව නොපෙනී යනවා වගේ.. මගේ වටේ වෙන හැමදෙයක්ම අමතක කල්ලා දැනුනා.. ඒක හිත ඇතුළෙන්ම එන ආදරෙත් එක්ක එකතුවුණු අමුතු ලස්සනක් තියන හැඟීමක්.. හැමදෙයක්ම පළවෙනි වතාව වුණත්.. රධ්‍ය අයියා මාව ඇල්ලුවේ හරි පරිස්සමට.. එක පොඩ්ඩක්වත් රිදෙන්නෙ නැතිවෙන්න.. මම එයාගෙ කොණ්ඩෙ අහුරක් මගේ අත් වලට තද කරගනිද්දි මගේ කොලර් බෝන්ස් වල ගනින්න බැරි තරම් පැල්ලම් ඉතුරු වෙලා තිබුණා..

මුලදි හැමදෙයක්ම හරි හිමිහිට පටන්ගත්තත්.. ඇත්තටම ටික ටික දුරට යද්දි රධ්‍ය අයියා සිහියෙන් එහාට යනවදෝ මට දැනුණා.. එයාගෙ ඇස් වල ආදරේ උතුරලා යන්න තරම් තිබුණත් ඇඟ හැසිරුණේ පුදුම ආවේගෙකින්.. රධ්‍ය අයියා මගෙන් එහාට වෙලා මගේ බාත් රෝබ් එකේ පටිය ඇදලා දැම්මම මගේ කම්මුල් රතු වුණා.. එයාට ඒකට හිනා ගියා..

@Shan

" උඹව දැක්කහම පිස්සු හැදෙනවා වරද්.."

මගේ කකුලක ඇඟිලි එයාගෙ පපුව දිගේ පල්ලම් බැහැගෙන එද්දි එයා මගේ කකුලක් උස්සලා හාද්දක් දීලා මගේ ඇඟේ තිබුණු බාත් රෝබ් එක ඇදලා බිමට දැම්මා.. මගේ අත් දෙකම එකට තියලා ඇඳට තද කල්ලා පපුව මැද්දෙන් හාද්දක් තියද්දි මාව හිරිවැටුණා.. මෙහෙම හැඟීම් මට කවදාවත් දැනිලා තිබුණෙ නෑ.. පැත්තකින් තියන කණ්නාඩියෙන්.. දුහුල් රෙදි අස්සෙන් මට මාවම පේනවා.. අවුල් වුණු කොණ්ඩයක් එක්ක.. ඇඟේ නූල් පොටක්වත් නැතුව.. රධ්‍ය අයියට පහළින් වැතිරිලා ඉන්නවා.. රධ්‍ය අයියා මගේ ඉණේ තිබුණු බෙලි චේන් එක දිගේ ඇඟිලි ඇදගෙන යද්දි, ඇඟට දැනෙන හුරු නැති කිතියට මම කොට්ටෙට ඔලුව තවත් තදකරගත්තා.. මගෙ තොල් තුවාල වෙලා ගිහිල්ලා.. රධ්‍ය අයියගෙ පිට දිගට පැල්ලම් හැදුණා.. එයාගෙ ඇඟිලි තුඩු මගේ පපුව දිගේ.. උරහිස දිගේ.. ඉණ දිගේ.. ඊටත් පහළට ඇදගෙන යන හැම වතාවකම.. මම එයාගෙම නම කියලා ගණින්න බැරි වතාවක් කෙඳිරුවා..

" අහ්-අයියෙ..!!"

රධ්‍ය අයියා මගේ ඇඟේ තොල් ඇදගෙන නොගියපු තැනක් නැති තරම්.. මම එයාගෙ ඇඟට යටවෙලා ඉවසිල්ලක් නැතුව දඟලද්දි සමහර වෙලාවට එයා මගේ තොල් වලින් හාද්දක් තිබ්බා.. ඒත් එයා තාම එකතැනක හිරවෙලා වගේ.. මගේ ඉවසිල්ල නැත්තටම නැති වෙන තැන මගේ ඇඟම පණනැති වුණා.. රධ්‍ය අයියගෙ අත් ආවේගෙන් වගේ මගේ ඇඟ පුරාම දුවද්දි එයාගෙ ඇඳුණුත් මගේ අතින් ගැලවිලා අහකට විසික් වුණා..

ඇත්තෙන්ම..එයා හුඟක් ලස්සනයි..

හැඩිදැඩි පිරිමියෙක්ට තියෙන්න ඕන හැම දෙයක්ම එයා ගාව උවමනාවටත් වඩා තිබුණා.. මම මගේ ඇඟිලි තුඩු රධ්‍ය අයියගෙ පපුව දිගේ පහළට ඇදගෙන එද්දි එයා මගේ අත නවත්තගෙන ආයෙම ඇඳට තියලා තද කරගෙන මගේ කකුල් දෙක දෙපැත්තට කරද්දි මගේ හිතට එකසැරේට බය හිතුණා.. මට ඒක කියාගන්න විස්තර කරන්න බැරි හැඟීමක් වුණත් මම ඒක නොපෙන්න හිටියා.. රධ්‍ය අයියා මගේ ඇඟිලි වල එයාගෙ ඇඟිලි පටලගෙන මගේ තොල් වලට පහත් වෙලා සීරුවට හාදු තිව්වා.. ඒ එක්කම කවදාවත්ම නැති තරම් වේදනාවක් ඇඟට දැනෙද්දි මම එයාගෙ උරහිස් වල තුවාල වෙලා යන තරම් හයියෙන් හූරගත්තා.. කෑගහලා අඩන්නම තරමෙ

@Shan

වේදනාවක් දැනෙද්දි.. ඉවසගෙන බැරිම තැන.. මගේ ඇස් වලින් කඳුළු කැට දෙපැත්තට කඩාගෙන වැටුණා.. රධ්‍ය අයියා මගේ මූණෙන් ගනින්න බැරි තරම් හාදු තිව්වා.. අහගෙන ඉන්න ආස හිතෙන තරමට ආදරණීය වචන මිමිණුවා.. මම හැම වේදනාවක් මැද්දෙම ඒවා අහගෙන ඉද්දි එකසැරේට මට කෑගැස්සුණා.. මහා හයියෙන්ම..

" අනෙහ්-අයියෙ!!!"

" මං දිහා බලන්න වරද්.."

මට බොඳ වෙලා තියන ඇස් වලින්ම රධ්‍ය අයියව පෙනුණත්.. මගේ ඇහි පිල්ලම් හැම තප්පරයකට වතාවක්ම උඩ අතට හැරවෙද්දි මට දැනුණේ.. එයා හිටියෙ වෙනම ලෝකෙක.. මගේ ඉණට පහළින් තියන කොට්ටෙ රුට්ටලා එහාට මෙහාට වෙන වාරයක් ගානෙම මම ඇඳ රෙද්ද ඇඟිලි වලට පොඩි කරගෙන කෙඳිරුවා.. වෙලාවකට වේගෙන්.. හිමින්.. වේදනාවම අනිත් අතට හැරවිලා මගේ ඇඟට තෘප්තියක් ගෙනැල්ලා දෙද්දි මෙච්චර වෙලා තිබුණු වේදනාව අමතක වෙලා ගිහිල්ලා මම එයාගෙ උරහිස් වලින් තද කලා අල්ලගෙන එයාගෙ කනට කෙඳිරුවා.. හාදු තිව්වා.. එයාව තව තව මගේ පැත්තට ඇදගත්තා.. පෙළඹුවා.. රධ්‍ය අයියව ඒ හැඟීමට රවට්ටගන්න ලේසිදෝ මට හිතුණා. එයාගෙ ගොරෝසු කටහඬෙන් පිටවෙන කෙඳිරුම් සද්දවලට මගේ හිත සැහෙන්න ආස කළා.. මට තව තව අහන්න ඕන වෙද්දි එයා මාව උකුලෙන් ඉන්දුව ගත්තා.. මට මහා හයියෙන් කෑගැස්සුණා.. කඳුළු අස්සෙන්ම හිත ඉල්ලලා කෑගහන අමුතු ආසාවට ඉඩදීලා මමත් හිතේ හැටියට ඇඳ පුරාම දැඟලුවා.. හති වැටිලා පණ නැතුව කොට්ටෙ උඩට ඇදගෙන වැටෙන හැම වෙලාවකම.. එයාට නවත්තන්න ඕන කියලා හිතුණු හැම වතාවකම.. මගේ එක බැල්මකින් එයාව තව තව මත් වුණා.. මමත් එයාව තව මටම හිර කරගත්තා..  කොහොමත් මෙතනින් එහාට.. එයාට ගැලවෙන්නත් බෑ..

" You know exactly how to make me feel better..hah??"

" I-I just want to make you-ah-happy.."

දෙවෙනි තුන්වෙනි වතාවත් පහුකල්ලා එළි වෙන කිට්ටුව මට ඇඟේ පොඩිම පණක්වත් ඉතුරුවෙලා තිබුණේ නෑ.. මගේ වටේ සැරින් සැරේ කළුවර වෙලා යද්දි.. තවත් බැහැ කියලා හිතුණු හැම වෙලාවකම මම ඉවසගෙන එයාට ඉඩ දුන්නත්.. අන්තිමේදි මට මතකෙ තිබුණේ මගේ වටේ

@Shan

කළුවර වෙලා එයාගෙ අත් දෙක මැද්දට කඩාගෙන වැටෙනවා විතරයි.. දාඩියෙන් මගේ මුළු ඇඟම තෙත් වෙලා තිබුණා.. එයාගෙ ඇඟිලි පාරවල්.. රතු පාටට.. දම් පාටට මගේ ඇඟ පුරාම පාට තවරලා අවසානෙදි මම ලොකු නින්දකට වැටුණා..

*beep* *beep*

එක එක හීන දහස් ගාණක් විතර දැකලා මම පහුවදා ඇහැරෙද්දි මුළු කාමරේම එළිය වැටිලා.. එළියෙ මෙහට ඇදපු.. තිර රෙදි නැති වීදුරු වලින් මට මූදට උඩින් ඉර පායලා තියනවා පෙනුණා.. මම හිටියෙ මෙහා පැත්ත හැරිලා.. කොණ්ඩෙ මූණට වැටිලා තියන නිසා ඒක හදාගන්න මම අත ඉස්සුවා විතරයි.. මට එහෙමම කෙඳිරි ගෑවිලා පාන්දර වෙනකල් වෙච්ච දේවල් මතක් වෙලා කම්මුල් රතුපාට වුණා.. මම අනිත් පැත්ත අතගාලා බලද්දි ඇඳේ කවුරුත්ම හිටියෙ නෑ.. බාත්‍රූම් එකේ වතුර වැටෙන සද්දයක් ඇහෙනවා.. මම එහෙමම කොට්ටයක් තුරුල් කරගෙන පුළුවන් තරම් ගුලි වුණා.. ඇඟට අමුතු සීතලක් දැනෙනවා.. මට ආයෙම නින්ද යාගෙන වගේ ආවත් නිදාගන්න හිත දුන්නෙ නෑ.. මම බ්ලැන්කට් එක පපුව ගාවට ඇදගෙන මූද දිහා බලාගෙන හිටියා..

කලින්දා දවසෙ මාවම මත් වෙච්ච රූපයක් වගේ පෙන්නපු කණ්ණාඩියෙන් අද මාව පෙනුණේ වෙනස් විදියට.. විසාල ඇඳක් මැද්දෙ මම හරිම පුංචියට පෙනුණා.. කලින් දවසෙ පත්තු වුණු ඉටි පන්දම් අයින් වෙලා ගිහින්.. ඇඳ වටේ තිබුණු දුහුල් රෙදි උඩට වෙලා.. කාමරේ රෑට වඩා දවල්ට හරි වෙනස්.. මම ආයෙම මගේ අතේ තිබුණු මුදු දෙක දිහා බලාගෙන හිටියා.. ඒ එක්කම රධ්‍ය අයියා දොර ඇරගෙන එළියට එද්දි මම කොට්ටයක් අත් දෙකට තුරුල් කරගෙන තව ටිකක් ඇඳේ ගුලි වුණා..

" ඔයා අවදි වුණාද.."

රධ්‍ය අයියා ඇඳ වටෙන් ඇවිත් ඇවිත් මං ගාවින් ඉඳගත්තම මම තව ටිකක් බ්ලැන්කට් එක අස්සටම වුණා.. එයා මගේ නළලින් අත තියලා අනිත් අත එයාගෙ නළලට තියාගෙන මං දිහා බයවෙලා වගේ බැලුවා..

" ඔයාට උණ නේද..!!"

සැක්.. අනේ ආච්චිඅම්මෙ.. එන්නකො.. මේ මොන නින්දාවක්ද.. මගේ ඇඟ මාව පාවලා දෙනවනෙ..

@Shan

" මිම්.."

රධ්‍ය අයියා මාව නැගිට්ටුවලා එයාගෙ ඇඟට හේත්තු කරගෙන කොණ්ඩෙ පිටිපස්සට කල්ලා නළලින් හාද්දක් තිව්වා.. මම එයාගෙ බෙල්ල අස්සෙ මූණ තියාගත්තා.. ඒ අස්සෙ මට බෙල්ල ගාව දිහට හරහට හීරිලා තියනවා පේනවා.. මම ඒවා පේන්නැති වෙන්න ඇස් දෙක පියාගත්තා.. මට මොකුත් පේන්නෙ නෑ..!

" අපි වොශ් දාලා කෑම කමු.."

මම නැගිටින්නෙ නැතුවම රධ්‍ය අයියගෙ ඇඟට හේත්තු වෙලා තද කල්ලා බදාගෙනම හිටියා.. එයා මගේ ඇඟේ තිබ්බ බ්ලැන්කට් එක එහාට කරන්න හදද්දි මම ඒකත් ඇඟටම තියලා තද කරගත්තා..

" දැන් ඉතින් තව මොනා හංගන්නද.. මම දැකලා ඉවරයිනෙ.. මෙහෙ වරෙන් බං.. පුදුම කැටයම් තමා තියෙන්නෙ.."

රධ්‍ය අයියා මාව බ්ලැන්කට් එකෙන්ම ඔතලා උස්සලා ගත්තහම මම ඇස් දෙක ගාවටම බ්ලැන්කට් එක ඇදගෙන වෙන පැත්තක් බලාගෙන හිටියා.. රධ්‍ය අයියා එහෙමම හිටගෙන ඇඳ දිහා බලාගෙන ඉද්දි මමත් හිමිහිට බෙල්ල අස්සෙන් මූණ දාලා ඇඳ දිහා බැලුවා.. ඇඳ මැද්දෙ ලේ පැල්ලම් දෙන තුනක්ම තියනවා.. රධ්‍ය අයියා අමුතුවට හිනාවෙලා මාවත් උස්සගෙන බාත් රූම් එකට ගෙනිහින් බ්ලැන්කට් එක ඇඟෙන් අයින් කල්ලා, මාව ලාවට රස්නෙ බාත් සෝල්ට් වලට රෝසපාට වෙලා තිබුණු උණු වතුර පුරවලා තිබ්බ බාත් ටබ් එකෙන් තිබ්බා.. වැඩි වතුර දෙපැත්තට ඉතිරිලා ගියාම මට වතුරෙන් හිතට සනීපයක් දැනෙන සුවදක් දැනුණා..

(*It is normal for the bottom person to bleed from injuries after first intercourse.. Don't get it wrong..)

" මොකෝ කතානැත්තෙ.."

රධ්‍ය අයියා මං ගාවින් නැමිලා ලූෆා එකකට බොඩි වොශ් හලලා ඒක මගේ අත දිගේ ඇදගෙන යද්දි මම ආයෙම රතු වුණා.. මේ මිනිහා ඊයෙ රෑ මාව කාලද.. මෙච්චර ඇඟේ පැල්ලම්.. අනේ දෙයියනේ පව්ලෙ මොකෙක්වත් හම්බෙන්න මමනම් යන්නෙ නෑ.. සොරි ආධ්‍ය අයියෙ..!

@Shan

" රිදෙනව අනේ.."

" උඹට පුදුම විසයක්නෙ තියෙන්නෙ.. මම මොකක් කරන්නද ඒකට.."

රධ්‍ය අයියා සබන් පෙණ ඇඟිල්ලට අරගෙන මගේ නහයෙ මැද්දෙන් තිබ්බා.. මම කට ඇදකරගෙනම හිටියා.. එයාම මාව සෝදවලා ටවල් එකකුත් ඇඟට දාලා අලුත් ඇඳුමක් හොයද්දි.. මට අර සෙනුක කියන මගේ යාළු හල්ලව මරාගෙන කන්න හිතුණා.. මේ පගා මගේ උඩ ඇඳුම් ටික උස්සලා යට ඇඳුම් ටික විතරක් දාලා බෑග් එක හදලා කාමරෙන් තියලා තියෙන්නෙ.. ඉඳපන් පුතේ උඹත් බඳිනවනෙ..

අන්තිමට මම රධ්‍ය අයියගෙ, සුදුපාට මට වඩා දහගුණයක් විතර විසාල අත් දිග ශර්ට් එකක් ඇඳගෙන ඒකට කොට කලිසමක් ගහගෙන උදේ කෑම කෑවා.. එළියෙ බැල්කනි එකේ.. එතකල් රූම් ස'විස් එකෙන් ඇවිත් කාමරේ අස් කළා.. මම එළියෙ හුළඟට ඇස් දෙක පොඩි කරගෙන කෑම කාලා ඉවරවෙලා රධ්‍ය අයියත් එක්ක ආයෙම ඇඳට ගියා.. එයා මට පේන්කිලර්ස් දෙකකුත් දීලා නිදාගන්නකල් තුරුල් කරගෙන හිටියා.. ඇඟට කොච්චරක් රිදුණත්.. එයා ළඟින්ම ඉන්න නිසා මට ආස හිතුණා.. මම රධ්‍ය අයියගෙ අත් දෙක අස්සට රිංගගෙන ඇස් දෙක ගාවටම අලුත් රෝසපාට බ්ලැන්කට් එක ඇදගත්තා.. රධ්‍ය අයියා මගේ පිට අතගෑවා.. සැරින් සැරේට මගේ නළලට හාදු දෙනවා.. ඒ හැම එකක්ම හැබැහින් විඳගන්න ආස නිසා මම ඇස් ඇරගෙනම හිටියා.. එයාගෙ ඇස් දිලිසෙද්දි හරි ලස්සනයි.. මම කොච්චර බැලුවත් එපා වෙන්නෙ නෑ.. රධ්‍ය අයියා මගේ ඇස් දිහාම බලාගෙන ඉද්දි මගේ කම්මුල් ආයෙම රතු වුණා.. එයා මගේ කම්මුලක් දිගේ හිමිහිට ඇඟිල්ලක් ඇදගෙන යද්දි මම ඉස්සරහට නැමිලා එයාගෙ තොල් වලින් හාද්දක් තිව්වා..

" දැන් ඇඟට අමාරු නැද්ද.."

" නෑ.."

රධ්‍ය අයියා මාව තව ටිකක් තුරුල් කරගත්තා. එයාගෙ ඇඟ හීටරයක් වගේ උණුම උණුයි.. ඒ රස්නෙ මගේ ඇඟත් වහගන්න තරමට තියනවා.. මම එයාගෙ අත් අස්සෙ තව ගුලි වුණා.. ඇඟට දැනෙන රස්නෙටයි, හිතට දැනෙන ප්‍රොටෙක්ටිව් ෆීලින් එකටයි, බෙහෙත් වලටයි ආයෙම මගේ ඇස් පියවේගෙන එනවා මට දැනුණා.. රධ්‍ය අයියා මගේ කොන්ඩෙ පිටිපස්සට කල්ලා නලලට තොල් තියාගෙන හිටියා.. එයා මෙච්චරක් ආදරේ කරන්න

@Shan

කොහෙන් ඉගෙනගත්තද මම දන්නෙ නෑ.. මම එයාගෙම වුණාට පස්සෙ එයා තව තව මගේ හිත පිරිලා යන්නම ආදරේ දෙද්දි.. ඇත්තමයි.. මගේ පිරිමි හිතත් සෑහෙන්න ඒ ආදරේට ලෝබකමේ බැඳුණා..

සිය දහස්වෙනි සැරේටත් මම හිතනවා.. මගේ ජීවිතේම දෝතින් මේ මනුස්සයගෙ අතට දුන්නත්.. දෙපාරක් නොහිතා.. එයා ඒක පරිස්සමට බලාගන්නවා.. අදින් පස්සෙ හැමදාම එයාගෙ එහාපැත්තෙන් ඇහැරෙන්න පුළුවන් කියන හැඟීම.. හැමදේම එයා එක්ක බෙදාගන්න පුළුවන් කියන හැඟීම.. මගේ හිතට තදින්ම කාවැදුණා.. මට අපි දෙන්නම එකට ගතකරපු පළවෙනි රෑම ලස්සන මතකයක් වුණා.. එයාටත් එහෙමයි කියලා මම හිතනවා.. කොහොම වුණත්..

මම එයාට මුළු හදවතින්ම ආදරේ කරනවා වගේම.. ඒක ගැන කවමදාවත් පසුතැවිල්ලක් ඇතිවෙලා නෑ.. හැමදාම එයා මගේ ජීවන සහකාරයා විදියට මගේ එහාපැත්තෙන් ඉඳීවි.. ඒකම මට හයියක් නෙමෙයිද..??



සිවිලිමේ කලවැද්දා රීස් බැක්..

හායිම් ළමයිනේ.. කෝමතේ.. තරුත් බැලුවා ඉමිතිම..

එන්නාම්.. ලව් යූ.. ❤



බෙලි වේන් දාන කොල්ලො ලස්සනයි අනේ..



ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම් යම් කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

@Shan

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 173 කොටස

" ආ සනෙරු මලේෂ්.. මල් කඩනවා වගේ.."

" අනේ ඉස්සරහ බලාගෙන පලයන්.. පකයා.. ඉදපන් මම උඹව අල්ලගන්නම් පස්සෙ වෙලාවක.."

මම කකුලෙ තිබ්බ මෙස් එක රෝල් කල්ලා සෙනුකයගෙ මූණට දමලා ගැහුවම ඌ ඒක අරගෙන උඩ කොක්කකින් එල්ලුවා.. හැමතැනටම ජේන්න.. අපි හිටියෙ ෆ්ලයිට් එකේ.. ආයෙම ලංකාවට එන ගමන්.. ලොස් ඇන්ජලිස් වල ඉඳලා ලංකාවට පැය දහනමයක් විස්සක් විතර යනවා.. රඩ්‍ය අයියට වැඩට යන්න තියන නිසයි.. ආයෙම ඉතින් බැඳලා එහේ ගෙවල් අරගෙන ඉන්න එකේ තේරුමක් නැති නිසයි අපි පහුවදා ලංකාවට එන්න ප්ලෑන් කරගෙන හිටියේ.. ඒකත් ආතල් වැඩේ වෙඩිමට ආපු උන්ම බාගෙට බාගයක් එකම ෆ්ලයිට් එකේ ඉන්නවා.. මම නම් කියන්නෙ කරුමය හොඳම යාළුවා ලෙසද පැමිණෙන්න පුළුවන්.. ඒකනෙ හරියටම වාසනාවට සෙනුකයයි අයුක අයියයි අපේ ඉස්සරහම ඉඳගත්තේ.. ආඩ්‍ය අයියා වගේ ඉඳගත්තනම් එහෙම කොච්චර ශෝක් ද.. මට එක්කො මාමව අපේ මනුස්සයා ගාවට දාලා ආඩ්‍ය අයියා ගාවින් ඉඳගෙන යන්න තියෙන්නෙ.. ඒත්.. බැනෙ.. ආඩ්‍ය අයියගෙ දරු පව්ලම ඉන්නවනෙ.. අර පොඩි යක්කු දෙන්නා මාව දැක්ක ගමන් තුති තාත්තී ගාගෙන ඇඟ දිගේ නගිනවා.. මගේ ඇහේ අමාරු එතකොට දෙගුණ තෙගුණ වෙලා.. මාව මැරිලා ගියොත් මගේ මනුස්සයා පව්නෙ..

මම හුඩ් එකේ හෙඩ් කවර් එක ඔලුවට දාගෙන දෙපැත්තෙ පටි දෙකෙන් ඇද්දහම ඒක මගේ මූණට තද වුණා..

" වත්සල් එක විදියක ඉන්නකො.."

" මොකද ඔවා කෑගහන්නෙ නිකම්.. අනිනවා හරිද බෙහෙතක් කලන්තෙ දාලා වැටෙන්න.."

අයුක අයියා තව ටිකක් උගේ  සීට් එකේ කොනට වෙලා වාඩිවුණාම සෙනුකයා ගිහින් අයියගෙ අතක් බදාගත්තා.. මම මගේ කකුල් දෙකෙන් එකක් සීට් එක උඩට අරගෙන උකුලෙ තිබ්බ කොට්ටෙ බදාගත්තා.. තව

@Shan

පැය දහයක් යන්න එපැයි.. ඇයි ඇයි ලෝකෙ මෙච්චර ලොකු වෙලා මම ෆ්ලයිට් එකක දවසක්ම උඩ බලාගෙන ඉන්නෙ.. ටිකකින් රඩ්‍ය අයියා ඇඳුම් මාරු කරගෙන අවිවත් ඇවිත් මං ගාවින් ඉඳගත්තා.. සෙනුකයා මේ නට නට ඉඳලා මේ විනාඩියට කටත් ඇරගෙන නිදි.. අයුක අයියා ස්ක්‍රීන් එකේ කාටූන් එකක් දාගෙන ඒක බලනවා..

" රතු තුතුළා හායි.."

අවී රඩ්‍ය අයියගෙ අතේ ඉඳලා මගේ අතට පැන්නා.. මම එයාව උකුළෙන් තියාගත්තා..

" හායි හායි.. මම හිතුවෙ දොයි කියලනෙ.."

" දොයියන්න තමා ඔකු තාතියි, තුති තාත්තියි ගාවට ආවෙ.."

අවී මගේ බෙල්ල බදාගෙන පපුවෙන් ඔලුව තියාගත්තම මම එයාව මගේ උකුළෙන් හරියට ඉන්දවගෙන ඉස්සරහා නමලා තිබ්බ බ්ලැන්කට් එක අරගෙන එයාගෙ ඇඟට දැම්මා.. එතකොට අවී බෝලයක් වගේ.. ඒකා ගෙදරදීත් හැමතිස්සෙම නිදාගන්න හොයන්නෙ මං ගාව.. ආරුත් එහෙමයි.. සමහර දවස්වලට අයියලා නැතුව මුළු රෑම මගේ ගාව නිදාගන්න වෙලාවලුත් තියනවා.. ඒ දෙන්නට හරි ආදරේ හිතෙනවා අප්පා.. රඩ්‍ය අයියත් ආරුටයි අවීටයි හරිම ආදරෙයි.. හරියට අපි දෙන්නම හදන ලමයි දෙන්නෙක් වගේ..

ටික වෙලාවක් අවී හතරවටේ බල බල ඉඳලා එහෙමම නිදාගත්තා.. මම එයාව හරහට තියාගෙන කොට්ටයක් ඔලුවෙන් තියලා ලේසි විදියට තුරුල් කරගත්තහම රඩ්‍ය අයියා අවීගෙ ගැලව්ලා තියන මේස් දෙක හරියට ඇන්දුවා..

" ඔයා ආයෙම වැඩට යන්නෙ කවද්ද.."

" මෙ සතිය අන්තිමෙ ඔෆිස් යන්න ඕන වරද්.. තව පොඩි වැඩ වගයක් තියනවා කරගන්න.."

" ආ.. ඈ..?? පොඩ්ඩක් ඉන්න.. දැන් අපි මෙ ගෙදර කියලා කොහෙද යන්නෙ ඒයි.."

@Shan

රද්‍ය අයියා හිනාවුණා.. හිනාවෙන්න නෙමෙ අඩන්න දෙන්න තියෙන්නෙ.. ගැටපොලොස් කොට්ටෝරුවා මේ දවස් දෙක අහිංසක මාව මරාගෙන කාලා.. ඇඳුමක් ඇඳාන්නත් බෑ.. ඇඟ පුරාම රතු පාටට බතික් කල්ලා වගේ.. ඉදපන් දවසක නිර්වින්දනය කල්ලා මම මූට තරු පෙන්නනවා.. මටත් හොඳ වැඩේ ඉලගෙන කන යනවට.. ආච්චිඅම්මට කියනවා මම ගියාම.. මුණුබුරා ඉන්න දෙන්නෙ නෑ කියලා..

" කියනවකො.. කොහෙද අපි යන්නෙ.."

" අපේ ගෙදර.. වෙන කොහෙ යන්නද.."

" ඉතින් අපේ ගෙදර කියන්නෙ කොහේ ගෙදරද.. කොට්ටාවෙද.."

" නෑ අනුරාධපුරේ.. එහේ හොඳ නැද්ද වරද්.. අලිත් ඉන්නවා.. උදේට ඔයාට ඉස්සරහා දොර ඇරලා අලි හුරතල් කරන්න පුළුවන්.."

" ගෙදර අලි තියාගෙන පිට අලි හුරතල් කරන්න පිස්සුද සුදුඅම්මියො.."

මම රද්‍ය අයියගෙ බෙල්ල පහුරුගාලා එතන රතුපාට ඉරි තුනක් හැදුවා.. රද්‍ය අයියා මගේ අත අරගෙන තද කල්ලා තියාගත්තා..

" පහුරුගාන්න එපා බං බළලෙක් වගේ.. මටත් උණ ගන්නවා.."

රද්‍ය අයියා මහ කුප්ප හිනාවක් දාගෙන ආයෙම මගේ දිහා බැලුවම මම අහක බලාගෙන හිටියා..

" ඒව් වරද්.. මට තරු පෙන්නන්න නේද ක-"

" අනේ මේ තව්සෙ කටවහගත්තෙ නැත්නම් මම මේ සෙරෙප්පුව බොගෙ කටේ ඔබනවා දැනගනින්.. රෙද්ද.."

" අනේ උඹෙ කට විතරයි.."

" මොකක්ද තව්සෙ කියන්නෙ.."

මම කකුලෙ තිබ්බ සෙරෙප්පුව උස්සලා රද්‍ය අයියට දෙකතුනක් අනින්න ගියා විතරයි අයුක අයියා මූණ ඉස්කුරුප්පුවක් කරගෙන පිටිපස්ස හැරුණා..

@Shan

සෙනුකයා කෙල පෙර පෙර බහිරවයා වගේ අයුක අයියගෙ ඇහේ දපලා නිදි..

" උඹලා දෙන්නා ගෙවල් වල ගිහින් රණ්ඩු වෙයන්.. මට බැට්මෑන් බලන්න දීලා.. කුලල් කනවා ඉවරයක් නෑ.. තොපි හොර බලල්ලුද.."

මම බළලෙන් නෙමේ මල්ලි..

" මම තමයි බැට්මෑන්.. මේ ඉන්නෙ සුපර්මෑන්.. අයියගෙ ඔය එහාපැත්තෙ ඉන්නෙ කව්ද දන්නවද.. ඒ ඇවිල්ලා කැප්ටන් ඇමරිකා.. සෝක් නේ.. අයියා කව්ද.. වොන්ඩර් වුමන්ද.."

අයුක අයියා මට දෙකක් රැව්වහම රධ්‍ය අයියා කටවහගත්තා.. පපුව පොඩ්ඩක් ආවනම් ඒ වගේ තමා.. සෙනුකයට කියන්න ඕන හදලා ගනින් කියලා..

" මුගෙ කට.."

අයුක අයියා ඉස්සරහා බලාගත්තා.. පොඩි මස්සිනාට ඉතින් ඉදලා හිටලා විහිළුවක් කල්ලා පිටට තට්ටුවක් දාගෙන ගියාට.. මම ආදරෙයිනෙ ලාවට.. ආදරේ කරන්නම බඩ්ඩ හැබැයි.. ඌ මහ චීත්ත ලයින් දෙද්දි තමයි මල පනින්නෙ.. මම රධ්‍ය අයියගෙ අතකට ගේත්තුවක් දාගත්තා.. ඇයි මම හිත රිදුනහම අඳින ඇඳුමක් ෆ්ලයිට් එකට ඇඳගෙන ආවෙ.. මගේ හිත රිදිලා නෙමෙයිනෙ.. මම හිත රිදුනහම ඇඟට වඩා හෙන ලොකු ඇඳුම් හොයාගෙන ඇඳගෙන ඉන්නවා.. නෑ මගේ ඇඟ රිදෙනවා.. මේ මිනිහට කන්න දෙන්න හොඳ නෑ ලොකුවට.. නැත්නම් මම කවදහරි යටවෙලා මැරෙයිනෙ.. ස්වාමිපුරුශයාට යට වුණු ප්‍රසිද්ධ ක්‍රීඩක ෂනෙරු උද්යෝග හුස්ම හිරවී.. මුගෙ ආච්චිට..

" අයියෙ..!!"

" මම.."

මම රධ්‍ය අයියගෙ අත අරගෙන එහාට දැම්මා.. එනවා මෙතන අරහෙන් මෙහෙන් අල්ලන්න..

" පාඩුවෙ ඉන්නවකො.."

@Shan

"....."

රධ්‍ය අයියා මගෙ හුඩී එක අස්සෙ අතක් දාගත්තහම මට තරු පෙනුණා.. දෙයියනේ දැන් හැමතිස්සෙම තරු පෙනුණ ගමන්මයි ඉන්නෙ.. වරදයා.. උඹ කට වරද්දගත්තු නිසා තමයි මේ සේරම.. ඇඳුම ගැවුණත් මගේ ඇඟ රිදෙනවා.. ආව්ච්අම්මෙ!!!! අන්තිමට නිකම් බොරුවට කතාකල්ලා වැඩක් නැති නිසා මම අවිගෙ ඇහේ තිබ්බ බ්ලැන්කට් එක මගේ ඇඟටත් පොරවගෙන ඒකව වලස් පැටියා වගේ තුරුල් කරගෙන හොඳට නිදාගත්තා.. රධ්‍ය අයියත් මට හේත්තුවක් දාගෙන නිදාගත්තා..

අපි ලංකාවට එනකොට රෑ අටට විතර ඇති.. හොඳටම කළුවර වෙලා.. හුඟක් වෙලා එකම විදියට ඇවිත් මගේ ඇඟත් හිරි වැටිලා නැගිටගන්න හෙන ගේමක් දෙන්න වුණා.. ඒ වුණාට මම කොහොම හරි ක්‍රව් එකකට වාරු වෙලා නැගිටගත්තා.. රධ්‍ය අයියා අවීව වඩාගෙන ගිහින් මාමට දුන්නා.. ඒකා මුළු වෙලාවෙම කියව කියව අපි දෙන්නා ගාව තමයි හිටියෙ.. දහපාරක් විතර මාරුවෙන් මාරුවට අපි දෙන්නා ගාව නිදාගත්තා.. අපිට කියලා කෑම කවාගත්තා.. කොහොම හරි එයාපෝට් එකෙන් එළියට ආවහම ආධ්‍ය අයියලා පේන්න හිටියෙ නෑ.. රධ්‍ය අයියා අපේ ලැගේජ් දෙකයි අනිත් බෑග් ටිකයි අරගෙන එළියට ඇවිත් කාටහරි කෝල් කරනවා ඇහුණා.. මම මොකුත් දන්නෙ නෑනෙ.. ඒකා මට කියන්නෙත් නෑ.. මම තඩි කහපාට ස්වෙට් පැන්ට් එකකුයි.. තඩි තාරා මූණක් තියන ඒකටම ගැළපෙන හුඩී එකකුයි ඇඳගෙන.. සැකේ.. මේ මිනිහගෙ තාරා පිස්සුව නිසා මම ඇත්තටම තාරාවෙක් වෙලා නවතීද දන්නෑ.. කහපාට අඳින එක නතර කරගන්න ඕන.. දැන් ඇවිදින්න වෙලා තියෙන්නෙ හෙන තාරා ලයින් එකකටනෙ..

" There is a little surprise for you.."

රධ්‍ය අයියා මගේ කර වටේ අතක් යවලා මාව එයාගෙ ඇඟට තුරුල් කරගෙන කම්මුලෙන් හාද්දක් තිබ්බා.. අපි වටේ යන සමහරු අපි දෙන්නා දිහා පුදුමෙන් හැරි හැරි බලනවා මම දැක්කා.. දැන් ඉන්නෙ කැලිෆෝනියාවෙ නෙමෙයිනෙ.. මේ ලංකාවනෙ.. නොබැලුවොත් තමයි පුදුම වෙන්න ඕන.. ටිකකින් කාර් එකක් ඇවිත් අපි ඉස්සරහින් නැවැත්තුවා.. මම එහෙමම ඉද්දි ඒකෙන් බැහැලා ආපු පිරිමි ළමයෙක් අපේ ලැගේජ් ටික කාර් එකට දාලා රධ්‍ය අයියට කී එක දීලා යන්න ගියා..

@Shan

" ඒ කවද.."

" කියාන්ලගෙ ගෙදර සර්වන්ට් කෙනෙක්.."

රධ්‍ය අයියා කාර් එකේ ඉස්සරහා දොර ඇරලා මම ඉඳගත්තම දොර වහලා ඇවිත් අනිත් පැත්තෙන් නැග්ගා.. හුඟ කාලෙකින් මම ආයෙම ලංකාවෙ ඉන්නවා.. එකපාරට එහේ ඉඳලා මෙහේ එළියට ආවහම ක්ලයිමේට් එක වෙනස් නිසා ඇඟට මහන්සී වගේ දැනෙනවා.. ඒ වුණාට මෙහෙට නම් අවුරුද්දෙ අන්තිමට වහිනවා.. අපි එනකොටත් වැහැලා වගේ හැම තැනටම..

" ඔයාට අවුරුදු හයකට විතර පස්සෙ මෙහෙට එද්දි මොනවද හිතුණෙ.."

රධ්‍ය අයියා ටිකක් වෙලා ඉස්සරහා බලාගෙන හුඟක් දේවල් මතක් කරනවා වගේ මට පෙණුනා.. ටිකකින් එයා මගේ උකුළ උඩ තියන අතක එයාගෙ ඇඟිලි පටලගත්තා..

" ඔයාව මතක් වුණා.. අන්තිම පාරට මෙහෙන් යද්දි වෙච්ච දේවල්.."

මට ඒ එක්කම හදිසියෙම අප්පච්චිව මතක් වුණා.. ඇත්තටම පවුලෙ හැමෝම හැසිරෙන්නෙ එහෙම කෙනෙක් පවුලෙ නොහිටි ගාණට.. එයා කරපු කියපු දේවල් වලට සමහරවිට දඬුවම ඒක වෙන්න ඇති.. කමක් නෑ ටික කාලෙකින් මම එයාව හැමදාම දකීවිනෙ.. අඩුම තරමෙ රධ්‍ය අයියා දැන් නමෙ අධිකාරි කියන කෑල්ලවත් පාවිච්චි කරන්නෙ නෑ.. පුදුම වෛරෙකින් ජීවත් වෙනවද.. නැත්නම් එයා ඉන්නෙ ලොකු කලකිරීමකින්ද කොහෙද.. රධ්‍ය අයියා කාටවත් වෛර කර කර ඉන්න මනුස්සයෙක් නෙමෙනෙ.. අවුරුදු ගාණක් එකතු කරපු කලකිරීම, එයාගෙ හිතේ ඒ අප්පච්චි ගැන තියන පැහැදීම ආදරේ මරලම දාලා.. මම හිතන්නෙ නෑ ඒකට ආයෙ පණ ගහවි කියලා.. මම ඒකට බල කරන්නෙ නෑ.. අප්පච්චි ගැන හොයලා බලන්න කියලා.. අඩුම අපි ඒක ගැන කතාකරන්නෙවත් නෑ.. එයා කැමති නෑ කියලා තේරෙනවා..

ආයෙම ලොකු අවුරුදු ගාණකට පස්සෙ අපි හැමෝම ලංකාවෙ ඉන්නවා.. අසලි අම්මා.. ආධ්‍ය අයියා.. මාමා..යාළුවො හැමෝම.. හිතට හරි නිදහසක් දැනෙනවා..

@Shan

මම ඇඳිලා ගිහින් රධා අයියගෙ කම්මුළුන් හාද්දක් තිබ්බහම එයා ලාවට හිනාවුණා.. මට මතකයි එයා දවසක් කිව්වා ආයෙම මගේ ජීවිතේ ඕනම කාලෙදි එයා මගේ ගාවින් ඉන්නවා කියලා.. ඇත්තටම පහුගිය කාලෙට වඩා දැන් මට එයාව හුඟක් ඕන කියලා හිතනව.. හැමෝම ඉස්සරහට යද්දි.. මම එකතැන නතරවෙලා වගේ දැනුණ හැඟීම ආයෙම දැනෙන එකක් නෑ..

හුඟ වෙලාවකට පස්සෙ මට එහෙමම නින්ද ගියා.. ආයෙම ඇහැරෙද්දි හිටියෙ ගෙදරක් ඉස්සරහා.. ලොකු ගෙදරක්.. මාව කරකලා අතෑරියා වගේ.. ඉන්නෙ කොහෙද කියලත් හරියට නිච්චියක් නෑ.. මේ අනුරාධපුරේ නෙමෙනෙ.. නෑ නෑ..!! රධා අයියා වටෙන් ඇවිත් මගේ පැත්තෙ දොර ඇරලා මට නැගිටින්න අත දුන්නා.. මම එයාගෙ අත අල්ලගෙන නැගිටලා එහෙමම කාර් එකට හේත්තු වුණා..

" අපි කොහෙද මේ ඉන්නෙ..??"

**" අපේ ගෙදර.."**

**" අපේ ගෙදර..??"**

මම පුදුම වෙලා බලාගෙන හිටියා.. මෙච්චර විසාල ගෙයක් අපේ ගෙදරද.. මෙහෙම පුදුම වෙලා ගිහින් මාව මැරෙයිදෝ දැන් හිතෙනවා.. රධා අයියා මගේ අතින් කී එකක් තිබ්බා.. මම ඒක අතකින් අල්ලගෙන එයා දිහා බලාගෙන ඉද්දි එයා නැමිලා මගේ තොල් වලින් හාද්දක් තිබ්බා..

" ඔයාගෙ ලොකු බැල්කනි එකක් තියන ඩ්‍රීම් හවුස් එක.."

මගේ ඇස් වල ආයෙම කඳුළු පිරුණා.. මොන මගුලක්ද මේ.. හැමතිස්සෙම ඇඬෙනවා.. ඇයි හැමදේම එයා මතක තියාගෙන ඉන්නෙ.. එහෙම කරද්දි.. මට මාව හුඟක් පොඩියට දැනෙනවා.. රධා අයියා මට හග් එකක් දුන්නා..

" යමු.."

" ඔයා මේ කරන දේවල් ඕනවත් වැඩිනෙ අයියෙ.."

" මට ආදරේ කරන්න ඉන්නෙ එක මනුස්සයනෙ වරද්.. එයා වෙනුවෙන් මම හැමදේම කරනවා.."

@Shan

මම රධ්‍ය අයියගෙ කම්මුලකින් අත තියාගත්තම එයා ආදරේ පිරිච්ච ඇස් දෙකකින් මගේ දිහා බලාගෙන හිටියා.. පොඩි දේවල් වලින් සතුටුවෙච්ච මනුස්සයෙක් වෙච්ච මට.. මේ දේවල් දරාගන්න බැරි තරම්..

මම ගෙදර දොරේ යතුර අල්ලගෙන කී හෝල් එකට දාලා වටයක් කැරකුවහම දොර ඇරුණා.. ඒ එක්කම ගෙදර ඉස්සරහ පැසේජ් එකේ ලයිට්ස් ඕන් වුනා.. මගේ ඇස් දෙක අදහගන්න බැරි තරමට ලොකු වුණා.. මගෙ දෙයියනේ!!!

" මේක.!!"

" ඔයා කැමතිද.."

රධ්‍ය අයියා පොඩි ළමයෙක් වගේ අහද්දි මම එයා දිහා බලාගෙන ඔලුව වැනුවා.. කතා කරගන්නවත් බැරි තරමට.. මම හිටියෙ පුදුම වෙලා.. ඇත්තටම ඒක හරි ලස්සන 'ගෙදරක්'.. හුඟක් ලස්සනයි.. යන තැනම පහළට පඩි පහ හයක් බැස්සහම ගෙදර සාලෙ තිබුණා.. ඒ එක්කම ඕපන් කිචන් එකක්.. පැත්තකින් වින්ඩෝ බෙඩ් එකක්.. ස්වින්ග් චෙයාර්ස්.. ලොකු සෝෆා දෙකක් එක්ක බිමට බූල් කාපට්ස්.. මම හිතේ මවාගෙන ඉදපු ඩ්‍රීම් හවුස් එක මගේ ඇස් ඉස්සරහම තිබුණා.. ගෙදර තැනින් තැන අපේ ෆොටෝස් එල්ලලා තිබුණා.. ලස්සන ඔයිල් පේන්ටින්ස්.. මැක්‍රම්.. මුළු ගෙදරම ඇත් දල පාට ගාලා.. බිමටත් ඒ පාටම.. ගෙදර වටේට බෝඩර් එකක් වගේ කළු පාට ටයිල් එකක් ගිහින් තියනවා.. ගෙදර මැද්දෙ තියන ලොකු Ceiling Light එක..!

මම රධ්‍ය අයියා දිහා බලද්දි එයා සාක්කුවට අත් දෙකත් දාගෙන බලාගෙන ඉන්නවා.. අලුත්ම අලුත් ගෙදරක්.. ඇත්තටම ඒක ගෙදරක් කියලා දැනෙනවා.. රධ්‍ය අයියා කොහේ හිටියත් මට ඒක ගෙදරක් වගේ තමා..

" ඔයා මාසෙට මෙච්චර ඒවා කලාද.."

මම පඩිපෙල බැහැලා ගිහින් සෝෆා එකෙන් ඉදගත්තම රධ්‍ය අයියා මං ගාවින් වාඩිවුණා..

" මේක හදපු ගෙදරක්.. මම අරගෙන අලුත් කළා විතරයි.. උඩ තට්ටුව ප්ලෑන් කළේ මම.. පහළ පැසේජ් එක ටිකක් වෙනස් කළා.. එච්චරයි..

@Shan

" ඔයා මාරයිනෙ අනේ.. මේ කාලෙ හැටියට මෙහෙම එකක් හදනවා කියන්නෙ.. අම්මෝ.."

" මම්.. එකසැරේ කන්ට්‍රැක් දුන්නහම ඉක්මනට වැඩ ටික ඉවරකරගත්තා.. තව පොඩි බැන්ක් ලෝන් එකක් දැම්මා.. වෙඩින් එකටත් ගාණක් ගියානෙ.."

" අපි ඒක සෙටල් කරමු.."

මම රධ්‍ය අයියට තුරුල් වුණා.. මම පොඩිකාලෙදි ආදරේ කරපු කෙනාම කොච්චර ලොකු වෙලාද.. හිතන්න අරගෙනද.. මට තාම හිතාගන්න බෑ.. මේවා ඇත්තට වෙන දේවල්ද කියලා..

" අපි උඩට යමු.."

" යමු.."

මම ආයෙම උඩට තියන පඩි හතර නැගලා උඩට එද්දි පැත්තකින් පොඩි කාමරේක ලයිබ්‍රි එකක් දගේ හදලා තියෙනවා දැක්කා.. එයාගෙ කලින් ගෙදර තිබ්බ පොත්ම රාක්ක ගණනක් තිබුණනෙ.. මගේ පරණ ගෙදර තියන බඩුත් මෙහේ තියනවා..

" ඔයා මම හිටිය ගෙදරට ගියාද.."

" මම්.. ඒකෙ කී එක ආයෙම බාරදුන්නා.."

උඩ තට්ටුවට යන්න තියන පඩිපෙළ ගාව ඉඳගෙන මම පඩිපෙළ දිගට එල්ලලා තියන ෆොටෝ දිහා බලාගෙන හිටියා.. ඇත්තටම එයා ලස්සනට ගෙදර ප්ලෑන් කල්ලා.. 'මම ඔයාට ආදරෙයි.. එච්චරයි..' කියන වචන පොඩ්ඩ අතුළෙ මෙච්චරක් දේවල් තියනවා කියලා මට හිතුනෙ නෑ.. එයා මට ඒ දවස්වල නොකියපු, මමත් ඉන්න හීනෙ මේක වෙන්න ඇති.. වැඩට ගිහින් 'හවස' ගෙදර එන්න.. මම හදන කෑම කන්න.. ඉඳලා හිටලා අපි කතාවෙද්දි, අපි ඉස්සරහට වෙන දේවල් කතාකලත්.. ඒ කාලෙ වාතාවරණෙ එක්ක ඒවා අපේ විසාල හීන වෙලා තිබුණෙ.. අද වෙද්දි හැම එකම හැබැවෙගෙන යනවා.. ඉතින් පහුගිය කාලෙම කොච්චර වේදනාවක් දරාගත්තත්.. අන්තිමේදි අවසානෙ අපි සතුටින් හිටියා.. සතුටින් ඉන්නවා..

@Shan

මම මුලින්ම තිබ්බ ෆොටෝ එක දිහා බලාගෙන හිටියා.. මේකෙ මොකක් හරි තේරුමක් තියේද.. ඒකෙ හිටියෙ අපි දෙන්නා ස්පෝර්ට්ස්මීට් එකේදි එතන තිබ්බ ෆොටෝ බූත් එකේදි කරට අත දාගෙන ගත්තු ෆොටෝ එකක්.. ඒ කාලෙ ඉඳලා ගත්තු අපේ ෆොටෝ හුඟාක් තිබුණා.. මෙහෙම එකක් මගේ ගාව තිබුණෙ නෑ.. එයා තනි සුදු බ්ලේසර් එකක් ඇඳලා.. මම නිල්-කහ ඉරි තියන බ්ලේසර් එකක් ඇඳලා.. කරට අත දාගෙන හිනාවෙගෙන ඉන්නවා.. ඊළඟ පඩි දෙක තුන නැග්ගහම අපි දෙන්නා කලර්ස් නයිට් එකේදි අම්මලා දෙන්නත් එක්ක ගහපු ෆොටෝ එකක් තිබුණා.. ඒ කාලෙ අසලි අම්මා හිටියෙ කොණ්ඩෙ කපලනෙ.. මම අම්මව දැක්ක මුල්ම දවස.. අපේ අම්මා අර කහපාට ඔසරිය ඇඳලා.. අහ්.. එදානෙ මගේ එක්සෑම් ඉවරවුණේ.. එදා රෑනෙ මේ මනුස්සයා පෙරුම් පුරාගෙන ඉඳලා මගේ පලවෙනි කිස් එක දුන්නෙ.. එකදිගට මම හුඟක් ඈත කාලෙකට ඇදිලා ගියා.. රධ්‍ය අයියත් ඒ ෆොටෝ එක දිහා බලාගෙන ඉඳලා ලාවට හිනාවුණා..

" හුඟ කාලයක් නේද.."

" ම්ම්.."

ඊළඟට තිබුනෙ අපි ට්‍රිප් එක ගිහින් අර ආශි ගත්තු ෆොටෝ එක.. ඒකනම් සිරාම රන්ඩම් ශොට් එකක් තමා.. ආයෙම අපි දෙන්නගෙන ග්‍රැජුවේශන් ෆොටෝස් දෙක තිබුණා.. තව උඩට හුඟක් ඉඩ තියනවා..

" අපි මෙතන වෙඩින් ශූට් එකේ එකක් එල්ලමු.."

" ම්ම්.."

" එතකොට අතන පලවෙනි බබාගෙ එකක් එල්ලමු.. ආයෙ අතන දෙවෙනි බබගෙයි.. අතන තුන්වෙනි බබාගෙයි.. තව ෆැමිලි ෆොටෝ එකකුයි.. ශෝයි නේද.."

රධ්‍ය අයියා ලාවට හිනාවුණා.. බබාලා ගැන කිව්වත් එයාගෙ ඇස් දිලිසෙනවා.. කොහොමත් අපේ නැන්දම්මලා දෙන්නා ඊළඟට මුණුබුරෝ ගේන්න කියලා භීශනයක් පටන්ගන්න හදන්නෙ.. බඳිනකල්ම බැඳපාන් ගගා කෑගැහුවා.. දැන් මේක..

මම උඩතට්ටුවට නැගගෙන ගිහින් මුලින්ම තිබුණු කාමරේ ඇරියා.. ඒක ලොකු කාමරයක්.. ලොකු ඔයිල් පේන්ටින් එකක් සම්පූර්න බිත්තියක්

@Shan

වැහෙන්න ඇඳලා තිබුණා.. ඒක මෙහාට කළාම තමයි ක්ලෝසෙට් එක තිබුණේ.. ක්ලෝසෙට් එක ඇතුළට ගියාම පැති දෙකක ඇඳුම් තියලා මැද්දෙ ලොකු කණ්ණාඩියක් තියනවා.. ආයෙම එළියෙ බැල්කනි එකක් තියනවා.. බැල්කනි එක හෙන හුරුපුරුදු නිසා මම හිමින්සැරේ එතනට ගිහින් දොර ඇරලා එළියට මූණ දැම්මහම රධ්‍ය අයියා හෙන හයියෙන් හිනාවුනා.. මගේ ඇස් දෙක ලොකු වුණා..

යකඩෝ අල්ලපුගෙදර ගෝනිබිල්ලා මේ මනුස්සයද..!!??

" අයියෙ..!!"

" මම හිතුවෙ හෙට එළිවෙලාම ඕක අහවි කියලා.."

මට බැල්කනි එකෙන් ආධ්‍ය අයියලගෙ මම හැමදාම ටවල් එක වනන තැන පේනවා.. අඹගහත් එක්ක.. එහේ ගෙදර ලයිට්ස් දාලා.. මාමලා ඇවිල්ලද කොහෙද.. සැක්..

" ඔයා කොහොමද මේකම ගත්තෙ.. තවසෙ රොස්මිඩ් වලින් ගේකුත් ගත්තද.. ඒකත් අර ගෙදරට එහා ගෙදරම.. මාර මනුස්සයෙක්නෙ.."

" මේක කොහොමත් විකුණන්න දාල තිබ්බ ගෙයක්.. මම කතාකල්ලා අරගත්තා.. මොකක්ද අර අවීට මෙහේ ගෝනිබිල්ලො ඉන්නවා කියලා එකක් කියලා තිබ්බෙ.."

" ඉතින් පාළුගෙදර ඉන්නවා තමා එහෙම උන්.. දන්නැද්ද.. ඔය කණ්ණාඩියෙන් බලනවකො හැරිලා මම කිව්වට.."

මගේ මෝඩ මනුස්සයා මෙලෝ සිහියක් නැතුව කණ්නඩිය දිහා බලලා අත කරකලා මගේ පස්සට පාරක් දුන්නා..

" උඹට මම පෙන්නන්නම් පස්සෙ පාළුගෙදර මොක්කුද ඉන්නෙ කියලා.."

" ඔඃස්ස්හ්.. ඇහුවෙ නෑනෙ.. ඉංජිනේරු මහත්තයගෙ මොලේ නරක් වෙගෙන එන්නෙ.. ආධ්‍ය අයියට කියන්නෝන ඉක්මනට.."

" ඔව් ඔව්.. අවුල් නොවුණොත් පුදුම වෙන්න දෙයක් නෑ.. උඹත් එක්කනෙ ඉන්නෙ.."

@Shan

රධ්‍ය අයියා මට හෙන පල් එකට හිනාවෙලා ක්ලෝසෙට් එක අස්සට වැදුණා.. මම එළියට ගිහින් හැමතැනම බැලුවා.. එලියෙ උඩ තට්ටුවෙ ලොකුම ලොකු බැල්කනි එකක් තියනවා.. එතෙන්ට මුළු වත්තම ලොකුවට පේනවා.. පහල තණකොල අල්ලලා ලොකු ගාඩ්න් එකක් තිබුණා.. මට එහෙමම අල්ලපු වත්තත් පෙනුණා.. දෙයියනේ මගෙ ආධ්‍ය අයියා දිහා බලාගෙන දැන් ජීවිත කාලෙම ඉන්න පුළුවන්.. ආච්චිඅම්මෙ!!

කොහොම හරි මම හැම අස්සක් මුල්ලක්ම ඇවිදලා බලලා නාගෙන පහළ කුස්සියට එද්දි රධ්‍ය අයියා කෑම වගයක් ඒකත් උස්සගෙන කුස්සියට ආවා.. මගෙ කලින් ගෙදර අඳුම් පැළඳුම් හැම එකම මෙහේ තියන නිසා හොඳයි.. ඒ අංකල්ට වෙලාවක කතාකරන්න ඕන.. පහුගිය කාලෙ වැඩ එක්ක කතාකරන්න මං ගාව නම්බර් එකක්වත් තිබ්බෙ නෑනෙ..

රධ්‍ය අයියා මං ගාවින් යනකොට මම පස්සට එකක් දුන්නා..

" මරු පස්ස ඒයි.."

" කාගෙද.. ඔයාගෙද.."

" අනේ මේ..!! බලනවකො තව්සෙට මට වගේ සෙක්සි පස්සක් නෑනෙ.. අලි ලොකුවට තිබ්බට.. ගැම්මක් නේද.."

" ඔව් ඔව්.."

මම කිව්ව අයිලන්ඩ් එකට හේත්තුවක් දාගත්තා..

" අපි අද රෑට තරු බලමුද ඒයි.."

රධ්‍ය අයියා එකසැරේට හැරිලා මගේ දිහා බැලුවා..

" අද රෑට..??"

" ඕ.. ඇයි.. අපි නිදාගන්න ඇඳ හයියට තියනවනෙ.."

" ඇඳේම බලන්න ඕන කියලා එකක් නෑනෙ වරද්.."

රධ්‍ය අයියා හෙන වල් හිනාවක් දාගෙන මයික්‍රොවේව් එක ප්ලග් කල්ලා කෑම එක ඒක ඇතුලට දාලා මගේ ගාවට ඇවිත් මගේ දෙපැත්තෙන් අත්

@Shan

දෙක තියලා මූණට එබුණා.. මමත් එයාගෙ මූණ ගාවට කිට්ටුවුණා..

" Never switching sides

Only switching angles.."

" You know what I mean.?"

එයා මගේ නිකටින් අල්ලගෙන තොල් වලින් හාද්දක් දුන්නහම මගේ අත් වල ඇඟිලි එයාගෙ පපුව දිගේ උඩට ඇදගෙන ගියා.. ආයෙම පහළට ඇදගෙන ගියා.. රධ්‍ය අයිය මාව උස්සලා කිචන් අයිලන්ඩ් එක උඩින් තියලා මගේ කකුල් දෙක මැද්දට ඇවිත් මාව කිස් කළා.. මම එයාගෙ කොන්ඩෙ අස්සෙන් ඇඟිලි යවද්දි මගේ ශර්ට් එක අස්සෙන්, එයාගෙ ගොරෝසුත් නැති සිනිදුමත් නැති අත් පපුව පුරාම දිව්වා.. මම එයාගෙ ඇඳුමෙ කර අතකට පොඩි කරගත්තහම අපි දෙන්නගෙ අතරෙ තිබ්බ ටෙන්ශන් එක සැහෙන්න වැඩිවෙලා දැනුණත්,

*beep*beep*beep*

රධ්‍ය අයියා මගේ තොල් වලින් ආයෙම පොඩි පෙක් එකක් තියලා එහාට වෙලා මයික්‍රොවේව් එකේ තිබ්බ කෑම එක අරගෙන එළියෙන් තියලා මගේ පැත්ත හැරුණා..

" After having dinner..??"

" DO ME..!! Right now.."

මම මගේ නයිට් කිට් එකේ බටන් උඩ ඉඳලා පහළට ඇරගෙන එද්දි රධ්‍ය අයියා මාව උස්සගෙන ගිහින් සෝෆා එක උඩට දැම්මා.. ස්ටූල් එක උඩ තිබ්බ රිමෝට් එකක් අරගෙන ලයිට්ස් ඩිම් කල්ලා මගේ ඇඟ උඩට ආවහම මම නයිට් කිට් එකේ උඩ කමිසෙ ගලවලා එහාට කළා.. එයා මගේ කකුලක් අරගෙන ඉණ වටේ තියාගත්තහම මම ඒ කකුලෙන්ම එයාව මගේ පැත්තට ඇදගත්තා.. එයා කලබලෙන් එයාගෙ උඩ ඇඳුම ගලවලා බිමට විසික් කල්ලා මගේ අත් දෙක එකට තියලා සෝෆා එකට තද කළා.. මගේ අනිත් ඇඳුනුත් ඇඟෙන් අයින් වෙලා පහළට වැටෙද්දි මම එයාගෙ උරහිසක් එක අතකින් තද කල්ලා අල්ලගත්තා.. රධ්‍ය අයියා මාව උස්සලා උකුළෙන් තියාගත්තම මම එයාගෙ කොණ්ඩෙන් ඇදගෙනම වේදනාව දරාගන්න

@Shan

බැරුව එහාපැත්තට නැමුණා.. මගේ ඇස් අග්ගිස්සෙන් කඳුළු බේරෙද්දි එයා මගේ මූණ එයාගෙ පැත්තට හරවගෙන මගේ ඉණ දෙපැත්තෙන් අල්ලගද්දි.. කලින් මැකුණෙ නැතුව ඉතුරු වුණු රතු පාට පැල්ලම් ආයෙම අලුත් වුණා.. මගේ ඇඟ දාඩියෙන් පෙඟෙද්දි ඔරලෝසුවෙ විනාඩි-පැය කටු වට ගණන් කැරකුනා.. අපි වටේට ඇහෙන්න තිබුණේ ගැඹුරින් හුස්ම ගන්න සද්දෙයි මගේ කෙඳිරිලියි විතරයි.. දෙවෙනි තුන්වෙනි වතාවටත් මාව එහෙමම රධ්‍ය අයියගෙ ඇඟට කඩාගෙන වැටෙද්දි එයා සෑහීමකට පත් වෙලා මගෙන් එහාට වෙලා මගේ නලලෙන් හාද්දක් තිව්වා.. මම ඇස් පියාගෙන හුස්ම අල්ලන්න ට්‍රයි කලා.. රධ්‍ය අයියා එයාගෙ ඇඟිලි, මගේ වේගෙන් උඩ පහල වෙන පපුව දිගේ ඇදගෙන ගියා..

ටික වෙලාවකට පස්සෙ එයාම මගේ නයිට් කිට් එක අන්දලා මාව උස්සලා අරගෙන කෑම මේසෙන් වාඩිකෙරෙව්වා.. මම අවුල් වෙලා තිබ්බ කොණ්ඩෙ අත් දෙකෙන්ම පිටිපස්සට කරගෙන හදාගත්තහම එයා කෑම එක ගෙනැල්ලා මං ගාවින් ඉඳගෙන මටත් කැව්වා.. එයත් කෑවා.. අපි දෙන්නම වෙනදා වගේ කියව කියව පැය ගානක් කෑම කෑමා.. සැරින් සැරේ හම්බෙන හාදු වලින්.. මම හිටියේ මත් වෙලා වගේ.. එයාගෙ හිනාවට මම වශී වෙලා වගෙ බලාගෙන හිටියා.. අන්තිමේ අපි දෙන්නම ආයෙම වොශ් දාගෙන නිදාගන්න යනකොටත් හුහක් පාන්දර වෙලා තිබුණා..

මෙක ඩබල් අප්ඩේටුවක් කියලා ගමමු ඇනේද්.. කලවැද්දට සිව්ලිම් වල බඩගාලම හම්ති..

එන්නාම.. ලව් යූ..❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

@Shan

- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..

@Shan

# 174 කොටස

" එක කෑල්ලක් දෙන්නකො වරද්.."

" මම එක්කො සේරම පැත්තකින් තියලා තව්සෙට තක්කාලි පාත්තියක් දාලා දෙන්නද.. ගොළුබෙල්ලෙක් වගේ කකා ඉන්න.."

" හා කුස්සිය පැත්තෙන් දාපන් හරිද.."

රධ්‍ය අයියා මම කප කප හිටිය තක්කාලි කෑල්ල අරගෙන කටේ දාගෙන අනිත් පැත්ත හැරිලා සුදුළුණු වගයක් තලන්න ගත්තා.. අපරාදෙ මම කතාකරන්න වැය කරන ශක්තිය..

" ඔයා එන්නෙ කීයටද ඒයි.. හුහක් හවස් වෙනවද.."

" දැන් ඔෆිස් ගිහින්.. හවස කැම්පස් එකටත් ගිහින් තමයි එන්නෙ.."

මාව එකසැරේට පිටිපස්සට විසික් වෙලා ගිහින් රධ්‍ය අයියගෙ ඇහේ වැදුණා.. කියාරා කවුන්ටර් එකට අත් දෙකත් තියාගෙන කටින් බෝඩ් එකට එබීගෙන ඉන්නවා.. අනේ ආච්චිඅම්මෙ..! තා පොඩ්ඩෙන් පපුවෙ අමාරුවක් හැදිලා මැරිලා යන්නෙ.. මේකා නිකන් මහසෝනියෙක් වගේනෙ.. මාව පිටිපස්සට විසික් වෙලා ගිය පාර රධ්‍ය අයියා මාව අල්ලගත්තා.. මහ එකා වගේ නැතෑ..

" එහෙට යන්න කියාරා.. මල යකින්නි වගේ.. මේකා හැමදාම මාව බය කරනවා උදේට ඇවිල්ලා.."

" කිරායා එන්න.."

රධ්‍ය අයියා ෆ්‍රිජ් එකෙන් කිරි බෝතලේ එළියට ගත්තහම කියාරා උඩ පැනගෙන ඒ පස්සෙන් ඇදිලා ගියා.. රෙක්සිත් එළියෙ ඉඳලා ගේ ඇතුළට ඇවිදගෙන ඇවිත් රධ්‍ය අයියගෙ ඇඟ වටේ එතෙන්න ගත්තා.. තාම උදේ හය හමාරට විතර ඇති.. රධ්‍ය අයියා උදේ අටට උෆිස් යනවා කිව්ව නිසා මම උදේ නැගිටලා කෑම හදන්න ආවා.. ඒ ගමන්ම එයත් නැගිට්ටා.. මෙහේ ගෙදරට ඇහෙනවා ආධ්‍ය අයියලගෙ ගෙදර යුද්ධෙ පටන් අරගෙන.. මාමා

@Shan

කැගහනවා.. ආධ්‍ය අයියා දෙකතුනක් බනිනවා.. ඒ අස්සෙ ආරු අඩනවා.. මම ඉතින් ඔයගෙදර ඉඳලා තියන එකා නිසා දින වයීාව හොඳට අඳුරනවා..

මුලින්ම අවදි වෙන්නෙ ආධ්‍ය අයියා.. උදේ හතර හමාරට නැගිටලා නිදිමරගාතෙ කුස්සියට යනවා.. ඊටපස්සෙ ටිකකින් මම ඉන්න දවසට මමත් අයියට උදවු කරනවා.. පහට හරියටම ආරු නැගිටිනවා.. ආරු නැගිට්ටහම ඒකට විශේශ අවධානෙ දෙන්න ඕන.. නැගිටිද්දි කවුරුහරි ළඟ ඉන්න ඕන.. නැත්නම් පැයක්වත් අඩනවා.. ඊටපස්සෙ කිරි බොනවා.. පහමාරට අවියා නැගිටලා ආධ්‍ය අයියව හොයනවා.. එතකොට මාමත් නැගිටිනවා.. ආධ්‍ය අයියා උයලා, ගෙවල් අස් කල්ලා, රෙදි සෝදලා, වනලා, එයත් නාගෙන හොස්පිටල් යන්න ලෑස්ති වෙනවා.. මාමනම් හුඟක් වෙලාවට ඉන්නෙ ගෙදර බබාලව බලාගෙන.. ඔක්කොම ලෑස්තිකල්ලා ආධ්‍ය අයියා හතට කැම්පස් එකට යනවා.. මමත් අයියා එක්කම හොස්පිටල් එකෙන් බැහැලා ක්ලිනිකල් දුවනවා.. දවසෙම මාමා තමයි බබාලා බලාගන්නෙ.. මාමගෙ ඇපොයිමන්ට්ස් තියෙන්නෙ හවස.. එතකොට අයියා ගෙදර ඇවිල්ලනෙ.. මාමා එළියට යනවා.. උදේට ඒ ගෙදර යුද්ධෙකට හපන්.. අරුන් දෙන්නා න'සරි යන්න ගත්තම අයියට තව වැඩ දෙක වෙවි.. මාමා ආච්චිඅම්මගෙ වැඩයි බබාලගෙ වැඩයි කල්ලා ආධ්‍ය අයියට උදව් වෙනවා.. මම හෙන ආසයි ඒ දෙන්නා ඇනුම් පද කිය කිය අරහෙන් මෙහෙන් රණ්ඩු වෙවී වැඩකරනවා බලන් ඉන්න.. මාමා කියනවා වගේ ආධ්‍ය අයියලව අවුස්සලා ගන්න මෙච්ච එක කොහෙන්වත් ගන්න බැහැල්ලු.. ඇත්ත තමා ලාවට..

එහේ ගෙදර යුද්ධ කරද්දි මෙහේ ගෙදර අපි දෙන්නා උදේ නැගිටගෙන හෙන සමාදානෙන් උයන ගමන් හිටියා..අපිට නෑනෙ අනේ ඔය පවුල් ප්‍රශ්න.. අපි ඇවිල්ලා නිවලි වෙඩඩ් කපල් එකක්.. සමාදානෙන් ඉන්නෙ.. කියලා හිතාගෙන ඉන්නවා..

" මට මෙඩිකල් කවුන්සිල් එකට යන්න ඕන අනේ.. පොඩි වැඩ වගයක් කරගන්න.. ඔයා අනිද්දට යන ගමන් මාව දාගෙන යනවද.."

" මොකක්ද වැඩෙ.."

" දැන් මට කලින් තරම් අමාරුවක් නෑනෙ.. අවුරුද්දක් ඕන නෑ මාස දෙක තුනකින් මම හොස්පිටල් යනවා.."

රධ්‍ය අයියා රයිස් කුකර් එක ඔන් කල්ලා මං ගාවින් කවුන්ටර් එකට හේත්තු වුණා..

@Shan

" ඔයාට පුළුවන්ද.. හදිස්සියක් නැනෙ වරද්.. සනීප වුණාම යන්න.."

" එහෙම නෑ.. මට පුළුවන්.. ගෙදරටම වෙලා ඉන්න බෑනෙ.."

" ඔයාට ශුවර්ද මෙච්චර ඉක්මනට යන්න ඕන කියලා.."

" ඔව්.. යන එක හොඳයි කියලා හිතෙනවා.."

" ඔයාට පුළුවන් නම් යන්න.. මම ඉන්නවනෙ.."

රධ්‍ය අයියා නැමිලා මගේ කම්මුලට හාද්දක් දුන්නා.. ඊටපස්සෙ කෑම හදලා ඉවරවෙලා කාලා මම ගිහින් එයාගෙ ඇඳුම් අයන් කළා.. සැරින් සැරේ මට කලින් දුවලා පැනලා වැඩ කරපු හැටි මතක් වෙනවා.. ආයෙම නැගිටගන්න මට ලොකු උවමනාවක් තිබුණත් සමහර වෙලාවට නැගිටලා පැය බාගයක්වත් ඉන්න බෑ.. ඒත් කලින් තරම් ලොකුවටම අමාරුවක් දැන් නෑ.. සල්ලි තියනවා කියලා මට ගෙදර ඉන්නත් බෑ.. අච්චර අමාරුවෙන් ඉගනගෙන ඩිග්‍රි එකක් අරගෙන ගෙදර ඉන්න පිස්සුවක් තියේයැ.. මාස දෙකතුනක් බලලා හොඳ වුණොත් මම හොස්පිට්ල් යන්න ගන්නවා..

රධ්‍ය අයියා ලෑස්තිවෙනකල් මම ගැරඬි පැටියා වගේ ඇඳේ දපලා හිටියා.. කියාරත් ඇවිත් මං ගාවින් කැරකි කැරකි ඉඳලා ඇඳට නැගලා මගේ බඩ උඩින් හොම්බ තියාගෙන ඉණේ තියන බෙලි චේන් එක කටින් අදිනවා.. ඌටත් පුදුම ආතල් තමා යන්නෙ හිටපු ගමන්.... දවසක් කලින් ගෙදර සමනලයෙක් පස්සෙන් දුවලා ගේට්ටුවක් තියනවා කියලා අමතක වෙලා ඒකෙ කූරු දෙකක් මැද්දෙ හොම්බ හිරකරගෙන.. මුළු ලේන් එකම එතෙන්ට ගෙන්නුවා.. ඒ වුනාට මගෙ බෝල කියාරා මම වොශ් රූම් එකට ගියත් දොර ගාවින් ඉන්නවනෙ.. අර දුස්ට අම්මණ්ඩි නැතුව.. හිතාගෙන ඉන්නෙ උත්තමාවිය කියලා.. හිතුණොත් රෙක්සිව උස්සන් ගිහින් මම ආරු ගාවින් බැඳලා එනවා.. ආරුට කියලා මේකප් එකක් දම්මගන්න..

මම දහ අතේ කල්පනා කර කර ඉද්දි රධ්‍ය අයියා ප'ෆියුම් එකත් නාගෙන හෙන හැන්ඩියා වගේ ඇඳගෙන මගේ පස්සට එකක් දුන්නා.. මම කියාරගෙ උලුවට උඩින් රධ්‍ය අයියා දිහා බැලුවා..

" වරද් මම ගිහින් එන්නම්.. පරිස්සමට ඉන්න.. දන්නැති කවුරුවත් ආවොත් ගේට් එක අරින්න එපා.. තේරුණානෙ.."

@Shan

" ඔයත් පරිස්සමට ගිහින් එන්න.."

රඩ්‍ය අයියා ඇඳ පැත්තට නැමිලා මගේ තොල් වලින් පෙක් එකක් තිබ්බහම මම එයාගෙ කරවටේ අතක් යවලා මෙහාට ඇදලා ගත්තා..

" ඉක්මනට එන්නහ්.."

මම එයාගෙ කනට කල්ලා කියද්දි රඩ්‍ය අයියා හෙන මනමාල හිනාවක් දාගෙන මගේ කම්මුලට ආපහු හාද්දක් දීලා බෑග් එකත් අරගෙන පහළට ගියාම මම කියාරව බදාගෙන එහෙමම උඩ බලාගෙන හිටියා.. මගේ කොන්ද රිදෙනවනෙ ආච්චිඅම්මෙ..!! ආච්චිඅම්මව බලන්න යන්න ඕන නාගෙන..

ටිකකින් රඩ්‍ය අයියා රෝල ඩෝ එකත් වහගෙන කාර් එක ස්ටාට් කල්ලා යනවා ඇහුණහම මම නාගෙන ඇඳුමක් දාගෙන ආච්චිඅම්මව බලන්න යන්න ලෑස්ති වුණා.. කෙල්ල සනීපෙන් ඉන්නවද දන්නෙ නෑනෙ.. මේ ටයිම් එකට බණ අහනවා වෙනදනම්.. උඩ බැල්කනි එකෙන් බැලුවහම ආඩ්‍ය අයියගෙ කාර් එක ගෙදර තියනවා දැක්කා.. හොඳ වෙලාව.. උදේම මස්සිනාව බලලා හිත සතුටින් පුරෝගන්න පුළුවන්.. මගේ ඇඹරුල්ලා මාළු හට්ටිය..

මම පැත්තෙන් තියන පොඩි ගේට් එක ඇරගෙන එරියට බැස්සා විතරයි රෙක්සියි කියාරයිත් මට කලින් එළියට පැනගත්තා.. මම ලේන් එකේ එහාපැත්තට පැනලා අපේ ගෙදර දිහා බලාගෙන හිටියා.. ඒක හරි ලස්සනට ඩිසයින් කල්ලා තියෙනවා.. උඩ බැල්කනි එක ලොකු නිසා ලස්සනයි.. මගේ හිතේ තිබ්බ විදියෙම ගෙදරක්.. මම ආයෙම මෙහා පැත්තට පැනලා හැමතැනම පිස්සු හැදිලා වගේ දුවන උන් දෙන්නව ලඟට කතාකරගෙන එහා ගෙදරට යන්නත් හදලා ගෙදර මෙහා තාප්පෙ ගාව තිබ්බ රත්තරං පාට තහඩුව ගාව නතර වුණා.. ඒකට අව්ව වැටිලා දිස්නෙ දෙනවා.. වටේට පොඩි බෝඩරයක් එක්ක.. තහඩුව මැද්දෙ වැල් අකුරුවලින් කළුපාටට නමක් ලියලා තිබුණා..

මම කිට්ටු වෙලා ඒක හිමින් සැරේ කියෙව්වා..

*" ...SEPALIKA... "*

@Shan

මම ඒ වැල් අකුරු උඩ ඇඟිල්ලක් ඇදගෙන ගියා.. හදිස්සියෙම ඒක දැක්කහම මගේ හිතට අමුතු හැඟීම් ගොඩක් එකදිගට ගලාගෙන ආවා.. සේපාලිකා කියන්නෙ.. අපි දෙන්නා මුලින්ම හම්බුණු තැන.. මුලින්ම දැක්ක තැන.. තවමත් ඒ මලක සුවඳ අහම්බෙන් හරි දැනුණත් අවුරුදු ගාණක අතීතයක් පස්සට ඇදිලා යනවා වගේ.. ඔලුව කැක්කුම හැදෙන්න තරම් සුවඳ වුණත් මම තවම ඉස්කෝලෙ සේපාලිකා ගහට පුදුම ආදරෙයි.. එතකොට මේ ගෙදර නමත්.. ඒකද..??

**අන්තිමේ මම ජීවත් වෙන ගෙදරම සේපාලිකාවක් වුණා..**

මම සෑහෙන්න වෙලාවක් ඒ වැල් අකුරු දිහා බලාගෙන ඉඳලා ආධ්‍ය අයියලගෙ ගෙදරට ගියා.. යනකොට අපේ මාමා පැල වගේකට වතුර දානවා.. මාව දැකලා මගේ ඇඟට හෝස් බටේ ඇල්ලුවා.. ඒක, ඉස්සරහ පැන්න කියාරට වැදිලා කියාරා බුරාගෙන මාමගෙ පස්සෙන් අඹෝගෙන යනකොට කාර් එකේ බොනට් එක උඩට වෙලා රස්ක් එකක් කකා ඉඳපු ආරු මාව දැකලා අත් දෙක දික් කළා.. මේ නාකි මමා.. මොකෙක්ද මන්දා.. හෝස් බටෙන් හෝ ගාලා වතුර යනවා.. මම ඒක උස්සලා පැලේකට තිබ්බහම ටිකකින් කකුලත් අල්ලගෙන එනවා වන වන..

" උඹලගෙ බල්ලො අරන් පලයන්කො.. මුන්ට කන්න දෙනෙ නැද්ද.. මිනී මස් කන්නෙ.."

" කියාරා බීෆ් ක-ආරු බබෝ.. ඔයා මොනවද අනේ කන්නෙ.."

මාමා මගේ පිටට දබෝස් ගාලා පාරක් දුන්නා..

" උඹනම් මහ පොල්පිති හරකෙක්.."

මාමා මට මූණ උරුක් කරගෙන ගිහින් ටැප් එක ඕෆ් කළාම අවීත් පැන පැන ගේ ඇතුලේ ඉඳුන් ඇවිත් මගේ කකුලක එල්ලුණා..

" ඔකු තාති කෝ.."

" ලොකු තාත්ති ගමනක් ගියානෙ අවී.."

" ඔකු තාති ආවම අවී බලන්න එන්න කියන්න තුති තාත්ති.. හාද.."

@Shan

" හා.. මම කියන්නම් හොදේ.."

මම අවිවත් උස්සලා බොනට් එක උඩින්ම තිබ්බහම මාමා කාර් වොශ් කරන තඩි ලික්විඩ් බෝතලයක් උස්සගෙන ඇවිත් ඒ ළඟින් තිබ්බා.. අද ආඩ්‍ය අයියගෙ දරු පවුල නාන්න වගෙයි හදන්නෙ..

" වලද්දලගෙ මාමි කලපිංචා නැමත.. වලද්දලගෙ මාමි.."

අවි මාමගෙ දිහාට අත දික් කල්ලා රුවන් වැකියක් කියද්දි මම ශේප් එකේ ගේ ඇතුළට රිංගගත්තා.. මට බෑ වතුර පාරවල් කන්න.. උදේ නාලනෙ ආවෙ.. මාමා අපි දෙන්නට දෙස් දෙවොල් තියනවා මට ලාවට ඇහුණා.. ආඩ්‍ය අයියා ආච්චිගෙ කාමරේ පුටුවකුත් තියාගෙන කියෝනවා.. මමත් හිමින්සැරේ කාමරේ දොර අස්සෙන් මූන දාලාබැලුවා.. අයියා හැරිලා මං දිහා බැලුවා..

" චූටියො.. කොයි වෙලේද ආවෙ.. අම්මෙ මෙ අපේ ගෙවල් ළඟ අසල්වැසියා ඇවිල්ලා.."

ආච්චිඅම්මා හිනාවුණා..

" ආදරණීය අසල්වැසියෙක්නෙ අයියට ඉන්නෙ.."

" පොඩි වැඩට ගියාද චූටි.."

" ඕ.. අයියා කැම්පස් යන්නෙ නෑ අද..??"

මම ගිහින් ආච්චිඅම්මා ගාවින් ඉඳගත්තා..

" අද හවස චූටියො.. කම්මැලි අනේ යන්න.. ඊයෙ නෙ ආවෙත්.."

ආඩ්‍ය අයියා පුටුව දිගට හාන්සිවෙලා අත් දෙක දෙපැත්තට දාගෙන දියබරියා වගේ හිටියා.. මම ආච්චිඅම්මව මගේ ඇඟට හේත්තු කරගත්තා.. මේ ඉන්නෙ සුවඳට උදේම නාලා කොණ්ඩෙත් වනාගෙන.. ආච්චිඅම්මා මෙහේ ඉන්නෙ ඇත්තටම සතුටින් තමයි.. ගමේ ගෙදර ලොකු අම්මලා ඉඳලාහ් ඉටලා යනවා.. ඒ වුනාට මහ ගෙදර අයිති ගෙදර බාලයටනෙ.. අපේ මාමට එහේ යන්න උවමනාවකුත් නෑ බැලූ බැල්මට.. නිකම්ම ගෙවල් පාළුවෙලා යනවා.. ඒත් මම ගමේ ගෙදරට ආසයි..

@Shan

" තුති තාත්ති ඉන්නෝද.. තුති තාත්තී.."

අවී හිච්චි තිබ්බටු ඇටෙ වගේ කාමරේට පැන පැන ඇවිත් මගේ ඇඟ දිගේ නැගලා උකුලෙන් ඉඳගෙන කකුල් දෙක දෙපැත්තට දාගෙන ඉඳගත්තා..

" චූටිට දෙන්නම් ඔය කොල්ලව හදාගන්න.. වැඩිපුරම ආදරේ කාටද ඇහුවම කියන්නෙ ලොකු තාත්තිටයි චූටි තාත්තිටයිලු ආදරේම.. ඊටපස්සෙ අත්තම්මට.. අන්තිමට අපි දෙන්නටලු.. බලහන් අපි අන්තිමට ඉන්නෙ ලිස්ට් එකේ.."

" මම මලක්නෙ හලෝ... පොඩි ළමයි මල් වලට කැමතියිලු.."

" අපිටනම් කිව්වෙ හැබැයි තාර පැ-අහ්ම.. අම්මෙ මම ගිහින් එන්නම් හොඳේ.."

ආඪ්‍ය අයියා මහ කුජ්ප හිනාවක් දාගෙන කාමරෙන් යන්න ගියා.. ඔවත් එහෙමයි නේත අයියෙ.. මෙච්චර අවුරුදු ගාණක් මමනෙ ආදරේ කළේ.. කමක්නෑ.. මම ආඪ්‍ය අයියට ආතරෙයි.. මගෙ චූටි මාමා..

" සුදුමහත්තයා අලුත් ගෙදරට කැමතිද.."

" ඔව් ආච්චිඅම්මෙ.. ඒක ලස්සනයි.. මම ඊයෙ දැක්කහම පුදුම වුණා.."

" ඔය කොල්ලා ඒ දවස්වල සැහෙන්න නැහුණා ඉක්මනට ගෙදර වැඩටික ඉවරකරගන්න.. මමනෙ මුලින්ම ඔය ගේ හැදුවට පස්සෙ ගියේ.. ඒකා හරි ආසාවෙන් හිටියෙ උඹව එක්කන් එන්න ගෙදරට.."

මට සතුටු හිතුණා ආච්චිඅම්මගෙ වචන වලට..

" මම දැන් හැමදාම උදේට එනවා ආච්චිඅම්මව බලලා යන්න.."

" මගේ සුදුමහත්තයා ආච්චිඅම්මව බලන්න එනවා කියලා මම දන්නවනෙ.."

ආච්චිඅම්මා මගේ ඔලුව අතගෑවා.. හැමෝම මං ගාව ඉන්නවනෙ.. අම්මා දුර හිටියත් අම්මත් සතුටින් ඉන්නවා..

@Shan

" තුති තාත්ති ඔකු තාතිට ඉක්මනට එන්න කියන්නකො අනේ.. අපිට කිකත් ගහන්න පුළුවන්නෙ.."

" අවී දැන් හොඳ බබෙක් වගේ ඔක්කොම කෑම කාලා පපාට වද දෙන්නැතුව දොයියගත්තොත් ලොකු තාත්ති ආවහම අපි සෙල්ලම් කරමු හරිද.."

" හා..තුති තාත්ති ඇයි වලද් උනේ.. ඔකු තාත්ති කාද.. ලදා ද.. ඇයි ඩඩා වලද්ගෙ මාමි වුණේ.."

අපේ ආච්චි ශේප් එකේ ඇඳේ හාන්සිවෙලා ඇස් දෙක පියාගත්තා.. මම දන්නෑ පුතේ!! මගෙන් අහන්න එපා.. කොහොම හරි එහෙම වුණා.. අපේ නාකි මාමා මගේ ආධ්‍ය අයියව කෑම එකක් දෙන්න ගිහිල්ලා රවට්ටගෙන යාළු කරගත්තනෙ.. නැත්නම් හරිනම් දෙන්නම මගේ.. මගේ තියන මනුස්සකමට තමයි බොලාගෙ අප්පා මාමට දුන්නෙ..

හිත දමනය කරගනින් වරද්..!! උඹ දැන් කසාද බැඳපු මිනිහෙක්..

කියලා මගෙ හිත අස්සෙන් කටහඬක් එන්න ආවහම මම ඒ කටහඬ අමතක කල්ලා දැම්මා.. අනේ මේ නටපන්.. දෙන්නම මගේ එච්චරයි.. අනික ආධ්‍ය අයියා වගේ හරි හොඳ සුර කුමාරයෙක් වගේ මස්සිනෙක් මම කොහෙන් හොයාගන්නද..  ඒ සේරමත් අස්සෙ මට අපේ ගෙදර රෙදි වැලත් ජනේලෙන් පේනවා.. එහේ උඩට යන්න තුන්වෙනි තට්ටුව වගේ පොඩි කෑල්ලක් තියනවා.. බිමට ආටිෆිශල් ග්‍රාස් අල්ලලා.. ඒකෙ රෙදි වනන්න රැක් වගයක් දාලා තියෙනවා අව්ව හොඳට වැටෙන නිසා.. මගේ සුවාමිපුරුෂයා මොනවා කරනවද දන්නෑ..

ආධ්‍ය අයියලගෙ ගෙදර ඉඳලා දවල් වෙන්න මම ආයෙ අපේ ගෙදරට ගිහින් එක්ටැම්ගේ කුමාරිකාව වගේ ගේට්ටුවත් වහගෙන ඔහේ දපලා ටීවී එක දාගෙන ඒක දිහා බලාගෙන ආශි එක්ක චැට් එකක් දාගෙන හිටියා..  ඒකි අයාන් අයියට ස්ටිකර් එකක් හදලා.. අයාන් අයියා නහයෙ ඇඟිල්ලක් ගහගෙන ඉන්න ෆොටෝ එකක් දාලා 'අයාන් පුතාගෙ බෙන්තො එක' කියලා.. ඒක ඌට ලක්ශ වතාවක් විතර යවලා.. කියාන් අයියගෙන් බැනුම් අහලා හිත රිද්දගෙන හොස්පිට්ල් එකේ ඉඳන් මැසේජ් එකක් දැම්මා.. ඒකි රිජ්වෙ එකේ ඕ පී ඩී එකේ වැඩ කරන්නෙ.. මහීශා ගම්පහ හොස්පිට්ල් එකේ.. මගේ පෞකාරයා කාන්තා රෝහලේ.. පෞකාරයගෙ පෞකාරයා මානසික රෝහලේ.. පෞකාරයගෙ පෞකාරයගෙ මස්සිනා ජාතික

@Shan

රෝහලේ.. මස්සිනාගෙ බැඳපු නාකි මනුස්සයත් දැන් ජාතික රෝහලේ.. රෝහල් පෞල.. අපේ මනුස්සයටත් බයෝ කළානම් මාත් එක්ක එකට මානසික රෝහලට යන්න තිබ්බනෙ.. අපරාදෙ.. කොහෙද ඒකට ඉංජිනේරුවෙක්ම වෙන්න ඕන කිව්වනෙ..

ඒවුණාට අනේ ලේසි පාසුද..

මම ටීවී එක දාගෙන ගෙදරත් හායි ගාලා ඇරගෙන කියාරවයි අනිත් දුස්ට්වච්චියි ලඟින් තියාඑන හෙන හවස් වෙනකල් සෝෆා එක උඩ පුප උඩ දාගෙන නිදාගෙන හිටියා.. ආයෙම පුස්තකාලෙන් පොතක් උස්සගෙන ඇවිත් කියෙව්වා.. ඔරලෝසුව දිහා බලාගෙන ඉඳලා යාන්තම් රෝල' ඩෝ එක උඩට වෙනවා ඇහිලා කකා ඉඳපු චුවින්ගම් පොහ් ගාලා ඩස්ට්බින් එකට විසික් කරගෙන ඉස්සරහට යද්දි රධ්‍ය අයියා අතින් කටින් පේපර් බෑග් වගේකුත් කාර් එකෙන් අරගෙන ගෙට ගොඩවුණා..

" මේ මොකද අනේ.."

" වෙඩින් ගිෆ්ට්ස් වගයක් ඔෆිස් එකෙන්.."

රධ්‍ය අයියා ඒ ටික කෑමමේසෙ උඩින් තිබ්බහම මාත් ගොළුබෙලි පැටියා වගේ ඒ පස්සෙන් ඇදිලා ගියා.. කිස් එකක් දීපන් මිනිහො.. මුළු දවසක් බලාගෙන හිටියා.. මේ මිනිහට- ආ දැන් හරි..!!

" මම වොශ් එකක් දාගෙන එන්නම්.."

" හා.."

මම ලද දෙයින් සතුටු වෙලා අර බෑග් එකේ ෆැබ් එකේ ලෝගෝ එක තිබ්බ බෑග් එකට ඔලුව දාඅලා බැලුවා.. ෆැබ් එකේ අයිස් කෝපි එක සෑහෙන්න මතක් වෙනවා දෙයියනේ.. ඒකට ගහන්න එකක් කොහේවත් නෑ.. සමහරවිට රධ්‍ය අයියට ඒ කාලෙ හොඳම පාරිභෝගිකයා විදියට මොකක් හරි ලැබෙන්න ඕන.. හැමදාම මට උස්සගෙන ආපු නිසා.. මම අයිස් කොෆී එක ෆ්‍රිජ් එකට දාලා පඩිපෙළ නැගගෙන උඩට යද්දි රෙක්සි බාත් රූම් එක දාග ලැගගෙන ඒක දිහා බලාගෙන ඉන්නවා.. කියාරා ඇඳ පහලට වෙන්න නිදි.. මාත් ඇඳට නැගලා කියාරව බදාඅත්තා.. මෙහෙම නිකන් ඉන්න බෑනෙ ආච්චිඅම්මෙ..!! මම කවද්ද නිකන් හිටියෙ.. අනික එකතැන ඉඳලා මහත් වුණොත් මොන දෙයියට කියන්නද.. ගිහින් සැරේ ජිම් එකටවත් යාගන්න

@Shan

තිබ්බනම්.. ර්‍ටකලින් මේ තුවාල හොඳ වුණාම ටැටූ ශොප් එකකට ඇපොයිමන්ට් එකක් දාගන්න ඕන.. අපේ මනුස්සයා හැමදාම ඕක දිහා බලාගෙන මූණ ඇද කරගන්නවනෙ.. ආධ්‍ය අයියගෙ මල් ටැටූ එක වැඩ මමත් මල් වැල් ටිකක් ගහගන්නවා එක කකුලක.. ඒ අස්සෙ ඡන්දෙ කාලෙ මහින්ද මහත්තයගෙ මූණෙ ටැටූ එකක් ගහගත්ත මනුස්සයෙකුත් මට මතක් වුණා..

රධ්‍ය අයියා නාගෙන එළියට ඇවිත් අහල් දෙකේ කලිසම් කොටෙකුත් ගහගෙන ඇඳට පැන්නහම මාවත් දෙපාරක් තුන්පාරක් උඩ ගියා.. කියාරා බයවෙලා ඇඳෙන් බිමට පැන්නා..

" මොනවද කල්පනා කරන්නෙ මගේ තාරපැටියා.."

" අපි දෙන්නට බඳින්න හරි රටක් ඉතුරුවුණේ මහින්ද මහත්තයා නිසානෙ.. නේද.."

රධ්‍ය අයියට හිනා ගියා..

" මොනවද බං ඔය අහන්නෙ.."

" ඇත්තනෙ.."

" අපි බැන්දෙ මෙහේ නෙමෙයිනෙ ඉතින්.."

" හරි බැඳලා ආවෙ මෙහෙටනෙ.. ඔයා දැක්කද ර්‍යෙ අපි දෙන්නා එයාපෝට් එකේ ඉඳපු ෆොටෝ එකක් එෆ් බී එකේ ශෙයාවෙලා තියනවා.. අපි දෙන්නා සෙලිබ්‍රිටිලා ඒයි.. මම හේලි බීබර්.. ඔයා ජස්ටින් බීබර්.."

" සිරාවට.. කව්ද සෙලීනා.."

" නෑ එක්කො.. ඔයා කැමීලා වෙන්න මම ශෝන් මෙන්ඩිස් වෙන්නම්.. මගේ ශෝන් අයියා.."

ඒ අස්සෙ මගෙ බාගෙට නිරුවතින් ඉන්න ආස මනුස්සයා මට කොන්සර්ට් එකේදි ප්‍රපෝස් කරපු විදිය මතක් වෙලා මම රධ්‍ය අයියගෙ ඇඟ උඩට පෙරළීලා ගිහින් තොල් වලින් හාද්දක් තිව්වා.. රධ්‍ය අර බුවඑ අඩු ටික

@Shan

සේරම මගේ ඇඟ වටේ ඔතාගත්තා.. බූවල්ලෙක් වෙන්න ඉඳලා අම්මගෙ කීමට මනුස්සයෙක් වුණාම..

" අද මොකද කළේ.. කම්මැලියිද.."

" ඔව් අනේ.. මම උදේ අයියලගෙ ගෙදර ගියා.. ටිකකින් අවිව බලන්න යමු..?? ඔයා එනකල් එයා උදේ ඉඳලා බලාගෙන ඉන්නෙ.."

" යමු.. හෙට අම්මා එහෙ එන්න කිව්වා ඔයාට.."

" කොට්ටාවෙ ගෙදරද.. මම හෙන කාලෙකින් යන්නෙ එහේ.. ඔයත් එනවද.."

" මම ඔෆිස් යන ගමන් ඔයාව ඩ්‍රොප් කරගෙන යන්නම්.. මේ ටිකේ ටිකක් බිසී වරද්.. අලුත් ප්‍රොජෙක්ට් එකක් පටන් අරගෙනෙ ඒකෙ වැඩ.."

" හා.."

මම රධ්‍ය අයියගෙ අත් දෙක අස්සෙන් දඟලලා දඟලලා යන්තම් මූණ එළියට දාගත්තා.. මෙකා වෙලාගන්න ගත්තහම බූවල්ලෙක් වගේම තමා.. රධ්‍ය අයියා මගේ බෙල්ල ගාවින් හාදු දෙක තුනක් තියලා මාව කොට්ටයක් උඩට අතෑරියා.. කියාරා ආයෙම ඇඳට නැගලා වටයක් කැරකිලා මගේ කකුල් දෙක ගාවින් ලැගගත්තා.. රධ්‍ය අයියා ඔලුවට අතකුත් තියාගෙන මගේ පැත්ත හැරිලා මගේ මූණට එබුණා.. මම එයාගෙ බඩ උඩින් කකුලක් දාගත්තා..

" අපේ ගෙදර නම ලස්සනයි.. මම ඒකට කැමතී.."

රධ්‍ය අයියා ලස්සනට හිනාවෙලා මගේ කම්මුලක් ලාවට ඇඟිලිතුඩු වලින් ඇල්លුවා

" සේපාලිකා මලේ කතාව ලස්සන නෑ හැබැයි.."

මම එයාගෙ පත්තට හැරුණා..

" ඒකට කතාවක් තියේද.. මම දන්නෙ නෑනෙ.."

@Shan

" ම්ම්.. මම පොතක කියවලා තියෙනවා ඉස්කෝලෙ යන කාලෙ.. මනඃකල්පිත එකක් හරිද.. ඒ වුණාට මට ඒක මතකයි.. ඉන්දියාවෙ පුරාවෘත වල තියෙනවා එක කුමාරිකාවක්, ඒ කියන්නෙ තරුවක් ඉරට ආදරේ කළාලු.. ඉර ඒ කුමාරිකාව ප්‍රතික්ශේප කළාම කුමාරිකාව දුකින්ම ජීවිතේ අවසාන කල්ලා.. ඒ කුමාරිකාවගෙ අළු වළදාපු තැන ටික කාලෙකින් පැළයක් පැළවුණාලු.. ඒක ලොකු ගහක් වෙනකල් පැළ වුනාම රෑට මල් හැදෙන්න පටනරගෙන.. ඉතින් මනුස්සයො කියන්නෙ ඒ කුමාරිකාවට තාම ඉරට මූණ දෙන්න බැරි නිසාලු රෑට මල් පිපෙන්නෙ.."

" සේපාලිකා මලට එච්චර දුක හිතෙන කතාවක්ද තියෙන්නෙ.."

" ඒකට කියන්නෙ tree of sadness, tree of sorrow කියලා.."

" අපි ඒ මලට අලුතින් කතාවක් ලියමු.. ඕක බොරු එකක්නෙ..

**මම කියන්නෙ ඇත්තම එකක්**

.."

රඩ්‍ය අයියා පහත් වෙලා මගේ ඇස් පිහාටු වලට පහළින් තොල් තියාගෙන හිටියා.. එයාගෙ දිග ඇස් පිහාටු මගේ නළලේ ගෑවෙනවා.. මම හිමින්සැරේ එයාගෙ බෙල්ලෙ තිබුණු නෙක්ලස් එකේ ඇඟිල්ලක් පටලගත්තා.. ටිකකින් එයා එහාට වුණා..

" අපි දැනටම පටන් අරගෙන නෙමෙයිද වරද්.. අපි ඒ මලට ලස්සන කතාවක් හදලා ඉවරකරමු.."

ඇත්ත තමයි.. අපි දුකින් පිරුණු මලක් තෝරගෙන ආදරෙන් කතාවක් ලිව්වා නේන්නම්.. මේ යන්නෙ ඒ මලේ ලස්සනම පරිච්ඡේද වෙන්න ඕන.. මම තරු වලට කැමතිත් නෑ.. හඳට ආසත් නෑ.. කළුවර අහසෙ කළුපාටට විතරක් ආසයි.. ඒ වුණාට සේපාලිකා ගහක මලකට වැටුණු එළිය විහිදෙන කණාමැදිරියෙක්ට.. හැම එකකටම වඩා ආසයි..

මම අහලා තියනවා කණාමැදිරියොන්ගෙන් නිරූපණය කරන්නෙ ජීවිතේ කුඩා, සරල දේවල් හුහක් වැදගත් කියන එක කියලා.. හරි හිමින් අපිට අපිවම ගොඩනගාගන්න.. අපි වටේ තියන හැමදේම අගය කරන්න.. එයාලා අපිව පොළඹවනවා..

@Shan

අපි දෙන්නගෙන්ම කවුරුහරි දවල්ට මූණ දෙන්න බැරුව රෑට පිපුණ පිපුණ සේපාලිකා මලක්නම්.. අපිට ලැබිච්ච ආදරේ කණාමැදිරියෙක් වගේ.. හැම පුංචි දේකටම ලොකු වටිනාකමක් දීලා.. අපිවම ගොඩනගාගන්න අපිව පොළඹවනවා.. අපි දෙන්නම එක සැරේ කණාමැදිරි එළියකුත් වෙලා.. සේපාලිකා මලකුත් වෙලා..

හැමෝම හදටයි, අහසටයි, තරු වලටයි කවි ලියද්දි මගේ හිතට ඕන වුණේ මලකටයි පුංචි එළියකටයි කවියක් ලියාගන්න.. රාමුවෙන් එහාට යාගන්න.. අන්තිමට මට කවියක් ලියන්න ලස්සන පිටුවක් හම්බුණා.. මම තීන්ත හොයාගෙන.. කවියක් ලියාගත්තා..

මට ඒක ලස්සනයි..



මගෙ දලඹු පැටවුනේ.. නරක සමනලයා ආවා..

අපි එහෙනම් දැන් තුනේ ඉදන් එකට ගනිමු.. නරක සමනලයා ආයෙම එන්නෙ තුනේ ඉදලා එක වෙනකල් විතරනෙ.. මේ ලියවෙන්නෙ එයාලගෙ කතාවෙ ලස්සනම ආරම්භයක අලුත් පිටු ගොඩක්..

එන්නාම.. ලව් යූ.. ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොට්ස්)**

**- කථාංගය පදනම කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 175 කොටස

" ඩොක්ටර් ෂනෙරු.. ඕෆ් වෙන්නද.."

" ඔව් මිසිස් අබේසිංහ.. දැන් හස්බන්ඩ් ඇවිල්ලා ඇති.."

" ටේක් කෙයා.. අහ්.. ඇන්ඩ්.. කන්ග්‍රැජුලේශන්ස්.. අපිට ආරංචියක් ආවා.."

" තැන්ක් යූ සෝ මච්.."

මම බෑග් එකයි ස්ටෙත් එකයි කෝට් එකයි අතේ එල්ලගෙන දාහතර වාට්ටුවෙ ඩොක්ටර්ස් රූම් එකෙන් එළියට එද්දිම සිස්ටර් කෙනෙක් හම්බුණා.. එයා මාව අඳුරනවා.. හුඟක් ළඟින් කතාබහ කරන කෙනෙක්.. මම සිස්ටර් එක්ක හිනාවෙගෙන එළියට ඇවිත් ගේට් එක දිහාට ඇවිදගෙන යන්න පටන් ගත්තා..

ඇවිදගෙන යන්න..!? ඔව්.. එහෙම තමා.. මගේ ඇක්සිඩන්ට් එක වෙලා හරියටම මාස හයකට පස්සෙ මම ආයෙම ක්‍රච්ස් නැතුව මගේ කකුල් දෙකෙන් හිටගත්තා.. හරිනම් මට වුණු ඩැමේජ් එකට මම අවුරුදු එක හමාරක්වත් ඇඳේ ඉන්න ඕන.. මට එහෙම ඉන්න බෑනෙ.. මම අදටත් පිං දෙනවා එදා මගේ ස'ජරි එක කරපු ඩොක්ටර්ස්ලට.. ඇත්තටම දෙවිවරු වගේ.. කකුල් දෙක පණ නැතිවුණානම් මට මගේ ජීවිතේ ගැන එතනින් එහාට හිතාගන්නවත් බෑ..

ඊයෙට අපි දෙන්නා බැඳලා අවුරුදු තුනක්.. බැඳල අවුරුදු තුනක් වුණාට ආදරේ කරන්න අරගෙන අවුරුදු දොළහක්.. හිතාගන්න බෑ කාලෙ යන ඉක්මන.. එක්කො මම රධ්‍ය අයියා එක්ක ඉද්දි කාලෙ යනවා දැනෙන්නෙ නැතුවද මන්දා.. අපි දෙන්නටම ඒකෙ ගාණක් නෑ.. දවස් ඉක්මනට ඉක්මනට ගෙවිලා යනවා වගේ.. මම මේ ගෙවාගෙන යන්නෙ මගේ ජීවිතේ ලස්සනම දවස්.. ඇත්තටම ලස්සනයි..

අපි දෙන්නගෙ මැරේජ් ලයිෆ් එක සමාන්‍යයෙන් කියන මැරේජ් ලයිෆ් වගේ හෙනම ස්ට්‍රෙස් නෑ ඉතින්.. අනික ගෙදර හැම වැඩේම මමම කරන්න ඕන කියලා එකකුත් නැනෙ.. රධ්‍ය අයියා එයාට පුළුවන් හැම වෙලාවකම මට පොඩි හරි උදව්වක් කල්ලා දෙනවා.. අපේ ගෙදර දැන් වෙනදට වඩා පිරිලා

@Shan

වගේ.. ඉන්නෙ දෙන්නෙක් තමා.. ඒ වුණාට ඒක නියම ගෙදරක් වගේ තැනක්.. ලෝකෙ කොහේ ඉදලා වුණත් ගෙදරට අඩිය තිබ්බම ඒ හුරුපුරුදු හැඟීම මට දැනෙනවා.. එතකොට ජීවත් වෙන්න ආස හිතෙනවා.. එකිනෙකා හරියට තේරුම් අරගෙන රණ්ඩු නැතුව.. ප්‍රශ්න නැතුව.. ආදරෙන් ජීවිතේ  ගෙවද්දි ඒක අමුතු හැඟීමක්.. මම හරිම ආදරෙයි මගේ ජීවිතේට..

අපි දෙන්නා බැඳපු මුල්ම කාලෙ මම හිටියෙ ගෙදරට වෙලානෙ.. එතකොට පොතක් කියවනවා.. මල් වනවනවා.. ආරුලා එක්ක ඉන්නවා.. ඔහොම මාස තුනක් හතරක් වගේ ඉදලා මම ඇවිදගන්න පුළුවන් වුණාම හොස්පිටල් එන්න ගත්තා.. එතකොට අපේ දින චර්යාව ටිකක් වෙනස්.. රඨ්‍ය අයියා මාව උදේට හොස්පිටල් එකෙන් ඇරලලා වැඩට යනවා.. එයාට පහුගිය කාලෙ එක්සැම් වගයක් තිබ්බා.. ඒ එක්ක බිසී වෙලා හිටියේ.. ඒ මනුස්සයා ඉගෙනගෙන ඉවරෙකුත් නෑ.. හැමදාම පාඩම් කරනවා.. කොහේහරි තියන එක්සැම් එකක් උස්සගෙන ඇවිත් ඒක ලියනවා.. මට ලොකුවට ඒ ෆීල්ඩ් එක ගැන තේරුමක් නෑ.. කොහොමහරි තව අවුරුදු පහකින් විතර PhD එක කරන්න පටන් ගන්නවා කිව්වා.. ඉතින් එයා ඔෆිස් ගිහින්, යුනිවසිටි එකේ ලෙක්චර්ස් ගිහින් ආයෙම හවස හතර හමාර-පහ විතර වෙද්දි මාව ගන්න හොස්පිටල් එකට එනවා.. දවල්ට අපේ ගෙදර කවුරුත් නෑ.... කියාරා රෙක්සි දැන් හුහක් වයසයි.. එයාලා ඉස්සර වගේ දුවලා පැනලා ඉන්නෙ අඩුවෙන්.. දවසෙම නිදාගෙන ඉන්නවා.. මොකක් වුණත් ඒ ඇත්තටත් අපි මූණ දෙන්න එපැයි.. ඉතින් අපි පුළුවන් උපරිමෙන්ම එයාලා දෙන්නව පරිස්සමට බලාගන්නවා.. අපේ ජීවිත වලින් කොටසක් වගේ දැනෙන්නෙ ඒ දෙන්නව.. මටනම් ජීවිත කාලෙම එයාලා මතක හිටී.. ආපස්සට මුකුත්ම බලාපොරොත්තු වෙන්නෙ නැතුව එයාලා මට හරියට ආදරේ කළා.. මගේ පාළුව මැකුවා.. තනියට හිටියා.. මාව අහගෙන හිටියා.. සමහර මනුස්සයොන්ට වඩා ඇත්තටම එයාලා දෙන්නගෙ හොඳ ගති තිබුණා..

පහුගිය අවුරුදු තුනේ අපි සෑහෙන්න ඇවිදින්න ගියා.. සමහර දිග වැකේශන් වලට වෙන රටකට ගිහින් සතියක් විතර ඉදලා ආපහු ලංකාවට එනවා.. අම්මලව බලන්න යනවා.. ගමේ ගෙදරත් දෙතුන් සැරයක්ම ගියා.. අපේ සහන් කිකිළිව උස්සලනෙ.. මූ කිව්වෙවත් නෑ.. මටත් සෑහෙන්න ප්‍රශ්න තිබ්බ කාලෙනෙ.. අවුරුදු ගාණකට පස්සෙ ගමෙ යද්දි කිකිළිලගෙ පරණ ගෙදර පේන්නත් නෑ.. ඊට ඉස්සරහින් ලොකුවට තට්ටු දෙකේ ගෙයක් වැඩ ඉවර කල්ලා හදලා..කිකිළිට බබෙක් හම්බෙන්න හිටියෙ.. සහන් දැන්

@Shan

ටියුෂන් වැඩේ හොඳටම කරගෙන යනවා.. ගාල්ල මාතර පැත්තෙ පොරට ඒ ලෙවෙල් ලමයි වැහි වැහැලා.. ඌ කොහොමත් උගේ හයියෙන් නැගිට්ට එකා.. අම්මලාටත් වෙනම ගේ හදලා දීලා පදිංචි කරවලා ඉන්නෙ.. නංගිටත් උගන්නෙන්නෙ එයාමයි.. තාත්තා ඇක්සිඩන්ට් එකෙන් පසෙ එකතැන.. අපි ගියාම අපි එක්ක එදා වගේම හෙන ලෙංගතුව කතාකලා.. කිකිළි හරි හොඳ කෙල්ල.. කොච්චර කාලෙකට පස්සෙත් ගෙදර ගියත් ෂනෙරු අයියේ ගාගෙන මොකක් හරි පිගානක් උස්සගෙන ගෙදරට එනවා.. ගමෙත් හුඟක් දේවල් දැන් වෙනස් වෙලා.. ආච්චිඅම්මත් දැන් හුඟාක් වයසයි.. එයාටත් ගමෙ ගෙදර ගැන හිතින් හිමිහිට අයින් වෙලා ගිහිල්ලා.. කොහොමත් ආච්චිට ඒවගෙ මහා තණ්හාවක් නෑ.. ලොකු අම්මත් ඒ ගැන හොයන්නෙ නෑ දැන්.. එයාගෙ පුතාලා හැමෝම රට.. බැඳලා අයින් වෙලා.. ලොකු අම්මා එයාගෙ මහත්තයා එක්ක කොළඹ ඉන්නවා.. දැන් රිටයර් වෙලා..

අපේ සෙනුකයා ගිය අවුරුද්දෙ අග බැන්දා.. අයුක අයියත් දැන් කම්පනි එකේ වැඩ කරගෙන යනවා.. ඒ දෙන්නම හුඟක් මහන්සි වෙලා ජීවිතේ බිංදුවෙ ඉඳලා ගොඩ නගාගෙන දැන් සතුටින් ඉන්නවා.. සෙනුකලාගෙ අම්මලත් අයුක අයියට හරි එකතුයි.. උන්ගෙ පවුලෙ හිමින් හිමින් උඩට නැගගෙන යනවා.. මහීශාත් බැන්දා.. බබා හම්බෙලා තාම මාස දෙකයි.. බෝලයක් වගේ කොල්ලෙක්.. කොළඹ නෑ.. අයියලාගෙ ගමේ, ගම්පහ ඉන්නෙ.. ළඟදි අපි ගියා මහීශායි බබයි බලලා එන්න.. ඒකිගෙ දැන් කොළු ගතියක් ආසාවකට පේන්න නෑ.. හැබැයි මහත් වෙලා බෝලයක් වගේ ඉන්නවා.. හොඳම වැඩේ..!! අපේ කියාන් අයියගෙ වෙඩිම ගත්තා මේ අවුරුද්දෙ මුල.. දැන් ආශි ප්‍රෙග්නට්.. කියාන් අයියා දහ දුක් විඳිනවා.. අරකි පුදුම රඟ් එකක් තමා ඒ මනුස්සයට දෙන්නෙ.. හැමෝම හරියට වෙනස් වෙලා ඉතින්.. ඉස්සර තිබ්බ සෙල්ලක්කාර කොළු ගති දැන් මොකෙක් ගාවවත් නෑ.. ජීවිතේ වගකීම කරට අරගෙන ඉස්සරහට යන්න පටන් අරගෙන.. අනික දැන් අම්මලා තාත්තලානෙ.. උන්ට සෑහෙන්න වගකීම් තියනවා.. අයාන් අයියත් නට නට ඉඳලා දෙයියනේ කියලා කෙල්ලෙක් බැඳගෙන දැන් මෙහේ නෑ.. නිව්සි වල පදිංචියට ගිහිල්ලා.. මාව දැක්කහමත් හොඳට කතාබහ කරනවා.. පරණ මගුල් මතක් වුණාම ඌටත් ලැජ්ජයි.. අපේ චමිරුවත් පාර්ලිමේන්තු මන්ත්‍රී කෙනෙක් වෙලා.. දැන් හෙන බිසී පොර.. හම්බෙන්නත් අමාරුයි.. ඌ දැන් ලමයි තුන්දෙනෙක්ගෙ අප්පච්චිනෙ.. ඒ ඇරෙන්න.. ආ.. මගෙ මස්සිනා හැමදාම වගේ අල්ලපු ගෙදර ඉන්නවා සිරික්කිය දාගෙන.. අවී බබා න'සරි යනවා.. ආරුත් දැන් හොඳට කතාකරන්න ඇවිදින්න අරගෙන.. කොයි වෙලෙත් දුවාගත්තු

@Shan

ගමන්මයි ඉන්නෙ.. මාමා ලඟදි කිව්වා කලින්ම රිටයර් වෙලා ගෙදර නවතිනවා කියලා.. බබාලා ලොකු වෙද්දි වැඩ වැඩිනෙ..

අපේ ගෙදර සුභ ආරංචිය තමා.. නැන්දම්මලා දෙන්නගෙ අවුරුදු තුනක පුදුමාකාර කන්දොස්කිරියාවයි.. අපි දෙන්නා තනියම හිටියා ඇති කියලා හිතුණ නිසායි.. අපි පළවෙනි බබාව ගෙදර ගේන්න තීර්ණේ කළා.. හෙට තමයි අපි කැලිෆෝනියා යන්නෙ.. මෙහේ සරෝගේට් බබාලා හදනවට වඩා ඇත්තටම එහේ ලේසියි.. අපේ අම්මයි බාප්පයි ඉන්න නිසා අපිට ඒක කොහොමත් ලේසියි.. දැන් මාස අටක් වෙනවා අපි දෙන්නම අන්තිමේදි කැලිෆෝනියා ගිහින් එහේ වැඩ සෙට්ල් කල්ලා එද්දි..

මම හොඳටම එක්සයිට් වෙලා ඉන්නෙ.. මම විතරක් නෙමෙ.. රධා අයියත්.. අපිට බබාව හම්බෙන්න ඉන්න අම්මා එක්ක කිසිම කනෙක්ශන් එකක් තියාගන්න දෙන්නෙ නෑ.. ඒ විස්තර මොකුත්ම දෙපැත්ත අතරෙ හුවමාරු වෙන්නෙ නෑ.. අනික සෑහෙන්න ලොකු වියදමක් යනවා සරෝගේට් බේබි කෙනෙක් ගන්න නම්.. අපි ඒ අතින් ස්ථාවර වෙලා තියන නිසා මේ කාලෙ හොඳම කාලෙ කියලා හිතුවා.. අපි මේ වයසට ගියාම වතුර ටිකක් දීගන්න නම් නෙමෙ ඇත්තටම බබෙක් හදාගන්නෙ.. එහෙනම් වැවක් හදනවනෙ.. ඒ වුණාට ලොකු වෙද්දි ඒ අවශ්‍යතාවය තේරෙනවා.. තනියම ඉන්නවට වඩා බබෙක් ගේන එක හොඳයි කියලා.. අනික අපේ මනුස්සයටයි මටයි වයස යනවා.. එයාට තිහයි.. මට විසි නමයක්.. අපේ අම්මනම් යැයි යැයි ගාණවා මෙත් වයස වැඩිලු.. එයානම කියයි.. අපි එපෑ කොරන්න..

අසලි අම්මා දැන් කට අයාගෙන බලාගෙන ඉන්නෙ බබාව ගෙදරට ගේනකල්.. අසලි අම්මා ඉන්නෙ පරණ ගෙදරමයි.. කොට්ටාවෙ ගෙදර.. එයා එයාට ආසම විදියට ගෙදර තියාගෙන ඉන්නවා.. එහේ යන තැනම නල්ලමලේ පුත්තු දෙන්නගෙ අලි ලොකු වෙඩින් ෆොටෝස් දෙකකුයි.. අපේ ෆැමලි ෆොටෝ එකකුයි තියනවා.. රධා අයියගෙ කාමරේ ඉස්සර වගේමයි.. හිටි ගමන් එහෙ ගියාම පරන මතක ලස්සනට හිතට ගලාගෙන එනවා.. අසලි අම්මා කියන්නෙ මම ජීවිතේ හුඟක් ගරු කරන කෙනෙක්.. ඇත්තටම පුදුමාකාර හිතක් තියන මනුස්සයෙක්..

අප්පච්චි ඉන්නෙත් මේ මානසික රෝහලේම තමයි.. හැබැයි විලාස් වල.. විලාස් කියන්නෙ මේ මානසික රෝහලේම ගෙවීම් කල්ලා වඩාත් සැපපහසුවට ඉන්න පුළුවන් වෝර්ඩ්ස්.. paying wards වලට.. මම හැමදාම අප්පච්චිව බලලා එන්න යනවා.. අසලි අම්මත් සතියකට තුන්සැරයක්වත්

@Shan

එනවා අප්පච්චිව බලලා යන්න.. එයා මාත් එක්ක කතාකරන්නෙ නෑ හැබැයි.. මාව දැක්කහම අත් දෙක පිටිපස්සට බැඳගෙන අහක බලාගෙන හරි ආඩම්බරෙන් ඉන්නවා.. ඒ වුණාට මම එයාට හරි කැමතියි අනේ..

අපි හැමෝම, අපි අපිවම තේරුම් ගන්න ඕන..!

අප්පච්චිව චෙක් කරන්නෙ මම නෙමෙයි.. ඒත් මම සයිකැට්‍රිස්ට්ව නිතර හම්බෙලා අප්පච්චි ගැන විස්තර අහගන්නවා.. එයාට තියෙන්නෙ BPD Disorder* එකක්.. ඒකෙන් හුඟක් වෙලාවට එයා තමන්ගෙ ළඟම ඉන්න අයව මානසිකව පීඩාවට ලක් කල්ලා ඒකෙන් අමුතු තෘප්තියක් ලබාගන්නවා.. මම ඩොක්ටර් කෙනෙක් විදියට.. අප්පච්චිව තෙරුම් නොගෙන එයාව නොබලා ඉන්න එක.. මගේ හිතට මදිකමක්.. එයාගෙ අතින් හුඟක් වැරදීම් වුණා.. ජීවිත ගාණක් කඩාවැටුණා.. ඒ අතීතෙ.. දැන් ආයෙම එහෙම වෙන්නෙ නැනෙ.. ඔක අපේ මනුස්සයට කිව්වට එයා තේරුම් ගන්නෙ නෑ.. මම එයා ඉන්න තැන ඉඳගෙනත් හිතන්න ඕනනෙ.. ඒත් මගේ හිතේ තරහක් නෑ අප්පච්චි එක්ක.. අදටත් මම උදේට වැඩිපුර ලන්ච් බොක්ස් එකක් බෑග් එකට දාගන්නවා රධ්‍ය අයියා දැක්කත් එයා මොකුත් කියන්නෙ නෑ.. පාඩුවෙ ඉන්නවා.. කොහොමත් රධ්‍ය අයියා මම ගන්න තීරනවලට හරි ගරුත්වයක් දෙන, මාර කොලිටීස් තියන හස්බන්ඩ් කෙනෙක්.. අප්පච්චි මුල් අවුරුදු දෙකේම හිටියෙ කාමරයක් ඇතුළෙ තනියම.. වෙන අය ගැටෙන්නෙ නැති වෙන්න.. එයාගෙ හුඟක් දරුණු වෙලා තියෙද්දි තමයි මෙහෙට එක්කන් ඇවිත් තියෙන්නෙ.. දැන් ටික ටික හොඳ වේගෙන යනවා.. ඒත් හිටි ගමන් එකසැරේට කලබල කරනවා.. බෙහෙත් වලින් එයාව පාලනය කරගෙන හිටියත් සම්පූර්ණෙන්ම සුව කරන්න බෑ.. මොළේට සංවේදන සමහර වෙලාවට හරියටම අඳුරගන්න මාරුයි..

(Borderline personality disorder (BPD) is

**a serious, long-lasting and complex mental health problem**

. People with BPD have difficulty regulating or handling their emotions or controlling their impulses..)

මම උදේට හොස්පිටල් ගිහින් විලාස් වලට යනවා අප්පච්චිව බලලා එන්න.. උදේට මම යද්දිත් ජනේලයක් ගාවට වෙලා අත් දෙක පිටිපස්සට බැඳගෙන හරි උජාරුවෙන් ඉන්නෙ.. කොහොමත් කතාකරන්නෙ නැනෙ..

@Shan

මම 'අප්පච්චි ගුඩ්මෝනින්' කියාගෙන කෑම එක මෙසෙ උඩින් තියලා එනවා.. මම එනකොට ඒක මෙසෙ උඩ හිස් වෙලා තියනවා.. වැකේශන් වලට හොස්පිට්ල් නාව දවසට මම ගේන ඒවා කන්නෙ නෑ.. තරහවෙලා වගේ ඇහිබැමත් උරුක් කරගෙන ඉන්නවා.. දවසක් මට වැරදිලා ස්ටෙත් එක දාලා ඇවිල්ලා මම ඇටන්ඩන් කෙනෙක් යැව්වා ඒක ගෙන්නගන්න.. ඇටන්ඩන් හොඳ බැනුම් ටිකක් අහගෙන ආයෙ ඇවිත් 'අනේ ඩොක්ටර්ම ගිහින් ගන්න.. මටනම් බෑ' කියලා නාහෙන් අඬාගෙන යන්න ගියා.. මම ඒක ගන්න වෝඩ් එකට යද්දි අප්පච්චි ඒක ලාච්චුවකට දාලා.. තියලා තියනවා.. මම ආවහම ඇහිල්ල දික් කල්ලා ලාච්චුව පෙන්නලා අනිත් පැත්ත හැරිලා නිදාගත්තා..

මම අප්පච්චිව එහෙම හරි බලාගන්න එකෙන් මගේ හිතේ වරදකාරී හැඟීම අඩුවෙලා යනවා.. රධ්‍ය අයියලා, ආධ්‍ය අයියලා කොහොමවත් හොයන්නෙ නෑ.. ඒත් මමයි අසලි අම්මයි බලනවා.. මොකක් වුණත් ඒ රධ්‍ය අයියගෙ තාත්තනෙ.. කිසිම වගකීමක් ඉටු නොකරත් නම හරි දුන්න මනුස්සයානෙ.. එහෙනම් මම මගේ තාත්තට කොච්චර වෛර කරන්න ඕනද.. එහෙම නෑ.. ජීවත් වෙලා ඉන්න ටිකකාලෙ අපි හැමෝම එක්ක හොඳින් ඉන්න ඕන.. මැරුණහම කිසිදෙයක් උස්සගෙන යන්නෙ නැනෙ.. මතකෙන් අමතක නොවුණත් හැම මනුස්සයෙක්ටම දෙවෙනි අවස්ථාවක් දෙන්නම ඕන.. අපි ඒ තැන ඉඳගෙන හිතලා බලන්න ඕන..

එහෙම බලද්දි අප්පච්චි අසනීප වෙන්න මුල්ම හේතුව යුද්දෙ වෙන්න එපෑ.. ඒ කාලකණ්ණි යුද්ධයක් නිසා තවම මිනිස්සු විඳවනවා.. අප්පච්චිට ඒ කාලෙ වුණු ලොකු කම්පනේකින්.. ඒක කේන්තියකට පරිවර්තනය වෙලා.. පස්සෙ ඒක මානසික රෝගයක් වෙනකල්ම උඩු දුවලා..

ඩොක්ටර්ස්ල නම් කිව්වෙ වැඩිපුරම අප්පච්චි ගේ රිලේශන්ශිප් වලට මෙ තරමට අකමැති එයාගෙ අතීතයේ ඒ සම්බන්ධව මොකක් හරි අඳුරු මතකයක් තියෙන නිසාලු.. ඒ කියන්නෙ අප්පච්චි ගේ නෙමෙයි.. මමත් හරියටම මෙ විස්තරේ දන්නෙ නෑ.. අප්පච්චිට ඒ කාලෙ හොඳම යාළුවෙක් ඉඳලා තියනා කෑම්ප් එකේ.. යුද්දෙ කාලෙ.. ඒ යාළුවා අප්පච්චිට කැමති වෙලා.. අප්පච්චි ඒක ප්‍රතික්ශේප කල්ලා පස්සෙ ඒ යාළුවා යුද්දෙදි නැතිවෙලා.. ඒ විස්තරේ මම දන්න කතාව ඔක වුණාට.. තව ලොකු දෙයක් ඇති සැහෙන්න අඳුරු කතා ගොඩක් තියන.. ඔය හැමදේම එක්ක දැනිච්ච පීඩනේ දරාගන්නම බැරි තැන.. හැම මනුස්සයටම වෙනවා වගේ එයාත් හුඟක් අසරණ වුණා.. අනික යුද්දෙ කියන්න ලේසි පාසු දෙයක්

@Shan

නෙමෙයිනෙ.. එයාගෙ මනසේ මැවෙන මොන මොනවහරි රූප ගොඩකට එයා තාම බයයි.. කලබලයි.. ඒත් හයියයි කියලා පෙන්නගෙන ඉන්නවා..

අදටත් මට කාගෙවත් පැත්ත ගන්න බෑ.. ජීවිතේ අපේ.. අපේ කතාව ඇතුලේ අපි හරි සාධාරණයි.. ඉතින් කොහොමද පැත්තක් ගන්නෙ.. පැත්තක් ගන්න ඕන නෑ.. හොඳින් ජීවත් වුණාම මට ඒ හොඳටම ඇති..

මම ගේට් එක දිහාට දිගට වවලා තිබුණු දාස් මල් පේළිය දිහා බලාගෙන ආවා.. හීනියට පොද වැස්සක් වැටෙනවා.. මාවත් ලාවට තෙමාගෙන.. ඒ වුනාට මේ හොස්පිටල් එක හරි ලස්සනයි.. ලොකු ගහත් එක්ක තියන විසාල බුදුමැදුර.. දෙපැත්තට බෙදෙන පාර.. මේ මල් පේළිය.. කප්පාදු කරපු තණකොල.. හිතට සැනසීමයි.. මානසික රෝහලක් කිව්වහම මනුස්සයොන්ගෙ හිතේ මොන වගේ ආකල්ප මැවෙනවද මම දන්නෙ නෑ.. මම හරි අකමැති ඒකට පිස්සන් කොටුවක් කියනවට.. ඒ වචනෙ සැර පහරක් වගේ.. මානසික රෝහලක්.. ඒකෙ එක එක මානසික මට්ටම් වල මිනිස්සු දාස් ගාණක් ඉන්නවා.. පොඩිම කම්කරුවගෙ ඉඳන්.. මහාචාර්යවරු පවා නැවතිලා ප්‍රතිකාර ගන්නවා.. මම ඉන්න වෝඩ් එකේ ඉන්නවා එක ප්‍රොෆෙසර් කෙනෙක්.. එයා මුළු දවසෙම එකම ගාණක් පොත් සීයක් පිරෙන්න වුණත් හදනවා.. සමහරු ඉන්නවා දවසකට සිය පාරක් විතර නාලා ආයෙම මගෙන් අහනවා 'ඩොක්ට මම අද නෑනෙ නෑනෙ.. නාලා එන්නද' කියලා.. තව සමහරු තනියම හිනාවෙනවා.. සමහරු කොට්ට තුරුල් කරගෙන බබාලා කියලා හිතාගෙන පණ යනකල් නලවනවා.. ඒ ඇරෙන්න තව අය ඉන්නෙ හිර කූඩු වල.. මුළු ඇඟපතවල් ගන්න දෙයක් නැති වෙන්න තුවාල කරගෙන.. දකින දකින මනුසයා පාරෙ පස්සෙ මරන්න පන්නනවා.. අමු තිත්ත කුණුහරුප කියාගන්නවා..

හිතුවට වඩා මෙහේ වැඩ ලේසිම නෑ.. ලෙඩ්ඩු කලබල කරද්දි ඒ එක්ක ඔට්ටු වෙන්න එපෑ.. සමහර අය දඟලන දැඟලිල්ලට හොස්පිටල් එකම එකතු වුණත් මදි කන්ට්‍රෝල් කරගන්න.. ඒ වුණාට ජීවිතේ හරි යතාර්ථය මොකක් වගේද කියලා තේරෙනවා මෙහෙම තැන් වල ඉද්දි.. මම දැන් අවුරුදු දෙක හමාරක්ම මේ හොස්පිටල් එකේ මේ පාර දිගේම යනවා එනවා..

මම නැමිලා දාස් මලක් කඩාගත්තා.. වටේ පිටේ කවුරුත්ම නෑ මේ වෙලාවට.. ඒ එක්කම කඩාගෙන හැලෙන පොද වැස්ස මහා වැස්සක් වුණා.. මම කෝට් එක උඩට අල්ලගෙන ගේට් එක පැත්තට දුවගෙන යද්දි

@Shan

රධ්‍ය අයියා ලොකු කුඩේකුත් ඉහළගෙන මගේ පැත්තට දුවගෙන ඇවිත් මාව තුරුල් කරගත්තා..

" කෝල් එකක් දුන්නනම් මම එනවනෙ වරද්.."

මම රධ්‍ය අයියගෙ ඇඟ වටෙන් අතක් දාගෙන හුළං එක්ක ඇඟට එන හිරිකඩින් බේරෙන්න එයාට තුරුල් වුණාම එයා මාව ළඟට කල්ලා තුරුල් කරගත්තා..

" මම එනගමන් හිටියෙ.. එකසැරේ වැස්ස වැඩිවුණානෙ.."

" අද මහන්සිද.."

" ටිකක් විතර.. මට බඩගිනී අනේ.. ඉක්මනට ගෙදර යමු.. ඇඳුම් වගේකුත් හදාගන්න තියෙනවා මට.."

" ම්ම.."

රධ්‍ය අයියා කාර් එකේ දොර අරලා මම නගනකල් ඉඳලා එයත් එහාපැත්තෙන් කාර් එකට නැග්ගා.. මේ මනුස්සයා මගේ ඩොක්ටර් ක්‍රොස් එක අවභාවිතා කරනවා.. දැන් බලන්න.. මේකා අනිත් ක්‍රොස් එක ගලවලා පිටිපස්සට දාලා මගේ ඩොක්ට ක්‍රොස් එක ගහගෙන හොස්පිටල් එකේ පාකින් ලොට් එකේ කාර් එක ගහගෙන ඉන්නවා.. හිටිගමන් ඩොක්ටර්ස් කැන්ටීන් එකට ගිහින් කාලත් එනවා.. ඩොකා කියලා හිතාගෙන ඉන්නෙ.. මගෙ චීස් කෑල්ල..

මමත් ඔය සෙනසුරාදට එහෙම රධ්‍ය අයියගෙ ඔෆිස් එකට යනවා කෑම එක දීලා එන්න.. බලන්න එපෑ මනුස්සයා මොකද කරන්නෙ කියලා.. එහේ හෙඩ් ඉන්ජිනියර් මාත් එක්ක හොඳට එකතුයි.. රධ්‍ය අයියා වැඩ කරන හැමෝ එක්කම හොඳින් කතාබහ කල්ලා ඉන්නවා.. ඒත් අනවශ්‍ය විදියට එකතු කවුරුත් නෑ.. එයාට කියාන් අයියලා වගේ ෆිට් උන් හම්බෙන්නෙත් නෑ ලොවෙත්..

" අපි සුදුපුතාව ගේනවා ඒයි.. මටනම් ඉවසිල්ලක් නෑ.. එයා පරිස්සමට ඇති නේ.. බෝලයක් වගේ ඉඳීවි.."

" ඔයා සෑහෙන්න එක්සයිට් වෙලානෙ බබා ඉන්නෙ.."

@Shan

" ඔව් දැන් මම මාස කීයක් බලාගෙනද ඉන්නෙ.. එයාව එක්කගෙන එන්න.. ආනෙහ්!! මම තාත්ති කෙනෙක් වෙන්නයි යන්නෙ ඒයි.. තව්සෙ අප්පච්චි කෙනෙක් වෙන්න යනවා.."

මම රධ්‍ය අයියගෙ කම්මුල් දෙක දෙපැත්තෙන් ඇදලා හාද්දක් දුන්නා.. මෙකගෙ මූණෙ කටු ඇනෙනවනෙ..

" ආ ඔයාට මලක්.."

මම අතේ තිබ්බ මල රධ්‍ය අයියගෙ කමිස සාක්කුවට දම්මා.. එයා ඒක දිහා බලලා හිනාවුණා..

" ඒක ලස්සනයි.."

රධ්‍ය අයියා මගේ අතක එයාගෙ ඇඟිලි පටලගත්තා.. මගේ අත් රස්නෙයි.. එයාගෙ අත් සීතලයි..

අපේ බබාව ගෙදරට ගේන්න කලින්.. දැන් මාස තුනකවත් ඉඳලා අපි දෙන්නා ගෙදර ලෑස්ති කරන්නෙ.. එයාට ලස්සන බේබි බ්ලූ වලින් රූම් එකක් පේන්ට් කල්ලා.. චූටි මීමැස්සො ඉන්න මැක්‍රම් එකක් එල්ලලා.. කොට් එකක් තියලා.. චූටි චූටි ලස්සන ඇඳුම් තෝරලා.. ඒවා සෝදලා.. වනලා.. අයන් කල්ලා.. බබෙක් එනකල් බලාගෙන ඉන්නවා කියන්නෙ ඒක වෙනමම හැඟීමක්.. අර ජීවිතේ වගකීම් සහගත මනුස්සයෙක් වැඑ දැනෙන්න ගන්නවා.. මටනම් එයා ගැන කියද්දිත් මගේ පපුව දෙතුන් ගුණේකින් වැඩිවෙලා ගැහෙනවා වගේ.. හැමදෙයක්ම කළේ අපි දෙන්නමයි.. එයාගෙ කාමරේ ලස්සනට ඩිසයින් කළා.. අපේ ආච්චිඅම්මා එයාගෙ මුණුබුරාගෙත් ළමයි බලනවා.. මට හරි සතුටුයි.. අපේ අම්මත් බලාගෙන ඉන්නෙ බබාව එක්කන් එනකල්..

ගෙදර එනකොටත් පුදුම වැස්ස.. මම කාර් එකේ තිබ්බ බඩු ටිකත් උස්සගෙන ගිහින් ගෙදර දොර ඇරලා ඒ ටික කුස්සියෙන් තිව්වා.. ආයෙම සතියකට අපි ලංකාවෙ නැති නිසා බඩු ගෙනැල්ලත් වැඩක් නෑනෙ.. ඒකනිසා එළියෙන් කනවා.. රධ්‍ය අයියා කුස්සියට ඇවිත් ෆ්‍රිජ් එකෙන් වතුර එකකුත් අරගෙන කෑම  මේසෙන් වාඩිවුණා..

" කාල නානවද.. නාලා කන්න එනවද.. කොහොම කළත් කන එකයි නාන එකයිනෙ.. මම බෙදනවා~"

@Shan

" දවල් අම්මා කතාකළාද.."

" ඔව්.. හවස්වෙලා මෙහේ එනවා කිව්වා.."

මම කෑම දෙක අරගෙන මයික්‍රොවේව් එක ප්‍රී හීට් වෙන්න තියලා ඒක භාජනේකට තිබ්බා.. රධ්‍ය අයියා මගේ ගාවට ඇවිත් මගේ ඉණ වටේ අත් දෙක බැඳගෙන උරහිසින් නිකට තියාගත්තා..

" එයා ලැබෙන්න කිට්ටු ඇති නේද.."

" ම්ම්.."

" අපි දෙවෙනි එක්කෙනාව ගේන්නෙ කවද්ද වරද්.."

මම රධ්‍ය අයියගෙ පැත්තට හැරිලා කවුන්ටර් එකට හේත්තු වුණාම ආයෙම ඒකා මාව බදාගත්තා... පුදුම කෝලම් තමා මේ මිනිහගෙත් තියෙන්නෙ.. මම අර අත් දෙක අස්සෙන් මූණ එළියට දාගත්තා..

" ඉන්නවකො ඉතින්.. තාම පලවෙනියා ගෙදරට ගෙනැල්ලත් නැනෙ.."

" අපි දුවෙක් එනකල් ට්‍රයි කරමු.. ඔයාගෙ වගේ බළල් ඇස් දෙකක් තියන.."

" බලමු බලමු.."

රධ්‍ය අයිය අමගේ කම්මුල් දෙක පොඩි වෙලා තැලිලා යන්නම අල්ලගෙන මගේ තොල් වලින් හාද්දක් තියලා මාව උස්සලා අරගෙන කවුන්ටර් එක උඩින් තියලා එහාට වුණා.. ඊටපස්සෙ කෑම එක අරගෙන අවන් එකට දාලා මං ගාවින්ම ඉඳගත්තා.. බැන්දා කියලා පුරුදු වෙනස් වෙන්නැනෙ.. තාම පාන්දර තුනා විතර නැගිටලා රධ්‍ය අයිඅය ඇඳේ නැත්නම් පහළට බැහැඅ බල්ද්දි ෆ්‍රිජ් එක ඇරගෙන පස්සත් දික් කරගෙන ඒකට එබීගෙන ඉන්නවා.. හෙන රෑ වෙනකල් ෆිල්ම් බලනවා.. එහෙමම සෝෆා එක උඩ මොක්කුද දෙන්නා වගේ දපලා නිදියනවා.. උදේට ඇහැරුණාම තමා ඉන්නෙ කොහෙද කියලා දන්නැතුව බිම පතබැව්ලා පිස්සු කෙලගන්නෙ.. අපේ මිනිහට සිහිකල්පනාව නැනෙ.. පාඩම් කරන දවසටනම් රීඩින් රූම් එකේ ඉන්නවා.. මමත් මොකක් හරි පොතක් කියවනවා.. ගෙදර උඩ තට්ටුවෙ ලොකු රීඩින් රූම් එකක් තියනවා.. රධ්‍ය අයියා ඔන්ලයින් ලෙක්චර්ස් කරන දවස්වලට ඒකෙ ඉඳන් තමා ලෙක්චර්ස් කරන්නෙ.. වැඩි සද්ද බද්ද නැති

@Shan

නිසා නිස්කලංකයි.. ඒ ඇරෙන්න ඉරිදා අපි දෙන්නගෙ නිවාඩු දවස.. ඉරිදට ගෙවල් අස් කරනවා.. මිදුලෙ තණකොළ කපනවා.. වාහන සෝදනවා.. එළියට යනවනම් එහෙම යනවා.. පෝයක් සෙට් වුණොත් පන්සල් යනවා අසලි අම්මත් එක්කලා.. මට නයිට් වැටෙන්නෙ හරි අඩුවෙන්.. මාසෙකටම එකක් දෙකක් වගේ.. ඒකත් හොස්පිටල් එකේ අඳුරන ඩොකෙක්ගෙ ඩියුටියක් ඇදලා දෙනවා.. අපේ මනුස්සයා මම නැතුව ගෙදර ඉන්නෙ නෑ.. ඊටපස්සෙ හොස්පිටල් එකේ ඉන්නකල්ම වද දෙනවා.. වරද් එනවකො.. වරද් ආයෙනම් නයිට් දාගන්න බෑ.. වරද් මොන මගුලක්ද අනේ.. වරද්.. වරද්.. ගගා ඉඳලා පහුවදා ගෙදර ආවහම ඉන්නවා මූණ ඉස්කුරුප්පුවක් කරගෙන.. ඒකා තිහක් වුණාට හැසිරෙන්නෙ අවුරුදු පහේ පොඩි එකෙක් වගේ වෙලාවකට..

අපි දෙන්නා කාලා නාලා ලැගේජ් එකකුත් දිගැරගෙන අපි දෙන්නගෙ ඇඳුම් වායක් ලෑස්ති කරගත්තා.. ආධ්‍ය අයියලගෙගෙදර ලයිට් දාලා.. ඒ කියන්නෙ මගෙ ලස්සන මස්සිනා දැන් තමා හොස්පිටල් ඉඳලා ඇවිත් තියෙන්නෙ.. අවීට මේ ටිකේ න'සරි එකේ ඇක්ටිවිටි ඩේ එකකට මොකක්ද තියනවා කියලා එන්න හවස් වෙනවා.. ආධ්‍ය අයියා එයාවත් අරගෙන තමා ගෙදර එන්නෙ.. මාමා ආරු එක්ක  ගෙදර..

" අම්මලා හෙට එයාපෝට් එකට එනවා කිව්වද ඒයි.."

" ඔව් මට උදේ කතාකලා.. හෙට කිව්වට යද්දි අනිද්දා විතර වෙනවනෙ..අනිද්දා රෑට ඩිලිවරි එක තියනවා කිව්වෙ.. අපි දවල් ගිහින් චේන්ජ් කරලා හොස්පිටල් යමු.."

" කලින් යන්න ප්ලෑන් කලේ නැනෙ.. නිවාඩු තිබ්බෙ නැනෙ අපි දෙන්නටම.. අපරාදෙ.."

" අලුත් තාරපැටියා මොන වගේ වෙයිද දන්නෑ නේද.."

රධ්‍ය අයියා මගේ පස්සට එකකුත් ගහගෙන ගිහින් ඇඳේ පෙරළුනා.. මම ලෑස්ති කරපු ලැගේජ් එක පැත්තකින් තියලා ඇඳෙන් වාඩිවුණා.. ඒ සැරේ තාර පැටවෙකුත් මෙකට ගාවගෙන..

" මොන මගුලක්ද තාරාවෙක් ගැනම කියන්නෙ.."

@Shan

මම ඇඳේ හිටපු තඩි තාරාවෙක්ගෙ ප්ලුෂි එකක් ඔලුවට තියාගෙන ඇඳෙන් ඇලවුනා.. මේ මිනිහා තමා මේ සුකුරුත්තන් ගෙදර උස්සගෙන එන්නෙ.. බලන බලන තැන තාරාවො..

" ඔයා ඒ වගේනෙ වරද්.. තාරාවො හුරතල් පාටයිනෙ.. අපි බබාලට තාර පැටව් කියමු.."

" එතකොට තව්සෙ කව්ද.. මහ තාරාවද.."

" නැහ්.. මම රධ්‍ය.. ඔයා තාරාවා.."

රධ්‍ය අයියා පස්සත් උඩ දාගෙන ඇඳේ දපලා මාව ළඟට ඇදලා අරගෙන අත පය සේරගෙන්ම මාව බදාගත්තා..

පහුවදා අපි කැලිෆෝනියා යන්න පිටත් වුණා.. පැය ගාණක් යනවනෙ මෙහෙ ඉඳලා එහෙට යන්න.. එයා අපි ගාවට එන්න හරියටම දවසයි තිබුණේ.. මට පිස්සු වගේ මතක් වෙද්දිත්.. කව්ද ආස නැත්තෙ ඒ හැගීමට.. අපි දෙන්නා ළමයි නැතුව ඉන්න අන්තිම දවසනෙ.. ඒක සමරමු කියලා ෆ්ලයිට් එකේදි හොඳවයින් වයින් බෝතල් දෙක ඇරලා දාලා එනකල්ම නිදාගත්තු එක තමා කළේ.. අනික ලංකාවෙ ගෙව්ව සතිය හුභක් මහන්සියි.. ජොබ් වල වැඩත් එක්කයි.. ගෙවල් වල වැඩත් එක්කයි.. මට අපේ ගෙදර බේබි බ්ලූ ගාපු කාමරේ මැවිලා පෙනෙද්දි ඇඟ ඇතුලේ සමනල්ලු නටනවා වගේ.. මට විශ්වාසයි රධ්‍ය අයියා හරිම ආදරණීය අප්පච්චි කෙනෙක් වේවි.. එයා ආදරණීය බෝයිෆ්‍රෙන්ඩ් කෙනෙක් වෙලා හිටියා.. ඒ වගේම දැනට මම දැකපු ආදරේ පිරුණු හොඳම හස්බන්ඩ් එයා.. ඉතින් අප්පච්චිගෙ රෝල් එකත් එයා ලස්සනට කරාවි.. එයාගෙ හිතේ 'අප්පච්චි' කියලා තියන වචනෙ අඳුරු එපාකරපු හැගීම මැකිලා ගිහින් ඒකට අලුතින් පනක් එකතුවේවි..

අපි කැලිෆෝනියා වල අම්මලගෙ ගෙදර එද්දි දවල් වෙලා තිබුණේ.. අපේ අම්මා ඒ කාමරේ කොට් එකක් තියලා පිරිසිදුව ලස්සනට ඇස්ති කරලා.. ඒ කියන්නෙ මම වෙඩින් එකට කලින් හිටිය කාමරේ.. ඒ මදිවට හෙන අඳුම ලොට් එකක් එයාම ගොතලා.. ඒවා පිළිවෙලට නමලා පැනල් එක්ක කාමරේ තියල තිබුණා.. මුළු කාමරේටම එළිය වැටෙන පාට කර්ටන් දාලා.. අපි ඇවිත් වොශ් දාලා ටිකක් රෙස්ට් එකේ ඉඳලා අම්මා එක්ක කතාකර කර ඉඳලා රෑ හොස්පිටල් එකට ගියා.. ඩොක්ටර් අපිට කතාකල්ලා කලින්ම කියලා තිබුණේ ඩිලිවරි එකට පැයකට තියා ඇවිත් කිට් එකක් චෙන්ජ්

@Shan

කරගන්න කියලා.. ඒ පැයගාණනම් ජීවිතේට අමතක නොවෙන පැයගාණක්..

අවසානෙ මමයි රධ්‍ය අයියයි මාස අටක්ම බලාගෙන ඉඳලා අපේ සුදුපුතාව අපේ අත් වලට අරගත්තා..!!

මම කලින්ම ඉගනගෙන තිබුනෙ පොඩි බබාලා අල්ලගන්නෙ කොහොමද කියලා.. අපිට ඕවා පුරුදු කරනවා හොස්පිට්ල් එකේදි.. එයා මුලින්ම සුදුපාට ලොකුම ලොකු බ්ලැන්කි එකක ඔතලා ගැහි ගැහි මගේ පපුව උඩින් තිබ්බහම එයා අඩන්න ගත්තා.. එයා රෝසම රොසපාට.. රෝස මලක් වගේ.. එහෙට මෙහෙට ලාවට ගැස්සි ගැස්සි ටිකක් වෙලා අඩනවා.. ආයෙම ටික වෙලාවක් අඩන්නෙ නැතුව ඉන්නවා.. මම එයාව අත් දෙකෙන්ම, බෙඩ් එකට වෙලා තුරුල් කරගෙන හිටියා.. මට හිතාගන්න බෑ එයා මගේ අත් දෙකේ ඉන්නවා කියලා..

රධ්‍ය අයියා අපි දිහා බලාගෙන ඉඳලා එකසැරේම ඇස් වල කඳුළු පුරෝගත්තා.. මටත් ඇඩෙන්න එනවා.. මම එයාව පරිස්සමට අල්ලගෙන ඉද්දි රධ්‍ය අයියා හිමිහිට ඇඟිල්ලකින් එයාගෙ කම්මුලක් සිනිඳුවට අතගෑවා.. එයාගෙ අත් චූටිම චූටියි.. හරිම පොඩියි.. බෝනික්කෙක් වගේ.. ඒ දිග ඇස් පිහාටු..

ඒකා ලොකු වෙලා අප්පොච්චගෙම කොපියක් වෙයි කියලා හිතෙනවා..

" එයා ලස්සනයි වරද්.."

රධ්‍ය අයියා මගෙ නලලට හාද්දක් දුන්නා.. මගේ ඇස් පියවෙද්දි කඳුළු කැට වැස්සක් වගේ කම්මුල් දිගේ පල්ලම් බැස්සා.. ඒ හැඟීම මට දැනෙනවා.. හුහක් වෙලා අඩ අඩ ඉඳලා ටිකකින් එයා මගේ පපුව උඩ ගුලි ගැහිලා නිදාගෙන හිටියා.. මම එක අතකින් හිමිහිට ඒ අතක් ඇල්ලුවා.. අල්ලන්නත් ලෝබයි.. හරිම පොඩියි එයා.. රධ්‍ය අයියා සෑහෙන්න වෙලාවක් බබා දිහා බලාගෙන හිටියා..

" මම ආදරෙයි වරද්.."

" මමත්..!!"

@Shan

අන්තිමේ අපි දෙන්නගෙ ලොකුම හීනෙ හැබෑවෙලා අපේ පුතාව අපි ගාවට ආවා.. මුල් දවසෙ හොස්පිට්ල් එකේ ඉඳලා ඊළඟ දවසෙ එයාව ගෙදර එක්කගෙන ආවහම අපේ අම්මා සතුටට මැරෙන්න ගියේ නැති ටික විතරයි.. ඊටපස්සෙ අපිට උපදෙස් කෝටියක් විතර දුන්නා බබාව බලාගන්නෙ කොහොමද කියලා.. මුල් කාලෙදි බබාව හුඟක් පපුව උඩට වෙන්න තියාගෙන ඉන්න තියනවා.. ඒකෙන් තමයි බබාගෙයි අපෙයි අතර skin-to-skin contact එක හැදෙන්නෙ.. ඒ කියන්නෙ ශර්ට් එක අයින් කල්ලා පපුව උඩ තියාගෙන ඉන්න ඕන.. අනික කිරි දෙනකොටත් එයාව පපුවට තුරුල් කරගෙන ඕන කිරි දෙන්න.. රධ්‍ය අයියා බබාව වඩාගද්දි අපි අම්මා රෙඩි පිට ඉන්නෙ බබා වැටෙයිදෝ කියලා අල්ලගන්න.. එයාට එච්චර චූටි බබාලා හුරු නෑ.. කවදාවත්ම වඩාගෙන නැනෙ.. ඒත් දවසක් දෙකක් යද්දි ඉබේම හුරු වුණා.. අනේ!! එයා රධ්‍ය අයියගෙ පපුව උඩට වෙලා නිදාගෙන ඉද්දි හරි චූටියි වගේ.. හුරතල් පාටයි.. රධ්‍ය අයියා දවසෙම එයා ගාවටම වෙලා ඉන්නවා මූණ දිහා බලාගෙන.. එයා අතක් පයක් හෙලෙව්වොත් ඒක ලොකු දෙයක්වගේ මාවත් ඇදගෙන ඇවිල්ලා පෙන්නනවා.. එයා කිරි බොන්නෙ මං ගාවට ඇවිල්ලා.. මම පපුවට තුරුල් කරගෙන කිරි බෝතලේ කටින් තිබ්බහම එක අතකින් මගේ පපුව අල්ලගෙන කිරි බොනවා පැය බාගයක්වත්.. මගෙ මූණ දිහාත් බලාගෙන ඉන්නවා විනාඩි දෙක තුනක්.. රධ්‍ය අයියා මට හේත්තු වෙලා එයාගෙ කකුලක් අල්ලගෙන හාදු දෙනවා.. එක එක කෝලම් කරනවා..

අපේ යාළුවො පිරිවරත් කෝල් කල්ලා අපිට විශ් කළා.. පඩිපෙළේ ෆොටෝ පේළියට තව ෆොටෝ එකක් එකතු වෙලා අපේ පවුලට අලුතින් එක්කෙනෙක් එකතුවුණා.. ඒ දැනෙන හැඟීම කියාගන්න වචන නැති තරම්.. මුළු දවසක් වුණත් එයාගෙ පොඩි පිරුණු කම්මුල් දිහා බලාගෙන ඉන්න පුළුවන්.. හරියට රෝස මලක් වගේ.. කොල්ලෙක්..

අන්තිමට ඒ හීනෙත් හැබෑවුණා..





ආ දැන්නම් ඔපිසියල් ඇන්ටිලා ටික හරිනෙ.. ඇම්ටිලා අම්කල්ලා එන්න ශුඩුපුතාව බලලා යම්න.. කලවැද්දා උඩ ඉඳන් බලාගෙන ඉන්නෙ සේරම.. හරිදෙ..

@Shan

එන්නාම්.. ලව් යූ..   ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 176 කොටස

" ඔයා ලෑස්තිවෙලා ඉවරද ඒයි.. එන්නකෝ.."

" පොඩ්ඩක් ඉඳහන් මේ කලිසමේ සිප් එක උඩට එන්නෑනෙ මගුල.. ආ හරි.."

මම මගේ අතේ ඉඳගෙන එහෙට මෙහෙට දඟලන සුදුපුතාව අල්ලලා හරියට වඩාගත්තා.. මෙකට යන්තම් මාස හයක් වුණා විතරයි නිදාගන්නෙත් නෑ.. එකතැනක ඉන්නත් බෑ.. දඟලනවා දඟලනවා අලි විසේ හැදිලා වගේ.. අපි, පොඩ්ඩක් හරි නිදි වෙලාවට කොට්ට හතරවටේට තියලා මෙහාට වුණොත් කොට්ට සේරම බිම වට්ටගෙන, නෙට් එකෙනුත් එළියෙ ඉන්නෙ.. දඟලනවා කියන්නෙ.. මෙහෙම එකෙක් මගෙ ජීවිතේට දැකලා නෑ.. දැන් එයා යන්තම් වාඩිවෙනවා.. ඊටපස්සෙ බැලන්ස් නැතුව බොහ් ගාලා එහාපැත්තට වැටෙනවා.. අපේ පවුල් උපදේශන සේවාව.. අල්ලපුගෙදර වෛද්‍ය ආධ්‍ය කිව්වෙ 'කොට් එකේම තියලා තියන්න වුටියො, තුවාල කරගන්න දෙන්න එපා' කියලා.. අයියනම් කියයි.. කොටින්ම දැන් මේ ගෙදර පොල් ගාන්නෙත් සද්දයක් ඇහෙන්නැතිවෙන්න.. ඇයි මෙකා සිරියහනෙ සතපවලා ඉන්නකොට හූනෙක් දිව්වත් ඇහැරිලා මම එනකල්ම අඬනවා.. එක්කො රධ්‍ය අයියා එයාව වඩාගෙන ගේ වටේ ඇවිදින්න ඕන.. මං ගාවට ආවොත් ශර්ට් එක අස්සට රිංගගන්නවා.. ආයෙ එළියට එන්නෙ නෑ වරුවකටවත්..

මදෑ අප්පොච්චා වගේ පුතෙක් හදාගත්තා..

ටිකකින් ළමයින්ගෙ අප්පොච්චි බේබි බෑග් එකකුත් උස්සගෙන පහලට බැහැගෙන ඇවිත් මගෙන් බබාව ඉල්ලගත්තා.. රධ්‍ය අයියගෙ අතට ගියා විතරයි ආයෙම දඟලන්න ගත්තා.. රධ්‍ය අයියා එතකොට එයාව හරහට තියාගෙන උස්සගෙන යනවා.. මෙකා ගේ දෙක වෙන්න හයියෙන් හිනාවෙනවා.. අපි දෙන්නා මැද්දෙ තමා සුදුපුතා රෑට නිදාගන්නෙ හුඟක් වෙලාවට.. එයා තනියම තිව්වහම අඬනවා මහ හයියෙන්.. ඊයෙ නිදාගන්න ගිහිල්ලා රධ්‍ය අයියගෙ කකුල පැටලිලා ඇඳේ වැදුණා කියලා මේ කොල්ලා හිනාවෙලා හිනාවෙලා.. මම හිතුවෙ හුස්ම ගන්න බැරි වෙයි කියලා.. හෙනාතල් යන්නෙ හිටපු ගමන්.. ඒ අස්සෙ අපේ මනුස්සයා සේරටම එහා.. මේ පොඩි එකාව රීඩින් රූම් එකෙන් තියාගෙන පාඩම

@Shan

කරනවා.. පාඩම් කරන ඒවා කියලා දෙනවා.. මම ඇහුවහම මොකක්ද ඔය කරන්නෙ කියලා.. එහෙම තමයිලු.. කාටහරි කියලා දුන්නහම මතක හිටිනවලු.. හරිම අගෙයි අප්පයි පුතයි..

" මම එන්නෙ නෑ වරද්.. ඔයා පුතා එක්ක ගිහින් එන්න.."

" හරි හරි අනේ.. යමුකො.."

රධ්‍ය අයියා මට පුතාව උකුළට දීලා අනිත් පැත්තෙන් නැග්ගා.. අද පෝය.. හවස් වෙලා නිසා අපි පන්සල් යන්න කියලා හිතුවෙ.. ඒ ගමන්ම අප්පච්චිව බලන්න යනවා.. පුතාව පෙන්නුවෙ නැනෙ අප්පච්චිට.. දුස්ට මාමණ්ඩි අදවත් අහක බලාගත්තෙ නැතොත් හොඳයි.. දුස්ට ගාමිණී අධිකාරි..

" කොල්ලො!! දෙනවා දෙකක් මම.."

" මම්-මම්-"

මගේ අතේ ඉඳගෙන ඇස් දෙකත් ලොකු කරගෙන අමුතු බැල්මක් හෙලාගෙන ඉඳපු එකා එකසැරේම ශර්ට් එක අස්සෙ ඔලුව ඔබාගත්තා.. මෙකට තියෙන්නෙ පුදුම විසයක්නෙ.. තාරාවෙක් වගේ පස්සත් උඩ දාගෙන.. පැම්පර්ස් ඇන්දුවහම ඒකගෙ පස්ස ලොකුවට පේනවා.. අප්පච්චිගෙ වගේ ලොකුවට හැදිලා එන්නෙ නැතෑ මගෙ පුතාගෙත්.. ගැම්මක් පුතේ.. තාත්තිට ඔයා ගැන ආඩම්බරයි.. රධ්‍ය අයියා මගේ දිහා බලලා කට දෙහි ලෙල්ලක් වගේ හදාගත්තා..

" අනේ වරද්..!!"

" මොකද.."

" මොකුත් නැහ්.. මොනවද ඔය කොල්ලට පුරුදු කරලා තියෙන්නෙ.."

" මම පුරුදු කළේ නෑ අනේ.. ඒකා තච්සෙ වගේ මහ නැහැදිච්ච කමට එහෙම කරන්නෙ.."

රධ්‍ය අයියා මගේ පපුවෙ එල්ලීගෙන සිරි නරබ නරබ යන තාර පැටියගෙ පස්සට එකක් හිමිහිට දුන්නහම ඒකා ඔලුව උස්සලා රධ්‍ය අයියා දිහා

@Shan

බලාගෙන හිටියා.. අර දුස්ට මූණ එහෙමම පිහිටලා තියනවා.. හිනාත් යනවා ඒ අස්සෙ.. ඇහිබැම උරුක් කරගෙන කට ඉරක් වගේ හදාගෙන..

" තාත්ති කාගෙද සුදුපුතා.. අප්පච්චිගෙ නේද.. නේ..??"

අර දුස්ට ආඩම්බර පාට මූණ පැත්තක් රතුවෙගෙන එද්දි රධ්‍ය අයියා මගේ කම්මුලට හාද්දක් දුන්නහම අරකා කෑගහලා අඩන්න පටන්ගත්තා.. අම්මපා මේ මිනිහා..

" අයියෙ!!"

" ඉතින් ඇත්ත-හරි හරි තාත්ති සුදුපුතාගෙ.. කෝ එන්නකො අප්පච්චිගෙ උකුළට.. මගෙ සුදුපුතා අඩන්නෙ නානෙ.."

රධ්‍ය අයියා කාර් එක අයිනට කල්ලා අර රැහැයි කොල්ලව උස්සගෙන කාර් එකෙන් බැහැලා මගේ පැත්තට ආවා.. මම ඩ්‍රයිවින් සීට් එකට කකුලක් තියනා ඒ පැත්තට පැනගත්තා.. රධ්‍ය අයියා මම හිටපු සීට් එකෙන් ඉඳගෙන උකුළෙන් කොට්ටයක් තියාගෙන ඒකෙන් පුතාව ඉන්දව ගත්තා.. දැන් යනවා ශෝක් එකට අප්පච්චිගෙ පපුවට හේත්තුවකුත් දාගෙන පස්සත් දික් කරගෙන..

" මේකා මහ හොර කොල්ලෙක්නෙ වරද්.."

" ඒකතමා තච්සෙ වගේ කිව්වෙ.. බලනවකො ඇඩුවෙ නෑ වගේ යන හැටි.."

සුදුපුතා එළියෙ තියන දේවල් දිහා ඇස් දෙකත් ලොකු කරගෙන කටත් ඇරගෙන බලාගෙන යනවා.. රධ්‍ය අයියා බෑග් එක අරගෙන ඒකෙ හදලා දාලා තිබ්බ කිරි බෝතලේ අරගෙන එයාට පෙව්වා.. ඔක බීලා පැම්පර් එකෙන් එකක් චූදාගන්නනම් එපා පුතේ.. සීයා බලන්නනෙ යන්නෙ.. සීයට මම ඊයෙ කේක් එකක් හදාගෙන ගිහින් දුන්නා.. ඊයෙ සීයගෙ බර්ත්ඩේ එකනෙ.. උදේ මම එනකල් හොරා වගේ බලාගෙන ඉඳලා මම එනවා දැකලා හිමින්සැරේ ඇඳට ගිහින් ඔරවගෙන ඉන්නවා.. අධිකාරි මුණුබුරා දැකලා මොනවා කියයිද දන්නෑ.. අප්පච්චිට මම කිව්වා මුණුබුරා ගෙදර ඉන්නෙ.. වෙලාවක එක්කන් එන්නම් කියලා.. අද රධ්‍ය අයියත් ඉන්න නිසා එන්න හිතුණා.. වැඩට එන අස්සෙ පුතාව එක්කන් එන්න බෑනෙ.. මමයි අයියයි දෙන්නම වැඩට යන දවස්වලට අසලි අම්මා පුතාව බලාගන්නවා..

@Shan

අසලි අම්මට වැඩක් නැනෙ ඉතින්.. එයා හරි ආසයි මුණුබුරෝ ටික පිරිවරාගෙන ඉන්න.. හිටි ගමන් මෙහෙ ඇවිත් අවීචයි ආරුචයි උස්සගෙන එහෙ ගෙදර යනවා.. අසලි ආච්චිඅම්මා සසට කෑම හදලා දෙනවා කියලා උන් දෙන්නා ආසයි අම්මා ගාව ඉන්න හරි ආසයි.. මේ දවස්වල මල්ලි බබාව ගාඩ කරන්න අවී අපේ ගෙදරමයි ඉන්නෙ..

හොස්පිටල් එකේ පාකින් ලොට් එකේ මම කාර් එක පාක් කල්ලා අප්පච්චිට දෙන්න ගෙනාපු කෑම දාලා තියන පික්නික් බොක්ස් එක අරගෙන මම කාර් එකෙන් බැස්සහම රධ්‍ය අයියත් පුතාව වඩාගෙන එළියට ආවා..

" ඔයා ගිහින් එන්න.."

මම පික්නික් බොක්ස් එක බොනට් එක උඩින් තියලා පුතාව වඩාගත්තා..

" ඔයා එන්නෙ නැද්ද.."

" මම ඔයාට කියලා තියනවනෙ වරද්.."

" ඒත් අයියෙ.. ඔයත් දැන් පුතෙක් ඉන්න අප්පච්චි කෙනෙක්නෙ නේද.. එන්න හිතුණොත් එන්න.. මම බලාගෙන ඉන්නවා.."

මම රධ්‍ය අයියගෙ උරහිස ගාවට හාද්දක් දීලා පික්නික් බොක්ස් එකත් අරගෙන හොස්පිටල් එක ඇතුලට ගියා.. දන්න අඳුරන නර්ස්ලා ඇවිත් බබාව බලලා මාත් එක්කත් කතාකල්ලා යනවා.. මම අප්පච්චිව බලන්න එහෙට යද්දි අප්පච්චි ජනේලෙ ගාව පුටුවක් තියාගෙන වාඩිවෙලා මම ඈත එන දිහා බලාගෙන හිටියා.. එකසැරේට මාව දැකලා නැගිටලා ඇතුලට ගියා.. දැක්කනෙ.. මේ අධිකාරි මාමණ්ඩියා වෙනස් වෙන්නෙ නෑ..

මම පුතාවත් වඩාගෙන අප්පච්චිගෙ රූම් එකට ගිහින් පික්නික් බොක්ස් එක මේසෙන් තිබ්බා.. අප්පච්චි පුදුම වෙලා වගේ මගේ අතේ ඉන්න පුතා දිහා බලාගෙන හිටියහම මම එයාවත් අරගෙන හිටින් අප්පච්චි ගාවින් ඉඳගත්තා.. අප්පච්චි එහාට වෙලා ඉඳගත්තා..

" අප්පච්චි මේ ඉන්නෙ අපේ පුතා.. සුදුපුතා මේ කවද බලන්න.. පුතාගෙ සීයාතාත්තා.."

@Shan

සුදුපුතා අප්පච්චි දිහාම හෙන ආඩම්බර පාට මූණක් හදාගෙන බලාගෙන ඉඳලා අතක් දික් කල්ලා අප්පච්චිට එකක් ගැහුවා..

" හම්ප්!!"

හරිම අගෙයි.. ඔය කළේ පුතණ්ඩියා අගේ ඇති වැඩක්.. මම ඒකගෙ අතින් අල්ලගත්තා.. අප්පච්චිගෙ මූණෙ හැමතිස්සෙම තද වෙලා තියන මස් පිඩු ලාවට ලිහිල් වෙනවා වගේ මට දැනුණා.. ඒ මූණෙ හැඟීම් එකකට එකක් කියවගන්න බෑ.. සැරින් සැරේ වෙනස් වෙනවා.. ටික වෙලාවකින් අප්පච්චි සුදුපුතාගෙ ඇඟිල්ලක් අතකින් අල්ලලා හෙලෙව්වහම එයා හිනාවුණා.. අප්පච්චිත් පේන්න නොපේන්න හරිම හීනියට හිනාවුණා..

" නම මොකක්ද.."

" මෙයා

**වරුන් රධීශ් අධිකාරි**

.. ලස්සනයිද.. මමයි රධ්‍ය අයියයි තිබ්බෙ.."

" ම්ම්.."

අප්පච්චිගෙ නාමෙත් සුදුපුතාගෙ නමෙ අගට තියෙද්දි අප්පච්චි සුදුපුතා දිහා බලාගෙනම හිටියා.. එයාගෙ හිතේ සතුටක් ඇතිවෙලාද මන්දා.. ඒ එක්කම අප්පච්චි කාමරේ දොර දිහා හැරිලා බලලා ගැස්සුණා.. මමත් ඇදෙන් නැගිට්ටා..

" ඔහ්.. ඔයා ආවද.."

" ම්ම්.."

මම රධ්‍ය අයියගෙ අතට පුතාව දීලා එයාගෙ පිටට තට්ටුවක් දාගෙන එළියට ගිහින් නර්ස්ව හම්බුණා.. සමහරවිට රධ්‍ය අයියා තේරුම් ගන්න ඇති.. එයත් අප්පච්චි කෙනෙක්නෙ.. තමන්ගෙ දරුවෙක් එහෙම කරද්දි.. එයා ඒ පවට අහුවෙන්න ඕන නෑ.. එයා කවදහරි මේවා ගැන පසුතැවෙද්දි පරක්කු වෙලා තිබුණොත්.. ඒක හිතේ නිදහස නැති කල්ලා දානවා.. එහෙම වෙන්න ඕන

@Shan

නෑ.. මටත් ඕන වුණේ එයා කාලෙත් එක්ක දෙයක් තේරුම් ගන්නවා දකින්න..

රධ්‍ය අයියා පැය බාගයක් විතර අප්පච්චි එක්ක කතාකරනවා මම දැක්කා.. මම එළියට වෙලා මම දන්න කියන පේශන්ලා දෙතුන් දෙනෙක් එක්ක කතාකළා.. සමහරු ඉන්නවනෙ එයාලට හොඳට දේවල් තේරෙනවා.. හිටපු ගමන් රෝග ලක්ශන මතුවෙනවා..

පැය බාගෙකට විතර පස්සෙ රධ්‍ය අයියා බබාවත් වඩාගෙන කාමරෙන් එළියට ඇවිත් මගේ අතකින් අල්ලගත්තා.. මම එයාගෙ අත අස්සෙන් අතක් දාගෙන එන්න ආවා.. රධ්‍ය අයියා කාර් එකේ දොර ඇරලා බබාව ඇතුළින් තියලා එහෙමම කාර් එකට හේත්තු වුණා.. නොකිව්වට එයාහිටියෙත් ඔක හිතේ තියාගෙන හිත හිතනෙ.. දැන්වත් හිතට නිදහසක් දැනුණොත් හොඳයි..

" ඇයි මේ.."

" ම්ම්..?? අනේ මන්දා වරද්.."

මම රධ්‍ය අයියගෙ අත් දෙකින් අල්ලගත්තා.. එයා දුකින් නෙ ඉන්නෙ..

" ඔයාට මොනවද හිතෙන්නෙ.. අප්පච්චි බලන්න ආපු එක හොඳයි නේද.."

" දැන් හිතෙනවා හොඳයි කියලා.. එයා ඒ තරමට වෙනස් වුණේ කොහොමද.."

" එහෙම වුණා.. ඔයා හුඟ කාලෙකින් නෙ අප්පච්චි එක්ක කතාකළේ.. මටනම් හුරුයි හැමදාම බලලා යන්න එන නිසා.."

" ම්ම්.."

රධ්‍ය අයියා මගේ අත් දෙක එයාගෙ අත් දෙක මැද්දට අරගෙන හාද්දක් දුන්නා..

" ඔයා අර මමත් අප්පච්චි කෙනෙක්නෙ කිව්ව ටික මගේ හිතට වැද දෙනවා.."

" ඒකෙන් හරි ඔයා අප්පච්චි හමුවුනානෙ.. අප්පච්චිට හරි සතුටු ඇති.."

@Shan

රඨ්‍ය අයියා සෑහෙන්න වෙලාවක් කල්පනා කල්ලා අන්තිමට කාර් එකෙන් ඉඳගත්තා.. වෛර කරන්න ඕන නෑ කාටවත්ම.. එහෙමනම් අසලි අම්මා අප්පච්චිට කොයිතරම් වෛර කරන්න ඕනද.. එයාළු මුළු ජීවිත කාලෙම ඒ මනුස්සයගෙ හිරකාරයෙක් වෙලා විඳෙව්වා.. ඒත් අදටත් ඇවිත් අප්පච්චිව බලලා කතාබහ කල්ලා යනවා..එයා ඉන්න තත්වෙයි අපි තේරුම්ගන්න ඕන.. අසලි අම්මා ඩොක්ට කෙනෙක්නෙ.. එයාට තේරෙනවා දැන් අප්පච්චිගෙයි කලින් අප්පච්චිගෙයි වෙනස.. කාලෙත් එක්ක එයා හොඳ වෙද්දි පහුගිය දේවල් ගැන සෑහෙන්න පසුතැවෙන්න පටන් ගත්තා.. දැනුත් එහෙමයි.. අපි කෙනෙක්ට හිතා මතා හරි නොහිත හරි වැරැද්දක් කළොත් ආපස්සට ඒකෙ පසුතැවීම කවදාකහරි හිතේ ඇතිවෙනවා.. මම කැමතිම නැති දෙයක් තමයි පසුතැවීම.. රඨ්‍ය අයියා එහෙම වෙන්න ඕන නැනෙ.. එයාටත් පුළුවන් අප්පච්චිව බලලා යන්න.. එයාට දැනුත් හිතට මොකක් හරි හැඟීමක් දැනෙනවා ඇතිනෙ ඒ එයාගෙ අප්පච්චි කියලා..

අපි හුඟ දවසකින් කැළණි පන්සල් ආවෙ.. සුදුපුතා කලින් පන්සල් ඇවිල්ලම නෑ.. එයා අඩුවෙන්නෙ එළියට එන්නෙ.. බෙහෙත් විදින්න යනවා ඇරෙන්න එන්නෙම නෑ.. අසනීප වුණාම මම ගෙදරම උන බලලා බෙහෙත් දෙනවා.. මෙකව උස්සගෙන සෙනඟ වැඩි තැන්වලට ගියෝතින් ටිකකින් අඬන්න ගන්නවා.. එයා කැමති නෑ එච්චර සෙනඟ ඉන්න තැන් වලට යන්න..

" මම පුතාව ගන්නම්.."

" හා.."

රඨ්‍ය අයියා මගෙ රුහැයි පැටියව වඩාගත්තම මම පිටිපස්සෙ තිබ්බ පන්සල් ගෙනියද්දි අරගෙන යන පොඩි වේවැල් බෑග් එක අතට ගත්තා.. අද පෝය නිසා කැළණියෙ සෙනඟ පිරිලා.. මෙකා අඬයිද දන්නෙ නෑ.. රඨ්‍ය අයියා එයාව දෙපැත්තට නළව නළව වඩේගෙන ඉද්දි එයා හතරවටේම පුදුම වෙලා වගේ අර දුස්ට මූණත් පුම්බගෙන බලාගෙන හිටියා..

මට අපි දෙන්නා මුලින්ම මේ පන්සලට ආපු දවස මතක් වෙනවා.. අපි දෙන්නම කොච්චර පන්සල් ඇවිල්ලා ඇද්ද.. මේ පන්සලටම අපි බැන්දට පස්සෙත් ආවා.. දැන් පුතා එක්කත් එනවා.. හැමතැනම බලද්දි ඉස්සරකාලෙ මතක් වෙනවා.. අවුරුදු දහනමයෙ මමයි.. අවුරුදු විස්සෙ රඨ්‍ය අයියයි.. දැන් මට විසි නමයක්.. රඨ්‍ය අයියට තිහක්.. කාලෙ සෑහෙන්න වෙගෙන්

@Shan

ගෙවීගෙන ගිහිලා.. ඒ ගස් කොළං හැමදේම තිබ්බ විදියටම තියෙද්දි අපි විතරක් වයසට යනවා.. ඒක නවත්තන්න විදියක් නැනෙ..

මම නෙළුම් මල් වල දඬු කඩලා බැග් එක අස්සට ඔබලා ඒවට පැන් ඉහලා පූජා කළා.. සුදුපුතත් මෙලෝ දෙයක් තේරෙන්නෙ නැති වුනාට හැමතැනම කලබලෙන් බලාගෙන ඉන්නවා.. රධ්‍ය අයියත් වැන්දා.. අපි වගේ යන සමහරු අපි දිහා හැරිලා බැලුවා.. සමහරු දන්නෙ නෑ අපිට බබෙක් ඉන්නවා කියලා.. කොහොම වුණත් මුල් කාලෙ ඉන්ටවිව් අරවා මේවට පස්සෙන් එලව එළව කරදර කළත් ඒ එකක්වත් වෙන්නෙ නෑ කියලා දැනගෙන ඒ මිනිස්සු ආයෙ අපි පස්සෙන් ආවෙත් නෑ.. සමහරු කියනවා අපේ ලොකුකම කියලා.. එහෙම ලොකු කමක් නෙමෙයි.. ඒත් අපි දෙන්නම ඕවට කැමති නෑ.. අනික දැන් මම බැඩ්මින්ටන් ප්ලෙයර් කෙනෙක් නෙමෙයිනෙ.. ඒ ෆීල්ඩ් එකේ සමහර දේවල් වලට තාම සහභාගී වුණාට ඉස්සර වගේ ඒකම කර කර ඉන්න තරම් වෙලාවක් නෑ.. කොහොම කිව්වත් අපි පවුල මුලට දාලා හිතන්න ඕන.. පිට තියන ප්‍රශ්න කුණුගොඩවල් ගෙදර ගෙනැත් හලාගෙන හරියන්නෙ නැනෙ.. ඒක අපේ ගෙදර.. ගෙදර ඉන්න ඕන හිත නිදහසේ.. ඒ සැනසීම තියෙන්න ඕන.. කොහොමත් අපි දෙන්නා ජොබ් වල ප්‍රශ්න ගෙදර ඇවිත් කියවන්නෙත් නෑ..

ඊටවඩා කොච්චර වැඩ තියද ගෙදර ඇවිල්ලා කරන්න.. නේත..

" මම්-මම්-"

මගෙ රූහැයි පැටියා අප්පච්චිගෙ අතේ ඉඳලා ඇති වෙලා මගේ පැත්තට අත දික් කලාම මම එයාව වඩාගත්තා.. එයා මගේ කම්මුලට කම්මුලක් හේත්තු කරගත්තා. ඒකගෙ කම්මුල් දෙක ඇපල් ගෙඩියක් වගේ පිම්බිලා තියෙන්නෙ.. මේ දුස්ට මූණට ආදරේ හිතෙනවා අප්පා.. රධ්‍ය අයියට මං දිහා බලාගෙන ඉඳලා හිනාඉගුහා.. රධ්‍ය අයියගෙ හිච්චි කාලෙ ෆොටෝ තියනවා අසලි අම්මලගෙ ගෙදර.. මගේ අතේ ඉන්න රූහැයි කොල්ලා වගේමයි.. ඒත් මේ කොල්ලා ඊටවඩා හුහක් සුදුයි.. බාගයක් ඇමරිකන් නෙ.. කොණ්ඩෙ තඹ පාටයි.. ලොකු වුණාම කෙල්ලොන්ගෙන් පරිස්සම් වෙලා ඉන්න කියන්න ඕන..

රධ්‍ය අයියා පහන් පත්තු කරනකල් මම සුදුපුතාවත් වඩාගෙන මෙහෙට වෙලා හිටියා.. එයා ඇස් දෙකත් ලොකු කරගෙන පහන් එළි දිහා බලාගෙන

@Shan

හිටියා.. එයාගෙ බෝල ඇස් වලට පහන් වල එළිය වැටිලා දිලිසෙනවා.. හරි ලස්සනයි.. ටිකකින් මගේ උරහිසට මූණ තියාගත්තා..

" නිදියගන්නද මේ හදන්නෙ.. මිම..??"

" මිම්-මිම්-මිම්.."

" මම මම නෙමේ දැන් ගෙදර ගිහින් වොශ් දාලා ඕන නිදාගන්න.. හරිද.. සුදුපුතා.."

" එයාට නිදිමතක් ඇවිල්ලද.."

" පුතේ මේ බලන්නකො.. ඔයාට හැපි කව්වෙක් පෙන්නන්නද මම.."

" මොකක්ද වරද් අර ඔයා ඉස්කෝලෙ නටපු සිංදුව.. නන්දා නේද.. මට ඒක මතක් වුණා එකසැරේට.."

" ඒ මොකද එකසැරේට ඒක මතක් වුණේ.. අනේ මේ..!! ඒ පොඩිකාලෙනෙ.."

" නෑ අප්පච්චි දැක්කහම අර දුවගෙන ගිහින් අප්පච්චිගෙ මූණට කිව්ව එක මතක් වුණා.. උඹ අපේ පවුලට වශියක්වත් කළාද.."

" නැත්තං.. බෙන්තර ගඟෙන් එහානෙ.. ලේසි නෑ හරිතෙ මම අධිකාරි පවුලම දැලේ දාගන්නවා.."

" අනේ ඔව්.."

" ඉතින් ඇත්තනෙ.. දැන් බලන්න තවුසෙගෙ අයියා කාගෙද.. මගේ.. තව්සෙ කාගෙද.. මගේ.. ඒ වුණාට අප්පච්චි මගේ කියන්න මොකක්ද වගෙ ඒයි.. මාමණ්ඩිට ගරු කරන්න එපෑ මොකක් වුණත්.."

රධ්‍ය අයියා මගේ ඔලුවට ටොක්කක් ඇන්නා.. සැක් වටේ පිටේ ඉන්න මිනිස්සුත් හිනස්සනවා මේ මිනිහා..

" අයියෙ..!!"

" පන්සල් ඇවිලවත් ඔක පොඩ්ඩක් වහගෙන ඉදපන්කො.."

@Shan

" බෑ ඇයි මොනව කරන්නද.."

" ගෙදර ගියාම කියන්නම්.."

රඩ්‍ය අයියා හෙන මනමාල හිනාවකුත් දාගෙන පඩිපෙල බැහැලා ගිහින් අත් දෙක සෝදගත්තා.. පන්සල් ඇවිත් කියන කතාද මේ මිනිහා කියන්නෙ.. පුතේ උඹනම් අප්පච්චි වගේ හැදෙන්නෙපා.. මම වගේ හැදෙන්න.. මම රටක් අඬවපු මනුස්සයෙක්.. රට ඕන්නෑ මගේ මාමණ්ඩියව අල්ලාත්තනෙ.. කොච්චර දෙයක්ද.. මම වගේ ඉන්න ඕන..

අපි පන්සල් ගිහින් වැඳලා පුදලා රෑ වෙන්න එග්දර ආවා.. පුතා එතකොටත් හොඳටම ඉනිදාගෙන හිටියෙ.. ඒකනිසා එයාව පිටිපස්සෙ බේබි කැරියර් එකේ තියලා හොඳට පොරවලා අපි දෙන්නා කියව කියව හිටියා.. අපිත් හුඟ දවසකින් එළියට ආවෙ.. ඉස්සරනම් ගෙදරක ඉන්නෙ නෑ හැමතැනම ඇවිදිනවානෙ.. දැන් එහෙම බෑ පුතා ඉන්න නිසා.. කාලෙන් කාලෙට අපේ ජීවිත වෙනස්වෙනවා..

" ඔයාට මතකද අපි දෙන්නා මුලින්ම මෙහේ අපු දවස.. පෝය දවසක.."

" ඔව් අර බැඩ්මින්ටන් ක්ලබ් එකෙන් ටෙලිපෝට් වුන දවසෙනෙ.."

" මතකයි නේද.."

" මතකයි හලෝ.. නිකමට හිතනවකො මට ආයෙ සිහිය එද්දි මතකෙවත් නැතිවෙලා තිබ්බනම් අර ෆිල්ම් වල වගේ.. දෙයියනේ ඔයා මොකද එතකොට කරන්නෙ.. දැන් තවුසෙ ඇවිත් 'වරද්!!' කිව්වහම මම දන්නෑ වගේ 'කවුද මල්ලි ඔයා' කියලා ඇහුවනම් එහෙම.. මොකද කරන්නෙ.."

" මම.. කහපාට රෙද්දකුත් හැට්ටෙකුයි ඇඳගෙන 'නාඩගමට ටීටරේට නැතුවම බැරි නන්දා' කියලා උඹ ඉස්සරහා නටලා පෙන්නනව.. එතකොට මතක් වෙයිනෙ.."

" ඔව නටපන්.. හැඩට ඉඳී.."

නෙද්දකින් කිව්ව කතාව මේ මිනිහා.. මම මගේ එහාපැත්තෙ ඉඳපු පොලොස් කොට්ටෝරුවටපයින් එකක් ඇන්නා.. රඩ්‍ය අයියා මගේ බෙල්ල

@Shan

වටේ අතක් යවලා මාව ළඟට ඇදලා ගත්තා.. කවදහරි බෙල්ලඟ හිරවෙලා තමා මට පරලෝ සැපත් වෙන්න වෙන්නෙ..

" ඔයා තරම් හැඩට නටන්න බැනෙ වරද්.. ඔයා නටපුවා අපිනෙ දන්නෙ.. ආ නෑ සොරි.. මමනෙ දන්නෙ.."

නරක සමනලයා ආවෝ~~~

සුදුපුතාව බලන්න ආපු හැමෝම දළඹු පැටවුන්ට ස්තූති වේවා අනේ.. දෙයියනේ සිව්ලිමේ කලවැද්දටත් කෙහෙල් කැනක් ගෙනාපු දැරිවියොන්ට ස්තූතියි..

සේපාලිකා අවසානෙන් හමුවෙමු එහෙනම්.. ඒක දිග චැප්ටර් එකක් වේවි.. අද විතරනෙ එන්නාම.. ලව් යූ කියන්න පුළුවන්..

එන්නාම්.. ලව් යූ.. ❤

තැන්ක් යූ සෝ මච් මන්දීනා.. මම ආදරෙයි අනෙ...

තැන්ක් යූ සෝ මච් අචිනියෝ~~~ මම ආදරෙයි..

අනේ තන්ක් යූ වන්දනා.. ආදරේම ආදරෙයි..

@Shan

අනේ මම හුඟක් ආදරෙයි මගෙ දළඹු පැටවුණේ..   ❤

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවූවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan

# 177 කොටස(අවසාන කොටස)

" මහ්.. තාත්තී.."

" sleep some more.. ඔයා නිදාගන්න ලේට් වුණානෙ සුදුපුතා.."

මම මගේ ඇඟේ හතර අතේ වෙලාවෙන ඉන්න සේරම අඩු ටික එහාට මෙහාට කල්ලා ඇඳෙන් බැහැගත්තා.. මම නම් කියන්නෙ මේ ගෙදර අනිත් කාමර හැදුවට වැඩක් නෑ.. මේ කාමරේම විතර ඇඳක් හැදුවනම් හරි.. මුළු ගෙදරටම නිදාගන්න තිබ්බා.. ඒ මදිවට තුන් හතරදෙනෙක්ම වෙලාගෙන ඉදලා මගේ ඇඟත් කකියනවා..

මම බාත්‍රූම් එකට ගිහින් මූණ සෝදගෙන කාමරේ දොරත් වහගෙන පහළට බැස්සා.. වෙලාව හය හමාරයි.. මේ දවස්වල අවුරුදු නිවාඩුව නිසා ගෙදර කවුරුත් කොහෙවත් යන්නෙ නෑ.. ගෙදරමයි ඉන්නෙ.. ඉස්කෝලෙත් නිවාඩුවනෙ.. මමත් හොස්පිටල් නිවාඩු දාලා ගෙදර ඉන්නවා.. කුස්සියෙ පැත්තෙන් තියන ජනේලෙන් ආධ්‍ය අයියලගෙ ගෙදර ලයිට් දාලා පේනවා.. එහේනම් කොයිවෙලෙත් ඔය කාමරේ ලයිට් දාලමයි තියෙන්නෙ.. අවී මේ දවස්වල පාඩම් කරනවා.. එයාගෙ කාමරේ තමා මෙහේට පේන්නෙ.. ආධ්‍ය අයියා අවදි වෙලා ඇති..මම ඒ පැත්තෙ ජනේලෙ ඇරියා.. උදේ පාන්දර ආපු සීතලම සීතල හුළං පාරක් මගේ මූණට වැටිලා තිබ්බ කොණ්ඩ කැලි ටික එහේ මෙහේ කරගෙන ගියා..

හැමදාම මෙහෙම තමයි.. මම හුඟක් දවසට හතරට විතර ඇහැරෙනවා.. ඒ එක්කම රධ්‍ය අයියත් ඇහැරෙනවා.. එතන ඉඳන් හවස හතර හමාර වෙනකල්ම ඉතින් අපි දෙන්නා ජොබ්වල වැඩ.. සතියෙ දවස්වලට හුඟක් බිසී.. මගෙ හොස්පිටල් මාරුවීමක් ඇවිල්ලා.. දැන් ජෙනරල් හොස්පිටල් එකේ වැඩ කරන්නෙ.. මෙහේ ඉඳන් ලොකු දුරකුත් නැනෙ.. යන්න එන්න ලේසියි..

අපේ ගෙදර සාමාජිකයො ගාණ දෙන්නා තුන්දෙනා වෙලා.. ඊටපස්සෙ හතරක් වෙලා.. අන්තිමට පහක් වෙලා එතනින් නැවතුණා.. හුඟ කාලයක්, හීයක වේගෙන් ගෙවිලා ගිහින් අපි වඩාගෙන ඇති දැඩි කරපු ළමයි දැන් අපිටත් වඩා උසයි.. තනියම තීරණ ගන්න හිතන වයසට ඇවිල්ලා.. ඒත් මගේ ඇස් වලින් මම දකින්නෙ..එයාලා මගේ අතට ගත්තු මුල් දවස්වල

@Shan

වගේ.. ඒකෙන් කියන්නෙ නෑ අපේ ආදරේ නිසා අපි එයාලා හිර කරගෙන ඉන්නවා කියලා.. ඒ වුණාට එයාලා ඒ ආදරේ අපෙන් බලාපොරොත්තු වෙනවා.. කවුරුත් ගාවදි නැතුව අපි ගාවදි විතරක් හුරතල් වෙනවා.. කොහේ ගියත් අප්පච්චී.. තාත්තී කියාගෙන ගෙදරට ගොඩවෙනවා.. මෙච්චර ලොකු වෙලත් මහ රෑ ජාමෙකට නැගිටලා පොඩි කාලෙ පුරුද්දටම අපිව හොයාගෙන එනවා.. ඉතින් එයාලා අපේ ආදරේ ලබන කාලෙ ඒක උපරිමෙටම දෙන්න ඕන.. මම හිතනවා අපි හොඳ තාත්තලා දෙන්නෙක් වුණා කියලා.. මම කියනවාටත් වඩා මදර්ස් ඩේ එකට මගේ මේසෙ උඩ තියලා යන කාඩ් එකකින්.. ලියුමකින් මට ඒක තේරෙනවා..

අපිට නොලැබුණ හැමදේම එයාලා විඳිනවා දකිද්දි ඇත්තටම හදවතින්ම ලොකු අවංක සතුටක් මට දැනෙනවා.. ඒක හරියට ළමයෙක් වදපු

**අම්මෙක්ට**

දැනෙනවා වගේ සතුටක්..

සුදුපුතා ලැබිලා අවුරුදු දෙකකින් අපේ ගෙදරට තව කොල්ලෙක් ආවා.. ඒකා තමයි චූටිපුතා.. සුදුපුතා එයාගෙ අප්පච්චි වගේමයි.. හරියට රධ්‍ය අයියගෙ කැරක්ටර් එක දෙකකට බෙදලා වෙන වෙනම අරගෙන වගේ.. සුදුපුතා වැඩි කතාබහක් නෑ.. හුඟක් වෙලාවට හොඳම යාළුවා එක්ක වගේ මාත් එක්ක තමා එයාගෙ ප්‍රශ්න කතාකරන්නෙ.. සැහෙන්න එයාලා අපි එක්ක විවෘතව කතාබහ කරනවා.. එයා හරි ආදරේ හිතෙන කැරක්ටර් එකක්.. මට පුදුම ආදරෙයි.. දැන්නම් ඒකා හැසිරෙන්නෙ මගෙත් අප්පච්චි වගේ.. ඒලෙවෙල් කරන්න අරගෙන තාම මාස දෙකතුනයි.. අප්පච්චි වගේ මැත්ස් තමා කරන්නෙ.. එයා පොඩි කාලෙ ඉඳලම පාඩම් කරන්න.. පොත් කියවන්න.. පාඩුවෙ ඉන්න තමයි කැමති.. ගෙදර වැඩක් කිව්වොත් ජීවිතේට බෑ කියන්නෙ නෑ.. කොහොමහරි කල්ලා දෙනවා.. එයාගෙ පුංචි හිතේ පොඩිම කාලෙ ඉඳලා මහා ගොඩක් ආදරේ පුරවගෙන ඉන්නවා කියලා මට දැනෙනවා.. එහෙම කොල්ලෙක් ගෙදර වැඩිමලා වෙනවා කියන්නෙ මාර හයියක්.. මට කියන්න තේරෙන්නෙ නෑ අනේ.. සුදුපුතා ඇත්තටම හරි හොඳ කොල්ලෙක්..

එයා සතුටු වෙන්නෙ හරි පොඩි දේවල් වලින්.. මෙ ලඟදි තමයි ඕ ලෙවෙල් රිසාල්ට්ස් ආවෙ.. ඕ ලෙවෙල් නම් ඒකා මහා විසාලෙට පාඩම් කල්ලා ලිව්ව එකක් නෙමෙ.. ඊටකලින් ඔලිම්පියාඩ් ලියලා අයිලන්ඩ් රෑන්ක් එකකුත්

@Shan

අරගත්තා.. දැනුත් ඒ ලෙවෙල් පටන්ගත්තා විතරයි නහින්න හදනවා පොත මූණෙ බැඳගෙන.. අප්පච්චි දෙකතුනක් බැන්නා ඔහොම හැමතිස්සෙම පාඩම් කරන්න ඕන නෑ ටිකක් නිදහසේ ඉන්න කියලා.. මමත් කියන්නෙ ඒක... කොහෙද අහන්නෙ නෑනෙ.. අලි ඔලුවෙන් නෙ ඉන්නෙ ඒවා කිව්වහම.. 'හරි අප්පච්චි මම කැමැත්තෙන්නෙ කරන්නෙ.. ඇයෙඳ් තාත්ති කියන්නකෝ' ගාලා අත් දෙකත් බැඳගෙන සෝෆා එකේ වාඩිවෙලා ඉන්නවා මහ දුස්ට මූණක් හදාගෙන.. ඉස්සර දඟලපු එකාද කියලා හිතාගන්නවත් බෑ..

අපේ ගෙදර අනිකා.. චූටිපුතා.. හොඳ චූටිපුතෙක් තමා ලැබිලා තියෙන්නෙ.. අධිකාරි පවුලෙ තියන සේරම අලි විසේ ජාන ප්‍රමුඛ වෙලා තමා ඒකා ඉපදුණේ.. අයියා වගේ නෙමෙයි මල්ලි.. අහසයි පොළොවයි වගේ.. මෙලෝ පාඩම් වැඩක් කරන්නෙ නෑ.. ඉස්කෝලෙ තියන සේරම ස්පෝර්ට්ස් කරනවා.. කැම්පේන් යනවා.. දැන් කැඩෙට් කරන්නත් අරගෙන.. පුදුමාකාර විසයක් තියෙන්නෙ.. සතියට හොස්පිටල් යන්නම මොකක් හරි කරගන්නවා.. නැත්නම් තමයි ඒකට උණ ගන්නෙ.. ඉස්කෝලෙ වැඩ කරවන්න කවුරුහරි ළඟ ඉන්න ඕන..

මේ දවස්වල අයියට බය නිසා අයියා ළඟින් ඉන්දවගෙන පාඩම් කියලා දෙනවා.. නැත්නම් ගහක් උඩ.. එක්කො ආරු අයියා එක්ක.. අවී දැන් කැම්පස් යනවා.. කොළඹ මොලිකියුලින්.. ආරු කැම්පස් යන්න එනකල් ගෙදර ඉන්නෙ.. ආරු ඇවිල්ලා තනි රස්තියාදුකාරයා.. ආධ්‍ය අයියා වගේම තමා.. ඒ පෙනුම එහෙමම පිහිටලා තියනවා.. ඒ වුණාට තනි රස්තියාදුකාරයා.. තාම චූටි තාත්තී කියාගත්තු ගමන් මගේ පාරෙ පස්සෙ තමා ඉන්නෙ.. ගෙදරක ඇත්තෙම නෑ.. මම හිතන්නෙ ඔය එළියට ඇවිල්ලා තියෙන්නෙ ආධ්‍ය අයියගෙ ඇතුළෙ හැංගිලා තියන අනිත් ප'සනැලිටිය වෙන්න ඕන.. ආරු අපේ ගෙදර චූටිපුතා එක්ක හරි ෆිට්.. දෙන්නා එක්ක තාප්පවල බඩගානවයි.. ලේන් එක පුරාම දුවනවයි.. වැඩක්නැත්නම් මිදුලෙ වලක් හරි හාරනවා.. පහුගිය දවස්වල එහෙම මගුලක් හාරලා අල්ලපු ගෙදර වතුර බටේට අලවංගුපාරක් ගහලා මාමා බෙරිහන් දෙනවත් ඇහුණා..

චූටි පුතණ්ඩියා එහෙම හෙන පිස්සෙක් වගේ හිටියට ඉතින් මටයි අප්පොච්චටයි ආදරෙයි.. පොඩි එකා වගේ.. තාම මගේ ඇඟ අස්සෙ රිංගගෙන, වෙලාගෙන බදාගෙන ඉන්නෙ.. මහා ලොකු වයසක්ම නෙමෙ ඉතින්.. නමය වසරෙ.. ඔය කාලෙ ළමයි ගැන කියන්න ඕන නෑනෙ.. අයියට මෙලෝ වැඩක් කරන්න දෙන්නෙ නෑ.. හැමතිස්සෙම විහිළු කරනවා..

@Shan

සුදුපුතා ඉවසලා ඉවසලා බැරිම වුණොත් අරුට දෙකක් ඇන්නහම එනවා කඳුළු පෙරාගෙන.. 'තාත්ති ඇයෙද් ශුදුඅයියා ගැහුවා' කියාගෙන..

එතකොට අපේ ගෙදර අනිකා.. ඒ ගැන කියද්දිත් මගේම තනි ඇහැකට කඳුළු උනනවා.. මුළු කොලු සංහතියටම ඉන්න එකම කෙල්ල.. අප්පොච්චගෙ දෝණිඇන්දා.. කොලු සංහතිය කිව්වෙ අපේ ගෙදර විතරක් නෙමෙ..අපේ මිතුරු සමාජයේ කිසිම එකෙක්ට ආසාවකට කෙල්ලෙක් ඉපදිලා නෑ.. කියාන් අයියට කොල්ලොම තුන් දෙනෙක් ඉන්නවා.. සෙනුකයගෙ ගෙදර දෙන්නයි.. මහීශගෙ එක්කෙනයි.. චමිරුවගෙ තුන්දෙනයි.. එහේ දෙන්නෙක් ට්වින්ස්ලා.. ඔය සේරම කොල්ලො.. අපේ ඉස්කෝලෙටමයි යන්නෙ.. දැන් ඉතින් අපි හොඳම යාළුවො නිසා එයාලත් හොඳම යාළුවො.. කියාන් අයියගෙ දෙවෙනියා තමයි චූටිපුතාගෙ ඉස්කෝලෙ හොඳම යාළුවා වෙලා ඉන්නෙ.. ඉතින් අපේ දෝණියට හතරවටේ ම ඉන්නෙ අයියලා තමා.. අර අයියා මේ අයියා.. කටේම අයියලා ගැන තමා.. ගෙදර ඉන්න දෙන්නත් නංගිට පණ ඇරලා ආදරෙයි.. ඒ ඔක්කොම පැත්තකින් තිබ්බහම අප්පච්චි.. එයත් දෝණිට හුඟක් ආදරෙයි..

අර දෙන්නම අප්පච්චි වගේ හෙන ආඩම්බර පාටට දුස්ටකමට පුම්බගෙන හිටියට දෝණි එහෙම නෑ.. එයා හරි හුරුබුහුටි කෙල්ලෙක්.. හැමතිස්සෙම කියවනවා කියවනවා.. මම බැරිවෙලාවක් දෙයක් කිව්වොත් ඒකට දාහක් විතර දේවල් කියනවා.. චූටි අයියා කියන්නෙ මෙකිව රජ් කරන්න යැව්වනම් හොඳයි කියලා.. එයා වැඩි උසක් නෑ.. එක ඇහැක් දුඹුරු පාටයි.. අනික නිල් පාටයි.. එයත් අනිත් දෙන්නා වගේ ඇමරිකන් මික්ස් එකක්.. ඒ වුණාට බැලුබැල්මට මම වගේ තමා.. මගේ ඉස්කෝලෙ කාලෙට කොණ්ඩයක් ඉණ ගාවට විතර දාලා ගවුමක් ඇන්දුව නම් ඒ වගේ..

රධ්‍ය අයියා Ph.D. එක ඉවරකල්ලා දැන් මොරටුව කැම්පස් එකේ ප්‍රොෆෙසර් කෙනෙක් විදියට වැඩ කරනවා.. ඒ ඇරෙන්න කලින් වැඩ කරපුම තැන හෙඩ් ඉන්ජිනියර් විදියට වැඩ බලනවා.. ප්‍රයිවට් කැම්පස් වල ලෙක්චර්ස් කරන්න යනවා.. එයා දැනටමත් එයාගෙ හීන හැම එකකටම ගිහින් ඉවරයි.. ඉතින් එයා දැනට 'ආත්මතෘප්තිය' කියන දේ උපරිමෙන්ම විඳිනවා.. මමත් මගේ හැම හීනයක්ම අල්ලගෙන ඉවරයි.. මටත් ඒ හැඟීමම දැනෙනවා.. ඉතින් ආයෙ කියලා සතුටුවෙන්න අපිට වෙන හේතු ඕන නෑ.. මෙ තියන දේවල්ම බලාගෙන ඉඳලා අපි සැහෙන්න සතුටින් ජීවත් වෙනවා..

@Shan

ජීවිතේට හරිම මනුස්සයො හම්බුණාම ඒ හැගීමට වෙන්න ඕන

**ජීවත්වෙනවා**

කියන්නෙ.. හරියට මට.. රධ්‍ය අයියට වගේ.. අපි ආදරේ කරන්න පටන් අරගෙනත් දැනට අවුරුදු තිහකට කිට්ටු වෙනවා.. අපි තනියම ගෙවපු ජීවිත කාලෙ වගේ දෙගුණයක් අපි එකට ඉදලා තියනවා.. එතකොට එයාගෙයි මගෙයි කියලා ජීවිත දෙකක් තියනවා කියලා දැනෙන්නෙ නෑ.. හරියට එකිනෙකාගෙ ජීවිත වල අනිත් කොටස වගේ දැනෙන්නෙ.. අසනීපයක් වුණොත්.. වෙන ප්‍රශ්ණයක් වුණොත් අපි දෙන්නම ඒවට මූණ දුන්නෙ 'එක්කෙනෙක්' විදියට.. මම ඒක වචනෙන් කියනවට වඩා ඒක ඇවිල්ලා කාලෙත් එක්ක හිතට දැනෙන දෙයක්.. එයා තාමත් ඉස්සර වගේම තමයි.. කොයි වෙලෙත් 'වරද්' කියාගත්තු ගමන්මයි.. වැඩ ඇරිලා මාව ගන්න හොස්පිටල් එක ගාවට එනකල්.. ඇනිවසරි එකට ලැබෙන මල් බොකේ එකක ඉදන්.. හැමදාම උදේට දෙන හාද්දක් වෙනකල්.. අසනීපයක් වුණොත් නිදිමරාගෙන මං ගාවට වෙලා එළි වෙනකල් ඇහැරන් ඉන්න තැන වෙනකල් එයාගෙ ආදරේ අඩුවක් පාඩුවක් නැතුව මට දැනෙනවා.. හරි පුදුම මනුස්සයෙක්.. ඇත්තටම.. අදට වඩා හෙට දවසෙ ආදරේ කරන එහෙම මනුස්සයො කලාතුරකින් ඉන්න ලෝකෙ.. මගේ හස්බන්ඩ් එහෙම වුණා කියන එකෙන් මගේ හිතට ලොකු සතුටක් දැනෙනවා..

එයා හස්බන්ඩ් රෝල් එකකරගෙන යනවා වගේම තමයි.. අප්පච්චි කියන රෝල් එකේදිත් හරි ආදරණීය මනුස්සයෙක්.. එයා හැමතිස්සෙම කියනවා 'අපිට වෙච්ච නරක දේවල් පෙන් ඉවරවෙලා අනිත් අයට ඒවා බෝ කරන්න ඕන නෑ' කියලා.. සතුට කියන දේලු බෝ වෙන්න ඕන.. දුක කියන දේවල් අපේ හිතේම මරලා දාන්න ඕනලු.. ඉතින් එයාගෙ අප්පච්චි එයාට සැලකුව විදියක් ගාවගන්නෙ නැතුව එයා ළමයින්ට හරි ආදරෙයි.. එයා ගෙදර ආවහම ගෙදර සේරම දුවගෙන ඇවිත් මුලින්ම තුරුල් වෙන්නෙ එයාට.. දවසෙ වෙන චූටිම දේ ඉදලා ඉවරයක් නැතුව කියන්නෙ එයාට.. බය වෙන්න ඕන අප්පච්චි කෙනෙක් නෙමෙයි බයක් නැතුව ඕනම දෙයක් කියන්න පුළුවන් අප්පච්චි කෙනෙක්.. වෙලාවකට මටත් පොඩිකාලෙ නොදැනුණ තාත්තෙක්ගෙ ආදරේ එයාගෙන් ලැබෙනවදෝ මට හිතෙනවා.. හුඟක්ම පුතාලා ලැබුණට පස්සෙ..

මම මේ මනුස්සයට හෙන ආදරෙයි ඉතින්..

@Shan

මාස අවුරුදු ගෙවිලා යද්දි මං ගාව ඉදපු රුස්ස ගස් වගේ දැනිච්ච ආදරණීයම මිනිස්සු කාලයත් එක්ක ඇස් පියාගත්තා.. මගේ හිතට ඒ වේදනාව අඩුවක් නැතිවම අද වෙනකල් දැනුණත්.. මට එයාලගෙ සතුට ගෙනැත්දෙන්න පුළුවන් වුණු නිසා හිතට සැනසීමයි.. ඒත් හිතේ අමරණීය වෙලා හැමදාමත් ඉන්නවා.. අදටත් මට හමුවුණු හොදම හමුවීම..මගේ ආච්චිඅම්මා.. අම්මෙක්ට වඩා මට ආදරේ දුන්නා.. මට හයියක් වුණා.. මගේ උකුළ උඩම ඇස් දෙක පියාගනිද්දි හිතට අකුණු දාස් ගාණක් කෙටුවත්.. මම දන්නවා ආච්චිඅම්මා හිටියෙ හුඟාක් සතුටින්.. මම තනියම නැගිටපු කාලෙ මගෙ ගාව ඉදපු තුන්දෙනෙක්ම අද වෙද්දි නෑ.. එයාලා හොද තැනක සතුටින් ඉන්නවා ඇති කියලා මම හිතනවා.. ජීවිතේ එහෙම තමයි.. හමුවීම් තියනවා.. වෙන්වීම් තියනවා.. දෙයක් හමුවුණොත් කවමදාහරි වෙන් වෙනවා.. ඒ වෙන් වෙද්දි හිතේ දුකක් පසුතැවීමක් තියාගන්න හොද නෑ.. හැම වෙන්වීමක්ම.. ආදරණීය වෙන්න ඕන.. මතක් වෙද්දිත් දුකක් එක්ක හිතට සතුටක් ලැබෙන්න ඕන..

ආධ්‍ය අයියා අවුරුදු ගාණක් ඉවසලා ඉවසලා මාමගෙ කීමට අප්පච්චිට ආයෙම ලං වෙන්න තීරණේ කළා.. කොහොමත් මාමා ආධ්‍ය අයියගෙ අප්පච්චිට මොකුත් කියන්නෙ නැනෙ.. මාමගෙ හිතේ තරහක් අමනාපයක් තිබ්බත් අපි දෙන්නම කවදාවත් එහෙම නරක විදියට අප්පච්චිට බැනලත්නෑ.. අනික සේරටම කලින් වෙච්ච හැමදේටම අප්පච්චිට අවස්ථාවක් දුන්නෙ මමයි මාමයි.. දැන් අප්පච්චි හුඟක් වයසයි.. අසලි අම්මා එක්ක ගෙදර ඉන්නෙ.. සැරින් සැරේ මතකෙ අමතක වෙන ගතියක් තිබ්බත් හැම මාසෙම බලාගෙන ඉන්නවා අපි එයාව බලන්න ඒවි කියලා.. අම්මා කියනවා සමහර වෙලාවට අපේ වෙඩින් ඇල්බම් ළඟ තියාගෙන වරු ගණන් බලාගෙන ඉන්නවලු.. මාත් එක්ක තාම මාමණ්ඩියා කතාබහ කරන්නෙ නෑ.. ඒ වුණාට මම ගිහින් කතාකරනවා.. කතානොකළොත් ඒත් තරහ වෙනවා.. මගේ දුස්ට මාමණ්ඩියනෙ..

අප්පච්චි මෙහේ තුන්දෙනාටයි ආධ්‍ය අයියගෙ බබාලා දෙන්නයි ආදරෙයි.. අපි කවුරුත්ම නැති වෙලාවට ලඟට කතාකරගෙන පාඩම් වැඩ ගැන අහනවා.. අපේ චූටිපුතාට එහෙම හරි එකතුයි.. ආච්චිලා සීයලා කියන්නෙ ආදරණීය මිනිස්සුනෙ.. අප්පච්චි ආස ඇති එයා සීයෙක් වුණාම මුණුබුරො මිනිබිරියො ළඟින් තියාගෙන කතා කියන්න.. රධ්‍ය අයියා කවදාවත් එයාගෙ අප්පච්චි ගැන ළමයින්ට නරක දෙයක් කියලා නෑ.. එයාලා දන්නෙත් නෑ.. අතීතෙ අපි එක්කම වැළලුනාවෙ.. ආයෙම ඒවා උඩට ගන්න

@Shan

උවමනාවක් නෑ.. හැම මනුස්සයෙක්ම ආදරණීය මනුස්සයෙක් වෙනවනම් ඒ ඇති..

අසලි අම්මත් හරි ආදරෙයි ළමයින්ට.. මම මගේ ආච්චිට ආදරේ කොහොමද අපේ ළමයිත් එයාලගෙ ආච්චිලා දෙන්නට හුඟක් ආදරෙයි.. අපේ අම්මත් මග බලාගෙන ඉන්නෙ මෙහේ අය එයාව බලන්න එහේ එනවනම්.. අනික අපේ නැන්දම්මලා දෙන්නා හොඳ යාළුවොනෙ.. අම්මා ලංකාවට ආවහම අපේ ගෙදරත් දවස් දෙකතුනක් ඉඳලා ළමයි හුරතල් කලා යන්නෙ.. මුළු පවුලටම ඉන්නෙ එක කෙල්ලයි නිසා දෝණිට හැමෝම හුඟක් ආදරෙයි.. අසලි අම්මට වුණත් ඒක වෙනස්ලු.. කොල්ලොම ඉන්න පවුලක එක කෙල්ලෙක් හැදෙනවා කියන එක..

දැන් අපේ කාලෙ වගේ අවුරුද්දෙ වාර තුනට පේරන්ට්ස් මීටින් තුනක් නෑ.. අවුරුද්දෙ අන්තිමට එකක් තියනවා.. පේරන්ට්ස් මීටින් ගියාම මුළු මිතුරු සංහතියම හම්බෙනවා.. ආශි අපේම ඉස්කෝලෙට බැන බැන ඉඳලා දැන් එනවා නෝනහාමු වගේ සාරි පටලගෙන පේරන්ට්ස් මීටින්.. අන්තිමට කොහොම හරි කියාන් අයියා ඒකිගෙන් පලි ගත්තනෙ.. අයුක අයියත් එයාගෙ බිස්නස් එක දැන් දියුණු කරගෙන ඒකෙ බ්‍රාන්චස් පවා ඕපන් කල්ලා.. ගෙදරත් ආයෙම කඩලා ලොකුවට හැදුවා.. අනික චමිරුත් අයුක අයියට හෙන සපෝට් එක උගේ පැත්තෙන් දෙනවා.. සෙනුකලා චමිරුලා හොඳ පවුලක්. අයියා මලෝ දැන් හරි එකතුයි.. අයුක අයියට එයාගෙ සහෝදරයෙක් ඉන්න එක හයියක්.. සෙනුකයා ඒ කාලෙ ගේමක් දීලා උන් දෙන්නව යාළු කෙරෙව්ව එකේ පාඩුවක් නෑ බලාගෙන යද්දි.. මගේකාට මොලෙත් පිහිටලා තියනවා..

හෙට අලුත් අවුරුද්ද..

හෙට අලුත් අවුරුද්ද නිසා රෑට අපේ මිතුරු සමාජෙ සේරම අපේ ගෙදර ඩිනර් එකකට එනවා කිව්වා.. අපිත් හම්බෙන්නෙ හෙන කාලෙකින්නෙ නිවාඩුවක් සෙට් වුණාම.. ඒ ඇරෙන්න ඇනුවල් ට්‍රිප් එකක් යනවා.. කොහේහරි සේරම එක්ක ගිහින් ඉඳලා කාලා බීලා දවස් තුනක් විතර ඉඳලා එනවා.. ජීවිත කාලෙටම වෙනසක් නැතුව ඉන්න උන් සෙට් එකක් ඉන්නවා කියන්නෙ ඒක වෙනමම ආතල් එකක් තමා.. කියාන් අයියා ළමයි තුන්දෙනෙක්ගෙ අප්පොච්චා වෙලත් තාමත් රධ්‍ය අයියට සුදුඅම්මියා.. අයුක අයියට සුදුදෝණියා ගාගත්තු ගමන්මයි ඉන්නෙ.. දැන් ඉතින් හෙට ආවහම මෙතන මැරෙන්න හදාවි..

@Shan

මම ට්‍රේ එකෙන් මග් ටික තියලා මෙහාපැත්ත හැරෙන්න යද්දි මගේ ඉණ වටේ අත් දෙකක් එතිලා මාව කවුන්ටර් එකට හිර වුනා..

" ගුඩ්මෝනින්.."

රධ්‍ය අයියා මගේ කම්මුලක් එබෙන්නම හාද්දක් තිව්වා..

" ගුඩ්මෝනින්.. මම දැන් එන්න හැදුවෙ උඩට.."

රධ්‍ය අයියා මාව එයාගෙ පැත්තට හරවගෙන තොල් වලින් හාදු දෙකතුනක් තියලා මගේ ඉන දිගේ අත් උඩට ඇදගෙන ආවා.. ටිකකින් එහාට වුණා..

" අප්පච්චී!!!!!!!!!!!! චූටි අයියා ඉන්න දෙන්නෑ.. යනවා අකහට බූරු අයියා.. සුදුඅයියේ!!!! අනේ එන්නකෝ.. තාත්තී මේ මෝඩ අයියා මගේ ඇඳේ පෙරලෙනවා.."

" මල්ලී!! මෙහෙ එන්න.."

" අඩෙ අප්පච්චි මෙන්න මෙයා කවියක් ලියලා.. කාටද හලෝ මේක ලිව්වෙ මට නේද.. අඩෙ අයියෙ.. එනවකො පෙන්නන්න.."

ඒ එක්කම සලබලාං ගාලා උඩතට්ටුවෙ එක එක බඩු පාවෙලා ගිහින් බිමට වැටෙන සද්දෙ ඇහුණහම රධ්‍ය අයියා මගේ දිහා මහ අමුතු විදියට බැලුවා.. මම මක් කරන්නද.. මගේ දිහා බලන්නෙ..??!!

" මොකද.."

" ආ..?? නෑ නෑ මොකුත් නෑ.."

ටිකකින් ආයෙම දෝණිඇන්දා බෙරිහන් දෙන සද්දෙ ඇහුණා..

" ඕන මම සාහිත්‍ය දිනේට ලියපු කවිය.. මෙහෙට දෙනවා..!! සුදුඅයියෙ එන්නකො අනේ.. සුදුඅයියේ!!!!!!!!!!!"

" ශුජුඅයියේ.. අපේ බටකොළ ආච්චි කවියක් ලියලා.. මේ බලනවකො.."

" මල්ලි!!"

@Shan

" අඩෙ අයියා නානවද.. සොරි ඈ.. ඒකට කමක් නෑ.. මෙ බලනවකො අපේ දෝණි කවියක් ලියලනෙ.. පොඩ්ඩක් ඉඳහන් මම මේක රාමු කල්ලා මගේ කාමරේ අලවගන්නවා.. අයියටත් කොපියක් ඕන්නම් කියන්න හොඳේ.."

" පලයන්කො නාගන්නවත් දීලා.. තාත්තී මේ මල්ලි වොශෲම් එක ඇතුළට ඇවිල්ලා යන්නෙ නෑ.."

" පුහ්.."

ටිකකින් චූටිපුතණ්ඩියා පඩිපෙල බැහැගෙන කුස්සියට ඇවිත් මගේ කරේ එල්ලිලා මූණ ඇදකරගත්තා.. මම කිරි එක අරගෙන අතට දුන්නහම රධ්‍ය අයියා ඒකගෙ පිටට තඩිබැවා.. දෙන්න තමා තියෙන්නෙ.. නැගිට්ට වෙලේ ඉඳලා යුද්ධ කරනවා..

" තාත්ති.."

" ම්ම්.."

" මොකුත් නැහ්.. කන්න මොකුත් නෑ නේද.. හෙන බඩගිනී අනේ.. අප්පච්චි තාත්තිගෙන් එහාටවෙලා ඉන්න.. එයා අපේ.. අයියගෙයි මගෙයි.. අර උඩ ඉන්න බටකොළ ආච්චිව ඔයාට දෙන්නම්.. නේද තාත්ති.."

"

**වර්ධ රාධෙව**

බූරු පැටියා..!!!!!!!!! මගේ කොළේ කොහෙද දැම්මෙ!!! අප්පච්චි මේ අයියා ඉන්න දෙන්නෑ අනේ.. අප්පච්චී!!! මෙහ් මගේ අත හීරුවා.. පිඹිනවා බූරු අයියා.."

දෝණිඇන්දා කොණ්ඩෙත් වනාගෙන මල යස්සනී වගේ කුස්සියට ඇවිත් චූටිගෙ කනෙන් ඇදලා බලෙන්ම අර ඇහැටවත් පේන්නෙ නැති තුවාලෙට පිඹගන්න හැදුවහම අරකා කුස්සියෙන් සාලෙට දිව්වා.. දෝණිඇන්දා අප්පච්චිව අත් දෙකෙන් බදාගෙන පපුව අස්සෙන් මූණ ගහගත්තා.. අඬනවද කොහෙද.. මම කිසිදෙයක් ඇහුණෙ නෑ වගෙ එළවලු දාපු බාස්කට් එක ළඟට අරගෙන උදේට උයන්න දෙයක් තේරුවා.. රධ්‍ය අයියා දෝණිව උස්සලා කිචන් කවුන්ටර් එක උඩින් තිබ්බා.. බොරුවට අඬනවා තියන

@Shan

කපටිකමට.. ඔච්චට රැවටෙන මිනිස්සු මෙ ගෙදර ඉන්න නිසා හොඳයි ඉතින්..

" අප්පච්චි අයියා අත සීරුවා.. මෙ.."

" මගෙ කෙල්ලට වද දෙන්නෑ!! චූටිපුතා..!!"

" බනින්න අප්පච්චි..!! බනින්න අනේ.. බනින්නකෝ.."

ඒ එක්කම මට ඇහුණා අල්ලපු ගෙදරයි අපේ ගෙදරයි මැද්දෙ තියන ගේට්ටුව කිරිස් ගාලා ඇරෙනවා.. ඔහොම තමා.. අපේ මාමයි ආරුයි එහේ ඉන්න නිසා රාධේව් ඉන්නෙම එහේ ගෙදර.. ආධ්‍ය අයියත් තියාගෙන නලවනවනෙ.. මගෙ ලස්සන මස්සිනා උයනවද දන්නෑ.. බලන්න යන්නත් ඕන අනේ.. උදේට දැක්කහම දවසම ලස්සනයි..

" ගුඩ්මෝනින් තාත්තී.. ගුඩ්මෝනින් අප්පච්චි.. මම මූවි එකක් බලන්නද අද.. පාඩම් කරන්න මූඩ් එකක් නෑ.."

කවුන්ටර් එක උඩට වෙආ අප්පච්චිගෙ බෙල්ල අස්සෙ මූණ ගහගෙන ඉඳපු එක්කෙනත් ටක් ගාලා ඔලුව උස්සලා සුදුපුතා දිහාබැලුවා..

" සුදුඅයියෙ මාත් එන්නම්කො.."

" එන්න.. මම වෙදරින් විත් යූ බලනවා.."

" හා!! හෙට අවුරුදු නිසා අද පාඩම් කරන්න ඕන නෑ නේ අප්පච්චි.. නේද.."

රධ්‍ය අයියගෙ ඇස් දෙක ගාවටම කිට්ටුවෙලා අර කෙල්ල ඇස්පිල්ලම් දෙක තුනක් ගැහුවා.. ඔච්චා කරන්න එපා පුතේ.. තාත්තා අප්පච්චිව රවට්ටගත්තෙත් ඔච්චා කරලනෙ.. එතකොට ඉබේම ඔලුව 'ඔව්' කියලා සිග්නල් එක්ක දෙන ගමන් වැනෙනවා..

" සුදුපුතා ක්ලාස් යන්න බෑ කියනවද වරද්.."

අර දෙන්නා සාලෙට ගිහින් ටීවී බලන්න ගත්තහම රධ්‍ය අයියා ට්‍රේ එක උඩ තිබ්බ ඉවරවෙච්ච මග් ටික සේදුවා..

@Shan

" බැහැල්ලුනෙ.. ළමයි ගොඩක් මැද්දෙ ගිහින් ඉන්න අමාරුලු.. ඒ වුණාට ක්ලාස් නොයවා බැනෙ.."

" එහෙනම් ඉන්ඩිවිජුවල් ක්ලාස් එකක් කරවමු.."

" ඒත් බැහැල්ලු.. එයාට කැමති විදියට කරන්න දෙමු ඒයි.. එහෙම හොයන්න තරම් දෙයක් ඇත්තෙ නැනෙ.. මම ඇහුවා මෙ අවුරුද්දෙ නැතුව ලබන අවුරුද්දෙ මාස හයක් වගේ තියලා සර් කෙනෙක් ගෙන්නන්නද කියලා.. එතකොට හා කිව්වා.."

" එහෙම හොඳයිනම් කරමු.. ඒ වුණාට චූටිපුතාව ක්ලාස් යවන්න වරද්..මෙලෝ වැඩක් කරන්නෙ නෑ.. පොත් වලත් හැමතැනම හිස් පිටු විතරයි.. ඇහුවහම කියනවා අර වැඩෙ තිබ්බලු.. මෙ වැඩෙට ගියාලු.. ස්පෝර්ට්ස් විතරක් කල්ලා බැනෙ.."

" එක්සැම් එකට ළකුණු අඩු නැනෙ ඉතින්.. පන්තියෙ හිටපු එක්කෙනෙක් කිව්වනම් කමකුත් නෑ.."

රඩ්‍ය අයියා අත කරකලා මගේ පස්සට පාරක් ගැහුවා..

" පන්තියෙ තමයි බොල හිටියෙ.. උඹ වගේ අඹගස් වල අපි බඩගෑවෙ නැනෙ.."

" ඒ වුණාට තව්සෙට මගුල් විසේනෙ පොඩි කාලෙ ඉඳලා.."

" අනේ මෙ වරද්.. මමද ෆිෆ්ටි ශේඩ්ස් ඔෆ් ග්‍රේ පොත ඉස්සුවෙ ලයිබ්‍රි එකෙන්.. ඒකත් අටේදි.. අනේ මෙ ඉඳහන්.. කෝ ඔය ලූණු කොළ ටික දෙනවා මෙහෙට.."

රඩ්‍ය අයියා මගේ අතේ තිබ්බ ලූණුකොළ ටික උදුරගෙන ගිහින් ඒක හේදුවා.. මුගෙ කට විතරක්.. මම ෆ්‍රිජ් එක ඇරලා අයිස් කැටයක් අරගෙන රඩ්‍ය අයියගෙ කලිසම අස්සට දැම්මහම ඒකා මැරෙන්න හැදුවා..

" වරද්!!!!"

" සීතල වුණා නෙහ්.. පරු පස්ස ඒයි.."

" උඹට මම පෙන්නන්නම් පොඩ්ඩක් ඉඳපන්කො.."

@Shan

"මොකක්ද පස්ස-කැහ්කැහ්.. චූටිපුතා.."

ඒ අස්සෙ පොඩි නසරාණියා කුස්සියෙ ජනේලෙන් එකසැරේට මතුවෙලා පැන්ට්‍රි එකට කකුලක් තියලා බිමට පැන්නා.. මෙ ජනේලෙට ග්‍රිල් ගැහුවනම් හරි වගේ..

" ඒඩ්‍රියනුත් එනවද අප්පච්චි හෙට.. අයුක අංකල් එනවා කිව්වා නේ.. තාත්ති අහන්නකො.. ඕකා ඉස්කෝලෙදි මගේ ලෙදර් බෝලෙ දෙකට පැළුවනෙ.."

" ඒ මොනවා කරන්න ගිහිල්ලද.."

" ඌට පිස්සු තාත්ති.. ආ නෙක්ස්ට් වීක් ෆුට්බෝල් ප්‍රැක්ටිස් තියනවා.. කැඩෙට් කැම්ප් යන්න තියනවා.. ඒ ඇරෙන්න ගේට්වෙ එකේ ක්ලාස් තියනවා.. අප්පච්චි ඒකනිසා මම සයන්ස් ක්ලාස් ස්කිප් කරන්නම් හොඳේ.."

" නෑ නෑ..!! ක්ලාසස් ස්කිප් කරන්නෙ නෑ.. එක්ස්ට්‍රා කරිකියුලර් කරනවා වගේම ඇකඩමික් බැලන්ස් කරගන්න ඕන චූටිපුතා..!!!"

" බෑ අනෙ.. අනේ~.. තාත්ති.. මොකක්ද අනේ.. සයන්ස් ක්ලාස් එකේ මිස් මල වදේ අනේ.. හැමතිස්සෙම අප්පච්චි ගැනයි තාත්ති ගැනයි කිය කිය බනිනවා.. අප්පච්චි ප්‍රොෆෙසර් කෙනෙක් නේද යැයි යැයි ගගා.. එහෙම ඕන නැනෙ.. අනික අප්පච්චිට වගේ මොලේ ඇඟපුරාම අපිට නැනෙ තාත්ති.. නේද..මගෙ සුදු තාත්ති.. මම ආදරෙයිනෙ හලෝ.."

ඒකා මගේ ඇඟේ වෙලෙන්න ආවහම මම එහාට වුණා.. ඊටපස්සෙ අප්පච්චිගෙ ඇඟ අස්සෙ ගැන්නුනා.. වෙලාගන්නම බඩ්ඩ කීයටවත්..

" හැශ්ටැග් චූටිපුතාට වෙනස්කම.."

" තාත්ති කියන්නෙ ඇත්තනෙ චූටිපුතා.. අපිටත් බැනුම් අස්සනවා.. ඒකනිසා සයස්න් ක්ලාස් ස්කිප් කරන්න බෑ.. අනික ඔයාට ඒකට ලකුණුත් අඩුවෙලා තිබ්බා.."

" අසූ අටක් ඇති අනේ.. අයියා වගේ අනූනමයක් අරගෙන ඉතුරු ළකුණට අඬන්නෙ නැනෙ තාත්තිගෙ චූටිපුතා.. ආයෙ මටනම් හැත්ත හයක් තිබ්බනම් ගොඩ තමා.. රාධේව් කියන්නෙ බ්‍රෑන්ඩ් එකක්.."

@Shan

" ඔව් ඔව් බ්‍රැන්ඩ් එක දැන් ගිහින් අර ටීවී එක බලනවකො.."

" තාත්ති දැන් චූටිපුතාව ගණන් ගන්නෙ නෑ නේද.. හරි හරි අපි ඕනවෙයිනෙ.. මමනම් හවසටයන්නෙ නෑ තාත්තිට බඩු උස්සන් එන්න කඩේ.. පේනවනෙ.. ගියාමත් බනිනවා.."

මම හැන්ද අතට ගත්තහම දෙයියනේ කියලා ඒකා කුස්සියෙන් චුත වෙලා සාලෙන් මතුවෙලා විනාඩියක් ගියේ නෑ දෝණිඇන්දා බෙරිහන් දෙනවා ඇහුණා..

" ඔව් මේ අවස්ථාවේදී

**වෙධා රාගවී**

බටකොළ ආච්චි වැරෙන් පහරක් එල කරනවා.. ඒව් නංගි.. මොකක්ද හලෝ.. හරියට පිලෝ ෆයිට් එකක්වත් කරගන්න බැරිද.."

" මල්ලි ඕක නවත්තන්න.."

" ගොම්බෙට්ටා!!! සුදුඅයියෙ මම අප්පච්චිට කියනවා දැන් මෙයාව.."

" දෙන්නම ඕක නවත්තගන්නවා!!!.. මොන මගුලක්ද.. මට මේක බලන්නත් නෑ.. දෙන්නම හුටි කන්න යන්නෙ හරිද.."

" අප්පච්චි සුදුඅයියත් බනිනවා!!!!!!!!!!!!!!!"

" අම්මපා මගේ ඔලුවත් කකියනවා දැන්නම්.. අවුරුදු හතහමාරක් මානසික රෝහලක වැඩ කළා.. මේ ගෙදර තරම් කලබල නෑ ඒකවත්.."

" අප්පච්චි.. අයියලා මට බනිනවා.. සුදුඅයියත් බනිනවා.. හරි වදේ.. මම ඒඩ්‍රියන් අයියා ආවහම එයා එක්ක යනවා.."

රධ්‍ය අයියා කප කප හිටපු කැරට් කැල්ලත් ලිස්සලා ගියා.. මොකක්ද යකඩෝ ඒ කිව්ව කතාව..

" දෝණි!!"

@Shan

" ඇත්තනෙ.. ඒඩ්‍රියන් අයියා හරි හොඳයි.. හෙට ආවහම මම අයියලා දෙන්නව මාරු කරගන්නවා.."

" හා හා මාරුකරගන්න.. දැන් හොඳ ළමයා වගේ ගිහින් පේන්ටින් එකක් කරන්නකො.. අයියලා ඕන නෑ.. මගෙ කෙල්ල අප්පච්චිට පේන්ටින් එකක් ෆිනිශ් කල්ලා පෙන්නනවා කිව්වා නේද.."

" ඔව්නෙ!! අයිව් ද බෙස්ට් අප්පච්චි ඉන් ද වර්ල්ඩ්.. මිම්වා!! මම හවසට අප්පච්චිට ඒක දෙන්නම් හොඳේ.."

ආයෙමත් දෝණි කොණ්ඩෙස් ගස්සගෙන පද්ද පද්ද උඩට ගිහින් කාමරේ දොර වහගන්නවා ඇහුණා..

" බලහන්කො උඹ වගේ ගස්සලා පද්දලා යනහැටි.."

" සැක් මම කවද්ද ගස්සලා පද්දලා ගියේ.. තවසෙට ඔල්මාදෙද.."

" ඇයි ගස්සලා ගියේ.. අනේ මේ තාරාවො..!!'

මම සියලු දේ සාන්තිවාදී හිතින් දරාගෙන ලූනු ගෙඩිය කපාගෙන කපාගෙන ගියා.. මේ මිනිහා මට කරන අපහාස ගොඩ.. පස්ස ලොකු පොල් කැඳැත්තා..

අපේ ගෙදර නිකන් ඉන්න දවසට දිනචරියාව ගෙවිලා ගිහින් පහුවදා අලුත් අවුරුද්ද ලබන්න ලැස්ති වුණා.. ආධ්‍ය අයියලගෙ ගෙදරත් මේ දවස්වල අස් කරනවා.. අචී අපේ ගෙදර ඇවිත් මෙහේ කට්ටියත් එක්ක සෙල්ලම් කල්ලා ගියා.. අවුරුද්දට නැකැත් තිබ්බෙ මල උදේ පාන්දර නිසා කලින්ම චාරිත්‍ර ඉවරවුනාට පස්සෙ ආධ්‍ය අයියයි මාමයි අපේ ගෙදර ආවා.. ඇයි රෑට හෙන තොගයක් ඉන්නවනෙ කෑම කන්න.. මට තනියම උයන්න බෑ.. ආධ්‍ය අයියා ආවහම පාළුවක් නෑ කියව කියව උයන්න පුළුවන්.. ඒ අස්සෙ කුස්සියෙ බල්බ් එකක් කැඩිල අපේ මාමා බල්බ් එක හයි කරනකල් රධ්‍ය අයියා පහළ ඉඳගෙන ටෝච් එක අල්ලගෙන ඉන්නවා.. එහෙම කල්ලා ගුටි දෙකතුනකුත් කාලා මූණ ඇද කරගෙන හිටියෙ.. මහ ලොකු ඉලෙක්ට්‍රිකල් ඉන්ජිනියර් දත් දොස්තරට බල්බ් එක දාන්න දීලා ටෝච් එක අල්ලගෙන ඉන්නවා.. කොහෙන්ද කියන්න මෙවට හිනාවෙන්න ඕන.. මෙකගෙ මහාචාර්‍ය උපාධියෙනුත් වැඩක් නෑ.. කැම්පස් එකේ ලමයි මෙවා දැක්කනම් කැලෑ පත්තරත් ගහනවා..

@Shan

" මගෙ මූණට නෙමෙයි ඕක මේ හෝඩරේට අල්ලපන්කෝ.."

" ඉතින් මේ හෝල්ඩරේනෙ.."

රධ්‍ය අයියා හිතාමතාම ටෝච් එක මාමගෙ මූණට ගැහුවම මාමා බල්බ් එකෙන්ම රධ්‍ය අයියගෙ ඔලුවට එකක් දුන්නා..

" කේන්තිගන්න එපා මාමෙ.. හොඳ නෑනෙ.. නේද ආධ්‍ය අයියෙ.."

" උඹ හිටපන්කො කට පියාගෙන.."

" ලොකු මහප්පෙ.. මේ ආරු අයියා එන්නෙ නැද්ද තාම.."

" ඒ අනිත් රස්තියාදුකාරයා.. ආපුදෙන්කො ගෙදර..මාත් මේ එනකල් බලාගෙන ඉන්නෙ.. කොහෙද සාකි යනවයි කිව්වෙ.."

" ඇයි අනේ.. අම්මලාගෙ ගෙදර ගිහින් එනවා කියලා කිව්වෙ.. අහගෙන නෙමෙයිද හිටියෙ.."

" කෙල්ලෙක්වත් බලන්න යනවද මන්දා.. මෙකා.. හොයලා බලන්න ඕන දැන්නම්.. ආපු දෙන්කො ඩඩා ගාගෙන.."

ආධ්‍ය අයියා මගේ දිහා හොරෙන් බලලා වෙන පැත්තකට හැරුණා.. ඉන්නවා තමා මාමෙ කෙල්ලෙක්.. ඕක දන්නෙ රධ්‍ය අයියයි මමයි ආධ්‍ය අයියයි විතරයි.. මූ මහගෙදර ගිහින් පැත්තෙන් කෙල්ලෙක් දාගෙන.. කව්ද..?? සයෝන් අයියගෙ පොඩි දුව..!! එහේ ගිය වෙලාවක දැකලා යාළුවෙලා තියෙන්නෙ..මාමට කියන්න බයයි මාමා බනීවි කියලා.. ඒ වුණාට නොකියා ඉදලා දැනගත්තු දවසට ආරුවා මැරුම් කන්න බලාගෙනවත් හිටියොත් හොඳයි.. ඔය ලව් එකට බොක්කෙන්ම උදවු කරන්නෙ රාධේව්.. දැනගත්තු දවසට අපේ එකාත් ඉවරයි.. ආරුත් ඉවරයි.. අපිත් ඉවරයි..

" වේධා!!! කෙල්ලෙ මෙහෙ එන්නකො පොඩ්ඩක්.."

" සුදුමහප්පෙ.."

" අනේ පුතා.. අවී අයියට එන්න කියන්නකො හොඳ පුතා වගේ.. දැන් හවස්වෙලානෙ.."

@Shan

" හා සුදුමහප්පෙ.."

" හෑව් ශුජුමැහැප්පෙ.."

මගක් දුර දුවගෙන ගියපු දෝණි මූණ ඉස්කුරුප්පුවක් කරගෙන ආපස්සට හැරිලා බැලුවා..

" මොකක්ද කිව්වෙ!!"

" ඉතින් ලොකුමහප්පට කියන්න.. සුදුමහප්පා ඒ කාලෙ හෙන ලස්සනයිලු නේ.. ගැම්මක් තමා.."

දෝණි ආයෙම ගස්සගෙන යන්න ගියා.. අවුරුදු නිසා ගෙවල් හරි කලබලයි වගේ.. අපේ ගෙදර සේරටම හපන්.. තව ටිකකින් දහයක් දොලහක් විතර එන නිසා.. මම දැක්කා සුදුපුතා පඩිපෙළ අතුගාගෙන පහළට එනවා.. ඒකට මෙතන ඉන්න එකා.. සුදුමහප්ප හම්බුණ විදියක් ගැන අහගෙන කට උඩ බලාගෙන ඉන්නවා..

කොහොමහරි හවස හත විතර වෙද්දි කියාන් අයියලා සෙනුකලා චමිරුලා මහීශලා සේරම අපේ ගෙදර ආවා.. දැන් ඉතින් උන් පවුල් පන්සල් වෙලානෙ.. එක වාහනේකින් අඩුම හතරක්වත් බහිනවා.. අපෙ ගෙදර කට්ටියත් මග බලාගෙන හිටියෙ යාලුවො බලන්න ඕන කියලා.. අර හිච්චි කාලෙ ඉඳපු හාල්මැස්සො කෙල්ලො කොල්ලො ළමයි උස්සගෙන බහිද්දි හෙන අමුතුයි වගේනෙ.. මමත් හොඳ ඇඳුමක් දාගෙන පහළට එද්දිම රධ්‍ය අයියා ඉස්තෝප්පුවට ගියා.. රාධේවිත් ගාල කඩාගෙන වසුපැටියා වගේ ඉස්සරහට දුවලා ආර්ලෝගෙ කරේ එල්ලුණා.. සෙනුකයගෙ ගෙදර දෙන්නෙක් ඉන්නවා.. එක්කෙනෙක් ඒඩ්‍රියන්.. අනික් එක්කෙනා ආර්ලෝ.. ඒඩ්‍රියන් අයුක අයියා වගේ.. හැබැයි එච්චර ළමාතැනී නෙමෙයි සෙනුකයා හොඳට හදලා තියනවා.. ඒඩ්‍රියන් ලොකු එක්කෙනා.. එයා එක්ක සුදුපුතා එකතුයි..

" ටසිරිහ්.. මචං.. දැක්ක කල්.. පෞකාරයා මහත්වෙලාද මන්දා.."

සෙනුකයා ඇවිත් මාව බදාගෙන කරකලා ඉඹලා හෙන ඇක්ට් එකක් දීලා මගේ කරවටේ අතක් දාගෙන මාව ළඟට ඇදලා ගත්තා.. මුගෙ කොළු පිස්සුවනම් මෙ ආත්මෙට හොඳ වෙන එකක් නෙමේ.. පේනවනෙ.. මිනිහා ඉස්සරහයි ළමයි ඉස්සරහයි හෙන අසභ්‍ය විදියට හැසිරෙනවා..

@Shan

" හායි අනේ.. සුබ අලුත් අවුරුද්දක් වේවා.. අපේ සනෙරුමල.. මට ඔයාලව මතක් වුණා අනේ.."

" බොරු කියන්න ඕන නෑ හොක්ක.. අපිටනම් සෑහෙන්න වැඩ උඹව මතක් කර කර කරන්න දෙයක් තිබ්බෙ නෑ.."

මහීශගෙ වක්කඩ වගේ කට තාම හොඳට වැඩ කරනවා.. ධනුජ අයියා මහීශගෙ පිටට එකක් තඩිබෑවහම මහීශා රවලා ධනුජ අයියා දිහා බැලුවා.. කියාන් අයියට උගෙ සුදුඅම්මියයි සුදුදෝනියයි හම්බෙලා දැම්මම ඇතුළට ගිහින් කියවනවා.. ඒ අස්සෙ චමිරුවත් බොඩිගාඩ්ලා දෙතුන්දෙනෙක් එක්ක ගෙදර ගාවින් බැහැලා ලිලීවත් අතේ එල්ලගෙන හෙන මනමාලයා වගේ අපේ දිහාට ඇවිත් මටයි සෙනුකයටයි හග් එකක් දුන්නා.. උගෙ ලොකු පුතණ්ඩියා දැක්කා විතරයි ඒඩ්‍රියන්ගෙ අතේ එල්ලිලා කියව කියව හිටපු දෝණි එකසැරේ අතුරුදහන් වුණා..

" හායි අංකල්.. අපිට ඔයාලව මතක් වුණා අනේ.."

" බොරු නොකිය ඉඳහන් බං.. මතක් වුණාලු.."

" මෙහෙමයි අංකල් ෂනෙරුට වඩා අංකල් රධ්‍යව තමා මතක් වුණේ.. අපේ ඉස්කෝලෙ ප්‍රයිස් ගිවින් එකට ආවනෙ.. කොහෙද හලෝ ඔයා එන්නෙ කලර්ස් නයිට් එකටනෙ.."

" හැදියන් මුන් දෙන්නා දිහා බලාගෙන.. තමන්ගෙම ඉස්කෝලෙට චීෆ් ගෙස්ට් විදියට එන්නත් වාසනාව තියෙන්න එපෑ.."

" ඔව් ඈ.. අංකල් ෂනෙරුගෙ පම්පෝරිය ගැම්මක් තමා.."

මම කියාන් අයියගෙ පොඩි එකාගෙ පිටට දෙකක් දුන්නා.. මුගෙ කියවිල්ල තමා..

" ආ මල්ලිලා.. එන්න ඇතුළට.."

ආධ්‍ය අයියා සුර ගමනින් ගේ ඉස්සරහට වැඩියා.. මගේ දේවදූතයනෙ ඉතිං.. මම කට ඇරගෙන ආධ්‍ය අයියා දිහා බලාගෙන ඉන්න අතරෙ සෙනුකයා මගෙ පස්සට එකක් ගැහුවා..

@Shan

" අසහනේද පගො.."

" නැතුව උඹව දැක්කෙත් කොච්චර කාලෙකට පස්සෙද.. අසහනේනෙ පෞකාරයෝ.."

" දෙයියනේ සුවාමිපුරුශයොන්ට හොරෙන් ලව් කරමු පනේ.."

" අපි කවද්ද සුදුමහත්තයො හැංගි හොරා එච්චා කලේ.. අඩෝ ගෙට යමන්.. ගේ ඉස්සරා හිටගෙන කතාකරන්නෙ.. මේ ළමයි ගෙට එන්න.. එළියෙ ඉන්නැතුව.."

" අපි එන්නම් අප්පච්චි යන්නකො.."

සෙනුකයගෙ ගෙදර තාත්තයි අප්පච්චියි මාරු කල්ලා කතාකරන්නෙ.. අපි දෙන්නා ගෙට එන්න ආවා.. සෙනුකයගෙ පුප යකෝ.. මම හිමින් සැරේ අත කරකලා පාරක් ගහන්න ගියාම මගේ හිත අස්සෙන් මොකෙක්ද කෑ ගහන්න ගත්තා..

වරදයා හිත පාලනය කරගනින්.. උබ දැන් ළමයි තුන් දෙනෙක්ගෙ තාත්තා කෙනෙක් නේද..!!

*චටාස්*

" හුක්! උබටනම් සෑහෙන්න අසහනේ වගේ ෂනෙරුවා.. අඩෝ රධ්‍ය අයියට කියන්න ඕන.. රධ්‍ය අයියේ මූටහ්මක්ක්ක්ක්!!!"

" පගො ළමයි ඉන්නවා ඕක වහගනින්.."

මම සෙනුකයවත් ඇදගෙන ගේ ඇතුළට ගියා.. හුඟ කාලෙකින් සෙට් වුණාම කතාකරන්න දේවල්ද ඉතින් නැත්තෙ.. කොච්චර දේවල් තියේද.. අපි කකා කියව කියව හිටියා.. උන්ගෙ ගෙවල් වල විස්තරයි.. මිනිස්සුන්ගෙන් ලැබෙන හිංසා පීඩා, අසාධාරනකම්, හොස්පිට්ල් වල ඔපදූප, රධ්‍ය අයියලගෙ ක්‍රිකට් රගර් මැචස්, ළමයිනෙ දාහක් දුක් ගැහැට, ප්‍රශ්ණ, කැම්පස් වල වැඩ, බිස්නස් වල විස්තර, කොටස් වෙළඳපොළ.. ඕවා තමා කියවන්නෙ.. උන් කියන ඒවා අපිට තේරෙන්නෙ නෑ.. අපි කියවන හොස්පිල් වල ඔපදූප උන්ට තේරෙන්නෙ නෑ.. ආධ්‍ය අයියයි මාමයිත් අපි එක්ක තමා හිටියෙ.. ඒගොල්ලො ඉස්සර ඉඳන් අපේ ෆිට් එකනෙ.. කෑම

@Shan

කාලා ඉවරවුණාම පුතාලා උඩට ගිහින් මූවි එකක් බලනවා කියලා සුදුපුතාගෙ කාමරේට ගියා.. අපි කියවන ඒවා ඒගොල්ලොන්ට හෙන බෝරින් ඇති.. අපිත් ඔය කාලෙ එහෙමනෙ..

මමයි ආශියි කුස්සියට වෙලා අයාන් අයියගෙ ඕපදූපයක් පට්ට ගගහා ඉද්දි රධ්‍ය අයියා උඩ පැන්ට්‍රි එකක් ඇරලා බෝතල් වගයක් උස්සගෙන මදහසක් පාගෙන සාලෙ පැත්තට ගියා.. අයාන් අයියා දැන් රටනෙ ඉන්නෙ.. ළඟදි ආශිලා එහේ ගිහිල්ලා.. මෙකි සේරම ඕපදූප ටික හොයාගෙන ඇවිත් අපි ඉස්සරහා දිගැරියා.. ටිකකින් ආශිටත් මොනාහරි බොන්න ඕන කියලා ඉස්සරහට ගියාම, මමත් කුස්සියෙ තිබ්බ ඒවා ටික අස් කල්ලා ඉස්සරහට යන්න යද්දි රධ්‍ය අයියා ග්ලාස් එකකුත් අතේ තියාගෙන වැනි වැනි ඇවිත් මගේ කරට අතක් දාගෙන මාව ළඟට ඇදලා අරගත්තා..

" මගෙහ් වරද්.. එන්නැද්ද.."

" තවුසෙට මේ කීයද කියලා පේනවද.."

මම ඇඟිලි දෙකක් ඇතටකල්ලා පෙන්නුවහම රධ්‍ය අයියා ඇස් දෙකත් හීනි කරගෙන ඒ දිහා බලාගෙන හිටියා..

" දෙකනෙ.. නේද.."

" තාම වැදිලා නෑ නේත.."

පස්සෙ රධ්‍ය අයියා මාවත් ඇදගෙන සාලෙට යද්දි ආධ්‍ය අයියා සුර හිනාව දාගෙන ඇස් දෙකත් බාගෙට පියාගෙන වොඩ්කා වීදුරුවකුත් අතේ තියාගෙන බොනවා.. මාමත් බියර් කෑන් එකක් කඩාගෙන බොනවා.. කොහොම හරි ආශියි මහීශයි විතරයි වයින් බීලා හීයෙ.. සෙනුකයා නම් කොහොමත් සෙට් වෙන්න ගත්තොත් අමු බෙබද්දා.. ඒකා කොහෙන්දෝ මන්දා මයික් එකකුත් උස්සගෙන ඇවිත් අයුක අයියගෙ ඇඟ උඩට කඩාගෙන වැටුණා..

" ශුඩුඅයියෙ.. තුවාල නෑ නේත.."

" වත්සල්..!"

" වස්සල් තමා ඒයි.. එහෙට පලකො මට ඉඳගන්න.."

@Shan

සෙනුකයා අයුක අයියව බිමට තල්ලු කල්ලා සෝෆා එකෙන් ඉඳගත්තහම මාත් ළඟ ගාවට ගිහින් වයින් ග්ලාස් එකක් පුරෝගෙන සෝෆා එකේ ඇන්දට හේත්තු වුණා..

" අයේ කවද හම්බෙන්නද අනේ.. මොකෝ අපි හැමදාම එකට ඉන්නවයැ.. කෝ සනෙරු ළමයි ටික.."

මම ඇඟිල්ලක් දික් කල්ලා උඩ තට්ටුව පෙන්නුවා..

" අඩෝ මෙහෙම බොන එක හරි නැද්ද මචං.. අපි දැන් දෙමාපියොනෙ නේත.."

" මෙ මිනිහට ඒක මතක් වෙලා තියෙන්නෙ බෝතලෙන් බාගයක්ම ගහලා ඉවරවුණාම.. මහී බබා.. පුරෝලම එකක් දාපන් කෙල්ලෙ.."

*cheers*

ඒ අස්සෙ සෙනුකයා ටීවී එකේ කැරෝකේ එකක් ප්ලේ වෙන්න දාලා තව මයික් එකකුත් හොයාගෙන ඇවිත් ඒක ඔන කල්ලා පිස්සුවක් කියවන්න ගත්තා.. රඨා අයියා එහාපැත්තෙ සෝෆා එකෙන් වාඩිවෙලා මාව ඇදලා කකුලකින් ඉන්දවගත්තා..

" අඩෝ සිංදුවක් කියමු මචං.. ඉස්සරනම් කොච්චර කියනවද.. ගිටාර් එකක් ගෙනෙන්කො.."

" උඹට ගිටාර් එක අඳුරගන්නවත් පුළුවන්ද.."

" පිස්සුද මල්ලෙ.. ගිටාර් එක ඇවිල්ලා මගේ ඇහේ අනිත් බාගෙනෙ.. ඔන්න ඕක දීපන් බං.."

සෙනුකයා සාලෙ පැත්තක තියලා තිබ්බ සුදුපුතාගෙ ගිටාර් එක අරගෙන දෙතුන්පාරක් ගහලා බැලුවා.. ඌට නාගසලං වෙන්න වැදිලා මිනිහා අඳුරගන්න බැරිවුණත් ගිටාර් එකනම් ගහගන්න පුළුවන්..

" මොකක්ද කියන්නෙ.. අපේ කාලෙ එක්ක කියමු බං.. දැන් තියන ඒවා මම දන්නෙත් නෑ.. අපි නාදගමේ එකක් කියමුද.."

@Shan

" ඕන එකක් අනේ.. මමත් හෙල්ප් කරන්නම්.. අපි මාරුකරගෙන කියමු හරිද.."

" හා.. ඉඳපන් පොඩ්ඩක්.."

සෙනුකයා ටිකක් වෙලා ඔලුවත් නමාගෙන ඉඳලා ගිටාර් එක ගහන්න පටන් ගත්තා.. මම තව වයින් ග්ලාස් එකක් පුරෝගෙන රධ්‍යා යියගෙ ඇඟට හේත්තු වුණා.. සාලෙ බිම පවා කට්ටිය ඉඳගෙන.. ඇත්තටම මෙහෙම එකතු වුණාම හරි ලස්සනයි.. මේ ගෙවෙන වෙලාව.. අවුරුදු ගාණක් ආපස්සට කාලෙ මතක් වෙනවා.. චමිරු මයික් එක ඉල්ලගත්තා.. ගිටාර් එකෙන් හරි ලස්සන මියුසික් එකක් ඇහෙනවා.. හැමතැනම කපල් ඉන්න නිසා හෙන රොමැන්ටික් වගේ..

" දෑත දරා ඇවිදින් ආදරයෙන්

මා වෙනුවෙන් හිඳිනා අයුරු

මිදෙමි දැහැනෙන් හැඟුමන් පාමුල

සිත් වාරු බිඳෙයි ඔබ ළඟ මියුරු.."

ඊළඟට අයුක අයියා මයික් එක ඔන් කරගත්තා..

" සේද වලා අතුරාලා සඳ පායා

ඇති රෑ තුරුලේ ගෙවමු

මා පැතු ඒ යුග නෙත් ආදර හිත්

ආදරයෙන් හමුවීමයි හිමි වූ.."

" මනහාරී නුරාවී නෙතු මානේ සිනාසී

තව ළං වී පෙමින් දම් ගොතමි.."

රධ්‍ය අයියා මයික් එක ඉල්ලගෙන මගේ දිහා හරි ආදරේ හිතෙන විදියට බැලුවා.. කොහොමත් රධ්‍ය අයියා ඉඳහිට බිව්වහම මම බලාගෙන ඉන්න

@Shan

කැමතියි.. අර පොඩි එකෙක් වගේ කියන කතා අහන් ඉන්න ආස හිතෙනවා..

"

**ගිමහානේ තුහීන ගේනාඹබෙන් මා නිවෙමි සදා කල් හිදිමිතරු යායේ පුරා හද මාගේවලාවකින් මාගේ ආලේ ලියමි**

.."

" සේද වලා අතුරාලා සඳ පායා

ඇති රෑ තුරුලේ ගෙවමු

මා පැතු ඒ යුග නෙත් ආදර හිත්

ආදරයෙන් හමුවීමයි හිමි වූ.."

" දෑත දරා ඇවිදින් ආදරයෙන්

මා වෙනුවෙන් හිදිනා අයුරු

මිදෙමි දැහැනෙන් හැඟුමන් පාමුල

සිත් වාරු බිඳෙයි ඔබ ළඟ මියුරු.."

අන්තිම කොටස ආධ්‍ය අයියා හරි ලස්සනට ඉවර කරද්දි මම දැක්කා අයියා අපේ මාමා දිහා හරි ආදරෙ එහිතෙන විදියට බලාගෙන ඉද්දි මාමගෙ ඇස් දිලිසෙනවා..

කොහොමහරි ආපු අය ආයෙම යද්දි පාන්දර දෙකට විතර ඇති.. එතකල් පුතාලා උඩ තට්ටුවෙ එයාලගෙ වෙනම ඩීජේ එකක් ප්ලේ කරගෙන පිස්සු නටලා හති දමාගෙන අම්මලා තාත්තලා එක්ක ආයෙම ගෙව වලට යන්න ලෑස්තිවුණා.. කියාන් අයිඅය එහෙම ගියේ හතරගාතෙන්.. හොඳවෙලාවට ගෙවල් වලින් එකෙක් හරි වෙරි අඩුවෙන් හිටියා.. අයුකා යියත් සෙනුකයව වාරු කරගෙන ඒඩ්‍රියන්ලා එක්ක යන්න ගියාම රධ්‍ය අයියා වැනි වැනි ඇවිත් මාව තුරුල් කරගත්තා.. දැන්නම් ඇහිලි දෙක්ක පෙන්නුවොත් 'මෙ මොකක්ද වරද් කෙහෙල් කැනක්ද' අහන ගාණටම වැදිලා ඉන්නෙ..

@Shan

පුතාලාත් කාමරවලට ගිහින් වොශ් දාගෙන අපි දෙන්නටත් වැදලා නිදාගන්න ගියාම ආධ්‍ය අයියලත් ගෙදර ගියා..

රධ්‍ය අයියා ටිකකින් කාමරේට එන්නම් කියපු නිසා මම කාමරේට ගිහින් වොශ් එකක් දාගෙන බාත් රෝබ් එකකුත් ඇඟේ පටලගෙන ෆෝන් එකත් අරගෙන ඇඳේ පැත්තකින් ඇලවෙලා හිටියා.. රධ්‍ය අයියත් වොශ් එකක් දාගෙන එනකල්.. ගෙදරට කට්ටිය ඇවිත් ගියාම හරියට වැස්සක් වැහැලා පැව්වා වගේ.. මෙලෝ සද්දයක් නෑ.. මෙච්චරවෙලා බෙරිහන් දුන්නනෙ.. මම ෆෝන් එක දිහා බලාගෙන කල්පනා කර කර ඉද්දි අයුක අයියා ගෙදර ගියා කියලා මට මැසේජ් එකක් එව්වා..

" අයුක අයියලා ගෙදර ගියා කියන්න කිව්වා.."

රධ්‍ය අයියා ඇස් දෙකත් රතු කරගෙන කණ්නාඩිය ගාවට ගිහින් ඔලුව පිහාගන්න ගමන් මගේ දිහා බැලුවා.. මම එහා කොනට ගිහින් ඇඳේ අනිත් පැත්තට තට්ටුවක් දැම්මහම රධ්‍ය අයියා ඇඳුමක් ඇඳගෙන ලයිට් එකත් ඩිම් කරගෙන අමුතු හිනාවක් දාගෙන මං ගාවට ඇවිත් මගේ අතින් ඇදලා එයාගෙ ළඟට ඇදගත්තා..

" උඹ ඔහොම ඉන්නවා දැක්කහම කොහොමද කියපන් නිදාගන්නෙ.. මම්..??"

රධ්‍ය අයියා මගේ බාත්‍රෝබ් එකේ පටිය හිමින් සැරේ ලිහලා බිමට දැම්මහම, කරේ එක පැත්තකින් බාත්‍රොබ් එක පහළට වැටුණා.. රධ්‍ය අයියා මගේ පපුව දිගේ ඇඟිලි පහලට ඇදගෙන කලව ගාව ඉඳන් තියන ටැටූ එක දිගට හාදු ගොඩක් තිව්වා.. මම කකුලක් උස්සලා රධ්‍ය අයියගෙ උරහිස උඩින් තියලා එයාව මගේ පැත්තට ඇදගෙන නයිට් කිට් එකේ බොත්තම සේරම පන්නලා දැම්මා..

" නිදාගන්නෙපා ඉතින්.."

රධ්‍ය අයියා මගේ පපුව දිගට හාදු ගොඩක් තිව්වහම මම එයාගෙ උරහිසක් තද කල්ලා අල්ලගත්තා.. උණු හුස්ම පපුවෙ වදිනවා දැනෙනකොට ඇඟ දිගේ දැනෙන හිරියට මට කෙඳිරි ගෑවුනා.. ඒ එක්කම මගේ ඇඟේ තිබුන බාත්‍රෝබ් එක ඇඳ කොනෙන් පල්ලම් බැස්සා.. වෙනදා වගේම මගෙ කම්මුල් ඉක්මනට රතුපාට වුණාම රධ්‍ය අයියා ලාවට හිනාවුණා.. ඒ වුණාට එයාගෙ ඇස් වලින් පේන ආදරේටයි ආසාවටයි හිතට බය හිතෙනවා..

@Shan

" අද මට කැමතියි කියලා හිතෙන වෙලාවක් වෙනකල් ඔයාව ඕන.. ප්ලීස් වරද්.. Can I have the permission..?"

" ඔයාට අද ඕන එහෙමනම්.. Do as you like.."

රධ්‍ය අයියා පහත් වෙලා මගේ තොල් වලින් හාද්දක් දීලා මගේ අතක ඇඟිලිවල එයාගෙ ඇඟිලි පටලගත්තා.. වෙනදා වගේම ඔරලෝසුවෙ විනාඩි කටු වටගණනක් කැරකෙනකල්ම මම හුස්ම අල්ලන්න හති දැම්මා.. ඉවසගන්න බැරිම තැනක රධ්‍ය අයියගෙ පිට දිගට පාරවල් මතුවුණා.. ඒත් එයාට ඇතිවීමක් තිබ්බෙත් නෑ.. මට ඇතිවීමක් තිබ්බෙත් නෑ.. සෑහෙන්න වෙලාවකට පස්සෙ රධ්‍ය අයියා වේගෙන් හුස්ම ගන්න ගමන් මගේ ඇඟ උඩට කඩාගෙන වැටෙද්දි මම හිටියෙ දාඩියෙන් පෙඟිලා ගිහින්.. ඇඟට දැනෙන තෙහෙට්ටුවටයි.. අමුතු තෘප්තිමත් හැඟීමටයි මගේ ඇස් පියවේගෙන එද්දි රධ්‍ය අයියා මගේ නලලට හාද්දක් දීලා මාවත් උස්සගෙන බාත්‍රෑම් එකට වැදුණා..

වෙලාවත් එක්ක ගෙවුණු ආදරණීයම මොහොතකට පස්සෙ මම පුරුදු විදියටම රධ්‍ය අයියගෙ අත් දෙක අස්සට හරි සනීපෙට තුරුල් වෙලා හිටියා.. එයාගෙ හද ගැස්මත් මගේ කම්මුලකට දැනෙනවා.. වොඩ්කා සුවඳට වැටෙන හුස්ම මගේ හිස් මුදුණෙ වදිනවා දැනුණත් සැරින් සැරේට මජ් නලලට ලැබෙන හරි ආස හිතෙන හාද්දකින් මගෙ හදවත පිරිලා ඉතිරිලා ගියා.. අවුරුදු ගාණකට කලින් මිදුලේ ඉන්දපු සේපාලිකා ගහ පිහගෙන ගලාගෙන යන හුළං පාරක් ජනේලෙ ඇතුළෙන් අපටත් දැනුණා.. මම රධ්‍ය අයියගෙ පපුව මැද්දට තොල් තදකළා..

" ඔයා කොහොමද වරද් මාව හොයාගෙන මෙච්චර දුරක් ආවෙ.."

රධ්‍ය අයියා හැමදාම අහන ප්‍රශ්නෙ අදත් මගෙන් ඇහුවහම මම එයාගෙ ඇස් දිහා බලාගෙන හිටියා..

" මට ඔයාවම ඕන නිසානෙ.. වෙන මොකටද.."

" මම හැමදාම හිතුවෙ මේ ලෝකෙ තියන ලස්සනම ආදරේ ඔයාට දෙන්න.. මං ගාව පරිස්සමට තියාගෙන ආදරෙන් බලාගන්න වරද්.. ඒක හරි ලෝබ හිතෙන හැඟීමක්.. හදවතින්ම එන දෙයක්.. වචන වලින් කියන එක නෙමෙයි.. මවාපාන එක නෙමෙයි.."

@Shan

" මම දන්නවා.."

" ඔයා ලස්සන මනුස්සයෙක් වරද්.. ඇත්තටම මම අවුරුදු ගාණකට පස්සෙත් තාම හිතනවා.. මම ඔයාට ආදරේ කරන එක ගැන එක මොහොතකටවත් පසුතැවිලා නෑ.. අදටත් මම ගත්තු හොඳම තීරනේ ඔයාට ආදරේ කරන්න ගත්තු එක.. මගෙ වරද්..!! මම හරි ආදරෙයි.. හැමදාම උදේට නැගිට්ද්දි මගේ එහාපැත්තෙ ඔයා ඉන්නවා කියන හැඟීම.. ඉස්සර අපි දෙන්නම හීන දැක්ක හැඟීම.. හැබැවෙලා තියනවා දැනුණහ.. මේ මොහොතෙත් මම ජීවත්වෙනවා කියලා මට දැනෙනවා.."

" අයියෙහ්.."

රධ්‍ය අයියා මාව පපුවට තුරුල් කරගෙන හිටියත් එයාගෙ කටහඬ වෙවුලනවා මට දැනුණා..

" අපිට තව ඉස්සරහා හුහක් කල් තියනවා වරද්.. අපේ ලමයි ලොකු වුණාට පස්සෙ.. එයාලා එයාලගෙ හීන වලට පියාඹලා ගියාටත් පස්සෙ.. අන්තිමට මගේ ජීවිතේට ඉතුරුවෙන්නෙ ඔයා විතරනෙ.. ඒකනිසා හැමදාම මාත් එක්කම ඉන්න වරද්.. දැන්නම් මට කොහොමවත් මතක නෑ උඹව නැතුව ජීවත්වෙන්නෙ කොහොමද කියලා.."

" මම ඔයා එක්ක ඉන්නවනෙ.. මමත් හුහක් ආදරෙයි.."

රධ්‍ය අයියගෙ පපුව උඩ තිබ්බ මගේ අත එයාගෙ ලොකු අතක් මැද්දට මැදි වුණාම එයාගෙ වෙඩින් රින්ග් එක සීතලට මගේ අතේ වැදෙනවා දැනුණා.. එයා මගේ අතින් හාද්දක් තිබ්බා.. මම තව ටිකක් රධ්‍ය අයියට තුරුල් වුණා.. ඒ ගෙදරක් වගේ හැඟීම මාව උණුහුමින් වහගන්නවා මට දැනුණා.. හරියට සීතකාලෙ ගෙයක් ඇතුලෙ පත්තු කරපු ගිනි උදුනකින් එන රස්නයක් වගේ.. ඒ උනුහුම ඇතුලෙ පුදුමාකර සැනසීමක් මට දැනුණා..

ඉතින් හැමදාමත් ඒ ආදරණීය අත් මට ගෙදරක් වුණා වගේම.. පහුකරපු හැම සීත කාලකම මට උණුහුමක් ගෙනැල්ලා දුන්නා.. මේ ජීවිතේ ගෙවිලා නොයනවනම්.. මේ ආදරේම සදාකාලික වෙනවනම්.. මම හරි ආසයි.. ලෝබයි.. මේ ආදරේට මම ලෝබයි..

නිදිමතක් ගලාගෙන ඇවිත් මගේ ඇස් පියවෙද්දි මම හිතින්ම ප්‍රාර්ථනා කළේ.. මගේ ◌ැස් පියවෙන අන්තිම මොහොතෙත් මෙ අත් අතරෙම ඉන්න

@Shan

ඕන කියලා විතරයි.. ඒ ගමනත් ඔයා මට සැනසීමක් එකතුකරනවා කියලා මම දන්නවා.. ආච්චිඅම්මා කිව්වා වගේම.. මහපොළව උඩ ආදරේ පුරෝගත්තු මිනිස්සු ඉන්නවා ආච්චිඅම්මෙ.. ඔයාගෙන් පස්සෙ ඒ එයා.. ඉතින්..,

**ලොකෙ වාසනාවන්තම ආදරවන්තයා වෙන එකත් ලේසි නෑ..!!**

***

ජීවිතේ මැද්දෙන් හමාගෙන ගිය සැඩසුළඟට අහුවුණු කණාමැදිරි එළියක්.. සේපාලිකා මල් පෙත්තක රඳවගෙන.. මෙච්චර ජීවිතේට සුවඳ තැවරුවට.. මලට අලුතින් කතාවක් ගෙතුවට.. ඒ සුවඳ අලුත් කලාට.. මට නවාතැනක් වුණාට.. රහසේම කඳුළු හංගන් හිනාවුණාට.. දරන්න බැරි සීත කුනාටු පහු කළාට.. මහා රුස්ස ගහක් වගේ දරාගෙන හිටියට.. මගේ ජීවිතේට ආයෙම එළියක් අරගෙන ආවට.. මම හුඟක් ආදරෙයි මගෙ වරද්..

ඔයා මං ගාව නැති කාලෙ.. මට දැනෙනවා මගේ වයසට ගිය හිතටත් ඒ පාළුව දරන්න බැරි තරම්.. ඔයාගෙ අතැඟිල්ලට මමම දාපු මුදුව.. මගේ අතේ තවම තියනවා.. ආයෙම ඔය හිනාව දකින්න මම පෙරුම් පුරාගෙන බලාගෙන ඉන්නවා.. අදටත් මම අවසානෙ විශ්වාස කරනවා.. මගේ දිනපොතට ඔයා නමින් අන්තිම ලියුමත් එකතු කල්ලා මම හරි ආසාවෙන් ඔයා ළඟට එන්න බලාගෙන ඉන්නෙ.. මෙ සති දෙක හුඟක් පාළුයි.. මගෙ පණ..

මම එනකල් ඔයා බලාගෙන ඉන්නවා කියලා මම දන්නවා.. අපේ දරුවො අපි වෙනුවෙන් සතුටු වෙනවා.. ඔයා මේ පොළොව උඩ ඉතුරු කල්ලා ගිය මනුස්සකම අදටත් දළු දානවා.. සේපාලිකා මල් පිපෙනවා වරද්.. ඒවා හරි සුවඳයි.. ඔයාව හරියට මතක් වෙනවා.. අපේ පඩිපෙල සම්පූර්න වෙලා හුඟක් කල්නෙ.. මම අද ආයෙම වතාවක් පඩියෙන් පඩියට නැගලා බලුවා වරද්.. අපි සැහෙන්න දුරක් ඇවිල්ලා නේද.. ඔයා කියනවා වගේම අපි ආදරණීය මිනිස්සු වෙන්න ඕන.. අපි ඒක කළා.. මම ඉක්මනට එනවා..

මම එනකල් පරිස්සමින් ඉන්න..

රධ්‍ය ශනව් හෙලාක්ශ..

දෙසැම්බර් එකොළහ

@Shan

***

ජීවිතේ හරි පුදුමයි නේද.. මම මේකෙ ලිව්වට කමක් නෑනෙ.. මම ඔයාට හුඟාක් ආදරෙයි.. මං ගාවට එනකල් පරිස්සමට ඉන්න.. ඔයා මේක බලනවා කියලා මම දන්නවා.. ඒ වගේම දුකින් ඉන්න එපා.. මම කැමති නෑ ඔයාගෙ හිත රිද්දන්න.. ඔය මූණ දුකින් පිරිලා තියනවා දකින්න.. තේරුණාද..

වරද් ෂනෙරු..

නොවැම්බර් දාහත

***

**..සේපාලිකා සුවඳ තැවරුණු ආදරණීය යුගයක අවසානයට ආදරෙන්....සමාප්තයි..**

@Shan

# මගෙන් සටහනක්...

මගේ ආදරණීයම දළඹු සේනාවට..

ඔයාලා අවසානෙ වෙනකල්ම මේ කතාවෙ හුහක් දුර ඇවිදගෙන ඇවිදගෙන ඇවිදගෙන ඇවිත්.. අපි අවසානෙට ඇවිල්ලා ඉන්නෙ.. මුලින්ම ඔයාලා වෙනුවෙන්

**හුහක් ස්තූතියි**

..

මම ලියන අකුරක් ගානෙ වටිනාකමක් එකතු කරපු.. අගයපු.. මට අදහස් ලියලා එවාපු.. නිසඳැස් ලියලා එවාපු.. ලස්සට කවර හදලා එවාපු.. සිංදු ලියලා එවාපු.. මීම් හදලා එවාපු.. වීඩියෝ හදලා එවාපු මගේ ආදරණීයම ළමයි හැමෝවම මම හදවතින්ම අගය කරනවා.. ඒ වගේම ආයෙම ස්තූතියි..

ආයෙම වතාවක් කතාව මුලදි වගේම අගදිත් ශෙනුන් අයියට මම හුහක් ස්තූතියි කියලා කියනවා.. ඔයාලා ආදරේ කරන.. මම ගොඩනගාපු චරිත වලට නම දුන්නෙ ශෙනුන් අයියා.. හුහක් ස්තූතියි අයියෙ..

ඒ වගේම මම වෙනුවෙන් විවේචන ඉදිරිපත් කරපු අයටත් හුහක් ස්තූතියි.. හැමදේම ජීවිතේට පාඩමක් කියලා හිතන්න පුළුවන් නෙ.. මම මේ කතාව ලියන්න පටන්ගනිද්දි මෙච්චර දේවල් බලාපොරොත්තු වුණේම නෑ.. ඉතින් මෙක ලියපු කෙනා විදියට මම මගේ හදවතින්ම හුහාක් සතුටු වෙනවා.. ඔයාලගෙ දවසක් හරි මම නිසා සතුටු වුණානම්.. මට හරිම වටිනවා..

ඒ වගේම මම විශ්වාස කරනවා කතාව කියවන හැම කෙනෙක් ගාවම ස්වයං විනයක්.. ආත්ම ගරුත්වයක් තියනවා කියලා.. ඉතින් මගේ මහන්සිය වෙනුවෙන් වටිනාකමක් එකතු කරන්න.. මගේ අනුදැනුමකින් තොරව මෙ චරිත සිද්ධි වෙන දේකට යොමු කරගන්න එපා කියලා මම ඉල්ලනවා.. අපි හැමෝම එකිනෙකාට ගරු කරන්න ඕන තැන ඉදලා මම කතාකරනවා..

හැමෝගෙම සේපාලිකාවට තියන අවසාන කමෙන්ටුවට මගෙන් රිප්ලයි එක්ක දෙන්න ආසයි අනේ.. ඇත්තටම ස්තූති කරන්න ඕන හුහාක් අය මට

@Shan

කතාව ඇතුළෙන් හම්බුණා.. ඔයාලගෙ ඉවසීම මම ආදරෙන් අගය කරනවා..

ඉතින් මගේ ජීවිතේටත් ලස්සනම මතකයක් එකතු කල්ලා මේ කතාව එක්ක රැඳිලා හිටපු හැම කෙනෙක්ටම.. ආයෙමත් වතාවක්.. ආදරෙයි.. හුඟක් ස්තූතියි.. සතුටින් ඉන්ඩෝ~

ඉතින් සේපාලිකාවට ඔහොමම අදහස් කීපෙකුත් අකුරු කරගෙන යමු නේහ්..

වෙරි මින්ෂි.. ❤





@janmiread මම ආදරෙයි අක්කා.. තැන්කිව් සෝ මච් මේ තැග්ගට.. ❤

මගෙ වරද් ,

හීනෙකින්වත් හිතුවෙවත් නැති දවසක..

හීනෙකින්වත් හිතුවෙවත් නැති වෙලාවක..

අහම්බෙන් මගෙ ලගට ආපු ඔයා..

අද වෙද්දී මගෙ මුලු ජීවිතේම වෙලා..

ඔයා වගේ පුදුමාකාර විසයක් තිබ්බ කොල්ලෙක්..මන් මගෙ ජීවිතේට දැකලා තිබුනේ නෑ වරද්..

ඔය බළල් ඇස් දෙක දකින සැරයක් ගානේ..

මගෙ පපුව ගැහෙන වේගේ මටම හිතාගන්න බැරි උනා..

ඒ ඇස් අස්සේ මන් අනන්ත වාරයක් අතරමන් වෙලා ඇති..

තාමත් ඒක ඒ විදියටම අඩුවක් නැතුවම වෙනවා..

@Shan

අපි දෙන්නට එකට ඉන්න පුලුවන් වෙයිද කියන..

ජීවිතයක් ගැන හිතන්න බැරි තරම් ප්‍රශ්න ආවා තමයි..

ඒත් ඔයා විශ්වාස කරනවද වරද්..

අදටත් ඔයා මගෙ අත් අස්සෙන් උදේට නැගිටිනවා දකිද්දී..

හිතට දැනෙන ඒ සැනසීම ගැන ඔයාට හිතාගන්නවත් පුලුවන් ද..

කොහොමද මන් ඒ දැනෙන සැනසීම ඔයාට පැහැදිලි කරන්නෙවත්..

ඔයාගෙ පපුවට තුරුල් වෙලා ඉන්න හැම තප්පරේම..

මන් ප්‍රාර්ථනා කරන්නේ එකම එක දෙයයි වරද්..

මේ ආත්මේ මගේම උනා වගේම..

මගෙ ළඟ මේ ඉන්නවා වගේම..

හැම ආත්මෙකම..

මන් කියන්නේ හැම ආත්මෙකම..

මගෙ ලගට එන්න වරද්..

මාව හොයාගෙන එන්න..

මගෙ ආත්ම සහකාරයා එනකන්..

මට ඕන තරම් කාලයක් බලන් ඉන්න පුලුවන්..

ඕන තරම් කාලයක්..ඉතින්..

මට ඇත්තටම කියන්න ඕන උනේ..

මගේ ජීවිතේම වෙනස් කරපු මගෙ තාරා පැටියට..

මන් කියාගන්න බැරි තරම්..

@Shan

මහ ගොඩක් ආදරෙයි කියලා..විතරමයි !!!

#ලින්ඩා

සේපාලිකා ගසකින් අැරඹුනු කතාවක්

අාදරණීය ම මතකයන් ගොන්නක් රැගෙන

දුර අා ගමනක්

සතුට, දුක හොඳින් ම දැනුනු මොහොතක්

අාදරය ගැන කියා දුන්නු කතාවක්

හීන පොදි බැඳගෙන එකට අා ගමනක්

හීන සැබෑ වී නැවතුනු මොහොතක

නොවෙනස් ව තිබූ ප්‍රේමයක්

අත අල්ලා ගත් මොහොතේ සිට

අවසන් තත්පරය දක්වා අත නොහැරි

රාගයෙන් මත් වූ ලෝකයක් තුළ

සැබෑ ප්‍රේමයෙන් මත්වී

ළඟින් නොසිටියත්

දුර සිට පා කර එවූ එ් අාදරය

අපේ හදවතත් හොරා ගෙන

සේපාලිකා මලක තවරා

අනාත්ම ගණනක් දුරට පාවී ගොස්

අපේ හදවත් සසල කරමින්

@Shan

මෙසේ නිමා විය........

සේපාලිකා මලට ලියූ ඒ කතාව

මියෙන තුරාවට හදේ රඳවා

ආදරය, මිතුදම, උත්සාහය, කැපවීම

සියල්ල එක් කොට

හදවතේ ගැඹුරුම තැනක රඳවා

ජීවිතයේ අරුත, ආදරයේ සුන්දරත්වය, හීනවල වටිනාකම

අපට කියා දුන් ඒ කතාව

සේපාලිකා.......

#hsykpbl95

***

ප.ලි.

**- මෙහි එන සියලු පුද්ගලයන් සහ ස්ථාන හුදෙක් කතුවරයාගෙ සිතුවිලි පදනම් කොටගෙන ලියැවුවකි..**

**- කථාංගයේ යම යම කොටස් උපුටා සමාජ මාධ්‍ය තුළ කතුවරයාගේ අවසරයකින් තොරව පළ කිරීමෙන් වළකින්න.. (ටික්ටොක් වීඩියෝස්/ ස්ක්‍රීන්ශොටස්)**

**- කථාංගය පදනම් කොටගෙන විවිධ ආකාරයේ වෙබ් පිටු, සමාජ මාධ්‍ය ගිණුම පවත්වාගෙන යන්න අවසර නෑ.. එවැනි අනවසර ක්‍රියාවල වගකීම කතුවරයා භාරගන්නෙත් නෑ..**

@Shan